# අපණ්ණක ජාතකය

ශාක්‍ය කුල තිලකවූ පරදුක්ඛ දුක්ඛිතවූ කරුණානිධාන වූ අසරණ සරණ වූ සමන්ත භද්‍ර වූ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජාණන්වහන්සේ මේ භද්‍ර කල්පයට සරාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් යට සාරමණ්ඩ නම් කල්පයෙහි තණ්හංකරය, මේධංකරය, සරණංකරය යි තුන් බුදුකෙණෙකුන් වහන්සේට ඉක්බිතිව උපන් තුන්ලොවට ඛේමංකර වූ මොහඳුරට දිවාකර වූ මුළු සතන්ට ශාන්තිකර වූ පින්වත්නට සිවංකර වූ මරසෙනඟට භයංකර වූ දිපංකර නම් සර්වඥයන් වහන්සේ බුදුව සියළු සත්වයන් අමාමහානිවනින් දක්වමින් සුදසුන් විහාරයෙහි වාසය කරණ සමයෙහි රඹගම් නුවර වාසී මනුෂ්‍යයෝ සර්වඥයන් ප්‍රධානකොට භික්ෂුසංඝයා වහන්සේ පවරා සර්වඥයන් වඩනා මාර්ගය සරහන්නට වන්හ. එසමයට අප මහා බෝධිසත්වයෝ සුමේධ නම් තාපසව වාසය කරන්නාහූ මන්සකස්කොට තබන්නාවූ මනුෂ්‍යයන් දැක මේ මාර්ගය කුමකටද සරහවුදැයි විචාරා එපවත් දැන එසේ වී නම් මා සරහන නියායෙන් භූමි ප්‍රදේශයක් දෙවයි කීහ. එවිට මනුෂ්‍යයෝ දෙන්නාහු දදුරුව දියබොර ඇති භූමි ප්‍රදේශයක් දිලුහ. ඒ භූමි ප්‍රදේශය සකස් කොට තනා නොනිමන තුරු සාර ලක්ෂයක් භික්ෂුන් වහන්සේ පිරිවරා ඒ දිපංකර නම් සර්වඥයන් වහන්සේ වැඩි සේක. ඒ සර්වඥයන් වහන්සේ දැක සුමේධ තාපසයෝ මඩ කළලෙහි අඳුන් දිවිසම් අතුට බුදු බව පතා වැදහොත්තාහ. සර්වඥයන් වහන්සේ ඒ තාපසයන්ගේ ඉස්දොර සිට මහා පුරුෂයා කුමක් සිතා වැදහොත්තේ දෝ හොයි දිවසින් බලා සිතු සිතුවිලි දැක මහණෙනි මේ පුරුෂ තෙම මෙතනට සාරාසංඛ කල්ප ලක්ෂයකින් මත්තේ ගෞතම නම් බුදුවෙතියි . විවරණ පතුල් දෙවා වදාල සේක. ඒ සුමේධ තාපසයෝත් ගාථා මාත්‍රයක් ඇසූ පමණින් නිවන් දකිනට හේතු සම්පත් ඇතිව තිබියදීත් ඒ හැර සංසාරයට වැද එතැන් පටන් දසපාරමිතාය, දස උප පාරමිතාය, දස පරමාර්ත පාරමිතාය, යන සම ත්‍රිංශත් පාරමිතා ධර්මයන් හා අංගපරිත්‍යාගය ජීවිත පරිත්‍යාගය යනාදී වූ පඤ්ච මහා පරිත්‍යාගයන් හා ඉන් මෑත බුදු වූ කොණ්ඩඤ්ඤ දිවු තෙවිසි බුදු කෙනෙකුන් වහන්සේ අතින් ලබන ලද විවරණ ශ්‍රී ද ඇතිව වෙස්සන්තරාත්ම භාවයේ සිට සත් වරක් මහා පොළොව ගුගුරුවා මහ දන් දී එයින් චුතව තුසිත බවනයෙහි ඉපිද බොහො කාලයක් එහි වැස දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආරාධනාවෙන් පස් බැලුම් බලා ඇස පුරු පසලස්වක් ලත් උතුරු ශල නැකතින් මාතෘ ගර්භයෙහි ප්‍රතිසන්දි ග්‍රහනය කොට දස එකඩ මසක් ඇවෑමෙන් මාතෘ ගර්භයෙන් ප්‍රසූතව එකුන් තිස් අවුරුද්දක් රාජ්‍ය කොට තුන් පූර්ව නිමිත්ත දැක සසල කල කිරි සතර වෙනි දුටු මහන වේසය දැක ප්‍රවෘජ්ජාවෙහි ආලය ඇතිව එදා රාත්‍රියෙහි කන්ථක නම් අශ්වයා පිට නැගී දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මයන් පිරිවරා අනෝමා නම් ගංතෙරදී මුහුලස කපා ආකාශයට දමා මහා බ්‍රහ්මයා විසින් දෙන ලද අශ්ට පරිශ්කාර ධරා පැවිදිව සාඅවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට අජපාල නිග්‍රෝධ මූලයෙහි සුජාතාවන් දුන් සීල පායාසය වළඳා සල්උයනෙහි දිවා විහාරය කොට සවස් වේලෙහි ජය මහා බෝධින් වහන්සේ කරා එමෙන් සිටි අතර මගදී සොත්තිය නම් බමුණෙකු දුන් කුස තණ අට මිටක් ගෙන ඇසතු බෝමුල් හි සලා ඉන් පැන නැංගා වූ තුදුස් රියන් වජ්‍රාසනාරූඪව මාර පරාජය කොට අළුයම් වෙලෙහි සියළු කෙලෙසුන් නසා බුදුව සත් සතියක් බෝධිද්‍රැම සමීපයෙහි දවස් යවා අටවන සතියෙහිදී මහා බ්‍රහ්මයාගේ ආරාධනාවෙන් බරණැස් නුවර ඉසිපතන නම් විහාරයේදී පස්වග මහනුන් වහන්සේ ප්‍රධාන කොට ඇති බොහෝ දිව්‍ය බ්‍රහ්මයන්ට දම් සක් පැවතුම් සූත්‍ර දේශනාව කොට බොහෝ සත්වයන් අමා මහා නිවන් දක්වා එතැන් පටන් වෛනෙය ජනයන් සංසාර සාගරයෙන් ගොඩනගා වාසය කරන සේක් ඒ ඒ මනුෂ්‍යයන් හා ඒ ඒ භික්ෂු භික්ෂුනියන්ගේ හා නෙයෙක් ආපත්ති හා නොයෙක් දෘෂ්ඨාංත වලට හා නොයෙක් කතාන්තර වලට හා මෙකී දෙයෙහි සංඛා දුරු කරන පිණිස දිව්‍ය බ්‍රහ්ම මනුෂාදීන්ට පිංපිණිස වදාරණ ලද පන්සිය පණස් ජාතක එළුවෙන් දක්වන්ට උවමනැයි කියා පරාක්‍රම නම් ඇමති සත් පුරුෂයාගේ ආරාධනාවෙන් හා වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යයෝත්තම යාගේ උත්සාහයෙන් ද අටුවාසාමින්ලි ජාතක නියාව නොවරදවා එළුවෙන් ලියු ජාතක කථාව සත් පුරුෂ වූ මනුෂ්‍යා විසින් කන්යොමා සිත් එළා ඇසිය යුතු

හේ කෙසේ ද යත්

භාග්‍යවත් වූ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජානන් වහන්සේ ජේතවන මහා විහාරයෙහි දිව්‍ය බ්‍රහ්ම ආර්ය ර්යාර්ය පථ සංඛ්‍යාත විහරණයන් අතුරෙන් එක්තරා විහරණයකින් දවස් යවන සේක් අනේපිඩු මහා සිටානන්ගේ යහළු වූ පන්සියයක් තීර්තක ශ්‍රාවකයන් අරභයා මේ අපණ්නක ජාතක ධර්ම දේශනාව වදාල සේක. එක් දවසක් අනේපිඩු මහා සිටානෝ තමන්ගේ යහළු වූ පන්සියයක් තීර්තක ශ්‍රාවකයන් කැඳවාගෙන බොහෝ ගඩ දුම් මල් පහන් හා ගිතෙල් මී උක් සකුරු හා සිවුරු පිළි ආදීය ගෙන්වාගෙන ජේතවනයට ගොස් බුදුරජානන් වහන්සේට නමස්කාර කොට මල් සුවඳ ආදීයෙන් පූජා කොට ගිතෙල් ආදී වූ බෙහෙත් බඩු හා සිවුරු පිළිද භික්ෂු සංඝයා වහන්සේට පිළිගන්වා නපච්චතෝන පූරතෝ යනාදී සය වැදෑරුම් වූ මිසත්‍ය දෝෂ දුරු කොට එකත් පස්ව හුන්නාහුය. ඒ අන්‍ය තීර්තක ශ්‍රාවකයෝ බුදුන්ට නමස්කාර කොට බුදුන්ගේ පුන් සඳ මඩලක් බඳු වූ සශ්‍රික මුඛය හා දෙතිස් මහා පුරුෂ ලක්ෂණ අසිත්‍යාණු ව්‍යජන බ්‍යාම ප්‍රභා කේතු මාලා ලංකාරයෙන් විරජ මාන වූ බ්‍රහ්ම ශරීර හා කරකැවි යුවල යුවල නික්මෙන්නා වූ සන බුද්ධ රශ්මී බල බලා අනේපිඩු මහා සිටානන් සමීපයෙහි උන්නාහුය. එකල්හි ඔවුන්ට බුදුහු රත් ගල් තලාවක හිඳ සිංහ නාද කරන්නා වූ අභිත කේෂර සිංහ රාජයෙක් මෙන්ද මේඝ කාලයෙහි මහා වර්ෂාවක් වස්නා කලක් මෙන්ද ආකාශ ගංගාවක් බානා කලක් මෙන්ද රුවන් දමක් ගොතන්නාහූ මෙන් ද අශ්ඨාංගයෙන් සමන්විත වූ ශ්‍රවණීය වූ මනෝඥ වූ බ්‍රහ්ම ස්වරයෙන් නානානය නිපුණ විචිත්‍ර වූ මදුර වූ ධර්ම දේශනාවකට වදාල සේක. ඒ තීර්තක ශ්‍රාවකයෝ බුදුන්ගේ ධර්මය අසා ප්‍රසන්න වූ සිත් ඇතිව නැගී සිට දස බලදාරී වූ බුදුන්ට නමස්කාර කොට තීර්තක ලබ්දිය හැර බුදුන්ගේ සරණ ගියහ. ඔහු එතැන් පටන් ඇමකලම

SANHIDA LANKA

අනේ පිඬු මහ සිටානන් හා සමග සුවඳ මල් ආදිය ගෙන විහාරයට ගොස් බණ අසති. දන් දෙති. සිල් රක්ෂා කෙරෙති. පෙහෙවස් වෙසෙති. ඉක්බිත්තෙන් බුදුහු සැවැත් නුවරින් රජගහ නුවරට වැඩි සේක. එකල්හි ඒ තීර්තක ශ්‍රාවකයෝ බුදුන් රජගහ නුවරට වැඩි කල්හි බුදුන්ගේ සරණය හැර නැවත අන්‍ය තීර්තකයන්ගේ සරණ ගෙන තමන්ගේ මුල සරණයේහිම පිහිටියාහ. බුදු රජානන් වහන්සේගේත් සත් අටමසක් කල් ගෙවා යවා නැවත ජේතවනයට වැඩි සේක. අනේ පිඩු මහ සිටානෝත් නැවත ඔවුන් කැඳවාගෙන බුදුන් සමීපයට ගොස් වැඳ සුවඳ මල් ආදීයෙන් පූජා කොට බුදුන්ට නමස්කාර කොට එකත් පස්ව උන්නාහුය. ඒ තීර්තක ශ්‍රාවකයෝ ත් බුදුන් වැඳ එකත්පස්ව හුන්නාහුය. එකල්හි ඔවුන් බුදුරජානන් වහන්සේ සැරි සරා වැඩි කල්හි ගන්නා ලද සරණ හැර නැවත අන්‍ය තිර්තකයන්ගේ සරණ ගැන මුලස්ථානයෙහි පිහිටි බව අනේපිඩු මහ සිටානෝ බුදුන්ට දැන්වූහ. එකල්හි සර්වඥයන් වහන්සේ ප්‍රමාණාතික්‍රාන්ත වූ කාලයෙහි අතරක් නැති කොට පවත්වන ලද වාක් සුචරිතානු භාවයෙන් දිව සුවඳින් සුවඳ කැවූ නොයෙක් සුවඳින් පිරුණු රුවන් කරඬුවක් හරින කලක් පරිද්දෙන් මුඛ පත්මය විවෘත කොට මදුර ස්වර විහිදුවමින් සැබෑද උපාසක වරුණි. තොපි රත්නත්‍රයෙහි සරණ හැර අන්‍ය තීර්තකයන්ගේත් සරණ ගියෙදැයි විචාරා වදාල සේක. එකල්හි තමන් කල කාර්ය හඟ වන්නට අසමර්ථ වූ ඔවුන් විසින් සැබැව ස්වාමිනි. බුදුහු උපාසක වරුන්ට ආමන්ත්‍රණය කොට එම්භා උපාසක වරුණි. යටින් අවිචිය හා මත්තෙන් භවාග්‍රය කෙළවර කොට සරසින් අනන්තාපරිමාන සක්වලහෙි සීල සමාධි ප්‍රඥා වූ ගුණයෙන් බුදුන් හා සමකෙනෙක් නැත. බුදුන්ට වඩනා කෙණෙක්ම නැත. මෙසේ උත්තම ගුණයෙන් සමන්විත වූ රත්නත්‍රය සරණ ගිය උපාසක කෙනෙක් වේවා යි උපාසිකා කෙනෙක් වේවායි නරකාදී වූ සතර අපායෙහි උපදිනා හු නොවෙති. අපායොත්පත්තියෙන් මිදි දිව්‍ය ලෝකයෙහි ඉපිද මහා සම්පත් අනුභව කෙරෙති. එසේ හෙයින් තොපි ඇම දෙනා මෙබඳු සරණ හැර අන්‍ය තීර්තකයන්ගේ සරණ යන්නවුන් විසින් කල සේ නපුරැයි වදාලසේත. තවද උපාසක වරුනි බුද්ධානුස්මෘති ධර්මානුස්මෘති සංඝානුස්මෘති කර්මස්ථාන එනම් ශෝතාපත්ති ඵලය දෙන්නේය. සකෘද්ධාගාමී මාර්ගය හා සකෘද්ධාගාමී ඵලය දෙන්නේය. අනාගාමි මාර්ගය හා අනාගාමි ඵලය දෙන්නේය. අර්හත් මාර්ගය හා අර්හත් ඵලය දෙන්නේයැයි මේ ආදි වූ කාරණයෙනුත් ධර්ම දේශනා කොට මෙබඳු රත්නතරය සරණ බිඳපු තොප විසින් නොකල මනා දෙයක් කරණ ලදැයි වදාල සේක. මෙසේ භාග්‍යවත් වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ අනේක ප්‍රාකාරයෙන් උපාසක වරුන්ට අවවාද කොට උපාසකවැරනි පළමුත් මනුෂ්‍යයෝ අසරණය සරණයයි විරුද්ධ ග්‍රහනය ගෙන අමුනුශ්‍යයෝ පරිගෘහිත වූ කාන්තාරයෙහි යක්ෂයන්ට ගොදුරුව මහා විනාශයට පැමිණියෝය. සරණ යැම සරණයයි ඒකාන්ත කොට අවිරුද්ධ ග්‍රහණය ගත්තා වූ මනුෂ්‍යයෝ ඒකාන්තාරයෙහි ස්වාසස්ථානයට පැමිණියෝ වේදැයි වදාරා මුවෙන් නොබැන වැඩ උන් සේක. එකල්හි අනේපිඩු මහා සිටානෝ හුනස්නෙන් නැගී සිට බුදුන්ට වැඳ ස්තුති කොට දොහොත් මුදුනෙහි තබා ස්වාමීනි දැන් වූ කලි මේ උපාසක වරුන්ගේ උතුම් වූ රත්නත්‍රය සරණ හැර විරුද්ධ ග්‍රහණය අපට ප්‍රකාශය. පූර්වෙහි යක්ෂාදිගෘහිත වූ කාන්තාර මාර්ගයෙහි විරුද්ධ ග්‍රාහින්ගේ විනාශය හා අවිරුද්ධ ග්‍රහිතව වූ මනුෂ්‍යයන් ස්වාසස්ථානයට පැමිණි බව අපට සැබවී තිබෙන්නේය. නුඹ වහන්සේටම ප්‍රකාශය. ස්වාමීනී යාඥ්ඥා කරම්හ. පින්වත් වූ සර්වඥයන් වහන්ස. ආකාශයෙහි පුන් සඳ මඬල නගා පානා කලක් මෙන් මේ කාරණය ප්‍රකාශ කොට වදාල මැනවයි ආරාධනා කළාහුය. ඉක්බිත්තෙන් බුදුහු මා විසින් සිටානෙනි අප්‍රමාණ කාලයක් මුළුල්ලෙහි දස පාරමිතාවන් පුරා ලෝක වාසීන්ගේ සැක දුරු කරන පිණිසම සර්වඥතා ඥානය ප්‍රතිවේදය කරන ලද්දේය. සිංහ තෛලයෙන් රන් නලක් පුරවන්නාක් මෙන් සකස් කොට කන් නමා අසවයි සිටානන්ට සිහි උපදවා හිම ගර්භයක් පලා පුන් සඳ මඬල පිටත් කොට පාන්නක් මෙන් භවාන්තරයෙන් සැඟ වූනාවූ කාරණය ප්‍රකාශ කොට වදාල සේක.

යටගිය දවස කසීරට බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් සතර සංග්‍රහ වස්තුවෙන් ජනරංජනය කොට රාජ්‍ය කරන්නාහුය. එසමයෙහි පුරණ ලද බෝධි සංබාර ඇති අප මහා බෝසතානෝ සාන්තු නායක කුලයක පිළිසිඳ ගෙන ක්‍රමයෙන් වැඩිවිය පැමිණ පන්සියයක් ගැලින් වෙළඳාම් කොට ඇවිදිනාහුය ඒ බෝධිසත්වයෝ කලෙක නැගෙනහිරින් බස්නාහිරට යෙති කලෙක බස්නාහිරන් නැගෙනහිරට යෙති. එකල බරණැස් නුවර අනෙකුත් ශාන්තු නායක පුත්‍රයෙක් විය. ඒ තම අඥාණය අව්‍යක්කතය. උපායෙහි දක්ෂ නොවෙයි. එසමයෙහි බෝධි සත්වයෝ බරණැස් නුවරින් මහඟි වූ බඩු ගෙන පන්සියයක් ගැල් පුරා ගමන සරහා සිටු වූහ. ඒ නුවනැති සාන්තු නායක පුත්‍රද එසේම පන්සියයක් ගැල් බඩු පුරා ගමනට සරහා සිටුවූයේය. බෝධි සත්වයෝ ඉදින් මේ නුවණ නැති ශාන්තු නායක පුත්‍ර තෙමෙ මා හා සමඟ යේනැම් ගැල් දහසක් එක් මග යන්ට පටන්ගත් කල මග නොසෑහෙන්නේය. මනුශ්‍යයන්ට දර පැන් හා සරකට තන නොලැබ හැක්කේය. මොහුවත් මාවත් පළමු කොට යාම කටයුතු යයි සිතා බෝධි සත්වයෝ ඒ අඥාණ වූ සාන්තු නායකයා කැඳවා මෙපවත් කියා අප දෙදෙනා එක්ව යන්ට නොපිළිවෙන. කිමෙක්ද තෙපි ඉදිරියෙහි යව්ද?. නොහොත් පස්සෙයි යව්ද යි විචාලෝය. එවේලෙහිම හෙතම මෙසේ සිතී තමා ඉදිරියේ යන්ට වන් කල්හි බොහෝ අනුසස් වන්නේය. ගැල් සකීන් නුබුන් මගින් යෙමෙන් ගැල් අදිනා ගොන් පළමු සරක් නොකෑ තන කති. මනුශ්‍යයන්ට පළමු කිසි කෙණෙකුන් විසින් නොකැඩූ පළාකොලවන් වන්නේය. ප්‍රසන්න වූ පැන් වන්නේය. කැමති පරිද්දෙන් අගය තබා ගෙන බඩු විකුණමියි සිතා හෙතම මම යහළුව පළමු කොට යෙමියි කීහ. බෝධි සත්වයෝත් පස්සෙහි යාමෙහි බොහෝ අනුසස් දැක මෙසේ සිතූය. ඉදිරියෙහි යන්නා වූ සත්වයෝ මග විසම තැන සම කෙරෙති. මම ඔහුන් ගිය මගින් යෙමි. පෙරත් දුව ගිය ගොන් මුහුකුරා තදව ගිය තණ කති යි මාගේ ගොන් නැවත අට ගත් මිහිරි වු ලා තණ අනුභව කෙරෙති. පළමු පලා පල කඩා නැවත අට ගත් මිහිරි වූ ලාතන අනුභව කෙරෙති. පළමු පලා කොල කඩා ගත් තැනින් නැගී දළු පලා මනුශ්‍යන්ට මිහිරි වන්නේය. පළමු පැන් නැති තැන වලකැන පැන් උපදවති. මොහුන් කැනවූ වල වලින් අපි පැන් බොම්හ. පළමු

SANHIDA LANKA

කොට අගය තිබියේනම් මනුශ්‍යයන්ගේ දිවි ගැලවූ වාක් වැන්නේය.  මම පස්සෙහි ගොස් මොවුන් විසින් තුබූ අගයෙන් බඩු විකුණම් යැයි ඒ මහා බෝසතානෝ මෙතෙක් අනුහස් දැක යහළුව තෙපි පළමු කොට යව් වයි කීවාහුය. එකල්හි නුවණ නැති ශාන්තු නායක යහපත යහළු යැයි කියා ගැල් යොදා ගෙන නික්ම. ක්‍රමයෙන් මනුෂ්‍ය වාසය ඉක්ම කාන්තාර මුඛයට පැමිණියේය. හෙතම පළමුව හැම කල්හි මහසැල තබ්බවා පැන් පුරවා සැට යොදුන් කාන්තාර මාර්ගයෙහි ගමන් ගත්තේය. ඉක්බිත්තෙන් ඔහු කාන්තාර මධ්‍යයට පැමිණි කල්හි එහි අදිගෘහිත යක්ෂයෙක් මේ මනුෂ්‍යන් ගෙන යන පැන් දම්මවා පියා දුරුවල කොට සියල්ලවුන් කමියි සිතා සර්වාංගයෙන් දවල වූ ඇලි ගොන් දෙන්නෙකු යොදන ලද සිත්කළු යානාවක් මවාගෙන දුණු හිය උරු පළඟ ආයධ ගත් අත් ඇතිව අමුනුෂ්‍යයන් දස දොලොස් දෙනෙකු පිරිවරාගෙන ඇඹුල උපුල මල් පැළඳ නෙත් තෙත් ඉසකේ හා නෙත් පිලි ඇතිව නායක පුරුෂයෙකු මෙන් ඒ රතයේ ඉඳ මඩ වැකි ගියාවූ රථයකින් යුක්තව පෙරමගට ගියේය. ඔහුගේ පිරිවර අමුනශ්‍යයෝද ඉදිරියේ පස්සේ වන්නාහු තෙත් ඉසකේ හා තෙත් පිළි ඇතිව ඇඹුල උපුල මල් පැළඳ රත් පියුම් හෙල පියුම් මිටි ගෙන නෙළුම් අල සහ නෙළුබුදලි කමින් පැන් බින්දු හා මඩ බින්දු වගුරමින් නික්මුනාහුය. යක්ෂයා ඉදිරියේ එන්නාවූ සාන්තු නායකයා දැක තමාගේ යනාවමගින් පහකොට කොයි යව්දැයි යනාදීන් ඔහු හා සමග සුවදව කතා කලේය.  සාන්තු නායකයාද තමාගේ යානාව මගින් ඉවත් කොට සෙසු ගැල් යන්ට මග අවසර හැර එකත්පස්ව සිට ඒ යක්ෂයාට මෙසේ කීය. අපි වූ කලී බරණැස් නුවර සිට ආම්හ. තෙපි හැම දෙන ඇඹුල උපුළ මල් පැලඳ රත් පියුම් හෙල පියුම් ගත් අත් ඇතිව නෙළුබල හා නෙළුඹුදලි කමින් සකල ශරීරයෙහි මඩ වකාගෙන පිනි බින්දු වගුරවා කොයි සිට අවුදැයි තොපි එන මග වැසි වටද ඇඹුල උපුල මල් ආදීයෙන් ගැවසී ගත් විල් ඇද්දැයි විචාලේය. යක්ෂයා ඔහුගේ බස් අසා යහළුව තෝ කුමක් කියයිද තෙල පෙනෙන්නේ නිල් වූ වන රේඛාවය. එතැන් පටන් සියළු වනය පැනින් ගැවසී ගත්තේය. නිඹඳ වැසි වස්නේය. කඳුරැලි පුරා දිය දුවන්නේය. ඒ ඒ තැන පියුමින් ගැවසී ගත් විල් හා පොකුණු වන්නේයැයි කියා පිළිවෙලින් යන්නාවූ ගැල් වල මනුශ්‍යයන් අතින් මේ ගැල් අරගෙන කොයි යව්දැයි විචාලේය. එකල්හි ඒ මනුශ්‍යයෝ අසවල් ජනපදයට යම්හයි කීහ. මේ මේ ගැල කිනම් බඩු දැයි විචාලේය. අසවල් බඩු යැයි කීහ. පස්සේ එන්නාවූ ගැල් ඉතා බරව එන්නේය. ඒ ගැල් වල කුමන බඩුදැයි විචාලේය. පැන් පිරු ගැල යයි කීහ. පළමු මෙතන දක්වා පැන් ගෙන ආ තොප විසින් කලසේ ඉතා යහපත් වන්නේය. මෙතැන් පටන් තොප ගෙන යන පැනින් ප්‍රයෝජන නැත. ඉදිරියේ බොහෝ පැන් ඇත. පැන් සැලවල් බිඳ පැන් දමා පියා සැපසේ යවයි කීයේය. මෙසේ කියා තොපි යව අපට ලස් වන්නේයැයි කියා මඳ තැනක් ගොස් අන්තර්දානව තමාගේ යක්ෂ පුරයට ගියේය. ඒ අඥඤාණ වූ ශාන්තු නායකයාද තමා නුවණ නැති බැවින් යක්ෂයාගේ බස් ගෙන සැලවල් බිඳුවා පැන් උලක්කුවක් විවරකුත් නොතිබා සියළු පැන් දම්මවා ගැල් පමණක් පදවාගෙන නික්මුනේය. ඉදිරියේ ස්වල්ප මාත්‍රයකුත් පැන් නොවිය. මනුෂ්‍යයෝ පැන් නොලැබ මිරිකී ගියාහු සවස්වන තුරු ගොස් ගැල් වලල්ලෙහි සිටුවා ගොන් ගැල් සක බැඳ සිටවූය. සරකුන්ට බොන්නටවත් මනුෂ්‍යන්ට බත් පිසන්නටවත් පැනක් නැති විය. පැන් නොළැබ මිරිකී ගියාහු මනුෂ්‍යයෝ ඒ ඒ තැන වැදහෙව නිදන්නට පටන්ගත්තාහුය. රාත්‍රි භාගයෙහි යක්ෂයෝ යක්ෂ පුරයෙන් අවුත් සරක් හා මනුෂ්‍යන් මරා මස් අනුභව කොට ඇට පමණක් තබා ගියාහුය. මෙසේ ඒ නුවණ නැති සාන්තු නායකයා නිසා සියළු සත්වයෝ විනාශයට පැමිණියාහුය. අත් ඇට ආදීය ඒ ඒ අත විසිරි ගියේය. පන්සියයක් ගැල් බඩු පිරුවනින්ම තිබුයේය. මහා බෝධි සත්වයෝද නුවණ නැති ශාන්තු නායකයා යෙල මසක් ඉක්මවා  පන්සියක් ගැල්වල බඩු පටවාගෙන නුවරින් නික්ම ක්‍රමයෙන් පැන් නැති අමුනුෂ්‍ය වාසය වූ කාන්තාර මුඛයට පැමිණියෝය.  මෙසේ පැමිණියාවූ මහා බෝධි සත්වයෝ එතැන්හිදි මහා සැල වල පැන් පුරවා බොහෝ පැන් ගෙන තමන් කැටිව යන මිනුසුන් කැඳවා කඳවුරු බැඳගෙන උන් තැන බෙර පියවි කරවා මනුෂයන් රැස් කොට මෙසේ කිවුය. මා නොවිචාරා පැන් පතක් විවරකුත් ප්‍රයෝජන නොවිඳුව මේ කතර මග විස වෘක්ෂයෝ ඇත. ඒහෙයින් පෙර නොකෑ විරු පළාකොලත් මලක් පළා පලයක්ම මා නොවිචාරා නොකවයි. මෙසේ මනුෂ්‍යයන්ට අවවාද කොට බඩු පැටවූ පන්සියයක් ගැල් හා සමග අමුනුෂ්‍යාදිගෘහිත නිරුදක කාන්තාරයට පැමිණියෝය. ඒ මහා බෝ සතානෝ කාන්තාර මධ්‍යයට පැමිණ කල්හි ඒ යක්ෂ තෙම පළමු පරිද්දෙන්ම බෝධි සත්වයන් එන පෙරමග තමා දක්වා සිටියේය. බෝධි සත්වයෝ ඔහු දැකලාම දැනගත්තුය. මේ කාන්තාරයෙහි පැන් නැති හෙයින් නිරුදක කාන්තාර යැයි මේ කාන්තාරයට නමක් වන්නේය. මේ තෙම නිර්භිතය. රත් වූ ඇස් ඇත්තේය. මොහුගේ ඡායාවත් නොපෙනෙන්නේය. ඒකාන්තයෙන්ම මොහු විසින් පළමු කොට බිය නුවණැති සාන්තු නායකයා ඔහුගේ පර්ෂින් සමඟ ගැල් වල පිරවූ පැන් දම්මවා කලාන්ත කොට කන ලද්දේ වන්නේය. මා ගේ වූ කලි නුවණැති බව හා උපායෙහි දක්ෂ බව මොහු නොදනිතියි සිතමි සිතා ඉක්බිත්තෙන් ඕ හට මෙසේ කීවුහ. තෙපි හැම දෙන පළා යව්. අපි හැම වෙළඳුන් නම් අනිත් තැනක් නොදැක ඇරගත් පැන් නොදම්හ. පැන් දුටු තැනකදී පැන් දමා පියා ගැල් සැහැල්ලු කොට ගෙන යම්යැව් කිවුහ. යක්ෂයා මඳ තැනක් ගොස් අන්තර්දානව තමාගේ යක්ෂ පුරයටම ගියේය. යක්ෂයා ගිය කල්හි මනුෂ්‍යයෝ බෝධි සත්වයන්ට මෙසේ කිවුහ. මේ සාමිනී මනුෂ්‍යයෝ මේ නිල් වූ වන රේඛාව පෙනෙන්නේය. එතැන් පටන් නිබඳ වැසි වස්නේයැයි කියා ඇඹුල උපුල මල් පැළඳ රත් පියුම් හෙල පියුම් මිටිගෙන නෙළුඹල හා නෙළුඹ දැලි කමින් තෙත් පිළි හැඳ තෙත් වූ හිසකේ හැරගෙන ආවාහුය. එසේ හෙයින් අප හැම ගෙන යන පැන් දමා පියා ගැල් සැහැල්ලු කොට ගෙන වහා පලායම්හයි කිවුහ. බෝධි සත්වයෝ ඒ මිනිස්සුන්ගේ කී බස් අසා ගැල් රඳවලා සියළු මනුෂ්‍යයන් රැස් කොට තොප විසින් මේ කාන්තාර මාර්ගයෙහි විලෙක්වත් පොකුණෙක්වත් ඇතැයි කිසිකෙනෙකුගෙන් ඇසූ විරු ඇද්දැයි විචාලෝය. ස්වාමීනි ඇසූ විරූ නැත. මේ තම නිරුද්දක කාන්තාරය වේද. ඒ මනුෂ්‍යයෝ කිහුය. එකල්හි බෝධි සත්වයෝ කියන්නාහු මේ අප දුටු මනුෂ්‍යයන්ගෙන් සමහර කෙණෙක් නිල් වූ වන රොදින් එපිට වැසි වස්නේ යැයි කියුය. වැසි සුළඟ නම් කෙතෙක් තැන් හමාදැයි විචාලෝය. ස්වාමීනි යොදුනක් පමණ තැන්

SANHIDA LANKA

හමන්නේ වේදැයි කිවුය. කිමෙක්ද තොප හැම දෙනා අතුරින් එක් කෙනෙකුගෙන් ඇඟ වැසි සුළඟක් වැදගත් දැයි විචාලෝය. නැත ස්වාමීනි කිහ. මේස ශර්ස නම් කොපමණකදී පෙනේදැයි විචාලෝය. යොදුනක් පමණ තැන් පටන් පෙනෙන්නේ වේද ස්වාමීනි කීයුය. තොප හැමගේ කිසි කෙනෙකුන් විසිනුත් එකල වැසි වලා කුලකුත් දුටුවේ ඇද්දැයි විචාලෝය. නැත ස්වාමීනි කීහ. විදුලියෙන් නම් කෙතැන් පටන් පෙනේදැයි විචාලෝය. සතර පස් යොදුනක් පසන් පෙනෙන්නේ වේද. ස්වාමිනි කිවුහ. තොප ඇම දෙනාගේන් කිසි කෙනෙකුන් විසින් විදුලි ආලෝකයක් දක්නා ලද්දේදැයි විචාලෝය. නැත ස්වාමීනි. විදුලි ආලෝකයක් නොදුටුම්හයි කීහ. මේස දවනිය නම් කොතෙක් තැන් පටන් ඇසේ දැයි විචාලෝය. එක් යොදුනක් මත්තේ පටන් ඇසෙන්නේ වේදැයි ස්වාමිනි කීයුහ. කිමෙක්ද තොප හැම දෙනාගෙන් කිසි කෙනෙකුන් විසින් විදුලි ආලෝකයක් වැසි සර්ජනාවක් කරන්නා ඇසූ ඇද්දැයි විචාලෝය. නැත ස්වාමිනි අකුණු ගසන හඬක් නොඇසුම් යැයි කීහ. එකල්හි අප මහ බෝ සතානෝ කියන්නාවූ එම්බා පින්වත්ති මොහු මනුෂ්‍යයෝ නොවෙතියි යක්ෂයෝය. මොහු අප හැම ගෙන යන පැන් දම්මවා පියා දුර්වල කොට කම්හයි ආවාහු යක්ෂ කෙණෙක් වෙති. ඉදිරියේ ගිය නුවනැති ශාන්තු නායක පුත්‍රයා උපාය දක්මෙහි අදක්ෂය. ඒ කාන්තයෙන්ම එතෙම මොහු විසින් පැන් දම්මවා මිරිකා දුර්වල කොට කන ලද්දේ වන්නේය. පන්සියයක් ගැල් බඩු පිරුවනින්ම තිබෙන්නේ වේදැයි අපි එම බඩු පිරු ගැල් දැකුම්හ. එසේ හෙයින් පැන් උලක්කුවක් විවරකුත් නොදමා වහවහා ගැල් පදුවයි කියා ගැල් පදවාගෙන නික්මුනාහුය.

මහා බෝධි සත්වයෝ යමෙන් සිට බඩු පිරුවනින්ම තිබු ගැල් දැක පන්සියයක් ගැල් හා ගොන් හා මිනිසුන්ගේ අත් පා ඇට ආදිය ඒ ඒ තැන විසිර තිබුවා දැක ගැල් මුදවා ගැල් වලල්ලෙන් කඳවුරු බඳවා වේලාසනම මනුෂ්‍යයන් හා ගොන්ද බත් හා තන කවා මනුෂ්‍යයන් මධ්‍යය යේ ගෙරි කැට කොට වැදහොවා  තුමු සත්ති සම්පන්න ප්‍රධාන පුරුෂයන් ගැන කඩු ගත් අත් ඇතිව තුන් යම් රාත්‍රියෙහි රැකවල් ගෙන සිටිසේ සිටම අරුණ නැගුය. දෙවන දවස් උදෑසනම සියළු කටයුතු සපයාගෙන ගොන් තණ ආදීය කවා ගෙන මාළු ගැල් දමා තර ගැල් ගෙන මඳ මිඳ ඇති බඩු දම්මවා බොහෝ මිල ඇති බඩු නංවාගෙන මහා බෝ සතානෝ තමන් වෙළදාම් කරන්නට යන්ට සිතු නෙතටම ගොස් දියුණු තියුණු මිලයෙන් බඩු විකුට සියළු පර්ශත් ගෙන නැවත තමන්ගේ නුවරටම ආවාහුය. සාස්තෘ වූ තිලෝගුරු බුදු රජානන් වහන්සේ මේ කතාව ගෙන හැර දක්වා වදාරා මහා සිටානෙනි මෙසේ පෙර විරුඩ ග්‍රාහය ගත්තෝ මහා විනාසයට පැමිණියෝය. අවිරුඩ ග්‍රාහය ගත්තෝ නුවණැත්තෝ අමුනුෂ්‍යයන් අතින් මිදි සැපසේ කැමති තැනට අභිමතාර්ථය සිද්ධ කොට ගෙන පෙරලා තමන් වසන නෙතට පැමිණියෝ වේදැයි පූර්වාපර සන්ධි ගැලපීම් වශයෙන් අතීත කථාවත් වර්ථමාන කථාවත් වදාරා මත්තෙහි අපණ්ණක ජාතක ධර්ම දේශනාව කොට වදාරණ සේක.

අපණ්තකං ඨානමේකේ දුතියං ආහු තක්ඛිකා

ඒත දංඥාය මේ දාවි තංගණේය යදපන්ථකං

මේ ගාථාව වදාලසේක. මෙහි අපණ්තක පටිපදාව නම් රත්නතත්‍රය සරණ යාම පංචශීලය හා දස සීලය රක්ෂා කිරීමය ප්‍රාතිමෝක්ෂ සංවර ශිලය ඉන්ද්‍රිය සංවර ශීලය ආජිව පාරිශුද්ධි ශීලය ප්‍රත්‍ය සන්ති සීත ශිලය යන සියළුම සිල් පිරිසිදුව සිල් නොකිලිටි කොට රැකීමය. චක්ශුරාධි පංචේන්ද්‍රයන් වසඟ කොට වසන බවය. භෝජනයෙහි පමණ දක්නා බව නිදි වර්ජිත කිරීමය. පංච විද ධ්‍යානය ඉපිද වීමය. විදර්ශනා භාවනා කිරීමය. පංචාභිඥාණ අෂ්ට සමාපත්ති ඉපිදවීමය. ස්විත ආපත්තාදීහු සතර ආර්ය මාර්ගය හා සතර ආර්ය ඵලය ඉපදවීම යන මේ සියල්ල අපණ්තක පටිපදා නම් වේ. නිර්වාණ ග්‍රාමී වු ප්‍රතිපත්තිය නම් වෙයි. සර්වඥ ශාසනයට අවිරුඩ ප්‍රතිපත්තිය නම් වෙයි. මේ අපණ්තක පටිපදා යන අන්‍ය ලබ්දි ගැන්මය දස අකුසල කර්මයෙහි හැසිරීම නුසුදුසු වූ කාය වාක් සමාදාරියෙහි යෙදීමය. යන මේ සියල්ල වන්නේය. මේ විරුඩ ප්‍රතිපදාව සතර අපායෙහි හා පංච විද නිච කුලයෙහි උපදවා මහා දුක් දෙන්නේය. තවද මේ අවිරුඩ වූ ඒ කාන්ත කාරණ වූ මේ අවිරුඩ ප්‍රතිපත්තියෙහිම සිට සර්වඥයෝ දෘඩ විර්යෙන් පාරමිතාවන් පුරා බෝධි ද්‍රම සමීපයෙහි ඉඳ සම්‍යක් සම්බෝධි ඥාණය සමාධිගමය කරන්නාහුය. පසේ බුදුවරයෝ ඉඳ සම්‍යයක් සම්බෝධි ඥාණය සමාධි ගමය කරන්නාහුය. පසේ බුදු වරයෝ ප්‍රත්‍යාක් බෝධි ඥාණය සමගි ගමනය කෙරෙති. බුද්ධ පුත්‍ර වූ ශ්‍රාවකයෝ ශ්‍රවක පාරමිතා ඥාණය ප්‍රතිවේද කෙරෙති. මෙසේ භාග්‍යවත් වූ බුදු රජානන් වහන්සේ ඒ උපාසක වරුන්ට ත්‍රිවිධ කුසල සම්පත්තීන් හා දිව්‍ය බ්‍රහ්ම සම්පත්තීන් දක්වා කෙලවර මේ අපණ්තක පටිපදාව අර්හත් මාර්ගයට පමුණුවා නිර්වාණ සම්පත්තිය සාදාදී ලන්නේයැයි කියා අනේ පිඩු මහා සිටානන්ගේ ප්‍රධෘන කොට ඇති පන්සියයක් උපාසක වරුන්ට මේ අපණ්තක ධර්ම දේශනාව දක්වා මත්තෙහි චතුරාර්ය සත්‍යය සොලොස් ආකාරයකින් ප්‍රකාශ කොට වදාල සේක. මේ චතුස් සත්‍යය ධර්ම දේශනාවගේ කෙළවර ඒ සියළු පන්සියයක් උපාසක වරු යෙළ දහසක් කෙළසුන් නසා දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටියාහුය. බුදු රජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා වදාරා මේ අපණ්තක ජාතකය නිමවා වදාලසේක. එසමයෙහි අඥ්ඥාණ වූ සාන්තු නායක පුත්‍ර නම් දූන් මේ දේවදත්ත ස්ථවිරයේය. ඔහුගේ පෂිද නම් මේ දේවදත්ත පර්ෂිද වන්නේය. එසමයෙහි නුවණැති  සාන්තු නායකයාගේ පර්ෂිද නම් දූන් බුදු පිරිස් වන්නාහුය. එසමයෙහි නුවණැති සාන්තු නායක පුත්‍ර නම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජු වූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේකි.

SANHIDA LANKA

# වණ්ණුපත ජාතකය

තවද එක් සමයෙක්හි බුදුහු දෙව්රම් වෙහෙර වැඩවසනසේක් භාවනා කිරීමෙහි හරණලද විර්යය ඇති භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක. ඒ කෙසේද? යත් බුදුරජානන් වහන්සේ සැවැත්නුවර වසන කල්හි එම නුවර වසන්නා වූ එක් කුලපුත්‍රයෙක් ජේතවනාරාමයට ගොස් බුදුන්ගෙන් බණ අසා රත්නත්‍රයෙහි ප්‍රසන්න වූ සිත් ඇතිව කාමයෙහි ආදීනව හා ප්‍රව්‍රජ්‍යාවෙහි අනුසස් අසා මහණව උපසම්පදා පස්වසක් ඇතුළත උභයමාතෘකාව වනපොත්කොට සික්ෂා පද ඉගෙන භාවනා මාර්ගයන් ඉගෙන සර්වඥයන් සමීපයේදී තමන් වහන්සේට අභිප්‍රාය වූ කර්මස්ථානයක් ගෙන උදකලාව වාසය කැමතිව වලට වැද වනයෙහි සැදැහැ ඇති උපාසක වරුන් විසින් කරවා පිළිගන්වන ලද පන්සලක වස් වැස වස් තුන් මස මුළුල්ලෙහි මාර්ග ඵල උපදවන්නට උත්සාහ කරණ සේක් විදර්ශනා ලෝකයක් වේවායි ප්‍රතිභාග නිමිත්තක් වේවායි උපදාව ගත නොහි මෙසේ සිතූ සේක. සර්වඥයන් වහන්සේ විසින් පුද්ගලයෝ සතර දෙනෙක් වදාරණ ලද මොහුන් සතර දෙනා අතුරින් මා පද පරම වන්ට කාරණය වන්නේය. මට මේ ආත්ම භාවයෙහි මාර්ගයෙක් වත් ඵලයක් වත් නැතැයි සිතමි. එසේ හෙයින් මේ වනයේ වැස කුමක් කෙරෙම්ද?. සර්වඥයන් වහන්සේ සමීපයට ගොස් රූපාග්‍ර ප්‍රාප්ත වූ බුදුන්ගේ ශරීරය බල බලා මිහිරි වූ බණ අසමින් විසියෙම් වීම් නම් යහපත් වන්නේයැයි සිතා නැවත ජේතවනා රාමයට වැඩි සේක. උන් වහන්සේ දැක සන්ද්‍රාදෘෂ්ට සම්භක්ත භික්ෂූහූ මෙසේ කිවුහ. ඇවැත්නි තෙපි ලොව්තුරා බුදුන්ගෙන් කමටහන් ගෙන මහණ දම් කෙරෙමි ගිව්ස දූන් වූ කලී වලින් අවුත් සනසන්සනීකා යෙහි ඇලී වාසය කරව. කිමෙක්ද තොපගේ ප්‍රව්‍රජා කෘත්‍යය මුදුන් පැමිණියේද පුනරුත්පත්තියක් නැතුව අර්හත් ඵල ඥානය ප්‍රතිවේද කලාදැයි කීහ. ඇවැත්නි මම මාර්ගයක් වත් නොලැබම අභව්‍ය පුද්ගලයෙක් විය යුතු යැයි සිතා වීර්යය හැර ආමී සේක. එකල්හි භික්ෂුන් වහන්සේ කියන සේක් ඇවැත්නි දෘඪ වීර්යය ඇති සර්වඥයන් වහන්සේගේ සාසනයෙහි මහණව භාවනා කොට මාර්ගඵල ඉපදවීමෙහි වීර්ය අඩුව තොප විසින් අකාර්යක්ම කරන ලද අපහාස කැටිව එව. සර්වඥයන් වහන්සේ සමීපයට යම් හයි කියා ඒ භික්ෂුව කැඳවාගෙන බුදුන් සමීපයට ගිය සේක. සර්වඥයන් වහන්සේ භික්ෂුන් දැක මහණෙනි තෙපි මේ භික්ෂුව නොකැමැති පරිද්දෙන් කැඳවා ගෙන කුමක් පිණිස  අවුද. මොහු විසින් කවර අපරාදයක් කරන ලදැයි විචාරා වදාළ සේක. එකල්හි භික්ෂූන් වහන්සේ දක්වන සේක් ස්වාමීනි මේ මහන මෙබඳු නෛර්යාණික ශාසනයෙහි මහණව මහණ දම් කරන්නේ විර්ය ඇර ආයේ යැයි දැක්වූ සේක. එකල්හි සර්වඥයන් වහන්සේ සැබැද මහණ තා විර්ය හලුයෙහි යැයි වදාරා සැබැව ස්වාමීනි දූන් වූ කල්හි කිමෙක්ද මහණ තෝ මෙබඳු ශාසනයෙහි මහණව අල්පේච්ච සේක. සතෘෂ්ට සේක. කුලයෙහි ගෙණෙහි නොඇලෙන සේක. වඩන ලද වීර්ය ඇති සේකැයි මෙසේ තමා ප්‍රසිද්ධ නොකොට මේ මහණ හරණ ලද වීර්ය ඇත්තේයැයි කුමක් පිණිස ප්‍රකාශ කරවූයෙහිද. මහණ තෝ පෙර වීර්ය වත් වූයේ නොවේද. තා එක තැන් වූ කල වීර්ය නිසා මරු කතර පන්සියයක් ගැල්වල ඒ මිනිසුන් හා ගොන් පැන් ලැබ ස්වාසස්ථානයට පැමිණියෝ නොවැද දූන් තෝ කවර කාරණයකින් වීර්ය ඇරපුයෙහි වේදැයි වදාල සේක. එකල්හි ඒ මහණ මෙපමණ බසකින් උපසම්ඵහ ලද්දේ විය. ඒ කතාව අසා භික්ෂූන් වහන්සේ බුදුන්ට යාඥ්ඥා කරණ සේක් ස්වමීනි දූන් මේ භික්ෂූ හූ විසින් වීර්ය හල බව අප ඇමට ප්‍රකාශය. අතීතයෙහි මොහු තනි තැනැත්තවූන්ගේ වීර්ය නිසා මරු කතර ගොන් හා මිනිසුන් පැන් ලැබ ස්වාසස්ථානයට පැමිණි බව භවයෙන් පටිච්ඡන්න හෙයින් අපට ප්‍රකාශය නුඹ වහන්සේගේ සර්වඥතා ඥාණයටම ප්‍රකාශය අපටත් ඒ කාරණය ප්‍රකාශ කොට වදාළ මැනවැයි ආරාධනා කළ සේක. එකල්හි සර්වඥයන් වහන්සේ එසේ වී නම් මහණෙනි අසව් යයි කියා ඒ භික්ෂුන්ට සිහි උපදවා භවාන්තරයෙන් සැඟ උනා වූ කාරණය ප්‍රකාශ කොට වදාල සේක.

යටගිය දවස කසීරට බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍ය කරන කල්හි අප මහා බෝසතානෝ සාත්තු නායක කුලයෙහි පිළිසිඳගෙන වැඩි විය පැමිණ පන්සියයක් ගැලින් වෙළඳාම් කොට ඇවිදිනාහුය. මෙසේ වෙළඳාම් කොට ඇවිදිනාහු මහා බෝධි සත්වයෝ එක් කලක මරු කතරක පැමිණියාහුය. ඒ වාළුකා කාන්තාරයෙහි වැලි ඉතා සියුම් වන්නේය. මිටින් ගත්වැලි මිට නොසිටින්නේය. හිරු නැගි වේලෙහි පටන් කිහිරඟිරු රැසක් මෙන් කකියන්නේය. පයින් වැලි මැඩගෙන යන්ට නොපිළිවන. එසේ හෙයින් ඒ වාළුකා කාන්තාරයෙහි යන්නා වූ සත්වයෝ දර පැන් තෙල් සහල් ආදිය ගැලින් අරගෙන රාත්‍රියෙහි ගොස් අරුණ නැගුණ වේලෙහි ගැල් මුදා ගැල් පට වලල්ලෙහි සිටුවා මුදුනෙහි කොළ මඩු ඉදිකොට වේලාසනම කා බී ඇකිල මණ්ඩප ඡායාවෙහි ඉඳ දවස් යවා ඉර බැස ගිය කල්හි  රාත්‍රි භෝජනය අනුභව කොට බිම සීතලව ගිය කල්හි ගැල් යොදා ගෙන යන්නාහුය. සමුද්‍ර යාත්‍රාවක් හා සමාන වූ ගමන් වන්නේය. ගැල් පදවා ගෙන යන ප්‍රධාන පුරුෂ තෙමේ ගොඩ නියමුවා යැයි නම් ලබන්නට සුදුසු වන්නේය. එසේ හෙයින් තරුසලකුණින් ගැල් සාත්තු පදවාගෙන යන්නේය. අප මහා බෝසතානෝද එකල්හි මේ ක්‍රමයෙන් ඒ මරු කතර යන්නාහු එකුන් සැට යොදුනක් ගොස් දූන් එක රාත්‍රියකින්ම මරුකතර ගෙවා සේම භූමියට පැමිණීම වන්නේයැයි කියහැකි. අවස්ථාවෙහි සවස බත් අනුභව කොට සියළු දර පැන් නිමවා ගැල් යොදා ගෙන නික්මුනාහුය. නියාම පුරුෂයානෝ ඉදිරියේ යන ගැල දික් සඟලා පුටුවක් අතුරුවාගෙන ආකාශයෙහි තරු සලකුණු බලමින් ගැල් මෙසේ පදුව මෙසේ පදුවයි කිය කියා වැදහොත් තැනැත්තෝය. බොහෝ කලක් නොනිදු බැවින් නින්දෙන් මිරිකී නිදන්නට පටන් ගත්තාහුය. එකල්හි ගොන් කරකැවි ආපස්සේ නික්මුනා බව නොදන්නාහු ගැල් අඳනාගොන් සකල රාත්‍රියෙහි අවුත් පළමු දවස් ලැගි තැනටම පැමිණියාහුය. සාත්තු නායක තෙමේ අරුණ නැගෙන වේලෙහි පිබිද නැකැත් තරු බලා ගැල් රඳව රඳවයි කීයේය. මෙසේ කියා ගැල් කරකවා පිළිවෙළින් සිටුවමින් සිටියදීම අරුණු නැංගේය. මනුෂයෝ කියන්නාහු

SANHIDA LANKA

මේ අපගේ කඳවුරු බැඳ උන් තැනය. අපගේ දර පැනුත් නිමවා ගියේය. දැන් නටුවෝමෝදැයි කියා ගැල් මුදා ගැල් වට වලල්ලෙහි සිටුවා මුදුනේ මණ්ඩපයක් කොට තම තමන්ගේ ගැල් යට සෝක ගෙන උන්නාහුය. එවෙලෙහි අප මහ බෝසතානෝ මා විර්ය ඇරපුවොත් සියල්ලෝම නසිතියි සිතා උදෑසන සිසිල් වේලේම ඇවිදිනා තැනැත්තෝ එක් ඊ තන පඳුරක් දැක මේ තණ පඳුරට දිය උරමින් නැංගේ වනැයි සිතා උදැල්ලක් ගෙන්වා ගෙන ඒ ඊතන පඳුර තිබු තැන කණින්ට පටන් ගෙන සැට රියනක් පමණ කැණපූය. මෙතෙක් තැන් කැණ නැවතත් පල්ලේ කන්හයි උදුලු එලන්නාවු මනුෂ්‍යන්ගේ උදුලයට ගල තල මත්තේ වැද ගන්නට පටන් ගත් කල්හි ඇම දෙන අවීරියව ගියහ. බෝධි සත්වයෝ වනාහී වම් ගල තලින් යට පැන් විය යුතුයයි සිතා ලිඳට බැස ගල තල මත්තෙහි සිට නැමී තමා දියේ යන හඬ පරීක්ෂා කරන්නෝ ගල තල යටින් දිය යන අඬ අසා ලිදෙන් ගොඩ නැගී තමන්ගේ අතවැසි පුරුෂයා හට මෙසේ කිවුය. දරුව තොප අවීරියව ගියෝත් අප සියල්ලෝම නසුම්හ. එසේ හෙයින් තොපි අවීර්යව නොවි පසුනොලැබ වීර්ය වඩා මේ යකුල ගෙන ලිඳට බැස මේ ගල තල මත්තෙහි කුළු ගණනක් එලාපියවයි කියුය. ඒ අසා අතවැසි පුරුෂ මහ බෝසතානන්ගේ වචනය පිළිගෙන ඇමදෙන වීර්ය තබා පියා සිටි කල්හි තෙමේ විර්ය නොහැර ලිඳට බැස ගල තල මත්තෙහි යකුලු ගණනක් එලාපුයේය. එකල්හි ගල තල මධ්‍යනේ බිඳී යට වැටි අවිච්න්නව පවත්නා වූ ජල ප්‍රවාහනය ඇස වාගෙන සිටියේය. නාඹ තල් කඳක් සා දිය කඳක් උඩ පැන නැංගේය. එකල්හි සියළු මනුශ්‍යයෝ පැන් බී ජලස්නානය කොට ඉතිරිව තිබු ගැල් සක් ආදිය පුරා කැඳ බත් ආදිය පිස අනුභව කොට ගොනුන් පැන් පොවා තණ ආදීය කවාගෙන ඉර බට වේලෙහි ලිඳ සමීපයෙහි දදජයක් බැඳ මරු කතර ගෙවා තමන් විසින් කැමතිව නල ලද්දා වූ ස්ථානයටම ගියාහුය. ඒ මනුෂ්‍යයෝ තමන් අභිප්‍රාය ස්ථානයෙහිදී බඩු විකුට එකට දෙක හා එකට සතර නියායෙන් දෙදියුණු සතර දියුණු ලාභ ලැබ තමන් පළමු වසන්නා වූ ස්ථානයටම පෙරලා ආවාහ. ඒ හැම මනුෂ්‍යයෝ එහි වසන්නා වූ ආයු පමණින් සිට කම් වූ පරිද්දෙන් මිය පරලව ගියාහය. මහබෝසතානෝද ධානාදී වූ පින්කම් කොට කම් වූ පරිද්දෙන් මියපරලොව ගියාහුය. තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා වදාරා තවද මත්තෙහි ඒ භික්ෂූන් වහන්සේට ධර්ම දේශනා කරන සේක් යම් සේ වෙළඳුන් නොකුසිතව මරු කතර ලිං බැඳ පැන් ලද්දාහුද එපරිද්දෙන්ම මේ සර්වඥ ශාසනයෙහි මහණව නුකුසීතව වීර්ය කරන්නා වූ නුවණැති මහණ තෙමේ ද්‍යාන මෝක්ෂා මාර්ගඵල ආදී වූ ප්‍රභේද ඇති ලය සැනසීම ලබන්නේය. මහණ තෝ පෙර පැන් පමණක් නිසා වීර්ය කොට දැන් මෙබඳු නෛර්‍යාත්මික සාසනයේ මහණව මාර්ගඵලයට පැමිණීමෙහි කවර කාරණයකින් වීර්ය ඇරපුයෙහිදැයි මෙසේ නැවතත් ධර්ම දේශනා කොට දුක්ඛ සමුදය නිරෝධ මාර්ගයැයි කියන ලද චතුරාර්ය සත්‍ය ප්‍රකාශ කොට වදාල සේක. චතු සත්‍යය දර්ම දේශනාවගේ කෙළවර පසුබට වීර්ය ඇති භික්ෂූන් වහන්සේ අර්හත් ඵලයෙහි පිහිටි සේක. සාතෘ වූ බුදුරජානන්වහන්සේ අතීත කතාවත් වර්ථ මාන කථාවත් දෙක එක් කොට අනුසන්ධි ගලපා මේ වන්ණුපත ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි නුපසුබට වීර්ය ඇති ගල තල බිඳ මහජනයාට පැන් දුන් අතවැසි පුරුෂයා නම් දැන් මේ පසුබට වීර්ය ඇති මහණ වන්නේය. එසමයෙහි මරු කතර ගියා වූ සෙසු පර්ෂද නම් දැන් මේ බුදු පිරිස් වන්නාහ. එසමයෙහි සාත්තු නායක පුත්‍ර නම් දැන් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජ වූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# සේරිවාණිජ ජාතකය

තවද එක් සමයෙක් හී සකල ගුණ නිදාන වූ තිලෝගුරු බුදු රජානන් වහනසේ සැවැත් නුවර නිසා ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් පසුබට වීර්ය ඇති භික්ෂූන් වහන්සේ අරඹයා මේ ජාතකය දක්වා වදාල සේක. ඒ කෙසේද යත් ඒ පසු බට වීර්ය ඇති භික්ෂුන් වහන්සේ පළමු පරිද්දෙන්ම අවශේෂ භික්ෂූන් වහන්සේ විසින් බුදුන් සමීපයට කැඳවාගෙන අවුත් පෑ කල්හි බුදුහුගේ භික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කොට එම්බල තෝ මෙබඳු මාර්ග ඵලදායක ශාසනයෙහි මහණව විර්ය හරණෙහිද. ලක්ෂයක් වටනා ඝන රන් තලියෙන් පිරිහුනා වූ සේරිවාණිජ වෙළෙන්දා මෙන් බොහෝ කාලයක් ශෝක කරන්නේ වේදැයි වදාරා තුෂ්ණිම්භූතව වැඩ උන් සේක. එකල්හි එතැනට රැස් වූ භික්ෂූන් වහන්සේ සකසා හැඳ පෙරව පල භාරයෙන් නැමනා වූ කදලි වෘක්ෂයක් මෙන් බුදු රජානන් වහන්සේට අභිමුඛව නම් නව බන්ධාඤ්ජලීව දොහොත් මුදුනෙහි තබා භක්ති ප්‍රේමාති භාර වනෝත්තම මාංගයෙන් නමස්කාර කොට සිට ඒ අර්ථය ප්‍රකාශ කරන පිණිස සර්වඥයන් වහන්සේට ආරාධනා කළ සේක. එවෙලෙහි බුදුරජානන් වහන්සේ අන්‍යභවයෙන් සැඟවුනාවූ කාරණය ප්‍රකාශ කොට ඉකුත් වත් දක්වා වදාල සේක.

යට ගිය දවස මෙම කල්පයට පස් වෙනි වූ අප මහා බෝධි සත්වයෝ සේරිව රාජ්‍යයෙහි රංපසිඹු පහිය කරලා කිසිල්ලෙහි ගෙන්වා ගෙන වෙළඳාම් කෙරෙන හෙයින් කච්චපුට වාණිජය නම් ඇති වෙළඳ උපන්නාහ. ඒ වෙළෙඳානෝ සේරිවාණිජ නම් එක් ලෝභි වෙළෙඳකු හා සමග නිලවාහිනී නම් වූ ගඟෙන් එතරව අන්ධපුර නම් නුවරට වැද නුවර විථිය බෙදාගෙන තමන්ට පැමිණි වීථියෙහි බඩු විකුණමින් ඇවිදිති. අන්‍යය ලෝභි වෙළඳ තම පැමිණි වීදියෙහි බඩු විකුට ඇවදිනේය. එකල්හි එක් සිටු කුලයක ඇත්තෝ දුප්පත් වූය. සියළු මල් බෑයන් හා දරුවෝත් වස්තුවත් නැසි ගියෝය. එක් මිණිබිරි  කුඩා කෙල්ලක් මිත්තනියන් හා සමඟ නොනැසි රඳා ගියාය. ඔවුන් දෙදෙනම අනුන්ට බැල මෙහෙවර කොට ජිවත් වෙති. මොවුන් දෙනොගෙහි පළමු මහ සිටානන් බත් අනුභව කල රන් තලියත් වළං අතුරෙහි තිබි බොහෝ දවසක් ප්‍රයෝජන නොවූ හෙයින් මළ ගැසී ගියේය. ඒ තාක් වන තුරු ඔහු දෙදන රන් තලිය බවක් නොදනිති. එකල ඒ ලෝභි වෙළඳා කදා වළුලු ගනුවයි කියමින් ඇවිදිනේ ඒ ගේ දොරට පැමිණියේය. ඒ ගෙයි කුමාරිකාවෝ වෙළඳා දැක මුත්තනියන්ට කියන්නේ මෑණියනි මට එක් පළඳානවක් ගනුවයි කීව. ඒ අසා මුත්තනියෝ අපි දුක්ඛිත යම්හ. කුමක් දී පළඳනා ගනුමෝදැයි කීයුය. එ වෙලෙහි ඒ කුමාරිකා කියන්නේ අපගේ තලියක් ඇත. ඒ තලියෙන් අපට කිසි ප්‍රයෝජනයකුත් නැත. මේ තලිය දී පියා වළලු ගත මැනවැයි කීහ. මුත්තනියෝ ඒ කුමාරිකාවගේ  ඇවිටිලි බලවත් හෙයින් වෙළඳා කැඳවා අස්නක හිඳුවා තලිය දී ස්වාමිනි මේ තලිය අරගෙන නුඹගේ නැගනියන්ට නිසි පළඳනාවක් දුන මැනවයි කීයුය. ඒ ලෝභි වෙළඳා තලිය අතින් ගෙන රන් තලියක් වනැයි තලිය පිට ඉඳිකටුවෙන් ඉරක් ඇඳ රන් භව දැන මොවුන්ට කිසිවක් නොදිම මේ තලිය ගෙනයමියි සිතා මේ තලිය කුමක් අගිද. අඩමදටකුත් පමණ මේ තලියට මිළ නැත්තේයැයි කියා බිමට දමා හුනස්නෙන් නැඟී ගියේය. එක් කෙනෙකුන් වැද නික්මුනු විථියට අනෙක් තැනැත්තේ වදින්ට නිසි වන්නේයැයි බෝධිසත්වයෝ ඒ විථියට වැද කදාවළලු ගනුවයි කියමින් එම ගේ දොරට පැමිණියෝය. නැවත ඒ කුමාරිකා තම පළමු පරිද්දෙන්ම මුත්තනියන්ට කියන්නේනේ මෑනියනි මට වළලු අරගෙන දුන මැනවැයි ඇවිටිලි කීව. එකල්හි මුත්තනනියෝ කුමාරිකාවන්ට කියන්නෝ දුවනියනි පළමුව ආ වෙළඳානෝ තමාට දුන් තලිය බිමට දමා ගියෝය. දුන් කුමක් දී ගනිමෝදැයි කිවුය. ඒ අසා කුමාරිකා තෙම කිය්නනේ මෑනියනි ඒ වෙළඳතෙම තද පරුෂ බස් ඇත්තේය. මේ වෙළඳානෝ වූ කලි ප්‍රිය වූ දැකුම් ඇත්තෝය. මොලොක් වූ කතා ඇත්තෝය. එසේ හෙයින් මේ තලිය අරගෙනදී මට පළඳනා අරගෙන දුන මැනවැයි වළලු නම් යහපත් වේදැයි කියුය. ඒ කුමාරිකාවගේ බස් අසා මුත්තනියෝ කියන්නෝ එසේ විනම් කැඳවයි කියා වෙළඳානන් කැඳවූහ. ඉක්බිත්තෙන් ගෙට වැදලා උන්නා වූ බෝධි සත්වයන්ට ඒ තලිය දුන්නාහ. බෝධි සත්වයෝ ඒ රන් තලියේ නියාව දැන කියන්නාහු මෑණියනි මේ තලිය අගනා බඩු මා අත නැතැයි කියුහ. ඒඅසා කුමාරිකාවගේ මුත්තනියෝ කියන්නෝ පළමු ආ වෙළඳානෝ මේ තලිය අඩමදටකුත් නොපුස්නේ යැයි කියා  බිමට දමා ගියෝය. මේ තලිය වූ කලි නුඹගේ කුසලයෙන් ස්වාමීනි රත්රන්ව ගියවනැයි  අපි නුඹට මේ තලිය දෙම්හ.  අපට යම් තම් දෙයක් දී පියා මේ තලිය ගෙන ගිය මැනවැයි කීයුහ. බෝධිසත්වයෝ එකෙණෙහිම අත තිබූ පන්සියයක් කහවනු හා පන්සියයක් අඟනා බඩු දී මිල ඇම මදියි මට මේ පළන්දන්ට ආපසුම්බියත් කහවනු අටකුත් දුන මැනවයි මෙපමණක් ඉල්වා අරගෙන පළා ගියා හුය. මහබෝසතානෝ වහ වහා ගංතෙරට ගොස් ඔරු පදනා තොටියාට කහවනු අටක් දී ඔරුවට පැනනැංගාහුය. ඉක්බිත්තෙන් ඒ ලෝභි වෙළඳා නැවතත් ඒ ගෙට ගොස් පළමු මා බලා පියා ගිය තලිය ගෙනව යන්තම් මිලයක් තොපට දෙමියි කියා කියුය. ඒ අසා කුමාරිකාවගේ මුත්නනියෝ ඕ හට බැණ දොඩා අපගේ ලක්ෂයක් වටනා ගනරන් තලිය අඩමදටකුත් නොමුස්නා කෙලිහිය. තට ස්වාමිදරුවෙකු වැනි වූ එක් ධර්මිෂ්ට වෙළඳාන කෙනෙක් අපට දහසක් මිළ දී ඒ තලිය අරගෙන ගියෝ වේදැයි කිවුය. ඒ අසා හෙතම ලක්ෂයක් වටනා ඝණ රන් තලියෙන් පිරිහී ගියෙම් වේදැයි මට වූයේ බලවත් හානියකැයි උපන්නා වූ බලවත් ශෝක ඇතිව සිහිඑලවා ගන්නට අසමර්ථව ඉසංඥව තමා අත තිබූ කහවණුත් බඩුත් ඒ ගෙදරම වගුරුවා හං පෙරවි පිරිහෙලා පළන්දන්ඩ මුගුරක් මෙන් අල්ලාගෙන බෝධිසත්වයන් පසුපස්සේ ලුහුබැඳවාගෙන යන්නේ ගං තෙරට පැමිණ යන්නා වූ බෝධිසත්වයන් දැක එම්බල තොටිය ඔරුව රඳවයි රඳවයි කියා අඬගසා ලීය. ඒ අසා බෝධි සත්වයෝ තොටියාට කියන්නාහු ඔරුව ආපස්සේ කරකවා නොපදුවයි වැලකුය. තමා කී බස් නොගිවිස ඔරුව නොරදා පදනා ඔරුවෙන් යන්නා වූ බෝධිසත්වයන් බල බලා සිටියා වූ ඒ ලෝභි වෙළඳාට බලවත් වූ සෝක උපන්නෝය. ලය උණුව ගියේය. මුඛයෙන් උණු ලේ නැගීය. වැවක පැලි වලල්ලක් මෙන් ලය පැලි ගියේය. ඒ ලෝභි වෙළඳා බෝධිසත්වයන් කෙරෙහි ආගාත බැඳ එතනැම

SANHIDA LANKA

ජීවිතක්ෂයට පැමිණියේය. මෙසේ බෝධි සත්වයන් කෙරෙහි දේවදත් ස්ථවිරයන් වහන්සේ පළමුවෙන් වෛර බැඳිම වන්නේය. බෝධි සත්වයෝ ධානාදී වූ පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලව ගියෝය.  තිලෝ ගුරු බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා වදාරා මත්තෙහි ධර්ම දේශනා කොට වදාරන සේක් යම් සේ පෙර සේරිවාණිජ නම් වෙළඳා ලක්ෂයක් වටනා ඝන රන් තලිය නොලැබ ඒ තලිය ගන්ට වීර්ය නොකොට ඒ තලියෙන් පිරිහී සෝක කරේද පංචස්තාපයට පැමිණියේද එපරිද්දෙන් මහණ තොපි මේ සාසනයෙහි සරහා පිළියල කරන ලද රන් තලියන් වැනි වූ ආර්ය මාර්ගයට පසු බට වීරිය ඇති බැවින් නොපැමිණ ඒ මාර්ග ඵලයෙනුත් පිරිහී බොහෝ කලක් සෝක කරන්නාහුය. ඉදින් තෝ වීර්ය නොහළුවේ වේනම් නුවණ ඇති වෙළඳා නම් රං තලිය ගෙන ප්‍රයොජනය වින්ද කලක් මෙන් මාගේ ශාසනයෙහි නවවිද ලෝකෝත්තර ධර්මය ලබන්නේහි වේදැයි මෙසේ ඒ සර්වඥයන් වහන්සේ නැවතත් ඒ භික්ෂූන් වහ්න්සේට අර්හත් ඵලය කුලු ගන්වමින් ධර්ම දේශනාව දක්වා චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කොට වදාලසේක. චතු සත්‍යය ධර්ම දේශනාවේ කෙළවර පසුබට වීරය ඇති භික්ෂූන් වහන්සේ අර්හත් ඵලයෙහි පිහිටි සේක. තවද බුදුහු පූර්වාපර සන්ධි ගලපා මේ සේරිවාණිජ ජාතකය නිමවා වදාල සේක. එසමයෙහි අඥ්ඥාණ වෙළදා නම් දූන් දේවදත්ත ස්ථවිරයෝය. එසමයෙහි නුවණ ඇති වෙළදානම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේක.

SANHIDA LANKA

# චුල්ලසෙට්ඨි ජාතකය

තවද සූර්ය වංශාභාජාත වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ රජගහ නුවර නිසා ජීවකයන්ගේ අඹඋයනෙහි වසනසේක් චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය ගෙණහැර දක්වා වදාළ සේක.

ඒ කෙසේද? යත්  රජගහ නුවර වසන මහධනසිටානන්ගේ දූවූ එක් කුමාරිකාවක් තමාගේ දාසයකු හා සමග මිත්‍රසන්ථවය වාසය කොට වසන දවස් මේ ක්‍රියාව අනික් කෙණෙක් දැකපූ නම් කටයුතු නොවෙයි සිතා භයින් වන්නේය. ඉදින් මාගේ දෙමව්පියෝ මේ දෝෂය දැකපූ නම් කටයුතු නොවෙයි අප කඩ කඩ කොට කපා පියති සිතා අන්‍ය දෙශයකට ගොස් වසම්හයි කියා හස්තාර වස්තුව හැරගෙණ පළමුකොට හළදොරින් නික්ම යම් තැනකට ගොස් අනුන් නොදන්නා තෙනකට යම්හ යි කථාකොට දෙදෙනම ගියාහුය. මෙසේ ගොස් එක්තෙනක වසන්නාවූ ඔවුන්ගේ සංවාසය නිසා කුමාරිකාවට බඩ දරුගර්භයෙක් පිහිටියේය. ඕ තොමෝ දරුගැම් මුහු කුරාගිය කල්හි වල්ලභයා සමග කථා කරන්නී දරු ගැබ මුහුකුරා ගියේය. ඥාතී බන්ධූන් නැතිතෙනදී දරුවැදීම නම් අප දෙදෙනාටම දුක්වන්නේය. එසේ හෙයින් දෙමව්පියන්ගේ ගමය යම්හයි කිව. ඒ පුරුෂයා අද යම්හ. සෙට යම්හයි කියා බස් ඉකුත් කරන්නේය. එකල කුමාරිකාව සිතන්නී මේ අඥාන පුරුෂයා තමාගේ දෝෂය මහත් බැවින් යන්ට උත්සහ නොකරයි. දෙමව්පියෝ නම් දරුවන්ට වඩා කැමැත්තෝය. එසේ හෙයින් මොහු යත් කිම?. නොයත් කිම?, මා යන්ට සුදුසුවන්නේයයි ඒ පුරුෂයා ගෙයින් බැහැර ගිය කල්හි තමාගේ ගෙයි වලං ඇඳ පුටු ආදී සියල්ලම තැන්පත් කොට තබා තමාගේ දෙමව්පියන්ගේ ගමට යන නියාව අසළ ගෙවල ඇත්තන්ට කියා මංහි නික්මුනාහ. එකල්හි ස්වාමිපුත්‍රයා ගෙට අවුත් කුමාරිකාව නොදක අසල ගෙවල මිනිස්සුන්ගෙන් විචාරා දෙමව්පියන්ගේ ගමට ගිය නියාව අසා වහා වහා ලුහුබැඳවාගෙණ ක්‍රමයෙන් ගොස් අතරමගදී දුටුයේය. ඒ දුටුවිට අතරමගදීම දරුවැදීම වූයේය. ඒ වල්ලභ පුරුෂයා අනේ සොදුර කිමෙක්දයි විචාලේය. ස්වාමීනි පුතකු වදාපිමි කීව. දැන් කුමක් කරමෝදැයි පුරුෂයා කී කල්හි යම් දරුකෙණෙකුන් වැදීම නිසා මා දෙමව්පියන් ගමට යහෝනම් ඒ කාරිය අතරමගදී සිද්ධ විය.නෑයන්ගේ ගෙට ගොස් කුමක් කරමෝදැයි කීය. මෙසේ කියා දෙදෙනම නැවත නික්මුණාහ. මෙසේ එක්සිත්ව පෙරලා තමන්ගේ ගෙට ආවාහුය. ඒ උපන්නාවූ කුමාරයාට නම් තබන්නාහු මගදී උපන් බැවින් පන්ථක කුමාරයෝයයි නම් තබාලූහ. තවද ඒ සිටු කුමාරිකාවට නොබෝ දවසකින්ම දරුගර්භයෙක් පිහිටියේය. ඒ සිටු දූ පලමු පරිද්දෙන්ම දෙමව්පියන්ගේ ගමට යෙමි කියා ගොස් අතරමගදීම දරුවන් වැදූය. ඒ කුමාරයන්ටත් මගදී උපන් බැවින් පළමු උපන් කුමාරයන්ට මහාපන්ථක කුමාරයෝය. බාලපුතනුවන්ට චුල්ලපන්ථක කුමාරයෝය යි නම් තුබූහ. ඔහු දෙදෙනාම දරුවන් පෝෂ්‍යකොට ක්‍රමයෙන් වැඩෙන්නාවූ ඔවුන් දෙදෙනාගෙන් මහාපන්ථක නම් කුමාරතෙමෙ සෙසු කුමාරවරුන් හා කෙළනා කල සෙසු කුමාරයෝ සුළු පියානෝය මුත්තනුවෝය මුත්තනියෝයයි කියන්නන්ගේ බස් අසා මැණියන් අතින් විචාරන්නාහූ මැනියන් වහන්ස සෙසු දරුවෝ සුළු පියානෝය, මුත්තනුවෝය මුත්තනියෝයයි කියති. කිමෙක්ද?. අපට නෑයෝ නැද්දැයි විචාලේය. එකල්හි මැණියන් කියන්නෝ එසේය පුත  තොපගේ නෑයෝ මෙතන නැත. රජගහනුවර මහධනසිටානෝය යන කෙණෙක් තොපගේ මුතතනුවෝය. ඒ නුවර තොපගේ නෑයෝ බොහොයි කීවුය. ඒ අසා කුමාරයෝ කියන්නෝ කුමක් නිසා ඒ නෑයන්ගේ සමීපයට නොයොමෝ දැයි කිවුය. මැනියෝද තමන් ඔබ නොයන කාරණ කියා දරුවන් නැවතූය. ඒ කුමාරයෝ නැවතත් මුතුන්මිත්තන් සමීපයට යම්හයි කියා ඇවිටිලිව කියන හෙයින් පුරුෂයාට මෙසේ කිවුය. මේ දරුවෝ හැමවේලාවෙම මට පීඩා කෙරෙති. කිමෙක්ද දෙමව්පියෝ අප දැක ඇඟමස් කපා කවද්ද, කැටුව දරුවන් කැඳවා ගෙණ ගොස් මුතුන්මිත්තන් දකුම්හයි කිවුය. ඒ අසා වල්ලභපුරුෂයා මම තොපගේ දෙමව්පියන්ගේ ඉදිරියෙහි සිටින්නට අසමර්ථයෙමි. කියා තොපි දෙදරුවන් කැඳවාගෙණ ගොස් මිතුන්මිත්තන් දක්වයි කීය. දක්වීමෙනුත් ප්‍රයෝජන ඇතැයි කියා දෙදරුවන් කැඳවා ගෙණ රජගහ නුවරට ගොස් නුවර දොර එක් ශාලාවෙක නවාතැන් ගෙණ දරුවන්ගේ මැනීයෝ ද දෙදරුවන් කැඳවාගෙණ ආ නියාව දෙමාපියන්ට කියායවුය, ඒ අසා සිටුදුවගේ දෙමව්පියෝ සිතන්නාහූ සසර ඇවිදිනාවූ අපට පුතනුවූ දූනුවූ කෙණෙක් නැත. ඔහු දෙනෙ අපගේ වංශය හානී කළාහ. එයස්හෙයින් මහත් වූ අපරාධ කළාහ. එසේහෙයින් ඔවුන් දෙදෙනා අප ඇස්හමුයෙහි සිටින්නට නොපිළිවන්නේය. මේ අප දීලුවස්තු හැරගෙණ දෙනොම තමන් කැමති සැප තෙනකට ගොස් ජීවත්වෙත්වයි කීවුය.ඒ අසා සිටුවූ දෙමව්පියන් එවූ වස්තුහැරගෙණ දරුවන් දෙන්නා තමන් තමීපයට ආ දූතයන් අතට පාවාදී යවුය. දෙදරුවෝද මුතුන්මිත්තන් සමීපයේ වැඩී වර්ධනය වෙති, ඔවුන් දෙනො අතුරෙන් චුල්ලපන්ථක කුමාරයෝ ඉතා බාලයෝහ. මහාපන්ථක කුමාරයෝ මුත්තණුවන් හා සමඟ බුදුන් සමීපයට බණ අසන්නට යෙති.නිරන්තරයෙන් බණ අසන්නාවූ කුමාරයන්ට මහණ වීමෙහි සිත්නැමුනේය. එකල්හි කුමාරයෝ මුත්තනුවන්ට කියන්නෝ ඉදින් නුඹ වහන්සේ ගිවිස්නාසේක් වී නම් මහණවන්නෙමි වේදැයි කිවුය. එබස් අසා මුත්තනුවෝ කියන්නාහු පුත තෙපි කුමක් කියව්ද සියලු ලෝවැස්සන්ගේ මහණවීමටත්  වඩා තොපගේ මහණවීම යහපත් වන්නේය. ඉදින් තොපි මහණ දම්පුරන්නට සමර්ථයෝ නම් මහණුවම් ගණුවයි කියා කුමාරයන් කීබස ගිවිස සර්වඥයන් වහන්සේ සමීපයට ගොස් සර්වඥයන් වහන්සේ විසින් මේ කිමෙක්ද මහා සිටානෙනි තෙපි දරුකෙණෙකුන් ලද්දැයි විචාළ කල්හි එසේය, ස්වාමීනී කුමාරයෝ මාගේ මුනුබුරාණෝය. උෟතුමූ නුඹ වහන්සේ සමීපයෙහි මහණවෙමියි කියකියි දක්වූහ. ඒ බස් බුදුහු අසා එක්තාරා තෙරකෙණෙකුන් වහන්සේට මේ කුමාරයන් මහණ කරවයි නියෝගකොට වදාළසේක. ඒ තෙරුන් වහන්සේ කුමාරයන්ට තචපඤ්චත කර්මස්ථාන දී මහණ කළ සේක. උන්වහන්සේත් බොහෝ වූ බුද්ධ වචනයන් ඉගෙණ පිරුණාව විසිවයස් ඇතිසේක් උපසම්පදා ලත් සේක. උපසම්පදා වූ තැන් පටන් නුවණින් සලකා භාවනා මනස්කාර කෙරෙමින් නොබෝ දවසකින් රහත් වූ සේක. මහාපන්ථක ස්ථවිරයන්

SANHIDA LANKA

වහන්සේ ධ්‍යාන සුවයෙන් දවස්යවන සේක් කිමෙක්ද මේ සැපය චුල්ලපන්ථක යන්ට දෙන්ට පුළුවන්දෝහෝයි සිතුසේක. ඉක්බිත්තෙන් ඒ මහාපන්ථක ස්ථවිරයන් වහන්සේ මුතුන් සිටානන්ගේ ගොට ගොස් මහා සිටානෙනි. ඉදින් තොපි ගිවිසුනම් මම චුල්ලපන්ථකයන් මහණ කරවන්නෙමි වේදැයි වදාළ සේක. ඒ අසා සිටානෝ යහපත ස්වාමීනි චුල්ලපන්ථකයන් මහණ කළ මැනවැයි කිවුය. තෙරුන් වහන්සේ චුල්ලපන්ථකයන් මහණකොට දශශීලයෙහි පිහිටවූ සේක. චුල්ලපන්ථක සාමණේරයන් වහන්සේ මහණවෙලා මන්‍දප්‍රාඥ වූ හ.

පදුමං යථා කොකනදං සුගන්ධං පතො සියා චුල්ල මවිතගන්ධං

අංඝීරසං පස්ස විරොචමානං තපන්නමාදිච්ච මිවන්නළිකෙඛං

යන මේ ගාථාව සාරමසකින් වනපොත් කරන්නට අසමර්ථ වූයේය. ඒ චුල්ල පන්ථක සාමණේරයන් වහන්සේ කාශ්‍යප සර්වඥයන් වහන්සේගේ සමයෙහි මහණව නුවණැතිව එක්තරා නුවණමද භික්ෂු කෙණෙකුන් වහන්සේගේ පාළි උගන්නා කල්හි සිනාසී නින්දාකොට කෙළිසේක. ඒ නුවණ මඳ භික්‍ෂූන් වහන්සේ ප්‍රඥාවන්ත භික්ෂූන් වහන්සේගේ නින්‍දයෙන් පාළිය නුගත් සේක. වනපොත් නොකළ සේක. ඒ පූර්ව ජන්මයේ කරණලද අකුශල කර්මානුභාවයෙන් මේ චුල්ලපන්ථක සාමණේරයන් වහන්සේ මහණ වූ ගමණේ නුවනින් මඳවු සේක. පළමු වනපොත්කළ පදය ඉදිරියේ වනපොත් කරණ කලට නස්නේය. මේ ගාථාව වනපොත් කරන්ට උත්සහාකරන්නාවූ චුල්ලපන්ථක සාමණේරයන් වහන්සේට සාරමසක් ඉකුත්ව ගියේය.

එකල්හි මහාපන්තක ස්ථවිරයන්වහන්සේ මෙසේ වදාළ සේක. පන්ථකයෙනි. මේ ශාසනයට අයෝග්‍යව සාරමසකින් එක ගාථාවක් වනපොත් කොට ගන්ට අසමර්ථිව ප්‍රව්‍රජ්‍යාකෘත්‍ය වූ කලී තෙපි කෙසේ මස්තකප්‍රාප්ත කරවූදැයි මෙතෙකින් පලායවයි කියා විහාරයෙන් නෙරපූ සේක. එසමයෙහි මහාපන්ථක ස්ථවිරයන් වහන්සේ සියලු සංඝයාවහන්සේට බත් බෙදාදෙනසේක. ජීවකයෝ බොහෝ ගඳ දුම්මල් පහන් ආදිය ගෙන්වාගෙණ තමන්ගේ අඹ උයනට ගොස් බුදුන්ට පූජාකොට බණ අසා හුනස්නෙන් නැගී බුදුන් වැඳ මහා පන්ථකස්ථවිරයන් වහන්සේ කරා එළඹ ස්වාමීනී බුහුන් සමීපයෙහි  කෙතෙක් භික්ෂූන් වහන්සේදැයි විචාළෝය. තෙරුන්වහන්සේ පන්සියයක් පමණ භික්ෂූන් වහන්සේයයි වදාළ සේක. එකල්හි ජීවකයෝ කියන්නෝ ස්වාමීනි සෙට බුදුන් ප්‍රධාන කොට ඇති පන්සියයක් භික්ෂූන්වහන්සේ කැඳවාගෙණ අවුත් මාගේ ගෙයිදී සිඟුව මැනවැයි කිවුය. උපාසකයින් චුල්ලපන්ථකයෝ ශාසනයෙහි පිහිටක් නොලද්දෝය. උන් හැර සෙසු භික්ෂූන් වහන්සේට තොපගේ ආරාධනාව ඉවසන්ට කියන්නෙමි වේදැයි වදාළසේක. ඒ අසා චුල්ලපන්ථක සාමනේරයන් වහන්සේ සිතනසේක් මහාපන්ථක ස්ථවිරයන්වහන්සේ මෙතෙක් භික්ෂුන්වහන්සේගේ ආරාධනාව ඉවසනසේක් මා පිටත් තොට ඉවසූ සේක. ඒකාන්තයෙන් මාගේ බෑණන්වහන්සේ මා කෙරේ බිඳී ගියේය. එසේ කළ මට දූන් ශාසනයෙන් ප්‍රයෝජන කිම්ද ගිහිවෙමි. ගිහිව සිට දානාදීවූ පින් කොට ජීවත්වෙමි යි සිතා දෙවෙනි දවස් උදෑසන ගිහිවෙමියි සිතා නික්මුණේය. සර්වඥයන් වහන්සේ අළුයම්වේලෙහි ලොවබලා වදාරණසේක් මේ කාරණය දැක  පළමුකොට ගොස් චුල්ලපන්ථකයන් වහන්සේ යන මග දොරටුවේ සක්මන්කරණ සේක්. තමන් වහන්සේ වසනගෙන් නික්මුණසේක් සර්වඥයන් වහන්සේ දැක ස්වාමීනියි කියා එළඹ නමස්කාර කළ සේක. ඉක්බිත්තනේ සර්වඥයන් චුල්ලපන්ථක  මේ වෙලේ කොයි යව්දැයි වදාළසේක. ස්වාමීනි මාගේ බෑණනුවන් වහන්සේ මා ශාසනයෙන් නෙරපූ සේක. එසේහෙයින් මම ගිහි වන්නෙමියි දැන්වූසේක. ඒ අසා සර්වඥයන් වහන්සේ චුල්ලපන්ථකයෙනි තොපගේ ප්‍රව්‍රජ්‍යාව නම් මා සන්තකය. බෑණන් විසින් නෙරපණලද්දා වූ තොපි කවර කාරණයකින් මා සමීපයට නාවාහුද මා කැටුව එවයි ගිහිවීමෙන් ප්‍රයෝජන කිම්ද මා සම්පයෙහි වාසය කරවයි කියා වදාළසේක. ඉක්බිති චුල්ලපන්ථකයන් වහන්සේ කැඳවාගෙණ ගොස් ගඳ කිළි නිසමත්තෙහි හිඳුවා චුල්ලපන්ථකයනි නැගෙණහිරට අභිමුව හිඳ මේ රෙද්ද රජොහරණං රජොහරණං යි කිය කියා පිරිමැදීමෙන් මෙතන හිඳුවයි වදාරා සෘදියෙන් මවන ලද පිරිසිදු රෙද්දක් දී වඩනට වේලා දැනුවූ කල්හි භික්ෂූ සංඝයා වහන්සේ පිරිවරා ජීවකයන්ගේ ගෙට ගොස් පනවන ලද බුද්ධාසන මස්ථකයෙහි වැඩවුන් සේක. චුල්ලපන්ථකයන් වහන්සේද සූර්ය රශ්මිය බල බලා ඒ රෙදි කඩ  රජෝහරණං රජෝහරණං යි කිය කියා පිරිමදිමින් උන් සේක. මෙසේ ඒ චුල්ලපන්ථකයන් වහන්සේ ඒ රෙදි කඩ පිරි මැද මැද සිටියදීම කිළිටුව ගියේය. ඉක්බිති උන් වහන්සේ සිතන සේක් මේ රෙදි කඩ ඉතා පිරිසිදුය. නිර්මලය. මේ ආත්මභාවය නිසා පූර්ව ප්‍රකෘත්තී හැර මෙසේ කිළිටුව ගියේ  ඒකාන්තයෙන් ප්‍රත්‍ය සමුත්පන්න ධර්මයෝ ඉපිද නස්නා සුල්භ යයි කිය කියා ප්‍රත්‍ය සමුප්පන්න ධර්මයන්ගේ ක්‍ෂණ ක්‍ෂණ යෙහි ඉපිද නස්නා බව සලකමින් විදර්ශනා වැඩූ සේක. සර්වඥයන් වහන්සේද චුල්ලපන්ථකයන්ගේ සිත විදර්ශනාවට නැගෙන්නේ යැයි චුල්ලපන්ථකය රෙදි කැබැල්ල කිලිටුව රජසින් රැඳි ගියේය. එමෙන්ම තාගේ අභ්‍යන්තරයෙහිද රාග රජාදීහූ ඇත. ඔවුන් දුරු කරවයි කියා ආලෝකයක් හැර ඉදිරියේ වූ නාක් මෙන් පෙනෙන්නා වූ ස්වරූප ඇතිව මේ ගාථාව වදාල සේක.

SANHIDA LANKA

රගෝ රාජෝ නවපන රේණු උච්චතී රාග සෙස්තං අදිවචනං රජති.
ඒතං රජං විප්ප ජහිට්ඨ භික්ඛවෝ විහරනති තේ.
විගත රජස්සං සාසනේ ද්වසෝ රජෝ නවපන රේණු වුච්චති දොස සේ සතං අධිවචනං රජෝතී...
ඒතං රජං විප්ප ජහිට්ඨ භික්ඛවෝ වහරනතී තේ විගත රජස්ස සාසනේ.
මෝහ රජෝ නවපන රේණු වුච්චතී මොහො ස්සතං අධි වචනං රජෝතී.
ඒතං රජං විප්ප ජහිට්ඨ භික්ඛවෝ වහරණතී තේත විගත රජස්ස සාසනේ .

යන මේ ගාථා වදාල ඉක්බිති චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ සිව් පිළිසිඹියා හා සමඟ රහත් වූ සේක. චතුපටිසම්භිධාවට පැමිණිමෙන් ත්‍රිපිටකය ප්‍රගුණ විය.ඒ චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ පෙර රජව ඉපද නුවර පැදකුණු කරන සේක් නළලින් දා වැගිරෙන්නට පටන් ගත් කලිහි පිරිසිදු සළු පටින් නළල් කෙළවර පිසපු සේක. සළුව කිලිටුව ගියේය. ඒ රජ්ජුරුවෝ සිතන් නාහු මේ ශරීරය නිසා මෙබඳු වූ පිරිසිදු සළුව තමාගේ පිරිසිදු ධවල ගුණය හැර කිළිටුව ගියේය. ඒ කාන්යෙන් ප්‍රත්‍ය සමුප්පන්න ධර්මයෝ අනිත්‍යයෝ යැයි අත්ත්‍යසංඥාව සිහි කලේය. ඒ කාරණයෙන් ඒ තෙරුන් වහන්සේට රජෝ හරණ යන පත්‍ර විය. ජීවකයෝ සර්වඥයන් වහන්සේට දක්ෂිණෝද්ධකය පළ වූ බුදුහු එවේලෙහි පීවකයිනි විහාරයෙහි භික්ෂු ඇත්තෝ නොවේදැයි කියා අතින් පාත්‍රය වැසූ සේක. එවෙළෙහි මහා පන්ථක ස්ථවිරයන් වහන්සේ ස්වාමීනි විහාරයෙහි භික්ෂූන් නැත්තේයි වෙද්දැයි කී සේක. සර්වඥයන් වහන්සේ භික්ෂුන් ඇති නැති නියාව දන එවයි කියා පුරුෂයකු යැවුහ. එකෙණෙහි චුල්ලපන්ථක ස්ථවිරයන් වහන්සේ සිතන සේක් මාගේ බෑණන් වහන්සේ විහාරයෙහි භික්ෂූහු නැතැයි සිතූහ. විහාරයෙහි භික්ෂූන් ඇති නියා උන් වහන්සේට ප්‍රකාශ කල මැනවයි සිතා සියළු අඹ උයන භික්ෂූන් ගෙන්ම පිරූ සේක. සමහර භික්ෂූන් වහන්සේ සිවුරු ගෙත්තම් කරන සේක. සමහර කෙණෙකු වහන්සේ සිව්රු රඳන සේක. කෙණෙකුන් වහන්සේ වණපොත් කරණ සේකැයි මෙසේ ඔවුනවුන් වෙනසක් නැතිව එක ස්වරූපය වූ භික්ෂූන් දහසක් මැවූ සේක. බලන්නට ගිය පුරුෂයා විහාරයේ බෝහෝ භික්ෂූන් දක නැවත අවුත් ජීවකයන්ට කියන්නේ සියළු අඹ උයන භික්ෂූන්ගෙන් ගැවසී ගත්තේයැයි කීය. ඉක්බිති සර්වඥයන් වහන්සේ ඒ පුරුෂයාට වදාරණ සේක් බුදුහු චුල්ලපන්ථකයන් වහන්සේ කැඳවන සේකැයි කියවයි වදාල සේක. එබස් අසා පුරුෂයා ගොස් එපරිද්දෙන්ම කී කල්හි මම චුල්ලපන්ථකයෙමි මම චුල්ලපන්ථකයෙහි මුබ දහසක් නැංගේය. එකල්හි පුරුෂයා නැවත බුදුන් කරා ගොස් ස්වාමීනී හැම දෙනා වහන්සේ අපි චුල්ලපන්ථක යම්හ. අපි චුල්ලපන්ථක යම් ය කියන සේක් යැයි දැන්වීය. ඒ බස් අසා බුදුහූ දැන්නෝ ගොස් පළමු කොට යමෙක් මම චුල්ලපන්ථක කිවු නම් ඔහු අත අල්වා ගනුව අවශේෂයෝ අන්තර්ධාන වෙතියි වදාලාහ. එවෙලෙහි ඒ පුරුෂයා එපරිද්දෙන්ම කලේය. දහසක් පමණ භික්ෂූන් වහන්සේ අන්තර්ධහන සේක. තෙරුණ් වහන්සේද කැඳවාගිය පුරුෂයා හා කැටිව වැඩි සේක. සර්වඥයන් වහන්සේ ජීවකයන් කැඳවා ජීවකියනි චුල්ලපන්ථකයන්ගේ පාත්‍රය ගනුවයි චුල්ලපන්ථකයෝ තොපට අනුමෙවැනි ධර්ම දේශනා කරවයි වදාලා හං ජීවකයෝ එපරිද්දෙන්ම කළෝය. එවේලෙහි චුල්ලපන්ථක ස්ථිවරයන් වහන්සේ සිංහ නාද කරන්නාහු අභීත කේසර සිංහ රාජයකු පරිද්දෙන් තුන් පිටකය අලලා අනුමෙවැනි ධර්මදේශනා කල සේක. සර්වඥයානන් වහන්සේ උනස්නෙන් පැන නැගී භික්ෂු සංඝයා පිරිවරා විහාරයට වැඩ භික්ෂූන් විසින්වත් දක් වූ කල්හි හුනස්නෙන් නැගී ගඩ කිළි නිසමත්තෙහි සිට භික්ෂූ සංඝයා වහන්සේට සුපතු වාදය දී කමටහන් දී වදාරා භික්ෂූ සංඝයා යවා සිව් දැගඳින් සුවඳ කරන ලද ගඩ කිලියට වැඳ දකුණැලව සිංහ සෛයාව කොට වදාල සේක. ඉක්බිත්තෙන් සවස් වේලෙහි ධම්සභා මණ්ඩපයට භික්ෂූන් වහන්සේ නොයෙන් තැන් රැස්ව රත් පලස් තිරයක් වට කරන කලක් මෙන් හිඳ බුදුන්ගේ ගුණ කථාව පටන් ගත් සේක.

ඇවැත්නි මහාපන්ථකස්ථවීරයෝ චුල්ලපන්ථක ස්ථවිරයන්ගේ අංධ්‍යාසය නොදන්නාහු එකගාථාව සාරමසකින් වනපොත් කොට ගත නුහුණුවෝය. නුවණ මදයෝයයි කියා විහාරයෙන් නෙරපූය. සර්වඥයන් වහන්සේ තමන් වහන්සේ ධර්මරාජ බැවින් එකම අන්තරාභක්තියෙහි සිවුපිළිසිඹියා හා සමග අර්හත්ඵලය දුන්සේක. චතුසටිසම්භිදා ප්‍රාප්තවිය. එමෙන් තුන්පිටකය ප්‍රගුණ විය. සර්වඥයන් වහන්සේගේ බලමහිමය නම් ඉතා ආශ්චර්යයන්නේය යි බුදුන් ගේ ගුණ කිය කියා උන්සේක. එකල්හි සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි මේ කථා ප්‍රවෘතිය දන අද මා විසින් එතනට යන්න වටනේයයි බුද්ධ සෙය්‍යාවෙන් නැගී රත්වූ දෙපට අඳනා සිවුර තිමණ්ඩල ප්‍රතිච්ඡාදනය කිරීම වශයෙන් හැඳ විජ්ජුල්ලතා සශ්‍රීකවූ පටිධාතුව ඊ මත්තේ බැඳ රත්පලසක් හා සමානවූ පාංශුකූල සුගත මහා චිවරය ඒකාංශ කොට ඊමත්තේ පොරවා සුගන්ධ ගන්ධ කුටියෙන් නික්ම මතත්හස්තිරාජයක්හූ අල්වන්නට නික්මුණු කෙශරී සිංහරාජයෙකුගේ විලාසයෙන් අප්‍රමාණ සර්වඥලීලාවෙන් දම්සභා මණ්ඩපයට වැඩ සරහන ලද මණ්ඩප මාධ්‍යයෙහි පණවන ලද උතුම්වූ බුද්ධාසන මස්තකයට පැන නැගී ෂඩ්වර්ණ බුද්ධරශ්මි මාලාවෙන් විහිදු මින් සාගරකුක්ෂිය බබුලුවමින් යුගදුරු මුදුනෙහි දිලිසෙන්නාවූ ලහිරුමඬලක් මෙන් දිලිහි දිලහි ආසන මධ්‍යයෙහි වැඩ උන්සේක. බුදුරජානන් වහන්සේ එතැනට පැමිණ කෙණෙහිම භික්ෂූ සංඝයා වහන්සේ කථාවිච්ඡේදනය කොට මුවෙන් නොබැණ වැඩ උන් සේක. සර්වඥයන් වහන්සේ මොළොක්වූ මෙත් සිතින් භික්ෂූපෂිත් බලා මේ පර්ෂිද ඉතා බොහෝ වන්නේය. එකද භික්ෂූවක්හුගේ අතපය සෙලවිමක් වේ වයි කැසපියන කිඹිසපියන ශබ්දයක් වේවායි නැත. මේ සියළු භික්ෂූහුම බුද්ධ ගෞරවයෙන් හා බුද්ධතේජසින් තැතිගත්හ. ආයුෂ්කල්පය මුළුල්ලෙහි මා බැනනොනැගී උන් කල්හිදු පළමුකොට කථාවක් නුපදවති. එහෙයින් මම පළමුකොට කථාවක් උපදවමියි සිතා මිහිරි වූ බ්‍රහ්මස්වරයෙන් භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට මහණෙනි දැන් කවර කථාවකින් යුක්තව උනුද කවර නම් කථාවක් තොපට අදාල වීදැයි විචාළසේක. එකල්හි ඒ භික්ෂූන් වහන්සේ අපි මෙතැන්හි උනනමෝ අන්‍යවූ සවර්ගමෝක්ෂද්වයට බාධාක වූ තිරශ්චින කථාවක් නොකීම්හ. නුඹවහන්සේගේ ගුණ වර්ථනානොට උනුම්හයි දැන් වූ සේක. එකල්හි භික්ෂූන් වහන්සේගේ කථාව අසා මහණෙනි චුල්ලපන්ථකයෝ දැන් මා නිසා ධර්මමහත්වයට පැමිණියෝ යි වදාළ සේක. එකල්හි එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ ඒ අර්ථය ප්‍රකාශ කරනු පිණිස භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේට ආරාධනා කළ සේක. භාග්‍යවතුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

SANHIDA LANKA

ඒකෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි අප මහා බෝසතානෝ

සිටු කුලයක ඉපද වැඩිවිය පැමිණ සිටුතනතුරු ලැබ චුල්ලසිටාණෝයයි යන නමින් ප්‍රසිද්ධව වසන කල ඒ සිටාණෝ නුවනැත්තෝය. ව්‍යක්තයෝය. සියළු නිමිති දනිති.එක් දවසක් ඒ සිටාණෝ රජ සේවයට යන තැනැත්තෝ විදි මධ්‍යයේ මල මිනියකු දක නක්ශත්‍රයෝගය පරීක්ෂා කොට මෙසේ කීව්ය. නුවනැති කුලපුත්‍රයක් වූ විසින් මේ මියා අරගෙන පුත්‍රධාරාවන් පෝෂ්‍ය කරන්නටවත් වෙළඳාම් කරන්නටවත් පුළුවන් වන්නේ වේදැයි කිව්ය. එක්තරා දූගි පුරුෂයෙක් සිටාණන්ගේ ඒ වචනය අසා සිටාණෝ නොදැන නොකියතියි සිතා මීයා අරගෙන එක් සල්පිලක බලලකු නිසා දී දිවියට සමාරක් රත්රන් ලද්දේය. ඒ කාකනික මාත්‍රාවෙන් උක්තකරු ගෙන එක කලයකින් පැන් ගත්තේය. එතෙම මලින් මල් කඩා ගෙන ලන්නාවූ මාලාකාරින් දක උත්සකුරු සුගඳ් දී පැන් රත්කලේය. ඒ මාලා කාරීහූ එකී එකී මල් මිට දුන්නාහ. ඒ තෙමේ මල් විකුට ඒ මල් මිලයෙන් දෙවැනි දවස් උත්සකුරු හා පැන් කලයක් ගෙන මල් වත්තට ගියේය. එදවස් ඕ හට මාලා කාරීන් හූ මල් භාගයක් කඩාගෙන මල් ගස් දී ගියාය. ඒ තෙමේ නොබෝ දවසකින් මේ උපායෙන් අටකහවනුවක් ලද්දේය. නැවත එක් වැසි සුළං දවසක රාජ්‍යය උද්‍යානයේ බොහෝ වියල් දඬු හා අතුපත් සුළඟින් වැටුනේය. උයන් ගොව්වාද දමන්නට උපාය නොදකින්නේය. එකල්හි ඒ පුරුෂයා ඇතුලට ගොස් ඉදීන් තොපි මේ දඬු හා අතුපත් මට දෙව්නම් මම සියළු දඬුපත් උයනින් පිටත් කරවා පියන්නෙමි වේදැයි උධ්‍යාන පාලයාට කීහ. උධ්‍යාන පාලයා යහපත යහළුව අරගෙනයි ගිවිස්සේය. චුල්ලනෙත්වාසික තෙම කුඩා කොල්ලන්ගේ කෙලිමඩුල්ලට ගොස් උත්සකුරු දීමටද ඇසිල්ලකින් ඒ සියළු දඬුපත් කොල්ලන් ලවා උයනින් අද්දා පිටත් කරවා උයන් දොරකොඩ කැටි කර වූයේය. එකල්හි රජගෙට වලං ලන කුඹලා රජගෙට වලං පලගනු සඳහා දර සොයා ඇවිදින්නේ උයන් දොර කඩා තුබූ ඒ දර ගොඩ දක ඔහු අතින් මිලදී විකිණ ගත්තේය. එදවස් චුල්ලනෙත වාසික තෙම සොලොස් කහවණුවක් හා සැල ආදීවූ වලං පන්සියයකුත් ලද්දේය. ඒ තෙමේ වෙළදාම් කිරීමෙන් කහවණු සූ විස්සක් වූ කල්හි මට මේ උපාය ඇතැයි නුවර දොරටුවට නොදුරු තැනක එක් පැන්සලක් තබාගෙන පෙන්සියයක් තණ අදිනා පුරුෂයන්ට පැන් වත්කලේය. ඔහු මෙසේ කිවුය. තොපි අපට බොහෝ උපකාර කෙළෙහිය. තොපට අපි කුමක් කරමෝදැයි කීය. එකල්ලහි චුල්ලනෙත වාසිකයා කියන්නේ මාගේ කාරියක් පැමිණි කල්හි කියන්නෙම් වේදැයි කියා ඇත මැත අවිදින්නේ ගොඩ වෙළඳාම් කරන්නවුන් හා සමගත් මුහුදු වෙළඳාම් කරන්නවුන් සමගත් මිත්‍ර ගත්තෙය.එකල්හි ඕ හට ගොඩ වෙළඳාම් කරන්නවුන්ගේ ප්‍රධාන පුරුෂ තෙම ඉදින් සෙට දවස් මේ නුවරට අස් වෙළදෙක් පන්සියයක් අසුන් ගෙන එන්නේ යයි කීය. එතම ඔහුගේ වචනය අසා තණ ගෙනෙන්නා වූ පන්නයින්ට අද මට එක එකී තන මිටියක් දෙව මා තණ විකුණන්නට පළමු කොට තොපි ඇම තණ නොවිකුණවයි කීහ. එකල ඔහු හැම දෙන යහපතැයි ගිවිස පන්සියයක් තණ මිටි ගෙණ උත් ඔහුගේ ගේදොර එලුහ. අස් වෙළෙන්දා සියළු නුවර ඇවිද අසුන්ට තණ නොලැබ ඒ චුල්ලනේථ වාසිකයා හට කහවණු දහසක් දී තණ අරගත්තේය. ඉක්බිත්තෙන් කීප දවසක් ගිය කලට සමුද්‍රයාත්‍රාවෙන් වෙළඳාම් කරන්නාවූ යහළුවා ඕ හට කියන්නේ තොටට නැව් අවුත් වනැයි කීය. එකල චුල්ලනේත වාසික පුරුෂයා මට මේ උපායෙන් ප්‍රයෝජන ඇතැයි සිතා කහවණු අටක් දී සියළු පිරිවරින් යුක්තව පිරුණු රථයක් ගෙන මහත් වූ යස පිරිවරින් බටහිර තොට ගමට ගොස් පේරැස් මුද්දක් නැවට අත්තිකාරම් කොට දී නුදුරු තැනක වට කොට තිරයක් බඳවා සමීප වූ චර පුරුෂයන්ට මෙසේ විධාන කලේය. පිටතින් වෙළඳු අවුනම් රැකවල් තුනකින් මෙහෙවර කියා මා සමීපයට කැඳවාගෙන එවයි කීහ. එකල පටුනු ගමට නැව බටයි අසා බරණැස් නුවරින් වෙළඳුන් සියයක් බඩු ගනුම්හයි ආවාහුය. නැවත බඩු වෙළඳාම් කරන්නාහු මනුෂ්‍යයෝ කියන්නාහු අපගෙන් තොපට බඩු නොලැබෙයි. අසවල් තැන හිදින්නා මහ වෙළදානන් විසින් අත්තිකාරම් දෙන ලදැයි කීවුය. එබස් අසා බරණැස් නුවර වෙළෙන්දු ඒ චුල්ලනේත වාසිකයා සමීපයට ආවාහුය. ඔහුගේ අතවැසි පුරුෂයෝ පළමු කොට ලුවිධාන නියාව රැකවල් තුනක් තුන් විටක් ඔබින් ඔබ මෙහෙවර කීයා වුත් ඒ වෙළදුන් ආබව කියා යැව්වාහුය. වෙළදුන් චුල්ල නේත වාසිකායට එකි එකී දහසක් දී චුල්ලනේත වාසික පුරුෂයා හා සමග නැව් බඩු ගනුහයි පත්තුව ගෙන නැවත එකි එකී දහසක් දී නැව බඩු අරවාගෙන බඩු තමන් සන්තක කලාහ.චුල්ලනේත වාසික තෙම දෙලක්ෂයක් වස්තු හැර ගෙන බරණැස්නුවරට අවුත් සත්පුරුෂයන්ට කෙළෙහිගුණ දන්ම සුදුසු වේදැයි ලක්ෂයක් වස්තු ගෙන්වා ගෙන චුල්ල සිටාණන් සමීපයට ගියේය. එකල්හි සිටාණෝ ඕ හට දරුව තොප විසින් කුමක් කොට මේ වස්තුව ලබන ලද්දේ දැයි කීහ. මලමීයාගේ විකිණීම පටන් සියළු ප්‍රවෘත්ති කීයේය. චුල්ල සිටාණෝ ඔහුගේ බස් අසා මෙබඳු පුරුෂයකු අනුන්ට ඇර පියන්නට සුදුසු නොවන්නේ යයි කියා වැඩි විය පැමිණ සිටි තමන්ගේ දියනියන් ඕ හට පාවා දී සියළු තමන්ගේ වස්තුවට හිමි කලාහ. ඒ පුරුෂයා චුල්ල සිටාණන්ගේ ඇවැමෙන් ඒ නුවර සිඹු සේසත් ලද්දේය. මහබෝසතාණෝ දානාදී පින්කම් කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාල සේක. තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ රාජොත්තමයාණන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා වදාරා මත්තෙහි ධර්ම දේශනා කොට යම්සේ ණුවනැති පුරුෂයෙක් මධ ගින්නක් ක්‍රමයෙන් ගොමසුනු ආදිය ලා මුඛයෙන් පිඹ මහත් වූ වක් නිස්කන්ධයක් කෙරේද එපරිද්දෙන්ම නුවණැති සත්ව තෙම යම් සුවල්ප වූ බඩු මිලයක් ලැබ නොයෙක් උපායෙන් වෙළඳාම් කොට වස්තු යසස් වර්ධනය කරන්නේයැයි මෙසේ භාග්‍යවත් වූ බුදු රජානන් වහන්සේ මහණෙනි චුල්ලපන්ථක ස්ථවිරයෝ දැන් මා නිසා ධර්මයේ මහත් තත්වයට පැමිණියෝය. පූර්ව ජන්මයෙහි මහත් තත්වයට පැමිණියෝ යැයි ධර්ම දේශනාව වදාරා අතීත කතාවත් වර්ථමාන කථාවත් දෙකම එක් කොට පූර්වාපර සන්ධි ගලපා මේ චුල්ලසෙට්ටි ජාතකය නිමවා වදාල සේක. එසමයෙහි චුල්ලනේථ වාසික පුරුෂ තෙම දැන් මේ චුල්ලපන්ථක ස්ථිවිරයෝය. එසමයෙහි චුල්ල සිටුව උන්නෙම් දැන් තිලෝගුරු සම්‍යයක් රජ වූ මම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේක.

SANHIDA LANKA

# තණ්ඩුලනාලි ජාතකය

තවද එක්සමයෙක්හි ශාක්‍යසිංහ වූ සම්‍යක් සම්බුදු රජානන්වහන්සේ සැවැත් නුවර නිසා ජේතවනාරාමයෙහි වාසය කරණ සේක් ලාළුදායී නම් තෙර කෙණෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළ සේක.

එ කෙසේ ද යත් එක් සමයෙක්හි දබ්බමලලපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සංඝයා වහන්සේට ලාබත් ආදී වූ බත් පමුණුවන සේක. උන් වහන්සේ උදෑසන ලා බත් පමුණුවන්ටවන් කල්හි උදායිස්ථවිරයන් වහන්සේට කිසිකලක යහපත් බතෙක් පැමිණෙන්නේය, කිසිකලක නපුරුබතෙක් පැමිණෙන්නේය, උදායි ස්ථවිරයන් වහන්සේ තමන් වහන්සේට නපුරු බත පැමිණ දවස් ලාබත් බෙදන්නාවූ ස්ථානයෙහි අලළාන කරණ සේක. කිම දබ්බල පුත්‍ර යෝමලාබත් බෙදන්ට දනිද්ද අපි නොදනිමෝදැයි කියාත් කියතන සේක. උන් වහන්සේ ලාබත් බෙදන තැන අලාළන කරණහෙයින් එසේ වී නම් දන්නුඹවහන්සේම ලාබත් බෙදාදුන මැනවයි කියා ලාබත් පෙට්ටි ඒ තෙරුණ් වහන්සේට පාවාදුන්හ. එතැන් පටන් සංඝයා වහන්සේට ඒ ලාළුදායි ස්ථවිරයන් වහන්සේම ලාබත් බෙදාදෙන සේක. දෙන්නාවුන් ඒ තෙරුන් වහන්සේ යහපත් බත වේවායි නපුරු බත වේවායි අසවළුන්ගේ කොටසේ යහපත් බත සිටියේයයි කියාවත් අසවල් කොටසේ නපුරු බත සිටියේයි කියාවත් නොදන්නාසේක. ඨිතිකාව කරණසේකුත් නපුරු බත සිටියේයයි කියාවත් නොදන්නා සේක. ඨිතිකාව කරණසේකුත් අසවල් ඨිපිකාවකොට සේසලකාගත නොහෙන සේක. භික්ෂූන් වහන්සේ පාළියේ සිටි වෙලාවෙහි මෙතන අසවල් ඨිතිකාව සිටියාය. මෙතැන අසවල් ඨිතිකාව බෙදන සිටියායිබිමවත් භික්තියේවත් ඉරක් අඳනාසේක. දෙවෙනි දවස් ලාබත් තැන භික්ෂූන් වහන්සේ මඳ හෝ වනසේක. බොහෝ හෝවනසේක. භික්ෂූන් වහන්සේ මඳවූකල ඇඳළුඉර අගට පලායන්නේය බොහෝවූ කල්හි මුලට වන්නේය. ඒ උදායි ස්ථවිරයන් වහන්සේ ඨිතිකාව දනගතනොහී රෙබා සංඥයෙන් ලාබත් දෙන සේක. එකල්හි අවශෙෂ භික්ෂූන් වහන්සේ කියන සේක් ඇවැත්නි උදායි ස්ථවිරයෙනි. රේබාව නම් පසු හෝ වෙයි උතුම්බත අසවල් කොටසේ සිටියේය නපුරුබත අසවල්කොටසේ සිටියේයයි කිසේක්. ඒ අසා උදායි ස්ථීවිරයන් වහන්සේ භික්ෂූන් වහන්සේ වා විවාද කරණසේක් ඒසේ වී නම් මේ ඉර කවර කාරණයකින් මෙසේ සිටියේද මම නුඹ වහන්සේගේ බස් කුමක්පිණිස අදහම්ද මේ රේබාවෙන් අදහස් කී සේක. එකල්හි බාලභික්ෂූන් වහන්සේත් සාමණේරයන් වහන්සේත් ඇවැත් වූ ලාළුදායි ස්ථීවරයන් වහන්ස නුඹ වහන්සේ ලාබත් බෙදාදොතොත් භික්ෂූන් වහන්සේ ලාභයෙන් පිරිහෙණ සේක. නුඹ වහන්සේ බත් බෙදාදෙන්නට සුදුසු නොවන සේක මෙතැනින් නික්මුණ මැනවැයි කියා ලාබත් බෙදාදෙන තැනින් නෙරපූසේක. එවෙලෙහි ලාබත් බෙදාදෙන තැන මහත් කෝලාහල විය. ඒ අසා සර්වඥයන් වහන්සේ අනදමහතෙරුන් වහන්සේ අතින් විචාරණසේක්. ආනන්දයෙනි ලාබත් බෙදන තැන මහත් වූ කෝලාහල ඇසෙයි. මේ කවර කෝලහල ශබ්දයෙක් දැයි වදාළසේක. අනදමහ තෙරුන් වහන්සේ සර්වඥයන් වහන්සේට එපවත් දන්වූසේක. එකල්හි සර්වඥයන් වහන්සේ එම්බා ආනන්දයෙනි, උදායි ස්ථවිරයා තමා අඥන බැවින් අනුන්ට ලාභාහානිකෙළේ දන් මතුනොවෙයි පළමුත් කෙළේවේදැයි වදාළසේක. අනදමහ තෙරුන්වහන්සේ ඒ අර්ථය ප්‍රකාශ කරණ පිණිස සර්වඥයන් වහ්නේසට ආරාධනා කළසේක. බුදුරජානන් වහන්සේ භාවනාතරප්‍රව්ජනන කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස කසීරට බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරන්නාහුය. එකල අප මහා බෝසතානෝ ඒ රජ්ජුරුවන්ට වන්නකුකම් කරන්නාහුය. ඇත් අස් ආදීන් හා රන්රුවන් ආදිය අගය කරවති. ඒ ඇත් අස් ආදියෙන් අගය කරවා වස්තු ස්වාමින්ට වස්තුවට සුදුසු වූ වටනා මිළම දෙවති. රජ්ජුරුවෝ වූ කලී ඉතා ලෝභියෝය. ඒ රජ්ජුරුවෝ තමන් ලෝභී ප්‍රවෘති ඇති බැවින් මෙසේ සිතූහ. මේ වන්නකකා මෙසේ වන්නකුකම්කොට අය වැය කෙරේ නම් නොබෝකලකින්ම මාගේ භාණ්ඩාගාරයේ වස්තු නිමා යන්නේය. එසේ හෙයින් අනිකකු වන්නකු තනතුරෙහි තබමියි සිතූය. මෙසේ සිතා ඒ රජ්ජුරුවෝ සිවු මැදුරු කවුළුව හැර රාජාංගණය බලන තැනැත්තෝ ලෝභී වූ නුවණැති එක් ගම්වැසි පුරුෂයකු රාජාංගණයෙන් යන්නා දැක මේ තෙමේ මට සියළු වස්තුවේ අගය තබා අය වැය කරන්ට සමර්ථ වන්නේයයි ඔහු සමීපයට කැඳවා ගෙන්වාගෙණ දරුව තෝ අපට වස්තුවෙහි අගය තබා අය වැයකොය වන්නකුකම් කරන්නට සමර්ථයෙහිදැයි කිවුය. එබස් අසා ඒ පුරුෂයා යහපත ස්වාමීනියි ගිවිස කල්හි රජ්ජුරුවන්ගේ වස්තුව රක්නාපිණිස ඒ අඥන පුරුෂයා වන්නකු කමෙහි සැලසූහ. එතැන්පටන් ඒ දන්ධයා ඇත් අස් ආදීන් අගය කරන්නනේ අගය පිරිහෙළා මුබවෙශාවූ යම්මිලයක් අභිප්‍රාය වූ පරිද්දෙන් කියයි. ඔහු වන්නකු තනතුරෙහි සිටි බැවින් එතෙම යම් මිළයක් කීනම් ඔහු කී මිළම ඒ වස්තුවට මිළ වන්නේය. රාජනියෝගයෙන් සැලසූ තැනැත්තවුන් හෙයින් ඊට වීරුද්ධව උත්තර කියන කෙණෙක් ම දවුය. එකල්හි උත්තරා පථයෙහි වසන්නාවූ එක් අස් වෙළෙන්දෙක් පන්සියයක් අසුන් එනුවරට ගෙණයේය. රජ්ජුරුවෝ අසුන් මිලකරවූයේය. එතෙම අසුන් මිළකරන්නේ පන්සියයක් අසුන්ට එකම සාල්නැළියක් අගය කළේය. මෙසේ අගය කොට අස්වෙළඳුන් එකමසාල් නැළියක් දෙවයි කියා සැල් නැළියක් මිලයට දී අසුන් පන්සියක් දෙනා රජ්ජුරුවන්ගේ අස්සල බැන්දවූයේය. අස් වෙළඳා පළමු අගය කරවන වන්නක්කානන් සමීපයට ගොසින් එපවත් කියා දන්කුමක් කරමොදැයි විචාලේය. ඒ අසා මහබෝසතානෝ කියන්නාහු ඒ පුරුෂයාට අත් ලස්දී මෙසේ විචාරව අපගේ අස්සුවූ කලී එකම සාල් නැළියක් වටිති. අප විසින් දන්නා ලද්දේය. තොප නිසා සාල් නැළියෙහි අගය දන්නා කැමැත්තෙම්හ. එසේ හෙයින් රජ්ජුරුවන් වහන්සේ සමීපයේ සිට සාල්නැළිය මෙතෙක් මිල අගනේයයි කියන්නට නොපිළිවන්දැයි විචාරව. ඉදින් සාල් නැළියේ මිල කියන්ට පිළිවනැයි කියේවීනම් ඔහු කැඳවාගෙන රජ්ජුරුවන් වහන්සේ සමීපයට යව. මමත් එතනට එන්නෙමි වේදැයි කිවුය. එකල්හි අස්වෙළඳා බෝධිසත්වයන් කී බස් යහපතැයි පිළිගෙණ ලෝභී

SANHIDA LANKA

වූ වන්නකු පුරුපායට අත්ලස් දී ඒ කාරණය කිය වූයේය. ඒ වන්නකු පුරුෂයා අත්ලස්ලැබලාම සාල් නැළියට මිලකින්වමට පිළිවන් වන්නේයයයි කිය. එබස් අසා වෙළඳා එසේ වී නම් රජගෙට යම්හයි කියා ඔහු කැඳවාගෙණ රජ්පුරුවන් සමීපයට ගියේය. බෝධිසත්වයෝත් අවශේෂ අමාත්‍යයෝත් ඒ වෙලාවට එතනට ආවාහුය. එකල්හි අස්වෙළදා රජ්පුරුවන් වැඳලා කියන්නේ ස්වාමීනි, මම පන්සියයක් අසුන්ට එක සාල් නැළිය අගනා බව දනිමි. ඒ සාල් නැළිය කෙතෙක් අගීදැයි වන්නකකානන් අතින් විචාල මැනව රජ්පුරුවන් වහන්සැයි කිය රජ්පුරුවෝ එපවත් නොදන කියන්නාහු එඹල වන්නකුපුරුෂය පන්සියයක් අස්සු කෙතෙක් මිළ වටිද්දැයි විචාලෝය. එබස් ඇසූ වන්නකු පුරුෂයා ස්වාමිනි සාල් නැළියක් වටනේ වේදැයි කීය. වන්නාට දරුව පන්සියක් අස්සු කලි සාල්නැළියක් අගිත්වයි ඒ සාල් නැළිය කෙතෙක් මිළපුස්නේදැයි විචාළෝය. ඒ අඥාන පුරුෂයා ස්වාමීනි අන්තඃපුරය පිටිපුර සහිතව බරණැස් නුවර අගය කෙළේය. එසමයෙහි බරණැස්නුවර පවුරුවලල්ල දොළොස්යොදුනක් පමණවන්නේය. මේ නුවර ඇතුළත්වන්නේය. පිටත වානාහිතුන් සියයක් යොදුන් පමණ රාජ්‍යය වන්නේය. මෙසේ ඒ අඥාන පුරුෂයා දොලොස් යොදුනක් වට ඇති නුවර හා තුන්සියයක් යොදුන් වට ඇති මේසා මහත් රාජ්‍යය එකම මාල් නැළියට අගය කළේය., ඒ අසා අමාත්‍යයෝ අත් පොළසන් දී සිනාසී කියන්නාහු අපි පෙර පොළව හා රාජ්‍යය අනර්ග මිළ නැතැයි සිතා උනුම්හ. දැන් වූ කලි මේසා මහත් සරාජිකවූ බරණැස් නුවර හා රාජ්‍යය සාල් නැළියක් පමණ අගනේය. නුඹවහන්සේගේ වන්නකු පුරුෂයාගේ සමර්ථතාවයක් ඉතා ආශ්චර්යය නිසාය මේතෙක් කල් මුළුල්ලෙහි මේ වන්නකු පුරුෂයා කොයි විසීද අපගේ රජ්පුරුවන් වහන්සේටම මෙතෙම සුදුසුවන්නේයයි හාසකොට නින්දා කළාහුය. එකල්හි රජ්පුරුවෝ ලජ්ජාවට පැමිණ ඒ නුවණැති පුරුෂයා නුවරින් පිටත් කරවා මහබෝසතානන්ටම වන්නකු තනතුරු දුන්නාහුය. මහබෝධිසත්වයෝ එතැන්පටන්  දානාදී වූ පින්කම්කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. ශාස්තෘ වූ  තිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා ආනන්ද ස්ථවිරයෙනි, මේ අඥාන වූ උදායි ස්ථවිරයා රෙමාහට ලාභහානී කෙළේ දැන් මතු නොවෙයි පෙරත් තමා නුවණ නැති බැවින් කෙළේම වේ දැයි අතීත කථාවත් වර්ථමාන කථාවක් දෙක එක්කොට සන්ධි ගලපා  මේ තණ්ඩුල නාළි ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ගම්වැසි වූ අඥාන වන්නකු පුරුෂයා නම් දැන් මේ ලාළුදායි ස්ථවිරය. නුවණැති වන්නකු පුරුෂයා නම් ලොකස්වාමී වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# දේවධර්ම ජාතකය

තවද එක් සමයෙක්හි ශාක්‍යකුල චින්තාමාණික්‍ය වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ සැවැත් නුවර නිසා ජේතවන මහා විහාරයෙහි වාසය කරණසේක් එක්තරා බහුභාණ්ඩික භික්ෂූකෙණෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළ සේක.

සැවැත්නුවර වාසීහු එක් කෙළඹි පුත්‍රයෙක් තමාගේ භාර්යාව මිය පරලොව ගිය කල්හි ශාසනයෙහි මහණ වූයේය. එතෙම මහණවන්නට පූර්ව භාගයෙහිම තමා වසනු පිණිස පන්සලකුත් ගිනිහල් ගෙයකුත් බඩු හල්ගෙයකුත් කරවා බඩුගල්ගෙය ගිතෙල් තලතෙල් ආදීයෙන් පුරා මහණ වූ යේය. මහණ වූ පසු තමාසන්තක කෙල්ලන් කොල්ලන් කැඳවා ගෙන්වා ගෙණ රුචිවූ පරිද්දෙන් බත් මාළු පිසවාගෙණ අනුභවකරන්නේය. සිවුරු ආදීවූ බොහෝ පිරිකර ඇත්තේය. රාත්‍රියෙහි එක් අඳනයක් හා පොරවනයක් පොරෝණේය. දිවාභාගයෙහි අනික් අඳනය හා අනික් පොරෝණයක් වළඳීන්නේය. විහාර කෙළවර වාසය කරන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් මේ භික්ෂූන් වහන්සේ සිවුරු හා ඇතිරි ආදිය ගෙන් පිටත්කොට මළුවේ වනා අවුගස්වන කලට බොහෝ දනව්වාසී වූ භික්ෂූන් වහන්සේ සෙනාසන චාරිකාවේහි ඇවිදිනාසේක් ඒ බහු භාණ්ඩික භික්ෂූන්ගේ මළුවට ගොස් සිවුරු ආදිය දැක මේ කාගේදැයි විචාළසේක. ඒ බහුභාණ්ඩික මහණ ඇවැත්නි මාගේ යයි කී සේක. ඇවැත්නි මේ සිවුරත් මේ අඳනයත් මේ අඳනයක් මේ ඇතිරියත් මේ ඇතිරියත් සියල්ලම තොපගේ දැයි විචාළසේක. එසේය ඇවැත්නි කී කල්හි භික්ෂූන් වහන්සේ කියනසේක ඇවැත්නි, බුදුරජානන් වහන්සේ විසින් තුන්සිවුරු අනුදන්නා ලදහ මෙසේ අපෙලච්ඡ වූ සර්වඥයන් වහන්සේගේ ශාසනයෙහි තොපි මහණ වී මෙසේ බොහෝ පිරිකර ඇති කල වරෝ යම්හ තොප සර්වඥයන් වහන්සේ සමීපයට ගෙණයම්හ යි කියා ඒ භික්ෂූහු කැඳවාගෙණ බුදුන් සමීපයට ගියසේක. බුදුහු දැකලාම කිමෙක්ද මහණෙනි, මේ භික්ෂූහු නොකමැති පරිද්දෙන්ම කැඳවාගෙණ අවුදැයි වදාළසේක. එකල්හි භික්ෂූන් වහන්සේ කියනසේක් ස්වාමීනි මේ මහණ බහු භාණ්ඩිකය බහු පරිෂ්කාර ඇත්තේයයි දැන්වූසේක. එබස් අසා බුදුහු මහණ තා බහුභාණ්ඩික වූයේ සැබෑදැයි විචාරා වදාළ සේක. ස්වාමිනි සැබෑවයි ඒ මහණ දැන්විය. එ බස් ඇසූ බුදුහු මහණ තෝ කවර කාරණයකින් බහුභාණ්ඩිකවූ වෙහිද මම නොයෙක් කාරණයෙන් අල්පේච්ඡ බව හා සන්තුෂ්ට භාවයෙහිද කායවිවේක චිත්තවිවේක හා විදර්ශනා භාවනාකිරීමෙහි වීර්යවැඩීමෙහි ගුණ කීයෙහි නොවේදැයි වදාළසේක. ඒ බහු භාණ්ඩික භික්ෂූන් වහන්සේ බුදුන් වදාල බස් අසා කිපි එසේකල මේ සැටියේ ඇවිදීම්දැයි පොරෝණය දමා පියාහය බස් අසා කිපී එසේකල මේ සැටියේ ඇවිදීම්දැයි පොරෝණය දමා පියාහය ලජ්ජා නැතිව පෂිත් මධ්‍යයෙහි තනි අඳනයෙන්ම සිටිසේක. එකල්හි සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන් පිටිවහල් වන සේක් මහණ තෝ පෙර බලවත්වූ භය ලජ්ජා ඇත්තෙහි නොවේදැයි දියරකුස්ව උපන්නාවූ කාලයෙහිත් භය ලජ්ජා දෙක සොයමින් දොළොස් අවුරුද්දක් විසුයෙහි නොවේදෝ. එසේ වූ තෝ දැන් කවර කාරණයකින් මෙබඳු ගරුවූ සර්වඥශාසනයෙහි මහණව සිව්වණක් පර්ෂීන් මධ්‍යයෙහි පොරෝණය දමා භය ලැජ්ජා හැර සිටියේහිදැයි වදාළ සේක. එබස් ඇසූ මහණ භය ලජ්ජාදෙක එලවා ගෙණ දමා පූ සිවුර නැවත පොරවාගෙණ බුදුන් වැඳ එකත් පස්ව උන්නේය. අවශේෂ භික්ෂූන් වහන්සේ ඒ අර්ථය ප්‍රකරණ පිණිස සර්වඥයන් වහන්සේට ආරාධනා කළසේක. බුදුරජානන්වහන්සේ අන්‍යභවයෙන් පිළිසන්වූ කාරණය ප්‍රකාශකොට වදාළසේක.

යටගිය දවස කසීරට බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් ජනරඤජනය කොට රාජ්‍යය කරන්නාහුය. එකල මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බසව කුස පිළිසිඳ ගත්තාහුය. උපන්නාවූ කුමාරයන්ට නම් තබන දවස් මහිංසාස කුමාරයෝ යයි නම් තුබූහ. ඒ කුමාරයන් ඇත මැත දිවපැන කෙළ ඇවිදිනා අවස්ථාවෙහි රජ්ජුරුරවන්ට අනික් පුතණුකෙණෙක් උපන්නාහුය. ඒ උපන් කුමාරයන්ට නම් තබන්නාහූ චන්ද්‍රකුමාර යෝ්යයි නම් තුබූහ. ඒ දෙවෙනි කුමාරයන් ඇත මැත දිව පැන කෙළ ඇවිදිනා අවස්ථාවෙහි බෝධිසත්වයන්ගේ මෑනියෝ කාලක්‍රියා කළෝය. රජ්ජුරුවන්ට ඉතා ප්‍රියයෝය. මනවඩති. සිත්කළුව වාසය කෙරෙති. එකල ඔවුන් දෙදෙනාගේ ප්‍රිය සංවාසයෙන් ඒ බිසව් එක්පතනු කෙණෙකුන් වැදූය. ඒ උපන් කුමාරයන්ට සූර්යකුමාරයෝයයි නම් තුබූහ. රජ්ජුරුවෝ පුතනුවන්ට වරයක් ගණුවයි කිවුය. බිසවු ඒ වරය මා කැමති විටෙක ඇරගණිමියි පසුව ගතයුතු කොට තබාතිබූය. ඒ බිසවූ පුතනුවන් වැඩිවියට පැමිණි කල්හි රජ්ජුරුවන්ට කියන්නේ ස්වාමීනි නුඹ වහන්සේගේ විසින් මාගේ පුතනුවන් උපන් දවස් වරයක් දෙනලදී. එසේ හෙයින් මාගේ පුතනුවන්ට රාජ්‍ය දුන මැනවැයි කිවුය. රජ්ජුරුවෝ ඒ අසා කියන්නෝ මාගේ දරුවෝ දෙන්න මහත් වූ ගිනිකඳක් මෙන් බබලමින් ඇවිදිති. තොපගේ පුතනුවන්ට රාජ්‍යය දෙන්ට නොපිළිවනැයි ප්‍රතිකෙෂ්ප කොට නැවත නැවතත් ඒ බිසවුන් තමන්ගේ පුතනුවන්ට රාජ්‍යය ඉල්වන්නා දැක මෝතොමෝ මාගේ දරු වන්ට අනර්ථයක් අවැඩක් උපක්‍රමයක් කොට පියාදෝහෝයි සිතා පුතුන් දෙබෑයන් සමීපයට කැඳවා මෙසේ කිවුය. එම්බා දරුවෙනි. මම සූර්යකුමාරයන් උපන් ගමනේ උන්ට වරයක් දිනිමි. දැන් උන්ගේ මෑනියෝ රාජ්‍යය ඉල්වති, මම රාජ්‍යය නොදෙනු කැමැත්තෙමි. ස්ත්‍රීහූ නම් පාපියෝය. එසේ හෙයින් තොපට නපුරක් සිතාපුනම් නපුරු වන්නේය. තොපි දැන් වලට වැද මා ඇවෑමෙන් අවුත් තොප සන්තක මෙනුවර රාජ්‍යය කරවයි කියා අඬාවැලප ඉස සිඹ සනසා යවුය. ඔවුන් දෙදෙනා පියරජ්ජුරුවන් වැඳ ප්‍රාසාදයෙන් බස්නාවුන් රාජංගණයේ කෙළනා සූර්ය කුමාරයෝ දැක ඒ කාරණය දැන මමත් දෙබෑයන් වහන්සේ හා සමග යෙමියි කියා කැටිවම නික්මුනාහුය. බෝධිසත්වයෝ මාර්ගයෙන් යන ගමණේ මගින් ඉවත්කර රුකක් මුල ඉඳ සූර්ය කුමාරයන්ට මෙසේ කීහ. මල සූර්ය කුමාරයෙනි තෙල පෙණෙන විලට ගොස් නාපියා පැනුත් බී පියුම්පතින් අපට පැන් ගෙණෙවයි කිවුය. ඒ විල තෙමේ වෙසමුණු රජ්ජුරුවන්ගෙන් එක්

SANHIDA LANKA

දියරකුස්සකු විසින් ලබන ලද්දේය. වෙසමුණු රජ්ජුරුවෝත් ඕහට කියන්නෝ දේවධර්ම දන්නා කෙණෙකුන් තබා යම් අනික්කෙණෙක් මේ විලට බටුනම් ඔවුන් කන්න ලැබෙන්නෙහිය. විලට නොබට කෙණෙකුන් කන්නට නොලැබෙන්නෙහියයි කිවුය. එතැන් පටන් දියරකුසු යම් කෙණෙක් ඒ විලට බටු වූනම් ඔවුන් අතින් දේවධර්මය විචාරා යම්කෙණෙක් නොදිනිත් නම් ඔවුන් කන්නේය. ඉක්බිත්තෙන් සූර්ය කුමාරයෝ ඒ විලටගොස් පරීක්ෂා නොකටම බටුවාහුය. එකල්හි උදක රාක්ෂයා ඒ කුමාරයන් අල්වාගෙණ දේවධර්මය දනුදැයි විචාලේය. එකල්හි සූර්ය කුමාරයෝ කියන්නෝ දේවධර්මය නම් චන්ද්‍ර සූර්ය දෙදෙනා වේදැයි කිවුය. ඉක්බිත්තෙන් දියරකුසු ඕහට තෙපි දේවධර්මය නොදෙවයි කියා දිය යට ගල්වා තමා වසන්නාවූ ස්ථානයෙහි සිටවිය. බෝධිසත්වයෝත් සූර්යකුමාරයන් ලස්වන්නා දැක චන්ද්‍රකුමාරයන් යවුය. දියරකුසු චන්ද්‍රකුමාරයන් අල්වාගෙණ දේවධර්මය දනුදැයි විචාළෝය. දනිම් දේවධර්මය නම් සතරදිග වේදැයි චන්ද්‍රකුමාරයෝ කිවුය. දියරකුසු තෙපින් දේවධර්මය නොදනුවයි කියා උනුන් අල්වාගෙන ඒසේම දියයට සඟවා සිටුවුයේය. බෝධිසත්වයෝ ඒ චන්ද්‍රකුමාරයනුත් කල්යවා නොයන හෙයින් එක්තරා අන්තරායෙක් විය යුතුයයි තුමූ එතනට ගොස් දෙදෙනාම විලට බට පියවර සටහන් දැක මේ විල රාකෂයකු අධිගෘහිත විලක් උවමැනවැයි සිතා කඩුව උරයේ එල්වාගෙන දුන්න නගා දුනුම්ට හියලාගෙණ සිටියාහුය. දියරකුසු බෝධිසත්වයන් දිනට නොබස්නා දැක වලදැඬු කපා ඇවිදිනා පුරුෂයෙකුමෙන් තමාගේ ස්වරූපය පාලා බෝධිසත්වයන්ට කියන්නේ පින්වත් වූ පුරුෂය. තොපි මග ගමන්යා මෙන් මිරිකිගියව, කුමක්හෙයින් මේවිලට බැස නාපියා පැන් වී නෙළුඹල හා නෙළුබුදැලිකා මල් පැළඳ සැපසේ නොයව්දැයි කිවුය. බෝධිසත්වයෝ ඔහු දැක සිතන්නාහු මොහු යක්ෂයා විය යුතුය මොහු විසින් මාගේ මල් දෙන්නා අල්ලා ගන්නා ලද්දෝවනැයි සිතා තෝ මාගේ මලුන් අල්වාගත්තෙහිදැයි කිවුය. එසේය මම ඇල්වූයෙම් කී කල්හි කවර කාරණයකින් දැයි විචාරා මම මේ විලට බට කෙණෙකුන් කන්ට ලබම්යි කී කල්හි කිමෙක්ද තෝ සියල්ලවුන්ම කන්ට ලබන්නේහිදැයි විචාරා යමෙක් දේවධර්මය දනී නම් ඔහු හැර සෙස්සවුන් කන්ට ලබම්යි කී කල්හි තට දේවධර්මයෙන් ප්‍රයෝජන ඇද්දැයි විචාලෝය. එසේය දේවධර්මයෙන් ප්‍රයෝජන ඇතැයි දියරකුසු කීය. එසේනම් මම තට දේවධර්මය කියම් කිවුය, එබස් අසා දියරකුසු එසේවීනම් කිවමැනව මම දේවධර්මය අසම්යි කීය. බෝධිසත්වයෝ මම තට දේවධර්මය කියම් බල එකෙක් ඇත කිලිටුව සිටිහෙයින් මදක් මැලියෙම්යි කිවුය. උදාකරාක්‍ෂසයා බෝධිසත්වයන් නහවා පැන් පොවා මල් පලඳවා සුවඳ විලවුන් ගල්වා සරහන ලද මණ්ඩපයෙහි උතුම් වූ පර්යංකයක් අතුට දුනේනේය. මහාබෝසතානෝ ඒ පනවන ලද ආසනමස්තකයෙහි ඉඳ යක්ෂයා පාමුල සිටුවා ගෙණ එසේවීනම් තෝ කන් යොමා සකස්කොට අසවයි කියා දේවධර්මය කියන්නාහු මෙසේ කිවුය. මේ ලෝකයෙහි යම් කෙණෙක් හයින් හා ලජ්ජාවෙන් අකුශල ධර්මනුත් නොකළමනා අවශේෂ ලෝකචාරිත්‍රයනුත් දැන හැකිළෙන හෙයින් භය ලජ්ජා දෙකින් යුක්තව වාසය කෙරෙද්ද කුශල ධර්මයෙහි ඇම කල්හිම බලවත්වූ ඇලුම් ඇත්තෝද උතුම්වූ සත්පුරුෂ ගුණ ඇත්තෝද එසේ වූ සත්වයන්ගේ ප්‍රවෘත්තිය මේ ලෝකයෙහි දේවධර්ම නම් වෙයි කියා ධර්මදේශනා කළෝය.යක්ෂයා මේ ධර්මදේශනාව අසා ප්‍රසන්නවූ සිත් ඇතිව බෝධිසත්වයන්ට කියන්නේ මම තොප කෙරෙහි ප්‍රසන්නයෙම් ප්‍රසන්න වූ මම එක් මලනුකෙණෙකුන් තොපට දෙම් කවුරුන් ගෙණෙම්දැයි කීය. ඒ අසා බෝධි සත්වයෝ බාලමලනුවන් ගෙණවයි කිවුය. දියරකුසු කියන්නේ පණ්ඩිතයෙනි තොපි උදක් දේවධර්මය දන්නා පමණෙක්මය එපමණක් විනා ඒ ධර්මයෙහි තොප පවත්නේ නැතැ යි කිය. කවරකාරණයෙකින් දැයි කී කල්හි වැඩි මහළු තැනැත්තන් තමා බාලතැනැත්තන් ගෙන්වනහෙයින් තොප ජෙට්ඨාපචායන කර්මය නොකරණ හෙයිනැයි කීය. එබස් අසා මහාබෝසතානෝ කියන්නෝ එම්බල යක්ෂය මම දේවධර්මයත් දනිම්, දේවධර්මයෙහිත් පවතිම්. අපි මේ වලට වදනමෝ මේ බාල මලනුවන් නිසා වනුම්හ. මුන් පිණිස අපගේ පියානන් වහන්සේගේ අතින් මුන්ගේ මෑණියෝ රාජ්‍ය ඉල්වුය. අපගේ පියානන් වහන්සේ ඒ වරය නොදී අප රකිනා නිසා වනයෙහි වසන්ට කී සේක. එබස් ඇසූ බාල මලනුවෝ නොරඳා අප හා සමග මේ වනයට අවුය. ඉදින් අපි ඒ කුමාරයන් වනයෙහි එක් යක්ෂයෙක් අනුභව කොට පීයයි කිමෝනම් අප කීබස් අදහා ගන්නාකෙණෙකු නැත. එසේ හෙයින් මම නින්දාවට හයින් බාලමපතුනුවන් ගෙන් වම්. කිවුය. එබස් අසා දියරකුසු සමාධිව සාධු සාධු පණ්ඩිතයෙනි තොපි දේවධර්මයත් දනුව දේවධර්මයෙහිත් පවතුවයි ප්‍රසන්නවූ සිත් ඇතිව බෝධිසත්වන්ට සාධුකාරදී  දෙබෑයන්ව ගෙණවුත් පාවාදින. එකල්හි බෝධිසත්වයෝ ඕහට අවවාද කරන්නෝ යක්ෂය තෝ පෙර කළ අකුශල කර්මයෙන් අනුන්ගේ වෙරළේ මස්කන්නාවූ යක්ෂව උපන්නෙහිය. දැන් නැවතත් අකුසල්ම කෙරෙති. නම් තා විසින් කරණ ලද අකුශල කර්මය නරකාදී සතර අපායෙන් තා මුදාලිය නොහෙන්නේය එසේ හෙයින් මෙතැන්පටන් අකුසල්හැර කුසල් කරවයි අවවාදකොට යක්ෂයා දමනයෙහිලන්ට සමර්ථ වූයේය. මහබෝසතාණෝ යක්ෂයා දමනයෙහි ලාගෙණ ඔහු විසින් කරණලද ආරක්ෂා ඇතිව එතැන්හිම වසන්නාහු එක් දවසක් නැකැත්තරු බලා පියරජ්ජුරුවෙන් කාලක්‍රියා කළ නියාව දැන යක්ෂයා කැඳවාගෙන බරණැස්නුවරට ගොස් රාජ්‍යයගෙණ චන්ද්‍රකුමාරයන්ට යුවරජ තනතුර හා සූර්යකුමාරයන්ට සෙනෙවිරත් තනතුරදී යක්ෂයාට සිත්කළු තෙනක දේවාලයක් කරවා එතැන්හි ඔහු වස්වා නිරන්තරයෙන් බත් හා මල් පහන් සුවඳ විලවුන් ඕහට පළමුකොට පුදන පරිද්දෙන් සැලසූය. ඒ මහා බෝසතානෝ දැහැමෙන් රාජ්ජය  කොට කම්වූ පරිද්දෙන් මියපරලොව ගියෝය. ශාස්තෘ වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. මේ චතුරාර්ය සත්‍යය ධර්ම දේශනාවගේ කෙළවර ඒ බහුභාණ්ඩික භික්ෂූන් වහන්සේ සෝවාන් පෙළෙහි පිහිටසේක. බුදුරජානන් වහන්සේ අතීත කථාවත් වර්ථමාන කථාවත් දෙක එක්කොට සන්ධිගලපා මේ දේවධර්ම ජාතකය. නිමවා වදාළසේක. එසමයෙහි උදක රාක්‍ෂසයා නම් දැන් මේ බහුභාණ්ඩික මහණය. සූර්යයකුමාරයෝ නම් ආනන්ද ස්ථවිරයෝය. චන්ද්‍රකුමාරයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, මහිංසාසකුමාරයෝ නම් තිලෝගුරු සම්‍යක්සම්බුදු රජ වූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාලසේක.

SANHIDA LANKA

# කඨහාරි ජාතකය

තවද එක් සමයෙක්හි සකල ලොකානන්දනය කරවූ බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසේක් වාසභක්ෂත්‍රියාවන්ගේ කථාව අරභයා මේ ජාතකය වදාළ සේක. මෙහි වර්ථමාන කථාව දොළොස්වැනි නිපාතයෙහිවූ භද්‍රසාල ජාතකයෙහි මතු පහළවන්නේය. ඒ වාසභක්ෂත්‍රියාවෝ වනාහී මහා නාම නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ දුවනියෝය. නාගමුණ්ඩා නම් දාසියගේ කුස පිළිසිඳ ගත්තාය. කොසොල් රජ්ජුරුවන්ට අගමෙහෙසුන් වූවාය. ඕ තොමෝ රජ හට ප්‍රිය වූ පුත්‍රයෙක් වැදූවාය. කොසොල් රජ වනාහි වාසභක්ෂ්‍රියාන්ගේ දාසි භාවය පසු දැන ස්ථානාන්තරයේ පිරිහෙලුවේය. විඩූඩභ නම් පුත්‍රයාගේ ද ස්ථානන්තරය පිරිහෙලුවේය. ඔහු දෙදෙනාම රජගෙය ඇතුළත ම වසන්නාහ. බුදු රජානන් වහන්සේ ඒ කාරණය දැන වදාරා පෙරවරු පන්සියයක් භික්ෂූන් පිරිවරා රජගෙට වැඩ පනවන ලද ආසනයෙහි වැඩ හිඳ මහරජ වාසභක්ෂත්‍රියාවෝ කොයිදැයි වදාල සේක. කොසොල් රජ්ජුරුවෝ ඒ කාරණය දැන්වූයේය. මහරජ වාසභ ක්ෂත්‍රියාවෝ කවරක්හුගේ දුවණියෝ දැයි විචාල කල්හි ස්වාමින් වහන්ස මහානාම නම් රජහුගේයැයි කීසේක. කවරක්හු නිසා ආයේදැයි වදාල කල්හි ස්වාමීන් වහන්ස මා නිසා යයි කීවෝය. මහරජ වාසභක්ෂත්‍රියාවෝ රජහුගේ දුවණියෝය. රජහු නිසාම අවුය. රජහු නිසාම පුත්‍රයෙක් ලද්දීය. ඒ පුත්‍ර තෙම කවර කාරණයකින් පියාණන් අයිති රාජ්‍යයට හිමිනොවන්නේද. පූර්ව කාලයේදී රජදරුවෝ මොහොතක් වත් එක්ව වාසය කලාවූ දරුකැටියාගේ බඩෙහි උපන්නාහු පුත්‍රයෙකු ලැබ ඒ පුත්‍රයාට රාජ්‍ය දෙන්නාහුයැයි වදාල කල්හි කොසොල් රජ තෙම ඒ කාරණය පහල කරන පිණිස භාග්‍යවතුන් වහන්සේට යාඥා කළේය. භාග්‍යවතුන් වහන්සේ භවයෙන් වැසි තිබූ කාරණය ප්‍රකාශ කොට වදාල සේක.

යටගිය දවස බරණැස්නුවර රාජ්‍ය කරන්නාහු බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් මහත් වූ පිරිවරින් උයනට ගොස් එහි පුෂ්ප ඵල ලෝභයෙන් හැසිරෙන සේක් උයන් වන ලැහැබෙහි ගායනා කොට දර නෙලන්නාවූ එක් ස්ත්‍රියක දැක පිළිබඳ සිත් ඇතිව තෘෂ්ණා සන්තවය කලෝය. එකෙණෙහිම අප මහ බෝධිසත්වයානන් වහන්සේ ඒ ස්ත්‍රියගේ බඩෙහිම පිළිබඳ ගත් සේක. එකෙණෙහිම ඇගේ බඩ විදුරුපුරනා ලද්දක් මෙන් ගරු වූ කුක්ෂිය වූයේය. ඒ ස්ත්‍රිය ගැබ පිහිටි බව දැන මහරජ මගේ ගර්භය පිහිටියේයැයි කීවාය. එකල්හි ඒ රජතෙම අන්කෘෂ්ට මුද්‍රිකාව දී ඉඳින් දුවනිකෙණෙක් වූ නම් මේ අන්කෘෂ්ට මුද්‍රිකාව විකුට පෝෂ්‍ය කලව. ඉඳින් පුත්‍රයෙක් වී නම් මුද්‍රිකාව හා සමග මාගේ සමීපයට ගෙණ එවයි කියා වැඩි සේක. ඒ ස්ත්‍රිද ගර්භිය මුහුකුරණ ලද්දී බෝධි සත්වයන් වහන්සේ වැදූවාය. ඒ අප මහා බෝධිසත්වයාණන් වහන්සේ ඔබ මොබ හැසිරෙන කල්හි කෙළි මඩුල්ලෙහි ළදරුවෝ උන් වහන්සේට මෙසේ කියන්නාහු. පියාණන් නැත්තාහු විසින් පහරණ ලදුම්හැයි කියන්නාහුය. ඒ අසා බෝධිසත්වයන් වහන්සේ මෑණියන් සමීපයට ගොස් මෑණියනි මාගේ පියාණෝ කව්දැයි විචාළසේක. පුත්‍රය තෙපි බරණැස් රජහුගේ පුත්‍රයකැයි කීවාය. මෑණියනී කිසි සලකුණක් නැත්තේදැයි විචාල සේක. පුත්‍රය රජ්ජුරුවෝ මේ මුද්‍රිකාව දී ඉඳින් දුවනි කෙණෙක් වී නම් මේ මුද්‍රිකාව වෙතට පෝෂ්‍ය කරව ඉඳින් පුත්‍රයෙක් වී නම් මේ මුද්‍රිකාව හා සමග ගෙනෙවයි කියා ගියසේක්යැයි කීවාය. මෑණියනි එසේ කල්හි කවර කාරණයකින් මා පියාණන්ගේ සමීපයට කැඳවාගෙන නොයන්නේයැයි කී සේක. ඒ ස්ත්‍රිය අප බෝසතානන්ගේ අධ්‍යාස දැන රාජවාස භවන චාරයට ගොස් රජහට කීව්වාය. රජහු විසින් කැඳවනු ලබන්නේ රජගෙට වැද රජහට වැඳ මහරජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේගේ මේ තෙම පුත්‍රයකැයි කීවාය. රජ්ජුරුවෝද දක්නා සේක්ම පරිෂිත් මැද ලැජ්ජාවෙන් මාගේ පුත්‍රයෙක් නොවෙයි කී සේක. මහරජ්ජුරුවන් වහන්ස. නුඹ වහන්සේ ගේ මේ මුද්‍රිකාව මේ දැන ගනුවයි කීවාය. මේ ද මාගේ මුද්‍රිකාවක් නොවෙයි කී සේක. මහරජ්ජුරුවන් වහන්සේ දැන් සත්‍යක් ක්‍රියාව හැර මට අනෙක් සාක්ෂියක් නැත්තේය. මේ ළදරු තෙම නුඹවහන්සේ නිසා උපන්නේ නම් අහස්හි සිටවයි. ඉඳින් එලෙස නොවුයේ වී නම් බිමහි මරණයට පැමිණේවයි කියා බෝධිසත්වයාණන් වහන්සේගේ පාද වන්දය අල්වාගෙන අහස්හි දැමුවාය. අප මහා බෝධිසත්වයානන් වහන්සේ අහස්හි පලක් බැඳ උන් සේක්. මිහිරි වූ කඩහඬින් ප්‍රිය මහා රජ හට බණ වදාරණ සේක් මෙසේ වදාලසේක. මහරජ මම නුඹ වහන්සේගේ ආත්මජ පුත්‍රයෙක්මි. ජන ප්‍රධාන වූ මහරජ නුඹ වහන්සේ මා රක්ෂා කොට වදාල මැනව. මහරජ්ජුරුවන් වහන්ස හස්ති බන්ධ අශ්ව බන්දාධි වූ මනුශ්‍යයන්ද සත්‍යය ස්වාදී වූ තිරස්චින සත්වයන් රක්ෂා කරණ සේක් ස්වකීය පුත්‍රවූ මහරක්ෂා නොකරණ සේක් දැයි නින්දා කිරීමෙන් හා අනුග්‍රහ කිරීමෙන් මෙසේ වදාල සේක. අහස්හි හිඳ මෙසේ ධර්මදේශනා කරන්නා වූ බෝධි සත්වයානන් වහන්සේගේ ධර්මය අසා පුත්‍රය මෙසේ වර මම්ම පෝෂ්‍ය කරමියි මම පෝෂ්‍ය කෙරෙමියි කියා අත දිගු කල සේක. අනෙකුත් සත්වයෝ දහස් ගණන් අත් දිගු කළාහුය. බෝධිසත්වයානන් වහන්සේ අනෙක් කෙණෙකුගේ අතට නොබැස රජහුගේ අතටම බැස ඇකයෙහි උන් සේක. රජ්ජුරුවෝ අප මහා බෝධිසත්වයාණන් වහන්සේට යුව රාජ්‍ය දෙව් සේක. මෑණියන් වහන්සේ අගමෙහෙසි කළ සේක. බෝධිසත්වයාණන් වහන්සේ රජහු ඇවෑමෙන් කාශ්ට වාහන නම් රජහ දැහමෙන් සෙමෙන් රාජ්‍ය කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියසේක. සාස්තෘ වූ බුදුරජානන් වහන්සේ කොසොල් රජ හට මේ ජාතක ධර්ම දේශනාව ගෙන හැර දක්වා වදාරා අතීත කථාව හා වර්ථමාන කථාව දක්වා පූර්වාපර සන්ධි ගලපා මේ කට්ඨහාරී ජාතකය නිමවා වදාල සේක. එසමයෙහි මෑණියෝ නම් දැන් මහා මයා දේවිය පියාණෝ නම් සුදවුන් මහරජානෝය කාශ්ඨ වාහන නම් රජව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජු වූ මමම වෙම්දැයි තමන්වහන්සේ දක්වා වදාල සේක.

SANHIDA LANKA

# ගාමිණී ජාතකය

තවද එක් සමයෙක් හි සඳරාමර ලෝක ගරු වූ බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් පසුහට විර්ය ඇති භික්ෂූන් කෙණෙකුන් අරඹයා මේ ජාතකය වදාල සේක. මේ ජාතකයේ වර්ථමාන කථාවත් අතීත කථාවත් එකොලොස් වැනි නිපාතයෙහි වූ සංවර ජාතකයෙහි මතු පහල වන්නේය. කථාව වනාහි ඒ ජාතකයෙහිද මෙතැන්හිද එකාකාරව ගාථාව වනාහි වෙනස් වන්නීය. ගාමිණී කුමර තෙම බෝධිසත්වයන් වහන්සේ අවවාදයෙහි පිහිටා ජ්‍යෙෂ්ඨභාතෘ වූ කුමාර වරුන් සියයකට ලාබාලව  සියයක් පමණ භාතෘන් පිරිවරා දවලච්ඡත්‍රායගේ උතුම් ආසනයෙහි හුන් සේක. තමාගේ අශ්චර්ය සම්පත්තිය බලා මේ මාගේ ආශ්චර්ය සම්පත්තිය අපගේ අචාරින් වහන්සේ සන්තකයි සතුටුව ප්‍රිති වාක්‍ය පවත්වන සේක් නුවණැත්තවුන්ගේ අවවාදයෙහි සිට තුරිත ලොව උපාය කලේය. කර්මාණ්තයෙනි ප්‍රයුක්තයන්ට පාර්තිත වූ ප්‍රයොජනයෙහි ආසාව සමෘද්ධ වේමය ධානාර්ථ ප්‍රියවචන සමානාත්ම යැයි කියන ලද බ්‍රහ්මචාරියාව මූලික වූ සමාපත්තීත් ද මුහුකුරා සිටි බැවින් පරිපක්ඛවම බ්‍රහ්මචාර්යාව ඇතිවීම ගාමණී කුමාරයා මෙසේ දැනගනුවයි කියා තමන් සර්වජන ජ්‍යෙෂ්ඨ බැවින් ආත්ම ප්‍රිතිය කොට තමන්ට ආමන්ත්‍රණය කොටආචාරීන් වහන්සේ නිසා බෑයන් සියයක් ඉක්මවා මේ මහා රාජ්‍යයට පැමිණියෙමියි ප්‍රිතී වාක්‍ය පැවැත්වූ සේක. ගාමිණී කුමාරයන් රාජ්‍යයට පැමිණී සත් අට දවසක් ඇවැමෙන් සියළු භ්‍රාතෘ වූ කුමාර වරුහු තමන් වසන තැනට ගියාහුය. ගාමිණී මහරජ තෙම දැහැමින් රාජ්‍ය කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියේය. බෝධි සත්වයානන් වහන්සේද ධානාදී ව  පින් කම් කොට කම් වූ පරිද්දෙන් මියපරලොව ගියසේක. ශාස්තෘ වූ බුදු රාජානන් වහන්සේම මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාල සේක. චතුස්සත්‍යයයාගේ අවසානයෙහි පසුබට වීර්ය ඇති භික්ෂූන් වහන්සේ අරහත් ඵලයෙහි පිහිටි සේක. අතීත කතාව හා වර්ථමාන කථාව ගෙනහැර දක්වා වදාරා පූර්වා සන්ධි ගලපා මේ ගාමිණී ජාතකය නිමවා වදාල සේක.

SANHIDA LANKA

# මඛාදේව ජාතකය

තවද එක්සමයෙක්හි සර්වලෝකෛක දීපායමාන වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන මහා විහාරයෙහි වාසය කරණ සේක් මහාභිනික්මන් අරභයා මේ ජාතකය වදාළසේක. එක්සමයෙක්හි භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේ මහභිනික්මන් වර්ණනා කොට කොට උන්සේක. එකල්හි සර්වඥයන් වහන්සේ දම්සභාමණ්ඩපයට අවුත් බුද්ධාසන මස්තකයෙහි වැඩහුන් සේක් භික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කොට මහාණෙනි, දැන් කිනම් කථාවකින් යුක්තව උනුද කිනම් කථාවක් දැන් තොපට අඩාලවීදැයි වදාරා සාමිනි අනික් කථාවකින් යුක්තව උනුමෝ නෙවම්හ. නුඹවහන්සේගේ මහනික්මන් වර්ණනා කොට කොට උනුම්හයි කී කල්හි මහණෙනි, සර්වඡයන් වහන්සේ නික්මුනේ දැන් මතු නොවෙයි පළමුත් නික්මුනෝවේදැයි වදාළසේක. භික්ෂූන් වහන්සේ ඒ අර්ථය ප්‍රකාශකරණු සඳහා සර්වඥයන් වහන්සේට ආරාධනා කළසේක. භාග්‍යවත්වූ බුදුරජානන් වහන්සේ භාවාන්තර ප්‍රවජ්ජන්න වූ කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස විදේහ රාජ්‍යයෙහි මියුලුනුවර මඛාදේව නම් රජ්ජුරුකෙනෙක් දශරාජ ධර්මයෙන් අකොප්‍යකොට සර්වධර්මිෂ්ඨව රාජ්‍යය කරන්නාහුය. ඒ රජ්ජුරුවෝ සුවාසුදහසක් අවුරුදු කුමාර ක්‍රීඩාකොට සුවාසුදහසක් අවුරුදු යුවරජකම්කොට සුවාසුදහසක් අවුරුදු එකරාජ්‍යකොට බොහෝකල් යවා එක් දවසක් කපුවාට බණවා කියන්නාහු යහළු කපුව යම් දවසක් මා ඉස නරකෙසක් දුටුයේවීනම් එදවස් මට කියවයි කිවුය. කපුවාත් බොහෝ කලයක් යවා එක් දවසක් රජ්ජුරුවන්ගේ අඳුන්වන් කෙස් අතුරේ තුබූ එකම නරකෙසක් දැක රජ්ජුරුවන් වහන්ස, කෙස් අතුරේ නරකෙන්දක් පෙණන්නේය යි කීය. එසේවිනම් සබඳ කපුව නරකෙස උදුරා මා අත්ලෙහි තබවයි කී කල්හි රන් අඬුවෙන් නරකෙස උදුරා රජ්ජුරුවන් අත්ලෙහි තැබීය. එසමයෙහි රජ්ජුරුවන්ට සූවාසුදහසක් අවුරුදු ඉතිරිව සිටියේය. එසේවී නමුත් නරකෙස දැකලාම මාතෘුරාජයා ඇවිත් සමීපයෙහි සිටියාක් මෙන්ද තමන් ගිනිගත් පන්සලකට වන්නාක් මෙන්දැයි සිතමින් සංවේගයට පැමිණ තුමු තමන්ට අවවාද කරනුනාහු අඥානවූ මඛාදේවයෙනි, ඉස නර නැගෙණතුරුත් කෙලෙසුන් ඇරපය නුහුනුවාහුද තොපසේ වූ අඥානයෝ නැතැයි තමන්ටම නින්දා කළාහුය. මෙසේ රජ්ජුරුවන්ට නරකෙස් පහළවූ නියාව කල්පනා කරත් කරත් අභ්‍යන්තරයෙහි දහවැදගත සකල ශරීරයෙන් ඩා වැගිරෙන්නට පටන්ගත්තේය. එවෙලෙහි රජ්ජුරුවෝ අදම නික්ම මහණදම් කරන්නට වටනේයයි කපුවාට ලක්ෂයක් වස්තු උපදිනා ගම්වරයක් දී ප්‍රධාන පුත්‍රවූ රාජ්‍ය කුමාරයන් කැඳවා පුත, මා ඉස නරකෙසක් පහල විය. එසේහෙයින් මම මහලුව ගියෙම් මා විසින් මනුශ්‍යලෝකයෙහි අනුභව කළ මනා සම්පතුන් අනුභව කරන ලද්දේය. දැන් දිව්‍ය සම්පතුන් අනුභව කරන්නාව කැමැත්තෙමි. එසේ හෙයින් මහණවන්ට දැන්ම මට කල් වන්නේය. තෙපි මේ රාජ්‍යය පවරා ගනුව. මම මහණව මඛාදේව නම් අඹ උයනේ වැස මහණ දම් කෙරෙමි කීවුය. මෙසේ මහණවනු කැමැත්තොවෝ රජ්ජුරුවන් කරා අමාත්‍යයෝ එළඹ ස්වාමීනි නුඹ වහන්සේ කවර කාරණයකින් මහණ වන සේක්දැයි විචාලෝය. රජ්ජුරුවෝ නරකෙස  අතින් ගෙන අමාත්‍යායන්ට තමන් මහණ වන කාරණය කියන්නාහූ ප්‍රථම වයස මධ්‍යම වයස පශ්චිම වයස යයි කියන දෙතුන් වයසම නසන හෙයින්  වයස පැහැර ගන්නා වූ මේ නරකෙස මගේ හිස හටගත්තේය. හිස නරකෙස් අටගත්විටම මරණය අවුත් නලල්තෙළහි සිටියා නම් වෙයි. නරකෙස් නම් යමරජ්ජුරුවන්ගෙන් එවුදේව දූතයන් වැන්නෝය. එසේ හෙයින් අදම මට මහණවන්නට කල් වන්නේයයි අමාත්‍යයන්ට කියා එදවස්ම රාජ්‍ය හැර ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවැදිව මඛාදේව නම් අඹ උයනේ වෙසෙමින් ස්වාසූදහසක් අවුරුදු මුළුල්ලේහි මෛත්‍රිය කරුණා මුදිතා උපේක්ඛා යයි කියන ලද චතුර් විද බ්‍රහ්ම විහාර භාවනා කොට නොපිරිහුනා වූ ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලෝකයෙහි ඉපිද නැවත එයින් චුත අවුත් මියළුනුවර ඉපිද පසුබස්නා වූ තමන්ගේ වංශය ගලපා එම අඹ උයනෙහි මහණව  බ්‍රහ්ම විහාර බාවනා කොට නැවත බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය. සාස්තෘන් වූ බුදුරජානන් වහන්සේ මහණෙනි සර්වඥයන් මහභික්නික්මන් නික්මුණෝ දැන් මතු නොවෙයි පෙරත් නික්මුණෝම වේදැයි මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාලා චතුරාර්ය සත්‍ය ප්‍රකාශ කලසේක. චතුස්සත්‍යය ධර්මදේශනාවගේ කෙළවර ඒ භික්ෂූන් වහන්සේ අතුරෙන් සමහරකෙණෙකුන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටි සේක. සමහර කෙණෙකුන් වහන්සේ සකෘදාගාමී ඵලයෙහි පිහිටි සේක. සමහර කෙණෙකුන් වහන්සේ අනාගාමී ඵලයෙහි පිහිටි සේක. මෙසේ බුදුරජානන් වහන්සේ අතීත කථාවත් වර්ථමාන කථාවත් දෙක එක් කොට සන්ධි ගලපා මේ මඛාදේව ජාතකය නිමවා වදාලසේක. එසමයෙහි කපුවා නම් දැන් මේ ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි ප්‍රධාන පුත්‍ර නම් දැන් මේ රාහුල ස්ථිවිරයෝය. එසමයෙහි මඛාදේව රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජු වූ මම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේක.

SANHIDA LANKA

# සුඛවිහාරී ජාතකය

තවද එක් සමයෙක්හි තුන්ලොවට නැගු ප්‍රදීපයක් වැන්නාවූ සර්වඥයන් වහන්සේ අනුපිය නම් නුවර ආශ්‍රය කොට අනුපිය නම් අඹ වනයෙහි වැඩවසන සේක් සුඛවිහාරී වූ බද්ධිය ස්ථවිරයන් වහන්සේ අරඹයා මේ ජාතකය වදාලසේක. සුඛවිහාරී වූ බද්ධිය ස්ථිවිරයන් වහන්සේ සත්‍රිය රාජකුමාරයන් සදෙනාගේ සමා සමයෙහි උපාලි ස්ථවිරයෙන් වහන්සේ සත්වැනි කොට පැවිදි වූ සේක. ඔහුන් අතුරින් බද්ධිය ස්ථිවිරයෙන් වහන්සේය, කිම්බිල ස්ථිවිරයන් වහන්සේය, භගු ස්ථවිරයන් වහන්සේය,දේවදත්ත ස්ථවිරයන් වහන්සේය. යන සතර දෙනා වහන්සේ රහත් වූ සේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ සෝවාන් වූ සේක.  අනුරුද්ධ ස්ථිවිරයන් වහන්සේ දිවැස් ලත් සේක. දෙව්දත් ස්ථවිරයන් වහන්සේ ධ්‍යාන ලාභි වූ සේක. සත්‍රිය රාජ කුමාරවරුන් සදෙනාගේ කථාව අනුපිය නුවර දක්වා ඛණ්ඩංගාල ජාතකයෙහි මතු ප්‍රකශ වන්නේය. ආයුශ් මත් වූ භද්දිය ස්ථවිරයන් වහන්සේ වනාහි රජවූ කල්හි තමන් රක්ෂා කරන සේක් රක්ෂාවට විධාන කිරීමද පළමු කොට බොහෝ ආරක්ෂාවෙන් රක්ෂා කරන ලදුව මතු මහල් තලයෙහි මහ යහන් හි ඔබිනොබ පෙරෙලෙමින් සයන කරන්නා වූ තම හට භය පැමිණීමද දුන් අරහත් ඵලයට පැමිණ ආරණ්‍යාදී වූ යම් කිසි තැනෙක් හි හැසිරෙණ සේක් තමාට පහ වූ බය ඇති බව දක්නා සේක් ඉතා සැපය ඉතා සැපයි කිය කියා ප්‍රිති වාක්‍ය පවත්වන සේක. ඒ අසා භික්ෂූන් වහන්සේලා ආයුෂ්මත් වූ භද්දිය ස්ථවිරියන් වහන්සේ අභිතත්වය ප්‍රකාශ කරන සේකැයි කියා සර්වඥයන් වහන්සේට දැන්වූවාහුය. සර්වඥයන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට වදාරන සේක් මහණෙනි භද්ධිය ස්ථිවිරයෝ සැප විහාරි වූවෝ දැන් මතු නොවෙති. පෙරත් සැප විහාරි වූ හයි වදාරා භික්ෂූන් විසින් ඒ කාරණය ප්‍රකාශ කරනු පිණිස යාඥා කල කල්හි සර්වඥයන් වහන්සේ භවයෙන් වැසි තුබුනු ප්‍රකාශ කොට වදාල සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණකල්හි අප මහා බෝධිසත්වයන්වහන්සේ ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ මහාසාර කුලයෙක්හි ඉපද වැඩිවයසට පැමිණ වස්තුකාම කෙලශකාමයෙහි ආදීනවද මහභිනික්මන් න්ක්ම මෙහි ආනිසංසද දැක වස්තුකාම කෙලාශකාම හැර හිමාලවනයට වැද සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව අෂ්ටසමාපත්ති උපදවා වාසය කරණසේක්, උන්වහන්සේට මහත් පිරිවර වූයේය. පන්සියයක් පමණ තපස්විහූ වුවාහුය, අප මහාබෝසතානන් වහන්සේ වර්ෂා කාලයෙහි හිමාලයෙන් නික්ම තපස්වි සමූහයා විසින් පිරිවරණලදුව ගම්නියම්ගම් ආදීයෙහි සැරිසරා වඩනාසේක් බරණැස්නුවරට පැමිණ රජුහු නිසා රාජොද්‍යානයෙහි වාසයකළ සේක. එතැන්හි වැසි සාරමස වාසයකොට රජහට දැන්වූසේක. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ බෝධිසත්වයන්වහන්සේට කියනසේක් ස්වාමීන්වහන්ස නුඹවහන්සේ වෘද්ධසේක. හිමාලය වනයට යාමෙන් නුඹවහන්සේට කවරප්‍රයෝජනද අතවැස්සන් හිමාලය වනයට යවා මෙතැන්හිම වාසය කරව යි කීයේය. බෝධිසත්වයන් වහන්සේ ප්‍රධාන අතවැසි තපස්වීන්වහන්සේට පන්සියයක් තපස්වීවරුන් භාරකොට තෙපි යව මේ තපස්වීවරයන් හා සමග හිමාලයවනයෙහි එතැන්හිම වාසය කරව. බෝධිසත්වයන් වහන්සේගේ ප්‍රධාන අතවැසි තපස්වීන් වහන්සේ රාජතපස්වීන් වහන්සේය. මහත් රාජ්‍යයක් හැර පැවැදිව කිසුණු පිරියම් කොට අෂ්ටසමාපත්ති ලාභිව වසන සේක් සෙසු තපස්වීන් හාසමග හිමාලය වනයෙහි වසන සේක් එක් දවසක් ආචාරීන් වහන්සේ දක්නා කැමතිව ඒ තපස්වීවරයන්ට ආමන්ත්‍රණය කොට තෙපි උකටලී නොව මෙතැන්හිම වාසය කරව මම ආචාරීන් වහන්සේට නමස්කාරකොට එන්නෙමියි කියා ආචාරීන් වහන්සේගේ සමීපයට ගොස් නමස්කාර කොට එන්නෙමි යි කියා ආචාරීන් වහන්සේගේ සමීපයට ගොස් නමස්කාර කොට පිළිසඳර කථාකොට එක් මැඩිලිපතක් අතුට ආචාරීන් වහන්සේගේ සමීපයෙහිම උන්සේක එවෙලෙහි බරණැස් රජ්ජුරුවෝ තපස්වීන් වහන්සේ දකිම් කියා උයනට ගොස් නමස්කාරකොට එකත්පසසෙක්හි හුන්සේක. අතවැසි තපස්වීන් වහන්සේ රජ්ජුරුවන් දැකත් නොමනැගී සිටිසේක්ම හුන්සේක්ම වනාහි ඉතා සැපය ඉතා සැපයයි කියා ප්‍රීතිවාක්‍ය පැවැත්වූසේක. රජතෙම සිතනුයේ මේ තපස්වීන් වහන්සේ මා දැකත් නැගී නොසිටිසේකැයි අසන්තෝෂව බෝධිසත්වයන් වහන්සේට කීයනසේක් ස්වාමීන්වහන්ස, මේ තපස්වීන් වහන්සේ කැමතිපරිද්දෙන් ආහාරය අනුභව කළසේක්ද ප්‍රිති වාක්‍ය පවත්වනසේක් සැපසෙය්‍යාවම කරණසේකැ යි කීයේය. මහරජ, මේ තපස්වීන් වහන්සේ දැන් මම පෙර ගිහිකල්හි රජ්‍යශ්‍රී අනුභවකරන්නෙම් ආයුධගත් අත් ඇති බොහෝ සේනාව විසින් රාක්‍ෂා කරණු ලබන්නේම් මෙබඳු සැපයක් නොලද්දෙමි කියා තමාගේ ප්‍රව්‍රජ්ජ්‍යාසැපය ධ්‍යාන සැපය අරභයා මේ ප්‍රිති වාක්‍ය පැවැත්වූයේයයි වදාළසේක. මෙසේද කියා බෝධිසත්වයන් වහන්සේ රජහට ධර්මදේශනා කොට වදාළසේක. යම් පුද්ගලයක්හු සෙසු බොහෝ පුද්ගලයෝ රක්ෂා නොකරෙද්ද යමෙක් සෙසු බොහෝ සත්ව යන් රක්ෂා නොකෙරේද මහරජ, ඒ පුද්ගලයා වස්තුකාම කේල්ශ කාමයෙහි අපේක්ෂාවක් නැතිව හුදකලාව කායවිවේක චිත්තවිවේක සැපයෙන් යුක්තව සයනය කරන්නේය හුදෙක් සයනය කරන්නේම නොවෙයි. මෙබඳු පුද්ගලතෙම සැපසේ යන්නේය සැපසේ සිටින්නේය. සැපසේ හිඳින්නේය සැපසේ හෝනේය සියලු ඊර්යාපථයෙහි සැපසේ කල්යවන්නේයයි වදාළසේක. රජ්ජුරුවෝ බෝධිසත්වයන්ගේ ධර්මදේශනාව අසා තුටුපහටු සිත් ඇතිව නමස්කාර කොට වාසභවනයට ගිය සේක. අතවැසි තපස්වීන් වහන්සේද ආචාරීන් වහන්සේට වැඳ හිමාලය වනයට වැඩිසේක. බෝධිසත්වයන් වහන්සේ වනාහී එතැන්හිම වාසයකරණ සේක් නොපිරිපුන් ධ්‍යානයෙන් යුක්තව කාලක්‍රියා කොට බ්‍රහ්මලෝකයෙහි උපන්සේක. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ දම්දෙසුන් ගෙණහැර දක්වා අතීත කථාව හා වර්ථමාන කථාව වදාරා පූර්වාපර සන්ධි ගලපා මේ සුඛවිහාරී ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි අතවැසි තපස්වීන් වහන්සේ නම් දැන් භද්දිය ස්ථවිර වූ සේක. ශාස්තෘන් උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජුවූ මමම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ලක්ඛණමිග ජාතකය

තවද එක්සමයෙක්හි පහකළා වූ කෙලෙස් මලයන් ඇති සර්වඥයන් වහන්සේ රජගහනුවර නිසා ජේතවනාරාමයෙහි වැඩවසන සේක් දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා වදාළසේක.

දේවදත්ත ස්ථවිරයන් වහන්සේගේ කථාව දුනුවායන් හැරීම දක්වා ඛණ්ඩහාල ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. ධනපාල නම් හස්තිරජයාගේ හැරීම දක්වා චුලහංස ජාතකයෙහි විස්තර වශයෙන් මතු පෙණෙන්නේය. දේවදත්ත ස්ථවිරයන් පොළොව පලාගෙණ ගියතැන් දක්වා සොළොස් වැනි නිපාතයෙහි සමුද්දවාණිජ ජාතකයෙහි මතු පහළ වන්නේය. එක් කලෙක්හි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ පඤ්ච වස්තුවක් යච්ඤාකොට නොලත්සේක් සංඝයා බිඳුවා පන්සියයක් භික්ෂූන් කැඳවාගෙණ ගයා නම් ගංහිස වාසය කරණ සේක. එකල්හි ඒ භික්ෂූන් වහන්සේගේ ප්‍රඥාව මිහිකිරීමට ගියේය. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ගේ ප්‍රඥාව මුහුකළ බව දූන වදාරා අග්‍රශ්‍රාවකයන්  දෙදෙනා වහන්සේට ආමන්ත්‍රණයකොට ශාරීපුත්‍ර ස්ථවිරයෙනි තොප ආශ්‍රය කළාවූ පන්සියයක් භීක්ෂූන් දේවදත්ත ස්ථවිරයන්ගේ ලබ්දිය රුස්වා ඔහු හා සමග ගියාහුය. දූනුදු වනාහි ඒ භික්ෂූන්ගේ ප්‍රඥාව මිහිකිරීමට ගියේය. තෙපි දෙදෙනා බොහෝ භික්ෂූන් හා සමග එතැනට ගොස් භික්ෂූන්ට ධර්මදේශනා කොට ඒ භික්ෂූන් මාර්ගඵලයෙන් ප්‍රබෝධකරවා කැඳවාගෙණ එවයි වදාළසේක. සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ එපරිද්දෙන් ගොස් ඒ භික්ෂූන්ට ධර්මදේශනා කොට මාර්ගඵලයෙන් පුබුදුවා දෙවැනි දිනයෙහි සූර්යෝද්ගමන වේලාවෙ ඒ පන්සියයක් භික්ෂූන් කැඳවාගෙණ වේළුවනාරාමයට වැඩියාහුය. ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වේළුවනාරාසයට අවුත් සර්වඥයන් වහන්සේට නමස්කාර කොට භාග්‍යවතුන් වහන්සේට දන්වූවාය. ස්වාමීන් වහන්ස අපගේ ජ්‍යෙෂ්ඨ භ්‍රාතෘවූ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ පන්සියයක් භික්ෂූන් වහන්සේ  විසින් පිරිවරණ ලදුව වඩනාසේක් ඉතා හොබනාසේක. දේවදත්ත ස්ථවිරයන් වහන්සේ වනාහි පිරිහුණා වූ පිරිබර ඇතිසේකැයි කිවාහුය. සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහණෙනි ශාරිපුත්‍රස්ථවිරයෝ නෑ සමූහයා විසින් පිරිවරණ ලදුව එනසේක් හෙබියෝ දැන්මතු නොවෙති, පෙරත් ශෝභාවත් වූවාහුය. දේවදත්ත ස්ථවිරයෝද පිරිවරින් පිරිහුණෝ දැන් මතුනොවෙයි පෙරත් පිරිහුණෝමයි. වදාළ කල්හි භික්ෂූන් ඒ කාරණය ප්‍රකාශ කරණු පිණිස භාග්‍යවතුන් වහන්සේට යාච්ඤා කළාහුය. භාග්‍යවතුන් වහන්සේ භවයෙන් වැසීතුබුන කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස මගධරට රජගහනුවර එක් මගධ රජෙක් රාජ්‍යයකරණ සේක. එකල්හි බෝධිසත්වයන් වහන්සේ මෘගජන්මයෙහි පිළිසිඳ ගෙණ වැඩි සයසට පැමිණ මුවන් දහසක් පිරිවරා ගෙණ වනයෙහි වසනසේක. උන් වහන්සේට ලක්ෂණය කාලයයි කියා පුත්‍රයෝ දෙදෙනෙක් වූවාහුය. අප මහා බෝසතානන් වහන්සේ තමා මහළු වයසට පැමිණි කල්හි පුත්‍රයෙනි මම දැන් මහලුයෙමි තෙපි මේ මෘගසමූහයා පරිහරණය කරව යි කියා පන්සියය පන්සියය බැගින් එකී  එකී පුත්‍රයාට භාරකළ සේක. එතැන් පටන් ඔහු දෙදෙන මෘගසමූහයා පරිහරණය කරන්නාහු ය. මගධරට ශස්‍ය සමීපයෙහි ගොයමින් අකපටු කල්හි වනන්තරයෙහි මෘගයන්ට උපද්‍රව වන්නේය. මනුශ්‍යයෝ ශස්‍යයන් අනුභවකරන්නාවූ මෘගයන් මරණ පිණිස ඒ ඒ තන්හි වල්කණනාහුය. හුල් හිඳුවන්නාහුය. පාසාණ යන්ත්‍රයක් සදන්නාහු සොර මල ආදිය අටවන්නාහුය. බොහෝ මෘගයෝ විනාශයට පැමිණෙන්නාහුය. බෝධිසත්වයන් වහන්සේ ශස්‍යයන් සම්බාධ සමය දූන පුත්‍රයන් කැඳවා ගෙන්වා අවවාද දෙනසේක් පුත්‍රයෙනි මේ තෙම ගොයමින් යුක්ත කල්වන්නේය. බොහෝ මෘගයෝ විනාශයට පැමිණෙන්නාහුය. අපි වෘද්ධ වුම්හ. යම්කිසි උපායකින් එක්තැනෙක්හි කල්යවම්හ. තෙපි තොපගේ වෘග සමූහය ගෙණ ආරණ්‍යයෙහි පර්වත පාදයකට වැද ගොයම්දා මැඩිකල්හි එව යි කියේය. ඔහු යහපතැයි කියා පියානන්ගේ වචනය අසා පිරිවර සහිතව නික්මුනාහුය. ඔහුන් යන්නාවූ මර්ගයෙහි මනුෂ්‍යයෝ මෙසමයෙහි මෙසමයෙහි මෘගයෝ පර්වතයට නැගෙන්නාහුය මේ සමයෙහි බස්නාහුය යි දන්නාහුය. ඔහු ඒ ඒ තැන සැඟවී හිඳ බොහෝ මෘගයන් විදමරන්නාහුය. කාලනම් මෘගරාජයාද තමා අඥාන බැවින් මෙනම් වේලෙහි යායුතුය මෙනම් වේලෙහි නොයායුතුයයි නොදන්නේ මෘගසමූහයා ගෙණ පරවරුද පස්වරුද පෙරයම්හිද අළුයම්හිද ගම්දොරින් යන්නේය. මනුශ්‍යයෝ ඒ ඒ තන්හි ස්වභාවයෙන් සිටියාහුද සැඟවී සිටියාහුද බොහෝ මෘගයන් විනාශයට පැමිණෙව්වාහුය. මෙසේ කාල  නම් මෘගරාජ තෙම තමා නුවණ මද බැවින් බොහෝ මෘගයන් විනාශයට පමුණුවා ස්වල්ප වූ මෘගයන් පිරිවරණ ලදුව වනාන්තරයට වන්නේය. ලක්ෂණ නම් මෘගරාජ වනාහි පණ්ඩිතය ව්‍යාක්තය උපායෙහි දක්ෂය, මේ වෙලාවෙහි යා යුතුය. මේ වෙලාවෙහි නොයායුතුයි දන්නේය. ඒ මෘගරාජ තෙම ගම්දොරින් ද නොයන්නේය. දවල්ද නොයන්නේය. පෙර පෙර යම් හිද නොයන්නේය. අලුයම්හිද නොයන්නේය. මෘගසමූහයා ගෙණ මධ්‍යම රාත්‍රියෙහිම යන්නේය. ඒ කාරණයෙන් එකම මෘගයෙකුදු නොනසා වනාන්තරයට වනි. ඒ මෘගයෝ එහි සාරමසක් වාසය කොට ගොයම්දා මිරිකූ කල්හි පර්වතයෙන් බැස ආවාහුය. කාලනම් මෘගරාජතෙම පසුව එනුයේද පූර්වොක්ත ක්‍රමයෙන් අවශේෂ මෘගයන් විනාශයට පමුණුවමින් හුදකලාවම අයේය. ලක්ෂණ නම් මෘගරාජ වනාහි එකම මෘගයකුදු නොනසා පන්සියයක් මුවන් විසින් පිරිවරණ ලදුව මව්පියන් දෙදෙනාගේ සමීපයට ආයේය. බෝධිසත්වයන් වහන්සේ මෙසේ එන්නාවු පුත්‍රයන් දැක මෘගසමූහයා සමග මන්ත්‍රණය කරණසේක් මෙසේ කථාවක් පහළ කළසේක. ආචාර ශීලයෙන් සමන්විත වූ ධර්ම පටිසන්ථාරය ආමිස අභිවෘද්ධිවන්නේය. ඥාති සමූහයා විසින් පිරිවරණ ලදුව එන්නාවු ලක්ෂණ නම් මෘගරාජයා බලව ඉක්බිත්තෙන් නෑයන්ගෙන් විශේෂයෙන් පිරිහී එන්නාවූ මේ කාලනම් මෘගරාජයා බලවයි කියා බෝධිසත්වයෝ මෘගධෙනුවට නියෝග කළසේක. මෙසේ ලක්ෂණ නම් පුත්‍රයාට වනාහි සන්තෝෂ වූ

SANHIDA LANKA

බෝධිසත්වයන් වහන්සේ ජීවිතාන්තය දක්වා සිට කම්වූ පරිද්දෙන් මිය පරලව ගියසේක. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ වදාරණසේක් මහණෙනි, ශාරිපුත්‍ර ස්ථවිරයෝ ඥාති සමූහයා විසින් පිරිවරණ ලදුව ශෝභාවත්වූවෝ දැන් මතුනොවෙයි පෙරත් ශෝභාවත්වූ වාහුමය. දේවදත්ත ස්ථවිරයෝ පිරිවර සමූහයා කෙරෙන් පිරිහුණෝද දැන්මතු නොවෙති පෙරත් පිරිහුණෝමයි වදාරා මේ ධර්මදේශනාව ගෙණ හැර දක්වා වදාරා අතීත කථාව හා වර්ථමාන කථාව ගළපා පූර්වාපරසන්ධි යොදා මේ ලක්ෂණමෘග ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කාල නම් මෘගතෙම දැන් දේවදත්ත ස්ථවිර වූසේක, පර්ෂිද් තොම දේවදත්ත ස්ථවිරයන්ගේ පර්ෂිද් වූවාය. ලක්ෂණ නම් මෘගරාජතෙම දැන් ශාරීපුත්ත ස්ථවිරවූසේක. ඔහුගේ පර්ෂිද්තොම දැන් බුදුපිරිස් වූවාය. එකල්හි මාතෘවූ මෘගධෙනුව දැන් රාහුල මව්වුවාය. පිතෘවූ මෘගරජව උපන්නෙම් වනාහි දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ය වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මාලුත ජාතකය

තවද එක්සමයෙක්හි සව්නේගෙවාදත් බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් වැඩ කළ මහණ වූ භික්ෂුන් දෙනමක් අරභයා මේ ජාතකය වදාළ සේක. ඒ භික්ෂු දෙනම කොසොල් ජනපදයෙහි එක් ආරණ්‍ය විහාරයෙක්හි  වසන සේක. එක්කෙනෙක් කාලස්ථිවිර නම, එක්කෙනෙක් පුණ්හස්ථවිර නම, ඉක්බිත්තෙන් එක්දවසක් ජුණ්හස්ථවිරයන් වහන්සේ කාලස්ථවිර නම, ඉක්බිත්තෙන් එක්දවසක් ජුණ්හස්ථවිරයන් වහන්සේ කාලස්ථවිරයන් වහන්සේ ගෙන් විචාරණසේක් ස්වාමීනි. කාලස්ථවිරයන් වහන්ස ශිතනම් කවර කලෙක්හි වන්නේදැයි විචාල සේක. හෙතෙම කාල පක්ෂයෙහි වන්නේ යයි කී සේක. ඉක්බිත්තෙන් එක් දවසක් කාලස්ථවිරයන් වහන්සේ ජුණහස්ථවිරයන් වහන්සේ අතින් විචාරණසේක් ස්වාමීනි ජුණ්හස්ථවිරයන් වහන්ස ශිතනම් කවරකාලෙක්හි වන්නේදැයි විචාළ සේක. හෙතෙම පුණ්හපක්ෂයෙහි වන්නේ යයි කී සේක. ඔහු දෙදෙනාම තම තමාගේ ශංකා සිඳින්නට නොහැකිව සර්වඥයන් වහන්සේ සමීපයට ගොස් සර්වඥයන් වහන්සේට නමස්කාර කොට ස්වාමීනි සර්වඥයන් වහන්ස ශිතනම් කවරකලෙක්හි වන්නේදැයි විචාළාහුය. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ගේ කථාව අසා වදාරා මහණෙනි මම පූර්වයෙහිත් තොපට මේ ප්‍රශ්නය දේශනාකෙළමි, භවයෙන් වැසී තුබුනු බැවින් නොසැලකුවාහු දැයි වදාරා ඉකුත්වත් දක්වා වදාල සේක.

යටගිය දවස එක් පර්වත ප්‍රාන්තයෙක්හි සිංහයෙක්ද ව්‍යාඝ්‍රයෙක්  දැයි කියා යහළුවෝ දෙදෙනෙක් එකම ගුහාවෙක්හි වසන්නාහුය. එකල්හී බෝධිසත්වයන් වහන්සේද ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව ඒ පර්වත ප්‍රාන්තයේ වාසය කරණසේක. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ යහළුවන් දෙදෙනාට ශිතය නිසා විවාදයක් උපන, ව්‍යාඝ්‍රයා කාළපක්ෂයෙහි වන්නේයයි කීයේය. සිංහයා ජුණහපක්ෂයෙහි ශිතවන්නේයයි කීයේය.  ඔහු දෙදෙනාම තමාගේ ශංකා සිඳින්ට නොහැකිව බෝධිසත්වයන් වහන්සේ අතින් විචාළාහුය. බෝධිසත්වයන් වහන්සේ වදාරණ සේක් කෘෂ්ණ පක්ෂයෙහිද නොහොත් ශුකුල පක්ෂයෙහිද යන මේ දෙපක්ෂයෙන් යම් කලෙක්හි පූර්වාදී දිගින් යුක්තව මාරුතය හමාද එසමයෙහි ශිතවෙයි. ඊට කාරණ කවරේද.ශිතය වාතයෙන් හටගන්නේය. වායු හමන කල්හි ශිතය වන්නේය. කෘෂ්ණපක්ෂය ශුකල්පක්ෂයම ප්‍රමාන නොවන්නේය. තොපි දෙදෙන මේ ප්‍රශ්නයෙහි නොපැරදුනාහ. මෙසේ බෝධිසත්වයන් වහන්සේද මහණෙනි පෙරත් මා විසින් තොපට මේ ප්‍රශ්නය කියන ලද්දේයයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා දුක්ඛ සමුදය නිරෝධ මාර්ග යන චතුරාර්ය සත්‍යයන් ප්‍රකාශ කොට වදාළ සේක. චතුස්සත්‍යයාගේ කෙළවර ඒ ස්ථවිරයන් දෙදෙනා වහන්සේම සෝවාන් ඵලයෙහි පිහිටියාහුය. ශාස්තෲන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළ සේක.  සිංහතෙම ජුණහස්ථවිරවූයේය. ප්‍රශ්නය විසර්ජනය කළාවූ තපස්විම උපන්නෙමි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේක.

SANHIDA LANKA

# ආයාචිතභක්ත ජාතකය

තවද එක්සමයෙක්හි තුන්ලෝවාසීන්ට ගෞරවස්ථානීය වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි සතර ඉරියව්වෙන් යුක්තව වැඩ වාසය කරණ සේක් දේවතාවන්ට යාඥාකොට බිලිපූජාව කිරීමක් අරභයා මේ ජාතකය වදාළ සේක. ඒ කාලයෙහි වනාහී මනුෂ්‍යයෝ වර්ණක් කර්මාන්තය පිණිස යන්නාහූ මෘග සූකරාදී ප්‍රාණීන් ඝාතනය කොට දෙවතාවන්ට බිලිපූජා කොට අපි අන්තරායක් නැතිව අර්ථසිද්ධියට පැමිණ ආවාහු දෙවතානුභාවයෙන් මේ අර්ථසිද්ධිය වූයේ යයි සිතමින් ඌරන් මුවන් ආදීවූ බොහෝ ප්‍රාණීන් නිසා යාඥාවෙන් මිදෙන පිණිස බිලි පූජා කරන්නාහුය. එසේ කරන්නාවූ බිලිපූජා දැක භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට දන්වන්නාහු ස්වාමීන් වහන්ස. මේ ප්‍රාණඝාත කිරීමෙහි වැඩෙක් ඇද්දොහෝ නැද්දෝහෝයි විචාළාහුය. භාග්‍යවතුන් වහන්සේ භවයෙන් වැසී තුබුනු කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස කසීරට එක් ගමෙක්හි කෙළෙඹි පුත්‍රයෙක් ගම් දොරෙහි පිහිටියා වූ නුගවෘක්ෂයෙක වාසය කරන්නා වූ දෙවතාවට බිලිපූජා කෙරෙමියි ප්‍රතිඥා කොට ගොස් අර්ථසිද්ධියට පැමිණ අන්තරායක් නැතිව අවුත් එළුවන් තිරෙළුවන් ආදී වූ බොහෝ ප්‍රාණීන් ඝාතනය කොට ඇයැද ගැණීමෙන් මිදෙමියි සිතා නුග රුක්මුලට ගියේය. නුග වෘක්ෂයෙහි අධිගෘහිත දිව්‍යපුත්‍ර තෙම කඳවෙලෙප්හි සිට මෙසේ කීයේය. පින්වත් පුරුෂය තෝ ඉදින් මින් මිදෙනු කැමැත්තෙහි නම් පරලොව මිදෙනු පරිද්දෙන් මිදේවා, ප්‍රාණ වධාදී වූ දුශ්චරිත කොට දූන් මිදෙන්නේද මතු පාප පාශයෙන් බැඳෙන්නේය. ඒ කාරණය දූන මෙසේ නුවනැත්තාවූ පණ්ඩිත පුරුෂයෝ මතු පාප පාශායෙන් නොබැඳෙන පරිද්දෙන් මිදෙත්. ඊට කාරණා කවරේද?. මෙබඳු මිදීම අඥනයාහට බන්ධනයට කාරණාය. මෙසේ ප්‍රාණඝාත කොට මිදී නම් අඥානයාහට බැඳීමට කාරණා වන්නේයයි කියා ධර්මදේශනා කළ සේක. එතැන් පටන් මනුෂ්‍යයෝ මෙබඳු වූ ප්‍රාණඝාත කිරීමයයි කියන ලද අකුශලකර්මයන් වැලක දානාශීලාදී වූ සුචරිත ක්‍රියාවෙහි හැසිරී දිව්‍යලෝකයෙහි උපන්නාහුය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ ආයාචිතභක්ත ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි වෘක්ෂ දේවතාව උපන්නෙම් දූන් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මමම වේදැයි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# කුරුංගමෘග ජාතකය

තවද එක් සමයෙක්හි ලොවට හිත ඇති වූ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජානන් වහන්සේ වේළුවනාරාමයෙහි වසන සේක් දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක. එක්සමයෙක්හි දම්සභා මණ්ඩපයෙක්හි රැස්ව උන්නාවූ භික්ෂූන් වහන්සේ ඇවැත්නි මේ දේවදත්ත ස්ථිවිරයෝ සර්වඥයන් වහන්සේගේ මරණ පිණිස දුනුවායන් මෙහෙයූහ. හිසට ගල් පෙරලූහ. නාලාගිරියා මෙහෙයූහ. සර්වප්‍රකාරයෙන්ම බුදුන් වධයට උත්සහ කළේයයි දේවදත්ත ස්ථිවිරයාගේ නුගුණ කියමින් උන්සේක. සර්වඥයන් වහන්සේ අවුත් පනවන ලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ මහණෙනි දැන් කවර කථා වකින් යුක්තව උනුදැයි විචාරා වදාළසේක. ස්වාමීනි දේවදත්ත ස්ථවිරයෝ නුඹවහන්සේට වධයට උත්සහ කෙරෙතියි උන්ගේ නුගුණ කිය කියා උනුම්හයි කීසේක. මහණෙනි. දේවදත්ත ස්ථවිරයන් මා වධයට උත්සහ කෙළේ දැන් මතු නොවෙයි පෙරත් උත්සහ කළෝමය එතකුදුවුවත් මරාගත නුහුනුවෝම යයි වදාරා ඉකුත් වත් ගෙනහැර දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි බෝධිසත්වයෝ කුරුංගමෘග යෝනියෙහි ඉපිද එක් වනයක ඵලාඵල කමින් වාසය කෙරෙති. ඒ බෝධිසත්වයෝ එක්කාලයක ඵල සම්පන්න වූ ඇද්දේමට වනයක ඇද්දෙමට ගෙඩි කන්නාහුය. එකල්හි මැස්සේ සිට සතුන් මරන්නාවූ ගම්වැසි වැදිපුත්‍රයෙක් ඵලගත් ගස් මුල් වල මුවන්ගේ පියවර සටහන් බලා ගස උඩ මැස්සක් බැඳ එහි ඵල අනුභව කරන්නට ආවාවූ මුවන් තෙප්දමාලා හැණ මරා ඒ මුවන්ගේ මස් විකුට ජීවත් වන්නේය. එක් දවසක් ඒ ගස මුල බෝධිසත්වයන්ගේ පියවර සටහන් දැන් ඒ ඇද්දෙමට ගස උඩ අට්ටාලයක් බැඳ උදෑසනම බත් කා තෙප් ගෙණ වනයට වැද ඒ වෘක්‍ෂය උඩට නැගී අට්ටාලය පිට උන්නේය. බෝධිසත්වයෝ උදෑසනම වසන්නාවූ ස්ථානයෙන් නික්ම ඇද්දෙමට කම්යි අවුත් ඒ ගස මුලට වහා නොවැද කිසිකළෙක අට්ටාල වැද්දෝ ගස්උඩ අට්ටාල බඳිති. එසේ හෙයින් එබඳු උපද්‍රවයෙක් ඇද්දෝහෝ යි පරීක්ෂා කෙරෙමින් දුරසිටියාහුය. වැදි පුත්‍රයාත් බෝධිසත්වයන් ලඟට නොඑන නියාව දැන අට්ටාලයෙහිම සිට ඇද්දෙමට ගෙඩි කඩ කඩා බෝධිසත්වයන් ඉදිරියට දමන්නේය. බෝධි සත්වයෝ මේ ඵල අවුත් මාගේ ඉදිරියහිම වැටෙන්නේ මේ ගසඋඩ වැද්දෙක් ඇද්දෝයි නැවත නැවත උඩබලන්නාහුය වැද්දහු දැක නොදුටුවාක් මෙන් පින් වත්වූ වෘක්‍ෂය පෙර තෝ ළඹ එල්වන කල්හි මෙන් ඉඳුරාම ඵල ලබන්නේය. දැන්වූ කල්හි තා විසින් වෘක්‍ෂ ධර්මය හළපසු මමත් අන්‍ය වෘක්‍ෂයක් කරා එළඹ මට ආහාරයක් සොයම්යි නික්මුනහ. එකල්හි වැදි පුත්‍රයා අට්ටාලයෙහිම හිඳ බෝධිසත්වයන්ට තෙප්දමා වැරද ගිය හෙයින් තොප දැන් පලයව වැරද ගියේ වේදැයි කීය. බෝධි සත්වයෝ කරකැවීසිට කියන්නෝ එම්බල පුරුෂය දැන් තා ඒකාන්තයෙන්ම මා වැරදිවූ බවමුත් අටමහනාරයකින් සොළොස් ඔසුපත් නරකායෙහිත් දෙතිස් කම්කටොලු නොවැරදවූයෙහිම වේදැයි කිවුය. මෙසේ කියා ඒ මහාබෝසතානෝ කැමති පරිදි ගියෝය. වැදිපුත්‍රයා ගසින් බැස තමා කැමති පරිද්දෙන් ගියේය. බුදුරජානන් වහන්සේ මහණෙනි දේවදත්ත ස්ථවිරියන් මා වධයට උත්සහකළේ දැන් මතු නොවෙයි පෙරත් උත්සහකළෝමය එතකුදුවූවත් මරාගත නුහුනුවෝයි ධර්මදේශනා ගෙනහැර දක්වා වදාරා මේ කුරුංගමෘග ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි අට්ටාල වැද්දා නම් දැන් මේ දේවදත්ත ස්ථවිරයෝය, කුරුංගමෘග වුයේ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජානන් මම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# ආජඤ්ඤ ජාතකය

තවද එක් සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරණ සේක් හරණලද විර්යය ඇති භික්ෂුවක් අරභයා මේ ජාතකය වදාළ සේක. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කොට මහණෙනි. පෙර නුවණැත්තෝ විර්ය කරන්නට සුදුසු තන්හි ශර ප්‍රහාර ලැබ ගෙණ විර්යය කලාහුයයි වදාරා ඉකුත්වත් කථාව වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනුන් රාජ්‍යය කරණ කල්හි පූර්වජාතකයෙහි කියන ලද ක්‍රමයෙන් සත් රජ්ජුරු කෙණෙක් නුවර පිරිවැරුවාහුය. ඉක්බිත්තෙන් එක් රථාචාර්යයෙක් භ්‍රාතෘවූ අශ්වයන් දෙදෙනකු රථයෙක් හි යොදා නුවරින් නික්ම බලකොටු සයක් බිඳ රජදරුවන් සදෙනෙක් අල්වා ගත්තේය. එකෙණෙහි වැඩිමහළු අශ්වතෙම ශර ප්‍රහාරයක් ලද්දේය. රථාචාර්ය තෙම රථය ගෙණයනුයේ රජගෙයි දොරට අවුත් වැඩිමහලු අශ්වයා රථයෙන් මුදා සන්නාහය ලිහිල් කොට එක් පාර්ශවයකින් සයනය කරවා අන් අශ්වයකු සරහන්නට පටන් ගත්තේතය. බෝධිසත්වයන් වහන්සේ ඔහු දැක පූර්වයෙහි කියනලද ක්‍රමයෙන් සිතා රථාචාර්යය කැඳවා හොත්සේක්ම මෙසේ අවවාද කළසේක. පූර්වන්දිවූ යම් යම් කලෙක් හි වේ වයි යම් ක්‍ෂණයෙක්හි වේවායි යම් යම් යුද්ධ මණ්ඩලයෙක්හි වේ වයි යම් යම් කලෙක්හි වේ වයි ප්‍රහාර ලත් කල්හි හෝ නොලත් කල්හි හෝ අභිප්‍රාය දන්නා සුළු උතුම් සෛන්ධවයාම ව්‍යායාම කෙරෙයි. විර්යය කිරීමට ප්‍රාරම්භ කෙරෙයි. එහි බළංකාශ්වරයෝ පිරිහෙන්නාහුය. ඒ කාරණයෙන් මේ රථයෙහි මම යොදවයි කී සේක. රථාචාර්යයා බෝධිසත්වයන් වහන්සේ නඟා සිටුවා රථයෙහි යොදා සත්වෙනි බලකොටුව බිඳ සත්වෙනි රජහු අල්වාගෙණ රථය පදිනුයේ රාජවාසභවනරයට අවුත් අශ්වයා මිදුයේය. බෝධිසත්වයන් වහන්සේ එක් ඇලයකින් හොත්සේක් යට කියන ලද ක්‍රමයෙන් රජහට අවවාද දී නිරුද්ධක වූසේක. රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේගේ ශරීරය ආදාහන කරවා රථාචාර්යයාහට ආදර සත්කාරකොට දැහැමෙන් රාජ්‍යය කරවා කම් වූ පරිද්දෙන් මිය පරලොව ගිය සේක. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශකොට වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශ කොට මේ ආජඤ්ඤ ජාතකය නිමවා වදාළ සේක. චතුස්සත්‍ය දේශනාවන්ගේ කෙළවර පසුබට විර්ය ඇති භික්ෂූන් වහන්සේ අරහත් ඵලයෙහි පිහිටි සේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිර වූ සේක. ප්‍රමාර ලදින් විර්ය කොට සත් වැනි රජහු අල්වා දුන් අශ්වයා නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# නිග්‍රෝධමිග ජාතකය

තවද එක්සමයෙක්හි අසරණ සරණ වූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජානන් වහන්සේ සැවැත්නුවර නිසා දෙව්රම් වෙහෙර වැඩ වසනසේක් කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ මෑනියන් අරභයා මේ ජාතකය වදාළසේක. ඒ තෙරුන් වහන්සේගේ මෑනියෝ නම් රජගහනුවර මහ සම්පත් ඇති සිටාන කෙනෙකුගේ දියනිකෙනෙක පූර්වජන්මයෙහි රැස්කරණලද බොහෝ කුසල් මුල් ඇත්තෝය. අනිත්‍යාදී වශයෙන් පරික්ෂා කරණලද සංස්කාර ධර්මයන් ඇත්තෝය පශ්චිමාත්ම භාවයෙහි සිටියාහුය. කළතුළෙ පහණක් මෙන් මුන්ගේ අර්හත් ඵලයට උපනිශ්‍රය බබලන්නේය. ඒ සිටු කුමාරිකා තමා නම දන්නා තැන් පටන් ගිහිගෙයි ඇල්මක් නැතිව මහණවනු කැමතිව දෙමව්පියන්ට කියන්නී මෑනියනි පියාණෙනි මට ගිහිගෙයි විසීමෙහි සිත තැලෙන්නේය. මට නෛර්යානික වූ සර්වඥ ශාසනයෙහි මහණවනු කුමාරකාව බඩ දරු ගර්භයෙක් පිහිටියේය. ඕ තොමෝ දරුගැබ පිහිටි බව නොදන්නීය. ඉක්බිත්තෙන් එක්දවසක් එනුවර නක්ෂත්‍ර ඝෝෂණය කොට සියලු නුවර වාසීහූ නකත්කෙළි කෙළින්ට පටන් ගත්තාහ. සැවැත් නුවර මුළුල්ල ශක්‍රපුරයක්මෙන් සරසා පිළියෙලකරණලද්දේ විය. ඒ කුමාරිකාවද දූන් මහත්වූ කක්‍ෂත්‍ර ක්‍රීඩාව පවත්නාකල්හි තමාගේ ශරීරය සුවඳ ආදීය ගල් වන්නීත් නොවෙයි. වස්ත්‍රාභරණාදීන් සැරහෙන්නීත් නොවෙයි. තමාගේ පියවි ස්වභාවයෙන්ම ඇවිදිනීය. ඇගේ වල්ලභයානෝද මෙසේ කීවාහුය. සොඳුර මේ සියලුම නුවර නකත්කෙළි කෙළිම ඇසුරුකොට ඇත්තේය. තෙපි කුමක් නිසා ශරිරය පටිජග්ගනය නොකරව්දැයි කීහ. සුවාමිපුත්‍රයා දෙසිත්කුණුප කොට්ඨාශයෙන් පිරුණා වූ මාගේ ශරීරය වස්ත්‍රාභරණාදීයෙන් සැරහීමෙන් ප්‍රයෝජන කිම්ද මාගේ ශරීරයද දෙවියන් විසින් නිර්මාණය කරන ලද්දේ නොවෙයි. බ්‍රහ්මයන් විසින් නිර්මාණය කරන ලද්දේ නොවෙයි. ස්වර්ණයෙන් නිර්මිතත් නොවෙයි. මාණික්‍යයෙන් නිර්මිතත් නොවෙයි. හෙළ සඳුන් ආදී වූ  චන්දනයෙන් නිර්මිතත් නොවෙයි. සත් පියුම් හෙළ පියුම් රඹේතෝත්පළ සේවතෝත්පල ගර්භයෙන් උපන්නේත් නොවෙයි. දිව්‍ය ඖෂධයකින් කරන ලද්දේත් නොවෙයි. වැලි කෙසේ උපන්ද යත් කුළුපයෙහි හට ගත්තේය. මව් පිය දෙදෙනාගේ සම්භවයෙන් ජාතිය අනිත්‍යය ඉලීම මැඩීම බෙදීම නැසීම ස්වභාව කොට ඇත්තේය. සෝනළුගොඩ වර්ධනය කරන්නේය. තෘෂ්ණා උපාදාන දෙකෙන් යුක්ත ශෝකයට මුල් කාරණය හැඬීමට වස්තුය. සියළු රෝගයට වාසස්ථානය තෙදිස් කම් කටොළු කරන්නවුන්ට පරිග්‍රහන කරන ලද්දේය. ඇතුළෙහි කුණුය. පිටද නිරන්තරයෙන් වෑහෙන්නා වූ කුණු ඇත්තේය. අසූ දහසක් ක්‍රිමි කුලයන්ට වාසස්ථානය අමු සොහොන් වලට ලංව සිටියේය. මරණයාගේ කෙළවර සියළු ලෝක වාසීන්ගේ චක්‍ෂුන් පථයෙහි පවත්නා වූ මේ ශරීරය තුන්සීයක් පමණ ඇට සඟලින්ද නවසියයක් නහරින්ද යෙදුනේය. සමින් ද නවසීයක් මස්වැදුල්ලෙන්ද දළඹුයෙන්ද යුක්තය. මේ කිව්වා වූ සියල්ලම මේ සමින් වැසි සිටීය. එසේ හෙයින් තත්වූ පරිද්දෙන් පිටත සිටිය වුන්ට නොපෙනෙන්නේය. ඇතුනෙන්ද පිරි සිටියේය. උදරයෙන්ද පිරි සිටියේය. අක්මාවටද හෘද මාංශයටද  පපු කැත්තටද වකු ගඩුවටද බඩ දිවටද සොටුවටද කෙළටද සෝදියටද දාඩියටද මේධ තෙලටද සඳමිදුලටද පිත්තයටද වාසාතෙලටද වාසස්ථානය තවද ඒ සත්වයාගේ නව මගදොරින් හැමවේලෙහිම අසූචී වහනය වන්නේය. දෑසින් රිල් ව්‍යවහාරයෙන් අක්ෂි ගූථයද දෙකන් සිලෙන් කාරදු ව්‍යවහාරයෙන් ඝනී කණ ගූථයද දෙනාසාපුටයෙන් වෑහෙන්නා වූ ද පිත්තයද සෙලෙස්මාවද සමාරවේලෙහි මුඛයෙන්ද වමනය කරන්නේය. ශරීරයෙන් ස්වේදී වහනය කරන්නේය. යළිදූ ඒ සත්වයාගේ සිදුරු ඉස ඉස මුලින්ද පිරුණේය. අවිද්‍යාව පෙරදැරි කොට  ඇත්තාවූ අඥාන සත්ව තෙමේ යථොක්ත කුණපක්කෝට්ඨාසයන්ගෙන් යුක්ත වූ ඒ සත්වයා යහපතැයි සිතන්නේය.  මේ ශරීරය අපමණ වූ  ආදීනවයෙන් ද යුක්තය. විෂ වෘක්ෂයට බඳු වූ උපමාත් ඇත්තේය. සියළු ව්‍යාදීන්ට වාසස්ථානය උදක්ෂිණ සියළු දුක්ඛයාගේ ශරීරය ඉඳින් මේ කුනුප ශරීරයාගේ ඇතුළත පිටත වූයේ වී නම් ඒ කාන්තයෙන් දන්ඩක් අරගෙන කෑමට පැමිණි හවුඩු බළු ආදීන් වලකන්නේය. මේ ශරීරය දුර්ගන්ධ වහනය කරන්නේය. එසේ හෙයින් අපවිත්‍රය. කුණුපයක් වැන්නය. පඨකටකින් වසා තුබූ කසල කොඩකට බඳු වූ උපමා ඇත්තේය. ඇතුළ අසූචි පුරා පිටත සිතුයම් කල මැටි කලයකට බඳු උපමා ඇත්තේය. තවද මේ ශරීරය නුවණස් ඇත්තවුන් විසින් නින්දා කරණ ලද අඥාන සත්වයන් විසින් සතුටුවන ලද්දේය. ස්වාමීපුත්‍රය මේ කුණුප ශරීරය සරහා කුමක් කෙරෙම්ද. මේ ශරීරයාගේ සැරහීන අසූචූ පිරුණා වූ කළයෙහි පිටත සිතියම් කරන්නාක් වැන්නේයයි කිව. සිටු පුත්‍රයාණෝ ඒ කුමාරිකාවන් මෙලෙසින් අනිත්‍ය ප්‍රතිසංයුක්තව කියන්නා වූ බස අසා මෙසේ කීහ. සොඳුර තෙපි මේ ශරීරයෙහි මෙලෙසින් දෝශ දක්නාහූ කවර හෙයකින් මහණ නොවව්දැයි කිව්ය. ස්වාමි පුත්‍රයාණෙනි මහණ වීමට තොප විසින් සම්මත ලදින් නම් අදම  මහණ වෙමියි කිව. සිටු පුත්‍රයාණොත් යහපත. මම තොප මහණ කරවිමියි කියා මහදන් පවත්වා මහත්වූ සත්කාර සම්මාන කොට මහත් වූ පෙලහරින් මෙහෙණව රටගෙන ගොස් ඒ කුමාරිකාව මහණ කරවන්නාහු. දෙව්දත් මහතෙරුන් වහන්සේව පක්ෂව හිඳින්නාවූ භික්ෂූනීන් සමීපයෙහි මහණ කරවූහ.

SANHIDA LANKA

ඒ කුමාරිකාවද ප්‍රවජ්ජාව ලැබ චිත්ත සංකල්පනා ඇත්තී සතුටු වූ සිත් ඇති වූය. ඉක්බිත්තෙන් ඒ කුමාරිකාවන්ගේ දරු ගර්භය මිහි කිරීමට පැමිනෙන්නේය. චක්ෂු රාධි ඉන්ද්‍රයන් ගේ අන්‍යය තත්වයද හස්තපාද පෘෂ්ට ඉල්පුනු බවද උදරපටලයාගේ මහත් බවද දැක භික්ෂූනීහූ ආර්යාව තෙපි දූරී ඇත්තාක් මෙන් පෙනව. මේ කීමෙක්දැයි විචාලාව. ආර්යාවෙනි මම මෙනම් කාරණයකැයි නොදනිමි. මාගේ ශීලය සම්පූර්ණයයැයි කිව. ඉක්බිත්තෙන් ඒ භික්ෂූනිය අවසේස භික්ෂූනියහුද දෙව්දත් මහතෙරුන් වහන්සේ සමීපයට කැඳවාගෙන ගොස් ආර්යයන් වහන්ස මේ කුල ස්ත්‍රිය දුකසේ වල්ලභයා සිත් ලබාගෙන ප්‍රවෘජ්ජාව ලද්දේය. දැන් වනාහී මැගේ දරු ගර්භයෙක් පෙනෙන්නේය. අපි

හැමගේ ගර්භය ගිහි කල ලත් බවුත් මහණ කල ලත් බවුත් නොදත්හ. දැන් ඉට කුමක් කරමුදැයි විචාලාහ. දෙව්දත් ස්ථවිරයෝද තමන් නුබුදු බැවින්ද අනුන් කෙරේ ශාන්තියක් මෛත්‍රියක් දයාවක් නැති හෙයින්ද මෙසේ සිතුහ. දෙව්දත් ස්ථිවිරයන් වහන්සේගේ පක්ෂයේ භික්ෂුනියක් විසින් දරු ගර්භයක් පරිහරණය කරන්නීල දෙව්දත්ත ස්ථවිරයෝය ඒ බලබල බලා ඉඳිතියි මට නින්දා උපදවන්නේය යි මා විසින් මේ මෙහෙණින්න මෙතැනින් නෙරපායන්ට සුදුසු යයි ඒ දේවදත්ත ස්ථවිරයෝ පරික්ෂා නොකොටම ගල් කැටක් පෙරලෙන කලක් පරිද්දෙන් උඩට පැන නැගී යව මෑ මෙතැනිනි නෙරපායි යි කිය. ඒ භික්ෂුණියද දේවදත්ත ස්ථවිරයන් කී බස් අසා උන් තැනින් නැගිටසිට වැඳලා සර්වඥයන් වහන්සේගේ පක්ෂයෙහි භික්ෂුනීන් වසන්නා වූ ස්ථානයට ගියාය. ඉක්බිත්තෙන් බාල වූ මෙහෙණින්නට කියන්නේ ආර්යාවෙනි දේව්දත්ත ස්ථිවිරයෝ බුදු නොවෙති. මට උන් සමීපයෙහි මහණව ඉඳිමෙන් ප්‍රයෝජන නැත. මේ ලෝකයෙහි අග්‍ර පුද්ගල වූ සර්වඥයන් වහන්සේ සමීපයේ මහණ වීමට අභිප්‍රාය කොට මා විසින් දුකසේ ලද්දා වූ මේ ප්‍රවජ්ජාවම අන්තර්ධාන නොකරව. මා කැඳවාගෙන සර්වඥයන් වහන්සේ කරා ජේතවනාරාමයට යවයි කීව. ඒ භික්ෂුනිහුද අලුත ගියා වූ භික්ෂූනිය කැඳවාගෙන රජගහ නුවරින් පන්සාලිස් යොත්නක් තැන් ම ගෙවා අනුපමයෙන් ජේතවනාරාමයට පැමිණ සර්වඥයන් වහ්සේ වැඳ මේ කාරණය දැන්වූවාහුය. සර්වඥයන් වහන්සේ මැගේ දරු ගැබ ගිහි කලම පිහිටියේයැයි සිතූ සේක. එසේ නියම කොට දනැත් ශ්‍රමණ බවත් ගෞතමයෝ දේවදත්ත ස්ථිවිරයන් විසින් හරණ ලද මෙහෙනින්ය අරගෙණ ඇවිදිනාහයි තිර්තකයන්ට කියන්ට අවසර පෙනෙන්නේය එහෙයින් මේ උපත් කතාව විචාරා සනිටුහන් කරන්නටද සරාජික පර්ෂිත් මධ්‍යයෙහි විනිශ්චය කරන්නට සුදුසු වන්නේ යැයි දෙවැනි දවස් පසේනදී කොසොල් රජ්ජුරුවන්ද අනේ පිඩු සිටානන්ද සුළු අනාථ පිණ්ඩිකයන්ද විශාකා මහඋපාසිකාවන්ද අනිකුත් ප්‍රසිද්ධ මහ කුලයන්ද කැඳවාලා මේ අධිකරණය විචාරා සනිටුහන් කරන්නට පාවා දුන් සේක. සවස් වේලෙහි සිව්වනක් පර්ෂිත් රැස්වූ කල්හි විනයට අග්‍රකොට තබන ලද්දා වූ උපාලි ස්ථවිරියන් වහන්සේට යව සිව්වනක් පර්ෂිත් මධ්‍යයෙහි මේ දහර භික්ෂූනියගේ අධිකරණ විචාරා ශුද්ධ කරවයි වදාල සේක. යහපත ස්වාමීනි යි තෙරුන් වහන්සේ පර්ෂිත් මධ්‍යයට ගොස් තමන් වහන්සේ ට පැමිණියා වූ ආසනයේ  වැඩ හිඳ රජ්ජුරුවන්ගේ ඉදිරියෙහි විශාඛා මහෝඋපාසිකාවන් කැඳවා යව  මහ උපාසිකාවෙනි මේ ලදරු භික්ෂූනි අසවල් මස අසවල් දවස් මහණ වූ වයි තත්වයෙන් දැන මේ දරු ගර්භය මහණ වන්නට පෙරාතුදෝ හෝ පසුවදෝ හෝයි නියම දැන කියවයි විසාඛාවන් අතට පාවාදුන් සේක. විශාඛා මහඋපාසිකාවෝද යහපත ස්වාමිනි පිළිගෙන වටකොට තිරයක් අද්දා තිරය ඇතුලදී බාල භික්ෂූනියගේ හස්ත පාදාදිය බඩකෙලවර කොට බලා මාස් දවස් එක් කොට ගණන් පරික්ෂා කරවා ගිහිකල දරු ගැබ ලත් නියාව තත්ව හෙයින් දැන උපාලි ස්ථවිරයන් වහන්සේ සමීපයට ගොස් මේ වූ නියාව දැන්වුය. තෙරුන් වහන්සේද සිව්වනක් පර්ෂිද් මධ්‍යයෙහිදී ඒ භික්ෂූනිය ශුද්ධ කළ සේක. ඒ භික්ෂූනියද උපන් කිළුටින් ශුද්ධව භික්ෂු සංඝයා වහන්සේද සර්වඥයන් වහන්සේද වැඳ සෙසු භික්ෂූනින් හා සමඟ මෙහෙණින් වසන්නාවූ ස්ථානයටම ගියාය. ඕ තොමෝ දරු ගර්භය බිහි කිරීමට පැමිණි කල්හි පියුමතුරාණන් සර්වඥයන් සමයෙහි කරණ ලද ප්‍රාර්ථනා ඇති මහානුභාව සම්පන්න වූ පුත්‍රයානන් කෙණෙකු වැදූය. ඉක්බිත්තෙන් එක් දවසක් පසේනදි කොසොල් රජ්ජුරුවෝ මෙහෙවර සමීපයෙන් යන්නෝ දරුවන් අඬන අඬ අසා අමාත්‍යයන් අතින් මේ කිමෙක්දැයි විචාලාහ. අමාත්‍යයෝද ඒ කාරණය දැක රජ්ජුරුවන් වහන්ස ඒ දවස් සිව්වනක් පර්ෂිද් මධ්‍යයේදී අධිකරණ විචාරා සනිටුවහන් කල භික්ෂූනීන් වහන්සේ පුත්‍රයාණ කෙණෙකුන් වැදූ සේක. ඔවුන්ගේ මේ ශබ්දයයි කීව්වාහුය. සගයෙනි භික්ෂූනීන්නට දරුවන් පරිහරණය කිරීම නම් තපසට ඉතා පරිබෝධය. අපි ඒ කුමාරයන් වඩම්හයි කියා ගෙන්වා ගෙන නාටක ස්ත්‍රීන්ට පාවා දිවා කුමාරයන් පරිහරණයෙන් වැඩුහ. ඒ කුමාරයන්ට නම් තබන දවස කාශ්‍යප යයි නම් තුබූහ. ඉක්බිත්තෙන් ඒ කුමාරයා පරිහරණයෙන් වැඩුනු බව හේතු කොට ගෙන කුමාර කාශ්‍යප යයි කියා නම් තුබුවාහුය. ඒ කුමාරයෝද සත් ඇවිරිදි අවස්ථාවෙහි සර්වඥයන් සමීපයෙහි මහණව සම්පූර්ණ වූ විසි වයස් ඇතිව උපසම්පදාව ලැබ කල්ගිය පසු බණ කියන්නාවුන් අතුරෙහි විචිත්‍ර කතිකවූවාහුය. ඉක්බිත්තෙන් ඔහු සර්වඥයන් වහන්සේද මහණෙනි මාගේ ශාසනයෙහි විසිතුරු කොට බණ කියන්නාවූ ශ්‍රාවකයන් අතුරෙන් යම් සේ කුමාර කාශ්‍යප ස්ථිවරයෙක් ඇද්ද මේ තෙම අග්‍රයයි එතද ග්‍රාපාලියෙහි තබා වදාල සේක. උන් වහන්සේද පසුව කල්යාමෙකින් වම්මික සූත්‍ර දේශනාවෙන් බණ අසා අරහත්වයට පැමිණි සේක. ඒ කුමාර කාශ්‍යප ස්ථවිරයන්ගේ මව් භික්ෂූනියද විදර්ශනා වඩා අරහත් ඵලයට පැමිණියාහුය. ඒ කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේද සර්වඥ ශාසනයෙහි ආකාශයෙහි චන්ද්‍රයා පරිද්දෙන් ප්‍රකාශ වූ සේක. එක්දවසක් සර්වඥ රාජෝත්තමයානන් වහන්සේ පස්බත ආහාර පර්යේෂණයෙන් වැලකී සේක් වදාල අන්තයෙහි භික්ෂූන් වහන්සේට අවවාද දී ගඳ කිළියට වන් සේක. භික්ෂූන් වහන්සේ අවවාද පිළිගෙන තම තමන් වහන්සේගේ රාත්‍රි ස්ථානාදී වාසස්ථානයෙහි දවල් දවස් යවා සවස් වේලෙහි ධම්සභා මණ්ඩපයට රැස්ව ඇවැත්නි දේවදත්ත ස්ථවිරයෝ තමන් නුබුදු බැවින්ද ක්‍ෂාන්ති මෛත්‍රියක් නැති බැවින්ද ඔහු විසින් කුමාර කාශ්‍යප ස්ථවිරයෝද  උන් වහන්සේට මව් වූ ස්ථිවරී වූද නෙලනා ලදහ. සර්වඥයන් වහන්සේ වනාහී තමන් වහන්සේ ධර්ම රාජයන් බැවින්ද සියළු සත්වයන් කෙරෙහි පතලා වූ කරුණා මෛත්‍රී ආදීය ඇති බැවින්ද ඔවුන් දෙදෙනාට පිහිට වූ සේකැයි සර්වඥයන් වහන්සේගේ ගුණ වර්ණනා කෙරෙමින් උන් සේක. බුදු රජානන් වහන්සේද සර්වඥ ලීලාවෙන් ධම් සභා මණ්ඩපයට වැද පණවන ලද බුද්ධාසන  මස්කයෙහි වැඩ හිඳ මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කවර කතාවකින් යුක්තව උන්නුදැයි විචාරා වදාරා  නුඹ වහන්සේ නොකියන්ට වදාලා වූ  රාජ කතා ඡෝර කතා ආදී වූ දෙතිස් කථාවෙන් යුක්තව උනුමෝ නොවම්හ. දේවදත්ත ස්ථිවිරයන්ගේ පිහිට නොලැබ පලා ආ කුමාර කාශ්‍යප ස්ථිවිරයන් හා මව් ස්ථිවිරයන් දෙදෙනාට පිහිට වූ නියාව කිය කියා උනුම්හයි ආදියෙහි පටන් සියළු ප්‍රවෘත්තිය දැන්වූහ. මහණෙනි සර්වඥයෝ මොහුන් දෙදෙනාට දැන් මතු පිහිට වූවෝ නොවෙති. පූර්වයෙහි ප්‍රත්‍යයත් පිහිටවූවාහු වේදැයි වදාල සේක. භික්ෂූන් වහන්සේ ඒ අර්ථය ප්‍රකාශණය පිණිස භාග්‍යවත් වූ  බුදු රජ හට

SANHIDA LANKA

යාඥ්ඥා කොට කී සේක. සර්වඥයන් වහන්සේද අන්‍ය භවයෙන් සැඟ වූනාවූ ඉකුත් වත් ප්‍රකාශ කොට වදාල සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්ම දත්ත නම් රජ කෙණෙකුන් රාජ්‍ය කරන සමයෙහි අප මහා බෝසතානෝ මෘග යෝනියෙහි පිළිසිඳ ගත්හ. බෝධි සත්වයෝද මව් කුසින් බිහි වූවාහු රන්වන් වූ ශරීර වර්ණ ඇති වූහ. ඒ මෘග පෝතකයන්ගේ අක්ෂිහු දෙදෙන ඉන්ද්‍ර නීල මානික්‍යයකට බඳුවූ සටහන් හා පැ ඇත්තාහ. අංකුර දෙක රජත වර්ණය මුහුණ රත් පලස් වූ පටක් බඳු වූ පැහැ ඇත්තේය. හස්ත පාදයන්ගේ පර්යන්තයෝ ලාක්ෂා රසයෙන් පිරියම් කරණ ලද්දාහු වැනිය. වලාදීය වමර වලාදිය වැනි වූ සේය. එ මෘග පෝතකයන්ගේ ශරිරයද මහත් වූ අශ්ව පෝතකයක් පමණ වූයේය. ඒ මව් රජ්ජුරුවෝද පන්සියයක් පමණ මුවන් විසින් පිරිවරණ ලදුව වනයෙහි වාසය කරන්නාහ. නමින් නිග්‍රෝධ නම් මුව රජ්ජුරුවෝය. එ මුව රජ්ජුරුවෝවන්ට නුදුරු වූ ස්ථානයෙහි පන්සියයක් මුවන් පිරිවරන ලදුව ශාඛා මුග නම් වූ අනිකුත් මුව රජ්ජුරුකෙණෙක් ඒ වනයෙහි වසන්නාහ. ඒ මුව රජ්ජුරුවෝද රන් වන් වූ ශරිර වර්ණ ඇත්තාහ. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝද මුවන් මැරීමෙහි නියුක්තව වෙසෙති. මංශ නැතිව බස් අනුභව නොකෙරෙති. මනුශ්‍යයන්ගේ කර්මාන්ත නැතිකොට සියළු ගම් නියම් ගම් ජනපදවාසීන් රැස්කරවා දවස් පතා මුව දඩයමට යන්නාහ. මනුශ්‍යයෝ මෙසේ සිතූහ. රජ්ජුරුවන් වහන්සේ නිරන්තරයෙන් මුව දඩයමට යාමෙන් අප හැමගේ කර්මාන්ත පමා වන්නේය. අපි හැම රාජධානියෙහි මුවන්ට ගොදුරට තිසි තන ආදිය රෝපණය කොට පැන් බොන්නා වූ ස්ථානයක්ද සමුද්ද කරවා බොහෝ මුවන් වලින් ගෙනවුත් උයනෙහි ලා දොර පැලලි බැඳ රජ්ජුරුවන් වහන්සේට පාවා දුනු මෝ නම් යෙහෙකැයි සිතා ඒ සියළු මනුශ්‍යයෝම එක්ව ගෙන උධ්‍යානයෙහි තණ පැන් සමුද්ද කරවා මුගුරු ආදී වූ නොයෙන් ආයුධ ගත් අත් ඇතිව වලට වැද මුවන් සොයා ඇවිදිනා වූ වන මධ්‍යයෙහි සිටියා වූ මුවන් හා ශාඛා නම් මුව රජ්ජුරුවෝ හා නිග්‍රෝධ නම් මුව රජ්ජුරුවන් වසන්නාවූ ස්ථානය මධ්‍ය කොට වටකලාහුය. ඉක්බිති ඒ මුග සමූහයා දැකලා ගස් වලද වල්පිටද බිමද මුගුරු වලින්ද දඬු ආදියෙන්ද ගසමින් මුවන් හය ගන්වා උගුළුවා කඩු අඩයටි දුනු ආදී වූ ආයුදයන් ඔසවා පෑ මහත්වූ ශබ්ද පවත්වමින් මුග සමූහයා උයනට වද්දවා දොර පැලලි වසා රජ්ජුරුවන් කරා ගොස් රජ්ජුරුවන් වහන්ස දවසක් පාසා මුව දඩයමට ගොස් අප හමගේ කර්මාන්ත නොනැසුව මැනව අප හැම විසින් වලින් මුවන් ගෙනවුත් නුඹ වහන්සේගේ උයනෙහි ලන ලද මෙතැන් පටන් ඔවුන්ගේ මස් අනුභව කල මැනවයි රජ්ජුරුවන්ට කියා තමන්ගේ ගං ගෙවලට ගියාහුය. රජ්ජුරුවෝ උන් හැම කී බස් අසා උයනට ගොස් මුවන් බලන්නාහු. රන්වන් මුව රජ්ජුරුවන් දෙදෙනා දැක ඔවුන් දෙදෙනාට අභය දානය දුන්නාහ. එවක් පටන් කිසි දවසක රජ්ජුරුවෝ තුමු ගොස් ඉන් එකමුවෙකු විඳ ගෙනෙන්නාහ. කී දවසක අරක් කැමියා ගොස් මුවකු විද ගෙනෙන්නේය. මුවෝ දුනු දැක මර හයින් තැති ගත්තාහු ඒ ඒ තැන සැඟ වී යන්නාහ. විත් දෙක තුන ලැබ බොහෝ දෙනා පීඩාවිඳින්නාහ. තනින් පැනින් දුක් විඳ ලෙඩ වන්නාහුද වෙති. මරණයටද පැමිණෙති. මුග සමූහයා මෙපවත් බෝධිසත්වයන්ට දැන්වීය. බොධි සත්වයෝද ශාකා මුග රජ්ජුරුවන් කැඳවාලා යහළු බොහෝ වූ මුවෝ වල පිති නසති එකාන්තයෙන් මලයතු බව නියම පසු මෙතැන් පටන් ශරයෙන් මුවකු නොවිදිත්වයි දන් ගෙඩියට තුබු ස්ථානයට මුවන් ට වර පැමිණේවයි එක් දවසක් අපගේ පර්ෂද වාරය පැමිණේවයි එක් දවසක් තොපගේ පර්ෂදට වාරය පැමිණේවයි වාරය පැමිණියා වූ මුවෝ ගොස් දම් ගෙඩියෙහි හිස තබාලා වැද හොත්වයි එසේ කල්හි මුවෝ ඒ වදයට නොපැමිණෙත්වයි සනිටුහන් කොට ඒ සියළු මුගයෝම යහපතියි පිළිගත්හ. එදවස් පටන් වාරය පැමිණියා වූ මුවෝ ගොස් දන් ගෙඩිය මත්තෙහි හිස තබා වැදහොත්තේය. අරක්කැමියා අවුත් ඒ දන් ගෙඩිය මත්තේහි වැද හොත්තාවූ මෘගයාම මරා ඇරගෙන යන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් ශාඛා මුගෘයානන්ගේ පර්ෂිත් හි දැරී ඇති වූ මුව දෙනකට වාරය පැමිණියෝය. ඒ මුව දෙන ශාඛා මුව රජ්ජුරුවන් සමීපයට එළඹ ස්වාමීනි මමත් ගර්භිනී දරුකෙණෙකුන් වදා අප දෙදනමෝ දෙවාරයක් යම් හයි මාගේ වාරය ඉක්මවාපුව මැණවයි කිව. ඒ ශාකා මුවාණෝ තොපට පැමිණි වාරය අනෙක් කෙනෙකුන්ට පමුණුවන්නට මට නොපිළිවන. තෝප තිබි පුත්‍රයා දන්නෙහිය. මෙතැනින් පලායවයි කිව්වාහුය. ඒ මුව දෙන්නාම ශාකා මෘගයන්ගේ සමීපයෙන් අනුග්‍රහයක් නොලබන්නී බෝධි සත්වයන් කරා එළඹ මේ කාරණය දැන්වුහ. බෝධිසත්වයෝද ඒ මුව දෙනගේ බස් අස අසා වන්නාට තෙපි යව මම තොපගේ වාරය ඉක්මවමියි තුමු ගොස් දන් ගෙඩිය මත්තෙහි ඉස තබා ගත්තේය. අරක් කැමියාද ඒ බෝධිසත්වයන් දැක ලබන ලද අභය ඇති මුව රජ්ජුරුවෝ දන් ගෙඩිය මත්තෙහි ඉස තබාගෙන වැද හොත්තාය. මීට කාරණය කිම්දෝ හෝයි සිතා යුහුව ගොස් එපවත් රජ්ජුරුවන්ට කීයේය. රජ්ජුරුවෝද එකිනෙහි රථයකට පැන නැගී මහත් වූ පෙරහරින් උයනට ගොස් දංගෙඩිය මත්තෙහි හිස තබා වැද හොත් බෝධිසත්වයන් දැක යහළු වූ මුව රජ්ජුරුවෙනි. මා විසින් තොපට අභය දානය දෙන ලද්දේ නොවේද. කවර කාරණයකින් තෙපි මෙතන වැදහොත්තාහුදැයි කීහ. මහරජ්ජුරුවෙනි දැරී ඇති මුව දෙනෙක් මා සමීපයට අවුත් මට පැමිණි වාරය අනිකෙක් හට පැමිණුව මැනවයි කිව. මා විසින් එකක් කට පැමිණි මරණ දුක් අනිකක් හට පව් නොවන්නට මට නොපිළිවන. ඒ මම මාගේ ජිවිතය ඈට දී ඈට පැමිණි වාරය මම අරගෙණ මෙතන වැදහොත්තෙමි. අනෙක් සැකයක් නොකරව රජ්ජුරුවෙනි කිව්වාහුය. මාගේ ස්වාමී වූ මුව රාජයාණෙනි මා විසින් තොප බඳු වූ ක්ෂණාන්තිය හා මෛත්‍රිය අනුකම්පා ඇති කෙනෙකුන් මනුෂ්‍යයන් කෙරෙහිදෝ නොදක්නා ලද ඒ කාරණයෙන් තොප කෙරෙහි ප්‍රසන්නයෙමි. නැගී සිටුව තොපටත් ඒ මුව දෙනටත් අභය දානය දෙනමියි කීහ. අප දෙදෙනා විසින් අභය දානය ලත් කල්හි සෙසු මුවෝ කුමක් කෙරෙද්ද රජ්ජුරුවෙනි කීහ. සෙසු මුවන්ටත් අභය දානය දිනිම් ස්වාමීනි කීහ. මහරජ උයන වසන මුවන්ට අභය දානය දුනවයි. වල වසන සෙසු මුවෝ කුමක් කෙරෙද්දැයි කීහ. ඕන්ටත් අභය දිනිමියි කීහ. මහරජ වලහා ගම වසන මුවෝ අභය දානය ලත්හ. අවශේෂ වූ චතුප්පදික සත්වයෝ කුමක් කෙරෙද්ද

SANHIDA LANKA

රජ්ජුරුවෙනි කීහ.  ඒ ඒ චතුශ්පදික සත්වයන්ටත් අභය දානය දිනිමියි කීහ. චතුශ්පදිකාදීහු අභය දානය ලත්හ. දියෙහි වසන්නාහූ මත්ස්‍ය ජාතීහු කුමක් කෙරෙද්ද කීහ. ඔවුන්ටත් අභව දානය දිනිමියි කීහ. මෙපරිද්දෙන් මහා බෝධිසත්වයෝ රජ්ජුරුවන් අතින් මුවන් ආදී වූ සියළු සත්වයන්ට අභය දානය ඉල්වාගෙන වැදහොත් තැනින් නැගී සිට රජ්ජුරුවන් පංචශීලයෙහි පිහිටුවා රජ්ජුරුවෙනි දස කුසල ධර්මයෙහි හැසිරෙව. මව් පියන් කෙරෙහිද දූ දරුවන් කෙරහිද ශ්‍රමණ බ්‍රහ්මණයන් කෙරෙහිද සියළු ජනපද වාසීන් කෙරෙහිද ධර්මයෙන් හැසිරෙවයි රජ්ජුරුවන්ට අවවාද කොට මධ්‍යම ප්‍රතිපදායෙහි හැසිරෙන්නා වූ සත්ව තෙම කරජකාය යාගේ බේදයෙන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාතයෝ ස්වර්ගලෝකයෙට පැමිණේවායි රජ්ජුරුවන්ට සර්ව ඥාණීලීලාවෙන් ධර්ම දේශනා කොට කීප දවසක් ඒ උයනේ වාසය කොට රජ්ජුරුවන්ට අවවාද දී මුග සමූහයා විසින් පිරිවරණ ලදුව තමන් පෙර විසුවා වූ වනයට පැමිණියාහුය. ඒ මුව දෙන්ද පුෂ්ප කර්ණිකාවට බඳු වූ පුතෙකු වැදූහ. ඒ මුව පැටියාණෝද  කෙළෙ තැනැත්තෝ ශා මුග රාජයායන් සමීපයෙහි ගොස් කෙරෙනාහ. ඉක්බිත්තෙන් ඒ මුග පෝතකයන්ගේ මෑණියෝ ඒ ශාක මුග රාජයන් සම්පයෙහි යන්නා හූ දක පුත මෙතැන් පටන් ඔහු සමීපයට නොයව. නිග්‍රාධ මුග රාජයානන් වහන්සේ සමීපයටම යවයි පුතනුවන් අවවාද කරන්නාවූ මෘග දේනුව මෙසේ කීහ. පුත තොප මේවායි අනෙක් කෙනෙක් වේවායි තමන්ට හිතයක් වැඩක් කැමැත්තේ වී නම් නිගොද්‍රාධ මෘග රාජයයානන් වහ්සේම සේවනය කරන්නේය. ශාක මෘග රාජයානන් කරා නොඑළඹෙන්නේය. සේවනයත් නොකරන්නේය. ඔහු නිසා ජීවිකාවත් නොකරන්නේය. ශාඛ මෘග රාජයානන් සමීපයෙහි යම් ජීවිකාවක් ඇද්ද ඒ ජීවිකාවටත් වඩා නිග්‍රෝධ මෘග රාජයානන් වහන්සේගේ පාද මූලයෙහි වැද හෙව මිය යාම උතුම් වන්නේයැයි ශාඛ මෘග රාජයානන් සමීපයට නොයෙන ලෙස අවවාද කලාහ. රජ්ජුරුවන් විසින් අභය දානය දුන් තැන පටන් අභය ලද්දා වූ මුවෝ මනුශ්‍යයන්ගේ ගොයම් කා නසන්නාහ. මනුශ්‍යයෝ අභය දානය ලත් මුවෝ යයි ගසන්නටද පළවන්නටද නොහැක්කාහ. ඒ සත්වයෝ රාජංගනයේ රැස්ව රජ්ජුරුවන්ට මෙපවත් කීවාය. රජ්ජුරුවෝ ප්‍රසන්න වූ සිත් ඇති මා විසින් නිග්‍රෝධ මිග නම් උත්තමයාට වරදෙන ලද ඒ රාජ්‍යය හරින්නේ නමුත් එදවස් දුන් ප්‍රතිඥා නොහරින්නේය පලායව මාගේ ආඥ්ඥාව පවත්නා ස්ථානයෙහි මුවන් මරන්නට කිසිත් සත්වයෙක් නොලබන්නේයයි කීවාහුය. නිග්‍රෝධ යුව රජ්ජුරුවෝද එපවත් අසා මෘග සමූහයා රැස් කරවා මෙතැන් පටන් අනුන්ගේ ගොයම් කන්නට නොපිළිවනැයි මුවන් වලකා මෙතැන් පටන් ගොයම් රක්නා වූ මනුශ්‍යයෝ ගොයම් රක්නා පිනිස වැටක් නොකරත්වයි කුඹුරුවට කොටපත් අදිත්වයි මනුශ්‍යයන්ට කියා යැව්වාහුය. එතැන් පටන් කොට ක්‍ෂෙත්‍රවල්හි කත් ඇදීම සංඥාව පහල විනූ එවක් පටන් පත් ඇඳි සලකුණ ඉක්මවන්නාවූ එකද මෘගයකුත් නැති මේ වනාහි ඒ සත්වයන්නට මහ බෝසතානන්ගෙන් ලැබෙන ලද අවවාදයි මෙපරිද්දෙන්ම මෘග සමූහයාට අවවාද කොට නිග්‍රෝධ බෝධිසත්වයෝ  ආයූ පමනින් සිට ඒ මුවන් හා සමඟ කම් වූ පරදිද්දෙන් මිය පරලොව ගියාහුය. ඒ රජ්ජුරුවෝද බෝධිසත්වයන්ගේ අවවාදයෙහි සිට දානමානාදී වූ කුසල් කොට කම් වූ පරිද්දෙන් මිය පරලව ගියාහ. ලොව්තුරා සර්වඥයන් වහන්සේද මහනෙනි මේ ස්ථිවරයන්ටද කුමාර කාශ්‍යප ස්ථිවිරයන්ටද මම දූන් මතු පිහිට වූයෙම් නොයෙම්.පළමුත් පිහිට වූයෙම් වේදැයි මේ ජාතක ධර්ම දේශනාව ගෙනහැර දක්වා චතුශ්සත්‍යය දේශනාව පෙරදූරි කොට අතීත කතාවත් වර්ථමාන කථාවත් වදාරා දෙක එක් කොට සන්ධි ගලපා මේ නිග්‍රෝධ මිග ජාතකය නිමවා වදාලසේක. එකල්හි ශඛ්‍ය මෘග රාජයානෝ නම් දූන් දේවදත් ස්ථිවිරයෝය. ඔවුන්ගේ එදවස් මෘග පරිශීල දූනුත් දේවදත්ත පරිශිලය ඒ මුව දෙන නම් දූන් මේ ස්ථිවිරයෝය එදවස් මේ මුව පැටවානෝ නම් දූන් බණ කියන්නවුන් කෙරෙහි අග්‍ර වූ මේ කාශ්‍යප ස්ථිවිරයෝයය. එදවස් බරණැස් රජ්ජුරුවෝ නම් දූන් ධර්ම භාණ්ඩාගාරික වූ  ආනන්ද ස්ථවිරයෝය. නිග්‍රෝධ මුව රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදු වූ මම ම වේදැයි තමන් වහන්සේ වදාල සේක.

SANHIDA LANKA

# කණ්ඩින ජාතකය

තවද තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජානන් වහන්සේ සැවැත්නුවර නිසා දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්. පුරාණ දූතිකාව කෙරෙහි ලොල් වූ එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ අරඹයා මේ ජාතකය වදාල සේක. මෙහි වර්ථමාන කථාව අටක නිපාතයෙහි ඉන්ද්‍රිය ජාතකයෙහි මතු ප්‍රකාශ වන්නේය. භාග්‍යවත් වූ බුදු රජානන් වහන්සේද ඒ භික්ෂු හට මහණ තෝ පූර්වයෙහි මේ මාතු ගාම නිසා ජීවිත විනාශයට පැමිණ සහල ගුරු රුසක්හි පැලහුනෙහි යැයි වදාල සේක්. භික්ෂූන් වහන්සේ ඒ කාරණය ප්‍රකශ කරණ පිණිස සර්වඥයන් වහන්සේට යාඥ්ඤාකොට දැන්වූ සේක. සර්වඥයන් වහන්සේද භාවාන්තරයෙන් පටිච්ඡන්න වූ ඒ කාරණය ප්‍රකාශ කොට වදාල සේක. මෙයින් මත්තෙහි වනාහි භික්ෂූන් වහන්සේගේ යාච්ඥාවද භවාන්තරයෙන් සැඟවුනේය යන එපමණකුත් නොකියා ඉකුත්වත් ගෙණහැර දැක්වූ සේකැයි මෙපමණක්ම කියමු. මෙපමණක් කී කල්හිත් යාච්ඥාවද වලාගැබකින් නික්මුණා වූ චන්ද්‍රයා පරිද්දෙන් භවාන්තරයෙන් සැඟවුනාවු කාරණයදැයි යන මේ සියල්ල යට කියන ලද ක්‍රමයෙන් යොදා දතයුතු.

යට ගිය දවස මගධරට රජගහනුවර මගධනම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කෙරෙති. මගධරට වාසීන් ගොයම්කරණ අවදියෙහි මුවන්ට මහත්වූ උපද්‍රව වන්නේය. ඒ මෘගයෝ වනයෙහි පර්වත සමීපයෙහි වසන්නාහ. ඒ මුවන් අතුරෙහි එක් වලෙක ඒ පර්වත සමීපයෙහි වසන්නාවූ මෘගයෙක් එක් ගමක් සමීපයෙහි වසන්නා වූ මෘගපෝතිකාවක් හා සමග මිත්‍රසන්තවය කොට ඒ මුවන් වසන්නාවූ පර්වත සමීපයෙන් බැස නැවත ගම් සමීපයට බස්නාකල්හි මෘගපෝතිකාව කෙරෙහි පිළිබඳ සිත් ඇති බැවින් ඈ හා එක්වම බස්නේය. ඉක්බිත්තෙන් ඒ මෘගපෝතිකා මෙසේ කීය. ස්වාමිපුත්‍රය. තෙපි වනාහි පර්වතයෙහි වසව ඉතා බාල යව. ගම් සමීපය නම් ශංකා ප්‍රතිභය සහිතය. අප හා සමග වනයෙන් නොබසුව නොඑවයි වැළකුව, ඒ මුවාද ඒ මෘගපෝතිකාව කෙරෙහි පිළිබඳ සිත් ඇති බැවින් නොවැළක ඈ හා සමග ගම් සමීපයට ගියේය. ඉක්බිත්තෙන් ඒ මගධරට වාසීහු දැන් මුවන් පර්වත පාදයෙන් බස්නාවෙලායයි දැන් මගසමීපයෙහි මුවාවූතැන්වල කොටුපත් බැඳගෙණ එහි සිටිනාහ. එ මුවාත් මුවදෙනත් එන්නාවූ පෙරමග එක්මුව වැද්දෙක් කොටුපතෙක සැඟවී සිටියේය. ඒ මෘගපෝතිකාවද මනුෂ්‍යගන්ධය ආඝ්‍රාණය කොට තමා හා කැටිව එන්නාවූ බාල මෘගයා ඉදිරිකොටලා තොමෝ පස්සේ එන්නීය. ඉක්බිත්තෙන් ඒ කොටුපත සිටියාවූ වැදිද එකසැරපහරින් මුවා එතතනම විද හෙළීය. මෘගපෝතිකා මුවා එතනදීම විද හෙළීය. මෘගපෝතිකා වුවා තමා කෙරහි පිළිබඳ සිත් ඇතිව එන බව දැන පැන වාත වේගයෙන් පලා ගියොය. වැදිද කොටුපතින් නික්ම තමා විදි මුවා මස්කොට ගිනි මොලවා සාලගුරු මත්තෙහි යහපත් වූ මස් බහා පුළුස්සාගෙන යැපෙන පමණක් කා පැන් බී ඉතිරි මස් ලේ බිංදු වගුරව වගුරවා කදෙක බැඳගෙන තමාගේ අඹු දරුවන් සතුටු කෙරෙමින් ගෙට ගියේය. එකල්හි මහා බෝධි සත්වයෝ ඒ වන ලැහැබ වෘක්ෂ දේවතාව උපන්හ. ඉක්බිත්තෙන් බෝධි සත්වයෝ ඒ කාරණය දැක මේ අඥාන වූ මෘගයාට පැමිණි මරණ මැනියන් නිසා පැමිණියේත් නොවෙයි. පියාණන් නිසා පැමිණියේත් නොවෙයි වැලි කෙසේ පැමිණියේද. කාමය නිසා පැමිණියේයයි කාමය නිමිත්ත කොට ගෙන සත්වයෝ සුගතියෙහි අත් පා කැපීම් ආදියටද නරකයෙහි පස් කම් කටොළු ආදී වූ අනේක ප්‍රකාර දුඃක්ඛයන්ටද පැමිණෙති. අනුන්ට මරණ දුක් ඉපදවීම නමුදු මේ ලෝකයෙහි උත්තමයන් විසින් නින්දා කරණ ලදමය යම් ජන පදයක් ස්ත්‍රියක් විධාන කෙරේද, අනුශාසනා කෙරේද ස්ත්‍රියක් නායක කොට ඇති ඒ ජනපදය නින්දිතිය. සත්වයෝ ස්ත්‍රීන් වසගත්වයට පැමිණෙද්ද ඒ සත්වයෝද නින්දිතයහයි මෙසේ නින්දිත වස්තු තුන්දෙනෙකු දක්වා වන දේවතාවුන් සාදු කාර දී ගන්ධ පුෂ්පාදීන් පූජා කෙරෙමින් සිටියදී මදුර ස්වරයෙන් ඒ වන ලැහැබ ඒක කෝලාහල කෙරෙමින් ධර්ම දේශනා කරන්නාහු බෝධි සත්වයෝ මෙසේ කීව්ය. තියුණු මුවහත් ඇති තර කොට දෙසිදුරු කොට විදින්නට සමර්ථ වූ ශරයන් ඇති පුරුෂයටද නින්දා වේ. මේ ජන පදයෙක්හි ස්ත්‍රියක් නායක කම් කෙරේද ඒසේ වූ ජනපදයටත් නින්දා වේ. යම් සත්ව කෙනෙක් ස්ත්‍රී වසඟත්වයට පැමිණියාහුද ස්ත්‍රීන් කීවාම කෙරෙද්ද ඒ සත්වයන්ටත් නින්දා වේ. යනාදීන් ධර්ම දේශනා කලාහුය. මෙසේ එන ගාථාවෙන් නින්දිත වස්තූන් 3 දෙනෙක් දක්වා බෝධි සත්වයො ඒ වනය එක නින් නාද කෙරෙමින් සර්වඥ ලීලාවෙන් ධර්ම දේශනා කලාහුය. තිලෝගුරු බුදු රජානන් වහන්සේද මේ ජාතක ධර්ම දේශනාව ගෙන හැර දක්වා චතුස් සත්‍ය ප්‍රකාශ කොට වදාල සේක. චතුස් සත්‍යයාගේ කෙලවර උකටලී මහන සෝවාන් ඵලයෙහි පිහිටියේය. සර්වඥයන් වහන්සේද වර්ථමාන කථාව හා අතීත කතාව වදාරා පූර්වාපර සන්දි ගලපා මේ කණ්ඩින ජාතකය නිමවා වදාල සේක.

එකල්හි පර්වතස්ත මෘගයානෝ නම් දැන් මේ සාසනයේ උකටලී වූ භික්ෂුහුය. එකල්හි මෘගයානන් හැර දිවු මෘගපොතිකා නන් මේ පුරාණ දූතිකාය කාමයෙහි දොස කියා ධර්ම දේශනා කල දේවතාණෝ නම් ලොව්තුරා බුදු වූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාල සේක.

SANHIDA LANKA

# වාතමිග ජාතකය

තවද එක් සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් චුල්ලපිණ්ඩපාතික තිස්ස ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක. ශාස්තෘන් වහන්සේ වනාහි රජගහ නුවර නිසා වේළුවනාරාමයෙහි වාසය කරණ කල්හි තිස්ස කුමාර නම් වූ මහා සම්පත් ඇති සිටු කුලයක පුත්‍රයෙක් ඇත්තේය. ඒ සිටු පුත්‍ර තෙම එක් දවසක් වේළුවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේගේ ධර්මදේශනාව අසා පැවිදිවනු කැමැතිව පැවිදිවීමට යාච්ඥාකොට  දෙමාපියන් විසින් නො අනු දන්නා ලද හෙයින් ප්‍රතික්ෂ්ප කරණ ලද්දේ සත්දවසක් නිරාහාරව ඉඳ රට්ඨපාල ස්ථවිරයන් මෙන්ම දෙමව්පියන් දෙන්නා අනුදන්වා සර්වඥයන් වහන්සේ සමීපයෙහි පැවිදි වූ සේක. සර්වඥයන් වහන්සේ ඕහු පැවිදි කරවා අඩ මසක් කල් වේළුවනාරාමයෙහි වාසය කොට ජේතවනාරාමයට වැඩිසේක. එතැන්හිද මේ කුලපුත්‍රයන් වහන්සේ තෙලෙස් ධූතාංගයන් සමාදන්ව සැවැත් නුවර ගෙපිළිවෙලින් පිඬු පිණිස හැසිරෙමින් කල්යවන සේක. චුල්ල පිණ්ඩපාතිකතිස්ස ස්ථවිරයන් වහන්සේ යයි කී කල්හි ආකාශයෙහි චන්ද්‍රයා මෙන් සර්වඥශාසනයෙහි ප්‍රකාශව ප්‍රසිද්ධ වූ සේක. එසමයෙහි රජගහනුවර නකත් කෙළි පවත්නා කල්හි ස්ථවිරයන් වහන්සේගේ මව්පිය දෙදෙන උන් වහන්සේ ගිහි කල්හි යම් ආභරණ භාණ්ඩයෙක් ඇද්ද ඒ ආභරණ බඩු රෙදි  කරඬුවෙක්හි බහා අභිමුඛයෙහි තබා ගෙණ අනිකුත් නැකත් කෙළිවල අපගේ පුත්‍රයා මෙනම් මෙනම් අලංකාරයෙන් සැරහී නැකත් කෙළි කෙළි වන්නේය. අපගේ ඒ එක පුත්‍රයා ගෙණ ශ්‍රමණ භවත් ගෞතමයානන් වහන්සේ සැවැත් නුවරට වැඩිසේක. අපගේ පුත්‍රයා දැන් කොතැන්හී හුන් සේක්ද කොතැන්හි සිටිසේක් දැයි කියා හඬන්නා වූය. ඉක්බිත්තෙන් එක් වර්ණදාසියක් ඒ සිටුකුලයට ගොස් හඬන්නා වූ සිටුභාර්යාව දැක ආර්යාවෙනි කවරහෙයකින් අඬන්නී දැයි විචාළීය. සිටු භාර්යාවෝ ඒ කාරණාව දැන්වූවාහුය. ආර්යාවෙනි. ස්වාමිපුත්‍රයානෝ කවර දෙයකට කැමතිවන්නා දැයි කිවුය. අසවල් අසවල් දෙයයි කීවාය. ඉදින් නුඹ වහන්සේ  මේ ගෙයි සියළු ඓශ්වර්යය මට දෙව් නම් මම  තොපගේ පුත්‍රයා ගෙණ එන්නෙමි කීවාය. සිටු භාර්යාව ඒ වචනය යහපති යැයි පිළිගෙන වැටුප් දී පිරිවරින් ඒ වර්ණදාසිය යැව්වාය. යව තමාගේ බලයෙන් මාගේ පුත්‍රයා ගෙණවයි කීවුය. ඒ වෛශ්‍යාංගනාව පිළිසන් යානාවෙක් හි ඉඳ සැවැත්නුවරට ගොස් තෙරුන් වහන්සේ භික්ෂාව පිණිස හැසිරෙන වීථියෙහි නවාතැන්ගෙණ සිටුකුලයෙන් ආ මනුශ්‍යයන් තෙරුන්වහන්සේට නොදක්වා තමාගේ පිරිවරින්ම පිරිවරණ ලද්දී පිඬු පිණිස හැසිරෙන්නා වූ තෙරුන් වහන්සේට පළමුකොට බත් සැන්දක්   පිළිගන්වා ක්‍රමයෙන් බත් මාළාවක් පිළිගන්වා තෘෂ්ණාවෙහි බැඳී අනුක්‍රමයෙන් ගෙයි වැඩ හිඳ සලස්වා ආහාරය දෙන්නී තමාගේ වසඟත්වයට පැමිණි බැව් දැන ගිලන් ආකාරය දක්වා ඇතුළු ගබඩාවෙහි ශයනය කළාය. තෙරුන් වහන්සේද භික්ෂාචාර වෙලෙහි ගෙපිළිවෙලින් හැසිරෙන සේක් ගෙයි, දොරට පැමිණි සේක. පිරිවර ජනයෝ තෙරුන් වහන්සේගේ පාත්‍රය ගෙණ තෙරුන්වහන්සේ ගෙයි වැඩ හිඳින්නට සැලැස්සුවාහුය. තෙරුන් වහන්සේ ඉඳගෙන මේ උපාසිකාව කොයිදැයි විචාළසේක. ස්වාමින් වහන්ස ගිලන් වූවාය. නුඹ වහන්සේ දක්නට කැමතියයි කිවුය. උන් වහන්සේ රස  තෘෂ්ණාවෙහි බැඳුන සේක් තමාගේ ව්‍රතසමාදානය බිඳ වෛශ්‍යාංගනාව හොත් තැනට වන්සේක. ඒ ස්ත්‍රී තමා ආ කාරණාව කියා උන් වහන්සේ පොලඹා රස තෘෂ්ණාවෙන් බැඳ සිවුරු හරවා තමාගේ වසඟයෙහි තබා යානාවේ හිඳිනට සලස්වා මහත්වූ පිරිවරින් රජගහනුවරටම ගියාය. ඒ ප්‍රවෘත්තිය හැම තැන්හිම ප්‍රකාශ වුයේය. භික්ෂුන් වහන්සේලා දම්සභා මණ්ඩපයෙහි වටින් රැස්ව හුන්නාහු ඇවැත්නි. චුල්ලපිණ්ඩපාතික තිස්ස ස්ථවිරයන් වහන්සේ වනාහි එක් වර්ණ දාසියක් රසතෘෂ්ණාවෙන් බැඳගෙන ගියාය යි කියා කථාවක් පහළ කළාහුය. සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට එළඹ අලංකෘත වූ බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ මහණෙනි මේ දම්සභා මණ්ඩපයෙහි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උන්නාහුදැයි වදාළකල්හි ඒ භික්ෂූහු ඒ ප්‍රවෘත්තිය දැන්වූවාහුය. සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහණෙනි මේ චුල්ලපිණ්ඩපාතික තිස්ස ස්ථිවරයෝ රස තෘෂ්ණාවෙන් බැඳී මේ ස්ත්‍රිය වසඟවුවෝ දැන් මතු නොවෙති. පෙරත් මේ ස්ථවිරයෝ මේ ස්ත්‍රිය වසඟවූවාහුමය යි වදාරා ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ සඤ්ජය නම් උද්‍යාන පාලයෙක් උයන රක්‍ෂා කරන්නේය. ඉක්බිත්තෙන් එක් වාත මෘගයෙක් ඒ උයනට අවුත් සඤ්ජය නම් උධ්‍යාන පාලයා දැක දිවයන්නේය. සඤ්ජය නම් උද්‍යාන පාලයා ද ඔහු තැතිගන්වා නොඑලවන්නේය. ඒ මෘගයා නැවත නැවත අවුත් උයනෙහිම හැසිරෙන්නේය. උද්‍යානපාල තෙම උයනේ නොයෙක් මල් එල ආදීය ගෙණ දවස්පතා රජහට දක්වන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් රජ්ජුරුවෝ කියනසේක් යහළු උද්‍යාන පාලය උයනේ කිසි ආශ්චර්යවත් දෙයක් දුටුවා ඇත්තෙහි නම් කියවයි කී සේක. මහරජ්ජුරුවන් වහන්ස. අනිකක් හු නොදුටුයෙමි එක් වාතමෘගයෙක් වනාහි අවුත් උයනෙහි හැසිරෙන්නේය. ඔහු දුටුමියි කියේය. ඔහු අල්වාගන්නට හැකිවන්නෙහිදැයි විචාළ සේක. මීපැණි මඳක් ලද්දේනම් මෘගයා රජු ගේ ඇතුළටම පමුණුවන්නට හැකිවන්නෙමියි කිය. රජ්ජුරුවෝ ඕ හට මී දෙව් සේක. උධ්‍යානපාලයා මී ගෙණ උයනට ගොස් වාත මෘගයා ගොදුරු කා ඇවිදිනාතන්හි තණපත්වලට මීපැණි ගිල්වා සැඟවී සිටියේය. මෘගයා අවුත් මීයෙන් ගල්වන තණ අනුභව කොට රස තෘෂ්ණාවෙහි බැඳුනේය. අන්තැනකට නොගොස් උයනටම එන්නේය.  උද්‍යානපාලතෙම ඔහු මී ගල්වන ලද තෘණයෙහි ඇළුනු බැව් දැන ක්‍රමයෙන් තමා පෙණුනේය. මෘගතෙම උද්‍යානපාලයා දැක කීපදවසක් දිවගොස් නැවත නැවත දක්නේ විශ්වාසබවට පැමිණ ක්‍රමයෙන් උද්‍යානපාලයාගේ හස්තයෙහි තිබෙන තණ අනුභව කරන්නේය. සඤ්ජයනම් උද්‍යානපාල තෙම මෘගයා විස්වාසබවට පැමිණියා දැන රාජවාසභවනට දක්වා විථිමාර්ගය හුණු පැදුරු වලින් වට කොට ඒ ඒ තන්හි කොල අතු කඩාහෙලා

SANHIDA LANKA

මී පුරණ ලද ලබු ඵලය ඇකයෙහි එල්වාගෙණ තණමිටිය කිසිල්ලේහි තබාගෙණ මී ගල්වන ලද තෘණයෙන් මෘගයාගේ අභිමුඛයෙහි විසුරුවමින් රජුගේ ඇතුලටම ගෙණ ගියේය. මෘගයා ඇතුළට වන්කල්හි දොර වැසුවාය. මෘගයා මනුෂ්‍යයින් දැක කම්පාවෙමින් මරණභයින් බියපත්වූයේ ඇතුළු රාජාංගණයෙහි ඔබිනොබ ධාවනය කරන්නේය. රජ්ජුරුවෝ මතුමහල් තලයෙන් බැස කම්පාවන්නා වූ මෘගයා දැක  වාතමෘගයා නම් මනුෂ්‍යයන් දුටු තැනට සත් දවසක් නොඑන්නේය. තැතිගත් තැනට ජීවිතාන්තතය දක්වා නොඑන්නේය. ඒ වාතමෘගයා සංජය තෙමේ රසතෘෂ්ණාවෙන් බැඳ යටත් කොට ගත්තේය. මෙබඳු ගහණ නිශ්‍රිත වූ වාතමෘග තෙම රසතෘෂ්ණාවෙහි බැඳී දූන් මෙබඳු තැනට ආයේය. ඒකාන්තයෙන් පින්වත්නි මේ ලෝකයෙහි රසතෘෂ්ණාවට වැඩියෙන් ලාමක දෙයක් නැත්තේයයි කියා ධර්මදේශනාවට පටන් ගත් සේක. නිරන්තර වාසස්ථාන වූ ආවාසයෙහිද ඡන්දාරාග ලාමකය මිත්‍රසන්ථවයෙහිද ඡන්දරාග ලාමකය. මේ දෙතැන්හි ඇල්මට වඩා මධු රාමිලදීවූ ජිව්හා විඥෙය වූ රසයෙහි ඇලීම පවිටුවන්නේය. කුමක් හෙයින්ද යත්? අරණ්‍යායෙහි ගහණ නිශ්‍රිත වූ වාතමෘගයා සංජය නම් උද්‍යාන පාලයා මධුර රසයෙන් තමාගේ වසඟයට පැමිණියේයයි කියා රස තෘෂ්ණාවෙහි ආදීනව වදාරා ඒ මෘගයා අරණ්‍යයටම යැව් සේක.

ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මහණෙනි. ඒ වර්ණදාසිය මේ මහණ රස තෘෂ්ණාවෙන් බැඳ තමා වසඟ කෙළේ දූන් මතු නොවේ. පෙරත් වසඟ කළා යයි වදාරා මේ දම් දෙසුම ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගලපා මේ වාතමික ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි සංජය නම් උද්‍යාන පාලයා නම් මේ වර්ණදාසි වූවාය. වාතමෘගයා නම් චුල්ලපිණ්ඩපාතිකස්ථවිරයෝය. බරණැස් රජව උපන්නෙම් නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජුවූ මමම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේක.

SANHIDA LANKA

# බරාදිය ජාතකය

තවද එක් සමයෙක් හි සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, එක්තරා අකීකරු භික්ෂුකෙණෙකුන් අරභයා මේ ජාතකය වදාළ සේක. ඒ භික්ෂුන් වහන්සේ වනාහි අකීකරුය අවවාදය නොගන්නා සේක. ඉක්බිත්තෙන් සර්වඥයන් වහන්සේ ඒ භික්ෂුන් වහන්සේට වදාරණ සේක් මහණ තෙපි අකීකරුව අවවාද නොගන්නේ සැබෑද කිම්දැයි. වදාළ සේක. භාග්‍යවතුන් වහන්ස සැබැවයි දැන්වූසේක. සර්වඥයන් වහන්සේ මහණ තෝ පූර්වයෙහිත් අකීකරු බැවින් ප්‍රඥාවන්තයන්ගේ අවවාද නොගෙණ මලෙහි බැඳුනේම ජීවිතක්ෂයට පැමිණියෙහියයි වදාරා ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත  නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහා බෝසතානන් වහන්සේ මෘග ජන්මයෙහි ඉපිද මෘගසමූහයා විසින් පිරිවරණ ලදුව අරණ්‍යයෙහි වසන සේක. ඉක්බිත්තෙන් බෝධිසත්වයන් වහන්සේට නැගණි වූ මෘගධෙනුවක් පුත්‍රයකු දක්වා බෑයන් වහන්ස මේ තෙම නුඹවහන්සේගේ බෑනා වන්නේය. මොහට මෘග මායම් උගන්වන සේක්වයි කියා භාරකළාය. බෝධිසත්වයන් වහන්සේ ඒ බෑණා වූ මෘග පෝතකයාට  අසවල් වේලාවෙහි අවුත් උගනුවයි කී සේක. මෘග පෝතක තෙම කියන ලද වේලෙහි නොඑන්නේය. යම්සේ එක්දවසක් එසේම සත් දවසක් සත් අවවාද ඉක්මවා ඒ මෘග පෝතකයා මාගමායම් නොඉගෙණ හැසිරෙණුයේ මලෙහි බැඳුනේය. ඒ මෘග පෝතකයාගේ මෑණී තොමෝ භ්‍රාතෘවූ මෘගයා කරා එළඹ භ්‍රාතෘන් වහන්ස කිමෙක්ද බෑණා වූ මෘගයා මුව මායම් උගන්වන ලද්දේදැයි විචාළීය. බෝධිසත්වයන් වහන්සේද ඒ අනොවාදක මෘගපෝතකයාගේ කාරණය නොසිතව තොපගේ පුත්‍රයා විසින් මුවමායම් නොඋගන්නාලදැයි කියා දූනුදු ඕහට අවවද දෙන්නට නොකැමැතිව මෙසේ කී සේක. බරාදිය නම් තැනැත්තීය එකී එකී පාදයෙහි දෙකක් දෙකක් බැගින් අටකුරයක් ඇති මුලින් වක්ව අගින් ඉතා වක්වූ අං ඇති හෙයින් වංකාතිවංක නම් වූ සප්ත අවවාද කළායෙන් ඉක්මුණු ඒ මෘගයාට අවවාද කරන්ට උත්සහ සිතක් නැත්තේම් කීසේක. ඉක්බිත්තෙන් ඒ අකීකරු මෘගයා මලෙහි බැඳුනු කල්හි වැදි පුත්‍රතෙම මරා මාංස ගෙණ ගියේය. ශාස්තෘ වූ බුදු  රජානන් වහන්සේ වදාරණ සේක් මහණ තෝ අකීකරු වූයේ දැන්මතු නොවෙයි පූර්වයෙහිත් අකීකරු වූයෙහියයි වදාරා මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගලපා මේ ජාතකය සමාප්ත කොට වදාළ සේක. එසමයෙහි බෑනා වූ මෘගයා නම් දැන් මේ අකීකරු මහණ වූයේය. නැගණිවූ මෘගධෙනු තොම උපුල්වන් මහාස්ථවරි වුවාය. අවවාද දුන් මෘගව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

SANHIDA LANKA

# තිපල්ලත්ථමිග ජාතකය

තවද තිලෝගුරු බුදු රජානන් වහන්සේ කොසඹෑ නුවර නිසා බදාරිකා රාමයෙහි වසන සේක් ශික්‍ෂාකාමී වූ රාහුල ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක. එක් සමයෙක්හි සර්වඥයන් වහන්සේ අලව් නුවර නිසා අග්ගාළව නම් දේවාලයෙහි වසන කල්හි බොහෝ උපාසිකාවරුද භික්ෂූනීහුද විහාරයට බණ අසනු පිණිස එළඹෙති, දවල් දවස බණ අසති, කල්ගිය ගියසේ උපාසිකාවරුද භික්‍ෂුණීහුද බණ ඇසීමට නොගොස් උන්හ. භික්ෂූන් වහන්සේද උපාසිකාවරුද ඒ පර්ෂිද්හි ඇතිවූහ. එතැන්පටන් රාත්‍රියෙහි බණ ඇසීම සැළසුනේය. බණ අසා අන්තයෙහි වැඩිමහළු භික්ෂූන් වහන්සේ තමන් වහන්සේ වසන්නා වූ ස්ථානවලට ගොස් සැතපෙන සේක. බාල භික්ෂූන් වහන්සේ උපාසකවරුන් හා සමඟ භෝජන ශාලාවෙහි සැතපෙන සේක. ඒ උපාසිකාවරුන් හා බාල වහන්ද නිද්‍රාවට පැමිණි කල්හි ඉන් සමහර කෙනෙක් සුරු සුරු යන අනුකරණ ඇතිව ප්‍රශ්වාස කරන්නාහුය. දත් කමින් හොනාහ. සමහර කෙණෙක් මද ඇසිල්ලක්  නිදා නැගී සිටිනාහුය. මේ විප්‍රකාර දක භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේට දැන්වූ සේක. බුදුහු යම් කිසි මහණෙක් අනුපසම්පන්නයක් හා එක සෙනස්නෙහි සහසෙය්‍යාව කෙළේ නම් පාචිත්තියාපත්ති වන්නේයයි ශික්ෂා පද පණවා කොසඹෑ නුවරටම වැඩිසේක. ඒ විහාරයෙහි භික්ෂූන් වහන්සේ ආයුෂ්මත්වූ රාහුල ස්ථවිරයන් වහන්සේට ඇවැත්වූ රාහුල ස්ථවිරයෙනි. සර්වඥයන් වහන්සේ විසින් අනුප සම්පන්නයක් හා එකසෙනස්නේ දනුවයි කී සේක. පළමුත් ඒ භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේද කෙරෙහි ගෞරවයෙන්ද ඒ ආයුෂ්මතුන් වහන්සේගේ ශික්ෂාකාමී බව නිසාද තමන්වහන්සේලා වසන්නා වූ ස්ථානයට පැමිණියා වූ ඒ රාහුල ස්ථවිරයන් වහන්සේට අතිශයින් සංග්‍රහ කරණ සේක. මිටි ඇඳක් පනවා ඉස තබන්නට සිවුරක් දෙන සේක. එදවස් වනාහි ශික්‍ෂාපද භයින් වසන්නාවූ ස්ථානයක් නුදුන් සේක. රාහුලෝත්තමයානන් වහන්සේද මාගේ පියානන් වහන්සේ යයි සර්වඥයන් වහන්සේගේද මාගේ උපාධ්‍යායන් වහන්සේයයි සැරියුත් මහතෙරුන් වහන්සේද මාගේ ආචාරීන් වහන්සේ යයි මුගලන් තෙරුන් වහන්සේගේද මාගේ සුළුපියානන් යයි අනද මහතෙරුන් වහන්සේද සමීපයට නොගොස් සර්වඥයන් වහන්සේ චලංජනය කරන්නාවු වර්චස් කුටියට බ්‍රහ්මවිහරණයකට වදනක් වූ මෙන් වැද රාත්‍රීයෙහි වාසය කළසේක. සර්වඥයන් වහන්සේ චංජනය කරන්නා වූ කුටියෙහි දොරඅගුළු මොනවට වසන ලද්දේ වෙයි. බිම සුවඳාන් පිරිබඩ ගන්නා ලද්දේය. ගන්ධ ධූම පුෂ්පදාමයෙන් එල්වන ලද්දේය. සකල රාත්‍රියෙහි පාන් ඇවිලෙන්නේය. රාහුලොත්තමයානන් විසින් ඒ කුටියෙහි මේ යථොක්ත වූ සමෘද්ධි නියාව ඒ රාත්‍රී වාසය කළ සේකුත් නොවෙයි භික්ෂූන් වහන්සේ විසින් තොප වසන්නාවූ ස්ථානයක් දනුවයි කියන හෙයින් අවවාදයෙහි ගෞරවයෙන්ද  ශික්‍ෂාකාමී බැවින්ද ඒ වර්චස් කුටියෙහි රාත්‍රි වාසය කළසේක. අතරතුරයෙහි භික්ෂූන් වහන්සේද ඒ රාහුල ස්ථවිරයන් වහන්සේ දුරදීම එන්නා දක ඔවුන් වහන්සේ වත්සම්පන්න බව පරීක්ෂා කරණ පිණිස මිටලු මුස්න හෝ කසල පෙට්ටිය හෝ පිටත දමා ඇවැත්නි, මේ කවුරුන් විසින් දමන ලද්දේදැයි කියන්නාහ. කිසිකෙණෙකුන් විසින් රාහුල ස්ථවිරයෝ මේ මගින් ගියෝ දැයි කී කල්හි ස්වාමීනි මේ මම නොදනිමි නොකියා ඒ නොතැන්පත්ව තිබූ මුස්න හා කසල පෙට්ටිය තැන්පත් කොට තබා මට ක්‍ෂමා කොට වදාළ මැනව ස්වාමීනියි භික්ෂූන් වහන්සේ තමන් වහන්සේගේ ශික්ෂාකාමී බව නිසා ඒ වර්චස් කුටියෙහි රාත්‍රිය වාසය කළසේක. ඉක්බිත්තෙන් බුදුරජානන් වහන්සේ අරුණු නැගෙන්නට පෙරාතුව වර්චස් කුටි වාරයෙහි වැඩසිට කැරූසේක. ඒ රාහුල ස්ථවිරයන් වහන්සේද ඇතුලේ ඉඳ කැරූ සේක. මේ කවරෙක් දැයි බුදුහු විචාල සේක. මම රාහුල යයි ගෙන් මෑත්ව වැඩිසේක. රාහුලය කවර  හෙයිකින් තෝ මෙතන වැදහොත්තේහිදැයි විචාළසේකී. ලගිනාතෙනක් නැතිහෙයින් නැයි කියා ස්වාමීනි. භික්ෂූන් වහන්සේ පළමු මා ආ කල්හි සංග්‍රහ කරණ සේක්. දැන් තමන්වහන්සේට ආපත්ති වෙයි යන භයින් වසන තැන් නොදෙන සේක. ඒ මම මේ ස්ථානය අනික් කෙනෙකුන් විසින් සට්ටනය නොකරන්නාවූ ස්ථානයක් වේදැයි මේ කාරණයෙන් මෙතැන සැතපීනිමි යි දැන්වූ සේක. ඉක්බිත්තෙන් භික්ෂූහු දම්ම රාහුලයා හරණ වූ සෙසු කුලදරුවන් වහණ කරවා කුමක් කෙරෙත්දැයි කියා සර්වඥයන් වහන්සේට ධර්මසංවේග උපන්න්යි ඉක්බිත්තෙන් උදෑසනක්සේම භික්ෂූන් වහන්සේ රැස් කරවා දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ අතින් ශාරිතපුත්‍ර ස්ථිවිරයයෙනි අද රාහුලයා කොතැනක ලැග්ගේද තෙපි දනුදැයි විචාරා වදාළසේක. ස්වාමීනි මම නොදනිමි දැන්වූසේක. ශාරිපුත්‍ර ස්ථවිරයෙනි අද රාහුලයා වර්චස් කුටියෙහි ලැග්ගේය.. මෙපරිද්දෙන් රාහුලයා හරණ වූ තෙපි හැම සෙසු කුලදරුවන් මහණ කරවා කුමක් කරව්ද මෙසේ  කළ කල්හි මේ බුද්ධශාසනයෙහි ප්‍රවෘජිතයෝ පිහිටක් නොලබන්නාවු වේදැයි ධර්මසංවේගයට පැමිණ මෙතැන්පටන් කොට අනුපසමපන්නයක්වූ එක්ව දෙදවසක් තමා සමීපයෙහි වස්වා තුන්වැනි දවස් ඔවුන් වසන තෙනක් දැන පිටත වස්වයි කියා මේ අනුප්‍රඥප්තිය වදාරා නැවත ශික්ෂාපද පැනවූසේකී. එකල්හි දම්සභා මණ්ඩපයෙහි වැඩහුන් රාහුල ස්ථවිරයන් වහන්සේගේ ගුණ කථා කියනසේක් ඇවැත්නි බලව රාහුල ස්ථවිරයෝ යම්තාක් ශික්‍ෂාකාමිහුය. ඒ භික්ෂූන් විසින් තොප වසන තෙනක් දනුවයි කියන ලද්දාහ. මම සර්වඥයෙමි තෙපි හැම මේ සස්නට කවුරු දැයි තෙපිම නික්මෙවයි කියා එකද සච්චක්හූ හාත් පිළිසඳරයක් නොකොට වර්චස් කුටියෙහි වාසය කළෝ දැයි කියා ඒ භික්ෂූන් වහන්සේ කථා කරණ කල්හි සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ සරහන ලද බුද්ධාසන මස්තකයෙහි වැඩ හිඳ මහණෙනි, දැන් මා එන්නට පූර්වභාගයෙහි කවර නම් කථාවකින් යුක්තව උනුදැයි විචාළසේක. ස්වාමීනි රාහුල ස්ථවිරයන්ගේ ශික්‍ෂාකාමී බව කතාකොට කොට උනුම්හයි. දැන්වූ කල්හි සර්වඥයන් වහන්සේ ද මහණෙනි රාහුල ස්ථවිරයෝ දැන් මතු ශික්ෂාකාමී නොවෙති. පූර්වයෙහිත් තිරශ්චින යෝනියෙහි උපන්නෝද ශික්ෂා කාමීව විසුවෝ වේදැයි වදාරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළ සේක.

SANHIDA LANKA

යටගිය දවස රජගහ නුවර එක් මගධ රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කෙරෙති. එකල්හි මහාබෝසතාණෝ මෘග යෝනියෙක්හි ඉපිද මෘග සමූහයා විසින් පිරිවරණ ලදුව වනයෙහි වාසය කරන්නාහ. ඉක්බිත්තෙන් ඒ බෝධි සත්වයන්ගේ නැගණියෝ තමන්ගේ පුතනුවන් එතනට කැඳවාගෙණ අවුත් බෑයන් වහන්ස නුඹවහන්සේගේ බෑණනුවන්ට මෘග මායම් ඉගැන්නුව මැන වැයි කිවුය. මහාබෝධිසත්වයෝ යහපතැයි නැගණියන්ට ප්‍රතිවචනාදී යවා දරුව අසවල් වේලේ ඇවිත් උගනුවයි කීහ. ඒ මෘග පෝතකයාද මයිලනුවන් විසින් නියමකොට කී වෙලා නොයික්මවා බෝධිසත්වයන් කරා එලඹ මෘග මායම් උගන්නේය. මෘගපෝතකයාද එක් දවසක් වනයෙහි ඇවිදිනේ මලෙක් හී බැඳුනේ තමා බැඳුනු නියාව කියා ඇඬුයේය. මෘගසමූහයාද පලාගොස් තොපගේ පුතනුවෝ මලෙක බැදූනෝ යයි ඒ මුවපැටවාගේ මෑනියන්ට කීහ. ඒ මෘගධෙනුවද බෑයන් සමීපයට ගොස් බෑයන් වහන්ස නුඹ වහන්සේගේ බැනණුවෝ මෘග මායම් උගත්තුදැයි විචාළිය. මහ බෝසතාණෝද තොපගේ පුතනුවන්ට කිසි සැකයක් තොපි නොකරවයි ඔහු විසින් යහපත් කොට මෘගමායම් උගන්නාලදැයි කිසිත් පීඩාවක් නැත. තොප සතුටු කර මින් දන් එති කියන්නාවූ බෝධිසත්වයෝ මෙසේ කීවාහුය. එම්බා පින්වත තෘණ භක්ෂණයකොට සෙයාාව කරන්නාවු අටකුහරයකින් යුක්තවූ මධ්‍යම රාත්‍රි වෙලෙහි පැන් බොන සුලුවූ මට බෑණාවූ මෘගපෝතකයාණන් නොයෙක් මෘග මායම් ඉගැන්විමි. එසේ හෙයින් නාසාවතයකින් සුලං රඳවා භූමියෙහි වැදහෙව ආස්වාසය කෙරෙමින් කලා සයකින් යුක්තවූ මෘග මායමින් වැද්දහු වඤ්චාකොට තොපගේ පුත්‍රයානෝ තොප සතුටු කෙරෙමින් නොබෝ කලකින් එන්නාහයි ඒ බෝධිසත්වයෝ කිවාහුය. මෙසේ මහබෝධිසත්වයෝ තමන්ගේ බෑනණුවන්ට මෘගමායම් යහපත් කොට ඉගැන්වූ බව දක්වන්නාහු නැගනියන්ට ශෝක නොකරවයි අස්වැසූහ. ඒ මුව පැටවාද මල බැඳුනු තැනැත්තෝ නොසෙල්විම භූමියෙහි හෙව ඉල ඇට පෙණෙන නියායෙන් කකුල් දික්කොට එක ඇලයකින් වැදහොත් තෙනට ආසන්නයෙහි කුර අගින් ගසා පස්ද තණද උපුල්වා මලමුත්‍ර පිටත් කොට ඉස එල්ලා දිව දික්කොට සකල ශරීරය කෙළින් කිළිටුකොට සුලන් ගැන්වීමෙන් බඩ උදුම්වාගෙණ ඇස පෙරලාගෙණ යටවූ නාසාපුටයෙන් වාතය සංවරණය කෙරෙමින් මතු නාසාපුටයෙන් පිටත නික්මෙන්නාවූ වාතය රඳවා සියලු ශරීරයෙහි තදබව ගන්වා මළා වූ ආකාරය දැක්වුයේය. නිලමැස්සෝද ඔහු වටකොටගත්හ. ඒ ඒ ස්ථානයෙහි කපුටෝත් සැඟවි උන්හ. මේ නියායෙන් වැදහොත්තෙනට මල ලූ වැදි අවුත් මුවාගේ බඩ අත ගසා උදෑසනම බැඳූනේ වන කුණුව ගියේ යයි ඌ බැඳූනු වරපට මුදා මෙතනදීම මොහු මස් කොට ගෙණ යෙමි සැකයක් නැතිව කොළ අතු කඩන්ට පටන් ගත, මුවපැටවාද වැදහොත් තැනින් නැගී සතරපයින් ශරීරයේ සිට කිළිපොළා කර දික්කොට මගවාතයෙන් සිඳුනාවූ වලාකඩක් මෙන් යුහුව දුවගෙණ ගොස් මෑණියන් සමීපයට ගියේය. සර්වඥයන් වහන්සේද මහණෙනි, රාහුලයා දැන් මතු ශික්ෂාකාමී නොවෙයි, පූර්වයෙහිත් ශික්ෂා කාමී යයි වදාරා මේ ජතක ධර්මදේශනාව ගෙණ හැර දක්වා සන්ධි ගළපා තිප්පල්ලත්ථිමිග ජාතකය නිමවා වාදළසේකි.

එකල්හි බෑණාවූ මුව පැටියානෝ නම් දැන් රාහුල ස්ථවිරයෝය, ඒ මුව පැටියානන්ගේ මෑණියෝ නම් උපුල්වන් මහාස්ථිවරීය, මුවපැටියානන්ට මයිල්වූ මුවාණෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම යයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මතකභක්ත ජාතකය

තවද එක් සමයෙක්හි බුදුරජානන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවනාරාමයෙහි වැඩවසනසේක් මතකභක්තයක් අරභයා මේ ජාතකය වදාළ සේක. එකල්හි මනුෂ්‍යයෝ එළුවන් ආදීවූ බොහෝ සත්වයන් මරා කාලක්‍රියා කළාවූ තමන්ගේ නෑයන් උදෙසා මතකභක්ත නම් වූ පරිත්‍යාගයක් කෙරෙති. භික්ෂූහු ඒ මනුශ්‍යයන් මෙපරිද්දෙන් කරන්නාවුන් දැක සර්වඥයන් වහන්සේ අතින් ස්වාමීනි. දැන් මනුෂ්‍යයෝ බොහෝ ප්‍රාණීන් ජීවිතක්ෂයට පමුණුවා මතකභක්ත නම් වූ දෙයක් දෙති, ස්වාමීනි මෙහි වැඩෙක් ඇද්දැයි විචාළසේකී. සර්වඥයන් වහන්සේ මහණෙනි. මතකභක්ත දෙම්හයි කියා කරණ ලද ප්‍රාණඝාතයෙහි කිසිත් වැඩෙක් නම් නැත. පෙරත් නුවනැත්තෝ ආකශයෙහි හිඳ ධර්මදේශනා කොට මේ මතකභක්තයෙහි ආදීනව කියා සියළු ජම්බුද්වීපවාසී සත්වයන් මේ ක්‍රියාවෙන් ඇරවූහ. දැන් වනාහී භවසංෂේපගත හෙයින් නැවත පහළවියයි වදාරා අතීත කථාව ගෙණහැර දැක්වූ සේකී.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි වෙදත්‍රයයාගේ පාරප්‍රාප්ත වූ දිසා ප්‍රධානව එක් ආචාර්ය බ්‍රාහ්මණයෙක් මතකභක්තයක් දෙමැයි එක් එළුවකු අල්වා ගෙණ තමාගේ අතවැස්සන්ට  සගයෙනි. මේ එළුවා ගඟට ගෙණ ගොස් නාවා කර මල්වඩම් බැඳ පසඟුල්දී සරහා ගෙණ්වයි විධාන කෙළේය. ඒ මනුෂ්‍යයෝද යහපතැයි බමුණාට ප්‍රතිඥා දී එළුවා ඇරගෙණ ගඟට ගොස් නාවා කී සැටියේ සරහා ගංතෙර සිටවූහ. ඒ එළු තමා පූර්යෙහි කරණ  ලද අකුශල කර්මය ජාතිස්මරණඥානයෙන් දැක මෙබඳු වූ දුක්ඛයෙන් අද දවස් මිදෙයි සොම්නසට පැමිණියේ කළයක් බිඳින කලක් පරිද්දෙන් මහත්කොට සිනාසී නැවත මේ බමුණා මා මරා මා විසින් මෙතෙක් කල් මුලුල්ලෙහි විඳිදුක් ලබන්නේයයි බමුණා මා මරා මා විසින් මෙතෙක් කල් මුලුල්ලෙහි විඳිදුක් ලබන්නේයයි බමුණා කෙරෙහි කරුණා උපදවා මහතුවූ ශබ්දයෙන් හැඬුයේය. ඉක්බිත්තෙන් ඒ තරුණ පුරුෂයෝ ඔහු අතින් සබඳ එළුවානෙනි. තොපි මහත්කොට සිනාසී ඇඬුවාහුය. කවර කාරණයකින් සිනා සුනද කවර කාරණයකින් ඇඬුවාහුදැයි විචාළාහුය. තෙපි ඇම මේ කාරණය තොපගේ ආචාරීන් සමීපයෙහි දී මා අතින් විචාරවයි කියේය. මනුෂ්‍යයෝ ඒ එළුවා ඇරගෙණ ගොස් මේ කාරණය ආචාර්යය බ්‍රාහ්මණයාහට කීහ. ඒ ආචාර්යයාද මනුෂ්‍යයන් කී බස් අසා එළුවා අතින්  එළුවානෙනි. තෙපි කවර කාරණයකින් සිනාසුනු ද කවර කාරණයකින් හැඬුයේදැයි විචාළයි ඒ එළුවාද තමා පූර්වයෙහි කළ අකුශල කර්මය ජාතිස්මරණඥාණයෙන් සිහිකොට බමුණාට කීහ. බ්‍රාහ්මණයානෙනි. මම පූර්වයෙහි තොපසේම වෙදත්‍රය හදාළ වූ බමුණුව ඉපිද මතකභක්තයක් දෙමියි එළුවකු මරා දිනිමි හේ මම ඒ එළුවා මැරූ අකුශල කර්මයෙන් එකකින් උනු පන්සියයක් ජාතියෙහි ඉස්කැපිම, දුක්ඛයට පැමිණියෙමි. මේ තෙම මට කොටිප්‍රාප්තිය වූ පිරුණු ජන්සියයක් ජාති ඇති ආත්මභාවය හේ මට අද දවස් මෙබඳු වූ දුක්ඛයෙන් මිදෙමියි සොම්නසට පැමිණියෙමි.මේ කාරණයයෙන් සිනාසෙමි. අඬන්නෙම් වනාහි මම එළුවකු මරා ජාති පන්සියයක් මුළුල්ලෙහි ඉස් කැපීම් දුක්ඛයට පැමිණ අද ඒ දුක්ණයෙන් මිදෙමි. මේ බමුණා ද මා මරා මා සේම පන්සියයක් ජාතියෙහි ඉසකැපීම දුක්ඛය ලබන්නේ යයි තොප කෙරෙහි කරුණාවෙන් ඇඬීමි. කීය. එළුවානෙනි. නොබව මම තොප නොමරමියි කිය. බමුණානෙනි කුමක් කියච්ද තොප නොමැරුවත් මා විසින් අද මරණින් මිදෙන්ට නොපිළිවනැයි කීය. එළුවානෙනි. තෙපි නොබව මම තොපට රැකවල් ගෙණ තොප හා සමග ඇවිදිමියි කිය. බමුණානෙනි තොපගේ ආරක්ෂාව ඉතා ස්වල්පය මා විසින් අද මරණින් මිදෙන්නට නොපිළිවනැයි කීය. බමුණානෙනි තොපගේ ආරක්ෂාව ඉතා ස්වල්පය මා විසින් කරණ ලද අකුශල කර්මය මහත බලවතැයි කීය. බමුණෝ එළුවානන් මුදා මේ එළුවා කවර කෙනෙකුන් විසිනුත් මැරිය නොදෙම්හයි කියා තමාගේ අතවැස්සන් ඇරගෙණ ගොස් බමුණානෝ එළුවානන් හා එක්වම ඇවිදිනාහ. එළුවා බැම්මෙන් හරණ ලද්දේ එක් ගලතලයක් පිට අටගත් තන කැලයෙක්හි කර ඔසවා කොල කන්ටයයි පටන්ගත්තේය. එකෙනෙහිම ගලතලපිට සෙනක් ගැසීය.  ඉන් ගල්ලැල්ලෙක් ඉපිරගෙණ ගොස් එළුවා දික්කලා වූ  ශ්‍රීවයෙහි හී හිස කැපුනේය. ඉක්බිත්තෙන් මහජනයාද එතනට රැස්විය. එකල්හි මහබෝධිසත්වයෝ ඒ ස්ථානයෙහි වෘක්ෂ දේවතාව උපන්හ. ඒ බෝධිසත්වයෝ ද මහා ජනවා බල බලා සිටියදීම දේවතානුභාවයෙන් නිරාලම්බ වූ ආකාශයෙහි ඌරුබද්ධාසනයෙන් උපලක්ෂිතව හිඳ මේ සත්වයෝ මෙපරිද්දෙන් අකුශල යෙහි විපාක දැන ප්‍රාණඝාත නොකොළෝ නම් යෙහෙකැයි මියරුවූ කටහඬින් යුක්තව ධර්මදේශනා කරන්නාහු  මෙසේ කියත්, ඒ ඒ භවයෙහි සත්වයාගේ උත්පත්තියත් ජරා ව්‍යාධි මරණ පැමිණීමත් දුක් වන්නේ යයි මෙසේ ලෝකයෙහි සත්වයෝ දන්නාහුවීනම් සත්වයෝ සත්වයකු නොමරන්නේය. ප්‍රාණඝාත කළා වූ පුද්ගලයා වනාහි අටමහනරකයෙහිත් සොළොස් ඔසුපත් නරකයෙහිත් අනෙකප්‍රකාර වූ තිරිසන් යෝනියෙහිත් ඉපිද මහදුක් අනුභව කෙරෙමින් බොහෝ කලක් සෝක කරන්නේය. මොහයෙන් මුළු වූ සත්වයෝ අවිජ්ජාවෙන් අන්ධව මේ ආදීනව නොදැක ප්‍රාණඝාත කරන්නාහු යයි මෙසේ මහබෝසතානෝ නරක භයින් තැතිගන්වා ධර්මදේශනා කළෝය. මනුෂ්‍යයෝ ධර්මදේශනාව අසා නරක භයින් භයපත්ව ප්‍රාණඝාතයෙන් වැලැක්කාහුය. බෝධිසත්වයෝත් ධර්මදේශනා කොට මහජනයා ශිලයෙහි පිහිටුවා කම්වූ පරිද්දෙන් මියපරලොව ගියෝය. මහජනයාත් බෝධිසත්වයන්ගේ අවවාදයෙහි පිහිටා දානාදී පින්කම් කොට දිව්‍යලෝකයෙහි උපන්නාහුය. ශාස්තෲවූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ මතකභක්ත ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි වෘක්ෂ දේවතාව ඉපිද ධර්මදේශනා කෙළෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# නලපාන ජාතකය

තවද එක්සමයෙක් හි දෙව්බඹුන් මුදුනෙහි කෙළනා පාපියුම් ඇති ලෝකස්වාමී වූ සර්වඥයන් වහන්සේ කොසොල්දනව්වෙහි සැරිසරා ඇවිදිනා සේක් නලපාන නම් ගමට පැමිණ නලපාන නම් පොකුණ සමීපයෙහි වූ වැටකේ වනයෙහි වසනසේක් බටදඬු අරභයා මේ ජාතකය වදාළසේක. එසමයෙහි භික්ෂූන් වහන්සේ නලපාන නම් පොකුණෙන් පැන් සනහා ඉදිකටු කුළා නිසා සාමණේරයන් වහන්සේ ලවා බටදඬු කප්පවා ගෙන්වා ගෙණ ඒ සියළු බටදඬු ගැට නැතිව එකච්ජිද්‍රව දිගටම සිදුරු නියාව දැක බුදුන් කරා ගොස් ස්වාමීනි අපි ඉදිකටු කුළා නිසා බටදඬු ගෙන්වුම්හ. ඒ පිළිබඳ මුල පටන් අග දක්වා සිදුරුය. මේ කිමෙක්දැයි විචාළෝය. සර්වඥයන් වහන්සේ එබස් අසා මහණෙනි. මේ මාගේ පුරාතනයෙහි අධිෂ්ඨානයෙකැයි වදාරා ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස ඒ වනලැහැබ වල්වූයේය. ඒ පොකුණෙහිත් එක් දිය රකුසෙක් පොකුණට බට මිනිසුන් කන්නේය. එසමයෙහි බෝධිසත්වයෝත් තිත්මුවකු හා මහතැති වඳුරු රජව අසූදහසක් පමණ වඳුරන් විසින් පිරිවරණ ලදුව වඳුරුමුල පරිහරණය කෙරෙමින් ඒ වනයෙහි වසන්නාහුය. ඒ මහාබෝසතානෝ වානර සමූහයාට අවවාද දෙන්නාහු දරුවෙනි මේ වන යෙහි විෂවෘක්ෂයෝත් අමනුෂ්‍යාධිගෘහිතවූ පුෂ්පකරණීහුත් වෙති. එසේ හෙයින් තොපි හැම නොකෑවිරූ ඵලා ඵලයන් කතොත් වේවායි නුපූවිරූ පැනක් බොතොත් වේවායි මා විචාරාම කව බොවයි විධානය කළෝය. ඒ වානරයොත් එබස් යහපතැයි පිළිගෙණ එක් දවසක් පෙර නොගියවිරූ තැනකට ගොස් එතැන්හි දහවල් දෙවරු ඇවිද පැන් සොයන්නාහු එක් පොකුණක් දැක පැන් නොබීම බෝධිසත්වයන්ගේ ඊම බල බලා උන්නාහුය. එකල්හි බෝධිසත්වයෝ අවුත් කිමෙක්ද දරුවෙනි. පැන් නොබෙව්වදැයි කිවුය. වානරයෝ කියන්නාහු නුඹ වහන්සේ එනතෙක් බලාඋනුම්හයි සිසාරා ඇවිද පියවර පරීක්ෂා කරන්නාහු දියටබට පියවර මදක දියෙන් ගොඩ නැගී පියවර නොදැක ඒ කාන්තයෙන් මේ අමුනුෂ්‍යපරිගෘහිත වූ පොකුණක් වුවමැනවැයි දැන් පැන් නොබී උන්නාවූ තොප විසින් කෙළද ඉතා යහපත් වන්නේය. මේ අමුනුෂ්‍යධිගෘහිත පොකුණෙකැයි කිවුය. උදාකරාක්ෂසයාද ඒ වඳුරන් දියට නොබස්නවුන් දැක නිල්වූ බඩ හා ධවල වූ මුක ඇතිව රත්වූ අතුල්පත් පතුල්තල ඇතිව භයංකර වේශයෙන් දිය දෙබැකොට නික්ම කුමක්නිසා උනුද පොකුණට බැස පැන් බොවයි කීය. එකල මහබෝසතානෝ ඕහට කියන්නෝ මේ පොකුණෙහි උපන් උදක රාක්‍ෂයා නම් තෝදැයි විචාලෝය. එසේය මම යයි කී කල්හි පොකුණට බටවුන් කන්නට ලැබෙන්නේදැයි කිවුය. එසේය ලබම් මම මීට  බට යටත් පිරිසෙයින් පක්ෂීන් පටන් කිසිකෙණෙකුන් නොහරිමි. තොපි ඇමදෙනාත් කන්නෙමි වේදැයි දියරකුසු කීය. ඒ බස් ඇසූ බෝධිසත්වයෝ අපි තොප විසින් අප හැම දෙනා කෑනොදෙම්හයි කිවුය. එසේකළ පැනුත් බොන්නෙව්වේදැයි දියරකුසු කීය. එසේය පැනුත් බොම්හ තොප වසඟයටත් නොපැමිණෙම්හයි කීවුය. එසේකළ කෙසේ පැන් බොව්දැයි උදක රාක්ෂයා කීකල්හි කිමෙක්ද තෝ බැස පැන්බොතියි සිතන්නෙහිද බෝධිසත්වයෝ කියා අපි අම අසූදහසක් පමණ වඳුරෝ පොකුණට නොබැසම එකෙක් බටදණ්ඩක් ගෙණ ඇඹුල ඇඹුල දණ්ඩන් පැන්බොන්නවුන් මෙන් තාගේ පොකුණෙන් පැන් බොම්හ. එසේ කල්හි තොපි අප ඇමදෙනා කන්ට අසමර්ථ වන්නෙහි වේදැයි කිවුය. මෙසේ කියා මහබෝසතාණෝ එක් බට දණ්ඩක් ගෙන්වා හැරගෙණ පාරමි ධර්මයෙන්  ආවර්ජිනා කෙරෙමින් සත්‍යක් ක්‍රියා කොට මුඛයෙන් පිඹපූහ. බටදණ්ඩ ඇතුළෙන් කිසිම ගැටයක් නැතිව මුල සිට අග දක්වා හැම තැනම සිදුරු විය. මෙම ක්‍රමයෙන් අනිකුත් අනිකුත් බට දඬු ගෙන්වා පිඹ දුන්නේය. තවද මෙසේ කල්හි පිඹ නිමවන්නට නොපිළිවන් යයි කියා බෝධිසත්වයෝ මේ පොකුණ වටකොට අටගත් සියලු බෙ දඬු එකචජිද්‍රවේවායි කියා අධිෂ්ඨාන කළෝය. බෝධිසත්වවරයාගේ කුසල් මහත් බැවින් සිතූ දෙය සමෘද්ධ වන්නේය. එසේහෙයින් එතැන්පටන් ඒ පොකුණ වටකොට සිටි සියළුම බටදඬු ඒකච්ජිද්‍රවිය. එකරන්ධ්‍රවිය. මේ කාලපයෙහි කල්පස්ථායික වූ ප්‍රාතිහාර්යය සතරෙක් වන්නේය. ඒ සතර කවරේද යත්. චන්ද්‍රයාගේ ශශලාඤ්ජන මේ කල්පය මුලුල්ලෙහි සිටිනේය. වට්ටක ජාතකයෙහි ගිනි නිවි ගියතැන් මේ කප මුලුල්ලෙහි ගින්නෙන් නොදවන්නේය. ඝටිකාර නම් කුම්භාකාරයාගේ ගේ පිහිටි තැන් සියලු මේ කප නොතෙම  තිබෙන්නේය. මේ පොකුණ පිරිවරා සිටි සියලු බටදඬු මේ කප මුලුල්ලෙහි එකරන්ධ්‍රව තිබෙන්නේයැයි මෙසේ කල්පස්ථායි වූ ප්‍රාතිහාර්ය සතරක් වන්නේය. බෝධි සත්වයෝ මෙසේ අධිෂ්ඨාන කොට එක බට දණ්ඩක් ගෙණ උන්නාහුය. ඒ අසූදහසක් පමණ වානරයෝත් එකී එකී බට දණ්ඩක් ගෙණ පොකුණ පිරි වරා උන්නාහුය. ඔහු ඇමදෙනෙක් බෝධිසත්වයන් බට දණ්ඩෙන් උරා පැන් බොන්ට ගත් කල්හි හැමදෙනාම ගොඩහිඳ බට දණ්ඩෙන් උරා පැන් පුවාහුය. මෙසේ ඔවුන්  ඇම දෙනාම පැන් පු කල්හි උදක රාක්‍ෂසයා කිසිවක් නොලැබ නොසතුටුව සිත් ඇතිව තමා වසන්නාවූ ස්ථානයටම ගියේය. බෝධිසත්වයෝත් සහපිරිවරින් වලටම වන්නාහුය. ශාස්තෘන් වූ සම්‍යක් සම්බුදු රජානන් වහන්සේ මහනෙනි මේ බට දඬු සිදුරුවීම මාගේම පුරාතන අධිෂ්ඨානයෙකැයි මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ නළපාන ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි උදක රාක්‍ෂසයා නම් දැන් මේ දේවදත්ත ස්ථවිරයෝය. අසූදහසක් වානරයෝ නම් දැන් මේ බුදු පිරිස්ය. උපායෙහි දක්ෂ වූ වානර රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මමම වේදැයි තමන් වහන්සේ  දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# කුක්කුර ජාතකය

තවද එක් සමයෙක්හි නිවණට දොරහළුවවූ තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් නැයන්ට වැඩෙහි හැසීරිමක් අරභයා මේ ජාතකය වදාළ සේක. ඒ ඥාත්‍යර්ථචර්යාව ද්වාදසනිපාත යෙහි භද්‍රශාලා ජාතකයෙහි මතු පළවෙන්නේය. වර්ථමාන කථාව පිහිටුවා ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ කල්හි බෝධිසත්වයෝ එබඳු අකුශල  කර්මයක් නිසා බලු යෝනියෙහි ඉපද  නොයෙක් සියදහස්ගණන් බල්ලන් විසින් පිරිවරණලදුව මහ සොහොනෙහි වෙසෙති. ඉක්බිත්තෙන් එක්දවසක් රජ්ජුරුවෝ ඇළි අසුන් යෙදූ සියලු රථාලංකාරයෙන් සරහන ලද රථයකට පැනනැගී උයනට ගොස් එහි දිවාභාගය මුලුල්ලෙහි කෙළ ඉරු අස්තයට ගියකල්හි නුවරට වන්නාහුය. රජ්ජුරුවන්ගේ රථය සැදුවනම රාජංගණයෙහි තිබුනේය. රාත්‍රියෙහි වැසියන්ට පටන්ගත්කල්හි ඒ රථයේ සැදු සම් හා වරපට තෙමී මොලොක්ව ගියේය. ප්‍රාසාදයේ මතුමහලින් කිණබල්ලෝ බැස ඒ රථයේ සම් හා වර පට කෑවාහුය. දෙවැනි දවස්  රජ්ජුරුවන්ට කියන්නෝ දේවයන්වහන්ස සොරොව්වෙන් බල්ලෝ ඇතුළට වැද රථයෙහි සම් හා වරපට කෑවාහුය යි කීවූය. එබස් ඇසු රජ්ජුරුවෝ බල්ලන්ට කිපී දුටු තැනදීම බල්ලන් මරවයි විධාන කළෝය. එතැන්පටන් බල්ලන්ට මහත්වූ ව්‍යසන උපන්නේය. ඔහු දුටු දුටු තැනම මරණහෙයින් භයින් සොහොනට ගොස් බෝධිසත්වයන් සමීපයට වන්නාහුය. බෝධිසත්වයෝ ඔවුන් දැක රැස්වූ නියාව බෝහෝය. මීට කාරණ කිම්දැයි විචාලෝය. ඔහු කියන්නෝ අන්තඃපුරයෙහි රජ්ජුරුවන් වහන්සේගේ රථයේ සම් හා වර මදු බල්ලන් විසින් කනලදැයි කිපියාවූ රජ්ජුරුවන් වහන්සේ බල්ලන් මරන්නට විධාන කළසේක. බොහෝ බල්ලෝ නසිති මහත් වූ භය උපනැයි කිවුය. එබස් ඇසූ බෝධිසත්වයෝ සිතන්නෝ රැකවල් ඇතිව තිබෙන තැන හෙයින් පිටත බල්ලන්ට වදින්ට අවසර නැත්තේය. ඇතුළු රජුගේ කීනබල්ලන්ගේම මේ ක්‍රියාවක් වන්නේයයි දැන් වූකලී සෙරුන්ට කිසිභයෙක් නැත්තේය. නිසොරුව සිටියෝ මරණයට පැමිණෙති. මම රජ්ජුරුවන් වහන්සේට සොරුන් දක්වා ඥාතිසමූහයාට ජීවිතදානය දුන්නේ වී නම් යහපත් වන්නේය යි ඒ මහා බෝසතානෝ නෑයන් අස්වසා තෙපි හැම දෙන නොබව මම තොපට දිවි ඇරදෙම් යම්තාක් රජ්ජුරුවන් දකින්නෙම්ද ඒ තාක් තෙපි මෙහි වසවයි කියා පාරමීධර්මයන් ආවර්ජනා කොට සලකා මෛත්‍රී භාවනා පෙරදැරි කොට මා ඇඟට කැටයක්වත් මුගුරක්වත් ගසන්ට කිසිවෙකුත් උත්සාහ නොකෙරේවායි ඉටාගෙණ තනිවම ඇතුළුනුවරට වන්නාහුය. ඉක්බිත්තෙන් ඔවුන් දැක එක සත්වයෙකුත් කිපී බැළු එකෙක්නම් නැත්තේය. රජ්ජුරුවෝ සුනඛවධය නියෝගකොට තුමූ විනිශ්චමණ්ඩලයෙහි උන්නාහුය. බෝධිසත්වයෝ රජ්ජුරුවන් උන්නාවූ ස්ථානයටම ගොස් වැද රජ්ජුරුවන්ගේ සිංහාසනය යටට වන්නාහුය. එකල්හී බෝධිසත්වයන් රාජ පුරුෂයෝ සිංහාසනය යටින් ඇද එළියේ ලන්ට පටන්ගත්තාහු ඒ දැක රජ්ජුරුවෝ වැලකූහ. මහාබෝසතානෝ මදක් සැතපී සිංහාසනය යටින් මෑත්ව රජ්ජුරුවන් වැඳ නුඹ වහන්සේ බල්ලන් මරණසේකැයි විචාළෝය. එසේය මමයයි කී කල්හි බල්ලන්ගේ අපරාධය කවරේදැයි රජ්ජුරුවන් වහන්සේයැයි කීවුය. මාගේ රථයේ සැදු සම් හා වරමදු කෑවාහුයයි කී කල්හි යම් කෙනෙක් කෑවුනම් ඔවුන් දන්නසේක්දැයි විචාළෝය. දිනාදනුම්හයි සම් කෑ සොරු මොහුයයි තත්වූහෙයින් නොදනම් දුටු දුටුතැන මේ මැරීම යහපත් ද රජ්ජුරුවන් වහන්සැයි කිවුය. රථයෙහි සම් බල්ලන් කෑ හෙයින් දුටු දුටු තැනදී හැම බල්ලන්ම මරවයි සුනඛවධය නියෝග කෙළෙමියි කිවුය. එබස් ඇසූ බෝධිසත්වයෝ කිමෙක්ද නුඹ වහන්සේගේ මනුෂ්‍යයෝ බල්ලන් ඇමම මරද්ද නොහොත්  මරණු නොබලන්නෝත් ඇද්දැයි විචාළෝය. මරණු නොලබන්නෝත් ඇත. අපගේ ගෙයි කීණ බල්ලෝ මරණු නොලබති කිවුය. එබස් ඇසු මහබෝසතානෝ කියන්නෝ මහරජ්ජුරුවන් වහන්ස දැන්ම නුඹවහන්සේගේ රිය සම් බල්ලන් කෑ හෙයින්  දුටු දුටුවන් ඇමම මරවයි සුනඛ වධය නියෝග කෙළෙම් කීසේක.  නැවත දැන්ම අපගේ ගෙයි බල්ලෝ මරණු නොලබතියි කීසේක. එසේ කල්හි නුඹ වහන්සේ ඡන්දාදී වශයෙන් අගතියට යනසේක් වේදැයි කිවුය. මෙසේ කියා අගතිගමනය නම් සුදුසු නොවන්නේය. රාජධර්මයකුත් නොවෙයි. රජ්ජුරුවන් නම් කාරණා කාරණ පරීක්ෂා කොට තරාදියක් මෙන් මධ්‍යස්ථවන්ට වටනේය. දැන් වනාහි කීණ බල්ලෝ මරණු නොලබති. දුර්වල වූ සුනඛයෝ මරණු ලබයි. එසේ හෙයින් මේ සියලු බල්ලන්ගේ මැරීමක් නොවෙයි. දුර්වල සුනඛ ඝාතන යයි කිවුය. මෙසේ කියා මහාබෝසතානෝ  මධුරස්වර විහිදුවා මහරජ්ජුරුවන් වහන්ස යමක් නුඹ වහන්සේ කරණසේක්වීනම් ධර්මයෙන් නොවෙයි. රජ්ජුරුවන්ට ධර්මදේශනා කළෝය. තවද රජ්ජුරුවන් විසින් සොරුන්ට නිග්‍රහ කටයුත්තේය. නිසොරුන්ට නිග්‍රහ නොකටයුත්තේය. කිසිවකුත් නැති නිසොරු මරණට පැමිණෙති. අනේ මේ ලෝකයෙහි අයුක්තියක් පවත්නේය. අනේ මේ ලෝකයෙහි අධර්මයක් පවත්නේය යි කිවුය. රජ්ජුරුවෝ බෝධිසත්වයන්ගේ බස් අසා කියන්නෝ විචාළේය. එසේය දනිම් කී කල්හි කවුරුන් විසින් කියන ලද්දේදැයි විචාළේය. නුඹවහන්සේ ගෙයි කීණ බල්ලෝයයි කී කල්හි කීණ බල්ලන් විසින් කෑ නියාව දැනගත්තේ කෙසේදැයි විචාළේය. මම ඔවුන් විසින් කෑ නියාව දක්වන්නේ නම් වේදැයි කී කල්හි දක්වව පණ්ඩිතයෙනි. කිවුය. එසේ වී නම් නුඹ වහන්සේගේ ගෙයි කීණ බල්ලන් ගෙන්වා පැන් මොරු සුඟකුත් ඊතන සුඟකුත් ගෙන්වුව මැනවයි කිවුය. රජ්ජුරුවොත් එපරිද්දෙන්ම කළෝය. ඉක්බිත්තෙන් මහාබෝධිසතානෝ මේ හීතණ මොරෙහි මඩනා බල්ලන්ට පෙව්ව මැනවයි කිවුය. රජ්ජුරුවොත් එසේම කොට පෙවුය. මෝරු පූ බල්ලෝ සම් හා වර සමග වමනය කළාහුය. ඒ දැක රජ්ජුරුවෝ සර්වඥකෙනෙකුන් වහන්සේගේ කීමක් මෙන් වන්නේයයි සතුටුව ධවලච්ඡත්‍රයෙන් හා රාජ්‍යයෙන් පූජා කළාහුය. මහාබෝසතානෝ මහරජ්ජුරුවෙනි දෙමව්පියන් කෙරේ ධර්මයෙන් හැසිරෙව යනාදීන් තෙසකුණ ජාතකයෙහි ආවාවූ දශරාජ ධර්මයෙන් රජ්ජුරුවන්ට ධර්මදේශනා

SANHIDA LANKA

කොට රජ්ජුරුවෙනි මෙතැන්පටන් ප්‍රමාදනොවවයි රජ්ජුරුවන් පංචශීලයෙහි පිහිටුවා තමන්ට දුන් ධවලඡත්‍රය හා රාජ්‍යය රජ්ජුරුවන් ටම පෙරලා දුන්නේය. රජ්ජුරුවෝ මහාබෝධිසත්වයන් ප්‍රධානය කොට බල්ලන් තමන් මේ නිමවන සැටියේම නිරන්තරයෙන්ම බත් ලන ලෙස සලස්වා බෝධිසත්වයන්ගේ අවවාදයෙහි සිට ආයු පමණින් දානාදී වූ පින්කම් කොට මරණින් මත්තෙහි ගොස් දිව්‍ය ලෝකයෙහි උපන්නාහුය.

කුක්කුරෝවාදය දසවා දහසක් අවුරුදු මුළුල්ලෙහි පැවැත්තේය. බෝධිතත්වයෝත් ආයු පමණින් සිට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මහණෙනි සර්වඥයෝ නෑයන්ට දූන්මතු වැඩෙහි හැසිරෙන්නෝ නෙවෙති පෙරත් වැඩෙහි හැසිරෙන්නෝම වේදැයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා  වදාරා පූර්වාපර සන්ධි ගලපා මේ කුක්කුර ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරියෝය. අවශේෂයෝ දැන් බුදු පිරිසය, එසමයෙහි අවවාද දුන් කුක්කුර නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# හෝජාජානීය ජාතකය

තවද එක්සමයෙක්හි ජේතවනාරාමයෙහි වැඩවසන සර්වඥයන් වහන්සේ පසුබට විර්ය ඇති එක් මහණෙකු අරභයා මේ ජාතකය වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි අප මහා බෝධිසත්වයෝ හොජාජානීය නම් සෛන්ධවයන්ට නායකව අස්රජව උපන්නහ. හෝජාජානීය නම් කුලයෙහි සෙසු අසුන්ට වැඩි තරම් උතුම්වූ ඒ අස්රජහු බරණැස්නුවර රජහට මගුලස්ව වෙසෙති ඔවුන් සිටිනා අශ්වශාලාව උඩුවියන් බැඳ බිත්ති සිතුයම් කරවා බිම සුදු වැලි අතුරණ ලද්දේය. මහබෝසතාණෝ එහි හෙළ කුඩයක් යටසිට මධුරවූ හෝජනය අනුභව කොට හැම අසුන්ට උතුම් ව වාසය කෙරෙති. එසමයෙහි සත් රජ්ජුරු කෙණෙක් ඒ බරණැස් රජ්ජුරුවන් හා යුධ කොට රාජ්‍යය ගණුම්හයි සටනට අවුත් බොහෝ සේනාව පිරිවරා පඤ්චායුධයෙන් සන්නද්ධව ඇත් අස් රථ ආදී මහත් කායබල සේනාව ගෙණ නුවර වටකොට සැරසී රැකසිටියාහුය. බරණැස්නුවර රජ්ජුරුවෝ තමන්ගේ අමාත්‍යයන් රැස්කොට එපවත් උන්ට කියා කළමනා කිම්දැයි කිවුය. එබස් අසා අමාත්‍යයෝ කියන්නාහු දේවයිනි. නුඹවහන්සේ පළමුකොට නොවැඩිය මැනව. නුඹ වහන්සේගේ මෙනම් රාවුතයාණ කෙණෙක් ඇත්තෝ වේද උන්ට පිරිස්පාවාදී ප්‍රසාදදී උන් යැව්ව මැනවයි කිවුය. රජ්ජුරුවෝ එපවත් අසා ඒ රාවුතයාණන් ගෙන්වාගෙණ කියන්නාහු දරුව අපගේ රාජ්‍යය ගණුම්හයි කියා අප හා සටන්කරන්නට රජ දරුවෝ සත්දෙනෙක් මහබලසෙනග ගෙණ රාජ්‍යය වටකොට රැකගත්හ. උන් සත්දෙනා හා කැටුව යුද්ධ කොට ගතහෙයි දැයි විචාළෝය. එපවත් අසා රාවුතයාණෝ ස්වාමීනි මට පිළිවනි නුඹ වහන්සේගේ මගුල් හොජාජානීය නම් අසු ලදිම් නම් යුද්ධකොට ජයගෙන දෙමියි කිවුය. රජ එපවත් අසා මාගේ රාජ්‍යය නැසීයාම සුදුසු නොවෙයි සිතා කැමති පිරිස් හා කැමති සෛන්ධවයකු ගෙණවයි සතුරනුත් සාධදෙවයි කිවුය. රාවුතයාණෝ සෛන්ධවයා හා සමග පිරිස් ගෙණ නික්ම සතුරන් සිටිතෙනට ආසන්නව සිට හෝජාජානීය නම් සෛන්ධවයානන් ඇළයට ගොස් සනහාලා ඇඟ අතගාලා තොපට ද මටද ස්වාමී වූ රජ්ජුරුවන්ට පක්ෂ පාතව සටන් කොට සතුරන් සාදාදෙවයි ඔවාතෙපුල් දී නොයෙක් රසයෙන් යුක්ත හෝජනය කවා මධුර පානය පොවා සුවඳ විලවුන් ගල්වා සන්නාහයක් ලා එහි රන්සැත්ලා වසා දැඩි කොට සාදාලා තෙමේ සැරහීගෙණ යන්නාහ. සන්නද්ධව මගුල්කඩුව ගෙණ අසුට නමස්කාර කොටලා පිටට පැන නැගී යුද්ධයට වන්නාහ. බෝධිසත්වයෝ සිතන්නාහු මේ සත් රජ්ජුරුකෙණෙකුන් තබා මුළු දඹදිව සෙනඟ අවුත් කම් කිම් ද උන් නොමරා ඇල්ලූ කල වේද සුරකමෙයි සිතා සබඳ ආශ්වාචාරිය රජ දරුවන් නොමරා යුද්ධය මට බාරයයි කිවුය. ඒ අශ්වචාරි තෙමේ සාහසිකව සතුරු සෙනඟ මදධ්‍යයට වන් සඳ අශ්වයා පිනු පිනු තෙනට විදුලියක් මෙන් කඩුව  හිස සිසාරා නොබාහිඳ පළමු බලකොටුව බිඳපියා එක් රජ්ජුරුකෙනෙකුන් නොමරා අල්වාගෙණවුත් නුවරට පාවාදී නැවතත් බිහිසුණු  සතුරු සෙනඟ මැදට වැද සේනාව බිඳ පරාජය කොට ඒ රජුත් නොමරා ගෙණ සේනාවට පාවාදී මෙසේ ම සදෙනෙකු ගෙණ නැවත සත්වන රජහු අල්වන්ට බොහෝ සෙනඟ එක්ව සිටත් අසු මෙහෙයලා යුද්ධයට වන් සඳ අස්හු සතුරන් අතින් කඩු පහරක් ලදින් කඩු පහර කා ඇඟින් ලේධාරා ඉසින්නාහු අශ්වර්යයා බලා මහත් වූ භයශෝකයෙන් ආයේ ආපසු මෙහෙයලා රජගෙයි මිදුලට ගෙණ ගොස් සන්නාහය ලිහිල් කොට නැවත අනි අසකු සන්නාහය බඳින්නට වන. අස් තෙමේ කඩු පහර කෑ වේදනාවෙන් වැදහෙව සිතත්තේ මේ අශ්වාචාර්යය තෙමේ මාගේ ගුණ නොදන්නේය. සත්වෙනි බලකොටුව බිඳින්ට හා සත්වන රජු ගන්ට නික්මෙයි. අනික් අසකු සදයි. ආශ්චර්යයා සත්වන රජු ගන්ට නොපොහොසත. මේ තෙමේ ද මරණයට යයි. ආශ්වයාත් මරන්නේ රටත් නසන්නේය. රජුත් සතුරන්ට අසුවන්නේය. එසේවත් මා දෙවුනා රජහට කළ විර්ය නොපෙණෙයි. දියෙහි ඉරක් ඇන්දාසේ වෙයි. මා ඇර අන් අයෙක් මෙ සකල දඹදිව සත්වනා රජු ගන්නද බලකොටුව බිඳින්නටද නොපොහොසතැයි සිතා කෙළෙහි ගුණ දන්නා වූ මහබෝසතානන් වහන්සේ මෙසේ සිතුසේක. මේ රජ මා තිරිසන් නැනැත්තවුට බොහෝ උපකාර තබා දී මගුලස්ථනාන්තරයෙහි තමා මට නොයෙක් පොෂ්‍යකොට මා රක්ෂා කෙළේ නම් මෙසේ වූ යුද්ධයක් දුටුකලට වේද මා ඇඟින් වැගිරෙන ලේ රජු මට දුන් නොයෙක් රසයෙන් මධුරපානයෙන් අටගන්නතා වූ ලේ මුත් අනිත් ඇතිවූ ලෙයක් නොවෙයි, එබැවින් මාගේ ශරීරයෙහි රජු නිසා අටගත් මාංශයද ජීවිතයද රජුට දී පක්ෂපාතව ම මළෙම් නම් පරලොව සුවයෙක් ම ලැබෙයි. තමන් පිණිස මාගේ ජීවිතය සතුරන්ට දී පක්ෂපාතව මළ කල තිරිසන්ව සිට මට සතුරන් සාදා දී මා නිසා ජීවිතය දුන්හයි මාගේ රජු කී කල්හි මලාත් නොමළායයි සිතන සේක්, සබඳ අශ්වාචාර්යය සත්වන බලකොටුව හා එහි බිහිසිණු සතුරන් මැදට වදින්ට අනිත් අසෙක් මා මුත් මුළු දඹදිව නැතැයි හෝජාජානීය නම් වු සෛන්ධව කුලයෙහි උපන්නාවූ මා මුත් අනිත් අස් රජෙක් නැතැයි මා නගා සිටුවාගෙණ සන්නාහ බැඳ සත්වන රජු ගන්ට යවයි කී සේක. බෝධිසත්වයන්ගේ බස් අසා ආශ්වාචාර්යය තෙමෙ බෝධිසත්වයන් සමීපයට ගොස් නඟා සිටුවාගෙණ වණය වසා බෙහෙත් බැඳ පෙරසේම සන්නාහයලා අසුපිට පැනනැගී කඩුව ගෙණ මහත් බලකාය ගෙණ සතුරු සෙනඟ බිඳ සත්වන රජු අල්වාගෙණ මහත් බලකාය ගෙණ සතුරු සෙනඟ බිඳ සත්වන රජු අල්වාගෙන නොමරාම ගෙණත් පිරිසට පාවාදීලූයේය. සත්වන රජු හා සෙනඟ සාදා සතුරන් බිඳපියා පිරිස් ඇරගෙණ බෝධිසත්වයන් හා සමඟ රජගෙදෙරට අවුත් රජ්ජුරුවන් දුටුයේය. රජ්ජුරුවෝ බෝධිසත්වයන් කෙටුම් කෑ බව අසා මහත් වූ ශෝකයෙන් කම්පිතව සිටියාහ. බෝධිසත්වයෝ තමන්ගේ රජ්ජුරුවන්ට කියන්නාහු දේවයෙනි මේ රජ සත්දෙනා නොමරවයි දිවරවාපියා මිත්‍රව සිට උන් උන්ගේ රටට යවයි කීහ. මහරජ තොප මට කරණ උපකාර නම් තෙල අශ්වාචාර්යයට කළ මැනවැයි සත්කාර කරවා තොපිද නොපමාව දන්දෙව පෙහෙවස්

SANHIDA LANKA

රකුව බණ අසව ප්‍රාණවධ නොකරව දශරාජ ධර්මයෙන් රාජ්‍ය කරවයි. අවවාද කොට බෝධිසත්වයෝ තුමූ සන්නාහය මුදාපීකල පරලොව ගියහ. රජ්ජුරුවෝ මහත් ශෝකයෙන් හඬා කම්පිතව බෝධිසත්වයන් මහත් වූ පෙළහරින් පූජාකොට ආදාහණ කරවූහ. බෝධිසත්වයන් කී පරිද්දෙන් රජ්ජුරුවෝ සිත තබා ආශ්වාචාර්යයාහට බොහෝ වස්තු ද ගම්බිම් ද තනතුරුද දී මිත්‍රද්‍රෝහී නොවී රක්ෂාස්ථානයෙහි තුබූ සේක. නැවත බෝධිසත්වයන් කී අවවාද සිත තබා තමන්ට ද්‍රෝහී වූ රජසත්දෙනා ගෙන්වාගෙණ නොමරා නාවා ආහාර අනුභව කරවා සත්දෙනා දිව්රවා උන් උන්ගේ රටට යවා තුමුද බෝධිසත්වයන් කී පරිද්දෙන්ම තමන් කළ කුශලමූලයෙන් දෙව්ලොව උපන් නාහුය. ශාස්තෘන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි. පෙර නුවනැත්තාවූ මහොත්තමයෝ විර්ය කරන්නට සුදුසුතන්හි වීර්ය කළාහුය. මෙබඳු ප්‍රහාර ලැබගෙණ ද විර්ය නොහැරියාහුය. තෙපි වනාහී මෙබඳු නෛර්යානිණික ශාසනයෙහි මහණව කවර කාරණයෙකින් විර්ය හැරියේහි දැයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළ සේක. චතුස්සත්‍යයාගේ අවසානයෙහි පසුබට විර්ය ඇති මහණතෙම අර්හත්ඵලයෙහි පිහිටිසේක. බුදුරජානන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ භෝජාජානීය ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිර වූ සේක. අශවාචාර්යය ශාරීපුත්තස්ථවිර වුයේය. භොජජානීය සෛනධවාශව ව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# තීර්ථ ජාතකය

තවද එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික වූ පූර්වයෙහි පරිචය කරණ ලද සවර්ණාකාර කුලයෙක්හි මහණ වූ භික්ෂුවක් අරභයා මේ ජාතකය වදාළසේක.

ආසයානුසයඤාණය වනාහී සර්වඥයන් වහන්සේලාටම වන්නේය. අවශේෂ ශ්‍රාවකයන් වහන්සේලා නැත්තේය. එහෙයින් දම්සෙනවි සැරියුත් මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේට ආශයානුසය ඥානය නැති හෙයින් සද්ධිවිහාරික භික්ෂූන් වහන්සේගේ අභිප්‍රාය නොදන්නාසේක් අශුභ කර්මස්ථානයම වදාළ සේක. ඒ භික්ෂූන් වහන්සේට ඒ භාවනාව සත්ප්‍රාය නුවූයේය. කවර හෙයින්ද යත් ඒ භික්ෂූන් වහන්සේගේ වනාහි පටිපාටියෙන් පන්සියයයක් ජාතියෙහි ස්වර්ණාකාර කුලයෙහි ම පිළිසිඳගත් සේක. ඉක්බිත්තෙන් ඒ භික්ෂූන් වහන්සේට බොහෝ කාලක් ඒ ස්වරණයාගේ දූක්ම පුරුදුකළ හෙයින් අශුභකර්ම ස්ථානභාවනාව සත්ප්‍රාය නුවූයේය. ඒ භික්ෂූන් වහන්සේ එහි උද්ග්‍රහනිමිත්ත මාත්‍රයකුදු උපදවන්නට නොහැකිව සාරමසක් කල්යැවූ සේක. දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ තමන්ගේ අතවැසි මහණට අර්හත්ඵලය දෙන්නට නොහැකිව ඒකාන්තයෙන් මේ තෙමේ බුදුන් විසින් විනයනයකට යුතු වන්නේයයි සර්වඥයන් වහන්සේගේ සමීපයට කැඳවාගෙණ යෙමියි සිතා අළුයම් වේලෙහි ම ඔහු කැඳවාගෙන සර්වඥයන් වහන්සේගේ සමීපයට වැඩි සේක. එසේ ගිය කල්හි සර්වඥයන් වහන්සේ වදාරණ සේක් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි. කවර හෙයකින් එක් මහණක් හූ කැඳවාගෙණ ආයේ දැයි විචාළසේක. ස්වාමීන් වහන්ස. මම මේ මහණහට කර්මස්ථානභාවනාව දුන්නෙමි සාරමසක් මුළුල්ලෙහි උද්ග්‍රහ නිමිත්ත මාත්‍රයකුදු නොයිපදවූයේය. ඒ මේ මහණ තෙමේ බුදුන් විසින් විනයනය කටයුතුයයි සිතා මේ මහණ නුඹ වහන්සේගේ සමීපයට කැඳවාගෙන ආයෙමි කී කල්හි ශාරිපුත්‍ර ස්ථවිරය. කවර නම් කමටහණක් අතවැසි මහණහට දුන්නේහිදැයි විචාළසේක. භාග්‍යවතුන් වහන්ස අශුභ කමටහනැයි දන්වූසේක. ශරිපුත්‍ර ස්ථවිරයෙනි. තොපගේ චිත්ත සන්තානයෙහි ආසයානුසයඤාණය නැත්තේය. තෙපි යව සවස් වේලෙහි අවුත් තොපගේ අතවැසි මහණ කැඳවාගෙණ යවයි වදාළසේක. මෙසේ සර්වඥයන් වහන්සේ සැරියුත් මහතෙරුන් වහන්සේ ගමන් කරවා ඒ භික්ෂූන් වහන්සේට මනොඥවූ අඳනා සිවුරු දෙවා ඔහු කැඳවාගෙන ම පිඬු පිණිස වැඩ ප්‍රණීතවූ ඛාද්‍යභොජ්‍ය විකෘතිය දෙවා මහත් වූ භික්ෂු සංඝයා පිරිවරා නැවත විහාරයට අවුත් ගඳකිලියෙහි දිවාභාගය ගෙවා සවස්වේලෙහි ඒ භික්ෂුව කැඳවාගෙන විහාරයෙහි සැරිසරා වඩනාසේක් අඹ උයනෙහි එක් පොකුණක් මවා ඒ පොකුණෙහි මහත් පියුම් පඳුරක් මවා එහිද මහත් පියුමක් මවා මහණ මේ පියුම් පඳුරක් මවා මහණ මේ පියුම් බලමින් හිඳුවයි කියා හිඳුවා ගඳකිළියට වන් සේක. ඒ මහණ ඒ පියුම නැවත නැවත බලන්නේය. භාග්‍යවතුන් වහන්සේ පියුම් ජරාවට පැමිණ වූසේක. ඒ පියුම ඒ මහණ බල බලා සිටියදීම ජරාවට පැමිණ විවර්ණ වූයේය. ඉක්බිත්තෙන් පියුම හාත්පසින් පෙති වැටෙමින් මොහොතකින් සියලු පියුම් පෙති වැටුනාහුය. ඉක්බිත්තෙන් රේනු වැගුරුනේය. පියුම් කෙමිය පමණක් අවශෙෂ වූයේය. ඒ භික්ෂූන් වහන්සේ ඒ පියුම බලමින් සිතනසේක් මේ පියුම දැන්ම පිපී අභිරූපව දක්නුම් කටයුතු වූයේය. ඉක්බිත්තෙන් ඔහුගේ වර්ණම මුහුකුරා පෙති ද රේනු ද හුණුයේය. කාර්ණික මාත්‍රයක් පමණව සිටියේය. මෙබඳු පියුම් පවා ජරාවට පැමිණියේය. මාගේ මේ ශරීරයට කෙසේ ජරාව නො පැමිණෙන්නේ දැයි සිතා සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යයයි කියා විදර්ශනා වැඩූසේක. සර්වඥයන් වහන්සේ ඔහුගේ සිත විදර්ශනාවට ආරූඪවූයේ යයි දැන ගඳකිළියෙහි වැඩහුන්සේක්ම ආලෝකයත් පතුරුවා වදාරණ සේක් සරත් කාලයෙහි ඇඹුල මලක් අතින් කඩාගන්නාක් මෙන් තමාගේ සිත් සතන්හි සෙන්හය අර්හත් ඵලමාර්ගඥානය නැමැති ශස්ත්‍රයෙන් සිඳ බුදුන් විසින් දේශනා කරණ ලද නිවනට පමුණුවන්නා වූ අෂ්ඨාංගික මාර්ගය වඩව යි වදාල සේක. ඒ භික්ෂූන් වහන්සේ මේ ධර්මයාගේ කෙළවර අර්හත් ඵලයට පැමිණ ඒකාන්තයෙන් සියළු භවයෙන් මිදුනෙමි සිතූහ.

සො වුත්ථවාසො පරිපුණ්ණමානසො ඛිණාසවො අන්තිමදේහධාරි

විසුද්ධසීලො සුසමාහිතින්ද්‍රියො චනෝද යථා රාහුමුඛාපාමුතෝතා,

සමෝන නං මොහා මහන්ධකාරං විනෝදයිං සබ්බමලං අසෙසං

ආලොක මුජෙජාතකරෝ පහං කරො සහස්සරංසි විය භානුමා නභොති

මේ ආදී ගාථාවලින් ප්‍රීතිවාක්‍ය පැවැත්වූ සේක. ප්‍රීතිවාක්‍ය පවත්වා ගොස් භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කළසේක. ස්ථවිරයන් වහන්සේ ද අවුත් ශාස්තෘන් වහන්සේට නමස්කාර කොට තමන්ගේ සෘද්ධිවිහාරික භික්ෂූන් වහන්සේ කැඳවාගෙණ වැඩිසේක. මේ ප්‍රවෘත්තිය භික්ෂූන් වහන්සේ අතරෙහි ප්‍රකාශවී භික්ෂූන් වහන්සේ දම්සභාවෙහි හිඳ ඇවැත්නි ශාරිපුත්‍ර ස්ථිවිරයන් වහන්සේ ආසයානුසය ඥානය නැති හෙයින් තමාගේ අතවැසි භික්ෂූන් වහන්සේගේ අභිප්‍රාය නොදත් සේක. සර්වඥයන් වහන්සේ වනාහි දැන එක දවසකින් ම ඕහට සිවු පිළිසිඹියා සමග අර්හත් ඵලය දෙවූ සේක. සර්වඥවරයෝ නම් මහානුභාව ආශ්චර්යයසේකැයි කියා සර්වඥයන් වහන්සේගේ ගුණවර්ණනා කොට හුන්නේය. බුදුරජානන් වහන්සේ එතනට වැඩ පනවන ලද ආසනයෙහි වැඩහිඳ මහණෙනි මෙහි මා එන්නට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාළසේක. භාග්‍යවතුන් වහන්ස අන් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. නුඹ වහන්සේ ම දම්සෙනවි සැරියුත් මහතෙරුණ් වහන්සේගේ සද්ධිවිහාරික

SANHIDA LANKA

භික්ෂූන් වහන්සේගේ අභිප්‍රාය දැන වදාළ කථාව යයි දන්නුවාහුය. සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහාණෙනි, ඒ මම දන් බුදුව ඔහුගේ අභිප්‍රාය දනගත්තා ආශ්චර්යය නොවෙයි. පෙරත් මම ඔහුගේ අභිප්‍රාය දනගත්තම් වේදයි වදාරා ඉකුත් වත් කථාව ගෙණහැර දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණසේක. එකල්හි අප මහා බෝසතානන් වහන්සේ ඒ රජහට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නා වූ අමාත්‍යයෙකු වූසේක. එකල්හි රජහුගේ මගුල් අශ්වයා නහනතොට එක්තරා බළුඬකාශ්වයකු නැහැවුවාහුය මගුල් අශ්වයා බළුඬකාශ්වයා නහවන ලද තොටට බස්වනු ලබන්නේ පිළි කුල් කොට බස්නට නොකැමැති වූයේය. අස්ගොව්වා ගොස් රජහට දන් වූ යේය. මහරජ්ජුරුවන් වහන්ස මගුල් අශ්වයා තොටට බසින්ට නො කමැති වූයේ යයි කීය. රජ්ජුරුවෝ බෝධිසත්වයන් යවනසේක් යව පණ්ඩිතයෙනි දනගණුව කවර කාරණයකින් අශ්වයා තොටට බස්වනු ලබන්නේ නොබස්නේදයි විචාළ සේක. බෝධිසත්වයන් වහන්සේ යහපත මහරජයි කිය ගංතෙරට ගොස් අශ්වයා බලා ඔහු නිරොගී බැව් දන කවර කාරණයකින්  මේ අශ්වයා තොටට නොබස්නේදයි පරීක්ෂා කරණ සේක් පළමුකොට මෙහි අශ්වයකු නහවන ලද්දේ වන. එහෙයින් පිළිකුල් කරන්නේය. තොටට නොබස්නේ යයි සිතා අස්ගොව්වාගෙන් විචාළ සේක. පින්වත්නි. මේ තොටෙහි කවරක්හු පළමුකොට නහවන ලද්දේදයි විචාළසේක. ස්වාමීන් වහන්ස අන් බළුඬකාශ්වයෙකැයි කීයේය. බෝධිසත්වයන් වහන්සේ සිතන සේක් මේ අශ්වයා තමා සුචිකාම බැවින් පිළිකුල් කෙරෙමින් මෙහි නහවන්නට නොකැමැතිය. මොහු අන්තොයෙක්හි නහවන්නට වටනේ යයි ඔහුගේ අභිප්‍රාය දන පින්වත් අශ්වාචාර්යය. ගිතෙල් මී සකිරායෙන් අභිසංස්කෘත ක්ෂිරපායාසයද වනාහී නැවත නැවත අනුභවකරන්නාහට තෘප්තිය වන්නේය. මේ අශ්වයා බොහෝ වර මේ තොටෙහි නහවන ලද්දේය. මොහු වනාහී  වෙන තොටකට බස්වා නහවා ජලය පොවාලවයි කියා මෙසේ කීසේක. රථාචාර්යය අශ්වයා අන් තොටකින් නහවා පැන් පොවව. යම් පුරුෂයෙක් සර්පි මධු සකීරායෙන් අභිසංස්කෘත පායාසය අධිකකොට කෑමෙන් තෘප්තියට පැමිණේද එපරිද්දෙන් අනික් අශ්වයෙකුගේ නැහැමෙන් අපවිත්‍ර වූ තොටෙහි තමාගේ ශෘංගාරත්වය හේතුකොට ගෙණ ස්නානය නොකමැත්තේය. අන් තොටකින් නහවවයි කී සේක. අශ්වාචාර්යයා බෝධිසත්වයන් වහන්සේගේ වචනය අසා අශ්වයා වෙන තොටක බස්වා පැන්පෙවා නැහැවුයේය. බෝධිසත්වයන් වහන්සේ අශ්වයා නහවා පැන් පොවන කල්හි රජුහුගේ සමීපයට ගොස් සියලු ප්‍රවෘත්තිය දන්වූ සේ. රජ්ජුරුවෝ මෙබඳු තීරශ්චීනයාගේ අභිප්‍රාය දනගත්සේකැයි කියා අප මහබෝසතානන් වහන්සේට මහත් ඓශ්චර්‍ය්‍යාදී ජිවිතයාගේ කෙළවර කම්වූ පරිද්දෙන් මිය පරලොව ගිය සේක. බෝධිසත්වයන් වහන්සේද කම්වූ පරිද්දෙන් මිය පරලොව වැඩිසේක. ශාස්තෘ වූ බුදුරජනානන් වහන්සේ වදාරණ සේක් මහණෙනි මම මොහුගේ අභිප්‍රාය දනගත්තෙමි දන්මතු නොවෙයි පෙරත් අභිප්‍රාය දනගත්තෙම් වේ දයි කියා මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගලපා මේ ජාතකය නිමවා වදාල සේක.

එසමයෙහි මංගල්‍ය අශ්වයා නම් දන් මේ භික්ෂූන් වහන්සේ වූ සේක. එකල්හි රජ්ජුරුවෝ නම් දන් ආනන්දස්ථිවිර වූ සේක. පණ්ඩිත අමාත්‍යව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම ම වේදයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මහිලාමුඛ ජාතකය

තවද එක්සමයෙක්හි බැළු බැළුවන් ඇස් නොනිමවන මනහර රූ ඇති ලොකස්වාමී වූ බුදුරජානන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සේක් දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක. දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අජාසත් කුමාරයන් පහදවා ලාභසත්කාර ඉපිද වූ සේක. අජාසත් කුමාරයෝ දේවදත්ත ස්ථවිරයන් වහන්සේ ගයාහිස විහාරයෙක් කරවා නොයෙක් රස ඇති තුන් අවුරුදු ගිය සුවඳ ඇල්සාලෙ බත් දවසක් පාසා පන්සියයක් වසුන්වලින් එවති. ලාභසත්කාර නිසා දේවදත්ත ස්ථවිරයන් වහන්සේට පිරිවර මහත් විය. දේවදත්ත ස්ථවිරයන් වහන්සේ පිරිවරා හා සමග විහාරයෙහි ම වසන සේක. එසමයෙහි රජගහනුවර වසන්නාවූ යහළුවෝ දෙදෙනෙක් වෙති. ඔවුන් අතුරෙන් එක්කෙනෙක් බුදුන් සමීපයෙහි මහණ වූය. එක් කෙනෙක් දේවදත්ත ස්ථවිරයන් ලඟ මහණ වූය. ඔහු දෙදෙන ඔවුනොවුන් ඒ ඒ තෙනදීත් දකිති. විහාරයට ගොසිනුත් දකිති. ඉක්බිත්තෙන් එක්දවසක් දෙවදත්ත නිශ්‍රිත මහණ අන් භික්ෂූහට කියන්නේ කිමෙක්ද තෝ දවසක් දවසක් පාසා ඩා පෙර පෙරා සිඟන්නෙහිය. දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ ගයාහිස විහාරයෙහිම හිඳ නොයෙක් අග්‍ර රසයෙන් යුක්තව භෝජනය වළඳන සේක. මෙබඳු උපායෙක් ඇත කුමක් පිණිස තෝ දුක් අනුභව කරන්නෙහිද. කිමෙක් ද තා විසින් උදෑසන ම ගයාහිස විහාරයට අවුත් අවුළු සහිත කැඳ වළඳා අටලොස්වැදෑරූම් වූ ඛාද්‍යා අනුභවකොට නොයෙක් අග්‍ර රසයෙන් යුක්ත වූ භෝජනය වළඳන්නට නපුරු දැයි කීය. ඒ මහණ නැවත නැවත කියන බස් අසා යනු කැමති ව එතැන් පටන් ගයාහිසට ගොස් වළඳා වේලපස වෙළුවනයට එන්නේය. ඒ මහණ හැම කල සඟවාගත නොහුණුයේය. ගයාහිසට ගොස් දේවදත්ත ස්ථවිරයන්ට තබා දෙනලද බත වළඳන්නෙයයි නොබෝකලකින්ම ප්‍රසිද්ධ විය. ඉක්බිත්තෙන් ඕහට සහාය භික්ෂූන් කියන්නාහු සැබෑද මහණ තෝ දේවදත්ත ස්ථවිරයන්ගේ බත වලඳන්නෙහි දැයි කී කල්හි අසවල්ලුයයි කිවුය. සැබෑව ඇවැත්නි මම ගයාශිර්ෂයට ගොස් වළඳිමි ම වූට කලී දේවදත්තයෝ බත් නොදෙති අන්මනුෂ්‍යයෝ දෙති කීය. ඇවැත්නි දේවදත්තයෝ සර්වඥයන්ට ප්‍රතිපක්ෂයෝය දුශ්ශීලයෝය. අජාසත් රජ්ජුරුවන් පහදවා අධර්මයෙන් තමන් ලාභසත්කාර ඉපදවූය. තෙපි මෙබඳු නෛර්යාණික ශාසනයෙහි මහණව දෙවදත්තයන්ට අධර්මයෙන් උපන්නාවූ භෝජනය වළඳවා වරෝ යම්හ බුදුන් සමීපයට ගෙණයම්හයි කියා ඒ භික්ෂූව කැඳවාගෙණ දම්සභා මණ්ඩපයට ආවාහුය. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන් කැඳවා කිමෙක් ද මහාණෙනි තොපි මොහු නොකැමැති පිරිද්දෙන්ම කැඳවාගෙණ අවුදැයි වදාළ සේක. එසේය ස්වාමීනි මේ මහණ නුඹ වහන්සේ සමීපයෙහි මහණව දෙවදත්තයන්ගේ අධර්මයෙන් භෝජනය වළඳන්නේ යයි දන් වූ සේක. එබස් අසා බුදුහු සැබෑද මහණ තෝ දේවදත්තයන්ගේ අධර්මයෙන් උපන් භොජනය වළඳවයි දැයි විචාළ සේක. එබස් ඇසූ මහණ දේවදත්තයෝ මට නොදෙති. මනුෂයෝ දෙති ඒ බත මම වළඳමියි දැන්වූසේක. එබස් ඇසු සර්වඥයන් වහන්සේ වදාරණ සේක්. මහණ තෝ මෙහි මහණව මාගේ ශාසනය භජනය කෙරෙමින් දේවදත්තයන්ගේ බත කෙසේ නම් අනුභව කෙළෙහිද හැමකලම දුටු දුටුවන් භජනය කරණ සුළුවූයෙහි වේදැයි වදාරා ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි මහබෝසතානෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍ය වූහ. එකල රජ්ජුරුවන්ගේ මහිලාමුළ නම් මගුලැතෙක් විය. ඒ තෙම සිල්වත ආචාර සම්පන්නය කිසිකෙනෙකුන්ට හිංසාවක් පීඩාවක් නොකරන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ ඇතු සිටිනා ඇත්හල සමීපයෙහි රාත්‍රීභාගයෙහි සොරු අවුත් ඕහට නුදුරු තැන හිඳ සොරකම් මන්ත්‍රණය කළාහුය. මෙසේ උමං බින්ද යුත්තේය. මෙසේ මං පැහැරිය යුත්තේය. උමං බිඳිම හා මංපැහැරීම මගක් තොටක් සේ නිරවුල්කොට ඉගෙණගෙණ බඩු සොරකම් කරන්ට වටනේය. සොරකම් කරන්නාහු විසින් වස්තු හිමියන් මරා සොරකම් කටයුත්තේය. එසේ කල්හි වස්තුව සොරකම් කරන්නාහු විසින් ශිලාචාර ගුණයෙන් යුක්ත නොවීය යුතුය. කර්කශපරුෂව සාහිසිකව පැවැත්ත යුත්තේයයි මෙසේ කථාකොට ඔවුනොවුන් උගන්වා ගෙණ ගියාහුය. මෙම ක්‍රමයෙන් දෙවැනි දවසය තුන්වෙනි දවසයයි කියා බොහෝ දවසක්හ එතනට අවුත් මන්ත්‍රණය කලාහුය. ඒ මහිලාමුඛ නම් හස්තියා ඒ සොරුන්ගේ බස් අසා මා උගන්වති යන සංඥායෙන් දැන් මා විසින් චණ්ඩපරුෂ රෞද්‍ර කියා ඇතිව පැවැත්ත යුත්තේ යයි සිතා එබඳු වූ චණ්ඩගුණ ඇතිවිය. ඉක්බිත්තෙන් උදෑසනම ආවාවූ ඇත්ගොව්වා සොඬින් බදා අල්වාගෙණ බිම ගසා මැරුයේය. එසේ ම අනිකකුත් අනිකකුත් මැරුයේය. මහිලාමුඛ නම් හස්තියාට මදනැංගේය. එසේ හෙයින් දුටු දුටුවන් මරන්නේයයි රජ්ජුරුවන්ට කිවුය. එබස් ඇසූ රජ්ජුරුවෝ බෝධිසත්වයන්ට කියන්නෝ පණ්ඩිතයෙනි යව කවර කාරණයකින් ඒ ඇතා දුෂ්ටවීදෝහයි දැනගෙණ එවයි කිවුය. බෝධිසත්වයෝ ගොස් ඔහුගේ ශරීරයෙහි රෝග නැති නියාව දැන කවර කාරණයකින් මේ තෙමේ දුෂ්ට වීදෝහෝයි පරීක්ෂා කරන්නාහු ඒකාන්තයෙන් නුදුරු තෙනක කිසිකෙනෙකුන්ගේ නපුරු වචනයක් අසා මොහුගේ ම බස් කර්ම උගන්වති යන සංඥා වෙන් දුෂ්ට වී යයි සනිටුහන් කොට ඇත්ගොව්වන් අතින් විචාරන්නාවූ ඇත්හල සමීපයේ රාත්‍රී භාගයෙහි කිසිකෙණෙකුන් විසින් කථාවක් කළ නියාවක් දනුදැයි විචාළෝය. ස්වාමීනි සොරු අවුත් කථාකළෝ යයි කිවුය. බෝධිසත්වයෝ ගොස් රජ්ජුරුවන්ට කියන්නෝ දේවයන් වහන්ස ඇතුට කිසි රෝගපීඩාවක් නැත. සොැරන්ගේ බස් අසා දුෂ්ට වී යයි කිවුය. දැන් කුමක් කළ යුතුදැයි කී කල්හි සිල්වත් මහණ බමුණන් ඇත්හල සමීපයෙහි හිඳුවා ශිලාචාර කථා කියන්නට සුදුසු වන්නේයයි කිවුය. රජ්ජුරුවන් විසින් එසේ කරවයි කී කල්හි බෝධිසත්වයෝ සිල්වත් වූ මහණ බමුණන් ඇත්හළ සමීපයෙහි හිඳුවා ස්වාමීනි. ශිලනිඃශ්‍රිත වූ කථා කිවමැනැවැයි කිවුය. එබස් අසා මහණ බමුණෝ ඇතුට නුදුරු තෙනක හිඳ කියන්නෝ කිසිවක් නොඇල්ලවිය යුත්තේය. කිසිවක් නොමැරිය යුත්තේය. ශිලාචරයෙන් ක්ෂාන්ති මෛත්‍රී කරුණාවෙන් යුක්ත විය යුතුයයි ශිල නිඃශ්‍රිත කථා කළාහුය.

SANHIDA LANKA

ඒ හස්තියා එබස් අසා මොහු මා බස්කම් උගන්වති. එසේ හෙයින් දැන් මේතැන් පටන් සිල්විය යුතුය සිතා සිල්වත්ව ක්ෂාන්ති කරුණාවෙන් යුක්ත විය. රජ්ජුරුවෝ බෝධිසත්වයන් අතින් විචාරන්නෝ කිමෙක්ද දරුව හස්තියා සිල්වත් වී දැයි විචාලෝය. බෝධිසත්වයයෝ එසේය. රජ්ජුරුවන් වහන්සැයි කීහ. එබස් ඇසූ රජ්ජුරුවෝ කියන්නෝ මෙබඳු දුෂ්ට වූ හස්තියා නුවණැත්තන් නියා පෞරාණික ධර්මයෙහි පිහිටියේ වේදැයි කියා බෝධිසත්වයන්ට ප්‍රශංසා කළෝය. තවද රජ්ජුරුවෝ තිරශ්චිත වූ හස්තියා ගේ පවා අභිප්‍රාය දැනගත්තෝ වේදැයි කියා බෝධිසත්වයන්ට මහත් වූ යශස් දුන්නාහුය. රජ්ජුරුවෝ ආයපමණින් සිට මහ බෝසතානන් හා සමග කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මහණ තෝ පෙරත් දුටු දුටුවන් භාජනය කළෝය. සොරුන්ගේ කථා අසා සොරුන් භජනය කෙළෙහිය. ධාර්මිකයන්ගේ බස් අසා ධාර්මික යන් භජනය කෙළෙහි යය් ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ මහිලාමුඛ ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි මහිලාමුඛ හස්තියා නම් දැන් මේ විපක්ෂසෙවි භික්ෂුය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. අමාත්‍යවූ යෙම් තිලොගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# අභිණ්හ ජාතකය

තවද එක්සමයෙක්හි බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් එක් උපාසකයකු හා මහළු තෙරුණුකෙණකුන් අරභයා මේ ජාතකය වදාළ සේක. සැවැත්නුවර වාසයකරන්නා වූ යහළුවෝ දෙදෙනෙක් වූවාහුය. ඔවුන් අතුරෙහි එක් කෙණෙක් පැවිදිව දවසක් දවසක් පාසා උපාසකයාගේ ගෙට වඩනා සේක. උපාසක තෙමේ තෙරුන්වහන්සේට ආහාර පිළිගන්වා තෙමේද ආහාර අනුභවකොට උන්වහන්සේ හා සමග විහාරයට අවුත් සූර්යයා අස්තාංගවන තැන් දක්වා ඔබිනොබ කථා කිරීමෙන්ද හිඳ නුවරට යන්නේය. තෙරුණ් වහන්සේද නුවර වහසල් දොර දක්වා ඒ උපාසිකයා එක්ව ගොස් නවත්නාසේක. ඒ දෙදෙනා විශ්වාස බව භික්ෂූන් වහන්සේ අතුරෙහි ප්‍රකාශ වූයේය. ඉක්බිත්තෙන් එක් දවසක් භික්ෂූහු ඔවුන් දෙදෙනා ගේ විශ්වාස කථාව කියමින් දම්සභාමණ්ඩපයෙහි උන්නාහුය. සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි. මේ දම්සභා මණ්ඩපයෙහි උන්නාහුය. සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මේ දම්සභාවෙහි දැන් මා එන්නට පූර්ව භාගයෙහි කවර නම් කථාවකින් යුක්තව උන්නාහුදැයි විචාරා ස්වාමීන් වහන්ස මේ නම් කථාවකිනැයි දැනු වූ කල්හි සර්වඥයන් වහන්සේ වදාරණ සේක් මහණෙනි. මොහුන් දෙදෙන විශ්වාස වූවෝ දැන් මතු නොවෙයි පෙරත් විශ්වාස වූවාහුයයි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහා බෝසතානන් වහන්සේ ඒ රජහට අමාත්‍යයෙක් වූ සේක. එකල්හි එක් සුනඛයෙක් මගුල් ඇත්හලට ගොස් මගුල් ඇතා අනුභව කරණ තන්හි වැටුනා වූ බත්හුළු අනුභව කරන්නේය. ඒ සුනඛතෙම ඒ ආහාරයෙන්ම වැඩෙනු ලබන්නේ මගුලැතාට විශ්වාස වූයේය. සුනඛයා හස්තියාගේ සමීපයෙන්ම අනුභව කරන්නේය. දෙදෙනාම වෙන්ව වසන්නට නොහැකි වෙති. සුනඛතෙම හස්තියාගේ සොඬ ගෙණ ඔබිනොබ කෙරෙමින් කෙළනේය. එසේ කල්හි එක් දවසක් පිටිසර වැසි එක් ග්‍රාමික මනුශ්‍යයෙක් ඇත්ගොව්වාට මිලදී ඒ සුනඛයා ගෙණ තමාගේ ගමට ගියේය. එතැන් පටන් ඒ හස්තියා සුනඛයා නොදක්නේ ගොදුරු නොම අනුභව කරන්නේය. පැන් නොබොන්නේය. නොම නහන්නේය. ඒ කාරණය රජහට දැන්වූවාහුය. රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේට වදාරණ සේක් යව පණ්ඩිතයෙනි දැනගණුව කවර කාරණයකින් හස්තිරාජ තෙම මෙලෙස කරන්නේ දැයි කියා යැවු සේක. බෝධිසත්වයන් වහන්සේ හස්තිශාලාවට ගොස් හස්තියාගේ දොම්නස් බැව් දැන මොහුගේ ශරීරයෙහි රෝගයක් නොපෙණෙන්නේය. මොහුගේ වනාහී කිසිකෙණෙකුන් හා සමග මිත්‍රසන්තවයක් විය යුතුයයි ඔහු නොදක්නේ මේ තෙමෙ ශොකයෙන් මඩනාලද්දේවනැයි සිතා හස්ත්‍යාචාර්යයා අතින් විචාරණසේක් මොහුගේ කිසිකෙනෙක් හා සමග විශ්වාස බවක් ඇද්දොහෝයි විචාළ සේක. ස්වාමීන් වහන්ස එසේය. එක් සුනඛයෙකු හා එක්ව බලවත් මිත්‍රකමක් ඇත්තේය යි කීය. දැන් ඒ සුනඛයා කොයිදැයි විචාළසේක. එක් මනුශෂයෙකු විසින් ගෙණ යන ලද්දේය. ඔහු වාසය කරණ තැන් දන්නේ දැයි කී සේක. ස්වාමීන් වහන්ස. නොදනිමි කීහ. බෝධිසත්වයන් වහන්සේ රජුගේ සමීපයට ගොස් මහරජ්ජුරුවන් වහන්ස හස්තියාට කිසි ආබාධයක් නැත්තේය. ඕහට වනාහී එක් සුනඛයෙකු හා සමග බලවත් විශ්වාසයක් වූයේය. ඒ සුනඛයා නොදක්නා වූ හස්තිරාජ තෙම භෝජනය අනුභව නොකෙරෙයි සිතමියි කියා මෙසේ කීසේක. මහරජ බතට පළමු කොට දෙන කටුක භෛෂජ්‍යයෙන් යුක්ත යුක්ත පිඬුගන්නට නොපොහොසත. පිඬු කොට දෙන භොජනය ගන්නට නොපොහොසත. කුශතෘණ ද අනුභව කරන්නට නෝද පොහොසත. නහන වේලෙහි ශරීරාවර්තනය කරන්නටද නොපොහසත, නිරන්තර දර්ශනය හේතු කොට ගෙණ හස්තිරාජ තෙම සුනඛයා කෙරහි සෙනහකෙළේයයි සිතමියි කී සේක. මෙසේ යමක් යමක් ඒ හස්තිරාජයාකරන්නට නොහැකිද ඒ සියල්ලම රජහට දැන්වූ සේක. රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේගේ වචනය අසා පණ්ඩිතයන් වහන්ස දැන් කවරක් කටයුතු දැයි විචාළසේක. අපගේ මගුලැතාගේ යහළු සුනඛ තෙම එක් ගම්වැසි මනුශ්‍යයෙක් ගෙණ ගියේය. යමක්හුගේ ගෙයි ඒ සුනඛයා දුටුවොත් ඕහට මේ බඳු දඬයක් කියා බෙර ලව මහරජයි කිසේක. රජතෙම එලෙස කරවූයේය. ඒ ප්‍රවෘත්තිය අසා ඒ පුරුෂතෙම සුනඛයා හැරියේය. සුනඛතෙම සීඝ්‍රයෙන් ගොස් හස්තියාගේ සමීපයටම ගියේය. හස්ති තෙමෙ සුනඛයා සොඬින් ගෙණ කුම්භස්ථලයෙහි තබා හඬා වැලප පියා කුම්භස්ථලයෙන් බස්වා ඔහු විසින් ආහාරය අනුභව කළ කල්හි පසුව තෙමේ අනුභව කෙළේය. තිරශ්චිනයාගේ අභිප්‍රාය දත්තේයයි කියා රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේට මහත් ඓශ්චර්ය දුන්සේක. ශාස්තෘන් වහන්සේ වදාරණ සේක් මහානෙනි. මොහු දෙදෙන විස්වාසවූවෝ දැන් මතු නොවෙයි පෙරත් විස්වාසවූවාහුයයි කියා මේ ධර්මදේශනාව ගෙණ හැර දක්වා චතුස්සත්‍ය දේශනාව වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ අභිණ්හ ජාතකය නිමවා වදාළ සේක. මේ චතුස්සත්‍ය දේශනාව කිම සියලු ජතකවල ම ඇත්තේය. අපි වනාහි චතුස්සත්‍යය යහ් තැනෙක්හි ආනිසංස පෙණේද එතැන්හි දක්වමු. එසමයෙහි සුනඛතෙමෙ දැන් මේ උපාසක වූයේය. හස්ති තෙම දැන් මේ මහල්ලක ස්ථවිර වූයේය. පණ්ඩිත අමාත්‍යව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මමම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# නන්දි විසාල ජාතකය

තවද එක්සමයෙක්හි අසම ධුර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසන සේක් ෂඩ්වර්ගික භික්ෂූන්ගේ පරුෂතෙපල්ලක් අරභයා මේ ජාතකය වදාළ සේක. එසමයෙහි වනාහි ෂඩ්වර්ගික භික්ෂූහු ඩබරකරන්නාහු ප්‍රියශීලි භික්ෂූන්ට ගර්හා කෙරෙති. අතිවචනශරප්‍රහාර දෙති. දශවිධ ආක්‍රොශ වස්තුවෙන් ආක්‍රෝශ කෙරෙති. භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට දැන්වූවාහුය. භාග්‍යවතුන් වහන්සේ ෂඩ්වර්ගික භික්ෂූන් කැඳවා ගෙන්වා මහාණෙනි ඩබරකරන්නේ සැබෑවදැයි විචාරා වදාරා භාග්‍යවතුන් වහන්සේ සැබැවයි දැන්වූ කල්හි ගර්හාකොට මහණෙනි පරුෂවචනය නම් තිරශ්චිනගතයන්ට ද අමනෝඥවන්නේය. පූර්වයෙහි ද එක් තිරශ්චීනගත සත්වයෙක් තමාට පරුෂ වචනයෙන් කියන්නාහු දස දහසකින් පරාජය කෙළේයයි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස ගන්ධාර රට තක්සලා නුවර ගන්ධාර නම් රජෙක් රාජ්‍යය කෙරෙයි, එකල්හි අප මහාබෝධිසත්වයන් වහන්සේ ගව ජන්මයෙහි උපන් සේක. ඉක්බිත්තෙන් බෝධිසත්වයන් වහන්සේ ලදරු වසුපැටව් කාලයෙහිම එක් බ්‍රාහ්මණයෙක් ගවයන් දෙන්නාවූ දායකයන්ගේ සමීපයට ගොස් ගවයෙක් ලැබගෙන නන්දිවිශාල යයි කියා නමක්කොට පුත්‍රස්ථානන්තරයෙහි තබා බොහෝ ඕහට ප්‍රියවෙමින් කැඳ බත් ආදියද පොෂ්‍ය කරන්නේය. අප මහ බෝධිසත්වයන් වහන්සේ වැඩි වයසට පැමිණි සේක් මම මේ බ්‍රහ්මණයා විසින් දුකසේ රක්ෂාකරණ ලද්දේමි. මා හා සමග සියලු ජම්බුද්වීපයෙහි මා සදාසවීම උසුලන අනික් ගවයෙක් නම් නැත්තේය. එහෙයින් මම තමාගේ බලය දක්වා බ්‍රාහ්මණයාහට මා රක්ෂා කළාට මිළ දුන්නෙමි වීනම් ඉතා යෙහෙකැයි සිතූ සේක. මෙසේ සිතා බෝධිසත්වයන් වහන්සේ එක් දවසක් බ්‍රහ්මණයාට වගකියන සේක් බ්‍රහ්මණය යව ගවයන් ධනකොට ඇති එක් සිටාන කෙණෙකුන් කරා එළඹ මාගේ ගව තෙම එකට බැඳනාලද ගැල් සියයක් අදනේයයි කියා දහසකින් පරදු තබවයි කියේය. ඒ බ්‍රහ්මණ තෙම සිටානන්ගේ සමීපයට ගොස් කථාවක් පහළ කොළෝය. මේ නුවර කවරක්හුගේ ගවයෝ කාය ශක්තියෙන් යුක්ත දැයි කියේය. ඉක්බිත්තෙන් ඕහට සිටුපුත්‍ර කියනුයේ අසවල්හුගේය අසවල්හුගේයයි කියා සියලු නුවරෙහි අපගේ ගොන් හා සදෘශ ගවයෝ නැත්තෝය. බ්‍රහ්මණ තෙම කියනුයේ මාගේ ඒකාබද්ධ කොට බඳනා ගැල් සියයක් අදනට සමර්ථ එක් ගොණෙක් කොයින්දැයි කීහ. බ්‍රාහ්මණතෙම මාගේ ගෙයි ඇත්තේයයි කීයේය. එසේ වී නම් පරදුව තමවයි කීම. යහපත කරන්නේම් කියා දහසින් පරදු කළේය. බ්‍රාහ්මණ තෙමෙ ගැල් සියක් වැලි කැටකැබලි ගළින්ම පුරවා පිළිවෙලින් තබා සියල්ල අකර බඳිනා යොතින් එකට බැඳ නන්දිවිශාල නම් ගවයා නහවා සුවඳින් පසඟුල් දී ග්‍රීවායෙහි මල් පළඳවා පළමු ගැල් ධුරයෙහි හුදකළාවම යොදා තෙමේ ගැල්හි හිඳ කැවිට ඔසවාගෙණ අදුව කූළ උසුලව කූළයි කීයේය. බෝධිසත්වයන් වහන්සේ මේ තෙමේ අකුළුවූ මට කුළුවචනයෙන් කියන්නේ යයි කිසා සතරපය ටැඹක් මෙන් නිශ්චල කොට සිටිසේක. සිටානෝ එකෙණෙහිම බ්‍රාහ්මණයාගෙන් වස්තු දහස ගෙන්වාගත්තෝය. බ්‍රහ්මණ තෙමේ දහසෙකින් පැරදුනේය. ගවයා මුදාහැර ගෙට ගොස් ශෝකයෙන් මඩනාලදුව හොත්තේය. නන්දිවිශාල නම් ගොණා තණ කා ආයේ ශෝකයෙන් මඩනා ලද බ්‍රාහ්මණයා දැක සමීපයට එළඹ බ්‍රාහ්මණය කවර හෙයකින් නිද්‍රාව කරන්නෙහි දැයි කීයේය. දහසකින් පැරදුනා වූ මට නිදි කොයින් දැයි කීය බ්‍රාහ්මණය මෙපමණ කලක් තොපගේ ගෙයි වසන්නවූ මා විසින් කිසි භාජනයක් බිඳපීමක් හෝ කිසිවක් මැඩ මීරිකීමක් හෝ නුසුදුසු තැනෙක්හි මලමුත්‍ර බැහීමක් හෝ කළවිරී දැයි කීයේය. පුත්‍රය එවැනි දෙයක් නැත්තේයයි කීය. එසේ කල්හි මට කවර කාරණයකින් කුළුවාදයෙන් කීයෙහිද?. මේ තෙම තොපගේ දෝෂ වන්නේය. මාගේ දෝෂයෙක් නැත්තේය. යව ඒ සිටානන් හා සමග වස්තු දෙදහසකින් පරදු කොට තබව. හුදෙක් අකුළු වූ මට කුළවාදයෙන් කථා නොකරවයි කීයේය. බ්‍රහ්මණ තෙම මහබෝධිසත්වයන් වහන්සේගේ වචනය අසා ගොස් වස්තු දෙදහසකින් ඇපකොට තබා යට කියන ලද ක්‍රමයෙන්ම ගැල් සියය ඒකාබද්ධ කොට බැඳ නන්දිවිශාල නම් වෘෂභයා සරහා පළමු ගැල්වියෙහි යෙදුයේය. කෙසේ යෙදුයේද යත් විය ගැලෙහි නිශ්චල කොට බැඳ එක් කෙළවරක නන්දිවිශාල නම් වෘෂභයා යොදා එක් කෙළවරක් ගැල්යොතින් වෙළා විය කෙළවර අකුරක ඇණමුල නිසා මුඩුරුක් දණ්ඩක්දී ඒ යොතින් නිශ්චලකොට බැඳ තැබූයේය. එසේ කළ කල්හි විය එයට හෝ මෙයට හෝ නොවන්නේය. එක ගොණෙකු විසින් ඇදගන්නට හැකි වන්නේය. ඉක්බිත්තෙන් ඒ බ්‍රාහ්මණ තෙම ගැලහෙි හිඳ නන්දිවිශාල නම් වෘෂභයාගේ පිට පිරිමැද මාගේ පුත්‍ර වූ යහපත් වෘෂභය මේ ගැල් යෙහෙන් අදුව උසුලුව යහපතැයි කීය. බෝධිසත්වයන් වහන්සේ ඒකාබද්ධව බඳනාලද ගැල් සියය එකවේගයෙන්ම ඇද පසුව සිටි ගැල අභිමුඛයෙහි ගැල පිහිටි තැන තිබූය. ගව ධනය කොට ඇති සිටානෝ පැරද බ්‍රහ්මණයා හට වස්තු දෙදහසක් දුන්නෝය. අනිකුත් මනුශෂයෝද බෝධිසත්වයන් වහන්සේට බොහෝ වස්තු දුන්නාහුය. ඒ සියලු වස්තුව බ්‍රාහ්මණයාහටම වූයේය. මෙසේ බෝධිසත්වයන් වහන්සේ නිසා බොහෝ වස්තුව ලද්දේය. සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහණෙනි පරුෂ වචනය නම් කිසිවක් හටත් මනාප නො වන්නේ යයි ෂඩ්වර්ගික භික්ෂූන්ට ගර්හාකොට ශික්ෂා පද පණවා මෙසේ වදාළසේක. අන්‍යයා හා සමග කථා කරන්නේ චතුර්දෝෂ විරහිත වූ මිහිරිවූ මටසිළුටු වූ මොළොක් වූ ප්‍රියවචනයෙන් ම බිණිය යුත්තේය. කිසිකලෙක්හිත් අමනෝඥ වචනය නො බිණිය යුත්තේය. කුමක් හෙයින්ද? යත් නන්දිවිශාල නම් වෘෂභ තෙම අමනාප වචන කියන්නහුගේ බර නො ඇද පසුව මනාප වූ ප්‍රිය වචනය කියන්නාවූ බ්‍රාහමණයාගේ ගරු භාරය ඇද්දේ යයි මෙසේ සර්වඥයන් වහන්සේ මනෝඥ වචනය බිණිය යුතුයයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මේ නන්දිවිශාල ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි බ්‍රාහ්මණතෙම දැන් මේ කාලයෙහි ආනන්ද ස්ථවිරයන් වූයේය. නන්දිවිශාල නම් වෘශභව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# කණ්හ ජාතකය

තවද එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් යමක ප්‍රාතිහාර්යය අරභයා මේ ජාතකය වදාළ සේක. සර්වඥයන් යමක ප්‍රාතිහාර්යය කොට දිව්‍යලෝකයෙහි වැස මහපවුරුණු දිනයෙහි සකස්පුර දොරට බැස මහත් වූ පිරිවරින් ජේතවනායට වන් කල්හි භික්ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ ඇවැත්නි  තථාගත නම් වූ සර්වඥයන් වහන්සේ නම් අසමධුරසේක. සර්වඥයන් වහන්සේ විසින් උසුලන ලද්දා වූ ධූරය උසුලන්නට සමර්ථ වූ අන් කිසි සත්වයෙක් නම් නැත්තේය. මක්ඛලිගෝසාලාදී වූ ශාස්තෘහු සදෙන අපි යමක ප්‍රාතිහාර්ය කරම්හ. අපි යමක ප්‍රාතිහාර්යය කරම්හයි කියා එක ප්‍රාතිහාර්යකුත් නොකළෝය. සර්වඥයන් වහන්සේ වූකලි ඉතා ආශචර්යයවත්සේකැයි බුදුන්ගේ ගුණ කිය කියා උන් සේක. එකල්හි සර්වඥයන් වහන්සේ අවුත් මහණෙනි දැන් කවර නම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාළසේක. ස්වාමීනි අන් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. නුඹ වහන්සේගේ මෙබදු ගුණ කථාව කිය කියා උනුම්හයි කී කල්හි, මහණෙනි දැන් ඉසුළු ධූරයක් කවරෙක් උසුලා ද පෙර තිරිසන් යොනියෙහි උපන්නාවූ මම මා හා සම ධූරය ඇති කිසිවක්හු නොලද්දේම් වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍ය කරණ කල්හි අප මහා බෝසතාණෝ ගවයෝනිහියෙහි උපන්නාහුය. ඉක්බිත්තෙන් ඔහු බාල්‍ය අවස්ථාවෙහිම ඔහුගේ ස්වාමිදරුවෝ එක් වෘද්ධ වූ ස්ත්‍රියකගේ  ගෙයි වැස නවාතැන් කුලියට  පිරිසිඳ දුන්නාහුය. ඒ වෘද්ධ ස්ත්‍රී මහබෝසතානන් කැඳ බත් ආදීන් පෝෂ්‍යකරන්නී පුත් තනතුරෙහි තබා වැඩුය. ඒ තෙමේ ආර්යකාකාලයෙහි මේ නමින් ප්‍රසිද්ධව වැඩිවිය පැමිණියේය. අඤ්ජනවර්ණව ගම ගොන් හා කැටිව ඇවිදින්නේය. ශීලාචාරයෙන් යුක්තය. ගම් දරුවෝ ඇඟත් කරත් එල්ලීගෙණ ඇවිදිති. වාලඩියත් අල්වාගෙණ ඇවිදිති. පිටට නැගීත් ඇවිදිති. ඒ වෘෂභයා එක් දවසක් මෙසේ සිතුයේය. මාගේ මෑණියෝ දුක්බිතයෝය. මා පුත් තනතුරෙහි තබා වඩා දුකසේ පෝෂ්‍ය කළෝය. එසේ හෙයින් මම බැලමෙහෙකොට මුන් දුප්පත් කමින් මිදුයේ වී නම් යහපත් වන්නේ යයි සිතා එතැන් පටන් බැලමෙහෙයක් සොයමින් ඇවිදින්නේයව. ඉක්බිත්තෙතන් එක් දවසක් සාත්තුනායක පුත්‍රයෙක් පන්සියයක් ගැල් හා සමග විසම වූ ගැඹුරු තොටකට බටයේය. ඔහුගේ ගොන් ගැල් ගොඩගන්න අසමර්ථයෝය. පන්සියයක් ගැල් ගොන් වියඬු පරම්පරායෙන් යොදන ලද්දාහු එකගැලකුත් ගොඩනගාගත නුහුනුවිය. බෝධිසත්වයෝ ද ගොන් හා සමග ඒ ඒ තැන්හි ඇවිදිති. සාත්තුනායක පුත්‍රයාද ගෙන් ලකුණු දත්තේය. එතෙම මේ ගෙරින් අතුරෙහි මේ ගැල් ගොඩගන්න සමර්ථ වූ වෘෂභජාතියෙක් ඇද්දෝහෝයි පරීක්ෂා කරන්නේ බෝධිසත්වයන් දැක මේ අජානීයයා මාගේ ගැල් ගොඩගන්නට සමර්ථවන්නේය. මොහුගේ ස්වාමීදරුවෝ කවුරුදැයි ගොප්ලලන් අතින් විචාලෝය. තවද පින්වත්නි මොහුගේ ස්වාමීදරුවෝ කවුරුන්ද මම මොහු ගැළයොදා ගැල් ගොඩනැගූ කල්හි මිළ දෙමි කිය එකල්හි ගොපල්ලා කියනනේ අල්වාගෙණ යොදාගත මැන. මෙතන මොහුගේ ස්වාමීදරුකෙණෙක් නැතැයි කිය. ඒ සාත්තුනායකයා එබස් අසා ඔහු ලඟට නැහැලනුවක් බැඳ අදනේ සිටිතෙනින් සොළවන්නට අසමර්ථ විය. බෝධිසත්වයෝ වනාහි ගැල් ඇදී කුලී කීකල්හි යෙහි සිතා නොගියාහුය. සාත්තුනායක පුත්‍ර ඔහුගේ අභිප්‍රාය දැන යාච්ඤාකරන්නේ පන්සියයක් ගැල් තොප විසින් ගොඩනැගූ කල්හි එකි එකි ගැලකට කහවණු දෙකක් කුළි කොට දහසක් දෙමි කීය. එකල්හි බෝධිසත්වයෝ තුමුම ගියාහුය. ගැල් සමීපයට ගිය බෝධිසත්වයන් දැක වෘෂභය ගැල්හි යෙදුයේය. එකල්හි බෝධිසත්වයෝ එක වේගයෙන්ම ඔසවා ගොඩනැගූවාහුය. මෙම ක්‍රමයෙන් සියලු පන්සියයක් ගැල්ම ගොඩ නැගුය. සාත්තනායක පුත්‍රතෙම එකී එකී ගැලකට එකි එකී කහවණුවක් බැගින් පන්සියයක් කහවණු පොදිබැඳ ඒ මහාබෝසතානන් කර බැන්දේය. ඒ බලා බෝධිසත්වයෝ මේ තෙම මට දෙමි පළමු නියමකළ කුලී නොදෙන්නේය. එසේ හෙයින් දැන් මොහු යානොදෙම්හයි ගොස් ඇමට පෙරතුම ඉදිරියේ ගැල අසුරාගෙණ සිටියෝය. ඉවත්කරන්නට උත්සහ කරන්නාහු ඉවත්කොට නුහුණුවාහුය. එවෙලෙහි සාත්තුනායක පුත්‍ර සිතන්නේ මේ තෙම තමාට කුලී මදි නියාව දතවනැයි සිතා එකවස්ත්‍රයක දහසින් පොදියක් බැඳ මේ තෙම තොප ගැලනැගූ කුලියයි කියා කරබැඳ එල්වුයේ. මහබෝසතානෝ දහසින් බැඳි පියල්ලගෙණ මෑනියන් සමීපයට ගියාහ. ගම් දරුවෝ ඒ දැක ආර්යකාකාළයන්ගේ කර කිමෙක්දැයි බෝධිසත්වයන් සමීපයට එන්නාහුය. බෝධිසත්වයෝ ඒ කුඩා කොල්ලන් පසුපස්සෙහි දිව ලුහුබඳවා යවා මෑනියන් සමීපයට ගියෝය. පන්සියයක් ගැල් ගොඩනැගූ බැවින් ඇස් රතුව මිරිකී ගියාවූ ස්වරූප ඇතිවූය. වෘද්ධ උපාසිකාවෝ මහබෝසතානන් කරදහසින් බැඳි පියල්ල දැක මුන් විසින් කොයිදී ලබනලදැයි ගොපලු දරුවන් අතින් විචාරා එපවත් අසා දරුව කිමෙක්ද මම තොප ලත් කුළියෙන් ජීවත්වනු කැමැත්තෙම්ද කුමක් සිතා තොපි මෙබඳු වූ දුක් අනුභව කළාහුදැයි කියා මහබෝසතානන් උනුපැනින් නාවා සියලඟ තෙල් ගල්වා පැන් පොවා සප්පාය භෝජනය අනුභව කරවා සන්තර්පණය කොට ජීවිත පර්යාවසානයෙහි බෝධිසත්වයන් හා සමඟ කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. බුදුරජානන් වහන්සේ මහණෙනි සර්වඥයන් වහන්සේ අසමධුරවූසේක් දැන් මතු නොවෙයි පෙරත් අසමධුරවෝවෝම වේදැයි වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ කණ්හ ජාතකය නිමවා වදාල සේක.

SANHIDA LANKA

එසමයෙහි වෘද්ධ ස්ත්‍රී නම් මේ උත්පලවර්ණ මහාස්ථවිරාය. ආර්යකාකාල වෘෂභයා නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසෙක.

# මුනික ජාතකය

තවද එක් සමයෙක්හි මෝහාන්ධකාර භග්නකළා වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් ථුලකුමාරිකාවපලොභනයක් අරභයා මේ ජාතකය වදාල සේක. සර්වඥයන් වහන්සේ සැබෑද මහණ තෝ සර්වඥ ශාසනයෙහි උකටලීවුයේහි දැයි භික්ෂූ අතින් විචාරා වදාළ සේක. එසේය ස්වාමීනි කී කල්හි කුමක් නිසා දැයි විචාරා ථුල්ල කුමාරිකාපලොභනයක් නිසාය ස්වාමීනි කී කල්හි බුදුරජානන් වහන්සේ වදාරණසේක් මහණ තට මෝතොමෝ අනර්ථකාරිය පෙරත් මැගේ විවාහ මගුලේ දී ජීවිත විනාශයට පැමිණ මහජනයාට මාළුවට පැමිණියෙහි වේදැයි ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන කල්හි බෝධිසත්වයෝ එක් ගමෙක එක් කෙළෙඹි පුත්‍රයෙකුගේ ගෙයි ගවයෝනියෙහි උපන්නාහුය. බෝධිසත්වයන්ට මහලෝහිතයෝ යයි නම් තුබුවාහුය. මලනුවන්ට චුල්ලලෝහිතයෝ යයි නම් තුබූහ. ඔවුන් දෙබෑයන් නිසාම ගෙයි කර්මාන්ත සමෘද්ධිව පිරිමැසෙන්නේය. ඒ කුලෙහි එක් කුමාරිකාවක් ඇත්තීය. ඒ කුමාරිකාව නුවර වැසි කුලපුත්‍රයෙක් තමාගේ පුත්‍රයාට විචාළේය. ඇගේ දෙමව්පියෝ කුමාරිකාවකගේ විවාහ කාලයෙහි ආවාවූ අමුත්තන්ට අවුළුවන්නේයයි සිතා කැඳ බත් ලා මුනික නම් ඌරෙකුපොෂ්‍ය කළාහුය. ඔහු දැක චුල්ලලෝහිතයෝ බෑණ ගොණානන්ට කියන්නෝ මේ කුලයෙහි කර්මාන්ත ධුරාව වර්ධනවන්නී අප දෙබෑයන් නිසාම වර්ධන වෙයි. මේ ගෙයි ඇත්තෝ වූ කලී අප දෙදෙනාට තණ හා පිදුරු ලති. මේ සූකරයා කැඳ බතින් නිතිපතාම පෝෂ්‍ය ලබයි. කවර කාරණයෙන් මේ ඌරා කැඳබත් ලබන්නේදැයි විචාළෝය. එකල්හි බෑනවූ කියන්නේ මල චුල්ලලෝහිතයෙනි තෙපි මොහුගේ භොජ්නයට ආලය නොකරව මේ ඌරා මරණ භෝජනය අනුභව කෙරෙයි. මේ කුමාරිකාවගේ විවාහකාලයෙහි ආවාවූ අමුත්තන්ට අවුළුවන්නේ  යයි මේ මනුෂ්‍යයෝ මේ ඌරා පෝෂණය කෙරෙති. මෙයින් කීපදවසක් ගියකල ඒ මනුෂ්‍යයෝ එති එකල්හි මේ ඌරා, දෙකකුල් අල්වා ගෙණ අදනාහු යට ඇඳින් මෑත්කොට මරා අමුත්තන්ට මාලුපිසන්ට ආවා වූහුය. ඔවුන් දැක මුනික නම් ඌරා මරා අනෙක ප්‍රකාරයෙන් මාළු පිසූය. බෝධිසත්වයෝ චුල්ලලෝහිතයන්ට කියන්නෝ දරුව තොප විසින් මුනිකයා දක්නා ලද්දේදැයි විචාලෝය. දක්නා ලද පින්වතුන් වහන්සැයි කී කල්හි ඌරාගේ භොජනයෙහි ඵල කවරේද ඔහුගේ බතට සියක් ගුණයෙන් දහස් ගුණයෙන් අපට තණ හා පිදුරු අනුභව කිරීම උතුම් වන්නේය. නිරවද්‍යය. දීර්ඝ යුෂ්ක ලක්ෂණයෙකැයි කිවුය. බුදුරජාණන් වහන්සේ මහණ තෝ පෙර මේ කුමාරිකාව නිසා ජීවිතක්ෂයට පැමිණ මහජනයාට අවුළු බවට පැමිණියෙහි වේදැයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා  වදාරා චතුස්සත්‍ය ප්‍රකාශ කළ සේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උකටලී මහණ සෝවාන් පෙලෙහි පිහිටයේය. සර්වඥයන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ මුනික ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි මුනික සුකරයා  නම් මේ උකටලී මහණය. එසමයෙහි කුමාරිකාව නම් මේ ථුල්ල කුමාරිකාය. චුල්ලලෝහිත ගොණානෝ නම් ආනන්ද ස්ථවිරයෝය. මහලෝහිත ගොණානෝ නම් තිලෝගුරු සම්මාසම්බුදු රජ වූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# කුලාවක ජාතකය

තවද එක් සමයෙක්හි ධර්මාධිපති වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් පැන් නොපෙරා වැලඳූ එක් භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක. සැවැත්නුවර වාසී වූ යහළු වූ භික්ෂූහු දෙදෙනෙක් දනව්වකට ගොස් එක් ඵාසුතෙනක අදහස් වූ පරිද්දෙන් වැස සර්වඥයන් වහන්සේ දකුම්හයි නැවත එයින් නික්ම ජේතවනාරාමයට අභිමුඛව ගිය සේක. ඒ දෙදෙනා වහන්සේ අතුරින් එක් කෙණෙකුන් වහන්සේගේ අත පෙරහංකඩකින් දියපෙරා වළඳන සේක. ඒ දෙදෙනා වහන්සේම එක් දවසක් විවිධ කොට පෙරහංකඩ ඇති භික්ෂූන් වහන්සේ අනික් තැනැත්තන් වහන්සේට පෙරහංකඩ නොදී තමන් වහන්සේ පැන් පෙරා වැළඳු සේක. අනික් භික්ෂූන් වහන්සේ පෙරහංකඩ නොලැබ පිපාසා ඉවසාගත නොහී නොපෙරා පැන් වැලඳූසේක. ඒ දෙදෙනා වහන්සේම ක්‍රමයෙන් ජේතවනාරාමයට ගොස් බුදුන් වැඳ එකත්පස්ව හුන්සේක. සර්වඥයන් වහන්සේම ක්‍රමයෙන් ජේතවනයට ගොස් බුදුන් වැඳ එකත්පස්ව හුන් සේක. සර්වඥයන් වහන්සේ සුවදුක් කථා කොට කොයිසිට අවුදයි විචාළ සේක. ස්වාමීනි අපි කොසොල් දනව්වෙහි එක් ගමක වැස එයින් නික්ම නුඹවහන්සේ දක්නා පිණිස ආම්හයි කීවෝය. තෙපි දෙදෙනා සමගියා දැයි විචාළ කල්හි පෙරහංකඩ නැති මහණ කියන්නේ ස්වාමීනි. මේ මහණ අතරමගදී මා හා විවාද කොට පෙරහංකඩ නුදුන්නේයයි කියේය. අනික් මහණ කියන්නේ ස්වාමීනි මේ මහණ නොපෙරාම දන දන ප්‍රාණීන් සහිත ජලය වැලඳූයේ වේදැයි කීය. එවෙලෙහි බුදුහු මහණ සැබෑද තෝ දන දන පනුවන් ඇති දිය පරිභෝග කෙළේ දැයි විචාළ සේක. එසේය ස්වාමීනී මා විසින් නොපෙරා දිය වලඳන ලද්දේයයි කීය. එබස් ඇසූ සර්වඥයන් වහන්සේ මහණ පෙර නුවණැත්තෝ දෙදෙව්ලොවට අධිපතිව රාජ්‍ය කෙරෙමින් යුද්ධයෙන් පැරද සමුද්‍රමස්තකයෙන් යන්නා වූ ඓශ්චර්යයක් නිසා ප්‍රාණවධයක් නොකරම්හයි ඒ සා මහත් යසස් හැර ගරුඬපෝතකයන්ට ජිවිතදානය දී රථය වැලකුවෝම වේදැයි වදාරා ඉකුත් වත් ගෙනහැර දක්වා වදාළ සේක.

යටගිය දවස මගධරට රජගහනුවර මගධ රජ්ජුරු කෙණෙක් රාජ්‍යය කරන්නාහුය. එසමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති අප මහා බෝසතාණෝ යම්සේ දන් ශක්‍රදේවේනද්‍රයෝ පූර්වාත්ම භාවයෙහි මගධරට මචල ග්‍රාමයෙහි උපන්නාහු ද එපරිද්දෙන්ම ඒ මචල ග්‍රාමයෙහි මහාසම්පත් ඇති කුලයක පුත්‍රව උපන්නාහුය. ඔවුන්ට නම් තබන දවස් මඝ කුමාරයෝ යයි කියා නම් තුබූය. බෝධිසත්වයෝ වැඩිවිය පැමිණ මඝ මානවකයෝ යයි මෙනමින් ප්‍රසිද්ධ විය. ඉක්බිත්තෙන් උන්ගේ දෙමව්පියයෝ සමජාති ඇති කුලයකින් කුමාරිකාවක් ගෙනවුත් පාවාදුන්නේය. ඒ බෝධිසත්වයෝ දූදරුවන් හා සමග වර්ධනය වෙමින් ධානපති වූහ. නිරන්තරයෙන් පඤ්චසීලය රක්ෂා කෙරෙති, එකල ඒ ගම ගෙවල් තිසෙක් වන්නේය. ඒ තිසක් පමණ මනුෂ්‍යයෝ එක්දවසක් ගම මධ්‍යයෙහි සිට කර්මාන්ත කරන්නාහුය. බෝධිසත්වයෝ සිටිතැන පයින් වැලි පීරා කසල ඉවත් කොට ඒ ප්‍රදේශය සිත්කළු කොට සිටියාහුය. එකල අනිකෙක් අවුත් එතැන්හි සිටියේය. බෝධිසත්වයෝ අනික් තෙනක් කසල හැර සිත්කළු කොට සිටියාහුය. එතැන්හී අනිකෙක් අවුත් සිටියේය. බෝධිසත්වයෝ නැවත අන්තෙනක නැවත අන්තෙනකයයි සියල්ලවුන්ම සිටිතැන් සිත්කළු කොට මැතභාගයෙහි එතන මණ්ඩපයක් කරවූහ. පසුව මණ්ඩපයත් හැර ශාලාවක් කරවූහ. ඒ ශාලාවෙහි සැතපෙන්ට පෝරු අතුට පින් පැන්සලක් තැබ්බවූය. මැතභාගයෙහි ඒ ගම්වැසියෝ දෙතිස් දෙනෙක් බෝධිසත්වයන් හා එක්වූහ. බෝධිසත්වයෝ ඔවුන් තිස්දෙනා පංචශිලයෙහි පිහිටුවා එතැන් පටන් ඔහුන් හා සමග කුසල් කෙරෙමින් ඇවිදිති. ඔවුන් හැමදෙනත් බෝධිසත්වයන් හා සමග කුසල් කරන්නාහු උදෑසනම නැගීසිට වෑ පොරෝ මෝහොල් ගත් අත් ඇතිව සතරමන් සන්ධි ආදීයෙහි මෝලීන් ගල් ඇන උදුර පෙරලත්, රථයක් ආදීයෙහි වැදගත් නාවූ ගල්කපාදමති, විසමතැන් සමකරති. ඒ දඬු ලති, පොකුණු කණිති ශාලාවල් කෙරෙති. දන්දෙති, සිල් රක්ෂා කෙරෙති, මෙසේ බොහෝසේ බෝධිසත්වයන්ගේ අවවාදයෙහි පිහිටා ශිලසංරක්ෂණය කලාහුය එකල්හි ඔවුන්ගේ ගම්මුදලි මෙසේ සිතීය. මම පෙර මේ මනුෂ්‍යයන් රා බොන කල්හි ප්‍රාණගාතාදීය කරණ කල්හි රා සැලකට කහවනුවක් නියායෙන් දඩ මුඩු නොමද අයපඬුරු අරගැනීම් වශයෙන් වස්තුලබමි. දන්වූ කලී මඝමානවකයෝ සිල් රක්වමි කියා ඔවුන් ප්‍රාණගාතාදිය කළ නොදෙති. දන් වනාහි උන්ලවා පන්සිල් රක්වන්නේම් වේදැයි කියා කිපී රජ්ජුරුවන් කරා ගොස් කියන්නේ ස්වාමීනි බොහෝ හොරු එක්ව ගම් පැහැකිරීම් ආදිය කෙරෙමින් ඇවිදිති කීය. රජ්ජුරුවෝ ඔහුගේ වචනය අසා තෝගොස් ඔවුන් හැමදෙනා ගෙණවයි කීවුය. එතෙම ගොස් සියල්ලවුන්ම බැඳ ගෙණ අවුත් රජ්ජුරුවන් වහන්ස සොරුන් ඇමදෙනාම ගෙණනලදැයි රජ්ජුරුවන්ට දන්වීය. රජ්ජුරුවෝ ඔවුන් කළ කාරිය නො විචාරා ශුද්ධනොකටම මුන් ඇමදෙනාම ඇතුන්ලවා මඬව වයි කිවුය. ඉක්බිත්තෙන් ඒ සියල්ලවුන්ම රාජාංගණයෙහි වැදහොවා ඇතු ගෙණවාහු, එකල්හි බෝධිසත්වයෝත් තමන්ගේ සියලු පර්ෂිදට අවවාද කරන්නෝ තොපි සියල්ල සීලයෙන් ආවර්ජනා කරව කේලාම් කී තැනැත්තහු කෙරෙහිත් රජ්ජුරුවන් කෙරෙහිත් ඇතුන් කෙරෙහිත් තොපතොපගේ ශරීරයෙහිත් සමකොට මෛත්‍රී කරවයි කිවුය. ඔවුහුත් එපරිද්දෙන්ම කළාහුය. ඉක්බිත්තෙන් ඔවුන් හැමදෙනාම මඩන පිණිස ඇතුන් අකුස්සෙන් කොටලාහට මෙහෙයාලුය. ඒ ඇත් ලඟට නොවදන්නේය, මහහඬින් හඬා පලායන්නේය. ඒ දැක අනික් ඇතෙකු ගෙණාවාහුය. ඔහුත් එපරිද්දෙන්ම ගියේය. රජ්ජුරුවෝ ඒ අතුන් මිනිසුන් නොමඩනා බැව් දැක මොහුන් අත කිසි ඖෂධයක් වන්ට උවමැනවයි පරීක්ෂා කරවයි කිවුය. පරික්ෂා කරන්නාහු නොදැක නැත රජ්ජුරුවන් වහන්සැයි කිවුය. එසේවීනම් කිසි මන්ත්‍රයක් ඇත. පරික්ෂා කරව තොප පිරිවන මන්ත්‍රයෙක් ඇද්දැයි ඔවුන් අතින් විචාරවයි කීවුය. එබස් අසා රාජපුරුෂයෝ විචාළාහුය. බෝධිසත්වයෝ ඇතැයි කිවුය. රාජපුරුෂයෝ ඔවුන් පිරිවන මන්ත්‍ර ඇතැයි රජ්ජුරුවන්ට දන්වුය. රජ්ජුරුවෝ ඔවුන් හැමදෙනාම සමීපයට කැඳවා තොප දන්නා මන්ත්‍රය කියවයි කිවුය. බෝධිසත්වයෝ

SANHIDA LANKA

කියන්නෝ රජ්ජුරුවන් වහන්ස අනික් අපගේ මන්ත්‍රණයක් නම් නැත්තේය. අපි තිසක් පමණ දෙනා ප්‍රාණවධ නොකරම්හ. සොරකම් නොකරම්හ, කාම මිථ්‍යාචාර නොකරම්හ, බොරු නොකියම්හ, රා නොබොම්හ, මෛත්‍රී භාවනා කරම්හ, දන් දෙම්හ, මං සමකරම්හ, පොකුණු කරම්හ, ශාලා කරම්හ, මේ අපට මන්ත්‍රවන්නේය පිරිතුත් වන්නේය වැඩක් වන්නේයයි කිවුය. එබස් ඇසු රජ්ජුරුවෝ ඔවුන් කෙරහි පැහැද කේලාම් කී තැනැත්තහුගේ සියලු වස්තුවත් ඔහු තුමුත් ඔහුන්ටම පාවාදුන්නේය. ඔහු ඇමදෙනාම එතැන් පටන් කැමති පරිද්දෙන් වඩ වඩා කුශල් කරන්නාහුය. සතර මංසන්ධියෙහි මහත් වූ ශාලාවක් කරම්හයි වඩුවකු කැඳවා ශාලාවක් කරන්නට පටන්ගත්තුය. ස්ත්‍රීන් කෙරෙහි ආලය මදබැවින් ඒ ශාලාව කිරීමට ස්ත්‍රීන් සමාදන් නොකරවූහ.

එසමයෙහි බෝධිසත්ත්වයන්ගේ ගෙයි සුධර්මා, චිත්‍රාය, නන්දාය, සුජාතා යයි ස්ත්‍රී හු සතර දෙනෙක් වෙති. ඔවුන් අතුරෙන් සුධර්මාවෝ වඩුවා හා එක්ව බෑනනි මේ ශාලාවට මා නායක කරවයි කියා අත්ලස් දුන්නුය. වඩුවා යහපතැයි ගිවිස පළමුකොටම කැණිමඩලට දණුඩක් කපා වියලා සැස විත් විද කැණිමඩලකොට නිමවා කඩකින් වසා වෙලා තුබූයේය. ඉක්බිත්තෙන් ශාලාව කොට නිමවා කැණිමඩල උඩනගන අවස්ථාවෙහි අනේ අපි එකක් සිහි නොකළම්හයි කීය, පින්වත කුමක්දැයි කී කල්හි කැණිමඩලක් උවමනා වේදැයි කිය, වන්නාට අපි ගෙණයම්හයි කී කල්හි දූන් කැපුදණ්ඩකින් කරන්ට නොපිළිවන් වන්නේ යයි පළමුකොට කපා සැප විඳ තුබූ කැණිමඩලක් ලදමැණවයි කීය. දූන් කුමක්කරමෝදැයි කී කල්හි ඉඳින් කිසිකෙණෙකුන්ගේ ගෙයි කර්මාන්තකොට නිමවා තුබූ කැණිමඩලක් ඇත්නම් එසේ වූ කැණිමඩලක් සොයවයි කිවුය. ඔහු ඇමදෙන සොයන්නාහු සුදර්මාවන්ගේ ගෙයි තුබූ කැණිමඩල දූක මිලයට ඉල්වා නොලද්දාහ, එකල සුදර්මාවන් විසින් ඉඳින් මා ඒ ශාලාවට එක්කොට ගණුනම් කැණිමඩල දෙන්නෙම්වේදැයි කී කල්හි අපි ස්ත්‍රීන් සමාදන්කොට නොගනුම්හයි කිවුය, එබස් ඇසූ වඩුවා කියන්නෝ ආර්යාවෙනි තොපි ඇම කුමක්කියව්ද, බ්‍රහ්මලෝකය හැර සෙසු ස්ත්‍රීන් නැති තෙනක් නම් නැත කැණිමඩල ඇරගණුව එසේ කල්හි අපගේ කර්මාන්ත වහා සමෘද්ධ වන්නෝයයි කිය ඔහු හැමදෙනා යහපතැයි කියා කැණිමඩල ගෙණ ශාලාවකොට නිමවා ඉන්නා පෝරු අතුට ඒ ඒ තැන පින් පැන්සල් තබ්බවා නිරන්තරයෙන් දුගී මගී යාචකයන්ට දෙන ලෙස කැඳ බත් තැබ්බවුය තවද ඒ ශාලාව වටකොට පවුරක් බඳවා දොරක් ලවා පවුර ඇතුළත වැලි තබ්බවා පවුරේ පිටත තල්පැල පන්තියක් රෝපනය කරවූය. චිත්‍රාවෝත් ඒ ශාලාව සමීපයෙහි උයනක් කරවූය. ඒ උයන මල් පලගන්නාවුත් අසවල්ගසෙක් නැතැයි  නොකියහැකි සියලු ගස්ම ඇත්තේය. නන්දාවෝත් එතනම පොකුණක් කරවූය. ඒ පොකුණ පස්වණක් පියුමෙන් සැදින, සිත්කළුය, සුජාතාවෝ වූ කලි කිසි පින්කමක් නොකරවූය. ඉක්බිත්තෙන් මහබෝසතානෝ මවුන්ට උපස්ථාන කිරීමය, පියන්ට උපස්ථාන කිරීමය, කුල දෙටුවන්ට උපස්ථාන කිරීමය, බොරු නොකිම්ය, පරුෂ වචන නොකීමය, කේලාම් නොකීමය, මසුරුමල දුරුකිරීමය යයි යන සප්ත විධ වූ ව්‍රතසමාදානයන් පූරා

මාතාපෙත්ති භරං ජන්තුං කුලෙජෙට්ඨා පචායිනං
සරණං සඛිල සමභාසං පෙසුණෙය්‍යප්පහායිනං
මචේඡරවිනයෙ යුත්තං සච්චං  කොධාභිභුං නරං
තං චේ දෙවා තාවතිංසා ආහු සප්පූරිසෝ ඉතිං.

මෙසේ ප්‍රශංසා කටයුතු බවට පැමිණ ජීවිතාන්තයෙහි ගොස් තව්තිසා දිව්‍යලෝකයෙහි ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහුය. බෝධිසත්ත්වයනගේ සහාය මනුෂ්‍යයෝද ඒ දිව්‍යලෝකයෙහි උපන්නාහුය. බෝධිසත්ත්වයන්ගේ සහාය මනුෂ්‍යයෝද ඒ දිව්‍යලෝකයෙහි උපන්නාහුය. එකල තවුතිසා භවනයෙහි අසුරයෝ වාසය කරති. ශක්‍රදේවේන්ද්‍රයෝ අපට අසාධාරණ රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්දැයි අසුරයන් දිව්‍යසුරාව පොවා මත්වුවන් දෙකකුල ගන්වා මහමෙරපත්ලේ එලුය. ඔහු ඇමදෙන අසුරභවනයට පැමිණියෝය. අසුර භවනය නම් මහමෙරයට තව්තිසා දිව්‍යලෝකයෙහි ශක්‍රපුරය මෙන් දසදහසක් යොදුන් පමණ තැන් ඇත්තේය. එහි දෙවියන්ගේ පරසතුරුකමෙන් චිත්‍රපාටලී නම් කල්පස්ථායී වෘක්ෂයෙක් ඇත. ඒ අසුරයෝ විචිත්‍රපාටලී වෘක්ෂය මල්පිපී ගිය කල්හි මේ අපගේ දිව්‍යලෝකය නොවෙයි, දිව්‍යලෝකයෙහි පරසතුමල් පිපෙන්නේය. එසේහෙයින් මේ දිව්‍යලෝකය නොවෙයි දනිති. එකල්හි ඔහු ජරා ශක්‍රයා අප සුරාවෙන් මත්කොට මහා සමුද්‍රයට දම්මා අපගේ දිව්‍යලෝකය ගත. එසේ හෙයින් අපි ඔහු හා සමග යුද්ධකොට අපගේ දිව්‍යපුරය ගණුම්හයි ටැඹක් ඔස්සේ නැගෙන්නාවූ කුහුඹුවන් මෙන් මහමෙර ඔස්සේ වටින් වැංගාහුය. එකල්හි ශක්‍රයෝ අසුරයන් විසින් පරද්දවන ලද්දාහූ යෙල සියයක් යොදුන් පමණ ඇති වෛජයන්ත රථයට පැනනැගී ද්ක්ෂිණ සමුද්‍රයාගේ මතු මත්තෙන් යන්ට පටන් ගත්තාහුය.එකල්හී ඒ රථය මුහුදු පිටින් වේගයෙන් යන්නේ කොළ ඉඹුල් වනයට පැමිණියේය. ඒ ශක්‍රයන් යන්නා වූ මාර්ගයෙහි ඉඹුල්වනය, තල් වනයක පතු වැගිරෙන කලක් මෙන් කැඩී කැඩී මුහුදු පිට වැගිරෙන්නේය. ගරුඩපෝතකයෝ මුහුදු පිට පෙරලෙමින් මහහඬින් හැඬුවාහුය. ඒ අසා ශක්‍රයෝ මාතලී නම් රථාචාර්ය වරයා අතින් විචාරන්නේ සබඳ මාතලිය ගරුඬ පැටවුන් අඬන අඬ ඇසෙන්නේය. මේ කුමන ශබ්දයක් දැයි විචාළෝය. ස්වාමීනි නුඹ වහන්සේගේ රථයේ වේගයෙන් ඉඹුල්වනය කැඩි වැගිරෙන හෙයින් ගරුඬ පෝතකයෝ මරණභයින් තැතිගෙණ එකකොළහළ කොට හඬති කීය. එබස් ඇසූ මහ බෝසතානෝ කියන්නෝ සමඳ මාතලීය අප නිසා මොහු පීඩාවට නො පැමිණෙත්වයි අපි ඓශ්චර්යයක් නිසා ප්‍රාණවධයක් නොකරම්හ, මොහුන් නිසා අපි ජීවිතය පරිත්‍යාග කොට අසුරයන්ට ජයදෙම්හ, මාතලිය රථය නවත්වයි කීවුය. පරිත්‍යාගකොට අසුරයන්ට ජයදෙම්හ, මාතලිය රථය නවත්වයි කිවුය. එබස් අසා මාතලී නම් දිව්‍යරථාචාර්යයා රථය වලකා අන්‍ය මාර්ගයකින් දිව්‍යලෝකයට අභිමුඛ කළේය. අසුරයෝ වනාහි ඒ රථය කර කැවුනා දූක ඒකාන්තයෙන් අන් සක්වලකින් ශක්‍රයෝ ආවාහුය. නැවත බලයක් ලදින් රථය

SANHIDA LANKA

වැලැක්කේවනැයි මරණභයින් භයපත්ව පලාගොස් අසුරභවනයට වන්නාහුය. ශක්‍රයෝත් දිව්‍යලෝකයට ගොස් දෙව්ලොව දෙවියන් පිරිවරණ ලදුව නුවර මධ්‍යයෙහි සිටියේය. එකෙණෙහි පොළොව පළාගෙණ දහසක් යොදුන් උස ඇති වෛජයන්ත ප්‍රාසාදය පැනනැංගේය. ජයගෙණ සිටි පසු පැනනැගී බැවින් වෛජයන්තයයි කියා එම ප්‍රාසාදයට නම් විය. ඉක්බිත්තෙන් ශක්‍රදේවේන්ද්‍රයෝ නැවත අසුරයන් නොඑන පිණිස පස්තෙනක රැකවල් ලැවුය. මහමේරුපර්වතයාගේ ප්‍රථමාලින්දයෙහි නාගරාක්ෂයන් සිටවුය. චතුත්ථාලින්දයෙහි යක්ෂයන් සිටවුය. පංචමාලින්දයෙහි සතරවරන් මහරජදරුවන් සිටවුය. මෙසේ පංචස්ථානයක ආරක්ෂාව තබා ශක්‍ර දේවේන්ද්‍රයෝ දිව්‍යසම්පත් අනුභව කරන්නාහුය.

එකල සුධර්මාවෝ මනුෂ්‍යලෝකයෙන් චුතව අවුත් ඒ ශක්‍රදේවේන්ද්‍රයන්ටම පාදපරිචාරිකාව උපන්නාහුය. කැණිමඩල දුන් කුශලයෙන් ඒ සුධර්මාවන්ට පන්සියයක් යොදුන් උස ඇති සුධර්මානම් මාණික්‍ය සභාවක් පහළ විය. ඒ දිව්‍යසභාවෙහි ධවලච්ඡත්‍රයයට යොදුනක් පමණ ස්වර්ණපර්යායකයක හිඳ ශක්‍රදේවේන්ද්‍රයෝ දිව්‍යමනුෂ්‍යයන්ගේ කාර්යකාර්ය විචාරන්නාහුය. චිත්‍රාවෝත් චුතව ඒ ශක්‍රදේවේන්ද්‍රයන්ටම පාදපරිචාරිකාව උපන්නාහුය. උයනකරවූ කුශලයෙන් ඔවුන්ට චිත්‍රානම් උයනෙක් පහළ විය. නන්දාවෝත් චුතව අවුත් ඒ ශක්‍රදේවේන්ද්‍රයන්ටම පාදපරිචාරිකාව උපන්නා හුය. උයනකරවූ කුශලයෙන් ඔවුන්ට චිත්‍රා නම් උයනෙක් පහළ විය. නන්දාවෝත් චුතව අවුත් ඒ ශක්‍රදේවේන්ද්‍රයන්ට පාදපරිචාරිකාව උපන්නාහුය. පොකුණ කැණවූ කුශලයෙන් උන්ට නන්දානම් පුෂ්පකරණියෙක් පහළ විය. සුජාතාවෝ වූ කලී කුශලයක් නො කළ බැවින් එක්වනයෙක කඳුරැළියෙක කෙකෙණියෙක්ව උපන්නාහුය. ශක්‍රදේවේන්ද්‍රයෝ සුජාතාවන් නොදැක කොතනැක උපන්නාවූදැයි හෝයි පරික්ෂා කරන්නෝ එහි උපන්නියාහු දැන එතනට ගොස් ඒ කෙකින්න හැරගෙණ දිව්‍යලෝකයට ගොස් සිත්කළු වූ දිව්‍යපුරයත් සුදර්මා නම් දිව්‍යසභාවත් චිත්‍රලතා වනයත් නන්දා නම් පුෂ්පකරණීයත් ඒ කෙකින්නට දක්වා මොහු හැමදෙනාම කුශල්කොට මට පාදපරිචාරිකාව උපන්නාහුය. තෝ වූකලී කුශල්නොකොට තිරිසන් යෝනියෙහි උපන්නෙහිය. මෙතැන් පටන් ශිලසංරක්ෂණය කරවයි අවවාදකොට පංචශිලයෙහි පිහිටුවා ඒ කඳුරැළියට ගෙණගොස් අළුවාහුය. ඒ කෙකිණිත් එතැන් පටන් පන්සිල් රක්නීය. ශක්‍රදේවේන්ද්‍රයෝ කීපදවසක් ගියකල මෝ තොමෝ සිල්රකින්නට සමර්ථදෝහෝයි විචසන පිණිස එතනට ගොස් මත්ස්‍ය රූපයක් මවාගෙණ බඩපෑ ඉදිරියෙහි වැදහොත්තාහුය. ඒ කෙකිණිතොමෝ මළාවූ මත්ස්‍යයෙක් දෝහෝයි සංඥායෙන් ඉගපටි ඩැහැගතමත්ස්‍යය නගුටසෙලවි, එකල්හි ඒ කෙකිණි මේ මත්ස්‍යයා ජීවත්වන්නේ යයි ඇරපුව, ශක්‍රදේවේන්ද්‍රයෝ ඒ දැක යහපත යහපත ශිල්රක්නට තෝ සමර්ථ යෙහි යයි සාධුකාර දී ගියාහුය. ඒ කෙකණි එයින් චුතව බරණැස්නුවර කුඹල් කුලයක උපන ශක්‍රදේවේන්ද්‍රයෝ කෙකිණි කොයි උපන්දෝහෝයි පරික්ෂා කරන්නාහු කුඹල්කුලයෙහි උපන්නියාව දැන රන්කැකිරෙන් ගැලක් පුරාගෙණ ගම් මධ්‍යයෙහි මහළු වේශයකින් ඉඳ කැකිරිගණුවයි අඬගා කියති. මනුෂ්‍යයෝ අවුත් ස්වාමීනි දුනමැනවයි කීහ. ඒ අසා ශක්‍රයෝ කියන්නෝ මම ශිල සංරක්ෂණය කරණකෙණෙකුට දෙමි තෙපි ශිල්රකුදැයි  විචාළෝය. එබස් ඇසූ මනුෂයෝ අපි ශිල්රැකිම්නම් කෙසේ වූ දෙයකැයි නොදනුම්හ. මිලයට දෙවයි කිවාහුය. මට මිලයෙන් ප්‍රයෝජනයක් නැත. ශිල් රක්ෂාකරණ කෙණෙකුන්ටම දෙමියි ශක්‍රයෝ කීවාය. මනුෂ්‍යයෝ මේ තෙම යම්කිසි නළවන්නෙකැයි කියා ගියෝය. සුජාතාවෝ එපවත් අසා මට ගෙණ එනලද්දේවනැයි ගොස් ස්වාමීනි දුනමැනවයි කීය. මැනියනි ශිල් රකුදැයි විචාළෝය. එසේය රකිමි කී කල්හි මා විසින් මේ කැකිරි තොපට ම ගෙණ එනලද්දේයයි කියා ගැල හා සමග ඇගේ ගේ දොරතබා ගියෝය. ඒ ස්ත්‍රී ද දිවිපමණින් ශිල්රක්ෂා කොට එයින් චුතව වෙපචිත්තිය නම් අසුරසුරෙන්ද්‍රයාට දූව උපන. ශිල්රැකි අනුසයින් විශිෂ්ට රූ ඇති උව,  ඉක්බිත්තෙන් ඒ වෙපචිත්තිනම් අසුරෙන්ද්‍ර තෙමේ අසුරකන්‍යාව වැඩිවිය පැමිණිකල්හි මාගේ දූ තමාට අභිප්‍රාය පුරුෂයකු ගණුවයි කියා අසුරයයන් රැස්කරන්නට විය. එකල්හි ශක්‍රදේවේන්ද්‍රයෝ ඒ සුජාතා දූන් කොයි උපන්නෝදෝහෝයි පරික්ෂා කරන්නෝ අසුරු භවනෙහි උපන් නියාව දැන සුජාතාවන් අභිප්‍රාය වූ පුරුෂයකු ගනිමියි කියා අල්වන්නීයයි අසුරවේශයක් මවාගෙණ ඒ අසුරයන් රැස්වූ තෙනට ගියෝය. එකල සුජාතාවන් සරහා අසුරයන් සමීපයට ගෙණ වුත් තොපට අභිප්‍රාය වූ වල්ලභයකු අල්වාගනුවයි කීහ. ඕ තොමෝ බලන්නී ශක්‍රයන් දැක පූර්වස්නෙහ වශයෙන් මේ මාගේ වල්ලභයායයි අත් අල්වාගත. ශක්‍රදේවේන්ද්‍රයෝ ඒ සුජාතාවන් ශක්‍රපුරයට ගොණ ගොස් අඩුතුන්කෙළක් නාටකස්ත්‍රීන්ට ප්‍රධාන කොට තබා සම්පත් අනුභව කරන්නාහු ආයු පමණින් සිට කම් වූ පරිද්දෙන් මියපරලොව ගියෝය. ශාස්තෘන් වූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා මහණෙනි පෙර නුවනැත්තෝ දිව්‍යරාජ්‍යය කරන්නාහු තමන්ගේ ජීවිතය පරිත්‍යාගකොට ප්‍රාණඝාත නොකොළෝ වේද තෝ වූකලී මෙබඳු වූ නෛර්යානික ශාසනයෙහි මහණව ප්‍රාණීන් සහිත නොපෙරුපැන් අනුභව කෙළෙහිවේදැයි ඒ භික්ෂුහට නින්දාකොට පූර්වාපර සන්ධි ගළපා මේ කුලාවක ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි මාතලී සංග්‍රහකනම් මෙසමයෙහි ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි ශක්‍රදේවේන්ද්‍රව උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# නච්ච ජාතකය

තවද එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් බහුභාණ්ඩික එක් භික්ෂු කෙණෙකුන් අරභයා මේ ජාතකය වදාළ සේක. මෙහි වර්තමාන කථාව යට කියන ලද දේවධර්ම ජාතකයෙහි කියනලද්ද හා සදෘශය සර්වඥයන් වහන්සේ ඒ මහණහට වදාරණසේක් මහණ තෝ බහුභාණ්ඩික වූයේ සැබෑද කිම් දැයි වදාළ සේක. ස්වාමීන් වහන්ස එසේයයි දැන්වූ කල්හි කවර කාරණයකින් තෝ බහුභාණ්ඩික වූයෙහි දැයි වදාළ සේක, ඒ මහණතෙම මෙපමණක් අසාම කිපුනේ අඳනා පොරෝනා සිවුරු දමා දැන් මේ ආකාරයෙන් ම හැසිරෙමි කියා සර්වඥයන් අඳනා පොරෝනා සිවුරු දමා දැන් මේ ආකාරයෙන් හැසිරෙමි කියා සර්වඥයන් වහන්සේ අභිමුඛයෙහි නග්නව සිටියේය. මනුෂ්‍යයෝ ඕහට නින්දාවේවයි කීවාහුය, එතෙම එයින් දිවගොස් ගිහිවූයේය. මනුෂ්‍යයෝ ඕහට නින්දාවේවයි කිවාහුය. එතෙම එයින් දිවගොස් ගිහිවූයේය. භික්ෂූහු දම්සභායෙහි රැස්ව උන්නාහු බුදුරජානන් වහන්සේගේ ඉදිරියෙහි මෙබන්දක් කෙළේ යයි කියා ඔහුගේ නුගුණ කථා කීවාහුය බුදුරජානන් වහන්සේ එතනට වැඩ වදාරා මහණෙනි මේ දම්සභාවෙහි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උන්නාහුදැයි භික්ෂූන්ගෙන් විචාරා වදාළසේක. ස්වාමීන් වහන්ස ඒ භික්ෂූන් වහන්සේ නම් නුඹ වහන්සේගේ ඉදිරියෙහි සිව්වනක් පර්ෂත් මධ්‍යයෙහි හිරිඔතප් දෙක හැර ගම් ළදරුවෙකු මෙන් නග්නව සිට මනුෂ්‍යයන් විසින් පිළිකුල් කරණු ලබන්නේ ගිහිව ශාසනයෙන් පිරිහුනේ යයි කියා ඔහුගේ නුගුණ කථාව කිය කියා උනුම්හයි දැන්වූහ. සර්වඥයන් වහන්සේ මහණෙනි ඒ මහණ හිරි ඔතප් නැතිව සර්වඥ ශාසනයෙන් පිරිහුනේ දැන් මතු නොවෙයි පූර්වෙහි ස්ත්‍රීරත්න ප්‍රතිලාභයෙන්ද පිරිහුණෝමයයි වදාරා ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස ප්‍රථම කල්පයෙහි සිව්පාවෝ සිංහයකු රජ කළාහුය. මත්ස්‍යයෝ ආනන්ද නම් මත්ස්‍යයා රජ කළාහුය. පක්ෂීහූ ස්වර්ණහංසයා රජකළාහුය. ඒ ස්වර්ණහංසයාගේ වනාහි ධීතෲවූ හංසපොතිකාව විශිෂ්ට රූ ඇත්තීය. හංසරාජතෙම ඒ හංසධෙනුවට වරයක් දුන්නේය. ඕතොමෝ තමාගේ සිතට රුචි වූ ස්වාමියකු ප්‍රාර්ථනා කළාහුය. හංසරාජතෙම තමාගේ දුවනියන්ට වරය දී හිමාලය වනයෙහි සියලු පක්ෂීන් රැස්කරවූයේය. අනේකප්‍රකාරවූ හංස, මයුරාදී පක්ෂි සමූහයෝ රැස්ව එක් මහත් වූ පහණතෙලෙක්හි රැස්වූවහුය. හංසරාජතෙම තමහට සිත්කළු වූ ස්වාමියෙකු අවුත් ගන්වයි කියා දුවනියන් කැඳවූයේය. හංසධේනුතොම පක්ෂි සමුහයා බලන්නී මැණික්වන් ග්‍රීවය ඇති විසිතුරු පත් ඇති මයුරයකු දැක මේ තෙම මට ස්වාමි වේවායි කැමතිවුවාහුය. පක්ෂි සමූහයෝ මයුරයා කරා එළඹ මෙසේ කීයාහුය. යහළු මයුරය මේ හංසරාජයාගේ දුවනියෝ මෙපමණ පක්ෂීන්ගේ මධ්‍යයෙහි ස්වාමියෙකු කැමතිවන්නී තොප කැමතිවූවායයි කිවාහුය. එවෙලෙහි මයුර තෙම දැන්ම වනාහි මාගේ බලය නුදුටුයෙහි දැයි කියා ඉතා සතුටු හිරි ඔතප් දෙක බිඳ පළමුකොට මහත්වූ පක්ෂි සමූහයාගේ මැද පක්ෂපත්‍රටන් දිගුකොට නටන්නට පටන් ගත්තේය නෘත්‍ය කරණුයේ නොසැඟවුනා වූ වර්ජස්මාර්ගය ඇතිවූයේය. ස්වර්ණහංසරාජතෙම ලජ්ජාවට පැමිණියේ මොහුට අධ්‍යාත්මිකව පහළ වන්නා වූ හිරිද නැත්තේය. බාහ්‍යව පවත්නා වූ භයද නැත්තේය. හිර ඔතප් දෙක බිඳුනා වූ මොහුට මාගේ දුවනියන් නොදෙමි කියා පක්ෂි සමූහයා මධ්‍යයෙහි මෙසේ කීසේක. මයුරය තාගේ ශබ්දය මනොඥය, පිටත සිත්කළුය, ග්‍රී වයද වෛඩූර්යය මාණික්‍යයෙහි වර්ණ හා සදෘශය, තාගේ පිංජභාරයෝද ව්‍යාම මාත්‍රයහ, මෙසේ රූපීවූවද හිරි ඔතප් දෙක බිඳ නෘත්‍ය කළ හෙයින් මෙබඳු ලජ්ජා නැත්තා වූ තොපට මාගේ දුව නෙදෙමි කියා හංසරජ එම පර්ෂත් මධ්‍යයෙහිම තමාගේ බෑනා වූ හංසපොතකයාහට තමාගේ දුවනි වූ හංසධේනුව දුන්සේක. මයුරතෙම හංසපෝතිකාව නොලැබ ලජ්ජාව එයින් පැන නැගී ගියේය, හංසරජ ද තමා වසන තැනටම ගියේය. ශාස්තෲවූ බුදුරජානන් වහන්සේ මහණෙනි, මේ මහණ හිරිඔතප් දෙක බිඳ රත්න ශාසනයෙන් පිරිහුනේ දැන් මතු නොවෙයි පෙරත් ස්ත්‍රීරත්නය ලැබීමෙන්ද පිරිහුනේමයයි වදාරා මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගලපා මේ නච්ච ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි මයුරතෙස දැන් මේ බහුභාණ්ඩික මහණවූයේය. හංසරාජව උපන්නෙම් වනාහී තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේම්දැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# සම්මෝදමාන ජාතකය

තවද එක්සමයෙක්හි ශාක්‍යකුලතිලකවූ බුදුරජානන් වහන්සේ කිඹුල්වත්පුරය ආශ්‍රය කොට නිග්‍රෝධාරාමයෙහි වැඩවාසය කරණසේක් සුඹුළුඩබරක් අරභයා මේ ජාතකය වදාළසේක. එය කුණාල ජාතකයෙහි මතු ප්‍රකාශ වන්නේය, ඒ කාලයෙහි වනාහි බුදුරජානන් වහන්සේ නෑයන්ට ආමන්ත්‍රණය කොට මහරජදරුවෙනි නෑයන්ගේ ඔබ්මොබ විවාද කිරීම නම් නුසුදුසුය. තිරශ්චිනගතයෝද පූර්වභාගයෙහි සාමාග්‍රීව වසන්නාහු පසමිතුරන් මැඩපැවත යම් දවසක විවාදකළාහු ද එකල්හි මහත් විනාශයට පැමිණියාහු යයි වදාරා නෑ රජදරුවන් විසින් යාච්ඤාකරණලදුව ඉකුත්වත් කථාව දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ කල්හි අප මහාබෝසතානන් වහන්සේ වටුජන්මයෙහි ඉපිද නොයක් දහස්ගණන් වටුවන් පිරිවර කොට ඇතිව අරණ්‍යයෙහි වසන සේක එකල්හි එක් වටුවැද්දෙක් ඒ වටුවන් වසනතැනට ගොස් වටුවන්ගේ හැඬීම කොට ඔවුන් රැස්වූ බැව්දන ඔවුන්ගේ මතයෙහි දැළදමා කෙළවරෙහි පටන් මඩිමින් සියල්ලවුන් එක්තැන් කොට පැසපුරවාගෙට ගොස් ඒ පැටවුන් වීකොට ඒ මිලයෙන් ජීවිකාව කරන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් බෝධිසත්වයන් වහන්සේ ඒ වටුවන්ට කියන්සේක් මේ පක්ෂි වැදිතෙම අපගේ නෑයන් විනාශයට පමුණුවන්නේය. මම එක් උපායෙක් දනිමි. මේ තෙම යමක්හු විසින් අප අල්වාගන්නට නොහැකිවන්නේද අද මෙතැන් පටන් මේ වැද්දා විසින් අප අල්වාගන්නට නොහැකිවන්නේද අද මෙතැන් පටන් මේ වැද්දා විසින් තොපගේ මත්තෙහි දැල දමූ කල්හි එකෙක් එකෙක් එකෙකි දැල් ඇසෙක් හිස තබා දැල ඔසවා කැමති තැනකට ගෙණ ගොස් එක් කටුලැහැබෙක්හි බහව එසේ දමු කල්හි යට ඒ ඒ තැනින් දිවම්හයි කී සේක. ඒ සියල්ලෝ යහපතැයි කියා පිළිගත්තාහුය. දෙවැනි දිනයෙහි මත්තෙහි දැල දමු කල්හි බෝධිසත්වයන් විසින් කියන ලද ක්‍රමයෙන් ම දැල ඔසවා එක් කටුලැහැබෙක්හි බහා තුමු යටි දිසාවෙන් ඒ ඒ තැනින් දිවගියාහුය. ලැහැබින් දැල මුදාගන්නා වූ වටුවැද්දාහට විකාලය වූයේය. ඒ තෙම හිස් අතින්ම ගියේය. දෙවැනි දිනයෙහි පටන් වටුවෝ එසේම කරන්නාහුය. ඒ වැදිද සූර්යාගේ හසතංගමනය දක්වා දැල මුදමින් කිසිවක් නොලැබ සිසතින්ම ගෙට යන්නේ. ඉක්බිත්තෙන් ඔහුගේ භාර්යාව කිපී තොපි දවසකින් පාසා සිතතින් එන්නෙහිල, අනිකුදු තොපගේ පිටත රක්ෂාකරණ තැනෙක් ඇතැයි සිතම් කීවාය. වැදිතෙම කියනුයේ සුන්දරාංගණිය මට අන් රක්ෂා කරණ තැනක් නැත්තේය. වැළිදු වනාහි ඒ වටුවෝ සමගිව හැසිරෙති මා විසින් දැල දමු පමණකින්ම දැල ගෙණ කටුලැහැබෙක්හි දමා යන්නාහුය. ඔහු හැම කල්හිම සමගිව වාසය නොකරති. තෙපි නහමක් සිතව, යම් දවසක ඔහු විවිදයට පැමිණියාහුද, එකල්හි ඒ සියල්ලවුන් ම මරා තිගේ මුහුණ සතුටුකරවමින් ගෙණ එන්නෙමි කියා භාර්යාවට කියේය. වටු පක්ෂිහු විවිද නොකරන්නාහු දැල ගෙනයති. ඒ පක්ෂිහු යම් කලෙක්හි විවාද කෙරෙද්ද එකල්හි මාගේ වසඟබවට පැමිණෙති. එකල්හි ඔවුන් ගෙණ තිගේ මුහුණ සතුටු කරවමින් එම්කියා භාර්යාව අස්වැසුයේය. කීප දවසක් ඇවෑමෙන් එක් වටුවෙක් ගොදුරුබිම බස්නේ නොසලකා අනිකක්හුගේ ඉස ඇක්මවිය අනික් වටුවා මාගේ හිස කවරෙක් ඇක්මිදැයි කියා කිපුනේය. මම නොසලකා ඇක්මවිම නොකිපෙවයි කී කල්හිද කිපුනේය. මම නොසලකා ඇක්මවීම නොකිපෙවයි කී කල්හි ද කිපුනේමය ඔහු නැවත නැවත කියන්නාහු තෙපිම දැල ඔසවන්නෙහි යැයි සිතම් කියා ඔහුනොවුන් විවිද කළාහුය. ඔහු නොවුන් විවාද කරණ කල්හි බෝධිසත්වයන් වහන්සේ විවිද කරන්නවුන් කෙරෙහි යහපතෙක් නම් නැත්තේය. දැන්ම ඔහු දැල නොඋසුලන්නාහු එයින් මහත් විනාශයට පැමිණෙති. වැව්දිතෙම අවසර ලබන්නේය මා විසින් මෙතැනිහ් වසන්ට නොහැකියයි සිතුසේක. බෝධි සත්වයන් වහන්සේ තමන් පර්ෂිත් ගෙණ අන්තැනකට ගියසේක. වටුවැදිවනාහි කීපදවසකින් අවුත් වටුහඬින් හඬා රැස්වුවාවූ ඔහුන්ගේ මුදුනෙහි දැල බැහුයේය. ඉක්බිත්තෙන් එක් වටුවෙක් දැල උසුලන්නා වූ තාගේ වනාහි මස්තකයෙහි රෝමයෝ පතිතවූවාහුය. දැන් ඔසවයි කීයේය. අනිකෙක් දැල ඔසවන්නා වූ තාගේ වනාහි පක්ෂපතතත්‍රදෙකෙහි සත්‍රයෝ පතිතවූවාහුය. දැන් උසුලවයි කීයේය. මෙසේ ඔවුනොවුන් තෝ උසුලව තෝ උසුලවයි කියද්දීම වැදිතෙම දැල ඔසවා සියලු වටුවන් එක්කොට පැස පුරා භාර්යාව හාස්‍ය කරවමින් ගෙට ගියේය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මෙසේ මහරජ නෑයන්ගේ ඩබරනම් නුසුදුසුය. ඩබරකිරීම් විනාශයට කාරණයයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වෝපර සන්ධි ගළපා මේ සමෝද්මාන ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි නුවනැති වටුවානස් දැන් මේ දේවදත්ත ස්ථවිරයෝය. ප්‍රඥාවන්ත වටුව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම ම වේම්දැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මත්ස්‍ය ජාතකය

තවද එක්සමයෙක්හි ලෝකාලෝකදිවාකර වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් පුරාණ දුතියිකා පලෝගනයක් අරභයා මේ ජාතකය වදාළ සේක. එසමයෙහි සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක. එසමයෙහි සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූහට සැබෑද මහණ තෝ උකටලී වී දැයි විචාළසේක. සැබෑව ස්වාමීනි දැන් වූ කල්හි කවුරුන් විසින් උකටලීකරණ ලද්දේ දැයි විචාළසේක. ස්වාමීනි මාගේ පුරාණ භාර්යා තොමෝ මාකෙරෙහි බලවත්වූ සෙනහ ඇත්තීය එසේ හෙයින් ඈ ඈරුපියන්ට අනතර්කාරිණියි කීය. ඉක්බිත්තෙන් සර්වඥයන් වහන්සේ ඕහට වදාරණ සේක් මහණ ඒ ස්ත්‍රී අනතර්කාරිණිය. පෙරත් තෝ ඈ නිසාම මරණයට පැමිණ මා නිසා මරණින් මිදුනෙහි වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ කල්හි අප මහා බෝසතානෝ ඒ රජ්ජුරුවන්ට පුරෝහිතව උපන්නාහුය. එසමයෙහි කෙවුලෝ ගඟට දැල් දැමුය. ඉක්බිත්තෙන් එක් මහා මත්ස්‍යයෙක් රතික්‍රිඩා වශයෙන් තමාගේ මත්ස්‍යධෙනුව හා සමග කෙළිමන් එන්නේය. ඔහුගේ ඒ මත්ස්‍යධෙනුතොමෝ පෙරත්තුව යන්නී ජලගන්ධය ආඝ්‍රාණය කොට දැල වළහා ඉවතින් ගියාය. ඒ කාමයෙහි ගිජුවූ ලොල් මත්ස්‍යයා දැල් කුසයටම  වන්නේය. කෙවුලෝ ඔහු දැලට වන් නියාව දැන දැල ඔසවා මත්ස්‍යයා ගෙණ නොමරා වැලිමත්තට දමා මොහු අඟුරේම පලහා කම්හයි ගිණිකොට අඟුරු බසිති, උල් සසිති මත්ස්‍යයා ඒ අඟුරේ පැලහීමවත් උලින් ඇනීමවත් අනික් දුකේවත් මට පීඩා නොකරන්නේය. ඒ මත්ස්‍යධෙනුව තොමෝ මාගේ ස්වාමීයා මත්ස්‍යයා අන් මත්ස්‍යධේනුවක හා සමඟ ගියෝදෝහෝයි යම් දොම්නසකට පැමිනේ නම් ඒ මට පීඩාකරන්නේයයි වැලි මත්තේ වැදහෙව අඬනේය. එසමයෙහි පුරෝහිත බමුණානෝ තමන්ගේ පරිවාරසමූහයා විසින් පිරිවරණලදුව නහන පිණිස ගන්තෙරට අවුය. ඒ මහබෝසතානෝ වූ කලී සියලු සත්වයන්ගේ බස් දනිති. එසේ හෙයින් ඒ මත්ස්‍යයා අඬන අඬ අසා සිතන්නෝ මේ මත්ස්‍යයා කාමරතියෙන් අඬන්නේ මෙසේ කෙලාශතුර වූ සිත් ඇතිව මියන්නා වූ මේ තෙම නරකයෙහි උපදන්නේය. එසේ හෙයින් මම ඕහට පිහිටවෙම්හයි කෙව්ලන් සමීපයට ගොස් කියන්නෝ එම්බා පින්වත්නි තෙපි අපට එක්දවසකුත් ව්‍යංජනයකට මත්ස්‍යයෙකු නොදෙව් දැයි කිවුය. එබස් ඇසූ කෙව්ලෝ කියන්නෝ ස්වාමීනි කුමක් කියන සේක්ද නුඹවහන්සේ කැමති මත්ස්‍යයෙකු ඇරගෙණ ගිය මැනවයි කිවුය. මහබෝසතානෝ කියන්නෝ අපට අන් මත්ස්‍යයෙකුගෙන් ප්‍රයෝජන නැත. මේ මත්ස්‍යයාම දෙවයි කිවුය. කෙවුලන් විසින් ගතමැනවයි ස්වාමීනි කී කල්හි මහබෝසතානෝ ඒ මත්සයා දෑතින් ඔසවාගෙණ ගන්තෙර හිඳ එම්බල මත්ස්‍යය ඉදින් මම තා අද නුදුටු යෙම්වීම් නම් මරණයට පැමිණෙන්නෙහි වේදැයි මෙතැන් පටන් කෙලශ වසඟ නොවෙවයි අවවාදකොට ඒ මත්ස්‍යාය දියට හැර නුවරට වන්නාහුය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාවගේ කෙළවර උකටලී මහණ සෝවාන් පෙලෙහි පිහිටි සේක. සර්වඥයන් වහන්සේත් පූර්වාපර සන්ධි ගළපා මේ මත්ස්‍ය ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි මත්ස්‍යධෙනුව නම් දැන් පුරාණ දුතියිකාය, මත්ස්‍ය නම් උකටලී මහණය, පුරෝහිත බ්‍රාහ්මණ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# වට්ටක ජාතකය

තවද එක්සමයෙක්හි සද්ධර්ම කෙතුක වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ මගධරට සැරිසරා ඇවිදිනාසේක් ලැවුගිනි නිවීමක් අරභයා මේ ජාතකය වදාළ සේක.

එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ මගධරට සැරිසරා ඇවිදිනාසේක් එක්තරා මගධ ග්‍රාමයක පිඬුසිඟා ඇවිද වළඳා ඉක්බිති භික්ෂූ සමූහයා පිරිවරා මගට පිළිපන් සේක. එසමයෙහි මහත් වූ ලැවුගින්නෙක් නැංගේය. ඉදිරියෙහිත් පස්සෙහිත් බොහෝ භික්ෂූහුය. ඒ ලැව්ගිනි එකධූමව එකජවාලව මැඩගෙණ එන්නේය. එතැන්හි සමහර පෘථජ්ජන භික්ෂූකෙනෙකුන් වහන්සේ මරණ භයින් භයපත්ව මේ එන ගින්නට අපි ඉදිරියෙහි ගිනිලම්භ මේ ගින්නෙන් දාගියතැන් ලැව්ගිනි නො දවන්නේ යයි කියා ගිනිදඬු මැත් කොට ගිනිගානසේක. ඒ දැක සමහර භික්ෂූ කෙණෙකුන් වහන්සේ මෙසේ කී සේක. ඇවැත්නී. තෙපි කුමක් කරව්ද ආකාශ මධ්‍යයෙහි සිට චන්ද්‍රමණ්ඩලයත් නැගෙණහිරිසක්වළින් නැගෙන්නාවූ දහසක් රස්මීන් හෙබියා වූ සූර්ය මණ්ඩලයත් වෙලාන්තරයෙහි සිට සමුද්‍රයත් මහමෙර සමීපයෙහි සිට මහමෙරත් නොදත්තවුමෙන් දෙව්මිනිස් සහිත වූ ලොවට අග්‍රපුද්ගල වූ තොප හා සමග යන්නාවූ සම්‍යක් සම්බුදුරජානන් වහන්සේ නො බලා පටග්ගිදානය දෙම්හයි කියව බුදුබල නොදනුව වර තොපි බුදුන් සමීපයට යම්හයි කියා ඉදිරියෙහිත් යන්නාවූ ඒ සියලු භික්ෂූන් වහන්සේම එක්ව දශබලධාරී වූ බුදුරජානන් වහන්සේ සමීපයට ගියසේක. සර්වඥයන් වහන්සේ මහත් වූ භික්ෂූසංඝයා පිරිවරා එක්තරා ප්‍රදේශයක වැඩසිටිසේක. එකල ලැවුගිනි මඩනාක් මෙන් බුරමින් එන්නේය. මෙසේ එන්නා වූ ලැව්ගිනි බුදුන් සිටි තැනට පැමිණ ඒ ප්‍රදේශයට හාත්පසින් සොළොකිරියක් පමණ තැනට පැමිණ දියෙහි ගලා නිවාපු තණ සුලක්මෙන් නිවිගියේය. එකල්හි භික්ෂූන් වහන්සේ බුදුන්ගේ ගුණ කියන්නට පටන් ගත්සේක. මේ සිත් පිත් නැති ගිනිපවා බුදුන් සිටි තැන් මැඩගෙන එන්ට අසමර්ථ විය දියෙහි ගලාපු තණ සුලක්මෙන් නිවිගියේය. සර්වඥවරයන්ගේ ආනුභාව නම් ඉතා ආශ්චර්යයි මෙසේ බුදුගුණ කියන්ට පටන්ගත් සේක.සර්වඥයන් වහන්සේගේ ගුණ නම් ඉතා ආශ්චර්යය සේක නොදතහැක්කේය. මේ සිත් පිත් නැති ගිනිපවා බුදුන් සිටි තැන් මැඩගෙණ එන්ට අසමර්ථි වීය. දියෙහි ගලාපු තණ සුලක්මෙන් නිවිගියේය. සර්වඥවරයන්ගේ ආනුභාව නම් ඉතා ආශ්චර්යයි මෙසේ බුදුගුණ කියන්ට පටන් ගත්සේක. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ගේ කථාව අසා මහණෙනි මේ මාගේ දැන් මල නොවෙයි මේ භූමිප්‍රදේශයට පැමිණ මේ ගිනි නිවියේ නම් මේ වූකලි මාගේ පුරාතනයෙහි සත්‍යක්‍රියා බලවන්නේය. මේ ප්‍රදේශය ප්‍රාතිහාර්යයයෙක් වන්නේයයි වදාළසේක. එකල්හි ආයුෂ්මත් වූ ආනන්ද මහා තෙරුන් වහන්සේ බුදුන් වැඩහිඳිනා පිණිස සඟලසිවුර සතරපට කොට පැණ වූසේක. එහි සර්වඥයන් වහන්සේ පලක් බැඳ වැඩහුන් සේක. භික්ෂූසංඝයා වහන්සේත් බුදුන් පිරිවරා වැඩහුන්සේක. එකල්හි සර්වඥයන් වහන්සේ භික්ෂූන් විසින් ස්වාමීනි මේ වුකලි අපට ප්‍රකාශය අතීත කථාව භවයෙන් පටිච්ඡන්න හෙයින් අප්‍රකාශය ඒ අතීත කථාව අපට ප්‍රකාශ කොට වදාළමැනවැයි භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස මගධරට එම ප්‍රදේශයෙහි බෝධිසත්වයෝ වටුයෝනියෙහි පිළිසිඳගෙණ මව්කුසින් බිහිව බිජුවට ගසාගෙණ නික්මුණු කල්හි මහත් වූ පෙදවටසා පමණ වටු පැටවෙක් වූයේය. ඉක්බිත්තෙන් ඔහු දෙමව්පියෝ කැදැල්ලේ වැදහොවා මුවතුඩින් ගොදුරු ගෙණවුත් පෝෂ්‍ය කෙරෙති. ඒ බෝධිසත්වයන්ට පක්ෂප්‍රහාර කොට ආකාශයෙන් යන්ට නිසිබලයෙක්වත් දෙපස ඔසවා ගොඩ ගමන් කරන්ට බලයෙක්වත් නැත. ඒ ප්‍රදේශය ද අවුරුද්දක් අවුරුද්දක් පාසා ලැවුගිනි ගන්නේය. ඒ ලැව්ගිනි එසමයෙහිත් මහහඬින් බුරමින් ඒ ප්‍රදේශයෙහි ගිනි ගත්තේ. ඒ දැක පක්ෂිය සමූහයා තම තමන්ගේ කැදැල්ලෙන් නික්ම මරණ භයින් භයපත්ව හඬමින් යන්නාහුය. බෝධිසත්වයන්ගේ දෙමව්පියෝ මරණ භයින් භයපත්ව බෝධිසත්වයන් හැර පියා පලාගියාහුය. බෝධිසත්වයෝ කැදැල්ලේ වැදහෙවම කර ඔසමා මැඩගෙණ එන්නා වූ ලැව්ගිනි දැක මෙසේ සිතූය. ඉදින් මට පක්ෂප්‍රහාර කොට ආකාශයෙන් යන්ට කිසි බලයෙක් වේනම් ආකාශයට පැනනැගී අනික් තැනකටයෙමි, මාගේ දෙමව්පියෝත් මරණභයින් භයපත්ව මා උදකලා කොට හැර තමන් රැකෙමින් ගියෝය. දැන් මට අන් පිළිසරණෙක් නැත. සරණයක් පිහිටක් නැත්තේම් මා විසින් අද කුමක් කටයුතුදෝහෝයි සිතූහ. තවද බෝධිසත්වයන්ට එකල මෙසේ වූ සිතිවිල්ලක් වුයේය. මේ ලෝකයෙහි ශීලගුණ නම් වූ දෙයක් ඇත. සත්‍යගුණ නම් වූ දෙයක් ඇත. යටගිය දවස පාරමීධර්මයන් පුරා බෝමැඩ හිඳ සම්‍යක් සම්බෝධිඥාන සමධිගමනය කළා වූ ශීලසමාධි ප්‍රඥාවිමුක්තිඥාන දර්ශනයෙන් යුක්ත වූ සියල්ලන් කෙරෙහි පතළා වූ මෛත්‍රී කරුණා ක්ෂාන්තියෙන් යුක්ත වූ සියලු සත්වයන් කෙරෙහි සමව පැවැත්තාවූ මෛත්‍රී භාවනාව ඇති සර්වඥවරයෝ නම් ඇත ඔවුන් විසින් ප්‍රතිවෙධකරණ ලද ධර්ම ගුණ නම් දෙයක් ඇත. මා කෙරෙහිත් එක් සත්‍යයක් ඇත. එසේ හෙයින් අතීතයෙහි උපන්නා වූ සර්වඥවරයන් හා ඔවුන් විසින් ප්‍රතිවේධකරණ ලද ගුණධර්මය ආවර්ජනය කොට මා කෙරෙහි විද්‍යාමාන වූ සත්‍ය සත්‍යක්‍රියා කොට ගිනිවළකා අද මා විසින් මටත් සෙසු පක්ෂීන්ටත් ස්වාස්ථ්‍යයක් කිරීම වටනේයයි සිතූය. ඉක්බිත්තෙන් බෝධිසත්වයෝ අතීතයෙහි පිරිනිවියා වූ සර්වඥයන් වහන්සේගේ ගුණ සලකා තමන් කෙරෙහි විද්‍යමාන වූ සත්‍යස්වභාවය උදෙසා සත්‍යක්‍රියා කරන්නාහු මෙසේ කිවුය. ඉදින් මාගේ පක්ෂපාත්‍රයන් විදා ආකාශයෙහි නොයාහැකි බවත් හස්තපාදයන් ඇති බවත් ඔසවා නොයාහැකි බවත් දෙමව්පියන් මා කැදැල්ලේම දමා ගිය බවත් සත්‍යයද ඒ සත්‍යයෙන් ජාතවෙදය ඉවත්ව යායි කියා කැදැල්ලෙහි වැද හෙව සත්‍ය ක්‍රියා කළෝය. ඒ බෝධිසත්වයන්ගේ සත්‍ය ක්‍රියා හා සමග සොළොස් කිරීයක් පමණ තැන් නිවි ගිනි ඉවත්ව ගියෝය. ගිනි පසුබස්නේත් දවාගෙණ වනයට නොගියේය. වැලි කුමක් කළෝදයත් දියෙහි ගලාපු තණසුලක් මෙන් එතැන්හිම නිවී ගියේය. ඒ

SANHIDA LANKA

මහාබෝධිසත්වයන් විසු වාසස්ථානය මේ පියලුම කපමුලුල්ලෙහි ගින්නක් වැද නොගන්නා බැවින් කල්පස්ථායි වූ ප්‍රාතිහාර්යය නම් විය. මෙසේ මහබෝසතානෝ සත්‍යක්‍රියා කොට ජීවිතාන්තයෙහි කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියේය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මහණෙනි, මේ වනය ගින්නෙන් නොදැයේ දූන් මාගේ බලයෙක් නොවෙයි පුරාතනයෙහි වටුව උපන්කල මාගේ සත්‍යක්‍රියා බලයෙකැයි මේ ධර්මදේශනාව ගෙණ හැර දක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍යායාගේ කෙළවර සමහර කෙණෙකුන් වහන්සේ සෝවාන් වු සේක. සමහර කෙණෙකුන් වහන්සේ සකෘදාගාමී වූසේක. සමහර කෙණෙකුන් වහන්සේ අනාගාමී වූසේක. සමහර කෙණෙකුන් වහන්සේ රහත් වූසේක. බුදුරජානන් වහන්සේ  පූර්වාපර සන්ධි ගලපා මේ වට්ටක ජාතකය නිමවා වදාල සේක. එසමයෙහි දෙමව්පියෝ නම් දූන් මේ දෙමව්පියෝමය. එසමයෙහි වටු රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේකි.

SANHIDA LANKA

# සකුණ ජාතකය

තවද එක්සමයෙක්හි ජගදානන්දකර වූ බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් දහනය වූ පන්සලක් ඇති භික්ෂු කෙණෙකුන් අරභයා මේ ජාතකය වදාළ සේක.

එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ වනාහි සර්වඥයන් වහන්සේගේ සමීපයෙන් කමටහන් ගෙණ දෙව්රම් වෙහෙරින් නික්ම කොසොල් දනව්වෙහි එක් පසල්ගමක් නිසා එක් අරණ්‍යයෙක්හි සෙනස්නෙක වසන සේක්. ඉක්බිත්තෙන් පළමුවැනි මාසෙහිම උන්වහන්සේගේ පන්සල දහනය වූයේය. ඒ භික්ෂූන් වහන්සේ මාගේ පන්සල දහනවූයේය. දුකින්ම වසමි කියා මනුෂ්‍යයන්ට කිසේක. මනුෂ්‍යයෝ දූන් අපගේ කෙත වියළුනේය, කෙතට දිය හෙලාකොට දෙම්හ. දිය හෙලූ කල්හි බිජු වපුටකොට දෙම්හ. බිජු වපුල කල්හි වැටකොට වැටකළ කල්හි නෙලායයි කියාද දාසඳයයි කියාද මැඩවයි කියාද මෙසේ මේ ක්‍රියාව දක්වමින් ම තුන්මසක් කල්යවුවාහුය. ඒ භික්ෂූන් වහන්සේ තුන්මසක් අභ්‍යවකාශයෙහි දුකින් වසන සේක් කමටහන් වඩා විශේෂයක් උපදවාගන්ට නොහැකි වූ සේක. පවුරුණුකොට වනාහි සර්වඡයන් වහන්සේගේ සමීපයට ගොස් නමස්කාර කොට එකත්පසෙක හුන්සේක. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන් හා පිළිසඳර කථාකොට කිමෙක්ද මහණ, සැපසේ වස් විසුයෙහිද තොපගේ කමටහන් මස්තකප්‍රාප්ත වූයේදැයි විචාළෙ සේක. ඒ භික්ෂූන් වහන්සේ ඒ ප්‍රවෘත්තිය කියා මට සෙනසුන් සප්‍රාය නැති හෙයින් කමටහන් මස්තකප්‍රාප්ත නුවූයේ යයි දූන්වූසේක. සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහණෙනි, පෙර තිරශ්චිනගතයොත් තමහට සප්‍රායා සප්‍රායා දූනගත්තාහුය. තොපි කවර කාරණයකින් නොදත්තාහු දූයි වදාරා ඉකුත්වත් කථාව වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහාබෝසතානෝ තිරශ්චීන පක්ෂි ජන්මයෙහි ඉපද පක්ෂි සමූහයා විසින් පිරිවරණ ලදුව අරණ්‍ය ප්‍රදේශයෙක්හි ශාඛාවෙල පින් සමුද්ධ වූ මහත් වෘක්‍ෂයක් ආශ්‍රය කොට වාසය කරණසේක. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ වෘක්‍ෂයාගේ ශාඛාවෙන් ඔබ්මෙබ ගැටෙන කල්හි සුනු වැගිරෙන්නේය. දුම් නැගෙන්නේය. ඒ දක බෝධිසත්වයන් වහන්සේ සිතනසේක් මේ ශාඛාවෝ දෙදෙන මෙසේ ඝර්ෂණයට ඝර්ෂණයව ගිනි පහළ වන්නේය. ගිනි පරඬුල්පත් ගන්නේය. එතැන්පටන් මේ වෘක්ෂයද දවන්නේය. මෙතැන්හි අප විසින් වසන්නට නොහැකිය. මෙයින් දිවගොස් අන් තැනකට යන්ට වටනේයයි සිතූ සේක. මෙසේ සිතා බෝධිසත්වයන් වහන්සේ පක්ෂි සමූහයාට මෙසේ කිසේක් යම් වෘක්ෂයක් පක්ෂීහු ආශ්‍රය කළෝද ඒ වෘක්ෂය ගිනිහරගත්තේය. වකුවූ ග්‍රීවය හා පක්ෂපත්‍ර ඇති හෙයින් වක්කංග නම් වූ පක්ෂිණී ඒ ඒ දිගුන් සේවනය කරව අපට  පිහිටවූ වෘක්ෂයෙන්ම ගිනිවැද භය උපන්නේය. එහෙයින් වරෙව අන්තැනකට යම්හයි ගියාහුය. යම් කෙණෙක් නුවණැත්තෝද ඔහු මේ පරිද්දෙන්ම මෙතම බින්දුවක් පමණ දියෙහි මෙතෙම කිඹුලන් දක්නේයයි කියා බෝධිසත්වයන් වහන්සේගේ වචනය නොගෙණ එතැන්හිම විසුවාහුය. ඉක්බිත්තෙන් නොබෝ කලකින් බෝසතානන් විසින් සිතූ ආකාරයෙන්ම  ගිනි පහළව ඒ වෘක්‍ෂය ගිනිගත්තේය. දුම්ද ගිනිදලුද නැගී කල්හි දුමින් අන්ධ වූ පක්ෂීහු අන්තැනකට යන්ට නොහැකිවුවාහු ගින්නෙන් වැටි වැටීම විනාශයට පැමිණියාහුය. බුදුරජානන් වහන්සේ මෙසේ වදාරා මහණ පෙර තිරශ්චිනයෝත් දහණ වෘක්‍ෂාග්‍රවල වසන්නාහු තමන්ට සප්‍රායා සප්‍රාය දූන ගත්තාහුය. තෙපි කවරහෙයකින් නොදත්තෙහි දූයි කියා ධර්මදේශනාව ගෙණහැර දක්වා චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාළ සේක. චතුස්සත්‍යය දෙශනාවගේ කෙළවර ඒ භික්ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටිසේක. බුදු රජානන් වහන්සේද පූර්වාපර සන්ධි ගළපා සකුණ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි බෝසතානන්ගේ අවවාදය කළා වූ පක්ෂීහු දූන් බුදුපිරිස් වුවාහුය. නුවැනැති පක්ෂිව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# තිත්තිර ජාතකය

තවද එක්සමයෙක්හි සසර කතරින් එතර කරණ හෙයින් ගැල්සාත්තු වාහකයක්හු වැනි වූ සර්වඥයන් වහන්සේ සැවැත්නුවරට වඩනා සේක් සැරියුත් මහතෙරුන් වහන්සේට සෙනසුන් වැළැකීමක් අරභයා මේ ජතකය වදාළ සේක.

අනේපිඬු මහසිටානන් විසින් විහාරය කරවා දූතයන් යැවූ කල්හි ශාස්තෘන් වහන්සේ රජගහනුවරින් නික්ම විශාලාමහනුවරට පැමිණ එහි කැමති පරිද්දෙන් වාසය කොට සැවැත් නුවරට එමි කියා මගට පිළිපන්සේක. එසමයෙහි වනාහි ෂඩ්වර්ගික භික්ෂූන්ගේ අතවැසි භික්ෂූන් අභිමුඛව ගොස් ස්ථවිරයන් වහන්සේලාට සෙනසුන් නොගත් කල්හිම මේ සෙනස්න අපගේ උපාධ්‍යයන් වහන්සේටය මේ සෙනස්න ආචාරීන් වහන්සේටය මේ සෙනස්න අපටම වන්නේ යයි කියා සෙනසුන් වලකාත්, පසුව ආවාවූ ස්ථවිරයන් වහ්නේසලා සෙනසුන් නො ලබන්නාහුය. සැරියුත් මහතෙරුන් වහන්සේගේ ද අතවැසි භික්ෂූහු ස්ථවිරයන් වහන්සේට සෙනස්න සොයන්නාහු නොලද්දාහුය. සැරියුත් මහතෙරුන් වහන්සේ සෙනස්නක් නොලැබමින් සර්වඥයන් වහන්සේගේ සෙනස්නට නුදුරු තැනැක්හි එක් වෘක්ෂ මූලයෙක්හි හිඳීමෙන්ද සක්මන් කිරීමෙන්ද කල්යැවූසේක. සර්වඥයන් වහන්සේ අළුයම් වෙලෙහි පිටතට නික්ම කැසපිසේක. තෙරුන්ව වහන්සේ ද කැසපි සේක, මේ තෙමේ කවරෙක්ද ස්වාමීන් වහන්ස මම ශාරිපුත්‍රයෙමි කී සේක. ශාරීපුත්‍රස්ථවිරය මේ වෙලාවෙහි මෙතැන්දි කවරක් කරන්නෙහිදැයි වදාළ සේක. සැරියුත් මහතෙරුන් වහන්සේ මේ ප්‍රවෘත්තිය දැන්වූ සේක. ශාස්තෘන් වහන්සේ ස්ථවිරයන් වහනේසේගේ බස් අසා දැන් වනාහි මා ජීවත් ව ඉන්දදී භික්ෂූහු ඔවුනොවුන් ගෞරව නැත්තෝය. ආදර නැත්තෝය. පිරිනිවන් පෑ කල්හි කවරක් කරන්නාහුදෝයි ආවර්ජනා කරන්නාහට ධර්මසංවේගය පහළ වූයේය. සර්වඥයන් වහන්සේ රාත්‍රිය පහන් වූ කල්හි භික්ෂු සංඝයා රැස් කරවා භික්ෂූන්ට වදාරණසේක් මහණෙනි. ශඩ්වර්ගික භික්ෂු පෙරටු පෙරටුව ගොස් ස්ථවිර භික්ෂූන් වහන්සේලාට සෙනසුන් වැලකුවෝ සැබෑදයි විචාරා වදාළ සේක. භාග්‍යවතුන් වහන්ස සැබෑවයි කිවාහුය. ඉක්බිත්තෙන් ෂඩ්වර්ගික භික්ෂූන්ට ගර්හාකොට ධර්ම කථාව වදාරා භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට මහණෙනි. අග්‍ර ආසන අග්‍ර උදෙක අග්‍ර පිඬු කවරක්හට ලබන්ට සුදුසුදැයි විචාරා වදාළසේක. සමහර භික්ෂූහු ක්‍ෂත්‍රිය කුලයෙන් පැවිදි වූයේය. සමහර කෙණෙක් බ්‍රහ්මණ කුලයෙන් මහණවූයේය, ග්‍රහපති කුලයෙන් මහණ වූයේය. ඔවුන්ට සුදුසුයයි කීවාහුය. සමහර කෙණෙක් විනයධර භික්ෂූහුය. ධර්මකථික භික්ෂූහුය ප්‍රථමංධ්‍යානලාභීය, ධිතියංධ්‍යානලාභීය, තෘතියධ්‍යානලාභීය, චතුර්තංධ්‍යානලාභීය. කිවාහුය. සමහර කෙණෙක් සෝවාන්ය. සකෘදාගාමීය.අනාගාමිය, අර්හත්ය, ත්‍රිවිද්‍යාවට පැමිණියාහ ෂඩ්අභිඥාවට පැමිණියාහුයයි කීවාහුය. මෙසේ ඒ භික්ෂූන් විසින් තමන්ගේ අභිප්‍රාය වශයෙන් අග්‍ර ආසනාදියට සුදුසු භික්ෂූන් කී කල්හි සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහණෙනි. මාගේ සාසනයෙහි අග්‍ර ආසනාදියට පැමිණ ක්‍ෂත්‍රිය කුලයෙන් පැවිදිවුයේ පමණ නොවෙයි බ්‍රාහ්මණ කුලයෙන් පැවිදිවුයේ පමණ නොවෙයි ගෘහපති කුලයෙන් පැවිදි වූයේ පමණ නොවෙයි විනයධර තැනැත්තේ ද පමණ නොවෙයි සූත්‍රාන්තික තැනැත්තේද පමණ නොවෙයි අභිධර්ම දන්නා තැනැත්තේද පමණ නොවෙන්නේය. ප්‍රථමධ්‍යානාදී වූ ධ්‍යානලාභීහුද පමණ නොවන්නේය. ශ්‍රෝතාපත්‍යාදී වූ මාර්ගඵල ලාභීහුද පමණ නොවන්නේය. වැලිදු වනාහි මහණෙනි මේ ශාසනයෙහි පටි පාටිය වූ පරිද්දෙන්ම වැඳිම ද හුනස්නෙන් නැගීමද අඤ්ජලිකම්ද, ආදර කියාද, කටයුත්තේය. අග්‍ර ආසනය අග්‍ර උදකය අග්‍ර පිණ්ඩිත ලැබ්බ යුත්තේය. මෙහි මේ ප්‍රමාණය ඒ කාරණයෙන් වැඩිමහලු භික්ෂූන් වහන්සේ මෙකී දෙය ලැබීමට සුදුසුය දැනුදු වනාහී මහණෙනි ශාරිපුත්‍රස්ථවිර තෙම මාගේ අග්‍රශ්‍රාවකය මා අනුව ධර්මචක්‍රයට පවත්නේය මට අනතුරුව සෙනස්න ලබන්නට සුදුසුය. ඒ ශාරිපුත්‍රස්ථවිර තෙම මේ රාත්‍රියෙහි සෙනස්නක් නොලබනසේක් වෘක්‍ෂ මූලයෙක්හි කල්යවු සේක. තෙපි දැන්ම මෙසේ ගෞරව නැතිව ආදර නැතිවුවාහුය. කල් යත්යත් කවරක් කොට වසන්නාහුදැයි කියා ඉක්බිත්තෙන් ඒ භික්ෂූන්ට අවවාද දෙනු පිණිස මහණෙනි පෙර තිරශ්චිනගතයෝද මෙසේ විසීම අපට සුදුසු නොවන්නේය. අපි ඔහුන් ගරු නොකොට ආදර නොකොට අසභායවෘත්තීව වාසය කරම්හ. අප අතුරෙන් මහලු යමක්හු දැනගෙණ ඕහට අභිවාදනාදිය කරම්හයි කියා යහපත් සේ පරීක්ෂා කොට මේ තෙම අපට මහළුයයි දැන ඕහට අභිවාදනාදීය කොට දිව්‍යලොක මාර්ගය පුරමින් ගියාහුයයි වදාරා ඉකුත්වත් කථාව වදාළ සේක. යටගිය දවස හිමාලවනයාගේ පාර්ෂවයෙක්හි එක් මහා න්‍යග්‍රෝධ වක්‍ෂයක් ආශ්‍රය කොට තිත්තිරය, වානරය, හස්තියයි කියා යහළුවෝ තුන් දෙනෙක් වාසය කළාහුය. ඔහුන් තුන්දෙන ඔවුනොවුන් ගරු නොකොට ආදර නොකොට සභාගීවෘත්තියෙන් යුක්තවූවාහුය. ඉක්බිත්තෙන් ඔවුන්ට මෙබඳු වූ සිතෙක් වූයේය. කෙබඳු සිතෙක්ද, අපට මෙසේ වාසය කරන්නට නුසුදුසුය. අපි අපගෙන් යමෙක් මහළුද ඕහට වන්දනාමානාදී කෙරෙමින් වාසයකළමෝ නම් ඉතා යෙහෙකැයි සිතුවාහුය. අපගෙන් කවරෙක් වෘද්ධතරදැයි සිතා එක්දවසක් මෙයට උපායෙක් ඇතැයි සිතා තිත්තිරය වානරය හස්තිය යන තුන් දෙනාම නුගරුකක් මුල්හි හිඳ තිත්තරය වානරය යන දෙදෙනා හස්තියා සමීපයෙන් විචාළාහුය. යහළු හස්තිය තෙපි මේ නුගරුක කවරක් ප්‍රමාණ කල් තැන්පටන් දන්නෙහි දැයි විචාළාහ. හස්තිතෙම කියනුයේ සබඳිනි. මම ලා පැල කල්හී මේ නුගගස බඩයට කොට ගියෙමි. යට කොට සිටි කල්හි වනාහි මේ වෘක්‍ෂයාගේ මුදුන් ශාකාව මාගේ නාභිය ගැයෙන්නේය. මෙසේ මම මේ වෘක්‍ෂය පැලකල් පටන් දන්නෙමි කීය. නැවතත් තිත්තිරය හස්තිය යන දෙදෙනා පූර්වයෙහි කියනලද ක්‍රමයෙන්ම වානරයාගෙන් විචාළාහුය. වානරතෙම කියනුයේ හයළුවෙනි මම වානරපැටවා වුයෙන් බිමහිඳ ග්‍රීවය නොඔසවාම මේ නුගපැලැටියගේ අක්දළු කෑයෙමි. මෙසේ මම මේ නුගවෘක්‍ෂය කුඩාකල් තැන් පටන් දන්නෙමි කීයේය. ඉක්බිත්තෙන් වානරයාය හස්තියාය යන දෙදෙනා

SANIDA LANKA

පූර්වයෙහි කියනලද ක්‍රමයෙන්ම තිත්තිර පණ්ඩිතයෙන්ගෙන් විචාළාහුය. තිත්තිර පණ්ඩිතයෝද කී සේක. යහළුවෙනි පූර්වයෙහි අසවල්නම් තැන මහත් නුග වෘක්ෂයෙක් වූයේය. මම ඒ වෘක්ෂයාගේ ඵලයක් අනුභවකොට මෙතැන්හි වර්චස් එලූයෙහි. එයින් මේ වෘක්ෂය හටගත්තේය. මෙසේ මම මේ වෘක්ෂය හටගත් කල් තැන් පටන් දන්නෙමි එසේ හෙයින් මම තොපට වැඩියෙන් ජාතියෙන් වෘද්ධතරයෙමි කීසේක. මෙසේ කී කල්හි වානරයාද හස්තියාද තිත්තිර පණ්ඩිතයන්ට කියන්නාහු නුඹ වහන්සේ අපට වැඩියෙන් වෘද්ධතරය අද මෙතැන් පටන් අපි නුඹ වහන්සේට සත්කාර ගරුකාර වන්දනාමානාදී වූ පූජාවෙන්ද වැඳීමය හුනස්සෙන් නැගීමය අඤ්ජලීකර්ම සාමීචිකර්මයන්ද කරම්හ. නුඹ වහන්සේගේ අවවාදයෙහි ද සිටම්හ. නුඹ වහන්සේ වනාහි මෙතැන් පටන් අපට අවවාද අනුශාසනා දෙවයි කිවුය. එතැන් පටන් තිත්තිර පණ්ඩිතයන් වහන්සේ ඔහුන්ට අවවාද දුන්සේක. ශිලයෙහි පිහිටවූසේක. තෙමෙත් පඤ්ශීලය සමාදන්ව රක්ෂා කළසේක. ඔහු තුන්දෙනම පඤ්ශීලයෙහි පිහිටුවා ඔහුනොවුන් ගෞරව ඇති ව සදෘශ වූ ප්‍රවෘත්ති ඇතිව ජීවිතයාගේ කෙළවර දිව්‍යලෝකයෙහි උපන්නාහුය. ඔහුන් තුන්දෙනාගේ සිල්සමාදන්වීම තිත්තර බ්‍රහ්මාචාර්යය නම් වූ යේය. මහණෙනි තිරශ්චිනගත වූ ඔහු වනාහි ඔහුනොවුන් ගෞරව සහිතව සත්කාර සහිතව වාසය කළාහුය. තෙපි මෙසේ යහපත් කොට දෙසනලද ධර්මය ඇති මාගේ ශාසනයෙහි පැවිදිව කවරහෙයකින් ඔවුනොවුන් ගෞරව නැතිව  ආදර නැතිව වාසයකරන්නාහුද? මහණෙනි මෙතැන් පටන් සඟ මහළු පිළිවෙළින් වැඳීමය හුනස්නෙන් නැගීමය අඤ්ජලීකර්මය සාමීචිකර්මය මහණ වූ පිළිවෙළින් අග්‍ර ආසනය අග්‍ර උදකය අග්‍ර පිණ්ඩය යන මේ සියල්ල මෙතැන් පටන් තොපට අනුදනිමි. අභිනව මහණවූවාහු විසින් වෘද්ධතරයාහට නොවැලක්විය යුත්තේය. යමෙක් වැලැක් වූයේ වී නම් දුක්කටප්තති යයි වදාරා මෙසේ සර්වඥයන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා මෙසේ වදාළ සේක. වෘද්ධපචායන ධර්මයෙහි දක්ෂ වූ යමෙක් කුලවෘද්ධ, ගුණවෘද්ධ, වයොවෘද්ධ, තුන්දෙනා කෙරෙන් ගුණවෘද්ධ වයොවෘද්ධ යන දෙදෙනාහට පූජා කෙරේද ඔහු  ඉහතාත්මභාවයෙහි ප්‍රශංසාහී වෙති. මෙලොව හැර යායුතු පරලොවෙයි සුගතියට යන්නාහු වෙති මහණෙනි. ක්ෂත්‍රීයයෝ වෙත්වයි බ්‍රාහ්මණයෝ වෙත්වයි වෛශ්‍යයෝ වෙත්වයි ක්ෂුද්‍රයෝ වෙත්වයි ගෘහස්තයෝ වෙත්වයි ප්‍රව්‍රජිතයෝ වෙත්වයි තිරශ්චිනගතයෝ වෙත්වයි යම් කිසි සත්ව කෙනෙක් ජ්‍යෂ්ඨපචායන කර්මයෙහි දක්ෂ වූවාහු ගුණයෙන්  යුක්තවූ වයෝවෘද්ධයන්ට ආදර කෙරෙත්ද. ඔහු මේ ආත්ම භාවයෙහිද ජ්‍යෂ්ඨපචායන ක්‍රියාව කළාහු යයි ප්‍රශංසා ලබන්නාහුය. කරජකායයාගේ භෙදයෙන් සවර්ගීලෝකයෙහි උපදනා වූ යයි වදාළ සේක. මෙසේ ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ ජ්‍යෂ්ඨාපචායන කර්මයාගේ ගුණ වදාරා පූර්වාපර සන්ධි ගලපා මේ තිත්තිර ජාතකය නිමවා වදාල සේක.

එසමයෙහි හස්තියා නම් දූන් මහාමෞද්ගල්‍යායන ස්ථවිර වූ සේක. වඳුරා නම් ශාරිපත්‍ර ස්ථිවිර වූ සේක. තිත්තිර පණ්ඩිතව උපන්නෙමි වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# බක ජාතකය

තවද ලෝකස්වාමී වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජෙතවන විහාරයෙහි වැඩවසන සමයෙහි චීවර වෘද්ධිකයකී නම් එක් භික්ෂුවකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාරණලදී. ඒ කෙසේද යත්, දෙව්රම්වෙහෙර වැඩ වසන එක්කෙණෙකුන් වහන්සේ කඩ කැපීම් ගෙත්තම් කිරීම ආදියෙහි දක්ෂ සේකි. එසේ හෙයින් උන්වහන්සේට චිවර වඩ්ඩකී නම් විය දිරාගිය රෙදි කැබලි ගෙණ හස්තකර්මාන්ත දක්වා සිවුරු ගෙත්තම් කොට රඳා සුරැකිව තබන සේක.

සිවුරු ගෙත්තම් කරන්ට නොදන්නා භික්ෂූන් වහන්සේ අලුත් අලුත් පිළි උන් වහනසේ සමීපයට ගෙණ ගොස් මේ කඩ කපා දුන මැනවයි කියන සේක. එකල ඒ මහණ කඩ කපා ගෙත්තම් කරණසේක් කල් යවන්නේය. මා පළමු තනතුමූ සිවුරු ඇතැයි කියා අලුත් පිළි ගෙණ ජීර්ණ වූ සිවුරු දෙන සේක් ඒ සිවුරු වැලඳ මදක් කිළුටු වූ කල උනුපැනෙහි ලා සෝදනසේක. එසමයෙහි ඒ ඒ තැන දිරුණු තැන් පෙනෙන්නේය. උන්වහන්සේලා බොහෝසේ කලකිරෙණසේක. මෙසේ ආ ආ භික්ෂූන් වහන්සේගෙන් අලුත් පිළි ගෙණ දිරාගිය සිවුරු දී වංචාකරණසේක් බොහෝ තැන ප්‍රකාශ වූ සේක. මුන් වහන්සේ පරිද්දෙන් පිටිසරත් එක මහණෙක් වූයේය. ඒ මහණෙක් වූයේය. ඒ මහණ දෙව්රම් වෙහෙර තමාගේ වංචා දන්නා එක්කෙණෙකුන් වහන්සේ ඇතැයි යනු අසා සිතනුයේ නුවරවාසී හු ඒ භික්ෂූ රවටන්ට උවමනවැයි සිතා ඉතා නොරත රෙදි සිවුරක්කොට යහපත්කොට රඳා ඒ සිවුර වැළඳ ගෙණ දෙව්රම් වෙහෙරට ගියසේක. අනික් මහණ ඒ භික්ෂූහුගේ සිවුර දැක ලෝභ උපදවා තමන් රවට්ටන්නට ආ බව නො දැන කියනසේක් ස්වාමීනි, මේ සිවුර නුඹ වහන්සේ විසින් කරණලද්දේදැයි විචාළේය. එසේය අප විසිනැයි කී කල්හි එසේවීනම් මේ සිවුර මට දුනමැනවයි කීසේක. කුමක් කියව්ද පැවිද්දෙනි. අප ඉන්නේ පිටිසර චීවරාදී ප්‍රත්‍යය දුර්ලභය. තොපට මේ සිවුර දී කුමක් පොරවම්දැයි කී සේක. ස්වාමීනි අපගේ අළුත් පිළිඇත. ඒ ඇරගෙණ සිවුරු කොට ගෙණ ගත මැනවයි සිවුර මට දුන මැනවයි කීසේක. එසේ තොප ඉල්වන කල සිවුර ගනුවයි කියා අළුත් පිළි ගෙණ සිවුර දී වංචා කොට ගියාහ. උන්වහන්සේ සිවුර වැලඳ කීපදවසකින් උනු පැනෙහිලා සෝදනසේක් නොයෙක් තැන ඉරි රෙදි බව දැන පිටිසර මහණ මා වංචා කෙළේයයි ලජ්ජා වූ සේක. ඉක්බිත්තෙන් පිටිසර වංචාදන්නා මහණෙකු දෙව්රම් වෙහෙර වංචාදන්නා මහණක් රවටනලදැයි භික්ෂූන් මධ්‍යයෙහි ප්‍රකාශ විය. මේ කථාව එක් දවසක් දම්සභා මණ්ඩපයේ වැඩහුන් භික්ෂූන් වහන්සේ කියා කියා උන්තැනට බුදුරජානන් වහන්සේ තුන් තරා ගමනකින් එක්තරා ගමනකින් වැඩ වදාරා පණවන ලද බුද්ධාසන මස්තකයෙහි සවණක් ඝනරසින් දිළිහි දිළිහි වැඩ හිඳ මිහිරි වූ කටහඬින් බ්‍රහ්මඝෝෂා විහිදුවමින් මහණෙනි. මා එන්නට පළමුවෙන් කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා ස්වාමීනි මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි දැන්වූ කල්හි මහණෙනි දැන්මතු නොවෙයි පිටිසර මහණ දෙව්රම්වෙහෙර මහණහු පෙරත් රැවටුයේ වේදැයි වදාරා ඒ භික්ෂූන් විසින් ආරාධිත වූ සේක් අතීත කථාව දක්වා වදාළ සේක.

යටගිය දවස අප ශ්‍රී මහාබෝධිසත්වයෝ එක්තරා වනප්‍රදේශයක පියුම් විලක් ඇසුරුකොට සිටි ලුණුවරණ ගසෙක රුක්දෙවිව උපන්හ. එසමයෙහි එක්තරා කුඩා විලෙක නියං සමයෙහි දිය මඳවූයේය. එහි කුඩමස්සෝ බොහෝය. එක් කොකෙක් ඒ කුඩමස්සන් දැක එක් උපායකින් මුන් රවටා ගෙණ ගොස් මස්කන්නට උවමැනවයි සිතා ඒ විලට ගොස් දියකෙළවර කරබාගෙණ බකතපස් අඟවා සිතිවිල්ලක් සිතා උන්නේය. කුඩමස්සෝ ඔහු දැක ලඟට ගොස් ස්වාමීනි කුමක් සිතා ඉඳින්නේදැයි විචාළාහුය. කොකා කියනුයේ තොපට වූ විපත සිතමින් ඉන්නෙමි කිය. ස්වාමීනි අපට වූ විපත කුමක්දැයි කී කල්හි කොකා කියනුයේ මේ විල දියත් මදය. තොපට ගොදුරුත් මදිය. නියගත් මහත් බැවින් කුඩමස්සන්ට වූයේ මහත් දුකකැයි සිතා ඉඳිමි. තොපි මා කිවා කරවුනම් තොප හැම එකින් එක තුඩින් ඩැහැගෙන ගොස් පස්පියුමින් සැදි මහවිලකට අරින්නෙමි වේදැයි කියේය. එවිට කුඩමස්සෝ කියන්නෝ ස්වාමීනි කොකානෙනි කප අටගත් දා පටන් කුඩ මස්සන්ට වැඩකට කාරියක් සිතූ කෙණෙක් නම් නැත. දැනුදු තොපි වනාහි කුඩමස්සන් වංචාකොට එකින් එකා කනු කැමතිව කළ උපායකැයි සිතම් හයි කීය. කොකා කියනුයේ තොපි එසේ නොකියව. මාගේ බස් නොඅදහම් නම් එක කුඩමස්සෙකු එවා විල ඇති බව ඔහු ඇතින් විචාරා දැනගනුවයි කියේය. එවිට කුඩ මස්සෝ ඔහුගේ වංචා නොදැන මේ කොකා ධර්මිශ්ට එකෙකැයි එක්සිත්ව විලබලා එන පිණිස එක් කණපද්දකු දුන්හ. කොකාද ඒ කන පද්දා තුඩින් ඩැහැගෙන ගොස් ඒ විලට හැර සියලු විල් වල ඉසුරු දක්වා නැවත ගෙණ කුඩමස්සන් සමීපයට හැරියේය. ඒ කනපද්දා විලෙහි මහිම කුඩමස්සන්ට විස්තර කොට කියේය. ඒ සියලු මත්ස්‍යයෝම ඒ කොකාට කියන්නාහු ස්වාමීන් අප හැම ඒ විල ලුව මැනවයි කිහ. කොකාද යහපතැයි කියා පළමුකොට කනපද්දා ඩැහගෙන ගොස් විල දක්වා විල ඉවුර පිට සිටි ලුණුවරණ ගසෙහි සැඟවි ඉඳ තුඩින් ඇන කනපද්දා මරා මස්කා ඇට ගස මුල එළා නැවත විලට ගොස් ඔහු වන්නා විලට ඇරපිම් වෙන එකෙක් එවයි කියා ඔහුද ගෙණ ගොස් මස් කා මෙම නියාවෙන් එකින් එක ගෙණගොස් මස් කා සියලු කුඩමස්සන් නිමාවට ගියසේ

SANHIDA LANKA

දැන නැවත විලට ආයේ එක් කකුළුවෙකු ඉතිරිවූයේ දැක ඔහුද කනු කැමතිව කකුළුවාට කියන්නේ එම්බා පින්වත් වූ කකුළුව මා විසින් සියලු මත්ස්‍යයෝම පස්පියුමින් සැදි මහ විලෙක්හි හරණ ලද්දේය. තොපි මෙතන තනිව කුමකට ඉදුද ඉදින් තෝ කැමැත්තෙහි නම් තාත් ගෙණ ගොස් විලට අරින්නෙමි වේදැයි කීය. එවිට කකුළුවා කියන්නේ එම්බා කොකාණෙනි. ඒ විලට ගෙණ යන්නේ කෙසේ දැයි විචාළේය. තුඩින් ඩැහැගෙණ යෙමි කීයේය. එසේ ගෙණ යෙතොත් තොපි මා බිම එලව එබැවින් තොප ගෙණයන්ට බමියි කීය. කොකා එවිට කියන්නේ තොපි එසේ නොබව යහපත්කොට අල්වාගෙණ යෙමි කිවුය. එවිට කකුළුවා සිතන්නේ මේ කොකා විසින් එක කුඩමස්සෙකුත් විලට හැරියේ නැත හැම මස් කැයේය. ඉදින් මාත් විලට ගෙණ ගොස් විල ලූවොත් ලූ නියාමය විලට නොහැරියේ

නම් මොහුගේ බොටුව කපා දිවි තොර කෙරෙමියි සිතා කොකාට කියන්නේ යහළු කොකානනි. තොප හයපත්කොට අල්වාගත නොහෙයි අපගේ යහපත් ඇල්වීමක් ඇත. ඉදින් තාගේ බොටුව අපගේ නලින් අල්වන්නට ලැබේනම් තොප හා සමඟ යන්නෙමි වේදැයි කිවුය. එවිට කොකා තුමු රවටන්ට කී බව නොදැනී යහපතැයි පිළිගත කකුළුවාද තමාගේ නලින් අඬුවකින් ඇල්ලුවක් මෙන් ඒ කොකාගේ බොටුව තරව අල්වා ගෙණ දැන් තොප යවයි කීහ. කොකාද කකුළුවා ගෙණගොස් විල දක්වා ලුණුවරණ ගස දිසාවට යන්ට පටන් ගත එවිට කකුළුවා කියන්නේ ඈයි මා විලට නොහැර කොයිගෙණ යවුදැයි කී කල්හි කිමෙක්ද කකුළුව තෝ මට මායම් කියයිද තෝ මගේ නගකගේ බුහුනනියකගේ පුතෙක්ද තෝ මා තා උසුලා ඇවිදිනා කොල්ලකුයි සිතයි ද තෙල ලුණුවරණ ගසමුල තිබෙන කටු ගොඩ බල මත්සායයන් යම්සේ අනුභවකෙළෙම්ද තාත් එසේම අනුභව කෙරෙමියි කිය. එවිට කකුළුවා කියන්නේ එම්බා කොක ඒ කුඩමස්සෝ තමන් නුවන මද හෙයින් තට ගොදුරු වූය. එසේ අප රවට්ටන්නට නොපිළිවන, තාම විනාශයට පමුණුවමි තො නුවන නැති හෙයින් කැවිල් කැ පමණක් මුත් තා රැවටුනු බව නොදන්නෙහිය. මියතොත් දෙන්නම මියම්හ. දැන් තාගේ බෙල්ල කපා බිම හෙලමි කියා අඬුව කින් ඇල්ලුවක් මෙන් තමා නලින් තොර ඔහුගේ බොටුව ඇල්විය. එකල කොකා කරකැවි බෙල්ල නමා කට දල්වා ඇස් උප හිඳුවා කඳුළුවම්මා මරණ හයින් තැතිගෙණ ස්වාමීනි කකුළුවානෙනි. නුඹට කිසි අවඩැක් නොසිතමි නොකරමි මට ජීවිතදානය දුනමැනවැයි කිය. එසේ වි නම් සෙමෙන් අගසෙන් බැස මා තෙල විලට ඇරපියවයි කිය. එවිට කොකාද නැවත කරකැවී ගොස් විලට බැස විල කෙළවර මඩපිට කකුළුවා තුබුයේය. කකුළුවා කතුරකින් පියම්දණ්ඩක් කපන්නාක් මෙන් කොකාගේ බොටුව දෙකට කපා දියට වන්නේය. ඒ ආශ්චර්යය දුටු ලුණුවරණ ගසෙහි දේවතාවා සාධුකාර දී සියලු වනය උන් නාදකොට මිහිරි කටහඬින් මෙසේ කීයේය. මේ ලෝකයෙහි අතිශයින්ම වඤ්චාබුද්ධි ඇති තැනැත්තේ හැමතැනම ඒ වඤ්චාවෙන් සැපසේ පිහිටන්ට නොපිළිවන හෙවත් එකතැනකදී දෙතැනකදී වඤ්චාවෙන් ජයගත හෙයි, ඈම කල්හි ම ජයගත නොහැක්කේය. ඒ සොරසිත් ඇති පාපී සත්වයා තමාට අවඩැක් ලබන්නේය.කැමති දෙය නො ලබන්නේය. කුමක් මෙන්ද යතහොත් කකුළුවාගෙන් ග්‍රීවච්ඡේදයට පැමිණි කොකා මෙනි. හෙවත් යම්සේ කකුළුවා කොකාගේ බොටුව කැපීද එපරිද්දෙන්ම වන්නේයයි මේ අර්ථය ප්‍රකාශ කොට බෝධිසත්වයෝ වනය එකනින්නාද කොට ධර්මදේශනා කළසේක. සුරාසුරව චක්‍රවාරු චූඩාමාණිමරිචිසඤ්චය පරිචුම්භිත චරණනබ මයුඛජවාලා ඇති බුදු රජානන් වහන්සේ වදාරණසේක් එම්බා මහණෙනි. දැන් මතු නොවෙයි පෙරත් වංචා දන්නවුන් වංචා කෙළෙම් වේදැයි වදාරා මේ ධර්මදේශනාව පූර්වාපර සන්ධි ගලපා මේ ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි කොකා නම් දැන් දෙව්රම් වෙහෙර වසන කෛරාටික ස්වභාව ඇති චීවරඩඪකී මහණ වන්නේය. එකල්හි කකුළුවා නම් දැන් මේ පිටිසර වසන වංචාබුද්ධි දන්නා මහණ වන්නේය. එකල ලුණුවරණ ගසෙහි අධිගෘහිත දිව්‍ය පුත්‍රයා නම් ලෝකදිවාකර වූ  මම ම වේදැයි තමන් වහන්සේ ගෙණ හැර දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# නන්ද ජාතකය

තවද එක්සමයෙක්හි බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් සැරියුත් මහතෙරුන් වහන්සේගේ සෘද්ධි විහාරික භික්ෂු කෙණෙකුන් අරභයා මේ ජාතකය වදාළ සේක.

ඒ භික්ෂූන් වහන්සේ වනාහි කීකරුය වචනයෙන් ඉවසන සේක, සැරියුත් මහතෙරුන් වහන්සේට මහත් ව්‍යායාමයෙන් උපකාර කරණ සේක. ඉක්බිත්තෙන් එක්සමයෙක්හි සැරියුත් මහතෙරුන් වහන්සේ බුදුරජානන් වහන්සේට සැළකොට දනව් සැරිසරා වඩනාසේක් දක්ෂිණගිරි ජනපනදයට වැඩිසේක. කීකරු ඒ භික්ෂූන් වහන්සේ ඒ ජනපදයට වැඩි කල්හි දැඩි මත් ඇතිව තෙරුන් වහන්සේගේ වචනය නොකරණසේක. ඇවැත්නි. මෙනම් දෙයකරවයි කී කල්හි වනාහි තෙරුන්වහන්සේට ප්‍රතිපක්ෂ වූයේය. ස්ථවිරයන් වහන්සේ ඔහුගේ අදහස් නොදන්නාසේක. තෙරුන් වහන්සේ  ඒ ජනපදයෙහි සැරිසරා නැවත ජේතවනාරාමයට වැඩිසේක. ඒ භික්ෂූන් වහන්සේ තෙරුන් වහන්සේට ජේතවනා විහාරයට ආකල් තැන් පටන් නැවත එබදු ගුණයෙන් යුක්තවූසේක. තෙරුන්වහන්සේ සර්වඥයන් වහන්සේට දැන් වූ සේක. ස්වාමීන්වහන්ස මාගේ එක් සෘද්ධිවිහාරික භික්ෂු කෙණෙක් එක් තැනෙක්හි සියයක් දී ගත් දාසයෙකු මෙන් වන්නේය එක් තැනෙක්හි දැඩි මත් ඇතිව මෙනම් දෙයක් කරවයි කියනු ලබන්නේ ප්‍රතිපක්ෂ වන්නේ යයි දැන්වූසේක. සර්වඥයන් වහන්සේ වදාරණසේක් ශාරිපුත්‍රස්ථවිරයෙනි මේ මහණතෙම මෙබදු ශිලීවූයේ දැන්මතු නොවෙයි. පෙරත් මෙතෙම එක් තෙනකට ගියේ සියයක්දී ගත් දාසයකු මෙන් වන්නේය. එක් තෙනකට ගියේ ප්‍රතිපක්ෂව පිළිසතුරු වන්නේ යයි වදාරා තෙරුන්වහන්සේ විසින් යාඥාකරණ ලදුව ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහා බෝධිසත්වයන් වහන්සේ එක් කෙළෙඹිකුලයෙක්හි පිළිසිඳ ගත්සේක. අප මහාබෝසතානන් වහන්සේගේ යහළු වූ එක් කෙළඹි පුත්‍රයෙක් ඇත්තේය. හෙතම වෘද්ධය ඔහුගේ භාර්යාව වනාහි ළදරුය ඒ තරුණ ස්ත්‍රී තොමෝ වෘද්ධ පුරුෂයා නිසා පුත්‍රයකු ලද්දේය. ඒ පුරුෂ තෙම සිතනුයේ මේ ස්ත්‍රී තරුණ බැවින් මාගේ ඇවෑමෙන් කිසියම් පුරුෂයකු ගෙණ මේ වස්තුව නසන්නීය. මාගේ පුත්‍රයාහට නොදන්නීය මම මේ ධනය පෘථිවිගත කෙලෙම්නම් යෙහකැයි සිතා ගෙයි නන්ද නම් දාසයා කැඳවාගෙණ වනයට ගොස් එක් තැනෙක්හි ඒ වස්තුව නිධානගත කොට ඕහට කියා පින්වත් නන්ද නම් දාසයා මේ වස්තුව මාගේ ඇවෑමෙන් මාගේ පුත්‍රයා හට කියව ඒ වස්තුව පරිත්‍යාග නොකරවයි කියා ඕහට අවවාද දී කාලක්‍රියා කෙළේය. ඔහුගේ පුත්‍රද අනුක්‍රමයෙන් වැඩිවිය පැමිණියේය. ඉක්බිත්තෙන් ඕහට මෑනියෝ මෙසේ කිවුය. පුත්‍රය තොපගේ පියානෝ නන්ද නම් දාසයා කැඳවාගෙණ වස්තුව නිධාන කෙළේය.ඒ වස්තුව ගෙන්වා ගෙණ කුටුඹ සංථාපනය කරවයි කිවුය. ඒ පත්‍රතෙම එක් දවසක් නන්ද නම් දාසයහට කියනුයේ මලනුවෙනි මාගේ පියානන් විසින් කිසි වස්තුවක් නිධාන කරණලද්දේ ඇද්දයි කියේය. එසේය ස්වාමීන් වහන්සේයැයි කීයේය. ඒ වස්තුව කොතැන්හි නිධානකරණ ලද්දේදැයි විචාළේය. ස්වාමින් වහන්ස වනයෙහි යයි කීයේය. එසේවීනම් යම්හයි කියා උදැල්ලක් හා කුඩයක් ගෙණ නිධාන තිබෙන තැනට ගොස් මයිල වස්තුව කොතැන්හිදැයි කීයේය. නන්ද නම් දාසයා නැගී වස්තුව මත්තෙහි සිට වස්තු නිසා මානය උපදවා කොල දාසි පුත්‍රය මෙහෙකරුව තොපට මෙතැන්හි වස්තු කොයින්දැයි කුමාරයාහට ආක්‍රෝශ කෙළේය. කුමාරතෙම ඔහුගේ පරුෂවචන අසා නො ඇසුනාක් මෙන්ම එසේවීමනම් යම්හයි කියා ඔශු කැඳවාගෙණ ආපසු අවුත් නැවත දෙතුන් දවසක් ඉක්මවා ගියේය. නන්ද නම් දාසතෙම එලෙසම ආක්‍රෝශ කරන්නේය. කුමාරයා ඔහු හා සමඟ පරුෂවචන නොකියාම ආපසු අවුත් මේ දාසතෙම මෙතැන් පටන් වස්තුව කියන්නෙම් කිය කියා යන්නේය. ගොස් වනාහි ආක්‍රොශ කරන්නේය. එහි කාරණා නොදන්නෙම් මාගේ පියානන්ගේ යහළු වූ කෙළඹි පුත්‍රයෙක් ඇත්තේය. ඔහු අතින් විචාරා දැන ගනිම් කියා බෝධිසත්වයන් වහන්සේගේ සමීපයට ගොස් ඒ සියලු ප්‍රවෘත්තිය  කියා පියානෙනි, කවර කාරණාවක් දැයි විචාලේය. බෝධිසත්වයන් වහන්සේ කියනසේක් පුත්‍රය යම් තැනෙක්හි සිට නන්ද නම් දාසතෙම ආක්‍රොශ කරන්නේද තොපගේ පියානන් සන්තක වස්තුව එතැන්හිමය. ඒ කාරණයෙන් යම් තැනෙක්හිදී තොපට නන්ද නම් දාසතෙම ආක්‍රෝශ කරන්නේද එතැන්හි දීම ඔහු කොල දාසය වරෙවයි කියා ඇද දමා උදැල්ලක් ගෙන එතැන බිඳ කුලසන්තක වස්තුව නිකුත්කොට දාසයා ලවා ඔසවා වස්තුව ගනුවයි කියා මෙසේ කීසේක. කුලජාත දාසියගේ පුත්‍ර වූ නන්ද නම් දාසතෙම යම් තෙනෙක්හි සිටියේ පරුෂකොට ගර්භාකෙරේද බෙණෙ ද සොහනවර්ණ සාමාන්‍යයෙන් ස්වර්ණ මාලාද යම් තැනෙක්හි ඔහු සිටී ද එතැන්හියයි සිතම් කියා බෝධිසත්වයන් වහන්සේ කුමාරයාහට වස්තු ගන්නා උපාස වදාළසේක. කුමාරතෙම බෝධිසත්වයන් වහන්සේට වැඳ ගෙට ගොස් නන්ද නම් දාසයා කැඳවා ගෙණ නිධාන තිබෙන තැනට ගොස් අවවාද කී පරිද්දෙන් පිළිපැද ඒ වස්තුව ගෙණ කුටුඹ සංථාපනය කොට බෝධිසත්වයන් වහන්සේගේ අවවාදයෙහි සිටියෙහි සිටියේ දාන ශිලාදී පින්කම් කොට  ජීවිතයාගේ කෙළවර කම් වූ පරිද්දෙන් මිය පරලොව ගිය සේක. ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේ වදාරණසේක් මේ මහණ පෙරත් මෙබදු ශිලීවූයේ යයි වදාරා මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ නන්ද ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

එසමයෙහි නන්ද නම් දාසතෙම මේ සැරියුත් මහතෙරුන් වහන්සේගේ සෘද්ධි විහාරික වූ භික්ෂූහුය. නුවනැත්තා වූ කෙළඹි පුත්‍රව උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජවූ මමම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

# කපොත ජාතකය

තවද එක් සමයෙක්හි ආර්ය වාදී තිලෝගුරු වූ බුදු රජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් එක්තරා ලොල් වූ භික්ෂූ කෙණෙකුන් වහන්සේ අරඹයා මේ ජාතකය වදාළ සේක. උන් වහන්සේගේ ලොල් බව නම් නව වැනි නිපාතයෙහි කපි ජාතකයෙහි මතු පහල වන්නේය. එසමයෙහි භික්ෂූන් වහන්සේ ස්වාමීනි මේ මහණ ඉතා ලොල් මහණෙකයි සර්වඥයන් වහන්සේට දැන්වූ සේක. එකල සර්වඥයන් වහන්සේ සැබෑද මහණ තෝ පෙරත් ලොබියෙහිය. ලොබි බැවින් ජීවිතක්ෂයට පැමිණියෙහිය. නුඹ වහන්සේ කා නිසා තමන් වසන තැනින් පිරිහුනෝ වේදැයි වදාරා ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකුන් රාජ්‍ය කරන කල්හි අප මහා බෝසතානෝ පාරාපත යෝනියෙහි උපන්නාහුය. එකල බරණැස් නුවර වැස්සෝ කුසක් පැවැති බැවින් ඒ ඒ තැන පක්ෂීන් ගේ සැපසේ විසීම නිසා තොපෙට්ටි එල්වා තිබෙති. බරණැස් නුවර සිටානන්ගේ අරක්කැමියා තමන්ගේ මුළු තැන්ගේ තොපෙට්ටියක් එල්වා තිබූයේය. බෝධි සත්වයෝ එහි වාසය කෙරෙති. එකල්හි ඒ බෝ සතානෝ උදෑසනම නික්ම ගොදුරු සොයා අනුභව කොට සවස් වේලෙහි අවුත් වාසය කරමින් දවස් යවති. ඉක්බිත්තෙන් එක් දවසක් එක් කපුටුවෙක් මුළු තැන්ගේ මත්තෙන් යන්නෙහි ඇඹුල් නියඹලා මත්ස්‍ය මාංශ දවා සුවඳ කැවු ගන්ධ ආග්‍රහණය කොට එහි ලොබ උපදවා කවරක් වූ නිසා මේ මත්ස්‍යය මාංශ ලබන්දෝ හෝයි මුළු තැන්ගෙට නුදුරු තැනක හිඳ පරික්ෂා කෙරෙන්නේ සවස බෝධිසත්වයන් අවුත් මුළු තැන් ගෙට වඩනා දක  මේ පරවියා නිසා මත්ස්‍ය මාංශ ලබම් දෙවැනි දවස් උදෑසනම අවුත් බෝධිසත්වයන්ගේ පෙට්ටියෙන් නික්ම ගොදුරු පිණිස යන වේලෙහි පසුපස්සේ නික්මුනේය. එකල මහ බෝසතානෝ ඹහට කවරකාරණයකින් අප හා සමග සබඳ තෝ ඇවිදිනෙහිදැයි කිවුය. ස්වාමීනි නුඹ වහන්සේගේ ක්‍රියාවට මට ඉතා රිසියෙයි එසේ හෙයින් මම මෙතැන්පටන් නුඹවහන්සේට උපස්ථාන කෙරෙමියි කිය. එබස් ඇසූ මහබෝසතානෝ කියන්නේ යහළු තොපි අන් ගොචාවරයක් අනුභව කරව. අපි අන්ගෝචරයක් අනුභව කරම්හ, තොප විසින් අපට උපස්ථාන කරන්නට නොපිළිවන් වේදැයි කිවුය. ස්වාමීනි නුඹ වහන්සේ ගොදුරු කනකල මමත් ගොදුරුකා නුඹ වහන්සේ හා සමඟ යන්නෙමි වේදැයි කීය. යහපත උදක් තොප විසින් අප්‍රමාදවිය යුතුයයි මෙසේ මහබෝසතානෝ කපුටුවාට අවවාදකොට ගොදුරුකරන්නාහු කණබිජු අනුභව කෙරෙති බෝධිසත්වයන් ගොදුරු අනුභව කරණ වේලෙහි කපුටුවා ගොස් ගොම පිඩක් පෙරලා පණුවන් අවුලාකා බඩපුරාගෙණ බෝධිසත්වයන් සමීපයට අවුත් ස්වාමීනි නුඹ වහන්සේ ඉතා බොහෝ වේලක් ගොදුරු අනුභව කරණ සේක. බොහෝ කොට කෑම යහපත් නොවන්නේ වේදැයි කියා බෝධි සත්වයන් හා සමග ඇවිද ගොදුරු අනුභවකොට පවස්වේලේ අවුත් මුළු තැන්ගෙයි වෙසෙයි ඉත්බිත්තෙන් එක් දවසක් සිටානන්ට බොහෝ මත්ස්‍ය මාංශ ගෙණාවාහුය. අරක්කැමියා ඒ මත්‍යමාංශ ඇරගෙණ මුළුතැන්ගෙයි ඒ ඒ තැන එල්වා තිබුයේ කපුටුවා ඒ දැක ලොභ උපදවා සෙට ගොදුරු බිමට නොගොස් මා විසින් මේ මත්ස්‍යාමංශ කෑ යුතුයයි රාත්‍රීයෙහි තනන තනනා කෙඳිරිලි ගාමින් වැදහොත්තේය. බෝධිසත්වයෝ සවස්වේලේ අවුත් ඒ ව්‍යසනයට පැමිණ තැනැත්තවුන් දැක ලොල්වූ කපුටුව මා කීවා නොකෙට තාගේ ලෝභය නිසා මහත් වූ දුකට පැමිණියෙහි වේදැයි කියා දැන් මාත් මේ තන වසන්ට නොපිළිවනැයි මහබෝසතානෝ අනික් තැනකට ගියෝය. කපුටුවා එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියේය. එකල්හි අරක්කැමියා ඔහු සැනින් ගෙණ කසල ගොඩට දැමිය ශාස්තෘවූ බුදුරජානන් වහන්සේගේ මහණ මහණ තෝ ලොල්වුයේ දැන් මතු නොවෙයි පෙරත් ලොල්වූයෙහිය. තාගේ ලොල් බව නිසා නුවණැත්තෝ තමන් වසන තැනින් පිරිහී ගියේ වේදැයි මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කොට වදාළ සේක. චතුස්සත්‍යයාගේ කෙළවර ඒ ලොල් මහණ අනාගාමී පෙළෙහි පිහිටි යේය. සර්වඥයන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ කපොත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කපුටුවා නම් දැන් මේ ලොල්වූ භික්ෂූහුය. එසමයෙහි පරෙවිව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# වෙලුක ජාතකය

තවද එක්සමයෙක් හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරණසේක් එක්තරා දුර්වල භික්ෂුවක් අරභයා මේ ජාතකය වදාළ සේක. සර්වඥයන් වහන්සේ ඕහට වනාහි වදාරණසේක් මහණ තෝ දුර්වල වූයේ සැබෑදැයි විචාරා ස්වාමීන් වහන්ස සැබවයි දැන්වූ කල්හි මහණ තෝ දුර්වල වූයේ දැන් මතු නොවෙයි පෙරත් දුර්වවූයෙහිය දුර්වවූ බැවින්ම නුවනැත්තන්ගේ වචනය නොකොට සර්ප මුඛයෙන් ජීවිතක්ෂයට පැමිණියෙහි යයි වදාරා ඉකුත් වත් කථාව වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි බෝධිසත්වයන් වහන්සේ මහාභොගකුලයෙක්හි ඉපිද වැඩි වයසට පැමින පංචකාමයෙහි ආදීනව හා මහබිනික්මන් කිරීමෙහි ආනිශංස දැක වස්තු කාමයෙන් හැර හිමාලවනයට වැද සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව කිසුණු පිරියම් කොට පංචාභිඥා අෂ්ට සමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් කල් යවනසේක් මෑත භාගයෙහි මහත් පිරිවර ඇතිව පන්සියයක් තපස්විවරයන් විසින් පිරිවරණ ලදුව ගණශාසතෘව වාසය කරණ සේක. ඉක්බිත්තෙන් එක් සර්ප පෝතකයෙක් තමාගේ ස්වභාවයෙන් ගොදුරු කා ඇවිදිනේ එක්තරා තපස්වියක්හුගේ ආශ්‍රමයට පැමිණියේය, තපස්වීන් වහන්සේ ඒ සර්පයා කෙරෙහි පුත්‍රසෙනහ උපදවා ඔහු එක් වෙළුපර්වතයෙක්හි හෝ රක්ෂා කරන්නේය. ඕහට වෙළුපර්වතයෙහි හෝනා හෙයින් වෙළුකයයි කියා නමක් කළාහුය. ඔහු පුත්‍රසෙනහයෙන් රක්ෂාකරන්නාහු තපස්වීයහට වෙළුකපියා යයි කියාම නමක් කළාහුය. එකල්හි බෝධිසත්වයන් වහන්සේ එක් තපස්වියෙක් වනාහී සර්පයෙකු රක්ෂා කරන්නේ යයි අසා ඔහු කැඳවා තොපි ආශිර්විෂයා හා සමග විස්වාසයෙක් නම් නැත්තේය. මෙසේ රක්ෂා නොකරවයි කීසේක. තාපසතෙම කියනුයේ ආචාරීන් වහන්ස ආශිර්විෂයා මාගේ පුත්‍රවන්නේය. මම ඔහුගෙන් වෙන්ව වසන්ට නොහැකි වන්නෙහියි කීයේය. එසේ වීනම් මොහුගේ සමීපයෙන් ජීවිතක්ෂයට පැවිණෙන්නේහියයි කීසේක. තපස්වීන් වහන්සේ බෝධිසත්වයන් වහන්සේගේ වචනය නොගත්තේය. ආෂිර්විෂයාද හරනට නොහැකිවූයේය. ඉක්බිත්තෙන් කීපදවසක් ඇවෑමෙන් සියලු තපස්වීවරයෝ ඵලාඵල පිණිස ගොස් ගිය තැන්හී ඵලාපලයාගේ සුලභ බැව් දැක දෙතුන් දවසක් එතැන්හිම වාසය කළාහුය. වේළුකපියානෝද ඒ තපස්වීන් වහන්සේලා හා එක්ව යනුයේ ආශිර්විෂයා හුණ පරුකෙහි හොවා පිධානකොට වසා ගියේය. ඒ තාපසතෙතම නැවත සෙසු තපස්වීවරයන් හා දෙතුන් දවසක් ඇවෑමෙන් අවුත් වෙළුකයා හට ගොදුරු දෙමියි කියා හුණ පුරුක පියන හැර පුත්‍රය ක්‍ෂුධායෙහිය එවයි කියා හස්තය දිගු කෙළේය. ආශිර්විෂතෙම දෙතුන් දවසක් නිරාහාර බැවින් කීපී දිගුකරණලද හස්තය ඩැහැ තපස්වියා එතැන්හිම ජීවිතක්ෂයට පමුණුවා වනයට වන්නේය. තපස් වීවරහු ඒ දැන බෝධිසත්වයන් වහන්සේට දැන්වූවාහුය. බෝධිසත්වයන් වහන්සේ ඔහුගේ ශරීරය ආදාහණ කරවා සෘෂි සමූහයාගේ මැද ඉඳ සෘෂින්ට අවවාද වශයෙන් මෙසේ වදාළසේක. වැඩකැමැත්තාවූ හිතවිත්තයෙන් අනු කම්පා කරන්නාහුගේ අනුශාසනාව අවවාදය යමෙක් නොහික්මිණි ද එසේ වූ පුරුෂතෙම වෙළුක නම් සර්පයාගේ පියානෝ යම්සේ හෝනාහුද එපරිද්දෙන්ම නසනලදුව හෝනේයයි වදාළසේක. මෙසේ බෝධිසත්වයන් වහන්සේ සෘෂි සමූහයාට අවවාද දී සතරබ්‍රහ්ම විහාරයන් වඩා ආයුෂයාගේ කෙළවර බ්‍රහ්මලෝකයෙහි උපන් සේක. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ වදාරණ සේක් මහණ තෝ දුර්වවූයේ දැන් මතු නොවෙයි පූර්වයෙහිද අකීකරු බැවින් සර්පිමුඛයෙන් පූතිභාවයට පැමිණියෙහි යයි කියා මේ ධර්මදේශනාව ගෙණ හැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ වෙළුක ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි වෙළුක සර්පයාගේ පියාණෝ නම් දැන් මේ දුර්වච මහණ වූ යේය. අවශේෂ පර්ෂිද් දැන් බුදුපිරිස් වූවාහුය. ගණ ශාස්තෘව උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මකස ජාතකය

තවද එක් සමයෙක්හි ශාන්තගුණ ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ මගධ රට සැරිසරා වඩනාසේක් එක්තරා ගමෙක නුවණ නැති ගම්වැසි මනුෂ්‍යයන් අරභයා මේ ජාතකය වදාළ සේක. එක් සමයෙක බුදුරජානන් වහන්සේ සැවැත්නුවරින් නික්ම මගධ රාජ්‍යයට ගොස් එහි චාරිකා කොට ඇවිදිනා සේක් එක්තරා ගමකට පැමිණිසේක. ඒ ගම තෙමේත් බොහෝසේ අඥාන මනුෂ්‍යයන් විසින් ගැවසීගත්තේය. එක් දවසක් ඒ ගම අඥාන මනුෂ්‍යයෝ රැස්ව කියන්නෝ පින්වත්නි. අප වනයට වැද කර්මාන්ත කරණ කල්හි මදුරුවෝ කති උන්ගේ කෑම නිසා අපගේ කර්මාන්තයට බාධා වන්නේය. අපි ඇමදෙනම දුනු හා ආයුධ ඇරගෙණ ගොස් මදුරුවෝ හා යුද්ධ කොට සියලු මදුරුවන් විද කොට මරම්හයි මන්ත්‍රණය කොට වනයට ගොස් මදුරුවන් මරම්හයි ඔවුනොවුන් විද කොට මහදුකට පැමිණ අවුත් ඇතුළු ගමත් ගම් මධ්‍යයෙහිත් ගම්දොරත් වැදහොත්තාහුය. එකල සර්වඥයන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා ඒ ගමට පිඬුසිඟා වන්සේක. අවශේෂ මනුෂ්‍යයෝ බුදුන් දැක වැද එකත්පස්ව උන්නාහුය. සර්වඥයන් වහන්සේ  ඒ ඒ තැන විත් කෙටි මෙන් ව්‍රණවූ ශරීර ඇති මනුෂ්‍යයන් දැක උපාසකවරුන් අතින් විචාළසේක. බොහෝ මනුෂ්‍යයෝ ගිලන්ව වැදහොවිති මොහුන් විසින් කුමක් කරණ ලද්දේදයි විචාළසේක. ස්වාමීනි මේ මනුෂයෝ මදුරුවන් හා යුධ කරම්හයි ගොස් ඔවුනොවුන් විද තුමු ගිලන් බවට පැමිණියෝ යයි දැන්වූය. සර්වඥයන් වහන්සේ එම්බා නුවණැති මනුෂ්‍යයෙනි. මේ අඥාන මනුෂ්‍යයන් මදුරුවන් මරම්හයි කියා තමන් මැරුවේ දැන් මතු නොවෙයි පෙරත් මදුරුවන් ගසම්හයි කියා අනුන් ගැසූ මනුෂ්‍ය කෙණෙක් වේදැයි වදාරා ඒ ප්‍රඥා මනුෂ්‍යයන් විසින් ආරාධිත වූ බුදුරජහු ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහාබෝසතානෝ වෙළදාමෙන් ජීවත් වෙති. එසමයෙහි කසීරට එක් පසල් ගමෙක බොහෝ වඩුවෝ වෙසති. ඒ ගම එක් ඉසකේ වැගිරීගිය වඩුවෙක් දණ්ඩක් සස්නේය. එකල එක මදුරුවෙක් ඔහුගේ තඹතැටිපිටක් වැනිවූ ඉසෙහිද අඩයටියෙන් පහරණාක් මෙන් ඉස මුව තුඩින් විදිනේය. එතෙම තමා සමීපයෙහි සිටි පුතුට කියන්නේ පුත මා හිස එක් මදුරුවෙක් තෙබකින් අනින්නාක් මෙන් විදිනේය. ඔහු නවතාපියවයි කීය. එබස් ඇසූ පුත්‍රයා කියන්නේ පියානන් වහන්ස. ඉවසුව මැනවයි එක පහරින් ඒ මදුරුවා මරාපියම්යි කීය. එසමයෙහි බෝධිසත්වයෝත් තමන්ට බඩු සොයමින් එගමට පැමිණි ඒ වඩුවන්ගේ දඬුගල සිටියාහ. ඒ වඩ්ඪකී පුත්‍රයා මදුරුවා දුරුකෙරෙමියි සියුම් මුවහත් ඇති මහ පොරවක් ගෙණ පියාගේ පිටිපස්සේ සිට මදුරුවා ගසමියි පියාගේ හික දෙකක් කොට පැළුයේය. වඩුවා එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියේය. බෝධිසත්වයෝ ඔහුගේ ක්‍රියාව දැක සතුරා උවත් නුවණැති තැනැත්තේ උත්තමය. ඒ නුවණැත්තාවූ  සතුරා අනුන් තමා මරතත් දඩ ගනිතත් ඒ දණ්ඩනාදියෙහි භයින් මනුෂ්‍යයන් නොමරන්නේයයි සිතා මෙසේ කිවුය. නුවණින් යුක්ත වූ සතුරා උතුම්, නුවණ නැත්තාවූ මිත්‍රයා උතුම් නොවෙයි කුමක් හෙයින්ද යත්, මේ කෙළ තොළුවූ නුවණ නැති පුතත්‍රයා මදුරුවා මරම්යි තමාගේ පියාගේ ඔළුව පලාපිය. එසේ හෙයින් අඥාන වූ මිත්‍රයාහට වඩා ප්‍රඥා වූ අමිත්‍රයාම උතුමැයි. මෙසේ මහ බෝසතානෝ එතනට පැමිණ සත්වයන්ට ධර්මදේශනා කොට හුනස්නෙන් නැගී ගොස් කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. වඩුවාගේ නෑයොත් ඔහු දවාපුය ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ උපාසකාවරුනි පෙරත් මදුරුවා ගසම්හයි අනුන් ගසා මැරූ මනුෂ්‍යයෝ ඇත්තෝම වේදැයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ මකස ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි එතනට පැමිණ සත්වයන්ට අවවාද කොට ගියාවූ නුවණැති වෙළදානෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# රෝහිනී ජාතකය

තවද එක් සමයෙක්හි බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙරෙ වැඩවසන සේක් අනේපිඬු මහාසිටාානන්ගේ දාසියක් අරභයා මේ ජාතකය වදාළ සේක. අනේපිඬු මහසිටාානන්ගේ වනාහී රෝහිණී නම් වූ දාසියක් වූවාය. ඒ දාසියගේ වී පහරණ තැනට අවුත් මැහැළිවූ මෑණියෝ හොත්තීය. එර් මැහැලි ස්ත්‍රිය මැස්සෝ පිරිවරා හිඳියෙන් විදිනාක් මෙන් කන්නාහුය. ඕ තොමෝ දුවනියන්ට කියන්නී දියනියෙනි මක්‍ෂිකාවෝ මා කති මොවුන් වලක්වයි කිව ඕතොමෝ මෑණියෙනි වලක්වමියි කියා මොහොළ ඔසවා මෑණියන්ගේ ශරීරයෙහි මක්ෂිකාවන් මරා විනාශයට පමුණුවන්නෙමි සිතා මෑණියන්ට මොහොලින් ප්‍රහාර දී ජීවිතක්ෂයට පැමිණිවුව,ඒ දැක මාගේ මෑණියෝ මළායයි කියා අඬන්ට පටන් ගත්තීය. ඒ ප්‍රවෘත්තිය අනේ පිඬු මහාසිටාානන්ට දැන්වූවාහුය. සිටාානෝ ඒ දාසියගේ ශරීරය ආදාහණ කරවා විහාරයට ගොස් සියලු ප්‍රවෘත්තිය සර්වඥයන් වහන්සේට දැන්හූහ. සර්වඥයන් වහන්සේ ගෘහපතිය මේ දාසිය මෑණියන්ගේ ශරීරයෙහි මක්ෂිකාවන් මරමි සිතා මොහොලින් ප්‍රහාර දී මෑණියන් මැරුවා දැන් මතු නොවෙයි පූර්වයෙහිත් මැරුවාමයයි වදාරා අනේපිඬු මහසිටාානන් විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි බෝධිසත්වයන් වහන්සේ සිටුකුලයෙක්හි ඉපිද පිය මහ සිටුහුගේ ඇවෑමෙන් සිටුතනතුරට පැමිණිසේක. ඒ සිටාානන්ගේ ද රෝහිණී නම් දාසියක් වූවාය. ඒ දාසිද තමාගේ විපහරණ තැනට අවුත් හොත්තා වූ මෑණියන් විසින් දුවනියෙනි මාගේ හිස මක්ෂිකාවන් වලක්වයි කියනු ලබන්නී මෙම ක්‍රමයෙන් මොහොලින් ප්‍රහාර දී මෑණියන් ජීවිතක්ෂයට පමුණුවා හඬන්ට පටන් ගත්තේය. බෝධිසත්වයන් වහන්සේ ඒ ප්‍රවෘත්තිය අසා අමිත්‍රද වනාහි මේ ලෝකයෙහි ප්‍රඥාවන්ත තැනැත්තෙම උතුමැයි සිතා මෙසේ කීසේක. කරුණා ඇත්තා වූ යම්බදු බාලයෙක් ඇද්ද ඌට වඩා නුවණැත්තා වූ අමිත්‍රයාම උතුම් වන්නේය. කුමක් මෙන්ද යත්, රෝහිණී නම් වූ නුවණ නැත්තී මව මැස්සන් මරමියි මුසලප්‍රහාරයෙන් මරා ශෝක කෙරෙයි. මේ කාරණයෙන් මේ ලෝකයෙහි අමිත්‍රද ප්‍රඥාවත් නැත්තේ උතුම්වන්නේ යයි බෝසතාානන් වහන්සේ ගෘහපතිය මෝ තොමෝ  මැස්සන් මරාමියි සිතා මව නැසුවා දැන් මතු නොවයි පෙරත් මැරුවාමයයි වදාරා මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා රෝහිණී ජාතකයනිමවා වදාළ සේක. එකල්හි මෑණියන් දැනුත් මෑණියෝම වූහ. දුවණියෝ දැනුත් දුවණියෝය. මහසිටාව උපන්නෙම් වනාහී තිලෝගුරු සම්‍යක් සම්බුදු රජානන් වූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# ආරාමදූසක ජාතකය

තවද එක්සමයෙක්හි ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ කොසොල් රට එක්තරා ගමෙක්හි වසනසේක් උද්‍යානයක් දූෂ්‍ය කිරීමක් අරභයා මේ ජාතකය වදාළ සේක. සර්වඥයන් වහන්සේ වනාහී කොසොල් රට සැරිසරා වඩනාසේක් එක්තරා ගමකට පැමිණිසේක. ඒ ගමෙහි වසන එක් කෙළඹි පුත්‍රයෙක් සර්වඥයන් වහන්සේට ආරාධනා කොට තමාගේ උයනෙහි වැඩහිඳිනට සලස්වා බුදු පාමොක් මහා සංඝයාවහන්සේට දන්දී ස්වාමීන් වහන්සේලා කැමති පරිද්දෙන් මේ උයනෙහි හැසිරෙන සේක්වයි කීයේය. භික්ෂූන් වහන්සේලා උන් තැනින් නැගී සිට උයන්ගොච්චා ගෙණ උයනෙහි හැසිරෙන්නාහූ එක් එලිවූ තැනැක් ඝනවූ ඡායාව ඇත්තේය මෙතැන්හි වෘක්ෂයක් හෝ ගසෙක් හෝ නැත්තේය. කවර කාරණයෙක්දැයි විචාළාහ. ස්වාමීන් වහන්ස මේ උද්‍යානය ගස් රෝපනය කරණ කල්හි ගම්දරුවෙක් දිය ඉස්නේ මෙතැන්හි පැල වුල් උදුරා මුල් මපණින් දිය ඉස්සේය. ඒ රුක්පැල මලානිකව මලේය. මේ කාරණයෙන් මේ ස්ථානය එලිවූයේයයි කීය. භික්ෂූන් වහන්සේලා සර්වඥයන් වහන්සේ කරා එළඹ මේ කාරණාව දන්වූවාහුය. සර්වඥයන් වහන්සේ මහණෙනි ඒ ගාමාදාරකතෙමේ ආරාමය දූෂ්‍යකෙළේ දැන් මතු නොවෙයි පූර්වයෙහිත් ආරාමය දූෂ්‍යකෙළේම යයි වදාරා ඉකුත්වත් කථාව වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි බරණැස් නුවර නකත් කෙළියට ඝෝෂා කළාහුය. නක්‍ෂත්‍ර හෙරි ශබ්දය ඇසූතැන්පටන් සියලු නුවර වැස්සෝ නකත්කෙළි ආශ්‍රය කොට හැසිරෙන්නාහුය. එකල්හි රජුහුගේ උයනෙහි බොහෝ වානරයෝ වසන්නා හුය. උද්‍යානපාලතෙම සිතනුයේ නක්‍ෂත්‍ර ක්‍රීඩාවට බොරලැවූහ්‍යය. මේ වානරයන්ට දිය ඉසුවයි කියා නක්‍ෂත්‍ර ක්‍රීඩා කෙරෙමියි සිතා ජෙෂ්ඨ වානරයා කරා එළඹ යහළු වානර ජෙෂ්ඨය මේ උද්‍යානය නුඹවහන්සේලාටද බොහෝ උප කාරය එහෙයින් නුඹවහන්සේලා මේ උයනෙහි පුෂ්පඵල එල්ලවයන් අනුභව කරවයි, නක්‍ෂත්‍ර ක්‍රීඩාවට ඝෝෂණය කෙළේය. මම නක්‍ෂත්‍ර ක්‍රීඩාකරන් නෙම් යම් කලකින් මම එම්ද ඒතාක් කල් මේ උයනේ රුක්පාල ගස්වලට දිය වත්කරන්ට හැකිවන්නාහු දැයි විචාළේය. යහපත හැකිවන්නෙම් කීයේය. එසේ වී නම් අප්‍රමාදවයි කියා දිය වත්කරණු පිණිස ඔවුන්ට සම්පයිද කාෂඨමය කළද දී ගියේය. වානරයෝ සම් පයිද දඬු කළද ගෙණ පැල ගස්හි දිය වත්කරන්නාහුය. ඉක්බිත්තෙන් ඔවුනට වානර රජතෙම කියනුයේ පින්වත්හු වානරයෙනි ජලය නම් රක්ෂා කටයුත්තේය. තෙපි පැල ගස්හි ජලය වත්කරන්නාහු ගස් උපුටා උපුටා මුල් බලා ගැඹුරුවගිය මුල්හි බොහෝ ජලය වත්කරව ගැඹුරුව නොගිය මුල්හි ස්වල්පයක් වත්කරව පසුව අපට ජලය ලැබගත නොහැක්කේයයි කීයේය. ඔහු වානර රජුහුගේ වචනය යහපතැයි පිළිගෙණ එලෙස කළාහුය. එසමයෙහි පණ්ඩිත පුරුෂයෙක් රාජ්‍යාද්‍යානයෙහි එලෙස කරන්නාවූ ඒ වානරයන් දැක මෙසේ කීයේය. පින්වත් වානරයෙනි කවර කාරණයනින් තෙපි අළුත රොපනය කරණලද පැලගස් උපුටා උපුටා මුල් පමණින් ජලය වත්කරන්නාහු දැයි කීයේය. ඒ වානරයෝ අපගේ වානර රජතෙම මෙසේ අවවාද දුන්නේයයි කීවාහුය නුවණැත්තා වූ පුරුෂතෙම ඒ වචනය අසා පින්වත්නි ඒ කාන්තයෙන් පිරිහීමක් වූයේය. අඥානවූ නුවණ නැත්තෝ වැඩක්කරම්හයි කියා අවැඩක් කරන්නාහුයයි සිතා මෙසේ කීයේය. අනර්ථයෙහි දක්ෂයා විසින් අර්ථයෙහි හැසීරීම සුවඑලන්නේ නොවෙයි නුවණ නැති තැනැත්තේ වැඩ පිරිහෙලන්නේය. කවරෙක්හු මෙන්ද කීවොත් උද්‍යානයෙහි නියුක්ත වානරයා වැඩකෙරෙමියි සිතා අවැඩ කෙළේයයි කියා මෙසේ ඒ නුවණැති පුරුෂ තෙම වානර රජහට නින්දා කොට තමාගේ පර්ෂිද් ගෙණ උයනින් නික්මුනේය. සර්වඥයන් වහන්සේ මහණෙනි මේ ගම ළදරුවා උයන දූෂ්‍ය කෙළේ දැන් මතු නොවෙයි පෙරත් උයන දූෂ්‍ය කෙළෙම් යයි වදාරා මේ ධර්මදේශනාව ගෙණ හැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ ආරාම දූසක ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ප්‍රධාන වානරතෙම දැන් ආරාම දූෂ්‍ය කළ ගම්ළදරු වූයේය. පණ්ඩිත පුරුෂව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# වාරුණී ජාතකය

තවද එක්සමයෙක්හි බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් ආරාම දූෂ්‍ය කිරීමක් අරභයා මේ ජාතකය වදාළ සේක. අනේපිඬු මහසාටනන්ගේ වනාහි යහළුවූ එක්තරා වෙළෙන්දෙක් තියුනුවූ රා යොදාහි රණ්‍යස්වර්ණාදිය ගෙණ විකුට වසනුයේ මහජනයා රැස් වූ කල්හි සගය තෙපි මිලගෙණ රා දෙවයි කියා අතවැස්සකුට අනවා තෙමේ නගනු පිණිස ගියේය. අතවැසි පුරුෂතෙම මහජනයාහට රාදෙනුයේ මනුෂ්‍යයන් අතරතුර එනුකැට ගෙන්වාගෙණ අනුභවකරන්නවුන් දක රා එනු නැත්තේවන එනු මෙහි බහන්නෙම් සිතාරා සැලෙහි නැළියක් පමණ එනූ බහා ඔහුන්ට රා දෙන්නේය. ඔහු මුබය පුරපුරාගත් රා දමා තොප විසින් කවරක් කරණ ලද්දේදැයි විචාළහුය. තෙපි රා බී එනු ගෙන්වන්නවුන් දක එනුයෙන් යෙදුයෙමි කියේය. මෙබඳු මනාප වූ රා නැසූයෙහිය අඥානයෙහි යයි ඕහට නින්දාකොට නැගීසිට ගියාහ. රා වෙළඳතෙම අවුත් එක් සත්වයෙකුත් නොදක රාපීවාහු කොතැන්හි ගියාහුදැයි විචාළේය. ආඥානය මෙබඳු මනොඥ රා තා විසින් නසනලද්දේදැයි නින්දාකොට මේ කාරණාව අනේපිඬු මහාසිටානන්ට දන්වූ යේය. අනේපිඬු මහසිටානෝ අපට මේ තෙපුල් පඬුරක් ඇතැයි සිතා ජෙතවනාරාමයට ගොස් බුදුරජානන් නමස්කාර කොට එකත්සප්ව ඉඳ මේ කාරණාව දන් වූයේය. බුදුරජානන් වහන්සේ වදාරණසේක් ගෘහපතිය මේ තෙම රා දූෂ්‍ය කෙලේ දන් මතු නොවෙයි පූර්වයෙහිත් රා දූෂ්‍ය කෙළේමයයි වදාරා අනේ පිඬු මහසිටානන් විසින් ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් කථාව දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහා බෝධිසත්වයන් වහන්සේ බරණැස්නුවර සිටු කුලයක ඉපිද වැඩිවියට පැමිණ සිටුස්ථානාන්තරයට පැමිණිසේක. ඒ බරණැස් සිටානන් නිසා එක්තරා වෙළෙන්දෙක් ජීවත්වන්නේය. ඒ වෙළඳපුත්‍රතෙම තියුණුවූ රා යොදා මේ රා විකුට මිලගණුවයි කියා අතවැස්සාට කියා නහනු පිණිස ගංගාවට ගියේය. අතවැසි පුරුෂතෙම අප මහබෝසතානන් වහන්සේ ආශ්‍රයකොට සිටි වෙළෙන්ඳා ගිය පමණකින්ම රා සැළවල්හි එනුබහා මෙම ක්‍රමයෙන් රා නැසුයේය. ඉක්බිත්තෙන් ඔහුගේ ආචාරිතෙම අවුත් ඒ කාරණාව දන සිටානන්ට දන් වූයේය සිටානෝ අනර්ථයෙහි දක්ෂ වූ අඥානයෝ වැඩකරම්හයි කියා අවැඩකරන්නාහුයයි කීසේක. අනර්ථයෙහි දක්ෂා විසින් කරණලද අර්ථචර්යා තොමෝ සුව එලවන්නී නොවෙයි නුවන නැතිතැනැත්තේ තමාහට වැඩ පිරිගෙලන්නේය. කවරක්හූ මෙන්දයත් රා සැලවල එනුලා නැසීද එපරිද්දෙන් නුවන නැති තැනැත්තේ යහපත් කෙරෙමියි නපුරක්ම කරන්නේයයි කියා බෝධිසත්වයන් වහන්සේ බණ වදාළ සේක. ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේද ග්‍රහපතිය මේ අතවැසි පුරුෂතෙම රා දූෂ්‍යකෙළේ දන් මතු නොවෙයි පෙරත් සුරා දූෂ්‍ය කෙළේමයි වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ වාරුණී ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රා දූෂ්‍ය කළ අතවැසි පුරුෂ තෙම දනුදු සුරා දූෂ්‍යකළ අතවැසි පුරුෂවූයේය. බරණැස් සිටුව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# නක්ඛත්ත ජාතකය

තවද එක් සමයෙක්හි ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක් එක්තරා ආජීවකයෙකු අරභයා මේ ජාතකය වදාළ සේක. සැවැත්නුවර වනාහි එක්කුලයෙක දුවනී කෙනෙකුන් ජනපදයෙහි වාසය කරන්නා වූ එක් කුලපුත්‍රයෙක් තමාගේ පුත්‍රයාහට වලක්වා අසවල් දින යෙහි කැඳවාගෙණ යන්නෙමි නියා දවස නියමකොට තබා ඒ දිනය පැමිණි කල්හි තමාගේ කුළුපග වූ ආජීවකයක්හුගෙන් විචාලේය. ස්වාමීන් වහන්ස අද අප එක් මඟුලක් කරම්හ. නක්‍ෂත්‍ර යහපත්දෝහෝ අයහපත්දෝහෝයි විචාළේය. ඒ ආජීවකතෙම සිතනුයේ මේ තෙම මා අතින් පළමුවෙන් නොවිචාරා දවස්තබා දැන් විචාරන්නේය වන්නාට මොහු හික්මවන්නමේ කිපී අද නක්‍ෂත්‍ර යහපත් නොවන්නේය. දැන් මගුල් නොකරව ඉදින් කළාහු නම් මහත් විනාශවන්නේයයි කීයේය. ඒ කුලයෙහි මනුෂ්‍යයෝ ඔහුගේ වචනය අදහාගෙණ එදවස නො ගියාහුය. නුවරවාසීහු සියලු මංගල්‍යය ක්‍රියාව කොට ඔහුන්ගේ නොර්මදක ජනපදවාසීන් විසින් අද දවස තබන ලද්දේය. නොම ආවාහුය. අපගේ ද බොහෝ වස්තුව විනාශයට ගියේය. අපට ඔහුන්ගෙන් කවර ප්‍රයෝජනද අපගේ දුවනීයන් අනිකක්හට දෙම්හයි කියා කරණ ලද මගුලෙන්ම දුවනියන් අනිකක්හට දුන්නාහුය. අනිකුත් ජනපදවැසි කුලයෙහි ඇත්තෝ දෙවැනි දිනයෙහි අවුත් අපට කුමාරිකාවක දෙවයි කිවාහුය. ඉක්බිත්තෙන් ඔහුන්ට සැවැත්නුවර වාසීහු කියන්නාහු ජනපද වාසී වූ තෙපි ගෘහපතියෝය, පව්ටු මනුෂ්‍යයෝය, දවස් තබා අනාදරයෙන් නො ආවාහුය. ආවාහු මගින්ම නැවත යව අප විසින් අන්‍යයන්ට කුමාරිකාව දෙන ලද්දීයයි කියා පරිභව බැන්නාහුය. ඔහු ඔවුන් හා සමඟ ඩබරකොට ආවාහු මගින්ම ගියාහුය. ඒ ආජීවකයා විසින් ඒ මනුෂ්‍යයන්ගේ මගුලට අන්තරාය කළ බව භික්ෂූන්ගේ අතුරෙහි ප්‍රකාශ වූයේය. ඒ භික්ෂූ දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නාහු ඇවැත්නි ආජීවකයා විසින් කුලයාගේ මගුලට අන්තරාය කරණ ලදයි කියමින් හුන්නාහුය. ශාස්තෘන් වහන්සේ අවුත් මහණෙනි මේ දම්සභා මණ්ඩපයෙහි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාළ කල්හි මෙනම් කථාවකිනැයි දැන්වූවාහුය. මහණෙනි ආජීවකයා විසින් කුලයාගේ මගුලට අන්තරාය කෙළේ දැන් මතු නොවෙයි පූර්වයෙහිද මේ ආජීවකතෙම ඔවුන්ට කිපී මගුලට අන්තරාය කෙළේයයි වදාරා ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ය කරණ කල්හි නුවරවාසීහු ජනපදවාසින්ගේ දුවනි කෙණෙකුන් රුස්වා දවස්  නියමකොට තබා තමාගේ කුළුපග වූ ආජීවකයෙකුගෙන් විචාළාහුය. ස්වාමීන් වහන්ස අද අපගේ එක් මංගල්‍ය ක්‍රියාවක් ඇත. නකක්‍ෂත්‍රය යහපත්දෝහෝ අයහපත්දෝහෝයි විචාළාහුය. ඒ ආජීවකතෙම සිතනුයේ මොහු තමාගේ අභිප්‍රාවෙන් දවස නියම කොට තබා දැන් මාගෙන් විචාරන්නා හුයයි කියා කිපී අද මොහුන්ගේ මගුලට අන්තරාය කෙරෙමියි සිතා අද නක්‍ෂත්‍රය යහපත් නොවන්නේය. ඉදින් මගුල් කළෝ නම් මහත් විනාශයට පැමිණෙන්නාහුයයි කියේය. ඒ නුවර වාසීහු ඔහුගේ වචනය අදහාගෙණ නොආවාහුය. ජනපද වාසීහු ඔවුන්ගේ නොර්ම දැන නුවරවාසීහු අද දවස තබා නොආවාහුය. අපට ඔවුන්ගේ ප්‍රයෝජන කවරේදැයි කියා අන්‍යයන්හට දුවනියන් දුන්නාහුය නුවරවාසීහු දෙවැනි දිනයෙහි අවුත් කුමාරිකාව ඉල්වූවාහුය. ජනපදවාසීහු කියන්නෝ තෙපි නුවරවාසීහු නම් නසනලද ලජ්ජා ඇති ගැහැවියහ දවස තබා කුමාරිකාව නොගත්තාහ, අප තොපගේ ගමන් නැති බැවින් අන්‍යයන්ට දුනුම්හයි කිවාහුය. අපි ආජීවකයක්හුගෙන් විචාරා නක්‍ෂත්‍රය යහපත් නොවන බැවින් නො ආම්හ. අපට කුමාරිකාව දෙවයි කීවාහුය. අප විසින් තොප නොඑන බැවින් අන්‍යයන්ට දෙනලද්දේය, දැන් දෙනලද කුමාරිකාව කෙසේ නැවත ගෙණ එමෝදැයි කියා මෙසේ ඔවුන් ඔබිනොබ ඩබර කරණ කල්හි එක් නුවරවැසි ප්‍රඥාවත් පුරුෂයෙක් එක් කර්මාන්තයක් නිසා ජනපදයට ගියේය. අපි ආජීවකයාගෙන් විචාරා නක්‍ෂත්‍රය යහපත් නොවන බැවින් නො ආම්හයි කියන්නාවූ ඒ නුවර වාසීන්ගේ වචනය අසා නක්‍ෂත්‍රයෙන් කවර ප්‍රයෝජනද කුමාරිකාවගේ ලැබීම් නක්‍ෂත්‍රය නොවේදැයි කියා මෙසේ කීසේක. නක්‍ෂත්‍රය බලන්නාවූ අඥානයාගේ අර්ථය ඉක්මෙන්නේය. අර්ථයට අභිෂ්ටාර්ථප්‍රතිලාභය ම නක්‍ෂත්‍ර නම් තාරකා රූපයෝ කවර නම් අර්ථයක් සාදද්දැයි කීසේක. නුවරවාසීහු ඩබර කොට කුමාරිකාව නො ලැබ ගියාහුය. ශාස්තෘන් වහන්සේ ද මහණෙනි මේ ආජීවකතෙම මේ කුලයාගේ මගුපට අන්තරාය කළේ දැන් මතු නොවෙයි. පූර්වයෙහිත් අන්තරාය කෙළේම යයි කියා මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ නක්‍ෂත්‍ර ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි ආජීවකතෙම දැනුදු ආජීවක වූයේය. එසමයෙහි ඒ කුලයෝ දැනුදු මේ කුලයෝ වූවාහුය. ඔවුන්ට අවවාද කියා සිටියා වූ පණ්ඩිත පුරුෂයන් වූයෙන් වනාහී තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# දුමේමධ ජාතකය

තවද එක් සමයෙක්හි දිව්‍යබ්‍රහ්මයන්ගේ මස්තකයෙහි කෙලෙනා ශ්‍රී පාද ඇති බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරණ සේක් ලෝකාර්ථ චර්යාවක් අරභයා මේ ජාතකය වදාළ සේක.

මෙහි වර්ථමාන කථාව දොළොස් වැනි නිපාතයෙහි වූ මහා කණහ ජාතකයයෙහි මතු ප්‍රකාශ වන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහ බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුහුගේ අග්‍රමෙහෙසිකාවන්ගේ කුක්ෂියෙහි පිළිසිඳ ගත්සේක. මව් කුසින් නික්මුනා වූ අප මහ බෝධිසත්වයන් වහන්සේට නම් තබන්නා වූ දිනයෙහි බ්‍රහ්මදත්ත කුමාරයයි කියා නම් කළාහුය. ඒ බ්‍රහ්මදත්ත නම් කුමාර තෙම සොළොස් ඇවිරිදි වයසට පැමිණ තක්ෂලා නුවරට ගොස් ශිල්පය ඉගෙණ වෙදත්‍රයාගේ පරතෙර පැමිණ අටළොස් විද්‍යාස්ථානයන්ගේත් නිස්පත්තියට පැමිණිසේක. ඉක්බිත්තෙන් අප මහබෝසතානන් වහන්සේට පියමහරජ්ජුරුවෝ යුවරජ තනතුරු දුන් සේක. එසමයෙහි බරණැස්නුවර වාසිහූ දේවතාවන් මගුල්කොට පවත්නාහ. දෙවියන්ට නමස්කාර කරන්නාහ. බොහෝ තිරළු පලෙළුවන් කුකුලන් ඌරන් ආදී වූ ප්‍රාණීන් ඝාතනය කොට අනේකප්‍රකාර වූ පුෂ්පයෙන් හා සුගන්ධයෙන්ද මාංශයෙන් හා රුධිරයෙන්ද බිලිපූජා කරන්නාහුය. බෝධිසත්වයන් වහන්සේ සිතනසේක් දැන් සත්වයෝ දෙවියන් මගුල්කොට පවත්වන්නාහූ බොහෝ ප්‍රාණවධ කෙරෙති. මහජනතෙම බොහෝ සේ අධර්මයෙහි පිහිටියේය. මම පියරජහුගේ ඇවෑමෙන් රාජ්‍යය ලැබ එකකුදු කලාන්ත නොකොට උපායෙන්ම ප්‍රාණවධ කරන්ට නො දෙන්නෙමි සිතුසේක. මෙසේ සිතා අප මහබෝසතානන් වහන්සේ එක් දවසක් රථයට නැගී නුවරින් නික්මුනුසේක් එක් මහත් නුගවෘක්ෂ මූලයෙක්හි මහජනයා රැස්ව නුගවෘක්ෂයෙහි අධිගෘහිත වූ දිව්‍ය පුත්‍රයාගේ සමීපයෙන් පුත්‍රයන් හා දුහිතෘ යසස් ධනාදීන් යමක් යමක් නැමතිද ඒ ඒ කැමති දෙය ප්‍රාර්ථනා කරන්නාවුන් දුටු සේක. ඒ අප මහාබෝසතානන් වහන්සේ රථයෙන් බැස ඒ නුග වෘක්ෂය කරා එළඹ සුගන්ධ පුෂ්පයෙන් පූජා කොට ජලයෙන් අභිෂේකකොට වෘක්ෂය ප්‍රදක්ෂිණාකොට දෙවතාමංගලික යක්හුමෙන් දෙවතාවට නමක්කාර කොට රථයට නැගී නුවරට ම වැඩි සේක. එතැන්පටන් මෙම ක්‍රමයෙන් අතරතුරෙහි එතනට ගොස් දෙවතා මංගලියක් හුමෙන් පූජාකරණසේක් ඒ අප මහාබෝසතානන් වහන්සේ විසින් මෑතභාගයෙහි පියරජ්ජුරුහුගේ ඇවෑමෙන් රාජ්‍යයෙහි පිහිටා සතර අගති දුරුකොට දශ රාජ ධර්මයෙන් කොප්‍ය නො කෙරමින් දැහැමෙන් රාජ්‍ය කෙරෙමින් මෙසේ සිතූ සේක. මාගේ මනෝරථය මස්තකප්‍රාප්ත වූයේය. රාජ්‍යයෙහි පිහිටියෙමි එබඳු වූ මම පූර්වයෙහි යම් එක් කාරණයක් සිතුයෙම් ද දැන් ඒ කාරණාව මස්තක ප්‍රාප්ත කරන්නෙමි සිතා අමාත්‍යයන්ද බ්‍රහ්මණ ගෘහපති ආදීන් රැස්කරවා මෙසේ ආමන්ත්‍රණය කළසේක. පින්වත්නි මා විසින් කවර කාරණයකින් රාජ්‍යයට පැමිණෙන ලදදැයි දන්නාහු දැයි විචාළසේක. මහ රජ්ජුරුවන් වහන්ස නොදනුම්හයි කීවාහුය. වැලිදු වනාහි මා අසවල් නම් නුගවෘක්ෂයට සුගන්ධාදීන් පූජා කොට බංඤජලීව සිට නමස්කාර කිරීම දුටු විරිදැයි වදාළ සේක, එසේය මහරජයි කීවාහුය. එකල්හි මම ප්‍රාර්ථනාවක් කෙළෙමි ඉදින් මම රාජ්‍යයට පැමිණියෙන් නම් නුඹ වහන්සේට බිලිපූජාකරන්නෙමියි කියෙමි එසේ හෙයින් මා විසින් ඒ දෙවතාවාගේ ආනුභාවයෙන් මේ රාජ්‍යය ලබන ලද්දේය දැන් ඒ දේවතාවාට බිලි පූජා කරන්නෙමි තෙපි ප්‍රමාද නො කොට සීඝ්‍රව දේවතාවාට බිලිපූජා සදවයි කීසේක. මහරජ කවර කවර දෙයක් ගණුමෝදැයි කිවාහුය. පින්වත්නි. මම දේවතාවාට යාඥාකරන්නේ යමෙක් මා ගේ රාජ්‍යයෙහි ප්‍රාණඝාතාදී පංච දුස්සීල කර්මයන්ද දශ අකුශල කම්පනයන්ද සමාදන්ව පවතිද්ද ඔවුන් ඝාතනය කොට අතුනු බහන් මාංශ රුධිරාදීයෙන් බිලිපූජා කෙරෙමැයි කියා ආරාධනා කෙළෙමි. තෙපි මෙසේ බෙර හසුවරවව අපගේ රජ්ජුරුවෝ යුවරජ කල්හි මෙසේ යාඥාවක් කළසේක. ඉදින් මම රාජ්‍යයට පැමිණියෙන් වීනම් යමෙක් මාගේ රාජ්‍යයෙහි දුස්සීලව වෙසේ ද ඒ සියල්ලවුන් ඝාතනය කොට බිලිපූජා කරන්නෙමි කියාය. දැන් ඒ රජතෙම පංච පාපයන්ද දශ අකුශල් දැයි කියන ලද දුස්සීල කර්මය සමාදන්ව පවත්නා වූ දුස්සීලයන් දහසක් නසා ඔවුන්ගේ හෘදයමාංශාදිය ගෙණ දේවතාවට බිලි පූජා කරනු කැමතිසේක. මෙලෙස නුවරවාසීහු දැනගණිත්වයි කීසේක. මෙසේ ද කියා යමෙක් දැන් මෙතැන්පටන් දුස්සීල ක්‍රියාවෙහි පවතිද්ද ඔවුන් දහසක් නසා යාගකොට ආරාධනාවෙන් මිදෙමියි කියා මේ කාරණය ප්‍රකාශ කරණු පිණිස මෙසේ කීසේක. මේ ක්‍රියාව කරන්නට සුදුසුයයි මෙය නොකරන්නට සුදුසුයයි කියා නොදන්නා වූ දුමේමධයන් ප්‍රාණඝාතාදී කරන්නාවූ අඥන පුද්ගලයන් දහසකින් යාගකරන්නට යාඥ කරණ ලද්දේය. ඒ මම දැන් ඒ ආරාධනාවෙන් රාජ්‍යය ලදිමි. දැන් යාගකරන්නෙමි කාරණා කවරේද?. දැන් අධර්මික ජනයෝ බොහෝය. ඔවුන් ගෙණ බිලිපූජා කරන්නෙමි කී සේක. අමාත්‍යයෝ බෝධිසත්වයන් වහන්සේගේ වචනය අසා මහරජ යහපැතැයි කියා දොළොස් යොදුන් බරණැස්නුවර බෙරලැවුවාහුය. ආඥහෙරිය අසා එකද දුස්සීල ක්‍රියාවක් සමාදන්ව සිටියාහූ එකපුරුෂයෙකුදු නුවූයේය. මෙසේ බෝධි සත්වයන් වහන්සේ යම්තාක්කල් රාජ්‍යය කළසේක් ද එතාක්කල් එක පුද්ගලයකුදු පංචපාප දශ අකුශලය යන කර්මයන් කෙරෙන් එක ද අකුශල ක්‍රියාවක් කරන්නෙකු නො පෙනුනේය. මෙසේ බෝධිසත්වයන් වහන්සේ එක පුද්ගලයකු කලාන්ත නො කරවා සියලු රටවැස්සන් ලවා සිල් රක්ෂා කරවා තමන් වහන්සේද දානාදී වූ පින්කම් කොට ජීවිතාගේ කෙළවර තමාගේ පර්ෂිද්ගෙණ දිව්‍ය ලෝකය පුරමින් වැඩි සේක. ශාස්තෘන් වහන්සේද මහණෙනි තථාගතත්වාද් කාරණයෙන් යුක්ත සර්වඥයන් වන්නසේ ලෝකයාහට වැඩෙහි හැසුරුනේ දැන්මතු නොවෙයි පෙරත් හැසුරුනුසේක්මයයි කියා මේ දම් දෙසුම ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ දුමේමධ ජාතකය නිමවා වදාළ සේක. එකල්හි පර්ෂිද්තොම දැන් බුදු පිරිස්වූවාය. බරණැස් රජුව උපන්නෙමි දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# චුල්ලජනක ජාතකය

තවද එක්සමයෙක්හි තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයේ වැඩවාසය කරණ සේක් පසුබට වීර්ය ඇති භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක. එහි වර්ථමාන කථාව හා අතීත කථාව මහජනක ජාතකයෙහි විස්තර වශයෙන් මතු ප්‍රකාශ වන්නේය. මේ ජාතකයෙහි චුල්ලජනක රජ්ජුරුවෝ වනාහී ධවල චඡත්‍රයාගේ යට පනවන ලද සිංහාසන මස්තකයෙහි හුන්සේක් මෙසේ පර්ෂිද්ට කීසේක.

පුරුෂතෙම නිෂ්ඨාවට පැමිණෙමියි ආසාව කරන්නේය. ප්‍රාඥා පුරුෂ තෙම මේ නම් සදාගත හැකිදැයි උකටලී නොවන්නේය. ඒ එසේමැයි දියෙන් ගොඩට නැංගාවූ මම මාගේ ඓශ්චර්ය බලමි යම් පුරුෂයෙක් වීර්ය කළේ නම් ඒ වීර්ය ඵලය සිද්ධ වන්නේය. සාගරයෙන් පීනා විර්යයෙන් ගොඩ දුටුවා මෙනැයි දැක්වූසේක. මේ ජාතකයෙහිද පසුබට විර්ය ඇති භික්ෂූන් වහන්සේ අර්හත් ඵලයට පැමිණිසේක ජනක නම් රජව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# පුණ්ණපාති ජාතකය

තවද එක් සමයෙක්හි අෂ්ට පර්ෂිත් හි අකම්ප්‍ය වූ ඥාන ඇති සර්වඥයන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසන සේක් විෂ යොදනලද සුරාවක් අරභයා මේ ජාතකය වදාළ සේක. එක් සමයෙක්හි සැවැත් නුවර වාසය කරන්නාවූ සුරා ධූර්තයෝ එකතැනකට රැස්ව කියන්නාහු අපගේ සුරා මිල ක්‍ෂය වූයේය. කෙසේ මිල ලබමුදෝයි කියා මන්ත්‍රණය කළාහුය. ඉක්බිත්තෙන් එක් කක්ෂි ධූර්තයෙක් කියන්නේ තෙපි නහමක් නොසිතව එක් උපායෙක් ඇත්තේය යි කිය. කවර නම් උපයෙක්දැයි කී කල්හි අනේපිඬු මහා සිටාණෝ අංගුෂ්ටමුද්‍රිකාව පැළඳ මට සිළිටු වස්ත්‍ර හැඳ පෙරවරු රජහට උපස්ථානයට යන සේක. අපි සුරා පාත්‍රවල්හි විසංඥ කරණ පිණිස බෙහෙත් බහා සුරා පාන ශාලාව සදාහිඳ අනේ පිඬු මහසිටානන් එන කල මහා සිටානෙනි මෙසේ එවයි කියා කැඳවා ගෙන්වා ඔහු සුරාපානය කරවා විසංඥවුවහුගේ අගුෂ්ට මුද්‍රිකාව ද වස්ත්‍රයන්ද ගෙණ රාම්ලකරම්හයි කියේය. ඒ අසා සූරාධූර්තයෝ ඔහුගේ වදනය යහපතැයි පිළිගෙණ එලෙසකොට සිටානන් එනකල්හි පෙර මගට ගොස් ස්වාමීන් වහන්ස මෙතනට අවමැනව මෙතන අපගේ සමීපයෙහි ඉතා මනෝඥ වූ සුරා තිබෙන්නේය. ඉන්මදක් පානය කොට යවයි කීවාහුය. සෝවාන් ඵලයට පැමිණියා වූ ආර්යශ්‍රාවක වූ අනේපිඬු මහසිටානෝ කවර හෙයකින් සුරාපානය අනුභව කරණසේක්ද, නොකමැතිවූසේක් වනාහි මේ ධූර්තයන් පරීක්ෂා කරන්නේම් සිතා ඔහුන්ගේ සුරාපාන භූමියට ගොස් ඔහුන් ගේ ක්‍රියාව බලා මේ රහ මොවුන් විසින් මෙනම් කාරණකයින් යොදන ලදැයි දැන අද මෙතැන් පටන් මේ ධූර්තීන් මෙතනින් එලවන්නෙම් සිතා කියනසේක් කොල දුෂ්ට වූ ධර්තයෙනි තේ සුරාපාත්‍රවල්හි බෙහෙත් බහා ආව උන් පානය කරවා විසගිඥා කරවා කොල්ල කම්හයි සිතා සුරාපාන මණ්ඩලය සරහා උන්නාහුද? උදක් මේ සුරාවර්ණනාකරවුද? තොප අතුරෙන් එකෙක්ද  ඔසවා පානය කරන්නට උත්සහ නොකරන්නේය ඉදින් මේ සුරා විෂ යොදන ලද්දේ වීනම් තොපි පානය කරවයි කියා ඒ ධූර්තියන් භය ගන්ව එතනින් එලවා තමාගේ ගෙට ගොස් ධූර්තියන් විසින් කරණ ලද කාරණාව සර්වඥයන් වහන්සේට දන්වම් සිතා ජේතවනාරාමයට ගොස් දැන්වූසේක. සර්වඥයන් වහ්නසේ වදාරණ සේක් ගෘහපතිය දැන්වනාහි ඒ ධූර්තියෝ තොප වංචා කරණු කැමති නුවුවාහුය. පෙරත් නුවනැත්තවුන් වංචාකරණු කැමති වුවාහුමයයි වදාරා අනේපිඩූ මහසිටානන් විසින් යාච්ඥා කරණ ලද්දාහු ඉකුත්වත් කථාව දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ය කරණ කල්හි අප මහබෝසතානන් වහන්සේ බරණැස සිටාන කෙනෙක් වූසේක. එකල්හිද මේ ධූර්තයො මෙම ක්‍රමයෙන් මන්ත්‍රණය කොට සුරාවෙහි විශයොදා බරණැස සිටානන් එනකල්හි පෙරමගට ගොස් මෙපරිද්දෙන්ම කිවාහුය. බරණැස සිටානෝ නොකැමතිව ඒ ධූර්තයන් පරික්ෂා කරනු කැමතිව ගොස් ඔවුන්ගේ ක්‍රියාව බලා මෙනම් දෙයක් කරණු කැමැත්තාහ ඔවුන් මෙතනින් එලවන්නෙමියි සිතා කියනසේක් පින්වත් ධූර්තයෙනි සුරාපානය කොට රජවාසභවනයට යන්ට නුසුදුසුය රජ්ජුරුවන් දැක නැවත එනකල්හි දැනගතිම්. තෙපි මෙතැන්හිම හිඳුවයි කියා රාජ සේවය ගොස් නැවත ආසේක. ධූර්තියෝ එන්නාවු සිටානන් දැක ස්වාමින් වහන්ස මෙතනට එවයි කිවාහුය. ඔහුන්ගේ වචනය අසා එතනට ගොස් විසයොදා තිබෙන රා පාත්‍රය බලා මෙසේ කීසේක. පින්වත් ධර්තියෙනි තොපගේ ක්‍රියාව මට නොරුචි වන්නේය. තොපගේ සුරා භාජනවල් පිරූ පරිද්දෙන්ම තිබෙන්නේය. තෙපි හුදෙක් සුරා වර්ණනාකරහු නොම පානය කරන්නාහුය. ඉදින් මේ සුරා මනාපෙවුයේවී නම් තෙපිත් පානය කරන්නාහුය. මේ සුරාව වනාහි විෂයොදා වන ලද්දේ වනැයි කියා ඔහුන්ගේ මනොරථය බිඳවනසේක් මෙසේ වදාළ සේක. සුරාපාත්‍රවල් මායන කළ මෙන් පිරිතිබෙන්නේය. මේ සුරා වර්ණනා කථාවක් පවතීද හෙද අනිකක්මය. ඉදින් මේ සුරා මනාපවීනම් තෙපි පානය කරන්නාහුය. පානය කළොත් අඩුපාත්‍ර තිබෙන්නේය. තොපගෙන් එක්කෙනෙකුන් විසිනුදු සුරාපානය නොකරණ ලද්දේය. එසේහෙයින් මේ සුරාපානය යහපත් නොවන්නේය. විෂයොදවන ලද්දේ වනැයි කියා ධූර්තියන් භයගන්වා නැවත මෙබන්දක් නොකරවයි කියා තැතිගන්වා එතැනින් එළවූසේක. අප මහ බෝසතානන් වහන්සේ ජිවිතාන්තය දක්වා දානාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මියපරලොව ගියසේක. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා ජාතක ධර්මය නිමවා වදාළසේක. එසමයෙහි ධූර්තියෝ දැනුදු ධර්තියෝ වුවාහුය. බරණැස් සිටුව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ  සේක.

SANHIDA LANKA

# ඵල ජාතකය

තවද එක් සමයෙක්හි ස්ව ධර්මයන් සර්වාකාරයෙන් කරතලාමලක ක්‍රමයෙන් අවබෝධ කළාවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරණ සේක් ඵලයෙහි දක්ෂ වූ එක් උපාසකයක්හු අරඹයා මේ ජාතකය වදාළ සේක.

සැවැත්නුවර වාසය කරන්නාවූ එක් කෙළඹි පුත්‍රයෙක් වනාහි බුදු පාමොක් භික්ෂූ සංඝයා වහන්සේට ආරාධනාකොට තමාගේ උයනෙහි වැඩ හිඳිනට සලස්වා කැඳ අවුළුපත් වළඳවා උයන්ගොව්වාට ආමන්ත්‍රණය කොට භික්ෂූ සංඝයා වහන්සේ හා සමග උයනෙහි හැසිර ආර්ය වූ භික්ෂූ සංඝයාවහන්සේට අඹ දඹ ආදී වූ නොයෙක් ඵලාජාති පිළිගන්වයි කීයේය. උද්‍යාන පාලතෙම ඔහුගේ වචනය පිළිගෙණ භික්ෂූ සංඝයා කැඳවාගෙණ උද්‍යානයෙහි හැසිරෙන්නේ වෘක්‍ෂය දිසාව බැලුපමණකින්ම මේ ඵලය අමුය. මේ ඵලය යහපත්ව නොපැසුනේය. මේ ඵල යහපත්ව පැසුනේයයි දැනගන්නේය. හෙතම යමෙක් කීයේද ඔහුගේ වචනය එලෙසම වන්නේයයි කියා භික්ෂූ සංඝයාගොස් සර්වඥයන් වහන්සේට දැන්වූවාහුය. ස්වාමීන් වහන්ස මේ උද්‍යානපාලතෙම ඵලයෙහි දක්ෂය භූමියෙහි සිටම වෘක්‍ෂය බලා මේ ඵලය අමුය, මේ ඵලය යහපත්ව නොපැසනේය, මේ ඵලය යහපත්ව පැසුනේයයි දන්නේය. මෙතෙම යමක්කීයේද ඒ එලෙසම වන්නේයයි දැන්වූවාහුය. සර්වඥයන් වහන්සේ වදාරණ සේක් මහණෙනි මේ උද්‍යාන පාලයාම ඵලයෙහි දක්ෂ වූයේ නොවෙයි. පෙරත් නුවනැත්තෝ ඵලයෙහි දක්ෂ වූවාහුමයයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ කල්හි අප මහාබෝධිසත්වයන් වහ්නසේ සිටුකුලයෙක්හි ඉපිද වැඩිවයසට පැමිණ පන්සියයක් ගැල් කරණකොටගෙණ වනික්කර්මාන්ත කරණ සේක් එක් එක් දවසෙක මහ මග ආරණ්‍යයකට පැමිණ අභිමුඛයෙහි සිට සියළු මනුෂ්‍යයන් රැස්කරවා මේ වනයෙහි විෂ වෘක්‍ෂයෝ නම් වන්නාහුය. එහි විෂපත්‍රයෝය. විෂ පුෂ්පයෝය, විෂ ඵලය, විෂ මධුය, යන මොහු වන්නාහුමය.පෙර තොප විසින් පරිභෝග නොකරණ ලද යම්කිසි පත්‍රයක් වත් පුෂ්පයක්වත් ඵලයක්වත් මා අතින් නොවිචාරා අනුභව නොකරවයි කීසේක. ඔහුන් උන්වහන්සේගේ වචනය පිළිගෙණ වනයට වන්නාහුය. වන අභිමුකයෙහි එක් ගම්දොරක කිං ඵල වෘක්‍ෂයෙක් ඇත්තේය. ඒ වෘක්‍ෂයාගේ ස්කන්ධ ශාඛා පුෂ්පඵල යන සියල්ලද අඹ හා සදෘශවන් නාහුය. හුදක් එම නොවෙයි වර්ණසටහනකින්ද සුගන්ධයෙන්ද රසයෙන්ද ආමපක්ව ඵලයෝද අඹඵල හා සදෘසය අනුභවකල කල්හි හලාහල විෂයක්මෙන් ජීවිතක්ෂයට පමුණුවන්නේය. පළමුවෙන් ගිය සමහර ලොල් වූ පුරුෂයෝ මේ අඹ වෘක්ෂයකැයි යන සංඥායෙන් ඵලයක් අනුභව කළාහුය. සමහර කෙණෙක් ගැල්සාත්තුවාහයන් අතින් විචාරා අනුභව කරම්හයි කියා අතින් ගෙන සිටියාහුය. ඔහු ගැල් සාත්තු වාහයන් ආ කල්හි ස්වාමීන් වහන්ස මේ ඵල අනුභව කරම්මෝදැයි විචාලාහුය. බෝධිසත්වයන් වහන්සේ මේ අඹ වෘක්ෂයෙක් නොවෙයි දැන වෘක්ෂය කිම් ඵල වෘක්ෂයක්ය අනුභව නොකරවයි වලක්වා යමෙක් අනුභව කළාහුද උද්ගාරය කරවා චතුමදුරය පානය කරවා නීරෝගී කළ සේක. පූර්වයෙහි මේ වෘක්ෂ මූලයෙහි මනුෂයෝ නවාතැන් ගෙන අඹ ඵල යයි සිතා මේ විෂ ඵලයන් අනුභව කොට ජීවිතක්ෂයට පැමිණියාහුය. දෙවැනි දින මෙහි ගම් වැසියෝ ඇවිත් මළ මනුෂ්‍යයන් දැක පාදයෙන් අල්වාගෙන ප්‍රතිච්ඡන්න ස්ථානයෙහි දමා ගැල් හා සමඟ ඔහුන් අයිති සියළු බඩු ගෙනයන්නාහුය. ඔහුන් ඒ දිනයෙහිද අරුණෝත්ගමන වේලාවෙහිම මට ගවයෝය මට ගැල්ය මට බඩු යයි කියා සීඝ්‍රව ඒ වෘක්ෂ මූලයට ගොස් නිරෝගීව සිට මනුෂ්‍යයන් දැක කෙසේ තෝ මේ වෘක්ෂය අඹ වෘක්ෂයක් නොවන්නේයයි දැනගත්තාහුදැයි විචාලාහුය. අප නොදනුම්හයි ගැල් සාත්තුවාහ ජ්‍යෙෂ්ඨයානන් වහන්සේ දත් සේකැයි කීය. එවිට මනුෂ්‍යයෝ බෝධිසත්වයන් අතින් විචාරන්නාහූ පණ්ඩිතයානන් වහන්ස නුඹ වහන්සේ මේ වෘක්ෂය අඹ වෘක්ෂය නොවන බව කෙසේ දත් සේක්දැයි විචාලාහුය. අප මහ බෝධිසත්වයානන් වහන්සේ කාරණා දෙකකින් දැනගතිම් වදාලා සේක. මේ වෘක්ෂය දුකින් නැගෙන පරිද්දෙන් වැඩි නොවෙයි. ඔසවා තබන ලද ගිනිපෙලෙල්ලෙක් සේ සුවසේ නැගෙන පරිද්දෙන් වැඩියේය. ගමින් දුර සිටියේද නොවෙයි. ගම් දොර සිටියේය. ඉදින් මේ තෙම මධුර ඵල ඇති වෘක්ෂයෙක් වී නම් මෙහි එකදු ඵලයකුදු නොතිබෙන්නේය. මනුෂ්‍යයන් විසින් නිරන්තරයෙන් පිරිවරන ලද්දේ වෙයි. ඉන් මේ වෘක්ෂය විස වෘක්ෂය බව දැනගතිම්යි කියා මහජනයාට ධර්ම දේශනා කොට යහපත් ගමනක් වැඩි සේක. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මහණෙනි පෙරත් නුවණැත්තෝ ඵලයෙහි දක්ෂ වූවාහුමයි කියා මේ දම්දෙසුන් ගෙන හැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගලපා මේ ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි ගැල් සාත්තු වාහයන්ගේ පරිෂිත්තෝම දැන් බුදු පිරිස් වූවාහුය. ගැල් සාත්තුවාහ ජ්‍යෙෂ්ඨ උපන්නේ නම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේක.

SANHIDA LANKA

# ඛදිරංගාර ජාතකය

තවද එක්සමයෙක්හි මෛත්‍රී නැමැති ජලයෙන් නිමවන ලද කොපාග්නි ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් අනේ පිඩු මහ සිටානන් අරභයා මේ ජාතකය වදාළ සේක. අනේ පිඩු මහ සිටානෝ විහාරයම උදෙසා සුපණස් කෙළක් ධන සර්වඥ ශාසනයෙහි ම විසුරුවා රත්නත්‍රයෙහි සරණ හැර අන් තැනෙක්හි රත්න සංඥාවක් නූපදවා සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වසන කල්හි දවසක් පාසා තුන් විටකම උපස්ථානයට යන්නාහුය. උදෑසනම එක්වරෙක යෙති. දාවල් බත් අනුභව කොට ඉක්බිති එක්වරෙක යෙති. සවස් වේලෙහි එක්වරෙක යති. තවත් අතරතුරෙහි උපස්ථානයට යෙති. මෙසේ යන්නාවූ අනේපිඩු මහ සිටානෝ කුමක් ඇරගෙණ අවුදෝහෝයි සාමණේරයන් වහන්සේ හා ලදරු භික්ෂූන් වහන්සේ මාගේ අත බලනසේක් වේදැයි කියා සිස් වූ අතින් එක් දවසකුත් නොගිය විරූය. උදෑසන යෙත් නම් කැඳ අවුළු පත් ගෙන්වා ගෙණ යෙති. වළඳ අන්තයෙහි යෙත් නම් ගිතෙල් මී උක්සකුරු ආදිය ගෙන්වා ගෙණ යෙති. සවස් වේලෙහි යෙත් නම් සුවඳ මල් හා සිවුරු පිළි ආදිය ගෙන්වා ගෙණ යති. මෙසේ දවසක් දවසක් පාසා කරන්නාවූ වස්තු පරිත්‍යාගයෙහි ප්‍රමාණයෙක් නැත්තේය. වෙළඳාම් කරන්නා වූ බොහෝ දෙනෙත් ඒ සිටානන්ට පත් අටළොස් කෙළක් වස්තු නය ගත්තාහුය. ඒ වස්තු මහා සිටානෝත් නොඑලවති. අනික් මතුන් මිත්තන් ආදීන් සන්තබ අටළළොස් කෙළක් වස්තු ගංතෙර නිධානකොට තබන ලද්දේය. ඒ වස්තු වරින්වර ඟග මහ වතුර ඊමෙන් ගංඉවුරු බුන් කල්හි මහා සමුද්‍රයට වැද ඇස් ඔබන ලද පරිද්දෙන්ම සැලවල් මහා සමුද්‍රය ඇතුලෙහි පෙරලි පෙරලි ඇවිදිනාහ. සිටානන්ගේ ගෙයි පන්සියයක් භික්ෂූන් වහන්සේට නිරන්තරයෙන් බත් තබා දෙන ලද්දේය. ඒ සිටානන්ගේ ගෙය පන්සියයක් භික්ෂූ සංඝයා වහන්සේට සතරමං සන්ධියක කරණ ලද පොකුණක් හා සමාන වන්නේය. සියලු භික්ෂූන් වහන්සේට මව්පිය තනතුරෙහි පිහිටියෝය. එසේ හෙයින් ඒ සිටානන්ගේ ගෙට බුදුරජානන් වහන්සේත් වඩනා සේක. අසූමව සව්වන් වහන්සේත් වඩනාසේක. සෙසු යන එන භික්ෂූන් වහන්සේගෙන් පමණෙක් නම් නැත්තේය. ඒ සිටානන්ගේ ගෙය සත්මහලක් ඇත්තේය. දොරටු සතකින් හෙබියේය. ඒ සිටානන්ගේ සතරවෙනි දොරටුවෙහි එක් මිත්‍යා දෘෂ්ටි දෙව්දුවක් වන්නීය. සර්වඥයන් වහන්සේ සිටානන්ගේ ගෙට වදනා කල්හිත් පිටතට වඩනා කල්හිත් තමාගේ විමන සිටින්නට අසමර්ථව දරුවන් වඩාගෙණ බැස බිම සිටිනීය. අසූමහ සව්වන් වහන්සේ හා අවශේෂ ස්ථවිරයන් වහන්සේ වදනා කල්හිත් විමනින් බැස බිම සිටිනීය. ඕතොමෝ මෙසේ සිතුවාය. ශ්‍රමණ භවත් ගෞතමයානන් වහන්සේත් ශ්‍රාවකයන් වහන්සේත් මේ ගෙට වදනා කල්හිත් නික්මෙන කල්හිත් මට සැපයක් නැත්තේය. හැමකල්ම බැස බිම සිටින්ට නොපිළිවන් වන්නේය. යම්සේ මොහු මේ ගෙට නොවදිත් නම් මා විසින් එපරිද්දෙන් කරන්ට වටනේයයි සිතා ඉක්බිත්තෙන් එක් දවසක් සිටානන්ගේ සියලු කාරියෙහි නියුක්ත පුරුෂයා වැදහොත් තැනට ගොස් ආලෝකයක් පතුරුවා සිටියාය. මේ තෙම කවුරුදැයි කී කල්හි මම සතවන දොරටුවේ අධිගෘහිත දේවතා දූ යයි කිවුය. කුමක් පිණිස අවුදැයි විචාළ කල්හි තොපගේ සිටානන්ගේ ක්‍රියාවක් නුදුටුද තමන්ගේ අන්තිම අවස්ථාව නොබලා වස්තුව පිටත් කොට ශ්‍රමණ භවත් ගෞතමයන්ම පුදති වෙළඳාමක් නොකරති. පොලියක් පිට නොලති. අවශේෂ වූ සීවප් ආදී කිසි කර්මාන්ත යකුත් නොකරවති. එසේ හෙයින් සිටානෝ තමන්ගේ කාර්යය යම්සේ කරවත් නම් ශ්‍රමණ භවත් ගෞතමයෝ යම්සේ ශ්‍රාවකයන් හා සමඟ මේ ගෙට නොවදිත් නම් එපරිද්දෙන්ම තොප සිටානන්ට අවවාද කරවයි. කිවුය. ඉක්බිත්තෙන් ඒ දේවතා දූවට සිටානන්ගේ කාරිය කරන්නා වූ පුරුෂයා කියන්නේ නුවනැත්තා වූ දිව්‍ය ස්ත්‍රීය සිටානන් වහන්සේ වස්තු වියදම් කරණ සේක් නෛර්යානික වූ සර්වඥ ශාසනයෙහි වියදම් කළසේක. ඉදින් ඒ සිටානන් වහන්සේ මාගේ කෙස් වැටිය අල්වා ඇදගෙණ ගොස් විකුණන සේක් වී නම් මම ඊට උත්තරයක් නොකියමි. එසේ හෙයින් තෝ මෙතැන නොසිට පලායවයි භයගැන්විය. නැවත එක් දවසක් සිටානන්ගේ වැඩිමහලු පුතනුවන් සමීපයට ගොස් එසේම අවවාද කළාය. ඒ ප්‍රධාන පුත්‍රතෙමේත් පළමු පරිද්දෙන්ම භයගැන් වූයේය. සිටානන් හා සමග කථා කරන්ට අසමර්ථ වන්නීය. සිටානන්ට නිරන්තරයෙන් දන්දීමෙන් හා වෙළඳාම් නොකිරීමෙන් අය මඳ වූ කල්හි වස්තුව නිමා ගියේය. ඉක්බිත්තෙන්  ඒ සිටානන් ක්‍රමයෙන් දිලිඳු බවට පැමිණි කල්හි අඳිනා පිළිත් හෝනා හිඳිනා දූත් භෝජනයත් පෙරසේ නොවන්නේය. මෙසේ දුක්පත් බවට පැමිණත් භික්ෂූ සංඝයා වහන්සේට දන්දෙති. මධුර කොට දන්දෙන්නට අසමර්ථයෝ ඉක්බිත්තෙන් එක් දවසක් නමස්කාර කොට උන්නා වූ සිටානන්ට සර්වඥයන් වහන්සේ වදාරණසේක් සිටාණෙනි. තව දක්වා තොපගේ ගෙයි දන්පවතී දැයි විචාළසේක. එබස් ඇසූ සිටානෝ කියන්නෝ ස්වාමීනි තව දක්වාත් දෙමින් සිටියෙමි දෙන පමණක් විනා සකස් කොට දිය නොහෙමි කාඩි දෙවනු කොට නිවුඩුසාලේ බත් දෙමින් සිටියෙමි කිවුය. එකල්හි සර්වඥයන් වහන්සේ වදාරණසේක් සිටානෙනි තෙපි රූක්ෂ වූ භෝජනය දෙමියි සිතා නාකුළුවවයි සිත ප්‍රසන්න කල්හි බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ආර්ය ශ්‍රවකයන්ට දුන්නා වූ  දානය රූක්ෂ නම් නොවෙයි. කුමක් හෙයින්ද යත් විපාක මහත් බැවිනැයි වදාළසේක. සිත ප්‍රසන්න කරන්ට සමර්ථ තැනැත්තහුගේ දානය රූක්ෂ නම් නොවෙයි. ඒ මෙසේ දතයුත්තේය.

SANHIDA LANKA

නත්ථි චිත්තෙ පසන්නම්හි අප්පිකානාම දක්ඛිනො

තථාගතො වා සම්බුදධ අර්ථවා තස්ස සාවකේ

නකිරත්ථි අනෝමදස්සි සුපාරිචරියා බුද්ධේසූ අප්පිකා

සුක්ඛාය අලෝණකායච එස්සඵලං කුම්මාස පිණ්ඩියා.

තවද සිටාානන්ට සර්වඥයන් වහන්සේ වදාරණසේක් සිටානෙනි. තොපි වූ කලී රුක්ෂ වූ දානය දෙන්නාහු අෂ්ටාර්ය පුද්ගලයන්ටම දෙව මම වේලාම නම් බ්‍රාහ්මණ කාලයෙහි සියලු දඹදිව නගුල් උඩ බඳවා සියලු යාචකයන්ට සත්රුවන් දෙන්නෙම් පඤ්ච මහා ගංගාවෙහි ජලය එක් ගංගාවකට වැද මහ වතුරු මඩනා කලක් මෙන් මහදන් පවත්වන්නෙම් සරණගත වූ පන්සිල් රක්නා වූ කිසිවක්හු නොලදිමි. දක්ඛිණෙය්‍ය පුද්ගලයෝ නම් මෙසේ දුර්ලභ වන්නාහුය. එසේ හෙයින් තෙපි කවර කාරණයකින් මාගේ දානය රුක්ෂය සකස් නොවෙයි කියා සිත අකුළු වව්දැයි වදාළ සේක. මෙසේ ම කියා නැවත වේලාම සූත්‍රය වදාළසේක. ඉක්බිත්තෙන් ඒ දෙවතා දූ ඉසුරුමත් කල ඒ සිටානන් හා සමග කථාකරන්ට අසමර්ථ වූ තැනැත්තී දැන් දුක්පත්ව ගිය බැවින් තමාගේ බස් ගන්නේ වේදැයි සිතමින් මධ්‍යම රාත්‍රී වේලෙහි ශ්‍රී යහන් ගබඩාවට වැද ආලෝක පතුරුවා ආකාශයෙහි සිටියාය. සිටානෝ දැක මේ කවරෙක්දැයි විචාළෝය. සිටානන් වහන්ස මම සතරවෙනි දොරටුවේ අධිගෘහිත දේවතා දූ යයි කිවුය. කුමක් පිණිස අවුදැයි විචාල කල්හි නුඹ වහන්සේට අවවාද කියනු කැමති යයි කිවුය. එසේ වී නම් කියවයි කී කල්හි මහ සිටානන් වහන්ස නුඹ වහන්සේ අන්තිම අවස්ථාවත් නොසිතන සේක. දූ දරුවන් බූහුනන් නො බලන සේක. ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශාසනයෙහි බොහෝ සම්පත් විසුරුවන ලද නුඹ වහන්සේ බොහෝ කලක් වස්තු වියදම් කිරීමෙනුත් කෘෂිවර්ණක් ආදී වූ කර්මාන්තයන් නොකිරීමෙනුත්ත ශ්‍රමණ භවත් ගෞතමයන් නිසා දුක්පත්ව ගියසේක් එසේ වුවත් නුඹ වහන්සේ ශ්‍රමණ භවත් ගෞතමයන් හැර නොපියන සේක. අද දක්වාත් ශ්‍රමණයෝ නුඹ වහන්සේගේ ගෙට වදිත්මය. ඒ ශ්‍රමණයන් විසින් යම් වස්තුවෙක් පළමු ගෙණ යන ලද්දේ වී නම් ඒ වස්තුව නැවත පෙරලා ගෙන්වාගන්ට නොපිළිවන් වන්නේය. ගත් දෙයක් ගත්තේමය. මෙතැන් පටන් නුඹ වහන්සේත් ශ්‍රමණ භවත් ගෞතමයන් කරා නොගිය මැනව. ඒ ශ්‍රමණ භවත් ගෞතමයන් කරකැවී සිටිත් නොබලා නුඹ වහන්සේගේ ගෙයිතැනුත් වෙළඳමුත් කොට කුටුඹ සන්ධාපනය කළ මැනවැයි කිවුය. එකල්හි සිටානෝ ඒ දෙව්දුවට කියන්නෝ මේ තොප මට දෙන්නාවූ අවවාද දැයි කිවුය. එසේය, මේ මා දෙන අවවාදයයි කී කල්හි තොප බඳු වූ දෙව්දුන් සියයකිනුත් දහසකිනුත් ලක්ෂයකිනුත් සොළවාලිය නොහැකි කොට දශබලධාරී වූ බුදුරජානන් වහන්සේ විසින් නිශ්චය කරණ ලද්දේම් වීම් මාගේ ශ්‍රද්ධාව වනාහි මෙර මෙන් නිශ්චලව පිහිටියාය. මා විසින් නෛර්යානික වූ රත්න ශාසනයෙහි නිර්මල වූ ශාසනයෙහි වස්තුව වියදම් කරණ ලද එසේ හෙයින් තී විසින් නොකිය යුත්තක් කියන ලද සර්වඥය ශාසනයට ප්‍රහාරයෙන් නින්දාවක් දෙනලදු වූ මෙබඳු අනාචාර වූ දුස්සීල වූ කාලකන්නි වූ තී හා සමඟ මා එක ගෙයි වසන්ට සුදුසු නොවෙයි වහා මාගේ ගෙයින් නික්ම අනික් තැනකට යවයි කිවුය. ඒ දේවතා දූ සෝවාන් ඵලයෙහි පිහිටි ආර්යය ශ්‍රාවක වූ සිටානන්ගේ වචනය අසා එතන සිටින්නට අසමර්ථව තමා වසන තැනට ගොස් දරුවන් අත අල්වාගෙණ නික්ම අනික් තැනක වසන්ට අවසරයක් නොලැබ සිටානන් ක්ෂමා කරවා එහිම වෙසෙමියි නුවර රකවල් ගත් දිව්‍යපුත්‍රයා සමීපයට ගොස් නමස්කාර කොට සිටායාය. කවර කාරණයකින් දැයි කී කල්හි ස්වාමීනි මම නොසලකා අනේපිඬු මහ සිටානන් හා සමඟ කථාවක් කෙළෙමි. ඒ සිටානෝ මට කිපී වසන තැනින් නෙරපූය. මා සිටානන් සමීපයට ගෙණගොස් ක්ෂමා කරවා වසනතැනක් මට දෙවයි කිව. තී විසින් සිටානන් හට කුමක් කරණ ලද දැයි විචාල කල්හි මෙතැන් පටන් බුද්ධෝපස්ථානය නොකරව ශ්‍රමණ භවත් ගෞතමයන් මේ ගෙට වැද්ද නොදෙවයි කීම් 'ස්වාමීනියි කිවුය. එබස් ඇසූ දිව්‍යපුත්‍රයා කියන්නේ තී විසින් නොකියයුත්තක් කියනලද ශාසනයට නින්දා කරණ ලද දෝශාරෝපනය කරණ ලද මම තී කැඳවාගෙණ සිටානන් සමීපයට යන්ට උත්සහ නොකරමියි කීය. ඒ දෙව්දුව ඔහු සමීපයෙන් සංග්‍රහයක් නොලැබ සතරවරන් රජදරුවන් සමීපයට ගියාය. ඔවුන් විසිනුත් එසේම ප්‍රතික්ෂේප කරණ ලද්දී ශක්‍රදේවේන්ද්‍රයන් සමීපයට ගොස් එපවත් කියා ස්වාමීනි. මම වසන තෙනක් නො ලැබ දරුවන් අත අල්වා ගෙණ පිහිටක් නොලැබ ඇවිදිම් නුඹ වහන්සේගේ ශ්‍රී සමෘද්ධියෙන් මා වසන තැනක් දුන මැනවයි තරකොට යාච්ඤා කළාය. එබස් අසා ශක්‍ර දේවේන්ද්‍රයෝ කියන්නෝ තී විසින් අයුක්තියක් කියන ලද සර්වඥ ශාසනයට පහර දෙනලද මමත් තී නිසා සිටානන් හා සමග කථා කරන්ට අසමර්ථයෙමි. බල එකෙක් කියමි. සිටානන් වහන්සේ සමාකරවා ගන්ට එක් උපායක් කියමියි කිවුය. යහපත ස්වාමීනි. කිවමැනවයි කී කල්හි ශක්‍රදේවේන්ද්‍රයෝ කියන්නෝ දිව්‍යස්ත්‍රීය මේ මහා සිටානන් අතින් මනුෂ්‍යයෝ පත්ලා අටළොස් කෙළක් වස්තු නය ඇරගත්තුය. ඒ වස්තුව තෝ සිටානන් ගේ නියුක්ත පුරුෂයානන්ගේ වෙසය ගෙණ කිසි කෙණෙකුන් නොදන්වා ඒ පත් ඇරගෙණ තරුණ යක්ෂයන් කීපදෙනෙකුන් විසින් පිරිවරණ ලදුව එක් අතකින් පත් හා එක් අතකින් පන්හිඳක් ගෙණ ඒ නය වැද්දන් තැති ගන්වා මේ තොප ලූ නයපත අපගේ සිටානන් හෙයින් තොප අතින් නය නො එල වූ සේක. දැන් දුක්පත්ව ගියසේක. එසේ හෙයින් තොප ගත් නය දෙවයි තොපගේ යක්ෂානුභාවයෙන් දක්වා ඒ අටළොස් කෙළක් වස්තු එලවා ගෙණ සිටානන්ගේ සිස්වු භාණ්ඩාගාරයේ පුරා අනිකුත් අචිරවතී නම් ගංතෙර නිධාන කළ වස්තුවකුත් ගඟ ඉවුර බිඳිගිය කල්හි සමුද්‍රයට වන්නා ඇත එයින් තොපගේ ආනුභාවයෙන් දක්වා ඒ ගෙණවුත් කොටුගුළු පුරා අනිකුත් අසවල් තැන අස්වාමික වූ අටළොස් කෙළක් වස්තු ඇත. ඒත් ගෙණවුත් සිස්වූ කොටගුළු පුරාලව. මේ සිව්පණස් කෙළක් පමණ වස්තුවෙන් සිස්වූ කොටුගුළු පුරාලීම තොපට දඬුවම මෙසේ දඬුවම් කොට මහා සිටානන් ක්ෂමා කරවාගෙණැයි ශක්‍රදේවේන්ද්‍රයෝ කිවුය. එබස් ඇසූ දේවතා දූ යහපතැයි ස්වාමීනි කියා ශක්‍ර දේවේන්ද්‍රයානන්ගේ වචනය පිළිගෙණ කියන ලද ක්‍රමයෙන්ම සියලු වස්තුව ගෙණවුත් කොටු ගෙවල් පුරාලා මධ්‍යම රාත්‍රි වේලෙහි සිටානන්ගේ ශ්‍රී යහන් ගබඩාවට වැද ආලෝකය පතුරුවා ආකාශයෙහි සිටියාය. තොප කවරෙක් දැයි කී කල්හි ස්වාමීනි මහසිටානන් වහන්ස, මම නුඹ වහ්නසේගේ සතරවෙනි දොරටුවේ වසන්නා වූ අඥාන වූ දිව්‍යස්ත්‍රීය මෝහයෙන් මුළාවූ මා විසින් බුදුන්ගේ ගුණ නොදන පළමු දවසෙක නුඹවහන්සේ හා සමග කළ කථාවෙක් ඇත. ඒ දෝශයට මට ක්ෂමා කොට වදාළ මැනව. තවද ශක්‍රදේවේන්ද්‍රයන් වහන්සේගේ වචනයෙන් නුඹවහන්සේගේම නය එලවා අටළොස් කෙළක් වස්තුත් සමුද්‍රයට වන් අටලොස් කෙළක් වත්තුත් ඒ ඒ තැන

SANHIDA LANKA

අස්වාමික වූ අටලොස් කෙළක් වස්තූන් එක්කොට සුපණස් කෙළක් පමණ වස්තූන් ගෙණ වුත් නුඹවහන්සේගේ සිස්වූ කොටගුළු පිරීමෙන් දඬුවම් කරණ ලද ජේතවනා මහා විහාරය නිසා වියදම් කළ සියලු වස්තුව මා විසින් එක්කොට තබන ලද වසනතැනක් නොලැබ දුක් විඳ ඇවිදිම් මා නුවන නැතිව කළ දෙය සිත නොතබා සිටානන් වහන්ස මට ක්‍ෂමාකොට වදාළ මැනවයි කිවුය. එකල්හි අනේපිඬු මහසිටානෝ ඇගේ වචනය අසා මෙසේ සිතුය.මේ දෙව්දු දඬුවම් කෙළෙම් කියාත් කියයි තමාගේ දෝෂයත් ගිවිස සිටිනීය. සර්වඥයන් වහන්සේ මැ විනයනය කොට තමන් වහන්සේගේ ගුණ දක්වන සේක. එසේ හෙයින් බුදුරජානන් වහන්සේට තමන් වහන්සේගේ ගුණ දක්වන සේක. එසේ හෙයින් බුදුරජානන් වහන්සේට දක්වම් සිතා ඒ දිව්‍යස්ත්‍රීයට මෙසේ කිවුය. එසේ හෙයින් බුදුරජානන් වහන්සේට දක්වම් සිතා ඒ දිව්‍යස්ත්‍රීයට මෙසේ කිවුය. දේවතාදුව ඉදින් මා ක්‍ෂමා කරනවනු කැමැත්තෙයි වී නම් සර්වඥයන් වහන්සේ සමීපයෙහිදී මා ක්‍ෂමා කරවයි කිවුය. එබස් ඇසූ දෙව්දු කියන්නී යහපත එසේ කෙරෙමියි සර්වඥයන් වහන්සේ සමීපයෙහිදී මා කැඳවා ගෙණ ගොස් ක්‍ෂමා කළ මැනවැයි කිවුය. සිටානෝ යහපතැයි කියා පාන්ව ගිය කල්හි උදෑසනම ඒ දිව්‍යස්ත්‍රී කැඳවා ගෙණ සර්වඥයන් වහන්සේ සමීපයට ගොස් ඈ කළ කාරිය සියල්ලම සර්වඥයන් වහන්සේට දැන්වුය. බුදුරජානන් වහන්සේ එබස් අසා සිටානෙනි මේ ලෝකයෙහි පාපීවූ පුද්ගලයාත් යම්තාක් පාපය විපාක නොදේ නම් ඒ තාක් කල් යහපතක් දක්නේය. යහ් කළෙක් ඕහට අකුශල කර්මය විපාකදේ නම් එකල අකුශල කර්මයාගේ විපාකයම දක්නේය. කුසල් කළා වූ සත්වයාත් යම්තාක් කුශල කර්මය විපාක නොදේ නම් ඒ තාක් අකුශල කර්ම දක්නේය. යම් කාලෙක ඕහට කුශල කර්මය විපාකදේ නම් ඒ කුශලකර්ම විපාකයම දක්නේයයි කියා මේ දම්පියායෙහි ගාථා දෙකක් වදාළසේක.

පාපොපී පස්සතී භද්‍රං යාවපාපංනා පච්චති

යදාච පච්චතී පාපං අථපාපො පාපතී පස්සතී

භද්‍රොපී පස්සතී පාපං යාවභද්‍රං න පච්චතී

යදාච පච්චති භද්‍රං අථභද්‍රො භද්‍රංනි පස්සතී.

යන මේ ගාථාවෙන් දෙදෙනා වදාළහ. ඉක්බිති ඒ දිව්‍යස්ත්‍රී සෝවාන් ඵලයෙහි පිහිටා සර්වඥයන් වහන්සේගේ චක්‍ර ලක්ෂණයෙන් විචිත්‍ර වූ ශ්‍රී පාදයෙහි වැටි ස්වාමීනි රාගයෙන් රත්ව ද්වේෂයෙන් දුෂ්ට වූ මෝහයෙන් මුළා වූ අවිද්‍යාවන් අන්ධ වූ නුඹ වහන්සේගේ ගුණ නොදන්නා වූ මා විසින් නොකිය යුත්තක් කියනලද ඊට මට ක්‍ෂමා කරවුය. එකල්හි අනේපිඬු මහ සිටානෝ සර්වඥයන් වහන්සේ ඉදිරියෙහි සිට තමන්ගේ ගුණ කියන්නෝ ස්වාමීනි දේවතාදූ බුද්ධෝපස්ථානයේදී නොකරවයි වලකන්නාවූ තැනැත්තී මා කලකාගත නුහුණුවාහුය. දැන් නො දෙව යි මා වලකමින් සිටිය දීත් මම දන්නිමිය ස්වාමීනි මේ මාගේ විශේෂගුණ නොවේදැයි දැන්වූ කල්හි එබස් ඇසූ සර්වඥයන් වහන්සේ සිටානන්ට වදාරණ සේක් සිටානෙනි තොප වූ කලී ශ්‍රොතාපන්න වූ ආර්යශ්‍රාවකව අචලශ්‍රද්ධාවෙහි පිහිටියාව නිර්මල වූ සම්‍යක් දෘෂ්ටි ඇත්තා වූ එසේ හෙයින් තොප මේ අල්පේශාක්‍යවූ දිව්‍යස්ත්‍රියවලකමින් සිටියදී නොවැලකී බස ආශ්චර්යය නො වන්නේය. පෙර නුවනැත්තෝ අබුධොත්පාදකලයෙහි නුවන ලැබූ අවස්ථාවෙහි කාමාවචර ඓශ්චර්යයට අධිපති වූ වසවර්තී මාරයා විසින් ආකාශයෙහි සිට ඉඳන් තෙපි දන්දෙවුනම් මේ නරකායෙහි පැසෙනවාදැයි අසූරියනක් පමණ ගැඹුර ඇති කිහිරඟුවලක් දක්වා දන් නොදෙවයි වලකනලද්දාහු පොළව පලාගෙණ පැන නැගී පියුම්කෙමිය මත්තෙහි සිට දන්දුන්නාහුය. මේ ආශ්චර්යයයි වදාරා අනේපිඬු මහසිටානන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණ ලද බෝධිසම්භාර ඇති අප මහබෝසතානෝ බරණැස් නුවර සිටුකුලයක ඉපිද අනේකප්‍රකාර වූ සැපයෙන් දිව්‍යකුමාරයකුමෙන් වැඩෙමින් ක්‍රමයෙන් විඥ බවට පැමිණ සොළොස් ඇවිරිදි කලම සියලු සිල්පයෙහි කෙළවර පැමිණියෝය, ඒ කුමාරයෝ පියානන්ගේ ඇවෑමෙන් සිටු තනතුර ලැබ නුවර සතරවාසල් දොර දන්හල් සතරෙක නුවරමැද එකෙක තමාගේ ගෙදොර එකෙකැයි සදන්හල් කරවා මහදන් දෙති. පන්සිල් රකිති. පෙහෙවස් වෙසෙති ඉක්බිත්තෙන් එක් දවසක් පෙරවරු වේලෙහි බෝධිසත්වයන්ට නොයෙක් අග්‍ර රසයෙන් යුක්තවූ භොජනය එලවූ කල්හි එක් පසේබුදු කෙණෙකුන් වහන්සේ සතියක් ඇවෑමෙන් නිරෝධසමාපත්තියෙන් නැගී පිඬු සිඟන වේලාව සලකා අද මා විසින් බරණැස්නුවර සිටානන්ගේ ගෙදෙරට යන්ට වටනේයයි සිතා නාලිය දැවටුවළඳා අනවත්පත විලින් මුව සෝදා රත්ගල්තලා මුදුනෙහි සිට අඳනය ඇඳ ඊමත්තෙහි පටිය බැඳ සඟල සිවුරෙන් ගැටවටු ගන්වා ඍධියෙන් උපන්නාවූ මැටිපාත්‍රයක් ගෙණ ආකාශයෙන් ගොස් බෝධිසත්වයන් අනුභව කරන්නට තලියේ බත් එෑ ඇසිල්ලහිම ගෙදෙර වැඩිසිටිසේක. බෝධිසත්වයෝ ඒ පසේබුදුන් වහන්සේ දැකලාම අස්නෙන් නැගී සිට ආදර දක්වා අතවැස්සා මුනබැලූය. ඔහු විසින් කුමක් කෙරෙමද ස්වාමීනි කී කල්හි පසේබුදුන් වහන්සේගේ පාත්‍රය ගෙණවුයි කිවුය. එකෙකෙහිම පාපී වූ වසවර්තීමාරයා කම්පිත වෙමින් නැගීසිට මේ පසේ බුදුන් වහන්සේ අදට සත්වෙනිදවස් බත් නොලත් සේක. එසේ හෙයින් අද බත් නොලත් සේක් වීනම් නස්නා සේක, උන්වහන්සේ නසම්, සිටානන්ගේ දානයටත් අන්තාරායක් කෙරෙමියි සිතා එකෙනෙහිම අවුත් මිදුල් මධ්‍යයෙහි අසූරියනක් පමණ අඟුරුවලක් මැවීය. ඒ අඟුරුවල කිහිරඟුවෙන් පිරුනේය. හාත්පසින් දිළි හෙන්නාවූ ගිණිදැල්හි ඇත්තේය. එකජටාවල ඇවිලෙන්නේය, අවීචිමහා නරකයමෙන් බලන්නාවූ සත්වයන්ට වැටහෙන්නේය ඒ කිහිරඟුරු වල මවා තෙමේ ආකාශයෙහි සිටයේය. පාත්‍රය ගන්නට ගියාවූ පුරුෂයා ඒ කිහිරඟුරු වල දැක මහත් වූ භයින් හවපත්ව වැළැක්කේය.

SANIDA LANKA

මහබෝසතානෝ ඔහු දුක දරුව තෝ කුමක් නිසා වැලැක්කෙහිදැයි විචාලේය. ඒ පුරුෂයා කියන්නේ ස්වාමීනි මේ මිදුල මධ්‍යයේ මහත්වූ අඟුරු වලෙක් ගිණිගෙණ දිලියෙන්නේය. ඒක ජවාලාව ඇවිලෙන්නේයයි කිහ. තවද අනිකෙක් අනිකෙකැයි එනු එන්නෝ සියල්ලෝම භයින් ත්‍රස්තව වේගයෙන් පලාගියාහ. එකල බෝධිසත්වයෝ මෙසේ සිතූහ. අද මාගේ දානයට අන්තරායක් කරණු කැමතිව වසවර්ති මාරයා ඉපිළ නැංගේ වන. ඒ මාරයා තමාසේම වූ මාරයන් සියයකිනුත් මාරයන් දහසකිනුත් මා සොලවාලිය නොහැකිබව නොදත්වන. අද දූන් මාරයාගේවත් මාගේවත් බල මහත්බව හා ආනාභාව මහත්බව දනිමියි සිතා සැරසූ සැටියේම බත්තලිය තුමුම ඇරගෙණ ගෙන්නික්ම අඟුරුවල මුවවිට සිට ආකාශය බලා මාරයා දුක තෝ කවරෙක්හිදැයි විචාළේය. මම වසවර්තිමාරයායයි කී කල්හි මේ අඟුරු වල තා විසින් මවනලද්දේදැයි කිවුය. එසේය ම විසිනැයි කී කල්හි කුමක් පිණිස දැයි විචාරා තොපගේ දානයට අන්තරාය කරණු පිණිසත් පසේබුදුන් වහන්සේගේ ජීවිතාන්තරාය කරණු පිණිසත් කෙළෙමි කීය. ඒ අසා බෝධිසත්වයෝ කියන්නාහු මාරය. තා විසින් මාගේ අන්තරාවක්වත් පසේබුදුන් වහන්සේගේ ජීවිතයට අන්තරාවක් වත් මම කොටලිය නොදෙමි අදදූන්මාගේවත් තාගේවත් බල මහත්නියාව දකිමි කියා මහබෝසතානෝ දෘඪසමාදානයෙන් බත්තලියගෙණ අඟුරුවල මත්තට පැන පූය. එකෙණෙහිම අසූරියනක් පමණ ගැඹුරු ඇති අඟුරුවල පත්ලෙහි ඊ ඊ පිට අටගත්තාවූ සත්බුමු මහපියුමෙක් උඩනැගී බෝධිසත්වයන්ගේ දෙපයල පිළිගත්තේය. ඒ පියුමෙන් තිඹක් පමණ රේණු ආකාශයට කරකැවී කැවී නැගී මහබෝසතානන් වහන්සේගේ ඉස්මුදුනෙහි පටන් සකළ ශරීරය රන්සුනෙන් නැවරුවාක් මෙන් කෙළේය. එකෙණෙහි මහබෝසතානෝ  පියුම් කෙමිය මත්තෙහි සිට නොයෙක් අග්‍රරසයෙන් යුක්ත වූ භෝජනය පසේ බුදුන්වහන්සේගේ පාත්‍රයට පිළිගැන්වුවාය. පසේ බුදුන් වහන්සේ ආහාරය පිළිගෙණ අනුමෙවැනි ධර්මදේශනා කොට පාත්‍රය ආකාශයට හැර මහ ජනයා බලබලා සිටියදීම ආකාශයට පැනනැගී පස්වනක් වලා මඩිමින් හිමාලය වනයට වැඩිසේක. වසවර්තීමාරයාත් පැරදා දොම්නසට පැමිණ තමන් වහන්නාවූ ස්ථානයටම ගියේය. බෝධිසත්වයෝ පියුම්කෙමිය මත්තහි සිට මහජනයාට දන්දීම  හා සිල්රක්ෂා කිරීමෙහි ගුණවර්ණනා කිරීමෙන් ධර්මදේශනා කොට මහජනයා විසින් පිරිවරුණලදුව තමන්ගේ ගෙටම වැද දිවිපමණින් දානාදී වූ පින්කම් කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියේය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ සිටාණෙනි යම් බුදූහු තෙපි ප්‍රථම මාර්ග ලැබ දෙව්දුව විසින් දූන් 'සොලවාලන්ට අසමර්ථවූවාහුය යන යමෙක් ඇත්නම් ඒ තෙමේ ආශ්චර්යය නොවන්නේය. පෙර නුවනැතන් විසින් කළ දෙයම ආශ්චර්යය වන්නේයයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ බදිරංගාර ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි පසේ බුදු වූ එහිම පරිනිර්වාණය කළෝය. වසවර්ති මාරයා පරදවා පියුම්කෙමිය මත්තහි සිට පසේ බුදුන්ට බත්තලිය පිළිගැන්වූ බරණැස්නුවර නිටානෝ නම් සම්‍යක් සම්බුදු රජවූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# පංචායුධ ජාතකය

තවද එක් සමයෙක්හි ජාම්බෝනදවවනියට බදු වූ ශරීර ප්‍රභා ඇති සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි පසුහට වීර්ය ඇති භික්ෂූන් කෙනෙකු අරඹයා මේ ජාතකය දක්වන ලදී. සර්වඥයන් වහන්සේ මේ භික්ෂූන් ට ආමන්ත්‍රණය කොට සැබෑද මහණ තෝ පසුබට විර්ය ඇත්තේදැයි වදාල සේක. සැබැව ස්වාමිනි කී කල්හි මහණ පෙර නුවණැත්තාවූ මහෝත්තමයෝ විර්ය කරන්න සුදුසු තැන්හි විර්ය කලෝදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකු රාජ්‍ය කරන සමයෙහි අප මහා බෝසතානෝ රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසිකා බිසවුන් කුස පිළිසිඳගත්තුය. ඒ බෝධිසත්වයන්ට නම් තබන දවස් අටොරාෂියක් බමුණන්ගෙන් හා සියළු සත්වයන් වස්තුවෙන් පිනවා ලක්ෂණ විචාලෝය. එකල ලක්ෂණ කීමෙහි දක්ෂ වූ බමුණෝ ලක්ෂණ සම්පත්තිය බලා මාහාපිනැති රාජ කුමාර කෙණෙකුන් වහන්සේ නුඹ වහන්සේගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ දස රාජ ධර්මයෙන් රාජ්‍ය කරන සේකැයි කීය. පංචායුධ යුධ ශිල්පයෙහි දක්ෂව ජම්බුද්වීපයෙහි සත්වයන්ට අග්‍ර පූරුෂ වනසේකැයි කිව්ය. බමුණන්ගේ බස් අසා කුමාරයන්ට නම් තබන්නාහු පංචායුධ කුමාරයෝ යයි නම් තුබූහ. ඉක්බිත්තෙන් ඒ කුමාරයන් මැදිවිය පැමිණි කල්හි රජ්ජුරුවෝ සමීපයට කැඳවා ශිල්පයක් ශාස්ත්‍රයක් නිමවා නොහෙන රාජ්‍යය කළ නොහැක්කේය එසේ හෙයින් ශිල්ප උගනුවයි කීහ. ස්වාමීනි කවුරුන් සමීපයෙහි උගනිම්දැයි කී කල්හි පුත ගන්ධාර දේශයෙහි තක්ෂලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි ශාස්ත්‍රය ඉගෙන නිමාවට පැමිණ ඉක්බිති ආචාරින් වැඳ තක්ෂලා නුවරින් නික්ම පංචායුධ සන්නද්ධව බරණැසු නුවරට යන්නාහු වනාන්තරගත මාර්ගයට අභිමුඛ වූ කල්හි එසේ පැමිණෙන්නාහු කුමාරයෝ අතරමග සිලේස ලෝම නම් යක්ෂයකු වසන්නාවූ එක් වනයකට පැමිණියෝය. එකල කුමාරයන් වනයට අභිමුඛ වූ කල්හි මනුෂ්‍යයෝ දැක පින්වත් වූ පුරුෂය තෙපි මේ වනාන්තරයට නොවදුවයි මේ වනාත්තරයෙහි සිලේෂ ලෝම නම් යක්ෂයෙන් ඉඳ දුටු දුටුවන් අවුරා අනුභව කරන්නේය එසේ හෙයින් තෙපි නොයවයි වැලකුය.

බෝධිසත්වයන් තමන්ගේ සමර්ථ කම තුමුම වලකා නිර්භීතව කේෂර සිංහ රාජයකුසේ වනයට සාහසිකව පැමිණි කල්හි කැනහිල් මල් කැකුළු සාදල ඇතිව කබර පත් වූ මුඛ හා බඩ ඇතිව නිල් වූ හස්ත පාද ඇති වූ ඕ හට බෝධිසත්වයෝ කියන්නාහු එම්බල යක්ෂය මම මාගේ සමර්ත කම් සලකා මෙතැනට වන්නෙමි. තෝ අප්‍රමාදව මා සමීපයට වර විෂ පොවන ලද ශරීරයකින් විද මෙතනම එලමි ඔහු තැතිගන්වා දරුණු වූ විෂ පොවන ලද ශරය දුනු පිට ලා ගෙන ඇඳ අත හලවා හුය. ඒ සැරය ගොස් යක්ෂයාගේ රෝමයෙහි ඇලි ගියේය. ඉක්බිත්තෙන් අනික් ෂරයක් යයි මෙසේ හී දඬු පනසක් විද්දේය. ඒ සියළුම හී දඬු යක්ෂයාගේ රෝමයෙහිම ඇලි ගියේය. තවද යක්ෂයා ඒ සියළු හී දඬුම කිලිපොලා තමාගේ පා මුල වගුරවා බෝධිසත්වයන් සමීපයට ගියේය. එකල බෝධිසත්වයෝ නැවතත් තැති ගන්වා කඩුව කොපුවෙන් හයා ගෙන ගැසුයේය. දෙතිස් අඟලක් දිග ඇති කඩුව රෝමයෙහි ඇලි ගියේය. එවිට මගුරෙන් ගැසු සේක. එයත් රෝමයෙහි ඇලි ගියේය. ඒ මුගුරු ඇලී ගියාදැක බෝසතානෝ කියන්නාහු පින්වත් වූ යක්ෂය මම පංචායුධ කුමාරයෝය මාගේ නම් ඇසූකෙනෙක් නැත මම තා විසින් අධිගෘහිත වූ වනාන්තරයට වදනෙමි. දුනු ආදී වූ ආයුධයක් සලකා වන්නේම් නොවි මාගේ සමර්ත කම සලකාවන්නේ එසේ හෙයින් තා සුනු විසුනු කරමි අධිෂ්ඨානය දක්වා ගර්ජනා කොට දකුණතින් යක්ෂයාට පැහැරී සේක. එයිදු රෝමයෙහි ඇලි ගියේය. වමතින් පහල සේක. එයිදු රෝමයෙහි ඇලි ගියේය. දකුණු පයින් පහල සේක. එයිත් රෝමයෙහි ඇලි ගියේය. වම් පයින් පහර සේක. එයිත් රෝමයෙහි ඇලි ගියේය. ඇන සුනු විසුනු කරමි ඉසින්ද පහලහ. මහබෝසතානෝ පස් තෙනකින් බැදී එල්ලෙමින් සිටි. නිර්භිතව කතා කෙරෙති. කල යක්ෂයා මෙසේ සීතිය. පුරුෂ සිංහයෙක පුරුෂ ශ්‍රේෂ්ඨයෙක. මේ කෙසේ වූ පුරුෂයෙක්දෝ කියා සිතන්නේ එම්බල පුරුෂය තෝ මට ගොදුරුව සිට මෙසේ වූ බුහුටි කතා කරන්නට කාරණා කවරෙක්ද විචාළේය. එකල්හි බෝධිසත්වයන් වහන්සේ තෝ මා කැයේ වී නම් මාගේ කුක්ෂීයෙහි වජ්‍රායුධයක් ඇත්තේය. ලයෙන් ඇනි පිටින් නැගෙන්නේය. තාගේ අතුනුභහන් කඩ කඩ කොට සිඳ ජීවිතක්ෂයට පමුණුවන්නේය. එසේ කල්හි අප දෙදෙනාම නැසෙම්හ. මේ කාරණය මම නොහාම් කිවාහුය. මේ වචනය වූ කලි බෝධිසත්වයන් තමන්ගේ අභ්‍යන්තර යෙහි ඥානායුධය සඳහා කීහ.

ඒ බස් අසා යක්ෂයා මෙසේ සිතීය. මේ මානවකයා සත්‍යයෙක්ම කියන්නේය. පුරුෂ සිංහයාගේ ශරීරයේත් මුං ඇටයක් පමණ අනුභව කළෙම් වීම් නම් මාගේ බඩ දිරවා ගත නොහෙමි. එසේ හෙයින් මොහු හැර පියෙමි සිතා මරණ භයින් ත්‍රස්තව බෝධිසත්වයන් ඇරපියන්නේ මානවකය තෝ සිංහ පුරුෂයෙක තාගේ මස් නොකමි තෝ රාහු මුඛයෙන් මිදුනා හූ චන්ද්‍රයා පරිද්දෙන් මා අතින් මිදි මිත්‍ර සමූහයා සතුටු කරවමින් පලා යවයි කීය. එකල්හි බෝධිසත්වයායන් වහන්සේ ඕ හට මෙසේ කීය. යක්ෂය මම වූ කලියෙන් තෝ වනාහි පෙර අකුශල කොට රවුද්‍ර කර්මයෙන් ලේ රැඳි ගියාහු අත් ඇතිව අනුන්ගේ ශරීර මාංශය භක්ෂනය කරන්නාවූ යක්ෂව උපන්නෙහිය. ඉදින් මේ යක්ෂාත්ම භවයෙහි සිට අකුශල් කරන්නේ වී නම් අඳුරෙන් අඳුරටය යන්නෙහිය. මා දුටු තැන් පටන් තා විසින් අකුසල් කරන්නට නොපිලිවන. ප්‍රාණගාත නම් නරක තිරිසන් ප්‍රේත අසුර කාය යන සතර අපායෙහි උපදවන්නේය. නැවත මනුෂ්‍ය ලෝකයෙහි උපන්තෙන මන්දායුෂ්ක බව ලබන්නේය. මේ ආදී වූ නොයෙක් කාරණයෙන් පංචදුෂ්ශීලයෙහි ආදීනව හා පංච ශීලයෙහි අනුහස් හා අනේක ප්‍රකාරයෙන් යක්ෂයා තැති ගන්වා ධර්ම දේශනා

SANHIDA LANKA

කොට ඔහු දමනයේලා ඔහුගේ සන්තානයෙහි කෙලෙස් නැමති සතුරන් නසා පංචශිලයෙහි පිහිටවා වනාන්තරයෙහි සත්වයන් විසින් දෙන ලද භෝජනය බිලියම් පිණිස ලැබ අප්‍රමාදව වාසය කරවයි අවවාද කොට වනයෙන් නික්ම මහාවන සමීපයෙහි මනුෂ්‍යන්ට කියා පංචායුධ සන්නද්ධව බරණැස් නුවරට ගොස් දෙමව්පියන් දක මෑත භාගයෙහි රාජ්‍යයෙහි පිහිටවා දැහැමෙන් රාජ්‍ය කරමින් ධානාදී වූ කුසල් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

මෙසේ ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා තවද භික්ෂුන්ට මත්තෙහි අවවාද කරන සේක් නොපසු බටවූවාහු විර්ය ඇති සිතින් නිරවද්‍ය වූ අන්තයෙන් කුසල යයි කියන ලද සප්තත්‍රිංසත්  බෝධිපක්ෂික ධර්මයෙන් වඩාද සියළු සංස්කාර ධර්මයන් අනිත්‍යය දුක්ඛය අනාත්මයි අනාත්මයයි මෙසේ ත්‍රිලක්ෂණ මෙනෙහි කර විදර්ශනාවෙහි පටන් බෝධිපාක්ෂික ධර්මයන් වඩන්නාහු යෝගාවචර තෙම සියළු සංයෝජනක්‍ෂයකරන්නා වූ සතර වැනි ආර්ය මාර්ගයාගේ කෙළෙවර උපන් බැවින් ධර්මදේශනාවෙහි කුළු ගන්වා මත්තෙහි චතුරාර්ය සත්‍යය ධර්මයන් ප්‍රකාශ කොට වදාළ සේක. චතුරාර්ය සත්‍යයන්ගේ අවසානයෙහි පසුබට වීර්ය ඇති භික්ෂූහු අරහත් ඵලයෙහි  පිහිටි සේක. සර්වඥයන් වහන්සේ පූර්වාපර සන්ධි ගලපා මේ පංචායුධ ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි යක්ෂයා නම් අංගුලි මාල ස්ථිවිරයෝය. පංචායුධ කුමාරයෝ නම් බුදු වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# කාංචනස්කන්ධ ජාතකය

තවද එක් සමයෙක්හි අසරණයන්ට සරණ වූ සර්වඥයන් වහන්සේ සැවැත් නුවර වැඩ වසන සේක් එක්තරා භික්ෂූන් කෙණෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක. සැවැත් නුවර වාසය කරන්නාවූ එක් කුල පුත්‍රයෙක් සර්වඥයන් වහන්සේගේ ධර්ම දේශනාව අසා සර්ව ඥායාසනයෙහි පැහැද පැවිදි වූයේය. ඉක්බිත්තෙන් ඒ භික්ෂූන් වහන්සේට අවවාද දෙන්නාහු ඇවැත්නි සීලය ඒක විද වන්නේය. විවිධ වන්නේය. යනාදී බහුප්‍රකාශ වන්නේය. මේ චුල්ලශිල නම් මේ මධ්‍යම ශීල යන මේ මහා ශීල ගුණ මේ ප්‍රාතිමොක්ෂ සංවර ශීල ගුණ මේ ඉන්ද්‍රිය සංවර ශීල ගුණ මේ ආජීව පාරිශුද්ධි ශීල නම් මේ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලනමැයි කියා සීලය ප්‍රභේද වන්නාහු වෙති. ඒ භික්ෂූන් වහන්සේ මෙසේ සිතූ සේක. මේ සිලය නම් ඉතා බොහෝය. මම මෙපමණක් සමාදන්ව පවත්වන්නට නොහැකි වන්නේය. සිල් පුරන්නට නොහැකි වන්නා හට ප්‍රව්‍රජ්ජාවෙන් කවර ප්‍රයෝජනද. මම ගිහිව ධානාදී වූ කුසල් කරන්නෙමි. පුත්‍ර දාරාවන්ද රක්ෂා කරන්නෙමි. සිතූ සේක. මෙසේ ද සිතා ස්වාමීන් වහන්ස මම සිල් රක්ෂා කරන්නට නොහැකි වන්නෙමි. සිල් රකින්නට නොහැක්කා හට ප්‍රව්‍රජ්ජාවෙන් කවර ප්‍රයෝජනද. මම සිවුරු හරින්නෙමි නුඹ වහන්සේලාගේ පා සිවුරු ගනවයි කීයේය. එසේ කී මහණ හට ආචාර්යය උපාධ්‍යායන් වහන්සේ වදාරන සේක් ඇවැත්නි එසේ කල්හි බුදුන් වැඳ යවයි කියා උන් වහ්නසේලා ඒ මහණ කැඳවාගෙන සර්වඥයන් වහන්සේගේ සමීපයට ධම්සභා මණ්ඩපයට ගියාහුය. සර්වඥයන් වහන්සේ දක මහණෙනි කවර කාරණයකින් නොකැමති කරවා මහණක් වූ කැඳවාගෙන ආවාහුදැයි වදාළසේක. ස්වාමින් වහන්ස මේ භික්ෂූන් වහන්සේ මට සිල් රකින්නට නොහැකි වන්නෙමි කියා පාත්‍රා සිවුරු භාරකොට දුන්නේය. ඉක්බිත්තෙන් ඒ මහණ අප කැඳවාගෙන ආම්හයි දැන්වූවාහුය. මහණෙනි තෙපි වනාහි මේ මහණ හට කවර කාරණයකින් ශිලය බොහෝ කොට කීවාහුද යම් පමණක් තෙමේම රක්නට හැකිවේද එපමණක්ම රක්ෂා කෙරේවා මෙතැන් පටන් තෙපි එසේ කිසිවක් නොකියව. මීට කටයුතු මම දනිම් කියා මහණෙනි තෙපි මෙසේ එව. තොපට බොහෝ ශිලයෙන් කවර ප්‍රයෝජනද ත්‍රිවිධ ශීලයම රක්ෂා කරන්නට හැකි වන්නේදැයි විචාරා  වදාළ සේක.

ස්වාමීන් වහන්ස හැකිවන්නෙමි කීය. එසේ වීනම් තෙපි මෙතැන් පටන් කායවරව, වාක් වාරය, මනෝ වාරය, යන ත්‍රිවිද වාරයන්ම රක්ෂා කරව. කාය වාරයෙන් අකුශල කර්මය නොකරව. වාග් වාරයෙන් අකුශල් නොකරව, මනෝ වාරයෙන් අකුශල් නොකරව, ගිහි නොව මේ ත්‍රිවිධ ශීලයම රක්ෂා කරවයි කීය. මෙපමණකින් ඒ භික්ෂූන් වහන්සේ තුටු පහටු සිත් ඇතිව යහපති ස්වාමීන් වහන්ස මේ ත්‍රිවිධ ශ්‍රීලය රක්ෂා කරමි කියා සර්වඥයන් වහන්සේට නමස්කරා කොට ආචාර්ය උපධ්‍යයන් වහන්සේ හා කැටිව ගිය සේක. ඒ භික්ෂූන් වහන්සේ ඒ ත්‍රිවිධ ශීලය පුරමින්ම දැනගත් සේක. ආචාර්ය උපාද්‍යයන් විසින් මට කියන ලද ශිලයද මෙපමණෙක්මය. උන් වහන්සේ වනාහි තමුන් සවුනේ ගෙවා නොදත් බැවින් මට අවබෝධ කරන්නට නොහැකි වූවාහුය. බුදුරජානන් වහන්සේ වනාහි තමන් සවුනේ ගෙවා ලද් බැවින් නිරුත්තර වූ ධර්ම රාජන්ම බැවින් මෙපමණ ශීලය චාරත්‍රයෙහිම බහා මට දැන් වූ සේක. ඒ කාන්තයෙන්ම සර්වඥයන් වහන්සේ මට පිහිට වූ සේකැයි කියා විදර්ශනා වඩා කීප දවසකින් ම අර්හත් ඵලයෙහි පිහිටි සේක. ඒ ප්‍රවෘත්තිය දැන දම්සභා මණ්ඩපයෙහි රැස්ව හුන්නාහු භික්ෂූන් වහන්සේලා කියන්නාහු ඇවැත්නි අසවල් මහණ සිල් රක්ෂා කරන්නට නොහැකි  වන්නේ කියා ගිහි බවට පැමිණෙන්නාහු සියළු ශීලයන් තුන් කොටසෙක්හි පිහිටුවා ග්‍රහණය කරවා ශාස්තෘන් වහන්සේ අරහත් ඵලයට පැමිණ වූ සේක. සර්වඥයෝ නම් ඉතා ආශ්වර්යය මත් සේකැයි බුදුගුණ කියමින් හුන්නාහුය. සර්වඥයන් වහන්සේ එතනට වැඩ වදාරා මහනෙනි ධම්සභාවෙහි කවර නම් කතාවකින් යුක්තව හුන්නුදැයි වදාරා මේ නම් කතාවකින් යයි දැන් වූ කල්හි මහණෙනි ඉතා බැරුරුම් බර කොට්ඨාශ වශයෙන් නොබෙදන ලද්දේ සැහැල්ලුවාක් මෙන් වන්නේය. පෙර නුවණැති මහොත්තමයෝ මහත් රත්රන් කඳක් ලැබ ඔසවා ගන්නට නොහැකිව විභාග කොට ඔසවාගෙන ගියාහුය. වදාරා අතීත කථාව ගෙන හැර දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකුන් රාජ්‍ය කරන කල්හි අප මහා බෝසතානෝ එක් ගමක කර්ෂකව උපන් සේක. බෝධිසත්වයානන් වහන්සේ එක් දවසක් එක්තරා කරන ලද ගමෙක්හි කෙතක් කර්ෂණය කරන සේක. පූර්වයෙහි ඒ ගම සම්පත්තියෙන් යුක්ත වූ එක් සිටාන කෙනෙක් කලලයක් හා පමණ වට ඇති සතර රියන් දිග ඇති රන්කඳක් නිදාන කොට කළුරිය කළේය. ඒ රන් කදෙහි බෝධිසත්වයන් වහන්සේගේ නගුල ලග්නව සිටියේය. බෝධිසත්වයන් වහන්සේ මුල් සමූහය වනැයිසිතා පස් පිරමින් ඒ මුල දැක පාංශුවෙන් වසා දාවල් කර්ෂණ කොට සූර්ය අස්ථාන ගත වූ  කල්හි වියදඬු නගුල් ආදීය එක් පසෙක්හි බහා තබා ස්වර්ණස්කන්ධය ගෙන යන්නෙමි සිතා ඒ රන්කඳ ඔසවා ගන්නට නොහැකි වූ සේක් හිඳ මෙපමණ කුක්ෂි රක්ෂා පිණිස වන්නේය. මෙපමණෙක් නිධාන කොට තබන්හෙි මෙපමණකින් කෘෂිවණෙක් කර්මාන්ත ආදියෙහි යොදන්නෙහි. මෙපමණ ධානාදී කුසල් කිරීමට වන්නේයයි කිය සතර කොට්ටාසයක් කල සේක. මෙසේ කොට්ටාසය කල කල්හි අප මහා SANHIDA LANKA බෝසතානන් වහන්සේට ඒ ස්වර්ණස්කන්ධය සැහැල්ලූ වූවාක් මෙන් වුයේය. අප මහ බෝසතානන් වහන්සේ ඒ ස්වර්ණස්කන්ධය ඔසවා ගෙට ගොස් සතර කොට්ටාසයකට බෙදා දානාදී වූ පින්කම් කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියසේකැයි වදාරා සර්වඥයන් වහන්සේ බුදුව වැඩ හිඳී මෙසේ වදාල සේක්. භෝගයන්ගේ කේෂමයට හෙවත් නිර්වාණයට පැමිණෙන පිණිස දුරු කර නීවරණයන් ඇති තිත්තයින් එසේ විගත නීවරණ වශයෙන් දවා සොහා කළස්වර්ණයක් සේ නිර්මල වූ සිත් ඇති යම් සත්වයෙක් නිරාමත්වයෙන් කුසල් කම් වූ පරිද්දෙන් බෝධිපාක්ෂික ධර්මයන් වඩාද ඒ තෙම සියළු සංයෝජනයන්ගේ විනාශයට පිළිවෙළින් පැමිණෙන්නේයයි මෙසේ

සර්වඥයන් වහන්සේ අරහත් ඵලයට කුළුගන්වා දේශනාව නිශ්ටා කොට පූර්වාපර සන්ධි ගලපා මේ කාන්චනස්කන්ධ ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි ස්වර්ණස්කන්ධය ලද්දා වූ පර්ෂික පුරුෂ වුයේම් තිලෝගුරු සම්‍යක් රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# වානරින්ද්‍ර ජාතකය

තවද එක්සමයෙක්හි චතුවෛසාරද්‍ය ඥානයෙන් යුක්ත වූ බුදුරජානන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සේක් දේවදත්ත ස්ථවිරයන්ගේ වධ පිණිස උත්සහාකිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක. එසමයෙහි බුදු රජානන් වහන්සේ දේවදත්ත ස්ථිවරයන් වහන්සේ වධ පිණිස උත්සාහ කෙරෙති අසා මහණෙනි දේවදත්ත ස්ථිවිර තෙම වධ පිණිස උත්සාහ කරන්නේ දැන් මතු නොවෙයි පෙරත් උත්සාහ කෙළේමය, එලෙස උත්සාහා කොට තැතිගැන්වීම පමණකුදු කරන්නට නොහැකි වූයේයයි වදාරා ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහා බෝධිසත්වයන් වහන්සේ වඳුරු ජන්මයෙහි ඉපිද වැඩිවයසට පැමිණ අස්පැටවකු පමණ කායශක්තියෙන් යුක්තව එකවරම ගංගාතීරයෙක්හි වාසය කරණ සේක. ඒ ගංගාවගේ මැද අනේකප්‍රකාර වූ ආම්බ්‍රපනසාදී ඵල වෘක්ෂයෙන්  යුක්ත වූ එක් දිවයිනක් වන්නේය. හස්තිබල හා සමාන කායශක්තියක් ඇති බෝධිසත්වයන් වහන්සේ ගංගාවගේ මෙතරින් පැනනැගී දිවයින මෙතර ගඟ මැද එක් අතලගලෙක් ඇත්තේය. එහි හෙන සේක. එතැනින් පැනනැගී ඒ දිවයිනෙහි හෙන සේක. එතැනදී අනේක ප්‍රාකාර ඵලයෙන් අනුභවකොට සවස ඒ උපායෙන්ම නැවත අවුත් තමා වසන තැන්හි විසීම කොට දෙවැනි දිනයෙහිද එලෙසම කරණ සේක. මෙම ක්‍රමයෙන් එතැන්හි වාසය කරණ සේක. එසමයෙහි වනාහී ප්‍රජාපතීන් සහිත වූ එක් කුම්භීලයෙක් ඒ ගංගාවෙහි විසීම කරන්නේය. ඔහුගේ භාර්යාව වූ කිඹුල් ධේනු තොමෝ ඔබිනොබ වඩනා වූ බෝධිසත්වයන් වහන්සේ දැක බෝධිසත්වයන් වහන්සේගේ හෘදයමාංශයෙහි දොළ උපදවා කිඹුලාට කියනුයේ ස්වාමීන් වහන්ස මට වනාහි මේ වානරෙන්ද්‍රයාගේ හෘදය මාංශයෙහි දොළෙක් උපන්නේය යි කීවාය. කුම්භීලතෙම යහපති පින්වන්ති ලබන්නෙහිය යි කියා අද සවස දිවයිනෙන් එන්නා වූ වානරේන්ද්‍රයා අල්වාගනිමි කියා ගොස් ගල් අත්ලෙහි හොත්තේය. බෝධිසත්වයන් වහන්සේ දහවල් ගොදුරු කා සවස් වේලෙහි දිවයිනෙහි සිටිසේක්ම පහණ බලා මේ පහණ දැන් උස්ව පෙණෙන්නේය. ඊට කාරණා කවරේදැයි සිතූසේක. උන්වහන්සේට වනාහි ජලප්‍රමාණයද, පාෂාණ ප්‍රමාණයද යහපත්ව වැටහී තිබෙන්නේය. ඒ කාරණයෙන් ඕහට මෙබඳු සිතෙක් වූයේය. අද මේ ගංගාවගේ ජලය අඩුවූයේත් නොවෙයි. වැඩිවුයේත් නැත. එසේ වුයේද මේ පහණ මහත්ව පෙණෙන්නේය. කිමෙක්ද මෙතැන්හි මා ගන්නා පිණිස කුම්භීලතෙම හුන්නේදැයි බෝධිසත්වයන් වහන්සේ පළමුකොට ඔහු පරීක්ෂා කරන්නෙමි සිතා එතැන්හිම සිට පහණ හා සමග කථාකරන්නාක්මෙන් පින්වත් පහණැයි කියා ප්‍රතිවචනයක් නොලබන සේක් තුන්වෙනිවර දක්වා පින්වත් පහණැයි කීසේක. එකල්හි පහණතෙම කවරහෙයකින් ප්‍රතිවචනයක් නොදන්නේයයි කියා නැවත ඕහට කියන්නාවූ වානරතෙම කිමෙක්ද පින්වත් පහණ අද මට ප්‍රතිවචන නොදෙන්නේයයි කී සේක. එකල්හි කුම්භිලතෙම සිතනුයේ ඒකාන්තයෙන් සෙසු දිනවල්හි මේ පහණ වානරේන්ද්‍රයාහට ප්‍රතිවචන දෙන්නේය. මෝහට දැන් ප්‍රතිවචන දෙන්නෙමි සිතා කිමෙක්ද පින්වත් වානරේන්ද්‍රයයි කීයේය, එවිට බෝධිසත්වයෝ තෝ කවරේහිදැයි විචාළසේක. මම කුම්භීලයෙකිමි කීයේය. කුමක් පිණිස මෙතැන්හි හොත්තෙහිදැයි විචාළ සේක. එවිට කිඹුල්වතෙම නුඹවහන්සේගේ හෘදයමාංශය පතායයි කියේය. බෝධිසත්වයන් වහන්සේ සිතනසේක් මට යායුතු මගක් නැත්තේය. අද මා විසින් මේ කුම්භීලයා වඤ්චාකටයුතුයයි සිතා ඉක්බිත්තෙන් ඕහට මෙසේ කීසේක. යහළු කුම්භීලය මම ආත්මභවය තොපට පරිත්‍යාග කරන්නෙමි තෝ මුඛය හයා මා තාගේ සමීපයට ආකල්හි ගණුවයි කීසේක. කිඹුලුන්ගේ වනාහි මුඛය විවෘත්වූ කල්හි ඇස් දෙක පියෙන්නේය. හෙතම ඒ කාරණය නොසලකා මුඛය විවෘත කෙළේය. ඉක්බිත්තෙන් ඔහුගේ ඇස්දෙක පිහිත වූයේය. හෙතම මුඛය විවෘතකොට ඇස්දෙක නිමිලනය කොට හොත්තේය. බෝධිසත්වයන් වහන්සේ එලෙස වූබව දැන දිවයිනෙන් අසහසට පැන නැගී ගොස් කිඹුලාගේ මස්තකය ආක්‍රාන්ත කොට එතැනින් පැනනැගී විජ්ජුල්ලතාවක් මෙන් බබලමින් එතෙර සිටිසේක. කිඹුලා ඒ ආශ්චර්යය දැක මේ වානරේන්ද්‍රය මේ ලෝකයෙහි චතුර්විධ කාරණයකින් සමන්විත වූ පුද්ගල තෙම පසමිතුරන් මැඩපවත්නේය. ඒ සියළු කාරණාවෝම තොපගේ අභ්‍යන්තරයෙහි ඇතැයි සිතමි කියා මෙසේ කීයේය. කෙසේද යත්? වානරේන්ද්‍රය වාක්සත්‍යයද පරීක්ෂා ඥානයද අනෂට ධෛර්යයද නිස්සංගත්‍යාගයද යන මේ සතරගුණයෝ නුඹවහන්සේට මෙන් යමක්හට ඇද්ද, ඒ තෙම පසමිතුරා මැඩපවත්නේය. මෙසේ කුම්භීලතෙම බෝධිසත්වයන් වහන්සේට වදාරණසේක් මහණෙනි, දේවදත්ත ස්ථවිර තෙම මට වධ පිණිස උත්සාහ කළේ දැන් මතු නොවෙයි පෙරත් උත්සාහ කෙළේමයයි මේ දම් දෙසුන් ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ වාරනින්ද ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කිඹුලා නම් දැන් දේවදත්ත ස්ථිවිරයෝය. ඔහුගේ භාර්යාව වූ කිඹුල් ධේනුව නම් දැන් චිංචිමානවිකාවෝය. වානරේන්ද්‍රව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# භේරිවාද ජාතකය

තවද එක්සමයෙක්හි සනරාමර ලෝකගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසේක් එක්තරා දුර්වච භික්ෂුවක් හූ අරභයා මේ ජාතකය වදාළසේක. සර්වඥයන් වහන්සේ ඒ මහණහට වනාහි වදාරණසේක් මහණ තෝ අකිකරුවුයේ සැබෑදැයි විචාරා වදාළකල්හි භාග්‍යවතුන් වහන්ස සැබෑවයි දැන්වූකල්හි මහණ තෝ අකිකරුවූයේ දැන් මතු නොවෙයි පෙරත් අකීකරු වූයේහියයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහාබෝසතාසන් වහන්සේ භේරිවාදක කුලයෙක්හි ඉපිද වැඩිවිය පැමිණ එක්ගමෙක්හි වාසය කරණ සේක. ඒ අප මහබෝසතානන් වහන්සේ බරණැස්නුවර නකත් කෙළියට බෙරලැවු ශබ්දය අසා නෘත්‍යමණ්ඩලයෙහි භේවාද්‍යකොට වස්තුව ගෙණඑන්නෙමි සිතා පුත්‍රයාද කැඳවාගෙණ නෘත්‍යමණ්ඩලයට ගොස් භේරිවාද්‍යකොට බොහෝ වස්තුව ලැබ ඒ වස්තුව ඇරගෙණ තමාගේ ගමට එනසේක් අතරමග සොරුන් විසින් අධිගෘහිත වූ අරණ්‍යයටකට පැමිණ නිරන්තරයෙන් භේරි වාද්‍ය කරන්නාවූ පුත්‍රයා වැලැක්වූ සේක් පින්වත් වූ පුත්‍රය නිරන්නරයෙන් භේරිවාද්‍ය නොකොට මගට පිළිපන්නාහු විසින් ප්‍රධානීන්ට වයන්නාවූ භේරිශබ්දය මෙන් අනතුරෙහි වයවයි කී සේක. පියානන් විසින් වලක්වන්නාවූ ඒ පත්‍රතෙම භේරිශබ්දයෙන්ම සොරුන් එහුබඳවමියි සිතා අතුරු නැතිවම බෙර වැයුයේය.

සොරුහු පළමුවෙන්ම භේරිශබ්දය අසා ඊශ්වර භේරිශබ්දයකැයි දිවගොස් අතිශයින් ඒකාබන්ධ ශබ්දය අසා  මේ ඊශ්වර භේරි ශබ්දයෙක් නොවන්නේයයි සිතා අවුත් පරික්ෂාකොට දෙදෙනාම දක තළා වස්තු පැහැරගත්තාහුය. අප මහබෝසතානන් වහන්සේ ඒ කාන්තරයෙන් දුකසේ ලබන ලද වස්තුව ඒකාබන්ධකොට භේරිවාද්‍ය කරන්නා වූ පුත්‍රයා විසින් නසන ලද්දේ යයි පුත්‍රයාට මෙසේ කීසේක. භේරිවාද්‍ය කරන්නේය භේරිවාද්‍ය ප්‍රමාණ ඉක්මවා නොම කරන්නේ නිරතුරු වාද්‍ය නොකරන්නේය. ප්‍රමාණාති ක්‍රමණය කොට නිරතුරුවම භේරිවාද්‍ය කිරීම වනාහි පවිටු වන්නේය. හේ කුමක් හෙයින්ද යත්? භේරිප්‍රහරණය කරන්නාහු විසින් කර්ෂිපාණ සියයක් ලබන ලද්දේය. ඒ ලබනලද දෙය නිරන්තරයෙන් නොකීකරුව වාද්‍යය කරන්නාහු විසින් නසනලද්දේයයි කීසේක. ශාස්තෘ වූ බුදුරජනානන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා නිමවා වදාළසේක.

එසමයෙහි පුත්‍රතෙම අකීකරු මහණ වූයේය. පියාණෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේකි.

SANHIDA LANKA

# සංඛ දමන ජාතකය

තවද එක්සමයෙක්හි තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසේක් දුර්වල භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරන කල්හි අප මහාබෝසතානන් වහන්සේ සක්පිඹිනා කුලයෙක්හි ඉපිද වැඩිවයසට පැමිණ වසන කල්හි බරණැස්නුවර නැකැත් කෙළියට බෙර ලැවුහ. එකල්හි බෝසතානෝ මව්පියාණන් කැඳවාගෙණ සක්පිඹීමෙන් වස්තුව ලබම් සිතා ගොස් සක්පිඹීමෙන් වස්තුව ලැබ ගමට එන කල්හි සොරුන් වසන අරණ්‍යයකට පැමිණ කල්පිඹින්වා වූ පියානන් වැලකූසේක. ඒ පියතෙම සක් හඬින් සොරුන් එහුබඳවයි කියා අනතුරුනැතුවම සක්පිම්බේය. ඒසොරුහු පෙර කියනලද ක්‍රමයෙන්ම අවුත් වස්තුව පැහැරගත්තාහුය. බෝධිසත්වයන් වහන්සේත් පූර්වයෙහි කියනලද ක්‍රමයෙන් මෙසේ කීසේක. සක්පිඹින්නේය. නොම සක් නොපිඹිනේය. අධිකකොට ප්‍රමාණ ඉල්මවා නොපිඹින්නේය. අධිකකොට ප්‍රමාණ ඉක්මවා නොපිඹින්නේය. ප්‍රමාණ ඉක්මවා අධිකකොට පිඹිය වනාහි ඉතා ලාමක වන්නේය. කුමක්හෙයින්ද යත් සක්පිඹීමෙන් ලබන ලද වස්තුව නැවත නැවත සක්පිඹින්නාවූ අපගේ පියානන් විසින් නසනලද්දේයයි කීසේක. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මෙසේ මේ දම්දෙසුම් ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය වදාළ සේක.

එසමයෙහි පියාණෝ නම් දැන් අකීකරු මහණ වූයේය. පුත්‍රව උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# තක්ක ජාතකය

තවද එක්සමයෙක්හි කරුණාවට පිහිටවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසේක් ශාසනයෙහි උකටලී භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක. සර්වඥයන් වහන්සේ ඒ මහණහට වනාහී වදාරණසේක් මහණතෝ උකටලීවූයෙහි සැබෑද කිම්දැයි විචාරා වදාරා ස්වාමීන් වහන්ස සැබැවයි දන්වූකල්හි ස්ත්‍රීහු නම් කළ උපකාර නොදන්නාහුය, මිත්‍රද්‍රෝහියා, කවර කාරණයකින් ඔවුන් නිසා උකටලීවූයෙහිදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගියදවස බරණැස් නුවර බ්‍රහම්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ කල්හි අප මහාබෝසතානන් වහන්සේ ඍෂිව්‍රජාවෙන් පැවිදිව ගංගාතීරයෙහක්හි අසපුවක්කොටගෙන අෂ්ටසමාපත්තීන්ද පංචාභිඥාවන්ද උපදවා ධ්‍යාන ක්‍රීඩාසැපයෙන් යුක්තව වාසයකරණසේක. එක්සමයෙහි බරණැස් සිටාණන්ගේ දුව දුෂ්ට කුමාරිකාවක් ඇත්තීය ඕ තොමෝ චණ්ඩය පරුෂය දැසිදස් කම්කරුවන්ට අක්‍රොශ කරන්නීය. ප්‍රහාර දෙන්නීය. ඉක්බිත්තෙන් එක්දවසක් ඒ කුමාරිකාව කැඳවාගෙන ගංගාවෙහි දිය කෙළුම් හයි කියා ගියාහුය. ඔහුන් ජල ක්‍රීඩා කරද්දීම සවස්වූයේය. වර්ෂාව පටන්ගත්තේය. මනුෂ්‍යයෝ වර්ෂාව දැක ඔබිනොබ සීඝ්‍රව දිව ගියාහුය. සිටුදුවගේ දැසි දස් කම්කරුවෝ අද අප විසින් මේ කුමාරිකාවගේ පිටි දකින්ට වටනේයයි සිතා ඒ කුමාරිකාව ජලභ්‍යන්තරයෙහිම දමා ගොඩ නැංගාහුය. වර්ෂාව වර්ෂනය කලේය. සූර්යාද හස්තන්ගත වූයේය. අන්ධකාරවූයේය. ඔව්හු ඒ කුමාරිකාවගෙන් වෙන්ව ගොටගොස් කුමාරිකාව කොයිදැයි කීකල්හි ගංගාවෙන් පථළමුව ගොඩ නැංගාය. ඉක්බිත්තෙන් ඒ කුමාරිකාව කොතැන්හි ගිය බවක් නොදනුම්හයි කිවාහුය. නැයෝද පරීක්ෂාකොට නොදක්කාහුය. මහත් වූ බෑගෑපත් ශබ්දයෙන් හඬන්නාවූ ඒ කුමාරිකාතෝම ජලශ්‍රෙතයෙන් ගෙණයනු ලබන්නී මධ්‍යම රාත්‍රියෙහි බෝධිසත්වයන්ගේ පන්සල සමීපයට පැමිණියාය. අප මහබෝසතානන් වහන්සේ ඒ ස්ත්‍රියගේ ශබ්දය අසා මාගමකගේ ශබ්දයක් වන්නේය. මැට පිහිට ආරක්ෂාවක් කරන්නෙම් සිතා තන සුලක්ගෙණ ගන්තෙරට ගොස් ඒ ස්ත්‍රිය දැක තෝ භව නොගනුව තෝ භය නොගණුවයි කියා අස්වසා හස්තිබල දරන්නාවූ කාය ශක්තියක් ඇති බෝසතානන් වහන්සේ ගඟින් පිණමින් ගොස් ඒ ස්ත්‍රිය ඔසවාගෙන අසපුවට ගෙණගොස් ගිනි දල්වා දුන්සේක. සීත පහවූ කල්හි මිහිරිවූ ඵලාඵලයෙන් ඵලවූසේක. ඒ ඵලාඵල අනුභව කොට සිටියාවූ ඒ ස්ත්‍රිය අතින් කොතැන්හි වාසය කරන්නීද කෙසේ ගංගාවෙහි හුණුවාහුදැයි විචාළ සේක. ඒ ස්ත්‍රීතොමෝ ඒ ප්‍රවෘත්තියවූ පරිද්දෙන් දැන්වූවාය. ඉක්බිත්තෙන් බෝධිසත්වයන් වහන්සේ ඒ ස්ත්‍රියට මෙතැන්හි වාසය කරවයි කියා පන්සලෙහි වාසය කරවා දෙතුන් දවසක් බෝධිසත්වයන් වහන්සේ අභ්‍යවකාශයෙහි වාසය කොට දැන් තෙපියවයි වදාළසේක. ඒ ස්ත්‍රීතොම සිතන්නී මේ තපස්වීන් වහන්සේ ශීලභේදයට පමුණුවාගෙණ යන්නෙමියි සිතා නොයෙන්නීය, ඉක්බිත්තෙන් කල් යත් යත් ස්ත්‍රි ගුත්තය ස්ත්‍රී ලීලාව දක්වා බෝධිසත්වයන් වහන්සේගේ ශිලභේදකරවා ධ්‍යන්‍යය අන්තර්ධාන කළාය. අප මහබෝසතානන් වහන්සේ ඒ ස්ත්‍රිය කැඳවාගෙණ ආරණයෙහිම වාසය කළසේක. ඉක්බිත්තෙන් ඒ ස්ත්‍රි තොම අප මහාබෝසතානන් වහන්සේට කියන්නී ස්වාමීන්වහන්ස අපට ආරණ්‍යවාසයෙන් කාරිය කිම්ද මනුෂ්‍ය පථයට යම්හයි කීවාය. බෝධිසත්වයන් වහන්සේ ඒ ස්ත්‍රිය කැඳවාගෙණ එක් පසල්ගමකට ගොස් මෝරුබැල මෙහෙයක් ලබා ජීවිකාව කොට ඒ ස්ත්‍රිය රක්ෂාකරණ සේක. අප මහා බෝසතානන් වහන්සේ මොරු විකුණා ජීවන්වන හෙයින් තක්‍රපණ්ඩිතයෝයයි කියා නමක් කළාය. එසේවාසයකරන්නාවූ අප මහ බෝසතානන් වහන්සේට ඒ ගම් වැස්සෝ වැටුප් දී අපට කටයුතු නොකොට යුතු කියමින් මෙහි වාසය කරවයි කියා ගම් දොරෙහි කුටියෙක වාසය කර වයි කියා ගම් දොරෙහි කුටියෙක වාසය කර වූවාහුය. එසමයෙහි චෞරයෝ පර්වතයෙන් බැස පසල්දනව්ව පහරන්නාහුය. ඒ සොරහු එක්දවසක් ඒ ගම පැහැර ගම් වැස්සන්ලවා බඩුපොදි ඔසවාගෙණ යන්නාහු ඒ සිටු දුවද අල්වාගෙණ තමන් වසන තෙනට ගොස් සෙසුජනයා හා හැරියාහුය. සොරදෙටු වනාහී සිටු දියනියගේ රූපයෙහි ඇලී ඔවුන් තමහට භාර්යාව කොට ගත්තේය. බෝධිසත්වයන් වහන්සේ මෙනම් ස්ත්‍රිය කොයිදැයි විචාළසේක, සොර දෙටුවා විසින් අල්වාගෙණ ගොස් තමාට භාර්යාව කරණ ලදැයි අසාත් ඒ ස්ත්‍රීතොම මාගෙන් වෙන්ව නොවසන්නීය. දිව අවුත් මා සමීපයට එන්නීයයි සිතා ඇගේ ඊම බලමින් ගම්හි වාසය කළසේක. සිටු දූද සිතන්නේ මෙතැන්හි සැපසේ වසන්නෙම් කලෙක මා තක්‍රපණ්ඩිතයන් වහන්සේ කිසි දෙයක් නිසා අවුත් මෙයින් කැඳවාගෙණ වඩනාසේක. එසේ කල්හි මම මේ සැපයෙන් පිරියෙන්නෙම් එසේහෙයින් මම ඕහට ප්‍රියකෙණෙකුමෙන් තක්‍රපණ්ඩිතයන් කැඳවාගෙන්වා නැසූවූයේවීන්නම් ඉතායෙහැකැයි සිතුවාය. ඒ ස්ත්‍රීතොම එක් මනුෂ්‍යයෙකු කැඳවා මම මෙතන දුකින් ජීවත් වන්නෙමි තක්‍රපණ්ඩිතයන් වහන්සේ අවුත් මා ගෙණයනසේක්වයි කියා හස්නක් යවුවාය. අප මහබෝසතානන් වහන්සේ ඒ හස්න අසා අදහා එතැන්හි ගොස් ගම්දොර සිට අස්නක් යවුසේක. ඒ ස්ත්‍රීතොම ගෙන් නික්ම අවුත් උන්වහන්සේ දැක ස්වාමීන් වහන්ස ඉදින් අප දෙදෙනා දැන් ගියමෝනම් සොර දෙටු තෙම එහුබැඳ එලවා අපි දෙදෙනාම නසන්නේය. රාත්‍රීභාගයෙහි යම්හයි කියා තක්‍රපණ්ඩිතයානන් වහන්සේ කැඳවාගෙන අවුත් ආහාර අනුභව කරවා කොටුයෙහි හිඳුවා සවස්වෙලෙහි සොරදෙටුවා අවුත් සුරාපානය කොට මත්වූ කල්හි ස්වාමීපුරුෂය ඉදින් මේ වෙලාවෙහි තොපගේ සතුරා දුටුයේ වීනම් ඕහට කවරක් කරන්නෙහිදැයි කීවාය. එතෙම මෙනම් මෙනම් දෙයක් කරන්නෙම් කීයේය. කිමෙක්ද ඒ තෙම දුරස්ථානයෙහි නොවේදැයි කීයේය. ඔහු කොටුයෙහි උන්නේයයි කීවාය. ඒ වෙලෙහි සොරදෙටු තෙම හුළක් ගෙණ එතැන්හි ගොස් අප මහාබෝසතානන් වහන්සේ දැක අල්වා ගෙණ  ගේ මැද හෙළා වැලමිටි ආදියෙන් අභිප්‍රාය වූ පරිද්දෙන් තැළුයේය. අප මහා බෝසතානන් වහන්සේ තැළුන් ලබන සේක් අන් කිසිවක් නොකියා කොධනා අකතඥඤුව පිසුනාමිත්ත දුබ්බීකා යි කියා මෙපමණක් වදාරණ සේක. සොරදෙටුතෙතම උන්වහන්සේට තළා පිටිතොලහයා බැඳ සයනය කරවා

SANHIDA LANKA

සවස් වේලෙහි ආහාරය අනුභව කොට සයනය කොට පිබිදුනේ රාමද සුන් කල්හි නැවතත් තලන්ට පටන්ගත්තේය. බෝධිසත්වයන් වහන්සේ එම කෝධනා අකතඤ්ඤුව යනාදී පද සතර වදාළසේක. සොරදෙටුතෙම සිතන්නේ මේ පුරුෂතෙම මෙසේ තළනුලබන්නේද අන්කිසිවක් නොකියා මේ සතර පද යම කියන්නේය. මොහු අතින් විචාරන්නෙමි සිතා ඒ ස්ත්‍රිය නිදිවන් බව දන තක්‍රපණ්ඩිතයන් අතින් විචාළේය. පින්වත් පුරුෂය තෙපි මෙසේ තාඩනය ලබන්නේද කවර කාරණයකින් මේ සතර පදයම කියව්දැයි විචාළේය.

ඉක්බිත්තෙන් තක්‍රපණ්ඩිතයන් වහන්සේ එසේ වීනම් අසවයි කියා ඒ කාරණය ආදීයෙහි පටන් වදාළසේක. මම පෙර වනාන්තරයෙහි වාසය කරන්නාවූ එක් තපස්වීයෙක්ව ධ්‍යානලාභීයෙක් වුයෙමි. මේ මම මේ ස්ත්‍රිය ගංගාවෙහි ජලශ්‍රෝතසින් ගෙණයනවා දක ගොඩනගා ප්‍රතිජග්ගනය කෙළෙමි.එසේ ප්‍රතිජග්ගනය කළාවූ මා මේ ස්ත්‍රී පොළඹා ධ්‍යානයෙන් පිරිහෙළුවාය. ඒ මම ආරණ්‍යය හැර මේ ස්ත්‍රිය පෝෂ්‍ය කෙරෙමින් පසල්ගමෙක වාසය කෙළෙමි. ඉක්බිත්තෙන් මේ ස්ත්‍රීය සොරුන් විසින් මෙතැන්හි ගෙණ එන ලද්දී මම දුකින් වාසය කරන්නෙමි, අවුත් මා කැඳවාගෙණ යවයි කියා මට හසුන් යවා දන් තොපගේ අතට පැමිණුවුවාය. මේ කාරණයෙන් මම මෙසේ කීවෙමි වදාළසේක. චෞරතෙම සිතනුයේ යම් බඳු වූ මේ ස්ත්‍රීතොම මෙබඳු ගුණයෙන් යුක්තව උපකාර කළාවුන් කෙරෙහි මෙසේ විපිළිපන්බවට පැමිණියාය. මෝතොම මට කවර නම් උපද්‍රවයක් නොකරන්නීද මෝතොමෝ හැරිය යුතුයයි කියා සිතුයේය. සොරදෙටුතෙම තක්‍රපණ්ඩිතයන් අස්වසා ඒ ස්ත්‍රිය ප්‍රබෝධකරවා කඩුව ගෙණ නික්ම මේ පුරුෂයා ගම්දොරහිදී ඝාතනය කරන්නෙමි කියා ඒ ස්ත්‍රීය හා සමග ගමින් පිටතට ගොස් මෙහුගේ අත අල්වාගණුවයි කියා බෝධිසත්වයන් වහන්සේ අල්වා ග්‍රහණය කරවා කඩුවගෙණ තක්‍රපණ්ඩිතයන්ට ප්‍රහාර දෙන්නාක් මෙන්ම ඒ ස්ත්‍රීය දෙකඩක් කොට සිඳ දමා ශිර්ෂසසනය කොට තක්‍රපණ්ඩිතයන් කීප දවසක් ප්‍රණීතාහාරයෙන් සන්තර්පණය කරවා දන් කොතැන්හි වඩනාසේක්දැයි කීයේය. තර්කපණ්ඩිතයන් වහන්සේ ගිහිගෙන් මට ප්‍රයෝජනයක් නැත ඍෂීප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ ආරණ්‍යයෙහිම වසන්නෙමි කීසේක. එසේ වීනම් මමත් පැවිදි වන්නෙමි කියා දෙදෙනම පැවිදිව ආරණ්‍ය ප්‍රදේශයට ගොස් පචඤ්ඤාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ජීවිතාවසානයෙහි බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය. ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේ වහන්සේ මේ  අතීත වර්තමාන කථාවස්තු දෙක වදාරා පූර්වාපර සන්ධි ගළපා වදාළසේක. මහණ මේ ස්ත්‍රීහු නම් ක්‍රොධියහ, උපන් ක්‍රොධ වලකාගන්නට නොපොහොසත්ය. කෘතඥයෝද නොවෙති, කරණ ලද ඉතා මහත් උපකාරයකුදු නොදනිති, ප්‍රියසුන්‍යකථා කෙරෙති, මිත්‍රයන් බිඳුවන්ට සුදුසු කථා කිරීම ස්වභාවකොට ඇත්තාහ. එසේහෙයින් මෛථුන විරතිසංඛ්‍යාත බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙව, එසේ හැසිරෙන්නාවූ තොපි ධ්‍යාන සැපය මාර්ග සැපය ඵල සැපය යන ත්‍රිවිධ සැපයෙන් නොපිරිහෙන්නාහුයයි වදාරා ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේ මේ දම්දෙසුම ගෙණහැර දක්වා වදාරා චතුසත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍යය දේශනාවගේ අවසානයෙහහි උකටලී වූ මහණ තෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මේ තර්ක ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි සොරදෙටුතෙම දන් ආනන්ද ස්ථිවරවූසේක. තර්ක පණ්ඩිතව උපන්නෙම් වනාහී තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# දූරාචාර ජාතකය

තවද එක් සමයෙක් හී තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවාසන සේක් උපාසකයක්හු අරභයා මේ ජාතකය වදාළසේක. සැවැත්නුවර වාසය කරන්නාවූ එක් උපාසකයෙක් වනාහී තිසරණ සරණයෙහි හා පංඥශීලයෙහිද පිහිටියේය. බුදුන් කෙරෙහි මමත්වය කරන්නේ. ධර්මය කෙරෙහි මමත්වය කරන්නේය. සංඝයා කෙරෙහි මමත්වය කරන්නේය, ඔහුගේ භාර්යාව වනාහී දූස්සිලය. පාප කර්මයෙහි හැසිරෙන්නීය, යම් දවසෙක මිථ්‍යාා චාරයෙහි හැසුරුණාද එදවස් සියයක් වස්තු දී ගත් දාසියක මෙන් වන්නීය. මිථ්‍යාාචාරය නොකළාවූ දිනයෙහි වනාහී ස්වාමිදුවක් මෙන් වැන්නීය. චණ්ඩය, පරුෂය, ඒ උපාසකතෙම ඒ ස්ත්‍රියගේ ස්වභාව දැනගන්නට නොහැකි වන්නේය. ඉක්බිත්තෙන් ඒ ස්ත්‍රි විසින් පෙළනලද්දේ බුදුන්ට උපස්ථානයට නොයන්නේය. ඉක්බිත්තෙන් එක්දවසක් සුවඳමල් ආදීය ගෙණවුත් නමස්කාර කොට එකත්පසව උන්නාහු උපාසකයාහට සර්වඥයන් වහන්සේ වදාරණසේක් උපාසකය තෙපි කවර කාරණයකින් සත් අට දවසක් බුද්ධ උපස්ථානයට නොආයෙහිදැයි වදාළසේක.

ස්වාමීන් වහන්ස මාගේ ස්ත්‍රිතොමෝ එක්දවසක සියයක් වස්තු දී ගත් දාසියක් මෙන් වන්නීය. එක් දිනයක ස්වාමිදුවක් මෙන් වන්නීය. චණ්ඩය, පරුෂය, මම ස්ත්‍රීයගේ ස්වභාව දැනගන්ට නොහැකිවන්නෙමි. මම ඒ ස්ත්‍රිය විසින් පීඩාවට පැමිණියෙමි සර්වඥ උපස්ථානයට නොයෙමි දැනුවූයේය. ඉක්බිත්තෙන් ඒ උපාසකයාගේ වචනය අසා සර්වඥයන් වහන්සේ වදාරණ සේක් උපාසකය මාගමුන්ගේ ස්වභාවය නම් දැනගත නොහැක්කේයයි වදාරා පූර්වකාලයෙහිද නුවණැත්තෝ තොපට ස්ත්‍රීන්ගේ ස්වභාවය ප්‍රකාශ කළාහුය. තෙපි වනාහී ඒ කාරණාව භවයෙන් වැසී තිබෙන හෙයින් සලකාගන්ට නොහැකිවූවාහුයයි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතානන් වහන්සේ දිසාපාමොක් ආචාරීව පන්සියයක් පමණ මාණවකයන්ට ශිල්ප උගන්වන්නාහුය. එකල අන්‍ය රාජ්‍යවාසීහු එක් බ්‍රාහ්මණ මානවකයෙක් අවුත් බෝධිසත්වයන් ස්වමීපයෙහි ශිල්ප උගන්නේය. එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇතිව ඈ භාර්යාව කොට එම බරණැස්නුවර වසන්නේ දෙතුන් වේලක් ආචාරීන්ට උපස්ථානයට නොගියෝය, ඔහුගේ භාර්යාතොමෝ දුස්සීලය, පව්ටුවූ ස්වභාව ඇත්තේය. මිත්‍යාචාර කළාවූ දිනයෙහි දාසියක් මෙන් වන්නීය. නොකළ දිනයෙහි ස්වාමිදුවක් මෙන් වන්නීය. චණ්ඩය, එරුෂය, ඒ බ්‍රහ්මණ මානවකයා ඇගේ අභිප්‍රාය දැනගත නොහෙන තැනැත්තේ ඈ විසින් පීඩිත වූ වියවුල් සිත් ඇත්තේ ආචාරීන්ට උපස්ථානයට නොයන්නේය. ඉක්බිත්තෙන් සත් අට දවසක් ඉකුත්කොට ආවාහු මාණවකයා දැක මාණවකය මෙතෙක් දවස් තොප නුදුටුයේ කුමක් නිසාදැයි ආචාර්යතෙම විචාළේය. එබස් ඇසූ මාණවකයා කියන්නේ ආචාරීන් වහන්ස මාගේ භාර්යා, තොමෝ මාම කැමති වන්නීය. එක් දවසක් දාසියක් මෙන් නිහතමානී වන්නීය. එක්දවසක් ස්වාමීදුවක් මෙන් තදය, රුක්ෂය, මම ඇගේ අභිප්‍රාය දැනගත නොහෙමි, ඈ විසින් පීඩිතව වියවුල් සිත් ඇත්තෙම් නුඹවහන්සේට උපස්ථානයට නොආයෙමි කීය. එකල ආචාරීහූ කියන්නෝ මාණවකය එසේමය ස්ත්‍රීහූ නම් අනාචාරයෙහි හැසිරුනු දවස් පුරුෂයා අනුව පවතිත්, දාසියක් මෙන් නිහත මානී වෙති, අනාචාරයෙහි නොහැසිරුනු දවස් තමන් ඇතිවූ වල්ලභයා කිසිවෙකු කොටත් නොසිතති. මෙසේ මේ ස්ත්‍රීහූ නම් එරුෂයහ, දුස්සීලයහ, ඔවුන්ගේ ස්වභාව දැනගත නොහැක්කේය, උන් කැමති කල්හිත් මධ්‍යස්ථව විසිය යුතුයයි කියා ඒ මාණවකයාට මෙසේ අවවාද කළාහුය. එම්බල මාණවකය මේ ස්ත්‍රී මා කැමති වන්නීය. පතන්නීය, මා කෙරෙහි සෙනහ කරන්නීයයි සතුටුනොව, මෝතොමෝ මා නොකැමතිවන්නීයයි සෙනෙහ නොකරන්නීයයි කියා ශෝක නොකරත්, කැමති කල්හි සතුටක්වත් නොකමැති කල්හි ශෝකයක් වත් නොකොට මධ්‍යස්තවම වාසය කරව, ස්ත්‍රීන්ගේ අභිප්‍රාය නම් ස්ත්‍රී මායාවෙන් සැඟවුනු හෙයින් නොදතහැක්කේය. ඊට කාරණා කවරේද යත්, යම්සේ මත්ස්‍යයා ගමනාදියෙන් සැඟවුනු බැවින් නොදතහැක්කේ වේද. එසේ හෙයින්ම ඒ මතස්‍යයා කෙවිලන් තමා අම්මනට ආ කල්හි දියෙන් තමාගේ ගමන සඟවාලා යේද තමා අල්වාගත නොදේද එපරිද්දෙන් ස්ත්‍රීහු නම් මහත් වූ දුස්සීලකර්ම කොට අපි මෙබන්දක් නොකළම්හයි, තමන් කළාවූ කාරිය ස්ත්‍රී මායාවෙන් සඟවා පුරුෂයන් වඤ්චා කෙරෙති, එසේහෙයින් මේ ස්ත්‍රීහු නම් පාපකර්මය, දූරාචාරයහ. එසේ වූ ස්ත්‍රීන් කෙරෙහි මධ්‍යස්තව වසන්නා වූ සත්වතෙමේ සුවපත් වන්නේයයි මෙසේ මහාබෝසතානෝ අතේතවාසීකයාට අවවාද කළාහුය. එතැන්පටන් අතේතවාසිකයා ඒ ස්ත්‍රිය ද කෙරෙහි මධ්‍යස්ථ විය, ඔහුගේ භාර්යාවත් ආචාරීන් විසින් මාගේ දුස්සීල භාවයද දන්නා ලද්දේයයි එතැන් පටන් අනාචාරයක් නොකළාහ. ඒ උපසාකයාගේ ස්ත්‍රීන් බුදුරජානන් වහන්සේ විසින් මාගේ දූරාචාර බව දැනගන්නා ලද්දේයයි එතැන් පටන් පාපකර්ම නොකළාහ. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍ය ධර්ම දේශනාවගේ කෙළවර උපාසකයා සෝවාන් පෙළෙහි පිහිටි යේය. සර්වඥයන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ දූරාජාන ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

එසමයෙහි ස්ත්‍රී පුරුෂයෝ දෙදෙනා නම් දැන් ස්ත්‍රී පුරුෂයෝ දෙදෙනාය. දිසාපාමොක් ආචාරීවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# අනභිරති ජාතකය

තවද එක්සමයෙක්හි ප්‍රතිපුද්ගලයකු වු තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් එබඳුවූ ම එක් උපාසකයෙක් හූ අරභයා මේ ජාතකය වදාළ සේක. ඒ උපාසකයා වනාහී පරීක්ෂා කරන්නේ ඒ තමාගේ ස්ත්‍රිය දුස්සීල නියාව දැන කලහකරණලද්දේ වියවුල් සිත් ඇති බැවින් සත් අට දවසක් සර්වඥයන් වහන්සේට උපස්ථානයට  නොගියේය. ඒ තෙම එක් දවසක් විහාරයට ගොස් සර්වඥයන් වහන්සේට නමස්කාර කොට උන්නේය. උපාසකය සත් අට දවසක් මුළුල්ලෙහි කුමක් නිසා නොඅයෙහිදැයි විචාළ කල්හි ස්වාමීනි මාගේ භාර්යාතොමෝ දුස්සීලය, පාපධර්මය, එසේ හෙයින් මම ඈ හා කලහකොට වියවුල් සිත් ඇති බැවින් නොආයෙමි කීය. එබස් අසා සර්වඥයන් වහන්සේ ඕහට වදාරණසේක් උපාසකය ස්ත්‍රීන් අනාචාර කළ කල්හි ඔවුන් කෙරෙහි කෝපයක් නොකොට මධ්‍යස්ථ වියයුත්තේයයි පෙරත් තට නුවණැත්තෝ කිවාහුය. තෝ වූකලි භවයෙන් සැඟවුණු බැවින් ඒ කාරණය සලකාගත නුහුණුයෙහි වේදැයි වදාරා උපාසකයා විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහාබෝසතානෝ පළමු පරිද්දෙන්ම දිසාපාමොක් ආචාරීවූවාහුය. ඉක්බිත්තෙන් ඒ දිසාපාමොක් ආචාරීන්ගේ අතේවාසිකයා භාර්යාවගේ දෝෂයක් දැක ව්‍යාකූලවූ සිත් ඇති බැවින් කීපදවසක් නොඅවුත් එක් දවසක් ආචාරීන් විසින් විචරණලද්දේ ඒ කාරණය කීයේය. එකල ආචාරී ඕහට කියන්නේ දරුව ස්ත්‍රීහූ නම් සර්වසාධාරණයෝ, දුස්සීලයෝය, එසේවූ ස්ත්‍රීන් කෙරෙහි නුවණැත්තෝ කෝප නොකරන්නාහුයයි කියා මහබෝසතානෝ අවවාද කරන්නාහු මෙසේ කිවුය. එම්බල මාණවකය යම්සේ නොයෙක් තොට ඇති ගංගාව ජලස්නානය කරණ පිණිස පැමිණි පැමිණියාවූ චණ්ඩාලාදීන්ටත් ක්ෂත්‍රියාදීන්ටත් සාධාරණම වේද එහි නොනාන කෙණෙක් නැද්ද යම්සේ මහවත යන එන්නාවූ හීනොත්කාෂ්ටවූ සියළු සත්වයන්ට සාධාරණ වේද ඒ මගින් නොයන කෙනෙක් නැද්ද, යම්සේ සුරාපානය මණ්ඩලය සියල්ලවුන්ට සාධාරණ වේද, යමෙක්  යමෙක් සුරාපාන මණ්ඩලයට වදනා කැමැත්තේ වීනම් ඒ ඒ සියළු සත්වතෙමේ වදන්නෙම් වේද, එතැන්හි මනුෂ්‍යයාන්ගේ  විසීම පිණිස කරණ ලද සභශාලාදීයත් සියළු සත්වයන්ට සාධාරණමවේද, ඒ ශාලා ආදියට නොවදින්ට නිසි එකෙක් නම් නැද්ද, මහමාවත පින් පැන් සල්වල් තබා කරණලද පින් පැන් මඩුවත් සියල්ලවුන්ට සාධාරණවේද එහි පැන් නොබොන එකෙක් නැද්ද එපරිද්දෙන්ම දරුව මාණවකය මේ ලෝකයෙහි ස්ත්‍රීහුත් සියළු හීනෝත්කෘෂ්ට සත්වයන්ට සාධාරණයෝය. එසේ හෙයින් නුවණැත්තෝ මේ ස්ත්‍රීහූ නම් ලාමකයෝය, අනචාරයෝය, දුස්සීලයෝය. සර්වසාධාරණයෝය යි සිතා තමන් බලවත් වූ බුද්ධි සම්පන්න බැවින් නොකිපෙන්නාහුයයි මෙසේ මහබෝසතානෝ අතේවාසිකයාට අවවාද කළාහුය. අතේවාසිකයා බෝධිසත්වයන් කී අවවාද අසා මධ්‍යස්ථව පැවැත්තේය. ඔහුගේ භාර්යාවත් ආචාරීන්වහන්සේ විසින් මාගේ නුගුණ දැනපියන ලදැයි එතැන් පටන් පාපකර්මයක් නොකළාහ. වර්තමාන කාලයෙහි උපාසකයාගේ භාර්යාව තොමෝ සර්වඥයන් වහන්සේ විසින් මාගේ කාරිය දැනපියන ලද්දේයයි එතැන් පටන් පාප කර්මයක් නොකළාය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුසත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍යය ධර්මදේශනාවන්ගේ කෙළවර උපාසකයා සෝවාන් පෙලෙහි පිහිටියේය. සර්වඡයන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ අනභිරති ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ස්ත්‍රී පුරුෂ දෙදෙනා දැන් ස්ත්‍රී පුරුෂ දෙදෙනාමය. දිසාපාමොක් ආචාරීවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මුදුලක්ඛණ ජාතකය

තවද එක්සමයෙක්හි ලෝකොත්තම වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් සංකෙලශයක් අරභයා මේ ජාතකය වදාළසේක. සැවැත්නුවර වාසීවූ එක් කුලපුත්‍රයෙක් සර්වඥයන් වහන්සේගෙන් ධර්මදේශනාව අසා පැහැද ශාසනයෙහි ලැදි මහණව සියළු ප්‍රතිපත්තියෙහි පිළිපදින්නේය. ඒ යෝගාවචරයන් වහන්සේ ඇමවෙලෙහි සිතින් නොහරණ ලද කමටහන් ඇතිව එක් දවසක් සැවැත්නුවර පිඬුසිඟා ඇවිදනසේක් ස්වර්ණාභරණයෙන් සැරහුණාවූ ස්ත්‍රියක් දැක සුභවශයෙන් ඉන්ද්‍රියයන් බිඳ බැලූ සේක. ඒ භික්ෂූන් වහන්සේගේ අභ්‍යන්තරයෙහි කෙලේශයෝ චලිත වූහ. වෑයෙන් කොටනලද කිරි ගසක් මෙන් විය. භික්ෂූන් වහන්සේ එතැන් පටන් කෙල්ශවසඟව කායාසවාදයක්වත් චිත්තාස්වාදයක්වත් නොලබනසේක් භයපත්ව වෙවුලන්නාවූ මුවෙකු හා සමානසේක. ශාසනෙහි ඇළුම් නැති බැවින් දික්ව ගියාවූ කෙසේ ලොම් නිය හා කිලිටුවූ සිවුරු ඇතිසේක. ඉක්බිත්තෙන් ඒ භික්ෂූන්වහන්සේගේ ඉන්ද්‍රිය විකාර දැක සහාය භික්ෂූන් වහන්සේ කියන සේක් ඇවැත්නි තොපගේ චක්ෂුරාදී ඉන්ද්‍රියෝ පෙරත් නොවෙති.

ඊට කාරණා කවරේදැයි විචාළසේක්. ඇවැත්නි ශාසනයෙහි ඇළුම් නැතිවීම් කී සේක. සර්වඥයන් වහන්සේ මහණෙනි මේ භික්ෂූහු නොකමැති පරිද්දෙන් කුමක් පිණිස කැඳවාගෙණ අවුදැයි විචාළසේක් ස්වාමීනි මේ මහණ ශාසනයෙහි ඇළුම් නැත්තේයයි දැන්වූසේක. සැබෑද මහණයි විචාළ කල්හි සැබෑව ස්වාමින් දැන්වූසේක. තා තා උකටලී කරවූවෝ කවුරුදැයි විචාළ කල්හි ස්වාමීනි මම පිඬුසිඟා ඇවිදිනේනම් එක් ස්ත්‍රියක් ඉඳුරන් බිඳ බැලීම්, එකල මට කේල්ශයෝ චලිතවූහ. ඒ කේලශයන්ගෙන් චලිතවීමෙන් ශාසනයෙහි ඇළුම් නැතිවීම, දැන්වූසේක. ඉක්බිත්තෙන් සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූහට වදාරණසේක් මහණ තෝ ඉන්ද්‍රියන් බිඳ විෂභාගාලම්බනය සුභවශයෙන් ලබන්නෙහි කේලශයන් විසින් කම්පා කරණලද්දෙහිය යන යමෙක් ඇත්නම් ඒ තෙමේ ආශ්චර්ය නොවන්නේය. පෙර පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ලාභීව ධ්‍යාන බලයෙන් ක්ලේශයන් විෂ්කම්භනයකොට පවා ඉන්ද්‍රියයන් විෂභාගලම්බන බැල්මෙන් ධ්‍යනයෙන් පිරිහී ක්ලේශයෙන් කම්පිතව මහදුක් අනුභව කළාහුයයි මහමෙර උපුටා එලන්ට නිසුවූ මාරුතය ඇතෙකු සා පමණ ඇති ක්‍ෂුද්‍ර පර්වතයෙක්හි පැකිලියේද සියක් යොදුන් උස ඇති මහ දඹගස මුලින් උදුරන්ට නිසිවූ මාරුතය ඉවුරුබුන් ගන්තෙර හටගත් ක්‍ෂුද්‍ර වෘක්ෂයෙක පැකිලියේද මහ සමුද්‍රය වියලාපියන්ට සමර්ථවූ මාරුතයකුදු වැගොන්නක දිය වියලා තොපි යාද එසේ හෙයින් මෙසේ වූ බුද්ධි ඇති පිරිසිදු චිත්තසන්තාන ඇති බෝධිසත්වයන් අඥාන කරවන්නාවූ ක්ලේශයන් නිසා කිලිටුව යෙති, උත්තමවූ යසසින් යුක්ත වූ සත්වයෝ අයසෙට පැමිණෙති වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක. යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහාබෝසතානෝ කසීරට එක් මහසම්පත් ඇති බ්‍රහමණ කුලයක ඉපිද විඥඥුබවට පැමිණි තැනැත්තෝ සියළු සිල්පයෙහි පරතෙරට පැමිණ පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් දවස් යවමින් හිමාලය වනප්‍රදේශයෙහි වාසයකරන්නාහුය. ඒ බෝධිසත්වයෝ එක් කලෙක ලුනු ඇඹුල් සෙවුනා සඳහා හිමාලය වනයෙන් බැස බරණැස්නුවරට පැමිණ රාජෝද්‍යානයෙහි වැස දෙවැනි දවස් සිවුරු පිළිදගරත්වූ වැහැරිසිවුරුමය වූ අඳනය පොරෝනය දෙක මානකොට හැඳ පොරොව අඳුන්දිවිසන් ඒකාන්ත කොට බහා දළමඬුලු බැඳ කෙණ්ඩියක් ගෙණ බරණැස් නුවර පිඬුසිඟමින් රජ්ජුරුවන්ගේ මාළිගා  දොරකඩට පැමිණියෝය. රජ්ජුරුවෝ ඒ තපස්වීන් ගේ ඊර්යා පථයෙහි පැහැද සමීපයට ගෙන්වාගෙණ මහානර්ඝ වූ බද්‍යභෝද්‍යයෙන් පිනවා කරණ ලද අනුමෝදනා ඇති බෝධිසත්වයන් රාජෝ්‍යද්‍යානයෙහි වසනු පිණිස ආරාධනා කලෝය. ඒ බෝධිසත්වයෝ ආරාධනා පිළිගෙණ රජගෙයිදී වළඳා රාජකුලයට අවවාද කෙරෙමින් උද්‍යානයෙහි සොළොස් හවුරුද්දක් විසුවාය. ඉක්බිත්තෙන් එක් දවසක් රජ්ජුරුවෝ කෂොභවූ ප්‍රත්‍යන්ත ජනපදයක් සන්හිඳුවනු පිණිස යන තැනැත්තෝ මුදුලක්ඛණා නම් වූ අගමෙහෙසිකාවන්ව මාගේ තපස්වීන් වහන්සේට අප්‍රමාදව උපස්ථාන කරවයි කියා ගියෝය. මහබෝසතානෝ රජ්ජුරුවන් ගියතැන් පටන් තමන් කැමති විටක රජගෙට යෙති. ඉක්බිත්තෙන් එක් දවසක් මුදුලක්ඛණාවෝ බෝධිසත්වයන්ට ආහාර පිස සමෘද්ධිකොට ලා අද තපස්වීයන් වහන්සේ කල් යවා එන සේකැයි සුවඳ පැනින් නහා සියළු බිසෝපළඳනාවෙන් සැරහී මතුමහල්තලයෙහි කුරුයහණක් පණවා බෝධිසත්වයන්ගේ ඊම බලා බලා වැදහොත්තාහුය. බෝධිසත්වයෝත් එතනට වලඳන්නට වේලාව සලකා ධ්‍යානයෙන් නැගී ආකාශයෙන්ම රජගෙට ගියෝය. මුදුලක්ඛණාවෝ බෝධිසත්වයන්ගේ වැහැරි සිවුරේ පවන්ගන්නා අඬ අසාම තපස්වීන් වහන්සේ වැඩිසේක් වනැයි වැද හොත් තැනින් වහා නැගිසිටියාහුය, වේගයෙන් නැගිසිටියාවූ ඒ බිසවුන්ගේ මටසිළුටුවූ සළුව වැටිගියේය. තාපසයෝ සිව්මැදුරු කවුළුවෙන් වදනා තැනැත්තෝ බිසවුන්ගේ විෂභාග රූපලම්බනය ඉඳුරන් බිඳ සුභවශයෙන් බැලූය.

එකල බෝධිසත්වයන්ගේ අභ්‍යන්තරයෙහි ක්ලේශයෝ චලිතවූහ. කිරි ඇති ගසකට කොටුවාක් මෙන් විය. එකෙණිහිම බෝධිසත්වයන්ගේ ධ්‍යානය අන්තර්ධාන විය. පියාබුන් කපුටුවෙකුමෙන් විය. බෝධිසත්වයෝ සිටම ආහාර පිළිගෙණ නොවළඳාම් ක්ලේශයෙන් කම්පිතව ප්‍රාසාදයෙන් බැස උයනට ගොස් පන්සලට වැද පෝරු මැස්ස යට ආහාර තබා විෂභාගාලම්බනයෙහි බැඳි කෙලෙස් ගින්නෙන් දැවෙමින් නිරාහාර බැවින් වියලෙන්නාවූ සත්දවසක් මුළුල්ලෙහි පොරු මැස්සෙහි වැදහොත්තාහුය. සත්වෙනිදවස රජ්ජුරුවෝ පසල්දනව්ව ජයගෙණ අවුත් නුවර පැදකුණුකොට මාළිගාවට නොගොස්ම තපස්වීන් වහන්සේ දකිම්හයි උයනට ගොස් පන්සලට වැද තපස්වීන් වැදහොත් තැන් දැක එක් අළුසුවෙක් වනැයි කසල හරවා පය මඩිමින් හිඳ ස්වාමීනි අළුසුව කිමෙක්දැයි වනැයි පන්සල කසල හරවා පය මඩිමින් හිඳ ස්වාමීනි ආවාසුව කිමෙක්දැයි විචාලෝය. එබස් ඇසූ බෝධිසත්වයන්

SANHIDA LANKA

වහන්සේ කියන සේක් මහරජ්ජුරුවෙනි මට අනික් ආශ්‍රවෙක් නැත ක්ලේශ වසඟයෙන් පිළිබඳසිත් ඇතිවීම් කිවුය. ආර්‍යයන් වහන්ස නුඹ වහන්සේගේ සිත කවුරුන් කෙරෙහි පිළිබඳ විදැයි විචාළෝය. මහරජ්ජුරුවෙනි මුදුලක්ඛණාවන් කෙරෙහි පිළිබඳවියයි කිවුය. රජ්ජුරුවෝ යහපත ස්වාමීනි මම මුදුලක්ඛණාවෙන් නුඹ වහන්සේට දෙමියි කියා තාපසයන් කැඳවාගෙණ මාලිගාවට වැද බිසවුන් ස්වර්ණාභරණයෙන් සරහා තපස්වීන්ට පාවාදුන්නුය. දෙමින් සිට රජ්ජුරුවෝ මුදුලක්ඛණාවන්ට කියන්නෝ තොප විසින් තොපගේ බලයෙන් මේ තපස්වීන් රැකපිය යුතුයයි කිවුය. යහපත ස්වාමීනි තපස්වීන් රැකපියම්හයි ගිවිස්සෝය. තාපසයෝ බිසවුන් ඇරගෙණ මාලිගාවෙන් බටුවාහුය. ඉක්බිත්තෙන් මුදුලක්ඛණාවෝ මහවාසල් දොරින් නික්මුණු වෙලෙහිම තපස්වීන්ට කියන්නෝ ස්වාමීනි අපට එක් ගෙයක් ලදමැනව, එසේහෙයින් නුඹවහන්සේ ගොස් රජ්ජුරුවන් වහන්සේගෙන් ගෙයක් ඉල්වාගත මැනවැයි කිවුය. තාපසයෝ එබස් අසා ගොස් රජ්ජුරුවන් අතින් ගෙයක් ඉල්ලුය. රජ්ජුරුවෝ මනුෂ්‍යයන් ශාරිරකෘත්‍යය සපයන වැසිකිලියක් හා සමානවූ එක් ගෙයක් දෙවුය. තාපසයෝ බිසවුන් කැඳවාගෙණ ගෙට ගියෝය. බිසව ගෙට වදින්ට මැලිව සිටියාහුය. කවර කාරණයකින් ගෙට වදින්නට මැලිදැයි කී කල්හි අපවිත්‍ර බැවින් වදිනට මැලියෙමි කිවුය. දැන් කුමක් කෙරෙම්දැයි කී කල්හි ඒ ගෙය කසල හැර පිරිසිදු කරවයි කියා රජ්ජුරුවන් සමීපයට යවා උදැල්ලක් ගෙණව පෙට්ටියක් ගෙණවයි ගෙන්වාගෙණ අපවිත්‍රය හා කසල දම්මවා ගෙමගෑව මැනව. නැවතත් යව ඇඳක් ගෙණව පුටුවක් ගෙණව පහණක් ගෙණව ඇතිරියක් ගෙණෙව සැලක් ගෙණෙව කලයක් ගෙණෙවයි කියා එකී එකී විටෙක ගෙන්වා නැවත පැන් ආදිය ගෙණන පිණිස විධාන කළාය. එවේලෙහි බෝධිසත්වයෝ කලයක් හැරගෙණ පැන් ගෙණවුත් සැල පුරා නහන පැන් සරහා තබා යහනක් ඇතුලේය. එකල යහනේ එක්ව ලගින්ට පටන්ගත් බෝධිසත්වයන් දැතින් රවුළුපත් දෙක මිරිකා අල්වාගෙණ තොප මේ ශ්‍රමණ බවත් බ්‍රාහ්මණබවත් නොදනුනැයි කියා තමා තමන් අභිමුඛයට ගසලා ඇදළුය. මහබෝසතානෝ ඒ වෙළෙහි සිහිලද්දාහුව මෙතෙක්කල් මුළුල්ලෙහි කාමච්ඡන්දයෙන් අඥානවූය. මෙසේ ක්ලේශයෝ නම් අඥානයාට මූලාකාරණයෝය. මහබෝසතානෝ සිහි ලැබගෙණ සිතන්නාවූ මේ තෘෂ්ණාව මතුමත්තෙහි වඩාගෙණ යේනම් සතර අපායෙන්ම ඉස ඔසවාලීය නොදෙන්නේය. එසේහෙයින් අදම මා විසින් මේ මුදුලක්ඛණාවන් රජ්ජුරුවන්ට පාවදී හිමාලය වනයට වදින්ට වටනේයයි බෝධිසත්වයෝ මුදුලක්ඛණාවන් කැඳවාගෙණ රජ්ජුරුවන් කරා ගොස් මහරජ්ජුරුවෙනි තොපගේ බිසව් තොපටම සුදුස්සෝය. මට උන්ගෙන් ප්‍රයෝජන නැත උදක් මුන් නිසා මාගේ තෘෂ්ණාව වැඩුණු පමණකැයි කියා බිසවුන් රජ්ජුරුවන්ටම පාවාදුන්නුය. තවද මහරජාණෙනි තොපගේ මුදුලක්ඛණා නම් බිසවුන් නොලැබ පෙර මට මුන් ලද්දේවිනම් යහපතැයි එකම තෘෂ්ණාවක් උපන. යම්වේලෙක මා විසින් මේ දිගුපුළුල්වූ නුවන් ඇති මුදුලක්ඛණාවෙන් ලබනලද්දීද ඒ වෙලෙහි පටන්ගෙණ ගෘහ  තෘෂ්ණාවය උපකරණ තෘෂ්ණාවය උපභෝග තෂ්ණාවයයි මෙසේ අනෙක ප්‍රකාරවූ තෘෂ්ණාව මතුමත්තෙහිම වඩාගෙණ ගියේය. ඒ තෘෂ්ණාව මතුමත්තෙහිත් මෙසේම වැඩීගෙණ යේ නම් සතර අපායෙන් මා ඉස ඔසවාලිය නොහෙන්නේය. එසේ හෙයින් මට මේ බිසවුන්ගෙන් ප්‍රයෝජන නැත, තොපගේ බිසවුන් තෙපිම පාවාගණුවයි මම්වූකලී හිමාලය වනයට වදිමි කියා එකෙණෙහිම නටුවාවූ ධ්‍යානය උපදවාගෙණ ආකාශයෙහි හිඳ ධර්මදේශනා කොට රජ්ජුරුවන්ට අවවාද දී ආකාශයෙන්ම හිමාලය වනයට ගොස් නැවත මනුෂ්‍ය පථයක් දිශාවට නොආවාහුය. මතුමත්තෙහිත් මෙත්තා කරුණා මුදිතා උපේක්ෂා යන සතර බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්‍ය සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුසත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උකටලී මහණ සෝවාන් පෙලෙහි පිහිටියේය. සර්වඥයන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ මුදුලක්ඛණ ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. මුදුලක්ඛණාවෝ නම් උත්පලවර්ණ මහාස්ථවිරියෝය. එසමයෙහි තවුස්වූයෙමි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# උච්ඡංග ජාතකය

තවද එක්සමයෙක්හි සංසාරචක්‍ර මථනය කළාවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් එක්තරා දනව්වාසී ස්ත්‍රියක් අරභයා මේ ජාතකය වදාළසේක. එක්සමයෙක්හි කොසොල්රට තුන් දෙනෙක් එක්තරා වනයක් සමීපයෙහි සීසානාහුය. එකල ඒ වන ඇතුළේ වසන්නාවූ සොරු මනුෂ්‍යයන් අල්වා කොල්ලකාගෙණ ගියෝය. රාජපුරුෂයෝ ඒ සොරුන් සොයා නොදක ඒ තුන්දෙනා සීසානා තැනට අවුත් තෙපි වනයෙහි හිඳ කොල්ලකාපියාදැයි සී සා ඇවිදුදැයි කියා ගම්කොල්ලෑ කෑ සොරුන් නම් මොහුයයි බැඳගෙණ අවුත් කොසොල් රජ්ජුරුවන්ට පාවාදුන්නය. එකල්හි එක් ස්ත්‍රීයක් අවුත් මට වස්ත්‍රයක් දෙවයි කිවා හඬමින් නැවත නැවත මාළිගාවට ඇවිදින්නීය. රජ්ජුරුවෝ ඒ ස්ත්‍රියගේ ශබ්දය අසා මැට වස්ත්‍රයක් දෙවයි කීය. එබස් අසා රාජ පුරුෂයෝ වස්ත්‍රයක් ගෙණ ඒ ස්ත්‍රිය සමීපයට ගියෝය. ඒ ස්ත්‍රිය වස්ත්‍රය දැක මම මේ වස්ත්‍රය නොඉල්ලීම. පුරුෂ වස්ත්‍රය ඉල්ලීම් කිව මනුෂ්‍යයෝ ගොස් රජ්ජුරුවන්ට කියන්නෝ ස්වාමීනි මේ ස්ත්‍රී වස්ත්‍රයක් උවමැනවයි නොකියයි. පුරුස වස්ත්‍රයක් උවමැනවයි කියයි. කියා රජ්ජුරුවන් ට දැන්වූහ. එකල්හි රජ්ජුරුවෝ ස්ත්‍රී සමීපයට කැඳවා ගෙන්වා ගෙණ තෝ පුරුෂ වස්ත්‍රය වුවමැනවයි කියා යාඥ්ඥා කරන්නේයැයි විචාලාහුය. එසේ ස්වාමීනි ස්ත්‍රියට වල්ලභයා නම් වස්ත්‍රයක් හා සමාන පුරුෂයා නැති කල්හි දහසක් නිල වටිනාවත් වස්ත්‍රයක් හැඳගෙණ සිටින්නාහු ස්ත්‍රි තොමෝ නග්න වූවාහු නම් වෙයි කිව. රජ්ජුරුවෝ ස්ත්‍රියගේ බස් අසා ප්‍රසන්න වූ සිත් ඇතිව මෝ තුන් දෙනෙක් පිට කවුරු වෙද්දැයි විචාළෝය. ස්වාමීනි මුන් තුන් දෙනා එක් කෙණෙක් මාගේ වල්ලභයාය. එක්කෙණෙක් මාගේ මළණුවෝය. එක්කෙණක් මාගේ පුතණුවෝය කීය. රජ්ජුරුවෝ එබස් අසා මම තිට සතුටුවෙමි කීහ. සතුටු වූ මම මුන් තුන්දෙනාගෙන් එක්කෙණෙකුන් දෙමි. කවුරුන් කැමැත්තෙහි දැයි විචාළේය. ස්වාමීනි මම ජීවත්ව වුන්නෙම් වීනම් එක් වල්ලභයෙකු ලැබෙමි.  පුතනුවන් කෙණෙකුන් ලැබෙම්ය. මාගේ දෙමාපියන් මල බැවින් මලණුන් කෙණෙක් දුල්ලභයෝය. එසේ හෙයින් ස්වාමීනි මට මළනුවන් දුන මැනවයි කියෝය. රජ්ජුරුවෝ සතුටුව තුන් දෙනාම ස්ත්‍රියට පාවා දුන්නේය. මේ ස්ත්‍රිය නිසා තුන් දෙනෙක් දුකින් මිදුනාය. මේ කාරණය භික්ෂූ සංඝයා කෙරෙහි ප්‍රකාශ විය. ඉක්බිත්තෙන් එක් දවසක් භික්ෂූ සංඝයා වහන්සේ දම්සභා මණ්ඩලයෙහි රැස්ව හිඳ ඇවැත්නි එක් ස්ත්‍රියක නිසා තුන් දෙනෙක් මිදුනෝ වේදැයි ඒ ස්ත්‍රියගේ ගුණ කිය කියා උන් සේක. ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේ දම්සභා මණ්ඩපයට අවුත් පනවන ලද බුද්ධාසන මස්ථකයෙහි වැඩ හිඳ මහනෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා මේ නම් කතාවකින් යුක්තව උනුම්හයි කී කල්හි මහණෙනි මේ ස්ත්‍රී මුන් තුන් දෙනා ගැලවූවාක් දැන් මතු නොවෙයි. පෙරත් ගැලවුවයි දක්වා වදාරා ඉකුත්වත් දක්වා  වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ය කරණ කල්හි තුන් දෙනෙක් මහා වන සමීපයෙහි සිසාති යන සියල්ලම යට කීයන ලද්දේ හා සමාන වන්නේය. එසමයෙහි වනාහි රජ්ජුරුවන් විසින් තුන්දෙනාගෙන් කවුරුන් කැමැත්තෙහිදැයි විචාරකල්හි ස්ත්‍රිය කියන්නී ස්වාමිනි තුන්දෙනාම දෙන්ට නොපිළිවන්දැයි කිවුය. එසේය තුන් දෙනාම දෙන්ට නොපිළිවනැයි කී කල්හි ඉදින් තුන්දෙනාම දෙන්ට නුඹ වහන්සේට නොපිළිවන්වී නම් මාගේ මළනුවන් මට දුනමැනවයි කිවුය. රජ්ජුරුවන් විසින් පුත්‍රයාවත් වල්ලභයාවත් හැරගණුව තිට මළුනුන්ගෙන් ප්‍රයෝජන කිම්දැයි කී කල්හි ස්වාමිනි වල්ලභයන් හා පුත්තු නම් සුළභයෝය. මල්වූකලී ලැබගත නොහැක්කාහුයයි කියන්නී මෙසේ කිවුය. රජ්ජුරුවන් වහන්ස යම්සේ වලටවැද ඉනවටකොට දෙන්ම ස්ත්‍රීන්ට පුත්‍රයෝ නම් සුලභවන්නාහුය. ඉනතුබූපලභා සමාණයෝය. මගටබසැ උදකලාව යන්නාවූ ස්ත්‍රියට වල්ලභයෝ නම් සුලභයෝය. දුටු කෙනෙක් ම වල්ලභ වෙති. යම්ගෙයකින් මට දෙමව්පියයෝ නැද්ද එසේ හෙයින් මම දැන් එකකුසින් ඔත් සහෝදරවූ මලනුකෙනෙකුන් යම්තෙනකින් හෙණෙම් නම් ඒ මාතෘ කුක්ෂී සංඛ්‍යාතවූ අන්‍යදේශයක් නොදකිමි එසේහෙයින් මා මලනු වන්ම දුනමැනවයි කිවුය. රජ්ජුරුවෝ  මේ ස්ත්‍රීය සැබැවක්ම කියන්නී යයි සතුටු වූ සිත් ඇතිව තුන්දෙනාම සිරගෙන් ගෙන්වා පාවාදුන්නාහුය. ඒ ස්ත්‍රී තුන්දෙනාම කැඳවාගෙණ තමන් වසනාවූ ස්ථානයටම ගියාය. ශාස්තෘවූ බුදු රජානන් වහන්සේ මහණෙනි මේ ස්ත්‍රිය මුන් තුන්දෙනා දුකින් ගැලවූවාදැන් මතු නොවෙයි පෙරත් ගැලවූමයයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ උච්ඡංග ජාතකය නිමවා  වදාළසේක.

අතීතයෙහි සතරදෙනම දැන් මේ සතරදෙනමය. එසමයෙහි රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# සාකෙත ජාතකය

තවද එක් සමයෙක්හි උපමාවිසයාතික්‍රාන්ත වූ රූපකාය ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ සාකෙත නුවර නිසා අඤ්ජනවනයෙහි වසන සේක් එක් බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය වදාළසේක. භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා සාකෙත නුවරට පිඬුසිඟා වඩිනා කල්හි සාකෙත නුවර වසන්නා වූ එක් මහළු බමුණෙක් නුවරින් පිටත් යන්නේ වාසල් අතුරෙහිදී සර්වඥයන් වහන්සේ දැක දෙපසවැටී ගොප්මස තරයේගෙණ අල්වා සුත දරුවන් විසින් වෘද්ධ අවස්ථාවෙහි දෙමව්පියෝ නම් රැක්කයුත්තෝ නොවෙත්වත්ද කවර කාරණයකින් මෙතෙක්කල් මුළුල්ලෙහි මට නොදැක්වුද මව්වුකලී තොප දිටිමි තොපගේ මෑනියන් දක්නා පිණිස එවයි කියා සර්වඥයන් වහන්සේ කැඳවාගෙණ තමන්වහන්සේගේ ගෙට ගියේය.

සර්වඥයවන් වහන්සේ ඔහුගේ ගෙට ගොස් භික්ෂූසංඝයාවහන්සේ හා සමග පනවන ලද ආසනමස්තකයෙහි වැඩහුන් සේක. බැමිණිත් අවුත් සර්වඥයන් වහන්සේගේ ශ්‍රී පාද මුල වැටී පුත මෙතෙක් කල් මුළුල්ලෙහි කොයිගියාද දෙමව්පියෝ වෘද්ධ අවස්ථාවෙහි උපස්ථාන කටයුත්තෝ නොවෙත්දැයි කියා ඇඬූය. දූ දරුවනුත් කැඳවාගෙණ අවුත් තොපගේ බෑනන්වහන්සේ වඳුවයි කියා වැඳවූය. ඔහු දෙදෙනා සතුටු සිත් ඇතිව බුදුන් ප්‍රධාන කොට ඇති භික්ෂූසංඝයාවහන්සේට මහදන් දුන්නාහුය. සර්වඥයන් වහන්සේ වළඳා ඉක්බිත් ඔවුන් දෙදෙනාටම ජරාධර්ම සූත්‍රය වදාළසේක. සූත්‍ර දේශනාවගේ කෙළවර දෙදෙනාම අනාගාමී ඵලයෙහි පිහිටියාහුය. සර්වඥයන් වහන්සේ හුනස්නෙන් නැගී අඤ්ජන වනයට වැඩියේය. භික්ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි වැඩ හිඳ ඇවැත්නි මේ බ්‍රාහ්මණයා සර්වඥයන් වහන්සේගේ පියානෝ සුද්ධෝදන රජ්ජුරුවෝ මෑනියෝ මහමායාදේවීයයි දන්නේය. එසේ දන දනත් බැමිණිය හා සමඟ සර්වඥයන් වහන්සේ මාගේ පුතනුවෝ යයි කියයි. සර්වඥයන් වහන්සේත් බමුණා කියන දෙය ඉවසූසේක. මීට කාරණා කවරේදැයි මෙසේ වූ කථාවක් උපදවා උන්සේක. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ගේ කථාව අසා මහණෙනි ඔහු දෙදෙනා තමන්ගේ පුතනුවන්ට පුතනුවෝවයව් කියති වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක. මහණෙනි මේ බමුණා යටගිය දවස අතුරක් නැතිව පටිපාටියෙන් පන්සියයක් ජාති මුළුල්ලෙහි මට පිය විය. පන්සියයක් ජාති මුළුල්ලෙහි මට සුළු පියවිය. පන්සියයක් ජාති මුළුල්ලෙහි මට මහළු පිය විය. මේ බැමිණිත් අත-රක් නැතිව පිළිවෙළින්ම පන්සියයක් ජාති මුලුල්ලෙහි මට මව් විය. පන්සියයක් ජාති මුළුල්ලෙහි කුඩා මව් විය. පන්සියයක් ජාති මුළුල්ලෙහි මෑහැලි මව් විය. මෙසේ යෙළ දහසක් ජාති මුළුල්ලෙහි බමුණා අත වැඩිනම් යෙළෙදහකක් ජාති මුළුල්ලෙහි බැමිණිය අත වැඩි නම් මෙසේ යෙළ දහසක් ජාති මුළුල්හෙි මොහු දෙදෙන මව්පියවූහයි වදාරා ධර්මදේශනා කොට වදාළසේක. යම් පුද්ගලයෙක්හූ දුටු පමණිකින්ම ඔහු කෙරෙහි සිත පහදිද මොලොක්වේද ස්වභාවයෙන් ඒ උපන්ජන්මයෙහි පෙරනුදුටුවිරූත් ඒ පුද්ගලයා කෙරෙහි අනුභූත පූර්වස්නෙහ වශයෙන්ම ඒකාන්තයෙන්ම සත්වතෙමේ විශ්වාසයට පැමිණෙන්නේයයි මෙසේ ධර්මදේශනා කොට වදාළසේක. මෙසේ ශාස්තෘ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගලපා මේ සාකෙත ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි බමුණා හා බැමිණි නම් දන් මේ බමුණා හා බැමිණිය. එසමයෙහි පුත්‍රවූයෙමි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# වරණ ජාතකය

තවද එක්සමයෙක්හි චක්‍රලක්ෂණයෙන් විහ්නිතවූ ශ්‍රී පාදපත්ම ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වසන සේක් කුටුම්බිය පුත්ත තිස්ස ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

එක් දවසක් සැවැත් නුවර වාසීහු අන්‍යෝන්‍ය සහාය වූ තිසක් පමණ කුල පුත්‍රයෝ සුවද මල් හා සුවඳ දියගෙණ සර්වඥයන් වහන්සේ සුගන්ධගන්ධවා සිතවූ ගන්ධ කුටිකයෙන් නික්ම දම්සභා මණ්ඩපයට ගොස් අලංකෘතවූ බුද්ධාසන මස්තකයෙහි වැඩහුන් කල්හි කුලපුත්‍රයෝ සහපිරිවරින් දම්සභාමණ්ඩපයට ගොස් සර්වඥයන් වහන්සේට සුවඳ මල් ආදියෙන් පූජාකොට චක්‍ර ලක්ෂණයෙන් විහ්නිතවූ පතුල්තල ඇති සුපුෂ්පිත පද්මයක් මෙන් ශ්‍රී සහිත වූ ශ්‍රී පාද වන්දනයෙහි වැඳ එකත්පස්ව හිඳ ධර්මය ඇසුවාහුය. එකල ඒ කුලපුත්‍රයන්ට මෙසේ වූ සිතිවිල්ලක් වුයේය. අපි බුදුරජානන් වහන්සේ විසින්  දෙසන ලද ධර්මය යම් පරිද්දෙන් දනුමෝ නම් එපරිද්දෙන්ම මහණවම්හයි කියා ඔහු හැමදෙනා සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයෙන් නික්මුනු කල්හි බුදුන් කරා එළඹ නමස්කාර කොට මහණවීමට යාඥාකළාහුය. ඔවුන්ට සර්වඥයන් වහන්සේ ප්‍රවෘජ්‍යාව දුන්සේක. ඔහු හැමදෙනාම ආචාරී උපාධ්‍යායන් වහන්සේ සිත්ගෙණ උපසම්පදා ලැබ පස්අවුරුද්දක් ආචාර්යය උපාධ්‍යායන් වහන්සේ සමීපයෙහි වැස උභය මාතෘවන් ප්‍රගුණ කොට කැප අකැප දන් ත්‍රිවිධවූ අනුමෝදනාවෙන් ඉගෙණ සිවුරු ගෙත්තම් කොට රඳා මහණ දම් කරම්හයි ආචාර්යය උපාධ්‍යායන් වහන්සේ පිළිවිය සර්වඥයන් වහන්සේ කරා එළඹ නමස්කාර කොට එකත් පස්ව හිඳ ස්වාමීනි අපි භවයෙන් කලකිරී ගියම්හ. ජාතී ජරාව ව්‍යාධි මරණභයින් භයපත්වුම්හ. අපගේ සංසාරයෙන් මිදීම පිණිස කමටහන් වදාළමැනවයි ආරාධනා කළසේක. සර්වඥයන් වහන්සේගේ ඒ භික්ෂූන්ට කර්මස්ථානයන් අටතිස්දෙනා අතුරෙන් සැප වූ කර්මස්ථාන තෝරා පරීක්ෂා කොට කමටහන් වදාළසේක. ඒ භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේ සමීපයෙන් කමටහන් ගෙණ බුදුන් වැඳ පැදකුණු කොට විහාරයට ගොස් ආචාර්යය උපාධ්‍යායයන් වහන්සේ දැක පාසිවුරු ගෙණ මහණ දම් කරම්හයි නික්මුණසේක.

ඉක්බිත්තෙන් ඒ හැමදෙනා වහන්සේ අතුරෙන් කුටුම්බිය පුත්ත තිස්ස ස්ථවිර නම් වූ භික්ෂූ කෙනෙකුන් වහන්සේ කුසීතසේක. හීනවීර්ය සේක. රසයෙහි ගිජුසේක. උන්හන්සේ මෙසේ සිතුසේක. මම වල්ලභිවසන්ටවත් විර්ය කරන්නටවත් පිඬුසිඟායන්නටත් අසමර්ථයෙමි.  එසේ හෙයින් මම ගමනින් කවර ප්‍රයෝජනයෙක්ද, නොගොස් රඳමි, පසුබට විර්යය ඇති භික්ෂූන් වහන්සේ පසුපස්සේ මදතෙනක් ගොස් රැඳුනුසේක. අවශේෂ වූ භික්ෂූන් වහන්සේත් කොසොල් දනව්වෙහි චාරිකා කෙරෙමින් පසල්දනව්වෙහි එක්තරා ගමකට ගොස් ඒ ගම් නිසා එක් වනයක වස්වැස වස්තුන් මස ඇතුළත විර්ය කෙරෙමින් විදර්ශනා වඩා ගැබ්ගන්ව මහීකම්පාව කෙරෙහි අරහත්ඵලයට පැමිණි වස් අන්තයෙහි පවරා වඩනා ලද ගුණධර්මය සර්වඥයන් වහන්සේට කියම්හයි ඒ වචනයෙන් නික්ම අවුත් ක්‍රමයෙන් ජේතවනයට පැමිණිසේක. පාසිවුරු තැන්පත් කොට තබා ආචාරී උධ්‍යයයන් වහන්සේ දැක නැවත සර්වඥයන් වහන්සේ දක්නා කැමතිව බුදුරජානන් වහන්සේ සමීපයට ගොස් නමස්කාර කොට උන්සේක. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන් වහන්සේ හා සමග මිහිරිවූ පිළිසඳර කථා කළ සේක. ඒ භික්ෂූන් වහන්සේ කරණලද සුව දුක් කථා ඇතිසේක් තමන් වහන්සේ විසින් ලබන ලද ගුණධර්මයන් සර්වඥයන් වහන්සේට දැන්වූසේක. බුදුරජානන් වහන්සේත් ඒ භික්ෂූන් වහන්සේට ප්‍රශංසා කළසේක. එකල ඒ කුටුම්බිය පුත්ත තිස්ස ස්ථවිරයන් වහන්සේ සර්වඥයන් වහන්සේට ඒ භික්ෂූන් වහන්සේගේ ගුණ කථාව කියන්නා අසා තමන් වහන්සේත් මහණ දම් කරණු කැමතිසේක. ඒ අවශේෂ භික්ෂූන් වහන්සේ ස්වාමීනි අපි අඹ වනයට ගොස් වසමෝදැයි සර්වඥයන් වහන්සේ අතින් විචාළ සේක., සර්වඥයන් වහන්සේ යහපතැයි අනුදත් කල්හි ඒ භික්ෂූන් වහන්සේ බුදුරජානන් වහන්සේට නමස්කාර කොට තමන් වහන්සෙගේ පිරිවෙන් වලට ගියසේක. ඉක්බිත්තෙන් ඒ කුටුම්බිය පුත්ත තිස්ස ස්ථවිරයන් වහන්සේ රාත්‍රී භාගයෙහි අධික කොටවඩනා ලද විර්ය ඇතිව මහවූ වේගයෙන් මහණ දම් කරණ සේක් මධ්‍යම යාමයෙහි ආලම්බන ඵලකයෙහි වැතිර සිටම නිදමින් පෙරළී වැටි කලාවේ ඇට බිඳගත් වේදනා බලවත් විය. අවශේෂ භික්ෂූන් වහන්සේ උන්වහන්සේට බෙහෙත් ආදිය බැඳ පරිහරණය කිරීමෙන් යානුහුණුසේක. ඉක්බිත්තෙන් උපස්ථාන වේලාවට ඒ භික්ෂූන් වහන්සේත් ආකල්හි සර්වඥයන් වහන්සේ මහණෙනි තොපි සෙට යම්හයි කියා ඊයේ අපට කීවා නොවේදැයි විචාළසේක. එසේය ස්වාමීනි යම්හයි කිම්හ. එතකුදු වුවත් අපට සහාය වූ කුටුම්බිය පුත්ත තිස්ස ස්ථවිරයෝ නොවේලේ අධිකවේගයෙන් මහණ දම් කෙරෙමින් නිද්‍රාවෙන් මඩනාලදුව පෙරළී වැටී හුණුමුවඋන්ගේ කලවේ ඇට බිඳුනේය. උත්තියා අපගේ ගමන් බාධාවීයයි දැන්වුසේක. එකල්හි සර්වඥයන් වහන්සේ මහණෙනි මොහු තමන්ගේ හීනවීර්යය කමින් නොකල්හි අධික වේගයෙන් වීර්ය කොට තොපගේ ගමනට අන්තරාය කෙළේ දැන් මතු නොවෙයි පෙරත් මෙතෙම තොපගේ ගමනට අන්තරාය කෙළේ වේදැයි වදාරා ඒ භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස ගන්ධාර රට තක්සලා නුවර බෝධිසත්වයෝ දිසාපාමොක් ආචාරීව පන්සියයක් මාණවකයන්ට ශිල්ප උගන්නාහුය. ඉක්බිත්තෙන් එක් දවසක් මාණවකයෝ දර ගෙණන පිණිස වලටගොස් දර කඩන්නාහුය. ඔවුන් අතුරෙන් කුසීත මානවකයෙක් මහත්වූ ලුනුවරණ ගසක් දැන මේ මළ ගසෙකැයි යන සංඥාවෙන් මද ඇසිල්ලක් වැදහෙව පසුව ගසට නැගී දර කඩාලා ඇරගෙණ යෙමි උතුරුසළුව අතුට වැදහෙව නාසා හඬවමින් නිදන්නේය. සෙසු මානවකයෝ දර මිටිබැඳ ඇරගෙණ යන්නාහු ඒ නිද්නනාවූ මානවකයාට පිටිපල්ලෙන් ගසා පොබයා ගියාහුය. ඒ කුසීත මානවකයා නැගී සිට ඇස නිදි පිස පිස නිදි පලසා නොදීම ලුනුවරණ ගසට නැගී අත්තක් අල්වාගෙණ තමා දිසාවට ඇද බිඳිනේ බිඳි නැගි අතු කෙළෙවරින් තමාගේ ඇස සීල් කොටගෙණ එක් අතකින්

SANHIDA LANKA

ඇස වසා අනික් අතින් නොමල දර කඩා ගසින් බැස දරමිටියක් බැඳ ඔසවාගෙණ වහා ගොස් ඒ මාණවයන් විසින් එලනලද දරමිටි මත්තේ එළුයේය.  එදවස් දනව්ගමෙක එක් කුලයක මනුෂ්‍යයෝ බමුණන් ලවා සාන්ති කරවා දනුත් දී දක්ෂිණාවත් දෙම්හයි ආචාරීන් පැවරූය. එකල්හි ආචාරීවූ මානවකයන්ට කියන්නාහු දරුවෙනි සෙට එක් ගමකට යායුතුය. එසේ හෙයින් තෙපි හැම කියන්නාහූ දරුවෙනි සෙට එක් ගමකට යායුතුය. එසේ හෙයින් තෙපි හැම නිරාහාරව යන්ට අසමර්ථ වේදැයි උදෑසනම කැඳ පිසවා අනුභව කොට ගොස් තොප ලබන කොටසුත් අපට පැමිණ කොටසුත් එක්කොට ඇරගෙණ එවයි කිවාහුය. එබස් ඇසූ මානවකයෝ කැඳ පිසනු පිණිස කෙල්ල පුබුදුවා නගාසිටුවා වහා අපට කැඳ පිසවයි කිවාහුය. ඒ කෙළි කැඳ පිසනු පිණිස දර ගණිමින් මත්තේ තුබූ අමු ලුණුවරණ දඬු ගින්නේ ලා නැවත නැවත පිඹත් ගිනිදල්වාගත නොහී ඉරුනැංගාය. මානවකයෝ ඉතා දහවල්ව ගියෝය. දුන් යන්ට නොපිළිවනැයි කියා ආචාරීන් සමීපයට ගියෝය. ආචාරීන් වහන්සේ කියන සේක් දරුවෙනි කුමක් පිණිස නොයාදැයි විචාලෝය. එසේය ආචාරීන් වහන්ස නොගියම්හයි කී කල්හි කවර කාරණයකින් නොගියාහුදැයි කිවුය. ස්වාමීනි අසවල් කුසීත මානවකයා අප හා සමග දරට ගොස් ලුණුවරණ ගසක් මුල වැදහෙව නිදාපියා පසුව වහ වහා  ගසට නැගී ඇසත් සීල් කොටගෙණ අමු ලුණුවරණ දර ඇරගෙණ අප විසින් පළමුකොට ගෙණවිත් එලනලද දරමත්තෙහි එලීය. කැද පිසන තැනැත්තී ඒ වියලි දරයයි යන සංඥාවෙන් ගින්නේ ලා පිඹින්නී හිරු නැගෙණතුරු ගිනි මොලවා ගත නුහුණුව, මේ කාරණයෙන් අපගේ ගමනට බාධා වියයි කීහ. ආචාරී මානවකයා කළ කාර්ය අසා අඥාන සත්වයන්ගේ කාරිය නිසා මෙබඳු ලාභ හානියෙක් වීයයි කියා මානවකයන්ට සෙසේ යම්කිසි පුද්ගලයෙක් මේ පළමු කොට කළමනාදෙය, මේ පසුව කළමනාදෙයයි මෙසේ පරීක්ෂා නොකොට පළමු කොට කළමනා කටයුතු පසුව කෙරේද ඒ අඥාන පුද්ගලතෙමේ අමු ලුණු වරණ දරකඩා ගෙන්වාවූ අපගේ මාණවකයා මෙන් පශ්චත්තාපයට පැමිණ සෝක කොට හඬන්නේයයි මෙසේ මහබෝසතානෝ අතවැස්සනට මේ කාරණය කියා දානාදී වූ පින්කම් කොට ජීවිතාන්තයෙහි කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මහණෙනි මොහු තොපගේ ගමනට අන්තරාය කෙළේ දැන්මතු නොවෙයි පෙරත් කෙළේයයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ වරණ ජාතකය නිමවා වදාල සේක.

එසමයෙහි අක්ෂිභෙදයට පැමිණි මානවකයා නම් දැන් මේ ඌරුභේදයට පැමිණියා වූ මහණය. සෙසු මානවකයෝ නම් දැන් මේ බුදු පිරිසය, ආචාරි බ්‍රාහ්මණ වූයේ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා  වදාළසේක.

SANHIDA LANKA

# මච්ඡ ජාතකය

තවද එක් සමයෙක්හි සශ්‍රීක වූ මුඛ පත්මයක් ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් තමන් වහන්සේ විසින් වස්වන වර්ෂාවක් අරඹයා මේ ජාතකය වදාළ සේක.

එසමයෙක්හි කොසොල් රට වැසි නොවැසීමෙන් ගොයම් ආදීය මිය යන්නේය. ඒ ඒ තැන වැව් පොකුණු ආදීය වියලී ගියේය. ජේතවන දොරටුව සමීපයෙහි වු ජේතවන පොකුණෙහිත් පැන් සිඳී ගියේය. කරල් යට වැදහොත්තාවූ මස් කැස්බන් කපුටන් වන් හා උකුස්සන් ආදි වූ පක්ෂිහුල් හා සමාන වූ තුඩින් ඇන මැත් මැත් කොට සල්ව සල්වා අනුභව කරන්නාහුය. සර්වඥයන් වහන්සේ මස් කැස්බන්ට පැමිණියා වූ ව්‍යසනය දක මහා කරුණාවෙන් මෙහෙයන ලද සිත් ඇතිව අද මා විසින් වැසි වස්සන්නට වටනේයයි පහන් වූ කල්හි සිවුරු පිළි දැග පිඬු සිඟන වේලාව සලකා මහත් වූ භික්ෂු සංඝයා වහන්සේ විසින් පිරිවරන ලදුව මහත් වූ බුද්ධ විලාශයෙන් සැවැත් නුවරට පිඬු සිඟා වැඩ වදාළ අන්තයෙහි සැවැත් නුවරින් විහාරයට වඩනා සේක් ජේතවන පොකුනෙහි පියගැට මත්තෙහි වැඩ හිඳ ආනන්ද මහ තෙරුන් වහන්සේට වදාරණ සේක් ආනන්ද ස්ථිවිරයනි. ජල සාටිකාව ගෙනව. ජේතවන පොකුනෙන් පැන් සනහාමියි වදාලසේක. ස්වාමීනි ජේතවන පොකුනෙහි පැන් සිඳී ගියේය. කරල් මඩ පමණක්ම තිබුයේ නොවේයි දැන් වූසේක. ආනන්ද ස්ථිවිරයනි සර්වඥයන්ගේ ආනුභාව නම් ඉතාමහත. එසේ හෙයින් තෙපි ජල සාටිකාව ගෙනවයි වදාල සේක. එබස් ඇසු අනද මහ තෙරුන් වහන්සේ යහපත ස්වාමීනි කියා ජල සාටිකාව ගෙනවුත් දුන් සේක. සර්වඥයන් වහන්සේ ජල සාටිකාව එක් කෙළෙවරක් ඇද එක්කෙළෙවරකින් ශරීරය වසා ජේතවන පොකුනෙන් ජල ස්නානය කරමියි පියගැට මත්තෙහි වැඩ සිටි සේක.

එකෙනෙහි සක්‍රදේවේන්ද්‍රයාගේ පාන්ඩු කම්බල ශෛලාසනය උණුවිය. ඒ සක්‍රදේවේන්ද්‍රයෝ කිමෙක්දෝහෝයි පරික්ෂා කරන්නාහු ඒ කාරණාව දැන් වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයා කැඳවා දරුව සර්වඥයන් වහන්සේ ජේතවන පොකුනෙන් පැන් සනහමියි මුදුන් පියගැට මත්තේ වැඩ හිඳ සේක. වහා සියළු කොසොල් රට එක මේගය කොට වර්ෂාව වස්වයි විධාන කළෝය.

ඒ වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයා යහපතැයි ගිවිස එක් වලාවක් ඇඳ එක් වලාවක් පෙරව මේග ගීතිකා ගායනා කරමින් නැගෙනහිර සක්වලට අභිමුඛව නික්මුනේය. එකෙනෙහි නැගෙන හිර දිශා භාගයෙහි කලවිටි මඬලක් පමණ එක් මේඝ මණ්ඩලයක් නැගී ක්‍රමයෙන් ශත පඨල සහශ්‍ර පඨල ගර්ජනා කෙරෙමින් විදුලිය ගස්වමින් කිබිසිනි කොට තබන ලද පැන් කලයක් මෙන් වසිමින් සියළු කොසොල් රට මහා වතුරෙන් සලා දිවන්නාක් මෙන් වැටුනේය. වර්ෂා ධාරානි පාතයෙන් වස්නට පටන් ගත් කල්හි මද ඇසිල්ල නික්ම ජේතවන පොකුණ පිරී ගියේය. මුදුන් පියගැට වසා පොකුණේ පැන් පිරී ගියේය. එකෙණෙහිම සර්වඥයන් වහන්සේ ජලස්නානය කොට රත් වූ දෙපට අඳය සිවුරු ඇඳ ඊ මත්තේ පටි ධාතුව බැඳ සුගත මහා චීවරය ඒ කාංශ කොට ගෙණ භික්ෂු සංඝයා වහන්සේ පිරිවරා ගොස් ගඩ කිලි මලුයේ පනවන ලද බුද්ධාසන මස්ථකයෙහි වැඩ හිඳ භික්ෂූ සංඝයා වහන්සේ විසින් වත් දක්වූ කල්හි නැගී සිට මැනික්මය වූ සඳකඩ පහණ මත්තෙහි වැඩ හිඳ භික්ෂූ සංඝයා වහන්සේට අවවාද දී යවා සුගන්ධ ගන්ධ කුටියට වැද දකුණැලයෙන් සිංහ සෛයියාවෙන් සැතපී වදාල සේක. සවස් වෙළෙහි දම් සභා මණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන් වහන්සේ ඇවැත්නි දසබලධාරී බුදු රජානන් වහන්සේගේ ශාන්ති කරුණා සම්පත්තියත් බලව නොයෙක් සත්වයන් මියන්නට පටන් ගත් කල්හි නොයෙක් විල් පොකුණු ආදිය වියලෙන්නට පටන් ගත් කල්හි මහා කැස්බන් මහා දුකට පැමිණෙන්නට පටන් ගත් කල්හි කරුණාව නිසා මහජනයා දුකින් මුදමින් ජල සාටිකාව හැඳ ජේතවන පොකුණෙහි පියගැට මත්තේ සිට මද ඇසිල්ලකින් සියළු කොසොල් රට මහ වතුරෙන් උන් පවා පියන්නාක් මෙන් වැසි වස්සවා මහජනයා කායික චෛතසික දුක්ඛයෙන් මුදා විහාරයට වන් සේක් වේදැයි කතා කරමින් සිටි කල්හි ගඩ කිළියෙන් නික්ම දම්සභා මණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නට පූර්ව භාගෙයිහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා මේ නම් කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි මහණෙනි සර්වඥයෝ මහජනයා දුකින් පීඩිත වන්නට පටන් ගත් කල්හි දැන් මතු නොවෙයි. පෙරත් තිරිසන් යෝනියෙහි ඉපිද මත්ස්‍ය රාජ කාලයෙහි වැසි වස්සුවෝම වේදැයි ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස මේ කොසොල් රට මෙම සැවැත් නුවර මෙම ජේතවන පොකුණ පිහිටි තැන වැල් කැලයෙන් ගැවසී ගත්තා වූ එකඳූ රැලියක් විය. එසමයෙහි මහා බෝසතානෝ මත්ස්‍ය යෝනියෙහි ඉපිද මත්ස්‍යය සමූහයා විසින් පිරිවරන ලදුව ඒ කඳූ රැලියෙහි වසන්නාහුය. දැන් යම් සේද එපරිද්දෙන්ම එසමයෙහිත් ඒ රට වැසි නොවටුයේය. මනුෂ්‍යන්ගේ ගොයම් මියගියේය. වැව් ආදිය සිඳී ගියේය. මස් කැස්බෝ කලල්යට වන්නහුය. මේ කඳූ රැලියෙහිත් මත්සයෝ කලල් යට වැද ඒ ඒ තැන සැඟවුනාහුය. කපුටු ආදිහූ තුඩින් ඇන මැත් කොට කන්නාහුය. මහ බෝසතානෝ ඥාති සමූහයාට පැමිණියා වූ ඒ ව්‍යසනය දක මොහුන් ට උපන්නාවූ මේ දුක්ඛය මා හැර අනික් මුදන්නට සමර්ථ එකෙක් නැත. සත්‍යක්‍රියා කොට වැසි වස්වා මරණ දුකින් මුදනු පිණිස කලු වූ මඩ දෙබැ කොට පීරා නික්ම අඟුරු කැටයක් වැනි වූ මාහා මත්ස්‍යයානෝ මනා කොට ගාන ලද ලෝහිත අංකයක් හෝ මානික්‍යයන් වූ සමාන වූ ඇස් දෙක දල්වා අකාශය බලා වැස්ස වලාහක දිව්‍යය පුත්‍රයාට අඬගා කියන්නාහු පින්වත් වු වැස්ස වලාහක මම නෑයන් නිසා දුකට පැමිණියෙමි. සිල්වත් වූ මා දුක් විඳිමින් සිටියදී තෝ කවර කාරණයකින් වැසි නොවැස්වන්නෙහිද. මා විසින් ස්වජාති මාන්සය කන්නාවූ මත්ස්‍යයෝනියෙහි ඉපිද සාලටක් සා පමණ වූත් මත්සයෙක් කෑ විරු නැත්තේය. මා විසින් අන් ප්‍රාණියෙකුත් ජීවිතයෙන් තොර කල විරු නැත්තේය.

SANHIDA LANKA

මේ සත්‍යයෙන් වැසි වස්වා මාගේ ඥාති සමූහයා දුකින් මුදයි කියා පරිවාරක කෙල්ලෙකුට විධාන කරන්නාහු මෙන් වස්සවලාහක දිව්‍යය පුත්‍රයාට විධාන කරන්නාවූ මහා බෝසතානෝ මෙසේ කීවුය. පිනවත් වූ වැස්ස වලාහක දිව්‍ය පුත්‍රය තෝ ගර්ජනා කොට විදුලිය ගසා වර්ෂාව වස්සවා කපුටු සමූහයා කලල් යට වැද සිටියා වූ මත්ස්‍යයන් තුඩින් හැන මැත් කොට කන්නාවූ දියෙන් සඟවා ඒ කපුටුවන්ගේ මත්ස්‍යය නිධානය නසා පියව. තවද කපුටු සමූහයා මේ කඳු රැලිය දියෙන් පිරි ගිය කල්හි මත්සයන් නොලැබ සෝක කරන්නනේය. ඒ කපුටු සමූහයා තෝ මේ කඳු රැලිය පුරමින් සෝකාග්නියෙන් දවා පියව. මාත් මාගේ නෑයනුත් සියල්ලඋන්ම මේ මරණ ශෝකයෙන් ගලවා පියා මෙසේ මහා බෝසතානෝ පරිවාරක සේවකයන් හට ආඥාඥා කරන්නාක් මෙන් වැස්ස වලාහක දිව්‍යය පුත්‍රයාට විධාන කොට මහවැසි වස්සවා මහජනයා මරණ දුකින් මුදා ජීවිතාන්තයෙහි කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. ශාස්තෘ බුදුරජානන් වහන්සේ මහනෙණි සර්වඥයන් වහන්සේ දැන් මතු වැසි වැස්සූවෝ නොවෙති. පෙරත් මත්ස්‍යයෝනියෙහි ඉපිදත් වැසි වැස්සවූවෝ වේදැයි වදාරා මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ මත්ස්‍යය ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි මත්ස්‍ය සමූහයා නම් දැන් බුදු පිරිසය. වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයා නම් ආනන්ද ස්ථිවරයෝය. එසමයෙහි මත්ස්‍ය රජ්ජුරුවෝ නම් දැන් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# අසංකිය ජාතකය

තවද එක් සමයෙක්හි අෂ්ටෝත්තර ශත මංගල්‍ය ලක්ෂණයෙන් විරාජමාන වූ ශ්‍රීපාද ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසන සේක් සැවැත්නුවර වාසීවූ එක් උපාසකයෙක්හූ අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ උපාසකයානන් ශ්‍රෝතපාන්න වූ ආර්යශ්‍රාවකය, ඒ තෙම කිසිකටයුත්තක් නිසා ගැල්සාත්තු නායකයකු හා සමඟ මාර්ගයෙහි යන්නේය. එක්වල් කඩෙක ගැල්මුදා කඳවුරු බැඳි කල්හි සාත්තු නායකයාට නුදුරුතෙනක එක් කරගසක් මුල සක්මන් කරන්නේය, එකල්හි පන්සියයක් සොරුන් තමන් සොරකම්කරන්නට කල්පරීක්ෂා කොට ඒ කඳවුර කොල්ලකම්හයි දුනුමුගුරු ආදීගෙන ඒ ස්ථානය පිරිවරා ගත්තාහුය. එකල්හි උපාසකයෝ සක්මන් කෙරෙත්මය සොරහූ ඒ උපාසකයා දැක ඒ කාන්තයෙන් තෙමේ ස්කන්ධාවාරය  රක්ෂා කරන්නා වූ  පුරුෂයෙක්වන එසේ හෙයින් මොහු නිදන්නට වන් කල්හි හැර පියා යම්හයි සිතා බලහත් කාරයෙන් මැඩ ගෙන වැද්දගත නොහී ඒ ඒ තැනම සිටියාහුය. ඒ උපාසකයෝත් ප්‍රථමයාමයෙහි මධ්‍යම යාමයෙහිත් පශ්චිම යාමයෙහිත් සක්මන් කරමින්ම සිටියාහුය. අළුයම් වෙලාව වූ කල්හි සොරු අවසරයක් නොලැබ ගන්නා ලද කැටමුගුරු ආදීය දමා ගියාහුය. උපාසකයෝ තමන් ගිය කල කලමණාකාරිය නිශ්චා කොට ගෙණ අවුත් බුදුරජානන් වහන්සේ නමස්කාර කොට ස්වාමීනි තමා රක්නා කෙනෙක් අනුන් රක්නාහු නම් වේදැයි විචාලෝය. එසේය උපාසකය. තමන් රක්නා එකෙක් අනුන් රක්නේය. අනුන් රක්නා එකෙක් තමා රක්නේයයි වදාල සේක. එබස් ඇසූ උපාසකයෝ ස්වාමීනි භගවත් බුදුරජානන් වහන්සේ විසින් ඒ කාරණය වදාල නියාව ඉතා යහපත්ව වන්නේය. මම එසේ එක සාත්තු නායකයෙකු හා සමග ගමට පිළිපැද රුකක් මුල සක්මන් කෙරෙන්නෙමි. මා රකිම් සියළු සාත්තුවන් රැකෙමියි කීය. සර්වඥයන් වහන්සේ උපාසකය පෙර නුවනැත්තෝ තමා රක්නෝ  අනුන් රැක්කෝම වේදැයි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිත වූ බුදුහු ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්ම දත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන සමයේදී අප මහා බෝසතානෝ බ්‍රහ්මණ කුලයෙහි ඉපිද වැඩි විය පැමිණ කාමයෙහි ආදීනම දැක ඍෂි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව හිමාලය වනයෙහි වසන්නාහු  ලුණු ඇඹුල් සෙවුනා පිණිස ජනපදයට අවුත් ජනපද චාරිකා කරමින් එක් සාත්තු නායකයෙකු හා සමඟ ගමට පිළිපැද එක්වන ප්‍රදේශයක සාත්තුව විසූ කල්හි සාත්තුවට නුදුරු තැන ධ්‍යාන සැපයෙන් දවස් යවමින් එක්තරා රුකක් මුල සක්මන් කරමින් සිටියාහුය. එකල්හි පන්සියයක් සොරුන් සවස බත් අනුබව කල කල්හි ඒ ගැල් සාත්තු නායකයා හැර පියා උදුරා ගනුම්හයි අවුත් වටලා ගත්තාහුය. ඒ සොරු සැමදෙන තාපසයන් දැක ඉදින් මේ තාපසයෝ අප දුටුහු නම් සාත්තු වාසින්ට කියති. එසේ හෙයින් මුන් නිදන්නට වන් කල්හි පැහැරයම් හයි කියා එතැනහිම සිටියාහුය. මහබෝසතානෝ එවේලෙහි පටන් සකල රාත්‍රියෙහි සක්මන් කලාහුය. සොරුන් අවසර නොලැබ ගත්තාහු කැට මුගුරු ආදිය දමා ගැල් සාත්තුවෙහි වසන්නාවූ සත්වයන්ට කටහඬ පෑ පින්වත් සාත්තු වාසිනි ඉදින් මේ ගස මුල සක්මන් කරන්නාවු තාපසයෝ අද නොවුවෝ නම් තෙපි හැම දෙනම මහත් විනාසයට පැමිනෙන්නේමය. එසේ හෙයින් සෙට මේ තාපසයන් මහත් වූ සත්කාර සම්මාන කරවයි කියා ගියාහ. ඒ සාත්තු වාහක සත්වයෝ පාන්ව ගිය කල්හි සොරුන් දුමු කැට මුගුරු දැක භය පත්ව බෝධිසත්වයන් සමීපයට ගොස් වැඳ ස්වාමීනි නුඹ වහන්සේ සොරු දක්නා ලද්දාහුදැයි විචාලෝය. එසේය පින්වත්නි. දක්නා ලද්දාහයි කී කල්හි ස්වාමීනි මෙතෙක් සොරුන් දැක භයෙක්වත් තැතිගැන්මෙක් නුපූදිත්වදැයි විචාලෝය. මහ බෝසතානෝ කියන්නෝ පින්වත්නි සොරුන් දැක භය නම් වස්තු ඇති කෙනෙකු වන්නේය. මම වූ කලි නිර්ධනයෙක්මි. එසේ වූ මම කුමක් පිණිස  බම්දැයි කිවුය. තවද ගමත් වලත් වසන්නාවූ මම භයෙක්වත් තැතිගැන්මෙක්වත් නැතැයි කියා ධර්මදේශනා කරන්නාහු  මහා බෝසතානෝ මෙසේ කිවුය. පින්වත්නි මම ගම්හි වසන්නේ මුන් ග්‍රාමෝප චාරයෙන් විනිර්මුක්තව වසන්නේ මුත් සංබාවෙක නොසිටි බැවිනි. සංබාවෙක් භයෙක් නැත්තෙමි. පිරිසිදු සිල් ඇති බැවින් කායවාචි මනෝ වංක විරහිත වූ ඍජු වූ දිව්‍යලෝක මාර්ගයටත් නැගෙමි.  එයින් මත්තේ මෙත්තා කරුණා දෙක්හි පිහිටි බැවින් ඍජු වූ බ්‍රහ්ම ලෝක මාර්ගයටත් නැගෙමි. මෙසේ මහා බෝසතානෝ ධර්ම දේශනා කොට සතුටු වූ සිත් ඇති මනුෂ්‍යයෝ විසින් කරන ලද පුජ්‍ය සත්කාර ඇත්තාහු දිවි පමණින් සතර බ්‍රහ්ම විහාර භාවනා කොට බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය. ශාස්තෲ වූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගලපා මේ අසංඛෙයය ජාතකය නිමවා වදාල සේක

එසමයෙහි සාන්තුනායක වාසී මනුෂයෝ නම් දැන් බුදු පිරිසය. එසමයහෙි තපස් වී වුයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේක.

SANHIDA LANKA

# කාලකන්නි ජාතකය

තවද එක්සමයෙහි සංසාර සාගරයට නැවක් බඳුවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක්. අනේපිඬු මහසිටානන්ගේ මිත්‍රයෙකු අරභයා මේ ජාතකය වදාළසේක. ඒ මිත්‍රයා වනාහී අනේපිඬු මහසිටානන් හා එක්ව වැලි කෙළියේය, එක් කලෙක ආචාරීන් සමීපයෙහි සිල්ප උගත්තේය, නමින් කාලකන්නිය, ඒ තෙමේ කල්යාමකින් දුක්පත්ව ජීවත්ව ගතනොහී අනේපිඬු මහසිටානන් සමීපයට ගියේය. එකල සිටානෝ ඔහු අස්වසාලා වැටුප් වියදන් දී තමන් සනතක සියල්ල ඕහට පාවාදුන්නාහුය. එතෙමේ සිටානන්ට උපකාරීව සියළු කටයුතු කරන්නේය. එකල එක් යාළුවෙක් සිටානන් සමීපයට ගොස් මෙසේ කිවූය, ''මහසිටාණෙනි මොහු තොප සමීපයෙහි විසිය නොදෙව, සිටු කාලකන්නිය, හිඳු කාලකන්නිය,අනුභවකරව කාලකන්නිය, යන මේ ශබ්දයෙන්වත් පලායන්නේය, මොහු වූකලී තොප හා සමාන කෙනෙක් නොවෙයි, දුකබිතය, විරූපීය, තොපට මූගෙන් ප්‍රයෝජන කිම්ද''යි කිවූය. එබස් අසා අනේපිඬු මහසිටානෝ කියන්නෝ නාමය නම් ව්‍යවහාර මාත්‍රයක, නුවණැත්තෝ ඒ නාම මාත්‍රය ප්‍රමාණ නොකරති, සුතමඬගලිකාවන්ට සුදුසු නොවන්නේය. මා විසින් නාම මාත්‍රයක් එක්ව වැලි කෙළි තැනැත්තහු හැරපියන්ට නොපිළිවනැයි ඒ යාළු විශවාසයන්ගේ බස් නොගෙණ එක්දවසක් තමන්ගේ හොගග්‍රාමයට යන තැනැත්තෝ ඒ කාලකන්නි නම් පුරුෂයා රැකවලට රඳවා ගියේය. එකල සොරු ''සිටානන් ගමට ගියෝය, එසේහෙයින් උන්ගේ ගෙය පැහැරපියම්හ''යි නොයෙක් ආවුධ හැරගෙණ රාත්‍රිභාගයෙහි අවුත් ගේ වටලා ගත්තුය. ඒ කාලකන්නි නම් පුරුෂයාත් සොරු එති යන සැකයෙන් නොනිදාම උන්නේය, එතෙමේ සොරුන් ආ නියාව දන මනුෂ්‍යයන් පුබුදුවා තෝ සක් පිඹුව, තෝ බෙර ගසවයි කියා මහත්වූ රඟ මණ්ඩලයක් සරහන්නාසේ මෙන් සියලු ප්‍රාසාදය එකඝොෂා කෙළේය. එකල සොරු ගෙය සිස්වා තිබුයේයයි අප විසින් වරදවා අසනලද, මහසිටානෝ මෙගෙයිමැයි කැටමුගුරු ආදිය දමාපිය ගියාහුය. දෙවෙනි දවස් එතන දමන ලද කැට මුගුරු ආදියදක භයපත්ව ඉදින් අද මෙබඳුවූ බුඬිසමපනතවූ ගේ බලන්නෙක් නුවූයේවීනම් කැමැති පරිද්දෙන් වැද සියළු ගෙය පැහැරපියන්නාහුය, මිත්‍රයා නිසා සිටානන්වහන්සේට වැඩක්මවීයයි ප්‍රශංසාකොට අනේපිඬු සිටානන් හොගග්‍රාමයෙන් ආ කල්හි ඒ සියළු ප්‍රවෘතතිය කීවාහුය. එකල්හි සිටානෝ ඒ මනුෂ්‍යයන්ට මෙසේ කිවූය. ''තොපි හැම මාගේ මෙබඳු ගේ බලන්නාවූ මිත්‍රයා මෙතනින් නෙරපියන්ට උත්සාහ කළෝවේදැයි ඉදින් මම තොප හැමගේ බසින්  මොහු නෙරපුයේ වීමනම් අද මාගේ වසතුවෙන් කිසිවකුත් නොතිබෙන්නේ වේද නාමය නම් අප්‍රමාණය, හිතමිත්‍රයාම ප්‍රමාණය''යි කියා ඕහට වඩාලා වැටුප් දී සඬග්‍රහ කළෝය.

ඉක්බිත්තෙන් ඒ සිටානෝ දූන් මම සර්‍වඥයන්වහන්සේට දන්වමි මේ කාරණා නැමැති පඬුරෙක් ඇත්තේයයි සර්‍වඥයන්වහන්සේ සමීපයට ගොස් ආදියෙහි පටන් සියළු පවත් දැන්වූය. සර්‍වඥයන්වහන්සේ ''සිටාණෙනි කාලකන්නි මිත්‍රයා තමාගේ ගෘහවසතුව රැක්කේ දූන්මතු නොවෙයි පෙරත් රැක්කෝ වේදැයි වදාරා සිටානන් විසින් ආරාධිතවූ බුදුවූ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගියදවස බරණැස්නුවර බ්‍රහමදතත නම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතානෝ මහත්වූ යසපිරිවර ඇති මහතානකෙණෙක් වූය. ඒ සිටානන්ගේ කාලකන්නි නම් මිත්‍රයෙක් විය, යනදී සියල්ල වර්‍තමාන කථාව හා සදාශ වන්නේය. බොධිසත්‍වයෝ තමන්ගේ හොගග්‍රාමයෙන් ආ තැනැත්තෝ එපවත් අසා ඉදින් මම තොප ඇමගේ බසින් මෙබඳුවූ මිත්‍රයා නෙරපියන්නම් අද මාගේ ගෙයි කිසි වස්තුවක් නොතිබෙන්නේවේදැයි කියා මිත්‍රයාගේ ගුණ කීවාහුය. තවද සත්පියවරක් එක්ව යැමෙන් මිත්‍රනම් වන්නේය. දොළොස් දවසක් එක්ව විසීමෙන් සහායනම් වන්නේය. මසකින් යෙළමසකින් ඥාතිසමාන වන්නේය. එසේ හෙයින් සත්පුරුෂ ගුණ ඇත්තාවූ මම ආත්ම සැපය නිසා බොහෝ දවසක් විශවාසවූ මේ කාලකන්නි නම්වූ පුරුෂයා කෙසේ නම් හැරපියම්දැයි මිත්‍රරසයෙහි ගුණ කීවාහුය. එතැන් පටන් නැවත කිසිවෙක් මේ කාලකන්නි නම් පුරුෂයා පිළිබඳ බසක් නොකීයේය. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්‍මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ කාලකන්නි ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කාලකන්නි පුරුෂයා නම් දූන් ආනන්‍ද ස්ථවිරයෝය, එසමයෙහි බරණැස්නුවර සිටානෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්මවේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ලොසක ජාතකය

තවද එක් සමයෙක් හි මොහොදුරට ශරත් සූර්යයා වැනි වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසනසේක් ලොසකතිස්ස ස්ථවිර නම් තෙරකෙණකුන් වහන්සේ අරභයා මේ ජතකය වදාළසේක. මේ ලොසකතිස්ස ස්ථවිරයන් වහන්සේ නම් කවරේද යත් කොසොල්රට එක් තමාගේ කුලය නැසුවාවූ කෙවුල් පුත්‍රයෙක සිවුපසය නොලැබෙන භික්ෂූ කෙනෙක උන්වහන්සේ වනාහී උන්තැනින් චුතව කොසොල්රට එක්කුල දහසක් දෙන වසන්නාවූ කෙවුල්ගමෙක්හි එක් කෙවුල් ස්ත්‍රියකුගේ කුස පිළිසිඳ ගත්තේය. උන් වහන්සේ පිළිසිඳගත් දිනයෙහි ඒ කුල දහසක් ගෙවල්වල ඇත්තෝ දැල් ගත ඇත් ඇතිව ගංගාවේහිද තඩාගයෙහිද මත්ස්‍යයන් සොයන්නාහු එක් කුඩා මත්ස්‍යයකුදු නොලද්දාහුය. එතැන් පටන් ඒ කෙවුලෝ පිරිහෙන්නාහුය ඔහු මව්කුස උපන් කල්හිම ඔවුන්ගේ ගම සත්වරක් ගින්නෙන් දාගියේ සත්වරක් රජුහු විසින් දඩ නොගානා ලද්දේය. මෙසේ අනුක්‍රමයෙන් දුක්ඛිත වූ ඔහු මෙසේ සිතුවාහුය. පූර්වයෙහි අපට මෙබඳු වූ පිරිහීමෙක් නැත්තේය. දැන්වනාහී පිරිහෙම්හ. අපගේ අතරෙහි එක් කාලකන්නියෙක් වියයුතුය. දෙකොට්ඨාසයක් වම්හයි කියා පන්සියය පන්සියය බැගින් එක්වූවාහුය. එයින් යම් කොටසෙක්හි ඔහුගේ මව්පියෝ එක් කොටසක පිරිහෙන්නේය. අනික් කොටස වැඩෙන්නේය. එ කොටසද දොකොටසක් ව බෙදී ඒ කොටසද දොකොටසක්ව බෙදී මෙසේ යම්තාක් ඒ කුලය එක්වුයේද ඒතාක් විභාගකොට ඔහුන්ගේ කාලකන්නි බව දැන තලා නිකුත්කළාහුය. ඉක්බිත්තෙන් ඔහුගේ මෑණියෝ දුකින් ජීවත් වනු ලබති. ගර්ගය මුහුකළ කල්හි එක්තැනෙක්හි වැදුවාය. ඒ පශ්චිම භවික සත්වයා නසන්නට නොහැකිය කාළය ඇතුලත තිබෙන ප්‍රදීපයක් මෙන් හෘදයෙහි අර්හත් ඵලයට උපනිශ්‍රය සම්පත් දිලිහෙන්නේය. ඒ ස්ත්‍රිය ඒ කුලදරුවා රක්ෂා කොට පියවර ඔසවා ඔබිමොබ හැසිරෙන කල්හි ඒ ලදරුවාට එක් කබලක් අතට දී පුත්‍රය මේ ගෙට වදුවයි කිය කියා දිවගියාය. ඒ ලදරු එතැන්පටන් හුදකලාව ඒ ඒ තන්හි භික්ෂා සොයා එක්තැනෙක්හි සයනය කරන්නේය,නොමනගන්නේය, ශරීරය නොසරහන්නේය. පාංසු පිසාචයකු මෙන් දුකින් ජීවත්වන්නේය. එතෙම අනුක්‍රමයෙන් සත්ඇවිරිදිව එක් ගෙදර කඩයහි බඳුන් අදෝනා ජලය දැමූ තැන්හි කපුටුවෙකුමෙන් එකඑකී හුල අවුලමින් අනුභව කරන්නේය. ඉක්බිත්තෙන් ඔහු දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ සැවැත්නුවර පිඩු පිණිස හැසිරෙන සේක් දැක මේ සත්වයා කෙරෙහි මෛත්‍රී සිත වඩා කොලවරවෙයි වදාළසේක. ඒ ලදරුතෙම ගොස් තෙරුන්වහන්සේට වැඳ සිටියේය. ඉක්බිත්තෙන් ඔහුට තෙරුන් වහන්සේ කවර ගමෙක්හිද වසන්නෙහිද තමාගේ මව්පිය දෙදෙන කොයිදැයි විචාළසේක. ස්වාමීන් වහන්ස මම කිසි පිහිටක් නැත්තෙමි මාගේ මව්පිය දෙදෙන මා නිසා ක්ලාන්ත වූම්හයි කියා මා හැර ගියාහුය. වැලිදු වනාහි පැවිදි වන්නෙහිදැයි විචාළ සේක. ස්වාමින් වහන්සෙ මේ වනාහි පැවිදිවන්නෙමි මා වැනි බැගෑපත් හු කවරෙක් පැවිදිවන්නේදැයි කීය. මම පැවිදි කරවන්නෙමි වදාළසේක. යහපත පැවිදිකළමැනවයි කීය. තෙරුන් වහන්සේ ඕහට ඛාද්‍යාභෝජ්‍යාදීය දී ඔහු විහාරයට ගෙණගොස් ස්වත්සාහයෙන්ම නහවා පැවිදි කරවා විසිවයක් පිරුණු කල්හි උපසම්පදා කරවූ සේක. එතෙම මහළු වයසට පැමිණි කල්හි ලොසකතිස්ස ස්ථවිරයයි කියා ප්‍රසිද්ධ වූයේය. නුවණැත්තේය ස්වල්ප ලාභ ඇත්තේය. උන්වහන්සේ විසින් වනාහී අසදස දානයෙහිදු කුක්ෂියපුරා ආහාර නොලත්විරුසේක. ජීවිතය යැපෙන පමණක්ම ලබන සේක. උන් වහන්සේගේ පාත්‍රයෙහි වනාහි එක් වරක්ම කැඳ කෙනෙස්සක් පිළිගැන්වූ කල්හි පාත්‍රය මුවවිට දක්වා පිරුණාක් මෙන් පෙණෙන්නේය. ඉක්බිත්තෙන් මනුෂ්‍යයෝ මුන්වහන්සේගේ පාත්‍රය පිරුණේයයි සිතා යටිදිසාවෙහි පාත්‍රවලට කැඳ පිළිගන්වති ඔහුගේ පාත්‍රයට කැඳ පිළිගන්වන කල්හි මනුෂ්‍යයන්ගේ භාජනවල කැඳ අන්තර්ධාන වෙයි කියාද කියත්, ඛාද්‍ය භෝජ්‍යාදීයයෙහිදු මෙම ක්‍රමයයි, ඒ ලෝසකතිස්ස ස්ථවිරයන් වහන්සේ එයින් මෑතභාගයෙහි විදර්ශනා වඩා අග්‍රවූ අර්හත්ඵලයෙහි පිහිටිසේක්ද ස්වල්ප ලාභිමුක වූසේක. ඉක්බිත්තෙන් අනුක්‍රමයෙන් ආයුසංස්කාරය පිරිහිණු කල්හි උන් වහන්සේගේ පිරි නිවන් පානා දිනය පැමිණියේය. දම්සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ ආවර්ජනා කොට වදාරණසේක් උන්වහන්සේ පිරිනිවන් පානා බැව් දැන මේ ලොසකතිස්ස ස්ථවිරයන් වහන්සේ අද පිරිනිවන් පානාසේක. අද මා විසින් මොහටයපෙන පමණක් ආහාර දෙන්නට වටනේයයි සිතා ඔහු කැඳවාගෙණ සැවැත් නුවරට පිඩුපිණිස වන්සේක. සැරියුත් මහතෙරුන් වහන්සේ ඒ මහණ නිසා පළමු බොහෝ මනුෂ්‍යයන් ඇති සැවැත්නුවරින් අත දිගුකොට වැඳිම් පමණක්ද නොලත්සේක. ඉක්බිත්තෙන් තෙරුන් වහන්සේ ඇවැත්නි. යව ආසනශාලාවෙහි හිඳුවයි කියා ඔහු යවා මේ ආහාර ලොසකතිස්ස ස්ථවිරියන් හට දෙවයි කියා ලත් ආහාර යවූ සේක. ඒ ආහාර ගෙණගියාහු ලොසකතිස්ස ස්ථවිරයන් සිහිකොට තෙමෙම අනුභව කළාහුය. ඉක්බිත්තෙන් තෙරුන් වහන්සේ නැගී සිට විහාරයට වඩනා කල්හි ලොසක තිස්ස ස්ථවිරයන් වහන්සේ ගොස් ස්ථවිරයන් වහනසේට නමස්කාර කළසේක. ස්ථවිරයන් වහන්සේ ආපසු බලා සිටිසේක්ම ඇවැත්නි තොප විසින් ආහාර ලද්දේදැයි විචාළසේක. ස්වාමීන් වහන්ස මම නොලබමියි කී සේක. තෙරුන් වහන්සේ කලකිරීමට පැමිණ කල් වේලා බැලූ සේක කල් ඉක්මුනේයයි දැන තෙරුන් වහන්සේ මෙහි එවයි ඇවැත්නි මෙතැන්හිම හිඳුවයි කියා ලොසකතිස්ස ස්ථවිරියන් ආසන ශාලාවේ හිඳුවා කොසොල් රජහුගේ මාලිගාවට වැඩිසේක. රජ්ජුරුවෝ තෙරුන් වහන්සේගේ පාත්‍රය ගෙන්වා ආහාරය පිළිගන්යන්ට විකාල යයි සිතා පාත්‍රය පුරා චතුමධුර පිළිගැන්වූසේක. තෙරුන්වහන්සේ ඒ චතුමධුර ගෙණ ගොස් ඇවැත්නි එවයි කියා ඕහට මේ චතුමධුර වළඳවයි කියා පාත්‍රය ගෙනම වැඩසිටිසේක. හෙතෙම තෙරුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ලජ්ජාවෙන් නොවළඳන සේක, ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේ ඕහට ඇවැත්නි එව මම පාත්‍රය ගෙණම සිටිනෙමි තොපි හිඳ වළඳව, ඉදින් මේ පාත්‍රය අතින් මුක්ත කෙළෙම් නම් කිසිවකුත් නොවන්නේයයි වදාළසේක. ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ ලොසකතිස්ස ස්ථවිරයන් වහන්සේ අග්‍ර ඊශ්වර වූ දම්සෙනවි සැරියුත් මහ තෙරුන් වහන්සේ ආර්යය

SANHIDA LANKA

ඍධි බලයෙන් ක්‍ෂය බවට නොගියේය. එකල්හි ලොසකතිස්ස ස්ථවිරයන් වහන්සේ කැමති පමණක් බඩපුරා වැළඳූසේක. එදිනයෙහි අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑසේක. සර්වඥයන් වහන්සේ සමීපයෙහි සිට ශරිරය ආදාහණ කරවූසේක. ධාතුන් වහන්සේ ගෙණ චෛත්‍යයක් කළාහුය. එකල්හි භික්ෂූහු දම්සභාවෙහි රැස්ව හිඳ ඇවැත්නි ලොසකතිස්ස ස්ථවිරයන් වහන්සේ පින් නැත්තේය. අල්ප ලාභිය මෙබඳු පින් නැත්තාවූ අල්ප ලාභීහු විසින් කෙසේ ආර්ය ධර්මය ලත් සේක්දැයි කියමින් හුන්නාහුය. සර්වඥයන් වහන්සේ දම්සභාවට වැඩ වදාරා මහණෙනි දැන් මේ දම් සභාවෙහි මා එන්නට පෙර කවර නම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාළ කල්හි ස්වාමීන් වහන්ස මෙනම් කථාවෙනැයි දැන්වූවාහුය. සර්වඥයන් වහන්සේ වදාරණ සේක් මහණෙනි මේ මහණ තෙම තමහට ලාභ නොලබන බවද ආර්යය ධර්මය ලබන බවද තෙමේම කෙළේය. මේ මහණ වනාහි පෙර අන්‍යයහට ලාභාන්තරය කොට ස්වල්ප ලාභී වුයේය. අනිත්‍ය දුඃඛය අනාත්මයයි කියා විදර්ශනාවට සුදුසු භාවනාවගේ ඵලයෙන් ආර්යය ධර්ම ලාභී වූයේයයි වදාරා ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාළසේක.

යටගිය දවස කාශ්‍යප සර්වඥයන් වහන්සේගේ කාලයෙහි එක්තරා භික්ෂූ කෙණෙකුන් වහන්සේ එක් කෙළඹි පුත්‍රයෙකු නිසා ගමෙක්හි වූ සෙනස්නෙක්හි වසන සේක. පියවි ස්වභාවශීලයෙන් යුක්තව විදර්ශනාවෙහි යෙදී වසනසේක. ඉක්බිත්තෙන් එක් ක්ෂීණාශ්‍රව තෙර කෙණෙකුන් වහන්සේ හැමවත් නොහැර වසනසේක් අනුක්‍රමයෙන් ඒ භික්ෂූන් වහන්සේට උපස්ථාන කරන්නා වූ කෙලෙඹි පුත්‍රයාගේ වසන  ගමට පැමිණිසේක. කෙළඹි පුත්‍රතෙම තෙරුන් වහන්සේගේ ඊර්යයාපථයෙහිම ප්‍රසන්නව පාත්‍රය ගෙණ ගෙට වැඩම කරවා සකස්කොට වළඳවා මඳක් ධර්ම කථාව අසා තෙරුන් වහන්සේට වැඳ ස්වාමීන් වහන්ස අපගේ සමීප විහාරයටම වැඩිය මැනවයි අපි සවස්වේලහෙි අවුත් දකුම්හයි කීයේය. තෙරුන් වහන්සේ විහාරයට ගොස් නේවාසික තෙරුන් වහන්සේට වැඳ ආපුච්ඡා කොට එකත් පසෙක්හි හුන්සේක. නේවාසික තෙරුන්වහන්සේ උන් වහන්සේ හා සමඟ පිළිසඳර කථාකොට ඇවැත්නි නුඹ වහන්සේ විසින් භික්ෂාගාරය ලබන ලදදැයි විචාළසේක. එසේය ලදිමි වදාළසේක. කොතනින් ලත්සේක්දැයි විචාළසේක. එසේය ලදිමි වදාළ සේක. කොතනින් ලද් සේක්දැයි විචාළසේක. නුඹ වහන්සේගේ ආසන්න ගම කෙළඹි පුත්‍රයාගේ ගෙයිනැයි කී සේක. මෙසේ ද කියා තමහට සෙනස්නක් විචාරා පටිජග්ගණය කොට පා සිවුරු තැන්පත් කොට තබා ධ්‍යාන සැපයෙන් ඵල සැපයෙන් කල්යවමින් වැඩහුන්සේක. ඒ කෙළඹි පුත්‍රයාද සවස් වේලෙහි සුවඳ මල් හා පහන් තෙල්ද ගෙන්වා ගෙණ විහාරයට ගොස් නේවාසික තෙරුන් වහන්සේට වැඳ ස්වාමින් වහන්ස එක් ආගන්තුක තෙරකෙණෙකුන් වහන්සේ ඇත. වැඩිසේක් දෝහෝයි විචාළේය, එසේය වැඩිසේක. දැන් කොතැන්හිදැයි කීයේය. අසවල් සෙනස්නෙහිය. කෙළඹි පුත්‍රතෙම උන් වහන්සේගේ සමීපයට ගොස් වැඳ එකත් පසෙක්හි හුන්නේ ධර්ම කථාව අසා ශිතල වේලෙහි චෛත්‍යයටද බෝධීන් වහන්සේටද සුවඳ මල් පුදා පහන් අවුළුවා දෙදෙනා වහන්සේට ආරාධනා කොට ගියේය. නේවාසික තෙරුන් වහන්සේ වනාහි මේ කෙළඹි පුත්‍රතෙම බිඳින්නේය. ඉදින් මේ භික්ෂූන් වහන්සේ මේ විහාරයෙහි වසනසේක් වීනම් මා මේ තෙම කිසිවකටත් නොගන්නේයයි කියා තෙරුන්වහන්සේ කෙරෙහි අසන්තෝෂ බවට පැමිණ මේ විහාරයෙහි මුන්වහන්සේ නොවසන ආකාර මා විසින්  කරන්ට වටනේයයි සිතුසේක. එහෙයින් උපස්ථාන වේලෙහි ආවාහු හා සමඟ කිසිවක් නොකී සේක. ක්ෂීණාශ්‍රව තෙරුන් වහන්සේ ඒ භික්ෂූහුගේ අභිප්‍රාය දැන මේ ස්ථවිරයතෙම මාගේ කුලයෙහි හෝ ගණයාකෙරෙහි හෝ නොඇළුනු බව නොදන්නේයයි සිතා තමා වසන තැනට ගොස් ධ්‍යාන සැපයෙන් ඵලසැපයෙන් කල්යැවූසේක. නේවාසික තෙරුන් වහන්සේද දෙවැනි දිනයෙහි නියපිටින් ගෙඩිය ගසා නියපිටින් දොරට ආකොටනය කොට කෙළඹි පුත්‍රයාගේ ගෙට ගියසේක කෙළඹි පුත්‍රතෙම උන්වහන්සේගේ පාත්‍රය ගෙණ පණවන ලද  ආසනයෙහි වැඩ හිඳිනට සලස්වා ස්වාමීන් වහන්ස. ආගන්තුක ස්ථවිරයන් වහන්සේ කොතැන්හිදැයි විචාළේය. මම තොපගේ කුළුපල ස්ථවිරයන්ගේ ප්‍රවෘත්තිය නොදන්නෙමියි ගෙඩිය ගැසුයෙමි දොරට ආකොටනය කරණුයෙහි පුබුදුවාගන්නට නොහැකිවූයෙමි ඊයේ දවස තොපගේ ගෙයදී ප්‍රණීත භෝජන වළදා දිරවාගන්නට නොහැකිවූයේ දැන් නිද්‍රාවට පැමිණ වන්නේය. තොපි පහදින්නාහු මෙබඳු තැන්හිම පහදනාහුයයි කීසේක. ක්ෂීණාශ්‍රව තෙරුන් වහන්සේ පිබිද තමාට භික්ෂාචාර වේලාව සලකා ශරීරය ප්‍රතිග්‍රහණය කොට පාත්‍රා සිවුරු ගෙණ අහසට පැනනැගී අන් තැන කට වැඩි සේක. ඒ කෙළෙඹි පුත්‍රතෙම නේවාසික තෙරුන්වහන්සේට ගිතෙල් මී සකීරායෙන් අභිංසකෘත පායාසය වළඳවා පාත්‍රය සුවඳ සුනයෙන් උලා නැවත පුරවා ස්වාමීන්වහන්ස ඒ ආගන්තුක ස්ථවිරයන් වහන්සේ මාර්ගීකලාන්ත වූ සේක් වන උන්වහන්සේට මේ ආහාරය ගෙණවයි කියා පිළිගැන්වූයේය. නේවාසික ස්ථවිරයන් වහන්සේට මේ ආහාරය ගෙණවයි කියා පිළිගැන්වූයේය. නේවාසික ස්ථවිරයන් වහන්සේ ප්‍රතික්ෂේප නොකොටම ගෙණයනසේක් ඉදින් ඒ භික්ෂූන් වහන්සේ මේ ක්ෂීරපායාසය වැළඳූසේක් වීනම් ග්‍රීවය ගෙණ නිකුත් කළේ නමුදු නොයනසේක. ඉදින් වනාහි මම මේ ක්ෂීරපායාසය මනුෂ්‍යයයන් හට දුන්නේ නම් මාගේ ක්‍රියාව ප්‍රකාශ වන්නේය. ඉදින් දියෙහි දැමින්නම් දියපිට ගිතෙල් පෙනෙන්නේය. ඉදින් භූමියෙහි දැමුයේ වීනම් කපුටුවන්ගේ රැස්වීමෙන් පෙනෙන්නේය. මේ ක්ෂිරපායාසය කොතැන්හි දම්මදෝහෝයි පරීක්ෂාකරනුයේ මැල පුලුස්සන්නාවූ එක් කෙතක් දැක අඟුරු දෙබේකොට එහි බහා මත්තෙහි අඟුරෙන් වසා විහාරයට ගියසේක. විහාරයෙහි ඒ භික්ෂූන් වහන්සේ නොදැක සිතනසේක් ඒකාන්තයෙන් ඒ භික්ෂූන්වහන්සේ ක්ෂිණාශ්‍රව කෙණෙක මා අභිප්‍රාය දැන අන්තැනකට වැඩිසේක් වන. මා විසින් බඩ හේතු කොට ඉතා නුසුදුස්සක් කරණ ලදැයි සිතුසේක. ඒ ක්ෂණයෙහිම ඒ භික්ෂූන් වහන්සේට මහත් දොම්නසක් පහළවූයේය. එතැන්පටන් කොටම මනුෂ්‍යප්‍රේතව නොබෝකලකින්ම කාලක්‍රියාකොට නරකයෙහි උපන්නේය. ඒ තෙම බොහෝ වර්ෂී සතසහස්‍රයක් නරකයෙහි පැසීගියේය, නිරයෙහි පැසී අවශිෂ්ටකර්මයෙන් පිළිවෙලින් පන්සියයක් ජාතියෙහි යක්ෂව ඉපද එකදවසකුදු බඩපුරා ආහාරයක් නොලද්දේය. එක් දවසක් වනාහී ගබමල බඩපුරා ලද්දේය, නැවත පන්සියයක් ජාතියෙහි

SANHIDA LANKA

සුනඛව උපන්නේය. එකල්හිද එකදවසක් උද්ගාරය කරන ලද ආහාරයක් බඩපුරා ලද්දේය. සෙසු කල්හි ඔහු විසින් බඩපුරා ආහාරයක් නම් නොලත් විරීය සුනඛ ජන්මයෙන් චුතව වනාහී කසී රට එක්ගමෙක දුක්පත් කුලයෙක්හි උපන්නේය. ඔහුගේ උත්පත්තියෙහි පටන් ඒ කුලය අතිශයින් දුක්පත් වූයේය නාභියෙන් මත්තට දියකැඳ පමණ කුදු නොලද්දේය. ඕහට වනාහි මිත්ත විඥකයයි කියා නමෙක් වූයේය. ඔහුගේ මව්පිය දෙදෙන ක්‍ෂුධාදුක්ඛය ඉවසන්නට නොහැකිව කාලකන්නිය යවයි තලා ඔහු නිකුත්කළාහුය. මිත්තවින්දකතෙම පිටිවහලක් නැතිව හැසිරෙනුයේ බරණැස් නුවරට ගියේය. එසමයෙහි බෝධිසත්වයාණන් වහන්සේ බරණැස් නුවර දිසාපාමොක් ආචාරීව පන්සියයක් මානවකයන්ට ශිල්ප උගන්වන සේක. එකල්හි බරණැස් නුවර වාසී හූ දුක්ඛිතයන්ට වැටුප් දී ශිල්ප ඉක්මවන්නාහුය. මේ මිත්ත වින්දකද බෝධිසත්වයානන් වහන්සේ සමීපයෙහි කුෂලව ශිල්පය පුරුදු කරන්නේය. හෙතම පුරුෂ අවවාද නොගන්නේය. ඔවුනොවුන්ට ප්‍රහාර දෙමින් හැසිරෙන්නේය. බෝධිසත්වයානන් වහන්සේ විසින් අවවාද දෙනු ලබන්නේද අවවාද නොගන්නේය. ඔහු නිසා උන් වහන්සේට අය මද වූයේය. ඉක්බිත්තෙන් මිත්ත වින්දක තෙම මානවකයන් හා සමග දබර කොට අවවාද නොගනිමි එතැනින් ගොස් ඒ ඒ තැන්හි ඇවිදින්නේ එක් පසල් ගමකට ගොස් බැලමෙහෙකොට ජීවත් වන්නේය. හෙතම එතැන්හි එක් දිලිඳු ස්ත්‍රියක හා සමඟ තෘෂ්ණා සන්තවය කලේය. ඒ ස්ත්‍රී ඔහු නිසා ලදරුවන් දෙදෙනෙකු වැදූවාය. ගම් වැස්සෝ අපට කටයුතු නොකටයුතු නොකියවයි කියා මිත්ත වින්දකයා හට බලය දී ඔහු ගන්දොර කිලියක විමසීම කරවූවාය. ඒ මිත්ත වින්දකයා නිසා ඒ පසල් ගම් වැසියෝ සත්වරක් රජ හට දඬ දුන්නාහුය. සත්වරක් ඔහුන්ගේ ගෙවල් දහන වූවාහුය. සත්වරක් තඩාගයෙහි දිය සිඳුනේය. ඔහු සිතන්නාහු අපට පළමු මේ මිත්ත වින්දකයා නො ආ කල්හි මෙබන්දෙකක් නැත්තේය. දැන් වනාහි මොහු ආ කල් තැන් පටන් පිරිහෙම්හයි කියා ඔහු තලා නිකුත්කලාහුය. හෙතම තමාගේ ලදරුවන් ගෙන අන් තැනකට යන්නෙහි අමුනුෂ්‍යයන් පරිගෘහිත එක් ආරාමයකට පැමිණියේය. එතැන් හි අමුනුෂ්‍යයන් ඔහුගේ දරුවන්ද භාර්යාවද මරා මාංෂ අනුභව කළාහුය. මිත්ත වින්දකයා එතැනින් දිව ගොස් ඒ ඒ තැන්හි හැසිරෙමින් ගම්බිර නම් එක් පටුන් ගමකට නැවු හරණා දිනයෙහිම පැමිණියේ කම්කරුවෙක්ව නැවට නැගුනේය. ඔහු නැගුණු නැව මුහුදු පිටින් සත් දවස් ගොස් සත් වෙනි දිනයෙහි සමුද්‍ර මධ්‍යයෙහි ඇණ තිබූ වාක් මෙන් සිටියේය. ඔහු පවිටු කුසපත් ලුවාහුය. සත්වරක් මිත්ත වින්දකයා හට පැමිණියේය. නැවෙහි මනුශ්‍යයෝ ඕ හට එක් උණ දඬු කළඹක් දී හස්තය අල්වාගෙන සමුද්‍රයෙහි බැහැ වූවාහුය. ඔහු දැමු පමණකින්ම නැව ගියේය. මිත්ත වින්දක තෙම කුණ කලප් හි හෙව සමුද්‍ර පිටින් යන්නේ කාශ්‍යප සර්වඥයන් වහන්සේගේ කාලයෙහි මහණව රක්ෂා කර සීල ඵලයෙන් මුහුදු පිට එක් ස්ඵටික විමානයක්හි දිව්‍ය ස්ත්‍රීන් සතර දෙනෙකු ලැබ ඔහුන්ගේ සමීපයෙහි දිවසැප විඳිමින් සත් දවසක් වාසය කළේය. ඒ විමාන ප්‍රේතයෝ වනාහි සත් දවසක් සැප අනුභව කෙරෙති. සත් දවසක් දුක් අනුභව කරන්නට යන්නාහුය. යම් තාක් කළක අපි එමුද ඒ තාක් කල් මෙතැන්හි වසවයි කියා ගියාහුය. මිත්ත වින්දකයා ඔහුන් ගිය කල්හි කුණ කලප් හි හිඳ මත්තෙහි යනුයේ රිදී විමනෙක් හි දිව්‍ය ස්ත්‍රීන් අට දෙනෙකු ලද්දේය. එයින් මත්තෙහිලු යනුයේ මැණික් මය. විමනෙක්හි දිව්‍ය ස්ත්‍රීන් සොලොස් දෙනෙකු වුද ස්වර්ණමය විමනෙක් හි දිව්‍ය ස්ත්‍රීන් දෙතිස් දෙනෙකු ලද්දේය. ඔවුන්ගේද වචන නොකොට මධ්‍යයෙහි යන්නුයේ තුරු දිවයිනක එක් යක්ෂ පුරයක් දුටුයේය. එහි එක් යක්ෂණියක් එළු රූපයෙන් හැසිරෙන්නීය. මිත්ත වින්දකයා ඈ යක්ෂණී බව නොදන්නී එළු මස් අනුභව කෙරෙන්නම් සිතා ඇගේ පය අල්වා ගත්තේය. ඕ තොමෝ යක්ෂානු භාවයෙන් ඔහු ඔසවා දැමුවාහුය. මිත්ත වින්දක තෙම යක්ෂණී විසින් දමන ලද්දේ මුහුදු පිටින් ගොස් බරණැස් නුවර පවුර පිට එක් කටුලැහැබක් මත්තේහි වැටි පෙරලෙමින් භූමියේ පිහිටියේය. එසමයෙහි වනාහී ඒ පවුර පිට රජහුගේ එළුවන් තණ කා ඇවිදින්නවුන් සොරු ගෙන යන්නාහුය. එළු ගොව්වෝ සොරු ගනුම්හයි කියා එකත්පසව සැඟ වී සිටියාහුය. මිත්ත වින්දකයා පෙරලී භූමියේහි සිටියේ ඒ එළු දෙනුන් දැක මම සමුද්‍රයෙහි එක් දිවයිනක එළු දෙනක පය අල්වාගෙන ඈ විසින් දමන ලද්දෙම් මෙතැන්හි වැටුනෙම් ඉදිවන්නාහි දැන් එක් එළු දෙනකගේ පය අල්වා ගතිමි නම් ඒ එළු දෙන මා මතු සමුද්‍ර මත්තෙහි විමාන දිව්‍ය ස්ත්‍රීන්ගේ සමීපයෙහි දමන්නේයයි සිතුයේය. හෙතම මෙසේ වූ නුවනින් මෙනෙහි කොට එළු දෙනගේ පය අල්වා ගත්තේය. ඒ එළු දෙන ගත් පමණකින් ඇඬුවාය. එළු ගොව්වෝ ඔබිනොබින් අවුත් සොරෙකැයි කී ඔහු බැඳ ඇණ රජුගේ සමීපයට ගෙන යන්නාහුය. එකිනෙහි බෝධිසත්වයානන් වහන්සේ පන්සියක් මානවකයන් පිරිවරා ගෙන නුවරින් නික්ම නගන්නට වඩනා සේක. මිත්ත වින්තකයා දැක හැඳින ඒ මනුශ්‍යයන්ට කියන සේක් සඝයෙනි මේ තෙම අපගේ අතවැස්සෙකි. කවර හෙයකින් මොහු ගත්තාහුදැයි කී සේක. ස්වාමීන් වහන්ස මේ එළුවන් සොරක එක් එළියකගේ පය අල්වා ගත්තේය. එහෙයින් ගන්නා ලද්දේ යයි කිවුය. එසේ වී නම් මොහු අපට දාස කොට දෙව අප නිසා ජීවත් වන්නේයයි කී සේක. ඔහු යහපත ස්වාමීන් වහන්සේ යයි කියා ඔහු හැර ගියාහුය. ඉක්බිත්තෙන් ඕ හට බෝධිසත්වයානන් වහන්සේ මිත්ත වින්දකය තෝ මෙතෙක් කල් කොතැන්හි විසීදැයි විචාල සේක. හෙතම සියළු තමා විසින් කරන ලද ක්‍රියාව දැන්වුයේය. බෝධි සත්වයන් වහන්සේ වැඩ කැමැත්තවූන්ගේ වචනය නොකරන තැනැත්තේ මෙබඳු දුකට පැමිණෙන්නේයි වදාරා වැඩ කැමැතිව හිත චින්තනයෙන් අනුකම්පා කරන්නාහුගේ අනුශාසනාව අවවාදය, යමෙක් නොකෙරේද එසේද පුරුෂ තෙම එළුවන් ගේ පය අල්වාගෙන ශෝක කරන්නාවූ මිත්ත වින්දකයා මෙන් නිරන්තරයෙන් මිරිකෙන්නේය. ශෝක කෙරෙන්නේයයි කියා බණ වදාල සේක. මෙසේ ඒ තෙරුන් වහන්සේ විසින් මෙපමණ කලක් මුළුල්ලෙහි ත්‍රිවිධ ආත්මය කී කුක්ෂිය පුරා ආහාර නොලත් විලි සේක. යක්ෂව උපන් කල්හි එක් දවසක් ගබමල ලද්දේය. සුනඛව උපන් කල එක් දවසක් උද්ගාරයකල ආහාරයක් ලද්දේය. පිරිනිවන් පානා දිනයෙහි දම් සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ ආනුභාවයෙන් චතු මදුරය ලත්සේක. මෙසේ අන්‍යයන් හට ලාභාන්තරාය කිරීම මහා දෝශයයි දත යුත්තේය. ඒ කාලයෙහි ඒ ආචාරීන් වහන්සේද මිත්ත වින්දකයා ද කම් වූ පරිද්දෙන් මියපරලොව ගියාහුය. සර්වඥයන් වහන්සේ මහණෙනි මෙසේ මේ මහණ

SANHIDA LANKA

තෙමේම ස්වල්ප ලාභීන් බවද තෙමේම ආර්ය ධර්මය ලත් බවද කෙලේ යයි කියා මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ ලොසොක ජාතකය නිමවා වදාල සේක.

එසමයෙහි මිත්ත වින්දකයා නම් දැන් ලොසක තිස්ස ස්ථවිර වූ සේක. දිසාපාමොක් ආචාරීව උපන්නෙම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# වේදබ්භ ජාතකය

තවද එක්සමයෙක්හි මහමෙරසේ නිශ්චල වූ ගුණ ඇති බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් දුර්වච වූ භික්ෂූන් කෙණෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළසේක. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූහට මහණ තා දුර්වචවූයේ දැන් මතු නොවෙයි පෙරත් දුර්වචවූ වූයෙහිමය ඒ දුර්වචවූ කාරණයෙන්ම නුවනැත්තන්ගේ බස් නොගෙණ සියුම් මුවහත් ඇති ඛඩ්ගයෙන් දෙකඩකොට නසන ලදුව මගවැටි ඔත්තෙහිවේද තා එක තැනැත්තවූ නිසා දහසක් පුරුෂයෝ ජීවිතක්ෂයට පැමිණියෝ වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි එක්ගමෙක එක්තරා බමුණෙක් වේදබ්භ නම් මන්ත්‍රයක් දන්නේය. ඒ මන්ත්‍රනය වූ කලී අනර්ඝ මාහැගිය නැකැත් යොගයක් ලත්කල්හි ඒ මන්ත්‍රය පිරුවා ආකාශය බැලූකල ආකාශයෙන් සත්රුවන් වර්ෂා වස්නේය. එකල පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතානෝ ඒ බ්‍රාහ්මණයා බෝධිසත්වයන් කැඳවාගෙණ කිසි කටයුත්තක් නිසා තමාගේ ගමින් නික්ම චේතිය රාජ්‍යයට ගියේය. අතරගම එක්වලෙක පන්සියයක් පමණ පෙසෙනකචොර නම් වූ සොරකෙණෙක් මන්පහරණුවෝය, ඒ පෙසෙනකචෝරයෝ බෝධිසත්වයන් හා වේදබ්භ නම් බමුණා අල්වාගත්තුය. ඔහු ඇමදෙනම දෙදෙනෙකු අල්වා ගත්කල එකෙකු වස්තුගෙණයන්ට යවා එකෙකු සමීපයෙහි රඳවා ගණිති එසේ හෙයින් ඔහු පෙසනක චොරනම් වෙති, ඔහු ඇමදෙනද දෙපුතු පිය කෙණෙකුන් අල්වාගෙණ පියානන්ට කියනකල තෙපි අපට වස්තුගෙණවුත් පුතනුවන් ගලවාගෙණ යවයි කියති මෙම ක්‍රමයෙන් දෙපුතු මෑණිකෙණෙකුන් අල්වාගෙණ මෑණියන් වස්තුගෙණයන්ට යවති දෙබෑ කෙණෙකුන් අල්වාගෙණ බෑණන් වස්තු ගෙණයන්ට යවති. ආචාරීය අනේතවාසිකදෙදෙනෙකු අල්වාගෙණ අනේතවාසිකයා වස්තු ගෙණයන්ට යවති. ඒ සොරුන් පන්සියයක් දෙනා එකල වේදබ්භ නම් බමුණා අල්වාගෙණ බෝධිසත්වයන් වස්තුගෙණෙන්ට යවූය. බෝධිසත්වයෝ ආචාරීන් වැඳ කියන්නෝ මම දෙතුන් දවසක් ගියකල එම් නුඹ වහන්සේ නොබා මැනව තවද එකක් කියම් මා කීවා කළමැනව අද සත්රුවන් වස්නා වූ නක්‍ෂත්‍ර යෝගය වර්ෂා නොවැස්සුව මැනව ඉදින් නුඹ වහන්සේ වැස්සුවසේක් වීනම් නුඹවහන්සේත් විනාශයට පැමිණෙනසේක. මේ පන්සියයක් සොරුන් විනාශයට පැමිණෙතියි මෙසේ ආචාරීන්ට අවවාද කොට වස්තුගෙණන්ට ගියෝය. සොරුන් හිරු හස්ථයට ගිය කල්හි බමුණා බැඳ හොවාලූය එකෙණහිම නැගෙණහිර සක් වලින් සම්පූර්ණව චන්ද්‍රමණ්ඩලය නැංගේය. එකල බමුණා නක්‍ෂත්‍ර යෝගය බලන්නේ සම්පත් වර්ෂාවස්වන්නා වූ නක්‍ෂත්‍ර යෝගය ලබනලද එසේ හෙයින් බන්ධනයෙහි වැදහෙව දුක් අනුභව කිරීමෙන් මට ප්‍රයෝජන කිම්ද මන්ත්‍රය පිරුවා සත්රුවන් වර්ෂා වස්වා සොරුන්ට වස්තු දී සැපසේ යෙමියි සිතා සොරුන්ට බෑණාවූයේය, පින්වත් වූ සොරුනි තෙපි ඇම මා කුමක් නිසා ඇල්වූ දැයි කීයේය. ආචාරීනි වස්තු පිණිස යයි කී කල්හි ඉදින් තොපට වස්තුවෙන් ප්‍රයෝජන ඇත්නම් මා බන්ධනයෙන් මුදවා වහා නහවා අලුත් පිළි අඳවා සුවඳ විලවුන් ගල්වා මල්පළඳවා සිටුවවයි කීයේය. ඒ සොරු ඇමදෙන ඔහුගේ කථාව අසා එපරිද්දේන් කළේය. එකල බමුණා නක්‍ෂත්‍ර යෝගය දැන මන්ත්‍රය පිරුවා ආකාශය උඩබැලිය එකෙනෙහිම ආකාශයෙන් සත්රුවන් වර්ෂා වූයේය. සොරු ඒ ධනය එක්තැන්කොට උතුරු සළුවල පොදිබැඳගෙණ නික්මුණාහුය. බමුණාත් ඔවුන් පසුපස ම ගියේය. ඉක්බිත්තෙන් ඒ සොරුන් පන්සියයක් දෙනා අන්‍ය වූ සොරුන් පන්සියයක් අල්වාගත්තුය. කුමක් පිණිස ඇල්වදැයි කී කල්හි වස්තුව පිණිස ඇල්ලුම්හයි කිවුය, ඉදින්තොපට ධනයෙන් ප්‍රයෝජන ඇත්නම් මේ බමුණා අල්වා ගනුව මේ බමුණා ආකාශය උඩ බලා ධනවර්ෂාව වැස් වූයේය අපට මේ වස්තුව මොහු විසින්ම දෙන ලද්දේයයි කිවුය. එකල්හි සොරු වස්තුව ඇති මේ වස්තුව මොහු විසින්ම දෙන ලද්දේයයි කීවුය. එකල්හි සොරු වස්තුව ඇති සොරුන් හැර අපටත් වස්තු දෙවයි කියා බමුණා අල්වාගත්තුය. බමුණු කියන්නේ මම තොපට වස්තු දෙමියි සත්රුවන් වැසි වස්වන්නා වූ නක්‍ෂත්‍ර යෝගය වූ කලී මෙතනට අවුරුද්දකින් මත්තෙහි වන්නේය. ඉදින් තොපට වස්තුවෙන් ප්‍රයෝජන ඇත්නම් කලක් ඉවසව ධන වර්ෂා වස්වන්නෙම් වේදැයි කිවුය. එබස් අසා සොරු කිපී එම්බල දුෂ්ට වූ බමුණ සෙස්සන්ට දැන්ම ධනවර්ෂා වස්වා අපට අනික් අවුරුද්දක් ඉවසන්නට කියන්නේහිදැයි කියා තියුණු වූ මුවහත් ඇති කඩුවකින් බමුණා දෙකඩ කොට ගසා මග හෙලා වේගයෙන් පසුපස්සේ ලුහුබඳවාගෙණ ගොස් ඒ සොරුන් හා සමඟ යුද්ධ කොට පන්සියයක් පුරුෂයන් මරා වස්තුගෙණ නැවත දෙකොටසක් ව ඔවුනොවුන් හා යුද්ධ කොට දෙසියපනසක් පුරුෂයන් මරා මෙම ක්‍රමයෙන් බෙදී ඔහුනොවුන් මැරීමෙන් දෙදෙනෙක් පමණක් සෙස්වූහ. ඒ තාක්වනතුරු ඔවුනොවුන් මැරුවාහුය. මෙසේ ඒ පුරුෂයෝ දහසක් දෙනා විනාශයට පැමිණියෝය. ඔහු දෙදෙනා උපායෙන් ඒ වස්තුව ගෙණගොස් එක් ගමක් සමීපයෙහි කැලයක වස්තුව සඟවා එකෙක් කඩුවක් ගෙණ වස්තුව රැක උන්නේය. එකෙක් සාල්ගෙණ බත්පිසන්ට ගමට වන්නේය. ලෝභය නම් මෙසේ විනාශයට මුල්කොට ඇත්තෙමය. ඉක්බිත්තෙන් ඒ වස්තුව සමීපයෙහි උන් තැනැත්තේ මෙසේ සිතීය. ඒ පුරුෂයා ආකල්හි මේ වස්තුව දොකොටසක් වන්නේය. එසේ හෙයින් මම ඔහු ආ ඇසිල්ලෙහි කඩුවෙන් ගසා මැරුයෙන් වීන්නම් යහපත් වන්නේයයි ඒ තෙම කඩුව කොපුවෙන් හයා ඔසවාගෙණ ඔහු එන පෙරමග බලබලා උන්නේය. අන්‍ය වූ බත් පිසන්ට ගිය පුරුෂයා සිතන්නේ ඒ ධනය දෙකොටසක් වන්නේය. එසේ හෙයින් මම මේ බතෙහි විෂයක් ලා ඒ පුරුෂයා කවා මරා තනිවම වස්තුව ගන්නෙම් වීන්නම් යහපතැයි සිතීය. ඉක්බිත්තෙන් ඒ බත් පිසන්නාහූ පුරුෂයා බත්පිස අන්තයේ තෙමේත් බස් අනුභව කොට ඉතිරි බතෙහි විෂලා ඒ බත් ගෙණ වස්තු තුබූ තැනට ගියේය. ඔහු බත් බා තබාලා සිට මද ඇසිල්ලකින්ම වස්තුව රැකසිටි තැනැත්තේ කඩුවෙන් ඔහු දෙකඩකොට ගසා මුවාතැනකට දමා ඒ බත් අනුභවකොට තෙමේත් එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියෝය. මෙසේ වස්තුව නිසා සොරුන් දහසක් දෙනා විනාශයට පැමිණියෝය. බෝධිසත්වයෝත් එක් දෙදවසක් ගියකල

SANHIDA LANKA

ආචාරීන් ගලවනු නිසා වස්තුව ඇරගෙණ එන තැනැත්තෝ පළමු තමන් කථා කොට ගියතැන ආචාරීන් නොදක විසිර තිබෙන්නාවුත් වස්තුවත් දැක ආචාරීන් විසින් මා කිවා නොකොට ධනවර්ෂා වස්වන ලද්දේවනැයි සියල්ලවුන් විනාශයට පැමිණි නියාවනැයි මහවතින් තික්වන ලද්දේවනැයි සියල්ලවුන් විනාශයට පැමිණි නියාවනැයි මහවතින් තික් මුණාහ. යන්නාහු මහබෝසතානෝ ආචාරීන් මධ්‍යයෙන් දෙකැබිලිව වැද හොත්තා දැක මා කීවා නොකොට මළෝයයි දර ගෙණවුත් දරසෑයක් බැඳ ආචාරීන් දවා වනපසමලින් පූජාකොට ඉදිරියේ යන තැනැත්තෝ ජීවිතක්ෂයට පැමිණියා වූ පන්සියයක් දෙනා හා එයින් මත්තෙහි දෙසියපණස් දෙනෙකැයි මෙම ක්‍රමයෙන් කෙළවර දෙදෙනකු ජීවිතක්ෂයට පැමිණියවුන් දැක මෙසේ සීතුය. මේ දෙදෙනෙකුගෙන් උනුවූ පුරුෂයෝ දහසක් විනාශයට පැමිණියෝය. අනිකුත් සොරුදෙදෙනෙකු වියයුතුය ඔහු දෙදෙනත් වස්තු වෙන් හැම්මීගත නොහෙති දූන් උන් කොයි ගියෝ දෝහෝයි කියා ඉදිරියේ යන්නාවූ මහබෝසතානෝ ඔවුන් දෙදෙනා ධනය ඇරගෙණ කැලේට වන් මග දැක පාදානුසාරයෙන් ගිය තැනැත්තෝ පොදිබැඳ තිබූ වස්තු රාසිය දැක එකක්හු බත්තලිය මත්තෙ වැටි මළ තැනැත්තහු දැක ඉක්බිත්තෙන් මොහුන් විසින් මෙනම් දෙයක් කරණලදැයි සියල්ල නුවණින් දැක ඒ පුරුෂයන් දූන් කොයි ගියේ වේ දෝහෝයි පරීක්ෂා කොට සොයන තැනැත්තෝ ඔවුන් මුවාතැනක දමනලද්දාහු දැක අපගේ ආචාරීහු මා කීවා නොකොට තමන් නො කීකරු බැවින් තුමුත් විනාශයට පැමිණියෝය. උන් විසින් අන්‍ය වූ දහසක් පුරුෂයෝ විනාශයට පමුණුවන ලද්දාහුය. එසේ හෙයින් ඒකාන්තයෙන් උපායක් නැතිව නිස්කාරණයෙහි තමන්ට අභිවෘද්ධියක් ප්‍රාර්ථනා කරන්නාවූ සත්වයෝ ආචාරීන් මෙන් මහත් වූ විනාශයට පැමිණෙති සිතා තවද මෙසේ මහබෝසතානෝ යම්සේ අපගේ ආචාරීන් උපායක් නැතිවම අස්ථානයේ උපායක් නැති වීර්යය කෙරෙමින් ධනවර්ෂා වස්වා තුමුත් ජීවිතක්ෂයට පැමිණියෝද අනුන්ටත් ජීවිත විනාශයට ප්‍රත්‍යය වූ ද ඒපරිද්දෙන්ම යම් අනිකුත් සත්වයෙක් උපායෙක් නැතිව තමාට වස්තු කැමතිව විර්ය කෙරෙත්නම් සර්වප්‍රකාරයෙන් තෙමේත් නස්නේය අනුන්ටත් විනාශයට ප්‍රත්‍ය වන්නේ යයි වනය එකනින් නාදකොට දෙවියන් සාධුකාරදෙමින් සිටියදී ධර්මදේශනාකොට උපායෙන් ඒ වස්තුව තමන් වහන්සේගේ ගෙට ගෙන්වා ගෙණ දානාදී වූ පින්කම් කෙරෙමින් ආයු පමණින් සිට ජීවිතාන්තයෙහි ස්වර්ගලෝකයට ගියාහුය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මහණ තා දුර්වවුයෙහි දූන් මතු නොවෙයි පෙරත්දුර්වවු බැවින් මහත් විනාශයට පැමිණියෙහි වේදැයි වදාරා මේ දේශනාව ගෙණහැර දක්වා වදාරා මේ වේදබ්භ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි වේදබ්භ බ්‍රහ්මණයා නම් දූන් මේ නොකීකරු මහණය, අන්තේවාසික වූයෙම් තිලොගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මහාශීලව ජාතකය

තවද එක් සමයෙක්හි මහපොළොව සේ විපුල වූ ගුණ ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වසන සේක් පසුබට විර්ය ඇති එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළ සේක. සර්වඥයන් වහන්සේ ඕහට සැබෑද මහණ තෝ පසුබට වීර්යය ඇත්තෙහිදැයි විචාරා එසේය ස්වාමීනි කී කල්හි මහණ තෝ කවර කාරණයකින් මෙබඳු නෛර්යානික ශාසනයෙහි මහණව වීර්යය හැරපුයෙහිද පෙර නුවණැත්තෝ රාජ්‍යයෙන් පිරිහීත් තමන්ගේ වීර්යයෙහි සිට නටුවාවුත් යසස ඉපදවූවෝම වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස  බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණ ලද බෝධිසම්භාර ඇති අප මහා බෝසතානෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්තුය. ඒ බෝධිසත්වයන්ට නම් තබන දවසේ ශිලවකුමාරයෝයයි නම් තුබූහ. සොළොස් ඇවිරිදි වයසෙහි දීම සියලු ශිල්පයෙහි කෙළ පැමිණ මෑතභාගයෙහි පියනන්ගේ ඇවෑමෙන් රාජ්‍යයයෙහි පිහිටා මහාශිලාව රජ්ජුරුවෝයයි මෙනමින් ප්‍රසිද්ධ වූය. ධර්මිෂ්ඨයෝය ධර්මයෙන් රාජ්‍යය කෙරෙති ඒ රජ්ජුරුවෝ නුවර සතරවාසල් දොරය නුවර මධ්‍යයෙහිය තමන්ගේ මාලිගාව සමීපයෙහි යයි දන්හල් කරවා දුගී මගී යාචකයන්ට දන්දෙති නිරන්තරයෙන් පන්සිල් රකිති. පොහොය පෙහෙවස්  වෙසෙති. ක්‍ෂාන්ති මෛත්‍රී කරුණාවෙන් යුක්තව ඇකයෙහි උන් දරුකෙණෙකුන් නලවා සතුටුකරන්නාක්මෙන් සියලු සත්වයන් සතුටුකරවමින් දැහැමෙන් රාජ්‍යය කෙරෙති එකල රජ්ජුරුවන්ගේ එක් අමාත්‍යයෙක් අන්තඃපුරයට වැද මෑතභාගයෙහි තමා කළ කාර්යයන් ප්‍රසිද්ධ විය. අමාත්‍යයෝ රජ්ජුරුවන්ට එපවත් දැන්වූය. රජ්ජුරුවෝ පරීක්ෂා කරන්නාහු තුමුම ප්‍රත්‍යක්ෂකොට ගෙණ ඒ අමාත්‍යයා කැඳවා කියන්නේ නුවනැනි තා විසින් නොකලමනා දෙයක් කරණ ලද තෝ මාගේ විජිතයෙහි වසන්නට නුසුදුසුයෙහිය. තාගේ වස්තුවත් පුත්‍රදාරා වනුත් හැරගෙණ අනික් තැනකට පලායායි කියා රටින් නෙරපූය. ඒ අමාත්‍යයා කසී රටින් නික්ම ගොස් කොසොල් රජ්ජුරුවන්ට සේවයකරන්නේ ක්‍රමයෙන් රජ්ජුරුවන්ට අභ්‍යන්තරව විස්වාසවීය එතෙම එක්දවසක් කොසොල් රජ්ජුරුවන්ට කියන්නේ රජ්ජුරුවන් වහන්ස ඉතා මොලොක්සේක. ස්වල්ප වූ සේනාවකින් බරණැස්නුවර රාජ්‍යය හැරගන්නට පිළිවන් වන්නේයයි කිය. රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා බරණැස් නුවර රාජ්‍යය නම් මහත් වන්නේය. මේ තෙමෙත් ස්වල්ප වූ බලවාහණයකින්ම රාජ්‍යය ගන්ට පිළිවනැයි කිය කිමෙක්ද මේ රජ්ජුරුවන්ගෙන් එව් චරපුරුෂයෙක් දෝහෝයි සිතා තෝ චරපුරුෂයෙක්දැයි කිවුය. රජ්ජුරුවන් වහන්සෙ මම චර පුරුෂයෙක් නොවෙමි ඇත්තම කියමි ඉදින් මාගේ බස් නො අදහනසේක්වී නම් මනුෂ්‍යයන් යවා පසල් දනව්වෙන් ගමක් නසාපුව මැනව ඒ ගම් පහරණ මනුෂ්‍යයන් අල්වාගෙණ තමන්වහන්සේ සමීපයට ගෙණගිය කල්හි වස්තුදීලා හැරපියනසේකැයි කිය. එබස් ඇසූ රජ්ජුරුවෝ මේ තෙම ඉතා නිර්භීතව කියන්නේ වන්නාට පරීක්ෂා කෙරෙමියයි සිතා තමන් පුරුෂයන් යවා පසල් දනව්වෙන් ගමෙක මිනිමරවා කොල්ලකැවුය. ඒ පසල්දනව්වේ මනුෂ්‍යයෝ මිනීමරු සොරුන් දැක දරුවෙනි කවර කාරණයකින් ගම් පැහැරුදැයි විදාළෝය. ස්වාමීනි ජීවත්ව ගතනොහි ගම් පැහැරුම්හයි  කී කල්හි එසේ කල කුමක් නිසා මෙතෙක් කල් මා සමීපයට නො ආවාද දැන් මෙවක් පටන් මෙබන්දක් නොකරවයි කියා ඔවුන්ට සම්පත් දී අළුවාහුය ඒ මනුෂ්‍යයෝ ගොස් කොසොල් රජ්ජුරුවන්ට එපවත් දැන්වූහ. ඒ රජ්ජුරුවෝ මෙපමණකිණුත් යා නොහි නැවත මධ්‍යයේ ජනපදයක් පැහැරවූය.  ඒ සොරුන්ටත් බරණැස් රජ්ජුරුවෝ පළමු පරිද්දෙන්ම සම්පත් යැවූය. කොසොල් රජ්ජුරුවෝ පෙම මණකිණුත් නො ගොස් නැවත පුරුෂයන් යවා විථිමධ්‍යයෙහි මිනී මරවා කොල්ලකැවුය. රජ්ජුරුවෝ ඒ සොරුන්ටත් සම්පත් දී යව්වාහුය. එකල්හි කොසොල් රජ්ජුරුවෝ ඉතා ධර්මිෂ්ට රජ්ජුරුකෙණෙකැයි දැණ බරණැස් රාජ්‍යය ගනිමියි සේවාවාහණ ගොණ නික්මුනාහුය. එසමයෙහි වනාහී බරණැස් රජ්ජුරුවන්ගේ මතහස්තිරාජයානුදු අභිමුඛව එනකල්හි පිටිපෑ පලා නොයන්නාහු ස්වභාව ඇති සියදහස් ගණන් අකුණු ගසන කල්හිත් තැති නොගන්නා වූ ස්වභාව ඇති ශිලව මහරජ්ජුරුවන්ගේ අභිප්‍රාවක් ඇති කල්හි දියළු දඹදිව රාජ්‍යය ඇරගන්නට සමර්ථ වූ දහසක් පමණ ඔවුනොවුන් හැර වෙන්ව පලානොයන්නාවූ උත්තම මහායෝධයෝ ඇත.  ඔහු හැමදෙනම කොසොල් රජ්ජුරුවෝ යුද්ධයටයෙති අසා තමන්ගේ රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නෝ කොසොල්  රජ්ජුරුවන් වහන්සේ බරණැස් නුවර රාජ්‍යය ගනිමියි එනසේක. ස්වාමීනි යම්හ උන්වහන්සේ අපගේ රාජ්‍යය සීමාවට බැස්ස නොදීම තලාපියා අල්වාගනුම්හයි කිය. ඒ අසා රජ්ජුරුවෝ ම නිසා දරුවෙනි අනුන්ට පීඩා කිරීමෙන් ප්‍රයෝජන නැත. රාජ්‍යය කැමති කෙණෙක් ගනිත්වයි එසේහෙයින් තොපි ඇමනොයවයි වැලකූය. කොසොල් රජ්ජුරුවෝ සීමාව ඉක්ම දනව් මධ්‍යයට වන්නාහුය. අමාත්‍යයෝ නැවතත් රජ්ජුරුවන් කරා ගොස් එසේම කීවාහුය. රජ්ජුරුවන් පළමු පරිද්දේන්ම වැලකූය. කොසොල් රජ්ජුරුවෝ පිටිනුවර සිට රාජ්‍යය හෝ දෙත්වයි යුද්ධ හෝ කෙරෙත්වයි කියා ශිලව මහරජ්ජුරුවන්ට අසුන් යවුය. රජ්ජුරුවෝ ඒ අසා මා හා සමග කරන්නා වූ යුද්ධයක් නැත. රාජ්‍යය ගන්නාසේක්වයි කියා පෙරලා අසුන් යැවූය. නැවතත් අමාත්‍යයෝ රජ්ජුරුවන් කරා ගොස් කියන්නෝ රජ්ජුරුවන් වහන්ස අපි කොසොල් රජ්ජුරුවන් නුවරට වැද්දනොදෙම්හයි පිටිනුවරදී තලාපියා අල්වාගනුම්හයි කිවුය. රජ්ජුරරුවන් පළමු පරිද්දෙන්ම වලකා නුවර වාසල් දොරහරවා අමාත්‍යයන් දහසක් දෙනා සමග ප්‍රාසාදයේ මතු මහල්තලයෙහි සිංහාසනමස්තකයෙහි උන්නාහුය. කොසොල් රජ්ජුරුවෝ මහත් වූ සේනා වාහන හා සමඟ බරණැස් නුවරට වන්නාහු ඒ කොසොල් රජ්ජුරුවන්ගේ මාලිගා දොර සමීපයට ගොස් අමාත්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුව නොවසන ලද දොර ඇති මාලිගාවෙහි සරහා පිළියෙල කරණ ලද මතුමහල්තලයට නැගී උන්නා වූ නිරපරාධව ශිලව මහරජ්ජුරුවන් අමාත්‍යයන් දහසක් දෙනා හා සමඟ අල්වා යවා මේ රජ්ජුරුවන් අමාත්‍යයන් දහසක් දෙනා හා සමග පිටිතල හයා බැඳ අමුසොහොනට ගෙණ ගොස් කරවටක් පමණ වලකැන යම්සේ එකෙකුත් අතක් ඔසවන්නටත් අසමර්ථ නම්

SANHIDA LANKA

ඒපරිද්දෙන් පස්ලා වලලා ලව රාත්‍රියෙහි සිවල්ලු අවුත් මොවුන්ට කලමනා දෙයක් කරන්නෝවේදැයි කිවුය. මනුෂ්‍යයෝ සතුරු රජ්ජුරුවන්ගේ බස් අසා රජ්ජුරුවන් හා සමග අමාත්‍යයයන් දහසක් දෙනා පිටිතල හයා බැඳ පිටත් කළාහ. එකල්හි ශිලව මහරජ්ජුරුවෝ සතුරු රජ්ජුරුවන් කෙරෙහි ආඝාත පමණකුත් නොකළෝය. ඒ අමාත්‍යයන් දහස්දෙනා මෙසේ බැඳලා ගෙණ යනකල්හි රජ්ජුරුවන්ගේ වචනය ඉක්ම පවත්වන්නට අසමර්ථ කෙණෙක් නම් නුවූයේය. මෙසේ ඒ මහා බෝධිසත්‍වානන්ගේ පර්ෂිද් ඉතාවිනීත පර්ෂිද් වන්නේය. ඉක්බිත්තෙන් ඒ සතුරු රජ්ජුරුවන්ගේ රාජපුරුෂයෝ අමාත්‍යයන් සහිතවූ ශිලව රජ්ජුරුවන් මධ්‍යයෙහි අවශේෂ අමාත්‍යයන් දෑලයෙහියයි දහසක් දෙනාම වලටබා පස්ලා ඝනකොට පස්තලා ගියාහුය. එකල්හි ශිලව රජ්ජුරුවෝ අමාත්‍යයන් බණවා කියන්නෝ සතුරු රජ්ජුරුවන් කෙරෙහි කෝපයක් නො කොට මෛත්‍රී කරවයි අවවාද කළෝය. ඒකල මධ්‍යම රාත්‍රිවේලේ මනුශ්‍ය මාංශ කම්හයි කැනහිල්ලු ආවාහුය. ඔවුන් දැක රජ්ජුරුවන් හා අමාත්‍යයෝ එකපැහැරම හඬ ගැසුය. කැනැහිල්ලු හයින් ත්‍රස්ථව පලාගියාහුය. නැවත ඔහු පෙරලාසිට බලන් නාහු පස්සෙහි එනකෙනෙකුන් නැති නියාව දැන නැවත ආපසු ගියෝය. වල තල මනුෂ්‍යයෝ පළමු පරිද්දෙන්ම අඬගැසූය. මෙසේ තුන්වාරයක් පළාගොස් නැවත පෙරලා සිට බලන්නාහු ඔවුන් අතුරෙන් එකෙකුවත් නොඑන නියාව දැන මොහු වධයට පැමිණියෝ වනැයි බුහුටිව පෙරලා අවුත් නැවත දහසක් දෙනා අඬගසමින් සිටියදීත් පලානොගියාහුය. ප්‍රධාන කැනහිලා රජ්ජුරුවන් කරා ගියේය. අවශේෂයෝ සෙසු අමාත්‍යයන් සමීපයට ගියෝය. උපායෙහි දක්ෂ වූ රජ්ජුරුවෝ ඔහු තමන් සමීපයට එන නියාව දැනහන්ට අවසරදෙන්නාක් මෙන් කර ඔසවා ඔහු යට උගුර ඩැහැගත්තාහ. නිකටින් ඇදයන කල මිරිකාගන්නාක් මෙන් තරකොට මිරිකාගත්තුය ඇත්බල ඇති රජ්ජුරුවන් විසින් නිකටින් ඇද ග්‍රීවයෙන් තරකොට මිරිකාගන්නා ලද කැනහිලා තමා ගලවාගන්ට අසමර්ථව මරණ හයින් හයපත්ව මහ හඬින් හැඬුයේය. සෙසු කැනහිල්ලු ඔහුගේ බැගෑ අඬ අසා එක් පුරුෂයක්හු විසින් අල්වාගන්නා ලද්දේ වනැයි අමාත්‍යයන් සමීපයට වදනට අසමර්ථව මරණ හයින් හයපත්ව ඇමදෙනාම පළාගියාහ. රජ්ජුරුවන්ගේ නිකටින් තරකොට ගන්නාලද කැනහිලා ඈත මෑත ගැසෙන්ට වන්කල්හි පස් සීතලව ගියේය. ඒ කැනහිලාත් මරණ හයින් හයපත්ව සතරකකුලෙන් රජ්ජුරුවන්ගේ ලය ශරීරයේ පස් පසුරුගා ඉවත් කෙළේය, රජ්ජුරුවෝ සීථල වූ නියාව දැන කැනහිලා හැර ඇත්බල ඇති ශක්ති සම්පන්න තැනැත්තෝ ඔබිමොබ කැරකැවී දෙපිටට නැමී දෑත ඔසවා මුවවිට එල්බ සුලගින් කඩා දැමූ වලාකුලක්මෙන් වලින් ගොඩ නැගී සිට අමාත්‍යයන් අස්වසා පස්පීරා සියල්ලවුන් ගොඩනගා අමාත්‍යයන් විසින් පිරිවරණලදුව අමුසොහොනෙහි සිටියාහු එසමයෙහි මනුෂ්‍යයෝ මළ මිනියක් අමුසොහොනට ගෙණ ගොස් දමන්නාහු යක්ෂයන් දෙදෙනෙකුගේ සීමා මධ්‍යයට දැමූය. ඒ යක්ෂයෝ දෙදෙන මිනිය බෙදාගතනොහී අපි මේ මිනිය බෙදාගත නොහෙම්හ. මේ සීලව රජ්ජුරුවන් වහන්සේ ධර්මිෂ්ට සේක. උන් වහන්සේ අපට බෙදා දෙන සේක. ඒ රජ්ජුරුවන් වහන්සේ සමීපයට යම්හයි ඒ මළ මිනිය දෙකකුල අල්වාගෙණ රජ්ජුරුවන් සමීපයට ගොස් රජ්ජුරුවන් වහන්ස අපට මේ මිනිය බෙදාදුන මැනවයි කීය. එකල බෝධිසත්වයෝ කියන්නෝ පින් වත් වූ යක්‍ෂයනි. මම තොපට මේ මිනිය බෙදාදෙමි මම වූකලී පිරිසිදු නොවෙමි එසේ හෙයින් පළමුකොට නාමියි කිවුය. යක්ෂයෝ සතුරු රජ්ජුරුවන්ට තිබූ සුවඳ කැවූ පැන් තමන්ගේ ආනුභාවයෙන් ගෙණවුත් රජ්ජුරුවන් නාන පිණිස දුන්නුය. ඉස්නානය කොට සිට රජ්ජුරුවන්ට සතුරු රජ්ජුරුවන්ගේ පත්කොටු තුබූ සළුවක්ගෙණවුත් දුන්හ. ඒ සළු ඇඳගෙන සිටියාවූ රජ්ජුරුවන්ට සිව්දැගඳ කරඬුවක් ගෙණ දුන්හ. සුවඳ විලවුන් ගල්වා සිටි රජ්ජුරුවන්ට රන්කරඬුවේ ලා මැනික් තල්වැට මත්තේ තුබූ නොයෙක් මල් ගෙනවුත් දුන්හ. මල් පැලඳ සිටි රජ්ජුරුවන්ට අනික් කුමක් කරමෝදැයි විචාලෝය. රජ්ජුරුවෝ තමන්ට සය ඇතිනියාව ඇඟවූය. යක්ෂයෝ ගොස් සතුරු රජ්ජුරුවෝ තමන්ට සය ඇතිනියාව ඇඟවූහ. යක්ෂයෝ ගොස් සතුරු රජ්ජුරුවන්ට පිස තබනලද නොයෙක් අග්‍රරසයෙන් යුක්ත වූ භෝජන ගෙණවුත් දුන්හ. රජ්ජුරුවෝ නාහා සුවඳ විලවුන් ගල්වා සැරහී සැදී පැහැදී සිටිතැනැත්තෝ අනෙකප්‍රාකාරවූ අග්‍රරසයෙන් යුක්ත වූ භෝජනය අනුභව කළෝය. යක්ෂයෝ සතුරු රජ්ජුරුවන්ට තුබූ සුවඳකැවූ පැන් ස්වර්ණ භිංකාර යෙන් රන්තැටිය හා සමග ගෙණාවාහුය. ඉක්බිත්තෙන් බෝධිසත්වයෝ පැන් බී මුඛය සෝදා අත සේදූකල්හි සතුරු රජ්ජුරුවන්ට සපයන ලද පස් පලාවතින් යුක්ත වූ බුලත් ගෙණවුත් දුන්හ. බුලත් කා සිටි කල්හි අනෙක් කුමක් කරමෝදැයි විචාළෝය. නැවත ගොස් සතුරු රජ්ජුරුවන්ගේ ඉස්දොර තුබූ මඟුල් කඩුව ගෙනෙවයි කිවුය. ඒ මගුල්කඩුවත් ගෙනාවාහුය. රජ්ජුරුවෝ කඩුවගෙණ එම මිනිය කෙළින් සිටුවා ඉස්මුදුනෙහි කඩුවෙන් ගසා දෙකක් කොට පලා යක්‍ෂයන් දෙදෙනාට සමබෙත්මෙන් බෙදා දුන්නාහුය. ඒ කඩුව සෝදා කොපුවේ ලා උරයේ බැඳ එල්වාගෙණ සිටියාහුය. ඉක්බිත්තෙන් ඒ යක්ෂයෝ මනුෂ්‍ය මාංස කා බඩපුරාගෙණ සතුටුවූ සිත් ඇතිව සිටියාහු රජ්ජුරුවන් වහන්ස නුඹ වහන්සේ ට අනික් කුමක්කරමෝදැයි විචාළෝය. ඒ සේ වී නම් තෙපි තොපගේ ආනුභාවයෙන් මා ගෙණගොස් සතුරු රජ්ජුරුවන්ගේ ශ්‍රී යහන් ගබඩාවේ බා සිටුවාලවයි මේ අමාත්‍යයන් ගෙණගොස් තම තමන්ගේ ගෙයි සිටුවාලවයි කිවුය. ඒ යක්ෂයෝ දෙදෙන යහපති ස්වාමීනි කියා ගිවිස එපරිද්දෙන්ම කළාහුය. එසමයෙහි රජ්ජුරුවෝ සරහන ලද ශ්‍රී යහන් ගබඩාවේ ශ්‍රී යහන් මස්තකයෙහි වැදහෙව නිදන්නාහුය. රජ්ජුරුවෝ සතුරු රජ්ජුරුවන් නිදිමත්ව නිදන තැනැත්තන්ගේ බඩට කඩුපතින් ගැසූය. ඒ රජ්ජුරුවෝ හයින් ත්‍රස්තව පිබිද ප්‍රදීපාලෝකයෙන් සීලවමහ රජ්ජුරුවන් හැඳින යහනින් නැගී ධෛර්යය උපදවාගෙණ සිට රජ්ජුරුවන්ට මෙසේ කිවුය. මහරජ්ජුරුවෙනි මෙබඳු වූ රාත්‍රියෙහි ගනනා ලද රැකවල් ඇතිව වසන ලද දොර ඇති මේ ප්‍රාසාදයෙහි රැකවල් මනුෂ්‍යයන්ගෙන් අවසරයක් නැත්තාවූ ස්ථානයෙහි කඩුව අල්වාගෙණ ස්වර්ණාභරණයෙන් සැරහී කෙසේ නම් තොපි මේ යහන් මත්තට අවුදැයි කීය. එබස් ඇසූ සීලව මහා රජ්ජුරුවෝ තමන් ආ සැටිය විස්තර කොට කීවාහුය. එබස් ඇසූ සතුරු රජ්ජුරුවෝ කලකිරුණාවූ සිත් ඇති මහරජ්ජුරුවෙනි මම මනුෂ්‍යාව සිටත් තොපගේ ගුණය නොදත්මි අනුන් ඇඟ වෙර ලේ මස් කන්නා වූ චණ්ඩ පරුෂ වූ යක්ෂයන් විසින් තොපගේ ගුණ දන්නා ලද රජ්ජුරුවෙනි දැන් මම මෙබඳු

SANHIDA LANKA

වූ සීල ගුණයෙන් යුක්තවූ තොප කෙරෙහි ද්‍රෝහයක් නොකරමි කඩුව ගෙණ සපථ කොට රජ්ජුරුවන් ක්‍ෂමා කරවා මහයානේ සතපවා තුමූ කුරු යහනෙක වැදහෙව පාන්වගියකල හිරුනැගි කල්හි බෙරලවා සියලු සේවාන හා අමත්‍ය බ්‍රාහ්මණ ගෘහපතීන් රැස්කරවා ඉදිරියේ ආකාශයෙහි පුන්සඳ මණ්ඩප ඔසවා පාන්නාක්මෙන් සීලව රජ්ජුරුවන්ගේ ගුණ කියා පර්ෂිත් මධ්‍යයෙහි දීම නැවත රජ්ජුරුවන්  ක්‍ෂමා කරවා රාජ්‍යය පාවාදී මෙතැන්පටන් නුඹ වහන්සේ උපන්නාවූ සතුරන්ගෙන් උපද්‍රවයෙක් ඇත්නම් මටභාර වන්නේය. මාගත් රැකවලින් නුඹ වහන්සේගේ රාජ්‍ය ශ්‍රී අනුභව කොට වදාළ මැනවයි කියා කේලාම් කී තැනැන්තවුන් රාජාඥාකොට තමන්ගේ සේනා වාහණ ගෙණ ස්වකීයවූ රාජ්‍යයටම ගියෝය. සීලව රජ්ජුරුවෝත් ස්වර්ණාභරණයෙන් සැරහී ධවල ඡත්‍රයට සරහන සරහ මෘගයන්ගේ කකුල් බඳුවූ පා ඇති ස්වර්ණ පර්යංකයේ හිඳ තමන්ගේ සම්පත්තිය බලා මෙබඳු සම්පත්තියත් අමාත්‍යයන් දහසක් දෙනාගේ ජීවිත ප්‍රතිලාභයත් මා විර්යනොකළ කල්හි කිසිවෙක් සිද්ධනොවන්නේ වේදැයි වීර්ය බලයෙන්ම මම නටුවාවූ යසසත් ලදිමි. අමාත්‍යයන් දහස්දෙනාට ජීවිත දානයත් දිනිමි. ඒ කාන්තයෙන්ම ප්‍රාර්ථනා කළ වස්තුවෙහි ආලය නොහැර වීර්යය කටයුත්තේය. කාළවූ වීර්යය ඇති සත්වයාහට විපාකනම් මෙසේ සමුර්ධි වන්නේයයි සිතා තවද ඒ මහබෝසතානෝ පින්වත්නි සිල්වතුන්ගේ වීර්යයෙහි ඵලනම් මෙසේ සමුර්ධි වන්නේයයි උදන් අනා දිවිපමණින් කුසල්කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව  ගියෝය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණ හැරදක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශ කළ සේක. චතුස් සත්‍යයාගේ කෙළවර පසුබට විර්ය ඇති භික්ෂූන් වහන්සේ අර්හත්ඵලයෙහි පිහිටිසේක. සර්වඥයන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ මහසීලව ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි දුෂ්ට වූ අමාත්‍යයා නම් දැන් මේ දේවදත්ත ස්ථවිරයෝය. දහසක් අමාත්‍යයෝ නම් දැන් බුදුපිරිස්ය. මහසීලව රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# තයෝධර්ම ජාතකය

තවද එක් සමයෙක්හි රාගාධිසංග රහිත වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සේක් දේවදත්ත ස්ථවිරයන් වහන්සේගේ වධයට උත්සහ කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරණ කල්හි දේවදත්ත ස්ථවිරයෝ වානර යෝනියෙහි ඉපිද හිමාල වන ප්‍රදේශයෙහි වානර සමූහයා පරිහරණය කරන්නාවූ තමන් නිසා උපන්නාවූ වානර පෝතකයන් මොහු වැඩීගිය කල වානර සමූහයා පරිහරණය කෙරෙති යන හයින් දතින්ඩෑ ඔවුන්ගේ බීජොත්පාටනය කරන්නාහුය. එසමයෙහි බෝධිසත්වයෝත් එම වානරයා නිසා එක් වැඳිරියක කුස පිළිසිඳගත්තාහුය. එකල වැඳිතොමෝ දරුගැබ පිහිටි නියාව දැන තමාගේ දරුගැබ රකිමින් අනික් පර්වත ප්‍රාන්තයට ගියාය. ඕතොමෝ ගැබ මුහුකුරා ගිය කල්හි බෝධිසත්වයන් වැදූහ. බෝධිසත්වයෝ වැඩී විඥාබවට පැමිණ ශක්ති සම්පන්නවූය. ඒ බෝධිසත්වයෝ එක් දවසක් මැනියන් අතින් මාගේ පියානන් වහන්සේ මැනියෙනි කොයිදැයි විචාළෝය. පුත අසවල් පර්වත ප්‍රාන්තයෙහි වදූරුමුල රකිමින් වෙසෙති කිව, මැනියෙනි ඒ වානර රජ්ජුරුවන් සමීපයට මා ගෙණයවයි කිවුය. පුත තොප විසින් පියානන් සමීපයට යන්ට නොපිළිවන, තොපගේ පියානෝ තමන් නිසා උපන්නාවූ වානරපෝතකයන්ගේ වඳුරුමුල පරිහරණය කෙරෙත් යන හයින් තින් ඩෑ බීජොත්පාටනය කෙරෙති කිවුය. මැනියෙනි මා එතනට ගෙණයව මම ඊය කටයුතු දන්නෙම් වේදැයි කී කල්හි ඒ වැඳිරි තොමෝ පුත්‍රයා වඩාගෙණ ඒ වානරයා සමීපයට ගියාය. එකල වානරයා තමාගේ පුත්‍රය දැකලාම මෙතෙම වැඩීගියේ වීනම් වඳුරුමුල පරිහරණය කළ නොදෙති, එසේහෙයින් දැන්ම මොහු දුරුකොට පියායුතුයි ඔහු වැලඳගන්නාක් මෙන් තරකොට මැඩලුයේය. බෝධිසත්වයෝ වූ කලී ඇත් බල හා සමාන වූ බල ඇත්තෝය. එසේහෙයින් බෝධිසත්වයෝත් පිය වඳුරු අල්වා තරකොට මැඩලූය. ඔහුගේ ඇඟ ඇට බිඳියන්නාක්මෙන් විය. ඉක්බිත්තෙන් ඒ වානරයාට මෙසේ සිතිවිල්ලෙක් විය. මේ තෙම වැඩිවීගියේ වීනම් මා මරන්නේය, කවර උපායකින් පළමු කොට මොහු මරාපියම්දෝහෝයි සිතීය. තවද මෙසේ සිතීය මට නුදුරුතෙන රාක්ෂාධිගෘහිතවූ විලෙක් ඇත. ඒ විල රාක්ෂසයා ලවා මොහු කවමියි සිතා ඉක්බිත්තෙන් ඕහට කියන්නෝ මම මහළු වයසට යෙමි මේ වඳුරුමුල තොපට පාවාදෙමි. අදම තොප රජකෙරෙමි, අසවල් තැන විලෙක් ඇත. ඒ විල ඇඹුල වන දෙකකුත් ඉපුලවන තුනකුත් නෙළුම්වන පසකුත් පිපෙන්නේය. එයින් මල් ගෙණවයි කිය. මහබෝසතානෝ යහපත පියානන් වහන්ස ගෙණෙමි කියා ගොස් වහා විලට නොබැස හාත් පසින් පියවරසටහන් පරික්ෂාකන්නෝ බට පියවර දුටුය. විළින් ගොඩනැගී පියවර නොදුටුය. බෝධිසත්වයෝ මේ විල රාක්ෂාධිගෘහිත විය යුතුය. මාගේ පියානන් වහන්සේ මා මරණුකැමතිව තමන්වහන්සේ මරාගතනොහි රාක්ෂසයා ලවා මරවනු කැමැතිසේවනැයි සිතා මේ විලට නොබස්මි. මළුත් කඩාගනිමියි පැන්නැති තෙනට ගොස් වේග දක්වා උඩපැන එපිට යන තැනැත්තෝ පැන් නැති ආකාශයෙහිම සිටියා වූ මල් දෙකක් කඩාගෙණ එපිට වැටිගියෝය. නැවත එතරින් මෙතර පැන එන තැනැත්තෝ ඒ උපායෙන්ම මල් දෙකක් කඩාගත්තුය. මෙසේ විල්දෙතෙර රැස්කරන්නා වූ බෝධිසත්වයෝ මළුත් කඩාගත්තුය. රාක්ෂයාගේ ආඥාව පවත්නා තැනටත් නොබටුය. ඉක්බිත්තෙන් මෙතැකින් වඩා ඔසවාගත නොහැක්කේයයි සිතා ඒ කැඩූ මල් එක්තෙනක රැස්කරමින් සිටිකලට ඒ රාක්ෂයා සිතන්නේ මා විසින් මෙතෙක් කල් මුළුල්ලෙහි මෙබඳු නුවණැති ආශ්චර්යමත් පුරුෂයෙක් දුටුවිරු නැත, මළුත් තමා කැමති පමණක් කඩාගෙණ මාගේ ආඥාව පවත්නාතෙනටත් නොබටුයේයයි දිය දෙබෑකොට දියෙන් ගොඩනැගී බෝධිසත්වයන් සමීපයට ගොස් කියන්නේ වානරෙන්ද්‍රය මේ ලෝකයෙහි සම්ප්‍රාප්ත වූ හය දුරුකිරීම දන්නා වූ ප්‍රඥාසම්ප්‍රයුක්ත වූ උත්තම වූ විර්යය නිර්භීතබවය උපාය ප්‍රඥාය යන මේ ධර්මයෝ තුන්දෙන යමහක්හට ඇත්තාහූ වී නම් ඒ සත්වතෙමේ පසමිතුරන් මැඩපවත්නේය. ඒ ධර්මයෝ තුන් දෙනාම තොපගේ අභ්‍යන්තරයෙහි විද්‍යාමානයෝයයි සිතමියි මෙසේ උදාකරක්‍ෂසයා බෝධිසත්වයන්ට ස්තුති කොට මේ මල් කුමක් පිණිස ගෙණවුදැයි විචාළේය. මපියානන් වහන්සේ මා රජකරණු කැමති සේක. ඒ කාරණයෙන් ගෙණයෙමි කී කල්හි රාක්ෂසයා මෙබඳු උත්තම පුරුෂයෙක්හූ විසින් මල් ශඳඔසවාගෙන යන්ට නොපිළිවන, මම ගෙණයෙමි තෙමේ මේ මල් මිටිය ඔසවාගෙණ බෝධිසත්වයන් පසුපස්සෙහි ගියේය. ඉක්බිත්තෙන් බෝධිසත්වයන්ගේ පියවඳුරා එන්නා වූ බෝධිසත්වයන් දුරදීම දැක මම මොහු රකුසුවත් කන්නේයයි යැවිමි. ඒ තෙමේ දැන් රාක්ෂසයා ලවා මල් ගෙන්වාගෙණ එන්නේය. දැන්වූකලී නටුයෙම්වේදැයි සිතමින් සත්කඩක්කොට ලය පලාගෙණ එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියෝය. එකල්හි අවශේෂ වානරයෝ එක්ව බෝධිසත්වයන් රජ කළාහුය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ තයෝධර්ම ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි යුථපතිනම් දැන් දේවදත්ත ස්ථවිරය. එසමයෙහි යුථපති පුත්‍ර වූයේම් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජ වූ මම්ම වේදැයි. තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# අසාත මන්ත ජාතකය

තවද එක් සමයෙක්හි ස්වධර්මයෙහි අප්‍රතිහතවූ ඥානාචාර ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වසන සේක් උකටලී වූ භික්ෂුවක් හු අරභයා මේ ජාතකය වදාළ සේක. මෙහි වර්ථමාන කථාව උම්මදන්ති ජාතකයෙහි මතු පහළ වන්නේය.සර්වඥයන් වහන්සේ ඒ භික්ෂුහට මහණ මේ ලෝකයෙහි ස්ත්‍රීහු නම් දුක්ඛයට වස්තුහුය. අසත්පුරුෂයෝය, ලාමකයෝය, අන්තිමයෝය, තෝ එබඳු ලාමක ස්ත්‍රියක නිසා කවර කාරණයකින් උකටලීවූයෙහිදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ කල්හි අප මහාබෝසතානෝ ගන්ධාර රට තක්ෂලා නුවර බ්‍රාහ්මණ වංශයෙහි ඉපිද නුවණැති බවට පැමිණ වේදත්‍රයෙහිත් සියළු සිල්පයෙහිත් නිමාවට පැමිණ දිසාපාමොක් ආචාරීවූය. එසමයෙහි බරණැස්නුවර බ්‍රහ්මණ කුලකයක පුත්‍රයෙකු උපන් දවස්ම ගිනිගෙණ නොනිවාතිබුය. ඉක්බිත්තෙන් ඒ බ්‍රාහ්මණ කුමාරයා සොළොස්ඇවිරිදි වයසට පැමිණි කල්හි දෙමව්පියයෝ මෙසේ කිවුය, පුත අපි තොප උපන් දවස්ම ගිනිගෙණ තිබූම්හ, ඉදින් තෙපි බ්‍රහ්මලෝකයෙහි උපදනා කැමැත්තාහුවිනම් ගිනිගෙණ වලටවැද ගිනිදෙවියාට නමස්කාර කෙරෙමින් බ්‍රහමලෝක පරායනවව ඉදින් ගිහිව වසනු කැමැත්තාහුවිනම් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි ශිල්ප ඉගෙණ කුටුඹ සණ්ඨාපනය කරවයි කිවුය. මාණවකයා කියන්නේ මම වලගිනි පරිහරණය කරන්නට අසමර්ථියෙමි කුටුඹසණ්ඨාපණය කෙරෙමියි කියා දෙමාපියන් වැඳ ආචාර්යය කොට්ඨාසයයි කියන ලද මස්සෙන් දහසක් ගෙණ තක්සලා නුවරටගොස් ශිල්ප ඉගෙණ පෙරලා ආයේය. ඔහුගේ දෙමාපියෝ ගිහිගෙයි විසීමට නොකැමැත්තාහුය. වනයේ හිඳ ගිණිදෙවියාට පුජාකරණු කැමැත්තාහුය. එසේ හෙයින් එකල මාණවකයාගේ මව්තොමෝ ස්ත්‍රීන්ගේ දෝෂදක්වා වලටයවනු කැමැත්තී දිසාපාමොක් ආචාරීන්වහන්සේ නුවණැතිසේක, ව්‍යක්තසේක, මාගේ පුතනුවන්ට ස්ථීන්ගේ දෝෂ කියන්ට සමර්ථසේකැයි සිතා පුත තොප විසින් ශිල්ප උගන්නාලදැයි කිවුය. එසේය මෑනියන් වහන්සැයි කී කල්හි තොප විසින් අසාතමන්ත්‍රයෝත් උගන්නාලද්දාහුදැයි කිවුය. නැත මෑනියන් වහන්සැයි කී කල්හි ඉදින් තොප විසින් අසාතමන්ත්‍ර නොඋගන්නා ලද්දේ වීනම් තොප විසින් කවර නම් ශිල්පයෙක් උගන්නාලද්දේද යව යව අසාතමන්ත්‍රයත් ඉගෙණ එවයි කිවුය. ඒ මාණවකයා මෑනියන් කී බස් යහපතැයි පිළිගෙණ නැවත තක්සලා නුවරට අභිමුඛව ගියේය. ඒ ආචාරීන්ගේත් මෑනියෝ ඉතා වෘද්ධයෝය. අවුරුදු එක්සිය විස්සක් වයස් ඇත්තාහුය. දිසාපාමොක් ආචාරීහු තමන්ගේ මෑනියන් සිය අතින් නහවා කවා පොවා පෝෂ්‍ය කෙරෙති. අවශේෂ මනුෂ්‍යයෝ බෝධිසත්වයන් මෙසේ කරන්නා දැක පිළිකුල්වන්නාහුය. එකල මතබෝසතානෝ මෙසේ සිතූහ.  මම වලට වැද ඒ වනයෙහිදී මෑනියන් වහන්සේ පෝෂ්‍ය කෙරෙමින් විසුයේවීනම් යහපතැයි සිතුය. ඉක්බිත්තෙන් මහබෝසතානෝ මෙසේ සිතා එක් විවේකවූ වනයෙක්හි පැන්පාසුතැනක පන්සලක් කොට ගිතෙල් මී උක්සකුරු උඳු මුන් සාල් ආදීවූ දෙය ගෙණ්වාගෙණ මෑනියන් උසුළුවාගෙණ ඒ වනයට ගොස් මෑනියන් පෝෂ්‍ය කෙරෙමින් වාසය කළෝය. ඒ අසාතමන්ත්‍රය උගන්නා කැමති මානවකයාත් තක්සලානුවරට ගොස් ආචාරීන් නොදක්නේ ආචාරීන් වහන්සේ කොයිදැයි විචාරා එපවත් අසා වනයට ගොස් නමස්කාර කොට සිටියේය. එකල ඕහට ආචාරීහු කියන්නෝ කිමෙක්ද දරුව ඉතා වහා අවුනැයි කිවුය. එබස් ඇසූ මානවකයා කියන්නේ නුඹ වහන්සේ මා අසාතමන්ත්‍රය උගන්ටකීවෝ කවුරුදැයි විචාළෝය, ආචාරීන් වහන්ස මාගේ මෑනියන් වහන්සේ කීසේකැයි කීය. එකල බෝධිසත්වයෝ සිතන්නෝ මේ ලෝකයෙහි අසාතමන්ත්‍ර නම් දෙයක් නැත මේ මානවකයාගේ මෑනියෝ මෝහට ස්ත්‍රීන්ගේ දෝෂ දක්වනු  කැමැත්තෝවනැයි  සිතූය.

ඉකිබිති ඕහට මහබෝසතානෝ කියන්නෝ දරුව යහපත තොපට අසාත මන්ත්‍රය දෙමි අද පටන් කොට මාගේ තනතුරෙහි සිට මාගේ  මෑනියන් වහන්සේ සිය අතින් නහවා කවා පොවා පෝෂ්‍ය කරව අත පය හිස පිරිමැදීම පිටමැඩීම් ආදිය කරන්නාවූ තොපි ආර්යයන් වහන්සේ නුඹ වහන්සේ ජරාවට පැමිණිකල්හිත් නුඹවහන්සේගේ මෙබඳු යහපත් වූ සැරිරයන් වන්නේය. ලදරු අවස්ථාවෙහි වීනම් කෙබඳුවේදැයි කියව, අතපය මඩනා අවස්ථාවෙහිත් හස්තපාදාදීද්ගේ ගුණ කියව, තොපට මාගේ මෑණියන් වහන්සේ යමක් කීයේවිනම් එකීදෙය තෙපි ලජ්ජානොව මට කියව, එසේ කළානම් අසාතමන්ත්‍රය ලබව නොකළානම් නොලබනවාදැයි කිවුය. ඒ මානවකයා යහපත ආචාරීන් වහන්සැයි කියා මහබෝසතානන්ගේ වචනය පිළිගෙණ එතැන්පටන් කියනලද්දාවූ සියළුකාරිය කෙළේය. ඉක්බිත්තෙන් ඒ බෝධිසත්වයන්ගේ මෑනියන්ට ඒ මාණවකයා නැවත නැවත ශරීර වර්ණනා කරත් කරත් මේ තෙම මා හා සමග අභිරමණය කරණු කැමැත්තේවනැටි සිතා අන්ධ වූ ජරාවෙන් ජීර්ණ වූ බෝධිසත්ව මාතාවෝ එක්දවසක් තමන්ගේ ශරීර වර්ණනාව කරණු කල්හි ඒ මාණවකයාට කියන්නෝ මා හා සමග අභිරමණය කරණු කැමැත්තෙහිදැයි කිවුය. ආර්යයන් වහන්සේ මම වූ කලී කැමැත්තෙමි ආචාරින් වහන්සේ ගුරුසේක්වී දැයි කිය. ඉදින් තෝ මා කැමැත්තෙහිවීනම් මාගේ පුතනුවන් මරාපියයි කිවුය. මෙසේ කී කල්හි මාණවකයා කියන්නේ මම ආචාරීන් වහන්සේ සමීපයෙහි මෙතෙක් ශිල්ප ඉගෙණ ක්ලේශ මාත්‍රයක් නිසා කුමකැයි කියා ආචාරීන් වහන්සේ මරම්දැයි කිය, එසේ වීනම් ඉදින් තෙපි මා නොහැරනම් මම්ම ඒ දරුවන් මරමි කිවුය.

SANHIDA LANKA

මේ ලෝකයෙහි ස්ත්‍රීහු නම් අසත්පුරුෂයෝය. දුක්ඛයට වස්තුහුය. ලාමක යෝය. පශ්චිමයෝය. එබඳුවූ වයසෙහි සිට පවා රාගසිත් උපදවා කෙල්ශ වසඟවන්නී මෙසේ උපකාරී වූ පුත්‍රයා මරණු කැමැතිවුව එසේහෙයින් ස්ත්‍රීහු නම් අසත්පුරුෂයෝමය. ඉක්බිත්තෙන් මාණවකයා ඒ සියළු කථා බෝධි සත්වයන්ට කීයේය. එබස් ඇසූ මහබෝසතානෝ මානවකය ඒ සියළු ප්‍රවෘත්තිය මට කියන්නාවූ තා විසින් කලද ඉතා යහපත් වන්නේයයි කියා මෑණියන්ගේ

ආයුසංස්කාරය බලන තැනැත්තෝ අදම මියෙතියි දැන මානවකය මෙසේ උන්වහන්සේගේ අභිප්‍රාය පරීක්ෂාකරම්හයි එක් දිඹුල් දණ්ඩක් ගෙන්වාගෙණ සැස මහබෝසතානෝ තමන්ගේ ප්‍රමාණයෙන් කාෂ්ටරූපයක් කොට ඉස හා සමග පොරොව තමන් වැදහොත් තැන උත්තැනිකොට හොවා රැනක් බැඳ අතවැස්සාට කියන්නාහු දරුව පොරවක්ගෙණ ගොස් මාගේ  මෑනියන්වහන්සේට මාමෙතන වැදහොත් නියාව හඟවාලවයි කිවුය. එබස් ඇසූ මාණවකයා ගොස් ආර්යයන් වහන්ස ආචාරීන් වහන්සේ පන්සල තමන් වහන්සේ වැදහොනාතැන වැදහොත්සේක මා විසින් වැදහොත් තැන දැනගන්නා සඳහා රැනක් බැඳ තබනලද, මේ පොරව ඇරගෙණ උයනින් රැනසනින් ගොස් ඉඳින් පිළිවන්වී නම් පුතනුවන් වහන්සේ මරාපුව මැනැවයි කිය. එබස් ඇසූ බෝධිසත්ව මාතාවෝ මා නොහරණාව දැයි කිවුය. කවර කාරණයකින් මම නුඹවහන්සේ හැරපියම්දැයි කීය. එකල බෝධිසත්ව මාතාවෝ පොරව ඇරගෙණ වෙවුල වෙවුලා නැගීසිට රැන සංඥාවෙන් ගොස් අතින් අල්වා බලා මේ තෙම මාගේ පුතනුවෝයයි යන සංඥාවෙන් කාෂ්ටරූපයෙහි මුහුනින් වස්ත්‍රය ඉවත්කොට පොරොව ඇරගෙණ එකපහරින්ම මරම් සිතා බොටුවෙහිම පොරොව හෙලා ටැකැයි යන අනුකරණ ශබ්දය උපන්කල්හි දඹුරුවකැයි දත්තුය. ඉක්බිත්තෙන් මහබෝසතානන් විසින් ඉවතට මෑනියන් වහන්ස කුමක් කරණසේක්දැයි කී කල්හි  වඤ්චාකරණ ලද්දෙම් වෙමියි සිතා එතැන්හිම මිය ගියේය. තමන්ගේ පන්සල වැදහොත් නමුත් ඒ වෙලාවට උන් විසින් මළයුතුමයි එසේ හෙයින් මහබෝසතාණෝ මෑනියන් මළ නියාව දැන ආදාහන කොට සොහොනෙහි ගිණි නිවා වනපස මලින් පුජාකොට මාණවකයා කැඳවා ගෙණ පන්සල් දොර හිඳ කියන්නෝ දරුව වෙන අසාත මන්ත්‍ර නම් දෙයක් නැත. ස්ත්‍රීහු නම් අසත්පුරුෂයෝය. අසාතයෝය තොපගේ මෑනියෝ අසාත මන්ත්‍රය ඉගෙණගෙණ එවයි මා සමීපයට එවන නැත්තෝ ස්ත්‍රීන්ගේ දොෂ දැනගන්නා පිණිස එවුය. දැන් වූකලී තොප විසින් ප්‍රත්‍යක්ෂයෙන්ම මාගේ මෑනියන්වහන්සේගේම දොෂ දක්නාවේද මේ කාරණයෙන් ස්ත්‍රීහුනම් සැපදුරු කොට දුක්එලවනහෙයින් අසාතයෝය. දුක්බවස්තුහුය අසත්පුරුෂයෝය. ලාමකයෝය. අන්තිමයෝය. දැනගනුවයි ඒ මානවකයාට අවවාද කොට යැවුය. ඒ මාණවකයාත් ආචාරීන් වැඳ දෙමාපියන් සමීපයට ගියේය. එකල්හි මෑනියෝ කියන්නෝ පුත තෙපි අසාතමන්ත්‍රය ඉගෙණ ගතුදැයි ඔහු අතින් විචාළෝය. එසේය මෑනියන් වහන්සැයි කී කල්හි දැන් කුමක් කරව්දැයි මහණව ගිණිදෙවියාට පුදපුජා කරව්ද නොහොත් ගිහිගෙයි වසව්දැයි කිවුය. එබස් ඇසූ මාණවකයා කියන්නේ මෑණියන් වහන්ස මා විසින් ප්‍රත්‍යක්ෂ කොට ස්ත්‍රීන්ගේ දොෂ දක්නා ලද එසේහෙයින් මට ගිහිගෙයින් ප්‍රයෝජන නැත මම තපස්ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදීවෙමි තමන්ගේ අභිප්‍රාව ප්‍රකාශකෙරෙමින් මෙසේ කීව්ය. මේ ලොකයෙහි ස්ත්‍රීහූ නම් දුක්බයට වස්තුහෙයින් අසාත නම්වෙති අසත්පුරුෂ නම් වෙති ඔවුන් කේල්ශ වසඟවීමට හිමෙක් නම් මරියාදාවෙක්නම් නැත්තේය. යම්සේ වහ්නිය තමා කෙරෙහි එෑ යම් යම් කාෂ්ටයෙක් ඇත්නම් මුළුල්ලෙම ද්වාහසමකරමුත් මෙතෙක් සෑහෙයි යන තෘප්තිවාරණයෙක් නැත්තේද එපරිද්දෙන්ම ස්ත්‍රීහු නම් කෙතෙක් දවස් කෙලෙස් වසඟවූ නමුත් මෙතෙක් සෑහෙයි යන තෘප්තියක් ඔවුන්ට නැත්තේය. එසේ හෙයින් ගර්හිත වූ කෙලෙස් වසඟවන්නාවූ ස්ත්‍රීන් හැර කාය විවේකචිත්‍රවිවේක වර්ධනය කෙරෙමින් මහණවෙයි පැවිදිව කිසුණු පිරියම් කොට බ්‍රහ්මලෝක පරායන වෙමියි කිය තවද මෙසේ කියා තෘපස ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව කිසුණුපිරියම්කොට පඤ්ඤාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ගණයාකෙරෙන් කාය හා කෙලෙසුන් කෙරෙන් චිත්ත විවේකකොට මේ විවිධ විවේකය වඩමින් බ්‍රහ්මලෝකොත්පත්තිය කෙරෙමි මට ගිහිතෙන් ප්‍රයෝජන නැතැයි මෙසේ ස්ත්‍රීන්ට නින්දාකොට දෙමාපියන් වැඳ පැවිදිව කියනලද ප්‍රකාර ඇති විවේකය වඩමින් බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය.ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මහණෙනි ස්ත්‍රීහූ නම් දුකට වස්තුහුය. අසත් පුරුෂයෝය. ලාමකයෝය. දුක්දෙන්නහුයයි කියා මෙසේ ස්ත්‍රීන්ගේ නුගුණ කියා චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍යය ධර්මදේශනාවගේ කෙළවර ඒ ශාසනයෙහි උකටලීව ඇළුම් නැතිවූ භික්ෂූන් වහන්සේ සෝවාන් පෙලෙහි පිහිටිසේක. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ පූර්වාපර සන්ධිගලපා මේ අසාත්මන්ත්‍ර ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි මෑනියෝනම් දැන් භද්‍රකාපීලානිය පියානෝ නම් මහා කාශ්‍යප ස්ථවිරයෝය, අන්තේවාසිකනම් දැන් ආනන්දස්ථවිරයෝය. එසමයෙහි දිසාපාමොක් ආචාරීවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# අන්ධභූත ජාතකය

තවද එක් සමයෙක්හි සර්වෝත්තම වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසන සේක් උකටලී වූ භික්ෂුවක් හූ අරභයා මේ ජාතකය වදාළසේක. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූහට සැබෑද මහණ තෝ උකටලී වුයෙහිදැයි වදාරා සැබෑව ස්වාමීනි  කී කල්හි මහණ ස්ත්‍රීහූ නම් රැක්ක නොහැක්කාහුය. පෙර නුවනැත්තෝ ස්ත්‍රියක ගර්භයෙහි පටන් රක්නාහු රැකගත නුහුනුවෝම්‍ම වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණ ලද බෝධිසම්භාර ඇති අප මහා බෝසතාණෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ වැඩිවිය පැමිණ සියලු සිල්පයෙහි නිස්පත්තියට පැමිණ පියරජ්ජුරුවන්ගේ ඇවෑමෙන් රාජ්‍යයෙහි පිහිටා දැහැමෙන් රාජ්‍යය කරන්නාහුය ඒ බෝධිසත්වයෝ පුරෝහිත බ්‍රහ්මණයා හා සමඟ දූකොළනාහූය කෙළෙමින් හිඳ.

සබ්බානදී වංකගතා සබ්බේ කට්ඨමයා වනා

සබ්බිත්තියෝ කරේපාපං ලහමානාති වාතකෙ.

යනමේ දූත ගීතිකාව කියමින් රිදීපෝරුවෙහි රන්පස ඇට දමන්නාහුය. මෙසේ කෙළනාවූ ඒ රජ්ජුරුවෝ නිරන්තරයෙන් දිනති. පුරෝහිතයා පරදනේය. ඒ පුරෝහිත බ්‍රාහ්මණයා ක්‍රමයෙන් තමාගේ ගෙයි සම්පත් නිමන්ට පටන්ගත්කල්හි මෙසේ සිතුයේය. මෙසේ නිරතුරුවපැරදීම ඇතිකල්හි මාගේ මේ ගෙයි සියලු ධනය ක්ෂයවන්නේය පුරුෂාන්තරයට නොගියවූ එක් ස්ත්‍රියෙක සොයා ගෙයි වාසයකරන්නෙමි සිතීය. තවද ඕහට මෙසේ වූ සිතිවිල්ලෙක් විය. අන්තපුරුෂයෙකු නුදුටුවාවූ ස්ත්‍රියෙක රක්නට නොපිළිවන ගර්භයෙහි පටන් එක්ස්ත්‍රියෙක රැක ඈ වැඩිවිය පැමිණිකල්හි මාගේ වසඟයෙහි තබා එක් පුරුෂ යෙක්හටම නියතකොට තරකොට රැකවල්ලා රජ්ජුරුවන් වහන්සේගෙන් වස්තු ගෙණගියේවිනම් යහපතැයි සිතීය. ඒ බ්‍රාහ්මණ තෙමේත් අඟපසඟ ලකුණු දන්මෙහි සමර්ථය ඉක්බිත්තෙන් ඒ තෙමේ දුක්පත්වූ ස්ත්‍රියක ගර්භනී නියාව දක දුවක වදන්නීයයි දන ඈ කැඳවා සමීපයට ගෙන්වාගෙන වැටුප් වියදන් දී ගෙහිම වස්වා වැදූකල්හි ඈට වස්තු දී යවා ඒ කුමාරිකාව අන්තපුරුෂයකු දක්කනොදී ස්ත්‍රීන් අතටම දී පෝෂ්‍යකරවා වැඩිවිය පැමිණිකල්හි ඒ කුමාරිකාව තම වසඟයෙහි තුබුයේය. යම් පමණ කලෙකින් ඒ කුමාරිකාව වැඩේ නම් ඒ තාක්කල් මුලුල්ලෙහි රජ්ජුරුවන් හා සමග දූ නොකෙළියේය ඒ ස්ත්‍රිය තමා වසඟයෙහි තබා පසුව මහරජ්ජුරුවන් වහන්ස දූකෙළුම්හයි කියේය රජ්ජුරුවෝ යන පතැයි කියා පළමු පරිද්දෙන්ම දූ කෙළියාහුය. පුරෝහිත බ්‍රාහ්මණයා රජ්ජුරුවන් ගායනාකොට පසඇට දමණකල්හි මාගේ ස්ත්‍රිය ඇර ගායනා කළමැනවයි කීය එතැන්පටන් පුරෝහිත බ්‍රහ්මණයා දිනන්නේය, රජ්ජුරුවෝ පරදිති බෝධිසත්වයෝ මොහුගේ ගෙයි පතිව්‍රතා ධර්මය රක්ෂාකරන්නාවූ එක් ස්ත්‍රියක් වියයුතුයයි පරීක්ෂාකරණ තැනැත්තෝ ඇතිනියාව දන් ඇගේ පතිව්‍රතා ධර්ම සංඛ්‍යාත වූ සීලය බිඳුවමි සිතා එක් ධූර්තියෙක් කැඳවා ගෙන්වා ගෙණ පුරෝහිතයන් ස්ත්‍රියගේ පතිව්‍රතා ධර්මය බිඳපියන්ට පිළිවන්දැයි කිවුය. පිළිවන ස්වාමීනි කී කල්හි ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ඕහට වස්තු දී එසේ වී නම් වහා ඒ කාර්යය නිෂ්ටා කරවයි කියා ඒ ධූර්තියා යැවුය. ඒ ධූර්තිතෙම රජ්ජුරුවන් සමීපයෙන් වස්තු ඇරගෙණ සුවඳසුනු කපුරුතකුල් ආදී වූ සුවඳ බඩුගෙණ ඒ පුරෝහිත බ්‍රාහ්මණයාගේ ගෙට නුදුරුතැන සියළු සුවඳ බඩුයෙන් සල්පිලක් සැදූයේය. පුරෝහිත බ්‍රාහ්මණයාගේත් ගෙය සත්මාලක් සත් දොරටුවක් ඇත්තේය. හැමදොරටුවලම ස්ත්‍රීන්ගෙන් රැකවල් වන්නේය. පුරෝහිත බ්‍රහ්මණයා හැර අන්පුරුෂයෙක් ගෙට වදනට අසමර්ථ වන්නේය. කසල දඹන්නා වූ පෙට්ටියත් බලා පරීක්ෂා කොටම ඇතුල් ගෙට ගන්නාහුය. ඒ මාණවිකාව පුරෝහිතයාම දක්නේය. අන්පුරුෂයෙක් නොදක්නේ. එකල ඒ ස්ත්‍රියගේ එක් පරිවාරිකා ස්ත්‍රියක් සුවඳ මල් ආදියට මිළ ඇරගෙණ යන්නී එම ධූර්තියාගේ සල්පිල සමීපයෙන් යන්නීය. එකල ඒ ධූර්තියා මෝ තෝමෝ පතිව්‍රතා ධර්මය රක්ෂාකරන්නාවූ ස්ත්‍රියගේ පරිවාරිකා ස්ත්‍රියෙකැයි නියමයෙන් දන එක් දවසක් ඒ පරිවාරිකා ස්ත්‍රිය එන්නවුන් දකලාම සල් පිළින් නැගී සිට ගොස් ඈ පාමුල වැටී හි දැතින් දෙපයතරකොට අල්වාගෙණ මෑනියෙනි මෙතෙක්දා මුළුල්ලෙහි කොයිගියෝදැයි කියා ඇඬුයේය. එකල අවශේෂ වූ ඕහට සහාය වූ ධූර්තියෝත් එක්පසෙකසිට අතපය මුව සටහන්නුත් ගමණාගමණ ආදීවූ ආකල්පයෙනුත් මෑනියන් හා පුතනුවෝ එක සැටියෝමයයි කිවාහුය. ඒ ස්ත්‍රී ඒ ඒ බොහෝ දෙනා මෙසේ කියන්ට  වන් කල්හි තොමෝද අදහාගෙණ මේ මාගේ පුත්‍රයෙක්වනැයි තෝමෝත් අඬන්ට පටන්ගත. ඔහුදෙදෙනාම අඬා වැලප ඔවු නොවුන් වැලඳ සිටියාහුය. ඉක්බිත්තෙන් ඒ ධූර්තිතෙම මෑනියෙනි දන් තෙපි කොයි වැලඳ සිටියාහුය. ඉක්බිත්තෙන් ඒ ධූර්තිතෙම මෑනියෙනි දන් තොපි කොයි යවුදැයි කියේය.

පරිවාරිකා ස්ත්‍රී කියන්නී කින්නරාඟනාවකගේ විලසබඳුවූ විලස්ඇති රූපයෙන් අග්‍රප්‍රාප්ත වූ පුරෝහිත බ්‍රාහ්මණයානන්ගේ ළදරු ස්ත්‍රියට උපස්ථාන කෙරෙමින් වෙසෙම් කිවුය. දන් මෑනියෙනි කොයියවුදැයි ධූර්තියා විචාලේය. ඒ කුමාරිකාවන්ට සුවඳ මල් ආදීය ගන්නා පිණිසයෙමි කී කල්හි මෑනියෙනි අනික් තැනකට යාමෙන් ප්‍රයෝජන කිම්ද මෙතැන් මා සමීපයෙන්ම සුවඳ මල් ගෙණවයි කියා මිළ නොගෙණ බොහෝ බුලත් තකුල් කපුරු ආදිය හා නොයෙක් සුවඳමල් ආදිය දුන්නේය. ඒ සුවඳ මල් ආදිය ඇරගෙණ පරිවාරිකා ස්ත්‍රිය ගෙට ආ කල්හි මානවිකාතොමෝ බොහෝ සුවඳ මල් ආදිය දක කීමෙක්ද මෑනියෙනි අද අපගේ බමුණානෝ අප කෙරෙහි ප්‍රසන්නවුදැයි කිව, කවර කාරණයකින් මෙසේ කියන සේක්දැයි පරිවාරිකා ස්ත්‍රිය කී කල්හි මේ සුවඳ මල් ආදිය බොහෝනියාව දකයයි කිවුය. එකල පරිචාරිකා ස්ත්‍රිය කියන්නී පුරෝහිතයානන් වහන්සේ සුවඳ මල් ආදියට බොහෝ මිළ නුදුන් සේක. මා විසින් වනාහි මේ සුවඳ මල් ආදිය මාගේ පුතනුවන් සමීපයෙන් ගෙණනලදැයි කිව,

SANHIDA LANKA

මෙසේ කියා එතැන්පටන් බමුණානන් දුන් මිළ තොමෝ ඇරගෙණ ඒ ධූර්තියාගෙන්ම සුවඳ මල් ආදිය ගෙණන්නීය. ඒ ධූර්තියා කීපදවසක් ගියකල ගිලන් ආකාරයක් දක්වා වැද හොත්තේය. ඒ පරිචාරිකා ස්ත්‍රී තොමෝ ඔහුගේ සල්පිලට ගොස් ඒ ධූර්තියා නොදක මාගේ පුතනුවෝ කොයිදැයි විදාළිය. ගෙයිසිටි මනුෂයෝ කියන්නෝ තොපගේ පුතනුවන් ඇඟට ආළුසුවෙක් බලවතැයි කිවුය. එබස් ඇසූ පරිචාරිකා ස්ත්‍රී ඔහු වැදහොත්තෙනට ගොස් හිඳ පිට පිරිමදින්නී පුත තොපට ආළුාසු කවරේදැයි විචාළිය. හෙතෙමමුවෙන් නොබැණ වැදහොත්තේය. පුත බැණනොනැගෙන්ට කාරණා කිම්දැයි විචාළකල්හි මැනියනි මියෙත් තොපට කියන්ට නොපිළිවනැයි කියා මට නොකියා පුත කවුරුන්ට කියව්දැයි කී කල්හි මැනියෙනි මට අනික් අළුවාසුවෙක් නැත. ඒ තරුණ මාණවිකාවගේ වර්ණ සෞන්දර්යය අසා පිළිබඳසිත් ඇතිවීම් ඒ මාණවිකාව ලද්දෙම් විනම් ජීවිතය තිබෙයි නොලද්දේ වීනම් මෙතැන්හිම මියන්නෙම් වේදැයි කීහ. පරිචාරිකා ස්ත්‍රී කියන්නී පුත මට ඒ භාරය තෙපි ඒ මාණවිකාව නිසා සිතිවිලි නොකරවයි කියා ඔහු අස්වසා බොහෝ සුවඳ ආදිය ගෙණ මාණවිකාව සමීපයට ගොස් කියන්නී මැනියෙනි මාගේ පුත්‍රයා මාගෙන් තොපගේ ගුණ අසා පිළිබඳ වූ සිත් ඇතිවිය. කුමක් කටයුතුමෝදැයි කිව, ඉදින් කැඳවාගෙණ එන්ට සමර්ථයෝ වී නම් අපගෙන් අමුතුකවරේදැයි කිය, පරිචාරිකා ස්ත්‍රී මාණවිකාවගේ බස් අසා එතැන් පටන් ඒ ගෙයි කොන් කොන් වලින්  බොහෝකසල එක්කොට මල්ගෙණෙන පෙට්ටියෙ ලාගෙණ යන්නී පෙට්ටිය පරීක්ෂා කරණ වෙලෙහි රැකවල් සිට ස්ත්‍රියගේ ඉසට දමන්නීය. ඒ රැකවල්සිටි ස්ත්‍රී ඇඟට කසලදැමීමෙන් පිළිකුල්ව ඉවත්වන්නීය. ඒ පරිචාරිකා ස්ත්‍රීතොමෝ මෙම ක්‍රමයෙන් යමක් යමක් කිසිවක් කියානම් ඒ ඒ ස්ත්‍රිය ඉසමත්තට කසල දමන්නීය එතැන් පටන් පරිචාරිකා ස්ත්‍රිය යමක් ඇතුලෙන් ගෙණතත් පිටතින් ඇතුලට ගෙණෙතත් කිසි ස්ත්‍රියක් ඒ ගෙණෙනදෙය පරික්ෂාකරන්නට උත්සාහ නොකරන්නීය. එකල්හි ඒ ස්ත්‍රී ධූර්තියා මල් ගෙණන පැස ඇතුලේ ලාගෙණ මාණවිකාවගේ සම්පයට ගෙණ ගියාය. ධර්තිකාව මාණවිකාවගේ ශිල භේදකොට එක්දවසක් ප්‍රාසාදයෙහි විසුයේය. පුරෝහිත බ්‍රාහ්මණයාගෙන් බැහැර ගිය කල්හි දෙදෙනාම අභිරමණ අභිරමණය කෙරෙති ඔහු ආකල්හි ධූර්තියා සැඟවෙන්නේය. ඉක්බිත්තෙන් ඒ මාණවිකාතොමෝ  එක් දෙදවසක් ගියකල්හි පුරුෂය තොප දූන් යන්ට වටනේයයි කිව, එබස් ඇසූ ධූර්තියා කියන්නේ මම බමුණානනිට පහරක් ගසා යනු කැමැත්තෙමි කීය, මාණවිකා තොමෝ එසේ වීනම් වන්නාටයයි ධූර්තීයා සඟවා හිඳුවා බමුණා ගෙට ආ කල්හි මෙසේ කීව, ස්වාමීනි මම නුඹ වහන්සේ වීණාගායනා කරණ කල්හි නටනු කැමැත්තෙම් කීව, යහපත සොඳුර නටවයි කියා බමුණා වීණාගායනා කරන්ට පටන් ගත්තේය. එකල මානවිකා කියන්නී නුඹවහන්සේ බලාහිඳිද්දී නටන්නට ලජ්ජා ඇත්තේමි. එසේ හෙයින් නුඹ වහන්සේගේ මූණ කඩ කින් වසා බැඳ නටම් කිව, එබස් ඇසූ බමුණා ඉදින් තෙපි ලජ්ජාව වී නම් එසේ කරවයි කීය. එකෙණෙහි මාණවිකා ඝනවූ වස්ත්‍රයක් ගෙණ ඒ බමුණාගේ ඇස්දෙක වසා මුහුණ බැන්දීය, මුහුණු කඩින් මුහුණ බඳවාගෙණ වීණාගායනාකරන්නට පටන්ගත. ඒ මාණවිකාතොමෝ මද ඇසිල්ලකින් නටාපියා කියන්නී ස්වාමීනි මම නුඹ වහන්සේගේ හිසට එකවිටක් ඇනපියන් නා කැමැත්තෙමි කිව, ස්ත්‍රිය කෙරෙහි ලොල් වූ බමුණා කිසි කාරණයක් නොදන පැහැර පියයි කිය, එකෙණෙහි මාණවිකා ධූර්තියාට ඉඟිකළාහුය, ධූර්තිතෙමේ සෙමෙන් සෙමෙන් අවුත් බමුණාගේ පිටිපස්සෙහිසිට ඉස වැලමිටෙන් ඇන්නේය. එකෙණෙහි ඇස්පිටපලායන්නාක් මෙන් විය. හිස ගැටක් පැනනැංගේය. ඒ බමුණා වේදනාවෙන් පිඩිතව තිගේ අත මෙසේ ගෙණෙවයි කිය,මාණවිකා තමාගේ අත ඔසවා බමුණාගේ අත මත්තෙහි තිබූය. බමුණා කියන්නේ තීගේ අත මොලොක පහරවූකලි ඉතාම තදයයි කීය. ධූර්තියා බමුණාට ඇණපියා සැඟවුනේය. මාණවිකා ඔහු සැඟවීගිය කල්හි බමුණා මුහුණින් වස්ත්‍රය මුදා හෙලා තෙල් ගෙණවුත් හිස ගැට නැගිතෙන ගා මැඩ සන්තර්පණය කළාය. බමුණා ගෙන් බැහැර ගිය කල්හි නැවත ඒ පරිචාරිකා ස්ත්‍රී ධූර්තියා පැසලාගෙණ පිටත් කළාය. ඉක්බිත්තෙන් ඒ ධූර්තියා රජ්ජුරුවන් සමීපයට ගොස් ඒ සියළු පවත් කියේය. රජ්ජුරුවෝ තමන්ට සේවයට ආවාවූ පුරෝහිත බ්‍රාහමණයා දක බමුණානෙනි දූ කෙළිමෝදැයි කිවුය. යහපත රජ්ජුරුවන් වහන්සැයි කී කල්හි රජ්ජුරුවෝ දූත ශාලාව සරහා පළමු පරිද්දෙන්ම දූත ගීතිකාවන් කියා පස ඇටදැමූය. බමුණා මාණවිකාවගේ තපස් බිඳිගියබව නොදන මාගේ මාණවිකාව හැර ගායනා කළමැනවැයි කීය. මෙසේ කියන්නාවූන් බමුණා පරැද්දේය. එකල්හි රජ්ජුරුවෝ ධූර්තියාගෙන් තමා මාණවිකාව පවත් අසා දත්හෙයින් කියන්නෝ බමුණ මාණවිකාව තබන්නට කුමට කියයිද තාගේ මාණවිකාවගේ තපස් බිඳි ගියේය. තෝ මගම ගර්භයෙහි පටන් රැකගත් තැනක රැකවල්ලා රැක්කගත හෙමියි සිතුයෙහිය. ස්ත්‍රීන් නම් බඩ ඇතුලේ ලාගෙණ ඇවිදිදත් රක්නටනොපිළිවන මේ ලෝකයෙහි එක්පුරුෂයෙකුම පතා පතිව්‍රතා ධර්මය රක්ෂා කරන්නා වූ ස්ත්‍රියක් නැත තාගේ මාණවිකාව නටනු කැමැත්තෙමි කියා වීනාගායනා කරන්නාවූ තාගේ මුහුණ වස්ත්‍රයකින් වසා බැඳ තමාගේ චෞර පුරුෂයා ලවා තාගේ හිස වැලමිටින් අන්නවා යවුය දූන් තෝ දූ කෙළිමින් හිඳ මාගේ ස්ත්‍රිය තබා දූත ගීතිකාව ගායනා කළ මැනවයි කුමක් පිණිස කියන්නෙහිදැයි මෙසේ මහබෝසතානෝ බමුණාට ධර්මදේශනා කළෝය.

එකල්හි බමුණා බෝධිසත්වයන්ගේ ධර්මදේශනාව අසා ගෙටගොස් ඒ මානවිකාවට කියන්නේ තී විසින් මෙබඳු පාප කර්මයක් කරණ ලදදැයි කීය. ස්වාමින් ඒ කිවෝ කවුරුද නොකෙළමි මම මා අතින් ඇන්නෙමි අනික් නුඹ වහන්සේගේ  හිසට ඇනි කෙනෙක් නැත. ඉදින් නුඹ වහන්සේ මා කීවා නොඅදහන සේක් වී නම් මම නුඹ වහන්සේ ඇර අන් පුරුෂයෙකුගේ මා අත ඇල්ලීම් පමණකුත් නොදනිමියි සත්‍ය ක්‍රියා කොට ගිනිවැද නුඹ වහන්සේ අදහවමියි කීව.

SANHIDA LANKA

බමුණා එබස් අසා එසේ වීනම් වන්නාටයයි මහත්වූ දරගොඩක් කරවා ගිනිදල්වා ඒ ස්ත්‍රිය කැඳවා කියන්නේ ඉදින් මා අදහනු කැමැත්තේ වී නම් මේ ගින්නට පැනපියවයි කියා මාණවිකාව තමාගේ පරිචාරිකා ස්ත්‍රියට උගන්වන්නී මැනියෙනි තොපගේ පුතනුවන් එතනටගොස් මා ගිනිවදනා වේලෙහි අත අල්වාගන්ට කියයි පළමුකොටම

උගන්නාව තුබූය. ඒ පරිචාරිකා ස්ත්‍රී ගොස් ධූර්තියාට එපවත් එපරිද්දෙන්ම කිව එබස් ඇසූ ධූර්තියා අවුත් පර්ෂිත් මධ්‍යයෙහි සිටියේය. ඒ මාණවිකා බමුණා වඤ්චාකරණු කැමතිව මහ ජනයා මධ්‍යයෙහි සිට කියන්නී බමුණානෙනි තොපහැර අන් පුරුෂයෙකු ගේ මා අත ඇල්ලීම් පමණකුත් නොදනිමියි මේ සත්‍යක්‍රියාවෙන් මේ ගිනි මා නොදවයි කියා ගිනි වදින්ටගත. එකෙණෙහි ධූර්තියා කියන්නේ පින් වත්නි පුරෝහිත බ්‍රාහ්මණයනන්ගේ කටයුතු දූන් බලව මෙබඳු වූ ස්ත්‍රියක් ගිනිවැද මරවති කියා ගොස් මාණවිකාව අත අල්වා ගත්තේය. ඕ තොමෝ ධූර්තියාගේ අත අරවා පියා පුරෝහිතයාට කියන්නී ස්වාමීනි මා සත්‍යක්‍රියාව බිඳී ගියේය. එසේ හෙයින් මා ගිනිවදින්ට නිර්භිතව නොපිළිවනැයි කිව. කවර කාරණයකින්දැයි බමුණා කී කල්හි අද මා විසින් මාගේ පුරුෂයකු මා අත ඇල්වීම් පමණකුත් නොදනිමි මෙසේ සත්‍යක්‍රයි කරණලද දූන් වූ කලී මේ පුරුෂයා අවුත් මාගේ අත අල්වාගත එසේ හෙයින් මා ගිනිවදින්ට නොපිළි වනැයි කිව, එබස් ඇසූ බමුණා මෑ විසින් මා වඤ්චවා කරණ ලද්දෙමි දූන ගෙන් නෙරපූයේය. එසේ හෙයින් මේ ලෝකයෙහි ස්ත්‍රීහු නම් මෙසේ වූ අධර්මයන්ට වඤ්චා කරණු කැමතිව මම මෙබන්දක් නොකෙළමි කියා දවස මුළුල්ලෙහිත් සපථකෙරෙත් නම් නොයෙක් වඤ්චා ප්‍රයෝගයෙන්ම සපථකොට ගිවිස්වන්නාහුය. ශාස්තෲවූ බුදුරජානන් වහන්සේ මෙසේ ස්ත්‍රීහූ නම් රැකළිය නොහැකි සත්වකෙනෙකැයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්ය සත්‍ය ප්‍රකාශ කොට වදාළ සේක. චතුස්සත්‍යය ධර්මදේශනාවගේ කෙළවර උකටලී වූ භික්ෂූන් වහන්සේ සෝවාන් පෙලෙහි පිහිටි සේක. සර්වඥයන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ අන්ධභූත ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# විස වන්ත ජාතකය

තවද එක්සමයෙක්හි නිර්මල වූ පස්පැදිස්නා නේත්‍ර යුගලයක් ඇති තිලෝගුරු බුදුරාජනන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසනසේක් දම් සෙනවි සැරියුත් මහතෙරුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක. තෙරුන්වහන්සේ පිටකන දෙයක් වළඳන වේලෙහි මනුෂ්‍යයෝ කියන්නාහු ස්වාමීනි ඇතුළුගමටවන් භික්ෂූන් වහන්සේගෙන් අවුළුපත් පිළිගත මැනවයි කීහ. එකෙණෙහි තෙරුන් වහන්සේ සද්ධි විහාරික වූ භික්ෂූන් වහන්සේ ඇතුළු ගම වූ සේක. උන් වහන්සේ කොටසගෙණ ඒ භික්ෂූන් වහන්සේ නොආහෙයින් ඉතා දහවල් වන්නේයයි සැරියුත් මහතෙරුන්වහන්සේට පිළිගැන්වූය. ඒ තෙරුන් වහන්සේ අවුළුපත් වැළඳූ නොබෝකලකින්ම සද්ධිවිහාරික භික්ෂූන් වහන්සේ ගමින් විහාරයට වැඩි සේක. එකල තෙරුන් වහන්සේ වදාරණ සේක් ඇවැත්නි අපි තොපට තුබූ පිටිකනදෑ වලඳාපුමොදැයි වදාළ සේක. එබස් ඇසූ සද්ධි විහාරිකයන් වහන්සේ කියන සේක් ස්වාමීනි මිහිරෙක් නම් කවුරුන්ට අප්‍රියදැයි කීසේක. එකෙණෙහි සැරියුත් මහතෙරුන් වහන්සේට සන්වේග උපන. උන්වහන්සේ මම මෙතැන්පටන් පිටකනදෙයක් නොවලඳිමි ඉටාගත් සේක. එතැන් පටන් සැරියුත් මහතෙරුන් වහන්සේ පිටකනදෙයක් නොවැලඳූවිරුසේක. උන්වහන්සේ පිටකනදෑ නොවලඳන නියාව භික්ෂු සංඝයා කෙරෙහි ප්‍රසිද්ධ විය. භික්ෂු සංඝයා වහන්සේ ඒ කථාව කියමින් දම්සභා මණ්ඩපයෙහි වැඩ උන් සේක. එකල සාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මහණෙනි දැන් මා එන්නට පූර්ව භාගයෙහි කවර නම් කථාවකින් යුක්තව හුනුදැයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි දැන්වූකල්හි මහණෙනි සාරිපුත්‍ර ස්ථවිරයෝ එක්වරෙක හැරපුදෙය ජීවිත පරිත්‍යාග කෙරෙත් නමුත් දෙවනුව නොගනිත් යයි වදාරා ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහා බෝසතානෝ විෂවිද්‍යාකුලෙයක ඉපිද වෙද කමින් ජීවත්වන්නාහුය. එකල එක් ජනපදවාසීවූ මනුෂ්‍යයෙක් සර්පයෙක් දෂ්ටකොටපුයේය. ඔහුගේ නෑයෝ ප්‍රමාද නොකොට වහා වෛද්‍යයා කැඳවා ගෙණ ආවාහුය. එකල වෛද්‍යා කියන්නේ කිමෙක්ද ඖෂධ ගල්වා විෂද වාගනිම්ද දෂ්ටකල සර්පයා ගෙන්වාගෙන් දෂ්ටකලතෙනින් ඔහු ලවාම විෂය අද්දවාගනිම්දැයි කියේය. සර්පයා ගෙන්වා විෂය ඇදදාගණැයි මනුෂ්‍යයෝ කීවාහුය.ඒ විෂවිද්‍යාචාර්ය මන්ත්‍රෞෂධයෙන් සර්පයා ගෙන්වාගෙණ තා විසින් මේ පුරුෂයා දෂ්ට කරණ ලද්දේදැයි කීය. එසේය මා විසිනැයි කී කල්හි තා දෂ්ට කල තැනින් තෝ විෂමුඛයෙන් ඇදගෙණැයි කීයේය. සර්පයා කියන්නේ එක්වරයෙක ඇරපුදෙය නැවත ගත් විරුනැත මම මා විසින් හරණ ලද විෂය නැවත ඇදනොගණිම්යි කීය. සර්පයාගේ බස් අසා විෂ විද්‍යාචාර්ය තෙම දර ගෙන්වාගෙණ ගිනිමොලවා ඉදින් තාගේ විෂ තෝ නොඅදනේ වීනම් මේ ගින්නට වැදයායි කියා සර්පයා ඉදින් මම ගිනිවදිම් නමුත් මා විස්න හරණ ලද විෂයක් මාගේ ජීවිත්විම කරණ කොට ගෙණ පෙරලා උරා ඇද ගන්නේම්වීනම් ඒ විෂයට නින්දාවේයයි ඒ විෂය නැවත උරා ඇදගැන්ම නිසා ගිනිවැදයම් මරණෙක් වේනම් ජීවත්වීමටත් වඩා ඒ මරණය උතුමැයි කියේය. මෙසේද කියා ගිනිවදින්ට නික්මුනේ. එකල වෙදානෝ ඒ සර්පයා වළකා ගිනිවැද්ද නොදී ඒ සර්පයා දෂටකළාවූ පුරුෂයා ඖෂධයෙන් හා මන්ත්‍රයෙන් විෂ නැති කොට නිරෝගි කොට සර්පයාට පන්සිල් දී මෙතැන් පටන් දෂ්ට කොනොකට කිසි කෙණෙකුන්ට පීඩාවක් නොකරවයි කියා අවවාද කොට ඇරපුවාහුය. ශාස්තෘ වූ බුදුරජානන්වහන්සේ මහණෙනි ශාරිපුත්‍ර ස්ථවිරයෝ එකවරෙක හැරපුදෙය ජීවිත පරිත්‍යාග කරතත් නැවත නොගනිම්යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ විෂවන්ත ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි සර්පයා නම් දැන් ශාරිපුත්‍රස්ථිවරයෝය. එසමයෙහි විෂ විද්‍යාචාරී වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# කුද්දාල ජාතකය

තවද එක්සමයෙක්හි ප්‍රඥාවිෂයාතික්‍රාන්තවූ ධර්මකාය ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් චිත්ත හස්ත ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක. ඒ තෙරුන් වහන්සේ නම් සැවැත් නුවර එක් එක් කුලපුත්‍රයානකෙණෙක ඉක්බිත්තෙන් එක් දවසක් ඒ කුලපුත්‍රතෙම සීසාපියා එනතැනැත්තේ විහාරයට වැද එක් තෙරකෙණෙකුන් වහන්සේගේ සිනිඳුවූ මිහිරිවූ ප්‍රණීතභොජනයක් ලැබ මෙසේ සිතුයේය. අපි රෑ දාවල් මුළුල්ලෙහි සිය අතින් නොයෙක් කර්මාන්ත කොටත් මෙබඳු වූ මධුරාහාරයක් නොලබම්හ. මාත් මහණවූවොත් යහපතැයි සීතීය. මෙසේ සිතා එ කුලපුත්‍ර මහණව මසක් යෙළමසක් ඇවැමෙන් නුවනින් සිහිනොකොට ක්ලෙශ වසඟව ගිහිව නැවත බත් නොලැබ මිරිකී අවුත් මහණව අභිධර්මය උගත්සේක මෙම ක්‍රමයෙන් සවාරයෙක ගිහිව සත්වෙනිවාරයෙහි මහණව සප්තප්‍රකරණය හදාරා බොහෝ භික්ෂූන් වහන්සේ අභිධර්මය උගන්වා විදර්ශනා වඩා රහත් වූසේක. එකල උන්වහන්සේගේ සහාය භික්ෂූහු පැවැත්වූ චිත්තනයෙහි කිමෙක්ද තොපට පෙරපරිද්දෙන් දූන් ක්ලේශයෝ නොවසිද්දූයි නින්දා කළසේක. එකල උන්වහන්සේ වදාරණසේක් ඇවැත්නි මම දූන් මෙතැන්පටන් ගිහිවන්ට අයොගායවෙම් කී සේක. මෙසේ උන්වහන්සේ අර්හත් ඵලයට පැමිණිකල්හි ධම්සභා මණ්ඩපයෙහි මෙසේ වූ කථාවෙක් පහළ වූයේය, ඇවැත්නි මෙබඳූ වූ අර්හත් ඵලයට උපනිශ්‍රය ඇතුව තිබියදී ආයුෂ්මත් වූ චිත්ත හස්ත ශාරිපුත්‍රස්ථිවිරයෝ සවාරයෙක ගිහිවූය. එසේ හෙයින් පෘථග්ජන බව නම් ඉතා මහත්වූ දෝෂ ඇති දෙයකැයි මෙසේ වූ කථාවක් උපදවා උන්සේක. එකල සර්වඥයන් වහන්සේ අවුත් මහණෙනි දූන් කවර කථාවකින් යුක්තව උනුදූයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි දූන්වූ කල්හි මහණෙනි පෘථග්ජන චිත්තය නම් ලඝුය. නිග්‍රහ නොකොට හැක්කේය. ආලම්බන වසයෙන් ගොස් ඇලින්නේය. එක්වරෙක ඇලිගිය සිත වහා මුදාලන්ට නොපිළිවන. එබඳුවූ චිත්තයාගේ දමනය යහපත් වන්නේය. දමනයෙහි ලනලද්දාවුම චිත්තය සැප එලවන්නේ. යම්බඳු වූ චිත්තයකට නිග්‍රහකොට ගතනුහුණු බැවින් පෙර නුවනැත්තෝ එක් උදලුකෙටියක් නිසාම ඒ උදලු හැරපිය නොහි ලෝභවශයෙන් සවාරයෙක ගිහිව සත්වෙනි වාරයෙහි පැවිදිව ධ්‍යාන උපදවා ලොභයට නිග්‍රහකළෝමවේදූයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණලද බෝධිසම්භාර ඇති අප මහාබෝසතානෝ එළාදිය විකුණන්නාවූ කුලයක ඉපිද විඥඥූ බවට පැමිණියෝය. කුද්දාපණ්ඩිතයෝ යයි ඔවුන්ට නම් තුබූයේය. ඒ බෝධිසත්වයෝ උදූල්ලෙන් බිම කොට එළ හා ලබු කොමඩු කැකිරි ආදිය රෝපනය කොට ඒ එළාදිය විකුණමින් දුක්ඛ ජීවිකාවෙන් ජීවත්වෙති ඒ බෝධිසත්වයන්ට උදලු කෙටිය හැර අනික් වස්තුවක් නැත්තේය. ඒ කුද්දාල පණ්ඩිතයෝ එක් දවසක් මෙසේ සිතූහ. මට ගිහිගෙයි විසීමෙන් ප්‍රයෝජන කිම්ද.  මේ ගිහි ගෙන් නික්ම මහණවෙම් සිතූහ. ඉක්බිත්තෙන් එක් දවසක් උදලුකෙටිය සඟවා තබා සෘද්ධි ප්‍රව්‍රජ්ජාවෙන් පැවැදිව උදලුකෙටිය සිහි කොට ලොභය සිඳගත නොහී කෙටි උදූල්ල නිසා  නැවත නැවත ගිහිවූයේය. මෙසේ දෙවෙනිවාරය තුන් වෙනි වාරයයි මෙසේ සවාරයෙක උදලුකෙටිය සඟවා තබා මහණත් වූහ. ගිහිත් වූහ. සත්වෙනිවාරයෙහි මහබෝධිසත්වයෝ සිතන්නාහු මම මේ කෙටි උදූල්ල නිසා නැවත නැවත ගිහිවිම් දුන් ඒ උදලු කෙටිය මාහාගංගාවට දමාපියා මහණවෙම් ගන්තෙරට ගොස් ඉදින් උදලුකෙටිය හුණු තැන් දුටුයේ වීන් නම් නැවත අවුත් ගොඩනගාගන්ට සිතිවිලි උපදනේයයි උදලුකෙටිය මිට අල්වා ගෙණ ඇත්බල හා සමාන බල ඇති බෝධිසත්වයෝ ඉසවට තුන්විටක් සිසාරා ඇසපියා ගෙණ ගංගාව මධ්‍යයට දමා ජයගතිම් ජයගතිම් කියා තුන්වරක් සිංහනාද කළෝය. එකෙණෙහි බරණැස් රජ්ජුරුවෝ පසල් දනව්වට සෙමෙහි තබා තනතැනැත්තෝ ගහවෙහිදි ඉස හා සමග ජලස්නානය කොට ස්වර්ණාභරණයෙන් සැරහී ඇත්කඳක් මත්තෙන් යමින් හිඳ බෝධිසත්වයන්ගේ ජයශබ්දය අසා මේ පුරුෂයා ජයගතිම් කියන්නේ මොහු විසින් කවරෙක් ජයගන්නා ලද්දේ දූයි ඔහු කැඳවා විචාරවයි බෝධිසත්වයන් කැඳවා ගෙන්වා ගෙණ පින්වත් වූ පුරුෂය. මම වූ කලී විජිත සංග්‍රාම ඇත්තෙම්, දූන් ජය ගෙණ එම්. තා විසින් ජයගන්නා ලද්දේ කවරෙක් දූයි විචාළෝය.

එසේ ඇසූ බෝධිසත්වයෝ කියන්නාහු මහරජ්ජුරුවෙනි යුද්ධ දහසකුත් යුද්ධ ලක්ෂයකුත් ජයගත්තාවූ තොප විසින් කෙලෙසුන් ජයනොගත් බැවින් ජය නොගෙන ලද්දේය. මම වූ කලී මාගේ අභ්‍යන්තරයෙහි ලෝභයට නිග්‍රහ කොට කෙලෙසුන්  ජයගතිම්යි කියමින් සිටම මහත් වූ ගංගාව බලා අපොකසිණය අරමුනු කොට ඇති ධ්‍යානය උපදවා පංඥචාභිඥා අෂ්ට සමාපත්ති උපදවා ආකාශයෙහි හිඳ රජ්ජුරුවන්ට ධර්මදේශනා කරන්නාහු මෙසේ කිවුය. පසමිතුරන්  පරාජය කොට රාජ්ජය ලැබ නැවත ඒ සතුරන් විසින් ජයගත යුතු හෙයින් ඒ යුද්ධයෙන් ලබන්නාවූ ජය අගපත් වූ ජයක් නම් නොවයි. කුමක් හෙයින් ද යත්?. නැවත සතුරන් විසින් ජයගතයුතු හෙයින් කෙලෙස් නැමති පසමිතුරන් පරාජය කොට මැඩ ජයගැන්මක් නැතිහෙයිනැයි එසේ හෙයින් මහරජ්ජුරුවෙනි තෙපි දහසක්වර ලක්ෂයක් වර යුද්ධ ජය ගෙණ තොපි සංග්‍රාම යෝධයෝ නම් නොවව්. කුමක්හෙයින්ව තොපගේ කේලේශයන් ජයනොගත් හෙයින් යහෙක් වනාහි තමාගේ අභ්‍යන්තරයෙහි ක්ලේශයන් ජයගනී නම් ඒ තෙමේ උත්තම වූ සංග්‍රම ශිර්ෂයෙහි යෝධනම් වන්නේයයි ආකාශයෙහි හිඳ මෙසේ සර්වඥවිලාශයෙන් ධර්මදේශනා කළෝය. මෙසේ රජ්ජුරුවෝ ධර්මය අසමින් සිටියදීම තදඟ ප්‍රභාණවශයෙන් ක්ලේශයෝ ප්‍රහීන වූහ. ප්‍රව්‍රජ්‍යාවට සිත නැමුනෝය. රජ සෙනඟටත් එසේම ක්ලේශයෝ ප්‍රහීනවූහ. මහරජ්ජුරුවෝ දූන් නුඹ වහන්සේ කොයි යන්සේක් දූයි බෝධිසත්වයන් විචාළෝය. හිමාලය වනයට වැද සෘද්ධි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිවෙම් මහරජ්ජුරුවෙනි කිවුය. එසේ වීනම් මමත් මහණ වෙම් කියා බෝධිසත්වයන් සමඟ නික්මුණාහ. සේනාව බ්‍රාහ්මණ ගෘහපතිහූය ඇති නායකවරුය යන සියල්ලෝම ඒ ස්ථානයෙහි රැස්වූය ජන සමූහයෝ රජ්ජුරුවන්  සමඟ නික්මුනාහුය. බරණැස්නුවරවාසී

SANHIDA LANKA

මනුෂ්‍යයෝ අපගේ රජ්ජුරුවන් වහන්සේ කුද්දාල පණ්ඩිතයන්ගේ ධර්මදේශනාව අසා මහණවනු කැමතිව සේනාව හා සමග නික්මුන සේක. එසේ හෙයින් අපි මෙතන කුමක් කරමෝද්දැයි දෝළොස් යොදුනක් පමණ ඇති බරණැස්නුවර සියලු නුවරවාසි සත්වයෝ නික්මුණාහුය. දොළොස්යොදුනක් පමණ පර්ෂිද වුයේය. ඒ පර්ෂිත් ගෙණ බෝධිසත්වයෝ හිමාලයවනයට වන්නාහුය. ශක්‍රදේවේන්ද්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය බෝධිසත්වයන්ගේ ආනුභාවයෙන් උෂ්ණාකාර දක්වූයේය. ඒ ශක්‍රදේවේනද්‍රයෝ කිමෙක්දෝහොයි පරීක්ෂා කරන්නාහු කුද්දාල පණ්ඩිතයෝ මහබිනික්මන් නික්මුණාහුයයි දැක මහත් ජයසමාගමක්වන්නේය. එසේ හෙයින් උන්ට වසනතැනක් උවමැනවයි සිතා විස්ව කර්මයා කැඳවා දරුව කුද්දාල පණ්ඩිතයෝ මහබිනික්මන් නික්මුනාහුය. වසනතැනක් ලබන්ට වටනේ, තෙපි හිමාලවනයට ගොස් සමවූ  භූමිප්‍රදේශයක දිගින් තිස්යොදනක් හා පුළුලින් පසලොස් යොදුනක් හා පමණ ඇති ආශ්‍රම ප්‍රදේශයක් මවයි කිවාහුය. ඒ ඇසූ විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා යහපත ස්වාමීනි ගිවිස එහි ගොස් එපරිද්දෙන්ම කෙළේය. තවද විශ්වකර්ම දිව්‍යපුත්‍රයාත් ආශ්‍රම ප්‍රදේශයේ පන්සල මවා භය ජනක ශබ්ද පවත්වන්නාහු දුෂ්ටමෘගයන් පක්ෂීන් අමුනුෂ්‍යයන් දුරුකොට ඒ දිසා භාගයෙන් එක්පියවරක් ඇති මාර්ගයක් දක්වා තමන් වසන්නා වූ ස්ථානයටම ගියේය. කුද්දාල පණ්ඩිතයෝ ඒ පර්ෂිත් ඇරගෙණ හිමාලවනයට වැද ශක්‍රදේවේන්ද්‍රයන් විසින් දෙනලද ආශ්‍රම ප්‍රදේශයට ගොස් විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් මවන ලද තවුස්පිරිකර ගෙණ පළමු තුමූ පැවිදිව පසුව පර්ෂිත් පැවැදිකොට ආශ්‍රම ප්‍රදේශය බෙදා දුන්නාහුය. සත්රාජ්‍යයක රජදරුවෝ තමන්ගේ රාජ්‍යය හැර බෝධිසත්වයන් සමීපයට අවුත් තාපසප්‍රවෘජ්‍යාවෙන් පැවිදි වූහ. තිස්යොදුනක් පමණ අසපු පිරිගියේය. කුද්දාල පණ්ඩිතයෝ අවශේෂ කසීපණයෙහිත් පරිකර්ම භාවනාකොට බ්‍රහ්මවිහාරයන් වඩා පර්ෂිද හැමටම කමටහන් කීවාහුය. ඇමදෙනාම පංචාභිඥා අෂ්ටසමාපත්තිලාභිව බ්‍රහ්ම විහාරයන් වඩා බ්‍රහ්මලෝකයෙහි උන්නාහුය. යම් සත්වකෙනෙක් ඒ තපස්වීවරයන්ට අත්පාමෙහෙවර උපස්ථාන කළාහු නම් ඔහු හැමදෙනම දිව්‍යලෝකයෙහි උපන්නාහුය. ශාස්තෲවූ බුදුරජානන් වහන්සේ මහණෙනි මෙසේ මා චිත්තය ක්ලෙශවශයෙන් ඇලී ගියේ නම් මුදාලිය නොහැක්කේය. උපන්නාවූ ලෝභධර්මයෝ දුරුකොට ලිය නොහැක්කාහුය. මෙබඳු නුවනැත්තන් පවා ඒ ලෝභධර්මයෝ අඥාන කොට පුවෝවවුදැයි මේ ධර්මදේශනාව ගෙන හැර දක්වා වදාරා චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කළසේක. චතුරාර්ය සත්‍යයයාගේ කෙළවර සමහර කෙණෙකුන් වහන්සේ සෝවාන් පෙළෙහි පිහිටිසේක. සමහර කෙණෙකුන් වහන්සේ සකෘද්ධාගාමී පෙලෙහි පිහිටිසේක. සමහර කෙණෙකුන් වහන්සේ අනාගාමී ඵලයෙහි පිහිටිසේක. සමහර කෙණෙකුන් වහන්සේ අර්හත් ඵලයෙහි පිහිටිසේක. සර්වඥයන් වහන්සේත් පූර්වාපර සන්ධි ගළපා මේ කුද්දාල ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථිවිරයෝය. එසමයෙහි පර්ෂිත් නම් දැන් බුදු පිරිසය. එසමයෙහි කුද්දාල පණ්ඩිතයෝ නම් දැන් තිලොගුරු සම්‍යයක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සීලව නාගරාජ ජාතකය

තවද සාන්ත වූ වෘත්තී ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසනසේක් දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක. දම්සභා මණ්ඩපයට රැස්වූ භික්ෂූන් වහන්සේලා ඇවැත්නි දේවදත්ත ස්ථවිරයෝ අකෘතඥයෝය. සර්වඥයන් වහන්සේගේ ගුණ නොදනිති කියමින් උන්සේක. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුනුදැයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි මහණෙනි දේවදත්ත ස්ථවිරයෝ අකෘතඥවූවෝ දැන් මතු නොවෙයි පෙරත් අකෘතඥයෝයයි කිසිකලෙකත් මාගේ ගුණ නොදන්නෝමයයි වදාරා ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහාබෝසතානෝ හිමාලය වනයෙහි ඇත්යෝනියෙහි උපන්නාහුය. ඒ බෝධිසත්වයෝ මව්කුසින් බිහිවන තැනැත්තෝ සර්වාංගයෙන් ධවලවූය. රිදී පිඩැල්ලෙක් හා සමානයෝය. ඒ බෝධිසත්වයන්ගේ ඇස් ඉඳුමිණිවට දෙකක් මෙන් ප්‍රකාශව පෙනෙන්නාවූ පඤ්චප්‍රාසාදයෙන් හොබනේය. මුඛය රත්පලසක් හා සමාන වන්නේය. සොඬ ස්වර්ණ බින්දුයෙන් හෙබියාවූ රජතදාමයක් හා සමාන වන්නේය. සතරපය ලාක්ෂරසයෙන් පිරියම් කරණ ලද්දෙක් වැන්නේය. මෙසේ ඒ මහා බෝධිසතානන්ගේ දසපාරමිතාවෙන් අලංකෘත වූ රූපාග්‍රප්‍රාප්ත වූ ආත්මභාවය විය. ඉක්බිත්තෙන් විඥඤූබවට පැමිණියා වූ ඒ බෝධිසත්වයන්ට ඒ සියලු හිමාලය වනයෙහි හස්තීහූ රැස්ව උපස්ථාන කෙරෙමින් ඇවිදිනාහුය. මෙසේ ඒ මහබෝසතානෝ අසූදහසක් ඇතුන් පිරිවරා හිමාලය වනප්‍රදේශයෙහි වසන්නාහුය. මෑතභාගයෙහි ගෙණහි දෝෂ දැක ගණයා කෙරෙන් කායවිවේක කොට උදකලාව වල්හි වාසය කළාහුය. ඒ බෝධිසත්වයන් වහන්සේ සිල්වත් බැවින් සීලව නාගරාජ යැයි කියා මේ නමින් ප්‍රසිද්ධ විය. එකල බරණැස් නුවර වැසි එක් වනචරයෙක් හිමාලය වනයට වැද තමා ජීවිකාවෘත්තිය කරන්ට නිසි භාණ්ඩයන් සොයන්නේ දික් නියමකොට ගත නොහි මංමුළාව වල්මත්ව හයින් භයපත්ව දෝත හිසතබා අඬමින් ඇවිදින්නේය. මහබෝසතානෝ ඔහුගේ ඒ බලවත්වූ බැගෑහඬ අසා මේ පුරුෂයා සමීපයට එළඹ ඒ පුරුෂතෙම බෝධිසත්වයන් දැකලා හයින් පලාගියේය. බෝධිසත්වයෝ ඔහු යන්නා දැක සිටතෙනම් සිටපුව, ඒ පුරුෂයා බෝධිසත්වයන් සිටියා දැක තෙමෙත් සිටියේය. බෝධි සත්වයෝ නැවත නික්මුණාහ. ඒ පුරුෂයා නැවත පලාගොස් බෝධිසත්වයන් සිටිවේලේම සිට මෙසේ සිතුයේය. මේ හස්තිරාජයා මට අවැඩක් කැමති එකෙක් නොවෙයි. මේ දුකින් මුදනු කැමැත්තේ වනැයි නිර්භිතව සැකයක් නැතිව සිටියේය. බෝධිසත්වයෝ ඔහු කරා ගොස් පින්වත් පුරුෂය තෝ කවර කාරණයකින් හඬමින් ඇවිදිනේදැයි විචාලෝය. ස්වාමීනි දික්නියම් කොටගත නොහී මන්මුලාව මරණභයින් භයපත්ව ඇවිදිමියි කීය. ඉක්බිත්තෙන් ඕහට බෝධිසත්වයයෝ තමන් වසනතැනට ගොස් කීපදවසක් එලාඑලයෙන් සතපා පින්වත් වූ පුරුෂය තෝ නොබව මම තා මනුෂ්‍යයා පථයට ගෙණ යෙමි කියා තමන් පිට හිඳුවාගෙණ මනුෂ්‍ය පථයට නික්මුනාහුය. ඉක්බිත්තෙන් ඒ මිත්‍රද්‍රෝහි පුරුෂයා කිසිවෙක් විචාළේ නම් කියයුතු වන්නේ යයි බෝධිසත්වයන් පිට හිඳුවා යන වේලෙහි වෘක්ෂ නිමිත්ත පර්වත නිමිත්ත සලකමින් යන්නේය. ඉක්බිත්තෙන් බෝධිසත්වයෝ අසත්පුරුෂයා වනයෙන් පිටත් කොට බරණැස්නුවරට යන්නාවූ මහමාවත සිටුවා පින්වත් පුරුෂය මෙ මගින් යව මා විචාළකෙණෙකුන්ට නොකියවයි ඔහු යවා මහා බෝසතානෝ පෙරලා තමන්වහන්සේ වසන්නාවූ ස්ථානයට ගියේය. ඉක්බිත්තෙන් ඒ පුරුෂයා බරණැස්නුවරට ගොස් ඒ නුවරට ඇවිදිනේ දන්තකාර වීථියට පැමිණ දන්ත විකෘති කරන්නා දැක කිමෙක්ද පින්වත්නි ජීවදන්ත ලද්දෝත් ගනුදැයි විචාළේය. එබස් ඇසූ දළ වඩුවෝ කියන්නෝ පින්වත තෝ කුමක් කියම්ද ජීවදන්ත නම් මළ ඇතුන්ගේ දළට වඩා ඉතා මාහැගී වේදැයි කිවුය. එසේ නම් මම තොපට ජීවදන්ත ගෙණෙමි කියා මාර්ගෝපකරණ ගෙණ කර්කශ වූ කියතක් ගෙණ බෝධිසත්වයන් වසන්නාවූ ස්ථානයට ගියේය. බෝධිසත්වයෝ ඔහු දැක කුමක් නිසා අවුදැයි විචාළෝය. ස්වාමීනි මම දුක්ඛිතයෙමි කාපනයෙමි ජීවත්ව ගත නොහමි නුඹවහන්සේගෙන් දළකැබෙල්ලක් ඉදින් දුන්සේක් වී නම් දළකැබැල්ල ඇරගෙණ ගොස් විකොට ඒ මිලයෙන් ජීවත්වෙමි සිතා ආමි කීය. එබස් ඇසූ මහබෝසතානෝ පින්වත වන්නාටය තට දළදෙමි දළ කපන්ට කියතෙක් ඇද්දැයි විචාළෝය. කියත ඇරගෙණ ආමි කිය. එසේවී නම් කියතින් දළ කපා ගෙණවයි කියා බෝධිසත්වයෝ පා හකුළුවා උරව් ලා වැදහුන්නුය. ඒ අසත්පුරුෂයා බෝධිසත්වයන්ගේ දළ අක් දෙකම කපා ගත්තේය. බෝධිසත්වයෝ ඒ දළ කැබලි දෙක සොඬින් ගෙණ පින්වත් වූ පුරුෂය මට මේ දළදෙක අප්‍රියය අමනාපයයි නොදෙමි, මාගේ මේ දළදෙක මටවඩා දහසක් ගුණයෙන් ලක්ෂයක් ගුණයෙන් ස්වධර්මයන සර්වාකාරයෙන් ප්‍රතිවේධ කරන්ට සමර්ථ වූ සර්වඥතා ඥානය නැමති දන්තයෝම අතිශයින් මට ප්‍රිය වන්නාහුය. මේ මාගේ දන්තදානය සර්වඥතාඥාන ප්‍රතිවෙධයට ප්‍රත්‍යය වේවායි කියා සර්වඥතාඥාණය ඇපකොට දළ සගල දුන්නාහුය. ඒ අසත්පුරුෂවූ පාපියා දළ සගල ගෙණගොස් විකුට ඒ මිල නිමාගිය කල්හි නැවතත් බෝධිසත්වයන් සමීපයට අවුත් ස්වාමීනි නුඹ වහන්සේගේ දළ විකොට ලබනලද මිල මාගේ නය ගෙවන්නට පමණක් සෑහිනෑ එසේ හෙයින් ඉතිරි දළ දුනමැනවයි කිය. බෝධිසත්වයෝ යහපතැයි ගිවිස පළමු පරිද්දෙන් කප්පවා ඉතිරි දළ දුන්නාහුය. ඒ පුරුෂයා ඒ දළත් විකොට නැවත අවුත් ස්වාමීනි ජීවත්වගත නොහෙමි මුල් දළ දුනමනවයි කීය. බෝධිසත්වයෝ යහපතැයි ගිවිස පළමු පරිද්දෙන්ම දුන්නාහුය. ඒ පාපී පුරුෂයා මහාබෝසතානන්ගේ රිදීදමක් හා සමාන වූ සොඬ මඩිමින් කෛලාසකූටයට හා සදෘශවූ කුඹත්තට නැගී දෙදළ විළුඹින් ඇන මස්පීරා රළු කියතින් මුල්දළ කපාගත නොහි වෙහෙසෙන රග බලා සොඬින් කියතකොන අල්වා දළකපා මුල්සිඳුවා ගෙණ ගියෝය. ඒ පාපීවූ පුරුෂයා මහබෝසතානන්ගේ දෘෂ්ටිපථයෙන් ඉවත්ව ගියෙන් මදකින්ම දෙලක්ෂ සතළිස්දහසක් සනකඩ

SANHIDA LANKA

මහබොල් පොළව සිනේරු යුගන්ධරාදී වූ භාරයන් හා දුර්ගන්ධ පිළිකුල් මළ මුත්‍රාදීය ධරන්ට සමර්ථවන්නේ වී නමුත් මහබෝසතානන් ගේ ගුණ රාශිය ධරාගත නොහෙන්නීය මෙන් පැළී විවරවුව, එකෙණෙහිම අවීචිමහ නරකයෙන් අග්නිජාලා නික්ම ඒ මිත්‍රද්‍රෝහී පුරුෂයා කුලසන්තකව රතු පලසකින් පොරවන්නාක් මෙන් වසාගෙණ අවීචිමහානරකයට ගෙණ ගියේය. මෙසේ පාපීවූ පුද්ගලයා පොළොවට වනකල්හි ඒ වන ලැහැබ වසන්නාවූ වෘක්ෂ දේවතාවා අකෘතඥ මිත්‍රද්‍රෝහී පුද්ගලයාට චක්‍රවර්තී රාජ්‍යශ්‍රීය දීත් සතුටුකරවන්ට නොපිළිවනැයි වනලැහැබ එකනින්නාද කොට මෙසේ ධර්මදේශනා කෙළේය. බෝධිසත්වයෝ ආයුපමණින් සිට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මහණෙනි දේවදත්ත ස්ථවිරයෝ අකෘතඥ වූවෝ දැන්මතු නොවෙති පෙරත් ආකෘතඥ වූවොම වේදැයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මේ සීලව නාගරාජ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි මිත්‍රදෝහී පුරුෂයා නම් දැන් දේවදත්ත ස්ථවිරයෝය. වෘක්ෂ දේවතාවා නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි සීලව නාගරාජවූයෙම් දැන් තිලෝගුරු සම්‍යයක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සච්චංකිර ජාතකය

තවද එක් සමයෙක් හි ශාක්‍යකුල ප්‍රදීපවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසනසේක් වධයට උත්සාහ කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක. භික්ෂු සංඝයා වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ ඇවැත්නි දේවදත්ත ස්ථිවිරයෝ සර්වඥයන් වහන්සේගේ ගුණ නොදනිති. වධයට උත්සහ කරති. දේවදත් ස්ථිවිරයන්ගේ නුගුණ කියමින් උන් කල්හි ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කවර නම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි මහණෙනි දේවදත්ත ස්ථවිරයෝ දැන්මතු නොවෙති මට වදයට උත්සාහකළෝ පෙරත් උත්සාහ කළෝම වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි ඒ රජ්ජුරුවන්ගේ දුෂ්ටකුමාර නම් පුත්‍රයෙක් විය. ඔහු කර්කෂය. එරුෂය, ප්‍රභාටාශිෂීයක්හු සමානය නොබැන නොගසා කිසිකෙනෙකුන් හා කථා නොකරන්නේය. ඒ කුමාරතෙම ඇතුලෙහි ජනයාටත් පිටත ජනයාටත් ඇසහුණු රජසක්මෙන්ද කන්ට ආ යකෙකු මෙන්ද අප්‍රියවන්නේය. උද්වේග උපදවන්නේය. ඒ කුමාර තෙම එක්දවසක් ගංගාවෙහි ජල ක්‍රීඩා කරනු පිණිස මහපිරිවරින් ගන්තෙරට ගියේය. එකෙණෙහි මහත්වූ මේඝයක් නැංගේය. සියළුදිග අන්ධකාර විය. ඒ කුමාරතෙමේ දාසකර්මකාරාදින්ට කියන්නේ සගයෙනි මෙසේ එව මා කැඳවාගෙණ ගංගාමාධ්‍යට ගෙණ ගොස් නහවා ගෙණවයි කීයේය. එබස් ඇසූ දාසකම්කරුවෝ දීයහූ ඒ කුමාරයා ගංගා මධ්‍යයට ගෙණගොස් රජ්ජුරුවන් වහන්සේ අපට කුමක් කරණසේක්ද මේ පාවීවූ පුරුෂයා මෙතැන්හිම මරාම්හයි මන්ත්‍රණයකොට කාලකන්නිය මෙසේ එවයි කියා ඔහු දියේ ලා ගොඩනැගී ගංතෙර සිටියාහුය. කුමාරයෝ කොයිදැයි විචාළ කල්හි අපි කුමාරයන් නුදුටුම්හ. වැසි නැගුවා දැක දිය කිම්ද ඉදිරයෙහි ආයේවනැයි කියා අමාත්‍යයෝ රජ්ජුරුවන් සමීපයට ගියාහුය. රජ්ජුරුවෝ කුමාරයා කොයිදැයි විචාළේය. ස්වාමීනි නොදනුම්හ. වැසිනැගු කල්හි ඉදිරියේ ආසේක්වනැයි සිතා ආම්හයි කීහ. එබස් ඇසූ රජ්ජුරුවෝ වාසල්දොර හරවා ගංතෙරට ගොස් පරීක්ෂාකරවයි ඒ ඒ තැන බැළුය. මෙසේ බලා කිසිවෙක් කුමාරයා නුදුටුයේය.

ඒ කුමාරයෝ මේඝයෙන් අන්ධකාරව වැසිවසින්ට පටන්ගත් කල්හි දියෙන් ගන්නාවූ එක් දඬුකඩක් දැක එහි හිඳ මරණභයින් තැතිගෙණ අඬ අඬා යෙති. එකල බරණැස්නුවර වාසීවූ එක් සිටුපුත්‍රයෙක් ගංතෙර සතළිස් කෙළක් ධන නිධානකොට වස්තුලෝභයෙන් ඒ නිධානය සමීපයෙහි සර්පව උපන්නේය. අනික් සිටුපුත්‍රයෙක් ඒ මහාගංගා ප්‍රවාහ දේසයෙහි තිස්කෙළක් ධන නිධානකොට ධන තෘෂ්ණාවෙන් එහිම මූසිකව උපන්නේය. ඔවුන් දෙදෙනා වසන්නාවූ ස්ථානයට වතුරුවන්නේය. ඔහු දෙදෙනා දියවන් මගින් නික්ම ගඟරස පීනාගෙණ ගොස් ඒ රාජකුමාරයන් එල්බගෙණ යන්නාවූ දඬුකඩ සමීපයට පැමිණ දෙන්නාම දෙකෙළවරට නැඟි කඳපිට හොත්තාහුය. තවද එම ගංතෙර එක් දිඹුල්රුකෙක් ඇත. එහි ගිරාපෝතකයෙක් වසන්නේය. ඒ වෘක්ෂයත් දියෙන් මුල්සේදී ගඟ මත්තෙහිය. ගිරාපෝතකයා වැසි වසින්ට පටන්ගත් කල්හි නැඟි පලායානොහී එම දඬුකඩෙහි එක්පසෙක උන්නේය. මෙසේ සතරදෙනා එක්ව ගඟවතුරෙන් යන්නාහුය. එකල්හි අප මහබෝසතානෝ කසීරට ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ වංශයෙහි ඉපිද වැඩිවිය පැමිණ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ ගඟ වක්කලමක පන්සලක් කොටගෙණ වාසය කරන්නාහුය. ඒ මහබෝසතානෝ මධ්‍යම රත්‍රී වේලෙහි සක්මන් කරන්නාහු ඒ රාජ කුමාරයන්ගේ බලවත් වූ බැගෑපත් අඬ අසා මෙසේ සිතූය. මෙබඳු වූ මෛත්‍රී කරුණාවෙන් යුක්ත වූ තාපසයකු බලා සිටියදී මේ පුරුෂයාගේ මරණය සුදුසු නොවෙයි. දියෙන් ගොඩනගා ඔහුට ජීවිත දානය දෙමි සිතා මහබෝසතානෝ ඕහට නොබවයි කියා අස්වසා ගඟට බැස දියසරස පීනා ගෙණ ගොස් ඒ දඬුකඩ එක් කෙළවරක් අල්වාගෙණ අදිනාහූ නාගබල ඇති ශක්තිසම්පන්න වූ මහබෝසතානෝ එකවේගයෙන්ම ගංතෙරට පැමිණ කුමාරයන් ඔසවා ගෙණ ගොස් ගොඩ සිටුවා ඒ නාගසර්පාදිනුත් ගොඩනංවා පන්සලට ගෙණගොස් ගිනිමොලවා මේ සර්පාදී තිරිසන් හෙයින් දුර්වලවෙද්දී සර්පයන්ටම දී පසුව රාජකුමාරයන්ට එලාඵල දුන්නාහුය. එකල රාජකුමාරයෝ මේ කූට තාපසයා මා රජකුමාරයයි නොසිතා තිරිසනුන්ට සත්කාර සම්මාන කොට සම්භාවනා කරන්නේයයි බෝධිසත්වයන් කෙරෙහි ආඝාත බැන්දේය. ඉක්බිත්තෙන් කීපදවසක් ගියකල්හි ඇමදෙනම ඇඟබල බදිසණ වතුරත් බටකල්හි සර්පයා තාපසයන් වැඳ කියන්නේ ස්වාමීනි නුඹ වහන්සේ විසින් මට බොහෝ උපකාරකරණලද, මමවූකලි දිළිඳු වූ එකෙකිමුත් නොවෙමි. අසවල් තැන මාගේ සතළිස් කෙළක් ධන නිධානකොට තිබෙන්නේය. නුඹ වහන්සේට වස්තුවෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි ඒ සියළු ධනය නුඹ වහන්සේට දෙන්ට සමර්ථයෙමි. ඒ ස්ථානයට නුඹ වහන්සේ අවුත් දීර්ඝයයි කියා හඬගාළුව මැනවයි කියා ගියෝය. මියාත් එසේම තාපසයන්ට වස්තු වෙන් පවරා අසවල්තැන සිට මූසිකයයි කියා කැඳවුව මැනවයි කියා ගියේය. ගිරවා වූකලි තාපසයන්ට වැඳ කියන්නේ ස්වාමීනි නුඹ වහන්සේ විසින් බොහෝ උපකාර කරණ ලද්දේය. මට වස්තු නැත. නුඹවහන්සේට රත්ඇල් සාලෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි අසවල් තැන මා වසන්නාවූ තැනට අවුත් සුවපෝතකයයි කියා අඬගාළුව මැනව, එකල මම මගේ නෑයන්ට කියා නොයෙක් සියගණන් ගැල්පුරණ පමණ රත්හැල් ගෙණදෙන්ට සමර්ථයෙමි කියා ගියේය. රාජකුමාරයෝ වනාහී මිත්‍රද්‍රෝහී බැවින් කිසිවක් නොකියාම ඒ බෝධිසත්වයන් තමන් සමීපයට ආකල මරමි සිතාගෙණ ස්වාමීනි මා රාජ්‍යයෙහි පිහිටි කල්හි වැඩියමැනවයි මම නුඹ වහන්සේට සිව්පසයෙන් උපස්ථාන කෙරෙමියි කියා ගියෝය. ඒ රජකුමාරයෝත් නුවරට ගොස් නොබෝ කලකින්ම රාජ්‍යයෙහි පිහිටියේය. බෝධිසත්වයෝ රාජකුමාරාදීන්ගේ සිත් පරීක්ෂාකෙරෙමි සිතා පළමුකොට සර්පයා සමීපයට ගොස් නුදුරුතැනක සිට දීර්ඝයයි කියා බැනවූසේක. දීර්ඝයා එකවචනයෙන්ම නික්ම අවුත් බෝධිසත්වයන්ට වැඳ කිමෙක්ද ස්වාමීනි මෙතන සතළිස් කෙළක් ධන ඇත. ඒ සියළු වස්තු වම

SANIDA LANKA

මැත් කරවාගෙණ ගියමැනවයි කිය බෝධිසත්වයෝ එසේවීනම් වන්නාටය මට කාරියක් පැමිණිකල ගන්නෙම්වේදැයි වදාරා සර්පයා රඳවාපියා මියා සමීපයට ගොස් අඬගෑවාහුය. ඒ මුසිකයාත් එපරිද්දෙන්ම පිළිගන්නේය. බෝධි සත්වයෝ ඔවුන් නවතා ගිරා පෝතකයා සමීපයට ගොස් සුවපෝතකයයි බැණ සත්වයෝ වූය. ඒ ගිරවාත් එකවචනයෙන්ම ගස අතුරින් බැස බෝධිසත්වයන් වැඳ ස්වාමීනි කිමෙක්ද මාගේ නෑයන්ට කියා හිමාලයවන ප්‍රදේශයෙන් නුඹ වහන්සේට සයංජාත හැල් හැරගෙන්වම්දැයි විචාළෝය. බෝධිසත්වයෝ ප්‍රයොජනයක් ඇතිකල්හි දන්නෙම්වෙදැයි ඔහුද වලකා දූන් රජ්ජුරුවන් පරීක්ෂා කෙරෙමි ගොස් රාජෝ‍යාද්‍යානයෙහි වැස දෙවැනි දවස් ආකල්පිත සමුර්ධි ඇතිව පිඬුසිගන්නාවූ වතින් නුවරට වන්නාහුය. එකෙණෙහි ඒ මිත්‍රද්‍රෝහි රජ්ජුරුවන් සරහා පිළියෙළ කරණ ලද ඇත්කඳ මත්තට නැගී මහත්වූ පෙළහරින් නුවර පැදකුණු කෙරෙමින් රජ්ජුරුවෝ ඇත්කඳ මත්තේ හිඳ බෝධිසත්වයන් දුරදීම දැක මේ කූට තාපසයා මා සමීපයේ වළඳ වළඳා වසනු කැමතිව ආයේය. ඒ කාලකන්නි යම්තාක් පර්ෂිත් මධ්‍යයෙහි හිස කප්පවාපියම්හටි සිතා රාජපුරුෂයන් මුනබැළුයේය. රාජපුරුෂයෝ ස්වාමීනි කුමක් කරමෝදැයි කී කල්හි මේ කූටතාපසයා මාගෙන් කිසිවක් ඉල්ලවනු කැමතිව ආයේය යි සිතමි. ඒ කාළ කන්නි තාපසයා මා දැක්ක නොදී ඔහු ලක්වාගෙණ පිටතට හයා බැඳ සතර මන්සන්නධියක් පාසා මරා මරා නුවරින් පිටත්කොට දන්ගෙඩියෙහිදී ඔහුගේ හිස කපි මිණිය ගෙණගොස් ඇනපියවයි විධාන කළෝය. ඒ රාජපුරුෂයෝ රජ්ජුරුවන් කිබස් යහපතැයි පිළිගෙණ ගොස් නිරපරාධ වූ මහබෝසතානෙන් බැඳගෙණ සතරමන් සන්ධියෙදී මරමින් දන් ගෙඩියට ගෙණයන්ට පටන්ගත්තාහුය. බෝධි සත්වයෝ මැරූ මැරූ තැන්හිදි මෑනියනි නොකියාම නොහඬා නිර්භීතකාරීව මෙසේ කියන්නාහුය. මේ ලෝකයෙහි සමහර නුවණැති සත්වකෙණෙක් දියෙන් යන්නාවූ වියලිදණ්ඩක් දියෙන් ගොඩනගාලීම යහපතැයි උතුමැයි කියන්නාහූ වීනම් ඒ උත්තම ප්‍රඥා පුරුෂයෝ සැබැවක්ම කියති. කවර කාරණයකින්ද ඒ දියෙන් නැගූ දඬු කඩ බත් ආදිය පිසීමටත් සිතයෙන් පීඩිත වූ සත්වයන්ට සිත දුරුකරන්නටත් අන්‍ය වූ සර්පාදීන්ගෙන් වන්නාවූ උපද්‍රව දුරු කරන්නටත් උපකාර වන්නේය. එසේවේද මේ පාවී වූ රුෂයා දියෙන් ගොඩනගා ගොඩලා මම්ම මට දුක්පමුණුවා ගත්තෙමි වේදැයි මෙසේ කැසූ කැසූ තැනදී මේ කාරණය කියන්නාවුය. එබස් අසා එතැනට රැස්වූ මනුෂ්‍යයන්ගෙන් යම් කෙණෙක් නුවනැත්තෝවූනම් ඔහු මෙසේ කිවාවුහ.

කිමෙක්ද පින්වත් වූ තාපසයෙනි තොප විසින් අපගේ රජ්ජුරුවන් වහන්සේට කළ කිසි ගුණයෙක් ඇද්දෙයි විචාලෝය. බෝධි සත්වයෝ එපවත් අසා කියන්නාහූ මම මොහු මහ වතුරෙන් යන්නාවූ ගොඩනගා මම්ම මට දුක් කළෙමි. ඒ කාන්තයෙන් පුරාතනයේ නුවණැත්තන් කීවා නොකෙලෙමි. සිතා මෙසේ කියම් කිව්වාහුය. එබස් අසා ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් හා නුවර වාසීහූ මේ මිත්‍රද්‍රෝහී වූ රජ්ජුරුවෝ එබඳු ගුණ සම්පන්න වූ තමන්ට ජීවිත ධානය දුන්නාවූ තපස්වීන්ගේ ගුණ පමණකුත් නොදනිති. මොහුන් නිසා අපට වෙන වැඩෙක් නම් කොයින්ද. එසේ හෙයින් මොහු ගණුවයි කිපී වටින් එක්ව කැට මුගුරු අඩයටි ආදී පහරින් ඇත් කඳ මස්තකයෙහිම රජ්ජුරුවන් මරා ජීවිතක්ෂයට පමුණුවා දෙකකුල් අල්වා ඇදගෙණ ගොස් අගල පිට දමා මහා බෝසතාණන් අභිෂේක කොට රාජ්‍යයෙහි පිහිටවූහ. ඒ මහා බෝසතානෝ දැහැමෙන් රාජ්‍යය කරන්නාහු එක් දවසක් ෂර්පාදීන් පරික්ෂා කරනු කැමතිව මහ පිරිවරින් සර්පයා වසන තැනට ගොස් දීර්ඝ යයි කියා බැනවූය. එවිට සර්පයා අවුත් වැඳ ස්වාමීනි නුඹ වහන්සේ මේ වස්තුව ගත මැනවයි කීය. රජ්ජුරුවෝ හතලිස් කෙලක් වස්තුව අමාත්‍යයන්ට පාවාදී මීයා සමීපයට ගොස් මූසික යයි කියා බැනවූ සේක. ඒ මීයාත් එබස් අසා අවුත් තිස් කෙලක් වස්තුව පාවාදුන්නේය. රජ්ජුරුවෝ ඒ වස්තුව අමාත්‍යයන්ට පාවාදී ගිරවා වසන තැනට ගොස් සුව පෝතකයැයි අඬගෑය. ගිරවාත් ඒ අසා අවුත් දෙපය බැඳ කිමෙක්ද ස්වාමීනි රත්හැල් ගෙනෙම්දැයි කීය. රජ්ජුරුවෝ ඇල් සාලෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි ගෙන්වා ගනිමියි වරෝ යම්හයි කියා සැත්තෑ කෙලෙක් වස්තුව හා සමඟ තුන් දෙනාම කැඳවාගෙන නුවරට ගොස් ප්‍රාසාදයෙහි මතු මහල් තලයට නැගී වස්තු සංග්‍රහ කොට තබා සර්පයාට වසනු පිණිස රන් නලයක් කරවා මීයාට වසනු පිණිස ස්ඵටික මාණික්‍යයමය වූ ගුහාවක් කරවා ගිරවාට වසනු පිණිස රන් මැදිරියක් කරවා සර්පයාට හා ගිරවාට ගොදුරු පිණිස දවසක් පාසා රන් තට්ටමේ මීහා විළඳ ලවා මීයාට ගොදුරු පිණිස සුවඳ ඇල් සහල් රන් තට්ටමේ මී ලවා දී ඔවුන් තුන් දෙනාට සංග්‍රහ කොට දානාදී වූ පින්කම් කළාහුය. මෙසේ සතර දෙනම දිවි පමණින් සමඟි සතුටුව බැස ජීවිතාන්තයෙහි කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහුය. ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේ මහණෙනි දේවදත්ත ස්ථිවිරයෝ දැන් මතු මට වද කලෝ නොවෙයි. පෙරත් වදයට උත්සහ කළෝම වේදැයි. මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගලපා මේ සච්චංකිරි ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි දුෂ්ට වූ රජ්ජුරුවෝ නම් දැන් දේවදත්ත ස්ථිවිරයෝය. සර්පයා නම් ශාරීපුත්‍ර ස්ථිවිරයෝය. මීයා නම් මෞද්ගල්‍යාන ස්ථිවිරයෝය. ගිරවා නම් ආනන්ද ස්ථිවිරයෝය. පසුව රාජ්‍යය කල ධාර්මික රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# රුක්ඛ ධර්ම ජාතකය

තවද අසරණ සරණ වූ තිලෝගුරු බුදු රජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් දියදබරය නිසා තමන්ගේ නෑයන් මහත් වූ විනාසයට පැමිණෙන නියාව දැන ආකාශයෙන් ගොස් රෝහිනී නම් වූ ගංගා මස්තකයෙහි ආකාශයෙහි පලක් බැඳ වැඩ හිඳ නිල් රැස් විහිදුවා ඒකාන්ද කාර කොට නෑයන් බය ගන්වා ආකාශයෙන් බැස ගංතෙර වැඩ හිඳ ඒ කලබය අරඹයා මේ ජාතකය වදාල සේක.

මේ මෙහි සංශේපය විස්තර වූ කලි කුනාල ජාතකයෙහි මතු පහල වන්නේය. එසමයෙහි සර්වඥයන් වහන්සේ නෑයන්ට ආමන්ත්‍රණය කොට මහ රජ්ජුරුවෙනි තොප ඔවුනොවුන්ගේ නෑයෝය. නෑයන් විසින් සමඟි සතුටුව වසන්ට වටනේයයි නෑයන්ගේ සමගී බවක් ඇති කල්හි පස මිතුරෝ අවකාශ නොලැබෙති. මනුෂ්‍යයන්ට තබා සිත් පිත් නැත්තා වූ වෘක්ෂයන්ගේ සමගි බව වන්නේයයි අතීතයෙහි හිමාලය වන ප්‍රදේශයෙහි මහ පවණෙත් සල් වනයෙකැ තරකොට හැමීය. ඒ සල්වනය ඔවුන් ඔවුන් හා මහරුස් පැලැටී ගස් කැලැ ලතා ආදීයෙන් වැළඳ ගත් බැවින් එක රුකකුත් එලවන්නට අසමර්ථව මුදුනෙන් මුදුනෙන්ම මහත් පවන් හමා ගියේය. ලතා ආදියෙන් වැලඳ ගැන්මක් නැතිව එළියෙහි සිටියා වූ අතු පතර වෙලෙත් ආදීයෙන් විශාල වූ එක් මහරුකක් සෙසු රුක් සේ ඒකාබද්ද නොවූ බැවින් ඒ රුක් මුලින් උදුරා එලාපුයේය. මේ කාරණයෙන් තොප හැම දෙනා විසිනුත් සමගි සතුටුව වසන්නට වටනේයයි වදාරා ඒ නෑයන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරන කල්හි පළමු කොට උපන්නාවූ වෙසවුණු රජ්ජුරුවෝ චුත වූය. සක්‍ර දේවේන්ද්‍රයෝ අන් වෙසවුනු රජ කෙණෙකුන් නායකත්වයේ තිබූහ. ඒ වෙසවුණු රජ්ජුරුවන් ඉකුත් වූ කල්හි පසුව උපන් වෙසවුනු රජ්ජුරුවෝ මහරුක්ගස් කැලැ ලිය ආදීයෙන් අතුරෙන් තමන් කැමති කැමති තෙනක විමන් ගතිවයි කියා අසුන් යවුය. එසමයෙහි අප මහා බෝසතානෝ හිමාලය වන ප්‍රදේශයෙහි එක් සල්වනයක රුක්ෂ දේවතාව උපන්නාහ. බෝධිසත්වයෝ නෑයන්ට කියන්නාහු තෙපි හැම විමන් ගන්නා වූ එළියේ සිටි රුක්ෂ වල විමන් ගනුව තෙපි මේ සල් වනයෙහි මා විසින් ගන්නා ලද විමානය පිරිවරා විමන් ගනුවයි කීය. ඒ බෝධි සත්වයන් කීවා කරන්නාවූ නුවණැති දේවතාවෝ බෝධිසත්වයන්ගේ විමානය පිරිවරා වට සිටි සල් ගස් වල විමන් ගත්තාහුය. නුවණැත්තා වූ දේවතාවෝ අපට වනයෙහි විමානයෙන් ප්‍රයෝජන කිම්දැයි මනුෂ්‍යය පථයෙහි ගම් නියම් ගම් රාජධානි වල විමන් ගනුම්හයි ගම්ආදී නිසා වසන්නාවූ දේවතාවෝ ලාභයෙන් හා යසසින් අග්‍ර බවට පැමිණෙති යි කියා මනුෂ්‍ය පථයෙහි හිඳ මග එළිවල අටගත්තාවූ මහ රුක් වල විමන් ගත්තාහුය. ඉක්බිත්තෙන් එක් දවසක් මහත් වූ වැසි සුලගෙක් උපන්නේය. පවන් ඉතා තද බැවින් ගැඹුරට මහ මුල් ඇතිවනස් පටි වෘක්ෂයෝ බිඳි සිඳි ගිය අතු හා වෙලෙක් ඇතිව මුලින් උපුටා වැටියාහුය. ඒ මාරුතය ඉතා චන්ඩ වූයේය. එසේ හෙයින් ඔවුන් හා එක්ව බැඳි සිටියා වූ සල්වනයට පැමිණ ඈත මැත බලා පහරමින් එකරුකකුත් එලන්නට අසමර්ථ විය. බග්න විමානයන් ඇති දෙවියෝ අන් පිළිසරණක් නැතිව දරුවන් ගෙන හිමාලය වනයට ගොස් තමන්ගේ පවත් සල් වනයේ දෙවියන්ට කීවාහුය.

ඒ සල් වනයේ දෙවියෝ මනුෂ්‍යය පථයෙහි දෙවියන් ආනියාව බෝධිසත්වයන්ට කීවාහුය. එබස් ඇසූ මහ බෝසතානෝ නුවනැත්තන්ගේ බස් නොගෙන පිහිටක් නැති තැනට ගියාවූ සත්වයෝ නම් මෙබඳුම වන්නෝ වේ. දැයි කියා ධර්මදේශනා කළාහුය. පින්වත් වූ දේවතාවෙනි ඔහුනවුන් හා එක්ව බැඳි නොසිටි වනයෙහි අට ගත්තා වූ වෘක්ෂයක් මහ පවණින් මුළින් උපුටා හෙලන්නේය. එසේ හෙයින් අචේතස් කවුද සචෙතස් කවුද සියල්ලටම සමගි බව උතුම් වන්නේ යයි මෙසේ මහා බෝසතානෝ මේ කාරණය කියා වෘක්ෂ දේවතාවන්ට අවවාද කොට යවා ආයුෂයාගේ කෙළවර කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියායෝය.  ශාස්තෲ වූ බුදු රජානන් වහන්සේ මෙසේ මහරජ දරුවෙනි නෑයන්ට සමගි වීම යහපත් වන්නේය. එසේ හෙයින් සමගි සතුටුව ප්‍රිය සංවාසයෙහි වසවයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මේ රුක්ඛ ධර්ම ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි දේවතාවෝ නම් දැන් බුදු පිරිසය. නුවණැත් වෘක්ෂ දේවතාවෝ යෙමි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මහාසුපින ජාතකය

තවද එක් සමයෙක්හි දිගු පුළුල් නිල්නුවන් ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වසන සේක්. සොළොස් මහසවප්තයක් අරභයා මේ ජාතකය වදාළ සේක.

එක් දවසක් කොසොල් රජ්ජුරුවෝ රාත්‍රියෙහි නිද්‍රාවට පැමිණි පශ්චිම යාමයෙහි සොළොස් සවප්නයක් දැක භයින් ත්‍රසතව පිබිඳ මේ සවප්නයන් දුටු බැවින් මට කුමක්වේදෝහෝයි මරණයින් භයපත්ව යහන්පිට හිඳම පාන්කොටපුය ඉක්බිත්තෙන් පාන්වූකල්හි ශාන්ති බ්‍රාහමණයන් හා පුරෝහිත බ්‍රාහමණයෝ රජ්ජුරුවන් කරා පැමිණ සවාමීනි රජ්ජුරුවන් වහන්ස රාත්‍රියෙහි සැපසේ විසූසේක්දැයි විචාළෝය, ආචාරිවරයෙනි මට සැපයෙක් නම් කොයින්ද අද මම අළුයම්වේලෙහි සොළොස් සවප්නයක් දුටිමී මම ඒ සවප්නයන් දුටු වේලේ පටන් භයපත් විමි ආචාරිවරයෙනි එහි දෝෂය කියවයි කිවූය සවප්නයන් අසාදන්නමෝවේදැයි කීකල්හි බමුණන්ට රජ්ජුරුවෝ දුටුවා වූ සවප්නය කියා කීමෙක් ද මට මේ සවප්නය දුටුකාරණයෙන් කුමක් වේදැයි විචාළෝය. එබස් ඇසූ බමුණෝ අතසැලූය. රජ්ජුරුවන් විසින් කවරකාරණයකින් තොපි අත්සලවේදැයි විචාළකල්හි මහරජ්ජුරුවන්වහන්ස ඒ සවප්නය ඉතා කකීශවූ සවප්නයකැයි කීහ, ඒ සවප්නයෙහි විපාක කවරේදැයි විචාළකල්හි රාජානතරායය භොගානතරායය ජීවිතානතරායය යන මේ ත්‍රිවිධවූ අනතරායන් අතුරෙන් එක්තරා අනතරායෙක් වන්නේ යයි කිවූය, ඒ සවප්නයට ප්‍රතික්‍රියා කලහැකි දැයි විචාළේය. ඒකාන්තයෙන් මේ සවප්නය ඉතා තද බැවින් ප්‍රතික්‍රියා කල නොහැක්කේය, අපිවූකලී ඒ ස්වප්නයට පිළියම් කරම්හයි ඒ සවප්නයෙහි දෝෂ පහකොටපියන්ට අසමත්වූ අපගේ ශාසත්‍ර ඉගැන්මෙන් ප්‍රයෝජන කිම්දැයි කිවූය, කුමක්කොට ඒ දෝෂ දුරුකරව්දැයි විචාළේය. මහරජ්ජුරුවන්වහන්ස සියල්ලෙන් සතරක්සතරක් නියායෙන් සවීචතුස්ක නම්වූ යාගයක් කරම්හයි කිවූය, රජ්ජුරුවෝ භයින් ත්‍රසතව එසේවී නම් ආචාරිවරයෙනි මාගේ ජීවිතය තොප ඇමඅතය, මට වහා සවසථයක්කරවයි කිවූය, එබස් ඇසූ බමුණෝ බොහෝ වසතුන් ලබම්හ බොහෝ කනබොනදෑත් ගෙන්වා ගණුම්හයි බලවත් සන්තෝෂයෙන් යුක්තව මහරජ්ජුරුවන්වහන්ස අස්වසා මාලිගාවෙන් නික්ම නුවරින් පිටත යාගාවාටයක්කොට බොහෝ චතුස්පද ජාතීන් යාගසථමහයේ බැඳ බොහෝ පක්ෂි සමූහයාත් ගෙණවුත් මේ මේදෑ ලදමැනවයි නැවත ඔබ් නොබ ඇවිදිනාහුය.

එක්ල්හි මල්ලිකා දේවී ඒ කාරණය දැන රජ්ජුරුවන්කරාගොස් මහරජ්ජුරුවන්වහන්ස බමුණෝ නැවත නැවත ඇතමෑත ඇවිදිති කිමෙක්දැයි විචාළීය, එබස් අසා රජ්ජුරුවෝ කියන්නෝ පෝසත්ව ඇවිදිනා තෙපි අපගේ කම්මුල සපීයන් ඇවිදිනා නියාව නොදන්නවාදැයි කිවූය, මහරජ්ජුරුවන්වහන්ස මේ කුමක් කී නියාදැයි විචාළකල්හි මා විසින් මෙබඳු ස්වප්නයක් දක්නා ලද සවප්නයෙහි විපාක බමුණන් අතින් විචාළ කල්හි බමුණෝ ත්‍රිවිධ අනතරායන් අතුරෙන් එක්තරා අන්තරායෙක් පෙණෙයි කියා ඒ අන්තරාය වලකන පිණිස යාගකරම්හයි කියා නැවත නැවත ඇවිදිති කිවූය. කිමෙක්ද මහරජ්ජුරුවන්වහන්ස දිව්‍යමනුෂ්‍යයන් සහිතවූ ලෝකයෙහි අග්‍රබ්‍රාහ්මණයානන් අතින් නුඹවහන්සේ විසින් දක්නාලද්දාවූ  ස්වප්නයට ප්‍රතික්‍රියා විචාරණලදදැයි කිවූය සොඳුර ඒ දිව්‍යමනුෂ්‍යයන් සහිතවූ ලෝකයෙහි අග්‍රබ්‍රාහ්මණවූවෝ කවුරුදැයි විචාළෝය. සවාමීනි දිව්‍ය මනුෂ්‍යයන් සහිතවූ ලෝකයෙහි අග්‍රපුද්ගල සවීධමීයන් සවීකාරයෙහි විශෙෂයෙන් දන්නා වූ පිරිසිදු චිතතසනතාන ඇති නික්ලෙශීවූ මහාබ්‍රහමයානන් වහන්සේ නාඳුනනසේක්ද ඒ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ වනාහි ස්වප්නයෙහි තොරතුරු දක්නාසේක. වැඩිය මැනව මහරජ්ජුරුවන්වහන්ස ඒ සවීඥයන්වහන්සේ අතින් විචාළමැනවැයි කිවූය. රජ්ජුරුවෝ යහපත දේවිනි කියා විහාරයටගොස් බුදුරජානන්වහන්සේට නමස්කාරකොට උන්නාහුය, සවීඥයන්වහන්සේ මධුරසවරවිහිදුවා කිමෙක්ද මහරජ්ජුරුවෙනි ඉතා උදෑසනම අවුදැයි වදාළසේක. ස්වාමීනි මම අළුයම්වේලෙහි සෙළොස් සවප්නයක් දැක භයින් ත්‍රසතව බමුණන්ට කීමී, බමුණෝ ඒ අසා මහරජ්ජුරුවන්වහන්ස ඒ සවප්නයනම් ඉතාතද රූක්ෂවූ ස්වප්නයක ඒ දුටු ස්වප්නය විනාසකරුණු පිණිස චතුෂ්කයෙන් යාගයක් කරම්හයිකියා යාගය සරහති, එසේහෙයින් බොහෝ ප්‍රාණීහු මරණභයින් භයපත්ව සිටියාහ, නුඹවහන්සේ වූකලී දිව්‍යමනුෂ්‍යයන් සහිතව ලෝකයෙහි අග්‍රපුද්ගලසේක, යමක් නුඹ වහන්සේගේ ඥනමුඛයට හමුනොවේ නම් එසේවූ අතීතාගත වතීමානයෙහි උපන්නාවූ කිසිම පදාතීයෙක්නම් නැත්තේය, එසේහෙයින් සවාමීනි බුදුරජානන්වහන්ස මේ සවප්නයෙහි විපාක වදාළමැනවයි කීවිය. මහ රජ්ජුරුවෙනි ඒ එසේමය දිව්‍යමනුෂ්‍යයන් සහිත වූ ලෝකයෙහි මේ සවප්නයන්ගේ තොරතුරු විපාක දක්නට මාහැර අන්සමතීකෙණෙක්නම් නැත්තාහුය, එසේ හෙයින් මම තොපට කියම් එතකුදුවුවත් තොප දුටුසැටියේම සවප්නයකියවයි වදාළසේක. යහපත ස්වාමීනි කියා රජ්ජුරුවෝ දුටුසැටියේම ස්වප්නය කියන්නාහු,

උසභා රුකබාගාවියො ගවාව අසෙසා කංසො

සිඟාලිච කුමෙහා පොකඛරණීච අපාක චන්‍දනං

SANHIDA LANKA

ලාපූ ති සීදනති සීලාපලවනති මණ්ඩූකියො කණහසපෙපගිලනති,

කාකාසුවණණා පරිවාරෙනති තසාවකා එලකානං භයාහීති

යන මේ මාතෘකාව සිතතබා සවප්නයකීවාහුය. කෙසේකීව්දයත් සවාමීනි මම එක් ස්වප්නයක් මෙසේ දිටිමි-අජනවණීවූ කාලවෘෂභයෝ සතරදෙනෙක් යුක්ෂකරම්හයි සතරදිගින් රාජක්ෂගනයට අවුත් වෘසභයුක්ෂය බලම්හයි මහජනයා රැස්වූ කල්හි යුක්ෂකරන්නාවූ ආකාර දක්වා ගජීජනා කොට ඒ ඒ අත පලායන්නාහ, මේ පළමුවන

ස්වප්නය දිටිමි මේ ස්වප්නයට විපාක කවරේදැයි විචාළෝය මහ රජ්ජුරුවෙනි මීටවිපාක තොපසමයෙත් අපසමයේත් නොවන්නේය, අනාගතයෙහි අධර්මිෂ්ඨවූ කෘපන රජදරුවන් හා අධර්මිෂ්ඨ මනුෂ්‍යයන් සමයෙහි ලොව යහපත පෙරලන්ට පටන්ගත්කල්හි කුසලය පසුබැස අකුසලය උත්සනනව කුසලයට අකුසලය මතුව ලොව පිරිහෙන්නාවූ කාලයෙහි වෂ්ඨාව යහපත්ව ඉඳුරා නොවස්නේය මේඝපාදයෝ සිඳෙන්නාහුය සශ්‍යයෝ මලානික වන්නාහුය, එසේහෙයින් දුර්භික්ෂවන්නේය, මේඝයෝ වස්නාක් මෙන් සතර දිගින් නගා සත්‍රීන් අව්වෙහි වැනුවී ආදිය තෙමෙයි යන හයින් අතුළු කොට ගත් කල්හි පුරුෂයන් උදළු හා පෙට්ටිගෙණ ඇල අමුනු නියරබඳින්ට නික්මුණුකල්හි වස්නාආකාරදක්වා ගර්ජනාකොටකොටවිදුලිය ගසගසා අඳුන්වන්කළුගොන් සතරදෙනා රාජාඟනයට අවුත් පොරඅරහයා බොහො දෙනා ගොන්පොරදකුම්හයි රැස්වූකල්හි පොර අන්නාවූ ආකාර දක්වා තප්ලා ගර්ජනාකොට පොරනෑනම ඒ ඒ අත පලායාමෙන් මේඝයෝ නොවැසම පලායන්නාහුය. මේ තෙමේම මේ සවප්නයෙහි විපාකවන්නේය, තොපට වූකලී මේ ස්වප්නය දුටුකාරණයෙන් කිසි අනතරායෙක් නැත. අනාගතය අරභයා දක්නා ලද්දාවූ මේ සවප්නයවන්නේය, බමුණෝ වනාහි තමන්ගේ ජීවිකාවෘතතිය නිසා යාගකිරීමෙන් සන්හිඳෙයි කිව්යයි මෙසේ සර්වඥයන්වහන්සේ ස්වප්නයට නිෂ්පත්තිවදාරා මහරජ්ජුරුවෙනි දෙවෙනිවූ ස්වප්නය කියවයි වදාළසේක.

ස්වාමීනි දෙවෙනි ස්වප්නය මෙසේ දිටිමි කුඩාරුක් හා ගස් පොළොව පලා වියතක් පමණත් රියනක් පමණත් උඩනොනැගීම මල් පිපෙන්නේත් පලාගන්නේත්වෙයි, මේ දෙවෙනි ස්වප්නය දිටිමී, මීට විපාක කවරේ දැයි විචාළෝය, මහරජ්ජුරුවෙනි මීටත් විපාක ලොවපිරිහෙන්නටවන්කල්හි මනුෂ්‍යයන් මන්‍දයුක්ෂ වූ කල්හි වන්නේය, අනාගතයෙහි සත්‍වයෝ අධිකවූ රාග ඇතිවන්නාහුවෙති වයසට නොපැමිණියාවූ කුමාරිකාවෝ පුරුෂාන්තරයට ගොස් ඍතුමතීබව ගර්භනීව දූදරුවන් හා සමඟ වෙසෙති, පැලගස් වල මල්මෙන්ඔවුනොවුන්ගේ ඍතුමතිබව හා එලමෙන් දූදරුවෝ වන්නාහුය, මේ කාරණයෙනුත් තොපට හයෙක් නැත. තුන්වැනි ස්වප්නය කියව මහරජ්ජුරුවෙනියි වදාළසේක.

එකල රජ්ජුරුවෝ තුන්වෙනි ස්වප්නයකින්නාහු මෙසේ කිවුය ස්වාමීනි එදවස්ම උපන්නාවූ වස්සන්ගෙන් දෙනුන් කිරිබොන්නා දිටිමි, මේ තුන්වෙනි ස්වප්නය, මීට විපාක කවරේදැයි විචාළෝය මීටත් විපාක මතු එන්නාවූ කාලයෙහිම මනුෂ්‍යයන්ගේ ජ්‍යෙෂ්ඨාපචායික කර්මයනටකල්හි වන්නේය අනාගතයෙහි සත්‍වයෝ මව්පියන් කෙරෙහිවත් නැදිමයිලන් කෙරෙහිවත් ලජ්ජාවක් නූපදවා තුමූම කුටුම්බයවිචාරා තුමූමතමන්ට සල සාගණිති, බත්පිලියකුත්වෘඤයන්ට දෙනුකැමතිකෙනෙක් දෙති, නොදෙනු කැමතිකෙණෙක් නොදෙති, ඒ වෘඤයෝ අනාථ අසරනව තුමු තමන්නිසා ජීවත්‍වගතනොහී එදවස උපන්නාවූ වසසන්ගෙන් කිරිබොන්නාවූ මහ දෙනුන්මෙන් දරුවන් සිත්ගෙණ උන්නිසා ජීවත්වෙති මේ කාරණයෙනුත් තොපට හයෙක් නැත, සතරවෙනි ස්වප්නය කියවයි මහරජ්ජුරුවෙතියි කීසේක.

ස්වාමීනි ආරොහ පරිනාහ සම්පන්න වූ මහගොන්යුග පරම්පරා අඟයොදා තරුණවූ ගොන්නාඹුන් රථයකටාදීවූ භාරයන් අදනා සඳහා මුල් ගැල් හිස යොදන්නවුන් දිටිමි, ඒ නාඹුගොන් මුලයොදනුලද්දාහු භාරය ඇදගතනොහිකරින් වියදමා සිටියාහුය. එසේ හෙයින් ගැල් කැමති තැනකට ගොස් වෙළඳාම් ආදීවූකාරිය සමුඞ්යකොට ගන්ට නුවූයේය, මේ මාගේ සතරවැනිවූ ස්වප්තය මීට විපාක කවරේදැයි විචාළෝය. මහරජ්ජුරුවෙනි මීට විපාක අනාගතකාපයෙහි අධර්මිෂ්ඨ වූ රජදරුවන් සමයෙහි වන්නේය. අනාගතයෙහි අධර්මිෂ්ඨවූකෘපණවූ රජදරුවෝ නුවනැත්තාවූ පරම්පරාව දූන්මෙහි සමර්ථවූ ඒ ඒ කාර්ය්‍ය සමුක්ෂීකොට දීලන්ට තිසිවූ මහා අමාත්‍යයන්ට යසපිරිවර නොදෙති, ධර්මාධිකරණයෙහිත් රාජකාර්ය්‍ය විචාරන්නාවූ ස්ථානයෙහිත් නුවනැත්තාහු විනිශවයෙහි දක්‍ෂවූ පරම්පරාවන් පැවත ආවාවූ වයෝවෘඤ අමාත්‍යයන් නොසලස්වති, ඔවුන්ට විරුඤවූ තරුණවූ බාලඅමාත්‍යයන්ට යසපිරිවරදෙති. එබඳුවූවන්ම විනිශවයෙහි සලසති, ඒ තරුණ අමාත්‍යයෝ රාජකටයුතු හා යුක්තා යුක්ති නොදන්නාහු ඒ තමන්ට දුන් යසසත් ධරාගත නොහෙති, මහලුවූ නුවනැති අමාත්‍යයෝද යසස් නොබලන්නාහු රාජකටයුතු සමුඞ්කොට දීලන්ට සමර්ථයෝ වීනමුත් අපට මේ රාජකටයුත්තෙන් ප්‍රයෝජනකීම්ද අපි දූන් පිටත්වගියමෝවේද අභ්‍යනතරවූ බාලඅමාත්‍යයෝම ඒ රාජකාරිය දන්නෝවේදැයි උපන්නාවූ රාජකාරියක් නොකෙරෙති, එසේකල්හි සර්වප්‍රකාරයෙන්ම ගැල්හිස උසුලන්ට අසමර්ථවූ නාඹුගොන් ගැල්හිස වියෙහි යෙදූකලක්මෙන්ද ගැල් හිසඋසුලන්ට අදින්ට අසමර්ථවූ මහගොන් වියදක්‍ෂු පරම්පරාවෙන් අගයෙදූ කලක් මෙන්ද, ඒ රජ දරුවන්ට මහත්වූ පරිහානියම වන්නේය, මහරජ මේ කාරණයෙනුත් තොපට හයෙක් නැත පස්වෙනි ස්වප්නය කියවයි වදාළ සේක.

ස්වාමීනි දෙදිසාවෙන් මුඛදෙකක් ඇති අශ්වයෙකු දිටිමි, ඔහුට දෙපිටිම්ම කෑහැකිය. ඒ තෙමේ දෙපිටින්ම කන්නේය. මේ මාවිසින් දක්නා ලද පස් වැනි ස්වප්තය, මීට විපාක කවරේදැයි විචාළේය. මහරජ මේ ස්වප්තයටත් අනාගතයෙහි අධර්මිෂ්ඨවූ රජදරුවන් සමයෙහි විපාකවන්නේය. අනාගතයෙහි අධර්මිෂ්ඨවූ අඥාන රජදරුවෝ අධර්මිෂ්ඨ වූ කල අධර්මිෂ්ඨ මනුෂ්‍යයෝත් විනිශවයෙහිසලසති, කුසලාකුසලයෙහි ආදරයක් නැත්තාවූ ඒ අඥාන මනුෂ්‍යයෝ සභාවෙහි හිඳ විනිශවයකරන්නාහු හිමි නොහිමි දෙදෙනා අතින්ම අල්ලස්ගෙණ මුඛදෙකින් කානම් කන්නාවූ අශ්වයාමෙන් අත්ලස් කන්නාහුය. මේ ස්වප්තය තොපට හයෙක් නැත, සවෙනි ස්වප්නය කියවයි වදාළසේක.

ස්වාමීනි මහාජනයෝ ලක්‍ෂයක් වටනා රන්තාලියක් මැද මෙහි මුත්‍රකරවයි එක් ජරා සිඟාලයක්හට එලවා තිබූය ඒ මහලු කැනහිලා සනරන් තලියෙහි මුත්‍රකෘත්‍යය කරන්නා දිටිමි. මේ මා විසින් දක්නාලද සවෙනි ස්වප්නය, මීට කවර විපාකයෙක්දැයි විචාළෝය. මීට විපාක අනාගතයෙහිම වන්නේය, මහරජ අනාගතයෙහි ජාතිසමපනන නොවන්නාවූ අධර්මිෂ්ඨ රජදරුවෝ ජාති සමපනන කුලපුත්‍රයන්ට මොහු අපට කිසි අනතරායක් කොටපියද්දෝහෝයි

SANHIDA LANKA

සංකාවෙන් යසස් නොදෙති. අකුලීනයන් ඇතිකොට වඨිත වෙති. එසේකල්හි මහාසම්පත් ඇති ජාතිසම්පනත මනුෂ්‍යයෝ ජීවත්ව ගතනොහි මොවුන් නිසා ජීවත්මිහයි අකුලිනයන්ට දූදරුවන්දෙති. මෙසේ ඒ කුලදූන්ගේ අකුලීනයන් සමඟ සංවාසය මහළු කැණහිලාගේ රන්තලියෙහි මුත්‍රකෘත්‍යය කිරීමක් හා සමානවන්නේය, මේ සවප්නයෙනුත් තොපට හයෙක් නැත. සත්වැනිවූ සවප්නය කියවයි වදාළසේක.

සවාමීනි එක් පුරුෂයෙක් ලනුවක් අඹර අඹරා පාමුල තබන්නේය. ඒ පුරුෂයා උන් පුටුවයට හොත්තාවූ හාකුස්ඇති එක් කැනහිල්ධෙනුවක් ඒ පුරුෂයා නොදන්නා පරිද්දෙන් ඒ වරමඬ කන්නීය මම මෙසේ දිටිමි. මේ මාගේසත්වැනිවූ සවප්නය මීට විපාක කවරේදැයි විචාළෝය, මීට විපාක අනාගතයෙහිම වන්නේය. තවද අනාගතයෙහි සත්‍රීහු පුරුෂයන්කෙරෙහි ලොල් වෙති. අලංකාරයෙහි ලොල්වෙති, වීථිවල ඇවිදීමෙහි ලොල්වෙති, ආමිසයෙහි ලොල්වෙති, දුශ්ශීලවෙති, දුරාචාරවෙති. එසේවූ සත්‍රීහු තමන්ගේ පුරුෂයන් කෘෂිවනික් ආදීවූ කර්මාන්තකොට දුකින් ආයාසයෙන් රැස්කරණලද්දාවූ සමපත් චෞර පුරුෂයන් හා එක්ව රාබී මල්පැලඳීම් සුවඳවිලවුන් ගැල් වීම ආදියකොට තමන්ගෙයි අත්‍යායිකවූ කාර්‍ය්‍යයන් නොබලා ගෙයි බල්ලාව සිදුරෙණුත් චෞර පුරුෂයන්ගේ ඊම පරීක්ෂාකෙරෙමින් සෙටදවස් වැපිරියයුතුවූවත් බිජුවට පැර කැඳ බත් අවුළුපත් ආදිය සපයාත් අඹරඅඹරා පාමුල තබනලද වරමඬ කන්නාවූ පුටුවයට වැදහොත් කැනහිල් ධෙනුවමෙන් ඒ චෞර පුරුෂයා හා එක්ව වසතුව කා නසන්නාහුය, මේ කාරණයෙනුත් තොපට හයෙක්නැත, අටවැනි සවප්නය කියවයි වදාළසේක.

සවමීනි මාලිගාදෙරකඩ බොහෝ හිස්වූකල පිරිවරා තබනලද එක්මහත පැන්පිරුණු කලයක් දිටිමි, ක්ෂත්‍රිය බ්‍රාහමණ වෛශ්‍ය ශුද්‍රය යන සතර පක්ෂයෙහි සත්‍වයෝ සතරදිගින් හා සතර අනුදිගින් කලවලින් පැන් ගෙණවුත් පැන් පිරීතිබෙන්නාවූ පූර්ණකුමහයම පුරවති, පුරාපුර වත්කල පැන් ඉතිරි ඉතිරී පලායන්නේය. එසේද විනමුත් නැවත නැවතත් පිරුණු කලයෙහිම පැන් වත්කරන්නාහුය, සිස්කල බලන්නාවූ කෙණෙකුත් නැත. මේ මාගේ අටවැනි සවප්නය මීටකවර විපාකයෙක්දැයි විචාළෝය මහරජ්පුරුවෙනි මීටත් අනාගතයෙහිම විපාකවන්නේය, අනාගතයෙහි වනාහි ලොව පිරි ගෙන්නේය රට නිරෝජ්ජකවන්නේය, රජදරුවෝ දුක්පත්ව කෘපණවෙති, යම් රජ්පුරු කෙනෙක් ඉසුරුමත්ව වෙසෙත්නම් උන් භාණ්ඩාරගෙයි ලක්ෂයක් පමණ කහවණු වන්නේය. ඒ රජ්පුරුවෝ මෙසේ දුක්පත්වූවාහු සියළු දනව්වාසී සත්‍වයන්ලවා තමන්ගේම කර්මාන්ත කරවති. රාජකාරියෙන් පීඩිතවූ මනුෂ්‍යයෝ තමන්ගේ කර්මාන්ත හැර රජදරුවන් පිණිසම ඇල්වී මහවි ආදීවූපුබබණණ හා උඳු මූත් තල කලන්ආදීවූ අපරණණ මපුරති රක්ෂාකෙරෙති කපතිමඩති ගෙටගෙණෙති උක්යතින් පැණීමැඩ උක්පැණී කකාරති පුෂ්පාරාම ඵලාරාමකෙරෙති ඒ ඒ තැන දාමැඩ තබනලද වී සාල් උඳු මුන් තල කලක් ආදිය ගෙණවුත් රජ්පුරුවන්ගේ කොටුගුල්ම පුරවති, තමන්ගේ ගෙයි සිස්වූ කොටුගුළු බලන්නොත් නැත මෙසේ කිරම සිස්වූ කල නොබලා පැන්පිරුකලයම පුරන්නාහා සමාණ වන්නේය. මේ සවප්නයෙනුත් තොපට හයෙක්නැත. නවවෙනි සවප්නය කියවයි වදාළසේක.

ස්වමීනි එකම සැල පැසෙන්නාවූ බත් අපාක වන්නාදිටිමි. අපාකනම් පලා බෙදා තැබුවාක්මෙන් තුන්ආකාරයකින්ම පැසීමය, එක්භාගයෙක බත් ඉතා කොමුය. එක්භාගයක බත් සාල එක්භාගයක මදකොට පැසුනේය, මේ මාගේ දසවැනිවූ සවප්නය මීට විපාක කවරේදැයි විචාළෝය මහා රජ්පුරුවෙනි මීටත් අනාගතයෙහි විපාකවන්නේය. තවද අනාගතයෙහි රජදරුවෝ අධර්මිෂටවෙනි ඒ රජදරුවන් අධර්මිෂටවූකල්හි රාජපුරුෂයෝය බ්‍රාහමණගෘහපතීහුය නියම්ගම්වාසීන් හා දනව්වාසී සත්‍වයෝයයි මෙසේ ශ්‍රමණ බ්‍රාහමණයන් පටන් සියළු සත්‍වයෝම අධර්මිෂට වන්නාහුය. ඉක්බිත්තෙන් ඔවුන්ට අරක්ගත් දෙවියෝය වෘක්ෂ දේවතාවෝය ආකාසසථ දේවතාවෝයයි මෙසේ සියළු දේවතාවෝම අධර්මිෂටවන්නාහුය අධර්මිෂට රජදරුවන්ගේ රාජ්‍යයෙහි මහපවන් තදව හමන්නේය. එසේ තදව හමන්නාවූ පවන් ආකාසසථ විමන් කම්පා කරන්නේය. ඒ විමන් කම්පිතවූ කල්හි දේවතාවෝ කිපී වැසි වැස්විය. නොදෙති, වස්නාවූත් වැසි සියළුරට එක පැහැර නොවස්නේය, තවද වස්නාවූ වර්ෂාව සීසෑමටවත් වැපිරීමටවත් උපකාරීව නොවස්නේය. රාජ්‍යයෙහි යම්සේද එපරිද්දෙන්ම දනව්වෙහිත් වැව් පොකුණු විල් ආදියෙහිත් එකපැහැරනොවස්නේය. වැව් උඩත්තට වසීනම් වැව යටිමියරට නොවස්නේය, යටිමියර වසීනම් උඩත්තට නොවස්නේය. එක්භාගයක ගොයම් අධික වර්ෂාවෙන් නස්නේය, එක්භාගයක ගොයම් වැසී නොවැසීමෙන් මැරෙන්නේය, එක්භාගයක ගොයම් සම වර්ෂාව වස්වා මනාව පැසවන්නේය. මේ එකම රජ්පුරුවන්ගේ රාජ්‍යයෙහි වපුරණලද ගොයම් එක්සැල පැසෙන්නාවූ බත් තුන්කොටසක් වූවාක්මෙන් තුන්පරිද්දකින් පැසෙන්නේය, කාරණයෙනුත් තොපට හයෙක් නැත, එකොළොස්වන සවප්නය කියවයි වදාළසේක.

සවාමීනි ලක්ෂයක් වටිනා සඳුන්හරයක් කුණුමොරට විකුණන්නා දිටිමි. කවර විපාකදැයි විචාළෝය. මීටත් අනාගතයෙහිම මාගේ ශාසනය පිරිහෙන්ට වන්කල්හි විපාකවන්නෝය, තවද අනාගතයෙහි ප්‍රත්‍යයෙහි ලොල්වූ භික්ෂූහු බොහෝවන්නාහ, ඔවුන් මා විසින් බොහෝ ප්‍රත්‍යයෙහි ලොල්බව මැඩ කියනලද ධර්මදෙශනාව චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය නිසා අනුන්ට දේශනාකෙරෙති, ප්‍රත්‍යය ලොභයෙන් මිදී නිසසරණ පක්ෂයෙහි සිට නිර්වාණාභිමුඛබව දෙසන්ට අසමර්ථවෙති, හුදක් මාගේ ව්‍යංජන සම්පතතිය හා මධුරසවරය අසා මාහැඟිවූ සිවුරු ආදිය දෙති, දෙනුකැමැතතා හුද වෙතියි කියාම දෙශනකරති, සමහර කෙනෙක් වීථිමක්ෂ්‍යයය සතරමන් සන්ධියය මාලිගාවේ වාසල්දොරකඩය යනාදීවූ සථානවල හිඳ මදකටක් කහවණුවක් නිසාත් දෙශනාකෙරෙති. මෙසේ මාවිසින් නිර්වාණය අගයකොට දෙසනලද ධර්මය චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍යය යන චතුර්විධ ප්‍රත්‍යය හා මදටක් කහවනුවක් නිසා විකිණියකොට දෙන්නාහුය. ලක්ෂයක් අගනා හඳුන්හරක් කුණුමොරට විකුණන්නාවූන් වැන්නෝය. මේ කාරණයෙනුත් තොපට හයෙක් නැත්තේය. දොළොස්වෙනි සවප්නය කියවයි වදාළසේක.

SANHIDA LANKA

සවාමීනි සිස්වූ වියලි ලබුදියෙහි ගැලෙන්නා දිටිමි, මීට විපාක කවරේදැයි විචාළෝය. මහරජ්පුරුවෙනි මීටත් අනාගතයෙහි යහපත පෙරලෙන්ට වන්කල්හිම විපාකවන්නේය. එසමයෙහි රජදරුවෝ ජාතිසම්පන්නකුල පුත්‍රයන්ට යශස් නොදෙති, කුලගැත්තන්ටම යශස්දෙති, ඒ කුලහීනයෝ ඉසුරුමත්වෙති. කුලපුත්‍රයෝ දිළිඳුවෙති. රජදරුවන් සම්මුඛයෙහිත් රාජචාරයෙහිත් අමාත්‍යයන් සම්මුඛයෙහිත් විනිශචයමණ්ඩලයෙහිත් සිස් ලබු හා සමාන අකුලීනයන්ගේම කථාගැලීසිටියාමෙන් නිශචලව සුප්‍රතිෂ්ඨිත වන්නීය. සඞසකම් ගණකම් යෙහිත් පාත්‍රචීවරදිය හා විහාරාදීන්ගේ විනිශචය සථානයෙහිත් දුශ්ශීලවූ පාපිපුද්ගලයන්ගේම කථාව නෛයර්‍යාණිකවන්නීය. ඔවුන්ගේබස් ග්‍රාහ්‍යවන්නේය. ලජ්ජි භික්ෂූන්ගේ එබස් අග්‍රාහ්‍යවන්නේයයි මෙසේ සර්‍වප්‍රකාරයෙන්ම සිස්ලබු ගිලෙන කලක්මෙන් වන්නේය, මේකාරණයෙනුත් තොපට භයෙක් නැත, තෙළෙස්වැනිවූ සවප්නය කියවයි වදාළසේක.

සවාමීනි මහත්වූ කුළුගෙවල් පමණවූ ඝණ ශෛල නැව්මෙන් දියෙහි හිල්පෙන්නා දිටිමි. මීට විපාක කවරේදැයි විචාළෝය, මහරජ්පුරුවෙනි මීටත් එබඳුවූ කාලයෙහිම විපාකවන්නේය, එසමයෙහි අධර්මිෂට රජදරුවෝ අකුලීනයන්ට යසස්දෙති, ඔවුහු සම්පත්ලැබ ඉසුරුමත්වෙති. කුලීනයෝ දුක්පත්වෙති, ඔවුන් කෙරෙහි කිසිවකුත් ආදර ගෞරව නොකෙරෙති. අන්‍යවූ අකුලීනයන් කෙරෙහිම ආදර ගෞරව කෙරෙති, රජ්පුරුවන් සම්මුඛයෙහිත් අමාත්‍යයන් සම්මුඛයෙහිත් විනිශචයමණ්ඩලයෙහි දක්‍ෂවූ බරගල් හා සමානවූ කුලපුත්‍රයන් බස් පිහිටා නොසිටිනේය, ඒ කුලපුත්‍රයන් කථාකරන්ට වන්කල්හිමුන් කියන්නේ කිම්දැයි අන්‍යවූ අකුලීනයෝ අපහාසකොට නින්‍දාකෙරෙති, භික්ෂූන්වහන්සේගේ සන්නිපාතයෙහිත් උකතප්‍රකාරවූ සථානවල්හී ලජ්ජිපෙසල භික්ෂූන්වහන්සේ ගරුකොට නොසිතති. ඒ ලජ්ජි භික්ෂූන්ගේ කථාවත් සඞසසන්නිපාතාදියෙහි නිශචලව නොසිටින්නේය. ගල හිල්පෙන කලක්මෙන් හිල්පෙන්නේය. ග්‍රාහ්‍ය නොවන්නේය. මේකාරණයෙනුත් තොපට භයෙක් නැත. තුදුස්වැනිවූ සවප්නය කියවයි වදාළසේක.

සවාමීනි මීපුක් සා මැඩියන් මහත්වූ කෘෂ්ණ සර්‍පයන් පසුපස්සෙහි වේගයෙන් එහුබඳවාගෙණගොස් ඇඹුල දක්‍ෂුමෙන් කඩකඩා මුරුමරුයන අනුකරණ ශබ්ද පවත්වමින් මස්කා ගලන්නවුන් දිටිමි. මීටවිපාක කවරේදැයි විචාළෝය, මීටත් නොපිරිහෙන්ට වන්කල්හි අනාගතයෙහි විපාකවන්නේය. එසමයෙහි මනුෂ්‍යයෝ අධිකරාගීවක්ලේශවසඟව ලදරුලදරුවූ තම තමන්ගේ භාර්‍යාවන් වසඟයෙහි පවතී. ඔවුන්ගේ ගෙයි දාසකම්කරු ආදීන් හා ගවමහිසඳී රන්රුවන් ආදියත් ඒ සත්‍රීන් සනතකවන්නේය. අසවල් රන්රුවන් මුතුමැණික් ආදිය හා වසත්‍රාභරණ ආදී සියළු වසතූන් කොයිදැයි විචාළකල්හි ඒ වස්තුව කොයි තිබෙයි නමුත් තට මේ විචාරා ආයාසගැන්ම ප්‍රයෝජන කිම්ද තෝ මාගෙන් ඇතත නැතත විචාරන් නොකැමැත්තෙහිදැයි කියා අනේකප්‍රකාරයෙන් ආක්‍රොශපරිභව බැණ මුඛනැමැති අඩයටියෙන් ඇණ දාසයකුමෙන් තමා වසඟයෙහි පවත්වා තමන් ඉසුරුමත්කම් පවත්වන්නාහුය. එසේකල්හි මීපුක් පමණමැක්ෂියන් කෘෂ්ණ සර්‍පයන් ගලනා කලක්මෙන් වන්නේය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත. පසළොස්වැනිවූ සවප්නය කියවයි වදාළසේක.

සවාමීනි දශවිධවූ අධර්‍මයෙන්යුකතවූ ගම්පහරන්නාවූ කපුටුවෙ රන්වන්වූ පැහැඇතිබැවින් සවර්‍ණයවී ලබනලදනම් ඇති සවර්‍ණහංසරාජයන් පිරිවරා ඇවිදින්නාවූන් දිටිමි. මීට විපාක කවරේදැයි විචාළෝය.

මහරජ්පුරුවෙනි මීටත් අනාගතයෙහි දුර්‍වලරජදරුවන් සමීපයෙහිම විපාකවන්නේය. මහරජ්පුරුවෙනි අනාගතයෙහි රජදරුවෝ හසතිශිල්පාදීයෙහිත් යුක්‍ෂයෙහිත් බුහුටිනොවෙති. සමත්‍ර්‍ථනොවෙති. ඒ රජදරුවෝ තමන්ම රාජ විපතතියෙහි සංකාකෙරෙමින් සමානජාති ඇතතවූ කුලපුත්‍රයන්ට ඓශවර්‍යනොදී තමන්ට මෙහෙකරණ කරනැවැමියන් ආදීවූ සත්‍ත්‍වයන්ට ඓශවර්‍යදෙති, ජාතිගොත්‍රයෙන් යුක්තවූ කුලපුත්‍රයෝ රජදරුවන් පිහිටක් ලැබගත නොහීජිවත්වන්ට අසමත්‍ර්‍ථ ඓශවර්‍යයෙහි පිහිටියාවූ ජාතිගොත්‍රයෙන්හීනවූ අකුලීනයන්ට සේවයකෙරෙති. ඇවිදිති, මෙසේ කල්හි සවර්‍ණහංසරාජයෝ කපුවූවන් පිරිවරා ඇවිදිනාකලක්මෙන් වන්නේය. මේකාරණයෙනුත් තොපටභයෙක් නැත. සොළොස්වැනිවූ සවප්නය කියවයි වදාළසේක.

සවාමීනි පෙර දිවියෝ එළුවන් කති, මමවූකලි දැන් එළුවන් දිවියන් පසුපස්සෙහි ලුහුබැඳගෙණගොස් මුරු මුරු යන අනුකරණකොට කන්නදිටිමි. එකල්හි අන්‍යවූ දෙවියෝ එළුවන් දුරින් එනනාදක භයින්ත්‍රසතව පලාගොස් කැළයට වැද සැඟවෙන්නාහුය, මම මෙසේ දිටිමි, මීට විපාක කවරේදැයි විචාළෝය. මහරජ්පුරුවෙනි මීටත් අනාගතයෙහි අධර්මිෂට රජදරුවන් සමයෙහි විපාකවන්නේය. එසමයෙහි අකුලීනයෝ රාජවල්ලභ වෙති, ඉසුරුමත්වෙති කුලපුත්‍රයෝ අප්‍රසික්‍ෂවෙති. ඒ රාජවලලභවූ කුලහිනයෝ තමන්ගේබස්රජදරුවන්ට කියා ගිය නම් මා විනිශචය ශාලාදියෙහි බලවහිඳ ජාති සම්පනනවූ ප්‍රවේණියෙන් ආවා වූ සත්‍ත්‍වයන්ගේ කෙත්වත් විසින් තොපගේ අපගේ දැයි කියා විනිශචය සථානාදියෙහි විවාදකරණය කල්හි වේවැල් ආදියෙන් ගස්වා බොටුව අල්වා ඉවත දැම්මවා තොපගේ පමණ නොදනුද අප හා සමඟ විවාද කරව්ද දැන් රජ්පුරුවන්වහන්සේට දන්වලා හසතපාදදිය කප්පවාපි නම් ඒ කුලපුත්‍රයා භයගන්වති ඒ කුලපුත්‍රයෝ රාජවල්ලභවූ කුලහීනයන්ට භයින් තමන් සන්තකවූ ක්‍ෂෙත්‍ර වස්තු ආරාමාදිය තොපිම ඇරගනුව තොපට මයයි පාවාදී තමන් ගෙට යහපත්ව වැදහෝනාහුය, පාපිවූ භික්‍ෂුහු ලජ්ජිවූ භික්ෂූන්ට කැමති පරිද්දෙන් පීඩා කරන්නාහු ඒ ලජ්ජි ප්‍රියසීලිවූ භික්ෂූන් වහන්සේ කිසිපිහිටක් නොලැබ වනයට වැද කැලෑදියෙහි සැඟවී හිඳිනා සේක. මෙසේ කල්හි හීනජාතීන් හා පැප භක්‍ෂූන් විසින් පීඩිතවූ ජාතිමත් කුලපුත්‍රයන් හා ලජ්ජි භක්‍ෂූන් එළුවන්ට යටින් දිවියන් සැඟවී භයගෙණ පලා යන කලක්මෙන් වන්නේය. මේ කාරණයෙනුත් තොපටභයෙක්නැත මේ ස්වප්නය අනාගතයම උදෙසා තොප විසින් දක්නාලද්දේය. බමුණෝ වනාහි තමන් අධර්මිෂ්ටවන බැවිනුත් ධර්මයෙහි තත්ත්‍වය නොදන්නා බැවිනුත් තොප කෙරෙහි ස්නෙහයෙනුත්

SANHIDA LANKA

කීහ.

බොහෝ වස්තු ලබම්හයි තමන් වස්තුවෙහි ලොහොබි බැවිනුත් ජිවත් වනු නිසා නුඹවහන්සේ දුටු මේ ස්වප්න විනාශය පිණිස සර්වචතුෂ්ක යාගය කරම්හයි කීවෝවේදැයි මෙසේ සර්වඥයන් වහන්සේ සොළොස් ස්වප්නයෙහි විපාක වදාරා මහරජ්ජුරුවෙනි දැන් මේ ස්වප්නය දුටුවෝ තොපි මතු නොවෙයි පුරාතනයෙහි රජදරුවෝත් දුටුවාහුමය. බ්‍රහ්මණයෝ ඒ රජදරුවන්ටත් මෙපරිද්දෙන්ම කියා මේ ස්වප්නය යාග මත්තට දැමූය. ඉක්බිත්තෙන් නුවනැත්තන් විසින් දෙසනලද  න්‍යායයෙහි සිට බොධිසත්වයන් අතින් විචාළෝය. පුරාතනයෙහි නුවනැත්තෝ ඔවුන්ට මේ ස්වප්නය කියන්නෝ මෙම ක්‍රමයෙන්ම කීවෝවේදැයි වදාරා ඒ කොසොල් රජ්ජුරුවන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතානෝ ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ වංශයෙහි ඉපිද වැඩිවිය පැමිණ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පංචාභිඥා අෂටසමාපත්ති උපදවා හිමාලයවන ප්‍රදේශයෙහි ධ්‍යානක්‍රීඩාවෙන් යුක්තව වාසය කරන්නාහුය. එසමයෙහි බරණැස්නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මෙම ක්‍රමයෙන් ස්වප්නය දැක බමුණන් අතින් විචාළෝය, බමුණෝම මෙපරිද්දෙන් යාග කරන්නට ගත්හ, බමුණන් අතුරෙන් පුරෝහිත බ්‍රාහ්මණයාගේ අතවැසි මාණවකයා ප්‍රඥසම්පන්නය ව්‍යක්තය, ඒ තෙමේ ආචාරීන්ට කියන්නේ ආචාරීන් වහන්ස නුඹවහන්සේ විසින් අපි වේදත්‍ර උගන්වන ලදුම්හයි ඒ වේදත්‍රයෙහි එකකු මරා එකක්හට ස්වස්තයක් කීරීමක් නැත්තේ වේදැයි කීය. එබස් ඇසූ ආචාරී කියන්නෝ දරුව මේ උපායෙන් අපට බොහෝ වස්තු උපදවන්නේය. තෝ වූකලී රජ්ජුරුවන්ගේ වස්තු රකනා කැමැත්තේ වෙනැයි කිවූය. එබස් ඇසූ මානවකයා එසේ වීනම් ආචාරීන්වහන්ස නුඹ වහන්සේගේ යාගකාරිය කළමැනවයි මම නුඹ වහන්සේ සමීපයෙහි කුමක් කරම්දැයි කියා ගොස් ඉවත ඇවිදිනේ රජ්ජුරුවන්ගේ උයනට ගියේය. එදවස් මහා බෝසතාණෝත් ඒ කාරණය දැන අද මා විසින් මනුෂ්‍ය පථයට ගිය කල්හි මහජනයා මගේ බන්ධනයෙන් මිදීම වන්නේ යැයි ආකාශයෙන් ගොස් උයනේ බැස රන්පිළිමයක් මෙන් මගුල් සල වට මත්තේ උන්නාහුය. ඒ මානවකයාද බෝධි සත්වයන් කරා ගොස් එකත්පසව හිඳ සුවදුක් කථා කළේය. මහාබෝසතාණෝ ඒ මානවකයා හා සමඟ මිහිරි වූ පිළිසඳර කථා කොට කිමෙක්ද මානවකය රජ්ජුරුවෝ දැහැමින් රාජ්‍යය කෙරෙත්දැයි විචාලෝය. ස්වාමීනි රජ්ජුරුවන් වහන්සේ වූ කලී ධර්මිෂ්ට සේක. එතකුදු වුවත් බමුණු උන් වහන්සේ අපාය මාර්ගයෙහි පවත්වති. රජ්ජුරුවන් වහන්සේ සොලොස් ස්වප්නයක් දැක බමුණන්ට කී සේක. බමුණෝ යාගකම් කරම්හයි පටන් ගත්හ. කිමෙක්ද ස්වාමීනී මේ ස්වප්නයන්ගේ විපාක මේ යයි රජ්ජුරුවන් වහන්සේ ගිවිස්වා මහජනයා භයින් මුදන්ට නුඹ වහන්සේට නොවටිදැයි කීහ. මානවකය අපි වූ කලී රජ්ජුරුවන් නාදුනම්හ. රජ්ජුරුවන් වහන්සේ අප නාදුනති. ඉදින් මෙතනට අවුත් විචාලෝ නම් අපි ඔහුන්ට කියන්නමෝ වේදැයි කිවුය. මානවකයා ස්වාමීනි මම රජ්ජුරුවන් වහන්සේ කැඳවාගෙන එමියි. නුඹ වහන්සේ මාගේ ඉම බලමින් ඇසිල්ලක් පවා උවමනදැයි කියා බෝධිසත්වයන්ට ප්‍රතිඥාදී රජ්ජුරුවන් සමීපයට ගොස් මහරජ්ජුරුවන් වහන්ස එක් ආචාරි තාපසකෙනෙකුන් වහන්සේ නුඹ වහන්සේගේ උයනෙහි බැස නුඹ වහන්සේ විසින් දුටු ස්වප්නයෙහි විපාක කියමි කැඳවන සේකැයි කියමි. රජ්ජුරුවෝ ඔහුගේ කථා අසා මහජනයා පිරිවරා එකෙනෙහිම උයනට ගොස් තාපසයන් වැඳ එකත්පස්ව හිඳ ස්වමීනි නුඹ වහන්සේ මා දුටු ස්වප්නයෙහි විපාක දන්නා සේක්දැයි විචාලෝය. එසේය මහ රජ්ජුරුවනි කී කල්හි එසේ වී නම් කිවමැනවයි කිව්ය. මහරජ්ජුරුවනි කියම් තොප දුටු සැටියේ ස්වප්නය මට කියවයි කිවුය. යහපත ස්වාමීනි කියා රජ්ජුරුවෝ

උසභා රුක්ඛාගාවියෝ ගාවාච අසේසා කංසෝ
සිඟාලීච කුමෝභා පොක්ඛරණිච අපාක චන්දනං
ලාපුනි සිදන්ති සිලාපලවන්ති
මණ්ඩුකියො කණභසපේපගිලන්ති
කාකාසුවණ්ණා පරිවාරයන්ති
තසාචකා එලකානං භයාහිති,

යන මේ ගාථාව කියා පසේනදි කොසොල් රජ්ජුරුවන් විසින් කියන ලද ක්‍රමයෙන්ම සොලොස් ස්වප්නය කිවුය. බෝධි සත්වයෝත් ඒ සොලොස්ස්වප්නය දැන් සර්වඥයන් වහන්සේ වදාල සැටියේම විස්තර හෙයින් විපාකයන් කියා කෙළවර මෙසේ කිවුය. මහරජ්ජුරුවෙනි මෙතන ස්වප්නයෙහි නිශ්පත්ති වන්නේය. ඒ ස්වප්නයෙහි දෝශ නසන පිණිස යම් යාග ක්‍රියාවක් පවතී නම් ඒ යාග විපරීත හෙයින් පවත්නේය. කවර කාරණයකින්ද යත් මේ සොලොස් ස්වප්නයෙහි විපාක නම් ලෝකයෙහි සත්වයන්ගේ ගුණ පෙරලෙන්ට වන් කල්හි අකාරණ කාරණ යයි කියා ගන්නා කල්හි කාරණය අකාරණයයි ගන්නා කල්හි අභූත භූත යයි කියා ගන්නා කල්හි භූතයා අභූතයයි කියා ගන්නා කල්හි අලජ්ජීන් උත්සන්න වන කල්හි ලජ්ජීන් පිරිහෙන කල්හි වන්නේය. දැන් තොපගේ වත් මේ පුරුෂ යුග්මය පවත්නා කල්හි මේ සොලොස් ස්වප්නයෙන් වන විපාකයෙක් නැත. එසේ හෙයින් මේ ඒ ස්වප්න විපාක විනාශය පිණිස පවත්නාහු යාග ක්‍රීයා විපරියාස හෙයින් පවත්නේය. ඒ යාගයෙන් ප්‍රයෝජන නැත. තොපට මේ සොලොස් ස්වප්නය දුටු කාරණයෙන් භයෙක්වත්, තැතිගැන්මෙක්වත්, නැතැයි මහාබෝසතාණෝ රජ්ජුරුවන් අස්වසාලා මහජනයා භන්දයෙන් මුදා නැවත ආකාශයේ සිට රජ්ජුරුවන්ට අවවාද කියා පංචශීලයෙහි පිහිටුවා මෙතැන් පටන් මහරජ්ජුරුවෙනි බමුණන් හා එක්ව කරන්නා වු පසුඝාත නම් යාගය ඇරපියවයි ධර්ම දේශනා කොට ආකාශයෙන්ම තමන් වසන්නා වූ ස්ථානයටම ගියෝය. රජ්ජුරුවොත් මහබෝසතානන්ගේ අවවාදයෙහි

SANHIDA LANKA

පිහිටා ධානාදි වූ පින්කම් කොට කම් වූ පරිද්දෙන් පින්කම් කොට මියපරලොව ගියෝය. සත්‍ය වූ බුදුරජානන්වහන්සේ මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා මහරජ්ජුරුවෙනි ස්වප්න දුටු කාරණයෙන් තොපට භයෙක් නැත. මේ යාගය හැර පියවයි යාග හරවා මහජනයාට ජීවිත දානය දී පූර්වාපර සන්ධි ගලපා මේ මහා සුපිනි ජාතකය නිමවා වදාල සේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. මානවකයා නම් ශාරිපුත්‍ර ස්ථවිරියෝය. එසමයෙහි තපස් වී වුයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේක.

SANHIDA LANKA

# ඉල්ලීස ජාතකය

තවද එක්සමයෙක්හි ලෝකාත්‍රයට ප්‍රදීපයක් බඳුවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක්. මචජරිය කොසිය සිටානන් අරභයා මේ ජාතකය වදාලසේක.

රජගහනුවරට නුදුරුතෙනක සකබරා නම්වූ නියම්ගමෙක් වූයේය. එහි අසූකෙළක් පමණ ධනසම්පත් ඇති මචජරිය කොසිය නම් සිටුපුත්‍රයෙක් වසන්නේය, ඒ සිටුපුත්‍රතෙම තණකොන්දක් තෙල්ගාලා එයින් තෙල්බින් දුවකුත් අනුන්ට නොදෙන්නේය. තෙමේත් අනුභවනොකරන්නේය. මෙසේ ඔවුන්ගේ වසතුසමූහය පුත්‍රදාරාදීන්ටවත් ශ්‍රමණ බ්‍රාහමණාදීන්ටවත් ප්‍රයෝජනයකට නොපැමිණෙන්නේය, රාක්‍ෂසාධිගෘහිතවූ පුෂ්කරණියන්මෙන් අපරිභොගව සිටිනේය. එක්දවසක් සර්‍වඥයන් වහන්සේ අලුයම්වේලේ මහා කරුණා සමාපතතියෙන් නැගී සියලු සක්වළ චතුසසත්‍යාවබොධයට සුදුසු බන්ධූන් බලා වදාරණසේක්. පන්සාලිස් යොදනකින් මත්තේ වසන්නාවූ භායර්‍යාව සහිතවූ සිටානන්ගේ ශ්‍රොතාපතතිඵලයට උපනිශ්‍රය දුටුසේක. සර්‍වඥයන් වහන්සේ මහාකරුණාසමාපතතියෙන් නැගී බලන්නෝ පළමු දවසෙක රාජ සේවයට රජගෙට ගොස් රජ්ජුරුවන්ට සේවය කොට එන්නාවූ සිටානෝ සාකුස් ඇතිව දනව්වැසි ම කොමුයෙන් පිරුණාවූ කබල්ලක් කන්නා දැක එහි තෘෂ්ණාව උපදවා තමන්ගේ ගෙට ගොස් මෙසේ සිතුය, ඉදින් කබල්ලක් කනු කැමැත්තෙම් කියෙම් නම් මා සමඟ බොහෝ දෙන කනු කැමති වෙති, එසේ කල්හි මාගේ බොහෝ සාල් ගිතෙල් මී උක්සකුරු ආදිය නිමවන්නේය, එසේ හෙයින් කිසිවක්හට නොකියම්, තෘෂ්ණාව ඉවසා ගෙණ ඇවිදිනාහුය, ඒ සිටානෝ කල් යත් යත් සුදුමැලිව ගිය ශරීර ඇතිව ඉපිල තිබෙන්නාවූ නහරබහනින් වලඳිනාලද ශරීර ඇතිවූය, ඉක්බිත්තෙන් තෘෂ්ණාව ඉවසාගතනොහී ගබඩාවට වැද ඇඳ වැලඳ ගෙණ වැදහොත්තාහුය, මෙසේ දුර්‍වල පැමිණත් වසතු විනාශ වෙයි යන භයින් කවුරුන්ටත් කිසිවක් නොකිවාහුය, එකල්හි සිටානන්ගේ භාය්‍ර්‍යාව සමීපයට ගොස් පිට පිරිමැද සවාමීනි නුඹවහන්සේට අඵාසුකුමක්දැයි විචාළීය. මට කිසි අඵාසුවෙක් නැතැයි කීකල්හි කීමෙක්දැයි සිටානන් වහන්ස රජ්ජුරුවන් වහන්සේ කිපීසේක්දැයි විචාළීය. රජ්ජුරුවන්වහන්සේ මට කළ කෝපයෙක් නැතැයි කීකල්හි එසේ කල නුඹවහන්සේගේ දූදරුවන් විසින්වත් දාසකම් කාරාදීන් විසින්වත් කරණලද කිසි අමනාපයෙක් ඇද්දැයි විචාළීය, එබන් දකුත් නැතැයි කීකල්හි නුඹවහන්සේට කිසි තෘෂ්ණවෙක් ඇද්දැයි විචාළීය, එසේ කල්හි වසතුවිනාශ භයින් කිසිවක් නොකියා නිශ්ශබ්දවම වැදහොත්තාහුය, ඉක්බිත්තෙන් සිටානන්ගේ භාය්‍ර්‍යාතොමෝ සවාමීනි කිවමැනවයි කිසිවක් නුඹවහන්සේට තෘෂ්ණාව ඇද්දැයි විචාළීය, එබස් ඇසූ සිටානෝ බස ගැලපියන්නාක්මෙන් එක් තෘෂ්ණාවක් ඇතැයි කිවූය, සවාමීනි කවර තෘෂ්ණාවෙක්දැයි විචාළ කල්හි කබල්ලක් කනුකැමැත්තෙම් කිවූය, සවාමීනි කවර තෘෂ්ණාවෙක්දැයි විචාළකල්හි කබල්ලක කනුකැමැත්තෙම් කිවූය. එසේ කල නුඹවහන්සේ මෙතෙක්දවස් කුමක් පිණිස නොකීසේක් ද, නුඹවහන්සේ දිළිඳු සේක් ද, සකබර නම් නියම්ගම් වැස්සන්ට සෑහෙන පරිද්දෙන් කබළු පිසම්දැයි කිවූය, තීට ඔවුන්ගෙන් ප්‍රයෝජන කීම් ද ඌතුමූ තමන්ට උපාය ගෙණ කති කිවූය, එසේවීනම් එක වීථියෙක වසන්නවුන්ට සෑහෙන පරිද්දෙන් පිසම්දැයි කිවූය, තොපි මහසමපත් ඇතිනියාව දන්නමෝවේදැයි කීවූය, එසේවීනම් මේ ගෙයි පමණක් සියල්ලවුන්ට සෑහෙනුකොට පිසම්දැයි කිවූය, මම තොප මහත්වූ අදහස් ඇති නියාව දන්නේවේදැයි කිවූය, ඒ එසේවීනම් නුඹවහන්සේගේ දූදරුවන් පමණට සෑහෙන නියායෙන් පිසම්දැයි විචාළීය, ඔවුන්ගෙන් තිට ප්‍රයෝජන කීම්දැයි කීකල්හි එසේවීනම් නුඹවහන්සේටත් මටත් සෑහෙනපරිද්දෙන් පිසම්දැයිකිවූය, තෝ මට කුමක්කරන්නෙහිදැයි කීකල්හි එසේවීනම් තනිව නුඹවහන්සේටම සෑහෙන නියාවෙන් පිසම්දැයි විචාළීය, එකල සිටානෝ කියන්නෝ මෙතනදී පිසන කල බෝහෝදෙනා කනුකැමති වෙති, නොකඩසාල් හැර කඩසාලත් උදුන හා කබල් ආදියත් ගෙනයන්නෙම් යන්තන් කිරිතෙල් මී උක්සකුරු ආදීයත් හෙණ සත්මාලක් ඇති ප්‍රාසාදයාගේ මතුමහල්තලයට නැඟී පිසවා එතැන්හිම උදකලාව හිඳ කම් කිවූය, ඒ සිටු දූ සිටානන් කීබස් යහපතැයි පිළිගෙණ ගතයුක්ත ගෙන්වා ගෙණ ප්‍රාසාදයට නැගී කෙල්ලන් යවා සිටානන් කැඳවූය, ඒ සිටානෝ ආදී පටන් දොරවල් පියමින් හැම දොරවල්වලම අගුල්ලා සත්වෙනි මාලට නැගී ඒ සත්වෙනි මාලයෙහි දොරපියා උන්නාහුය සිටානන්ගේ භාය්‍ර්‍යාවන් උදුනෙහි ගිනිමොලවා කබල ලිපතබා කබළු පිසන්ට පටන්ගත්තීය, එකල සර්වඥයන් වහන්සේ මුගලන් මහතෙරුන් වහන්සේට උදෑසනම මෙසේ වදාළසේක. මහාමොග්ගල්ලාන ස්ථවිරයෙනි රජගහනුවර සකබාර නම් නියම්ගම මචජරිය කොසිය නම් සිටුපුත්‍රයෙක් කබළු කම් සිතා අනුන්ගේ දැක්මට භයින් සත්මාලක් ඇති ප්‍රාසාදයෙ මතුමහල් තලයෙහි කබළු පිසන්නේය, තෙපි එතනට ගොස් ඒ සිටුපුත්‍රයා දමනෙහිලා ඔහුගේ සනතානගතවූ කෙළෙස් නමැති විෂවිනාශකොට සිටු පුත්‍රයා හා සිටුදූ ලවා කබළු කිරිතෙල් මී සකුරු ආදීවූ දෙය ගෙන්වා තොපගේ බලයෙන් ජෙතවනයට එව මම අද පන්සියයක් භික්‍ෂූන් හා සමඟ විහාරයෙහිම හිඳිමි, ඒ කබල්ලක පූපයෙන් ආහාර කෘත්‍යය කෙරෙමි, වදාළසේක, තෙරුන්වහන්සේ යහපත ස්වාමීනි කියා සර්වඥයන් වහන්සේගේ වචනය පිළිගෙණ එකෙණෙහි ඍද්ධිබලයෙන් ඒ නියම්ගමට ගොස් ඔහුගේ ප්‍රාසාදයෙහි සිව් මැදුරු කවුළුව සමීපයෙහි මනාකොට හැඳපෙරවා ආකාශයෙහි ඉඳුනිල්මිණි රුවනක් මෙන් සිටිසේක. මහසිටානන්ට තෙරුන්වහන්සේ දැකලාම ලය කම්පිතව ගියේය. ඒ සිටානෝ මම මෙබඳුවූ ශ්‍රමණයන්ට භයින්ම මේ ස්ථානයට ආම්, මේ ශ්‍රමණයෝ වනාගි අවුත් කවුළුදොර සමීපයෙහි සිටියේයයි අතිකක් කියා කොටගතහැකි දෙයක් නොදැක ගින්නට දැමූ ලුණුකැටියක් මෙන් රොසයෙන් තට තට යන අනුකරණ ශබ්ද පවත්වමින් මෙසේ කීහ.

ශ්‍රමණයෙනි තෙපි ආකාශයෙහි සිට කුමක් ලබව්ද? ආකාශයෙහි ආපදයෙහි පද දක්වා සක්මන් කළමුත් කිසිවක් නොලබන්නා වේදැයි කිවුය. තෙරුන්වහන්සේ එමතෙන ආකාශයෙහි සිට ඈත මෑත සක්මන් කළසේක. සිටානෝ ඒ දැක ශ්‍රමණයෙහි සක්මන්කොට කුමක් ලබව්ද ආකාශයෙහි පලක් බැදගෙණ උන්නේවීනමුත් කිසිවක්

SANHIDA LANKA

නොලබන්නාවේදැයි කිවූය. තෙරුන් වහන්සේ ආකාශයෙහි පලක් බැඳ හුන්සේක. ඉක්බිත්තෙන් සිටාණෝ ඒ දැක ආකාශයෙහි හිඳ කුමක් ලබව්ද කවුළුදොර එළිපත්තෙන් සිටියේවී නමුත් කිසිවක් නොලබන්නාවේදැයි කිවූය. තෙරුන්වහන්සේ එළිපතමත්තේ අවුත් සිටි සේක. ඉක්බිත්තෙන් ඒ දැක එළිපතමත්තේ සිට කුමක් ලබනසේක්ද දුමා ගියානමුත් කිසිවක් නොලබන්නාවේදැයි කිවූය. තෙරුන්වහන්සේ එබස් අසා දුමාගියසේක. සියළු ප්‍රාසාදය ධූමයෙන් ඒකාන්ධකාර විය. සිටානන්ගේ ඇස් ඉදිකටුවෙන් විදිනාකලක්මෙන්විය. ගෙය දාදෝහෝයි යන භයින් ඉදින් දිලිහි ගියා නමුත් කිසිවක් නොලබන්නාවේදැයි නොකියා මෙසේ සිතුයේය. මේ මහණ ඉතා ලග්නය, ඒකාන්තයෙන් නොලැබ නොයන්නේය. එසේහෙයින් මෝහට එක් පූපයක් දෙවමියි භාර්‍ය්‍යාවට කියන්නෝ සොඳුර මෝහට කුඩා පූපයක් පිසදී යවාපියවයි කීහ. ඕතොමෝ සැඳිඅගින්ම පිටිසුගක් කබලේ වත්කොටපූය. එකෙණෙහි මහත්වූ පූපයක්ව සියළු කබලපුරා ගෙණවිත් නැගීසිටියේය, සිටාණෝ ඒ දැක තී විසින් බොහෝකොට පිටි උකාගන්නාලදැයි කියා තුමූම සැඳිඅගින් පිටිපොඩියක් උකාගෙණ කබලේ වත්කොටපූය. පළමු වත්කොට පිසූ පූපයට වඩා මහත්විය. මෙසේ යම් යම් පූපයක් පිසන්නේනම් ඒ පූපය මහත්ව ගෙණයන්නේය. සිටාණෝ ඒ දැක කලකිරී භාර්‍ය්‍යාවට කියන්නේ සොඳුර මෝහට එක් පූපයක් දී යවාපියවයි කිවූය. එබස් අසා ඒ සිටුදූ පෙට්ටියෙන් එක් පූපයක් ගන්ට වන්කල්හි සියල්ලම ඒකාබද්ධව ඇලී ගියේය. ඒ සිටුදූ සිටානන්ට කියන්නී සවාමීනි සියළු පූපයන්ට ඒකාබද්ධව ඇලී ගියේය. වෙන්කොට ගතනොහෙමි කිව, මම වෙන් කෙරෙමියි කියා සිටාණෝත් වෙන්කොට ගතනුහුවෝය. දෙදෙනම දෙකෙළවර අල්වා ඇද වෙන්කොට ගතනුහුනුවාහුය. ඉක්බිත්තෙන් ඒ සිටානන් පූපයන්ට හා වෑයම්කරන්නවූ තැනැත්තහුගේ සකල ශරීරයෙන් ඩා බිඳගත්තේය. කබල්ලෙහි තෘෂණාව සිඳීගියේය. එකල්හි සිටාණෝ භාර්‍ය්‍යාවට කියන්නෝ සොඳුර මට පූපයෙන් කම්නැත, පෙට්ටියපිටින්ම මේ භික්ෂුවට දීපියවයි කිවූය. ඒ සිටුදූ පෙට්ටියපිටිම්ම ඇරගෙණ තෙරුන්වහන්සේ සමීපයට ගියාය. එකල තෙරුන්වහන්සේ දෙදෙනාටම ධර්‍මදෙශනාකොට රත්නත්‍රයෙහි ගුණ වදාළසේක. දෙනලද දානයෙහි විපාක ඇත. අමුතුපඬුරුවශයෙන් දෙනලද දක්ෂිණායෙහිත් විපාක ඇතැයි දානාදීන්ගේ විපාක ආකාශයෙහි පුන්සඳමඬලක් මෙන් ප්‍රකාශ කොට දැක්වූසේක.

ඒ අසා ප්‍රසන්නවූ සිත් ඇතිව ස්වාමීනි අවුත් මේ පර්‍ය්‍යඞකයෙහි වැඩහිඳ මේ පූපයන් වැලඳුව මැනවැයි ආරාධනා කළෝය. තෙරුන්වහන්සේ වදාරණ සේක්. සිටාණෙනි සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ පූපයන් වලඳිමියි පන්සියයක් භික්ෂූන්වහන්සේ හා සමඟ විහාරයෙහි වැඩහුන්සේක. තොපගේ අභිප්‍රාය ඇත්නම් සිටුදුව ලවා පූපයන් හා ක්ෂීරාදිය ගෙන්වාගෙණ සර්‍වඥයන්වහන්සේ සමීපයට යවයි වදාළසේක. සිටාණෝ කියන්නෝ සවාමීනි සර්‍වඥයන්වහන්සේ කොයි වසනසේක්දැයි විචාළෝය. සිටාණෙනි මීට පන්සාලිස් යොදනකින් මත්තෙහි ජේතවන විහාරයෙහියයි වදාළසේක. ස්වාමීනි වේලා නුගුළුවා මෙතෙක් දුර කෙසේ යමෝදැයි කිවූය. පින්වත්වූ සිටාණෙනි තොපගේ යන්ට අභිප්‍රායෙන් ඇත්නම් මම තොප සෘඬිබලයෙන් ගෙනයම්, තොපගේ ප්‍රාසාදයෙහි ඉණිහිස තිබූතැනම තිබෙන්නේය, ඉණිපාමුල වනාහී ජේතවන දොරටුවෙහිම වන්නේය, උඩුමාලෙන් යටිමාලට බස්නාදතුරෙහිම තොප දෙදෙනා ජේතවනයට ගෙණයම් වදාළසේක. සිටාණෝ යහපත සවාමීනියි පිළිගත්තුය. එකල තෙරුන්වහන්සේ හිණිහිස ඒ ප්‍රාසාදයේ හිමකොට ඒ හිණිපාමුල ඒ ජේතවන දොරටුව වේවයි ඉටුසේක. එසේවූයේය. තෙරුන්වහන්සේ සිටානනුත් සිටුදුවත් උඩුමාලෙන් යටිමාලට බස්නාට පළමුකොට ජේතවනයට පැමිණවූසේක. ඔහු සර්‍වඥයන්වහන්සේ කරා එළඹ වලඳින්ට වේලායයි දැන්වූය. සර්‍වඥයන්වහන්සේ එබස් අසා භොජනශාලාවට වැද භික්ෂුසංඝයාවහන්සේ හා සමඟ පනවනලද බුද්ධශාසන මසතකයෙහි වැඩහුන්සේක. මහසිටාණෝ බුදුන් ප්‍රධානකොට ඇති පන්සියයක් භික්ෂුසංඝයාවහන්සේට දක්ෂිණෝදකය දුන්නුය. සිටුදූ සර්‍වඥයන්වහන්සේගේ පාත්‍රයට පූප පිළිගැන්වූය. සර්‍වඥයන්වහන්සේ තමන්වහන්සේට යපෙනපමණක් පිළිගත්සේක. පන්සියයක් භික්ෂූන්වහන්සේත් එසේම පිළිගත්සේක. සිටාණෝ දිගටම කිරි තෙල් මී සකුරු පිළිගන්වාගෙණ ගියෝය. සර්‍වඥයන්වහන්සේ පන්සියයක් භික්ෂූන්වහන්සේ හා සමඟ පූපයෙන්ම ආහාර කෘත්‍යය සැපවූසේක. මහ සිටාණෝත් භාර්‍ය්‍යාව හා සමඟ සෑහෙන පමණ පූප අනුභව කළාහුමය. එතෙකුදුඋවත් පූපයෙහි කෙළවර නොපෙණුනේය. සියළු විහාරයෙහි භික්ෂූන් වහන්සේටත් සිඟන්නන් හා යාචකයන්ටත් දුන්කල්හිත් පූපයෙන් කෙළවරක් නොපෙණුනේය. එසේ කල සිටාණෝ සවාමීනි පූපයෝ නොනිමන්නෝ යයි බුදුරජාණන්වහන්සේට දැන්වූවෝය. එසේවීනම් සිටාණෙනි ජේතවන දොරටුව සමීපයෙහි ලාපයවයි වදාළසේක. ඉක්බිත්තෙන් ඔහු දෙදෙන දොරටුව නුදුරුතෙන සමීපයෙහි පෙට්ටියෙන්ම සලාපුය. අද දක්වාත් ඒ ස්ථානය කබල්ලක පූවප්‍රාබභාරයයි කියාම් ප්‍රසිද්ධ විය. මහ සිටාණෝ භාර්‍ය්‍යාව සමඟ සර්‍වඥයන්වහන්සේ සමීපයට ගොස් එකත්පස්ව සිටියාහුය. බුදුරජාණන්වහන්සේ අනුමෙවෙනි ධර්‍මදෙශනා කළසේක. අනුමෝදනාවගේ කෙළවර මේ දෙදෙනම සෝවාන්ඵලයෙහි පිහිටා බුදුරජානන්වහන්සේට නමස්කාරකොට ජේතවන දොරටුවෙහිදී හිතට නැඟී තමන් ප්‍රසාදයෙහිම ගොස් පිහිටියාහුය. එතැන්පටන් මහසිටාණෝ අසූකෙලක් ධන බුඬශාසනයෙහි දාන පරිත්‍යාග වසයෙන් විසුරුවූය.

SANHIDA LANKA

දෙවෙනිදවස් සම්‍යක් සම්බුදුරජානන්වහන්සේ සැවැත්නුවර පිඬුසිඟා ජේතවනයට අවුත් භික්ෂූන්වහන්සේට සුගතෙවාද දී ගඳකිළියට වැද සැත පුණුකල්හි සවස්වේලේ දම්සභාමණ්ඩපයෙහි රැස්වඋන්නාවූ භික්ෂූන්වහන්සේ ඇවැත්නි මහාමෞද්ගල්‍යාන ස්ථවිරයන්වහන්සේගේ ආනුභාවයක් බලව, මසුරු සිටානන් ඇසිල්ලකින්ම දමනයෙහිලා සනතාගතවූ කෙලශ නමැති විෂ විනාසකොට පූපය ගෙන්වාගෙණ ජේතවනයට අවුත් සර්‍වඥයන්වහන්සේට සම්මුඛකොට සෝවාන්පෙළෙහි පිහිටවූය. ඒ මහාමෞද්ගල්‍යානස්ථවිරයෝ ඉතා මහත්වූ ආනුභාව ඇත්තෝයයි තෙරුන්වහන්සේගේ ගුණ කියා උන්සේක. ශාසනාවූ  බුදුරජානන්වහන්සේ දම්සභාමණ්ඩපයට වැඩ මහණෙනි දැන් මා එන්නාට පූර්‍වභාගයෙහි කවර කථාවකින් යුකතව උනුදැයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කීකල්හි

මහණෙනි, කුලයන් දමනයෙහි ලන්නාවූ භික්ෂූන් විසින් කුලයන්ට පීඩා නොකොට නොමිරිකා නොතලා මලින් රොන් ගන්නා වූ බඹරක්හු මෙන් කුලයන් කරා එලඹ බුදුගුණ දන්වීය යුත්තේයයි වදාරා තෙරුන්වහන්සේට ප්‍රශංසා කරනසේක.

යථාපි භමරෝ පුප්ඵං වණ්ණගන්ධං අහෙඨයං

පලෙති රස මාදාය එවං ගාමෙ මුණී චරති

යන මේ දම්පියාවෙහි ගාථාව වදාරා මත්තෙහිත් තෙරුන්වහන්සේගේ ගුණ ප්‍රකාශ කරනු පිණිස මහණෙනි මෞද්ගල්‍යානසථවිරයන් විසින් මසුරු සිටානන් දමනෙහි ලැවේ දන්මතු නොවෙයි පෙරත් ඕහු දමනෙහි ලා කර්මඵල සම්බන්ධය දන්වූවෝම වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහමදතත නම් රජ්ජුරුකෙණෙකුත් රාජ්‍යය කරණ කල්හි බරණැස්නුවර ඉල්ලීස නම් සිටානෙක් විය. ඒ සිටානෝ අසූකෙළක් සම්පත් ඇත්තෝය, පුරුෂද්‍රෙෂයෙන් සමන්විතයෝය, බුන් සිහිල් කකුල් ඇත්තෝය, වක් හසතපාද්‍රදිය ඇත්තෝය. වමරැස් ඇත්තෝය. රත්නත්‍රයෙහි අප්‍රසනනයෝය, සැදැහැ නැත්තෝය, මසුරුගුණ ඇත්තෝය, තමන් සනතක වසතුව අනික් කෙනෙකුට නොදෙති, තුමුත් අනුභව නොකරති. උන්ගේ සම්පත රාක්ෂාධිගෘහිතවූ පොකුණක් මෙන්වූය, ඒ සිටානන්ගේ දෙමව්පියෝ වූකලී සත්වැනිකුලපරම්පරාව දක්වා දායකයහ, දනපතියහ. මූතුමූ සිටුතනතුරු ලැබලාම වංසය නසා දන්හල් දවා යාචකයන් තළා පිටත්කොට වසතුවම රැස්කරවූය. ඒ සිටානෝ එක්දවසක් රජ්ජුරුවන්ට රාජසේවයට ගොස් තමන් ගෙට එනතැනැත්තෝ ගමන් ආයාසයෙන් මිරිකුණාවූ එක් දනව්වැසි මනුෂ්‍යයෙක් එක රාකලයක් ගෙණ පුටුවක් මත්තෙහි හිඳ ඇඹුල්රායෙන් ඔඩමක් පුර පුරා කුණුමක් අවුළු හා සමඟ බොන්නාවුන් දැක රාබොනු කැමතිව මෙසේ සිතූය, ඉදින් මම රාබොත් නම් මා බොන්නට වන් කල්හි බොහෝදෙන බොනු කැමැත්වෙති, එසේ කල්හි මාගේ වසතුව නැසීයන්නේයයි ඒ සිටානේත තෘෂණාව ඉවසමින් ඇවිද කල්යාමෙන් ගිය කල්හි තෘෂණාව ඉවසාගතනොහී පොළානැගූ පුළුනක් මෙන් සුදුමැලිවූ ශරීර ඇතිවූය, ඉල්පව තිබෙන්නාවූ නහරබහනින් වෙළඳනාලද ශරීර ඇත්තේය. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ සිටානෝ ගබඩාවට වැද ඇඳ වැළඳගෙණ හොත්තාහුය. සිටානන්ගේ භාය්‍ර්‍යාවතොමෝ සමීපයට ගොස් පිට පිරිමැද සවාමීනි නුඹවහන්සේට අඑාසු කිම්දැයි විචාළීය. මෙතැන්හි කියයුතු සියල්ල යට කියන ලද ක්‍රමයෙන්ම දතයුත්තේය. එසේවීනම් තනිවූ නුඹවහන්සේටම සෑහෙන නියායෙන් ඉදිකෙරෙම්දැයි විචාළකල්හි ගෙයිදී සුරාව ඉදිකළ කල බොහෝ දෙන ඒ සුරාව බොන්ට ප්‍රාර්ථනා කෙරෙති, අන්ගානියෙන් ගෙන්වාත් මෙතන හිඳ බොන්ට නොපිළිවන්නේයයි මදටක් පමණ රන් දී අන්ගානියෙන් රාකලයක් කුඩා කොල්ලකු ලවා ගෙන්වාගෙණ නුවරින් නික්ම ගංතෙරට ගොස් මහාවනසමීපයේ එක් කැලයකට වැද රාකලය තබ්බවාගෙණ තෝ පලායයි කියා කොල්ලා දුර යවා ඔඩමක් පුරාගෙණ රාබොන්නට පටන්ගත්තාහුය.

ඒ සිටානන්ගේ පියානෝ වනාහී දානාදී පින්කම් කළ බැවින් දිව්‍යලෝකයෙහි ශක්‍රව උපන්නාහුය. ඒ ශක්‍රදේවේන්ද්‍රයා එකෙණෙහිම මාගේ දන්වට පවතීදෝහෝයි නොපවතීද්‍රෝහෝයි පරීක්ෂාකරන්නාහුය. ඒ දන්වැට නොපවත්නා බවත් පුත්‍රයා කුලවංසය නසා දන්හල් දවා යාචකයන් මරා නෙරපා මසුරුබව් පිහිටා අනික් කෙනෙකුන්ට දියයුතුවන්නේය යන භයින් වන ලැහැබකට වැද උදකලාව රාබොන නියාව දැක දූන් යෙම් ඔහු අල්ලා දමනයෙහිලා කර්මඵල සම්බන්ධයන් දක්වා දන්දෙවා දිව්‍යලෝකයෙහි උපදනා ලෙසත් කෙරෙමියි මනුෂ්‍යපථයට බැස ඉල්ලීස සිටානන් හා නොවෙනස්වූ කොරපළුවම රැස්වූ වෙනින් ආත්මභාවයක් මවාගෙණ රජගහනුවරට වැද රජ්ජුරුවන්ගේ මාලිගාදොරකඩ සිට තමන් ආ නියාව කියා යවා අවුත් වදිත්වයි කීකල්හි මාලිගාවට වැද රජ්ජුරුවන් වැඳ එකත්පසෙක සිටියාහුය. රජ්ජුරුවෝ කිමෙක්ද මහසිටානෙනි නොවේලේ අව්නැයි කිවූය. ආම් සවාමීනි මාගේ ගෙයි අසූකෙළක් පමණ වසතු ඇත. ඒ වසතුව නුඹවහන්සේ ගෙන්වා භාණ්ඩාරගේ පුරවාගතමැනවැයි කිවූය. මහසිටාණෙනි තොපගේ වසතුව අපට ප්‍රයෝජන නැත. තොපගේ වසතුවට වඩා අපගේ වසතුව ඉතා බොහෝයයි කිවූය. එබස් ඇසූ සිටානෝ කියන්නෝ ඉදින් රජ්ජුරුවන් වහන්ස නුඹවහන්සේට ප්‍රයෝජනයක් නැත්නම් කැමති පරිද්දෙන් ගෙණ දන්දෙමි කිවූය. දෙව මහසිටාණෙනි කීකල්හි යහපත මහරජ්ජුරුවන්වහන්සැයි කියා ඒ සිටානෝ රජ්ජුරුවන් වැඳ නික්ම ඉල්ලීස සිටානන්ගේ ගෙට ගියෝය. එකල්හි සියළු පරිවාර මනුෂ්‍යයෝ අවුත් පිරිවරාගත්තුය. කිසි එකකුත් ඉල්ලීස සිටානෝ නොවෙති කියා දැනගන්ට සමර්ථවූ කෙණෙක් නම් නැත. එකල්හි සිටානෝ ගෙටවැද එළිපත ඇතුළේ සිට දොරටුපාලයා කැඳවා එම්බල කොල මා හා සමාන සවරූප ඇති යම් අනිකෙක් අවුත් මාගේ ගෙය යයි වදින්ට ආනම් ඔහු පිටිකරගසා පිටත්කරවයි කියා දොරටුපාලයාට විධානකොට තුමූ ප්‍රාසාදයේ මතුමහත්තලයට නැඟී මහානසීවූ අස්නක හිඳ සිටුදූ සමීපයට කැඳවා සතුටුආකාර දක්වා සොඳුර දන්දෙමෝදැයි කිවූය. ඒ වචනය අසාලාම සිටුදූත් දූදරුවෝත් දසකම්කාරාදීහුත් මෙතෙක්කල් මුළුල්ලෙහිත් මුන්වහන්සේට දන්දෙන්ට සිතිවිල්ලකුත් නූපන්නේය. අද වූකලී රාබී මොලොක්වූ සිත් ඇතිව දෙනුකැමතිසේක් කීහ.

SANHIDA LANKA

ඉක්බිත්තෙන් සිටුදූ ඒ සිටානන්ට සවාමීනි කැමතිපරිද්දකින් දන්දුන මැනවැයි කිව. එසේවීනම් නුවර බෙරලවනු තැනැත්තහු කැඳවා ගෙන්වා ගෙණ රන්රිදී මුතුමැණික් ආදියෙන් ප්‍රයෝජන ඇතිකෙණෙක් ඉල්ලීස සිටානන්ගේ ගෙට එවයි කියා සියළු නුවර බෙරලවයි කිවූය. ඒ සිටුදූත් එපරිද්දෙන් කළාය. මහජනයෝ පැස්පෙට්ටිපයි ආදිය දොරකඩට රැස්වූවාහුය. එකෙණෙහි ශක්‍රයෝ සත්රුවන් පිරුණු ගබඩාවල දොරහරවා මේ සියළු වසතු තොපහැමට

දෙමි සෑහෙන පමණක් ගෙණයවයි කීවාහුය. එකල මහජනයෝ ගබඩාවලින් වසතු මැත්කොට රාජාඞගනයෙහි රැස්කොට තම තමන් ගෙනා භාජන පුරාගෙණ යන්නාහුය. එක්තරා දනව්වැසි මනුෂ්‍යයෙක් ඉල්ලීස සිටානන්ගේ ගොන් උන්ගේම රථයෙහි යොදාගෙන සත්රුවනින් පුරා නුවරින් නික්ම මාවතකට පැමිණ ඉල්ලීස සිටානන් වැදඉඳ රාබොන්නාවූ කාලයට වැද නුදුරු තැනකින් රථය පදනේ ස්වාමීනි ඉල්ලීස සිටානන්වහන්ස අවුරුදු සියයක් ජීවත්වුව මැනව නුඹවහන්සේ නිසා දූන් මා විසින් සියඅතින් කර්‍මනත නොකොට දිවිපමණින් රැකෙණ පමණ සම්පත් ලබනලද්දේය, නුඹ වහන්සේගේම රථය, නුඹවහන්සේගේම ගොන්ය, නුඹවහන්සේගේම ගෙයි සත්රුවනය, දූන් මේ වසතු මැනියන් විසින් දුන් දෙයකුත් නොවෙයි, පියානන්වහන්සේ විසින් දුන් දෙයකුත් නොවෙයි, ස්වාමීනි නුඹවහන්සේම නිසාලත් සම්පත්යයි සිටානන්ගේ ගුණ කිය කියා යන්නේය.

සිටානෝ එබස් අසා හයින් ත්‍රසතව මෙසේ සිතූය. මේතෙම මාගේ නම කියායෙයි කීමෙක්ද රජ්ජුරුවන්වහන්සේ විසින් මාගේ ධනය ලෝවැස්සන්ට දෙනලද්දේවනැයි කැලයෙන් නික්ම ගොන්ගෙය හා රථය ඇඳිනගෙණ එම්බල දුෂ්ටවූ කොල්ල මාගේ ගොණා මාගේ රථයයයි කියා ගොස් ගොන්ගේ අනුව අල්වාගත්තේය. එකල්හි ඒ දනව්වැසි පුරුෂයා රථයෙන් බැස එම්බා දුෂ්ට කොල්ල ඉල්ලීස සිටානෝ සියළු නුවරවාසීන්ට දන්දෙති, තෝ උන්ට කුමක්වන්නෙහිදැයි ඇන හෙණගසන්නාක් මෙන් පිටිකරගසා ඒ රථය ඇරගෙණ ගියේය. මේ ඉල්ලීස සිටානෝ තමන් වෙව්ලමින් නැගීසිට ඇඟ වැලි පිස පිස වහ වහා ගොස් රථයේ එල්ලීගත්තුය. එකල්හි ඒ දනව්වැසි පුරුෂයා රථයෙන් බැස ඉසකේ අල්වා නමාගෙණ වැලිමිට දෙකකින් ඇන තලා බොටුව අල්වා මාර්‍ගයටම අභිමුඛකොට දමා ගියේය. මෙපමණකින් ඒ සිටානන්ගේ රා මද සිඳීගියේය ඒ සිටානෝ වෙව්ල වෙව්ලා වේගයෙන් තමන්ගේ ගේදොරට ගොස් සම්පත් ඇරගෙණ යන්නාවුන්ට එම්බා පින්වත්ති මේ කිමෙක්ද? රජ්ජුරුවන්වහන්සේ මාගේ සම්පත් කොල්ලකනසේක්දැයි කියා ගොස් ඒ ඒ වස්තු අල්වා ගණිති, ඇල්වූ ඇල්වූ මනුෂ්‍යයෝ ගස ගසා පාමුල එලති. ඒ සිටානෝ වේදනාවෙන් පීඩිතව ගෙටවදින්නට පටන්ගත්තුය. එකල්හි දොරටුපාලයා එම්බල දුෂ්ටවූ ගොවිය කොයි වදනෙහිදැයි උනපත්තෙන් දෙපත්ත හසුකොට මත්තෙපොත්ත පත්තට යන්නාක්මෙන් තළා බොටුව අල්වාගෙණ පිටත්කළාහුය. එවේලෙහි සිටානෝ දූන් මට රජ්ජුරුවන් වහන්සේ හැර අන්කිසි පිළිසරණෙක් නැතැයි රජ්ජුරුවන්වහන්සේ සමීපයට ගොස් දේවයන්වහන්ස මාගේ ගෙය නුඹවහන්සේ කොල්ලකනසේක්දැයි කිවුය. එබස් ඇසූ රජ්ජුරුවෝ සිටානෙනි මම කොල්ලනොකම් තොපම අවුදින් නුඹවහන්සේ නොගන්නාසේක්වීනම් මන්ම මාගේ වස්තුව දන්දෙමි, නුවර බෙරලවා දන්දුනනෝවේදැයි කිවුය. එකල්හි සිටානෝ කියන්නෝ දේවයන්වහන්ස මම නුඹවහන්සේ සමීපයට නාමි, කිමෙක්ද නුඹවහන්සේ මා මසුරු නියාව නොදන්නාසේක්ද? මම තණකොන්දක් ගලා තෙල්බින්දුවකුත් කිසිකෙනෙකුට නුදුන්විරීම්, යම් සිටානකෙනෙක් දන්දෙන්නේද උන් කැඳවා ගෙන්වාගෙණ පරීක්ෂා කරවුව මැනව රජ්ජුරුවන්වහන්සැයි කිවුය. එබස් ඇසූ රජ්ජුරුවෝ ශක්‍රදේවේන්‍ද්‍රයන් කැඳවා ගෙන්වාගෙණ දෙදෙනාගේ වෙනස් රජ්ජුරුවෝ නොදනිත්, අමාත්‍යයෝත් නොදනිති, මසුරු සිටානෝ කිමෙක්ද රජ්ජුරුවන්වහන්ස මූ සිටානෝද මම් සිටානෝදැයි කිවූය, අප නාදුනම්හ. එසේ දෙදෙනා අඳුනන්නාවූ කිසි කෙණෙක් ඇද්දැයි විචාළෝය. සවාමීනි මාගේ භාර්‍ය්‍යාව අඳුනන්නී වේදැයි මසුරුසිටානෝ කීහ. එකල්හි ඒ සිටානන්ගේ භාර්‍ය්‍යාව කැඳවා තොපගේ සවාමිපුත්‍රයානෝ කවුරුදැයි විචාළසේක. ඒ සිටුදූතොමෝ මූවේදැයි කියා ශක්‍රයන් සමීපයෙහි සිටියාය. දූදරුවනුත් දාසකර්‍මකාරාදීනුත් කැඳවා විචාළාහුය. හැමදෙනම ගොස් ශක්‍රයන් සමීපයෙහි සිටියාහුය. නැවත සිටානෝ මෙසේ සිතූය, මාගේ හිස පිළිකාවෙක් ඇත, කෙසින් වැසීතිබෙන බැවින් ඒ පිළිකාව කපුවාම දන්නේය, අනික් කෙනෙක් නොදනිති, ඔහු කැඳවුවමැනවැයි කිවූය. එසමයෙහි වනාහී බොධි සත්‍වයෝ ඉල්ලීස සිටානන්ට කපුව උපන්නාහුය. රජ්ජුරුවෝ ඒ කපුටා කැඳවා ඉල්ලීස සිටානන් අඳුනන්නෙහිදැයි විචාළෝය. ඉසබලා ඇඳිනගතිම් සවාමීනි කීය. එසේවීනම් දෙදෙනාගේම ඉස බලවයි කිවූය. එකෙණෙහි ශක්‍රයෝ ඉස පිළිකාවක් මවාගත්තුය, බොධිසත්‍වයෝ දෙදෙනාගේම ඉස පිළිකා බලා පිළිකා දැක මහරජ්ජුරුවන්වහන්ස දෙදෙනා ඉසම පිළිකා ඇත්තේය. මම ඔවුන් දෙදෙනාගෙන් එක්කෙනෙකුත් ඉල්ලීස බව දූනගත නොහෙමි කියා මෙසේ කිවූය. දෙදෙනම කොරවූය, දෙදෙනම පිළිවූය. දෙදෙනම වමරැස් ඇත්තෝය, දෙදෙනම පිළිකා ඇත්තෝය, එසේහෙයින් ඉල්ලීසයන් අසවල්ලුයයි මම නොදනිම් කිවූය. බොධිසත්‍වයන්ගේ වචනය අසා මසුරු සිටානෝ කම්පිතවූ සිත්ඇතිව ශොකයෙන් සිහි එලවාගතනොහී එතනම වැටීහුන්නාහුය. එකෙණෙහි ශක්‍රදේවේන්‍ද්‍රයෝ මහරජ්ජුරුවන්වහන්ස මම ඉල්ලීසයෙක් නොවෙමි, ශක්‍රදේවේන්‍ද්‍රයෙමි කියා මහත්වූ ශක්‍රදේවේන්‍ද්‍ර ලීලාවෙන් ආකාශයෙහි සිටියාහුය. ඉල්ලීසයන් මූන පැන්ඉස සනතර්‍පනය කළෝය. ඒ සිටානෝ නැඟීසිට ශක්‍රදේවේන්‍ද්‍රයන්ට නමස්කාර කොට සිටියාහුය. එකල ශක්‍රදේවේන්‍ද්‍රයෝ සිටානන්ට කියන්නෝ ඉල්ලීසයෙනි මේ වසතුව මා සතුය, තා සනතක නොවෙති, මම තොපගේ පියානෝය, තෙපි මාගේ පුතනුවෝය, මම දානාදීවූ පින්කම් කොට ශක්‍රාත්මභාවයට පැමිණයෙමි, තොප වනාහී මාගේ වංශයෙහි අයනසිලීව මසුරුබවෙහි පිහිටා දන්හල් දවා යාචකයන් පිටත්කොට වසතුව රැස්කෙළෙහිය, ඒ වසතුව තොපිත් අනුභව නොකරන්නෙහිය. අනික් කෙණෙකුන්ටත් ප්‍රයෝජන නැත්තේය, රාක්ෂසාධි ගෘහිතවූ පොකුණක් මෙන් සිටිනේය. ඉදින් මාගේ දන්හල් කරවා පෙර පරිද්දෙන්ම දන්දුන්නෙහිවීනම් යහපත, ඉදින් නොදෙන්නෙහිවීනම් තාගේ සියළු ධනධාන්‍යයන් අනතර්‍ධානකොට මේ වජ්‍රායුධයෙන් තාගේ ඔළුවත් පළා ජීවිතක්ෂයට පමුණුවමියි කිවූය. එබස් අසා ඉල්ලීස සිටානෝ මරණභයින් තැතිගෙණ මෙතැන්පටන් දන්දෙමියි ප්‍රතිඥා දුන්නුය. ශක්‍රයෝ සිටානන්ගේ ප්‍රතිඥා ලැබ ආකාශයෙහි හිඳ ධර්‍මදෙශනාකොට පඤ්චශීලයෙහි පිහිටුවා ශක්‍රභවනයට ගියෝය. ඉල්ලීස සිටානෝත් දානාදී පින්කම් කොට සවර්‍ගලෝකයෙහි උපන්නාහුය. ශාසතෘවූ බුදුරජානන්වහන්සේ මහණෙනි මහාමෞද්ගල්‍යානසථවිරයෝ මසුරුසිටානන් දමනයෙහි ඇවෝ දූන්මතු නොවෙයි පෙරත් දමනයෙහි ඈවෝ මේ ධර්‍මදෙශනාව ගෙණහැර දක්වා වදාරා පූර්‍වාපරසන්‍ධිගළපා මේ ඉල්ලීස ජාතකය

SANHIDA LANKA

නිමවා වදාළසේක.

එසමයෙහි සිටානෝ නම් දූත් මසුරුසිටානෝය, ශක්‍රදේවේන්ද්‍රයෝ නම් මහාමෞද්ගල්‍යානස්ථවිරයෝය, රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි කපුව උපන්නෙමි. තිලෝගුරු සම්‍යක්සම්බුදුරජුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# බරස්සර ජාතකය

තවද එක්සමයෙක්හි ශාක්‍යකුල චින්තාමාණික්‍යවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක්. එක්තරා අමාත්‍යයෙකු අරභයා මේ ජාතකය වදාළසේක.

කෝසල රජ්ජුරුවන්ගේ එක්තරා අමාත්‍යයෙක් රජ්ජුරුවන් සිත්ගෙණ පාසල්දනව්වේ ගමෙක අයපඬුරු ආදිය ලැබහෙණ සොරුන් හා එක්වගෙණ ඒ සොරුන්ට කියන්නෝ මම මනුෂ්‍යයන් ඇරගෙණ වනයට වදිමි තොපි ගම කොල්ලකා එයින් ලබනලද වසතුවෙන් මටත් භාගයක් දෙවයි කියා පළමු කොට මිනිස්සුන් රැස්කරවා තෙමේ වනයට ගොස් එහි ඉඳ සොරුන් අවුත් සරක් මරා මස් කා ගමපැහැර ගියකල්හි සවස්වේලේ මහජනයා විසින් පිරිවරණලදුව ගමට එන්නේය, ඔහුගේ ඒ ක්‍රියාව නොබෝ දවසකින්ම ප්‍රසිඬ විය. මනුෂ්‍යයෝ එපවත් රජ්ජුරුවන්ට දැන්නුය. රජ්ජුරුවෝ ඒ අමාත්‍යයා කැඳවා ගෙන්වාගෙණ දෙ‍රහිඳුවා තරයේ නිග්‍රහකොට අනික් ගම්මුදලියෙකු ඒ පසල්දනව්වට යවා ජේතවනයට ගොස් සර්‍වඥයන්වහන්සේට නමස්කාර කොට එකත්පස්ව හිඳ එපවත් දැන්වූය. බුදුරජානන්වහන්සේ මහරජ්ජුරුවෙනි මොහු මෙසේ කෙළේ දැන්මතු නොවෙයි පෙරත් මෙසේම කරණසුළුයයි වදාරා ඒ රජ්ජුරුවන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගියදවස බරණැස්නුවර බ්‍රහමදත්තනම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ කල්හි ඒ බරණැස් රජ්ජුරුවෝ එක් අමාත්‍යයක්හට ප්‍රත්‍යනත ජනපදයෙහි ගමක් දුන්නුය. මෙතැන්හි කියයුතුවූ සියල්ල පළමු කියනලද්ද හා සමානවන්නේය. එසමයෙහි බොධිසත්‍වයෝ වෙළඳම්කොට ප්‍රත්‍යනත දනව්වෙහි වාසයකරන්නාහු ඒ අමාත්‍යයා ලත් ගම වාසයකරන්නාහුය. ඒ මහ බෝසතානෝ ඒ ග්‍රාමභොජකයා සවස්වේලෙහි පිරිවරා තදවූ ශබ්ද ඇති පටාහෙරියක් ගස්වාගෙණ එනකල්හි මේ දුෂ්ටවූ ග්‍රාමභොජකයා සොරුන් හා එක්වගෙණ ගම්පහරවා කොල්ලකවා සොරුන් පලාගොස් වනයට වන්කල්හි දැන් තෙමේ සානතද්‍රනත එක්කහුමෙන් නිවීසැනහී බෙර ගස්වාගෙණ එන්නේයයි නින්‍දකළාහුය. නොබෝකලකින් ඔහුගේ ඒ ක්‍රියාව ප්‍රකාශ විය. රජ්ජුරුවෝ දෙසානුරූපව නිග්‍රහකළාහුය. ශාසතෲවූ බුදුරජානන්වහන්සේ මහරජ්ජුරුවෙනි මොහු මෙබඳුවූ සවභාවඇත්තේ දැන්මතු නොවෙයි පෙරත් මෙබඳු සවභාව ඇත්තේවේදැයි මේ ධර්‍මදෙශනාව ගෙණහැර දක්වා පූර්‍වාපරසන්‍ධිගළපා මේ බරස්සර ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි අමාත්‍යයා නම් දැන් මේ අමාත්‍යයාමය, එසමයෙහි අමාත්‍යයාට නින්‍දකළාවූ ප්‍රාඥපුරුෂවූයෙමි. සම්‍යක්සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# හීමසෙන ජාතකය

තවද එක්සමයෙක්හි ලෝකත්‍රයෙහි පතළාවූ කීර්තිඝොෂා ඇති තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් තමහට ස්තුති කරන්නාවූ එක්තරා භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක. එක් භික්ෂුකෙනෙකුන් වහන්සේ '' ඇවැත්නි අපගේ ජාතිය හා සමානවූ ජාතියෙක්නම් නැත, අපගේ ගොත්‍රය හා සමානවූ ගොත්‍රයෙක්නම් නැත, අපගේ දාසකම්කාරාදීහුත් ඇල්සාලේ බත් හා මත්ස්‍යමාංස අනුභවකෙරෙති, කසීරට සුවඳවිලවුන් ගල්වති, අපි මහණවූ බැවින් දැන් මෙබඳුවූ රූක්ෂ භොජනය අනුභව කරම්හ. රූක්ෂවූ සිවුරු වලඳිම්හයි ස්ථවිර නවක මධ්‍යම භික්ෂූන් සමීපයෙහිදී තමන්වහන්සේගේ මහණ තත්වය කියමින් ජාත්‍යාදීප වශයෙන් මෙරමාහට නින්දාකෙරෙමින් ඇවිදිනා සේක. ඉක්බිත්තෙන් එක් භික්ෂුකෙනෙකුන්වහන්සේ මේ භික්ෂුහුගේ කුලප්‍රදේශය හා ජාතිගොත්‍රය පරීක්ෂාකොට මොහු තමාගේ ප්‍රතාප කියන බව භික්ෂූන්වහන්සේ ධර්‍මසභා මණ්ඩපයෙහි රැස්වහිඳ ''ඇවැත්නි අසවල් මහණ මෙබඳුවූ නෛයර්‍යාණික ශාසනයෙහි මහණව තෙමේ තමහට සතුතිකොට මොරමාහට නිඥාකෙරෙමින් ඇවිදිනේය.''යි ඒ භික්ෂුවගේ නුගුණ කිය කියා උන්සේක. එකල්හි ශාසතෲවූ බුදුරජාණන්වහන්සේ දම්සභාමණ්ඩපයට වැඩ ''මහණෙනි දැන් මා එන්නාට පළමුව කවර කථාවකින් යුතුව උනුදැ''යි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කීකල්හි මහණෙනි ඒ මහණ දැන් තමාට සතුතිකොට ඇවිදින්නේ වෙයි, පෙරත් තමාට සතුතිකොට අනුන්ට නිඥාකරමින් ඇවිද්දේම වේදැයි වදුරා ඉකුත්වත් දක්වා වදළසේක.

යටගියදවස බරණැස්නුවර බ්‍රහමදතතනම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතානෝ එක් නියම්ගමෙක ප්‍රසිඬවූ බ්‍රාහමණ වංශයෙහි ඉපද වැඩිවිය පැමිණ තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි හිඳ වේදත්‍රය හා අෂ්ටාදශ විද්‍යාසථානය ඉගෙණ සියලු ශිල්පයෙහි මුදුන් පැමිණ චුලලධනුගගහ පණ්ඩිතයෝය්යි මේ නමින් ප්‍රසිඬවූය, ඒ අප මහ බෝසතානෝ තක්සලානුවරින් නික්ම සියළු සමයනතර ශිල්පයෙහි පරීක්ෂා කෙරෙමින් මහිංසකරාජ්‍යයට ගියෝය. මේ ජාතකයෙහි වූකලී අප මහබෝසතානෝ මදක් මිටියෝය, නැමුනාවූ ආකාර ඇත්තෝය, එසේහෙයින් ඒ බොධිසත්‍වයෝ මෙසේ සිතූය, ඉදින් මම කිසි රජ්ජුරුකෙනෙකුත් කරා ගියෙම්නම් ඒ රජ්ජුරුවන්වහන්සේ මෙසේ ලකුන්ටවූ ශරීර ඇත්තෝ අපට කුමක් කරන්නෝදැයි කියනසේක, එසේහෙයින් මම ආරොහපරිනාහයෙන් යුක්තවූ එක් පුරුෂයෙකු ඉදිරිකොටගෙණ ඔහු නිසා ජීවත්වීන්නම් යහපත් වන්නේයයි සිතා බෝධිසත්‍වයෝ එබඳුවූ පුරුෂයෙකු සොයන්නාහු හීමසේන නම් වෙම් කී කල්හි කිමෙක්ද තෝ කිනම්හුදැයි විචාළෝය. මම හිමසේන නම් වෙම් කී කල්හි කිමෙක්ද තෝ මෙසේ ක්‍රියා නොකොට සියළු දඹදිව මාහා සමානවූ දුනුවායෙක් නැත, ඉදින් මම කිසි රජ්ජුරුකෙණෙකුන්වහන්සේ දුටුයෙම්වීන්නම් උන්වහන්සේ මේ ලකුන්ටකයා අපට කුමක් කෙරේදැයි මට කිපෙනසේක, එසේහෙයින් තෝ රජ්ජුරුවන්වහන්සේ දැක මම දුනු මායෙම් නියෙහිවීනම් රජ්ජුරුවන්වහන්සේ තට වියදම් දි නිරන්තරයෙන් වෘත්ත තබා දෙනසේක. මම තට උපන්නාවූ කාය්‍ර්යයෙක් ඇත්නම් කෙරෙමින් තාගේ සෙවන් ජීවත්වෙමි, එසේකල්හි අපි දෙදෙනම සුඛිතවම්හ, මා කීවා කරවයි බෝධිසත්‍වයෝ කිවුය. ඒ පුරුෂයාත් මහබෝසතානන්ගේ බස යහපතැයි පිළිගත්තේය.

ඉක්බිත්තෙන් බෝධිසත්‍වයෝ ඒ හීමසේන නම් පුරුෂයා කැඳවාගෙණ බරණැස්නුවරට ගොස් තුමු ඕහට උපස්ථායකව ඒ පුරුෂයා ඉදිරිකොට ගොස් මාලිගා දොරකඩ සිට රජ්ජුරුවන්ට දන්වායවූය, රජ්ජුරුවන්වහන්සේ විසින් එක්වයි කී කල්හි දෙදෙනම මාලිගාවට වැඳ රජ්ජුරුවන් වැඳ සිටියාහුය. කවර කාරණයක් නිසා තෙපි මෙහි අවුදැයි කී කල්හි හීමසේනයා මම දුනුවායෙකිමි, මා හා සමානවූ දුනුවායෙක් මේ සියළු දඹදිව නැත්තේ යයි කීය කුමක් ලදින්නම් මට උපස්ථාන කරන්නෙහිදැයි කී කල්හි දෙපෝයක් පාසා දහසක් ලබන්නේ වීම්නම් උපසථාන කරන්නේ වේද රජ්ජුරුවන්වහන්සෙයි කිවුය. මේ පුරුෂයා තට කුමක් වේදැයි කී කල්හි රජ්ජුරුවන්වහන්ස මාගේ අතවැසි පුරුෂයායැයි කීය. යහපත මට උපස්ථාන කරවයි කී කල්හි එතැන්පටන් හීමසේන නම් පුරුෂයා රජ්ජුරුවන්ට සේවය කරන්නේය, ඕහට පැමිණ කාය්‍ර්යයක් බෝධිසත්‍වයෝම සමෘර්ධි කරති. එසමයෙහි කසීරට එක් වනයක බොහෝ මනුෂ්‍යයන් යන එන්නාවූ මාර්ගයක ව්‍යාඝ්‍රයෙක් නිස්සඤ්චාරය කරමින් බොහෝ මනුෂ්‍යයන් අල්ව අල්වා කන්නේය. එපවත් රජ්ජුරුවන්ට දැන්වූවාහුය. රජුජුරුවෝ හීමසේනයා කැඳවාගෙණ දරුව ඒ ව්‍යාඝ්‍රයා අල්වන්ට පිළිවන්දැයි විචාළෝය. රජ්ජුරුවන් වහන්ස මම දුනුවාය, කුමක් නිසා බම්ද, ව්‍යාඝ්‍රයා අල්වන්ට අසමර්ථ වෙම්දැයි කීය. එබස් ඇසූ රජ්ජුරුවෝ ඕහට වැටුප් වියදන් දී යවූය. ඒ හීමසේනයා ගෙට ගොස් බෝධිසත්‍වයන්ට එපවත් කීයේය. බොධිසත්‍වයෝ යහපත යාලුවයි කිවුය, තොප නොයව්දැයි කීකල්හි එසේය මම නොයමි, තොපට උපාය වූකලී කියම් කිවුය. සබඳ උපාය කියවයි කී කල්හි තෙපි ව්‍යාඝ්‍රයා ඉගිලගිය නියාව දැන පලාගොස් එක් කැලයකට වැද බඩින් තලච්ච වැදහෙව දනව්වැසි මනුෂ්‍යයෝ ඒ ව්‍යාඝ්‍රයා තළා අල්වා ගණිති, ඔවුන් විසින් ව්‍යාඝ්‍රයා අල්වාගත් කල්හි තෙපි දතින් වැලක් කපා වැල් කෙළවර අල්වාගෙණ මළාවූ ව්‍යාඝ්‍රයා සමීපයට ගොස් '' පින්වත්නි මේ ව්‍යාඝ්‍රයා මැරුවෝ කවුරුදැ '' යි කියා මම මේ ව්‍යාඝ්‍රයා ගොණෙකු මෙන් බැඳ රජ්ජුරුවන් සමීපයට ගෙණයෙමි වැල් නිසා කැලයට ගොස් මා වැල් කඩාගෙණ එන්නාට පළමුකොටම මේ ව්‍යාඝ්‍රයා මැරුවෝ කවුරුදැයි කිව, එකල්හි දනව්වැසි මනුෂ්‍යයෝ භයින් ත්‍රසතව ''ස්වාමීනි රජ්ජුරුවන්වහන්සේට නො කියවයි'' යි කියා තොපට බොහෝ වස්තු දෙති, '' ව්‍යාඝ්‍රයා තොප විසින් අල්වා ගන්නා ලද්දේය'' රජ්ජුරුවන් සමීපයෙන් බොහෝ වස්තු ලබන්නා වේදැයි කිවුය, ඒ හීමසේන නම් පුරුෂයා යහපතැයි ගොස් බෝධිසත්වයන් කී පරිද්දෙන්ම ව්‍යාඝ්‍රයා අල්වාගෙණ වනය නිර්‍භය කොට මහජනයා විසින් පිරිවරණ ලදුව බරණැස්නුවරට වැද රජ්ජුරුවන් දැක මා විසින් ව්‍යාඝ(යා අල්වාගන්නා ලද, වනයත් නිර්‍භය කරණලදැයි කීය. රජ්ජුරුවෝ සතුටුව බොහෝ වස්තු දුන්නාහුය.

SANHIDA LANKA

නැවත එක්දවසක් මාර්ගයෙක මීමෙක් මිනිසුන්ට ඇන මග යා නොදෙන්නේයයි රජ්ජුරුවන්ට කිහ. රජ්ජුරුවෝ පළමු පරිද්දෙන්ම භීමසේනයා යවූය, ඒ භීමසේනයාත් බෝධිසත්ත්වයන් කී උපායෙන් ව්‍යාඝ්‍රයාමෙන් ඒ මීමත් අල්වා ගෙණ අවුය, රජ්ජුරුවෝ නැවතත් ඕහට සතුටුව වසතු බොහෝ සේ දුන්නුය. ඔහු මහත්වූ ඓශ්චර්යය මදයෙන් මත්ව බෝධිසත්ත්වයන් කෙරෙහි අවඥකොට උන්ගේ බස් නොගෙණ තොප නිසා ජීවත් නොවෙමි, කිමෙක්ද පුරුෂයෝ නම් තෙපිමදැයි ආදීවූ පරුෂ වචනයන් කියන්නේය. ඉක්බිත්තෙන් කීප දවසක් ගියකල්හි සතුරු රජ්ජුරුකෙණෙක් අවුත් බරණැස්නුවර වටලාගෙණ '' රාජ්‍යය හෝ දෙව යුද්ධ හෝ කරව'' යි රජහට හසුන් යවූය, රජ්ජුරුවෝත් අසුන් අසා'' යුද්ධ කරව '' යි භීම සේනයා යවූය, ඒ තෙමේ සියළු සන්නාහයෙන් සන්නද්ධව යුද්ධ වෙසක් ගෙණ හසති සන්නාහයෙන් සන්නද්ධවූ හස්තියෙකු පිටට පැනනැගී උන්නේය. බෝධිසත්වයෝත් ඔවුන්ගේ මරණ හයින් සියළු සන්නාහයෙන් සන්නද්ධව භීමසේනයාගේ පශ්චිමාසනයෙහි උන්නාහුය. හස්තියා මහජනයා විසින් පිරිවරණ ලදුව නුවර දොරින් නික්ම යුද්ධ භූමියට පැමිණියේය. එකල්හි භීමසේනයා සටන් බෙරහඬ අසාලාම වෙව්ලන්ට පටන් ගත්හ. '' බෝධිසත්ත්වයෝ '' දැන් මූ වැටීම මියන්නේයයි සිතා ඇතු පිටින් නොවැටෙන පිණිස භීමසේනයා ලනුවකින් ඉඟ සිසාරා අල්වාගත්තුය. භීමසේනයා යුද්ධ භූමිය දැක මරණභයින් තැතිගෙණ මලමුත්‍රයෙන් ඇතුපිට කෙළ ගැසූයේය එකල බෝධිසත්ත්වයෝ කියන්නෝ භීමසේනය පළමු කී කාරිය නියාවට පසුව කළ කාරිය සමවන්නේ නොවේද? තෝ පළමු යුද්ධ භටයෙක් මෙන් වූයේය, දැන් ඇතුපිට කෙළසන්නෙහියයි කියා බොධිසත්ත්වයෝ ඕහට නින්දා කළෝය. තවද භීමසේනයා තා විසින් පළමු කීවේ කිමෙක්ද? පුරුෂයෝනම් තෝමද? මම පුරුෂනොවෙම්ද? මමත් යෝධභටයයි නින්දා වචනයක් කීය. මේ වූ කලී එකෙක, ඉක්බිත්තෙන් පළමු තා කී නින්දා වචනයෙන් මෑත භාගයෙන් දැන් මේ යුද්ධ භූමියෙහිදී සන්නාහයෙන් සන්නද්ධ වූ ඇතුගේ පිට කෙළසා තාගෙන්ම මලමුත්‍ර ධාරාවෝ වැහෙති, මේ එකෙක එසේ හෙයින් භීමසේනය පළමු කී යුද්ධකථාවය ඇතුපිට කෙළසා විඳින්නාවූ ආයාසය යන මේ දෙක සමාන නොවන්නේ වේදැයි මෙසේ මහබෝසතානෝ ඕහට නින්දා කොට '' සබඳ තෝ නොබව, මා සිටියදී කුමක් නිසා තෝ ආයාසවිඳිද'' යි භීමසේනයා ඇතුපිටින් බාවාගෙණ පලායයි කියා යවා '' අද මා විසින් ප්‍රස්ද්ධවන්නට වටනේය'' යි යුද්ධයට වැද සිංහනාද කොට බලකොටුව බිඳ සතුරු රජ්ජුරුවන් ජීවග්‍රහයෙන් අල්වාගෙණ බරණැස් රජු සමීපයට ගියෝය. රජ්ජුරුවෝ සතුටුව බෝධිසත්ත්වයන්ට මහත් වූ යසපිරිවර දුන්නිහුය. එතැන් පටන් බෝධි සත්ත්වයෝ චුල්ලධනුග්ගහ පණ්ඩිතයෝයයි සියළු දඹදිව ප්‍රසිද්ධවිය. ඒ මහ බෝසතානෝ භීමසේනයාට වැටුප් වියදන් දී ඔහු පළමුව විසුවා වූ ස්ථානයට යවා දානාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියේය. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මහණෙනි මේ භික්ෂූහූ තමාට ස්තුති කොට අනුනට නින්දා කළේ දැන්මතු නොවෙයි, පෙරත් නින්දා කළෝම වේදැයි මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා පූර්වාපරසන්ධි ගළපා මේ භීමසේන ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි භීමසේන නම් දැන් අනුන්ට නින්දාකොට තමාට ස්තුති කරන්නාවූ මහණය, එසමයෙහි චුල්ලධනුගගහ පණ්ඩිතයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සුරාපාන ජාතකය

තවද එක්සමයෙක්හි පඤ්ච මාරයන් ජයගත්තාවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ කොසඹෑනුවර නිසා ඝොසකාරාමයයෙහි වැඩවසනසේක සාගත ස්ථවිරයන්වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක.

භාග්‍යවත් බුදුරජානන්වහන්සේ සැවැත්නුවර වස්වැස චාරිකා ගමණින් භද්දවතිකා නම් නියම්ගමට පැමිණි කල්හි ගොපල්ලන් අජපාලයන් ගොවින් මගීන් ආදිවූ සත්‍වයෝ සර්‍වඥයන්වහන්සේ දක වැඳ ස්වාමීනි බුදුරජානන්වහන්ස අඹතිත්ථියට නොවැඩිය මැනව, අඹතිත්ථියෙහි ජටිලයාගේ ආශ්‍රමයෙහි අඹතිත්ථ නම් නාග රාජයෙක් ආශීර්විෂය, ඝොරවිෂය. ඒ නාග රාජයා සර්‍වඥයන් වහන්සේට පීඩාකරන්නේයයි කියා වැළකූය. සර්‍වඥයන්වහන්සේද ඔවුන්ගේ කථාව නොඇසුවාක්හු මෙන් ඔවුන් තුන්යලක් දක්වා වලකමින් සිටියදීම වැඩිසේක. සාගත සථවිරයන්වහන්සේ විසින් නාග රාජයා දමනයෙහි ඈ නියාව සියළු ජනපදයෙහි පතළලෙස කොසඹෑනුවර වාසීවූ සත්‍වයෝ සර්‍වඥයන්වහන්සේට පෙරගමන්කොට නමස්කාරකොට සාගත සථවිරයන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිට මෙසේ කීවාහුය. සවාමීනි යමෙක් නුඹ වහන්සේට දුලීභ වීනම් ඒ වදාළ මැනව, අපි එය සමූඩ් කරම්හයි කිවූය. එබස් ඇසූ තෙරුන්වහන්සේ මුවෙන් නොබිණුසේක. සමහර භික්‍ෂූන් වහන්සේ වනාහී උපාසකවරුනි ප්‍රව්‍රජජිතයන්වහන්සේට කාපෝතිකා නම් සුරාව දුලීභද වෙයි, සිත්කළු ද වෙයි. ඉදින් තෙපි තෙරුන්වහන්සේට ප්‍රසනන වූවාහුනම් කාපෝතිකා සුරාව පිළියෙළකරවයි කී සේක. ඒ උපාසකවරු සවාමීන් වහන්ස යහපතැයි පිළිගෙණ සර්‍වඥයන්වහන්සේට සෙටදවසට ආරාධනාකොට නුවරට වැද තම තමන්ගේ ගෙයිදී තෙරුන්වහන්සේට දෙම්හයි කාපෝතිකා නම් සුරාව පිළියෙල කර තෙරුන්වහන්සේට පවරා තමන්ගේ ගෙයිදී සුරාව පිළිගැන්වූය. තෙරුන්වහන්සේ ඒ සුරාව වළඳා මදයෙන් මත්ව නුවරින් නික්මෙන සේක්. වාසල් දොර වැටී නන්දොඩමින් වැදහොත්සේක. සර්‍වඥයන්වහන්සේ වළඳා ඉක්බිති නුවරින් නික්මෙනසේක්. ඒ තෙරුන්වහන්සේ ඒ ආකාරයෙන් වැදහොත්තා දක මහණෙනි සාගත සථවිරයන් ඇරගණුවයි කියා ගෙන්වාගෙණ විහාරයට වැඩිසේක. ඒ භික්‍ෂූන්වහන්සේ තෙරුන්වහන්සේගේ හිස සර්‍වඥයන්වහන්සේගේ ශ්‍රීපාදමූලයට කොට වැදහොවාලූසේක. තෙරුන්වහන්සේ පෙරලී තමන්වහන්සේ දෙපය ශ්‍රීපාද මූලයට කොට වැදහොත්සේක, සර්‍වඥයන්වහන්සේ භික්‍ෂූන්වහන්සේ අතින් විචාරණයක් ''කිමෙක් ද? මහණෙනි පෙර සාගත සථවිරයන්වහන්සේ මා කෙරෙහි යම් ගෞරවයක් ඇත්නම් ඒ ගෞරවය දුන් ඇද්දැ'' යි විචාළසේක. නැතැයි සවාමීනි කීකල්හි මහණෙනි අඹතිත්ථ නම් නාගරාජයා දමනයලුවෝ කව්රුදැයි විචාළසේක. සවාමීනි සාගත සථවිරයන්වහන්සේයයි කීකල්හි ''කිමෙක්ද මහණෙනි දුන් සාගත සථවිරයෝ දියබරණයකුත් දමනයෙහි ලන්ට සමත්ථයෝද''යි වදාළසේක. සවාමීනි ඒ නැතැයි කීකල්හි කිමෙක්ද මහණෙනි ''යමක් මෙසේ විසංඥව වැදහොවිත් නම් එසේවූ සුරාව බොන්නට සුදුසුදැයි'' විචාළසේක. සවාමීනි සුදුසු නොවෙයි දන්වූසේක. ඉක්බිත්තෙන් භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේ සාගත සථවිරයන්වහන්සේට නින්‍ද කොට භික්‍ෂූන්වහන්සේට ආමන්ත්‍රණය කොට රාමෙර බිම නිමිතතකොට පාචිතතියාපතතී වෙයි කියා ශික්‍ෂාපද පනවා හුනස්නෙන් නැගී සිට ගඳකිළියට වන්සේක. දම්සභා මණ්ඩපයට රැස්වූ භික්‍ෂූන්වහන්සේ සුරාපානයෙහි නුගුණ කීසේක. ඇවැත්නි මේ සුරාපානය නම් මහත්වූ දොෂ ඇත්තේය, මහත්වූ ශ්‍රඬාමත්වූ සාගත සථවිරයෝ යම්සේ බුදුන්ගේ ගුණ නොදනිත් නම් එපරිද්දෙන් කළෝයයි සුරාවෙහි නුගුණ කීසේක. ශාසතෲවූ බුදුරජානන්වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ මහණෙනි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කීකල්හි ප්‍රව්‍රජජිතයන් රා බී මත්ව විසංඥවූයේ නොවෙයි පෙරත් විසංඥ වූවෝම වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහමදතත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතානෝ කසීරට ප්‍රසිඬවූ බ්‍රාහමණ වංශයක ඉපිද වැඩිවිය පැමිණ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපතති උපදවා ධ්‍යාන ක්‍රීඩා කෙරෙමින් හිමාලය වනප්‍රදෙශයෙහි වාසයකරන්නාහුය. පන්සියයක් අනෙතවාසික තාපසයෝ මහබෝසතානන් නිරන්තරයෙන් පිරිවරා ඇවිදින්නාහුය.

ඉක්බිත්තෙන් ඒ මහබොධිසත්‍වයන්ට වසසාන කාලය පැමිණි කල්හි අනෙතවාසිකයෝ කියන්නෝ ''ආචාරීන්වහන්ස මනුෂ්‍යපථයට ගොස් එනු ඇඹුල් සෙවෙනිය අනුභවකොට එම්හ''යි කීහ. ඒ ඇසූ මහබෝසතානෝ ''අනෙතවාසිකයෙනි මම මෙහිම වෙසෙමි, තෙපි හැම ගොස් ශරීර සතප්පා ගෙණ වර්‍ෂා කාලය ඉකුත්කොට එව''යි කිවූය. ඔහු හැමදෙන යහපතැයි ආචාරීන් වැඳ බරණැස් නුවරට ගොස් රාජොද්‍යානයෙහි වැස දෙවෙනිදවස් පිටත මාසල් දොර සමීපයෙහි ගම සිඟා වළඳා සම්පූර්ණව දෙවෙනි දවස් නුවරට වන්නාහුය. මනුෂ්‍යයෝ ඔහු දක ප්‍රසනනව භික්‍ෂා දුන්නාහුය. කීප දවසකින් රජ්ජුරුවන්ටත් දන්වූය. ''දේවයන්වහන්ස හිමාලය වනයෙන් පන්සියයක් ඍෂිවරයෝ අවුත් උයනේ වෙසෙති. ඔහු හැමදෙන ඝොරවූ තපස් ඇත්තෝය, දමනයෙහි ලන පඤ්චෙන්ද්‍රියන් ඇත්තාහ, උතුම්වූ සීලසංරක්‍ෂණය ඇත්තාහ''යි දන්වූය. රජ්ජුරුවෝ ඔවුන්ගේ ගුණ අසා උයනට ගොස් වැඳ සුවදුක් කථාකොට වස් සාරමස එහිම වසන පිණිස ප්‍රතිඥා ගෙණ ආරාධනා කළෝය. ඍෂිවරයෝ එතැන්පටන් රජගෙයිදී වළඳා උයන වෙසෙති. ඉක්බිත්තෙන් එක්දවසක් නුවර මහත්වූ සුරාපානයෙක් විය. රජ්ජුරුවෝ ''තපස්විවරයන්ට සුරාපාන නම් දුලීභ වෙ''යි උතුම්වූ බොහෝ සුරායවූය. ඍසිවරයෝ රාබී උයනට ගොස් රා මදයෙන් මත්ව සමහර කෙණෙක් පැන පැන නටති. සමහර කෙණෙක් ගී කියති. නටා ගී කියා කෙණ්ඩිය හා එක්ව බිම ගසාගෙණ වැටී හී නිද්‍ර රා මද සුන්කල්හි පිබිද තමන්ගේ විප්‍රකාරය දක ''අප විසින් ප්‍රව්‍රජජිතයන්ට නොසරුප් දෙයක් කරණලදැයි හඬා වැලප අප ආචාරීන් වහන්සේ සමීපයෙන් වෙන්වූ බැවින් මෙබඳුවූ ලාමක ක්‍රියාව කළෝවම්හ'යි

SANHIDA LANKA

එකෙණෙහිම උයන හැර හිමාලය වනයට ගොස් තවුස් පිරිකර තැන්පත් කොට තබා ආචාරීන් වැඳ එකපත්පස්ව හිඳ ''කිමෙක්ද තපස්විවරයිනි මනුෂ්‍යපථයේ ආහාරයෙන් නොමිරිකී සැපසේ විසූද සමඟවත් වාසය කළාද''යි බොධිසත්‍වයන් විසින් විචාරණලද්දාහු. ආචාරීන් වහන්ස සැපසේ විසුම්හ, එතකුදුළුවත් අපි හැමදෙන නොපියයුත්තක් බී විසංඥව සිහි එලවා ගතනොහී නැටුම්හ, ගී කීම්හ, නැවත සිහි එලවාගෙණ අප කළසේ නපුරැයි ඇඬුම්හ''යි කියා ''මෙබඳු සිහිපත් නැතිකරන්නාවූ සුරාපානයටත් වඩා මා වානරවූවෝ නම් යහපත්වන්නේය''යි මෙසේ තපස්විවරයෝ තමන්ගේ නුගුණ බොධිසත්‍වයන්ට කීවාහුය. එපවත් ඇසූ මහබෝසතානෝ ගුරුවරයන් හා එක්ව නොවසන්නවූ තපස්විවරයන්ට මෙබන්දක් වන්නේම වේදැයි ඒ තාපසවරුන්ට නින්දා කොට මෙබන්දක් මතු නොකරවයි ඔවුන්ට අවවාදදී නොපිරිහුණු ධ්‍යානයෙන් බ්‍රහමලෝකයෙහි උපන්නාහුය. ශාසතෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්‍මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ සුරාපාන ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි සෘෂිසමූහයා නම් දැන් බුදු පිරිසය, ගණ ශාසතෘ වූයේ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මිත්තවින්දක ජාතකය

තවද එක් සමයෙක්හි පරහිත නිරතවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් එක් දුර්වච භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාව මිත්තවින්දක ජාතකයෙහි විස්තර වශයෙන් කියන ලද්දේය. මේ ජාතකය වූකලී කාශ්‍යප සර්වඥයන්වහන්සේ සමයෙහි වන්නේය. එසමයෙහි උරචක්‍රමාලාව උසුලා නරකයෙහි පැසෙන්නාවූ එක් නාරකික සත්‍වයෙක්  ස්වාමීනී කෙබඳුවූ අකුසල කර්‍මයෙක් කෙළෙහිදැයි බෝසතානන් අතින් විචාළේය. බෝධිසත්‍වයෝ තා විසින් මේ අකුසල කර්‍මය කරණලදැයි මෙසේ කිවුව. සමුද්‍ර මධ්‍යයෙහි දිවයිනක වෛමාණික ප්‍රේතීවූ දිව්‍යාඞ්ගනාවන් සතරදෙනෙකු දැක එපමණකින් සතුටුනොව මේ යහපත්දෝහෝයි අයහපත්දෝහෝයි කියා ඒ ඒ තැන අධික තෘෂ්ණාවෙන් මතුමත්තේ ගොස් දිව්‍යාඞ්ගනාවන් අටදෙනෙකු ලද්දෙහිය, එපමණකිනුත් සතුටුනොව ඉදිරියෙහි යන්නාවූ තෝ දිව්‍යාඞ්ගනාවන් සොළොස්දෙනෙකුත් ලද්දෙහිය. තවද එපමණකිනුත් සතුටු නොවන්නාවූ තෝ දිව්‍යාඞ්ගනාවන් දෙතිස්දෙනෙකුන් ලද්දෙහිය, ඉනුත් සතුටුනොව අතිච්ඡතායෙන් යන්නේ උරචක්‍රමාලාවට පැමිණියේ වෙහිය. මෙසේ ස්වකීයවූ ලාභයෙන් සතුටු නොව ඒ ඒ තැන්හි ඉච්ඡායෙන් ලාභය ප්‍රාර්ථනා කරන්නාවූ තෝ දැන් මේ උරචක්‍රමාලාවට පැමිණියේ වෙහිය. මෙසේ තෘෂ්ණා වසඟවූ තාගේ මස්තකයෙහි නැවත නැවත මේ උරචක්‍රමාලාව වැටී හිස කපමින් මහා දුක් දෙන්නේයයි ඔහුගේ කර්ම විපාකය ප්‍රකාශ කොට කිවූය. මෙසේ කියා මහබෝසතානෝ තමන් වසන්නාවූ දිව්‍ය ලෝකයටම ගියෝයි නාරකීක සත්වයා තමා කළ අකුසල් ගෙවීගිය කල්හි කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියේය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා මිත්තවින්දක ජාතකය  නිමවා  වදාළසේක.

එසමයෙහි මිත්තවින්දක  නම් දුර්වච මහණය, එසමයෙහි දිව්‍ය පුත්‍රවූයේ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# අත්ථස්සද්වාර ජාතකය

තවද එක් සමයෙක්හි සංසාර සාගරයට පසුරක් බඳුවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් කාරණ දැනීමෙහි සමර්ථවූ එක් කුලපුත්‍රයක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවර එක් මහ සම්පත් ඇති සිටානකෙණෙකුන්ගේ පුත්‍රයෙක් සත් ඇවිරිද්දෙහිම නුවණැත්තේය, කාරණා කාරණා දැන්මෙහි සමර්ථය, එක් දවසක් ඒ කුලපුත්‍රයා පියානන් සමීපයට ගොස් අභිවෘධියට උපායවූ ප්‍රශ්නය විචාළේය, ඒ සිටානෝ ඒ ප්‍රශ්න දැනගත නුහුනුවාහුය. ඉක්බිත්තෙන් ඒ සිටානන්ට මෙසේවූ සිතිවිල්ලෙක් විය. මේ ප්‍රශ්නය ඉතා සූක්ෂමය, සර්වඥයන්වහන්සේ හැර අනික් කෙණෙක් උඩින් භවාග්‍රය හා යටින් අවීචියෙන් පිරිහුනාවූ මේ ලෝකයෙහි මේ ප්‍රශ්නය කියන්නට සමර්ථ කෙණෙක් නැතැය’යි සිටානෝ පුත්‍රයා කැඳවාගෙණ බොහෝ සුවඳ මල් ආදිය ගෙන්වාගෙණ ජේතවනයට ගොස් සර්වඥයන්වහන්සේට පූජා කොට වැඳ එකත්පස්ව හිඳ බුදුරජානන් වහන්සේට මෙසේ දැන්වූය, ස්වාමීනී මේ කුමාරයා නුවණැත්තේය, කාරණා කාරණා දැන්මෙහි සමර්ථය, මේ තෙමේ මා අතින් අභිවෘධියට කාරණා වූ ප්‍රශ්නයක් විචාළේය, මම ඒ ප්‍රශ්නය දැනගතනොහී බුදුරජානන්වහන්සේ සමීපයට ආමී, ස්වාමීනී බුදුරජානන්වහන්ස මට ඒ ප්‍රශ්නය වදාළසේක්වීනම් යහපත් වන්නේය’’යි කීයේය.

එකල්හි සර්වඥයන්වහන්සේ වදාරණසේක් ’’ උපාසකය පෙරත් මේ කුමාරයා මා අතින් මේ ප්‍රශ්නය විචාළේය, මමත් ඔහට කීමි. එසමයෙහි මේ තෙමේ ඒ ප්‍රශ්නය දන්නේය, දැන් වූකලී අන්‍යභෂයෙනුත් සැඟවුනු බැවින් නොසලකන්නේය’’ යි වදාරා ඔහු විසින් ආරාධිතවූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණ ලද බොධිසම්භාර ඇති අප මහබෝසතානෝ මහා සම්පත් ඇති සිටාන කෙණෙක් වූය. එකල ඒ සිටානන්ගේ පුත්‍රයෙක් සත්හැවිරිදි වයසේදීම ප්‍රඥාවෙන් වැඩ අවැඩ දැන්මෙහි සමර්ථය, ඒ කුමාර තෙමේ එක් දවසක් පියානන් සමීපයට ගොස් ’ පියානන්වහන්ස වැඩ අවැඩ උපාය නම් කවරේද ’’ යි විචාළේය. එකල ඔහට පියානෝ ප්‍රශ්නයක් කියන්නාහු මෙසේ කිවුය, ශරීර ව්‍යාධියෙන් පීඩිත කල්හි නොලද්දාවූ ලාභයක් උපදවනටත් ලද්දාවූ ලාභයක් ප්‍රයෝජන විඳින්නටත් අසමර්ථ වන්නේය, නිරෝගි තැනැත්තේම නූපන්නාවූ ලාභ උපදවන්නටත් උපන්නාවූ ලාභයක් ප්‍රයෝජනය විඳින්නටත් සමර්ථ වන්නේය, චිත්තක්ලේශයෙන් පීඩිතවූ කල්හි නූපන්නාවූ ධ්‍යානාදී ලාභ නැවත නැවත සමාපත්ති වශයෙන් ප්‍රයෝජන විඳින්ටත් අසමර්ථ වන්නේය, ඒ අනාරොග්‍යය ඇති තල්හි නොලබන ලද්දාවූ ලාභය නොලබන්නේය, ලබන ලද්දාවූ ලාභය නිරාර්ථක වන්නේය, නිරෝගී බව ඇති කල්හි නොලබන ලද්දාවූ ලාභය ලැබෙන්නේය, ලබන ලද්දාවූ ලාභය සාර්ථකවන්නේයයි නිරෝගී බවම උක්කෘෂ්ටවූ ලාභයෙක් නම් වන්නේය, එසේහෙයින් පළමුකොට නිරෝගී බව වෘද්ධියට උපායක, මහා ආචාර ශීලයෙන් යුක්තව ලෝක චාරිත්‍ර දැන්මද දෙවෙනිවූ අභිවෘද්ධියට කාරණයක, ඥාණවෘද්ධිය, වයෝවෘද්ධිය, තපෝවෘද්ධි වූ ගුරුන්ගෙන් අවවාද ඇසීම් තුන්වෙනිවූ අභිවෘද්ධියට කාරණයක, මේ ලෝකයෙහි කාරණා තිශ්‍රිතවූ බහුශ්‍රැතවූ බව සතරවෙනිවූ ලෝවැඩ උපායක, ත්‍රිවිධ දුශ්චරිත ධර්මය දුරුකොට ත්‍රිවිධවූ සුචරිත ධර්මයන්ට අනුව පැවැත්ම පස්වැනිවූ අභිවෘඩියට, චිත්තයාගේ මලින නොවන බව නොපසුබට සවැනිවූ අභිවෘඩියට කාරණයක, එසේහෙයින් මොහු සඳෙන ලෞකික ලෝකොත්තර සඛ්‍යාත අභිවෘඩියම සාදාදීලන්ට සමර්ථ හෙයින් උතුම් වූ අභිවෘඩිකාරණාවෝ යයි මෙසේ මහබෝසතානෝ පුත්‍රයාට අභිවෘඩියට උපායවූ ප්‍රශ්නය කීවාහුය. ඒ කුමාරතෙම එතැන් පටන් ඒ සවැදෑරුම්වූ අභිවෘඩිකර ධර්මයෙහි පැවැත්තේය. බොධිසත්ත්වයෝ දානාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. ශාසතෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා අත්ථස්සවාර ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි පුත්‍රයා නම් දැන් මේ පුත්‍රයාය, එසමයෙහි ප්‍රශ්න විසසර්ජනය කළාවූ මහ සිටානෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# කිම්පක්ක ජාතකය

තවද එක්සමයෙක්හි සියළු ලෝවැඩ කිරීමෙහි සමර්ථවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් උකටලීවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා වදළසේක.

එක්තරා කුලපුත්‍රයෙක් බුඬශාසනයෙහි ලැදිව මහණව එක් දවසක් සැවැත් නුවර පිඩුසිඟා ඇවිදිනේ සර්වාභරණයෙන් සැරහුණාවූ එක් ස්ත්‍රියක් දක කෙලශ වසඟව ශාසනයෙහි ඇළුම් නැතිවූයේය. ඉක්බිත්තෙන් ඒ භික්ෂුව ආචාර්‍ය උපාඬ්‍යායන්වහන්සේ සමීපයට කැඳවාගෙණ ගියේය. සර්වඥයන් වහන්සේ ''සැබෑද මහණ තෝ ශාසනයෙහි උකටලීවූයෙහිදැ''යි විචාරා සැබව සවාමීනි කීකල්හි මහණ මේපඤ්චකාම ගුණයෝ නම් පරිභොග කාලයෙහි සිත්කළුවන්නාහ. ඒ පඤ්චකාම කොටඨාසයන්ගේ අනුභව කිරීම නරකාදී සතර අපායෙහි ඉපිද මහදුක් දෙන බැවින් කීම්ඵල නම් විෂඵල අනුභවකිරීම හා සමාන වන්නේය, කිම්ඵල නම් වර්ණයෙන් ගන්ධයෙන් රසයෙන් සමුර්ධය, අනුභව කළකල්හි වනාහි අතුනුබහන් සිඳ ජීවිතක්ෂයට පමුණුවන්නේය, පෙරත් බොහෝදෙන ඒ ඵලයෙහි දෘෂ නොදන වර්ණ ගන්ධ රසයෙහි බැඳී ඒ ඵලය අනුභවකොට ජීවිතක්ෂයට පැමිණියෝ වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහමදතත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතානෝ සාත්තුනායකව පන්සියක් ගැලින් බඩු ගෙන්වාගෙණ නැගෙනහිරින් බස්නාහිරට යන්නාහු. මහවන සමීපයට පැමිණ මනුෂ්‍යයන් රැස්කරවා ''මේ වනයෙහි විෂ වෘක්ෂයෙක් ඇත, එසේ හෙයින් මා නොවිචාරා තොපි හැම පෙර නොකෑවිරූ ඵලයක් නොකව''යි අවවාද කළාහුය. මනුෂ්‍යයෝ වනය ඉක්ම ආරණ්‍ය මුඛයෙහි එක් කිම්පකක නම් විෂ වෘක්ෂයෙක් ඵලභාරයෙන් නැමී තිබෙන්නා දුටුය, වෘක්ෂයාගේ කඳ අතුපත් ඵල සටහනින් හා වර්ණ ගන්ධ රසයෙන් අඹ ඵල හා සමාන වන්නේය, ඒ යන්නාවූ සත්‍වයන් අතුරෙන් සමහර කෙණෙක් වර්ණ ගන්ධ රසයෙහි බැඳී අඹ ඵලය යන සංඥාවෙන් අනුභජ කළාහුය. සමහර කෙණෙක් සාත්තුනායකයා විචාරා කම්හයි අතින් අල්වා ගෙණ සිටියාහුය, මහබෝසතානෝ ඒ සථානයට පිමිණ අල්වා ගෙණ සිටි ඵල දම්මවා යම්කෙණෙක් කමින් සිටියෝ නම් ඔවුන් වමනය කරවා බෙහෙත් දුන්නාහුය, ඒ සත්‍වයන්ගෙන් සමහරකෙණෙක් නිරෝගීවූහ, පළමුකොට අනුභවකොට සිටියාවූ සත්‍වයෝ ජීවිතක්ෂයට පැමිණියාහුය, බොධිසත්‍වයෝ තමන් කැමති තැනට සැපසේ ගොස් වෙළඳාම් කිරීමෙන් ලාභ ලැබ ගෙණ නැවත තමන් වසන්නාවූ සථානයට අවුත් දනාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාසතෘවූ බුදුරජානන්වහන්සේ මහණෙනි යම් සත්‍වයෙක් මත්තෙහි වන්නාවූ දෘෂ නොදන පචකාමය අනුභව කෙරේද ඒ සත්‍වයා කිම්පක්ක නම් විෂ ඵලය අනුභවකළාවූ සත්‍වයන් මරණට පැමිණියාක්මෙන් නරකාදී සතර අපායෙහි ඉපිද මහදුක් අනුභව කරන්නේ යයි වදරා චතුරායර්‍යසත්‍යය ප්‍රකාශ කළසේක. උකටලීවූ මහණ සෝවාන්ඵලයට පැමිණියේය, අවශෙෂපර්‍ෂාදීන් සමහර කෙණෙක් සෝවාන් ඵලයෙහි පිහිටියහ, සමහර කෙණෙක් සකෘද්‍රගාමී ඵලයෙහි පිහිටියහ, සමහරකෙණෙක් අනාගාමී ඵලයෙහි පිහිටියහ, සමහර කෙණෙක් රහත්වූහ, ශාසතෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදරා මේ කිම්පක්ක ජාතකය නිමවා වදළසේක.

එසමයෙහි පර්‍ෂත් නම් දන් බුදුපිරිසය, එසමයෙහි සාත්තුනායක වූයෙමි. තිලෝගුරු සම්‍යක්සම්බුදුරජවූ මම්මවේදැයි තමන්වහන්සේ දක්වා වදළසේක.

SANHIDA LANKA

# සීලවීමංස ජාතකය

තවද එක්සමයෙක්හි සීලසමාධි ප්‍රඥාවෙන් යුක්තවූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසනසේක්. සිල් පරීක්‍ෂාකරන්නාවූ බ්‍රාහමණයෙකු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ බ්‍රාහමණතෙමේ කොසොල්රජ්ජුරුවන් නිසා ජීවත්වන්නේය, තිසරණ ගතය, අඛණ්ඩපචසීලය. රක්‍ෂාකරන්නේය, වෙදත්‍රයෙහි පරතෙරට පැමිණියේය. රජ්ජුරුවෝ මේ තෙමේ සිල්වතැයි ඕහට අධිකවූ සත්කාර සම්මාන කෙරෙති. ඉතා ගරුකොට සලකති, එකල බ්‍රාහමණයා මෙසේ සිතීය, කිමෙක්ද මේ රජ්ජුරුවෝ මාගේ ජාතිකුල ප්‍රදෙස සමුර්ධිය නිසා මට සත්කාර සම්මාන කරණසේක් ද්‍රෝහෝයි නොහොත් සීලසමුර්ධිය නිසා සම්භාවනා කරණසේක් ද්‍රෝහෝයි එසේ හෙයින් මා පළමුකොට පරීක්‍ෂාකොට පුව මනාවේ දැයි සිතා ඒ බ්‍රාහමණයා එක්දවසක් රජ්ජුරුවන්ට සේවයට ගෙට යන්නේ එක්වන්නකු පුරුෂයෙකුගේ පෝරුවෙන් නොකියා එක්කහවණුවක් ඇරගෙණ ගියේය, ඒ දැක වන්නක්කා බ්‍රාහමණයා කෙරෙහි ගරුත්‍වයෙන් කිසිවක් නොකියා උන්නේය, නැවත එක්දවසක් කහවණු දෙකක් ගත්තේය, ඒ වනනකු පුරුෂයා ඒ දවසුත් එසේම ඉවසූයේය, බමුණා තුන්වෙනි දවස් කහවණු මිටක් හැරගත්තේය. ඉක්බිත්තෙන් වන්නකු පුරුෂයා ඕහට කියන්නේ එමබල බ්‍රාහමණය රජ්ජුරුවන්ගේ රාජභාණ්ඩාගාරය සොරකම් කරන්නේ අදට තුන්දවසක් නොවේදැයි කීය, මෙසේ කියා තමා විසින් රාජභාණ්ඩාරය සොරකම් කරන්නාවූ සොර අල්වාගන්නාලද දැයි තුන්විටෙක අඬගැසූයේය, එකල ඔහු සමීපයට මනුෂ්‍යයෝ ඇතින් මෑතින් අවුත් බොහෝ දවසක් සිල්වත් එකකුමෙන් ඇවිදිනේ නොවේද දැන් තා කළේ කිම්දැයි පහරකීපයක් ගසාපියා බැඳ ගෙණ රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ ඔහු දැක කලකිරී බමුණ කවර කාරණයකින් මෙබඳුවූ දුස්සීල ක්‍රියාවන් කෙළෙහිදැයි කියා ඇරගෙණ යව මෝහට රාජාඥකරවයි කිවූය, බමුණා රජ්ජුරුවන් වහන්ස මා රාජභාණ්ඩාගාර සොරකම් කළේ නැතැයි කීය, එසේකල කුමක් නිසා වන්නක්කාගේ සල්පිල පෝරුවෙන් කහවණු ගතීදැයි ඇසූය, රජ්ජුරුවන්වහන්ස එසේකළේ නුඹවහන්සේ මට අධිකකොට සත්කාර සම්මාන කොට සම්භාවනා කරණහෙයින් කිමෙක්ද මේ රජ්ජුරුවන්වහන්සේ මාගේ ජාත්‍යාදිය නිසා මට අධික කොට සම්භාවනා කරණසේක් ද්‍රෝහෝයි නොහොත් සීලය නිසා සම්භාවනා කරණසේක් ද්‍රෝහෝයි පරීක්‍ෂාකරණ පිණිස කෙළෙමි, දැන් වූකලී මා විසින් ඒකාන්තයෙන් රජ්ජුරුවන්වහන්සේ මට සම්භාවනාකෙළේ සීලය නිසාමය, ජාත්‍යාදියක් නිසා නෙවෙයි දන්නාලද, එතකුදු උවත් දැන් නුඹවහන්සේ මට රාජාඥ කරමින් සිටිසේක. එහෙයින් මම ඒකාන්තයෙන් මේ ලෝකයෙහි සීලයම උතතමය සීලයම ප්‍රධානයයි නිෂ්ඨාවට ගියෙමි, මම මේ සීලයම සුදුසු කාරියක් කෙරෙම් නම් ගිහිගෙයි සිට පචකාමය අනුභවකෙරෙමින් කොටගත නොහෙම්, අදම ජෙතවනයට ගොස් සර්වඥයන්වහන්සේ සමීපයෙහි මහණ වෙම් සවාමිනි මට මහණවීමට අවසර දුනමැනවැයි කියා රජ්ජුරුවන් අනු දන්වා ජෙතවනයට අභිමුඛ ගියේය, ඉක්බිත්තෙන් ඔහුගේ ඥාතිමිත්‍රයන් හා බන්ධුන් රැස්ව මහණවීමට යාම වළකාගත නොහී නැවත ගියෝය, ඒ බමුණා බුදුරජානන්වහන්සේ සමීපයට ගොස් ප්‍රව්‍රජ්‍යාව ඉල්වා ප්‍රව්‍රජ්‍යාවත් උපසමපදත් ලැබ කමටහන් මෙනෙහි කොට විදර්ශනා වඩා රහත්ව සර්වඥයන්වහන්සේ කරාගොස් සවාමීනි මාගේ ප්‍රව්‍රජ්‍යාව මසතකප්‍රාප්තවීයයි තමන් වහන්සේ අහීත් ඵලයලත් නියාව ප්‍රකාශ කළසේක. උන්වහන්සේගේ අර්ගත්‍වය ප්‍රකාශ කිරීම භික්‍ෂු සඞඝයා කෙරෙහි ප්‍රසිඬවිය. ඉක්බිත්තෙන් එක්දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්වූ භික්‍ෂූන්වහන්සේ ''ඇවැත්නි අසවල් කොසොල්රජ්ජුරුවන්ගේ උපසථායකයා වූ බමුණා තමාගේ සීලය පරීක්‍ෂා කොට රජ්ජුරුවන් අනුදන්වා මහණව අර්හත් ඵලයෙන් පිහිටියේය''යි ඒ භික්‍ෂූන්වහන්සේගේ ගුණ කියමින් උන්සේක. සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩවදරා ''මහණෙනි දැන් කවර කථාවකින් යුකතව උනුදැ''යි විචාරා ''මෙනම් කථාවකින් යුකතව උනුම්හ''යි කීකල්හි මහණෙනි තමාගේ සීලය පරීක්‍ෂාකොට පැවිදිව තමන්ට පිහිටක් කළෝයයි වදාරා ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහමදතත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතානෝ ඒ රජ්ජුරුවන්ට පුරෝහිතවූහ. දන්දීමෙහි බලවත් වූ ඇළුම් ඇත්තෝය, සිල්රක්‍ෂාකිරීමෙහිද බලවත්වූ ඇළුම් ඇත්තෝම අඛණ්ඩ පඤ්චසීලය රක්‍ෂාකෙරෙති, රජ්ජුරුවෝ සෙසු බමුණන්ට වඩා උතතරිතර කෙරෙති යන සියල්ලම පළමුකියන ලද්ද හා සදෘශවන්නේය, මහබෝසතානෝ සොරකම් කළෝයයි බැඳගෙණ රජ්ජුරුවන් සමීපයට ගෙණ යන කල්හි අහිගුණ්ඨිකයෝ වීථිමඬ්‍යයෙහි සර්පයින් කෙළවන්නාහුය, නගුට අල්වති, බොටුව අල්වති, සර්පයා අල්වාගෙණ තමන්ගේ කරවට වෙළති, එකල බොධිසත්‍වයෝ ඔවුන් දැක දරුවෙනි මේ සර්පයාගේ නගුට නාල්ලව, බොටුවෙහි නොවෙළව, මේ සර්පයා තොප දෂ්ටකළේවීනම් තොප ජීවිතක්‍ෂයට පමුණුවන්නේයයි කිවූය, අහිගුණ්ඨිකයෝ කියන්නෝ ''බමුණ මේ සර්පයා සිල්වත, ආචාරසමපනනය, තාසේ දුස්සීල නොවෙයි, තෝ වූකලී තාගේ දුස්සීල බැවින් අනාචාරයෙන් රාජභාණ්ඩාගාර සොරකම්කොට සොරායයි දැන් බැඳ ගෙණ යන ලද්දේය''යි කිවූය, එකෙණෙහි බොධිසත්‍වයෝ මෙසේ සිතූහ. සර්පයෝ පවා දෂ්ට නොකිරීමෙන් අනුන්ට හිංසා පීඩා නොකිරීමෙන් සිල්වත්හයි නම් ලැබති, මනුෂ්‍යයන් කෙරෙහි එවැනිගුණ විශෙෂයක් පිහිටියේ වීනම් කියනු කීමෙක්ද මේ ලෝකයෙහි සත්පුරුෂයන් විසින් රක්‍ෂා කරණලද දශශීල දෂටාඞගසල ආදී සියල්ලම උතුම් වන්නේය. ඒ ශීලයට වඩා ශ්‍රෙෂඨතර වසතුවෙක් ලෝකයෙහි නැත්තේයයි සිතූහ, එකෙණෙහි ඒ රාජපුරුෂයෝ ඒ බ්‍රාහමණයා ගෙණ ගොස් රජ්ජුරුවන්ට දැක්වූහ, ඉක්බිත්තෙන් රජ්ජුරුවන් විසින් ''කොල මේ කීමෙක්දැ''යි විචාරණලද රාජපුරුෂයෝ මෙසේ දැන්වූහ. දෙවයන්වහන්ස මේ බ්‍රාහමණ තෙමේ රාජභාඩාගාර සොරකම් කරණලද සොරෙකැයි කියා දැන්වූ කල්හි රජ්ජුරුවෝ අමාත්‍යයන්ට නියෝගකරන්නාහු 'කොල මේ බ්‍රාහමණයා විසින් රෑ දවල් මෙසේම සොරකමෙහි ලා යෙදී වාසය කරන්නේ වීනම් ඕහට රාජාඥාවකරව'යි නියෝගකළ කල්හි බ්‍රාහමණ තෙමේ රජ්ජුරුවන්ට කියන්නේ

SANHIDA LANKA

රජ්ජුරුවන් වහන්ස මා කළ සොරකමෙක් නැතැයි කියා දන්වීය, එසේකල කුමක් හෙයින් වසතු හැරගත්තෙහි දැයි විචාළ කල්හි බ්‍රාහමණතෙම පළමු කී පරිද්දෙන්ම තමා සොරකම් කළ කාරණා රජ්ජුරුවන්ට දන්වන්නේ ඒ කාරණයෙන් මම මේ ලෝකයෙහි ලා සිටියමැණවැයි දේවයන්වහන්ස ලෝකයෙහි ලාමක මෙවැනි ආශීර්විෂයෝ පවා අනුන් දෂට නොකිරීමෙන් සිල්වත්යයි බොහෝදෙනා විසින් ප්‍රශංසා කටයුතු වන්නාහුය, මේ කාරණයෙනුත් ශීපයම උතුම් වන්නේය, ශීලයම ශ්‍රෙෂඨවන්නේයයි ශීලාදී ගුණයට ප්‍රශංසා කරන්නේ මෙසේ කීය, මහරජ මේ ලෝකයෙහි කයින් වචසින් මනසින් අව්‍යතික්‍රම සංඛ්‍යාතවූ ආචාර සීලයම ශ්‍රෙෂඨවන්නේය, තවද මහරජ අඛණ්ඩාදී භාවයෙන් රක්‍ෂා කරණ ලද්දාවූ පංචසීල අෂටාඞගසීල දශසීලාදීවූ සීලයම නිරුතතරවන්නේය, ශ්‍රෙෂඨවන්නේය. ඝොරවිෂ තෙජස් ඇත්තාවූ ආශීර්විෂයෝ පවා සිල්වතතුයයි සත්පුරුෂයන් විසින් ප්‍රශංසාවට පැමිණියෝ යයි අතරමගදී තමා දුටුකාරණා අභිමුඛ කොට දක්වා රජ්ජුරුවන්ට මෙසේ ධර්‍මදෙශනා කොට වසතුකාම කෙලශකාමයන් හැර සෘෂිව්‍රජ්‍යාවෙන් මහණව හිමාලයවනයට වැද පඤචාභිඥා අෂටසමාපතති උපදවා චුතිප්‍රතිසනධිවශයෙන් බ්‍රහමලෝකය පරම ප්‍රතිෂඨා කළේයයි ශාසතෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්‍මදෙශනාව ගෙණ හැර දක්වා වදුරා පූර්‍වාපරකථාව ගළපා මේ සීලවිමංස ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි රජපිරිස් නම් දැන් බුදුපිරිස්වූවාය. එසමයෙහි පුරෝහිත බ්‍රාහමණයා නම් දැන් බුදුවූ මම්මයයි දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මඞගල ජාතකය

තවද එක්සමයෙක්හි සඬම් චක්‍රවර්තිවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසනසේක්. එක් වසත්‍ර ලක්‍ෂණ දන්නා බ්‍රාහමණයෙකු අරහයා මේ ජාතකය වදාළසේක.

හේ කෙසේ ද යත්

රජගහනුවර වසන්නාවූ එක්තරා බමුණෙක් දුටුදෙය ඇසූදෙය මගුලැයි ගන්නාලද ලබ්ධි ඇත්තේ බුඬාදී රත්නත්‍රයෙහිලා අප්‍රසනනය, දුඪමීථ්‍යා ලබ්ධි ඇත්තේය, ඒ තෙම රාජපාක්‍ෂිකය, බොහෝ සම්පත් ඇත්තේය, බොහෝසේ උපභොග පරිභොග ඇත්තේය, තවද ඒ බ්‍රාහමණයාගේ සුමුගක් තිබුණු අනඝවූ පිළිසඟලක් මීයන් විසින් කණ ලද්දේ විය, නැවත එක් දවසක් ඒ බ්‍රාහමණයා ඉස් සෝද්‍ර නහා අඳින පිළි ගෙණවයි කී කල්හි ඔහුගේ අතවැසියෝ අඳිනා පිළිසඟල මීයන් කෑ නියාව ඕහටකීහ, බ්‍රාහ්මණතෙම එකල මෙසේ සිතුයේය, මීයන් කාපු මේ පිළිසඟලක් ගෙයි තිබුයේ වී නම් මහත්වූ විනාශයට පැමිණෙන්නේය, මේ පිළිසඟලක් ගෙයි තිබීම අවලක්‍ෂණය අශ්‍රීකය, තවද මේ පිළිසඟල මාගේ ගෑණු පිරිමි දරුකෙණෙකුන්ට යොග්‍ය නොවන්නේය, දෑසිදස් මෙහෙකරුවන්ට දෙන්ටත් නොනිසිවන්නේය, කුමක් නිසා ද යත්? යම් කිසි කෙණෙකුන්ට මේ පිළීසඟල දුනහොත් උන්ට මහවිනාශ වන්නේය, එවැනි පිළිසඟල අමුසොහොනෙක ලවාපියවම්''යි සිතා නැවත මෙසේ සිතීය, දෑසිදස් මෙහෙකරුකෙණෙකුන් අත යැවූයේ වී නම් ඔහු මේ වස්ත්‍රයෙහිලා ලොභ උපදවා ගෙණ හැරගත්තෝ වූනම් මහත්වූ විනාශයට පැමිණෙන්නාහුය, එබැවින් පුතු අත යවා මේ වසත්‍රය දමවාපියම් පුතු කැඳවා තෝ මේ වසත්‍රය අතින් නොඇල්වා දණ්ඩකින් ඇරගෙණ අමුසොහොනට ගෙණගොස් දමාපියා ඉස්සෝද්‍ර නහා පිරිසිදුව එවයි කියා යවුයේය, තුන්ලොවට සිත ඇතිවූ කරුණා නිධානවූ සරණගත වජ්‍රපඤ්ජරවූ තිලෝගුරු සම්මා සම්බුදුරජානන් වහන්සේ අළුයම් වේලෙහි මහාකරුණා සමාපතතියට සමවැද අද දවස්හි කවර කෙණෙකුන් සවර්ගමොක්‍ෂ සම්පතෙහි පිහිටුවා පියම්ද්‍රෝයි පූර්වසර්ඥයන් වහන්සේ විෂයෙහි කෘතාධිකාරවූ මහ පින් ඇතිවන්නාවූ බන්ධූන් බලා වදුරණසේක්. මේ බමුණා හා දෙපුතුපියන් තමන් වහන්සේගේ අනාවරනඥාණ ජාලයට ඇතුළත්වූ නියාව දැක මේ දෙදෙනාට අද කවර අභිවෘද්ධියෙන් වේද්‍රෝහෝයි බලා වදුරණසෙක්. ශ්‍රොතාපතති මාර්ගයට පැමිණීමට හේතුසම්පත් ඇතිනියාව දැක වදුරා මුවන් යන්නා වූ හසර නොහැර සිටිනාවූ මුවවැද්දෙකු පරිද්දෙන් අමුසොහොන් දොරට ගොසින් සවණක් ඝනරැස් විහිදුවමින් එක්තරා සථානයෙක්හි වැඩහුන්සේක, ඉක්බිති මාණවකතෙමේ පියාගේ බස් මුදුනෙන් පිළිගෙණ ගරවිල් කුණක් දණ්ඩකින් ඔසවාගෙණ යන පරිද්දෙන් ඒ පිළිසඟල දඬු කෙළවරින් ඔසවා ගෙණ අමුසොහොන් දොරට ගෙණ ගොස් දමන්ට සිටියේය. ඉක්බිති සර්ඥ රාජොතතමයානන් වහන්සේ ඔහුගේ ඒ ක්‍රියාව දැක වදාරා මාණවකය තෝ කුමක් කරන්නෙහිදැයි විචාරා වදාළසේක. ඒ වේලෙහි මාණවකයා බුදුන්ට දන්වන්නේ භවත් ගෞතමයෙනි මේ පිළිසඟල මීයන් විසින් කනලද, එසේ හෙයින් නිශ්‍රීකය, හළා හළ විෂයක් හා සමානය, එසේ හෙයින් මපියානෝ මේ වසත්‍රයෙන් අමුසොහොනට දමන්නෝ අනිකක්හු අත යව්වෝතින් ඔහු මෙහි ලොභඋපදවාගෙණ ඇරගනිති සිතා මා අත එව්වෝයයි කියා දැන්වීය, එබැවින් මේ වසත්‍රය දමා ඉස් සෝදා නහා ගෙටයෙම් කීයේය, ඔහු කී බස් අසා බුදුහු වදාරණසේක් එබැවින් බ්‍රාහමණ මාණවකය තෙල පිළිසඟල දමාපියවයි වදාළසේක. මාණවකද ඒ පිළිසඟල අමුසොහොනෙහි දැමුයේය, එකල්හි ශාසතෘවූ බුදුරජානන්වහන්සේ මෙබඳු දෙය අපට වටනේ යයි ඔහු බල බලා සිටියදීම ගෙණ වදාළසේක. මාණවකතෙම යුහුව ගොසින් භවත් ගෞතමයෙනි මේ පිළිසඟල තොපට සුදුසු නොවෙයි, බොහෝදෙනා විසින් අවලක්‍ෂණයයි කියනලද, ඒ අශ්‍රීකය නොගණුවයි වලක්ව වලක්වාම සිටියදී පිළිහැරගෙණ වේළුවන මහාවිහාරයට වැඩ වදාළසේක. මාණවක තෙම යුහුව ගොසින් තමාගේ පියාහට එපවත් කීයේය, එකල්හි බ්‍රාහමණතෙම මෙසේ සිතීය. ඒ වසත්‍රය වනාහි අවමඞගල්‍ය සම්මතය අශ්‍රිකය ඉදින් ශ්‍රමණ භවත් ගෞතමයෝ ඒ පිළියෙන් සිවුරුකොටගෙණ පෙරවියෝනම් මහත්වූ විනාශයට පැමිණෙන්නාහුය, උන් උන්නාවූ වේළුවනාරාමයත් නසින්නේය. එබැවින් අපට බොහෝ අයස් උපදින්නාහයි ශ්‍රමණභවත් ගෞතමයන්ට අනිකුත් බොහෝ පිළිගෙන්වාගෙන ගොසින් සිවුරු පිණිස පිළිගන්වා උන් ඇරගත් අවලක්‍ෂණ වසත්‍රය උන්ලවා දම්මවාපියන් නම් යහපතැයි බොහෝ සිවුරු පිළිගෙන්වාගෙණ පුතා හා සමග වේළුවනාරාමයට ගොස් ශාසතෘවූ බුදුරජානන්වහන්සේ දැක නමස්කාර මාත්‍රයකුත් නොකොට එකත්පස්ව සිට මෙසේ විචාළේය. සැබෑද භවත් ගෞතමයෙනි අමුසොහොනට දමාපියනලද අශ්‍රීකවූ පිළිසඟලෙක් තොප විසින් ගෙණෙනලදද''යි විචාළේය. සැබෑය බමුණැයි වදාළසේක. බමුණු කියන්නේ ''භවත් ගෞතමයිනි ඒ පිළිසඟල අවමඟුලැ''යි බොහෝ දෙනා විසින් දන්නාලදහ, දින් තොපට ප්‍රයෝජනයක් වුනුනම් තොපට මහත් වූ විනාශ පැමිණෙයි සිතම්, තොප උන් වේළුවනාරාමයත් නස්නේය, ඉදින් තොපට අඳනා පොරෝනා සිවුරු මාත්‍රාවකුදු නොසෑහෙන්නේවීනම් මා විසින් මේ දෙනලද බොහෝ වසත්‍රයන් ඇරගෙණ නපුරුවසත්‍රයෙන් දමාපුව මැනවැයි කීයේය, එසේ කී බමුණාට බුදුහු වදාරණසේක් ''බමුණු අපවැනි තපස්විවරයන්ට අමුසොහොනකටවත් ඇතුළුවීථියටවත් කසලගොඩටවත් නහණතොටටවත් මහමගටවත් මෙසේ මෙසේවූ සථානයෙහි හුණුදෙයක්වත් දමාපුදෙයක්වත් ජීර්ණවසත්‍රවත් වටනේයයි වදාළසේක. එමබල බ්‍රාහමණය තා මෙබඳු මිථ්‍යාදෘෂ්ටියෙහි පිහිටියේ දැන්මතුනොවෙයි යටගිය දවසත් තෝ මෙබඳු ලබ්ධිඇත්තේමයයි වදාරා ජාතකදෙශනාවට මුඛමාත්‍රයක් දක්වා නිශ්ශබ්දව වැඩඋන්සේක. එකල්හි ඒ බ්‍රාහමණයා විසින් ආරාධිතවූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක. ඒ කෙසේදැයි යතහොත්?

SANHIDA LANKA

යටගිය දවස මගධරට රජගහනුවර ධාර්මකනම් මහරජජුරුකෙණෙක් දාන, ප්‍රියවචන, අර්ථචරියා, සමානාත්මයයි

ය සතරසංග්‍රහ වසතුවෙන් ජනරඤ්ජනය කෙරෙමින් රාජ්‍යය පරිපාලනයකරන්නාහුය, එසමයෙහි පුරණලද පාරමිතා ධර්මයන් ඇත්තාවූ අපමහබෝසතානෝ එක්තරා ප්‍රසිද්ධවූ බ්‍රාහමණ මහාසාරකුලයක ඉපිද වැඩිවිය පැමිණ පචකාමයෙහිලා ආදීනව දක තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිගෙණ පංචාභිඥා අෂ්ටසමාපතති උපදවා හිමාලය වනයෙහි වාසයකරන්නෝ එක්සමයෙක්හි හිමාලය වනයෙන් නික්ම රජගහ නුවර රජ්ජුරුවන්ගේ මඟුල් උයනට පැමිණ එහිවාසයකොට දෙවෙනි දවස් භික්ෂාචාර්තිය සඳහා ශානතායයී ප්‍රවෘතියෙන් ඇතුළු නුවරට සිඟාවන්හ මතුමහල්තලයෙහි සිටියාවූ රජ්ජුරුවෝ තාපසයන්දැක ප්‍රසන්නව මතුමහල්තලයට ගෙන්වාගෙණ මාහැඟි අස්නෙක්හි වඩාහිඳුවා චතුමධුරයෙන් වළඳවා තාපසයන්ගෙන් මධුරවූ බණඅසා සතුටුවූ සිත් ඇත්තාවූ රජ්ජුරුවෝ මඟුල් උයන තාපසයන් වසනනියායෙන් ප්‍රතිඥාඇරගෙණ මහත් වූ උපසථාන කරන්නාහුය. තාපසයෝද දවස දවස රජගෙයිදී වළඳා රජ්ජුරුවන්ගේ මඟුල් උයනෙහි ලා වාසයකෙරෙති, එසමයෙහි රජ්ජුරුවන්ගේ රජගහනුවර දූෂ්‍ය ලක්ෂණ නම් බ්‍රාහමණයෙක්විය. ඔහු සුමුගෙකතුබු පිළිසඟලක් මීයන් විසින් කපනලද්දේදැයි යනාදීන් සියල්ලම පළමු දක්වනලද කථානතරය හා සමානවන්නේය, එකල මහබෝසතානෝ පළමුවගොස් සොහොන්දොර එක්තරාසථානයෙක්හිලා හිඳ ඒ බ්‍රාහමණයා විසින් දමනලද පිළිසඟල ඇරගෙණ තමන් වසන්නාවූ උද්‍යාන භූමියට නැගී ගියහ, බ්‍රාහමණ මාණවකයාද ගොසින් එපවත් පියාහට කීයේය, ඔවුන්ගේ පියවූ මහබමුණු මෙසේ සිතුයේය, මේ රාජකුළුපගවූ තාපසයෝ මෙබඳු කාරණයකින් නැසීගියෝනම් නපුරැයි සිතා මහබෝසතානන් කරා එළඹ තාපසයෙනි තොපඇරගත්තාවූ තෙල අශ්‍රීකවූ පිළිසඟලක් ඇද්ද ඒ දමා පියවයි කීහ, එකල්හි ඒ තාපසයෝ කියන්නාහු එම්බල බමුණ සුසාන භූමියෙක්හි දමනලද්දාවූ ද මෙයින් අන්‍යසථානයෙක්හි දමාපු දෙයෙක්ද අපවැනි තාපසයන්හට විවරයන්ට යොග්‍යයයි කීහ. එම්බල බ්‍රාහමණය දුටුදෙය ඇසූදෙයම ගන්ධරස ප්‍රෂ්ඨව්‍ය වසයෙන් දන්නේය, අපි මඟුලැයි ගන්නමෝ නොවම්හ, මෙබඳු ලබ්ධිය බුඬ ප්‍රත්‍යෙකබුඬාදී උත්තමයන් විසින් ප්‍රසංශා කරණ ලද්දේ නොවෙයි එබැවින් නුවනැත්තවුන් විසින් මෙබඳු ලබ්ධි ගතයුතු නොවන්නේ යයි බමුණාට මිහිරිවූ ධර්මදෙශනාකොට අවවාද කළාහ, බ්‍රාහමණතෙම තාපසයන් විසින් කියනලද ධර්මය අසා සතුටු සිත් ඇත්තේ තමාගේ මිථ්‍යාදෘෂ්ටිය හැර මහබෝසතානන්ගේ සරණයෙහිලා පිහිටියේය, මහබෝසතානෝද නොපිරිහුණා වූ ධ්‍යාන ඇතිව චූතිප්‍රතිසනධි වශයෙන් බ්‍රහමලෝකයෙහි පිළිසරණකොට උපන්නාහුය, දෙවාතිදෙවවූ ශාසතෲවබුදුරජානන්වහන්සේ මේ ඉකුත්වත් කථා ගෙණහැර දක්වා වදාරා බුදුව බැඩහිඳ බමුණාට ''යසස මඞගලං සමොහතාය'' යන ගාථාවකින් වදාරණසේක් ''එම්බල බ්‍රාහමණය ක්ෂීණාශ්‍රවයෝ දෘෂට මඞගල සෘතමඞගලයයි යනාදිවූ චන්ද්‍රග්‍රහණ සූර්යග්‍රහණ අසනිපාත උල්කාපාත වසත්‍රලක්ෂණ ආයුධ ලක්ෂණ යනාදිවූ ඉෂටානිෂට දෙක්හි මඬ්‍යසථාකාරයෙන් පවත්නාහ''යි යනාදීන් මෙසේ තිලෝගුරු බුදුරජානන්වහන්සේ නැවත චතුසසත්‍යය ප්‍රකාශ කොට ධර්මදේශනා පවත්වා වදාළසේක. ධර්මදෙශනාවගේ කෙළවර මහබමුණු තමාගේ පුත්‍රයා හා සමග දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ ශ්‍රොතපතතිමාර්ගයට පැමිණ නිවන් දුටුසේක. ශාසතෲවූ බුදුරජානන්වහන්සේ මේ ජාතකය පූර්වකථාව හා අපරකථාව හා එක්ව සන්ධිගළපා නිමවා වදාළසේක.

එසමයෙහි ඒ බ්‍රාහමණයා හා දෙපුතුපියෝ දැන් මෙකලත් මේ බ්‍රාහමණයා හා දෙපුතුපියෝය, එසමයෙහි ඔවුන් සම්‍යක්දෘෂටියෙහි පිහිටෙව්වාවූ තාපසෝනම් දැන් සර්වඥපදප්‍රාප්තවූ මම්මවේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

## සාරම්භ ජාතකය

තවද එක්සමයෙක්හි ත්‍රෛලෝක්‍ය ප්‍රදීපායමානවූ ගෝතමගොත්‍රයෙහි උපන්නාවූතිලෝගුරු සම්‍යක්සම්බුදුරජානන්වහන්සේ එක්සමයෙක්හි සැවැත්නුවර නිසා ජෙතවන මහවිහාරයෙහි වැඩවසනසේක්. මුසාවාද ශික්ෂාපදය අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද යතහොත්

නාමගොත්‍රයෙන් අප්‍රසිඬවූ එක්තරා භික්‍ෂු කෙණෙකුන්වහන්සේ ලජ්ජා ප්‍රීයසිලීවූ සෙසුභික්‍ෂුන්වහන්සේට ජාතිකුල ප්‍රදෙශාදීන් සටා ආක්‍රොශ දොඩනසේක. බණිනසේක. එසේ උන්වහන්සේ කියන්නාවූ වචනය සෙසු සබ්‍රම්සරුන්වහන්සේ අසා එපවත් බුදුන්ට දැන්වූ සේක. බුදුහු ඒ භික්‍ෂූන්වහන්සේ ගෙන්වා සැබෑද මහණ ලජජාප්‍රියසීලි භික්‍ෂූන්වහන්සේ විසින්ම සැබවයි සවාමීනි දැන්වූකල්හි එමබල මහණ පරුෂ වචනය නම් මනුෂ්‍යයන්ට තබා තිරිසනුන්ටත් අප්‍රිය දෙයකැයි වදාරා මේ ජාතක ධර්‍මදේශනාව දක්වා වදාළසේක.

මෙහි පූර්‍වකථාව හා අපර කථාව නන්‍දිවිශාල ජාතකයෙහි කී පරිද්දෙන් දන්නේය. මේ ජාතකයයෙහි වනාහි අපමහබෝසතානෝ ගන්‍ධාර දේශයෙහි තක්සලා නුවර එක්තරා බමුණෙකුගේ නමින් සාරම්භ නම් වෘෂභ රාජයෙක්ව උපන්නහයි සර්‍වඥයන්වහන්සේ මෙසේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාරා ඒ භික්‍ෂූන්වහන්සේට ධර්‍මදේශනාකොට වදාරණසේක් එම්බල මහණ ප්‍රිය වචනයන් සියල්ලන්ටම කියයුතුය මුසාවාද පිසුනාවාචා ඵරුෂාවාච සම්ඵප්‍රලාපාදිවූ දුර්භාෂිත තෙපුල් කියන්නාවූ සත්‍වයෝ ඉහලෝකයෙහිත් පර ලෝකයෙහිත් දෙකින්ම පශචාත්තාපයට පැමිණ බොහෝ අනහි වෘද්ධියට පැමිණෙන්නාහයි වදාරා අනේකාකාරයෙන් දුර්භාෂිත වචනයෙහි ආදීනව දක්වා ධර්‍මදේශනාකොට වදාළසේක.

එසමයෙහි බ්‍රාහ්මණයානම් දූන් මේ ධර්‍මභාණ්ඩාගාරික ආනන්‍ද ස්ථවීරයෝය, එසමයෙහි බැමිණි නම් දූන් මෙකල්හි උපුල්වන් මෙහෙනිනීය, නමින් සාරම්භ නම් වූ වෘෂභ රාජ නම් දූන් බුදුවූ මම්ම වේදයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# කුහක ජාතකය

තවද එක් සමයෙක්හි තුන් ලොවට චිත්තාමාණික්‍යයක් බඳුවූ අප තිලෝගුරු බුදුරජානන්වහන්සේ සැවැත් නුවර නිසා ජේතවන මහවිහාරයෙහි වැඩවසනසේක් කොහොන් තපස් රකීනාවූ එක්තරා භික්ෂුන්වහන්සේ කෙණෙක් අරභයා මේ ජාතකය වදාළසේක. මෙහිලා කුහක වස්තුව උද්දාළ ජාතකයෙහි කියනලද්ද හා සමාන වන්නේය.

හේ කෙසේදැයි යතහොත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණකල්හි එක්තරා කුඩාගමක් නිසා කොහොන්තපස් රකිනා එක්තරා ජටාධර තාපසයෙක් වසන්නේය, එක්තරා කෙළෙඹි පුත්‍රයෙක්ද ඔහු කෙරේ ප්‍රසන්නව වනයෙහි ඕහටපන්සලක්කරවාදී මධුරවූ අන්නපානාදියෙන් නිරන්තරයෙන් උපසථානකරන්නේය, එකල්හි ඒ කෙළෙඹි පුත්‍රයා ඔහු කෙරෙහි පන්සලට ගෙණගොස් එක්තැනක නිධානකොට ස්වාමීනි මේ බැළුව මැනවයි කියා තාපසයන්ට භාරකොට ගියේය, එකල්හි තාපසයෝ තුමු උපාසකයෙනි භණ්ඩපටිසාමනම් තපස්වීවරයන්ට කැප සරුප් නොවන්නේය. අනුන්සනතක වසතුවෙහි අපට තමාලත් ලාභය නූපදින්නේයයි කීහ. කෙළෙඹි පුත්‍රයාද යහපත සවාමීනියි තාපසයන්ගේ ගුණයට ප්‍රසංශා කොට ඔහුගේ බස් අදහාගෙණ නැගී ගියේයි, දුෂ්ට තාපසයෝද මෙපමණ වසතුවක් ලදහොත් රැකීම්ගතහැක්නැයි සිතා කීපදවසක් ඉක්මවාලා ඒ නිධානකොට තුබූ වසතු අරගෙණ අතරමග එක්තරා සථානයෙක්හි තබා නැවත අවුත් තමා වසන්නාවූ පන්සලම වාසයකොට දෙවෙන දවස් කෙළෙඹි පුත්‍රයගේ ගෙයි ආහාර කෘත්‍යය සපයා මෙසේ කීහ. උපාසකයෙනි තොපනියා අපි බොහෝ දවසක් මෙහි වාසයකළෝවම්හ, එසේ හෙයින් බොහෝ දවසක් නික්මුනෝය, එකතැන බොහෝකලක්වසන්නාවූ තපස්විවරයන්ට මනුෂ්‍යයන් හා සංසර්ග දෝෂ වන්නේය, ඒ සංසර්ගයවූකලී තපස්විවරයන්ට කිළුවක් හා සමානය, එබැවින් උපාසකයෙනි අපි අන්‍ය සථානයකට යම්හයි කීයේය.

එකල්හි කෙළෙඹි පුත්‍රයා විසින් සවාමීනි කිසිවකින් ප්‍රයෝජනයෙක් ඇත්නම් මට වදාළමැනව නොවැඩියමැනවැයි කියා වලකන ලද්දාවූ තාපසතෙම උපාසකයන්ගේ බස් නොපිළිගත්තේය, කෙළෙඹි පුත්‍රයාද සවාමීනි නොනවත්ව වඩනාබැවින් ගොසින් වහ වහා වැඩියමැනවැයි කියා ගම් දොර දක්වා පසුගමන්කොට ගොසින් වැලැක්කේය, ජටාධර තාපසයෝද මේ කෙළෙඹි පුත්‍රයාට වංචාවක් කෙළෙම්නම් යහපතයැයි සිතා ජටා අතුරෙහි තණපතක් තබාගෙණ ගොසින්ලා නැවත වැලැක්කාහුය, ඉක්බිති කෙළෙඹි පුත්‍රයාද ජටාධරයන් දැක කීමෙක්ද සවාමීනි ගිය ඇසිල්ලෙහිම වැඩිසේක්මැයි විචාළේය. උපාසකයෙනි තොපගේගෙන් පිටත්වෙන වේලෙහි අපගේ මේ ජටාවෙහිතණ පතක් වැදගණ රැඳීගියේය. එසේහෙයින් අදත්තා දානයනම් තපස්විවරයන්ට නොවටනේය, ඒ තණපත ඇරගෙණ තොපගේ ගෙයි ලාපියන පිණිස ආමිකියා කීයේය, කෙළෙඹි පුත්‍රයාද සවාමීනි මෙවිතරකින් නුඹවහන්සේට කවර දෝෂයෙක්ද ඒ ඇර දමාපියා වැඩියමැනවැයි කියා අනේ මාගේ තාපසයෝ ඉතා කුකුස්පර කෙණෙක අනුන්සනතක වසතුවකිනුත් තණපතක් විවරකුත් ඇරගන්ට සිතකෙණෙක් නෙවෙති කියා තාපසයන්ගේ ගුණෙහි අතිශයින් ප්‍රසන්නව වැඳලා වැඩිය මැනවැයි සවාමීනි කීයේය, එකල්හි බඩු නිසා පසල් දනව්වටයන්නාවූ බොධිසත්‍වයන් විසින් එමගෙයි නවාතැන් ගන්නාලද්දේවිය, කෙළෙඹි පුත්‍රයා අතින් තාපසයන්ගේ බස් බොධිසත්‍වයෝ අසාලාම ඒකානතයෙනම මේ දුෂ්ටතාපසයන් විසින් මේ අඥාන කෙළෙඹි පුත්‍රයාගේ යම් කිසි ධනයෙන් වංචාවෙන් හැරගත්තේ වනැයි අනුමාණයෙන් සිතා කෙළෙඹි පුත්‍රයා අතින් බොධිසත්‍වයෝ විචාරන්නෝය සැබෑද මේ තාපසයන් කෙරෙහි තොප තුබූ වසතුවෙක් ඇද්දැයි විචාළෝය. සැබව යන්තම් වසතුවක් තිබීම් කීහ. කොපමණ ධණයෙක්දැයි විචාළකල්හි සබඳ රත්රණින් මැණික් සියයක් පමණයයි කීය. එසේවීනම් ගොසින් පන්සල තුබූ වසතුව ඇත්ත නැත්ත බලවයි කියා කීයේය. කෙළෙඹිපුත්‍රයා ගොසින් තමා තුබූ ධනය පරීක්ෂාකොට සබඳ මා තුබූ තැන්හි නුදුටුම් කීහ. බොධිසත්‍වයෝකියන්නෝ යහළු තා තබාළු වසතුව ඇරගත් කෙණෙක් නැත. ඒ සොරතව්සා විසින් ඇරගන්නාලද වන්නේය, වරෝ දෙදෙනම අපි ගොසින් ඔහු අල්වාගෙණ ඌ අත තුබූ වසතුව ඇරගණුම්හයි කියා කීහ. යහපතැයි දෙදෙනම එක්ව ඔහුකරා දිව ගෙණ ගොස් සොරකම්කළ තාපසයන් අල්වාගෙණ අතින් පයින් තළා මරා ගහටකොට ජටාධරයා අතතුබූ වසතුව ඇරගත්තාහුය. බොධිසත්‍වයෝද ඒ මැනික් සියයක රත්රන් දැක මෙතෙක් වසතුවෙහි කුකුස්නොකළ තොපි ජටාවෙහි වැදගත් තණපතෙහි කෙසේ කුකුස්දැයි නින්දාකොට එම්බල අඥානය මෙතැන්පටන්ගෙණ එබන්දක් නොකරවයි අවවාදකොට දිවිපමණින් දානාදී පින්කම්කෙරෙමින් තමන් කම්වූ පරිද්දෙන් මිය පරළොව ගියාහ. ශාසතෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැරදක්වා වදාරා මේ ජාතකය පූර්වාපරසන්ධිගළපා නිමවා වදාළසේක.

එසමයෙහි කුටකජටාධරයානම් මේ කොහොන් තපස් රකීනා භික්ෂුහුය. එසමයෙහි ප්‍රඥසම්පනතවූ සිටුපුත්‍රයානම් දැන් සර්වඥපදප්‍රාප්තවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# අකතඤ්ඤුත ජාතකය

තවද ශාක්‍යකුලකල්පදාමවූ තිලෝගුරු සම්මාසම්බුදුරජානන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවනාරමයෙහි වැඩවසනසේක්. මේ ජාතකය අනේපිඬු මහසිටානන් අරභයා වදාළසේක.

හේ කෙසේදැයි යතහොත්?

අනේපිඬු මහාසිටානන්ට පසල්දනව්වැසි එක්තරා සිටානකෙණෙක් අදාෂටමිත්‍රව වාසය කරන්නාහුය, එකල්හි ඒ පසල්දනව්වෙහි උපදනා බඩුයෙන් ගැල්පන්සියයක් බඩුපුරා තමන්ගේ කාරියෙහි නියුක්ත පුරුෂයන් කැඳවා දරුවනි තොපි හැමදෙන මේ ගැල්පන්සියයෙහි බඩු ගෙන්වාගෙණ ගොස් සැවැත්නුවර අපගේ යාළුවූ අනේපිඬුමහසිටානන් සම්මුඛයෙහි ගෙන ගියාවූ බඩු විකුට ඒ රටින් අපට උවමනා බඩුවක් ගෙනඑවයි විධානකළාහ. ඒ පුරුෂයෝ සිටානන්ගේ බස්ගිවිසගෙණ බඩුගෙන්වාගෙණ සැවැත්නුවර අනේපිඬුමහසිටානන් දැක ඒ බඩු හා පඬුරුත් දක්වාදී තමන් ආ පවතුත් සිටානන්ට කීවාහුය, මහසිටානෝද ඔවුන් දැක අපලඟට තොප හැම ආයේ ඉතා යහපතැයි කියා හිඳිනා නවාතැන් බත් වැටුප් ආදියද දෙවෙව්වාහුය. අපගේ මිත්‍රවූ මහසිටානන්ට සුවදුක් කීමදැයි විචාරා සමීපයට එවූ බඩු පඬුරු විකුණවා මිළ පුරුෂයන්ට දෙව්වාහුය. තමන්ගේ පසල්දනව්වට ගොසින් ඒ කාරණය තමන්ගේ සිටානන්ට කීවාහුය.

තවද මැතභාගයෙහි එක්සමයෙක්හි අනේපිඬුමහසිටානෝ බඩුපිරූ පන්සියයක් ගැල් පසල්දනව්වට යව්වාහුය, සිටානන්ගේ මිනිස්සු පසල් දනව්වට ගොසින් තමන් ගෙණගිය පඬුරු පසල්දනව්වැසි සිටානන්ට පැදූටහ. සිටානෝද තොපි හැම කොයිසිට අව්දැයි විචාරා සැවැත්නුවර නුඹ වහන්සේගේ යහළුවූ අනේපිඬුසිටානන්වහන්සේ ළඟසිට ආම්හයි කීකල්හි අනේපිඬුමහසිටානෝයයි යන නමකුත් මිනිසුන්ට ඇද්දැයි අප හා සරිකොට කියා තමන් යව් පඬුරුත් ඇරගෙණ යහපත තොපි නික්මෙවයි කීහ. ගිය පුරුෂයන්ට හිඳිනා තැනක්වත් බත් වැටුප් ආදියක්වත් විචාරා නුදුන්හ. එකල්හි ගියපුරුෂයෝ තමන් ගෙණගිය පඬුරු තුමූම විකුට ඒ රටින් උවමනා පඬුරු ඇරගෙණ සැවැත්නුවරට ගොසින් අනේපිඬුමහසිටානන්ට එපවත් කීවාහුය. නැවත කලාතුරකින් පසල්දනව්වාසී සිටානෝ ගැල් පන්සියයක් බඩුපුරවා සැවැත්නුවරට යව්වාහුය. ඒ පුරුෂයෝ තමන් ගෙනගිය පඬුරු ඇරගෙණ අනේපිඬුමහසිටානන්ට දුටහ. එකල්හි අනේපිඬුමහසිටානන්ගේ මිනිස්සු මෙසේ කීහ. සවාමීනි මේ ආ සියල්ලවුන්ට හිඳිනා ගෙවල් බත් වැටුප් දීමත් අපට භාරයයි කියා ඔවුන්ගේ ගැල් පිටි නුවර එකතරා ස්ථානයක මුදවා තොපි හැමදෙනම මෙතැන්හි ඉඳුවයි තොපි හැමදෙනාටම බත් බුලත් ආදීවූ සියල්ලම අපගෙන් ලැබෙන්නේ යයි කියා ඔවුන් විවරක් නොහැර උදුරගෙණ රථ අදිනා ගොන් ඒ ඒ තැන ලූහුබඳවා ගැලින් රතසක්ගලවා ගැල්පිට තබා ගැලසක් හැරගෙණ ගියාහුය, ඒ පසල්දනව් වැස්සෝ තමතමන් හැඳිපෙරව් අහිමිව මහත්වූ භයින් තැතිගෙණ නොරදා යුහුව නික්මුනාහුය, අනේපිඬුමහසිටානන්ගේ මිනිස්සු තමන් ඒ කළාවූ පවත් සිටානන්ට කීවාහුය, සිටානෝද එපවත් අසා සර්වඥයන්වහන්සේට දන්වන්ටසුදුසුවූ බස් පඬුරෙකැයි සිතාගෙණ සර්වඥයන්වහන්සේ සමීපයට ගොසින් ආදියෙහි පටන්ගෙණ තමන් කළ කටයුතු සහ පසල්දනව්වැසි සිටානන් කළදෙයත් සර්වඥයන්වහන්සේට දැන්වූවාහුය, ඒ වේලෙහි බුදුහු වදාරණසේක් එම්බල ගහපතිය පසල්දනව්වැසි සිටානන් කෙළෙහිගුණ උපකාර නොදත්තේ දැන්මතුනොවෙයි යටගියදවසත් කෙළෙහිගුණ උපකාර නොදත්තෝමයයි වදාරා සිටානන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේදැයි යතහොත්?

යටගියදවස බරණැස්නුවර බ්‍රහමදතත නම රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද බොධිසමභාර ඇති අප මහබෝසතානන් වහන්සේ බරණැස මහාසම්පත් ඇත්තාවූ සිටුකුලයක උපන්නාහ, ඒ බොධිසත්‍වයන්ට අදාෂටමිත්‍රව වාසයකරන්නාවූ පසල්දනව්වැසි අනික් සිටාන කෙනෙක්ද වූවාහයි කියා ඒ සියළු ඉකුත්වත් කථාව වර්‍තමාන කථාව හා සදාෂවන්නේය. බොධිසත්‍වයෝ වනාහි තමාගේ මිනිසුන් අද මේ කටයුත්තක් අප විසින් කරණලදැයි කියා අවුත් තමන්ට කීකල්හි පළමුව අනුන් විසින් තමාට කළාවූ උපකාරයක් නොදන්නාවූ යම් සත්‍වකෙණෙක් ඇත්නම් මෙබඳු විකාරයට පැමිණෙන්නාහුයයි කියා සම්ප්‍රාප්තවූ පර්ෂදට ධර්මදෙශනාකරන්නාවූ බොධිසත්‍වයෝ මේ ලෝකයෙහි ක්‍ෂත්‍රිය බ්‍රාහමණාදීවූ යම්කිසි පුරුෂයෙක් අනුන් විසින් පළමුකොට තමා කරණලද්දාවූ උපකරණයක් නොදන්නාවූ අඥානපුරුෂතෙම කුදු මහත් යම්කිසි කටයුත්තක් තමාට පැමිණගියාවූ යම්කාලයෙක් ඇද්දා එබඳු කාලයෙහි ඊට ප්‍රතිබලව සිටියවූ අනික්සහයක්වත් නොලබන්නේ යයි යනාදී ධර්මදෙශනාකොට තුමූ දිවිපමණින් දානාදී පින්කම්කොට තමාගේ කම්වූපරිද්දෙන් මිය පරලොව ගියාහ, ශාසතෘවූ බුදුරජාණන්වහන්සේ මේ ජාතක ධර්මදෙශනාව ගෙණහැරදක්වා වදාරා ජාතකය පූර්වාපර සන්ධිගළපා නිමවා වදාළසේක.

SANHIDA LANKA

එකල්හි පසල්දනව්වැසි සිටානෝනම් දැන් මේ පසල්දනව්වැසි සිටානෝය, බරණැස්නුවර සිටානෝනම් මේ සර්වඥපදප්‍රාප්තවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

# ලිතත ජාතකය

තවද එක්සමයෙක්හි ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ අපගේ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ සැවැත්නුවරනිසා දෙව්රම්වෙහෙර වැඩ වසනසේක්. මේ ජාතකය චීවරාදීවූ චතුර්විධ ප්‍රත්‍යයලදින් නොපස්විකා වළඳන්නාවූ පෘථග්ජන භික්ෂූන් වහන්සේ අරභයා වදාළසේක.

ඒ කෙසේදැයි යතහොත්

එක්සමයෙක්හි බොහෝ භික්ෂූන්වහන්සේ බොහෝ චීවරාදී චතුර්විධ ප්‍රත්‍යයලදීන් බොහෝසේම නොපස්විකා වළඳනසේක. එසේ නොපස්විකා චීවරාදී ප්‍රත්‍යය ප්‍රයෝජන විඳිනා බොහෝ භික්ෂූන්වහන්සේ බොහෝ නිරාදුකින් හෝ තිරිසන් අපායෙහි හෝ ප්‍රෙතාත්මභාවයෙහි හෝ ඉපිද නොමිදෙනසේක. ශාසතෘවූ සම්මාසම්බුදුරජාණන්වහන්සේ මේ කාරණාව දිවසින් දැක වදාරා භික්ෂූන්වහන්සේට අනේකාකාරයෙන් නොපස්විකා වැළඳීමෙහි ආදීනව දක්වා වදාරා බණ වදාරණසේක්. ''මහණෙනි මේ ප්‍රියසීලි භික්ෂූන් විසින් චතුර්විධ ප්‍රත්‍යයලදීන් නොපස්විකා වැළඳීම නොකටුයතු වන්නේය, එසේහෙයින් මෙතැන්පටන්ගෙණ මහණෙනි පස්විකා වළඳව''යි වදාරා ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ ක්‍රම දක්වනසේක්. මහණෙනි මාගේ ශාසනයෙහි යම්භික්ෂුකෙනෙක්තෙම ''සීතසසපටිඝාතාය'' යනාදීන් ඒ ඒ ප්‍රත්‍යයට සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යවේක්ෂා පාලිය වදාරා මහණෙනි මෙපරිද්දෙන් චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය ලදින් පස්විකා වැළඳීම සුදුසුවන්නේයයි වදාරා එම්බා මහණෙනි මේ පස්විකා වැළඳීම නම් උග්‍රවිෂයක් අනුභවකරන්නාහා සමාන වන්නේය, විෂ අනුභවකිරීමෙහි ආදීනව නොදන්නාවූ පුරාතනයෙහි කිසිසත්ත්වකෙනෙක් විෂ අනුභවකොට අවසන්හි බොහෝ දුකට පැමිණියාහයි වදාරා අරාධිතවූ බුදුරජානන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක,

හේ කෙසේදැයි යතහොත්

යටගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජරුකෙණෙකුන් රාජ්‍යයකරණසමයෙහි පුරණලද පාරමිතා ඇති අප මහබෝසතානෝ එක්තරා මහාසම්පත් ඇති කුලයක ඉපද වැඩිවිය පැමිණ දූකෙළියෙහි ලොභ ඇතිව අක්ෂධූර්තව වසන්නාහුය.  තවද එසමයෙහි වංචාවෙන් දූකෙළ අනුන්පරදවන්නාවූ අක්ෂධූර්තීයෙක්ද විය. එකල්හි සොරහු අක්ෂධූර්තීනොව බොධිසත්වයන් හා සමඟ දූකෙළනේ තමා දිනනකල්හි කෙළිමඩුල්ල නොබිඳිනේය. තමා පරදිනාකල්හි පසඇට මුඛයටදමා පසඇට අපවත්වගියේයයි කෙළි මඩුල්ලබිඳ නැගීයන්නේය. බොධිසත්වයෝ ඕහුගේ කාරණාව දැන යහපත ඊට සුදුස්සක් කෙරෙමි සිතාගෙණ පසඇට ඇරගෙණ තමන්ගේ ගෙයිදී විෂයෙන් පසඇට දෙතුන්වැනිව රදාගෙන නැවතනැවත විෂපෙවූ පසඇට ගෙණ ධූර්තීයා සමීපයට ගොසින් සබඳ දූකෙළිම්හයි කියා කීහ. ධූර්තකයා යහපතැයි කියා කෙළිමඩුල්ල සරහා ඕහු හා සමඟ කෙළිනේ තමා පරදින අවසථාවෙහි එයින් එක් පසඇටක් ඇරගෙන මුඛයට දමන නියාව දැක යහපත යහළු තෙපි ගැළපියව මතු මින් මෙසේවූ දෙයක්වෙයි කියා දැනගනුවයි මතුවන ආදීනව දක්වන්නේය, යහළු තෙපි දැන් වංචාවෙන් පසඇට ගළතත් උග්‍රවිෂයෙන් රුඳුබව හේතුකොටගෙණ අවසන්හි බලවත්වූ දුක්වේදනාවට පැමිණෙන්නෙහියයි බොධිසත්වයන් මෙසේකියා උන් කලට ධූර්තතම විෂයෙන් මූර්ජාවෙමින් ඇස්දෙක පෙරලා කරමිය නමාගෙණ වැටිහුණුයේය, බොධිසත්වයෝ වනාහි මා නිදුක්හු නිසා මෙවැනි අඥානයෙකු නැසී යාම සුදුසු නොවන්නේය. මෝහට මා ජීවිතදානය දීම වටනේයයි සිතා ඖෂධයෙන් පරිභාවිතාකරණලද බෙහෙත් යොගයෙන් ඕහු අනුභවකරවා විෂය වමනය කරවා නිරෝගිකොට මතු මෙබන්දක් නොකරවයි අවවාද කියා දිවිපමණින් දන්දී පින්කම් කෙරෙමින් තමන්ගේ කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ශාසතෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙනහැරදක්වා වදාරා එම්බා මහණෙනි නොපස්විකා වළඳන චතුර්විධ ප්‍රත්‍යයනම් විෂඅනුභව කිරීමක් හා සදෘෂයයි වදාරා මේ ජාතකය පූර්වාපරසන්ධිගලපා වදාළසේක. එකල්හි ප්‍රඥාසම්පනන අක්ෂධූර්තීයානෝනම් දැන් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මහාසාර ජාතකය

තවද එක් සමයෙක්හි මුළුලොවට උතුම්වූ රූපකාය සමපතතියෙන් හා ධර්මකාය සම්පතතියෙන් යුක්තව දසබල චතුවෛශාරද්‍යාදිවූ ගුණයෙන් විරාජමානවූ අප තිලෝගුරු සම්මා සම්බුදුරජානන්වහන්සේ සැවැත්නුවර නිසා දෙව්රම්වෙහෙර වැඩවසනසේක්. මේ මහාසාර ජාතකය ආයුෂ්මතවූ අනඳමහ තෙරුන්වහන්සේ අරභයා වදාළසේක.

ඒ කෙසේදැයි යතහොත්

එක්සමයෙක්හි කොසොල් රජ්ජුරුවන්ගේ පුරසත්‍රීහු මෙසේ සිතුවාහ. බුඬොත්පාදකාලයනම් ඉතා නොලද හැක්කේය. මනුෂ්‍යාත්මභාවයද එසේ ලද නොහැක්කේය. චක්‍ෂුරාදී පංචන්‍ද්‍රියන්ගේ සම්පූර්ණතාවය ලැබ ගැන්මත් එසේම දුර්ලභ වන්නේය. අපිද මෙබඳුවූ බුඬොත්පාදය හා ක්‍ෂණ සම්පතතියත් ලැබගෙණ අපගේ අභිප්‍රායෙන් දෙව්රම්වෙහෙරට ගොස් බුදුන්ගේ මධුරවූ ධර්ම දේශනා අසන්ට හෝ වේවයි දන්දෙන්ට හෝ වේවයි නොලබම්හ, මැදිරියෙක ලූවන්මෙන් වාසයකරම්හ, මහරජ්ජුරුවන්වහන්සේට දක්වා අපට බණ කියන්ට සුදුසු භික්‍ෂූකෙණෙකුන් වහන්සේ ගෙන්වා ගෙණ උන්වහන්සේ සමීපයෙහි ධර්මය අසාම ඒ පාලිධර්මයෙන් යම් යම් විවරක් ඉගෙණගතමෝ නම් එබඳු ධර්මයකුත් ඉගෙණගනුම්හ. දානාදිවූ පින්කමුත් කොට ගණුම්හ. එසේකල්හි මේ ක්‍ෂණ සමපතතිය අපට සඵලවන්නේය''යි ඔහු හැමදෙනම රජ්ජුරුවන් සමීපයට ගොසින් තමන් හැම සිතුකාරණය රජ්ජුරුවන්ට දැන්නුවාහුය, රජ්ජුරුවෝ එබස් අසා යහපතැයි ගිවිස්වාහුය. නැවත එක්දවසත් රජ්ජුරුවෝ උයන් කෙළිනා කැමැත්තෝ උද්‍යානපාලකයා ගෙන්වා උයනෙහි මිනිස්කෙණෙකුන් ඇත්ත නැත්ත පරීක්‍ෂාකොට එවයි නියෝග කළ කල්හි උද්‍යානපාලකයා තෙමේ උයනේ මිනිසුන් ඇත්ත නැත්ත පරීක්‍ෂාකොට ඇවිදිනේ එක්තරා රුකක්මුල සර්වඥයන් වහන්සේ වැඩඋන්නියාව දැක රජ්ජුරුවන් සමීපයට උද්‍යානපාල තෙමේ ගොස් දේවයන්වහන්ස උයනේ අන්කිසිවෙකුත් නැත. තවද සම්මා සම්බුදුරජානන්වහන්සේ එක්තරා රුකක්මුල වැඩඋන්සෙක්යැ කීයේය, යහපතැයි කෝසල රජ්ජුරුවෝ සර්වඥයන් වහන්සේ සමීපයෙහිදී බණත් අසා ගණුම්හයි සරහා පිළියෙල කරනලද උතුම්වූ රථවාහනයකට නැගී සර්වඥයන්වහන්සේ සමීපයට ගියාහ. එසමයෙහි ඡතතපානි නම් අනාගාමී උපාසකයෙක් සර්වඥයන්වහන්සේ සමීපයෙහි බණ අසමින් උන්නාහුය, එසේ බණ අසමින් උන් උපාසකයන් රජ්ජුරුවෝ දැක කීමෙක්දෝහෝයි සංකාවෙන් මදවේලාවක් බලාසිට නැවත මෙසේ සිතුහ. ඉදින් මේ ලාමක පුරුෂයෙක්වීනම් සර්වඥයන් සමීපයෙහි ඉඳබණ නොඅසන්නේය. මොහු අලාමක පුරුෂයෙක්හුම වියයුතුයයි සිතින් සිතා සර්වඥයන් වහන්සේ කරා එළඹ පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව උන්හ. උපාසකයෝද බුඬගෞරවයෙන් රජ්ජුරුවන් දැක නැගී සිටීමක්වත් වැඳීමක්වත් නොකළාහ. ඒ කාරණයෙන් රජ්ජුරුවෝ ඔහු කෙරෙහි නොසතුටුසිත් ඇතිවූහ. ශාසතෘවූ සම්මා සම්බුදුරජානන්වහන්සේ රජ්ජුරුවන්ගේ සිත අසන්තුෂටනියාව දැන වදාරා උපාසකයන්ගේ ගුණ රජ්ජුරුවන්ට වදාළසේක. මේ උපාසකයෝ බොහෝ ඇසූපිරූතැන් ඇත්තෝය, අනාගාමී මාර්ගඵලයෙහි පිහිටි කෙණෙක, වසතුකාම කෙලශමාකයෙහි අලග්න සිත් ඇතිවූ බලවත්වූ උපාසක කෙනෙකැයි වදාළසේක.

රජ්ජුරුවෝ සිතන්නෝ මේ පුරුෂතෙම ලාමක එකෙක් නොවන්නේය, මොහුගේ ගුණ බුදුහු පවා වර්ණනාකළසේකැයි සිතින් සිතා උපාසකයන්ට මෙසේ කීහ. උපාසකයෙනි තොපට යම්කිසි වසතුවකින් ප්‍රයෝජනයක් ඇත්තේවීනම් ඒ අපට කියවයි කියා කීහ. උපාසකයෝද යහපත ස්වාමීනි පිළිගත්තාහුය. රජ්ජුරුවෝ ද සර්වඥයන්වහන්සේගෙන් මධුරවූ ධර්මදෙශනාව අසා වැඳ තුන්යලක් පැදකුණුකොට රජගෙට නැගී ගියහ. තවද එක්දවසක් කොසොල් රජ්ජුරුවෝ තමන් වසන මතුමහල්තලයෙහි සිටුමැදුරුකවුළුව හැර ඇතුළුවීථිය බලා සිටියේ පෙරවරු බත් අනුභවකොට පත්කුඩයක් ඉසටකොට ගෙණ රජ්ජුරුවන්ගේ මාලිගාව සමීපයෙන් දෙව්රම්වෙහෙරට යන්නාවූ ඡතතපාණි නම් උපාසකයා දැක රාජපුරුෂයන් යවා ගෙන්වා ගෙණ මෙසේ කීහ. උපාසකයෙනි තෙපි බොහෝ ඇසූපිරූතැන් ඇතිහෙයින් බහුශෘතය අපගේ පුරසත්‍රීහු බණ අසන්නා කැමැත්තෝය. පාලිධර්මයෙන් කිසිවක් ප්‍රගුණකොට ගන්නා කැමැත්තාහු වෙති, ඉදින් තෙපි පුරසත්‍රීන්ට බණ කියා පාලිධර්මයන් ප්‍රගුණ කරවා ලියා එවුනම් යහපතැයි කීහ. උපාසකයෝ කියන්නාහු මහරජ ගිහිගෙයි සිටි කෙණෙකුන් විසින් පුරගෙවල බණ කියන්ට හෝ වේවයි බණ උගන්වන්ට හෝ වේවයි සුදුසු නොවන්නේය. භික්‍ෂූන් වහන්සේටම ඒ කටයුත්ත සුදුසුයයි කීහ, එකල්හි රජ්ජුරුවෝද උපාසකයන් කීබස් ගිවිස යහපත තෙපි යවයි උපාසකයන් නික්මවා පුරසත්‍රීන් ගෙන්වාගෙණ භද්‍රාවෙනි තොපි හැමදෙනාටම බණ කියනු පිණිස ධර්මය උගන්වනු පිණිස සර්වඥයන් වහන්සේ සමීපයට ගොසින් එක් භික්‍ෂුකෙනෙකුන් වහන්සේ ඉල්වම්, අසූමහසව්වන්වහන්සේගෙන් කවර කෙනෙකුන් වහන්සේට ආරාධනා කෙරෙම්දැයි කියා විචාළහ. ඔහු හැමදෙනඑක්ව කථාකොට ධර්මභාණ්ඩාරික අනද මහතෙරුන්වහන්සේම කැමතියයි කීහ. රජ්ජුරුවෝ සර්වඥයන්වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පස්ව උන්නාවූ රජ්ජුරුවෝ බුදුන්ට මෙසේ දැන්වූහ. සවාමීනි අපගේ පුරසත්‍රීහු අනඳමහතෙරුන්වහන්සේ සමීපයෙහි ධර්මය අසන්ටද උගන්වන්ටද කැමති වන්නාහුය, ඉදින් අනඳමහතෙරුන්වහන්සේ දවස දවස රජගෙට වැඩ අපගේ අනතඃපුර වාසීන්ට බණ වදාරා උන්ගේ සක්ති පමණින් පාලිධර්මයන් වණපොත් කරවා වඩිනාසේක්වීනම් යහපතැයි කියා දැන්වූහ. බුදුහු යහපත මහරජයි රජ්ජුරුවන් කීබස් පිළිගෙණ එපරිද්දෙන්ම අනඳමහතෙරුන්වහන්සේට නියෝගකොට වදාළසේක. එතැන්පටන් ගෙණ රජ්ජුරුවන්ගේ පුරස්ත්‍රීහු අනඳමහතෙරුන් වහන්සේ සමීපයෙහි බණ අසන්නාහුද වන පොත් කරන්නාහුද වෙත්. එසමයෙහි එක්දවසක් රජ්ජුරුවන් පලඳනාවූ චූඩාමාණික්‍යය සොරුන් විසින් ගත්බව අසා අමාත්‍යයන්ට මෙසේ නියෝගකළහ. රජගෙට සියළු අභ්‍යන්තර ජනයාම අල්වාගෙණ තොප දන්නා නියායකින් මැණික පවත්කරවා

SANHIDA LANKA

දෙවයි විධාන කළහ. එබස් ඇසූ අමාත්‍යයෝ රාජභවනයෙහි අභ්‍යන්තර සත්‍රීන් ආදිකොට ඇති සියල්ලන් අතින් මැණික තොප ගතුදැයි විචාරා බොහෝ ජනයාහට පීඩාකරන්නාහුය. එදවස් අනඳ මහතෙරුන්වහන්සේ යම් මේ ස්ත්‍රීහු පළමු තෙරුන්වහන්සේ දැක තුටුපහටුව බණ අසන්නාහු වෙද්ද පාලිධර්මය පුහුණු කරන්නාහු වෙද්ද එලෙස නොව වීක්‍ෂෙපයට පැමිණියාවූ සියල්ලවුන්ම දැක මෙසේ විචාරා වදාළසේක, අද කවර කාරණයකින් තෙපි හැමදෙනම මෙබඳු වික්‍ෂෙපයට පැමිණියාදැයි විචාරා වදාළසේක. එකල්හි සත්‍රීහු මහතෙරුන්වහන්සේට මෙසේ කීහ. ස්වාමීනි රජ්ජුරුවන් වහන්සේගේ චූඩාමාණික්‍යය අපවත්ව ගිය හෙයින් පවත්කරම්හයි කියා අමාත්‍යයෝ වල්ලභ ස්ත්‍රීන් පටන් ඇතුළුගෙයි බොහෝ ජනයා පීඩාකරන්නාහුය. කාට කුමක්යනබවත් නොදන්නාහෙයින් වික්‍ෂෙපව සිටිම්හයි කීහ. මහතෙරුන්වහන්සේද තොපි හැම ඊට ශෝක නොකරවයි ඒ පුරස්ත්‍රීන් හැමදෙනම අස්වසා රජ්ජුරුවන් සමීපයට වැඩ පණවනලද ආසනයෙහිලා වැඩඋන්සේක, මහරජ තොපගේ චූඩාමාණික්‍යය සොරුන් විසින් ගන්නාලදැයි විචාළසේක. එසේය ස්වාමීනි කියා කීය. ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේ වදාරණසේක් මහරජ මැණික පවත්කරවාගන්ට නොපොහොසත්තුදැයි වදාළසේක. ස්වාමීනි රජගෙයි අභ්‍යනතරව හිඳිනා ස්ත්‍රීන් පටන් සියල්ලවුන්ම අල්වාගෙණ ගහටකොට විචාරත් මැණික පවත්කරවාගන්ට නොපිළිවන්වීයයි කීහ. තෙරුන්වහන්සේ වදාරණසේක් මහරජ බොහෝ දෙනාට පීඩානොකොට මැණික ඇරගන්ට උපායෙක් ඇතැයි වදාළසේක. ස්වාමීනි කවර උපායෙක්දැයි විචාළහ. පිදුරු ඇදීමෙන මහරජ වදාළසේක. ස්වාමීනි කවර පිදුරු ඇදීමෙක්දැයි විචාළහ. මහරජ යම්පමණ ජනයාකෙරේ සැක ඇත්නම් ඒ ඇමදෙනම ගණන්කොට එකී එකී කෙණෙකුන් අතට එකී එකී පිදුරුකැටියක් හෝ මැටිපිඩක්දී මේ උදාසන්හිම අසෝතැනලාපියවයි කිය යුතු වන්නේය, යමක්හු විසින්ම මැණික ගන්නා ලද්දේවීනම් ඒ තමා ඇරගත් මැණික පිදුරු මැටි ආදියෙහි නොපෙණෙන පරිද්දෙන් වසාගණ අවුත් දමාපියන්නේය, මහරජ මෙසේ කළ කල්හි ඉදින් පළමු දවස්ම මැණිකලාපුනම් යහපත්මය, ඉදින් නුළුවෝනම දෙවෙනිදවසුත් තුන්වෙනිදවසුත් එසේම කරවිය යුතුවන්නේය, එසේකල්හි බොහෝ දෙනාට පීඩා නොවන්නේය. මැණිකද පවත්නේයයි වදාළසේක, තෙරුන්වහන්සේ රජ්ජුරුවන්ට මෙසේ කියා විහාරයට වැඩිසේක. රජ්ජුරුවෝද තෙරුන්වහන්සේ වදාළ පරිද්දෙන්ම තුන්දවසක් මෙම ක්‍රමයෙන්ම කරවූවාහුය, රජ්ජුරුවන් මෙසේ නොයෙක් සැටියෙන් උත්සාහකළෝ නමුත් සොරු තමන් ඇරගත් මැණික නුදුන්නාහුය, තෙරුන්වහන්සේ තුන්වෙනිදවස් රජගෙට වැඩ කිමෙක්ද මහරජ මැණික ලදුදැයි විචාළසේක. සවාමීනි සොරු මැණික අපට නුළුහයි කීහ. එසේවීනම් මහරජ මතුමහල්තලයෙහි පිළිසන්තන්හි දියසැලක් තබ්බවා වටාතිරයක් මුවාකරවා රජගෙහි අභ්‍යනතරයෙහි සියළු සත්‍රීන්ටද කුදුන් රකවලුන් ද ආදීවූ සියළු පුරුෂයන් උතුරුසළුවක් පොරවාගෙන අවුත් ඒ දියසැලබලා එන්ට නියෝගකරවයි කීයේය, ඒ භාණ්ඩාගාරික අනඳ මහතෙරුන්වහන්සේම මේ අධිකරණය තමන්වහන්සේට භාරකොට ගත්සේක. ඒකාන්තයෙන් මැණික පවත්කරවා විනා නොවළකිනාසේක, ඒ තමාගෙණ හිඳීම කාරණා නොවන්නේය, මෙවිට මේ මැණික ගෙණගොස් රජගෙයි ලාපියවයි සිතා සොරු දියසැලෙහි මැණික ඈයේය. මැණික ලබන ලදැයි සතුටුවූ රජගෙයි සියළු ස්ත්‍රී පුරුෂයෝද තෙරුන්වහන්සේ නිසා මෙවෙනි මහදුකින් මිදීගියෙම්හයි කියා සතුටුවූහ. තෙරුන්වහන්සේගේ ආනුභාවයෙන් රජ්ජුරුවන් වහන්සේගේ චූඩාමාණික්‍යය පැවැත්වූයේයයි කියා තෙරුන්වහන්සේගේ ප්‍රඥාආනුභාවය සියලු නුවරද භික්‍ෂුසංඝයාවහන්සේ කෙරෙහිද ප්‍රසිඬවූයේය,එකල්හි දම්සභාමණ්ඩපයෙහි රැස්ව උන්නාවූ සීලසමාධි ප්‍රඥාවිමුක්තිඥාන දර්ශනාදියෙන් යුක්තවූ මහාකාශ්‍යප ස්ථවිරයන් ප්‍රධානවූ භික්‍ෂුසංඝයා වහන්සේ තෙරුන්වහන්සේගේ ගුණකථනය කෙරෙමින් වැඩඋන්සේක. ඇවැත්නි අනදමහතෙරහු තමන්ගේ බහු,ශෘතභාවය හේතුකොටගෙණ පණ්ඩිත සවභාවයෙන් උපායෙහි තමන් දක්‍ෂහෙයින් බොහෝදෙනාට පීඩානොකොටම උපාශකතියෙන් රජ්ජුරුවන්ට මැණික ඇරගෙණ දෙව්හයි කියා මෙවෙනි කථාවෙන් උපලක්‍ෂි තව වැඩ උන්කල්හි සුරාසුරවර චක්‍රවාරු චූඩාමාණික්‍ය මරිචිසංචය පරිචුඹිත චරණනඛ මයුඛ ඇති තිලෝක සවාමීවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ ශ්‍රීගන්ධකුටියෙහි වැඩහිඳ දිව්‍යශ්‍රෙත ධාතුයෙන් ඒ භික්‍ෂූන්වහන්සේ කියමින් උන් කථාප්‍රබන්ධය අසාවදාරා මේ භික්‍ෂුහු ආනන්ද ස්ථවිරයන්ගේ ගුණකථනය කෙරෙමින් උන්නාහ, එතනට ගිය කල්හි තමන් කියමින් උන් කථා මට කියන්නාහුය. මම අතෛඑත්පත්ති කොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසටද ධර්ම දෙශනා කෙරෙමින් ඒ මාගේ දෙශනාව ඇසූ සවර්ගමොක්‍ෂ දෙකට කාරණාවන්නේයයි සිතා වදාරා තුන්තරාගමනින් එක්තරා ගමණකින් දම් සභාමණ්ඩපයට වැඩ පනවනලද බුඬාසන මසතකයෙහි වැඩහිඳ සශ්‍රීකවූ ශ්‍රී මුඛපත්මය විවෘතකොට සියළු දම්සභා මණ්ඩපය එකපැතිර සුවඳකරමින් අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ මධුරඝොෂා පවත්වා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කවරනම් කථාවකින් උපලක්‍ෂිතව උන්නුදැයි විචාරා වදාළසේක. එකල්හි අසූමහසව්වන්වහන්සේගෙන් එක්කෙනෙකුන්වහන්සේ නැගීසිට සකස් කොට හැඳ පොරවාගෙණ බඬාංජලීව දොහොත්මුදුනෙහි තබාගෙණ එලගත් රුකක්මෙන් නැමීසිට මෙසේ දැන්වූසේක. ස්වාමිදරුවන්වහන්සේ නොකියන්ට වදාළ රාජ කථා චෝර කථා ඉත්ති කථා ධූර්ත කථා පාන කථා යනාදීවූ දෙතිස්කථාවෙන් උපලක්‍ෂිතව උනුමෝ නොවම්හ, ආනන්ද ස්ථවිරයන් ගේගුණ කථනය කෙරෙමින් මෙතෙකින් උපලක්ෂිතව උනුම්හයි කියා දැන්වූ කල්හි ''එම්බා මහණෙනි අනුන් හැරගත් වස්තුව ආනන්ද ස්ථවිරයෝම දැන් ඇර දුන්නාහු නොවෙති පුරාතනයෙහි නුවනැත්තෝද බොහෝ ජනයාට පීඩා නොකොට තමන්ගේ ප්‍රඥානුභාවයෙන් තිරිසනුන් අතට පැමිණියාවූ වස්තුව පවා ගෙණහැර දෙව්වෝදැයි'' වදාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුරජානන්වහන්සේ ඉකුත්වත් කථාව ගෙනහැර දක්වා වදාළසේක.

හේ කෙසේ දැයි යතහොත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණ ලද පාරමිතා ඇති අප මහබෝසතානෝ සියළු අෂ්ටාදස විද්‍යාඞ්ඝානයෙහි ඉගෙණ කෙළපැමිණියාවූ අමාත්‍යයෙක්ව රජ්ජුරුවන්ට අර්ථයෙන්

SANHIDA LANKA

අනුශාසනා කරන්නාහු වෙති, එසමයෙහි එක්දවසක් බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෝ මහත්වූ පෙළහරින් උයන් කෙළියට ගොසින් වන ක්‍රීඩා කොට දියකෙළිනා කැමතිව මහරජ්ජුරුවෝ මඟුල් පොකුණට බැස අනතඃපුර සියළු ස්ත්‍රී සමූහයාද දියකෙළියට ගෙන්වූවාහුය, ඉක්බිති පුරස්ත්‍රීහු ඉස පළඳනා වූද කරපළඳනාවූද පාද පාදාංගුලි පාදාභරණ පාසලඹ කිංකිණික ජාලා ජංඝාපාන ඌරුජාලා කටීසූත්‍ර උදරබන්ධන අවුල්හර මුත් හර තෝඩු සිරෝජාලා මේ ආදීවූ ආභරණ විශේෂයෙන් ගලවා උතුරු සළුවෙක්හි බහා උතුරුසළුව සුමුගෙක බහා වස්තු රකිනා පරිද්දෙන් දාසීන් අතට පාවාදී ජලක්‍රීඩාවට බටුවාහුය, එසමයෙහි එක් වැඳිරියෙක් උයනෙ එක්තරා ගසෙක සාඛාවෙහි බලාගෙණ උන්නීය, එකල්හි බිසවූ සියළු පළඳනා ගළවා උතුරුසළුවෙක්හි බහා ඇතුළෙහි තබන්නාවුන් දැක ඒ මුත්හරගෙණ තොමෝද පළඳනා කැමැත්තී රැකවල උන්නාවූ දාසියගේ ප්‍රමාදභාවයක් බල බලා උන්නීද එකල්හි ඒ දාසිද පළඳනා සුමුගෙක තබාගෙණ ඇත්මැත් බල බලා උන්තැනැත්තීද නිදා උන්නිවුව, එකල්හි වැඳිරිතොමෝ දාසියගේ ප්‍රමාදභාවය දැක පවනට බඳුවූ වේගයෙන් යුහුව දිවගෙණ ගොස් මහමුත් හර තමා කරපළඳගෙණ පවනට බඳුවූ වේගයෙන්ම යුහුව දිවගෙණ ගොස් රුකට නැගී කොල අතුරෙහිලා සැඟවී හිඳ සෙසු වැඳිරියෝ දකිති යන භයෙන් එක්තරා ගස්සිදුරෙක්හි සඟවා අතිශයින්ම සන්හුන් කෙණෙක් මෙන් ඒ මුත්හර රකිමින් උන්නාවූව, ඒ බිසෝ පළඳනා රැක උන්නාවූ දාසිවූ මුත්හර නොදක්නා තැනැත්තී භයින් වෙව්ලන ස්වරූප ඇති තැනැත්ති තමා ගැලවී ගන්නා අනික් උපායක් සොයන තැනැත්තී පුරුෂයෙක් බිසවුන්වහන්සේ මුත්හර හැරගෙන දිවපියයි මහත් කොට අඬළුය. ආරක්ෂාවෙහි සිටි පුරුෂයෝ ඒ ස්ථානයෙන් රැස්ව  ඒ දාසියගේ බස් අසා රජ්ජුරුවන්ට දැන් වූවාහුය, එකෙණෙහි රජ්ජුරුවෝ සොරුන් වහා අල්වයි කියමින් අමාත්‍යයන් ගෙන්වාගෙණ සොරුන් අල්වන පරිද්දෙන් වෙන වෙන නියෝග කළහ. රාජපුරුෂයෝද උයනින් පිටත්ව සොරුන් අල්වයි කියමින් ඇතමැත සොරුන් පරීක්ෂා කරමින් ඇවිදිනාහුය. එකල්හි දනව්වාසී අය පඬුරු පසිඳ යන දුක්පත් මිනිසෙක් බොහෝ දෙනාගෙන් සොරුන් අල්ලව යන ඝෝෂාව අසා තමා කෙරෙහිලා භයින භයපත්ව යුහුව දිවන්ට වන. එසේ දිවන්නාවූ පුරුෂයා දැක සොරකම් කළ මේ පුරුෂයාවනැයි සිතා ඔහු ළුහුබඳවාගෙණ ගොස් අල්වාගෙණ අතින් මරා තළා එම්බල දුෂ්ටවූ සොර මහාසාර නම් පළඳනාව හැරගත්තෙහිදැයි විචාළහ. එකල්හි ඒ පුරුෂයා මෙසේ සිතීය. ඉදින් මම නොගතිමි කීන්නම් අද මාගේ ජීවිතය නැත. මෙතනදීම තළා මරා ජීවිතය හැරගන්නාහුය. නැතැයි නොකියා උන් කී දෙයම ගිවිසීම් සිතා ස්වාමීනි මම හැරගතිමි කීහ. ඉක්බිත්තෙන් රාජපුරුෂයෝ ඔහු පිටිතල හයා බැඳ රජ්ජුරුවන් සමීපයට ගෙණගියාහ. රජ්ජුරුවෝද ඔහු අතින් මෙසේ විචාළහ. කොළ තා විසින් මහාසාර නම්වූ පළඳනාව ගන්නාලද්දැයි විචාළහ. එසේය දේවයන්වහන්ස මා විසින් මහාසාර නම් ඇඳෙක් පුටුවකුත් නොදක්නාලද විය, සිටානන්ගේ කීමෙන් පළඳනාව ඇරගෙණ උන්ට දිනිමි කීය. රජ්ජුරුවෝ ඒ සිටානන් ගෙන්වා ඔහු අතින් මහාසාර නම් පළඳනාවෙක් සිටානෙනි තොප විසින් ගන්නාලද්දැයි විචාළහ. සිටානෝ නොදනිති නොකියා දේවයිනි මහාසාර නම් පළඳනාව මොහු අතින්ම මම ඇරගෙණ පුරෝහිතයන්ට දිනිමි කීය. රජ්ජුරුවෝ පුරෝහිත බමුණා ගෙන්වා කීමෙක්ද පුරෝහිතයෙනි තොප විසින් මහාසාර නම් ළඳනාව ගන්නාලද්දැයි විචාළ කල්හි එසේය දේවයෙනි මම හැරගෙණ  ගාන්ධර්වයාහට දිනිමි කීය. ඒ ගාන්ධර්වයා ගෙන්වා ''කොල ගාන්ධර්වයෙනි පුරෝහිතයන් අතින් මහාසාර නම් පළඳනාව ගන්නාලද්දේදැ''යි විචාළහ. ගාන්ධර්වයා නැතැයි නොකියා එසේය දේවයනි මම ඇරගෙණ ඒ පළඳනාව කෙලශ වසඟයෙන් මේ නුවර වෛශ්‍යාවට දිනිමි කීහ. රජ්ජුරුවෝ ඒ වෛශ්‍යාවද ගෙන්වා ''තී විසින් මහාසාර නම් පළඳනාව ගන්නාලද්දැ''යි විචාළ කල්හි ඒ වේලෙහි වෛශ්‍යාදුව කියන්නී දේවයිනි මහාසාර නම් පළඳනාවක් මා පැලැන්දේ නැත, ඔබ්බකින් ලද්දේත් නැතැයි කියා කිව. මෙසේ පස්දෙනා අතින් විචාරන කල්හි හිරු අසතයට ගියේය. එකෙණෙහ රජ්ජුරුවෝද ''දැන් වේලා නොවෙයි සෙට විචාරාගණුම්හ''යි ඒ පස්දෙනාම අමාත්‍යයන් අතට පාවාදී ඇතුළු නුවරට වදනාහ.

එකල්හි බෝධිසත්වයෝ මෙසේ සිතූහ, මේ මහාසාර නම් පළඳනාව අභ්‍යන්තරයෙහි අපවත්වූයේය. මේ පළඳනාව ඇරගතැයි යන පුරුෂතෙමේ පිටත සඤ්චාරණය කරණ එකෙක, උයන් දොරකඩ ආරක්ෂාවෙහි පුරුෂයෝ සිටියාහ, එහෙයින් පිටත එකෙක් තබා අභ්‍යන්තර එකෙකුත් වස්තුව හැරගෙණ පලායන්ට අවකාශයෙක් නම් නැත්තේය, එසේ හෙයින් පිටතින් ආ කෙනෙකුන්ටවත් ඇතුළේ සිටි කෙනෙකුන්ටවත් ඇරගන්ටවත් කාරණයෙක් නොපෙණෙන්නේය, මේ දුක්පත් මිනිසා විසින් සිටානන්ට දෙනලදැයි කියා කියන්නම් තමා ගැලවෙනු පිණිස කියයුතුවන්නේය. පුරෝහිතයන්ට මා විසින් දෙනලද්දැයි කියන්නාවූ සිටානන් විසිනුත් පුරුෂයෝ රාජඩ්‍යාසයෝය, උෟ ගැලවෙන්නම් මමත් ගැලවෙමි සිතා කිවාහු වන, ගාන්ධර්වයාට මා විසින් දෙන ලදැයි කියන පුරෝහිතයන් විසිනුත් ගාන්ධර්වයා නිසා සැපසේ ඔවුන් හා කථා කොට ඉඳුම්හයි කියා කීයේ වන, වෛශ්‍යාවට මා විසිනුත් දෙනලදැයි යන ගාන්ධර්වයන් විසිනුත් උකටලීයක් නැතිව වෛශ්‍යව හා කථාකරමින් ඉඳුම්හයි සිතා කීයේ වන මුන් පස්දෙනාම නොසොර වියයුතුය. මඟුල් උයනෙහි වඳුරෝ බොහෝකොට ඇත්තාහුය, මේ පළඳනාව එක්තරා වැඳිරියකගේ අතට පැමිණෙන්ට කාරණයයි සිතා එකල්හි බෝධිසත්‍වයෝ රජ්ජුරුවන් කරා එළඹමහ රජ තෙල සොරුන් අපට භාරකළ මැනව, අපි ඒ විචාර සුඬකොට දෙම්හයි කීහ. රජ්ජුරුවෝද යහපත පණ්ඩිතයෙනි ඒ තොපට භාරය, විචාරා පවත් කරවා දෙවයි කියා පස්දෙනාම පණ්ඩිතයන්ට පාවාදුන්හ එකල්හි බෝධිසත්‍වයෝ තමන්ගේ අතවැසි පුරුෂයන් ගෙන්වා පස්දෙනම එකසිරයක ලවා වට කොට රැකවල් ලවා මොහු පස්දෙන ඔවුනොවුන් හා යම් යම් කථාවෙක් කෙරෙත්නම් කන්දී අසාගෙණ සිට ඇසූදෙය මට අවුත් කියවයි කියා කීහ. පණ්ඩිතයන්ගේ පුරුෂයෝද එපරිද්දෙන්ම කළාහුය. ඉක්බිති මනුෂ්‍යයන් කාබී ඇතුළුනුවේලෙහි සිටානෝ ගොවියාට මෙසේ කිහ. එම්බල දුෂ්ටවූ කොල ගැහැටිය තෝ කවර දවසෙක්හි මා දුටු විරූද මම කවර දවසක දිටිම්ද කවර දවසෙක්හි තෝ මට දනීදැයි විචාළහ. එකල්හි ගැහැවි තෙමේ කියන්නේ ස්වාමීනී මහසිටානෙනි මට නොකිපෙව

SANHIDA LANKA

මැනව, මහාසාර නම් පළඳනාවක් තබා මහාසාර යයි යන නම් ඇති ඇඳක් පුටුවකුත් මා දිටුවිරූ නැත, සිටානන්වහන්සේ රාජවල්ලභසේක, ගැලවීමක් වේනම් දෙන්නම එක්ව ගැලවීයම්හයි කියා ජීවිත ආසාවෙන් කීම් කීහ. එකල්හි බමුණානෝද සිටානන්ට මෙසේ කීහ, '' මහ සිටානෙනි තොපට තුලූ නුදුන් පළඳනාව තෙපි මට දිතිම් කුමක් නිසා කිව්දැයි විචාළහ. එකල්හි සිටානෝ කියන්නාහු අපි දෙදෙනෙම ඉසුරුමත්ව පධානව සිටියම්හ, එසේවූ අප දෙදෙනා එක්ව සිටිකල්හි කාරිය සිද්ධිය වහා පැමිණෙන්නේ යයි සිතා කීම් කීහ. එකල්හි ගාන්ධර්වයා ද පුරෝහිතයාට මෙසේ කීහ, ''බමුණ තොප විසින් කවර දවසෙක පළඳනාව මට දෙනලද්දේ දැ''යි විචාළහ. එකල්හි පුරෝහිත බ්‍රාහ්මණතෙම කියන්නේ එම්බල ගාන්ධර්වය තට දුන් හෙයින් කීයෙම් නොවෙම්, අපි හැම තා නිසා සැපසේ ඉදුම්හ''යි සිතා කීම් කීහ, එකල්හි වෛශ්‍යාතොමෝ ගාන්ධර්වයන් අතින් මෙසේ විචාළීය,''කොල දුෂ්ටවූ ගාන්ධර්වය මම කවර දවසෙක තා ලඟට ගියෙම්ද, තෝ මා ලඟට කවර දවසෙක්හි ඈ විරූ එකෙක්දැ''යි විචාළීය, නග තෙපි මට නොකී පෙව අපි පස්දෙන එක්ව වසන කල්හි ගෘහවාසයක් හා සමානවන්නේය, කිසි උකටලීයක් නැතිව සැපසේ වැද හිඳුම්හයි කියා කීහ, බොධිසත්‍වයෝ තමන්ගේ චරපුරුෂයන් අතින් නියම දූන මුන් පස්දෙනා කී කථාව අසා නියම දූන මුන් පස්දෙනා නොසොර නියාව තත්‍වහෙයින් දූන වැඳිරිය අතින් ඇරගත් පළඳනාව ඇරගණිම් සිතා රත්පලස් හුයෙන් බොහෝ පළඳනා කරවා උයනේ වැඳිරියන් අල්වාගෙණ අතපයද කරද පළස් හුයෙන් කළ බොහෝ පළඳනා පළඳවා උයනේම අළුවාහුය, දලහර පළඳනාව ගත් වැඳිරි තොමෝ තමා ඇරගත් පළඳනාව රකිමින් උයනෙහි උන්නීය, බෝධිසත්වයෝ මනුෂ්‍යයන්ට මෙසේ විධාන කළහ, තොපි හැම ගොසින් උයන වැඳිරියන් හැමදෙනාම පරීක්ෂා කරව, යම් වැඳිරියක අත මුත්හර දුටුනම් ඈ භයගන්වා පළඳනාව හැරගණුව''යි කීහ, එකල්හි වැඳිරියෝ අප විසින් පළඳනා ලබන ලදැයි තුටුපහටු සිත් ඇතියාවූ උයනෙහි ඇවිදිනාහුය, කිසිකෙනෙක් පලස්හු පළඳනා ලදින් පළඳනා නොලත් වැඳිරියන් ලඟට ගොසින් අපගේ අතකර පළඳනා බලව, තොපි නොලද්දේවවදැයි කියා කීහ. එකල්හි පලස් පළඳනාව නොලත් වැඳිරි තොමෝ එක් සෙර වැඳිරියක් කියන්නාවූ බස් සහනයකොට ගතනොහී ගුණමකුව සෙසු වැඳිරියන්ට මෙලෙස කිව, තෙල සෙවූ පලස්හු පළඳනාවෙන් මට ප්‍රයෝජන කිම්දැයි තමා සඟවාගෙණ උන් මහාසාර නම් පළඳනාව තමාගේ කරේ ලාගෙණ නික්මුණාය,එසේ ඈ මුත්හර කර ලාගෙණ නික්මුණු කල්හි පණ්ඩිතයන්ගේ චරපුරුෂයෝද දූක වැඳිරිය භයගන්වා පළඳනාව එලවාගෙණ අවුත් බෝධිසත්වයන්ට දුන්හ. එකල්හි බෝධිසත්වයෝද මුත්හර ගෙන්වා ගෙණගොස් රජ්ජුරුවන්ට පෑහ. මහරජ්ජුරුවෙනි මේ නුඹ වහන්සේගේ මුත්හරය, නුඹවහන්සේ සිරගෙයි ලැවූ පස්දෙනම සොරකම් නොකළාහුය, මඟුල්උයනේ වැඳිරියන් විසින් මේ මුත්හරය ගෙණයන ලදැ'යි කීකල්හි පණ්ඩිතයෙනි ඒ මුත්හරය වැඳිරි ඇරගත්තා කෙසේ දතද? ඇරගත් දෙය කෙසේ ගෙන්වාගතුදැයි විචාළහ ආදීයෙහි පටන් සියළු ප්‍රවෘත්තිය මහ රජ්ජුරුවන්ට බෝධිසත්වයෝ විස්තර වශයෙන් කීවාහුය, රජ්ජුරුවෝ සතුටු සිත් ඇතියාහු මෙසේ සිතුවාහුය, සටනක් පැමිණි අවස්ථාවෙහි සටන ජය ගන්ට නිසි සුරවීර යෝධභටයෝ වියයුත්තාහුය. කාරිය චින්තාවක් පැමිණි කල්හි එබඳු කාරිය මෙම කටයුතුයයි කළමැනවැයි නියමකරන්ට නිසි අමාත්‍යයෝද සෙවියයුතු වන්නාහ, මධුරවූ අන්නපානාදියක් ලත් කල්හි ප්‍රියවූ බන්ධු මිත්‍රාදීහු සිහිකටයුතු වන්නේය, අත්ථගාම්භීර ධර්මගාම්භීරයෙන් යුක්තවූ ප්‍රතිභාගයක් දුටු කල්හි නුවණැති පණ්ඩිතවරහු සෙවියයුත්තාහුයයි මෙසේ රජ්ජුරුවෝ බෝධිසත්වයන්ට ස්තුතිකොට ඝනවර්ෂාවක් වස්වන්නාවූ මහා මෙඝයක් පරිද්දෙන් සත්රුවන් පූජාකොට ඒ බෝධිසත්වයන්ගේ අවවාදයෙහි සිට දිවිපමණින් දානාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. මහබෝසතානෝද දිවිපමණින් දානාදී පින්කම් කොට තමන්ගේ කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ජාතක ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා අනඳ මහතෙරුන්වහන්සේගේ ගුණ වර්ණනා කොට වදාරා ජාතකය පූර්වපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

එසමයෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ නම් දැන් මේ භාණ්ඩාගාරක අනඳමහතෙරහුය, ප්‍රඥාසම්පන්න වූ අමාත්‍යයෝ නම් දෙවාති දෙවවූ සර්වඥපදප්‍රාප්තවූ දැන් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# විසවාසභොජන ජාතකය

තවද එක්සමයෙක්හි ෂට් අසාධාරණ ප්‍රඥයෙන් යුක්තවූ තිලෝගුරු සම්මා සම්බුදුරජානන්වහන්සේ සැවැත්නුවර නිසා දෙව්රම්වෙහෙර වැඩවසන සේක්. විස්වාස භොජනයක් අරභයා මේ ජාතකය වදාළසේක.

හේ කෙසේදයි යතහොත්

එසමයෙහි වනාහි බොහෝ භික්ෂූන් වහන්සේ අපගේ දෙමව්පියන්ගෙන් එවඑෑ භෝජනයෙහි කියාද අපගේ නගුන් බුහුනන්ගෙන් එවාඑෑ භෝජනයෙහි කියාද අපගේ මයිලනුවන්ගෙන් නැන්දනියන්ගෙන් එවාඑෑ භෝජනයයි කියාද අපමණවුවත් මේ කියන බත්ධුහු අපට භෝජනය දෙන්ට නිස්සහ, අපි ඔවුන්ගෙන් ලැබගෙණ වලඳන්ට නිස්සම්භයි නෑයන් විසින් දෙනලද චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය දුන් කල්හි සැක නැතිව නොපස්විකා වළඳන්නාහුය, ශාසතෘවූ බුදුරජානන්වහන්සේ ඒ කාරණය දිවසින් දක වදාරා නොපස්විකා වැළඳී මෙහි ආදීනව දක්වා භික්ෂූන්ට මා විසින් ධර්ම දේශනා කෙළෙම් නම් යහපතැයි සිතා භික්‍ෂූන් වහන්සේ රැස්කරවා මහණෙනි භික්ෂූන් විසින් නෑයන් විසින් දෙනලද චීවරාදී  චතුර්විධ ප්‍රත්‍යය පස්විකා අනුභව කටයුත්තේය, එසේ නොපස්විකා සතරපසය අනුභවකොට කළුරියකරන්නාවූ භික්ෂූහු යක්ෂාත්මභාවයෙන් ප්‍රේතාත්මභාවයෙන් නොමිදෙන්නාහුය, මහණෙනි මෙසේ නොපස්විකා වළඳනාලද චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය නම් විෂ අනුභවකිරීමක් හා සදාශවන්නේය. මහණෙනි මේ විෂ නම්වූ දෙය විසවාස ඇත්තවුන් දුන්දෙයක් විසවස නැත්තවුන් දුන් දෙයක් අනුභව කළ කල්හි ප්‍රානහානි කරන්නේමය, පුරාතනයෙහි විසවාසයෙන් විෂ අනුභව කළෝ ජීවිත විනාශයට පැමිණියාහයි වදාරා නිශ්චලව වැඩ උන්සේක. එකල්හි භික්ෂූන් වහන්සේ විසින් ආරාධනා කරණ ලද සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේදයි යතහොත්?

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතානෝ මහාවිභාවි සිටුකුලයක උපන්නාහුය. මහබෝසතානන්ගේ ගෙරි රකිනා එක් ගොපල්ලෙක් වෙල ගොයම් කොට වැට බැඳි සමයෙක්හි ගෙරින් හැරගෙණ ගොසින් වලටවැද එහි ගාලක් ගසා ගෙරි රකිමින් ඒ වල වසන්නේය, සිටානන්ට කලින්කලට තෙල් දීකිරි ගෙණැවිත් දෙන්නාහුය. එකල්හි ගෙරි සිටිනා ගාලට නුදුරු තැන්හි වසන්නාවූ සිංහයෙකුට භයින් ගෙරි දුර්වලවීමෙන් කිරි මදවූයේය. එක්දවසක් ගොපල්ලා කිරි තෙල් හැරගෙණ සිටානන් දකින්ට ආකල්හි සිටානෝ ඔහු අතින් මෙසේ විචාළහ, ''කිමෙක්ද ගොපල්ල කිරි තෙල් ඉතා මදව ගියේවනැ''යි විචාළහ. එකල්හි ගොපළුතෙමේ කිරි තෙල් මදවගිය කාරණාව සිටානන්ට කීහ, සබඳ ගොපල්ල සිංහයා හා සමඟ සම්බන්ධව ඇතිව වසන අන් සත්වකෙණෙක් ඇද්ද නැද්දැයි විචාළහ, ස්වාමීනි සිටානන්වහන්ස එක්තරා මිහිවින්නෙක් සිංහයා හා සංවාසය කොට වෙසෙයි කීහ. කොල ඒ මිහිවින්නා තා විසින් අල්ලන්ට පුළුවන්දැයි විචාළහ. ස්වාමීනි මිහිවින්නා විවරක් අල්වාගැන්ම පිළිවනැයි කීයේය. එසේවීනම් තා ඒ මීවින්නා අල්වාගෙණ නලල පටන්ගෙණ සියළු ශරීරය ලොම්හි විෂ ගල්වා නැවත කීපවාරයක විෂ ඇඟ හා වියලා දෙතුන් දවසක් ඉකුත්කොට ඒ මිහිවින්නා ඇල්ලූ තෙනටම හැරපියවයි විධාන කෙළේය. එකල්හි සිංහයාද මිහිවින්නා කෙරෙහි සෙනෙහසින් සියළු ශරීරය දිවෙන් ලෙව ජීවිත විනාශයට පැමිණෙන්නේය, එසේ සිංහයා මළකල්හි ඔහුගේ සමද නියපඳුරුද දළද සිංහ තෙල්ද හැරගෙණ අපලඟට එවයි කියා විධානකොට ගොපල්ලා යැවූහ. එසේ යුන්නාවූ ගොපළු ඊට නිසි විෂයකුත් සිටානන්ට කියා හැරගෙණ ගොසින් මිහිවින්නා වසනතෙන ගොපළු දළක් බැඳ උපායෙන් ඒ මිහිවින්නා අල්වා ගෙණ සිටානන් කී පරිද්දෙන් විෂය මිහිවින්නා ඇඟ ගල්වා හැරියේය. සිංහ තෙම මිහිවින්නා දක බලවත් වූ සෙනෙහසින් ඇගේ සියළු ශරීරය දිවින් ලෙව තෙමේ ජීවිත විනාශයට පැමිණියේය. ගොපළුද නියසම් වසා තෙල් ආදිය හැරගෙණ මහබෝසතානන් සමීපයට ගියේය. බෝධිසත්වයෝ ඒ කාරණය දන මේ මා කෙරෙහි ස්නේහ කිරීම නොකටයුතුවන්නේය, මෙසේ බලපරාක්‍රමයෙන් යුක්ත ශක්තිසම්පන්නවූ සිංහරාජයා පවා කෙලෙශසංසර්ග මිහිවින්නා ඇඟ ලෙවීමෙන් විෂය අනුභවකොට ජීවිතක්ෂයට පැමිණියේයයි කියා එතනට සම්ප්‍රාප්ත පෂීදට බණ දෙසන්නාවූ බෝධිසත්වයෝ විශ්වාස ඇත්තවුන් කෙරෙහිද නැත්තවුන් කෙරෙහිද විශ්වාසය නම් නොකටයුතුවන්නේය. කුමක්මෙන්ද යත්? ඒ ස්නේහ කිරීම හේතුකොටගෙණ භය කාරණා උපද වන්නේය, මිහිවින්නාගේ මිත්‍රසංවාසයෙන් සිංහතෙම ජීවිත විනාශයට යම්සේ පැමිණිසේක්ද එසේහෙයින් කිසිකෙණෙකුන් කෙරෙහි විශ්වාස නොකටයුතුයයි මෙසේ මහබෝසතානෝ සම්ප්‍රාප්තවූ පෂීදට ධර්මදේශනා කොට දිවිපමණින් දානදී පින්කම් කොට තමන්ගේ කුසල්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. ශාසතෘවූ සම්මාසම්බුදුරජානන්වහන්සේ මේ ජාතක ධර්මදේශනාව නිමවා වදාළ සේක.

එකල්හි මහසිටානෝ නම් දන් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ලොමහංස ජාතකය

තවද එක්සමයෙක්හි ත්‍රෛලෝක්‍ය නායකවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ විසාලාමහනුවර නිසා පාටිකාරාම නම්වූ වෙහෙරෙහි වැඩවසන සේක්. සුනකබතත නම්වූ නිගණ්ඨ පරිබ්‍රාජිකයක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේදැයි යතහොත්

එක් සමයෙක්හි සුනකබතත නම් නිගණ්ඨ පරිබ්‍රාජික තෙමේ සර්වඥයන් වහන්සේට උපස්ථායකව බුදුන්ගේ පාසිවුරු ගෙණ බුදුන් හා සමඟ ඇවිදිනේය, කොරක්‍ෂත්‍රිය නම් නිගණ්ඨයාගේ බණ අසනු කැමති වූයේ දශබලධාරීවූ සර්වඥයන්වහන්සේ පාසිවුරු ඔබට පාවාදී කොරක්‍ෂත්‍රිය නම් නිවටයා නිසා වාසය කරන්නේ ඔහු මිය කාලකංජා නම්වූ අසුර යෝනියෙහි උපන් කල්හි තමාගේ තපස් ඇර ගිහිභාවයට ගොසින් මෙසේ කියා ඇවිදිනේය. ශ්‍රමණ භවත් ගෞතමයන් කෙරෙහි ධ්‍යානවිමෝක්ෂාදීවූ උත්තරි මනුෂ්‍ය ධර්මයෙක් නම් නැත, කෙලෙශ ප්‍රහාණය කරන්නාවූ ඥාණදර්ශණ විශේෂයකුත් නැත, විරක්තයෙන් මඩනාලදුව ශ්‍රමණ භවත් ගෞතමයෝ ධර්මය කියන්නාහ, විසීම අනුව ධර්මදේශනාව කරන්නාහුය, ආචාරිකෙණෙකුන් නැතිව සුබුඩියෙන්ම සිතාගෙණ කියන්නාහුය, යමෙක්හට ධර්මදේශනා කෙරෙත්නම් ඒ ධර්මය වූ පරිද්දෙන් පිළිපදිනාවූ සත්වයන්ට නරකාදී සතර අපාය දුක්ඛයෙන් ගැළවීම පිණිස නොවන්නේ’’යි විශාලාමහනුවර තුන්පවුර ඇතුලෙහි සර්වඥයන්වහන්සේගේ නුගුණ බොහෝ දෙනාට කියා ඇවිදිනේය, එකල්හි ආයුෂ්මත්වූ සැරියුත් මහතෙරුන්වහන්සේ පිඩුසිඟා වඩනාසේක්. බුදුන්ගේ අගුණ කියන්නාවූ සුනකබතත නම් නිගණ්ඨ පරබ්‍රාජිකයන්ගේ බස් අසා බසු බත ආහාරකෘත්‍යයෙන් වැළකීසේක. ඒ කාරණය භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේට දැන්වූසේක. සැරියුත් මහතෙරුන්වහන්සේද වදාළ බස් අසා බුදුහු වදාරණසේක්. එම්බල ශාරීපුත්‍රස්ථවිරය සුනකබතත නම්වූ ඒ තුච්ඡ පුරුෂතෙමේ ක්‍රෝධ බහුලවූ ස්වරූප ඇත්තේය, මාගේ ධර්මය නෛර්‍යාණික නොවන්නේයයි තමන්ගේ ක්‍රොධ බහුල භාවයෙන්ම කියන්නේය, ඒ සුනකබතත තෙමේ නොදැන එලෙස කියන නමුත් මාගේ ගුණ කීවාම වන්නේය, තවද ඒ තුච්ඡවූ පුරුෂතෙමේ මේ මාගේ ගුණ නොදන්නෝ නොවෙයි, එම්බල ශාරීපුත්‍රස්ථවිරය ෂට්අභිඥාවෝද මා කෙරෙහි ලා පිහිටියාහ, එසේහෙයින් මේ මාගේ උත්තරීමනුෂ්‍ය ධර්‍මය වන්නේය, තවද ශාරීපුත්‍ර ස්ථවිරය දසබල චතුවෛශාරාදී විශාරද ඥානයද මා කෙරෙහි ඇත,  එසේ හෙයින් මේද මාගේ උත්තරීමනුෂ්‍ය ධර්මය නම් වන්නේය, අණ්ඩජ ජලාබුජ සංසේදජ ඕපපාතිකය යන පරිච්ඡේද ඥානයද මා කෙරෙහි ඇත, දිව්‍යගති මනුෂ්‍යගති ප්‍රේතගති අසුරගති තිරිසන්ගති සඞඛ්‍යාතවූ පඤ්චගතියම පිරිසිඳ දන්නා නුවණද මා කෙරෙහි ඇත, එසේහෙයින් මේද මාගේ උත්තරී මනුෂ්‍ය ධර්මය නම් වන්නේය. මෙසේ යථොක්තවූ උත්තරීතර මනුෂ්‍ය ධර්ම ගුණයෙන් යුක්තවූ මට යම් පුද්ගලයෙක් දානාදීවූ උතුරු මිනිස්දම් මා කෙරෙහි නැතැයි කියන්නේවීනම් එසේ තමා ගත්තාවූ දුර්ලබ්ධි නොහැර සිටින්නේවීනම් තමා විසින් වරදවා ගත්තාවූ දුර්ලබ්ධිය හේතුකොටගෙණ අත අල්වාගෙණ නරකයෙහි ඇර සිටුවාක් මෙන් වන්නේය, එසේ තමන්වහන්සේ කෙරෙහි විද්‍යාමානවූ උත්තරී මනුෂ්‍ය ධර්මයෙහි ගුණ වදාරා එම්බල ශාරීපුත්‍රස්ථවිරය ඒ සුනකබතත නම් පරිබ්‍රාජක තෙමේ කොරක්‍ෂත්‍රිය නම් නිවටාගේ ධර්මය අසා ඔහුගේ දුෂ්කරක්‍රියා ප්‍රසන්නවූ ඔහුගේ කොහොන්තපස්හි විශ්වාශීවූයේ මාගේ ගුණ ගන්ට ඒ තෙමේ අයොග්‍යයයි වදාරා එම්බල ශාරීපුත්‍රස්ථවිරය මම මේ භද්‍රකල්පයට ඒකානූවන කපින් මත්තෙහි සසරෙහි සැරිසරන්නෙම් මේ අචලවූ ව්‍රතයෙහි හරයෙක් ඇද්දෝහෝයි බාහිරයන්ගේ මිථ්‍යාතපස් විමසන්නෙම් චතුරඞගයෙන් යුක්තවූ බඹරවස් රකින්නෙම් අචල ව්‍රතසමාදානය කෙරෙමින් වාසය කරන්නෙම් අචල ව්‍රතයට සුදුසුවූ සීලසංරක්‍ෂණය කරන්නෙම් වේදැයි සියළු තපස්විරයන්ට අග්‍රවූ පරම තපස්වීව වාසය කෙරෙමි රූක්‍ෂ ප්‍රතිපත්තිය පුරන්නෙම්ද අතිශයින් විශිෂ්ඨවූ රූක්‍ෂ ප්‍රතිපත්ති පුරන්නෙම්වීම්, පාපයෙහි ලජ්ජා ඇතිව වසන්නේමුත් උත්කෘෂට පාපනිරුකවූයෙම් ජනව්‍රතසථානයෙහිලා වාසයකරන්නේමුත් උත්කෘෂට ජනවිචික්තවාසයෙන් වසන්නෙම්වීම් වදාරා නිශ්ශබ්දව වැඩඋන්සේක. එකල්හි අනඳ මහතෙරුන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේදැයි යතහොත්

යටගිය දවස මේ භද්‍රකල්පයට ඒකානූවන කපින් මත්තෙහි එක්තරා කපෙක්හි පුරණලද පාරමිතා ධර්මයන් ඇති මහබෝසතානෝ බුදුසස්නෙන් පිටත් බායහ. ශාසනයෙහි තපස් රක්‍ෂාකෙරෙමි, ආජීවක ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ගෙණ අචෙලක පරිබ්‍රාජකවගෙණ තපස් රක්‍ෂා කරන්නාහුය, සියලඟින් රජස් දූලි උසුලන්නාහ, හුදකලාව වාසයකරන්නාහ, මිනිසුන් දැක භයපත්ව මුවන් පරිද්දෙන් වනයට වදිනාහ, මහාවිකෘත භොජනයෙන් සනතුෂට වන්නාහ, වසුන්ලාපු ආදිය අනුභවකරන්නාහ, නොපමාව තපස් රක්‍ෂාකරණ පිණිස මහ වනයෙහි හුදකලාව වාසයකරන්නාහ. බොල්පිණිබාන සමයෙහි බොල්පිණිද අධිකවූ සුලඟම පවත්නා සමයෙහිද මෙබඳු අනතරාෂ්ටක අකාල වනප්‍රදේශයෙන් නික්ම අබවස්හි වාසයකොට ඉරුනැගි කල්හි මහ වනයට වදිනාහුය. ඒ බොධිසත්වයෝ යම්සේ රාත්‍රියෙහි අබවස ඉඳ බොල් පින්නෙහි තෙමුණාහු. වෙද්ද දිවාභාගයෙහිත් වලටවැද වනලැහැබින් වැහෙන පිණි බින්දුයෙන් තෙමෙනලද ශරීර ඇතිව දහවල් ශරීර පීඩාවෙන් දුක්විඳිනාවූ ග්‍රීෂ්ම ඍතුවෙහිද දවල් අබවස්හි වාසය කෙරෙමින් ලවන ප්‍රදේශයෙන් නික්ම අබවස්හි වාසයකොට ඉර නැගිකල මහවනයට වදිනාහුය. ඒ බෝධිසත්වයෝ යම්සේ රාත්‍රියෙහි අබවස ඉඳ බොල්පින්නෙහි තෙමුනාහුවේද දිවාභාගයෙහිත් වලට වැද වනලැහැබෙන් වැහෙන පිණිබින්දුයෙන් තෙමෙනලද ශරීර ඇතිව රෑ දවල් සීත පීඩාවෙන් දුක්විඳිනාහු ග්‍රීෂ්ම ඍතුවෙහි දවල අබවස වාසය කෙරෙමින් රාත්‍රියෙහි වනලැහැබටම වදිනාහුය. ඒ බෝධිසත්වයෝ යම්සේ දිවාභාගයෙහි

SANHIDA LANKA

අබවසෙහි අව්වෙහි වාසය කළාහු. රාත්‍රියෙහි එපරිද්දෙන් පවන් නැති වනලැහැබ පීඩාවට පැමිණෙන්නාහුය. එකල්හි බෝධිසත්වයන්ගේ ශරීරයෙන් ග්‍රීෂ්ම කාලයෙහි නිවාසස්ථානයෙහිලා ඉදීම හේතුකොටගෙණ සියලු ශරීයෙන් සෙවද ජලධාරාව වැහෙන්නේයයි මෙබඳු දුෂ්ප්‍රතිපත්තීන් බඹලොව පිළිවෙතට සිතා පිළිවෙත් පුරන්නෝ බොහෝ කලක් මා විසින් මෙසේ අචෙල ව්‍රතසමාදාන කොට වාසයකරණලද එසේ වාසයකරන්නාවූ බෝධිසත්වයන්ට ආයුකෙළවර නරකයෙහි උපදින්ට සුදුසු ගතිනිමිත්ත දැක මෙතෙක් කල් මුළුල්ලෙහි මා කරණ ලද ව්‍රතසමාදානය ව්‍යර්ථව ගියේවනැයි සිතා එකෙණහිම තමන්ගේ ගත් මිත්‍යාදෘෂ්ටියෙහි පිහිටාගෙණ චුතිප්‍රතිසන්ධි වශයෙන් තව්තිසා භවනෙහි උපන්නාහුයයි ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ජාතක ධර්මදේශනාව මෙපරිද්දෙන් ගෙණහැර දක්වා වදාරා පූර්වපරසන්ධි ගළපා වදාළසේක.

එසමයෙහි අචෙලව්‍රතසමාදානය කොට එහි දෝෂ දැක සම්‍යක් ප්‍රතිපත්තියෙහි පිහිටා ස්වර්ගයෙහි උපන්නෙම් දැන් සර්වඥපදප්‍රාප්තවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මහාසුදස්සන ජාතකය

තවද මුළුලොවට පතළාවූ ආඥා ඇති තිලෝගුරු සම්මා සම්බුදුරජානන්වහන්සේ කුසිනාරානුවර මලලරාජෙන්ද්‍ර ශාලවනොද්‍යානයෙහි යුග්ම ශාලාභ්‍යානතරයෙහි පරිනිර්වාන මංචකයෙහි සැතපුනුසේක්. අනඳ මහතෙරුන්වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක්. සැරියුත් මහතෙරුන්වහන්සේ ඉල්මස මැදිපොහොයෙහි නාලක නම් ගම තමන් වහන්සේ උපන් ගර්භයෙහිම පිරිනිවන් පෑ වදාළසේක. මුගලන් මහතෙරුන් වහන්සේද ඉල්මස කළුවර පොහොයෙහි පිරිනිවන් පෑසේක. බුදුහු කුසිනාරා නුවරට ගොස් මම පිරිනිවන්පාමියි අනුක්‍රමයෙන් දනව් සැරිසරා වඩනාසේක. කුසිනාරානුවරට වැඩ මල්ලරජ්ජුරුවන්ගේ මඟුල් උයනෙහි උයනමැද යුග්මශාලානතරයෙහි උතුරුදිගට ඉසලා ඇතුළුයහනෙහි නැගී නොසිටිනා සෙය්‍යාවෙන් සැතපුණුසේක. ඉක්බිති ඒ සැතපුණු සර්වඥයන්වහන්සේට අනඳ මහතෙරුන්වහන්සේ දන්වනසේක්. භාග්‍යවතුන්වහන්ස මේ නුවර පිරිනිවන් පෑ නොවදාළ මැනව, ජලාශ්‍රයක් නැතිහෙයින් තිරුදකවූ රළුනුවර පිරිනිවන් නොපෑව මැනව, රජගහනුවර සැවැත්නුවර ආදිවූ එක්තරා මහා නුවරක පිරිනිවන් පෑව මැනවැයි ආරාධනා කළසේක. සර්වඥයන්වහන්සේද අනඳ මහතෙරුන්වහන්සේට වදාරණසේක්. ආනන්ද ස්ථවිරයිනි එසේ නොකියව, කුඩා නුවරෙහි කියාද අතුනුවරයයි කියාද මේ කුසිනාරානුවරට කියන්ට සුදුසු නොවන්නේය, ආනන්ද ස්ථවිරය යටගිය දවස මහා සුදර්ශන නම් සක්විතිරජව උපන් සමයෙහි මෙම නුවර මම වාසය කෙළෙමි, එම්බා ආනන්ද ස්ථවිරයෙනි පෙර මෙම නුවර දොළොස් යොදුන් රුවන් පව්රෙන් පිළිකෙව්කරණලද වීයයි වදාරා නිශ්ශබ්ද වූසේක. එකල්හි ආනන්ද මහතෙරුන්වහන්සේ විසින් ආරාධිතවූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාරණසේක්. මහා සුදර්ශන සූත්‍රදේශනාව ගෙණහැර දක්වා වදාළසේක.

හේ කෙසේදැයි යතහොත්?

එහි විස්තර මහා සුදර්ශන සූත්‍රයෙන් දතයුතුවන්නේය. එකල්හි මහා සුදර්ශන නම් සක්විතිරජව තමන් වසන ධර්ම නම් ප්‍රාසාදයෙන් පාතබැස ප්‍රාසාදයට නුදුරුව සත්රුවන්මයවූ තල්වනයෙහි පණවනලද කැප අස්නෙක්හි ඉඳ දකුණැලයෙන් නැඟී නොසිටිනා සෙය්‍යාවෙන් මරණමඤ්චකයෙහි වැදහොත්තාවූ සක්විති රජ්ජුරුවන්ට අගමෙහෙසුන්වූ සුභද්‍රානම් බිසව කියන්නී. දේවයිනි සුවාසූ දහසක් නුවරින් පිරිවරණලදුව මේ කුසාවතී නම් රාජධානියෙහි ඇළුම්කොට වදාලමැනවයි ඒ සුභද්‍රා නම් බිසවුන් කීකල්හි මහාසුදසුන් සක්විති රජතෙමේ බිසවුන්ට මෙසේ කීය, දේවීනි එසේ නොකියව තවද මේ සියළු රජ ඉසුරෙහි අපෙක්‍ෂාවක් නොකළමැනව, ඇල්මක් නොකළමැනවැයි මෙසේ අනුශාසනා කරවයි කියා කීහ. එබස් අසා බිසව්ද සුවාසූදහසක් පමණ ස්ත්‍රීහුද හඬාවැලපීහ. එබස් ඇසූ අමාත්‍යයෝද සියළු නුවර වැස්සෝද රජ්ජුරුවන් කීබස් අසා සහනයකොට ගත නොහී අඬාවැලපීහ. සුදසුන් නම් මහරජ්ජුරුවෝද බොහෝදෙනාගේ අරගළ අසා කිසිකෙණෙකුන් හඬා අරගළ නොකරවයි සියල්ලවුන් නවතා සුභද්‍රා නම් බිසවුන් කැඳවා එම්බා දේවීනි නොහඬව නොහඬව තල බීජ මාත්‍රෘවකුත් සියළු සංස්කාර ධර්‍මයන්ගේ එකාකාර පැවැත්මක් නැති හෙයින් නිතශ දෙයක් නැතැයි කියා " අනිච්චාවත සංඛාරා" යනාදී ගාථාවෙන් බිසවුන්ට බණ කියා ඒ මහා සුදසුන් රජ්ජුරුවන් අමෘතමහා නිර්‍වාණය දැක්වීමෙන් දේශනාව කුළුගන්වා සෙසු බොහෝ ජනයාටද දන්දෙවයි සිල් රක්‍ෂාකරවයි පෙහෙවස් රක්‍ෂාකරවයි අවවාද කොට චුතිප්‍රතිසන්ධි වශයෙන් දිව්‍යලෝකයෙහි උපන්නාහ. ශාස්තෘවූ සම්මා සම්බුදුරජානන්වහන්සේ මේ ජාතක ධර්‍මදේශනාව ගෙණහැර දක්වා වදාරා ජාතකය පූර්‍වපරසන්ධිගළපා වදාළසේක, එසමයෙහි ස්වාසූදහසක් ස්ත්‍රීන්ට නායකවූ සුභද්‍රාදෙවීහුනම් දැන් මෙකල්හි රාහුලමාතාවෝය, එකල්හි පරිනායකරත්නය නම් මෙකල්හි රාහුල ස්ථවිරයෝය, සෙසු පිරිස් නම් මෙකල්හි බුදුපිරිස් වන්නාහ. එසමයෙහි මහාසුදසුන් සක්විති නම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළාසේක.

SANHIDA LANKA

# තෙලපත්ත ජාතකය

තවද එක්සමයෙක්හි කරුණාවට වාසසථානවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ සුමහ නම් රට දෙසක නම් නියම්ගම් නිසා එක්තරා වන ප්‍රදේශයෙක්හි වාසය කරණ සේක්. මේ ජාතකය ජනපදකල්‍යාණී සූත්‍ර දේශනා අරභයා වදාළසේක.

හේ කෙසේදැයි යතහොත්

එක්සමයෙක්හි භික්ෂූන්වහන්සේ කම්සථාන දෙවා වදාරා උපමාවක් දක්වා භික්ෂූන්වහන්සේට අප්‍රමාදව මහණ දම් පුරවයි අවවාද කරණ බුදුහු මෙසේ වදාරණ සේක. මහණෙනි ජනපදකල්‍යාණී නම් උතුම්වූ රූදන්නාවූ තමා උන් දනව්වට කල්‍යාණවූ එක් ස්ත්‍රියෙක, කෙසකල්‍යාණය, මාංස කල්‍යාණය, අට්ඨිකල්‍යාණය, ඡවිකල්‍යාණය, වයකල්‍යාණය යන පඤ්ච කල්‍යාණයෙන් යුක්තය. තවද ඒ නාටක ස්ත්‍රී තොමෝ උතුම්වූ රූපයෙන්ද උතුම්වූ නෘත්‍යයෙන්ද උතුම්වූ ගීතයෙන්ද උතුම්වූ වැයීමෙන්ද බොහෝ ජනයාට සිත්කළුවන්නීය, එබඳුවූ නාටක ස්ත්‍රිය ඒ නෘත්‍යමණ්ඩලයට බැස නෘත්‍ය ගීත වාද්‍යාදිය පවත්වන්ට පටන්ගත් කල්හි බොහෝ ගම් නියම්ගම් රාජධානියෙහි මනුෂ්‍යයෝ ඇගේ රූපය දකුම්හ. මධුර ශබ්දය අසම්හ, නෘත්‍ය ගීත වාද්‍යාදිය දකුම්හයි බොහෝ දෙනා රැස් වන්නාහු වෙද්ද මහණෙනි යම්සේ රජ්ජුරුකෙණෙක් සිරගෙයි උන් පුරුෂයෙකු ගෙන්වාගෙණ මෝවිටි ගසා පිරුණ තෙල් පාත්‍රයක් ඔහු අතටදී එම්බල පුරුෂය තාගේ ජීවිතයෙහි අපේක්ෂා ඇත්තෙහි වීන්ම් මේ තෙල් පිරුණාවූ තෙල් පාත්‍රය දැතින් ඔසවාගෙණ තෙල් බින්දුවක් විවරත් බිම නොවගුරුවා ඇලී නොගස්වා බිම නොහෙලා ජනපදකල්‍යාණී නම්වූ තෙල නාටකස්ත්‍රිය නටන්නාවූ රඟමණ්ඩල මධ්‍යයෙන් නෘත්‍ය ගීතාදීන් නොබලා නොඅසා බොහෝ ජනයාගේ ඇඟත් නොපැහැර පලා ගියේ වීනම් තාගේ ජීවිතය ලබන්නේ යයි නියෝග කොට රජ්ජුරුවන් නැවත අනික්පුරුෂයෙකු ගෙන්වා තියුණු මුවහත් ඇති කඩුවක් ඔහු අතටදී තෙල් පාත්‍රය ගෙන යන පුරුෂයා තෙමේ තෙලෙන් බින්දුවක් වගුරුවා හෝනම් වේවයි නියෝග කළේවීනම් නියෝග ඇසූ පුරුෂ තෙමේ තෙල් පාත්‍රය ගෙණ යන පුරුෂයා පෙරටුකොට ඔහු භයගන්වමින් තැතිගන්වමින් පසුපස්සෙහිලා යනුවෙද තෙල් පාත්‍රය ගෙණ යන්නාවූ පුරුෂයාද තමන්ගේ ජීවිත ආසාවෙන් පිරූ තෙල් පාත්‍රයෙන් තෙල් පොදකුත් බිම නොවගුරුවා ඇලිත් නොගස්වා බිම නොහෙලා ජනපදකල්‍යාණී නම්වූ නාටකසත්‍රිය නටන්නාවූ බොහෝ දෙනා රැස්ව රඟමඩුල්ල මධ්‍යයෙන් ගැලවී පලා ගියේ නම් ඒ බැරිදෙයක් නොවෙයි, කුමක් නිසා දැයි යතහොත් කඩුගත් අත් ඇති පුරුෂයෙකු ඔහු පසුපස්සෙහි භයගන්වමින් ගියසෙයිනි, එම්බා මහණෙනි, මාගේ ශාසනයෙහි කමටහන් ඇරගෙණ මහණ දම් පුරන්නාවූ යොගාවචරයා විසින් ජීවිත ආසාවෙන් තෙල් පාත්‍රය නොවගුරුවා ගෙණ යන පුරුෂයා පරිද්දෙන් රූප ශබ්ද ගන්ධ රස ප්‍රෂ්ටව්‍යයෙහි අලග්නව මහණ දම් පිරියයුතුයයි මෙසේ ජනපදකල්‍යාණී නම් එබඳු නාටකස්ත්‍රිය නටන රඟමඩුල්ල මධ්‍යයෙන් යම් පුරුෂයෙක් පිරුණ තෙල් පාත්‍රයක් නෙහෙලා නොවගුරුවා ඉඳින් ගෙණ ගියේ වීනම් සවාමීනි ඉතා ආශචර්‍ය්‍ය වන්නේ යයි වදාළසේක. එසේ වදාළ භික්ෂූන් වහන්සේට සර්‍වඥයන් වහන්සේ වදාරණසේක්. එම්බා මහණෙනි, ඒ ආශචර්‍ය්‍ය නොවෙයි පුරාතනයෙහි නුවනැත්තෝ තමන්ගේ අප්‍රමාද සිහිය හේතුකොට ගෙණ අමනුෂ්‍යයන් විසින් නිර්මිත කරණලද දිව්‍යරූපයෙහිද ඉඳුරන් බිඳ ඇස් දල්වා බැලීම මාත්‍රාවකුත් නොකොට අමනුෂ්‍ය පරිගෘහිතවූ ස්ථානයෙන් ගැලවී ගෙණ ගොසින් රාජශ්‍රියට පැමිණියාහුය, එම්බා මහණෙනි, ඒ ආශචර්‍ය්‍යයි ජාතකදේශනාවට මුඛමාත්‍රයක් දක්වා නිශ්ශබ්දව වැඩහුන්සේක. එකල්හි ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහමදතත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි පුරණලද පාරමිතා ඇති අප මහබෝසතානෝ ඒ බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ පුත්‍රයන් සියක්දෙනා අතුරෙන් හැමටම බාලව ඉපිද අනුක්‍රමයෙන් විඥබවට පැමිණියේය. එකල්හි රජ්ජුරුවන්ගේ රජගෙයි පසේබුදුවරයන් වහන්සේ නිබඳ වළඳනසේක. බෝධිසත්වයෝ පසේබුදුවරයන් වහන්සේට වතාවත් කරන්නාහ. එක්දවසක් බෝධිසත්වයෝ මාගේ මල්බෑයෝ බොහෝය. මේ නුවර කුලසන්තක වූ රාජ්ජය ලබම්දෝ හෝයි නොලබම්දෝහෝයි සිතූහ, ඉක්බිත්තෙන් ඔහුට පසේබුදුවරයන්වහන්සේ අතින් විචාරා නියම දනිමි, මෙසේ සිතිවිල්ලෙක්විය, ඒ මහබෝසතානෝ දෙවෙනි දවස් පසේබුදුවරයන්වහන්සේ වැඩිකල්හි ඩබරාව හැරගෙණ පැන් පෙරා ගෙණවුත් පය සෝදා තෙල් ගල්වා ඉක්බිත්තෙන් පසේබුදුරජානන්වහන්සේ අන්තරබජ්ජකය වළඳවා වැඩහුන් කල්හි වැඳ එකත්පස්ව උන්නාහුය, ස්වාමීනි මාගේ බොහෝ මල්බෑයෝ ඇත්තාහ, කුලසනතකවූ රාජ්‍යයට මම පැමිණෙම්දෝහෝයි කියා විචාළාහුය, ඉක්බිත්තෙන් පසේබුදුරජානන්වහන්සේ වදාරණ සේක්. කුමාරයෙනි තෙපි මෙනුවර ඉඳ රාජ්‍යය ලබන්නාහු නොවෙත්. මීට එක්සියවිසියොත් නකින් මත්තෙහි ගන්ධාර රට තක්සලා නුවරෙක් ඇත්තේය, ඒ නුවරට යන්ට සමත්‍වූ වූ තෙපි මෙයත් සත්වන දවස් රාජ්‍යය ලබහු, අතරමගවූ මහමාවතක් ඇත. වනයෙහි උපද්‍රවයෙක් ඇත, ඒ වනය ඉකුත්කොට යන්නාහට යොදුන් සියයක් පමණ මාර්ගය වන්නේය, එල්ලයට යතොත් පණස්යොදුනක, ඒ මාර්ගය වනාහි අමනුෂ්‍යකානතාරනම්, එහි යක්ෂනීහු අතරමග ගම්නියම්ගම් සාලාවන් මත්තෙහි එල්වන ලද රන්තරු රිදීතරුයෙන් විසිතුරු වියන් ඇති මහයහන්පණවා රන් තිල් ඇඟෑයෙන් නොයෙක් පැහැ ඇති පටකඩතිර වටකොට ඇඳ දිව්‍ය භරණයෙන් ආත්මභාවය සරසා ශාලාවෙහි හිඳ යන එන්නාවූ පුරුෂයන් මිහිරිවූ වචනයෙන් පොළඹවා ගෙණ මිහිරි ගී කියා ස්වරූප ඇත්තව මෙතන ඇවිත් හිඳ පැන්බීපියවයි කැඳවා සමීපයට පැමිණියාවූ පුරුෂයන්ට අසුන් පණවාදී තමන්ගේ රූපසොභාවෙන් හා භාව භාවලීලා කටාක්ෂමන් දස්මිතයෙන් පොළඹවා කේලශ වසඟකොට තණහා ව්‍යතික්‍රම කළ කල්හි එතනදීම ලේ වගුරුව වගුරුවා කා ජීවිතක්ෂයට පමුණුවන්නාහ, රූපයෙහි ඇළුම්

SANHIDA LANKA

ඇති සත්වයා රූපයේ සිත්ගන්නාහ. ශබ්දයෙහි ඇළුම් ඇති සත්වයා මිහිරිවූ ශබ්දයෙන් සිත්ගන්නාහ, ගන්ධයෙහි ඇළුම් ඇති සත්වයා දිව්‍යගන්ධයෙහි පොළඹවන්නාහ, රසවිසයකොට ඇති සත්වයා දිව්‍යමයවූ නොයෙක් අග්‍රරසභොජනයෙන් පොළඹවන්නාහ, ස්පර්ශයෙහි ඇළුම් ඇති සත්වයා ඉස්දොර පාමුල ලනලද රංකන්වයින් ඇති මනාවූ ඇතිරිලි අතුරණලද දිවයනනින් පොළඹවන්නාහ, ඉන්ද්‍රියන් බිඳ ඒ යක්ෂනීන් නොබලා සිහි එලවාගෙණ ගියේවීනම් ඒ තක්සලා නුවර රජජ්ය ලබන්නවාදැයි පසේබුදුරජානන්වහන්සේ වදාළසේක, බෝධිසත්වයෝ ස්වාමීනි වන්නාටය. නුඹවහන්සේ අවවාද ගෙණයන්නාවූ මම යක්‍ෂනීන් කුමක් නිසා ඉන්ද්‍රියයන් බිඳ බලම්දැයි කියා ප්‍රතිඥාදී පසේබුදුවරයන්වහන්සේ ලවා පිරිත් කරවා පිරිත්වැලි හා පිරිත්හුය ගෙන පසේබුදුවරයන් වහන්සේ හා දෙමව්පියන් වැඳ තමන්ගේ මාලිගාවට ගොස් තමන්ගේ සේවකයන්ට කියන්නාහු. මම තක්සලා නුවර රාජ්ජය ගන්ටයමි තෙපි සිටුවයි කීහ, එසඳ පස්දෙනෙක් අපිත් නුඹවහන්සේ හා සමග එම්හයි කීහ. බෝධිසත්වයෝ තොප විසින් එබඳුව යන්ට නොපිළිවන. අතරමග යක්ෂනීහු රූපාදියෙහි ඇළුම් ඇතිවම මනුෂ්‍යයින් එබඳු රූප ශබ්දාදියෙන් පොළඹවා ගණිති, මහත්වූ උපද්‍රව ඇත. මමවූකලී මාගේ සමත්ථ්‍යය සිතාලායෙමි කිවූය, කීමෙක්ද දේවයන්වහන්ස අප නුඹවහන්සේ හා සමඟ යන්නමෝ අපට ප්‍රිය රූපයක් බලමෝද අපි නුඹවහන්සේ මෙන් ධෛර්‍ය්‍යමත්ව යම්හයි කිවූය, බෝධිසත්වයෝ එසේවීනම් අප්‍රමාදවයි කියා ඒ පස්දෙනා ගෙණ මාර්ගයට පිළිපන්හ.

ඒ යක්ෂනීහු ග්‍රාමාදීන් මවාහුන්හ. ඒ පුරුෂයන් පස්දෙනා අතුරෙන් රූපයෙහි ඇලුම් ඇති, පුරුෂයා බලා රූපාලම්බන ප්‍රීතිබඬව මදක් පසු බැසෙන්ටවන, බෝධිසත්වයෝ කිමෙක්ද පින්වත මදක් පසුගැසුනේ ඇයිදැයි කීහ. එසඳ ඒ පුරුෂයා කියන්නේ දේවයන්වහන්ස මාගේ පා රිදෙයි මදක් ශාලාවේ හිඳ එම් කීය, බෝධිසත්වයෝ එම්බල පුරුෂය මොහු යක්ෂනීය මොවුන් ප්‍රාර්ථනා නොකරවයි කිවූය, ඒ පුරුෂයා වන්නාට කුමක් වේවයි දුටුදෙයක් දකිම් දේවයන්වහන්ස නොයායෙමි කීය, බෝධිසත්වයෝ එසේ වීනම් තාගේ නොකීකරුකමින් වනදෙය තෝ මාදක්නේ වේදැයි කියා අන්පුරුෂයන් සතරදෙනා ගෙණගියාහ, ඒ රූපයෙහි ඇළුම් ඇති පුරුෂයාත් යක්ෂනීන් සමීපයට ගියේය. ඔහු තමන් හා සමග ව්‍යතීක්‍රමණය කළ කල්හි ඒ පුරුෂයා එතනදීම ජීවිතක්ෂයට පමුණුවා ඉදිරි ඉදිරියෙහි ගොස් අනික් සාලාවක්මවා ආතත විතතාදීවූ නොයෙක් තූර්‍ය භාණ්ඩයන්ගෙන් ගෙණ ගී කියා උන්හ. එතැන්හිදී ශබ්දයෙහි ඇළුම් ඇති පුරුෂයා රදා ගියේය, ඔහුත් අනුභවකොට ඉදිරියේ අනෙකප්‍රකාර සුවඳ කරඬුපුරා සල්පිල් හදාගෙණ සිටියාහුය, එතැන්හි ගන්ධයෙහි ඇළුම් ඇති පුරුෂයා රැඳුනේය. ඔහුත් අනුභවකොට ඉදිරියේ ගොස් නොයෙක් අග්‍ර රස ඇති දිව්‍ය භෝජනය පුරාගෙණ බතිනි. අඟානිය සදාගෙණ උන්හ, එතැන්හි රසයෙහි ගිජුවූ පුරුෂයා රැඳුනේය. ඔහු අනුභව කොට ඉදිරියෙහි ගොස් අනේක ප්‍රකාර දිවයහන් පනවා උන්හ, එතැන්හි ප්‍රෂටව්‍යයෙහි ලොල්වූ පුරුෂයා රැඳුනේය, ඔහුත් අනුභව කළහ, බෝධිසත්වයේ උදාකළාවූය ඉක්බිත්තෙන් ඒ යක්ෂනී සිතන්නී ඒකාන්තයෙන් මේ පුරුෂයා ඉතාම මෘදුය, මම මොහු කාවත් නොරඳිම් බෝධිසත්වයන් පසුපස්සෙහි ගියාය. වනකර්මාන්ත නිසා දඬුපත කපන්ට ගිය සත්වයෝ යක්ෂනිය දැක තී ඉදිරියෙහි යන්නා වූ මේ පුරුෂයා තිට කවරෙක්වේදැයි විචාළාහ, ස්වාමි දරුවෙනි මා බාල අවස්ථාවෙහි පටන් වල්ලභ වූ පුරුෂයානෝ යයි කිව, එසඳ පුරුෂයෝ පින්වත මෙබඳුවූ සිව්මැලි මල්දමක්සේ රන්වන් කුමාරිකාව තමාගේ දෙමව්පියන්වත්වූ පසුපස්සෙහි නික්මයෙහි කුමක්නිසා තොපි මෑ නොමිරිකා ඇරගෙණ නොයව්දැයි කීහ. එසඳ බෝධිසත්වයෝ එම්බා පින්වත්නි මෝතොමෝ මාගේ ස්ත්‍රියක් නොවෙයි යක්ෂනීය, මෝ මාගේ මනුෂ්‍යයන් පස්දෙනෙකු අනුභවකොටපුවයි කිවූය, බෝධිසත්වයෝ මෙසේ කීය, රුදු යක්ෂනී කියන්නී පින්වත්නි පුරුෂයෝ නම් කිපිකල තමන්ගේ ස්ත්‍රීන් යක්ෂණීන් හා ප්‍රේතදූන් හා සදාශකෙරෙති කියා යමින්සිටම ගර්භණී ස්වරූපයක් දක්වා නැවත එක්දරුකෙණෙකුන් ලත් රූපයක් දක්වා පුතෙකු ඇකයෙන් වඩාගෙණ බෝධිසත්වයන් පසුපස්සෙහි නික්මුණාදුටු මනුෂ්‍යයෝ පළමුසේ විචාරති, බෝධිසත්වයෝ ඈ යකින්නී නියාව කිය කියා ගොස් තක්සලානුවරට පැමිණියාහ.

ඒ යක්ෂණී පුතු අනතඬාකොට තනියම පසුපස්සෙහි ගියාහ. බෝධිසත්වයෝ මෙනුවර වාසල්දොරට පැමිණ එක්ශාලාවක උන්නාහ, යක්ෂණී බෝධිසත්වයන්ගේ තේජසින් ඇතුළට වදින්ට අසමත්ව දිව්‍යරූප මවාගෙණ ශාලාවාරයෙහි සිටියාහ. එකෙණෙහි තක්සලා නුවරින් කොසොල්රජ්ජුරුවෝ උයනට යනතැනැත්තෝ ඈ දැක පිළිබඳ සිත් ඇතිව දරුව මෑ අස්වාමික නියාව දැක හෙණ එවයි කියා පුරුෂයෙකු යවූහ. ඒ පුරුෂයා ඈ කරා පැමිණ සස්වාමිකදැයි විචාළේය. යකින්නී කියන්නී එසේය පුරුෂයානෙනි මේ ශාලාවේ ඉන්නා පුරුෂයානෝ නම් මට බාල අවස්ථාවෙහි පටන් බත් පිළිදී ස්වාමීව සිටි තැනැත්තෝයයි කීය, බෝධිසත්වයෝ එසඳ කියන්නාහු මෝතොමෝ මාගේ සත්‍රියක් නොවෙයි මෑ යක්ෂණිය මෑ විසින් මාගේ මනුෂ්‍යයෝ පස්දෙනෙක් අනුභවකොට පියනලදහයි කිවූය, යක්ෂණී කියන්නී ස්වාමිපුරුෂයෝ නම් පින්වත කිපි කල යමක් මුඛාවේසවීනම් එම කියති කිව මෙහෙවරගිය පුරුෂයා දෙදෙනාගේ බස් අසා රජ්ජුරුවන්ට ගොස් කීය. රජ්ජුරුවෝ අස්වාමිකභාණ්ඩයනම් රජ්ජුරුවන් සන්තකයයි කියා යක්ෂණිය කැඳවා ගෙන්වාගෙණ ඇතුපිට තබා නුවර පැදකුණු කොට ප්‍රසාදයට නැඟී ඈ අගමෙහෙසුන් තනතුරෙහි තිබූහ. ඒ රජ්ජුරුවෝ ඉස් සෝදා නහා සුවඳවිලවුන් ගන්වා සවස මෙහෙනිමවා ශ්‍රීයහන් මසතකයට නැගී සැතපුනේය, ඒ යක්ෂණී තමන්ට සුදුසු ආහාරයක් අනුභවකොට ස්වර්ණාභරණයෙන් සැරහී සුවඳ විලවුන් ගන්වා ශ්‍රීයහන් මසතකයෙහි රජ්ජුරුවන් හා සමඟ වැදහෙව රජ්ජුරුවන් රතීසවයෙන් සැපවිඳ සැතපුනු කල්හි එක් ඇලයකට පෙරලී ඇඬූය,

SANHIDA LANKA

එසඳ රජ්ජුරුවෝ ඈට සොඳුර තෝ කුමක් පිණිස අඬන්නෙහිදැයි විචාළහ, දේවයන්වහන්ස මම නුඹවහන්සේ විසින් මගදී දැකගෙණ එනලද්දෙමි, නුඹවහන්සේගේ අනතඃපුරයෙහි බොහෝ ස්ත්‍රීහු ඇත. මාවූකලී සමපතිතීන්යන් අකොප්‍යව දැහැමෙන් රාජ්‍යය කෙරෙමින් දානාදීවූ පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. ශාසතෘවූ

බුදුරජානන්වහන්සේ මේ අතීතකථාව ගෙණහැරදක්වා වදාරා භික්ෂූන් වහන්සේට අවවාද වදාරණසේක්. මෙසේ වදාළසේකි. මහණෙනි ඇතුළුවූ මුවවිට රේඛාවසමව පිරුණාවූ තෙල් බින්දුවකුත් නොවගුරුවා යම්සේ පුරුෂයෙක් ගෙණගියේද එපරිද්දෙන්ම තමාගේ සිත කායගතා සතියෙහි බහා යම්සේ පුරුෂයෙක් ගෙණගියේද එපරිද්දෙන්ම තමාගේ සිත කායගතා සතියෙහි බහා යම්සේ ඇසිල්ලකුත් බහිඬාලඹනයෙහි විකෙෂපයට නොපැමිණේනම් එපරිද්දෙන්ම නුවනැත්තාවූ යෝගාවචරතෙමේ ස්වකීයවූචිත්තය රක්නේය, කුමක් පිණිසදයත්? අනවරාග්‍ර සංසාරයෙහි කිසි බාල පෘථජජන කෙනෙකුන් විසින් සවප්නයෙනුත් නොගියවරූ නිර්වාන නැමැති දයාව ප්‍රාර්ථනා කරන්නාහු විසින් කර්මස්ථානයෙහි ඇමවේලෙහිම අභ්‍යාසකටයුතුද එසේහෙයින් යම් පුද්ගලයෙක් නිවන් දකිනා කැමැත්තේවීනම් ඒ සත්‍වයා විසින් තෙල් පාත්‍රය ගෙනයන්නාවූ සත්වයා හැමවේලෙහිම සිහිඇතිව තෙල්බින්දුවකුත් නොවගුරුවා ගෙනයන්නාක් මෙන් හැමවේලෙහිම කායගතාසති කර්මස්ථානයෙන් යුක්තව නානා ලම්බනයෙහි සිත යා නොදී චිත්තෛකාග්‍රතාකොට තමාගේ සිතරැක අමෘත මහානිර්වාණය කෂාත් කෂාත් කටයුත්තේයයි මෙසේ ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ නිර්වාණධර්මයෙන් දේශනාව කුළුගන්වා මේ තෙලපත්ත ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි රජපිරිසනම් දැන් බුදුපිරිසය, එසමයෙහි රාජ්‍යයට පැමිණියාවූ කුමාරයෝනම් තිලෝගුරු සම්මාසම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# නාමසිඬි ජාතකය

තවද එක්සමයෙක්හි අසමසමවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක්. නාමසිඬික හික්ෂූන්වහනසේ අරභයා මේ ජාතකය වදාළසේක.

එක් කුලපුත්‍රයෙක් නමින් පාපකනම, ඒ තෙම ශාසනයෙහි ලැදිව මහණව භික්ෂූන්වහන්සේ විසින් ඇවැත්වූ පාපකයෙනි මෙසේ එව මෙසේ සිටුවයි කියන්නාහු එබස් අසා මෙසේ සිතුසේක. ලෝකයෙහි පාපකනම් ලාමකය කාලකන්නියක් හා සමානය අන්‍යවූමංගල්‍යප්‍රති සංයුක්තවූ නමක් කියවා ගණිම් ඒ මහණ ආචාරී උපාධ්‍යයන්වහන්සේ කරා ගොස් ස්වාමීනී මාගේ නම අවමංගල්‍යය අනිත් නමක් මට කළමැනවැයි කීසේක. ඉක්බිත්තෙන් භික්ෂූන්වහන්සේ කියනසේක්. ඇවැත්ති නාමයනම් ප්‍රඥප්ති මාත්‍රයක නමින් කිසි අත්‍ථසිද්ධික් නම් නැත. තොපගේ නමින්ම සතුටුවයි කීසේක. ඒ මහණ නැවත නැවත යාඥාකෙළේමය, තවද භික්ෂූන්වහන්සේ නාමසිද්ධික බව සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රසිද්ධ විය. ඉක්බිත්තෙන් එක්දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන්වහන්සේ ඇවැත්ති අසවල් මහණ නම් සිද්ධකරන්නේය. අභිවෘද්ධිකරණ නාමයක් ඉල්වන්නේයයි මෙසේවූ කථාවක් උපදවා හුන්සේක, සර්‍වඥයන් වහන්සේ ධම්සභාමණ්ඩපයට වැඩ අතුරේ වසන්නෙම් බසක් උපන්විට තිගේ මව්පිය ජාතිගොත්‍ර දන්නෝ කව්රුද අතර මගදී දැක ගෙණෙනලද්දි නොවේදැයි කියා ඉසබොල් කෙළහෙව පීඩාකරන්නියක් මෙන් මතුකරතබාගණිම්, ඉදින් නුඹවහන්සේ සියළු රාජ ඓශ්වර්‍ය්‍යයත් ආඥාවත් මට දුන්සේක්වීනම් මාගේ සිත අලලා බසක් කියන්ට කවර නම් සත්වයෙක් සමත්වේදැයි කිව, එසඳ රජ්ජුරුවෝ කියන්නාහු සොඳුර මට සියළු රාජ්‍යවාසින් නොනැමෙති, මම උන්ට නායක නොවෙමි. යම්කෙනෙක් රාජඥාව මරුත්තුකොට නොකළමනාදෙයක් කෙරෙද්ද ඔවුන්ටම නායකවෙමි මේ කාරණයෙන් තොපට සියළුරාජජ ඓශ්වර්‍ය්‍යයත් ආඥාවත් දෙන්ට නොපිළිවනැයි කීහ. එබැවින් දේවයන්වහන්ස ඉදින් රට නුවර ආඥාවදෙන්ට නුපුළුවන්වීනම් මේ ඇතුළු මාලිගාවෙහිත් අනතඃපුරයෙහිත් වසන්නාවූ සත්වයන් කෙරෙහිත් මගේ ඉසුරු පවත්නාලෙස ආඥාව දුනමැනවයි කිව, රජ්ජුරුවෝ දිවපහස් බැඳි ඇගේ බස මිරිකාගතනොහී යහපත සොඳුර මේ අන්තඃපුරයෙහි වසන්නාවූ සත්වයන් කෙරෙහි තිගේ ඉසුරු පවත්නාලෙස ආඥාවදෙමි, තෝ ඔවුන් තිගේ වසඟයෙහි පවත්වා ගැණැයි කීහ. යක්ෂණිය යහපත ස්වාමිනියි පිළිගෙන රජ්ජුරුවන් නිදිබරමත්ව නිදනකල්හි යක්ෂපුරයට ගොස් යක්ෂණියන් කැඳවාගෙණ අවුත් තොමෝ රජ්ජුරුවන් ජීවිතක්ෂයට පමුණුවා ඇට පමණක් ශෙෂකොට සියළු සම් මස් නහර ලේ අනුභවකොට අවශේෂය යක්ෂයෝ අනතඃපුරය ඇතුලේ මහවාසල්දොරපටන් අගානියේ කුකුලන් බල්ලන් ආදීකොට සියල්ලවුන් නොහැර කා ඇටපමණක් ශේෂකළාහ. දෙවෙනි දවස් දොරපියවනම තිබෙනා දැක මනුෂ්‍යයෝ පොරවෙන් දොරපලා ඇතුලටවැද සියළු මාලිගාව ඇටින් පිරුතිබුවාදැක ඒකාන්තයෙන් ශාලාවේ හොත් පුරුෂයා මේ මාගේ ස්ත්‍රිය නොවෙයි යක්ෂණියයි කීබස් සැබෑමයයි රජ්ජුරුවෝ වූකලී තමන් කිසිවක් නොදන්නා හෙයින් තමන්ට බිසෝ තනතුරෙහි තිබූහ. ඕතොමෝ යක්ෂයන් කැඳවාගෙණ අවුත් සියළු ජනයා කාගියායයි කීහ. බෝධිසත්වයෝත් එදවස් ශාලාවෙහිත් පිරිත්වැලි ඉසලාගෙණ පිරිත් හූ වටකොට කඩුව අතින්ගෙණ සිටම අරුණු නැගූහ. මනුෂ්‍යයෝ සියළු රාජාඞගය හා මාලිගාවේ ඇටඅද්දවා දම්මවා කසලහැර ශුඬකොට ගොමගාවා ඊ මතුපිට සිව්දෑගඳින් පිරිබඩකොටගෙණ සුවඳමල් විසුරුවා සුවඳමල් තැන තැන එල්වා සුවඳ දුන්දී පුන්කලස් තනා ධජ පතාකයෙන් හා කෙසෙල් ගස් ආදියෙන් බැඳ දිව්‍යවිමානයක්මෙන් සරහා කථාකරන්නාහු පින්වත්ති යම් පුරුෂයෙක් දිව්‍යරූප මවාගෙණ පසුපස්සෙහි යන්නාවු යක්ෂණී ඇඳින ඉන්ද්‍රියන් බිඳ බැලීම පමණකුත් නොකළේද ඒ තෙම උදාරතර මනුෂ්‍යයෙක ධෛර්‍ය්‍යසම්පන්නය මහනුවනැත්තේය. එබඳු පුරුෂයෙකු අනුශාසනාව කරණ කල්හි සියළු රාජජය සුඛිතවන්නේය. ඔහු රජකරම්හයි කීහ.

ඉක්බිත්තෙන් සියළු අමාත්‍යයන් හා නුවරව වාසීන්ද ඒකච්ඡන්දව බෝධිසත්වයන් කරා පැමිණ දේවයන් වහන්ස නුඹ වහන්සේ මේ රාජ්ජයෙහි රාජ්‍ය ශ්‍රී අනුභව කොට වදාළ මැනවැයි කියා නුවරට කැඳවාගෙණ ගොස් රුවන් රැසක් මත්තෙහි සිටුවා අභිෂේක කොට තක්සලා නුවර රජ කළාහුය, ඒ රජ්ජුරුවෝ ඡන්දයෙන්ද මෝගයෙන්ද භයින්ද නොකළමනාකාරියක් නොකරණ හෙයින් සතර වැදෑරුම්වූ අගතිගමනය දුරුකොට දශරාජධර්ම ගණෙහි දූන් කවර කථාවකින් යුක්තව හුනුදැයි විචාරා මේනම්  කථාවකින් යුක්තව හුනුම්හයි කී කල්හි මහණෙනි ඒ භික්ෂුහූ නාමසිඬිකවූයේ දූන්මතු නොවෙයි පෙරත් නාමසිඬිකමයයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස තක්සලා නුවර මහබෝසතානෝ දිසාපාමොක් ආචාරීව පන්සියයක් මානවකයන්ට මන්ත්‍ර හදාරන්නාහුය, ඒ බෝධිසත්වයන්ගෙන් එක් මානවකයෙක් නමින් පාපකනම, ඒ තෙමේ සෙසු මානවකයන් විසින් ඒ පාපකයාට මෙසේ සිටු පාපකය මෙසේ යව පාපකයයි කියන්නාවූ බස් අසා සිතන්නේ මාගේ නාමය අවමංගල්‍යය අන්‍ය නාමයක් ඉල්වාගතිමියි සිතා ආචාරීන් කරා ගොස් ආචාරීන් වහන්ස මාගේ නම අවමංගල්‍යය, එසේ හෙයින් මට අනික් නමක් තබවයි කිවූය. එකල්හි ආචාරී ඕහට කියන්නෝ දරුව ජනපද චාරිකාකොට තොප සිතට අභිප්‍රාය වූ එක් අභිවෘද්ධිනාමයක් ගෙණ එව. ඒ නාමය හැරගෙණ ආකල්හි ඒ නම් පෙරලා අනික් නමක් තොපට තබම් කිව්ය, එබස් ඇසූ මානවකයා යහපත ආචාරීන් වහන්සැයි කියා මාර්ගෝපකරණ ගෙණ නික්ම ගමින් ගමට ඇවිදිනේ එක් නුවරකට පැමිණියේය. එනුවර ජීවක නම් එක් පුරුෂයෙක් බන්ධු වර්ගයා විසින් දවන්ට ගෙණයන්නා දැක මේ කිනම් පුරුෂයෙක්දැයි විචාළේය. ජීවක නමැයි, ජීවකයාත් මියේදැයි විචාළකල්හි ජීවකයාත් අජීවකයාත් මියන්නෙවේද නාමයවූකලී ප්‍රඥප්තිමාත්‍රයක තා අඥාන එකෙකුයි සිතම්හයි කිවූය, එකල්හි ඒ පාපක නම් පුරුෂයා

SANHIDA LANKA

ඒ කථාව අසා නාමයෙහි මධස්ථව ඇතුළු නුවරට වන්නේය, එකල්හි දාසියන් බැලමෙහෙ නොකරන්නා දැක ස්වාමි දරුවෝ බැඳහිඳුවා වැලක්ගෙණ ගසන්නාහුය, ඇගේ නම ධනපාලි නම් වන්නේය, ඒ පාපකයා නම් පුරුෂයා වීදි මාධ්‍යයෙන් යන්නේ ඈට තලන්නා දැක කුමක් නිසා මෑට තළව්දැයි විචාළේය. බැලමෙහෙනොකරණ හෙයින් තලම්හයි කී කල්හි මැගේ නම කිම්දැයි විචාළේය, ධනපාල නමැයි කීකල්හි ධනපාල නම් ඇත්තෝ බැලමෙහෙ පමණක් දිගත නොහෙද්දැයි විචාළේය. ධනපාලනුත් අධනපාලනුත් දුක්පත් වෙති, නාමය වූකලී ප්‍රඥප්ති මාත්‍රයක එසේ හෙයින් තෝ අඥානව විචාරෙහි සිතම් කීය, එබස් ඇසූ පාපක නම් මානවකයා නාමයෙන් අතිශයින් මධ්‍යස්ථව නුවරින් පිටත්ව මගට පිළිපන්නේ අතරමග මංමුලාවූ පුරුෂයෙක් දැක දරුව කුමක් කොට ඇවිදිදැයි විචාළේය. ස්වාමීනි මංමුලාවීම්යි කීකල්හි තාගේ නම කුමක්දැයි විචාළේය. පන්‍ථක නම් ඇත්තෙම් කීයේය, පන්‍ථකයෝත් මංමුලාවෙද්දැයි විචාළේය, පන්‍ථයෝත් අපන්‍ථකයෝත් මංමුලාවෙති නාමයවූකලී ප්‍රඥප්ති මාත්‍රයක තෝ අඥානව විචාරෙති සිතම් කීහ. එබස් ඇසූ පාපකනම් මානවකයා නාමයෙහි අතිශයින් මධස්ථව බෝධිසත්වයන් සමීපයට ගොස් කීමෙක්ද දරුව නමක් අභිප්‍රාය කොට ගෙණආයිදැයි විචළේය, එකල්හි ආචාරීන් වහන්ස ආජීවකයෝත් ජීවකයෝත් මියති, මංමුලාවෙති, එසේ හෙයින් නාමය නම් ප්‍රඥප්ති මාත්‍රයක, නාමයෙන් අත්‍ථසිඬියක් නැත, මේ කර්මයෙන්ම අත්‍ථසිඬිය වන්නේය. එසේ හෙයින් මට අනික් නමකින් කම් නැත, පළමු මාගේ නමම මට නම්වෙයි කීය. එබස් ඇසූ මහබෝසතානෝ ඔහු විසින් දුටුදෙයක් කළ දෙයක් එක්කොට ගළපා කියන්නාහ. ජීවකයා මළාදැක ධනපාලයා දුක් පත්නියාව දැක පන්‍ථකයෝ මංමුළාවූ නියාවදැක පාපකනම් මානවකයා අභිවෘද්ධිනාමයෙන් ප්‍රයෝජනයක් නැතකියා නැවත තමා වසන්නාවූ ස්ථානයට ආයේවේදැයි කිවූය, ශාස්තාවූ බුදුරජනන්වහන්සේ මේ අතීත කථාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි මේ පාපකනම් පුරුෂයා අභිවෘද්ධිකරණ නාමයක් උවමැනවැයි නම් සිඬකොට ඇවිද්දේම වේදැයි වදාරා මේ නාමසිඬි ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි නාමසිඬික මහණය, එසමයෙහි ආචාරීන්ගේ පෂිත් නම් දන් බුදුපිරිසය, දිසාපාමොක් ආචාරී නම් වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# කූටවාණිජ ජාතකය

තවද එක් සමයක්හි අප්‍රතිවාද වූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක්. එක් සොර වෙළඳක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වෙළෙන්දෝ දෙදෙනෙක් එක්ව වෙළඳම්කරන්නාහු ගැලින් බඩුගෙණ ජනපද චාරිකාවට ගොස් වෙළඳම් කොට ලාභ ලැබගෙණ පෙරලා ආවාහුය, ඔවුන් දෙදෙනා අතරෙන් සොරවෙළඳා මෙසේ සිතූහ. මේ වෙළඳානෝ බොහෝ දවසක් දුර්භෝජනයෙන් හා දුක්ඛසෙය්‍යාවෙන් මිරිකුණෝය, දැන් තාගේ ගෙයි අනේකප්‍රකාරවූ අග්‍රරසයෙන් යුක්තවූ භෝජනය අනුභව කොට දිරවාගතනොහි අජීණීව මියයන්නේය, එකල්හි මම මේ භාණ්ඩය තුන්කොටසක්කොට එක් කොටසක් ඔහුගේ දරුවන්ට දෙමි. දෙකොටසක් මම ගනිමියි සිතා ඒ සොරවෙළඳා අද බෙදමි සෙට බෙදමි කියා බෙදන්ට මැලිව හිඳිනේය. ඉක්බිත්තෙන් නුවනැති වෙළදා ඔහු නොකැමැතිවුවත් බලාත්කාරයෙන් බඩුබෙදවා විහාරයට ගොස් බුදුරජානන්වහන්සේට නමස්කාර කොට සුවදුක් කථා කොට උන් කල්හි සර්‍වඥයන්වහන්සේ විසින් උපාසකය මෙසේ දවස් ලස්වගියේ කුමක් නිසාදැයි එනුවරට අවුදිනුත් කල්යවා බුද්ධෝපස්ථානයට නොආයේය. කවර කාරනයකින්දැයි විචාළ කල්හි එපවත් බුදුරජානන්වහන්සේට දැන්විය, සර්වඥයන් වහන්සේ උපාසකය මොහු තොප වංචා කරණු කැමතිය. පෙර නවාතැනත් වංචා කරන්ට උත්සාහ කළේ වේදැයි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහ බෝසතානෝ බරණැස් නුවර වෙළඳ කුලයක උපන්නාහුය, ඒ බෝධිසත්වයන්ට නම් තබන දවස් පණ්ඩිතයෝය්යි නම් තැබූහ. ඒ මහබෝසතානෝ වැඩිවිය පැමිණ අන් වෙළඳකු හා සමග එක්ව ගෙන වෙළදාම් කෙරෙති. ඔහුට අති පණ්ඩිතයයි නමෙක් විය. ඔහු දෙදෙන බරණැස් නුවරින් පන්සියයක් ගැලින් බඩු පටවා ගෙණ ජනපදයට ගොස් වෙළඳාම් කොට ලාභ ලැබගෙණ නැවත බරණැස් නුවරටම අවාහුය. ඉක්බිත්තෙන් ඔහු දෙදෙන බඩු බෙදන කල්හි අතිපණ්ඩිතයෝ මා විසින් දෙකොටසක් ලැබිය යුතුයයි කිවූය. කුමක් නිසාදැයි කීකල්හි තෙපි පණ්ඩිතයෝය, මම අතිපණ්ඩිතයෙමි. එසේ හෙයින් පණ්ඩිතයෝ එක් කොටසක් ලබන්ට නිස්සෝය, මම අතිපණ්ඩිත හෙයින් දෙකොටසක් ලබන්ට කාරණා කවරේදැයි විචාළෝය. මා අතිපණ්ඩිත බැවිනැයි කීය. මෙසේ ඔහු දෙදෙන බසින් බසට කලහ කළාහුය. ඉක්බිත්තෙන් අතිපණ්ඩිතයෝ එක් උපායෙක් ඇත සිතා තමන්ගේ පියානන් ගස්සිදුරෙක්හි හිඳුවා කියන්නේ තොපි අප හැමදෙනම මෙතනට ආකල අතිපණ්ඩිතයෝ දෙකොටසක් ලබන්නට නිස්සෝයයි කියාලවයි කියා බොධිසත්‍වයන් සමීපයට ගොස් සබඳ මට දෙකොටසක් ලබන්නට නිසිනියාවත් මේ වෘක්‍ෂදේවතාවා දන්නේය, වරෝ යම්හ ඔහු අතින් විචාරම්හයි කියා  මහාබෝසතානන් එතනට කැඳවාගෙණ ගොස් ස්වාමීනී වෘක්‍ෂදේවතාවන් වහන්ස අපගේ යුක්ති පසිඳිනමැනවයි කිවූය. ඉක්බිත්තෙන් ඕහට අතිපණ්ඩිතයෝ කියන්නාහුය මූ පණ්ඩිතයෝය, මම අතිපණ්ඩිතයෝය, අප දෙදෙනා විසින් එක්ව වෙළඳාම් කරණ ලද, අප දෙදෙනාගෙන් කවුරුන් විසින් දෙකොටසක් ලැබ්බයුතුදැයි විචාළ කල්හි පණ්ඩිතයන් විසින් එක්කොටසක් ලැබ්බ යුතුය. අතිපණ්ඩිතයන් විසින් දෙකොටසක් ලැබ්බයුතුයයි කීය. එකල්හි මහබෝසතානෝ මෙසේ විනිශ්චයකරණලද යුක්තිය අසා දැන් තා දේවතා නියාවත් දේවතාවා නොවන නියාවත් දන්නෙම්වේදැයි කියා පිදුරු ගෙණ ගස් සිදුර පුරවා ගිණි මෙලවූය. එකල්හි අතිපණ්ඩිතයන්ගේ පියාගිණි දැල් ඇඟ ගැසෙන්ට පටන්ගත් කල්හි ශරීරයෙන් අඩියක් දක්වාගෙණ උඩට පැනනැඟී අත්තක් අල්වාගෙණ එල්ලමින් ධරාගතනොහී බිමට වැටී අඬමින් කියන්නේ මේ ලෝකයෙහි කාරණා දන්නාවූ පණ්ඩිතභාග්‍යයෙන් යුක්කවූ උත්තම පුද්ගලයාම යහපත් වන්නේය, අතිපණ්ඩිතයා යන නාම මාත්‍රයකින් වඤ්චාස්වභාව ඇති කූට පුරුෂයා යහපත් නොවන්නේය, කුමක් නිසාද යත් ? වඤ්චාස්වභාව ඇති පණ්ඩිතයන්ට පියව මදක් දාගියමෝ වේදැයි මෙසේ බැගෑපත්ව හැඬුයේය ඉක්බිත්තෙන් ඊ පණ්ඩිත අතිපණ්ඩිත දෙදෙන මධ්‍යයෙන් දෙකක් කොට වස්තු සරිකොටස් ගසා ඇරගෙණ කම්වූපරිද්දෙන් මිය පරලොව ගියෝය. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ පෙරත් මේ සොර වෙළදාම යයි මේ අතීත කථාව ගෙණහැර දක්වා වදාරාමේ කූටවාණිජ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි සොරවෙළඳානම් දැනුත් සොරවෙළඳාමය, නුවණැති වෙළඳවූ යෙම් තිලෝගුරු සම්‍යක්සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# පරොසහස්ස ජාතකය

තවද එක්සමයෙක්හි වීතරාගීවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් පෘථජ්ජනක ප්‍රශ්නය අරභයා මේ ජාතකය වදාළසේක. මෙහි වර්තමාන කථාව සරභඞගජාතකයෙහි විස්තර වශයෙන් වන්නේය. එක්සමයෙක්හි භික්ෂූන් වහන්සේ දම්සභාමණ්ඩපයෙහි රැස්ව ඇවැත්නි දස බලධාරීවූ බුදුරජානන්වහන්සේ විසින් සංක්ෂේපයෙන් විචාරණ ලද්දාවූ ප්‍රශ්නය ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විස්තර හෙයින් විසර්ජනය කළසේක් වේදැයි තෙරුන්වහන්සේ ගුණ කථාව කිය කියා උන්සෙක. සර්වඥයන්වහන්සේ දම්සභාමණ්ඩපයට වැඩ මහණෙනි දැන් කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කීකල්හි මහණෙනි ශාරීපුත්‍ර ස්ථවිරයෝ මා විසින් සංක්ෂේපයෙන් කියන ලද ප්‍රශ්න විස්තර හෙයින් දැන්මතු විසරජනා කළෝ නොවෙති, පෙරත් මෙසේ විසර්ජනා කළෝම වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතානෝ ප්‍රසිද්ධවූ බ්‍රාහ්මණ වංහයෙක ඉපිද තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් සියළු සිල්ප ඉගෙණ පංචකාමය හැර ඍෂිප්‍රවෘජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපතති උප දිවා හිමාලය වනයෙහි විසුවාහුය. ඒ මහබෝසතානන්ට පන්සියයක් අත වැසි වූවාහුය. ඉක්බිත්තෙන් බෝධිසත්වයන්ගේ ප්‍රධාන ශිෂ්‍යවූ තාපසයෝ වර්ෂා කාලයෙහි දෙසියපණසක්  තපස් විවරයන් ගෙණ ලුණු ඇඹුල් සෙවුනා සඳහා මනුෂ්‍ය පථයට ගියෝය. එසමයෙහි බෝධිසත්වයන්ට කාලක්‍රියාවට කල් පැමිණියේය. සමීපයෙහි සිටි අතේතවාසිකයා ආචාරීන්වහන්ස නුඹවහන්සේ විසින් කවර ගුණ ධර්මයක් ලබනලදැයි අධිගමය විචාළේය. මහබෝසතානෝ ඔවුන්ට "නත්‍ථීකිඤ්චි"යි කියා මිය ගොස් ආභසසර බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය. බෝධිසත්වයෝ වූකලී අරූපසමතති ලාභීව සිටත් අරූපී බ්‍රහ්ම ලෝකයෙහි නූපදනාහුය. ඉක්බිත්තෙන් අතේතවාසිකයෝ ආචාරීන්වහන්සේට අධිගමයෙක් නැතැයි සවසාන භූමියෙහි සත්කාර නොකළාහුය. එකල්හි ප්‍රධාන ශිෂ්‍යානෝ ඇවිත් ආචාරීන්වහන්සේ කොයිදැයි විචාරා කාළක්‍රියා කළායයි යනු අසා කිමෙක්ද ආචාරීන්වහන්සේ අධිගමයක් විචාළහුදැයි කීවූය. එසේය විචාළම්හයි කී කල්හි කුමක් කීසේක්දැයි විචාළෝය. උන්වහන්සේ විසින් "නත්‍ථීකිඤ්චි"යි කියා මිය ගොස් මෙපණක් කියනලද එසේ හෙයින්  අපි උන්වහන්සේට කිසි සත්කාරයක් නොකළම්හයි කීහ. එබස් ඇසූ ප්‍රධාන ශිෂ්‍යයානෝ තෙපි ආචාරීන්ගේ වචනාර්ථය නොදන්නෝය, ආචාරීන්වහන්සේ ආකිඤ්චඤ්ඤායතන ලාභිසේකැයි කීවූය. අනෙතවාසිකයෝ ප්‍රධාන ශිෂ්‍යයන් නැවත නැවත කියමින් සිටියදීත් අදහා නොගත්තෝය. මහබෝසතානෝ ඒ කාරණය දැන නුවණැත්තාවූ අතවැස්සෝ මාගේ ප්‍රධාන ශිෂ්‍යයාගේ බස් අදහා නොගනිති. ඒ අතවැස්සන්ට මේ කාරණය ප්‍රකාශ කෙරෙම්යි සිතා බ්‍රහ්ම ලෝකයෙන් අවුත් ආශ්‍රම ප්‍රදේශමසතකයෙහි මහත්වූ ආනුභාවයෙන් ආකාශයෙහි සිට ප්‍රධාන ශිෂ්‍යයන්ගේ ප්‍රඥානුභාව වර්ණනා කරන්නාහු මෙසේ කීවූය. කියන ලද වචනයෙහි අර්ථ දැනගත නොහෙන්නාවූ අඥානවූ දහසක් දෙන රැස්ව මේ නුවණැති තාපසවරු මෙන් අවුරුදු සියයකුත් අඬවලප්නාහුය. කිසිම අර්ථයක්වත් කාරණයකවත් දැනගත නොහෙති. මෙබඳුවූ දහසක්දෙනාට වඩා ප්‍රධාන ශිෂ්‍යයා මෙන් කියනලද වචනයෙහි අර්ථය දැනගන්නේවීනම් එබඳුවූ එකම නුවණැති පුරුෂයාම උතුම්වන්නේයයි මෙසේ මහබෝසතානෝ ආකාශයෙහි සිටම ධර්ම දේශනාකොට තපස්වී සමූහයට තමන් ආකිඤ්චඤ්ඤායතන සමාපතතිලාභිනියාව ප්‍රකාශකොට බ්‍රහ්ම ලෝකයට ගියාහුය. ඒ තාපසයෝත් කිසුණුපිරියම් කොට ධ්‍යානලාභීව බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය. ශාසතෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැරදක්වා වදාරා මේ පරොසහස්ස ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ප්‍රධාන ශිෂ්‍යයා නම් දැන් ශාරීපුත්‍රස්ථවිරයෝය, මහාබ්‍රහ්මව උපන්නෙම් තිලෝගුරු බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# අසාතරූප ජාතකය

තවද එක්සමයෙක්හි වීතවෙෂිවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ කොඩන නම් නිවර නිසා කුඬාධාන වනයෙහි වසනසේක්. කෝලිය රජ්ජුරුවන්ගේ දූ වූ සුප්පවාසා නම් උපාසිකාව අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ සුප්පවාසා නම් උපාසිකාතොමෝ එසමයෙහි සත් අවුරුද්දක් මුළුල්ලෙහි කුසින් දරුගැබ පරිහරණය කොට සතියක් මුළුල්ලෙහි ගර්භයෙන මූඪව ඉතා මහත්වූ වේදනා උපන්නේය. ඒ උපාසිකාව මෙසේ අධික ප්‍රමාණවූ වේදනාවෙන් පීඩිතවත් බුදුගුණ කියන්නී "යම් සර්වඥකෙණෙකුන්වහන්සේ මෙබඳුවූ දුක් තරණය පිණිස ධර්මදේශනා කරණසේක්වීනම් ඒ භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේ ඒකාන්තයෙන් සර්වධර්මයන් සර්වකාරයෙන් පරොපදේශ රහිතව දත්තේය. යම් අෂ්ටාර්‍යය පුද්ගල භික්ෂු සමූහයෙක් මෙබඳුවූ දුක් දුරු කරණ පිණිස පිළිපන්නේ වීනම් භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේගෙ ශ්‍රාවක සංඝයා ඒකාන්තයෙන් මොනවට පිළිපන්නේය, යම් නිර්වාණ ධර්මයෙක්හි මෙබඳුවූ දුක්ඛයෙන් නැත්තේවීනම් ඒකාන්තයෙන් ඒ නිර්වාණ ධර්මය සැප වන්නේය"යන මේ ත්‍රිවිධානුසමෘතියෙන් යුක්තව ඉවසූය. ඒ සුප්පවාසා නම් උපාසිකා තොමෝ තමාගේ ස්වාමිපුරුෂයා ලඟට කැඳවා තමාගේ පවතුන් මේ නමස්කාර අස්නත් කියන පිණිස සර්වඥයන්වහන්සේ සමීපයට යවූහ. සර්‍වඥයන්වහන්සේ නමස්කාර අසුත් අසා "සුප්පවාසා නම් කෝලිය රජ දූ සුවපත්වේවයි, නිරෝගිවේවයි, පුතකු වදාවයි' කීසේක. සර්‍වඥයන්වහන්සේගේ ඒ වචනය හා සමගම සුප්පවාසා නම්වූ කෝලිය රජදුව සුවපත්ව නිරෝගී පුතෙකු වැදූහ. ඉක්බිත්තෙන් ඒ උපාසිකාවගේ වල්ලභයා ගෙට ගොස් ඒ උපාසිකාව වැදූ නියාව දැක පින්වත්නී, ඒකාන්තයෙන් ආශ්චර්යයයෙකැයි අතිශයින් බුද්ධානුභාවයෙන් ආශ්චර්ය අත්භූතවූ සිත් ඇතිව සුප්පවාසා නම් උපාසිකාවත් පුතකු වදා සතියක් මුළුල්ලෙහි බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂු සංඝයා වහන්සේට දන්දෙනු කැමතිව නැවත ආරාධනා කරුණු සඳහා තමාගේ ස්වාමිපුරුෂයා යවූහ. එසමයෙහි මුගලන් මහතෙරුන්වහන්සෙගේ උපාසකයක්හු විසින් බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂු සංඝයා වහන්සේ පවරණ ලදසේක. සර්වඥයන්වහන්සේ සුප්පවාසාවන්ගේ දනට අවසර දෙන පිණිස මුගලන් මහතෙරුන්වහන්සේ ඒ උපාසකයා සමීපයට යවා ඔහු ගිවිස්වා සතියක් මුළුල්ලෙහි භික්ෂූන් වහන්සේ හා සමඟ ඒ සුප්පවාසාවන්ගේ දන් පිළිගත්සේක. සත්වෙනි දවස් සුප්පවාසාවෝ පුතනුවන් සීවලී කුමාරයන් සරහා භික්ෂු සංඝයා වහන්සේ වැන්දවූය. ඒ කුමාරයන් පිළිවෙලින් සැරියුත් මහතෙරුන්වහන්සේ සමීපයට ගෙණගිය කල්හි තෙරුන්වහන්සේ ඒ කුමාරයන් සමග කිමෙක්ද සීවලීනි තොපට සැපදැයි සුවදුක් කථා කළ සේක. එවිට කුමාරයෝ කියන්නෝ ස්වාමීනි මට සැපයෙක් නම් කොයින්ද? මම සත් අවුරුද්දක් මුළුල්ලෙහි ලොහෝකුඹුනිරයක් වැනිවූ මව්කුස විසූයෙම් වේදැයි තෙරුන්වහන්සේ හා සමඟ මෙබඳු කථාවක් කළෝය, සුප්පවාසාවෝ ඒ කුමාරයන්ගේ බස් අසා උපන් සතියෙන්ම මාගේ පුතනුවෝ අනු බුද්ධවූ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ හා සමග කථා කෙරෙයි සොම්නයට පැමිණියෝය. සර්වඥයන් වහන්සේ සුප්පවාසාව අතින් මෙබඳු වූ දරුවන් කැමැත්තේදැයි විචාළසේක. ස්වාමීනි ඉදින් මෙබඳුවූ සෙසුත් දරුවන් සත්දෙනෙකු ලද්දේවීන්නම් මම කැමැත්තෙම් වේදැයි කීව්ය. සර්වඥයන් වහන්සේ උදම් අනා අනුමෙවෙනි ධර්ම දේශනාකොට වැඩිසේක. සීවලී කුමරුවෝත් සත් ඇවිරිදිකලම ශාසනයෙහි ලැදිව මහණව විසි වයස පිරුණ කල්හි උපසම්පදාව ලැබ පිනැතව ලාභයෙන් අග්‍රප්‍රාප්තව මහී කම්පාකරවා අර්හත්ඵලයට පැමිණ පිනැත්තවුන් අතුරෙන් ඒතදගග තනතුරට පැමිණිසේක. ඉක්බිත්තෙන් එක් දවසක් භික්ෂූන් වහන්සේ ධම්සභා මණ්ඩපයට රැස්ව "ඇවැත්නි සීවලී ස්ථවිරයන්වහන්සේ සත් අවුරුද්දක් මුලුල්ලෙහි මව්කුසෙහි වැස සත් දවසක් ගර්භමූඪ බවට පැමිණිසේක. අනේ දෙපුතු මව් මහාදුක් අනුභව කළාහුය. කෙබඳු කළෝද"යි කථාවක් උපදවා උන්සේක. ශාස්තෲවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ එතනටම වැඩ වදාරා මහණෙනි දැන් කවරනම් කථාවකින් යුක්තව හුනුදැයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි මහණෙනි මහපිණැත්තාවූ සීවලී ස්ථවිරයන්ට සත් අවුරුද්දක් මුළුල්ලෙහි ලෝකුඹුනරකාදිය හා සමාන මව්කුස වාසයද සතියක් මුළුල්ලෙහි ගර්භමූඪ බවට පැමිණීමත් ඔවුන් විසින්ම කළ කර්මය මුල්කොට ඇත්තේද සුප්පවාසාවන්ට සත්අවුරුද්දක් මුළුල්ලෙහි කුසින් දරුගැබ පරිහරනය කරන්නාවූ දුකුත් සතියක් මුළුල්ලෙහි ගර්භමූඪවූ දුකුත් තමන් කළ කර්මය මුල්කොට ඇත්තෙයයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතානෝ රජ්ජුරුවන්ගේ අග්‍රමහේසිකාවන්ගේ කුස පිළිසිඳ ගෙණ වැඩිවිය පැමිණ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙන් සිල්ප ඉගෙණ පියානන් ඇවෑමෙන් දැහැමෙන් රාජ්‍යය ගෙණ රජ්ජුරුවන් ජීවිතක්ෂයට පමුණුවා රජ්ජුරුවන්ගේම අගමෙහෙසුන් තමන්ට අගමෙහෙසුන් කළෝය. බරණැස්නුවර රජ්ජුරුවන්ගේ පුතනුවෝ පියානන් මළ කල්හි වාරි මාර්ගයෙන් පලාගොස් සේනාව රැස්කරවා බරණැස්නුවරට අවුත් නුදුරුතෙනක හිඳ රජ්ජුරුවන්ට රාජ්ජය හෝ දුන මැනව යුද්ධය හෝ කළමැනවැයි පත්යවූහ. එකල කෝසල රජ්ජුරුවෝ යුද්ධ කෙරෙමි පෙරලා පත්යවූහ. රාජකුමාරයන්ගේ මෑණියෝ ඒ අසුත් අසා යුද්ධයන් කම්නැත හැමදිගම සංචාරය සිඳ බරණැස් රජ වටලා ගණුව ඉක්බිත්තෙන් දර පැන්බත් ආදිය නිමාගිය කල්හි ආහාරයෙන් පීඩිතවූ මනුෂ්‍යයන් ඇති නුවර යුද්ධයක් නැතිවම ගන්නාමෝදැයි පතක් යවූහ. ඒ රාජකුමාරයෝ මෑණියන්ගෙන් එවූ අසුත් අසා සත් දවසක් මුළුල්ලෙහි සංචාරය සිඳ නුවර වටලාගත්තුය. නුවර ඇතුළට පැමිණියාවූ සත්වයෝ මැදිරිය හසුවූ පක්ෂීන් පරිද්දෙන් විය. සත්වෙනි දවස් ඒ කොසොල් රජ්ජුරුවන්ගේ හිස ගෙණවුත් කුමාරයන්ට දුන්නාහුය. කුමාරයෝ නුවරට වැද රාජ්‍යය ගෙණ රාජ්‍යශ්‍රී අනුභව කොට කෙළවර කම්වූපරිද්දෙන් මිය පරලොව ගියාහ. ඒ කුමාරයෝ සතුරු රජ්ජුරුවන්ගේ සේනාවට පීඩාකළාවූ අකුසල කර්ම විපාකයෙන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි මව්කුසවැස

SANHIDA LANKA

සතියක් මුළුල්ලෙහි ගර්භමූඪ බවට පැමිණියෝය. තව ද ඒ කුමාරයෝ පියුමතුරා නම් සර්වඥයන්වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහිදී ලාභීන් අතුරෙහි අග්‍රවෙම්වයි කියා මහදන් දී යම් ප්‍රාර්ථනාවක් කළෝද විපස්සි සර්වඥයන් සමයෙහි නුවරවාසීන් සමඟ දහසක් වස්තු අගනාවූ දී උක් සකුරු දන් දී යම් ප්‍රාර්ථනාවක් කළෝද එහි ආනුභාවයෙන් ලාභීන් කෙරෙහි අග්‍රවූහ. සුප්පවාසාවෝත් නුවර වටලාගෙණ නිස්සඤ්චාරය කොට බත් පැන් වැද්දනොදී නුවර අරගණුවයි පුතනුවන්ට කියායවූ බැවින් සත්අවුරුද්දක් මුළුල්ලෙහි කුසින් දරුගැබ පරිහරණකොට සතියක් මුළුල්ලෙහි ගර්භමූඪවූය. ශාස්තෲවූ බුදුරජානන්වහන්සේ මහණෙනි ඒ දෙපුතු මවුන් මේ ගර්භ පරිහරණය ගර්භවාස සංඛ්‍යාතවූ දුක්ඛයෙන් පීඩිතවුවන් පෙර තමන් විසින් නුවර වටලා නිසසඤ්චාර කොට මහජනයාට දුක්දීමෙන් කළ අකුසල කර්මයෙනැයි මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා අසාතරූප ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි නුවරවටලා රාජ්‍යයට පැමිණි කුමාරයෝ නම් සීවලී ස්ථවිරයෝය, මෑණියෝ නම සුප්පවාසාවෝය, පියවූ බරණැස්නුවර රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ව වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# විතීය පරොසහස්ස ජාතකය

තවද එක්සමයෙක්හි වීතමෝහීවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසන සේක්. පෘථග්ජන ප්‍රශ්නය අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාවත් අතීත කථාවත් ප්‍රශ්නව්‍යාකරණයෙන් යටකියන ලද පරෙසහස්ස ජාතකය හා සමානවන්නේය. හුදක් මෙහි නුවණැත්තාවූ සත්වයෝ අවුරුදු සියයක් කියනලද වචනයෙහි අර්ථ පරීක්ෂා කරන්නාහුවීනම් එසේ බලා පරීක්ෂාකරන්නාවුත් සත්වයෝ අර්ථයක්වත් දැනගත නොහෙන්නාහුය. එසේහෙයින් යම් සත්වයෙක් කියනලද වචනයෙහි අර්ථය දන්නේවීනම් ඒ එකම නුවණැති පුද්ගලයා උතුම්වන්නේය. මෙසේ මහබෝසතානෝ ආකාශයෙහිම සිට ධර්මදේශනාකොට තපස්වී සමූහයාට ප්‍රශ්නය අවබෝධ කොට බ්‍රහ්ම ලෝකයටම ගියෝය. ඒ තපස්වීවරයෝත් කිසුණු පිරියම්කොට ධ්‍යානලාභීව ජීවිතපර්‍යාවසානයෙහි ගොස් බ්‍රහ්මලෝකයෙහි උපන්සේක. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා මේ පරෝහස්ස ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# පණ්ණික ජාතකය

තවද එක්සමයෙක්හි අසිත්‍යානුව්‍යංජනයෙන් යුක්තවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක්. එක් පණ්ණික උපාසකයක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ පණ්ණික නම් උපාසකයා සැවැත් නුවර වැසි සැදෑ ඇති රත්නත්‍රයෙහි ප්‍රසන්නවූ එක් උපාසකයෙක. ඒතෙම අනේකප්‍රකාරයෙන් ඉඟුරු කසා ආදියද තම්පලා ආදීවූ පලාකොල හා ලබුපුසුල් ආදිය විකොට ජීවත්වන්නේය. ඒ උපාසකයාගේ එක් දුවක් ඉතා විශේෂ රූ ඇත්තීය, බැලූබැලූවන්ට ප්‍රසාද එලවන්නීය, ආචාරශීලයෙන් යුක්තය, භය ලජ්ජා දෙකින් සමන්විතය, හුදක් හැමවේලෙහි සිනාමුසු මුහුණු ඇත්තීය. ඒ කුමාරිකා සමානජාති ඇත්තාවූ කුලයකින් පුරුෂයන් අවුත් විවාහ නිසා විචාළකල්හි කුමාරිකාවන්ගේ පියානෝ මෙසේ සිතූහ, මේ කුමාරිකාව ඔබ්බෙත් පුරුෂයෝ ඇවිත් විචාර ගියෝය, මෝතොමෝත් හැමවේලෙහිම සතුටුවූ මුහුණු ඇත්තීය, කුමාරිකා ධර්මය නැති බැවින් කුමාරිකාවන් අන්කුලයට ගියකල්හි දෙමව්පියන්ට නින්දා වන්නේය, එසේහෙයින් මේ කුමාරිකාවට කුමාරිකා ධර්මය ඇද්දෝහෝයි නැද්දෝහෝයි පරීක්ෂාකෙරෙමියි සිතා ඒ උපාසකයා එක් දවසක් දුව ලවා පෙට්ටියක් ගෙන්වා ගෙණ වලින් පලාකඩනු සඳහා වලට ගොස් පරීක්ෂා කිරීම් වශයෙන් කේලශ නිශ්‍රිතවූවාක්හු මෙන් රහස් කියා ඒ කුමාරිකාවගේ අත අල්වාගත්තුය, ඒ කුමාරිකාව අත අල්වාගත් පමණකින් අඬමින් වලපමින් කියන්නී පියානන් වහන්ස මේ නුඹ වහන්සේට සුදුසු නොවෙයි, දියෙන් ගිනිනැන්ගා හා සමානය, එසේ හෙයින් නුඹවහන්සේ මෙබන්දක් නොකළමැනවැයි කිව. එබස් ඇසූ පියානෝ මෑනියෙනි මා විසින් තොප පරීක්ෂා කරුණු පිණිස තොප අල්වා ගන්නාලද දැන්වූකලී යවයි කිමෙක්ද තොපට කුමාරිකා ධර්මය ඇද්දනැද්දැයි විචාළේය. එසේහෙයින් පියානන් වහන්ස මට කුමාරිකා ධර්මය ඇත, මම ලෝභ වශයෙන් පුරුෂයෙකුගේ මුහුණ පමණකුත් නොබැළුවිරුමැයි කිවූය. එබස් ඇසූ පියානෝ දුවනියන් අස්වසාලා ගෙටගොස් මගුල්කොට අන්පුරුෂයෙකුට පාවාදී සර්වඥයන්වහන්සේට නමස්කාර කරමි කියා ගඳදුම් මල්පහන් ආදිය ගත් අත් ඇතිව ජේතවනයට ගොස් බුදුරජානන්වහන්සේට වැඳපුදා එකත්පස්ව උන්නාහුය. එකල්හි සර්වඥයන් වහන්සේ විසින් උපාසකයෙනි තොප කල්යවා ආයේ කුමක්නිසාදැයි කීකල්හි එපවත් සර්වඥයන්වහන්සේට දැන්වීය, සර්වඥයන්වහන්සේ උපාසකය මේ කුමාරිකාව බොහෝ කලක පටන් ආචාර ශීලයෙන් යුක්තය, තෝ වූකලී කුමාරිකාව දැන්මතු පරීක්ෂා කළෝ නොවෙයි පෙරත් පරීක්ෂා කෙළෙහිම් වේදැයි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතානෝ වනයෙහි වෘක්ෂ දේවතාව උපන්සේක. එකල්හි බරණැස් නුවර පණ්ණික නම් උපාසකයෝය යනාදීවූ සියල්ල වර්තමාන කථාව හා සමානවන්නේය. ඒ උපාසකයා විසින් පරීක්ෂා කරණු පිණිස අත අල්වාගන්නාලදුව අඬමින් වළපමින් කියන්නී යම් පියානකෙනෙක් කායික චෛතසික දුක්ඛයෙන් පීඩිතවූ තැනැත්තීට පිහිටවෙද්ද එසේවූ මාගේ පියානන්වහන්සේ දැන් මේ වනඩ්‍යයෙහිදී මෙබඳු මිත්‍රද්‍රෝහිවූ කර්මයක් කරණ සේක. එසේහෙයින් මේ වනමඬ්‍යයෙහිදීම කවුරුන්ට අඬම්ද යම් පියාන කෙණෙකුන් වහන්සේ මට පිහිටවන්ට රක්ෂා ස්ථානවන්ට සුදුසුසේක්වීනම් එසේවූ පියානන්වහන්සේද දැන් සාහසිකවූ රෞද්‍ර ක්‍රියාවක් කරණසේක. එසේහෙයින් මම දැන් කව්රුන්ගේ නම කියා අඬම්දැයි දෙවතොපජඣායනයක් කරන්නාක් මෙන් මුරගා ඇඬූය. එකල්හි ඒ කුමාරිකාවගේ පියානෝ කුමාරිකාව අස්වසාලා මෑනියෙනි තොපි කුමාරිකා ධර්මය රැක්කෝවේදැයි විචාළේය. එසේය පියානන්වහන්ස මම රැක්කෙමි කීකල්හි ඒ කුමාරිකාව ගෙට කැඳවාගෙණ ගොස් මඟුල්කොට අන්කුලයක පුරුෂයෙකුට පාවාදුන්නුය. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්ය සත්‍යය ප්‍රකාශකොට වදාරා මේ පණ්ණික ජාතකය නිමවා වදාළසේක.

චතුසසත්‍ය ධර්ම දේශනාවගේ කෙළවර උපාසකයා සෝවාන් පෙළෙහි පිහිටියේය. එසමයෙහි දූනම් දැන් දූමය, ඒ කාරණය ප්‍රත්‍යක්ෂ කොට දුටුවාවු වෘක්ෂ දේවතා වුයෙම්. තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# වෙරි ජාතකය

තවද එක්සමයෙක්හි ශාක්‍යකුල සිඛාමාණික්‍යවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් අනේපිඬු සිටානන් අරභයා මේ ජාතකය වදාළසේක.

අනේපිඬු මහසිටානෝ තමන්ගේ ගොවිතැන් කරන්නාවූ ගමට ගොස් එන තැනැත්තෝ අතරමඟදී අතරමග වසන්නට සුදුසු නොවෙයි සැවැත් නුවරටම යෙමි සිතා වහ වහ ගැල්පදවාගෙණ සැවැත්නුවරටම අවුත් දෙවෙනි දවස් විහාරයට ගොස් බුදුරජානන්වහන්සේට එපවත් දැන්වූය. සර්‍වඥයන්වහන්සේ සිටානෙනි පෙරත් නුවණැත්තෝ අතරමග සොරුන් දැක අතරමග ලස්නොවී තමන් වසන්නාවූ ස්ථානයටම වහ වහාම ගියෝවේදැයි වදාරා සිටානන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහ බෝසතානෝ මහා සම්පත් ඇති සිටුපුත්‍රව ඉපිද එකගමක ඇත්තන් කළ යාචඤ්ඤවක් නිසා අමුතු බත් අනුභව කරන්නට ගොස් පෙරළා ගමට එන්නාහු අතරමගදී සොරුන් දැක අතර නොවැස වහ වහා ගැල් පදවාගෙණ තමන්ගේ ගෙටම අවුත් අනේක ප්‍රකාරවූ අග්‍රරසයෙන් යුක්ත වූ භෝජනය අනුභව කොට මහා අනඝවූ ශ්‍රීයහන් මස්තකයේ හිඳ සොරුන් අතින් මිදී නිර්භයස්ථානවූ මාගේ ගෙටම ආයෙම්වේදැයි ප්‍රීතිවාක්‍ය වශයෙන් උදන් අනන්නාහු මෙසේ කිවුය, යම්බඳුවූ ස්ථානයෙක්හි වෛර සිත් ඇති පුද්ගලයෙක් වසන්නේවීනම් එබඳු ස්ථානයෙක්හි කාරණා දන්නාවූ පුද්ගලයෝ කිසියම් කාරියක් නිසා එක දවසක් වසන්නේ වීනමුත් සිතට සැපයකින් වැසපිය නොදෙනනේය, හැමවේලෙහිම බලවත්වූ චිත්ත ඛෙදයක් හා දොම්නසින් යුක්තව වසන්නේයයි මෙසේ මහබෝසතානෝ උදන්අනා දානාදීවූ පින්කම්කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මෙසේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මේ වෙරි ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි බරණැස්නුවර සිටානෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# විතීය මිත්තවින්දක ජාතකය

තවද එක් සමයෙක්හි පරහිත නිරතවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් එක් දුර්වච භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාව මිත්තවින්දක ජාතකයෙහි විස්තර වශයෙන් කියන ලද්දේය. මේ ජාතකය වූකලී කාශ්‍යප සර්වඥයන්වහන්සේ සමයෙහි වන්නේය. එසමයෙහි උරචක්‍රමාලාව උසුලා නරකයෙහි පැසෙන්නාවූ එක් නාරකික සත්ත්වයෙක්  ස්වාමීනී කෙබඳුවූ අකුසල කර්මයෙක් කෙළෙහිදැයි බෝසතානන් අතින් විචාළේය. බෝධිසත්ත්වයෝ තා විසින් මේ අකුසල කර්මය කරණලදැයි මෙසේ කිවුව. සමුද්‍ර මධ්‍යයෙහි දිවයිනක වෛමාණික ප්‍රේතීවූ දිව්‍යාඞ්ගනාවන් සතරදෙනෙකු දැක එපමණකින් සතුටුනොව මේ යහපත්දෝහෝයි අයහපත්දෝහෝයි කියා ඒ ඒ තැන අධික තෘෂ්ණාවෙන් මතුමත්තේ ගොස් දිව්‍යාඞ්ගනාවන් අටදෙනෙකු ලද්දෙහිය, එපමණකිනුත් සතුටුනොව ඉදිරියෙහි යන්නාවූ තෝ දිව්‍යාඞ්ගනාවන් සොළොස්දෙනෙකුත් ලද්දෙහිය. තවද එපමණකිනුත් සතුටු නොවන්නාවූ තෝ දිව්‍යාඞ්ගනාවන් දෙතිස්දෙනෙකුන් ලද්දෙහිය, ඉනුත් සතුටුනොව අතිච්ඡතායෙන් යන්නේ උරචක්‍රමාලාවට පැමිණියේ වෙහිය. මෙසේ ස්වකීයවූ ලාභයෙන් සතුටු නොව ඒ ඒ තැන්හි ඉච්ඡායෙන් ලාභය ප්‍රාර්ථනා කරන්නාවූ තෝ දැන් මේ උරචක්‍රමාලාවට පැමිණියේ වෙහිය. මෙසේ තෘෂ්ණා වසඟවූ තාගේ මස්තකයෙහි නැවත නැවත මේ උරචක්‍රමාලාව වැටී හිස කපමින් මහා දුක් දෙන්නේයයි ඔහුගේ කර්ම විපාකය ප්‍රකාශ කොට කිවූය. මෙසේ කියා මහබෝසතානෝ තමන් වසන්නාවූ දිව්‍ය ලෝකයටම ගියෝයි නාරකීක සත්වයා තමා කළ අකුසල් ගෙවීගිය කල්හි කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියේය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා මිත්තවින්දක ජාතකය  නිමවා  වදාළසේක.

එසමයෙහි මිත්තවින්දක නම් දුර්වච මහණය, එසමයෙහි දිව්‍ය පුත්‍රවූයේ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# දුබ්බල කාෂ්ට ජාතකය

තවද එක්සමයෙක්හි මහත්වූ ධෛර්‍ය්‍යී ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක්. මරණභීරුකවූ එක් භික්ෂු කෙණකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවර වාසීවූ එක් කුලපුත්‍රයෙක් බුදුරජාණන් වහන්සේ වදාරන්නාවූ ධර්ම දේශනාව අසා ශාසනයෙහි මරණභීරුත වීය. රාත්‍රී ස්ථාන දිවා ස්ථානයෙහි පටන් අමනාප ශබ්දයක් වේවයි පක්ෂීන් හා චතුෂ්පද ජාතීන්ගේ ශබ්දයක් වේවයි අසා මරණ භයින් තැතිගෙණ මහ හඬින් හඬමින් පළා ගියේය. ඒ භික්ෂුන් වහන්සේට මියම් යන සිතිවිලි පමණකුත් නැත්තේය, ඉදින් ඒ මහණ මම මීයම් දන්නේවීනම් මරණට නොබන්නේය. මරණානුස්මෘති කර්ම ස්ථානය නොවැඩූ බැවින් මරණට භයවන්නේය. ඒ භික්ෂූන්ගේ මරණභීරුක බව භික්ෂු සංඝයා වහන්සේ කෙරෙහි ප්‍රකාශ විය. ඉක්බිත්තෙන් දම්සභා මණ් ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන් වහන්සේ මෙසේවූ කථාවක් ඉපදවූසේක. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ දම්සභාමණ්ඩපයට වැඩ මහණෙනි, මා එන්නාට පළමු කීනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උන්මිහයි කීකල්හි ඒ භික්ෂූහු කැඳවා මහණ තා මරණ භීරුක වූයේ සැබෑදැයි විචාරා සැබව ස්වාමීනි දැන්වූ කල්හි මහණෙනි මේ භික්ෂු හට නොසතුටවව් මේ මහණ දැන්මතු මරණ භීරුක වූයේ නොවෙයි පෙරත් මරණ භීරුක යයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ කල්හි පුරණ ලද බෝධිසමාභාර ඇති අප මහබෝසතානෝ හිමාලය වනයෙහි වෘක්ෂ දේවතාව උපන්හ. එසමයෙහි බරණැස් නුවර රජ්ජුරුවෝ තමන්ගේ මගුලැතු යුඩක්ෂම කොට හස්ති ශික්ෂාව කරුණු නිසා හසත්‍යාචාරීන්ට ඇතු පාවාදුන්නුය, එකල්හි හස්තියාට ඉවසාගත නොහී තමා බැඳි කඹය බිඳ ගෙණ මනුෂ්‍යයන් ලුහුබඳවා දිවගෙණ ගොස් හිමාලය වනයට වන්නේය, මනුෂ්‍යයෝ ඕහු අල්වා ගත නොහී පසුපස්සෙහි ගොස් නැවත ආපසු ගියාහුය. ඒ හස්ති රාජයා එතැන් පටන් මරණ භීරුක විය. පවන් හැඬූ හඬ අසා වෙව්ලමින් මරණ භයින් භයපත්ව සොඬ කෙළව කෙළවා මහත්වූ වේගයෙන් දිවන්නේය, අත්කඹුයෙන් බැඳ කොළින් දුක්කම්කටුල් කරණ කලක් මෙන් ඕහට මහත් භය උපන්නේය. කායාස්වාදයෙක් වේවයි චිත්තාසවදයෙක් නොලැබ වෙව්ල වෙව්ලා ඇවිදිනේය, වෘක්ෂ දේවතාවානෝ ඕහු දැක වෙලෙප් අතුරෙහි සිට මෙසේ කිවූය, යම් දුර්වල වූ කාෂ්ටය පූර්විදික් ආදියෙන්ම හමන්නාවූ මහපවනින් බිඳ හෙලාද එසේ කාෂ්ටය මේ වනයෙහි බොහෝය, සුලභය, ඒ ඒ තැන ඇත, ඉදින් තෝ ඒ පවනින් බිඳී වැටෙන දරදඬු ආදියට භයවන්නේ වීනම් එසේ කල්හි නිරන්තරයෙහි තණ පැන් අනුභව කොට සැපසේ ජීවත්වයි කියා මෙසේ වෘක්ෂ දේවතාවෝ හස්තියට අවවාද දුන්නාහුය, ඒ හස්තියාත් එතැන් පටන් නිර්භීත විය. ශාස්තෘවූ සම්‍යක් සම්බුදුරජානන්වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කොට මේ දුර්වල කාෂ්ට ජාතකය නිමවා වදාළසේක.

චතුසසත්‍ය ධර්ම දේශනාවගේ කෙළවර මරණභීරුක මහණ සෝවාන් පෙලෙහි පිහිටියේය, එසමයෙහි හස්තියා නම් දැන් මේ මරණභීරුක මහණය, එසමයෙහි වෘක්ෂදේවතා වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# උදංචනී ජාතකය

තවද එක්සමයෙක්හි කරුණාස්පදවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක්. ථුල්ල කුමාරිකා පලෝභනයක් අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාව තෙරස නිපාතයෙහි චුල්ල නාරද කාශ්‍යප ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. සර්වඥයන් වහන්සේ භික්ෂුවහට මහණ තා උකටලී වූයේ සැබෑදැයි විචාරා සැබව ස්වාමීනි කීකල්හි මහණ තාගේ සිත කා කෙරෙහි පිළිබඳවීදැයි විචාළසේක. ස්වාමීනි පුරුෂ සමාගමකට නොපැමිණියාවූ බාල වයස ඉක්මව සිටි ඒ කුමාරිකාව කෙරෙහි සිත් පිළිබඳවීයයි දැන්වූසේක. එකල්හි සර්වඥයන් වහන්සේ ඒ භික්ෂුහට වදාරණ සේක්. මහණ තට මේ ස්ත්‍රිය අනත්‍ථකාරිය. පෙරත් තෝ මේ ස්ත්‍රිය නිසා ශිලවිපත්තිය පැමිණ වෙව්ලමින් ඇවිදිනේ නුවනැත්තන් නිසා සැපලද්දේ වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි යනාදීවූ අතීත කථාවත් චුල්ලනාරද කාශ්‍යප ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. එසමයෙහි වනාහී අප මහබෝසතානෝ සවස් වේලෙහි පලාඵල ඇරගෙණ අවුත් පන්සලට වැද දොරහැර පුතනුවන් චුල්ලතාපසයන්ට කියන්නේ පුත තෙපි මෙතෙක් දවස් දර ගෙණෙව නහණ බොණ පැන් ගෙණෙව ගිණිදල්ලව අද වූ කලී කිසිවකුත් නොකොටම කුමක් නිසා දුර්මුඛව සිතිවිලි ගෙණ හුන්නාදැයි විචාළේය. එබස් ඇසූ චුල්ල තාපසයෝ කියන්නෝ පියානන් වහන්ස නුඹ වහන්සේ පලාඵල ගෙණෙන්ට ගිය කල්හි එක් ස්ත්‍රියක් ඇවිත් පොළඹවා හැරගෙණයන්ට පටන්ගත. මම නුඹ වහන්සේගෙන් අවසර ගෙණ යෙමි සිතා නොගියෙමි. අසවල්තැන ඒ ස්ත්‍රී හිඳුවා ආමි පියානන් වහන්ස මම දැන්යම් කිවූය. එබස් අසා මහබෝසතානෝ මොහු නවතන්ට නොපිළිවනැයි සිතා එසේවීනම් දරුව යව මේ ස්ත්‍රිය තොප ගෙණ ගොස් යම් දවසෙක මත්ස්‍යමාංස කනු කැමති හෝ වේදැයි තෙල් තලතෙල් එනු සාල් ආදියෙන් හෝ ඈට ප්‍රයෝජනයක්වේද එදවස් මේ මේ දෙය ගෙණෙවයි කියා තොපට පීඩා කෙරේ ද එකල මාගේ ගුණ සිහි කොටලා අවුත් මෙතනම වාසය කරවයි කියා අවසරදී යවූහ, චුල්ල තාපසයෝ ඈ හා සමග මනුෂ්‍ය පථයට ගියෝය. එකල ඒ ස්ත්‍රී ඒ තාපසයන් තමා වසඟයට පමුණුවා මස් ගෙණෙවයි කියා යමකින් යමක් ප්‍රයෝජන ඇත්නම් ඒ මත්ස්‍යමාංසාදිය ගෙන්වන්නීය. එකල්හි චුල්ලතාපසයෝ මෝතොමෝ තමාගේ කොල්ලකු ලවා බැල මෙහෙකරවන්නෙක් මෙන් නොයෙක් දෙය ගෙන්වා පීඩා කරන්නීයයි එතනින් නික්ම පියානන් සමීප යට ගොස් නමස්කාර කොට සිටිපලම සිට මෙසේ කිවූය. පියානන් වහන්ස නුඹ වහන්සේ සමීපයෙහි හිඳ සැපසේ ජීවත් වන්නාවූ මා වසඟයෙහි පමුණුවා සිතට තැවුල් කරමින් තමා හා කැටිව කැඳවා ගෙණ ගොස් නැවත මට පීඩා කරන්නියක් මෙන් යමක් යමක් කැමති වීනම් ඒ මත්ස්‍ය මාංසාදිය මා ලවා ගෙන්වමින් ලිඳෙන් පැන් උකාගන්නනා වූ තුලාවක් මෙන් ද සැලින් පැන් උකාගන්නා වූ දාලුවක් මෙන් ද කැමති කැමති ඒ වස්තු මා ලවා අද්දන්නීය. තවද මෙසේ වූ ස්ත්‍රී මා කෙරෙහි සෙනඟ ඇත්තීය, කාමයෙන් මියුරුවූ වචනයෙන් පොළඹවා ගෙණ තමා වසනතෙනට ගොස් තෙල් හා ලුනු ඇඹුල් සහල් ආදීවූ සෙසු යමක් යමක් කැමතිවී නම් ඒ සියල්ලම මා අතින් ඉල්ලා කොල්ලෙකු මෙන් බාලයෙකු මෙන් කොට මා ලවා ඒ සියල්ලම ගෙන් වන්නීයයි. ඒ ස්ත්‍රියගේ නුගුණ කීවාහුය, එකල්හි මහබෝසතානෝ චුල්ල තාපසයන් අස්වසාලා වන්නාට පුත මෙසේ එව තෙපි මෙතැන් පටන් මෛත්‍රී වඩව කරුණා වඩවයි සතර විහාර භාවනාවන් කීවාහුය, චුල්ල තාපසයෝ නොබෝ දවසකින්ම පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා චතුර්විධ බ්‍රහ්ම විහාර භාවනාවන් කොට පියානන් හා සමඟ ගොස් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා දුඃඛසත්‍යය සමුදය සත්‍යය නිරෝධ සත්‍යය මාර්ග සත්‍යයයි කියන ලද චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කොට මේ උදංචනී ජාතකය නිමවා වදාළ සේක.

චතුසසත්‍ය ධර්ම දේශනාවගේ කෙළවර ඒ මහණ සෝවාන් පෙලෙහි පිහිටියේය. එසමයෙහි ථුල්ල කුමාරිකා නම් දැන් ථුල්ල කුමාරිකාය චුල්ල තාපසයෝ නම් උකටලී මහණය. එසමයෙහි චුල්ල තාපසයන්ගේ පියවූ තාපසයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සාලික ජාතකය

තවද එක්සමයෙක්හි සුබාස්පදවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක්. අතකුරු ගැසීමෙහි දක්ෂ එක් භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වාසී එක් කුලපුත්‍රයෙක් අතකුරු ගැසීමෙහි දක්ෂ විය. ඒ තෙම එක් දවසක් බුදුරජාණන් වහන්සේ වදාරන්නා වූ ධර්ම දේශනාව අසා ශාසනයෙහි ලැදිව මහණව උපසම්පදාව ලද්දේය, උපසම්පදාව ලත් බවවිනා ශික්ෂකාමී නොවනසේක්. ප්‍රතිපත්ති සාරයක් නොවන සේක. ඒ භික්ෂූන් වහන්සේ එක් දවසක් ලදරු භික්ෂූන් වහන්සේ කැඳවා ගෙණ  අචිරවතී නම් ගඞගාවට ගොස් පැන් සනහා ගන්තෙර සිටිසේක. එසමයෙහි සෙවත හංසයෝ දෙදෙනෙක් ආකාශයෙන් යන්නාහුය, ආකාශයෙන් යන්නාවූ හංසරාජයන් දෙදෙනා දැක වැඩි මහළු භික්ෂූන් වහන්සේ බාල භික්ෂූන්ට කියනසේක්. මේ පස්සෙහි යන්නාවූ හංසයා අතකුරකින් ඇස ගසා පාමුල එලම්දැයි කීසේක. අන්‍යවූ බාල මහණ කියනසේක්. කෙසේ ගසා එලනසේක්ද ගසා එලන්ට නුඹ වහන්සේට නොපිළිවනැයි කීසේක. අන්‍යවූ වැඩි මහළු භික්ෂූන් වහන්සේ එබස් අසා කියනසේක්. ඇවැත්ති ඒ හංසයාගේ මෙපිට ඇසතට තිබියදී දෙවෙනි එපිට ඇසින් ගසා මෙපිට ඇසින් පලවමි කීසේක. බාල භික්ෂූන් වහන්සේද මේ කියන්නේ නැත්තයයි කීකල්හි එසේවීනම් පරීක්ෂා කොට බලා වදාළ මැනවැයි කියා එක් තුනස් අකුරක් ගෙණ අතකුරෙන් පැහැර හංසයාගේ පෙඳගොල්ල දිශාවට ගැසූසේක. ඒ ගැසූ අකුර රූ රූ යන අනුකරණධවනී පවත්වමින් බුරාගෙණ අවුත් පෙඳගොල්ල සමීපවූයේය. එකල්හි හංසයා උපද්‍රවයක් වියයුතුයයි සිතා කරකැවී අතකුරුගලේ ශබ්දය අසන්ට පටන්ගත, එකෙණෙහි ඒ භික්ෂූන් වහන්සේ එක් වට අකුරක් ගෙණ හංසයා කරකැවී බලන තැනැත්තහුගේ ඒ පිට ඇසට ගැසූයේය, ගසනලද අකුර පිට ඇසින් වැදගෙණ මෙපිට ඇසින් බඳ පලා ගියේය, හංසයා අඬමින් පාමුල වැටී ගියේය. එකල්හි ඒ ඒ තැනින් භික්ෂූන් වහන්සේ අවුත් නින්දාකොට තොප විසින් කළසේ නපුරැයි කිය කියා සර්වඥයන් වහන්සේ සමීපයට කැඳවා ගෙණ ගොස් ස්වාමීනි මේ භික්ෂූහු විසින් මෙනම් දෙයක් කරණ ලදැයි එපවත් දැන්වූසේක, එකල්හි සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ට නින්දා කොට මහණෙනි මොහු අතකුරු ගැසීම් සිල්පයෙහි දක්ෂ වූයේ දැන්මතු නොවෙයි පෙරත් දක්ෂවීයයි වදාරා ඉකුත්වත් දක්වා  වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතානෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍ය වූහ. එසමයෙහි රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා ඉතා මුබරිය බහුභාණිය ඔහු කථා කරන්ට පටන් ගත් කල්හි අවශේෂයන්ට කථාවට අවසරයක් නොලැබේ. එකල රජ්ජුරුවෝ සිතන්නෝ මොහුගේ කථා විච්ඡේදය කරන්ට නිසිවූ කවරක්හු කවර දවසක ලැබෙම් දෝහෝ සිතා එතැන් පටන් එබඳු එකක්හු පරීක්ෂා කරමින් ඇවිදිති. එසමයෙහි බරණැස් නුවර එක්පිළිවූ පුරුෂයෙක් අකුරු ගැසීමෙහි දක්ෂ විය. එනුවර කුඩා කොල්ලෝ ඒ පිළිමිණිසා රථයක ලාගෙණ ඇවිදිමින් බරණැස් නුවර වාසල් දොර සමීපයෙහිවූ සාඛාවිට සම්පන්නවූ මහත් නිග්‍රෝධ වෘක්ෂයක් ඇත. එතනට ගෙණවුත් ඔහු පිරිවරා සිටිති, දේවියට ස්මාරක අඩදමක යනාදී රන් මිලදී ඇත්රුවක්කර අස්රුවක් කරවයි කියති. ඒ පිළා අතකුරු ගස ගසා නුගපත් වලට ගසති, සිංහ ස්වරූප මෘග ස්වරූප පක්ෂි ස්වරූපාදීවූ අනේකප්‍රකාර රූපයන් දක්වන්නේය, ඒ නිග්‍රෝධ වෘක්ෂයෙහි සියලු පත්‍රයෝ ඡිද්‍රව පෙනෙන්නාහුය, එකල්හි රජ්ජුරුවෝ උද්‍යාන ක්‍රීඩාවට යන්නාහු ඒ ස්ථානයට පැමිණියෝය, ඒ පිළිපුරුෂයා වටලා ගෙණ සිටි කුඩා කොල්ලෝ රැකවුලුන් ගසා ඉවත් කරන්නාහු හයින් හැමදෙනම ඒ ඒ තැන පලා ගියෝය, පිළි පුරුෂයා නුග ගස මුල වැදහොත්තේය, රජ්ජුරුවෝ නුග ගස මුලට ගොස් රථයේ හිඳම පත් සිදුරු බැවින් ඡායාව විරල විරලව තිබෙන්නා දැක උඩ බැලූ තැනැත්තෝ සියලු පත්ම සිදුරු සිදුරුව තිබෙන්නා දැක මෙසේ කළෝ කවුරුදැයි විචාළෝය. ඒක පරීක්ෂා කරන්නාවූ රාජපුරුෂයෝ දේවයන්වහන්ස පිළකු විසිනැයි කීකල්හි මේ පිළා නිසා පුරෝහිත බ්‍රාහ්මණයාගේ මුබරිබව හා බහුභාණික බව ඔබවාපියන්ට පිළිවන් වන්නේ යයි සිතා පිළා කොයිදැයි විචාළෝය. එකල පරීක්ෂා කරන්නාවූ රාජපුරුෂයෝ මුල්හස්සේ වැදහොත් තැනැත්තහු දැක දේවයන් වහන්ස පිළා මේ වේදැයි කිවූය. රජ්ජුරුවෝ ඔහු සමීපයට ගෙන්වා පෂීත් ඉවත් කරවා විචාරන්නෝ අප සමීපයෙහි මුබරි බමුණෙක් ඇත. ඔහු නිශ්ශබ්ද කරන්ට පිළිවන්දැයි විචාළෝය. ස්වාමීනි එළුබෙටි නැලියක් ලද්දෙම් වීනම් නිශ්ශබ්ද කරන්ට පිළිවන. දේවයන් වහන්සැයි කිව්ය, රජ්ජුරුවෝ පිළා මාලිගාවට කැඳවා ගෙණ ගොස් තිරයක් ඇතුලෙහි හිඳුවා තිරය සිදුරු කොට බමුණා තිරය අභිමුඛ කොට හස්නක් පණවා නැලියක් පමණ වියලි එළු බෙටි පිළාසමීපයේ තබ්බවා පුරෝහිත බ්‍රාහ්මණයා රාජ සේවයට ආ තැනැත්තාහු ඒ අස්නේ හිඳුවා කථා ඉපදවූය. බමුණු අනික් කෙණෙකුන්ට අවසරයෙක් නොදී රජ්ජුරුවන් සමග කථා කරන්ට පටන් ගත්තේය. එකල්හි පිළා තිරය සිදුරෙන් එකී එකී එළු බෙටි ගසා ඇම නිම ගියේය. බමුණුගේ බඩටවන්නාවූ නැලියක් පමණ එළු බෙටි ගලනතුරුත් කිසිවකුත් නොදැනම දැන් මෙයින් මත්තෙහි එළු බෙටි ගැල දිරවාගන්ට අසමත්වේය. එසේ හෙයින් ගෙට පලා ගොස් පුවඟු ගෙන්වා ගෙණ කොටා යුෂ මැඩ පැන් හා කලන්දු කොට බී වමණය කොට තොපගේ ශරීරය නිරෝගී කොට ස්වස්ථ කොට ගණුවයි කිවූය, බමුණු එතැන් පටන් මුඛය වසා ගත්තාක් මෙන්ම කථා කරන්නාවුන් සමගත් කථා කරණුයේය. රජ්ජුරුවෝ මොහු විසින් මට කණ් සැපය කරණ ලදැයි පිළාට අවුරුද්දකට ලක්ෂයක් නිමවන්නාවූ සතර දිගින් ගම් සතරක් දුන්නාහුය. එකල්හි මහ බෝසතානෝ රජ්ජුරුවන් කරා එළඹ දේවයන් වහන්ස සිල්ප නම් ලෝකයෙහි නුවනැත්තන් විසින් උගත යුත්තේය". පිළා විසින් අතකුරු ගැසීමෙහි දක්ෂ වීමෙනුත් මෙතෙක් සම්පත් ලබන ලද්දේයයි කියා "මේ ලෝකයෙහි කවරක් වී නමුත් යම් යම් සිල්පයක්

SANHIDA LANKA

ඉගැන්ම යහපත් වන්නේ යයි මහ රජ්ජුරුවන් වහන්ස බළා වදාළ මැනවැ මේ කොරපිළීවූ පුරුෂයා විසින් එළුබෙටි අතකුරෙන් ගැසීමෙන් සතර දිගින් ගම්වට සතරක් ලබන ලද්දේවේද එසේ හෙයින් සෙසු සිල්පයෙහි අනුසස් කෙළවරක් ඇද්ද යි කියා ශිල්පයෙහි ගුණ කීවාහුය.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේධර්මදෙශනාව ගෙණහැර දක්වා වදිරා මේ යාලිකජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි පිළානම් දැන් මේ හංසසාතක මහණය, රජ්ජුරුවෝනම් ආනන්ද ස්ථවීරයෝය, නුවනැති අමාත්‍ය වූයෙම් තිලෝගුරු සම්‍යක්සම් බුදුරජවූ මම්ම වේදැයි  තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# බාහ්‍ය ජාතකය

තවද එක්සමයෙක්හි සුරාසුරවර චක්‍රවාරු චූඩාමාණිමරීචිසංචය පරිචුම්බිත චරණ නබ මයූඛ ඇති ලෝකස්වාමීවූ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජානන් වහන්සේ විසාලාමහනුවර නිසා මහාවනයේ කූටාගාර ශාලාවෙහි වැඩවසනසේක් එක් ලිච්ජවිරජ්ජුරුකෙණෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ ලිච්ජවි රජ්ජුරුවෝ ශ්‍රද්ධාසම්පන්නයෝය, රත්නත්‍රයෙහි ප්‍රසන්නයෝය, බුද්ධමාමකය, ධම්මමාමකය, සංඝමාමකය, නිරන්තරයෙන් අඛණ්ඩවූ පඤ්චශීලය රක්‍ෂාකෙරෙති පොහොය නොවරදවා පෙහෙවස් රක්‍ෂාකෙරෙති ඒ රජ්ජුරුවෝ එක්දවසක් බුදුන් ප්‍රධානකොට ඇති භික්‍ෂුසංඝයාවහන්සේට ආරාධනාකොට මහදන්සරහා තමන්ගේ මාලිගාවත් විශේෂකොට සරහා මාලිගාවේදී බුදුපාමොක් මහසඟපිරිසට මහදන්දුන්නාහුය, ඒ රජ්ජුරුවන්ගේ බිසව් ස්ථූලවූ අඟප්‍රත්‍යඟ ඇත්තෝය, උඩුමාතක අසුභ නිමිත්තක්මෙන් ආකල්ප සමෘඨියක් නැත්තෝය. ස්ථූලශරීර හා මහත්වූ උස මහත ඇත්තෝය. බුදුරජානන්වහන්සේ අනුමෙවෙනි ධර්මදේශනාකොට විහාරයට ගොස් භික්‍ෂුසංඝයා වහන්සේට අවවාද දී ගඳකිළියට වන්සේක. දම්සභාමණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්‍ෂූන්වහන්සේ කථාවක් උපදවන සේක් ඇවැත්නි එබඳු සැදැහැ ඇති විශිෂ්ට රූ ඇති රජ්ජුරුවන්ගේ බිසව් බැලූ බැලූවන්ට ප්‍රසාදවන්නාවූ රූපශ්‍රියක් නැත්තෝය. ස්ථූලවූ ශරීර ඇත්තෝය, රුවක් පිනක් නැත්තෝය. එසේවූ බිසවුන් හා සමඟ කෙසේනම් මේ රජ්ජුරුවෝ අභිමරණය කෙරෙද්දැයි මෙසේ වූ කථාවක් ඉපදවලා උන්සේක.

එකල්හි ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ තුන්තරාගමනින් එක්තරා ගමනකින් දම්සභාමණ්ඩපයට වැඩවදාරා පණවනලද බුද්ධාසනමස්තකයෙහි යුගඳුරු මුදුනෙහි දිළිහෙන්නාවූ ලහිරුමඩලක්මෙන් දිළිහි දිළිහී වැඩහිඳ මහණෙනි දැන් මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුනු දැයි කවර නම් කථාවක් තොපට අඩාලදැ”යි විචාරා ස්වාමීනි නුඹ වහන්සේ විසින් නොකියන්ට වදාළාවූ රාජ කථා චෞර කථා යනාදී දෙතිස් කථා අතුරෙන් එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. ශ්‍රද්ධා සම්පන්නවූ බුදුහු මාගේමය. ධර්මය මාගේමය. සංඝයා මාගේමයයි කියා රත්නත්‍රයෙහි මමත්වය කොට වසන්නාවූ ඉතා රූපත් වූ මේ ලිච්ඡ වීර රජ්ජුරුවෝ රූපශ්‍රීයක් නැනැත්තාවූ ආකල්ප සමෘඨියක් නැති මේ ස්ථුල වූ ශරීර ඇති බිසවුන් හා සමග කෙසේ නම් සංවාසයක් කෙරෙද්දැයි මෙසේ වූ කථාවකින් යුක්තව උනුම්හයි කීකල්හි ‘මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් මේ ලිච්ඡවිරරජ්ජුරුවෝ ස්ථුල වූ ශරීර ඇති ස්ත්‍රියක් හා සමග අභිරමණය කළෝ නාවේදැයි’’ වදාරා මුවෙන් නොබැණ වැඩ උන් කල්හි ඉක්බිත්තෙන් එතනට රැස්වූ ඇමදෙනා වහන්සේ අතුරෙන් එක්කෙණෙකුන් වහන්සේ නැගී සිට සුපිළිසන්ව මනා කොට දසනබසමෝධානයෙන් බඬාඤ්ජලීව දොහොත් මුදුනේ තබාගෙණ එලභාරයෙන් නැමුනාවූ කදලීවෘක්ෂයක් මෙන් නම්නව බුදුරජානන්වහන්සේ අෂෙටාත්තර ශතමංගල්‍යයෙන් සල්ලක්ෂණව විරාජමානවූ ශ්‍රීපාද වන්දය වැඳ එකත්පස්ව සිට දන්වනසේක්. ස්වාමීනි දැන් මෙසේ සැදැහැ ඇති රූපත්වූ ලිචඡවි රජාකුමාරයන් ස්ථූලවූ ශරීර ඇති ප්‍රසාදවූ මේ බිසවුන් හා සමග සංවාසය කරණ නියාව සියල්ලන්ට ප්‍රකාශය. අතීතයෙහි විරූපවූ ස්ථූල ශරීර ඇති ස්ත්‍රීන් හා සමග අභිරමණය කළනියාව භස්මයෙන් ප්‍රචඡනන්වූ ජාත වේදයක්මෙන් වළාකුළෙන් සැඟවී තුබූ පුන්සඳමඬලක් මෙන්ද පාංසුවෙන් ප්‍රචඡන්නාවූ ජාතිරඟ මාණික්‍යයක් මෙන්ද භවයෙන් ප්‍රච්ඡන්න හෙයින් අප ඇම දෙනාවහන්සේට අප්‍රකාශය. එසේහෙයින් ඒ කථා ස්වරූපය හිමගර්භයක් පළා පුන් සඳමඬලක් ගෙණහැරපානා කලක් මෙන් ඒ අතීත කථාව ගෙණහැර දක්වා වදාළොත් යහපතැයි ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිතවූ බුදුන් ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ කල්හි පුරණ ලද බෝධි සමහර ඇති අප මහබෝසතානෝ බරණැස් රජ්ජුරුවන්ට අමාත්‍යවූය, එකල්හි ජනපද වාසීවූ එක් ස්ත්‍රියක් ස්ථූලවූ ශරීර ඇත්තීය, ආකල්ප සමුර්ධියෙක් නැත්තීය. අනුන්ට බැල මෙහෙකොට ඇවිදිනීය. රාජාඬගනය සමීපයෙන් යමින් සිට ශරීරවලංජනයෙන් පීඩිතව අත්කඩින් ශරීරය වසාගෙණ මලමූත්‍ර බාහ්‍යකොට නැගී සිටියාය, එකෙණෙහි බරණැස් රජ්ජුරුවෝ සිව්මැදුරු කවුළුව හැර රාජාඬගනය බලන තැනැත්තෝ ඒ ස්ත්‍රිය කළාවූ ක්‍රියා දැක මෙසේ සිතූහ.

මේ ස්ත්‍රී මෙබඳු වූ එලිපිට අඬගන ස්ථානයෙහි ශරීරවලංජනය කරන්නී භයා ලජ්ජා දෙකට හැර නොහැර අත්කඩින් ශරීරය වසාගෙණ හිඳ මලමූත්‍ර බාහ්‍යකොට වහා නැගී සිටියාය, එසේහෙයින් මැ නිරෝගි විය යුතුය, මැගේ වස්තු විසද බව වන්නේය, විසදවූ වස්තුවෙහි වූකලී එක් පුත්‍රයෙක් උපන්නේ වීනම් විසදව පිණැති වන්නේය, එසේහෙයින් මේ ස්ත්‍රිය මා විසින් අග මෙහෙසුන් තනතුරෙහි තබන්නට වටනේයයි සිතා ඒ රජ්ජුරුවෝ ඈ අසවා මක නියාව දැන සමීපයට කැඳවා ගෙන්වාගෙණ රුවන් රැසක් මත්තේ සිටුවා මස්තකයෙහි අභිෂේක ජලය වත්කොට අග මෙහෙසුන් තනතුරෙහි තිබුවාහුය, ඒ බිසව රජ්ජුරුවන්ට අතිශයින් ප්‍රියව සිත් කළුව

SANHIDA LANKA

මනවඩමින් නොබෝකලකින්ම එක් කුමාර කෙණෙකුන් වැදූය, ඒ බිසවුන් වැදූ ඒ රාජ කුමාරයෝ පියරජ්ජුරුවන්ගේ ඇවෑමෙන් චක්‍රරත්නාදීවූ සප්තරත්නයෙන් සමන්විතවවූ මුලු සක්වල ඒකාතපත්‍ර කොට චක්‍රවර්ති රාජ්‍ය ශ්‍රී අනුභව කළාහුය, එකල්හි මහබෝසතානෝ ඒ බරණැස් රජ්ජුරුවන්ගේ බාහිය නම්වූ දනව්වැසි බිසවුන්ගේ යශසමුර්ධිය දැක එබඳුවූ කථාවක් කරන්ට සුදුසු අවසරයක් ලදින් රජ්ජුරුවන් දැක වැද එකත්පස්ව සිට දේවයන් වහන්ස උගතමනා සිල්පය නම් කුමක් නිසා නූගත යුතුද මම් මේ පිටත දනව්වැසි බිසවුන්ගේ මහත් කුසල් ඇත්තාවූ භය ලජ්ජා සහිතව අත්කඩින් සකල ශරීරය වසා ගෙණ පිළිසන් ආකාරයෙන් ශරීර කෘත්‍යය කොට මෙබඳු කුසල්

ඇත්තාවූ දෙවඟනන් බඳු වරඟනන් සොළොස් දහසකට නායකව චක්‍රවර්ති රාජ්‍ය ශ්‍රී අනුභවකරන්ට පුතනු කෙනෙකුන් වහන්සේත් ලැබ ප්‍රමාණාතික්‍රාන්තවූ යස පිරිවරින් හා ශ්‍රී සමෘද්ධියෙන් යුක්තව අග්‍ර මෙහෙසිකා ස්ථානයට පැමිණිසේක. උන් වහන්සේ මේසා මහත්වූ ඓශ්වර්‍ය්‍යයකට පැමිණිසේක් වේද එසේහෙයින් ලෝකයෙහි උගතමනා සිල්පයෙක් ඇත්නම් උගතමනා යුතුමයි සිල්ප ශාස්ත්‍ර උගන්නාවූ සත්වයන්ට වර්ණනා කරන්නාහු මෙසේ කිවූය, රජ්ජුරුවන් වහන්ස මේ ලෝකයෙහි අක්ෂර ලිඛිත ගණිත ගාන්ධර්ව නක්ෂත්‍ර ඡන්දස් නිඝණ්ඩු අලංකාර යනාදීවූ ඒ ඒ ශිල්පයෙහි විපාකය හා සවච්ඡන්දිකවූ ශිල්ප ඉගැන්මෙහි බලවත්වූ අභිප්‍රාය ඇති මනුෂ්‍යයෝ බොහෝ ඇත්තාහුමය. එතකුදු වුවත් මා තමාට සුදුසු ස්පවල්ප මාත්‍ර වුවත් ආචාර ශීලය විවරකුත් ඉගෙණීම් කළමනා දෙයයි එහි ඇදහිල්ලක් ඇතුව නොපිරිහෙළා කරන්නාවූ සත්ව කෙනෙක් ඇත්නම් එසේවූ සත්වයන්ට ඉහාත්ම භාවයෙන්ම ඉෂ්ට විපාක වන්නේය. ඒ එසේමවේදැයි පිටත දනව්වෙහි වැඩී වර්ධනවූ බිසවුන් වහන්සේ භය ලජ්ජා සහිතව ආචාරශීලය නොපිරි හෙළා කරන්නාවූ ක්‍රියාවෙන් නුඹ වහන්සේගේ සිත් මෙසේ මහත්වූ සමුර්ධියකට පැමිණිසේක් වේදැයි කියා මහබෝසතානෝ උගතමනා ශිල්පයෙහි ඉෂ්ට විපාක හා ගුණ විශේෂයෙන් ප්‍රකාශ කොට කීවාහුය, ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා දුඃඛසත්‍යය සමුදය සත්‍යය නිරෝධ සත්‍යය මාර්ග සත්‍යයයි කියනලද චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කොට පූර්වපර සන්ධි ගළපා මේ බාහ්‍ය ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි රජ්ජුරුවන් හා බිසවුන් සමසමයෙහි රජ්ජුරුවන් හා බිසවූය. එසමයෙහි රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කොට සියලු ලෝකවාසීන්ට කතීව්‍යාකතීව්‍ය කුසල් අකුසල් ප්‍රකාශ කොට ලෝවැඩසාදාදී නුවනින් යෙදී වාසය කළාවූ නුවණැති අමාත්‍යවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා  වදාළසේක.

SANHIDA LANKA

# කුඩ්ඩක පූව ජාතකය

තවද එක්සමයෙක්හි භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැවැත් නුවර වාසීන් එක්ව බුදුපාමොක් මහ සංඝයා වහන්සේ පවරා දනක දෙනගමනේ නුවර වසන මහා දුගී නම් එකෙක් තමා ඒ දානයෙහි මුසුවන පිණිස තමාට සැපවුනු කුඩුපූවක් සකසා ඉදිකොට බුදුන්ටම පිළිගන්වමියි සිතා සිටියකලට උපාසකවරුන් කැඳ පිළිගන්වා අවුළුපත් පිළිගන්වයි කී බස හා සමඟ පෙරතුයෙන් තමා ගෙණ ගිය කුඩුපූව බුදුන්ට පිළිගැන්වීය. බුදුහුත් සෙසු මිහිරි අවුළුපත් පිළිගැන්වූවත් නොපිළිගෙණ දුගියා කෙරේ කරුණාවෙන් එම වළඳා වදාරා ජේතවනාරාමයට වැඩ වදාළසේක. එපවත් රජ යුවරජ සෙනෙවිරත් ආදීවූ ප්‍රජාව අසා මහ දුගියා කරා ගොස් මිළ අරගෙණ පින්දෙවයි පින් ඉල්වූහ, එවිට මහ දුගියා සිතන්නේ මා දුකින් කොටගත් කුසලය බුදුන් විචාරා දෙමි සිතා බුදුන් කරා එළඹ මිළ ගෙණවත් නොගෙණ වත් පින්දීම යහපතැයි වදාළ බස් අසා එනුවර වාසීන්ට මිළගෙණ පින් දීමෙන් නවකෙළක් වස්තුව ලද ඒනියාව අසා කොසොල් රජ්ජුරුවෝ ඕහට සිටුසේසත් නැංගවූය, එදවස් දම්සභා මණ්ඩපයෙහි වැඩ උන් සංඝයා වහන්සේ දුගියා කුඩුපූ පිළිගන්වා සිටු සේසත් ලත් නියාව කිය කියා උන්සේක. එතනට තුන්තරා ගමනින් එක්තරා ගමනකින් සර්වඥන් වහන්සේ වැඩ වදාරා පනවන ලද බුද්ධ ශාසනයේ වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාළ කල්හි නොකියන්ට වදාළ දෙතිස් කථාවෙන් එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ, නුඹ වහන්සේට දන් දී මහදුගියා මහා සම්පත් ලත්නියාව කිය කියා උනුම්හයි දැන්වූ කල්හි මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් කුඩුපූවක් දී මහා සම්පත් ලද්දේවේදැයි වදාරා ජාතකයට මුඛමාත්‍රයක් දක්වා තුෂ්ණීම්භූතව වැඩ උන්කල්හි හැමදෙනා වහන්සේගේ අනුමැතියෙන් එක් නමක් නැගී සිට සුපිළිසන්ව හැඳ පෙරව භක්ති ප්‍රේමයෙන් බුදුන්ට බඬාංජලීව දොහොත් මුදුනේ තබා වැඳ සිට ස්වාමීනි දැන් වනාහී මොහු සම්පත් ලත් නියාව අප හැම දෙනාට ප්‍රකාශව දැනෙයි පළමු කුඩුපූවක් දී මහ සම්පත් ලත් නියාව තෙකල් දත් බුදුන්ට මිසක් අපට නොදැනෙයි දක්වා වදාළොත් යහපතැයි ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් දැහැමෙන් රාජ්‍යය කරණ සමයෙහි බරණැස් නුවර වාසීන් ඒ ඒ වෘක්ෂ දේවතාවන්ට පූජා කොට දවස්හරණා කල්හි එනුවර දුක්පත් පුරුෂයෙක් එඬරු ගසක් වට කසල හැර ඒ රුක් දෙවියන්ට ගඳ දුම් මල් පහන් බාද්‍යාභොද්‍යාදිවූ දෙය හැරගෙණ යන්නවුන් දැක තමාගේ එඬරු ගස දෙවියාට අනික් පුදන්ට නිසි උපකරණයක් නැතිහෙයින් තමාට සැපවුනු කුඩුපූවක් දෙවියාට පුදමී. ගෙණගොස් ගස මුලදී සිතන්නේ දෙවියෝ නම් දිව්‍යාහාරය අනුභව කෙරෙති. එසේහෙයින් මෙසේවූ කුඩුපූ මාගේ දේවතාවා අනුභව නොකරන්නේ යයි සිතා කවර කාරණාවකින් ගෙණයෙම්දැයි සිතා මම්ම ප්‍රයෝජන විඳිමි සිතා ආපස්සේ නික්මුණු කල්හි ඒ ගස වසන දේවතාවා කියන්නේ තමාගේ අර්ධ ශරීරයක් දක්වා සිට පුරුෂය තා ලබන්නේ යම් දෙයක් වේද තාගේ දෙවියාත් ලබන්නේයයි කියා දෙවෙනිව ඒ කුඩුපූව දේවතාවාටම පිදීය. එවිට දේවතාවා කියන්නේ තොප මා ආශ්‍රය කෙළේ කුමක්නිසා දැයි කීකල්හි ස්වාමීනි මා දුප්පත් විසිනැයි කීකල්හි එසේවීනම් මේ එඬරු ගස වටකොට කරින්කර ගසා නිධාන සැලවල් තිබෙන්නේය. ඒ නිධාන සැලවල් හාරාගෙණ රජ්ජුරුවන්ට කී ලෙස සම්පත් උල්පවාගෙණ රජ්ජුරුවන්ට පැකල්හි මෙතෙක් සම්පත් ඇති තැනැත්තෙකුට සේසත් දිය යුතුයයි කියා සිටුසේසත් දුන්හ. එසඳ මහා සම්පත් ලදින් දානාදීවූ කුසල් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය. සර්වඥයන් වහන්සේ දෙකල් ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි දුඃඛිත පුරුෂයා නම් මෙසමයෙහි දුඃඛිත පුරුෂයාමය, එඬරු ගස දේවතාව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ප්‍රථම සිඟාල ජාතකය

තවද එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ රජගහ නුවර නිසා වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ විසින් අළුත මහණවූ පන්සියයක් භික්ෂූන් වහන්සේ ඇරගෙණ ගයා නම් ගඞගාවෙහි විහාරයක් කොටගෙණ සර්වඥයන් වහන්සේ කරන්නේ ප්‍රතිපත්ති නොවෙයි මා කරන්නේ ප්‍රතිපත්තියමැයි කියා සංඝයා වහන්සේ හැරගෙණ වෙනම පොහොය කොට වසන සමයෙහි එක් දවසක් සංඝයා වහන්සේ රාත්‍රී මුඛයෙහි දම්සභා මණ්ඩපයෙහි වැඩහිඳ ඇවැත්නි දේවදත්ත ස්ථවිරයෝ නැත්තෙක් බොරුගුණ අඟවා වාසය කෙරෙති, මේ කථාව කිය කියා උන්කල්හි බුදුරජානන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ වදාරා පණවන ලද බුද්ධ ශාසන මස්තකයෙහි වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාළ කල්හි දේවදත්ත ස්ථවිරයන් සංඝභෙද කළ නියාව කිය කියා උනුම්හයි සැළ කළ කල්හි මහණෙනි දැන්මතු නොවෙයි පළමුත් මුසාවාද කීවෝවේදැයි වදාරා භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බරණැස්නුවර නැකත් කෙළි කෙළිනේයයි විධාන ඇසූ නුවර වාසීන් විසින් දේවතාවන්ට බලි පිණිස රා මස් ආදීවූ දෙය වීථියේ කෝවකොට තිබූ කල්හි එදවස් රෑ මත්ස්‍ය මාංස ගන්ධයෙන් කැණහිල් බල්ලෙක් නුවරට වැද රා මස් කා මත්ව රෑ යානොහි පාන්වූකල්හි මේ වේලෙහි පිටත්වීනම් බොහෝදෙන කැටමුගුරු ගෙණ මරති සිතා ඝන කැලයක සැඟවී මග බල බලා ඉඳ බොහෝ මොත්තන්යන්නවුන් හා කථාකොට තනිව යන බමුණෙකු දැක බමුණෝ නම් ඉතා ලොහොබී අයෙකැයි සිතා බමුණා ලඟට අවුත් තොප මා නුවරින් පිටත ගෙණ ගියේ නම් මසුරන් දෙසියයක් තිබූ තැන් පාමි කියන්නාහු බමුණු සැබවයි සිතා තමාගේ උතුරු සළුවෙන් වසා කිසිල්ල අස්සේ සඟවාගෙණ නුවරින් පිටත ගොස් සම්පත් පාවයි කියන්නා කැණහිල් කියන්නේ ඈත යන්නා පාමි කියා හැරගෙණ ගොස් සුසාන භූමියට ගොස් මෙතන නිධාන යයි කිය කියා බිමට බැස සම්පත් ලබන්ට තාගේ උතුරු සළුව පාත්කොට බාලයි තබ්බවා තෙල ගස මුල නිධානය කණුවයි කියා උන් බිම කණද්දී තෙමේ කඩව නැගී සතර කොණ හා මධ්‍යය හා වර්චස් කොට නැගී ගියේය. එතන වෘක්ෂ දේවතාවා කියන්නේ බමුණ බොල්ලන් සියයකටවත් මන්නැති කැණහිලා ගතින් සම්පත් ගන්ට අවුත් ඉනකඩ වර්චස් කරවාගත් විවරක්වේද එසේ හෙයින් අඥාන බ්‍රාහ්මණය තොපගේ කඩත් සෝදා ඉස්සෝදා නා තා කළමනා බමුණු කෘත්‍යය කරයි කීකල්හි එලෙසම කොට නුවරට ගියේයයි වදාරා දෙකල් ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කැණහිල් බල්ලා නම් දේවදත්ත ස්ථවිරයෝය, එසමයෙහි මේ යුක්තිය බලා සිටි වෘක්ෂ දේවතාවා නම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මිතචින්ති ජාතකය

තවද එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වයෝවෘද්ධ තෙර දෙදෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක. ඒ තෙර දෙදෙනා වහන්සේ පිටිසර ජනපදයෙහි ගමක වස් වසන්ට වැඩ උපාසකවරුන් විසින් එලවූ සිව්පසය පිළිගෙණ වස් තුන්මස රඳා ඒ ගම සැප බැවින් දෙවන අවුරුදු වසුත් ඒ විහාරයේ වැස අන්තයේ සැවැත් නුවරට වැඩිසේක. ඒ දෙදෙනා වහන්සේ දුටු සංඝයා වහන්සේ ඇවැත්නි බුඬුපසඨානයට පමා වූයේ ඇයිදැයි කියන්නා ගිය තැන පාසුවිසින් රැඳුනම්හයි වදාළසේක. එදවස් සවස දම්සභාමණ්ඩපයට වැඩ වැඩි මහලු වරුන්වහන්සේ විසින් මේ කථාව කියමින් උන්සේක. එතැනට බුදුහු වැඩ පණවන ලද බුඬාසන මස්තකයෙහි වැඩහිඳ මහණෙනි මා එන්නාට පළමු කිනම් කථාවකින් යුක්තව උනුදැයි වදාරා භික්ෂූන් වහන්සේ විසින් අසවල් මහළුතෙර දෙදෙනෙකු වහන්සේගේ කුසීතභාවය කියමින් උනුම්හයි කීකල්හි මහණෙනි දැන්මතු නොවෙයි පළමුත් ඔහු දෙදෙන කුසිතවූවෝම වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බාරානසී ගංඉස්වන ප්‍රදේශ ස්ඵානයෙහි වසන බහු චිනතිය, අලපචිනතිය, මිතචිනතිය යන මත්ස්‍යයන් තුන් දෙනෙක් මනුෂ්‍යපථ ආසන්නව ගඟ වසන කල්හි ඉන් මිතචින්ති නම් මත්ස්‍යා කියන්නේ මනුෂ්‍යයන්ට දෙදෙන තෘෂ්ණාවෙන් ලෝභීව අදයම්හ, සෙටයම්හයි කිය කියා තුන් මිසක් දවස් යව්කල්හි එක් දවසක කෙවුළෝ ගඟ අහුරා දැල් එලූහ, බහුචින්ති අලපචිනතියයි කියන මත්ස්‍යයෝ දෙදෙන ඉදිරිව යන්නාහු දැල ආඝ්‍රානය නොකොට ගොසින් දැලෙහි බැඳුනුවුය, පස්සේ යන මිතචින්ති නම් වූ මත්ස්‍යයා දැල ආඝ්‍රානය කොට දැල ඇතුළට නොවැද දැල ඇසින් අනික් පිට ගොස් සිතන්නේ මා කියමින් නොගෙණ මත්ස්‍යයෝ දෙදෙන අසුවූය. උන් ගලවන්ට උවමැනවැයි සිතා ඇතුලේ සිට පිටට පැන්නාසේ අඟවා පැණ පිටත සිට ඇතුළටත් මේ සැටියෙම්ම පැණ දිය පළාගෙණ කවා ගියකල්හි මහ මසුන් බැඳුනු හෙයින් දැල ඉරුනේවනැයි සිතා දැල එකපිටකින් එසෙව් කල්හි මත්ස්‍යයෝ දෙදෙන දැලින් ගැළවුනාහයි වදාරා දෙකල් ගළපා මේ ජාතකය නිමවා වදාරා චතුසසත්‍යය ප්‍රකාශ කොට බණ වදාළ කල්හි මහතෙර දෙදෙනාම දහසක්නයින් ප්‍රතිමණ්ඩිතව සෝවාන් පෙළෙහි පිහිටිසේක.

එසමයෙහි බහුචින්තිය අලපචින්තිය යන මත්ස්‍යයෝ නම් මේ තෙර දෙදෙනාය, මිතචින්ති නම් මත්ස්‍යව උපන්නේම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සකුණ ජාතකය

තවද සැවැත් නුවර සර්වඥයන් වහන්සේ වැඩවසන සමයෙහි එක්තරා කුලස්ත්‍රියක් භික්ෂුණී ශාසනයෙහි මෙහෙණිව තෘෂ්ණාවෙහි ගිජුව වසනසේක්. මෙහෙණිතැන් නොකැඩී වීථියක සිඟා වැඩ එහි උපාසකවරුන් විසින් දුන් මිහිරි ආහාර වළඳා දවස්හරණසේක්. මේ වීථියට අනික් මෙහෙණිකෙණෙකුන් වහන්සේ වැඩිසේක් නම් මට ආහාරය මෙබඳු නොලැබෙයි. එසේහෙයින් ඊට මහා කුලක් කෙරෙම් සිතා මෙහෙණිවරට ගොස් අසවල් තැන වීථියේ චණ්ඩවූ ඇතුන් අසුන් කඩා කන බල්ලන් ආදී වූවන්ගෙන් උපද්‍රව ඇත, ඒ වීථියේ කවුරුන් වහන්සේත් නොයන බව යයි කියන්නා එබස් ඇසූ මෙහෙණින් වහන්සේලා කීවේ ඇත්තෙකැයි සිතා වීථියෙන් යන්නා තබා කරකැවී බලන්නකුත් නොකළසේක.

එසමයෙහි ඒ කියන මෙහෙණින් වහන්සේ තනිව සිඟා වළඳා ඇවිදිනා කල්හි එක් දවසක් එක් ගෙයකට සිඟා වඩනා ගමනේ බැටළුවෙක් දිව අවුත් ඇන කළවය ඇටබිඳ එළුකල්හි එතන සිටි උපාසකවරු අල්වා කැඩී ගිය ඇට සන්ධි ගන්වා බැඳගෙණ ඇඳක ලා ගෙණගොස් මෙහෙණිවරළුහ. මේ කථාව භික්ෂූන් වහන්සේ කෙරෙහි ප්‍රකාශ විය. එදවස් දම්සභාමණ්ඩපයෙහි වැඩි උන් සංඝයා වහන්සේ අසවල් මෙහෙණි අනුන්ට අවවාද කියා තමන්ගේ පය බිඳවා ගතැයි කිය කියා උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩමවා මා එන්නාට පළමු කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා මෙහෙණින්නගේ කථාව කිය කියා උනුම්හයි දැන්වූ කල්හි දැන්මතු නොවෙයි පෙරත් අනුන්ට අවවාද කිය කියා තුමූ මළහයි වදාරා ආරාධිත වූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ පක්ෂීන්ට රජව උපන්සේක. ඉන් එක්තරා පක්ෂි ධේනුවක් ගොදුරු බොහෝව ලැබෙයි. මාවතක ගොදුරු කා ඇවිදිනී එක් දවසක් මේ මගට අන්‍ය පක්ෂි කෙණෙකුන් වැද්ද නොදෙම් සිතා පක්ෂීන්ට පලාගොස් අසවල් මාවත ඇතුන් අසුන් රථ අදින ගොන් ආදීන්ගෙන් උපද්‍රව බොහෝයයි කියන්නීය. ඒ ඇසූ පක්ෂීහු ඒ දිසාවට නොගිය විරූහ. තමා අචඡාපරාව ඇවිදිනී එක් දවසක් පවනට බඳු වේගයෙන් රථයක් පදිනවා දැක කරකැවී බලා තවදුරයයි සිතා කරබාගෙණ ගොදුරු කමින් සිටි කළට වහා අවුත් රථය පැමිණි කලට පියාසර කරන්ට අසමත්ව දෙකක්ව තෙරපී මළහ. බෝධි සත්වයෝ පක්ෂි ගණයා පිරිවරා ආකාශයෙන් යන්නාහු පක්ෂීන් සමන්වා මෙකියන පක්ෂි ධේනුව නොදැක අසවල් අවවාද කියන පක්ෂි ධේනුව බලා මහ මාවත මිය පියා මැදහොත්තී දැක අනුන්ට අවවාද කියා තෘෂ්ණාවට වසඟව මළායයි වදාරා වනයට වැඩිසේක.

එසමයෙහි අවවාද දෙන පක්ෂිණී නම් මේ කියන මෙහෙණිය, එසමයෙහි පක්ෂිව උපන්නෙම් වනාහී බුදුහු මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# දුබ්බත ජාතකය

තව ද එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් නොකීකරු භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළ සේක. මේ ජාතකය නවවැනි නිපාතයෙහි ගිජක්ඛ ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය, සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට මේ මහණ දැන් මතු නොවෙයි නොකීකරු වූයේ පෙරත් නොකීකරුමයයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ කරනම්පනන විජජත් කුලයක ඉපිද වැඩිවිය පැමිණ කරනම් නිමවා ඉගෙණ ගුරුන් හා සමග ඒ ඒ තැන ඇවිදිනාසේක්. එක්තරා ගමකට පැමිණ ආචාරීන් විසින් සිල්ප දක්වන්ට ආයුධ පසක් බිම හිඳුවා පණින්ට සරා මෙතෙක් දවස් අභ්‍යාසය පණින්නේ ආයුධ සතරපසක් කෙළේ ඇයිදැයි එකක් හලමැනවැයි කියන්නා රාමදයෙන් මත්ව ඒ ආචාරී තෙපි මාගේ පමණ නොදන්නවාදැයි කියා ආයුධ සතර පැන පස්වන ආයුධය ඇනී මළාහ. ඒ දුටු ශිෂ්‍යයා මා කියමන් නොගෙණ ආචාරීහු මළහයි ආයුධයෙන් ගළවා ආදාහන කරවූහයි දෙකල් ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ආචාරී නම් නොකීකරු මහණය, ශිෂ්‍යව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# තිත්තිර ජාතකය

තවද ජේතවනාරාමයෙහි සර්වඥයන් වහන්සේ වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන්ගේ දක්ෂිණ ශ්‍රාවකවූ කෝකාලික ස්ථවිරයන් නිසා මේ ජාතකය දක්වන ලදී. එහි වර්තමාන කථාව තෙරස නිපාතයෙහි විස්තර වශයෙන් එයි. සර්වඥයන් වහන්සේ මහා කෝකාලික ස්ථවිරයෝ බොහෝ කොට බස් කීමෙන් පෙරත් ජීවිතක්ෂයට පැමිණියෝම වේදැයි වදාර,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ප්‍රසිද්ධ බ්‍රාහ්මකුලයක ඉපද වැඩිවිය පැමිණ ඍෂිප්‍රව්‍ර‍ජ්‍යාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන්ට ගණනාසකව හිමාලය වනයෙහි වසනසේක. එසමයෙහි පාඬු රෝග ඇති තාපස කෙනෙක් ගිණිතපිනා නිසා පොරවක් ඇරගෙණ වලට ගොස් දර පලන්නාහ. එතනට තාපසකෙනෙක් ගොසින් මෙතන පලවයි මෙතන පලවයි යනාදීන් නොයෙක් පරිද්දෙන් කියන්නා කිපී දර පැලුම් උගන්වන්ට ආචාරී කෙණෙක්දැයි තියුණු මුවහත් ඇති පොරවින් පළා එක පහරිම්ම ජීවිතක්ෂයට පැමිණවූහ. බෝධිසත්වයෝ ඒ තාපසයන් කළ පවත් අසා මළ තාපසයන්ට කළමනාකෘත්‍යය කර වූහ. තවද බෝධිසත්වයන් වසන පන්සල කෙරේ ආසන්නවූ තුඹ ගස තිත් වටුවෙක් දවස් පතා මහත්කොට අඬයි. ලිහිණි වැද්දෙක් උගේ අඬ අසා අල්වා මරා හැරගෙණ ගියේය. බෝධිසත්වයන් වහන්සේ උගේ හඬ නාසා මෙතෙක් දා අඬන තිත් වටුවා කොයිදැයි විචාරා එපවත් අසා තිත් වටුවාගේ කථාව හා තාපසයන්ගේ කථාව එක්කොට ගාථාව ගළපා ඒ ගාථාවෙන් ඒ තාපසයන්ට අවවාද කොට සතර බ්‍රහ්ම විහාර භාවනා කොට තාපසවරුන් හා සමග නොපිරිහුණු ධ්‍යානයෙන් බ්‍රහ්ම ලෝකප්‍රාප්තවූහයි ජාතකය නිමවා වදාරා එසමයෙහි බොහෝ කොට බස් කීමෙන් හිස පලවා ගත් තාපසයෝ නම් කෝකාලික ස්ථවිරයෝය, ගණ ශ්‍රේෂ්ටව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# වට්ටක ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උත්තර සෙට්ඨි පුත්‍රයන් අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත් නුවර වසන මහා සම්පත් ඇති උත්තර සිටානන්ගේ ගෙයි මහා පින් ඇති බ්‍රාහ්මණ කුමාරයෙක් ඇවිත් උන්ගේ භාර්‍ය්‍යාවන්ගේ කුස පිළිසිඳ දසඑකඩමසක් ඇවෑමෙන් බිහිව වැඩිවිය පැමිණියේය. එසමයෙහි එනුවර කරතික උත්සවය බොහෝ සිටුකුමාරවරු තමන්ගේ ගෙයි භාර්‍ය්‍යාවන් හා සමග උත්සව සත් දවසක් කෙළනාහු උත්තර කුමාරයෝත් ස්ත්‍රීන් හා සමග උත්සව සත් දවසක් කෙළනාහු උත්තර කුමාරයෝත් ස්ත්‍රීන් හා සමග උත්සව කෙළින්ට උවමැනවැයි සිතා උන්කරා ගොස් එපවත් කීහ. උත්තර කුමාරයන් බ්‍රහ්ම ලෝකයෙන් ආ නියායෙන් එබස් නොගිවිස්සෝය. එසේ නොගිවිස්සත් සිටුකුමාරවරු එක්ව ඒ ගම වෛශ්‍ය ස්ත්‍රියක් ගෙණ අවුත් සර්වාභරණ පළඳවා සරසා ගෙයි ලූහ. උන් දැක කරනගා බලන්නක්වත් බසක් කියන්නක්වත් නොකියා ඉන්නා විසින් භාව භාවයක් දක්වා වුවත් ලබවවා ගතහැකිදෝහෝයි සිතා මන්දස්මිතවූ දෙයක් දැක්වූහ. එසඳ සිටුකුමාරයෝ අසුභ වශයෙන් බලා ඇගේ ශරීරය ඇට කැල්ලක් කොට සිතා පිළිකුල්ව ආ ගමන් සිස්ව යන්නේ ඇයිදැයි සිතා ඇට උවමනා සම්පත් දී යවූහ. එසේ ගෙයින් පිටත්ව වීථියෙන් යන්නීය. පොහොසත් අමාත්‍යයෙක් දැක තමාගේ ගෙට කැඳවා ගෙණ ගියෝය. උත්සව කෙළි කෙළ ඉක්බිති වූ පසු වෛශ්‍ය ස්ත්‍රියගේ මවු තමාගේ දූ නොදක්නී සිටු කුමාරවරුන් කරා ගොස් තොපි හැම මාගේ දුව ගෙණ ගියාහුය පාවයි කියන්නා උත්තර කුමාරයන්ට එදාම පාවාදීපුම්හයි උන්කරා යවයි කියන්නා උන්කරා ගොස් මාගේ දුව පාවාදුනමැනවයි කියන්නා එදාම් උන් යවපීම් කොයිගිය බවත් නොදනිමි කියන්නා උත්තර කුමාරයනුත් හැරගෙණ රජ්ජුරුවන් කරා ගොස් එපවත් කියා මුරගාන්නා රජ්ජුරුවන් විසින් අද්‍යනත විචාරණා තොපගේ ගෙට වන්පසු පාවාදුනමනාමයයි කියන්නා කොයිවන් බව නොදනිමි කියන්නා එසේ වීන්නම් ආඥා කරවයි විධාන කළාහ. විධාන ඇසූ අමාත්‍යයන් විසින් පිටිතල හයා බැඳ ගෙණ වදබෙර ගස්වාගෙණ වීථියෙන් පිටත්වූහ. ඒ ඇසූ බොහෝ මනුෂ්‍යයෝ අඬමින් වැලපෙමින් එතනට අවුත් නුඹසේවූ ව්‍යවසථයන්ටත් මෙසේවූ දෙය පැමිණියේයයි වැලපෙමින් යන්නවුන් දැක ඒ සිටු කුමාරයා සිතන්නේ මේ දුකින් යම්සේ ගැලවීයෙන් නම් ගෞතම බුදුන්ගේ ශාසනයෙහි මහණ වෙමි සිත සිතා යමින් සිටිකල වෛශ්‍ය ස්ත්‍රිය තමා නිසා සිටු පුත්‍රයා මරණ නියාව අසා මහා ප්‍රාසාදයෙන් බැස වධකරණ පුරුෂයා කරා ගොස් තමා දක්කවිය. ඈ දුටු පුරුෂයෝ ඈටම පාවාදී සිටු පුත්‍රයා ගැලවුනාහ. මරණින් මිදුනාවූ සිටු පුත්‍රයා වැවට ගොස් ඉස් සෝදා නහා බත් කා දෙමවුපියන් වැඳ අවසර ඉල්ලාගෙණ මහත්වූ පෙළහරින් වනයට ගොස් මහණව උපසම්පදා ලදින් නොබෝ දවසකින් විදර්ශනා වඩා රහත්වූසේක. එදවස් දම්සභාමණ්ඩපයට රැස්වූ මහළුවරුන්වහන්සේ මේ කථාව කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුණුදැයි විචාරා වදාරා අසවල් සිටුකුමාරයෝ මරණ දුකින් ගැලවී රහත්වූ නියාව කිය කියා උනුම්හයි දැන්වූකල්හි මහණෙනි නුවණැත්තෝ පළමුත් මරණ පැමිණි කල උපායෙන් ගැලවුනෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන්වහන්සේ වටු ජාතියෙහි උපන්සේක. එසමයෙහි බරණැස් නුවර ලිහිණි වැද්දෙක් වලට ගොස් වටුන් බඳාගෙණ ගෙයි තබා ගොදුරා ලා අනුන්ට මිලයට දෙන්නේය. එක් දවසක් බෝධිසත්වයන් වහන්සේ වැද්දහු දැමූ දැලට අසුව උගේ ගෙට අවුත් උගෙන් ලූ ගොදුරු දැක ඇඟ මහත්වීනම් නපුරැයි සිතා ගොදුරු නොකා ඇඟ දුර්වල කොට ඒ වැදිත් බෝධිසත්වයන් ගොදුරු නොකන්නේ කුමක් නිසාදෝහෝයි සිතා අල්ලෙහි තබාගෙණ බලමින් සිටි කලට උගේ ප්‍රමාදයක් බලා පවනටබඳුවූ වේගයෙන් වනයට පලා ගියාහ. බන්ධු වටුවන් විසින් මෙතෙක්දා පමාවූයේ ඇයිදැයි විචරන්නා වැද්දෙකුට අසුව ගැළවුනු මාන කීවාහුයයි වදාරා දෙකල් ගළපා මේ වට්ටක ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි වටුව උපන්නෙම් තිලෝගුරු බුදුවූ මම්ම යයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# අකාලරාවි ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා වහන්දෑ දෙනමක් කළමනා වත්පිළිවෙත් කළමනා වේලාවට නොකොට රාත්‍රියෙහි නිදිවූ කලත් යෙහෙන් පිබිදීමක් නැතිව පිබිදිනා කල මහත් කොට ඝෝෂාව පවත්වා පුබුදිනා හෙයින් ස්වමීපයෙහි වැදහොත් වහන්දෑ රාත්‍රියෙහි නිදි නැතිව හිඳිනාසේක. මේ කථාව දම්සභාමණ්ඩපයෙහි රැස්වූ මහළුවරුන් වහන්සේ විසින් කියමින් උන්කල්හි සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි විචාරා වදාල කල්හි අසවල් නම අකාළරාවිවූ නියාව කිය කියා උනුම්හයි දැන්වූකල්හි මහණෙනි මොහු දැන්මතු නොවෙයි පළමුත් අකාළරාවී වූවෝ වේදැයි වදාරා ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ කුලයක ඉපද උගතමනා ශිල්ප ශාස්ත්‍ර නිමවා දිසාපාමොක් ආචාරීව පන්සියයක් අතවැස්සන්ට ආචාරීව වසන්නාහ. එසමයෙහි අතවැස්සන්ගේ කල් නොවරදවා හඬන කුකුළෙක් ඇතිවූ නිසා ශිල්ල ශාස්ත්‍ර වේලාවට පිරුවති. ශාස්ත්‍ර නොපිරිහෙලා ඉන්නා අවදියෙහි ඒ කුකුළා කල්යාමකින් නැසී ගියහ. එක් ශිෂ්‍යයෙක් සවසානභූමිය කෙරේ බැද්දක දර කඩා ගියේ එක් කුකුළකු අල්වා ගෙණවුත් මැදිරියක ලා පෝෂ්‍යය කෙරෙති. එසමයෙහි ඒ කුකුළා අඬන කල මධ්‍යම රාත්‍රියෙහි ඇඬූ කල්හි ශිෂ්‍යයෝ පිබිද ශිල්ප ශාස්ත්‍ර පිරිවන්නට නැගීසිටි කලට වේලා බෝ විසින් නිද නිදා පිරිවීමෙන් වනපොත් කළ දෙයත් පිරිහෙයි. අළුයම් වේලේ හැඬූ කල මඳ විසින් තිබෙයි. මේ දෙකාරණයෙන්ම ශිල්පය පසුබසිනා බව දැක සිතන්නාහු මේ කුකුළා ඇඩීමෙන් අමුතුම ශිල්ප උගන්නා තබා පළමු කළදෙයත් අපවත් වෙයි සිතා ඌ මරා එපවත් ආචාරීන්ට කීහ. ආචාර්‍ය්‍ය මවුපියන් නැතිව ආචාර්‍ය්‍ය ගුරු කෙනෙක් නැතිව ව්‍යසථිත වෙන කෙනෙකුන්ගේ පණත මේ කුකුළාසේමයයි කියා ශිෂ්‍යයන්ට අවවාද දී කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා දෙකල් ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කල්වරත් නොදන අඬන කුකුළා නම් පිබිදීම ව්‍යවස්ථිත නොවන මහණය, ශිෂ්‍යයෝ නම් දැන් මේ බුදුපිරිසය, ආචාරීව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාරා මේ ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# බන්ධනමොක්ඛ ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි චිඤ්චමානවිකාව නිසා මේ ජාතකය වදාරණ ලද එහි වර්තමාන කථාව වාදස නිපාතයෙහි මහාපදුම ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ට ප්‍රියවූ බෝධිසත්වයන් වහන්සේ පුරෝහිතව උපන්සේක. ඒ රජහට පියව අගමෙහෙසුන් බිසෝ කෙනෙක් ඇත්තාහ. රජ්ජුරුවෝ ඒ බිසවුන් කෙරෙහි අධික වූ ප්‍රේම ඇතිහෙයින් තොප කැමති වරයක් ගණුවයි කියන්නා එවිට බිසව් කියන්නේ තෙල කුමක් අඩු හෙයින් ඉල්වම්ද අන්‍ය ස්ත්‍රියක රාග චිතතයෙන් නොබැලුවහොත් ඒ මට වරයයි කියන්නා රජ්ජුරුවන් වහන්සේ විසින් සොළොස් දහසක් පුරඹගනාවන්ද ඉන්දදී එබඳු වරයක් දෙන්ට බැරියයි කීව බිසවුන් තත්පරව නැවතත් ඉල්වන හෙයින් බිසවුන් බස ඉක්මවා යා නොහෙන රජ්ජුරුවන් වහන්සේ විසින් වැරදී එතැන් පටන් අන්‍ය ස්ත්‍රියක රාග මිශ්‍රව නොබලා දවස් යවන කල්හි පසල් ගමක සතුරන්ගෙන් භයක් පැමිණ ඒ රට උන් අමාත්‍යයා විසින් කීපවරෙක සටන් කොටත් ජය ගතනොහී එපවත් රජ්ජුරුවන්ට කියා යවීය, රජ්ජුරුවෝ ඒ අසා සිව්රඟ සෙනග රැස් කරවා සටනට නික්මෙමින් සිටි අග්‍රමෙහෙසිකා බිසවුන් ගෙන්වා සටන් නම් චපල භයක් පැමිණියක් ස්ත්‍රීන් ජාතිය හැරගෙණ වහා ගැළ වී ගත නොහැක්ක. එසේ හෙයින් තෙපි රඳවයි කියන්නා නොපිළිවන එම් කීය, තත්පරවත් රජ්ජුරුවන් විසින් රැඳුනුමනාමයයි කියන විසින් එසේවීනම් යොත්නෙන් යොත්නමා විචාරා එවන්ට උවමැනවැයි කියන්නා යහපතැයි කියා බිසවුන් රඳවා නුවර රැකවල් ලවා පුරෝහිත බමුණන්ට පාවාදී නික්ම යොත්තෙන් යොත්නය එකක නියායෙන් මෙහෙවරකරන්නන් ආකළ තොපි ආවෝ ඇයිදැයි බිසව විචාරා සුවදුක් විචාරන්ට ආම්හයි කියන්නා එසේවීනම් මෙසේ එවයි කියා උන් හා සමග ලොකසවාදරතියෙන් යෙදී යවන්නාහ, මෙම නියායෙන් දෙතිස් යොදුන් මාර්ගයට රජ්ජුරුවන් විසින් එවන ලද දෙතිස් දෙනාද යුද්ධයෙහි ජයගෙණ එන ගමනේ එවන ලද දෙතිස් දෙනාදයි කියා මෙසේවූ සැටදෙනා හා සමග සංවාසය කළහ, එකල්හි රජ්ජුරුවෝ නුවර සමීපයට අවුත් ජය කඳවුරු ස්ථානයෙහි හිඳ තමන් ආ පවත් බෝධිසත්වයන් වහන්සේට කියා යවූකල්හි පිටිනුවර සරහා අනතඃපුරයට ගොස් එපවත් බිසවුන්ට කියන්ට බිසෝ ගෙට ගියාහ, බිසව් බෝධිසත්වයන්ගේ යහපත් රූපශ්‍රීය දැක පිළිබඳ සිතින් මෙසේ අවුත් යහන පිට ඉඳුවයි කීහ, එබසට බෝධිසත්වයන් වහන්සේ විසින් ඇයි දේවීන් වහන්ස රජ්ජුරුවන් වහන්සේ ඉතා රූපත්සේක. පරලොවටත් බයිම් කියන්නා රජ්ජුරුවන් විසින් එවන ලද සූසැට දෙනානියාවට තොපම රජ්ජුරුවන්ටත් පරලොවටත් බාගියාදැයි කියන්නා මේසා මහත්වනතුරු පර ස්ත්‍රියයක මුහුණත් රාග වශයෙන් නොබැලීම්. මෙබස් මා කණ එලන්ට එපයි කියන්නා එසේ වීනම් රජ්ජුරුවන්ට කියා තාගේ හිස කප්පම් කියන්නා 'එක ජාතියක තබා දහසක් ජාතියේ හිස් කප්පතත් එසේවූදෙයක් නොකරම්' නික්මුණුසේක. බිසවු ඇඟ නබ ගෙණ තෙල් වැටුණු ශරීරයෙන් කිළුටුව වස්ත්‍රයක් ඇඳ ලෙඩ වේසයක් මවාගෙණ ශ්‍රී යහන් ගබඩාවෙහි වැදහොත්සේක. ස්ත්‍රීන්ට කියන්නාහු රජ්ජුරුවන් වහන්සේ ඇවිත් මා විචාළොත් ලෙඩ නිසා කියවයි කියා වැදහොත්තාහ, බෝධිසත්වයන් වහන්සේ රජ්ජුරුවන්ට පෙර ගමන්කොට රජ්ජුරුවන් දුටුසේක. රජ්ජුරුවෝ මහා පෙළහරින් නුවර පැදකුණුකොට රජගෙට අවුත් බිසවුන් නොදැක කොයිදැයි විචාරා ලෙඩනියාව අසා ශ්‍රී යහන් ගබඩාවට ගොස් බිසවුන්ගේ පිට පිරි මැද සුවදුක් කීම්දැයි දෙතුන්වැනිව විචාරන්නා කරකැවී බලා නොනැසී නුඹවහන්සේත් ආනියාවේද අපිත් සස්වාමික නියාවේදැයි කියන්නා රජ්ජුරුවනුත් ඒ කීම්දැයි විචාරනලදුව පුරෝහිත බමුණන් විසින් තමා කීවා නොකළ විසින් මට කළදැයයි කියන්නා රජ්ජුරුවෝ වහා උදහස්ව මාලිගාවෙන් පාතට බැස එතන සිටි සේවකයන්ට පුරෝහිත බමුණා පිටිතලගයා බැඳ ගෙණගොස් මරාපියවයි මෙවර කීහ.

එපවත් ඇසූ රාජ පුරුෂයෝ බෝධිසත්වයන් පිටිතලහයා බැඳගෙණ වද බෙරගස්වාගෙණ මරන්ට නික්මුණාහ. එවිට බෝධිසත්වයෝ සිතන්නාහු බිසවුන් විසින් වූ දෙයක ප්‍රඥාවනම් මෙසේවූ දුකක් පැමිණිවේලේ ගැලවෙන්ටයයි සිතා රජ්ජුරුවන්ට පාවාමිසක් නොමරවයි කියන්නා මරන්ට ගෙණ යන තොප කීම්ද පාණෙයයි කියන්නා රජ්ජුරුවන් වහන්සේ ගෙන් මා නිසා නිධාන කරණ ලද බොහෝ සම්පත් ඇත, එසේ විසින් මා මැරුවොත් රජ්ජුරුවන් වහන්සේට බොහෝ අලාභවන්නාහ. ගෙණ ගොස් රජ්ජුරුවන්ට පෑහ, රජ්ජුරුවෝ දැක බමුණ භය ලජ්ජා නැතිව තා කළේ කුමක්දැයි කියන්නා දේවයන් වහන්ස එසේවූ දෙයක් මම නොකළෙම්. තවද නම දන්නා තැන් පටන් ඉකිනිය කසා ප්‍රාණඝාතයකුත් නොකෙළෙම්. අනුන්ගේ වස්තුවකින් තණකොන්දක්සාත් අදත්තා දානයක් නොගත්තෙමි. පරස්ත්‍රීන් රාග චිතතයෙන් කර ඔසවාත් නොබැලි චිරීම් කෙළි පිණිසත් බොරුවක් නොකිව්රීම්, තණ කොන්දකින් ගලලාත් රාපෙණත් නොබීව්රීම්, දෙහ කළෝ මෙහෙවර එව් සූසැට දෙනාමය, මාත් එතනට අල්ලන්නාම එලෙස නොකළෙම්යි කී විසින් මේ මට කරවූදෙයයි දැන්වූහ. එපවත් අසා රජ්ජුරුවෝ සූසැට දෙනා ගෙන්වා බිසවුනුත් ගෙන්වා බිසවුන් අතින් සැබෑදැයි විචාරා සැබවයි කී විසින් කළෝයයි කියා උනුත් ගලවා උන් උන්ගේ ස්ථානානතර වල සලස්වා ස්ත්‍රීන්ට නම් තිබීම ආදෙයකැයි බිසවුනුත් ගළවා ගිහිගෙයි සිටියෙන් වේද මේසා අවුලත් වූයේයයි සිතා නෑයන් විසින් හැඬියදී බොහෝ සම්පත් හැර හිමාල වනයෙහි මහණව පඤ්චාභිඥා අෂ්ට සමාපතති උපදවා බඹලොව ගියාහයි වදාරා එසමයෙහි බිසවුනම් චිඤ්චමාණ විකාවය එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය, පුරෝහිත බ්‍රාහ්මණ උපන්නේ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි වදාරා මේ බන්ධන මොකඛ ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

## කුසනාලි ජාතකය

තවද එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අනේ පිඬුමහසිටාණන් මිත්‍රයෙකු නිසා මේ ජාතකය වදාරණ ලද යටකියන ලද කාලකන්නි ජාතකයෙහි කියන ලද ක්‍රමයෙන් මයයි දත යුතුයි.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධි සත්වයන් වහන්සේ මඟුල් උයන මඟුල් සල්ගස වන දේවතාවා හා සමග විශ්වාස වැලුප් පඳුරෙක වාසය කරණ සේක, එසමයෙහි බරණැස් රජ්පුරුවෝ එක සතම්භ මහා මාලිගාවෙක වාසය කරණසේක, එසමයෙහි ටැඹ සෙලවෙන, ඒ රජ්පුරුවෝ වඩු ආචාරීන් ගෙන්වා එක් සත් මහ මාලිගාවෙහි පළමු කප උදුරවා ඇර කපක් අමුතුව ඉඳුවයි කී විසින් ආචාරීවරු ගසක් බලා නොදැක උයනට ගොස් උයන මඟුල් සල් ගස මිසක් අනික් ගසක් නොදැක ඒ ගොසින් රජ්පුරුවන් වහන්සේට කීහ. රජ්පුරුවෝ එසේ උවත් කපා එව ඉඳුවයි කී විසින් වඩු ආචාරිවරු ගස ළඟට ගොස් බලි පූජා කොට සෙට ගස කපම්හයි කියා දේවතාවන් අනික් ගසකට පලායන්ට ආරාධනා කළහ. දේවතාවානෝත් තමන් ඉන්ට අනික් ගසක් නොදැක තමන්ගේ දරුමල්ලන් වැලඳ හඬන්ට වන්නාහ. එසමයෙහි දුක් සුව විචාරන්නට ආවාවූ වනදේවතාවෝත් අඬන්ට වන්හ. එසමයෙහි වැළුප් පඳුරෙහි වසන දේවතාවත් එතනට අවුත් අඬන කාරණා විචාරා ගසට සෝක නොකොට වදාළ මැනව. නුඹ වහන්සේගේ වෘක්ෂය මම ගලවමි කියා අස්වසා දෙවෙනි දවස් ගස කපන්ට වඩුවන් ආවේලා කටුසුවෙසක් මවා ගෙණ බල බලා සිටියදී ගස මුල් අස්සට වැදී අස්සෙන් යන්නාක් බඳුව ශාඛාග්‍රයෙන් පෙනුනාහ. එසේවූ අර තරවූ ගස බෝධිසත්වයන්ගේ උපායෙන් නිස්සාරත්වයට පැමිණියෝය, වඩුවෝත් ඒ දැක අරය ඇති ගසෙකැයි උනුම්හ. මෙසේ නිස්සාරවූ ගසින් කම් කීන්දැයි පළා ගියාහ. ඒ ගස වසන වනෂ්පතිවූ දේවතාවා තමාගේ උපවෙනෙහි දේවතාවන්ට කියන්නේ මම් මාගේ සාක්‍යව සිටත් මගේ ගස ගලවා ගන්නා උපාය නොදන්නෙමි වැලුප් වනයේ වසන දේවතාවා විසින් වෘක්ෂය රකිණා නුවන දන්නවනැයි එසේ හෙයින් ප්‍රඥාවන්තයන් විනා නීච උත්තමයන්ගෙන් කම් කීම්දැයි බණ කියා තමන් හා වැලුප් වනයේ දේවතාවානන් හා විස්වාස හිඳ කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. එසමයෙහි වන දේවතා නම් ආනන්ද ස්ථවිරයෝය. වැලුප් වනයේ දේවතාව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාරා මේ කුසනාලි ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# දුමෙමධ ජාතකය

තවද රජගහ නුවර නිසා වේළුවනාරාමයෙහි සර්වඥයන් වහන්සේ වැඩ වසන සමයෙහි එක් දවසක් දම් සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ උන්නාවූ මහළුවරුන් වහන්සේ ඇවැත්නි දේවදත්ත ස්ථවිරයෝ බුදුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ අසූ අනු ව්‍යජන ව්‍යාමප්‍රභා ආදීවූ රූපශ්‍රී දකත් බුදුන් කෙරෙහි මෛත්‍රියක් නැතිව මෙබඳුවූ රූපශ්‍රීයක් මට ඇතිනූයේ යයි සිතා බුදුන් කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් බුදුන් නසන්ට සිතති කිය කියා කථා කොට උන් සේක. එතනට සර්වඥයන් වහන්සේ වැඩ බුද්ධාසන මසතකයෙහි වැඩ හිඳ මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තන උනුදැයි විචාරා වදාරා දේවදත්ත ස්ථවිරයෝ බුදුන් කෙරේ ඊර්ෂ්‍යා නියාව කිය කියා උනුම්හයි දැන්වූ කල්හි මහණෙනි මතු නොවෙයි පළමුත් මා කෙරෙහි ඊර්ෂ්‍යාව ඇත්තේමවේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස රජගහ නුවර මගධ නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඇත් කුලයක ඉපිද ස්වර්ග ධවලව විසිතුරු වූ රූප ශ්‍රීයෙන් අලඞකෘතව මගධ නම් රජ්ජුරු කෙණෙකුන් වහන්සේට වාහණව සිටිනා සේක, එසමයෙහි එක් දවසක් මගධ රජ්ජුරුවෝ සර්‍වාලඞකාරයෙන් සරහණ ලද මගුලැතාට ආරූඪව මහත් පෙළහරින් නික්මුණාහ. එවිට රාජ්‍යවාසීන් මගුලැතු දැක ඇතුගේ ආරෝහ පරිනාහ රූපශ්‍රීයක් හා මෙසේවූ ඇතෙකු චක්‍රවර්ති රජ්ජුරුකෙණෙකුන්ටවීනා මෙවැනි රජ්ජුරුකෙණෙකුන්ට ඇතෙක් නොවෙයි කියා ඇතුම වර්ණනා කළාහ. ඒ වර්ණනාව රජ්ජුරුවන් විසින් අසා තිරිසන් ඇතු වර්ණනා කළෝය, මා වර්ණනා නොකළෝයයි ඇතුකෙරෙහි ඊෂ්‍ර්‍යාකොට ඇතු නසන්ට සිතා රජ ගෙට ගොස් ඇත්තලයා ගෙන්වා තොප විසින් මඟුලැතු ඉඳින් කම්බස් ඇතිව ව්‍යවසථිතකරණලදදැයි විචාරා හසත්‍යාචාරියා විසින්ම ඇතු නාවා කම්බස්කරණලදැයි කීකල්හි එසේවීනම් වේපුල්ල පර්‍වතයට ඇතු නඟවයි කී කල්හි හසත්‍යාචාරියා විසින් යහපතැයි ගිව්ස ඇතු ඇරගෙණ පර්වතයට නැගී කල්හි රජ්ජුරුවෝත් අමාත්‍ය මණ්ඩලයා පිරිවරා පර්වත මුදුනට නැංගාහ. ප්‍රපාත ආසන්නව ඇතු සිටුවාබලයි කීහ. ඒ මානට ඇත්තලයා සන්කොට තුන්පයින් සිටිවීය. එවිට රජ්ජුරුවෝ පෙරවා අත්දෙක ඔසවා පස්සා පාදෙක ඔසවයි කියන්නා එලෙස ඇතු නොවැටෙන්නා නැවත රජ්ජුරුවන් විසින් පෙරවා අත්දෙක ඔසවා සිටුවයි කියන්නා එලෙසත් සිටිවිය. පසුව එකපයකින් සිටුවා බලවයි කියන්නා එලෙසටත් සිටිවිය. මෙලෙස කොටත් ඇතු නොවැටෙන්නා එවිට රජ්ජුරුවෝ කියන්නෝ ඇතුන්ගේ සතර කකුලම ඔසවා ප්‍රපාත දිසාවට මෙහෙයාලවයි කීහ. එවිට ඇත්තලයා සිතන්නේ රජ්ජුරුවන් වහන්සේ විසින් ඇතු නසන්ට ප්‍රයෝගයක් වනැයි සිතා ඇතු කන්තල දිසාවට කරනමා කියන්නේ පින්වත් ඇත් රජ්ජුරුවෙනි තොප නසන්ට උත්සාහ කරණසේක. එසේහෙයින් තටපිළිවන්වීනම් ආකාශයට නැගී බරණැස් නුවරට පළායවයි කීහ. ඒක්ෂණයෙහිම පෙර කරණ ලද පින්බලයෙන් පහළවන ලද ඍඞියෙන් පුළුන් පෙදක් ආකාශයට පැන නැංගාක් මෙන් පැනනැන්ගේය. එවිට ඇත්තලයා ඇතු පිටට පැණ හිඳ කියන්නේ නුඹ වහන්සේ වැනි පින්මද රජ්ජුරුකෙණෙකුන්ට පහළවන ඇතෙක් නොවෙයි එසේ හෙයින් නුඹ වහන්සේ වැනි නිවට රජ්ජුරුකෙණෙකුන්ට වාහණයට නොනිසිය, නුඹ වහන්සේට සිටිනේයයි කියා බරණැස් නුවරට නැගී ගොස් රජ්ජුරුවන්ගේ රාජාගණ සමීපයෙහි සිටියේය, ඒ දුටු නගර වාසීහු මහත් සන්තෝෂයට පැමිණ ඔබගොස් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් වහා එතනට ගොස් ඇතු දැක මහත් සන්තෝෂයෙන්ම මානිසා මටපිටදෙන්ට ආ ඇතෙක් වීනම් බිමට බසීවයි ආරාධනා කළාහ. එවිට ඇතු බිමට බටුයේය. ඒ වේලෙහි ඇත්තලයා ඇතු පිටින් බැස රජ්ජුරුවන් විසින් දරුව ඇතු ඇරගෙන කුමක් නිසා අවුදැයි විචාරන්නා තමා ආ ගිය ලෙස තත්වූ පරිද්දෙන් කීකල්හි තා කළසේ යහපතැයි කියා සමාධිව නුවර සරහා ඇතු මහත්වූ පෙළහරින් මඞගල්‍යහසතිවාහරණයට පමුණුවා බරණැස්නුවර රාජ්‍යය තුන් කොටඨාසකොට ඇතුට එක්කොටඨාසයක් ඇත්තලයාට එක්කොටඨාසයක් රජ්ජුරුවන්ටත් එක් කොටඨාසයක් සලස්වා දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූපරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා එසමයෙහි බරණැස් රජ්ජුරුවෝනම් සාරිපුත්‍රසථවිරයෝය, ඇත් තලයා නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි මගධ රජ්ජුරුවෝ නම් දේවදත්ත ස්ථවිරයෝය, එසමයෙහි ඇත්ව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාරා මේ දුමෙමධ ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# නගුලිස ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කාළුදායි තෙරුන්වහන්සේ උපාසකවරුන්ට බණ වදාරා ප්‍රස්තාව බලා වදාරන්ට නොදන්නා විසින් මඟුල් පැමිණි තැනදී බණ වදාරන්ට ආරාධනා කළ කල අවමඟුලට සුදුසු බණ වදාරණ සේක. අවමංගල්‍ය ස්ථානයකදී බණ වදාරන්ට ආරාධනා කළ කල්හි මංගල සූත්‍රාදී බණ වදාරණ සේක. මේවූනියාවෙන් ප්‍රසථාවට නොනිසිකොට කාළුදායි තෙරුන්වහන්සේ බණ වදාරණ නියාව දම්සභාමණ්ඩපයෙහි රැස්ව උන්නාවූ සංඝයා වහන්සේ කිය කියා උන් සේක. එතනට බුදුරජානන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුම්දැයි විචාරා වදාළ කල්හි කාළුදායි තෙරුන්වහන්සේගේ නුවණ මද නියාව කිය කියා උනුමහයි දැන්වූහ. මහණෙනි දැනමතු නොවෙයි පළමුත් නුවණ නැත්තෝම වේදැයි වදාරා ආරාධිත වූ බුදුරජානන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේ ද යත්?

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ දිසාපාමොක් ආචාර්‍ය්ව සියළු මනුෂ්‍යයන්ට සිල්ප දෙමින් වාසය කරන්නාහ. එසමයෙහි පොහොසත් කෙණෙක් ශාස්ත්‍ර උගන්නාහ. දුඃඛිත කෙනෙක් බැලමෙහෙකොට ශාස්ත්‍ර උගන්නාහ. එසමයෙහි නුවණ නැති දුඃඛිත පුරුෂයෙක් දිසාපාමොක් ආචාරීනට බැලමෙහෙකොට ශාස්ත්‍ර උගන්නේය. ඒ තෙම එක්දවසක් ආචාරීන්ගේ පය මැඩ මැඩ උන්කල්හි ආචාරීන් පාමුල් කකුල් දෙක රැකුල්ලවයි කියන්නා යහපතැයි කියා එක පයකට පත්ලා අනික් පයට රැකුල් නැත්තෙන් තමාගේ කලවය මත්තේ ඇඳකකුල තබා තුන්යම් රාත්‍රියෙහි ඉඳ පාන්කෙළේය. උදාසනක්සේ ආචාරීන් නැගීසිට උන්ලෙස බලා කම්පාවූවාහු වාලක් පරිද්දෙන් මෙබඳු දුක් ගෙණෙත් ශාස්ත්‍රයක් ඉගෙණ ගතනොහෙයි, එසේහෙයින් පණ්ඩිත කරවාගන්ට උවමැනවැයි සිතා මූ අතින් දවස්පතා දුටු දුටු දෙය තමන්වහන්සේට සලස්වා එකීකල මීට උපමා කෙසේදැයි විචාරා කාරණා නොවරදවා උපමා කීපයක් නොවරදවා කී නම් නුවනැති කර ගණිම් සිතා ඔහු ලඟට කැඳවා තොප විසින් දර පළා ගෙණෙන්ට ගිය තැන දුටු දෙයක් ඇත්නම් කියවයි කීහ. එසඳ යහපතැයි කියා එක්දවසක් බැද්දට ගියේය. එක්තරා සර්පයෙකු දැක එපවත් ආචාරීන්ට කීහ. ආචාරී ඒ අසා සර්පයා කුමක්වැන්නදැයි විචාළහ. එවිට කියන්නේ නගුලිසක් වැන්නේයයි කීය. ඒ අසා ආචාරී සර්පයාත් දිගය නගුලිසත් දිගය එසේහෙයින් ඒ කාරණය සරියයි සතුටුවූහ. පසු දවසක් බැද්දට ගියේය. ඇතෙකු දැක අවුත් ආචාරීන්ට කීහ. ඒ ඇතුට උපමා කියවයි කියන්නා නගුලිසක් වැන්නැයි කීහ. ඒ අසා ආචාරී සොඞ උපමා කොට කීවනැයි සතුටුවූහ. පසු දවසක් උක්දණ්ඩක් ලදින් ඒ නියාව ආචාරීන්ට කීහ. ඊට උපමා කියවයි කියන්නා නගුලිසක් වැන්නැයි කීහ. එවිට ආචාරී උක්දණ්ඩත් දිගය නගුලිසත් දිගය ඒ කාරණයයි සිතූහ. පසුදවස් දන්දෙන ස්ථානයකට ගිය ගමනේදී කිරි හා සමග බත්ළුහ. ඒ බත්කා ඇවිත් ඒ සැටිය කීහ, එවිට ආචාරී තා කෑ කිරි හා බත් කුමක්වැන්නදැයි විචාළාහ. නගුලිසක් වැන්නයයි කීහ, ආචාරීන් විසින් පළමු කාරණා තුන්වන්නා සරිවේයයි මෙසේ සරිවේවයි සිතා කෙසේ උත්සාහ කළත් නුවණැත්තාහු ඇතිකරවාගන්ට බැරියයි කියා හළහයි වදාරා එසමයෙහි නුවනැති අතවැස්සා නම් කාළුසායි ස්ථවිරයෝය, දිසාපාමොක් ආචාරීව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි වදාරා නගුලිස ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# අඹ ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා කුලපුත්‍රයෙක් ලැදිව මහණවූ කළමනා වත්පිළිවෙත් මහත් පිළිවෙත් සතළිසක් හා සූක්ෂම පිළිවෙත් අසූවක් පුරාගෙණ හැමදීම් මළුහැමදීම්, පෙත්මන් හැමදීම්, ධර්මශාලා හැමදීම්, සඞසාරාම හැමදීම් හා පින්පැන් තැබීම් යනාදීන් නොකුසීතව කරණ සේක, උන්වහන්සේ වත්පිළිවෙත් කිරීමෙහි ප්‍රසන්නව උපාසකවරුන් විසින් පන්සියයක් පමණ පාත්‍ර දවස්පතා උන්වහන්සේට තිබූහ. ඒ පාත්‍ර පන්සියයක් බොහෝ දෙනා වහන්සේට ලාභවිය, මේ කථාව දම්සභාමණ්ඩපයෙහි රැස්ව වැඩඋන් මහළු වරුන් වහන්සේ කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා අසවල් නම නිසා ලාභ සත්කාර පැමිණි නියාව කිය කියා උනුම්හයි දැන්වූ කල මහණෙනි දැන් මතු නොවෙයි පළමුත් මුන් පිළිවත් වතාවත් නිසා බොහෝ ලාභ සත්කාර පැමිණියේ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත් ?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ කුලයක ඉපද පඤ්චකාමයෙහි ආදීනව දැක පන්සියයක් තාපසවරුන් ඇතිව හිමාලය වනයෙහි ගණජ්‍යෙෂටව වාසය කරණසේක. එසමයෙහි හිමාලය වනයෙහි වැසි නොවැස ලින් පොකුණුවල පැන්සිඳී සිව්පාවෝත් පැන් නොලැබ විඩාපත්ව දුක් විඳිනාහ. එසමයෙහි පන්සියයක් තාපසවරුන් අතුරෙන් එක් තාපසකෙණෙක් ගසක් කපා ඔරුවක් කැණ සිව්පාවුන්ට පැන් ඇද වත්කරන්නාහ. සිව්පාවුන් ආ ආසේ පැන් ඇද වත්කරණා විසින් පලාඵල කඩායන්ට කල් නැතිව විඳිනා ආයාස සිව්පාවෝ දැන උනුනුන් හා කථා කරන්නෝ තාපසයන්ගෙන් පැන්ගන්ට යම්හයි සිව්පාකෙණෙක් තමතමන්ට පිළිවන් යම් යම් විවර අඹ කොස් ආදීවූ දෙය ගෙණ එත්වයි උනුන්ට විධානකොට ඒ නියාවට ගෙණ දසඅටක් ගැල් පුරායන විවර දවස්පතා රැස්කරන්නාහ. ඒ රැස්කළ දෙය පන්සියයක් තාපසවරුන් බෙදා වළඳන්නාහ. ඉතුරුවූ දෙය වල දමන්නාහ. මෙපමණත් දැන බෝධිසත්වයෝ තාපසවරුන්ට අවවාද කියන්නාහු අසවල් තාපසයන්ගේ වීර්‍ය්‍යයෙන් අපි පන්සියයක් දෙනම පලාඵල පිණිස වනයට නොගොස් උන්පළම ඉඳම මිහිරි ඵලාඵල ප්‍රයෝජන විඳිම්හයි එසේහෙයින් ගෘහස්ථව උවත් ප්‍රව්‍රජිතවූවත් වීර්‍ය්‍ය කළයුතු යයි වදාරා එසමයෙහි පැන් ඇද වත්කළ තාපසයෝ නම් මෙසමයෙහි වතාවත් ව්‍යස්ථිතව කරණ ලද්දාවූ භික්ෂූහුය. ගණජ්‍යෙෂටවූ තාපසයෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාරා මේ අඹ ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# කටාහක ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පිත්තු කියන නමක් නිසා මේ ජාතකය දක්වන ලද, එහි වර්තමාන කථාව යට කියන ලද විකත්ථන ජාතකයෙන දැක්ක යුතුය යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එනුවර මහාසම්පත් ඇති සිටුව උපන්සේක. එසමයෙහි බෝධිසත්වයන් වහන්සේගේ ගෙයි පුතනුකෙණෙක් උපන්නාහුය. ඔහු උපන් දවස්ම ගෙයි කෙල්ලකගේ පුතෙක් උපන, සිටුකුමාරයෝත් කෙල්ලකගේ පුතාත් එක්ව වැඩිවිය පැමිණියාහ, සිටුකුමාරයන් අකුරු කරන්ට යන කළ තමුන් කැටුවම ගොස් ලීම් ගිණීම් ආදීවූ නොයෙක් ශාස්ත්‍ර ඉගෙණ ගත, තෙමේ නමින් කටාහක නම්විය වෙළඳාම් ආදීවූ දෙයෙහි දක්ෂය. කීමෙහි බිණීමෙහි සපන එසේහෙයින් උන්භාණ්ඩාගාරගේ බැලීමෙහි සිටානෝ සලස්වාගත්හ. එක්දවසක් කටාහක නම් කොලු සිතන්නේ ඇමදාම මට ගේ බැලීමෙහි තිරනොවන්නේය, යම්සේ මාගේ වැරැද්දක් දැක ස්වාමිදරුවෝ ලෙහිසත් ගසා වහල්මෙහෙවරට ඇරගත්තු නම් මට බොහෝ දුකැයි සිතා ඊට උපායක් කරන්ට උවමැනවැයි සිතන්නේ අපගේ සිටානන් වහන්සේට යහළුව හිඳිනා පිටිසර සිටානකෙණෙක් ඇත, උන් කරා ගොස් සිටානන්ගේ පුතනුවෝයයි කියා උන්ගේ දුවනියන් ලවා පිසවා කැන්නම් යහපතැයි සිතා සිටානන්ගෙන් ලී පතක් කොට පතක් ලියන්නේ, මාගේ කටාහක නම් පුත්‍රයා තමන්දැ කරා යවීම් තමනදැ අප හා සමාන කුල විසින් අපගේ පුතනුවන්ට තමන්ගේ දුවනියන් පාවාදෙන්ට අමුතු නැති නියාවත් ඒ නියාව දැන තමන්දැ දුවනියන් පාවාදී බොහෝ සම්පත් රැක්ක යුතු නියාවත් මමත් මෙතන කටයුතු බොහෝ විසින් නොගිය නියාවත් පසුව මා එන නියාවත් කියා සිටානන් ලියායවූ බඳුව බොරු පතක් ලියා ගෙණ සිටානන්ගේ අසමුන්දෙන් අසුන් ඔබා ගෙණ සිටානන්ගේ බලන විසින් සාන්දු සුවඳ ආදීවූ දෙයත් සිහිත් පිළිත් ඇරගෙණ පසල් සිටානන්ගේ ගමට ගොස් සිටානන් වැඳලා සිටියේය. සිටානන් කොයිසිට අව්දැයි විචාළකල්හි බරණැස්නුවර සිට ඇම් කී විසින් කාගෙ දරු කෙණෙක්දැයි විචාරන්නා බරණැස් සිටානන්ගේ පුතනුවෙමි, තී විසින් කුමක් නිසා අවුදැයි විචාරන්නා මා ආ කටයුතු පතින් දැක්ක හැකැයි කියා පත අතට දුන්නාහ. සිටානෝ පත කියවා පතෙහි අසුන් අසා සතුටුව තමන්ගේ දුවනියන් පාවාදී බොහෝ සම්පත් දුන්නාහ. එදා සිටුදූ විසින් තමාට එව් බාදපා හොදපා මල් සුවඳ ආදීවූ දෙය එලවූකල්හි ඒ දැක මෙසේවූ බත් කැන්ද මෙසේවූ පිළි අඳින් ද මෙසේවූ මල්සුවඳ පලඳින් දැයි පිටිසර ඇත්තන්ගේ කොලකම මෙසේ වනැයි කියා වෙහෙසයි එසමයෙහි බරණැස් නුවර සිටානෝ තමන්ගේ කටාහක නම් කොල්ලා නොදැක ඒ තැන මිනිසුන් යවා පිටිසර සිටානන්ගේ ගම උන් නියාව අසා රජ්ජුරුවන් වහන්සේට දන්වා අවසර ඇරගෙණ පිටිසරට නික්මුණාහ. සිටානන් පිටිසර යන නියාව ඒ ඒ තැන ප්‍රසිද්ධ විය, කටාහක නම් කොලුත් එපවත් අසා සිටානන් එන්නේ අනික් දෙයක් නිසා නොවෙයි මා ලඟටයයි සිතා සැඟවී ගියේ නම් ඒ කටයුතු නොවෙයි සිතා මෙතැන්හිම ඉඳ සිටානන් වහන්සේ ආ කල උන්වහන්සේට මෙහෙවර කොට සිත ලබා ගණිම් සිතා එතැන් පටන් තමාගේ ගෙයි මිනිසුන් ආදීවූ ඇම දෙනාට කියන කල සෙස්සන්සේ නොවෙයි අපි අපගේ දෙමව්පියන් දුටු කළ හය ලජ්ජා ඇත්තම්හ. එකසරියේ හිඳන් බත් නොකම්හ. මඬා සෝධා තිබීම්, පැන් පෙරා තිබීම්, වීල් තිබීම්, පළට පැන් තිබීම් පටන් වාල් කළමනාදෙය අපි කරන්නේමයයි කිය කියා ඉන්නා කලට ඒ සිටානෝ අවුත් ලඟ ගමෙක උන්නාහ. එවිට තෙමේ මයිලනුවන් ලඟට ගොස් අපගේ පියානන් වහන්සේ මේ ගමට වඩිනාසේක. නුඹවහන්සේ විසින් ආගන්තුක සත්කාර කළමැනවැයි සිටානන් විසින් කරණ ලද සුවදුක් කථා ඇතිව සිටානන් බත් කා ඉක්බිති පළට පැන් ඇරගෙණ ගොස් තිබා ඉක්බිතිව සිටානන්ට බිම බැස වැඳ ස්වාමීනි කළ මනා යම් මෙහෙයක් කෙරෙම් මාගේ සම්පත්තීන් පිරිනොහෙළුවමැනවැයි යාච්ඤා කෙළේය. එවිට සිටානෝත් උන්ගේ උගත්කම් නැති නියාව දැන මා නිසා තොපගේ සම්පත් පිරි නොහෙළම් කියා උන් හා සමඟ ගමට අවුත් පිටිසර සිටානන් විසින් කරණලද ආගන්තුක සත්කාර විඳ කා බී අන්තයෙහි ප්‍රියවූ කථා කොට උන්නාහ, එවිට ආගන්තුක සිටානෝ කියන්නෝ නුඹවහන්සේගේ පුතනුවන් අත පත එව් වේලේම ඒ නියාවට මම් මාගේ දුවනියන් පාවාදීකළ මනා කටයුත්තෙන් අඩුවක් නොකෙළෙම් කිහ. එපවත් සිටානෝ අසා යහපතැයි කියා එක් දවසක් තමන්ගේ යෙහෙළනියන්ගෙන් ඉස උකුණන් හරුවයි කියා උකුණන් හරවා හිඳ කියන්නාහු කුමක්ද තොපගේ ස්වාමිපුත්‍රයා ප්‍රියවාසය කෙරේදැයි කියා විචාළහ, එවිට ඕතොමෝ කියන්නී කිසිවකුටත් අමුත්තක් නැත කළ මෙහෙයකුත් ඇත්නම් කසලියයි කියා නින්දා කියන පමණක් විනා සෙසු අමුත්තෙක් නැතැයි කියන්නාවූ ආදීත් එසේමය, මෙයින් මතු බයක් කීවොත් මේ මන්ත්‍රය උගන්නා උන්ගේ මුඛය මැඩීයේයයි කියා මේ මන්ත්‍රය උගන්වා කීපදවසක් ඇතුළත එමගම රඳා නික්මුණාහ. ඒ කොලුත් ඊ ඉන්නාදාමතෙක් අනික් කෙණෙකුන්ට අවකාශයක් නොදී මෙහෙකොට නික්මුණු ගමනේත් පසු ගමන් කොට නැවත ගමට අවුත් පළමු කී නියාවටම වඩා උඬතව වාසය කරන්නාහ, එක් දවසක් සිටුදුව විසින් එලවන ලද බත් දැක මෙසේ වූ බත් ද ලබන්නේයයි කියන්නා එවිට සිටුදූ ඉදිරියේ සිට සිටානන් කී මේ ගාථාව කීහ.

SANHIDA LANKA

ඒ කෙසේද යත්?

බහුමපි සො විකත්ථෙය්‍ය අඤ්ඤං ජනපදං ගතො

අන්වා ගනත්වා දූසෙය්‍ය භුංජ භොගෙ කටාහක

මේ ගාථාවෙහි අභිප්‍රාය සිටුදූ නොදනිය කටාහකයා ගාථාවෙහි අභිප්‍රාය දැන එතැන්පටන් බැණ නොනැගී ඉඳින්නේය, ගාථාවෙහි අභිප්‍රාය නම් කෙසේද යතහොත්, තෝ අනික් දේශයක සිට මීට ආවයි කියා තෝ තාගේ

තරම් නොදනීද මේ මුරයට සිටානන් වහන්සේ නිකම් පළාගියසේකැයි කියා පසුව මුරයේ ආසේක්වීනම් තා ලෙහි සංගසා ඇරගෙණ යනසේක්දැයි කියවයි වදාරා එසමයෙහි කටාහකයා නම් මේ පිතතු කියන භික්ෂුහුය, එසමයෙහි බරණැස් නුවර සිටුවූයෙම් මම්ම යයි වදාරා කටාහක ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# චන්ද්‍රාභය ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සකස්පුර සැරියුත් සාමීන්ගේ ප්‍රශ්න නිසා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ හිමාල වනයෙහි  බොහෝ තාපසවරුන්ට නායකව ඉඳ පිරිනිවන් පාණ දවස් තාපසවරුන් විසින් ලඟට අවුත් කුමණ සෘඬියෙක් පැමිණියේදැයි විචාරන්නා චන්ද්‍රාභායං සුරියාභායං කියා පරලොව ගියාහ. එවිට ජ්‍යෙෂ්ට තාපසයන් විසින් අපගේ තාපසයන් වහන්සේ ආභසසරනම් බඹලොව උපන්සේකැයි කී විසින් තාපසවරුන් නොගිවිස්නා හෙයින් මහාබ්‍රහ්මයා එතනට අවුත් ජ්‍යෙෂට තාපසයන් කීයේ සැබෑමයයි කියා බඹලොව ගියාහයි වදාරා එසමයෙහි ජ්‍යෙෂට තාපසයෝ නම් සැරියුත් මහා ස්ථවිරයෝය, මහා බ්‍රහ්මව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මවේදැයි චන්ද්‍රාභය ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# ප්‍රථම පුෂ්පරත්න ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සර්වඥයන් වහන්සේ සකස්පුරදොරට බට සැරියුත් ස්වාමීන් වහන්සේ ප්‍රශ්න විසර්ජනය කළ නියාව යහපතැයි යන මේ කථාව නිසා මේ ජාතකය කියන ලදී.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ හිමාලය වනයෙහි බොහෝ තාපසවරුන්ට නායකව වසන්නාහුය, එසමයෙහි බෝධිසත්වයන්ගේ ප්‍රධාන අතවැස්සානම් ඔබ්බේ ගමකට වස්වසන්ට යාමේදී බෝධිසත්වයන් වහන්සේගේ මරණ කාලය පැමිණියේය, එවිට අතවැසි තාපසවරු විසින් ලඟට අවුත් කුමක්ද ධ්‍යානයක් උපදවා ගත්සේක්දැයි විචාරන්නා ආකිංචනං නත්ථිකිංචි'යි වදාරා ප්‍රාණය නිරුඬව ගොස බඹලොව ගොසින් පෙණනුසේක, එවිට තාපසවරුන් විසින් ආකිංචනං නත්ථිකිංචි යන බසෙහි අර්ථ දැනගතනොහී මිත්‍යා දෘෂ්ටීන් උපදනා බඹලොව උපන් නියා නොවේදැයි සිතා ආදාහන පූජාව මා හැඟී කොට නොකළාහ, එවිට ප්‍රධාන අතවැසි තාපසයෝ එතනට අවුත් තාපසවරුන් අතින් ආචාරීන් වහන්සේගේ ප්‍රාණය නිරුඬව යන ගමනේ කීයේ කිම්දැයි විචාරා එපවත් අසා එසේවීනම් ආභසසරනම් බඹලොව උපන්නේයයි කීහ, බෙහෝ තාපසවරුන් ඒ කීයේ බොරුයයි යන විසින් මහාබ්‍රහ්ම තෙමේ එතනටම අවුත් මාගේ ප්‍රධාන තාපසයා කීයේ ඇත්තම යැයි කියා පෙරලා බඹලොව ගියාහයි වදාරා එසමයෙහි ප්‍රධාන තාපසයෝ නම් සැරියුත් මහා ස්ථවිරයෝය, මහා බ්‍රහ්මව උපන්නේ නම් බුදුවූ මම්මයයි වදාරා ජාතසොම ජාතකය වදාළසේක.

SANHIDA LANKA

# අසිලකඛණ ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොසොල් රජ්ජුරුවන්ගේ මඟුල් කඩුව ඉඹිමින් ලක්ෂණ කියන බමුණෙක ඇත. අත්ලස දුන්න වැමියන්ගේ කඩු ගෙණවිත් පෑ කල යහපතැයි කියයි, අත්ලස නුදුන්න වැමියන්ගේ කඩු පෑ කල නපුරු කියයි, අත්ලස් කා ලක්ෂණ කියන නියාව එක් වැමියෙක් දැන ඒ නියාවට සහ පත් කඩුවක් ලක්ෂණ යුක්ත කොට තුන්සන ගහා කොපුවක් ඉදිකොට කොපුව ඇතුළත මිරිස් සුනුකොට පුරා කඩුව ඊලා ගොසින් රජ්ජුරුවන්ට පෑහ. රජ්ජුරුවන් විසින් බමුණා ගෙන්වා කඩුව පෑ ලක්ෂණ කියයි. කී විසින්  යහපතැයි කඩුව කොපුවෙන් ඇද නාසය කෙරේ තිබා කඩුව ඉඹලීය. ඒ ක්ෂණයෙහි කඩුව ඇලී තුබූ මිරිස් සුනු නාසයට වැද කිඹිසීය, කඩුව නාසයෙන් ඈත්කොට කිඹිසින්ට පමා සෙයින් කඩුව පිටම කිඹිස කප්පවාගත. ඒ කථාව භික්ෂු සංඝයා වහන්සේ කෙරෙහි සැලවීය. ඒ කථාව දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මහළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන්තැනට සර්වඥයන්වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා කඩුවේ ලකුණු කියන බමුණාගේ නාසය කැපුණු කිය කියා උනුම්හයි දැන්වූ කල්හි මහණෙනි දැන්මතු නොවෙයි පළමුත් නාසය කප්පවාගතැයි වදාරා ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේද යත් ?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ කඩුවේ ලක්ෂණ කියන බමුණෙකු ඇතිවීමද, කඩුව ඉඹ ලක්ෂණ කීම්ද, කිඹිස නාසය කපා ගැණිමද, මෙකී සියල්ලම වර්තමාන කථාව කී පරිද්දෙන්මයයි දතයුතු ඒ නියායෙන් නාසා කප්පවා ගත් බමුණන් දැක රජ්ජුරුවන් විසින් ඉටියෙන් නාසයෙන් ලවා පළමුසේම උන්ගේ ස්ථානානතරයේ සිටුව තමන්ට සේවය කරණ පිණිස සලස්වා ගත්හ. එසමයෙහි රජ්ජුරුවන්ගේ බෑණ රාජ කුමාරයෙක්ද රජ්ජුරුවන්ගේ දූ වන රාජකුමාරිකා කෙනෙක්ද බාලදා පටන් එක්ව කෙළ එක්ව වැඩි උනුන් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව වසන සමයෙහි බරණැස් රජ්ජුරුවන් විසින් අමාත්‍ය මණ්ඩලයා එක්ව හිඳ කථාකරන්නාහු මාගේ දුවනියන් ඔබ්බේ රජ්ජුරුකෙනෙකුන්ට පාවා දෙන්නායින් මට භාරය. එසේ හෙයින් රජ්ජුරුවන් දෙන්නෙකු මට සහයවන්නේයයි සිතා රාජකුමාරිකාවන් රාජකුමාරයන්ට නොපෑ වාසය කරන්නාහ. දෙන්නාම උනුන් කෙරෙහි බිළිබඳසිත් ඇති විසිනුත් වයසුත් මුහුකුරා සිටි විසිනුත් එක්දවසක් රාජකුමාරයෝ රාජකුමාරිකාවගේ කිරිමව් දැක මසුරන් දහසක් දී රාජකුමාරයෝ කියන්නෝ තොප විසින් රාජකුමාරි කාවන්රජගෙන් මෑත්කරණ උපායක් කරවයි කී විසින් ඒ මට බාරයයි කියා රජ්ජුරුවන් කරා ගොස් දේවයන් වහන්ස නුඹවහන්සේගේ දුවනියන්වහන්සේගේ ශරීරයෙහි කාලකණ්නියක් වෙසෙයි. එසේ හෙයින් ඒ කාලකණ්නි ප්‍රවාහකරන්ට උවමැන වැයි එසේ හෙයින් අසවල් තෙන සමසාන භූමියෙහිදී පිළක් බැඳ පිළපිට මිණියක් තබා මිණිය පිට ඇඳක් තබා ඇඳපිට රාජකුමාරිකාවන් ඉඳුවා ඉස්සෝදා නහවාගෙණ ආයුතුයයි කීහ. රජ්ජුරුවෝත් ඒ අසා එසේම කරවයි උන්ටම භාරකළහ. එම විට ගොස් සම් සාන භූමියට මිරිස්සුනු පොට්ටනියක් ඇරගෙණ ගොස් එක්ව ගිය මිනිසුන් ඒ ඒ තැන සඟවාපියා මියගිය මිණියක් සේ මුනින් වැද හෙව මා විසිනුත් නුඹලාට අඬක් ගසාපියා මා කැටිව රැකවලට ගිය සේවායනුත් ඇරගෙන දුවපියන්නා එවිට නුඹවහන්සේ රාජකුමාරිකාව ඇරගෙණ ඉස්සෝදා නහා ගෙටම පලා ගිය මැනවයි කියා එපවත් ගොස් රාජකුමාරිකාවන්ටත් කියා රාජකුමාරයන් විසින් එකී දවසට එකී සැටියේ ගොසින් සම්සානා භූමියෙහි වැදහොත් කලට රාජකුමාරිකාවන් හැරගෙණ සේනාව විසින් රැකවල් ලවාගෙණ නික්ම පෙරමඟදී සේනාව ඇත්තන්ටත් කියන්නී සම්සාන භූමියෙහි වැදහොත් පුරුෂයා කීපවාරයක් කිඹියපියා නැගීසිට පළමුව දුටුකෙණෙකුන් අල්වාගෙණ මරාපියයි එසේ හෙයින් තොප හැමදෙන බියපත්වයි මඟදීම කියා සොන්පලයට ගොස් කී ලෙසම රාජකුමාරයන් කිඹිසපියන්නා තෙමේ හයින් මහඬින් හඬාගෙණ ඇමටම පළමුව දිවපුව, ඒ දුටු පිරිස් ආවුද එලා මහහඬින් හඬා දිවාපුවාහ. එවිට රාජකුමාරයෝ රාජකුමාරිකාවන් ඇරගෙණ ඉස්සෝදා නහා තමාගේ ගෙට ගියහ. එපවත් රජ්ජුරුවෝ අසා සතුටුව සිතා උන්නා පැමිණියයි වහා මඟුල්කොට සරණ පාවාදී  රාජ්‍යයත් පාවාදුන්හ. එසමයෙහි කඩුලක්‍ෂණ කියන බමුණා රජ්ජුරුවන් නැගෙණහිරට පිටලා උන් විසින් නැගෙණහිරට මූණලා සිටි බමුණාගේ මුහුණ අව්ව ගැසෙත් ගැසෙත් ඉටිවිරී නාසය වැටී ගියවිට බමුණා ලජ්ජාවෙන් කරබාගත. එවිට රාජකුමාරයෝ කියන්නෝ ආචාරීනී ලජ්ජි නොවෙව, කිඹිසීම නිසා තොපට මෙයා අලාභයක් විය, ඒ කිඹිසීම් නිසා මට මෙසේවූ ලාභයක් වියයි කියවයි වදාරා, එසමයෙහි කඩුලක්‍ෂණ කියන මෙසමයෙහි කඩුලක්‍ෂණ කියන බමුණාහය, බරණැස් රජ්ජුරුවන්ට බෑණාවූ රාජ්‍යය ලත් රාජකුමාරයෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාරා අසිලකඛණ ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# කලණ්ඩුක ජාතකය

තවද සර්‍වඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කලණ්ඩුක ජාතකය දක්වනලද එහි වර්තමාන කථාවද බරණැස් සිටානන්ගේ පුතනුවන් හා කෙල්ලකගේ පුතා එක්ව අකුරුකළ නියාවද සිටානනගේ ගෙයි ගේ බැලුනියාවද, සිටානන් ලිව්වා බඳු බොරුපතක් ලියූ නියාවද, ඒ පත ගෙණගොස් පසල් සිටානන්ගේ දුවට දුන් නියාවද යන සියල්ල පළමු කියන ලද කටාහක ජාතකයෙහි පණතමයයි දතයුතු

මේ ජාතකයෙහි වෙනස නම් කටාහක නම් කොළු සිටුදුව පාවාගෙණ වාසය කරණ සමයෙහි බරණැස් නුවර සිටානෝ තමන්ගේ කොල්ලා අපවත්ව ගිය හෙයින් තමන් ගේ වසන ගිරවාට කියන්නාහු ගිරාපෝතකයෙනි තොප විසින් කලණ්ඩුකයා උන් තෙනින් බලා ඇවිත් කියවයි කියන්නා යහපතැයි නික්ම ඒ ඒ තැන්හි බලාගෙණ යන්නේ කලණ්ඩුකයා වසන ගමට අවුත් පැමිණියේය. ගිරා පෝතකයා පැමිණි දවසම කලණ්ඩුකයා සන නය කරන්ටයි ගඟට ගියේය. ගිරාපෝතකයාත් ගඟ සමීපයෙහි දිඹුල් ගසක කොලතුරේ සැඟවීගෙණ උන්නේය. කලණ්ඩුකයන් ජලක්‍රීඩාව කරණ හෙයින් සිත නොවදින්ට සිටුදුව විසින් කුළුබඩු කකාරණලද කිරි අතට දුන් කල්හි කලණ්ඩුක කිරි කටක් ඇරගෙණ කට සෝදා සිටුදුවගේ ඉස වත්කරන්නා දුටු ගිරාපෝතකයා කියන්නේ ඇයි කලණ්ඩුකයෙනි අප බැද්දේ වසන පක්ෂීන් පමණ මිසක් තොප අප හා එකගෙයි වාසය කළෝය, තොපි තොපගේ තරම්නොදනුද එසේ විසින් මෙසේවූ ජාතිසම්පන්න සිටුදුවගේ ඉසද කිරි වත්කරන්නේය, කටට ඇරගත් කිරි බීපියන පමණක් විනා නොදනිම් කීහ. එබස් ඇසූ කලණ්ඩුක සිතන්නේ ගිරවානන් දැන් මාගේ තත්වය එලියේ කිව්වොත් නපුරුයි සිතා ගිරවානෙනි මෙසේ ඇවිත් සාමීචිකථා කොට හිඳුවයි කීහ. එබස් ඇසූ ගිරවා තමාගේ තත්වය කී හෙයින්  මාගේ බොටුව මඩින්ට මූ කැන්දන්නේයයි සිතා ආකාශයට නැගී බරණැස් නුවරටම ගොසින් සිටානන්ට මේ තත්වය කීයේය. ඒ ඇසූ සිටානෝද එකියන කලණ්ඩුකයා ගෙන්වාගෙණ ආවොත් මෙසේ සලසාගත හැකිය වදාරා එසමයෙහි කලණ්ඩුක නම් මේ පිත්තු කියන භික්ෂූහුය, බරණැස් සිටානෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාරා කලණ්ඩුක ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# බිළාර ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂු කෙනෙකුන් වහන්සේ ගෙණවුත් පෑ කල්හි මහණෙනි දැන් මතු නොවෙයි පෙරත් වඤ්චා ප්‍රයෝගයෙන්ම දන්නෝ වේදැයි වදාරා ආරාධිතවූ සර්වඥයන්වහන්සේ විසින් ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත් නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ මූසිකව උපන්සේක. මහතින් ඌරු පැටියෙකුගේ ප්‍රමාණය. සියදහස් ගණන් මීයන්ට නායකව තුඹසක වසනසේක. එසමයෙහි එක කැනහිලෙක් ගොදුරු සොයා ඒ ඒ තැන ඇවිදිනේ මීයන් සමූහයා දැක යම් උපායකින් මේ මීයන් කන්ට උවමැනවැයි සිතා බෝධිසත්වයන් ගොදුරු කන්ට යන මග නැගෙනහිරට මුහුණ ලා කට දල්වා ගෙණ තුන්පයක් ඔසවා ගෙණ එක කකුලක් බිම ගසාගෙණ කැණහිලා සිටියේය. බෝධිසත්වයෝ ගොදුරු සොයා යන තැනැත්තවුන් වහන්සේ ඔහු දැක තොපි කව්රුදැයි විචාරා උන් විසින් මා ධාර්මිකයෝයයි කීකල්හි එක පයින් සිටිනේ ඇයිදැයි කී විසින් තුන්පයින් සිටියෙම් නම් පොළොව ධාරාලිය නෙහෙයි කිය කට දල්වාගෙණ සිටිනේ ඇයිදැයි කී විසින් සුලන් අනුභව කරන්ටයයි කීහ. නැගෙනහිරට මුහුණලා සිටිනේ ඇයිදැයි කී විසින් සූර්‍ය්‍ය දිව්‍ය පුත්‍රයාට සේවය කරමි කී විසින් බෝධිසත්වයෝ මූ කියන්නේ ඇත්තෙකැයි සිතා මුන් ලෙහි යහපත් ගුණයක් ඇතැයි සිතා දවසට දෙවිටක් ඇවිත් සේවය කරන්නාහ. එසමයෙහි කැණහිල් මීයන් තමාට සේවය කොට යන්නවුන් බලා හැමට පස්සේ යන මීයෙකු අල්වා ගෙණ කා කට ලේ පිස පළමු සිටි නියාවටම සිටියේය. මෙම නියායෙන් දවස්පතා මීයන් කණ විසින් කල්යාමෙන් මීයෝ අඩු වී ගියාහ. එවිට මීයෝ ගොස් බෝධිසත්වයන්ට කියන්නාහු පෙර අපි මේ තුඹස ඉඳිනේ ගැටි ගැටිය, දැන් ඉතා තුනීව ගියම්හ. ඒ කුමන කාරණාවක් බවත් නොදනුම්හ, ඒ බව දතොත් යහපතැයි කීහ. ඒ බව බෝධිසත්වයෝ අසා එසේවීනම් කැණහිලාගෙන් වන උපද්‍රවයෙක් නිසායයි සිතා එදවස් කැණහිලාට සේවයට ගොස් එනගමනේ පරීක්ෂා කරන්ට උවමැනවැයි සිතා මීයන් ඇමෝම යවා පසුව බෝධිසත්වයෝ නික්මුණාහ. බෝධිසත්වයන් නික්මෙන්නා දැක මෙතෙක් දා මීයන්ට පතින්නාසේම පැන්නේය, බෝධිසත්වයෝ ඔහු අතින් ගැලවී ඉවත පැකිල යන්නාහු බළලුන් කරණ තපස් වැන්නේයයි සිතා කරණ තපසැයි කියා තපස්කරම්හයි මෙසේ වූ වඤ්චා කෙරෙද්දැයි කියා බොටුවට පැණ කුලල කඩා කා මරාපුවාහ. ඒ දුටුවාවූ මීයෝ එතනට අවුත් කැණහිල් බල්ලාගේ මාංස එකසීම ලියා කාපුවාහා, පසුව ආ මීයෝ මොත්තමට මාංස සම්හනුවූයේය, ඔහු මරා සැපසේ වාසය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා, එසමයෙහි මීයන්ට නායකව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාරා බිළාර ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# අග්ගිදත්ත ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාරණ ලදී.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ මූසිකව උපන්සේක. එසමයෙහි එක් කැණහිලෙක් ගින්නෙන් දා ඉස ලොම් පමණක් තිබියදී සර්වාංයෙහි ලොම් දා ගියේය. එවිට හිස පමණක් රැකගත්තාවූ කැණහිල් ඡායාවෙන් තමා හිස් කුඩිඹිය පමණක් දැක කුඩිඹිය ඇති පසු ජීවත්විය හැක්කැයි සිතා බෝධිසත්වයන් ඇතුළුවූ බොහෝ මීයන් වසන තැනට ගොස් පළමු කී ජාතකය පරිද්දෙන් වැද සිටි ව්‍යවස්ථාවට බෝධිසත්වයෝ එතනට අවුත් තොපි කවුරු දැයි වදාරන්නාහු අගගික භාරද්වාජයෝයයි කියන්නා කුමක් නිසා අව්දැයි විචාරා තොප හැම රකින්ට ආමි කී විසින් අප රකිනේ කෙසේදැයි විචාරන්නා උදාසන සවස ගොදුරට යන්නවුන් හා දෙවනුව බිලයට වදිනවුන් ගැණ නියමය දනිමිය කී විසින් යහපත මයිලනුවනි එලෙස කරවයි කී විසින් එතැන් පටන් යන එන මීයන්ගේ ගණන පසාරයෙන් කන විසින් මීයෝ තමන්ගේ මීයන් අඩු නියාව බෝධිසත්වයන්ට කීහ. බෝධිසත්වයෝ එපවත් අසා එදවස් හැමට පස්සේ නික්මුණාහ. මෙතෙක්දා සේම කැණහිල්බළු බෝධිසත්වයන් වහන්සේට පැන්නේය. බෝධිසත්වයෝ වළහා ඉවත පැන තොප විසින් මීයන් රකිම් කියා මීයන් නැසූ පමණක්මයයි බොටුවට පැන කුලල සපාකා මැරූහයි වදාරා, එසමයෙහි කැණහිලා නම් දැන් මේ කුහක භික්ෂූහුය, මීයන්ට රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි මේ අග්ගිදතත ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# කොසිය ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයෙක් උපාසකව තුරුනුවන් මමායන ඇතිව වාසය කෙරෙයි එසමයෙහි ඔහුගේ ගෙයි වසන බැමිණි දුරාචාරව වාසය කරණ විසින් රාත්‍රී මානයෙහි නිදි නොලැබ දහවල් ගෙයි කළමනා කිසි කර්මාන්තයක් නොකොට වැදහෙව නිදන්නීය. බමුණා අවුත් ඇයි තොප වැදහෙව නිදන්නේ කුමක් නිසාදැයි විචාළේය. එවිට ලෙඩවීම කියන්නා කුමක් ලෙඩදැයි විචාරන්නා රැජාවෙක කී විසින් කළමනා කවරේදැයි බමුණා විචාරන්නා ප්‍රණීත ආහාරය ලබන්නා යහපතැයි කී විසින් දවස්පතා සිඟා සොයා ගෙණෙන්නේය. මේ නියායෙන් තමාගේ දවස්පතා ලත් රැජාව සන්සිඳීමක් නැති විසින් ඒ බව බුදුන්ට දන්වන නියාත් කීපදවසක් නොගිය විසින් ගඳ දුම් මල් පහන් ගත් අත් ඇතිව බුදුන් කරා ගොස් බුදුන් වැඳ පුදා එකත්පස්ව උන්නේය. බුදුහු බමුණා දැක මෙතෙක් දවස් නොආයේ ඇයිදැයි විචාළසේක. බමුණු එවිට කියන්නේ තමාගේ ගෙයි බිරින්ද රැජාවක් විසින් බෙහෙත් සපයන නිසා පමාවීමියි කියා නැවත කියන්නේ රැජාව පමණක් මිසක් සර්‍වාඞගයෙන් වැහැර ගිය කෙණෙක්වත් ශරීර වර්ණයෙන් අඩුවත් වූයේත් නැත, එසේ පමණක් මිසක් කෙතෙක් ප්‍රණීත ආහාර දුන්නත් රැජාවෙන් අඩුවක් නැත. ඊට කළමනා කුමක්දැයි සර්වඥයන් වහන්සේගෙන් විචාළෝය. සර්වඥයන් වහන්සේ වදාරණසේක් භවයෙන් ප්‍රතිච්ඡන්නතව තිබෙන හෙයින් තට නොදැනෙන්නේ පමණක් මිසක් පළමුත් ඊට බෙහෙත් කීවෝ වේදැයි වදාරා බමුණා විසින් ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ දිසා පාමොක් ආචාරීව එසියයක් නුවර කුමාරවරුන්ට හා බ්‍රාහ්මණ කුමාරවරුන් ආදීවූ බොහෝ දෙනාට ශිල්ප දී වාසය කරනසේක. එක් බමුණෙක් දිසාපාමොක් ආචාරීන් අතින් ත්‍රිවෙදය හා අක්ෂර ලිඛිත ගණිත තර්ක ව්‍යාකරණාදීවූ අෂ්ටාදශ ශිල්පයෙහි පාරප්‍රාප්ත විය. ඒ බමුණාද දවස තුන්විටක් ආචාරීන්ට සේවය කොට ශිල්ප ශාස්ත්‍රයෙහි අඩුවැඩිය අරවාගෙණ යෙයි එසමයෙහි ඒ බමුණාගේ බිරින්ද දුශ්ශීල නියාව පළමුව වර්තමාන කථාවෙහි පණතයේම බමුණා අවුත් ආචාරීන්ට කී කල්හි ආචාරී එපවත් අසා ප්‍රණීත ආහාර කැවීමෙහි කම්නැත. ගොමුදියෙහි පස්පළා කකාරා ඇරගත් පැන් හා තිකුළු තිපල් කකාළ කෂාය ඉදිකොට තඹ භාජනයෙහි වත්කොට කීපදවසක් තිබා තඹ ගඳ වෙඬරුවූ කල්හි ඒ කෂාය ගෙණ ගොස් වැලක්වත් ලනුවක්වත් ඉපලක්වත් ඇරගෙණ සිට මේ බෙත් බී රැජාව සංහිඳුවා ගනුව. එසේ නැත්නම් මාගෙන් දෙන ප්‍රණීත ආහාරය කණ බොන නියාවට ගෙයි මේවර හෝ කරවයි කියව, මෙකී දෙයකට කැම්මැලිවූනම් ඉසකේ පත අල්වාගෙණ අත තුබූ ඉපල වුවත් වේවැල වූවත් ලනුව වූවත් තුනින් එකකින් යහපත් කොට ඇන මේ නියායෙන් කරන්නා ලෙඩ සුවවෙයි කියා ආචාරී කීහ. බමුණා ගෙට ගොසින් එලෙස කරන්ටවූ දින උපාය කීවේ කවුරුදැයි විචාරන්නා ආචාරීන් වහන්සේ කීසේකැයි බමුණා කී විසින් ආචාරීන් මාගේ තත්ත්වය දත් නියාව වේදැයි සිතා එවිට මේ වධ මා විඳින්නේ ඇයිදැයි සිතා ඇඳින් නැඟීසිට කළමනා මෙහෙවර කළහ. එතැන්පටන් කරණ දුස්සීලය හැර පතිව්‍රතා ධර්මය රක්කාහ. වර්තමාන කථාවෙහිත් බුදුන් ඇසූ නියාව දැන මේ කියන බැමිණිත් තමා කරණ ලද දුස්සීලය හරණලද්දීය. එසමයෙහි දෙමහල්ලෝ නම් මෙසමයෙහිත් දෙමහල්ලෝමය, දිසාපාමොක් ආචාරීව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාරා දෙකල් ගළපා මේ කොසිය ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# අසම්පදාන ජාතකය

තවද සර්වඥයන් වහන්සේ රජගහ නුවර නිසා වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ උන්නාවූ මහළුවරුන් වහන්සේ ඇවැත්නි දේවදත්ත ස්ථවිරයෝ කෙළෙහි ගුණ නොදනිති කිය කියා වැඩඋන්සේක. එතනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාළ කල්හි දේවදත්ත ස්ථවිරයන් කෙළෙහි ගුණ නොදන්නා නියාව කිය කියා උනුම්හයි දැන්වූකල්හි මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් කෙළෙහි ගුණ නොදන්නෝම වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස  මගධ රට රජගහ නුවර මගධ නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එනුවර අසූකෙළක් සම්පත් ඇති සංඛ සිටුව උපන් සේක. එසමයෙහි බරණැස් නුවර මහ සම්පත් ඇති පිළිය නම් සිටාන කෙනෙක් ඇත්තාහ. එනුවර සිටුවරු දෙදෙන උනුන් කෙරේ විශ්වාසය දවසරනාහ. එසමයෙහි බරණැස් නුවර පිළිය සිටානන්ගේ ගෙයි සම්පත පිරිහී ගොස් දුක්ඛිතව සිතන්නාහු මාගේ යහළු සංඛ සිටානන් කරා ගොස් සම්පත් ඇරගෙණවුත් රැකෙමි සිතා තමන් හා සිටු දුවනියන් පමණක් බරණැස් නුවරින් නික්ම නැගී යන්ට වාහනයක් පමණ නැතිව පයින්ම රජගහනුවරට අවුත් සංඛ සිටානන්ගේ ගෙට වැද  දුටු කල්හි සිටානෝ කුමක් නිසා අවුදැයි විචාරන්නා දුක්ඛිතව රැකෙනමානක් නැතිව නුඹ කරා ආමි කී විසින් එවිට සංඛ සිටානන් විසින් ආයේ යහපතැයි කියා තමන්ගෙන් සතළිස් කෙළක් සම්පත් දී දැසිදස් පරිවාර සම්පත් සියල්ලත් දෙකොටසක් කොට බෙදා කොටසක් දී සත්කාර සම්මාන කොට යවූහ. කල්යාමකින් සංඛ සිටානෝත් දුක්ඛිතව සිතන්නාහු මෙසේ දුක් විඳිනා බලත් මාගේ බොහෝ සම්පතක් ඇරගෙණ ගිය පිළිය සිටානන් කරා යන්නා මටත් ප්‍රත්‍යුපකාර කරන්නෝ වේදැයි සිතා සිටු දුවනියන් හා සමග බරණැස් නුවරට ගොස් සිටුදුව ශාලාවක රඳවා තුමූ පිළිය සිටානන්ගේ ගෙදරට ගියාහ. එවිට පිළිය සිටානෝ සංඛ සිටානන් ආහයි අසා ගෙට කැඳවා යවූහ. සංඛ සිටානෝ ගෙට අවුත් දැක උනස්නෙන් නැගී සිටින්නක්වත් ඉන්නා අසුන් පැණවීම් සාමීචි කමක්වත් නොකොට කුමක් නිසා අවුදැයි විචාළහ. එවිට සංඛ සිටානෝ කියන්නෝ නුඹ දකිනා පිණිස ආමි කියන්නා එදවස් තමන්ගේ ගෙදරට දාසක් යාල රත්හැල් වැදති බැදි කෙළෙහි ගුණ නොදන්නා හෙයින් තමන්ගේ ගෙයි කොල්ලෙකු කැන්දාලා කියන්නෝ මුන් ආ ගමන සිස් නොකොට බොල් තිඹක් මුන්ගේ එකතුරුපටම මැනලවයි කියා සම්මත කොට සිටානන්ට කියන්නාහු තෙපිත් තෙල ඇරගෙණ ගොස් නවාතැනකදී පිස කාපියා මා කරා නොඅවුත් තොපගේ උටටම පළායවයි කීහ. එබස් අසා සංඛ සිටානෝ සතන්නාහු මේ බොල් තිඹ ඇරනොගණිම්දෝහෝයි සිතා නැවත සිතන්නාහු මා විසින් මිත්‍ර ධර්මය නොබිඳිනා ඒ කුමක් වේවයි සිතා බොල් තිඹ හින ලවා ගෙණ ශාලාවට ගොස් එපවත් සිටුදුවට කීහ. ඒ සිටුදුව කියන්නී නුඹවහන්සේ විකේෂ්පව සතළිස් සම්පතුත් පරිවාරත් දී බොල් තිඹ ලවාගෙණ ආයේ කුමදැයි කී විසින් උන් විසින් එෑ බොල් තිඹ ඇරනොගණිම් නම් මාගේ මිත්‍රකම් බිඳිනා හා සරිය, එසේ විසින් ගෙණාමි, ඊට තොපි කනස්සළු නොවෙයි කීවත් සිටුදූ හඬන්නීමය, පළමු සංඛ සිටානන් විසින් පිළිය සිටානන්ට පාවාදුන් ගම් ධූරයෙක් ශාලාව සමීපයෙන් යන්නේ ශාලාව ඇතුළට වැද සිටානන් හා සිටුදුවනියන් දැක දෙන්නා පයගෙණ හඬා සාමිදුවනියෙනි කුමකට හඬව්දැයි විචාරන්නා සතළිස් කෙළක් සම්පත් දී බොල් තිඹක් දුන් විසිනැයි කිවූය. එවිට කියන්න නුඹ වහන්සේ විකෂෙප නුවුව මැනවැයි කියා තමන්ගේ ගෙට දෙන්නාම කැඳවාගෙණ ගොස් ඉස්සෝදා නහවා බත් කවා තමාගෙනුත් බොහෝ සත්කාර කොට තමා හා එක්ව ආ පරිවාරයන්ටත් කියා උන් ලවාත් බොහෝ සත්කාර කරවා ඒ කියන කොලු තමාගේ රැස පරිවාරත් හැරගෙන වාසල සිට මොරගෑය. එවිට රජ්ජුරුවෝ තමන්ගේ සිටානන් හා රජගහනුවර සිට ආ සංඛ සිටානන් දෙන්නා ගෙන්වා බරණැස් නුවර රජ්ජුරුවෝ සංඛ සිටානන් අතින් විචාරන්නා තොපගේ ලඟට මුන් ගියගමනේ මුන්ට කුමක් දුනුදැයි විචාරන්නා සතළිස් කෙළක් සම්පත් හා බොහෝ පරිවාර දුනිමි කී විසින් පිළිය සිටානන් අතින් සැබෑදැයි විචාරන්නා සැබවයි කී විසින් තොප කරා මුන් ආ ගමනේ තොප දුන්නේ කුමක්දැයි පිළිය සිටානන් අතින් විචාරන්නා කරබාගත්හ. එවිට රජ්ජුරුවන් විසින් බොල් තිඹක් දුන්නෙයි කියන්නා ඇසුම්හයි කී විසින් කරබාගත්තාහ. එසමයෙහි රජ්ජුරුවන් හා අමාත්‍ය මණ්ඩලයා හා බොහෝ නින්දා කළාහ. එවිට රජ්ජුරුවෝ සංඛ සිටානන්ට කියන්නෝ මුන්ගේ ගෙයි සම්පත් එකහීම ඇරගෙණ යවයි කියන්නා දේවයන් වහන්ස අනුන්ගේ සම්පතතින් මට කාරිය කිම්ද මා දුන් සතළිස් කෙළක් සම්පත් හා මාගේ පරිවාර ඇම්මෙයි කියා ඇමම ඇරගෙණ රජගහනුවරට ගොස් දානාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා, එසමයෙහි පිළිය සිටානෝ නම් දේවදත්ත ස්ථවිරයෝය, එසමයෙහි සංඛ සිටානෝ නම් බුදුවූ මම්ම වේදැයි දෙකල් ගළපා අසම්පදාන ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# පංචගරු ජාතකය

තවද සර්වඥයන් වහන්සෙ ජේතවනාරාමයේදී අජපාල නිග්‍රෝධ සූත්‍රය වදාළසේක. එදවස් සංඝයා වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ හිඳ කථා කරණ සේක්. ඇවැත්නි සර්වඥයන් වහන්සේ විසින් අජපාල නිග්‍රෝධ මූලයෙහිදී තණ්හාය රතීය රගාය යන මාර ස්ත්‍රීන් තුන්දෙනා විශිෂ්ඨ රූ මවා ගෙණ බුදුන් පොළඹවන්ට ආ ගමනේ බුදුන් විසින් කර ඔසවා ගත් නොබලන ලද. එසේ විසින් මේ නියා රූපශ්‍රීයක් දැක වැඩහුන් නියාව යහපතැයි කියා කථා කොට වැඩහුන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා දැන් මහණෙනි මා විසින් සියලු කෙලශයන් නසා ලොව්තුරා බුදුවූ ජාතියෙහි ස්ත්‍රී වසඟවූවා කුමක්ද අපූර්වද අබුඬොත්පාදයෙහි බෝධිසත්වයන් නුමුකළ නුවණින් දවස අරණ සමයෙහි පවා ස්ත්‍රී වසඟව නුවමෝදැයි වදාරා ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ට රාජකුමාරවරුන් පන්සියයක් ඇතිවූ නියාවද බෝධිසත්වයන් ඇමටබාලව ඉපද පසේ බුදුන් අතින් කවරදා මට රාජ්‍යය ලැබේදැයි විචාළ නියාවද පසේබුදුන් විසින් සත් දවසකින් තක්සලා නුවරට ගියානම් රාජ්‍යය ලබයි කී නියාවද අමාත්‍යයන් පස් දෙනෙකු එක්ව ගොස් පඤ්චකාම තෘෂ්ණාවෙන් යකින්නට ගොදුරු වූ නියාවද බෝධිසත්වයන් පස්සේ යකින්න එලවාගෙණ ඊම ආදී ගාන්ධාර නුවර ශාලාවක වන්නියාවද ගන්ධාර නුවර රජ්ජුරුවන් නුවරට ඇතුපිටින් වඩිමින් සිට බෝධිසත්වයන් එපයි කියව කියවා යකින්න ඇරගෙණ රජගෙට ගිය නියාවද එදවස් රෑ තමාගේ යක්ෂ විමානයට ගොස් යකින්නන් ඇරගෙණ රජ්ජුරුවන් හා සියලු වාසල පටන් ඇතුළු අයගේ ජීවිතක්ෂයට පමුණුවා ඇට තිබියදී භක්ෂණය කළ නියාවද යන සියල්ලම පළමු කියනලද ගන්ධාර ජාතකය සේමයයි දත යුතුය. යකුන් පළාකල පසු දවස් ගම්මුදලිවරුන් විසින් දොරවල් බිඳ ඇතුලට අවුත් රජගෙයි තුබූ කසල දමා ශුඬකොට නුවර දිව්‍යපුරයක් මෙන් සරහා රජගෙය සුධර්මා නම් දිව සභාවක් මෙන් සරහා අමාත්‍ය මණ්ඩලයා රැස්කරවන්නාහු අසවල් ශාලාවේ උන් පුරුෂයා රාජ්‍යය කරන්ට නිස්සෝ යයි කියා ඔබ කරා ගොස් එපවත් කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නෝ රජ්ජුරුවන්ගේ පුතනු කෙණෙකුන් නැද්දැයි විචාරන්නා නැතයි කී හෙයින් ඔටුණු පැළඳ මහත් වූ පෙළහරින් නුවරට වැද දළපුඩුසේසත් නැගූ සිංහාසනාරූඪ යුවරජ සෙනෙවිරත් ඇතුළුවූ අමාත්‍ය මණ්ඩලයා පිරිවරා බ්‍රාහ්මණ පෂීත් ගෘහපති පෂීත් සමන්විත වූ සොළොස් දහසක් නාටක ස්ත්‍රී නැටීම් ගී කීම් බෙර ගැසීම් ආදීවූ දෙයින් මේඝ ගර්ජනාවක් කරන්නට වන්නාහ, පඤ්චා ඞගික තූර්‍ය්‍යනාදවයන් රකකින් නාද කෙරෙමින් ඒ ඒ තැන ඝෝෂා කරවන්ට වන්නාහ, මේ නියායෙන් බොහෝ රාජානුභාවයෙන් ඉඳ සිතන්නාහු පසේබුදුන් වහන්සේ කීපණතට හා වීර්‍ය්‍ය ධෛර්‍ය්‍යයෙන් මෙසේ ප්‍රතාපයක් ලද්දේයයි සිතා එතැන් පටන් දානාදීවූ කුසල් කොට දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා එසමයෙහි ගන්ධාර දේශයෙහි රාජ්‍යය කළ රාජකුමාරයෝ නම් බුදුවූ මම්ම යයි වදාරා මේ පඤ්චගරු ජාතකය නිමවා වදාළසේක

SANHIDA LANKA

# සසන ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද, එක්තරා භික්ෂු කෙණෙකුන් වහන්සේ පිටිසර ගමක වස්වසන්ට පළමු තුන්මස පන්සල ගිණිවැද දාගිය විසින් උපාසකවරුන්ට එපවත් කියා උපාසකවරුන් විසින් සී සාම්භ වැට බඳිම්හ යනාදී කී කී දවස්ම අවුත් කිය කියා තුන්මසම ගණය නොනැගුහ, විහාර එාසු මදහෙයින් අධිගමයක් වන්නා තබා ආලෝකයක් පමණකුත් උපදවාගත නුහුණුවාහුය, මේ නියායෙන් දවස් ඇරවස් ඉක්බිති බුදුන් කරා අවුත් වැඳ එකත්පස්ව වැඩඋන්සේක. සර්වඥයන් වහන්සේ සුවදුක් විචාරා ඇයි මහණෙනි ගිය කාරිය මුදුන් පැමිණියේ දැයි විචාරන්නෝ විහාර අඑාසුහෙයින් භාවනාකරන්ට නුවූයේයයි දන්වන්නා එාසු ගොසින් උවත් භාවනාකරන්ට එපාදැයි පෙර පක්ෂීහු පවා තමන් උන්තෙන අඑාසුහෙයින් ඔබ්බට ගොසින් වාසය කළෝවේදැයි වදාරා ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ පක්ෂීව බොහෝ පක්ෂීන්ට රජව ඉපද ගඟක් සමීපයෙහි වාසය කරණසේක, එසමයෙහි බොහෝ පක්ෂි ගඟට නැමී තිබෙන අත්තෙක ඉඳ වචීස්කරන්නාහ, උන් වසන ගස ගින්නෙන් දවන්ට උවමැනවැයි සිතා රාත්‍රියෙහි පක්ෂීන් එකසිම ගසට රැස්ව උන් වේලාවට පළමුකොට විෂධූමයක් අළේයැ ඉන් ඒ ගඟ පැන් උනුකරවා පිය දෙවෙනිව ගිණිකඳ අළේය. ඉන් දුම්කඳ පැන නැංගේය, තුන්වෙනිව අල ගිණිකඳින් නාඹතල්කඳසා ගිණිකඳ පැණ නැංගේය, ඒ දුටු බෝධිසත්වයෝ ගින්නට විරුද්ධ වු දියෙන් ගිණිකඳ පැණ නැගී අවස්ථාවෙහි අපි මෙතන ඉඳීම කාරණා නොවෙයි කීවා කරණ පක්ෂීන් ගණනක් ඇරගෙණ ඔබ්බට ගියේ වේදැයි වදාරා එසමයෙහි පක්ෂව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාරා සසන ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# ස්වර්ණහංස ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා උපාසකයෙක් ළෑනු වත්තක් කොට භික්ෂූන් වහන්සේ බොහෝ දෙනාට ළෑනු කඩා දෙන්නේය, මේච්චරටත් කඩා ගණුවයි කියා උන් ලවාම කඩවාත් යවන්නේය. භික්ෂුණී වහන්සේත් ඔහුට කියා ඔහු කීව් වරක් කපා කොටා තමන් වහන්සේ හෝ කඩාගෙණ යන සේක. උපාසකයා හෝ කඩා දෙන්නේය, මේ නියායෙන් දවස් හරණා සමයෙහි එක් දවසක් උත්සවයක් නිසා බොහෝ දෙනා ගෙට අවුත් ළෑනු කඩාගෙණ ගියාහ. ඒ වේලාවට නන්ද නම් භික්ෂුණී කෙණෙකුන් වහන්සේ ඔහුගේ ගෙට එදවස් අවුත් උපාසකයෙනි ළෑනු දෙවයි කී සෙයින් උපාසක තැනත් ළෑනු දීපියා සිටි ප්‍රස්තාවට ඉල්වූ හෙයින් නුඹ වහන්සේ මේ ළෑනු වත්තට ගොසින් ළෑනු තුනක් කඩා ගත මැනවැයි කීය, එබස් අසා තමන් වහන්සේගේ මෙහෙණින්නන් හා සමග වත්තට ගොස් ළෑනු එකසීම කඩා ගෙණ ගියසේක, එවිට උයන් ගොව්වාත් නොකියන් ඉන්ද දී මෙසේ වූ අන්‍යකෙරෙද්දැයි කියා මුරගෑය, උපාසකයාගේ සිතිවිල්ල කළ කිරුණ ඒ ඇසූ බොහෝ මෙහෙණින් වහන්සේත් උස්කොටනා කොට වදාළසේක. භික්ෂුණී වහන්සේත් උස් කොටනා කොට එපවත් සර්වඥයන් වහන්සේට දැන්වූසේක, සර්වඥයන් වහන්සේත් එපවත් අසා මහණුන් විසින් නම් දුන් දෙයක් විනා නුදුන් දෙයක් ඇරගතයුතු දැයි බොහෝ තෘෂ්ණාවෙන් අත සිටි දෙයක් නැසී යන්නේ ඔබ්බෙන් ලබන ලද දෙයක් නැත, ලත් දෙයෙහි සතුටු වීමෙන් ඔබ්බෙනුත් සම්භවෙයි අත සිටි දෙයත් තාවුරුවෙයි කියා බොහෝ කොට භික්ෂූන් වහන්සේ මෙහෙණින්නන්ට නින්දා කොට මහණෙනි පෙරත් මේ මෙහෙණින්න බහුවිතත ඇත්තීවේදැයි වදාර ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේදැයි යතහොත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ බමුණු කුලයක ඉපද දූන් තුන්දෙනා ගෙණ එකෙක් නන්දාය, එකෙක් නන්වතිය, එකෙක් සුන්දරී නන්දනීයයි. දූන් තුනදෙනෙකු ලදින් ඔබ්බේ පරකුලයෙක ලන්ට විවාහ කරන්නට පළමු මපියවූ බෝධිසත්වයන් වහන්සේ මිය ගොස් ස්වර්ණහංසව ඉපද ජාති සමරණ ඥාණයෙන් මේ හංස ජාතියට පළමුවෙනි ජාතියෙහි බ්‍රාහ්මණ කුලයෙහි උපන් නියාවත් බැමිණිය හා දූන් තුන්දෙනා අනුන්ට බැලමෙහෙකොට රකෙන නියාව දැක මාගේ පියාපත් රන්පියාපත් විසින් කැපීම් තැලීම් ආදීවූ කර්මාන්තයට නිසිව තිබෙයි එසේහෙයින් මාගේ අඹුදරුවන්ට සංග්‍රහ පිණිස මවිසින් දෙමසින් එතනට ගොස් පියාපත් එල එලා ආන්නම් යහපතැයි සිතා දවසක් තමන්ගේ ගෙට අවුත් පළයපිට උන්කල්හි දූන් තුන් දෙන විසින් තොපි කවුරුදැයි විචාරන්නා තොප ඇමට පියවූ බ්‍රාහ්මණයානෝ නම් මමය තොපට හා තොපගේ මෑණියන්ටත් සංග්‍රහ පිණිස ආමි කියා රන්පතක එලා ගියහ. මෙම නියායෙන් කීපවාරයෙක රන්පත් එලා සිටි කල්හි එක් දවසක් බැමිණි සිතන්නී තිරිසනා නම් එක් සිතක් නොවන්නාහ. ඉදිරියේ මෙතනට නොයෙමි සිතුවොත් අපට බොහෝ අලාභයයි සිතා දූන් කැඳවා කියන්නී තොපගේ පියානන් දවසෙක අල්වාගෙණ ඇඟ පියාපත් උදුරා ගනුවයි කීහ. එපවත් උන්ගේ දූන් තුන්දෙන කියන්නාහු අපගේ පියානන් වහන්සේගේ සර්වාංගය රිදෙයි අපි එලෙස නුදුරම්හයි කීහ. මෙසේ නියායෙන් කිය කියා උන් කලට හංසයා ඒ ගෙට ආවේය, එකල්හි බැමිණි කියන්නී ස්වාමි පුත්‍රයා මා කරා එවයි කියා කැඳවූ කල්හි එවිට බෝධිසත්වයන් වහා උන් කරා එන්නාම අල්වාගෙණ සර්වාංගයේ රෝමයන් උදුරා ගත්තාහ. බෝධිසත්වයන් නොමනා අභිප්‍රායෙන් උදුරා ගත් හෙයින් සියළු රන්පත් නිස්ප්‍රභාව ගියේය, බෝධිසත්වයෝ පියාපත් නැතිහෙයින් යානොහී හිම ගෙයිම උන්නාහ. දෙවෙනිව ඇවිත් වතලොම් සුදුපා ඇතිවන්නා බෝධිසත්වයන් ඇරපූවාහ, එතැන් පටන් බෝධිසත්වයෝ ගෙට නොආවිරූහයි වදාරා මහණෙනි තෘෂ්ණාවගේ අධිතත්වය නිසා යෙහෙන් සෙමෙන් ලැබ ගන්නා රන්පත් ලැබගන්ට නුවූයේ වේදැයි වදාරා එසමයෙහි බැමිණි නම් මේ නන්දා නම් මෙහෙණින්නය. එසමයෙහි දූන් තුන්දෙනා නම් මෙසමයෙහි දූන් තුන්දෙනාමය. ස්වර්ණ හංසව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මයයි වදාරා ස්වර්ණහංස ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# බබ්බු ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන කාණමාතාව ආයශ්‍රාවක නම්වූ උපාසිකාවක් ඇත්තීය. එකියන උපාසිකාව කාණමාතාවයයි කියන්ට කාරණා කින්දැයි යතහොත්, කාණ නම් දුවක් ඇත්තීය, ඈට මව් විසින් කාණ මාතාවයයි නම් කළේ කාණමාතා නම් දුවට කාණ යයි කියන්නේ ඇස කණ හෙයින් නොවෙයි විශේෂව රූ ඇති හෙයින් ඈ දුටු පුරුෂයෙක් ඇගේ රුවෙහිම තෘෂ්ණාව බැඳී අනික් ස්ත්‍රියක කෙරේ දෘෂ්ටියක් නොයෙලන විසින් කාණවූවා හා සමානයෝයයි කියා කාණාවෝයයි නම් තිබූහ. කාණ නම් දුව ඔබ්බට ඇගේ මැනියෝ පාවා දුන්හ. ඔබ්බේ කුලයක වැද ඉඳ බොහෝ දවසකින් මෑණියන් දකින්ට මෑණියන් කරා අවුත් දැක උන් ලඟ වැද ඉඳ නොඑන විසින් උන්ගේ ස්වාමි පුත්‍රයා කියා යවන්නේ කාණාවන් දකිනා බොහෝ අභිප්‍රා ඇත්තෙම් වහා එන්නේයයි කියා යවූහ, එපවත් අසා කාණාවෝ තමන්ගේ මැනියන්ට එපවත් කීවාහ. එපවත් කාණාමාතාවෝ අසා ස්වාමි පුත්‍රයා දකින්ට යන ගමන සිසතින් යාම නපුරුයයි කැවුම් ආදීවූ දෙය පිසවා ගෙණ යායුතුයයි පණත් කළාහ. ඒ අවස්ථාවට වහන්දෑ නමක් සිඟා වැඩිසේක. සෝවාන් උපාසිකාවන් විසින් ගෙයි කැවුම් තිබෙද්දී නැතැයි කියන්ට කාරණා නොවන හෙයින් පාත්‍රය පුරා කැවුම් පිළිගැන්වූහ. ඒ භික්ෂූන් වහන්සේත් අනික් සිඟායෙන භික්ෂුකෙණෙකුන් වහන්සේ දැක උන්වහන්සේට කියනසේක්. කාණාමාතාවන්ගේ ගෙයි කැවුම් ඇත. ඔබ්බට යවයි කීසේක. එපවත් අසා ඒ ගෙට ගොස් පාත්‍රය පුරා කැවුම් ලබාගෙණ අනික් නමකට කීසේක. ඒ නම අනික් නමකට කීසේකැයි කියා මේ නියායෙන් සතර නමකට පාත්‍රා පුරා දීමෙන් කැවුම් නිමා ගියේය.

එසේහෙයින් කාණාව ඒ මුරයේ යන ගමන් තිබා දෙවෙනි වලියේත් ස්වාමිපුත්‍රයා අවමැවනැයි කියා යවන්නා මුරයේත් ගමනට පිසූ කැවුම් එම භික්ෂූන් වහන්සේම පිළිගත් හෙයින් ගමනට බාධාවූ හෙයින් ඔබ්බෙන් කුල ස්ත්‍රියක් ගෙණාහ, එපවත් කාණාවෝ අසා බොහෝ විකේෂ්පව අඬන්ට වන්නාහ. කාණාමාතාවෝත් විකෙෂපවූහ, එපවත් සර්වඥයන් වහන්සේ දැක කාණාමාතාවන්ගේ ගෙට අවුත් උන් විසින් පණවන ලද බුධාසනමසතකයෙහි වැඩහිඳ උපාසිකාවෙනි තොපගේ දුව අඬන්නේ ඇයිදැයි විචාරා එපවත් අසා ඊට සුදුසු බණ වදාරා උන්ගේ සෝකනිවා ජේතවනාරාමයට වැඩි සේක. එදවස් සවස දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මහළුවරුන් වහන්සේ අසවල් භික්ෂූන් සතර දෙනා නිසා කාණාවන්ගේ ගමණටත් බාධාවීයයි ආයශ් උපාසිකාවන්ටත් බොහෝ විකෙෂපයයි කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා මහණෙනි දැන් මතු නොවෙයි පෙරත් මෙකියන භික්ෂුහු සතර දෙනා විසින් කාණාමාතාවන්ගේ ලාභය උදුරා ගෙණෙන ලදැයි වදාරා ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාරණලදී.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ගල්වඩු කුලයක ඉපිද ගල් වඩුවන්ට ආචාරීව දවසරිනාසේක, එසමයෙහි සතළිස් කෙළක් සම්පත් නිධාන ගතව තිබෙන්නාවූ පිටිසර සිටාන කෙණෙක් නැසී ගියාහ. උන්ගේ බැදෑනියෝ මිය ගොස් සම්පතෙහි ගත්තාවූ ආසාවෙන් නිධාන භූමියෙහි තුඹසෙක මූසිකා ධෙනුව උපන්නාහ. ඒ අවස්ථාවට බෝධිසත්වයෝ ඒ පාළු ගමට අවුත් ගල් පළා ඉන් කර්මාන්ත කොට ජීවත් වන්නාහ, දවස්විටක් බෝධිසත්වයන් ඒ ගමට එන හෙයින් මූසිකා ධෙනුව බෝධිසත්වයන් කෙරෙහි සෙනහ උපදවා ගෙණ මාගේ සතළිස්කෙළක් සම්පත් ඇත, ඒ සම්පත් ඒ සත් පුරුෂයාට දී මමත් ප්‍රයෝජන විඳිමී සිතා එක් දවසක් කෂීපණයක් කටින් ඩැහැගෙණ අවුත් බෝධිසත්වයන්ගේ පාමුල එලාළුව බෝධිසත්වයෝ මේ කීමෙක්දැයි කීහ. මූසිකාව විසින් මේ රත්තරන් නුඹ වහන්සේ විසින් ඇරගෙණ මට රත්තරන් සතර වියටෙක දඩමස් ඇරගෙණ ඉතිරිවා ප්‍රයෝජනගත මැනවැයි කීහ.

ඒ නියාවට දවස්පතා කෂීපණයක් මී දෙන්නීය බෝධිසත්වයෝ රත්තරන් සතර විටටෙක දඩමස් ඇරගෙණ ලා මේ නියායෙන් දවස් අරණා සමයෙහි එක් බළලෙක් ගොදුරු සොයා ඇවිදිනේ මූසිකා ධෙනුව දැක අල්වාගත, එවිට මූසිකාව කියන්නී මා ඇරපියාවයි කීය. ඊට බළල් කියන්නේ ගොදුරු සොයන්නෙමි කී විසින් මා ඇල්එයේ කුමටදැයි විචාරා මාංස කන්ටයයි කී විසින් එකදා කණමාංසය යහපත්ද ඇමදාකණමාංසය යහපත්දැයි විචාරන්නා හැමදා කණ මාංසය ලැබේ නම් යහපත්වෙයි බළලා කියන්නා එසේවීනම් මා ඇරපියන්නා දවස්පතා මාංස ලබමි මූසිකාව කී විසින් අසා බළලා කියන්නේ යහපත ඒ නියාවට මස් දෙවයි පමාවූ දවසෙක දන්නෙම් වේදැයි භය ගන්වා අලහ. එතැන්පටන් මූසිකා ධෙනුව තමා ලත් මාංස දෙකොටසක් බළලාට කොටසක්දී කන්නීය, මේ නියායෙන් අනික් බළලෙක් ඇල්විය උන්ටත් මාංස කොට්ඨාසයක් දෙන නියායෙන් කියා ගැලවුනාහ. මේ නියායෙන් බළලුන් සතර දෙනෙකු ඇල්වූ ගමනේ සතර දෙනාම මේ නියායෙන් ගිවිස තමා එකතැනැත්තිය බඩපුරා මාංස පස් කොටසක් කොට සතර කොටසක් බළලුන්ටදී තමා කොටසක් කණ හෙයින් බඩපුරා කන්ට නොලත්තීය. දවසින් දවස දුර්වලභාවයට පැමිණියාහ. එපවත් බෝධිසත්වයෝ දැන මෙසේවන්ට හේතු කවරේදැයි විචාරා එපවත් අසා මෙතෙක් දවස් මට නොකීවේ ඇයිදැයි කියා විචාරා ඒ නියාවට දෑවාන ගුහාවක් ඉදිකොට ඉන්ට සලස්වා තී විසින් මස් ඉල්ලා ආ බළලුන්ට පරිභව බණවයි සලස්වාළුහ. ඒ නියාවට මූසිකාව දෑවාන කරඬුවේ උන්කලට පළමුකොට බළලෙක් ඇවිත් තී විසින් මට දෙන මස් කොයිදැයි විචාරන්නා ඇයි තොපට මස් දෙන්ට එකෙක්ද තොපට මස් උවමනාවීනම් තොපගේ දරුවන්ගේ මාංස කවයි කියා කිපෙන ලෙස බස්කීව එවිට

SANHIDA LANKA

බළල් කෝපව නොපිත් මෙසේවූදැයි දැවාන කරඬුවට පැණ ලයතලාගෙණ ඉවත ගොස් බැද්දේ ලැග මිය ගියේය, මෙම නියායෙන් අනික් බළලුන් තුන්දෙනත් මූසිකාවගේ බසට කෝපයෙන් දැවාන කරඬුව පැණ ලයපලාගෙණ මළාහ, එතැන් පටන් මූසිකාව බෝධිසත්වයන් කෙරේ සමාධියෙන් පැහැද කෂීාපණ දෙකක් දවසකට දෙන්නීය, මේ නියායෙන් තමාගේ සතළිස් කෙළක් සම්පත් දුන්නීයයි වදාරා බළලුන් සතරදෙන මස් කෑමෙන් මූසිකාවට වූ අලාභයසේම උපාසිකාවන්ටත් වූ අලාභයයි වදාර අදවක් පටන් පවරා දුන් දනක් විදා නොපවරා දුන් දනක් ගෙට ගොස් ඇරගණිම අකැපයයි සික්ෂාපද පණවා වදාළසේක. එසමයෙහි බළලුන් සතරදෙනා නම් මේ භික්ෂුහු සතරදෙනය, මූසිකා ධෙනුව නම් කාණාමාතාවූ උපාසිකාවෝය. එසමයෙහි ගල්වඩුව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මයයි දෙකල් ගළපා මේ බබ්බු ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# ගොධ ජාතකය

තවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයොග දන්නා භික්‍ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද, එහි වර්‍තමාන කථාව යටකියනලද කුහක ජාතකයයෙහි සැලැස්ම සේයයි දතයුතු.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්‍වයෝ ගොයි යෝනියක ඉපිද පිටිසර ගමක බැද්දේ තුඹසෙක වාසය කරන්නාහ, එසමයෙහි සිල්වත් ගුණවත් තාපසකෙණෙක් එකියන පිටිසරගම  මනුෂ්‍යයන්ගෙන් සිව්පසය අනුභව කරන්නාහ, බෝධිසත්වයෝ ඒ තාපසයන්ගේ මියුරු ධර්‍මදේශනාව අසන නිසා දවසක දෙවිටක් අවුත් තාපසයන් දැක වැඳ යන්නාහ. කල්යාමකින් උපාසකවරුන්ට කියා ගෙණ ඒ තාපසයන් වහන්සේ හිමාලය වනයට වැඩිසේක. පසුව කූට තපස් කරන්නාවූ තාපසකෙණෙක් එම ගමට අවුත් උහුත් උපාසකවරුන් විසින් දෙන දන් ලබන්නාහු එම පන්සල වසන්නාහ, එසමයෙහි ගොයානෝ පළමු තාපසයන්සේම මුයිත් යහපත් කෙණෙකැයි සිතා දවසකට දෙවිටක් අවුත් දකිනාහ, එසමයෙහි එක් දවසක් නොකල් වැස්සෙක් වට විසින් මෙරු පැණ නැංගාහ, මෙරුන් කණ නිසා බොහෝගොයි ඒ ඒ තුඹස්වලින් එලිබටහ, ඒ දැන මනුෂ්‍යයෝ බැද්දට අවුත් බොහෝ ගොයින් මරාගෙණ යන්නාහු. ගොයිමාලු යහපත් කොට පිසගෙණ ගියාහ, තාපසයෝත් ගෝමාලු කා කුමන මාන්සදැයි විචාර ගෝමස නියාව කියන්නා එහි තෘෂ්ණාව බැඳ මා කරා එන මහාගොයෙක් ඇත, ඔහු මරා මස් කම්යි සිතා උපාසකවරුන්ට කියා එනු මිරිස් ආදීවූ දෙයත් අත්පල්ලයකුත් ගෙන්වා පන්සල ඇතුලේ සඟවා තිබා යහපත් පොල්ලකුත් ඉදිකොට ඒ පොල්ල වැහැරී සිවුරෙන් සඟවා ගෙණ සක්මන් කෙළවර ගළ අස්නපිට කර නමාගෙණ ගොස් ගොයානන් එනමග යටැසින් බල බලා අපිස්භාවයක් අඟවා උන්නාහ. ගොයානෝත් තුඹසින් පිටත්ව එන්නාහුමය. මෙතෙක්දා සේ ලඟට නොඅවුත් කොව කොවා තාපසයන් ඉන්නා සැලැස්මෙන් සැකව උඩුසුලඟට ගොස් තාපසයන් හෝමස් කෑ නියාව නාසයෙන් ආඝ්‍රාණකොට දැන දැන ලන් නොවී දුරුව දුරුව ඇවිදිනාහ, ඒ තාපසයෝ තමන් කරා ගොයානන් නොඑන විසින් කොවපුවයි සිතා පොල්ල බලා දමාලා ගසා මරම් සිතා දැමුවාහ. දැමූ පොල්ල වල්ගය අගට වැදගත, දෙවෙනිව එහුබඳා පොල්ල ඇරගෙණ ගසනතුරු බෝධිසත්වයෝ වහා ගොසින් තුඹසට වැද අනික් තෙනකින් මූන එලියට ලා තා යහපත් තාපසකෙණෙකැයි සිතා උනිම්, තසේවූවන්ට කාෂායවසත්‍රයෙන් හා දිවිසම් ජටා ආදීවූ දෙය තරම් නොවෙයි කියා බැන තුඹසට වැදගියාහ, ඒ තාපසයෝ මෙවක් පටන් මෙතන උනිනම් ගොයානෝ මාගේ තතු උපාසකවරුන්ට කියයි සිතා එදවස්ම හිමාලය වනයට නික්මුණහයි වදාරා එසමයෙහි කූට තාපසයෝ නම් වඤ්චායෝග දන්නා භික්ෂූහුය, යහපත් තාපසයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, ගෝව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාරා ගොධ ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# උභයභ්‍රෂ්ට ජාතකය

තවද සර්වඥයන්වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව මහළුවරුන්වහන්සේලා කථාවක් උපදවනාසේක්. දේවදත්ත ස්ථවිරයෝ බුදුන් වදාළ ප්‍රතිපත්ති නුපුරා ඉන්න විසින් භික්ෂූහු නොවන්නාහ, ගිහිව සිට ලබන ලද ලාභයෙනුත් පිරිහුනාහ, මහණව සිට ලබන්නාවූ අධිගම ආදීවූ ලාභයෙනුත් පිරිහුනාහ, එසේහෙයින් දෙකෙළවර ගිණිවැද ගෙණ මධ්‍යයේ අසූචි ගෑවුණු දණ්ඩක් සෙයින් අභව්‍ය, දේවදත්ත ස්ථවිරයෝ උභයභ්‍රෂ්ටවූවයි මේ කථාව කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන් මතු නොවෙයි දේවදත්ත ස්ථවිරයෝ පළමුත් උභයභ්‍රෂ්ටයෝ වේදැයි වදාරා ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ පිටිසර ගමක බැද්දේ විලක් ගාවා ගසක වෘක්ෂ දේවතාව උපන්සේක, එසමයෙහි එක්තරා බිළිවැද්දෙක් තමාගේ පුතු කැඳවා ගෙණ ඒ විල සමීපයට අවුත් ඒ විල බොහෝ මසුන් ඇති හෙයින් බිළිය දමාළීය. ඒ බිළිය ගොස් මහා කණුවක ඇවිලින ඇදගත නොහැකි විසින් කෙවුළු සිතන්නේ මහා කුඩමස්සෙකැයි සිතා පුතා අත ගෙට කියා යවන්නේ තොපගේ මැණියන් අසල ගෙයි ඇත්තන්ලා ඩබරකන්ට කියාලවයි කියා යවා තෙමේ බිළීකටු ඇදගත නොහැකි විසින් කැඩෙයි යන භයින් ඉනකඩ ගොඩ තිබා මසු අල්වම්යි දියට බැස දියෙහි අතපතගා ඇවිදිනා කල දියෙහි තිබූ කණු දෙකක් දැස ඇනී ඇස් දෙක නැසින. ගොඩ තිබූ ඉනකඩ මග යන හොරෙක් ඇරගත. පුතාගේ බස් අසා මව් දබර උපදවා ගන්නා උපායක් උවමනා විසින් එක් කණෙක තල්පතක් තබාගෙණ එක් ඇසෙක බඳුන් කබල්ලේ දැලිගෙණ පිරිමැද ගාගෙණ පිරිය ඇති පුතෙකුගේ බළුකුක්කෙකු වඩාගෙණ වියරු උනු කෙනෙකු මෙන් අවුනැයි කියන්නා වියරු උනෙන් නොපවිනා මා වියරු උනේ නැතැයි බසින් බසට දබර බෝවනමෝ ගම්මුදලියාට කී දබර එලවම් කියා ඇරගෙණ ගොස් ගම්මුදලින්ට පැමිණියාය. ගම්මුදලි යුක්ති විචාරා ඇටම වරදයයි කියා දඩ සලස්වා මරා තළා දඩ ඇරගත්තාහ. එවිට කෙවුල් දියෙන් ගොඩට නැගී අතින් ඇස වසාගෙණ කඩ සොයා ගොඩ නොදැක සිටියේය. ඒ වේලාවට බෝධිසත්වයෝ වෘක්ෂයෙන් පිටත්ව කියන්නාහු කෙවුල තාගේ අඥානකමින් දිය කළමනා කටයුතතෙනුත් දියට බැස ඇස් දෙකත් නසාගෙණ ගොඩ තිබුණ ඉනකඩත් නුවූයේයයි අවවාද කී යුක්තියෙන් දබර කොට තොපගේ බිරින්දෑ මරා ගෙයි තිබූ සම්පතතියෙනුත් ප්‍රයෝජන නුවූයේය. එසේහෙයින් දියෙන් කළමනා කටයුත්තෙනුත් ප්‍රයෝජන නුවූයේය. අවවාද කියා අනතර්ධාන වූහයි වදාරා, එසමයෙහි ඇස නසාගත් කෙව්ලා නම් දේවදත්ත ස්ථවිරයෝය, වෘක්ෂ දේවතාව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මයයි වදාරා උභයභ්‍රෂ්ට ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# කාක ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බන්ධු සංග්‍රහයක් නිසා මේ ජාතකය දක්වන ලද එහි වර්තමාන කථාව දසවැනි නිපාතයෙහි භද්‍රසාල ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයෙක් වීථියේ යමින් සිටියේය. එවේලාවට කවුඩෝ දෙන්නෙක් තොරණයක් පිට උන්නාහ. ඉන් එක් කවුඩෙක් කියන්නේ මේ බමුණාගේ ඉස වර්චස් කරන්ට මට අභිප්‍රායයි කියන්නා එවිට අනික් කවුඩු කියන්නේ මහා සම්පත් ඇති උවමනා බමුණාය. එසේවූ බමුණා හා කැටිව වෛර වීමෙන් කවුඩු රුස එකසීම නසාලන්ටත් සපන. එසේවූ දෙයක් නොකරවයි කීහ. ඊට කවුඩු කියන්නේ බමුණා ඉස වර්චස් නොකොට ඉන්ට බැරිය, කුමක් වේවයි වර්චස් කරමි කී විසින් අනික් කවුඩු තා කළදෑ තොමෝ දකුවයි කියා ඔබ්බකට ගියේය. එවිට බමුණාත් තොරණ කෙළවරට ලන්වන්නාම කවුඩු ඉස වර්චස් කොටපීය. එවිට බමුණුත් කවුඩුත් කෙරේ වෛර බැන්දේය. ඒ අවධියට අනුන්ට බැලමෙහෙකොට ජීවත් වන ගැහැණියක් වී සිඟිත්තක් අව්වේ වනාලුය. පීඩාම්ලොම් ඇති එලුවෙක් ඒ වී කන්ටවන, එවිට ඒ ස්ත්‍රිය විසින් පොල්ලක් ලා මරා ලුහුබඳවපුව තවත් ඈගේ ප්‍රමාදයක් බලා වී කන්ට ආය. දෙවෙනිවත් එසේම ගැසූය. එවිටත් පලා ගියේය. පසුව මැහැලි සිතන්නී තවත් මූ විටින් විටම වී කත්නම් මාගේ බැලමෙහෙය පහරින්ට ගෙණා වි නිමායෙයි සිතා ගිණි පෙණෙල්ලක් අතින් ඇරගෙණ නිදා වැටී වැටී වැදහොත්තීය. එවේලාවට ඒ එලුවා වී කන්ට ආ විසින් ගිණි පෙණෙල්ලෙන් බල පහරක් ගැසුව. සැඩ ඇතිව එලුවා විසින් ඇඟ ගිණිවැදගත. ඒ ගිණි නිවන්ට එලුවා වහා ගොසින් ඇත්හළ තුබූ ඉලුප් ගොඩක වැඩී වැදහොත්තේය. ඒ ඉලුප් ගේත් ගිණිගත්හ. ඇත්හළ දා ඇතුන් පිට වැටී ඇතුන්ගේ පිට බොහෝ වණව ගියේය. ඇත්හළ වෙදවරුන් පිළියම්කොට බැරිහෙයින් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ එපවත් අසා පුරෝහිත බමුණා ගෙන්වා ඇතුන්ට පිළියම් කරන්ට බැරියයි වෙදවරු කීහ. ඊට ආචාරීනි කළමනා කින්දැයි විචාළහ. එපවත් බමුණු අසා කවුඩන්ගේ තෙල් ලදොත් පිළියම් කරන්ට භාරයයි කීහ. එපවත් රජ්ජුරුවෝ අසා කවුඩන් මරවයි කීහ. ඒ නියාවට මෙහෙවර අසා ගත් නුවර වාසී කවුඩන් සිය දහස් ගණන් මරා ගොඩකොටපුවාහ. එසමයෙහි බෝධිසත්වයන්වහන්සේ සමසානයක් සමීපයෙහි සුවාසූදහසක් කවුඩන් පිරිවරා කවුඩන්ට නායක රජව ඉන්නාහ. එපවත් රජ්ජුරුවෝ අසා කවුඩන්ටවූ විපත්තිය කවුඩකු අතින් අසා මාගේ බන්ධූන්ටවූ ආපදාය මාම ගොසින් ගළවතොත් විනා අනික් කෙනෙකුන්ට බැරියයි සිතා දශපාරමිතාව පෙරදැරි කොට සියලු සත්වයන් කෙරේ මෛත්‍රී පතුරුවා මා විසින් මාගේ බන්ධූන් වූ කවුඩු සමූහයා ගලවන නිසාය මා යන්නේය, ඒ ගැළවීම සත්‍යය නම් මට කිසි අන්තරාවක් නොවේවයි කියා අධිෂ්ඨාන කොට පවනට බඳුවූ වේගයෙන් අවුත් ඇරලා තිබූ කවුළු දොරින් රජගෙට වැද රජ්ජුරුවන්ගේ සිංහාසනයට වන්හ. එවිට එතන සිටි මිනිසුන්ගෙන් එකෙක් කවුඩා අල්ලන්ට ලඟට ආයේය. එවිට රජ්ජුරුවන්ට කියන්නාහු රජ්ජුරුවෙනි පරීක්ෂා කරවීනා කීවන්ගේ බසට මෙසේ අනර්ථයක් කෙරෙද්දැයි කීහ. රජ්ජුරුවන් විසින් නම් පරීක්ෂාකාරීව මිසක් වෛරයෙන් කී කී බස්පස්සේ ගොසින් මෙසේ කෙරෙද්දැයි අවවාද කීහ. එවිට රජ්ජුරුවෝ සතුටුව සතපාක තෙලින් දෙපිය එවමැඩ තමන්ට ඉදිකළ අනනපාන ආදී දෙය බඩ පුරා කවා රන්බිස්සක් පිට ඉඳුවා කවුඩන්ට තෙල් නැත්තේ කුමක්දැයි විචාළහ. එවිට රජගෙය මුළුල්ලේ එකනාදකොට මිණියක නාදයක්සේ මිහිරි කටහඬින් කියන්නාහු දෙවයෙනි කවුඩෝ යටත් පිරිසෙයින් කුඩා කොල්ලකුත් පමණ මනුෂ්‍යයෙකුත් දකිනා කලත් මහ භයචකිත ඇත්තාහ. එසේ හෙයින් උන්ගේ ලෙහි දැන්වත් ගියදවසත් අනාගතයෙහිවත් ඇඟ තෙල් නැත්තේමයයි කියා බමුණා විසින් කවුඩන් නසන නිසා කියයි කියා මිහිරි කටහඬින් කියත් කියත් රජ්ජුරුවන්ගේ ලය මොලොක්ව කියන්නාහු මාගේ රාජ්ජයෙන් තොපට පූජාකෙරෙමි රාජ්ජය පිළිගනුවයි කියන්නා ඉන් මට ප්‍රයෝජන කින්ද මාගේ බන්ධූන් ගැලවෙන්නා පමණයයි කීහ. රජ්ජුරුවෝ සතුටුව සියලු ප්‍රාණීන්ටම අභය දී කවුඩන් මරන්ට එපායයි කියා එතැන් පටන් සාල් අමුණක බත් පිසවා ඊට නිසි මාළු ආදීවූ දෙය ඇතිව දවස්පතා කාවනුවේ බත් ලන්නාහ. බෝධිසත්වයෝ දවස්පතා තමන් මේ නිමවන බත් ලබන්නාහ. මේ නියායෙන් දවස් ඇර කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා, එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය, කවුඩන්ට රජව උපන්නෙම්. ලොව්තුරා බුදුවූ මම්මයයි වදාරා කාක ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# ගොධ ජාතකය

තවද සර්වඥයන වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි නොකීකරු භික්ෂු කෙනෙකුන් වහන්සේ නිසා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්තමාන කථාව මහිලාමුඛ ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ගෝ යෝනියක ඉපිද ගොයින් දහස්ගණන් පිරිවරා මහත්වූ තුඹසක වාසය කරන්නාහ. එසමයෙහි බෝධිසත්වයන්ගේ හෝ පැටියෙක් කටුස්සකු හා විශ්වාසව ගෙණ වසන්නේය. එසමයෙහි බොහෝ ගොයි එපවත් ගොසින් බෝධිසත්වයන්ට කීහ. බෝධිසත්වයෝ තමන්ගේ හෝ පැටවා ගෙන්වා ගෙණ අද පටන් තෝ නීචව ජාති ඇති කටුස්සා හා විශ්වාසය නිසා මතු හෝ රැසට අනත්ථවෙයි. තමන්ගේ ස්ථානෝචිත ප්‍රඥාවෙන් දැන කීවාහ. එසේ කීවත් ඒ ගෝ පැටවා කීවා නොකොට කටුස්සාගේ ඇඟ වැතිර කෙළින්නේය. මේ නියායෙන් කල් යත් යත් ගොයා ඉතා මහත් විය. ඒ මහත්වූ කය ඇරගෙණත් කටුස්සා ඇඟ වැතිර කෙළිනේය. මේ නියායෙන් ඒ වේලාවට කටුසු තමා කය කුඩා හෙයින් මහත්වූ ශරීර ඇඟ වැතිර ගන්නා මහත් පර්වතයක් ඇඟ වතුරුවා ලූවාසේ තමාට දැනෙන විසින් ගොයින් කෙරේ වෛර බැන්දේය. ගෝ රජ්ජුරුවෝත් කටුස්සා නිසා යම් දවසෙක භය පැමිණෙයි නියම දැන ඒ නියාවට සොර උමගක් කැණ තිබුවාහ. ඒ අවදියට නොකල් වැස්සෙක් වට බොහෝ මෙරු පැන නැංගාහ. ඒ දැක එක් වැද්දෙක් මෙරු කන්ට ගොයින් බස්නා කලැයි සිතා ගොයින් මරන්නට බැද්දට ගියේය. ඔහු බැද්දේ ඇවිදිනා කලට ගොයින් කෙරේ වෛර බැඳි කටුසු ඒ කියන වැද්දහු දැක කුමක් නිසා බැද්දේ ඇවිදිදැයි විචාරා ගොයින් සොයා ඇවිදීම කී විසින් ගොයින් සොයා තා දුක් ගන්ට එපයි පිදුරු හා ගිණි ගෙණ ගොසින් මමවේද පාම් කියන්නා ඒ නියාවට වැදි ගොසින් පිදුරු හා ගිණි ගෙණය. එවිට කටුසු කියන්නේ මේකියන තුඹස්කටැයි පිදුරු ගන්වාලා ගිණි ඇනපියව. එවිට දුම් කැලෑ ගොසින් තුමූම පිටත්වන්නාහ. පිටත්වූ වේලාවට තොප අත තුබූ පොල්ල බලාවත් බල්ලන් පෑලවාත් කැමති ගොයි මරාගණුවයි කීය. එසේම වැදි කෙළේය. බෝධිසත්වයෝ මෙතෙක් අපේ බන්ධුන්ට භය වූයේ අසත්පුරුෂවූ කටුස්සා නිසායයි සිතා සාරා තුබූ සොර උමඟින් පලා ගියාහයි වදාරා,එසමයෙහි කටුස්සා නම් දේවදත්ත ස්ථවිරයෝය. නොකීකරු ගෝපැටියා නම් නොකීකරු භික්ෂූහුය, එසමයෙහි හෝ රජව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම යයි වදාරා ගොධ ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# සිඟාල ජාතකය

තවද සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් මහළු තෙරුන් වහන්සේ දම් සභා මණ්ඩපයට රැස්ව දේවදත්ත ස්ථවිරයෝ සර්වඥයන් වහන්සේ නසන්ට නාලාගිරියා මෙහෙයා ගිජකඩකූට පර්වතයෙහි සිට ගල් පෙරලා විදින්ට දුනුවායන් යවාත් නසන්ට නොයෙක් ප්‍රයෝග කොටත් නසා ගතනුහුනුවෝ වේදැයි කිය කියා උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාළ කල්හි එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි පෙරත් දේවදත්ත ස්ථවිරයෝ මා නසන්ට සිතා නසාගත නුහුනුවෝ වේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ කැණහිල් යෝනියෙහි ඉපිද දහස්ගණන් කැණහිළුන් පිරිවරා අමු සොහොනක වාසය කරන්නාහ. එසමයෙහි බරණැස් නුවර උත්සව කෙළියක් නිසා රා මස් ඒ ඒ තැන බොහෝ කොට තිබා දාවළුත් කෙළ රැවූ දවස පසළොස් පැයකුත් කෙළි විසින් මස් නිමා ගොසින් රා පමණක් තිබුයේය. එවිට එක් පුරුෂයෙක් රා මස් දෙවයි කීය. එවිට බොහෝ මනුෂ්‍යයෝ මස් නැතැයි කීහ. එවිට එක්තරා මිනිහෙක් කියන්නේ මා ඉන්දදී මස් අමාරුදැයි කිය පොල්ලක් ඇරගෙණ වාසල් අඟුළු ලූ විසින් දිය යන සොරොව්ව අස්සෙන් පිටත්ව සොහොන්පලකට ගොස් උඩුබැල්ලෙන් මළමිණියක් සේ වැදහොත්තේය. ඒ වේලාවට බෝධිසත්වයෝ මිණී කන්ට ගොස් මිනිසා වැදහොත් නියාව දැක මේ තෙමේ නොමළ එකෙකැයි සිතා එසේවූවත් පරීක්ෂා කරන්ට උවමැනවැයි යටි සුලඟට ගොස් ඉවකොට නොමළ නියාව දැන මූ රවටා පලායන්ට උව මැනවැයි සිතා ලඟට අවුත් පොල්ල ඩෑ ලඟට ඇද්දාහ. මිනිසත් පොල්ල ලඟට ඇද්දේය. එවිට කැණහිල් ඈත ගොසින් කියන්නේ වැදහොත් පමණකින් මළ නොමළ නියාව දැනගත නොහැක්ක. නමුත් පොල්ල ඩෑ ලඟට ඇද්දාහාම නොමළ නියාව දැන කුමන තින්දක්දැයි කීවාහ. එවිට ඒ පුරුෂයා නැගීසිට පොල්ල බලා ගසා වැදහොත් බැවින් තෝ මා විසින් ගැලවී ගියාවේදැයි කියා කැණහිල් කියන්නේ තා අතින් මම ගැලවී ගියෙමි. තොපි සතර අපායෙහි නොගැළවනෝදැයි කීහ. එවිට ඒ පුරුෂයා කරබාගෙණ තමා ආලෙස ඇතුළු නුවරට අවුත් අගලින් ඉස්සෝදා නහා තමාගේ ගෙටම ගියේයයි වදාරා, එසමයෙහි කැණහිළුව මරන්ට ගිය පුරුෂයා නම් දේවදත්ත ස්ථවිරයෝය, එසමයෙහි කැණහිළුන්ට රජව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# විරොචන ජාතකය

තවද එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් විසින් බුදුන් අතින් සියලු භික්ෂූන් වහන්සේ පාංශුකූල චීවර පොරවනා නියායෙන් සොසානිකාඞ්ගය පුරණ ලෙසද වෘක්ෂමූලයෙහි හිඳ භාවනා කරණ ලෙසද මච්ඡ මාංස නොකන ලෙසද කියා මේ ප්‍රශ්නයද බුදුන් අතින් ඉල්වා බුදුහු මාගේ ශාසනයෙහි සුඛිත මුදිතයෝ බොහෝ දෙන මහණවෙති. එසේ හෙයින් කී දෙස පිළිවන්කෙණෙක් පුරති, බැරිකෙණෙක් නුපුරති. මා විසින් එසේ එකසී පුරන්ට උවමැනවැයි අපාතති නොපණවමි වදාරන්නා ඊට දේවදත්ත ස්ථවිරයෝ බුදුහු මා කීවා නොකළසේකැයි කිපී සැරියුත් සාමීන්ගේ ගණයෙන් අලුත සිවුරු පෙරවූ විනය නොදන්නා භික්ෂූන් පන්සියයක් ඇරගෙණ බුදුන්ගෙන් ලබන ලද උපසම්පදා සෘඬි ආදීවූ දෙය ඇතිව තිබියදීත් බුදුන් කෙරෙන් තණ අගක් ගලා ඇර ගන්නා විවරක් මා ඔවුන් ප්‍රයෝජනයක් නැතැයි කියා එකසී මසින් මස පොහො දෙකක් කොට සඞ්ඝ භේද කරවාගෙණ ගයානම් ගඟඉස පන්සලක මමත් බුදුයයි කියා බුඞකෘත්‍යය කරමින් දවස් අරණසේක.

එසමයෙහි සර්වඥයන් වහන්සේ එක් දවසක් දේවදත්ත ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් පන්සියක් දෙනාට අධිගමය හේතුනියා දැන සැරියුත් මුගලන් දැගසව්වන් ලඟට කැඳවා තෙපි දෙන්න දේවදත්ත ස්ථවිරයන් සමීපයට ගොස් උන්ගේ පරිවාර භික්ෂූන් පන්සියයක් දෙනාට බණ කියා කැඳවා ගෙණ එවයි වදාළසේක. එපවත් අසා දැගසව්වන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන්ගේ ගණයට වැඩිසේක. දේවදත්ත ස්ථවිරයෝත් දැගසව්වන් වහන්සේ දැක තමන් කරා පලා ආහයි සිතා ඒ වේලාවට තමන් බණ කිය කියා උන් විසින් බුදුරජානන්වහන්සේ වදාරණ ලෙස දේවදත්ත ස්ථවිරයන් වහන්සේ වදාරණසේක්. ශාරිපුත්‍ර ස්ථවිරයෙනි මාගේ වසට රිදෙයි තෙපි බණ කියවයි කියා තමන් වහන්සේ බණ අස්නගාවා බිම සැතපුනුසේක. ඒ වේලාවට සැරියුත් සාමි බණ කියා පන්සියක් දෙනාම රහත් කොටගෙණ වේළුවනාරාමයට වැඩිසේක. එවිට කෝකාලික ස්ථවිරයේ දේවදත්තයන්ගේ ගණයට අවුත් ගණය සූන්‍යව තිබුනු නියාව දැක දේවදත්ත ස්ථවිරයන්ට කියන්නාහු තොපගේ වහන්දෑ එකසීම දැගසව්වන් ඇරගෙණ යාදී කුමන මරනිදි නිදන්නේයයි කියා විලුඹ බාලා සිවුර ඇත්කොට ලා කුලකින් ගැසූවාසේ විලුඹෙන් ලැමැද්දට ඇන ලේ තුන්කටක් නන්වාපීය සැරියුත් සාමිත් රහතුන් පන්සියයක් ඇරගෙණ බුදුන් දුටුසේක. එවිට සර්වඥයන් වහන්සේ ශාරිපුත්‍ර ස්ථවිරයෙනි දේවදත්ත ස්ථවිරයෝ තොප යන කලට කෙසේ උනුදැයි විචාරා වදාරන්නා සැරියුත් සාමි කියනසේක්. ස්වාමීනි දේවදත්ත ස්ථවිරයෝ සර්වඥයන් වහන්සේගේ විලාසයෙන් උන්නේයයි වදාරා කෝකාලික ස්ථවිරන් කළදැත් දන්වූ සේක. එපවත් සර්වඥයන් වහන්සේ අසා වදාරා ශාරිපුත්‍ර ස්ථවිරයෙනි දන්මතු නොවෙයි පළමුත් දේවදත්ත ස්ථවිරයෝ මා සේ ක්‍රියා කරන්ට වැද බොහෝ විනාසයට පැමිණියෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ සිව්පාවුන්ට උතුම්වූ කේසර සිංහව ඉපිද පර්වතයක් මුදුනේ රත්ගල් ගුහාවක වාසය කරණසේක. එසමයෙහි එක් දවසක් කේසර සිංහරාජතෙම පර්වතයෙන් පැන මීමෙකු අල්වාගෙණ මාංස අනුභව කොට වැවට ගොසින් පැන්බී පෙරලා පර්වතයට එන ප්‍රස්ථානට එක් කැණහිලෙක් සිංහයාට ලන්ව ගියහෙයින් තමා ගැලවී යන උපායක් නැතිහෙයින් සිංහයාගේ පය වැඳලා සිටියේය. එවිට සිංහයා කියන්නේ ඇයි ජම්බුකය කුමකට සිටියේදැයි විචාරා නුඹවහන්සේට සේවාකම්කරන්ට සිටියෙමි කී විසින් බෝධිසත්වයෝත් ඒ කැණහිලා කැන්දාගෙණ පර්වතයට නැගී උන් ඉන්ට එක් තැනක් සලස්වා තොප විසින් පර්වත මුදුනේ සිට සිව්පාවන්ට බලා මා කරා අවුත් අසවල් සිව්පාවා ඇල්ලුව මැනවැයි කියාද පැලඹී වදාළ මැනවැයි කියන්නා තොපට කැමති මාංස මරා තොපටත් ලා මමත් කා ජීවත්වෙම්හයි කීසේක. එතැන්පටන් කැණහිල් එලෙසම පෑ මස් ගෙණ තෙමේත් කා කැණහිලාටත් ලන්නේය. මේ නියායෙන් සිංහයා මරාලූ මස් කන හෙයින් දවසින් දවස ඇඟ පුෂ්ටිමත්ව මහත්වූ හෙයින් උඬතව සිතත්නේ සිංහයෝත් සිව්පාගතයෝය, මමත් සිව්පාගතයෙමි, එසේ විසින් එකෙකු මරාලන මස් කන්නේ කිම්ද මට මස් මම්ම මරාගණිමියි සිතා සිංහය කරා ගොසින් කියන්නේ නුඹ වහන්සේ මරාලන මස් මම මෙතෙක් දා කැමි, ඉනිබ්බේ මරාලන මස් නුඹ වහන්සේම කැවමැනවැයි කියන්නා සිංහයා කියන්නේ හසතිවිදාරණයට අපට විනා තොපට බැරියයි කීපවාරයක කියද්දීත් උවමැනවැයි සිතත් මෙපමණක් ඇතිවන්නාහ. හසති විදාරණය මට පිළිවනැයි කියන්නා යහපතැයි එසේවීනම් අද රෑට නුඹ වහන්සේ වැදහෝනා ස්ථානයෙහිම වැදහෝනට උවමැනව උදෑසනක්සේම මා නික්මෙන වේලාවට පැළඹ කැණහිලායයි කියන්න උවමැනව මෙපමණක් ඇතිවන්නා හස්ති විදාරණය මට පිළිවනැයි කියන්නා යහපතැයි එලෙස සිංහයා කෙළේය. කැණහිල් රත් ගල් ගුහාවෙන් නික්ම පර්වත මුදුනට නැගී පර්වත මුදුනට නැගී ඇඟ තුන් ඈවරක් කිළිපොළා තුන් විටෙක කැණහිල් අඬ අඬා සතරදිසා බලා මහත් වූ ඇතු දැක ඇතු පිටට පැනපීය. ඇතු පිටට පිණූ ගමනේ කැණහිල් ඇතු පාමුල වැටී ඇතු විසින් පයින් මැඩ සුනුවිසුනුකොට පෙරලා සුනුකළ ඇට එක්තැන්කොට ඊපිට වර්චස් කොට හා මූත්‍රකොට කුඤ්චනාදද කොට ගියේය. ඒ දුටු සිංහයා කැණහිලා පැලඹුනු නියාව ඉස ළය තළාගත් දෙයත් සොඳසැටිය පැලඹුනු නියාවත් ඔබිමයයි කියා ගල්ගුහාවටම ගියෝයයි වදාරා, එසමයෙහි සිංහයා කරණ ක්‍රියාවම කෙරෙම්යි කියා ළය තළාගත් කැණහිලා නම් බුදුන් කරණ ක්‍රියාකෙරෙමි ළය තළාගත් දේවදත්ත ස්ථවිරයෝය, එසමයෙහි කේසර සිංහව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාරා විරොචන ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# නංගුඪ ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ජේතවනාරාමය පිටිපස්සේ නිගණ්ඨ තාපසයෝ මෙතතමෙක හිඳ තපස් කරන්ට දුක්දී කළමැනවැයි කියා සමහරු එක්පයක් බිම ඔසවාගෙණ අනික් පය ඇගිලි අගින් සිට මෙසේවූ තපස්කරන්නා සමහරු ඉර මුදුන්වේලේ සතරකොණ ගිණිමැල සතරක් බැඳ ඊ මඬ්‍යයේ පඤ්චතාප නම් ව්‍රතයක් කරන්නාහ. බොහෝ මහළුවරුන්වහන්සේ බුදුන් කරා අවුත් ස්වාමීනි නිගණ්ඨයන් විසින් මෙසේ ව්‍රතයක් කරන්නාහ. ඒ නිසා උන්ට ඉදිරියේ පැමිණෙන ලාභ ඇද්දැයි විචාරා සර්වඥයන් විසින් මහණෙනි ඉන් කුමන ලාභයද පළමු උත්තමයෝ පවා මෙයින් යහපත් දෙයෙකැයි සිතා ජාතාග්නි ඇරගෙණ වලට ගොස් ගිණිදෙවියාට පූජා කොට ඉන් පැමිණෙන්නාවූ ලාභයක් නැති හෙයින් පෙරලා ඒ ගිණි නිව කිසුනු පිරියම් භාවනාකොට බඹලොව ගියෝවේදැයි වදාරා ඒ කෙසේදැයි යතහොත්,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ප්‍රසිද්ධවූ බ්‍රාහ්මණ කුලයක උපන්හ. එදවස්පටන් දෙමව්පියන් විසින් ගිණි නොනිවා තිබා දොළොස් ඇවිරිදි වයස් පැමිණි අවස්ථාවේ දෙමව්පියෝ කියන්නාහු. පුත තොපි උපන් දවස් පටන් ජාතාග්නිය තබාගෙණ උනුම්හයි ඒ අග්නිය ඇරගෙණ වලට ගොස් ගිණිදෙවියාට පූජාකොට බඹලොව යව්නම් එසේවන, එසේ නැත්නම් කුටුම්බසණ්ඨාපනය කොට ගිහිගෙයි වාසයකරවයි කියා කීහ. එපවත් බෝධිසත්වයෝ අසා ගිහි ගෙයින් මට ප්‍රයෝජන කින්ද ජාතාග්නිය ඇරගෙණ වලට ගොස් ගිණිදෙවියාට පූජාකරන්නාහ. එසමයෙහි එක්දවසක් පිටිසර ගමකට සිඟාගියකල ගෝදානයෙන් ගොණෙකු ලැබ ඒ ගොණ ඇරගෙණ අවුත් ගිණිදෙවියාට පුදම් සිතා ඒ කියන ගොණා අත්තේ බැඳ ලුනු ඇඹුල් සොයා යාමට ගියාහ. ඒ යාදී වල් වැද්දෝ ගෙණ මරාගෙණ ගෝකකුල් සතර හා සම හා වල්ගය එතනට දමා සෙසු මස්කන්නක් කා ඉතිරිදෙය ඇරගෙණ ගියාහ. බෝධිසත්වයෝත් ලුනු ඇඹුල් ඇරගෙණ එතනට අවුත් සම හා කකුල් හා වල්ගය තිබුවා දැක තම කන්ට තුබූ දෙය රැකගතනුහුනු දේවතාවා ර ක්කේ කුමක්දැයි සිතා එකී ගොනාගේ කකුල් හා සම හා වල්ගය ගින්නට දමමින් සිට කියන්නුහු තොපසේවූ අසත්පුරුෂයන්ට මෙපමණක්ම මහාදෙයකැයි සිතාද සී සී බලව තොප නිසා මටවත් ලාභයෙක් නැතෙයි කියා පැන් වක් කොට ගිණි නිවා ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව කිසුනුපිරියම් භාවනා කොට පඤ්චාභිඥා අෂ්ටසමාපතති උපදවාගෙණ නොපිරිහුනු ධ්‍යානයෙන් බඹලොව ගියාහයි වදාරා එසමයෙහි තාපසව උපන්නෙම් ලොවුතුරා බුදුවූ මම්මයයි වදාරා නංගුඪ ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# රාධ ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පුරාණ දූතිකාවක් කෙරෙහි ලෝභකළාවූ භික්ෂුකෙනෙකුන් වහන්සේ නිසා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්තමාන කථාව මතු කියන ලද ඉන්ද්‍රිය ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි උකටලී වූ භික්ෂුන්වහන්සේ පෑ ගමනේ සර්වඥයන් වහන්සේ විසින් පළමුත් තොපි මුන්ගේ අනාචාර වලකා ගත නුහුනු කල දැන්නම් පිළිවන්දැයි තමාගේ ඉච්ඡාවේ ලාගතනොහෙන ස්ත්‍රීන්ට තා  උකටලීවනු කරණා නොවෙයි කියා ආරාධිතවූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත් ?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ගිරායෝනියෙක උපන්නාහුය. එසමයෙහි එක්තරා බමුණෙක් බෝධිසත්වයන්ගේ මල්වූ ගිරාපැටියෙකුත් බෝධිසත්වයනුත් වඩාගෙණ ගමට අවුත් බෝධිසත්වයන් වහන්සේට පොටඨපාදයයි කියාත් මලනුවන්ට රාධයයි කියාත් නම් තබා දරුකොට වඩන්නාහ. එසමයෙහි බමුණා වෙළදාමක් නිසා ඔබ්බට යන්නේ තමාගේ ගිරා දරුවන් දෙන්නා ලඟ ඉඳුවා කියන්නාහු තොප මව් බැමිණිය විසින් නොකටයුත්තක් කරතොත් තොපි අවවාද කරවයි කියන්නා අවවාද කියා නවත්වනු හැක්කේ වීනම් කියම් බැරියේ වීනම් බැනනොනැග ඉඳිම් කියා කීහ. බමුණාත් තමා යන වෙළඳාමට ගියේය. එවක් පටන් බැමිණියගේ ගෙට එන්නන් යන්නන්ගේ අවසරයක් නැතිවිය. එවිට බෝධිසත්වයන්ගේ මලනුවෝ බෝධිසත්වයන් ලඟට අවුත් කියන්නාහු පියානන් වහන්සේ යන ගමනේ අවවාද කියන්නට වේදැයි කියාලා ගියේය. අවවාද කියා බලම්හයි කියන්නා එවිට බෝධිසත්වයෝ කියන්නෝ මලඬ තොප බාල විසින් නොදන කියන බස්ට පෙරයම් දසපැයට මේ ගෙට වන්නාවූ ගණන් නැත. අනික් විසිපැයේ ගෙට වදනවුත් ගණන් නොදනෙයි එසේවූ ස්ථානයෙහි කුමන අවවාද කියන්නේද බැණ නොනැගී ඉඳුවයි මයිලනුවන්ට අවවාද කියා උන්නාහ. එසේ සිටි නොබෝ දවසකින් බමුණු ආයේය. බමුණු ඇවිත් බෝධිසත්වයන් අතින් බැමිණිගේ දුරාචාර කුමක්දැයි විචාරන්නා ගිරවානෝ කියන්නා දුරාචාර අප්‍රමාණය, මෙසේවූ දුරාචාර කරන්නේ නුඹ වහන්සේ කෙරේ අභිප්‍රාව නැත්තෙන් නොවේද එසේවූ තැනැත්තිය ගෙයි තිබාගෙණ ඉන්නේ කින්දැයි කියා නැවත කියන්නාහු. මේ දෝෂය කී වේලේ පටන් අප මෙතන ඉඳීම කාරණා නොවෙයි සිතා මලනුවනුත් ඇරගෙණ පිය බ්‍රාහ්මණයාගේ දෙපතුල් වැඳ ආකාශයට වැද වනයට ගියෝයයි වදාරා, එසමයෙහි බැමිණි නම් පුරාණ දූතිකාය, බමුණා නම් මේ කියන භික්ෂූය, රාධ ගිරවානෝ නම් ආනන්ද ස්ථවිරයෝය, පොටඨපාද ගිරවානෝ නම් ලොව්තුරා බුදුවූ මම්මයයි වදාරා රාධ ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# කාක ජාතකය

තවද එක් සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මහළු උපසකවරු මොත්තමක්ව පින්කොට ඇවිදිනාහු. එක් දවසක් සමඟවා හිඳ සිතන්නාහු. මහළුව සිටිනා බලාත් තපස්කොට මහණව රහත්ව කෙළෙසුන් නසාපුවොත් යහපතැයි සිතා බුදුන් කරා අවුත් ස්වාමීනි මහණ කරවා වදාරන්නේ යහපතැයි කියා මහණ කරවා මහණවුගමණෙත් ජේතවනාරාමයෙහි කෙළවර එක්තැනක පන්සල් ඉදිකොට ගෙණ වාසය කරන්නාහ, මහළුව මහණවූ විසින් අකුරක් කොටගතත් නොහෙනසේක. බුදුන් වදාළ බණ භාවනා කොටත් රහත්ව ගතනොහෙනසේක. වීථියේ සිඟා වඩනාකලත් තමන් වහන්සේ අඹුදරුවන්ගේ ගෙටම සිඟා වඩනාසේක. මෙසේ ඉන්නා අවදියට ඒ උපාසිකාවෝ එක්තරා ව්‍යාධියකින් නැසීගියහ. එපවත් ඒ මහළුවරුන් වහස්සේත් අසා හස්ත කර්මාන්තයෙහි සපන් ස්ත්‍රී නැසී ගියාහයි උනුන් කරා අත්වැල බැඳ අඬන්ට වන්නාහ. එපවත් සංඝයා වහන්සේ අසා එතනට අවුත් අඬන කාරණා විචාරා යහපත් කොට බත් මාළු පිසන ස්ත්‍රිය මළහෙයින් අඬම්හයි කී විසින් එපවත් ඇසූ මහළුවරුන්වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ මේ කථාව කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථවකින් යුක්තව උනුදැයි වදාරා එපවත් අසා පළමුත් මූ අඹුවන් මලගමනේ අඬා මහ මුහුද පැන් ඉසීන්ට බැරිහෙයින් අඬා මියන්ට වන් ගමනේ උත්තමයන්ගේ සහයෙන් ගැළවුනේ වේදැයි වදාරා ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත් ?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ සමුද්‍රයෙහි දේවතාව, ඉපද වාසය කරණසේක. එසමයෙහි බොහෝ මනුෂ්‍යයෝ රැස්ව සමුද්‍රයේ වසන දේවතාවන්ට හා නයින්ට බලි පිණිස බොහෝ රා මස් බත් මුදුවැල්ලේ තිබුවාහ, ඒ අවස්ථාවෙහි කැව්ඩියක් හා කපුටෙක් මූදුවැල්ලේ ඇවිදිනාහු ඒ බත් හා රා මස් කා රා මතින් මත්ව මුහුද නාම්හයි කියා රලගසන සමීපයෙහි නාමින් සිටිකල මහත්වූ රල ඇවිත් කැව්ඩිය රලෙන් අරගෙණ ගිය කලට වහා මතස්‍යයෙක් කාපිය, ඒ දැක කපුටුවා තමාගේ බිරින්ද රැලින් අරගෙණ ගියහෙයින් ඇඬීය. ඒ අඬ අසා එතනට රැස්වූ කපුටුවෝ දුක්මුසුව කින්දැයි විචාරා තොප ඇමගේ යෙහෙලිය මහ මුහුද ඇරගෙණ ගියේයයි කීකලට බොහෝ කපුටුවෝ ඒ අසා වික්‍ෂෙපව අප මෙතෙක්දෙනා එක්වූ කළ මහමුහුද පැන් ඉසපිය නොහැක්කදැයි සිතා මහ මුහුද පැන් කටින් උක උකා දමන්ට වන්නාහ. මේ නියායෙන් බොහෝ වේලාවක් උත්සාහ කොට සැතපී ඉන්නාහු යම්තම් අඩුවකුත් නුදුටුහෙයිනුත් එනුදිය කටින් හයන විසින් උගුරවියලින, හුඹුක්ක පුප්පා පැන්ගෙණෙන හෙයින් හනුවත් ඉගිලින, බොහෝ විට පැන් ගැළෙන හෙයින් දෑසුත් රතුව බොහෝ ආයාසයට පැමිණ පැන් ඇදීම් තිබා රැකියයි කියා අඬන්නාහු. ගිරා කටක් සේ කටක් ඇති මොණරපිටක් සේ පෑය ඇති කුරව්කෙවිල්ලක හඬබඳු කටහඬ ඇති අපගේ යෙහෙලිවන කැව්ඩිධෙනුව සොරහු මුහුදු ඇරගෙණ ගියේ වේදැයි කිය කියා එකරාවයෙන් බොහෝ කපුටුවෝ අඬන්ට වන්නාහ. එවිට බෝධිසත්වයෝ එපවත් දැන හයන්කාර වේෂයක් පෑ උන්ගේ සෝක නිවිහයි වදාරා එසමයෙහි කැව්ඩී නම් මෙසමයෙහි යහපත් මාළු පිසූ උපාසිකාය. ඒ ඇඬූ කපුටුවෝ මොතතම නම් මේ මහළු භික්ෂු මොතතමය, උන් ඇමට හයගන්වාසෝක සන්සිඳවූ සමුද්‍ර දේවතාවා නම් ලොව්තුරා බුදුවූ මම්මයයි වදාරා කාක ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# ද්විතීය පුෂ්පරත්ත ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උකටලීවූ වහන්දෑ නමක් දැක වදාරා මහණ කුමක් නිසා උකටලීදැයි විචාරා පියමන් ආදියෙහි දක්ෂවූ මාගේ පුරාණ දූතිකාව නිසා උකටලීවීම් දන් වන්නා පළමුත් මහණ ඈ නිසා උල ඉඳුවා අවීචිමහනරකයට ගියෝවේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ආකාශස්ථ දේවතාව උපන්සේක. එසමයෙහි කාර්තික උත්සව දවසෙක දුක්බිත පුරුෂයෙක් තමාගේ ඇති රෙදි කඩ පොළු දෙකක් යහපත් කොට අපුල්ලා සියයක් දෙසියයක් විවර පටබිඳ ගෙයි තබා උත්සව දවස් අඹුවන් විසින් ළඟට අවුත් වනුක් මලෙහි පැය ඇති කඩක් ඇඳගෙණ තොප හා මා හා සිපගෙණ වීථියේ කෙළින්ට උවමැනවැයි කීහ. එවිට පුරුෂයා කියන්නේ මා දුක්බිතවුව මට වනුක්මලේ පැය ඇති පිළි කොයින් දැයි මාගේ අපුල්ලා තිබූ සුදුකඩ ඇත. ඒ ඉනකඩ ඇඳගෙන කෙළුවයි කීහ. එසේ කීවත් ඕතොමෝ කියන්නී වනුක්මලේ පැය ඇති ඉන කඩක් ලදොත්විනා මා කෙළිනා කෙළිනැත, සුදුකඩ ඇඳගෙණ කෙළින්ට අභිප්‍රාය ඇත්නම් අනික් බිරින්දක් ඇරගෙණ කෙළයවයි කීහ. එපවත් පුරුෂයා අසා නැවත යාචඤාකොටත් ස්ත්‍රිය විසින් කියන්නී පිරිමින් විසින් සිතුකල කුමක් බැරිද රජ්ජුරුවන්ගේ වනුක්මල් වත්තට ගොසින් මල් කඩා ගෙණ එවයි කියන්නා ඊට පුරුෂයා කියන්නේ රජ්ජුරුවන්ගේ වනුක්මල් වත්තට ගොසින් මල් කඩාගෙණ එන්නා තිබා කර ඔසවා බලන්ටත් මට බැරියයි කියන්නා රාත්‍රියෙහි ගොසින් කරණ සොරකම් බැරිදැයි කියා තත්පර විසින් ස්ත්‍රියගේ අභිප්‍රාය මැඩගත නොහෙන පුරුෂයා විසින් යහපතැයි ගිවිස නුවරින් පිටත ගොස් වැට පැන වත්තට වන්නාහ. වත්ත බලන මනුෂ්‍යයෝ ඔහු වැට පැණි නියාව අසා ගොස් සොරෙක්වනැයි යුහුව එතනට ගොස් ඔහු අල්වා පිටිතල හයා බැඳ රෑ උයනේ රඳවා පාන්වූ ගමනේ රජ්ජුරුවන්ට පෑකල්හි රජ්ජුරුවෝ උයනේදී අල්වාගත්කල මට පානේ කින්දැයි දිවස් උල ඉඳුවයි කීහෙයන් වද බෙරගස්වා ගෙණගොසින් දිවස් උල ඉඳවූහ. දිවස්උල ඉඳවූ වේදනාද කඩවුන් විසින් තියුනු මුවහත් ඇති තුඩින් ඇස සරණා වේදනා හා මේ එකක්කොට නොසිතා මාගේ සොඳ බිරින්ද වනුක් මලින් රැඳුනු කඩක් ඇඳගෙණ කාර්තික උත්සව කෙළිසට සිතුවානුවූයේ වේදැයි වික්ෂෙපය උපන් අවස්ථාවට ප්‍රාණය නිරුඬව අවීචි මහ නරකාදියෙහි උපන්හයි වදාරා එසමයෙහි දෙමහල්ලෝ නම් මෙසමයෙහි දෙමහල්ලෝමය, ඒ කාරණය ප්‍රත්‍යක්ෂව දුටු ආකාශයට දේවතාව නම් ලොව්තුරා බුදුවූ මම්මයයි වදාරා මේ පුෂ්පරත්න ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# තෘතීය සිඟාල ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අළුත මහණවූ පන්සියයක් දෙනාවහන්සේ මධ්‍යම රාත්‍රියෙහි කාම රාගයක් ඉපදවූසේක. ඒ වේලාවේ සර්වඥයන් වහන්සේ මේ වේලාවට මාගේ භික්ෂූහු කුමන සිතිවිලි සිතත් දෝහෝයි මහා කරුණා සමාපත්තියෙන් බලා වදාරණසේක්. ඒ පන්සියයක් භික්ෂූන්ට රාගවිතකියක් උපන්නියාව දැක චක්‍රවර්ති රජ්ජුරුකෙණෙකුන්ගේ නුවරට සතුරුකෙණෙකුන් වන්නාසේ මා ඉන්නා ජේතවනාරාමයෙහි ඉන්නා වහන්දෑට උපන් විතර්කය මා විසින් බණකියා රාගචිත්තය දුරුකොටපියන්ට උවමැනවැයි සිතා ආනන්දයයි වදාළසේක. ආනන්දසාමි බුදුන්ට අත්පාමෙහෙවර කරණ පස්විසි අවුරුද්ද මුළුල්ලෙහි බුදුන්කෙරේ රාත්‍රි රැකවල් පිණිස අහෝ රාත්‍රියෙහි අත්වැට පහන්ගත් අත් ඇතිව ඇවිදිනාසේක. එසේහෙයින් බුදුන් අඬගෑ අඬ අසා ඇයිද සාමිනි කියා ලඟට ආසේක. සර්වඥයන්වහන්සේ සිතා වදාරණසේක්. රාගචිත්තය උපන් පන්සියයක් දෙනා වහන්සේ ගෙන්වාගෙණ බණ කීම් නම් අපට උපන් සිතිවිල්ල සර්වඥයන් වහන්සේට දැනීනැයි සිතා භයපත්වන්නාහ. භයපත්වූකල සිතහෙලා බණ නොඅසන්නාහ. සිතහෙලා බණ නොඇසීමෙන් අධිගමයට නොපැමිණෙයි සිතා වදාරා සාමාන්‍යයෙන් ඇමට බණකියම් සිත ජෙතවනාරාමයෙහි වසන භික්ෂූන් එක්කරවයි කියා වදාළසේක. එපවත් ඇසූ ආනන්දසාමි යතුරු කෙසි මුදු ඇරගෙණ ගෙයක් ගෙයක් පාසා ගොස් දොර දොර ඇර එපවත් කීසේක. එපවත් ඇසූ මහළුවරුන්වහන්සේ ජේතවනාරාමයට වැඩිසේක. භික්ෂූන් වහන්සේ රන් පර්වතයක් රත්පලසකින් වසනකලක් පරිද්දෙන් වත්පිළිවෙත් දක්වා වැඩඋන්සේක. සර්වඥයෝත් නීල පීත ලෝහිත අවදාත මාංජෙෂටප්‍රභාසවර යයි යන සවනක් ඝණ බුදුරැස් ආකාශයෙහි විහිදුවා හිරු දහස් සඳ දහස් නැන් ගාසේ ඒකාලෝකකොට වැඩහිඳ බණවදාරණසේක්. මහණෙනි භික්ෂූන් විසින් කාම විතර්ක ව්‍යාපාදවිතර්ක නොසිතිය යුතුය, ස්ත්‍රීන් විෂයෙන් සිතිවිලි යම්තමක් සිතුවත් බොහෝ අකුසල් පිරෙයි කාරණා කිම්ද සර්පයෙක් කඩා කෑ මුඛය යම්තම් වචනයක් වුවත් සියළු සර්වාංගයම විෂමූර්ජාවෙන් නසා පියන්නේය. ගින්නක් යම්තම් උවත් බොහෝදෙය දවා භෂම කොට පියන්නේය, එකසෙනක් ගැසූතෙනක බොහෝ ගස්කොලන් දවා භෂම කොට පියන්නේය, පඤ්චකාමයෙහි සිතිවිල්ලත් එවැන්න මෙහි ඇල්මක් කිරීම ඇත්මයෙහි ඇල්ම කොට කරණහිලාටවූ දුක්වැන්නේයයි වදාරා ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ සිඟාල යෝනියෙහි උපන්සේක. එසමයෙහි එක් ඇත්මිණියක් බෝධිසත්වයෝ දැක මාගේ දිවි හිමියෙන් කන්ට ඇතැයි සිතා කැණහිල් ගොස් ඇතු සොඬ ඩැලිය නගුලිසක් ඩෑ කලක්මෙන් වූයේය, දල ඩැලිය හරයක් ඩෑවාසේ තුබුයේය, බඩ ඩැලිය අටුපලලක් ඩෑවාසේ තුබූයේය, ගුදය ඩෑයේය, තෙල්කැවුමක්සේ තුබූයේය. එසේ තිබෙන්නාවූ තැනින් මොලොක් මසක් ලදිම් සතුටුව කකා බඩටවැද සැපසේ මාංසත් කෑ හැක්ක පැනට මාරුව ලෙත් පියහැක්ක අක්මා පපු ඉසට ලාගෙණ ඇත් සමපිට වැද හෝනටත් හැකිය. එසේහෙයින් ඔබ්බට ගොසින් ජීවත් වීමෙන් ප්‍රයෝජනයකින්ද මෙතෙන ඉඳ ජීවත්වෙම් සිතා එලෙසම කා බි දවස්හරින්ටවන, ඒ අවදියට නියඟයක කොට ඇත්සම වියලෙත් වියලෙත් වලිමග ඇසිර ගියේය, ඇතසම වියලෙන්න මාංසත් තදව ගියේය. ලෙත් සිඳී ගිය ලොකනතරක නරකය මෙන් මහා අන්ධකාරවිය. මහත්වූ උෂ්ණ පවතින්ටවන. කැනහිල් මහත්වූ භයට පැමිණ ගැලවීයන උපායක් ඇද්දෝහෝයි වටම දිව ඒ ඒ තැන හිස ඇන ගැලවී යන මගක් නොදැක මහත්වූ භයින් තැවිතැවී ඉඳීය, එක්තරා වැස්සෙක් වැස වලිමග තෙමී තරුවක්සේ එලියපෙණින. ඒ වේලාවෙහි කුම්භස්ථලය දක්වා පසුබැස මහත් වේගයෙන් පිටතට දීවෙමියි පීනාහු, එකල්හි කැණහිළුගේ සර්වාංගය ඉදී තිබූහෙයින් සියළු ලොම්ම වලිමග ඇලින, කැණහිලා ලොම් ඇරී තල්කඳක් මෙන් මැත්ව බිය නැත්තේ සිතන්නේ මාගේ තෘෂ්ණාවේ අධිකයෙන් මෙසේ විනාසයට පැමිණියෙමි, මෙයින් මතු ඇත් කුණු නොකම්යි අධිෂ්ඨාන කොට එතැන් පටන් කොට ඇත්කුණක් නොකෑයේයයි වදාරා චතුස්සත්‍යය වදාළසේක, ජාතකය අවසානයෙහිදී පන්සියයක් භික්ෂූන් වහන්සේ සියළු කෙලෙසුන් නසා අර්හත් මාර්ගයට පැමිණිසේක. සෙසු බොහෝ භික්ෂූන් වහන්සේ සෝවාන් සැදැගාමී අනාගාමී තුන්මග තුන්ඵලයට පැමිණිසේක. බොහෝදෙනාට ධර්මය අභිවෘද්ධිවිය, එසමයෙහි කැනැහිල්ව උපන්නේ ලොව්තුරා බුදුවූ මම්මයයි වදාරා මේ සිඟාල ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# විරොචන ජාතකය

තවද සර්වඥයන් වහන්සේ විශාලා මහනුවර මහවනයේ කූටාගාර ශාලාවෙහි වැඩවසන සමයෙහි විශාලා මහනුවර ගව්වෙන් ගව්ව නියාවට පවුරු තුනක් හා අට්ටාල ගෝපුරයෙන් සමලංකෘතව තිබෙන්නේය. තවද ඒ නුවර සත් දහස් සත්සිය සත්දෙනෙක් රජදරුවෝ ඔටුනු පැළඳ රජ කෙරෙති. එපමණම යුවරජ දරුවෝත් ඇත්තාහ, එපමණ සෙනෙවිරත්වරුත් ඇත්තාහ.

එපමණ භාණ්ඩාර නායකවරුන් ඇත්තාහ. මේ නියායෙන් අමාත්‍ය මණ්ඩලයා හා සෙනා සමුර්ධිය ඇතිව ඉන්නා අවදියේ සත්දහස් සත්සිය සත්දෙනෙකු රාජකුමාරවරුන් අතුරෙන් දුටයි නම් ලිච්ඡවි කුමාරකෙණෙක් ඇත්තාහ. චණ්ඩය පරුෂය බසක් කියා නම් ගසාලා බැනලා විනා නොකියන්නේය, ඇමදාම දණ්ඩෙන් ගසා කුපපවන ලද සර්පයෙකු වැන්නේය, කෝපයෙන් දිලිහි කොපාග්නියෙන්ම දිලිහී ඇවිදිනේය, ඒ රාජකුමාරයන් දැක්කදී බස් එකක් දෙකක් කියාගන්ටත් නොපිළිවන් වන්නේය, දෙමව්පියන් පටන් තුන්මල් බෑවුන් ආදීවූ එක් කුසෙහි බන්ධුහුද සුත ප්‍රේමයෙන් වදාගත් දරුවෝද ඉච්ඡාපරව ඉඳිනාහ. බිරින්දද යාළු විශ්වාසයෝද යන සියල්ලෝම තද එෂී කෝපී මනුෂ්‍යයන් දුටුකළ කඩාකන්ට ආ සර්පයෙකු මෙන්ද සොරුන් අතින් වනයකට වන්නාක්මෙන්ද මස්කන්ට ආ යකෙකු දුටුවාක් මෙන්ද ඔහු කෙරේ භය ඇතිව දවස් හරණාහ. මේ නියායෙන් ඉහලෝකයෙහි දවස් ඇර පරලෝ සතර අපායෙහි වැටී බොහෝ දුක් විඳිනාහ. කෝපී මනුෂ්‍යයෝ කෝපී විසින් පූර්වචන්ද්‍රයාසේ මුහුනක් උවත් ගිණිදුම් වැදගත් පියුමක්සේ අසෝභමත් වන්නේය. මල ගැසුනු රන් කැඩපතක් සේ වන්නේය, කෝපයාගේ අධිකත්වය ඉවසාගත නොහී තමා තමාට ඇනගන්නේය, ඒ නැත්නම් හලාහල විෂයෝ අනුභව කරන්නේය, කරවැල් ලා ගෙණ මීයන්නේය, මහත්වූ ප්‍රපාතයෙන් වැටී මීයන්නේය, මෙසේ එක් උපායෙකින් මළකළ දෙවෙනි ජාතියෙහි නරකයට වැටී බොහෝ දුක් විඳ මනුෂ්‍යාත්මභාවයක් ලත් කල්හි උපන්දා පටන් චක්ෂු රොග ශ්‍රොත රොගාදීවූ රොගයෙන් එක්තරා ව්‍යාධියකින් මෙසේ අපරිමිත ව්‍යාධි ඇතිව බොහෝ දුක්විඳිනේය, සියළු සත්වයන් කෙරේ මෛත්‍රී මුදිතා දයා කරුණා ඇතිවීමෙන් මෙකී දුක් ඔහට නොවී සියළු සම්පත් විඳිනේයයි වදාළසේක. මේ එකවාරේ වදාළ අවවාදයෙන්ම ඒ කුමාරයා තමාගේ මානය හැර එතැන්පටන් දල උදුරාපු නයින්සේද නල උදුරාපු කකුළුවන්සේද අඟකපාපු ගෝනුන්සේද සාගත දානතව දවසරිනෝය. යම්කෙණෙක් මැරූ තැළු නමුත් බැන්නෝ නමුත් මට බැන්නෝ මැරූ තැළුවෝ කව්රුදැයි කියා ආපස්සා පමණකුත් නොබලන්නේය, මේ නියායෙන් දවස් අරනේය, එක්දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්වූ මහළුවරුන් වහන්සේ ඇවැත්නි සර්වඥයන් වහන්සේ විසින් දෙමව්පියන්ට පවා අවවාද කියා හික්මවා ගත නුහුනු රාජ කුමාරයන් ඇතෙකු හසත්‍යාචාරියෙක් දමනයළුවාසේ එක අවවාදයෙන්ම දමනේ ලවනලදැයි කියන්නා ඊට අනික් නමෙක් එසේමය, ඇවැත්නි නැගෙණහිර බස්නාහිර උතුරු දකුණු දිගය යන සතර අනුදිගට තමා සිතුතෙනට අසුන් ගොන් දමනයේලාද එසේම පුරිසධම්ම සාරථීවූ තිලෝගුරු සර්වඥයන් වහන්සේ පුරුෂයනුත් රූපාරූපාදිවසයෙන් සිතු දිසාවට මනුෂ්‍යයනුත් හික්මවීම සර්වඥයන් වහන්සේට මිසක් අනික්කාට පුළුවන්දැයි කියා මේ කථාව කිය කියා උන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි වදාරා එපවත් අසා මහණෙනි දැන් මතු නොවෙයි පළමුත් ඒ රාජකුමාරයන් දමනේලනලදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජයය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ප්‍රසිද්ධවූ බ්‍රාහ්මණ කුලයක ඉපිද දෙමව්පියන්ගේ ඇවෑමෙන් පිරුණු සම්පත් හැර හිමාලය වනයට ගොස් මහණව ලුණු ඇඹුල් සොයා බරණැස් නුවරට අවුත් පිඩු පිණිස වීථියේ වඩිනාසේක. එකල්හි රජ්ජුරුවෝ තාපසයන් වහන්සේ දැක එක්තරා අමාත්‍යයෙක් කැඳවා අර වඩිනා තාපසයන්වහන්සේ කැඳවාගෙණ එවයි කීසේක. අමාත්‍ය තෙම එහි ගොස් ඒ බව දැන්වූ කල්හි තාපසයන් වහන්සේ ඔහට මෙසේ කීසේක, පින්වත රජ්ජුරුවන් හා පළමු පුරුදුකමෙකුත් නැත, අපි හිමාලය වැසී තොප සවරුවම්හ මම රජ්ජුරුවන්ගේ කුළුපග තාපසකෙණෙකුත් නොවෙමි එහෙයින් අප රජ්ජුරුවෝ කුමට කැඳවද්දැයි කීසේක. එපවත් අසා අමාත්‍යයා ගොස් උන්වහන්සේ නොවඩිනාසේකැයි රජ්ජුරුවන්ට දැන්වීය, රජ්ජුරුවෝ එපවත් අසා අපගේ කුළුපගවූ තාපසකෙණෙකුන් නැත, තමන්වහන්සේ විනා අනික් තාපසකෙනෙකුන් අපි දුටුයේ නැත, එසේ හෙයින් වඩිනට උවමැනවැයි දෙවෙනිවත් ආරාධනා කළාහුය, එපවත් තාපසයන් වහන්සේ අසා රජගෙට වැඩිසේක. රජ්ජුරුවෝ තාපසයන් වැඳ වැඩහිඳිනේ වඩිනේ කොයිදැයි විචාළහ. එවිට තාපසයෝ කියන්නාහු මහරජ හිමාලය වනයෙහි වාසය කොට වර්ෂා කාලය පැමිණි කල්හි වස්වසන තැනක් සොයා ඇවිදිම්හයි කීහ. එපවත් රජ්ජුරුවෝ අසා මාගේ මඟුල් උයනෙ වස් වසන්නේ යහපතැයි කියා තුමූ බත්කා ඉක්බිති තාපසයන් වහන්සේ කැඳවාගෙණ උයනට ගොස් උයනේ වැඩ ඉන්ට සලස්වා උයන්ගොව්වා මුන් වහන්සේ අතපාමෙහෙවර කරන්ට තොපට භාරයයි භාරකොට රජගෙට අවුත් එතැන්පටන් දවසකට කීපවිටක් තාපසයන් දකින්ට යන්නාහ. මේ නියායෙන් දවසරින සමයෙහි රජ්ජුරුවන්ගේ දුෂ්ට කුමාරයෝයයි කුමාරකෙණෙක් ඇත්තාහ, ඒ තෙම චණ්ඩය ඵරුෂය දණෙඩන් ගසනලද සර්පයෙකු මෙන් කෝපයෙන් දවසරිනේය, ඒ අවදියේ දෙමව්පියන් බන්ධුසභාය ආදීවූ වන් කීදෙයක් නොඅසන්නේය. එපවත් රජ්ජුරුවෝ දැක කුමාරයන් ඇර ගෙණ තාපසයන්වහන්සේ ලඟට ගොස් ස්වාමීනි මේ කුමාරයා චණ්ඩය ඵරුෂය. ඔහු හික්මවා වදාළමැනවැයි කියා

SANHIDA LANKA

තාපසයන් වහන්සේට පාවාදී රජ්ජුරුවෝ ගියාහ. තාපසයෝත් කුමාරයන් අත අල්වාගෙණ උයනේ ඇවිදිනාහ. දෙපෙති කොහොඹගසක් පෑ කුමාරයෙනි මින් එකපතක් සපාකාපියවයි කීහ. යහපතැයි කියා කුමාරයෝ ඉන් එකපතක් සපාකා තිත්තහෙයින් කෙළ හා සමග බිමට දමා දෙපෙති අවස්ථාවේ මෙසේ මහත්වීනම් බොහෝ නසාපියයි කියා ඒ ගස උදුරා අතින් සටා දමාපුවාහ. එවිට තාපසයෝ කියන්නාහු. දුටුවාද කොහොඹ ගස තිත්ත විසින් කඩා දමන ලද ඒ නියායෙන් මේ අමාත්‍යයෝ මේ කුමාරයෝත් දැන්ම මෙසේවූ චණ්ඩත ඵරුෂය. රාජ්‍යයට පැමිණියහොත් බොහෝ අනත්ථ කරන්නේයයි කියා තොපත් නසන්නාහ. එසේහෙයින් තොප විසින් චණ්ඩ ඵරුෂ නොව දැහැමෙන් දවස්හරුවයි අවවාද කීසේක. අවවාද ඇසූ කුමාරයෝ එතැන්පටන් චණ්ඩ ඵරුෂ නොවී දවස් ඇරියාහ. රජ්ජුරුවන්ගේ ඇවෑමෙන් දැහැමෙන් සෙමෙන් රාජජය කොටකම්වූ පරිද්දෙන් මියපරලොව ගියාහයි වදාරා එසමයෙහි දුෂ්ට රාජකුමාරයෝ නම් මෙසමයෙහි දුෂ්ට රාජකුමාරයාය, එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය, එසමයෙහි තාපසයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම යයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සංජීවක ජාතකය

තවද සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි අජාසත් රජ්ජුරුවෝ දුස්සීල පාපීවූ දේවදත්ත ස්ථවිරයන් කෙරෙහි පැහැද ගයා නම් ගඟ හිස පන්සලක් කරවා උපස්ථාන කරන්නාවූ උන්ගේ බසින් බුදුන්ට නාලාගිරියා මෙහෙයිමෙන් විදින්ට දුනුවායන් යවීම් ආදීවූ බුදුන්ට බොහෝ අනර්ථකරවා සෝවාන්වූ ධර්මිෂ්ටවුපියම්හ. රජ්ජුරුවනුත් දේවදත්ත ස්ථවිරයන්ගේ බසට මරවා දේවදත්ත ස්ථවිරයන් පොළොව පලා ගිලුම්හයි ඇසූ දවස් පටන් දේවදත්ත ස්ථවිරයන් පොළොව ගිළුකල් උන්ගේ බස් නියාවට පිළිපන් මටත් එසේ පැමිණේයයි සිතා රෑ දවල් භයට පැමිණ දිවාමානයේ සැපසේ දවසැර රාත්‍රිමානයේ සැපවේදෝහෝයි සිතා වැදහොත් කලක් පොළොව පළාගෙණ යන්නාසේ නරකයෙහි ගිණිදැල් ඇඟට වැද ගන්නාසේ ස්වප්නයෙන් දක්නා විසින් බොහෝ භයට පැමිණ බෙල්ල කරකවා අච්චට දැමූ කුකුලෙකුසේ රෑ දවල් භයට පැමිණ රාජ ඓශ්වර්‍ය්‍ය කෙතෙක් දුටු ස්වප්න විචාරන්ට තද සිතිවිලි ඇතිව බුදුන් දකින්ට යෙමි. එදවස් ජීවකයන්ට ලැජ්ජා ඇතිව ව්‍යාජයෙන් කියන්නාහු. අමාත්‍යයෙනි සඳ පහණ දවාලක්සේ දුනු පන්සාළිසෙක එපිට තුබූ කප විද්දහැකි මේ සඳ පහණ ඉතා ප්‍රසන්නයහ, ඉතා නිස්කලංකයහ, ඉතා මනෝඥයයහ, ඉතා රම්‍යයහ, මෙසේවූ වේලෙහි නිකම් මෙතන ඉඳ කරන්නේ කිම්ද යහපත්වූ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙකුන් කරා ගොස් බණ දහම් අසන්ට යන්ට අභිප්‍රා ඇත, කව්රුන් කරා යමෝදැයි විචාළහ, ඒ ඇසූ අමාත්‍යයෝත් තමන් භක්ති ගත් සැලැස්ම කියන්නාහු. නිවටුන්ගේ ගුණ කියන්ට වන්නාහ, ඉන් එකෙක් කියන්නේ පුරාණ කාශ්‍යප නම් මකබලිගෝසාල නම් බුදුන් කරා ගියොත් යහපතැයි කීහ. අනිකෙක් කියන්නේ උන්නියාවට අජිතකෙසකම්බල නම් බුදුන් කරා ගියොත් යහපතැයි කිව, අනිකෙක් කියන්නේ කකුධකාත්‍ය යන බුදුන් කරා ගියොත් යහපතැයි කීය, අනිකෙක් කියන්නේ සංජයබෙල්ලධීපුත්‍ර නම් බුදුන් කරා ගියොත් යහපතැයි කීහ. අනිකෙක් කියන්නේ මෙකී බුදුන් ඇමදෙනා නියාවට නිඝණ්ඨනාථ පුත්‍ර නම් බුදුන් කරා අපගේ යාම යහපතැයි කීහ. මේ නියායෙන් නිවටුන් වැනි කොල්ලන් ඇරගෙණ තම තමන්ට කටට ආවාක්ම කීවාහ. රජ්ජුරුවෝ උන් කියන බස් නොඅසා ඉඳ ජීවකයන් විසිනුත් මා නිසා යම් කථාවක් උපන්නේයයි දැන ගණත් බැණ නොනැගී උන්නාහ, එපවත් රජ්ජුරුවෝ දැන ඇයි කුමාර භාණ්ඩකවූ ජීවකයෙනි මෙතෙක් දෙන තම තමන්ගේ භක්ති ගත් බුදුවරුන් කීයේය, තොප බැණ නොනැගී ඉඳිනේ තොප භක්තිගත් බුදුකෙණෙක් නැද්දැයි කීය. එවිට ජීවකයෝ ඒ අසා උනස්නෙන් නැගිට බුදුන් වසන දිසාවට වැඳ බුදුන්ගේ නව හරහාදී ගුණ කියා මෙසේ ගුණ ඇති සර්වඥයන් වහන්සේ මාගේ අඹ උයනේ එක් දහස් අටසියයක් භික්ෂූන්වහන්සේ පිරිවරා ගෙණ වැඩහිඳිනාසේක්. දකින්ට වැඩියොත් යහපතැයි කීය. ඒ පවත් රජ්ජුරුවෝ අසා ඉතාම හොඳය. ඒ නියාවට ඇත්වාහන හා සේනා සමුර්ධිය කරවයි කියා ඒ නියාවට සේනා සමුර්ධිය කරවාගෙණ මහත්වූ රාජ ඓශ්වර්‍ය්‍යයෙන් බුදුන් කරා ගොස් ඇතු පිටින් බැස ගණයට අවුත් සකස්ව හැඳ පෙරව මනා ඉඳුරන් ඇතිව අතක් පයක් සැලීමක්වත් මෙතෙක් දෙනා වහන්සේ ඉඳිනාතෙන කැස පිහන පමණක්වත් නැතිව මනාව වැඩ උන්නා දැක සතුටුව සංඝයා වහන්සේ පළමුව වැඳ පසුව බුදුන් වැඳ එකත් පස්ව හිඳ ප්‍රශ්න විචාරන්නා කැමැත්තෙයි දැන්වීය, යහපත මහරජ ප්‍රශ්න විචාරවයි වදාළ කල්හි රජ්ජුරුවන් විසින් කියන්නාහු ස්වාමීනි මහණදම් පිරීමෙන් ලැබෙන ආනිසංස කුමක්දැයි විචාරන්නා දෙබනවරකින් හා පන්සියයක් ග්‍රන්ථ සංඛ්‍යාවෙන් යුත් සාමාන්‍ය ඵල සූත්‍රය වදාරා රජ්ජුරුවන් විසින් බුදුන් වැඳ ස්වාමීනි මා නොදැන කළ දොහ ඉවසා වදාරන්නේ යහපතැයි ක්‍ෂමා කරවා ගෙණ ගියාහ. සර්වඥයන් වහන්සේත් භික්ෂූන් වහන්සේට මහණෙනි අජාසත් රජ පිතෘඝාත කර්මය කොට අසත්පුරුෂයා හා එක්වීමෙන් තමන් තමාම නසාගත් හෙයින් මිස නැත්නම් අදම සෝවාන් වන්නේයයි වදාල සේකි, දෙවෙනි දවස් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මහළුවරුන් වහන්සේ අජාසත් රජ අසත්පුරුෂයා නිසා ලාභයකින් පිරිහී ගියේවේදැයි වදාරා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන් මතු නොවෙයි පළමුත් අසත්පුරුෂයන්ට සහායව අනර්ථය සලස්වා ගත්තේ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බරණැස් නුවර බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් ගාවට ඇවිත් ශිල්ප ශාස්ත්‍ර ඉගෙණ ගෙණ අවුත් බරණැස් නුවර දිසාපාමොක් ආචාරීන්ගේ පන්සියයක් අතවැස්සන්ට අකුරුකරවා වාසය කරන්නාහු. ඉන් එක් සංජීවක නම් මානවකයෙකුට මලමිණිමන්ත්‍රය පිරුවා දේවතානුභාවයෙන් උපද්දා කීප අඩියක් ඇවිදිනා පමණට මන්ත්‍රය ඉගැන්වූහ, ලඟට ආ කළ නවතන මන්ත්‍රය නීගැන්වූහ. එසමයෙහි ඒ ශිෂ්‍යයා ඇතුළු වූ පන්සියයක ශිෂ්‍යයෝ වලට දරකඩා ගියාහ. එවිට ව්‍යාඝ්‍රයෙකු උපද්දා දෙම්හයි කීහ. අතවැස්සන් එනම් දෙයක් කවරකලකත් බැරියයි කියන්නා එසේවීනම් බලවයි කීය. මන්ත්‍රපිරුවන්ට පටන්ගත්හ, සෙසු අතවැස්සෝ කවුරු දනිද්දැයි කියා ගස් උඩට පැන නැන්ගාහ, ඒ තෙමේ මන්ත්‍රය පිරුව පිරුවා ගල් දැම්හ, එවිට ව්‍යාඝ්‍රයා නැගී සිට මන්ත්‍රය පිරූ තෙනැත්තහුගේ බෙල්ල කඩා මරා තෙමේත් එතනම වැටී ගියේය, සෙසු අතවැස්සෝ දරකඩා ගෙණවුත් ආචාරීන්ට කීහ. එපවත ඇසූ ආචාරීන් ශිෂ්‍යයන් ලඟට කැඳවා අසත් පුරුෂයාට සංග්‍රහ කිරීමෙහි විපාක ලද්දේ වේදැයි දැහැමෙන් සෙමෙන් සුචරිත පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝවේදැයි වදාරා එසමයෙහි සංජීවක මානවකයා නම් අජාතසත්‍රෘ රජය, එසමයෙහි බරණැස් නුවර දිසාපාමොක් ආචාරීව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මයි වදාරා සංජීවක ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# රාජෝවාද ජාතකය

තවද දුක්නිපාතයෙහි ජාතකය දක්වම්හ. කෙසේද යත්? සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි රජ්ජුරුකෙණෙකුන්ට කී අවවාදයක් නිසා මේ ජාතකය දක්වන ලද, මෙහි වර්තමාන කථාව තෙසකුණ ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. මෙහි කොසොල් රජ්ජුරුවෝ එක් දවසක බරණැස්නුවර යුක්තියක් විචාරණ නිසා බුදුන් දකින්ට උදය යානු හුනු හෙයින් දවල් බත් කා ඉක්බිති අතපැන් කොසිඳෙන තුරුම වහා රථයකින් ගොස් බුදුන් වැඳ එකත්පස්ව හුන්නාහ, සර්වඥයන් වහන්සේ මහරජ අද වූකලී දෙවැනි දවස කුමක් නිසා අවුදූයි විචාරන්නා දැහැමෙන් සෙමෙන් විචාරා පසිඳූවන නිසා නො ආයෙමි දූන් වනාහි රජ දරුවන් දැහැමෙන් සෙමෙන් යුක්ති විචාරීම් යහපත් වෙයි, මාසෙවු සම්මාසම්බුදු රජකෙණෙකුන් ගේ  අවවාද වූ නියාවෙන් වේද යුක්ති විචාරන්නේය. පළමු උත්තමයෝ කිසි කෙණෙකුන්ගේ අවවාදයක් නැතිව ඡන්ද්‍රාගිතිය, වෙෂාගතිය, භයාගතිය, මොහගතිය යන සතර අගතියට නොගොස් දැහැමෙන් රාජ්‍යයකළෝ වේ දූයි වදාරා රජ්ජුරුවන් විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ දස එකඩමසකින් බිහිවූසේක. ඒ කුමාරයන්ට නම් තබන්නාහු බ්‍රහ්මදත්ත කුමාරයෝය්යි නම් තුබූහ. ඒ කුමාරයානන් වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් කරා ගොස් ශිල්ප ඉගෙණ නිමවා බරණැස් නුවරට අවුත් පියානන්ගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ සතර අගතියට නොගොස් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරන්නාහ, උන්ගේ ධර්මිට්ඨකමින් අන්‍යායවෙකැයි යන දෙයක් නැතිවිය. අධිකරණ ශාලා හිස්විය. අමාත්‍යයෝ සවස්වනතුරුත් අධිකරණ ශාලාවේ හිඳ යුක්ති  විචාරන්නට එන්නන් නැතිහෙයින් ගෙවලට පලා යන්නාහ.  මේ නියායෙන් කිසි අයුක්තියක් නැතිව දවස් අරණා හෙයින් රජ්ජුරුවෝ සිතන්නාහු යම්සේ මාගේ නුගුණයක් කියන්නෝ ඇද්දෝහෝයි සිතා රෑ නිවාසයේ පරීක්ෂා කොටත් තමන්ගේ නුගුණයක් කියන කෙණෙක් නැතිව අපගේ රජ්ජුරුවන් වහන්සේ සුඛි සුවපත් වෙනසේක්වායි දීර්ඝායුෂ්කව ඉඳිනාසේක්වයි යන බස විනා අන්‍යයක් යුක්තියක් කළසේකැයි යන බසක් නොඅසා දෙවැනිව සිතන සේක් මොහු මා සමීපයෙහි වාසය කරන හෙයින් නුගුණ නොකියන්නෝයයි සිතා ඇතුළු නුවර පිටිනුවර අප්‍රසිද්ධ වෙෂයෙන් ගෙයක් ගෙයක් පාසා පරීක්ෂා කොටත් තමන්ගේ නුගුණයක් කියන කෙණෙකේ නොඅසා මා කෙරේ භයින් උනුන් නොකියන්නෝමයයි සිතා මාගේ අඥාව වැටෙන පිටි සරගම් නියම්ගම් බලන්ට යෙමි සිතා රාජ්‍යය අමාත්‍යයන්ට පාවාදී රථයට පැනනැගී නික්ම ඒ ගම්වල තමන් වහන්සේගේ යාපත්කර්ම විනා නපුරක් කියන කෙණෙකුන් නො අසා දෙවැනිව නුවරට එනසඳ සැවැත් නුවර මල්ලිකානම් රජ්ජූරුවෝත් තමන්ගේ නුගුණ කියන්නෝ ඇද්දෝ හෝයි පරීක්ෂා කරන්නට පිටත්ව ආ තැනැත්තෝ සැවැත් නුවර රජ්ජුරුවන් ගේ රථාචාරී කියන්නේ  අපගේ රජ්ජුරුවන්ගේ ගුණ කියමයි සිතා නුගුණම කියන්නේ එම්බල රථාචාර්යය අපගේ රජ්ජුරුවෝ දුෂ්ටයාට දුෂ්ටයෙන්ම ජයගන්නාහ, සත්පුරුෂයාට සත්පුරුෂකමින්ම ජයගන්නාහ. බොරු කියන තැනැත්තහුට බොරුවෙන් ජයගන්නාහ, සැබෑව කියන්නවුන්ට සැබෑව කියා ජයගන්නාහ, ලෝභී තැනැත්තවුට ලෝභයෙන් ජය ගන්නාහ,  තැගී තැනැත්තවුට ත්‍යාගයෙන්ම ජයගන්නාහ. මේ අපගේ රජ්ජුරුවන් වහන්සේග් ගුණය එසේ හෙයින් මග අරුවයි කීහ. ඒ බරණැස් නුවර රථාචාරීයා අසා තොපගේ රජ්ජුරුවන්ගේ ගුණ කියම් කියා තොප කීවා ගුණුවුව නුගුණයට ගිය කල ගුණ කොයිදැයි කියා අපගේ රජ්ජුරුවන් ගේ ගුණ අසවයි කියන්නෝ  කෝපි මනුෂ්‍යයාට කෝප නොකිරීමෙන් ජයගන්නා සේක. ලෝභ තැනැත්තවුට තෑගයෙන් ජයගන්නාසේක. බොරුකියන තැනැත්තවුට සැබෑ කීමෙන් ජයගන්නාසේකැයි කියා මේ අපගේ රජ්ජුරුවන් වහන්සේගේ ගුණය රථාෂාරීය මගහැරවයි කීහ. එබස් අසා මල්ලිකා රජ්ජුරුවෝ බිමට බැස ගොන් මුදා රථය ඉවත්කොට රජ්ජුරුවන් වහන්සේගේ රථය පදුවයි කිය. එවිට බරණැස් රජ්ජුරුවෝ සැවැත්නුවර රජ්ජුරුවන්ට කියන්නාහූ තොපි මාසේ දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියායයි වදාරා ගියාහයි එසමයෙහි මල්ලිකා රජ්ජුරුවන්ගේ රථාචාර්යයානම් දූන් මේ මෞද්ගල්‍යයාන ස්ථිවිරය. මල්ලිකා රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථිවිරයෝය. බරණැස් රජ්ජුරුවන්ගේ රථාචාර්යය නම් ශාරීපුත්‍ර ස්ථවිරයෝය. බරණැස් රජුව උපන්නෙම් ලෙව්තුරා බුදු වූ මම් ම වේදූයි රාජොවාද ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# සිඟාල ජාතකය

තවද සර්වඥයන් වහන්සේ විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩ වසන සමයෙහි එනුවර එක්තරා කරනැමියෙක් රාජවල්ලභව රජ්ජුරුවන් බිසෝවරුන් ආදීන්ගේ ඉසකේ වැඩීම දැලිවැඩීම් අන්දන් තිබුම් ආදීවූ කර්මාන්ත කොට රාජවල්ලභව ඉඳින්නේය. මෙතෙක්දනොව උපාසකව තිසරණයෙහි පිහිටා පන්සිල් දවස්පතා රැක බුද්ධවල්ලභව ඉඳිනේය. එසමයෙහි එක්දවසක් කරනවැමියා තමගේ පුතෙක් ඇරගෙණ රජගෙට මෙවර කරන්නට ගියේය. ඒ වෙලාවට ලිච්ඡවී කුමාරියක් එතනට ඇවිත් සිටියාය. ඒ කුමාරිකාවන්ගේ විශිෂ්ඨවූ රූ දැක කරුනැමියාගේ පුතා පිළිබඳවූ සිත් ඇතිව ගෙට ගොසින් ඇඳවැලඳගෙණ නොකා නොබී වැදහොත්තේය. එවෙලෙහි කරනැමියා කියන්නේ තා කරනැමිව නොසන්දුරු කුලයෙහි උපන්නියාව තෝ නොදනීද උභයකුල පරිසුද්ධ වූ රාජවංසයෙහි උපන් රාජකන්‍යායන් තොපට ලැබේද එසේ හෙයින් තොපි ඒ අසා සෝක නොකරව ඔබ්බේ කරනැමි කුලයකින් යහපත් ස්ත්‍රියක් පාවා දියහැක්ක සෝක නොකරවයි කීහ, එකී අවවාදත් නොඅසා දෙමව්පියන් නගුන් බුහුන් යාළු විශ්වාසයන් ආදීවූවන්ගේ අවවාදත් නොගිවිස ශෝකයෙන්ම නොකා නොබී සුෂ්කව වියළී නැසීගියේය. පියාත් ඌට කළමනා ආදාහන කෘත්‍යය කොට පින් පෙත් දී සෝකයෙන් බුදුන් දකින්ට නොගොස් සෝක සන්හිඳුනුපසු ගඳමල්පාහන්ගත් අත් ඇතිව බුදුන් දකින්නට ගොස් සර්වඥයන් වහන්සේ ඇයි උපාසකය මෙතෙන්දා නොආයේ ඇයිදැයි විචාරාන්නා එවිට කරනැමියා කියන්නේ මාගේ පුතා මෙසේ වූ සිතක් සිතා මළ හෙයින් නොආයෙමි දක්විය. එපවත් සර්වඥයන් වහන්සේ අසා පළමුත් මේ තෙමේ නිචව සිට උත්තම ජාතියට සිතිවිලි සිතා මළේවේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ සිංහරාජව උපන්සේක, බෝධිසත්වයන්ට සහෝදර මල් සිංහයෝ සදෙනෙක් ඇත්තාහ, ඇමට බාල වූ නන්වූ සිංහ ධේනුවක් ඇත්තීය. මේ කියන සිංහයෝ ඇමරන් පර්වතයෙහි රන්ගල් ගුහායෙක වාසය කරන්නාහ. එතනට නුදුරු වූ රිදී පර්වතයේ දූවානගුහායෙක කැණහිලෙක් වසන්නේය. එවකට බෝධිසත්වයන්ගේ දෙමව්පියෝ දෙන්න නැසීගියහ, එවක් පටන් බෝධිසත්වයන් වහන්සේ ඇතුළුවූ සත්බෑයෝ නැගනියන් ගල්ගුහාවේ ඉඳුවාලා සත්බෑයෝ මාංස මරා තමුන් කා නැගනියන්ට දී මේ නියායෙන් දවසරිනාහ, එකල රිදීපර්වතයේ වසන කැනහිල් සිතන්නේ දෙමව්පියෝත් නැත, බෑයෝත් ගොදුරු සොයා යන්නාහ. මම් මේ අවසරයේ ගොස් සිංහධේනුව හා කැටුව සංවාසය යෙදුනේ වී නම් යහපතැයි සිතා රිදී පර්වතයෙන් බැස රන් පර්වතයට සිංහධේනුව යන ගුහාව සමීපයට අවුත් සිංහධේනුවට කියන්නේ තොපිත් සතරපයක්ව මමත් සතරපයක්ව ඇත්තෙමි. එසේහෙයින් තොප හා මා හා සමග වම්හ. තොපි මට ප්‍රජාපතිවව් මම තොපට ස්වාමී වෙමි කියා රාගනිශ්‍රිත බස් කියා එබස් සිංහධේනුව අසා මේ තෙමේ සිව්පාවුන්ට අධම ජාතියෙහි උපන මම් සිව්පාවන්ට උතුම් ජාතියෙහි උපනිම් මූ හා කුමන විශ්වාසයෙක්දැයි සිතා නැවත සිතන්නාහු කැණහිල් අතින් රාගනිශ්‍රිත බස් ඇසුකල මා ඉඳත් කින්ද ස්වාසය අල්වා ජීවිතය අරිමි සිතා සොරා අරනේ ඇයිදැයි සත් බෑයන් ආකල උන්ටත් කියා අරිමි සිතා උන්නීය. ඒ වෙලාවට සත් බෑයන්ගෙන් එක් සිංහයෙක් මස් මරාගෙණ සිංහධේනුව ලඟට අවුත් නග මේ මස් කවයි කීහ. සිංහධේනුව නොසතුටුවිය. එවිට සිංහයා ඇව්දැයි විචාරා එපවත් අසා කැණහිලා කොයිදැයි කියා කිහ. අරවේද රිදී පර්වතය මුදුනේ ආසනයේ ඉඳිනේයයි කිව, එබස් සිංහයා අසා මහත් වූ කෝපයෙන් දූවාන ගුහාවට පැන ලය තලාගෙණ පර්වත පාර්ශවයෙහි වැටී මළේය. මෙම නියායෙන් සදෙනෙක් කැණහිලා ගණුම්හයි පැනලා ලය තලාගෙණ මිය වැටී උන්නාහ, සත්වෙනිව ආ බෝධිසත්වයෝ එපවත් අසා කැණහිළුන්ගේ ආකාශයෙහි ඉඳිමෙක් නැත. මේ පෙණෙන්නේ දූවානගුහාවයි සිතා කැණහිලා ගොදුරුකන්ට බස්නා මග පරීක්ෂා කොට පොළොව පැළෙන කලක්මෙන් ආකාශ ගර්ජනාවක් මෙන්දැයි සිංහනාද කෙළේය. සිංහනාද ඇසූ කැණහිල් හයින් තැතිගෙණ ලබ තලා පැළී මළේය. ඒ කාරණය දක්වන සර්වඥයන් වහන්සේ මහණෙනි සිංහධේනුව ට කැනහිල්ලෝ හයකොට සිංහනාදයෙන්ම මළෝයයි වදාළසේක. සිංහයාත් කැනහිලා මරා පෙරලා ගල් ගුහාවට අවුත් බෑයන් මළනියාවත් අසා සෝකපත්වූ නැගනියන්ගේ සෝකත් අරවා දැහැමෙන් සෙමෙන් වාසයකොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා එසමයෙහි කැනහිලානම් මේ කරනැමියාගේ පුතාය. සිංහධේනුව නම් ලිච්ඡවී කුමාරිකාය, මල්වූ සිංහයෝ සදෙන නම් මහතෙරුන් වහන්සේය. එසමයෙහි කේසර සිංහව උපන්නෙම් ලොවුතුරා බුදුවූ මම්ම යි වදාරා සිඟාල ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# සූකර ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් දවසක් සවස ගඳකිළියෙහි දොර වැඩසිට  මහළුවරුන් වහන්සේට අවවාද කොට සමුදී වදාළ සේක. සැරියුත් මහසාමින් මුගලන් මහසාමින් බුදුන් වැඳ තම තමන් වහන්සේගේ විහාරවලට වැඩිසේක. ඉන් මුගලන් සාමින් වහන්සේගේ ගණයේ යම්තමක් සැතපී සැරියුත් සාමින්ගේ ගණයට ගොස් ප්‍රශ්න විචාරමි සිතා සැරියුත්  සාමින්කරා අවුත් ප්‍රශ්න විචාළසේක. උන් වහන්සේත් බණ පලගටනැගි විජිනිපත්‍රයක් ගත් අත් ඇතිව වැඩහුන් සේක් මුගලන් සාමින් විචාළ ප්‍රශ්න ආකාශයේ පුන් සඳ මඬල ඔසවා පාන්නාක් මෙන් විස්තර කොට වදාරණ සේක. උන් වහන්සේගේ ප්‍රශ්නවිචාරීම් හා උන්වහන්සේගේ ප්‍රශ්න කිම් ඇසීම් බොහෝ භික්ෂු භික්ෂුණින් උපාසක උපාසිකා යන සිව්වනක් පර්ෂිත් දෙදෙනා වහන්සේම් වදාරණ බණ කථා අසා උන්නාහ. ඒ වෙලාවට මාළුතෙරුන් වහන්සේ සිතන සේක් මෙසේවූ වේලේ මමත් කටට ආවක් කියා ප්‍රශ්ණයක් කොට විචාරා උන්වහන්සේට කියාගත නුහුනුකල මෙතනසිට බොහෝ මනුෂ්‍යයෝත් මුන්වහන්සේට කියාගත නුහුනුකල මෙතැන සිට බොහෝ මනුෂ්‍යයොත් මුන් වහන්සේ විනය නොදන්නා නුවනැති නමෙකැයි සිතා මට සත්කාර කරන්නාහයි සිතා සැරියුත් සාමින් ලඟට ගොස් ඇවැත්නි ශාරිපුත්‍රස්ථවිරයෙනි අපිත් ප්‍රශ්ණයක් විචාරන්ට අවසරදැයි කීයන සේක. ආවෙධි කාසාවා නිබේබෙදී කායාවා නීග්ගහෙවා විසේසොවා පටිවිසේසෙවා ආහ යි කියා මේ කාරණය කීසේක. එබස්  සැරියුත් සාමි අසා මේ මාළු භික්ෂූහූ තමන් කටට ආදෙයක් කිවුය. මුන් සේ වුවත් ප්‍රශ්න විචාරන්නේ අප ඉඳිනේ ඇයිදැයි සිතා විජිනිපත්‍රය දණ්ඩාසනයෙහි තබා වැඩහිඳිනා ගණය ඇතුලට වැඩපූසේක. මුගලන් සාමීන් තමන්වහන්සේගේ වැඩහිඳිනාගණයට වැඩපු සේක. එවිට එතනට එක්වූ බොහෝ උපාසකවරුන් ඒ දෙදෙනාවහන්සේගේ මිහිරි බණ මුන් වහන්සේ නිසා අබඩවීයයි පෙළුමුගුරුගෙණ ලුහුබඳවාගත්හ. උන් වහන්සේත් හයින් දිවනසේක් පොරු දිරාගිය පරණ නානා ගෙයක වැටී අසූචි වැකුණු සැරිර ඇතිව පිළිකුල් බවට පැමිණිසේක. එපවත් දැක උපාසකවරු මධ්‍යම රාත්‍රීකාලයෙහි බුදුන්කාරා ගියාහ. සර්වඥයන් වහන්සේ උපාසකරුන් නොවේලේ ආයේදැයි විචාරා එපවත් අසා පළමුත් උත්තමයන් හා සරිවන නියා අසූචී ගැවසුනු සැරීර ඇතිවූයේ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත් ?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ සිංහව ඉපිද වනයේ වාසය කරන්නාහ. එසමයෙහි ඌරු සමූහයක් විලක් සමීපයෙහි ගොදුරු කා වසන්නාහ. එතනම තාපසවරුන් වහන්සේ වාසය කරණ සේක. එසමයෙහි බෝධිසත්වයෝ සිංහව ඉපිද වනයේ වාසය කරණ සේක. එසමයෙහි සිංහයෝ ගොදුරු කා පැන් බොන නිසා ඌරන් වසන විලට බට ඒ වෙලාවට මහත් ඌරෙකු ගොදුරු කා විල සමීපයෙන් යන්නාවූ දැක සුවසේ මූ කම් සිතා අද මූට නොපෙණී යන්නට මැනව මා අද දුටු නම් පසුවදවසෙක නොපැණෙන්නේයයි සිතා ඌරාට නොපෙනී අනික් තොටකින් ගෙඩනැගී සිටිකල ඒ ඌරා සිංහයා දැක තමාට හයින් යෙති සිතා කියන්නේ යාළුව මමත් සතර පයක් ඇත්තෙක්වෙමි. තොපටත් සතරපයක් ඇත්තෙහිය. එසේ හෙයින් තොප මා දැක නොගොසින් මා කරා එවරැයි වාසි කියා පරදවා බස් කීය. එබස් සිංහයා අසා අද මට බැරිය අදට සත්වෙනිදා තොප හා මා හා යුද්ධයක් කරම්හයි කියා ගියේය. එවිට ඌරු තමාගේ ඌරු රැසට කිය. ඌරෝ එවිට කියන්නෝ තාගේ බල නොදන සිංහයන් හා කැටුව යුද්ධ කෙරෙමියි කියා තා සලසා ගත්හෙයින් ඉදිරියේ මේ ඌරන්ට විනාසය තා නිසායයි ඌරෝ අසා හයින් තැතිගෙණ මේ ඇමදෙනාම එක්ව මට උපායක් කියවයි කිය. එවිට එසේවීනම් මේ සත්දා මුළුල්ලේම තාපස වරුන්ගේ නාන ගෙවල්වලට ගොසින් අසූචි ශරීරය මුල්ලේ තවර තවරා වියලාගෙණ ඇමදෙනා එක්ව උඩුසුළඟේ සිටිනා අසූචි ගන්ධය අසා සිංහයෝ පැරද පලායෙයි කියා ඌරෝ එක්ව මේ උපාය කිවුය. ඌරාත් එලෙසම කොට සත්වෙනි දවස් ඇවිත් උඩුසුලගේ සිටියේය. සිංහයා එතනට අවුත් ඌරු සිටිනා නියාව දැක තා විසින් සිතූ උපාය යහපත නැත්නම් තා මරා පියන්නෙම්වේද මෙවිට තා අතින් අල්ලන්ට හා පයින් අල්ලන්ට හා කටින් අල්ලන්ට හා කැතවුව එසේ හෙයින් ජය තොපටමයයි කියා සිංහයා පලා ගියේය. ඌරුත් තමා ජයගත් නියාව තමාගේ  රැලට කියා ඊට සතුටුව සිංහයන් අප කෙරේ කිපුනේය. අපට මෙතන ඉන්ට නපුරැයි කියා ඔබ්බට ගියාහයි වදාරා එසමයෙහි ඌරා නම් භික්ෂූය. සිංහව උපන්නෙම් බුදුවූ මම මයයි වදාරා මේ සූකර ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# උරඟ ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොසොල් රජ්ජුරුවන්ගේ අමාත්‍යයෝ දෙන්නෙක් උනුඋනුන් කෙරෙහි වෛරව වාසය කරන්නාහ. එපවත් රජ්ජුරුවෝ දූන නොයෙක් අවවාද කියාත් උනුන් කෙරෙහි වෛර හරවාගත නුහුනුවාහ. උන්ගේ බන්ධුහුත් අවවාද කියා අරවාගත නුහුනුවාහ, එපවත් සර්වඥයන් වහන්සේ අසා එක් දවසක් අළුයම් වෙලෙහි මහාකරුණා සමාපත්තියට සමවැද බලාවදාරණසේක් ඒ කියන අමාත්‍යයන් දෙන්නා සෝවාන් වන්ට හේතු ඇති නියාව වදාරා ඉන් එකකුගේ ගෙට උදෑසනක්සේ වැඩ වදාරා ඔහු විසින් පාත්‍රය ගෙණ සර්වඥයන් වහන්සේ ඇතුළුගෙට වඩා කැඳ අවුළුපත් ආදීවූ දෙය වළඳවා අන්තයෙහි ඕහට මෛත්‍රියෙහි අනුසස් වදාරා ඔහු සෝවාන් කොට දාවල් බත් වළඳන වෙලාවට ඔහු ලවා පාත්‍රය ගෙන්වාගෙණ අනිත් අමාත්‍යයාගේ ගෙට ගොස් ඔහු විසින් සර්වඥයන් වහන්සේ වඩා ගෙට ගෙන්වා මධුර වූ ආහාරපානයෙන් සර්වඥයන් වහන්සේට වැලඳවිය. සර්වඥයොත් වළඳා අන්තයෙහි ඕහටත් මෛත්‍රීයෙහි අනුසස් වදාරා ඔහුත් සෝවාන් කරවාගත, කාවිසිනුත් එක්කරවාගත නුහුනුවා සර්වඥයන් වහන්සේ එක්කරවා වෛර අරවා වදාළසේක. එදවස් දම්සභා මණ්ඩපයට රැස්වූ මාළුවරුන් වහන්සේ ඇවැත්නි උනුන්කෙරේ වෛරවූ අමාත්‍යයන් දෙන්නා කා විසිනුත් එක්කරවාගත නුහුනුය. සර්වඥයන් වහන්සේ එක් කරවා වෛර අරවා වදාළ සේක, ඉතා අපූර්වවි වදාළ සේක. එතනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ තාපසව ගංගාවක් සමීපයෙහි පන්සලක වාසය කරණ සේක. එසමයෙහි බරණැස් නුවර මහත් වූ උත්සවයෙක් විය. ඒ උත්සවය බලන්ට දිව්‍ය නයෙකු හා ගරුඬයකුත් ඇවිත් මනුෂ්‍ය වේෂයෙන් කෙළිබලා අන්තයේ ගරුඬයා නයාදැක එහුබඳවාගත එවිට නයාත් නාග වේෂය ගෙණ වහා වහා දුවන්නේය. ඒ වෙලාවට තාපසයෝ කාසවස්ත්‍රය ගොඩ තබා  නානකඩක් ඇඳගෙණ දිය නාන්ට බටහ. ඒ වෙලාවට නයා එමින් සිට සිතන්නේ තාපසයන්ගේ වැහැරීමයවූ සිවුරයට වනීන් නම් මා ගැලවිය හැක්කේයයි සිතා ඉන්ද්‍රනීල මාණික්‍යයක් ලෙසට රූපය මවාගෙණ වල්කලා සිව්රට වැඳ ගියේය. ඒ වෙලාවට ගුරුළුත් පසුපස්සේ ආයේ තාපසයන්ගේ වලාකලා සිවුරු වන්නියාව දැක තාපසයන් කරාගොස්  කියන්නී ස්වාමීනි ක්ෂුධාවෙන් පීඩිතව නයා එහුබඳවගන ආ මම නුඹවහන්සේ කෙරෙහි ගත් ආදරයෙන් සිවුරු ඇතුලට වැදගිය නයා නොඇල්වීම් එසේහෙයින් සිව්රු ඇරගෙණ නයා මට දූන මැනවැයි කීය. එපවත් බෝධිසත්වයෝ අසා ගුරුකුළ තා කළුදෑ ඉතායහපත තොපට දෙවියෝ ආයුබෝකෙරෙත්වයි දෙවියන්ගේ භෝජනය තොපට ලැබේවවි යනාදී ආශිර්වාද කොට  ගොඩට අවුත් නයා එක්අතකින් ඇරගෙණ සිව්රු ඇඳ පෙරවගෙණ නයා හා ගුරුළු ඇරගෙණ පන්සලට ගොස් දෙන්නාට බණ කියා ජාති වෛරී ගුරුළා හා නයා සමගිකරවා ඒ උපන් ආත්මභාවයට ඔහුනොවුන් කෙරේ වෛර නොවන පණතට සලස්වා යවුහයි වදාරා එසමයෙහි ගුරුලා හා නයා නම් මේ අමාත්‍යයෝ දෙන්නාය. තාපසව උපන්නෙම් ලොවුතුරා බුදුවූ මම් මයයි වදාරා උරග ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# ගග්ග ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පසේනාදී කොසොල් රජ්ජුරුවන් විසින් කරවා පිළිගන්වනලද රාජකරාම යෙහි වැඩ වසන සමයෙහි එක්දවසක් සිව් වනක් පර්ෂිද් මධ්‍යයෙහි වැඩ හිඳ බණ වදාරණ සර්වඥයන් වහන්සේ කිඹිස වදාළසේක. එවෙලෙහි බොහෝ භික්ෂූන්  වහන්සේ භාග්‍යවත්වූ බුදුරජානන් වහන්සේ බොහෝ කලක් ජීවත්වන සේක්වයි සුන්දර වූ බුදු රජානන් වහන්සේ බෙහෝ කලක් ජීවත් වන සේක්වයි යනාදින් ආවැඩූහ. මේ නියායෙන් බොහෝ දෙනා වහන්සේ ආවැඩීමෙන් අරගල මහත්ව බණ එදවස් කඩවිය. එපවත් අසා සර්වඥයන් වහන්සේ මහණෙනි ආවැඩීම පමණකින් ආයුෂ බොහෝවේද, අනොවැඩුවෝ ආයුෂමද වේදැයි වදාරා ස්වාමීනි එසේ වූ දෙයක් ඇත්දැයි දන්වන්නා මහනෙනි එසේවීනම් අද වක් පටන් අනුන්ට ආවැඩුවාට පෙරලා ආවඩීමමක් කළෝද ආපත්තිවන්නේයයි සික්ෂා පද පණවා වදාළසේක. එතැන්පටන් මහළු වරුන් වහන්සේ කිඹිසිකල උපාසකවරුන් ආවඩන්නාහ තමන් අතින් ආවැඩුන් අසාගෙණ මහළුවරුන්වහන්සේ ආනොවඩනසෙයින් ශාක්‍ය පුත්‍රවූ සර්වඥයන් වහන්සේ ගේ ශ්‍රාවකයෝ අප ආවැඩු කල අපට ආනොවඩන්නාහයි උක්තාකළහ. එපවත්  සංසයාවහන්සේ දැන සර්වඥයන් වහන්සේ දැන සර්වඥයන් වහන්සේට දැන්නුසේක සර්වඥයෝ ආවඩන්නා අභිප්‍රාය ඇත්තේ වේදැයි වදාරා සික්ෂා පද අරවා වදාළසේක. එවිට භික්ෂූන් වහන්සේ දන්වනසේක්, ආවැඩීමත් පෙරලා ඒ වැඩීමත් කොතැන් පටන් සිට ස්වාමීනි ඇතිවීදැයි විචාරන්නා මහණෙනි පූර්වයෙහිදී ඇතිවීයයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක්තරා සෙට්ඨියෙකුට පුත්ව උපන්නාහ. ඒ වෙළඳ තමාගේ පුතා අත කදාවලලු ආදීවූ බඩු පොදියක් දී ඒ ඒ තෙන වෙළඳාම් කොට ගෙණ එන්නේය. එක්දවසෙක සවස් වෙලෙහි බරණැස් නුවරට අවුත් තමන් රෑ ලගින තැනක් නැතිහෙයින් ඒ නුවර මනුෂ්‍යයන් අතින් ආගන්තුක මනුෂ්‍යයන් ලගින්නේ කොතනදැයි විචාළකල්හි මනුෂ්‍යයෝ කියන්නෝ නුවරින් පිටත සාලාවෙක් ඇත. ඊ යක්ෂයෙක් වාසය කෙරෙයි. ඊ ලගිතොත් යවයි කිවුය. එවිට සෙට්ඨියාගේ පුත්‍රයා කියන්නේ පියානන් වහන්ස ඔබම ලගුම්හ යක්ෂයා දමනේලන්ට මටම භාරයයි කිහ. යහපතැයි ගිව්ස දෙන්නාම ගොස් සාලාවේ ලැග්ගාහ. එවෙලෙහි බෝධිසත්වයෝ පියානන් වහන්සේ වැදහොත්තද පය මැඩ උන්සේක. ඒ වෙලාවට ඒ සාලාවෙ වසන යක්ෂයාත් දොළොස් අවුරුද්දක් වෙසමුනි රජ්ජුරුවන්ට පැන් ඇද ඔවුන් විසින් අසවල් සාලාව වැදහොත්තවුන්ගේ කිඹිසිකල ආවැඩුවන් පෙරලා ආවැඩුවන් හැර සෙස්සන් කවයි වරලැබ ඊ ඉඳ ආනොවැඩුවන් කන්නේය. එදවස් රෑ දෙපුතු පියන් නක නිසාත් වස්කප උපන්  යක්ෂයා සියුම්ධූලි සිඟිත්තක් මැදහෝනා  සෙට්ඨියාගේ නාසේ එලාලිය එවිට වැදහොත් සෙට්ඨියා කිඹිස පියාපය මැඩ සෙට්ඨියා ආනොවැඩීය. එවිට යක්ෂයා වස්කපින් බැස ඔහු කරා ගියේය. එවිට බෝධිසත්වයෝ එසේවීනම් යක්ෂයා කිඹිස පුතල ආනොවැඩුනේ කන්ට එන යක්ෂයෙකැයි සිතා ආවඩන බෝධිසත්වයෝත් අවුරුදු විස්සක් ඉතිරි සියක් අවුරුද්දක් ඉඳිනාසේක්විය මෙසේ ආවැඩීමෙන් ප්‍රේතයෝ මා ලඟට නොඑවත්වයි කියා කීහ. මේ නියායෙන් පුතනුවන්ගේ ආවැඩීම අසා පියානන් කරා ගියේය. එවිට පියානෝත් ආවැඩුවන්ට පෙරලා ආනොවැඩුවන් කන්නාවූ යක්ෂයෙක් වනැයි සිතා පුත තෙපිත් අවුරුදු විස්සක් උතුරා සියක් අවුරුදු ආයු බොහෝ වේවවි තොපට මා ආවැඩීමමෙන් ප්‍රෙතයෝ මා කරා නොඑත්වයි කියා කිය එවිට යක්ෂයා දෙන්නාම ආවැඩුහෙයින් බැනනොනැගී සිටියේය. බෝධිසත්වයෝ කියන්නාහු යක්ෂය තෝ ආදිත් බොහෝ පව්කොට යක්ෂව උපන දැනුත් ප්‍රාණඝාත කොට පෙරලාත් දුක් විඳින්නෙහිය එසේහෙයින් තෝ අඳුරෙන් අඳුරට ගියා සරියයි කියා ඕ හට බොහෝ අවවාද කියා පන්සිල් ද යක්ෂයා දමනේලූහ. එපවත් බොහෝ දෙනාට කීය. එවිට රජ්ජුරුවෝත් එපවත් අසා සතුටුව මෙසේ වූ පුරුෂයෝ සියලු කටයුත්තෙහි සපන් නුයයි සිතා සෙනෙවිරත් ධුරයට තබා ගත්හ. බෝධි සත්වයන්ගේ පියානුන්ටත් බොහෝ සම්මාන දුන්නාහ. යක්ෂයාටත් දේවාලයක් සලස්වා බලිපිදේනි දෙන නියායෙන් පණත්කොට බෝධිසත්වයන්ගේ අවවාදයෙන් දැහැමින් සෙමෙන් රාජ්ජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියායයි වදාරා එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ධර්මභාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථිවිරයයෝය. බෝධිසත්වයන්ට පියව උපන් සෙට්ඨියානෝ නම් ධුතාංගධරයන් කෙරෙහි අගතැන්පත් වූ මහා කාෂ්‍යප ස්ථවිරයෝය. එසමහයෙහි යක්ෂයා දමනය කළාවූ සෙට්ඨියානෝ නම් ලොව්තුරා බුදුවූ මම් ම වේදැයි වදාරා ගග්ග ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# අලීනචිත්ත ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි විර්ය අඩු කළ භික්ෂූන් කෙණෙකුන් නිසා මේ ජාතකය දක්වන ලද, මෙහි වර්ථමාන කථාව එකාදය නිපාතයෙහි සීවලී ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. මෙහි සර්වඥයන් වහන්සේ මහණ දූන් තොපගේ වීර්යය අඩුපමණක් විනා ආදී තොපගේ විර්ය බලයෙන් දොළොස් යොදුන් බරණැස් නුවර වටලාගත් සේනාව බිඳුවා රාජ්ජය ගෙණදුන්නේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ කරණ සමයෙහි වඩුවෝ පන්සියයක් ඒ නුවර මංපාදී දෙසවලට ගොස් දඬුපත් කපාගෙණවුත් කර්මාන්ත කරන්නාහ. එසමයෙහි වඩුවෝ සිතන්නාහු දඬුපත් කපාදාගත මෙතනට එන්නා සුලභව ලබනතෙන ගෙවල් කොටාගෙන වසන්නාහ. එසමයෙහි එක් මහා ඇතෙක් ගොදුරු සොයා ඒ ඒ තැන ඇවිදිනේ දිරාගිය කිහිරිගසෙක පය උලා ඇනි මහත්වූ වේදනාවෙන් තුන් පසයක් ඇන වඩුවන් උන්තෙනට අවුත්  වැටීපියා වැදහොත්තේය. ඒ වෙලාවට වඩුවෝ එතනට අවුත් ඇතු පය ඇනුනු උල දැක වටින් අවුළුවා උල ඇද බෙහෙත් කොට වණය සුවකළාහ. එවිට ඇතු තමාට කළ උපකාරය දැක ප්‍රත්‍යුපකාර කරන්ට උවමැනවැයි සිතා ඇතා එතැන්පටන් මෙහෙකරන්ට පටන්ගත. මේ නියායෙන් දවස්පතා දඬු ඇදීම් දඬු පෙරලීම් ආදී මෙහෙවරකොට වඩුවන් විසින් දවස්පතා ලබන බත්පිඩ් පන්සියය කා දවස් ඇර තමා දුර්වලවන්නා සිතන්නේ මෙහෙකොටගන්ට ශක්ති මදව එසේ හෙයින් තමන්ගේ පුත්වන අජානීය ඇත්පැටවා මෙහෙයට ලා යෙමිසිතා ඇත්පැටවා වඩුවන් ලඟට ගෙනවුත් පුත මා කළ මෙහෙලෙස වඩුවන් සිත්ගෙණ මෙහෙකරවයි කියා වඩුවන්ට පාවාදී ගියේය. ඒ ඇතිපැටවාත් වඩුවන් සිත්ගෙන මෙහෙකොට වඩු කුඩා කොල්ලන් හා සමග දියකෙළි ආදී වූ කෙළිත් කෙළිනේය අජානිය ඇත් ගොඩමිස දියෙහි මලමුත්‍ර නොකරන්නේය. එක්දවසක් වට වැස්සකින් ඉලත්තියෙක් දියේ වැටී ගස්වලක අස්සේ වැටී ගියේය. බරණැස්නුවර ඇත්තලයෝ ඇතුන් නාවන්ට ගොස් ගගට බැස ඇත් ඉලත්තිය ආඝ්‍රානය කොට දියට නොබසිනාහ එවිට ඇත්තලයෝ කුමන කාරණයක්දෝහෝයි පරීක්ෂා කොට ඒ ඉල්ලත්තිය කලන්දුකොට, ඇතුන්ගේ ඇග ඉස්සාහ. සුවඳ ඇති ඉලත්තිය ඇඟ වැදගත්තා හා සමාන කොට සිතා සතුටුව දියට බැස දිය කෙළියාහ, ඇත්තලයෝ වඩුගම අජානීය හස්තියා ඇතිනියාව දූන රජ්ජුරුවන්ට එපවත් කියා මගුලැත්කමට නිසි ඒ ඇතා ගෙන්වා ගතහොත් යහපතැයි දූන්වූහ. රජ්ජුරුවෝ එපවත් අසා සතුටුව ඔරු පාරු පණත්කොට වඩුවන් ඉන්නා උඩුගන් බලා ගියාහ. ඒ වෙලාවට ඇත්පැටවාත් දියකෙළිමින් සිටි පංචාගික තූර්යනාද අසා ගොඩ අවුත් වඩුවන්ලඟ සිටියෝය. ඒ වෙලාවට රජ්ජුරුවන්ට වඩුවෝ පෙර ගමන්කොට රජ්ජුරුවන් වහන්සේ දූක වැඳ බලා ගැත්තවුන්ගෙන් දඬු පතින් ප්‍රයොජන ඇත්නම් මිනිස් කෙණෙකුන් අත කියා එවන්නෝමෝ වේදැයි වැඩියේ ඇයිදැයි විචාළහ. එවිට රජ්ජුරුවෝ තොප ඇමගෙන් දඬු පත් ඉල්ලවා නොආම්හයි කීහ. එවිට වඩුවෝ කියන්නෝ  යහපත ඇරගෙණ වඩිනාබව යහපතැයි කීහ. රජ්ජුරුවෝ ඒ ඇතා ගෙනයන්ට යොමු කළහ. ඒ ඇත්යන්ට වැලිවිය රජ්ජුරුවන් වසින් මේ කුමන නිසාදැයි විචාරන්නා එවිට වඩුවෝ කියන්නෝ තමා රැකී මිලදී යන අභිප්‍රාය ඇතිවයයි කියන්නා රජ්ජුරුවෝ ඇතු මිලකොට සොඬ ලක්ෂයක් අගනා කොට සතරපය සාරලක්ෂයක් වටිනාකොට වල්ගය ලක්ෂයක් වටිනාකොටත් මේ නියායෙන් ඇතුට සලක්ෂයක් මිලකොට වඩුවන්ට එපමණ මිලදී ඇතාගෙනයන්ට උත්සහකළත් ඇතා යන්ට මැලිවිය. එවිට රජ්ජුරුවන් විසින් මැලිවන්ට කාරණා කිම්දැයි විචාරන්නා වඩුවන් පන්සියයට පිළිසිදෙන නිසායයි කියන්නාහ. එවිට රජ්ජුරුවෝ වඩුවන්ට පිළිදී එසේත් මැලිවනසෙයින් වඩුවන් විසින් පන්සියයක් බිරින්දන් පන්සියයටත් පිළිදීත් එසේත් පමාවන හෙයින් වඩුවන්ගේ දරුවන් ආදීන්ටත් වැල්වලළු ආදී කර්මාන්තදී ඉක්බිති කිසිකෙනෙකු හන් කොකොට ඉන්දදීම තෙමේම නික්මිනි. එවිට බරණැස් රජ්ජුරුවෝ ඇතා ඇරගෙණ නුවර ඇත්තල දිව්‍යපුරයක් මන් සරහා නුවරට ගෙන්වත් තමන්ට මගුල් සහසනය කොට සලස්වා තමන්ට ඇතියම්ම පෙරෙහැරක් ඇත්රජ්ජුරුවන්ටත් සලස්වාලා වසස්ථාන දවස්රිනා සමයෙහි ඇත් රජ්ජුරුවන්ගේ ආනුභාවයෙන් ඒ රජ්ජුරුවෝ සිත්ගෙණ වාසය කරන්නාහ. එසමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසිකා බිසවුන් කුස පිළිසිඳ දසඑකඩ මසක් පුරා වදන අවස්ථාවට එක්තරා ව්‍යාධියකින් බරණැස් රජ්ජුරුවෝ  නැසි ගියේය. එවිට අමාත්‍යයෝ රජ්ජුරුවන් මළ පුවත් ඇත්රජ්ජුරුවන්ට කිවොත් ඇත් රජ්ජුරුවෝ නැසියෙති සිතා නොකිවාහ. ඒ අවස්ථාවට කොසල රජ්ජුරුවෝ කාත්නැති රාජ්ජය හෙයින් මාසන්තකයයි කියා ඇවිත් නුවර වටකොටගෙණ රාජ්ජය හෝ දෙව යුද්ධ හෝ කරවයි කියා පත් යව්වාහය. එබස් ඇසු බරණැස් නුවර අමාත්‍යයෝ කියා යවන්නාහු ශාමුද්‍රික දන්නා බමුණෝ බිසවුන් වහන්සේගේ බඩ පිරිමි කුමාරයෙක් සත් දවසකින් බිහිවෙති කිහ. එබස් නියම දත්කල රාජ්ජය දෙතත් යුද්ධ කරත් එවිටයයි කියා කැඩපත් යවූහ. එබස් ඇසූ කෝසල රජ්ජුරුවෝ යහපතැයි කියා ගිවිස්සාය. මේ නියායෙන් සත්දා ගිය පසු බෝධිසත්වයෝ උපන්නාහ. උපන් පසු සේනාව තල්ලු පසු යුද්ධ කරවන්ට වැද පිටතල නැතිහෙයින් සේනාව බිඳ බිඳ අනිලන්නාහ. එපවත් අමාත්‍යයෝ බිසවුන්ට පලාගොස් කියන්නාහු පිටබල නැති හෙයින් යුද්ධ කල නොහැක්ක එසේ හෙයින් රජ්ජුරුවන් වහන්සේ මළ නියාවත් රාජකුමාරයන් වහන්සේ උපන් නිසා ඇත් රජ්ජුරුවන්ට් කියා ඇත් රජ්ජුරුවන් පිටිවහකොටගෙණ යුද්ධ කරම්හයි කීහ. එබස් බිසව අසා යහපතැයි බෝධිසත්වයන් දුහුකල වැදහොවා ගෙණ ඇතාකරා ගොස් කියන්නාහු නුඹ වහන්සේගේ යාළුවූ රජ්ජුරුවන් වහන්සේ නැසුනු නියාව නුඹ වහන්සේ ශෝකයෙන් පැලෙතියි සිතා නොකිම්හ. ඒ අවසරයෙන් කෝසල රජ්ජුරුවෝ අවුත් නුවර වටකොට

SANHIDA LANKA

ගත්තෑය. එසේ හෙයින් නුඹ වහන්සේගේ යාළු රජ්ජුරුවන්ගේ පුතනුවන් මරතත් නුඹවහන්සේම මැරුව මැනව නැවත රාජ්ජය ගෙණදෙතත් දුනමැනවයි කියා ඇතා පාමුල රාජකුමාරයන් ඉඳුවුහ. එවිට ඇත්රාජයන් කුමාරයන් වඩා ඉස තිබාගෙණ අඬා මෑනියන් වහන්සේට පාවාදී සේවාකමට නික්මුනේය. එවිට අමාත්‍යයෝ ඇත් රජ්ජුරුවන් සන්නාහයෙන් සන්නද්ධ කරවා සරහා සතර වාසල් දොර අලහ. එවිට ඇත් සේනාව සමුර්ධියෙන් නුවරින් පිටත්ව කුඤ්චනාද කොට ඒ ඒ සත්වයන් නොයෙක් තැන ලුහුබඳවා පළමුව රජ්ජුරුවන්ගේ බලකොටුව බිඳ රජ්ජුරුවන් ජීවග්‍රහයෙන් ඉසකේ පත්ගසා අල්වාගෙණ අවුත් රාජ කුමාරයන් දක්වා බොහෝ දෙනම මරන්ට කී ගමනේ මැරීයනොදී ඉතික්බිත් මෙසේ වූ දෙයක් නොකරවයි අවවාද කියා උන්ගේ රටට යවුහ. බෝධිසත්වයන්ටත් සියල්ලන්ගේ සිත් සන්තෝෂකරවා උන් විසින් අලිනඩිත්තයයි නම් තුබුකල්හි සත් ඇවිරිදි අවස්ථාවේ අභිශේකකොට එක්සියයක් රාජධානිවල රජදරුවන්ට නායකව දැහැහෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මහණෙනි ඒ ඇතුන්ගේ විර්ය බලයෙන් බිලිඳු කුමාරයන්ට පාවා රාජ්ජය දුන්නුය එසේ හෙයින් මහණෙනි විර්යම කළමනායයි වදාළ සේක.

මේ දේශනාවගේ අවසානයෙහිදි විර්ය අඩුවූ භික්ෂූන් වහන්සේ සියලු කෙලෙසුන් නසා අර්හත් භාවයට පැමිණිසේක. එසමයෙහි ඒ රාජ කුමාරයන් ගේ මෑනියෝ නම් මහා මායා දේවියන් වහන්සේය. පියරජ්ජුරුවෝ නම් සුද්ධෝදන රජුය. එ අජානිය හස්තියානම් මේ විර්ය අඩු වූ භික්ෂූන්ය. ඒ ඇතුට පියවූ මහඇත්නම් සාරිපුත්‍ර ස්ථවිරිය, අලිනසන්තු කුමාරව උපන්නෙම් දැන් බුදුවූ මම්මයයි වදාරා අලිනචිත්ත ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# ගුණ ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ආනන්ද සාමින් විසින් එක් දවසක් ලබන පිළිසඟල දහසක් නිසා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්.

ආනන්ද සාමින් කෝසල රජ්ජුරුවන්ගේ අන්තඃපුර ස්ත්‍රීන්ට බණ කියන සමයෙහි එක්දවසක් කොසල රජ්ජුරුවන්ට දාස් මිල වටිනා පිළිසඟල දාසක් පාක්කුඩම් පිණිස පැහ. ඉන් රජ්ජුරුවෝ පිළිපන්සියයක් අනදසාමින් ගෙන් බණ අසන බිසෝවරුන්ට දුන්හ. ඒ බිසෝවරු පන්සියය නොඇඳ තිබාගෙණ ඉඳ සාමින් බණ කියන්ට ආවේලේ පන්සියයක් දෙනම තම තමන් ලත් පිළි  පන්සියයම පිළිගැන්වූහ.

අනද සාමින් ඒ පිළිගෙණ ගණයට වැඩිසේක. පසුව දවස් මේ නිමවන වේලාවට බිසෝවරු පන්සියයක් දෙනම පරණ පිළි ඇඳගෙන රජ්ජුරුවන් කරා එන්නාහ. එවිට රජ්ජුරුවෝ ඊයේ මාදුන් පිළිකොයිද්දැයි විචාරන්නාහ. ස්වාමිනි  ඒ පිළිසඟල පන්සියයම අනද සාමින්ට පිළිගැන්වූහයි කියන්නාහ. එවිට රජ්ජුරුවෝ අනදසාමින්ම පිළිගත්සේක්දැයි විචාරා බිසෝවරුන් එසේය පිළිගත්සේකැයි කියන්නා සර්වඥයන් වහන්සේ වදාළේ තුන්සිවුරක් වුව මෙතෙක්  පිළිගත්තේ පිළි වෙළඳාම් කරණසේක්දැයි සිතා රජ්ජුරුවෝ කිපී අනදසාමින්ගේ ගණයට ගොස් ස්වාමිනි අන්තඃපුර වාසීන්ට බණ කියා වදාරන්නේ ඇද්දැයි විචාරන්නා එසේය මහරජ කියම්හයි වදාරන්නා කියන පමණක්ද උයිත් බණ අසා උගනිද්දැයි විචරන්නා එසේය මහරජ අසති පිළිවන් පිළිවන්දෙයක් වණපොත් කෙරෙති කියන්නා නුඹ වහන්සේ අතින් අසන පමණක්වීනා යම්සත්කාරත් කෙරෙද්දැයි විචාරන්නා එසේය මහරජ ඊයේ බණ අසා පිළිසඟල පන්සියයක් දුන්නුහයි වදාරන්නා ඇසී සර්වඥයන් වහන්සේ තුන්සිවුරක් අනුදත්සේක. මෙතෙක් පිළි ගත්තේ ඇයිද්දැයි විචාරන්නා මහරජ සර්වඥයන් වහන්සේ විසි ප්‍රයෝජන විදිමට තුන්සිවුරක් මිස පිළිගැන්වීමට මෙතෙක් දෝශනැතැයි සර්වඥයන් වහන්සේ වදාළසේක. එසේ හෙයින් මාලත් පිළිදුර්වල සිවුරු ඇතිතෙනට දෙමිකියන්නා පළමුසඟල සිවුරුකරන්නේ කිම්දැයි කියන්නා ඒ සිවුරුපොරෝනා සිවිරට අරගන්නාසේකැයි වදාළසේක. එවිට රජ්ජුරුවෝ කියන්නේ පොරොනාසිවුරු කුමක් කෙරෙද්දැයි විචාරන්නා මළුතැණක්කපා හැර අඳනාසිවුරට අරගන්නාසේකැයි වදාළසේක. පළමු ඇඳනා කුමක්කෙරේද්දැයි විචාරන්නා ඒ සිවුරු සැතපෙන ඇඳ අතුරණ ලෙස ඇරගන්නාසේකැයි වදාරන්නා පළමු ඇඳ ඇතිරිලි කුමක්කරණසේද්දැයි විචාරන්නා යහපත් ඔපළුබුමු තුරුණුකොට අතුරණසේකැයි වදාළසේක. පළමු බුමුතුරුණු කුමක්කරණ සේක්දැයි විචාරන්නා බිස්සකෙට අකුලා පයපිසින්ට ගන්නාසේකැයි කීසේක. පළමු තුබූ බිසී කුමක්කරණසේක්දැයි රජ්ජුරුවෝ විචාළහ. මහරජ සැදූ ඇත්තන් දුන්දෙයම අපවත් නොකරණහෙයින් සියුම් මුවහත් ඇති කරයෙන් ලෙසීන්කොට කපා මැටි හා භික්තියෙහි අනා ගානාසේකැයි එසේවූ අවස්ථාවේ සැදැඇත්තන් දුන්දෙය මහරජ අපවත් නොකරණසේකැයි වදාළා සේක. එබස් ඇසූ රජ්ජුරුවෝ සතුටුව තමන් ලඟ තිබූ පිළිසඟල පන්සියයත් අනද සාමින්ට දී ගියාහ. අනද සාමි පළමුත් පන්සියයක් පිළිසඟල දුර්වල සිවුරු ඇති තැනට දී රජ්ජුරුවන්ගෙන් ලත් පන්සියයක් සඟලට සිතනසේක් මාගේ භික්ෂූ පන්සියයක් ඇත. ඉන් ඇම්මට බාල භික්ෂූන් කෙණෙකුන් මට අතපය මැඩීම මළු ඇමදීම ආදීවූ නානාගෙවල් ගොමගැම් ආදීවූ වත්පිළිවෙත් සුවච කීකරුව කෙරෙත් එසේහෙයින් මුන්ට සංග්‍රහ කලමනාවේදැයි සිතා අනදසාමි ඒ නමකෙරේ පැහැද පිළි පන්සියයක් දුන්සේක. ඒ බාල භික්ෂූන් වහන්සේ තමන් වහන්සේ ලත් පිළි අනද සාමින්ගේ ගනේ පන්සියයක් භික්ෂුන් වහන්සේට පිළිගැන්වූසේක. ඒ පන්සියයක් දෙනාවහන්සේත් සිවුරුකොට කිනිහිරි මලෙහි පැහැය හා සමාන කොට, පැය ලා ඒ අලුත් සිවුරු පොරවාගෙණ සර්වඥයන් වහන්සේගේත් මුන බැලිම් ඇද්දැයි විචාලසේක. එවිට සර්වඥයන් වහන්සේ භික්ෂුණි ආර්යශ්‍රාවකයන් වහන්සේ එසේවූ දෙයක් නැතැයි වදාරන්නා එසේකල අපගේ උපාධ්‍යායන් වහන්සේ විසින් බාල භික්ෂූනමට පිළි පන්සියයක් දෙනලද්දේ නොවේදැයි

දන්වන්නා භික්ෂූණී ආනන්දයින් විසින්  මුනබලා දුන් දෙයක් නොවෙයි. තමන්ට බොහෝ උපකාරීව සිටි භික්ෂූන් හෙයින් ප්‍රත්‍යුපකාරී නිසා දුන්නුය, උන් තබා පළමු උත්තමයෝත්, උපකාරකලාවූන්ට ප්‍රත්‍යුපකාර කළෝවේදැයි යතහොත්, ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ සිංහව ඉපිද පර්වතයක වාසය කරණසේක. ඒ කියන පර්වතයට දුනුරුතෙන විලක් සමීපයෙහි මඩට ඉවුරු බිඳී ඊපිට මොලොක් තන ඇතිව තිබෙන පලෙක් ඇත. ඊට ලඟු සැහැල්ලු සාවුන් මුවන් යා ඇත. මහත් සත්වයා යානොහැක්කේය. එක් දවසක් එක්මුවෙක් ඒ පල සමීපයෙහි තනකමින් සිටියේය. බෝධිසත්වයෝත් ගොදුරුනිසා පර්වතය මුදුනට නැගීගියේ ඒ දෙසබලා පලෙයි තන කන මුවාදැක, මුවාට පනිම් සිතා සිංහනාද කොට පැන්නේය. මුවාත් සිංහනාද අසා භයපත්ව වහා ගැලවී පලා ගියේය. සිංහයාත් පැමිණි වෙග රඳවාගත නොහී පලට පැන තන කැඩී පා සතර මඩෙහි ගැලී ටැම් සරතක්සේ නිශ්චලව ඇනීගියේය. මඩින් ගැලවිගත නොහී, සිංහයාත් සත්දවසකින් නිරාහාරව සිටියේය. එකල්හි කැනහිලෙක් එන්නට අවුත් සිංහයා දැක භයින් දුවන්ටවන එවිට සිංහයා කියන්නේ පා සතර මඩෙහි එරී පියාසිටියෙමි, මා කෙරේ තෝ නොබා මාකර අවුත් මාගේ ජිවිතය ගලවාදෙවයි කීහ. එවිට

SANHIDA LANKA

කැනහිල් නොබා අවුත් සිංහරජ්ජුරුවෙනි නුඹ වහන්සේ මා දක්නා උපායෙකින් ගලවමි. ගලවාපුවේලේ පෙරලාම මා මරතියි භය ඇත්තෙමි ජීවිතදානය දුන්නොත් යහපතැයි කිය එබස් සිංහයා අසා කැනහිල්ල තෝ භානොගෙණ මට උපකාරවයි සිටි තොපට විනාශයක් නොකෙරෙමි තොපගේ ජීවිතය ඇතිතෙක්මානයේ රකිමි දන්නා යම් උපායකින් ගලවයි කීහ. එබස් අසා කැනහිල් සිංහයාගේ පය කෙරෙන් පසුරුගාමින් ඇලක් කැන්නේ විලදක්වා කැන ඒ කැන්නාවූ ඇලින් පැන් ගෙණවුත්, සතර පයට ඇරීය වියලි තුබූ මඩ සිහිල්විය. එවිට කැනහිල් සිංහයාගේ බඩ කෙළවරට ගොස් තමාගේ ඉසින් සිංහයාගේ යටිබට ඔසවා ස්වාමීනි වීර්යකල මැනවයි කියා සිංහයා එවිට ආරාලා පිනුයේය. ගොඩපැන සිට යන්නේ වේලාවක් සැතපි එතන ලඟ යෙමින් සිටි මියෙකු මරා, පළමුකොට කැනහිලාට මස්ලා පසුව පසුව තුමු මස් කැහ. කැනහිල් තමාටඑෑ මස් කොට්ඨාසයෙන් සමහරක් කා සමහරක් ඩැගණයන්ට වන මේ මස් ගෙණයන්නේ කාටදැයි විචාරන්නාහු නුඹ වහන්සේගේ බැලිම්ඩියටයයි කියන්නා එවිට සිංහයා යහපත ඈ සමීපයට ගොස් ඇට බස් දී එකියන කැනහිල්දෙන හා කැනහිලා ඇතුළුව ඇරගෙණ ගුහාව සමීපයෙහි ගුහාවක වාසය කරවා දවස්පතා සිංහරජ්ජුරුවන් හා කැණහිල් ගොදුරට යන්නාහු සිංහධේනුව හා කැනහිල් ධේනුව ගුහාවේ හිඳිනිය. සිංහරජ්ජුරුවෝ මස්මරා කැනහිලාට දී සිංහධේනුවට හා කැනහිල්ධේනුවට මස්කැටි දෙකක් ඩැගෙනවිත් දෙන්නාහ. මේ නිසායෙන් දවස් අරණ සමයෙහි සිංහධේනුව පුතුන් දෙදෙනකු වැදුහ. මේ නියායෙන් සිංහපැටවුන් කැනහිල් පැටවුන් එක්ව දවස් හරණාහ. සිංහයාත් කැනහිලාගේ දරුවන්ට සෙනග ඇත්තේය. එවිට සිංහධේනුව සිතන්නී සිංහයා කැනහිල් ධේනුවගේ දරුවන්ට සෙනෙහේ ඇත්තේය. කැනහිල් ධේනුව හා කැටිව සංවාසය ඇත්තේයයි සිතා සිංහයා කැනහිල් ගොදුරට ගියතැන සිංහධේනුව කැනහිල් ධේනුවට භය ගන්වන්නී මෙතන ඉඳිනේ ඇයිද පලායයි කියන්නීය. සිංහපැටවුත් කැනහිල් පැටවුන්ට භයගන්වන්නාහ මේ නියායෙන් ඉදිනාකල්හි කැනහිල් ධේනුව කැනහිලාට කියන්නී සිංහධේනුන් වහන්සේ මෙසේ භයගන්වන සේකැයි සිංහ රජ්ජුරුවන් වහන්සේගේ සම්මතබවත් නොදනෙයි. එසේ හෙයින් අපි මෙතන ඉන්ට නොපිළිවනැයි කීහ. එපවත් කැනහිල් අසා සිංහ රජ්ජුරුවන් කරාගොස් කියන්නේ ස්වාමිනී නැකැත්දවස් එකතැන වාසය කරන්නේය. එසේ හෙයින් අප්‍රිය වන්නේය. නුඹ වහන්සේගේ සිංහධේනුන් වහන්සේ අප ගේ අඹු දරුවන් භයගන්වන සේක, අප සෙවු දුර්වලයන්ට පලායන්ට කියන්නා පලායන පමණක් විනා භයගන්වන්ට උවමනාද එසේම පෝසතුන් ලඟ දුප්පතුන් උන්කල පහාකිරීම කාරණා නොවන්නේය. එසේ හෙයින් අපට අවකාශ දුනමැනවයි ඔබ්බකට ගොහින් වාසය කරම්හයි කැනහිල්කීහ. එබස් සිංහයා අසා තමාගේ සිංහධේනුවට කියන්නේ එම්බල සිංහධේනුව මේ කැනහිලා මා විස්වාසවූ කාරණය දනිදැයි විචාරා විශ්වාසවූ කාරණය නොදනිම් කී විසින් එසේ නම් එක් සමයෙක ගොදුරු සොයා ගොස් සත්දවසක් මා මෙතනට නොආකාරණා දනිදැයි විචාරා නොදනිම් කී විසින් එම්බල මම මුවෙකුට පැන මුවා වැරදගොස් මඩකලලෙක එරී සත්දවසක් නිරාහාරව උන්ගමනේ මූ නිසා ප්‍රාණය ලද්දේය එසේ හෙයින් මාගේ ඉෂ්ට මිත්‍ර යාළුවා බන්ධූවුයයි කියාත් ඇත ඉෂ්ටමිත්‍රයයි කියාත් ඇක. එසේවූ කැනහිලාට තොප විසින් වෛරවීම කාරණානොවෙයි. අදවක් පටන් මට යම්ම සැටියෙක සිතනවානම් ඒ සැටිම මේ කැනහිලාව සිතවයි කියා එතැන්පටන් සිංහධේනුවත් කැනහිල්ධේනුවත් විශ්වාසව දවස් අරාණහ, සිංහපැටවුන් කැනහිල්පැටවුත් විශ්වාස එක්ව කෙළනාහ, මේ නියායෙන් දවස් අරණාකල්හි සිංහපැටවුන්ගේ දෙමව්පියනුත් කැනහිල් පැටවුන්ගේ දෙමව්පියනුත් මළපසුත් උනුඋනුන් කෙරෙහි විශ්වාසව දවස්කලාහ. මේ නියායෙන් සත්පරම්පරාවෙක දවස්කලහයි වදාරා චතුසත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුසත්‍යය ධර්මදේශනාවගේ අවසානයෙහි එමතෙක්දෙනාවහන්සේ සෝවාන් වූසේක. එම තෙක් දෙනාවහන්සේ ශකෘදාගාමී වූසේක. එමතෙක් දෙනා වහන්සේ අනාගාමී වූසේක. එමතෙක් දෙනා වහන්සේ සියළු කෙලෙසුන් නිසා රහත්වූසේක. එසේහෙයින් මේ ධර්මය බොහො දෙනාට වැඩ පිණිස වදාරා මේ ගුණ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කැනහිලානම් ආනන්ද ස්ථවිරයෝය. සිංහව උපන්නේ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක

SANHIDA LANKA

# සුහනු ජාතකය

තවද සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝපී භික්ෂූ දෙදෙනෙකුන් වහන්සේ නිසා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්.

සැවැත්නුවර වාසය කරණ භික්ෂූ කෙනෙකුන් වහන්සේ කෝපව චන්ඩ පර්ෂව වාසය කරණ සේක. පිටිසර එසේම එක් නමෙක් චන්ඩ පර්ෂව වාසය කෙරෙති මෙකී යන දෙනම චඩපර්ෂ නියාව ප්‍රකාශව තිබෙයි. එසමයෙහි පිටිසර නම සැවැත් නුවරට වැඩිසේක. සාමනේරදහර භික්ෂූන් වහන්සේ සිතනසේක් තොපි දෙනම එකතැනට සැලසුනුකළ කුමක් කරද්දෝහෝයි සිතා ඇවැත්නි නුවර කෝපිනම වසනගෙයි පිටිසර කෝපීනමලු සේක. කෝපී දෙනම ඔවුනවුන් වහන්සේ දක ආචාර සමාචාර කොට උනුන්වහන්සේගේ අත් පා මැඩ මේ නියායෙන් විශ්වාසව උන්සේකැයි මේ කාරණාව ධම්සභා මණ්ඩපයෙහි රැස්වූවන් මාළුවරුන්වහන්සේ කිය කියා වැඩ උන්සේක. එතනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි වදාරා මහණෙනි එපවත් අසා මහණෙනි දැන්මතු නොවෙයි යටගිය දවසත් මේ භික්ෂූහු දෙනම ඔවුනවුන් වහන්සේ දකපුවෙලෙහි සමගිවුයෝ වේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන් වහන්සේට කලමනා සියළු කටයුත්තෙහි තමන් යුක්තව රජ්ජුරුවන්ගේ භාණ්ඩාගාරයට වදිනා අය වියදම් ආදීවූ දෙයත් අසුන් විකිණීමෙන් දක්ෂව මැදහත්ව වෙළඳාම් කරණ අමාත්‍යව උපන්සේක. ඒ අවදියට අසුන්ගෙණ වෙළඳාම් කරණ ලෙස අසුන්වත් සියයක් ඒ නුවරට ගෙණාවුය. බරණැස් රජ්ජුරුවෝ ලොභිව එසේ හෙයින් බෝධිසත්වයන් දැහැමින් සෙමින් කරණ වෙළඳාම් වලට මැලිව අනිත් අමාත්‍යයෙකුට අසුන් වෙළඳාම් කරණ ලෙස සලස්වා ඒ අමාත්‍යයාට කියන්නා හූ අපගේ සොන නම් වඩවු අසෙක් ඇත. ඒ අස්ව වෙළඳාමට ගෙණා අසුන් මධ්‍යයේ ලාපියව ඒ අසුන් මේ අශ්වයා කඩකා වනයකොටපියයි වනකොටපු කල මිල අඩුවෙයි මිල අඩුවුකල සම්පත් දී අරගතැයි කියා මෙවර කීහ. අමාත්‍යයෝත් එලෙස කෙළෝය. ඒ අයුත්ති විඳගත් අස්වෙලඳා බෝධිසත්වයන් වහන්සේ කරා ගොස් එපවත් කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු ඇයි තොප ඇම්ලඟ චඩපර්ෂ අශ්වයෙක් නැද්දැයි විචාළාහ. එබස් ඇසූ අස්වෙලෙන්දා කියන්නෝ අපලඟත් සුහ නම් චඩපර්ෂ අශ්වයෙක් ඇතැයි කීහ. එපවත් බෝධි සත්වයෝ අසා එසේ වීනම් දෙවැනිව එනකල අශ්වයාත් ඇරගෙණ එවයි කීහ. එපවත් අස්වෙලෙදෝ යහපතැයි ගිවිස පසුව  වලියේ එන්නාවූ ඒ අසාත් අරගන ආවාහුය. එවිට රජ්ජුරුවෝ අසුන් ඒ නුවරට ආනියාව අසා රජ්ජුරුවෝ  සීව්මැදුරු කවුළුවේ මතුමාලේ බලාසිටියාහු සොන නම් අසාත් අසුන් මධ්‍යයට මුදපූහ. එවිට අස් වෙළඳූන් තමන්ගේ සුහ නම් අසා උනුපුහ. එවිට චඩපර්ෂ අසුන් දෙන්නා උනුන්කරාගොස් උනුන් පිටිතොල තබාගෙණ කම්පස් අසුන් මෙන් සිටියාහ. එවිට  රජ්ජුරුවෝ බෝධිසත්වයන්ගේ මූනබලා මේ කිමෙක්ද කම්පස් අසුන් දෙන්නෙකු මෙන් උනුන් මුනබලා සිටියාහයි බෝධි සත්වයන් අතින් විචාළාහ. බෝධිසත්වයෝ ඊට කියන්නාහු කෙතෙක් දුරවුනත් අසත්පුරුෂයෝ අසත්පුරුෂයා දුටුකල එක්වන්නේය සත්පුරුෂයා සත්පුරුෂයෝ දුටුකල් එක්වන්නේමය. එසේ හෙයින් නීවවූ අසා හා නිවවු අසා එක්වූයයි කියා නැවත කියන්නාහු රජ්ජුරුවන් විසින් අධිකලොභ නුවමැනව මනුෂ්‍යයන්ගෙන් අයුක්ති සම්පත්ති ගැනීම දෝෂයයි කීහ. එබස් රජ්ජුරුවෝ අසා ඔවුන්ගේ වෙළඳාම් කිරීම බෝධිසත්වයන්ටම භාරකළාහ. බෝධිසත්වයොත් අගයවු නියාවට ඒ වෙළඳාම් කොට අස්වෙළදුන්ට සම්පත් දුන්නාය. අස්වෙළදුන් සම්පත් ලැබ සන්තෝෂයෙන් ගියාහ. රජ්ජුරුවොත් බෝධිසත්වයන්ගේ අවවාදවූ නියාවට දැහැමින් සෙමින් රාජ්ජය කොට කම් වු පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මහණෙනි එසමයෙහි චඩපර්ෂ අනුන්දෙන්නා නම් මෙසමයෙහි කෝපී වූ භික්ෂූන් දෙදෙනය රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. පණ්ඩිත අමාත්‍ය නම් බුදුවූ මම්මයයි වදාරා සුහනු ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# ස්වර්ණමයුර ජාතකය

තවද කරුණානිධාන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ශාසනයෙහි උකටලීවූ භික්ෂූකෙණෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට පානාහ. සර්වඥයෝ සැබෑද මහණ උකටලී වුයෙහියයි වදාරා සැබෑව ස්වාමීනි කියන්නා කුමක් නිසාදැයි විචාරා වදාරන්නා සරහන ලද ස්ත්‍රීයක දැක ඈ කෙරෙහි පිළිබඳ සිතින් ශාසනයෙහි උකටලී වූයෙහියයි කියන්නා එවිට සර්වඥයෝ මහණෙනි මුන්සේවු අහේතුක ප්‍රඥා ඇති සත්වයා තබා මහොත්තමයෝ ස්ත්‍රීවසඟයට පැමිණියෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ මයුරව උපන්සේක. උපදිනා බිජු වටින්ම රන්වන් පෑ ඇතිව ඉපිද බිජුවට ගසාපු කල රන්වන්පෑයව ඉපිද වැඩි විය පැමිණ පියාපත් අසුඅන්ධසේ රතුරේඛාවලින් සමලංකෘතව බැළුවන්ට ප්‍රසාද එලවන තරම් විශේෂවූ රූපශ්‍රියෙන් යුක්තව ඉන්නාසේක් මෙසේවූ සිතක්සිතු සේක. මාගේ රූපශ්‍රිය අනර්ඝ හෙයින් මනුෂ්‍යයන් ලඟ දවස්වැහැරීමෙන් යම්සේ උපද්‍රවයෙක් වෙයි සිතා හිමාලය වනයට ගොස් පර්වත වලාළුතුනක් ඉක්ම ගොස් සතරවන පර්වතවලල්ලෙහිවූ දණ්ඩකාරණ්‍යඥ නම් පර්වත වලල්ලෙහි වාසය කරන්නෙහිය. ඒ මයුර රජ දවස්පතා ගොදුරු භූමියට බස්නාකල තමාට ආරක්ෂාව පිණිස නැගෙන්නාවූ සූර්ය දිව්‍යපුත්‍රයන් බලා මෙසේ වූ බ්‍රහ්ම මන්ත්‍රයක් කියයි ඒ කෙසේද

උදෙතයං  චක්ඛුමා එකරාජා හරිස්සවනෙනා පඨවිප්පභාසොතං නං නමස්සාමි හරිස්සවන්තං පඨවිප්පභාසං තයජ්ජගුත්තා විහාරෙමු දිවයං යන මේ මන්ත්‍රය කියා පර්වතයෙන් බිමට බස්නේය.

එහි අභිප්‍රාව කෙසේද යත් ?.

සකල චක්‍රාවාල ගර්භවාසීවූ සියලු සත්වයාහට රාත්‍රිභාගයෙහි වූ අන්ධකාරය විධ්වංශනය කොට රූපදර්ශනය කොට හේතුවූ ආලෝක පතුරවන හෙයින් ඇස් ඇත්තාවූ වොරජීම් අර්ථයෙන් සියළු සක්වළගැබ ආලෝක පතුරවන්නාවූ ඒ සූර්ය පුත්‍රයාහට නමස්කාර කෙරෙම් අද දවස් ඒ සූර්ය දේවතාවා විසින් රකිනාලදුවයි නිර්භයව වාසය කෙලෙම් කියා  සූර්යාට නමස්කාර කොට දෙවනුව අතීතවූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරණ මයුරයා මෙලෙස කියා යේ බ්‍රාහ්මණවෙදගු සබ්බධම්මේ තෙමේ නමො තෙවමං පලායන්තු නමත්ථු බුද්ධානං නමත්ථුබෝධියා නමො විමුත්තානං නමො විමුක්තියා ඉමං සො පරිචත්තං කත්වා මොරොවරති එසනා.

මෙහි අභිප්‍රාව කෙසේද යත්?.

තවද දුරුකරණලද පාපයන්ඇති සකන්ධධාතු ආයතනාදී සියළු පදාර්ථයන් සර්වප්‍රකාරයෙන් පිරිසිඳ දත්තාවූ යම් සර්වඥයවන් වහන්සේ කෙනෙක් ඇද්ද මාගේ නමස්කාරය උන්වහන්සේට වේවයි ඒ අතීත කාලයෙහි අපමණවූ අචින්ත්‍ය වූ ආබංගුණාගණාගයෙන් යුක්තවූ සර්වඥයන්ට නමස්කාර වේවායි ඒ සර්වඥයන් විසින් ප්‍රතිවෙධ කරණලද සමායක් සම්බුද්ධ ඥාණයටද නමස්කාර වේවායි ඒ සර්වඥයන් විසින් වදාරණලද සද්ධර්ම වූ පරිද්දෙන් පිළිපදින්නාවූ සංසාර සාගරයෙන් ගොඩනැගී අමාමහනිවන් දුටුවාවූ සංසරත්නයටද නමස්කාර වේවායි ඒ සර්වඥයන් විසින්ද, ඒ ආර්ය සංඝයා වහන්සේ විසින් ප්‍රතිවෙධ කරණලද සතරමහ සතරඵල සංඛ්‍යාතවූ විමුක්තියටද නමස්කාර වේවායි කියා ඒ මයුර රජ්ජුරුවෝ මේ පිරිත් ආරක්ෂාකොට ගොදුරුපිණිස හැසිරෙන්නාහයි වදාළසේක.

ඒ මයුරතෙම මේ පිරිත් ආනුභාවයෙන් දාවල් දවස් සැපසේ කිසි අන්තරාවක් නැතිව සැපසේ ඇවිද රාත්‍රීභාගයෙහි පර්වතයට නැගී බස්නාහු සූර්‍යයා දැක ඒ පරිත්තය පිරිත්වන්නාහු අපෙතයං චක්ඛුමා ඒකරාජා හරිස්සවනෙනා පඨවිප්ප භාසො තං තං නමස්සාමි හරිස්සවන්තං පඨවිප්පභාසං තයජජගුනතා විහාරෙමුරත්තිං. යෙ බ්‍රහ්මණ වෙදගුස්බ්බ ධම්මේ තෙ මේ නමො තෙව මං පාලයන්තු නමත්ථු බුද්ධානං නමත්ථ බෝධියා නමො විමුත්තානං නමෝ විමුක්තියා ඉමං සො පරිත්තා කත්වා මොරොවාසමකප්පයිති කියන මේ පරිත්තානුභාවයෙන් රාත්‍රියෙහිත් සැපසේ වාසය කරන්නාහ. මේ නියායෙන් පරිත්‍රානුභාවයෙන් දවස්පතා වාසය කරණ කල්හි එසමයෙහි එක් වැද්දෙක් වනචරකව හිමාලවනයෙහි ඒ ඒ තැන ඇවිදින්නේ ය. බෝධිසත්වයන් වාසය කරණ පර්වත සමීපයට තමා මියන අවස්ථාවේ එම්බල අසවල් දණුඩකාරණ්‍යඥ පර්වත මුදුනේ රන්වන් මයුරයෙක් ඉදිනේය. යම්දවසක රජ්ජුරුවන් වහන්සේ රන්වන් මොණරෙකුගෙන් ප්‍රයෝජන ඇතැයි කීසේක් නම් තෝ ඒ මොණරා අල්වාදෙවයි කිය. එසමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ අග්‍රමහේසිකාව වූ ඛේමානම් බිසව රාත්‍රියෙහි ස්වප්නයෙන් රන්වන් මොනරකු අතින් බණ අසන්නා දැක පිබිද උදෑසන රජ්ජුරුවන්ට කියන්නී රන්වන් මොණරකු මට අවසෲයෙන් දුටොත්විනා මගේ ජීවිතය නැතැයි කියා දොලගත්තාහ. එබව රජ්ජුරුවෝ දැක අමාත්‍යයන්ගෙන් රන්වන් මොණරකු ඇද්දයි විචාළාහ. අමාත්‍යයෝ රන්වන් මොණරෙකු ඇතිනියාව නැති නියාව දන්නෝ බමුණෝයයි කීවාහ. රජ්ජුරුවෝ යහපතැයි බමුණන් අතින් විචාළහ. බමුණෝ ශාස්ත්‍ර බලා රන්වන් මොණරු ඇත ඒ දන්නෝ වැද්දෝයයි කීහ. එවිට රජ්ජුරුවෝ වැද්දන් ගෙන්වා රන්වන් මොණරුන් ඇතිතැන් දන්නෝ ඇද්දයි විචාළහ. ඉන් එක් වැද්දෙක් කියන්නේ ස්වාමීනි හිමාලවනයෙහි පර්වතවලලු තුනකින් එපිට දණ්ඩකාරණ්‍යඥ නම් පර්වතයෙහි

SANHIDA LANKA

ඇතැයි කීහ එවිට රජ්ජුරුවෝ එසේ වීනම් තොප ගොසින් ගෙණවයි කීහ. එවිට වැදිතෙමේ යහපතැයිගිවිස තමාගේ පුතාට එපවත්කීයා තෙමේ වලට ගොස් පියා කී සලකුණු නියාවට දණ්ඩකාරඤ්ඤ නම් පර්වතයේ මොණරා වාසය කරණ නියාව දැක මොණරා ගොදුරු සොයා බස්නා මාවත දැක එම මාවත වල ඉඳුවා බෝධිසත්වයන් බඳන්ට බොහෝ උත්සාහකළේය. බොධි සත්වයන්ගේ මන්ත්‍රානුභාවයෙන් මල ඇතුලේ පයලුවත් මලනොහැසිරෙන්නේය. මේ නියායෙන් ඒ වැදි තමාගේ දිවිහිමියෙන් උත්සහකොටත් බැරිහෙයින් ඒ හිමාලවනයෙහිම හිඳ මලේය. බේමානම් බිසවුන් මොණරාලබම් දොළානොලත් හෙයන් මළාහ. රජ්ජුරුවෝත් මොණරා නිසා බිසවුනුත් මළේයයි සිතා මොණරා කෙරෙහි වෛර බැඳ රන්පොතක ලියාවන්නාහූ අසවල් හිමාලවන පර්වතයෙහි පර්වතවල තුනකින් ඇතුළේ දණ්ඩකාරඤ්ඤ නම් පර්වතයෙහි ස්වර්ණමයුරයෙක් වෙසෙයි ඒ මයුරයාගේ මස් කෑ කෙණෙක් අජරාමර වෙති රන්පත ලියාවා භාණ්ඩාගාරයේ රක්ෂාකොට තබා මළහ. උන්ට ඉක්බිති රාජ්ජයට පැමිණ රජ්ජුරුවෝත් ඒ රන්පත්දැක එසේ වීනම් මොණරා මරා මස් කා අපරාමරවෙන්ට උවමැනවැයි සිතා වැද්දෙකු යවුහ. ඒ වැදිත් බොහෝ උත්සාහ කොට මන්ත්‍රානු භාවයෙන් බැරිහෙයින් ඒ වනයේම මළේය. මේ නියායෙන් රජදරුවෝ සදෙනෙක් යැවු වැද්දෝ සදෙනම බැද්දේ මළ  පමණ විනා මොරණාරා අල්වාගත නොහුනුවාහුය. සත්වැනි රාජ්ජයට පැමිණි රජ්ජුරුවෝත් රන්පත බලා එලෙසම වැද්දෙකු යවුහ. එර් වැදිත් වලටගොස් බෝධිසත්වයන්ට මල ඉඳුවා බොහෝ උත්සාහකොට බැරිහෙයින් සීතන්නේ මේ මොණරා මලෙයි පයාලාත් නොබැඳෙන්නේය. කුමණකාරණයකින්දෝහෝයි සිතා පරීක්ෂා කරනනේ බෝධිසත්වයන් උදසනක්සේ සූර්යාව නමස්කාරය හා බ්‍රහ්මමන්ත්‍රය පිරවීම් ආදීයවූ කාරණ දැක එසේ වීනම් මන්ත්‍රය ආකුලකෙරෙමි සිතා පිටිසරගමක පෙරලා අවුත් මොණරා සෙබඩක් අල්වාගෙණ ඒ මොණරා සෙබඩ සිටි තැනට අවුරුසන් ගැසුවේලේ නටහාරව ප්‍රතිරාව කරන්නට හා මෙකී දෙය මොණරා සෙබඩ කරණ ලෙස  සලස්වාගෙණ මොණර සෙබඩ ඇරගෙණ පෙරලා හිමාලවනයට ගොස් බෝධිසත්වයන් ගොදුරු භූමියට බස්නාතෙන මල ඉඳුවා එතැන සෙබඩ සිටුවා බෝධිසත්වයන් ඉරුබලා මන්ත්‍රය පිරුවනට පළමුකොට මොණර සෙබඩා ලවා රාගානිශ්‍රිත කොට ඇඬිවිය බෝධිසත්වයෝත් නැතැක් දවස් ඇසුරුගනිශ්‍රිත අඩ සෙයින් ඊ බැඳ යක්ෂයන් ආවේසවුකල කිසිවක් නොදන්නාමෙන් රාගයෙහි බැඳි පිරිවන මන්ත්‍රය සඳහන් නැතිව සෙබඩ සිටිතෙනට මොණරා බටතෙනත්තෝ මල බැඳින එවිට වැදි මොණර අල්වාගෙණගොස් රජ්ජුරුවන්ට පෑහ. රජ්ජුරුවෝත් මොණරා දැක සතුටුවුහ. එවිට මයුර රජ්ජුරුවෝ රජගෙන් විචාරන්නේ මා ගෙන්වුයේ කුමකටදැයි විචාළහ. රජ්ජුරුවෝ කියන්නෝ තොපගේ මස්කෑවන් අජරාමරවෙති අසා තොප මරා මස්කන්ට ගෙනවම් කීසේක. එවිට මයුර රජ්ජුරුවෝ කියන්නාහු මාගේ මස් කා අජරාමර වෙතොත් යහපතැයි මා මියනකල මාගේ මස් කැවුන් අජරාමර වෙන්නේ කෙසේදැයි කිහ. එබස් රජ්ජුරුවෝ අසා එසේ නොකියව රන්වන් මොණරා වේදැයි කිහ. එබස් මයුරරජ්ජුරුවෝ අසා එසේ වීනම් රන්වන් වූ කාරණාව අසව මම යටගියදවස බරණැස්නුවර චක්‍රවර්ති රජව ඉපිද පන්සිල්රැක දැහැමෙන් සෙමින් රාජ්‍යය කොට ඉන් මියගොස් දිව්‍ය ලෝකයෙහි ඉපිද එයින් චුත වුකල අකුසල් බලයෙන් මේ තිරිසන් යෝනියෙහි උපනිමි මාරැක්කාවූ පඤ්චශීලයෙහි බලයෙන් මෙසේ වූ රූපශ්‍රියකට පැමිණියෙමි කීහ.ඒ දොඅදහන රජහට මයුර රජ්ජුරුවෝ  කියන්නාහු මම යටගියදවස චක්‍රවර්තී රාජජ්‍ය කරණ සමයෙහි මම ද ආකාශ චාරීව ඒ ඒ තැන ඇවිද්දාවූ රන්රුවන් රථයක් ඇත. ඒ රථය තොපගේ මගුල් පොකුනේ දිය ඉස්සා රථය ඇරගෙණ මාගේ බස් සැක අරවයි කිහ. එබස් අසා රජ්ජුරුවෝ එලෙස පැන් ඉස්සවා රථය ගොඩලා ගත්තාහ. රජ්ජුරුවෝ සතුටුව බෝධිසත්වයන් මුදාඅලහ. බෝධිසත්වයෝත් එවිට රජ්ජුරුවන්ට පන්සිල් දී අවවාදකොට පක්ෂ ප්‍රහාර කෙරෙමින් දණ්ඩකාරඤ්ඤ නම් පර්වතයටම ගියායයි වදාරා ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ චතුසත්‍යය ප්‍රකාශ කොට මේ ස්වර්ණමයුර ජාතකය නිමවා වදාළසේක. ජාතකාවසානයේදී ඒ භික්ෂූන් වහන්සේත් සියළු කෙලෙසුන් නසා රහත්වූසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථිරයෝය, මයුර රජ්ජුරුවෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# විනීල ජාතකය

තවද ශාස්තෘ වූ සම්මාසම්බුදු රජානන් වහන්සේ රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන්ගේ සර්වඥ විලාශය දක්විමක් නිසා මේ ජාතකය දක්වන ලදී. හේ කෙසේද යත්?

සර්වඥයන් වහන්සේ දගසවුවන් වහන්සේට වදාරණසේක් දේවදත්ත ස්ථවිරයන්ගේ පන්සියයක් දෙනාවහන්සේ රහත්කරවාගෙණ එනසේකැයි කියා ඒ දෙදෙනා වහන්සේ ගයාශිර්ෂ නම් දේවදත්ත ස්ථවිරයන්හිඳිනා විහාරයට ගිය සේක. එවිට දේවදත්ත ස්ථිවිරයෝ සර්වඥ විලාසයක් දක්වන්නෝ ශාරිපුත්‍ර ස්ථවිරයෙනි. මාගේ වසටරිදෙයි තොපි බණ කියවයි කියා ධර්මසනය පිටිපස්සේ වැදහොත්තාහ. සැරියුත් සාමින් බණ කියා පන්සියයක් දෙනාවහන්සේ රහත්කරවා අරගන පලාගියසේක. එවිට දෙවදත්ත ස්ථවිරයන්ගේ ලඟට කොකාලිකස්ථිවරයෝ පැමිණ පයින් ලයට ඇන ලේ තුන්කටත් ගන්වාපුහ. සැරියුත් මුගලන් දගසට වන් දෙදෙනාවහන්සේත් සර්වඥයන් කරා වැඩිසේක. සර්වඥයෝද එවිට දගසව්වෙනි තොප දක දේවදත්ත ස්ථිවිරියෝ කුමන කෘත්‍යයක් කලසේක්දැයි විචාළසේක. දගසව්වන් වහන්සේ වදාරණ සේක් ස්වාමිනි දේවදත්ත ස්ථවිරයෝ සර්වඥ කෘත්‍යයකොට ලය තලාගෙන ලේ තුන්කටත් නගාපුවෝ වේදැයි වදාළසේක. එවිට සර්වඥයන් වහන්සේ දැන්මතු නොවෙයි පළමුත් දෙවදත්ත ස්ථවිරයෝ මාගේ කෘත්‍යකොට හීනවූවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස විදේහරට මියුළුනුවර විදේහ නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි හංසයෙක් කැවිධියක හා සමග සංවාස විය. ඒ සංවාසයෙන් කැවිඩිධේනුව පුතකු වැදූහ. එකියන පුත්‍රයා මවසේ කළුපැහැයත් නොවෙයි පියවූ හංසයාගේ රන්වන් පැහැයත් නොවෙයි. දෙපැයටම නොවනිලවන් පැහැයමවිය. ඒ උන්ගේ දෙමව්පියෝ උන්ට නම් තබන්නාවූ විනීලයෝයයි නම් තුබූහ. හංසයානන්ගේ හිමාලයෙහි හංසපැටවුන් දෙන්නෙක් ඇත්තාහ. එසේ හෙයින් හංසයා අතුරේ මියුළුනුවරට ඇවිත් යන්නේය. ඒ දක හංස පැටව් දෙන්න කියන්නෝ පියානන් වහන්සේ නුඹවහන්සේ මනුෂ්‍යපථයට නිතර යාමෙන් උපද්‍රවවන්නේය. අපි ගොසින් ඒ පැටවුන් ගෙනෙම්හයි කිහ. එසේ වීනම් මියළුනුවර වාසලකෙරේ තල්ගසෙක කවුඩු කැදැල්ලක වෙසෙති තොපි දෙන්න ගොසින් හැරගෙණවයි යැව්හ. එවිට හංසපෝතකයෝ දෙන්න විනීල නම් කපුටුවා ලඟට අවුත් ඔහු ලීයක හිඳුවා හංසයෝ දෙන්න ලියදෙපිටින් ඩැගෙණ විනීලයා මැද්දෙහි හිඳුවාගෙණ මියුළුනුවර මධ්‍යයෙන් නික්මුනාහ. ඒ වෙලාවට වේදෙහ රජ්ජුරුවෝ යහපත් කොටසැරහී ඇලිඅසුන් සතරදෙනෙකු යෙදූ රථයකට නැගී නුවර මහත් ප්‍රදක්ෂිනාවෙන් නික්මුනාහ, ඒ වෙලාවට විනිලකයාත් ආකාශයෙන් යමින් සිටියේ රථයෙන් යමින් සිටි රජ්ජුරුවන් දක කියන්නේ මියුළු නුවර ගෙයක්කොට ඇති වේදෙහ රජ්ජුරුවෝත් අසුන්සතර දෙනෙකු යොදනලද රථයකින් නික්මුනාහුය. මමත් ස්වර්ණාහංසයෝ දෙන්නෙකු යොදන ලද රථයෙන් ආකාශයෙන් නික්මුනෙමි කිය. එබස් අසා හංසයෝ කෝපවූ මෙතනදී මරා පියාම්හයි සිතානැවත සිතන්නාහු එසේකළ මෝනම් පියනාන් වහන්සේ ඊර්ෂියාවෙන් මරාපියා ගියහයි සිතනාසේකැයි සිතා එසේ නොකොට හැරගෙණගියාවූ හංසයාන්ට එපවත් කීයේය. හංසයා කිපි තෝ තාගේ තරම නොදනිද. තොපසේ වුවන්ට නිසි මල මුත්‍ර ඇති ස්ථානයෙක විනා මෙසේවුතෙන තොපට ආස්ථානයයි කියා හංසපැටවුන්ට කියන්නාහු, මොහු ඇරගෙන මුගේ වලග ලාපියාඑවයි කිහ. හංසයොත් එලෙසම කළෝදැයි වදාරා දෙකල් ගලපා මේ විනිල ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි විනිලනම් දේවදත්ත ස්ථවිරයනය. හංසපැටවා නම් දගසව්වෝය. පියානෝ නම් ආනන්ද ස්ථිවිරයයෝය. වෙදහරජව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම යි වදාළසේක.

SANHIDA LANKA

# ඉන්ද්‍රගුත්ත ජාතකය

තවද ශක්‍යසිංහවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසන සමයෙහි නොකීකකරු භික්ෂූන් කෙණෙකුන් වහන්සේ අරඹයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

එක් නොකීකරු භික්ෂූන් කෙණෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට දන් වන්නා මහණ නොකීකරුවූයේ සැබෑදැයි විචාරා සැබැවයි දන්වන්නා මහණ තාගේ නොකීකරුකම් පිණිස පළමුත් අතුපයින් මැඩවුම් කෑයෙහි වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රජාහය කරන සමයෙහි බෝධිසත්වයෝ පන්සියයක් තපස්වරුන් පිරිවරාගෙණ ගණනායකව හිමාලවනයෙහි වසන්නාහ, එසමයෙහි ඉන්ද්‍රගුප්ත නම් තාපස කෙණෙක් ඇත්පැටවෙකු වඩාගත්හ.  බෝධිසත්වයෝත් මේ ඇතා වැඩිමෙන් ඇතා නිසා උදව පැමිණෙයි ඒ නොවඩවයි කීහ. ඒ තාපසයෝ කීවා නොකොට ඇතා මුහුකුරුවා වැඩී එයින් වැඩිවිය පැමිණ මදසෙල්වි ගිය අවස්ථාවට තාපසයෝ තාපසවරුන් හා සමග ඔබේම ගමකට ගොස් එනකල ඇත් මදයෙන් සිටිහෙයින් ඒ තාපසයන්ගේ පන්සලවිදා පැන්සල්වල් ආදීවූ දෙයත් බිඳ තාපසයන් ඉදිනා ගල්පුවරුවත් උදුරාදමා සක්මන් කෙළවර වැතිරසිටිනා පුවරුවත් උදුරාදමා තාපසයන් මරා යෙමි සිතා වනසමීපයෙහි සිටියේය. එවේලාවට තාපසයෝ එතනට අවුත් සැකනැතිව ලගට ගියාහ. එවිට ඇත් තමා ලගට ආ තාපසයන් දක තමාගේ දළින් ඇන මරා වලට ගියේය. ඒ දුටු තාපසවරු එපවත් බෝධිසත්වයන් කීවාහුය. බෝධිසත්වයෝත් එවිට තාපසයන්ම කළමනා ආදාහණ කෘත්‍යය කොට තාපසවරුන් සමීපයට කැඳවා කියන්නාහු අසත් පුරුෂ නීචවූ සත්වයා ලංකිරීමෙන් දෝෂනියාව මේ ඉන්ද්‍රගුප්ත තාපසයන් කීවා නොකිරීමෙන් අසත්පුරුෂ ඇතා වඩා මරවාගත්තා වැන්නේය. එසේහෙයින් සත්පුරුෂයා සත්වයා ලංකිරීමෙන් හා උන් කී අවවාද ලෙසට පිළිපැදීමෙන් බොහෝ ඉෂ්ටාර්ථයට පැමිණෙන්නේයයි යනාදීන් තාපසවරුන්ට අවවාද කියා කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ ඉන්ද්‍රගුප්ත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ඉන්ද්‍රගුප්ත තාපසයෝ නම් මේ නොකිකරු භික්ෂූහුය. එසමයෙහි කීකරු තාපසයෝ නම් බුදු පිරිසය. එසමයෙහි තාපසයන්ට අවවාද කළාහු නායක තාපසයෝ නම් මම්ම වේදැයි සම්මාසම්බුදු රජානන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සන්ථ ජාතකය

අසරණ සරණ වූ සර්වඥයන් වහන්සේ ජේතවනා රාමයෙහි වැඩ වසන සමයෙහි ගිණිදෙවියාට පූජා කරණ නිගණ්ඨයන් අරභයා මේ ජාතකය දක්වන ලද

ඒ කෙසේද යත්?

මෙහි වර්තමාන කථාව නං ගුඪ ජාතකයෙහි විස්තර වශයෙන් දක්වන ලද. භික්ෂූන් වහන්සේ ස්වාමීනි මුනකරණගිණි දෙවියාගෙන් මතුවන වැඩෙක් ඇද්දයි විචාළසේක. ඊට සර්වඥයන් වහන්සේ මහණෙනි පෙර උත්තමයෝත් මෙහි වැඩෙක් ඇද්දෝහොයි බලා වැඩක් නැති හෙයින් ඇරපුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ  සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරුකෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බමුණු කුලයක ඉපිද දෙමව්පියන් විසින් උපන් දවස් තිබු ගිනි නොනිවා තිබා බෝධිසත්වයන්ගේ වයස් සොළොස් ඇවිරිද්දට පැමිණි කල්හි බෝධිසත්වයන්ට කියන්නාහු පුත මේ ගිනි ඇරගෙණ ගොස් වහ්නිදේවතාවාට පූජා කොට වනයේ තපස් කරවුනම් එසේ කරව නැත්නම් ශාස්ත්‍රය ඉගෙණ කුටුම්බ සණ්ඨාපනය කොට වාසය කරවයි කීහ. එවිට බෝධිසත්වයෝ මට ගිහිගෙයින් කම්නැතැයි කියා ගිනි දෙවියා ඇරගෙණ ගොස් වග්නිදෙවතාවාට පූජා කොට වලට  ගොස් පන්සලක් ඉදිකොට ගිනි දෙවියාට පූජා කන්නාහ. එසමයෙහි එක් දවසක් දන්දෙන ගෙයකින් එලඟිතෙල් මුසු කිරිබතක් ලැබ මාගේ ගිනිදෙවියාට පූජා කෙරෙමියි සිතා ගෙනවුත් ගිනි මොලවා තෙල් මුසු කිරිබත් ගින්නට දමූහ. එවිට තෙල් අධිකහෙයින් ගිනිමහත්ව ඇවිල පන්සල දන්ටවන, ඒ වෙලාවට බ්‍රහ්මණ පන්සලින් පිටත්ව තමාගේ  පන්සල දන්නා බලා කියන්නේ අසත්පුරුෂවූ නිචයා හා එක්වීමෙන් මා බොහෝ දුක්විද ඉදිකොටගත් පන්සල දවනපමණකැයි කියා ගිනි නිවා හිමාලය වනයට නික්මිනි. එවිට අතරමග සිංහයකු හා ව්‍යාඝ්‍රයෙකු හා දිවියෙකු හා තුන් දෙනාගේ මූන ලෙව ලෙව සිටි රිලවකු දැක සිංහ ව්‍යාඝ්‍ර දෙදෙනා හා දිවියා ඇතුළුවූ තුන්දෙනා විශ්වාසනිසාත් අසත්පුරුෂයා විසිනුත් මුන්ට අනර්ථ නොකරති කියා හිමාලයවනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤාභිඥා අෂ්ට සමාපත්ති උපදවා ආයුකෙළවර බ්‍රහ්මලෝකයෙහි උපන්හයි වදාරා සන්ථ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළ සේක.

SANHIDA LANKA

# සූසීම ජාතකය

තවද සරණගත වජ්‍රපඤ්ජරවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ඡන්දදානයක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්

සැවැත් නුවර වාසීහු එක්සමයෙක තනි තනිව සර්වඥයන්ට දන්දෙන්නාහ. සමහරදා පස්දෙනා එක්ව දන් දෙන්නාහ. සමහර දවස් වීථියක මනුෂ්‍යයෝ එක්ව දන්දෙන්නාහ. සමරහ දවස් නුවර වාසී එක්ව දන්දෙන්නාහ. මේ නියායෙන් දන්දෙන සමයෙහි එක්දවසක් නුවර වාසීහු එක් වදනක් සරහා ගත්තාහ. එවිට තීර්ථභක්තික ඇත්තෝ නිගණ්ඨනාථපුත්‍ර මක්ඛලිගෝසාලාදී වූ සත්සමයේ ඇත්තන්ට දන්දෙම්හයි එකභක්තිගත් උපාසකවරු කියති, සම්‍යයක් භක්ති ගත්තො සර්වඥයන් වහන්සේ ප්‍රධාන භික්ෂු සංඝයාවහන්සේට දන්දෙම්හයි කියති. මේ නියායෙන් උනුන් ගිවිස්වාගත නොහි දවස් හරණා සමයෙහි එක්නුවනැති මනුෂ්‍යයෙක් කියන්න් මේ දෙපක්ෂයෙන් බොහෝ මිනිසුන් ඇති පක්ෂයේ කෙනෙකුන්ට දන්දෙම්හයි කියා කීහ. ඒ වෙලේ බොහෝ මිනිසුන් ඇත්තේ බුද්ධශාසනයේ හෙයින් බුද්ධසානයටම දන්දෙම්හයි කියා ඒ නියාවට දන් සපයා දුන්නාහ. එසමයෙහි සර්වඥයන්ගේ දන් කඩකරන්නට සිතුවත් කඩනොකොට දන්දීපුවාහ. සර්වඥයෝත් අනුමෙවැනි බණ වදාරා ජේතවනාරාමයට වැඩිසේක. භික්ෂූන් වහන්සේත් තමන් වහන්සේගේ ගණවලට වැඩි රාත්‍රි මානයෙහි දම්සභා මණ්ඩපයට රැස්ව ඇවැත්නි තීර්තකයන් විසින් සර්වඥයන් ලබන්නාවූ ලාභසත්කාරයට අන්තරායෙක් කරන්ට උත්සහ කොටත් අන්තරායෙක් කොටගත නුහුනුවෝ වේදැයි මේ කථාව කිය කියා වැඩ උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා මහණෙනි දැන්මතු නොවෙයි පළමුත් මා ගේ ලාභසත්කාරයට අන්තරායකරන්නට වැදත් අන්තරායකොටගත නුහුනුවෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර සූසීම නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ පුරෝහිත බමුණාන කෙණෙක් ඇත්තාහ. ත්‍රිවේදයෙහි පරාප්‍රාප්තව ඇත්වෙද හා ඇත් ලක්ෂණ දන අවුරුදු පතා හස්තියාග කොට කෙළගණන් සම්පත් ලබන්නාහ. ඒ අවදියේ බෝධිසත්වයෝ එ බමුණාගේ ගෙයි බැමිණිය බඩ පිළිසිඳ ඉපිද සත්අට අවුරුදු පැමිණිකල බෝධිසත්වයන් වහන්සේ ගේ පියාණෝ නැසීගියාහ. එසමයෙහි හස්ති යාගය පැමිණියේය. එවිට  බමුණෝ එක්ව හස්තියාගය කරණ කල් පැමිණියේය. ස්වාමිනි මෙතෙක් දවස් හස්තියාගකොට සිටි පුරෝහිත බමුණා වැටීහුණුහෙයිනුත් උන්ගේ පුතානෝ කිසිම ශාස්ත්‍රයක් නොදනිති, එසේ හෙයින් අපි හස්තියාගකරම්හයි කීවාහුය. එවිට රජ්ජුරුවෝත් යහපතැයි ගිවිස්සොය්. අදින් බමුණෝ සතරවෙනිදා හස්තියාගය කරම්හ, එසේ හෙයින් බොහෝ ලාබ ලබම්හයි ඇවිදිනාහ. ඒ දුටු බෝධිසත්වයන්ගේ මෑණියෝ සත්මුත්තක ප්‍රවේණිව පැවත ආ හස්තියාගත් ඔබ්බකට සැලසී ගියේය. අප බොහෝ ලබන සම්පතුන් හා නිවියයි කියා හඬන්ට වන්හ. එසේ අඬ අඬා උන්නාවූ මෑනියන් උන්තෙනට බෝධිසත්වයොත් ඇවිත් මැනියන්වහන්ස අඬන්නේ ඇයිදැයි විචාරා එපවත් අසා අදට යාගකරන්නේ කීපදවසකැදැයි විචාරා මෙතනට එකසිය විසියොදුන් ඇති තක්සලා නුවර දිසාපාමොක් සිල්ප දනිති කී විසින් එසේවීනම් සෙටදවල් තක්සලා නුවරට යෙමියි රෑ දෙවරු ශාස්ත්‍ර උගෙණ පසුදවස් අවුත් සතරවෙනි දිනයෙහි යාගය කෙරෙමි එසේ හෙයින් නුඹ වහන්සේ විඤසස නුවමැනවයි මෑනියන් අස්වසා මෑනියන් උදෑසනක්සේ ලූ බත් කා අචාරිභාගය හැරගෙණ උදෑසනක්සේ නික්ම සනධ්‍යාවලාවට එක්සියවියොදුන් මගගෙවා තක්සලා නුවරට පැමිණ දිසාපාමොක් ආචාරින් දුටුහ. ඒ ආචාරින් කුමක් නිසා අවුදැයි විචාරා ත්‍රිවේදය හා හස්තිශාස්ත්‍රය උගන්ට ආමි. මට වහාඋගන්නට උඩමැනවයි කීවිසින් මෙතෙක් ශාස්ත්‍ර කෙසේ උගන්වන්නෙහිදැයි කියන්නා එසේ නොවෙයි අදින් තුන්වෙනි දවස් හස්තියාගෙවෙයි. එසේහෙයින් එක්සියවිසියොදුන් කතරගෙවා මමත් ආයේවෙතිය, එසේහෙයින් අදට පරක්කුවක් නොවි  නුඹ වහන්සේ විසින් පාලිය පමණක් පිරිවණ මම අද්‍යතන වශයෙන් අර්ථවිදහා දැනගනිමි කියා ඒ නියාවට ආචාරින් ගිවිස රෑ බත් කා ඉක්බිති බෝධිසත්වයෝත් බත් කා ආචාරීන් පය සෝදා ආචාරීන් වැඳ ආචාරිභාගයේ මසුරන්දහස පාමුලතිබා උන්නාහ. ආචාරීන්ද වැඳ ආචාරීභාගයේ මසුරන්දහස පාමුලතිබා උන්නාහ. ආචාරීන්ද තමන් දන්නා ශාස්ත්‍රය පිරිවා පාන්කොට පුවාහ. බෝධිසත්වයෝත් ආචාරීන් විසින් වහා වහා සඟවා කියාපුවා එකශෘතිහෙයින් ධරා ආචාරින් වහන්ස තව ඇද්දැයි විචාළසේක. ආචාරී එතෙකැයි කී විසින් එසේ වීනම් අසවල් තැන අසවල් වැරදිය අසවල් තෙන මෙසේ හරිය එසේ හෙයින් මෙවක් පටන් සිල්ප උගන්වන කල මෙසේ උගන්විය මැනවයි යනාදීන් අචාරාන්ට කියා උදෑසනක්ස් පිටත්ව බරණැස්නුවරට අවුත් මෑනියන්ට ශාස්ත්‍ර උගත් පුවත කියා උන්නාහ. පසු දවස් රජ්ජුරුවන්ගේ සියක් ඇතුන් රන්යන්නාහයෙන් සරහා රන්ධජ රිදීධජ ආදීවුදෙය නන්වා මහත්වූ අලංකාරකොට අපි යාග කරම්හයි සැරහී බමුණෝ සිටියාහ. ඒ වෙලාවට රජ්ජුරුවොත් මහත්වූ අලංකාරයෙන් සැරහි යාගයට උවමනා පිළි පළඳනාවූදෙයක් ගෙන්වාගෙණ යාග ශාලාවට ආහ. ඒ වෙලාවට බෝධිසත්වයෝත් කුමාර අලංකාරයෙන් සැරහී මහත් පිරිවර පිරිවරණ ලදුව එතනට අවුත් රජ්ජුරුවන් දක කියන්නාහු කළුපැහැ ඇති සුදුදල ඇති රන්සන්නාහයෙන් සරහන ලද සියක් ඇතුන්ගේ යාගය අපට පැවත ආ යාගය ඔබ්බකට සලස්වා වදාළයි කියන්නා ඇසිමි. ඒ සැබෑදැයි කිහ. එවිට රජ්ජුරුවවෝ කියන්නාහු කළුපැහැ ඇති සුදුදලඇති රන්සන්නාහයෙන් සරහණ ලද සියක් ඇතුන්ගේ යාගය තෝ ශාස්ත්‍ර නොදෙවෙනිව කී විසින් ඔබ්බකට සැලසුවා සැබැවයි කිහ. එවිට

SANHIDA LANKA

බෝධිසත්වයෝ යාගකොට ලදමනා සම්පත් ලබාගෙණ ගෙටගියෝ වේදැයි වදාරා සුසීම ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි බැමිණියෝ නම් මහාමායාදේවිය. පියාණෝ නම් සුද්ධෝදන රජ්ජුරුවෝය. බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථිවරියයෝය. දිසාපාමොක් ආචාරීනම් ශාරිපුත්‍ර ස්ථවිරිය. බ්‍රාහ්මණකුමාරව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම යයි වදාළ සේක. මේ ජාතකය අවසානයෙහි බොහෝදෙනා සෝවන් වුහ. එමතෙක් දෙනා අනාගාමි වුහ. එමතෙක් දෙනා සකෘදාගාමි වුහ. එමතෙක්දෙනා සියළු කෙලෙසුන් නසා රහත් වුහ. එසේහෙයින් මේ ධර්මය බොහෝදෙනාට සාර්ථක විය.

SANHIDA LANKA

# නකුල ජාතකය

තවද පරදුක්ඛ දුක්ඛිත වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ සේනානායක මහා අමාත්‍යයන් දෙන්නෙකුගේ කෝපයක් නිසා මේ ජාතකය දක්වන ලද, මෙහි වර්ථමාන කථාව යටකියන ලද උරග ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. මහනෙනි මේ මහා අමාත්‍යයන් දෙන්නාගේ කෝපවෛරය පළමුත් ඇරවුවෙම් වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයක උපන්සේක, පංච කාමයෙහි ආදීනව දැක ඍෂි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව පන්සලක වාසය කරණ සේක. එසමයේයි පන්සල සමීපයෙහි සක්මන් කෙළවර තුඹසක මුගටියෙක් වාසය කෙරෙති. එතනට සමීපයෙහි ගස්බිලයක සර්පයෙක් වාසය කෙරෙයි, එසමයෙහි ඒ කියන නාගයා හා මුගටියා දවස්පතා උනුන් කඩා කා උනුන් කන්නාහ. එසමයෙහි තාපසයෝ සිතනුයේ මාසේවූ තාපසකෙණෙකුන් සමීපයෙහි ඉන්නා මුන්දෙන්න උනුන්කෙරේ වෛරව ඉඳින්ට සුදුසු නොවෙයි සිතා අවවාද කියා සමගි කළහ. එසමයෙහි එක් දවසක් සර්පයා ගොදුරට යාදී මුගටියා තුඹසින් කරමැත්කොට දත් පෙණනතුරු කට දල්වාගෙණ වැදහෙව නිදමින් සිටියේය. ඒ වෙලාවට තාපසයෝ එතනට අවුත් ඌ දැක ඇයි තා ඉතා භයංකාර කොට පියා ඉන්ට තාගේ අසත්පුරෂ වූ සර්පයාත් සත්පුරුෂව ගියාවුව කුමක් නිසාදැයි විචාළහ. එවිට මුගටියා කියන්නේ අමිත්‍රයා කෙරෙහිත් සංකා කලයුතුමය මිත්‍රයා කෙරෙහිත් සංකා කළයුතුමය, එසේ හෙයින් පසමිතුරා කෙසේ විශ්වාසවුත් සංකා කලයුතුයයි කීහ. එබස් අසා බෝධිසත්වයෝ තොපසේවූ සිතක් සර්පයා කෙරේ නොසිතවයි කියා භාවනා කොට නොපිරිහුනු ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලොකයෙහි උපන්නාහ. මුගටියා හා නාගයත් කම්වූපරිද්දෙන් මියපරලොව ගියාහයි වදාරා මේ නකුල ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි මුගටියා හා නාගයා නම් මේ සමයෙහි වෛරී වූ අමාත්‍යයෝ දෙන්නාය. තාපසය උපන්නෙම් ලොවුතුරා බුදුවූ මම්මයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# උපසාල්හක ජාතකය

තවද කරුණානිධාන වූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපසාල්හක නම් බ්‍රාහ්මණයෙක් ඇත. ඒ බ්‍රාහ්මණයාගේ පුතනුවෝ දවසෙක මා මළහොත් චංලාදීන් නොදවපු සුවිපවිත්‍රස්ථානයක දවවයි කීහ. එබස් අසා බමුණාගේ පුතා කියන්නේ මම එසේවූ ස්ථානයක් නොදනිමි නුඹ වහන්සේම එසේ වූ ස්ථානයක් පැවොත් යහපතැයි කීහ. එබස් අසා බමුණා කියේ කාරණයයි කියා පුතා හා සමග ගිජ්ජකූට පර්වතයට ගොස් ගල් කුළුතුණක් මධ්‍යයේ මෙතන යහපතැයි පුතාට කියා පුතා හා තම දෙන්නා පාතට බස්නා අවස්ථාවට එදවස් සර්වඥයන් වහන්සේ මහාකරුණා සමාපත්තීන් ලොව බලා වදාරණසේක් බමුණා හා පුතාගේ හේතුසම්පත් දැක ගිජ්ජකූට පර්වතයට නැගී වදාළසේක. එවෙලාවට බමුණා හා පුතා බස්නාවුන් දැක ඇයි තොතනට ගොසින් බසුදැයි විචාරා වදාළසේක. එවිට පියබමුණා නොබැන නොනැගී සිටි යේය. පුතා කියන්නේ ස්වාමීනි මේ අපගේ පියානන් වහන්සේ හානිවූ දවසෙක යහපත් තෙනක තමන්වහන්සේ දවන්ට කියා පර්වත මුදුනේ කුළුතුනක් මධ්‍යයේ දවන්ට කීසේක. ඒ බලන්ට ගියම්හයි කිහ. එවිට සර්වඥයෝ ඒ ස්ථානය බලන්ට අපිත් යම්හයි බමුණා සමග පර්වතයට නැගී ස්ථානය දැක තාගේ පියා හා තෙපි නොයිඳුල් තෙනක් සොයා ඇවිද්දෝවේදැයි වදාරා බමුණා විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස රජගහනුවර උපසාල්හක නම් බමුණෙක් ඇති. ඒ තමාත් තමාගේ පුතා හා සමග කාත් නොදවි ස්ථානයක දවන්ට උවමැනවැයි කියා ගිජ්ජකූට පර්වතයට නැන්ගේය. බෝධිසත්වයෝ මගධරට බමුණුකුලයක ඉපිද දිසාපාමොක් ආචාරින් අතුරෙන් සිල්ප නිමවා ඉගෙණ ඍෂිප්‍රජ්ජ්‍යාවෙන් පැවදිව වාසය කරන්නේ බමුණා හා පුතා ගිජ්ජකූට පර්වතයට අවුත් බස්නාවෙලාවට උන් හා සමග පර්වතයට ගැනී මේ තොප කරන්නේ කිම්දැයි විචාරා එපවත් අසා තාපසයෝ පරසිත් දන්නා විසින් එම්බල බ්‍රාහ්මණය සුචි පවිත්‍රයට අටගත්තාවූ ස්ථානයේ ඒ ඒ ජාතියේ සත්වයන් මෙතන දැවූ ජාති හා තත් ඒ ඒ කුලයෙහි ඉපිද වූ ජාතිහැර මෙමනුවර උපසාල්හක නම් බ්‍රහ්මණව ඉපිද මේ තමාගේ පුතා හා සමග එතනට අවුත් දැවූ ජාති තුදුස්දාසයක් වෙයි, එසේහෙයින් මිනියත් නොදැව ස්ථානයක් මිනියක් නොතිබෙන ස්ථානයක් එකතැනකත් නැත්තේ වේදැයි කියා සතර විහාර භාවනාකොට බඹලොව ගියහයි වදාරා උපසාල්හක ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි දෙපුතුපියෝ නම් දැන් මේ දෙපුතු පියෝමය. තාපසව උපන්නෙමි ශාස්තෘ වූ බුදුවූ මම්මයයි වදාළසේක. මේ ජාතකාවසානයේදී ඒ බ්‍රහ්මණ දෙපුතු පියෝ දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටියාහ.

SANHIDA LANKA

# සම්ධි ජාතකය

තවද ලෝකදිවාකර වූ සර්වඥයන් වහන්සේ රජගහනුවර තපෝදාරම විහාරයෙහි වැඩ වසන සමයෙහි සම්ධි තෙරුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක. සම්ධි තෙරුන් වහන්සේයයි යන නම කුමක් නිසාදැයි යතහොත් එක් දවසක් ජලස්නානය කොට අඳනය ඇඳගෙණ සිවුර අතලාගෙන ඇඟ පැන් වියලෙන තුරු සිටසේක. එවිට බොහෝ භික්ෂූන් වහන්සේ උන්වහන්සේගේ රූපශ්‍රිය දැක රූපශ්‍රීයෙන් අඩුවක් නැතිහෙයින් සම්ධි තෙරුන් වහන්සේ යයි නම් ලත් සේක. එක්තරා දිව්‍ය ස්ත්‍රියක් උන්වහන්සේගේ රූපශ්‍රීය දැක පිළිබඳ සිත් ඇතිව, එක් දවසක්. උන් වහන්සේ කරා ගොස් කියන්නී මේ නිසා රූපශ්‍රීයාවක් ඇතුව පංචකාම සැපය අනුභව නොකොට මහණව ඉඳිමෙන් කාරණය කිම්ද. වෘද් අවස්ථාවට පැමිණිකල තපස් රැක්ක මැනවයි කිව. මේ අවස්ථාවෙහි ගිහිගෙයි උන්නමැනවයි කී එබස් අසා තෙරුන් වහන්සේ කියනසේක්, එඹල මරණනම් කවර අවස්ථාවෙහි පැමිණෙන බවත් නොදනෙයි. එසේ හෙයින් සිවුරු නොහරිමියි කීසේක. එවිට දේව දූ තමා අභිප්‍රාවට බස් නොකී හෙයින් අන්තර්ධානව ගියාහ, තෙරුන් වහන්සේ එපවත් ගොසින් සර්වඥයන් වහන්සේට කීසේක. සර්වඥයෝත් පළමුත් දේවතා දූ තොප තබා උත්තමයන්ටත් මේ බස් කීවාවේදැයි වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ හිමාලය වනයෙහි වාසය කරණ සේක. එක්දවසක් ජලස්නානය කොට රිටිසුඹුලක් අතල ගෙණ ශරීරයේ පැන් වියලෙන තුරු වැඩ සිටිසේක. එක්තරා දිව්‍යස්ත්‍රියක් උන්වහන්සේගේ රූපශ්‍රීය දැක පිළිබඳ සිත් ඇතුව යෞවන අවස්ථාවේ පංචකාම සැප අනුභව නොකොට මහණව ඉඳිමෙන් කාරිය කිම්ද වෘද්ධ අවස්ථාවට පැමිණකල තපස්රැක්ක මැනව මේ අවස්ථාවෙහි ගිහිගෙයි උවමැනවයි කිව, එබස් අසා තාපසයෝ කියන්නෝ එඹල මරණ නම් කවර අවස්ථාවේ පැමිණෙන බවත්, නොදෙනයි. එසේහෙයින් තාපස ප්‍රව්‍රජ්ජා නොහරිම් කීසේක. එවිට දිව්‍යස්ත්‍රී අන්තර්ධාන වියයි කියා සම්ධි ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි තාපසව උපන්නේ බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# සකුන්ගඝී ජාතකය

තවද ත්‍රෛලෝක්‍ය චූඩමාණික්‍යවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්දවසක් භික්ෂූන් වහන්සේට අවවාද කරණ සේක් මහණෙනි භික්ෂූන් විසින් දෙමව්පියන් ගොදුරුසොයා ගිය මග යායුතුය. අස්ථානයෙහි ගොදුරුසොයා යාම විනාසයට කාරණයයි යනාදී සකුණ සූත්‍රය වදාළසේකී. ඒ විස්තර වශයෙන් මහවගෙහි බස්නේය. මහණෙනි පක්ෂිපවා අස්ථානයේ ගොදුරු සොයා යාමෙන් විනාශයට පැමිණියෝ වේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වන් වහන්සේ කැටකිරිල්ලීව උපන්සේක. කැට කිරිල්ලිව ඉපිද සීකැට අස්සේ ගොදුරුකා නෑයන්හා සමග වසන්නාවූ කැටකිරිලි තොමෝ එක් සමයෙක අන්‍යභූමියෙක ගොදුරු සොයා කම්සිතා ඔබ්බකට ගොස් තැනිබිමක ගොදුරුසොයා කමින් සිටියේය. ඒ වෙලාවට එක් උකුස්සෙක් කැටකිරිල්ලට නොඅඟවා අවුත් ගසාගත කැටකිරිලි උකුස්සා ගසා ගෙණ යමින් සිටියෙදී හඬ හඬා කියන්නී මාගේ විෂය නොවු පරවිෂයට අවුත් මේ සා දුක් පැමිණියේය. මාගේ විෂය නම් මට කුමක් කොට නියන්නෝ ඇද්දැයි කීය. එබස් ඇසූ උකුස්සා එසේවීනම් තාගේ විෂයට නොගොස් හිඳු තාගේ විෂය මම ගසා ගත නොහෙම්දැයි කියා කැටකිරිල්ල අතහළහ. එවිට කැටකිරිල්ල ඇවිත් සී කැට මධ්‍යයේ හිඳ මෙවිට මා ගසා ගතැයි කීය.එබස් උකුසු අසා මහා වේගයෙන් ගසන්ට අවුත් ලඟට ආ වේගය රඳවාගත නොහී සී කැටෙහි ලය තලාගෙණ දැස් උඩහිඳුවා මළේය. ඒ දක්වන්නාවූ සර්වඥයන් වහන්සේ මහණෙනි නියම්සේ දෙමව්පියන් ඉන්නා වූ ස්ථානයෙන් ඔබ්බට ගියාවූ කැටකිරිල්ලී යම්සේ දුකට පැමිණයේද පියානන් නැවිදුනාවූ මග ඇවිදුනාවූ භික්ෂූන්ට එසේම වන්නේය. භික්ෂූන්ට පියාණො කවුරුදැයි යතහොත් සර්වඥයන් වහන්සේය, උන්වහන්සේ වදාළ මර්ගය නියාවට පිළිපැදීම උතුම, යම්සේ කැටකිරිල්ලී සීකැට ඇති තැන ගොදුරු නොකා තැනිබිම ගොදුරු කන්ට ගොස් උකුස්සාට අසුවිද එමනියායෙන්ම මහණෙනි රූපශ්‍රීයක් දැක ඊටම චක්ෂුරීන්ද්‍රය එලීමෙන්ද යමෙක් තෘෂ්ණාවට වාල් වීමෙන්ම ඉන්ද්‍රිය එලිමය යනාදී සංලමනයෙහි ඇල්මකොට මාත්‍රුයාට අසුවන නියාව යහපත් තෙනට ගොදුරට නොගොසින් උකුස්සාට අවුවාක් මෙන් එසේ වූ සඳ ලම්බනයෙහි සිත නොඑලවා සර්වඥයන් වදාළ ප්‍රතිපත්ති නියාවට දවස්හැර සංසාරසාගරයෙන් ගැලවී යාම නම් තමාගේ ස්වකීයස්ථානයට ඇවිත් ගැළවීගියාවූ කැටකිරිල්ල වැන්නේයයි මහණෙනි ඒ කැට කිරිල්ලිත් මළාවූ උකුස්සා පිටට පැනනැගී මාගේ ස්ථානයට පැමිණිහෙයින් පසමිතුරාපිට දක්වනලදැයි වදාරා සකුන්ග්ඝි ජාතකය නිමවා වදාළසේක. ජාතකාවසානයෙහි බොහෝ සත්වයෝ සෝවාන් වූහ. එසමයෙහි උකුස්සා නම් දේවදත්ත ස්ථවිරියයෝය. කැටකිරිල්ලිව උපන්නෙම් බුදු වූමම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# අරක ජාතකය

තවද ශාක්‍යසිංහවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මෙත්ත සූත්‍රය නිසා මේ ජාතකය දක්වන ලදි.

ඒ කේසේද යත්

මහණෙනි පුරුදු කරණ ලද්දාවූ වඩනලද්දා වූ මෙනෙහිකරන ලද්දාවූ මෛත්‍රී සිතින් උපලක්ෂිත වූ සත්වයන් මට එකොළොස් වැදෑරුම් වූ ඉෂ්ටවිපාක ඇත්තේයයි ඒ කවරේද යත්, ඒ සත්වතෙමේ යෙහෙන් නිදන්නේය. යෙහෙන් පුබුදින්නේය. භයංකර ස්වප්නාදියක් නොදක්නේය. සියලු සත්වයන්ට ප්‍රියකරු වන්නේය. යක්ෂ රාක්ෂාදින්ටත් ප්‍රියකරු වන්නේය. දෙවියන් විසින් රක්නාලබන්නේය. ඕහට ගින්නෙන් හෝ විෂයෙන් හො ආයුධයෙන් හෝ උපද්‍රවයක් නැත්තේය.කිපියාවුත් ඔහුගේ සිත වහාම තැනෙන්නේය. ඔහුගේ මුඛය ප්‍රසන්න ජවිවර්ණ ඇත්තේය. සිහිමුළාව නොමියන්නේය. මරණින් මත්තෙහිත් නොපිරහුණු මෛත්‍රී ඇත්තේය.බ්‍රහ්මලෝකයෙහි උපදින්නේයයි මෙත්තා නිශංස ගෙණහැර දක්වා වදාරා මහණෙනි භික්ෂූන් විසින් තමා සියළු සත්වයා කෙරෙහි පිරිසිඳ හෝ සාමාන්‍යයයෙන් හෝ සියළු සත්වයෝ නිදුක් නිරෝගී සුවපත් වෙත්වයි කියා මෛත්‍රී භාවනාවද දුක්ඛිත සත්වයෝ දුකින් මිදෙත්වයි කියා කරුණාභාවනාවද සුවපත් සත්වයන් දැක සත්වයෝ සුඛිත මුදිතාවෙත්වයි කියා මුදිතාභවනාවද, සියළු සත්වයන් කෙරෙහි උත්කර්ෂවත් නෙකොට සමතින්දැකීමෙන් උපෙක්ෂා භාවනාවදැයි චතුර්විද බ්‍රහ්මවිහාර භාවනායෙහි අභියෝගකල යුත්තේ යයි සම්ප්‍රපත පර්ෂිදට ධර්මදේශනාකොට වදාරා මහණෙනි පෙරත් උත්තමයෝ මෛත්‍රී භාවනාව කොට සංවර්තීස්ථායි, කප්සතක් වනතුරු බ්‍රහ්මසම්පත්තියෙන් නොපිරි හුණෝවේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස එක්තරා කපෙක බ්‍රාහ්මණකුලයෙක ඉපිද පඤ්කාමයෙහි ආදීනම දැක ඍෂි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන්ට නායකව අරක මහාශාස්තෘව වාසය කරණසේක. තුමුත් මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා යන සතර බ්‍රහ්ම විහාර භාවනාකොට තමන්ගේ තාපසවරුන්ටත් අවවාද කරන්නෝ මෙසේ කියාත් තාපසවරු නම් යම්සේ සත්වයෙක් සතරදිගය සතර අනුදිගය උඩය යටය යන දශ දිශාවෙහි ඇත්තාවූ සත්වයාකෙරෙහි මෙත්සිත් පතුරුවාද, ඒ සත්වයාගේ සන්තානයෙහි ඉන් අටගත් අකුශල ධර්මකෙණෙක් ඇත්නම් අධික වූ මෛත්‍රී ආනුභාවයෙන් යුක්ත වූ හෙයින් විපාකදායක නොවී ඒ අකුශලයෝ වන්නාහුයයි බෝධිසත්වයෝ ඒ සෂීගණයාට ධර්මදේශනා කොට සතර බ්‍රහ්මවිහාර භාන කොට එයින් චුතව බ්‍රහ්මලෝකයෙහි ඉපිද සංවර්තී විවර්තීස්ථායි කප්සතක් බ්‍රහ්ම සම්පත් වින්දාහයි කකන්ටක ජාතකය උමන්දාවෙන් දැක්ක යුතුයයි වදාරා එසමයෙහි අරකනම් ශාස්තෘවූයෙම් ලොව්තුරා බුදුවූ මම්මයයි වදාරා අරක ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# කළ්‍යාණ ජාතකය

තවද ශාක්‍යකුලනායකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ශාසනයෙහි ප්‍රසන්න වූ එක් උපාසකයෙක් සර්වඥයන් වහන්සේ ගෙන් බණ අසන්ට ගඳදුන් මල් පහන් ගස් අත් ඇතිව සර්වඥයන් කරා දකින්ට ගියේය. උන්යාදී උන්ගේ නැන්දා ගෙටවුත් තමාගේ දුවඅතින් විචාරන්නී තොපගේ ස්වාමීපුත්‍රයා තොපට ප්‍රියකරුව වාසය කෙරේදැයි විචාළීය. එපවත් අසා කියන්නී අපගේ ස්වාමී පුත්‍රයා දවස් අරණ මාන භික්ෂූ කෙණෙකුන් දවස අරණ වැන්නැයි කිව, මවගේ කණ මහඬුසෙයින් ඇට ඇසෙන්නේ ස්වාමිපුත්‍රයා ගියා යයි කීවාසේ ඇසින එසේද තොපගේ ස්වාමිපුත්‍රයා මහණවෙන්ට ගියයි කියා අඬන්නට වන ඇගේ අඬඅසා ගෙයි දැසීදස්සියල්ලෝ අඬන්නට වන්හ. බොහෝ ස්ත්‍රී පුරුෂයෝ ඒ ගෙට එන්නෝ කිමෙක්දැයි විචාරා එපවත් ඇසූහ. ඒ වෙලාවට උපාසක පෙරලා ගෙට එන්ට විදියට බැසපියා ඒ වෙලාවට එක් මිනිසෙක් ගොස් එපවත් මගදීදක කෙළඹිපුත්‍රයාට කියන්නේ තොපගේ ගෙයි තොප මහණවූවයි කියා එහි අඬති කීහ. එපවත් කෙළඹිපුත්‍රයා අසා මට උපන්නාවූ කිර්ති ඝෝෂාව නොනසමිතා ගණයට ගොස් සර්වඥයන් වහන්සේ ගේ සමීපයට ගියේය. සර්වඥයෝත් ඇයි උපාසකය දන්නොවේදතෝ බුද්ධපස්ථානය කොට ගියෝය. පෙරළා කුමක් නිසා අවුදැයි විචාරා ස්වාමීනි මහණනොවි ඉන්දදී මහණවූවයි ඇසින. ඇසුනු කීර්තීඝෝෂාව නොනසමි සිතා මහණවන්නට ආමී. එසේ හෙයින් මා මහණකරවදාළොත් යහපතැයි කීය. එබස් අසා සර්වඥයෝත් යහපැතැයි කියා බෝදවසකින් විදර්ශනා වඩා රහත් වූසේක. එක්දවසක් භික්ෂූන් වහන්සේ ධම්සභා පංඩපයේ රැස්ව කථාකරණසේක් ඇවැත්නි අසවල් කෙළඹි පුත්‍රයා තමාට  උපන් කිර්ති ඝෝෂාව නොනසා මහණව සියළු කෙළෙසුන් නසා රහත්වූවෝ වේදැයි කිය කියා වැඩහුන්තැනට සර්වඥයන් වහන්සේ වැඩවදරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි පෙර උත්තමයෝත් උපන්නාවූ කීර්තීඝෝෂාව නොනැසුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ නුවර සිටාණකෙණෙකුගේ ගෙයි ඉපිද වැඩිවිය පැමිණ ඒ සිටාණන්ගේ ඇවෑමෙන් සිටුසේසත් ලැබ රජ සේවය කරණසමයෙක්හි එක් දවසක්  රාජසේවය කරන්ටයාදී වර්ථමාන කථාව සේම සිටානන් මහණ වූහයි හඬන්නට වන්නාහ. ඒ වෙලාවට බෝධිසත්වයන් වහන්සේත් රාජ්‍යයසේවය කොට පෙරලා ගෙට යන්නාවූ මගයන මිනිසෙකුගෙන් එපවත් අසා කිර්ති ඝෝෂා නොනසමි සිතා පෙරළා රජගෙට අවුත් රජ්ජුරුවන් දුටුහ. රජ්ජුරුවෝත් සිටානන් ගියවර නොමකා ආයේ කුමකටදැයි විචාරන්නා දේවයන් වහන්ස මා මහණ නොවි ඉන්දදී මහණවුහයි කීර්තිඝෝෂා පැතිරින. ඒ උපන්නාවූ කිර්තිඝෝෂා නොනසා මහණවන්නා කැමැත්තෙමි. එසේ හෙයින් ඒ අර්ථනය ප්‍රකාශකොට දක්වන පිණිස මහසිටානෝ මෙසේ කියත් ජනප්‍රධාන වූ දේවයන් වහන්ස යම්සේ කළ්‍යාණ වූ කිර්තිඝෝෂාවක් ප්‍රකාශවූකල කිර්තිඝෝෂාව නසාපිම කාරණානොවෙයි හිරිඔතප් ඇති සත්වයන් තමාට පැමිණිධූරයහ හැරපිම් කාරණා නොවෙයි කියා තවද කියන්නාහු ජනප්‍රධාන වූ දේවයන් වහන්ස එසේ හෙයින් මට පැමිණියා වූ කළ්‍යාණගුණය අරනේ යුතු නැත. එසේ හෙයින් ස්වාමීනි මම්ම මහණ දම් පුරමි පංඤකාමයෙහි තෘෂ්ණාව නැතැයි කියා රජ්ජුරුවන් අතින්  අවකාශ ඉල්වාගෙන හිමාලවනයට ගොස් තාපසව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවාගෙණ නොපිරිහුනු ධ්‍යානයෙන් ගොස් බඹලොව උපන්නාහයි වදාරා කළ්‍යාණ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථිවිරයෝය. තාපසව උපන්නෙම් දැන් බුදුවූ මම්ම යයි වදාළ සේක.

SANHIDA LANKA

# දද්දර ජාතකය

තවද ශාක්‍යකුලතිලක වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසමයෙහි කොකාලිකස්ථිවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි

ඒ කෙසේද යත්

සැවැත්නුවර බොහෝ  භික්ෂූන් වහන්සේ ඒ ඒ තැන බුදුන්ගේ පාළි ධර්මය පිරිවරණසේක. ඒ කෝකාලික තෙරුන්නාස්සේ බණ කියන්නා අසා තමන් වහන්සේ බණ කියාගතනොහෙතත් බණකියනනියාවට අපි බණ නොකියමෝදැයි එසේ කල අපගේ බණ අසන්නෝ ඇත්නම් කියන්නමෝ වේදැයි කියාගෙන ඇවිදිනාසේක. එපවත් සංඝයාවහන්සේ අසා ඒසේ වීනම් කොකාලිකයෙනි අදවස්  තෙපි බණ කියවව් කීසේක. එබස් අසා යහපත බණකියම් ගිවිස යහපත් කොට කැඳ අවුළුපත් ආදී දෙය වළඳා කටුකරඬුමලේ පැහැය ඇති සිව්රකුත් යහපත් තැඹිලිවන් සිවුරකුත් ඇඳ පෙරව බණකියන්ට උන්සේක. ධම්මස්සවන කාලෝ අයං පදන්තා කියා බණට අඬගා ඒ අඬඅසා බොහෝ භික්ෂූන් වහන්සේ ධම්සභා මණ්ඩපයට රැස්වූසේක. එතනට තමන්වහන්සේත් වැඩවෘද්ධ භික්ෂුන් වහන්සේට නමස්කාර කොට විසිතුරු කර්මාන්ත කළ විජිනිපත්‍රයක් අතට ගෙන ධර්මාසනාරූඪව බණ කියන්ට වැද පළමුකොට කියන ගාථාවෙන් පදයක් කියා අනිකුත් පදය දැකගත නොහි තුෂ්ණිම්භූතව සර්වාංගය මුළුල්ල ඩාදිය සෙල්වී තමන් වහන්සේ කී වාසියට බණ කියාගත නුහුනු හෙයින් භය ලජ්ජාවට පැමිණ ධර්මාසානයෙන් බැස කරබාගෙණ පලාගියසේක. ඒ වෙලේ අනිකුත් භික්ෂූ කෙණෙකුන් වහන්සේ පලග නැගී බණ කීසේක. එක් දවසක් ධම් සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කොකාලික ස්ථවිරියන් බණ කියන්ට සපනායයි උනුම්භ දූන් උන් බණ නොදන්න නියාවත් නුව නැතිනියාවත් දතුම්භයි කිය කියා මේ කථාවෙන් යුක්තව උනුසේක. එතනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා එපවත් අසා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ සිංහයන් ට රජව ඉපිද ගල් ගුහාවක වාසය කරන්නාහ. එතන සමීපයෙහි ගල් ගුහාවෙක කැනහිලෙක් වාසය කරන්නේය. එසමයෙහි එක්දවසක් මහවැස්සෙක්වට, එවිට බොහෝ සිංහයෝ බෝධිසත්වයන් ලඟට අවුත් බෝධිසත්වයන් හා සිංහනාද කොට කෙළනටවන්හ ඒ වෙලාවට කැනහිලාත්තමාගේ ගල් තමාගේ ගල්ගුහාවෙන් එලියට අවුත් අඬගසා කෙළිනට වන කැනහිලාගේ හඬ ඇසූ සිංහයෝ  ලජ්ජාවට මුවෙන් නොබැන සිටියාහ. ඒ වෙලාවට බෝධිසත්වයන්ගේ පුත්වන සිහපැටවෙක් බෝධිසත්වයන්ට කියන්නේ පියානන් වහන්සෙ මේ සිංහසමූහයා අඬගසා කෙළිමින් සිටියව තිබුයේ ඇයිදැයි විචාළේය. එපවත් සිංහරජ්ජරුවෝ අසා එඹල පුත අපිනම් සිව්පාවුන්ට රජකුලේ උපනුමහ, එසේ වූ අපි හැම කෙළිනා වේලාවට සිව්පාවුන්ට නිචවූ සිගාලයා අප හා සමග අඩුහෙයින් ලජ්ජාවෙන් සිංහයෝ බැනනොනැගී උනුම්භයි වදාරා මේ දද්දර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි සිගාලයෝ නම් කෝකාලිකස්ථවිරයෝය. සිංහපෝතකයෝ නම් රාහුල ස්ථවිරයෝය. සිංහරාජව උපන්නෙම් ලොවුතුරා  බුදුවූ මම්මයි තමන් වහන්සේ දක්වා  වදාළසේක.

SANHIDA LANKA

# මර්කට ජාතකය

තවද ශාක්‍යාසිංහවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වංචා ප්‍රයෝගදන්නා භික්ෂුකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද, මෙහි වර්තමාන කථාව පකිණ්ණක නිපාතයෙහි උද්දාලජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. මෙහි මහණෙනි පළමුත් මේ භික්ෂූහු වංචාවෙන් ගිනි තපින්ට වන්නේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එක්තරා කෙළඹි පුත්‍රයෙක්ව උපන්නාහ. එසමයෙහි බෝධිසත්වයන්ගේ බිරින්ද පුතෙකු වැදූහ. ඒ පුතා වැඩිවිය පැමිණ අවස්ථාවට බෝධිසත්වයන්ගේ බිරින්ද නැසීගියහ. එවිට බෝධිසත්වයන්ගේ පුතනුවන් කැන්දාගෙණ බොහෝ නෑයන් අඬමින් සිටියදී ගේ පිරුනු සම්පත් හැර හිමාලවනයට ගොස් පන්සලක් කොට වාසයකරන්නාහ. එසමයෙහි එක්දවසක් මහා වැස්සසෙක් වසින්ටවන ඒ වෙලාවට බෝධි සත්වයෝ පන්සල මැස්සෙක වැදහොත්තාහ. බෝධිසත්වයන්ගේ පුතනුවෝ බෝධිසත්වයන්ගේ පය මැඩ මැඩ උන්නාහ. ඒ වෙලාවට එක්වඳුරෙක් සිතයෙන් පිඩිතවපියා සිතන්නේ මම තාපසයන්ග් පන්සලට ගියේනම් වැදද නොදෙති තාපස වේසයක් ලාගෙණ යම් සිතා මළාවූ තාපස කෙණෙන්ගේ වල්කලා ඇඳගෙණ තාපසයන් පන්සල ගාවා තල්ගසමුල කරබාගෙණ සිටියේය. ඒ වෙලාවට බෝධිසත්වයන්වහන්සේ ඇවිත් සිටිනසේකැයි සිතාගෙට අවුත් පියානන් වහන්ස තාපසකෙණෙන් වහන්සේ අවිත් සිටිනස්කැයි සිතාගෙට අවුත් පියානන් වහන්සේ තාපසකෙණෙකුන් වහන්සේ ඇවිත් දොර හරින සේක. උන්ගෙට ගෙන්වා ගිනිතප්පවන්නට උවමැනවයි කියා එබස් අසා මැස්සෙන් බැසදොරට අවුත් වඳුරා දක එඹලපුත තාපසකෙණෙකුන්ට මෙසේ වූ මුහුණක් නැත. එසේ හෙයින් මේ වඳුරාය, මුන්සේ වුවන් ගිනිතපින්ට ගෙන්වූකල තාපයනකල පන් සල ගිණිලාපියා යන්ටහපනුය. එසේ හෙයින් තාමෙතන සිටින්නේ ඇයිදැයි කියා ගිණිපෙල්ලක් බලාගැසුහ. එවිට තමාගේ මල්කලාදාමා ගසට පැනනැන්ගේය. බෝධිසත්වයෝත් සතර බ්‍රහ්මවිහාර භාවනා කොට නොපිරිහුනු ධ්‍යනයෙන් ගොස් බ්‍රහ්මලෝකප්‍රාප්ත වූ හයි වදාරා මර්කට ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි වඳුරා නම් වංචා ප්‍රයෝගයෙන් දන්නා භික්ෂූහුය. එසමයෙහි තාපස මාරයෝ නම් රාහුල ස්ථවිරයෝය. තාපසව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# දූතියමක්කට ජාතකය

තවද ශාක්‍යකුල චූඩාමාණික්‍යවූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්ත මහතෙරුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

එක්දවසක් දම්සභ මණ්ඩපයෙහි රැස්වූ භික්ෂූන් වහන්සේ දේවදත්ත ස්ථවියෝ අකෘතඥයෝය. කෙළෙහිගුණ නොදනිති යනාදීන් මේ කථාව කොට උන් කල්හි සර්වඥයන් වහන්සේ එතනට වැඩ වදාරා මා එන්නට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා අනික් කථාවකින් යුක්තව නුනුම්හ. දේවදත්ත ස්ථිවිරයන් වහන්සේගේ කෙළහිගුණ නොදන්න බව කිය කියා උනුම්හයි කී කල්හි මහනෙණ දැන් මතු නොවයි දේවදත්ත ස්ථවිරයෝ කෙළෙහි ගුණ නොදන්නේයයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ කසීරට බමුණුකුලයක ඉපිද පඤ්චකාමය හැර තාපසව වසන්නාහ. එසමයෙහි එක්තරා මාවතක නියෝගයක් කළේය. බොහෝ පක්ෂිහු පැන් නොලබන්නාහ. මගයන මනුෂ්‍යයන් ඇති කාලයෙහි පැන් ලබන්නාහ, නැතකිලයෙහි නොලබන්නාහ. එසමයෙහි මනුෂ්‍යයන්ගේ සංචාරය නැකත් කාලයක් ඒ මගනුවුයේය. එසමයෙහි බෝහෝ පක්ෂිහු පැන් නොලබන්නාහ. එක් වඳුරෙකුත් පැන්වලක් සමීපයෙහි පැන් වත්කරණ කෙණෙකුන් නැත්තෙන් බලාබලා ඉඳිය. එසමයෙහි බෝධිසත්වයෝ කිසියම් කටයුත්තක් නිසා ඒ මග යන්නාහු ඒ විල සමීපයට ආවාහු පැන් උකා බී නහා වඳුරාත් එතනසිට විසින් උන්ට පැන්වත් කළාහ. ඒ පැන් බී බඩ පුරවාගෙණ ගසට නැගී බෝධිසත්වයන්ට උසුළුපාන්නට වන, එවිට බෝධිසත්වයෝ යහපත තොපසේවුවන්ට පැන්වත්කල හෙයින් උසුළුපානෙවේදැයි නිවයාම කළදෙයෙහි ප්‍රත්‍යුපකාර නැත්තේ වේදැයි කිහ. එපවත් වඳුරා අසා අපගේ ජාතියෙහි සත්වයන් උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කළකෙනෙක් කොයිද ඇද්දී?. තව මා කරන්නේ මෙතෙක්ද තොපගේ හිස වර්චස් කොටද මා යන්නේයයි කීහ. එබස් අසා බෝධිසත්වයෝ මෙසේ නීචයා එසේ කරන්නේ සැබැවයි කියා  නික්මුණාහ. වඳුරා තමාකරා එන්නා අත්තළඩ ඉඳ බෝධිසත්වයන් හිස්මුදනේ වර්චස් එළාගියෝය. බෝධිසත්වයෝ වඳුරාකෙරේ අමෛත්‍රීයක් නොසිතාගොස් ඉසසෝදා නහා ගියෝ වේදැයි වදාරා මේ විතීය මක්කට ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි වඳුරා නම් දේවදත්ත ස්ථවිරයෝය. තාපසව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# ආදිච්චුපට්ඨාණ ජාතකය

තවද ශාක්‍යකුල ප්‍රසාද වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසන සමයෙහි වංචාප්‍රයෝග දන්නා භික්ෂූන් කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

වංචා ප්‍රයෝග දන්නා භික්ෂූ කෙණෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට දක්වන්නා මහණෙනි දැන් මතු නොවෙයි පළමුත් වංචා ප්‍රයෝගදන්නේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ කසීගම්බ්‍රාහ්මණකුලයක ඉපිද පඤ්චකාමයෙහි ඇලුම්හැර ඍෂිපප්‍රව්‍රජ්ජාවෙන් මහණව හිමාලය වනයෙහි බොහෝ තාපස වරුන්ට නායකව වාසය කරන්නාහ. එසමයෙහි වස් සාරමස ලුනු ඇඹුල් සපයන නිසා හිමාලය වනයෙන් බරණැස්නුවරට අවුත් ඒ ගම උපාසක වරුන්ගේ ආරාධනාවෙන් නන්වා දුන්නාවූ පන්සල වාසය කරන්නාහ.එසමයෙහි එක්තරා වඳුරෙක් තාපසවරුන් විථියෙහි සිඟායාද මේ තාපස වරුන්ගේ පන්සලවිදා පැන්වලින් ආදී වූදෙයත් බිඳ ඩබරාවල පැනුත් නමා පන්සලෙන් වර්චස් කර මේ නියායෙන් කරන්නේය. එසමයෙහිත් තාපසවරුන් වස්තුන් මස වස්වැස අන්තයේ උපාසකරුනි අපි යම්හයි කීහ. එවිට උපාසකවරුත් සෙටදවස අපගෙන් දෙන දන් වළඳා යන්නේයයි  කීහ. තාපසවරුන් යහපතැයි ගිවිස්සාහ උපාසකරුත් බාද්‍යභෝද්‍ය ඇතිව බත් මාළු තාපසවරුන් ඉන්නා තැනට ගෙනගියහ. ඒ වෙලාවට වදුරුත් සිතන්නේ මම සාන්ත දාන්ත වේශයක් දක්වාගෙණ මේ ගෙනා මධුරකැවිල්ලෙන් මාත්කන්ට උවමැනවයි සිතා මෙතෙක් සාන්තදාන්ත වෙෂයක්ව ඉරබලාගෙණ සිටියේය. ඒ වෙලාවට තාපසවරුන්ට දන්ගෙනා උපාසකරු වඳුරා සිටිමාන් දැක යහපතුන් ලඟ විසිගත් ගුණයෙන් මෙසේවනැයි කියා ස්තුති කරන්ට වන්නාහ. එවිට තාපසයෝත් මේ වඳුරාගේ යහපත් ගුණයක් නැත. මූට කුමට ස්තුති කරන්නෙහිදැයි කීහ. මුන් විසින් අපගේ පන්සලවිදා ගිණිහල්වා ගෙයි වර්චස් කොට කල ඩබරා ආදී වූ දේත් බිඳ බොහෝ අනර්ථ කරණලදැයි කීහ. එපවත් අසා උපාසකරු කැටමුගුරුත් අත් ඇතිව වඳුරා එහුබඳවාගත්හ. තාපසවරුන් හිමාලයවනයට සැපසේ ගොස් තපස් රැක බඹලොව ගියාහයි වදාරා මේ ආදීචචු  පට්ඨාන ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි වඳුරා නම් දැන් වංචාප්‍රයෝග දන්නා භික්ෂූහුය. තාපසවරුන් නම් බුදු පිරිසය. ගන ශාස්තෘව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම යයි දක්වා වදාළසේක.

SANHIDA LANKA

# කලහමුග්ධී ජාතකය

තවද ශාක්‍යකුල ප්‍රසාද වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්පුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද.

හේ කෙසේද යත්

එක් සමයෙක්හි කෝසල රජ්පුරුවන්ගේ පසල් දනව්වේ එක් ගමකට සතුරන්ගෙන් භයක් පැමිණියේය. එබස් අසා රජ්පුරුවෝ වර්ෂා කාලය තිබියදී යුද්ධ පිළිබඳවූ කටයුතු හෙයින් අකාලයව තිබියදී නික්ම චතුරන්ගිනිසේනාව ඇරගෙණ ජේතවනාරාමය සමීපයේ දවස් ගතව කඳවුරු බැඳ උන්නාහ. ඒ ඉඳ සිතන්නාහු මම අකාලයෙහි නික්මිණිමි. එසේ හෙයින් සර්වඥයන් වහන්සේ දකිමි සර්වඥයෝ මට මෙලව්නුත් පරලොව්නුත් සංග්‍රහකරණ සේක. එසේහෙයින් නොයායුතු වී නම් මහරජ කොයියව්ද අකාලයයි කියාව වදාරණ සේක. එසේහෙයින් නොයායුතු වී නම් මහරජ කොයියව්ද අකාලයයි කියා වදාරණසේක. යායුතු වීනම් මුවෙන් නොබැන වැඩහිඳිනාසේකැයි සිතා බුදුන් දකින්ට ගියහ. සර්වඥයෝ මහරජ මධ්‍යහ්නවේලේ කුමකට අවුදැයි විචාරා ස්වාමිනි පසල්රට සතුරන් විසින් සේවාකමට යනගමනේ ස්වාමින් දැක වැඳ යන නිසා ආමි කීහ. එබස් සර්වඥයෝ අසා මහරජ අකාලයෙහි යාම යහපත් නොවෙයි වදාරා පළමුත් අකාලයෙන් නික්මුනා වූ රජදරුවෝ උත්තමයන්ගේ කාරණා අසා නැවත්තෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරුකකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් ඒ රජ්පුරුවන්ට සියළු කටයුතු රාජකාරීයට ප්‍රධාන වූ අමාත්‍යව උපන්සේක. එසමයෙහි පසල් රට සතුරන්ගෙන් භයක් උපනැයි කියා අසා රජ්පුරුවෝ සේවාකමට යන ලෙස මගුල් උයනේ කථාකොට කොට උන්කළ අසුන්ට කානම් ගෙනවුත් නිවන නිසා කානම් ඔරුවෙක ලැවුහ. ඒ වෙලාවට එක් වඳුරෙක් එතනට අවුත් කටිනුත් අතිනුත් උකාගෙන ගසට නැගී කමින් සිටියේය. කමින් සිටියාවූ මුහින්ම ඇටෙක් බිමහින, ඒ කන්ට සිතා අතකට තිබුනානම් දමාපියා බිමට බැස වැටුනු මුත් ඇටය ඇතමැත සොයා ඇවිද නොදැක ගසට නැගී සෝකයෙන් දහසකට ගැතිසිඟිනිතියා පැරද ගිය එකෙකු සේ උන්නේය. ඒ වෙලාවට රජ්පුරුවෝ බෝධිසත්වයන් අතින් මේ වඳුරාකළඳ දුටුදැයි කියන්නාවූ වානරතෙම අල්ප වූ මුගටක් නිසා බොහෝකොට කන කැවිල්ල අපවත් කළේය. ඒසේවූ අල්ප කටයුත්තක් නිසා මහත් කටයුත්තක් යම්පුරුෂයෙක් නසාපියාද එසේමය අපහැම ඇතුළුවූ ඇමදෙනාගේ කටයුත්තේ සැලැස්මය මුගට සඳහා බොහෝ මුගට දමාපු වඳුරා වැන්නේයයි කියා යන ගමන වැලකුහ. සර්වඥයන් වහන්සේ බස් අසා කෝසල රජ්පුරුවෝ තමන්ගේ නුවරටම ගියාහයි වදාරා කලහමුග්ධී ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බඹදත් රජ්පුරුවෝ නම් අනාන්ද ස්ථිවිරයයෝ අමාත්‍යව උපන් නෙම් ලොව්තුරා බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

## දුද්ද ජාතකය

තවද ශාක්‍යකුල ක්‍රිටවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපාසකවරුන් කීපදෙනෙකු සමගව දුන් දානයක් අරභයා මේ ජාතකය දක්වන ලද. ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බ්‍රාහ්මණකුලයක ඉපිද වැටි විය පැමිණ පඤ්චකාමයෙහි ආදීනව දැක ප්‍රව්‍රජ්‍යායෙහි අනුසස් දැක පැවිදිව බොහෝ බොහෝ තාපසවරුන් පිරිවරා හිමාල වනයෙහි වාසය කරණසේක. වස් වසන අවධියට බරණැස් නුවර එක් උපාසකයෙක් බොහෝ දෙනා ලබා ගෙණ සත්දවසක් බොහෝතාපසවරුන්ට දන්දින, දන්දී අවසානයෙහිදී නායකව දන්දෙන උපාසක කියන්නේ ස්වාමීනි යන්තමක දන් දුන්නොත් ඈත බොහෝව දන්දුන්නොත් ඈත පින් එකසරියේ වෙදැයි කිහ. තාපසයෝ කියන්නේ ඒ එසේමය, ස්වල්පවුවත් බොහෝවුවත් දුන්නා වූ දානයෙහි විපාක බුදු පසේබුදු මහරහතුන් විසින් ප්‍රසංසාකරණ ලද. එසේ විසින් දානයෙහි විපාක කියාගත නොහැක්කේය. දානවිෂයෙහි මදදෙයක් දුන්නත් දිව්‍යලෝක සම්පත් විඳිනාහ. මේ මනාවූ දානය දීමෙන් කිම්දැයි සිතා දන් නුදුන්නොත් නරකාදීවූ දුක්විඳිනාහයි කියා වස් සාරමස ඒ ගම රඳා වස් අන්තයෙහි හිමාලය වනයට වැඩ සතර බ්‍රහ්මවිහරණයෙන් දවස්යවා නොපිරිහුනාවූ ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකප්‍රාප්ත වූහයි වදාරා දුද්දා ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි තාපසවරු නම් දැන් බුදුපිරිසය ගණජෝෂටව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාලසේක.

SANHIDA LANKA

# අනභිරත ජාතකය

තවද ත්‍රිභුවන තිලකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්

සැවැත්නුවර එක් බ්‍රහ්මණයෙකු මානවකයෙක් ත්‍රිවේදය පාරප්‍රාපතව බොහෝ රාජකුමාරවරුන් කම් මන්ත්‍රහද්‍රත්වයි, ඒ තෙමේ කල්‍යාමෙකින් අඹුදරු වන් වහල් සරක් ආදීවූ බොහෝ හිගිකටුලේයේදී තෙමේ තමාගේ මන්ත්‍ර මධයෙන් අනන්තයෙත් ආදීයෙහිත් සිත කැළඹී සිහිනැතිවන්ටවන, එසමයෙහි එක්දවසක් ඒ බ්‍රාහ්මණ ගඳදුම් මල් පහන් ගත් අත් ඇතිව බුදුන් දකින්ට ගොසින් බුදුන්දිට. සර්වඥයෝ ඇයි බ්‍රහ්මණය බොහෝ දෙනාට මන්ත්‍ර උගන්වයි දනටම වණපොත් ඇද්දයි විචාරා වදාළසේක. එදකියන්නේ ස්වාමිනි පඤ්චකාමවිසයෙහි හා ගිහිකම්කටු ඇල් සිතවැටී ආදිය හපත් වදන් නාදෙය දූන් සඳහන් නැති වෙන්නට වනැයි කියා එබස් සර්වඥයෝ අසා පළමුත් තට එසේම වූයේ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බරණැස්නුවර දිසාපාමොක් ආචාරීව ඉපිද බොහෝ ශිෂ්‍යයන් අකුරුකියවා වාසය කරණ සේක. එසමයෙහි අතවැස්සන්ට ප්‍රධාන බෝධිසත්වයන්ට ඉක්බිතිව ඉන්නා බ්‍රාහ්මණයෙක් ඇත, ඒ බ්‍රාහ්මණයා පඤ්චකාමයෙහි හා ගිහිකන්කටුල්ලෙහි වන එවක් පටන් ශිල්ප  වනපොත් නැතිවන්නට වන, බෝධිසත්වයෝ ඇයි මානවකය තාගේ සිල්ප වනපොත් නැද්දැයි විචාළහ. එසේය පඤ්චකාමයෙහි හා ගිහිකම්කටුලට සැලවුනු ගමනේ වනපොත් නැතිවන්ට වන්නාහයි කීහ. එබස් අසා එළඹ කැළඹුනාවූ ජලයෙහි සිප්පි මස්කැස්බෝ නොපෙණෙන්ද එමෙන් කැළඹුනාවූ සිත්විල්ලෙන් ශාස්ත්‍රය නොපෙනේන්නේය. ප්‍රසන්න වූ ජලයෙහි සිප්පි මස් කැස්බන් පෙණෙන්නාසේ ප්‍රසන්නවූ සිතිවිල්ලේ බොහෝ ශාස්ත්‍ර සිත තිබෙයි වදාරා අනගිරත ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි බ්‍රාහ්මණමාණවකයා නම් මෙසමයෙහිත් බ්‍රාහ්මණ මාණවකයාමය දිසාපාමොක් ආචාරීන් නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# චතුම්මට්ට ජාතකය

තවද ත්‍රිභුවන ඊස්වර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මාළු වූ භික්ෂු කෙණෙකුන් වහන්සේ අරඹයා මේ ජාතකය දක්වන ලද. ඒ කෙසේද යත් එක් දවසක් සැරියුත් මුගලන් දෑගසව්වන් වහන්සේ උන් වහන්සේ කැටුව ප්‍රශ්ණ විසඳිම ආදී වූ ධර්ම කථාවෙන් යුක්තව සිව්වනක් පර්ෂීත් මධ්‍යයෙහි වැඩ වූන් සේක. එතනට මාළු තෙර කෙණෙකුන් වහන්සේ අවුත් තුන්වෙනුව ඉඳ සැරියුත් ස්වාමිනි නුඹ වහන්සේට නොදෑනෙන දෙයක් ඇත්නම් මට වදාල මැනවයි මම කියමි. මට නොදන්නා දෙයක් ඇත්නම් නුඹ වහන්සේට කිව මැනවයි කී සේක. එබස් දෑගසව්වන් වහන්සේ අසා මේ නිකම්ම තුච්ඡ පුරුෂයා අප හා සමඟ ඉඳ කථාකෙරෙයි කියා ලජ්ජාව එතැනින් පළාගිය සේක. එවිට බොහෝ උපාසක වරු ඒ නම එතැනින් පහ කොට එපවත් සර්වඥයන් ට සැල කලාය. සර්වඥයෝ උපාසක වරුනි දැන් මතු නොවෙයි පෙරත් දෑගසව්වන් කථා කොට උන් කලට මේ කියන භික්ෂූහූ නිසා කතාව ඉගුළුනේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය පාලනය කරන සමයෙහි බෝධිසත්වයන් වහන්සේ හිමාල වනයෙහි ගසක වෘක්ෂ දේවතාව ඉපිද වාසය කරන සේක. එසමයෙහි චිත්ත කූට පර්වතයෙහි වසන්නා වූ ස්වර්ණ හංසයෝ දෙන්නෙක් ගෝචර භූමියට යන එකල බෝධි සත්වයන් වාසය කරන්නාවූ වෘක්ෂයේ සැතපී යන්නාහ. මෙසේ යාමෙන් බෝධිසත්වයන් හා හංසයෝ දෙන්නා විශ්වාසව මෙලොවින් පරලොවින් යුක්ත කිය කියා යන්නාහ. එසමයෙහි එක් දවසක් බෝධිසත්වයන් වහන්සෙ හා ස්වර්ණහංසයෝ දෙන්නා හා කථා කොට අන් තැනට කැනහිලෙක් ඇවිත් ගස මුල ඉඳ හංසයනි, උඩ මයිද රහස් කතා කරවුදැයි සිව්පාවුන්ට නායක වූ මා හා සමඟ කතා නොකොට උඩ ඉදින්නේ ඇයි කීහ. එබස් හංසයෝ අතා මේ නිචයා අප හා කැටිව කථා කරයි කියා ලජ්ජාව චිත්ත කූට පර්වතයට නැගී ගියහ. බෝධිසත්වයෝ එවිට කැනහිලාට පෙනී හංසයන් හා හංසයොන් කතා කෙරෙතියි හංසයන් හා දෙවියෝ කථා කෙරෙති.  තෝ වනාහි ජාතියේන වර්ණයේ රූපයෙන් ශබ්දයනේ යන සතර කාරයෙන් අවු තා හා සමඟ නෙ කථාද කිවා කුමන කථාවක් දැයි කිවා අභයංකාර වේදය පෑ කැනහිලා ලුහුබඳ්දා වදරා මේ චතුම්මට්ට ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කැනහිලා නම් මුළු බුදු පිරිසය. හංසයෝ දෙනෙ සැරියුත් මුගලන් වහන්සේය. වෘක්ෂකාව උපන්නෙහම් බුදු වූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# සීහචම්ම ජාතකය

තවද ත්‍රිභුවන නායක වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොකාලික්ස්ථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

කෝකාලිකස්ථවිරයන් වහන්සේ බොහෝ ත්‍රිපිටකය ශදාරණ මාළුවරුන් වහන්ස් දක අපිත් කියමෝදැයි කියා එක් දවසක් බණ කියන්නට වැද බණකියාගත නොහි ඩාදිය සෙලවී බිමට බැසපූය. බොහෝ භික්ෂූන් වහන්සේත් බුදුන් කරාගොස් ආදී මුන් බණදහම් දනිතියි වදාළසේක. එබස් අසා සර්වඥයෝ පළමුත් තමන් කිසිවකුත් නොදන්නා නියාව තමන්ම ප්‍රකාශ කළෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ගොවිකුලයක ඉපිද සිසා ජීවත්වන්නාහ. එසමයෙහි එක්තරා වෙළඳෙක් කොටළුවෙකු පිටින් බඩු අරගෙණ ගොසියන සමක් පොරවා යවන්නේය. මේ නියායෙන් කොටළුවා තණ කවා බෝධිසත්වයන් වසන්නාවූ ගමට පැමිණියාවූ වෙළඳ පළමුපරිද්දෙන් සිංහ සමක් පොරවා යවුවාහූ වපුල කුඹුර කන්ට හළ, එකියන කොටළුවාත් තණ කන්ටවන, එවිට කුඹුර රකිනා මනුෂ්‍යයෝ සිංහයෙක් අවුත් තණ කති සිතා මරන්ට භයින් ගමට ගොස් බොහෝදෙනා එක්කොට ගෙන ආයුධ හා ගැස්වීම් පිඹීම් ඇතිකොට කුඹුර වට කොට ගෙණ අඬගසා භයගන්වන්නාහ. එවිට කොටළුවා භයින් තමාගේ රාවයන් ඇඬුහෙයින් ගද්‍රභයා මරා තළා ඇට සුනුවසුනු කොට පුවාහ. එවෙලේ වෙළඳා එතනට අවුත් තාගේ ව්‍යවස්ථාවසේ බැණා නොනැගී හිඳ ඇඬීමෙන් තළවාගත්තේ වේදැයි අවවාද කොට වදාරා සිංහචම්ම ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි ගද්‍රභයා නම් කොකාලිකස්ථවිරය. එසමයෙහි ගොවියාව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# රූහක ජාතකය

තවද ත්‍රිභුවන චින්තාමාණික්‍යවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා පුරාණ දුතියකකෙරේ පිළිබඳ සිත්ඇති භික්ෂූන් වහන්සේ කෙණෙකුන් නිසා මේ ජාතකය දක්වන ලද.

ඒ කේසේද යත්

මෙහි වර්ථමන කථාව අටඨකනිපාතයෙහි ඉන්ද්‍රිය ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. මෙහි මහණ තෝ වනාහී පුරාණ දුතිකාව නිසා සිව්වනක් පර්ෂිත් මධයෙහි ලජ්ජාභාවයට පැමිණියේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ රජ්ජුරුවන්ගේ ආග්‍රමෙහෙසිකා බිසවුන් කුස පිළිබඳ ඉපිද වැඩිවිය පැමිණ පියරජ්ජුරුවන්ගේ ඇවෑමෙන් රාජ්ජය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ගේ රූහක නම් පුරෝහිත බ්‍රාහ්මණයෙක් ඇත. ඒ රජ්ජුරුවෝ සන්නාහ සන්නද්ධයෙන් සරහණ ලද අශ්වයෙකු බමුණාන්ට දී බමුණානන් මා දකින්ට එනකල මේ අසා නැගී එවයි කියා සැලැස්සුහ. ඒ නිසා වට පුරෝහිතයාත් අසා නැගී එන්නේය. බොහෝදෙනා අශ්වයාට ස්තුතිකරන්නාහ. ඊට බ්‍රාහ්මණ තමාගේ පුරාණ ස්ත්‍රියට කියන්නේ එඹල සොඳුර අපගේ අශ්වයාට බොහෝසේ ස්තුතිකරන්නාහයි කීහ. එවිට ස්ත්‍රිය කියන්නී මාගේ බමුණු වෙහෙසාපියන්ට උවමනවැයි සිතා කියන්නී බමුණානන් වහන්සේ අසාට කවුරුත් ස්තුතිකරන්නේ සන්නාහය ලාගෙන යන නිසාය, එසේ හෙයින් නුඹ වහන්සේ සන්නාහය ලාගෙණ සතරකකුලයෙන් ගියමැනවයි කීව. එබස් බ්‍රහ්මණයා අසා මුන් කිවේ ඇත්තකැයි සිතා මොහොයෙන් අන්ධ වූ බ්‍රාහ්මණයා පසු දවස සන්නාහය ලාගෙණ විථියේ නික්මින, එවිට බොහෝ දෙන සිනාසී බමුණානන් වහන්ස ඉතාම රිසියෙම් කීහ. රජ්ජුරුවෝ දැක ඇයි බ්‍රාහ්මණය තට පින්කිපිනිදැයි නැතහොත් උම්මාදයක් සැලසුනුවේදැයි කීහ. එවිට බ්‍රහ්මණයා ලජ්ජාවට වේදැයි කෝපයෙන් බැමිණියට කියම් කියා ගෙට නික්මින බැමිණියත් බමුණා කෝපව ගෙට එන නියාව දැන පැලදොරින් පලාගොස් රජගෙට වන රජ්ජුරුවෝත් කීපදවසක් පලායන්නා බමුණාට කියන්නාහ බ්‍රාහ්මණය දුනුදිය කැඩිගිය කල රෙලා ගැටගසා දුන්නේ ලාගනිද්ද එමෙන් තොපගේ බ්‍රාහ්මණීය ක්‍ෂමාකොට පාවාගණුවයි කීහ. එවිට බ්‍රාහ්මණයා කියන්නේ දේවයන් වහන්ස දුනුදිය කැඩීගිය කල ඔබ්බෙන් නියද සලස්වා දුනුදිය සලස්වා ගනිද්ද එමෙන් ඔබගෙන් ස්ත්‍රියක් සලස්වාගනිතොත්විනා මෙතෙක් ලජ්ජාවට පමුණුවාපු තැනැත්තීය එපායයි කියා හැර ඔබ්බෙන් ස්ත්‍රියක් ගෙනාහයි වදාරා මේ රූහක ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි පුරාණ ස්ත්‍රියනම් මෙසමයෙහිත් පුරාණ දුතියිකාය පුරෝහිත බමුණා නම් ශාසනයෙහි ඇළුම්මද භික්ෂුහුය. බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මිත්තාමිත්ත ජාතකය

තවද කරුණානිධාන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සමයෙහි උපාධ්‍යයන් වහන්සේ කෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් බාල නමෙක් තමන් වහන්සේගේ උපාධ්‍යයන් වහන්සේ කෙරේ විස්වාසිසේක මාකළ දෙයකට උරණ නොවනසේකැයි වාන් ලනලෙස පයියක් විදිනට රෙද්දක් ඇරගත්පසු එපවත් උපාධ්‍යායන් වහන්සේට කීසේක. උපාධ්‍යායන් වහන්සේ මාගේ කඩ කුමකට ඇරගත්තුදැයි විචාරන්නා නුඹ වහන්සේ මා හා විශ්වාසය තකා ඇරගතිමි කියන්නා තොප හා මා හා කුමන විශ්වාස දැයි කියා අත්ලෙන් පාරකීපයක් ගැසුසේක. මේ කථාව ධම්සභා මණ්ඩපයෙහි ප්‍රකාශ විය. එබස් සර්වඥයන් වහන්සේ අසා මහණෙනි පළමුත් එහි භික්ෂූහු කෝපිවූවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ කසීරට බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ ගිහිගෙයි ආලයහැර හිමාලයවනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන්ට ගණශාස්තෘව වාසය කරන්නාහ. එසමයෙහි එක්තරා තාපසකෙණෙක් ඇත. ඒ තාපසයෝ කුඩා ඇතෙක් වඩති බොධි සත්වයෝ ඒ ඇතා වැඩීමෙන් බොහෝ උපද්‍රව සැලසෙයි ඇරපියවයි කිවත් ඇර පියානොහි පුත්‍ර ප්‍රේමයෙන් වඩා මුහුකෙරෙව්වාහ. එකියන ඇත් ත්‍රිමද හලිතවූ තැනැත්තේ තාපසයන් එලාපල ගෙණෙන්නට ගිය කීපදවසකින් ආතැනැත්තන් දැක අල්වාගෙණ මරා තළාපියා පලාගියෝය. බොහෝ තාපසවරු ඒ තාපසයන්ට කළමනා ආදාහණකොට එපවත් බෝධිසත්වයන්ට කීහ. නැවත කියන්නාහු ස්වාමීනි වෛර මිත්‍රයන් දැන ගන්නේ කෙසේදැයි කීහ. එවිට බෝධි සත්වයෝ කියන්නාහු යම් අහිත මනුෂ්‍යකෙණෙකුන් දුටු වෙලේ පිළිසඳර කථා නොකෙරේද, සිනාවක් නොයේද, ඇස් දල්වා ප්‍රියව නොබලාද, දැක සතුටු නොවේද, යන මෙකී කාරණාවෙන් යුක්තවූ තැනැත්තේ වෛරීය. මෙකී කාරණා නොවඉන්නා තැනැත්තේ ප්‍රියකරුයයි බොහෝ තාපසවරුන්ට අවවාද කියා සතර බ්‍රහ්මවිහරණයෙන් බඹලොව ගියාහයි වදාරා මේ මිත්තා මිත්ත ජාතකය නිමවා වදාළ සේකී. එසමයෙහි ඇතා වැඩූ තාපසයෝ නම් අතවැසි භික්ෂූහුය, ඇතා නම් උපාධ්‍යායෝය, ගණශාස්තෘව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේකි.

SANHIDA LANKA

# ගිරිදත්ත ජාතකය

තවද ශාක්‍යකුල ප්‍රදීපවූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සර්වඥයන්ට විපක්ෂ වූ දේවදත්ත ස්ථවිරයන්ට පක්ෂවූ භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදහේ කෙසේද යත් වර්තමාන කථාව මහිලාමුඛ ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය.

යටගිය දවස බරණැස් නුවර සාමනම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් අමාත්‍යකුලයක ඉපිද වැඩිවිය පැමිණ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කොට ඉඳිනසේක. එසමයෙහි පාංඩ නම් අශ්වයෙක් ඇත. ඒ අශ්වයා බලන්නාවූ ගිරි දත්ත නම් අස්සලයෙක් ඇත. එර් අස්සලයාගේ පය සිඟිතතකට කොරය, ඒ කොරවූ අස්සලයා අසුගෙණ කඩියාලම අල්වාගෙණ කොර පය ඇන ඇන ඉදිරියේ යන්නෙන් අසාත් මං උගන්වන දෙයක සිතා ඒ මානයට ගොසින් පය කොරකොටම ඔබ ඔබා යන්නේය. එපවත් රජ්ජුරුවෝ අසා බෝධිසත්වයන්ට කියන්නා මගුලසා පය කොරකොට ඔබත් කියන්නා ඇසිමි උඟට කවර ව්‍යාධියෙක්දෝහෝයි ගොසින් බලා එවයි රජ්ජුරුවෝ කීහ. බෝධිසත්වයෝ ගොසින් අසා බලා ව්‍යාධියක් නොදක සිතන්නාහු අස්සලායාගේ පය කොරකොට ඔබන නිසාමුත් ඒ නිසාම උඟ පමණක් විනා ව්‍යාධියක් නැතැයි රජ්ජුරුවන්ට කියන්නාහු සාමනම් රජ්ජුරුවන් වහන්සැ නුඹ වහන්සේගේ පාංඩ නම් අස්වයා ගිරිදත්ත නම් අස්සලයාගේ දෝෂයෙන් පය කොරකොට ඔබන පමණක් මිසක් අසාගේ ව්‍යාධියක් නැත. එසේ හෙයින් යහපත් නිර්ව්‍යාධි අස්සලයෙකු අසා බලන්ට සලස්සන්නා අසාගේ පය කොර ඇරෙයි කියන්නා ඒ නිය වට නිර්ව්‍යාධි අස්සලයෙකු සැලැස්සූ ගමනේ අසාගේ පය කොරපලාගියේයයි වදාරා මේ ගිරිදත්ත ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ගිරිදත්ත අස්සලායනම් දේවදත්ත ස්ථවිරියෝය. පාංඩ නම් අශ්වයා මාකෙරේ වෛරීපක්ෂයේ ඇත්ගත් භික්ෂුහුය, රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. අමාත්‍යයව උපන්නෙම් බුදුවූ මමමයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# තින්දුක ජාතකය

තවද ශාක්‍ය කුල ලෙවනවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්

බෝධි ජාතකය, උම්මග්ල ජාතකය ආදීවූ දෙයෙහි ප්‍රඥා පාරමිතාව වර්ණනා කරන්නාක් මෙන් මේ ජාතකයෙහිත් සර්වඥයන් වහන්සේගේ ප්‍රඥාපාරමිතා වර්ණනාව කිය කියා වැඩ උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන් තිබා තිරිසන්ව උපන්සමයෙහිත්, තමන්ගේ ප්‍රඥා බලයෙන් බොහෝ දෙනා ගොඩලැවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ අසූහාරදහසක් පමණ වඳුරන්ට නායකව හිමාල වනයෙහි වසන්නාහ. සමහර කලෙක් මනුෂ්‍යපථයට අවුත් වන සමීපයෙහි පිටිසරගමෙක වසන්නාහ. යහපත් එල පල්ලවයෙන් සම්පූර්ණ වූ තිඹිරි ගසෙක් ඇත මනුෂ්‍යයෝත් ඒ වන සමිපයෙහි ගමින් පලායන්නාහ. ඒ අවස්ථාවට වඳුරෝ ගමට අවුත් තිඹිරි කා ඒ ගම වාසයකොට මනුෂ්‍යයන් එන අවස්ථාවට පෙරලා හිමාලය වනයට පලායන්නාහ. එක්සමයෙක මනුෂයෝත් ඒ ගමට බැස උණපත්තෙන් ගෙවල්සොයා උනපත්තෙන් ගෙවල් බිත්ති බැඳ, දොරලී දොරබලා ඒ ගම වාසය කරන්නාහ. එසමයෙහි ගම මධ්‍යයේ තිඹිරිගසක් එල්ලවයෙන් අතු කැඩීයන්නාසේ එලගෙණ සිටිනේය. එසමයෙහි වඳුරෝ සිතන්න හු තිඹිරිගසෙහි එල පල්ලවයෝ කීමෙන්දො මනුෂ්‍යයෝ ඇද්ද නැද්දෝහොයි සිතා පරීක්ෂා කරණ පිණිස තමන් ඇමදෝ මනුෂයෝ ඇද්ද නැද්දෝහෝයි සිතා පරීක්ෂා කරණ පිණිස තමන් ඇමදෙන වඳුරෙකු යවුහ. ඒ වඳුරාගොස් බලා එපවත් වඳුරන්ට කීහ. වඳුරෝ එපවත් අසා නායක වදුරු රජ්ජුරුවන් කරාගොස් දේවයන් වහන්ස අපගේ තිඹිරිගස එල පල්ලවයෙන් සම්පූර්ණය එසේ හෙයින් එතනට යායුතු යයි කීහ. එබස් වානර රජ්ජුරුවෝ අසා ඒ ගම මිනිස්සු ඇද්ද නැද්ද විචාරා මිනිස්සු ඇතැයි කියන්නා එසේ නම් තිඹිරිගස නිසා යන ගමන නොයම්හයි කීහ. එසේ තමන් කීවත් වඳුරෝ එකසීම එක්ව දේවයන් වහන්ස ගම සමීපයෙහි බැද්දේවල ඉඳ රෑ මධ්‍යම වෙලාවට අපි ගොස් තිඹිරිකා එම්හයි කීහ. බොහෝ සේ කාරණා කියා වානර රජ්ජුරුවන් කැඳවාගෙණ හිමාලයවනයෙන් නික්ම ඒ ගම සමීපයෙහි ගල් පොත්තෙක රෑ පසළොස් පැය වනතුරු වැදහොත්තාහු නිදා මධ්‍යම රාත්‍රි වේලේ ගසට නැංගාහ. ඒ වෙලාවට එක් මිනිසෙක් ශරීර කෘත්‍යකරණු සඳහා පිටත්ව යමින් සිටියේ තිඹිරිගස බොහෝ වඳුරන් උන් නියාව දැක ගම මධ්‍යයෙහි සිට ගම ඇත්තන්ට ඇසෙන නියාවෙන් අඬගැසීය. ඒ අඬ අසා බොහෝ දෙන ආයුධ හා කැටමුගුරු ගත් අත් ඇතිව අවුත් ගසමුල වටකොටගෙණ පාන්වූවිට වඳුරන් මරම්හයි සන්නද්ධව ගෙණ සිටියාහ. ඒ වෙලාවට වඳුරෝ මනුෂ්‍යයන් දැක හයින් ත්‍රස්ථව අපට පැමිණියාවූ හය වානර රජ්ජුරුවන්ට කියම්හයි කියා රජ්ජුරුවන්ගේ ප්‍රතිශ්ඨාපන විනා අනික් ප්‍රතිෂ්ඨාවෙක් නැතැයි සිතා වානර රජ්ජුරුවන් ලඟට ගොස් දේවයන් වහන්ස, බොහෝ මනුෂ්‍යයෝ ආයුධ හා කැටමුගුරු ගත් අත් ඇතිව අප මරන්ට වටකොට ගත්තාහ. අප ගැලවීගන්ට නුඹ වහන්සේගේ ප්‍රතිෂ්ඨාවක් කිවමැනවයි වඳුරෝ එක්ව කීහ. එබස් බෝධිසත්වයෝ අසා තෙපි හැම නොබව මනුෂ්‍යයෝ ඔබ්බේ හයක් පැමිණි තැනකට පලායෙති තොප හැම නොබවයි කියා මිනිසුන් ඉදිනා විදියේ ගිනි මොලවා කපුකටිනා මැහැල්ලක කම්පයට එකියන වඳුරා කුඩාකෙල්ලකු සේ අවුත් ගිනිපෙනෙල්ලක් ඇරගෙණ ගොසින් විජි ගිනිලාපීය. ඒ වෙලාවට ගිනි නිවන්ට මනුෂයෙන් යාදී වඳුරෝ ගසින් බස් නාහු සේනක නම් වඳුරා එක තිඹිරිගෙඩියක් කඩාගෙණ බටහයි වදාරා මේ තින්දුක ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි වානර රජ්ජුරුවන්ට බෑනව උපන් සේනක නම් වඳුරා නම් මෙසමයෙහි මහානාම ශාක්‍ය රජ්ජුරුවෝය. වානර සමූහයා නම් බුදු පිරිසයයි. වානර රජව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# ගිජ්ඣ ජාතකය

තවද සමන්ත භද්‍ර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙමව්පියන්ට උපස්ථාන කරණ භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි වර්ථමාන කථාව සාම ජාතකයෙහි විස්තර වශයෙන් දක්වන ලද, දෙමාපියන්ට උපස්ථානකරණ භික්ෂුවක් භික්ෂූන් දක්වන්නා මහණ ගිහින්ට උපස්ථාන කරන්නේ සැබෑදැයි විචාරන්නා සැබැව දෙමව්පියන්ට උපස්ථාන කෙරෙමි කී විසින් ඒ භික්ෂූන් වහන්සේට උපස්ථම්භව වදාරණ සර්වඥයන්වහන්සේ සාධු සාධු මහණ තා කළදෙය යහපත පෙරත් උත්තමයන් ගිහිසමයෙහි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක,

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ගිජ්ජකූඨ පර්වතයෙහි ගිජුලිහිණිව ඉපිද වෘද්ධ වූ දෙමව්පියන්ට උපස්ථාන කරණ සේක. එසමයෙහි වැසි සුලන් කාලය පැමිණියේය. ගිජුලිහිණියෝ එකසීම පර්වතයෙහි ඉඳගතනොහි අවුත් බරණැස්නුවර සමීපයෙහි පියාපත් තෙමී බරව වැටිගියහ. බරණැස් සිටානෝත් වැවට නාන්ටගොස් තෙමී වැටී වැදහොත් ගිජුලිහිනියන් දැක ගිනිගෙන්වා ගන ගිජු ලිහිණියන් පියාපත් තවා මළමීවුන් දමන තැනට මිනිසුන් යවා එතන තිබූ ගෝමස් ගෙන්වා ගිජුලිහිනියන් සතප්පවූහ. ඒ ගිජු ලිහිණියෝත් හිමකාලයෙහි සිටානන්ගේ අනුග්‍රහයෙන් සැපසේ වාසය කොට වැසි සුලන් පසුවූ කල්හි සැපසේ ගිජ්ජකූට පර්වතයට ගොස් උනුන් හා කැටිව සාකච්ජා කරන්නාහු බරණැස් සිටානන් විසින් අපට බොහෝ සංග්‍රහ කරණ ලද එහෙයින් අපිත් ඊට ප්‍රත්‍යුපකාර කරන්ට උවමැනවැයි සිතා අපි පළඳනාවක් පිළියක් ලදමෝ නම් සිටානන්ගේ ගෙයි එළම්හයි කියා කථාවක් කොට විථියේ රණක් රත්රනක් පිළියක් දුටුවූ නම් වහා ඩැහැගෙණ ගොස් සිටානන්ගේ සඳල්ලේ එලන්නාහ. ඒ සිටානෝත් මේ වස්තුව එලන්නේ ගිජුලිහිණියෝයයි සිතා තමන්ගේ ගෙයි ඒ ඒ තැන දමන්නාහ. එවිට බොහෝ දෙනා තමන්ගේ වස්තුව ගිජුලිහිණියන් කොල්ලකන හෙයින් එපවත් ගොසින් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් එසේවීනම් ඉන් ගිජුලිහිණියෙකු අල්වයි කීහ. එවිට යහපතැයි කියා මල ආදීවූ දෙයින් අල්වන්ට උපාය කළහ. එවිට දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ ගිජු ලිහිණියා මළෙහි බැඳින, එවිට ඒ පුරුෂයා ගිජු ලිහිණියා අල්වා ගෙණ රජ්ජුරුවන් කරා ගියේය. එ වෙලාවට බරණැස් සිටාණෝත් ගිජු ලිහිණියන් ගෙණයන්නා දැක යම්සේ මුන් මරාපුනම් නපුරුයි සිතා එක්කම රජගෙට අවුත් වන්හ, එවිට රජ්ජුරුවෝත් ඇයි තොපි සම්පත් කොල්ලකන්නෝ ඇයි දැයි විචාළහ. එවිට සැබැව ස්වාමිනි කී විසින් කවුරුන්ට දෙන්නටදැයි සම්පත් ඇර ගන්නෝයයි විචාරන්නා අපට බොහෝ උපකාරකළ විසින් ප්‍රත්‍යුපකරණ නිසා මේ සිටානන් වහන්සේට සම්පත් දෙම්මැයි කියන්නා එබසට සතුටුව තොපි ඈම සියක් යොත්නක් ඔබ්බේ තුබූ කුණු දකින තොපට මේ මලදැකගත නුහුණුවෝ ඇයිදැයි විචාළහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු රජ්ජුරුවෙනි ගිජු ලිහිණියන් සියක්යොතකින් ඔබ්බේ තුබූ කුණුදකින්නේ සැබැව පැමිනෙන්නා වූ විපත්තියට තුබූ මල හෙයින් දැනගත නොහෙන්නාහයි කීහ. එවිට රජුජුරුවෝ සිටානෙනි ගිජු ලිහිණියන් තොපට සම්පත් දුන්නෝ සැබෑදැයි විචාළ සේක. සැබැව දේවයන් වහන්ස ලිහිණියා ඇර වදාළමැනව මම උන් උන් ගේ සම්පත් උන් උන්ටම දුන්හයි වදාරා දෙකල් ගලපා ගිජ්ජ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථිවිරයයෝ බරණැස් සිටානන් නම් ශාරීපුත්ත ස්ථවිරයෝය. දෙමව්පියන්ට උපස්ථාන කළාවූ ගිජු ලිහිණියා නම් බුදුවූ මම්මයි වදාළසේක. මේ බණ අවසානයේහිදී ඒ භික්ෂූන් වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන්ඵලයට පැමිණිසේක.

SANHIDA LANKA

# කච්ඡප ජාතකය

තවද ශාක්‍යකුල තිලක වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අහිවාතක රෝගය නිසා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්

සැවැත් නුවර සිටුකුලයක අහිවාතක රෝගය උපන. ඒ රෝගය උපන් කල ගෙයි කුකුලන් බල්ලන් ආදීවූවන් පටන් නසිති ඒ අවස්ථාවෙහි සිටානෝ තමන්ගේ පුතනුවන්ට කියන්නාහු තොප විසින් භිත්ති බිදගෙන ගියොත් ව්‍යාධිය සන්හිඳෙයි ඒ නිසා වලට පලාගොස් ව්‍යාධිය සන්හිඳුනුකල මෙතනට අවුත් අසවල්තැන තිබූ සම්පත් ඇරගෙණ කුටුම්භ සණ්ඨාපනය කොට ජීවත්වව් කිහ. යහපතැයි කියා ඒ සිටුකුමාරයා ගිවිස භිත්තිය බිදගන ගිය තැනැත්තෝ සර්වඥයන් වහන්සේ දිට, සර්වඥයෝත් කොයිසිට ආවාදැයි විචරන්නාහු අසවල් ගෙයි අහිවාතක රෝගය උපන්හෙයින් මාගේ ප්‍රාණය ගලවා ගෙණ බන්ධූන් ඇරපියා ආමි කීහ. සර්වඥයෝත් එබස් අසා තා කලදේම හොඳය පළමුත් තමන්ගේ වාසස්ථානයෙහි නොසිට විපත්ති දූක ගැලවීගියෝ සුව වුවෝ වේදැයි තමා වාසස්ථානයෙහි සිතා උන්නෝ දුක්වූනෝවේදැයි වදාරා තා ගැලවිගියේ යහපතැයි වදාළසේක. එබස් අසා සිටුකුමාර ඒ කෙසේදැයි ආරාධනා කළයේය. එකල්හි සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකී.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ කුම්භකාරව ඉපිද කුඹල්කමින් අඹුදරුවන් පෝෂ්‍යය කරණසේක. එසමයෙහි බරණැස ගංගා සමීපයෙහි එක්වලක් ඇත. ඒ විල වතුරු ආකලට විල හා ගංගා හා එක්වන්නේය. එසමයෙහි මත්සයෝ මේ අවුරුද්දේ නියන් කෙරෙයි මේ අවුරුද්දේ වැසිවතුර ඇතැයි දන්නා වූ එන අවුරුද්දේ නියංකෙරෙයි මේ අවස්ථාවේ පලාගියොත් යහපතැයි සිතා බොහෝ මස්කැස්බෝ දියෙන් ගඟට පලාගියහ. එසමයෙහි එක් ඉබ්බෙක් මාගේ දෙමාපියන් පටන් උන්නෙන් මෙතන මාත් වැඩිවිය පැමිණයේත් මෙතනයයි සිතා නොයම් ඒ විලම උන්නේය. ඒ ප්‍රස්ථාවට වතුර බැස නියන් කොට දියසිඳි මඩ හා පස් අරගන්න නිසා ඒ විල සමීපයේ පස් කොටන්ටවන්නාහ. ඒ වෙලාවට ඉදුප්පස් පිරාගෙණ යන්නේ පස් කොටන වලට පැමිණියේය. බෝධි සත්වයෝ එළාළු උදල්ලෙන් කැපින. බෝධිසත්වයෝත් පස්පිඩැල්ලකැයි සිතා උදල්ලෙන් ගොඩලූහ. එවිට මහත් වූ වේදනාපත්ව කියන්නේ බොහෝ බන්ධූන්යාදී මා ඉපිද වැඩීගත ස්ථානයයි ඉඳ උන්නායේ එලලදිමි. එසේ එසේ හෙයින් භාර්ගව කුලයෙහි උපන් කුඹලානෙනි තමා උපන් වැඩි තෙනයයි කියාම ඇල්ලීම කරන්ට දෝෂයයි කියා කුඹලානන්ට අවවාද කිය කියා ජීවිතක්ෂයට පැමිණියේය. කුඹලානෝත් ඉදුබුවා අතට ගෙණ ඒ ගම්වැසි මනුෂ්‍යයන් මධ්‍යකොට කියන්නේ යම්සේ මේ ඉදිබුවා තමන්ගේ බන්ධූන් යාදීත් තමා ස්ථානයයි කියා උන්නාසේ එලලදිමි කියා මට ගාථාදෙකකින් කිය. එසේ හෙයින් කව්රුත් මේ මාගේ ප්‍රියවූ රසයය මේ මාගේ ප්‍රෂටව්‍යය මේ මාගේ දරුවෝය. මේ මාගේ භාර්යාවෝය. මේ මාගේ බන්ධූය මේ මාගේ ධන ධාන්‍යය මේ මාගේ ගේදොරයයි තෘෂ්ණා කළෝ නම් වන්නාවූ දෝෂය ඉදිබුවාටවූ හානිය හා සමානයයි බුද්ධලීලාවෙන් අවවාද කීවාහ. දසදහසක් යොදුන් දඹදිව ප්‍රකාශ විය. ඒ කුම්භාකාර කී අවවාදය සද්දහසක් අවුරුදු අවවාද නියාවට පැවැත් තේයයි වදාරා කච්ඡප ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ඉදිබුවා නම් ආනන්ද ස්ථිවිරයෝය. කුම්භාකාරව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මයි තමන් වහන්සේ දක්වා වදාළසේක

SANHIDA LANKA

# සත්තධම්ම ජාතකය

තවද ශාක්‍යකුල හද්‍රසටවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් විස්සක් අන් වෙසනයන් අරභයා මේ ජාතකය දක්වන ලද

ඒ කෙසේද යත්

එක අවධියෙක භික්ෂූන් වහන්සේ බුදුන් නොකරන්ට කී පිළියම් කොට ජීවත්වීම සානාවපුරණ තැනට ගොස් උපසාසකවරුන් කී මෙහෙවර කිරීමෙන් උනුන්ගේ ගෙට ගොස් උන් කීවා කිරීම යනාදීන් බුදුන් නොකරන්ට කී කාරණා එක්විස්සක් කොට චීවර පින්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍යය ආදීවූ සතරපසය උපදවාගෙණ වාසයකරණ සේක. එසමයෙහි සර්වඥයන් වහන්සේ එපවත් අසා ඉදිරියේ පැමිණෙන නරක තිරිසන් ප්‍රේත අසුරකාය යන සතර අපාය දැක බොහෝ භික්ෂූන් වහන්සේ රැස්කරවා වදාරණසේක් මහණෙනි මා නොකරන්නට එක් සිවි අන්වෙසන කීයෙන් පසය උපදවාගෙණ කෑ නම් ගිනිවට හා විෂ හා නොසන්දුරුවන්ගේ ඉඳුල් හා කෑවා හා සමානයයි ආරාධනා නැතිවම ජාතකය දක්වන සර්වඥයන් වහන්සේ මහණෙනි යම්සේ සත්තධර්ම නම් මානවකයා වංලායාගේ ඉඳුල් බත් කා ප්‍රාණය නසාගද්ද, එසේමයයි වදාරා ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ වඩාලකුලයෙක ඉපිද ඕබ්බේ ගමකට යනගමනේ බත් ගැටයක් හා සාල් නැලියක් ඇරගෙණ නික්මුණාහ. ප්‍රසිද්ධ බ්‍රාහ්මණකුලයක උපන් සත්ත ධර්ම නම් බ්‍රහ්මණ මානවකයෙකුත් මගට උපකරණයක් සමයාගෙණ වංලයානික්මුනාවූ මාවතින් නික්මින. බමුණු වඩාලයා අතින් තෝ කවරේදැයි විචාළේය. බෝධිසත්වයෝ එක්ජාතියකුත් බොරු නොකීහෙයින් තමන් වංලනියාව නොහඟවා කීහ. බෙරවායන් එවිට නුඹ කවුරුදැයි විචාරන්නා මම අසම්භිනන නම් බ්‍රාහ්මණයෙමි කීහ. එවිට වංචාලයා එසේ නම් නුඹවහන්සේලා කැටිව යෙමි සිතා නික්ම අතරමග පැන් පාසු තැනකදී බමුණා හා වංලයා වැවට බැස නා ඉක්බිත්තෙන් වංචාලයාත් මා ගෙනාබත්මුලින් බමුණානන් වහන්ස නුඹවහන්සේ පළමුවෙන් බත් කෑවොත් වේද මා කන්නේයයි කීය. එබස් ඇසූ බමුණා වංචාලය තාගේ ගෙන් ගෙනා බත්ද මා කන්නේයයි කියායාද එවිට වඩල තමා ගෙනා බතින් එක්කොටසක් සවස කන්ට තිබා අනික්කොටස කා නික්මිණ බමුණාත් නික්මිණ. සවස් වන තුරු ගනේ ගොසින් සවස් වෙලේ ගඟකදී දෙන්නම නා බෙරවායා බලබලා සිටියදී දවල් කන්නට කීගමනේ නොකෑහෙයින් දනුත් නොකති සිතා කන්නට වන ඒ වෙලාවට බමුණු බඩයා ඉවසාගත නොහී වංචාලයාමට බත් නොදීම කන්නට වන. එසේ හෙයින් මුගේ ඉඳුල්උවත් උදුරාගෙණ කන්ට උවමැනැවයි සිතා වංචාලයා ළඟට ගොසින් ඉඳුල්පත උදුරාගෙණ ඊ තුබූ බත්කා අත කට සෝධා නැවත සිතන්නේ මා කළේ කිම්දැයි උතුම් බ්‍රාහ්මණකුලයෙහි ඉපිද බඩසායක් නිසා වංචාලයාගේ ඉඳුල්පත් නොකන්නට නුවුයේය. ඉඳුල්බත් කනදෙයත් වඩාලයා ගිහිස්වාගන්ට නුවුයේය. උදුරාගෙන කනදෙයත් බඩපුරා කන්නයත් නුවු යේය. කෑදෙයත් බඩරඳාගත නුවුයේයයි සිතා බොහෝ විකෙෂ්පයට පැමණ මෙසේම ඉඳ මාගේ ප්‍රාණය තිබාගණෙ ඉඳිමෙන් ප්‍රයෝජන නැතැයි වලටවැද අභ්‍යවසකාශයෙහි නැසිගියේයයි වදාරා මහණෙනි භිකිෂූහු නම් අනුන්ගෙන් බත් නොකෑ සැටියේකැයිනමෙන් බුදුන් කීවා නොකළම්හයි තමාසිතට විකෙෂ්පව පසුව නරකාදී සතර අපායෙන් නොගැලවෙන්නාහ. එසේ හෙයින් සත්ත ධර්ම බ්‍රහ්මණයාට වුවාසේ වන්නේයයි වදාරා මේ සන්තධර්ම ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි වංචාලව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# අසදෘශ ජාතකය

තවද ශාක්‍යකුල මහනිධානවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද,

ඒ කෙසේද යත්

එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළු වරුන්වහන්සේ ඇවැත්නි සර්වඥයන් වහන්සේ මේ නියා රාජ්‍යයක් හැර මහානික්මන් කළෝ වේදැයි කියා වැඩ උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දූන් සර්වඥ කාලය පැමිණි කාලයෙහි තිබා නුමුනුකල නැවන ඇති අවස්ථාවෙහි තමන්ට පැමිණෙන රාජ්‍ය ශ්‍රී හැර මහනික්මන් කළෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අග්‍ර මහේසිකා බිසවුන් බඩ පිළිසිඳ දසළුකඩමසකින් බිහිවුහ. ඒ කුමාරයන් බිහිවූ ගමනේ නම් තබන්නාහූ අසදෘශ කුමාරයෝය්යයි නම් තුබූහ. ඒ කුමාරයන් වැඩිවිය පැමිණෙන අවස්ථාවට අනිකුත් පින්වත් කුමාරයෙක් බඩ පිළිසිඳ දසළුකඩ මසකින් බිහිව ඒ කුමාරයන්ට නම් තබන්නාහු බ්‍රහ්මදත්ත කුමාරයෝය්යයි නම් තුබූහ. අසදෘශ කුමාරයෝත් වැඩි දිසාපාමොක් ආචාරීන් කරාගොස් උගතමනා සිල්ප ඉගෙණ රජ්ජුරුවන් කරා අවුත් උන්කලට පියරජ්ජුරුවන්ට මරණ කාලය පැමිණියෙහින් රජ්ජුරුවෝ කියන්නාහු අමාත්‍යයෙනි අසදෘශ කුමාරයන්ට රාජ්‍යය දෙව බ්‍රහ්මදත්ත කුමාරයන්ට යුවරජ තනතුරු දෙවයි කියා සවර්ගස්ථ වූහ. එවිට අමාත්‍යයෝත් අසදෘශ කුමාරයන්ට රාජජය පමුණුවන්ට උත්සහ කළාහ. ඒ අසා අසදෘශ කුමාරයෝ රාජ්ජ්‍ය නොගිවිස්සාහ. අමාත්‍යයෝ බ්‍රහහ්මදත්ත කුමාරයන්ට රාජජය පමුණුවා බෝධිසත්වයන්ට යුව රජ තනතුරු දුන්නාහ. එවිටත් නොගිවිස නිකම්ම කුමාර සැලැස්මෙමළුන් අවස්ථාවට එක්තරා අමාත්‍යයෙක් රජ්ජුරුවන් කරාගොස් නුඹ වහන්සේගේ බෑනන් වහන්සේ නුඹ වහන්සේ නසා රාජ්ජ්‍ය ගන්ට උත්සහාකරණ සේකැයි කියා බිඳවුය. රජ්ජුරුවෝත් එබස් අසා බිඳි බෑනන් වහන්සේ අල්වයි කිහ. එවිට බෝධිසත්වයෝ වැඩපස්නා අමාත්‍යයෙකු අතින් අසා බරණැස් නුවරින් පිටත්ව සාමන්ත කෙණෙකුන්ගේ නුවරට ගියාහ. ඒ නුවරට ගොස් වාසල් දොරසිට ධනුද්ධරයෙක් ආයයි කියා රජ්ජුරුවන්ට දන්වා යවන්නාහූ රජ්ජුරුවන් විසින් එන්නේයයි කියා යවන්නා රජ්ජුරුවන්ට දන්වා යවන්නාහු රජ්ජුරුවන් විසින් එන්නේයයි කියා යවන්නා රජ්ජුරුවන් විසින් කොතෙක් පඩි තොපට උවමනාදැයි විචාරන්නා මසුරන් ලක්ෂයක් පඩි උවමනවැයි කියන්නා රජ්ජුරුවෝත් පිරිස් අඩු කරන්ට උවමනා හෙයින් යහපත ලක්ෂයක් නියායෙන් පඩි දෙවයි කියා සැලැසුවූය. මෙසේ පඩි කන අවස්ථානෙහි දුනුවායෝ එකසීම අපට වඩා මූ පඩි කන්නේයයි කියා ඊර්ෂියාවෙන් ඉඳිනාහ. එසමයෙහි එක්දවසක් රජ්ජුරුවෝ මගුල් උයනට ගොස් අඹගස්මුල යානක් ලවාගෙණ වටතිරයක් අද්දා උත්තානිව වැදහොත් රජ්ජුරුවෝ අඹ ගස අත්තේ තුබූ අඹ කැන දැක මිනිස් කෙනෙකුන් නැගී කඩා කන්ට බැරිසෙයින් දුනුවායන් ලවා විද්දවා ගනිම් සිතා දුනු වායන් රැස්කොට අඹ කැන විදින්ට කීහ. ස්වාමීනි අපගේ විදමන් දැක වදාළේ ඈත ලක්ෂයක් පඩිකන අළුත් ධනුද්ධරයානන් ලවා වද්දවන බවයයි කීහ. එවිට රජ්ජුරුවෝ බෝධිසත්වයන්ගෙන්වා අඹ කැනට විදුවයිකීය. බෝධිසත්වයෝත් නුඹ වහන්සේ වැදහොත් තැනට ආරින්ට උවමැනවයි, එතන යාන ඉවත්කරවා එතන සිටියාහ. සෙසු දුනුවායන් අත දුනු ඊතල නැතිහෙයින් දුනුවායෝ කථාකරන්නාහු අප අත දුනු ඊතල ඉල්වුවත් කවුරු වත් දුනු ඊතල නොදෙවයි කථාකළාහ. බෝධිසත්වයෝත් වටකොට තිරයක් බන්දා ඇතුළේ වැඩසිට ඉනතුබූ සුදුකඩ ඉවතතිබා රන්සේලයක් ඇඳ බුලත් පයිය ඇතුලේ තිබූ කඩුව උරේ එල්ලවාගෙණ බඩඅවුරා රන්ඹලියලක් බැඳ හිස චුරපිට බඳ රන්සන්නා කුත් ලාගෙණ රන්පටක් නලල බැඳ සන්ධිවත්කල හඟුදුන්න අතින්ගෙණ පබළුාලක් හා සමාන දුනුදියක් ලාගෙණ ඊදඩක් අතින්ගෙණ පොලොව පලාගෙණ නැගාවූ නාගමානකයෙකුසේ තිරයෙන් මෑත්ව, විදිනාවූ ස්ථානයෙහි සිට රජ්ජුරුවන්ට කියන්නාහූ දෙවයන් වහන්ස අඹ තැන යන ගියෙන් විදිම්ද එන හීයෙන් විදිම්දයි විචාළාහ, රජ්ජුරුවෝ කියන්නාහු යන ගියෙන් විදිනවා දුටුවිරු ඇත. එන හීයෙන් විදිම අපූර්වයයි කියන්නා එසේවිදුයයි කීහ. බෝධිසත්වයෝ නැවත කියන්නාහූ මගේ හීය චාතුම්හාරාජිකය දක්වායෙයි, එසේහෙයින් මදක්වෙලා වැඩ සිටිනේ යාපත බලාවදාළ මැනවයි කියා වේගදක්වා ඊදඬු විදපුහ, ඒ හීය අඹ කැනින් කැබැල්ලක් කපාගෙණ චාතුම්මහාරාජිකයට පැනනැගේය. බෝධිසත්වයෝත් ඒ හීය චාතුම්මහාරාජිකයාට පැනනැගිබව දූන අනික් හීයක් වේග දක්වා විද්දාහ. ඒ හිය පළමු විදි හීයේ පගිලියේ වැදගෙණ උඩ ගියේය. ඉන් එක හීයක් දෙවතාවෝ ඇරගත්හ. අනික් හීය පවතින් ගුගුර ගුගුරා බසින් නටවන එවිට බොහෝ දෙනා මේ කිමෙක්දැයි බලන්නට වන්නාහ. බෝධිසත්වයෝ ඊදන්ඩෙන් පවන්ගෙණ බස්නාබවයයි කියන්නා බොහෝදෙන තමන්ගේ ශරීරයෙහි වැටෙති සැකවන්ට වන්නාහ. එවිට හීය ඇවිත් අඹකැන කැපුනු ස්ථානයෙන්ම කැපී වැටෙන්නට වන, බෝධිසත්වයෝ එක අතකින් අඹකැන හා එක් අතකින් ඊදඬු අල්වාගත්තාහ. මේ දුටු සමාධියෙන් දහස් ගණන් ශල්වර හඬ හා දහස්ගණන් අසුරුසන් හා දහස්ගණන් පිළිහිස සිසාරමින් නැටූහ. රජ්ජුරුවෝත් කෙළගණන් සම්පත් දුන්නාහ. එසමයෙහි බරණැස් නුවර අසදෘශ කුමාරයෝ නැති නියාම අසා සත් රජ්ජුරුකෙනෙකුන් හා සේනාව අවුත් නුවර වටකොටගෙණ රාජ්‍යය හෝ දෙන්නේය. යුද්ධ හෝ කරන්නේයයි කියා යවුහ. එබස් බරණැස් රජ්ජුරුවෝ අසා

SANHIDA LANKA

භයින්ත්‍රස්තව බෑනන් වහන්සේ කොයිදෝහෝයි සිතා සාමන්ත රජ්ජුරුවන් ලඟ සිටිනා නියාව අසා එක් අමාත්‍යයෙකු කැඳවා තොප මා වැන්දාකොට වැඳ මාගේ බෑනන් වහන්සේ කැඳවාගෙණ එවයි කියා යවුහ. ඒ අමාත්‍යයෝ ගොසින්, ඒ සැටි කීයේය. බෝධිසත්වයෝ තමන්ගේ රජ්ජුරුවන්ට කියා අවසර ඉල්වාගෙණ බරණැස් නුවරට අවුත් අට්ටාලය පිට සිට ඊදඬක පත්ලියා බඳනාහු අසදෘශ කුමාරයෝ මේ ශමය පළමුකොට මා විදි හීයෙන්ම පලායව දෙවැනි හීයට සිටියානම් තොප ඇම ජීවිතක්ෂයට පමුණුවමි කියා සත්කඩවල්ලියා ඊදඬක් විද්දාහ. ඒ ඊදඬගොසින් සත් රජ්ජුරුවන් බත්කන තලිය පිට වැටීහින. එවිට රජ්ජුරුවෝත් දෙවෙනි හීය විද්දොත් ඒ නියාව වන්නේ නියමයයි කියා බිඳි තමන්ගේ නුවරවලට පළාගියාහ. බෝධිසත්වයෝ පිනිබිඳක් සාලේ පෙතක් නොසොල්වා සත්රජ්ජුරුකෙනෙකුන් ජයගත්තාහ. එවිට බ්‍රහ්මදත්ත කුමාරයෝ බෑනන් වහන්ස පළමුත් නුඹ වහන්සේ සන්තක රාජ්‍යය නුඹවහන්සේ එපයි කී නිසා මම රාජ්‍යය කෙළමි. දැනුත් නුඹ වහන්සේ රාජ්‍යය කල මැනවැයි කීසේක. එබස් අසදෘශ කුමාරයානන් වහන්සේ අසා මාගෙන් තොපට දුන් රාජ්‍යය දැහැමින් සෙමෙන් කරවයි කියා පාවාදී හිමාලය වනයට ගොස්, ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්ඤාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගියාහ. ඒ අර්ථය ප්‍රකාශ කරන්නාවූ සර්වඥයාන් වහන්සේ මහණෙනි ඒ ධනුද්ධර වූ අක්‍ෂරවෙධි වාලාවෙධි ශරවෙධි ශබ්දවෙධි යනාදී වූ විදීමෙන් ද වැලිබිසි පිදුරුබිසි ගැල් තඹපත් යපත් ආදීවූ දෙයෙහි විද මන්ද යනාදීන් සුසැට කලාවේ දක්ෂ වූ අසදෘශ කුමාරයන්ගේ මලනුවන්ට පැමිණි භය එලවා ඉක්බිති මහබිනික්මන් කළෝ වේදැයි වදාරා අසදෘශ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෝ ආනන්ද ස්ථවිරයෝය. අසදෘශ රජව උපන්නෙම් බුදුවූ මම්මයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සංගාමවචර ජාතකය

තවද ශාක්‍යකුල කල්පද්‍රැමවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ සන සමයෙහි නන්දසාමී අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

නන්දසාමින්වහන්සේ මහණවන දවස් ජනපද කල්‍යාණිය විසින් වහා එව නන්දයයි කවුළුදොරසිට කී බස් සිතන්නාහු නන්දසාමි මහණදමෙහි උකටලීව පඬුවන්වූ පැහැයෙන් හා නිය කෙස් වැඩී ශාසනයෙහි උකටලීව වාසයකරණ සේක. එපවත් සර්වඥයෝ දූන නන්දසාමී ඉන්නාතැනට ගියසේක. උන්වහන්සේ සර්වඥයන් වහන්සේට අසුන්පනවා වදාළසේක. සර්වඥයන් වහන්සේ පැනවූ අසුන්පිට වැඩ උන්සේක. වැඩහිඳ නන්දයෙනි ශාසනයට ඇළුම් ඇද්දැයි විචාරන්නා ස්වාමීනි ජනපදකල්‍යාණිය කෙරේ තෘෂ්ණාව ඇතිහෙයින් ශාසනයෙහි ඇළුම් මදව වාසයකෙරෙමි කීහ. එවිට සර්වඥයන් වහන්සේ නන්දයෙනි හිමාලවනය අඳුනනවාදැයි විචාරන්නා ස්වාමීනි නාඳූනම් කී හෙයින් එසේවීනම් හිමාලවනය දකින්ට යම්හයි වදාළසේක. එවිට නන්දසාමී කියනසේක් මාගේ ඍද්ධියක් නැතිව කෙසේ යම්දැයි කීසේක. එබස් අසා සර්වඥයෝ තොපි මාගේ ඍද්ධියෙන් එවයි කියා අත අල්වාගෙණ ආකාශයට පැනනැගී වැඩිසේක් අතරමග දාගිය සේනක් මවා ඒ සේන දාගිය කණුවක්මවා එහි කන්නාසා වල්ගය දාගිය වැඳිරියෙක මවා නන්දය තෙලදාගිය වැඳිරිය දුටුදැයි විචාරන්නා දිටිමි කී විසින් මේ වැඳිරිය සිත තබාගණුවයි හිමාලයවනයට ගොස් හිමාලයවනයේ අනෝතත්ත විල ආදී මහවිල් සතරක් හා පංචමහා ගංගාව හා දහස්ගණන් පර්වත හා හිමාලයවනයෙහි නොයෙක් අපූර්ව දක්වා චාතුම්හාරාජිකාව අඳූනනවාදැයි විචාරා නාදුනම් කී විසින් එසේවිනම් දකින්ට එවයි කියා නන්දසාමින් ඇරගෙණ චාතුම්හාරාජික දිව්‍යලෝකයට ගොස් පඬුපුල්සලස්නේ වැඩහුන් සේක. එවෙලෙහි ශක්‍රදේවේන්ද්‍රයෝ තමන්ගේ දෙදෙව්ලොව දේවතාවන් පිරිවරා බුදුන් දැක එකත්පස්ව සිටියාහ. එවෙලාවට ශක්‍රයාගේ දෙකෙළපණස්ලක්ෂයක් දිව්‍ය ස්ත්‍රීහු දකින්ට ගියාහ. පන්සියයක් කකුටපාදිනිවූ දිව්‍යස්ත්‍රීයෝ සර්වඥාන් දකින්ට ගියාහ. එවිට සර්වඥයෝත් කියන්නාහු නන්දයෙනි ජනපදකල්‍යාණි නියාවට මුන් වඩිද්දැයි විචාළහ. එපවත් අසා නන්දකුමාරයෝ කියන්නාහු ස්වාමිනි ජනපදකල්‍යාණි නම් අතරමග දුටු වැඳිරිය වැන්නීහ. එසේහෙයින් ජනපද කල්‍යාණිය කෙරේ ඇති සිතුවිලි ඇරින. මේ දිව්‍යාංගනාවන් මා ලබන්නේ කෙසේදැයි විචාළහ. එවිට සර්වඥයෝ ඉඳූරා මහණදම් පිරුවොත් දිව්‍යාංගනා වන් දැක්කහැක්කැයි වදාළසේක. එසේ වී නම් මහණ දම් පුරම් ස්වාමිනි මට දිව්‍යස්ත්‍රීන් ලබනනියාවට ඇපවන්ට උවමැනයි කිහ. සර්වඥයෝත් යහපත නන්දයෙනි මම ඇපවෙමි වදාළසේක. එවිට නන්දසාමී මහණදම් මහණදම් වහාපුරන්ට උවමැනවයි කියා දිව්‍යලෝකයෙන් සර්වඥයන් හා සමග ජේතවනාරාමයට වැඩ එතැන් පටන් දිව්‍යස්ත්‍රීන් පතා මහණදම් පුරන්නාහ. සර්වඥයන් වහන්සේ සැරියුත් සාමින්ට වදාරණසේක් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි නන්දයෝ දිව්‍යස්ත්‍රීන් ලබතොත් මහණදම් පුරමි මා අතින් ඇප ලවාගත්තෝ වේදැයි වදාළසේක. එවිට නන්ද සාමින්ටත් එලෙස වදාළසේක. කාශ්‍යප සාමින්ටත් එලෙස වදාළසේක. අනුරුද්ධ සවාමින් වහන්සේටත් එලෙස වදාළසේක. ආනන්දසාමින්ටත් එලෙස වදාරා අසුමහා සව්වන් වහන්සේ ඇතුළු බුද්ධවල්ලභ බොහෝ භික්ෂූන් වහන්සේට එපවත් වදාළසේක. සැරියුත්සාමින් නන්දස්මාන් කරාගොස් නන්දෙයනි දිව්‍යලෝකයෙහි දෙවියන් මධ්‍යයේ බුදුන් ඇපලවාගෙණ ස්ත්‍රීන්තකා මහණදම් පුරවාදතොපගේ මහණදම් පිරිමනම් කුලියට බැලමෙහේ කරන්නා වැන්නැයි වදාළසේක. මේ නියායෙන් නන්දසාමින් දුටුයම් තැනකදීම කුලියට බැලමෙහෙ කරන්නා වැන්නේයයි කියා බොහෝ මාළුවරුන් වහන්සේ ලජ්ජා කරණ සේක. බොහෝ දෙනාවහන්සේ කියන බසට ලැජ්ජාව නන්දය මින් එකඟව ස්ත්‍රීන් කෙරෙහි සිතිවිල්ල ඇර විදර්ශනා වඩා රහත්වුසේක. රහත්ව බුදුන් කරා ගොස් ස්වාමින් වහන්ස මට ඇපවූ ඇපය ඉනිගියේ වේදැයි කීසේක. සර්වඥයෝත් නන්දයෙනි තොප රහත් වූ ගමනේ ඇපයෙන් මිදිගිය ගමනයෙමි වදාළසේක. එදවස් වැස එක්ව  මාළුවරුන් වහ්නසේ නන්දයෝ අවවාදක්ෂමයෝය. යන කථාව කිය කියා වැඩහුන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මාළුන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා නන්දයෝ පෙරත් අවවාදක්ෂමයෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට පසමිතුරු වූ රජ්ජුරුවකෙනෙකුන්ට හස්ත්‍යචාරීව දහස් හරණාහ. බෝධිසත්වයන් විසින් කම්පස්කරණ ලද මගුල් ඇතුත් යුද්ධයෝග්‍යව සිටිනේය. එකියන පසල් රජ්ජුරුවෝත් සේනාවක් පිරිවරා බරණැස්නුවරට අවුත් නුවර වට කොට ගෙණ රට හෝ දෙන්නේය යුද්ධ හෝ කරන්නේයයි පත්යවුය. එබස් බරණැස් නුවර රජ්ජුරුවෝ අසා රාජ්‍යයකුමට දෙම්ද යුද්ධ කෙරෙමියි කියා අට්ටාලවෙට්ටම ආදීවූ දෙයෙහි සේනාව සලස්වා යුද්ධ කරන්ට වන්නාහ. ඒ වෙලාවට අට්ටාලවල සිට දමන්නාවූ බොහෝ ශරවරුෂාව දැක ඉවසාගත නොහි ඇත් පසුබැස ගියේය.එවිට බෝධිසත්වයෝ කියන්නාහු යුද්ධයට යෝග්‍යයයි කියා ඉන්නාවූ හස්තිරජයා ශර වර්ෂාව නැත්තාවූ යුද්ධයෙක් නම් යුද්ධ නොවෙයි එසේ හෙයින් ශරවර්ෂාව ඇඟට වැදගතැයි පසුබසිනේ ඇයිදැයි නාගේන්ද්‍රය වහාගොස් කණයම් බිඳ ඉන්ද්‍රකීලය උසුවාදමා පවුරුවාසල එලා නුවරට වැද බරණැස් රජ්ජුරුවන් අල්වාගෙණ

SANHIDA LANKA

අපගේ රජ්ජුරුවන්ට පාවා දෙවයි කීහ. එබස් අසා පෙරලා කරකැවී දිවගෙණගොස් ඉන්ද්‍රකීලයසකු උදුරා දමන්නාමෙන් දමා පවුරු පදනම් ඇනබිඳ නුවරට වැද බරණැස් රජ්ජුරුවන් අල්වාදුන්නායි වදාරා සංගාමවච්ඡ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ඇතානම් ආනන්ද ස්ථිවිරිය. හස්තචාරීව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# වාලොදක ජාතකය

තවද ශාක්‍යකුලතිලකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි විඝාසාදයන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

පන්සියයක් උපාසකවරුන් තමන්ගේ ඇති ගම්බිම්වල සරකා තමතමන් අඹුදරුවන්ට පාවාදී බුදුන්ගෙන් බණ අසා එක්කම හිඳිනාහ. එකී පන්සියයක් දෙනාගෙන් සමහරු සෝවාන් වූහ. සමහරු අනාගාමි වූහ, සමහරු සකෘදාගාමි වූහ. මෙසේ තුන්මග තුන්ඵලයට පැමිණි උපාසකරුන් සසරසිටි එක් උපාසක කෙනෙක් නැත. එසමයෙහි දන්දෙන යම් කෙනෙක් ඇත්නම් උපාසකරුන්ටත් සමග දන්දෙන්නාහ. ඒ උපාසකවරුන්ගේ දැහැටිදඬු ආදීවූදෙය පනත් කොට දෙන්නාවූ පන්සියයක් අතවැස්සෝ ඇත්තාහ, උපාසකවරුන්ගේ ඉඳුල් පත් කනහෙයින් විඝාසාදයයි යන නම් ලද්දාහ. එක් දවසක් එකියන විඝාසාදනයෝ පන්සියයක් දෙන දනට ගොස් ඕනුත් කැටිව මල්වල යුද්ධයක් සලසා ගෙණ ඒ ඒ තැන පැන බැයගෙන බොහෝ අරගල කරන්ට වන්නාහ. පන් සියයක් උපාසකරුන්ගෙන් බණ නොනැගී තමන් ගෙවල්වලම උන්නාහ. සර්වඥයෝ අනදසාමින් ගෙන්වා ආනන්දය මේ කුමන අරගලදැයි බලාපියා එවයි කියා යවූසේක. ආනන්දසාමින් ඒ බලා එපවත් සර්වඥයන්ට දැන්වූසේක. සර්වඥයෝ එපවත් අසා ආනන්දයෙනි පෙරත් මේ කියන උපාසකවරු බැණ නොනැගී ඉන්දදීම මේ කියන කොල්ලෝ දිවපැන ඇවිද්දෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒ ඒ රජ්ජුරුවන්ට වැඩපසස්නා අමාත්‍යව උපන්සේක. එසමයෙහි පසල්රට සතුරන්ගෙන් භයක් පැමිණියයි අසා පසල්රට ගොසින් යුද්ධකොට උන්හැමදෙනම පරදවා නුවරට අවුත් රජගෙට වදිනා රජ්ජුරුවෝ අමාත්‍යයන්ට කියන්නාහු මේ එක්ව දුක්ගැන අසා පන්සියයක් අසුන්ට මුදිරප්පලන් පැන් නුමුසුකොට මිරිකා ඒ රස පොවවයි කීහ. යහපතැයි ඒ නියාවට මුදිරප්පලන් පැන් අසුන්පොවා ඉතිරිපැන් මිරිකා කසට පිපීගිය වසල බොහෝව තුබූ විසින් අමාත්‍යයෝ රජ්ජුරුවන් අතින් මීට කුමක් කරමෝදැයි විචාරා අසුන් පන්සියයකට කානම් ඇදගෙණ ඒ ආ කොටළුවන්ට ඒ කසට පිපිගිය වසළු බොහෝව තිබූ හෙයින් පැනෙහි ලා මිරිකී පොවයි කීහ. ඒ මානයට පෙවු යාපත් රසයබීපූ අස් පන්සියය කිසිම අරගලයක් නැතිව තමන්ගේ අස්සල බැනනොනැගී සිටියාහ. කසට පැන් බීපුවාවූ කොටළුවෝ රජගෙයි ඒ ඒ තැන පැන නටන්නට වන්හ, රජ්ජුරුවෝ ඒ දැක ලඟසිටි බෝධි සත්වයන් විචාරන්නාහු එඹල යහපත් රසය බීපු අශ්වයෝ උඩතකමත් නැතිව වාසය කරන්නාහ. අසුන් බී ඉතිරි වූ කසට පිපීදමාපූ මුද්දිරප්පලන් පැන් බී උඩතව ඇවිදිනාහ. මෙයට කාරණ කිම්දැයි විචාළහ, එවිට බෝධිසත්වයෝ කියන්නාහු ජනප්‍රධානවූ දේවයන් වහන්ස අශ්වයෝ උත්තම් ජාතිහෙයින් ඒ පැන් බීත් උත්තම නොවූ දවසරිනාහ, නීචයන් විසින් තමන් ලත් යම් යම් තාක් දෙයකට උත්තම වන්නාහ. එසේ හෙයින් මේ කොටළුවෝත් තමන් නුපුවිරු මුද්දරප්පලන් රසය බිපූහෙයින් උඩතව දවසනාහයි කීහ. රජ්ජුරුවෝත් ඒ කොටළුවන් මරා වහසලින් පිටත ලුහයි වදාරා මේ වාලොදක ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි කොටළුවෝ පන්සියයක් නම් දැන් මේ විඝාසාදයෝය. අශ්වයෝ පන්සියයක් නම් උපාසකවරු පන්සියය. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයයෝය. එසමයෙහි අමාත්‍යව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම යියි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# දධිවාහන ජාතකය

තවද ත්‍රිභුවනාධිපතිවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ භජනය කරණ භික්ෂු කෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වනලද.

මෙහි වර්ථමාන කථාව යටකී ජාතකය හා සමානය. මෙහි සර්වඥයන් වහන්සේ මහණෙනි අසත්පුරුෂයන් භජනය කිරීමෙන් සත්පුරුෂයෝත් නපුරුවන්නාහ. කාරණා කිම්ද යත් කොසඹගස හා අගුල් වැල් එක්වීමෙන් තිත්තවූ අඹගස වැන්නේයයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාල සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බමුණෝ සතර දෙනෙක් ගිහිගෙය හැර හිමාලය වනයට වැඩ ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පෙළපාළියෙන් පන්සල් ඉදිකොටගෙණ වාසය කරන්නාහ. එසමයෙහි හැමට වැඩි මාළු තාපසයෝ කළුරියකොට දෙදෙව්ලොව දෙවියන්ට නායකව ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහ, ඉපිදි තාපසකම්කොට ශක්‍රභවනයට ආ නියාවත් තමන් මලනු තුන්බෑයන් තාපස කම්කරණ නියාවත් දැක එතුන් බෑයන් ශක්‍රයෝ අවුත් දක යන්නාහ. එක් දවසක් වැඩි මාළු තාපසයා කරා අවුත්, ස්වාමීනි ඵාසූ අඵාසූ කිම්දැයි උවමනා කිම්දැයි විචාලහ. එවිට තාපසයෝ කියන්නාහූ පාඩු රෝගය ඇති හෙයින් ගින්නෙන් ප්‍රයෝජන ඇත. ඊට උපකාරවව් කීහ. එබස් ශක්‍රයෝ අසා වාසඵරසුවයයි යන දෙයක්ද, එක් පිටකින් පෙරලාගන්නා පොරවයයි කියා තෙලෙන් කැමති ප්‍රයෝජනයක් විදුවයි කියා ශක්‍රයෝ තාපසයන්ට දුන්නාහ. තාපසයෝ කියන්නාහූ ශක්‍රයෙනි මේ වෑපොරව, ඇරගෙන මට දරගෙණෙන්නෝ කවුරුදැයි කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහූ නුඹ වහන්සේ අතපිස හින්දදීම දර පලාගෙණ එවයි කියන්නා තෙමේම ගොස් පෙරලා දරපලාගෙණවිත් ගිණිමොලවන්නේයයි කියා වාසී එරසුව දී අනික් මැදිබෑ තාපසකරා ගියේය. ඒ තාපයන් සමීපයට ගොසින් ශක්‍රයෝ කියන්නාහූ තාපසයන් වහන්ස නුඹ වහන්සේට ඵාසූ අඵාසූ කිම්දැයි විචාළාහ. ඒ තාපසයෝ කියන්නාහූ ඇතුන්ගෙන් පන්සල ඇලගෑමෙන් බොහෝ අවුසුය. එසේ හෙයින් ඇතුන් පහකරණ උපායක් කියවයි කීහ. ශක්‍රයෝ එබස් අසා බෙරයක් දී මේ බෙරය එක් ඇසක් ගසාලන්නා චතුරංගිනි සේනාව උවත් බිඳෙන්නාහ, එක් ඇසක් ගසාලන්නා එකීහිම මිතුරුව සිටිනා හයි කියා බෙරය දී බාල තාපසයන් කරා ශක්‍රයාගොස් ඵාසු අඵාසු විචාරා ඒ තාපසයෝත් තමන්ට පාඩුරෝගයක් ඇති නියාව කියාදී ඊට සෑහෙන යමක් ඇතොත් යහපතැයි කීහ.

එවිට සක්‍රයෝ දී කලයක් දී මේ එකිනෙක තමා පියන්නා මහත් වූ ගංගාවක් වෙයි. කියා දී සක්‍රයෝ ගියාහ. එසමයෙහි එක්තරා පුරෙක් පාළුව ගිය ගමක සාරාකා ඇවිදිනේ අනර්ග මැණිකක් දක ඒ මැණික කටින් ඩැහැගෙන ඒ මැණිකේ ආනු භාවයෙන් ආකාශයෙන් නික්ම සමුද්‍ර මාද්‍යයෙන් දිවයිනකට බැස සිතන්නේ ඒ ඒ තැන ගොදුරු සොයා ඇවිදින්නට කාරණ කිම්ද මෙතැනම ඉදින් සිතා දිඹුල් ගසක් සමීපයට ගොසින් දිඹුල් ගහ මුල මැණික තබා එහි වැදහොත්තේය. එකලට එක් ගමක මනුෂ්‍යයෙක් දෙමව්පියන් විසින් හරණ ලද එක්තරා පුරුෂයෙක් පටුන් ගමකට ගොස් කුලියට පඩව්වකට නැගී යාත්‍රා කරන්නේය. මුහුදු මධ්‍යයේදී ඩව්ව නැසින එවිට පුරුෂයා ලැල්ලක් බඩ තබා ගෙන පීනන්නාහූ ඌරා වැදහොත් දිවයිනට පාව ගියේය. එතැනට පාව ඌරා වැදහොත් නියාවත් මැණික තිබූ නියාවත් දක ඌරා මෙතනට ආවේ මැණිකේ ආණුභාවයෙන්මැයි සිතා ඌරා කරා සෙමින් සිට සොල්මන් නොකොට අවුත් මැණික අරගෙණ ආකාශයෙන් දිඹුල් ගසට නැගී සිතන්නේ ඌරා මරා මස් කාපියා ඔබ්බකට නොයෙමි. සිතා දිඹුල් කණ්ඩක් කඩා ඌරා ඇඟට දැයෙමි. එවිට ඌරා පිබිද මැණික ඇසින් නොදක ඒ ඒ තැන ඇවිද වියරු වැටුනා සේ සොයන්ට වන. ඒ වෙලාවට ගස උඩ උන් පුරුෂයා සිනා සී පිය. එවිට ඌරු උඩ බලා මිනිසා දක දිඹුල් ගස පළාපියා මිනිසා එලා ගෙන නසමි සිතා දිඹුල් ගසට වේගවත්ව ඉසින් ඇන්න වන. ඒ නියාවෙන් දිඹුල් ගසට ඇන තමන්ගේ ඔලුව පලාගෙන තෙමේම මලේය. පුරුෂයා ඌරා මළ බව දන ගසින් බැස ගිනි ගා ඌරා පුලුස්සා කා එතැන සිට මැණිකෙහි ආනු භාවයෙන් හිමාල වනය බලා ආකාශයෙන් යන්ට වැඩ අතර මග උන් තාපස වරුන් තුන් දෙනා දැක ඉන් පළමු තාපසයන්ගේ පන්සල කෙරේ බැස ඒ තාපසයන් දක එතැන කීප දවසක් රඳා තාපසයන් ගේ වාසී පරසුවේ ආනුභාවයෙන් දක මේ මැණික ඇරගන්ට උවමනවයි කියා තමන්ගේ මැණිකේ ආනුභාවය කියා තාපසයෝ එපත් අසා ආකාශයෙන් මාත් ඒ ඒ තැන යන්ට උවමැනවයි සිතා වාසී පරසුව දී මැණික ඇරගත්තාහ. ඒ වාසී පරසුව ගත්තා වූ පුරුෂයා අත පවා තාපසයන්ගේ හිසකපාගෙණ එවයි යැවීය. වාසිඑරසුව එලෙසම ගොස් තාපසයන්ගේ ඉස කපාගෙණ ආය. මැණිකත් ඇරගෙණ එවිට ඒ පුරුෂයා වාසිඑ සුව එක් තැනක සඟවා තිවා අනික් තාපසයන් කරා ගොස් මැණික ඇරගෙණ උන් හා කීප දවසක් රඳා බෙරෙහි ආනු භාව දක මේ බෙරය මා ඇරගන්නට උවමැනවයි සිතා තමන්ගේ මැණිකේ ආනුභාවය කියා තාපසයන් විසින් මැණික ඇරගෙණ බෙරය දුන් පසු ඒ තාපසයන්ටත් ඒ නියායෙන් වාසී පරසුව අතු පායවා

SANHIDA LANKA

තාපසයන්ගේ හිස කප්පා ගෙන්වාගෙන මැණිකත් අරගෙණ අනෙක් තාපසයන් කරා ගොස් උන්ගේ දී කලයෙහි ආනුභාව දැක දී කලය ගෙන්වා පිණිස මැණිකේ ආනුභාවය කියා මැණික දී කලය අරගෙන වාසි පරසුව අත පායවා තාපසයන්ගේ හිස කප්පා ගෙන්වාගෙන මැණිකත් අරගෙන ආකාශයෙන් බරණැස් නුවර කරා ගොස් බරණැස් නුවර සමීපයෙහි සිට රජ්ජුරුවන්ට කියා යවනේ මට රාජ්‍යය හෝ දෙව. යුද හෝ කරවයි කියා මිනිසෙකු අත කියා යැවුය. එවිට රජ්ජුරුවෝ අසා චතුරංගනී සේනාව අරගෙන මොහු අල්ලවම්යි නික්මුනාහ. නික්ම පුරුෂයා කරා අවුත් යුදයට වන්නාහ. එවිට පුරුෂ සියල්ලවුන්ම තමාට මිතුරු වන්නා වූ බෙර ඇස ගසාලීය. ඒ වෙලේ බොහෝ සේනාව අවුත් ඒ පුරුෂයා වට කොට ගත්තාහ. එවිට රජ්ජුරුවෝ එසේ වූවත් රාජ දෛර්යෙන් කීප දෙනෙකු අරගෙන බැනගෙන නික්මුණාහ. ඒ වෙලාවට තමාගේ දී කලය නමාපීය. එවිට ගංගාවක් සේ දී වතුර අරගෙන නික්මුණේය. එවිට සතුරුව ඉන්නා බොහෝ දෙනා ඉගුලුනාහ. එවිට අනික් බෙර ඇස ගසා සතුරන් ඒ ඒ තැන යවා වාසි පරසුව අත පැසවා රජජුරුවන්ගේ හිස ගෙන්වා ගත්තාහ. මෙතෙක් සේනාවෙන් එකකතුත් ආයුදයක් සරස් කොට ලම්හයි නොසීතුහ. එවිට බොහෝ දෙන එක්ව ඒ පුරුෂයාට දදිවාහන රජ්ජුරුවෝයයි නම් තබා මහත් කොට පෙරහරින් නුවර ගෙනවුන් ඔටුනු පලන්දා රාජ්‍යයට සලස්ව ගත්හ. ඒ දැදි වාහන රජ්ජුරුවෝ දැහැමෙන් රාජ්‍යය කරන්නාහ. එසමයෙහි දදි වාහන රජ්ජුරුවන් එක් ගඟක ලෝ දැල් එලා නාමින් සිටි සේක. හිමාල වනයෙන් කර්ණිමුද නම් විලින් දේවතාවන් ආනුභව කරන්නවූ අඹ ගසින් අඹයෙක් අවුත් ඒ ලෝ දැල් වල බැඳිනි. ඒ දුටු කෙවුලෝ රජ්ජුරුවන්ට ගෙන ගොස් පෑහ. රජ්ජුරුවෝත් වැද්දන් අතින් විචාරා අඹ රසය අනුභව කොට ඒ කියන අඹ ඇටය උයනේ රෝපනය කරවා ඒ ගස වට බොහෝ සුවඳ ගස් ඇති කරවා දවස් පතා සුවඳ පැන් කිරි පැන් සඳුන් පැන් වත්කරවා ගස නොයෙක් මල් දම් එල්වා සුවඳ දුම් හා සුවඳ පැන් හා ලවා වට කොට පට කඩ තිර ජවනිකා බන්දවා මේ නියායෙන් බොහෝ පෙර හර අඹ කසට කරවූහ. අඹ ගස තුන් අවුරුද්දකින් රන්වන්ව මී අඹ එල ගෙන මී හා සමාන රස ඇති විය. රජ්ජුරුවෝ ඒ ගස එල අනුභව කොට මේ එල ඒ ඒ රජ දරුවන්ට පඬුරු කොට යවම්යි සිතා නැවතත් සිතන්නාහ. මේ එල රජ දරුවෝ කා ඒ ඇට ඉඳුවා ඇති කලෝ නම් මේ ගස නිස්සාර වෙයි. සිතා අඹ ගෙඩියේ පැලවෙන ස්ථානය මඩු කටු ගසා යුවුහ. ඒ ඒ රජ දරුවෝත් අඹ කා අඹ ඇට ඉඳුවා  නැස්පෙන හෙයින් මීට කාරණා කිම්දෝහොයි සිතා පරීක්ෂා කොට මඩු කටු ගසා යවන ලද නියාව දැන ඉන් එක් රජ්ජුරුකෙණෙකුන්ගේ උයන් ගොව්වාත් බරණැස් නුවරට ගොස් දදිවාහන රජ්ජුරුවන්ට තමන් ආ පවත් කියා යවා රජ්ජුරුවන් විසින් ගෙන්වා උයන් ගොව්වෙක් දැයි විචාරන්නා සේ එසේය රජ්ජුරුවන් වහන්ස අකාලයට එල ඇති කිරීම මල් ඇති කිරීම ආදී වු දේ දනිම්යි කියා එබස් රජ්ජුරුවෝ අසා තමන් උයන් ගොව්වා හා කැටිව උයන් බලන ලෙස සැලසූහ. ඒ කියන උයන් ගොව්වා කලට මල් හා එල දා ඇති කොට රජ්ජුරුවන්ට පෑය. රජ්ජුරුවෝ සතුටුව පළමුව සිටි උයන් ගොව්වා හැර අමුතුව ආ උයන් ගොව්වාට උයන භාර කොට දුන්නාහ.  එවිට උයන්ගොව්වා උයන තමා නතුවූ පසු අඹගස තිත්තාකෙරෙම් සිතා අඹගසට කොසඹගසක් හා අගුල්වැල් වට ඉඳුවිය. ඒ වැඩීම අඹ ගස මුල් බැඳි ශාඛා හා එක්ව බැඳි අඟුල් වැල් ගස වැළඳ කල්යාමකින් අඹ ගස කොසඹ ගස මෙන් තිත්තව ගියේය. තමා ආ කාරී සිද්දව ගිය හෙයින් උයන් ගොව්වා තමා නුවරට පළා ගියේය. එවිට රජ්ජුරුවෝ එක් දවසක් මඟුල් උයනට ගොස් අඹ කම්යි සිතා අඹ කා කොසඹ කොල සැපුවා සේ තිත්ත විසින් රජ්ජුරුවෝ කාරා බිමට දැමූහ. බොධි සත්වයෝ ඒ රජ්ජරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුසාසනා කරන්නාවූ අමාත්‍යයව ඉපිද රජ්ජුරුවන් ලඟ සිටියාහ. රජ්ජුරුවෝ බෝධිසත්වයන්ට කියන්නාවූ අමෘත්ත වූ අඹ ගසට කළ මනා ප්‍රතිකාරයෙන් අඩුවක් නැත. තිබියදී තිත්ත වන්ට කාරණය කිමදැයි විචාළීය. එවිට බෝධිසත්වයෝ කියන්නාහු දධිවාහන රජ්ජුරුවන් වහන්සේ කොසඹ ගස් අඟුල්වැල් නිසා මවනැයි කීහ. එවිට රජ්ජුරුවෝ කොසඹ ගස් අඟුල් වැල් කප්පවා දම්මවා තිත්ත වූ පස්ද අද්දවා දම්මවා මිහිරි පස් ලවා කිරිපැන් සඳුන් පැන් වත්කොට පෙදෙසේ පනත් කළාහ. පළමු උයන් ගොව්වාට උයන පාවාදුන්නාහ. අඹ ගස පෙරසේම මිහිරි රස ඇතිවීයයි වදාරා දධිවාහන ජාතකය නිමවා වදාල සෙක්. එසමයෙහි අමාත්‍යයව උපන්නෙම් ලොව්තුරා බුදු වූ මම්ම යයි දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ශිලානිසංශ ජාතකය

තවද ත්‍රිභූවන චූඩාමාණික්‍යවූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපාසක කෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද,

ඒ කෙසේද යත්

එක්තරා උපාසකයෙක් බුදුන් දක්නා පිණිස ජේතවනාරාමයට එමින් සිට අතරමග අචිරවතී නම් ගංගාවක් දැක ගංගාවේ ඔරු පාරු පදින තොටියා නොදැක එවිට සිතන්නාහු ඔරුපාරු නැතැයි කිම්ද බුද්ධාලඹන ප්‍රීතියෙමියි සිතා දියට බැස ගල්පොත්තක යන්නාසේ නික්මුණාහ. ගංගාව මධ්‍යයට ගියකල ගඟදූලයෙන් බිඳිනා රලදැක බුද්ධාලම්භන ප්‍රීතිය යම්තෙමෙක් අඩුවිය. එවෙලාවට පැනෙයිපය ගැලෙන්ටවන, නැවත බුද්ධාලම්භන ප්‍රීතිය උපදවා දියපිටින් ගොසින් බුදුන් දකින්නට ගියාහ. එවිට සර්වඥයෝ උපාසකයෙගෙන් සෙමෙන් අව්දැයි විචාරන්නා එසේය ස්වාමින් වහන්ස බුද්ධාලම්භන ප්‍රීතියෙන් අචිරවතී නම් ගංගාවෙන් ගල්තලක්පිට එන්නාසේ ආමි ස්වාමීනි කීය. එබස් සර්වඥයෝ අසා උපාසකය පළමුත් උපාසකවරු බුද්ධාලඹන ප්‍රීතියෙන් ජීවිතය රැකගත්තෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරුකෙණෙක් රාජ්‍යය කරණ සමයෙහි කාශ්‍යප බුදුන්ගේ අනාගාමී උපාසකයෙකු පඬවිනැගෙන්නට යන අවස්ථාවට එක්තරා කරනැමියෙකුත් පඬවි නැන්ගේය. ඒ කරනැමියාගේ භාර්යාවද උපාසකයන්ට කරනැමියා පාවාදී පැමිණිදුකක් සුවයෙක බැඳෙවයි කියා කිව, යහපතැයි ගිවිස දෙන්නම් පඬවිනැගී සත්දවසක් සමුදුයාත්‍රාකොට සත්වෙනි දවසේ පඬවි බුන්කල්හි ලැල්ලක් පිට උපාසකයන් හා කරනැමියන් හා දෙන්න ලැල්ල බඩතියාගෙණ පීනාගෙණ ගොස් දිවයිනකට පාවගියහ. එවිට කරනැමියා දිවයිනක බොහෝ පක්ෂීන් මරා කා උපාසකයාටත් දෙයි උපාසකයා සිතන්නාහු මෙතන සරණයෙක් නම් බුද්ධ, ධම්මය, සංඝය, යන ත්‍රිරත්නය විනා අනික් සරණයෙක් නැතැයි කියා සිතා ඉන්නාහ. එවෙලාවට මහාසමුද්‍රයෙහි වසන්නාවූ නාගරාජයෙක් තමාකය සත්රුවන් පිරු නැවක් මෙන් මවාගෙණ, ඒ සමුද්‍රයේ වසන්නා වූ දේවතාවා මාලනී වෙසක් මවාගෙණ උපාසකයන් වසනස්ථානයට ගොස් බරණැස්නුවරට යන්නෝ ඇද්දයි අඬ ගැසීය. එවිට උපාසක අපි බරණැස්නුවරට යම්මැයි කියා එවිට යහපත තොප නිසා ගෙනා නැවය තොප නැගෙවයි කීහ. උපාසකයා කරනැමියාට නැංගෙන්ට අඬගැසීය. එවිට දේවතාවා කියන්නේ තොප විනා උන් නැංගන්ට අවසර නැතැයි කීය. ඇයි උන් නැංගෙන්නට බැරි කවර කාරණයක් නිසාදැයි විචාරන්නා තිසරණ පිහිටි කෙණෙක් විනා තිසරණ නොපිහිටියන් නැංගනැතැයි කීහ. එවිට උපාසකයෝ මා ගත්තාවූ  යම්සීලයෙක් ඇත්නම් තොපිත් අනුමෝදම් වේවයි කීහ. එවිට කරනැමියාත් ස්වාමීනි මාගේ අතින් පිනක් කොටගත නුහුනු වත් නුඹ වහන්සේ දුන් පින් අනුමෝදන්වෙමි කියා සිත සුද්ධකොට පින් අනුමෝවගත. එවිට කරනැමියාත් නැවට නන්වාගෙණ දෙන්නා මුදින් ගඟට බාගෙණ ගඟ ඔස්සේ ගොසින් බරණැස් නුවරට බා දෙන්නාගේ ගෙවලට වෙන වෙනම සම්පත් සලස්වා ආකාශයේ සිට කියන දිව්‍යපුත්‍ර බරණැස්නුවරට සත්වයන්ට ඇසෙන සැටියේ යම්කෙණෙක් සත්පුරුෂවූ වාසයෙන් හා තුනුරුවන් කෙරෙහිම මාන ඇතිව වෙසෙත්නම් ඒසේ වූ සත්වයාට සමුද්‍ර මධ්‍යයේදී ප්‍රතිෂ්ඨාව පෙනෙන්නේ වේදැයි කියා නැවත කියන්නාහූ යම්සේ සත්පුරුෂයන් හා සමගාමීවිවෙහි ආනුභාවයෙන් කිසිගුණයක්නැති කරනැමියාත් ප්‍රතිස්ථාවක් ලද්දේවේදැයි කිහයි. වදාරා ශිලානිසංශ ජාතකය නිමවා වදාල සේකි. එසමයෙහි උපාසකයෝ නිවන්දැක පූහ, එසමයෙහි නාගරාජයා නම් ශාරිපුත්‍ර මහාස්ථවිරය, දේවතාව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක. මේ බණ අවසානයේහිදී මේ උපාසක සකෘදාගාමී මාර්ගයට පැමිණියා.

SANHIDA LANKA

# චුල්ලපදුම ජාතකය

තවද ත්‍රිභුවන ප්‍රදීප වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසන සමයෙහි ස්ත්‍රීන් කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂූන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද මෙහි වර්ථමාන කථාව උම්මදත්ත ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. මෙහි වනාහි සර්වඥයන් වහන්සේ භික්ෂූන්ට ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව උරයපලා ලේ බොන්ට දුන්නේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අග්‍ර මහේසිකා බිසවුන් බඩ පිළිසිඳ දසළුකඩමසකින් උපන් කුමාරයාට නම් තබන්නාහු පදුම කුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරයන්ට ඉක්බිති රාජ කුමාරයෝ සදෙනෙක් උපන්නාහූ මේ නියායෙන් රාජකුමාරවරුන් සත්දෙන වැඩිවිය පැමිණ ගේ දොර ඇක පියානන් වහන්සේට ඉතා ලෙන්ගතුව වාසය කොට රාජ සේවය කරන්නාහ. එක් දවසක් රජ්ජුරුවෝ සිව්මැදුරු කවුළුවෙන් විථිය බලන්නාහූ පුතුන් සත්බෑයන් මහත් වූ සේනා සමෘද්ධියෙන් රාජසේවයට එන්නාවුන් දැක රජ්ජුරුවෝ සිතන්නාහු මේ දරුවෝ සත්දෙන මාගේ රාජ්ජය උදුරාගනිතියි සිතා පුතුන් සත්බෑයන් තමන් කැඳවා කියන්නාහූ දරුවෙනි තොපකෙරේ සැක ඇත්තෙමි එසේ හෙයින් මගේ නුවර නොයිද ඉයළු යම් අතෙක පලාගොස් මාගේ අයාමෙන් අවුත් තොපගේ කුලසන්තක වස්තුව හා රාජ්‍යය හිමිකරගනුවයි කීහ. එවිට සත්බෑයයෝ පියානන් වහන්සේගෙන් වියෝවන සෝකයෙන් අඬා වැලප රජ්ජුරුවන්ගේ ආඥාව ඉක්මගත නොහෙන්නාවූ තමන්ගේ භාර්යාවවූ බිසෝවරු සත්දෙනාම අත අල්වා නික්මුනාහ. නික්ම ක්‍රමයෙන් ගොස් මහත් වූ වාළුකා කාන්තාරයකට පැමිණ ඒ කාන්තාරයේ ඇවිදින්නාහූ කණ බොණ දෙයක් නැතිව සාපිපාසයෙන් පීඩිත වූවාහු අඹුවන් කෙරේ තෘෂ්ණාව හැර පළමු දවස් බල මලනුවන්ගේ අඹුව මරා මස් බෙදා කෑහ. බෝධිසත්වයෝ තමන් ලත් දෙකොටසින් කොටසක් දෙන්නා බෙදා කා මේ නියායෙන් මළුන් සයදෙනාගේ බිරිඳන්ගේ මස් කා සත්වෙනි දවස් බෝධිසත්වයන්ගේ භාර්යාවන් මරන්නට වන්නාහ. එවිට බෝධිසත්වයෝ මරන්නනෝ ඇයිද අද දවස කන්ට මස්දෙමි කීයා පළමුතිබූ මස් කොටස් දී මේ මස් කොටස් අදටකව සෙට දවසට පුළුවන්වේදැයි අස්වසා රෑ මළුන් සදෙනා නිදන්නට වන් වෙලේ මේවිට මාගේ භාර්යාව ගලවාගනිමි සිතා භාර්යාව අතඅල්වා ගෙණ නික්මුණහ. ඒ කියන ස්ත්‍රියත් යානොහෙමි කිහෙයින් කරඉඳුවාගෙණ නික්මුණාහ. මේ නියායෙන් රාත්‍රිය මුළුල්ලේ ගමන් කොට උදෑසන නික්මෙන්ට වන් වේලාවට ඉරුරස්මී ශරීරයේ වැදගෙණ පැන්පිපාස අධිකව පැන්බොමි කියන්නා මෙතන පැන් කොයින්දැයි කීවත් පැන්බොමි කියා තත්පරහෙයින් දකුණු උරපලා ඉන් වෑහෙන්නා වූ ලේධාරා බොවයි සලස්වා ඒ නියායෙන් ලේ බී සන්තර්පිත වූ බිසවුන් ඇරගෙන ගඟක් සමීපයට පැමිණ ඒ ගඟින් පැන් බී නා සන්තර්පිතව වනයට වැද පන්සලක් කොටගෙණ පලාඵලකා පැවිදිව දවස් අරණාහ. එසමයෙහි ඒ ගන්තෙර ඉස නුවරෙක රජ්ජුරු කෙණෙක් රාජ්‍යය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ට රාජද්‍රෝහකළ එක් සොරකු අත පය කන් නාසා කපා ඔරුවක් පිටලා යටිහන් බලා අලහ. ඒ කොටාදීයේදී මුරගාගණ යන්නේ බෝධිසත්වයන් වසන්නා වූ පන්සල සමීපයට පැමිණියේය. බෝධිසත්වයෝත් මොරගාගෙණ දියෙහි යන්නාවූන් දැක ඔහු කෙරේ කරුණාවෙන් ඔහුකරා අවුත් දියෙන් ගොඩලා පන්සලට ගෙණගොස් මැස්සක් බැඳ එහි ඔහුලා අත පය ආදීවූ දෙය කසට පැනින් සෝධා බෙහෙත් කරන්නාහ. බෝධිසත්වයන්ගේ බිසව මේ කොටා ගෙණායේ කුමටදැයි බෝධිසත්වයන්ට දොඩා කොටාකරේ පිළිකුල්ව දශවිටම කෙලගසා දමා ඉඳිනාහ. එසේද මංහිඳිත් බෝධිසත්වයෝ කළමනා පිළියමින් අඩුවක් නොකොට නොබෝදවසකින්ම වනය සුවකළහ. වන ගුණකොට ඒ කොටා හා බිසවුන් පන්සල සතප්පවා බෝධිසත්වයෝ පලා පළු කඩා ගෙණවිත් දෙන්නාම රක්නාහ. මේ නියායෙන් කල්යාමක් යත්, කොටාකෙරේ බිසවුන් බිළිබඳ සිත් ඇතිව ලොකස්වාද රතියෙන් යෙදී දවස් අරන්නාහු බෝධිසත්වයන් කෙරේ පිළිබඳ සිත් මදව බෝධිසත්වයන් මරන්ට උත්සාහ සිතා එක් දවසක් බෝධිසත්වයන් ආ වෙලාවට සොර ලෙඩක්ගෙණ වකුටු ගසාගෙණ නිදා කියන්නාහූ ස්වාමිනි නුඹවහන්සේ හං වැලිකතර එමින් සිට මේ පර්වතය දැක සැපසේ අපි වාසය කරමෝනම් පිදේනි යක් පුදමි කියා ආරාධනා කෙළෙමි. ඒ දෙවතාවා රෑ සිනෙන් පෙනී බොහෝ හයගන්වයි එසේ හෙයින් ඒ දෙවතාවාට බලි පූජාවක් කළොත් යහපතැයි කීහ. එබස් බෝධිසත්වයෝ අසා සැබෑදෙයෙකැයි සිතා ඒ නියාවට පිදේනී සෂයාගෙණ බිසවුන් සමග පර්වතයට නැංගාහ. එවිට බිසවුන් කියන්නාහු ස්වාමීනි මේ දෙවතාවන් වහන්සේ එසේ මෙසේ දේවතාන කෙණෙකුන් වහන්සේ නෙවෙයි. එසේ හෙයින් නුඹවහන්සේ පළමුකොට වනමලින් පූජාකොට තුන්විටක් ප්‍රදක්ෂිණා කොට වැඳසිට ආරාධනා කොට ඉක්බිති බත් පූජා කෙරම්හයි කියා ඒ නියාවට බෝධිසත්වයෝ යහපතැයි ගිවිස වනමල් පුදා තුන්විටෙක ප්‍රදක්ෂිණා කොට සෙල සමීපයට ආකල ඕ තොමෝ බෝධිසත්වයන් පස්සෙහි සිට බෝධිසත්වයන්ගේ අවසර බලා පිටිකරගසා බෝධිසත්වයන් සෙලින් පහත හෙළුය. බෝධි සත්වයෝ වැයෙන්නහුම් කටුනැත්තාවූ කැලයෙන් ගැවසීගත්තාවූ මගදිඹුල් ගසෙක වැටුනාහ, බෝධිසත්වයෝ දිඹුල් ගස මහත්හෙයින් බසින්ට බැරිව දිඹුල් කා ඒ ගසේම උන්නාහ. එසමයෙහි මහත් වූ ශරීරයක් ඇති ගොයෙක් බෝධිසත්වයන් උන් සමීපයට අවුත් දිඹුල් කන්නේය. බෝධිසත්වයන් දැක හයින් පලාගොසින් දෙවැනි දවස සැඟවී ගොදුරු කා පසුව සැක ඇරී බෝධිසත්වයන් හා පුරුදුව කියන්නෝ සත්දවස එකතැන කොයිත් නොගොසින් ගසම් ඉන්නේ කුමක් නිසාදැයි විචාරන්නා තමන් ප්‍රවෘත්ති කියාගෙන ගොයානන් විසින් තොපි නොබසයි අස්වසා ගසට නැගී මාපිට හිඳුවයි සලස්වා ගසින් බිමට බස්වා බිම සිටුවා වලට යන්නාහ. බෝධිසත්වයොත් මග ශස්සේ ගොසින් එක් පියවර ගමකට

SANHIDA LANKA

පැමිණ ඒ ගම වාසයකරන්නාහු පියානන් වහන්සේ මළපවත් අසා රාජ්‍යයට අවුත් රාජ්‍යයට පැමිණ දවස සලක්ෂයක් වස්තු වියදන් කොට දන්හල් කරවා දන්දි දැහැමින් සෙමින් රාජ්‍යය කරන්නාහ. එසමයෙහි බිසව හා කොටාත් පිටිසර අවුත් කොටු ඉසබාතගාගෙණ සිඟාකන්නාහ. බොහෝදෙනා බිසවුන් දැක මූ නුඹට කුමක් වේදැයි විචාළකල මාගේ නැදිමයිල් සරණහෙයින් පාවාදී බාලදාපටන් ප්‍රියකරු ස්වාමි පුත්‍රයාය. එසේ හෙයින් මුන් දුකට පැමිණයත් අත්හරින්නේ කෙසේදැයි අත් නොහැර ඇවිදිමි කියන්නාහු එබස් ඇසූ බොහෝදෙනා මුන් කියන්නේ ඇත්තකයැයි සිතා උන්ට කැඳබත් ආදිවූදෙය බොහො කොට දුන්නාහ. එකියන බිසවු දුටු බොහෝ මනුශ්‍යයෝ තොප මෙසේ දුක් විඳින්නේ ඇයිද මහපදුම රජ්ජුරුවන් වහන්සේ දන්හල්කරවා බොහෝ යාචයන්ට දන්දෙන්නාහ. උන්වහන්සේගේ දන්හලට ගොස් දන් කා දවසරුවයි කීහ. එබස් අසායහපතැයි ගිවිස බරණැස් නුවරට අවුත් දන්හල් දක්නට වන්නාහ. බෝධිසත්වයෝත් එක්දවසක් දන්හල් බලා ගොස් කීපදෙනකුට තමන් අතින් දන් දී සෙස්සන්ට මෙලෙසම දන්දෙවයි කියා ඇතුපිට නැගී නික්මුණාහ. බිසව් කොටා ඉසතබාගෙණ දන් කා යන්නාවුන් හා කැටිව නික්මුණාහ. රජ්ජුරුවෝ බිසවුන් හා කොටු දැක ඇඳිනගෙණ ලඟට ගෙන්වා කොටු බිම්බා තමා තොප කවුරුන්දැයි විචාළහ. බිසෝ සැකනැතිව කියන්නාහූ මාගේ නැදිමයිල් සරණ සමනයයි කීහ. එබස් රජ්ජුරුවෝ අසා ඇත්තමදැයි විචාරන්නා එසේය නිර්භීතව කී හෙයින් බොහො දෙනා ඊට සතුටු වූහ. රජ්ජුරුවෝ කියන්නාහු තොපගේ පියානන් අසවල් රජ්ජුරුවන්වුව, තොපගේ මෑනියන් අසවල් වුව. තෙපි අසවල් රාජකුමාරිකාව, තොපි පිස කැවු මගාපදුම කුමාරයානන් මම වුව, මෙසේ වූ කොට තොපට කෙසේ නැදිමයිල් සරණ සමණයෝද. ඇයි තෙපි මා මැලැයි සිතා නලලත් තිබාගෙණ අවුදැයි කියා අමාත්‍යයන්ට කියන්නාහූ අමාත්‍යයෙනි මා විසින් තොප ඇමට කියන ලද්දේ පළමුවෙන් නෙවේද අප සත්බෑයන් වැලිකතර පැමිණ නියාවත් සබෑයන් උනුගෙන් අඹුදරුවන් මරා මස් කෑදීම මුන් ගලවාගෙණ උරය පලා ලේ දී පැන් පිපාස නිවා මුන් සතප්පවූ නියාවත් කොටා දියෙහි අත්පා කපා දමාපු ගමනේ මුරාගෙණ යන තැනැත්තහු මා විසින් ගොඩලාගෙන දැක බේත් කොට රැකී නියාවත් මේ බිසවුන් කොටාකෙරේ සිත් බැඳි පර්වතයෙන් මා එළු නියාවත් මා දිඹුල්ගසට වැටී ගොයානන් විසින් බිමට බා අවුත් රාජජයට පැමිණ නියාවත් යන සියල්ලම තොපි ඇමට මා විසින් පළමු කියන ලද්දේ වේද ඒ කියන බිසව නම් මෙබිසවය. එකියන කොටානම් මේ කොටාය. ඒ ගලින් එළු පදුම කුමාරයයෝ නම් මම්මය. එසේ හෙයින් මළ මිනියක් හා සමාන කොටාත් පොළු මුගුරු බා තලා සුනුවිසුනු කොට පියව මෑත් කන්නාසා කපාපියවයි කෝපයෙන් කියා නැවත කෝප සන්සිඳි යාපත් පැසක කොටලා බිසවුන්ගේ ඉස හා එක්ව අයා බන්දා මේ නුවර ඉන්දනොදි පිටිනුවර ලවවයි යවුහයි වදාරා මේ චුල්ල පදුම ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි මල්ලු සත්දෙනා නම් බුද්ධවල්ලභ වූ මහතෙරවරුය. බිසව නම් චිංචිමානවිකාය, කොටා නම් දේවදත්ත ස්ථවිරයෝය. ගොයානම් ආනන්ද ස්ථිවිරියෝය. පදුම කුමාරව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# මණිචොර ජාතකය

තවද ත්‍රිභුවන තිලකාකාරවූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්තවිරයන් වහන්සේ  බුදුන්ට පැමිණි වදයක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

එක් දවසක් දම් සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ විසින් දේවදත්ත ස්ථවිරියෝ මට වධයොදා උත්සාහ කළ පමණක් මිසක් කින්චිමාත්‍රාවකුත් කොටගත නුහුනුවාහයි යන මේ කථාව කිය කියා උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් දේවදත්ත ස්ථවිරියෝ මට වධයොදා කින්චිමාත්‍රාවකුත් කොටගත නොහැක්කේ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ පිටිසර ගමක ඉපිද බරණැස් නුවරින් කුලස්ත්‍රියක පිසවාගෙණ කන්ට සලස්වා ගත්සේක. එකියන ස්ත්‍රි විසිෂටවූ රූ ඇත්තීය. පඤ්චකල්‍යාණයෙන් යුක්තය. දිව්‍ය ස්ත්‍රියක් හා සමානය කින්නරාංගනාවන්ගේ සොභාධරන්නීය බැලුවන් ප්‍රසාධවන්නීය. ස්වාමිපුත්‍රයාට පතිවෘතා ධර්මය රකින්නේය. ස්වාමිපුත්‍රයාගේ දෙමව්පියන්ට වත් පිළිවෙත් කරන්නීය. එසේ හෙයින් ස්වාමිපුත්‍රයත් ප්‍රියව දවස් අරනේය. එකියන ස්ත්‍රීනම් සුජාතා නම් වන්නීය. එකියන සුජාතා නම් ස්ත්‍රි තමාගේ ස්වාමීපුත්‍රයාට කියන්නී මාගේ දෙමව්පියන් දක්නා නියායෙන් බරණැස් නුවරට යන්ට උවමැනවැයි කිවුය. බෝධිසත්වයෝත් යහපතැයි කියා ගිව්ස දෙමව්පියන් දකින්ට නිසි කැවුම් ආදී දෙය පිසවාගෙණ බෝධිසත්වයෝ රථය ඉදිරියේ පදිනාහුය, බෝධි සත්වයන්ගේ භාර්යාව වූ සුජාතාවෝ විසිතුරුව සැරහී යහපත් මනාවූ වස්ත්‍රයක් හැඳ රථයේ උන්නාහ, මේ නියායෙන් නුවරට වැද නුවර මධ්‍යයෙන් රථය පැද යන්නාහ. ඒ වෙලාවට බරණැස් රජ්ජුරුවෝ මහත් වූ පෙළහරින් ඇත් කඳට පැනනැගී නුවර ප්‍රදක්ෂිණා කොට යන්නාහුය. ඒ වෙලාවට බෝධිසත්වයන්ගේ බිසවුන් රථයෙන් බැස හංසලීලායෙන් රථය පසුපස්සේ ගමන් කරන්නට වන්නාහ, රජ්ජුරුවෝ ඒ විසිතුරු රූපශ්‍රිය දැක පිළිබඳ සිත් ඇතිව අමාත්‍යයෙකු ලඟට කැඳවා කියන්නාහු තෙලයන්නාවූ ස්ත්‍රිය අස්සවාමිකද සස්සාමිකදැයි විචරා එවයි කියා අමාත්‍යයා යවුය. ඒ අමාත්‍යයා ඒ ස්ත්‍රිය අතින් විචාරා ගෙණ ගොස් රජ්ජුරුවන්ට කියන්නනේ දෙවයෙනි රථයේ ඉන්නා පුරුෂයා තෙල ස්ත්‍රියගේ පුරුෂයායයි කීහ. එබස් රජ්ජුරුවවෝ අසා පිළිබඳ සිත් ඇරගත නොයෙන්නාහූ යම්සේ මේ පුරුෂයා උපායකින් නසාවුවත් මෑ ඇරගත මැනවයි සිතා එතන සිටි අමාත්‍යයකුට කියන්නාහූ තෝ චූඩා මාණික්‍යය ඇරගෙණ ගොස් අර පදිනා රථයෙහි ලා එවයි කියා යවුය. පුරුෂයාත් එලෙසම කොට රජ්ජුරුවන්ට එපවත් කියා රජ්ජුරුවෝත් එපවත් අසා මාගේ චුඩාමානික්‍යය අපවත්ව ගියේයයි අමාත්‍යයන් ට ඇසෙන සැටියේ කීහ. අමාත්‍යයෝ ඒ අසා ඒ ඒ වාසල් රැකවල්ලවා නුවර මුළුල්ල ඇලලී ඒ ඒ තැන දිවපනින්ට වන්නාහ, ඒ වෙලාවට මැණික රථයේ ලූ පුරුෂතෙමෙත් මිනිස් මොත්තමක් ඇරගෙණ පුරුෂයාගේ රථය බලන්ට උවමැනැවයි කියා රථයේ තුබූ මැණික ඇරගෙණ මේ පුරුෂයා සොරායයි කියා මරාතලා පිටි තොලහයා බැඳ ගෙණගොස් ස්වාමිනි මෙවෙද මැණික් සොරායයි කිහ. එවිට රජ්ජුරුවෝත් නොවිචාරාම ඉස කපාපිය වයි කීහ. එපවත් ඇසු රාජපුරුෂයෝ බෝධිසත්වයන් කෝපයෙන් කෝපයට ගෙන ගොස් දහස්ගණන් ගෙඩිගසා දකුණුවාසල් දොරකඩින් ඇරගෙණ ගොස් බෝධිසත්වයන් උඩුබල්ව වැදහොවා ඉසකපන්ට වන්නාහ, ඒ දුටු බෝධිසත්වයන්ගේ භාර්යාවෝ පසු පස්සේ අඬාගෙණ ගොස් බෝධිසත්වයන්ගේ ඉස කපන්ට ඔසවාගත් පොරව දැක කියන්නාහූ අනේ ස්වාමිනි මා නිසා නුඹ වහන්සේට මෙබඳු දුකෙක් පැමිණියේවේද නුඹ වහන්සේ වැනිවූ නිරපරාධීන්ටත් මෙවැනි පාටොව සැලසෙන්නටවත් මම ඒකාන්තයෙන් නුඹ වහන්සේට පතිවෘතා ධර්මය රැක්කේ නම් යම්සේ මෙලෝ රක්නා දේවතා කෙණෙක් ඇත්නම් ලෝකනිර්මාණ කළාවූ බ්‍රහ්මයා මේ සක්වල ඇත්නම්  රජ්ජුරුවන් කරන්නාවූ නොකට යුත්ත වලක්වා ගණුවයි දේවතා කෙණෙකුන් නැති හෙයින් වෙද නොවැලකුනේ වේදැයි සිතහ. එවිට පතිවෘතවූ සුජාතාවන් සිතූ සිතිවිල්ලෙන් ශක්‍රයාගේ පාන්ඩුකම්බල ශෛලාසනය උණුවිය. එවිට සක්‍රයෝ දහසක් නුවනැසින් මාගේ ශක්‍රසම්පත් උදුරාගන්නා කෙණෙක් ඇද්දෝ හෝයි සිතා බැලූහ.  ශක්‍රදේවේන්ද්‍රයෝ මේ කාරණය දැක මා එතනට යායුතුයයි සිතා අප්‍රසිද්ධ වේශයෙන් එතනට අවුත් දන්ගෙඩියට පැමිණ බෝධිසත්වයන් සර්වාලංකාරයෙන් සරහා ඇතුපිට වඩා හිඳුවා ඇතු පිටි උන් රජ්ජුරුවන් ක්ෂණයකින් දන්ගෙඩියේ වැදහෙවා බෝධිසත්වයන්ට ඔසවා ගත්තාවූ පොරව රජ්ජුරුවන්ගේ ඉස කපා වෙන්කළ පසු

SANHIDA LANKA

බරණැස් රජ්ජුරුවනැයි දන්හ.

ශක්‍රයෝ තමන්ගේ ශක්‍රානුභාවයෙන් ආකාශයෙහි සිටියාහ. බ්‍රහමණ ග්‍රහපති ආදීවු බොහෝ මනුෂ්‍යයෝ ශක්‍රයන් විසින් අසත්පුරුෂ රජ්ජුරුවන් මරා ධර්මිෂ්ට රජ්ජුරුකෙණෙකුන් අපට සලස්වන ලදැයි සතුටු වූහ. ශක්‍රයෝ අකාශයෙහි සිට ඒ පුරුෂයාට ඔටුනුපලඳවා සුජාතාවන්ට අග්‍රමහෙසිකා පට බන්දා ශක්‍රයෝ කියන්නාහු අසත්පුරුෂ රජ්ජුරුවන් රාජ්‍යය කරණ සමයෙහි නොකල වැසි වසින්නේය කලට වැසි නොවසින්නේය දුර්භික්ෂ භය චොර භව ආදීවූ භය උපදිනේය. එසේ වූ රජ දරුවෝ ඉන්නදා අයස හා අප කිර්ති අසන්නාහ, මළකලත් සතර අපායේ දුකිවිදිනාහයි කියා ශක්‍රදේවෙන්ද්‍රයෝ දිව්‍යලෝකයට ගියෝය. බෝධිසත්වයෝ දැහැමෙන් සෙමෙන් රාජ්‍යයකොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ මණිචෝර ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# පර්වතුත්ථ ජාතකය

තවද කරුණානිධාන වූ ස්ර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොසොල් රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද

ඒ කෙසේද යත්

කොසොල් රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට අමාත්‍යයන් ද්‍රෝහ කළේයයි රජ්ජුරුවෝ අසා තුමුත් ඒ නියාවට පරීක්ෂාකොට ඇත්තබව නියමකොටත් බුදුන් විචාරා මුන්ට ආඥා කෙරෙමි සිතා බුදුන්කරා ගොස් කියන්නාහු ස්වාමීනි අන්තඃපුරයට එක්තරා අමාත්‍යයෙක් ද්‍රෝහ කෙළේය. උහුට කළමනා කිම්දැයි බුදුන් විචාළාහ. සර්වඥයෝත් ඒ අමාත්‍යයෝ තොපට වැඩ පස්සන අමාත්‍යයෙක්ද ස්ත්‍රීයත් තොපට ප්‍රියවූ ස්ත්‍රියක්දැයි විචාරා රජ්ජුරුවන් විසින් ස්වාමීනි අමාත්‍යයෝ එකියන ස්ත්‍රීන් මට ප්‍රියකරු ස්ත්‍රීයයි කීහ. එබස් සර්වඥයෝ අසා අමාත්‍යයාත් වැඩ පස්නා කල ස්ත්‍රීයත් ප්‍රියකරු ස්ත්‍රිය කළ ක්‍ෂමා කිරීම යාපතැයි කියා වදාරා පෙරත් මෙසේම පුරද්‍රොහ කළවුන්ගේ සැලැස්ම නුවනැත්තන් විසින් විචාරන්නා ඊට කාරණා කිවෝ වේදැයි වදාරා ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන ලද අමාත්‍යව උපන්සේක, බරණැස් රජ්ජුරුවන්ගේ එක්තරා අමාත්‍යයෙක් අන්තඃපුරයට ද්‍රෝහකළේයයි අසා තුමුත් ප්‍රත්‍යක්ෂව දක අමාත්‍යයන් මට වල්ලභයයි සියළු කටයුත්තෙහි නියුක්ත වූ අමාත්‍යයාය ස්ත්‍රීන් මා පියකරු ස්ත්‍රිය එසේ හෙයින් මේ කටයුත්ත මාගේ පණ්ඩිත අමාත්‍යයා අතින් ප්‍රශ්න යක් කොට විචාරා අඥා කරමි සිතා අමාත්‍යයන් ගෙන්වා ආසනේක හිඳුවා කියන්නාහු ප්‍රශ්ණයක් කියම් විසඳවයි කිහ. යහපතැයි දේවයන් වහන්ස යයි කියන්නා විසඳමි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාවහු යම් පර්වත පාර්ෂවයෙක පස් පියුමින් සැදුනු විලක් සමීපයෙහි සිංහයෙක් වාසය කෙරෙයි සිංහයාගෙන් ආරක්ෂාව තිබූ විල පැන් කැනහිලෙක් ඉඳුල් කෙළේය. එපැන් දමාපියයුතුද නොදමාපිය යුතුදැයි කිහ. එබස් බෝධි සත්වයෝ ඇසූගමනේම බෝධිසත්වයෝ අන්තඃපුරයට වැරදුනැයි  සිතා කියන්නාහූ මහරජ්ජුරුවන් වහන්ස නොයෙක් සිව්පාවන් ගංගාවට බැස පැන් බොති ඒ පැන් ඉඳූලක් නැත්තේය. එමෙන් රජ්ජුරුවන් වහන්ස බිසවුන් වහන්සේ හළ නොහැක්ක! එසේ හෙයින් අමාත්‍යයා හා බිසවුන් වහන්සේට ප්‍රියවී නම් ආඥා නොකලමැනවයි කීහ. රජ්ජුරුවෝත් කෝප සංසිඳි අමාත්‍යයා හා බිසවුන්ට ඉනිබ්බේ මෙසේ නොකටයුත්තක් කළානම් දන්නමෝ වේදැයි භයගන්වා කීහ. එතැන්පටන් එසේ වූ නොකටයුත්තක් නොකළාහයි වදාරා පර්වතුත්ථ ජාතකය නිමවා වදාළසේකි.  කොසොල් රජ්ජුරුවන්ගේ අමාත්‍යයන් හා බිසවුන් හා දෙදෙනා සර්වඥයන් වහන්සේ ඇසූතැන් පටන් එසේ වූ නොකට යුත්තක් නොකළාහ. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරියෝය. පණ්ඩිත අමාත්‍යයෝ නම් බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# වලාහක ජාතකය

තවද කරුණානිධාන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා ස්ත්‍රියක් කෙරෙහි පිළිබඳ සිත් ඇති භික්ෂූන් කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

හේ කෙසේද යත්

එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ ස්ත්‍රීයක් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව වාසය කෙරෙති සර්වඥයන් වහන්සේ ඒ අසා සැබෑද මහණ ස්ත්‍රියක් කෙරෙහි තා පිළිබඳ සිත් ඇත්තේදැයි විචාළ සේක. සැබෑවයි ස්වාමීනි කියන්නා මහණ ස්ත්‍රීන් කෙරේ පිළිබඳවීමෙන් යකින්නන් අතට පැමිණ වෙළඳු පන්සියයමෙන් දුකට පැමිණෙන්නේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස තාම්බ්‍රපණ්ඩිපයෙහි තම්මැන්නා නුවර යක්ෂ පුරයක් මවාගෙන බොහෝ යකින්නෝ වාසය කරන්නාහ. ඒසමයෙහි ඒ යකින්නෝ තමන්ගේ තම්මැන්නාවට පඩව් පාරූ නැගී මනුෂ්‍යයන් ආකල උන් හා සමග වාසය කොට අනික් වෙළඳකෙණෙකුන් නැව්නැගී ආකලට පළමු සිටියවුන් ඇසිල්ලෙකින්ම නාසා සිරගෙයි ලා උන් කන්නාහ. තම්මැන්නා ඉද්දට නැවෙක් නොආනම් නාගදිවයින පටන් කැළණිය දක්වා මේ අන්තරා කඩයේ කඩක්කරේ ඇවිද දුටු නැවෙක් ඇත්නම් අල්වා කන්නාහ. මේ නියායෙන් දවස් හරණා සමයෙහි වෙළෙන්දෝ පන්සියයෙක් නැව් නැගී යන්නාහුය තාම්බ්‍රපර්ණි දිවයිනට පාවශියහ. එවිට යකින්නෝ තම තමන්ගේ වාසස්ථානයට මනුෂ්‍යයන් ඇති ස්ථානයක් මෙන් වප් වැපිරීම් සිසෑම් හා බල්ලන් කුකුලන් ආදීවූවන්ගේ නොයෙක් වෙස් මවා පෑහ. මනුෂ්‍යයන් ඇති ගමෙකැයි සිතා ගොඩබැසපු කල්හි ඒ යකින්නෝ එතැනට අවුත් ඒ වෙළඳුන්ට කන බොන කැවිලි සලස්වා කා බී අන්තයෙහි කියන්නාහු තොප හැම කොයිසිට අවුදැයි විචාරා ඉක්බිති ස්වාමිපුත්‍රයෝ වෙළඳාමට ගියාහ. දැන් තුන්අවුරුද්දක්නේ ආහ. එසේ හෙයින් තොප ඇමත් වෙළඳුන් හෙයින් අප ඇමට ස්වාමි පුත්‍රව ඉඳුවයි කිහ, ඒ නියාවටම ඒ යකින්නෝ තමන් භාවභාව දක්වා තමන් හැමට ලබාගෙන පන්සියයක් වෙළඳුන් තමන් ඇමට සලස්වා ගත්තාහ. නායක වෙළඳාගේ භාර්යාවද රෑ පළාගොස් මිනිකා ඇවිදින් ස්වාමිපුත්‍රයා ලඟම හොත් වේලාවට යකින්න ඇඟ සිසිලස තිබූහෙයින් වෙළෙන්දා මේ කිමෙක්දෝහෝයි පරීක්ෂා කොට මිනී කන නියාව දැන පසුවදවස් උදෑසන වෙළෙඳුන් පන්සියය හා සමග ශරීර කෘත්‍ය කරන්නට ගොසින් නායක වෙළඳෙන්දා කියන්නේ එම්බල මුන් ඇමනම් යකින්නෝය. පළමු උන් පුරුෂයන් අප දැක කාපුහ. ඉතිබ්බේ පලායායුතු යයි කීහ. එවිට ඉන් දෙසිය පණසෙක් මේ කුමණ බසෙක්ද මෙසේවූ දිව්‍යාංගනාවන් හා සමාන ස්ත්‍රියන් ඇරපියා අපි යානොහෙමැයි කියා රැඳුනාහ. දෙසියපණසෙක් අපි ගැලවීයන්නේ කෙසේදැයි සිත සිතා මුදු වැල්ලේ ඇවිදිනාහ එකලට බෝධිසත්වයන් වහන්සේ හිමාලය වනයෙහි අජානීය සෛන්ධව ඉපිද කවුඩුවන්ගේ පැහැය හා සමාන වූ මුහුණක් හා ඉන්ද්‍රනීල මාණික්‍යයමය වූ කෙස්වැටියක් හා පෙළපු පුළුන් හා සමාන ධවල වූ පෑයක් ඇතිව ආකාශයෙන් යන්නාවූ සෘද්ධි ඇතිව දවස් පතා තම්මැන්නාව සමීපයෙහි විලෙක සයංජාත ඇල් කා යනවිටෙක මා හා දඹදිවට යන්නෝ ඇද්දැයි අඬගා යන්නාහ. එසේ අඬගෑකලට ඒ මිනිස් දෙසියපණස එතැනට අවුත් අපි යම්හයි දොහොත් මුදුනේ තමාගෙන කීවාහ, එවිට බෝධිසත්වයෝ බිමට බැස පිටහිඳුව ගෙණ වල්ගසේ එල්ලනුන් වල්ගයේ එල්වාගෙණ සෙස්සන් ඔහුගේ ආනාභාවයෙන් ඇරගෙණ ආකාශයට නැගී දඹදිවට ගොස් උන් උන්ගේ වාසස්ථානයට සලස්වා බෝධිසත්වයෝ තමන්ගේ හිමාලයවනයට ගියාහ. සර්වඥයන් වහන්සේත් මහණෙනි යම් භික්ෂූනි කෙණෙක් උපාසක උපාසිකාකෙණෙක් සිව්වනක් පර්ෂිදෙන් යම්කෙණෙක් ස්ත්‍රීවිෂයෙහි ලෝභවූනම් පඤ්චවිධ වූ වදවිඳිනාහ. පඤ්චවිධ වූ වධය නම් කවරේද යත් අත් කැපීම එකෙක, කන් නාසා කැපීම එකෙක මාපට ඇඟිල්ල කැපීම එකෙක උරය කැපීම එකෙක ඉස කැසීම එකෙක යන පඤ්චවිධ වූ වධ විඳිනාහුය. නරකාදී වූ සතර අපායෙත් බොහෝ දුක් විඳිනා හයි වදාරා නැවත වදාරණ සර්වඥයන් වහන්සේ මහණෙනි යම්කෙණෙක් සර්වඥයන් වහන්සේගේ බස් නොඅසා ස්ත්‍රීවිෂයෙහි තමන් සිතූ සැටියේ වාසය කෙරෙන්නම් නායක වෙළෙන්දාගේ බස් නොඅසා යකින්නට ගොදුරුවූ වෙළඳුන් දෙසියපණස හා සමවන්නාහ. යම් කෙණෙක් සර්වඥයන් වහන්සේගේ බස් ගිවිස එසේ වූ කටයුත්ත ඇරපුනම් අස්වසා නායක වෙළඳුන්ගේ බස් ගිවිස ගැලවිගිය වෙළඳුන් දෙසිය පණස හා සමවන්නායෙහි දිව්‍යලෝකයෙහි හා සොලොස් බඹ ලොවින් වින්දමනා සම්පත් විඳිනාහයි කියා අමාමහ නිවන් දැක්වීමෙන් මේ ධර්ම දේශනාව කුළුගන්වා මේ ජාතකය චතුසත්ත්‍යය ප්‍රකාශ කිරීමෙන් මේ ධර්මදේශනාව නිමවා වදාළ සේක. මේ ජාතකාවසානයෙහි ඒ භික්ෂූන් වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටි සේක. එසමයෙහි බෝධිසත්වයන් වහන්සේගේ අවවාද ගිවිස වෙළඳ පුත්‍රයෝ දෙසිය පණස නම් බුදු පිරිසය, අශ්වව උපන්නේ නම් ලොව්තුරා බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# ගෘහපති ජාතකය

තවද කරුණාවට වාසස්ථාන වූ සර්වඥයන් වහන්සේ උකටලීවූ භික්ෂුවක් දක්වූ කල්හි මහණ ස්ත්‍රීන් කෙරේ පිළිබඳවීම යහපත් නොවෙයි පෙරත් ස්ත්‍රීන් කෙරේ පිළිබඳව දුක්වූයේ නොවේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාල සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ පිටිසර ගමෙක ගොවිව උපන් සේක. ගම්මුදලියා බෝධිසත්වයන්ගේ භාර්යාව කෙරේ පිළිබඳව දවස් අරණේය. බෝධිසත්වයෝ ඒ සංකාව දැන අල්වන්ට උත්සහ කරන්නාහ. එසමයෙහි සිතනා කාලය පැමිණ බොහෝ ගොවි තමන් බිජුවට වපුළාභ වසුට බත්සායව කටුසර කා දවසරිනාහු ගොයම්බඩ අවදියෙහි ගොවින් එක්ව ගම්මුදලින් කරා ගොස් කියන්නාහු ගම්මුදලිනි දෙමසක් විතර ගියකල ගොයම්දා මඩුම්හ, ඒ දා මැඩිකල නුඹ වහන්සේට වී දෙම්හ. දැන් අපට කන්න මාළු ගොනෙකු දෙන්ට උවමැනවයි කියා ඇරගෙණ මරා කාපුහ. එවිට කීප දවසක් ගම්මුදියා බෝධි සත්වයන් ගෙයින් ගිය නියාව දැන ගෙට අවුත් වැද ඉන්නා වෙලාවට බෝධි සත්වයන් ගොසින් ගිය නියාව දැන ගෙට අවුත් වැද ඉන්නා වෙලාවට බෝධිසත්වයෝත් පෙරලා ගෙට එන්නට වන්නාහ. බෝධිසත්වයන්ගේ භාර්යාවත් ඒ දැක ගැලවී යන උපායක් නොදැක ගම්මුදලියාට කියන්නාහු නුඹ වහන්සේගේ මධ්‍යයේ සිට වී දෙවයි කිය මැනව, මම අටුයේ සිට වී නැතැයි කියම් කියා සිටි වෙලාවට බෝධිසත්වයෝ ගෙට අවුත් දෙන්නාගේ කාරණා දැක කියන්නාහු මේ මා වංචාකරණ ප්‍රයෝගයකැයි සිතා බෝධිසත්වයෝ ඇයි ගම්මුදලියා තොප විසින් ගොණා දුන්නේ දෙමසකින් වී දෙන්ටවුව, දෙපෝයකුත් නොගිසින් ඉන්දදී දැන් කුමන විද ඉල්ලන්නේයයි කියකියා තීත් කෙටුවේ වී නැති නියාව දැන දැන තොප කියන්නේ කුමන වියක්දැයි කියා ඇයි ගම්මුදලිනි තොප ගම්මුදලිකම් කරමැයි කියා අනුන්ගේ භාර්යාව හා කථා කරන්නට කාරණ කිම්දැයි ඉසකේ පත අල්වා හෙළා යහපත් කොට ඇන පිටිකරතලා බොටුව අල්වා දමාපිහ. ඒ ස්ත්‍රියද කොටුවෙන් බාගෙණ ඇගේ ඉසකේ පත අල්වා බිම හෙළාගෙණ ඇණ මරා තලා ඉතිබ්බේ මෙසේ වූ වැරැද්දක් නොකර වයි කියා භය ගැන්වූහ. එවක් පටන් ගම්මුදලියා ඒ ගේ දිසාව බලන්නාක් නොකළේය. ස්ත්‍රීන් එසේ වූ අතිරහස චිත්තතයෙක් නොසිතුහයි වදාරා මේ ගෘහ පති ජාතකය නිමවා වදාළසේක, එසමයෙහි ගෙවිව උපන්නෙම් බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සාධුසීල ජාතකය

තවද කරුණා සමුද්‍රවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද

ඒ කෙසේද යත්

එක්තරා බ්‍රහ්මණයෙකුගේ දූ සතරදෙනෙක් ඇත්හ. දූන් සතරදෙනා ප්‍රාර්ථනා කරන්නාවූ පුරුෂයෝ සතරදෙනෙක් ඇත්තාහ. ඒ පුරුෂයන් සතර දෙනාගෙන් එකෙක් රූපත්ව ඉඳිය. එකෙක් වයොවෘද්ධව ඉඳිය. එකෙක් ජාති සම්පන්නව ඉඳිය. එකෙක් සිල්වත් ගුණවත්ව ඉඳිය බ්‍රාහ්මණයාත් මේ කියන සතරදෙනාගෙන් කට මාගේ දූන් දෙන්දැයි සිතා තමන්ට නොදැනෙන පමණක් විනා පෙර නුවණැත්තෝ ඒ කාරණය තට කීවෝ වේදැයි වදාරා බ්‍රහ්මණයා විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එම නුවර බ්‍රාහ්මණ කුලයක ඉපිද දිසාපාමොක් ආචාරීන්ව දවස් අරණ සේක. එසමයෙහි එක්තරා බ්‍රහ්මණයකුගේ දූ සතර දෙනෙක් ඇත්තාහ. ඒ පුරුෂයන් සතර දෙනාගෙන් එකෙක් රූපත්ව දිනේය. එකෙක් වයොවෘද්දව හිඳිනේය. එකෙක් ජාතිසම්පන්නව ඉඳිනේය. එකෙක් සිල්වත් ගුණවත් වන්නේය, මේ කියන සතරදෙනා බ්‍රාහ්මණයා විසින් ගෙන්වා කාටදෙන්දෝහෝයි සිතාතමන් නොදන්නා හෙයින් බ්‍රාහ්මණයා දිසාපාමොක් ආචාරීන් ලඟට ගොස් එපවත්කීය. එවිට දිසාපාමොක් ආචාරීන් කියන්නාහු බ්‍රාහ්මණය රූඇත්තාවුන්ට දීම යහපත, වයෝවෘද්ධයන්ට දීමත් යහපත, වංශවතුන්ට දීමත් යහපත, එසේ වූවත් සිල්වතුන්ට දීම උත්තමයයි කීහ. බ්‍රාහ්මණය සිල්වත් පුරුෂයාට තමන් දූන් සතර දෙනාම දුන්නමැනවයි වදාරා සාධු සීල ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි බ්‍රාහ්මණයා නම් මෙසමයෙහිත් බ්‍රාහ්මණයාය දිසාපාමොක් ආචාරීනම් බුදුවූ මම්මයයි වදාළ සේක. ඒ බණ අවසානයෙහි බ්‍රාහ්මණයා දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් මර්ගයට පැමිණියේය.

SANHIDA LANKA

# බන්ධනාගාර ජාතකය

තවද කරුණාපුජාහි වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බන්ධනයක් අරභයා මේ ජාතකය දක්වන ලද,

හේ කෙසේද යත්

එක් සමයෙක්හි උමන්පැහැර මත්පහරණ සොරුන්ද මිනිමරණ සොරුන්ද මේ කියන සොරුන් අල්වා රජ්ජුරුවන්ට පෑහ. රජ්ජුරුවෝත් ඒ සොරුන් දඬුකන්තලයෙලිම පිටිතොලහයාබැඳිම දම්ලාමැසීම් ආදීවූ බොහෝ බන්ධනයට පමුණුවා හිරගෙයි ලැව්වාහ, එකල පිටිසර සිට වහන්ද නමක් සැවැත් නුවරට වැඩිසේක් මේ බන්ධනාගාරයට පැමිණියා වූ මනුෂ්‍යයන් දැක එපවත් සර්වඥයන් වහන්සේට වැඳ සැලකොට ඉක්බිති ස්වාමිනි බන්ධනයට පැමිණි මනුෂ්‍යයන් මෙසේ වූ බන්ධනයට වඩා අනික් බන්ධනයෙක් පවා ඇද්දයි විචාළසේක. මහණෙනි මේ කුමන බන්ධනයක්ද. පඤ්චකාමවිෂ නැමැත්තා වූ බන්ධනවේද බන්ණිත නම් එසේ වූ බන්ධනයෙන් ගැලවියන්ටවේද බැරිය එසේ වූ බන්ධනයෙන් පවා උත්තමයෝ ගැලවිගියෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ දුප්පත් කුලයක ගොවිව ඉපිද වැඩිවිය පැමිණ කනවැන්දුන් මැනියන්ට අත් පා මැඩීම උනුපැන් සිතිල්පැන් තිබීම ආදී වතාවත් තමන් වහන්සේ තනිවම කරණ සේක. බෝධිසත්වයන්ගේ මැනියෝත් තමන් පුතනුවන් තනිවම දුක්ගන්නා හෙයින් බෝධිසත්වයන්ට නොකියා ඔබ්බෙන් කුලස්ත්‍රියෙකු ගෙන්වා සරණ පාවා දුන්හ. මේ නියායෙන් දවස් අරණ සමයෙහි බෝධිසත්වයන්ගේ මැනියෝ එක්තරා ව්‍යාෂියකින් නටහ. එසමයට බෝධිසත්වයන්ගේ භාර්යාවන් බඩ දරුගැබක් පිහිටියේය. ඒ දරුගැබ පිහිටි නියාව බෝධිසත්වයෝ නොදන හදුව ගිහි ගත් මට කම් නැත. තපසට යෙමි අවසර දෙවයි කීහ. එවිට බෝධිසත්වයන්ගේ ස්ත්‍රී ස්වාමිනි මා බඩ ගර්භයෙක ඒ ගර්භය ප්‍රසූත කල වඩිනේ යහපතැයි කිහ. යහපතැයි රඳා කිරිවපුරා පසු තපසට යන්ට සිතන අවස්ථාවට අනික් දරුගැබෙක් බඩ පිළිසිඳගත, එවිට බෝධිසත්වයෝ සිතන්නාහු මුන්ට කියා අවකාශ ඉල්වාගෙණ යෙමි නම් මූ යානොදෙති. මුන්ට මා නොකියා යායුතු යයි සිතා මධ්‍යම රාත්‍රීවෙලේ හෙයින් නික්ම විරියට බටහ. ඒ වෙලාවට ගම් රැකවල්ලු දැක අල්වාගත්හ, එවිට බෝධිසත්වයෝ කියන්නාහු ඔවුන්ට උපස්ථාන කරන්නාවූ මම අනික් නොකට යුත්තක් නිසා පිටත්වූයෙම් නොවෙයි. හිමාලය වනයට ගොස් තපස් කරන්නට යෙමි සිතා ආම් කියන්නාහු එවිට ගම රැකවල්ලු ඇරපුවාහ. එවිට බෝධි සත්වයෝ එතැනින් ගැලවිසිතන්නාහු මේ වෙලේ නික්මුනොතින් අනික්තෙනක දීත්ඇල්ලුනම් නපුරුයි සිතා ඔබ්බේ ගෙයක රෑ ලැග පාන් වූගමනේ නික්මූනාහු. හිමාලය වනයට වැද සෘෂිප්‍රවජ්‍යාවෙන් පැවැදිව ගිහිබන්ධනයෙන් ගැලවී ගියෙම්යි උපන්නාවූ ප්‍රීති වේගයෙන් උදන්අනන්නාවූ යමසේ සිරදඬුකම්ලැබ මැසීම බැඳීම් ආදී වූ බන්ධනයෙන් ගැලවී ගත ඇකත් මතු මැණික් පුත්‍රදාරාදී හූ පටකාම විෂබන්ධනයෙන් මදි මෙසේ වූ සැපයක් ලදිමි උදන්අනා පංචාභිඥා අෂ්ට සමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයෙහි උපන්නාහයි වදාරා බන්ධනාගාර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි පියානෝ නම් සුද්ධෝදන රජ්ජුරුවෝය, එසමයෙහි මැනියෝ නම් මහාමායා දේවිය, එසමයෙහි බෝධිසත්වයන්ගේ භාර්යාවෝ නම් යශෝධරා දේවිය, පුතනුවෝ නම් බුදුවූ මම්ම යයි වදාළසේක. මේ බණ අවසානයෙහිදි බොහෝ සෝවන් සෙදගැමි අනාගිමී අර්හත් යන සතරඵලයට පැමිණියාහ.

SANHIDA LANKA

# කෙළිසිල ජාතකය

තවද කරුණා ස්වාමිනී සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලකුනන්ටක ලක්වන භද්දිය තෙරුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක.

ඒකෙසේ ද යත්

ලකුන්ටක භද්දිය ස්වාමින් වහන්සේ මහාසෘද්ධි වන්ත සේක. මධුරවූ ධම්මකථික සේක. අවගෝෂරහත් භාවයක් නොවි සිව්පිළිසිඹියාපත් රහත් සේක. ලකුන්ටක භද්ධිය මහතෙර ස්වාමින් දක මිටිව සාමනේර නමක් සේ සිටිනා හෙයින් තිස්ස නම් උන් වහන්සේට ඇයි සාමනේරයෙනි කොයිගියාදැයි සිවුරු ඇඳ ඉස අතගා මේ නියායෙන් උන් වහන්සේ ඇරගෙණ කෙළ ජේතවනාරාමයට වැද සිවුරු ඒ ඒ තැන තැන්පත් කොට තබා බුදුන් සර්වඥයන් විසින් සුවඳක් විචාරා අන්තයෙහි ස්වාමිනි මිහිරිකොට බණ කියන්නාවූ ලකුන්ටක භද්දිය තෙරුන් වහන්සේ කොයිදැයි විචාළසේක. ඇයි මහණෙනි තොප කන්පොත්ත අල්වා ගෙණ කෙළපියා ආයේ ලකුන්කෙ භද්දිය තෙරුන්වහන්සේ වේදැයි වදාළ සේක. එබස් අසා භික්ෂූන් වහන්සේ ඇයි ඉනියා ආනුභාව ඇති මුන් වහන්සේ ලකුන්ටක කෙළිනා රුවක්සේවන්ට කාරණා කිම්දැයි විචාළසේක. සර්වඥයන් වහන්සේ මහණෙනි තුමූ තමන්ට කොටගත්දෙයකැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටිගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ශක්‍රදේවේන්ද්‍රව උපන් සේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ ක්‍රීඩා පරව දවස් අරණාහූ මාළු අසුන් මාළු රථ ඇතමැත ලිබන්දා කඩා වඩා සිනාසී කෙළිනාහ. මැලි ගැනුන් ගෙන්වා බඩපිට ගසා යථා වලි මාහ මාළු මිනිසුන් හා එතයවාපීය. මේ නියායෙන් රජ්ජුරුවන් ගහටකරන්නා දක බොහෝ මනුෂ්‍යයෝ තමතමන්ගේ දෙමව්පියන්ට කරන් නාවූ  මාතෘ උපස්ථානය පීතෘ උපස්ථානය හැර දෙමව්පියන් ඒ ඒ තැන යවාපීය. මේ නියායෙන් ඒ රජ්ජුරුවන් වෘද්ධ පත් හැරගෙණ කෙලිනා හෙයින් අමාත්‍යයෝත් එලෙසම කෙළේය. ඒ නියායෙන් බොහෝ පව්පිරි මනුෂ්‍යයෝ දිව්‍යලෝකයට නොගොස් නරකයෙහිම උපන්නාහ. එවකට ශක්‍රදේවේන්ද්‍රයෝත් තමන්ගේ දිව්‍යභවනයෙහි අමුතුව උපදිනා දිව්‍යපුත්‍රයන් නොදක කුමන කාරණයෙක්දැයි මනුෂ්‍යලෝකය බලන්නාහූ බරණැස් රජ්ජුරුවන් කරන්නාවූ අසද්ධර්මය නිසා නුවරවාස්හුත් එලෙසකොට නරකයෙහි උපදිති කියා දක මා ගොසින් රජ්ජුරුවන්ට අවවාද කිව මැනවැයි සිතා මාළු වෙසයක් මවාගෙණ මාළු රථය ට නැගී මාළු ගොන්දෙන්නෙකු අදිනාලෙස සලසා ගෙණ කිලාන් දෙසැලක් රථයේ තිබාගෙණ මා රජ්ජුරුවන්ට විනා කාටත් නොපෙනේවයි සිතා අධිෂ්ඨාන කොටලා විථියට බටහ, එවෙලාවට රජ්ජුරුවෝත් මහත්වූ අලංකාරයෙන් සැරහී ඇතුපිටට පැන නැගී විථියෙහි නික්ම තමන් ඉදිරියට එන්නාවූ මාළු රථයේ ශක්‍රයන් දක මේ මාල්ලා ඉවතලවයි අමාත්‍යයන්ට කීහ. අමාත්‍යයෝත් තමන්ට නොපෙණෙනහෙයින් කොයිද ස්වාමිනි කියා විචාරන්නාහ. ඒ වෙලාවට ශක්‍රයෝ තමන් පදිනා රථය ඇතුපිට උන් රජ්ජුරුවන්ගේ ඉසමුදුනෙන් රථය පැද ඉස සමීපයට ආකල්හි කිලාන් සැලක් ඉසගසා බිඳපුවාහ. නැවතත් එන අත අනිත් කිලාන් සැල ඉස ගසා බිඳපුවාහ. එවිට රජ්ජුරුවෝ විපිළිසරලෙසට පැමිණියාහ එවෙලෙහි ශක්‍රයෝ ශක්‍රාත්මභාවය මවාගෙණ වජායුද්ධ ගත් අත් ඇතිව අවකාශයෙහි සිට ඇයි රජ්ජුරුවෙනි තොපට මාළුවෙෂය නොපෙණෙන්නාසේ සිතාගෙණ බොහෝ මාළු මිනිසුන් ගහට කොට කෙළින්ට කාරණා කිම්දැයි තොප එක තැනැත්තන් නිසා බොහෝදෙන මාතෘඋපස්ථාන පිතෘඋපස්ථාන හැර තොපම  වැඩි මහල්ලන්ට කරණ ගහටයෙන් බොහෝදෙනා නරකාදි සතර අපායෙහි දුක්විඳින්නාහ. මෙවක්පටන් එසේ මෙසේ අනාචාරකළානම් මේ මාගේ වජ්‍රායුධයෙන් තොපගේ ඉස සත්කඩක්කොට ගසමි භයගන්වා ගියහ. රජ්ජුරුවෝ එවක්පටන් ශක්‍රයන්  කී පරිද්දෙන්ම තමන් මාළු මිනිසුන් හා කැටිව කෙළනාවූ කෙළි නොකෙළිහයි වදාරා මහණෙනි යම්සේ හංසයන් කොස්ලිහිනියන් ආදීවූ  පක්ෂින්ද, ඇතුන් අසුන් ආදීවූ සිව්පාවුන් ඇතුළුවූ සියල්ලෝම සිංහයා කෙරෙහි භය ඇතිව වාසය කෙරෙද්ද එපරිද්දෙන්ම මහණෙනි ලකුන් ටකභද්දිය මහතෙරුන් වහන්සේ කුඩා උවත් උන්ගේ ගුණමහිමවේද බැළුවමැනවැයි වදාරා කෙළිසීන ජාතකය නිමවා වදාළසේකි. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ලකුන්ටක භද්ධියහ, ශක්‍රදේවේන්ද්‍රව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# බන්ධක වර්ත ජාතකය

තවද කරුණානාථ වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සර්පදෂ්ට භික්ෂූන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද, එක් භික්ෂු කෙණෙකුන් වහන්සේ විහාර සමීපයෙහි දරපලමින් සිටිකල එක් වෘක්ෂයෙක වසන්නා වූ සර්පයෙක් අවුත් ඒ භික්ෂූන් වහන්සේ දෂ්ට කෙළේය. එකල ඒ භික්ෂුන් වහන්සේ විෂමූර්ජාවෙන් මළසෙක. ඒකථාව භික්ෂුන්වහන්සේ දම්සභා මණ්ඩපයෙහි කිය කියා උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහාණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා අහිරාජ කුලයට මෛත්‍රී කොට කිසිම අන්තරාවකට නොපැමිණියේය වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බ්‍රාහ්මණව ඉපිද පංචකාමය හැර හිමාලය වනයෙහි ඍෂිප්‍රව්‍රජ්‍යායාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන්ට ගණශාස්තෘව වාසය රකිණසේක. එසමයෙහි බොහෝ සර්පයන්ගෙන් තාපසවරුන් වහන්ස්ට භය පැමිණෙයි එපවත් බොහෝ තාපසවරුන් වහන්සේට කීසේක. උන්වහන්සේලා එපවත් අසා සතරකුලෙහි සර්පයන්ට මෛත්‍රීකරවයි කියන බෝධිසත්වයෝ මේ ජාතකයේ පළමුවෙනි ගාථාව කියනසේක්.

විරූපක්ඛෙහි මෙ මෙත්තං මෙත්තං එරාපථෙහිමෙ

ඡබ්‍යාපුතෙතහි මේ මෙත්තං මෙත්තං කණ්හා ගොතම කෙහිව

යන මේ ගාථාව කිහ. මෙහි අර්ථ මේ මෙත්තං මාගේ මෛත්‍රිය විරූපක්ඛෙහි, විරූපාක්ෂකනම් නාගකුලයන්හාය මේ මේත්තං මාගේ මෛත්‍රීය ඡබ්‍යාපුතේතහි, ඡබ්‍ය පුත්ත නම් නාගකුලයන්හාය මේ මෙත්තං මාගේ මෛත්‍රී කණ්හා ගෝතම කෙහිව, කණහ ගොතමකනම් අහිරාජකුලයන්හායි මෙසේ සතර කුලයන්ය ඉදින් තෙපි මෙවුන්කෙරෙහි මෛත්‍රීකළාහුනම් සර්ව සාපීපද්‍රව නොවන්නේයයි වදාරා දූන් සාමාන්‍යයෙන් මෛත්‍රීභාවනා දක්වන්නාහු

අපාදකෙහි මෙමෙතනං මෙත්තං දීපදකෙහිව

චතුප්පදෙහි මෙමෙත්තා මෙත්තං බහුප්පදෙහිමෙ

යන මේ ගාථාව කීහ. මෙමෙත්තං මාගේ මෛත්‍රිය අපාදකෙහි අප දක දීර්ඝජාතීන් කෙරෙහිය මෙමෙත්තං මාගේ මෛත්‍රිය දීපදකවූ මනුෂ්‍යයන් හා පක්ෂීන් හාය. මෙමෙතතං මාගේ මෛත්‍රීය බහුප්පදෙහි, චතුෂ්පාදවූ හස්ත්‍යශාවාදීන්හාය. මෙමෙත්තං මාගේ මෛත්‍රිය බහුප්පාදෙහි ගොනුසු ආදීවූ බොහෝ පා ඇත්තවුන් කෙරෙහිය. මෙසේ මෛත්‍රීභාවනාවෙහි ස්වරූප දක්වා දූන් යාඥාවශයෙන් ආරක්ෂා දක්වන්නාහු

මාමං අපාදකො හිංසි මාමං හිංසි දිපාදකො

මාමං චතුප්පදෝ හිංසි මාමංහිංසි බහුප්පාදො

යන මේ ගාථාව කීහ. අපාදකො අපාදසතෙක් මාමංහිංසි මානගමක් පොළඹ දීපංදකො දිපාද සත්වයෙක් මාමංහිංසි මානගමක් පෙළඹා චතුප්පාදො සිව්පාසතෙන් මංමංහිංස මානගමක් පොළවා බහුප්පදෝ බොහෝ පා ඇති සතෙක් වාවංහිංසි, මානගමක් පෙළවා දූන් අනෙදිස්සකාහෙයින් මෛත්‍රීය දක්වන්නාහු

සබ්බෙසත්තා සබේපාණා සබේබභූතාව කෙවලා

සබේබභද්‍රානි පස්සන්තු මාකංචිපාප්මගමා

යන මේ ගාථාව කිහු සබේබසත්තා ඇමසත්හුද සබේබෙපාන හැමප්‍රාණිහුද, සබේබභූතාව කෙවලා හැමභූතකයෝද සබේබ හැමදෙනාම භද්‍රාණී කල්‍යාණයන් පස්සන්තු දකිත්වා කිඤචිං මොවුන් කෙරහි කිසිසතක්හුකරා පාප දුකක් මා ආගම් නගමක් නොපැමිණෙව මෙසේ හැමසතුන් කෙරෙහි අනෝදිස්සකහෙයින් මෛත්‍රී දක්වා දූන් තුනුරුවන් ණ සිහිකරණ පිණිස අප්පමානො බුද්ධෝ අප්පමනො ධම්මො අප්පමානො සංඝයා යනු කීහ. බුද්ධා බුද්ධරත්නයද අප්පමත්තෝ අප්‍රමානය කරන්නාවූ කෙලේශයන් නැතිහෙයින් ගුණයන්ගේ ප්‍රමාණ නැතිහෙයින්ද අප්‍රමාණයි. ධම්මො ධම්මනතයද උක්ත ප්‍රකාරහෙයින් ප්‍රමාණ නොකොටහැකි හෙයින් අප්පමානෝ, අප්‍රමාණයක් නැත්තේය. සංඝේසා සංඝරථනය අප්පමානො අප්‍රමානය ධර්මය සමානයෝගයෙන් අප්පමානයයි මෙසේ රත්නත්‍රයෙහි ගුණ සිහිකරවයි වදාරා ප්‍රමාණ සත්වයන් දක්වන්ට ප්‍රමාණවන්තනි

SANHIDA LANKA

සිරිංසපානී අභිවිච්චජිකාසතපාදී උන්නාභිසර වූ මුසිකා යනුකී හූ සිරංසපානී දීර්ඝ ජාතීහූ ප්‍රමානවන්තානි ප්‍රමාණ කර ක්ලේශ සංයෝගයෙන්ද අප්‍රමාණකර ගුණයෙන් නැතිහෙයින්ද ප්‍රමාණවත්හුයි දුන් අහිංසා යනාදින්ඩ වුන් ස්වරුපයෙන් දක්වත් අහි සර්පය විච්ජිතා ගොනුසුය. සතපාදී පත්තෑයහ. උන්නානාභි මකුළුවහ සරබූ සිකනැලහ මූසිකා සියහ යන මොවුයි දූන් මත්තෙහි කටයුතු දක්වන්නාහූ.

කතා මෙරකබා කතා මෙපරිත්තා පටික්කමනතුභූතානි

සොහං නමො භගවතො නමො සත්තන්නං සම්මාසම්බුද්ධනනති.

යන මේ ගාථාව කියත් රත්නත්‍රයෙහි ගුණානුස්මරණය කරන්නාවූ මේ මා විසින් රක්බා රක්ෂාතොමෝ කතා කරණලද මේ මා විසින් පරිත්තා පරිත්තානයෝ කතා කරණලද භූතානි සත්වයෝ මේ මා කෙරෙහි අහිත, අදහස් ඇති භූතානි, සත්වයෝ පටික්කමන්තු පහවෙත්වා සොහං එ මම භගවතො අතීතවූ භාග්‍යවත් බුදුන්ට නමො නමස්කාරකෙරෙමි. සත්තනතං සම්බුද්ධානං අතීතවූ විප්සසීආදීවූ සත් බුදුන්ට නමො නමස්කාර කෙරෙමි. යනාදීන් ඛන්ධපරිත්තය තපස්වරුන්ට ඉගැන්වූහ. එතැන්පටන් තාපසවරුන්ට සර්පයන්ගෙන් කිඩඟයක් නුවුයේයයි වදාරා ඛන්ධවත්ති ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි තාපසවරු නම් බුදු පිරිසය. ගුණනායකව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# වීරක ජාතකය

තවද ස්වසම්බුද්ධ වූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරමයෙහි වැඩ වසන සමයෙහි සර්වඥ කෘත්‍යයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

දේවදත්ත ස්ථිවිරියන් වහන්සේගේ පන්සියයක් භික්ෂූන් වහන්සේ දගසව් වහන්සේ ගොසින් බණ කියා ඇරගෙණ බුදුන් කරා වැඩිසේක. සර්වඥයෝ දැගසව්වන් වහන්සේ දක තොප ඇම එන වෙලාවට දේවදත්ත ස්ථවිරියෝ කෙසේ උනුදැයි විචාරා සර්වඥ විලාසයෙන් ඉඳ බොහෝ විනාසයට පැමිණියෝයයි වදාළ සේක. එබස් සර්වඥයෝ අසා පළමුත් දේවදත්ත ස්ථවිරයෝ මාගේ ක්‍රියාව කරන්ට වැද බොහෝ විනාසයට පැමිණියෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එක්විලක දියකාව උපන්සේක. නමින් වීරක නම්ව වසන සමයෙහි බරණැස් නුවර සායගසා බෝහොදෙනාද ආහාර නැතිහෙයින් කවුඩුවන්ට තබාදෙන කාවනුයේ බත් නොලබන්ට වන්නාහ. සවිටඨක නම් එක් කපුටුවෙක් තමාගේ කවුඩු දේනුව හා සමග බෝධිසත්වයන් වසන්නාවූ විලට ගොස් බෝධිසත්වයන්ට ආධාර දක්වා සිටියේය. බෝධිසත්වයෝත් ඇයි සබඳ කුමක් නිසා අවුදැයි විචාරා නුඹ වහන්සේට සේවය කරන්නට ආමී කියන්නා යහපතැයි කියා එතැන්පටන් තුමු ගොදුරුකා කවුඩ ට දෙන්නාහ. ගොදුරුකා කවුඩුත් බඩපුරා ගොදුරුකා තමාගේ කැවිඩි ධේනුවටත් දෙන්නේය.  මේ නියායෙන් දවස් හරණා සමයෙහි එක් දවසක් කවුඩ, කියන්නේ මුයිත් කළුපැහැය මුයිත් දෙපා ඇත්තාහ, මමත් දෙපා ඇත්තෙමි මුන් මැරූ ගොදුරු කන්නේ කවුද. මම ගොදුරු මරාකමි සිතා දවසක් දිය කාවාලඟට ගොස් කියන්නේ සබඳ තොප මරාළු ගොදුරු කන්නේ කවුද මම ගොදුරු මරාකමි කීහ. එබස් අසා දියකාවා කියන්නේ දියෙහි කිමිද කණ මසුන් හෙයින් අපට මිසක් තොපට බැරියයි කිවත් ඒ කපුටු ගොසින් මසුන් මරා කමි දියට බැස සෙවෙල් අස්සේ බැඳි පැන්බී මළාහ. ඒකියන කවුඩාගේ කැවිඩිදෙන් කවුඩා නාහෙයින් බොධිසත්වයන් කරාගොස් කියන්නී මිහිරි කට හඬක් ඇති මොනරුන්ගේ කරට බඳුවූ නිල් වූ ග්‍රීවයක් ඇති සවිට්ඨක නම් කවුඩා දුන් කොයිද. වීරක නම් පක්ෂියානන් වහන්සේ කියන්නේ මා කීවා නොඅසා මානය උපදවා ගොදුරුකන්ට දියට බැස සෙවෙල් පයබැඳි මළේයයි කීහ. එබස් කැවිඩි අසා අඬා වැලප පෙරලා බරණැස් නුවරට ගියාහයි වදාරා වීර ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි මාගේ ක්‍රියාව කෙරෙමි කියා ගිය මළ කවුඩා නම් දේවදත්ත ස්ථවිරිය, දියකාව උන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම යයි වදාළ සේක.

SANHIDA LANKA

## ගංඟානම් ජාතකය

තවද දශබලදාරීවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බාල භික්ෂූදෙදෙනකුන් වහන්සේ අරභයා මේ ජොතකය දක්වන ලදී

ඒ කෙසේද යත්

සැවැත් නුවර වාසීහූ කුල පුත්‍රයෝ දෙදෙනෙක් බුද්ධශාසනයෙහි මහණව අසුභ භාවනාදිය කොට රුවට බැඳී මමද රූ ඇත්තෙමි තොපි රූ ඇත්තේ නොවෙයි උනුන් හා වාදකොට එක් මාළු භික්ෂූකෙණෙකුන් වහන්සේ ලඟට ගොස් ස්වාමිනි අප දෙන්නාගෙන් රූ ඇත්තේ කාටදැයි විචාළසේක. ඒ භික්ෂූන් වහන්සේ කියනසේක් තොප දෙන්නා නියාවට මගේ රුව යහපතැයි කිසේක. එබස් අසා භික්ෂූන් වහන්සේ අප විචාළේ එකෙක මුන්වහන්සේ කීයේ එකෙනැයි රොස්ගසාගෙණ නික්මුණසේක. මේ කථාව ධම්සභාමණ්ඩපයේ රැස්ව උන් භික්ෂූන් වහන්සේ කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා සර්වඥයන් වහන්සේ දැන් මතු නොවෙයි පළමුත් මේ භික්ෂූන් දෙන්නා රුවට බැඳී ඇවිද්දෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ගංගා නම් ගංගාව සමීපයෙහි වෘක්ෂයක දේවතාව උපන්සේක. එසමයෙහි එක් ගංගානම් මත්ස්‍යයෙකු හා යමුනා නම් මත්‍යයෙකු හා මත්ස්‍යයෝ දෙන්නෙක් උනුන් දැක මාගේ රූ ඇත. තොපගේ රූ නැතැයි යනාදීන් තර්කකොට ගොඩ සමීපයේ උන්නාවූ ඉදි බුවෙකු සමීපයට අවුත් කියන්නේ ගංගානම් මත්ස්‍යයාගේ රුව වැඩිද යමුනා නම් මත්සයාගේ රුව වැඩිදැයි විචාළහ. එවිට ඉඳුබුවා කියන්නේ ගංගානම් මත්ස්‍යයාගේත් රුව වැඩිය යමුනානම් මත්ස්‍යයොගේ රුව වැඩිය යමුනානම් මත්ස්‍යයාගේ රුව වැඩිය උන් දෙන්නා නියාවට රුවින් නිග්‍රෝධ වෘක්ෂයයේ වටවූ කබලක් ඇති රිය ඉසක්සේ ඉස ඇති සතරසාතයක් ඇති මාගේ රුවම වැඩියයි කිය. එබස් අසා ඒ මත්ස්‍යයෝ දෙන්නා තට එක්කාරණයක් කියන්ටත් කාරණා කීයයි කිපී වරල්පතින් පැන් ඉස ගියාහයි වදාරා ගංගා නම් ජාතකය නිමවා වදාළ සේකී. එසමයෙහි මත්සයෝ දෙන්නානම් මේ ළදරු භික්ෂූහුය. එසමයෙහි වෘක්ෂ දේවතාව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළ සේක.

SANHIDA LANKA

# කුරුඞගමික ජාතකය

තවද ශාස්තෘ වූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථිවරියන් සර්වඥයන් වහන්සේ නසන්ට කළ උත්සායක් නිමා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවැන් වහන්සේ දේවදත්ත ස්ථවිරියන් බුදුන් නසන්ට කළ උත්සාහය කියකියා වැඩ උන් සේක. එතනට සර්වඥයන් වහන්සේ වැඩ මහණෙනි මාළුන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදයි විචාරා වදාරා එපවත් පළමුත් දේවදත්ත ස්ථිවරියෝ මහත්වූ උත්සාහ කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්දේ කුරුංගමාංග ජාතකයෙහි ඉපිද විලක් සමීපයෙහි ගසක් මුල වාසය කරණ සේක, ඒ විල වසන්නාවූ ඉදිබුවෙකු හා ගසෙක වාසය කරන්නාවූ කෑරලයෙකු හා බෝධිසත්වයෝ මිත්‍රව වසන්නාවූ එසමයෙහි එක් වැද්දෙක් බෝධිසත්වයන් වසන්නාවූ ගස සමීපයෙහි වරමන් දෙන් ඉදිකරණලද උගුලක් සලස්වාලීය. බෝධිසත්වයෝ උගුලෙහි පෙරයම බැඳුනාහ. වරපටින් එමල වරපට කඩාගත නොවී මරණප්‍රාප්රාග වශයෙන් ඇඬූහ. ඒ අඬ අසා කෑරලා හා ඉදිබුවා එතනට අවුත් යහළුවාට දුක්ඛය පැමිණී කල ගලවාගන්ට උවමනාවේදැයි සිතා කෑරලා ඉදිබුවාට කියන්නේ සබඳ ඉදිබුවානෙනි නුඹගේ කට දත් ඇත. එසේහෙයින් නුඹ වරමන්ද කපන්න මම වැද්දාගේ ගෙට ගොස් මෙතනට ආනොදෙමි කියා ඉදිඹුවා වරමන්ද කපන්නට සලස්වා තෙමේ වැද්දාගේ ගෙට ගොස් වැද්දාගේ ඉදිරියේ දොරපලය පිට උන්නේය. වැදි ඉරපාන් වන්නට නැකැත්වේලා තබා නැගිට තෙබෙගත් අත් ඇතිව යන්ටවන ඒ වෙලාවට කෑරලා කෑරල්ශබ්දය අඬා පියාපත් තබා මූනට ගැසීය. එවිට වැදි කාලකන්නි පක්ෂියා ඇගගැසිනැයි කියා පෙරලා ගෙට වැදිගියේය. එවිට කෑරලා සිතන්නේ දෙවැනි ආවර නික්මෙන්නේ පැලදොරනැයි සිතා පැලදොර පලය පිට උන්නේය. ඒ වෙගාවය වැදිත් ඉදිරියේ දොරින් නික්මුණු හෙයින් කෑරලා ඇග ගැසින පැලදොරින් යෙමි සිතා පැලදොර බලා නික්මිණි. එවිටත් කෑරලා ඇග ගැසිනි. ඒ වෙලාවටත් කාලකන්නි පක්ෂියා ඇග ගැසිනැයි කියාත් වැලක මා නික්මුනු වේලේ පක්ෂියා ඇග ගැනිසිනැයි කියා රෑ නොගොස් උදෑසනක්සේ යෙමි සිතා රෑ වැදනිදා පාන්වූ දොරින් පැයක් ගියවෙලේ නික්මිනි ඌ නික්මුනු පවත් කෑරලා වහා ගොසින් මුවාට කීව. ඒ වෙලාවට ඉදිබුත් තමාගේ කුඩාදත්වලින් වරපට කඩාගෙන තුන්පටකින් දෙපටක් කපාහළ. දත් ටැම්මෙන්නාසේ මහත් වේදනාවට පැමිණ කටින් ලේගොසින් අසේනිව වැදහොත්තේය. ඒ මුවා එවිට වැද්දවූ තෙබ ඇතිව ගෙණඑන්නවුන් දැක අරාපීනුයේය. වරපට කඩාගෙණ වහා වැද්දටවන, කැරලා ගසට නැගේය. ඉදිබුවා රැගෙණ පසුඹියේලාලා කනුවක් පිට එල්වාලිය. එවිට බෝධිසත්වයෝ ඉදිබුවාට වූ වද දැක වැද්දවුට ලංනොවනුදුරුව පෙණ නාවුය වැදි මුවාපසුපස්සේ නික්මුන. මුවා අතට අසුවන්නාසේ ගැවී ගැවී නික්ම වැද්දවූ මහවනයේ ලා මුවා ලංවුමගින් ඉදිබුවා උන්තැනට වහා අවුත් අඟබාලා පසුඹිය ඉරා ඉදුබා මැත්කොට කියන්නේ ඉදුබ තොසින් දියට වැදයව කෑරලා තොසින් වෘක්ෂයට පැන නැගේවයි කියා ඒ අර්ථය ප්‍රකාශ කොට දක්වන සර්වඥයන් වහන්සේ මහණෙනි ඒ මුවා කී නියායෙන්ම ඉදුබුත් දියට බට කෑරලා ඔබ්බට ගියේය. මුවාත් වනයට වැදි දෙවැනිව එතන්ට අවුත් ඉඳුබා නොදැන සිස්වූ පසුඹිය හැරගෙණ තමා ගෙටම ගියේය. වදාරා කුරුඞගමිග ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි වැදිතෙම දේවදත්ත ස්ථවිරය. ඉදිබුවා නම් මෞද්ගල්‍යායාන ස්ථවිරිය. කෑරලා නම් ශාරීපුත්‍ර ස්ථවිරය. කුරුගමිගව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# අස්සක ජාතකය

තවද දීපදෝත්තමවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පුරාණ දුතිකාවක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් ස්ත්‍රීයක් නිසා උකටලී වූ භික්ෂු කෙණෙකුන් වහන්සේ දක්වන්නා මහණ තාගේ අභිප්‍රාය මිසක් තා කෙරේ ඇගේ අභිප්‍රාවක් නැත. එසේ වුවත් තෝ ඈ කෙරේ ආලයෙන් පළමුත් බොහෝ දුක්වුයේ නොවේදැයි වදාරා ඒ කෙසේ දැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස පොතලීනුවර අස්සක නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි උන්ගේ උබ්බරිනම් බිසෝකෙණෙකුන්  ඇත්තාහ. පංච කල්‍යාණයෙන් යුක්ත වූ විසිෂ්ටවූ රූ ඇත්තීය, මනුෂ්‍යරූපය ඉක්ම සිටියාහ, දිව්‍යාගනාවකගේ රූපයට ආසන්නව සිටියහ. මේරූ ඇත්තාවූ අග්‍රමහේසිකා බිසව එක්තරා ව්‍යාධියකින් මළහ. රජ්ජුරුවෝ ඒ බිසව්කෙරේ බොහෝ සෝකයෙන් බිසවුන් දෙනකලා කුණුනොවන්ට තෙල්පුරා වත්කොට තමන් වැදහෝනා යානයටලා නොකා නොබී උන්හ. අමාත්‍යයන් ආදී අය ස්වාමිනි සවසංස්කාරයම අනිත්‍යයහ එසේ හෙයින් විඛෙෂප නොවුවමැනවැයි කීවත් රජ්ජුරුවෝ තමන්ගේ විඛෙෂ්පය ඇරගත ලියනොහි සත්දවසක් නොකා නොබි දවස් අරින්නට වන්නාහ. එසමයෙහි පුරාණලද බෝධි සම්භාර ඇති අප මහා බෝසතානෝ හිමාලය වනයෙහි පැවිදිව ධ්‍යාන ක්‍රීඩාවෙන් දවස් අරණ සේක් එක් දවසක් ලෝකය දිවසින් බලා වදාරණසේක් අස්සකනම් රජ්ජුරුවන්ගේ දුක්බය බලා මම ගොසින්  උන්ගේ දුක්බය හරින්ට උවමැනවයි සිතා ආකාශයෙන් ඒ නුවරට අවුත් ඒ රජ්ජුරුවන්ගේ මගුල්උයනේ සල්වට මත්තේ රන්පිල්මයක්සේ වැඩඋන්සේක. එතනට එක් බ්‍රාහ්මණ මානවකයෙක් ආය, එවිට තාපසයෝ කියන්නෝ තොපගේ රජ්ජුරුවෝ දශරාජධර්මයෙන් රාජ්ජ්‍යය කෙරෙද්දැයි විචාළහ. එවිට බ්‍රාහ්මණ මානවකයා කියන්නේ ස්වාමිනි ඉන් අඩුවෙක් නැත. උන්වහන්සේගේ අග්‍රමහේසිකා බිසවුන් වහන්සේ නැසීගියසේක. එසේ හෙයින් සෝකතුරසේක. නුඹ වහන්සේ වැනි ස්වාමින් විසින් ඒ සෝකය හළ මැනවයි කීය. එබස් තාපසයෝ අසා ඒ කියන රජ්ජුරුවන් අපි නාඳුනම්හ. අඳූනමෝනම් එකියන බිසවුන්ගේ උත්පත්තියත් කියා බිසවුනුත් පා සෝක තුනිකරන්නෝමෝ වේදැයි කීහ. එබස් බ්‍රහ්මණ මානවකයා අසා රජ්ජුරුවන් වහන්සේ කැන්දාගෙණ එමි. නුඹවහන්සේ මෙතන වැඩඋනමැනවැයි කියා රජ්ජුරුවන් කරා ගොස් එපවත් කීහ. රජ්ජුරුවෝ දිවැස් ඇති තාපසකෙණෙකුන් ආ නියාව අසා ඒ තාපසයෝ මාගේ බිසවුන්ගේ උත්පත්තිය දනිති. එසේ හෙයින් උන්කරා සිතා අමාත්‍යයමණ්ඩලය පිරිවරා උයනට ගොස් තාපසයන් දැක, තාපසයන් වහන්සේ මාගේ බිසවුන්ගේ උත්පත්තිය දන්නාසේක්දැයි විචාළය. එසේය මහරජ දනිමි කියන්නා එසේවීනම් උපන්ස්ථානය කියමැනවැයි කියන්නා මහරජ ගොමපැණිව උපන්නාහයි කිහ. එවිට රජ්ජුරුවෝ මේ නිසා රූපශ්‍රීයක් ඇති තැනැත්තෝ ගොමපැණිව උපද්දිද ඒ අදහාගත නොගනිමියි කීහ. එසේ වීනම් රජ්ජුරුවෙනි උන් මෙතනට ගෙන්වා පාමිදැයි කීහ. යහපත ස්වාමිනි කීහ. එවිට තාපසයෝ ගොමපැණියා හා උන්ගේ වල්ලභ ගොම පණුවා හා දෙදෙනා ගොමඋන්ඩි දෙකත් පෙරලා පෙරලා එත්වයි අධිෂ්ඨාන කළහ. එම නියායෙන් ගොමපණුවා ඉදිරිකොටලා ගොමපැණි ගොමඋණ්ඩයක් පෙරලා පෙරලා එතනට ආවාය. එවිට තාපසයෝ එන්නාවූ ගොමපැණිනම් උබ්බරිනම් බිසවයයි කීහ. එවිට තාපසයෝ කියන්නාහූ මහරජ්ජුරුවෙනි මුන් විසින් පූර්වජාතියෙහි තමන්ගේ රූපමදයෙන් මත්ව කිසි පිනක්කරන්ට නුවූය. එසේ හෙයින් මෙසේ උපන්නාහ. මුන්ලවා කථාකරන්දැයි කීහ. එබස් අසා යහපතැයි කී විසින් උබ්බරිනම් බිසවුන් ලවා උබ්බරිනි තොපගේ ජාති ගොත්‍ර කියව තොපගේ රජ්ජුරුවන්ට ප්‍රිය ඇද්දැයි විචාළහ. එවිට හොම පැමිණියා තාපසයන් වහන්ස රජ්ජුරුවන් වහන්සේ හා මා හා ආදී මේ උද්‍යානයෙහි බොහෝ කෙළි කෙළපියව වාසයකරණ ලද දැන් ජාතියෙන් වෙන්වූ හෙයින් රජ්ජුරුවන් හා මා හා කුමන විශ්වාසදැයි කිව, එබස් අසා රජ්ජුරුවෝ බිසවුන් කෙරේ තෘෂ්ණාව ඇර රජ්ජුරුවෝ මිනිය ගෙන් පිටත්කරවා ඉස්සෝධා නාහා සෝක තුනීකොට තාපසයන් කී අවවාද නියාවට දැහැමෙන් සෙමෙන් රාජ්ජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා අස්සක ජාතකය නිමවා වදාළසේකී. එසමයෙහි අස්සක රජ්ජුරුවෝ නම් මේ කියන ශාසනයෙහි උකටලීවූ භික්ෂුහුය, උබ්බරිබිසව නම් මේ උකටලී කළාවූ ස්ත්‍රීහුය. එසමයෙහි මේ කාරණය තපසයන්ට කී බ්‍රාහ්මණ මානවකයා නම් ශාරිපුත්‍ර ස්ථවිරය, තාපසව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේකී.

SANHIDA LANKA

# සුංසුමාර ජාතකය

තවද මුනීන්ද්‍රවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරියන්ගේ වධයට උත්සාහ කිරීමක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

එක් දවසක් සංඝයා වහන්සේ ධර්මසභා මණ්ඩපයෙහි රැස්ව දේවදත්ත ස්ථිරියෝ සර්වඥයන් වහන්සේට වධයට උත්සාහ කෙරෙති කිය කියා උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්ත උනුදැයි වදාරා එපවත් අසා පළමුත් දේවදත්ත ස්ථවිරියෝ මා නසන්නට උත්සාහ කොට හයක් විවරත් උපදවා නුහුනුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේකි.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ගංගාවක් සමීපයෙහි බැද්දක වානරව ඉපිද දවස් හරණ සේක. එසමයෙහි එක් කිඹුල් දෙනෙක් බෝධිසත්වයන් දැක බෝධිසත්වයන්ගේ හෘදමාංශය කන්ට දොළොක් ඇතිව එපවත් තමාගේ කිඹුලාට කියන්නී ස්වාමි පුත්‍රයානෙනි ඇත්සමාන බලඇති වානර රජ්ජුරුවන්ගේ හෘදමාංස කන්නට මට දොළක් උපනැයි කියන්නා ඊට කිඹුලා කියන්නේ අපි ජලයෙහි වාසය කරන්නෝය ඔහු වනාහි ගොඩ වාසයකරන්නේය, එසේ හෙයින් උන්ගේ හෘදයමාංසය ගෙණෙන්ට මට පිළිවන්දැයි කිහ. එබස් අසා කිඹුල් දෙන කියන්නී ස්වාමිනි නුඹදන්නා යම් උපායකින් හෘදමාංශය ගෙනෙන්න, නොගෙනාවොත් මාගේ ජීවිතය නොතිබෙයි කිව එබස් අසා කිඹුලා යහපැතැයි කියා වදාරා වානර රජ්ජුරුවන් වසන ගස සමීපයට ගොස් වානර රජ්ජුරුවෙනි ඇයි තොප කසට එලාපල කා මෙතන ඉන්නේ බලාත් එගොඩ අඹ දොඹ දෙල් බෙලි කිතුල් තල් ආදීවූ මිහිරි එලාපල ඇති වනයේ වාසය කළොත් නපුරුදැයි විචාළාහ. එබස් අසා වානර රජ්ජුරුවෝ කියන්නාහු  කිඹුලානෙනි දෙබිත්තියේ ගසා වතුර යෙමින් සිටියදී ගඟ මෙගොඩ සිට එගොඩට පැනපියා නොහැක්ක කුමක් කෙරෙම්දැයි කීහ. එවිට කිඹුල් කියන්නේ තොපගේ අභිප්‍රාය ඇත්නම් මාගේ පිට ඉඳවාගෙණ ගොඩලාගණිම් කිය. එබස් වානර රජ්ජුරුවෝ අසා යහපත පිට පැලවයි කිය කිඹුලා පිටට පැන නැංගාහ. එවිට කිඹුල් වඳුරානන් පිට හිඳුවා ගඟ මධ්‍යයට ගොස් දියෙහි ගිලෙන්නට වන, එවිට බෝධිසත්වයෝ මේ කිම්ද සබඳ මා ඇරගෙණ දියෙහි ගිලෙව්නැයි කිහ. එබස් අසා කිඹුලා කියන්නේ තොපට එලාපල දෙන්ට උන් එකෙක්ද මාවාගේ කිඹුල්දෙන් තොපගේ හෘදමාංස උවමැනවැයි මාහට කී සෙයින් තොප මරා හෘදමාංස ගන්ට ගෙණාවෙමි කිහ. එබස් අසා වානර රජ්ජුරුවෝ කියන්නාහු එසේ සිතන්නේ යහපත වඳුරානගේ හෘදමාංස ලෙයි තිබේනම් ඒ ඒ තෙන පිණිමෙන් සුනුවිසුනු නොවේදැයි කීය. එබස් අසා කිඹුල් තොපගේ හෘදමංසය කොයිතිබේදැයි කිය. බෝධිසත්වයෝ එතනට ලන්වූ විලික්ෂණ වූ දිඹුල් ගෙඩි ඇති ගසක් දැක තෙළ දිඹුල් ගසෙහි එල්ලෙන්නේ මාගේ හෘදමංසවව් කීහ. එවිට කිඹුලා එසේ වීනම් තොප නොමරමියි හෘදමංසය මට දෙවයි කියා වඳුරා ගොඩලීය. වඳුරු ගසට නැගී තාගේ ගොඩතිබූ අඹ දඹ යෙන් මට කිසි ප්‍රයෝජනයක් නැත එළම අඥාන වූ කිඹුල වඳුරන්ගේ අත් මාත් ඔබ්බේ තිබේද. තා මහත් පමණ මිසක් තාගේ ලෙයි කිසිම නුවනෙක් නැත්තේවේද, තා වංචාකළ නියාව තෝ නොදන්නේය. එසේහෙයින් තෝ තාගේ විමනයට පලායවයි කීහ. කිඹුල් දාසින් පැරදාගිය එකෙකුසේ වික්ෂ්පයට පැමිණ තමා ඉන්න වාසස්ථානයටම ගියේයයි වදාරා සුංසුමාර ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි කිඹුල්දෙන නම් චිංචිමානවිකාය, කිඹුලා නම් දේවදත් ස්ථවිරියෝය. වඳුරුව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# කක්කර ජාතකය

තවද භාග්‍යවත් වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සැරියුත් සාමින්ගේ විහාරයෙහි බාල භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

සැරියුත් සාමින්ගේ අතවැසි භික්ෂූකෙණෙකුන් වහන්සේ කය ආරක්ෂා පිණිස උෂ්ණබත් කෑවොත් පත්තය කුපිතවෙයි කියා උෂ්ණවෙලාවෙහි තමන් වහන්සේ කයට කිසිදුකක් වැද්දනොදී රකිනාසේක. මේ නියාව ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දූන් මතුනොවෙයි පෙරත් මූ තමන් ශරීරයට කිසිදුකක් වැද්දනොදුන්නේ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වනයෙහි වෘක්ෂ දේවතාව උපන්සේක. එසමයෙහි ලිහිණිවැද්දෙක් පක්ෂි ධෙනුවක් ඇරගෙණ කොරවකුන් බඳන්නේය. පළමුත් මැදිරියෙක අසුව ගැලවිගිය කොරවකෙකු ඒ වැදි බදන්ට උත්සහ කෙළේය. පළමුත් තමා අසූවූහෙයින් ඒ වැද්දහුට අසුනොවි වැද්දහුලාලු මල කොට ඇවිදින්නේය. පළමුත් තමා බැඳුනුහෙයින් මළට අසුනොවි ගැලවි දවස් අරනේය. එවිට වැදි සිතන්නේ මළඉඳුවා බැරිමයයි සිතා තමා උසනියාවට කඩුවක් ඉදිකොට ඊ අතුබේරා තුමූ ගසක් හැටියට නික්මුනාහ. එවිට කොරවකා වැද්දවූ නියාව දන සිතන්නේ මූ සීහිකරන්ට උවමැනවැයි මෙකල වනාන්තරයෙහි ඇවිදින්නෙම් බොහෝ අඹ දඹ දෙල් බෙලි කිතුල් දුටුවිරු නම් මෙසේ ඇවිදිනා ගසක් දුටුවිරුද, තාගේ වළාවට මා අසුවන්නේ නැතැයි කියා පියා අඬාගෙණ පලාගියහ. වැදිත් පක්ෂියා පලාගියපසු කියන්නෝ එසේ වීනම් පක්ෂියා මන්දිරය කඩාගෙණ ගියවනැයි එසේ හෙයින් මූ සොරකම් දන්නේයයි ඔබ්බට ගොසින් පක්ෂින් බදාගෙණ තමාගේ වාසස්ථානයට ගියේයයි වදාරා මේ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ලිහිනි වැදිනම් දේවදත්ත ස්ථවිරය කොරවකා නම් ශරීරය රක්ෂා කරන්නාවූ භික්ෂූහුය, මේ කාරණය ප්‍රත්‍යක්ෂකොට දුටුවාවූ වෘක්ෂදේවතාවා නම් බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

SANHIDA LANKA

# කන්දගලක ජාතකය

තවද ලෝකනායකවූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සුගතාලය අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්.

එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ දේවදත්ත ස්ථවිරියන් වහන්සේ සර්වඥවිලාසය කළ නියාව කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා මහණෙනි දැන්මතුනොවෙයි පෙරත් මූ මාගේ විලාසය ධර බොහෝ දුක්ඛයට පැමිණියෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකී.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ නමින් ඛදිරවන්නම් කෑරලව ඉපිද කිහිරිවනයෙහි දවස් අරණ සේක, එසමයෙහි බෝධිසත්වයන්ට යාළු වූ එරබදු ඉඹුල් ආදීවූ ස්ථානයෙහි වාසය කරන්නාවූ කන්දගලනම් කෑරලෙක් බෝධිසත්වයන් කරා ආය. බෝධිසත්වයෝ තමන්ගේ කිහිරිවනයෙහි කිහිරිගස් විද පණුවන් කෑරලාට ලූහ. කෑරලා බෝධිසත්වයන් ලූ පණුවන් කැවුම්කන්නාසේ කා කීපදවසකින්  මොහු සිතන්නේ මොයිත් ගස්විද කන්නෝය. මුන් විදිනා ගස් මම විද පණුවන් කම් තොපි ගස්විද ආයාස නොගනුවයි කීය. බෝධිසත්වයෝ කියන්නාවූ තොපට පිළිවන් එරබදු ඉඹුල් ආදී ගස්විද පණුවන් කතොත් විනා මේ හරඇති කිහිරිගසෙහි හොට ඇන කඩාගෙණ ඔළුවත් පළාගෙණ දැස් උඩඉඳුවා මහත්වූ වේදනාවට පැමිණ ගස එලීගෙණ ඉන්දනොහි මුර්ජාව බිමවැටී කුමක් බවත් නොදන නන්දොඩන්නේ සිහින්වූ පත් ඇති යකඩසේ තදවූ ගස කුමනගසෙක්දැයි විචාළෝය. බෝධිසත්වයෝ කියන්නාහූ තොප විද අභ්‍යාසගස් නොවිද මා කියමන් නොගෙණ බොහෝ ආයාසයට පැමිණියාව මේ ගස් නම් කිහිරිගසැයි කීහ. එකියන පක්ෂියා එතනම මළහයි වදාරා කන්දගලක ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි කන්දගල කෑරලා නම් දේවදත්ත ස්ථවිරිය. ඛදිරවන්නම් කෑරලාව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# සෝමදත්ත ජාතකය

තවද විනායකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලාලුදායි ස්ථිවිරියන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

ලාලුදායි ස්ථවිරියන් වහන්සේ සභයක ඉද බස්පස් කියන්ට වන්සේක්නම් කියන බසතබා නොකියන බසම කියනසේක, මුන්වහන්සේගේ අඥනකම් ධම් සභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ කිය කියා වැඩඋන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා පළමුත් ලාලුදායියෝ එසේමයයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ කසීරට බමුණුගමක ඉපිද වැඩිවිය පැමිණ සෝමදත්ත නම් බ්‍රාහ්මණව තක්සලා නුවරට ගොස් දියපාමොක් ආචාරීන් ලඟ ශාස්ත්‍ර ඉගෙණ පෙරලා දෙමව්පියන් කරා අවුත් දුක්පත් හෙයින් රජ්ජුරුවන් වහන්සේට සේවයකොට දෙමව්පියන් රකිම් සිතා බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ට රාජවල්ලභව දවස් අරණා සමයෙහි බෝධිසත්වයන් වහන්සේගේ පියවූ බ්‍රහ්මණයන්ගේ සානා ගොන්ගෙයක් ඇත, ඒ ගොන් ගෙයෙන් එක් ගොනෙක් නැසින එපවත් පුතනුවන්ට කියමි සිතා බරණැස් නුවරට ගොස් සෝමදත්තනම් පුතනුවෙනි මාගේ ගොන්ගෙයෙන් ගොනෙත් නැසින ඊට ගොනෙකු රජ්ජුරුවන්ට කියා මට ඉල්වාදෙවයි කීය. එබස් බෝධිසත්වයෝ අසා පියනන්වහන්ස රජ්ජුරුවන් වහන්සේට යල්ලභ වූ ගමනේදී ගොනෙකුදුන මැනවයි කියන්ට මට යොග්‍ය නොවෙයි නුඹවහන්සේම රජ්ජුරුවන් වහන්සේට කියා ඉල්වාගත මැනැවැයි කීහ. එවිට පියානන් වහන්සේ කියන සේක් පුත දෙන්නෙකු සිටියදී යම්ම දෙයක් මට කියන්ට බැරිය මම කන්නලව් කියන්නෙම් සිටින ගොනතා ඇරගන්ට කියතොත්විනා කන්නලව් කියාගෙන ගොනෙකු ඇරගත නොහෙම් කීහ. එසේ ගොනා දෙතත් ගොනෙකු ඇරගතත් නුඹ වහන්සේ ම කිවමැනව මම ඊට උපායෙක් කියාලම් කියන්නාහු රජ්ජුරුවන් වහන්සේ දුටුවිට ජයතුභවං මහාරාජ කියා ආශිර්වාද කොට ගාථාවක් කිය මැනවයි කියන්නාහු.

වේ මේ ගොණා මහරාජ යෙහි ඛෙත්තං කසාම්සේ

තෙසූ එකොමතො දෙවදුතියං දෙහබත්තියා

යන මේ ගාථාව කිවමැනවයි කියා. මෙහි අභිප්‍රාය මහරජ්ජුරුවන් වහන්ස මාගේ සිසාන ගොන්නු දෙන්නෙක් ඇත්තාහ. ඉන් එක්ගොනෙක් මළ, අනික් ගොනෙකු ක්ෂත්‍රියෙස්වර රජ්ජුරුවන් වහන්ස දෙවාවදාළමැනවයි කියා මේ ගාථාව අවුරුද්දකින් උගන්වා අවුරුද්ද මුළුල්ලේ සුවඳගස් ඇත්තාවූ සමාසනයෙක පිදුරුකැරලි රැසක්සේ සිටුවා මූ රජ්ජුරුවෝය මූ සෙනවිරද්දුයයි කියා මේ නියායෙන් අවස්ථාන කෝල අරවා ඉක්බිති බෝධිසත්වයන්ගේ පියානෝ පුත ගාථාව වනපොත්ව ගියේයි කියන්නා යහපතැයි පඬුරක් ගෙන්වාගෙණ පියනුත් කැඳවාගෙණ රජ්ජුරුවන් දැක සිටියාහ. එවිට බෝධි සත්වයන් පියානෝ රජ්ජුරුවන් දැක ජයතුභවං මහරාජ කියා තමන්ගෙණගිය පඬුරුත් දී රජ්ජුරුවන් දැක සිටියාහ. එවිට රජ්ජුරුවන් විසින් සෝමදත්ත යෙනි මූ තොපගේ පියානෝදැයි විචාරන්නා එසේය. ස්වාමිනි කී අවස්ථාවෙහි බෝධිසත්වයන්ගේ පියානෝ කියන්නාහු.

වේ මේ ගොණෙ මහරාජයෙහි ඛෙත්තං කාසමසො

තෙසු එකොමතො දේව දුතියං ගණ්හ බත්තියා.

SANHIDA LANKA

කී හෙයින් බෝධිසත්වයන් දෙහි කියා ඉගැන්වා තිබියදී ගණ්හ යි කියා කී හෙයින් රජ්ජුරුවෝ ගාථාව වරද්දවා කී නියාව දැන්ම සිතාසී ඇති සෝම දත්තයෙනි තොපගේ ගෙයි මෙසම ගොන බෝහෝදැයි කියා බෝධිසත්වයන් විසින් ගොන්දුන්නොත් ඇත්තේවේදැයි කී බසට තමන් වල්ලභව සිට තුමූ කන්නලව් නොකියා තමන්ගේ පියානන් හා කන්නලව් කියෙව්වාට සතුටුව ගොන් දසදෙනෙකු දී බ්‍රහ්මණයා උන් ගමත් පටුනුකොට ලියාදී යවුහ. එවිට බෝධි සත්වයන් හා පියානෝ රථයකට නැගී යමින් සිට බොහෝසත්වයෝ කියන්නාහු මේ කිම්ද මුළුල්ලේ සුවඳගස් ඇත්තාවූ සමාසානයෙහිදී ගාථාවන පොත් කරවා වරදවා කියේ

ඇයිදැයි කීහ. පුත සභායෙහිදී බස්කියා යහපත අසන්නොත් ඇත නපුර අසන්නොත් ඇත මා විසින් වරද්දා කියාත් මෙතෙක් දේ ලද්දෙම්වේදැයි කිහයි  වදාරා මේ සෝමදත්ත ජාතකය නිමවා වදාළසේකී. එසමයෙහි සෝමදත්ත යන්ගේ පියානෝ නම් ලාලුදායි ස්ථවිරියෝය. පුතනුවෝ නම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# උච්චිංහත්ත ජාතකය

තවද සුගතේන්ද්‍ර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ස්ත්‍රියක් නිසා උකටලී වූ භික්ෂුකෙණකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ දුක්පත්වූ කිසිවක් නැත්තාවූ විජ්ජත්කුලයක ඉපිද සිඟාකා ජීවත්වන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයකුගේ භාර්යාව දුරාචාරව දවස් අරිනිය, බෝධිසත්වයෝත් ඒ බ්‍රාහ්මණයාගේ ගෙට සිඟා ගියහ. ඒ බ්‍රාහ්මණයා ඔබ්බේ ගමකට ගියේය, උන්යාදී ඒ බැමිණිද තමාගේ අන්‍යවූ චෞර පුරුෂයෙකු ගෙන්වාගෙණ ලෝකස්වාදරතියෙහි යෙදී ඉක්බිති බත් කා යවයි බ්‍රාහ්මණයාහට කීය. ඉක්මන්ව බත්පිස චෞර පුරුෂයාට බත් ලා ඈතොමෝ මග බලා සිටියාහ. බෝධිසත්වයෝත් යම්තම් දෙයක් ලැබේදැයි සිතා දොරකඩ සිටියාහ. ඒ වෙලාවට ගෙය ඇති බ්‍රාහ්මණයා ගෙට එන්ටවන එවිට බැමිණි ගෙටඑන්නාවුන් දැක සොරසැමියා බත්කමින් උන් තැනැත්තාහු කොටුවඇතුලේලුව ගෙට ආ සැමියා බත්කන පෝරුව ඇදලා අතට පැන් දී සොරසැමියා බත්කමින් සිටි මධ්‍යයේ ගොයිසැමියාට උනු බත් ලා ලා අතට දිලුව. එවිට බ්‍රාහ්මණ බතෙහි අත ඔබා උඩ බත් උනුය යට බත් සීතලය බත් නිවේනම් උඩ බත් විනා යට බත් නිවෙන්ට කාරණා කිම්දැයි ඒ කවර කාරණා නිසාද ඒ කාරණය මට කියවයි කිහ. බ්‍රාහ්මණ කීපවරක් විචාරත් බ්‍රහ්මණ තමාකළ සොරකම සැලවෙයි සිතා බැණනොනැගී කිටියාහ. එවිට බෝධිසත්වයෝ සිතන්නාහූ පළමු ආයේ සොරසැමියායයි සිතා සොරසැමියා කොටුවේ උන් නියාව මා කියන්ට උවමැනවයි සිතා කියන්නේ බ්‍රහ්මණයන් වහන්ස නුඹ වහන්සේට තිබූයේය, අපිනම් විජ්ජත්කුලයෙහි උපන් හෙයින් ඇසින් දුටු දෙයක් යා පත්වත් නපුරවත් කියම්ම එසේ හෙයින් ඉනිබ්බේ නපුරු නොකරණ නියායෙන් හික්මවාගත මැනවයි කියා ගියහ. බමුණත් දෙන්නාම අල්වාගෙණ පාටවකොට ඉනිබ්බේ මෙසේ වූ දෙයක් නොකරවයි කිවයි වදාරා මේ උච්චටයීහත්ත ජාතකය නිමවා වදාළසේක. ජාතකාවසානයේදී ඒ භික්ෂූන් වහන්සේ දහසක් නසින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටිසේක. එසමයෙහි බ්‍රාහ්මණයානම් මේ කියන භික්ෂූහුය. එසමයෙහි බ්‍රාහ්මණ නම් මෙසමයෙහි ස්ත්‍රීය. දුක්පත් විජ්ජත්ව උපන්නෙම් බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# හරු ජාතකය

තවද කරුණානිධාන වූ මාගේ ස්වාමිදරුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලාභයෙන් යසසින් වැඩි දවස් අරින සේක. එසමයෙහි තීර්තකයෝ ලාභසත්කාරයෙන් පිරිහී සිතන්නාහු ශ්‍රමණ භවත් ගෞතමයන් හා ශ්‍රාවකයන්ගේ ලාභසත්කාර මහත අපට නැත. ලාභසත්කාර මහත්වන්නේ ජේතවනාරාමයෙහි භූමිවිශේෂයනැයි කියා සිතාගෙණ අපටත් එතන තීර්ථකාරාමයක් ඉදිකොටගෙණ වාසය කරන්නට උවමැනවයි සිතා රජ්ජුරුවන්ට නොකියා කළමෝන්නම් භික්ෂූහු කළ නොදෙති සිතා රජ්ජුරුවන්ට අත්ලසක්දී ලබ්බවාගත තනම්හයි සිතා තීර්තකයෝ එක්ව මසුරන් ලක්ෂයක්දී කියන්නාහූ මහරජ්ජුරුවෙනි ජේතවනාරාමය කෙරේ තීර්තකාරාමයක් කරවන්නා අභිප්‍රා ඇත්තම්හ, භික්ෂූ ඇවිත් රජ්ජුරුවන්ට කීකල රජ්ජුරුවන් ඊට අවුලක් නොකියන්නේ යහපතැයි කී යන්නා ගිවිස්සාහ, තීර්ථකයෝ බොහෝ වඩුවන් ඇරගෙණ ජේතවනාරාමයට පිටිපස්සේ කරණ බොහෝ අරගල අසා ආනන්දය මේ කුමන අරගලයක්දැයි විචාරා එපවත් අසා ආනන්දය භික්ෂූ සංඝයා රැස්කරවයි කියා සංඝයා වහන්සේ රැස්කරවා භික්ෂූනි තොප ගොස් රජ්ජුරුවන්ට කියවයි කියන්නා යහපතැයි කියා භික්ෂූන් වහන්ස් රැස්ව රජ්ජුරුවන් කරා ගොස් රජ්ජ්රුරුවන්ගේ වාසල සිට එපවත් කියා යැවුසේක. රජ්ජුරුවෝ තමන් කියන්නට උත්තරයක් නැති හෙයින් ගෙයි නැතැයි කිවුහ. භික්ෂූන් වහන්සේ විහාරයට ගොස් එපවත් සර්වඥයන් වහන්සේට සැලකළසේක. සර්වඥයන් වහන්සේ රජ්ජුරුවෝ අත්ලස්කා මෙසේ කරති සිතා පසුවදවස් දෑගසව්වන් යවයි වදාළසේක. දෑගසව්වන් වහන්සේ දොරකඩ සිට රජ්ජුරුවන්ට කියායවන්නා එවිට රජ්ජුරුවෝ ගෙයි නැතැයි කියා යවුහ. පසුව දවස් සර්වඥයන් වහන්සේ පන්සියයක් රහතුන් වහන්සේ පිරිවරා රජගෙට වැඩිසේක. එවිට රජ්ජුරුවෝ  උඩුමාලෙන් බැස සර්වඥයන් වැඳ පාත්‍රය අතට ගෙණ බුදුන් රජගෙට වඩා ගෙණගොස් වළඳවා අන්තයෙහි එකත්පස්ව උන්නාහ. එවිට සර්වඥයන් වහන්සේ වදාරණසේක මහරජ අත් ලස්බලයෙන් තාපසවරුන් දෙපසක් ගස්වා පෙරත් රජ දරුවෝ බොහෝ විනාසයට පැමිණියෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ හිමාලය වනයෙහි තාපසව පන්සියයක් තාපසවරුන්ට නායකව වාසය කරණ සේක් වස් කාලයෙහි ඒ ඒ තැන සැරිසරා වඩිනාසේක් බරණැස් නුවරට වැඩ නුවර සිඟා උතුරුදිග වාසලින් පිටත්ව ඒ වාසල සමීපයෙහි නුගගසක් මුල වාසය කරන්නාහ. එසමයෙහි අනිකුත් පන්සියයක් තාපසවරුන් ලුනු ඇඹුල් සොයනා පිණිස බරණැස් නුවට අවුත් ඒ තාපසවරු මොත්තමත් නුවර සිඟා දකුණු වාසල සමීපයේ නුගගසක් මුල වාසය කරන්නාහ. මේ නියායෙන් තාපසවරු වස්සාන කාලයෙහි එහි වැස හිමාලය වනයට ගියාය. දෙවනු අවුරුදුත් එම නුවරට එන අවස්ථාවට දකුණු දොර වාසල සිටි නුගගස වැටින දකුණු  දොර වාසල පළමු  අවුරුද්දේ උන්නාවූ තාපසවරු තමන් උන් නුගගස වැටුනුහෙයින් උතුරු දිග වාසල නුග ගසමුල ඉන්ට වන්නාහ. එසමයට උතුරුවාසල නුගගස මුල උන්නාවූ තාපසවරු ඒ නුවරට අවුත් තමන් පළමු උන් නුගගස කෙරේ ගියහ. මේ කියන තාපසවරුන් යන්නාට පළමු අනිත් තාපසවරු මේත් තමන් උන්නු හෙයින් අප පළමු මුරයේ උන් නුගගසමුල උන්නේ කවරනිසාදැයි කියා උන් හා දබර කළාහ. මේ කියන තාපසවරුන් අපි පළමුකොට උන්නමෝ එසේහෙයින් අපි නුග ගසමුල නාරිම්හයි කියා දබරකරන්ට වන්නාහ. මේ නියායෙන් දෙපක්ෂ ඇත්තෝම දබරකොට එපවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ එපවත් අසා පළමුකොට උන් තාපසවරුන්ටමයයි කීහ. එබස් අසා අනික් තාපසවරු මොත්තම ඉරඩියෙර් පළමු චක්‍රවර්ති රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කළාවූ රණ මැදිරියෙක් රජ්ජුරුවන්ට අල්ලස්කොටදී රජ්ජුරුවෙනි අපගේ වාසස්ථානය අපට සලස්වයි කීහ. ඊටත් රජ්ජුරුවෝ ගිවිස්සාහ, එවිට තාපසවරු උනුන්ලා බොහෝ අඬදබර කොට අන්තයෙහි සිතන්නාහූ අපි ගිහිගෙය හැර මහණවුවන් විසින් කළසේ නපුරැයි සිතා එතනින් වහා හිමාලය වනයට ගියහ. දේවතාවෝ මෙතෙක් තාපසවරුන්ට උක්කොටනාකළෝ මේ රජ්ජුරුවෝ වේද මේ රජ්ජුරුවන්ගේ නුවර නසම්වයි සිතා මහමුහුද අල්ලා මහත්වූ වතුරක් එවා ඒ තුන්සියයක් යොදුන් නුවරගලා නැසූහයි වදාරා රජ්ජුරුවෙනි එක්රජ්ජුරුවන් කළාවූ අධර්ම නිසා නැතැක් මනුෂ්‍යයෝ නසිනලද්දාහූ එසේ හෙයින් ඡන්දිවශයෙන් අගතියට යාම යහපත් නොවෙයි කියා රජ්ජුරුවන්ට සර්වඥයන් වහන්සේ අවවාද වදාරා හරු ජාතකය නිමවා වදාළසේක. කෝසල රජ්ජුරුවෝ මේ ධර්මදේශනාව අසා තීර්ථකයන්ගේ ආරාම බිඳවා අලහ. එසමයෙහි ගණශාස්තෘව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# පුණ්ණනදී ජාතකය

තවද මාගේ චින්තමාණික්‍ය වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද.

එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ ඇවැත්නි සර්වඥයන් වහන්සේ මහාපඤ්ඤා මහත්වූ අර්ථ, ධර්ම, නිරුත්ති, ප්‍රතිභානාදී මහත්වූ ප්‍රඥාවෙන් යුක්ත සේක. පුථුපඤ්ඤා, ආකාශයසේ ප්‍රථුල වූ ප්‍රඥාවෙන් යුක්ත සේක. හාසුපඤ්ඤ, හාසුබහුලව, තුෂ්ටිබහුලව, ප්‍රමෝද්‍ය ප්‍රඥාබහුලවූ ප්‍රඥාවෙන් යුක්ත සේක. ජවනිපඤ්ඤ, ජවනභාසෙයගතියක් පරිද්දෙන් සීඝ්‍රවූ පරිද්දෙන් පවත්නා ප්‍රඥාවෙන් යුක්ත සේක. තික්ඛපඤ්ඤ සියුම් වූ ප්‍රඥාවෙන් යුක්ත සේක. නිබෙබධිකපඤ්ඤ, විනිවිද පවත්නාවූ ප්‍රඥාවෙන් යුක්ත සේක. උපායකුසලො ඒ ඒ කටයුත්තෙහි උපායකෞශල්‍ය ඥානයන් ඇතිසේකැයි යනාදීන් ප්‍රඥාපාරමිතාව වර්ණනාකොට වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් සර්වඥප්‍රාප්තව ඉන්දිදී නුවනවිශේෂ වර්ණනාකරන්නේ කිම්ද පෙරත් බෝධිසත්වයෝ නුවනින් අග්‍රප්‍රාප්තයෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය්‍ය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයාට පුත්ව ඉපිද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරි සමීපයට ගොස් සියළු ශාස්ත්‍ර ඉගෙණගෙණ අවුත් පියානන්ගේ ඇවෑමෙන් පුරෝහිත ධුරයට පැමිණ රජ්ජුරුවන්ට සේවය කරන්නාහ. රජ්ජුරුවෝ දුර්ජනයන්ගේ බසින් බෝධිසත්වයන් තමන් ඉන්නා නුවරින් නෙරපුවාහ. බෝධිසත්වයෝ තමන්ගේ අඹුදරුවන් ඇරගෙණ ගොසින් පිටිසර කසීගමෙක වාසය කරන්නාහ. රජ්ජුරුවෝත් කල්යාමකින් බෝධිසත්වයන්ගේ ගුණ සිහිකොට දුර්ජනයන්ගේ බස්නිසා නුවරින් නෙරපමි උන් මා ගෙන්වාගන්ට උවමැනවැයි සිතා මිනිසෙකු අත කැන්දායවින්නම් ඒ තරම් නොවෙයි, එසේ හෙයින් ප්‍රශ්ණක් යවා ඒ ප්‍රශ්නයෙන්ම ගෙන්වාගනිමි සිතා මේ ජාතකයෙහි පළමුවෙනි ගාථාව බැඳයවූහ.

ඒ කෙසේද යත්.

පුණ්ණං නදිං යෙනව පෙය්‍යමාහු ජාතං යවං යෙනව ගුයහාමාහු.

දූරං ගතං යෙනව අවහයනතී සොත්ත්‍යගතොහන්දව භුඤ්ජබ්‍රාහ්මණාති.

කියන ගාථාව යවුහ. මේ කියන ගාථාව හා කවඩුමස් තමන්ගේ අතපේරැස් මුද්දෙන් අස්ඹසවා රජ්ජුරුවෝ බෝධිසත්වයන්ට යවුහ. මෙහි අභිප්‍රායනම් එකපැතිරයන්නාවූ මහවතුරෙහි පැන්බොන්නෝ කවුරුද ගොයම් කුඹුරු ආදීවූ දෙයෙහි සැඟවී ඉන්නෝ කවුරුද දුරගියාවූ මනුෂ්‍යයන් එනනියාව කියන්නෝ කවුරුද බ්‍රාහ්මණයා මේ අභිප්‍රාය හා මේ කියන මස්දනුවයි කීහ. බෝධිසත්වයෝ කියායවූ ප්‍රශ්නය විසඳා වැසිවතුර දියෙහි පැන් බොන්නාහුත් කව්ඩෝය. ගොයම් ආදී දෙයෙහිත් ඉන්නෝත් කව්ඩුවෝය. දුරගියාවූ මනුෂ්‍යයන් එන නියාව කියන්නෝත් කව්ඩෝය එසේ හෙයින් මේ කවුඩුමස් නියාය නැවත ඒ ප්‍රශ්නය විසඳා බලන්නාහු රජ්ජුරුවන් වහන්සේ විසින් වැසි වතුර හා ගොයම් කුඹුරු ආදීවූ දෙයෙහිත් සමුද්ධව ඒ ඒ තෙනට ගියාවූ මනුෂ්‍යයෝ නුවරට රැස්වුව, එසේ හෙයින් බ්‍රාහ්මණය තොසින් නුවරට එවයි කියා සිතා කවුඩුමස් එව්වාට සතුටුව ස්වාමිනි මා කෙරේ කරුණා ඇතිසේකැයි සිතා ගාථාව කියන්නාහු,

යතො මංශං රතී රාජා වාසයමපි පහෙතවෙ

හංසං කොළුා මයුරාව අසනියෙව පාපියා යි.

කියා ගාථාව යවුහ. එහි අභිප්‍රාය දේවයන් වහන්ස මා කෙරේ කරුණාව ඇති නියාව දනිමි කවුඩුමස් එවුගමනින්ම අනික් හංස කොස්ලිහිණි මයුරයන් ආදීවූ පක්ෂීන්ගේ මිහිරිමාංශය ලත්කලක් මා සිතා වදාරන්නේ ඇත්තේවේදැයි කියා මනාවූ රථයට නැගී නුවරට වන්නාහ. රජ්ජුරුවෝ බෝධිසත්වයන් දැක සතුටුව පෙරපරිද්දෙන්ම පුරෝහිත ස්ථානාන්තරදී රක්නාහයි වදාරා මේ පුණ්ණ නදී ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බ්‍රාහ්මණයා උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# කච්ඡප ජාතකය

තවද මාගේ කල්පද්‍රැමවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝකාලිකස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්ථමාන කථාව තක්කාලී ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය. මෙහි මහණෙනි කෝකාලිකස්ථවිරියෝ වස්තු රැක්කනොහි බොහෝ විනාශයට පැමිණියෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව දවස්අරිනාහ. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ බහු භාණ්ඩිව ඉන්නාහ. බෝධිසත්වයෝ මේ රජ්ජුරුවන්ගේ බොහෝකොට දෙඩීම කවරදා අරවාපියම්දෝහෝයි සිත සිතා ඉදිනාහ. ඒ අවධියට එක් හංසයෝ දෙන්නෙක් ඉදිබුවෙකු හා හාදව ඉදිනාහු ඉදුබානෙනි අප හිමාලයවනයෙහි රන්ගුහායෙහි වාසය කරම්හ, එතන ඉතා සිත්කළුය එතන දකින්ට  එව්දැයි කීහ. එවිට ඉදුබා කියන්නේ තොපි නම් පියා අඹ යයි මා කෙසේ යෙම්දැයි කිව එපවත් අසා හංසයෝ කියන්නාහූ තොපගේ කවරැකගත එවුනම් ගෙණයෙම්මයයි කියා ලීයක් කඩාගෙණ දෙන්න දෙකොළවර ඩැගෙන ඉදුබුවා ලීය මැද්දෙන් ඩැගන්නාලෙස සලස්වා පිය අඹාගෙණ නික්මෙන්නට වන්නාහ. ඒ වෙලාවට කුඩාකොල්ලෝ මොත්තමෙක් ඒ හංසයන් දෙන්නා අල්වාගෙණ යන ඉදුබා දැක එම්බල හංසයෝ දෙන්නෙක් ඉදුඹුවෙකු ඩැගෙන ආකාශයෙන් යන්නාහයි අඬගා කීහ. ඒ ඉදිඹු ඒ අසා අපගේ යාළුවෝ අප කෙසේ ගෙණවෙත්වයි තොපට මේ දෙකම ඇයිදැයි සිතා කියන්ට කටදැල්වන දතුරේ බරණැස් නුවර විථිය සමීපයට ආඅවස්ථාවට ඉදිඹු කටදල්වා බිම වැටි දෙකැබැල්ලක්ට පැලී මළහ. නුවර වාසී ඉබ්බෙක් ආකාශයෙන් වැටී මළෝයයි එකකෝලාහල කොළෝය. රජ්ජුරුවෝ එපවත් අසා බෝධිසත්වයන් ඇතුළුවූ අමාත්‍ය මංඩලයා පිරිවරා එතනට ගොස් බෝධිසත්වයන් අතින් හංසයන් දෙන්නෙකු ඩැගෙණ යමින් සිටියදී හුනුයේ කුමන කාරණයකින්දැයි විචාළහ. බෝධිසත්වයෝ එවිට සිතන්නාහූ හංසයන් දෙන්න ඩැගෙණයමින් සිටියදී යම් කෙනෙකුන් කීබසක් නිසා වුන්ට ප්‍රතිවචන කියන්ට සිතා කටදල්වා උනුවයි සිතා රජ්ජුරුවෝ ස්වාමීන් වහන්ගේ බොහෝකොට බස් කීම්අරවන්ට මට උපායෙක් සම්භවීයයි සිතා කියන්නාහූ දේවයන් වහන්ස මේ ඉදිඹු තමාගේ වචනය රැකගතනෙහි බස් කියා මේ අස්ථානයේ වැටින. එසේම යම්කෙනෙක් ජනොත්තමවූ රජ්ජුරුවන් වහන්ස යම්කෙණෙක් වාචාල බස් බිනුනම් උන්ටත් මෙසේම විනාශයට පැමිණෙන්නේ වේදැයි කිහ. එබස් රජ්ජුරුවෝ  මේ කීයේ මයදැයි කීහ. දේවයන් වහන්ස නුඹවහන්සේ සරියයි කීහ. එතැන් පටන් රජ්ජුරුවෝ වාචාළකම් හළහයි වදාරා මේ කච්ඡප ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි හංසයෝ දෙන්නනම් දගසව්වෝය. ඉදුබානම් කෝකාලික ස්ථවිරයෝයය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. අමාත්‍යයව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මච්ඡක ජාතකය

තවද කරුණානාථ වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උකටලී වූ භික්ෂූන් කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

එක් උකටලී භික්ෂූකෙණෙකුන් වහන්සේ දැක මහණ තා ශාසනයෙහි උකටලීවූයේ සැබෑදැයි විචාරා එසේය. ස්වාමිනි කී කල්හි පළමුත් මහණ තෝ මේ ස්ත්‍රිය නිසා තොපට පැමිණි වධ නොදන අසූවූයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට පුරෝහිත තනතුරෙහි සිටිනාසේක. එසමයෙහි එක්දවසක් කෙවුලෝ දැල්දමා මත්ස්‍යයෙකු බදාගෙණ හුනුවැල්ලේලා මේ කියන මත්ස්‍යයා පුළුස්සා කම්මැයි ගිනි මොලවා උල්සමින් සිටියාහ. එවිට මත්ස්‍යයාගේ මත්ස්‍යධේනුව කුමක් සිතාදෝ අඬන්නෝ මා මේ උනුවැල්ලේ ලාපු දුක්ඛයට සසිනා උල් ආදිවූ ගිනි මොලවා කරණදුක්ඛය සියල්ලම මට දුක් නොවෙයි සිතන්නේය. මාගේ මත්ස්‍ය ධේනුව අනික් මසින්තකලා කැටිව එක්ව ගියයි සිතා විකෂේපවේදෝයි සිතා කියන සෝකය මට සෝකයයි සිතා එසේවිසින් මැරිය නොදී යම්පුරුෂයෙක් ඇත්නම් මා දුකින් ගලවයිකියා මහහඬින් හඬුය. ඒ වෙලාවට බෝධිසත්වයෝ නාන්නටයයි කියා ගඟ අසලට ගියාහු මත්ස්‍යයාගේ අඬ අසා කෙව්ලන්ට කියා ඇරගෙණ මත්ස්‍යය ගඟට හලහයි වදාරා මේ මත්ස්‍ය ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ඒ මසින්න හා මත්ස්‍යයානම් උකටලී වූ භික්ෂූ හා පුරාණදුතියිකාය, බ්‍රහ්මණව උපන්නම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සෙග්ගු ජාතකය

තවද මාගේ ස්වාමී දරුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පණ්ණක නම් උපාසකයකු අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්ථතමාන කථාව එකාදසනිපාතයෙහි වූ පණ්ඩිත ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. මෙහි පණ්ණකනම් උපාසකයෝ කීපදවසක් බුදුන් කරා ගොස් බුදුන් දකින්ට ගියහ, ස්වාමින් ඇයි තා මෙතෙක්දා පමාවූයේ ඇයිදැයි විචාළ සේක. ස්වාමිනි මාගේ දුව විමසා නිදොස් නියාව දැන ඔබ්බකට විවාහමගුල් කරවා මගුල් කෙරෙමි ඒ නිසා පමාවිම් කිහ. සර්වඥයෝත් තොප පළමුත් නිද්දෝෂ තැනැත්තිය විමසුයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේකි.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ වෘක්‍ෂදේවතාව ඉපිද වනයේ වාසය කරණ සේක. එක්තරා කෙළඹිපුත්‍රයෙක් තමාගේ දුව විශිෂ්ටවූ රූ ඇති සඳහාත් භාවභාවලීලාකටාක්‍ෂයෙන් තමාට සැක උපන් හෙයින් මේ කන්‍යාස්ත්‍රීය නොවේදෝහෝයි පරීක්ෂාකරන්නට උවමැනවයි සිතා දුව අත අල්වාගෙණ වනාන්තරයට ගොස් කෙලෙස් වසඟව අත ඇල්ලුවාසේ ඇඟවිය. එවිට දූ හයින්ම අඬන්නට වන, එවිට පියා මේ වංචාවෙන් අඬති සිතා කුමක්ද පංචකාම විෂය නම් කාටත් සරිය එසේහෙයින් තොපි කන්‍යාස්ත්‍රිය නොවුනම් අඬන්නේ ඇයිදැයි කීහ. එබස් අසා පියානන් වහන්ස මම එසේවූ පංචකාම රසවිඳිනා සැටියක අනභ්‍යාසයෙහි. අඬන්නී මම දුක්බයක් පැමිණිවේලේ ප්‍රතිෂ්ඨාව සිටිනාවූ දෙමව්පියන් විසින් පැමිණි දුක්බය කාටකියම්ද කියා ඇඬුහ. එවිට පියාත් තමාගේ දුව නිද්දෝෂ නියාව දැන ඒ නියාවට සුදුසු මගුල් කොට ඔබෙම සරණ පාවා දුන්නාහයි වදාරා මේ සෙග්ගු ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ඒ දූනම් මේ දූමය. කෙළෙඹි පුත්‍රයා නම් පණ්ණක නම් උපාසකය, වෘක්‍ෂ දේවතාව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේකී.

SANHIDA LANKA

# කූටවානිජ ජාතකය

තවද මුළුලොවට ගුරුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සොරවෙළඳාම් දන්නා උපාසකයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්?,

සැවැත්නුවර වාසය කරන්නාවූ පණ්ඩිත වෙළඳාය සොර වෙළඳායයි ව්‍යාපාරයෝ දෙදෙනෙක් පන්සියයක් ගැල්වලින් බඩුපුරෝගෙන නැගෙණහිරට බස්නාහිරට වෙළඳාමට ගොස් වෙළඳාම් කොට දෙවැනිව සැවැත්නුවරට අවුත් පණ්ඩිත වෙළඳා වෙළඳාම් කොට ගෙණ ආ බඩු සරියේ බෙදාගණිම්හයි කියා එවිට සොරවෙළඳ සිතන්නේ මෙතෙක්දා කටුක ආහාරකෑමෙන් දුක්බවූ සයන ආදී වූ දෙයෙහි සැතපී රෑපාන නිදිමරා බොහෝ දුක්විඳිනලද, එසේ හෙයින් මිහිරිවූ භෝජනයකා යහපත් වූ යහන්වල සැතපුනුකලට අජීර්ණ වූ ආහාරය හෙයින් දිරවාගත නොහි මියන්නේය. මු මළකල මුගේ සම්පත් ඇරගනිම් සිතා දවස් පසුකරන්නට වන, එපවත් පණ්ඩිත වෙළඳා දැන දසවිටකංසංකොට බඩුසරියේ බෙදාගත, පසුවදවස් ගඳ දුන්මල් පහන්ගත් අත් ඇතිව බුදුන් දකින්ට ගියේය. එවිට සර්වඥයෝ ඇයිද උපාසකය කවරද ඇයිදැයි විචාරා ස්වාමිනි මා ආයේ පසළොස් දවසකට ඇතැයි කියන්නා උපාසකය මෙතෙක්දවස් කළ බුද්ධෝපස්ථානයට නායේ ඇයිදැයි විචාරා එපවත් අසා එකියන ව්‍යාපාර පළමුත් වංචා ප්‍රයෝග දන්නෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්.?

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ රජ්ජුරුවන්ගේ අධිකරණනායක අමාත්‍යව උපන්සේක. එසමයෙහි පිටිසර ගමක වාසයකරන්නා වූ එක් ව්‍යාපාරයෙක් බරණැස් නුවර වසන්නාවූ සොර වෙළඳම්කරණ ව්‍යාපාරයෙක් ඇත. ඌ ලගට අවුත් යහළු පන්සියයක් තිබෙන ලෙස කියා පාවාදී ගියේය. ඒ ව්‍යාපාරයත් තමා අභිප්‍රාය නියාවට වියදම් කොට මියන්ගේ මීබෙටි පළු යහළු තිබූගෙයි විසුරුවාලීය. කල්යාමකින් පිටිසර වෙළඳා බරණැස් නුවර වෙළඳා සමීපයට අවුත් මා තොපට තබන්ට දුන් යහළු පන්සියය දෙවයි කීහ. එකීයන වෙළඳා කියන්නේ යහළු පන්සියය මීයෝ කාපූයයි කියා මීබෙටි ගෙනුවත් පෑය. එවිට පිටිසර වෙළඳා අසා එසේද මීයෝ යපළු කෑවුදැයි කියා කිසිදෙයකුත් නොකියා බරණැස් නුවර වෙළඳා හා කැටිව ප්‍රිය කථාකොට ඌගේ පුතා කැඳවාගෙණ ජලස්නානයට යෙමි ඇරගෙණගොස් අනික් ගෙයක සඟවාතබා තුමූ ඉස සෝධා නහා ගෙට ගියේය. එවිට බරණැස් නුවර ව්‍යාපාරිකයා පිටිසර වෙළඳා අතින් තොප හා කැටිව නාන්නට ගිය මාගේ පුතා කොයිදැයි විචාළේය. එවිට කියන්නේ තොපගේ පුතා ගොඩ සිටුවාලා මා නාන්ට බටදී උන් උකුස්සෙක් ගසාගෙණ ගියේය. මමත් අත්පිඩිගා බොහෝ උත්සහාකොට එලවා ගතනුහුනුයෙම් කීහ. එවිට බරණැස් නුවර වෙළඳු කියන්නේ උකුස්සෝ කුඩා කොල්ලන් ගසාගෙණ යෙද්දැයි කීහ. එවිට පිටිසර වෙළඳා කියන්නේ ඒ කියෙත් කාරණමය මම කුමක් කෙරෙම්දැයි කීහ. එවිට බරණැස් නුවර වෙළඳා කියන්නේ තෝ මාගේ දරුවන් කොයිබදෝ සඟවාපිය අවුත් උකුස්සා ගසාගෙණ කියේයයි බොරුකියාදැයි කියා අධිකරණ නායකන්ට කියම්හයි කියා වෙළඳ බෝධිසත්වයන්ට කියන්නේ ස්වාමිනි මේ කියන ව්‍යාපාර මාගේ පුතා නාන්නටයි තමා කැටිව කැන්දාගෙණ ගොස් මේ කොයිබදෝ සඟවාපියා උකුස්සාගෙණ ගියයි කියයි මේ යුක්තිය නුඹ වහන්සේ මැදහත්ව විචාළ මැනවයි කීහ. එබස් අසා බෝධිසත්වයෝ පිටිසර වෙළඳා අතින් මූ කියන්නේ ඇත්තදැයි විචාළාහ. එකියන ව්‍යාපාර කියන්නේ ඇත්තමය මා කියන්නකුත් අසන්නේ යහපතැයි කියා ස්වාමිනි මාගෙන් තුබු යපළු පන්සියය මීයන් කෑකල කුඩා කොල්ලා උකුස්සා ගසාගෙණ යෑම අරුමකින්ද මාගේ යපළු පන්සියය මියන් කෑකළ නියාව සැබෑව බොරුව මටත් විචාර කිව මැනවයි කිය. එබස් අසා බෝධිසත්වයෝ එසේ වීනම් මූකළාවූ වංචාවට ප්‍රතිවංචාවක් කළනියාව යහපතැයි කියා උදන් අනන්නාව ඒ ඒසේමය. මීයන් යපළු කෑකල උකුස්සා කුඩා කොල්ලා ගසාගෙණයාම අපූර්ව කිම්දැයි එසේහෙයින් තා කළ වංචාවට ප්‍රතිවංචාකළ නියාව යහපතැයි කියා නැවත කියන්නාහු තොප මුන්ගෙන් තිබූ යපළු පන්සියය දිපියන්නා තොපගේ පුතා මු පාවාදෙති කියන්නා එවිට යහපැතිය කියා මම යපළු පනසියය දෙමි මාගේ පුතා පාවාදෙවයි කියා ඒ නියාවට උන්ගේ යපළු පන්සියය උන්ට පාවාදී උන්ගේ පුතා උන්ට පාවාදුන්නැයි වදාරා මේ කූටවාණිජ ජාතකය නිවමා වදාළසේක. එසමයෙහි සොරවෙළඳා නම් දැන් සොර වෙළඳාමය එසමයෙහි පණ්ඩිත වෙළඳානම් දැන් පණ්ඩිත වෙළඳාමයි එසමයෙහි අධිකරණ නායකව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# ගරහිත ජාතකය

තවද මුළු ලොවට මව්වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පංචකාමයෙහි ඇලීමෙන් උකටලී භික්ෂූකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

එසමයෙහි එක්තරා භික්ෂූ කෙණෙකුන් වහන්සේ පංචකාමයෙහි ඇල්ම ඇතිව වාසය කරණසේක. එපවත් භික්ෂූන් වහන්සේ දූන සර්වඥයන් වහන්සේට ගොසින් දැන්වූ සේක. සර්වඥයන් වහන්සේ සැබෑද මහණ තා ශාසනයෙහි උකටලීවූයයි විචාරා වදාරන්නා සැබෑව ස්වාමිනි කුමක් කියන්නා කුමක් නිසාදැයි විචාරා ස්වාමිනි පංචකාමයෙහි ඇල්ම ඇත්තෙමි ඒ නිසා කියන්නා මහණ පළමුත් තිරිසන්නු පවා පංචකාමයට නින්දාකළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ වඳූරුව උපන්සේක. වඳුරුව උපන්ගමනේ බෝධිසත්වයන් වහන්සේ එක් වැද්දෙක් වඩාගෙණ ගොස් බරණැස් නුවරට රජ්ජුරුවන් වහන්සේට දින. රජ්ජුරුවෝත් බෝධිසත්වයන් වහන්සේ ක්‍රීඩාචරකොට සලස්වාගත්තාහ. බෝධිසත්වයන් වහන්සේ මනුෂ්‍යයන්ගේ සත්ගුණය ඉගෙණගෙණ ව්‍යවස්ථිට වාසය කරන්නාහ. රජ්ජුරුවෝත් වානරයාගේ ව්‍යාවස්ථික දමන බෝධිසත්වයන් අල්වා ගෙනා වැද්දවූ කියන්නා සොඳුරාගෙණගොස් මේ වඳූරා ඇල්ලුවනයෙහිම ලාපියවයි කියා යවුහ. එකීයන වැදිත් කීලෙසම හිමාලයවනයට ගොණගොස් අළහ. බොහෝ වඳුරෝ බෝධිසත්වයන් අළපවත් අසා ගලතලයක් පිටට එක්ව බෝධිසත්වයන් හා කථා කරන්නාහු. ඇයි කිමෙක්ද මෙතෙක්දවස් කොයිගියේදැයි විචාළහ.බෝධිසත්වයෝ කියන්නාහූ එක්වැද්දෙක් මා අල්වාගෙණ ගොස් බරණැස් රජ්ජුරුවන්ට පෑය. රජ්ජුරුවෝත් මාගේ ගුණ ක්‍රියාව දැක මා මෙතනට අරවාපූ වයි කීහ. වානරයෝ එපවත් අසා විචාරන්නාහු මනුෂ්‍යයන්ගේ ක්‍රියාව කිමෙක්දැයි විචාළාහ. බෝධිසත්වයෝ කියන්නාහූ මා කියන්නේ කිම්දැයි කීප ඇවරක් කීවත් දෙවෙනිව තුන්වෙනිවත් විචාරන්නා බෝධිසත්වයෝ කියන්නාහූ මනුෂ්‍යයන්ගේ අනිත්‍යය දුක්ඛ අනාත්මයයි කියන තිලකුණු නොදන මෙය යන ග්‍රහණින් දවස් අරණාහූ මේ මාගේ රත්රන් අමුරන් මේ මාගේ අඹුදරුවෝ ආදී දෙයයි කියා ඇල්මකොට දවසරිනාහ. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය එක්ව දළිරවුළු ඇති සත්වයතන් පුරුෂයනැයි කියාත් තන හා කන්විදීම හා මේවර ආදීවූ දෙයලා ඉන්නාවුන් ස්ත්‍රියනැයි කියාත් මෙසේ දෙපක්ෂයක් ඇතිව උනුන්ට විවාහ මගුල් ආදීවූ දෙයකොට ස්ත්‍රී පුරුෂයන් එකගෙයි වාසය කොට ස්ත්‍රියගේ ආධිපත්‍යය ඇතිව දවස් අරණාහයි සත්වූපරිද්දෙන් බෝධිසත්වයෝ කීහ. එබස් අසා වානරයෝ අසා නැසියයුත්තක් ඇසුම්හ. නොකියවමැනව නොකියවමැනවයි කියා දෙකණ කණ අත වසාගෙණ නැසියයුතු බස් ඇසූ ගෙල් පොත්තස්ථානයට ගර්හිතශ්ශෛලයයි නම් තබා ඒ වනයේ නොසිඳ අනික් වනයටක ගියහයි වදාරා මේ ගරහිත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි වානරාධිපතිව වඳූරුව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# ධර්මධවජ ජාතකය

තවද මුළුලොවට ප්‍රියවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරියන් සර්වඥයන් වහන්සේට වධයට උත්සාහ කෙරෙති යන මේ කථාව කිය කියා උන්කලට සර්වඥයන් වහන්සේ එතනට වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතු නොවෙයි දේවදත්ත ස්ථවිරියෝ පළමුත් මට වධයට උත්සාහ කොටත් භයක් චකිතයක් පමණකුත් උගුළුවාගත නුහුණුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ කාලනම් සෙනවිරත් කෙණෙක් ඇත්තාහ. ඡත්තපානි නම් මගුල් කපුවෙකුත් ඇත්තාහ. පුරණලද පාරමිතා ඇති බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුරෝහිත තනතුරෙහි සිටිනාහ. නමින් ධර්මධවජ පණ්ඩිතයහ. එසමයෙහි කාලනම් සෙනවිරද්දු අධිකරණ විචාරන්නාහු අත්ලස්කා හිමියන් අහිමියන්කොට අයුක්ති කරන්නාහ. එසමයෙහි එක් බලි අයුක්තියක් විඳගත්තාවූ පුරුෂයෝ අධිකරණයෙන් පැරදා ඉසතිබූ අතින් මොරගහගෙණ යන්නාහු රාජසේවයට එන්නාවූ බෝධිසත්වයන් පස කඩාගණිහී අඬාගෙණ ඇයි ස්වාමිනි කාල නම් සෙනවිරදුන් වහන්සේ යුක්ති අයුක්තිකොට අත්ලස්කා බොහෝ අනර්ථකරන සේක. නුඹ වහන්සේ වැනි ධර්මිෂ්ඨ අමාත්‍යයෙක් ඇතිව ඉන්දිදි අපගේ අන්‍යාය විචාළකල නපුරුදැයි කීහ. බෝධිසත්වයෝ එපවත් අසා කරුණාපුරස්සරව සිතින් යාපත විචාරමි කියා මා හා කැටිව එවයි කියා කැඳවාගෙණ අධි කරණ ශාලාවට ගොස් යුක්තිය වූ පරිද්දෙන්ම විචාරා හිමියන්ට හිමිකළහ. ඒ යුක්තිය දැහැමෙන් සෙමෙන් විචාළනියාව දැනගත් මනුෂ්‍යයෝ බොහෝ සාධුකාර දී යහපත යුක්තිය විචාළ නියාවයි ඝෝෂාකළාහ. රජ්ජුරුවෝ එපවත් අසා කුමන ඝෝෂායෙක්දැයි විචාළාහ. සිටි අමාත්‍යයන් විසින් කාලනම් සෙනවිරදුන් විසින් වරද්දා කී යුක්තියක් ධර්මධවජ පණ්ඩිතයෝ මැදහත්ව විචාළාහ. ඊට බොහෝදෙනා විසින් කරණ ලද සාධුකාර ශබ්දයයි කීහ. එපවත් රජ්ජුරුවෝ අසා බෝධිසත්වයන් ලඟට ආචාරීනි යුක්තියක් යහපත්ව ඇසුනැයි යන්නා ඇසුම්හයි සැබෑදැයි විචාරා එසේය ස්වාමිනි කී කල්හි එවිට රජ්ජුරුවෝ කියන්නාහු ආචාරීනි අදවක්පටන් තෙපිම අධිකරණයේ ඉඳ යුක්ති විචාරවයි කීහ. බෝධිසත්වයෝත් නොගිවිස්සාහ. රජ්ජුරුවෝ ඊ ඊ පිටම අධිකරණ විචාරවයි කී විසින් යහපතැයි ගිවිස එතැන් පටන් හිමියන් හිමිකොට අහිමියන් අහිමි කොට මැදහත්ව යුක්ති විචාරන්නාහ. බෝධිසත්වයෝත් යුක්ති විචාරන්නාට වන්පසු කාලනම් සෙනවිරදුන් කණ අත්ලස් නැතිව ගියේය. ඊට කාංසිව සිතන්න හූ යම්සේ මුන් රජ්ජුරුවන් කෙරේ බිඳුවාමරවාපියන්ට උවමැනවයි සිතා රජ්ජුරුවන් කරා ගොස් කියන්නාහු රජ්ජුරුවන් වහන්ස ධර්මධවජ පණ්ඩිතයෝ නුඹවහන්සේගේ රාජ්‍ය ප්‍රාර්ථනා කෙරෙති කීහ. ආචාරීනි මට එසේ නොසිතෙයි නොගිවිස්සාහ. ඉදින් දේවයන් වහන්ස මා කීවා නොගිවිස්නා සේක් වී නම් සෙට රාජසේවයට එන වෙලාවට සිව්මුදුරු කවුළුවෙන් බලා වැඩ සිටිනා උන් එන්නාවූ ප්‍රතාප දැක මා කීබස් අදහාගත මැනවයි කීහ. රජ්ජුරුවෝත් දෙවැනි දවස් කීලෙසම සිව්මැදුරු කවුළුවෙන් බලාසිටියාහ. බෝධිසත්වයන් එනවෙලාවට බොහෝ දෙන තමන්ගේ යුක්තිය අයුක්තිය කියන නිසා බොහෝ දෙනා වටකොටගත්හ. රජ්ජුරුවෝත් මහත්වූ පිරිවර ඇතිව එන්නාවූ බෝධිසත්වයන් දැක කාලනම් සෙනවිරදුන් කීවේ ඇත්තයයි අදහාගෙණ කාලනම් සෙනවිරදුන්ට කියන්නාහු මෙවිට කුමක්කරමෝදැයි කිහ. එවිට කාල නම් සෙනවිරද්දු කියන්නේ මරවාදම්මවා පියමෝයයි කීහ. රජ්ජුරුවෝත් කියන්නාහු වැරැද්දක් පමුණුවා මිස මරන්ට බැරියයි කීහ. එබස් අසා සෙනවිරද්දු කියන්නාහු ඊට උපායෙක් ඇත. උන් විසින් කොරගත නොහැක්කාවූ මෙහෙයක් කියා ඒ මෙහෙය කොට ගත නුහුනුකල මරවාපියම්හයි කීහ. එවිට රජ්ජුරුවන් කුමක්සෙවු මෙහෙයක් කියමෝදැයි විචාරන්නා දේවයන් වහන්ස උයනක් කරනකල තුන් සතර අවුරුද්දකින් මිසක් මවාගත නොහැක්කය. එසේ වූවා මරවාදමන්නේ යහපතැයි කීහ. එබස් රජ්ජුරුවෝ අසා බෝධිසත්වයන් කැඳවා කියන්නාහු ධර්මධවජ පණ්ඩිතය සෙට උයන් කෙළියක් කෙළනා කැමැත්තම්හ. පළමු උයන පරණව ගියේය. අපට අළුත් උයනක් කරවා පාවාදෙව, සෙට අප එන වෙලාවට කරවාගත නුහුනුවෝ තොපගේ ජීවිතය හානිවෙයි කීහ. බෝධිසත්වයෝත් කාලනම් සෙනවිරදුන් කිනියා දෙයෙක් වනැයි සිතා යහපත දේවයන් වහන්ස පිළිවන්වීනම් කරන්නෙම්වේදැයි කියා ගෙටගොස් ඉස්සෝධා නහා බත් කා ඉක්බිත්තෙහි යානපිට විඝ්ෂේපයෙන් උන්නාහ.

SANHIDA LANKA

එවිට බෝධිසත්වයන් වහන්සේගේ ගුණානුභාවයෙන් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණුවිය. ශක්‍රයෝ මාගේ සම්පත් උදුරාගන්නෝ කවුරුදෝහොයි දහසක් නුවනැසින් මිනිස්ලොව බලන්නාහු

බෝධිසත්වයන් වහන්සේ වික්ෂේපව උන්නියාව දැක එසේවිනම් මො එතනට ගොස් උන්ගේ වික්ෂේපය අරවන්ට උවමැනවයි සිතා බෝධිසත්වයන් වහන්සේගේ ගෙය සමීපයෙහි ආකාශයෙහි සිටියාහ. බෝධිසත්වයෝ තොපි කවුරුදැයි විචාරා මම දෙදෙව්ලොව දෙවියන්ට නායකවූ ශක්‍රදේවේන්ද්‍රයායයි කියා ඔබගේ ගුණානුභාවයෙන් ආමි. තොපි විසින් වික්ෂේපව ඉඳිනා කාරණ කියවයි කීහ. බෝධි සත්වයෝ කියන්නාහු සෙට දවස ස්වාමින් උයන් කෙළියට වඩිනා වේලාවට උයනක් කරවන්නට කීසේක. උයන් නම් තුන්හතර අවුරුද්දකින් මිස කරවාගත නොහැකීළව එක දවසකින් කෙසේ කරවන්දැයි වික්ෂේපව උනුම් කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහු මහාපුරුෂය වික්ෂේප නොව. නන්දනම් චිත්‍රලතා නම් උයම්සේ උද්‍යානට නිර්මත කොටලම් කොතන උයනක් කරවන්දැයි කීහ. බෝධිසත්වයෝ අසවල් තෙන අපගේ රජ්ජුරුවන් වහන්සේට වාසපහසුය එතන උයන ඉදිකරවයි ලකුණු කීහ. ශක්‍රයෝත් එමනියායෙන් අටලොස් රියන් උස ඇති මහා සීමාපවුරක් වටසලස්වා ඊ ඇතුළේ අඹ දඹ ආදීවූ ඵලාපල්ලවයෙන් යුක්තවූ උයනක් මවාගියේය. බෝධිසත්වයෝත් පෙරවරු බත් කා ඉක්බිත්තෙන් ශක්‍රයා නිර්මිත කළාවූ උයන් බලා රජ්ජුරුවන් කරා ගොස් දේවයන් වහන්ස උයන්කොට නිමියේය. උයන්කෙළියට වැඩිය මැනවයි කීහ. රජ්ජුරුවෝත් උයනට ගොස් උයන දැක සතුටුව කාලනම් සෙනවිරදුන් අතින් විචාරන්නාහු අභිප්‍රාය නියාවට උයනකොට නිමියේය. කුමක් කරමෝදැයි කීහ. එවිට සෙනවිරද්දු කියන්නාහු ධර්මධවජ පණ්ඩිතයන් සිතූ ඇසිල්ලෙහිම උයන කොට නිමවනලද, පතසක් මවාලන්ට බැරිදැයි කියා සෙට දවස් වඩිනා වෙලාවට පස් පියුමෙන් සැදෑ සත්රුවන්මය වූ පොකුණක් මවන්නව මෙහෙවර වදාළමැනවයි කීහ. රජ්ජුරුවෝත් යහපතැයි බෝධිසත්වයන් කැඳවා පණ්ඩිතයෙනි උයනවනාහී අභිප්‍රයනි යාවට කොට නිමියේය. ඒ නියාවට පස්පපියුමෙන් සැදුනු සත්රුවන් පොකුණක් සවසට නිමවාලව නොකරවු නම් තොපගේ ජීවිතය නැත්තේ වේදැයි කීහ. බෝධිසත්වයෝත් යහපත දේවයන් වහන්ස පිළිවන්වීනම් කරවන්නෙම්වේදැයි කීහ. එයිත් පළමු පරිද්දෙන්ම දාසක් වක් ඇති සියක් තොට ඇති සත්රුවන්මයවූ රලපාන ඇති පස්පියුමෙන් සැදුනු පොකුණක් මැවීය. බෝධිසත්වයෝ උදෑසනක්සේ ශක්‍රයන්  මැවූ පොකුණබලා රජ්ජුරුවන් ලඟට ගොස් දේවයන්වහන්ස පොකුණ කොට නිමියේය. බලාවදාරන්නේ යහපතැයි කීසේක. රජ්ජුරුවෝ යහපතැයි පොකුණට ගොස් පොකුණබලා සතුටුව කාලනම් සෙනවිරදු අතින් විචාරන්නාහූ සෙනවිරදුනි පත්සත් අභිප්‍රයනියාවට නිමවන ලද මෙවිට කුමක්කරන්නෝමෝදැයි විචාළහ. එවිට සෙනෙවිරද්දු කියන්නාහූ උයන්ටත් පතසටත් සුදුසුනියායෙන් සවදන්තමයවූ මාලිගාවක් කරවන්ට කියන්නේ යහපතැයි කීහ. රජ්ජුරුවෝත් බෝධිසත්වයන් කැඳවා පණ්ඩිතයෙනි පතසට සුදුසුකොට ස්වදන්තමය ප්‍රාසාදයක් කරව ඒ නොකළානම් තොපගේ ජීවිතය නැතැයි කීහ. බෝධිසත්වයෝ යහපැතැයි පිළිවන්නම් කරවන්නෙමි වේදැයි කීහ. එයිත් ශක්‍රදේවේන්ද්‍රයෝ ස්වදන්ත මයින් විසිතුරු කොට මාලිගාවක් ඉදිකළාහ. බෝධිසත්වයෝත් ශක්‍රයන් මැවූ මාලිගාව බලා රජ්ජුරුවන් ලඟට ගොස් දේවයන් වහන්ස මාලිගාවක් කොට නිමවන ලද බලන්ට වඩින්නේ යහපැතයි කීහ. රජ්ජුරුවෝත් ගොසින් මාලිගාව බලා සතුටුව කාලනම් සෙනවිරදු අතින් විචාරන්නාහූ ඇයි ඉතින් කුමක්  කරමෝදැයි සෙනෙවිරදිනි කීහ. එවිට සෙනවිරද්දු කියන්නාහූ  මාලිගාවේ පාන්නොලා මාණික්‍යාලෝකයෙන් බබලන කියායෙන් යාපත් මැණික් මවන්ට කියන්නනියා යහපතැයි කීහ. රජ්ජුරුවෝත් බෝධිසත්වයන් කැඳවා කියන්නාහූ මාලිගාවට සුදුසුකොට ප්‍රදීපාලෝකයක් නැතිව මාණික්‍යාලෝකයෙන්ම ඉදිනා නියායෙන් මැණිකක් මවයි කීහ. එයිත් ශක්‍රයෝ නිර්මිත කළාහ. බෝධිසත්වයෝ එයිත් දැක රජ්ජුරුවන්ට දේවයන් වහන්ස මැණික නිර්මිත කරණ ලදැයි කීහ. රජ්ජුරුවෝත් ඇවිත් බලා සතුටුව මෙවිට කුමක් කරමෝදැයි කාල නම් සෙනවිරදුන් විචාළහ. කාලනම් සෙනවිරද්දු දේවයන් වහන්ස මුන්සිතුදෙයක්ම මෙසේ නිර්මිතවන්නේ දේවානුභාවයෙන, එසේ හෙයින් දේවයන් වහන්ස දෙවියන්ටත් බැරිදෙයක්ම කියම්මයයි කියා කියන්නාහූ චතුරාංගයෙන් යුක්ත වූ උධ්‍යාන පාලකයෙකු මවන්නේ යහපතැයි කීහ. රජ්ජුරුවෝත් එපවත් අසා යහපතැයි කියා බෝධිසත්වයන් කැඳවා උයන හා පතැස හා මලිගාව හා මැනික මැව්වනියාව යහපත ඒ ඇමට රක්ෂාවට චතුරංගයෙන් යුක්තවූ උධ්‍යාන පාලකයකු සලස්වාලවයි කීහ. බෝධිසත්වයන් වහන්සේ යහපත ස්වාමිනි පිළිවන් වීනම් කරවන්නෙම් වේදැයි කියා ඉස සෝධා නහා බත් කා ඉක්බිති සිතන්නාහූ සෙස්ස නම් ශක්‍රයෝ තමන්ට පිළිවන් හෙයින් නිර්මිත කළාහ. චතුරංගයෙන් යුක්ත වූ පුරුෂයෙකු නිර්මිත කරන්ට දෙවියන්ටත් බැරිය. එසේ හෙයින් අනාථයේ අනුන් අත මියෙන්නා බලා වලට ගොස් අසරණව මිය යන්නේ යහපතැයි සිතා කාටවත් නාගවා ප්‍රාසාදයෙන් බිමට බැස අලදොරින් නික්ම වලට ගොස් ගසක්මුල වැඩහිඳ.

SANHIDA LANKA

ලාගෝ අලාභෝ අයසෝ යසෝචා

නින්දා පසංසාච සුඛංච දුක්ඛං.

යන මේ අෂ්ටලෝක ධර්මය සිහි කෙරෙමින් උන්නාහ. ඒ වෙලාවට ශක්‍ර දේවෙන්ද්‍රයෝත් එපවත් දැන වැදිපුත්‍රයෙකුගේ වේශයක් ගෙණ බෝධිසත්වයන් ලඟට අවුත් කීයන්නේ බ්‍රාහ්මණයාණන් වහන්ස සැපසේ ගේදොරව උන්සේක් වේද දූන් මෙසේ උදාකලාව උන්නේවේදැයි විචාළහ. බෝධිසත්වයෝ කියන්නාහූ

සැබෑය වැදිපුත්‍රය ගෝ දොරව උන්නෙත් සැබැව උදකළාව වනාන්තරයේ උන්නොමෝ වේදැයි කියන්නා ඊට කාරණා කින්දැයි ශක්‍රයෝ විචාළහ. බෝධි සත්වයෝ රජ්ජුරුවන් තමන්ට කීදෙයත් තමන් කළ දෙයත් ඇම්ම කියා දන් රජ්ජුරුවන් වහන්සේ චතුරංගයෙන් යුක්තවූ මිනිසෙකු මවන්ට කියා කියන සේක. එ ක මා තබා දෙවියන්ටත් බැරිය එසේ හෙයින් අනාථයෙ මියයන්නා බලාත් මෙසේ ඉද මියන්නේ යහපතැයි උන්නෙමි කීහ. එපවත් ශක්‍රයෝ අසා ඇයි බෝධිසත්වයන් වහන්ස මා වැද්දෙකැයි කියා උන්සේක්ද නුඹ වහන්සේ කිවා කරන්නාවූ මාසේ එකකු ඉන්දදී නුඹවහන්සේ විකේෂ්පව ඉන්නා කාරණා කිම්දැයි චතුරාංගයෙන් යුක්තවූ මිනිසෙකු මවන්ටත් බැරිබවක් සැබැව, ඊට මම උපායෙක් කියමි, ඒ රජ්ජුරුවන්ගේ චත්තපානිනම් මගුල් කපුවා චතුරාංගයෙන් යුක්තය. ඔහු රජ්ජුරුවන්ට පා උයන්ගේ විකමට සලාසාපියවයි කීහ. බෝධිසත්වයෝත් යහපතැයි පෙරලා ගෙට අවුත් ගෙයි සැතපී පසුවදවස් රජගෙට එන්නාහු අතරමගදී ඡත්තපානි නම් කපුවා දැක කියන්නාහූ එම්බල ඡත්තපානිය තොප චතුරංගයෙන් යුක්තදැයි ඇසීය. එවිට කියන්නාහූ මා චතුරංගයෙන් යුක්ත නියාව තොපට කීවේ කව්රුදැයි කීහ. මට කීවේ ශක්‍රදේවේන්ද්‍රයෝ කීහ. ශක්‍රදේවේන්ද්‍රයෝත් කොයිදී දුටුදැයි කියන්නා තමන් වහන්සේ වනයට ගිය නියාව හා සියලලම තත්වූපරිද්දෙන් කීහ. එවිට ඡත්තපානීන් එසේමය මම චතුරංගයෙන් යුක්තයෙමි කීයා එවිට බෝධිසත්වයෝත් ඡත්තපානිගේ අත අල්වාගෙණ රජගෙට ගෙණගොස් දේවයන් වහන්ස මූ චතුරංගයෙන් යුක්තයහ, මුන් උයන් ගොවිකමට සලස්වා වදාරන්නේ යහපතැයි කීහ. රජ්ජුරුවෝත් සැබෑද ඡත්තපානිය තෝ චතුරංගයෙන් උක්තදැයි විචාළහ. එසේය දේවයන් වහන්ස මම චතුරංගයෙන් යුක්තයෙමි කීහ. තොපගේ චතුරංගයෙන් යුක්ත පරිදි කියවයි කියන්නාහූ ඡත්තපානි කියන්නාහූ දේවයන් වහන්ස අනුන්කෙරේ වෛරයක් ද්වේෂයක් නොකිරීමය. මද්‍ය පාන නොකිරිමය. අවිඤ්ඤාණක සවිඥඥණක සියල්ලන් කෙරෙහි ඇල්ම නොකිරීමය. මෛත්‍රී භාවනා කිරීමයයි යන මාගේ චතුරංගයයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ සියල්ලෝම යම් යම් දේකට උනුන්කෙරේ වෛරවන්නාහ, තොප එසේ වෛර නොකරන්නට කවර අරමුණක් නිසාදැයි විචාළාහ. ඡත්තපානි නම් මගුල්කපුවා කියන්නේ මම පෙර රජව ඉපිද බිසවුන්ගේ බස් අසා පුරෝහිත බමුණා බන්දනයට පැමිණිවීම, එතැන්පටන් මා ද්වෙෂය හළේයයි කීහ.

කෙසේද යත්.

එක් සමයක මම මෙරට බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුව ඉපිද එක් ගමණක් යන්නෙමි බිසවුන් සැප පහසු විචාරා සූසැටවරක් මෙහෙකරන්නන් යවිමි. උන් ඇමලා කැටුවම බිසවුන් අනාචාරයේ යෙදී අන්තයෙහි පුරෝහිත බමුණා අත අල්ලාපූ විසින් මම එසේ වූදෙයක් නොකරමි කියා පළාගියහ. බිසව් ඔහු කෙරේ වෛර බැඳගෙන මට බමුණා වරදින්ට උනයි කිහ. රජ්ජුරුවෝත් ඒ ඇත්තියයි කියා අදහාගෙණ බ්‍රාහ්මණයා පිටිතල හයා බැඳගෙණ ලගට ගෙන්වා ගත්තාහ. එවිට බ්‍රහ්මණ දේවයන් වහන්ස මම එසේවූ නොකටයුත්තක් නොකෙළමි. මේ නොකටයුතුකළෝ මෙවර ඇසූ මනුෂ්‍යයෝ සැමදෙනායයි කීහ. රජ්ජුරුවෝත් නත්වූපරිද්දෙන් නියම දැන බිසවුන් කෙරේ කිපුණාහ, පුරෝහිත බමුණාත් දේවයන් වහන්ස දේවීන්වහන්සේට නොකිපුන මැනව ස්ත්‍රීන්ට තිබී ආ ස්වභාවයෙක යම්සේ තමාගේ ඇගින් වැගිරෙන්නාවූ පිළිකුල් ආදීවූ දෙයට යම්සේ කැතනොවෙත්නම් තමාගේ මලමුත්‍ර ආදීවූ දෙයට ඇයි මා විසින් යහපත්වූ අන්නපානය කන බොන ලදදැයි මේ අසූචිභාවයට පැමිණියේ ඇයිදැයි නොකී පෙත්නම් එම ස්ත්‍රීන් විෂයෙහි එමෙන් තොප නොකිපුනමැනවයි කීහ. එබස් ඇසූ මමත් ඒ ජාතියෙහි බමුණානන් කීබස් අදහාගෙණ මේ ජාතියේ පටන් නිවන් දකින ජාති දක්වා කවුරුන්කෙරේත් කෝපයක් නොකරමි අධිෂ්ඨාන කෙළෙමියි ඒ නිසා මම මේ ජාතියෙහි කා කෙරේවත් ද්වෙෂයක් නැත්තෙමි කීහ. එබස් රජ්ජුරුවෝ අසා ඒ වන්නා ඒ සඳහාය, මද්‍යපාන නොකරන්නේ කුමණ කාරණාවක් නිසාදැයි විචාළහ. එවිට චත්තපාණි නම් කපුවා කියන්නේ පෙර මම රජව ඉපිද ප්‍රියපුත්‍ර මාංශය රාමදයෙන් කෑමි. එවක් පටන් මා රා පෙවිලි අළේයයි කීහ.

ඒ කෙසේද යත්.

පෙර මම මේ රටම චත්තපානි නම් රජව ඉපිද මච්ඡමාංස ඇතිව මසක් බත් නොකන්නා ඒ රජ්ජුරුවන්ට එක් දවසක් අරක්කැමියා සෙට දවස් පෝදා පතිවාකම් කරන්ට බැරියයි කියා පළමුවෙනිදාම මස් ඇර තබාගත, එම මස් බල්ලා කාපුවාහ. එවිට අරක්කැමියා රජ්ජුරුවන්ට බත් වඩන්ට හයින් බිසවුන් වහන්සේට කියන්නේ දේවින් වහන්ස රජ්ජුරුවන් වහන්සේට මෛනිමවන්ට තුබූ මස් බල්ලා කාපුව රජ්ජුරුවන් වහන්සේ මස් ඇතිව මිසක් මේ නොනිමවන සේක. එසේ විසින් නිකම්බත් අතලන්ට බම් කීහ, එවිට බිසව කියන්නාහු තොපි ඊට නොබව ඊට උපායක් ඇත, රජ්ජුරුවෝ මාගේ පුතනුවන් කෙරේ බලවත්වූ සෙනග ඇත්තාහ, එසේ හෙයින් මම බත්කන වෙලාව බලා මගේ පුතනුවන් සරහාලා ඔක්කේ තබාලම්, රජ්ජුරුවෝ පුතනුවන් සනස සනසා උන්නාහු දඬමස්ලුවෝ නොලුවෝ නොදන බත්කන්නාහයි කීහ. අරක්කැමියා යහපතැයි කියා ගියේය. රජ්ජුරුවෝත් රාබී මත්විපියා බත් කන්ට උන්නාහ. බිසවුන් රාජ කුමාරයන් ශක්කේ ඉන්දවුහ. එවිට

SANHIDA LANKA

රජ්ජුරුවෝත් බත්කමින් සිටි දඬමස් නොදක ඇයි කොල දඬමස් නැත්තේ ඇයිදැයි විචාරා ස්වාමිනි අද දවස් පෝය නිසා ඊයේ මස් අරන්තිබීමි. ඒ මස් බල්ලෝ කෑවාහ. අද පෝය බැවින් වීදියේ මස් නොලද්දෙමි කීහ. රජ්ජුරුවෝ තොපට මස් සායපමණක් මිසක් මටත් මස් සායදැයි ඔක්කේ උන් රාජකුමාරයන්ගේ බොටුව මිරිකා මේ මස්ගෙණ පිස පියා ගෙණවයි කීහ. අරක්කැමියාත් ඊට උත්තර නොකියා යහපතැයි රජ්ජුරුවන් වහන්සැයි කියා ගොස් මාළු පිස මෙවැඩිය. රජ්ජුරුවෝ ප්‍රියපුත්‍රමාංශය කෑවාහ. එතන සිටියාවූ බොහෝ දෙනා රජ්ජුරුවන් කෙරේ භයින් අඬන්නක්වත් නොකටයුතුයයි යන බසක් වත් කියන්ට අසමර්ථ වූහ. රජ්ජුරුවෝත් බත් කා අත කට සෝධා වැදහෙව නිදා පිබිදුනාහ. එවේලාවට රාමදය සිදින එවිට රජ්ජුරුවෝ මාගේ පුතනුවන් මෙසේ ගෙණවයි කීහ. එවිට බිසව් රජ්ජුරුවන්ගේ පාමුල අඬාහුන. එවිට රජ්ජුරුවෝ මේ කිමෙක්දැයි  විචාරා ඇයි ස්වාමිනි නුඹවහන්සේ දවල් මේ තිමවූයේ ප්‍රියමාංශය නොවේදැයි කීහ. එවිට රාපෙවිල්ලේ දෝෂයෙන් වේද ප්‍රිය පුත්‍රමාංශ කෑයේයයි කියා බොහෝ වික්ෂේපයට පැමිණ මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා රා නොබොමි කළ අධිෂ්ඨාන බලයෙන්  දැනුත් මා රා බොන්නේ නැතැයි කීහ. ඒ අසා රජ්ජුරුවෝ ඒ වන්නාට ඒ සඳහාහ. කා කෙරෙත් තොප ඇල්මක් නැත්තේ කවර කාරණයක් නිසාදැයි විචාළාහ. එවිට ඡත්තපානි නම් කපුවා කියන්නේ කවර කාරණයක් නිසාදැයි විචාළහ. එවිට ඡත්තපානි නම් කපුවා කියන්නේ පසේ බුදුන්ගේ පාත්‍රය බිඳ අවීචිමහා නරකාදියෙහි වැටුනාවූ කෙණෙකුන්ට පියරජව සිට මම බොහෝ දුක් වුනෙමි, එසේ විසින් එවක් පටන් මේ දක්වා එක්කෙනෙකුන් කෙරෙහි ඇල්මක් නොකරන්නේ ඒ කාරණයෙනැයි කීහ.

ඒ කෙසේද යත්.

යටගිය දවස මෙම නුවර කිතවාසනම් රජව උපන්මි. ඒ රජ්ජුරුවන්ට එක් පුත්‍රයෙක් උපන. නිමිතිදන්නා බ්‍රාහ්මණයෝ දේවයන් වහන්ස මේ රාජ කුමාරයෝ යම් දවසක මිසන්නේ පැන් නොලැබයයි කිහ, රජ්ජුරුවෝ ඒ අසා පතරවාසල මහා වැව් සතරක් බන්දා ඇතුළුනුවර ඒ ඒ තැන බොහෝ පතැස් පොකුණු බිඳවා අඹලන් තන්වා ඒ ඒ තැන පැන්තබ්බවා  මේ නියායෙන් දවස් අරණාහ. රාජකුමාරයෝත් වැඩි යුවරජතනතුරු ලැබ දුෂට රාජ කුමාරයෝ යයි යන නමින් ප්‍රසිද්ධවූවාහ. රජ්ජුරුවෝත් තමන්ගේ අඹුදරුවන් ඡායාව මෙන් කැටුවම යන යම් තැනකට කැඳවාගෙණ යන්නාහ. එක්දවසක දුෂ්ට රාජකුමාරයෝ තනිව පියාණන් කැටිව එකනොවී ඇත්කඳපිටව නැගී චතුර ගිනිසේනාව පිරිවරා නුවර ඇවිදින්ට වන්නාහ, ඒ වෙලාවට සිල්වත් ගුණවත් දමුනාවූ ඉඳුරන් ඇති එක් පසේබුදු කෙණෙකුන් වහන්සේ බත්පාත්‍රයක් සිගාගෙණ විථියේ වඩිමින් සිටිසේක. ඒ වෙලේ රජ්ජුරුවන්ලා කැටිව එන්නාවූ බොහෝ පර්ෂිත් පසේ බුදුන් වඳින්ට හා ගුණ කියන්ට වන්නාහ. එවිට යුවරජ්ජුරුවෝ මාවැනි රාජකුමාරයෙක් දක්කදී මේ හිසමුඩු භික්ෂූන් දකින්ට වන්නාහයි පසේ බුදුන්ට කිපි ඇතුපිටින් බැස පසේ බුදුන් කරාගොස් පාත්‍රයට බත් ලද්දේ ඇද්දැයි විචාරා එසේය කුමාරයෙනි වදාරන්නා එවිට යාපත පාත්‍රය බලමමයි පාත්‍රය අතටගෙණ බිමළුලා පයින් මිරිකා සුනුවිසුණුකළාහ. පසේබුදුහු නිකන් නිස්කාරණයේ මේ මාගේ පාත්‍රය බිඳ බොහෝ අකුසල් පුරාගතැයි මූන බැළුහ. ඒ කුමාර තමන්කෙරේ උරනිත් මුනබැළුවයි සිතා කිතිවාසනම් රජ්ජුරුවන්ගේ පුත්වූ දුෂ්ට කුමාරයෝ නම් මම, නුඹවහන්සේ මට උරණව කරන්නේ කිම්දැයි කීහ. පසේ බුදුහු නිකන් නිස්කාරණයේ මේ මාගේ පාත්‍රය බිඳ බොහෝ අකුසල් පුරාගතැයි මූන බැළුහ. ඒ කුමාර තමන්කෙරේ උරනිත් මුනබැළුවයි සිතා කිතවාසනම් රජ්ජුරුවන්ගේ පුත්වූ දුෂ්ට කුමාරයෝ නම් මම, නුඹවහන්සේ මට උරණව කරන්නේ කිම්දැයි කිහ. පසේ බුදු රජානන් වහන්සේ සුන්බත්ව උත්තරපථවූ නන්දමූලපබ්භාරයට වැඩිසේක. ඒ වෙලාවට අවිචිමහා නරකයෙන් ගිනිදැල් ඇවිත් රාජකුමාරයන්ගේ ඇඟ වැදගත රාජකුමාරයෝත්, බොහෝ දාහයට පැමිණ පැන් පිපාසයෙන් පැන්ගෙණවයි කීහ. ඒ වෙලාවට ඒ ඒ තැන තිබූ වැව් පොකුණු පතැස් ආදීවූ තැන තිබූ පැන් එකෙණහිම හිඳිගියේය. පොලොව පලාගෙණ රාජ කුමාරයන් අවිචිමහානරකයට අරගණගියේය, කිතිවාස නම් රජව උපන්නාවූ මම බොහෝ වික්ෂේපවට පැමිණ සිතන්නේ යමකට ඇල්මකිරීමෙන් පව්ද වික්ෂේපයද උපදනේය. එසේ වීසින් මේ ජාතියෙහි පටන් නිවන් දකිනා ජාති දක්වා කිසිම වස්තුවක ඇල්ම නොකෙරෙමි කියා අධිෂ්ඨාන කෙළෙමි එසේ නිසා මේ ජාතියෙහි කිසිදෙයකත් ඇල්ම නොකෙරෙමි කීහ. එබස් රජ්ජුරුවෝ අසා ඒ වන්නා එසේය. සියලු සත්වයන් කෙරේ මෛත්‍රී කරන්නේ කවරකාරණයකින්දැයි කීහ. ඒ කාරණය කියන්නාවූ ඡත්තපානි නම් කපුවා පෙර තාපසව ඉපිද කළාවූ මෛත්‍රී භාවනායෙක අභ්‍යාසයෙන් මේ ජාතියේ මෛත්‍රිය ඇත්තේ යයි කීහ.

SANHIDA LANKA

ඒ කෙසේද යත්

පෙර මේ නුවර අරකනම් තාපසව ඉපිද මෛත්‍රීභාවනා කොට බඹලොව ඉපිද සංවති විවර්තී ආදීවූ සත්කපස් මෛත්‍රී භාවනාකොට බඹලොව ඉපිද ඒ අභ්‍යාසයෙන් දැනුත් මා මෛත්‍රී ආනුභාව ඇත්තේයයි කීහ. එබස් රජ්ජුරුවෝ අසා කිසිම අපරාධයක් නැති ධම්ධවජ පණ්ඩිතයන් කෙරේ මේ කාලනම් සෙනවිරද්දු අන්‍යායෙන්

කන අල්ලස් නිසා උන් මා කෙරේ කනස්සළුයයි සිතා සෙනවිරදුන් කෙරේ කෝපව අමාත්‍යයන් මූන බැලූහ, අමාත්‍යයෝ රජ්ජුරුවන් අභිප්‍රාය දන දුෂ්ටවූ අත්ලස්සොර තා කණ අත්ලස් තිබීගියේයයි කියා නිරපරාධ ධර්මධවජ පණ්ඩිතයන් නසන්ට උත්සාහකළ නියාවදැයි ඇම දෙනාම උනස්සෙන් නැගීසිට කාලනම් සෙනවිරදුන් ඇද බිමහෙලාගෙණ බොහෝ දෙන තමා අතට සම්භවූ කැටමුගුරු ආදීවූ  දෙයින් තළා අල්වාගෙණ නුවරින් පිටත කසලගොඩට ඇදපුවයි වදාරා මේ ධම්මධවජ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි කාලනම් සෙනවිරද්දුනම් දේවදත්ත ස්ථවිරයෝය, ධම්මධවජ පණ්ඩිතව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළ සේක.

SANHIDA LANKA

# කාසාව ජාතකය

තවද මුළුලොවට පිහිටවූ සර්වඥයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත් ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද. මේ කථා උත්පත්තිය වෙළුවනාරාමයෙහිදීය.

ඒ කෙස්ද යත්.

එක්සමයෙක්හි සැරියුත් සාමින් වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි ඒ ගම උපාසකවරු සැරියුත් සාමින්ටත් දේවදත්ත ස්ථවිරියන්ටත් එක් දානයක් දෙන්නට යන්නාහ. එසමයෙහි එක් ව්‍යාපාරයෙක් ලක්ෂයක් වටිනා සළුවක් උපාසකවරුන්ටදී මාත් මේ දානයට මුසුවන්ට  උවමැනවයි සිතා මුසුවිය, එකියන උපාසකවරු දන්දී අත්තයෙහි මේ ලක්ෂයක් වටිනා සළුව සැරියුත් සාමින්ට දෙමෝද දේවදත්ත ස්ථවිරයන් වහන්සේට දෙමෝහෝද්දැයි කියා කථාකළාහ.  ඉන් සමහරු රඳාලා වැඩ පියනසේක, අපගේ දුකෙහි සුවෙහි නොබැදෙන සේක, දේවදත්ත ස්ථිවරයන් වහන්සේ වන්නා මේ ගමේම නිධානයක් සේ පිඩ හිඳ අපගේ දුංකහි සුවෙහි බඳෙනාසේක. එසේ හෙයින් ඔබ වහන්සේට දෙම්මැයි කියා උන්වහන්සේට පිළිගැන්වූහ, දේවදත්ත ස්ථිවරයන් වහන්සේ දාවළුඉරා යහපත්ව ගෙත්තම් කොට කිනිහිර මල් පෙත්තක් මෙන් යහපත්කොට රඳා සිව්ර පෙරවාගත්සේක, වෙළුවනාරාමයෙහි සිට වහන්ද තිස්දෙනෙකුන් වහන්සේ ජේතවනාරාමයට වැඩ සර්වඥයන් දැක ස්වාමිනි දේවදත්ත ස්ථිවිරයෝ තමන්ට නුසුදුසු වූ අරිහධවජය පෙරවියෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකී.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ අසූදහසක් ඇතුන්ට නායකව ඇත්රජව ඉපිද ඇත්සමූහයා පිරිවරා ඒ ඒ තැන ඇවිදිනාහ, ඒ සමයෙහි එක්තරා දුක්ඛිත මනුෂ්‍යයෙක් දළකඩලියා ජීවත්වන්නාවූ මනුෂ්‍යයන් ඉන්නා විථියට ගොස් කියන්නේ තොප ඇමට දළකඩ සම්භවී නම් යහපතැයි විචාළේය. එවිට දළ කඩ කම්මාන්ත කරන්නාවූ මනුෂ්‍යයෝ කියන්නාහු දළකඩ සම්භවීනම් ඉතා යහපතැයි කීහ, එවිට ඒ පුරුෂයාත් නිකන් ගියේනම් ඇත්තු මා මරති පසේ බුදු විලාසයෙන් යෙමි සිතා මනාවූ කාසවස්ත්‍රයක් ඇඳ පෙරව තෙබක් කාසවස්ත්‍රය යට සඟවාගෙණ බෝධිසත්වයන් ආදිවූ ඇතුන් වසන්නාවූ වනාන්තරයට ගොස් ඇතුන් යන්නාවූ මාවත වැඳ සිටියේය. ඇත්තු මොහුදැක පසේ බුදුකෙණෙකුයයි සිතා ආදාරකොට ගියහ. ඒ වැදි ඇමට පස්සෙන් යන්නාවූ ඇත් බලා නොබදමාලා ඇතුමරා දළ ගෙණගොස් විකුණයි. මේ නියායෙන් දවස්පතා ඇතුන් මැරීමෙන් බෝධිසත්වයන් ලගට ගොස් එපවත් කීහ, බෝධිසත්වයෝ එසේවීනම් පසේබුදු විලාසය ඇරගෙණ සිටිනා තැනැත්තාවුත් ඇතුන් මරණ වැද්දෙකු නියාවේදැයි සිතා ඒ මා පරීක්ෂාකරන්ට උවමැනවැයි සිතා පසුව දවස් ඇතුන් සැමටම පස්සේ එන්ට වන්නාහ, එදවසුත් ඒකියන පසේ බුදු විලාසය ගත්තාවූ වැදි බෝධිසත්වයන් දැක තමාගේ තෙබ දැමීය. ඌතුමූ තෙබ බලා වැද්දා මරමි අත බිමගසා දිවගෙණ අවුත් සිතන්නාහු මූ කුමක් වේවා කාසාවවස්ත්‍රය ඇදගෙණ සිටියේය. එසේ හෙයින් මා මරන්ට නොයෙදෙවයි සිතා කියන්නාහු තොපසේවූ පාපිෂ්ටයන්ට මෙබඳු අරහධවජයවූ කාසාව වස්ත්‍රය නොහොබීය තා විසින් මෙතන වැදහිඳ මාගේ ඇතුන් නසන්ට කාරණා නොවෙයි ඉදින් බොහෝ දවසක් තා දිටින්නම් දන්නෙම්වේදැයි කියා භයගන්වා යව්හයි වදාරා මේ කාසාව ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි වැදිනම් මේ දේවදත්ත ස්ථිවිරයෝය. ඇත් සමූහයාට නායකව උපන්නාවූ ඇත්රජ නම් බුදුවූ මම්මයයි වදාළසේකී.

SANHIDA LANKA

# චුල්ලනන්ද ජාතකය

තවද මුළුලොවට ආධාරවූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථිවරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් දවස් ධම්සභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ දේවදත්ත ස්ථවිරයෝ සර්වඥයන් වහන්සේට දුනුවායම් මෙහෙයිම් ආදීවූ බුදුන් නසන්ට බොහෝ උත්සාහ කළාහ, සර්වඥයන්ගේ සීල සමාධිගුණ කරුණා බොහෝ වූ ගුණ දැක දැකත් බුදුන් කෙරේ දායාවක් කරුණාවක් නූපන. එසේ වී නම් දෙවදත්ත ස්ථිවරියෝ මහාතදයෝයයි යන කථාව කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතුනොවෙයි පෙරත් දේවදත්ත ස්ථිවිරියෝ තදයෝම වේදූයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙස්ද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් හිමාලයවනයෙහි අසූදහසක් වානරයින්ට නායකව නන්දනම් වානරාධිපතිව දවස් අරණාහ. බෝධිසත්වයන්ගේ මල්වූ  චුල්ල නන්දානම් වානරයෙකුත් ඇත්තාහ. මේ කියන දෙබෑයෝ අන්ද වූ මෑනියන් රකිනාහ. බෝධිසත්වයෝත් වානරයන් සමඟ පලාඵල සොයා කන්නාහූ පලාඵල තමුනුත් කා වඳුරන් අත පලාඵල මාගේ මෑණියන් වහන්සේට දෙවයි කියා එවන්නාහ. ඒ ගෙණගියාවූ වඳුරෝ තමනුත්කා බෝධි සත්වයන්වහන්සේගේ මැනියන්ට නොදෙන්නාහ, බෝධිසත්වයන් වහන්සේගේ මෑනියෝත් පළාපල නොලැබ ඉතා දුර්වල භාවයට පැමිණියාහ. බෝධිසත්වයෝ දවසක් මෑනියන්ට කියන්නාහූ ඇයි මාගෙන් යවන්නාවූ පලාඵල ඇත්තවුව දුර්වලවන්ට කාරණා කින්දූයි කීහ. බෝධිසත්වයන්ගේ මෑනියෝ කියන්නාහූ පුත තොප එවනපමණක් මිසක් මට නොදෙන්නාහයි කීහ, එබස් බෝධිසත්වයෝ අසා මන් මේවඳුරන්ට රාජ්ජය කරන්නේන් මාගේ මෑනියන් වහන්සේ රැකගන්ට නොපිළිවනැයි සිතා තමාගේ බාලමලනුවන්ට කියන්නාහූ මල තොප විසින් වඳුරුමුලට රාජ්ජයකොට වාසය කරව මම මාගේ මැනියන් වහන්සේ රකිමි කීහ. ඒ අසා බෝධිසත්වයන්ගේ මලනුවෝ කියන්නාහූ මටත් වානරයන්ට රාජ්ජය කරන්ට බැරිය මමත් මාගේ මැනියන් වහන්සේ රකිමි කියා බෝධිසත්වයන් හා දෙන්නම මෑනියන්ද අරගෙණ බරණැස් නුවරට අවුත් බරණැස් නුවර කෙළෙවර මහත්වූ නුගගසක වාසය කරන්නාහ,එසමයෙහි එක්තරා මනුෂ්‍යයෙක් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් ලග අකුරු කරන්නට වන, දිසාපාමොක් ආචාරී මේ ඒ කාලපුරුෂයාය මූට ශාස්ත්‍ර උගන්නා කිම්දූයි සිතා නැවතත් මුගේ උත්සාහ බලවත කුමක්වේවා අකුරු කරවමි සිතා ඔහුට බොහෝ ශාස්ත්‍ර උගන්වා යවන්නාහූ යම්සේ තොපි සාහසික ක්‍රියාවක් එක්කෙණෙකුන්ට හිංසාවක්වත් නොකරවයි කියා අවවාදකියා යවුහ, එකී  පුරුෂයාත් යහපතැයි ගිවිස බරණැස්නුවර කරා ගොස් දැනුගත් අතඇතිව දඩ යම් කොට මස්මරා විකුට ජීවත්වන්නේ එක්දවසක් කිසිම දඩයමක් සමග නොවී ගෙට යන තැනැත්තේ නුවර කෙළවර මහත් නුගගසක් දැක මේගස යම් ඇත්තෙක් ඇද්දෝහෝයි ගසමුලට ගොස් උඩ බැලීය. ඒ වෙලාවට බෝධිසත්වයන් මෑනියන් ඉදිරියේ ඉදුවාගෙණ බෝධිසත්වයන් හා බෝධිසත්වයන්ගේ මලනුවෝ පස්සේ උන්නාහු දුනුගත් අත් ඇති වැද්දාහූ දැක බෝධිසත්වයෝ සිතන්නාහූ මාගේ මැනියන්වහන්සේ මැලි විසින් හා කය දුර්වල විසින් හා නොමරන්නාහයි සිතූහ. වැදිත් එකියන මැහැලි වැදිරිය දැක සිතන්නේ මාගේ ගෙයි කොල්ලෝවත් කාපියවයි සිතා විදින්ට දුන්න නගාගත, ඒ දැක බෝධිසත්වයෝ සිතන්නාහූ මේ වැදි මාගේ මෑනියන් විදින්ට උත්සහ කෙරෙති. එසේහෙයින් මාගේ මෑනියන් වහන්සේට මාගේ ජීවිතය දෙන්ට උවමනවැයි සිතා මලනුවන්ට කියන්නාහූ මම මාගේ මෑනියන් වහන්සේට ජීවිතය පරිත්‍යාගය දෙමි තොපි මාගේ මෑනියන් වහනසේ රකුවයි කියා වැද්දහුගේ දුනුපාසට  අවුත් කියන්නාහූ මාගේ මෑනියන්වහන්සේට ජීවිතදානයදී මා මරා මස් කවයි කීහ. යහපත තොපගේ මෑනියන් වහන්සේට  ජීවිතදානය දෙමි  කියා බෝධිසත්වයන් විද මරා එලාගත තවත් මෑනියන්ට මරන්ට දුන්න ඇදගත, එවට බෝධි සත්වයන්ගේ ලෙනුවෝ මේ වැදි මාගේ මෑනියන් මරන්ට උත්සාහ කෙරෙයි, එසේ හෙයින් පළමුකොට මම මෑනියන් වහන්සේට ජීවිතදානය දෙමි එක දවසක් වීනමුත් රැකෙන සේක්වේදැයි සිතා වැද්දහුගේ දුනුපාසටඅවුත් කියන්නාහූ මාගේ බෑයන් වහන්සේත් මරාපුව මාත් මරාගනුව අප දෙන්නාගේ මස් අදට තොපට ජීවිත්වෙන්ට ඇත. මෑනියන් වහන්සේට ජීවිතදානය දෙවයි කීහ. වැදිත් යහපතැයි කියා බෝධිසත්වයන්ගේ මලනුවන් විද මරා ඉක්බිත්තෙහි මාගේ ගෙයි කොල්ලෝවත් කාපියති සිතා බෝධිසත්වයන්ගේ මට වැදිරිත් විද මරා

SANHIDA LANKA

එල්වාගෙණ තුන්දෙනම කදබැදගෙන නික්මින, ඒ වෙලාවට උගේ ගෙට හෙණක් ගසා දරුවන් දෙන්නත් මැනියනුත් මැරිනි. තමන් ඒ අසා අතතුබූ දුනු දඬු දමා දඩමස් කදත් දමා කඩ ඉරා කරලාගෙණ ගෙටගොස් ගෙයි තුබූ දාගිය කණුවක් ඉස වැටින, ඒ වෙලාවට පොලවත් විවරවී අවිචිමහානරකයෙන් ගිනිදූල් ඇවිත් ඇඟ ඉසවසාගත එවිට නරකයට යමින් සිට කියන්නේ යම්සේ මාගේ දිසාපාමොක් ආචාරින් වහන්සේ විසින් කාකෙරේවත් ද්වෙෂයත් නොකරවයි කියන ලද අවවාදයේ විපාක අදම ලදිමි. ඒ එසේමය, යම්සේ කල්‍යාණ ධර්මයක් කළ කෙණෙක් ඇත්නම් කල්‍යාණධර්ම දකිති, යම් අකුශලයක් කළ කෙණෙක් ඇත්නම් අකුශලයක්ම දකිති, ඒ එසේමය, තමා වපුළාවූ බිජුවටින් නැගෙන්නාවූ ඵලයත් එසේම වේදැයි යනාදින් කියා ගොසින් අවිචිමහානරකාදියෙහි වැටුනාහයි වදාරා මේ චුල්ලනන්ද ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි එකියන වැදිනම් දේවදත්ත ස්ථවිරයෝය. දිසාපාමොක් ආචාරී නම් ශාරීපුත්ත ස්ථවිරිය. එසමයෙහි බෝධිසත්වයන්ගේ මව්වැදිරි නම් ප්‍රජාපතීගෝතමී ස්ථවිරියන් වහන්සේය, බෝධිසත්වයන්ගේ මල්වූ චුල්ලනන්ද වඳුරු නම් ආනන්ද ස්ථවිරියෝය. එසමයෙහි වඳුරන්ට රජව උපන්නාවූ වානර රජනම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේකි.

SANHIDA LANKA

# පුටභත්ත ජාතකය

තවද මුළුලොවට කල්‍යාණමිත්‍ර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් කෙළඹිපුත්‍රයෙකු නිසා මේ ජාතකය දක්වන ලද

ඒ කෙසේද යත්

එක්තරා කෙළඹි පුත්‍රයෙක් පසල්ගම්වාසී එක්තරා මනුෂ්‍යයෙකුට නයක් දී පෙරලා ඒ නය එලවන්නටයි සැවැත්නුවර සිට පසල්ගමට තමන්ගේ නය නොදෙන හෙයින් ඒ නය ඉල්වා ආ කෙළඹි පුත්‍රයා හා ඔහුගේ බිරින්ද නය දරන්නන් හා කැටිව දබරකොට ගෙණ දෙමහල්ලන් බත්කන්ට කියන්දී බතුත් නොකා නික්මුනාහ. අතරමග යනකලට එක්තරා මනුෂ්‍යයෙක් දෙමහල්ලන්ගේ මුහුන වැහැරී තිබූහෙයින් බත්මුල පුරුෂයා අතට දුන්නාහ. ඒ පුරුෂයාත් ඒ බත් ස්ත්‍රීට නොදී කනුකැමැතිව භාර්යාවට කියන්නේ මේ වල සොරු ඇත එසේ හෙයින් තොපි ඉදිරියේ යවයි කියන්නා ඒ ස්ත්‍රීන් ඇත්තකැයි සිතා ඉදිරියෙන් නික්මුනාහ. එවිට ඒ පුරුෂයා බත්මුල උනා බත්කා පියා ස්ත්‍රීයට නියන්නේ එඹල තුමූ ඇම බත් කාපියා තුබූ සියමුලය අපට දුන්නේයයි කිවුය. ඒ අසා ස්ත්‍රිය මා දැක්කදී දුන් බත්මුල මටනොදී තෙමේම කා දැන් මට සිස් බත්මුල පැයයි විඤෙප්පව දෙන්නම එක්ව සැවැත්නුවරට එන්නාවූ ජේතවනාරාමයෙහි පොකුණෙන් නා බුදුන් දැක යම්මැයි සිතා සැපසේ පොකුණෙන් නා සර්වඥයන් වහන්සෙ දකින්ට ගියහ. සර්වඥයෝත් ඒ දෙමහල්ලන් දැක ඈයි උපාසිකාවෙනි උපාසකයන් කෙරේ සෙනඟ ඇත්තේදැයි විචාළාහ. එවිට උපාසිකා කියන්නී ස්වාමිනි මා මුන්ට සෙනග ඇති පමණක් මිසක් මූ මා කෙරෙහි සෙනෙහදය නැත්තාහ. අද අතරමගදී එමෙන් සිටියදී දුන් බත්මුල මා සිටියදී තෙමේ කාපියා මේ කාපියා මේ මාතෘකාකෙර් ඇති සෙනහසයයිකියා කියා සර්වඥයන්ට දන්වූහ. සර්වඥයෝත් උපාකසිකායෙනි දැන්මතු නොවෙයි පෙරත් තොපි මුන්කෙරෙහි සෙනහදය ඇත්තාමය. මූ තොපි කෙරෙහි සෙනහදය ඇත්තාමය මූ තාපි කෙරෙහි කෙරේ සෙනහදය නැත්තෝමය, මම නුවනැත්තන්ගේ බසින් පෙරලා උනුත් කෙරේ සෙනහදය මම නුවවැත්තන්ගේ බසින් පෙරලා උනුත් වහන්සේගෙන් කෙරේ සෙනහදයවූවෝ වේදැයි වදාර ඒ කෙදෙස්දැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ විභායන් දක්වා වදාළසෙක්.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජ්‍යය කරන සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ පුතනුකෙණෙකුන් ඇත්තාහ. ඒ පුතනුවෝ වැඩිවිය පැමිණ රජ්ජුරුවන්ට යුවරජ තනතුරෙහි සිටියාහ. එකියන බාරනාසි කුමාරයන් කෙරෙහි සැකව කියන්නාහූ තොපි පලාගොසින් පාසල් නුවරක ඉඳ ඉක්බිති රාජ්ජය කරන්නට එවයි කීහ. යහපතැයි කියා ඒ රාජකුමාරයෝ තමන්ගේ අගමෙහෙසුන් බිසවූ අත අල්වාගෙණ පසල් රටකට පලාගොස් වාසය කොට උන්කලට පියරජ්ජුරුවන් මළපවත් අසා රාජ්ජයට නික්මුනාහ. අතරමග යනකලට එක්තරා මනුෂ්‍යයෙක් දෙමහල්ලන්ගේ මුහුනු වැහැර තිබුහෙයින් බත්මුල කුමාරයන් අතට දුන්නාහ. ඒ රාජ කුමාරයෝත් තමන්ගේ බිසවුන්ට නොදී කණු කැමැත්තේ බිසවුන්ට කියන්නේ මේ වලසොරු ඇත එසේහෙයින් තෙපි ඉදිරියේ යවයි කියන්නා ඒ බිසවුනුත් ඇත්තකැයි සිතා ඉදිරියෙන් නික්මුනාහ. එවිට රාජකුමාරයෝ බත්මුල උනා බත් කාපියා බිසවුන්ට කියන්නේ එම්බල හැම බත් කාපීය. බත් නොතිබූ සිස්මුල අපට දුන්නේයයි කිය ඒ අසා බිසව මා දැක්කදී දුන්බත්මුල මටනොදී තෙමේ කා සිස්බත් මුලක් පැයේයයි විඤෙප්පව දෙන්නමසමඟව බරණැස් නුවරට අවුත් රාජකුමාරයෝත් රාජ්ජයට පැමිණ බිසවුන්ට අග මෙහෙසුන් තනතුරු දුන්නාහ. ඒ දුන්පමණක් මිසක් කරුණාවක් බිසවුන්ගේ දුක්සුව විචාරන්නක් නැත්තාහ. එසමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්නාහ. එක් දවසක් බිසවු ලඟට ගොස් කියන්නාහූ ඈයි දේවීන් වහන්ස අපසේ වූ වයෝවෘද්ධවයන්ට බත්කඩ ආදීවුදෙය දී සාදුක් විචාරන්ට එපාදැයි කීහ. එබස් බිසව් අසා පියානනි මාගේ පොහොසත්කම් විචාරකට වේද මාත් සංග්‍රහකරන්නේයයි කියන්නා ඇයිද නුඹ වහන්සේ අගමෙහෙදුන් බිසවුන් වහන්සේ නොවේදැයි කියන්නාම අගමෙහෙසුන් බිසවුම්සක් සාමී මා ඇති නියාවත් නොදන්නාසේක.දැන් රාජ්ජ්‍ය පුරුදුවපියා සිතත්නේ කෙසේද පෙර දුප්පත්ගමනේ රාජ්ජය ලබන්ට එන ගමනේ පවා අතරමගදී බත්මුලක් ලත්ගමනේ මට නොදී කාපුසේක. එසේවූද එසේකල දැන් තමාම වේදැයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහූ රජ්ජුරුවන් දැක්කදීත් මා විචාලකල එවිටත් මේ මානේ කියන සේක්දැයි විචාළසේක. යහපතැයි කියම් කීහ, එවිට බෝධිසත්වයෝ කියන්නාහූ එසේවීනම් දැන්මගොසින් රජ්ජුරුවන් ලඟ සිටිම්. නුඹ වහන්සේ එතනට අවමැනවයි කියා බෝධිසත්වයෝ රජ්ජුරුවන් ලඟ කථාකොට කොට සිටියාහ. ඒ වෙලාවට බිසවුන් රජ්ජුරුවන් ලඟට ගොස් රජ්ජුරුවන් වැඳ සිටියාහ, එවිට බෝධිසත්වයෝ බිසවුන් අතින් විචාරන්නාහූ ඈයි දේවීන් වහන්ස නුඹ වහන්සේ අපසෙවූ වයෝවෘද්ධයන්ට බත්කඩ ආදී වූදේයදී දුක්සැප විචාරන්නට එපාදැයි කීහ. එබස් බිසව් අසා පියානනි මාගේ පෝසත්කම් විවරටවේද මාත්

SANHIDA LANKA

සංග්‍රහ කරන්නේයයි කියන්නා එසේ කියන්නේ ඇයිද නුඹවහන්සේ අගමෙහෙසුන් බිසවුන්වහන්සේ නොවේදැයි කියන්නා මා අගමෙහෙසුන් පමණක් මසක් සාමි මා ඇගනියාවත් නොදන්නාසේක. දැන් රාජ්ජය පුරුදුවපියා සිතන්නේ කෙසේද පෙර දුප්පත් සමසේ රාජ්ජ්ය ලබන්ට එන ගමනේ පවා අතමගදී බත් මුලක් ලත් ගමනේ මට නොදී කාපුසේක, එසේකළ දූන් තමා මවේදැයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ මුවෙන් නොබැන ඉවසූහ. ඒ පවත් දැක බෝධිසත්වයන් වහන්සේ බිසවුන්ට කියනසේක් දේවින් වහන්ස නුඹ වහන්සේ කෙසේ කරුණාව ඇතත් රජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේ කෙරේ ඇල්ම නැතුව වාසය කරමින් සිටියද ලගවිසීම රජ්ජුරුවන් වහන්සේ ගේ සිතට සැපයෙක් නැත. එසේ හෙයින් නුඹවහන්සේට මෙතමයයි කියා ඇද්ද සෙසු අනික්ස්ථානයකට ගොසින් ජීවත් වන්නාසේක්දැයි යව. එබස් රජ්ජුරුවෝ අසා තමන්ගේ රාජාශ්‍රී බිසවුන්ට දී එතැන් පටන් ප්‍රියවාසය කළාහමි වදාරා පුටභත්ත ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි ඒ දෙමහල්ලෝ නම් තොපි දෙමහල්ලෝමය. ඒ අමාත්‍යව උන්නෙම් බුදුවූ මම්ම යයි වදාල සේක.

SANHIDA LANKA

# බණ්තියවර්ණ ජාතකය

තවද කුම්ල ජාතකය පළමු කියන ජාතක වලින් ම විස්තරාවසානයෙන් පෙණෙන්නේය.

තවද මුළුලොව එකබන්ධවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයේහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද,

ඒ කෙසේද යත්

කෝසල රජ්ජුරුවන්ට වැඩ පස්නා එක් අමාත්‍යයෙක් අන්තඃපුරයට එක් ද්‍රෝහයක් කළේය. රජ්ජුරුවෝ උන්කෙරේ ක්ෂමා කොට එපවත් සර්වඥයන් වහන්සේට සැලකළාහ. සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකී.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි උන්ගේ එක්තරා වැඩ පස්නා අමාත්‍යයෙක් අන්තඃපුරයට ද්‍රෝහයක් කෙළේය. ඒ අමාත්‍යයාගේ ගෙට උගේ ගෙයි එක්මිනිසෙක් ගෙටවැද ද්‍රෝහකෙළේය. එකියන අමාත්‍යයා තමාගේ ගෙයි ගෙයි ද්‍රොහකළ තැනැත්තහු අල්ලාගෙණ රජ්ජුරුවන්ට පෑ කියන්නේ දේවයන්වහන්ස මට වැඩ පස්සා මාගේ ගෙයි එක්මිනිසෙක් මා ගෙට වැරදින. ඌට කුමක් කරම්දැයි විචාළහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ එම්බල මාගේ ගෙයිත් එක් වැඩපස්නා අමාත්‍යයෙක් ද්‍රෝහකළේය. එසේහෙයින් උන්කෙරේ තොප විසින් මෛත්‍රී කරවයි කීහ. එබස් අමාත්‍යයෝ සාමින් මාත් සිතාය මේ කිවේයයි සිතා එවක්පටන් අන්තඃපුරයට ද්‍රෝහකරන්නට නොසිතීයයි වදාරා බත්තියවර්ණ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි රජව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේකි.

SANHIDA LANKA

# කෝසිය ජාතකය

තවද මුළුලොවට තිලකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසිය රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්ථමාන කථාව ඉකුත්වතසේමයයි දතයුතු

ඒ කෙසේද යත්

එක් රජ්ජුරුකෙණෙක් නොකාලයෙහි යුද්ධයට නික්ම මඟුල්උයන කඳයුරු බැඳගෙණ උන්නාහ. ඒ වෙලාවට එක්බමුණෙක් උනපඳුරක් මධ්‍යයෙහි  සැතපුනේය. කව්ඩෝ උණ පඳුර වටකොටගෙණ උන්නාහ. බකමුනු තමාට බල ඇතිවූ රූපිවත් නොවී දහවල්ම පිටත්විය. එවිට වටකොටගෙණ උන් කවුඩෝ ඔළුවේ ඇන එතන එලාපුවාහ. රජ්ජුරුවෝත් ඒ දැක තමන්ට අමාත්‍යකම් කරමින් සිටියාවූ බෝධිසත්වයන් අතින් මේ කිමෙක්දැයි විචාළහ. බෝධිසත්වයෝ කියන්නාහූ රජ්ජුරුවන් වහන්ස මේ බකමුනා තමාට නොකාලයෙහි පිටත්වූ හෙයින් බොහෝ විනාශයට පැමිණියේය. ඉදින් දේවයන් වහන්ස සබකනොවි සැපසේම පලායන්නේයයි යනාදීන් වදාළසේකී. රජ්ජුරුවෝ ඒ අසා යහපතැයි සිතා පෙරලා රජගෙට ගියහයි වදාරා කෝසිය ජාතකය නිමවා වදාළ සේකී. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථිවිරයෝය. එසමයෙහි අමාත්‍යයව උන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේකී.

SANHIDA LANKA

# ගුථපාණී ජාතකය

තවද මුළු ලොවට අමාවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා භික්ෂූන් කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සැවැත් නුවර ගව්වක් දෙගව්වක් විව්රකදී උපාසකරුන් දන්නා ගමක් ඇත්තේය, එසේවූ උපාසකවරු බොහෝ භික්ෂූන් වහන්සේලාට ලාබත් පොහොබත් ආදීවූ බොහෝ බත් දානය දෙන්නාහ. එසමයෙහි ඒ ගම ඉන්නා ප්‍රශ්න ගුණ්ඨිකයෙක් ඇත. ඒ තෙම සාමණේර මාළු භික්ෂූන් වහන්සේ අකාල ප්‍රශ්නගුණ්ඨිකයා විසින් දක්නා ලදසේ දන්කාපුවායේ විපාක කීන්දැයි යනාදිනී ප්‍රස්න විචාරයි. එවිට භික්ෂූන් වහන්සේ කියාගත නුහුනුවේලේ තෙමේ බණ කියන්නේය. එසේහෙයින් මූකරණ අලොහලනිසා බොහෝ මාළුවරුන් වහන්සේ ලාබත් පොහොබත් නිසා යන්ට මැලිවූහ. එසමයෙහි පිටිසර සිට භික්ෂූන් කෙණෙකුන් වහන්සේ ජේතවනාරාමයට වැඩිසේක ජේතවනාරාමයෙහි භික්ෂූන් වහන්සේ අතින් ලාබත් පොහොබත් කොයිදී දෙන්නේ දැයි විචාරා අසවල් ගමදී ය ඒ ගමට ප්‍රශ්න ගුණ්ඨිකයෙක් බොහෝ භික්ෂූන් වහන්සේ ගියාවේලේ නොයෙක් ප්‍රශ්න විචාරා ගැහැට කරන්නේය. එසේහෙයින් ඔබ්බට යන්නේ කුමටදැයි කීහ. එවිට භික්ෂූන් වහන්සේ අද දවස ලාබත් මට පමුණුවන්නාහ. මම ඉනිබ්බේ තර්කයක් වාදයක් නොකරණලෙස සලස්වාලමි කීහ. යහපතැයි කියා එදවස් උන්වහන්සේට පොහොබත් සැලැස්වූසේක. උන් වහන්සේත් යහපතැයි ගමට ගොස් ගමකෙළවර සිට සිවර ගැටගන්වන්ට මත්සේක. ඒ වෙලාවට  එකියන ප්‍රශ්න ගුණ්ඨිකයා අන්ට දිවන්නාවූ බැටළුවෙකු මෙන් එතනට අවුත් කුමක්දැයි දන්වලඳන්ට අවුද මේ ගමට වන්නේ එසේ හෙයින් දන් කැවිපාකකින්දැයි විචාලේය. යහපත දන්වළදා ඉක්බිති ප්‍රශ්න කියම්මයයි කීසේක. යහපත කියා ගමට ගොස් කැඳ වැලඳූසේක. ඒ වෙළේ බත් වලදා ඉක්බිත්තෙන් කියම්මයයි කියා ඉක්බිති බත්වලදා අන්තයෙහි ඌ විස්න ප්‍රස්න විචාරන්නා යහපත මෙතනදී බැරිය ගමින් කෙළවරලදි කියම් කියා ඌ හා සමග ගමින් කෙලවරට ගොස් පාසිවුරු එක්තැනක තබා යාපත්කොට අතින්බැට කැඩෙන සැටියේ  ඇන මේ මාගේ ඇන්න බැඳැයින් කුමන විපාකයෙක් ඇද්දැයි කියා අදවක්පටන් මෙගමට ආ මාළුවරුන්වහන්සේ කෙරේ ඉනිබ්බේ ප්‍රස්න විචාළා නම් දන්නමෝදැයි කියා භයගන්වාලා ගියසේක. එතැන්පටන් ඒ භික්ෂූන් වහන්සේලාට ඒ වරපුරුෂයාගෙන් භයනුවූයේය. මේ කථාව එක්දවසක් ධර්ම සභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩඋන්තැනට සර්වඥයන්වහන්සේ වැඩවදාරා මහනෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත්අසා මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් ඒ භික්ෂුන් විසින් උන්ට නිග්‍රහකරණලද්දේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස අඟරට හා මගධරට වාසී සත්වයෝ උනුන් හා සමඟ වෙළදාම් ආදීවූ දෙය කරණ පිණිස උනුන්ගේ රටට යන්නාවූ එක්දවසක් දෙරටවාසී මනුෂ්‍යයෝ මගධරට සීමාව කෙරේ ගඟක් සමීපවයට අවුත් එහි ඉඳ නොයෙක් රා මස් කා බී උන්නාහ. ඒ වෙලාවට එක් කුරුමිණියෙක් එතනට අවුත් මනුෂ්‍යයන් බී ඉතිරිව දමාලූ ගොටුවල තිබූ රා බී මත්ව අසූචිගොඩක්පිට ඉඳ යන්තමක් අසූචි මුග් බරින් සැලියන්නා පොලොවට බරින් ධරාගත නොහෙයි කියා මහත්වූ අහංකාරයෙන් උන්වෙලාවට ත්‍රීමදගලිත හස්තිරාජයෙක් එතනට අවුත් අසූචි දුර්ගන්ධය  අසා පෙරලා කරකැවී නික්මෙන්ට වන්වෙලාවට කුරුමිණියා කියන්නේ ඇයි හස්තිරාජය සපන්වූ සේවායෝ උනුන් දුටුකල බිඳියෙද්ද එසේකල හස්තිරාජයා මා හා යුද්ධකොට යෙද්ද කියා කීය. එබස් ඇත් අසා කරකැවිසිට කියන්නේ තා හා මා හා කුමන යුද්ධ කරන්නේද මාගේ පිරිසිඳුවූ පයින් තා නොමඩින්වුව, දලින් නොහනුන්වුව මාගේ සොඬින් තා නොගසත්වුව, තා උන්ගේ අසූචිපිටය, එසේහෙයින් තට අසූචියෙන් නිග්‍රහ කෙරෙමි කියා කුරුමිණියා ලඟට අවුත් වර්චස් පිඩක් ඌපිට හෙළා මුත්‍රකොට කුන්වනාද කොට නික්මිණ. ඒ කුරුමිණියාත් එතනම ජීවිතක්ෂයට පැමිණියේ යයි වදාරා ගුථපාණි ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කුරුමිණියා නම් ප්‍රස්නගුණ්ඨික නම් පුරුෂයාය, එසමයෙහි හස්තිරාජයා නම් නිග්‍රහකළ භික්ෂූහුය, මේ කාරණය ප්‍රත්‍යක්‍ෂව දුටු වනදේවතාවා නම් බුදුවූ මම්ම යයි වදාළ සේක.

SANHIDA LANKA

# කාමනිය ජාතකය

තවද මුළුලොවට රසායන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසේක් කාමනීය නම් බ්‍රහ්මණයා අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්ථමාන කථාවත් දසවෙනි නිපාතයෙහි විස්තර වශයෙන් දක්නේය.

මෙහි බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ බෑණාවන බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එපයි කියා ඇරපු රාජ්ජය පෙරලා අවුත් ඇරගෙණ ලොභ ද්වේෂ මෝහ ඇතිව රාජ්ජය කරන්නාහ. ලෝභයෙන් රාජ්ජය කරණ නිසා ශක්‍රදේවේන්ද්‍රයෝ දැන මම ගොසින් මේ රජ්ජුරුවන් රවටාපියා අයින්නම් යහපතැයි සිතා බ්‍රාහ්මණාවේෂයෙන් අවුත් කියන්නා දේවයන් වහන්ස බොහෝ ඇත් අස් රථ පාබලසෙනගින් සමුර්ධවූ මුතු මැණික් සංඛසීලාප්‍රවාලාදී අනන්ත රත්නයෙන් සමුර්ධවූ මදසේනාවකින් ජයගත හැක්කාවූ උත්තරපංචාල නුවරය ඉදිපත්නුවරය කෙනෙක්ම් රාජධානිය යන තුන්රයක් දැක නුඹවහන්සේට කියන්ට සිතා ආමි එසේ හෙයින් ප්‍රපංචනොකොට සෙට උදෑසනක්සේ චතුරංගීනි සේනා සමුර්ධිකොට නික්මෙන්ට උවමැනවයි කීහ. රජ්ජුරුවෝත් ඒ අසා සතුටුව උදෑසනක්සේ මාකරා එවයි කියා යැවුහ. ශක්‍රදේවේන්ද්‍රයෝත් තමන්ගේ ශක්‍රභවනයට නැගීගියාහ. රජ්ජුරුවෝත් පසුදවස් චතුරංගනීසේනාව සමුර්ධකොට ඊයේ අපට රාජ්ජාය තුණක් දෙම්මැයි කිබ්‍රහ්මන මාණවකයා කොයිද්දැයි කියා අමාත්‍යයන් අතින් විචාළාහ. අමාත්‍යයෝ කියන්නාහූ අප විසින් උන්ට ගොසින් බුලතක් දෙන්ට සැලැස්සුවේ නැත ස්වාමීනි විසින් සලක්වා වදාළේද්දැයි විචාළහ. රජ්ජුරුවෝ මා එසේ කළාදෙයත් නැත. එසේවුවත් එක්තෙනක ඉදිය ගොසින් බලවයි කීහ. යහපතැයි අමාත්‍යයෝත් ඒ ඒ තැනබලා නුදුටුවාහ. රජ්ජුරුවෝත් එසේවීනම් අපගේ කිසි සංග්‍රහයක් නෙකළ විසින් ඉනිබ්බේ රටකට ගියාවනැයි සිතා බොහෝ වික්ෂේපයට පැමිණ මා විසින් බොහෝ ලාභයෙන් පිරිහෙනකල දැයි කලකිරී ඒ නිසාම ලයහුණුව රක්තිප පාත අතීසාරයට පැමිණියාහ. බොහෝ වෙදවරුන් විසින් පිලියම්කරණලදුවත් සහනයක් නුදුටුවාහුය. එපවත් ශක්‍රයෝ දැන මා විසින් එතනට ගොසින් රජ්ජුරුවන්ගේ සෝකයත් අරවලා ලෙඩෙත්සුවකොට රජ්ජුරුවන්ගේ මාලිගාව දොරකඩ සමීපයෙහි සිට වෙඳකම් දන්නා වෙදෙකි රජ්ජුරුවන්ගේ රක්තානිසාරය සුවකරන්නට ආමි කිහ. රජ්ජුරුවෝ එපවත් අසා මහවෙදවරුන් පිළියම් කරණලදුව සුවකොටගත නුහුණු ව්‍යාධිය සුවකරන්නට මුන්ට පිළිවන්ද යම්ලාභයක් කොටපියා යවාපිය වයි කීහ. එපවත් ශක්‍රයෝ අසා මම ලාභයක්තකා ආවෙම්නොවෙමි. රජ්ජුරුවන් වහන්සේගේ ලෙඩ සුවකරණ පිණිස ආමි කීහ. එබස් රජ්ජුරුවෝ අසා එසේවීනම් කැඳවයි කියා තමන් ලඟට ගෙන්වාගත්තාහ. ශක්‍රයෝත් රජ්ජුරුවන් ලඟට අවුත් රජ්ජුරුවන්ට කියන්නාහූ දේවයන් වහන්ස රක්තපිත්ත ඇති සාරය ඇතිවනලක හයින් ශෝකරයෙන් හා ආදීවුදෙයින් ඇතිවන්නේය. නුඹ වහන්සේට ඇතිවූයේ කුමන කාරණයක් මුල්වද ඒ කිවෝත්වේද නිදන් දැන පිළියම් කරන්නේයයි කීහ. එබස් රජ්ජුරුවෝ අසා එම්බල බ්‍රාහ්මණය එක් තරා බ්‍රහ්මණ මාණවකයෙක් මාකරා එලඹ පංචරට හා ඉදිපත් නුවර හා කෙකයකම් රට හා යන රට තුනක් මට සාදාදෙමිකියා කීය. මමත් ඔවුන්ට කිසි සංග්‍රහයක් නොකෙළමි. ඒ තෙම ඒ නිසා කටයුත්තක් කීමට සංග්‍රහයක් නොකළ සේකැයි සිතා ඔබ්බේ රටකට ගියේවනැයි සිතා මා විසින් අපරීක්ෂා කාරීවිමෙන් මේ නිසා ලාභයකනින් පිරිහි ගියෙමි සිතා උපන්නාවූ සෝකය මුල්කොටගෙණ මේ ව්‍යාධිය ඇතිවීයයි කීහ. එබස් ශක්‍රයෝ අසා රජ්ජුරුනි බරණැස් නුවරට හා ප්‍රාර්ථනාකරන්නාවූ නුවර තුන ඇතුළුව රාජ්‍ය සතරකට තොපි රාජ්‍යය කරවානමුත් සතර නුවරින් පිළිසතරක් අඳුද සතරනුවරක රාජ්‍යය වාතන සතරකට නැගී යව්ද එසේ නොයන විසින් තමා කෙරේ පැමිණ රාජ්‍යයට ලෝභකිරීමෙන් පැමිණියාවූ ආයාස දුටු සේක්වේද එසේ විසින් නුඹවහන්සේගේ ව්‍යාධියට හා හැර දඹදිව අනික් වෛද්‍යයෙක් පිළියම්කළ නොහෙයි කීහ. එවිට රජ්ජුරුවෝ යහපතැයි වෛද්‍යයානෙනි තොප විසින් දන්නා යම් උපායකින් මාගේ සෝක සන්හිඳුවා ව්‍යාධි සුවකරවයි කීහ. එවිට ශක්‍රයෝ යහපතැයි කියා රජ්ජුරුවන්ට අවවාද කියන්නාහූ මහරජ්ජුරුවවෙනි යම්සේ ලොභ ද්වේෂ මෝහාදිවූ දෙය නුවනැත්තන් විසින් ප්‍රසංසාකරනු නොලැබෙයි. ඉඳුරාම එයත් අකුසලට භාජනව තිබෙයි කියා නරකාදිවූ දුකට පමුණුවාලවයි කියා නරක දක්වා රජ්ජුරුවන් භයගැන්වූහ. ඉක්බිති රජ්ජුරුවෙනි ඉනිබ්බේ තොප විසින් රාග ද්වේෂ මොහාදී පාපයන් දුරුකොට දශරාජධර්මයෙන් අකොප්‍යව රාජ්‍යයකොට ශක්‍ර සම්පත් අත්පත්කරවයි කිහ. රජ්ජුරුවොත් ශක්‍රයන්ගේ බස් අසා තමන් සිත ලොභය අළඟ එක්ෂණයෙහි ව්‍යාධියත් සන්සිඳෙන, ශක්‍රයෝත් තමන්ගේ දිව්‍ය භවනයටම ගියහ. රජ්ජුරුවෝත් දැහැමෙන් සෙමෙන් රාජ්ජය කොට මියපරලොව ගියාහයි වදාරා කාමනීය ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් මෙසමයෙහි කාමනීය බ්‍රාහ්මණයාය, ශක්‍රදේවේන්ද්‍රව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# පලාස ජාතකය

තවද මුළුලොවට නිවන්සුව දෙන්නා සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පලාස පරිබ්‍රාජකයන් අරභයා මේ ජාතකය දක්වන ලද,

ඒ කෙසේද යත්.

පලාස නම් එක් පරිබ්‍රාජක කෙණෙක් මුළු දඹදිව තමන් හා සරිව වාදකරණ කෙණෙක් නැතිව සැවැත්නුවරට අවුත් මා හා සමඟ තර්ක කරන්නේදැයි කීහ. එවිට නුවරවාසී පරවද මදිනවූ සර්වඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි තාසේවූ පරිබ්‍රාජකයෝ සියෙක් දහසකුත් ඔබවහන්සේ දැක්කදී එකබසකුත් කියාගත නොහෙන්නාහයි කීහ. එබස් පරිබ්‍රාජකයෝ අසා එසේ නම් මාත් ශ්‍රමණභවත් ගෞතමයන්ලා කැටිව කථාබුදක් කොට පියන්ට උවමැනවයි සිතා බොහෝදෙනා පිරිවරාගොස් ජේතවනාරාමයෙහි සැත්වන දොරටුව දැක මේ සර්වඥයන් වසන්නාවූ ශ්‍රී ගන්ධකුටියදැයි විචාළේය. එපවත් අසා මනුෂ්‍යයෝ කියන්නාහු පරිබ්‍රාජකය සර්වඥයන් වසන්නාවූ ගඳකිළි වෛජයන්ත ප්‍රාසාදය මෙන් තුබූයේය. මේ වනාහී සත්වන දොරටුවයයි කීහ. එබස් පරීබ්‍රාජකයා අසා සත්වන දොරටුව මෙසේවනකල ඉන්නා ගණය කෙසේ තිබේද එසේවූ තෙන ඉන්නා සර්වඥයන්ගේ නුවන කෙබඳුදැයි තර්කකරන්ට හයින්ම බිඳී පලාගියේය. බොහෝ උපාසකරුත් ඔල්වරහඬ ගසා සර්වඥයන් සමීපයට ආහ. සර්වඥයෝත් ඇයි උපාසකයෙනි නොකල්වේලේ අවනැයි විචාරා එපවත් අසා මේ පරිබ්‍රාජක දැන්මතුනොවෙයි පළමුත් මාකරා අවුත් සත්වන දොරටුවදැක බිඳීපලාගියේවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකී.

ඒ කෙසේද යත්

යටගිය දවස ගන්ධාරරට තක්සලා නුවර බෝධිසත්වයන් රාජ්ජය කරන සමයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුත් තක්සලා නුවර ගනුම්හයි චතුරංගී සේනාව පිරිවරා නුවරට අවුත් මාගේ ත්‍රිමදගලිත යුද්ධ හස්තිසේනාව මෙලෙස මෙහෙයත්වයි. ඒ නියායෙන් සන්නාහ සන්නද්ධ වූ අශ්ව සේනාව මෙලෙස මෙහෙවත්වයි. රථාලංකාරයෙන් සරහනලද රථ සමූහය මෙලෙස දිවෙත්වයි සැරවර්ෂාවක්මෙන් සැරවර්ෂයාවත්වයි කඩුගත්තාවූ යෝධයෝ ඒ ඒ තැනින් පැනනැගී මනුෂ්‍යන් පොළුගසත්වයි යනාදීවූ සේනාවට විධාන කෙරෙමින් නුවරට අවුත් සත්වන දොරටුව දැක මේ රජ්ජුරුවන් ඉන්නා මාලිගාවදැයි විචාරා මනුෂ්‍යයන් විසින් මේ මාලිගාව නොවෙයි සත්වන දොරටුවයයි අසා දොරටවු මෙසේ කළරජ්ජුරුවන් ඉන්නා මාලිගාව කෙසේදැයි සිතා බිඳී ගියහයි වදාරා මේ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් පලාසපරිබ්‍රාජකය තක්සලා නුවර රජව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේකි.

SANHIDA LANKA

# ද්විතීය පලාස ජාතකය

තවද මාගේ ස්වාමිදරුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසමයෙහි පලාස පරිබ්‍රාජකය නම් එකෙකු අරභයා මේ ජාතකය දක්වන ලද

ඒ කෙසේද යත්,

පලාසනම් පරිබ්‍රාජකයෙක් බොහෝ මනුෂ්‍යයන් පිරිවරා ජේතවනාරාමයට සර්වඥයන් හා තර්කයට ගොස් සර්වඥයන්ගේ චන්ද්‍රමණ්ඩලයමෙන් සශ්‍රීක වූ මුඛශ්‍රීය දැක මා මුන්ලා කැටිව තර්කකරන්නට බැරියයි සිතා පිරිස් හඬ පවත්වා සිටියාහ, සර්වඥයෝත් උපාසකවරුනි දැන්මතුනොවෙයි පෙරත් මාගේ මුඛමණ්ඩලය දැක බිඳුනේවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නමින් බෝධිසත්වයන් වහන්සේ රාජ්‍යය කරණ සමයෙහි තක්සලා නුවර රාජ්ජය කරන්නාවූ රජ්ජුරුකෙනෙක් චතුරංගී සේනාව පිරිවරා බරණැස් නුවර වටකොට ගත්හ. එවිට ගන්ධාර නම් රජ්ජුරුවෝ තමන්ගේ සේනාවගේ බලය කියන්නාහූ රථවල නගන්නාවූ බොහෝ ධජවලින් සම්පන්න වූ මාගේ චතුරංගිනි සේනාව පිරිවරා ඉක්මවා බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කෙසේ පලායෙද්ද මහා සමුද්‍රයෙහි යම්සේ පක්ෂියෙක් පියඅඹා තීරණයක් දක්ක නොහෙද්ද යම්සේ මහත්වූ පර්වතයක් පුළුන් රැලකින් සොලවාලිය නොහෙද්ද එමෙන් මාගේ චතුරංගිනි සේනාව තොප විසින් බිඳුවා පිය නොහැකියි කියා කීහ. එබස් අසා බරණැස් රජ්ජුරුවෝ අට්ඨාලයෙහි සිටිතැනැත්තෝ  ගන්ධාර රජ්ජුරුවන්ට කියන්නාහූ එඹල තොපි විසින් නිකම් ප්‍රලාප කීම්කිම්ද තොපගේ සේනාව විසින් මාගේ සේනාව මැඩපියන්ට බැරිය කියා කීහ. එබස් අසා ගන්ධාර රජ්ජුරුවෝ බරණැස් රජ්ජුරුවන්ගේ පුන් සඳක් සමානවූ මුඛශ්‍රීයක් ඇති රජ්ජුරුවන්ට මා විසින් යුද්ධකරන්ට බැරියයි සිතා තමන්ගේ රටට ගියාහයි වදාරා ද්විතීය පලාස ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ගන්ධාර රජ්ජුරුවෝ නම් පලාස පරිබ්‍රාජකය, බරණැස්නුවර රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# උපාහන ජාතකය

තවද සද්ධර්ම චක්‍රවර්තිවූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරියන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්.

එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරන් වහන්සේ දේවදත්ත ස්ථවිරයෝ ගුරුව සිටිය සර්වඥයන් වහන්සේ කෙරෙහි වැරදි බොහෝ විනාසයට පැමිණියෝ වේදැයි යන කථාව කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාලා එපවත් අසා පළමුත් දේවදත්ත ස්ථවිරයෝ මා හා කැටිව සරිගස්වා බොහෝ විනාශයට පැමිණියෝවේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ හස්ත්‍යාචාරිකුලයෙක උපන් සේක. එසමයෙහි කසීරටින් එක්තරා මාණවකයෙක් බරණැස් නුවරට අවුත් බෝධිසත්වයන් අතින් හස්ති සිල්පය උගත බෝධිසත්වයෝත් හස්තිසිල්පය තමන් දන්නා පරිද්දෙන් ආචාරහාගයක් නොතිබා නිමවම සිල්පදුන්නාහ. එකියන මාණවක තම විසින් සිල්ප නිමවා උගත්නියාව දැන අචාරීන්ට කියන්නේ අචාරීන් වහන්ස මා රජ්ජුරුවන්ට පැමට තරමක් තබා වදාළ මැනවැයි කීහ. යහපතැයි කියා බෝධිසත්වයෝත් රජ්ජුරුවන් කරාගොස් දේවයන් වසන්ස  මාගේ එක් අන්තේවාසිකයෙක් නුඹවහන්සේට සේවය කරන්නෝ කැමතිය. එසේ විසින් ඔහුට තරමක් පදමක් සලස්වා සේවයගන්නේ යහප තැයි කීහ. රජ්ජුරුවෝත් එපවත් අසා එසේවීනම් තොපගේ තරමින් භාගයක් උන්ට සලස්වාලමි. ඒ මානවකයා සේවයකරන්ට කියවයි කීහ. යහපතැයි බෝධිසත්වයෝ එපවත් තමන්ගේ අතවැසියාට කිහ. එබස් අසා අතවැසි කියන්නේ ඇයි මාත් ශාස්ත්‍ර නිමවා උගත්වුව, නුඹවහන්සේගේ තරම් නොබලා භාගලබන්ට කාරණා කිම්දැයි කීහ. එපවත් බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් එසේකළ තොප සරියේ සිල්පශාස්ත්‍ර ඨානාන්තර සරියේ ලැබ ගණිති කීහ. බෝධිසත්වයෝත් එපවත් තමන්ගේ අතවැසියන්ට කීහ. අතවැසි යහපතැයි තර්ක  කෙරෙමි කීහ. එබස් රජ්ජුරුවෝ අසාහසව්‍යචාරීන් හා උන්ගේ ශිෂ්‍යයාගේ තර්කයවෙයි නුවර මුළුල්ලට සැලකළාහ. බෝධිසත්වයෝත් මුන් හා තර්කකරන්නට උවමැනවයි සිතා උපායෙක් සලසන්නාහු ඇතා යන්ට කීවේලේ සිටින්නට හා සිටින්ට කී වේලේ යන්ට හා වදෝන්ට කීවෙලේ නැගීසිටින්ට හා නැගීසිටින්ට කීවෙලේ වදෙන්ට හා යමක් දෙන්ට කිවෙලේ නොදෙන්ට හා නොදෙන්නට කීවෙලේ මීදන්ට හා යනාදී විපරිතග්‍රහ කොට එක්රැයින්ම ඇතා කුකම්පස්කළහ. බෝධිසත්වයෝත් ඇතකු පිට නැගී රාජාගනයට ගියාහ. ශිෂ්‍යයෝත් ඇතුකුපිට නැගී රාජාගනයට ගියේය. බොහෝ දෙනා දෙන්නාගේ වාදබලන්නට එක්වූහ, ඒ හස්ත්‍ය චාරීහූ දෙන්නාත් සමයමව ශිල්ප දක්වන්නට වන්නාහ. එවිට බෝධිසත්වයෝ විපරිත ශිල්ප දක්වන්නට වන්නාහ. එවිට ඒ අතවැස්සවුට ඒ බැරිවිය එවිට බොහෝ මනුෂ්‍යයෝ මේ තෙමේ මේ ආචාරීන් වහන්සේ හා මහග තර්ක කරණලදැයි කියා බොහෝ දෙන කැටමුගුරුදමා ඔහු  එතනම ජීවිතක්ෂයට පැමිණවූහ. බෝධිසත්වයෝත් ඇතු පිටින් බැස රාජ්ජුරුවන් දැක කියන්නාහු දේවයන් වහන්ස යම්සේ සුවපිණිස විදියන් වහන් ඇරගන්නාහ, ඒ වනාහී නොවිතර සෙයින්වත් අසමජයවීමෙන් පයසෙල්ලී බොහෝ විනාසයට පැමිණෙන්නේයයි එමෙන් ශාස්ත්‍රයක් සැප පිණිස ඉගෙණ තමා නීච හෙයින් අසපයටපත් පැමිණෙන්නාහ. සත්පුරුෂයෙකු උගත් ශාස්ත්‍රයක් වීනම් යහපතටත් වන්නේවේදැයි කීහ. එබස්  රජ්ජුරුවෝ අසා බෝධිසත්වයන්ට බොහෝ තරම් පදම් දුන්නාහයි වදාරා මේ උපාහන ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි අතවැසි නම් දේවදත්ත ස්ථවිරියෝය. හස්ත්‍යචාරීනම් බුදුවූ මම්ම යයි වදාළ සේක

SANHIDA LANKA

# වෙණ්ණුථුන ජාතකය

තවද සද්ධර්ම සංඝ වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් කුමාරිකාවක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

බරණැස් නුවර සිටානකෙණෙකුන්ගේ දුවක් ඇත, ඒ සිටානන්ගේ ගෙයි වෘෂභරාජයෙක් ඇත, උෟට එගෙයි ඇත්තෝ දේවතා ස්ථානයෙහි තිබා රකිණාහ. ඒ දුටු කුමාරිකා තමාගේ කෙල්ලක අතින් ඇසිමෙසෙසු ගොන්නියාවට මුන්ට ආදර සත්කාර කරන්ට බලි ඇසිදැයි විචාළාහ. එවිට ඒ කෙළි කියන්නී සෙසු ගොන්නියාවට මේ ගොනාගේ පිට මොල්ලිය මහත්ව තිබෙන හෙයින් මේ වෘෂභරාජයාය. එසේහෙයින් පූජාසත්කාර කෙරෙති කීහ. එබස් ඇසූ සිටුකුමාරිකා එක් දවසක් මතුමාල්තලයේ සිට විථියෙහි යන පිටගැටයක් ඇති මිනිසකු දැක එසේ නම් මේ පුරුෂ මනුෂ්‍යයන්ගේන් උතුම් එකෙක් වනැයි සිතා එසේ හෙයින් මම උතුම් කුලයක උපනිමි මම මුන්ලඟ උනිත්නම් යහපතැයි සිතා තමන්ගේ  ගෙයි කෙල්ලක් ඇරගෙණ අළදොරින් නික්ම එකියන කුදා හා සමග නික්මුනාහ. මේ කථාව සංඝයාවහන්සේ අතර ප්‍රසිද්ධ විය. සංඝ වහන්සේ ධම්සභා මණ්ඩපයෙහි මේ කථාව කිය කියා වැඩ උන්සේක. සර්වඥයන් වහන්සේ  එතනට වැඩ මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි පෙරත් මේ කුමාරිකා මේ කුදාකෙරේ ඇල්මවුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ පසල් ගමෙක සිටුකුලයෙක ඉපිද දූ පුත් දරුවන්ගේන් වර්ධනයට පැමිණියාය. බරණැස් නුවර සිටානකෙනෙක් ඇත්තාහ. ඒ සිටානන්ගෙ දුවනියන් තමන් වහන්සේගේ පුතනුවන්ට පාවාදෙන්ට කතාකොට උන් අවස්ථාවට බරණැස්නුවර සිටානන්ගේ දුවක් ඇත. ඒ සිටානන්ගේ වෘෂභාරජයෙක් ඇත. උෟට ඒ ගෙයි ඇත්තෝ දේවස්ථානයෙහි තබා රකිනාහ. ඒ දුටු සිටු කුමාරිකා තමන්ගේ කෙල්ලක අතින් ඇයි මෙසේ සෙසු ගොන්නියාවට මුන්ට ආදරසත්කාර බලිඇයිදැයි විචාළාහ. එවිට ඒ කෙළි කියන්නී සෙසු ගොන්නියාවට මේ ගොන්ගේ පිට මොල්ලිය මහත්ව තිබෙන හෙයින් මේ වෘෂභරාජයාය එසේ හෙයින් ආදරසත්කාර කෙරෙති කීහ. එබස් ඇසූ සිටු කුමාරිකා එක්දවසක් මතුමාල් තලයෙහි සිට විථියෙහි යන පිට ගැටයක් ඇති මිනිසකු දැක එසේවීනම් මේ පුරුෂ මනුෂ්‍යයන්ගෙන් උතුම් එකෙක්වනැයි සිතා එසේ හෙයින් මම උතුම්කුලයෙහි උපනිමි මමත් මුන්ලඟ උනිත්නම් යහපතැයි සිතා තමන්ගේ ගෙයි කෙල්ලට කියන්නාහු අසවල් පුරුෂයා අසවල්තෙන සිටින්නට කියවයි කියා යවුහ. ඒ පුරුෂයාත් එළසම සිටියේය. එකියන සිටුකුමාරිකාත් උදැසනක්සේ අප්‍රසිද්ධවේශයෙන් අනර්ඝ සම්පතුන් ඇරගෙණ ඇළදොරින් ම එකියනකුදාහා සමග නික්මුණාහ. නික්ම අතර මගට ගොස් එකියන කුදා අතරමගදී රුජාවක් අල්වාගෙණ වකගසාගෙණ හොත්තේය, ඒ වෙලාවට කියන්නාවූ සිටු දූ පාමුල උන්නීය ඒ වෙලාවට බෝධි සත්වයෝ තමන්ගේ පුතනුවන්ට මගුල් නිසා බරණැස්නුවරට යන්නාහූ අතරමග සිටියාවූ සිටු දූ දැක ඇඳිනාගෙණ එසේවීනම් මුන් විසින් තමන්ම සිතාගෙන මුන් පස්සේ ආවනැයි සිතා එවිට සිටුදුවට කියන්නාහූ ඇයි තොපි උතුම්වංශයෙහි ඉපිද මේ කුදා පස්සේ ආයේ ඇද්දැයි විචාළාහ. එවිට සිටු දූ කියන්නී වෘෂභාරාජයා මොල්ලිය නිසා දේවතා තනතුරෙහි තබා ආදරය කරණ හෙයින් මමත් මේ කුදා මනුෂ්‍යයන්ගෙන් උතුම් එකෙකැයි සිතා මූ පස්සේ ආමි කය. එබස් අසා බෝධිසත්වයෝ තමන්ගේ රථයට එසිටුදුව ඉස් සෝදා නහවා, නංවා, ගෙණ තමන්ගේ ගමට ගොස් ශාසනයේ පුතනුවන්ට පාවාදුන්නහයි වදාරා මේ වණ්නුපත්ත ජතාකය නිමවා වදාළ සේක. එසමයෙහි එකියන සිටු දූ නම් මේ සිටු දුවය. පසල්ගම සිටුව උපන්නෙමි බුදුවවු මම්මයයි වදල සේකී.

SANHIDA LANKA

# විකණ්ණව ජාතකය

තවද සද්ධර්මහාප්‍රදීපායමානවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ශාසනයෙහි උකටලී වූ භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද

ඒ කෙසේද යත්

භික්ෂූ කෙණෙකුන් වහන්සේ ස්ත්‍රීයක් නිසා ශාසනයෙහි උකටලීව උන් කෙණෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේ දක්වන්නා මහණ පළමුත් තෘෂ්ණා වසඟවීම නිසා කිඹුලා යම්සේ මූන ඇත්තාවූ ඊ දඬෙන් යම්සේ මළේද එමෙන් විනාශයට පැමිණියයි වදාරා ඒ කෙසේදයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක්.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නමින් බෝධිසත්වයන් වහන්සේ රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එක් දවසක් මගුල් පතයට ගොස් මහත්වූ නැව්නැගී බොහෝ නෘත්‍ය ගීත වාද්‍ය කෙරෙමින් නැවින් ඒ ඒ තැන සෙවච්ඡාපරව ඇවිදිනාහ. මත්සයෝත් රජ්ජුරුවන්ට කියන්නාහු නෘත්‍ය ගීත වාදිත අසා තමුන් රජ්ජුරුවන්ගේ නැව පසුපස්සේ තාලස්ඛන්ධ ප්‍රමාණ මස් කැලය පසුපස්සේ නික්මුනාහ, රජ්ජුරුවෝත් පසුපස්සෙහි නික්මුනු මත්ස්‍යයන් දැක මෙතෙක් මත්ස්‍යයෝ පසුපස්සේ එන්නේ කිම්දැයි විචාරා අමාත්‍යයන් විසින් සේවයකරන්ට පසුපස්සේ එනනියාවයයි කියන්නාහ. එසේකළ අපට කරණ සේවය තරමක් පදමක් උවමැනවයි සිතා අදවක් පටන් මේ මත්ස්‍යයන්ට සාල් අමුනක බත්ලවයි එක්තරා අමාත්‍යයෙකුට භාර කළාය. ඒ අමාත්‍යයාත් එලෙසම බත්ලන්නේය. ඒ බත්කන වේලාවට එක්කිඹුලෙක් නිසා මත්ස්‍යයෝ පමාවන්නාහ. බත් ඉතිරිවන්නාහ, එපවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් කියන්නාහු ඔරුවක් පිට නැගී ගොසින් කිඹුලා මත්ස්‍යයන් කණවේලාවට උල්ගීයකින් විදමරා පියවයි කීසේක. ඒ අමාත්‍යයෝත් ඒ  නියායෙන් කිඹුලාත් මත්ස්‍යයන් කණ වේලාවට ඔරුවක නැගීගොස් බඩින් පිටවන ලෙස අන්නාපුවාහ. කිඹුලාත් බොහෝ වේදනාවට පැමිණ තමා වාසස්ථානයට සින්ට නික්මිණ, එවිට අමාත්‍යයො කිඹුලා නොරැකෙන නියාව දැන කියන්නේ එඹල කිඹුලා තාගේ තෘෂ්ණාව නිමා ප්‍රාණය තොරවන්නේයයි කීහ. කිඹුලාත් තමාවසන ලෙනටම ගොසින් ජීවිතක්ෂයට පැමිණියේයයි සර්වඥයන් වහන්සේ මහණෙනි යම්සේ තෘෂ්ණා වසඟයට විනාසයට පැමිණ කිඹුලා හා සමානයයි වදාරා විකර්ණණව ජාතකය නිවමා වදාළසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# අභිතාබූ ජාතකය

තවද සද්ධර්ම මහාගංගාවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් කුල ස්ත්‍රීයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

එක්තරා කුලස්ත්‍රියක් ඔබ්බේකට පාවාදුන්නාහ. පාවාගත්තාවූ කෙළෙඹි පුත්‍ර එකියන කුමාරිකාව කෙරේ ආදරනැතිව ඉච්ඡාපරව ඇවිදිනේය. එ ස්ත්‍රිත් දහස්ගව්වන් වහන්සේගේ උපාසිකා කුලයෙහි උපන්නේයින් ඊට නමුත් අපේක්ෂාව තමාදන්නාවූ දන් ආදිය දිදී දවසරිති. ඔයිත් දෙදෙනා වහන්සේගේ අවවාදයෙන් සෝවාන් පෙලෙහි පිහිටා මහණවන්ට අභිප්‍රාය ඇතිව දෙමව්පියන්ගෙන් අවකාශ ඉල්වාගෙණ ගොසින් මෙහෙනිසස්නෙහි මහණව විදර්ශනා වඩා රහත්වූසේක. මේ කථාව ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ අසවල් කුලස්ත්‍රිය තමා ගලවාගෙණ නිවන් දක්වාපුවාදැයි යන මේ කථාව කිය කියා  උන්සේක. සර්වඥයන් වහන්සේත් එතනට වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි පෙරත් මූ තමන් ගලවාගෙණ ගියෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයට ඉපිද හිමාලය වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධ්‍යානලාභිව වාසයකරණසේක. එ සමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ වැඩිවියට පැමිණියා වූ රාජ කුමාර කෙණෙක් ඇත්තාහ. ඒ රාජ කුමාරයාත් තමන්ගේ අභිතපානම බිසවුන් ඇරගෙණ හිමාලය වනයට ගොස් බෝධිසත්වයන් වසන්නාවූ පන්සල සමීපයෙහි ගොස් ඉන්නාහ. එසමයෙහි එක්තරා ලියකින්නරාවක් රජ්ජුරුවන් ඉදිරියෙහි නික්මෙන්ටවන. රජ්ජුරුවන් ඈකෙරේ පිළිබඳ සිත් ඇති බිසවුන් කෙරේ අපේක්ෂාව ලියකින්නරාව අල්වම් සිතා පසුපස්සේ නික්මුනාහ. එවිට බිසව් සිතන්නාහූ මේ රජ්ජුරුවන් කැටිව එක්ව දුක්ගෙණ ඇ මා කෙරේ අපේක්ෂාව මේ පක්ෂියක පස්සේ නික්මුනාහ. රජ්ජුරුවන් මට කාරණා  කින්දැයි තාපසයන් කරා ගොස් ස්වාමිනි මා තාපසකරන්නේ යහපතැයි කීහ. යහපතැයි කියා තාපස කළාහ. ඒ කියන බිසවුන් වහන්සේ කිසුනුපිරියම් භාවනා කොට පංච ඉර්ධි අෂ්ට සමාපත්ති උපදවාගෙන තාපසයන් ලඟ සිටියහ. ඒ වෙලාවට ඒ බාරණාසි කුමාරයෝත් කිඳුරු පක්ෂියා සොයාගොස් නොදැක තාපසයන් උන්තෙනට අවුත් සිටියාහ. එවිට බිසව් කියන්නාහූ රජ්ජුරුවෙනි තොප මා ඇර පක්ෂි ධේනුව බලාගිය විසින් මම්ම ධ්‍යානලාභිව ගියෙමි. එසේ හෙයින් නුඹ වහන්සේ නිසා මට බොහෝ ලාභ වූයේය. ඉනිබ්බේ  මේ ජාතියේ නුඹ වහන්සේ හා මා හා සංවාසයෙක් නැතැයි කියා ආකාශයට නැගී ඉර්ධියෙන් ඔබ්බට ගියහයි, රජ්ජුරුවෝත් බොහෝ වික්ෂේපයට පැමිණ කියන්නාහූ යම් පුරුෂකෙණෙක් බොහෝ තෘෂ්ණාවට පැමිණ බොහෝ දුකට පැමිණෙද්ද ඒ කාරණය මාගෙන්ම දිටිමි යම්සේ මම අභිතාපනම් බිසවුන්ගේ වියෝවූ මා වැන්නැයි කීහ. එකියා ඒ රාජකුමාරයෝ තමන්ගේ පියානන් මළපවත් අසා බරණැස් නුවරට ගොස් රාජ්ජය කළහයි වදාරා අභිතාබූ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි බිසවු නම් මෙසමයෙහි මේ භික්ෂූණිහුය. එසමයෙහි රාජකුමාරයෝ නම් මෙසමයෙහි කෙළෙඹි පුත්‍රායය තාපසව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# වච්ඡනඛ ජාතකය

තවද සද්ධර්මවර චක්‍රවර්තී වූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ආනන්ද සාමින් අරහයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

ආනන්ද සාමීන්ගේ යාළු ජුජමල්ල නම් යාළුවෙක් ඇත. ඒ තෙම ආනන්ද සාමින් දකිනා අභිප්‍රාය ඇතිව කියායවිය. අනන්ද සාමින් සර්වඥයන් වහන්සේට දක්වා ඒ ජුජමල්ල නම් යාළුවාගේ ගෙට වැඩිසේක. ඒ කියන යාළුවා ආනන්ද සාමින් බත් මිහිරි කොට වළදවා අන්තයෙහි කියන්නේ ස්වාමිනි මහණව සිටිනා බලාත් සිවුරු ඇරපියා ආවොත් මා හා සමව බොහෝ මුතු මැණික් ආදීවූ සම්පත් විඳිනාසේක්වේදැයි කියා ගිහිගෙයි සම්පත් වර්ණනා කළහ. ආනන්ද සාමිත් ගිහිගෙයි ආදිනව හා මහණවීමේ විපාක හා කියා ජේතවනාරාමයට වැඩිසේක. සර්වඥයෝත් ඒ පවත් අසා ජුජමල්ලයෝ පළ මුත් එලෙසම කීවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එක්තරා බ්‍රාහ්මණ කුළයක ඉපිද හිමාලය වනයට ගොස් තාපසව වාසය කරණ සේක් ලුණු ඇඹුල් සෙවුනා පිණිස බරණැස් නුවරට ආසේක. බරණැස් නුවරට සිටානෝ බෝධිසත්වයන්ගේ ඉරියාපථයෙහි පැහැද සතුටුව බෝධීසත්වයන්ට දන්දෙන්නාහ. මේ නියායෙන් දවස් යාමෙන් බෝධිසත්වයන් හා සිටානෝ උන්කෙරෙහි විස්වාස වූහ. එවිට සිටානෝ  සිතන්නාහූ මේ වච්ඡනක තාපසයන් ගිහිකරවාගෙණ පංචකාම සැප අනුභව කරම්හයි සිතා බෝධිසත්වයන්ට දවසක් දන්දී අන්තයේ කියන්නාහූ වච්ඡනක තාපසයන් වහන්සේ මේ තාපස ක්‍රියාවෙන් බොහෝ දුක එබැවින් එපමණ එසේවූ තාපසයන් වහන්සේ මේ තාපස ක්‍රියාවෙන් බොහෝ දුක එබැවින් එපමණ එසේවූ තාපස ක්‍රියාව ඇර සැපවූ පංචකාම සැපය මා හා කැටිව අනුභව කරන්නේ යහපතැයි කීහ. ඒ අසා බෝධිසත්වයෝ කියන්නාහූ පංචකාම සැපය නම් ආඥානයන්ට සැපයෙක් සේ සිතන පමණක් මිස බන්ධනයක් හා සමානය එසේහෙයින් මෙදුක්ඛය මේ ඇරසැපසේ තාපස ක්‍රියාාවෙන්  වනමුල් ඵලාඵලකා සැපසේ දවසරිනේසය යාපතැයි කියා තමන් වසන්නාවූ හීමාලය වනයට ගියහයි වදාරා මේ වච්ඡනක ජාතකය නිමවා වදාළ සේකී. එසමයෙහි සිටාණෝ නම් මේ කියන ජුජමල්ලවයෝය. එසමයෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේකී.

SANHIDA LANKA

# බක ජාතකය

තවද සද්ධර්ම මහා සමුද්‍රවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වංචාප්‍රයෝග දන්නා භික්ෂුකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්.

එක් වංචාප්‍රයෝග දන්නා භික්ෂූන් කෙණෙකුන් වහන්සේ මාළු සිවුරක් සකස් කොට ගෙත්තම් කොටගෙණ ජේතවනාරාමයට ආසේක. ජේතවනාරාමයෙහි වහන්ද සිවුරදක මේ සිවුර අපට දුන මැනවයි කියන්නාහු අප දුකසේ ලබාගත් සිවිර දෙන්නේ කෙසේදැයි කියන්නා එසේවීනම් අපගේ අළුත් පිළිඇරගෙණ සිවුර අපට දුන මැනවයි කියා පිළිඇගෙණ සිවුර දුන්නාහ. ඒ කිලිටු සිවුර සෝදාපු ගමනේ රෙදි සිවුර නියාව දැන ඒ වංචාකළ භික්ෂූන් වහන්සේ ඇරගෙණ බුදු රජානන් වහන්සේ කරාගොස් සර්වඥයන්ට පෑහ. සර්වඥයෝ පළමුත් මේ භික්ෂුහු වංචාප්‍රයෝග දනිති වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාල සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහම් දත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ මත්ස්‍යව ඉපිද බොහෝ මත්ස්‍යයන්ට රජකම් කරන්නාහ. එසමයෙහි කොකෙක් ඒ වැව සමීපයෙහි පියාපත් දෙක විදා කරනමාගෙන බකතපස් කෙරෙමින් සිටියේය. ඒ වොවට බෝධිසත්සයෝ බොහෝ මත්සයන් පිරිවරා කොකා උන් ස්ථානයට ආහ. ඒ වෙලාවට මත්ස්‍යයෝ කොකාදක එල නෙළුම් මලෙක පැහැ ස්ථානයට ආහ. ඒ වෙලාවට මත්ස්‍යයෝ කොකාදක එල නෙළුම්මලෙක පැහැ සමානවූ යහපත් තාපසකෙනෙකැයි සිතා කියන්නාහු මූ වනාහී පියාපත් විදාගෙණ කරබාගෙණ සිටියාහ. එසේහෙයින් මූ මහසිල්වත් කෙනෙකැයි කීහ. එබස් බෝධිසත්වයෝ අසා කැකැවී බලා කොකා නියාව දැන කියන්නාහු එම්බල මත්ස්‍යයෙනි මුන් මෙසේ ඉන්නේ තාපසයන් නිසා නොවෙයි අපගේ අවකාශයක් බලාය. මුගේ කුමන ශීලයෙක්දැයි කීහ. එවිට මත්ස්‍යයෝ දියකළඹා ඌ එතනින් යවාපුවාහයි වදාරා බක ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි කොකා නම් වංචාප්‍රයේග දන්නා භික්ෂුහුය. මත්සව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# සාකෙත ජාතකය

තවද සද්ධර්ම චූඩාමානික්‍ය වූ සර්වඥයන් වහන්සේ සාකෙත නුවර වැඩ වසන සමයෙහි සාකෙත නම් බ්‍රාහ්මණයා සර්වඥයන්ට ප්‍රිය නැකම් කී හෙයින් මේ ජාතකය දක්වන ලද. මෙහි ඉකුත් වර්ථමාන කථාවක් එරක නිපාතයෙහි බස්නේය.

මෙහි පළමුත් තමන්ටම පුත් උපන්හෙයි ජාතිවාසනා හේතුකොට කියන්නාහයි වදාළ කල්හි එවිට භික්ෂූන් වහන්සේ දක්වනසේක්, ස්වාමීනි පූර්ව වාසනා ඇතැයි කියා පසුව ජාතියේ විශ්වාසය වේදැයි වදාළසේක, සර්වඥයන් වහන්සේ වදාරණ සේක් මහණෙනි යම්සේ දියෙහි අටගන්නා නෙළුම් අල කෙතෙක් දවසින්වුවත් දිය හා මඩඑක්වුද එදවස් ඇතිවේද එමෙන් කොතෙක් දවසින් උවත් අනුන් දුටුවේලේ පූර්වවාසනා බලයෙන් වුව ඒ නැත්නම් උන් නිසා තමාට පැමිණි ලාභයක් නිසා වුවත් තවත්නාහයි වදාරා මට මව්පියව උපන්නෝ මේ බමුණා හා බැමිණිමය උන්ට පුත්ව උපන්නෙමි බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# එකපාද ජාතකය

තවද සද්ධර්ම කිරීටවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෙළඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය වදාරණ ලද.

ඒ කේසේද යත්

එක්තරා කෙළඹිපුත්‍රයෙක් තමාගේ පුත්‍රයෙකු ඇකයේ ඉඳුවාගෙණ උන්නේය, ඒ පුත්‍රයා පියාට කියන්නේ එකපාදයකින් යුක්තවූ බොහෝ වුතය ඇති එකචාර ප්‍රාසාදය මට කියවයි කීම. එවිට ඒ පුරුෂයාත් මේ ප්‍රශ්නය සර්වඥයන් වහන්සේට මිසක් අපට නොදනෙයි සිතා සර්වඥයන් කරා තමාගේ පුතත් ඇරගෙන ගොස් කියන්නේ ස්වාමිනි මේ පුත්‍රතෙම එකචාරනම් ප්‍රශ්නයක් මා අතින් විචාරයි ඒ මට  නොදනෙයි වදාළොත් යහපතැයි කිහ. සර්වඥයෝත් උපාසකයෙනි මේ කුමර ප්‍රශ්නය පළමුත් විචාළේය. නුවැනැත්තෝ මුට ප්‍රශ්නය විසඳූය, මේ වනාහී භවයෙන් සැඟවුනු විසින් නොදනෙයි වදාරා ඒ කෙසේ දැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරන සමයෙහි බෝධිසත්වයන් වහන්සේ සිටුකුලයක උපන්සේක. එක්දවසක් බෝධිසත්වයෝ තමන්ගේ පුත්‍රකෙණෙකුන් ඔක්කේ වඩාගෙණ උන්නාහ. එවිට කුමාර කියන්නේ එකපාදයෙන් යුක්ත බොහෝ අර්ථ ඇත්තාවූ එකචාර ප්‍රශ්නය කිවමැනවයි කීහ. එවිට බෝධිසත්වයන් කියන්නාහූ එඹල දරුව බොහෝ කොට කිමෙන් කාර්යකින්ද එකසීල රකිනාම බොහෝ කෙලෙසුන් නැසීමට හා බොහෝ සතුන් නැසීමට කාරණාවෙයි කීහයි වදාරා මේ ඒකපාද ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි පුත්‍රයානම් මෙසමයෙහි මේ කුමාරයයි. බරණැස් සිටුව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේකී. මේ බණ අවසානයෙහිදි දෙපුතුපියෝ දාසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් පෙලෙහි පිහිටියාය.

SANHIDA LANKA

# හරීතමෘත ජාතකය

තවද සද්ධර්ම මහාතිලකවූ සර්වඥයන් වහන්ස් වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අජාසත් රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද.

කෝසල රජ්ජුරුවන්ගේ නැගනියෝ බිඹිසාර රජ්ජුරුවන්ට පාවාදෙන්නාහ. ඒ පාවාදෙන ගමනේ තමන්ගේ නැගනියන් නානාපිණිසයයි ලක්ෂයක් වටිනා කසීගමක් දුන්නාහ. පසුව අජාසත් රජ්ජුරුවන් විසින් පියානන් මැරූ පසු මැනියෝත් රජ්ජුරුවන් කෙරේ සොකයෙන්ම මළහ. එවිට කෝසල රජ්ජුරුවෝත් පියාමරාපුසොරාට මාගේ නැගනියන්ට දායාද දුන්ගම නොදෙමි කියා උන්නාහ. මේ ගම නිසා දෙමයිලෝ උනුත් හා දවස්පතා සටන් කරන්නාහ.

සමහර දවස් කෝසල රජ්ජුරුවෝ බිඳි පලායන්නාහ. සමහර දවස් අජාසත් රජ්ජුරුවෝ බිඳිපලායන්නාහ. අජාසත් රජ්ජුරුවෝ දිනාපියා නුවරට එන කල බොහෝ ගැස්සුම් පිඹුම් ඇතිව එන්නාහ. පැරද එනවිට ඒ ප්‍රසිද්ධ කාටවත් නාහවා එන්නාහ. මේ පනත සංඝයාවහන්සේ එදවස් කථාකොට කොට උන්කලට සර්වඥයන් වහන්සේ එතනට වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් තමන්ට පරාජයක් වූවේ ලේ විකෂ්පව වුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එක්වැවෙක නිලමඬුකව උපන්නාහ. එසමයෙහි එක්කෙවුළෙක් වැවට කෙමනක් එබීය. ඒ කෙමනට බොහෝ මත්ස්‍යයෝ වන්නාහ, එක්උදක සර්පියෙක් මසුන්කන්ටයයි මසුන්ලා කැටිව කෙමනටවන. එවිට බොහෝ මත්ස්‍යයෝ ඒ සර්පියා කඩාකා ලේ මුසු කොටපුවාහ. ඒ සර්පයාත් කෙමෙනින් මෑත්විය. ඒ වෙලාවට නිලමඬුකායාත් එතන සිටියෝය. නිලමඬුකායදක සර්පියා කියන්නේ එම්බල නිලමඬුකය මත්ස්‍යයන් විසින් අන්‍යාය කරණනියාව තොපටත් හැඟිදැයි කීහ. එවිට මඬුකයා කියන්නේ ඇයිතොප විසින් මත්ස්‍යයන්ට අන්‍යාකරණ කළමුයිත් තමුන්ට විෂය වූවේලේ අන්‍යයකරන්නේ වේදැයි කීහ. මත්ස්‍යයෝ ඇවිත් සර්පියා කා මරාපුවාහයි වදාරා හරීතමෘත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ජල සර්පියා නම් අජාසත් රජ්ජුරුවෝය නිලමඬුකව උපන්නෙමි ලොව්තුරා බුදුවූ මම්මයයි වදාළ සේකී.

SANHIDA LANKA

# මහාපිංගල ජාතකය

තවද සද්ධර්මමහාකේතුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි  දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද

ඒ කේසේද යත්

දේවදත්ත ස්ථිවිරයෝ නවමසක් ව්‍යාධියට පැමිණ බුදුන් දකින්ට ජේතවනාරාමයෙහි වාසල සමීපයට ආගමනේ පොලොව පැලී නරකයට වන්නාහ. ඒ දුටුඇසූ බොහෝ දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීවූ අය මහා සතුටුවවුහ. සංඝයාවහන්සේත් මේ කථාව කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි පෙරත් දේවදත්ත ස්ථවිරියන් මළපවත් අසා බොහෝ මනුෂ්‍යයෝ සතුටුවූවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර පිංගලනම් රජෙක් රාජ්‍යයකරණ සමයෙහි ඒ රජ්ජුරුවෝ අසද්ධර්මයෙහි පිහිටා බොහෝ මනුෂ්‍යයන්ට වධබන්ධනාදීවූ නිග්‍රහ කරන්නේය. බොහෝ මනුෂ්‍යයන් මැඩ අයුක්තියෙන් රාජ්ජය කරන්නේය. තමාගේ පුත්‍ර මිත්‍ර බන්ධුවර්ගයා අමාත්‍ය ගෘහපති සේනා ආදීවූ බොහෝ  සත්වයන් කෙරෙහි කිසි දයාවක් නැත්තේය, බොහෝ මනුෂ්‍යයෝත් රජ්ජුරුවන් කෙරෙහි කිසි දයාවක් නැතිව තම තමන්ගේ ඇඟගැසූ කටුවක්සේ රජ්ජුරුවන් කෙරෙහි වෛරීව ඉන්නාහ. බෝධිසත්වයෝත් රජ්ජුරුවන්ට පුත්ව උපන්නාහ. පිඟල රජ්ජුරුවෝත් බොහෝ දවසකින් මළහ. එවිට බොහෝ මනුෂ්‍යයෝ සතුටුව සියගණන් ගැලවලින් දරපටවා ආදාහන භූමියෙහිලා ආදාහනය කළාහ. සියගණන් පැන්කල ගෙන්වාගෙණ සුසානභූමියෙහි වත්කොට ආදාහණය නිමා බෝධිසත්වයන්ට ඔටුනුපලදවා බොහෝ ශ්‍රමණ ගෘහපති ආදීවූ සත්වයෝ රජ්ජුරුවන් වටකොට සිටිනා වේලාවට එක්තරා දොරටුපාලයෙක් ඒ වෙලාවට ආස්වාස ප්‍රාස්වාය ප්‍රාස්වාස නැතිව අඬන්නට වන, එවිට ඒ දුටු බෝධිසත්වයෝ කියන්නාහු මපියානන් වහන්සේ බොහෝ දෙනාට උක්දන්ඩක් මිරිකා වසල්ලක් ඇරගන්නාසේ බොහෝ දෙනාට අන්‍යයකළ විසින් පිඟුවන් ඇස් ඇත්තාවූ රජ්ජුරුවන් මළා යහපතැයි බොහෝ දෙනා සතුටුව ඉන්දදී තා ආස්වාස ප්‍රාස්වාසය නැතිව අඬන්ට තොපට රජ්ජුරුවන් වහන්සේ  කුමන යහපතක් කළ හෙයින්දැයි විචාළාහ. ඒ අසා දොරටුපාලයා කියන්නේ උන්වහන්සේ මට කළාවූ යහපත සිතා අඬන්නේ නොවෙයි පිඟුවන් ඇස් ඇති ඒ පිඟල රජ්ජුරුවන් වහන්සේ උඩුමාලයට යන වේලෙත් බස්නාවේලෙත් නැවමියෙකු  කුලක් ඇරගෙණ බාන්නාක් මෙන් ටොකු අටක් බැගින් ඇන්නාහ. ඒ ඇන ඇන ආ අභ්‍යාසයටම යමයන්ගේ ඔලුවේ ඇනිසේක් නම් උයිත් ටොකු කාපියා පෙරලාත් මෙතනට එවපුනම් තවත් මට ටොකු ඇත්තේම වේදැයි සිතා අඬමි කීහ. එබස් රජ්ජුරුවෝ අසා මූ අස්වසන්නට උවමනවයි සිතා කියන්නාහු ඒ කින්දැයි සියගණන් ගැල්වලින් දරපටවා දවන ලද සියදහස් ගණන් පැන්කළ වත් කොට සුසාන භූමියේ ගිණි නිවාපියනලද වටකොට පවුර බදනාලද එසේහෙයින් මළාවූ සත්වකෙණෙක් අනික් ජාතියක උපදිතොත් මියක් මෙම සැටියේ එවකයින් නූපදනාහයි වදාරා දොරටුපාලයා අස්වැසුහ. එසමයෙහි පිඟාල රජ්ජුරුවෝ නම් දේවදත්ත ස්ථිරියෝය. පිඟාල රජ්ජුරුවන්ට පුත්ව උපන් ධර්මිෂ්ඨ රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# සබ්බදාඨක නම් ජාතකය

තවද සද්ධර්මාභිධාන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරබයා මේ ජාතකය වදාළ සේකී.

ඒ කෙසේද යත්

එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ දේවදත්ත ස්ථවිරයෝ තමන්ට තිබි ලාභසත්කාර නාලාගිරියා මෙහෙයිමෙන් ලාභසත්කාර පිරහෙළාගත්තාහයි යන කථාව කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන් මතු නොවෙයි පෙරත් දේවදත්ත ස්ථවිරයෝ තමන්ට පැමිණ ලාභසත්කාරය පිරිහෙලාගත්තෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේකී.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ පුරෝහිත බ්‍රාහ්මණව උපන්නාහ, බෝධිසත්වයෝ පෘථිවි මන්ත්‍රයක් දන්නාහ. ඒ මන්ත්‍රය නම් සියල්ලවුන්ම ලබ්බා ගන්නාවූ ආඥාවක් ඇත්තේය. ඒසේවීසින් බෝධිසත්වයෝ ඒ මන්ත්‍රය පිරි වන්නාහ. ඒ වෙලාවට එක් කැනහිලෙක් මන්ත්‍රය පිරිවනු අසාගෙණ උන් තැනැත්තේ මන්ත්‍රය ඉගෙණගත. එකජවනේම ඉගෙණගන්ට කාරණාකින් දැයි යතහොත් පෙර ඔහු බ්‍රාහ්මණව ඉපිද මේ මන්ත්‍රය දන්නේය. ඒ අභ්‍යාසය ඇතිහෙයින් මන්ත්‍රය එකවරින්ම ඉගෙණගත එවිට බ්‍රාහමණය මට ඒ මන්ත්‍රය නිපුනැයි කියා කින්මින. එවිට සිගාලයාත් මටත් මන්ත්‍රය නිපුනැයි කියා නික්මින. මේ කැනහිලා නිසා බොහෝ විනාසවෙයි සිතා කැණහිලා අල්වයි කිහ. ඒ කැණහිලාත් වහාදිවගෙණ ගොස් වනයට වැද එක්තරා කැණහිල්දෙන කඩැලීය. එවිට කැණහිල්දෙන් ඇයිද ස්වාමීනි කිව. එවිට කැණහිල් ඇයි තෝ නාඳුනෙයිද මම සිව්පාවුන්ට රඳවම් කියා ඒ මන්ත්‍රය කිය, ඒ වෙලේත් බොහෝ කැණහිලුන් පළමුකොට එක්වූවාහ. ඉක්බිති සිංහ ව්‍යාඝ්‍ර ඇත් අස් දිවි වලස් මුවන් ගෝණන් ඌරන් සාවුන් ආදීවූ බොහෝ සිව්පාවෝ පිරිවරාගත්තාහ. ඒ සිගාලත් එක්තරා සිගාල ධේනුවක් අගමෙහෙසුන් කොට සර්වදාඨවනම් රජව මා විසින් මනුෂ්‍යයන්ට රාජයකරන්ට උවමැනවයි සිතා ඇතුන් දෙන්නෙකුපිට සිංහයෙකු සිටුවා සිංහයා පිට තමන් හා තමන්ගේ අග්‍රමෙහෙසිකා සිගාල ධේනුව හා දෙන්න සිංහයා පිටට නැගී දොළොස් යොත්තක් ගැවසී සිටි සිව්ප සේනාව පිරිවරා බැණැස්නුවර වටකොටගෙණ සිට බරණැස් රජ්ජුරුවන්ට කියා යවන්නාහූ රාජ්ජය හෝ දෙන්නේය. යුද්ධ හෝ කරන්නේයයි කියා යවුහ. බොහෝ නුවරවාසී සිංහයන් ආදීවූවන් දැක භයින් ත්‍රස්තව වාසල් අගුළු ලූහ. එවිට බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට කියන්නාහූ දේවයනි නොබවමැනව මේ සබ්බදාඨක නම් කැණහිලා කැටිව කරණ යුද්ධය මට භාරයයි කියා අට්ටාලයට නැගී සබ්බදාඨකනම් කැණහිලා දැක කියන්නාහූ එම්බල සබ්බදාඨකනම් කැණහිල, තා නුවර කා කා ඇරගෙණදැයි විචාළහ, එවිට කැණහිල් කියන්නේ මාගේ සිගාලයන් ඇරගෙණ ඔවුන්ලවා නාදකරවා ඒ නාදයෙන් බියගත්තාවූ නුවර හඬාන් භයගන්වා නුවර ගණිම් කීහ. එබස් අසා බෝධි සත්වයෝ කියන්නාහූ එඹල සිගාලය තා මෙනුවර ගන්නේ කවුරුන් ලවාදැයි විචාළහ. එවිට කැණහිල් කියන්නේ මාගේ කේසරසිංහයන් ලවා නාදකරවා ඒ නාදයෙන් බියගත්තාවූ නුවර සිංහ හඬින් භයගන්වා නුවර ගණිමියි කීහ. එබස් බෝධිසත්වයෝ අසා අට්ටාලයෙන් බිමට බැස මුළුනුවර බෙරලවා නුවර වාසීන් කණ උදුපිට බහාගෙණ ඉදිරියේ බෙරලවා නුවරවාසී ඒ නියායෙන්ම යටත්පිරිසෙයින් ගෙයිවඩනා පක්ෂීන් කණත් උඳුපිටි එැවාහ. ඒ නියාවට උඳුපිටි එැපසු බෝධිසත්වයෝ අට්ටාලයට නැගී කැණහිලාට කියන්නාහූ තාසේවූ නීච කැණහිලෙකු කීවා අසා උත්තමජාති ඇති කේසරසිංහයෝ නාදකෙරෙද්දැයි කීහ. එබස් අසා කැණහිල් කියන්නේ බ්‍රාහ්මණය මාගේ සෙසු සිංහයන් තබා මේ සිංහයා අඬගසන්දැයි කීය. එබස් අසා යහපතැයි අඬගස්සයි කීහ. එවිට කැණහිලා නැගීවුන් සිංහයාට අඬගසනලෙස සන්කළේය. එවිට සිංහයා ඇත්තේ කුම්බස්ථලය ඩැ මහත්කොට සිංහනාද කළේය. එවිට ඇතු භයින් දිවන්නාහූ කැණහිලා පයින් ගසා සුනුවිසුනු කළාහ. ඇත්තු උනුන් ඇණ බිඳගෙණ එතනම මළහ. දොලොස් යොදුන් සිටියාවූ සිව්පාසේනාව සිංහයන් ඇර සෙස්සෝ මළහ. එවිට බොහෝ මනුෂ්‍යයෝ කණතුබූ උඳුපිටි ඇර නුවරින් පිටත තුබූ බොහෝ සිව්පා සත්ව සමූහයා දැක කන්න කා බොහෝ විසින් කපා විසලාගත්තාහ. එතැන්පටන් වැලඉරා ඇතිවියයි දතයුතු සබ්බදාඨකනම් ජාතකය නිමවා වදාරා වැඩහිඳ වදාරණසේක් මහණෙනි යම්සේ සබ්බදාඨකම් සිගාලයා තම ලද්දාවූ රාජ්‍යසම්පත් ස්ථාවරුකොට ගතනොහී යම්සේ විනාශයට පැමිණියේද එමෙන්ම යම් සම්පතක් ලද්දාවූ පුරුෂයෙක් උඩගුව වාසය කෙරේ නම් මෙසේ විනාශයට පැමිණෙන්නේ වේදැයි වදාරා මේ සබ්බදාඨක කැණහිලා නම් දේවදත්ත ස්ථවිරිය. බරණැස් රජ්ජුරුවෝ නම් ශාරිපුත්ත ස්ථීවිරයෝය බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්මයයි වාදරා සබ්බදාඨකනම් ජාතකය නිමවා වදාළසේකී.

SANHIDA LANKA

# සුනඛ ජාතකය

තවද සංසාරසේතුවූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අඹනම් ස්ථානයෙහි පිහිටියාවූ භොජනශාලාවෙක් ඇත. ඊට හෙන්නාවූ පැන්තානයන් විසින් ගෙණවුත් මෙතන බත්කා වැඩෙති කියා එක්තරා බළු කුකුරුවකු එහ. එද භික්ෂූන් වහන්සේ විසින් ලබනලද බත්කා වැඩි ස්ථූල කය ඇත්විය. එක්තරා පිටිසර වාසී මනුෂ්‍යයෙක් ඒ සාලාවට අවුත් එතනසිට පැන්නායන්ට යම්තම් රණක් කඩක් දී බල්ලා බළුකඩකින් බැඳලා ඇරගෙණ නික්මිණි. එවිට බළුත් බුරන්නවත් ඇවිටිකමක් කරන්නවත් උනුදුන් ගොදුරු කා උන්ද කම්පස් එකකුමෙන් උන. ඒ පුරෂයාත් බළු මාකෙරේ පුරුදුවියයි සිතා බැම්ම මිදීය. එවිට ඒ සුනඛ වහා අවුත් පළමු තමා සිටිතැනටම ගියේය. මේ කථාව ධම්සභාමණ්ඩපයෙහි භික්ෂූන් වහන්සේ කිය කියා වැඩඋන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන් මතු නොවෙයි පෙරත් සුනඛ සොරකම් දන්නේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේකී.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි එක්තරා කෙළෙඹිපුත්‍රයෙක් වඩන්නාවූ බළුකුක්කෙක් ඇත, ඒ බළු කුකු ඔහු විසින් ලබන ලද්දාවූ බත් කා ස්ථූල වූ කය ඇතිවිය. එක් තරා පිටිසර වැසි මනුෂ්‍යයෙක් බල්ලා දැක ඒ කෙළඹි පුත්‍රයාට මසුරන් දහසක් හා කඩක් ද ඒ බල්ලා බැඳගෙණ ගියේය. එවිට ඒ බළුත් බුරන්නක්වත් නොකොට උන්දුන් ගොහුරු කා උන් කම්පස් එකකුමෙන් උන්නේය. ඒ පුරුෂත් බල්ලා ඇරගෙණගොස් වනාන්තරයෙහි බල්ලා කරපටින් බැඳ ඒ පුරුෂ වැදහො නිදනට වන, එවිට බෝධිසත්වයෝත් එතනට කටයුත්තක් නිසා ආවාහු බල්ලා දැක කියන්නාහු වරපට සපාකා කඩාපියන්ට පුළුවන්වත් බැමි කඩ ගෙණනොගොස් ඉඳිය. මෙසේ වූ අන්දමන්දෙයෝ ඇද්දැයි කීහ. එබස් ඇසූ සුනඛ කියන්නේ පණ්ඩිතයෙනි තොපකීවාම මාගේ සිතට නගාගතිම් නැත්නම් බැඳගන්නේවේද, එසේ හෙයින් අවසරයක් බලායෙමි කියා ඒ පුරුෂයා නිදාපුකල්හි තෙමේ බැඳුම් කඩාගෙණ තමා වසන තෙනට ගියේයයි වදාරා මේ නිදාපුලක්හි තෙමේ බැඳුම් කඩාගෙණ තමා වසන තෙනට ගියේයයි වදාරා මේ සුනඛ ජාතකය නිමවා වදාළසේකී. එසමයෙහි ඒ සුනඛයා නම් මෙසමයෙහි සුනඛය, ඒ පණ්ඩිතයෝ නම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේකී.

SANHIDA LANKA

# වීථිවච්ඡ ජාතකය

තවද සංසාර සාගරපරගත වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පලාස පරිබ්‍රාජකයන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්

පලාස පරිබ්‍රාජක කෙණෙක් මුළුරට තමන්ට වඩිනාකෙණෙකුන් නොදක සැවැත්නුවරට අවුත් මා හා සමග තර්ක කරන්නට සමර්ථයෝ ඇද්දැයි විචාරා මනුෂ්‍යයන් විසින් සර්වඥයෝ තොපසේ වූ පරවාදීන් හා වාද කරන්ඩ සමර්ථයෝය. එසේ හෙයින් සර්වඥයන් කරා යවයි කීහ. යහපතැයි කියා ඒ කියන පරිබ්‍රාජකයා බුදුන් හා සමඟ තර්කකරන්නට සිතා ජේතවනාරාමයට ගියෝය. සර්වඥයන් හා තර්ක කළේය. සර්වඥයෝත් ඌ කී ප්‍රශ්න විසඳා තොපි කී ප්‍රශ්න අපි විසදුම්ම අප කී ප්‍රශ්න විසඳවයි වදාරා එකෙක්නම් කිම්දැයි විචාළසේක. ඒ තෙම කුමක් බවත් නොදන්නේය. පැරද පලාගියේය. බෙහෝ භික්ෂූන් වහන්සේ මේ කථාව කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතුනොවෙයි පෙරත් මා එකබසින් පැරද පලා ගියෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍යය කරන සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බ්‍රාහ්මණව ඉපිද පංචකාමයෙහි ආදීනව දැක වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වාසය කරණසේක, එසමයෙහි තර්ක කරන්නාවූ එක්තරා පරිබ්‍රාජකයෙක් බෝධිසත්වයන් වසන්නාවූ වනය සමීපයෙහි ගමකට ගියේය. ඒ ගම්වාසීන් ලඟට ගොසින් මා හා සමඟ තර්ක කරන්නට සමර්ථයෝ ඇද්දැයි විචාරා මනුෂ්‍යයන් විසින් තෙල වනයේ ඉඳිනා තාපසයෝ තොපසේ වූ වාදීන් හා වාදකරන්නට සමර්ථයෝහ. එසේ හෙයින් තාපසයන් කරා යවයි කියා ඇරගෙණ බොහෝ මනුෂ්‍යයෝ  බෝධිසත්වයන් වසන පන්සල සමීපයට ගියාහ. බෝධිසත්වයෝ පරිබ්‍රාජකය මේ ගාංගාවෙන් ගෙණා සිහිල් පැන් බී ඉඳුවයි කිහ. එවිට පරිබ්‍රාජකයයෝ පළමුකොට කී බස්ම අල්වාගෙණ තර්ක කෙරෙමි සිතා කියන්නේ ගංගාව නම් එගොඩද මෙගොඩද මැද්දේද දියෙන් යන්නාවූ තුන්ස්ථානයෙන් ගංගාව කියන්නේ කොතැනටදැයි විචාලේය. ඒ අසා බෝධිසත්වයෝ කියන්නාහූ එතරත් ගංගාව නොවනකල මෙතරත් ගංගාව නොවනකල දිය යන්නාවූ ස්ථානයත් ගංගාව නොවනකල ගංගාව නම් කොයිදැයි විචාළාහ. ඒකියන පරිබ්‍රාජකයෝ මා කී බස්ම දෙවනිව මටම කියා මා පැරදුවයි ඉතා ලජ්ජාව පලාගියෝයයි වදාරා විථිවච්ඡ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි පරිබ්‍රාජකයෝ නම් මෙසමයෙහි පලාස පරිබ්‍රාජකයෝ ය. එසමයෙහි තාපසයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළ සේකී.

SANHIDA LANKA

# මූලපරියාය ජාතකය

තවද සංසාර ප්‍රතිෂ්ඨාධාර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පන්සියයක් බ්‍රාහ්මණ භික්ෂූන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

ත්‍රිවේදයෙන් පාරප්‍රාප්ත වූ බ්‍රාහ්මණයෝ පන්සියයක් බුද්ධශාසනයෙහි මහණව බුදුන්ගේ ත්‍රිපිටකය හදාරා ඒ බ්‍රාහ්මණ භික්ෂූන් වහන්සේ විසින් සර්වඥයන් දන්නා ත්‍රිපිටකය අප විසිනුත් දන්නාලදයි ඉතිකින් සර්වඥයන් වහන්සේට උපස්ථාන කිරීමෙන් කින්දැයි සිතා මානයක් උපදවා ආලිස්සම්වූ සේක. සර්වඥයෝත් ඒ දැන බ්‍රාහ්මණ භික්ෂූන් පන්සියයක් දෙනා වහන්සේට මූලපරියාය සූත්‍රයෙන් බණවදාරා පන්සියයක් දෙනා වහන්සේගේ මානගර්භය අරවා වදාළ සේක. මේ කථාව ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ භික්ෂූන් වහන්සේ කථාකොට කොට උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි පෙරත් මේ පන්සියයක් දෙනාගේ මානය බින්දෙම්වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකී.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ දිසාපාමොක් ආචාරීව පන්සියයක් බ්‍රාහ්මණ මානවකයන් ඇරගෙණ අකුරුකරවා ත්‍රිවේදයෙහි පාරප්‍රාප්ත කළහ. තමන් දන්නා ශාස්ත්‍ර ඇම්ම නිපුණකෙරෙව්වාහ. එකියන බ්‍රාහමණ මානවකයෝ ඉතිකින් දිසාපාමොක් ආචාරීන්ට උපස්ථාන කිරීමෙන් කම්කිම්දැයි සිතා මානයක් උපදවාගෙණ ආලිස්සම්ව ඉන්නාසමයට දිසාපාමොක් ආචාරි දෙබර  ගසක් වැතිරගෙණ උන්නාහ. අතවැස්සෝත් දෙබරගස නියොන් ගසා මේ කිහිරිගසසේ අරය නැතැයි කියා කීහ. දිසාපාමොක් ආචාරී මේ කීයේ මටයයි දැන කියන්නාහූ ප්‍රශ්නයක් කොට කියම්සිතා ගාථාවක් කිහ. ගාථාවේ අර්ථ කාලෝ අතීතනාගතවර්ථමාන සංඛ්‍යාත වූ කලය මෙන්, අන්ත හා ඒව තමා හා සමග සබ්බානි එවභූතානි, සියළුම සත්වයන් තම සසති අනුභව කරන්නේය කාලඝසො කාලය අනුභව කළාවූ යොගුතො යම්සත්වයෙක් ඇද්ද සෝ ඒ ක්‍ෂණශ්‍රවතෙමේ භූතපචනිං සත්වයාපචනය කරන්නාවූ හෙවත් සියළු සත්වයන් නසන්නාවූ කාලය පච් පාකකෙළෙයි හෙවත් නැසුයේය. යම් කාලයෙක් සියළු සත්වයන් තමා හා සමඟ නසානම් ඒ කාලය ක්‍ෂණා ශ්‍රවයන් වහන්සේ මතෙතහි නැවත උත්පත්තියක් නැතිහෙයින් නැසුවා නම් වන සේක. රහතන් වහන්සේ සකලකෙලාශයන් නසා රහත්වූ හෙයින් සත්වයන් විනාශකළාවූ කාලය ක්‍ෂයකළානම් වනසේකැයි කියා මේ ගාථාවේ අර්ථ මට සත්වෙනි දවසකින් කියවයි කීහ. එකියන ශිෂ්‍යයෝ යහපතැයි ආචාරීනි කියා වැඳ තමන්ගේ ගෙදරට ගොස් සත් දවසක් මුළුල්ලෙහි උත්සහකොට එහි අර්ථනොදැක ආචාරීන් කරා අවුත් අපට ඒ අර්ථය නොයෙදෙයි කීහ. එවිට දිසාපාමොක් ආචාරීන් තොපහැම තල්ගෙඩියේ ඉස්තබාගෙණ මා කිසි වකුත් නොදනිති කියා තොප කියනපමණක් විනා මෙපමණකුත් නොදනිති කියා නින්දාකළාහ. ඒකියන ශිෂ්‍යයෝ ආචාරීන් සමාකරවාගතැයි වදාරා මුලපරියාය ජාතකය නිමවා වදාළසේකී. එසමයෙහි එකියන අතවැස්සෝ නම් මේ බ්‍රාහ්මණ භික්ෂූහුය. එසමයෙහි දිසාපාමොක් ආචාරී නම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේකී.

SANHIDA LANKA

# තෙලොවාද ජාතකය

තවද සංසාර පාරගතවූ සර්වඥයන් වහන්සේ විසාලා මහනුවර කුටාගාර ශාලාවෙහි වැඩ වසන සමයෙහි සිංහනම් සෙනෙවිරදුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සර්වඥයන් වහන්සේ සිංහනම් සෙනවිරදුන්ට බණ කියා උන් සෝවාන් කළ දවස් උන් විසින් බොහෝ මත්ස්‍යමාංස ඇතිව රස සවුලෙන් යුක්තව ආහාරය සර්වඥයන් වහන්සේ ඇතුළුව සංඝයාවහන්සේට දන්දුන්නාහ. ඒ දුටු නිඝණ්ඨනාථපුත්‍ර බුදුන් කෙරේ කාංසිව උක්කෙ ට නාකොට කියන්නේ ශ්‍රමණ භවත් ගෞතමයන් තමන් නිසා මැරූ මස් තමන් වලදනලදැයි උක්කොටනා කළහ. සර්වඥයෝ එපවත් භික්ෂු සංඝයා වහන්සේ අතින් අසා පෙරත් නිගණ්ඨ නාථපුත්‍රයෝ උචච්ඨීමාංශය කෑවයි පෙරත් උක්කොටනා කලෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද සෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව බරණැස් නුවරට ලුනු ඇඹුල් සෙවුනාපිණිස ආහ. එසමයෙහි බරණැස් නුවර කෙළෙඹිපුත්‍රයෙක් බෝධිසත්වයන් දක බෝධිසත්වයන් වෙහෙසන පිණිස තමාගෙට පවරා ගෙන්වාගෙණ රසමසවුලෙන් යුක්ත ආහාරය දන් දී අන්තයෙහි කියන්නේ නුඹවහන්සේ නිසා මම වධකොට මස්මරා දන්දිනිමි එසේහෙයින් ඒ පව් නුඹවහන්සේට හා මට හා සරියයි කීය. බෝධිසත්වයෝත් තොප විසින් තොපගේ අඹුදරුවන් මරා මස් මට දුන්නත් මා විසින් මෛත්‍රී පුරශ්‍ර විසින් වලඳන්නමෝයයි කියා බෝධිසත්වයෝ හිමාල වනයට ගියාහයි වදාරා තෙලොවාද ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි කෙළෙඹිපුත්‍රයා නම් මෙසමයෙහි නිගණ්ඨනාථ පුත්‍රය, එසමයෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# පාදංජලි ජාතකය

තවද සංසාරවහුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලාලුදායි ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් දවසක් සැරියුත් මුගලන් දගසව්වන් වහන්සේ බොහෝ සංඝයා වහන්සේ විසින් විචාළ ප්‍රශ්න විසඳ විසඳා උන්සේක, ඒ වෙලාවට භික්ෂූන් වහන්සේ සතුටුව අස අසා වැඩඋන්කලට ලාලුදායි ස්ථවිරයන් වහන්සේ ඇයි දෑගසව්වන් වහන්සේ කියෙත් අප දන්නා දෙයෙකැයි කීසේකී. එබස් අසා දගසව්වන් වහන්සේ එතනින් වැඩපුසේක. සර්වඥයෝ එබස් අසා දන්මතු නොවෙයි පෙරත් තොල පෙරලා කටට ආදෙයක් කියනපමණක් විනා කුමකුත් නොදෙන්නේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේකී.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට වැඩ පසන්නා අමාත්‍යව උපන්සේක. රජ්ජුරුවන්ගේ පාදාංජලි නම් රාජ කුමාරකෙණෙක් ඇත්තාහ. රජ්ජුරුවෝ කාලක්‍රියා කළහ. අමාත්‍යයෝ ඒ රජ්ජුරුවන්ට ආදාහණ කෘත්‍යකොට ඒ පාදාංජලි නම් රාජ කුමාරයානන් රාජ්ජයට පමුණුවන්ට සිතා නුවන පරීක්ෂා කරම්හයි සිතා එක් දවසක් ඒ කුමාරයන් අතින් විචාළ යුක්තියද අයුක්තියදැයි විචාළාහ. එවිට කුමාර තොල පමණක් පෙරලාලීය. එවිට අමාත්‍යයෝ අප විචාළ යුක්තිය අයුක්තිය නියාව දන තොළ පෙරළාපුවමැනැයි සිතා අමාත්‍යයෝ එදවස් රාජ කුමාරයෝ නුවනැත්තෝවනැයි සිතූහ. දෙවන දවසුත් ඒ කුමාරයන් සභායේ ඉඳුවා යුක්තිය ඇතිසැටියේම විචාරා මේ යුක්තිය යහපත්ද නපුරුදැයි විචාළහ. එදවසුත් ඒ කුමාර තොළපෙරළාවත් මේ යුක්තිය නියාවට කියාදීත් තොළ පෙරළන්නේ යුක්තියක් නොදන්නා හෙයිනැයි කියා ඒ කුමාරයා බැහැරකර බෝධිසත්වයන් රාජ්ජයට තබා ගත්හයි වදාරා පාදාංජලි ජාතකය නිමවා වදාළ සේකී. එසමයෙහි රාජ කුමාරයෝ නම් ලාලුදායි ස්ථවිරියෝය. එසමයෙහි අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේකී.

SANHIDA LANKA

# කිංසුගොකාම ජාතකය

තවද සංසාර පාරගත වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කිංසුගොකාම සූත්‍රය අරභයා මේ ජාතකය වදාරණ සේක.

ඒ කෙසේද යත්

භික්ෂූන් සතරදෙනෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේගෙන් කමටහන් ඉගෙණගෙණ ඒ සතර දෙනා වහන්සේගෙන් එක් කෙණෙකුන් වහන්සේ පංච ස්ථානයෙන් භාවනාකොට රහත්වූසේක. එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ පංචස්කන්ධ භාවනාකොට රහත්වූසේක. එකී භික්ෂූන් කෙණෙකුන් හන්සේ පංචස්කන්ධ භාවනාකොට රහත් වූසේක. එක්කෙණකුන් වහන්සේ මහභූත භාවනාකොට රහත්වූ සේක. එක් කෙණෙකුන් වහන්සේ අසුභ භාවනාකොට රහත් වූසේක. සතරදෙනා වහන්සේ සර්වඥයන් වහන්සේ දකිනට ගොස් කියනසේක් අපි සතරදෙනම රහත්වූම්හ. රහත්වීම් එක්කලෙක භාවනා සතරක් වන්ට කාරණා කවරේදැයි විචාල සේක. සර්වඥයෝත් කැළමල් විචාළා සතරබෑයන් වැන්නයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේකි.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ රාජකුමාරවරු සතරදෙනෙක් ඇත්තාහ. එ සතරදෙනා කැළමල් කෙසේදැයි විචාරා රථාචාරීයා ගෙන්වා කැළමල් ගෙන්වා අපට පාවයි කීහ. රථාචාරියා සතරදෙනාට එකවිට නොපෑ පළමු කොට එක් රාජකුමාකෙණකුන්ට පත්‍රාංකුරයෙන් යුක්ත ගසක් දක්වාලීය, අනික් කුමාර කෙනෙකුන්ට මල්පිපුනු ගසක් දක්වාලීය. අනික් කුමාර කෙණෙකුන්ට විලිසුනු ගසක් පෑලිය. ඒ කුමාරවරුන් සතරදෙනා එක් දවසක් ඉඳ කථාකරන්නාහු කැළගස්නම් දාගිය කනුවක්මයයි කීහ. එක් කෙණෙක් කියන්නාහු නුග ගසක් සේමයයි කීහ. එක්කෙණෙක් මස් කැටි එල්වුවාසේමයයි කීහ. එක්කෙනෙක් විලිස්සාපියාතිබෙන පත්ඇති රුක්මෙනැයි කීහ. මෙසේ කියා සතරදෙන උනුන්ගේ කථා නොගිවිස පියරජුහු සමීපයට ගොස් දේවයන් වහන්ස කැළගස්නෙම් කෙසේ තිබේදැයි කීහ. රජහු විසින් තොප කීයේ කෙසේදැයි කී කල්හි ඒ කුමාරවරු සතරදෙන තමන් කීවා වූ ක්‍රම පළමුපරිද්දෙන්ම කීවාහුය. එබසට රජ්ජුරුවෝ කියන්නාහු දරුවෙනි තොප සතරදෙනා විසින්ම කැළ ගසක් දක්නා ලද්දේය. එතකුදුවුවත් රථාචරියා විසින් තොපට කැලෑගසක් දක්වන කල්හි මේ ගස ඇමකල්ම මෙලෙස තිබේද නොහොත් කලින් කලට වෙන වෙන ආකාරයෙන් පවතීදැයි විභාග කොට නොවිචාළ හෙයින් සැක උපන්නේය. ඒ වෘක්ෂයෝ කොලගියකාලයෙහි තනුවක්මෙන් තිබෙන්නේය. පත්‍රාංකුරයෙන් යුක්තවූ කල ගසක් මෙන් තිබෙන්නේය. මල්ගත් කල මස් කැටි එල්ලුවාක් මෙන් තිබෙන්නේය. කොල විලිස්සුනු කල්හි රන්වන් මහරිගසක් මෙන් තිබෙන්නේය. ඒ අවස්ථාවෙහි කාලවිශේෂයෙන් ආකාරභෙදවූ පමණක් මුත් එකකැලගස වන්නේයයි කියා සැක දුරුකළාහුය. සර්වඥයන් වහන්සේද මේ කථාව දෘෂටාන්තය ගෙණහැර දක්වා වදාරා මහණෙනි ඒ සතර බෑයෝ කැළෑ විභාගකොට නොවිචාළයෙන් යම්සේ සැක උපදාවාපුහුද එපරිද්දෙන් සියළු විදර්ශනඥානයන් සකන්ධායතනගුත ධාතු ප්‍රභේදවූ ධර්මයන්ගේ විභාග දන සෝතාපත්ති මාර්ගයට නොපැමිණි හෙයින් එක්රහත් විමට භාවනා සතරක් වීමට කාරණා කින්දැයි තොපට සැකඋපන් පමණක්මුත් ඒ භාවනා සතරින්ම පැමිණෙන්නේ එක් නිර්මාණයයි වදාරා මේ කිංසුගොකාම ජාතකය නිමවා  වදාළ සේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් දැන් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# සාල ජාතකය

තවද ශාක්‍යකුල කල්පද්‍රැමවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා මහතෙරකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් මහතෙරකෙණෙකුන් වහන්සේ ඔහු සමීපයට ගොස් තොපගේ ජාසිවුරු තොප සන්තකය, මාගේ තුන්සිවුරු පාත්‍රය ආදීවූ පිරිකරත් තොප සන්තක වන්නේයයි පොළඹාගෙණ නැවතත් මහණ කරවූසේක. ඒ මහණකරවූ තැන් පටන් පළමුසේම තදවන්නට පටන් ගත්සේක. එ තෙම නැවතත් සිවුරු ඇර මහතෙරුන් වහන්සේ යාඥාකළත් නැවත සිවුරු නොපෙරවියේය. එක් දවසක් භික්ෂූන් වහන්සේ ධම්සභාමණ්ඩපයෙහි රැස්වහිඳ ඇවැත්නි සාමණේරතෙම මොළොක්වූ සිත් ඇත්තේමය. මහතෙරුන් වහන්සේගේ කෝපී කමින් පහ වූයේයයි කියා කියා වැඩ උන්සේක. සර්වඥයන් වහන්සේ ධම්සභා මණ්ඩපයට වැඩ වදාරා මහණෙනි මා එන්නාට පෙර පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි විචාරා වදාරා මේ ප්‍රවෘත්තීය දූන් වූ කල්හි මහණෙනි මේ ලදරුවෝ දූන් මතු මොලොක් සිත් ඇත්තෝ නෙවෙයි පළමුත් එක් වරෙක මොහුගේ රොස දැක නැවත නොආයේයයි වදාරා ඒ කෙසේදූයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරන සමයෙහි බෝධිසත්වයන් වහන්සේ කෙළෙඹි කුළයක ඉපිද වැඩි වියට පැමිණ වී වෙළඳාම් කිරීමෙන් ජීවිකාව කරන්නේය. එකල එක්තරා අහිකුන්ඨිකයෙක් වඳුරකු ඇතිකොට හික්මවා ඔහු අතට බෙහෙත් දී ඔහුලවා නයින් කෙළවමින් රැකී ඇවිදිනේ බරණැස්නුවර උත්සවකෙළි කෙළනා පිණිස ඒ වඳුරා වී වෙළඳානන් අතට භාරකොටදී උත්සවකෙළ ඉක්බිත්තෙහි වී වෙළදානන් සමීපයට ගොස් මාගේ වානරයා කොයිදූයි විචාළේය. එවිට එකියන වානරත් තමාගේ ස්වාමිපුත්‍රයා ආහෙයින් සන්තෝෂයෙන් ලඟට ආහ. එවිට අහිකුන්ඨිකයා තමාගේ අත තුබූ උණපත්තක්බලා වානරයාට පහරක් ගසා බැඳගෙණගොස් එක් අඹගසක්මුල වැදහොත්තේය. එකියන වානරත් බැඳුන් කඩාගෙණ අඹගසට නැගී අඹ කා අහිකුණ්ඨකයා ඇඟට අඹගැට ගැසීය. එවිට අහිකුණ්ඨකයාත් පිබිද වානරයාත් නොදැක ගස උඩබලා වානරයා දැක නලවා බාගන්ට උවමැනවයි සිතා මට ඇත්තානම් තොප එකපුතාමවුව, එසේ හෙයින් මාගේ ඇති යම් සම්පතෙක් ඇත්නම් තොපගේ මවුව, පුත මෙසේ එවයි. කීහ. එවිට වානර කියන්නේ මා තොපකෙරේ මෛත්‍රීයෙන් ආවෙමි තොප විසින් කිපී උණපත්තෙන් ගැසූහෙයින් තොපකෙරේ මම කිපිනිමි. එසේ හෙයින් මා එන්නේනැතැයි කියා වානර ඔබ්බකට පලාගියේය. ඒ පුරුෂයාත් විකෂෙපව ගොටගියේය යයි වදාරා සාල ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි වානරනම් මෙකියන කෙළෙඹිපුත්‍රයාය, එසමයෙහි අහිකුන්ඨිකයා නම් මෙකියන මහතෙරය. එසමයෙහි වී විකුනන වෙළඳව උපන්නෙම් බුදු වූ මම්ම යැයි වදාළ සේක.

SANHIDA LANKA

# කපි ජාතකය

තවද සංසාර එලකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වංචා ප්‍රයෝග දෙන්නා භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

වංචාප්‍රයෝග දන්නා භික්ෂූ කෙණෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට දක්වන්නා මහණෙනි දැන්මතුනොවෙයි පෙරත් මූ වංචා ප්‍රයෝගකොට ගිණි තපින්ට උත්සාහකළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එක්තරා කෙළඹි පුත්‍රව ඉපිද තමන් ගේ බිරිඳ මළ පසු දරුවන් වඩාගෙණ වනාන්තරයට ගොස් ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව තමන්ගේ පුතනුවන් මහණකොටගෙණ වාසය කරන්නාහ. එසමයෙහි වැස්සක් වසින්ට වන. එවිට එක්තරා වානරයෙක් වැස්සේ තෙමී තමාට සිත පිඩාව බලවත් හෙයින් තාපසයන්ගේ පන්සලටගොස් ගිණිතැප ගණිමියි සිතා මා නික්මිගියොත් වැද්දනොදෙති සිතා තාපසවේසයක් හැරගෙණයෙමි සිතා පුරාතන මළ තාපසකෙණෙකුන්ගේ අඳුන් දිවිසම ජටා ආදීවූ දෙය ඇඳ පෙරව අඬුගත් අත් ඇතිව පන්සල සමීපයෙහි සිටියේය. ඒ වෙලාවට බෝධිසත්වයෝ මැස්සපිට වැදහොත්තාහ. බෝධිසත්වයන්ගේ පය මැඩ මැඩ උන්නාවූ පුත්‍රයා තාපසවේසයෙන් සිටි වඳුරා දැක මූ තාපසකෙණෙකැයි සිතා පියාණන්ට කියන්නාහූ පියානන් වහන්ස ඉඳුරන් දමුණු තාපස කෙණෙක් වැස්සේ තෙමී තෙමී ශිත පිඩා ඇතිව සිටිනාහ. එසේ වූ තාපසයන් වහන්සේ පන්සලට ගෙණ ගිණි තප්පවූකල නපුරුදැයි කීහ. බෝධිසත්වයෝ තාපසකෙණෙකුන් වහන්සේ වැඩි නියාවනැයි බිමට බැස බලා වඳුරා නියාව දැන පුතනුවන්ට කියන්නාහූ මුතුමූ ඉඳුරන් දමූ තාපසකෙණෙක් නොවේය. මේතෙම වඳුරාය එසේ හෙයින් මුකෙරේ කරුණායෙන් මෙතනට ගෙන්වා ගිණිතැප්පුවෝ නම් මේ තෙමේ පන්සල ගිණිලායන්ටත් සැපතැයි සිතා එතන තිබූ ගිණිපෙණල්ලක්බාලා උෟ භය ගන්වා එතනින් පහකොටපූවාහ. එකියන වානරයාත් එතැන්පටන් නොආයේය. බෝධිසත්වයෝත් පංචර්ධි අෂ්ටසමාපත්ති උපදවාගෙණ තමන් වහන්සේගේ පුතනුවන්දටත් කිසුනුපිරියම් භාවනා උගන්වා නොපිරිහුනු ධ්‍යානයෙන් බඹලොව ගියාහයි වදාරා කපී ජාතකය නිමවා වදාළ සේකි. එසමයෙහි  එකියන වඳුරානම් මේ වංචාප්‍රයෝග දන්නා භික්ෂූහුය. තාපස කුමාරයෝ නම් රාහුල කුමාරයෝය. තාපසව උපන්නෙමි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේකී.

SANHIDA LANKA

# සුව ජාතකය

තවද මාගේ මුදුන්මල්කඩවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෑවාවූ අන්නපානාදිය දිරවාගතනොහි මළාවූ භික්ෂූකෙණෙකුන් වහනසේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේදයි යත්

එක්තරා භික්ෂූ කෙණකුන් වහන්සේ සයදන නොවළඳා අජීර්ණකොට වළඳා මළසේක, මේ කථාව දම්සභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහනසේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතුනොවෙයි පෙරත් තෘෂ්ණාවසඟව මළෝවේදයි වදාරා ඒ කෙසේදයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාල සේකී.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජරුකෙණෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන්ගේ හිමාලවනයෙහි ගිරාව ඉපද වායෝවෘද්ධව දෑස් නැතිව වාසය කරන්නාහ. බෝධිසත්වයන්ගේ පුතනුකෙණෙක් ඇත්තාහ. ඒ පුතනුයෝ දෙමව්පියන්ට පලාඵල ගෙණවිත්ලා රකිනාහ. එසමයෙහි ඒ ගිරා පොතකයෝ සමුද්‍ර මධ්‍යයෙහි මී අඹ ඇති නියාව දැන පසු දවස් සමුද්‍ර මධ්‍යයෙහි දිවයිනට ගොස් අඹකා දෙමව්පියන්ට අඹ ගෙණවුත් දුන්නුය. බෝධිසත්වයෝත් එකියන අඹ කා මේ අඹ අසවල් දිවයිනේ අඹගසේමයයි කිවුය. එවිට බෝධිසත්වයන්ගේ පුතනුවෝත් ඒ අඹයයි කිවුය. ඊට බෝධිසත්වයෝ කියන්නෝ පුත ඒ දිවයිනින් අඹ ගෙනීමෙන් ඉදිරියේ බොහෝ උපද්‍රව පැමිණෙයි. එසේ හෙයින් දිවයිනට ගොස් අඹ කන්නේමය. එක් දවසක් අඹ කා මත්ව පියා නිදිකන ඇතිව පියා අඹන්නේ මංහසර දැනගතනොහි මහමුහුද මැද පියාසර කොට දියේ වැටී මළහ. ඒ මළාවූ ගිරාපෝතකයා මත්ස්‍යයෝ ගසා කෑවාහ. බෝධිසත්වයෝ තමන්ගේ පුතනුවන් නොආහෙයින් මා කීවානොඅසා මළමැනවයි සිතා තමන්ට ගොදුරුලන කෙනෙකුන් නැති හෙයින් තල්ල වියලී මළාහයි වදාරා බුදුව වැඩහිඳ වදාරණසේක් යම්සේ කීවා නොඅසා තෘෂ්ණාවාසභව ඒ ගිරවා මළද එමෙන් යම්කෙණෙක් තෘෂ්ණාවසඟව ඒ ගිරවා මළද එමෙන් යම්කෙණෙක් තෘෂ්ණාවසඟව අන්නපාන බොහෝ කොට කත්නම් උන්ටත් එසේම වන්නේයයි යම් කෙනෙක් තමන්ගේ අග්නි විවරට අන්නපාන කන්නම් දෙලොවින් සුවඵලවයි වදාරා මේ සුව ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි එකියන ගිරාපෝතකයා නම් මේ කියන භික්ෂූහුය. ගිරවාට පියව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# ජරදපාන ජාතකය

තවද සංසාරවාහවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පන්සියයක් වෙළඳුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

පන්සියයක් උපාසක වෙළෙන්දෝ වෙළඳාම් පිණිස යන්නාහු සර්වඥයන් වහන්සේ දක පන්සිල් ඇරගෙණ යම්හයි සිතා ආම්හයි කියා සර්වඥයන්වහන්සේ අතින් පන්සිල් ඇරගෙණ නික්මුණාහ. නික්ම අතරමගදී පුරාතන ළිඳක් දක ඒ ළිඳ පැන් ඇද්දෝහෝයි සිතා බලා පැන් නොදක පැන් උනන තුරු කනුම්හයි සිතා කැනන්නාහු පළමුකොට යකට ලෝකඩ තඹ රත්රන් මුතු මැණික් ආදීවූ බොහෝ සම්පත් දක තමන්ගේ පන්සියයක් ගැල්පුරා ගෙණ සැවැත්නුවරට ආවාහුය. ඇවිත් සර්වඥයන් නිසාය අප සැපසේ යාත්‍රා කොටගත්තේයයි කියා සර්වඥයන් වහන්සේ එපවත් අසා පෙරත් ඒ ළිඳන් වෙළෙන්දු සම්පත් ඇරගන්ට සිතා බොහෝ විනාශයට පැමිණියෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ වෙළෙඳකුලයෙහි සාත්තුනායකව උපන්නාහ. පන්සියයක් වෙළෙදුන් ඇරගෙණ වෙළඳාම් පිණිස නික්ම මෙම ළිඳ සමීපයට අවුත් බොහෝ සම්පත් කැණ ගොඩනැගුහ. බෝධිසත්වයන් ඉතකින් පමණ නොකණුවයි කියව කියා කනින්ටවන්හ. එකියන ළිඳ පාත වසන්නාවූ දියනයෙක් ඇත. ඒ නයාගේ ඉස උළුපස් වැටෙන්න වන, එවිට නයා කිපි පණ්ඩිත වෙළඳ හැර සෙසු වෙළෙන්දු මියෙත්වයි සිතා නාසාපුටයෙන් විෂධුමයක් ඇර පන්සියයක් වෙළදුන් ජීවිතක්ෂයට පමුණුවා පන්සියයක් ගැල්ම බෝධිසත්වයන්ට පාවාදී තමන්ගේ නාගනෙවියන් ලවා ගැල්පද්දවා බෝධිසත්වයන්ගේ ගෙයි ලැවුහ. බෝධිසත්වයෝත් බොහෝ යාචකයන්ට දන්දී කුසල්කොට පංචසීලය රැක පෙහෙවස් රැක කම්වූපරිද්දෙන් මිය පරලොව ගියාහ. ඒ අර්ථය දක්වන සර්වඥයන් වහන්සේ මහණෙනි යම්සේ ඒ වෙළෙන්දු යකඩ තඹ ලෝකඩ රත්රන් මුතු මැණික් ආදීවූ සම්පත් දක පණ්ඩිත වෙළඳා ඇඹෙයි කියාදි තෘෂ්ණාවසගවා විනාසයට පැමිණියාහ. තොප ඇමවනාහී තොප ඇමට විවර සම්පත් ගෙණාහෙයින් විනාසයට නොපැමිණියයි වදාරා ජරදපාන ජාතකය නිමවා වදාළසේකී. එසමයෙහි පණ්ඩිත වෙළෙඳා නම් බුදුවූ මම්මයයි වදාළ සේකී.

SANHIDA LANKA

# සංකප්ප ජාතකය

තවද තිකනිපාතයෙහි ජාතකවලින් සංකප්ප ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සංසාරදීපවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ස්ත්‍රියක නිසා ශාසනයෙහි උකටලී වූ භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක්තරා භික්ෂුකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක නිසා උකටලී වූ නියාව සංඝයා වහන්සේ දැන මහණ සර්වඥයන් වහන්සේ විසින් ස්ත්‍රීන්කෙරේ පිළිබඳ සිතීම දෝෂයයි කියා වදාළ නියාව දැන එසේ වූ පච්පිරෙන්නාවූ ස්ත්‍රීන් කෙරේ ශෝකව තොප සිවුරු අරින්ට කාරණා කින්දැයි කියා මහණ නොකමැති පරිද්දෙන් බුදුන් කරා ගෙණගොස් බුදුන්ට පෑහ. සර්වඥයෝත් ඒ නම දැක ඇයි මහණෙනි මෙනම නොකැමැති පරිද්දෙන් ගෙණගෙණායේ කුමක් පිණිසදැයි විචාරා වදාරා එපවත් අසා සැබෑද මහණ තා ස්ත්‍රියක් නිසා උකටලී වූයේයයි විචාරන්නා සැබෑය ස්වාමිනි කී කල්හි මහණෙනි මේ භික්ෂූන්ට වරද කොට ගෙණා පමණක් විනා මුන්තිබා පෙර උත්තමයන්ගේ පවා සිතිවිල්ල කළඹාපූ ස්ත්‍රීහූ මුන්සේ වුවන් බලද්දායි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකී.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රාහ්මණ කුලයක ඉපිද ගෙදොරව දෙමවුපියන්ගේ ඇවෑමෙන් බොහෝ සම්පත් දැක සිතන්නාවූ මාගේ දෙමව්පියෝ මේ සම්පත් තිබා තුමූ පරලොව ගියාහ. එසේ හෙයින් මට සම්පත්තියෙන් කාර්යකිම දැයි සිතා ගේ පිරුණු සම්පත් දානමුඛයෙහි විසුරුවා බොහෝ බන්ධූන් කඳුළුගත් මුහුණු ඇතිව සිටියදී ගිහිගෙයහැර හිමාලය වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පංචඉර්ධි අෂ්ටසමාපත්ති උපදවාගෙණ වාසය කරන්නාහු එනු ඇඹුල් නිසා බරණැස් නුවරට ආහ. රජ්ජුරුවෝත් මතුමාලෙහි සිටියාහු බෝධිසත්වයන් ගේ ඊර්යාපථයෙහි පැහැද තමන් ලඟසිටි අමාත්‍යවරයෙකුට කියන්නාහු ආරවඩනා සිල්වත් තාපසයන් වහන්සේගේ භික්ෂාපාත්‍රය ඇරගෙණ එවයි කියා යවූහ. එකියන අමාත්‍යයාත් ගොසින් බෝධිසත්වයන්ගේ භික්ෂා පාත්‍රය ඉල්වීය. බෝධිසත්වයෝත් රජ්ජුරුවන් අප හා පුරුදුකම් විස්වාසකම් නැතිවුව රජ්ජුරුවෝ අප කුමටකැඳවද්දැයි කියා යවූහ. ඒ අමාත්‍යයෝ එපවත් රජ්ජුරුවන් වහන්සේට කියා මා එනතුරු සිටියමැනවයි කියා අමාත්‍යයෝ එපවත් රජ්ජුරුවන් වහන්සේට කියා මා එනතුරු සිටියමැනවයි කියා රජ්ජුරුවන් කරාගොස් එපවත් කියා රජ්ජුරුවෝ එපවත් අසා ඒ අමාත්‍යයා අත කියාඑවන්නාහු මාගේ කුළුපග තාපසකෙණෙක් නැත්තාහ, එසේ හෙයින් වඩිනේ යහපතැයි කියා යවා රජ්ජුරුවෝ තුමූත් මතුමාලේ සිට සිව්මැදුරු කවුළුවෙන් අතපොවා තාපසයන් වැඳ වඩිනේ යහපතැයි ආරාධනා කළහ. බෝධිසත්වයෝත් රජ්ජුරුවන් කළ ආරාධනාව ඉවසා රාජපුරුෂයා අතට ශික්ෂාපාත්‍රය දී අමාත්‍යයා හා සමග රජගෙට වන්හ. රජ්ජුරුවෝත් බෝධිසත්වයන්ට අසුන් පනවා වඩාහිඳුවා මිහිරි ආහාරපාණ වළඳවා බණඅසා බෝධිසත්වයන් තමන්ගේ මගලොදායානයෙහි වසන නියායෙන් ප්‍රතිඥා ඇරගෙණ බෝධිසත්වයන් හා සමග උයනට ගොස් බෝධිසත්වයන්ට රාත්‍රී ස්ථාන දිවාස්ථාන චංක්‍රමණ ආදීවූ දෙයකරවා තාපසවරුන්ට කැපවූ ශ්‍රමණ පරිස්කාර සලස්වා උද්‍යානපාලයට තාපසයන් වහන්සේගේ දුකෙහි සැපෙහි බැඳෙන නියාවෙන් ඕහට භාරකොට රජගෙට ගියාහ. එවක්පටන් දොළොස් අවුරුද්දක් තාපසයන්ට සිවුපසයෙන් නිරන්තරයෙන් පෝෂ්‍යකරන්නාහ එසමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ පසල් දනව්වට සතුරන්ගෙන් භයෙක් විය එපවත් දත් රජ්ජුරුවෝ අග්‍රමමහසිකාවන්ට කියන්නාහු ප්‍රත්‍යන්තයේ සතුරන්ගෙන් භයෙක් විය, එය සන් සිඳවන්ට යන්නාකැමැත්තෙමි මෙනුවරත් තොප හෝ මා හෝ දෙන්නාගෙන් එක් කෙණෙකුන් ඉන්දමනායයි කීහ. අග්‍රමහේසිකාවොත් එපවත් අසා ඇයි කාරණාකින්දැයි විචාරා සිල්වත් තාපසයන් වහන්සේට දන්දෙන පිණිසයයි කීහ. අග්‍රමහේසිකාවෝත් යහපතැයි දේවයන් වහන්ස නුඹ වහන්සේ වඩිනාතුරු තාපසයන් වහන්සේගේ කාර්යය මට භාරයි නුඹ වහන්සේ කිසිසැකයක් නොසිතා වැඩියමැනවැයි කීහ. රජ්ජුරුවෝ යහපතැයි චතුරංගිනී සේනාව ඇරගෙණ යුද්ධයට ගියාහ. එතැන්පටන් බෝධිසත්වයෝ ආකාශයෙන්ම රජ්ජුරුවන්ගේ මාලිගාවට වැඩ බිසවුන් පණවාදෙන අස්න පිට යන්නහ. මේ නියායෙන් දවස්පතා රජ ගෙයින් වළඳාඑන්නාහ. එක් දවසක් බිසවුන් දන් සූපයා බෝධිසත්වයන් එන පෙරමග බල බළාඋන්නාහු සිඟිත්තක් ප්‍රමාදව හෙයින් නහා සිහින් කසාවන් වස්ත්‍රයක් ඇඳ සර්වාලංකාරයෙන් සැරහී කුරුයානකට වැදහෙව නිදන්නාහ. බෝධිසත්වයෝ වේලා බලා භික්ෂු පාත්‍රය ඇරගෙණ පස් වණක්

SANHIDA LANKA

වළාමඩිමින් රජ්ජුරුවන්ගේ මතුමාලට වැඩිසේක. එවිට බිසවු වල් කලා සිවුරෙන් සුලන් වැදගත් අඬ අසා තාපසයන් වහන්සේ වැඩිව නැයි සිතා වහා නැගිසිටිනාහු ලිහිල්ව තුබූ සළුවකටියෙන් ගැලවී වැටින. බෝධිසත්වයෝත් ඒ දැක සුභ නිමිත්ත වශයෙන් බලන්නාහු දෘෂ්ටි ජාලයෙන් බිදබැළුහ. එවේලෙහි බෝධිසත්වයන්ගේ ධ්‍යානය පිරිහිණි. පියසුනු කවුඩෙකුමෙන් සැදූල්ලේ පයින් බැස සිටියාහ. බිසවුන්ගේ රූපශ්‍රීය යහපත් නියාය අතුල් පතුල් කලවා කෙඬ ආදීවූ අවයව වෙනවෙනම බලන බෝධිසත්වයන්ට බලවත්වූ සෝක උපන. එවිට අමාත්‍යයෝ අසුන් පනවා ඉන්ට කීවත් නොයින්නාහ. බිසවුන් තමන් නිසා බෝධිසත්වයන්ට සෝක උපන් බව දැන තමන් අන්නපානය බෝධිසත්වයන් ගේ භික්ෂා පාත්‍රයෙහි ලූහ. බෝධිසත්වයෝ ආකාශයෙන් යානොහී ඉනිමගින් බිමට බැස තමන් වසන්නාවූ පන්සලටම ගොස් බත්පාත්‍රයත් නොවළඳා තිබා මැස්සට නැගී සද්දවසක් නිරාහාරව වැදහොත්තාහ. රජ්ජුරුවෝත් සතුරන් සන්සිඳුවා නුවරට අවුත් ප්‍රදක්ෂිණාකොට බැස තමන් වසන්නාවූ රජගෙට වැද තාපසයන් වහන්සේ දකින්ටයයි කියා උයනට ගියාහ. තාපසයන් වහන්සේගේ මළුව කසලව තිබූ නියාව දැක එසේ වීනම් තාපසයන් වහන්සේ හිමාලය වනයට වැඩපුනියාවේදැයි සිතා දොර අඬවල්කොට තිබූ හෙයින් ගෙටවැද තාපසයන් වහන්සේ දැක එසේ නම් තාපසයන් වහන්සේ ලෙඩ නියායයි සිතා මලුවෙකසලක් හරවා පිළිනිව නිලමැස්සන් ඇසිරෙමින් සිටි පාත්‍රයේ බතුත් දම්මවා තාපයන් වහන්සේ කරාගොස් ස්වාමීනි ඇති ඵාසුඅවාසු කින්දැයි විචාරා එවිට තාපසයෝ කියන්නාහු රජ්ජුරුවෙනි ඊපාරක් ලදුම්හයි කීහ. රජ්ජුරුවෝ සිතන්නාහු සතුරෝ මට කුමකුත් කොටගතනොහි තාපසයන් වහන්සේට දුක්ඛයක් කළ නියාවනැයි සිතා ස්වාමින් වහන්සේගේ ඊපාර වැදගත්තේය. කොතනදෝ කියා ශරීරයේ වටබලා නොදැක තාපසයන් අතින් විචාරන්නාහු කොතනක ඊය වැද ගත්තේදැයි විචාළාහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු සතුරන්ගෙන් වැදගත් ඊයෙක් නොවෙයි කියා තමන් වැදගත් ඊය කියන්නාහු මහරජ්ජුරුවෙනි මම අන්‍යවූ පසමිතුරන් විසින් විදින ලද්දෙම් නොවෙමි. වැලිකවුරුන් විසින් විදිනාලද්දේයත් මම මාගේ හෘදයෙහි ඊය විදිනාලද්දෙමි කුමක් විදිනා ලද්දෙම්ද යත් සංකප්පරාගධොතෙන, සංකප්පරාග දොහනයෙන් විතර්ක තිස්සිතෙනව, විතර්කයෙන් යුක්තවූ රාගයෙන් කොරොස්සනක ගාලද්දාවූ චිත්තයෙන් හස්තයෝ සොභොනය පාදයෝ සොභනය මුඛය සොභනය යනාදීවූ හස්ත පාදාදී අවයවයන් යහපතැයි ගන්නාලද විතර්ක නැමැති සිළුවූ සනාගන්නාලද්දාවූ නාලංකතහදෙදන, ඉඟුලින්ලා බැඳසරහා යහපත්කොට නොකරණලද්දාවූ ඇස් කෙළවරින් බල ඇදමඩ නොසිටුවනලද්දාවූ නළසුකාරෙනෙව, සර්වාකාරයෙන්ම ඊවඩුවකු විසින් නොකරණ ලද්දාවූ බවදැන නාගනනායකමුතෙතන, දකුණුකන්මුලදක්වාඋරපුරා ඇද අසුර නොගලවන ලද්දාවූ නපිමොරු පසෙවිනා, මොනරුන්ගේ තඹවන්වූ ගිජුලිහිණියන්ගේ ලොහොතුඬුවන් පතින් නොසදන ලද්දාවූ සබ්බංගපරිදාභිනො, සර්වංග පරිදාහවිනාශකල සකල ශරීරයෙහි ගිණිසුළු ගසන්නාක්මෙන් දාහඋපදවන්ට සමර්ථවූ තෙන ඒ කාමරාග නැමති කෙලශ සැරයෙන් විඩොඅමහි, විදිනලද්දෙම්වීම්, මහරජ්ජුරුවෙනි ඒ කාමරාග නැමති ඊයෙන් විදිවෙලෙහි පටන් මාගේ සකලශරීරය ගින්නෙන් තැවෙන කලක්මෙන් දාහ වැදගෙණ දන්නේය. රුධිර මස්සවෝ. මාගේ ලෙහි වැදගෙණ යම්ශරප්‍රහාර මුඛයකින් ලේ වැගිරේ නම්, අවෙධවන මාගේ සිත ඉතාසරකොට නුනුවනින් වඩනාලද්දේය, එසේ හෙයින් මා විසින් මේ මට, දුක්ඛසමාගතං, අසුභාලම්බන වසයෙන් ගැණීමෙන් රාගචිත්තය උපදවා දුක් එලවනලදැයි ධර්මදේශනා කොට රජ්ජුරුවන් ඇතපලායවයි කියා පන්සල ඉඳ පංචවෘද්ධි අෂ්ටසමාපත්ති උපදවාගෙණ රජ්ජුරුවන් උන්තෙනට ගොස් ආකාශයෙහි පලක්බැඳ වැඩහිඳ බණකියා රජ්ජුරුවන් උන්තෙනට ගොස් ආකාශයෙහි පලක්බැඳ වැඩහිඳ බණකියා රජ්ජුරුවෙනි මම හිමාලය වනයට යම්හයි වදාළසේක. රජ්ජුරුවෝ මාගේ දිවිහිමින් නුඹවහන්සේව ආරක්ෂා කෙරෙමි නොගිය මැනවයි කියද්දීත් රජ්ජුරුවෙනි මනුෂ්‍යභාවනයෙහි ඉදිමෙහි බොහෝ ආදීනව ඇතැයි කියා හිමාලය වනයට ගියහයි වදාරා සංකප්ප ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# තිලමුට්ඨි ජාතකය

තවද මාගේ සිරෝමාණික්‍යවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් කොපීවූ භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක්තරා භික්ෂූකෙණෙකුන් වහන්සේ යම්තම් බසකටම කෝපවනසේක. සෙසු භික්ෂූන් වහන්සේ එනම් දැක කෝපී නොවන්නාවූ බුද්ධශාසනයෙහි මහණව තොප කොපවීමෙන් දවස් යවන්නේ කටයුතු නොවන්නේ වේදැයි කියා ඒ භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේ කරා ගෙණගොස් දැක්වූසේක. සර්වඥයන් වහන්සේත් සැබෑද තා කෝපවීමෙන් දවස්යවන්නේදැයි විචාලකල්හි සැබෑව ස්වාමිනි දැන්වූකල්හි සර්වඥයන් වහන්සේ මහණෙනි දැන්මතුනොවෙයි පෙරත් මේ භික්ෂූහු කෝපවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේකී.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ බ්‍රහ්මදත්ත නම් රාජ කුමාරකනෙක් ඇත්තාහ. ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් තමන්ගේ පුතනුවන්ට මසෙසන් දහසක් හා පිළිසඟලක් හා පත්කුඩයක් හා වහන්සඟලක් හා බත්මුලක් ආදීවූ දෙයදී දිසාපාමොක් ආචාරීන් කරාගොස් සිල්පශාස්ත්‍ර ඉගෙණගෙණ එවයි යවූහ. එකියන කුමාරයාත් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරී දකින්ටගිය වෙලාවට දිසාපාමොක් ආචාරීන් ශිෂ්‍යයන් ශිල්ප ශාස්ත්‍ර උගන්නා මිදුලෙහි සක්මන් කොට කොට සිටියහ. ඒ වෙලාවට රාජකුමාරයන් ලඟ එන්නා දැක ඇයි තොපි කුමට අවුදැයි විචාරා ශිල්ප උගන්ට ආමී කී කල්හි ආචාරීන්ට වස්තු දී ශිල්ප දැක උගනුද කුලියට ශිල්ප උගනුදැයි විචාළකල්හි එවිට රාජ කුමාරයාත් ආචාරී භාගයක් පළමුකොට තබා වැදහොත්තාහ, එවිට දිසාපාමොක් ආචාරීන් රාජකුමාරවරුන් නම් කල්යවා ශිල්ප උගන්ට බැරිය වහා ශිල්ප උගතමැනවයි කියා සාමාන්‍යයකක් සලස්වා ශිල්ප උගන්ට පටන් ගැන්වූහ. එක් දවසක් රාජ කුමාරයන් පිටිපස්සේ ලාගෙණ නාන්ට වැවට යමින් සිටියාහ. ඒ වෙලාවට එක්තරා මැලි ස්ත්‍රියක් එලකරපුතල අව්වේ වනා වියලමින් සිටියහ. ඒ වෙලාවට දිසාපාමොක් ආචාරී පස්සේ යමින් සිටි රාජකුමාරයෝත් ඒ කියන එල තල දැක කන්නා අභිප්‍රාය ඇතිව ගාණක් අතටගෙණ කාපූහ. එකියන මැලි ස්ත්‍රීන් ඒ දැක කුඩාකොල්ලා හෙයින් බඩසයින් කාපුවමැනවැයි සිතා බැණ නොනැගී සිටියාහ. එවන දවසුත් එපරිද්දෙන්ම රාජ කුමාරයෝත් එල තල ගාණක් අරගෙණ ගියාහ. තුන්වන දවසුත් එපරිද්දෙන්ම ඇරගත්තාහ. එවිට ස්ත්‍රී සිතන්නී මේ නියායෙන් දවස්පතා කත්නම් මාගේ තල නිමායෙයි සිතා කියන්නී දිසාපාමොක් ආචාරීන් වහන්ස තමන් වහන්සේගේ අතවැස්සන් ලවා මාගේ තල ගන්නා සේකැයි මොරගෑව. එවිට දිසාපාමොක් ආචාරී ඇයි මෑනියනි මම කුමන අන්‍යවක් කෙලෙම්දැයි කීහ. එවිට ස්ත්‍රී කියන්නී නුඹ වහන්සේ පස්සේයන අතවැසි තුන්වාරයක් මාගේ තල ඇරගෙණ ඉනිබ්බේත් තලගනිත්නම් මාගේ තල නිමන්නේයයි කියා මොරගා කීය. එවිට දිසා පාමොක් ආචාරී කියන්නාහූ ඊට තොප වික්ෂේපනොව තොපගෙන් කෑ තලවලට මම මිලදෙමි කීහ. එවිට ස්ත්‍රී කියන්නී කෑ තලයට මිළ එපයි ඉනිබ්බේ මාගේ තල නොකන ලෙස අවවාද කියවයි කීහ. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහූ ඉදිරියේදී පාටව කෙරෙමි කියා අතවැස්සන් දෙත්නකුලවා දෑත් කර අල්වා උනපත්තෙන් පාරගණනක් ගස්වා පාටව කරවූහ. එවිට රාජ කුමාරාත් දෑස්රත්කොට උරණවමුහුණුබලා වෛරබැන්දේය, දිසාපාමොක් ආචාරීන් තමන් කෙරේ වෛර බැඳි නියාව දන්හ. දැන දැනත් සියළු ශාස්ත්‍ර උගන්වා නිපුනකරවූහ. ඒ රාජ කුමාරයාත් දිසාපාමොක් ආචාරීන් වැඳ නුවරට යන්නාහූ ආචාරීන් වහන්ස මම සැපසේ රාජ්ජයට පැමිණියෙම්වීන්නම් නුඹවහන්සේ කැඳවා එවම් එවිට අවමැනවයි කියා තමන්ගේ රටටගොස් තමන්ගේ පියරජ්ජුරුවන්ට ශිල්ප දැක්වූහ. එවිට රජ්ජුරුවෝ සමාධිව මා අසසමුයේ මොහුගේ රාජ්ජ්‍යශ්‍රී දකිම් සිතා රාජ්ජ්‍යශ්‍රීය දුන්නාහ. එකියන රාජ කුමාරයාත් රාජ්ජයට පැමිණ දිසාපාමොක් ආචාරීන්ට පාටවකරන්නා කැමතිව ආචාරීන් වහන්සේ මාකෙරේ සැකනොසිතා වහා එන්නේ යහපතැයි කියායවූහ. එපවත් දිසාපාමොක් ආචාරීන් වහන්සේ අසා රජ්ජුරුවන් වහන්සේ මා කැඳවා එන්නේ මට සෙනෙහයෙන් නොවෙයි මා ගැසූ පාරට නිග්‍රහ කරන්නටයයි සිතා දූන කුමාරයෝ බාලයෝය එසේ හෙයින් මා කියන අවවාද දූන් අසන්නේ නොවෙති. පසුව වැඩි මාළු වයසට පැමිණිකල යෙම්සිතා නොගොස් කල් යමක්කොට රජ්ජුරුවන් වැඩිමාළුව ගියපසු දිසාපාමොක් ආචාරීන් නොකැඳවාම තුමූ ගියහ. ගොස් වාසල සිට තමන් ආපවත් කියායවූහ. එපවත් අසා රජ්ජුරුවෝ යහපත ආචාරීන් වහන්සේ කැඳවම් කියා කැඳවා කියන්නාහූ ඇයි ආචාරීනී තොපි මරණ නලලේ තබා අවුද එදවස් තොප විසින් මා තලකෑවයි කියා දෙන්නකුලවා අත් දෙක දල්වා උණපත්තෙන් තැළවූපාර තවදක්වා මාගේ පිටේ රිදෙන්නේයයි කියා අමාත්‍යයෙනි මේ දිසාපාමොක් මරවයි කීහ. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහූ රජ්ජුරුවෙනි එදවස් තොප කෑ තලවට පාරක් නොගැසී නම් දෙවෙනි දවස් අනික් සොරකමක් කරණසේක. එවිට යම් කෙණෙක්

SANHIDA LANKA

මරාදමාපුනම් දූන් මේ රාජ්ජශ්‍රීය බලන්ට නැත්තේ වේද එසේ හෙයින් හික්මවීම පිණිස කළ පාටවයට උත්තමයෝ වෛරනොබදිති කියානීහ. එපවත් අසා බොහෝ අමාත්‍යයෝත් එසේමය දේවයන් වහන්සැයි දිසාපාමොක් ආචාරීන් වහන්සේ පිණිස රාජ්ජ්‍යශ්‍රී නුඹ වහන්සේ ලද්දේයයි අමාත්‍යයෝ කීහ. රජ්ජුරුවෝ ඒ කාරණය සිතාගෙණ ආචාරීන්ගේ බොහෝ ගුණ සඳහන්කොට කියන්නාහු දිසාපාමොක් ආචාරීනි රාජ්ජජයට පැමිණියේ තොප පිණිසයයි එසේ හෙයින් රාජ්ජය පිළිගණුවයි කීහ. එපවත් අසා දිසාපාමොක් ආචාරීන් රාජ්ජය නොගිවිස්සාහ. රජ්ජුරුවෝත් තමන්ගේ මිනිසුන් යවා ආචාරීන්ගේ අඹුදරුවන්ගෙන්වාගෙණ තමන්ගේ නුවරලා ආචාරීන්ට බොහෝ තරම්පදම් සලස්වා තමන්ට පුරෝහිත තනතුරෙහි තිබුවේදැයි වදාරා මේ තිළමුට්ඨී ජාතකය නිමවා වදාළ සේක. මේ ජාතකය අවසානයෙහි එකියන හික්ෂූන් වහන්සේ අනාගාමිඵලයෙහි පිහිටි සේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් මේ කෝපි හික්ෂූහුය. දිසාපාමොක් ආචාරීව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මණිකණ්ඨ ජාතකය

තවද මාගේ ස්වාමිදරුවානන් වහනසේ අලව්නුවර නිමා අග්ගලා චෛත්‍ය භූමියෙහි වැඩවසන සමයෙහි කුටිකාර සික්ෂා පදයන් දක්වන ලද.

ඒ කෙස්ද යත්

අලව්නුවරවාසී භික්ෂූන් වහන්සේ බොහෝ මනුෂ්‍යයන්ට අපට ගෙවල් ඉදි කරන්ට කැති දේව පොරෝ දෙවයි කියා නොයෙක්දේ ඉල්වා ආයාස කරණ සේක. එසේ හෙයින් මනුෂයෝ සංඝයා වහන්සේ දකිනා අභිප්‍රායමදව වාසය කරන්නාහ. එසමයෙහි කාශ්‍යප ස්වාමින් අලව්නුවර සිඟාවැඩිසේක් තමන් වහන්සේත් තමන් වහන්සේගේ මනුෂ්‍යයන් සැඟවුනුහෙයින් උන්වහන්සේ දූකසේ සිඟා වළඳා සර්වඥයන් වහන්සේ වසන්නාවූ අග්ගලාකනම් චෛත්‍යභූමියට ගොස් සර්වඥයන් වහන්සේට දන්වනසේක් ස්වාමිනි ආදී අලව්නුවර සිඟා ගියකල සතරපහස සැපසේ ලැබෙයි දූන් අප දූක මනුෂ්‍යයෝ සැඟවෙති කී සේක. සර්වඥයෝත් ඒ සැඟවෙන්නාවූ කාරණය දූන අලව්නුවර වාසී භික්ෂූන් වහන්සේ කැන්දා තොප හැමවිසින් අලව්නුවර මනුෂ්‍යයන්ට බොහෝ ගැණ සිහිනිකොට නොයෙක්දෙය ඉල්වති යන්නක් ඇසිමි, ඒ සැබෑදැයි විචාළ සේක. ඒ භික්ෂූන් වහන්සේ සැබෑව ස්වාමිනි දන්වන්නා මහණෙනි ඉල්විම් නම් කවුරුන්ටත් නොකන්කලු දෙයක යටත්පිරිසෙයින් බොහෝ සම්පත් ඇත්තාවුන්ට පවා ඉල්විම් විකෙෂ්පවේදැයි කියා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජයකරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එක්තරා බ්‍රහ්මණකුලයක ඉපිද වාසය කරණසේක. බෝධිසත්වයන් වහන්සේගේ මෑනියන් වහන්සේ පසුවත් එක් බ්‍රහ්මණ කෙණෙකුන් වැදූහ. ඉක්බිත්තෙන් බෝධිසත්වයන් වහන්සේගේ මෑනියන් වහන්සේ පසුව කාලක්‍රියා කළහ. බෝධිසත්වයන් හා මලනුවෝ ගිහිගෙයි සම්පත්හැර හිමාලයවනයට ගොස් ගඟක් සමීපයෙහි දෙබෑයෝ ගඟ දෙහිකතියෙහි පන්සල කොටගෙණ වාසය කරන්නාහ. බෝධිසත්වයන්ගේ මලනුවෝ වසන්නාවූ පන්සල සමීපයෙහි ගඟ වසන්නාවූ මණිකණ්ඨ නම් නාග රාජයෙක් ඇත. ඒ තාපසයන්ගේ පන්සල සමිපයේ මනුෂ්‍ය වෙෂයෙන් සක් මන් කොට ඇවිදින්නේය. තාපසයන් දූක තාපසයන් හා පිළිබඳ සිත් ඇතිව කථා කොට යන වෙලේ තාපසයන් නාග වේෂයෙන් සිපගෙණ තාපසයන් ඉස්මත්තේ පෙණය තිබා යම්තම් වේලාවක් සනෙතාෂව නිවාගෙණ පෙරලා දරණවැලය ඇර තාපසයන් වැඳ නාග භවනයට යන්නේය. මෙම නියායෙන් දවස් පතා ඇවිත් යාමෙන් තාපසයන් ඇඟගැවෙත් ගැවෙත් භයින් තාපසයෝ වැරීතාහ. මේ නියායෙන් ඉතා දුර්වලව පඬුවූ ශරීර ඇතිවූහ. එක් දවසක් තාපසයෝ තමන්ගේ බෑයන් වහන්සේ දකින්ට පන්සලට ගියාහ. බෝධිසත්වයෝ මල් තාපසයන් දූක ඇයි තොපගේ ශරීරය මෙලෙස දුර්වලවන්ට කාරණා කින්දැයි විචාළාහ, එවිට බෝධිසත්වයන්ගේ මලනුවෝ කියන්නාහූ මණිකණ්ඨ නම් නාග රාජයෙක් දවස්පතා අවුත් මා සිපගන්නේය. එසේ හෙයින් මා වැරීනේයයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහූ ඒ නයා තොප සමීපයට නොඒ නම් සමාධිදැයි විචාළාහ. එවිට බෝධිසත්වයන්ගේ මලනුවෝ එසේ වීනම් යහපතැයි කීහ. ඒ නාගරජ්ජුරුවන් පැලඳගෙණ එන්නේ කුමණ ආභරණදැයි විචාළාහ. තාපසයෝ කියන්නෝ කර පළඳිනා කණ්ඨමාණික්‍යයයි කීහ. එසේ වී නම් ඒ නාගරාජයා තොප සමීපයට ආකල උන් පැලඳගෙණ ආවාවූ කණ්ඨ මාණික්‍යය ඉල්වව, එදා පලාගොස් පසුව දවස් ඒ මලුව සමීපයට ආකල මාණික්‍යය ඉල්වව පසුව දවස් දියෙන් ගොඩනැගෙන කලට මාණික්‍යය ඉල්ලව. මේ නියායෙන් ඉල්වන්ට වදිනාකල තෙමේම නොයෙක් කීහ. මේ නියාවට එකියන තාපසයෝත් පළමු දවස් නාගරාජයා ගෙටවදින වෙලාවටම තොපගේ ග්‍රීවයේ තිබූ කණ්ඨමාණික්‍යය මට දෙවයි කීහ. එවිට නයා ගෙට නොවැදම පලාගියේය. දෙවැනි දවස් මළුවේ කෙළවර සිට ආවේලාවටම මැණික ඉල්වන්නා එතන සිට පලාගියේය. තුන්වෙනි දවස් නයා දියෙන් ගොඩනැගෙණ වේලාවටම තාපසයෝ මැණික ඉල්වූහ. එවිට නයා දියෙන් කිම්ද දිය මධ්‍යයෙන් ඉසඹසවා කියන්නෝ මට අන්නපානාදීවූ බොහෝ ලාභසත්කාර උපදවන්නාවූ කණ්ඨමාණික්‍ය තොපට මම් කෙසේ දෙම්ද එසේ හෙයින් තොපගේ පන්සලට නේනා පමණක් වේදැයි කියා නැවත කියන්නාහූ මාගේ බොහෝ සම්පත් ඇතිදෙය නොසිල්වා කණ්ඨමාණික්‍යය ඉල්වූ හෙයින් තොපලඟට නොඑණපමණෙක් වේදැයි කියා නාගරාජයා දියේ කිමිද නාගලොවට ගියේය. එතැන් පටන් තාපසයන් සමීපයට නොආවිරුයේය. තාපසයෝත් නයා නොඑන දවස් පටන් පළමුනියාවටත් වඩා සොකිපත්ව දුර්වලව ගියෝය. බෝධිසත්වයෝ මළනුවන් විචාරණ පිණිස ආවාහූ මලනුවන් ඉතා දුර්වල හෙයින් දුර්වල වූයේ කුමක් නිසාදැයි විචාළහ. එවිට තාපසයෝ කියන්නාහූ නයා නොදකීමෙන් දුර්වලව ගියෙම් කීහ. බෝධිසත්වයෝත් මූ නයාකෙරෙහි මහත් සෙනෙහ ඇත්තාහ. එසේ හෙයින් නයාකෙරේ සෝකයෙන් මළෝනම් නපුරුයි සිතා සෝක අරවන්ට උවමැනවයි සිතා කියන්නාහූ මළ නොයිල්විය යුතුදෙය ඉල්වීමෙන්

SANHIDA LANKA

ඊට සොක උපදවයි කීහ. ඉතකින් සෝක අරවයි කියා තමන් පළමු වසන්නාවූ පන්සලටම ගියාහ. එකියන තාපසයා සෝක අළුයේය. බෝධිසත්වයන්ගේ මළනුවන් හා දෙන්නා පංචඝෘධි අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනාහූ ධ්‍යානයෙන් බඹලොව ගියාහයි වදාරා මණිකණ්ඨ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බෝධිසත්වයන්ගේ මලනුවෝ නම් ආනන්ද ස්ථිවිරයෝය. එසමයෙහි අවවාද කී තාපසයෝ නම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# කුඩකක්කුච්ඡිසින්ධව ජාතකය

තවද මාගේ සිරෝ මාණික්‍යවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සැරියුත් ස්වාමින් අරහයා මේ ජාතකය දක්වන ලද,

ඒ කෙසේද යත්

සර්වඥයෝ සැවැත්නුවර ඉඳ ජනපද චාරිකාවේ සැරිසරා වැඩ පෙරලා සැවැත්නුවරට වැඩීසේක. සැවැත්නුවර වාසී බොහෝ මනුෂ්‍යයෝ සර්වඥයන්ට ආගන්තුක සත්කාර කරම්හයි සිතා උපසාකවරු ධර්මශෝක නම් භික්ෂූකෙණෙකුන් වහන්සේ අතින් තමතමන්ට උවමනා විචාර පන්සිය සසියදාසයයි මේ නියායෙන් පාත්‍ර ඇරගත්තාහ. එක්තරා දුක්පත් මැහැලි උපාසිකාවක් එකම එකනමකට දන් සපයා විධාන කරවන වහන්දැ සමීපයට ගොස් මටත් දන් දෙන නියායෙන් එකනමක් සලස්වන්ට උවමැනවයි කියන්නා එසේවීනම් සැරියුත් ස්වාමින්ගේ පාත්‍රය ගනුවය කීහ. යහපතැයි කියා එකියන මැලිඋපා සිතා සැරියුත් ස්වාමින් වඩාගෙණවුත් යහපත්කොට වැලඳවූහ. එගම අනේ පිඬු මහසිටාණන් විශාඛා මහඋපාසිකාවන් කොසල රජ්ජුරුවන් ඇතුළුවූ බොහෝ උපාසිකාවරුන් එකි උපාසිකාවට බොහෝ රත්තරන් මුතුමැණික් දුන්නාහ. එකියන උපාසිකාවත් බලීව පොහොසත්වූව මේ කථාව ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මෙසේ වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ උත්තරාපථයෙහි අස්වෙළඳව උපන්නාහ. එසමයෙහි බරණැස් නුවරටත් උත්තරාපථයටත් අතුරේ එක්තරා නියම් ගමෙක් ඇත, එ ගම ඉන්නා මැලිස්ත්‍රීයක් ඇත්තාහ. එසමයෙහි අස්වෙළෙන්දු අසුන් පන්සියයක් ඇරගෙණ බරණැස් නුවරට යන්නාහූ මැලි ස්ත්‍රීයකගේ ගෙයි කීපදවසක් රැඳුනාහ. එතන රැඳුනුගමනේ වෙලෙඹෙක් ආජානීය සෛන්ධවයකු වැදුව, එකියන සෛන්ධවයා එකියන මැලි තමාට දරුකොට වඩවන්ටවන එකියන අස්වෙළන්දු කීප දවසක් සැතපිලා බරණැස් නුවරට අසුන් ඇරගෙණ යන්ට වන්නාහ. එවිට එකියන ස්ත්‍රී කියන්නී මෙතෙක් දවස් මාගේ ගෙයිදී කා බී යනකලට මට කුලියක් නොදී යන්නේයයි කීය. එවිට අස්වෙළෙන්දු යහපත මැනියෙනි කුලියක් දෙම්මැයි කිවුය. එවිට ස්ත්‍රී කියන්නී කුලියෙන් මට කාරිය නැත. මාගේ ගෙයිදී උපන්නාවූ අස්පැටවා මටදෙන්නා පමණැයි කීහ. යහපතැයි කියා එකියන අස්වෙළන්දු අස්පැටවාදී ගියාහ.  ඒ කියන මැලි ඒ අස් පැටවා කුඩු හා තණ හා බත්පෙරු කැඳ ආදීවූ දෙය කවා වඩන්නීය. මේ නියායෙන් කවා මුකුරුවූ අවස්ථාවට බෝධිසත්වයෝත් උත්තරාපථයේ සිට අසුන් පන්සියයක් ඇරගෙණ බරණැස් නුවරට එන්නාහූ ඒ වෙලාවට අජානීය අශ්වයා වඩන මැහැල්ලගේ ගෙට නවාතැනට ආවාහ. ඒ වෙලාවට අජානීය අශ්වයා තණ කන්ට ගියේය. බෝධිසත්වයන් ගෙණා අසුන් පන්සියයක් එකියන අජානීය අශ්වයාගේ ඉලත්තියේ සුවඳ අසමින් හයින් ගෙට නොවැද දොරම සිටියාහ. බෝධිසත්වයෝ ගෙට වැද අම්ම මේ ගෙයි අස්සු ඇද්දයි විචාළාහ. එවිට මැලී කියන්නී පුත මා දරුකොට වැඩූ අසකුවිනා වඩා අස්සුනැතැයි කීහ. බෝධි සත්වයෝ අශ්වයා කොයිදැයි විචාළාහ. මැලි කියන්නී තණකන්ට ගියේය දැන් දක්කහැකියි කීහ. ඒ කියන අශ්වයාත් තණ කා ගෙට අවුත් තමා සිටින ස්ථානයට ගියේය. ඉවිට සෙසු අස්සු ගෙටවන්නාහ. බෝධිසත්වයෝත් එකී යන අශ්වයා දැක මේ අශ්වයා අජානීය අශ්වයයි කියා මා දත්හ. බෝධිසත්වයෝත් ඒ ගෙයි කීප දවසක් වාසය කොට බරණැස් නුවරට යනු කැමතිව මැහැල්ලට කියන්නාහූ අම්මබරණැස් නුවරට යෙමි මේ කියන අශ්වපොතකයා මාගෙන් මිළ ඇරගෙණ මට දෙවයි කීහ. කුමක් කියන්නේද පුත දරුවනුත් මිළ ඇරගෙණ විකුනැද්දැයි කීහ.  එවිට බෝධිසත්වයෝ කියන්නාහූ අම්මා මෙතන ඉඳ දුක්විඳිනා බලාත් මාලඟවීනම් බොහෝ සුව විඳිනේ වේද එසේ හෙයින් මටදෙන්නේයයි කීහ. ඒ ස්ත්‍රී මාගේ දරුවන් සුවවිඳිනාවේද යහපතැයි කියා අජානිය අශ්වයා බෝධිසත්වයන්ට දුන. බෝධිසත්වයෝත් ඒ අශ්වයා මිළකොට සතර පයට සාරදහසක් හා මුඛයට දහසක් වලිගයට දහසක් ඇතුළුව සදායක් වස්තුව හා ඒ ස්ත්‍රී සර්වාභරණයෙන් සරහා යහපත් වස්ත්‍රයක් ඇන්දූහ. එවිට ඒ අජානීය අශ්වයාත් තමා වස්තුවට විකුටපුහෙයින් මාගේ මැනියෝ මා මෙතෙක් දවස් වඩා වස්තු නිසා මා විකුටපුවයි අශ්වයා ඇඬූහ. එවිට මැලි ස්ත්‍රීන් පුත වික්ෂේප නොවන්නා තොප නිසා බොහෝ වස්තු ලදිමි. එසේ හෙයින් මේ කියන වෙළඳානන් කැටිව යවයි කීයා යවුහ. බෝධිසත්වයෝත් එකියන අශ්වයා ඇරගෙණ සිතන්නාහූ මේ අශ්වයා තමා අජානීය නියාව දනීදෝ නොදනීදෝහෝයි සිතා එම ස්ත්‍රිය ලන්නාවූ තණ හා කුඩු හා බතින්පෙරූ උළුකැන්ම ලූහ. එවිට අශ්වයා නොකෑයේය. ඇයි තොප පළමු කණදෙය දැන් නොකෑයේ ඇයිදැයි කියන්නා එවිට අශ්වයා කියන්නේ තමාගේ තරම් පදම් නොදන්නා කෙනෙකුන් සමීපයේදී උන් කුමක්කලත් ඉවසෙයි තමාගේ තරම් පදම්

SANHIDA LANKA

දන්නාවූ බ්‍රාහ්මණය තොප දක්කදීත් මා කුඩුකන්ටයෝග්‍යදැයි කීහ. එවිට බෝධිසත්වයෝ තොප පරීක්ෂා කරන්ට කෙළෙම් කියා ඒ අශ්වයාට මිහිරි අන්නපානලා එකීයන අශ්වයා ඇතුළුවූ පන්සියයක් අසුන් ඇරගෙණ බරණැස් නුවරට වැදී අවශේෂ අසුන් පන්සියය එක් ඇලයෙක සිටුවා අජානීය අශ්වයාට බුමුතුරුණුලා වියම් බැද එක් ඇලයෙක සිටුවූවාහ. එවිට රජ්ජුරුවෝ බෝධිසත්වයන් අතින් විචාරන්නාහු ඇයි මේ අසුන් පන්සියය එක් ඇලයක සිටියදී මූ එක්තෙනක සිට තෙමේ අසුන් පන්සියය නියාවට මේවඩිදැයි කීහ. එසේය දේවයන් වහන්ස මේ අසුන් පන්සියය නියාවට මේ වඩිය මේ අශ්වයාගේ ජවවේග බලාවදාළ මැනවැයි කියා මිනිසුන් පහකොට අශ්වයා පිට නැගී පාරේ අළහ. අසාගේ වේගයෙන් අසුන් කරින් කරගසා සිටෙව්වාසේ එක අස්වලල්ලක් මෙන් විය. නැවත බලාවදාලමැනවයි කියා දුවනවේග දන්වා අසා දිවන්ටවන. එවිට පිටඋන් බෝධිසත්වයනුත් අසාත් නොපෙණ්නටවන. එවිට බෝධිසත්වයො අසා ඇරගෙණ සෘර්ධිවුවාක් මෙන් වැටහේදෝහෝයි සිතා බඩු අවුරා රතු කඩක් බැඳගත්තාහ. ඒ වෙලේ අශ්වයා පාරේ අරින්ට වන්වෙලාවට රතු කඩක් වට ඇද්දාක් මෙන්විය. නැවත බෝධිසත්වයෝ බලාවදාරන්නේ යහපතැයි කියා මගුල්පත සටගොස් දියපිට නෙළුම්පතෙහි පාරේ අරින්ටවන්නාහ. එවිට අශ්වයාගේ කුරය තෙමෙන්නේත්නොවී නෙළුම්පත ඉරන්නේත් නොවි පාරේ අල, නැවත බෝධිසත්වයෝ අශ්වයාගේ ලසුතවය පාන හූ අසාපිටින් බැස අතින් අත ගසා අල්ලපෑහ. එවිට අශ්වයා තමාගේ සතුරකුරයම අල්ලපිට තිබිය. එවිට බෝධිසත්වයෝ කියන්නාහූ ස්වාමනිනි මේ අශ්වයාගේ වේගය සමුද්‍රය කෙළවර කොට තිබෙනමුත් මුගේ වේගයෙහි අන්ත්‍රායක් නොපෙණෙයි කීහ. එවිට රජ්ජුරුවෝ බෝධිසත්වයන් කෙරේ සතුටුව මේ නියා අශ්වයෙකු දුන්තැනැත්තවුව රාජ්‍යයෙන් කැබැල්ලක් දෙමි කළුහුගසාදී අශ්වයා සිටිනාතැන තමන්ගේ රාජමැදිරියමෙන් සරහා තමන්ට ඇතියම්ම පෙරහැරකදී රක්කැයි වදාරා කුඩකක්කුච්ඡිසින්ධව ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි මැහැලිනම් මෙසමයෙහි මැහැළිමය, එසමයෙහි අජානිය අශ්වයා නම් ශාරීපුත්ත ස්ථවීරය, එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය, එසමයෙහි අස්වෙළඳාව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සෙක්.

SANHIDA LANKA

# මහාමන්ධාතු ජාතකය

තවද කරුණා නිදාන වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උකටලීවූ භික්ෂු කෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

එක්තරා භික්ෂුකෙණෙකුන් වහන්සේ තෘෂ්ණා වසඟට සිවුරු හරිනට උත්සාහකරණ නමක් දැක ඒ නම ඇරගෙණ ගොස් සර්වඥයන් වහන්සේට දන් වන්නා ඇයි මේ මහණ නොකමැති පරිද්දෙන් ගෙනායේ කුමකටදැයි විචාරා එපවත් අසා මහණ තා විසින් සිවුරුහැර ගිහිගෙයි සිටත් තාගේ තෘෂ්ණාව පුරාගත එයිද රහත්ව තෘෂ්ණාව ක්‍ෂය කරතොත් මිසක් ගිහිගෙයිසිට තෘෂ්ණාව පුරා ගතඑයිද තා තිබා සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් චක්‍රවාටගර්භයට ඒකාධිපත්‍ය රාජ්ජය හා තාරකාදිව්‍ය ලෝකයේ රාජ්ජය හා තව්තිසා භවනයෙහි ආඞ්ඪරාජ්ජයත් ඇතුළුවූ රාජ්ජ තුනක් සතිස්ශක්‍රකොණෙකුන්ගේ ආයුෂය නිමා වනතුරු රාජ්ජයකොට තමන්ගේ තෘෂ්ණාව පුරාගතනුහුනුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස ප්‍රථමකල්පයෙහි සූර්යපුත්‍රවූ මහාසම්මත නම් රජ්ජුරු කෙණෙකුන් ඇතිවූහ. ඔහුගේ පුත් වරරොජ නම් රජ්ජුරුකෙණෙකක් ඇති වූවාහ. ඔවුන් පුත් කල්‍යාණ නම් රජ්ජුරුකෙණෙක් ඇතිවූහ. ඔවුන් පුත් වර කල්‍යාණ නම් රජ්ජුරුකෙණෙක් ඇතිවූහ. ඔවුන් පුත් උපෝස්ථ නම් රජ්ජුරුකෙණෙක් ඇතිවූහ. ඒ රජ්ජුරුවන්ට පුත්ව මහාමන්ධාතු නම් රජ්ජුරුකෙණෙක් ඇතිවූහ. ඒ රජ්ජුරුවන් ආඥාවෙන් චක්‍රරත්නය හස්තිරත්නය අශ්වරත්නය හාසපති රත්නය පරිනායකරත්නය මාණික්‍යරත්නය පුත්‍ර රත්නය ආදීවූ සප්ත රත්නයන් පහළ විය. සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් චක්‍රවාට ගර්භයට ඒකාධිපත්‍යව රාජ්ජය කරන්නාවූ මහත්වූ ආඥාතේජස් ඇත්තාහ. වමත හකුළුවා දකුණතින් අත්පොලොසන් කරන්නා සත්රුවන් වැසි වස්නේය.

මෙසේ වූ ආඥාසම්පන්න රජ්ජුරුවෝ ආයුෂ බොහෝ හෙයින් සුවාසුදහසක් අවුරුදු කුමාරකෙළි කෙළියාහ, සුවාසූ දහසක් අවුරුදු යුවරජ තනතුරෙහි සිටියාහ. සුවාසුදහසක් අවුරුදු රාජ්ජය කොට චක්‍රවර්තී රාජ්ජයෙහි කනස්සළුව උන්නාහ. එපවත් අමාත්‍යයෝ දැන රජ්ජුරුවන් වහන්සේ විකෂේපව උන්නේ ඇයිදැයි විචාරන්නා කුමක්ද මේ නියාවට සම්පත් හා ආශ්චර්යය ඇත තෙනකට ගොස් රාජ්ජය කරන්නා කැමැත්තෙමි, එසේවූ ස්ථානයක් මට කියවයි. කීහ.යහපතැයි කියා අමාත්‍යයෝ කියන්නාහූ මේ නියාවට සම්පත්තී හා පංචකාමයෙන් තාරකා දිව්‍යලෝකයෙහි වඩනේයයි කීහ. එවිට රජ්ජුරුවෝ යහපතැයි කීයා චක්‍රරත්නයට පැන් ඉස නැගී අමාත්‍යමණ්ඩලයා පිරිවරා චාතුම්භාරාජකයට ගියාහ. ඒවසන්නාවූ සතරවන් දෙවියෝත් රජ්ජුරුවන්ගේ ආඥාවෙන් ඉදිරියට අවුත් රජ්ජුරුවන් වහන්සේ කැන්දාගෙණ තමන් වාසස්ථානයට ඇරගෙණ ගියහ. එවිට රජ්ජුරුවෝ චාතුම්මහාරාජික දිව්‍යලෝකයෙහි නැතක්කාලයක් වාසය කොට එහි මදක්කල් විකෂේපව සතරවරම් දෙවියන් අතින් විචාරන්නාහූ මේ නියාවට සම්පත්තීයෙන් හා පංචකාමදපයෙන් කොයි වඩීදැයි විචාරන්නා සතරවරම් දෙවියෝ කියන්නාහූ අපි නම් ශක්‍රදේවේන්ද්‍රයන්ගේ සේවකයෝය. ශක්‍රදේවේන්ද්‍රයන් වසන තව්තිසා දිව්‍යලෝකයෙහි සම්පත්තීන් හා පංචකාමයෙන් වැඩියයි කීහ. මහාමන්ධාතු රජ්ජුරුවෝ ඒ අසා චක්‍රරත්නයයෙහි පැන් ඉස සප්තරත්නය හා සමග තව්තිසා දිව්‍යලෝකයට ගියාහ. එවිට ශක්‍රයෝත් තමන්ගේ දිව්‍යසේනාව ඇරගෙණ රජ්ජුරුවන් කරා අවුත් රජ්ජුරුවන් තමන්ගේ ශක්‍රභවනයට ගියාහ. ශක්‍රයෝත් තමන්ගේ තව්තිසා දිව්‍යලෝකය සරියේ බෙදා අර්ධරාජ්‍යයක් දුන්හ. ඒ දෙවියන්ගේ ආනුභාවයෙන් ඔහුගේ උස මහත හා දෙවියන්ගේ උස්මහත හා දෙවියන්ගේ ආත්මභාව නියාවට නිරිමිත විය. ශක්‍රයන් හා මහාමන්ධාතු රජ්ජුරුවන් එක්තැන උන්කලට වෙනස නම් ඇසපිය එළිමනිනා සෙස්ස එකසරිය, මේ නියායෙන් සතිස් ශක්‍රකෙණෙකුන්ගේ ආයුෂය යනතුරු රාජ්‍යකොට තම තෘෂ්ණාව අධිකසෙයින් විතර්කසිතක් සිතන්නාහූ කිමෙක්ද අධිරාජ්ජය කිම්ද ශක්‍රයන් මරා රාජ්‍යය කෙරෙමි සිතා එම ක්‍ෂණයෙහිම කයත් වයොවෘද්ධව දිව්‍යාත්මභාවය නැතිවී මනුෂ්‍යාත්ම භවය පහළවිය. එවිට මහාමන්ධාතු රජ්ජුරුවෝ දිව්‍යලෝකයෙන් බැස තමන්ගේ මගුල් උයනට බටහ. ඒ වෙලේ එකියන මගුල්උයනේ උයන්ගොව්වාත් මහාමන්ධාතු රජ්ජුරුවන් වහන්සේ නියාව දැන ආසනයක් පනවා නුවරට පලාගොස් නුවර රජකම් කරණ රජ්ජුරුවන් හා අමාත්‍යයෝ එතනට අවුත් රජ්ජුරුවන් වහන්සේ දැක නුඹවහන්සේ සවර්ගස්ථ වූ කල කුමක් කියාමෝදැයි කියන්නා එවිට කියනසේක් සතිස්ශක්‍ර කෙණෙකුක්ගේ ආයුෂවළදා මනුෂ්‍යභාවනයට අවුත් මළ මහාමන්ධාතු ජාතකය නිමවා වදාළ සේක. මේ බණ අවසානයෙහි එකියන භික්ෂූන් වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටිසේක. එසමයෙහි මහාමන්ධාතුව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# කිරීටවච්ඡ ජාතකය

තවද අසාධාරණ වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අනදමාමින් කෝසල රජ්ජුරුවන්ගෙන් පිළිදහසක් ලත් කථාව අරභයා මේ ජාතකය දක්වන ලද,

මෙහි වර්ථමාන කථාව එකනිපාතයෙහි සිඟාල ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය.

මෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රාහ්මණ ගමෙක කිරීටවචඡ නම් බමුණුව උපන්නාහ. එවිට පංචකාමයෙහි ආදීනව දැක තාපසව වනයෙහි වාසය කරන්නාහ. එසමයෙහි කෝසල රජ්ජුරුවන් හා කැටිව සේවාකම් කරන්නාහ. එසමයෙහි කෝසල රජ්ජුරුවන් හා කැටිව සේවාකම්කරන්ටයයි කියා බරණැස් රජ්ජුරුවෝ නික්ම සේවාකර්මයෙහි බිඳි ඉස්ලුලු අත සේනාව බිඳි වල්වන්හ. රජ්ජුරුවෝ එකලාව ඇතුපටින් වල්වන්නාහු කිරීටච්ඡ නම් තාපසයන් වසන්නාවූ පන්සලට වන්හ. ඒ තාපසයෝත් ඒ වෙලාවටම ඵලාඵල සොයා ගියහ. රජ්ජුරුවෝත් පන්සලට වැද පැන් පිපාස ඉවසාගත නොහී පැනක් බලන්නාහු තාපසයන් බොන පැන් ලිද දුටුහ. ඒ ලිඳ පැන් උකාගන්ට රැනක් කලයක් නොදැක ඇතා බැඳි පොරොද්ද උනාලා ඇතා පයබැඳ ලිඳට බැස ලිඳ ගැඹුරුහෙයින් පෙරලා ගොඩට අවුත් තමන්ගේ උතුරුසළුව ගැටගසා බැස තව ගැඹුරු හෙයින් සිතන්නාහු පැන් තත්තයෙන් මියන්නා බලාත් පැන් බී මියයාම යහපතැයි සිතා අතහැර ලිඳට පැන පැන් බී පිපාස නිවාගෙණ උඩට ගොඩනැග නොහී ලිඳම සිටියාහ. ඒ වෙලාවට තාපසයෝ එතනට අවුත් සන්නාහ සන්නද්ධව සිටිනා ඇතා දැක රජ්ජුරුවන් වහන්සේ මෙතන ආ නියා වේදැයි සිතා නැවත සිතන්නාහු ඇතා, සිටියේ රජ්ජුරුවන් වහන්සේ මෙතන ආනියාවේදැයි සිතා නැවත සිතන්නාහු ඇතා සිටියේ රජ්ජුරුවන් වහන්සේ කොයිදෝහොයි සිතා බලන්නාහු ඇතා සමීපයට අවුත් ඇතා කම්පස් හෙයින් රජ්ජුරුවන් වහන්සේ බල බලා ලිඳගාවාම සිටියෝය. තාපසයෝ රජ්ජුරුවන් නොදක්නාහු ලිඳ සමීපයට අවුත් ලිඳ ඇතුලෙහි සිටි රජ්ජුරුවන් දැක නොබවමැනවය රජ්ජුරුවන් වහන්සැයි කියා ඉණක් වතුරුවා රජ්ජුරුවන් ගොඩ නැගූහ. ගොඩනගා රජ්ජුරුවන්ට ඵලා ඵල දී ඇතා සන්නාහ මුදා රජ්ජුරුවන් ඇඟතෙල් කිරි හා දෙතුන් දවසක් රජ්ජුරුවන් සතපා යවුහ. නුවරවාසීන් රජ්ජුරුවන් වහන්සේ මළබවත් නොදනුම්හ. නියමයක් දැක විනා නුවරට නොවඳුම්හයි කඳවුරුබැඳ නුවරින් පිටත උන්නාහු රජ්ජුරුවෝ තාපසයන් වැඳ මාගේ නුවරට වැඩියමැනවයි කියා තමන්ගේ නුවරට ගියාහ, ඒ තාපසයෝත් මසක් පෝයකින් බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ගේ මගුල් උයනේ සැතපී දෙවැනි දවස් වීථියේ හෙපිළිවෙලින් සිඟා රාජාංගනයට පැමිණියදා රජ්ජුරුවවෝ තාපසයන් වැඳ ඇඳිනගෙණ  සතරපසයෙන් සංග්‍රහ කරන්ට වන්හ. ඒ දැක බොහෝ අමාත්‍යයෝත් රජ්ජුරුවන් වහන්සේ විසින් මේ තාපසයන්ට කරණ සංග්‍රහ සේවකයකුට කරණ සේක් වීනම් කොතෙක් රාජ්‍යය කටයුතුකොට නොකියද්දැයි කියා එක් දවසක් යුවරජ්ජුරුවන් හා මුදලිවරුන් රජ්ජුරුවන් වහන්සේට අවුත් කියන්නාහු මේ කිරීටච්ඡනම් තාපසයන් වහන්සේ මෙලෙස උපස්ථාන කරන්ට ගුරුකමක් නැත යහළුකමක් නැත මිත්‍ර කමක් නැත බන්දු කමක් නැත. උන් වහන්සේ අතින් උගත් ශාස්ත්‍රයෙකුත් නැත. කුමක් නිසා උපස්ථාන කරණ සේක්දැයි කීහ. එවිට රජ්ජුරුවෝ පුත්‍ර යුවරජ්ජුරුවෙනි මා බිඳි වල්වැද ගියදා මේ තාපසයනිගේ ලිදහුණුගමනේ මේ තාපසයන් නිසා මාගේ ජීවිතය රැකුනේය. මා මේ රාජ්ජයට පැමිණියේත් ඒ නිසාමය, එසේ හෙයින් මේ තාපසයෝ මට මහ උපකාරීය, මුන් මට කළ උපකාරයට රාජ්‍යය දුන්නත් ඒ උපකාරයට සමාන නොවෙයි. ඒසේ වීනම් තොප ඇමත් මාලද්දේ මේ තාපසයන් නිසාය. තොප ඇම විසිනුත් තාපසයන්ට සංග්‍රහකරන්ට උවමැනවයි කීය කිහ. ඒ තාපසයොත් රජ්ජුරුවන්ගෙන් සිව්පස ලැබ එහිම වාසයකොට පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා උපන්නාවු ධ්‍යයනයෙන් බඹලොව ගියාහ. එකියන රජ්ජුරුවෝත් දානාදී කුසල් කොට දෙව්ලොක ගියාහයි වදාරා මේ කිරීටවච්ඡ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි රජ්ජුරවෝ නම් ආනන්ද ස්ථවිරිය. කිරීටච්ඡ තාපසව උපන්නෙම් බුදුවූ මම්ම යයි දක්වා වදාළසේකී.

SANHIDA LANKA

# දූත ජාතකය

තවද සාධාරණ වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි තෘෂ්ණාසවගවූ භික්ෂූ කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්ථමාන කථාව නවවෙනි නිපාතයෙහි කාක ජාතකයෙන් විස්තර වශයෙන් බස්නේය. මෙහි වනාහී සර්වඥයන් විසින් මහණෙනි මේ භික්ෂූහු තෘෂ්ණාවෙහි අධිකත්වයෙන් ඉස්කැපීමට පැමිණියෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකී.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුත්ව උපන්නාහ. අන්නාපාන යහපත් කොට අනුභව කරණ හෙයින් පාජිනසුද්ධ රජ්ජුරුවෝයයි කියා නම් තුබූහ. ඒ රජ්ජුරුවෝ අන්නපාන කණලද බොහෝ මනුෂ්‍යයන් මධ්‍යයේ දළපුඩුසේසත්යට සිංහාසනයෙහි ඉඳ රන්තලියෙහි ලාලූ රසමසවුලෙන් යුක්තවූ ආහාර බොහෝ දෙනා මධ්‍යයෙහි අනුභව කරන්නාහ. එවිට එක්තරා පිටිසර මනුෂ්‍යයෙක් රජ්ජුරුවන් බත් මේ නිමන තෙනට ආයේ රජ්ජුරුවන් මේ නිමවන්නාවූ බොහෝ බද්‍ය භෝද්‍ය දූක තෘෂ්ණා ඉවසාගත නොහෙන්නේ අතක් උඩනගා මම දූතයයි කියා අඬගැසීය. ඒ අවධියේ යම් කෙණෙක් මම දූතයයි කියා අඬගැසී නම් උන්ට අවකාස ඇර රජ්ජුරුවන් කරා ගෙණයන්නාහ. එසේ හෙයින් ඔහු දූතයයි කියා කී හෙයින් මනුෂ්‍යයන් දෙපලට බෙදී උඟට අවකාස අළභ. ඔහු වහා අවුත් රජ්ජුරුවන් මෙනිමවන්නාවූ රන්තලියෙන් බත් පිඩක් උකාගෙණ කාපිය. එතන සිටි පුරුෂයෙක් නමා අතතුබූ කඩුව කොපුවෙන් ඇද අයා ඉසකපන්ට වන. රජ්ජුරුවෝ උගේ ඉස නොකපවයි රජ්ජුරුවෝ තලියෙන් අත අයා ඕහට බත්කන්ටහැර කා ඉක්බිති මිහිරි පැනුත් පොවා අත කට සෝධවා කපුරු හා බුලතුත් කවා අන්තයෙහි ඇයි තෝ කවර රජ්ජුරුකෙණෙකුන් ලඟසිට අව්දැයි විචාරන්නා කියන්නේ කීමෙන් මම ඇවිත් නුඹ වහන්සේගේ තලියෙන් බත්කෑම්මය, එසේ හෙයින් යථොක්ත වූ රජ්ජුරුවන් වහන්ස තෘෂ්ණාවසඟවූ ආවාවූ මට කෝප නොකළමැනවයි කීහ. රජ්ජුරුවෝත් උඟ කී බසට සතුටුව එම්බල ඒ එසේ මය යම් මනුෂ්‍යකෙණෙක් දුක්ගන්නේ තෘෂ්ණාව මූලිකවමය, එසේ හෙයින් මමත් තෘෂ්ණාවසඟව ඉන්නා එකෙකිම්. එසේහෙයින් තොයිත් තෘෂ්ණාවසඟව ආ හෙයින් දූතයන්ට සංග්‍රහ කළමනානොවේදැයි එළගෙරින් සියයක්ද ගම්වර පසක්ද ආදීවූ බොහෝ සංග්‍රහ කළහයි වදාරා මේ දූත ජාතකය නිමවා වදාළසේක. මේ බණ අවසානයෙහි භික්ෂූන් වහන්සේ අනාගාමිඵලයෙහි පිහිටි සේකැයි වදාරා මේ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි තෘෂ්ණාවසඟවූ පුරුෂයානම් මෙසමයෙහි මේ භික්ෂූහුය. එසමයෙහි පාජිනසුද්ධ රජ්ජුරුවෝ නම් දූන් බුදුවූ මම්මයයි වදාළ සේකී.

SANHIDA LANKA

# පදුම ජාතකය

තවද ලෝකේශ්වර සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ආනන්දබෝධීන් වහන්සේට පූජාකළ භික්ෂූකෙණෙකුන් වහන්සේ  අරභයා මේ ජාතකය දක්වන ලද. ආනන්ද බෝධිකථාව කාලිංගබෝධි ජාතකයෙහි පෙනෙන්නේමය. මේ වනාහී ආනන්ද බෝධීන් වහන්සේට පූජා කරණ පිණිස පිටිසර සිට එක් නමක් සැවැත්නුවරට වැඩිසේක. මාලාකාර වීථියේ  මල් සොයාගියසේක් විථිමුලුල්ලේ ඇවිදින් මල් නොලැබ පෙරලා අත්දස්වමින් කරා අවුත් මල් නොලදුම්හයි කීසේක.  ආනන්දසාමින් යහපත දන් මල් ගෙණනනිසා බැළුව මැනවයි කියා විථියට ගොස් බොහෝ ඇරගෙණගොස් ඒ පිටිසර සිට ආ නමට දුන්සේක. ඒ නමත් ආනන්දබෝධීන් ඇරගෙණ ගොස් ඒ පිටිසර සිට ආ නමට දුන් සේක. ඒ නමත් ආනන්ද බෝධීන් පූජාකළසේක. ආනන්දසාමින් මල්ලත් කථාව ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතුනොවෙයි පෙරත් නුවවැත්තෝ මල් ලද්දෝවේදැයි වදරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ සිටු කුලයක සිටුකුමාරයෙක්ව උපන්සේක. ඒ නුවර මල්වතු බලන්නාවූ පුරුෂයෙක් නාසාභිනය එක්දවසක් මානෙල් මලින් ප්‍රයෝජනයක් ඇත්තාවූ සිටු කුමාරවරු තුන්දෙනෙක් එකියන නාසා හීන මල්කරුවා කරාගොස් මල්ඉල්ලන්නා ඉන් එක සිටුපුත්‍රයෙක් අර උයන්ගොව්වා සිත්ගෙණ කියම් මෙසේ කීය. දැලිඅන්දන් කපාපුවා දෙවනුව අටගණිද එමෙන් තාගේ නාසය අටගන්නා නියායෙන් අපට මල් දෙවයි කීහ. උෟ ඊට කාන්සිව මල්නොදී ඉන්නා අනික් සිටු කුමාර කියන්නේය මාසේ කපාගත් ගොයම් අටගනිද එසේම තාගේ නාසය අටගන්නා නියායෙන් අපට මල් දෙවයි කීහ. ඊට උෟ විසින් විකෙෂ්පව මල්නොදෙන විසින් අනික් සිටු කුමාර කියන්නේ මුන්දෙන්නාම කීයේ බොරුය. කපාපු නාසය නම් ඇති නොවෙයි මේ මා කීයේ සත්‍යය යාළු මට මල් දෙවයි කීහ. එවිට ඒ පුරුෂ මුන් කීයේ ඇත්තැයි සිතා  ඔහු මල් මිටියක්  ඇරසෙන ගොස් ඒ සිටු කුමාරයන්ට දිනැයි වදාරා මේ පදුම ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි මල් ලත් සිටු කුමාර නම් බුදුවූ මිමම වේදැයි වදාළ සේක.

SANHIDA LANKA

# මුදුපාණී ජාතකය

තවද අනේකේශ්වරවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇති  භික්ෂූන් කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂූන් කෙණෙකුන් වහන්සේට සර්වඥයයන් වහන්සේ දක්වන්නා මහණ තා ස්ත්‍රීන් කෙරේ පිළිබඳව ස්ත්‍රීන් රැකගත එද්දී පෙර දෙමාපියන්  විසින් රැක්කගතනුහුනු ස්ත්‍රීහුයයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට  පුත්ව ඉපිද වැඩිවිය පැමිණ යුවරජ තනතුරෙහි සිට රජ්ජුරුවන් ඇවෑමෙන්  රාජ්ජයට පැමිණ දුවනි කෙනෙකුන් හා බෑනනුකෙනෙක් ඇත්තා. ඒ රාජ කුමාරවරු දෙන්නම රජගෙයි වැඩෙන්නාහ. උන්දෙන්නම උනුන්කෙරේ පිළිබඳ සිත් ඇත්තාහ. රජ්ජුරුවෝ එක්දවසක් අමාත්‍යයන් කැඳවා කියන්නාහු මාගේ බෑනන්ට මාගේ දුවනියන් පාවාදී රාජ්ජය දෙම්මැයි කීයා නැවත කියන්නාහූ එසේ නොවෙයි මාගේ බෑනනුවන්ට අනික් රාජ කුමාරිකාවක්  පාවාදෙමි මාගේ දුවනියනුත් වෙන රාජ කුමාරයෙකුට පාවාදෙමි. එසේ කළ මට බොහෝ සහායවන්නේ යයි කියා තමන්ගේ බෑනා රාජ කුමාරයන්ට වෙනරජගෙවල් නන්වා රාජාඟනයෙන් වෙන් කළහ. ඒ කුමාරයෝත් එකියන කුමාරිකාව කෙරේ පිළිබඳ සිත් ඇතිව ඒ කුමාරිකාවගේ කිරීචව දැක කියන්නාහූ කුමාරිකාව රජගෙන් පිටත් කොටගන්ට උවමැනව, ඊට මට උපායෙක් කිය මැනවයි කිහ. එවිට කිරිමව් කියන්නී මාගේ කුමාරිකාවන් වහන්සේ විචාරා අභිප්‍රාය දැන වදාළ දෙයක් කියමි කියා රජ කුමාරියන් සමීපයට ගොස් දුවනියෙනි ඉස උකුණන් අරිමිකියා තුමූ උස්පුටුවේ හිඳ  කුමාරිකාවන් මිටිඅස්නෙක හිඳුවා තමා දෙකලවයෙන් හීයමැඩ ගෙණ හිඳ උකුණන් අරිනා ආකාරයෙන් ඉස නියක් ඇනලූව එවිට මෙකියන කුමාරිකා රාජකුමාරයන් වහන්සේ මා එපිට කොට ගන්නා නියා මෑ අත කියා එවුනියාවේදැයි සිතා ගාථාවක් සඟවා කියා යව්ව. ඒ රාජ කුමාරයන් එපවත් දැන ඒ නියාවට සන්ධකාරවූ මහත් වර්ෂා කාලයක අත මොළක ඇති එක් පුරුෂයෙකුත් ඇරගෙණ කම්පස් ඇතෙකුත් ඇරගෙණ රජ්ජුරුවන්ගේ පාත මාළ සමීපයෙහි ඇතා සිටුවා වැස්සේ තෙමි තෙමි සිටියාහ. ඒ වෙලාවට රජ්ජුරුවන් වහන්සේත් තමන් වහන්සේගේ රාජකුමාරිකාවට රැකවල් පිණිස තමන්වහන්සේගේ යානාගාවා කුරු ඇඳක් ලා වැදහෝනාහැටියේ සලස්වා රකිනාසේක. එකියන කුමාරිකා එදවස් එකියන රාජකුමාරයෝත් අද එති සිතා පියානන් වහන්සේට කියන්නාහූ පියානන් වහන්ස මා අද නාන්ට උවමැනවයි කීහ. එවිට රජ්ජුරුවෝ යහපත දුවනියෙනි නාවයි කිය දුවනියන් වඩාගෙණගොස් සිව්මැදුරුකවුළුවෙන් පිටත සිටුවා එක් අතක් අල් වාගෙණ නාවයි කීහ.  ඒ වෙලෙහි එකියන කුමාරිකාත් රාජ කුමාරයන්ගේ ඇඟ අල්වා රාජ කුමාරයන් විසින් ඒ අතතිබූ ආභරණ එකියන ලද්දාවූ අතවැස්සා අත ලා ඒ අත රාජ කුමාරිකාවෝ පියානන් අටත දී තමන්ගේ අත්දෙකම ගලවා ගෙණ අනික් අතතුබූ ආභරණ ඔහු අනික් අතලා තුමූ ගොසින් ඇතුපිටට නැගී ගියාහ. රජ්ජුරුවෝත් අතවැස්සා වඩාගෙණ තමන් දුවනැයි සිතා වඩාගෙණ තමන් දුවනැයි සිතා වඩාගෙණ ගොස් ගෙයිලා සැතපෙවයි කියා තුමූ වැදහෙව නිදූහ. රජ්ජුරුවෝත් උදෑසන නැගී සිට එකියන පුරුෂයා දැක මේ කින්දැයි විචාරා ඌ විසින් ඒ තත්වය කියන්නා රජ්ජුරුවෝ විස්මව කියන්නාහූ මුන්සේවූ බාලදරුවන් පවා මා වැනි  පියෙකු අත අල්වා සිටියදී මාගේ අත උපායෙන් ගලවාගෙණ ඇතුපිටට නැගී ගිය ය. මුත් මෙසේ කල සෙස්සන් තමා කියනුම කින්දැයි කියා එසේ හෙයින් ස්ත්‍රින්නම් රැකගත නොහැක්කේමයි කියා තමන්ගේ දුවනියන්ට බොහෝ මගුල්කොට බෑණනුවන්ට සරණපාදීත් තමන් යුවරජුතනතුරෙහි පිහිටූවූහ එකියන යුවරජ්ජුරුවෝත් රජ්ජුරුවන්ගේ ආයාමෙන් රාජ්ජයට පැමිණ දැහැමින් සෙමෙන් රාජ්‍ය පාලනය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහ වදාරා මේ මුදුපාණ ජාතකය නිමවා වදාළ සේකී. එසමයෙහි රජව උපන්නෙම් බුදු මම්මයි වදාළ සේක.

SANHIDA LANKA

# සංකප්ප ජාතකය

තවද ලෝකනාථවූ සර්වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ස්ත්‍රීන් කෙරේ පිළිබඳ භික්ෂුකෙණෙකුන් වහනසේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක්තරා භික්ෂූ කෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් කෙරේ පිළිබඳව හිඳිනා දක සර්වඥයන් වහන්සේට දක්වන්නා එඹල මහණ උත්තමයෝ පවා මේ පංචකාමය නිසා මිනීමරා පෙරලා තපස්රැක්කෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක්.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි රජ්ජුරුවන්ට දරුකෙණෙක් නැත්තාහ. ඒ රජ්ජුරුවෝ තමන්ගේ අන්තඃපුරවාසීන්ට කියන්නාහූ දරුවන් ප්‍රාර්ථනා කරවයි කීහ. එකියන අන්තඃපුරවාසී ඒ නියාවට දරුවන් පතා නැතක්කල් ගිය බෝධිසත්වයෝ බඹලොවින් චුතව අවුත් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්හ. දස එකඩමසකින් උපන්නාහ. උපන් දවස් නාවාපියා එක් කිරීමවක් අතට දුන්හ. ඒ කිරීමට අතට යන්නාවූ බෝධිසත්වයෝ අඬන්ට වන්නාහ. එවිට අනිත් ගැනියෙක් අතට වැඩුහ. එවිට කුමාරයෝ අඬන්නට වන්හ. මේ නියායෙන් ගැනුන් අත වැඩුව. ඩුසේ අඬනහෙයින් පිරිමින් අතට වැඩුහ. එවිට නාඬන්නාහ. එතැන්පටන් පිරිමින් විනා ගෑනුන්වැඩූකලම අඬනාහ. එසේහෙයින් පිරිමි වඩනාහ. කිරිපොවන තැටියේ වත්කොට පොවන්නාහ. නැත්නම් මෑනියන් වහන්සේ තිරයෙන් පිටසිට තණපුඩුව මැත්කොට කිරිපොවන්නාහ. මේ නියායෙන් වැඩිවිය පැමිණි පසුත් ස්ත්‍රීන් නොදක්නාහ. එබැවින් රජ්ජුරුවෝත් වෙන මාලිගාවක් කරවා වෙනම සයනය කරණ නියෙයන් සැලැස්සූහ. ඒ කුමාරයන්ට වයස සොළොස් ඇවිරිදි පිරුණුකල රජ්ජුරුවෝ සිතන්නාහූ මාගේ අත්තේ එකම පුතනුවෝය. ඔහු වනාහී මා ඉක්බිති රාජ්ජය කරන්ට උවමැනව, රාජ්ජය කළනම් ස්ත්‍රීන් සමග පංචකාම විෂය අනුභව කරන්ට උවමැනව, එසේහෙයින් මාගේ පුතනුවන් ස්ත්‍රීන් නොදකිනාහෙයින් රාජ්‍යයකරන්ට බැරිය. කරන්නේ කිම්දැයි කියා විකෂේපව උන්සේක. ඒ වෙලාවට එක් ගීකීමෙහි දක්ෂ වූ ස්ත්‍රියක් රජ්ජුරුවන් කරා අවුත් කියන්නී දේවයන් වහන්ස විකෂේපව උන්නේ ඇයිදැයි විචාරා එඹල මාගේ පුතනුවන් අසනඝ කුමාරයන් ස්ත්‍රීන් වසඟනොවන හෙයින් විකෂේපව ඉඳිමියි කීහ. එවිට ස්ත්‍රී දේවයන් වහන්ස මේ නිසා නුඹවහන්සේ විකෂේපවන්ට එපයි මම ගීකියා විනාගා ලබ්බවාගණ්මි සිතා ඒ ස්ත්‍රී කුමාරයන් ලඟසිටි පුරුෂයන්ට කියන්නී මා සෙට ගී කිය වීනා ගායනාකෙරෙමි, එවිට කුමාරයන් වහන්සේ කීදෙයක් ඇත්නම් මට කියවයි කියන්නා යහපතැයි ඒ පුරුෂයෝ ගිවිස්සාහ. එකියන ස්ත්‍රීන් පසුවදවස් දුරසිට ගී කී නියාවට විනා නාදකරන්ටවන. එක්ෂණයෙහි රාජ කුමාරයාත් කන්දී අසාගෙණ වැඳ හොත්තේය. කන්දී අසාගෙණ වැදහොත් පවත් ඒ ස්ත්‍රී අසා දෙවන දවස් ලඟසිට ගායනාකළේය. එවිට බෝධිසත්වයෝ එකියන ස්ත්‍රිය මාගේ ගෙට කැන්දාගෙයි ඇතුලේ සිට ගිතිකා විනානාදකරන්ට කියවයි කීහ. යහපතැයි කියා ලඟට කැඳවා ගී අස අසා ඈ හා සමඟ ලෝකාස්වාද රතියෙහියෙදී පංචකාමයෙහි තත්පරව පංචකාම විෂය මා මිසක් අනික්කෙණෙකුන් අනුභව කරන්නෙම් කින්දැයි කඩුවකොපුවෙන් අයාගෙණ විථියට බැස මිනිසුන් පොළුගසන්ට වන්හ. මේ නියායෙන් මිනිසුන් පොළුගසාගෙණ විථියේ නික්මුණු නියාව රජ්ජුරුවන් අසා තමන්ගේ මිනිසුන් යවා ඒ කුමාරයන් අල්වා එකියන ස්ත්‍රී ඒ කුමාරයත් දෙන්නාම නුවරින් නෙරපූහ. එකියන ස්ත්‍රීන් කුමාරයෝත් දෙන්නම හිමාලය වනයට ගොස් ඒකන්නකම් සමුද්‍රයහා එකන්නකිම් ගඟක් ඇති එක් ස්ථානයක පන්සලක් කොට වාසය කරන්නාහ. එකියන ස්ත්‍රීය පන්සල ඉඳුවා බෝධිසත්වයෝ ඵලාඵල ගෙණවුත් දෙන්නාහ. ඒ ස්ත්‍රීන් පිසලාලා ඉන්නීය. මේ නියා දවස් අරණ කල්හි මුදමැද්දේ දිවයිනක වසන්නාවූ තාපසකෙණෙක් ඵලාඵල නිසා ආකාශයෙන් වනාන්තරයට යන්නාවූ බෝධිසත්වයන්ගේ ගෙයි දුම් පෙණෙන්නා දක ඒ ගෙයකරා බටහ. ඒ වෙලාවට බෝධිසත්වයෝ ඵලාඵල කඩා වනාන්තරයට ගියහ. ඒ වෙලාවට ඒ තාපසයෝ ඒ පන්සලට පටහ. ඒ ස්ත්‍රී ඒ තාපසයන් පන්සලට වඩා වළඳවා ඉක්බිති වඩිනේ යහපතැයි කියාත් රඳවා තමාගේ භාවනාව දක්වා තාපසයන් ලබ්බාගන උන්හා කැටිව ලොකාස්වාද රතියෙහි යෙදුනාහ. ඒවෙලාවට බෝධිසත්වයෝ ඵලාඵල කඩාගෙණ පන්සලට වන්නාහ. ඒ තාපසයෝ බෝධීසත්වන් දක පන්සලින් නික්ම සමුද්‍රය ලඟට ගොස් ධ්‍යාන ඇතැයි ආකාශයට නැගෙමියි උත්සාහකොට සමුද්‍රයෙහි වැටිහුන. බෝධිසත්වයෝත් මරන්ට කඩුව ඇරගෙණ පස්සේ ලුහුබන්දා ගොස් තාපසයන් දක මේ තාපසයන් පළමු සාර්ධිපිරිහුන මුන්ට සෘද්ධි උපදවන්ට උවමැනවයි සිතා කියන්නාහූ තාපසයෙනි ස්ත්‍රීන් කෙරේ පිළිබඳවීමෙන් ධ්‍යානයෙන් පිරිහුන ස්ත්‍රීහූ නම් සියල්ල දවන්නාවූ ලැව්ගින්නක් මෙන් අවැඩකරණ සුල්ලහ ආශිර්විෂයෙකුමෙන් දෂ්ටකරණ සුල්ලහ. යම්සේ කඩුවගෙණ මරණව සිටි පුරුෂයෙකු හා සමග කරන්නාවූ කථාව යහපතට යෙයි ස්ත්‍රීන් හා

SANHIDA LANKA

කරණ කථාව වැඩකට නොසැලසෙයි කියා බෝධිසත්වයන් කියන්නාහු බණ අසා තාපසයෝ සමුද්‍රයෙහි සිටම ධ්‍යාන උපදවා තමන් වසන්නාවූ දිවයිනට ගියාහ. එවිට බෝධිසත්වයෝත් මෙසේවූ බරාබෑරීහැර ධ්‍යාන උපදවා ආකාශයෙන් යෙම්සිතා එකියන ස්ත්‍රීය ගෙණගොස් මාගසිටවා කැමති තෙනකට යවයි කියා බෝධිසත්වයෝ පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා මිය පරලොව ගියාහයි වදාරා මේ චුල්ලනලොභන ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි අසනිසාත කුමාරයෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# මහාපනාද ජාතකය

තවද අප්‍රතිනාථවූ සර්වඥයන් වහන්සේ කොටි ග්‍රමයෙහි වැඩවසන සමයෙහි භද්දිය මහතෙර සාමීන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එකියන කොටිග්‍රාමයෙහි භද්දිය සිටානන්ගේ භද්දිය නම් සිටු කුමාර කෙණෙක් ඇත්තාහ. උන් වාසය කරන්නාහු තුන්ඍතුවට තුන්ප්‍රාසාදයෙක් ඇත. ඉන් එකී එකී ප්‍රාසාදයෙහි සාරසාරමස වාසය කරන්නාහ. ඌත් එක් ප්‍රාසාදයෙක වාසයකොට එක් ප්‍රසාදයකට නික්මෙනවේලේ උන්ගේ ආශ්චර්වව බලන්ට බොහෝ මනුෂ්‍යයෝ මැසිපිට මැසි බැඳසිට ආශචර්ය බලන්නාහ. මේ නියායෙන් වාසයකරණ කල්හි එක් දවසක් කොටිග්‍රාමයෙහි මනුෂ්‍යයෝ දනක්දෙන්ටයයි බුදුන් ප්‍රධාන මහාසංඝයා පවරාගෙණ මහත්වූ ශාලාවෙක වඩාහිඳුවා දන්දෙන්නාහ. ඒ වෙලාවට එකියන භද්දිය කුමාර තමාලත් ප්‍රාසාදය ඇර අනික් ප්‍රාසාදයකට යමින් සිටි කලට සර්වඥයන් වහන්සේ බොහෝ මනුෂ්‍යයන් පිරිවරා ධර්මදේශනා කරමින් වැඩඋන්තෙනට තමාගේ පිරිවර හා සමඟ සර්වාලංකාරයෙන් සැරහී සිටිපලසිටම සියලු කෙලෙසුන් නසා රහත්වූහ. සර්වඥයෝ භද්දිය සිටානන්ට කියන්නාහූ තොපගේ පුතනුවෝ භද්දිය කුමාරයෝ රහත්වූහ. එසේ හෙයින් අද උන් පිරිනිවන් පාන්නක් හෝ මහණ වන්නක්හෝ උවමැනවයි වදාළසේක. එවිට භද්දිය සිටානෝ කියන්නෝ මාගේ පුතනුවෝ මීයන්නේ ඇයිද මහණ වෙතිකීහ. යහපතැයි කියා සර්වඥයෝ ඒ කුමාරයන් මහණකරවාගත්තාහ. එකියන භද්දිය ස්ථවිරයෝත් තමන්වහන්සේට පැමිණියාවූ නිවන් සැපත අනුභව කරණසේක් ධ්‍යානභවනාදීවූ දෙය කොට සැපවූ ස්ථානයක උන්සේක. ඒ වෙලාවට බොහෝ භික්ෂූහූ උන් වහන්සේ කරා ආසේක. උන්වහන්සේත් තමන් වහනසේගේ ධ්‍යානභාවනායෙන් උන්හෙයින් කවුරුන් වහන්සේ ආවත් නැගී නොසිට උන්සේක. එවිට බොහෝ පෘථග්ජන භික්ෂූන් වහන්සේ ඇයි භද්ධිය ස්ථවිරයන් මහණවූයේ නොබෝ දවසෙක වැඩිමහළු වහන්ද දූක මහතෙරකෙණෙකුන් මෙන් ඉන්ට කාරණා කින්දැයි උත්ඝෝෂණය කළසේක. සර්වඥයෝ එපවත් දූන ඒ වහන්දූගේ සිතිවිල්ල සුද්ධකරණ පිණිස උපාසකවරුන්ට කියා අපි මේ ගංගාවෙන් එගෙඩයන්නා කැමැත්තෙම්හයි වදාළසේක. යහපතැයි කියා නැව් ඔරු පාරු ඉදිකොට සර්වඥයන් වහනසේ හා සංඝයා වහන්සේ වඩිනා නියායෙන් සැලැස්සූහ. සර්වඥයන් වහන්සේලාගට කැඳවා භද්දිය ස්ථවිරයෙනි තොප මහාපනාද කාලයෙහි තොප විසූ පස්විසියොදුන් දිග හා සත්යොදුන් පුළුල හා සත්රුවන් ප්‍රාසාදය කොයිදැයි විචාළසේක. එවිට භද්දිය තෙරුන් වහන්සේ කියනසේක් ස්වාමිනි ඒ ප්‍රාසාදය මේ ගංගායයි වදාළසේක. ඒ අසා  බොහෝ භික්ෂූන් වහන්සේ සිතනසේක් මේ භද්දිය තෙරුන් කියන්නේ කින්දැයි සිතුසේක. එපවත් සර්වඥයෝ දූන භද්ධිය ස්ථිවිරයෙනි තොපගේ සබ්‍රම්සරුන්ගේ සාංකාවන් දුරුකරවයි වදාළසේක. එවිට භද්ධිය තෙරුන්වහන්සේ යහපතැයි කියා තමන් වහන්සේ පළමුසිටි ප්‍රාසාදයෙහි කෙවින්න මාපටඟිල්ලෙන් ඔසවාගෙණ ප්‍රාසාදය උඩ ඔසවාගත්සේක. ඒ වෙලේ බොහෝ මනුෂ්‍යයෝ ප්‍රාසාදය ගව්වක් එසවන දෙගව්වක් එසවීනැයි යනාදීන් කියා බල බලා සිටියාහ. එවිට මහාපනාද කාලයෙහි නෑයෝ එකියන මාලිගාව කෙරේ ගත් ලෝභයෙන් එහිම මස්කැසුප්ව උපන්නාහ. ඒ උපන්නාවූ බන්ධූහූ ප්‍රාසාදය උඩට ඔසවත්ව පෙරලි පෙරලි දියෙහිම වැටෙන්නාවුන් බලා සර්වඥයන් වහන්සේ භද්දිය ස්ථවිරයෙනි තොපගේ පූර්වයෙහි නෑයෝ බොහෝ ව්‍යසනයනට පැමිණෙති වදාරා ප්‍රාසාදය හරුවයි වදාළසේක. යහපතැයි කියා භද්දිය තෙරුන්වහන්සේ මාලිගාව අළසේක. මාලිගාව පළමුතුබූ ස්ථානයෙහිම පිහිටුවාහ. සර්වඥයෝත් එකියන ගංගාවෙන් එගෙඩව පණවනලද බුද්ධාසනයෙහි වැඩහුන්සේක. එවිට බොහෝ භික්ෂූන් වහන්සේ මේ භද්දිය තෙරුන් වහන්සේ මහාපනාද කාලයෙහි මෙහිවිසූ කාරණය ශ්‍රී බුද්ධියට මිසක් අපට නොදූනෙයි එහි පිළිවෙළකථාව දක්වා වදාළොත් යහපතැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක. ඒ කෙසේදයත්

මෙහි ජාතක කථාව පකිණ්ණක නිපාතයෙහි සුරුචිරුජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

මෙහි වනාහී යටගිය දවස වේදේහ රට මියළුනුවර සුරුචි නම් රජ්ජුරු කෙණෙක් වූහ. ඒ රජ්ජුරුවන්ගේ සුරුචි කුමාරයෙක් වූහ. සුරුචි නම් රජ්ජුරුවන්ට මහාපනාද නම් රාජ කුමාරයෙක් ඇතිවූහ. ඒ කුමාරයන්ට ශක්‍රයන් විසින් මවනලද ආයාමෙන් මාලිගාව දියෙහි තිබූයේයයි වදාරා බුදුව වැඩහිඳ වදාරණසේක් මහාපනාද නම් රජ්ජුරුවන්ගේ පස්විසියොදුන් සියක් මාල් ඇති නගනලද ධජයෙන් අලංකෘතවූ ඉන්ද්‍රනීල මානික්‍යමය වූ දොරලී දොරබාවෙන් යුක්තව සැටදහසක් නාටකයන් විසින් දක්වන ලද ජාතත විතත විතතාතය ඝනය සුසිරියයන පංචාංගික තූර්ය නාදයෙන් ඒකානාද වූ අලංකෘත වූ මාලිගාවෙහි චක්‍රවර්තී රජකෙනෙකුමෙන් රාජ්ජය කොට පරලොක ගියහයි වදාරා මේ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි මහාපනාද රජ්ජුරුවෝ නම් භද්දිය ස්ථවිරයෝය. එසමයෙහි ශක්‍රවඋපන්නේ නම් බුදුවූ මමම යයි තමන් වහන්සේ දක්වා වදාළ සේකී.

SANHIDA LANKA

# කුරඟ්ග ජාතකය

තවද ලෝකස්වාමී වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි විර්ය අඩු භික්ෂූන් කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද

ඒ කෙසේද යත්

එක්තරා වීර්ය අඩුනමක් සර්වඥයන් වහන්සේට දක්වන්නා මහණ මේ නියා සැපතෙහි සිට වීර්ය වඩවතොත්විනා අඩුවෙන්ට කාරණා කින්ද පෙර උත්තමයෝ පවා තනිවසිටත් වීර්ය කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සෙක්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ වනයක් සමීපයෙහි ගමෙක සේවායන් පන්සියයක් ඇරගෙණ යන එන්නාවූ මනුෂ්‍යයන් ඒ වනයෙන් ඈතලා ඉන්ලත් දෙයක් ඇරගෙණ ජීවත්වන්නාහ. එසමයෙහි පන්සියයක් ගැල් ඇරගෙණ සාත්තුනායක ව්‍යාපාරයෙක් එකියන බෝධිසත්වයන් වසන්නාවූ ස්ථානයට ආය. බෝධිසත්වයෝත් ඔහු දුන් කුලී ඇරගෙණ මොවුන් මා විසින් ගලවා හරින්ට උවමැනවයි සිතා තමන්ගේ සේවා පන්සියයක් ඇරගෙණ ඒ ගැළුත් පදවාගෙණ වනාන්තරයට නික්මුණාහ. ඒ වනාන්තරය මධ්‍යයෙහි සෙරුන් පන්සියයක් ඒ ගැල් කොල්ලකන්ට ආහ. ඒ වෙලාවට බෝධිසත්වයන් හා කැටිව ආ සේවායන් පන්සියය භයින් සැඟවී ගියාහ. එවිට බෝධිසත්වයෝ තනිවසිට ඇත මැත පැන භයගන්වා සතුරන් පලවා ගැන් පන්සියය ගලව වනාන්තරයෙන් එතරකළහ. එවිට ගැල් සාත්තු නායකයා බෝධිසත්වයන් රස මසවුළෙන් යුක්තවූ ආහාරය කවා කියන්නේ ආයුධ සන්නද්ධ සොරුන් ආ සොරුන් දැක භයක්වත් තැතිගැන්මක් වත් නැත. උන් දැක මට මහාසන්තෝෂ උපන තොප හැමකළාවූ උපකාරය සිතා සතරන් බිනිම් යන සිතින් නිර්භීතව සිට සතුරන් සෑදීම වදාරා කුරඟ්ග ජාතකය නිමවා වදාළසේක. බණ අවසානයෙහිදි විර්යය අඩු භික්ෂූ විර්යය වඩා රහත් වූහයි වදාරා එසමයෙහි එකීයන වෙළඳුන් ගැළවූ පුරුෂයානම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# වාතසෙන්ධව ජාතකය

තවද එක්ස්වාමී වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

එක්තරා රූපශ්‍රීයෙන් යුක්ත වූ ස්ත්‍රීයක් තමන්ගේ රූපශ්‍රියෙන් යුක්තවූ පුරුෂයෙකු දැක පිළිබඳ සිත් ඇතිව ඒ නිසා සෝකාග්නියෙන් තැවි තැවී තමාගේ ඇඳ වැලඳ සිපගෙණ නොකා නොබි වැදහොත්තිය. ඒ දුන උන්ගේ යෙහෙලියෝද පරිවාරස්ත්‍රීහුද ලඟට අවුත් ඇයි තොපට කුමන ආයාසයෙක්දැයි දෙතුන් ඇවැරක් විචාරන්නා එපවත් කී කල්හි එවිට එකියන ගෑනුන් අපට ඒ භාරය තොපි සෝක නොගනුවයි කියා එකියන පුරුෂයා සමීපයට ගොස් එපවත් කිවුය. ඒ පුරුෂයාත් කීපවරක් කියනතුරු නොගිවිස පසුවයහපතැයි අසවල්දා එම් කියායවුහ. ඒ ගෑනුන් ගොසින් එපවත් සෝකයෙන් උන් ස්ත්‍රීන්ට කියා තෝ වික්ෂේප නොව අසවල්දා එතිකීහ. යහපතැයි කියා ඒ ස්ත්‍රීන් ඒ නියාවට තමාගේ ගෙයත් සරහා තොමෝත් සැරගිගණ යහනාවේ වැදහොත්තීය. ඒ වෙලාවට එ පුරුෂයාත් ඒ ගෙට අවුත් ඇඳ පාර්ශවයක ඉඳ ස්ත්‍රීයගේ අත අල්වන්ට වන. ස්ත්‍රී සිතන්නී ස්ත්‍රීන් නම් පළමුකොට පුරුෂයා අතඇල්එූවිට ලැගීනම් නිස්සාරයයි සිතතති. එසේ හෙයින් පළමුකොට මා නොකමැත්තාමෙන් අඟවා දෙවනු ආ දවසක අවකාසදෙම් සිතා අතගසා දමාපුවාහ. ඒ පුරුෂයාත් ලජ්ජාව එතනින් පලාගියේය. ඒ ස්ත්‍රීය ලඟට ගෑනු අවුත් ඇයි නි ලඟට ආ පුරුෂයාට තොපිකලේ කිම්දැයි විචාරන්නා ස්ත්‍රීන් නම් පළමුකොට ලැගිනම් නපුරැයි සිතා නොලැගුනෙම් කීහ. ඒ අසා ගෑනු කියන්නාහු අප බොහෝ උත්සාහයයෙන් ඒ පුරුෂයා අපමෙතනට ගෙණායේය. තොපි උන්ට ප්‍රිය වූ බසක් විචරකුත් නොකියා යවුවාහ. උන් යවාපුයේ විපාක දන්නවාදැයි කියා කීහ. එකි යන පුරුෂත් ලජ්ජාවෙන් එකියන ස්ත්‍රීයාගේ මුහුනත් නොබැළුයේය. ඒ නිසායයි සෝකයෙන් වියලි වියලී මළේය එකියන පුරුෂයාත් ඒ ස්ත්‍රිය මලේ මා කරා ගොස් පූජාකොට සිටියේය. සර්වඥයෝත් ඇයි උපාසකය මෙතෙක් දවස් නොආයේ කින්දැයි විචාරන්නා උපාසකයා විසින් එපවත් නොවළහාදන් විය. සර්වඥයෝ ඒ අසා පළමුත් ස්ත්‍රි උත්තමයන් පවා තොමෝම කැඳවා රවටා යවුවායයි වදරා කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැසු නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ වාතසෙන්ධව නම් අශ්වව ඉපද බරණැස් රජ්ජුරුවන්ට මඟුල් අශ්වවාහනව සිටිනාහ. එක් දවසක් බෝධිසත්වයන් ඇර ගෙණ නාවන්ටගොස් නාවාපියා ඇරගෙණ එන්නාවූ බෝධිසත්වයන් දුටු කුන්තාලිනම් කොටළු ධේනුවක් තෘෂ්ණාව වැටී සෝකයෙන් තණ පැන් නොකා නොබී වාසය කරන්නීය. ඒ කියන කොටළු ධේනුවගේ පුතෙක් තමාගේ මව අතින් ඇයි ශෝකව තණ පැන් නොකා නොබී ඉන්ට කාරණා කින්දැයි විචාරන්නා එපවත් කීපවිටක් විචාරන්නා ඒ කාරණා පුතාට කිව, ඒ පිත් යහපත අශවයාට කියාලා ලබ්බන්ට මට භාරයයි කියා අශ්වයා නාවන්ට වැවට ගෙනා වේලේ ඒ කොටළුවා අශ්වයාලඟට වත් පියානන් වහන්ස මාගේ මව්වූ කොටළු දෙන් නුඹ වහන්සේ කෙරෙහි තෘෂ්ණාව වැටී මියන්ට ඉදිති, එසේ හෙයින් උන්ගේ ජිවිතදානය දුනමැනවයි කීහ. එවිට එකියන අශ්වයාත් මාගේ අස්සලයා මෙතන සිටිනාහෙයින් බැරිය, අස්සලයා මා නාවාපියා පිටියේ තණ කන්ට හරනේය. ඒ වෙලාවට තොපගේ මව කැඳවා ගෙණ එවයි කීහ. ඒ කියන කොටළුවාත් ඒ නියාවට තමාගේ මව කැන්දාගෙණ අවුත් එලියේ සිටුවා තෙමේ බැද්දේ සැඟවී සිටියේය. අස්සලයා බෝධිසත්වයන් නාවා පිටියට අළහ. බෝධිසත්වයෝත් ඒ කියන කොටළුදෙන්සිතන්නී ස්ත්‍රීහු නම් පුරුෂයන් ආවේලේ පළමුකොට ලැගීනම් යහපත් නොවෙයි එසේ කල නොතකති සිතා තමා නොකමැති සැටියේ අඟවන්ට උවමැනවැයි සිතා පලාගියහ. ඒ කියන කොටළු ධේනුවගේ පුතාත් තමාගේ මව්ලඟට අවුත් කියන්නේ මෙතෙක්දා වික්ෂේපව උන්නිසා මාගේ පියානන් නුඹ වහනසේ සමීපයට ලන්වුකල්හි ඇයි නොලැග්ගෙන්නට කාරණා කුමක් නිසාදැයි විචාළේය. එවිට කොටළු ධේනුව කියන්නී පුත ස්ත්‍රීහු නම් පළමුකොට නොලැගෙති. පසුව ලැග්ගයුතුය ඒ නිසා පලාආම් කීහ. ඒ අර්ථය දක්වන සර්වඥයන් වහන්සේ යම් ස්ත්‍රීයක් ලඟට ප්‍රාප්තවූ පුරුෂයාට අවකාශ නොදෙත්තනම් වාතසෙන්ධව නම් අශ්වයාට ආලස ඇතිව පළමුකොට තදකම්පෑ එකියන අශ්වයා වික්ෂේපකරවූ කුන්තාලිනම් කොටළු ධේනුව වැනියයි වදාරා මේ වාතසෙන්ධව ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි කොටළුදෙන්නම් මේ ස්ත්‍රීයය අශ්වව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# කර්කටක ජාතකය

තවද මාගේ ස්වාමිදරුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා ස්ත්‍රියක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක්කෙළෙඹි පුත්‍රයෙකු හා උන්ගේ භාර්යාවන්හා දෙන්නා සැවැත්නුවරට එන්නාහු අතරමග සොරුන් ඇති ස්ථානයට පැමිණියාහූ ඒ වනාන්තරයේ වසන්නාවූ සොරදෙටුවා එකියන ස්ත්‍රියගේ විශිෂටවූ රූපය දැක ඈ කෙරෙහි පිළිබඳ සිතින් මෙකියන පුරුෂයා මරා මෙකියන ස්ත්‍රීය ඇරගණිමියි සිතා පුරුෂයා මරන්ට කොපුවෙන් කඩුව අයාගත, එවිට ස්ත්‍රීය පතිව්‍රතා ධර්මය රත තමාගේ ස්වාමි පුත්‍රයා දෙවතාස්ථානයෙහි තබා වාසය කරණ හෙයින් සොරදෙටුවා පය ගෙණ අඬා මා නිසාවේද මාගේ ස්වාමිපුත්‍රයා මරන්ට සිතන්නේ මාගේ ස්වාමි පුත්‍රයා රැකගතනුහුනුවත් මාගේ ප්‍රාණය සිරිගිකාවුවත් ස්වාසය රඳවාවුවත් නසා ගණිමි කීහ. එවිට එකියන සොරා ඒ දෙමහල්ලන් නොමරා අළහ. ඒ දෙමහල්ලොත් සැවැත්නුවරටම එන්නාහු ජේතවනාරාමයට අවුත් සර්වඥයන් දැක යම්හයි සිතා ජේතවනාරාමයට අවුත් සර්වඥයන් දැක සිටියාහ. සර්වඥයෝත් කෙළෙඹි පුත්‍රය මගසැපසේ පලාආවාදැයි විචාරා වදාරන්නා ස්වාමිනී අපට කුමන සැපයෙක් ඇද්ද අතරමගදී සොරුන් අප අල්වාගත් ගමනේ මාගේ ස්ත්‍රීය නිසා ජීවිතය ලදුයේයයි දැන්විය. සර්වඥයෝ වදාරණ සේක් පෙරත් මේ ස්ත්‍රී නුවනැත්තන්ගේ ජීවිතය රැකදුන්නේයයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි එක්විලෙක මහත්වූ කලවිටක්යා මහත ඇති රන්වන් කකුළුවෙක් ඇත. එකියන කකුළුවා වසන්නාවූ විලටද එකියන කකුළුවාගේ නමින් විලටද නම්විය. එකියන කකුළුවාගේ විල සමීපයෙහි ඇත් රජ්ජුරුවකෙණෙක් නිබදම ඇත්මුලක්ගෙණ වාසය කරන්නාහ. ඒ ඇත්මුල විලට බැස පොකුරු මී නෙලඹුදලි කන්ට බටවේලාවට ඒ විලවසන්නාවූ කකුළුවා එක් ඇතෙකුගේ කකුල ඩැගෙණගොස් කන්නේය. මේ නියායෙන් ඇතුන්ට බොහෝ ගැහැට කරණහෙයින් ඇත්තු ඒ විලට නොබසිනාහ. එසමයෙහි ඒ විල සමීපයෙහි වාසය කරන්නාවූ ඇත්රජ්ජුරුවන්ගේ ඇතිනීගේබඩ බෝධි සත්වයෝ පිළිසිද ගත්හ. එකියන ඇතින්නීත් තමාගේ දරුගර්භය රකිනා නිසා ඔබ්බකට ගොස් බෝධිසත්වයන් වැදූහ. බෝධිසත්වයෝ වැඩිවිය පැමිණ අංජන කූටයක්සේ මහත්වූ ශරීරයක් ඇතිව ඇතින්නක් තමන්ට පාදපරිචාරිකාකොට සලස්වාගෙණ බෝධිසත්වයෝ තමන්ගේ මෑනියනුත් ඇතින්නත් ඇරගෙණ පියානන් දකින්ට ඒ විලසමීපයට අවුත් පියානන්දැක ඒ විලට බට ඇතුන් කකුළුවෙකු විසින් අල්වකන නියාව අසා බෝධිසත්වයෝ තමන්ගේ පියානන්ට කියන්නාහූ පියානන් වහන්ස මේ කකුළුවා මරන්ට මට භාරයයි කියන්නා බෝධිසත්වයන්ගේ පියානෝත් කියන්නාහූ පුත ඒ කකුළුවා බොහෝ ඇතුන් කා මරාපිටා එසේහෙයින් තොපි ඒ විලට නොයවයි කීහ. ඒ මාන කියව කියවාත් මා විලට යන්ට උවමැනවයි කියා බොහෝ ඇතුන් පිරිවරා එකියන විලසමීපයට ගොස් ඇතුන්ගෙන් විචාරන්නේ මේ විලවසන කකුළුවා ඇතුන් අල්වන්නේ විලට බසිනාවේලේද ගොදුරු කණවේලේද විලින් ගොඩනගින වේලේදැයි විචාළෝය. එකියන ඇත්තු කියන්නෝ දියට බැස ගොදුරු කා ගොඩනගිනවේලේ ඇමට පස්සේ එන ඇතා පය අල්වන්නේයයි කීහ. එබස් අසා බෝධිසත්වයෝ යහපතැයි කියා ඇතුමුල හා ඇතින්න පිරිවරා දියට බැස ගොදුරුකා ගොඩනගිනවේලේ බෝධිසත්වයෝ හැමඇතුන් පළමුකොට එවා තමන් වහන්සේ පස්සේ එමින් සිටිකලට එකියන කකුළුවත් ලෝකරුවකු අඬුවකින් දිලිහිගිය ලොවටත් අල්වන්නාක්මෙන් ඇතුන්ගේ පය අඬුවෙන් අල්වාගෙණ තමාගේ වාසස්ථානයට අදින්ට වන්කල්හි බෝධිසත්වයෝත් තමන් සිටිතැනින් පා ඇද යානොහි මරණභයින් භයපත්ව මහත්කොට මරණ ප්‍රතිරාවයෙන් ඇඬූහ. ඒ අඬ ඇසූ බොහෝ ඇත්තු තමන්කෙරේ භයින් කුංචනාද කොට ඉල්ලති මුත්‍රවත්කොට ඒ ඒ අත දිවූහ. බෝධිසත්වයන්ට බිරින්ද වන ඇතිනීත් කැටුව භයක්වත් නොදැන දිවන්ටවන බෝධිසත්වයෝ තමන් ඇර නික්මුනු ඇතින්නට කියන්නාහූ පින්වත් වූ මා කෙරෙහි ප්‍රියවූ ඇතින්න අඬු ඇත්තාවූ උස්ව විසාරදව තිබෙන්නාවූ ඇස් ඇති මේ විල වසන්නාවූ කකුළුවෙක් මාගේ පස්සපාය ඩැගත. එසේ හෙයින් තී විසින් මා ඇරපියා යන්නේ ඇයිදැයි කීහ. එබස් අසා එකියන ඇතින්නියෝ නොබවමැනව නුඹවහන්සේ ඇර මම කොයියෙම්ද ඉදින් මේ දසදහසක් යොදුන් දඹදිව මට ලැබෙනමුත් නුඹ වහන්සේ ඇරකොයියෙම්දැයි කියාලඟට අවුත් සිතන්නී කකුළුවාට යාඥාකොට ගලවාගන්ට උවමැනවැයි සිතා කියන්නාහූ රන්වන් පැයක් ඇති ඉතා මහත්වූ කකුළුවන්ට නායක වූ කර්කටක රාජය නුඹට අයදිමි මාගේ ස්වාමිපුත්‍රවූ හස්තිරාජයා ඇරවයි කියා යාඥාකළහ. එකිය කකුළුවා ස්ත්‍රීයගේ යාඥා අසා නාරින්ට කාරණා නොවෙයි සිතා තමන්ට වන්නාවූ හානිය නොදැන අළුයේය. බෝධිසත්වයෝත් තමන්ගේ පයගෙණ කකුළුවාගේ පිට පය තබා මැණ්ඩහ. ඒ වෙලෙහිම කකුළුවාගේ ප්‍රාණය පලාගියේය. බෝධිසත්වයෝත් සතුටුව කුංච නාද කළහ. ඒ කුංචනාදය ඇසූ ඇත්තු පෙරලා දියට අවුත් කකුළුවා ඇද ගොඩලාගෙණ සුනුවිසුනු කොට මඩවාපුහ. ඒ කකුළුවාගේ කලදෙක වනාහී දියෙන් තිබූවාහ. ගංගංනම් ගඟත් එකියන කකුළුවා වසන්නාවූ විලත් සමීපහෙයින් වතුර ආකල ගඟින් ඒ විලට හා මලින් ගඟවටා පැන්වදිනා හෙයින් වතුරෙන් ගොසින් ඒ නල දෙක දියෙහි වැටී ගංගානම් ගඟට වැටී ඉන් එක් කලයෙක් දියෙන් ගොසින් මූදට වැටින. ඒ අසා අසුරයෝ දැක තමන්ට උත්සවයට මිහිගුබෙරයක් කොට සලස්වාගත්තාහ. ශක්‍රයෝත් අසුරයන් පැරදයන ගමනේ දමාපුවා ශක්‍රයෝත්

SANHIDA LANKA

තමන්ගේ උත්සවයට ගසන්ට සලසාගත්හ. එක් නළයෙක් වනාහී දසබෑරජ්ජුරුවන් ලෝදල් එලනා ගංගාවේ ආ නළ දෝදලේ බඳුනා ඇරගෙණ තමන්ගේ උත්සවයට ගසන්ට මිහිඟුබෙරයක් කොට සලස්වා ගත්තාහයි වදාරා මේ කර්කටක ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි එකියන ඇත්තී නම් මේ කියන ස්ත්‍රීය එසමයෙහි ඇරත්රජව උපන්නෙම් බුදුවූ මම්මයයි දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ආරාම දූෂක ජාතකය

තවද මාගේ ගුරු වූ සර්වඥයන් වහන්සේ දක්ෂිණාපථයෙහි උයන්ගොව්වෙකු අරභයා මේ ජාතකය දක්වන ලදී,

ඒ කෙසේද යත්.

සර්වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වාසයකොට වස්අන්තයේ දක්ෂිණ ජනපදයට වැඩීසේක. දක්ෂිණා ජනපදයෙහි එක්තරා උපාසකයෙක් සතරපසයෙන් සර්වඥයන් පවරා දන්දී උයන පිළිගැන්වීය. පිළිගන්වා මේ උයනේ ඒ ඒ තැන වඩිනේ යහපතැයි කීය. එවිට භික්ෂූන් වහන්සේ උයන් ගොව්වා අත අල්වාගෙණ ඒ ඒ තැන ඇවිදිනාසේක. එක්සිස්වූ ප්‍රදෙසයක් දැක මේ ස්ථානයේ මෙසේ වූයේ ඇයිදැයි විචාරා බාල උයන් ගොව්වෙකු විසින් මුල්බට නියාවට බල බලා පැන්වත්කරන්ට උවමැනවැයි ගස්පැල උදුර උදුරා පැන්වත් කළේය. එසේ හෙයින් මේ ප්‍රදේශය මේ නියාවට වීයයි කීහ. ඒ කථාව සංඝයා වහනසේ සර්වඥයන්ට දැන්වූසේක. සර්වඥයෝ එකියන උද්‍යානපාලයා පෙරත් උයන්නැසුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ උයන කරා උයන් ගොව්වා එතනට අවුත් නුවර උත්සවයක් විසින් තෙමේත් උත්සවයට යනු කැමතිව උයන ඉඳිනා වඳුරන්ට කියන්නේ තොපඇමටත් මේ උයන නිසා බොහෝලාභය එසේවීසින් මම නුවර උත්සව කෙළපියා එනදාතුරෙන් උයනේ පැළැටිගස් වලට පැන්වත්කරවයි කීහ. එ කියන වඳුරෝ යහපතැයි ගිවිස උයන්ගොව් විසින් දෙනලද රෑනි හා දඬු කල ඇරගෙණ ළිඳත් පැන් උකා පැළැටිගස්වලට පැන් වත්කරන්නාහ. මේ නියායෙන් පැන්වත්කරණකලට එකියන වඳුරන්ට නායකවූ වඳුරා එතනට අවුත් මේ නියායෙන් පැන් වත්කරණ කලට පැනට හානිවෙයි ඒ නියායෙන් මුල් බොහෝ කොට බටගසට බොහෝකොට පැන්වත්කරන්ට උවමැනවයි මදකොට බටගසට මදකොට පැන් උවමැනවයි ගස් උදුරා බල බලා පැන් වත්කරන්නා පැනට හානි නොවෙයි මේ නියාවට බල බලා පැන්වත්කරන්නා යහපතැයි එකියන වඳුරෝත් මුන් කීයේ ඇත්තමයි ගිවිස සමහර පැල උදුරා බලා සමහර පැල ඉඳුවා සමහරට පැන් වත්කොට යන්නාහ. මේ නියායෙන් දවස් අරණා කලට නුවනැති බ්‍රාහ්මණයෙක් එතනට අවුත් වඳුරන් කරන්නාවූ ක්‍රියාව දැක කියන්නේ තොපි ඇම මේ නියායෙන් පැල උදුරා පැන්වත්කරණ කල ගස් නොමියේද මේ උපාය තොපි ඇමට කීවෝ කවුරුදැයි කීහ. එවිට වඳුරෝ කියන්නාහු අපගේ අධිපතිවානරයන් කීවාට කරම්හයි කිව්හ. බෝධිසත්වයෝ තොපගේ යුථපතීයානන්ගේ නුවන මෙසේකල තොප ඇමගේ නුවන තමාම කියනුම් කින්දැයි කියා කීහ. ඒ අසා එකියන වඳුරෝ කියන්නාහු බමුණානන් වහන්සේ කියන්නේ කින්ද අපකළේ නුවනැතිව කළදෙයක් නොවෙයි ගස්කොලනම් ප්‍රමාණය දැන පැන් වත්කළමනා වේදැයි සිතා ඒ නියාවට පැන් වත්කළම්මැයි කීහ. බමුණානන් වහන්ස අපට නින්දාකරන්නේ ඇයි දැයි කියා කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු තොප හා තොපගේ වඳුරු මුලට මා කියන්නේ කින්දැයි තොපලවා පැන්වත්කරන්නේයයි කීහයි වදාරා මේ ආරාමදූෂක ජාතකය නිමවා වදාළසේක. එකියන උයන් නැසූ වඳුරානම් මෙකියන උයන්ගොව්වාය ඒ කාරණය ප්‍රත්‍යක්ෂව කීවාහු බ්‍රාහ්මණයා නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්මවේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සුජාත ජාතකය

තවද මාගේ මව්වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සුමනා නම් සිටුදුවනියන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

ධනංජය සිටානන්ගේ දුවූ  විශාලා මහ උපාසිකාවන්ගේ නන්වූ සුජාතා නම් සිටුදියනියන් අනේපිඬු මහ සිටානන්ගේ පුතනුවන්ට විවාහ මඟුල් කොට ගෙණාහ. එකියන සුජාතාවෝත් ගෙට ආවක් පටන් ගෙයි වහල් හා කැටිවත් ස්වාමි පුත්‍රයා කැටිවත් අඬදබර කන්නාහ. මේ නියායෙන් දවස් අරණා සමයෙහි සර්වඥයෝත් එක් දවසක් අනේපිඬු මහ සිටානන්ගේ ගෙට වළඳන්ට වැඩිසේක. අනේ පිඬු මහා සිටානෝත් සර්වඥයන් දන්වළඳීමින් සිටිකලට එකියන සුජාතාවෝ ගෙයි වහල්හා කැටිව දබර කරන්ට වන්හ. සර්වඥයෝ දබර කරණ අඬඅසා මේ කිමෙක්දැයි සිටානෙනි වදාළසේකී. ස්වාමිනි මාගේ ගෙයි කළහකාරීය දන්නා ලෙහෙළියක් ඇත. ඕතොමෝ තමාගේ ස්වාමිපුත්‍රයා කැටිවත් ගෙයිවහල් හා කැටිවත් වත්කළහා කාරීකෙරෙයි, ඇදරබර කරණ අඬය ස්වාමිනී කිහ. එබස් අසා සර්වඥහන් වහන්සේ සුජාතාවන් ලඟට කැඳවා තී විසින් තොපගේ ස්වාමීපුත්‍රයාට වාසය කරනමාන වධකරන්නාමෙන එඹල ස්වාමීපුත්‍රයාට අඹුවෝ සත්දෙනෙක් ඇත්තාහ.ඉන් තෝ කුමන අඹුදැයි විචාරා වදාල සේක. එවිට සුජාතාවෝ කියන්නෝ ස්වාමීනි මම නොදනිමියි කීහ.එවිට සර්වඥයෝ කියන්නාහු යම් ස්ත්‍රියක් තමාගේ ස්වාමි පුත්‍රයා හා ගෙයි දැසි දාසයන්ට දසවිට බැනදොඩා වාසය කෙරේ නම් ඒ ස්ත්‍රිය වදකභාර්යා නම් වෙයි. යම් ස්ත්‍රියක් ස්වාමිපුත්‍රයා ඉපද වූ සම්පත් අනියමින් තමා සිත සැටියේ වියදම් කෙරේ නම් ඒ සත්‍රිය චොරභාර්යා නම් වෙයි. යම් ස්ත්‍රියක් ස්වාමි පුත්‍රයා නියාවට තොමෝ වැඩි තරම් සිට ස්වාමිපුත්‍රයා කීවා නොඅසා තොමෝ වාසය කෙරේ නම් ඒ ස්ත්‍රිය අරියභාර්යා නම් වෙයි. යම් ස්ත්‍රියක් තමාගේ ස්වාමිපුත්‍රයාගේ අන්නපානාදි වුදෙය දූන වැදූ  මවක් යම්සේ තමාගේ  පුත්‍රයකුට කැවිලි පෙවිලි ඇදියෙන් ඉදුරා පිරි මසාද ඒ නියාවට වාසය කරණ ස්ත්‍රී මාතුභායර්යයා නම් වෙයි. යම් ස්ත්‍රීයක් තමාගේ ස්වාමිපුත්‍රයාට යම්සේ භය ලජ්ජා ඇතිව නැගනි බූනනි කෙනෙකුන් මෙන් වාසය කෙරේ නම් ඒ ස්ත්‍රි භගිනි භාර්යා නම් වේ. යම් ස්ත්‍රියක් තමාගේ ස්වාමිපුත්‍රයා තමාමරතත් බණතත් දොඩතත් ඒ ඉවසා වාසය කෙරේද ඒ ස්ත්‍රිය දාසිභාර්යා නම් වෙයි යනාදීන් අඹුවන් සත්දෙනාගේ කථාව සර්වඥයන් වහන්සේ වදාරන්නාම එකියන ගාථාසත අවසානයෙහිදී ඒකියන සුජාතාවෝ දාසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටියාය. එවිට සර්වඥයෝ වදාරණ සේක් එඹල සුජාතාව පුරුෂයන්ට යම් ස්ත්‍රියක් වදකභාර්යාව චොරභාර්යාව ආරියභාර්යාව වාසය කළානම් නරකාදිවල ඉපිද බොහෝ දුක්විඳිනාහ. යම් ස්ත්‍රියක් මාතුභාර්යා භගිනි භාර්යාව දාසිභාර්යාව වාසය කෙරේ නම් ඔහු වනාහී දිව්‍යලෝකයෙහි සම්පත් වඳිනාහ. තෙපි වනාහී මෙකියන උතුම් භාර්යාවන් සතරදෙනාගෙන් කොයි භාර්යාවන්ගේ ගුණයෙන් වාසය කරව්දැයි විචාරා වදාළසේක. එවිට සුජාතාවෝ කියන්නාහු මාගේ ස්වාමිපුත්‍රයාට දාසී භාර්යාව සිට වාසය කෙරෙම් කීහ. එවිට සර්වඥයන් වහන්සේ යහපතැයි කීය. ජේතවනාරාමයට වැඩිසේක. එක් දවසක් සංඝයාවහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව කථාකරණසේක් යම්සේ සුජාතාවෝ සර්වඥයන් වහන්සේ වදාළ එක බසින්ම නියාව අවගුණයෙන් හැර නැමුනාහ සර්වඥයනුත් එක බසින් සුජාතාවන් සිටුවූනියාව යහපතැයි කියා මේ කථාව කිය කියා උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා පෙරත් එකබසින්ම තිබූයෙම් වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන්වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවරය බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුත්ව ඉපිද ඒ රජ්ජුරුවන්ගේ ආයාමෙන් රාජ්ජයට පැමිණියාහ. බෝධිසත්වයන්ගේ මෑණියෝ කෝපිව වාසය කරන්නාහ. රජ්ජුරුවෝ මාගේ මෑණියන්ගේ කෝපය කෙසේ සන්සිඳුවා ගනිම්දෝහෝයි සිත සිතා හිඳිනාහු යම් කාරණයක් දුකව් නා නිකම් කාරණා කියන්ට බැරියයි සිතා කාරණයක් පරීක්ෂා කෙරෙමින් උන්නාහ. එක් දවසක් රජ්ජුරුවෝ තමන්ගේ මෑණියන් ඇරගෙන උයන් කෙළියට නික්මුණාහ.ඒ වේලාවට එක් කැරලෙක් උයනේ හිඳ ඇඬීය. ඒ හඬ අසා බොහෝ මනුෂ්‍යයෝ අවලක්‍ෂණ පක්ෂියා ඇඬීයයි කියා දෙකන වසා ගත්තාහ. ඉන් ඔබ්බට ගිය කලට කෙවිල්ලක ඇඬූ ශබ්දය අසා යහපත් නියා ශබ්දයකැයි කියා සතුටු වූහ. මේ අර්ථය දැන රජ්ජුරුවෝ මෑණියන්ට කියන්ට කාරණයක් දිටිම් කියා කියන්නාහු මෑණියන් වහන්ස නපුරු ශබ්දය අසා සියල්ල වුන්ටම අප්‍රියය. යහපත් පක්ෂියාගේ ශබ්දය අසා සියල්ලවුන්ටම සන්තෝෂ විය. එසේ හෙයින් මෑණියන් වහන්ස, තදපරුෂ වූ බස් ඇර මධුර වූ බස් කිව මැනවයි කියා ඒ බරණැස් රජ්ජුරුවෝ මෑණියන්ට අවවාද කීහ. එකියන මව් බිසවුන් පුතනුවන් කී එක අවවාදය අසා තමන්ගේ තදපරුෂකම් අලහයි වදාරා මේ සුජාත ජාතකය නිමවා වදාළ සේක.  එසමයෙහි ඒ රජ්ජුරුවන්ගේ මව්බිසවු නම් මෙසමයෙහි මේකියන සුජාතා නම් සිටුකුමාරිකාය, එසමයෙහි බරණැස් රජව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මයයි වදාළ සේකි.

SANHIDA LANKA

# කාකඋළුක ජාතකය

තවද මාගේම දෙව්වු සර්වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කව්ඩන්ගේ හා බකමූණන්ගේ කථාව අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙස්ද යත්.

ජේතවනාරාමයෙහි පිටිපස්සේ හිඳිනා භික්ෂූකෙණෙකුන් වහන්සේ දවස් පතා උදෑසන මළුව අමදිනා කළ කව්ඩන්ගේ ඉස් නැලිය දෙනැලිය ඇමද දමන සේක. මේ නියායෙන් දවස් පතා උකාදමානහෙයින් එක් දවසක් භික්ෂූන් වහන්සේට එපවත් කීසේක. ඒ කථාව කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේට එපවත් කීසේක. ඒ කථාව කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා ඒ භික්ෂූන් වහන්සේ ස්වාමිනි කව්ඩන් හා බකමූණන් කවරකලක පටන් උනුන් හා වෛර වූයේදැයි කියා විචාළසේක. මහණෙනි ප්‍රථම කල්පයෙහියයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස ප්‍රථම කල්පයෙහි මනුෂ්‍යයෝ තමන්ට රූපත්වූ පුරුෂයන් රජකමට තකාගත්තාහ. සිව්පාවෝ සිංහයන් රජකමට තක ගත්තාහ. මත්ස්‍යයෝ ආනන්ද නම් මත්ස්‍යයා රජකමට තකාගත්තාහ. පක්ෂි එකෙණෙහ ගල තලක් මත්තේ රැස්වගෙණ කියන්නාහූ මනුෂ්‍යයෝ තමන්ට රජකමට තකාගත්තාහ. සිව්පායෝ සිංහයන් රජකමට තකාගත්තාහ. මත්ස්‍යයෝ ආනන්ද නම් මත්ස්‍යයා රජකමට තකාගත්තාහ. ඒසේ විසින් අපටත් රජ්ජුරුකෙණෙකුන් උවමැනවයි සිතා සෑම පක්ෂීන් එක්ව බකමූණෙකු රජකමට තකාගත්තාහ. තකාගෙණ එකෙණිහිම ගිවිස්සන්ට උවමැනවයි උවමනා නිසා එක පක්ෂීයෙක් නැගීසිට බකමූණාට රාජ්ජ්‍ය පැමිණීම එකෙණිහම ගිවිස්සේ ඇද්දැයි ගිවිස්සේ ඇද්දැයි තුන්විටක් විචාළේය. දෙවිටක් විචාරාණ තුරු එකෙකුත් මුවෙන් නොබැණ උන්හ. එවිට එක්කව්ඩෙක් සිතන්නේ මුන් රාජ්‍ය ශ්‍රීලත් සන්තෝෂයෙන් ඉඳිනාවූ මුගේ මූන මෙසේ කල ඉදින් කෝපයක් වූ වේලේ මුන මෙසේ බැලිය ඇද්දැයි කියා සිතා පක්ෂීන්ට කියන්නේ සියගෝත්‍රයෙහි උපන් පක්ෂීනි මාකියන්නක් ඇමදෙනම නොකිපී අසතොත් කියම් කීහ එබස් අසා පක්ෂී කියන්නාහූ ඉදින් බාල පක්ෂීයෙක් විනමුත් කටයුත්ත කියයි කිනම් එමවේද කටයුතු තොපදත් දෙයක් ඇත්නම් කියවයි කීහ. එවිට කව්ඩු කියන්නේ මේ බකමූණා රාජ්ජය ලද්දාවූ සන්තෝෂයෙන් ඉඳිනාවූ මුන්ගේ මූණ මෙසේකල ඉදින් කෝපවූයක් වූ නම් කකියාගිය කබලේලු තලසේ පක්ෂි ඒ ඒ තෙන ඉසිර පලායන්නාහයි කියා මුන්කෙරේ ඇලෙන්නේ නැත. එසේ හෙයින් බකමූණන් රාජ්ජයට තැකීමට මා ගිවිස්සේ නැතැයි කියා ආකාශයට නැගී පලාගියෝය. එකියන බකමූණන් කවුඩුපස්සේම දිවගත මේ නියායෙන් උන්දෙන්න පලා ගියපසු සෙසු පක්ෂී එක්ව කවුඩා කීයේ ඇත්තමයි කියා බකමූනන් ඇර ස්වර්ණහංස පෝතකයෙකු රාජ්ජයට තකාගත්තාහයි වදාරා මේ කාක උළුක ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි හංසපොතකව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළ සේක.

SANHIDA LANKA

# උදපාන දූසක ජාතකය

තවද මාගේම කරුණානිධාන වූ සර්වඥයන් වහන්සේ බරණැස් නුවර ඉසිපතනාරාමයෙහි වැඩ වසනසේක් බොන පැන් ලිඳක් කසල කරණ කැණහිලෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒකෙසේද යත්.

එක්තරා කැණහිලෙක් බොහෝ භික්ෂූන් වහන්සේ බොනපැන් වළඳන්නාවූ ලිඳක්දැක ඒ ලිඳක් දවස්පතාම පැන් බී ඒ ලිඳ කසල කරන්නේය. එක් දවසක් එකියන කැණහිල් බල්ලා දැක සාමණේර මහළුවරුන්වහන්සේ කැටකැබිලිති දමාගසා එතනින් පහළකළසේක, එයිත් එවක්පටන් එතනට නාවිරීය. එපවත් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ කථාකොට කොට උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් මෙකියන කැණහිල් මේ බොන පැන් ලිඳම කසල කළේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බෝධිසත්වයෝ එක්තරා කුලයක ඉපිද තාපසව බරණැස් නුවර ඉසිපතනාරාමයේ බොහෝ තාපසවරුන් පිරිවරා වාසය කරන්නාහ. එසමයෙහි මෙම කියන ලිද මෙම කියන කැණහිල් පැනුත් බී කසලත් කරන්නේය. එවිට තාපසවැන් මල්බාන්ලා කැණහිලා අල්වාගෙණ ගොස් බෝධිසත්වයන්ට පෑහ. බෝධිසත්වයෝත් එකියන කැණහිලා දැක කියන්නාහු ඇයි තා විසින් තාපසවරුන් පැන් බොන්නාවූ ලිඳ කසල කරන්නේ ඇයි දැයි කීහ. එබස් අසා කැණහිල් කියන්නේ තාපසයන් වහන්ස මට කෝප නොකළමැනව අපගේ සත්මුත්තන් පරම්පාරාවේ යම්තෙනකින් යමක් අනුභව කළමෝනම් එතන කසලකිරීම් අපටතිබී ආ ජාතධම්මයහ, එසේ හෙයින් කෙළෙම් මට කෝප නොකළ මැනවයි කීහ. එවිට බෝධිසත්වයෝ තොප ඇමගේ යාපතට ඇරගත්දේ මෙසේකළ නපුර තමාම වේදැයි කියා අදපටන් තොපි මේ ලිඳ කසල කළානම් දන්නවාදැයි කියා අළහ. එකියන කැණහිලා එතනට එන්නාක් නොකළේයයි වදාරා මේ උදපාන ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# ව්‍යාඝ්‍ර ජාතකය

තවද මාගේ මව්වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝකාලිකස්ථිවරයන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙස්ද යත්.

මෙහි වර්ථමාන කථාව තෙළෙස්වෙනි නිපාතයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේයි මෙහි වනාහී කෝකාලිකස්ථිවිරයන් වහන්සේ වාසය කරන්නාවූ කෝකාලික ගම දැගසව්වන් වහන්සේ කාටත් නොකියා වස්වැස සැවැත් නුවරට වැඩිපුසේක. ඒ කෝකාලික ගම වසන්නාවූ මනුෂ්‍යයෝ කෝකාලික තෙරුන් වහන්සේට කියන්නාහු දැගසව්වන් වහන්සේ මෙගම වස් වැස වැඩිනියාව අපට නොකීයේ ඇයිද? එසේ හෙයින් නුඹ වහන්සේ ගොසින් දැගසව්වන් වහන්සේ කැඳවාගෙන වඩිනේ යහපතැයි කීහ. යහපතැයි කී කෝකාලිකස්ථවිරයන් වහන්සේ සැවැත්නුවරට ගොස් දැගසව්වන් වහන්සේ කෝකාලික ගමට වඩිනානියාවට ආරාධනා කළසේක. දැගසව්වන් වහන්සේ අප එන්නේ නැත තොපි යවයි නොගිවිසිසේක. මේ කථාව දම්සභාවට රැස්වූ මාළුවරුන් වහන්සේ කෝකාලිකස්ථවිරයෝ දූගසව්වන් වහන්සේ එක් වත් ඉන්දනොදෙති ඇරපියාත් ඉන්දනොදෙති, කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදූයි විචාරා එපවත් අසා දැන්මතුනොවෙයි මහණෙනි පෙරත් ඔහු එසේම වේදූයි ආරාධිත වූ සර්වඥයන් වහ්නසේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයෝ වෘක්‍ෂ දේවතාව උපන්නාහ. ඒ ගාව එක්වනයෙක සිංහයෙකු හා ව්‍යාඝ්‍රයෙක් වාසය කරන්නේය. ඔවුන් දෙදෙනා නිසා මනුෂ්‍යයෝ ඒ වනය නොකපා ඉන්නාහ. සිංහයා හා ව්‍යාඝ්‍රයාත් ඒ වනයෙහි ඉදිනා සිව්පාවුන් කා ඒ ඒ තැන මස් කැබලි එලාතබන්නාහ. එසේහෙයින් ඒ වනය කුණුමසින් ගඳව වනය මුලුල්ලම දුර්ගන්ධ විය. ඒ වනය වසන්නාවූ වෘක්‍ෂදේවතාවා බෝධිසත්වයන් කරාගොස් එපවත් කියා සිංහයා හා ව්‍යාඝ්‍රයා මෙතෙකින් පහකොටපුවෝත් යහපත ඒ නියාවට පහකරන්ටදූයි විචාලේය. එවිට බෝධිසත්වයෝ කියන්නාහු සිංහයා හා ව්‍යාඝ්‍රයන් වනාන්තරයේ ඉදිනා නිසා මනුෂ්‍යයන් මෙකියන වනාන්තරය නොකපන්නේය. එසේ නැත්නම් සිංහයන් හා ව්‍යාඝ්‍රයන් මෙකියන වනාන්තරයෙහි නැති නියව දත්තු නම් මෙකියන වනාන්තරය කොට පියා සේන්කොට ගන්නාහ. එසේ විසින් සිංහයා හා ව්‍යාඝ්‍රයන් පහකරවයි කීහ. එසේ කීවත් ඒ දිව්‍ය පුත්‍රයා බෝධිසත්වයන් කිවා නොඅසා භයන්කාර ශබ්දපවත්වා සිංහයා හා ව්‍යාඝ්‍රයන් පහකොටපීහ. මනුෂ්‍යයෝ සිංහ ව්‍යාඝ්‍රයන්ගේ පියවර නොදැක සිංහ ව්‍යාඝ්‍රයන් ඔබ්බේ වනාන්තරයකට ගියනියාවේදූයි සිතා ඒ වනාන්තරය එක් භාගයකින් කපා හෙළි කරන්නට වන්හ. එවිට එකියන දිව්‍යපුත්‍රයා බෝධි සත්වයන් කරාගොස් සබඳ තොප කීවා නොඅසා මම සිංහ ව්‍යාඝ්‍රයන් පහකෙළෙම්. සිංහ ව්‍යාඝ්‍රයන් වනාන්තරයේ නැති නිසාව දත්තාවූ මනුෂ්‍යයෝ වනාන්තරය එළිකරන්ට වන්නාහ. මෙවිට කුමක්කරම්දූයි කියා කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු සිංහ ව්‍යාඝ්‍රයන් ගියාවූ වනාන්තරයට තොපි ගොසින් පිළිගන්වීනම් ඔවුන් ගියාවූ වනාන්තරයට ගොස් දොහොත් මුදුනේ තබා ඔවුන් දෙදෙනාට ආරාධනාකොට මේ මම නොදැන තොපි හැම භයගන්වා එලවාපීම් ඒ මම නොදැන කළෙම් මට ක්‍ෂමා කොට මා වසන්නාවූ වනයට එවයි කීහ. එවිට ඔවුහුත් එබස් අසා තොප වසන්නාවූ වන්තරයට අපිනේම්මැයි කියා නාවාහුය. එකියන මනුෂ්‍යයෝත් ඒ බැද්ද කොටා එලිකොට සේන්කොටාගත්හයි වදාරා මේ ව්‍යාඝ්‍ර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි සිංහයා නම් සැරියුත් මහාස්ථවිරයන්ය. ව්‍යාඝ්‍රයා නම් මුගලන් මහාස්ථවිරයන්ය. එකියන වනස්පති දේවතානම් කෝකාලිකස්ථවිරය වෘක්‍ෂදේවතාව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# කච්ඡප ජාතකය

තවද මාගේ බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනා සමයෙහි කොසොල් රජ්ජුරුවන්ගේ අමාත්‍යයන් දෙන්නෙකු අරභය මේ ජාතකය දක්වන ලද. මෙහි වර්ථමාන කථාව එකක නිපාතයෙහි විස්තර වසයෙන් පෙණෙන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ කසීගමක බමුණුව ඉපිද පංචකාමයෙහි ආදීනව දැක හිමාලයවනයට වැද ඍෂිප්‍රව්‍රජාවෙන් පැවිදිව පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ගඟක් සවම්පයෙක ධ්‍යානලාභිව උපේක්‍ෂා පාරමිතාව පුරන්නාහ. එවිට එක් දුශ්ෂිල වානරයෙක් බෝධිසත්වයන්ගේ උරයපිට ඉඳ ශ්‍රොතයට දුග්චරත ක්‍රියා කරන්නේය. මේ නියායෙන් දවස අරනේය. බෝධිසත්වයෝ උපේක්ෂා පාරමිතාව පුරණහෙයින් එහි උපෙක්ෂාව ඉදිනාහ. ඒ අභ්‍යාසයට එක් දවසක් දියෙන් ගොඩනැගී අව්ව තැප තැප කටදවල්වාගෙණ වැදහෝනා ඉබ්බෙකු දැක තාපසයන්ට කළාවූ ක්‍රියාවසේ කෙරෙමි කියා ඉබ්බාගේ කටට දුශ්ශීල කළේය. එකල්හි ඉදිබුවා යහපත්කොට ඩැගත. එවිට වඳුරු තමා බලවත් වේදනා වැදගත්හෙයින් ඉදුබා දැතින් අල්වාගෙණ මේ මාගේ දුක්බය කවුරුන්ලගට ගොස් අරවාගනිම්දැයි සිතා අනික් කාටත් බැරිය උපේක්‍ෂා පාරමිතාව පුරන්නාවූ තාපසයන් කරා යෙමි සිතා අනික් කාටත් බැරිය උපේක්ෂා පාරමිතාව පුරන්නාවූ තාපසයන් කරා යෙහි සිතා ඉඳුබුවා වඩාගෙණ බෝධිසත්වයන් කරා ගියේය. බෝධිසත්වයන් ඒ වඳුරා දැක මේ කිම්ද භික්ෂා පාත්‍රයක් වඩාගෙණ එන්නාවූ තාපසකෙණෙකුන්මෙන් කින්දැයි විචාළාහ. එවිට එකියන වානරයා කියන්නේ තාපසයන් වහන්ස මා විසින් යහපත් දෙයක්දෝහෝයි සිතා මේ ඉබ්බාගේ කටට දුශ්චරිත කෙරෙමු සිතා මෙහෙයිම් ඒ වනාහී ඩැගත මට වනාහී බලවත් වේදනා පත්වී ඒ වේදනාවෙන් මා මිදුවොත් යහපතැයි කීය. එවිට තාපසයෝ ඉදුබාට කියන්නේ මේ කියන වඳුරු මෛථුන ක්‍රියාවෙහි තෘෂ්ණාව බලවත් හෙයින් මොහු සිත්සිතා දුෂ්‍යකම් කළේය. තොසින් උෟසේම අඥනයෙක්ද ඇරපියවයි කීහ. එවිට ඉදුබාත් බෝධිසත්වයන් කී නියායෙන්ම ඇරපියා එකියන වඳුරුත් තමාට පැමිණ දුක්බය තාපසයන් නිසා  මිදුනු හෙයින් එවක්පටන් එසේවූ අධර්මයක් නොකළේයයි වදාරා මේ කච්ඡය ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ඉදුබා හා වඳුරා නම් මේකියන අමාත්‍ය දෙදෙනාය. උපේක්ෂා පාරමිතාව පිරූ තාපසයෝ නම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# ලෝල ජාතකය

තවද මහපොළොව සේ විසාරදවූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලෝභී භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සිව්පසයෙහි ලෝභිවූ භික්ෂූකෙණෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේ කරා ගෙණගොස් දක්වූසේක. එවිට සර්වඥයෝ සැබෑද මහණ තා සිව්පස ලෝභියයි විචාරා වදාරා සැබැව ස්වාමිනි දන්වන්නා මහණෙනි මෙකීයන භික්ෂූහු පළමුත් ලෝභිකම නිසා උත්තමව තමන් වසන්නාවූ ස්ථානයෙන් ඉන්ද නුහුණුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර සිටානන්ගේ ගෙයි අරක්කැමියා පින් පිණිස පක්ෂීන්ට ඇවිත් ඉදිනා නියායෙන් පෙට්ටිවිය එල්වන්නේය. බෝධි සත්වයෝත් පරවිය ඉපිද එකියන අරක්කැමියා විසින් එරල්වනලද පෙට්ටියක වාසය කරණසේක. එක් දවසක් කපුටුවෙක් මුළුතැන්ගෙයි උඩින් පියඹා යන්නේය. මංචමාංස ගන්ධය ඉවසාගත නොහී මුළුතැන්ගොට කෙසේ වැදහෙම්දෝහෝයි සිතා උන. බෝධිසත්වයෝත් ගොදුරු කන්ටයයි පිටත්උනාහ. එකියන කපුටුවා බෝධිසත්වයන් පස්සේ පියඅඹා යන්ටවන. බෝධිසත්වයෝත් ඇයි සබඳ කපුටුවානනි තොපහා එක්ව ගොදුරු කන්නේ නැත. තොපි මාහා කැටිව ගොදුරු බිමට එන්නේ ඇයිදැයි විචාළසේක. එවිට කපුටු කියන්නේ පරවියානන් වහන්ස නුඹවහන්සේගේ ගොදුරු කැවිලි හා වාසයමටත් අභිප්‍රාය එසේහෙයින් නුඹවහන්සේට සේවාකම් කරන්ට ආමිකීහ. එබස් අසා පරවියානෝ යහපතැයි කියා උෟ සමග ගොදුරුකන්ට ගියාහ. පරවියානන් ගොදුරුකාදී තෙමේ ගොසින් ගොමරිම්බක් තුඩින් ඉරා පණුවන් කා බඩපුරා ගෙණ පරවියානන් ලඟට අවුත් යහපත්ව තව දක්වා ගොදුරු කණනියාවද තමාගේ සය ඇදින කන්ට අවුදැයි කියා පරවියානන් කැටිව ගොදුරු කා කැටිවම වාසස්ථානයට ගියේය. එවිට අරක්කැමියාත් අපගේ පරිවියානෝ තමන් සහයවූ කව්ඩෙකු ඇරගෙණ ආවයි කියා එකියන කව්ඩාට ඉන්ටත් එක් පෙට්ටියක් වියලා බැඳලීය. ඒ පෙට්ටියේ කව්ඩා වාසය කෙරෙයි මේ නියායෙන් කීප දවසක් වාසය කළ කල එක් දවසක් එකියන සිටානන්ගේ ගෙට බොහෝ දඩමස් ගෙණාවාහුය. එදවස් එකියන කවුඩාත් මාත් එමින් යම්සේ මාංසයක් කන්ට උවමැනවයි සිතා උන්හ. පරවියානෝ ගොදුරට යෙමින් සිට ඇයි තව්ඩානෙනි ගොදුරුකන්ට එවයි කියන්නා ස්වාමිනි ඊයේ මා කෑවාවූ ගොදුරු නොදිරූණ අජීර්ණව බඩරුජාගන්ටවන, මම අද නේම්කීහ. එවිට පරවියානෝ කියන්නෝ තොපි කුමක් කියව්ද කව්ඩන් නම් එළගිතෙලින් ඇඹරූ පාන්කඩක් කැවිමට බඩසුඟක් තිබී දිරණ පමණක් සෙසුයම් ගොදුරක් උරෙන්පාත ගියවිටම නොදිරා තිබේද කව්ඩන්ටත් අජීර්ණයෙක් ඇතිව බඩරුජාගණිදැයි කීහ. ඒ එසේමය එසේද වූවත් මට රුජා දැඩිය. මම අදනේම් කීය. එවිට පරවියානෝ තා මේ මච්ඡමාංස නිසාය කියන්නේ සිටානන් වහන්සේගේ මච්ඡමාංස ඉඳුල් නොකරව, ඉඳුල් කෙළෙහි නම් තට බොහෝ විනාස පැමිනෙන්නේයයි කීහ. මෙසේ අවවාද කියා පරවියානෝ ගොදුරුකන්ට ගියහ, එවිට අරක්කැමියාත් මච්ඡමාංස පිස පණත්කොට තිබා ඇඟ ඩානිවන්ට පිසනගෙන් පිටතට ගොස් සිටියේය. ඒ වෙලාවට කව්ඩා මේ මච්ඡමාංසකන්ට අවකාශයයි මාළුපිස වසා තුබූ බඳුනක් මත්තේ උන්නේය. උෟ ඉඳිනාවස්න ක්‍රීංයන ශබ්ද විය. එවිගස අරක්කැමියා අසා ගෙට අවුත් කව්ඩා අල්වාගෙණ ඇඟ පියාපත් සිඳ කුඩිඹියක් තබා ලුනු මිරිස් අඹරා කාඩිගා ඇඹුල්දියෙන් අනා ඇඟ ගල්වා කපුටුවා ඉඳිනා පෙට්ටියට දැමූහ. පරවියානෝ ගොදුරු කා එතනට අවුත් කව්ඩා දැක වෙහෙසා කියන්නාහූ කෙකින්න අපගේ සබඳ කව්ඩා ඉන්නා මැදිරියේ තොප උන්කල තොපට නොදොඩා උෟ එන්නාට පළමුකොට වහා පලායවයි කීහ. එබස් අසා කව්ඩා කියන්නේ ස්වාමිනි මම කෙකින්නක් නොවෙමි. නුඹවහන්සේ වදාළ අවවාද නොගිවිස මච්ඡමාංසයෙහි තෘෂ්ණාව උපදවා ලෝභයෙන් මච්ඡමාංස කන්ට ගොසින් අරක්කැමියා මා අල්වාගෙණ මටකළ ගහටයයි කීහ. එවිට පරවියානෝ මා කීවා නොගිවිස මේසා දුක්ඛයට පැමිණියේය. ඉනිබ්බේ මින් මිය පරලොව ගියකලත් නරකාදී දුක්ඛයට පැමිණෙන්නේ වේදැයි කියා මමත් මෙතන උන්කල අරක්කැමියා මා කෙරෙහි සැක උපදවයි කියා එතනින් පියාසර කොට ඔබ්බකට නැගී ගියහයි වදාළසේක. මේ බණ අවසානයෙහි භික්ෂූත් වහන්සේ අනාගාමිඵලයෙහි පිහිටිසේක. පූර්වාපර සන්ධි ගළපා මේ ලෝල ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ලෝභී කව්ඩානම් මේ ලෝභී භික්ෂූහුය. පරවිව උපන්නේම බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# දුලුසි රාජ ජාතකය

තවද මහමුහුදේ ගැඹුරුවූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ලෝභී භික්ෂුකෙණෙකුන් වහනසේ අරභයා මේ ජාතකය දක්වන ලද මෙහි වර්ථමාන කථාවත් අතීත කථාවත් දෙකම පළමු කී ජාතකය මෙනි.

SANHIDA LANKA

# කුරුධම්ම ජාතකය

තවද මහමෙරක් සේ ස්ථිරවූ සාරගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් අකුරක් ගසා හංසයෙකු මැරූ භික්ෂුවක් හූ අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද යත්.

එම සැවැත් නුවර යාළුවෝ දෙදෙනෙක් ශාසනයෙහි මහණව උපසම්පදාව ලදින් බොහෝසේ උනුන් නොහැර එක්වම ඇවිදිනාහූ අචිරවතී නම් ගඟාවට ගියාහූ නාපියා අව්ව තැප තැප පුරාතන කථාවන් කිය කිය වැල්ලේ සිටියාහ. ඒ ඇසිල්ලෙහි ආකාශයෙන් යන්නාවූ හංසයන් දෙන්නෙකු දැක දෙන්නාගෙන් කුඩාමහණ කියන්නේ තෙළ හංසයන් දෙන්නාගෙන් එකෙකු ඇසකට අකුරකින් ගසම් කීහ. අනික් මහණ කියන්නේ තොපට බැරියයි කීහ. එසේ වී නම් බැළුවමැන මාදසාවේ ඇසට ගහන්ට ආශ්චර්යය කින්ද ඇත ආලයේ ඇසට ගසම් කීහ. අනික් මහණ තොපට බැරියයි කීය. නැවතත් එසේ විනම් බැලුවමැවැයි කියලා තුනැස් අකුරක් අල්වාගෙණ හංසයාගේ පශ්චාත්භාගයට ගසාලීය. යන්නාවූ හංසයා අකුර බුරාගෙණ යන අඬ අසා නැවත පෙරලා බැළිය. එක්ෂණයෙහි වට අකුරක් ගසැලීය. ඒ අකුරගොස් ඇලයේ ඇසින්ද වැද තමාදසාවේ ඇසින් නාගපිය. හංසයාද අඬාගෙණ පාපිට වැටි ගියේය. ඒ ස්ථානයෙහි සිටි භික්ෂූහූ දැක ඔහු සමීපයට අවුත් කිමෙක්ද ඇවත මේ නියාවූ බුදුසන්නෙහි මාහණව නොකළමනා ප්‍රාණවධ කෙළේ යුක්තතෙක් නොවෙයි කියා ඔහු නොකමැතිකරවාගෙණ ගොස් බුදුන්ට දැන්වූහ. ඒ අසා බුදුහූ වදාරණසේක් මහණ තා ප්‍රාණඝාත කළේ  සැබෑදැයි විචාරා වදාළසේක. ඒ භික්ෂූන් විසින් සැබැව ස්වාමිනි කී කල්හි මේ නියානෛර්යාණික බුද්ධසාසනයෙහි මහණව සිට කිසිභයක් නැතිව මෙබඳු ප්‍රාණවධ කළේ සුදුසු නොවෙයි වදාරණ බුදුරජානන් වහන්සේ මෙසේ වදාළසේකී. පුරාතනයෙහි නුවනැත්තාහූ අබුඬොත් පාදකාලයෙහි පවා ගිහිගෙයි වසන්නාහූ ඉතා ස්වල්පවූ නොකළමනාසැප උපදවා විසුවෝ වේදැයි වදාරා දැන් තෝ වුකලී කිසිභයක් නොකළේ වේදැයි වදාරා එඹල මහණ පැවිදිවූවහු විසින් කාය වාක් මනඃ යන වාරත්‍රයෙන්ම සිහි ඇතිව විසුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ භවයෙන් ප්‍රතිච්ඡන්නවූ ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස කුරුරට ඉඳිපත් නුවර ධනංජය නම් රජ්ජුරුවන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන්කුස පිළිසිඳගත්සේක. දසමස් පිරී මව්කුසින් බිහිව සඳමඬලසේ වැඩී සත්ඇවිරිදි වයසට පැමිණ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් කෙරෙහි නුවනැතිව සියළුසිල්ප ඉගෙණ නිමවා අවුත් පියරජ්හු විසින් යුවරජ තනතුරෙහි සිටුවනසේක් කල්යාමකින් පියරජහුගේ ආයාමෙන් රාජ්ජයට පැමිණසේක් දශධර්මයෙන් යුත්තව කුරුධම්ම ජාතකයෙහිදී වාසයකරණ සේක. එසේවසන්නාවූ බෝධිසත්වයන් වහන්සේ අඛණ්ඩකොට පංචසීලය රක්නාහූ බෝධිසත්වයෝ මතුනොවන්නාහූය ඔහු කවුරුදැයි යත් රජ්ජුරුවෝය, රජ්ජුරුවන්ගේ මෑනියෝය, අගමෙහෙසුන් බිසව්ය, යුවරජ්ජුරුවෝය පුරෝහිත බමුණාය. යටුකම්කරණ අමාත්‍යයෝය, රථාචාරියාය, සිටානෝය. බඩ සැලමනන අමාත්‍යයයා, දොරටුපාලයාය, ඒ නුවර රූපශ්‍රීන් හොබවා ඇවිදිනා වෛශ්‍යයා මෙසේ කියන එකොළොස් දෙන කුරුධම්ම යයි කියන ලද පංචශිලය අඛණ්ඩකොටරක්නාහ, රජ්ජුරුවෝද නුවරවාසල්දොරද නුවර මධ්‍යයෙහිය රජගෙය දොරකඩය යන මේ ස්ථානයෙහි සඳහන්කරවා දවස සලක්‍ෂයක් බැගින් ධනවියදම්කොට දඹදිව සියළු සත්වයන්ගේ නගුල් උඩබඳවා සියළු යාචකයන්ට දන්දෙන්නාහූය. මෙසේ දන්දෙන ඒ රජ්ජුරුවන්ගේ දානාධ්‍යාසයත් දන්දෙන නියාත් අඛණ්ඩකොට සිල්රක්නානියාත් සියළු දඹදිව පැතිර ගියේය. එසමයෙහි කළිඟුරට දන්තපුරනුවර කලිගු රජ්ජුරුවන් රාජ්ජය කරණ සමයෙහි උන්ගේ රට බදමානයෙහි වැසිනොවැස දුර්භික්ෂා භය උපන නුවර විපත්තිය නිසා මනුෂ්‍යයන්ට රෝග භය උපන, දුර්භික්ෂ භයින් මළාවූ සත්වයන් නිසා අමුනුෂ්‍ය භය උපන, මේ තුන් භය නිසා මනුෂ්‍යයෝ දුක්ඛිතව ගොසේ රැකීගන් නා කිසිම උපායක් නොලදින් දරුබිලිඳුන් අත් අල්වාගෙණ ප්‍රෙතයන්සේ ඇත මැත ඇවිදිනාහ. මෙසේ සියළු නුවරවාසීහුද එක්ව සඳවක් රාජාංගනයෙහි රැස්ව ශබ්දපවත්වා කොලාහළකළාහ සිව්මැදුරු කව්ළුව සමීපයෙහි සිටියාවූ රජ්ජුරුවෝ ඒ කෝලාහළ අසා කුමන කෝළාහලයෙක්දැයි විචාළාහ. ඒ අසා සිටියවූ අමාත්‍යයෝ කියන්නාහූ මහරජ්ජුරුවෙනි මේ ජානපදයෙහි තුන්භයෙක් උපනැයි රටටවු විපත්තිය තත්වූ පරිද්දන් කීවාහ. රජ්ජුරුවෝ එපවත් අසා ඊට මා විසින් කුමන කටයුතුදැයි අමාත්‍යයන් අතින් විචාළාහ. මහරජ වැසිවස්වා දුර්භික්ෂ භයසංසිඳුව මැනවැයි කිහ. මෙසේ භය පැමිණකල පුරාතනයෙහි රජදරුවෝ කෙසේ වැසි වස්වද්දැයි කීහ. මහරජ දන් දී සිල්රැක ගර්භගෙවල හිතන ඇතිරියෙහි සත් දවසක් වැසිවස්වාගත නුහුනුවාහ. රජ්ජුරුවෝද දෙවෙනිවත් අමාත්‍යයන්ට කියන්වාහූ මම කළ මනායක් පරිත්‍යාග කොට සිල්සමාදන්ව පේවස වැසත් වැසිවස්වාගත නුහුණුයෙමි නැවත කුමක්

SANHIDA LANKA

කෙරෙම්දැයි කීහ. අමාත්‍යයෝ කියන්නාහූ මහරජ්ජුරුවෙනි ඉදිපත් නුවරට යවා ධනංජය කොරව්‍ය රජ්ජුරුවන්ගේ අංජනොපමවූ මංගල හස්තියෙක් ඇත. ඒ ඇතුන්ගෙන්වා ගන්නාම්හ වැසිවසිති කීහ. රජ්ජුරුවෝ චතුරංගිණී සේනාවෙන් හා සංචප්‍රකාර බලයෙන් යුක්ත මහබලඅති රජ්ජුරුවෝය. උන්ගේ ඇතු කෙසේ ගෙන්වමෝදැයි කීහ. ඒ මහරජ්ජුරුවන් හා යුද්ධකළ මැනවැයි නැත ඒ රජ්ජුරුවෝ දන්දීමෙහි ඇළුම් ඇතිකෙනෙක ඉදින් යමක් ඉල්ලු කෙණෙක් ඇත්නම් තමන්ගේ හිස වීනමුත් කපාදෙන්නාහ. මෙසේ තමන්ගේ පස්පෑ දිස්නා ඇස් උපුටා දන්දෙන්නාහ. තමන්ගේ රාජ්ජය ඉල්ලුවත් දෙන්නාහ ඒ ඇතුගේ දෑ කියනුම්කින්දැයි කීහ. එසේකල ඇතු ඉල්වාගෙණනන්ට සමර්ථයෝ කවුරුදැයි කීහ. ඉල්වන්ට සුරුවුවෝනම් බමුණෝය. බමුණන් යවාගෙන්වාගත මැනවයි කීහ. එසේ වීනම් යහපතැයි කියා රජ්ජුරුවෝ බමුණන් අටදෙනෙකු ගෙන්වාගෙණ උන්ට නොයෙක් සම්පත් දී සිත් ප්‍රිතිකරවා ඇතුඉල්වාගෙණ එවයි කියා බමුණන් යවුහ. ඔහු අටදෙන සියළු ප්‍රසාද ලදින් තුටුපහටු සිත් ඇත්තාහූ බැගෑපත් බමුණන්ගේ දුගීවෙස් මවාගෙණ දෙපයක් තෙනක නොලැග ඉදිපත් නුවරට පැමිණ වාසල්දොර දන්සැලින් කීපදවසක් දන් කා සැතපී මාර්ගපීඩාව සන්සිඳුවාගෙණ රජ්ජුරුවන් දන්හලට එන්නේ කවරදාදැයි විචාළාහ.මනුෂ්‍යයෝ කියන්නාහූ මසකට තුන්වාරයෙක වඩනා සේක. පුරපසළොස්වකය තුදුස්වකය අටවකය ඉනුත් සෙට පුරපසළොස්වකය දන්හළ බලන්ට වඩනා සේකැයි කීහ. බමුණෝ දෙවැනිදා උදෑසන ගොසින් නැගෙණහිර වාසල්දොර සිටියාහ. බෝධිසත්වයන් වහන්සේ උදාසනම සුවඳ පැන් සොළොස්කලයකින් ඉස්සෝධා නා හා නොයෙක් රසයෙන් අග්‍රවූභෝජන අනුභවකොට සඳුන් සුවඳ ආදීවූ නොයෙක් ආභරණයෙන් හා ඔටුනු සහිත සුසැට ආභරණයෙන් ශක්‍රදේවේන්ද්‍ර විලාශයෙන් සැරහී රන්සැත් පොරොන්දු ආදීවූ සියලු හස්ත්‍යාලංකාරයෙන් සරහන ලද සර්වාලක්‍ෂණ  සම්පන්නවූ හස්තීරාජයා පිටට පැණනැගී චතුරංගිණී සේනාවෙන් හා  ආතත විතතාදීවූ  නොයෙක් ඝෝෂාවෙන් නුවර එකනින් නාදකරමින් නැගෙණහිර වාසල්දොරට වැඩ ඇතුපිටින් බැස දන්හල් වැද නායක බමුණන් කීපදෙනෙකුට තමන්වහන්සේ අතින් දන්දීලා මේ මා දුන්ලෙසට දන්දෙවයි කියාලා ඇතුපිටට නැගී දකුණු වාසල් දොරට වැඩිසේක. බමුණෝ නැගෙණහිර වාසල් දොර රැකවල් බලවත් හෙයින් රජ්ජුරුවන් දැක ගතනෙහී දකුණු වාසල්දොරට ගියාහූ එන්නාවූ රජ්ජුරුවන් බල බලා නුදුරු තෙනක සිටියාහූ ආසන්නවූ මහතානන්ට බමුණෝ අටදෙන අත්ඔසවාලා අයුරසතු බලමසතු සමාධිරයතු නිර්ව්‍යාධිරසතු භගවාන් ප්‍රියදර්ෂිණමස්තු යනාදීන් ආශිර්වාද කොට සිටියාහ. රජ්ජුරුවන් වහන්සේත් ඔවුන් දැක වජ්‍රාංකුසයෙන් ඇතු නවතා උන් සමීපයට ගොසින් පින්වත්වූ බමුණානනි කුමක් නිසා කුමක්සොයා අව්දැයි විචාරා වදාළ සේක.

බ්‍රාහ්මණයෝ බෝධිසත්වයන්ගේ ගුණවර්ණනා කරන්නාහූ මේ කුරු ධර්මජාතකයෙහි පළමුවන ගාථාවෙන් මෙසේ කියතළු මරජ්ජුරුවෙනි නුඹ වහන්සේ අඛණ්ඩකොට රක්ෂාකරණ කුරුධර්ම නමැති පංචසීලය දහම් දුන්පත් යාචකයකු ඉල්වත් නොලෙනසේක් දෝහෝයි සැකකොට ඉල්වූ යම් යම් පතක් නැත නොදෙමි කියා දෙතියි කියන කිර්තිඝෝෂාවද දස දහසක් යොදුන් දඹදිව මුදුපිට ඉසළුතෙලිත්තක්සේ සියළුදිග පැතිර ගියාසේ ප්‍රසිද්ධව ගියේය. එහෙයින් නුඹවහන්සේගේ ඇතු ඉල්වාගෙණ ආම්හයි කිහ අපගේ කලිගුරජ්ජුරුවන්ගෙන් බොහෝ වස්තු ලදුම්හ. එබැවින් අප ලත් සම්පත අපට තාවුරු වන ලෙස තෙළ ඇතු අපට දේවාවදාළමැනවැයි කීහ. ඒ අසා මහතානෝ වදාරණ සේක් තෙපි ඉදින් මේ ඇතු නිසාම වස්තුලදුනම් ඒ ලත්දෙයම යහපත මා විසින් පෙර පටන් නැතැයි කියා ආකෙණෙකුන්ට අතැයි කියා දෙනලදද නොදෙති නොසිතුව මේ සත්රුවනින් විසිතුරුකොට සරහන ලද සියළු හස්ත්‍යාලංකාරයෙන් සැරහුවන්ම දෙමිකියා බමුණන් අස්වසාලා වදාරණසේක් රාජවාහනයට යෝග්‍යවූ මේ මාගේ හස්තිරාජයා තනිකොට මා දෙති නොසිතුව මේ ඇතු පළමු පිරිමසා සිටි ඇත්වෙදුන් ඇත්ගොව්වන් පන්නයන් ආලත්ති බාන්නාවූත් මුල්වෙරියන් මේ ආදී සියලු කර්මකාරයන්ද ඕහට  පළමුකොට තබාදුන් වුත්තියන සියළු යනුමානයෙන් කිසිවකුත් අඩුනොකොට නොයෙක් කුලයෙන් සිය ගණන් මිනිසුන් සමුළුලන් පාවාදෙමි ඒ සියල්ලනුත් හස්තිරාජයාත් ඇරගෙණ තොපට කැමති තෙනකට යවයි ඇතුපිටම ඉඳ කියාලා ඇතුපිටින් බැස පියා ඇතුගේ නොසැරුනු තෙනක් ඇත්නම් සරහාලා දෙමැයි සිතා ඇතුවට තුන් විටක් පැදකුණු කොට බලනසේක් නොසැරුහුතෙනක් නොදැක ඇතුසොඬ ගෙණ බමුණන් අතපිටතබා සුවඳ පැන් පිරුණු සවර්ණාභිංකාරය ගෙන්වාගෙණ බමුණන් අත පැන් වත්කොට ඇතු දන්දී වදාළසේක. ඒ ඇතු දන්දුන් නියාවට උපමාකියත් මතු වෙස්සන්තර කළ පුලස්ති නම් හස්තිරාජයා මෙසේම ආබමුණන්ට දන්දීමට පූර්වනිමිත්ත පානාක්වැන්නැයි සිතමි. බමුණෝ පිරිවර හා සමග ඇතු දන්ලදින්  ඇතුපිට හිඳ දන්තපුරයට ගොසින් තමන්ගේ රජ්ජුරුවන්ට ඇතු පාවාදුන්නහ. ඇතු නුවරට ගෙණගියත් වැසි නොවටුයේමය ඒ වෙලෙහි රජ්ජුරුවෝ ඊට කාරණා කින්දැයි විචාළාහ. අමාත්‍යයෝ කියන්නාවූ  ධනංජය කොරව්‍ය රජ්ජුරුවෝ කුරුධර්ම කියති එසේ හෙයින් උන්ගේ රටට වැසිවස්නේය වැලිත් සෙස්සකින් නොවෙයි රජ්ජුරුවන් රකිනා කුරුධර්මයෙහි ආනුභාවයෙන් ඇතුගේබල මතුනොවෙයි කීහ. එවෙලෙහි රජ්ජුරුවෝ එබස් අසා එසේවිනම් තෙල ඇතු පාවාදිලා ඒ රජ්ජුරුවන් රක්ෂා කරණ කුරුධර්මය තෙල රන්පත ලියවාගෙණ එවයි බමුණන් හා අමාත්‍යයන් යැවුහ. ඔහු ගොස් රජ්ජුරුවන්ට ඇතුපාවාදෙවාලා නැවත කියන්නාහූ දේවයන් වහන්සේ කුරුධර්මය රක්නාසේක්ල අපගේ රජ්ජුරුවෝත් ඒ

SANHIDA LANKA

කුරුධර්මය රකින්නේ සැබෑය දන් මට ඒ සැකකෙරෙයි කීහ. එසේහෙයින් ලියාදෙන්ට නොපිළිවනැයි කීහ. රජ්ජුරුවන් එහි සැක උපදවන්ට කාරණකින්ද යත් එසමයෙහි රජ්ජුරුවෝ අවුරුද්දක් අවුරුද්දක් පාසා කාර්තික නැකතයයි යන මහ සැණකෙළියක් ඇත. එදවස් රජ්ජුරුවෝ සියළු අලංකාරයෙන් සැරහී දිව්‍යරාජ වෙශයෙන් චිත්‍රරාජයයි යන නමැති යක්ෂයෙකු සම්පයෙහි සිට සුවඳ මලින් විසිතුරුකොට සරහන ලද මල්හී සතරයක් සතරදිග විදිනාහ. එකල්හි බොහෝකලක් රජදරුවන් විසින් කොට එන චාරිත්‍රයෙක් මේ රජ්ජුරුවන් වහන්සේත් එසේම සැනකෙළි කෙළිනා දවසෙක පොකුණු තෙරකචිත්‍ර රාජයා සමීපයෙහි සිට සතරදිග මල්හී සතරයක් විදපීසේක. ඒ සතරහීයෙන් තුන්හීයෙක් දුටුහ. දියපිට විදපි හීය නොදක සිතනසේක් කිම්දෝ මා විසින් විදිනා හීය දියෙහි විදුනා මසකු ඇඟ වැදගත්දෝහොයි සැක උපදවා ගත්සේක. එසේහෙයින් ප්‍රානවධය නිසා සිලය හෙදවීනමුත් මට සැක කෙරෙයි එබැවින් මාගේ සිත ගැටුනේයි කියා දරුවෙනි පළමු අඛණ්ඩකොට මා කුරුධර්ම රක්නේ සැබැව, දැන් මට එක් සැකයෙක් ඇතැයි පිළිවෙළවූ පරිද්දෙන් දූතයන්ට කියලා යව අපගේ මැනියන් වහන්සේ කුරුධර්මය මනාකොට රක්ෂා කරණ සේක. ඔබ සමීපයෙන් ලියවාගෙණ යවයි වදාළසේක. එබවසට දූතයෝ කියන්නාහූ මහරජ නුඹවහන්සේ සතෙකු මැරුවමැනවයි යන සිතක් නැතිව එසේකල නුඹ වහන්සේට ප්‍රාණතිපාතය සිද්ධ නොවෙයි අපට කුරුධර්ම ලියාදුන මැනවයි රන්පත ලියවාගත්හ. කුමක්සේ ලියවාගත්තුදැයි යත් පාණෝ නහං තබෝබා අදිනනං නදායි තබ්බං කාමේසු මිච්ඡා න චරි තබ්බා මුසා න භනිතබ්බා මජ්ජං න පාතබ්බනති. මෙසේ ලියවාලා සිට වදාරණ සේක් තව ද මා පිට සැකමහත අපගේ මැනියන් වහන්සේ අතිනුත් ලියවා ගණුවයි කියා යවුසේක. නැවත බෝධිසත්වයන් වහන්සේ වැඳ බිසවුන් වහන්සේ සමීපයට ගොසින් දේවියන් වහන්සේ නුඹ වහන්සේ කුරුධර්මය රක්ෂා කරණසේක්ල අපට දුනමැනවයි කීහ. දරුවනි මා කුරුධර්මය රක්නේ සැබැව දන් මට එහි සැකයක් උපන එබැවින් මට ඒ දෙන්ට නොපිළිවනැයි කීහ. කුමක් පිණිස ද යත්.

බිසවුන්ගේ පුත්තු දෙන්නෙක් ඇත්තාහ. ඉදින් වැඩිමහළු පුතනුවෝ නායකරජ්ජුරුවෝය. කුඩා පුතනුවෝ යුව රජ්ජුරුවෝය. අනික් රටකින් රජ්ජුරුකෙනෙක් බෝධිසත්වයන් ලක්ෂයක් වටනා හඳුන් හරකුත් දහසක් වටනා රන්මාලාවකුත් පාක්කුඩම් පිණිස එවුහ. බෝධිසත්වයන් වහන්සේ එවසතුදෙක තමන් වහන්සේගේ මැනියන් වහන්සේට පූජා කරමියි කියා ඔහුට දෙවාපි සේක. එද බිසවුන් වහන්සේ මෙසේ සිතූසේක. මම සඳුනුත් නොගාමි මාලා වත් නොපළඳිමි මාගේ යෙහෙළින් දෙන්නාට දෙමි සිතාලා නැවත මට මෙසේවූ අදහසක් වුයේය මාගේ වැඩිමහල් යෙහෙළනියෝ සොළොස්දහසක් බිසෝවරුන්ට නායකව රජ්ජුරුවන්ට අගමෙහෙසුන්ව මා ඓශ්චර්යයෙහි පිහිටා සිටියාහ. උන් දහසක් වටිනා මාලාව දිපියම් කුඩා යෙහෙලනියෝ වනාහී අරුන්සේ උ෧සුවපත් නොවෙයි උන්ට ලක්ෂයක් වටිනා සඳුන්හරය දීපියම් සිතා දිපියා සිට නැවත සිතන්නාහූ මම කුරුධර්මය රක්ෂා කෙරෙමි උන්දෙන්නා දුක් පත්කීම් සුවපත් කිම් වයසින් උන් උන්ගේ තරම්ලෙස වේද සංග්‍රහ මැනවැයි සිතා වැඩි මහළු යෙහෙලනියන්ට දහසක් වටිනා රන්මාලාවදී කුඩා යෙහෙළනියන් ට ලක්ෂයක් වටනා සඳුන්හරය දුන්නේය අයුක්තිය කුමක් දෝහො මාගේ කුරුධර්ම දරුවෙනි ලියාදෙන්ට සැකකෙරෙමි කීහ. ඒ අසාදූතයෝ කියන්නාහූ තමා සන්තකවස්තු තමා කැමති තෙනකට දෙති එපමණකින් සීලය භේදනොවෙයි නුඹවහන්සේ මෙපමණක පවා සැක ඇතිසේක අනික් කුමක් නම් කරණසේක්ද නුඹ වහන්සේගේ සීලය ඉතා පිරිසිදුය ඉතා නිර්මලය. එබැවින් අපට නුඹ වහන්සේත් කුරුධර්ම ලියාදුනමැනවයි කීහ ඔබගෙනුත් ලියවා ගත්හ. ඉක්බිති බිසවුන් වහන්සේ කියනසේක් දරුවෙනි මා සිත සැක ඇත මාගේ යෙහෙලනියෝ යහපත්කොට කරුධර්මය රකිති. ඔබගොසින් ලියවාගණුවයි කීහ. දූතයෝ බිසව සමීපයට ගොසින් පළමු පරිද්දෙන්ම ඉල්ලුවාසේ කුරුධර්මය ඉල්ලුවාහ. ඒ අසා බිසව් කියන්නාහූ මා පළමුකොට කුරුධර්මය රක්නේ සැබැය දන් මට එහි සැකයෙක් ඇත එසේ හෙයින් දෙන්ට නොපිළිවනැයි කීහ. ඒ කවරේදැයි යතහොත් එක් දවසක් බිසව් සිව්මැදුරු කව්ළුව සමීපයෙහි සිටියාහූ ඒ නුවර පැදකුණුකොට යන රජ්ජුරුවන් පසු කුඹයේ උන් යුවරජ්ජුරුවන් දක පිළිබඳසිත් ඇතිව සිතන්නාහූ මම ඉදින් සහවාසයෙන් එක්සිත්ව විසින්නම් මතු රජ්ජුරුවන්ගේ ආයාමෙන් රාජ්ජයෙහි පිහිටියේ වීනම් මා අගමෙහෙසුන් තනතුරේ තබා රකියි සිතූහ. එසේ හෙයින් මම කුරුධර්මය රකිමින් සිට සස්වාමිකව කෙළෙසුන් වසඟව අනුන් සන්තක පුරුෂයා මූන බැලිමි. එසේහෙයින් මාගේ සීලයට අන්තරාය විඳෝහෝයි සැකකෙරෙමියි එබැවින් ලියාදෙන්ට නොලිළිවනැයි කීහ. ඒ අසා දූතයෝ  කියන්නාහූ ස්වාදියනියෙනි අනාචාරනම් සිතින් සිතූ පමණකින් සිද්ධනොවෙයි නුඹ වහන්සේ මෙපමණක පවා සැක උපදවනදද මෙපමණකින් සිලභේදය නොවෙයි ලියාදුනමැනවැයි උන්දැගෙනුත් කුරුධර්මය රන්පත ලියවා ගත්හ. ලියාදීසිට කියන්නාහූ කුඩාවරුනි මා සිත සැක ඇත යුවරජ්ජුරුවෝ යහපත්කොට කුරුධර්මය රක්ෂාකෙරෙති උන්දෑ සමීපයට ගොස් කුරුධර්මය ලියවාගණුවයි කීහ. දූතයෝ උන්සමීපයට ගොස් කුරුධර්මය අපට ලියවාදුන මැනවැයි කීහ. යුවරජ්ජුරුවෝ කියන්නාහූ එක් දවසක් පෙරවරු රාජසේවයට යන්නාහූ රථයකින් ගොසින් රාජාංගනයට පැමිණ රජගෙයිදී කා රජගෙයි ලගිත්නම් රථයටදෙන බාන්ආදීවූ රථෝපකරණ රථය ඇතුලේ ලවාපියා රජගෙට වදනාහ. ඒ සලකුණෙන් සේනාව සිතන්නෝ යුවරජ්ජුරුවෝ අද රජගෙයින් කා බී එහිම ලගිනාහයි කියා සියළු සේනාව

SANHIDA LANKA

තම තමන්ගේ ගෙවල්ලැග පාන්වූකල අවුත් රජගෙයින් ඒ රජ්ජුරුවන් පිටත්වන්ට කවරවිටදෝහෝයි පෙරමග බල බලා සිටිනාහ. රථාචාරියා දෙවන දවස් රථය සරහාගෙණ පෙරමග බලා බලා සිටිනේය ඉදින් රජ්ජුරුවන් වහන්සේ දූන් දූකපියයා එම් සිතා රජගෙට වදිනාසේක් වීනම් එකැට බාන් ආදීවූ රථොපකරණ පිටත තබා වඩනාසේක. ඒ සලකුණෙන් සියළු සේනාව දූන් දූන් වඩිනාසේකැයි රථය සරහා රාජංගනයෙහි එකසීම සිටිනාහ එක් දවසක් රථයෙන් මෙලෙස ගොසින් රාජංගනයට බැස දූන්ම එම් යන සිතින් මෙතෙක් දවස්කර සංඥාව සේනාවට නොහඟවා රජගෙට වැඩියාහ. ඒ ඇසිල්ලෙහි මහා මේඝයක්නාගා වසින්ට පටන්ගත රජ්ජුරුවෝ වැසිවස්නා දූක නොයවයි කියා යුවරජ්ජුරුවන්ට සමුදුන්හ. ඒ වෙලෙහි රජ්ජුරුවෝ රජගෙයිදීම කා බී රජගෙයිම සැතපූනාහ. කැටිව ගිය සේනාව දූන් එනසේකැයි පෙරමග බලබලා සිටියාහූ තුන්යම රාත්‍රියෙහි සිටිවනමසිවපන්කළහ. ඒ රජ්ජුරුවෝ දෙවැනි දවස් පාන්වූකල රජගෙන් පිටත්වූවාහූ සේනාව තෙම් තෙම් සිටියාදූක සිලයට අන්තරායවූ සැටියයි සිතින් සැක උපදවා ගත්හ. එසේ හෙයින් දූතයන්ට කියන්නාහූ මා පළමු කුරුධර්ම රක්නේ සැබැව දූන් එය වනාහී සැකයෙක් ඇත තොපට ලියාදෙන්ට නොපිළිවනැයි මේ කාරණය වූ පරිද්දෙන්ම කීහ. ඒ අසා දූතයෝ කියන්නාහූ දේවයන් වහන්ස නුඹ වහන්සේ මේ සේනාව මෙසේවූ පීඩාවකට පැමිණෙත්වයි සිතා කළදෙයක් නොවන පසු නුඹ වහනසේගේ සීලයට අන්තරායනොවෙයි මෙපමණකපවා සැක උපදවන ලද සිලය ඉතා පිරිසිදුය අපට කුරුධර්මය ලියාදුන මැනැවයි කියා උන්ගෙනුත් කරු ධර්මය රන්පත ලියවා ගත්තාහ. ලියාදී කියත්තාහූ හෙවත් මා සිත සැකයෙක් ඇත්මය පුරෝහිත බමුණානෝ යහපත්කොට කුරුධර්මය රක්ෂාකෙරෙති උන්ගෙන් ලියවාගනුවයි කීහ. දූතයෝ උන්සමීපයට ගොසින් කුරුධර්මය උන්ගෙනුත් ඉල්වූහ. උයිත් තමන්ටම උපන් සැකය කියන්නාහූ මම එක්දවසක් රාජ්ජසේවයට යන්නේම අනික් රටකින් අපගේ රජ්ජුරුවන් වහන්සේට පාක්කුඩම් පිණිස එවන ලද ලහිරුමඬලක් සේ ඉතා සෝභමාන වූ රථවාහනයක් අතරමගදී දූක මේ රථය කාගේදූයි විචාරා රජ්ජුරුවන් වහන්සේට ගෙණ රථයකැයි අසා සිතන්නාහූ මම වයෝවෘද්ධයෙම් අපගේ රජ්ජුරුවෝ රථය මට දිපුනම් සුවසේ රථයට නැගීගණ ඇවිදිනෙම් වේදූයි සිත සිතා ගොසින් රජ්ජුරුවන්වහන්සේ ලඟ සිටියාහ. එපමණකින් රථය එවිටම ගෙණවුත් රජ්ජුරුවන්ට දූක්වූහ. රජ්ජුරුවෝත් රථය ආචාරීන්ට දෙවයි කියා කීහ. පුරෝහිතයානෝ නොයිවසූහ. නැවතත් අරගණුවයි කීවත් නොගිවිස්සේමය, කුමක්හෙයින්ද යත්.

මා කුරුධම්ම රක්නා තැනැත්තාහූ අනුන්සන්තක වස්තුවෙහි ලෝභය ඉපදවූයේ ඉතා නපුර මාගේ සීලය බිඳූනු සැටියයි මෙපමණක් සඳහන්කොට පියා කුඩාවරිනි මාගේ සීලයෙහි මෙබදූ සැකයෙක් ඇත එබැවින් දෙන්ට නුපුළුවනැයි කීහ. එබසට දූතයෝ කියන්නාහු යමකට ලොභකළ පමණකින් සිල් බිඳෙන්නේ නොවෙයි නුඹවහන්සේ මෙපමණක් පවා සැක කරණසේක් අනික් පවත් කරණසේක්දූයි කියා උන්ගෙනුත් කුරුධර්මය රන්පත ලියවා ගත්හ.

තවද මට එකී සැක කෙරෙති යි එඹල රථාචාරීයානෝත් කුරු ධර්ම රක්ෂාකරන්නේයයි උන් ලඟට ගොසිනුත් ලියවා ගනුත් යහපතැයි කීහ. ඒ දූතයෝ ගොසින් ඔහු අතින් කුරුධර්මය අපට ලියවා දුන මැනවැයි ඉල්වූහ. උයිත් කියන්නාහූ කුරුධර්මය මා රක්ෂා කරන්නේ සැබැව, මෙයිදූ සැකයෙක් ඇතැයි කියා ඒ සැකය කියන්නාහූ එක් දවසක් පෙරවරු රජ්ජුරුවන් රථයෙන් උයනට වඩගෙණ ගියෙමි. රජ්ජුරුවොත් දාවල් දවස උයන් කෙළි කෙළපියා සවස නික්ම රථයට නැන්ගාහ. රථයෙන් අවුත් නුවරට නොවදනා තුරු හිරු හස්තයට ගියේය. ඒ ඇසිල්ලෙහි වැස්සෙක් නැගීය රජ්ජුරුවන් වහන්සේ තෙමෙනසේක්දෝහෝයි හයින් රථය අදනා හසුන්ට තරව කැවුටුසන්දී හයගන්වා ලුහුබඳවාලිම් රථාසවායෝකුමක් බවත් නොදක්නාහූ වහාවහා දිවයත්හ. එතැන්පටන් උයනට යනකලත් එතනට පැමිණිකලත් කැවුටුසන් දූන්නත් නුදූන්නත් වහවහා දිවන්නාහ. ඒ තිරිසන් සත්වයෝ කුමක්නිසා මෙලෙස දිවන්නේදූයි යතහොත්, ඒ කාන්තයෙන් එතන  හයකටයුතු නිසිකාරණයක් ඇතැයි සිතා අසුදිවන්නාහ මම හසුන් හයගන්වන පිණිස කලදෙයක් නොවෙයි එදවස් රජ්ජුරුවන් තෙමුනැයි මට වරදක් නැත මම අදථානයෙහිදී ඉතා සුසික්ෂිත අසුන්ට තරුව කැවිටියන්දී හයගන්වා කොටළු නොදූන්ම නිසා එතනට ආ යම්විටකම ඒ ස්ථානයහිම කුමක් නිසාවූ හයෙක්දෝහෝ වහවහා දිවෙමින් පීඩාවට පැමිණෙති, මම කුරුධර්මය රක්නාතැනැත්තෙම් මේ කාරණය නිසා මාගේ කුරුධර්මය නැමති සීලය දෙන්ට බැරියයි කීහ. ඕහට දූතයෝ කියන්නාහු මෙපමණකට පවා මෙසේ සැකකරන්නා හූ  අනික් පවක්කෙසේ කරව්දූයි උන්ගෙනුත් කුරුධර්මය රන්පත ලියවාගත්හ. එසේ වී නමුත් තවසැක ඇත. මෙනුවර සිටානෝ අඛණ්කොට කුරුධර්මය රකිති උන්ගෙනුත් ලියවාගණු වයි කීහ. දූතයෝ සිටානන් ලඟට ගොස් නුඹරක්නා කුරුධර්මය අපට දුන මැනවැයි ඉල්වූහ.

SANHIDA LANKA

සිටානෝ කියන්නාහූ එක් දවසක් මම ඇල්කෙත උඩුදරාබිම්යන්නේ මාගේ කෙත්වත් බලාපියා නැවත ගෙට එන්නෙම් මේ ඇල්කාවලින් මාලාවක්සේ ගොතා බඳවාගණිමැයි සිතාඑකම කරල්මිටියක් ගන්වාගෙණ ඒ දවස්පටන් මෙසේවූ අදහසක් මටවූයේ ඒ ඇල්කෙත රජ්ජුරුවන්ටත් මටත් අඳයට කළදෙය එසේවූ තැනින් අනුන්සන්තක කරල්මිටක් මා ගෙන්වා ගනලදහෙවත් මම කුරුධර්මය රක්ෂාකෙරෙම් එබැවින් මාගේ සීලයට

අන්තරායවිදෝහෝයි කියා මාගේ කුරු ධර්මය මට දෙන්ට නොලිළිවනැයි කීහ. දූතයෝ කියන්නාහූ සිටානෙනි නුඹසොරසිතින් කලදෙයක් නොවන හෙයින් මෙපමණක් නිසා අදින් නාදනය සිද්ධනොවන්නේය. මෙපමණක සැකඋපදවන්නාවූ නුඹ වහන්සේ අනික් පවක්නම් කෙසේ කරණසේක්ද නුඹ වහන්සේගේ සීලය ඉතා පිරිසිදු යයි කියා උන්ගෙනුත් කරුධර්ම රන්පත ලියවාගත්හ එසේවී නමුත් මට සැක ඇත බඩසල් මනන්නාවූ අමාත්‍යයෝ යහපත්කොට කරුධර්ම රක්ෂා කෙරෙයි ඔහු ලඟටගොස් කරුධර්මය ලියවා ගනුවයි කීහ. දූතයෝ ඔහු සමීපයට ගොස් නුඹ රක්නා කුරුධර්මය අපට දුනමැනවැයි කීහ. ඒ මනන්නානෝද තමන් සිතට උපන් සැක කියන්නාහූ එක් දවසක් කොටගෙයි දොරඉඳ රජ්ජුරුවන්ගේ භාණ්ඩාගාරයට වී මනන්නාහූ නොනිමි චිත්ගෙණ සන්ලුවාහ වි මැන නොනිමෙන තුරු වැස්සෙක් වසින්ට පටන්ගත. අමාත්‍යයා මිනුවියෙහි සන්ගැන මෙතැකිය කියා මා සන්ලු වී අසවල් වියයි සලකුණක් නොකොට වීයෙහි එක්කොට සිහිනැතිව වෙරයතුරුලා පියවහා දිවගෙණ ගොසින් හිඳ සිතන්නාහූ සන්ළු මිනුවියෙහි එක්කෙළෙන්නම් නොමිනු වියෙහි එක්කෙළෙම්දොහෝය සිතා මිනු වියෙහි එක්කෙළෙන්නම් රජ රජ්ජුරුවන් වහන්සේගේ වී වඩනේය. සිටානන්ගේ වි නස්නේය. වැලිත් මම කුරුධර්මය රකිමි. මාගේ ගුණ ධර්මය බිඳිනිදෝහෝයි සිතා මේ පමණක් නිසා මම කුරුධර්මය දෙන්ට බැරියයි කියෙමියි කීහ. ඕහට දූතයෝ කියන්නාහූ තොපගේ සොරසිතක් නැත, මේ පමණකින් අදින්නාදානය සිද්ධි නොවෙයි මේ පසණකට මෙසේ සිතන නුඹට අනික් කවර දවසෙක පාපයක් කරණදදූයි කියා උන්ගෙනුත් කුරුධර්මය ලියවා ගත්හ. එසේ වී නමුත් මට සැක ඇත. මේ නුවර වාසල බලන දොරටුපාලයා යහපත් කොට කුරු ධර්මය රක්ෂා කෙරෙයි ඔහු ගෙනුත් ලියවා ගණුවයි කීහ. අමාත්‍යයෝ ගොසින් ඔහු ගෙනුත් කුරුධර්මය දුනමැනවයි ඉල්ලූහ. ඒ තෙමේ එක් දවසක් වාසල් දොර වසන්නේ මෙතෙක් දවස් සේම තුන්විටක් අඬගා කියා දොර වසන්ට සිටි කලට ඒ නුවර එක් දිළිඳු මිනිසෙක් තමාගේ බාලනඟක් කැඳවාගෙණ වල දරපළා සොයා ගියාහූ නැවත අවුත් හඬගෑ ශබ්දය අසා නැගනියන් කැඳවාගෙණ වහා අවුත් වාසල් දොරට පැමිණ දොර ඇරපියවයි කීව. උන්ට දොරටුපාලයා කියන්නේ වාසල අගුල ලන නියාව දූන දූන තාගේ අඹුව ඇරගෙණ වල කෙළ ඇවිද පියා දූන් ඉඳ කුමට අයිදූයි කීය. ඒ දුගියා කියන්නේ ස්වාමීනි එසේ නොකිව මැනව, මාගේ බිරින්දයෙක් නොවෙයි මාගේ නැගනියෝයයි කීහ. දොරටුපාලයාද එවෙලෙහි සිතන්නේ තමා අකාරණයෙක මෙලෙස කිවයි සිතා මා විසින් නොකිවමනා බසක් කියාපිමි, ඔහුගේ නඟා ඔහුගේ අඹුවයයි නො දූන කිමි. මම වූ කලී කුරුධර්මය රකිමි. මේ කාරණය නිසා මාගේ කුරු ධර්මය බිඳිනැයි මට සැක ඇත, ලියා දෙන්ට නො පිළිවනැයි කීහ. දූතයෝ කියන්නාහූ තොපි උන්ගේ නඟා නියාව දූන දූන කී දෙයෙක් නොවන හෙයින් තොපගේ සීලය භේද නොවෙයි. මෙපමණක පවා සැක කරන්නාහූ අනික් වරදක් කෙසේනම් කරවුද?. ඉන් අපට දූනුනු වරදෙක් නැතැයි කියා උන් ගෙනුත් කරුධර්මය රන්පත ලියවාගත්හ. එසේ වී නමුත් මාගේ සිත සැක ඇත. මෙනුවර වසන්නාවූ වෛශ්‍යා දූ යහපත් කොට කරුධර්මය රකිනිය ඔබ ගොසින් උන්ගෙනුත් ලියවා ගනුවයි කීහ. උන් ලඟට ගොසින් කුරුධර්මය අපට දුන මැනවයි කියා ඉල්වූහ. ඒ වෛශ්‍යා දූත් තමා සිතට උපන් සැකයක් කියන්නී මටත් සැකයෙක් ඇත. දෙන්ට නො පිළිවනැයි කීහ. ඒ කවරේදූයි යතහොත් මේ වෛශ්‍ය දූව යහපත් කොට කරුධර්මය රක්නා නියාව ශක්‍රයෝ දූන තමන් ඉඳුරා පරීක්ෂා කොට පියන පිණිස ඈ සමීපයට ලදරු වූ පුරුෂ වේසයක් මවාගෙණ මසුරන් දහසක් දීලා තමාගේ දිව්‍යලෝකයටම පලා ගියේය. ඌ ගිය තැනැත්තෝ තුන් අවුරුද්දක්ම නො අවාවාහූය. ඒ වෛශ්‍යා දූ තමාගේ සීලයට අන්තරාය වේදෝ යන භයින් තුන් අවුරුද්දක් මුලුල්ලෙහි අනික් පුරුෂයකු අතින් මස්සක් අකක් තබා බුලත්පතක් පමණකුත් නොගත්තීය. ඕ තොමෝ දවසින් දවස අය මුඛයෙන් නැතිව ඇති දෙය වියදම් වීමෙන් තමාගේ තමාගේ ඇති සම්පත්තිය වියදම් වීමෙන් පිරීහි දුක් පත්ව ගොස් සිතන්නී මට දහස දිලා ගිය පුරුෂයා දූන් තුන්අවුරුද්දක්ම නො ඇයේය. එසේ හෙයින් මම ඉතා දුක් පත්ව දැන් මාගේ බඩ පමණකුත් පැදගත නොහෙමි. මෙසේ ඉඳ නස්නට නොලිළිවන. අධිකරණ නායකයන් ලඟට ගොස් මේ බව කියා දවස් හැරගැන්ම යහපතැයි සිතා අධිකරණයට ගොස් මුදලිවරිණි . මට මසුරන් දහසක් දීලා පුරුෂයෙක් ගියේය. මෙවකට තුන් අවුරුද්දක් උන් මළබවත් උන් බවත් නොදනිමි, එබැවින් බැහැරින් මා ලැබගන්නා දෙයක් නැති බැවින් දූන් බඩ පමණකුත් පැදගත නොහෙමි. කුමක් කෙරෙම්දූයි කීහ. උන් තුන් අවුරුද්දක් නොආ කල කුමක් කරවුද?. මෙතැන් පටන් ලත්දෙයක් ඇරගෙණ රැකෙවයි කීහ. අධිකරණයෙන් වරලදින් නික්ම යන තැනැත්තියට එක් පුරුෂයෙක් දහසින් බැඳි පියල්ලක් දික් කොට ලීහ. ඒ ඇරගන්ට යයි අත දික්කරන්නා හා ම ශක්‍රයෝ අවුත් ඉදිරියෙහි සිටියාහ. එ වෙලෙහි වෛශ්‍යා දූ කියන්නී මෙතනට යටගිය දවස තුන් අවුරුද්දකින් ඔබ්බේ මට දහසක් දිලා ගිය පුරුෂයා අවුත් සිටිනේය. තාගේ රණින් මට ප්‍රයෝජන කිම්දූයි කියා දික්කල අත අයාගත්තහ. එවෙලෙහි ශක්‍රයෝ තමන්ගේ දිව්‍යාත්ම භාවයෙන් සවර්ණාභරණයෙන් සැදී පැහැදී ලහිරු රැස්ව ගියාහ. ශක්‍රයෝ ජන සමාගමෙහි කියන්නාවූ මම මෑ විමසන පිණිස තුන් අවුරුද්දකින් ඔබ්බේ මෑට මසුරන් දසක් දීලා ගියෙමි. මේ දූතුරෙහි මෑ රක්නා කුරුධර්මයෙහි මා දුටු කිසි අඩුවෙක් නැත. එබැවින් සිල් රක්නවුන් විසින් මෙලෙස රැක්ක යුතුයයි කියා සියල්ලවුන්ට අවවාද දිලා ඈගේ ගෙය සත්රුවනින් පටන් නො පමාව සීලය රක්ෂා

SANHIDA LANKA

කරවයි උන්ට අවවාද කියා තමන්ගේ දිව්‍යලෝකයට ගියාහ. ඕ තොමෝ මේ කාරණය නිසා එකකුගෙන් ගත් අල්ලස් නොවරදවාම අනිකකු දික්කල වස්තුවට අත දික්කෙළෙමි. මේ කාරණය නිසා මා රක්නා සීලය නැසී ගියා දෝහෝයි සිතා නො දෙමි කීහ. එවෙලෙහි ඈට දූතයෝ කියන්නාහු අත දික්කල පමණින් සිල්බිඳි නොයෙයි තොපෙගේ සීලය ඉතා පිරිසිදුයයි ඔවුන්ගෙනුත් කුරුධර්මය රන්පත ලියවා ගත්හ. මෙසේ එකොළොස්දෙනා රක්නා වූ සීලය රන්පත ලියවාගෙණ දන්තපුරයට ගොසින් කලිඟුරජහට ඒ රන්පත දීලා එපවත් වූ පරිද්දෙන් කීහ. එතැන්පටන් රජ්ජුරුවෝත් ඒ කුරු ධර්මයෙහි ඇදහිලි ඇතිව අඛණ්ඩ කොට පංඥශීලය රක්නාහ. ඒ සීලයෙහි ආනුභාවයෙන් කලිගුරට දනව් බිඳ මානයෙහි වැසී වැසීපීය. ඒ රට උපන්නාවූ තුන්භයක් සන්සිඳි සියලු රට කිසි භයක් නැතිව ඉතා නිරාකූලව බත් බුලත් ආදීවූ සියළු සමාපත්තින් සමුර්ධිවිය. බෝධිසත්වයන් වහන්සේ දිවිපවත්නා කල් මුළුල්ලෙහි දන් පින් සිල් රක්ෂා කිරීම් ආදීවූ සියළු සුචරිතයෙහි යෙදී ජීවිතාවසානයෙහි දෙව්ලොව ගියහ යි වදාරා චතුරාර්ය සත්‍ය ප්‍රකාශ කොට කුරුධර්ම දේශනාව නිමවා වදාළ සේක. ඒ බණ අවසානයෙහි බොහෝ දෙනා සතරමග සතරඵලයට පැමිණියාහ. එසමයෙහි කුරුධර්මය රැකී එකොළොස්දෙනා මූ මූ යයි වදාරණ සර්වඥයෝ

ගණිනා උප්පලවණ්ණා ච, පුණ්ණො දොවාරිකො තදා.

රජ්ජුගාහො ච කච්චානො දොණමාතාවච කොළිතො

සාරිපුතෙතා තදාසෙට්ඨී අනුරුධො ච සාරථී

බ්‍රහ්මණ කස්සපො ථෙරෝ උපරාජා නන්ද පණ්ඩිතො.

මහෙසී රාහුලමාතා මායාදේවි ජනෙත්තියා

කුරුරාජා බෝධිසතෙතා එවං ධාරෙථ ජාතකං.

එම්බා මහණෙනි, එසමයෙහි ගණිකා නම් වෛශ්‍යා දූ මෙසමයෙහි වමත්සව්වූ උපුල්වන් මහාස්ථවිරිය, එසමයෙහි දොරටුපාලයා නම් දූන් පූණ්භද්‍ර නම් මහා ස්ථවිරයෝය. එසමයෙහි යටුවම කළ අමාත්‍යයා නම් දූන් කසයින් මහා ස්ථවිරයෝය. බඩසැල අමාත්‍යයා නම් දූන් මුගලන් මහා ස්ථවිරයෝය. එසමයෙහි සිටානෝ නම් දූන් ශාරිපුත්‍ර ස්ණවිරය, එසමයෙහි රථාචාර්යයා නම් දූන් අනුරුද්ධ මහාස්ථවිරය, එසමයෙහි පුරොහිත බ්‍රාහමණයා නම් දූන් මහාකාශ්‍යප ස්ථවිරය, එසමයෙහි යුවරජ්ජුරුවෝ නම් දූන් නන්දමහාස්ථවිරය. එසමයෙහි අගමෙහෙසුන් නම් දූන් රාහුල මාතා වූ යසෝධරා මහා ස්ථවිරය, එසමයෙහි රජ්ජුරුවන් වහන්සේගේ මෑනියන් වහන්සේ නම් දූන් මහාමායා දේවිය. එසමයෙහි කරු රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදු වූ මම්ම වේදයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# රෝම ජාතකය

තවද ආකාශයසේ අප්‍රමාණ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වා වදාළ සේක. මෙහි වර්ථමාන කථාව බොහෝ ජාතක වල පෙණෙන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බොහෝ පරවියන්ට නායක ව පරවි ව උපන්සේක. ඒ පරවියන් වසන්නාවූ වන සමීපයෙහි තාපස කෙණෙක් වාසය කරන්නාහ. ඒ තාපසයන් කරා බෝධිසත්වයෝ පරවියන් පිරිවරා ගොසින් තාපසයන් දැක වැඳ පුදා යන්නාහ. ඉක්බිති තාපසයෝ ඔබ්බකට ගියාහ. ඒ පන්සල අනික් කූට තාපස කෙණෙක් වාසය කරන්නාහ. බෝධිසත්වයෝත් ඒ තාපසයන් කරා ගොස් තාපසයන් වැඳ පුදා බණ අසා ඒ පන්සල් මලුයෙහි ගොදුරු කා යන්නාහ. මේ නියායෙන් පණස් අවුරුද්දක් ගියේය. එක් දවසක් උපාසක වරු පරවි මස් රසයක් තාපසයන්ට පිළිගැන්වූහ. තාපසයෝ පරවි මසෙහි තෘෂ්ණාව ඇතිව මේ කුමන මස් දැයි විචාරා පරෙවි මසැයි කී පසු එසේ වී නම් තොප ඇම විසින් මට සාල් ලුණු මිරිස් ආදී වූ දෙය ගෙන්වා දෙවයි කියා ගෙන්වා ගෙණ පොල්ලකුත් සැස වල්කලා අස්සේ තබාගෙණ පරවියන් එන පෙරමග බල බලා උන්නාහ. ඒ වෙලාවට බෝධිසත්වයෝ බෙහෝ පරවියන් පිරවරා තාපසයන් කරා ආහ. තාපසයන් උන්නාවූ විලාසයෙන්ම බෝධිසත්වයෝ අද තාපසයන් ඉදිනා නියාව අමුත්තක් ඇත මැනව, කුමක් දෝහයි සිතා යටිසුලගට ගොස් අඝ්‍රානය කොට තාපසයන් පරවිමස් කෑ නියාව දැන තාපසෝ පරවිමස් කා අප මරන්ට උත්සාහ කොට ඉඳිති සිතා පන්සලට දුරුව දුරුව ගොදුරු කන්ට වන්නාහ. තාපසයෝ ඒ දැක මේ පරවියෝ මා කරා නො එති. කටයුතු කාරිය කියාලන් කොට ගෙණ මරමි සිතා කියන්නාහු ඇයි. තොප ඇම මෙතෙක් දවස් මා කරා අවුත් ලඟම ගොදුරු කන්නාහ. දැන් පණස් අවුරුද්දක් වාසය කරණුවෝද අද කවර සැකයක් තොප ඇමට දැනුදු සඳහා මා ලඟට නො එව්ද?. නැතහොත් මා අනික් තාපස කෙනෙකැයි සිතා නො එව්ද?. නැත තොපි අනික් පරෙවි මොත්තමෙක්දැයි කීහ. එබස් අසා බෝධිසත්වයෝ කියන්නාහු තොප අනික් තාපසකෙණෙකුන් සන්දාත් නොවෙයි, අනික් පරවි මොත්තමෙක් නිසාත් නොවෙයි, තා ඉදිනා ආකෘතිය අපට සැක කෙරෙයි, එසේ ගොසින් ලඟට නේන්නේ යයි කියන්නෝ මා ඉදිරි සැලැස්ම මුන් ඇම දැනගත් නියා වේදැයි සිත දුරතබා පොල්ල දමාලා ගැසීය. ඒ දමාලු පොල්ල වැරද ගිය. එවිට තාපස කියන්නේ තෙපි මාගෙන් වැරදුනවා දැයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහූ තමා ගසාම වැරුද ගියාහූ පමණක් විනා තාපසයෙනි, තෙපි සතර අපායෙන් නොවැරදුන වාදැයි කියා එම්බල තාපසය ඉනිබ්බේ තෝ මෙතන උන්නෙහි නම් උපාසක වරුන්ටත් තාගේ නුගුණ බොහෝ කොට කියමි. තෝ මෙතනින් පලායවයි කියන්නාහූ ඒ තාපසයා එවිට එතනින් පලාගියේ යයි වදාරා මේ රෝම ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි එකියන තාපසෝ නම් දේවදත්ත ස්ථවිරයෝය. පළමු විසූ සිල්වත් තාපසයෝ නම් සාරිපුත්‍ර ස්ථිවීරය, පරෙවිව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# මහිස ජාතකය

තවද අකනිටා බඹලොවසේ උස්වූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ක්‍රීඩා වඳුරෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් ක්‍රීඩා වඳුරෙක් එක් කම්පස් ඇතෙකුගේ කුම්භස්තලයට නැගී කෙළනේය. එ කියන ඇතාත් එකියන වඳුරු කෙරේ නො කිපී ඒ කෙළි ඉවසා ඉඳිනේය. පසුව එක් දවසෙක ඒ ඇතා ඔබ්බෙක බැඳ අනික් තෙනකින් අකම්පස් ඇතකු පළමු ඇතා සිටියාවූ තීලයේ බැන්දාහ, එකියන වඳුරාත් පළමු ඇතා මෙනැයි සිතා මේ ඇතා පිටට නැගෙමි සිතා ඇතු පිටට නැගී කුම්භස්ථලය මත්තේ උන්නේය. එ කියන ඇතා තමාගේ කුම්භස්ථලයෙන් වඳුරා අල්වාගෙණ දළින් ඇන පයින් මිරිකා මරා දමාපිය. මේ කථාව දම්සභාවෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි. මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි, පෙරත් එකියන වඳුරා එළෙසම කෙළේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඡයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයෝ වනාන්තරයට නුදුරු තෙනක මිගොන්ව උපන්නාහු ඇලි දුර්ග බොහෝ වූ ස්ථානයක ගසක් මුල වාසය කරන්නාහ. ඒ ගස වසන්නාවූ එක් වඳුරෙක් ඒ කියන බෝධිසත්වයන්ගේ පිට වර්චස් කරන්නේය. අඟ අල්වා කෙළිනේය. වල්පත් අල්වාගෙණ ඔන්සිල්ලා කෙළිනේය. බෝධිසත්වයෝත් ඊට නො කිපීම වාසය කරන්නාහ. ඒ අවස්ථාවේ ඒ ගස වසන්නාවූ දේවතාවා බෝධිසත්වයන්ට කියන්නේ මීමාණෙනි තොප ඇඟපත දූෂ්‍ය කොට කෙළිනාවූ වඳුරාට තොප බැණ නොනැගී ඉඳිනේ ඇයිද?. අඟවාලා ඇනපියා පයින් මිරිකා දමවයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු ඒ කියන වඳුරා මාගේ ඇඟපත එලිගෙන කුමක් කරතත් මා මුන්ට කරණ දෙයක් නැ. ඌ මැරීම නම් මට ප්‍රාණඝාතය සිද්ධවන්නේ වේදැයි කියා මා එසේ කරන්නේ නැත, අනික් මීමෙක් මෙතනට ආ නම් එනි හඬ කියා ගනුවයි කියා මා මූට කරණ දෙයක් නැතැයි කියා බෝධිසත්වයෝ කීපදවසකින්ම ඔබ්බකට ගියාහ. අනික් මීමෙක් ඒ ගසමුල වාසය කරන්ට ආහ. ඒ කියන වඳුරුත් පළමු මීමා සේම යයි සිතා පිටට පැන කෙළිනට වන. එවිට ඒ කියන මීමා වඳුරා බිමහෙලා ගෙණ අඟින් ඇන ලය පළා මැරී යයි වදාරා මේ මහිස ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි ඒ කියන වඳුරා නම් මේ කියන වඳුරා මය. මීමා නම් මේ කියන ඇතා මය. ඒ වඳුරාගේ ක්‍රීඩාව ඉවසූ මීමා නම් බුදුවූ මම්මයයි වදාළසේකී.

SANHIDA LANKA

# සතපත්‍ර ජාතකය

තවද සක්වළ අනන්ත වූවා සේ අපරියන්ත ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමහෙි වැඩ වසන සමයෙහි වහන්දෑ දෙනමක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

පඬුකය ලෝහිතකය යන සවගවහන්දෑගෙන් දෙනමක් බොහෝ භික්ෂූන් වහන්සේට නුඹ වහන්සේ අසවලුන් වහන්සේ නියාවට ගුණ නුවණ නැද්ද. නුඹ වහන්සේ අඩුව ඉදිනේ ඇයිද?. යනාදීන් ද්වේෂ උපදින්ට තිසි බස් කියා කුප්පවා තමන් වහන්සේ ලාපනත ක්‍රියාවට කරවන සේක. මෙපවත් දම්සභා මණ්ඩපයේ රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි. මා එන්නට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා මා කීවා නොගිවිස සවග වහන්දෑගේ බස් අසන වහන්දෑ නම් සතපත්‍ර පක්ෂියාගේ බස් අසා සන්තෝෂ වූ මානවකයා මෙනැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේදැයි යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක් වනාන්තරයක පන්සියයක් සොරුන්ට නායකව සොරදෙටුව වාසය කරන්නාහ. එ සමයෙහි එක් පුරුෂයෙක් දහසක් ඔබ්බකට නය දී ඒ නය එළවාගත නොහි මළ. ඔහුගේ බිරින්දදනය එළවාගත නොහී මියයන අවස්ථාවෙහි තමාගේ වැඩසිටියාවූ පුත කැන්දා කියන්නී පුත දාසක් ඔබ්බෙන් නය ඇරගත් කෙණෙක් ඇත. මා මළකළ ඒ නය තොපට නොදෙති. මා ඉන්දදී ඒ නය එලවාගෙණ එවයි පුතා නය එලවා යවිය. ඌ දෙන්නා අතින් නය එලවාගෙණ එනකලට මෑනියෝ මිය ගොසින් පුතා කෙරේ සෙනහයෙන් පුත එන ඉදිරියේ කැණහිල් බැලිව ඉපද ගියාය. පුතාත් මස්සෙන් දාස ඇරගෙණ සොරුන් ඉදිනා වනාන්තරය සමීපයට පැමිණියේය. ඒ විට ඒ කියන කැනහිල් දෙන් තමාගේ පුතු සොරුන් මරණ හෙයින් මත අවුරා යානොදී වැදහොත්තීය. ඒ කියන පුරුෂයා අවලක්ෂණ සීපාවා දැක ජිම් කියා කැට මුගුරු ආදියෙන් ගසා වනාන්තරයට ගියේය. ඒ වෙලාවට එක්තරා කැරලෙක් සොරුන්ට අසවල් පුරුෂයෙක් දාසක් ඇරගෙන එයි කියා කැරුල් ශබ්දයෙන් ඇඬීය. එවිට එ කියන පුරුෂයා තමාට යහපත් කොට ඇඬූ අඬෙකැයි සිතා කැරළා වැඳ තවත් අඬව තවත් අඬව යි කීහ. බෝධිසත්වයෝ මේ කැණහිල් ධේනුව කළ දෙයත් කැරලා කළ දෙයත් දෙකම බලා සිටියාහ. බලා සිට මෙකියන කැනහිල් ධේනුව පූර්ව ජාතියෙහි මූට මව්ව උපන් කෙනෙකුන් උවමැනව, එසේ නිසා තමන්ගේ පුතා කෙරේ සෙනෙහයෙන් අප ලඟට ආකලට මරාපියති සිතා මග අවුරා වැදහොත්තීය. මේ කියන පුරුෂයා තමා වැඩ සිතා කැණහිල් ධේනුව කළදෙය නොදන උන් මරා පහකොට පියවයි අපට හිතව තමාට විපක්ෂව ඇඬූ කෑරලාට සමාධිව වැන්දෝයයි සිත සිතා උන්කලට සොරුන් මධ්‍යයට එකියන පුරුෂයා ඇවිත් වැද ගියේය. බෝධි සත්වයෝ තුළු අල්ලවයි කියා අල්වා ගත්තාහ. අල්වාගෙණ බෝධිසත්වයෝ විචාරන්නාහූ තොප මෙතනට ආයේ කුමක් සන්දාදැයි විචාළාහ. එවිට ඒ කියන්නේ තමා මවගේ වන දූන්තැන් එලවාගෙණ එන්ට කී නිසා නය එලවාගෙණ යෙමි කියන්නා ඇයි මසුරන් දාස තොප අතදැයි විචාරන්නා ගෙණාමි කිහ. එවිට බෝධිසත්වයෝ තොපගේ මෑනියන්ගෙන් තත්වය දනුදැයි විචාරන්නා මම නොදනිමි කීහ. තොපගේ මෑනියෝ මිය ගොසින් කැණහිල්ව ඉපද අතරමගදී තොප වැලකුවෝ ඌයයි කියා ඒ තොපි නොදන අවැඩැට කළ දෙයෙකැයි සිතා උන්ව පහකොටපුව. තොපට අවැඩව අපට පක්ෂව ඇඬූ කෑරළාගේ ශබ්දය අසා තොපි සතුටු වූව. එසේ හෙයින් තොප සේ වූ අඥානයෝ නැත. එසේවූ තොප මා නසන්නේ කිම්දැයි කියා තොපට ජීවිත හානිත් අර්ථහානිත් නො කෙරෙමියි අළහයි වදාරා බුදුව වැඩ ඉඳ වදාරණසේක් යම්සේ ඒ පුරුෂයාට වැඩ කී කැණහිල්ධේනුව අවැඩ කොට අවැඩ කී කැරලා ශබ්දය වැඩ කොට සිතා විනාශයට පැමිණෙන්ට ගියේද. එලෙස යම් කෙණෙක් මා කීවා නොගිවිස මේ අඥාන භික්ෂූන් කීවා ගිවිසිකෙනෙක් ඇත්නම් මේ කෑරලා කීවා කොට විනාශයට පැමිණි පුරුෂයා මෙනැයි වදාරා මේ සතපත්‍ර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි සොරුන් පන්සියයට නායකව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළ සේක.

SANHIDA LANKA

# කූටසාක ජාතකය

තවද සත්වලෝකයෙ සේ අචින්ත්‍ය වූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා උපාසකයෙක් තමාගේ වාසස්ථානයට සර්වඥයන් වහන්සේ හා සංඝයා වහන්සේ වඩාගෙණ ගොස් දන්දී තමාගේ උයනේ දාවල් භික්ෂූන් වහන්සේ ස්වෙච්ඡාපරයේ ඇවිදිනා සේක්වයි කියා යහපතැයි කියා භික්ෂූන් වහන්සේ ඒ ඒ තෙන ඇවිදිනා කලට එක්තරා උයන්ගොව්වෙක් මල් පලාපල කඩාගෙණ එන්ටයයි පත්කොල කඩා ගොටුවිද බිම එලන්නේය. ඌගේ පිත් එලාලූ ගොටු බිම ඉඳ ඉරා දමන්නේය. ඒ දැක සර්වඥයන් වහන්සේ දූන් මතු නොවෙයි මහණෙනි පෙරත් ඒ එසේම ගොටු ඉරා දැමූයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි එක්තරා උයන්ගොව්වෙක් ගසකට නැගී උඩ ඉඳ ගොටු විද එලන්නේය. ඒ එලූ එඑවා එක්තරා වඳුරෙක් ඉරා අරිනේය. ඒ වෙලාවට එක්තරා පුරුෂයෙකු එතනට ආයේය. ඒ දැක වඳුරා අතින් විචාරන්න් ඇයි. එලූ ගොටු තා විසින් ඉරා අරින්නේ යහපත් කොට ඉදිකරන්ටදැයි විචාළේය. ඒ අසා වානර කියන්නේ මුතුන් මී මුතුන් සමයේ පටන් අවැඩට නිසිදෙයක් විනා වැඩකට නිස්සක් නො කරණ ලද එසේහෙයින් මම කුමකට ගොටු විදවා දැයි මාගේ ස්වභාවධර්ම මෙසේ කල අධර්මය තමා කියනුම් කිම්දැයි කියා වානරයාට නින්දාකොට ඔබ්බකට ගියේයයි වදාරා වඳුරා ලඟට ගිය පුරුෂයා නම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# ලාභගරු ජාතකය

තවද මාගේම දෙව්වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැරියුත් ස්වාමින් ගණයේ ලාභගරුවූ භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද්දේය.

ඒ කෙසේද යත්

සැරියුත් ස්වාමින්ගේ ගණයේ එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ සැරියුත් සාමින් අතින් ලාභ කුමන කාරණයකින් උපදවා ගතහැකිදැයි විචාළ සේක. සැරියුත් ස්වාමින් කියන සේක් යම් කෙණෙක් උමතුව වාසය කෙරෙද්ද යම් කෙණෙක් කේලාම් කියා වාසය කෙරෙද්ද, යම් කෙණෙක් නටා ගී කියා වාසය කෙරෙද්ද, යම් කෙණෙක් කටට ආවක් කියා දවස අරිද්ද, එසේවූ මේ සතර පක්ෂයේ ඇත්තෝ ලාභය ලබති කීහ. එබස් අසා මෙසේ ලබන්නාවූ ලාභයෙන් මට ප්‍රයෝජන කිම්දැයි නින්දා කොට කියා ගියහ. මේ කථාව සර්වඥයන් වහනසේට සැරියුත් ස්වාසින් දැන්වූසේක. මේ බස් අසා සර්වඥයන් වහන්සේ පළමුත් මේ ලාභයට නින්දා කොමටම ගියෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහ්නසේ ඉකුත්වත් දක්වා වදාළසේක

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය පාලනය කරණ සමයෙහි බෝධිසත්වයෝ දිසාපාමොක් ආචාරීව ඉපිද පන්සියයයක් අත වැස්සන්ට ශිල්ප උගන්වා ඉන්නා අවස්ථාවෙහි ඉන් එක් අතවැස්සෙක් දිසාපාමොක් ආචාරීන් අතින් විචාරන්නේ ස්වාමිනි ලාභය උපදවා ගන්නේ කෙසේදැයි විචාළේය. ආචාරීහු කියන්නේ යම් කෙණෙක් උමතුව වාසය කෙරෙද්ද, එසේවූ මේ සතරපක්ෂයේ ඇත්තෝ ලාභය ලභති කීහ. අතවැසි කියන්නේ ජනාපවාදය නිසා ලබන්නාවූ ලාභය නින්දා වෙයි. එසේවූ ලාභය අපට එපයි මෙසේවූ බස් අපට නොකියව මැනවයි කියා කිවයි වදාරා ලාභ ගරු ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ඒ ලාභයට නින්දා කළ අත වැස්සා නම් මේ භික්ෂුහුය. එසමයෙහි දිසාපාමොක් ආචාරීව උපන්නේනම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# සාලොහිත ජාතකය

තවද සඳූට වඩා සෞම්‍යවූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි චුල්ල කුමාරිකා පලෝභනය අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් භික්ෂු කෙණෙකුන් වහන්සේ චුල්ලකුමාරිකා යන ස්ත්‍රියකට ආලය ඇති නියාව භික්ෂූන් වහ්සේ සර්වඥයන් වහ්නසේට දැන්වූසේක් සර්වඥයන් වහන්සේ සැබෑද මහණැයි විචාරා වදාරන්නා සැබැව, ස්වාමිනි කී කල්හි පෙරත් තොපි මුන් නිසා අමුත්තන්ට බලන්නට මස්වූයේ වේදැයි වදාරා එර් කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක්තරා ගෙයක ගොන්ව උපන්නාහ. බෝධිසත්වයන්ට මහලෝහිත යයි නම් තුබූහ. බෝධිසත්වයන්ගේ මලනුවන්ට චුල්ලලෝහිතයයි නම් තුබූහ. එ කියන ගොන් දෙන්නා ඒ ගෙයි කළමනා යම්තාක් මෙහෙවරක් කොට සිටිනාහ. සාලක නම් එක් ඌරෙකු ඒ ගෙයි ඇත්තෝ වඩා තමන් කන්නාසේ බොන්නාසේ කවා පොවා වර්ධනය කරන්නාහ. එවිට චුල්ලලෝහිතයෝ කියන්නාහූ මේ ගෙයි කළමනා යම්මදෙයක් කරන්නාහු අපය, අපට තණ හා කුඩු ලති. නිකම් ඉඳිනාවූ ඌරාට නිරන්තරයෙන් සියලු කනදෑ කවා ඌව පෝෂ්‍යකරන්නාහ. අපට එලෙස නොකරන්ට කාරණා කිම්දැයි කීහ. එවිට මහාලෝහිතකයෝ කියන්නාහූ එම්බා මලඩ ඌට සියළු කනබොනදෑ ලන්නේ ඌගේ මාංශ වර්ධනවන නිසාය. මේ ගෙයි වැඩෙන කුමාරිකාව දුටුවාද? ඈ සරණපාවා දෙන මගුලේ බත්කන්ට ආ අමුත්තන්ට මාළු පිණිස කීපදවසකින් මූ මරන්නාහ. අපට ඒ කැවිල්ලෙන් කම් නැත, අපට දීර්ඝායුවට තණ හා කුඩු පමණැයි කීහ. ඊට කීපදවසකින් ඒ කුමාරිකාව සරණපාවා ගන්නා පිණිස ආවාවූ මනුෂ්‍යයන්ට ඒ කියන ඌරා කඩකඩ කොට කපා මාළුකොට ආ අමුත්තන්ට අමුතුබතට දුන්නාහ. ඒ දැක ගොන් දෙන්නා දුටුවාද සැපසේ කවා පොවා ඌරාටවූ දෑය? අපට අපගේ තණ හා කුඩුම් යහපත් වියයි උන්ට කීහයි වදාරා බුදුව වැඩහිඳ වදාරණසේක් ඒකියන ගොන් දෙන්නා ඒ ඌරාගේ කැවිල්ලට පළමුකොට නොසතුටුවූවෝ පසුව සමාධිවූවෝ වේදැයි වදාරා සාලෝහිත ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි කුමාරිකාව නම් මේ කුමාරිකාවය. එසමයෙහි ඌරා නම් මේ භික්ෂුහුය. චුල්ලලෝහිතයෝ නම් ධර්මභාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරිය. මහාලෝහිත නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# කාමවිලෝපන ජාතකය

තවද හුදුසීලයෙන් මවාලු රුවක් වැනි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පුරාන දුතියිකාව අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

මෙහි වර්ථමාන කථාව යටකී පුෂ්ප ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වණුක්මල් කඩාගිය පුරුෂයා උලපිට උන්නේය. තමා විඳිනා දුක්ඛ වේදනාවට වඩා මා මෙසේවූ නියානොදන කොයිගියේ දෝහෝයි සිතා මාගේ ස්ත්‍රී වික්ෂේප දෝහෝයි යන දුක්ඛය මට වේදනායයි සිත සිතා උන්තැනට එක් වාහනයක් කොට ඇත්තාවූ කවුඩුව මාගේ භාර්යාව වනාහී මා විඳිනා දුක්වේදනා නොදන ඔබ්බට ගියයි මා කෙරේ වික්ෂේපව සිටියි යන සෝකය මට මේ වේදනාවටත් වඩා වේදනාය එසේ හෙයින් තොපි ගොස් මා දුක්ඛයට පැමිණ නියාවත් කියලා මාගෙයි ඇඳ ඉස්දොර උපුල්මලට බඳු පැහැ ඇති සන්නාහයකුත් රන් පසළෝස්කළදකින් කරණලද පේරුස්මුද්දකුත් ශුභ්‍රවූ කසීසළුවකුත් තුබූයේ මේ වස්තු තුන ඇරගෙණ මා දුටුවාසේ ශොකනොගෙණ ප්‍රයෝජන විඳින්ට කියවයි කියා යවා එම උලපිට ඉඳම කාලක්‍රියාකොට නරකයෙයි උපනැයි වදාරාමේ කාමවිලෝපන ජාතකය නිමවා වදාළසේකී. එසමයෙහි මේ කාරණය ප්‍රත්‍යක්‍ෂ කොට දුටු නාගරාජ දේවතාවා නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# අභ්‍යන්තර ජාතකය

තවද සංස්කාර ලෝකය සේ කලපනාවට ආවිෂයවූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි යශෝධරා ස්ථවිරයන් වහන්සේට අඹ දුන් සැරියුත් ස්වාමින් අරභයා මේ ජාතකය දක්ව ලද

ඒ කෙසේද යත්

සර්වඥයන් වහන්සේ විසාලා මහනුවර කුටාගාර ශාලාවෙහි වැඩවසන සමයෙහි ප්‍රජාපති ගෝතමීන් වහන්සේ ගෑනුන් පන්සියයක් පිරිවරා කුටාගාර ශාලාවට අවුත් බුදුන් අතින් භික්ෂුණි ශාසනයට අනුදක භික්ෂූණී කරවා ගත් පසු උන්වහන්සේ උපසම්පදාව ලදින් සෝවාන්ව භාවනා උපදවා රහත්වූපසු යශෝධරා ස්ථවිරයන් වහන්සේ සිතනසේක්, රාහුල ස්වාමින් වහන්සේත් යසෝධරා ස්ථවිරයන් වහන්සේත් සිතන සේක් රාහුල ස්වාමින් වහන්සේත් මහණ වූ පසු සුද්ධෝදන රජ්ජුරුවන් වහන්සේත් අතීතවූ පසු ඉතකින් මා ඉඳිනේ කිම්දැයි සිතා සැවැත්නුවරට අවුත් ජේතවනාරාමයේ වැඩ උන් සර්වඥයන් වහන්සේ අතින් පැවිදි ඉල්වාගෙණ මහණව උපසම්බදාව ලදින් යසෝධරා ස්ථවිරීන් වහන්සේ යයි ප්‍රසිද්ධව ඉන්නා සමයේ දවස විටක් යසෝධරා ස්ථවිරින් වහන්සේ තමන් වහන්සේගෙ ග් පුත්වූ රාහුල ස්වාමින් දකින්ට රාහුල ස්වාමින් වසන්නාවූ විහාරයට වඩනාසේක. එක්දවසක් යසෝධරා ස්ථිවීරින් වහන්සේවහන්සේට බඩරුජාවක් ඇතිව රාහුල ස්වාමින් දකින්ට නොආසේක. උන්වහනසේගේ අතවැසි භික්ෂුණි කෙණෙකුන් වහන්සේ එපවත් රාහුල ස්වාමින්ට කීසේක. රාහුල ස්වාමින් තමන්ගේ මෑනියන් වහන්සේ යසෝධරා ස්ථවිරයන්ගෙන් ආඑාසු කිම්දැයි විචාරා පුතනුවන් වහන්ස බඩරුජාවක් ඇත. එසේ හෙයින් මට බොහෝ ආයසයයි වදාළසේක. ආදින් ලමන්දුනි මෙසේවූ අවස්ථාවක කරන්නේ කිම්දැයි විචාළසේක. පැනි අඹ හා සකරා කෑකල පළමුත් මේ රුජාව සමනයවෙයි කීහ. රාහුල ස්වාමිත් යහපතැයි කියා තමන්වහන්සේට පියවූ සර්වඥයන් වහන්සේ කරානො ගොසින් සුලුපිය වූ ආනන්ද ස්වාමින් කරාත් නො ගොසින් උපාධ්‍යායවූ මුගලන් ස්වාමිත් කරාත් නොගොසින් ගුරුවූ සැරියුත් සාමින් ලඟට ගොසින් ස්වාමිනි යසෝධරා ස්ථවිරයන්ට බඩරුජාවක් ඇත. පෙරත් සකිරා හා අඹ කෑකල බඩරුජා සන්හිඳෙයි එය ලබන්නේ කෙසේදැයි විචාළසේක. සැරියුත් ස්වාමින් යහපත, ලද්දමෝනම් දෙන්නමෝ වේදැයි වදාරා රාහුල ස්වාමිනුත් පස්සේලා පසේනදී කෝසල රජ්ජුරුවන්ගේ රජගෙට ගොස් රාහුල සාමණේරයන් වහන්සේ රාජඟනයෙහි සිටුවා තමන් වහන්සේ රජගෙට ගොස් රජ්ජුරුවන් ලඟ සිඟා සිටියේය. එවෙලාවටම එක්තරා උයන්ගොව්වෙක් විලිස්සගිය අඹකැනක් ගෙණවිත් රජ්ජුරුවන් අතට දීන. රජ්ජුරවෝ තමන්ගේ ස්වහස්තයෙන් අඹලොලා ශකිරා හා අඹ පාත්‍රය පුරා දුන්හ. සැරියුත් ස්වාමින් අඹ පාත්‍රය ගෙණ මෙය තොපගේ මෑනියන්ට දෙවයි කියා රාහුල ස්වාමින් අතට දුන්සේක. රාහුල ස්වාමින් වහන්සේත් ඒ අඹ ගෙණ ගොස් යසෝධරා ස්ථවිරයන් වහන්සේ අතට දුන්සේක. යශෝධරා ස්ථවිරීන් වහන්සේත් අඹ වැළඳුසේක. අඹ වැළඳූ ගමනේ බඩරුජාව ගුණය විය. කෝසල රජ්ජුරුවෝත් සැරියුත් ස්වාමින් අඹ මා ලඟදී නොවළඳා ගෙණ ගියසේක. කාට දෙන්න ගෙණ ගියසේක් දොහෝයි බලවයි පස්සේ මිනිසුන් යවා රාහුල ස්වාමින්ට දුන් නියාව හා රාහුල ස්වාමින් තමන්වහන්සේගේ මෑනියන් වහන්සේට දුන් පවත් අසා කෝසල රජ්ජුරුවෝ සිතන්නාහු ඉදින් සර්වඥයන් වහන්සේ බුදුවූ හෙයින් අපගෙන් සිඟා වළඳා ඉන්නා පමණක් මිසක් නැත් නම් චක්‍රවර්තී රාජ්ජය කරණ සේක් නම් අපි ඇමම උන්වහන්සේගේ පරිවාර වේද, චක්‍රවර්තී රාජ්ජය කරණ දවසට පරිනායක රත්නව රාහුල ස්වාමින් වහන්සේ තමන්වහන්සේගේ මෑනියන් වහන්සේට බඩ රුජාව නිසා අඹ සිඟා වැඩිසේක. අපි ඇම උපාසකව ඉඳ යසෝධරා ස්ථවිරින් වහනසේට ඇඟි නොදත්තම්හ. එසේ හෙයින් අප කළසේ නොයෙදයි කියා යසෝධරා ස්ථවිරින් වහන්සේට අඹ හා ශකිරා ඇම දවස්ම යවුහ. සැරියුත් ස්වාමින් නිසා යසෝධරා ස්ථවිරයන් වහන්සේට අඹ රසය නිසා බඩජාරු පහවූ බව දම්සභා මණ්ඩපයට රුස්වූ මාළුවරුන්වහන්සේ කිය කියා උන්තැනට සර්වඥයන්වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කවරනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි පෙරත් ශාරිපුත්‍ර ස්ථවිරයෝ රාහුල මාතාවන්ට අඹ දුන්නේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

SANHIDA LANKA

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක්තරා බමුණුගමෙක බමුණුව ඉපිද වැඩිවිය පැමිණ පඤ්කාමයෙහි ආදිනව දක සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන් පිරිවරා බරණැස් රජ්ජුරුවන්ගේ මගුල් උයනෙහි වාසය කරන්න්හ. එසමයෙහි එකියන තාපසවරුන්ගේ ගුණ තේජසින් ශක්‍රයන්ගේ පාඬු කම්ඹලශෛලාසනය හුනුවිය. ශක්‍රයෝ මා නො කැමති පරිද්දෙන්උනු වන්ට කාරණා කිම්දැයි තමන්ගේ දිවසින් බලා එපවත් දැක ඒ තාපසවරුන් මෙකීයන උයනේ නොයිඳිනා මානයක් කෙරෙමියි ඉඳිනා තැනින් උගුළුවාපු කල එක තැන ඉඳ එකඟව භාවනා කිරීම් නැතිව ඒ නියාවට අද මම ගොසින් රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසිකාවන්ට අභ්‍යන්තර නම් අඹ කෑවාහු වූනම්

චක්‍රවර්තී රාජ්ජය කරන්ට පින් ඇත්තවූ පුතනුකෙණෙකුන් උපදියි කියමි ඒ බිසවු යහපතැයි කියා රජ්ජුරුවන්ට කියති. රජ්ජුරුවෝ යහපතැයි උයන අඹගස්වල අඹ බලවති. ඒවෙලාවට මම උයනේ අඹගස්වල අඹ අන්තර්ධාන කරවා පියමි. රජ්ජුරුවෝ එවිට මේ කියන උයනේ අඹ කෑවෝ කවුරුන්දැයි උයන්ගොව්වා විචාරති. එවිට උයන්ගොව්වා තාපසවරු අඹ කෑවෝයයි කියා රජ්ජුරුවන්ට කියන්නාහ. රජ්ජුරුවෝ එවිට එසේ විනම් තාපසවරු මෙතනින් පහකරවයි පහකරන්වාහු වෙති. එවිට තාපසරුන් එකතැන විසීම නොලබන්නාහු සිල්රක්ෂා කිරීමෙහි පමාවන්නාහ. තාපසවරුන් සිල භේද කරන්ට මේ කාරණා වන්නේයයි සිතා එදවස් මධ්‍යම රාත්‍රී වේලාවේ රජ්ජුරුවන්ගේ බිසවුන්ගේ ශ්‍රී යහන් ගබඩාවට ගොසින් කියන්නාහු අභ්‍යන්තර නම් අඹගසක අඹ තොපගේ රජ්ජුරුවන්ට කිය ගෙන්වූ නම් චක්‍රවර්තී රාජ්ජය කරන්ට පින් ඇති පුතනු කෙණෙක් උපදිති කියා දෙව්ලොවට ගියහ. බිසවුන් පින් ඇති පුතනු කෙණෙක් උපදිති කියා දෙව්ලොවට ගියහ. බිසවුන් එදවස් පසුව බොරු ලෙඩක් ගෙණ තමන්ගේ පරිවාර ස්ත්‍රීන්ව රජ්ජුරුවෝ මා කොයිදැයි විචාලෝ නම් මා ලෙඩ නියාව කියවයි කියා වැදහොත්තාහ. රජ්ජුරුවෝ සිංහාසනාරූඪව සොළොස් දහසක් බිසෝවරුන් පිරිවරා උන්නාහු අග්‍රමෙහෙසිකාවන් වහන්සේ ලෙඩට වැදහොත්සේකැයි කියන්නා ලෙඩකින්දැයි විචාරන්ට රජ්ජුරුවෝ ගෙට ගියාහ. ගෙට ගොසින් බිසවුන්ගේ යහනේ එක් පාර්ශවයෙක ඉඳගෙණ බිසවුන්ගේ පිට පිරිමැද බිසවුනි ඇති අපාසු කිම්දැයි විචාළාහ. බිසවු කියන්නාහු දෙවියන් වහන්ස මට වෙන අපාසු නැත අබ්‍යන්තර නම් අඹ කන්ට දොළොක් උපන මේ අඹ ලදිම් නම් විනා මාගේ ප්‍රාණය නැතැයි කීහ. එවිට රජ්ජුරුවෝ අමාත්‍යයන් අතින් විචාරා ලදිම් නම් ගෙණෙන්නෙම් වේදැයි කියා අමාත්‍යයන් ලගට ගොසින් අමාත්‍යයන් කැඳවා කියන්නාහු අභ්‍යන්තර අඹ නම් කිම්ද? තොපි අම දනුදැයි විචාළාහ. එවිට අමාත්‍යයෝ කියන්නාහු අභ්‍යන්තර අඹ නම් අඹගස් දෙකට මධ්‍යයේ සිටිනා අඹගස් වන්නේය. නුඹ වහන්සේගේ උයනට මිනිසුන් යවා ගස් දෙකට මධ්‍යයෙහි සිටියාවූ අඹගස එලකඩා ගෙන්වාගත මැනවැයි කීහ. රජ්ජුරුවෝ එවිට උයන බලන්ට මිනිසුන් යව්වාහ. මිනිසුන් යනකලට ශක්‍රයන්ගේ ආනුභාවයෙන් එකගසකත් අඹ නැත්තාහ. එපවත් රජ්ජුරුවෝ අසා ඇයි මේ කාලයට අඹ නැතිවෙන්ට කාරණා කිම්දැයි උයන්ගොව්වා විචාරා උයන් ගොව්වා විසින් තාපසවරුන් කෑවායයි කියන්නා රජ්ජුරුවෝ තාපසවරුන් එතනින් පහකර වූහ. රජ්ජුරුවෝ අබ්‍යන්තර නම් අඹ නොලැබ අමාත්‍යයන් අතින් පෙරලා අබ්භ්‍යන්තර අඹ කොයිදැයි විචාළේය. එවිට බමුණෝ කියන්නාහු හිමාලය වනයෙහි පර්වත වලළු සතකින් ඇතුළත සවර්ණ පර්වතයක් සමීපයෙහි ලෝදූල් සතකින් වසා තබනලද වෙසවුණු රජ්ජුරුවන්ගේ අබ්භ්‍යන්තර නම් අඹ ගසක් ඇතැයි අසා දනුම්හ. දුටුදෑ නැතැයි කීහ. රජ්ජුරුවෝ එවිට මිනිසුන් විසින් එතනට යන්ට නොපිළිවනැයි කියා තමන් වඩවන්නාවූ මහත්වූ ශරීරයක් ඇත්තාවූ ගිරාපෝතකයා රන් මැදිරියෙන් මෑත්කොට ලඟ තබා ඉඳ කියන්නාහු සබඳ තොපට අප විසින් බොහෝ උපකාර කරණලද, ඊටත් උපකාරයට අප කී කටයුත්තක් සාදා දීලුවොත් යහපතැයි කීහ. එවිට ගිරවා යහපත, දෙවයන් වහන්ස, කීවක් කරමි කියන්නා රජ්ජුරුවෝ ගිරවාට යහපතැයි කියා මී හා විළඳ කවා මී පැන් පොවා ශතපාක සහශ්‍රපාක තෛලයෙන් දෙපියා මැද සබඳ හිමාලය වනයෙහි සත්වන පව්වක වලල්ලෙන් ඇතුලෙහි ස්වර්ණ පර්වතයක් ලඟ අබ්භ්‍යන්තර නම් අඹගසෙක් ඇත්ල ඒ අඹ ගසින් අඹ ගෙණවුත් දී බිසවුන්ගේ දොල සන්සිඳවයි කියා ගිරා පෝතකයානන් දූතින් අල්වාගෙණ සිවු මැදුරු කවුළුව සමීපයෙහි සිට අළහ. ඒ කියන ගිරවාත් රජ්ජුරුවන්ට ආදර දක්වා පියා අඹාගෙණ රාජ්ජ සීමා ගෙවාගෙණ වනාන්තරයට වැද හිමාලය වනයෙහි පළමුවන පර්වත වලල්ලට ගොසින් එහි වසන්නාවූ ගිරවුන් අතින් අබ්භ්‍යන්තර නම් අඹ ගස දනුදැයි අපි නොදනුම්හ. දෙවන වලල්ලෙහි ගිරවුන් අතින් විචාරන්න් යහපතැයි කියන්නාවූ ඔවුනුත් විචාරා මෙම නියායෙන් දෙවන වලල්ලය තුන්වන වලල්ලය සතරවන වලල්ලය පස්වන වලල්ලය සවෙනි වලල්ලය යයි කියා සවන වලල්ලට ගොස් එහි උන් ගිරවුන් අතින් විචාළාහ. ගිරව් කියන්නෝ සැබැව, සවර්ණ පර්වත සමීපයෙහි අභ්‍යන්තර නම් අඹ ගසෙක් ඇතැයි කීහ. එවිට ගිරවා කියන්නේ ඒ අඹගසෙන් මට ප්‍රයෝජනයෙන් ඇත. ඉන් මට අඹගෙඩි කීපයක් ගෙණවිත් දීලවයි කිය. එවිට කියන්නාහු අඹගස නම් වෙසවුණු රජ්ජුරුවන් වහන්සේ ප්‍රයෝජන විඳිනා අඹගසය, ලෝදලින් වසාතිබෙයි, කුමභාණ්ඩයන්ගෙන් රැකවල් ලද, ඒ අඹ කඩා ගන්නා තබා ඒ අඹ ගස ලඟටත් යන්ට නොපිළිවනැයි කීහ. එවිට ගිරවා කියන්නේ කෙසේවුවත් මම අඹ කඩාගණිම්, මට සලකුණු කියවයි සලකුණු විචාරාගෙණ රෑ කුම්භාණ්ඩයන් නිදාපු වේලෙහි එකියන අඹ ගස මුල සමීපයෙන් ලෝදල යටින් ගස සමීපයට ගොස් ගසට වන ඒ වෙලාවට ලෝදූල් ක්‍රිංයන ශබ්දය පවත්වා ලෝදූල් ඇඬුහ. එවිට කුම්භාණ්ඩයෝ පිබිද ගිරවා අල්වාගෙණ මේ ගිරවා ගැලපීයම්හයි කියාද කඩකොට පලා කාපියම්හයි කියාද පුලුස්සා කාපියම්හයි කියාද යනාදීන් ගිරවා භය ගන්වා බස් කීහ. එකියන ගිරවාත් එවිට නිර්භීතව කියන්නේ දෙමව්පියන් කී මෙවරටත් බත්ලත් සාමින් කී මෙවරවත් කොට ප්‍රාණය ගියේ නම් දිව්‍යලෝකය ලැබෙන්නේ වේදැයි එසේ හෙයින් තගේ රජ්ජුරුවන් වහන්සේ කී මෙවර නිසා බිසවුන් වහන්සේගේ දොළ සන්සිඳුවනු නිසා අඹ ගෙණයන්ට මෙවර මා ආයේය. ඒ නිසා මාගේ ප්‍රාණය ගියෙහි වී නමුත් යහපතැයි කියා කීහ. එබස් අසා කුම්භාණ්ඩයෝ සතුටුව යහපත, තොප කීබස් අප සිත්ගත, තොප නොමරා අරුම්හයි කීවාහ, එවිට ගිරවා කියන්නේ මා ආ කාරිය

SANHIDA LANKA

මුදුන් පත් නුවු කල මා ගොසින් කම් කිම්දැයි කියන්නාහු තොපට මේ ගසින් අඹ ගෙඩියකුත් දෙන්ට බැරි නොවෙයි, රජ්ජුරුවන් වහන්සේගෙන් ඇතිව තිබෙන අඹය ඒ නිසා දෙන්ට බැරිය. දුන්නොත් අපට බොහෝ නිග්‍රහ පැමිණෙයි තොපට උපායක් කියම්හයි අඤ්ජන ගුහාවෙයි වසන ජෝතිය තාපසයන්ට දවස දවස අඹගෙඩි සතරක් දෙති. උන් අතින් අඹගෙඩියෙක් ඉල්වා ගණුවයි ඒ තාපසවන් කරා යවුහ. ඒ ගිරවාත් තාපසයන්ට එපවත් කියා තාපසයෝත් යහපතැයි කියා දෙකක් තුමූ කා එකක් ගිරවා කවා එක අඹගෙඩියක් ඉල්වා සාල්ලෙක ලා ගිරවා කර බැඳ රජ්ජුරුවන් කරා යවුහ. ඒ ගිරවා අඹගෙඩිය රජ්ජුරුවන් අතට දීන, රජ්ජුරුවෝ බිසවුන් කරා යවුහ. ඒ ගිරවා අඹගෙඩිය රජ්ජුරුවන් අතට දින, රජ්ජුරුවෝ බිසවුන්ට දුන්හ. ඒ අඹ කාත් දරුවෝ ඇතිනුවුහයි වදාරා මේ අබ්භන්තර ජාතකය නිමවා වදාළසේක, එසමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසව් නම් යශෝධරා ස්ථවිරය, ගිරාපෝතකයා නම් ආනන්ද ස්ථවිරයෝය. හිමාලය වනයෙහි තාපසයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරය. බරණැස් නුවර උයනේ විසූ තාපසයෝ නම් බුදුවූ මම්මයයි දක්වා වදාළසේකී.

SANHIDA LANKA

# සෙයාංස ජාතකය

තවද සෘද්ධි විෂයෙහි සූක්ෂම වූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා අමාත්‍යයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

කෝසල රජ්ජුරුවන්ගේ අමාත්‍යයෙක් ඇත, ඒ අමාත්‍යයා කෙරෙහි සෙසු අමාත්‍යයෝ දෝෂ කියා රජ්ජුරුවන් බිඳවූහ. රජ්ජුරුවෝත් ඇත්තෙකැයි කියා අමාත්‍යයා තමන්ගේ රාජ්‍ය ආසාවෙන් සිරගෙයි වැස්සූහ. ඒ අමාත්‍යයා සිරගෙයි ඉඳම බුද්ධාලම්බන ප්‍රීතියෙන් භාවනාකොට සෝවාන් වූහ. රජ්ජුරුවෝත් ඔහු නොවැරදි නියාවත් දුර්ජනයන්ගේ බස් නිසා ගැහැට පැමිණි නියාවත් දැන දම් කපා පළමු සිටියාවූ ස්ථානාන්තරයෙහි පිහිටුවා බොහෝ තරම් පදම් කී රක්කාහ. එකියන අමාත්‍යයා සර්වඥයන් වහන්සේ දකින්ට ගියේය. සර්වඥයන් වහන්සේ එකියන අමාත්‍යයා දැක උපාසකයෙනි තොපට දුඃඛයක් පැමිණියයි කියන්නා ඇසූම්හයි වදාළසේක. සැබැව, ස්වාමිනි දුඃඛයක් පැමිණියේය. පැමිණි දුඃඛයෙන් වැඩකට පැමිණියෙමි කියන්නා සර්වඥයන් වහන්සේ වදාරණසේක් කුමන සැපයෙක් ලද්දෝදැයි විචාරන්නා බුද්ධාලම්භන ප්‍රීතියෙන් සෝවාන් වීම් කියන්නා පළමුත් උත්තමයෝ දුඃඛයට පැමිණ සැපයකට පැමිණියෝ වේදැයි වදාරන්නා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකී.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි දශධර්ම කොපාය නොකොට රාජ්ජය කරන්නාහ. දවස් පතා පංඥශිලය රකින්නාහ. පොහොයෙන් පොහොය අටසිල් රකින්නාහ. මේ නියායෙන් ධර්මිෂ්ඨව රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ අභ්‍යන්තර අමාත්‍යයෙක් රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට වැදිත. රජ්ජුරුවෝ එපවත් අසා තුමූම පරික්ෂා කොට නියම දැන තෝ මාගේ විජිතයෙන් එපිට නොරඳා පලා යවයි අළහ. මේ කථාව යටකියනලද සීලව ජාතකයෙහි පෙණෙන්නේය. මෙය වනාහී එකියනලද අමාත්‍යයා කොසොල් රජ්ජුරුවන් කරා ගොස් දේවයන් වහන්ස යම්තම් සේනාවක් ලබන්නා බරණැස් නුවර රාජ්ජය සාධගත හැකැයි කීහ. රජ්ජුරුවෝත් මූ කියන්නේ කිම්දැයි කියා මිනිසුන් යවා එක් ගමක් කොල්ල කෑවූහ. ඒ කොල්ලකෑ ගම මිනිසුන් අල්වා ගෙණ රජ්ජුරුවන්ට පානා රජ්ජුරුවෝ ඇයි. තොප ඇම මාගේ රාජ්ජය කොල්ලකෑයේ විචාරන්නා සම්පත් නැත්තෙම් කොල්ලකෑම්හයි කී කල්හි එසේ උන්ට බොහෝ සම්පත්දී යැවූහ. එපවත් කෝසල රජ්ජුරුවෝ අසා එසේවීනම් බරණැස් නුවර ගහතැකැයි කියා මහත්වූ සේනාව ඇරගෙණ බරණැස් නුවරට ආහ. බරණැස් නුවර යෝධයෝ රජ්ජුරුවන් කරා ගොස් කියන්නාහූ කෝසල රජ්ජුරුවෝ උන් හා කැටිව යුද්ධයට යන නියායෙන් අවසර දුන මැනවැයි කීහ.

ඒ අසා බරණැස් රජ්ජුරුවෝ යුද්ධ කරන්ට කාරණා කිම්ද?. යුද්ධයට නොයවයි කියා අමාත්‍යයන් පිරිවරා මතුමාලේ ඉඳ වාසල් දොර අරුවයි කියා දොර ඇරවූහ. කෝසල රජ්ජුරුවවෝ සේනාව ඇරගෙණ කිසි සැකයක් නැතිව තමන්ගේ රාජ්ජයට වදිනාසේ වැද මතුමාලට නැගී රජ්ජුරුවනුත් බිසවනුත් තමන්ගේ රාජ්ජයට වදිනාසේ වැද මතුමාලයට නැගී රජ්ජුරුවනුත් බිසවනුත් අල්වා සිරගෙයි වැස්සූහ. බෝධිසත්වයෝ සිරගෙයි හිඳ මෛත්‍රී භාවනා කොට ධ්‍යාන උපදවා ගත්තාහ. එකියන රජ්ජුරුවන්ගෙත් බිසවුන්ගේත් මෛත්‍රී භාවයෙන් ආනුභාවයෙන් රජ්ජ්රුවන්ගේ ශරීරය දාහ වැදගත. කෝසල රජ්ජුරුවෝ මේ කිමෙක්දැයි විචාරන්නා අමාත්‍යයෝ කියන්නාහූ මෛත්‍රී කරණ රජ්ජුරුවන් වහන්සේගේ රාජ්ජය ඇරගත් හෙයින් උන්වහන්සේ කරණ මෛත්‍රී ආනුභාවයෙන් ශරීරයේ දාහ වැදගතැයි කියන්නා රජ්ජුරුවෝ සිරගෙයි උන් රජහුගේ දම් කප්පවා නුඹවහන්සේගේ රාජ්ජය නුඹ වහන්සේම පිළිපැද්ද මැනවැයි කියා පාවාදී ඒ කියන කේලාම් කී අමාත්‍යයා මරවා තමන්ගේ නුවරටම නැගී ගියහ. බෝධිසත්වයෝත් පණවන ලද සිංහාසනාරූඩව අමාත්‍ය මංඩලය පිරිවරා උන්නාහූ අමාත්‍යයෙනි මා විසින් එක රජ්ජුරුවන්ට කළාවූ මෛත්‍රී ආනුභාවයෙන් මමත් ගැලවී තොප ඇමත් ගලවාගතිමි එසේ හෙයින් මට රාජ්ජයෙන් කම් නැතැයි කියා මහණ වූ හයි වදාරා බුදුව වැඩ හිඳ වදාරණ සේක් එකියන රජ්ජුරුවෝ මෛත්‍රී ආනුභාවයෙන් ගැලවී ගියෝ වේදැයි වදාරා සෙයාංස ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කෝසල රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. නොකටයුතු කියා බිඳුවූ අමාත්‍යයා නම් දේවදත්ත ස්ථවිරය. බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැයි තමතන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# වඩ්ඪසූකර ජාතකය

තවද බුද්ධ විෂයයේ අනුන් විසින් නොසිතිය හැක්කාවූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ධනුග්ගහතිස්ස තෙරුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

බිම්බිසාර රජ්ජුරුවන්ට කෝසල රජ්ජුරුවන් විසින් තමන්ගේ නැගනියනුත් පාවාදී නැගනියන් නානුමුරයටය කියා ලක්ෂයක් වටිනා කසීගමක් දුන්හ.ඉක්බිති අජාසත් රජ්ජුරුවන් විසින් පියානන් මරාපු හෙයින් කොසල රජ්ජුරුවෝ තමන්ගේ නැගනියන්ට දුන් කසීගම උදුරා ගත්තාහ. ඒ නිසා දසවිටම උනුන් හා කැටිව සටන් ඇතිව තිබෙන්නේය. එක් දවසක් කෝසල රජ්ජුරුවෝ සිතන්නාහු, සංඝයා වහන්සේ නම් බොහෝ නුවනැති සේක. එසේ හෙයින් විහාරයක් පාසා ඇවිද කියන බස් අසවයි කියා චරපුරුෂයන් සැලැස්වූහ. එකියන චරපුරුෂයො ගණයක් පාසා පරීක්ෂා කොට ඇවිද්දාහ.තෙරුන් වහන්සේ යයි දෙදෙනාවහන්සේ වාසය කරණසේක් මධ්‍යම රාත්‍රියෙහි පිබිද ධනුග්ගහතිස්ස තෙරුන්වහ්නසේ උපතිස්ස තෙරුන්වහන්සේට කියන සේක්, කෝසල රජ්ජුරුවෝ බත් බොහෝ කන්ට සුරු පමණක් විනා තමාගේ බෑව් අජාසත් රජ්ජුරුවන් අල්වාගත නො එන්නාහයි කියන්නාහු උන් වහන්සේ කියන්සේක්, ඇවැත්නි සේවාකම් නම් පදුබ්‍යුහය චක්‍රබ්‍යුහය සටක බ්‍යුහයයි යන තුන් උපායක් ඇත. සකටබ්‍යුහ නම් දලයෙන් පිරිස් සලසා සේවාකම් කොට පසුබැස මරුබට සේ පිරිස් මධ්‍යයේ සටන් වන්කල අල්වා ගැන්ම එක් උපායෙක. ඒ නියායෙන් අසවල් පර්වත සමීපයෙහිද යුද්ධ කරන්නා අල්වා ගත හැක. ඒ ඇසූ චරපුරුෂයෝ මේ උපාය රජ්ජුරුවන්ට කිවුය. ඒ ඇසූ රජ්ජුරුවෝ සේනා වාහන සන්නද්ධව නික්ම කී නියාවට පිරිස් සලසා යුද්ධකොට අජාසත් රජ්ජුරුවන් අල්වාගෙණ තමන්ගේ නුවරටම ගෙණවුත් තමන්ගේ දුවනියන් වූ ජීරකුමාරිකාවන් පාවාදී පළමු දුන් ගම්වරත් දී උන්ගේ නුවරටම යවුහ. මේ කථාව ධම්සභාවේ රැස්වූ මාළුවරුන්වහන්සේ කියනසේක් මේ යුද්ධ ප්‍රයෝගය කරවුසේක් ධනුග්ගහතිස්ස තෙරුන්වහන්සේ මයි කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි, පෙරත් ධනුග්ගහතිස්සයෝ යුද්ධප්‍රයෝගයෙහි දක්ෂයෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි වඩුගමෙක උපන්නාවූ වඩුවෙක් දඬු සොයා වලට ගියේය. එක් ඌරු පැටවෙකු දැක අල්වාගෙණ වඩන්ටයයි කියා ගෙට ගෙණ ගොස් වැඩීය. එකියන ඌරුත් වැඩී දළවලල්ල වැටී මහත්වූ කය ඇතිවිය. එකියන ඌරා වඩුවන් වැඩූහෙයින් වඩ්ඪසූකර යයි කියා නම් තැබීය. එකියන ඌරාත් වඩුවාට වෑ තියන් දිලයි කපන කල දඬුපෙරලා පෑලයි කලුහුය කටින් ඩැගෙණ කලුහුය ගසා මේ නියායෙන් කීකරුව වසන්නේය. වඩුවා දවසක් සිතන්නේ, මාගේ ඌරා වැඩිවිය පැමිණියේය. එසේ හෙයින් යම් කෙණෙක් මරාපුනම් නපුරැයි සිතා එකියන ඌරා වඩාගෙණ වලට ගොස් ඌරා වලට අළහ. ඒ ඌරාත් වලට වැද තමාගේ රැස් ඌරන් හා එක්වුයේය. පැන් හා කැවිලි පෙවිලි පාසුතෙනක බොහෝ ඌරන් දැක එතනට ගියේය. ඒ වල ඌරෝත් මේ ඌරා කරා අවුත් සිටියාහ. එවිට වල වසන ඌරන්ට කියන්නේ කුමක්ද? පලාඵල සමුර්ධිවූ පසු ඌරනුත් බොහෝ වූ තෙනකට පැමිණියයි කියන්නා එවිට ඌරෝ කියන්නාහු ඉන් අඩුවෙක් නැත, එසේවුවත් අපට මහත්වූ භයෙක් ඇතැයි කීහ. වඩ්ඪසූකර කියන්නේ තොපදුටු ගමනේ මේ නියා කැවිලි ඇතිතෙන දුර්වලව ඉඳිනේ භයෙක් ඇති නිසායයි දනිමියි කියා තොප ඇමට ඇති භය කිම්දැයි විචාළාහ. එවිට එකියන ඌරෝ කියන්නාහු එක ව්‍යාඝ්‍රයෙක් අප කරා ඇවිත් දුටුදුටුවන් කයි කීය. එසේහෙයින් අප ඌ කෙරේ භයින් වැරද ගියම්හයි ඌරෝ කිවුය. වඩ්ඪසූකර එවිට කියන්නේ එකියන ව්‍යාඝ්‍රයා දවස් පතා ඒද අතරතුරෙක එද්දැයි විචාරන්නා ඌරො කියන්නාහු දවස්පතා නොඑයි. අතරතුරක එන්නේයයි කියන්නා එසේවිනම් මා කීවක් කරවු නම් ව්‍යාඝ්‍රයා මම අල්වා දෙමි කීහ. ඌරෝ යහපතැයි ගිවිස්සාහ. එවිට එකියන වඩ්ඪසූකර ඌරුත් යුද්ධයට සලස්වන්නේ කුඩා ඌරන් වටකොට සලස්වා ඊට ඇතුළුපිට දළවලල්ල වැටුනු ඌරන් සලස්වා ඊට ඇතුළුපිට යුද්ධයෝග්‍ය ඌරන් සලස්වා සතරදිසාවේ ඌරන් දසය විස්සය නියායෙන් ඇනි සලස්වා මධ්‍යයේ ගොඬක්කොට තිබා ඔරුවක් සේ වළක් ඉදිකොට ඒ වල නම්වල තිබෙන නියායෙන් සලස්වාගෙණ වටරැකවල් ලා සිටි ඌරන්ට තෙපි ඇම නොබවයි කියා විධාන කොට ඇවිදිනාකලට ඉරු උදාව පාන්වන්නට වන. ඒ වේලාවට ව්‍යාඝ්‍රයා පර්වත මුදුනෙන් පෙණින. එවිට ඌරෝ ස්වාමිනි පසමිතුරා ආ යයි කිහ. එවිට ඌරු කියන්නේ ව්‍යාඝ්‍රයාද කළ යම් ක්‍රියාවක් තෙපි ඇමත් කරවයි කීහ. එවිට ව්‍යාඝ්‍රයා කිළිපොලන්නා ඌරෝ කිළිපෙලුහ. ව්‍යාඝ්‍රයා ගර්ජනා කරන්නා ඌරොත් ගර්ජනා කළහ. ව්‍යාඝ්‍රයා මලමුත්‍ර කරන්නා ඌරෝ මලමුත්‍ර කළහ. එවිට ව්‍යාඝ්‍රයා

SANHIDA LANKA

සිතන්නේ මෙතෙක් දවස් සේ නොවෙයි අද යම් අමුත්තෙක් ඇතැයි සිතා තමා මස් මරාලන තාපසයන් කරා ව්‍යාඝ්‍රයා ගියේය. එවිට තාපසයෝ කියන්නෝ ඇයි? මෙතෙක්දා ඌරු මස් ගෙණන තැනැත්තවූ අද ඌරු මස් නොගෙණායේ ඇයිද? තාගේ ඇඟ ශක්ති නැද්ද? ඌරෝ නිමාගියෝ දැයි විචාළෝය. එවිට ව්‍යාඝ්‍රයා කියන්නේ තාපසයන් වහන්ස මා ඇඟ ශක්ති ඇත. ඌරොත් ඇත මෙතෙක්දාසේ නොවෙයි, අද අහංකාරව සිටියේය. එහෙයින් නොගියෙමි කියන්නා  තාපසයෝ කියන්නාහූ ඌරන් කෙසේ ශක්ති ඇතත් තොප ඇමටම භය ඇත්තෝය. එසේ හෙයින් නො බා වහා ඌරන් ගෙණවයි කීහ. එබසට යහපතැයි කියා ව්‍යාඝ්‍රයා අවුත් තමා පළමුත් ඌරන්ට පණින්නාවූ පර්වත මුදුනට පැන නැගී සිටියාවුන් ඌරන් දැක තෙමෙත් වල මධ්‍යයෙහි  සිටියේය. එවිට ව්‍යාඝ්‍රයා ඌරා සිටියාවූ දැක වේගයෙන් පිනුකලට ඌරු තමා ගැලවියන්ට සාරා තුබූ උමගින් පලාගියේය. ව්‍යාඝ්‍ර පිනුවේගය රඳවාගතනොහී එවලට පැන ඔරුවෙක ලුවාසේ සිටියේය. එවිට වඩ්ඪසූකර තමා සිටි තෙනින් ගොඩ නැගී ව්‍යාඝ්‍රයා දුටුයේය. මහත් වේගයෙන් දිවගෙණ ගොස් ව්‍යාඝ්‍රයා මරා උගේ පඤ්චමධුර මාංසය අනුභව කොට ගොඩ නැගී ඌරන්ට කියන්නාහූ තොපගේ සතුරා මරාපිමි, කියන්නා පළමුවෙන් දිවගෙණ ආ ඌරෝ උගේ මාංශය අනුභව කළහ. පස්සේ ආ ඌරෝ මස්කෑ ඌරන්ගේ හොට ඉඹ සිටියාහ. වඩ්ඪසූකර කියන්නේ තොපගේ සතුරා මළේය. ඉදිරියේ කිසි භයෙක් නොවිවාසය කරව් කීහ. එසේ කීවත් ඌරෝ දුර්මුඛව සිටියාහ. එවිට තොපි දුර්මුඛව ඇයිදැයි කියන්නා ස්වාමිනි ව්‍යාඝ්‍රයා මැරීමෙන් කම් කිම්ද? තව මුන්සේ ව්‍යාඝ්‍රයන් දසදෙනෙකු උගන්වා එවන්ට නිසි තාපසකෙණෙක් ඇත. ඌ මැරුවොත් විනා අපට භය සන්නොසිඳෙයි කියන්නා තාපසයෝ කොයිදැයි විචාරන්නා අසවල්තෙන වාසය කෙරෙති කියන්නා යහපතැයි කියා ඌරන් ඇර ගෙණ තාපසයන් උන්ගැනට දිවුහ. එවිට තාපසයෝ ව්‍යාඝ්‍රයා තව දක්වා නො එන්නේ ඇයි දැයි සිතා බලන්ටයයි එන කලට ඌරෝ තාපසයන් දැක ලුහුබඳවා ගත්හ. එවිට තාපසයෝ තමාගේ අෂ්ටපරිෂ්කාර දමා වහා දිවගෙණ ගොස් දිඹුල් ගසකට පැන නැංගේය. එවිට ඌරෝ අප නටුවෝද තාපසයා ගැලවී ගියේයයි කියන්නා ඊට මම උපායක් දනිමි කියා ඊරියන්ට කියා පැන් අද්දවා ගසමුල වත්කරවා පැටිති ඌරන් සිඟින් මුල් කඩන්ට හා මහ ඌරන් මහමුල් කඩන්ට සලස්වා මේ නියායෙන් දිඹුල් ගසවට මුල් කප්පවා මැද්දේ තුබූ මහමුල තුමූ පොරවක් බාලා කපන්නාක්මෙන් කපා හළහ. එවිට දිඹුල් ගස වැටින. ඌරෝ තාපසයන් යා නොදී ඇට පමණක් තිබා මස් ලියා කෑවාහ. එකියන දිඹුල් ගස පිට වඩ්ඪසූකරයනුත් යහපත් ඊරියකුත් ඉඳුවා තාපසයන්ගේ සකින් අභිෂේක ජලය වත්කොට තමන් ඇමටම රජකොට ගත්තාහ. එතැන් පටන් රජදරුවන්ට දිඹුල් ගස භද්‍ර පීඨයට ගත්තාහ.එතන වනයේ වෘක්ෂයක වාසය කරන්නාවූ වෘක්ෂ දේවතාවා මේ කාරණය දුටුහයි වදාරා වඩ්ඪසූකර ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි වඩ්ඪසූකරයා නම් ධනුග්ගහ ස්ථවිරය. එසමයෙහි වෘක්ෂදේවතාව උපන්නෙම් බුදුව මම්මයයි තමන් වහන්සේ දක්වා  වදාළසේක.

SANHIDA LANKA

# සිරි ජාතකය

තවද යුගන්ධර සාගරය සේ අනන්ත වූ ගුණ මුහුදට ගලායන්නාවූ සියුම් නුවණ ඇති සර්වඥහන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ශ්‍රී දන්නාවූ බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදී. මෙහි වර්ථමාන කථාව දුකනිපාතයෙහි බදිරභාර ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. අනේපිඬු මහා සිටානන්ගේ සතරවන දොරටුවේ වාසය කරණ මිත්‍යා දෘෂටිගත් දේවතා දුවෙක් ඇවිත් අනේපිඬු මහා සිටානන්ට කියන්නේ තොපි පොහොසත් දා සිව්පණස් කෙළක් ධන වියදම් කොට බොහෝ දන් පින් කළහ. දැන් සම්පත් වියදම්ව ගියහ. එහෙයින් දැන් පින් කරන්ට දුක්පත්ව ගියාහ. එසේ හෙයින් දන් පින් නොකරවයි දේවතා දූ කියන්නී, අනේ පිඬු මහ සිටානෝ, තී මාගේ දොරටුවේ වාසය කරන්ට බැරියයි නෙරපූවාහ. එවිට දේවතා වූ නුවර අරක්ගත් දේවතාවාට සහ සතරවරම් දෙවියන්ට හා ශක්‍රයන්ට කිව, එකියන දේවියෝ අපට බැරියයි කියන්නා තොමෝ අනේපිඬු මහාසිටානන්ට සිවුපණස් කෙළක් සම්පත් දී බුදුන් මැදයේ අනේපිඬුමහාසිටානන් සමා කරවා ගෙණ සෝවාන් ඵලයට පැමිණියාහ. ඉක්බිති අනේපිඬු මහා සිටානන් පොහොසත්ව මහ සම්බත් ඇතිව ඉන්නා අවස්ථාවට ශ්‍රී දන්නා බමුණෙක් අනේ පිඬු මහාසිටානන් ශ්‍රී ඇරගන්ට උවමැනවයි සිතා ගෙට ගියේය. එවිට අනේ පිඬුමහා සිටානෝ ඒ බමුණා දැක දන්දී ඉඳ ඇයි?. බමුණා ආයේයයි විචාරන්නා බමුණා කථා කරමින් සිතන්නේ මේ සිටානන්ගේ ශ්‍රී කොයි දැයි පරීක්ෂාකරන්නේ සිටානන්ගේ ගෙයි ඇලි කුකුලෙකු දැක සිතන්නේ සිටානන්ගේ ශ්‍රී මේ ඇලි කුකුලාගේ කරමලේයයි සිතා සිටානෙනි මා ලඟ අකුරු කරණ අතවැස්සෝ පන්සියයක් ඇත. ඒ අතවැස්සන් ශාස්ත්‍ර පිරුවන්ට වේලා වරද්දා අඬන යම් කුකුලෙක් ඇත. එසේ හෙයින් ශාස්ත්‍ර පිරිහෙයි, වේලා නොවරද්දා අඬ නගන නියායෙන් තෙල ඇලි කුකුලා මට දෙවයි කියා ඉල්වූහ. යහපතැයි කියා ඇලි කුකුලා දුන්නාහ. ඒ වෙලෙහි ශ්‍රී ගොසින් සිටානන්ගේ සිරෝමාණික්‍යයෙහි පිහිටියේය. එවිට බමුණා සිරෝමාණික්‍යය ඉල්විය. සිටානෝ සිරෝමාණික්‍යය දුන්නාහ. එවිට ශ්‍රී ගොසින් අන්තරයෂටියෙහි පිහිටියේය. එයිත් අන්තරයෂටිය ඇරගත, එවිට ශ්‍රී ගොසින් සිටානන්ගේ අග්‍රමහේසිකා සිටුදියනියන්ගේ ශරීරයෙහි පිහිටියාහ.

එවිට බමුණෝ කියන්නේ සිටානන් වහන්ස නුඹ වහන්සේහේ ශ්‍රිය ඇර ගන්ට යයි කියා ඇවිත් කුකුලා ඉල්වීමි. ඇලි කුකුළා ගන්නා සිරෝමාණික්‍යයෙහි පිහිටියාහ. එසේ හෙයින් සිරෝමාණික්‍යයත් ඇරගතිමි. සිරොමාණික්‍යයෙන් ගොස් අන්තරයෂ්ටියෙහි පිහිටියාය. එවිට අන්තරයෂ්ටියත් ඇර ගතිමි. අන්තරයෂඨියෙන් ගොස් තොපගේ අග්‍රමෙහෙසිකා සිටුදුවගේ ශරීරයෙහි පිහිටියාය. එවිට බමුණා සිටානන්ට කියන්නේ සිටානෙනි තොපගේ ශ්‍රී ඇරගන්ටයයි කියා ආමි. තොපගේ ශ්‍රී මා තිබා කවුරුන් විසිනුත් ඇරගත නොහැක්ක. එසේ හෙයින් එකියන ශ්‍රීත් සියළු සම්පතුත් නුඹ වහන්සේම වින්ද මැනැවැයි කියා ගියේය. එවිට සිටාණෝ මේ බමුණා කී නියාව සර්වඥයන් වහන්සේට කියන්ට උවමැනවයි සිතා සර්වඥයන් වහන්සේට ගොසින් මේ නියාව සිටාණෝ දැන්වූහ. සර්වඥයන් වහන්සේ වදාරණසේක් තමාගේ පිණින් සම්භවවූ සම්පත් කව්රුන් විසිනුත් හැරගත නොහැක්ක. පෙරත් උත්තමයන්ගේ පිණින් සම්භවවූ සම්පත් උත්තමයන් නිසා තාවුරුවුයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ තාපසව ඉපිද බරණැස් නුවර වාසය කරන්නාහු එනුවර වාසය කරන්නාවූ හසත්‍යාචාර්යයෙක් බෝධිසත්වයන්ට සතරපසයෙන් සංග්‍රහ කරන්නේය. එසමයට එනුවර දරකැටියෙක් වලට ගොස් දරපළාගෙණ එන්නේ නුවරට වදින්නට ඵවගිය හෙයින් එක් දේවාලයක සැතපුනේය. ඒ දේවාලය සමීපයෙහි ගසෙක කුකුළෝ දෙන්නෙක් උඩනැගී වැදහොත්තාහ. අළුයම්වේලේ අගඅත්තේ වැදහොත් කුකුළු අඬනගා වර්චස් කරන්නේය. පාත අත්තේ වැදහොත් කුකුළාගේඉස වර්චස් කළෝයයි කියන්නා අග අත්තේ වැදහොත් කුකුළු කියන්නේ මම නොදැන වර්චස් කෙළෙමියි කියා දෙවැනිව එරකියන කුකුළුගේ ඉස වර්චස් කෙළේය. එවිට පාත වැදහොත් කුකුළා කියන්නේ පළමු නොදැන වර්චස් කෙළෙහිය. දෙවනුව වර්චස් කලේ අයිදැයි කියා උනුන්හා කලහ . ඇයි මාගේ තත්වය නොදැනුද? යම්කෙණෙක් මා කවුනම් මසුරන් දහසක් ලබති කිය. උඩ අත්තේ වැදහොත් කුකුළු කියන්නේ තාගේ මසුරන් දහසක් ලබති කීය. උඩ අත්තේ වැදහොත් කුකුළු කියන්නේ තාගේ මාංශවිපාක මෙතෙක් වේද යම්කෙණෙක් මාගේ මාංශ කැවු නම් රජ වති ලගු මාංශය කැවුනම් සෙනෙවිරත් වෙති. ඇටමුසු මාංශය තාපස කෙණෙක් කැවු නම් රාජා කුලුපග වෙති. යම් ස්ත්‍රියක් කැවු නම් අග්‍රමෙහෙසිකා වෙති කීය. එබස් දාරකැටියා අසා ඒ කුකුළා ගසට නැගී අල්වාගෙණ තමාගේ ගෙට ගෙණ ගොස් කුකුළා මරා මස්කොට අඹුවට දී තෙල කුකුළා මාලු පිස බතුත් පිසවා මේ කුකුළු නම් අලිසම් දෙයක් නොවෙයි. මේ කුකුළු මස් කෑ කෙනෙක් රාජ්ජයට පැමිණෙති. එසේවූ මාංසය ඉසසෝධා නහා කන්ට උවමැනවැයි අඹුවත් කැන්දාගෙණ බස් හා කුකුළු මසුත් ඇරගෙණ ගඟට ගොස් බස් මාලු වැල්ලේ තබා ගඟට බටහ. ඒ වෙලාවට උඩුගඟින් වතුර ඇවිත් බත් සැළ හා මාළු ගඟ වතුරේ ගෙණ යන්නේ ගඟ පාත

SANHIDALANKA

ඇත්හලට නායක වූ අමාත්‍යයා හා ඇත්හල ඇතුන් නාවන තැනට පැමිණියේය.එය දැක ඇත්හලයෙක් අමාත්‍යයාට ගෙණ ගොස් දින. අමාත්‍යයොත් ඒ කුකුලු මාලු හා බත් දැක තෙල අලවි නොකොට තබන්ට කියවයි කියා ගෙට යවුහ. ඒ දරකැටියා වැලි මිටක් හා මාලුවට පැන් කටක් බී ගොඩ නැන්ගේය. ඒ අමාත්‍යයාගේ කුලුපග තාපසකෙණෙක් ඇත්තාහ. ඒ තාපසයන්ට දිවස් ඇත්තේය. ඒ කුකුලු මස් දිවසින් දැක මා එතනට ගොස් මාගේ මේ අමාත්‍යයා කුකුලු මස් කැවා රාජ්ජයට පමුණුවා මා ඔවුන්ට කුලුපග තාපස උවමැනැවයි අමාත්‍යයා එන්නට පළමු තාපසයා ගොස් ඇත්හලට නායක අමාත්‍යයාගේ ගෙයි ගොසින් උන්නාහ. ඒ වෙලාවට අමාත්‍යයා ගොට අවුත් තාපසයන්ට බත් පිළිගන්වා කුකුලු මාලු පිළිගන්වන්ට වන. එවිට තාපසයෝ කියන්නාහු මා විධාන කළ කල මාලු පිළිගන්වන්නේයයි කියා උත්තම මාංසය ඇත්හල නායකයන්ට කන්ට සලස්වා මධ්‍යම මාංසය උන්ගේ ඇඹෙනියන්ට අනුභව කරණ නියායෙන් සලස්වා තුමූ ඇට මාංසය අනුභවකොට උපාසකය අදට තුන්වෙනිදා තොපට රාජ්ජය පැමිණෙයි සුවපත්වයි කියා ගියහ. ඉක්බිති කෝසල රජ්ජුරුවෝ බරණැස් නුවර ගන්නා පිණිසයයි සටනට අවුත් නුවර වටකොට ගත්හ. එවිට බරණැස් රජ්ජුරුවෝ තුමූ සේනාවට විධානකොට සේවාකම් කරන්ට උවමැනවයි කියා ඇත්හල නායකයන්ට සේසත් නන්වා ඇතුපිට ඉඳුවා තුමූ සේනාව මධ්‍යයෙහි සිටියාහ. ඒ වෙලාවට පරසතුරන් ගෙන් එකෙකු විදි ඊදණ්ඩකින් රජ්ජුරුවෝ විත්කා ජීවිත විනාසයට පැමිණියාහ. එවිට සේනාව රජ්ජුරුවන් නැසුනු නියාව දැන පසු බසින්ට වන්හ. එවිට ඇත්හල නායකයා මම වසතු දෙමි තොප සටන් කරවයි කීහ. එවිට සේනාව සටන් කොට පරසතුරන් සිඳුවා තමන්ගේ මළාවූ රජ්ජුරුවන් ආදාහනය කරවා රාජ්ජයට කවුරුන් තබමෝදැයි කථාකොට රජ්ජුරුවන් වහන්සේ ජීවත්ව ඉඳම ඇත්හල නායකයන්ට රාජ්ජය පමුණුවන ලදහ. උන්වහන්සේ මළ පසුත් සේනාව හා සටන් කොට සතුරන් පරාජයට පමුණුවා අපට වැඩ කරණලද. එසේහෙයින් මෝහටම රාජ්ජය පමුණුවම්හයි රාජ්ජයට තබා උන්ගේ බිරිඳ අග්‍රමෙහෙසිකා කොට සලස්වා තාපසයෝ රාජකුලුපගව තාපසකමට සැරසුනාහයි වදාරා බුදුව වැඩ ඉඳ වදාරණසේක් ගෘහපති පුත්‍රය මේ ලෝකයෙහි සත්වයන්ට කුසලය හා සදෘශවූ ආකාරයෙක් නම් නැත. පිනැතිවුන්ට අනාකරයේ රත්නයන් උපදිති. එසේහෙයින් මේ කුසලය නම් දේවමනුස්සානං, දිව්‍යමනුෂ්‍යයන්ට, සබ්බකාමදදෝ ඉෂ්තාත්ථීය ඉෂ්ටකරන්නාවූ නිධි නිධානයක් හා සමාන වන්නේය. යං යං එව, යමක් යමක්ම, අභිපත්‍ථෙනති, සිතින් පාර්ථනා කළාහු වීනම්, සබ්බං ඒ සියල්ල එතෙන මේ කුසලය කරණ කොට ගෙණ ලබ්භති, ලැබෙන්නේය. සුසණ්ඨානතා මනාවූ වර්ණ සංස්ථාන ඇති බවද, සුරූපිතා මනාවූ රූපසම්පත්ති අති බවද, අධිපච්චපරිවාරො සියල්ලන් මැඩපවත්නා ආකාරයෙන් පවත්නාවූ අධිපතිභාවය හා පිරිවර ලබ්භති ලැබෙන්නේය. මානුසිකව සම්පත්ති මනුෂ්‍ය ලෝකයේ ඉපද අනුභව කටයුතු වූ සම්පත්තියක් ඇද්ද. දෙවලොවකොව යාරති දිව්‍යලෝකයෙහි ඉපිද සම්පත් අනුභවකරන්නට හේතු යම් ඇල්මෙක් ඇද්ද, යාවනිබ්බාන සමාපත්ති කෙළවර අර්හත් ඵලවසානයෙහි වින්දයුතුවූ යම් නිර්වාණ සම්පත්තියක් ඇද්ද, සබ්බං ඒ සියල්ල එතෙන මේ කුසලබලය හේතු කොටගෙණ ලබ්භති ලැබෙන්නේය.

මිත්ත සම්පද මාගමම, කල්‍යාණ මිත්‍රයන්ගේ සම්පත්තීයට පැමිණ හෙවත් සත්පුරුෂ සමාගමයට පැමිණ, වේ ඒකාන්තයෙන් යොනිසෝ පයුජ්ජතො, නුවණින් යෙදී වාසය කරන්නාවූ පුද්ගලයාහට, පුබ්බ, පූර්ව නිවාසානුස්මෘති, දිව්‍යචක්‍ෂුරභිඥාණ, ආශ්‍රවක්‍ෂයකරඥාණය සංඛ්‍යාතවූ ත්‍රිවිද්‍යාවන් හා විමුක්ති අර්හත්ඵල විමුක්තිහුගේ බසින් හා වොවසිතා, ප්‍රාප්තබය යන සබ්බං සියල්ල, එතෙන මේ කුසලය හේතුකොට ගෙණ ලබ්භති, ලැබෙන්නේය. පටිසම්භිදාය අර්ථපටිසම්බිදාය ධර්මපටිසම්භිදාය, නිරුත්ති පටිසම්බිදාය පටිභාණ පටිසම්බිදාන කියන ලද චතුපටිසම්භිදාද විමොක්ඛාච, සුඤ්ඤත විමෝක්‍ෂ අනි මිත්තවිමොක්‍ෂය අප්‍රනිහිත විමොක්‍ෂයයි කියන ලද ත්‍රිවිධ විමොක්‍ෂයන්ද. යාවසාවක පාරමී. යම් සාවක පාරමිතා ඥානයෙක් ඇද්ද, පචෙචකබෝධි ඥානයෙක් ඇද්ද. බුද්ධභූමි සම්‍යක් සමොබාධිඥාණයෙක් ඇද්ද සබ්බං ඒ සියල්ල මේ කුසලය කරණකොට ගෙණ ලබ්භති ලැබෙන්නේය.

යදිදං පුඤ්ඤසම්පදා යම් මේ කුසල සමුර්ධියෙක් ඇද්ද ඒසා මේ කුසල සප්පත්තිය එවං මෙසේ යථොක්තවූ කාරණයෙන් මහිඩිමා මහත්සෘධි ඇත්තේය. තසමා එසේහෙයින් ධිරා අෂ්ටලෝක ධර්මයෙහි අකම්පස් ස්වරූප ඇත්තාවූ පඩිතා නුවනැත්තාවූ සුක්තපුඤ්ඤතං සීලාදිවශයෙන් බොහෝ කොට කරණලද කුසල් ඇතිබව පසංසනති ප්‍රසංසාකෙරෙති වදාරා මේ සිරි ජාතකය නිමවා වදාළසේක. ඇත්හලට නායක අමාත්‍යයා රාජ්ජයට පැමිණියේය. රජ්ජුරුවන්ට කුලුපග තාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වලාදසේක.

SANHIDA LANKA

# මණි සූකර ජාතකය

තවද ඉරුට වඩා තේජෝ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සුන්දරී පරිබ්‍රාජිකාව අරභයා මේ ජාතකය දක්වන ලද. සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සර්වඥයන් වහන්සේට ලාභ සත්කාර මහතැයි තර්කයන්ට ලාභ සත්කාර මඳ එසේ හෙයින් තීර්ථකයෝ එක්ව ශ්‍රමණ භවත් ගෞතමයන්ට කිළුටක් උපද්දවා ලාභයෙන් පිරිහෙලම්හයි සිතා අනික් කෙණෙකුන්ට බැරිය. සුන්දරී පරිබ්‍රාජිකාව රූපයෙන් යෞවනයෙන් යහපත්ව ඉඳිනීය. ඈ විෂයෙහි ශ්‍රමණ භවත් ගෞතමයන්ට කිළුටක් උපද්දවම්හයි සිතා උන්කලට සුන්දරී පරිබ්‍රාජිකාවෝ නිගණ්ඨනාථ පුත්‍රයන් දිකින්ට ගොසින් වැඳලා සිටියහ. නිගණ්ඨයෝ උන්ට බසකුත් බැණ නොනැගී උන්නාහ. එවිට සුන්දරී පරිබ්‍රාජිකා කියන්නී ඇයි ස්වාමිනි බැණ නොනැගී වැඩ ඉඳිනේ සිතට කුමන වික්ෂේපයෙක්දැයි විචාළීය. එවිට නිගණ්ඨයෝ කියන්නෝ ඇයි තොපට නොදනේද ශ්‍රමණභවත් ගෞතමයන් අපට වන ලාභ සත්කාරත් විය නොදී අප මූන දලි ගා අපට කරණ නිසරු තොපි නොදනුදැයි කියා ඒ ශ්‍රමණ භවත් ගෞතමයන්ට කිළුටක් උපදවා පියාතොත් තොප විනා අනික් කෙණෙකුන්ට බැරියයි ඒ නියාවට තොපි යහපත් රූපශ්‍රී ඇත්තී දන්නා යම් උපායක් කොට උන්ට කිළුටක් උපදවයි කියන්නා ඔයිත් යහපත ස්වාමිනි කියා එදවස් පටන් උපාසකවරුන් ජේතවනාරාමයට ගොස් බණ අසා රූ එනකලට තොමෝත් ගඳ දුම් මල් පහන්ගෙණ බුලත් පුවක් ගෙණ කඩක්ගෙණ ඇතිරී කොට්ටත් ඇර ගෙණ ජේතවනාරාමයට යන්නාක්මෙන් අඟවා යන්නීය. ඈ දැක උපසකවරු ඇයි තෝ මේ වෙලේ කොයියෙහි දැයි විචාරති. ඔඳ ජේතවනාරාමයේ ගඳකිලියේ මාත් වාසයකරන්නේයයි කියයි. නිදානැඟිත් උපාසකරු එන්නාට පළමු ඉවත නිගණ්ඨයන් වාසය කරණ තෙනක ලැග ගමට බැස කොයි සිට එව්දැයි විචාළ කලට ජේතවනාරාමයේ ගඳකිළියෙහි ලැග එමියි කීයයි. මේ නියායෙන් බොහෝදෙනා දකිනා නියායෙන් ඇවිද කල්යවා බොහෝ දෙනා සැක උපන්පසු නිගණ්ඨයෝත් සෙරුන්ට අත්ලස්දී ඒ සුන්දී පරිබ්‍රාජකාව අල්වා මරා සර්වඥයන් ශ්‍රාවකයන් මැරුවා කොට අඟවා ජේතවනාරාමයේ ගඳ කිළියේ මල් දමන කසලගොඩ පීරාලවා නිගණ්ඨයෝ රජ්ජුරුවන්ට කියන්නාහු සුන්දරී පරිබ්‍රාජිකාව දන් දකින්නේ නැත. යම් යම් කෙනෙකුන් මරාපු බවත් නොදනෙයි, රජ්ජුරුවන්ට කියා අමාත්‍යයන් ගෙණ නුවර මුළුල්ල බලා ජේතවනාරාමයට ගොස් පරීක්ෂාකොට මල්කසල යට තිබුනු මිනිය ඇද එළියේලා ඇඳල ලාගෙන රජ්ජුරුවන්ට ගොසින් පෑහ. රජ්ජුරුවෝත් ශ්‍රමණ නියායෙන් සුසුන භූමියේ තබවයි කියා මුලුනුවර ආරියශ්‍රාවකයන් හැර සෙසු බොහෝදෙන එතනට රැස්ව ශ්‍රමණභවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයන් කළද බලවයි ඒ ඒ තැන සිට බණන්නාහ. එපවත් භික්ෂූන් වහන්සේ සර්වඥයන්වහන්සේට දැන්වූවාහ. සර්වඥයන් වහන්සේ වදාරණසේක් වැරැද්ද කළ කෙණෙකුන්ට ආක්‍රෝශය කියන පමණක් විනා නිවරදි සත්වයන්ට කවරෙක් කිවත් තමාට ප්‍රයෝජන කිම්දැයි කියවයි වදාළසේක. කෝසල රජ්ජුරුවෝ කියන්නාහු සර්වඥයන් වහන්සේගේ ශාසනයෙහි ශ්‍රාවකයන් වහන්සේ මිනියක් නොමරණ සේක. මිනිය මැරුවන් විචාරා නියම් කරන්ට උවමැනව වදාළ කල්හි අමාත්‍යයෝ මිනිය මැරුවන් පරික්ෂාකරන්ට නියෝග කළ කල්හි නිගණ්ඨයන්ගෙන් මසුරන් පන්සියයක් අත්ලස් ඇරගෙණ මිනිය මැරූ වන් පරීක්ෂා කරන්ට නියෝග කළ කල්හි නිගණ්ඨයන්ගෙන් මසුරන් පන්සියයක් අත්ලස් ඇරගෙණ මිනිය මැරූ සොරුන්ගෙන් සමහර කෙනෙකුන් එකියන රන් දීලා රා මස් ආදිය ගන්නාහ. රන් නොලත් සොරු කියන්නාහු එක් මිනියක් මරා ලත් රනින් අපටත් සරියේ නොදී තුමූම ප්‍රයෝජන ගන්නාහයි සියල්ලවුන්ට ඇසෙන නියායෙන් කීබස් අමාත්‍යයෝද අසා මෙකියන සොරුන් ගෙණගොස් රජ්ජුරුවන් වහන්සේට පෑ කල්හි මෙකියන මිනිය කවුරුත් කියමනකින් මැරූදැයි විචාළ කල්හි නිගණ්ඨයන්ගෙන් අත්ලස් ඇරගෙණ මිනිය මැරුම්හයි කී කල්හි එකියන නිගණ්ඨයන් ගෙන්වා විචාරා සැබෑවයි නිගණ්ඨයන් කි කල්හි එබස් අසා රජ්ජුරුවන් වහන්සේ එකියන මිනිය ගෙන්වාගෙණ මිනිය නිගණ්ඨයන්ගෙන් ඉස තබා එනුවර විථියක් පාසා කියා ඇවිදින්නාහු මේ මිනිය සර්වඥ ශාසනයේ ශ්‍රාවකයන් වහන්සේ නොමැරූසේක. ඔබ වහස්සේගේ සර්වඥයන් වහන්සේ නිෂ්ප්‍රභාකරණ පිණිස අපිය මැරුමෝයයි කියවයි කියා විථියක් පාසා ඇවිදුවයි කියා යවු නියාව සියලු සත්වයෝ අසා සර්වඥ ශාසනයට බොහෝ ශ්‍රාවකයන් වහන්සේ නිශ්ප්‍රභා කරන්ට සිතා නිගණ්ඨයෝ තුමූම නිෂ්ප්‍රභාවූවෝ වේදැයි ශ්‍රාවකයන් වහන්සේ කියා කියා වැඩඋන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තවය උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි යම්සේ සිංහයාගේ ඡායාව නොපෙණන පරිද්දෙන් උන් ගුහාව කිළුටුකරන්නට වැද කිළුටු කොටගත නුහුනුවාක්මෙන් සර්වඥයන් කිළුටුකොටගත නුහුනුවෝ වේදැයි වදාරා ඒ භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

SANHIDALANKA

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක්තරා බමුණු කුලයක ඉපිද පංච කාමයෙහි ආදිනව දැක ගිහි භාවය හැර හිමාලය වනයට වැද සත්පර්වත වලල්ලක් ඇතුළුපිට තාපසව වාසය කරන්නාහ. බෝධිසත්වයන් වසන්නාවූ ස්ථානයට නුදුරු තැනක වෛඩූර්ය මාණික්‍යමය ගුහායෙහි උපන්නාවූ ඌරෝ තිස්දෙනෙක් වාසය කරන්නාහ. ඊට ඔබ්බේ ගුහායෙක සිංහයෙක්

වාසය කෙරෙයි. එර් සිංහයාගේ ඡායාව වෛඩූර්ය ගුහායෙන් පෙනෙන්නේය. ඌරෝ සිංහයාගේ ඡායාව දකිමින් දවස්පතා භයට පැමිණෙන්නාහ. එවිට ඌරෝ සිතන්නාහූ මේ ජායාව මකන්ට උවමැනවයි සිතා මඩෙහිගැලී ඇවිත් ඒ ගුහායේ ඇඟ උලන්නාහ. මේ නියායෙන් මඩ හා ඌරන්ගේ ලොම් වැද ගැණීමෙන් මැණිකේ ඡායාව ආදි නියාවටත් දියුණුව බබලන්ට වන. ඌරෝ මේ නියායෙන් උත්සහ කොට ඒ පර්වත කිළුටුකොටගත නොහි එන්නාහූ තාපසයන් කරා ගොස් මීට උපායක් විචාරම්හයි සිතා තාපසයන් වහන්සේ අපි මේ වෛඩූර්ය ගුහායේ සත් අවුරුද්දක් විතර වාසය කළම්හ. අපි වසන්නාවූ ගුහාවට නුදුරු තැනක සිංහයෙකු වාසය කරන්නේය. සිංහයාගේ ඡායාව පර්වතයේ වැටි අපට දවස් පතා භය බැවින් උපදවයි. එසේ බැවින් පර්වතය කිළුටු කරන්නටයයි කියා මඩගා උලාත් පර්වතය කිළුටුකොට ගත නුහුනුවම්හ. ඊට අපට උපායක් කියන්නේ යහපතැයි සිතා තාපසයන් වහන්සේ අතින් උපයාක් විචාළාහ. තාපසයෝ කියන්නාහූ ඌරු ලොම් හා මඩ වැද ගැණීමෙන් පර්වත ඔහය පවත්වන පමණක් විනා කිළුටු කොටගත නොහැක. මේ උපායෙක් නොවෙයි තොපි ඇම මේ ගුහාව ඇරපියා භය ඇත්නම් ඔබ්බකට පලායවයි කීහ. යහපතැයි ඌරෝ ඔබ්බට ගියහ. බෝධිසත්වයෝත් නොපිරිහුනු ධ්‍යානායෙන් පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගියහයි වදාරා මේ මණිසූකර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි තාපසව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

## මච්චවාර ජාතකය

තවද මාගේ කල්‍යාණ මිත්‍රවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් සොර වෙළඳාම් දන්නා ව්‍යාපාරිකයෙකු අරභයා මේ ජාතකය වදාරණසේක්.

මෙහි වර්තමාන කථාව යටගිය ජාතකවල පෙණෙන්නේයයි. මෙහි වනාහී බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයහි බෝධිසත්වයෝ කෙළෙඹි කුලයෙක ඉපිද තමන්ගේ මලනුවන් හා සමග වෙළඳාම් කොට මස්සෙන් දහසක් උපදවාගෙණ දෙබෑයෝ ගමට එන්නාහු සැඩ ගඟක් සමීපයෙහි වැල්ලේ ඉඳ බෝධිසත්වයෝ බත් කා මසුන්ට බත්ලා දෙවියන්ට පින්දුන්නාහ. ඒ ගංගාවේ වාසයකරන්නාවූ දේවතාවා පින් අනුමෝදන්විය. ඒ විපාකයෙන් එමවිටම බොහෝ සම්පත් ලැබ බෝධිසත්වයන් කෙරේ සතුටුවිය. ඒ අවස්ථාවට බෝධිසත්වයෝත් බත් කා වැල්ලේ නිදන්ට වන්නාහ. ඒ වෙලේ බෝධිසත්වයන්ගේ මලනුවෝ වංඤ්චා ප්‍රයෝග දන්නාහ. එසේ හෙයින් මාගේ බෑනනුවන් වඤ්චාකොට මසුරන් දාස ඇරගන්ට උවමැනවැයි සිතා බොරළු පයියක් මසුරන්දාස නියාවට බැඳ බෝධිසත්වයන් ලඟ තබා බෝධිසත්වයන් පිබිද යන්නාවුන් හා සමඟ ඔරුවට නැගෙන ගමනේ රන්පයියත් බොරලු පයියත් ඇරගෙණ නික්මුනාහ. බෝධිසත්වයන්ගේ මලනුවෝ බොරලු පයියත් ඇරගෙණ නික්මුනාහ. බෝධිසත්වයන්ගේ මලනුවෝ බොරළු පයිය දමා රන්පයිය ගනිමියි සිතා දමන තැනැත්තෝ බොරළු පයිය තිබාගෙණ රන්පයිය දැමුහ. බොරලුපයිය දමමි සිතා රන්පයිය වැටිනැයි කීහ. එවිට බෝධිසත්වයෝ යහපතැයි කියන්නාටයයි කියා උන්නාහ. ගඟ වසන්නාවූ දේවතාවා ලාභයක් කළ තෙනැත්තවුට මා උපකාරකරන්ට උවමැනවයි සිතා වැටුනු මසුරන්දහස මත්ස්‍යයෙකු ගිලින්ට සලස්වා තෙමේත් ඒ මත්ස්‍යයන්ට ආරක්ෂා ගත්තේය. එකියන දෙබෑයෝ ඔරුවෙන් ගොඩනැගී තමන්ගේ ගමට ගියාහ. බෝධිසත්වයන්ගේ මලනුවෝ රන්පයිය යයි සිතා බොරළු පයිය මුදා බලා සිතන්නේ රන් මටත් නුවුයේය. මාගේ බෑනන්ටත් නුවුයේය. බොහෝ විකේෂ්පව වැදහොත්තාහ. එවෙලාවට කෙවුලෝ මාදල් එලා කුඩමැස්සන් අල්ලන්ට ගියාහ. දේවතාවගේ ආනුභාවයෙන් මසුරන් දහස ගිලුනු මත්සයා මාදැලට අසුව ගියේය. එවිට කෙවුලෝ කුඩමැස්සන් මරාගෙණ අවුත් සෙසු මත්ස්‍යයන් විකොට රන්දාස  ගිලු මත්ස්‍යයා ගෙයක් පාසා ඇරගෙණ මසුරන් එක්දාස් සත්කලඳකට ඇරගණුවයි කියා ඇවිද ඇරගන්නන් නැති හෙයින් බෝධිසත්වයන්ගේ ගෙදරට ගෙණ ගියාහ. බෝධිසත්වයෝ කොතනට විකුනන්නේයයි විචාරන්නා එක්දහස් සත්කලඳකට යයි කියන්නා සත්කලඳකට දෙවයි කියා ඉල්ලු ගමනේ යහපත, නුඹවහන්සේ ඇරගණිතොත් ඒ නියාවට දෙම්හයි කියා රන් සත් කලඳක් ඇරගෙණ මත්ස්‍යයා දුන්නාහ. ඈ මත්ස්‍යයා දෙම්හයි කියා රන් සත් කලඳක් ඇරගෙණ මත්ස්‍යයා දුන්නාහ. ඈ මත්ස්‍යා ගෙණ ගොසින් මාලු කරණකලට මත්ස්‍යයා බඩුතුබු මසුරන් දහස දැක බෝධිසත්වයන්ට ගෙන ගොසින් දුන්හ. බෝධිසත්වයෝ දාසින්බඳ පියල්ල දැක තමන්ගේ අස් නියාව දැන කවුරුදෝ මාගේ මේ ලාභය මට පවත්කොට දුන්නේයයි සිතා උන්කලට දේවතාවා ආකාශයෙහි සිට මමය මේ මත්ස්‍යයා අනික් කෙණෙකුන් ඇර ගත නොදි තොපට ගෙනැවිත් දුන්නේම් මම්මයි කියාත් තොපගේ මලනුවන් කෙළේ මෙලෙසයයි කියාත් උන්ට මින් මස්සකුත් නොදෙවයි කියාත් දේවතාවනුත් යම්කෙනෙකුන්ට ප්‍රසංසා වන්නේ යහපත් කෙනෙකුන්ට විනා මුන්සේවූ ලෝභින්ට ප්‍රසංසා නොවෙයි කියා මස්සකුත් නොදෙවයි කීහ. එසේ වුවත් බෝධිසත්වයෝ මසුරන් පන්සියයක් දුන්නාහයි වදාරා මච්ඡචාර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කූටවාණිජ වෙළඳා නම් මෙසමයෙහි සොරවෙළඳුය, එසමයෙහි කෙළෙඹි පුත්‍රව උපන්නේ නම් බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළ සේකී.

SANHIDA LANKA

# නානාච්ඡන්ද ජාතකය

තවද සරණවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ආනන්ද සවාමින් ලත් වර අටක් අරභයා මේ ජාතකය දක්වන ලද මෙහි වර්ථමාන කථාව එකක නිපාතයේ ජුණ්හ ජාතකයෙහි බස්නේය.

හේ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරු කෙණෙක් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝත් ඒ රජ්ජුරුවන්ට පුත්ව ඉපද පියානන්ගේ ඇවෑමෙන් රාජ්ජයට පැමිණ පියානන් සමයේ පුරෝහිතව සිටි බමුණා හැර අනික් බමුණකු පුරෝහිත ස්ථානන්තරයට ගත්හ. ඒ බමුණුත් එක්මාර්ගයෙක වාසය කරන්නේය. එක්දවසක් බරණැස් රජ්ජුරුවෝත් නගර සෝධන දිනයේ තනිව ඇවිදිනාහ. එකල පන්සියයක් රාබී මත්ව යන්නාවූ සොරු රජ්ජ්රුවන් දැක කවුරුන් බවත් නොදන තළා උතුරුසළුවත් උදුරා ගෙණ රා කලයක් ඉස තබා ගෙණ යන්නාහු රජ්ජුරුවෝත් තනි විසින් කුමකුත් කියාගත නොහී සොරුන් පස්සේම නික්මුණාහ. එවෙලාවට දුක්පත් පුරෝහිතයා තමාගේ මිදුලේ සිට ආකාශය බලන්නේ ආකාශයේ තාරකා විශේෂයක් දැක තමාගේ බැමිණිය කැන්දා එම්බල බැමිණිය අපගේ රජ්ජුරුවන් වහන්සේ පසමිතුරන්ට අසුව ගිය සේකැයි කීහ. බැමිණිත් නුඹ කෙසේ දතුසේක්දැයි කියන්නා තාරකා විසෙසයකින් දනිමි කීහ. රජ්ජුරුවෝ බමුණා කීබස් කථාව ඇසුවාහ. රජ්ජුරුවෝත් සොරුන්ට කියන්නාහූ ස්වාමිවරුනි මම නිකම් දුක්ඛිතයෙකිමි. මා නිකම් ගෙණගොස් තොපට ප්‍රයෝජන කිම්ද? මාගේ උතුරුසලුව පමණක් ඇරගෙණ මා ඇරපියවයි දුප්පත් නියා කීකල්හි සෙරුන් සැබැව, මේ නිකම් දුක්ඛිතයාගෙන් කම් කිම්දැයි කියා දයාවෙන් ඇරපීහ. එවිට බමුණා එම්බල පින්වත අපගේ රජ්ජුරුවන් වහන්සේ දන් ගැලවි ගිය සේකැයි කීහ. ඒත් රජ්ජුරුවෝ අසා රජගෙට ගොස් උදෑසනක්සේම පුරෝහිත බ්‍රාහ්මණයා ඇතුලුවූ බොහෝ බමුණන් රැස්කරවා විචාරන්නාහු කුමක් ඊයේ රෑ අපට වූ ලාභ අලාභයක්වත් අපට වූ දුකක්වත් ඇද්දැයි විචාළාහ. බමුණෝ කියන්නෝ ස්වාමින්ට වූ ලාභයකුත් නැත, අන්තරායකුත් නැත, ග්‍රහයෝත් සිටිහයි කිසිම අමුත්තක් නැතැයි කීහ. එවිට රජ්ජුරුවෝ අසවල් මාලුගෙයි පුරාතන පුරෝහිත බමුණා ගෙන්වයි කියා ගෙන්වා තමා විසින් දුටුකාරණයකින් මටවූ අන්තරායක් ඇත්නම් කියවයි කියා ගෙන්වා තමා විසින් දුටුකාරණයකින් මටවූ අන්තරායක් ඇත්නම් කියවයි කියා කිහ. එසේය දේවයන්වහන්ස, තාරකා විශේෂයකින් නුඹ වහන්සේ සෙරුන්ට අසුව එවිට ගැලවි ගිය නියාව දිටිමි කීහ. එවිට රජ්ජුරුවෝ මේ කියන කොල්ලෝමෙපමණෙක් නුදුටුවෝය. ශාස්ත්‍ර උගනිතොත් මෙසේ උගන්ට එපාද, තෙල කොල්ලන් පිටත ලවයි පුරෝහිත බමුණා ඇතුළුව බමුණන් පිටත් කරවා පරණ පුරෝහිත බමුණා පුරෝහිත ධුරයෙහි සලස්වා තොපි කී ශාස්ත්‍රයෙහි ඉතා සතුටු වුම්හ. තොප කැමති වරයක් ගණුවයි කීහ. එවිට බමුණු කියන්නෝ මා කැමති වරයක් මා ගත්කල මාගේ බිරින්ද දරුවන් යෙහෙළියන් කොල්ලන් කෙල්ලන්ගේ අභිප්‍රාව නොදනෙයි ගෙටගොස් විචාරා ඇවිත් කියමි කීහ. එවිට රජ්ජුරුවෝත් යහපතැයි විචාරා එවයි කී කල්හි බමුණු ගෙට ගොස් අඹුදරුවන් යෙහෙලියන් කෙල්ලන් කොල්ලන් එක්කරවා විචාරන්නේ රජ්ජුරුවන් වහන්සේ මට කැමති වරයක් ගණුවයි වදාළසේක. මම තොප ඇම විචාරමියි තොපට කැමැත්තක් කියවයි කී කල්හි ඔහුගේ අඹුව කියන්නී මට කිරිදෙනුන් සියයක් දෙවයි කීහ. ඡත්තපාණී නම් පුත්‍ර කියන්නේ යහපත් සවින්ධයන් යෙදූ රථයක් ඉල්වා දෙවයි කීය. යෙහෙළි කියන්නේ මට යහපත් මැණික් කුණ්ඩලාභරණ දෙකක් ඉල්ලා දෙවයි කීය. කෙළි කියන්නී මට යහපත් වනක් මෝලක් කුල්ලක් ඉල්වාදෙවයි කීය. එකියන බ්‍රාහමණතෙම සිතන්නේ මට ගමක් උවමැනවැයි සිතා රජ්ජුරුවන් කරා ගොස් කියන්නේ අප ඇමගේ සිතිවිල්ලම එකඟ නොවෙයි නානාච්ඡන්ද යයි කියන්නේ මම ගමක් ලබන්නා කැමැත්තෙමි. මාගේ ගෙයි බිරින්ද කිරිදෙනුන් සියයක් කැමැත්තීය. මාගේ ඡත්තපාණී නම් පුත් අසුන් දෙදෙනකු යොදනලද රථයක් ලබන්නා කැමැත්තේය. මාගේ යෙහෙලි මැණික්මය කුණ්ඩලාභරණ දෙකක් කැමැත්තීය. මාගේ පුණ්ණා නම් දාසී වනක් මෝලක් ලබන්ට කැමැත්තිය කීය. එවිට රජ්ජුරුවෝ පුරෝහිත බමුණාට ගමක් දෙවා ඌගේ අඹුවට කිරිදෙනුන් සියයක් දෙවා ඌගේ පුතාට අසුන්දෙන්නෙකු යොදනලද රථයක් දෙවා යෙහෙළියට කුණ්ඩලාභරණ දෙවා පුණ්ණා නම් දාසියට වනක් මෝලක් කුල්ලක් දෙවයි යන මේ සියල්ලම දී බොහෝ සම්පත් රජ්ජුරුවෝ දුන්හයි වදාරා මේ නානාච්ඡන්ද ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා නම් ආනන්ද ස්ථවිරිය. රජව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේකී.

SANHIDA LANKA

## විතිය සීලවිමංස ජාතකය

තවද මටම පිහිවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්ථමාන කථාවත් එකක නිපාතයෙහි සීලවිමංස ජාතකයෙහි දක්වන ලද.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රාහ්මණව ඉපද සීලය වැඩිදෝහෝයි ජාතිය වැඩිදෝහෝයි විමසන පිණිස විරීයේ පිළින් රන් තුන්මස්සක් සොරකම් කොට ඇරගත්තාහ. විරීයේ වෙළෙඳුන් බමුණා රන්සොරා අරගතැයි අල්ලා ගෙණ රජ්ජුරුවන්ට පාන්ට යයි ගෙණෙන කලට අතරමග පාඹට්ටියෙක් නයෙකු ඇරගෙණ කෙළවන්ට වන. ඒ වෙලාවට බෝධිසත්වයෝත් සර්පයා නන් විෂසෝරය. එසේවූ සර්පයා අල්වාගෙණ කෙළින්ට යහපත් නොවෙයි ඇරපියවයි කීහ. එකියන පාඹට්ටියා කියන්නේ මේ සර්පයා සිල්වත කඩා නොකති කීහ. එවිට බෝධිසත්වයෝ සිතන්නාහු සර්පයා පවා කඩානොකන්නේ සිල්වතැයි අසාගතැයි සිත සිතා රජගෙට ගියාහ. රජ්ජුරුවෝත් ආචාරීනි මේ කෙළේ කිම්දැයි කියන්නා දේවයන් වහන්ස, මා සොරකමට කළදෙයක් නොවෙයි, සීලය වැඩිදෝ ජාතිය වැඩිදෝහෝයි සිතා පරීක්ෂාකරන්ට කෙළෙමියි කියන්නාහු, සිලං, ආචාරසීලය, කලානංකිරෙව, යහපත් වන්නේය. ලොකෙ, ලොකයෙහි, සිලං, සීලය, අනුත්තරං, නිරුත්තරය, පස්ස, බලව, සොරවිසෝනාගො, සොරවූ දරුනු විෂ ඇති සර්පයා, සිල්වා ඉති සිල්වතැයි කියා, නහඤ්චති, හිංසනය නොකෙරෙයි, සිල්වා, සිල්වත්වූ පුරුෂ තෙම යෙන, යම් සිලාභරණයක් හේතුකොටගෙණ සිල්වා සිල්වත් වූයේ ආරියවුත්ති සමාචාරො, බුද්ධාදී වූ ආර්යයන්ගේ ප්‍රතිපත්තිය හැසිරෙන්නේයයි වුච්චති, කියනු ලැබේ. ලොකො, ලොකයෙහි සිවං, නිරුපද්‍රයයි, අනුමතං, දන්නා ලද බවද, එසේවූ, සිලං සිලය, සෝ අහං, ඒ මම , සමාදිස්සං, සමාදන්වෙමි, සිල්වා, අඛංඩාදින් යුක්ත කොට රක්ෂාකරණ සිලය ගුණයෙන් යුක්තවූයේ ඤාතිනච නැයන්ටද, පියෝ ප්‍රියවූයේ, හෝති වන්නේය. මිතෙතසුව, මිත්‍රයන් කෙරෙහිද, විරොචති, බබලන්නේය, කායස්සභේදා,ශරීරයාගේ භේදයෙන් චුති, චුති, චිත්තයෙන් මත්තෙහි සුගතිං, සුගතියෙහි, උප්පජ්ජති, උපදනේයයි කියා දේවයන් වහන්ස, මට ගිහිගෙයින් ප්‍රයෝජන නැතැයි කියා අවසර ගෙණ හිමාලය වනයට වැද ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බ්‍රහ්ම ලෝකයෙහි උපන්නේ යයි වදාරා සීලවිමංසන ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළ සේකී.

SANHIDA LANKA

# භද්දසට ජාතකය

තවද මා නිසා බුදුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අනේපිඩු මහා සිටානන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

අනේපිඩු මහා සිටානන්ගේ එක්පිතෙක් අක්ෂ ධූර්තී සුරා ධූර්තී ස්ත්‍රී ධූර්තී නොයෙක් දෙයෙහි වාසය කොට ඇති සම්පත් නසා දුක්පත්ව තමන්ගේ පියානන් කරා අවුත් දුක්ඛිතයෙමි කියන්නා පියාණෝ මසුරන් පන්සියයක් දුන්නාහ. ඒ මසුරන් පන්සියත් වෙළඳාම් ආදීවූ දෙය කොට සම්පත් උපදවා නොගෙණ එයිත් ධූර්තිකමින් නසා පෙරලා අවුත් පියානන් අතින් සම්පත් ඉල්වූහ. පියාණෝ පෙරළා සම්පත් දී ඒ බව සර්වඥයන් වහන්සේට දැන්වූශ. සර්වඥයන් වහන්සේ පළමුත් මුන්ට උත්තමයෝ සම්පත් දීම ගියාහ. මේ සම්පත් නසාම ගියෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එනුවර සිටු ව ඉපිද සදන්හල් කරවා මහත්වූ දන්දී මිය ගොස් දෙදෙව්ලොවට නායකවූ ශක්‍රදේවේන්ද්‍රව තෙමේ තමාගේ පුත්‍රයා කුමක් කොට වාසයකෙරේදෝහෝයි බලා දුක්ඛිතව සිඟාකා වාසය කරණ නියාව දැක දයාවෙන් මොහුට මා විසින් සම්පතක් දෙන්ට උවමැනවැයි සිතා භද්‍රඝටයක් දී කියන්නාහු මේ පූර්ණඝටය ඉඳුරා තිබාගෙණ උන්නුනම් තොපට කිසි සම්පතකිනුත් අඩුවෙක් නැතැයි කියා පූර්ණඝටය දී දෙව්ලොවටම ගියේය. ඒ තෙම පූර්ණඝටයෙන් උපන් සම්පත් ඇරගෙණ සුරාව අනුභව කොට උන් කලට එක්දවසක් තෙමේ පූර්ණඝටය රා බී මත්ව ආකාශයට දම දමා උන්කලට පූර්ණඝටය බිම වැටී බිඳුනි. එතැන්පටන් තමන් දුක්ඛිත විය. ඒ අර්ථය දක්වන සර්වඥයෝ සබ්බකාමද්දං, සියලු කැමැතියෙක් දෙන්ට සමර්ථවූහ. කුම්භං සංඛ්‍යාතවූ කුම්භඝටය ධර්තිකොට ඒ ධර්තීයාට යම් පමණ කාලයක් රක්ෂා කෙරේද?. තාව, ඒ තාක්, සුඛං සුව, වඩ්ඪති, වඩායදා, යම් කලෙක්හි මතෙතා, සුරාමදයෙන් මත්ව, දදිතෙතාව, දර්පිතද, එකල්හි, පමාදං ප්‍රමාදයෙන්, කුම්භං පූර්ණඝටය, අබභිදා, බින්දේද, තාතො, ඉක්බිත්තෙන්, නගොගාව, නග්නවූයේද, පොතෙව, කැතිරිකඩ, අඳනාලද්දාවූද, බාලො, අඥානයා, පච්ඡා, පසුව, විභඤ්ඤති, පශ්චාත්තාපයෙන් තැවෙන්නේයි, යෝ යමෙක් තෙම, ඉමං, මේ ධනං, ධනය, එවමේවං, එපරිද්දෙන්ම, අමත්තා, පමණ නොදැන, ස්පොපාති, ප්‍රයොජන විඳිද, සො දුමේමධො, ඒ අඥාන සත්වතෙමේ, කුම්භංභිත්වා, ධූත්තෙක, භද්‍රඝටය බිඳ වික්ෂේපයට පැමිණියාවූ ධූර්තීයා පරිද්දෙන් පච්ඡාතංපති, පසුතැවිලි බවට පැමිණෙන්නේයයි වදාරා භද්‍රඝට ජාතකය නිමවා වදාළසේකී. එසමයෙහි පූර්ණඝටය බිඳි සිටුපුත්‍රයා නම් මේ කියන සිටුපුත්‍රයාය. එසමයෙහි ශක්‍රව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේකී.

SANHIDA LANKA

# සුපත්ත ජාතකය

තවද මාම නිසා මේ සද්ධර්මය දේශනා කොට තබාලූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සැරියුත් ස්වාමින් යසෝධරා ස්ථවිරින් වහන්සේට දුන් රේමස් මුසු ඇල්සාලේ බතක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

අබ්භ්‍යන්තර ජාතකයෙහි අඹ ලද්දාමෙන් රාහුල ස්ථවිරයන් වහන්සේ සැරියුත් සාමින්ට කියා කොසොල් රජ්ජුරුවන්ගෙන් රේමස්මුසු ඇල්සාලේ බතක්ගෙණ ගොසින් යසොධරා ස්ථවිරීන්ට දෙවයි කියා රාහුල ස්ථවිරින්ට දුන්සේක. එපවත් රජ්ජුරුවෝ අසා එවක් පටන් රේමස් මුසු ඇල්සාලේ බත් යසෝධරා ස්ථවිරීන්ට දුන්නාහ. මේ කථාව ධම්සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බොධිසත්වයන් වහන්සේ අසූදහසක් කවුඩන්ට නායකවූ සුපතක නම් රජ්ජුරුවෝය, සුමුඛ නම් සෙනෙවිරද්දුය, සුඑස්සා නම් බිසවිය යනාදීන් තුන්දෙන බරණැස් නුවර වාසය කරන්නාහුය. එක් දවසක් බෝධි සත්වයන් හා අග්‍රමෙහෙසිකාවන් හා දෙන්න මුළුතැන් ගෙය මුදුනෙන් ආකාශයෙන් යන්නාහුය. එකල අරක්කැමියා මාළු උෂ්ණ නිවන්ට යයි කියා අත්පතලා වලමලා ඇර තිබූහ. ඒ වෙලාවට බෝධිසත්වයන්ගේ බිරින්ද මත්ස්‍ය ගොදුරට යන්නාහු භාර්‍ය්‍යාවන් කැඳවූහ. එවිට සුඑස්සාවෝ කියන්නාහු ස්වාමිනි, මට දොළෙක් උපන, එසේහෙයින් නුඹවහන්සේ ගොදුරට ගිය මැනව, මම යා නොහෙමි කීහ. බෝධිසත්වයෝ කෙබඳු දොළෙක් දැයි විචාරන්නා රජ්ජුරුවන්ගේ අග්‍රභෝජනය ලබන්නා කැමැත්තෙමි එය මට ලැබෙන්නේ නැත. එසේ හෙයින් මාගේ ප්‍රාණය යන පමණෙකැයි කියා වැදහොත්තාහ, බෝධිසත්වයෝත් විකෙෂ්පව උන්කලට සුමුඛ නම් සෙනෙවිරද්දු බෝධිසත්වයන් ලඟට අවුත් ඇයි මූණ මලානිකව මුසුප්පුව ඉන්නේ කිම්දැයි විචාරා එපවත් අසා යහපත, ස්වාමිනි, මට භාරය නුඹවහන්සේලා දෙදෙනා වහන්සේ ගොදුරට නොවඩින්නමෝ යයි කියා කවුඩන් එකෙණෙහිම එක්කරවා ගෙණ බරණැස් නුවරට ගොස් කවුඩන් මොත්තන් නියායෙන් රැකවල් සලස්වා ශක්ති සම්පන්න කවුඩන් අටදෙනෙකු ඇරගෙණ රජ්ජුරුවන්ගේ මුළුතැන් ගෙයි පලය පිට ඉඳ කියන්නාහු රජ්ජුරුවන් වහන්සේට මේ වඩන්ට ගෙණ යන වේලාවට මම ගොසින් වස්න එලාපියමි. තොපි සතරදෙනෙක් ගොසින් බත් උකාගණුව, මම අසූවයෙමි මා අසුවූ නියාව නොකියව මා අසුවූ නියාව ඇසුවොත් බත් මේ නොනිමන සේක. පසුපස්සේ එන නියාව කීය. ස්වාමිනුත් අග්‍රමහේසිකාවන් වහන්සේත් බත් කවයි කියා උන්කලට අරක්කැමියත් වසුන්කද කරතබා ගෙණ මේ වඩා ගෙනෙන කලට කවුඩු සෙනෙවිරද ගොසින් ලැමද්දේ ඉඳ නාසය ඩැගෙණ පියාපත් දෙකින් දෑස වසාගත, ඒ වෙලාවට රජ්ජුරුවෝ මතුමාලේ සිටියාහු මේ ක්‍රියාව දැක අරක්කැමියා වසනේන් අපට කම් නැත. ඒ දෙමාපියා කවුඩා නොහැර අල්වයි කීය. යහපතැයි කියා වස්න දමා කවුඩා නොහැර අල්වාගත, එවිට කවුඩෝ අටදෙන තමන්ගේ බඩ පුරා කන්නක් කා තමන්ගේ රජ්ජුරුවන්ට හා බිසවුන්ටත් බත් හැරගෙණ ගියහ. බිරින්දත් කවුඩු රජ්ජුරුවෝත් බඩපුරා කෑහ. රජ්ජුරුවන්ට ඒ සුමුඛ නම් සෙනෙවිරදුන් පාන්නා ඇයි තොපගේ ප්‍රාණයටත් නොසිතා රජ්ජුරුවන් වහන්සේට ගෙනන වසුනැයි කියාත් නොසිතා අරක්කැමියාගේ නාහයත් ඩැ වණකලේ කුමක් නිසාදැයි විචාළාහ. දේවයන් වහන්ස. නුඹ වහන්සේගේ මේ නුවරම අපගේ අසූදහසක් කවුඩන්ට රජව ඉන්නාවූ සුප්තක නම් කවුඩු රජ්ජුරු කෙණෙක් ඇත. ඒ රජ්ජුරුවන්ගේ සුප්තතා නම් බිසෝ කෙනෙකුන් වහන්සේ නුඹවහන්සේගේ භෝජනයට දොළ ඇතිව ආයාසය විඳිනා මාගේ රජ්ජුරුවන් වහන්සේට ජීවිතය පුදා උන්වහන්සේට බත්දෙන නිසා මාගේ ප්‍රාණයට නොසිතා කෙළෙමි කීහ. එසේ හෙයින් යම්කෙනෙක් තමන්ගේද දෙමව්පියන්ගේද ස්වාමිපුත්‍රයාගේද යම් මනෝරථයක් නිසා ප්‍රාණය දුන්නත් මෙලොවත් පරලොවත් යහපතක් විනා නපුරෙක් නැත, නුඹ වහන්සේගේ වස්නත් බිඳ මෙසේවූ ද්‍රෝහයක් කෙළෙමි කැමති යම් ආඥාවක් කරවා වදාරණ බවයයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු එම්බල මාගේ බොහෝ සත්කාර සම්මාන විඳ ඉඳිනා අමාත්‍ය ආදීවූ අය අපට මෙසේවූ පක්ෂපාතකමක් කරණ කෙණෙක් නැත. තොප මෙකළ පක්ෂපාතකම ඒ කවුඩු රජ්ජුරුවන්ට කලදෙයෙක් නොවෙයි මට කල පක්ෂ පාතකමය එසේහෙයින් තොපට ආඥාවක් නොකරවමි. තොපට මාගේ රාජ්ජයෙන් පූජාකෙරෙමි කියා රාජ්ජය පූජාකලහ. එවිට සුමුඛනම් සෙනෙවිරද්දු කියන්නාහු දේවයන්වහන්ස, අපි තිරිසන්නුය, අපට සේසතින් ප්‍රයොජන නැතැයි කියා තමන්ගේ සුප්ත්තා නම් කවුඩු රජ්ජුරුවන්ගේ ගුණ විස්තරවශයෙන් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ කියන්නාහු තොපගේ කවුඩුරජ්ජුරුවනුත් උන්ගේ බිරින්දත් අප දකින්ට උවමැනවයි කියන්නා සුමුඛ නම් සෙනෙවිරද්දු තමන්ගේ රජ්ජුරුවනුත් බිසවුනුත් රජ්ජුරුවන්ට පෑහ. එවිට රජ්ජුරුවෝ බෝධිසත්වයනුත් බිසවුනුත් දැක මහාසමාධිව තමන්ගේ මේ නිමන බතින් සුපත්ත නම් කවඩුරජ්ජුරුවන්ට හා සුඑස්සානම් බිසවුන්ට හා සුමුඛ නම් සෙනවිරදුන්ට හා තුන්දෙනාට බත්දෙවා සෙසු කවුඩන්ට සාල්තුනමුනෙක බත්දෙන්ට සලස්වාලූහ. කවුඩුරජ්ජුරුවන්ට කවුඩුව කී බණ සත්සියයක් අවුරුදු නොනැසී පැවැත්තෙයයි වදාරා සුපත්ත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරිය. සුමුඛනම් සෙනෙවිරද්දු නම් ශාරිපුත්ත ස්වීවිරිය. සුඑස්සා නම් බිසව් නම් යසෝධරා ස්ථවිරිය සුපත්තා නම් කවුඩුරජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# ජම්බුඛාද ජාතකය

තවද හුදු කරුණාවෙන් මවා ලූ රුවක්වැනි සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ හා කොකාලිකස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

කෝකාලිකස්ථවිරයෝ තැනින්තැන ගොස් උපාසකවරුන්ට දේවදත්ත ස්ථවිරයන්ගේ ගුණ කියන්නාහු දේවදත්ත ස්ථවිරයෝ නම් කෝලිය වංසයේ උපන්නාහ. ධුතරංගයහ ධ්‍යානලාභිව ධම්මකථිකයාහයිකියා නොයෙක් ලාභ සත්කාර උපදවන්නාහ. දේවදත්ත ස්ථවිරයන් වහන්සේත් කෝකාලිකස්ථවිරයන්ගේ ගුණ කියන්නාහු කෝකාලිකස්ථවිරයෝ නම් බ්‍රාහමණ කුලයෙහි උපන්නාහ. ත්‍රිපටකධරයහ, ධුතංගධරයහ, ධ්‍යාලාභිහයි, යනාදීන් ඔවුන්ගේ ගුණ කියා උපාසකවරුන්ගෙන් ලාබ උපදවාගන්නාහයි කීහ. මේ කථාව කිය කියා භික්ෂූන් වහන්සේ ධම්සභාවේ රැස්ව උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි. මා එන්නට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි පෙරත් කෝකාලිකස්ථවිරයන් හා දේවදත්ත ස්ථවිරයෝ උනුනුන්ගේ ගුණ කියා උන්නෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආධිනවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්ම දත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි දඹගසක් උඩ ඉඳ කවුඩෙක් දඹ කකා උන්නේය. එතනට කැණහිලෙක් ඇවිත් ගසළඩ උන් කපුටුවා දැක් මේ කපුටුවාගේ නැතිගුණ කියා මොහු සිත්ගෙණ දඹ කම් සිතා මොහුගේ ගුණ කියන්නේ මිහිරිකට හඬක් ඇති මොනරකුගේ පැහැයට බදුවූ නිල්වූ යහපත් පැහැයක් ඇති පක්ෂින්ට උතුම්වූ කපුටුවාණෙනි. දඹ අත්ත උඩ ඉඳ කුමක් කරණසේක්දැයි විචාළේය. එවිට කපුටුවා කියන්නේ ව්‍යාඝ්‍රපොතකයෙකු හා සමාන කැණහිලාණෙනි. උත්තමයන්ගේ ගුණ දන්නෝ උත්තමයෝයයි කියා තට දඹ දෙමි දඹ අනුභවකරවයි කියා දඹ සලා එලීය. ඒ දඹවනයෙහි වසන්නාවූ වෘක්ෂදේවතාවෙක් බොරු කියාන්නාවූ නිචක්‍රියා ඇති දෙන්නෙකු දුටුනියායයි කියා භයංකාර වේසයක් පා භයගන්වා උන්දෙන්නා එතනින් පහකළෙමියි කියා වදාරා මේ ජම්බුඛාද ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කවුඩානම් දේවදත්ත ස්ථවිරයන්ය. කැණහිලා නම් කෝකාලිකස්ථවිරය. වෘක්ෂදේවතාවඋපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේකී.

SANHIDA LANKA

# කායච්ඡන්ද ජාතකය

තවද මාගේ ස්වාමිවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පාණ්ඩුරෝග ඇති පුරුෂයකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

හේ කෙසේද යත්

පාණ්ඩුරෝග ඇති මනුෂ්‍යයෙකුට වෙදවරු බේත්කොට අසාද්ධ්‍යයයි කියා අළහ. නෑසියෝත් ලෙඩ අසාධ්‍යයයි ආලිස්සන්වුහ. ඒ පුරුෂයා සිතන්නේ ඉදින් මේ ලෙඩින් සමනයෙක්වීනම් බුද්ධශාසනයෙහි මහණවෙමි සිතිය. ඒ සිතූ ආනුභාවයෙන්ම ඒ ව්‍යාධිය නොබෝ දවසකින් සමන විය. ඒ කියන පුරුෂයා මහණව උපසම්පදාව භාවනා කොට රහත්ව  පිරිනිවන්පෑසේක. එක් දවසක් භික්ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්වහිඳ අසවල් නම් පාන්ඩුරෝග ඇතිව මියන්ට උන් තැනැත්තේ බුද්ධශාසනයෙහි මහණවෙමියි යන සිතුවිල්ලෙන් මහණව භාවනාකොට රහත්ව නිවන් දුටුවෝදැයි කිය කියා වැඩ උන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා දැන් මතු නොවෙයි පළමුත් නුවණැත්තෝ බුද්ධශාසනයේ මහණවෙමි යන සිතිවිල්ලෙනේ රෝගය සන්සිඳුවා මහණවුවෝ වේදැයි එපවත් අසා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක්.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බ්‍රාමණව ඉපිද වාසයකරණ කල්හි පාන්ඩුරෝගයක් ඇතිව උපන් අවස්ථාවෙහි ගෙයි අඹුදරුවෝ නෑසියෝ වෙදවරු අසාධ්‍ය ව්‍යාධියයි කියා අලහ. බෝධිසත්වයෝ සිතන්නාහු මේ රෝගයෙන් මිදෙනම් මහණවෙමියි යන සිතිවිල්ලක් සිතුනු නොබෝදවසකින් ව්‍යාධිය සන්සිඳින. හිමාලය වනයට වැද ඍෂිප්‍රජ්ජායෙන් පැවිදිව පංචඍධි අෂ්ට සමාපත්ති උපදවාගෙණ උදන් අනන්නාහු අඤ්ඤතරෙන, අට අනූවක් රෝගයන් අතුරෙන් එක්තරා, රෝගගෙන, බ්‍යඤ්ජන ස්වරූපයෙන් අතරෙන් රෝග නම්වූ. ව්‍යාධිනා පාන්ඩුරෝග ස්වරූපසඛ්‍යාත රෝගයෙන් බාල්හං දැඩිකොට ඵුඵස්ස, පහකරණලද, දුක්ඛ, දුක්ඛිතවූ රුප්පතො ව්‍යධියෙන් පිඩිතවූ මේ මාගේ ඉදං කලේබරං මේකලේබරය, ආතපෙ ආතප ඇති හෙවත් අව් පහරණ, පංසුනි පාංසුවෙයි කතං කරණලද, පදුමංයථා පද්මයෙක්මෙන්වුයේයි අජ්ඣඤං, අපවිත්‍රවූ නොදතහැකිවූ මේ ආත්මය, ජඤ්ඤසංඛාතං, අඥානසත්වයන් විසින් පවිත්‍රයයි අසූචිං, අපවිත්‍රවූ මේ ශරීරය, සුචිසම්මතත්තං, සුචියයි දන්නාලදද, නානාකුණප්පරිපූරං, නොයෙක් කුණපයෙන් පරිපූර්ණ වූ මේ ශරීරය අපස්සතො ඥාණචක්ෂූසින් බලන්නාහට, ජඤ්ඤරූපං, දතහැකිවූ ස්වරූප ඇත්තෙයි, යත්ථ, යම් ශරීරයෙක්හි, අධිමුච්ඡතා, කේලශමුර්ජාවෙන් අතිශයින් මුර්ජාවූ, පජා, සත්වයෝ සුගතුප්පත්තිය, සප්තකාම ස්වර්ගයෙහි, මග්ගං මාර්ගය, හාපෙනති, පිරිහෙද්ද (එසේ වුසත්වයන් ඇතුළුවූ) ජෙගුචරියං ප්‍රතිකූලවූ අසූචිං සුචිනුවූ, ව්‍යාධිධම්මං, ව්‍යාධිප්‍රකෘති ඇති, ඉමංපූතිකායං, මේ කුණුප ශරීරයට, ධිරත්ථු, නින්දාවෙයි කියා වදාරා කායච්ඡන්ද ජාතකය නිමවා වදාළ සේකී. එසමයෙහි බ්‍රාහමණතාපසව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# අන්ත ජාතකය

තවද මුදිතාවෙන් මවාලූ රුවක් වැනිවූ සර්වඥයන් වහනසේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝකාලිකස්ථවිරයන් වහන්සේ හා දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්ථමාන කථාව පළමු කී ජාතකයෙහි පෙනෙන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත් නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයෝ එඬරුවනයක දෙතාව උපන්නාහ. එනුවර මීමෙකු මළගමනේ නුවරින් පිටතට එඬරුවනය ගාවා ඇදපූහ. ඒ කුණුකන්ට කැණහිලෙකු ඇවිත් කමින් සිටිතැනට කපුටෙක් ඇවිත් සිතන්නේ මේ කැණහිලාට ප්‍රශංසා කොට ම මුත් අතින් මස් ඉල්ලා ගන්ට උවමනාවැයි සිතා ප්‍රශංසාකරන්නේ වෘෂභරාජයෙකු බඳුවූ කණක් ඇති සිංහරාජයෙකුට බඳුවූ ගාත්‍රයක් ඇති කැණහිලානෙනි. කිසිවක් දෙව්දැයි කීයේය. එවිට කැණහිලා කියන්නේ මිහිරි කටහඬක් ඇති කපුටුවානෙනි උත්තමයන්ගේ ගුණ දනනෝ උත්තමයෝයයි කියා තමා කන කුනින් කැබැල්ලක් දුන්නේය. ඒ වනයේ වසන්නාවූ දේවතාවා කැණහිලා සිවුපාවුන්ට අධමය කපුටුවා පක්ෂීන්ට අධමය එඬරුගස් වෘක්ෂජාතියට අධමය මේ තුන්දෙනා එක්තැන්වූ නියාය යහපතැයි වදාරා මේ අන්ත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කැණහිලා නම් දේවදත්ත ස්ථවිරියෝය. කපුටා නම් කෝකාලිකස්ථවිරයන් වහන්සේය. වෘක්ෂදේවතාව උපනනෙම් බුදුවූ මම්මයයි වදාරා මේ අන්ත ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# සමුද්‍ර ජාතකය

තවද මෛත්‍රියෙන් මවාලූ රුවක් වැනිවූ සර්වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපනන්ද නම් ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

ඒ උපනන්ද නම් ස්ථවිරයන් වහ්නේ ඉතා ලොභිසේක. එක් ගෙයක සිවුරු හා එක් ගෙයක සැරයැටි හා එක්ගෙයක පාත්‍රය තබා ඒ ගෙවල්තුන මොගේ යයි කියා ලාභ ගන්නා සේක. මහාලෝභිසේක අනුන්ට ලොභ නොකරවයි බණ කියනසේක. තමන්වහන්සේ ගරුභාණ්ඩ ආදීය පිළිගන්නාසේක. යම් තෙනකට යන සේක්නම් ගැල් පටවාගෙණ යන්නාසේ නොයෙක් ගරුභාණ්ඩ පටවාගෙණ යනසේක. අනුන්ට ගරුභාන්ඩ නොගනුවයි බණ කියනසේකැයි යන කථාව භික්ෂූන් වහන්සේලා ධම්සභා මණ්ඩපයෙහි රැස්ව කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහ්නේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි වදාරා මෙපවත් අසා මහණෙනි තමන් මෙසේ කොට අනුන්ට අවවාදකිම යහපත් නොවෙන්නේවේදැයි නින්දා කොට වදාරා දැන්මතු නොවෙයි, මහණෙනි පෙරත් මූ මහලෝභීව සමුද්‍රයේ පැන් බොහෝව අන්න්ට බොන්නට නුපුරැයි අවවාද කළ කෙණෙක් වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි ආකාශයෙන් යන දියකාවෙක් කියන්නේ දූතිමෝරුන් කුඩ මැස්සන් ආදීවූ මත්ස්‍යයෙනි, මුදපැන් විතරක්සේ බොව, පැන් බොහෝ කොට වීවොත් තෝ නසියයි කියා ඇවිදිනේය. සමුද්‍රයේ වසන දේවතාවා කියන්නේ මේ කොයි පක්ෂීයෙක්ද?, සමුද්‍රයේ වසන මත්ස්‍යයන්ට පැන් නොබොන්නට කියා ගෙණ යන්නේයයි විචාළේය. දියකාවා කියන්නේ මම දියෙම් වසන්නාවූ දියකාවෙකි. සමුද්‍රයේ පැන් නැසෙති කිම් කීහ. එවිට දේවතාවා, කියන්නේ නිවවූ සමුද්‍රකායකය, මේ සමුද්‍රයේ දිය එක්කෙනෙකුන් විසින් බී අඩුකොට ගත හැක්දැයි කියා ඌට භයංකාරවේශයක් දක්වා එතනින් පහකොට පුවයි වදාරා මේ සමුද්‍ර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි සමුද්‍රකපුටා නම් උපනන්ද භික්ෂූහුය, සමුද්‍රදේවතාවා උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# උදුඹර ජාතකය

තවද හුදුක්ෂාතතියෙන් මවාලු රුවක්වැනි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා භික්ෂු කෙණෙකුන් වහන්සේ වාසය කරණසේක්. උන් වහන්සේ වාසයකරන්නාවූ විහාරය සිත්කලුය. ඡායසම් පන්නය, පැන් එාසුය, උපාසකවරුත් ආවේනිකව පසදෙන්නාහ. මෙසේ බොහෝ දවසක් ඒ විහාරයේ වාසයකරණ කල්හි එක් ආගන්තුක භික්ෂුන්කෙනෙකුන් වහන්සේ විහාරයට වැඩිසේක. උන්වහන්සේට ආගන්තුක සාදකම්කොට උපාසකවරුන් ලවා පසයත් දවා කිපදවසක් විහාරයෙහි වාසයකොට ආගන්තුක නම සිතනසේක් මේ විහාරය එාසුය මේ භික්ෂූහු පහකොට මා මෙතන වාසය කරන්ට උවමැනවයි සිතා ඇයි ඇවැත්නි. බුදෝධාපස්ථානයට නොයෙද්ද බුදුන් නොදක වාසය කරන්ට සුදුසුදැයි වදාළසේක. උන්වහන්සේ වදාරණ සේක් බුදුන් දකින්ට අභිප්‍රා ඇත්තෙමි, මාගේ විහාරය පාළුවේදෝහෝයි සිතා විහාරය බලනකෙනෙකුන් නැති හෙයින් නොයන්නෙමියි වදාළසේක. එවිට ආගන්තුක භික්ෂූන් වහන්සේ වදාරණසේක් තමන් වහන්සේ එනතෙක් විහාරය බලමි තොපි ගොසින් බුදුන් දක එන්නේ යහපතැයි කිසේක. උන්වහන්සේත් ආගන්තුක භික්ෂූන් වහන්සේට විහාරය පාවාදී උපාසක වරුන්ට උපස්ථානකරන්ට සලස්වා බුදුන් දකිනා නියා ජේතවනාරාමයට වැඩිසේක. උන් වහන්සේ ජේතවනාරාමයට ගොස් එනකලට භික්ෂුතෙම විහාරයත් ගස උන් උපාසක වරුනුත් අත්ගෙණ උන්වහන්සේට වැඩඉඳිනාතෙක් විචාරකුත් අවසරයක් නුදුන්සේක. උන්වහනසේ වෙන විහාරයක සැතපී මුන් වහන්සේ කුමක් උවත් මා බොහෝ දවසක් වාසයකළ ගැමි උපාසකරු වට ආවේනිකව නොසිතද්දැයි උදෑසනක්සේම උන්වහන්සේ ගමට සිඟාවැඩිසේක. උපාසකවරුත් දන්දෙන්නා තබා සාමිචිකථාපමණකුත් නොකළෝය. උන්වහන්සේ උන්ඇම කෙරේ විපරීත නොව මෙතන වාසය කරන්නේ කිම්දැයි නැවතත් ජේතවනාරාමයට ගොස් එනකලට ආන්තුක භික්ෂූතෙම විහාරයක් ගම උන් උපාසක වරුනුත් අත්ගෙණ උන්වහන්සේට වැඩ ඉඳිනාතෙනක් විචරකුත් අවසරයක් නුදුන්සේක. උන්වහනසේ වෙන විහාරයක සැතපී මුන්වහන්සේ කුමක් උවත් මා බොහෝ දවසක් වාසය කළ ගම් උපාසකරු මට ආවේනිකව නොසිතද්දැයි උදෑසනක්සේම උන්වහන්සේ ගමට සිඟා වැඩිසේක. උපාසකවරුත් දන්දෙන්නා තබා සාමිචිකථා පමණකුත් නොකොළෝය උන් වහන්සේ උන් ඇම කෙරේ විපරිතනොව මෙතන වාසයකරන්නේ කිම්දැයි නැවතත් ජේතවනාරාමයට වැඩිසේක. මේ කථාව දම්සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් මුන්ගේ වාසස්ථානය උදුරාගත්තේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඡයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ වනාන්තරයෙහි වෘක්ෂදේවතාව උපන්සේක. එතනට නුදුරු ගල්ගුහායෙක රත්වූ මුඛ ඇති කුඩා වඳුරෙක් වාසය කරන්නේය. සත් රෑ සත්දාවලක් නොහැර සණවර්ෂාවක් වසින්ට වන එවිට එක් ක්‍රිෂ්ණ මුඛ නම් මහත් වානරයෙක් වැස්සේ තෙමි  ඒ ගල්ගුහාව සමීපයට අවුත් සිතන්නේ බොරුවක් කියා මේ වඳුරා මෙතනින් පහකොට මේ ගුහාව ගණිම් සිතා ඒ ඵලාඵල කෑ එකෙකුමෙන් බඩපුප්පා කියන්නේ වඳුර, මේ වනයේ අඹ දඹ නුග ආදීවූ යහපත් ඵලාඵල ඇති ඒ අනුභවකොට පියා එවයි කියා ඒ වඳුරා එතනින් පහකොට තෙමේ ගල් ගුහාවට වැද උන්නේය. ඒ කුඩා වඳුරාද ඒ වනය මුළුල්ල ඇවිද නුග ගෙඩියක් විවරයකුත් නොදක ගල් ගුහාව සමීපයට අවුත් මේ වඳුරා මා වංචාකොට මෙතනින් පහකොට පියම් සිතන්නේ තොප කී සැටියේ වනාන්තරයට වැද අඹ දඹ ආදීවූ ඵලාඵල අනුභවකොට ආමි. තොපිත් ගොසින් ඵලාඵල අනුභව කොට එවයි කීහ. එවිට ඒ මහවඳුරා කියන්නේ මේ වනයේ  ඵලාඵල අනුභව කොට එවයි කීහ. එවිට ඒ මහවඳුරා කියන්නේ මේ වනයේ ඵලාඵලයෙක් කොතනක ඇද්ද යටත් පිරිසෙයින් අඹ දඹ තබා කුඹුක්ගෙඩියක් පමණකුත් මේ වනයේ ඇද්දැයි කියා ඒ ගුහායෙන් නොගියෝ වේදැයි වදරා මේ උදුඹර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කුඩා වානරයා නම් නේවාසික භික්ෂූහුය. මහා වානරයා නම් විහාරය නැර උන් ආගන්තුක භික්ෂූහුය. වෘක්ෂදේවතාව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# කුමාරපත්ත ජාතකය

තවද හුදුප්‍රඥාවෙන් මවාලූ රුවක්වැනි වූ සර්වඥයන් වහන්සේ සැවැත්නුවර උත්තරා රාමයේ වැඩවසන සමයෙහි ක්‍රීඩාසිලීවූ සාමනේර වහන්දෑ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සර්වඥයන් වහන්සේ උඩුමාලේ ඉන්දදී යටමාලේ ඉඳිනා සාමරනේරයන් වහන්දෑ බොහෝසේ අරගලකොට උනුන් හා මහත්කොට දොඩා කෝළාහල කළසේක. සර්වඥයෝ එපවත් අසා සැරියුත් සාමින්ට, ශාරීපුත්ත ස්ථවිරය, මේ යට මාලේ හිඳිනා භික්ෂූහු බොහෝ කොට අරගළ කරන්නාහ. උන් භයගන්වා මතු අරගල නොකරණලෙස හික්මවයි වදාළසේක. එවිට ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ එගෙයි කොත්කැරැල්ල පයින් අල්වාගෙණ සොලවාලූසේක. එවිට යටමාලේ උන් සාමනේරයන් වහන්දෑ උනුන් ඇඟගැයි භයින් තැතිගෙණ දොරට ගොස් මළුවේ සිටිසේක. එතනට ශාරිපුත්ත ස්ථිවිරියන් වහන්සේ වැඩ අරහල නොකරවයි භයගැන්වූසේක. මේ කථාව දම්සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ කීය. කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා මහණෙනි මේ සාමණේරයෝ දැන් මතු නොවෙයි පෙරත් ක්‍රීඩාවෙහි තත්පරයෝ වේදැයි ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණසමයෙහි බෝධිසත්වයන් වහන්සේ කුමාරපත්ත නමින් යුක්තව බ්‍රාහ්මණ කුලයක ඉපිද පංචකාමයෙහි ආදීනව දැක ඍෂිප්‍රවෘජ්ජාවෙන් පැවිදිව ඒ වනාන්තරයට වන්නාහ. ඒ වනාන්තරයෙහි පන්සියයක් තාපසවරු එක් පන්සලක වාසය කරන්නාහ. උන් ඇම කෙළිනා ක්‍රීඩා වානරයකුත් ඇත ඒ තාපසවරු ලුනු ඇඹුල් නිසා මනුෂ්‍යපථයට ගියාහු එකල බෝධිසත්වයෝ ගොස් ඒ පන්සල උන්නාහ. ක්‍රීඩා වානරයා පළමු තාපසරු සේම වනැයි සිතා ඒ තාපස යන්ට මුඛවිකාර දැක්විය. එවිට බෝධිසත්වයෝ එඹල වානරය තාපසරුන් ලඟ වසන්නාහූ සුසික්ෂිත උවමැනවයි ආචාරශීලයෙන් යුක්ත උවමැනවයි වානරයා හික්මවූසේක. එතැන් පටන් වානරයා හික්ම ආචාරශිලයෙන් දවස් අරිනේය. ඒ තාපසවරු ලුනු ඇඹුල් සපයාගෙණ තමන් වාසය කළාවූ පන්සලට ආවාහ. එවිට ඒ වානරයා පළමු පරිද්දෙන් නොකල බැන නොනැගී උන්නේය. එවිට තාපසවරු කියන්නාහූ ඇයි? වානරය තෝ පළමු අප හා හසතවිකාර මුඛවිකාර පෑ කෙළෙනෙහි වෙද්ද දැන් නොකෙළින්නේ ඇයිදැයි විචාළාහ. එවිට වානරයා කියන්නේ එම්ඹා තාපසරුනි. කුමාරපතත්ත නම් තාපසයන් වහන්සේ මට අවවාද කළසේක. ඒසේහෙයින් උන්වහන්සේ කී අවවාද මා සිත ඇත. පෙරසේ නොකොළම් කීය, එසේනම් අපට අවවාද කියාගියා නියාවේදැයි වදාරා මේ කුමාරපත්ත ජාතකය නිමවා වදාළසේකී.

SANHIDA LANKA

## තෘතීය බක ජාතකය

තවද හුදු සද්ධර්මයෙන් මවාලු රුවක් වැනිවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උපසේන නම් මහතෙර කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්ථමාන කථාව සුත්‍රපිටකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. උපසේන ස්ථවිරයන් වහන්සේ බාලවහන්දෑ එක් කොටගෙණ දුස්සීලව වාසයකරණසේක. සර්වඥයන් වහන්සේ එපවත් දැන කෝපකොට වදාළසේක. උපසේන මහතෙරුන් වහන්සේ භාවනාකොට ධ්‍යාන උපදවා රහත්ව තෙලෙස්ධුතාංගධරව වාසය කරණ කල්හි එක් දෙදෙනකුන් වහන්සේගේ විවාදය නිසා බුදුහු පාටලිවනයට වැඩ වාසය කරණ සේක් එසමයෙහි උපසේන නම් මහතෙරුන්වහන්සේ ධුතාංගධරව වහන්දෑ ඇරගෙණ සර්වඥයන් වහන්සේ කරා පාටලීවනයට වැඩිසේක.

සර්වඥයන් වහන්සේ ධුතාංගධර වහන්දෑ විනා නොවන වහන්දෑ  මා දකින්නට නොඑත්වයි වදාළසේක. එවිට ධුතාංගධර නොවන වහන්දෑ පාංශුකූලචීවරය පෙරවා ධුතාංගධරව සර්වඥයන් වහන්සේ දුටුසේක, භික්ෂූන් වහන්සේ බුදුන් ජේතවනාරාමයට වැඩිය පසු ඒ පාංශු කූල චීවරයත් හැරතෙළෙස් ධුගාංගයත් හළසේක. එවිට බුදුහු වදාරණ සේක් මුන් හැමගේ සිල්රක්ෂා කිරීම බකනම් සිව්පාවා රැක්කාවූ සීලය මෙනැයි වදාළසේක. ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍යකරණ සමයෙහි බෝධිසත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහ. එසමයෙහි බකනම් සිව්පාවෙක් ගඟක් අසලක පිටුපහණෙක වාසය කරන්නේය. ඒ ගඟ වතුර ඇවිත් ගල්පොත්ත වටකොට මහවතුර ගලාගෙන එනවිට බකකම් සිව්පාවා සිතන්නේ මෙතනින් මා බැනනොනැගී උන්නේය. එවිට ශක්‍රයෝ මුගේසී ලය පරීක්ෂා කරන්ට උවමැනවයි සිතා එළුවෙසක් මවාගෙණ ලඟට ආවාහ. එ විට බකනම් සිව්පාවා එළුවා කම් සිතා පිටට පැනපීය. ශක්‍රයෝ අන්ත්‍රස්ධාන වූ සේක. දෙනුවනුත්  ගල්ලැල්ලට නැගී මට ප්‍රාණඝාතය සිද්ධනුවුහෙයින් මාගේ සීලය බණ්ඩ නුවුයේයයි සිතා උන්නේය. එවිට ශක්‍රයෝ දිව්‍යාත්මභාවයෙන් සිට මේ තෝ සිල්රක්ෂාකරණ මනාදැයි කියා දෙව්ලොව ගියහ. ඒ අර්ථය දක්වන සර්වඥයන්වහන්සේ වදාරණසේක් භික්ෂූහු මා එළඹ සිටිනාතුරු ධුතරාංගධරයම්හයි කියා අඟවා මා ජේතවනාරාමයට වැදුනාම පාංශුකූල චීවරය හැර ධුතාංගත් අළහ. මුන් රැකී සීලය නම් බකනම් සිව්පාවා එළුවා පිටට පැන වැරද ගියකල්හි මට ප්‍රාණඝාතය සිද්ධනොවුයේය. මාගේ සීලය බණ්ඩනුවුයේයයි සිතා උන් බකනම් සිව්පාවා මෙනැයි බොහෝ භික්ෂූන් වහන්සේට බණ වදාරා සීලය රක්ෂා කරණ කල නම් සිල්රක්නා පරිද්දෙන් සුසික්ෂිතව සීලය රක්ෂා කල මැනවැයි අවවාද වදාරා මේ බකජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ශක්‍රදේවේන්ද්‍රව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේකී.

SANHIDA LANKA

## ගාමණිචණ්ඩ ජාතකය

තවද ලෝකාවචාරීවූ සර්වඥයන් වහන්සේ සැවැත්නුවර වාසය කරණ සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සර්වඥයන් වහන්සේ ප්‍රඥාවිශේෂයක් යහපත් නියාව කියනසේක් ඇවැත්නි මහාපඤ්ඤ, මහත්වූ අර්ථ ධර්ම නිරුත්ති ප්‍රතිභානාදී ගුණයෙන් යුක්ත වූ හෙයින් මහත්වූ ප්‍රඥා ඇතිසේක. පුථුපඤ්ඤ දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් ඝණකඩ බොල් මහපොළොවසේ පැතිරපවත්නාවූ ප්‍රථුලවූ ප්‍රඥාවෙන් යුක්තසේක. හාසුපඤ්ඤ, හාසුබහුලවූ තෘෂ්ටිබහුලවූ ප්‍රමෝද්‍ය බහුලවූ ප්‍රඥාවෙන් යුක්ත වූසේක. ජවනපඤ්ඤ, ජවනහංසගතියක් පරිද්දෙන් සීඝ්‍රව පවත්නාවූ ප්‍රඥාවෙන් යුක්තසේක. නිබ්බේධික පඤ්ඤ ජීර්ණපුටයෙක්හි දිවයනසයංතප්ත අස්ඛලිත අයස්සුලයක් පරිද්දන් සංස්කාර විකාර ලක්ෂණ නිර්වාණ ප්‍රඥප්තිය යන පංචවිධ ප්‍රකාරවූ ඥෙයාමණ්ඩලයෙහි අස්ඛලිතව විනිවිද පවත්නා වූ ප්‍රඥාවෙන් යුක්තසේකැයි ප්‍රඥවිෂශෂය වර්ණනාකොට හුන්නාහුය. සර්වඥයන් වහන්සේ එතනට වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් සර්වඥයෝ නුවනඇත්තෝ වේදූයි වදාරා ඒ කෙසේදූයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර ජනසන්ධව නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජයකරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසිකා බිසවුන් කුස පිළිසිඳ දසළුකඩ මසකින් බිහිවූහ. ඒ රාජකුමාරයන්ගේ මැදපු කැඩ පතක්මෙන් යහපත්වූ මුඛශ්‍රීයක් ඇති හෙයින් ආදාසමුඛ කුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරයන් සත් ඇවිරිදි අවස්ථාවෙහිම ඉගැන්වූවමනා සියළු ශාසත්‍රම උගන්වා නිපුණකරවා යුවරජතනතුරු සලස්වා ජනසන්ධව නම් රජ්ජුරුවෝ සවර්ගස්ත වූහ. ඉක්බිති අමාත්‍යයෝ සිතන්නාහූ මේ ආදාසමුඛ නම් රාජ කුමාරයා බලය මුන් වහන්සේගේ නුවන පරීක්ෂා කරන්ට වුවමැනවැයි කියා එක් දවසක් සභායේ ඉඳූවා දෙපසින් ගමන්කරන්ට දන්නා කම්පස් වඳුරෙකු පිළිඅන්දා ඉස තලකඩුපපුවක් බැඳ රියන්දණ්ඩක් අතට දී වානරයා රජ්ජුරුවන් වහන්සේ දක්වා දේවයන් වහන්ස මේ නුඹ වහන්සේගේ පියානන් වහන්සේට ආචාරීධුරයෙහි හිසට වස්තු විද්‍යාආදී කටයුතු කාරීයෙහි පටන් නුවනින් ඉතා වැඩිතරම් එකෙකැයි කීහ. එසේ හෙයින් මුරකිණාබව යහපතැයි කීහ. රජ්ජුරුවෝ එකියන වානරයා බලා මූවනාහී මනුෂ්‍යයෙක් නොවෙයි, මේ වනාහී වඳූරායයි සිතා අමාත්‍යයන්ට කියන්න හූ මුන්සේදු වඳූරෝ තමන්ගේ නකුට සඟවා ඉන්දනොදී ඉන්නෝ වස්තු විද්‍යා කෙසේ දනිද්දූයි මේ කා වඳුරාය මූ ඇරපියවයි කීහ. අමාත්‍යයෝත් සැබැව දේවයන් වහන්ස නුඹ වහන්සේ පරීක්ෂා කරණ නිසා කළම්හයි කියා ඒ වානරයා ඇරගෙණ පලාගොස් කීප දවසක් අපොකොටලා දෙවෙනිව එම වානරයා පිළිඅන්දා සැට්ටමෙලක්කට්ටුලා පොතක් අතටදී ඔහු ඇරගෙණගොස් රජ්ජුරුවන්ට දක්වා දේවයනි නුඹ වහන්සේගේ පියානන් වහන්සේගේ අවධියේ අධිකරණ නායකකමට නියුක්තව සිටි අමාත්‍යයවරයා මොහු රැක්ක මැනවයි කීහ. එවිට රජ්ජුරුවෝ ඔහු වඳුරා නියාව දැන අමාත්‍යයන්ට කියන්නාහූ සත්පුරුෂයන්සේ නොවෙයි ලොම්දික්ව ලොම්ත්දව තිබෙන මුගේ ලෙයි කුමන ගුණයෙක් ඇද්ද මුන් සේවුවන් ජනසන්ධව රජ්ජුරුවන් වහන්සේ අධිකරණ නායකකමට නොසල්වනසේක. එසේ හෙයින් මේ වඳුරාය මූ එපිටලවයි කීහ. එවිට අමාත්‍යයෝ කියන්නාහූ සැබැව දේවයන් වහන්ස නුඹ වහන්සේ විමසන පිණිස කළම්හයි කියා ඔහු එපිටලා පෙරලා කීප දවසකින් ඔහු අනික් වෙසක් ගන්වා රජ්ජුරුවන් වහන්සේ කරා ගෙණගොස් නුඹ වහන්සේගේ පියානන් වහන්සේ සමීපයෙහි දෙමාපියන්ට උපස්ථාන කරන්නට සපන් ධර්මිෂ්ට වූ පුරුෂයෙකැයි කියා මූ රැක්ක මැනවයි කීහ. එවිටත් රජ්ජුරුවෝ ඌ වඳූරා නියාව දැන නියන්නාහූ මුන් සේවුවන් තමන්ගේ දෙමාපියන් මල්බෑ ආදී වූවන් රකින්ට අසමර්ථිය මේ වනාහී වඳූරාය මූ අරවයි කීහ. එවිට අමාත්‍යයෝ වඳුරා ඇර රජ්ජුරුවන් වහන්සේ මහානුව නැතිසේකැයි කියා රාජ්ජයට තිබා ඔටුනුපලන්දා ආදාසමුඛ රජ්ජුරුවන් වහන්සේගේ ආඥාවයි කියා නුවර බෙරලැවුය. එකියන රජ්ජුරුවෝත් දැහැමෙන් සෙමෙන් රාජ්ජය කොට දසරාජ දර්මයට අකෝප්‍ය නොව රාජ්ජය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ගේ යසස් හා කීර්තීය දශ දිසාවෙහි පැතිරිනි. ඒ රජ්ජුරුවන් මත්තෙහි විමසූ ප්‍රශ්න මෙසේ දත යුතු. ඒ කෙසේද යත් ගොණො පුතොතා හයෝවෙවනලකාරේ ගාම භෝජකෝ ගණිකා තරණී සපොපා මිගො තිතතර දෙවතා නාගො තපස්සිනා චේවා අථො බ්‍රහ්මණ මානවොයි යනාදින් ප්‍රශ්න දසසතරක් විසඳූසේක. ඒ කෙසේද යත්. ඒකියන ආදාසමුඛ නම් රජ්ජුරුවන් වහන්සේගේ පියානන් වහන්සේට දූකගත් ගාමණිචණ්ඩනම් එක් පුරුෂයෙක් සිතන්නේ මුන් වහන්සේ බාලසේක. මම් වනාහී වයොවෘද්ධයෙමි. එසේ හෙයින් බාල රජ්ජුරුවන්ට දුක්ගැණී යහපත් නොවෙයි සිතා එතනින් පලාගොස් දෙයොත්නක් විවරකින් ඔබේබ එක්ගමෙක වාසය කරන්නේය. වැසිවට කල්හි සිසාන්ටයයි කියා වෙන අයකුගෙන් ගොන්ගෙයක් ඇරගොණගොසින් සීසා අන්තයෙහි ඒ ගොන්ගේ පාවාදෙන්ට සිතා ඔහුගේ ගෙට ගියේය. ඒ වෙලාවට ඒ ගෙයි දෙමහල්ලන් බත්කන හෙයින්

SANHIDA LANKA

තෙමේ මන් ගෙටගියේ නම් මා බත්කන්ට කියති සිතා ගොන්ගෙයි ගෙටම දක්වාලීය. ඒ වෙලාවට ස්ත්‍රී සහ පුරුෂයා බත්කමින් සිට මධ්‍යය අතට ඇරගෙණ නැගීසිට ගොන්ගෙය දුටුහ. එකියන පුරුෂයාත් ගොන්ගෙය දුටු නියාව දන ගොන්ගෙය පාවානොදීම පලාගියේය. එ කියන ගොන්ගෙය තමන් සිටිනා පට්ටියෙහිම සිටියාහ. එදා රෑ සොරු ඇවිත් ඒ කියන ගොන්ගෙය ඇරගෙණ ගියාහ. ඒ පුරුෂයෝත් තමන්ගේ ගොන්ගෙය නොදක ගාමණිචණ්ඩියන් කරා අවුත් ඇයි තොප සාන්ට අපගෙන් ගොණගිය ගොන්ගෙය දෙවයි කීහ. ගාමිණිචණ්ඩියෝ කියන්නෝ තොප බත්කමින් සිටියදී නොවේද මා ගොන්ගෙය ගෙට බාණකා ආයේයයි කීවත් ඒ ගොන්ගෙය දෙන්ට උවමැනැයි කියා නොයෙක් හෙයින් රජ්ජුරුවන්කරා යන්ට නික්මිණි. දෙන්නා රජ්ජුරුවන් දකින්ට යනකලට ගාමණිචණ්ඩයෝ අතරමග තමන් අඳුනන ගෙයක් දක මේ ගෙටගොස් බත්කාපියායෙමි සිතා ගෙට වන්හ. ඒ වේලාවට ඒ ගෙයි පුරුෂතැන, එවිට ඒ ගෙයි ඉන්නා ස්ත්‍රී ගාමණිචණ්ඩියන් දක මුන්ට බත් උයන්ට කොටුවට නැගෙමියි සිතා සත්මැසි බඩින් ඉඳ ඉනක් වතුරුවා නැගෙන්ට වන් වෙලාවට ඉන්පයපලාවැටුනු ස්ත්‍රියගේ දරුගැබ වැටිහින. ඒ වෙලාවට ඒ ගෙයි පුරුෂයා ගෙට අවුත් ඇයි ගාමණිචණ්ඩයෙනි මාගේ බිරින්ද මරා දරුගැබ කුමක් නිසා එලාපුදැයි කියා කැටක්නගා මොහු රාජදූතයයි කියා ඇරගෙණ ගාමණිචණ්ඩයන් මධ්‍යයේලාගෙණ දෙන්න දූලයෙන් නික්මුණාහ. ඒ වෙලාවට එක් අස්ගොව්වවෙක් තමාගේ අසාගේ බැඳූන් කඩාගෙණ ගාමණිචණ්ඩයන් කරා දිවනහෙයින් මයිලනුවෙනි ගාමිණිචණ්ඩයෙනි අසුව කැටක් ගසාලා රඳවාලවයි කීහ. යහපතැයි ගාමණිචණ්ඩයොත් අසා රඳවන පිණිස කැටක් ගැසූහ. ඒ ගැසූ කැටින් අසාගේ කකුල උන කිලිල්ලක් සේ බිඳින එකියන අස්ගොව්වාත් අසා ඉක්මවන්ට කීපමණක් විනා මාගේ අසාගේ කකුල ගසා කඩන්ටකීම් දැයි කියා කැටක් නගාලා පා මොහු රාජ දූතයෝයයි කියා ගාමණිචන්ඩයන් මධ්‍යකොට තුන්දෙනා නික්මුනාහ. එවිට ගාමණිචණ්ඩයෝ කියන්නේ මම ශරීරකෘත්‍යයට යෙමි තෙපි සැම මෙසේ සිටු වයි කියා වලට වැද ගලකට නැගී මියන්ටයයි කියා ගලින්පාත පැනපීහ. එකීයන ගලපාත කුළුපොතු දෙපුතුපියකෙණෙක් උනදඬු කපමින් සිටියාහ. එකී යන ගාමණිචණ්ඩයෝ පනින්නාහූ මාළු කුළුපොත්තා පිටට පැණපූහ. ඒ කුළුපොත්ත එකපිම්මෙන්ම මළේය. ගාමණිචණ්ඩයෝ නොමියුනු හෙයින් එකී යන කුළුපොත්තාගේ පුතා මාගේ පියා මරාපූ පිතෘඝාතක සොරායයි කියා කැටක් නගා මොහු රාජදූතයෝයයි කියා ගාමණිචණ්ඩයන් ඇරගෙණ තුන්දෙනා සිටිතැනට ආය, එකියන තුන්දෙනා මේ කින්දැයි විචාළාහ, කුළුපොත්තා විසින් මාගේ පියා මැරූ සොරායයි එසේහෙයින් ගෙණාමි කීහ. සතරදෙන වට කොටගෙණ නික්මුණාහ. ඒ වෙලාවට එක් ගම්මුදලියෙක් ගාමණිචණ්ඩයන් දක එළඹ රජ්ජුරුවන් වහන්සේ මහානුවනැතිසේක,

එහෙයින් මා කී අස්න ගොසින් කියවයි කියන්නේ ආදී මම මහත්වූ උපභොග පරිභොග ලැබුයෙමි. මමත් නිරෝගීවීම් දැන්වනාහී මම ඔබ්බෙන් සම්භාවන්නාවූ සම්පතුත් නැත, පාඬුරෝගත් මට ඇතිව දුක්විඳිමි. මීට කාරණා කින්දැයි රජ්ජුරුවන් වහන්සේ අතින් විචාරවයි කීහ. දෙවෙනිව එක් වෛශ්‍යාස්ත්‍රියක් ගාමණිචණ්ඩයන් දක කියන්නී රජ්ජුරුවන් වහන්සේ මහානුවනැතිසේක, මා කී අස්නක් කියාලවයි කියන්නී ආදී මම බොහෝ ලාබලැබිමි පුරුෂයෝ මා කරා එලඹෙන්නාහ, දැන් වනාහී බුලත්පතක් විවර නොලබමි, ඊට කාරණා කින්දැයි විචාරවයි කීහ. ඉක්බිති යහපතැයි කියා ඔබ්බට යනකලට එක්තරා ස්ත්‍රියක් ගාමණිචණ්ඩවයන් දක කියන්නී රජ්ජුරුවන් වහන්සේ මහානුභාව නැති සේක. එසේහෙයින් මා කී අස්නක් රජ්ජුරුවන් වහන්සේ මහානුභාව නැතිසේක. එසේ හෙයින් මා කී අස්නක් රජ්ජුරුවන් වහන්සේට කියවයි කීයන්නී මම ස්වාමි පුත්‍රයා ලඟත් ඉන්දනොයෙමි, දෙමාපියන් ලඟත් ඉන්දනොහෙමි, මීට කාරණා කින්දැයි රජ්ජුරුවන් අතින් විචාරවයි කීහ. ඉක්බිති යහපතැයි කියා නික්මුනු වේලාවට එක් සර්පරාජයෙක් ගාමණිචණ්ඩයන් දක කියන්නෝ තොපගේ රජ්ජුරුවෝ මහා නුවනැත්තෝල, මා කියන යුක්තියක් කියවයි කියා කියන්නේ මම තුඹසින් නික්මෙනවෙලේ ගැහැටි ගැහැටි කින්මෙමි, ගොදුරු කා තුඹසට වහා වැදයෙමි, මේ කාරණෘව රජ්ජුරුවන් වහන්සේගෙන් විචාරවයි කීහ. යහපතැයි කියා ගිවිස ඔබ්බට නික්මුණ කලට ඒක් මුවෙක් ගාමණිචණ්ඩයන් දක කියන්නේ රජ්ජුරුවන් වහන්සේ මහත්වූ නුවනැතිසේක්ල, එසේහෙයින් මා කී අස්නක් කියවයි කියා කියන්නේ මා සිටිනා ගසසමීපයේ තණ කන්ටත් මට අභිප්‍රාය, ඔබ්බේ තණකන්ට මට අභිප්‍රාය නැත, ඊට කාරණා කින්දැයි රජ්ජුරුවන් වහන්සේගෙන් විචාරවයි කීහ. යහපතැයි කියා නික්මුණකලට ඔබ්බේ තීත්වටුවෙක් ගාමණිචණ්ඩයන් දක කියන්නේ රජ්ජුරුවන් වහන්සේ මහා නුවනැතිසේක්ල, එසේ හෙයින් මා කී අස්න කියවයි කියා කියන්නේ මම තුඹසපිට හිඳ නාදකරණ වේලේ යහපත් කොට නාදකරමි අනිත්තෙනක ඉද නාදකරණ වේලේ යහපත්ව නාදනොවෙයි මේ කවරකාරණයක් නිසාදැයි විචාරවයි කීහ. යහපතකියා නික්මුණවේලාවට එක් වෘක්ෂදේවතාවෙක් ගාණිචණ්ඩයන් දක කියන්නේ තොපගේ රජ්ජුරුවෝ මහානුභාවනැති සේක්ල මා කී විත්තියක් රජ්ජුරුවන්ට කියවයි කියා කියන්නේ මාගේ වෘක්ෂයට පළමු බොහෝ බලිපූජා ඇත. දැන් බලිපුජා නැත, ඊට කාරණාකින්දැයි රජහු අතින් විචාරවයි කීය. යහපතැයි කික්මුනු වේලාවට දියෙහි වසන නයෙක් කියන්නේ මාගේ විල පැන් පළමු ප්‍රසන්න තිබෙයි දැන් කැළඹීතිබෙයි ඒ කවර කාරණාවක් නිසාදැයි විචාරවයි කීහ. යහපතැයි කියා ඔබ්බට නික්මුණු කලට තාපසවරු කියන්නාහූ රජ්ජුරුවෝ මහා නුවනැත්තෝල,

SANHIDA LANKA

පළමු අප වසන්නාවූ පන්සල අඹ කොස් ආදීවූ වෘක්ෂවල ඵලාපල ඉතා මධුරය, දැන් එම ඵලා ඵල තික්තරසය ඒ කවරකාරණයක් නිසාදැයි විචාරවයි කීහ. මේ නියායෙන් ගාමණීචණ්ඩියෝ එකී ප්‍රශ්න දසය සිත තබාගෙණ ඒ යුක්ති කියන සතර දෙනා ඇරගෙණ රජ්ජුරුවන් අධිකරණයෙහි උන් වෙලාවට අවුත් රජ්ජුරුවන් දුටුහ.. රජ්ජුරුවෝත් ඇයි ගාමණීචණ්ඩයෙනි මෙතෙක් දවස් කොයි උන්නාද නැතැක්දවස් තොපගේ උකුලේ උනුම්හ මෙතෙක් දවස් නුදුටුම්හ කුමක් නිසා ආවාදැයි විචාළාහ. එවිට ගාමණීචණ්ඩයෝ කියන්නාහූ මේ සතරයුක්තියක් තියන නිසා මා ඇරගෙණ ආහයිකීහ. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහූ යුක්තියක් නිසාවුවත් තොප අප දුටුසේ යහපතැයි සතුටුව යුක්ති කියන්ට ආ අය අතින් රජ්ජුරුවන් විචාරන්නාහූ මුන් තොප ඇමට කිලු අන්‍යාය අයුක්තිය කියවයි කීහ. පළමුකොට ගොන්යුකති එකා කියන්නේ දෙවයන් වහන්ස සීසාන්ට උවමැනවයි කියන්නා ගොන්ගෙයක් දිලිම් මොහුවනා හී පසුව ගොන්ඉල්එකල නුදුන්නේය. ඒ ගොන් මට දෙවාවදාරන්නේ යහපතැයි කීහ. එවිට රජ්ජුරුවෝ සැබෑද ගාමණීචණ්ඩයෙනි විචාරා සැබෑව දේවයන් වහන්ස සීසාන්ටයයි කියා ගොන්ගෙයක් ඇරගෙණ සීසා අන්තයෙහි මුන් බත්කමින් සිටියදී ගෙට වනින්නම් මාත් බත්කන්ට කියත්දෝහෝයි සිතා ගොන් ගෙටම දක්කාලිමි. ඒ වෙලාවට මුන් ගොන්ගෙය දුටුහ. ගොනුත් පට්ටියෙම සිටියදී සොරුන් ඇරගත්තාට මූ මට නයකියයි කීහ. එබස් රජ්ජුරුවෝ අසා එකියන පුරුෂයා අතින් විචාරන්නාහූ තා විසින් ගොන්ගෙය දක්නාලදැයි විචාළාහ. එවිට පුරුෂයා කියන්ට මම ගොන්ගෙය නුදුටුම්හයි කීහ. රජ්ජුරුවෝ ඇයි තොප මා ආදාසවුබ රජ්ජුරුවන් නියාව නොදනීද මා දක්කදී ඇත්තවිනා බොරු නොකියවයි කීහ. එවිට ඒ පුරුෂයා කියන්නේ සැබෑව දේවයන් වහන්ස ගොන්ගෙය දිටිමි. කීහ. එවිට රජ්ජුරුවෝ ගාමණීචණ්ඩයන්ට කියන්නාහූ ගාමණීචණ්ඩය මාගෙන් මසුරන් සොළොස් කළඳක් හැරගෙණ ගොන්ගෙයක් දිපියා මූ මා දැක්ක බොරුකීවාට ඇස්දෙක උදුරා පියවයි කීහ. එවිට ගොන්යුක්තිය කියන්ට ආ පුරුෂයා එබස් අසා කියන්නේ ගාමණීචණ්ඩයෙනි මට ගොන්ගෙයි මිලත් එපයි මාගේ ඇස්දෙක උදුරන්ටත් එපායි මා ගලවාපුවමැනවයි කිහ. යහපතැ කියා ගාමණීචණ්ඩයෝ උන් ගළවා යවාපූහ.

ඉක්බිති දරුයුක්ති කියන එකා රජ්ජුරුවන් ලඟට අවුත් දේවයන් වහන්ස මූ වනාහී මාගේ අඹුවත් මරා දරුගර්භය එළීය. එසේ හෙයින් මට දරුවන් දුනමැනවයි කීහ. එවිට රජ්ජුරුවෝ එකියන පුැරෂයා අතින් මෙවිට කරන්නේ කිම්දැයි විචාළාහ. දේවයන් වහන්ස කෙසේවුවත් දරුවන් ලබන්ට උවමැනවයි කියන්නා එවිට රජ්ජුරුවෝ කියන්නාහූ ගාමණීචණ්ඩයෙනි මුන් දරුවන් උවමැනවයි කියන පසු මළ දරුවන් උපද්දවාදෙන්ට බැරිවුවත් එසේහෙයින් මුන්ගේ බිරින්ද තෙපගේ ගෙයි තිබාගෙණ දරුකෙණෙකුන් ලත්කල අඹුවනුත් දරුවනුත් පාවාදෙවාලවයි කීහ. එවිට ඒ පුරුෂයා මා සත් ඇවිරිදි කාලයෙහි පටන් පිසවා කෑ බිරින්ද දැන් මා වියෝ නොකළමැනව මට දරුවනුත් එපයි කියා ගාමණීචණ්ඩයන්ගේ පයගෙණ අඬා කන්නලව් කීහ. යහපතැයි කියා ගාමණීචණ්ඩයෝ ඔහු අලහ.

එවිට අස්සලයා රජ්ජුරුවන් කරා ගොස් කියන්නේ මොහු විසින් මාගේ අනර්ඝවූ අශ්වයාගේ පය බිඳනාලදහ. මට අස්මිළ දුනමැනවැයි කීහ. එවිට රජ්ජුරුවන් විසින් සැබෑද ගාමණීචණ්ඩය තා විසින් අශ්වයාගේ පය බිඳිනාලදදැයි විචාළාහ. එසේය දේවයන් වහන්ස මොහු විසින් මට මයිලනුවෙනි කැටක් ගසා අසා රඳවාලවයි කී විසින් කැටක් ගැසීමි, එවිට අසාගේ පයබිඳුනේ සැබැවයි කීහ.එවිට රජ්ජුරුවෝ අස්සලස තා විසින් එසේ කියන ලදදැයි විචාළාහ. අස්සලයා ස්වාමීනි නොකීමි කියන්නා ඇයි මා ආදාසමුබ රජ්ජුරුවන් නියාව නොදනීද?. මා දක්කදී ඇත්තක්විනා බොරු නොකියවයි කීහ. එවිට අස්සලයා කියන්නේ සැබෑව දේවයන් වහන්ස කැටක් ගසා රඳවයි කීහ. රජ්ජුරුවෝ ගාමණීචණ්ඩයාට කියන්නාහූ අසාගේ පය බිඳුනාට මිළදීයයුතුය. මාගෙන් මසුරන් දහසක් ඇරගෙණ මුන්ට දිපියව අසා කැටක් ගසා රඳවන්ට කියාලා මාමැද නෑකීමි කියා බොරු කීහෙයින් මුගේ දිව කපවයි කීහ. එවිට අස්සලයා මට දිය යුතු මසුරන් දහස නුඹ වහන්සේ ඇරගෙණ මාගේ අසාගේ පය බිඳූනාටත් මට පලිනැත, මාගේ දිව ගලවාපූව මැනවයි ගාමණීචණ්ඩයන්ට මුරගා කියා ගැලවී ගියේය.

ඉක්බිති කුළුපොත්තා ඇවිත් කියන්නේ මූ විසින් මාගේ පියා මරණලද, ඒ මට විචාරන්නේ යහපතැයි කියා එවිට රජ්ජුරුවෝ සැබෑද ගාමණීචණ්ඩයයි කියා විචාරා එසේය දේවයන් වහන්ස මුන් තුන්දෙනා විසින් මා වටකොට ගෙණහෙයින් මම සිත්නෙම් ගොන්ගෙය යන ගෙවාගත නොහෙන දරුවන්ගේ නය හා අසාගේ නය කෙසේ දී ගැලවෙම්දැයි සිතා මාගේ ප්‍රාණය නසා ගනිමි සිතා පර්වතයට නැගී පනින්නෙම් මුගේ පිය ගේ ඇඟට පැණීපිම් මාගේ පිනුවේගයෙන් ඌ මියාගියේයයි කීහ. එවිට රජ්ජුරුවෝ කුළුපොත්තාට කියන්නාහූ අන්‍යායෙන් මැරුගමනක් නොවෙත් නොදන කළවරදට කරන්නේ කිම්දැයි කීහ. ඒ කෙසේ වුවත් දේවයන් වහන්ස මාගේ පියානන් ලදමැනවයි කිහ. එවිට රජ්ජුරුවෝ ගාමණීචණ්ඩයන්ට කියන්නාහූ මළාවුපියා උපද්දාගන්ට බැරි වූව එසේ හෙයින් මුගේ මහගෙණ තොප පිසවාකන්නා තොපපියායයි කීහ. එවිට කළුපොතු කියන්නේ මාගේ මව නුඹ වහන්සේට කෙසේ දෙම්ද මාගේ පියාත් මට එපයි මාගේ මවත් දෙන්නේනැතැයි කන්නලව් කියා ගැලවීගියේය.

SANHIDA LANKA

ගාමණීචණ්ඩයෝ යුක්තියෙන් දිනා සිටිනාහු අතරමගදී රජ්ජුරුවන් වහන්සේට කියන්ට කී ස්වරූප කියම් සිතා කියන්නාහු අගසිට මුලට විචාළාහ.

ඒ කෙසේද යත්.

දේවයන් වහන්ස  බ්‍රාහ්මණ මානවක මොත්තමක් මට කියන්නාහු ආදී අපි සිල්ප වණපොත් කළදේ යහපත්කෙට සිතතිබෙයි, දැන් සිතනොතිබෙන්නේ කුමන කාරණයක් නිසාදැයි විචාරන්ට කිවුය, කුමක් නිසාදැයි වදාළමැනවැයි කීහ.  එවිට රජ්ජුරුවෝ කියන්නාහු ආදීවුවන්ගේ ගෙදරවල නොවරද්දා අඬන කුකුලෙක් ඇත. එසේහෙයින් සිල්පශාස්ත්‍රය සිත තිබෙයි දැන් වනාහී මධ්‍යම රාත්‍රීවේලේ හෝ පාන්වන්ට සිටියදී හෝ අඬන කුකුලෙක් ඇත, එසේ හෙයින් සිල්පශස්ත්‍ර නිදිමත හෙයින් සිත නොතිබෙයි අනික් කුකුලෙකු වෙලාදැන අඬන ලෙස සලස්වයි වදාළ සේක.

දේවයන් වහන්ස තාපසවරු මොතත්මෙක් මට කියන්නාමූ ආදී අප වසන පන්සල අඹකොස් ආදී ඵලාඵල මධුරය, දැන් එම ඵලාඵල තික්තරසය ඊට කාරණය විචාරාගෙණ එවයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ ආදී ඒ තාපසවරුන් යහපත්කොට තපස්රකිනාහෙයින් ඵලාඵල මිහිරිය, දැන් තපස් නපුරුකොට රකිනාහෙයින් තික්තරසය ඉනිබ්බේ මාගේ ආඥාකියා ඉඳූරා තපස් රකින්ට කියවයි කිහ.

නැවත තුන්වෙනි පැනය කියන්නේ පළමු මාගේ විල පැන් ප්‍රසන්නව තිබෙයි දැන් කැළඹීතිබෙයි ඒ කාරණය විචාරාගෙණ එවයි කීහ. ඊට කාරණා කවරේදැයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ ආදී ඒ නයා මෛත්‍රීකෙරේ දැන් නොයෙක් අඬදබර කරණහෙයින් පැන් කැලඹීතිබෙයි බළමුසේ මෛත්‍රීකොට වාසය කරන්නා පැන් නොකැලඹී තිබෙයි ඒ නියාවට වාසය කරන්ට කියවයි කීහ.

සතරවෙනි පැනය කියන්නේ වෘක්ෂදේවතාවෙක් කියන්නේ තමා පළමු නොයෙක් බලිබිලිපටන් සියල්ල ඇත දැන් නොලැබෙයි ඒ කුමක් නිසාදැයි විචාරන්ට කීය. ඊට කාරණා කියවයි කීහ. ඊට රජ්ජුරුවෝ කියන්නාහූ වෘක්ෂදේවතාවා විසින් පළමු මනුෂ්‍යයන් සිතුදෙය සිද්ධකරණහෙයින් බලිපූජා කරන්නාහ. දැන් සිතුදෙය සිද්ධකරණ හෙයින් බලිපූජා සිද්ධනොකරන්නාහ. ඉනිබ්බේ මාගේ ආඥාකියා මනුෂ්‍යයන්ගේ සිද්ධාර්ථය සිද්ධකරන්ට කියවයි කීහ.

එවිට පස්වෙනි ප්‍රශ්නය කියන්නේ තිත්වටුවෙකු තුඹසක් පිට ඉඳ නාද කරන්නාවූ වේලෙහි යහපත්ව නාදකෙරෙමි අනික්තැනට ඉඳ නාදකරණ වේලේ නාදය යහපත් නොවෙයි ඒ කාරණය විචාරාගෙණ යන්ට කිය. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ ඒ තුඹසයට යහපත් නිධානයෙක් ඇත, එසේ හෙයින් නාදය යහපත් වෙයි ඒ තුඹස බිඳපියා නිධානය තොප ඇරගණුවයි කීහ.

සවන ප්‍රශ්ණය කියන්නේ එක්මුවෙක් තමා වාසය කරන්නාවූ ගසමුල තණ කන්නා මිහිරිය, අනික්තෙනක තණකන්ට නොමිහිරිය මේ කාරණය විචාරාගෙණ එවයි කීය. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ ඒ මුවා වසනනාවූ ගස අග මහත්වූ බඹමියෙක් ඇත, ඒ මී බින්දු වට පැගිරීමෙන් තණණ මිහිරි වන්නේය. ඒ ගස මිස සලාගෙණ තොපිත් ඇරගෙණ අපටත් මී එළවාලවයි කීහ.

යහපතැයි කියා සත්වන ප්‍රශ්නය කියන්නේ එක්නයෙක් තමා වසන්නාවූ තුඹසින් පිටවන වේලේ ගැටී ගැටී පිටත්වෙමි. ගොදුරුකා තුඹසට වදිනා වෙලේ යුහුව වැදයෙමි මේ කාරණය විචාරගෙණ යන්ට කියවයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහූ ඒ නයා වසන තුඹස මහත්වූ නිධානයෙක් ඇත, ඒ නිධානයෙහි ගත් ආසාවෙන් නික්මෙන වේලාවේ ගැහැටි ගැහැටි නික්මෙයි. තුඹසට වදිනාවේලේ එහි ගත් ලෝභයෙන් වහා වැදයෙහි එසේ හෙයින් ඒ තුඹස බිඳපියා නිධානය ඇරගණුවයි කීහ. යහපතැයි කියා අටවෙනි පැනය කියන්නාහූ එක්ස්ත්‍රියක් දෙමව්පියන්ගේ ගෙයිත් ඉන්දනොහෙමි ස්වාමිපුත්‍රයාගේ ගෙයිත් ඉන්දනොහෙමි මීට කාරණකින්දැයි විචාරන්ට කියවයි කියන්නා රජ්ජුරුවෝ කියන්නාහූ එසේ වීනම් ඒ ස්ත්‍රියගේ අතරමග ඉන්නා චරපුරුෂයෙකු ඇත. තොපි ගොසින් ඉනිබ්බේ ඒ ස්ත්‍රියට හා පුරුෂයාට මාගේ ආඥාකියා එසේ වූ නොකටයුත්තක් නොකරන්ට කියවයි කීහ. යහපතැයි කියා නැවත ප්‍රශ්නයක් කියන්නේ දේවයන් වහන්ස එක්තරා වෛශ්‍යාස්ත්‍රියක් කියන්නී පළමු මට බොහෝ සම්පත් ලැබෙයි දැන්වනාහී මට මස්සක් විවරක් දෙනෙකෙණෙක් නැත ඒ කුමක් නිසාදැයි විචාරන්ට කිවුය. ඊට කාරණාකින්දැයි විචාළිය. රජ්ජුරුවෝ කියන්නාහූ ආදී තමාගේ වෛශ්‍ය ධර්ම නොරකිණාහෙයින් කවුරුත් වුවමැනවයි නොසිතති ඉනිබ්බේ වෛශාධර්මය රකින්නා කවුරුත් වුවමැනවැයි නොසිතති කීහ.

SANHIDA LANKA

නැවත දසවෙනි ප්‍රශ්නය කියන්නේ ගම්මුදලියා පළමු තමාට බොහෝ සම්පත් ලැබෙයි, දැන් කිසිවකුත් නොලැබෙයි පාණ්ඩරෝගයක් ඇත මීට කාරණා කින්දැයි විචාරන්ට කීය. ඊට කාරණා වදාරන්නේ යහපතැයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ පළමු මෙහු විසින් අන්‍යායනොවී යුක්තායුක්ති විචාරණ හෙයින් කවුරුත් බොහෝ සම්පත් දෙන්නාහ. දැන්වනාහී අයුක්ති කාරණ විසින් කවුරුත් සම්පත් නොදෙන්නාහ. තෙමේත් රෝගීය. එසේ හෙයින් ඉනිබ්බේ තමාගේ අඟැකියා යුක්ති ඉඳුරා විචාරන්ට කියවයි කීහ.

මේ නියායෙන් ගාමණිචණ්ඩයන් කී ප්‍රශ්න දසයම බුදුකෙණෙකුන් වහන්සේගේ ප්‍රශ්ණ විසඳීමෙන් විසඳා වදාරා ගාමණිචණ්ඩයන්ට කිසිකෙණෙකු ගෙණුත් අවුලක් නොවන නියාවට ගමකුත් සලස්වා යවූහ. ගාමිණිචණ්ඩයොත් රජ්ජුරුවන්ට කී මෙහෙවර බමුණන්ට හා තපස්වරුන්ට හා නයාට හා වෘක්ෂදේවතාවාට හා ස්ත්‍රීයට හා ගම්මුදලියාට කියා නයාගේ හා තිත්වටුවාගේ හා නිධාන දෙකක් උදාරා ඇරගෙණ මුවා වසන්නාවූ ගලඋඩ තුබූ බඹරමියත් සලාගෙණ ඉන් අග්‍රමී රජ්ජුරුවන් කරා යවා තමන්ගේ ගමට ගොස් දැහැමෙන් සෙමෙන් දවස් යවා කම්වූ පරිද්දෙන් මියපරළොව ගියාහ. එකියන ආදාසමුඛ රජ්ජුරුවන් වහන්සේ දැහැමෙන් සෙමෙන් රාජ්ජ්‍ය කොට කම්වුපරිද්දෙන් මිය පරලොව ගියාහයි. වදාරා මේ ගාමණිචණ්ඩ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි ගාමණිචණ්ඩයෝ නම් මෙසමයෙහි ආනන්ද ස්තවිරය, ආදාසමුඛ රජව උපන්නෙම් බුදුවූ මිමමයයි වදාළ සේක.

SANHIDA LANKA

# ගුත්තිල ජාතකය

තවද සංසාර නෞකාවූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරියන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

එක් දවසක් සංඝයා වහන්සේ දේවදත්ත ස්ථිවිරයන්ට කියන සේක් ඇවැත්නි සර්වඥයන් වහන්සේගෙන් තොපි ත්‍රිපිටකයක් දරණ ලද සර්වඥයන් වහන්සේ නිසා චතුර්ධ්‍යානයෙන් ලබන ලද එසේ වූ බොහෝ උපකාරීව තොපට ආචාරී පදවියේ සිටි තොපි සමව සිතා විපරිතව කුමට ඉඳූදැයි කියා කී සේකී. ඒ අසා දේවදත්ත ස්ථිවිරයන් වහන්සේ කියන සේක් ඇවැත්නි සර්වඥයන් වහන්සේ මට කුමන ලාභ සත්කාර කලෝද මම්ම ත්‍රිපිටකය දැරිමි. මම්ම ධ්‍යානය උපදවා ගතිමි. සර්වඥයන් වහන්සේ මට කුමක් කලෝදැයි කීහ. මේ කථාව ධර්ම සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්ට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි පෙරත් දේවදත්ත ස්ථිවිරයෝ ගුරුන්ට අපඛ්‍යාතකලෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකී.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුරව බ්‍රහ්මදත්ත නම් රජකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ගාන්ධර්ව නම් විද්වත් කුලයක ඉපිද වැඩිවිය පැමිණ ගාන්ධර්ව නම් ශිල්පය නිමවා ඉගෙන ගෙන ගුත්තිල නම් ගාන්ධර්වයෙක් යන නමින් දඹදිව ප්‍රසිද්ද වූහ. අඳ දෙමාපියන් රක්නාහ. එසමයෙහි බරණැස් නුවර සිට වෙළෙඳුන් උදේනි රටට ආවාහු එක් දවසක් ඉස්සෝදා නාහා කා බී සැපසේ උන්නාහු. අපට ගී කියන්නට වීනා ගයනා දන්නා විද්වතකු ගෙනවයි කීහ. යහපතැයි කියා එගම ගාන්ධර්වයන්ට නායක වූ මූසිල නම් ගාන්ධර්වයෙක් එතනට අවුත් එකීයන වෙළඳූන්ට නටා ගී කිය. ඒ අසා ව්‍යාපාරයෝ සතුටු වන්නා නොවුහ. එවිට මූසිලයෝත් මධ්‍යම කොට විනා ගාන්ට වන. එවිටත් මඳකුත් සතුටු නොවුය. උත්තම කොට විනා ගාන්ට වන. එවිටත් කිසි කෙණෙක් සතුටු නොවුහ. මූසිල නම් ගාන්ධර්ව සිතන්නේ එසේ වී නම් විශේෂයෙන් නොදන්නා කෙණෙකුන් වනැයි සිතා එසේ නම් මමත් මුන් හැම නොදන්නා මිනිසුන්ට නපුරු කොට ගායනා කෙරෙමියි ගායනා කරන්නට වන. එවේලේත් කිසි කෙණෙකුන් සතුටු නොවුය. එවිට මූසිල නම් ගාන්ධර්වයාෙ කියන්නේ ඇයි තෙපි හැම මා මෙසේ ගායනා කරද්දී බැන නොනැගි ඉන්නේ. කිසි විශේෂයක් නොදන්නා හෙයින්ද නැත්නම් මට වඩා ගාන්ධර්ව කරන්නා ගාන්ධර්වයෙකු දුටු විරු ඇද්දැයි විචාළේය. එබස් අසා මනුෂ්‍යයෝ කියන්නහු එම්බල මූසිල නම් ගාන්ධර්වය ගුත්තිල නම් ගාන්ධර්වයාගේ විණා නාදය ඇසුවා වූ අපට තොපගේ විණා නාදය උනුපත්තක ගාන්නක් මෙන් අපට සිතේයයි කීහ. එබස් ඇසූ මූසිල ගාන්ධර්ව කියන්නේ එසේ වීනම් තොපි හැම බරණැස් නුවරට යන කල මාත් කැන්දාගෙන යවයි කීහ. යහපතැයි කී එකී යන ව්‍යාපාරයෝත් තමන් බරණැස් නුවරට යන ගමනේ එකියන මූසිල නම් ගාන්ධර්වයාත් කැඳවාගෙණ ගොස් බරණැස් ගුත්තිල ගාන්ධර්වයාගේ ගෙය පෑහ. තම තමන්ගේ වාසස්තානයට ගියාහ. එකියන මූසිල නම් ගාන්ධර්වයා ගෙට වන. ඒ වෙලාවට බෝධිසත්වයෝ ගෙයි නැත්තාහ. එවිට මූසිල නම් ගාන්ධර්ව බෝධිසත්වයන්ගේ ඉද්දොර තිබූ ජාතී විණාව ගාන්ට වන. අන්ධ වූ බෝධිසත්වයන්ගේ දෙමාපියෝ කියන්නාහු අපගේ දරුවන්ගේ වීණාවක් මීයෝ එක්ව පියා කපන සැටියයි කීහ. ගාන්ධර්ව බෝධිසත්වයන්ගේ දෙමාපියන් වැඳලා නුඹ වහන්සේගේ පුතනුවන් කොහිදැයි විචාලේය. එවිට බෝධිසත්වයන්ගේ දෙමාපියන් කියන්නාහූ දැන් දරුවෝ එති. මෙතන ඉඳූවයි කියා උන් අවස්ථාවට බෝධිසත්වයෝ එතනට ආහ. එවිට මූසිල නම් ගාන්ධර්ව බෝධිසත්වයන් වැඳ තමාට ශිල්ප උගන්වන්නට කීහ. එවිට බෝධිසත්වයෝ සාමුද්‍රිකා ලක්ෂණ දන්නා හෙයින් මේ අසත්පුරුෂයා යයි කියා දැන තොපට මා දෙන විද්‍යා නැත. පලායවයි කීහ. එකීයන මූසිලයාත් බෝධිසත්වයන් නොකැමැති බෝධිසත්වයන්ගේ සිත් ගෙන නුඹ වහන්සේගේ පුතනුවන් වහන්සේට කියා මට ශිල්ප දෙන්ට කිව මැනවයි කියා යාඥ්ඥා කළේය. බෝධිසත්වයන් ගේ දෙමාපියෝත් බෝධිසත්වයන්ට කියන්නාහු. මොහුට ශිල්ප උගන්වන්ටයි කීහ. බෝධිසත්වයෝත් දෙමාපියන් කීවා අපත්වන්ට බැරිහෙයින් යහපතැයි කියා අචාරීභාග නොතිබාම ශිල්ප නිමාවට විද්‍යාව ඉගැන්වූහ. බෝධිසත්වයෝත් රජ්ජුරුවන් දකින්ට යනවිටෙක අතවැස්සනුත් ඇරගෙණ යන්නාහ. රජ්ජුරුවෝ මුකවුරු දැයි විචාරන්නා දේවයන් වහන්ස මාගේ අන්තේවාසිකයෙක්යයි කීසේක. රජ්ජුරුවෝත් ඌ හා සමාන කල්යාමෙන් විශ්වාසවූහ. බෝධිසත්වයෝත් දරුව තොපට වඩා මම විද්‍යාව නිමවා දනිමි කීහ. එක් දවසක් මූසිල ගාන්ධර්වයා සිතන්නේ මම ඔබ්බේ නුවරකට ගොස් ජීවත්වන්නා බලා ඇමටම ප්‍රධානවූ බරණැස් නුවර ඉඳිමියි ආචාරීන් වයෝවෘද්ධවයහ. එසේ හෙයින් මෙතනම ඉඳිමියි සිතා

SANHIDA LANKA

බෝධිසත්වයන්ට කියන්නේ ආචාරීන් වහන්ස රජ්ජුරුවන් වහන්සේට සේවය කරන්නා කැමැත්තෙමි එසේ හෙයින් මට පඩියක් සලස්වන්නා කැමැත්තෙමි කීහ. බෝධිසත්වයෝත් රජ්ජුරුවන්ට ගොසින් කියමි කියා රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නාහු, දේවයන් වහන්ස මාගේ අන්තේවාසිකයා නුඹ වහන්සේට සේවය කරන්නා කැමැත්තේය. උඟට පඩියක් සලස්වන්නට උවමැනවැයි කිහ. රජ්ජුරුවෝත් එසේවිනම් තොපගේ පඩිනියාව භාගයක් සලස්වාලමි කීහ. එපවත් ගොස් ශිෂ්‍යන්ට කීහ. ශිෂ්‍යයෝ කියන්නාහු ඇයි මාත් ශස්ත්‍රසරියේ දනිත්වුව මට පඩි අඩුවනට කාරණ කවරේදැයි කීහ. එපවත් බෝධිසත්වයෝ ගොස් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් තොප සරියට විද්‍යාපෑනම් එතරම් නියාවට පඩිත් වෙයි කීහ. බෝධිසත්වයෝ එපවත් ශිෂ්‍යයන්ට කීහ. ශිෂ්‍යයෝ යහපතැයි විද්‍යානියාවට පාම් කීහ. රජ්ජුරුවෝ බෝධිසත්වයෝත් ශිෂ්‍යයාත් ලඟට ගෙන්වා ශිෂ්‍යයාට කියන්නාහු එඹල තොප විසින් ගුත්තිල නම් ගාන්ධර්වයන් හා කැටිව වාදකරන්ට පිළිවන් දැයි විචාළාහ. එවිට මූසිල කියන්නේ ශාස්ත්‍ර මාත් විශේෂකොට දනුත් උව අදට සත්වෙනිදා උඟ හා මා හා වාදකරම්හයි කීහ. රජ්ජුරුවෝත් ගුත්තිල ගාන්ධර්වයා හා ශිෂ්‍යයා හා දෙන්නා අදටසත්වෙනිදා වාදකෙරෙති නුවරසැලකළහ. බෝධිසත්වයෝත සිතන්නාහු මේ කාරණය එසේ හෙයින් මොහුගේ විද්‍යාව සහයට යෙදෙයි මා වයොවෘද්ධ හෙයින් සහයට නොයෙදෙයි. එසේ හෙයින් මා සරිවුවත් පැරැද්දාහම සරිය පැරැද්දත් පැරදිනියාමයයි සිතා එසේ හෙයින් මුව පරදිනා බලාත් ප්‍රාණය නසා ගන්ට යහපතැයි සිතා වලට වදිම් සිතා ලජ්ජාවෙන් නික්මෙන්නාහ, මරණ භයින් ගෙට එන්නාහ. මේ නියායෙන් සත්දවසක් අවිජින්නව යාමෙන් ඒ මෙන්ම තනනලද මාවත්ව ගියේය.

මේ නියායෙන් බෝධිසත්වයන් සත්වන දවස් වනාන්තරයට ප්‍රාණය නසාගන්ට ගියකල්හි ශක්‍රයන්ගේ පාංඩුකම්බල ශෛලාසනය උනුවිය. ශක්‍රයෝ මාගේ සම්පත් උදුරාගන්නේ කවුරුදැයි සිතා දිවසින් බැළුගමනේ බෝධිසත්වයන්ගේ විකෙෂ්පය දැක එතනට අවුත් ඇයි ආචාරීනි මෙතන අවුත් සිටියාවනැයි විචාළාහ. එවිට බෝධිසත්වයෝ තොපි කවුරුදැයි විචාරා මම දෙදෙව්ලොවට අධිපති වූ ශක්‍රයෝයයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහූ සත් සත් කඩක් ඇති විනාවාද නමැත්තාවූ විද්‍යාව සෙට මා හා මාගේ ශිෂ්‍යයා හා දෙන්නා රජ්ජුරුවන්ට පාම්හ. කෝසියගෝත්‍රයෙතහි උපන්නාවූ ශක්‍රදේවේන්ද්‍රය මට පිටිවහල්වෙවයි කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහූ යහපත ආචාරීනි තොපට මම පිටිවහල් වෙමි තොප හා උන් හා සරියේ විද්‍යාව පාන්න, එකල්හි මා සහිඥාකළවේලෙහි සත් තත කඩාපියව, තොප විසින් විණා දණ්ඩ අතගසන්ට වන් වේලාව පළමුවෙනියාවට නාදවඩිනේය. උගේ තත් සතෙහි නාද අඩුවෙයි. ඒ අවස්ථාවට තොප විසින් මේ පසඇටතුණ ආකාශයට දමන්නාම නවසියයක් දිව්‍ය ස්ත්‍රීන් නටන්නාහ, මමත් එතනට එන්නෙම් වේදැයි කියා ගියාහ. මනුෂ්‍යයෝත් සෙට දවස් ගුත්තිල ගාන්ධර්වයා හා මූසිල නම් අත වැස්සා හා දෙන්නාගේ සෙට තර්කවන්නේයයි කියා මැසිපිට මැසිබැඳ රථපිට රථ තිබාගෙණ හිවිගැවසී සිටගත්හ. බෝධිසත්වයෝත් තමන්ගේ ජාති විනාව ඇරගෙණ අවුත් තමන්ට පැනවූ අස්නපිට උන්නාහ. මූසිලනම් අත වැසිත් තමාට පැනවූ අස්නපිට උන්නේය. බොහෝ මනුෂ්‍යයෝත් බලාසිටි යාහ, රජ්ජුරුවෝත් රාජාසනයෙහි උන්නාහ. ශක්‍රදේවේන්ද්‍රයෝත් ආකාශයෙහි අදෘශ්‍යමානව සිටියාහ. ශක්‍රයන් ආනියාව බෝධිසත්වයෝ පමණක් දන්නාහ. එවිට බෝධිසත්වයන් හා අතවැසි විද්‍යාව සමව පෑහ. බොහෝදෙනා විද්‍යාව පෑ නියාව යහපතැයි බොහෝ දෙනා සතුටුවූහ. එවිට ශක්‍රයන්ගේ සංඥාවත් බෝධි සත්වයෝත් පළමුවන තන කඩාපුවාහ. එවිට ඒ තත්සිදුරෙන් පළමු නාදනියාවට මහත්ව නාදපවතින්ට වන, ඒ දැක මූසිල ගාන්ධර්වයාත් තත් කැඩීය. ඒ හඬ ආදී නියාවට අඩුවිය. මේ නියායෙන් බෝධිසත්වයෝ දෙවන තතය තුන්වන තතය සතරවෙනි තතය, පස්වෙනි තතය සවන තත සත්වන තතයයි මේ නියායෙන් තත් සතම කඩා වීනාදණ්ඩ විනාගන්ටවන්නාහ. බරණැස් නුවර එකනින් නාදව ඇසෙන්ට වන, මූසිලයාත් මේ  නියාවට තත් සතම කඩා නාදකරන්ටවන් වේලාවට උනපත්තක අතගානකලක් මෙන් නිශ්ශබ්දවිය. ඒ වෙලාවට බෝධිසත්වයෝ ශක්‍රයන් දුන් පස ඇට තුනින් එකක් ආකාශයට දැමූහ. තුන්සියක් දිව්‍යස්ත්‍රීන් නටන්ට වන්නාහ. දෙවැනි පසඇට දැමූහ, එවිට තුන්සියයක් දිව්‍ය ස්ත්‍රීන් නටන්ට වන්නාහ. තුන්වෙනි පස ඇට දැමූකල්හි තුන්සියයක් දිව්‍ය ස්ත්‍රීන් නටන්ට වන්නාහ, බෝධිසත්වයෝ මියුරුවූ ගිතිකා කිය කියා විනානාද කරන්නාහ, ඒ දුටු රජ්ජුරුවන් හා නුවරවාසී බොහෝ සතුටුවූහ. රජ්ජුරුවෝත් මූසිලයා කෙරේකිපී අමාත්‍යයන්ගේ මුනබැළුහ. අමාත්‍යයෝ රජ්ජුරුවන්ගේ අභිප්‍රාය දත්තාහූ විසින් ආචාරීන් කැටිව ගුරු ද්‍රෝහකරණ ලදැයි තමන්'ත්තමන්ගේ අත තිබූ කැටමුගුරු බාලා මරාතලා පයඅල්වා ඉවත දැමූහ.  රජ්ජුරුවෝත් බෝධිසත්වයන් කෙරෙහි සතුටුවූහ. එකපැතිර වස්නා මහාවර්ෂාවක් මෙන් බොහෝ සත්රුවන් ආදීවූ ප්‍රාසාද දුන්නාහ. නුවරවාසී බොහෝ සම්පත් දුන්නාහ. ශක්‍රයෝත් මා විසින් තොපගේ ගෙට වෛජයන්ත රථය එවමි. තොපි ඒ රථයට නැගී මාකරා එවයි කියා දිව්‍යලෝකයට ගියහ. දිව්‍යස්ත්‍රීන් ඇයි දේවයන් වහන්ස යම්තම් වේලක් පමාවූයේදැයි විචාරා ගුත්තිල ගාන්ධර්වයන්ගේ වීණා නාදය අසන්ට ගියෙමි කී කල්හි එවිට දිව්‍යස්ත්‍රීන් අපිත් විණා නාදය අසන්නා කැමැත්තෙම්හයි කියන්නා ශක්‍රයන් විසින් මාතලි නම් දිව්‍යපුත්‍රයා අත වෛජයන්ත නම් රථය යවූහ. බෝධිසත්වයෝත් ඒ රථයට නැගී ශක්‍රයන් ලඟට අවුත් සිටියාහ. ශක්‍රයෝ ආචාරීනි විණාගායනාකරවයි කීහ. බෝධිසත්වයෝ කියන්නාහූ

SANHIDA LANKA

විජ්ජුත්තුනම් මිලයක් ඇතිව මිසක් විද්‍යානොපානාහ. එසේවී නම් මා විද්‍යා පෑකල දෙන්නේ කීන්දැයි කීහ. ශක්‍රයෝ විද්‍යා පෑ කල බොහෝ සම්පත් දෙම්මැයි කියන්නා සම්පත්තීන් මට කාර්ය නැත, මම නුඹ වහන්සේගේ දෙතිස් දිව්‍යස්ත්‍රින්ගේ පින් අසන්නා පමණකැයි කීහ. එවිට දිව්‍යස්ත්‍රින් විණානාදකරන්නා ආචාරීනි අප කළ පින් කියම්හයි කීහ. එවිට බෝධිසත්වයෝත් යහපතැයි කියා දිව්‍ය ගාන්ධර්වයන් මෙන් ගායනා කොට පෑ පළමුවන දිව්‍ය ස්ත්‍රිය අතින් විචාරන්නාවූ තොපි ඔසධිතාරකාවන් මෙන් විශිෂ්ට වූ රුවින් දස දිග බබුළුවා දහස්ගණන් දිව්‍යස්ත්‍රීන් විසින් පිරවරණලදුව සිටිනීය, එසේ හෙයින් තොපදැක මට සතෙතාෂකරවයි මනුෂ්‍යාත්භාවයෙහිදී කෙසේවූ පින්කොට මේ දිව්‍යභවනයෙහි උපන්දැයි ඒ මට කියවයි කීහ. ඔයිත් කියන්නී ගාන්ධර්වයානෙනි මනුෂ්‍යාත්මභාවයෙහි සිටි මා විසින් කාශ්‍යප සම්මාසම්බුදු රජානන් වහන්සේගේ ශාසනයෙහි රහත් නමකට පිළිසඟලක් දිනිමි. ඒ විපාකයෙන් මේ නියා අනාභාවයක් ඇතිව උපනිමි කීහ. බෝධිසත්වයෝ සෙස්සන් අනිනුත් විචාළාහ. සෙස්සෝත් තමන් කළ කුසල් කීහ.

ඒ කෙසේද යත්

එකෙක් කියන්නී මල් කළඹක් පුදා දිව්‍යලෝකයෙහි උපනිමි කීහ. එකෙක් එක දාගැබකට සුවඳ පසඟුල්දී ඒ පින් කරමින් දිව්‍යලෝකයෙහි උපනිමි කීහ. එකක් සුවඳබඩුවක් දන්දී උපනිමි කීහ. එකක් මිහිරි එළාඑල දන්දී දිව්‍ය ලෝකයෙහි උපනිමි කීහ. එකක් මිහිරි එළාඑලයක්ම දන්දී උපනිමි කීහ. එකක් මිහිරිස භික්ෂූන් වහන්ස්ට දන්දී උපනිමිකීහ. එකක් කාශ්‍යප බුදුන්ගේ දාගොබකට සිය අතින් පසඟුල් දී උපනිමි කිව. එකක් මන් මුලායෙන් ආ භික්ෂූන් වහන්සේට දන්දී බණ අසා දිව්‍යලෝකයෙහි උපනිමි කීහ. එකක් නැවින් යන වහන්දෑකෙණෙකුන්ට පැන් පිළිගන්වා උපනිමි කීව. එකක් නැදිමයිලන් ආක්‍රොස බිනියදී බැනනොනැගී මෛත්‍රී කොට උපනිමි කිව, එකක් තමා ලත් බත් කොටස බෙදාදන්දී උපනිමි කිව, එකක් අනුන්ට වාල්ව ඉපිද තමා ලද දෙය දන්දී උපනිමි කිව, මේ නියායෙන් දෙතිස් දිව්‍යස්ත්‍රීන් තමන්කළ පින් බෝධිසත්වයන්ට කීහ. බෝධිසත්වයෝත් තමන්ගේ ජීවිතය ලද්දාවූ එලලදිමි කියා සතුටුව මනුෂ්‍ය ලෝකයට අවුත් එපවත් බොහෝදෙනාහට කියා බොහෝ දෙනා පින්කමෙහි ඇසුරුවා වදාරා මේ ගුත්තිල ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි මූසිල ගාන්ධාර්වයා නම් දේවදත්ත ස්පීවිරය, බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ත්‍රිවිරය. ශක්‍රයෝ නම් අනුරුද්ධ ස්පීවිරය. ගුත්තිල ගාන්ධර්ව උපන්නෙම් බුදුවූ මමමයයි වදාළ සේකී.

SANHIDA LANKA

# විතීය රාධ ජාතකය

සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරන සේක් ස්ත්‍රියක කෙරෙහි සිත් බැඳි භික්ෂුවක් අරභයා මේ ජාතකය කළ සේක.

බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂුව අමතා මහණ, ස්ත්‍රිය නම් විශ්වාසයකට නොහැක්කේ ය. පෙර රැකවල් තබාත් ස්ත්‍රීන් ව රැක ගත නුහුනුවෝ වේදැයි ඉකුත් වත වදාල සේක.

මෙහි ජාතක කතාව පෙර රාධ ජාතකය මෙනි.

SANHIDA LANKA

# සිරිකාලකන්නි ජාතය

සිරිකාලකන්නි ජාතකය උමන්දයෙහි විස්තර වශයෙන් බස්නේය.

SANHIDA LANKA

# චුල්ලකාලිඟ ජාතකය

තවද එක් සමයෙක්හි පරහිත නිරතවූ සකල ජනමන නයනානන්ද කරවූ ශාස්තෘ වූ අප තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්. සතර පරිබ්‍රාජිකා කෙනෙකුන්ගේ පැවිදිවීමක් අරභයා මේ ධර්ම දේශනාව ප්‍රකාශ කොට වදාළසේක.

ඒ කෙසේ ද යත්

විශාලා මහනුවරෙහි වනාහි සත්දහස් සත්සිය සත් දෙනෙක් ලිච්ඡව රජහු වෙසෙති, ඒ සියළු රජ දරුවෝ ඔවුනොවුන් හා සාකච්ඡා කිරීමෙන් කල්පනාවක් කරන්නාහු. ඊට ඉක්බිතිව පන්සියයක් වාද බිනීමෙහි නිපුණවූ එක් නිගණ්ඨ පුත්‍රයෙක් මෙම විශාලා මහනුවරට පැමිණියේම ඒ රජදරුවෝ ඔහුට සුදුසු සංග්‍රහ කළාහුය. අනිකුදු පන්සියයක් වාද බිනීමෙහි නිපුණවූ නිගණ්ඨ පරිබ්‍රාජිකාවක් එම නුවරට පැමිණියාය, ලිච්ඡවි රජදරුවෝ ඔවුන් දෙදෙනා වාද කරවූවාහුය. ඒ කිරීමෙන් ඔවුන් දෙදෙනා සදාශ වූවාහුය. ඉක්බිති ලිච්ඡවි රජ දරුවන්ට මෙබඳුවූ සිතිවිල්ලෙක් වූයේය. මොවුන් නිසා උපන් පුත්‍රයෙක් ව්‍යකත වන්නේයයි සිතා ඔවුන් දෙදෙනා විවාහ කරවා සමග වාසය කෙරෙව්වාහුය. ඔවුන්ගේ සංවාසය නිසා පිළිවෙලින් දූන් සතර දෙනෙකු හා එකම පුත්‍රයෙක් වැදුවාය. ඒ දූන් සතරදෙනාට ක්‍රමයෙන් සච්චය ලෝලාය අවවාදකය පටාචාරායයි නම් කළහ. පුත්‍රයාට සච්චකයයි නම් කළාහුය. ඔවුන් පස්දෙන විඥ්ඥ බවට පැමිණිලි කල මෑණියන්ගෙන් පන්සියයෙක පියානන්ගෙන් පන්සියයෙකැයි වාද දහසක් උගත්තාහුය. මව් පිය දෙදෙන දූන් සතරදෙනාට මෙසේ අවවාද වාද කළාහුය. ඉදින් ගෘහස්ථ පුරුෂයෙක් තොපගේ වාදය බින්දේනම් ඕහට පාදපරිචාරිකා හා වව් පැවිදි කෙනෙක් තොපගේ වාද බින්දේනම් සමීපයෙහි ඔහුගේ පැවිදිවේවායයි කීවාහුය. එයින් මෑතභාගයෙහි මව් පිය දෙදෙන කාල ක්‍රියා කළෝය. ඔවුන් කාල ක්‍රියා කළ කල්හි සච්චක නම් නිගණ්ඨ පුත්‍රයා ඒ විශාලා නුවරෙහි ලිච්ඡවි රජදරුවන් අක්ෂර ලිඛිතාදී සිල්ප උගන්වමින් වාසය කෙරෙයි ඔහු සතරදෙන දඹ අත්තක් ගෙණ වාදය පිණිස නුවරින් නුවර ඇවිදිනාහු. ක්‍රමයෙන් සැවැත්නුවර වාසල්දොර සමීපයෙහි දඹ අත්ත හිටුවා යම්කිසි ගෘහස්ථයෙක් සැවැත් නුවර වාසල් දොර සමීපයෙහි දඹ අත්ත හිටුවා යම්කිසි ගෘහස්ථයෙක් හෝ පරිබ්‍රාජිකයෙක් හෝ අපට වාදාරොපනය කරන්ට හැකිවී නම් ඒ පුරුෂතෙම මේ පාංශුරාසිය පයින් විසුරුවා පයින් දඹ අත්ත මිරිකාපියත්වයි කියා ගම් දරුවන්ට කියා පිඬු පිණිස නුවරට වන්නාහුය. ඉක්බිති ආයුමෙත්වූ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ නොහැමදිතැන් හැමද සිස්භාජනය දිය පුරවා ගිලන් භික්ෂූන්ට පිළිදැගුම් කරවා ඉතා දහවල්හි සැවැත් නුවරට වඩනාසේක්. ඒ පස්රැස පිහිටවූ දඹ අත්ත දැක විචාරා ගම්දරුවන් ලවා හෙලවා මිරිකවා යම් කෙනෙකුන් විසින් මේ සාඛාව පිහිටුවන ලද්දීද ඔහු ආහාර කෘත්‍යය කොට අවුත් දෙව්රම් වෙහෙර දොරටුවෙහිදී මා දකිත්වයි ගම් දරුවන්ට කියා නුවරට කියා නුවරට වැද කරණලද ආහාර කෘත්‍ය ඇති සේක්. දෙව්රම් වෙහෙර දොරටුවෙහි වැඩිසේක. ඒ පරිබ්‍රාජිකාවෝ සතරදෙන පිඬු පිණිස හැසිර ආහාර කිස සපයා ආවාහු. මිරිකා හෙලූ සාඛාව දැක කවරක්හු විසින් මේ සාඛාව මර්දනය කරණ ලද්දාහු වෙද්දැයි විචාළෝය. ශාරිපුත්‍ර ස්ථවිරයන් විසිනැයි අසා ඉදින් තොපි වාදය කරණු කැමැත්තාහු වී නම් දෙව්රම් වෙහෙර වාසල් දොරටුව ගියමැනවයි කියනලද්දාහු. නැවත නුවරට ගොස් මහජනයා රැස් කරවා වෙහෙර වාසල් දොරටුවට ගොස් තෙරුන් වහන්සේ අතින් වාද දහසක් විචාළාහුය. තෙරුන්වහන්සේ ඒ සියළු වාදයන් විසඳා අන්කිසි වාදයක් දනුදැයි විචාළසේක. ස්වාමීනි අපි නෙදනුම්හයි කීවාහුය. මම වනාහි අන්කිසි ප්‍රශ්නයක් විචාරම්දැයි කීසේක. ස්වාමීනි විචාළ මැනවැ දතිතොත් කියන්නමෝ වේදැයි කිවූය. තෙරුන් වහන්සේ එකෙක් නම් කිම් දැයි විචාළසේක. ඒ පරිබාජිකාවෝ ස්වභාව වූ පරිද්දෙන් නොදන්නාහුය. එවිට තෙරුන් වහන්සේ විසඳා වදාළසේක. ඔහු ස්වාමීන් වහන්ස අපට පරාජයය, නුඹ වහන්සේට ජයවියයි කීවාහුය. දැන් තොප කුමක් කරව්දැයි විචාළසේක. අපගේ දෙමව්පියන් විසින් මෙබඳු අවවාදයක් දෙනලද ඉදින් තොපගේ වාදය ගෘහස්ථයෙක් බින්දේවී නම් ඕහට පාද පරිචාරිකවව් ඉදින් පැවිදිකෙනෙක් බින්දේ නම් ඔවුන්ගේ සස්නේ පැවිදිවෙව්වයි කීවාහුය. එබැවින් අපට පැවිදි වීම දුන මැනවැයි කිවූය. තෙරුන් වහන්සේ යහපතැයි වදාරා ඒ පරිබ්‍රාජිකාවන් සතරදෙනා උත්පලවර්ණ මහා ස්ථවිරින් වහන්සේගේ යම් සමීපයෙහි පැවිදි කරවූසේක. ඒ සියළු මෙහෙනින්නෝ පැවිදි කරවූ නොබෝ කලකින් රහත් බවට පැමිණියාහුය. ඉක්බිති එක් දවසක මේ ආශ්චර්යමත් කථා ශ්‍රවණයෙහි කෝතුහල භික්ෂූන් වහන්සේ ධම්සභා මණ්ඩපයෙහි රැස්ව ඉඳ ඇවැත්නි ශාරිපුත්‍ර ස්ථවිරයෝ පරිබ්‍රාජිකාවන් සතර දෙනාට මාර්ග ඵල ප්‍රදානය කිරීමෙන් ඇවැස්සවූ සේක් වේදැයි උන් වහන්සේගේ ප්‍රඥාවි ශේෂ ගුණය ප්‍රකාශ කොට කීමෙන් වැඩ උන් සේක්. එකල්හි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ එතැන්හි වැඩ වදාරා මහණෙනි දැන් මා එන්නාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාළසේක. ස්වාමීනි බුදුරජානන් වහන්ස රාජා කථා ආදීවූ අන් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. ශාරිපුත්‍ර ස්ථවිරයන් කරණ ලද ආශ්චර්යත්වූ මෙනම් කථාවකින් කිය කියා උනුම්හයි දැන්වූ කල්හි මහණෙනි ශාරිපුත්‍ර ස්ථවිරයෝ මේ

SANHIDA LANKA

පරිබ්‍රාජිකාවන්ට අවශ්‍ය වූයේ දැන් මතු නොවෙයි පෙරත් වැඩෙහි යෙදීමෙන් අවශ්‍ය වූය. දැන් ප්‍රවජ්ජාභිසේක දීමෙන් අවස්සාවුසේක. පෙරත් රාජ මහේසිකාභිසේක ස්ථානයෙහි පිහිටවීමෙන් අවශ්‍යවූයයි වදාරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

යටගිය දවස කලිගුරට දන්තපුර නුවර කලිඟු නම් රජක්හු රජ කරණ සමයෙහි අස්සක නම් රටක පොතලීනුවර අස්සක නම් රජෙක් රාජ්ජය කෙරෙයි ඔවුන් දෙදෙනා අතුරෙන් කලිඟු රජ සමුර්ධ වූ හස්ත්‍ය ස්වවාහනාදී බලා සෙනග ඇතිව තෙමේද ඇත් බල ඇත්තේ තමා හා යුද්ධ කරන්නක්හු නොදැක යුද්ධ කරණු කැමතිව ඒ රාජ මා හා යුද්ධ කරණ කෙනෙකුන් නොදක්නෙමි. කවර ප්‍රයෝගයකින් යුද්ධයක් යොදම්දැයි කියා අමාත්‍යයන් අතින් විචාළේය. එවිට අමාත්‍යයෝ කියන්නාහු. මහ රජ්ජුරුවන් වහන්ස, එක් උපායෙක් ඇත, නුඹට හන්සේගේ දුටු කුමාරිකාවෝ සතරදෙන උත්තම රූපශ්‍රී දරන්නාහ, ඔවුන් සියළු ස්ත්‍රී ආභරණයෙන් සරහා පිළිසන්වූ ආසනයෙහි වඩා හිඳුවා බළ සෙනඟ පිරිවරණ ලද්දාවූ ඔවුන් ගම් නියම් ගම් රාජධානියෙහි ඇවිදුවා යම්කිසි රජෙක් ඔවුන් තමාගේ ගෙයි ඇතුලත් කොට වාසය කරණු කැමැත්තේ වීනම් ඔහු හා සමඟ යුද්ධ කරම්හයි කීවාහුය. ඒ කලිගුරාජ අමාත්‍යයන් කීපරිද්දෙන්ම කෙළේය. ඔවුන් ගිය ගිය තැන්හි රජදරුවෝද කලිගුරජගහට භයින් තමන් නුවර වලට වදින්ට අවසර නොදී අන්නපානාදීවූ පඬුරු ගමන් කරවා පිටිනුවර දීම යපීම කොට වාසය කරත්. මෙපරිද්දෙන්ම සියළු දඹදිව මුළුල්ලෙහි ඇවිද අස්සක පොතලී නුවරට පැමිණියාහුය. එනුවරෙහි අස්සක රජ නුවර වාසල් දොර වස්වා පඬුරු ගමන් කරවූයේය, ඒ රජහුගේ නුවණැති කාර්‍ය්‍ය කාර්‍ය්‍ය පරිඥානයෙහි ව්‍යක්තවූ උපාය ඥානයෙහි දක්ෂවූ නන්දිසේන නම් අමාත්‍යයෙක් ඇත, ඒ තෙමේ මෙබඳු සිතිවිල්ලක් සිතීය. මේ රාජකුමාරිකාවෝ වනහි සියළු දඹදිව්තෙලෙහි සැරිසරා ඇවිද ප්‍රති යුද්ධ කරණ කෙණෙකුන් නොලද්දාහුය. එසේ කල්හි සියළු ජම්බුද්වීපය හිස්වූයේ නම් වන්නේය. මම කලිගුරජ හා සමඟ යුද්ධ කෙරෙමියි කියා නුවර වාසල් දොරට ගොස් දොරටුපාලයා කැඳවා ඒ රාජ කන්‍යාවන් නුවරට වදනා පිණිස කියනුයේ කලිඟු රටට ප්‍රධානවූ රජගහ කලිඟු රජයයි කියා යම්සේ ව්‍යවහාර වීද ඒ පරිද්දෙන්ම අරුණ කුමාරයන් වහන්සේ අපගේ මේ අස්සක නුවරට අධිපතිවූ හෙයින් අස්සකයයි නම්ලත් රජහු පුරුෂ ශ්‍රේෂ්ටවූ ගුරුවරයන් විසින් මොනවට අනුශාසනා කරණ ලද්දාවූ නන්දිසේන නම්වූ මා විසින් සුරක්ෂිතවූ වාසල්දොර මේ රාජ කන්‍යාවන්ගෙන් සර ප්‍රවේශය පිණිස කරණලදැයි අමාත්‍යයන් විසින් මෙසේ කියා දොර හරවා ඔවුන් ගෙණ ගොස් අස්සකර රජහට දක්වා රජ්ජුරුවන් වහන්ස භය නොහත මැනව, යුද්ධ ඇති කල්හි ඊට සුදුසු කාරිය මම දතිමියි මේ උත්තම රූපශ්‍රී ධරවූ රාජ කන්‍යාවන් අගමෙහෙසුන් කරවයි කියා ඔවුන්ට අභිශේක දී ඔවුන් සමඟ ආවාවූ රාජපුරුෂයන්ට සගයෙනි තොප තොපගේ නුවරට පලායවයි රාජ කන්‍යාවන් අස්සක රජහු විසින් අගමෙහෙසුන් තනතුරෙහි තුබූබව තොපගේ රජහට කියවයි කියා ගමන් කරවූයේය.

ඒ රාජ පුරුෂයෝ ගොස් එපවත් කලිගු රජහට කීවාහුය. එබස් ඇසූ කලිගු රජ අස්සක මාගේ බල පරාක්‍රම නොදන්නේදැයි කියා එකෙනෙහිම මහත් සිව්රඟ සෙනග හා සමග යුද්ධයට සැරසී නික්මුනේය. එපවත් ඇසූ නන්දිසේන නම් අමාත්‍යයා කලිගුරජහු යුද්ධයට සැරසී එන බව දැක තමන්ගේ රාජ්ජ සීමවෙහි වෙසෙත්වයි අපගේ රාජ සීමාවට නොබසිත්වයි දෙරට සීමා මධ්‍යයෙහි වන්නේයයි කියා අසුන් ලියා ගමන් කරවූයේය. ඒ රජ අස්න අසා තමාගේ රාජ්ජ සීමාවෙහි සිටියේය. අස්සක රජ බල සෙනග පිරිවරා තමාගේ රාජ්ජ සීමාවෙහි සිටියේය. එකල්හි පුරණ ලද බෝධි සමාභාර ඇති අප මහබෝසතානන් වහන්සේ ඍෂිප්‍රව්‍රජාවෙන් පැවිදිව දෙරට අතුරෙහි වූ එක් පන්සලෙක වාසය කරණ සේක. කලිගුරජතෙම ශ්‍රමණයෝ නම් යම් කිසිවක් දනිත, යුද්ධයෙහි ජය පරාජය නම් කවරක් විසිනුදු නොදත හැක්කේය. එසේ හෙයින් එපවත් තාපසයන් වහන්සේ අතින් විචාරම් සිතා අප්‍රසිද්ධ වේශයකින් මහබෝසතානන් කරා ගොස් නමස්කාර කොට එකත්පස්ව හිඳ පිළිසඳර කථාකොට ස්වාමීනි කලිගුරජද අස්සක රජද හා යුද්ධ කරුණු කැමැත්තාහු. තමතමන්ගේ රාජ්ජ සීමාවෙහිම සිටියාවූ මොවුන් දෙදෙනා අතුරෙහි කවරක් හට ජය පරාජය වන්නේ දැයි විචාළේය. මහ පින්වත්වූ පුරුෂය, මම අසවල් රජහට ජයය අසවල් රජහට පරාජය වන්නේයයි නොදනිමි, ශක්‍රදේවේන්ද්‍රයෝ වනාහි මෙතනට එන්නෝය. මම් ඔහුගෙන් විචාරා කියමි, සෙට දවස මෙතනට එවයි කීසේක. ශක්‍රදේවේන්ද්‍රයෝ මහබෝසතානන් වහන්සේට උප ස්ථානයට අවුත් උන්නේය. ඉක්බිති මහබෝසතානන් වහන්සේ ඔහු අතින් එම කාරණාව විචාළසේක.

SANHIDA LANKA

ස්වාමීනි තාපසයන් වහන්ස කලිගු රජහට ජය වන්නේය. අස්සක රජහට පරාජය වන්නේය. මෙබඳුවූ පූර්ව නිමිතිද පෙනෙන්නේ යයි කීයේය. කලිගු රජ දෙවෙනි දවස් ඇවිත් විචාළේය. මහබෝසතානන් වහන්සේද ඔහට ඒ කාරණය කීසේක. ඒ රජ කවර පූර්ව නිමිතෙකක් වන්නේදැයි නොවිචාරා මම වනාහි දනිමි. යන සන්තෝෂ චිත්තයෙන් ගියේය. ඒ කථා ප්‍රවෘත්තිය දෙසෙන රට පැතිර ගියේය. එබස් ඇසූ අස්සක රජ නන්දිසේන නම් අමාත්‍යයා කැඳවා කලිගුරජහට වනාහි ජයවන්නේය. අපි පැරදුනම්හ. මෙයට කළයුතු කින්දැයි කීයේය. එබස් ඇසූ අමාත්‍යයා මහරජානන් වහන්ස, මේ යුද්ධ කිරීමෙන් කවර රජක්හටම ජය

පරාජය වේදැයි කවරෙක් දනීද. නුඹ වහන්සේ එස් නොසිතව මැනවයි රජහු අස්වසාලා බෝසතානන් කරා එළඹ නමස්කාර කොට එකත් පස්ව හිඳ ස්වාමීනි, මේ යුද්ධ කවර රජෙක් ජයපරාජය වේදැයි විචාළේය. නන්දිසේනය කලිගුරජ දිනන්නේය. අස්සක රජ පරදින්නේයයි කීයේය. ස්වාමීනි දිනන්නාහට කවර පූර්ව නිමිත්තක් පෙනෙන්නේද? පරදින්නා කවර පූර්ව නිමිත්තක් පෙනෙන්නේදැයි විචාළේය. මහ පිනැති නන්දිසේනය දින්නනාහුගේ ආරක්ෂා දිව්‍ය පුත්‍රයා දිවසර්‍වාංගධවලවූ වෘෂභවේසයෙන් පෙනෙන්නේය. පරදින්නාහුගේ ආරක්ෂා දිව්‍ය පුත්‍රයා සියලඟ කෘෂ්ණ වර්ණණවූ වෘෂභයක් මෙන් පෙණෙන්නේය. ඔවුන් දෙදෙනාගේ ආරක්ෂා කොට දෙන් දිව්‍ය පුත්‍රයෝම යුද්ධ කොට ජය පරාජය කෙරෙති කීයේය. එබස් ඇසූ නන්දිසේන නම් අමාතයයා නැගීසිට ගොස් රජුගේ සහාය වූ දහසක් පමණ මහ යෝධයෝ ඇත. ඔවුන්ගෙන් එතනට නුදුරුතන්හි එක් පර්වතයක නැගී පින්වත්නි අපගේ රජ්ජුරුවන් වහන්සේගේ ජීවිතය රක්ෂාකොට දෙන්ට හැකිදැයි විචාළේය. ඒ තෙපුල් ඇසූ යෝධයෝ එසේය. ජීවිතය රක්ෂාකරන්ට හැකිවම්හයි කීවාහුය. එසේ වී නම් ප්‍රපාත ස්ථානයෙහි වැටෙවුදැයි විචාළේය. එබස් ඇසූ දහසක් පමණ යෝධයෝ ප්‍රපාත ස්ථානයෙහි වැටෙන්ට පටන් ගත්තාහුය. ඒ වේලෙහි ඔවුන් වලක්වා ප්‍රපාත ස්ථානයෙහි වැටී මිය ගියායින් ප්‍රයෝජන කිම්ද? අපගේ රජ්ජුරුවන් වහන්සේට සහායව නොපසු බැස යුද්ධ කරවයි කීයේය. ඔහු එබස් පිළිගත්තාහුය. ඉක්බිති යුද්ධය පැමිණි කල්හි කලිගුරජ මම දිනමි. හීන විර්යයට පැමිණි සන්නාහ. සන්නද්ධව ගොළු ගොළුවූවාහුය, තම තමන්ගේ අභිප්‍රාය ස්ථාන වලට ගියාහු. යුද්ධ කිරීමට සුදුසු කල්හි වීරිය නොකළාහුය. රජ දරුවෝ දෙදෙනාද අශ්ව යානාවට පැන නැගී යුද්ධ කරමි කියා ඔවුනොවුන් කරා එළඹියාහුය. එකල්හි රජ දරුවන් දෙදෙනාගේ ආරක්ෂා දිව්‍ය පුත්‍රයෝ පෙරටුව ගොස් කලිගු රජහුගේ ආරක්ෂා දිව්‍ය පුත්‍රයාට ස්වර්ගාධවලවූ වෘෂභ වේශයක් වූයේය. අස්සක රජහුගේ ආරක්ෂා දිව්‍යපුත්‍රයාට සර්‍වාංගධවල වූ වෘෂභ වේශයක් වූයේය. අස්සක රජහුගෙ ආරක්ෂා දිව්‍ය පුත්‍රයා සියලඟ කෘෂ්ණා වර්ණ වෘෂභවේශයක් වූයේය. ඔහු දෙදෙනද ඔවුනොවුන් හා යුද්ධාකාර දක්වා එළඹියාහුය. වෘෂභයෝ වනාහි ඒ රජදරුවන් දෙන්නාටම පෙනෙති, අන් සත්වයන්ට නොපෙනෙති, නන්දිසේන නම් අමාත්‍යතෙම මහ රජ්ජුරුවන් වහන්ස නුඹ වහන්සේට ආරක්ෂා දිව්‍ය පුත්‍රයෝ පෙනෙන්නේදැයි කීයේය. කවර රූපයක් පෙනේදැයි විචාළේය. කලිගුරජහුගේ ආරක්ෂා දිව්‍ය පුත්‍රයා සර්‍වාංගධවලට වෘෂභයක්ව පෙණෙන්නේය. අපගේ ආරක්ෂා දිව්‍යපුත්‍ර තෙම සියලඟ කෘෂ්ණ වර්ණව මිරිකුණු ශරීරව පෙණෙන්නේය. මහරජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේ නොබව මැනව, අපි ජය ගණුම්හ, කලිගුරජ පරදනේය. එසේ හෙයින් නුඹ වහන්සේ අසු පිටින් බිමට බැස මෙතෙප් ගෙණ මොනවට හික්මුනු සවින්ධවය උදර පාර්ශවයෙහි වාම පාර්ශවයෙන් උනමීලනය කොට මේ දහසක් පමණ යෝධයන් හා සමග වේගයෙන් ගොස් කලිගුරජහුගේ දිව්‍ය පුත්‍රයාහට තෙප්පහරින් පහරවයි කීයේය. ඉක්බිති අපි දහසක් පමණ ඇත්තෝ දහසක් තෙප්වලින් පහරුම්හ, එසේ කල්හි කලිගුරජගේ ආරක්ෂා දිව්‍යපුත්‍ර නැසෙන්නේය. ඉක්බිති කලිගුරජ පරදිනේය. අපි දිනම්හයි කියා අස්සක රජ එසේවීනම් යහපතැයි ගිවිස නන්දිසේනයා විසින් දුන් සලකුණෙන් ගොස් තෙබින් පහරක් දුන්නේය, දහසක් පමණ යෝධයෝ තෙප්දහසක් පහළාහුය. ආරක්ෂා දිව්‍ය පුත්‍රයා එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියේය, එකෙණෙහි කලිගුරජ පැරදිගියේය. පැරද යන කලිගුරජහු දැක දහසක් පමණ යෝධයෝ කලිගුරජ පැරදයන්නේයයි මහ ශබ්ද පැවැත්වූවාහු. මරණ භයින් භය ගෙණ යන කලිගුරජ තාපසයන් වහන්සේට ආක්‍රෝශ කියා බණන්නේය. එඹල කොල කුට තාපසය අන් සත්වයන් විසින් සහනය කළ නොහැකි බුද්ධ ප්‍රයෝගාදිය සහනය කරන්නාවූ කලිගු රජහට ජයයි කියාද අස්සක රජහට අවැඩව පරාජය වෙයි කියාද කියන ලද්දාවූ තොප විසින් අත්ලස් ගෙණ පරදින රජහු දිනති කියා දිනන රජහු පරදිති. තොප විසින් කියන ලද විරුද්ධ වචනය කායවාරාදීන් ඍජුවූ උත්තම සත්වයෝ මෙබඳු මුසා නොකියයි කියා කලිගුජ තාපසයන්ට වෙහෙසා ආක්‍රෝශ පරිභව බෙනෙමින් ගොස් තමාගේ නුවරටම ගියේය. නැවත පසු බලන්ටද අසමත්විය. ඉක්බිත්තෙන් කීප දවසක් හුගේ ඇවෑමෙන් සක් දෙව්රජ තාපසයන් වහන්සේට උපස්ථානයට ආයේය. උන් වහන්සේ ඒ සක්දෙව් මහරජහු හා සමග කථා කරණසේක්. දෙදෙව්ලෝ වැසි දෙවියන්ට රජවූ ප්‍රථවීනීශ්‍රිත දෙවියන්ට ප්‍රධානවූ මඝ මානවක යන පූර්‍ව නාමධෙයක් ඇති ශක්‍ර දේවේන්ද්‍රයානනි, තොප වැනි මහේශාක්‍ය දෙවියෝ මුසාවාදයෙන් වැලැක්කාහ. සබවසෙහි කියන ලද උතුම් දනය ඒ දෙවියන් කෙරෙහි පිහිටියේය. තොප විසින් යම් වචනයක් මට කියන ලද්ද ඒ අනන්ත විනාශ කරවූ මුසාවාදයයි කියන්නාවූ එබඳුවූ අවිද්‍යාමාන වචනයක් කවර කාරණයක් පිණිස කියනදැයි කීයේය. එබස් ඇසූ ශක්‍ර දේවේන්ද්‍රයෝ කියනුයේ රාගාදී කෙලශයන් තමාගේ චිත්තසනතානයෙන් බැහැර කරණ ලද හෙයින් බ්‍රාහ්මණ නම්වූ තාපසයානන් වහන්ස, දෙවියෝ පුරුෂයන්ගේ බල පරාක්‍රමය ඊර්ෂ්‍යා වසඟ නොකෙරෙමි සිතා එතැන්හි ආගම ශාස්ත්‍ර වල කියන බස් නුඹ වහන්සේ විසින් අසන ලද්දේ නොවේද ආත්ම දමනයට පැමිණි සියලු සෙනග සමගි වීමෙන් නොපසු බැස යුද්ධයට එන කල්හි දාඪවීර්‍ය බලපරාක්‍රම ඇති අස්සක රජහට ජයවීයයි කියා ශක්‍රදේවේන්ද්‍රයා තාපසයන් වහන්සේට කීයේය. ඉක්බිති කලිගු රජ්ජුරුවන් පැරද ගිය කල්හි අස්සක රජ්ජුරුවෝ පර සෙනග දමා ගිය වස්තු ගෙණ තමාගේ නුවරටම ගියේය. ඉක්බිති නන්දිසේන නම් අමාත්‍යයා කලිගු රජහට අසුන් ලියවා ගමන් කරවන්නේ ඉදන් මේ රාජ

SANHIDA LANKA

කන්‍යාවන් සතරදෙනාට දායාද කොටස් එව්ව මැනව. නොඑව්වහොත් මේ තැන්හි කටයුතු කාරිය කාරිය දනිමි ලියා ගමන් කරවූයේය. එබස් ඇසූ කලිගුරජ භයින් තැතිගෙණ ඒ රාජ කන්‍යාවන් විසින් ලැබිය යුතු දායාද ගමන් කරවූයේය. එතැන් පටන් සමගිව වාසය කළාහුය, ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා මේ චුල්ලකාලිඟ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කලිගු රජ දූ සතර භික්ෂුනයෝ වන්නාහුය, එකල්හි නන්දිසේන අමාත්‍යයා නම් දැන් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි තාපසයෝ නම් බුදුවූ මම්මවේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මහා අශ්වාරෝහක ජාතකය

තවද එක් සමයෙක්හි ධර්ම ස්වාමී වූ බුදුරජානන් වහන්සෙ දෙව්රම වෙහෙර වැඩ වසනසේක්. අනඳ මහ තෙරුන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

වර්තමාන කථාව යට කියන ලද ජාතකය හා සදාශමය, පෙර නුවනැත්තෝ තමාට කළ උපකාර වශයෙන් අනුන්ටත් ප්‍රත්‍යුපකාර කළාහුමවේදැයි වදාරා මෙතැන්හි ඉකුත්වත් ගෙණ හැර දක්වා වදාළසේක.

යටගිය දවස පුරණ ලද බෝධි සමාභාර ඇති අප මහ බෝසතානන් වහන්සේ බරණැස් රජව දැහැමෙන් සෙමෙන් රාජ්ජය කරණ සමයෙහි දන්දෙන සේක. සිල් රක්ෂා කරණසේක. ඒ රජානෝ පසල් දනවවක් කිපුනු බව අසා ඒ පසල් දනව්ව සන්සිඳවම්යි බල සෙනඟ පිරිවරා ගොස් යුද්ධයෙහි පැරදුනු ඒ රජ්ජුරුවෝ අසුටට පැන නැගී යුද්ධයටම සැරහුනු ඇමතියන් සිටි ගම් දොරින් ඇතුළු ගමට වන්නේය, ඔවුන් තිස්දෙන මේ කිමෙක්දැයි භයින් තැති ගෙණ ගොස් තම තමන්ගේ ගෙවලට වන්හ, එයින් එක් පුරුෂයෙක් තමාගේ ගෙට නොගොස් රජහට පසු ගමන් කොට අපගේ රජ්ජුරුවන් වහන්සේ යුද්ධයක් පිණිස ප්‍රත්‍යනත ජනපදයකට වැඩිසේක්වේද, තෙපි කවුරුද, රාජ පුරුෂයෙක්ද, චොර පුරුෂයෙක්දැයි විචාළේය. යහළු මම රාජපුරුෂයෙක්මි කීයේය. එසේවීනම් මා හා සමග ආව මැනවැයි කියා රජහු ගෙට කැඳවා ගෙණ ගොස් තමා හිඳිනා අස්නේ හිඳුවා සොඳුර මෙසේ එව මිත්‍රයානන්ගේ පය සෝදවයි භාර්‍ය්‍යාවන් ලවා පය සෝධවා තමන්ගේ ශක්ති පමණින් ආහාර දී මොහොතක් කල් සැතපුන මැනවැයි කියා සැතපෙන ගෙය අතුළේය. එහි රජ සැතපුනේය, ඉක්බිති ගම්වැස්සෝ අශ්වයෝ සන්නා හමුදා සක්මන් කරවා දිය පොවා පිට තෙල් ගල්වා ඔහු කෑයුතු තණ දුන්නේය. මෙසේ තුන් සතර දවසක් රජ්ජුරුවන් රක්ෂා කොට යහළු, මම නුවරටයෙමි කී කල්හි නැවත රජ්ජුරුවන් වහන්සේටද අසුටද කළ මනා සියළු වතාවත් කෙළේය. ඔහු විසින් කළ සත්කාර විඳ යන ඒ රජ කියනුයේ යහළු මම අශ්වාරෝහකයෙමි අපගේ නුවර මැද වන්නේය. ඉදින් යම්කිසි කාරියක් කරණ කොට ගෙණ නුවරට එන්නෙහි වී නම් දකුණු දෙස මහ වාසල් දොර සිට මහ අශ්වාරෝහකයා කවර ගෙයක වාසය කෙරේදැයි විචාරව දොරටු පාලයාහට ඔහු කැඳවා ගෙණ අපගේ ගෙට එවයි කියා තමාගේ නුවරටම ගියේය. බල සෙනඟද නොදැක පිටිනුවර කඳවුරු බැඳ සිටියාහු. රජහු දැක පෙර ගමන් කොට පිරිවැරූවාහුය. නුවරට විදනා රජ්ජුරුවෝ දොරකඩ ඇතුලෙහි සිටිනා නගර පාලයා ලඟට මහ ජනයා එතනින් පහ කරවා කොල එක් පිටිසර ගම් වැසි පුරුෂයෙක් මා දක්නා කැමතිව ඇවිත් මහ අශ්වාරෝහකයාගේ ගෙය කොතැන්හි දැයි විචාළේ නම් තොපි ඔහුගේ අත අල්වාගෙණ ආයෙහි වී නම් එකල්හි තෙපි දහසක් ලබන්නෙහියයි කියා ගියේය. ඒ ගම් වැසි පුරුෂයා කලක් නුවරට නො ආයේය. ඔහු නොආ කල්හි රජ්ජුරුවෝ ඔහු වසන ගම කරවූ වර වැඩූහ. කරවුවර වැඩි කල්හිත් නොඑන්නේය. මෙලෙස දෙතුන් වරෙක කර වුවර වැඩිවිය. එසේද නොඑන්නේය. ඉක්බිති ගම් වැසි මනුෂ්‍යයෝ රැස්ව ඕහට කියන්නාහු. අයර්‍ය්‍යන් වහන්ස නුඹ වහන්සේ මහා අශ්වාරෝහකයන් ගෙට ආකල් තැන් පටන් වැඩි කරවූවර දීමෙන් පීඩා විඳ මෝ ඉවසාගත නොඑම්හ. එසේහෙයින් නුඹ වහන්සේ නුවරට ගියමැනවැයි මහා අශ්වාරෝහකයාට අපගේ වැඩි කරවූවර හැර වුවමැනවයි කීවාහුය. යහපත එසේවී නම් යෙමි කියා මාගේ මිත්‍රයා ලඟට සිස් අතින් යාම සුදුසු නොවන්නේය. උන්ගේ දරුවෝ දෙදෙනෙක් ඇත, ඒ දෙදෙනාටද මාගේ මිත්‍රයානන්ටද ඔවුන්ගේ භාර්‍ය්‍යාවුන්ටද හිඳිනා පොරොනා දෑ හා ආභරණද මාගේ ගමනට පිළියෙළ කරවයි කීයේය. යහපත, පිළියෙල කරම්හයි කියා ඒ ගම්වැසි පුරුෂයෝ ඒ සියළු උපකරණ සැරහුය. එකියන උපකරණ හා තමාගේ ගෙයි පිසූ අසුරුලහළු ගෙණ ගොස් දකුණු දෙස මහවාසල් දොරට පැමිණ යහළුව, මේ නුවර මහා අශ්වාරෝහකයන්ගේ ගෙය කොතැන්හි දැයි දොරටු පාලයා අතින් විචාළේය, ඒ තෙම මා හා සමග එව, තොපට මහා අශ්වාරෝහකයන් දක්වමි කියා ඔහු අත අල්වාගෙණ රාජ භවනයෙහි දොරකඩට ගොස් දොරටු පාලකයා පසල් ගම්වැසි පුරුෂයා කැඳවාගෙණ ආයෙමියි කියා යැවීය. රජ එපවත් අසා උන්තෙනින් නැගීසිට මාගේ මිත්‍රයානන් ඔහු හා සමග ආකෙණෙකුන් එත්වයි කියා යැවීය. රජ පෙර ගමන් කොට ඔහු දැකම ඔවුනොවුන් වැලඳ මට උපස්ථාන කළ යෙහෙලි ස්ත්‍රීද ඕ දරුවෝ නිරෝගී දැයි විචාරා අත අල්වාගෙන මතු මහල්තලයට ගෙණ ගොසින් ඒ ගම්වැසි පුරුෂයා දළපුඩුසේසත්යට රාජාසන මස්තකයෙහි ඉඳුවා අග්‍ර මෙහෙසිකා බිසවුන් කැඳවා සොඳුර අපගේ මිත්‍රයානන් පය සෝදවයි කීහ. එ බිසවද ඔහුගේ පය සේදුවාය. රජ ස්වර්ණභිංකාරයෙන් දිය වත් කෙළේය. බිසවු පය සෝදවා සුවඳ තෙල් ගැල්වුවාහුය. රජද යහළු අප කෑයුතු කිසි දෙයක් ඇද්දැයි විචාළේය. ඒ ගම් වැසි පුරුෂ තෙම කෑ යුතු දෑ ඇතැයි කියා පසුබියෙන් ඇසුරුලහළු නිකුත් කෙළේය. රජ රන්තලියෙන් ගෙන ඔහුට සංග්‍රහ කරන්නේ මාගේ මිත්‍රයා විසින් ගෙණ ආ දෑ අනුභව කරවයි කියා බිසවුන්ට ද අමාත්‍යයන්ටද දෙවා තෙමේත් අනුභව කෙළේය. නැවත අන් පඬුරු දැක්වූයේය. නැවත රජ ඔහු සිත් ගන්නා පිණිස හන්පෙරවී කසී සළුව හැර ඔහු ගෙනා වස්ත්‍රයක්ම හැන්දේය, බිසවුද අමුතුව ගෙණා වස්ත්‍රාභරණයන් හැඳ පැලඳ ඉක්බිති ඔහු රාජ

SANHIDA LANKA

භෝජනය අනුභව කරවා මොහු කැඳවා ගෙණ ගොස් මට මෙහෙකරණ පරිද්දෙන්ම කරකම් කරවා සුවඳ දියෙන් නාවා ලක්ෂයක් අගනා කසී සළුවක් හඳවා රාජාභරණයෙන් සරහා ගෙණවයි කියා එක්තරා අමාත්‍යයෙකුට නියෝග කෙළේය. ඒ අමාත්‍යයාද එපරිද්දෙන්ම සරහා ගෙණ ආයේය. ඉක්බිති රජ්ජුරුවෝ නුවර බෙර හසුරවා ඇමතිගණයා රැස් කරවා ධවලාත පත්‍රයාගේ මැද්දෙහි හිඳ හිගුල්මස සූත්‍රයක් හෙලා අධිරාජ්ජය දුන්නේය. ඔහු දෙදෙන එතැන්පටන් අන්නපානාදිය අනුභව කිරීම් වශයෙන් යන එන ක්‍රියාවන් එක්පවත්වන්නාහ. කවරක්හු විසින් හෙද කොටගත නොහැක්කාවූ විශ්වාසය ස්ථිර විය. ඉක්බිති ඔහුගේ අඹු දරුවන්ද නුවරට ගෙන්වා ඇතුළු නුවරෙහි ගෙවල් තනවා දුන්නේය. ඔහු දෙදෙන සමගි සතුටුව රාජ්ජය කෙරෙති. ඉක්බිති අමාත්‍යයෝ කිපී රාජ කුමාරයන්ට කියන්නාහු කුමාරයන් වහන්ස අපගේ රජ්ජුරුවන් වහන්සේ එක් පිටිසර වැසියෙකු ගොවියෙකුට රාජ්ජයෙන් අඩක් දී ඔහු හා සමග අනනපනාදිය එක්වා පවත්වන සේක. රජ කුමරුවන් ලවා නමස්කාර කරවනසේක. මේ ගොවියානන් විසින් රජ්ජුරුවන් වහන්සේට ගිය දවස කළ කෙළෙහි ගුණයක් අපි නොදනුම්හ, රජ්ජුරුවන් වහන්සේ කුමකින් කුමක් කරන බවත් නොදැන ඉදිරියේ සිට කිවූය. එබස් රාජ කුමාරයෝ යහපතැයි කියා පළිගෙණ ඒ සියළු කථා ප්‍රවෘර්ති රජ්ජුරුවන්ට දක්වා මහ රජ්ජුරුවන් වහන්ස මතු යෙබදු දෙයක් නොකළ මැනවැයි කීයේය. එබස් ඇසූ රජ පුතනුවෙනි මම යුද්ධයෙහි පැරදුනේ නම් කොතැන්හි වාසය කෙරෙම්ද ඒ විසූ තැන් තෙපි දනුදැයි විචාළේය. දේවයන්වහන්ස අපි නොදනුම්හ. කී බස් අසා කියනුයේ මම මොහුගේ ගෙයි වාසය කරන්නෙම් නිරෝගීව අවුත් දැන් මේ බරණැසෙහි රාජ්ජය කෙළෙමි. මෙසේ මට උපකාර වූවන්හට ප්‍රත්‍යපකාර වශයෙන් කවර සැපතෙක් නොදෙම්ද මෙසේද කියා වනාහි මහ බෝසතානන් වහන්සේ යම් කිසි සත්ව කෙනෙක් පෙර තමාට අනුපකාරී සත්වයන් කෙරෙහි දියයුතු වස්තු නොදෙද්ද එබඳුවූ සත්ව තෙම ආපදාප්‍රාප්ත දුකට පැමිණියේ. නමුදු මිත්‍රයන් විසින් කළයුතු සහායකට නොපැමිනෙන්නේ මෙයින් නොදිය යුතු සත්වයනන් ගුණ ප්‍රකාශ කොට කියනසේක්. යම් සත්වයෙක් පළමු තමාට උපකාර නොකළ සත්වයන් කෙරෙහි දියයුතු වස්තුව නොදේද කෘතෝපකාරී සත්වයන් කෙරෙහි දියයුතු වස්තුවදේද එතෙම ආපාදාප්‍රාප්තියෙහි දුකට පැමිණියෙම් මිත්‍රයන් විසින් කළ යුතුවූ සහායකට පැමිණෙන්නේය. නොපිරිසිදු කාය වාක් සමාචාර ඇති ශඨ ප්‍රයෝග දන්නා මනුෂ්‍යයන් කෙරෙහි දියයුතු දානසීලාදී සුචරිත ධර්මයෙහි එක්ව යෙදීමද පංචකාම සමාප්තතිය සමඟ අනුභෝග කිරීම මොහු විසින් මට විශේෂයෙන් උපකාර කෙළේය. යන මේ සියල්ල නසින්නේයයි පිරිසිදු කායවාක් සමාචාර ඇති ඍජුවූ සිත් ඇති සත්වයන් කෙරෙහි කරණ දෙය ස්වල්ප වූ උපකාරයන් නමුදු මහත් ඵල මහානිසංස වන්නේයයි දක්වන ආචාර්‍යවරයෝ.

යථාබීජං අගගිසම්ං ඩයහති නවිරූහති
එවං කතං අසපපුරිසෙ ඩයහති නවිරූයහති.

කතඤඤමහිව පොසමගි සීලවනෙත අරියවුතතිකෙ
සුඛෙතෙත විය බීජාන කතං තමහි නනසසති.

යම් සත්වයෙක් මේ ලෝකයෙහි පළමු කල්‍යාණ සුචරිත ධර්මයක් කෙළේද එබඳු සත්වයන්ගේ ලැබීම අතිශයින් දුෂ්කරය. පසුව අන්කිසි උපකාරයක් කෙළේය. හෝ වෙයි පළමු කළ ගුණයෙන්ම අතිශයින් සියළු සත්කාර සම්මානාදී පූජාවට සුදුසු වන්නෙයයි කියා රාජකුමාරයාට කීහ. මෙබස් කාරණයෙන් ඇසූ රාජ පුත්‍රයා වනාහි අමාත්‍ය ජනයාහට කිසි බසක් නොකීයේය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා මේ මහා අශ්වාරෝහක ජාතකය නිමවා වදාළසේක. එකල්හි පසල් දනව්වැයි පුරුෂයා නම් ආනන්ද ස්ථවිරයෝය, එසමයෙහි බරණැස් රජ නම් දැන් තිලෝගුරු බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

## ධිතිය සීලවීමංසා ජාතකය

තවද එක්සමයෙක්හි ශාක්‍යකුල තිලකවූ සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක. කෙලශ නිග්‍රහයක් අරහයා මේ ජාතක ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාළසේක. මෙහි වර්තමාන කථා වස්තුව යට ප්‍රඥා ජාතකයෙහි ප්‍රකාශ වූයේය. මේ කථාවෙහි මතු දක්වන්නේ සංකේෂප මාත්‍රයෙක පන්සියයක් පමණ භික්ෂුහු දෙව්රම් වෙහෙර අබතුරෙහි වාසය කරන්නාහු. මධ්‍යම යාමයට අනතුරු කොට කාමවිතර්කයක් කල්පනා කළාහුය. සර්වඥයන් වහන්සේ රෑ දවල් දශ දශ බැගින් සකොටසෙක්හි දිවසින් බලනසේක්. ඇසක් ඇති පුරුෂයා යම්සේ එක ඇස රක්ෂා කෙරේද එක පුත්‍රයෙක් ඇති පුරුෂයෙක් යම්සේ ඒ පුත්‍රයා රක්ෂා කෙරේද වාලධිය රක්ෂා කරන්නාවූ සෙමර ධෙනුවක් යම්සේ අප්‍රමාදව රක්ෂා කෙරේද එපරිද්දෙන්ම හැම කල්හි බුදුහු භික්ෂූන් බලා වදාරණසේක. මුනීන්ද්‍රවූ අප බුදුරජානන් වහන්සේ රාත්‍රී භාගයෙහි දිවසින් සියළු දෙව්රම් වෙහෙර වැසී භික්ෂූන් බලා පරීක්ෂා කරණසේක්. සක්විති රජක්හුගේ රාජභවනය ඇතුලෙහි පහළවූ සොරුන් මෙන් ඒ පන්සියයක් පමණ භික්ෂූන් දැක ශ්‍රී ගන්ධ කුටිඞාරය විවර කොට ආනන්ද ස්ථවිරයන් කැඳවා ආනන්දය තෙපි ඇතුළු විහාර කෙළවර සන්නිපාත ශාලාවෙහි භික්ෂූන් රැස් කරවා ගඳ කිළි දොර සමීපයෙහි අස්නක් පණවයි වදාළසේක. එබස් ඇසූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ එලෙස කොට දැන්වූසේක. ශාසතෘවූ බුදුරජානන් වහන්සේ පණවන ලද බුඬාශන මස්තකයෙහි වැඩහිඳ සර්ව සංග්‍රහ වංශයෙන් ආමන්ත්‍රණය කොට වදාරා මහණෙනි පුරාතනයෙහි නුවනැත්තෝ පව් කිරීමෙහි රහසෙක් නම් නැත්තේයි කියා පව් නොකළාහුමයි වදාරා ඉකුත්වත් ගෙණ හැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි මහා බෝසතානන් වහන්සේ බමුණු කුලයෙහි ඉපිද උවමනා වයසට පැමිණ ඒ බරණැස්හි දිසාපාමොක් ආචාරීන්ගේ සමීපයෙහි පන්සියයක් පමණ මානවකයන්ට ප්‍රධානව සිල්ප උගන්නේය. දිසාපාමොක් ආචාරින්ගේ දියනි කෙනෙක් උවමනා වයසට පැමිණියේය. ඒ ආචාරිතෙම මෙසේ සිතුයේය, මානවකයන්ගේ සිල් රක්ෂා කොට ගුණයෙන් සමුඬිවූවාක්හට මාගේ දියනියන් විවාහකොට දෙමි සිතා ඒ ආචාරී තෙමේ එක් දනයෙක්හි අතවැසි මානවකයන් කැඳවා සගයෙනි මාගේ දියනියෝ උවමනා වයසට පැමිණියෝය. මෑට විවාහයක් කරුණු කැමැත්තෙමි එසේ හෙයින් වස්ත්‍රාභරණ ලැබියයුතු වන්නේය. තොප තොපගේ නෑයන් නොදක්වා සොරා ගෙණවුත් වස්ත්‍රාභරණ ගෙන්වා කිසිවක්හු විසින් නුදුටුදේම හැර ගනිමි පෙනී ගෙනා දෙය ඇර නොගනිමි කීය. ඒ මානවකයෝ ඔහු කී බස් යහපතැයි පිළිගෙණ එතැන් පටන් නෑයන්ට නොදන්වා සොරාගෙණ වස්ත්‍රාභරණ දී ගෙණහැර දෙන්නාහ. ආචාරිතෙම ඔවුන් විසින් ගෙන ගෙනා දෙය වෙන්ව තිබුයේ මහාබෝසතාණෝ කිසිදෙයක් නොගෙනා සේක. ඉක්බිති ආචාරී කියන්නෝ සගයෙනි තොපි කිසිවක් නොගෙනාහු වේදැයි කීයේය. එසේය ආචාරීන් වහන්ස නොගෙනාමියි කීයේය. සගයෙනි තොපි කවර කාරණයකින් නොගෙනාහු දැයි විචාළේය. නුඹවහන්සේ වනාහී පෙනී ගෙනා දෙය ඇරනොගන්නාක් සේක් වේදැයි මම වනාහි පව්කිරීමෙහි රහසෙක් නොදන්නෙමි ප්‍රකාශකොට කියන සේක් ආචාරීන් වහන්ස මේ ලෝකයෙහි ප්‍රාණඝාතාදී පාපකර්‍මයන් කරන්නාවූ සත්‍වයන්ට රහසක් නම් නැත වනදෙවියෝද ඒ පාපකර්‍මයන් දකිති. ඒ පාප කර්‍මය අඥන සත්‍වයෝ රහසෙකැයි සිතති මම ඒ පාපකර්‍මයට රහස් ස්ථානයක් නොදන්නෙමි. ජන සූන්‍ය ස්ථානය කුදු නැත්තේය. යම් තෙනක්හි ජන සූන්‍ය ස්ථානයක් නොදක්නෙම් කීවේය. මාගේ දියනියන් නුඹ වහන්සේටම සුදුසුයයි වස්ත්‍රාභරණයෙන් සරහා බෝධිසත්වයන් වහන්සේට පාවා දුන්නේය. සෙසු මානවකයන්ට ආචාරී කියන්නෝ තොප විසින් ගෙනා ගෙනා වස්ත්‍රාභරණාදිය තොප තොපගේ ගෙවලටම ගෙනවයි කීයේය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මහණෙනි අඥාන දුශ්ශීල මානවකයා තමා දුශ්ශීල බැවින් ඒ කුමාරිකාවන් නොලද්දාහුය. නුවනැති අන් මානවකයෝ නම් සිල්වත් බැවින් විවාහයෙන් ඒ ස්ත්‍රිය ලද්දේයයි වදාරා සම්‍යක් සම්බෝධිඥාය ප්‍රතිවෙධ කළාවූ බුදුහු වදාරණ සේක්. දුජ්ජච්චය, අජච්චය, නන්‍දය, සුබවජ්ජනය, වෙජ්ජය. අඬවලිය යන නම්ලත් සදෙනා ප්‍රධාන කොට ඇති සියළු මානවකයෝ ස්ත්‍රී ප්‍රතිලාභය කැමැත්තාහුද තමන්ගේ දුශ්ශීල භාවය හේතු කොට ගෙණ ඒ ස්ත්‍රී ප්‍රතිලාභයෙන් පිරිහුනාහුය. පඤ්චසීලය, දසසීලය, ත්‍රිවිධ සුචරිතයයි යන ගුණ ධර්මයන් පිරිමෙන් පරතෙරට පැමිණියාවූ නුවනැත්තාවූ ස්වභාවවූ යථෝක්ත වූ ගුණ ධර්මයන් රක්ෂා කිරීමෙහි වීර්‍යය ඇත්තාවූ මම පාප කර්මයට ප්‍රතිච්ඡනන ස්ථානයක් නොදකිමි. යම් තැනක් මහජනයන් විසින් සූන්‍යද එබඳු ස්ථානයක්ද නැත්තේය. යම් තෙනක්හි ජනයන් විසින් අසූන්‍යවූ අන්කිසි තෙනක් ඇද්ද එබඳු ස්ථානයක්ද නොදක්නා ලද යමෙක් පඤ්චසීලය දශසීලය ත්‍රිවිධ සුචරිතය යන ගුණ ධර්මයන් පිරීමෙන් පරතෙරට පැමිණියාවූ සීල සංරක්ෂණය ඥාණයෙන් සමුඬිවූ යථෝක්ත ගුණ ධර්මයන් රක්ෂා කිරීමෙහි වීර්‍ය්‍ය ඇත්තා වූ යම් බ්‍රාහ්මණයෙක් සීලාදී ගුණ ධර්මයන් රක්ෂා කෙරේද එබඳුවූ බ්‍රාහ්මණයාම කවර කාරණයකින් ස්ත්‍රී ප්‍රතිලාභය හරණේයයි වදාළ සේකි. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර

SANHIDA LANKA

දක්වා වදාරා චතුරාර්‍ය්‍ය සත්‍යයන් ප්‍රකාශ කොට සීල වීමංස ජාතකය නිමවා වදාළසේක. චතු සත්‍යය ධර්ම දේශනාවගේ කෙළවර ඒ පන්සියයක් පමණ භික්ෂූහු රහත් ඵලයෙහි පිහිටියාහුය. එකල්හි දිසාපාමොක් ආචාර්‍ය නම් දැන් ශාරිපුත්‍ර ස්ථවිරය, එකල්හි නුවණැති බ්‍රාහ්මණ කුමාරයෝ නම් දැන් බුදුවූ මම්ම වේදැයි වදාරා තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ඵිතිය සුජාතා ජාතකය

තවද එක් සමයෙන්හි ශාක්‍යකුල තිලකවූ බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක්. මල්ලිකා දේවන් අරභයා මේ ධර්ම දේශනාව දෙසා වදාළසේක. එක් දවසක් කොසොල් රජ තමාගේ මල්ලිකා දේවීන් සමග සයන කලහයෙක් වූයේය, ඒ රජ කිපී ඒ බිසව ඇති බව නොදන්නේය. මල්ලිකා දේවී තොමෝ කොසොල් රජ තමා කෙරේ කිපුනු බව සර්වඥයන් වහන්සේ නොදනිති සිතුවාය. බුදුරජානන් වහන්සේද එපවත් දැන වදාරා මොවුන් දෙදෙනාගේ සමගි භාවය කෙරෙමියි සිතා වදාරා පෙරවරු එක් ක්‍ෂණයක් මුළුල්ලෙහි හිඳිනා සිව්රු හැඳ කයින් සිව්ර හා අතින් පාත්‍රය ගෙණ පන්සියයක් භික්ෂූන් පිරිවරණ ලද සේක්. සැවැත් නුවරට ප්‍රවිෂ්ටව රාජද්වාරයට වැඩිසේක. කොසොල් රජ තථාගත යානන් වහන්සේගේ පාත්‍රය ගෙණ තමාගේ වාස භවනයට වැඩම කරවා ගෙණ පනවන ලද බුඩාසනමසතකයෙහි වඩා හිඳුවා බුදුපාමොක් මහ සඟනට දක්ෂිණාදකය දී කැඳ අවුලු ගෙන්වූයේය. බුදුහු පාත්‍රය ශ්‍රී හස්තයෙන් වසා මහා රජානෙනි මල්ලිකා දේවීන් කොතැන්හිදැයි විචාළසේක, ස්වාමීනි බුදුරජානන් වහන්ස ඇගෙන් ප්‍රයෝජන කවරේදැයි ඕ තොමෝ තමාගේ යසසින් මහත්වූයයි දැන්වීය, මහරජානෙනි තොපම යස පිරිවර සම්පත් දී මාතෘගාමයන් උසස් කොට උන් විසින් කරණ ලද අපරාධ සහනය නොකිරීම නම් සුදුසු නොවන්නේයයි වදාළසේක. ඒ කොසොල් රජ බුදුරජානන් වහන්සේගේ වචනය අසා බිසවුන් ගෙන්වූයේය. ඒ බිසව අවුත් බුදුරජහු වැලඳවූවාය. සර්වඥයන් වහන්සේද ඔවුනොවුන් සමගිවන්නට සුදුසුයයි සාමාගගි කෘත්‍යයාගේ ගුණ වර්ණනා කොට වැඩිසේක. එතැන් පටන් ඔවුන් දෙදෙන සමගිව වීසීමෙන් වාසය කළාහුය. ඊට අනතුරු කොට භික්ෂූන් වහන්සේ දම් සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ හිඳ ඇවැත්නි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ එක වචනයෙන්ම ඔවුන් දෙදෙනා සමගි කොට වදාළසේකැයි කිය කියා කථාවක් පහළ කළාහුය. ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ එතැන්හි වැඩ වදාරා මහණෙනි දැන් මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි දැන් වූ කල්හි මහණෙනි දැන් මතු නොවෙයි පූර්වයෙහි මම මොවුන් දෙදෙන එකම අවවාද වචනයකින් සමගි කෙළම්වේදැයි වදාරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ කල්හි මහා බෝසතානන් වහන්සේ ඒ රජහට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකරණ අමාත්‍යවූ සේක. ඉක්බිති එක් දිනයෙක්හි බ්‍රහ්මදත්ත නම් රජ මහා සිව් මැදුරු කවුළුව හැර රාජාගනය බලමින් සිටියේය. එකෙණෙහි විසිතුරු වූ මැදුරු කවුළුව හැර රාජාගනය බලමින් සිටියේය. එකෙණෙහි විසිතුරුවූ රූ ඇතිව ප්‍රථම වයසෙහි සිටියාවූ ඩෙබරඵල වෙළඳක්හුගේ එක් දුවක් ඩෙබර පැයක් හිස තබා ගෙණ ඩෙබරඵලගනුවයි කිය කියා රාජභවනයෙන් යන්නීය. ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ඇගේ ශබ්දය අසා ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇතිව හිමියන් නැති බව දැන කැඳවමින් රාජාගනයට ගෙන්නා ඒ ස්ත්‍රිය අගමෙහෙසුන් තනතුරෙහි තබා මහත් යස පිරිවර සැපත් දුන්නේය. ඕ තොමෝ රජහට ප්‍රිය වන්නීය. මනවඩන්නීය. ඉක්බිති එක් දිනයෙක්හි රන්තලියෙහි බහන ලද ඩෙබර ඵල අනුභව කරමින් හුන්නේය. සුජාතා දේවීතොමෝ ඩෙබර ඵල අනුභව කරන්නාහු දැක මහ රජ්ජුරුවන් වහන්ස නුඹ වහන්සේ කවර නම් ඵලයක් අනුභව කරණසේක්දැයි කියන්නී දේවයන් වහන්ස රන් තලියෙහි බහන ලද්දාවූ ලෙහෙවන් පැහැ ඇති නිම්ලවූ කවර ඵලයෙක් වන්නේදැයි විචාළාවූ මට එපරිද් නොවළහා කියවයි කීවාය. එබස් ඇසූ බරණැස් රජ කිපී කියන්නේ පැසුණු ඩෙබර ඵල වෙළඳාම් කරන ග්‍රහපතියන්හු දුටු කෙල්ල තිගේ වංශයට අයිතිවූ ඩෙබර ඵලයන් නොදනීදැයි නින්දා බස් කියන්නෝ දෙවිනි. තෙපි හිස පැස තිබීමෙන් මොටවූ හිසක් ඇතිව දිරුනු රෙදි ඇඳවලට වැද දෙහෙටිල්ලෙන් අතු නමා කැඩූ කැඩූ ඵල අතින් එකතුරු පටට අවුලා වෙළඳාම් කරන්නීය, එසේ හෙයින් මා අනුභව කරන්නාවූ මේ ඩෙබර ඵල තිගේ අයිති වන්නේය. මේ කාලකන්නි ස්ත්‍රීය ලෝකුඹුනිරයෙහි වෙසෙන්නියක මෙන් අපගේ මේ රාජභවනයෙහි සිත් අලවා වාසය කරන්නීය. අශ්‍රිකවූ මේ ස්ත්‍රිය මේ රාජ සම්පත හැරීයාහුයයි කියා ඒ රජ යම් තෙනකින් ඩෙබර ඵල රැස් කිරීමෙන් විකිණී ගෙන ජීවත් වන්නිද එතැන්හිම ගෙණ ගොස් හැරලවයි කීයේය. එබස් ඇසූ මහබෝසතානන් වහන්සේ මා හැර අන් සත්ව කෙනෙක් ඔවුන් සමගි කරවන්ට නොහැකිවන්නාහු යයි සිතා රජහු අනුදන්වා මේ බිසවුන් පිටතලීමට අවසර නොදෙම් සිතා රජ හට කියනසේක්. මහරජ්ජුරුවන් වහන්ස උසස්වූ බිසෝ තනතුරට පැමිණි ස්ත්‍රීන්ගේ මෙබඳුවූ ප්‍රමාද දෝෂ නොවන්නේ නොවෙයි. එසේ හෙයින් නර ශ්‍රේෂ්ඨ වූ දේවයන් වහන්ස මේ සුජාතාවන්ගේ ස්වල්ප වූ මෙබඳුවූ අපරාධයට නොකිපී සමාකළ මැනවයි කීසේක. ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ අමාත්‍යයාගේ වචනයෙන් සුජාතා නම් බිසවගේ ඒ අපරාධය ක්ෂමා කොට ඈ බිසෝ තනතුරෙහි පිහිට වූයේය. එතැන් පටන් ඔහු දෙදෙන සමගිව වාසය කොට විසූහ. ශාස්තෘවූ සර්වඥයන් වහන්සේ මේ ජාතක ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා මේ සුජාතා ජාතකය නිමවා

SANHIDA LANKA

වදාළසේක. එකල්හි බරණැස් ජර නම් දැන් කොසළ මහ රජය, එකල්හි සුජාතාවෝ නම් දැන් මල්ලිකාදේවිය. එකල්හි අමාත්‍ය වූයේ නම් දැන් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේම දක්වා වදාළසේක.

SANHIDA LANKA

# තෘතීය පලාස ජාතකය

තවද එක් සමයෙක්හි විජිත පංචමාරවූ සර්වඥයන් වහන්සේ පරිනිර්වාන සයනයෙහි සැතපුනුසේක්. ආනන්ද ස්ථවිරයන් අරභයා මේ ධර්ම දේශනාව වදාළසේක. ආයුෂ්මත් වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ අද රෑ අළුයම වේලෙහි ශාස්තෘවූ තථාගතයානන් වහන්සේ පිරිනිවන්පානාසේකැයි දැන මාගේ ශාස්තෘන් වහන්සේට කළ උපස්ථානය නිෂ්ඵල වන්නේ යයි කියා සෝකයෙන් පීඩිත වූසේක්. උද්‍යානයෙහි වූ නිවාස ගෘහබභ්‍යන්තරවූ අගුළු බාවෙහි එල්බසට හැඬුසේක. සර්වඥයන් වහන්සේ අනඳ මහතෙරුන්නාන්සේ නොදක්නා සේක් මහණෙනි ආනන්දයෝ කොතැන්හි දැයි විචාරා වදාරා ඒ වූ කරුණු අසා කැඳවා කරණ ලද පින් ඇත්තෙහිය. සපධන් වීයර්‍යයෙහි යෙදෙව එසේවූ තෙපි චතුරාශ්‍රවයන් දුරුකොට රහත්වන්නෝවේද මට කළ උපස්ථාන නිෂ්ඵලයයි නොසිතව, දැන් තෙපි විසින් මට කළ උපස්ථාන කවර කාරණයකින් නිෂ්ඵල වන්නේද පෙරයමක් හට රෝග දෝෂාදී කාලයෙහි කළ උපස්ථාන නිෂ්ඵලනුවූයේ යයි වදාරා ඉකුත් වත් කථා වස්තුව ගෙණ හැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගියද දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි මහ බෝසතානන් වහන්සේ බරණැසට නුදුරු තැන්හි කැල ගසෙක්හි දේවපුත්‍රයෙක්ව උපන්සේක. එකල්හි බරණැස් නුවර වාසීහු දෙවියන්ට කළ යුතු මඟුල් නිරන්තරයෙන් බිලියම් කිරීම් ආදියෙහි යෙදුනාහුය. ඉක්බිති දුගී එක් බමුණෙක් මමද එක් දේව පුත්‍රයෙකු පිළිඳම් කියා උසස්වූ භූමි ප්‍රදේශයෙක්හි පිහිටියාවූ මහත්වූ එක් කැල රුකක් මුල බිම සමතලා කොට තණ දුරු කොට වට පරික්ෂෙප කොට සුදු වැලි විසුරුවා හැමද ඒ වෘක්ෂයෙහි සුවඳ සදුනෙන් පසගුල්දී ගඳ දුම මල් පහන් ආදියෙන් පූජා කොට පහන් දල්වා සැපසේ සැතපෙවයි කියා වෘක්ෂය පැද කුණු කොට යන්නේය. දෙවෙනි දිනයෙහි උදෑසන් හිම අවුත් සැපයන් විචාරන්නෝය. ඉක්බිති එක් දිනයෙක්හි වෘක්ෂ දේවතාවා මෙසේ සිතුයේය. මේ බමුණු අතිශයින් මා පිළිඳ ගියේය, මේ බ්‍රාහ්මණයා යම් කාරණයකින් මා පිළිඳහීද ඕහට තමා දක්වමි සිතා ඒ බ්‍රාහ්මණයා එතැන්හි අවුත් රුක් මුල හමදිනා කල්හි මහළු බමුණු වේසයකින් ඔහුගේ සමීපයෙහි සිය කියන්නේ එම්බා බ්‍රාහ්මණයාණෙනි තො පරවෙතන රහිත වූ නොආසන්නවූ කිසිවක් දැනගන නොහෙන්නාවූ මේ කැලෑ ගස යයි දැන පටන් ගන්නා ලද වීයර්‍ය ඇතිව නිරන්තරයෙන් ප්‍රමාද නොවීම කවර කාරණයක් හේතු කොට ගෙණ සැප සයනය විචාරන්නෙහිදැයි විචාළේය. එබස් ඇසූ බ්‍රාහ්මණ තෙම කියන්නේ බ්‍රාහ්මණයානෙනි මේ වෘක්ෂය දුර සිටියවුන්ට පැහැදී පෙනෙන්නේය. ආසනයෙහි වූ අයට අප්‍රකාශය මහත් ද වෙයි. ඒකාන්තයෙන් මහේශාක්‍ය දෙවියන්ගේ විසීමට සුදුසු වෘක්ෂයෙක් වන්නේය. එසේ හෙයින් මේ කැලෑ වෘක්ෂයට නමස්කාර කෙරෙමි මේ වෘක්ෂයෙහි යම් දෙවි කෙණෙක් වාසය කෙරේද්ද ඔවුන්ට නිස්කාරණ නොවී ධන ප්‍රතිලාභය කරණ කොට ගෙණ නමස්කාර කෙරෙමි කීයේය. එබස් ඇසූ දේව පුත්‍රයානෝ ඒ දුගී බ්‍රාහ්මණයාට ප්‍රසන්න වූයේ තමාගේ විමාන ඬරයෙහි මහත් දිව්‍යානුභාවයෙන් උපලක්ෂිතව අහසෙහි සිට එඹා බ්‍රාහ්මණයානෙනි මම මේ වෘක්ෂයෙහි නිපන් දේවපුත්‍රයෙකි. භය නොගනුව. තොපට ධනයක් දෙමි කියා ඔහු ඇස් වසා කියන්නේ එඹා බ්‍රාහ්මණයානෙනි මා වැනි සත් පුරුෂයන්ගේ සමීපයෙහි අවුත් සැප සයනය විචාරීම ආදී වූවාක් ඬාරයෙන් කළ ව්‍යායාමද හැමදීම් සුවඳ මල් පහන් පූජා කිරීම් ආදීවූ කාය ඬාරයෙන් කළ ව්‍යායාමද මෙසේ නිෂ්ඵල වේද එසේ හෙයින් තොප විසින් කරණ ලද කෙළෙහි ගුණ දන්නාවූ මම මාගේ දිව්‍යානුභාව වූ පරිද්දෙන් තොපට උපකාරයක් කෙරෙමි සිතා කියා විමානඬාරයෙහි සිටියාවූ දිව්‍ය පුත්‍රතෙම අත දිගු කොට කියන්නේ මේ තිඹිරි රුක ඇත පෙණෙන ලද පුලිල වෘක්ෂය පිරිවරා ග්‍රීවයෙන් ග්‍රීවය හැර මහත් රැසක්ව සිටියවූ පූර්ව වස්තු ස්වාමීහු විසින් යාගකොට තබන ලද දැන් මේ අසවාමිකවූ ඒ නිදානයන් ගොස් උගුළුවා ගණුවයි මෙසේද කියා නැවත ඒ දේව පුත්‍රයා කියන්නේ බ්‍රාහ්මණයාණෙනි තෙපි මේ නිදානයන් උගුළුවා ගන්නේ ක්ලාන්ත වෙයි තෙපි නික්ම වෙයි මම තොපගේ වාසස්ථානයට ගෙණ ගොස් අසවල් තෙන නිධාන කෙරෙමි තොපි ජීවිතාන්තය දක්වා පරිභෝග කරමින් දන් දෙව සිල් රකුවයි කියා ඒ බ්‍රාහ්මණයාට අවවාද දී ධනයන් තමාගේ දිව්‍යානුභාවයෙන් ඒ බමුණානන්ගේ ගෙයි පිරවූයේය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා මේ පලාස ජාතකය නිමවා වදාළ සේක. එකල්හි බ්‍රාහ්මණයා නම් දැන් ආනන්ද ස්ථවිරය එකල්හි වෘක්ෂ දේවතාව නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ජවනසකුන ජාතකය

තවද එක් සමයෙක්හි ෂට් අසාධාරණ ඥානාදියෙන් උපලක්ෂිත වූ ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසනසේක්. දෙව්දත් තෙරුන් වහන්සේ කෙළෙහි ගුණ නොදන්නාහුමයයි වදාරා ඉකුත්වත් ගෙණ හැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි අප මහ බෝසතානන් වහන්සේ නානාවිධ  කුසුම් භාරවන්ත වෘක්ෂ මණ්ඩිත හිමාලය වන ප්‍රදේශයෙක්හි කැරල පක්ෂියාව උපන්සේක. ඉක්බිති මාංශ අනුභව කරන්නාවූ එක් සිංහයක්හුගේ ග්‍රීවයෙහි ඇටයක් ලග්නව ඉදිමී ගොස් ගොදුරු අනුභව කිරීම නොහැකවූයේය. කර්කෂවූ වේදනාවෝ පවත්නාහ. නැවත ගොදුරු සොයා දැක එක් අතුපතුරක් අතුරෙහි සැඟවී උන්නේය. යහළු සිංහය, තොපගේ දුකෙක් ඇද්දැයි විචාළේය. එබස් ඇසූ සිංහයා ඒ වූ කාරණය කීයේය. යහළුව, මට තොපගේ මේ ග්‍රීවයෙහි ලග්නවූ ඇටය පහකරන්ට හැකි වෙමි, එසේද වූවත් මා අනුභ කෙරෙති යන සිත ගත් භයින් වනාහි තොපගේ මුඛයට වදින්නට නොහැකි වෙමි කීයේය. යහපත තොප මම අනුභව නොකරමි. එබැවින් මාගේ ජීවිතය රක්ෂා කොට දෙවයි කීයේය. ඒ කැරල් පක්ෂියාට යහපතැයි ගිවිස සිංහයා ඇලයකින් සතප්පවා සිංහයා කවර ඉෂ්ටානිෂ්ට ක්‍රියාවක් මට කරණ බව කවරෙකුටත් දැනගත නොහෙයි සිතා යම්සේ මුඛය වහන්ට නොහැකිවේද එපරිද්දෙන් ඔහු දෙතල්ලෙහි දඬු කෝටුවක් තබා මුවට වැද ගෙලෙහි ලැගුනු ඇට කෙළවර තුඩින් පහ කෙළේය. ඇටය ගිලිහී වැටී ගියේය. ඒ පක්ෂියා ඇටය හෙලා සිංහයාගේ මුඛයෙන් නික් මෙන්නේ දඬුකඩ තුඩින් පැහැර හෙලන්නේම නික්ම ගියේ ශාඛාග්‍රයෙහි සැඟවුනේය. නැවත එක් දිනයෙක්හි එක් වන මහිසයෙකුගේ ජීවිතය නසා අනුභව කරන්නේය. ඒ කැරල් පක්ෂියා ඔහු පරීක්ෂා කෙරෙමි සිතා ඔහුගේ හිස උඩ සාඛාවක සැඟවී ඉඳ සිංහයා හා සමග කථාරන්නේ පින්වත්වූ සිංහයානෙනි තොපට නමස්කාර වේවායි මා විසින් කළයුතුවූ තොපගේ යම් කෘත්‍යයක් ඇද්ද ඒ කෘත්‍යය මාගේ ඥාන ශක්තියෙන් කිසිවක් නොනසා කෙළෙමි එසේ කළාවූ මම මෙයින් මාංශ කොටසක් ලබම්ද කින්දැයි විචාළේය. එබස් ඇසූ සිංහයා කියන්නේ ලේ මිශ්‍ර මාංශ අනුභව කරන්නාවූ නිරන්තරයෙන් දරුනුකම් කරන්නාවූ මාගේ දත් අතුරව පැමිණියාවූ තොපගේ බහුල වූ යම් ජීවිකාවෙක් ඇත්නම් ඉන් ජීවත්වයි කීකල්හි ඒ ඇසූ පක්ෂියා කියන්නේ යම් සත්වයෙකු කෙරෙහි කෙළෙහි ගුණ දැන් මෙක් නැද්ද තමා විසින් අන් සත්වයන්ට කරන්නාවූ කිසි ගුණයක් ඇද්ද, කළාවූ ගුණයට නැවත ගුණ කිරීමෙක් නැද්ද, එබඳු සත්වයන් සේවනය කිරීම නිෂ්ප්‍රයෝජන වන්නේයි. තවද යම් සත්වයක්හුගේ අභිමුඛයෙහි කරණ ලද ගුණය කරණකොට ගෙණ මිත්‍ර ධර්මය නොලැබේද, ඕහට රැහැනි නොවී ආක්‍රොශපරිභව නොබැන යුහුසුලු නොවීමෙන් ඔහු කෙරෙන් පහවිය යුත්තේයයි මෙසේද කියා ඒ කැරල පක්ෂියා ගියේය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා මේ ජවනසකුන ජාතකය නිමවා වදාළසේක. එකල්හි සිංහයා නම් දැන් දේවදත්ත ස්ථවිරය, එකල්හි කැරල පක්ෂියා වනාහි දැන් බුදුවූ මම්ම වේයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ජව ජාතකය

තවද එක්සමයෙක්හි ෂට් අසාධාරණ ඥානාදියෙන් උපලක්ෂිත වූ ශාස්තෘවූ සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්. ස්වර්ගයෙහි භික්ෂූන් අරභයා මේ ජාතකය වදාළ සේක. මෙහි වර්තමාන කථා වස්තුව විනය පිටකයෙහි විස්තර වශයෙන් ආයේය. මෙතැන්දී මතු කියන්නේ සංක්‍ෂෙප කථාවය. ශාස්තෘවූ තථාගතයන් වහන්සේ සවගෙහි භික්ෂූන් කැඳවා මහණෙනි තෙපි මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි උනනක් හට ධර්ම දේශනා කරන්නේ සැබෑදැයි විචාරා වදාළසේක. ස්වාමීනි, භාග්‍යවත්වූ බුදුරජානන් වහන්ස, අප දේශනා කරන්නේ සැබෑයයි දැන්වූ කල්හි ඒ භික්ෂූන් වහන්සේට නින්දා කොට වදාරා මහණෙනි, මාගේ ධර්මයෙහි තොපගේ ගරු නොකිරීම යුතු නොවන්නේයයි වදාරා පුරාතන නුවනැත්තෝ වනාහි මිටි අස්නේ හිඳ මේ දේශනාවෙන් පිටත් මන්ත්‍ර යන්ත්‍රයක් අදාරනනාවුන්ට නින්දා කළාහුයයි වදාරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි පුරණ ලද බෝධි සමභාර ඇති අප මහබෝසතානන් වහන්සේ සැඩොල් කුලයෙක්හි ඉපිද උවමනා වයසට පැමිණිසේක්. උන්වහන්සේගේ භාර්‍ය්‍යාවෝ අඹ අනුභව කරන්ට දොළෙක් ඇතිව හිමියාණන් වහන්ස, මම අඹ අනුභව කරන්ට කැමැත්තෙමියි උන් වහන්සේට කීවාය. සොඳුර මෙකල්හි අඹඵල නැත්තේය. අනික් කිසි ඵලයක් ගෙණ දෙම්දැයි විචාළේය. හිමියාණෙනි මම අඹඵල ලබන්නේ ජීවත්වෙමි නොබලන්නාවූ මාගේ ජීවිතය නැතැයි කීවාය. ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇත්තාවූ ඒ පුරුෂයා කවර තැනෙක්හි අඹඵල ලබම්දොහෝයි සිතීය, එසමයෙහි බරණැස් රජුගේ උයනෙහි අඹ වෘක්ෂයෙහි නිරන්තරයෙන් ඵලගෙණ සිටින්නේ ඒ සැඩොල් පුරුෂයානෝ ඒ වෘක්ෂයෙන් විලිකුන් අඹ ඵලයක් ගෙණවුත් මැගේ දොළ සන්සිඳුවම් සිතා රාත්‍රී භාගයෙහි බරණැස් රජුගේ උයනට ගොස් අඹ ගසට නැගී සාඛාවෙන් සාඛාවට සැඟවී අඹඵල බලමින් ඇවිදිනසේක. එසේ අඹ සොයන උන් වහන්සේට රාත්‍රිය පහන් වූයේය. ඒ පුරුෂයානෝ මෙසේ සිතූහ. දැන් මේ වෘක්ෂයෙන් බැස ගියේ වීනම් මා සොරාහුයයි අල්වා ගනිතියි සිතා රාත්‍රි භාගයෙහි ගසින් බැසයෙමි සිතා එක් සාඛාවකට නැගී සැඟවී හුන්සේක. එකල්හි බරණැස් රජ පුරෝහිත බ්‍රාහ්මණයාගේ සමීපයෙහි මන්ත්‍ර යන්ත්‍ර උගන්නේය. ඒ බරණැස් රජ උයනට ගොස් අඹ රුකමුල උස් ආසනයෙක්හි ඉඳ ආචාරීවූ පුරෝහිත බ්‍රාහ්මණයා මිටි අස්නක හිඳුවා මන්ත්‍රයක් උගන්නේය. වෘක්ෂ මස්තකයෙහි උන් පුරුෂයා සිතන්නේ මේ රජ උසස්නෙහි හිඳ යම්තාක් කල් මන්ත්‍රයක් උගනීද ඒතාක්කල් මේ රජ්ජුරුවෝ අධාර්මිකය. යම් බ්‍රාහ්මණයෙක් තෙමේ නිචාසනයේ හිඳ යම්තාක් කල් මන්ත්‍රයන් හදාරවාද ඒතාක්කල් ඔහුද අධාර්මිකය යම් බඳුවූ මාගේ භාර්‍ය්‍යාව කරණ කොටගෙණ ජීවිතය ගරු නොකොට සොරකමින් අඹ ඵලගෙණ හැරයෙම්ද ඒ මමද අධාර්මිකයෙමි කියා ගසින් බසිනා වූ පුරුෂයා එල්ලන්නාවූ එක් සාඛාවක් අල්වා ගෙණ ඔවුන්ගේ දෑතුරෙහි සිට කියනසේක්. මහ රජ්ජුරුවන් වහන්ස මම නෂටවීම, නුඹ වහන්සේ ස්ථූලවූ ක්‍රියා ඇතිසේක. පුරෝහිත බමුණානෝ පූර්ව ක්‍රියා නැසූ හෙයින් මෙළේ නම් වෙයි කියේය. කවර කාරණය කින්දැයි විචාණ ලද්දාවූ ඒ පුරුෂතෙම රජහට කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස අප තුන්දෙනා විසින් කරණ ලද්දාවූ ක්‍රියාවෝ සත් පුරුෂයන්ගේ ආචාර සීමාව ඉක්මුණු හෙයින් අධාර්මිකය. යමෙක් නිචාසනයෙහි හිඳ මන්ත්‍රය උගන්වාද යමෙක් උසස්නේ හිඳ මන්ත්‍රයක් උගනීද මොහු දෙදෙන පෙර පිය විදහමන්ම චුතවූවාහ. එසේ හෙයින් නුඹ දෙදෙනා වහන්සේ ගරු කළ යුතු පූර්ව ධර්මයන් නුදුටුසේක් යයි කීයේය. එබස් ඇසූ පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ පින්වත් වූ පුරුෂයාණෙනි නොයෙක් මාංශ ව්‍යඤ්ජන කිරියෙන් වහන ලද සුදුවූ පැහැ ඇත්තාවූ හැල්සාලෙන් නිපන්නාවූ ආහාරය අනුභව කිරීමෙන් උදාර පෝෂ්‍යයෙහි ගිජුවූ මම සෘෂීන් විසින් සෙවුනා ලද මේ පුරාතන ධර්මය සේවනය කෙරෙමි කීයේය. එබස් ඇසූ සැඩොල් පුරුෂයානෝ කියන්නෝ මේ රජ හැර මේ දඹදිව් තලෙහි අන් සත්වයෝත් මෙපරිද්දෙන් ආහාරය පිසති, එසේ හෙයින් මේ සත්ව ලෝකය මහත, මෙතැන් හැර අන් තැනකට පලායව, තොපි අධර්මයෙහි නොහැසිරෙව්, යම්බඳුවූ තෙපි අන් තැනෙක්හි නොගොස් මෙතැන්හි වෙසෙත් නම් අධර්මයෙහි නොහැසිරපියා පාසාන කුමන යකමෙන් පුරාතන වර්තිය නොබිඳවන්ටය, බ්‍රාහ්මණයානෙනි තොපගේ පුරෝහිත තනතුරට පැමිණීමෙන් ලබන ලද යස පිරිවර සැපයට හා ධනයට නින්දා කරම්හ. අපායේ ඉපදීමට හේතුවූ තොපගේ ජීවිකා වෘත්තියෙක් ඇද්ද ඊට නින්දා කෙරෙමි කීයේය. ඉක්බිති ධාර්මික බැවින් ඒ සැඩොල් පුරුෂයා හට පැහැදී පින්වත්වූ පුරුෂය තෝ කවර ජාති ඇත්තෙක්දැයි විචාළේය. රජ්ජුරුවන් වහන්ස මම චණ්ඩාලයෙක්මි කීයේය. පින්වත ඉදින් තොපි ජාති සම්පන්න වූයේ වීනම් තොපට රාජ්ජය දෙමි, මෙතැන් පටන් වනාහි මම දහවල් රජ කෙරෙමි තොපි රාත්‍රියෙහි රජ කරවයි කියා තමාගේ ග්‍රීවයෙහි පැළඳි මල්දම් ඒ සැඩොල් පුරුෂයාණන්ගේ ගෙලෙහි පලඳවා ඔහු නුවරට ගෙණ ර කවල්හි නියුක්ත කෙළේය. නුවර රකවල්ලුගේ ග්‍රීවයෙහි රක්ත පුෂ්ප මාලාවන් ලබන මේ වංශ විය. එතැන්

SANHIDA LANKA

පටන් වනාහි ඒ බරණැස් රජ්ජුරුවෝ ඒ පුරුෂයානන්ගේ අවවාදයෙහි පිහිටා ආචාරි පුරෝහිත බ්‍රාහ්මණයන් කෙරෙහි ගෞරව උපදවා මිටි අස්නෙහි හිඳිනේය. මන්ත්‍රයන් උගන්නේය. ශාස්තෲවූ සර්වඥයන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා මේ ජව ජාතකය නිමවා වදාළ සේක. එකල්හි බරණැස් රජ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය, එකල්හි චණ්ඩාල පුත්‍රයා වනාහි දැන් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සයිහ ජාතකය

තවද එක් සමයෙක්හි සංසාර වෘත්තියෙහි අවිද්‍යාදී කෙලශයන් විසින් භ්‍රමණය වන සත්වයන් සද්ධර්මාමෘත පානය කරවා සවර්ගාපවර්ග සමපතති ප්‍රතිලාභය කළාවූ සර්වඥ රාජෝත්තමයානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ශාසනයෙහි උකටලීවූ භික්ෂු කෙණෙකුන් වහන්සේ අරහයා මේ ජාතකය දක්වා වදාළසේක.

එක් භික්ෂූන් වහන්සේ කෙනෙක් වනාහි සැවැත් නුවරෙහි පිඬුසිගා වඩනා සේක්. විශිෂ්ටවූ රූපශ්‍රී සම්පත් ඇති එක් ස්ත්‍රියක් දැක උකටලීවූ සේක්. ශාසනයෙහි සිත් නොඇලෙනසේක. ඉක්බිති භික්ෂූන් වහන්සේ නොකැමති කරවා ගෙනගොස් සර්වඥයන් වහන්සේට දැක්වූසේක. ඒ භාග්‍යවත් බුදුරජානන් වහන්සේ මහණ, තෝ උකටලී වූයේ සැබෑදැයි විචාරණ ලද, සැබව, ස්වාමීනියි කීසේක. එතෙපුල් ඇසූ සර්වඥයන් වහන්සේ විසින් මහණ තොප කවරෙක් උකටලී කරවූයේදැයි විචාරා වදාළ කල්හි එපරිදි දැන්වූ සේක. එපවත් ඇසූ බුදුරජානන් වහන්සේ වදාරණසේක්, මහණෙනි තෙපි මෙබඳුවූ නෛර්‍යාණික ශාසනයෙහි පැවිදිව කවරකරණයකින් උකලීවූයෙහිද පෙර නුවනැත්තෝ පුරෝහිත තනතුරු ලබන්නා ඒ සම්පත්තිය නිරපෙක්ෂව හැර පැවිදිවූවාහු වේදැයි කාලත්‍රයවර්තීවූ සකල නාමරූප ධර්මයන්ගේ පරම්පරානුස්සරියක්ෂණයෙහි අවිපරීතයෙන් දක්නාවූ සදහම් චක්‍රවර්තීවූ සර්වඥරාජෝත්තමයානන් වහන්සේ ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

ඒ කෙසෙ ද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි පුරණලද බෝධිසම්භාර ඇති අප මහා බෝසතානන් වහන්සේ පුරෝහිත බ්‍රාහ්මණයාණන්ගේ භාර්‍යාවූ බැමිණිය කුස පිළිසිඳ රජ්ජුරුවන්ගේ පුත්‍රයා බිහිවන දවස්හිම ජාතවූසේක. එකල්හි පුරෝහිතයෝ මාගේ පුත්‍රයෙක් ඇතැයි කීවාහුය. ඒ තෙපුල් ඇසූ රජ්ජුරුවෝ ඒ බ්‍රාහ්මණ කුමාරයා ගෙන්වා කිරිමවුන්ට භාරකොටදී රජකුමරුවා හා කැටුවම් පිළිඳගුම් කරවූයේය. එතැන් පටන් කුමරුන් දෙදෙනාම පලඳනා ආභරණ හා ඛාද්‍ය භෝජ්‍යාදී සියල්ලම එකසදාශ වන්නේය. ඔහු දෙදෙනා වැඩිවිය පැමිණි එක්වම තක්සලා නුවරට ගොස් අක්ෂර ලිඛිතාදී සියළු උගත්මතා සිල්ප නොවළහා ඉගෙන ආවාහුය. එකල්හි රජ්ජුරුවෝ තමාගේ පුත්‍රයාට යුවරජ තනතුර දුන්නේය. රාජකුමාරයා මහත් යසපිරිවර සම්පත් ඇතියේය. එතැන්තැපටන් බෝධිසත්වයන් වහන්සේ යුවරජ්ජුරුවන් හා එක්වම ආහාර අනුභව කරන්නේය. පානීය යනාදීන් මෙම ක්‍රමයෙන් වන්නේය. මෙසේ ඔවුනොවුන්ගේ විශවාස ධර්මය ස්ථිරවූයේය. එයින් මෑත භාගයෙහි යුවරජ්ජුරුවෝ පියමහ රජුහුගේ අයාමෙන් රාජ්‍ය සම්පත්තියෙහිපිහිටා මහත්වූ රාජ්‍යශ්‍රී සම්පත්තිය අනුභවය කරන්නේය. ඉක්බිති ඒ විශුද්ධි ශීල සමාධ්‍යාදී ගුණයන්ට වාසස්ථාන වූ අප මහා බෝසතානන් වහන්සේ සිතනසේක් මාගේ මිත්‍රයා රාජ්‍යානුශාසන කරන්නේය. සිතුනු ඇසිල්ලෙහි මට වනාහි පුරෝහිත තනතුරු දෙන සේක. පඤ්චකාම සම්පත්තියෙන් යුක්තවූ ගෘහවාසයෙන් මට ප්‍රයෝජන කිම්දැයි ඍෂි ප්‍රවජ්‍යාවෙන් පැවිදිව කායවිතේතකග්ගතා දෙක වර්ධනය කෙරෙම් සිතා බෝධිසත්‍වයන් වහන්සේ දෙමව්පියන් වැඳ පැවිදිවීමට අනුදන්වා මහත්වූ භවභෝගසම්පත්තිය නිරපෙක්ෂව දමා අසහායචාරීවූ මෘගෙන්‍ද්‍රයෙකු පරිද්දෙන් උදකලාවූ ස්වකීය වූ වාසභවනයෙන් නික්ම ප්‍රසිද්ධ සිංහ ව්‍යාඝ්‍රාදීන් විසින් භයානක වූ හිමාලය වනයට වැද සිත්කළු වූ එක්භූමි ප්‍රදේශයෙක්හි පන්සලක් මවා ඍෂිව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ඨ සමාපත්ති උපදවා චිත්තානු කූලව ධ්‍යාන ක්‍රීඩා කෙළිමින් වාසය කරණසේක. එකල්හි රජ්ජුරුවෝ තම හට මිත්‍රවූ බෝධිසත්‍වයන් සිහිකොට මාගේ විත්‍රයානන් මේ ස්ථානයෙහි දකින්ව නැත්තේය. ඔහු කවර තෙනෙක්හි දැන් වාසය කරන්නේ දැයි වාසය කරන්නේ දැයි විචාළේය. එතෙපුල් ඇසූ අමාත්‍යයෝ බෝධිසත්‍වයන් වහන්සේ පැවිදිවූ බව කීයේය. එයට ගොස් මාගේ මිත්‍රයානන් කැඳවාගෙණ එවයි ඔහුට පුරෝහිත තනතුර දෙනු කැමතිවෙමි කීහ. එබසට සයහ නම් වූ අමාත්‍යයා, යහපත, ගොස් කැඳවා ගෙන එමියි ගිවිද බරණැස් නුවරින් නික්ම අනුපිළිවෙළින් එක් ප්‍රත්‍යන්ත ගමකට පැමිණි එගම්හි උන්වහන්සේ එනකල ලැගුම් පිණිස කඳවුරක් කරකවා වැදිපුරුෂයන් හා කැටිව බෝධිසත්‍වයන් වහන්සේ වාසය කරන්නාහු පන්සල සමීපයට ගොස් පන්සල් දොරකඩෙහි සකල කමලාසනා නිමි සයුර ගරුඬ මනුෂ්‍ය විෂධරීන්‍ද්‍රයන්ගේ හෘදය නේත්‍රානන්ද කරවූ සවර්ණ ප්‍රතිබිම්බයක්සේ වැඩවුන් බුද්ධාංකුරයන් වහන්සේ දැක දොහොත් මුදුනෙහි තබා වැඳ එකක් පස්ව හිඳ පිළිසඳර කථා කෙරෙමින් ඉක්බිති ස්වාමීන් වහන්ස අපගේ රජ්ජුරුවෝ නුඹවහන්සේට පුරෝහිත තනතුරු දෙනු කැමතියෙන් නුවරට එනු කැමතිසේකැයි කීහ. එබසට බෝසතානන් වහන්සේ කියනසේක් මම පුරෝහිත තනතුරු තබා සියළු කාසි කෝසලාදි සියලු ජම්බුද්වීප රාජ්‍යය හෝ චක්‍ර වර්ති රාජ්‍ය ශ්‍රී සම්පත්තිය ලබතෝතිනුත් නොයෙමි. නුවණැත්තෝ වරක් දමන ලද කෙලශයක් නැවත ග්‍රහණය නොකරති. වරක් හරන ලද දෙය වනාහි උත්ගාර කොට දමූ කෙළ පිඬක් හා සමාන වන්නේයයි කියා ප්‍රකාශ කරණ සේක්. එම්බා සයහ නම්වූ අමාත්‍යය, මම වනාහි චක්‍රවට පර්වතය

SANHIDA LANKA

විසින් පිරිවැරූ සාගරයට කර්ණාවතංසයක් වැනිවූ මේ පෘථිවි සංඛ්‍යාත චක්‍රවර්ති රාජ්‍ය ශ්‍රී සම්පත්තිය ධ්‍යාන සැපයෙන් යුක්ත වූ ප්‍රව්‍රජ්‍යාව හැර පඤ්චකාම සම්පත්තියෙන් යුක්තවූ ඓශ්වර්‍ය්‍ය ඇරගතියි යන මේ ලෝක නින්දායෙන් යුක්තව නොකමැතියෙමි. මෙබඳු වූ නින්දා ස්වාභාවයෙන් දනුවයි කියා ශ්‍රේෂ්ඨ අමාත්‍ය ධ්‍යානයෙන් ආත්මය පිරිහෙලා හෝ අධර්මයෙහි හැසිරීමෙන් හෝ යම් යස ලාභ වෘත්තියෙක් ඇත්නම් ඒ සියලු සම්පත්තිය නින්දිත වන්නේය කියාද යම් අධර්මයකින් වස්තු රැස් කිරීමෙක් ඇත්නම් එයින් ජීවත් වීමට වඩා ඉඳින් ගෘහ වාසය හැර භික්ෂා භාජනය අතින් ගෙන අන් කුලයෙක්හි පිඬු පිණිස හැසිරෙමි. එම ජීවත් වීම මට උත්කෘෂ්ට වන්නේයයි කියා මම වනාහි ඉඳින් ගෘහ වාසය හැර සත්ව ලෝකයෙහි සත්වයන්ට හිංසා පීඩා නොකොට භික්ෂා භාජනය අතින් ගෙන අන් කුලයෙක්හි පිඬු පිණිස හැසිරෙමි. එබඳු ජීවිකාව රාජ්‍ය ශ්‍රී සම්පත්තියටත් වඩා උත්කෘෂ්ට යයි කීසේක. බෝධි සත්වයන් වහන්සේ අමාත්‍යයා විසින් නැවත යාඥා කරද්දීත් පුරෝහිත තනතුරු මේ ආකාරයෙන් ප්‍රතික්ෂේප කළසේක. එවිට සයහ නම්වූ අමාත්‍යයා බෝධි සත්වයන් වහන්සේගේ සිත් ලැබ ගත නොහී වැඳ අවසර ඉල්වා ගෙන නුවරට ගොස් බෝධිසත්වයන් වහන්සේ නොඑන බව රජ්ජුරුවන්ට දැන්වූයේය. අජරාමර සංඛ්‍යාත නිර්වාණ ක්ෂෙම භූමිය ප්‍රණිධානය කළාවූ සත්වයන්ගේ අභිමතාර්ථය සිඬ කර අප තිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කොට වදාරා මේ සයහ ජාතකය නිමවා වදාළසේක. චතුරාර්ය සත්‍යය ධර්ම දේශනාවගේ කෙළවර උකටලී භික්ෂූන් වහන්සේද දහසක් නයින් ප්‍රති මණ්ඩිත වූ ශ්‍රොතාපතති ඵලයෙහි පිහිටිසේක. අවශේෂ පිරිසත් මෙවැනි ශ්‍රොතාපත්ති ඵලාදිය ක්‍ෂාත් ක්‍ෂාත් කළාහුය. එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් බුද්ධෝපස්ථායක වූ ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි සයහ අමාත්‍යයා නම් දැන් ඥානාග්‍රාප්‍රාප්ත වූ ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි පුරෝහිතයා නම් සමස්ථ සත්වයන් කෙරෙහි පතළ කරුණාවෙන් සමත්‍රිංසත් පාරමිතා ධර්මයන් පුරණය කොට අසවත්ථ මූලයෙහිදී ප්‍රාදූර්භූතවූ වජ්‍රාසනාරූඪව සකලඥෙයය ධර්මයන් කරතලාමලක ක්‍රමයෙන් ප්‍රතිවෙධ කළාවූ මම්ම වේදයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# පුචිමන්ද ජාතකය

තවද එක් සමයෙක්හි සුරා සුර බඹුන් මනුජචන්දනීයා ශාස්තෘ වූ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සේක්, ආයුෂ් මත්වූ මහ මුගලන් තෙරුන් වහන්සේ අරභයා මේ දේශනාව වදාළ සේක. මුගලන් තෙරුන් වහන්සේ අරභයා මේ දේශනාව වදාළ සේක. මුගලන් මහතෙරුන් වහන්සේ වනාහි රජගහ නුවර නිසා වන කැලියෙක්හි වසන කල් එක් සොරෙක් නගරවාර නම් ගම්හි උමන් බිඳගෙන හස්තසාර බඩු ගෙන ගොස් තෙරුන් වහන්සේ කළ ආකාරයෙන් කළ පිරිවෙණට වැදමට ආරක්ෂා වන්නේ යයි සිතා තෙරුන්වහන්සේ පන්සල නිසමත්තෙහි සැතපුනේය. තෙරුන් වහන්සේ ඔහු නිසමත්තෙහි සැතපුන බව දැන ඒ පුරුෂයා කෙරෙහි සැක කොට සොරුන් හා එක්ව විසීම නම් සුදුසු නොවන්නේයයි සිතා පන්සලින් නික්ම ගොසින් මෙතැන්හි තොප නොසැතපේවයි නිකුත් කළ සේක.

ඒ සොරා එතැනින් නික්ම නොපෙනෙන ලෙස පියවලහා ගියේය. එගම්වැසි මනුෂ්‍යයෝ ගිනිසිළු ඇරගෙන සොරහුගේ පියවර සටහන් ඒ ඒ තැන්හි පරීක්ෂා කොට ගොස් ඒ සොරහු ආවාවූ තැන්ද සැතපුන තැන්ද යන මෙකී තැන් දැක සොරුන් මෙතැන්හි ආයේය. මෙතැන්හි සිටියේය. මෙතැන්හි හුන්නේය. මේ ස්ථානයෙන් නික්ම ගියේය. අප විසින් සොරහු නොදක්නා ලද්දේ යයි ඔබ් නොබ ඇවිද නොදැක ගියාහුය. දෙවෙනි දවස්හි මුගලන් මහතෙරුන් වහන්සේ පෙරවරු වේලෙහි රජගහ නුවර පිඬු පිණිස ආහාර කෘත්‍යයෙන් වැලකුන සේක්. වේළුවනාරාමයට ගොස් එපවත් බුදුන්ට දැන්වූ සේක. මොග්ගල්‍යානයෙනි සැක කළ යුතු තැන් සැක කෙළේ තොපි දැන්මතු නොවෙයි. පුරාතන නැවනැත්තෝද සැක කළ යුතු දෙයෙහි සැක කළාහු වේදැයි වදාරා ස්ථවිරයන් විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකු රජ කරන සමයෙහි අප මහ බෝසතානන් වහන්සේ බරණැස් නුවර සුසාන වනයෙහි කොසඹ ගසෙක්හි වෘක්ෂ දේවතාව උපන්සේක. ඉක්බිති එක් දිනයෙක නුවර දොර සමීප ගමෙක්හි කරන ලද සොරකම් ඇති පුරුෂයෙක් ඒ සුසාන වනයට ප්‍රවිෂ්ට වීය. එකල්හි වනාහි ඒ සුසාන වනයෙහි කොසඹය ඇසතුය යන වනස් පතී වෘක්ෂයෝ දෙදෙනෙක් වූහ. කරණ ලද සොරකම් ඇති පුරුෂයා කොසඹ ගස මුල බඩු පොදිය තබා සැතපුනේය. එකල්හි වනාහි මනුෂ්‍යයෝ සොරුන් ගෙන කොසඹ හුල්හි අමුනති. ඉක්බිති ඒ දේවපුත්‍රයා සිතනුයේ ඉදින් මනුෂ්‍යයෝ අවුත් මේ සොරහු අල්වාගෙන මේ කොසඹ ගසෙහි ශඛාවන් ඡේදනය කොට හුලක් තනා මොහු කොසඹ හුල්හි අමුනුවන්නාහුය. එකල්හි අපගේ මේ විමාන වෘක්ෂයත් නසන්නේය. එබැවින් ඔහු මෙතනින් නිකුත් කෙරෙමි. ඔහු හා සමඟ කථා කරන්නේ කොල සොරු නැගී සිටුව, කවර කාරණයකින් සිතා සයනය කරන්නෙහි දැයි මෙතැන්හි තාගේ සයනය කිරීමෙන් කවර අර්ථයෙක් සිද්ධවේද ගම්හි දරුණු සහාසික චොර ක්‍රියා කළාවූ සොරා යම්සේ රාජ පුරුෂයෝ අල්වා නොගනිද්ද එපරිද්දෙන් නැගී සිට නික්මවෙයි කීයේය. ඒ දේවපුත්‍රයා ඔහුට මේ උක්තප්‍රකාර වචනයෙහි හය ගන්වා ගමන් කර වූයේය. ඒ සොරහු එතනින් ගිය කල්හි ඇසතුරුක්හි වසන දේවපුත්‍රයා කියනුයේ ගමට ප්‍රවිෂ්ට කළ යම් සොරකු රාජ පුරුෂයෝ අල්වා ගෙන වනයෙහි ගෙන ගියා වූ කොසඹ වෘක්ෂයෙන් ශාඛාවක් කපා උල් හිඳුවති. එකල්හි පුචිමන්ද දේවපුත්‍රයාට කවර හානියෙක් වේදැයි කී කල්හි එබස් ඇසූ කොසඹ රුක්හි වසන දේවපුත්‍රයා කියන්නේ අශ්වත්‍ථ දේවපුත්‍රය තෙපි මාගේ ද, සොරහුගේ ද, එක්ව නොවසන බව නොදනුව ගම්හි සොරකම් කළ පුරුෂයා කොසඹ හුල්හි අමුනති. එසේ කල්හි මාගේ විමාන වෘක්ෂය නස්නේය. නොහොත් ශාඛායෙහික්හි බැඳ එල්වූ නම් මාගේ විමානය කුණප ගන්ධයෙන් හමන්නේය. එහි මාගේ සිත සැක කරවයි කීයේය. එපරිද්දෙන් ඒ දේවපුත්‍රයන්ට ඔවුන් කථා කරමින් සිටියදී වස්තු ස්වාමි සිළු කොලගත් අත් ඇතිව පියවර අනුසාරයෙන් අවුත් සොරහු සැතපුනු තැන් දැක පින්වත්ති දැන් මේ සොරු නැගී සිට ගියෝය. ඉදින් සොරුන් ලද මෝ නම් ඔහු මේ කොසඹ හුල්හි හෝ අමුනා ශාඛාවෙක්හි හෝ බැඳ එල්වා යන්නමෝ වේ දැයි කියා ඔබ්මොබ දිව ඇවිද සොරුන් නොදැකම ගියාහුය. ඔවුන්ගේ බස් ඇසූ අශ්වත්‍ථ දේවපුත්‍ර කියන්නේ එම්බා නිමබ වෘක්ෂ දේවපුත්‍රය සැක කළ යුතු දෙයෙහි සැක කල යුත්තේය. පාපමිත්‍ර සංසර්ගය දුරු කිරීමෙන් මෙලෙව්හි තමා රක්ෂා කෙරෙති. ත්‍රිවිධ දුශ් චරිතය දුරු කිරීමෙන් මෙලෙව්හි තමා රක්ෂා කෙරෙයි. එසේ හෙයින් අනාගත භය කරණ කොටගෙන නුවණැති සත්වයෝ මෙලොව පරලොව දෙකින් වන වැඩ දක්නහුයයි කීයේය. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා මේ පුචිමන්ද ජාතකය නිමවා වදාළ සේක. එකල්හි අශවත්‍ථ වෘක්ෂයෙහි නිපන් දේවපුත්‍රයා නම් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේය. එකල්හි නිමබවෘක්ෂයෙහි නිපන් දේවපුත්‍රයා නම් දැන් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# කස්සපමන්දිය ජාතකය

තවද එක්සමයෙහි ෂඩ්භිඥද්‍යානෙනෙගුණ රත්නා ලංකෘත ශාස්තෘවූ බුදුරජානන් ජේතවනාරමයෙහි වාසය කරන සේක්. එක් මහළු භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දේශනා කළසේක. සැවැත් නුවර වැසි එක් කුල පුත්‍රයෙක් වස්තුකාම කෙපලශකාමයෙහි ආදීනව දැක. සර්වඥයන් වහන්සේ සමීපයෙහි පැවිදිව කමටහන්හි යෙදී වාසය කරන්නේය. නොබෝ කලකින්ම රහත් බවට පැමිණියේය. ඊට මැත භාගයෙහි උන් වහන්සේගේ මෑණියෝ කළුරිය කළහ. ඒ රහතන් වහන්සේ මෑනියන්ගේ ඇවෑමෙන් දෙපුතුපියන් පැවිදි කරවා දෙව්රම් වෙහෙරරෙහි වැසි වස් එලඹෙන කල්හි චීවර ප්‍රත්‍යයන්ගේ සුලභ බව අසා එක් ගමක විසීමට ගොස් එතැන්හි තුන්දෙනා වහන්සේම වස් එලඹ නිමවන ලද වස් ඇති සේක්. ජේතනාරාමයට ආ සේක. රහත් වූ දහර භික්ෂූන් වහන්සේ කියන සේක්. ජේතවන විහාරස්ථානාසනනයෙහි සිට සාමණේර තෙපි මහළු තෙරුන් වහන්සේ සතප්පා කැන්දාගෙණ එව මම පෙරටුව ගොස් පිරිවෙණ පිළිදගිමියි කියා ජේතවනාරාමයට ගිය සේක. මහළු තෙරුන් වහන්සේ සෙමින් සෙමින් සිට යන සේක. සාමණේරයෝ නැවත නැවත හිසින් පීඩා කරන්නාහුමෙන් ස්වාමිනි, ගිය මැනවැයි කියා ඒ මහළු තෙරුන් බලාත්කාරයෙන් ගෙණ එන්නේය. මහළු තෙරුන්වහන්සේ කියන සේක්. තොපි අප හා ගමන නොකැමැති කරවා ගෙණ යව් දැයි කියා නැවත වැලකී ආපස්සෙහි යන සේක. ඔවුනොවුන් හා විවාද කරන්නාවූම ඔවුන්ට හිරු හස්තඞගත විය. අන් චීතරාගී භික්ෂූන් වහන්සේ පිරිවෙන හැමද දිය සපයා තබා ඔවුන් දෙදෙනාගේ ඊම නොදන්නා සේක්. ගිනිසිළු ගෙණ පෙර ගමන් කොට එන්නා වූ ඔවුන් දැක කල්ගියේ කිම් දැයි විචාළසේක. මහළු භික්ෂූතෙම ඒ වූ කාරණය කී සේක්. ඒ රහත් භික්ෂූන් වහන්සේ ඒ දෙදෙනා සතප්පවා සෙමින් කැඳවා ආ සේක. එදවස්හි බුදුන්ට කළ යුතු උපස්ථානාදියට අවසර නොලත්සේක. නැවත බුදුරජානන් වහන්සේ දෙවැනි දවස්හි බුද්ධුපස්ථානයට අවුත් නමස්කාර කොට අන් භික්ෂූන් වහන්සේට බුදුහු තෙපි කවර කල්හි අවු දැයි විචාළසේක. ස්වාමීනි, ඊයේ ආයෙමි දැන්වූ සේක. තොපි ඊයේ වැනි දවස අවුත් අද බුද්ධොපස්ථන කරව්දැයි වදාළ සේක. ස්වාමීනි, බුදුරජානන්වහන්ස එසේයයි කියා ඒ වූ කාරණය දැන්වූසේක. ශාස්තෘ වූ බුදුරජානන්වහන්සේ මහළු තෙරුන් වහන්සේට නින්දා කොට වදාරා මෙතෙම මෙබඳු ක්‍රියා කෙළේ දැන්මතු නොවෙයි, පෙරත් නින්දා කෙළේමවේදැල වදාරා දැන් මතු වනාහි ඒ මහළු භික්ෂූන් ක්ලාන්ත කරවන ලද්දේ නොවෙයි, පෙර නුවනැත්තන් ක්ලාන්ත කරවීයයි වදාත් ඒ රහත් භික්ෂූන් විසින් ආරාධිත වූසේක්. ඉකුත්වත් ගෙණහැර දක්වා වදාල සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරන කල පුරණ ලද බෝධිසමභාර ඇති අප මහබෝසතානන් වහන්සේ කසී නම් නියම්ගම්හි බ්‍රාහ්මණ කුලයෙක්හි උපන්සේක. උවමනා වයසට පැමිණි බ්‍රාහ්මණ කුමාරයන්ගේ මෑණියෝ කළුරිය කළේය. ඒ බ්‍රාහ්මණ කුමාරයා මෑණියන්ගේ අවමඟුල් කෘත්‍යකො මසක් අඩමසක් ඇවෑමෙන් ගෙයි විද්‍යාමාන වස්තුන් දන් දීපියා පියානන්ද මලනුවන්ද ගෙණ හිමාල වන ප්‍රදේශයෙහි දෙවියන් දුන් රිටි සුඹුළු ගෙණ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව අල මුල්, වනමුල්, පලාහාරයෙන් වර්ෂා කාලයෙහි නොසිඳෙන ලද ජලධාරාවන් ඇතිව වැසි වස්නා කල්හි අලමුල් සාරන්ටද නොහැකිවන්නේය. එලා පල වර්ණයෝ පතිත නොවෙති. එසේ හෙයින් තාපසවරයෝ බොහෝ සේ හිමවතින් බැස මනුෂ්‍ය පථයෙහි වෙසෙති. එකල්හි මහ බෝසතානන් වහන්සේද පියානන් හා සමඟ මලනුවනුත් ගෙණ මනුෂ්‍ය පථයෙහි වැස නැවත හිමාලය වනය මල් පිපී එල ගත් කල්හි ඔවුන් දෙදෙනාගෙන හිමාලය වන ප්‍රදේශයෙහි පෙර විසූ තමාගේ ආශ්‍රම පදයට එන සේක්. පන්සලට නුදුරු තැන්හිදී හිරු හස්තයට ගතවූ කල්හි තොපි ලසි ගමනින් එව. මම පෙරටුව ගොස් පන්සල පිළිදගිමි කියා ඔවුන් දෙදෙනා හැර ගිය සේක. බාල තාපසයෝ පිය මහළු තාපසයන් හා සමඟ ලැසි ගමනින් යන්නේ ඒ මහළු තාපසයන්ගේ කටි ප්‍රදේශයෙහිත් පීඩා කෙරෙමින් යන්නේය. මහළු තාපසයේ තොපි මාගේ අභිප්‍රායෙන් ගෙන යන්නේ යයි කියා නැවත වැලකී ආපස්සෙහි එන්නේය. මෙපරිද්දෙන්ම කලහ කරන්නාවූ ඔවුන්ට අන්ධකාර විය. මහ බෝසතානන් වහන්සේද පන්සල හැමද දියා පෙරා තබා ගිනිසුළු ගෙන පෙර මගට එන සේක්. ඔවුන් දෙදෙනා දැක මෙතෙක් කල් කුමක් කළ යුතුදැයි කීසේකි. බාල තාපසයෝ පිය තාපසයන් විසින් කළමනා කාරණා කීයේය. මහබෝසතානන් වහන්සේ ඔවුන් දෙදෙනා ලැසි ගමනින් ගෙන ගොස් තාපස පරික්ෂ්කාරයන් තැන්පත් කොට තබා පියා තාපසයන් ජලස්නානය කරවා පය මැදීම් තෙල් ගෑවීම් පිට මිරිකීම මෙකී වත් කොට එක් ගිණි කබලක් සමීපයෙහි තබා සන්සිඳුවන ලද සීත ඇති පිය තාපසයාන් වහන්ස, ලදරුවෝ නම් මැටි බඳුනක් හා සම සදෘශය යන මදකින්ම බිඳෙති. වරෙක බිඳුනු කල් තැන් පටන් නැවත ගලපන්ට නොහැකිවන්නේය. ඔවුන් ආක්‍රොශකරණ කල්හිද මහළු සත්වතෙම ඉවසිය යුත්තේයයි කියා පියතාපසයන්ට අවවාද කරන සේක්. අඥාන භාවයෙන් තරනුවූ කාශ්‍යප නම් පිය තාපසයන් වහන්ස නුවනැති සත්වතෙම

SANHIDA LANKA

බාල දරුවෝ ආක්‍රොශ වචන හා පීඩා කෙරෙත්මුත් සියළු නොකමැති ක්‍රීඩාවන් ක්ෂමා කෙරෙති. ඉඳින් අනුවන සත්වයෝ ආක්‍රොශ පරිභව බෙනෙති. නමුදු පහරින් බාලදාරකයන් විසින් කලාවූ සියළු අපරාධයන් සත් පුරුෂවූ වැඩි මහළු නුවනැති සත්වයෝ යුහුව මිත්‍රභාවයෙන් සමඟි වෙති. වැලිදූ අඥාන සත්වයෝ මැටි භාජනයක් මෙන් බිඳෙති. ඒ නුවනැති සත්වතෙම ස්වල්ප මාත්‍රවූ විවාදයක් කෙළේද වෛරයන් සන්සිඳීම් වශයෙන් සමඟි භාවයට නොපැමිණෙන්නේය. මෙලෙව්හි යම් සත්වයෙක් තම විසින් ඉක්මවා පැවතී දෝෂ දනී නම් යම් සත්වයෙක් තමා විසින් ඉක්මවා පැවති දෝෂ දනී නම් යම් සත්වයෙක් තමා කල දෝෂ වරද නියායෙන් පිළිගන්ට දනීද, ඔහු දෙදෙන මිත්‍රභාවයෙන් සමඟි වෙති. එසේ හෙයින් ඔවුන් දෙදෙනාගේ මිත්‍රසම්බන්ධය නොනස්නේය. තවද මේ වේලෙහි යම් සත්වයෙක් වේෂයෙන් මැඩ පවත්නා වූ අපරාධකාරී වූ අන්සත්වයන්ගේ ව්‍යතික්‍රමයෙන් ඔවුන් ක්‍ෂමා නොකළ කල්හිද තමා විසින් හඳුමුබයානෙනි තොපි එසේ එව. පාලි වචනයන් උගනුව, අත්‍ථ කථාවන් අසව භාවනායෙහි යෙදී වාසය කරව. කවර කාරණයක් නිසා බැහැර වාසය කරව් දැයි කියා තෙමේ අන්සත්වයන්ගේ අපරාධ දරු මෛත්‍රී භාවනාවට ප්‍රයත්නය කෙරේද මිත්‍රයන්ගේ අක්‍රියාභාරය උසුලාද මිත්‍රයා විසින් කළ යුතු ධූරාව උසුලාද එහෙයින් මෙබඳු වූ සත්වතෙම විශේෂයෙන් උතුම් වන්නේ යයි මෙසේ කියා මහ බෝසතානන් වහන්සේ පිය තාපසයන්ට අවවාද කළ සේක. ඒ මහළු තාපසයානෝද එතැන් පටන් මොනවට දැපුනේය. ශාස්තෘ වූ තථාගතයන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා මේ කස්සපපමන්දිය ජාතක ධර්ම දේශනාව නිමවා වදාල සේක. එකල්හි පිය තාපස නම් දැන් මහල්ලක ස්ථවිරයය. එකල්හි සිළු තාපසයෝ නම් දැන් සාමණේරයෝය. එකල්හි පිය තාපසයන්ට අවවාද කළ තාපසයෝ නම් දැන් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# ක්ෂාන්තිවාද ජාතකය

තවද මෙරසේ මුළු ලොවට අසාධාරණවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝපී භික්ෂු කෙනෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට කැඳවා ගෙනවුත් දූන්වූ කල්හි මහණ, පෙර උත්තමයෝ නම් කටු සැමිටියෙන් පහර දහසක් කාත් නොකිපුනෝ වේදැයි තොප වනාහි මේ නිසා බුද්ධ ශාසනයෙහි මහණව කෝපව වාසය කරන්නේ ඉතා අයුක්තියයි වදාරා අත් පා කන් නසා කැපූවන්ටත් උත්තමයෝ කෝප නොකළෝ වේ දැයි වදාරා ඉකුත් වත් ගෙණ හැර දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස කසීරට කලාබු නම් රජ කෙනෙකුන් රාජ්ජය කරන සමයෙහි බෝධිසත්වයෝ බමුණු කුලයක උපන්නාහ. බෝධි සත්වයන්ට නම් තබන්නාහු. කුරුඬක කුමාරයෝ යයි නමක් ඇතිව වැඩිවිය පැමිණ දෙමව්පියන් ඇවෑමෙන් ඒ සම්පත් හිමිව ඒ සම්පත් දාන විෂයෙහි විසුරුවා පංචකාමයෙහි ආදීනව දැක ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමාලය වනයෙහි වාසය කොට ලුනු ඇඹුල් නිසා බරණැස් අවුත් රජ්ජුරුවන්ගේ උයනට වැද වාසය කොට භික්ෂාව පිණිස වීථියෙහි සිතා ඇවිදිනාහු. සෙනෙවිරදුන්ගේ ගෙදරට පැමිණි සේක. සෙනෙවිරද්දූ මුන් වහන්සේගේ ඊර්‍ය්‍යා පථයෙහි පැහැද එවක් පටන් තමන්ගේ ගෙයින් දන් දී උපස්ථාන කරන්නාහ. එසමයෙහි එක් දවසෙක කලාබු රජ්ජුරුවෝ රා බී මත්ව සත් දවසක් බිසෝවරුන් පිරිවරා උයන් කෙළියට ගොසින් මඟුල් සලවට මස්තකයෙහි කරුණාව ඇති ස්ත්‍රියක සමීපයෙහි කලවයෙහි හිස තබාලා වැදහොත්තාහුය. සොළොස් දහසක් නාටක ස්ත්‍රීන් අපගේ ස්වාමීන් නිදන කල අපි නෘත්‍ය කරන්නේ කාටදැයි කියාලා ගත්තාවූ පංචාංගික තූර්‍ය්‍යනාටක තබාලා ගොස් තාපසයන් ලඟ ගසමුල වටලා ගෙණ බණ අස අසා උන්නාහ. එකියන ස්ත්‍රී තමා කළවය සොල්වා රජ්ජුරුවන් කුබද්දාපූහ. පිබිද මඟුල් සල්වට මත්තෙහි හිඳ මෙතන සිටියා වූ චංඩාල ස්ත්‍රීහු කොයි ගියේ දැයි විචාළහ. එවිට බිසව් කියන්නාහු තාපස කෙනෙක් ලඟ හිඳ බණ අසති කීහ. යහපත, කුට තාපසයන්ට නිහඬක් කියමි නැගී සිට කඩුව අයාපියා ඇරගෙණ මරන්ට දිවූහ. රජ්ජුරුවන් වහන්සේගේ වල්ලභ ස්ත්‍රී රජ්ජුරුවෝ ඉදිරියට ගොස් කඩුව ඇර ගත්තාහ. රජ්ජුරුවෝ ගොසින් තොපි කුමනවාදි දැයි විචාළාහ. එවිට බිසව් කියන්නාහු තාපස කෙනෙක් ලඟ හිඳ බණ අසති කීහ. යහපත, කුට තාපසයන්ට නිහඬක් කියමි නැගී සිට කඩුව අයාපියා ඇරගෙණ මරන්ට දිවූහ. රජ්ජුරුවන් වහන්සේගේ වල්ලභ ස්ත්‍රී රජ්ජුරුවන් ඉදිරියට ගොස් කඩුව ඇර ගත්තාහ. රජ්ජුරුවෝ ගොසින් තොපි කුමනවාදී දැයි විචාළහ. එවිට මහරජ මම ක්ෂමාන්තිවාදී නම යයි කීහ. ඒ කුමක්ද? ක්‍ෂාන්තිවාදී නමැයි විචාළ තෙන මා කෙරේ මෛත්‍රීන් කෙරෙහිත් අමෛත්‍රීන් කෙරෙහිත් මම එක කරුණාව මැයි කීහෙයින් මම ක්ෂාන්තිවාදී මැයි කීහ. මුන්ගේ ක්ෂාන්තිය බලන්නට උවමැනවැයි වධකයා ගෙන්වූහ. වධකයාත් රත්කඩක් හැඳ රතක් කරලා රත්මල් පැලඳ පොරවක් අතින් ගෙන කවරක් හට කවර වධයක් කෙරෙම්ද? වදාල මැනවැයි කීහ. අනික් කාට වද කරන්ටද? තෙල කුට තාපසයා ඉස බිමලා එලාගෙන පිට පාර පන්සියයක් ද, බඩපාර පන්සියයක්ද, දැලයෙහි දෙසිය දෙසියක් ද ගසාලයි කීහ. එවිට වධකයාත් කී ලෙස ගෙඩි ගසා සිටියාහ. එවිට කියන්නාහු, තවද තොපගේ ක්ෂාන්තිවාදී නොගියේ දැයි විචාළාහ. ඇයි? මහරජ මාගේ ක්ෂාන්තිය පයෙහි කීහ. පයක් කපාහරුවයි කී හෙයින් වධකයාත් කී ලෙසම කළාහ. එවිටත් තෝ කුමනවාදී දැයි විචාළෙත් ඇයි? මහරජ, මාගේ අත් පා කැපුවයි කිම් ද මාගේ ක්ෂාන්තිය මාගේ හෘදයෙහි වේ දැයි කීහ. තිළුගේ කන් නාසා කපා තෝ ක්ෂාන්තිවාදි දැයි විචාළෙන් ඇයි? මහරජ, මාගේ ක්ෂාන්තිය මාගේ මාගේ ලෙයි නොවේ දැයි කියා වැදහොත් බෝධිසත්වයන් කැපූ අත් පා කන් නාසායෙන් හිය ලෙයෙන් රැඳී ඔත්තාහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු ඇයි තාපසයානෙනි, තව දක්වා තොපගේ ක්ෂාන්තිය නොගියේ දැයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු මහරජ ක්ෂාන්ති නම් අත් පා කන් නාසායෙහි තිබූ දෙයෙක්ද? මාගේ ගම්භීර වූ හෘදයෙහි පිහිටියේය. තොප කුමක් කළත් මාගේ ක්ෂාන්තියට කුමක් වේ දැයි කීහ. එවිට රජ්ජුරුවෝ තොපගේ ක්ෂාන්තිය තොපගේ ලෙයිහිම තිබෙයි කියා විළුඹෙන් ලයට ඇන්මක් ඇන පිටත්වලා ගියාහ. එවිට තාපසයන්ට උපස්ථාන කරන්නාවූ සෙනෙවිරද්දූ තාපසයන් කරා අවුත් තාපසයන්ගේ කපාපු අත් පා කන් නාසා ඇරගෙන කඩ කඩ බැඳ තාපසයන් ඇඟ ලේ පිස තාපසයන් එක්තෙනක සතප්පවා වැඳ එකත්පස්ව හිඳ කියන්නාහු උත්තමයානන් වහන්ස වධ කළ සේක්. රජ්ජුරුවන් වහන්සේය. රාජ්ජ වාසීන්ට කෝප්පයක්වත් අමෛත්‍රියක්වත් නොකළ මැනව, කෝප කරතත් මෛත්‍රී කරතත් රජ්ජුරුවන් වහන්සේටම කළ මැනවැයි කීහ. එවිට තාපසයෝ කියන්නාහු රජ්ජුරුවන් විසින් මාගේ කන් නාසා අත්පා කප්පවා වද කරන ලද. එසේ කළත් මම රජ්ජුරුවන් කෙරෙහි නිෂ්කාරණාවක් නැත. එසේ හෙයින් රජ්ජුරුවෝ චිරාත් කාලයක් ජීවත් වෙත්වයි සුඛී සුවපත් වෙත්වයි කියා මෛත්‍රී කළහ. එකියන කලාබු රජ්ජුරුවෝ තාපසයන්ගේ දෘශ්‍යමානයක් ඉක්ම උයන් කෙළවරට ගිය කල්හි දෙලක්ෂ සතලිස් දහසක් ඝනකඩ බොල් මහ පොළොව පලාගෙන අවීචි මහ නරකයෙන් ගිනි කඳෙන් අවුත් රජ්ජුරුවන් පලසකින් වට කරන්නා සේ

SANHIDA LANKA

වටලා අවීචි මහා නරකයට ඇරගෙන ගියේය. ඒ අර්ථය දක්වන්නාවූ සර්වඥයන් වහන්සේ වදාරණ සේක්. මහණෙනි මෙකින ක්ෂාන්තිවාද තාපසයෝ තමන්ගේ අත් පා කන් නාසා කපා දලයේ පාරදහසක් ගසා වධකරන්නාහු. කලාබුරජහු කෙරෙහි කෝපයක් නොකොට මෛත්‍රී කළ සේක. එරජ පොළොව නොහී පොළොව පලා ගෙන අවීචිමහනරකයට ගියේයයි වදාළසේකැයි එකියන තාපසයෝ එදවස්ම කාලක්‍රියා කළහයි වදාරා මේ ක්ෂාන්තිවාද ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි කලාබු රජ නම් දැන් දේවදත්ත ස්ථවිරයෝය, සෙනෙවිරද්දූ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, ක්ෂාන්තිවාද තාපසව උපන්නෙම්. දෙවාති දෙවවූ ශක්‍රාති ශක්‍ර වූ වන්දනෙයයාහි වන්දනෙයයාහි පූජනෙයාවූ තිලෝගුරු බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# ලොහකුම්භි ජාතකය

තවද තිලෝගුරු සර්ව රාජෝත්තමයානන් වහන්සේ එක් සමයෙක්හි සැවැත් නුවර ගොදුරු ගම් කොට දෙව්රම් වෙහෙර වැඩවසන සේක්. කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය වදාළ සේක.

එක් දවසක් කෝසල රජ්ජුරුවෝ රාත්‍රී භාගයෙහි තිරිසතුන් සතර දෙනෙකුගේ ශබ්දය ඇසූය. ඉන් එක් තිරිසනෙක් දුකාරයම කීහ. එකෙක් සකාරය කීය. එකෙක් නකාරය කීය. එකෙක් සෝකාරය කීහ. ඔහු සතර දෙන පූර්ව ජන්මයෙහි මෙම සැවැත් නුවර රාජ කුමාරව ඉපිද ඓශ්වර්‍ය්‍ය මදයෙන් බොහෝ කලක් පරදාර සේවනය පුරුදු කොට අනිකුදු බොහෝ අකුසල් රැස් කෙරෙමින් ජීවත්ව ආයු කෙළවර ඒ පරදාර කර්මය හේතු කොට ගෙන සැවැත් නුවර සමීපයෙහි ලෝකුම්භී නරකයෙහි උපන්නාහු. බඳනෙක්හි පැසෙන සාල්මෙන් පැසී තිස් දහසක් අවුරුද්දෙන් මුව විටට පැමිණ උනුන් දැක කවර දවසෙක මේ දුකින් මිදමෝද්දැයි ක්‍රමයෙන් බැගෑවත්ව ශබ්ද කළාහ. කොසොල් රජ්ජුරුවෝ මධ්‍යම රාත්‍රියෙහි ඒ ශබ්දය අසා භයින් තැති ගෙන යහන් මත්තෙහි නොනිදා ඉඳම අරුණු නැගී වේලෙහි පුරෝහිත බමුණන් අවුත් රාත්‍රියෙහි සැතපීමෙහි සැපයෙක් කොයින්ද රාත්‍රියෙහි මෙබඳු භයානක වූ ශබ්දයක් ඇසීමි කීය. ඒ ඇසූ බමුණන් විසින් අතුල්සලා කම්පාව සිටි කල්හි කීමෙක් ද? ආචාර්‍යනි විචාරා මහරජ්ජුරුවන් වහන්ස උග්‍රවූ ශබ්දයෝයයි කී කල්හි පිළියමට සමවේදැයි කියා ඒකාන්තයෙන් මේ ශබ්දයෝ ප්‍රතිකාර ක්ෂම නොවෙති. අපි වනාහි යාග විධානයෙහි මොනවට දක්ෂයම්හ. ඉදින් ප්‍රතිකාර නොහැර කරතොත් ගතාධි වශයෙන් පරිත්‍යාග වශයෙන් මහත්වෙයි. ඒ මහත්වූ යාගය අපගේ සාමර්ථයෙන් අසුරුවා සර්ව චතුස්ක නම් නාගයෙන් අසුභ විපාකය වළකම්හයි කීකල්හි එසේ වීනම් ප්‍රමාද නොකොට ඇතුන් සතර දෙනෙකු අසුන් සතර දෙනෙකු ඇලි ගොන් සතර දෙනෙකු මිනිසුන් සතර දෙනෙකු යනාදී වශයෙන් කුරුල්ලන් දක්වා නොහැර සියළු දිපාද චතුෂ්පාද ප්‍රාණීන් සතර දෙනා බැගින් අල්වා ගෙන එවයි අමාත්‍යයන්ට විධාන කළහ. අමාත්‍යයෝ යහපතැයි පිළිගෙන යථෝක්ත වූ සියළු ප්‍රාණීන් හා අනිකුදු යාගයට ගතමනා සියළු උපකරණ සපයා යාගාවට සමීපයෙහි සියළු ප්‍රාණීන් බැඳ සිටුවූහ. බමුණෝද යාගය මූලිකව බොහෝ බාද්‍යාභොද්‍යා හා වස්තු ලබම්හයි යන උත්සාහයෙන් යාගයට මෙනම් මෙනම් දෑ උවමැනවැයි කියා ඔබ්මොබ කුතුහලයෙන් ඇවිදිනාහුය. මල්ලිකා දේවී ඒ කෝලාහලය අසා රජ්ජුරුවන් කරා එළඹ මහරජ්ජුරුවන් වහන්ස බමුණෝ ඉතා මහත්ව බෙණෙමින් කුතුහලව කුමට ඇවිද්දැයි විචාරා එබසට රජ්ජුරුවෝ දේවීන් තොපට ඉන් ප්‍රයෝජන කිම්ද? තොපි තොපගේ ඓශ්වර්‍ය්‍යයෙන් මත්ව ඉඳුව. දුක් ඇත්තේ අපටම වේදැයි කීකල්හි දෙවනුවත් කීමෙක්ද? මහ රජ්ජුරුවන් වහන්සැයි විචාරා දේවීනි මම මෙබඳුව නැසිය යුතු අනිෂ්ට ශබ්දයන් ඇසීමි ඒ කාරණය බමුණන් අතින් විචාළෙමි. බමුණෝ රාජ්‍යයට හෝ ඓශ්වර්‍ය්‍යයට හෝ ජීවිතයට හෝ අන්තරාය පෙණෙයි සර්ව චතුෂ්කයාගයම කොට ඒ අන්තරාය වලකම්හයි කියා යාගයට සුදුසු උපකරණ සපයා මාගේ බසින් ඔබ්මොබ ඇවිදිති කීහ. කීමෙක්ද දේවයන් වහන්ස මේ ශබ්දයන්ගේ නිෂ්පත්තිය දෙවියන් සහිත වූ තුන් ලොවට අග්‍ර පුරෝහිතයානන් වහන්සේගෙන් විචාළසේක්දැයි කියා දේවිනී දෙවියන් සහිත වූ තුන්ලෝ වැසි අග්‍රපුරෝහිතයානෝ නම් කවුරුදැයි විචාළෝය. රජ්ජුරුවන්ට නැවත ඒ මල්ලිකා දේවි දේවයන් වහන්ස ඒ අග්‍රපුරෝහිතයෝ නම් අන් කෙනෙක් නොවෙයි. සියලු පදාර්ත නිමවාදත් මහා ගෞතම සර්වඥයන් වහන්සේය. මේ මූඪ බමුණෝ කුමක් දනිද්ද? යුහුවගොස් බුදුන් විචාළ මැනවැයි කීකල්හි කෝසල රජ්ජුරුවෝ මල්ලිකා දේවීන්ගේ වචනය ගිවිස උදය මේ නිමවා සැපවූ රථ යානාවකින් ජේතවන විහාරයට ගොස් බුදුන් වැඳ එකත්පස්ව ආදර දක්වා සිට මහරජ කුමට ආයෙහිදැයි විචාළ කල්හි තිලෝගුරු සර්වඥයන් වහන්ස ඊයේ රාත්‍රියෙහි මම මෙබඳු ශබ්දයක් අසා උදැසන බමුණන්ගෙන් විචාළෙමි. ඔහු රාජ්‍යයට හෝ ජීවිතයට හෝ සැපතට හෝ අන්තරාය වෙයි සර්වචතුෂ්ක යාගය කොට අන්තරා වලක්කම්හයි කියා යාගස්ථානයෙහි කර්මාන්ත කෙරෙති. ඒ ශබ්දයන් සතර දෙනා ඇසීම කරණ කොටගෙන මට කවර උපද්‍රවයෙක් වේදැයි විචාළහ. එබසට ලොව එක මවෙක් වැනි මාගේ ස්වාමි දරුවූ බුදුහු අඬන පුත්‍රයක්හු ලෙහිලා සනසන්නාක් මෙන් මහරජ තට කිසි උපද්‍රවයෙක් නොවෙයි නරකයෙහි උපන්නාවූ තිරිසත්හු දුක් අනුභව කෙරෙමින් ඒ ඉවසිය නොහී ශබ්ද පැවැත්වූහ. මහ රජ මේ ශබ්දයෝ දැන් තා විසින්ම මතු අසන ලද්දෝ නොවෙති. පුරාතනයෙහි රජදරුවන් විසිනුදු අසන ලද්දෝමය. ඔහුද මෙපරිද්දෙන්ම බමුණන් විචාරා මෙසේම පශුඝාතක යාග කරුණු කැමතිව යාගෝපකරණ සපයා ප්‍රාණීන් බන්ධන ගත කරවූහ. එකල නුවණැත්තෝ ඒ ශබ්දයන්ගේ අභිප්‍රාය ප්‍රකාශ කොට කීහ. භයට පැමිණියාවූ මහජනයා මුදා අරවා ලෝවැඩ කළෝ වේදැයි වදාරා තුෂ්ණිම්භූතව වැඩහිඳ අතීත කථා ශ්‍රවණයෙහි කෞතුහල සිත් ඇති කොසොල් රජ්ජුරුවන් විසින් ආරාධනා කළ කල්හි ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

SANHIDA LANKA

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය නරන සමයෙහි සසර සැරිසරන්නාවූ බෝධිසත්වතෙම එසමයෙහි කසී රට එක්තරා බමුණු කුලයෙක්හි ඉපිද වැඩිවිය පැමිණ වේදත්‍රය නිමවා දූන

පඤ්චකාමය හැර ගිහිගෙන් නික්ම ඍෂිප්‍රව්‍රජ්‍යාවට පැමිණ පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා ධ්‍යාන ක්‍රීඩා කෙරෙමින් හිමාලය වනයෙහි සිත්කළු වූ එක් වන ලැහැබෙක්හි වාසය කරන්නේය. ඒ බ්‍රහ්මදත්ත රජතෙමේ එක් දවසක් රාත්‍රියෙහි තිරිසනුන් සතර දෙනෙකුගේ ශබ්දයන් අසා භයින් තැතිගෙන තසේම රාත්‍රියෙහි නොනිදා හිඳ උදය බමුණන් විචාරා උන් විසින් මෙම රාත්‍රී විධානාත්තරයෙන් වේවයි ඒ උපද්‍රවය මේ යාගයෙන් සන්සිඳුවම්හයි මෛත්‍රී ධ්‍යානයට සමවැද එයින් නැගී ලොව බලන්තේ බරණැස් රජතෙම එකල උපද්‍රවය නසමි. අඥාන මූඪ වූ බමුණන්ගේ බස් ගෙන නොයෙක් ගණන් ප්‍රාණීන් නසා බොහෝ උපද්‍රව පමුණුවා ගන්ට උත්සාහ කරන්නෝය. අද දවස මම එතනට ගොස් සත්වයන්ට පැමිණි මේ උපද්‍රවයද රජහට පැමිණි පරලොව උපද්‍රවයද වලකා ජන රංජන සංග්‍රහ කරන්නට සුදුසුයයි සිතා ඍඬියෙන් අහසට පැන නැගී බරණැස් රජහුගේ උයනට බැස මඟුල් සල්නට මත්තෙහි උන්නේය. එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයාගේ ප්‍රධාන අතවැසි වූ එක් බමුණු කුමාරයෙක් ඔහු කරා එළඹ ආචාරීන් වහන්ස අපගේ වේදත්‍රයෙහි එකක්හු මරා අනිකක් හට සැප කිරීමෙකැයි යන දෙයක් නැත. වෙද විරෝධ වූ මෙවැන්නක් කුමට කරණ දෙයෙක්දැයි කියා පුරෝහිතයා විසින් මෙයින් අපට බත් මාංස කන බොන දූ හා බොහෝ වස්තු ලැබෙයි. තෙපි ඒ නොවලකා නිකන් ඉඳුවයි කී කල්හි මම මේ පාපවිධානයට සහාය නොවමැයි සිතා විවේක කැමතිව උයනට ගොස් මඟුල් සල්වට මත්තෙහි උන් තාපසයන් දුක වැඳ කරණ ලද ප්‍රිය කථා ඇතිව එකත්පස්ව හිඳ තාපසයන් විසින් කිමෙක්ද? සගය මෙනුවර රජ්ජුරුවෝ දැහැමෙන් රාජ්‍යය කෙරෙද දැයි විචාළ කල්හි ස්වාමීනි, රජ්ජුරුවෝ දැහැමින් රාජ්ජය කෙරෙති. එතකුදු උවත් රාත්‍රියෙහි ශබ්ද සතරක් අසා බමුණන් විචාරා උන් විසින් ඊට සර්වචතුෂ්ක යාගය සුදුසුයයි යනු අසා දහස් ගණන් ප්‍රාණීන් අල්වා බන්ධාගත කළෝය. ස්වාමීනි, නුඹවහන්සේ වැනි සිල්වත් තාපස ස්ථවිරයන් විසින් ඒ ශබ්දයන්ගේ නිෂ්පත්ති කියා ඒ සත්වයෝ මරණින් මුදන්ට නොවටිද්දැයි කීයේය. තාපසයෝ, සගය රජ්ජුරුවෝ අප නොහඳුනති. අපි රජ්ජුරුවන් නොහඳුනම්හ. ඉදින් රජ්ජුරුවෝ අප අතින් විචාළෝ නම් සැක නැති වනසේ ශබ්දයන්ගේ අර්ථ ප්‍රකාශ කොට කියම්හයි කීහ. ඉක්බිති ඒ බමුණු කුමාරතෙම ස්වාමීනි එසේ වීනම් මදක් කල් ඉවත නොගොස් මෙහිම වැඩ උවමැනවයි මම රජ්ජුරුවන් වහන්සේ කැඳවා ගෙණ එම් කියා ගොස් දේවයන් වහන්ස, උයනෙහි මෙවැනි තාපස කෙනෙක් ඇතැයි දන්වා රජ්ජුරුවන් කැඳවා ගෙන ආයේය. රජ්ජුරුවෝත් මඟුල් සල්වට මත්තෙහි ස්වර්ණ ප්‍රතිමාවක් මෙන් තාපසයන් දුක එකත්පස්ව හිඳ තමා ඇසූ ශබ්දයන් පිළිවෙලින් කියා එහි අර්ථනිෂ්පත්තිය කියන්ට යාචඤා කළහ. තාපසයෝ මහරජ, මේ ශබ්ද පැවැත්වූ සතර දෙන පූර්ව ජන්මයෙහි ඔවුන් විසින් වස්ත්‍රාභරණ අන්නපාන මාලාගන්ධවිලේපනාදීන් මමත්වය කොට රක්ෂිත ගෝපිත වූ ස්ත්‍රීන් ඒ ඒ ස්ථානයෙන් ගෙන්ව ගෙන්වා බොහෝ කලක් මුළුල්ලෙහි පරදාර පාපය රැස් කෙරෙමින් අනිකුදු ප්‍රාණඝාතාදිවූ අනේකවිධ පාපයන් සිඬකොට ජීවිතාවසානයෙහි ලොහොකුඹු නරකයෙහි ඉපද කකියා ගිය ලෝදියෙහි පෙනනැගී පැසෙමින් තිස් දහසක් අවුරුද්දකින් මුවවිට පටන් යටතලයට පැමිණ පිටත බලා ගාථා සතරක් සම්පූර්ණ කොට කියනු කැමතිව අකුරු සතරක් කියා ඉතිරිය කියන්නට කල් මදවා යට බලා කරකැවී එහිම ගිලී ගියාහ. ඔවුන් සතර දෙනා අතුරෙන් දුකාරය කියා ගැළුනු සත්වතෙම පූර්ව ජන්මයෙහ් සියලු වස්තුවෙන් සම්පූර්ණව රාජ කුමාරව උපන්නාවූ දාන වස්තු හා දාන ක්ෂෙත්‍ර ඇති යම්කිසි වස්තුවක් බරලොව අදහා නුදුනම්හ. උපභෝග පරිභෝග වස්තු ඇතිවම පර ලොවට පිහිටක් නොකළම්හයි සියලු වස්තු පරදාරකර්මාදී අක්‍රියාවෙහි යොදා දුෂ්ට ජීවිකාවෙන් ජීවත් වුම්හයි කියනු කැමති විය. සකාරය කී සත්ව තෙම මේ ලොහෝකුඹු නරකයෙහි පැසෙන්නාවූ අපට උඩුයටිව පැසී යාම් ඊම් දෙකින් එක්ව දූන් සැට දහසක් අවුරුදු හැමපරිද්දෙන් පිරී ගියේය. කවර කලෙක්හි කෙළවරක් වේදැයි කියනු කැමති විය. නරකය කීසත්ව තෙම නිදුක්නි, මේ නරකයෙහි පැසී තව දක්වා කෙළවර නැත, කෙළවර අසවල් කලෙකැයි දක්නා කැමතිවූ අපට එවැනි කෙළවරෙක් නොපෙණෙයි. ඒ එසේමය. පූර්ව ජන්මයෙහි තොප හා අප විසින් කෙළවරක් නැතිවම පරදාරාදී වූ බොහෝ අකුසල් කරණ ලද්දේමය. එවැනි අපට කෙළවරෙක් කොයින් නම් වේද කියනු කැමති විය. සෝකාරය කී සත්ව තෙම ඉදින් මම මේ නරකයෙන් ගොඩ නැගී මනුෂ්‍ය ආත්මභාවයක් ලදින් නම් උදිතව සිටීම් සංඛ්‍යාත බුදු පසේබුදු සව්වන්ගේ ආඥාව දූන දන්නෙමි සරණ සීලාදී සිල් රක්ෂා කෙරෙමින් බොහෝ කුසල් රැස් කරන්නෙම් වේදැයි කියා කැමති විය යනාදී තිරිසනුන් සතර දෙනාගේ පූර්ව කර්මය හා අක්ෂරයන් සතර දෙනා පටන් ගත් අභිප්‍රාය ප්‍රකාශ කොට කියා මහරජ, නරකයෙහි උපන් සත්වයෝ තමන් විඳිනා මහ දුකින් ශබ්ද පැවැත්වූහයි ඒ ශබ්දයන් කරණ කොට ගෙන තොපට කිසි අන්තරායක් නැත. තොප භය නොගනුවයි රජ්ජුරුවන් ගිවිස්සූහ. ඉක්බිති බරණැස් රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේගේ කථාව නැමැති අමෘතාභිෂේකයෙන් මහත් අස්වැස් ලැබ නුවර බෙරලවා බන්ධගත සත්වයනට අභය දානය දී යාගශාලාදිය පිදහන කරවා ජන සංග්‍රහ කළාහ. බෝධි සත්වයෝ ද ජනයාට හිත සැප එළවා කීප දවසක් උයන්හි වාසය කොට රජහට අවවාද දී පළමු විසූ හිමාලය වනයටම ගොස් වාසය කොට ආයු කෙළවර ධ්‍යානයෙන් නොපිරිහී බඹලොව උපන්නේය. ලෝක ස්වාමී වූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා එකල්හි පුරෝහිතයාගේ අතවැසි බමුණු කුමාරතෙම දූන් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. තාපසව උපන්නෙම් දූන් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාරා මේ ජාතකය පූර්වපරසන්ධි ගලපා නිමවා වදාල සේක්.

SANHIDA LANKA

# මාංශ ජාතකය

තවද සර්වඥ ගෙවාදන් අප බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි ඒ වෙහෙර සමහර කෙණෙකුන් වහන්සේ විරේකයට තෙල් මුසු බෙහෙදක් වැලදූ හෙයින් මස් රජ ආහාර පිණිස ගිලන් උපස්ථාන කරණ සබ්‍රම්සරුන් වහන්සේ සැවැත් නුවරට වැද බත් වෙළෙඳ වීථියෙහි ගෙපිළි වලින් සිඟා ඇවිද කිසිවක් නොලදින් නැවත වෙහෙරට නික්මුනු සේක්. ඉතා දහවල්ව පිඩු පිණිස සිඟා වඩනා සැරියුත් මහ තෙරුන් වහන්සේ විසින් අතුරු මග දක කීමෙක්ද, ඇවැත්නි, ඉතා උදාසනම ආහරින් වැලක එව්දැයි විචාරා එපවත් අසා එසේ වී නම් මා හා එක්ව එවයි එම වීථියටම කැඳවා ගෙන යන ලදුව උන්වහන්සේ දක සතුටුව උපාසකවරුන්ගෙන් පාත්‍රා පුරා බොහෝ මස් රස අහර ලැබ විහාරයට ගෙණ ගොස් ගිලන් භික්ෂූන්ට දුන් සේක. උන් වහන්සේලා ඒ ආහාර වලදා යැපුනු කල්හි එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි වටින් රැස්ව උන්නාවූ භික්ෂූන් වහන්සේ ඇවැත්නි, ශාරිපුත්‍ර ස්ථවිරයෝ නම් දුටුවන් ප්‍රසන්න වන තරම් මහපින් ඇති සේක. විරේකයට බෙහෙත් වැලඳූ භික්ෂූන් උදෙසා මස් රස අහර ලබනුව බත් වෙළඳ වීථියට සිඟා ගොස් කිසිවක් නොලැබ එන්නා වූ භික්ෂූන් කැඳවා ගෙණ ගොස් ඒ වීථියෙන් බොහෝ මස් රස භික්ෂාව ඇරදුන්නාහයි යනාදීන් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ භාග්‍යමහිමය ආදී ගුණ කථාව ඉපද වූ සේක. ගඳ කිළියෙහි වැඩ උන් සර්වඥයන් වහන්සේ ඒ කථාව දිව්කනින් අසා වදාරා ධම් සභා මණ්ඩපයට වැඩ පනවන ලද බුද්ධාසන මස්තකයෙහි වැඩ හිඳ බුද්ධ තේජසින් තැති ගෙන මුවෙන් නොබැනහුන් භික්ෂූන්ගේ දසාව වැඩ හිඳ බුද්ධ තේජසින් තැති ගෙන මුවෙන් නොබැනහුන් භික්ෂූන්ගේ දසාව බල බලා මහණෙනි. මෙතැන්හි තෙපි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වෙන දෙයක් නොවෙයි සැරියුත් මහ තෙරුන් වහන්සේගේ එනම් ගුණ කථාවෙක අප කිය කියා උන්නේයයි දන්වූ කල්හි මහණෙනි, දන් මේ ශාරිපුත්‍ර ස්ථවිරයෝ දැන්මතු මාංශ භෝජයන ලද්දෝ නොවෙති. පළමුත් ප්‍රිය කථාවෙහි දක්ෂ වූ නුවණැත්තෝ මස් අහර ලද්දෝ නොවේදැයි වදාරා තුෂ්ණිම්භූතව වැඩ ඉඳ ඒ කථා ස්වරූප අසනු කැමති භික්ෂූන් විසින් කළාවූ යාඥාව අරභයා ඉකුත්වත් ගෙන හැර දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි අප මහබෝසතානන් වහන්සේ මෙම නුවර සිටු පුත්‍රව ඉපිද එක් වැදි පුත්‍රයෙකු මුව දඩයමට ගොස් බොහෝ මස් ලැබ ගැලක් පුරා ලැබ ගෙන වෙළඳාමට නුවරට යන්ට නික්මුණු වේලෙහි ඒ නුවර අනික් සිටුපුත්‍රයන් තුන් දෙනෙකු හා එක්ව නුවරින් නික්ම මහවලට නුදුරුවූ එක් තෙනෙක්හි දූක්සැප කථා කෙරෙමින් උන්නේය. ඉන් එක් සිටු පුත්‍රයෙක් මස් පිරුනු ගැල ගෙනෙන්නාවූ වැද්දා දක මේ වැද්දා ලවා මස් කඩක් ගෙන්වමි දැයි කියා ඉතිරි තුන් දෙන යහපතැයි කී කල්හි ගැල කරා ගොස් කොල වැද්ද මට මස්කඩක් දෙවයි කීයේය. ඒ ඇසූ වැදි අනුන් අතින් කිසිවත් ඉල්වන්නාවුන් විසින් ප්‍රිය කථා ඇතිවිය යුතුය. නුඹ එසේ නොවී පරුෂ වචනයෙන් ඉල්වූදැය. එවෙනි නුඹට නුඹ විසින් කීවාවූ වචනය මෙන් පරුෂ රහිත වූ දලබුවම සුදුසුය. එම දෙම් කියා පිට මාංශය හා කැපූ රොම සහිත වූ දලබුව දුන්නේය. ඒ දක අන් සිටු පුත්‍ර තෙම යහළු, තෝ කුමක් කියා ඉල්වා ගත්තෙහිදැයි විචාරා කොල, වැද්දැයි කියා ඉල්වම් කී කල්හි මමද මොහුගෙන් මස් ඉල්වීම් කියා ගොස් බැනෙනි මටද එක් මස්සක් දුන මැනවයි කීයේම එබසට වැදි මේ ලෝකයෙහි බැනෙනි මලනුවෙනි යනාදීන් කියන්නාවූ ප්‍රිය වචනය මනුෂ්‍යයන්ට අගවූ දෙයක වචනය කී තොපට අගමානසයම සුදුසුයයි කියා මස්පිඬක් දුන්නේය. ඒ දක අනික් සිටු පුත්‍රතෙම යහළු, තෝ කුමක් කියා ඉල්වා ගනීදැයි විචාරා බැනෙනි කියා ඉල්වම් කී කල්හි මමද වැද්දා අතින් මස් ඉල්වම් කියා ගොස් පියානෙනි මට මස්සක් දෙවයි කීයේය. එබසට වැදි ස්වාමීනි මේ ලෝකයෙහි පියානෙනි කියන පුත්‍ර තෙම පියාගේ ලය කම්පා කෙරෙයි. එහෙයින් තොපකේ වචනය හෘදය මාංශයට සුදුසුයයි කියා ඒ හා එක්ව මිහිරි මස් දුන්නේය. ඒ දක සතරවෙනිව බෝධිසත්වතෙම යහළුව, තෝ කුමක් නිසා මස් ලද්දැයි විචාරී පියානෙනි කියා ලදිමියි කී කල්හි මමත් ඉල්වමියි ගොස් මිත්‍රය මටද මස් කඩක් දෙවයි කියා ඉල්ලූ කල්හි එබසට වැදි තෙම ස්වාමීනි මේ ලෝකයෙහි පියානෙනි මට මස්සක් දෙවයි කීයේය. එබසට වැදිතෙම ස්වාමීනි ලෝකයෙහි යමක්හු වසන ගම්හි මිත්‍රයෙක් නැත්නම් ඒ ගම ජනසූන්‍ය වනයක් වැන්න. නුඹ වහන්සේ කීයේ සියල්ලම ලැබ යුතු වචනයක එහි සතුටුව මම සියල්ලම දෙම් කියා ගැල හා සමඟ ගෙනා මස් සියල්ලම දී ගැල බෝසතානන්ගේ ගේ දොරට ගෙන ගොස් පැමිණ වූයේය. බෝධිසත්වයෝ ද ගැලින් මස් බාවාගෙන ඉක්බිති ඕහට කළමනා සත්කාර උපකාර කොට ඔහුගේ අඹු දරුවනුත් ගෙන්වා ගෙන වැද්දා වැදි කමින් වලකා පින්කමෙහි යොදා තමාගේ සම්පත් අතුරෙහි ඔහුද ජීවත් වන ලෙසට සමීපයෙහි වාසය කරවයි ජීවිතාන්තය දක්වා මිත්‍ර ධර්මය රක්ෂා කොට වාසය කළේය. ලෝකස්වාමී වූ සර්වඥයන් වහන්සේ උපන්නේ දූන් මේ මාගේ ශාසනයෙහි ශාරිපුත්‍ර ස්ථවිරය ගැල හා සමඟ සියළු මාන්සය ලද්දාවූ සිටු පුත්‍රයා නම් දූන් බුදුවූ මම්ම යයි තමන් වහන්සේ ගෙනහැර දක්වා මේ ජාතකය පූර්වපරසන්ධි ගලපා නිමවා වදාළ සේක.

SANHIDA LANKA

## සස ජාතකය

සද්ධර්මයන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සෙක්, සත් දිනක් බුදුපාමොක් මහ සඟනට සපිරිකර මහ දන් දුන් එක් කෙළෙඹිපුත්‍රයෙක් අරභයා මේ ජාතකය වදාළ සේක.

යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හි එක් වනයක වඳුරෙක්, සිවලෙක් මස්කාවෙක් සහ සාවෙක් ද ඉතා මිත්‍රව වාසය කළහ. සාවා ඉතා නුවණැති බැවින් ඔහුව සස පණ්ඩිත යන නමින් හැඳින්විය. මේ සස පණ්ඩිතයෝ දිනපතා ගොදුරු කැමෙන් පසු එන තම මිතුරන් තිදෙනාට අවවාද කරන්නාහ. දිනක් මේ සිව් දෙනා සවස අහසෙහි පිරුන හඳ දැක හෙට පොහොය දවස හෙයින තෙපි සිල් ගනුව. සිල්වත් ව සිට දෙන දනෙහි විපාකය මහත්ය. එබැවින් කවරෙක් හෝ යාචකයෙක් තොප සමීපයට ආ නම් තොපි අනුභව කරන දෙයින යමක් දෙවයි අවවාද කළේ ය. පසු දින උදේ මස්කාවා ගොදුරු සොයා යන්නේ එක් බිලි වැද්දෙක් පසුව ගැනීමට වැලි යට දමා ගිය රේමසුන් සත් දෙනෙකුගෙන් යුත් වැලක් මස් ගඳින් ගොස් එය දැන අයිතිකරු සොයා බලා නොදැක එය ගෙන ගොස් වේලාව ආ කල කමියි සිතා පසෙක තබා තම සීලය සිහිපත් කරමින් උන්නාහ. සිවලා සිල් ඉටා ගොදුරු සොයා යන්නේ එක් පැළක වහලේ එල්ලූ වෙලූ තලගොයෙක් ද එක් දී ගෙඩියක් ද දැක තුන් යළක් අඬගා බලා අයිතිකරුවකු නොදැක එය ගෙන හිඳිනා තැනට අවුත් පසෙක තබා සිල් සිහි කරමින උන්නේය. වඳුරා ද ගොස් මී අඹ කැනක් ගෙනවුත් එල්ලා තබා තම ශීලය ආවර්ජනා කරමින සිටියේ ය. සාවා ද බඩගිනි ආ කල හී තණ කමි යි සිතා සිල් සිහි කරමින් වැදහොත්තේ ය. නැවත සිතන්නේ මගෙන් යමෙක් අද කෑමට යමක් ඉල්ලූ නම් හී තණ දීමට ද නොහැක. උඳු, මුං, තල, මෑ ආදිය ද නැත. එබැවින් මම ඔහුට මගේ ඇඟ මස් දන් දෙමියි සිතුයේ ය.

ඔහ්ගේ සීල තේජසින් සක් දෙව් අසුන හුනුවූයේ ඊට හේතුව පරීක්‍ෂා කර බලා ඔවුන් සිව් දෙනාගේ සිල් ඉලමියි සිතා බමුණෙක් මෙන් මස්කාවා ළඟට ගොස් යමක් ඇයදී ය. ඔහු රේ මස් වැළ දන් දුන් පසු එය එහි ම තබා නැවත එන බව කියා ක්‍රමයෙන් හිවලා සමීපයට ද එතැනින් වඳුරා සමීපයට ද ගොස් පෙර සේම ලැබුණු දේ එහි ම තබා සාවා ළඟට ගොස් අහරක් ඇයදී ය. සස පණ්ඩිතයෝ ඉතා සතුටට පත් ව මාගේ ඉලා පොරොත්තුව මුදුන් පමුණුවා ගැනීමට ඔබගේ පැමිණීම ඉතා ම උතුම්ය. මම මීට පෙර නුදුන් විරූ දනක් අද තොපට දෙමි. බමුණ තොප ද සිල්වත් බැවින් සතුන් නොමරන්නෙහි ය. තොපි දර රැස් කොට ගිණි දල්වා අඟුරු බස්වා මට දන්වව. මම මගේ ජීවිතය තට පමුණුවාලා අඟුරට පැන පියමි. මාගේ ශරීරය හොඳින් පිළිස්සුනු කල්හි ඒ මස් අනුභව කොට හොඳින් සිල් රක්වයි දැන්වී ය. සක්‍රයා එබස් අසා තම ආනුභාවයෙන් අඟුරු රැසක් මවාලා සාවාට දැන්වී ය. සාවා සැතපී සිටිය තැනින් නැගිට තම ලොම් වැළවූ කිනිතුලන් ආදී කුඩා සතුන් තුන්විටක් ඇඟ කිලිපොළා අහකට යවා සියළු ශරීරය දාන මුඛයෙහි පැමිණේ එය අධිෂ්ඨාන කොට පියුම් ගැබකට පනින රාජ හංසයකු මෙන් සතුටු සිතින් අඟුරු මුදුනට පැන්නේ ය. ඒ ගින්නෙන් සස පණ්ඩිතයන්ගේ ලෝම කූපයකට පවා උණුසුමක් නොදැනුනේ ය. තම ශරීරය සිහිල් වූයේ ය. සස පණ්ඩිතයෝ එවිට ශක්‍රයා අමතා බ්‍රාහ්මණය මේ ගිනි ඉතා සිසිල් ය. ඒ කිමෙක් දැයි විචාලේ ය. එවිට සක්‍රයා සස පණ්ඩිතයෙනි මා බ්‍රාහ්මණයෙක් නොවෙමි. සක්‍රයා වෙමි. තොප ව පරීක්‍ෂා කිරීම සඳහා ආවෙමි යි කීහ. සක්‍රයෝ තොප තබා මෙලොව එක් වී ආවත් මා දන් දීමෙන් පරදවා ලිය නොහැක්ක. මා යමක් නොදෙතියි කවරෙක් කියත් දැයි විචාලේ ය. එවිට සක්‍රයා මා හු තිරිසනුන්ට පවා කළා වූ අරුමය මේ භද්‍ර කල්පය මුළුල්ලෙහි සියලු දෙනාට ප්‍රකාශව පෙනුනු සඳහා තම ආනුභාවයෙන් අංජන කූට පර්වතය මිරිකා රසය ගෙන චන්ද්‍ර මණ්ඩලයෙහි සස රූපය ඇඳ සස පණ්ඩිතයන් වඩා ගෙනවුත් ඒ වනයේ අලුත් හීතණ ඇතිරියක් පිට තබා ගියහ.

එසමයෙහි මස්කාවා නම් ආනන්ද ස්ථවිරයෝ ය. සිවලා නම් මුගලන් තෙරුන් ය. වඳුරා නම් සැරියුත් තෙරුන් ය. සස පණ්ඩිතයෝ නම් බුදුරජාණන් වහන්සේ ය.

SANHIDA LANKA

# ඒකරාජ ජාතකය

තවද හුදුනිවන් මවාලූ රුවක් වැනි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොසොල් රජ්පුරුවන්ගේ අමාත්‍යයෙකු ඇළුයා මේ ජාතකය දක්වන ලදී. මෙහි වර්තමාන කථාව සෙයාංස ජාතකය විස්තර වශයෙන් කියන ලදී.

මෙහි යටගිය දවස බරණැස් නුවර එක් රජ්පුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි එක් අමාත්‍යයකු ඒ රජ්පුරුවන් වහන්සේගේ අන්තඃපුරයට වැරදි කළ කථාව මහා සීලව ජාතකයෙහි ආයේය. මෙහි කොසොල් රජ්පුරුවෝද දබ්බලමල්ල නම් රජ්පුරු කෙනෙකුන්ගේ අනතඃපුරයට වැදී අමාත්‍යයාගේ කියමනින් බරණැස් නුවරට අවුත් ඒකරාජ රජ්පුරුවන් වහන්සේ අල්වා ඉස්බිම බලා කකුල් උඩිලිය එල්වා දබ්බමල්ල රජ්පුරුවෝ මතු මහල් තලයට පැන නැගී පලක් බැඳහුන්නාහ. මතුමහල් තලයෙහි උන් දබ්බමල්ල රජ්පුරුවන්ගේ සකල ශරීරයෙහි දාහ අල්වා ගෙන ඉවසිය නොහී බිම පෙරලී බොහෝ ආයාසයෙන් අමාත්‍ය ගණයා කැඳවා විචාරන්නාහු එඹල අමාත්‍යානෙනි මාගේ ශරීරය දාහ අල්වා ගෙණ බොහෝ වේදනාවෙන් පීඩිත වීම්, කුමන කාරණයක් පිණිස දැයි විචාළහ. රජ්පුරුවන්ට අමාත්‍යයෝ කියන්නාහු නිරපරාධ දැහැමෙන් රාජ්ජය අනුභව කරන්නා වූ එක රාජ රජ්පුරුවන්ට කළ ගහටයෙනැයි නුඹ වහන්සේට දාහ පැමිණියෙයි කීකල්හි එබස් ඇසූ රජ්පුරුවෝ ඔහු උනවයි කී බසින් ගිය අමාත්‍යයෝ එක රාජ රජ්පුරුවන් ධ්‍යාන සැපයෙන් ආකාශයෙහි අවුත් රජ්පුරුවන් වහන්සේ වැඳ එකත්පස්ව සිට කියන්නාහු එකරාජ රජ්පුරුවන් වහන්ස නුඹ වහන්සේ එක්විචැස්ස සැප අනුභව කොට සුබු මාලාව රාජ්ජය කළ නුඹ වහන්සේ මේ සා ආයාසයකට පැමිණත් නුඹ වහන්සේගේ ධෛය්‍ය්‍යමත් පියුමක් බඳුවූ මුබ සෝභාවත් ශරීර වර්ණයත් මදකුත් නොමිරිකීම සමාධි සිතකින් ඉඳිනේ කුමන කාරණයකින්දැයි විචාළා සේක. එවිට එකරාජ රජ්පුරුවන් වහන්සේ දබ්බමල්ල රජ්පුරුවන් වහන්සේට කියන සේක්. මා විසින් පළමුව භාවනා මනස්කාර කිරීමෙන් ද පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් පලක් බැඳ ඉඳීමනම් මාගේ මුබ සොගාවද ශරීර වර්ණයද කුමක් පිණිස මිරිකේ දැයි කීහ. එපවත් දබ්බමල්ල රජ්පුරුවෝ අසා එක රාජ රජ්පුරුවන් වැඳ ක්ෂමා කරවා ගෙන කියන්නාහු මහ රජ්පුරුවන් වහන්ස නුඹ වහන්සේගේ රාජ්ජය පාවාගත මැනවැයි රාජ්ජය පාවාදී ද්‍රෝහිකම් කළ අමාත්‍යයාට ආඥා කරවා නුඹට සතුරන්ගෙන් භයක් පැමිණියේ නම් මට භාරයයි කියා රාජ්ජයට පලා ගියහ. එක රාජ රජ්පුරුවන් වහන්සේත් රාජ්ජය අමාත්‍ය ගනනයාට පාවාදී තපස් රක්ෂා කරන පිණිස වනයට ගොස් රක්ෂා කළ සේක් වේ දැයි මේ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි දබ්බමල්ල රජ්පුරුවෝ නම් මෙසමයෙහි ආනන්ද ස්ථවිරයෝය, එකරාජ රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ඬිතිය දද්දර ජාතකය

තවද හුදුනිවන් මවාලූ රුවක් වැනි වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා කෝ්පී වූ භික්ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

වර්තමාන කථාව යට කියන ලද බොහෝ ජාතක වල දක්වන ලද මෙහි වනාහි ඒ කෝ්පී භික්ෂූන් වහන්සේ කැඳවා ගෙන ධම් සභා මණ්ඩපයෙහි වැඩ උන් සර්වඥයන් වහන්සේට දක්වූ කල්හි සර්වඥයන් වහන්සේ වදාරණසේක්. එම්බා මහණෙනි මේ භික්ෂූහු නොකීකරු වූයේ දැන් මතු නොවෙයි පෙරත් දිව්‍ය නාගම ඉපිද තමා නොකීකරු හෙයින් දඬුවම් පිණිස කසල ගොඩක් මත්තෙහි තුන් අවුරුද්දක් වාසය කළාවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරන සමයෙහි දද්දර නම් නාග භවනයෙහි සුරදද්දර නම් නා රජෙකුට පුත්‍රව මහාද්දරයෝයයි චුල්දද්දරයෝයි නා රජහු දෙදෙනෙක් උපන්නාහ. ඉන් චුලදද්දර නම් නා රජ්ජුරුවෝ නා මෙනෙවියන් මරා තලා බොහෝ වේදනා කෙරෙති. පිය නා රජ්ජුරුවෝ ඒ අසා චූලදද්දදරයන් මාගේ නාග භවනයේ වසන්ට බැරියයි වහා නික්මුනු මැනවැයි කියා එබස් අසා දද්දර නා රජ්ජුරුවෝ කියන්නාහු. පියානන් වහන්ස මාගේ මලනුවන් කළ වැරදි ඉවසා වදාල මැනවැයි කියා රුඳවූහ. දෙවන වාරයෙහිත් නාග භවනයෙන් යන්ට කී කල්හි මහාදද්දරයන්ගේ යාඥාවට රුඳවූහ. තුන්වන වාරයෙත් චූලදද්දර නා රජ්ජුරුවන්ට නාග භවනයෙන් යන්ට කී කල්හි මහාදද්දර නාරජ්ජුරුවෝ පියානන්ට කියන්නාහු පියානන් වහන්ස මාගේ මලනුවන් චූලදද්දරයන් මේ මුරයත් රඳවා වදාළ මැනවැයි කන්නලව් කී කල්හි සූරදද්දර නා රජ්ජුරුවෝ කියන්නාහු. දෙවරයෙක තොප කී කන්නලව්වට රුඳවූම්හ. තුන් වෙනි වාරයේත් රඳවන්ට බැරිය තොප කළ වැරැද්දට පාටට පිණිස තුන් අවුරුද්දක් කසල කොඩක විසුවමැනවැයි කියා යවූහ. ඔහු දෙදෙන එපරිද්දෙන්ම ගොස් මහත් වූ කසලක් මුදුනේ වසන්නාහ. ඒ නා රජ දෙන්නා ගොදුරු පිණිස නොයෙක් තැන ඇවිදිනවා කුඩා කොල්ලෝ දැක කියන්නාහු මහත් වූ හිසක් සිහින් වූ වාලගයක් ඇති ගැරඬියන් දියබරණුමෙන් හිස ඇත්තා වූ මේ සර්පයන් දෙන්නා මරම්හයි කැට මුගුරු ඇරගෙන ගසමින් ඇවිදිනාහ. මෙපවත් ඉවසා ගත නොහී චූලදද්දර නා රජ්ජුරුවෝ බෑනන්ට කියන්නාහු බෑනන් වහන්ස අපි දෙන්නම මහත්වූ විෂ තේජස් ඇති නාරජ්ජුරුවම්හ. අපගේ විවර නොදන මේ කොල්ලෝ කැට මුගුරුත් ගසා අපහස නපුරුත් බැන නිස්සාරව ඇවිදිනාහු. මෝට මම මහත් වූ විෂ ධූම ඇරමෝදැයි බෑනන් අතින් විචාළ කල්හි මහාදද්දර නා රජ්ජුරුවෝ එම්බා මලනුවෙනි අපගේ පිය රජ්ජුරුවන් වහන්සේ අතින් තොප අසා ගෙන දුක විඳින පිණිස මෙතනට ආම්හ. අපගේ විවරක් කවුරුන් බවත් මේ කොල්ලෝ නොදන්නාහ. එසේ හෙයින් මොවු කෙරේ කෝ්පි නොවයි අවවදා කියා ඒ කසල ගොඩ තුන් අවුරුද්දක් විසූ කල්හි පියනාරජ්ජුරුවෝ තමන් පුත්වූ දරුවන් දෙදෙනා තමන්ගේ නාග වනයට ගෙන්වා ගෙන චූලදද්දරයන්ගේ අතමානය බිඳ දෙබෑයෝම ස්ව ස්ථයෙන් වාසය කළාහයි මේ දද්දර ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි චූලදද්දරයෝ නම් ඒ කෝ්පී භික්ෂුහුමය, මහාදද්දරයෝ නම් බුදුවූ මම්මවේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මතරෝදන ජාතකය

තවද අසරණ සරණ වූ අප බුදුහු දෙව්රම් වෙහෙර වැඩවසන සේක්. එක්තරා කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය වදාළ සේක.

සැවැත් නුවර වැසි එක් කෙළෙඹි පුත්‍රයෙක් තමාගේ බෑයා මළ කල්හි ශෝකයෙන් ආහාර වර්ජිත කොට ස්නාන විභූසන මාලා ගන්ධ විලේපනාදිය නොකෙරෙයි රූක්ෂ වූ ශරීර ඇතිව සවස උදෑසන බෑයා දවුතැන සොහොනට ගොස් අඬයි. එක් දවසක් බුදුහු අළුයම් වේලෙහි මහා කරුණා සමාපත්තියට සම වැද එයින් නැගී මාර්ග ඵල ලැබීමට හේතු සම්පත් ඇති වෛනයජනයෝ කවුරුදැයි ලොව බලා වදාරණසේක්. කෙළෙඹි පුත්‍රයාගේ සෝවාන් ඵලයට සුදුසු බලවත් හේතු සම්පත ඇති බව දැක දෙවෙනි දවස් පස්වරු වේලෙහි එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ පසු මහණ කොට ගෙන ඔහු කෙරෙහි පැවති අනුග්‍රහයෙන් ගේ දොරට වැඩි සේක. ඉක්බිති ඒ කෙළෙඹි පුත්‍රතෙම බුදුහු වැඩිසේකැයි යනු අසා පෙරමගට අවුත් මහත් ආදරයෙන් බුදුන් තමාගේ ගෙඩ වඩාගෙන ගොස් මාහැගි වූ බුද්ධාසනයක් පනවා එහි වැඩ උන් කල්හි වැඳ එකත් පස්ව උන්නේය. එවිට බුදුහු කීමෙක්ද කෙළෙඹිය ශෝකයෙන් ඇද්දැයි විචාරා වදාළ සේක. එකල්හි කෙළෙඹි පුත්‍ර තෙම එසේය ස්වාමීනි මාගේ බෑයන් වහන්සේ මළ තැන් පටන් බොහෝ ශෝක ඇත්තෙමි දැන්වූයේ බුදුහු සියලු සංස්කාරයෝම අනිත්‍ය නෙවෙද්ද ඒකාන්තයෙන් මේ ශරීරය නම් ජරාවෙන් මිරිකී ව්‍යාධියෙන් පීඩිතව මරණින් භේදයට පැමිණෙති. එබඳු ස්වාභාව ඇත්තේය. මේ ලෝකයෙහි උපන්නාවූ සත්වයන් සංස්කාරයෙන් අතුරෙහි නිත්‍යව නොනැසී පවත්නා එකකුදු නැත්තේය. එහි නුවනැත්තවුන් විසින් කවර ශෝක කිරීමක්ද පෙර නුවනැති පණ්ඩිත ජනයෝ තමන්ගේ බෑයෙක් මළ කල්හි බිඳෙන සුළු දෙයය බිඳුනේය. නස්නා සුලු දෙය නැසුනේයයි සංස්කාරයන්ගේ අනිත්‍ය ස්වාභාවය සලකා ශෝක නොකළෝ වේදැයි වදාරා තුෂ්නිම්භූතව වැඩ හිඳ ඒ කථාව අසනු කැමැති කෙළෙඹි පුත්‍රයා විසින් ආරාධිත වූ සේක්. අතීත කථා වස්තු ගෙණ හැර දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි අප මහා බෝධිසත්ව තෙම එම නුවර අසූ කෙළක් ධන ඇති සිටු කුලයක ඉපිද දෙමවුපියන්ගේ ඇවෑමෙන් සිටු තනතුරට පැමිණ බෑයන් නිසා ජීවත් වන්නේය. මෑත භාගයෙහි බෝධි සත්වයන්ගේ බෑවූ ඒ සිටානෝ කාල ක්‍රියා කළහ. ඥාති මිත්‍රාදීහු බොහෝ දෙන මහ හඬින් බැගෑපත්ව විලාප තියති. එතැන්හි රැස්වූ එකද සත්ව කෙනෙකුදු සොම්නසට නොපැමිණ ස්වාභාවෙන් සිටිනව සමස්ථයෙක් නොවීය. බෝසතානෝ පමණක් නොහඬති. විලාප නොකියති. මුඛ විකාර පනෙකුදු නොදක්වූහ. ඒ දැක සෙසු ජනයෝ මේ පුරුෂයාගේ කාර්යය දැන්මක් බලව, මේතෙම ඉතා තද රෞද්‍ර එකෙක තමාගේ බෑයාගේ ධන කොටස් දෙකම එක් කොට අනුභව කරමියි යන සිතින් බෑයාගේ මරණ කැමති වූයේවනුයි යනාදී බෝසතානන්ට නින්දා කරන්ට පටන් ගත්හ. අතවැස්ස බන්ධහුද එසේම නින්දා කළහ. අවවාද කළහ. එකල්හි බෝධිසත්ව තෙම එම්බා තොපි හැම දෙනම තොපගේ අඥාන ස්වාභාවෙන් ලාභය, අලාභය, අයසය, යසය, සැපය, දුකය යන අෂ්ටලෝකධර්මය සියළු සත්වයන්ට නියත බව නොදනිති. මාගේ බෑයා මළේය. ඔහු මළාය යනාදී අඬා විලාප කියව, මම ඒකාන්තයෙන් මියන්තෙමය තෙපි සියල්ලෝමද එසේම මියන්නාහ. ඉදින් අඬතොත් තමා හට පැමිණෙන්නාවූ මරණ සලකා අඬන බව මිස අනුන්ගේ මරණ උදෙසා ඇඬුමට කාරණයෙක් නැත. හේතුවෙන් උපදනා සියලු සංස්කාරයෝම නැතිවෙති. පළමු ස්වරූපයෙන් පවත්නේ නොවෙති. තෙපි හැම දෙනම මේ බව හා යථෝක්ත අෂ්ටවිධ ලෝක ධර්මය ස්වාභාවය නොදන අඬන තුදු ඒ සියල්ල දත්තා වූ මම කුමට අඬම්දැයි කියා නැවත ඒ ජනයන් හට ඇවැත්නි තෙපි සියල්ලෝ මළ එකෙක් හට හැඬීම් වැලපීම් කෙරෙති, මියන්නාක් බලා නෙකෙරෙති. මේ ලෝකයෙහි සියලු සත්වයෝම ඔවුනොවුන් පසු පස්සෙහි පිළිවෙලින් මරණට පැමිණෙති. නොමියෙන එක සත්වයෙකුදු නැත. තවද මේ ලෝකයෙහි අධිකතර දිව්‍ය සම්පත්තියෙහි පිහිටි ශක්‍ර බ්‍රහ්මාදී දෙවියෝද එසේම මනුෂ්‍ය ලෝකයෙහි අධික වූ ආධිපත්‍යයට පැමිණි චක්‍රවර්තී ප්‍රදේශයක මඬලිකා දී වූ රජ දරුවන් ආදී කොට ඇති සියලු මනුෂ්‍යයෝද බලසම්පන්න සීහ ව්‍යාඝ්‍ර හස්ති අශ්වාදී අනේකවිධ චතුෂ්පද ජාතීහුද මහානුභාව සම්පන්න ගරුඬ රාජයන් ආදී වූ අනේකවිධ පක්ෂීහුද උග්‍රවූ විෂ තේජස් හා මහත් දිව්‍යානුභාව ඇති වාසුකී මහාකාලාදී සර්ප රාජයෝද යනාදී වූ අපාද දීපාද චතුෂ්පාදාදී වූ සියලු සත්වයෝම තමතමන් ශරීරයෙහිම ඉසුරුනු වූවාහු දිව්‍ය මනුෂ්‍යලෝකාදී තම තමන් උපන් ස්ථානයෙහි ද ශරීර ධන ජීවිතයෙහි ද සිත් අලවාම පරිත්‍යාග කරණ බව මුත් එහි අලාය හැර මියන්නෝ නොවෙති. මේ යථෝක්ත ප්‍රකාරයෙන් කාම භවය රූප භවය අරූපභවය යන තුන් ලෝවැසි සත්වයන්ට පැමිණියාවූ සුවදුක් දෙකම නිරන්තරයෙන්ම ඒකාකාරව නොපැවත සැපයට අනතුරුව දුකය දුකට අනතුරුව සැපයයි යන මේ දෙක ක්‍රමයෙන් පෙරලී චක්‍රාකෘතිව පවත්නා හෙයින්ම චංචල වන්නේයයි දැක අෂ්ටලෝක ධර්මය දක්නා වූ

SANHIDA LANKA

නුවනැත්තවුන්ට හැඬීම් වැලපීම් නිෂ්ප්‍රයෝජනව වැටහෙන්නේය. තෙපි මේ මහත්වූ සෝක නැමති පර්වතයෙන් මිරිකී කවර කාරණයකින් දුක් අනුභව කරව්ද. තවද යම් කෙනෙක් ස්ත්‍රී ධූර්ත සුරාධූර්ත වෙද්ද දූ කෙළි ආදියෙහි ලෝල වෙද්ද අනිත්‍යාදී වශයෙන් පැවතීමයයි කියන ලද යොනිසො මනස්කාරයෙහි යෙදීමක් නැත්තාහුද කෙලෙස් නැමති සතුරන් ජය ගැම්මෙහි සෞරවීර්‍ය්‍යයක් නැතිවෙද්ද ධර්මාධර්ම විභාග කල්පනාව කුදු නැතිව ආස්වාස මාත්‍රයෙකින් ජීවත්වෙද්ද යන මේ ධර්මයෙහි අදක්ෂ වූ ආඥාන බාල ජනයෝ තමන්ගේ අඥාන මූඪවූ බබව හේතු කොට ගෙන ඥාතිව්‍යසනාදිය පැමිණි කල්හි අඬමින් අනේකප්‍රකාර විලාප කියමින් ධර්මය දාන ඥාති මිත්‍රාදීන්ගේ මරණයෙහි ඇඬීම් වැලපීම් නොකරන්නාවූ නුවනැත්තවුන්ට කිසිවක් නොදන්නා අඥානයෝයයි අපහාස කෙරෙතියි යනාදීන් කුසල් අකුසල් හා අෂ්ටලෝක ධර්මය විභාග කරණයෙන් ධර්ම දේශනා කොට සෝක දුරු කෙළේය. බුදුහු මේ අතීත වස්තුව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට කෙළෙඹි පුත්‍රයා සෝවාන් ඵලයට පමුණුවා එකල්හි අඬන්නා වූ මහජනයා ධර්ම කථාවෙන් නිස්සෝක කළාවූ සිටු පුත්‍රයා නම් මම්ම වේදැයි තමන් වහන්සේ ගෙන හැර දක්වා මේ ජාතකය පූර්වපරසන්ධි ගලපා නිමවා වදාළ සේක.

SANHIDA LANKA

## නඬරී ජාතකය

තවද මේ ජාතකයෙහි වර්ථමාන කථාව හා අතීත කථාව මතුකියනු ලබන කුනාල ජාතකයෙහි ප්‍රකාශ වන්නේය.

SANHIDA LANKA

# බාවේරු ජාතකය

තවද භූරිප්‍රාඥ යන නම්වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි තිර්ථකයන්ගේ ලාභසත්කාරයන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සර්වඥයන් වහන්සේ ලෝකයෙහි පහළවන්නාට පළමු අබුදෙධාපතාදයෙහි තීර්ථකයන්ට ලාභසත්කාර මහත සර්වඥයන් වහන්සේ පහළවූ කළ ලාභ සත්කාර මදවිය. මේ කථාව සංඝයා වහන්සේ පහළ වූ කළ ලාභ සත්කාර මදවිය. මේ කථාව සංඝයාවහන්සේ එතනට වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි විචාරා වදාරා එපවත් සර්වඥයන් වහන්සේට දැක්වූ කල්හි මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් තීවයෝ අබුදෝත්පාද කාලයෙහි ලාභසත්කාරයන් මහත්වූයයි වදාර ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි ව්‍යාපාරයෝ මොත්තමෙක් බාවේරු නම් ගමට කවුඩෙකු වඩාගෙණ වෙළඳාමට කියාහ. ඒ නුවර ඇත්තෝ කවුඩා කෙරේ සමාධියෙන් අපට දෙවයි කීහ. ව්‍යාපාරයෝ අප කවුඩා දෙන්නේ නැතැයි කියාදීත් උන් සහයෙන් කියා මසුරන් දහසක් දී කවුඩා ඇරගත්තාහ. ඒ කියන කවුඩාට එම ගම ඇත්තෝ බොහෝ සත්කාර සම්මාන කළාහ. පසුව මුරයේ ඒ ගමට වෙළඳාමට යන්නා යහපත්ව නටන මොණරෙකු ගෙන්වාගෙන ආහ. ඒ මොණරා දැක ඒ ගම ඇත්තෝ මහා සමාධිව අපට දෙවයි කීහ. ව්‍යාපාරයෝ අපගේ පළමු මුරයේ ගෙණා කවුඩාත් ඇරගත්තුය. දැන් ගෙනා මොණරාත් ඉල්එව අප ගෙණ ගෙණා දෙයම ඇරගන්ට උත්සාහා කරව අප දෙන්නේ නැතැයි කියාදීත් තොපට පක්ෂි සම්භවෙති අපට සම්භ නොවෙතියි කියා මොණරා අප දෙන්නේ නැතැයි කියාදිත් මහ උත්සාහයෙන් මසුරන්ද දහසක්දී මොණරා ඇරගත්තාහ. ඒ කිය මොණරාට ඒ ගම ඇත්තෝ බොහෝ සත්කාර සම්මාන කළාහ. මොණරා ඇරගත්තැන් පටන් කවුඩාට කැවිලි පෙවිලි ආදියත් අඩුව ආදරත් මදව ගිය හෙයින් තමා උන් මැදිරියෙන් පිටත්ව කුසල ගොඩ ඉඳ නොයෙක් කුණු කසල ඇසිඳ කන්නේය. මොණරාට බොහෝ කැවිලි පෙවිලිත් ඇතිව රන් මැදිරියක් ඉදිකරවා ඊලාසැපසේ වාසය කරන්නේ යයි වදරා බුදුව වැඩහිඳ වදාරණසේක් උත්තමයන් නැතිහෙයින් දශකාරණයකින් අඩුව කවුඩා සැප විඳින්නේය. පසුව උත්තමවූ ජාති ඇති මධුරවූ නාදඇති මනාවූ ගාත්‍රා ඇති උත්තමයා ආතැන් පටන් නිස්සෝභාගිවිය. එසේ හෙයින් සද්ධර්ම චක්‍රවර්ති වූ සර්වඥයන් වහන්සේ නැති අවස්ථාවේහිදී තිර්ථකයෝ ලාභසත්කාරයෙන් මහත් වුය යම් මනාවූ ශබ්ද ඇති සර්වඥයන් වහන්සේ පහළවූ තැන්පටන් තීර්තකයෝ ඉරුදුටු කදෝපැනියන් හෙයින් නිස්සෝභ වූ හයි වදාරා මේ බාවේරු ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කවුඩා නම් නිගන්ඨනාථ පුත්‍රය. එසමයෙහි මොණරා නම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# වානර ජාතකය

තවද නරසිංහවූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

දේවදත්ත ස්ථවිරයන් වහන්ගේ වෛරයට උත්සාය කරණ නියාව දම් සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන් මතු නොවෙයි පෙරත් වෛරයට උත්සහ කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් වහන්සේ රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එක්ගසෙක වානරව උපන්සේක. උන් වහන්සේ වාසය කරන්නාවූ වනය ලඟ ගංගාවෙක් ඇත. ඒ ගඟ වසන්නාවූ කිඹුලෙක් ඇත. ඒ කිඹුලාගේ කිඹුල්දෙනට ඒ වානරයාගේ හෘදමාංශය අනුභව කරන්ට දොළොක් උපන. ඒ කිඹුල්දෙන් මේ වඳුරාගේ හෘදයමාංසය ලදහොත් විනා ජීවත්වන්නේ නැතැයි කිඹුලාට කීව. කිඹුලා ගොසින් බෝධි සත්වයන්ට කියන්නේ එම්බා සබඳ වඳුරානෙනි මේ එකතෙනම තොප වාසය කරන්නේ ඇයිදැයි මේ ගඟින් එතර යහපත් අමෘත ඵලාඵල ඇති උයනෙක් ඇත, ඊ ගොසින් අනුභව කළ කල නපුරුදැයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහූ ගඟින් එතර අප යා හැකි උව කෙසේ යමෝදැයි කීහ. එවිට කිඹුලා කියන්නේ මම පිට ඉඳුවාගෙණ ගොස් එතර ලමි. මා පිටට නැගෙවයි කීහ. එවිට බෝධිසත්වයෝ යහපතැයි කියා කිඹුලා පිටට පැනපුවාහ. කිඹුලාත් බෝධිසත්වයෝත් ඇරගෙණ ගඟ මධ්‍යයට ගොසින් ගඟ ගිලෙන්නට වන, එවිට බෝධිසත්වයෝ කියන්නාහූ ඇයි සබඳ තොප මා කැඳවා ගෙණ පිට ඉඳුවා ගෙණ ආයේ ගඟින් එතරලන්ට වේද, දැන් තෝ මා බා දියයට ගිලෙන්නේ ඇයිදැයි විචාළ කල්හි කිඹුලා කියන්නේ තොපට සෙනෙහයෙන් ගඟින් එතර ඵලාඵල කන්ට ගෙණාම්ද, මාගේ කිඹුල් දෙනට තොපගේ හෘදය මාංසයට දොලාක් හෙයින් තොප මරා උන්ට හෘදයමාංසය දෙන්ට ගෙනාමි කී කල්හි බෝධිසත්වයෝ කීයන්නාහු එසේ කළ මේ සැටියටම ගොඩදී කිව, මාගේ හෘදයමාංසය තෙල දිඹුල්ගස රතුරතුව පෙනෙන්නේය. මීට ආයාසය ගන්නේ ඇයිදැයි කීහ, මීට ආයාස ගන්නේ ඇයිදැයි කිය, එවිට කිඹුලාම එසේ කළ කළමනා කින්දැයි කීය. බෝධිසත්වයෝ කියන්නාහූ මා ගෙණගොස් දිඹුල්ගසට නන්වාලන්නා හෘදය මාංසය දිලමි. කිඹුලාත් සැබැවැයි සිතා බෝධිසත්වයන් ගෙණගොස් දිඹුල්ගස සමීපයට ගිය. බෝධිසත්වයෝත් කිඹුලා පිටින් දිඹුල් ගසට පැන තොපි මා රැවටුව. මම තොප රවටාපීමී වඳුරන්ගේ හෘදය මාංසයත් දිඹුල් ගස උඩ තිබේද, තා රවටාලා මාගේ ප්‍රාණය ගළමා ගතිමි. තොපගේ උයනේ ඇති අමෘත ඵලාඵලයෙනුත් මට කම් නැතැයි වදරා මේ වාන ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කිඹුලා නම් දේවදත්ත ස්ථවිරය. වානරව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළසේකී.

SANHIDA LANKA

# කනවෙර ජාතකය

තවද ලෝක ස්වාමී වු තිලෝගුරු බුදුරජානන් වහන්සේ සැවැත් නුවර ගම් කොට ජේතවනාරාමයෙහි වැඩ වසන සේක්. පුරාණ දූතියක් විසින් පොලඹන ලදුව සස්නෙහි උකටලී එක් භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක. මෙහි වර්තමාන කථාව අටය්ක නිපාතයෙහි ඉන්ද්‍රිය ජාතකයෙහි කී පරිද්දෙන්ම දත යුත්තේය. බුදුහු ඒ භික්ෂු හට එම්බල මහණ තෝ පළමුත් මේ ස්ත්‍රිය නිසා කඩුවෙන් ඉස් කැපීමට පැමිණියේ වේදැයි වදාරා එපවත් අසා නුවනැති භික්ෂූන් වහන්සේ විසින් යාඥා කොට දැන්වූ කල්හි ඉකුත්වත් කථාව ගෙණ හැර දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි අප මහ බෝසතනානන් වහන්සේ කසී රට එක්තරා ගමෙක්හි එක් සිටාන කෙනෙකුන්ගේ ගෙයි පිළිසිඳ සොර නැකතකින් බිහිව වැඩි විය පැමිණ ගෞරවීයයී හා ඇත් පොව්වකුට බඳු වූ බල ඇති ලෝක ප්‍රසිද්ධ සොරකම් කොට ජීවත් වනසේක. කිසි කෙනෙකුන් අල්වා ගත නොහෙති. එක් දවසක් සිටාන කෙනෙකුන්ගේ ගෙට උමං බිඳ වැද බොහෝ වස්තු අරගත් කල්හි දෙවෙනි දවස නුවර වැස්සෝ රජ්ජුරුවන් කර එලඹ කියන්නා වූ දේවයන් වහන්ස එක් මහ සොරෙක් නුවර බොහෝ සොරකම් කොට ඇවිදිනේය. ඔහු ඇල්ලුව මැනවැයි කීහ. රජ්ජුරුවෝද ඔහු අල්වන්ට නුවර රැකවලෙහි නියුක්ත පුරුෂයාට නියෝග කළහ. ඒ පුරුෂතෙම රාත්‍රියෙහි රැකවලුන් ඒ ඒ තැන්හී මුළු මුළුව කොට සිටුවා බඩු හා එක්ව සොරු අල්වා ගෙන රජ්ජුරුවන්ට දැන්වූයේය. එකල්හි රජ්ජුරුවෝ සොරුන්ගේ ඉස සිඳින්ට ඒ පුරුෂයාට නියෝග කෙළේය. ඒ පුරපෙල පුරුෂ තෙම සොරු පිටි තොල හයා බැඳ රත් කණේරු මල්දම් කරලා උළුසුණු ඉසට ගසා වීථිසන්ධියක් පාසා සැමිටියෙන් පහර දෙමින් කර්කශ වූ අඬ ඇතිව වද බෙරගස්වමින් සොරුන් මරණ තැනට ගෙනයන්ට වන්නේය. මේ නුවර වොලෝගෙන ඇවිදින සොරතෙම අල්වන ලද්දේයයි මුළු නුවර එක කෝලාහල විය. එසමයෙහි ඒ නුවර දවස දහසක් ලබන්නා වූ පන්සියයක් වෛශ්‍යා පිරිවර ඇති සාමානම් වූ රාජ වල්ලභ වූ වෛශ්‍යාවක් ඇත. ඕ තොමෝ එදවස්ද තමා වාසය කරණ ප්‍රාසාදයාගේ මතුමාලේ සිව් මැදුරු කවුළුව හැර වීථිට බලන්නී උතුම් වූ රූප සොභාවෙන් අග්‍රප්‍රාප්ත වූ දුටුවන් ප්‍රසාදවහ වූ සියල්ලන්ගේ මත්තෙන් පෙනෙන්නාවූ සොරහු දක පිළිබඳ සිත් ඇතිව මේ උතුම් වූ රූප ශ්‍රී ඇති පුරුෂයා කවර උපායකින් තමාට වල්ලභ කරා ගනිම්දෝහෝයි සුදුසු උපායක් සොයන්නී තමහට වැඩ හැසිරෙන්නාවූ එක් ස්ත්‍රියක් අතර දහසක් දී මේ සොරතෙම සාමාවගේ මලනුවෝය, සමවන්හැර සොරුට පිටි වහලෙක් නැත. නුඹ වහන්සේ මේ දහස ගෙන මේ පුරුෂයා සාමාවන්ට දුන මැනවැයි කියා යන ලෙස් උගන්වා ගමන් කරවූවාය. ඒ ස්ත්‍රී දහස ගෙන ගොස් ඒ පුරුෂයාහට දි එපරිද්දෙන් කීවාය, එකල්හි ඒ පුරපාලක පුරුෂ තෙම කියන්නේ මේ සොරතෙම ප්‍රසිද්ධ වූ එකෙක, එසේ හළ නොහැක්ක. අන් පුරුෂයෙකු වධයට ලද හොත් පිළිසන් යානාවෙක හිඳුවා එවන්ට පිළිවන්දැයි කීයේය. ඒ ස්ත්‍රීද එපවත් අසාගෙන ගොස් වෛශ්‍යයාට කීවාය. එසමයෙහි එක් සිටු පුත්‍රයෙක් සාමාව කෙරෙහි පිළිබඳ සිත් ඇතිව දවස දහසක් දෙයි ඒ සිටුපුත්‍රතෙම එදවස් සවස් වේලාවෙහි දහසක් වස්තු ගෙන ඇගේ ගෙට ගියේය. ඒ සාමාවද ඔහු දුන් දහසින් බඳ පියල්ල අතට ගෙන උකුලෙහි තබා අඬන්ට පටන් ගත්තීය. කුමට අඬද්දැයි විචාළ කල්හි කියන්නී සාමිනී වධයට ගෙනයන්නාවූ මේ සොර තෙම අනිකෙක් නොවෙයි මාගේ මලනුවෝය, තමා හීන නිවවවූ සොරකම් කරන හෙයින් ලැජ්ජාවෙන් මා සමීපයට එන්ඩ අසමත්ය. පුර පාලක පුරුෂයා හට මා විසින් යාඥාකොට කියාය වූ කල්හි දහසක් දුනහොත් අරිමි කියා එව්වේය. දැන් මේ දහස ගෙන ගොස් පුරපාලක පුරුෂයා හට දෙන්ට නිසි පුරුෂයෙකු නොබලම් කීවාය. ඒ සිටු ප්‍රත්‍ර තෙම තමා ගෙන දහසින් බඳ පියල්ල ගෙන පුර පාලනයාගේ ගෙට ගියේය. ඒ පුර පාලක පුරුෂ තෙමේම සිටු පුත්‍රයා සඟවා තබා සොරු පිළිසන් යානාවක හිඳුවා සාමාවගේ ගෙට යවා අප විසින් මේ වධයට ගෙනා පුරුෂතෙම රාජ්‍යයෙහි ප්‍රසිද්ධ සොරෙක මධ්‍යම රාත්‍රියෙහි මනුෂ්‍යයන් නිදි ගෙන හැසුරුණු වේලෙහි මරම්හයි ඉතිරි රාජ පුරුෂයන්ට ව්‍යාජයෙන් කියා මදක් කල් යවා මනුෂ්‍යයන් නිදි ගත් කල්හි සිටු පුත්‍රයා මහත්වූ රැක වලින් සොරුන් මරණ තැනට ගෙන ගොස් කඩුවෙන් හිස කපා ශරීරය උල තබා නුවරට වන්නේය. එතැන් පටන් ඒ වෛශ්‍ය දූ තොමෝ අන් පුරුෂයන් අතින් කිසිවක් නොගෙන සොරු හා එක්වම ප්‍රියසංවාසය කෙරෙමින් වෙසෙයි. ඉක්බිතිව ඒ සොරු සිතනුයේ මෝතොමෝ ඉතා මිත්‍ර ද්‍රෝහිය අනිකක්හු කෙරෙහි සුපිළිබඳ සිත්වූ නමුදු ඒ සිටු ප්‍රත්‍රයා මෙන් මාත් මරවා ඔහු හා එක්වත් ප්‍රිය වාසය කරන්නීය. කවර උපායකින් මෑ කෙරෙන් මිදෙන්ද මෙහි බොහෝ දවසක් කල් නොයවා යා යුතු යයි සිතා ඉක්බිති සිතන්නේ යන කල සිස් අතින් ගොස් ප්‍රයෝජන කින්ද මැගේ ආභරණයන් ඇරගෙන යෙමි සිතා එක් දවසක් සිතන්නේ සොඳුර අප මැදිරියෙහි ලූ කුකුලන් මෙන්

SANHIDA LANKA

නිරන්තරයෙන් ගෙයිම වැදලා ඉඳ දුක් විඳීමෙන් ප්‍රයෝජන කවරේද උයන් කෙළියට යම්හයි කීහ. ස්ත්‍රී යහපතැයි ගිවිස කන බොන දෑ ඇතුලුව උපකරණ සපයාගෙන තොමෝ ස්වර්ණාභරණයෙන් සැරහී සොරු හා එක්ව පිලිසන් යානාවෙකින් උයනට ගියාය. ඒ සොරුද ඈ හා එක්ව උයනේ කෙළ ඇවිදිනේ දැන් මා විසින් යන කලැයි සිතා ඈ සමඟ රති ක්‍රීඩා කරුණු කැමැත්තෙකු මෙන් කනේරු ගස් ගොල්ලකට වැද ඈ ආලිඞගනය කරන පසාරයෙන් දැඩි කොට මිරිකා මූර්ඡාකොට සියළු ආභරණ ගලවා ඇගේ උතුරු සළුවෙහිම පොදියක් කොට බැඳ කරට දමා ගෙන උයන් වැට පැනගෙන පලා ගියේය. සොරු ගිය නොබෝ කලකින් ඒ ස්ත්‍රිය සිහිලැබ බැණ නැගී සිට තමාගේ පිරිවර ස්ත්‍රීන් කරා ගොස් මාගේ ස්වාමි පුත්‍රයා කොයි දැයි විචාරා උන් විසින් නොදනුම්හයි කී කල්හි මූර්ඡා වූ මා මළැයි යන හෙයින් ගියේවනැයි සිතා දොම්නසට පැමිණ ගෙට ගොස් මාගේ ප්‍රිය වල්ලභයා දුටු දවසකමුත් කවර සැප විඳීමෙක්දැයි යන ශෝකයෙන් සැරහු යානෙහි නොසැතපී භූමි සෙය්‍යාව කෙරෙමින් මනා වස්ත්‍රායෙහිද ඇළුම් නොකොට කිළුටු වස්ත්‍ර අඳිමින් එකවේල අනබව කෙරෙමින් සුවඳ මල් ආදිය නොපැළඳ හැරම යම්කිසි උපායකින් ප්‍රිය වල්ලභයා ගෙන්වා ගණිමියි සිතා නාටකයන් ගෙන්වා දහසක් වස්තු දී තොප විසින් නොයන තැන් නැත. ගම් නියම්ගම් රාජධානි ආදියට ගොස් ගී නැටුන් පවත්වන තැන්හි පළමු කොට මේ ගීතිකාව ගායනා කරව. මාගේ ස්වාමිපුත්‍ර තෙම එතැන්හි වී නම් මේ ගීතිකාව ඉඳිනා බව කියා කැඳවා ගෙන එව. අනුන් හෝ කියා එවයි නියෝග කොට තමාගේ ගීතිකාව උගන්වා මාර්ගෝපකරණ සපයා දී යැවුවාය. ඒ නාටක ජනයෝ ඒ බරණැස් නුවරින් නික්ම ගම් නියම්ම ගම් පිළිවෙලින් ගී නැටුන් පවත්නා ඇවිදිනාහු. ඒ සොරහු වාසය කරණ පිටිසර ගමට පැමිණ එතැන්හි රැස්වූ පිරිස් මැද නෘත්‍ය මඬලය මැද ගී නැටුන් පවත්නා පළමු කොට මේ ගීතිකාව කීහ.

යනතං වසනත සමයෙ - කණවෙරෙසු භානසු,

සාමං බාහාය පීලෙයි - සාතං ආරොගායමබ්‍රවීති

මේ ගාථාවෙන් කීයේ නම් අනේකවිධ පුෂ්පඵල වාදියෙන් වනය සොභාමත් වූ වසන්ත කාලයෙහි උයන් කෙළියට ගියා වූ නුඹ වහන්සේ මොන වට පිපී මල් පැහැයෙන් රත්වූ සොභා ඇති කනේරු ගස් අතුරට වැද රති ක්‍රීඩා අභිප්‍රායෙන් සාමා නම් ස්ත්‍රියක් ආලිඞගනය කොට මූර්ජාවූ කල්හි මළයි යන භයින් සැඟවී ගිය සේක්ද ඕතොම නුඹ වහන්සේට තමා නිදුක්ව ජීවත්ව ඉඳිනා බව කියන්නීය යන අභිප්‍රාවය.

ඉක්බිති ඒ පිරිස් අතුරෙහි අසා සිටියා වූ සොර තෙම නාටකයා කරා එලඹ කියන්නේ එම්බල කොල නාටකය, තෝ සාමාව ජීවත්ව ඉඳිති කියන්නෙහිය. මම වනාහි වචනය අදහන්නෙම් නොවෙමි. එඹල නාටකය මෙලොවෙහි පවනෙක් තණ පරඬලා මෙන් පර්වත ගෙන යන්නේය යන මේ බසෙක් ඇද්ද එබස ඇදහිය යුතු නොවෙයි. ඉදින් පවනෙකින් පර්වතයක් ඔබ්මොබ ගෙන යන්නේ වී නම් මේ මුළු ලොව ද එපරිද්දෙන්ම ගෙන යයි. පොළොව හා පර්වතයන් පවනින් ගෙන යෙති යනු යම්සේද, සාමාව ජීවත් වෙති යනුද එමෙන් වන්නේය. යම් හෙයකින් සාමා නම් ස්ත්‍රී මළාද ඈ ආරෝග්‍යාව විචාරති යනු කුමට අදහම්ද, මළ සත්වයෝත් කථා කෙරෙත්දැයි කීයේය. ඒ වචනය අසා නාටක තෙම කියන්නේ සාමීනි නුඹ වහන්සේ කුමක් කියන සේක්ද ඒ සාමාවෝ මළෝ නොවෙති. අන් පුරුෂයකු කැමැත්තෝද නොවෙති. නුඹ වහන්සේ නික්ම ආ තැන් පටන් කිළුටු වූ වස්ත්‍ර හැඳ එක්වේලේ අනුභව කොට සුවඳ මල් විලේපනාදිය දුරු කොට යහන්වරා බිම සැතපී නුඹ වහන්සේගේ ඊම බලමින්ම ඉඳිති කීයේය, ඉක්බිත්තෙන් සොරතෙම කියන්නේ ඕ තොමෝ ජීවත් වේවයි නොවේවයි ඇගෙන් ප්‍රයෝජන නැත. ඕ තොමෝ නොබෝකලක් තමාගේ පුරුදු වූ නියමසාමී වූ සිටු පුත්‍රයා මට පැමිණි වධයට යොදා කිසි පුරුදු කමක් නැත්තා වූ අමුතුව දුටු මා වධයෙන් මුදා තමාට වල්ලභ කළාය. මතු අන් පුරුෂයකු දුටු කල ඔහු නිසා මාත් අනර්ථයට පමුණුවන්නීය. එසේ හෙයින් ඈ සමීපයට යන්නා තබා ඒ නාටකයන් බල බලා සිටියදී වස්ත්‍රය තරව ඇඳ වේගයෙන් නික්ම ගියේය. නාටක ජනයෝ එපවත් දෙවනුව ගොස් සාමාවට කීහ. ඒ ඇසූ සාමාතෙම තමා කළ මිත්‍රද්‍රෝහියට කලකිරී පළමුවෙන් තමාගේ වෛශ්‍යා ස්වාභාවයෙන් ජීවත් වූවාය. තිලෝගුරු බුදුරජානන් වහන්සේ මහණ තෝ දැන් මතු නොවෙයි. පෙරත් මේ ස්ත්‍රී නිසා දුකට පැමිණියේ වේදැයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කිරීමෙන් මේ ජාතකය නිමවා වදාළ සේක. දේශනා වගේ කෙළවර ශාසනයෙහි උකටලීවූ භික්ෂූන් වහන්සේ සොවාන් ඵලයෙහි පිහිටි සේක. එකල්හි වෛශ්‍යාව නිසා ඉස් කැපුන් ලත් සිටු පුත්‍රයා නම් මේ උකටලීවූ මහණය, එකල්හි සාමා නම් වූ වෛශ්‍යාව නම් උකටලී කරවා ශාසනයෙන් චුත කරවන්ට උත්සාහ කළ පුරාණ දූතිකාය. එසමයෙහි සොරව උපන්නේ දැන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ ගෙණ හැර දක්වා වදාළ සේකි.

SANHIDA LANKA

# තෘතිය තිත්තිර ජාතකය

තවද සමත්‍රිංශත් පාරමිතා සම්භාරයෙන් සංසිඬ බොධිඥානයෙන් සුපරි සුඬ ස්කන්ධසන්තාන ඇති අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන් වහන්සේ කොසඹෑ නුවර ගොචර ග්‍රාම කොට බදරිකා නම් ආරාමයෙහි බ්‍රහ්ම විහාරයෙන් වාසය කරණ සේක්. රාහුල ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක.

මෙහි වර්තමාන කථා වස්තුව යට තිපල්ලත්‍ථ ජාතකයෙහි විස්තර වශයෙන් කියන ලද්දේමය. මේ මතු කියන තිත්තිර ජාතකයෙහි ධර්ම දේශනාවට කාරණයෙක් යම් කලෙක උපන්ද එසමයෙහි ධම් සභා මණ්ඩපයෙහි රැස්ව උන් භික්ෂූන් වහන්සේ විසින් වදාරණසේක්. ඇවැත්නි රාහුල ස්ථවිර තෙම ත්‍රිවිධ සික්ෂාවන් පුරුදු කැමැත්තේ නම් ඔහු කෙරෙහි ද කුකුස් කරන්නේ අනුන් විසින් කරණ ලද අවවාදයෙහි පිහිටන්නේ යයි යනාදීවූ ආයුෂ්මත් රාහුල ස්ථවිරයන්ගේ ගුණ කථාවත් හෙවත් ප්‍රශංසාවත් පහල වූ කල්හි ඒ භික්ෂූන් වහන්සේ විසින් කරන ලද ප්‍රශංසාව දිව කනින් අසා වදාරා ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ සුගන්ධ ගන්ධ කුටි විහාරයෙන් තුන්තරා ගමනින් එක්තරා ගමනකින් වැඩ වදාරණ සේක්. එඹා මහණෙනි, දැන් වනාහි කිනම් කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි බුදුහු එබසට වදාරණසේක්. එඹා මහණෙනි, රාහුලයන් ශික්ෂා නැති වූ යේත් කුකුස්කාරි වූයේත් අවවාදක්‍ෂම වූයේත් දැන් මතු නොවෙයි. පෙරත් තිත්තිර නම් ක්ෂුද්‍ර පක්ෂි ජාතියක ඉපිදත් මෙබඳු ශික්ෂා ඇති ගුණ ධර්මයෙන් යුක්ත වූයේ වේ දැයි මුඛමාත්‍රයක් දක්වා වදාළ කල්හි භික්ෂූන් විසින් ස්වාමීනි බුදුරජානන් වහන්ස, ඒ අතීත ප්‍රවෘර්තිය භවයෙන් ප්‍රතිජනන හෙයින් අපට නොදැනෙන්න්ය. අපට දැනෙන පරිද්දෙන් විස්තර වශයෙන් ප්‍රකාශ කොට වදාළ මැනවැයි ආරාධිත වූ බුදු රජානන් වහන්සේ වදාරණ සේක්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් සතර සංග්‍රහ වස්තුවෙන් ජනරංජනය කොට රාජ්‍ය ශ්‍රී අනුභවකරණ කල්හි පුරණ ලද බෝධිසමභාර ඇති අප මහබෝධිසත්වතෙම බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද වැඩිවිය පැමිණියේ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙන් සියළු උගතමනා සිල්ප ඉගෙන එයින් අවුත් හිමවත් වන පෙදෙසෙහි සෘෂිප්‍රවෘජ්ජාවෙන් පැවිදිව ඉර්ධිවිධාදී වූ පඤාභිඥාවන්ද රූපා රූප අෂ්ටසමාප්තිද නිපදවා ධ්‍යාන ක්‍රීඩාව කරන්නේ සිත්කළු වන ලැහැබෙක්හි වාසය කොට ලුනු ඇඹුල් සෙවිනා සඳහා එක්තරා ප්‍රත්‍යනත ග්‍රාමයකට ගියේය. ඒ ගම්හි මනුෂ්‍යයෝ ඒ තාපසයන් දැක සතුටු සිත් ඇත්තවුන් එක්තරා වනයක පන්සලක් කොට පිණ්ඩපාතාදී ප්‍රත්‍යයෙන් උපස්ථාන කරන්නාවූ ඒ පන්සල්හි වාසය කරවූවාය. එකල්හි ඒ ගම්හි පක්ෂීන් මරා දාරභරණාදිය කරණ එක්තරා වැද්දෙක් වටුවෙකු ගෙන යාපත් කොට අභ්‍යාස කරවා මැදිරියෙක ලා රක්ෂා කරන්නේය. එසේවූ වටුවා වලට ගෙන ගොස් ඔහුගේ ශබ්ද අසා ආ තිප්වටුවන් අල්වා ගෙනෙන්නේය. ඒ මැදිරියේ උන්සේ වටුවා සිතන්නේ මාගේ කුලෙහි බොහෝ නෑයෝ මාගේ කුලෙහි බොහෝ නෑයෝ මාගේ ශබ්දය නිමිත්ත කොට ගෙනන විනාශයට පැමිනෙන්නාහ. මේ අකුශලය මට පැමිනේදෝහෝයි නිශ්ශබ්දව උන්නේය. වැදි පුත්‍රයා ඒ පක්ෂියා බැන නොනැග ඉන්නවා දැක ඔහු කෙරෙහි කිපුනු සිත් ඇත්තේ උන ලෑල්ලකින් ඔහුගේ ඉස් මුදුනේ පහරමින් පීඩා කරන්නේය. එසේ වටු තෙම මෙසේ සිතුයේය. මා විසින් පවත්වන්නා වූ ශබ්දය කරණ කොට ගෙන මේ පක්ෂීහු නසිත්වයි යන මාගේ සිතක් නැත්තේය. එතකුදු උවත් මා විසින් කළ අකුසල කර්මය මාම ස්පර්ශ කරන්නේය. මා ශබ්ද නොපවත්වන කල්හිම මේ පක්ෂීහු මා සමීපයට නොඑන්නාහ. ශබ්ද පවත්වන කල්හිම එන්නාහ. ආ ආ පක්ෂීන් මේ වැදි පුත්‍රතෙම අල්වා ගෙන මරන්නේය. මේ ක්‍රියාව නිමිත්ත කොට ගෙන අකුසල් ඇද්දෝහෝයි ඒ තෙම එතැන් පටන් කවර නුවනැත්තා වූ සත්වයෙක් වනයෙහි මාගේ සිත්හි උපන්නාවූ ඔත්තප ලක්ෂණ වූ කාංසාව මුදන්නේදොහෝයි සිතා එබඳු කාංසා විචේඡදනයට සමර්ථ වූ ප්‍රඥාවන්තයෙකු පරීක්ෂා කෙරෙමින් වාසය කරන්නේ, ඉක්බිත්තෙන් එක් දවසක් ඒ වැදි බොහෝ වටුවන් අල්වා පැසක් පුරා ලා ගෙන ශ්‍රමදාහයක් සන්සිඳුවා ගනිමි, පැන්බොමි සිතා බෝධිසත්වයන් වාසය කරන්නා වූ ආශ්‍රමයට ගොස් ඒ පක්ෂියාගේ මැදිරිය බෝධිසත්වයන් වහන්සේ සමීපයෙහි තබා පැන් බී වැලිතලාවෙක්හි හොත්තේ නිද්‍රාව පැමිණියේය. එසේවූ වටු තෙම ඔහු නිද්‍රාවට පැමිණි බව දැන තමාගේ සිත උපන් කුකුස් මේ තාපසයන් අතින් විචාරමි, විචාළවූ මට තත්වූ පරිද්දෙන් දන්නා වු මේ තාපසයන් වහන්සේ වදාරාණසේකැයි මැදිරියේ සැතපී ගෙනම ඒ තාපසයන් වහන්සේගෙන් විචාරන්නාහු. එසේ වටු පක්ෂි තෙම පළමු කොට මෙසේ විචාළේය. කෙසේද යත් සාමීනි නුවනැත්තාවූ තාපසයන් වහන්ස. ඒකාන්තයෙන්ම සැපයෙන් ජීවත් වෙමි. මා කැමති කැමති කැවිලි පෙවිලි සුවසේ ලැබෙන්නේය. එතකුදු උවත් බොහෝ ඥාති කුලයෙහි වූ පක්ෂීන් නසා ජීවත් වෙන තරම් උපද්‍රව ස්ථානයක

SANHIDA LANKA

පිහිටියෙමි. එසේ හෙයින් තාපසයන් වහන්ස, මෙයින් මට කවර අකුශල කර්මයක් සිද්ධ වන්නේද? ඒ මාගේ සත්හි උපන් කාංසාව පසිඳ වදාල මැනවැයි විචාළ වූ ඔහුගේ ප්‍රශ්නය විසඳන්නාවූ ඒ තාපසයානන් වහන්සේ මෙසේ වදාරණ සේක්. එඹා පක්ෂිය, ඉදින් තාගේ චිත්තය පාප කර්මය පිණිස නොනැමෙන්නේය. එසේ කල්හි පාප කර්මය පිණිස සංභ්‍රමනයක් නැත්තා වූ නිරුතසාහවූ සත් පුරුෂ වූ තට ලාමක වූ පාප චේතනාවෙක් තා ලිම්පනය නොකරන්නේය. එසේ හෙයින් තට අභිවෘද්ධියම වන්නේය. එසේ හෙයින් ශෝක නොකරවයි වදාළසේක. බෝධිසත්වයන් වහන්සේගේ උත්තප්‍රකාර වූ බණ ඇසූ ඒ තිත්තිර පක්ෂි තෙම මෙසේ විචාරන්නේය. ස්වාමීනි මම ශබ්ද නොපැවැත්තුවේ වී නම් මේ තිත්තිර පක්ෂි සමූහයෝ මා සමීපයට නොඑන්නාහ. ශබ්ද පැවැත්වූ කල්හි අපගේ ඥාති වූ පක්ෂී තෙම මෙතැන්හි ඉඳිනේයයි බොහෝ පක්ෂීහු එන්නාහ. එසේ හෙයින් මා නිසා මේ ප්‍රාණඝත අකුශල කර්මය ස්පර්ශ වශයෙන්ම වන්නේය. එසේ හෙයින් මාගේ චිත්තය මේ පාප කර්මය නිමිත්ත කොට ගෙන කාංසාවට පැමිණෙන්නේයයි කීයේය. ඒ ඇසූ බෝධිසත්වයන් වහන්සේ වදාරණ සේක්. එඹා තිත්තිර පක්ෂිය ඉදින් පව් කරණ නිසා චිත්තයත් ඉපිද වූයේය. එසේ හෙයින් මාගේ චිත්තය දූෂ්‍යානුවූයේය. හෙවත් තන්නින්න තප්පොන භාවයෙක් නැත්තේය. එසේ කල්හි වැද්දා විසින් ආයුෂ්මත්වූ තා නිසා කරණ ලද්දාවූ පාපකර්මයක් කෙරෙම් යන සිත් නැති හෙයින් ශෝභන චිත්ත සන්තාන ඇති තට ප්‍රාණඝාත චේතනාවගේ නොවීමෙන් ඒ අකුසලය තා ලිම්පනය නොකරන්නේය යනාදී වචනයෙන් මහ බෝසත්වූ තාපසතෙම ඒ තිත්තිර පක්ෂියාට තත්වූ පරිද්දෙන් දක්වා සංසිඳුවා වදාළසේක. ඒ තිත්තිර පක්ෂියාද මහබෝසතානන් වහන්සේ වැඳ අවසර ගෙන ඒ පක්ෂි රාජයා ගෙන ගියා යයි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ තිත්තිර ජාතක ධර්ම දේශනාව ගෙනහැර දක්වා පූර්වපරසන්ධි ගලපා නිමවා වදාළසේක. එකල්හි තිත්තිර පක්ෂි වූයේ රාහුල ස්ථවිරය. අවවාදයෙන් ඔහු සිත උපන් සැක සිඳිනා තාපසයෝ නම් දැන් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ ගෙන හැර දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# සුබ්බව ජාතකය

තවද එක් සමයෙක්හි අප තිලෝගුරු සර්වඥරාජෝත්තමයානන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරණ සේක්. එක්තරා කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ සුබ්බව ජාතකය නිමවා වදාළසේක.

ඒ කෙළෙඹි පුත්‍රයා වනාහි ගම්හි නය එලවමින් භාර්යාව හා එක්ව ගොස් නය එලවා ගෙන ගැලක් ගෙන ගොස් පසුව ණෛමියි. එක්තරා ගෙයක තබා නැවත සැවැත් නුවරට යන්නාහු එක්තරා පර්වතයක් දුටුවාහුය. ඉක්බිත්තෙන් ඔහුගේ භාර්යාතොම කියන්නී ස්වාමිනී ඉදින් මේ පර්වතය ස්වර්ණමය වීනම් මට කිසිවක් දෙන්නෙහිදැයි විචාළීය. එබසට ස්වාමියා කියන්නේ මාගෙන් එලෙස ලබන්ට තෝ කවුරුද මම නොදනෙමි කීයේය. ඉක්බිත්තෙන් ඕ තොම එපමණ කින් තදවූ සිත් ඇත්තී ඒ කාන්තයෙන්ම මේ පර්වතය ස්වර්ණමය වූ කල්හිදු මට කිසිවක් නොදන්නේයයි කියා නොසතුටු වූවා ඉක්බිති ඒ ස්ත්‍රී පුරුෂ දෙදෙනා බුදුන් වාසය කරන්නා වූ ජේතවන විහාරය සමීපයට ගොස් මාර්ග ශ්‍රමයන් සන්සිඳුවා පැන් බී ගෙණ යම්හයි විහාරයට වන්කල්හි බුදුරජානන් වහන්සේ ද එදා අළුයම් වේලෙහි ඔවුන් දෙදෙනාගේ ශ්‍රොතාපතති ඵලයට බලවත් ප්‍රත්‍යය ඇති බව දූන වදාරා ඔවුන් දෙදෙනාගේ ඊම බලමින් ෂඩ් වර්ණ ඝන බුද්ධ රස්මීන් ශ්‍රී ශරීරයෙන් නික්මවා මදක් වැඩහුන් සේක. ඒ දෙමහල්ලෝද පැන් බී අවුත් බුදුන් වැඳ එකත්පස්ව උන්නාහුය. සර්වඥයන් වහන්සේ ඔවුන් හා සමඟ පිළිසඳර කථා කොට හෙවත් තමන් වහන්සේ කරා පැමිණි ආගන්තුකයන්ට සන්තෝෂයට කාරණා වදාරා තෙපි දෙදෙනා ලද්දා වූ ධනයන් එලවාලන්ට ගියම්හයි කීවාහුය. එබසට බුදුරජානන් වහන්සේ කිමෙක්ද උපාසිකාව තොපගේ වල්ලභ වූ පුරුෂතෙම තොපට හිතසිත් ඇත්තෝද උපකාරීව වාසය කරන්නේදැයි විචාරා වදාළසේක. එබසට ස්වාමීනි භාග්‍යවත් වූ බුදුරජානන් වහන්ස මම මොහු කෙරෙහි සෙනහයෙන් යුක්ත යෙමි මේ වනාහි මා කෙරෙහි සෙනහයක් නැත්තේය. ඊට කාරණා කවරේද? අද දවස් මා විසින් පර්වතයක් දැක මේ පර්වතය ස්වර්ණමය වීනම් මට කිසිවක් දෙන්නෙහි දැයි විචාරණ ලද්දෝතෝ ඒ මාගෙන් ලැබීමට කවරෙක්දැයි කිසිවකුත් නොදෙමියි කීයේය. එසේ හෙයින් මෙබඳු වූ කිසි ස්නේහ ගුණයක් නැති මෙතෙම තද වූ සිත් ඇත්තේයයි කීවාය. එබසට බුදුරජානන් වහන්සේ එඹල උපාසිකාව මෙනම් දෙයක් නොවන්නේ වී නම් යම් කලෙක වනාහි තොපගේ ගුණ සිහි කෙරේද එදවස් වනාහි සියලු ඓශ්වර්‍ය්‍ය ම දෙන්නේයයි වදාරා බුදුන් විසින් වදාළ වචනය ඇසූ උපාසිකා තොම ස්වාමීනි බුදුරජානන් වහන්ස සියළු ඓශ්වර්‍ය්‍ය ලැබීම නම් කවරේදැයි ඔවුන් විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ අතීත කථාව ගෙන හැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්ජය කරණ කල්හි පුරණ ලද පෙරුම් ඇති මහබෝධිසත්ව තෙම එ රජහුගේ සියලු ක්‍රියා සිද්ධ කරන්නාවූ අමාත්‍ය විය. ඉක්බිත්තෙන් එක් දවසක් ඒ බරණැස් රජතෙම තම පුත්‍ර වූ යුව රජහු උපස්ථානයට එන්නා දැක මේ තෙමේ මාගේ අභ්‍යන්තරයෙහි වාසය නොකෙරේවයි සිතා ඒ අමාත්‍යයා සමීපයට කැඳවා එම්බා සගය මම යම්තාක් කල් ජීවත් වන්නෙම් ඒ තාක් කල් මෙතෙම මේ නුවරෙහි වාසය කිරීම නොලබන්නේය. අන්‍ය ස්ථානයක වාසය කොට මාගේ ඇවෑමෙන් රාජ්ජය කරවයි කීයේය. එතෙම යහපතැයි ගිවිස පිය රජහු වැඳ ප්‍රධාන භාර්යාව හා සමඟ බරණැස් නුවරින් නික්ම ප්‍රත්‍යනත ජනපදයකට ගොස් වනාහි පන්සලක් කොට වනමුල් වන ඵලාඵල අනුභව කෙරෙමින් වාසය කරන්නේය. මෑත භාගයෙහි පිය රජතෙම කළුරිය කෙළේය. යුවරජ තෙම තරු බලා ඒ තමාගේ පීතෘ වූ බරණැස් රජ කාල ක්‍රියා කළ බව දූන බරණැස් නුවරට එන්නේ අතරමග එක් පර්වතයක් දුටුවේය.

ඉක්බිත්තෙන් ඔහුගේ භාර්‍ය්‍යාතොම කියන්නී ඉදින් දේවයන් වහන්ස මේ පර්වතය ස්වර්ණමය වී නම් මට මින් කිසිවක් දෙන්නෙහිදැයි විචාළීය. එබසට යුවරජ කියන්නේ තෝ මාගෙන් ලබන්නට කවරෙහිදැයි කිසිවක් නොදෙමියි කීයේය. ඉක්බිත්තෙන් ඕතොම මම ඔහු හා සමඟ වාසය කෙරෙමියි සෙනහයෙන් වාසය කරන්ට නොහැකි වූයේය. මේ පුරුෂ ද මා කෙරෙහි කලකිරිණි. සෙනහව තදවූ සිත් ඇත්තේ රජ්ජයට පැමිණද මෝතොම මට කවර යහපතක් කළාදැයි නොසතුටුවන්නේයයි සිතා ඒ පුරුෂයා හැර වනයට නොගොස් ඔහු හා සමඟ ගියාය. එතෙම රාජ්‍යශ්‍රීයෙහි පිහිටා ඒ ස්ත්‍රිය අගමෙහෙසුනැයි යන යසස් මාත්‍රයක් දුන්නේය. මත්තෙහි වනාහි කළ සත්කාර සම්මානයෙක් නැත්තේය. මෑත කාලයෙහි ඇ ඇති බවත් නොදන්නේය. බෝධිසත්වයන් වහන්සේ සිතන සේක්. මේ ස්ත්‍රී තොම රජහුට උපකාරව වල වාසය කරණ කාලයෙහි මෙපණක් දුක් ගනිමියි සිතා නුකුසී තව මෙරජහට විශ්වාසව සිත පක්ෂ පාත බැව්හි වාසය කළාය. දැන් මෙරජ යනාහි තමහටගත් දුක් පමණක් නොදූන අන්‍ය වූ ස්ත්‍රීන් හා රමණය කෙරෙමින් දවස් අරනේය. යම්සේ මෝතොම සියළු ඓශ්වර්‍ය්‍ය ලබන්නීද ඒ ලබන්නට සුදුසු උපායක් කෙරෙමියි සිතා එක් දවසක්

SANHIDA LANKA

බෝධිසත්වයන් වහන්සේ බිසෝවරුන් කරා ගොස් වැඳ දෙවීන් වහන්ස දැන් අපි නුඹ වහන්සේගෙන් සෙසු දේ තබා ආභරණ පමණක් නොබලම්හ. කුමක් හෙයින් අප කෙරෙහි උදාසීන භාවයෙන් ප්‍රමාද වූ සේක්ද ඉතා තදවූ සිත් ඇති සේක්නුයි කීසේක. එබසට බිසව් කියන්නාහු එඹා අමාත්‍යයානෙනි තොපට දෙන්නේ මම ලබන්නෙම් වේදැයි කිවුය. නමුත් නොලබන බව කියා රජ්ජුරුවන් වහන්සේ දැන් වනාහි මට කුමක් දෙනසේක්ද එදවස් අතර මගදී පර්වතය දැක සිත අදහනු පිණිස මේ පර්වතය ස්වර්ණමය වීනම් මට මින් කෙතෙක් දෙන සේක්දැයි විචාළ කල්හි මාගේන් ලබන්ට තෝ කවරේදැයි කීයේය. දැන් වනාහි එදවස් ඒ ප්‍රවෘර්තිය රජ්ජුරුවන් ඉදිරියෙහි සිට කියන්නට හැක්කේ වී නම් කියවයි කී කල්හි කීයේය. රජහු සමීපයෙහි සිටියාවූ මම විචාරමි නුඹ වහන්සේ කිව මැනවයි කී කල්හි යහපතැයි කියා බෝධිසත්වයන් වහන්සේ ඒ රාජ දේවිය රජ්ජුරුවන්ට උපස්ථාන කොට සිටි කල්හි විචාරණ සේක්. බිසවුන් වහන්ස මම නුඹ වහන්සේගෙන් කිසිවකුත් නොලබන්ට කාරණා කවරේදැයි විචාල කල්හි බිසවු කියන්නෝ එම්බා සගය මම ලබන්නෙම්වේද නුඹ වහන්සේට දෙන්නේ යයි කියා රජ්ජුරුවන් වහන්සේ එකල් වනයෙහි වාසය කොට එන්නාවූ මාර්ගයෙහි එක් පර්වතයක් දැක ඉදින් මේ පර්වතය ස්වර්ණමය වී නම් ඉන් මට කොපමණ දෙනසේක්දැයි විචාළෙමි. ඒ ලබන්නට තෝ කවරෙක්ද ඉදින් මා දෙන දෙයක් නැතැයි කියා නිරපේක්ෂව හැරියාද මුන් වහන්සේ මම නොහැර එබඳු වූ තැනැත්තන් වහන්සේ දැන් මට කුමක් දෙනසේක්දැයි යනාදීන් මේ ප්‍රවෘර්තිය ප්‍රකාශ කොට කියන්නී, එදවස් ස්වර්ණ පර්වතය වීනම් දෙන සේක්දැයි විචාළාවූ මට ඒ පර්වතය මාගේ වචනයෙන් ස්වර්ණ පර්වතයෙකැයි කී පමණක් විනා ස්වාභාවයෙන් ස්වර්ණමය වූ වචන මාත්‍රයෙන් සැප දෙන්නට හැක්කාවූ පර්වතයද පවා වචනයෙන් නොදුන්නේය. දැන් කුමක් දෙන්නේදැයි කී බිසවුන්ගේ තෙපුල් ඇසූ රජ කියනුයේ මෙසේ කියා යමක් කරතොත් ඒම කිය යුතු වන්නේය. නොකරණ දෙය නොකිය යුතු වන්නේය. නොකරණ දෙය කියන්නාවූ අඥානයාගේ ස්වාභාවය තත්වූ පරිද්දෙන් පණ්ඩිතයෝ හැර දනා තුවජ තොට සිතති. අඥානයෝ වචන මාත්‍රයටම සතුටු වන්නාහුයයි කීවාය. රජ්ජුරුවන්ගේ බස් ඇසූ රාජදෙවි රජ්ජුරුවන්ට නමස්කාර කොට කියන්නී රාජ පුරුෂයානන් වහන්ස නුඹ වහන්සේ ස්වාභාව ධර්මයෙහි පිහිටි සේක් වී නම් නුඹ වහන්සේට නමස්කාර වේවයි යමෙක් නුඹවහන්සේගේ රටින් නෙරපණ ලද බැවින් ව්‍යසනය පැමිණියේද ඔහුගේ චිත්තය සත්‍ය වචනයෙහි රමණය කරන්නේ වේදැයි මෙපරිද්දෙන් ඒ රජහුගේ ගුණ කථනය කරන කල්හි ඒ මහබෝසතානන් වහන්සේ ඒ රාජ දේවියගේ ගුණ කියන සේක්. රජ්ජුරුවන් වහන්සේ මේ ලෝකයෙහි යම් ස්ත්‍රියක් දරිද්‍ර ස්වාභාව ඇත්තීද ඕතොම දරිද්‍රයන් හටම වඳින්නීය. කීර්තිමත් වූ උපභෝග පරිභෝග සම්පත්තියෙන් ආඪ්‍ය වූ යම් ස්ත්‍රියක් ඇද්ද ඕතොම එබඳු වූ ආඪ්‍යයක් හට වඳින්නීය. යම් ස්ත්‍රියක් කීර්ති සම්පන්නවූ නම් එබඳු පුරුෂයන්හටම වඳින්නීය. එසේහෙයින් කල්‍යානවූ රාජ දේවීද නුඹ වහන්සේට අකුශල හෙයින් උතුම් වූ භාර්‍ය්‍යා වන්නීයයි කියා බෝධිසත්වයන් වහන්සේ නැවත රජ්ජුරුවන් වහන්සේ වනයෙහි දුක් දෙන වාසය කරණ කල්හිද නුඹ වහන්සේ හා සමාන දුකට පැමිණ වාසය කළ බිසවුන්ට සත්කාර සම්මාන නොකරන්නට සුදුසු නොවන්නේයයි කියා රාජ දේවියගේ ගුණ වර්ණනාකොට ගියේය. රජතෙම ඒ වචනයෙන් සතුටුවූයේ ඒ බිසවුන් තමහට කළගුණය සිහි කරමින් එම්බා පණ්ඩිතයෙනි තොපගේ වචනයෙන් මේ දේවියගේ ගුණ සිහි කරමියි කියා ඒ බිසවට සියළු ඓශ්වර්‍ය්‍ය දුන්නේය. දේවියගේ ගුණ ප්‍රකාශ කළ බෝධිසත්වයන් ද බොහෝ සතටු වූ රජ්ජුරුවෝ මහත් සැපත් ඔබට දුන්නේයයි ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේ මේ දේශනාව ගෙණ හැර දක්වා චතුසසත්‍ය ධර්ම දේශනාව ප්‍රකාශ කොට පූර්වපර සන්ධි ගලපා මේ ජාතකය නිමව වදාළසේක. චතුසසත්‍යයාගේ අවසානයෙහි ඒ දෙමහල්ලෝම ශ්‍රොතාපත්ති ඵලයෙහි පිහිටියාහුය. එකල්හි බරණැස් රජ්ජුරුවෝ නම් මේ කෙළෙඹි පුත්‍රයාය. ඒ රාජ දෙවිතොම මේ උපාසිකාවය පණ්ඩිත අමාත්‍යව උපන්නෙම් බුදු වූ මම්ම වේදැයි තමන් වහන්සේ ගෙන හැර දක්වා වදාළ සේකි.

SANHIDA LANKA

# කුටිදූෂක ජාතකය

තවද කරුණාවෙන් සිල්වූ ලය ඇති ප්‍රඥා ප්‍රජොතයෙන් නසන ලද මොහාන්ධකාර ඇති ත්‍රෛලෝක ස්වාමීවූ ජාතිකාන්තරාදීන් සත්වයන්තරණය කොට අමෘතමහා ලක්ෂණ ක්‍ෂෙ භූමියට පමුණු වන හෙයින් ශාස්තෘ නම් සම්‍යක් සම්බුද්ධ රාජොත්තමයානන් වහන්සේ ප්‍රාකාර ගොපුර ප්‍රාසාදාදියෙන් හා මධුරි මධුග්‍රන්ධි ගන්ධිත ඡායුදක සම්පන්න රම්‍ය භූමිභාග ඇති ජේතවනාරාමයෙහි මෛත්‍රී කරුණා මුදිතා උපේක්ෂා ලක්ෂණ චතුර්විධ ආයර්‍ය ඊයර්‍ය පථ විහරණයෙන් යුක්තව වාසය කරන්නාවූ එක් සමයෙක්හි මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ පන්සල දූවූ එක් සාමණේරයෙකු අරභයා මේ ජාතකය වදාළ සේක.

ඒ කෙසේද යත්

මේ ජාතක කථා වස්තුවට නිදාන වූ විස්තර කථා වස්තුව රජගහයෙහි පහල විය. ඒ කුටිදූෂක ක්‍රියාව යම් සමයක්හි වීද? එසමයෙහි මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ රජගහනුවර ගෝචර ග්‍රාමකොට වනමධ්‍යයෙහි වූ පන්සලක වාසය කරණසේක. එතැන්හි වාසය කරන්නාවූ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේට බාල සාමණේරයන් දෙදෙනෙක් වතාවත් කරන්නාහ. ඔවුන් දෙදෙන අතුරෙන් එක් සාමණේරයන් වහන්සේ කෙනේක තෙරුන් වහන්සේට සුවච කීකරුව උපකාරිකව චාරිත්‍ර සීලයෙන් යුක්තව වාසය කරති. අනික් සාමණේර තෙම එබඳු ගුණ ධර්මයන් නැති හෙයින් දුශ්චාරිත්‍රව වෙසෙයි. ඉන්වත් සම්පන්න සාමණේරයන් විසින් කළ යම් වත් පිළිවෙත් ආදියක් අනික් සාමණේර තෙම තමා ගුණමකු හෙයින් තමා කළ දෙයක් මෙන් තෙරුන් වහන්සේට අඟවන්නේය. වත් සම්පන්න සාමණේරයන් විසින් උදෑසනක් සේ දැහැටි දිය එලවා තිබූ කල්හි තෙරුන් වහන්සේගේ සමීපයට ගොස් වැඳ ස්වාමීනි දැහැටි දිය මා විසින් එලවා තිබෙන ලද දැහැටි කිය සපයා වදාළ මැනවයි යනාදීන් කියන්නේය. අනික් වත් සම්පන්න සාමණේරයන් විසින් උදෑසනක් සේ නැගී සිට පිරිවෙණ ඇමදි කල්හි තෙරුන් වහන්සේ පිටත නික්මෙන වේලාවෙහි එ සෙවචඡාචාරී අනාචාර සාමණේරතෙම මුස්නක් ඇරගෙන ඈත මෑත පැහැර තමා විසින් ඇමදියෙක් මෙන් තෙරුන් වහන්සේට අඟවන්නේය. එපරිද්දෙන් නිරන්තරයෙන් අප වෙහෙසන ඔවුන් එක් දවසක් වෙහෙසා ඔවුන්ගේ චාටු ක්‍රියාව ප්‍රකාශ කෙරෙමි යි සිතා ඉක්බිති එක් දවසක් ඔහු ඇතුළුගමින් වළඳා අවුත් විහාරයෙහි නිද්‍රාවට පැමිණි කල්හිම වත් සම්පන්න සාමණේරයෝ නහන පැන් උනු කොට අනික් සාමණේරයන්ට නොපෙණෙනසේ පැන් නහන තැන පිට කොටුවේ තබා අනික් මහා භාජනයක නැලියක් පමණ දියවත් කොට උදුනෙහි තිබුවාය. සැතපුනු සාමණේර තෙම පිබිද ගිනිහල් ගෙට ගොස් උදුනෙහි කකියා උණුසුම් නැගෙන දිය දුරදීම දැක තෙල උනුවන්නේ දිය පිරුණු භාජනයෙක් වනැයි සිතා තෙරුන් වහන්සේ සමීපයට ගොස් ස්වාමීනි මා විසින් නහන පැන් සම්පාදනය කරණ ලද්දේය. පැන් සැනසුව මැනවැයි කීයේය. තෙරුන් වහන්සේ ඒ සැබවයි සිතා සාමණේර සීඝ්‍රව ගිනිහල් ගෙට ගොස් උදුනෙහි තුබූ සිස් භාජනයෙහි කෙනෙස්ස එලුයේය. එසේ එලූ කෙනෙස්ස භාජනය සිස් බැවින් තට තට යන අනුකරණ පැවැත්තේය. ඒ කාරණයෙන් ඒ සාමණේරයාට එතැන් පටන් උළුක ශබ්දයායයි ව්‍යවහාර විය. ඒ වේලෙහි වත් සම්පන්න සාමණේරයෝ පිට කොටුවෙහි පළමුවෙන් සපයා තිබූ උනු පැන් ගෙනවුත් තබා ස්වාමිනි පැන් සැනසුව මැනවයි කියා පැන් සැනැස්වූසේක. ඉක්බිති තෙරුන් වහන්සේ ඒ උලුඞක ශබ්දක සාමණේරයාගේ අනාචාරභාවය සිත සිතා උන්වේලෙහි සවස වතාවත් කරන්ට ආ සාමණේරයාට අවවාද කොට වදාරණසේක්. ඇවැත්නි එම්බා සාමණේරය මේ ශාසනයෙහි මහණදම් පුරන්නහු විසින් තමා කළ දෙයත් මෙමා විසින් කළ දෙය යි කියන්නට වටනේය. අන් පරිද්දකින් අනුන් කළ දෙය තමා විසින් කළ දෙයක් බඳු කොට කීයේ වීනම් දැන දැන බොරු කීම නිමිති කොට ගෙන වාක්දුශචරිත වෙයි මුසාවාදයෙන් අකුසල සිඞවන්නේය. මෙයින් මතු මෙබඳු අභූත වචනයක් නොකියවයි අවවාද කොට වදාළසේක. ඒ අවවාද දක්ෂම නොවන සාමණෙරතෙම තෙරුන් වහන්සේ කෙරෙහි කිපි සිත් ඇත්තේ දෙවන දවස් තෙරුන් වහන්සේ සිඟාවනා කල්හි එක්ව නොගියේය. වත් සම්පන්න සාමණේරයෝ තෙරුන් වහන්සේ කැටුවම ගියේය. සිඟන්ට වඩිනා තෙරුන් වහන්සේ නොගිය උලුඞක ශබ්දක සාමණේර තෙරුන් වහන්සේට උපස්ථාන කරණ එක කුල ගෙයකට ගොස් සිටි කල්හි ඒ කුලගෙයි ඇත්තා විචාරන්නා ස්වාමිනි, අපගේ භාග්‍යවත් වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ කොයි දැයි විචාළ කල්හි ගිලන් භාවයකින් විහාරයෙහි වැඩ හිඳිනා කීකල්හි ස්වාමීනි, ඊට අපගෙන් කුමක් ලබන්ය සුදුසු දැයි විචාරණ ලද්දේ මෙනම් මෙනම් දෙයක් දුන මැනවැයි තමා කැමති කැමති දෙය ඉල්වා ගෙණ කැමති තැන් වලදී සෙවචඡාවූ පරිද්දෙන් තෙමේ අනුභව කොට ගියේය. දෙවෙනි දවස් තෙරුන් වහන්සේ එම කුල ගෙට සිඟන්ට වැඩි කල්හි ඒ කුලගෙයි වැස්සෝ කියන්නාහු ස්වාමීනි ඊයේ දවස් නුඹ වහන්සේ ගිලන් භාවයකින් විහාරයෙහි වැඩ උන්හයි යනු අසා නුඹ වහන්සේ විහාරයෙන් වැඩි සාමණේරයන් වහන්සේගෙන් අසා ගිලන් බෙහෙත් ආදීවූ දෙය එවුම්හ. ඒ නුඹ වහන්සේට ප්‍රයෝජන වී දැයි විචාළාහුයි.

SANHIDA LANKA

තෙරුන් වහන්සේ එබසට මුවෙන් නොබැන ආහර කෘත්‍යය කොට විහාරයට වැඩ සවස් වේලෙහි තමන් වහන්සේට උපස්ථාන කරන්ට ආවාවූ සාමණේරයා සමීපයට කැඳවා ඇවැත්නි අසවල් ගම අසවල් කුලෙහි ඇත්තන්ගෙන් මෙනම් මෙනම් දෙයක් දුන මැනවැයි ඉල්වා ගෙන තා විසින් අනුභව කරණ ලද්දේදැයි විචාරා එපරිද්දෙන් විනවා ගෙන අනුභව කිරීම ශ්‍රමණ සාරූප්‍ය නොවන හෙයින් නුසුදුසු වන්නේය. එසේ හෙයින් මතු මෙබඳු අක්‍රියා නොකරවයි අවවාද කොට වදාළසේක. එවේලෙහි අවවාද ක්ෂම නොවන්නා වූ අනාචාර වූ සාමණේරතෙම තෙරුන් වහන්සේ කළ අවවාද පමණකට ආඝාත බැඳගෙන සිතන්නේ මේ තෙරුන් වහන්සේ ඊයේ දවස් දිය පමණක් නිසා මා හා විවාද කළසේක. අද දවසත් තමන් වහන්සේගේ කුලුපගවූ උපාසකයන්ගේ අහර පමණක් වැලඳුවා නොයිවසනසේක්. නැවතත් කලහ කරණ සේක්. ඉදින් වන්නාටය. මුන් වහන්සේට කටයුත්තක් දනිමියි දෙවෙනි දවස් තෙරුන් වහන්සේ පිඬුසිඟා වැඩිය කල්හි වියරු හුනු එකෙකුමෙන් මුගුරු කඩක් ඇරගෙණ වලන් බිඳ පන්සලත් ගිනිලා ගියේය. ඒ අකතීව්‍යකාරී පවිටු සාමණේරතෙම ඒ ආත්ම භාවයෙහි යපී ගන්නා පමණ අහරක් නොලැබ සම් මස් නහර වියලී මනුෂ්‍ය ප්‍රේතව කාලක්‍රියා කොට අවීචි මහනරකයෙහි උපන්නේය.  ඔහු විසින් කලාවූ ඒ දුෂ්ට ක්‍රියාව මහජනයා මඬ්‍යයෙහි ප්‍රකාශ විය. ඉක්බිත්තෙන් එපවත් ඇසූ භික්ෂූන් වහන්සේගෙන් සමහරක් දෙනා වහන්සේ රජගහනුවරින් සැවැත් නුවරට ගොස් සභාග භික්ෂූන් වැඩ හිඳිනා විහාර වල පාසිවුරු තැන්පත් කොට තබා බුදුන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව උන්නාහුය. සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන් හා පිළිසඳර කථා කොට කොතැන්හි වාසය කොට අවුදැයි විචාරා වදාළ කල්හි ස්වාමීනි බුදුරජානන් වහන්ස, රජගහ නුවර සිට ආම්හයි කීවාහුය. එතැන්හී තොපට අවවාද කරණ ආචාරීහු කවුරුදැයි විචාරා වදාළසේක. ස්වාමිනි මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේයයි දන්නුවාහුයි මහණෙනි මහාකාශ්‍යප ස්ථවිරයන්ට සැපදැයි විචාරා වදාළසේක. එසේය ස්වාමීන් වහන්ස උන්වහන්සේ සැපසේ වාසය කරණ සේක. එතකුදු උවත් උන් වහන්සේගේ සදධිවිහාරික සාමණේරයෙක් අවවාදයෙහි කිපී එම කාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ පන්සල ගිනිලා ගියා වේදැයි දන්වූ සේක. එබස් ඇසූ බුදුරජානන් වහන්සේ වදාරණසේක්. ඒ මහාකාශ්‍යප ස්ථවිරයන්ට ඒ නුවණ නැති තුච්ඡ සාමණේරයා හා එක්ව වාසය කිරීමට වඩා  හුදකලාව විසීම යහපත් වන්නේදැයි දම්පියාවෙහි මේ ගාථාවෙන් වදාළසේක.

ඒ කෙසේද යත්

චරං තෙ නාධිගච්ජෙය්‍ය සෙය්‍ය සදිසමත්තනො

එකචරියං දළහං කයිරා නත්ථි බාලෙ සහායතා

යන මේ ගාථාව  වදාරා නැවත ඒ භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට මහණෙනි එතෙම කුටි දූෂකයෙක් වූයේත් අවවාද දුන්නවුන් කිපුනේත් දැන් මතු නොවෙයි පෙරත් අවවාද දුන්නවුන්ට කිපී කුටී දූෂක වූයේ වේදැයි වදාරා එකල්හි එයින් වර්තමාන කථාව අත්‍යෝත්පත්ති කොට ගෙන ඒක්ෂණයෙහිම පූර්වේනිවාසානුස්මෘති ඥානයෙන් අතීත කාල ප්‍රවෘත්තිය දැන වදාරණ සර්වඥ රාජොත්තමයානන් වහන්සේ මේ කුටිදූෂක ජාතකයෙහි අතීත කාල ප්‍රවෘත්ති වූ කථා ප්‍රබන්ධය ගෙන හැර දක්වා වදාරණ සේක්. එම්බා මහණෙනි යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් චතුර්විධ සංග්‍රහ වස්තුවෙන් ජනරංජනය කෙරෙමින් රාජ ධර්මයෙන් අකොප්‍යව රාජ්ජය කරණ සමයෙහි පුරණ ලද බෝධිසමභාර ඇති මහ බෝසතානෝ සිංගිලි නම් පක්ෂි ජාතියෙක ඉපිද වැඩිවිය පැමිණ හිමාලය වන ප්‍රදේශයෙහි තමන් වහන්සේට සිත්කළු වූ වර්ෂා කාලයෙහි නෙතෙමෙන සේ කැදැල්ලක් කොටගෙන වාසය කරන්නේය. ඉක්බිත්තෙන් එක් වානරයෙක් වර්ෂා කාලයෙහි අවිච්ඡින්නධාරයෙන් නොපායා වස්නා කල්හි සීතයෙන් පෙලෙනා ලදුව වෙව්ලමින් දතින් දත්කා පහරමින් අවුත් බෝධිසත්වයන් සමීපයෙහි උන්නේය. බෝධිසත්වයන් වහන්සේ ජීවිත පීඩාවෙන් පෙළෙන්නා වූ වඳුරු දැක ඔහු හා කථා කරණ සේක්. එම්බා වානරය, තාගේ ඉස්මුදුන අතුල පතුල මනුෂ්‍යයන් බඳුවූ සටහන් ඇත්තේය. එසේ කල්හි තාගේ වාසය කිරීමට සුදුසු ගෙයක් නැත්තේය. කුමක් නිසා දැයි විචාළසේක. ඒ අසා වානරයා කියන්නේ එම්බා සිංගිලි පක්ෂිය ඒ සැබෑමය මාගේ ඉස මුදුන අතුල්පතුල් මනුෂ්‍යයන්ට බඳුවූයේය. එතකුදු වුවත් මනුෂ්‍යයන් කෙරෙහි නැත්තේය. එසේ හෙයින් මනුෂ්‍යයන් විසින් කටයුතු වූ ක්‍රියාවක් මා විසින් කොට ගන්ට නොහැක්කෙමි. එබැවින් වාසය කරන්ට ගෙයක් කොට ගත නොහෙමි කීයේය. ඒ අසා බෝධිසත්වයන් වහන්සේ වදාරණසේක්. එම්බා වානරය, මේ ලෝකයෙහි එකඟකොට නොපිහිටුවන ලද සිත් ඇති හෙයින් යුහුව පෙරළෙන සුළු ස්වාභාව ඇති ලඝුවූ ප්‍රවෘත්ති ඇති කෙළෙහි ගුණ නොදන්නා හෙයින් මිත්‍රද්‍රෝහී වූ නිරන්තරයෙන් අඛණ්ඩ කොට රක්ෂා කරණශීලාචාරාදී ගුණ ධර්මයක් නැති අඥානයාට කිසිකලෙකත් කායික චෛතසික සැපයට කාරණයක් නොවන්නේය. එසේ හෙයින් යහළු වඳුරාණෙනි ප්‍රඥාව උපදවා ගන්නා පිණිස තමාගේ දුශ්ශීල ස්වාභාව පහකොට ශීලාදී ගුණ ධර්මයෙන් යුක්තව ඒ ශීලාදී ගුණ රක්ෂා කොට ගෙන ශීත සුලඟින් පීඩා නොවී වාසය කිරීමට සුදුසු උපායක් කොට ගෙනැයි යනාදී අවවාද කළසේක. ඒ අවවාද අසා ස්වාභාවයෙන් ගුණ මකු දුෂ්ට වානර සිතන්නේ

SANHIDA LANKA

මූ නෙතෙමනතෙන උන් බැවින් තමුන්ගේ අහංකාර දක්වා පරිභව බෙනෙයි කියා උපන් ක්‍රෝධ චේතනාවෙන් ඉඳින් මුන් දැන් මේ කැදැල්ලෙහි සැපසේ ඉන්ට සලස්සන්නෙම් වේදැයි බෝධිසත්වයන් අල්වා ගන්නා පිණිස කැදැල්ලට පීනුයේය. බෝධිසත්වයෝ කැදැල්ලෙන් ඉගිල එක්තැනකට ගියේය. ඒ දුෂ්ට වානරතෙම කැදැල්ල සුන්බුන් කොට ගියේ වේදැයි වදාරා ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ කුටි දූෂක ධර්ම දේශනාව පූර්වපරසන්ධි ගලපා නිමවා වදාළසේක. එකල්හි ඒ කැදැල්ල බිඳු වානරයා නම් දැන් මේ කුටිදූෂක සාමනේරය, සිංගිලි පක්ෂි වූයේ දැන් තිලෝගුරු බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක

SANHIDA LANKA

# දද්දභ ජාතකය

තවද මෙසේ භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි තීත්ථිකයන් අරභයා මේ ජාතකය වදාරණසේක්.

ඒ කෙසේද යත්

ජේතවනාරාමය සමීපයෙහි තීත්ථික පරිබ්‍රාජිකාවරු වැද කණ්ටක තාපසව පඤ්චතාපන තාපස කුක්කුර ව්‍රතය යනාදීන් නොයෙක් තපස් කොට ඉඳිනාහ. ඒ දුටු භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේ අතින් විචාරණ සේක. ස්වාමීනි මුන් රකිනා වූ තපස් මහා උග්‍රතපස්ව මුන්ට මින් වන මාර්ගඵල විපාකයෙක් ඇද්දැයි විචාළසේක. සර්වඥයන් වහන්සේ වදාරණසේක්. මින් මුන්ට වන විපාකයෙක් නැත, මේ නිකම්ම තුච්ඡ දෙයක පොළොව පෙරලෙයි කියා දිවූ සාවා මෙනැයි වදාළසේක. ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ සිංහව ඉපිද වාසය කරණ කල්හි එක් සාවෙක් තල් ගස් හා බෙලි ගස් ඇති වනයෙක වාසය කෙරෙයි. තල් වක්කන්නතන් යට වැදහොත් තැනැත්තේ සිතන්නේ පොළොව පෙරලී ගහ ඒ නම් කුමක් කෙරෙම්දෝහෝයි සිතා ගෙන වැදහොත් බෙලි ගෙඩියක් තල් වක්වන්නක් පිට වැටින. සාවා තමා සිතූ සිතිවිල්ල නියාවට පොළොව පෙරලී ගෙන එති සිතා භයින් දිවන්ට වන. ඒ දුටු සාවෝ තා දිවන්නේ කුමක් නිසාදැයි විචාළ කල්හි සාවා කියන්නේ කින්ද තොප විචාරන්නේ පස්සේ පොළොව පෙරලීගෙන එයි. එසේ හෙයින් දිවම්යි කීහ. ඒ දුටු අනික් සාවුන් විචාරා සාවෝ දහසෙක් එක්ව දිවන්ට වන්හ. එවිට සාවුන් දිවන්නාහු දැක මුවෝ සාවුන් අතින් විචාරා සැබෑයි දිවන්නාහ. මුවන් අතින් විචාරා ඌරෝ දිවූහ. ඌරන් අතින් විචාරා ගෙරි දිවූහ. උන් අතින් විචාරා දිවියෝ වලස්සු  ගවරු කඟවේනු ඇත්තු අස්සු ව්‍යාඝ්‍රයෝ සිංහයෝ ඇතුළුවූ සිවුපාවෝ උනුන් අතින් විචාරා ඇත්තමයයි සිතා හතරයොත්නෙක ගැවසී සිටියාවූ සිවුපා සේනාව මූදූබත් වන්ට දිවූහ. මෙකියන සිවුපාවුන් දිවන තෙනට සමීපයෙහි වසන්නාවූ සිංහයෙක් සිවුපාවන් දිවන කාරණා විචාරම් සිතා තමා වැදහොත් පර්මතයෙන් එළියට පැන මහත් වූ සිංහනාද කොට සිටියේය. ඒ සිංහනාද අසා සිවුපාවෝ භය ගෙණ සිටියාහ. භයින් සිටියා වූ සිවුපාවුන් අතින් දිවන කාරණා විචාරම් සිතා විචාළ කල්හි පොළොව පෙරලී ගෙන එයින් දිවම්හයි සිංහයෝ කීහ. තොපට කීවෝ කවුරුදැයි  සිංහයන් විචාළ කල්හි ව්‍යාඝ්‍රයන්ගෙන් ඇසුම්හයි කීහ. ව්‍යාඝ්‍රයෝ ඇතුන් ගෙන් ඇසුම්හයි කීහ. ඇත්තු අසුන්ගෙන් ඇසුම්හයි කීහ. අස්සු කළවෙනුන් ගෙන් ඇසුම්හයි කීහ. කඟවෙනු ගවරුන්ගෙන් ඇසුමම්හයි කීහ. දිවියෝ ගෙරින්ගෙන් ඇසුම්හයි කීහ. ගෙරි මීමුන්ගෙන් ඇසුම්හයි කීහ. මීමුගොනන් ගෙන් ඇසුම්හයි කීහ. ගොනෝ ඌරන්ගෙන් ඇසුම්හයි කීහ. සාවුන් ළඟට ගොස් තොපට කීවෝ කවුරුදැයි විචාළ කල්හි මේ සාවා අපට අපට කීයේයයි සාවෝ තොරතුරු පෑහ. බෝධිසත්වයෝ ඒ සාවා කරා ගොස් සැබෑද පොළොව පෙරලී එන්නේයයි විචාළ කල්හි මම දිටිමි. ස්වාමීනි සැබව පොළොව පෙරලෙන්නා දුටුදැයි සාවා අතින් විචාළ කල්හි ස්වාමීනි මම මුදූබඩ තල්වනයක හා බෙලි වනයෙක් කෙරේ වාසය කෙළෙමි. එතැන් පටන් පොළොව පෙරලෙන්ට වන්නේයයි කිහ. බෝධිසත්වයෝ සාවා පිට හිඳුවාගෙන සාවා කී වචනයට සිංහයා නොපෑන සාවා බිම සිටුවා කොතන පටන් පොළොව පෙරලෙන්ට වනැයි කියවයි විචාළහ. මම එතැනට ගොසින් පාන්ට භය ඇත්තෙමි කියා නොගියේ බෝධිසත්වයෝ තෝ නොබා අසවල් තෙනයයි කියයි. දැන් එතැනට ගොසින් පානට භය ඇත්තෙමි. අසවල් තල්ගසමුල තල්වක්කන්නක් යට වැදහොත් තෙම් එතනටපටනැයි කීහ. බෝධිසත්වයෝ එතනට ගොසින් බලා සිතන්නාහු සාවා මේ තල්වක්කන්ට යට වැදහොත්තේ පොළොව පෙරලීගෙන ඒ නම් මම කොයියම්දෝහෝ සිත සිතා වැදහොත් කල බෙලි ගෙඩියක් තල්වක්කන්නක් පිට වැටුනු අඬ අසා භයින් පොළොව පෙරලති සිතාගෙන දිව්නියාවයි සිතා දෙවනුව සිවුපා සමූහයා උන් තැනට පැන සිව්පාවුන්ට කියන්නාහු සාවා තමා කෙරෙහි භයින් කී පමණක් විනා ඇත්තෙක් නොවෙයි කියා සිවුපාවුන් ඒ ඒ තැනට යවූහ. ඒ අර්ථයෙන් ප්‍රකාශ කරණ සර්වඥයන් වහන්සේ මහණෙනි සාවා කී බසින් එතක් සිවුපාවෝ පරීක්ෂා නොකොට මුදුබත්වන්ට ගිය ගමනේ සිංහයා එතන සිට පරීක්ෂා කොට නැවතු හෙයින් විනා මුදුබත්වන්නොවේද එමෙන් මුන්ගේ ව්‍රතය කිසි විපාකයක් දිලිය නොහෙයි කියා වදාරා මේ දද්දභ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි සිංහව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# බ්‍රහ්මදත්ත ජාතකය

තවද මෙසේ පූජ්‍ය වූ සර්වඥයන් වහන්සේ අලව්නුවර නිසා අග්ගාල නම් දේවාලයෙහි වාසය කරණසේක් කුට ශික්ෂාපදයක් අරභයා මේ ජාතකය දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

මෙහි වර්ථමාන කථාව යටකී මණිකණ්ට ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය. මෙය වනාහි භික්ෂූන් වහන්සේ කුළුපග උපාසකවරුන් අතින් උන් නොකමැති කරවා ලාභය ඉල්වීම කටයුතු නොවෙයි භික්ෂූහුනම් දැහැමෙන් සෙමෙන් ලත්දෙයක් විනා දසවිධ උපාසක වරුන්ගෙන් ඉල්වූකල විකෂ්ප වෙති. පෙර උත්තමයෝ පවා එක පත්කුඩයක් හා වහන්සඟලක් ඉල්වා ගතනොහී දොලොස් අවුරුද්දක් ලජ්ජාවෙන් උන්නෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස උත්තර පඤ්චාලරට යම්පිල්ල නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රාහ්මණව ඉපිද පඤ්ච කාමයෙහි ආදීනව දැක සෘෂි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව හිමාලය වනයට වැද වාසය කරන්නාහු ලුනු ඇඹුල් සෙවිනා පිණිස උත්තරපංචාල නුවරට ආවාහු රජ්ජුරුවන්ගේ මගුල් උයනෙහි වාසය කොට උදෑසනම නුවරට සිඟා ආහ. රජ්ජුරුවෝ තාපසයන්ගේ ඊර්යාපථයෙහි පැහැද වස් සාරමස උයනේ වාසය කරණ නියායෙන් ආරාධනාකොට තාපසයන් පවරා උපස්ථාන කළාහ. තාපසයෝ වස් අන්තයෙහි හිමාලවනයට යන්ට අභිප්‍රාය ඇතිව රජ්ජුරුවන්ගෙන් එක්පට වහන්සඟලක් හා පත්කුඩයක් ඉල්වා ගන්නා පිණිස අභිප්‍රා ඇතිව රජ්ජුරුවන්ට කන්නලව් කියම් සිතා යම්කෙනෙකු අතින් ඉල්වීම නම් ඇඬීමය. දෙන තැනැත්තො දෙවැනිව නැතැයි කිවුනම් ඒ දෙවැනි ඇඬීමය. මේ අප දෙදෙනාගේ අඬන ඇඬීම බොහෝ දෙන මැද කිම කටයුතු නොවෙයි කියා රජ්ජුරුවෙනි රහස කටයුත්ත තනිව කියන්නා අභිප්‍රාය ඇත්නම් හයි කිහ. රජ්ජුරුවෝත් ලඟසිටියවුන් පහ කරවා වදාළමැනවැයි කීහ. තාපසයෝ කියන්නාහු යම් කෙනෙකුන් අතින් යමක් ඉල්ලුකල ලැබේ හෝ නොලැබේ හෝ ඉඳින් මා ඉල්ලූ දෙය නැතැයි කිවුනම් රජ්ජුරුවන් සිත් කල කිරි මෛත්‍රී මදවෙයි සිතා පසුව දන්නෙම් වේදැයි සිතා කියා රජ්ජුරුවන් යවූහ. මෙම නියායෙන් දවසින් දවසම කියම් උත්සාහා කොට දොළොස් අවුරුද්දක්ම ඉක්මුනේය. රජ්ජුරුවෝ තාපසයන් වහන්සේ මාගෙන් ඉල්වීමක් ඉල්වන්ට සිතන්නේ දොළොස් අවුරුද්දක. අද මම උයනට ගොසින් තාපසයන් වහන්සේට බොහෝ දවසක් තපස්කොට ගිහිගෙයි ආලය ඇතිව නම් කටයුතු නොවෙයි. රජ්ජුරුවෝ නම් රාජ්‍යලෝභය ඇත්තේයයි කියා ලජ්ජාවෙන් නොයිල්වන දෙයක්වන අද රාජ්ජය ඉල්වූවත් දෙමි. රාජ්ජයෙන් අර්ධයක් ඉල්ලුවත් දෙමි සිතා තාපසයන් වහන්සේ කරා උයනට ගොස් වැඳ එකත්පස්ව හිඳ ස්වාමිනි මා අතින් නුඹවහන්සේ ඉල්වීමක් ඉල්වන්නේ දොළොස් අවුරුද්දක. අද නුඹ වහන්සේ මාගේ රාජ්ජය ඇතුළුවූ අභිප්‍රා යම් දෙයක් ඉල්ලුව මැනව දෙමි කිහ. එවිට තාපසයන් වහන්සේ  මහරජ මා ඉල්ලූ දෙයක් දෙව්දැයි කියා විචාරා රාජ්ජය දෙමි කීයම්. සෙසු වස්තුවක් නොලෙම්දැයි රජ්ජුරුවන් කී කල්හි එවිට තාපසයෝ කියන්නාහූ මහරජ අපි හිමාලය වනයට යන්න අභිප්‍රාය ඇත්තෙම්හ. වහන්සඟලක් හා පත් කුඩ ලබන්නා කැමැත්තම්හයි කීහ. රජ්ජුරුවෝ කියනනාහු මේපමණකින් පසුව මට මෙතෙක් දවස් නොකියේ ඇයිදැයි කීහ. මෙපමණ සඳහා මිනිසුන් වෙහෙසෙන්නේ ඇයිදැයි සිතා නොකිම් සිතා තාපසයෝ කියන්නාහු මහරජ, යම් කෙණෙකුන්ගෙන් නැතැයි කියා ඉල්වීම් එක් ඇඬීමෙක. ඉල්ලුකල නැතැයි කිම එක් ඇඬීමකි. මේ අප දෙදෙනාගේ ඇඬීම බොහෝ දෙනා දැකිම නපුරැයි සිතා තනිව කියම්මැයි කියේය. පංචාලවාසී ජනයන්ට උත්තම වූ රාජෝත්තමය. යම් කෙනෙකුන් අපට යමක් ඉල්වූ කල බොහෝ නොලැබෙයි සිතා නොයිල්වූයේය. අනික් කන්නලව්වෙක් මේ මිසක් නැත මෙපමණක්ම අපට සෑහෙයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු නුඹ වහන්සේ කී මේ ගාථාවෙහි ප්‍රසන්නවූ මම නුඹ වහන්සේට රාජ්ජයත් දෙමි රථ දහසකුත් දෙමි නුඹවහන්සේ කැමති පරිද්දෙන් මෙකී දෙය ප්‍රයෝජන උපමැනැවැයි කීහ. එවිට තාපසයෝ කියන්නාහු මහරජ පඤ්චකාමයෙහි ආදීනම දැක සෘෂි ප්‍රවුජ්ජ්‍යාවෙන් පැවිදිව හිමාලය මනයට ගියෙහි. එසේහෙයින් අපට වස්තුවෙන් ප්‍රයෝජන නැත. මේ පත්කුඩය හා වහන්සඟලක් පමනැයි කියා ආරගෙණ රජ්ජුරුවන්ට පන්සිල් රකුවයි අවවාද දී හිමායල වනයට ගොස් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් කම්වූ පරිද්දෙන් බඹ ලොව ගියහයි වදාරා මේ බ්‍රහ්මදත්ත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. තාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළසේකි.

SANHIDA LANKA

# තෘතියගොධ ජාතකය

තවද දශබලධාරීහු සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොහෙන් තපස් කරන්නාවූ නමක් අරභයා මේ ජාතකය දක්වන ලදී. එක් කොහොන් තපස් රක්නාවූ නමක් සර්වඥයන් වහන්සේට දැන්වූ කල්හි සර්වඥයන් වහන්සේ මහණෙනි මා දැන් මතුනොවෙයි පෙරත් කොහොන් කෙළේ වේදැයි වදරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයෝ ගොව ඉපිද එක් තුඹුසෙක වාසය කරන්නාහ. බෝධිසත්වයන් වාසය කරන්නාවූ ස්ථානයට නුදුරු තෙනක එක් කූට තාපසයෙක් වෙසෙයි. බෝධිසත්වයෝ මූ ගුණ ඇති තාපස කෙනෙක් දෝ හෝයි සිතා උන්ලඟට ගොස් වැඳ පුදා එන්නාහ එක් දවසක් ගෝමස් සහිතව භෝජනයක් උපාසකවරු ඒ තාපසයන්ට දුන්නාහ. තාපසයෝ මේ කුමන මාංසයක් දැයි විචාරා ගෝ මාංස යයි යනු අසා අප දකින්ට එන්නාවූ ගොයාන කෙණෙක් ඇත. උන් මරා මාංසය අනුභව කෙරෙමියි සිතා උපසාක වරුන්ට කියා සාල් ඵනු මිරිස් පත්කඩ ආදීවූ දෙය ගෙන්වා තබාගෙන පොල්ලකුත් සැසස කඩ යට තබාගෙන ගොයානන් එන පෙරමග බල බලා උන්නාහ. ඒ වෙලාවට ගොයානෝත් එතනට අවුත් තාපසයන් ඉඳිනා නියායෙන්ම අද තාපසයන් ඉඳිනා අහංකාරයම නපුරුයි සිතා යටි සුලගට ගොසින් තාපසයන් ඇඟින් අමන ගන්ධය ආඝ්‍රාණය කොට ගෝමස් කෑ නියාව නියම දැන ඉවතින් යන්නට වන්නාහ. තාපසයෝත් තමන් ළඟට නෑවිත් ගොයාගේ වලාධිය ලඟින් නික්මෙන්නා කසකඩ යටතිබූ පොල්ල ඇරගෙණ දමාලා ගැසීය. දමාලූ පොල්ල ගොයාග් වලධිය ගෑවිගත ඉවත පලාගියේය. එවිට ගොයා වහා දිවගෙන ගොස් තුඹුසට වැද ගියේය. එවිට තාපසයා කියන්නේ මා අතින් ගොයා ගැලවී ගියේ වේදැයි කීය. එවිට බෝධිසත්වයෝ කියන්නාහු තා අතින් මා ගැලවුනු පමණක් විනා තෝ සතර අපායෙන් නො ගැලවුනේ වේදැයි කියා තුඹුසට වැද අනික් තුඹස් කටකින් ඉස එලියට පොවා එම්බල තාපසය. තා කසාය වස්ත්‍රයකුත් පොරවා අඳුන් දිවි සම්නි හා ජටාවෙනුත් කම්කිම්දැයි කීහ. එවිට තාපසයා කියන්නේ එම්බල ගොයානෙනි මාගේ ගෙයි සාල් තෙල් ඵනු මිරිස් ආදීවූ දෙය ඇත. ඇවිත් ඒ ඇම කාපියවයි කීහ. එවිට ගොයා කියන්නේ තාගේ සාල් ඵනු මිරිස් තෙල් ආදීවූ දෙයින් මට ප්‍රයෝජන නැත. මා ඉඳිනා තුඹස ගැඹුර සියක් රියනක් පමණ ඇතැයි කියා භයගන්වා එම්බල තාපසය, තෝ මෙවක් පටන් මෙතන රැඳුනෙහි නම් තාගේ ප්‍රවෘතිය උපාසකරුන්ට කියමියි කීහ. ඒ තාපසයාත් එතකින් පලාගියේයයි වදාරා මේ ගොධ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කූටතාපස නම් මෙසමයෙහි කූට භික්ෂූහුය. ගොධව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළ සේක.

SANHIDA LANKA

# වම්මසාටක ජාතකය

තවද මෙසේ පූජාර්හවූ සර්වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වම්මසාටක නම් පරිබ්‍රාජකයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

වම්ම සාටක නම් පරිබ්‍රාජකයෙක් සැවැත්නුවරට යන්නාහු පොර අන්නා එළුවන් දෙන්නකු දැක නවතන්ට යයි සිටියාහ. ඉන් එළුවෙක් පරිබ්‍රාජකයන් දැක පසුබස්නේය. පරිබ්‍රාජකයෝ තමන්ට ආදර කෙරෙතියි සිතා කොයිත් නොගොසින් සිටියාහ. එළුවා දිවගෙන අවුත් පරිබ්‍රාජකයන්ගේ කලවය ඇන පලාගියේය. මේ කථාව ධම්සභාමණ්ඩපයෙහි රැස්වූ සංඝයා වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා ආරාධිත වූ සර්වඥයන් වහනසේ ඉකුත් වත් දක්වා වදාළසේක.

එ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි වම්ම සාටක නම් පරිබ්‍රාජිකයෙක් විථියේ යමින් සිටිටේට. එළුවෝ දෙන්නෙක් පොරඅනිමින් සිටියාය. පරිබ්‍රාජිකයෝ එළුවන් දෙන්නා පොර අන්නා දැක නවතිම්යි සිතා සිටිකලට ඉන් එක් එළුවෙක් පරිබ්‍රාජිකයන් දැක පසුබස්නේය. පරිබ්‍රාජිකයෝ එළුවා තමන්ට සංග්‍රහ කරණ නිසා පසුබතියි සිතා කියන්නාහූ උතුම් ජාති ඇති බැටළුවානෝ මාගේ විශේෂ දත්සේය. එසේහෙයින් මම තොප වදිමි මමත් උතුම් ජාති ඇති බ්‍රාහ්මණ කුලයෙක උපනිම්යි කිය කියා සිටිකල්හි පිළ උන් සෙට්ටියෙක් පරිබ්‍රාජිකයන්ට කියන්නාහූ එළුවා පසුබසිනේ ඇවිත් අන්ටය ඉවත්ව ගනුවයි කියදිත් පරිබ්‍රාජිකයෝ ඉවත් නොවි සිටියාහ. එළුවා දිවගෙණ අවුත් පරිබ්‍රාජිකයන්ගේ කලවය ඇන හෙලාගත. ඒ අර්ථය දක්වන සර්වඥයන් වහන්සේ මහණෙනි, බ්‍රාහ්මණ එළුවාට ස්තුතිකොට සිටිය ගමනේ එළුවා ඇවිත් කලවය ඇනහෙළා පියවයි වදාළසේක. බ්‍රාහ්මණයත් විථියේ ඇනුම් කා වැදහෙව කෙඳිරි ගගා කියන්නෝ යහපත් නියාව සත්පුරුෂ කමෙක යහපත් එකෙකැයි කියා නමස්කාර කළදීම ඇවිත් ඇවිත් එලාගෙන කලවය පලා ජීවිතක්‍ෂයට පමුණුවාපියයි වදාරා මේ වම්මසාටක ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි පරිබ්‍රාජික නම් මෙසමයෙහිත් වම්මසාටක පරිබ්‍රාජිකමය, පිළඋඩ උන් සෙට්ටියා නම් බුදුවූ මම්මයයි වදාළසේකි.

SANHIDA LANKA

# කක්කාර ජාතකය

තවද සියළු සත්වයා ජාතිකාන්තාරයෙන් එතර කරණ හෙයින් ශාස්තෘ නම් වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් දවසක් දම්සභාවේ රැස්වූ සංඝයා වහන්සේ දේවදත්ත ස්ථවිරයන් සංඝභේදය කියා සංඝයා බිඳුව අකුසලයෙන් රත්පිත් නගා බොහෝ දුකට පැමිණියෝ වේදැයි කිය කියා උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි පෙරත් මෙතම මූසාවාදා කියා බොහෝ දුකට පැමිණියෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි දොළොස් යොදුන් බරණැස් නුවර දිව්‍යපුත්‍රයෝ සතරදෙනෙක් කක්කරී නම් මල්සොළු සතර බැඳගෙන අවුත් ආකාශයෙහි සිටියාහ. එ මලෙහි සුගන්ධ දොළොස් යොදුන් බරණැස් නුවර ඒකසුගන්ධව ගියේය. එවිට මනුෂ්‍යයෝ මේ කුමන සුගන්ධයක්දැයි කියන්නට වන්නාහ. එවිට දිව්‍ය පුත්‍රයෝ සතරදෙන ආකාශයෙහි දිව්‍යාත්මභවයෙන් සිට මේ කක්කාරිය මලෙ හිමල්ලැබ ඉන් එක් පුරුෂයෙක් කියන්නේ තොපට දිව්‍යලෝකහි මල් ලැබෙයි මට තෙල් මල් සොළුව දිපියවයි කීහ. ඉක්බිති එක් දිව්‍යපුත්‍රයෙක් කියන්නේ යමෙක් තෙමේ අනුන් සන්තක තෘණ්ණසලාක මාත්‍රාවකුදු ඇර ගනිද යමෙක් තෙම වචසින් මුසා බොරු ජීවිත පරිත්‍යාග කෙරෙත්මුත් නොකියාද හෙවත් යමෙක්තෙමේ  කායවර වච්චාරයෙන් වදනා දස අකුසල කර්ම පථයෙන් දුරුකොට දසකුසල කර්ම පථයෙහි යෙදී වාසය කෙරේද යමෙක් තෙම ඓශ්වර්යයක් ලදින් අකුශල කර්මපථයෙහි අප්‍රමාද වේද එබඳු උත්තම පුරුෂ තෙමෙ දෙවියන් පලඳිනා කක්කාරික දිව්‍ය පුෂ්ප සතර ප්‍රසාධනය කරන්නට සුදුසු යයි කීහ. එවිට බ්‍රාහ්මණයා මෙකී ගුණයෙන් මට එකගුණයකුත් නැත, බොරු කියා මේ දිව්‍ය පුත්‍රයා අතින් මල්සොළුව ඇරගත මැනවැයි තමාගේ නැතිගුණ ඇතැයි කියා ඒ දිව්‍ය පුත්‍රයා අතින් මල් සොළුව ඉල්වාගෙණ අනික් දිව්‍ය පුත්‍රයා අතින් මල්සොළුව ඉල්විය. ඒ දිව්‍යපුත්‍ර කියන්නේ යමෙක් තෙමේ කෘෂිවනික් ආදීවූ ධාර්මික ජීවිකාවෙන් වේවයි රාජකාරිය කිරීමෙන් වේවයි විරති රජත ස්වර්ණ යනාදී වස්තු ධාර්මික වූ ජීවිකාවෙන් සොයන්නේද යමෙක් තෙමේ වචනාදී ප්‍රයෝගයෙන් මෙරමා සන්තක වස්තුව නොගනීද යමෙක් තෙමේ වස්ත්‍රාභරණාදීවූ උපභෝග පරිභෝග වස්තු ලදින් දස අකුශල කර්මපථ දුරුකොට කුසලකර්මපථය යෙදී අප්‍රමාදව වාසය කෙරේද එබඳු උත්තම පුරුෂ තෙමේ කක්කාර දෙවියන් ප්‍රසාධනය කරන්නාවූ කක්කාර නම් දිව්‍ය පුෂ්පය පලඳින්ට යොග්‍යයයි කීය. එවිට බ්‍රාහ්මණ මෙකී ගුණයෙන් එක් ගුණයක් මා කෙරේ නැත. බොරු කියා මූ අතින් මල්සොළුව ගනිමියි තමාගේ නැතිගුණ ඇති නියාවට අඟවා ඒ දිව්‍ය පුත්‍රයා අතින් මල්සොළුව ඇරගෙණ අනික් දිව්‍යපුත්‍රයා අතිනුත් ඉල්වීය.  ඒ දිව්‍ය පුත්‍රයාත් කියන්නේ යමක්හුගේ සිත වහා නොබිඳේද ක්ෂණයෙක්හි අස්වාමිව මායා විරියෙහි වැදගත් කසා පරිද්දෙන් ස්වභාව ඇත්තේද යමක්හුගේ ශ්‍රද්ධා ලෞකික ලෝකෝත්තර තොමෝ කිසිවක්හු විසින් නොබිඳවිය හැකිද හුදකලාව මියුරු රසයක් ලබන්ට සුදුසු ශ්‍රමණ බ්‍රහ්මණයන්ට නොදී අනුභව නොකෙරේද ඒ පුරුෂ තෙමේ මෙකී ගුණයෙන් එකකුත් මට නැත. බොරු ගුණ කියා මල් සොළුව ගනිමියි සිතා තමාගේ නැති ගුණ කියා ඒ දිව්‍යපුත්‍රයා අතින් මල්සොළුව ඇර ගෙණ සතරවෙනි දිව්‍යපුත්‍ර අතිනුත් මල්සොළුව ඉල්විය. ඒ දිව්‍යපුත්‍රයා කියන්නේ යමෙක් තෙමේ සම්මුඛයෙහි වේවායි අසම්මුඛයෙහි වේවායි ශිලශ්‍රැතාදී ගුණයෙන් යුක්ත පුරුෂතෙමේ මේ කක්කාරී නම් දිව්‍ය ප්‍රසාධනය කරන්ට සුදුසුයයි කීය. එවිට බ්‍රාහ්මණ තෙමේ මෙකී ගුණයෙන් එකගුණයකුත් මා කෙරේ නැත. මාගේ නැති ගුණකියා මූ අතිනුත් මල්සොළුව ඇරගනිමයි බොරුකියා ඒ දිව්‍යපුත්‍රයා අතිනුත් මල්සොළුව ඇරගෙණ ඉස බැඳගතිමි. ඒ වෙලෙහි පටන් මට ඉස රුජාව පැහැර බොහෝ දුක්බයයි කීය. එසේකල තා හිසින් මල් සොළුව ඇරපියවයි කීහ. අරින්ට වන්විටත් ඉසින් නොහැරෙයි බ්‍රාහ්මණයා බොහෝසේ පෙලෙන්නේය. රජ්ජුරුවෝ කළමනා කිත්දැයි අමාත්‍යයන් විචාළාහ. අමාත්‍යයෝ කියන්නාහු ස්වාමිනි. දෙවෙනිවත් නුවර සරහා උත්සව කෙළිම්හ. දිව්‍යපුත්‍රයෝ සතරදෙන එවිට එන්නාහු උන් ආකල ඉස රුජාව ගුණකරම්හයි කීහ. රජ්ජුරුවෝත් යහපත ඒ ක්‍රියාවට පූජාකරවයි කියා නුවර සරහා පූජාව පටන්ගත් කල්හි දිව්‍යපුත්‍රයෝ සතරදෙනා ආහ. එවිට බ්‍රාහ්මණ දිව්‍යපුත්‍රයන් සතරදෙනා වැඳගෙන හෙව ස්වාමිනි. මම මගේ නැති කියා මල්වට ඇරගතිමි ප්‍රාණ දානය දුනමැනවැයි කීය. එවිට දිව්‍යපුත්‍රයෝ සතරදෙනා, බොරු කිවාසේ විපාක දුටුයේද මෙවක්පටන් බොරු නොකියවයි අවවාද කියා මල්වට සතර ඔහු හිසින් ඇරගෙණ දිව්‍යලෝකයට ගියහයි වදාරා මේ තක්කාර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බ්‍රාහ්මණයා නම් දේවදත්ත ස්ථවිරය. දිව්‍යපුත්‍රයා සතරදෙනාගෙන් එක්කෙනක් කාශ්‍යප ස්ථවිරය, එක්කෙනෙක් මුගලන් මහා ස්ථවිරය, එක්කෙනෙක් කාශ්‍යප ස්ථවිරය. වැඩිමහළු දිව්‍යපුත්‍රයා නම් බුදුවූ මම් ම වේදැයි වදාළසේකී.

SANHIDA LANKA

## තෘතිය කාක ජාතකය

තවද සියලු සංස්කාර ධර්මයන් ගුරුපදේශයක් නැතිව ස්වයම් භූඥානයෙන් දත්හෙයින් සර්වඥ නම් වූ බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් කෙරෙහි තෘෂ්ණාවූ භික්‍ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් ස්ත්‍රියක් කෙරේ අභිලාෂ වූ භික්‍ෂු කෙණෙකුන් වහන්සේ ගෙණවුත් සර්වඥයන් වහන්සේට දක්වූ කල්හි සැබෑද මහණ තා ස්ත්‍රියක් කෙරෙහි තෘෂ්ණා ඇතිවුයේදැයි විචාළ කල්හි සැබැව ස්වාමිනි කී කල්හි ඒම්බල මහණ ඉඹුල්වනයෙහි ලා රැකගත නුහුන ස්ත්‍රීන්ට තොප ආලය කරන්නේ කවරකටදැයි වදාරා, ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ගේ බිසවුන්කුස පිළිසිඳ ඉපිද වැඩි විය පැමිණ පිය රජ්ජුරුවන්ගේ ඇවෑමෙන් රාජ්ජ්‍යයට පැමිණියාහ. රජ්ජුරුවන්ගේ කාකදේවි නම් අග්‍රමෙහෙසිකා බිසෝකෙණෙක් ඇත්තාහ. ඉතා විශේෂී වූ රූප ඇත්තාහ. ඒ බිසවුන්ගේ රූපශ්‍රී ඉදිරියෙහි කියන්නාවූ කුනාල ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. ඒ රජ්ජුරුවන් හා එක් ගුරුලෙක් මනුෂ්‍ය වේශයෙන් අවුත් රජ්ජුරුවන් හා කැටිව දුකෙළි කෙළ උන්නේය. කලාතුරකින් බිසවුන් කෙරෙහි අභිලාෂ ඇතිව තමාගේ ඉඹුල් වනයේ තබාගෙණ ඉදිනේය. රජ්ජුරුවෝත් බිසවුන් නොදැක මාගේ බිවස්කොයි පලාගියේදෝහෝයි විකෙෂ්පයට පැමිණියාහ. නටටකවිරූ නම් ගාන්ධර්වයෙකු කැඳවා මෙපවත් කියා තා දන්නා යම් සැටියකට බිසවුන් ගිය යම් තැනක් පරීක්ෂා කරවයි විධාන කළාහ. ඒ ගන්ධර්වයාත් මට කාරණා කින්දැයි පරීක්‍ෂා කොට අනික්කාරණයක් නොදැක රජ්ජුරුවන් වහන්සේ හා දු කෙළිනා පුරුෂයා වින අනික් සැකයෙක් නැත. මූ පරීක්ෂා කරන්නට උවමැනවැයි රජ්ජුරුවන් හා දූ කෙළාපියා ගුරුලා නික්මෙන්නාවූ පසුපස්සේ ගොසින් තමාගේ යෙල සියයක් යොදුන් ගුරුළු වේසය මවා ගන්නා පියාපත් අස්සේ ගාන්ධර්වයා  සැඟවී වැද උන්විට ගුරුළු රාජයාත් සමුද්‍රමධ්‍යයෙන් ගොස් ඉඹුල් වනයට ගියේය. ඒ ගාන්ධර්වයාත් ඒ බිසවුන් හා කැටිව සංවාසයකොට කීප දවසක් ඉඹුල් වනයේ රඳා දෙවෙනිවත් ගුරුළු රාජයාගේ පියාපත් අස්සේ සැඟවී අවුත් ගුරුළුවා හා සමග රජ්ජුරුවන් දූ කෙළිනා තැනසිට මේ වෙලාවට කාකදේවී ගුරුළු විමානයෙහි ඉදිනා නොවේදැයි කීහ. එවිට ගුරුළා කියන්නේ මහාසමුද්‍රය හා ගංගාවක් හා සිදන්ත සාගරය ඇතුළු වූ සන්තිමහා සාගරයෙන් එපිට ඉඹුල්වනයෙහි කැදැල්ලේ උන්නාවූ බිසවුන් තා දුටුවේ කෙසේදැයි කීහ. එවිට ගාන්ධර්වයා කියන්නේ තොපගේ පියාපත් අස්සේ සැඟවිගෙණ ගොසින් තොපගේ ඉඹුල්වනයේ දෙතුන් විටක් රඳා දෙවැනිවත් තොපගේම පියාපත් අස්සේම සැඟවිගෙන ආමි කීහ. එවිට ගුරුළු රාජයා මෙසේවූ තැන ඉඳත් රැකගත නොහැක්කාවූ ගෑනුන් මට ප්‍රයෝජන කින්දැයි බිසවුන් ගෙනවුත් රජ්ජුරුවන්ට පාවාදී එවක්පටන් රජ්ජුරුවන් හා කැටිව දූ කෙළින්ට නොආයේයයි වදාරා මේ කාක ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි නට්ටකවිරූ නම් ගාන්ධර්වයා දැන් මේ උකටලී භික්ෂූහුය. බරණැස් රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# අනනු සොචිය ජාතකය

තවද දීපදොත්තමවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි භාර්යාවක් මළාවූ කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් කෙළඹි පුත්‍රයෙකුගේ බිරින්දක් මළාය. ඒ කෙළෙඹි පුත්‍ර තමාගේ බිරින්ද මළාවූ ශෝකයෙන් බොහෝ විකෙෂ්පව උන්නේය. සර්වඥයන් වහන්සේ ඒ කෙළඹි පුත්‍රයා සෝවාන්වන්ට හේතුසම්පත් ඇති නියාව දැක වදාරා කුඩා භික්ෂු කෙණෙකුන් වහන්සේ පස්සේ යවා කෙළඹි පුත්‍රයාගේ ගෙට වැඩවදාළ සේක. කෙළඹි පුත්‍රයා සර්වඥයන් වහන්සේට ඉදිනා අසුන් පණවා වැඳ එකත් පස්ව උන්නේය. සර්වඥයන් වහන්සේ කිමෙක්ද උපාසකය විකෙෂ්ප උනායි වදාළසේක. කෙළඹි පුත්‍රයා කියන්නේ ස්වාමිනි මාගේ බිරින්ද මළ හෙයින් විකෂෝපව උන්නෙමි කීහ. සර්වඥයන් වහන්සේ වදාරණ සේක්ත උපාසකය නස්නා සුළුවූ යම්දෙයක් නස්සී මළවුන්ට ශෝක කරන්නට කාරණා කින්ද . පෙර උත්තමයෝ මළවුන්ට ශෝක නොකළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය පාලන කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රාහමණ කුලයෙක කුමාර බ්‍රහ්මචරියායෙන් වාසය කරන්නාහ. මෙහි වර්ථමාන කථාව දසවෙනි නිපාතයෙහි චුල්ල බෝධි ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මව්පිය දෙදෙන අපගේ පුතනුවන්ට ඇස්සමුවේ
චුල්ල බෝධි ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මව්පිය දෙදෙන අපගේ පුතනුවන්ට ඇස්සමුවේ
කුටුම්බසණ්ඨාපනය කරන්ට උවමැනවැයි කියා පුතනුවන් කැඳවා කියන්නාහු තොපට නිසි බ්‍රාහ්මණ කුලයකින් කුමාරිකාවක් පරීක්ෂා කොට කියවයි කීහ. එවිට බෝධිසත්වයන් වහන්සේ කියන සේක් මට ගිහි ගෙයින් කම්කිම්ද, නුඹ වහන්සේලා දෙදෙන අතිතෙක් දවස් අත් පා මෙහෙකොට නුඹ වහන්සේගේ ඇවෑමෙන් වනයට ගොස් තපස් කෙරෙමි. මට බිරින්දගෙන් කම් කිම්දැයි කීහ. එවිට බෝධිසත්වයන්ගේ දෙමාපියන් කිපවාරයෙකම කුටුම්භ සන්ඨාපනය කළ මැනවයි කීයා යවූ කල්හි බෝධිසත්වයන් වහන්සේ දෙමාපියන් කීවාට උත්තර කීම සත්පුරුෂයන්ට යුක්ති නොවෙයි. මාගේ දෙමව්පියන්ට බැරි දෙයක් කියායවමි. රන් රුවක් කරමි. මේරු නියාවට රූපත් කුමාරිකාවක් ලදිමි නම් ගිහිගෙයි වාසය කෙරෙමියි රන්රුවක් කරවා දෙමාපියන් ලඟට යව්හ. මව් පියෝ දෙදෙනත් යහපතැයි කියා රන්රූ රථයක තබා මේ රන්රුව නියාවට කුමාරිකාවක් පරීකෂා කොට එවයි බමුණන්ට ප්‍රසාද දී යවූය. ඒ රන්රුව ඇරගෙණ නුවරක් නුවරක් පාසා ඇවිදිනා කල්හි බඹ ලොවින් චුතව බ්‍රහ්මණයෙක් අවුත් එක් කසීගමෙක බමුණු කුලයක සම්මිල්ලවාහිනි නම් කුමාරිකාව උපන. මග යන බමුණෝ ඇයි සම්මිල්ලවාහිනි නම් කුමාරිකාව මෙතන සිටිනැයි කීහ. එවිට බමුණෝ එතනට අවුත් මේ රන්රුව හා සාදෘෂ්‍ය කුමාරිකාවක් ඇද්දැයි විචාරා ඇත. යනු අසා ඒ රන්රුව ඇරගෙණ ඒ බ්‍රාහ්මණයාගේ ගෙට ගොසින් එපවත් කීහ. ඒ කුමාරිකාවගේ දෙමව්පියෝ යහපතැයි ගිවිස එපවත් කුමාරිකාවන්ට කීහ. ඒ කුමාරිකාවගේ දෙමව්පියෝ යහපතැයි ගිවිස එපවත් කුමාරිකාවන්ට කීහ.කුමාරිකාව බ්‍රහ්මලෝකයෙන් ආ හෙයින් පඤ්චකාමයෙහි ඇල්මක් නැතිව කියන්නාහූ නුඹ වහන්සේලා දෙදෙන ජීවත්ව ඉන්නාතෙක් දවස් අත් පා මෙහෙකොට නුඹ වහන්සේලා ඇවෑමෙන් තපස් කෙරෙහියි කීහ. එවිට දෙමාපියයෝ මුන්කීවාද අප කරන්නේ. මු උරණව කුමක් කෙරෙද්දැයි කීයා නොකැමැති කරවාම සරණපාවා දුන්හ. ඒ බමුණෝත් කුමාරිකාව ගෙණගොස් බෝධිසත්වයන්ගේ දෙමාපියන්ට පෑහ. බෝධිසත්වයන්ගේ දෙමාපියෝත් කුමාරිකාව දැක සතුටුව බෝධිසත්වයන් නොකැමැති කරවාම එකගෙයිලා විවාහ මගුල කළහ. ඒ කුමාරිකාවත් බඹලොවින් ආ හෙයිනුත් උන්ගේ මුහුන පමණකුත් කෙලෙස් වශයෙන් නොබලා බඹුන් දෙදෙනකු මෙන් වාසය කරන්නාහ. මෙසේ වාසය කරණ කල්හි බෝධිසත්වයන්ගේ දෙමව්පියෝ කාලක්‍රියා කළහ. ඒ බෝධිසත්වයෝ දෙමව්පියනේ ආදාහන කරවා තමන්ගේ සම්මිල්ලවාහිනි නම් භාර්යාවන්ට කියන්නාහු සොඳුර මාගේ දෙමවාපියන්ගෙන් ගෙනා අසූකෙළක් වස්තු ඇත. මාගේ වස්තුවත් තොපගේ වස්තුවත් ඇරගෙණ ජීවත්වුව. මම තපසට යෙමි කීහ. සම්මිල්ලවාහිනි නම් කුමාරිකා කියන්නී නුඹ වහන්සේ අළුයම දමාපු කෙළපිඩක් මාගේ ඉස්මුදුනෙන් පිළිගන්නාක්මෙන් නුඹ වහන්නේ ඇරපු සම්පත් මම පිළිගණිම්ද නුඹ වහන්සේ තපසට යනකල මම තපසට නොයන්නෙම්දැයි මමත් තපසට යෙමි කීහ. බෝධිසත්වයන් වහන්සේත් යහපතැයි ගිවිස වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවැදිව පන්සල් කොට වාසය කරන්නාහු කල්යාමකින් ලුනු ඇඹුල් සෙවුනා පිණිස බරණැස් නුවරට අවුත් ගෙපිළිවෙළින් සිඟා ඇවිදිනා කල්හි සම්මිල්ලවාහිනී නම් පරිබ්‍රාජිකාව පළමු දුකක් නුදුටු හෙයිනුත් මෘදුවූ ශරිර හෙයිනුත් උනුසිහිල්බත් වැලදීමෙන් රක්තාතීසාය ඇතිවිය. බෝධිසත්වයන් වහන්සේත් පරිබ්‍රාජිකාවන් වඩාගෙණ ගොස් වාසය කළ තමන්වහන්සේ සිඟාසේත්

SANHIDA LANKA

එනකල සම්මිල්ලවාහිනි නම් පරිබ්‍රාජිකාවන්ගේ ප්‍රාණය නිරුද්ධව ගියේය. බොහෝ මනුෂ්‍යයෝ එක්ව මෙසේවූ රූපශ්‍රීයක් ඇති පරිබ්‍රාජිකාවන් නටනියායයි කිය කියා අඬන්නාහ. බෝධිසත්වයයෝ එතනට ගොස් මළ පරිබ්‍රාජිකාවන් දැක නටමනා වස්තුව නැසුනේයයි සිත සිතා උන් මිය පියා වැදහෝනා පෝරුව මත්තේ ඉන්දදීම බත් වළඳා අත කට සෝදා බැණ නොනැගීම උන්නාහ. එවිට එතනට රැස්වූ මනුෂ්‍යයෝ තාපසයන් වහන්ස. මේ පරිබ්‍රාජිකාවන් වහන්සේ ගිහිකල නුඹ වහන්සේ කෙසේ වාසය කළසේක් දැයි විචාළාහ. එම්බා මුනුෂ්‍යයෙනි. මේ පරිබ්‍රාජිකා මා ගිහිකල මට පාදපරිචාරිකාව උන්හයි කීහ. එවිට මනුෂ්‍යයෝ කියන්නාහු ස්වාමිනි අපි හැම මේ පරිබ්‍රාජිකාවුන් වහන්සේගේ රූප ශ්‍රී දුටු පමණකට ලය වාවාගත නොහි බොහෝ දුකින් අඬම්හ. නුඹවහන්සේට පාදපරිචාරිකාව බොහෝ දුක්ගත් තැනැත්තන් වහන්සේ මිළදී බැනනොනැගී ඉඳිනේ ඇයි දැකි කිහ. එම්බා මනුෂ්‍යයෙනි. සම්මිල්ලවාහිනි ගිහි අවස්ථාවෙහි මට ඉතා මල්ගතුව වාසය කළාහ. දැන් වනාහී මිය ගොසින් මළවුන් හා එකීභාවයට පැමිණියෝය. එසේ හෙයින් දැන් ඕ කවුරුද ඕ තොමෝය. මම වෙනමමය. එසේහෙයින්ම උන්ට අඬා කාරියකිම්ද. මේ පැමිණෙන මුර්තුව නම් ඉන්දදීය. සිටියදීය. වැදහොත්දීය. ඇවිදිමින් සිටියදීයයි යන සතර ඉරියව්වෙන් කවර ඉරියම්වකදී මුර්තුවට ඇවිත් පැමිණෙන බවත් නොදනෙයි. නටමනා දෙය නස්නේමය. උපන්නේ සැබැවීනම් මූර්තුවට පැමිණිම සැබෑමය. මමත් වනාහී අජරාමර එක්කෙණෙක් නොවෙමි. මමත් මූර්තුවට පැමිණෙන්නෙමි තමාට අඬන පමණක් විනා අනුන් මළාට ඇඬීමෙන් කාරියකින්දැයි වදාරා බොහෝ දෙනාගේ ශෝක සංසිඳුවා හිමාලය වනයට වැඩ පඤ්ඤාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා චතුරාර්ය සත්‍යය ප්‍රකාශ කොට මේ අනනුසෝචිය ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර කෙළඹි පුත්‍රතෙම සෝවාන් පෙළෙහි පිහිටියාය. එසමයෙහි සම්මිල්ලවාහිනි නම් වූ බිසව් මෙසමයෙහි රාහුල මාතාවූ යසෝධරා ස්ථවිරය. තාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේකී.

SANHIDA LANKA

# කාලබාහු ජාතකය

තවද විසුද්ධිබුද්ධ සන්තාන ඇති අතුල්‍යවූ ස්වභාවයෙන් තුන්ලොවට උතුම්වූ සම්මා සම්බුදු රජානන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වාසය කරණ සමයෙහි පිරිහුනු ලාභ සත්කාර ඇති දේවදත්ත ස්ථවිරයන් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද යත්

දේවදත්ත ස්ථවිරයන් විසින් බුදුන් කෙරෙහි නිස්කාරණයෙහි වෛර බැඳ දුනුවා ආදීන් යෙදූ කල්හි නාලාගිරි හස්තියා බුදුන් අභිමුඛයට මෙහෙයි ඒ දේවදත්ත ස්ථවිරයන්ගේ දෝෂ ගම් නියම්ගම් රාජධානියෙහි ප්‍රකාශ විය. ඉක්බිත්තෙන් ඒ දේවදත්ත ස්ථවිරයන්ට නිරන්තරයෙන් පවත්වන ලද ආහාර දිය මනුෂ්‍යයෝ පිරිහෙළුවාහුය. යහළුවූ අජාසත් රජ්ජුරුවෝද ඒ දේවදත්ත ස්ථවිරයන් කෙරෙහි අගෞරවව ඔහුගේ මුහුණ පමණකුත් නොබලා නිස්සා කොට අරපූයේය. එතෙම පිරිහුනාවූ ලාභසත්කාර ඇතිව කුලයන් විනවා වළඳන්නේය. මේ කාරණය ධම්සභා මණ්ඩපයෙහි වටින් රැස්වූ භික්ෂූන් වහන්සේලා වදාරණසේක් ඇවැත්නි දේවදත්ත ස්ථවිරතෙම තමාහට ලාභසත්කාර උපදවමින් උත්සහකොට උපන් ලාභසත්කාර ස්ථිරකොට පවත්වන්ට නොහැකි වූයේයයි යන මෙබඳු කථාවකින් පහළ කළාහුය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ ධම්සභා මණ්ඩපයෙහි ඉපද වූ කථාව දිව්‍යකණින් අසා වදාර එක්තරා ගමනකින් එතැන්හි වැඩ, එම්බා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා ස්වාමිනි නුඹ වහන්සේ විසින් නොකියන්ට වදාළ රාජ කථා ආදීවූ දෙතිස් කථාවෙන් එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. දේවදත්ත ස්ථවිරයෝ තමන් ලාභසත්කාර උපදවම් උපන් ලාභසත්කාර ස්ථිරකොට ගත නුහුණුවෝවේදැයි යනාදීන් කිය කියා උනුම්හයි බුදුන්ට දන්වූ කල්හි මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් දේවදත්ත ස්ථවිරයෝ ලාභසත්කාරයන් පිරිහුණෝ වේදැයි වදාරා භික්ෂූන් විසින් ස්වාමිනි තිලෝගුරු බුදුරජානන්වහන්ස අතීත චරියාව භවයෙන් ප්‍රතිච්ඡන්න හෙයින් හස්ම ප්‍රතිච්ඡන්න ජාතවේදයක් සෙයින් අපට නො පෙණෙන්නේය. දැනෙන පරිද්දෙන් අපට වදාළ මැනැවයි ආරාධිත වූ බුදුරජානන් වහන්සේ මහණෙනි.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි පුරණලද පාරමිතා ඇති අප මහබෝසතානෝ රාධනම් ගිරාව උපන්හ. ඒ ගිරාණෝ සෙසු ගිරවුන්ට වඩා සම්පූර්ණ වූ ශරීර අවයව ඇත්තේය. ඔහුගේ මල්වූ පොට්ඨපාද නම් ගිරවෙක් විය. එසමමයෙහි එක්තරා වැද්දෙක් ඒ ගිරව් දෙන්නා බදාගෙණ ගොස් බරණැස් රජහට දුන්නේය. ඒ බරණැස් රජතෙම ගිරවුන් දෙන්නා රන් මැදිරියෙක ලා රන්තැටිල්ලෙක්හි මී හා විළඳ ලා කවමින් සකීර්රා පැන් පොවමින් පෝෂ්‍ය කරන්නේය. මේ පරිද්දෙන් කරණ මහත් සත්කාරයෙන් ඒ ගිරවු ලාභයෙන් යසසින් අගපැමිනියහ. මෑතකාලයෙහි එක් වනචරයෙක් කල්බානු නම් එක් මහත් කළුවඳුරෙකු අල්ලා ගෙනගොස් ඒ බරණැස් රජහට දුන්නේය. ඒ වානරයාට පසුව ඉතා මහත් ලාභසත්කාරවිය. ගිරව් දෙන්නාට කරණ සත්කාරද ක්‍රමයෙන් අඩුවූයේය. මහබෝධිසත්වවූ රාධ නම් ගිරවාණෝ ඉතාදී ගුණයෙන් යෙදුනු බැවින් හෙවත් උතුම්වූ සත්පුරුෂ ගුණයෙන් යුක්ත බැවින් කිසිවකුත් නොකියා ලත් ලත් ගොචර පමණින් යැපෙමින් උන්නේය. ඔහුගේ මල්වූ පොට්ඨපාද නම් ගිරවා තෝ වනාහී එබඳු උතුම් ගුණධර්මයක් තමාගේ සන්තානයෙහි නැති හෙයින් ඒ වානරයාට කරණ සත්කාර සහනය නොකරන්නේය. බෑනන් වහන්ස පළමු මේ රාජභවනයහි මධුරවූ රස ඇති ඛාද්‍යාදීය දැන් ඒ කාලබහු වානරයාට මුත් අපට නැත්තේය. මේ ධනංජය රජුගෙන් ලාභසත්කාර නොලබන්නාවූ අපි දෙන්නා මේ ස්ථානයෙහි ඉඳ කෙසේ ජීවත්වමෝද අවමැනව වලට ගොස් වාසය කරම්හයි කියා රාධා නම් බෑනන්ට කීහ. ඒ අසා රාධා නම් ගිරවාණෝ කියන්නාහු එම්බල පොට්ඨපාදය මේ ලෝකයෙහි සියළු සතුන්ගේම යස සපිරිවාර සමෘද්ධිය ලැබිමකදු වන්නේය. නැවත එයින් පිරිහිමද වන්නේය. යම්සේ විශේෂගුණයක් හේතුකොට ගෙණ කීර්තිලැබීමක්ද නැවත ලද්දාවූ කීර්තියගේ මලිනාභාවයට පැමිණිමකුදු වන්නේය. එසේ හෙයින් සත්වයන් කෙරෙහි මේ අෂ්ටලෝක ධර්ම නිශ්‍රිතවූ අධ්‍යාත්මික බාහිර වූ සියලු සංකාර ධර්මයෝ නිත්‍යනොවන බැවින් ආද්‍රවවන බැවින් අනිත්‍යයහ. මේ යථොක්ත අෂ්ටලෝකධර්මයෙන් විනිර්මුක්ත එකද සත්වයෙක් නැත්තේය. එසේ හෙයින් ලාභසත්කාර අඩුවූ පමණකට ශෝක කිරීමෙන් ප්‍රයෝජන නැත්තේය. එසේ හෙයින් බෑගෑපත් නොවී බෑණ නොනැගී ඉඳුවයි කීයේය. ඉක්බිති පොට්ඨපාද නම් ගිරවා ඒ වානරයා කෙරෙහි කළ ඊෂියාව පහකරන්නට නොහැකිව නැවත කියනුයේ අනාගතයෙහි වන කාරණයන් ප්‍රඥාවක්ෂුසින් දකින්ට සමර්ථවූ රාධා නම් බෑනන් වහන්ස මේ පාපිෂ්ටවූ කලබාහු නම් වානරයා මේ රාජභවනයෙහි පහකොට පිටි දකින්ට උපායක් සිතුවමැනවයි කීයේය. ඒ පොට්ඨපාදයාගේ වචනය ඇසූ රාධ නම් ගිරවාණෝ කියන්නාහූ එම්බා පොට්ඨපාදයාගේ වචනය ඇසූ රාධා නම් ගිරවාණෝ කියන්නාහූ එම්බා පොට්ඨපාදය මේ

SANHIDA LANKA

කාලබාහු නම් වානරතෙම ස්වභාවයෙන්ම චචලයහ. එසේ හෙයින් චචලවන්නේය. ක්‍ෂණ ක්‍ෂණයෙහි බැමබිඳ විසුලුපෑමෙන් වීරූප දක්වා රාජකුමාරවරුන් එකානුව භය ගන්වන්නේය. උඵ පරිද්දෙන් කරණ විකාර හේතුකොට ගෙන ඕහු ලබන ආහාරාදීය දුරුවනනේය. එහෙයින් තමුන් විසින් තමා ලබන සත්කාර දුරු කොට තුමුගේ වැඩ තමුන්ම නසමින් සිටියදි තොප යුහුසුළුවන්නේ ඇයිදැයි කියා මලනුවන්ට සෝක නොකරන්ට කියා අවවාදකොට සන්සිඳ වුයේය. ඒ රාධා නම් ගිරවානන් කී පරිද්දෙන්ම ඒ වානරතෙම කර්ණ චලන මුඛවිකාර දියෙන් රාජකුමාරවරුන් භය ගැන්වූයේය. භයපත්වූ රාජකුමාරවරු භයින් ත්‍රස්තව බැගෑපත්ව මුරගැසුවාහුය. ඒ ඇසූ රජ්පුරුවෝ මේ කිමෙක්දැයි විචාළකල්හි රාජකුමාරවරුන් වඳුරාගෙන් භයපත්ව මුරගෑනියාව අසා ඒ දුෂ්ටවඳුරා මෙතනනින් පහකරවයි කියා පහකරවූවායයි ඒ රාධ නම් ගිරවාණන් හා මළනුවන් පළමු පරිද්දෙන්ම ලාභ ස්තකාර මහත්ව ප්‍රකෘත්තිමත්වූයේයයි ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ කාලබාහු ජාතක ධර්මදේශනාව ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා නිමවා වදාළසේක. එකල්හි කාලබානු නම් දැන් මේ දේවදත්ත ස්ථවිර වන්නේය. එකල්හි පොට්ඨපාද නම් වුයේ මේ ආනන්ද ස්ථවිරය වන්නේය. එකල්හි පොට්ඨපාදයන් අවවාදයෙන් සන්සිඳවූ රාධ ගිරවාණෝ නම් දැන් මේ රාගාදී කේලේශයන් ප්‍රහීන කොට තුන්ලෝ වාසීන් විඳිනා සියළු සසර දුක් සන්සිඳුවන දැන් බුදුවූ මීමම වේදැයි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# චතුෂ්ඨසීල විමංශ ජාතකය

තවද භාග්‍යවත්වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සීලවිමංස බ්‍රාහ්මණයා අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වර්තමාන කථාවවත් ජාතක කථාවක්ත පළමු කී ජාතකවල පෙනෙන්නේය. මෙහි වනාහී බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයෙක් සොරකම් කළේය. ඒ පුරෝහිත බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ට ගෙණ ගොස් පෑවාහ. රජ්ජුරුවෝ ඇයි පුරෝහිත බ්‍රාහ්මණය කුමක් නිසා සොරකම් කෙලෙහිදැයි විචාළ කල්හි පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ රජ්ජුරුවන් වහන්ස මාගේ වංශය උතුම් දොහෝ ශීලය උතුම්දෝහෝයි පරීක්ෂා කරන නිසා සොරකම් කෙළෙමි. සර්පරාජයන් පවා කඩා නොකෑ පමණකින් සිල්වත්වූ යයි ගුණ අසා ගත්තුය මම වනාහි සොරකම් කළ පමණකින් සොරයයි නින්දාවට පැමිණියෙමි ඉතිකින් ගිහිගෙයින් මට කම් නැත. හිමාලය වනයට වැද තපස් කෙරෙමි රජ්ජුරුවන් අතින් අවසර ඉල්වාගෙණ වනයට යන්නාහු අතරමග විථියෙහි එක් උකුස්සෙක් මස් කැටියක් ඩැගෙණ ආකාශයට පැන නැංගෝය. අනික් උකුස්සෙක් අවුත් ඔහු ඉස ටොකු ඇන පියා පතින් ගසා ගහට කරන්ට වන. ඒ උකුසු වේදනාව ඉවසාග නොහී මස්කැටිය හල. අනික් උකුස්සෙක් මස් කැටිය ඩැගත. මෙම නියායෙන් මස් කැටිය හළ උකුස්සාට ගහට නැත. ඩැගත යන උකුස්සාට ගහට කෙරෙති. බොහෝ උකුස්සෝ එක්ව මේ මස් කැටිය නිසා ගහට උනාහු පුරෝහිත බ්‍රාහ්මණයාණෝ ඒ දැක පංචකාම ඇල්ම ඇතිව ගිහිගෙයි වාසය කිරීම නම් මේ උකුස්සා ඩැගත් මස්කැටිය වන්නැහි පංචකාමයෙහි ආලය හැරපියා යන්නෙම් නම් මස් කැටිය හැරපියා ගියාවූ උකුස්සා වන්නැයි සිත සිතා යන්නාහු එක්දාසියක් පුරුෂයකු එන්ට කියා මග බල බලා ඉඳ පෙරයම දසපැයත් නොනිදා ඉඳ මධ්‍යම දසපැයත් නොනිදා ඉඳ නෙන හෙයින් අළුයම දසපැයේ නේතියි නියමකර ආලය හැර ඇඳේ නිදාපුව බෝධිසත්වයෝ පංචකාමයෙහි ආලය හැර වාසය කන්නාවූන්ටත් මෙම නියායෙන් සැපවිඳීම වන්නේමැයි සිතා ගියකලට තාපසකෙනෙකුන් ගසක්මුල ඉඳ භාවනාකොට ධ්‍යානයෙන් උන්නාහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයාණොත් ඉඳ භාවනාකොට ධ්‍යානයෙන් උන්නාහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයානෝත් මේ තාපසයන්සේම සැපවිඳිමයි වනයට වැද ඍෂිප්‍රව්‍රජාවෙන් පැවිදිව පංචාභිඥ අෂ්ට සමාපත්ති උපදවා ධ්‍යාන සුවයෙන් වැස නොපිරිහුනු ධ්‍යානයෙන් කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ සීලවිමංස ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# රථලද්ධි ජාතකය

තවද දිවැස පැණැස මනැස යනාදීන් පංචේන්ද්‍රයන් ඇති හෙයින් චක්ෂුර්මත්වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

පුරෝහිත බ්‍රාහ්මණයා කෙත්වත් බලන්ටයයි රථයක නැගී එන්නේය. එක් පුරුෂයෙක් ඉදිරියට රථයක් පැදගෙණ එමින් සිටියේය. ඒ බ්‍රාහ්මණයා ගොස් තමා අත තිබු කැවිටි දණ්ඩ දමාලා ඇන්න. ඒ කැවිටි දණ්ඩ රථයේ ඇනිලා දෙවෙනිව ඇවිත් ඒ බ්‍රාහ්මණයාගේ නලල ඇනී ගැට පැන නැංගේය. මේ පුරුෂයා මා මැරීයයි බ්‍රාහ්මණයා ගොස් රජ්ජුරුවන්ට කියේය. කොසොල් රජ්ජුරුවෝ ඒ විචාරා සනිටුහන් කළහයි මේ කථාව දම්සභා මණ්ඩපයේ රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා උන්තෙනට වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා මෙපවත් අසා මහණෙනි දැන් මතු නොවෙයි පෙරත් මේ බ්‍රාහ්මණයා රථයෙන් එන්නාවූ බ්‍රහ්මණයාට කැවිටින් ඇන සිගායෙහි පැමිණියේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා කෙත්වත් බලන්ටයයි රථයකට නැගී නික්මින. එක් පුරුෂයෙක් ඉදිරියට රථයක් පැද ගෙණ එමින් සිටියේය. තමා අත තුබූ කැවටි දඩ දමාලා ඇන්න. ඒ කැවට දණ්ඩ රථසකෙහි වැදගෙණ ආපස්සේ පැන බ්‍රාහ්මණයා තමාගේ නලලට ඇනි ගැට නැගීය පුරෝහිත බ්‍රාහ්මණයා මේ පුරුෂයා මා මැරීයයි කියා රජ්ජුරුවන්ට ගොස් පැමිණියේය. රජ්ජුරුවෝ මාගේ පුරෝහිත බ්‍රාහ්මණයා මරා නලල ගැට නැගු තැනැත්තවුන්ගේ සර්වයසස් ගනුවයි කීහ. එවිට අධිකරණ නායකයෝ කියන්නාහු දේවයන් වහන්ස යම් කෙණෙක් තමන් අතින් යමක් තමන්ට පැමිණියත් අනුන් පිට වරදවා කියන්නාහු ධර්මිෂ්ටව විචාරා වැරදි පක්ෂයකින් දඩගත්ත යුතුයයි යම් ගෘහවාසීව ජීවත්වන්නාවූ යම් පුරුෂයෙක් තමාගේ කලමනා ගොවිතැන් ආදීවූ දෙයකට කුසීතවී නම් එයින් යහපත් නොවන්නේය. නොදමුනාවූ ඉන්ද්‍රියන් ඇති යම් තපස්වී කෙනෙක් ඇත්නම් ඒ තාපසයත් යහපත් නොවන්නේය. අපරීක්ෂා කාරී කීවන්ගේ බස් පස්සේ යන්නාවූ යම් රජෙක් ඇත්නම් එසේවූ අපරීක්ෂාකාරීවූ රජත් යහපත් නොවන්නේය. යම් පණ්ඩිතයෙක් කෝප වී නම් එසේවූ පණ්ඩිතයාගේ නුවනත් යහපත් නොවන්නේය. යම් රජ්ජුරුකෙණෙක් අපරීක්ෂා කාරී විනම් ඒ රජ්ජුරුවන්ගේ යසස් කීර්තියත් අඩුවන්නේය. යම් රජ්ජුරු කෙනෙක් පරීක්ෂා කාරීහූ විනම් ඒ රජ්ජුරුවන්ගේ යසස් කීර්තියත් වර්ධනය වන්නේයයි කීහ. එවිට රජ්ජුරුවෝ පුරෝහිත බ්‍රාහ්මණයා ගෙන්වා දබර විචාරා පුරෝහිත බ්‍රාහ්මණයාට වරදවා සනිටුහන් කළාහයි වදාරා මේ රථලද්ධි ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා නම් පුරෝහිත බ්‍රාහ්මණයාමය. අධිකරණ නායකව උපන්නේ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# ජම්බුක ජාතකය

තවද දසබලධාරීවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමීපයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

දේවදත්ත ස්ථවිරයෝ සර්වඥ ශාසනයෙහි පන්සියයක් භික්‍ෂූන් වහන්සේ හා සමඟ ගයාශර්ෂ නම් විහාරයෙහි වස කල්හි සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ දේවදත්ත ස්ථවිරයන් වසන්නාවූ ස්ථානයට ගිය කල්හි දේවදත්ත ස්ථවිරයෝ කියන්නාහු සැරියුත් මුගලන් දෙනම අප සමීපයට ආතැන් පටන් සර්වඥයෝ නම් මම්ම යයි සිතමින් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි. මාගේ වසටරිදෙයි තොපි බණ කියන්නෝ යහපතැයි සැරියුත් ස්වාමින්ට කී කල්හි විජිනිපත්‍රය අතට දී වැඳ හොත්තාහ. උන්වහන්සේ පන්සියයක් භික්ෂූන් වහන්සේ අර්හත් මාර්ගයෙහි පිහිටුවා එකියන භික්ෂූන් වහන්සේ හා සමග දෙදෙනා වහන්සේ සර්වඥයන් වහන්සේ සමීපයට වැඩිකල්හි අවස්ථා නොදන නිදන්නාවූ දේවදත්ත ස්ථවිරයන් ලඟට කොකාලික ස්ථවිරයයෝ ගොසින් විළුඹෙන් ඇන කුමන නිදිද නිදන්නේ පන්සියයක් භික්ෂූන් වහන්සේ ඇරගෙණ සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ පලාගිය සේකැයි යනු අසා සෝකයෙන් ලේ තුන්කටක් නගා බොහෝ ආයාසයට පැමිණ නියාව සර්වඥයන් වහන්සේ අසා වදාරා එම්බා මහණෙනි මාගේ විලාසය ගෙන නටුයේ දැන් මතු නොවෙයි පෙරත් මාගේ විලාසය ගෙණ නටුයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි සර්වඥයන් වහන්සේ සිංහව ඉපිද මීමකු මරා මස් කා පැන් බී වසන්නාවූ පර්වත සමීපයට නික්මුණු කල්හි කැනහිලෙක් මගදී දැක සිංහයා ගැලවෙන උපායක් නොදැක බිමපැස වැදහොත්තේය, සිඟාලයා දැක සිංහයා කියන්නේ තොප කුමක් නිසා තෝ මෙතන උනිදැයි විචාළ කල්හි නුඹ වහන්සේට සේවාකම් කරණ පිණිසයි ඔත්තේමියි කී කල්හි එසේ වීනම් මා හා කැටිව එවයි කී ක්ලහි කැඳවාගෙණ ගොස් සිංහයා තමා වසන්නාවූ ගල් ගුහාවේ එක්තරා තැනෙක කැනහිලා වසන නියායෙන් සලසා මාංසමරා ලමින් වසන්නාහ. ඒ මස් අනුභව කොට ස්ථූලව කැනහිලා මානයක් ඇතිව කියන්නේ නුඹ වහන්සේ මරාලන මස් කා මෙතෙක් දවස් වාසය කෙළෙමි. ඇම දවස්ම නුඹ වහන්සේ මරාලන මස් කා මෙතෙක් දවස් වාසය කෙළෙමි. ඇම දවස්ම නුඹ වහන්සේට ආයස කරන්නේද කින්ද. මම්ම ගොසින් මහත්වූ හස්තියෙකු මස්තකයට පැන ඉස්මොල අනුභව කොට වෙසෙමි කී කල්හි සිංහයා කියන්නේ එම්බල ජම්බුකය ස්ථූලවූ කය ඇති දික්වූ දල ඇති ඇතුන් ගේ මස් අනුභව කරන්නාවූ ජාතීන්ට විනා තොපට පිළිවන් නොවෙයි කී කල්හි එපවත් නොගිවිස වහාගොස් පර්වතයට පැනනැගී කාලාවක කුලේ හස්තියෙකු දැක කුම්භස්තලයට පනිමි. පැන්න තැනැත්තේ ඇතාගේ පය කෙරේට පැනපියා එවෙලෙහි කැනහිලාගේ ඉස්මොල පයින් මිරිකා ඇතා පලාගිය කල්හි සිංහයා කැනහිලා පරීක්ෂා කරණ පිණිසයයි ගොසින් කැනහිලාට පැමිණ විලාසය දැක විකෂ්පව කියන්වාහු යම් සත්වයෙක් තමාගේ බල නොදැන වාසය කරන්නේ වී නම් හස්තියාගේ මස්තකයට පනිමියි කකුල සමීපයට පැන මළාවූ කැනහිලා මෙනැයි කියන්නාහු වංශවත් ශක්ති සම්පන්න ආඥා තේජස් ඇත්තාවූ සත්වයක්හු කරන්නේ වී නම් හස්ති විනාශය කෙරෙමියි මළාවූ කැනහිලා මෙනැයි කියාද, තවද මාගේ වංශය හා ශක්ති ආඥා තේජස් විචාර නියාවට මෙව්වර කටයුතු කළ මැනව, නොහොත් අවිචාර කටයුතු කිරීමෙන් යම් එකෙක් සිතන්නේ වී නම් ඒ සත්ව තෙමේ හස්තියා පයින් මළවූ කැනහිලා මෙනැයි කියා මේ ජම්බුක ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ඒ කැනහිලා නම් දේවදත්ත ස්ථවිරයහ. සිංහව උපන්නෙම් බුදුවූ ම්මම යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# බ්‍රහත් ඡත්ත ජාතකය

තවද විනායකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වංචා ප්‍රයෝග දන්නා භික්ෂූකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද.

ඒ වංචා ප්‍රයෝග දන්නා භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේට දක්වන්නාවූ සර්වඥයන් වහන්සේ මහණෙනි මුන් දැන් මතුනොවෙයි පළමුත් වංචා ප්‍රයෝග දන්නේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙක් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්නාහ. කෝසල රජ්ජුරුවන් හා යුද්ධයට බරණැස් නුවර රජ්ජුරුවෝ චතුරංගිණී සේනාව ඇරගෙන යුද්ධයට ගොස් බරණැස් නුවරට රජ්ජුරුවෝ චතුරංගණී සේනාව ඇරගෙන යුද්ධයට ගොස් නුවරසාධා සියලු පන්සියයක් ලෝ සැලිවල ලවා උද්‍යානයෙහි නිදානකරවූහ.

බ්‍රහත්ඡත්ත නම් රාජකුමාරයෝ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීනි අතින් සූසැටකලා සිල්පය හා අෂ්ටාදාස සිල්ප ආදීවූ සිල්ප ඉගෙණ පන්සියයක් තපස්වීවරයන් උන්තෙනට අවුත් ඒ තාපසවරුන්ගෙන් බණ දහම් අසා ප්‍රවෘත්තිය දැන තපස්වීවරයන්ට නායකව වාසය කරනසේක. එක් දවසක් බ්‍රහත් ඡත්ත නම් තපස්වී පන්සියයක් තපස්විවරයන්ට කියන්නාහු බරණැස්  නුවර සිඟා වළඳන ලෙස යම්හයි කීහ.

පන්සියයක් තපස්වීවරයෝ කියන්නාහු අපි ඊට ගියමෝ නම් මනුෂ්‍යයෝ අප අතින් ප්‍රශ්න විචාරති. බණ කියවති, උන් කී කල නොකී අවස්ථාවේ නොයෙක් නින්දා කියා වෙසෙති. එසේ හෙයින් අපි බරණැස් නුවරට නොයෙම්හයි කීහ. ඊට බ්‍රහත් ඡත්ත නම් තපස්වී උන් කී යම් ප්‍රශ්ණයක් විසඳහන්නට මට භාරයයි කියා පන්සියයක් තපස්වීවරයන් ඇරගෙණ නික්ම බරණැස් නුවර රජ්ජුරුවන්ගේ මගුල් උයනේ එදා රෑ සැතපී පසුදවස් උදෑසන පන්සියයක් තපස්වීවරයෝ නුවරට සිඟා නික්මුනාහ.

රජ්ජුරුවෝ පන්සියයක් තපස්වීවරයන් තමන්ගේ රජගෙට වඩාගෙණ ගොස් ආසන වල ඉඳූවා ප්‍රශ්න හා සමග බණ විචාළාහ. එවිට බ්‍රහ්මචත්ත නම් තපස්වී පන්සියයක් තපස්විවරයන් බැන නොනැගී ඉන්ට කියා රජ්ජුරුවන් විචාළා බණ හා ප්‍රශ්න රජ්ජුරුවන්ගේ අභිප්‍රාය නියාවටම කීහ. රජ්ජුරුවෝ සමාධිම පන්සියයක් තපස්වීවරයන් වළඳවා තමාගේ මගුල් උයනේ ඉදිනා නියායෙන් සැලැස්වූහ. යහපතැයි කිහා බ්‍රහත් ඡත්ත නම් තාපසයන් හා පන්සියයක් තපස්විවරයෝ ඒ මගුල් උයනේ වාසය කරණ කල්හි බ්‍රහත්ඡත්ත නම් තපස්වී නිධාන් දක්නාවූ ශාස්ත්‍රයක් දන්නාහ. එවිට සිතන්නාහු මාගේ පියානන් වහන්සේ මරාපිය බොහෝ වස්තුව බරණැස් රජ්ජුරුවෝ ගෙනාහ. ඒ සම්පත් කොයි තිබාපුදෝහෝයි බැලූ තැනැත්තෝ ඒ මගුල් උයනේ තිබුවා දැක පන්සියයක් තපස්විවරයන්ට බ්‍රහත්ඡත්ත නම් තපස්වි කියන්නාහු මම පරලොවට ආධාරයෙකින් තපස් වූයෙම් නොවෙමි. මම මා කෙරේ භයින් තපස්වීම් මාගේ කොසොල් නුවර රජ්ජුරුවන් වහන්සේ නම් මාගේ පියානන් වහන්සේය. එසේ හෙයින් උන්වහන්සේගේ බොහෝ සම්පත් බරණැස් රජ්ජුරුවෝ ගෙවැවිත් මගුල් උයනේ සැලවල ලැවූ පන්සියයක් නිධාන සැලලැවුහ. ඒ සැලවල නිධාන ඇරගෙණ මම මාගේ පියානන් වහන්සේගේ කොසොල් නුවර ගණිමි. තොපි ඇම කුමක් කරව්දැයි විචාළාහ. තපසවරු  කියන්නාහු නුඹවහන්සේ ගුරුකොට ආම්හ. එසේහෙයින් නුඹ වහන්සේ හා කැටිවම කී කල දෙයක් කරමුයි කීහ.

යහපතැයි කියා කොසොල් නුවර සිට ආ මනුෂ්‍යයන්ගෙන් සමහර අය කුත් තපස්වීවරයන් පන්සියයත් නිධාන සැලවල් ගොඩනගා පන්සියයක් සමීපයිද විඳ ඒ සම්පයිවල ලාගෙණ ඒ සැලවල තණ ආදීවූ දෙයලා තිබා තිබූ වලම නිධානසැල ඔබවා කෝසල නුවරට පලාගොස් බ්‍රහ්ත් ඡත්ත නම් රාජ කුමාරයෝ රාජ්ජයට පැමිණ ඔටුනු පැලඳ නුවර පදනම් අට්ටාල වෙට්ටම් ආදීවූ කර්මාන්ත කරවා සතුරන්ගෙන් කිසභයක් නොවදිනා නියාවට නුවර කරවා රාජ්ජය කරන්නාහ.

බරණැස් නුවර රජ්ජුරුවෝ බොහෝ ශෝක පත්ව කිසිදෙයක් නොදැක මගුල් උයනේ උන් තාපසවරුන් පලාගිය නියාව අසා බොහෝ විකේෂ්පයට පැමිණ මගුල් උයනට අවුත් නිධාන සැලවල් තිබූ තිබූ තැනින් ගොඩනංවා බැලු අවස්ථාවෙහි  සම්පත් නැතිව තණපුරා තිබූ සැලවල් දැක රජ්ජුරුවෝ සෝකපත්ව කිසිදෙයක් නොදැක උන්සිටිය එතෙනකුත් තණයයි කිය කියා ඉඳිනාහ.

SANHIDA LANKA

බෝධිසත්වයෝ රජ්ජුරුවන් කියන්නාවූ මේ ප්‍රලාප මා අරවතොත් විනා අනික් කෙනෙකුන්ට බැරියයි සිතා රජ්ජුරුවන් හා කථාකරන්නට යෙමියි ගොස් කථාකොට උන් අවස්ථාවෙහි රජ්ජුරුවෝ තණය තණයයි කීහ.

එවිට බෝධිසත්වයෝ කියන්නාහු ස්වාමිනි, නුඹ වහන්සේගෙන් කෙසේවූ තණයක් අපවත්විද කෙසේද තණයකට අභිප්‍රාය ඇතිසේක්ද ඒ මට කිව මැනවැයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු බොහෝ ඇසූපිරූ තැන්ඇති බ්‍රහත්ඡත්ත නම් තාපසයෝ මාගේ මගුල් උයනේ වාසයකොට මාගේ නිධාන සැලවල් පන්සියයේ සම්පත් ඇරගෙණ සැලවල තණපරලා සම්පත් ඇරගෙණ ගිය හෙයින් කියන පමණක් විනා මා අභිප්‍රාය ඇති තණක් ඇති හෙයින් කියන දෙයක් නොවෙයි කීහ.

එවිට බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට කියන්නාහූ තාපසවරු නම් තමන් සන්තක වස්තුව විනා නොසන්තක දෙයින් තණකොන්දක් විවර නොගෙණ ගියේය. ඒ රාජ කුමාරයෝ තමන්ගේ පියානන් සන්තක සම්පත් ඇරගත්තීය. නුඹ වහන්සේ සන්තක දෙයින් තණ කොන්දක් විවර නොගෙණ ගියේය. නුඹ වහන්සේ සන්තක සම්පත් නුඹවහන්සේගේ දරුමුනුබුරන්ට දෙන්ටත් ඇත. තමන් සන්තක වස්තුව ඇරගෙණ ගියයි කියා සෝක නොගත මැනවයි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහූ බ්‍රහත්ඡත්ත නම් රාජකුමාරයන් තාපස වේසය පෑ මගේ සම්පත් අරගත්තුය. ඒ කවරවේවායි කියා බෝධිසත්වයන් කී අවවාදයෙන් සෝක තුනකළහයි වදාරා බ්‍රහත් ඡත්ත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බ්‍රහත් ඡත්ත තාපසයෝ නම් මේ වඤ්චා ප්‍රයෝග දන්නා භික්‍ෂුහුය. එසමයෙහි රජ්ජුරුවන්ට අවවාද කී අමාත්‍යයා නම් බුදුවූ මම්ම යයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# පීඨ ජාතකය

තවද සමන්ත චක්‍ෂු වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපාසක කුලයට නින්දා කළ භික්ෂූ කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් භික්‍ෂු කෙණෙකුන් වහන්සේ සැවැත්නුවරට අවුත් මේ නුවර යහපත්ව දන්දෙන්නේ කවුදැයි විචාළසේක. මේ නුවර යහපත්ව දන්දෙන්නෝ සුලු අනේ පිඬු මහසිටානෝය. විශාඛාවෝය, මල්ලිකාදේවියයි කීහ,

ඒ අසා පාන්වූ ගමනේ සිඟාගියතෙන කවුරුත් පාත්‍රය අරනොගත්තුය. නුවර මුළුල්ලේ ඇවිදගණ යට එනකලට වහන්දෑ කැඳ වළඳපුසේක. භික්ෂූන් වහන්සේ නිදානැගිට සිඟාගිය හෙයින් කැඳවළඳනට නුවුනේය. දවාලට බත් සිඟායයි දෙවනුව ගිය ගමනෙත් නො වෙලා හෙයින් පාත්‍රය ගත් කෙනෙක් නැත. ගණයේ උන් වහන්දෑ භික්ෂූන් වහන්සේ සිඟාගොස් එන කලට බත් වළඳපුසේක. නුවරින් බත් සිඟන්ටවත් නොවි ගණයෙන් වළඳන්ටවත් නොවි භික්ෂූන් වහන්සේ සුන්බත්ව කියනසේක් මේ නුවර උපාසකවරු යහපත්ව දන්දෙති, කී පසණක් විනා දද්දෙන කෙනෙකුන් නුදුටුවා සේ නින්දා කියමින් උන්සේක. සර්වඥයන් වහන්සේ එතනට වැඩ වදාරා මහණෙනි, භික්ෂූහු නම් බඹරුන් කුසුමයේ රොන් ගත්තාසේ උපාසකරුන්ගේ සිත් නො මිරිකා දන්ගත්තොත් විනා අක්‍රෝශ පරිභව හා නින්දා කිරීම් තපස් වීන්ට යෝග්‍ය නොවෙයි, පෙර මහොත්තමයෝ පවා දන්දුන් උපාසකවරුන්ට යෝග්‍ය නොකළෝවේදැයි වදාරා හේ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්ව වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ වනාන්තරයට වැඩ ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව වාසය කරණ කල්හි බරණැස් නුවරට අවුත් මේ නුවර යහපත්ව දන්දෙනෝ කවුරුදැයි විචාළකල්හි මේ නුවර අසවල්තෙන සිටානෝ යහපත්ව දන්දෙති අසා එසේ වී නම් උන්ගේ දොරට යම්හයි සිඟා වැඩිසේක. උන්වහන්සේ සිඟාවඩිනට පළමුවෙන් සිටානෝ රජ්ජුරුවන් වහන්සේට රාජ්‍යසේවයට පලාගියහ. බෝධිසත්වයෝ සිටානන්ගේ දොරකඩ නැතක්වේලා සිඟා සිටි කල්හි සිටානන්ගේ ගෙයින් කවුරුත් නුදුටුවාහ. බෝධිසත්වයෝ සිට වෙහෙසී නික්මුනාහ.

සිටානෝ රාජ්‍යසේවය කොට ගෙට එන්නාවූ තැනැත්තෝ අතරමගදී බෝධිසත්වයන් දැක භික්‍ෂා පාත්‍රය දැක ගෙණ බෝධිසත්වයන් වහනසේ පවරා තමන්ගේ ගෙට ගෙණවුත් රසමසවුලෙන් යුක්තව භෝජනය බෝධිසත්වයන් වහන්සේට වළඳවා සිටානෝ කියන්නාහු ස්වාමිනි, මාගේ ගෙට සිඟා ආ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙක්ද දුගී මඟී යාචකකෙණෙක්ද දන් නොගෙණ ගිය විරූ කෙණෙක් නැත. නුඹ වහන්සේ වඩනට පළමුවෙන් මම රාජ්‍යසේවයට පලාගියෙමි යන  මම එක්කෙණෙකුන්ට සම්මත කොටලා නොගියෙමි. එසේ හෙයින් නුඹ වහන්සේ දුටු කෙණෙක් නැත. එසේ හෙයින් ඒ වැරුද්ද මා කෙරේමය සමාකර මැනවැයි සිටානෝ කීහ.

එවිට බෝධිසත්වයෝ කියන්නාහු සිටානෙනි තොප කෙරේ අප කෝප වූයේ නැත. වෙෂවුයේත් නැත. අප ඇසූ නියාවට මෙ කියන සිටානන්ගෙන් මෙවිතරදැයි සිතූ පමණක් විනා අප විකේෂප වූයේ නැතැයි කීහ.

එවිට සිටානෝ කියන්නාහු මගේ දෙමව්පිය මුතුන් මීමුතුන් පරම්පරාවෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් දුටුකල ආදර සම්භාවනාවෙන් සතරපසයෙන් දන්දී දෙමව්පියන් දුටුයේ ආදර භක්ති ඇත්තාහ. මේ මාගේ අඩුවෙක් වුයේ යයි කීහ.

යහපතැයි බෝධිසත්වයෝ සිටානන්ගේ ආරාධනාවෙන් උන්ගේ ගෙයි කීපදවසක් රදා තමන් පළමු වාසය කළ හිමාලය වනයට ගොස් පංචාභිඥාෂ්ට සමාපත්ති උපදවා බඹලොව උපන්හයි වදාරා මේ පීඨ ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# තුෂ ජාතකය

තවද සුගත නම්වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බිම්බිසාර රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

බිම්බිසාර රජ්ජුරුවන්ගේ බිසවුන් බඩ අජාසත් රජ්ජුරුවන් පිළිසිඳගත් පසු එකියන බිසවුන්ට රජ්ජුරුවන් දකුණු උරය පලා ලේ බොන්ට දොලොක් උපන. එපවත් බිසව් රජ්ජුරුවන්ට කියාගත නොහි වාරිති රජ්ජුරුවෝ බොහෝ උත්සාහායෙන් විචාරාගත්හ.

නිමිත්ත දන්නා බමුණන් රජ්ජුරුවෝ ගෙන්වා බිසවුන්ට මෙසේ වූ දොළක් උපනැයි කීහ. එපවත් අසා බිසවුන්වහන්සේගේ බඩ රාජ කුමාරයන් වහන්සේය. උන්වහන්සේ වැඩිවිය පැමිණිකළ නුඹ වහන්සේ මරා රාජ්ජ්‍ය ගන්නාසේකැයි කීහ.

රජ්ජුරුවෝ මේ අසා මාගේ දරුවෝ මා මරා රාජ්ජය ගත්තු නම් ගත්තේය. අනික් කෙණෙකුන් නොවත් උන් රාජ්ජය ගතොත් යහපතැයි සමාධිව ශාස්ත්‍රය ගෙන්වා දකුණු උරය පලා රන්තැටියේ ලේ වත්කොට බිසවුන් පොවා දොළ සන්සිඳවූහ. එපවත් බිසවු අසා මාගේ රජ්ජුරුවන් වහන්සේ මරන්නාවූ දරුකෙනෙකුන් ලබා උසුලාගෙණ ඉඳිනේය. මාගේ රජ්ජුරුවන් වහන්සේට සතුරුවූ දරුවන්ගෙන් මට ප්‍රයෝජන කින්දැයි කියා බඩ මඩවා දරුවන් එලන්ට සැරසුණාහ. රජ්ජුරුවෝ මෙපවත් අසා බිසවුන්ට කියන්නාහු මාගේ දරුවෝ මා මරා රාජ්ජය ගත්තු නම් ගත්තේමය. බඩ මඩවා දරුවන් නොඑලවා මා සුරතල් දැකපියන තුරායයි කියා බඩ මැඩවිය නොදි රැකවල් ලැවූහ. රජගෙයිදී බඩ මඩනවන හෙයින් රැකවල්ලෑවූහ. මගුල් උයනට ගොසි බඩමඩවා දරුගැබ එලන්ට උත්සහ කරණ නියාව රජ්ජුරුවෝ දැන මගුල් උයනට යා නො දෙවයි රැකවල් ලැවුයේය. මගුල් උයනට යා නොදී උන්කලට දස එකඩ මසකින් රාජ කුමාරයන් වැදූහ. රාජ කුමාරයන් පියවර නගා කෙළ ඇවිදිනා ප්‍රස්ථාවෙහි සර්වඥයන් වහන්සේ මහා සංඝයා වහන්සේ පිරිවරා බිම්භිසාර රජ්ජුරුවන්ගේ රජගෙට සිගා වැඩිසේක. රජ්ජුරුවෝ සර්වඥයන් වහන්සේ ඇතුළුව භික්ෂු සංඝයා වහන්සේ පවරා රාජ ගෙයි වඩාහිඳුවා රසමසවුලෙන් යුක්තවූ අන්නපානාදිය තමන්ගේ ස්වහස්තයෙන් වළඳවා ඉක්බිත්තෙහි ධර්මය අසන්ටයයි උන්කල රාජ කුමාරයන් සරහා රජ්ජුරුවන්ගේ ඇකයේ හිඳුවාලූහ.

රජ්ජුරුවෝ පුත්‍රප්‍රේමයෙන් රාජකුමාරයන් සනහ සනහා සුරතල් බලා සර්වඥයන් වහන්සේ වදාරණ බණ සිතහෙලා නොඅසන නියාව සර්වඥයන් වහනසේ දැන රාජ්ජුරුවන්ට වදාරණසේක් රජ්ජුරුවෙනි, පළමුත් රජ්ජුරුවෝ සැක ඇති රාජ කුමාරවරුන් දුරුකොට විසුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයයෝ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීව උපන්නාහ. බරණැස් නුවර රාජ කුමාරයෝ දිසාපාමොක් ආචාරීන් ලඟට ගොස් උගතමනා සියලු ශාස්ත්‍ර ඉගෙණ උන්කලට දිසාපාමොක් ආචාරී රාජ කුමාරයන්ගේ අංගලක්ෂණ පරීක්ෂාකොට මතු මෙම රාජකුමාරයන් නිසා උපදිනා රාජ කුමාර කෙණෙකුන්ගෙන් රජ්ජුරුවන්ට සැලසෙන උපද්‍රව දැන රාජකුමාරයන්ට ගාථා සතරක් උගන්වා කියන්නාහූ තොපගේ රාජකුමාරයන් සොළොස් ඇවිරිදි අවස්ථාවෙහි රාජ කුමාරයනුත් තොපත් බත්කමින් ඉඳ පළමුවන ගාථාව කියව, සේනාසමෘද්ධව ආසථානයේ උන්විට දෙවන ගාථාව කියව, උඩුමාලට නැගෙණ ඉනිඉසට තුන්වෙනි ගාථාව කියව, ශ්‍රී යහන් ගබඩාවට වැදහෝනාට යනකලට සතරවෙනි ගාථාව කියවයි කියා දිසාපාමොක් ආචාරී රාජකුමාරයන්ට ඉගැන්වූහ. රාජකුමාරයෝ නුවරට අවුත් රජ්ජුරුවන් වහන්සේට ශාස්ත්‍ර පෑ ගමනේ රජ්ජුරුවෝ සමාධිව රාජකුමාරයන්ට යුවරජ තනතුරුදී උන් අවස්ථාවෙහි රජ්ජුරුවන් අයාමෙන් රාජකුමාරයෝ රාජ්ජ්‍යට පැමිණ රාජ්‍යය කරණ කල්හි රජ්ජුරුවන්ට රාජ කුමාරකෙණෙක් ඇතිව සොලොස් ඇවිරිදි වූහ. එක් දවසක් රාජ කුමාරයෝ රජ්ජුරුවන් උයන් කෙළියට යන රාජ ඓශ්වර්ය දැක මම මෙසේවූ රාජ ඓශ්වර්යයක් කවරදා ලබම්දෝහෝයි සිතා තමන්ගේ අතවැස්සන්ට කීසේක. අතවැස්සෝ කියන්නෝ සිතූ නියාව ඉතා යහපත. බාල අවස්ථාවේ ලත් සම්පත විනා මාලු අවස්ථාවෙහි ලත් සම්පත්තීන් ප්‍රයෝජන කින්ද, රාජ්‍යයට උත්සාහ කළ මැනවැයි

SANHIDA LANKA

කීහ. රාජ කුමාරයෝ ආයුධයකින් රජ්ජුරුවන් වහන්සේ මරන්ට බැරි යයි කියා විෂක් ලා මරමි සිතා රජ්ජුරුවෙන් වහන්සේ එක්ව බත් කමින් සිට යැයි කියා විෂයක් ලා මරමි සිතා රජ්ජුරුවන් වහන්සේ එක්ව බත්කමින් සිට විෂ ලමියි විෂය මිටිමොලවාගෙණ බත්කන්ටයයි උන්නාහ. රජ්ජුරුවෝ බත් කන්ට ඉඳ සිතන්නාහු දිසාපාමොක් ආචරී සොළොස් ඇවිරිදිවූ රාජකුමාරයා හා කැටිව බත් කන්ට ඉගැන්වූ ගාථාව රජ්ජුරුවෝ සඳහන් කොට කීහ. එහි අභිප්‍රාය නම් යම්සේ ඝණාන්ධකාරයෙහි මියෝ වී තලා දවසෙයයා හැර හාලට කද්ද එමෙන් තොප කෙසේ මට විෂලන්ට උත්සහ කළත් මා විෂ කන්නේ නැත. දවසෙයයා තෝරා සාල් කෑවාසේ විෂ තෝරා බත් කම් කී ගමනේම රාජකුමාරයෝ සැකව රජ්ජුරුවන් වහන්සේ දූන පූ නියාවේදැයි සිතා විෂ නුලූහ. රජ්ජුරුවන් හා කැටිව බත් කා මෙපවත් රාජකුමාරයෝ තමන්ගේ අතවැස්සන්ට කීහ. අතවැස්සෝ එසේ වී නම් කීපදවසක් බැලුව මැනවයි කීහ. පසු දවසෙක රජ්ජුරුවෝ අසාථනදී මුදලිවරුන් හා කථා කරණ පරක්කුවක් රාජ කුමාරයෝ දූන මෙසේ වූ පරක්කුවේදී ගසමි සිතා කඩුව ඇරගෙණ මිනිසුන්ගේ ඇස්වර බල බලා සිටියාහ. ඒ වෙලාවට රජ්ජුරුවෝ මේ ක්‍රියාව දැක දිසාපාමොක් ආචාරී මෙසේවූ අස්ථානයෙක උන්වෙලා වට කියවයි ඉගැන්වූ ගාථාව කීහ. එහි අභිප්‍රාය නම් තොප ඇම ගෙවලදි උයනේදී කළ කථාව මා නොදනිති සිතාද, ඒ ඒ තැන සැංගී සිටිනේ යයි කියන්නා රාජකුමාරයෝ සිතින් සැකව පලාගොස් තමන්ගේ අතවැස්සන්ට කීහ. අතවැස්සෝ කීපදවසක් ගිය කල යම් උපායක් කළ මැනවයි ඉඳ කියන්නාහූ රජ්ජුරුවන් වහන්සේ නො දන්නා සේක. නුඹ වහන්සේ සිතින් සැකවෙන පමණක් විනායයි කීහ. යහපතැයි කියා රාජ කුමාරයෝ ඉනිඉස කඩුව ඇරගෙණ සිටියාහ. රජ්ජුරුවෝ උඩුමාලට නැගෙන්ටයයි යන වේලාවට කියන්ට කී ගාථාවෙක් ඇතැයි කියා සදහන් කොට කීහ. එහි අභිප්‍රාය නම් තොප මට කළ ප්‍රයෝගත් දනිමියි දූනුත් ඉනිඉස කඩුව ඇරගෙණ මට ගසන්ට සිටිනියාව මා නොදනිති සිතව්දැයි කීප මුරයෙක ඉවසමියි කී ඉනිබ්බේ නො ඉවසමියි කී අභිප්‍රාය රාජකුමාරයෝ දූන භයින් ත්‍රස්තව සැඟවි පලාගොස් නැගෙන්ටයයි යන වේලාවට කියන්ට කී ගාථාවෙක් ඇතැයි කියා සදහන් කොට කීහ.එහි අභිප්‍රාය නම් තොප මට කළ ප්‍රයෝගත් දනිමියි දූනුත් ඉනිඉස කඩුව ඇරගෙණ මට ගසන්ට සිටිනියාව මා නොදනිති සිතව්දැයි කීප මුරයෙක ඉවසමියි කී ඉනිබ්බේ නො ඉවසමියි කී අභිප්‍රාය රාජකුමාරයෝ දූන භයින් ත්‍රස්තව සැඟවි පලාගොස් තමන්ගේ අතවැස්සන්ට කී. අතවැස්සෝ කියන්නාහූ රජ්ජුරුවෝ තොප මෙසේ වූ දෙයක් කෙරෙතියි නොදනිති තොපි තොප කෙරේ භයින් නොකරණ පමණක් විනා දනිතොත් තොපට කුමක් නො කෙරෙත්ද රජ්ජුරුවෝ නොදනිතියි රාජ්ජය ගන්ට උත්සාහ කරවයි කීහ. යහපතැයි කියා රාජකුමාරයෝ කඩුව ඇරගෙණ රජ්ජුරුවන් වැදහෝනා ශ්‍රී යහන් ගබඩාවේ යාන යන වැදඹත්තාහ. රජ්ජුරුවෝ ශ්‍රී යහන් ගබඩාවට වැදහෝනට යන තැනැත්තෝ එලිපත පිට සිට සිතන්නෝ දිසාපාමොක් ආචාරී ශ්‍රී යහන් ගබඩාවට වැදහෝනාට යන වේලේ කියන නියායෙන් ඉගැන්වූ ගාථාවෙක් ඇතැයි සඳහන් කොට කීහ. එහි අභිප්‍රාය නම් තොප කඩුව ඇරගෙණ පෙරලි පෙරලි වැදහෝනා නියාව මම නොදනිම්ද, විෂලු නියාවත්, ආස්ථානයේදී කඩුව ඇරගෙණ ගසන්ට ආ නියාවත්, ඉනි ඉස කඩුව ඇරගෙණ සිටි නියාවත්, දූන් කඩුව ඇරගෙණ යහන යට වැදහෝනා නියාවත් මම දනිමි යන අභිප්‍රාය කී ගමනේ රාජකුමාරයෝ භයින් ත්‍රස්තව කඩුව ඇරගෙණ යට මැස්සෙන් එලියට අවුත් කඩුව යහන පාමුල දමා වැදහෙව ස්වාමිනී, නිකම් මිනිසුන්ගේ බසට කෙළෙමියි මා කෙරේ ක්‍ෂමා කළ මැනවැයි කීහ. රජ්ජුරුවෝ තමන් පළමු දූන උන්නාසේම මහකෝපයෙන්ම යානින් නැඟි සිට තා මුරයෙන් මුරයේම කළාද මා නොදනිතියි උනිද දරුවන් කළදෙය ඉවසන්ට උවමැනවැයි සිතා මෙතෙක් දවස් ඉවසා උනිමි. ඉනිබ්බේ නොයිවසමි කියා රාජ කුමාරයන් දඟගෙයි ලවා රැකවල් සලස්වා ඉඳ සිතන්නාහු මා මෙතෙක් අන්තරාවලින් ගැලවුනේ මාාගේ දිසාපාමොක් ආචාරීන් නිසායයි ආචාරීන්ගේ ගුණ සඳහන් කොට කම්වු පරිද්දෙන් මිය පරලොව ගියාහ. රාජ කුමාරයන්ද දඟගෙයින් මැසුම් කප්පා රාජ්‍යයට අමාත්‍යයෝ සලස්වා ගත් තුයයි සර්වඥයන් වහන්සේ වදාරන්නා ඒ රජ්ජුරුවෝ ඒසේ කළේ නුමුත් මම මාගේ දරුවන් ඇර වාසයකළ නොහෙමි කීහ. සර්වඥයන් වහන්සේ මේ නියාව වදාරමේ තුෂ ජාතකය නිමවා වදාළසේකී. එසමයෙහි දිසාපාමොක් ආචාරීව උපන්නෙම් බුදුවූ මම් ම වේදැයි වදාළසේකී.

SANHIDA LANKA

# විසයිහ ජාතකය

තවද පස්මරුන් බිඳ ජයගත් හෙයින් මාරජී නම් වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් අනේපිඬු මහ සිටානන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

මෙහි වර්ථමාන කථාව බදිරංගාර ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. අනේපිඬු මහ සිටානන්ගේ දේවතාදුව වලක්ව වලක්වා දන්දුන්නෙම් ඊට ආශ්වර්යයකින්ද කියන්නේ මාසේවූ ලොවුතුරා බුදු කෙණෙකුන්ගෙන් අවවාද අසා දන්දීමෙහි පෙර මහෝත්තමයෝ අබුද්ධෝත්පාද කාලයෙහි ශක්‍ර දේවේන්ද්‍ර වලක්ව වලක්වා දන්දුන්නෝ වේදැයි වදාරා හේ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ විසය්හ නම් සිටුව උපන්නාහුය. දන්හල් කරවා දවස සලක්‍ෂයක් ධන වියදම් කොට ජම්බුද්වීපයෙහි නගුල් උඩ බඳවා මහත් දානසම්භාරයන් කරන්නාහ. මේ කුසල සම්බාරයෙහි ආනුභාවයෙන් ශක්‍රයන්ගේ පාණ්ඩුකම්භල ශෛලාසනය උනුවිය. එවිට ශක්‍රයෝ දිවසින් බලාගෙණ ශක්‍ර සම්පත් ඇරගන්නා නිසා මූ මම දානාධාසය කෙරෙතියි සැකව දානාධ්‍යාසියට මම අන්තරාය කෙරෙමි සිතා අවුත් සිටානන්ගේ දන්දෙන්ට තිබූ එලගිතෙල් සාල් තල මුං ආදීවූ දෙයද රත්රන් මුතු මැණික් සංඛසීලා ප්‍රවාලාදීවූ දෙයද වාල්සරක් ආදිවූ උපභෝග සියලු වස්තුද අන්තර්ධාන කරවූහ. සිටානන්ගෙන් දන්දෙන්නට සැලැස්වූ පුරුෂයා සලක්‍ෂයක් වස්තුව වියදම් කොට දන්දෙන්ට තිබූ සියලු වස්තූන් අනතර්ධාන වූවා දැක සිටානන්ට ගොසින් කියන්නේ ස්වාමීනි දන්දෙන්ට තිබූ සියලු වස්තු අන්තර්ධාන විය. එසේ හෙයින් සෙට දන්දෙන්ට කිසිදෙයකුත් නැතැයි කීහ. එපවත් සිටානෝ අසා ඊට කාරණා කින්දැයි සිතා තමන්ගේ බිරින්ද ගෙන්වා කියන්නාහූ සෙට දවසට දන්දෙන්ට තිබූ සියලු වස්තුවත් නැතිව අන්තර්ධාන විය. මාගේ රත්රන් මුතු මැණික් ආදී සියලු වස්තුව තිබූ භාණ්ඩාගාර ගෙවල්වල දොර අරවා ඉන් වස්තු වියදම් කොට දන්දෙවයි කියා වස්තු තිබූ ගෙවල් දොර ඇර බැලූ ගමනේ අමුනක් විවරක කිසි වස්තුවක් නැතිව අන්තර්ධාන වූ හෙයින් කිසි වස්තුවකුත් නුදුටු වාහ. සිටානන්ගේ භාර්යාවෝ සිටානන්ට කියන්නාහූ නුඹ වහන්සේගේ ඉන තුබූ සළුව හා මාගේ ඉන තිබූ කඩවිනා වී නැලියක්වත් සාල් නැලියක්වත් මස්සක් අකක්වාලක්සරකක් නැතිව සියලුවස්තු අන්තර්ධානවයයි කිවුය. සිටානෝ කියන්නාහූ මාගේ ප්‍රාණය තිබුතෙක් වේලා මාගේ දානයට අන්තරාය නොකෙරෙමි. එසේ හෙයින් උත්සාහ ඇතිව ගෙයබලා දන්දෙන්ට තිසි දෙයක් ගෙණ වයි කීහ. යහපතැයි ගෙට ගොසින් බැලූ ගමනේ මිනිසකු දමාගිය කඳකුත් දැකැත්තකුත් දැක ගොසින් ගෙණවිත් ස්වාමිනි මෙපමණක් විනා දුටුදෙයක් නැතැයි කියා සිටානන් අතට දුන්හ. සිටානෝ හද්‍රාව මෙතෙක්දා අපගේ සියලු වස්තු ඇති හෙයින් දනුත්දී අපිත් සැපසේ රැකුම්හ. දැන් වස්තු නැති හෙයින් රැකෙන්ටත් දන්දෙන්ටත් අනික්මානෙක් නැත. මේ කදත් දෑකැත්තත් ඇරගෙණ වලට ගොසින් තණදාගෙණවිත් වී කොට භාගයෙක් දන්දෙම්හ. භාගයක් ගෙණ රැකෙම්හයි කීයා කදත් දෑකැත්තත් ඇරගෙණ තණ දානලෙස වලට නික්ම තණකඳක් ගෙණවිත් වී කොට භාගයක් දන්දී භාගයක් තමන් රැකෙන්ට යයි තිබාගත් ගමනේ යාචකයන් එනහෙයින් තමන්ට තිබූ භාග යත් දී නිරාහාරයෙන් ඉඳ මේ නියායෙන් සත්දවසක් දන්දී නිරාහාරයෙන් උන් නාහ. සත්වෙනි දවසේ තණකද කරතබාගෙණ ගෙට එන ගමනේ අව්රශ්මි ශරීරයේ වැදගත් ගමනෙනුත් සත්දවසක් නිරාහාරයෙන් උන්හෙයිනුත් සුබු මාල වූ ශරීර හෙයිනුත් භ්‍රමිතව තණකද ඇරගෙණ විථියේ වැටුනාහ. එවිට ශක්‍රයෝ ආකාශයෙහි සිට කියන්නාහූ එම්බල සිටානෙනි තොප දුප්පත් අවස්ථාවෙහි තොපගේ ප්‍රාණයද රැකනොගෙණ දන්නොදී සැපසේ වැදහෙව ඉඳුවයි ශක්‍රයන් අතින් විචාළෝය. ශක්‍රයෝ මම ශක්‍රයෙක්මියි කිවුය. සිටානෝ කීය. තොප මේසා වූ ශක්‍රසම්පත් ලද්දේ විශේෂයෙන් දන්දී පඥසීලය රැකපෝය අෂ්ඨාංග ශිලය රැක වුව. මෙසේ පින්කොට මෙසේවූ ශක්‍රසම්පත් ලැබ සිටිනෝත් මෙලෙස කියන්ට කාරණා කින්ද තොප එක ශක්‍රකෙණෙකුන් තබා දහසක් ශක්‍රයෝ අවුදින් පින් නොකරවයි කිවු නමුත් මාගේ දානයට අන්තරාය නොකරමියි, මෙසේ වූ දුක්ඛිතව සිටත් මාගේ දානාංධ්‍යාශයට අඩුවක් නොකරමි සිටානෝ කී කල්හි ශක්‍රයෝ මෙසේ දුක්ඛිතව සිටත් තොප මෙසේ පින්කරමි මාගේ දානයට අඩුවක් නොකරමි කියන්නේ කවර කාරණාවක් නිසාදැයි විචාළ කල්හි සිටානෝ කියන්නේ එම්බල ශක්‍රය ශක්‍රසම්පත් මාර සම්පත් බ්‍රහ්මසම්පත් ඇරගන්නා නිසා නොවෙයි, තා ඇතුළුවූ සූවිසි අසංඛ්‍යයක් සත්වයන් සංසාර සාගරයෙන් ගොඩලා සම්‍යක් සම්බෝධියට පැමිණෙන නිසායයි කීහ. එපවත් අසා ශක්‍රයෝ වහා සන්තුෂ්ටව සිටානන්ගේ ශරීරය ශක්‍රයෝ තමන්ගේ අතින් පිරිමැද එෑ ගමනේ දිව්‍ය පහස හෙයින් සිටානන්ගේ ශරීරය පිණ නැගී සිටියාහ. එවිට ශක්‍රයෝ සිටානන්ට කියන්නාහු

SANHIDA LANKA

පළමු කොට තොප දෙන්නේ සලක්‍ෂයක් වස්තුනොවේද මෙතැන්පටන් දොළාස් ලක්ෂයක් සම්පත් වියදම්කොට දන්දෙවයි කියා සිටානන්ගේ අනතර්ධාන කළ සම්පත් සිටානන්ට පෑ ශක්‍රයෝ තමන්ගෙනුත් සියලු සම්පතින් උන්ගේ ගෙය පුරා තමන්ගේ ශක්‍රභවනයට ගියහයි සිටානෝ බොහෝ දානාංශ්‍යශය කොට කම්වූ පරිද්දෙන් ගියහයි වදාරා මේ විසය්ග ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි සිටුව උපන්නෙම් බුදුවූ මම් ම යයි වදාළසේක.

SANHIDA LANKA

# කුන්තානි ජාතකය

තවද නරවර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොස්වාලිහිණියක අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

කෝසල රජ්ජුරුවන් වහන්සේ වඩන කොස්ලිහිණියක් ඇත. ඒ කොසොල් රජ්ජුරුවන්ගේ ඒ ඒ රජ්ජුරුවන්ට රහසිගතව යවන්නාවූ යම් සන්දේශයක් ඇත් නමුත් ගෙණ ගොස් ඒ ඒ රජ්ජුරුවන්ට දී ඒ ඒ රජ්ජුරුවන්ගෙන් දී එවන සන්දේෂයෙක් ඇත් නමුත් තමතන්ගේ රජ්ජුරුවන්ට ගෙණවිත් දූත මෙහෙවර සැලැස්වීමේ සිටින්නීය. එක් දවසක් ඒ කොස්ලිහිණිය රජ්ජුරු කෙණෙකුන් ලඟට දූත මෙවර යාදී රජගෙයි කෙළනා කුඩා කොල්ලෝ ඒ කොස්ලිහිණි මෙවර ගොසින් ඇවිදින් මාගේ දරුවෝ කොයිදැයි විචාළීය. අසවල් කුඩා කොලු මැඩ මරාපීයය් කුඩා කොල්ලෝ කීහ. ඒ කොසොල් රජ්ජුරුවන්ගේ වාසල බැඳ සිටිනා ව්‍යාඝ්‍රයෙක් ඇත. එක් දවසක් කුඩාකොල්ලෝ කෙළගන යන්නාහූ ඒ ව්‍යාඝ්‍රයා ලඟට ගියහ. ලිහිණිත් කුඩා කොල්ලන් හා එක්වම කෙළගණ යන්නාසේ ගොසින් කුඩා කොල්ලන් ව්‍යාඝ්‍රයාට ලන්වූ කල්හි තමාගේ දරුවන් මැරූ කුඩාකොල්ලන් පියාපතින් ව්‍යාඝ්‍රයා ලඟට යතා දමා එෑහ. ව්‍යාඝ්‍රයාත් ඒ කුඩා කොල්ලා අල්වාගෙණ කඩාකා මැරීය. එවිට කොස්ලිහිණි මාගේ පලිය ඇරගතිමි මා කෙළේ රාජද්‍රෝහය. මා මෙතන රැඳීම් කටයුතු නොවෙයි කියා රජ්ජුරුවන්ට කියලා ගියාහ. මේ කථාව දම්සභාවේ රැස්වූ මාළු වරුන් වහන්සේ කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි පෙරකලද මේ කොස්ලිහිණිය පළි ඇරගත්තෙම වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ කොස්ලිහිණියක් ඇත. ඒ කොස්ලිහිණිය රජ්ජුරුවන්ගේ රහසිගතව ඒ ඒ රජදරුවන්ට යවන්නාවූ යම් සන්දේශයක් ඇත්නම් ගෙණගොස් දී ඒ රජ්ජුරුවන්ගේ බරණැස් රජ්ජුරුවන්ට එවන්නාවූ සන්දේශ පත්‍රයෙක් ඇතනමුත් ගෙණවුත් දී දූත මෙහෙවර සැලැස්මෙහි සිටින්නීය. එක් දවසක් ඒ කොස්ලිහිණිය එක් නුවරකට මෙහෙවර යාදී රජ ගෙයි කෙළනා කුඩා කොල්ලෝ කොස්ලිහිණියගේ පැටවුන් මැඩ මරාපිය කොස්ලිහිණි ඇවිත් මාගේ දරුවෝ කොයිදැයි විචාළීය. කෙළනා කුමාරවරු කියන්නාහූ අසවල් කුමාරයා තොපගේ දරුවන් මැඩ මරාපියයි කීහ. එවිට කොස්ලිහිණි රජ්ජුරුවන්ගේ වාසල බැඳ සිටිනා ව්‍යාඝ්‍රයා ලඟට යන්නාවූ කුඩා කොල්ලන් හා සමඟ ගොස් තමාගේ දරුවන් මැඩ මැරූ කුමාරයා පියා පතින් ගසා ව්‍යාඝ්‍රයා ලඟට යන්න දමාලුව, ව්‍යාඝ්‍රයාත් අල්වාගෙණ කඩා කා මැරීය. එවිට කොස්ලිහිණි රජ්ජුරුවන්ගේ රජගෙයි කෙළිනා කුමාර වරුන්ට රජ්ජුරුවන් වහන්සේගේ හික්මවීම නැති හෙයින් වේද මාගේ දරු වන් මැඩ මැරුවේ. යම් මාගේ දරුවන් මැරූ සෝකයෙන් කුමාරයා ව්‍යාඝ්‍රයා ලගට යන්නා දමා පළි ඇරගතිමි. දරු සෙනෙහයෙන් කළ පමණක් විනා මාත් කළේ රාජ ද්‍රෝහය ඉතිකින් හා මෙතන රැඳිම් කටයුතු නොවෙයි කියා යන්ට වන්නීය. එවිට රජ්ජුරුවෝ එපවත් දැන කොස්ලිහිණිය ගෙන්වාගෙණ තොපගේ දරුවන් මැරූ කුමාරයා මරා තෙපි පිළි ඇරගත්තුය. පළියට පළි සරුවුව ඒ නිසා තොප කෙරේ උදහස් නෙවම්හ. තොපි මෙතනින් යන්ට කාරණා කින්ද?, නොයවයි කීහ. එවිට කොස්ලිහිණි කියන්නී දේවයන් වහන්ස. දරුවන් කෙරේ සෝකයෙන් ඉවසාගත නොහි කුමාරයා මැරූ පමණක් විනා මා කෙළේ රාජද්‍රොහය. එසේ හෙයින් මම මෙතන රඳන්ට භය ඇත්තෙම් කීව. රජ්ජුරුවෝ දෙවෙනි තුන්වෙනි කීවත් නෙගාවිස කොස්ලිහිණිය පළාගියාහයි වදාරා මේ කුන්තානි ජාතකය නිමවා වදාළ සේකී.

එසමයෙහි කොස්ලිහිණි මෙසමයෙහිත් කොස්ලිහිණිමය, බරණැස් රජව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේකී.

SANHIDA LANKA

# අම්බචොර ජාතකය

තවද කාසිය ජාතකය කුණාලයෙහි විස්තර වශයෙන් බස්නේය. ධර්මරාජ ගුරුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අඹසොර භික්ෂූන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක්තරා මහළු භික්ෂූකෙණෙකුන් වහන්සේ අඹ උයනෙක වාසය කරණ අචිරවතී නම් ගංගාවෙන් ඉස්සෝධා නහා අඹ උයන බලන්ටයයි කියා උයනට ආවාහ. ඒ වෙලාවට එ කියන මහළු භික්ෂූන් වහන්සේ උයනට වැඩි උයනේ අඹ නැතිනිසාවත් එකියන සිටුදුන් සතරදෙනාත් සිටියා දූන එසේ වීනම් මෙකියන සිටුදූ සතරදෙනා වන අඹ කඩාගත්තේයයි සිතා තොප ඇමය මේ අඹ කඩාගත්තේයයි කියන්නා එකියන සිටුදූ සතරදෙනා මේ අප නාපියා ආ පමණක් විනා අප කැඩූ අඹයක් නැතැයි කීය. එසේත් මට දිවුරන්ට උවමැනවැයි කියන්නා යහපතැයි කියා එකියන සිටු දූ සතරදෙන දිවුලාහ. මේ නිසායෙන් එකියන සිටු දූ සතරදෙනා ලජ්ජා කරවා පියා උන් ඇම තමතමන්ගේ ගෙවලට යැවුසේක. මේ කථාව දම්සභා මණ්ඩපයට රැස්වූ මාලුවරුන් වහන්සේ කථාකොට කොට වැඩ උන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා, මහණෙනි, දැන් මතු නොවෙයි පෙරත් මේ භික්ෂූහු ස්ත්‍රීන් ලජ්ජාකරවුවෝ වේ දැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි එක්තරා තාපස කෙණෙක් අඹ උයනේ වාසය කරන්නාහූ ඒ ඇත්තාවූ අඹ තමුනුත් කා අඳුනන්නන්ටත් දී වංචා ප්‍රයෝගයෙන් දවස් යවන්නාහ. එසේම බෝධිසත්වයන් වහන්සේ ශක්‍රදේවේන්ද්‍ර ව ඉපද මනුෂ්‍යලෝකය බලා වදාරණසේක් කවුරු දෙමව්පියන්ට ආදර කෙරෙත්ද කවුරු අටසිල් රකින්දෝ කවර තාපසකෙනෙක් තපස් රකිද්දෝහෝයි බලා වදාරණ සේක් මේ තාපසයන්ගේ කුහක තපස් දැක ඒ උයනට අවුත් උයනේ අඹ අන්තර්ධානකොට පැවාහ. ඒ වෙලාවට බරණැස් නුවර සිටුදූ සතරදෙනෙක් නාපියා එතනට ආවාහ. තාපසයෝ එතනට අවුත් උයනේ අඹ නැති නියාව දැක මේ උයනේ අඹ කඩාගත්තෝ තොපියයි කියන්නා උං සතරදෙන අප අඹ කැඩුවේ නැතැයි කීහ. එසේ කීවත් කම්නැත දිවුරුන්ට උවමැනවයි කියන්නා යහපතැයි ගිවිස පළමුවන තැනැත්තී දිවුරන්නී ඉස්කරපුරා සුදුලොම් අඩුවෙන් උදුරන්නාවූ වයස් පිරුනු මාළුපුරුෂයකු අතරේ ඉඳිම්මැයි මේ අඹ කැඩින්නමැයි කියා කිහ. දෙවෙනි ස්ත්‍රී කියන්නී වයස් පසළොස් විස්ස තිස අවස්ථාවේදී සරණ නොගොස් ඔබදී සරණයම්මැයි කියා දිවුලාහ, තුන්වන ස්ත්‍රී දිවුරන්නී අනඟයාගෙන් සැරප්‍රහාර ලදින්ම දෙඟවුවෙක ඉන්නා ප්‍රියවූ පුරුෂයෙකු ලඟට ගොස් ඒ පුරුෂයා ලැබගන්නෙම්මැයි මේ අඹ කැඩින්න මැයි කියා කීහ. සතරවන ස්ත්‍රී දිවුරන්නී යහපත් කොට ඉස්සෝධා නහා සාන්දුජබාදු ආදීවූ දෙය හා කොකුන් ගල්වාගෙණ යහපත් කොට අතුලයානේ තනිව වැදහෝම්මැයි මේ අඹ කැඩින්නමැයි කියා දිවුලාහ. එවිට තාපසයෝ තෙපි ඇම දිවුලනියා යහපතැයි කියා උන් සතරදෙනා තොපි තොපගේ ගෙවලට යවයි කියා යවාපුවාහ. ශක්‍රයෝත් භයංකර වෙසක් මවාගෙණ තාපසයිනුත් එතනින් පහකොටපුවයි යි වදාරා මේ අම්බචෝර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි තාපසයෝ නම් මෙසමයෙහි මෙකියන භික්ෂූහුය. එසමයෙහි සිටු දූ සතරදෙනා නම් මේ සමයෙහි මේ සිටුදූ සතරදෙනාමය, එසමයෙහි ශක්‍රව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# ගජකුම්භ ජාතකය

තවද ධර්මරාජානන් වූ සර්වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කුසීත භික්ෂූකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක්තරා භික්ෂූකෙනෙකුන් වහන්සේ කළමනා පිළිවෙත්හි ද උගතමනා ධර්මයන් නොයිගැන්මෙන් කුසිත භාවය කරණ සේක. එපවත් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා ඒ කෙසේ දැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්සේක. රජ්ජුරුවෝ සියලු කටයුත්තෙහි කුසීතව වාසය කරන්නාහ. බෝධි සත්වයෝ කුසිතභාවය අරවාපියම්දෝහෝයි සිතා උන් කලට එක් දවසක් රජ්ජුරුවෝ මගුල් උයනට ක්‍රිඩාවටයයි ගියාහ. ඒ උයනේ ගජකුම්භයෝ යයි යන තිරිසනෙකු යන්නාවූ රජ්ජුරුවෝ දැක බෝධිසත්වයන් අතින් මේ කුමන තිරිසනෙක්දැයි විචාළ හ. බෝධිසත්වයෝ ස්වාමිනි මේ ගජකුම්භයෝයයි යන තිරිසනකැයි කියා බෝධිසත්වයෝ ගජකුම්භයා හා කැටිව කථාකරන්නේ එම්බල ගජකුම්භය. තාගේ ගමන් දාවල්තිස්සේ පලායෙයි නම් අඟලක් හෝ දඟලක් හෝ පලායන්නෙහිය. ඉදින් ලැවු ගින්නෙක් වැදගත් නම් කෙසේ ගැලවීයෙයි දැයි බෝධිසත්වයෝ ගජකුම්භයා අතින් විචාළාහ. ගජකුම්භයා කියන්නේ ගස් බිලයකට හෝ පොළවට හෝ වැදයෙමි. ඉදින් එසේවූ දෙයක් නොලදීන් නම් මාගේ ජාතිකර්මයයි කීහ. එවිට බෝධි සත්වයෝ රජ්ජුරුවන්ට කියන්නාහු ස්වාමිනි මේ ගජකුම්භා තමාගේ කුසීත භාවයෙන් යම් දුක්බය කට පැමිණෙද එමෙන් තපස්වීවරුන් වහන්සේ ද රජ්ජුරුවන් වහන්සේද ගිහි දනද තම තමන් කළමනා ඒ ඒ කටයුත්තෙහි ප්‍රමාදවෙත් නම් පසඳභායන පක්ෂයෙහි චන්ද්‍රයාමෙන් භායනයට යන්නාහ. යම් තපස්වී කෙණෙක් තමන් කළ මනා වත් පිළිවෙත් ආදීවූ දෙය වේලා නොවරදවා විචාරත් නම් එසේ වූ සත්වයන්ට අවවාද කෙරෙද්ද යම් රජ්ජුරුකෙණෙක් තමන්ගේ රාජ්‍යයේ කළමනා කටයුතු කාර්ය ඒ ඒ කාර්ය වෙලෙහි විචාරා කියන්ද යම් ගිහි කෙණෙක් තමන්ගේ කල්පනා ගොයිතැන් ආදීවූ සියලු කටයුතු වෙලා නොවරදවා විචාරත් නම් එසේ වූ සත්වයන්ට සියලු ඓශ්චර්ය කලාවෙන් කලාවට වඩනා පූර්ණ චන්ද්‍රයාමෙන් වඩනේයයි කිහ. මේ කියේ මට යයි රජ්ජුරුවෝ දැන එතැන් පටන් කුසිත භාවය හැර රජ්ජය කළහයි වදාරා මේ ගජකුම්භ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් මේ භික්ෂූහුය. එසමයෙහි අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම ම යයි වදාළසේක.

SANHIDA LANKA

# කේසව ජාතකය

තවද දේවාතිදේව වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි විශ්වාස භෝජනයක් ඇරභයා මේ ජාතකය දක්වන ලද.

අනේ පිඬු මහ සිටානන්ගේ ගෙයි දවස් පතා පන්සියයක් භික්ෂූන් වහන්සේ වළඳන සේක. සෙසු සංඝයා වහන්සේත් අවිච්ඡින්නව එලඹෙන සේක. සියලු සංඝයා වහන්සේට අනේ පිඬු මහ සිටානන්ගේ ගෙය නම් සතර මං සන්ධියෙහි සාරා තිබූ පැන් පොකුණක් විය. මේ නියාවට දවස් යවන කල්හි එක් දවසක් කොසොල් රජ්ජුරුවෝ නුවර ප්‍රදක්ෂිණාකොට නික්මෙන කල්හි බොහෝ සංඝයා වහන්සේ අනේ පිඬු මහ සිටානන්ගේ ගෙට වඩනා නියාව දැක උන් වහන්සේලා බොහේව අනේ පිඬු මහ සිටානන්ගේ ගෙට වඩිනේ කුමක් නිසා දැයි විචාරා නිත්‍ය සංඝයා වහන්සේ පන්සියයක් දෙනා වහන්සේ වළඳන්නට උවමැනැවයි සිතා සර්වඥයන් වහන්සේ පන්සියයක් සංඝයා වහන්සේට රසමසවුලෙන් යුක්තවූ භෝජනය වලඳගන්නාහ. මේ නියාවට දන්දෙන්ට සැලසූ පමණක් විනා අසවල් කෙණෙක් සංඝයා වහන්සේට විශ්වාසයෙන් වළඳවයි නො සැලවූහ. ඇසූ මෙවෙහවර නියාවටය පාත්‍රා කටයුතු කොට පිළි ගන්වාපියන්නාහ. තෙනට පාත්‍රා ගෙණගොස් පාත්‍රා වල බත් ඒ උපාසකරුන්ට දී උන්ගෙන් හිත විශ්වාසයෙන් පිළිගැන්වූ යම් ආහාරයක් වළඳන සේක. එක්දවසක් කොසොල් රජ්ජුරුවන්ට බොහෝ කොට වැල වරකා අඹ දඹ ආදීකොට ඇති මධුර ඵල බොහෝ කොට ගෙණාහ. රජ්ජුරුවෝ සංඝයා වහන්සේට මධුර ඵල ජාති යවයි කියා යවූහ. සංඝයා වහන්සේ වළඳන්නට ඒ ඒ තෙනට වැඩපුසේක. එක්කෙණකුන් වහන්සේත් නොදැක රජ්ජුරවන්ට ගොසින් ස්වාමිනි එක්වහන්ද නමකුත් නුදුටුයෙමි කීහ. රජ්ජුරුවෝ මාගෙන් දිලු භෝජනය මගේ රජගෙයිදී නොවළඳ ඒ ඒ තැනට ගොසින් වළඳන්නට කාරණා කින්දැයි සිතා සර්වඥයන් වහන්සේ අතින් විචාරම් සංඝයා වහන්සේ මාගෙන් දෙන ධානය මාගේ ගෙයිදී නොවඳා නම් ඒ ඒ තැන වළඳනසේක. කවර කාරණයකින් දැයි විචාළාහ. සර්වඥයන් වහන්සේ රජ්ජුරුවෙනි සංඝයා වහන්සේට දන්දීම නම් ආදර විශ්වාස ඇතිව පයට දිය දී පය සෝදවා දැහැට පැන්දී විශ්වාසව දන්දෙතොත් වළඳනසේක. ඔවා දියට දන් දුනැයි වළඳන්ට කම් කරණ ගමනේ ව්‍යාධියෙන් නොසිදෙන්නා එතනින් පලාගොස් තමන්ට හිත විශ්වාස වූවන්ගෙන් ගොඩ ඇල් හුරුවි ආදියෙන් උළුකැන් පිසඳුන් ගමනේ ව්‍යාධි සන්සිඳුනේය. එසේහෙයින් රජ්ජුරුවෙනි සංඝයාවහන්සේට නම් ආදර භක්තියෙන් දිලු දානයම වඩිනේයයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ උතුම්වූ බ්‍රාහ්මණ කුලයක ඉපිද කප්ප නම්ව පඤ්චකාමයෙහි ආදීනව දැක හිමාලය වනයට ගොස් කේසව නම් තාපසයන් පන්දහසක් දෙනාට නායකව වාසය කරන්නවුන් දැක එකියන තාපසයන් ලඟ බෝධිසත්වයෝ කප්ප නම් තාපසව අතවැස්සන්ට ප්‍රධාන අතවැසිව හිත වාසය කරන්නාහ. එසමයෙහි කේසව තාපසයෝ වැසි සාරමස පැමිණි හෙයින් ලුනු ඇඹුල් පිණිස තමන්ගේ පන්සියයක් තාපසවරුන් පිරිවරා බරණැස් නුවරට ගොසින් එනුවර රජ්ජුරුවන්ගේ උද්‍යානයෙහිද සැතපී නිදානැගී පන්සියයක් තාපසවරුන්ගේ උද්‍යානයෙහි රඳවා වස් සාරමස උන්කල්හි වස් සාර මස ඉකුත් ගමනේ කේසව නම් තාපසයෝ අපගේ හිමාලය වනයට නික්මෙමහයි රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ නුඹ වහන්සේ වයොවෘද්ධ සේක. වනාන්තරයේ ඉඳ ප්‍රයෝජන කිම්ද නුඹ වහන්සේගේ පන්සියයක් තාපසවරුන් යවා නුඹ වහන්සේ රැඳූන මැනවයි කීහ. කේසව නම් තාපසයෝ යහපතැයි කියා තමන්ගේ පන්සියයක් තාපසවරුන් කප්ප නම් තාපසයන්ට පාවාදී ගෙණ නායක කමට සලස්වා හිමාලය වනයට යවා රජ්ජුරුවන් කී හෙයින් රැඳූනා පමණක් විනා කේසව නම් තාපසයෝ තප්ප නම් තාපසයන්ට අධික ප්‍රේම ඇත්තාහ. ඒ ප්‍රේමයෙන් රෑ නිදිමැරීමෙන් කාපූ ආහාරය නොදිරීමෙන් කේසව නම් තාපසයන්ට රක්ත අතීසාරය ඇතිව ව්‍යාධියෙන් පිඩිතවූ කල්හි රජ්ජුරුවෝ එපවත් දැන තමන්ගේ අංග වෛද්‍යයන් පන්සියයක් ලවා වෙදකම් කරවන්නට පටන්ගත්තාහ. දවසින් දවස කේසව තාපසයෝ රජ්ජුරුවන්ට කියන්නාහු රජ්ජුරුවෙනි. මා ලෙඩින් ගොඩ නැගෙන්නා කැමැත්තාද මේ ලෙඩින් නැසී යන්නා කැමැත්තා දැයි විචාළ කල්හි රජ්ජුරුවෝ ස්වාමින් වහන්ස සැපසේ ලෙඩින් ගොඩනැගෙන්නා කැමැත්තෙම් කීහ. එසේ වී නම් මාගේ හිමාලයෙහි කප්ප නම් තාපසයන් ලඟට මා ඇරලවා පියව, මේ ලෙඩින් ගොඩ නැගෙමි කීහ. රජ්ජුරුවෝ යහපතැයි කියා තමන්ලඟ සිටිනා නාරද නම් අමාත්‍යයෙකු කැඳවා කේසව නම් තපස්වීන් කැඳවාගෙණ ගොසින් උන් වහන්සේ හිමාලය වනයෙහි ඇරලවා එවයි කීහ. නාරද නම් අමාත්‍යයා යහපති ස්වාමීනි කියා කේසව නම් තාපසයන් හා බොහෝ තාපසවරුන් වාසය කරන්නාවූ උන්වහන්සේ

SANHIDA LANKA

පන්සලට ගෙණගොස් එැහ. කේසව නම් තාපසයෝ කප්ප නම් තාපසයන් දුටු අධිකවූ ප්‍රේමයෙන් ගොඩ ඇල් හුරුවී ආදියෙන් ලුනුලා දුම් නැතිව පිස වත්කළ උළුකැන් ආදර ගෞරවයෙන් වළඳවාලු ගමනේ රක්ත අතීසාරය ගුණව ගියේය. එවිට බරණැස් රජ්ජුරුවෝ නාරද නම් අමාත්‍යයා කැඳවා කියන්නාහු අපගේ කේසව නම් තාපසයන් වහන්සේගේ ව්‍යාධිය සංසිඳුනිදෝහෝයි නියම දැන පියා එවයි යවුහ. නාරද නම් අමාත්‍යයා තාපසයන් සමීපයට ගොසින් ස්වාමිනි වෙදවරුන් පන්සියයක් ලවා වෙදකම් කරවූ ගමනේ ගුණනුවූ රක්ත අතීසාරය දැන් කවර සැටියේ ගුණව ගියේදැයි විචාළේය. කේසව නම් තාපසයෝ නාරද නම් අමාත්‍යය මාගේ ව්‍යාධිය සන්සිඳුනු කාරණා අසවයි කියා කියන සේක් කප්ප නම් තාපසයන් ප්‍රිය සම්පන්නවූ පන්සලයෙහි විශේෂ ගුණ යෙන් හා කප්ප නම් තාපසයන් මා කෙරේ ඇති භක්ති ප්‍රේමයෙන් හා ගොඩ ඇල් හුරුවී ආදීයෙන් ලුනුදුන් ආදිය නැතිව පිස වත්කොට ලූ උළුකැනින් මාගේ ව්‍යාධි සන්සිඳුනැයි නාරද නම් අමාත්‍යයාට කිසේක. අමාත්‍යයා කියන්නේ රජ්ජුරුවන් වහන්සේ දෙනලද සුභෝජන වූ ආහාරයෙන් ගුණ නොදී මෙසේවූ කටුක ආහාරයෙන් ගුණ වූයේ කවර කාරණයකින්දැයි විචාළේය. කේසව තාපසයෝ අමාත්‍යය භෝජනය කෙසේ යහපත්වූවත් කටුක වුවත් විශ්ව භෝජනය මාහැඟිය නිකම් තැනින් කෑවාවූ මධුර භෝජන නියා වට හිතවිශ්වාසයෙන් ගෙන් බීපු ඇඹුල් කැඳට අඩුයයි කී සේක. මේ නියාවට බරණැස් රජ්ජුරුවන්ට නාරද නම් අමාත්‍යයා ඇවිත් කීහයි වදාරා මේ කේසව නම් ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය. එසමයෙහි කේසව තාපසයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. නාරද අමාත්‍යයා නම් බකනම් බ්‍රාහ්මණයාය. එසමයෙහි කප්ප නම් තාපසව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# අයකූට ජාතකය

තවද ලෝකගුරු වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලෝකාර්ථචර්යාව අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වර්ථමාන කථාව මහාකණ්හ ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය, මෙහි වනාහී දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ සර්වඥයන් වහන්සේ ලෝකාර්ථ චරියාව කළ නියාව යහපතැයි කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි විචාරා වදාරා එපවත් අසා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බරණැස් නුවර බොහෝ මනුෂ්‍යයෝ යක්‍ෂයන්ට ප්‍රේතයන්ට එළුවන් කුකුලන් ප්‍රාණීන් බොහෝ මරා බලියම් දෙන්නාහ. රජ්ජුරුවෝ නුවර වාසීන් බොහෝව යක්‍ෂයයන්ට ප්‍රේතයන්ට ප්‍රාණීන් මරා බිලියම් දෙන නියාව අසා මාගේ අඥා ඇත්නම් නුවර ප්‍රාණවධ කළ නොහැක්කැයි බෙරලැවුහ. එතැන්පටන් ප්‍රේතයන්ට බිලියම් නැතිව ගියහෙයින් යක්‍ෂයෝ ඉඳ කථාකරන්නාහූ අපට බිලියම් නැතිකළෝ අසවල් රජ්ජුරුවෝය. උන්ගේ ඉස යකුලකින් පළා මරා පියන්ට උවමැනවයි එක් ප්‍රේතයකු යවුහ. ඒ ප්‍රේතයා රජ්ජුරුවන් ආස්ථානයේ උන් ගමනේ ඉසට ගන්ටයයි යකුලක් අතින්ගෙණ ආකාශයෙහි අමෝරාගෙණ සිටියේය. එපවත් ශක්‍රයෝ ධර්මිෂ්ටවූ රජ්ජුරුවන්ට යකුලෙන් ගසන්ට සිටි නියාව දූන තුමූද ඔහු ඉස් මුදුනේ යකුලක් ගෙණ සිටියාහ. රජ්ජුරුවන්ට ප්‍රේතයා සිටි නියාව පෙණෙයි. ශක්‍රයන් සිටි නියාව නොපෙනෙයි, එවිට රජ්ජුරුවෝ ප්‍රේතයා තමන්ට ආරක්ෂාගෙණ සිටි දොහෝයි සිතා මා මේ විචාරන්ට උවමැනවයි රජ්ජුරුවෝ ප්‍රේතයාට කියන්නාහූ තා යකුල අතින්ගෙණ ආකාශයෙහි  සිටින්නේ මට ආරක්ෂාවටද නැත්නම් මට සතුරුව දූයි විචාළේය. ප්‍රේතයා කියන්නේ රජ්ජුරුවෙනි යක්ෂයෝ ප්‍රේතයෝ එක්ව කථාකොට තොපගේ ඉසට මේ යකුලින් ගසන නියායෙන් එවුහ. එසේ හෙයින් තොපට මා සතුරුව ආයේය යි කීහ. රජ්ජුරුවෝ කියන්නාහූ කාරණයක් නිසාද මට යකුලින් ගසන්ට කියේය යයි විචාළේය. ප්‍රේතයා කියන්නේ රජ්ජුරුවෙනි. තොප විසින් තමන් ඇමටදෙන බිලියම් නැවැත්තු නිසාය යි කීහ. එවිට රජ්ජුරුවෝ තා සේ ප්‍රේතයන් කෙතෙක් දෙනා යකුළුගෙණ සිටියත් මා කියපු බස දෙවෙනිව නො කියමි තාගේ ප්‍රේතයන් කී සැටියට යකුලින් ගැසූවිටම අප ඇමට නායකවූ ශක්‍රයෝත් මා ඉසට ගසිමි යකුලක් අතින්ගෙණ ආකාශයෙහි සිටිති. එසේ හෙයින් ගැසීය නොහෙමි කීහ. එවිට රජ්ජුරුවෝ තා සේ වූ කොතොක් ප්‍රේතයන් යකුළුගෙණ අවුදින් සිටියත් මා බිය වන්නේ නැත.  මා කියපු බස දෙවෙනිව නොකියමි. පළමු මම තනිව සිටියෙමි. දූන් ශක්‍රයෝ මට ආරක්ෂාව සිටිපසු මම කුමට බිය වෙම්ද යි කීහ. ශක්‍රයෝ එකියන ප්‍රේතයා රජ්ජුරුවන් සමීපයෙන් පහකොට රජ්ජුරුවන් ලඟට අවුත් රජ්ජුරුවෙනි තොපට මෙතැන්පටන් මම ආරක්‍ෂා වට සිටිමි. කිසි භයක් නොවී පළමුවෙන් දූහැමෙන් සෙමෙන් රාජ්‍යය කරවයි අවවාද කියා ශක්‍රයන් දෙව්ලොවට ගියහයි වදාරා මේ අයකූට ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ශක්‍රයෝ නම් අනුරුද්ධ මහා ස්ථවිරිය. එසමයෙහි බරණැස් රජව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළ සේකී.

SANHIDA LANKA

# සන්ධිභේද ජාතකය

තවද තථාගතවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සවගයේ භික්ෂූන් වහන්සේ සන්ධිභේද ව්‍යාප්තියක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

ස්වගයේ භික්ෂූන් වහන්සේ උනුන් ගැස්සීම් බිඳිම් ඇතිව වාසය කරණ නියාව සර්වඥයන් වහන්සේ දන එම්බා මහණෙනි උනුන් හා විරෝධකරණ මනුෂ්‍යයෝ කඩු හා තෙප් හා සමානයෝය. පෙරසිංහයන් හා වෘෂභයන් හා හිත විශ්වාසව කරණ ගමනේ උනුන් විරෝධකරවූවාමෙන් තොප ඇමත් විරෝධව වාසය කරණවා දැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයයෝ දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි සියලු ශාස්ත්‍රය ඉගෙන අවුත් පියරජ්ජුරුවන්ට ශාස්ත්‍රපෑ යුවරජ තනතුරෙහි සිට පියානන් අවෑමෙන් බෝධිසත්වයෝ රාජ්ජයට පැමිණ දැහැමෙන් රාජ්ජය කරණ සමයෙහි එක්තරා පුරුෂයෙක් වනාන්තරයෙහි සරක් පටව් ලාගෙණ සිසානේය මෙකියන පුරුෂයාගේ සරක්පට්ටියෙන් දරිඇති දෙනක් තණ කාගෙණ එන තැනැත්ති හිමාලය වනයට ගියාය. ඒ වෘෂභධේනු තොමෝ සිංහධෙනුවක හා හිත විශ්වාසව වාසය කරන්නීය. ඒ කියන සිංහධෙනුව සිංහපැටවෙකු වැදූහ. වෘෂභ ධෙනුව වෘෂභ පැටවකු වැදූහ. එකියන සිහපැටවා හා වෘෂභ පැටවා හා දෙන්නත් තමන්ගේ මවුන්දෙන්නා හිත හෙයින් තුමු දෙන්නාත් හිතව එකතැන ගොදුරක් කා එකතැන සැතපී එකට වාසය කරන්නාහ. එසමයෙහි ඒ දුටු වල් වැද්දෙක් මා නුදුටු විරූ අපූර්වයයි සිතා බරණැස් රජ්ජුරුවන් දකින්ට යන්නේ තමාගේ වනයෙන් ගෙණගිය මනා උපකරණයන් සපයා ගෙණ රජ්ජුරුවන් දකින්ට ගොස් රජ්ජුරුවන් දිට. රජ්ජුරුවොත් තා විසින් වසන වනාන්තරයෙහි තා දුටුවිරූ අරුමය නොඅරුම කින්දැයි විචාළාහ. එවිට වැදි කියන්නේ දෙවයන් වහන්ස, අනික් දුටුවිරූ ආශ්චර්යයක් නැත සිංහයකු හා වෘෂභයෙක් හිත විශ්වාසව වාසය කෙරෙති කීය.

එබස් අසා රජ්ජුරුවෝ කියන්නෝ තුන්වන මිත්‍රයෙකු එක්වූ කල්හි විනාශයට පැමිණෙයි තුන්වන මිත්‍රයා එක්වූකල මට කියවයි කියා වැද්දාට සමුදුන් නාහ. වැදිත් යහපතැයි කියා හිමාලය වනයට ගියේය. එසමයෙහි එක්තරා කැනහිලෙක් සිංහයා හා වෘෂභයා උන්තෙනට අවුත් මමත් තොප ඇම හා එක්ව වාසය කරන්නේය. ඒ දුටු වැදි තුන්වන මිත්‍රයෙකු ඇතිවූ කල රජ්ජුරුවන් වහන්සේ කියන්ට කීසේක. මෙපවත් රජ්ජුරුවන්ට කියන්ට යෙමි සිතා ගියේය. ඔහු යද්දී කැනහිලා සිතන්නේ බොහෝ සිවුපාවුන්ගේ මස් මා විසින් කණලද සිංහයන් හා වෘෂභයන්ගේ මස් මා විසින් නොකණලද එසේ හෙයින් මුන්දෙන්නා උන්ගස්වා මරාපියා මාංශකන්ට උවමැනවැයි සිතා සිංහයා නොකීදෙය වෘෂභයාට කියා වෘෂභයා නොකිදෙය සිංහයාට කියා උනුන් ගස්වා දෙන්නා උනුන් හා සටන් කරුවා මැරවීය. වැදිගොසින් රජ්ජුරුවන්ට ස්වාමීනී තුන්වන මිත්‍රයෙක් ඇතිවියයි කීය. රජ්ජුරුවෝ කෙසේ මිත්‍රයෙක්දැයි විචාරා කැනහිලායයි යනු අසා එසේ කල නිචයා එක්වූ පසු අනර්ථයට පැමිණෙන්නේ නියමය යි කියා වහා ගමන්කරන්ට තිසි රථයකට නැඟී වැද්දහු ගමන්ලන්ට සලස්වාගෙණ සිංහයා හා වෘෂභයා හුන් තෙනට ගියාහ. එවෙලාවට කැන හිලා මා සිතූදෙය සිද්ධවියයි සමාධියෙන් සිංහයා පිටට පැන ඌගෙන් මාංශ කැටියක් කඩා වෘෂභයා පිටට පැණ ඔහුගෙන් මාංශ කැටියක් කඩා කා පැණ පැන සිටියේය. රජ්ජුරුවෝ එපවත් දන තමන්ගේ රථාචාර්යයාට කියන්නාහු රථාචාර්යය සිංහයා එක්වන්නේ සිංහධේනුවක් හා කැටුවය. වෘෂභයා එක්වන්නේ වෘෂභ ධේනුවක් හා කැටුවය. සිංහයා කන්නේ මාංශය. වෘෂභයා කන්නේ තණ ජාතිය. එසේ හෙයින් ස්ත්‍රීන් නිසාවූ විපත්තියකුත් නොවෙයි. කැවිලි නිසාවූ විපත්තියකුත් නොවෙයි බොහෝ කාලයක් උනුන් හා හිත විශ්වාසව වාසය කළ දෙන්නා ජීවිතක්ෂයට පැමිණියේ නීච තැනැත්තවුන්ගේ බසින. එසේ හෙයින් කේලාම් කියන යම් කෙනෙකුන්ගේ බස් ගිවිසිම් තියුණු මුවහත් ඇති ඛඩ්ගයක් හා අඩයටියක් ද සමානය. උනුන්ට හිත විශ්වාස කෙනෙකුන්ගෙන් විරුද්ධ ලෙස බස් කිවූ නම් උනුන් මැදසේ කියා විචාරීමෙන් ම ඇත්තෙක් වී නම් ඇත්තට පලා යෙයි. නැත්තෙක් වී නම් නැත්තට පලායෙයි. ඒ මානයට විචාරීමෙන් ම කෙලාම් කියන තැනැත්තේ නො කියා තිබා පිය යි. කේලාම් නොඇසීමෙන් දෙපක්ෂයේ ඇත්තන් සිතට වහා සුව තිබෙයි. කේලාම් කී කෙනෙකුන්ගේ යම් තෙනක ගිවිස්සෝ නම් සිංහයාට හා වෘෂභයාට වූ දෙය මෙන්ම අනර්ථයට පැමිණෙන්නේය යි කියා සිංහයාගේ කෙසරු සලා බහා සම් හා නිය හා තෙල් හා ඇරගෙණ තමන්ගේ බරණැස් නුවරට ම ගියාහයි වදාරා සන්ධිභේද ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

එසමයෙහි රජ්ජුරුවො නම් බුදුවූ මම් මයයි තමන්වහන්සේ දක්වා වදාළසේකී.

# අරඤ්ඤ ජාතකය

තවද ධම්ස්වාමි වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි චුල්ල කුමාරිකාවන් අරභයා මේ ජාතකය දක්වන ලදී. මෙහි වර්තමාන කථාව ඉන්ද්‍රිය ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි වනාහී යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්ස් බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ වාසය කරණ කල්හි බෝධිසත්වයන් වහන්සේ තමන් වහන්සේගේ පුතනුවන් වහන්සේත් ඇරගෙණ වනාන්තරයට ගොසින් ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව පුත නුඹ වහන්සේ පන්සල රඳවා බෝධිසත්වයන් වහන්සේ වනයට ගොසින් පලාඵල ගෙණවිත් ජීවත්වන සමීපයෙහි සොරු මොත්තමෙක් එක්ව ගම් පැහැරගෙණ යන්නෝ ස්ත්‍රියක් අල්වාගෙණ ගොසින් වනාන්තරයට ඇරපියා පලා ගියහ. ඒ වනයේ ඇවිදිනා තැනැත්තී පන්සලට ඇවිදින් බැසපු වැඩි මාළු තාපසයෝ පලා එල ගෙණෙන්ට ගියහ. කුඩා තාපසයන් පන්සල උන් තැනැත්තේ ඒ ස්ත්‍රිය තමාගේ භාව භාවලීලා කටාක්‍ෂ දක්වමින් තාපසයන් ගේ ශිල භේදකොට කියන්නී මේ වනයේ ඉඳ කින්ද, මනුෂ්‍යයන් ඇතිතෙන කට යම්හයි කීහ. තාපසයෝ මාගේ පියානන් වහන්සේ අතින් විචාරා විනා නොයෙමි කීහ. ඒ ස්ත්‍රී සිතන්නී මා මෙතනට ඉන්ට කාරණා නොවෙයි මම මඟ ඉදිමියි වැඩිමාළු තාපසයන් වහන්සේ විචාරා එවයි කියා පලා ගියාහ. එතකොට වැඩිමාළු තාපසයෝ වනාන්තරයෙන් එලාඵල ගෙණවිත් පන්සලට ආසේක. කුඩා තාපසයෝ වැඩිමාළු තාපසයන් වහන්සේ අතින් විචාරණසේක් ස්වාමිනි මම මනුෂ්‍ය පථයට ගොසින් ගිහිව රකෙන්නෙම් කෙසේ වාසය කෙරෙම්දැයි කෙසේවූ කෙණෙකුන් භජනය කෙරෙම්දැයි විචාළාහ. වැඩිමාළු තාපසයෝ කියන්නාහු පුත තපස්වී භාවය ඇර ගිහිගෙයි රකෙන්ට සිතතොත් වෙෂ පරදවයි. ස්ත්‍රී කී දෙයට කිපෙන සුළු කාය වකා මනඃ යන වාරත්‍රයෙන් අවැඩක්ම සිතන්නාවූ අකුසල් ආදීවූ දෙය එකඟ නොව අස්ථිර වූ වංඤවල වූ සිත් ඇති එසේවූ අසත්පුරුෂයන් භජනය නොකොට වාසය කරවයි කීහ. එබස් අසා තාපස කුමාරයෝ කියන්නාහු මෙකී අගුණ නැති කෙණෙක් නම් නුඹ වහන්සේ විනා අනික් කෙණෙක් නැත. එසේහෙයින් නුඹ වහන්සේ ඇරපියා නොයෙමි යයි වදාරා මේ අරඤ්ඤ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි එකියන ස්ත්‍රී හා තාපසයෝ නම් මෙකියන භික්ෂූන් හා චුල්ල කුමාරිය එසමයෙහි තාපසයෝ නම් බුදුවූ මම් ම යයි වදාළසේක.

SANHIDA LANKA

# මණිකුණ්ඩල ජාතකය

තවද පරදුක්ඛ දුක්ඛිතවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට වැරදී ගියාවූ අමාත්‍යයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වනාහි වර්ථමාන කථාව මතු පහළ වන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ බරණැස් නුවර රජ්ජුරුවන්ට පුත්‍රව ඉපිද වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් ලඟ ශිල්ප ඉගෙණ තමන්ගේ නුවරට අවුත් පිය රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට අමාත්‍යයෙක් වැරදී ගියේය. ඒ වැරදි ගිය අමාත්‍යයා රජ්ජුරුවෝ තමන්ගේ නුවරින් පිටත ලැවුහ. ඒ අමාත්‍යයා කෝසල රජ්ජුරුවන්ගේ නුවරට පලාගොස් කෝසල රජ්ජුරුවන්ට කියා උගන්වා ගෙණ රජ්ජුරුවන් හා සේනාව ගෙණවිත් බරණැස් නුවර ඇරගෙණ රජ්ජුරුවනුත් දඟගෙයි ලැවිය. බෝධිසත්වයෝ දඟගෙයි ඉඳ කිසි වික්ෂේපයක් නොවී ධ්‍යාන උපදවා ගත් ගමනේ කෝසල රජ්ජුරුවන්ගේ සකල ශරීරය සැත්කම් කරන්නා සේ මහවේදනාවට පැමිණ ගමනේ කෝසල රජ්ජුරුවන්ගේ සිතින් සැකපී කිසි අපරාධයක් නැති බරණැස් රජ්ජුරුවන්ට කළ අපරාධයෙන් මට මේ ශරීර වේදනා වූයේයයි සිතා බරණැස් රජ්ජුරුවන් උන් දඟගෙට අවුත් බැලූකලට ධ්‍යානයෙන් සැප සේ උන් රජ්ජුරුවන් දැක. රජ්ජුරුවෙනි තොපගේ හස්ති සේනාව අශ්ව සේනාව ඇතුළුවූ පාබල සේනාව ද රත්තරන් මුතු මැණික් කුණ්ඩලාභරණ ආදීවූ සියළු සම්පත් ද අග්‍රමෙහෙසිකා බිසෝවරු නෑ දරුවන් ඇතුළුව සියළු අන්තඃපුරයද, රාජ්‍යය ද ඇරගෙණ තොප සිරගෙයි එෑ ගමනේ ඊට කිසි සෝකයක් නොවී සිත එකඟ කොට ගෙණ කෙසේ ධ්‍යාන උපදවා ගතු දැයි බෝධිසත්වයන් අතින් විචාළේය. බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට කියන්නාහු, එම්බා රජ්ජුරුවනි සම්පත් ඇති කළ පළමුවෙන් සම්පත් හෝ නස්නේය. සම්පතට පළමු මනුෂ්‍යයෝ නසින්නාහ. චන්ද්‍රයා උදා වූයේ නම් අස්තගත වන්නේය. සූර්යා උදා වුයේ වී නම් අස්ගත වන්නේය. එසේ හෙයින් පැමිණෙන්නාවූ අලාභය පැමිණෙන්නේමය. ඊට මා විඤෙ කින්දැයි සිතිමෙන් සිත එකඟ කොට ගෙණ ධ්‍යාන උපදවා ගතිම් යි බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට කීහ. දෙවැනි බෝධිසත්වයන් වහන්සේ රජ්ජුරුවන්ට කියන්නාහු යම් ගෘහස්ථයෙක් කම්මැලිව කුසිතභාව ඇත්තේද, යම් තපස්වී කෙනෙක් ඉඳුරන් දමා එකඟවූ සිතින් වාසය නොකරත් නම් එසේවූ තපස්වියාද රජ්ජුරු කෙණෙක් කී කී වන්ගේ බස්පස්සේ ගොසින් වෙසේ නම් එසේ වූ රජත් යහපත් නොවන්නේය. යම් පණ්ඩිතයෙක් කෝපිද එසේවූ පණ්ඩිතයාත් යහපත් නොවන්නේය. එසේ හෙයින් යම් රජ්ජුරුකෙණෙක් පරීක්ෂාකාරීව දවසනාරිහුද පරීක්ෂාකාරීව දවසරිනා රජ්ජුරුවන්ගේ යසස් හා කිර්තීයත් කළාවෙන් කළාවට වඩනා චන්ද්‍රයාමෙන් සම්පූර්ණවන්නේයයි කීහ. එබස් අසා කෝසල රජ්ජුරුවෝ අප නොදන කළදෙයට ක්‍ෂමා කළමැනැවයි පාවාදී කෝසල රජ්ජුරුවෝ තමන්ගේ රාජ්‍යයට ගියායයි වදාරා මේ මණිකුණ්ඩල ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළ සේක.

SANHIDA LANKA

# සුජාත ජාතකය

තවද ස්වයංමහඥනවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරණ සමයෙහි පියානන් මළාවූ උපාසකයකුගේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

එක්තරා උපාසකයෙකු තමාගේ පියානන් මළාවූ සෝකයෙන් බොහෝ වික්ෂේපයට පැමිණ ඉන්නාවූ උපාසකයා සර්වඥයන් වහන්සේ දැක සෝවාන් වෙන්ට හේතු සම්පත් ඇති නියාව දැක වදාළ අන්තයෙහි පසු මහණ භික්ෂූ කෙණෙකුන් වහන්සේ ඇරගෙණ එකියන උපාසකයාගේ ගෙට වැඩි සේක. උපාසකයාත් සර්වඥයන් වහන්සේට අසුන් පණවා දුන්නේය. සර්වඥයෝත් ඇයි උපාසකය විකෂෙපව උන්නේ ඇයිදැයි විචාළාහ. ස්වාමිනි මාගේ පියානන් නැසීගිය හෙයින් විකෂෙ ව උන්නෙමි දැන්වූහ. උපාසකයා මළවුන්ට ඇඬීම කාරණා නොවෙයි පෙර උත්තමයෝ නැසිගිය උන්ට අඬන්නාවූන්ට අවවාද කිවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක්තරා කෙළඹියෙක් හට පුත්‍රව උපන්නාහ. ඔහු සුජාත නම් වූහ. බෝධිසත්වයන්ගේ මුත්තනුවෝ එක්තරා ව්‍යාධිකෙින් මළහ. බෝධිසත්වයන්ගේ පියානන් මළ සෝකනේ පියානන්ගේ ආදාහණ භූමියෙහි තිබූ ඇට ගෙණවිත් තමන්ගේ ගෙදර සමීප භූමියෙහි ලා එතනට පස් කොට දවසකට තුන්විටක් එතනට ගොස් වැඳ පුදා අඬා පෙරලී නොකා නොබී බොහෝ විකේෂ්පයෙන් දුක්විඳිනාහ. බෝධිසත්වයෝ මව්පියානන් වහන්සේ මාගේ මුත්තනුවන් වහන්සේ කෙරේ සෝකයෙන් පෙරලෙන සේක. ඒ සෝකය මා අරවන්ට උවමැනවයි සිතා බෝධිසත්වයෝ මළ මීමකු වැඳහොත් තැනට තණත් පැනුත් ගෙණගොස් කට කෙරේ තබා මීමා තණ කාපිය පැන් බීවය යි කියති. බොහෝ මනුෂ්‍යයෝ මේ කිම්ද සුජාත කුමාරයානෙනි මළ මීමා තණ පැන් කෙසේ කා දැයි කියා විචාළත් කවුරුන්ටත් කිසිබසකුත් නොකියා මීමා තණ කාපිය පැන් බීපිය යි කියති. මනුෂ්‍යයෝ සුජාත කුමාරයන්ට ප්‍රලයක් ඇතිව ගොසින් මෙසේ කරන්නේයයි මනුෂ්‍යයෝ සුජාත කුමාරයන්ගේ පියානන්ට කියන්නාහු තොපගේ පුතනුවන්ට ප්‍රලගුණයක් ඇතිව මළ මීමකු ලඟට ගොස් කටලඟ තණ පැන්තිබා මීමා තණ පැන් කාපියයි කියති. කවුරුන්හාත් සෙසු බසක්වත් නො කියන්නේ යයි ගොසින් කීහ. කෙළඹි පුත්‍රයා තමන්ගේ පියානන් මළ සෝකය හැර පුත්‍රප්‍රේමයෙන් සුජාත කුමාරයන් කරා අවුත් කිමෙක්ද සුජාත කුමාරයෙනි මළ මීමා කෙසේ තණපැන් කාද, තොපි මට වඩා නුවනැත්තා කවුරුදැයි උන් තැනත්තන්ගේ නුවන විශේෂ ඉතා යහපතැයි කීහ. සුජාත කුමාරයෝ එවිට කියන්නාහූ මීමාගේ දෑත දෙපය වල්ගය ඇතුළුවූ ශරීරයෙන් කිසිදෙයක් අඩු නොවි තිබුනු නිසා කණපැන් කවයි කියා කීමියි. අෟ මළේ යයි කියද්ද උෟගේ ශරීරය තිබුනේ වේද එසේකළ තණපත් කයි සිතා මම කීමි. මීමාගේ ඉස් කන් නාසා දෑත දෙපය වල්ගය ඇති තැනැත්තන්ට තණ පැන් කන්ට කි මම අඥාණයෙක්ද නුඹ වහන්සේගේ පිායානන්ගෙ ශරීරය දවා භස්මව කිසිදෙයකුත් නොපෙණී තිබියදී අඬා වැලප බොහෝ සෝකයට පැමිණියේ නුවණ ඇති නිසාදැයි විචාළාහ. එවිට බෝධිසත්වයන්ගේ පියානෝ යහපත පුත මාගේ සෝක සන්හිඳුවූ නියාව, දෙමාපියන්ගේ සෝක සන්හිඳුවන්ට මා භාරය. මහත් ගිනි රැසක් වැඳගත් ගමනේ පැන්කල බොහෝ වත්කොට නිවුවාමෙන් මාගේ සෝක සන්හිඳුනැයි සුජාත කුමාරයන්ට ස්තුති කොට වදාරා මේ සුජාත ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි සුජාත කුමාරව උපන්නෙම් බුදුවූ මිම් ම යයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# ජේත ජාතකය

තවද සියළු සත්වයන්හට නායකවූ සර්වඥයන් වහන්සේ භගුනම් රට සුංසුමාර නම් ගුහාව සමීපයෙහි විංසන නම් වනයෙහි වැඩ වසන සමයෙහි බෝධිරාජ කුමාරයන් අරභයා මේ ජතාකය දක්වන ලද

ඒ කෙසේද යත්

බෝධිරාජ කුමාරයෝ සෙසු රජදරුවන් ඉඳිනා ගේවලට වඩා යහපත් මාලිගාවක් කරවා ඉන්ට උවමැනවැයි එක් වඩුවෙකු කැඳවා කෝකාලික නම් අනර්ඝ රජගෙය ඉදිකරවා මේ වඩුතෙම මේ මාගේ මාලිගවක්සේම රජගෙයක් අනික් රජදරු කෙණෙකුන්ට ඉදිකළේ වී නම් නපුරුයයි වඩුවාගේ ඇස් උදුරුවපියයි. එදවස් දම්සභාවේ රැස්වූ භික්ෂූන් වහන්සේ මෙසේ වූ රාජ ගෙයක් කළ වඩුවාට බොහෝ උපකාර කොට ප්‍රසාද දුනමනා තැන වඩුවාගේ ඇස් උදුරුවාපුවෝ වේදැයි කිය කියා උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්ත ව උනුදැයි විචාරා වදාර එපවත් අසා දැන් මතු නොවෙයි මහණෙනි පෙරත් මේ රාජ කුමාර තෙම රජදරුවන් ගේ අව සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීව බොහෝ රාජ කුමාරයන්ට ශාස්ත්‍ර උගන්වා වාසය කරන්නාහ. එසමයෙහි බරණැස් නුවර රජ්ජුරුවන්ගේ පුත්වූ බ්‍රහ්මදත්ත නම් කුමාරයෝ ශිල්ප උගන්ට යයි තක්සලා නුවරට දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි ශිල්ප උගන්නා සඳහා ගියාහ. දිසාපාමොක් ආචාරී රාජකුමාරයන් දැක ලක්ෂණ බලා මේ රාජ කුමාරයා චණ්ඩය මුගේ සන්තානයෙහි ගුණයක් නැත්තේයයි රාජ කුමාරයන්ට අවවාද කරන්නාහු එම්බා රාජ කුමාරයෙනි තොපි රාජ්ජයට වන්කල කිසිපිහිටක් නොලබන්නාසේ වැඩනැත්තවුව යම් අවසරයක දේවතාවෝත් අත් නොදන්නාහ. මනුෂ්‍යයෝ තමාම අත් නොදන්නාහ සාහසික කළාවූ යම් පාපයෙක් ඇත්නම් එම ජාතියෙහි විපාක දෙන්නේමය, ඒ එසේමය. යම් ඵලයක් රෝපනය කළේ නම් නොබෝ කලකින් එහි ලාභය විඳිද්ද, එසේම සාහසික කළාවූ යම් පාපයක් අත්පිට විපාකදෙයි සහසික නොවමැයි රාජ කුමාරයන්ට බොහෝ අවවාද කියා උන්ගේ නුවරට යවුහ. ඒ රාජ කුමාරයෝත් බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ට ශිල්ප දක්වා පිය රජ්ජුරුවන් විසින් දෙන ලද්දාවූ යුවරජ තනතුරු ලැබ වාසය කරන්නාවූ පියානන්ගේ ඇවෑමෙන් රාජ්ජයට පැමිණ රාජ්ජය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ගේ චණ්ඩ පරුෂ වූ පුරෝහිත බ්‍රාහ්මණයෙක් ඇත. ඒ බ්‍රහ්මණයා සිතන්නේ රජ්ජුරුවන් දස දහසක් දඹදිවට නායක කරවාපි නම් අග්‍රපුරෝහිතව බොහෝ සම්පත් ලබන්නෙම් වේදැයි සිතා රජ්ජුරුවන්ලඟට ගොස් මෙපවත් කියා බොහෝ කාරණා කියා රජ්ජුරුවන් පොලඹවාගෙණ යුද්ධයට යන ලෙසට චතුරංගනී සේනාව සන්නද්ධ කරවාගෙණ පළමුකොට ගොස් කුඩා නුවරක් වටලාගෙණ ඒ රජ්ජුරුවන් පොළඹවාගෙණ මේ නියායෙන් දස දහසක් යොදුන් දඹදිව නුවරවල් ඇරගෙණ දහසක් රජ්ජුරුවන් අල්වාගෙණ තක්සලා නුවර රජ්ජුරුවන් අල්ලා ගන්නා පිණිස ගියහ. ඒ නුවර ලඟ ගඟෙක් ඇත.ඒ ගඟ අසල යහපත් ඡායා සම්පන්න නුග ගසෙක් ඇත. ඒ නුගගස මුල රජ්ජුරුවෝ යානක් ලබාගෙණ එනත සැතපී පසු දවස තක්සලා නුවරට සටනට ගියාහ. දිසාපාමොක් ආචාරීන් ඒ රජ්ජුරුවන් යුද්ධයට එන නියාව අසා නුවර අට්ටාල වෙට්ටම් පවුරු වාසල් ආදීවූ තැන සේනාව සලස්වාගෙණ යුද්ධකොට නුවරට වැද්ද නුදුන්නාහ. රජ්ජුරුවෝ නුවර සටන්කොට ඇරගත නොහි දෙවෙනිවත් නුගගස මුලට අවුත් පුරෝහිත බ්‍රාහ්මණයාට කියන්නාහු මේසා මහත් සේනාවක් ඇරගෙණ ගොසින් යුද්ධකොටත් නුවර ඇරගත නුහුනුම්හ කළමනා කිම්ද කැඳවා විචාළාහ.

එවිට පුරෝහිත බ්‍රහ්මණයා කියන්නේ මේ රජ්ජුරුවන් දහස අල්වා ඇස් උදුරා උන්ගේ පංචරුධිරමාංශයෙන් මේ නුග ගසේ වසන්නාවූ රාක්ෂයාට බිලිදී ඒ රාක්‍ෂසයාගේ ආනුභාවයෙන් යුද්ධකොට රාජ්ජය අරගණුම්හයි කීහ. රජ්ජුරුවෝත් යහපතැයි මල්ලවයන්ගෙන්වා තිරය ඇතුලේ සිටුවා රජ දරුවන් එකින් එකා ගෙන්වා අල්වාගෙණ ඇස්දෙක උදුරා ලයපලා අතුනු අක්මා පපුකැන් බඩවැල් උදුරා මිණි ගඟට දමා මෙම නියායෙන් රජ දරුවන් දහසම ඇස් උදුරවා රුධිර මාංශ ඇරගෙණ මිණි ගඟට දමා ඒ නුගගස උඩ බඩවැල් එල්වා රුධිර මාංශයත් පුදා පසු දවස් සටනට ගියාහ. ඒ වෙලෙහි අට්ටාලයක සිටි එක් රාක්‍ෂසයෙක් දකුණැස උදුරා ගෙණ පළා ගියේය. රජ්ජුරුවෝ වේදනාව ඉවසාගත නොහී ඇවිත් නුග ගස මුල උඩබලා වැද ඔත්තාහ. මස්ලියා කාපු ඇටයක් ඩැහැගෙණ උඩින් යන පක්ෂියෙක් ඒ රජ්ජුරුවන්ගේ වම් ඇස ඇටය එලාපිය. ඒ ඇසත් උදුරා ගෙණ දකුණුඇසින් නැංගේය. වේදනාව ඉවසාගත නොහී අඬන්නාව අනර්ථයක් නොකරව කළවා අනර්ථයෙක්

SANHIDA LANKA

ඇත්නම් අත්පිට විපාකදෙයි කී සේක. උන්වහන්සේට කීවා නොකොට මෙතෙක් රජදරුවන් ඇස් උදුරවා මේ නුගගසට රුධිරමාංශයෙන් පූජා කෙළෙමි. එසේ පුජාලත් දේවතාවත් මට අත්නුදුන්නේය. මේ පුරෝහිත බ්‍රාහ්මණයාත් මට සහයක් නුවුනේය. මම ආචාරීන් කීවා නොකොට අසරණව ගියෙමි. මේ නුගයට රුධිර මාංශයෙන් පූජා කෙළෙමි. අඬා කියන්නාහූ මාගේ රන්වන් වූ විශිෂ්ට රූ ඇති බලා ඇස් ඇද ගත නොහැක්කාවූ මාගේ උඬරී නම් බිසවුන් මා විඳිනාවූ වේදනාව දකින්නටත් නුවුයේය. උන්ගේ ප්‍රිය වචනය මා කණහෙන්ටත් නුවූයේය. මාගේ ඇස් දෙක නැති වේදනාවටත් වඩා මාගේ බිසවුන් නොදක්නා වේදනවා ඉවසාගත නොහෙමි. ඇස් දෙකේ වේදනාවෙනුත් බිසවුන් කෙරේ සෝකයෙනුත් අඬා විටින් විට පෙරලී ප්‍රාණය නිරුද්ධ අවිචීමහනරකයට ගියාහ. දඹදිව ඒ ඒ නුවර වලින් ආ සේනාව තමන්ගේ නුවරටම ගියාහයි වදාරා මේ ජේත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් මේ කියන බෝධිරාජ කුමාරයෝය. පිංගල පුරෝහිත බ්‍රාහ්මණයා නම් දේවදත්ත ස්ථවිරය. දිසාපාමොක් ආචාරීම උපන්නෙම් බුදුවූ මම්ම යයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

## උරග ජාතකය

තවද පස්මරුන් ජයගත් හෙයින් ජින යයි නම් වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මළාවූ පුතෙකු ඇති කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් කෙළඹි පුත්‍රයෙක් තමාගේ පුතෙකු මළ සෝකයෙන් වික්ෂේපව ඉඳිනේය. සර්වඥයන් වහන්සේ ඒ කෙළඹි පුත්‍රයා සෝවානයට හේතු ඇති නියාව දන අළුත මහණවූ භික්ෂු කෙණෙකුන් වහන්සේ කැඳවාගෙණ ඒ කෙළඹි පුත්‍රයාගේ ගෙට සිඟා වැඩිසේක. කෙළඹි පුත්‍රයාත් සර්වඥයන් වහන්සේ දැක වැඳ පුදා එකත්පස්ව සිටියේය. සර්වඥයන් වහන්සේ කෙළඹි පුත්‍රයාට වදාරණ සේක් ඇයි උපාසකය වික්ෂේපව උනුදැයි විචාරා වදාළසේක. කෙළෙඹි පුත්‍රයා කියන්නේ ස්වාමිනි මාගේ පුතනු කෙණෙක් මළහෙයින් වික්ෂේපව උනිමි කීහ. එවිට සර්වඥයන් වහන්සේ වදාරණසේක් උපාසකය පෙර උත්තමයෝ තමන්ගේ දරුවන් මළාට සෝක නොකළෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක්තරා බ්‍රාහ්මණ කුලයක උපන්නාහු තමනුත් තමන්ගේ භාර්යාවනුත් පුතනුවෝත් දියනියෝත් පුතනුවන්ගේ භාර්යාවොත් කෙළිත් සදෙන නම් වන්නාහ. බෝධිසත්වයෝ මුන් සදෙනාට මරණ සිහි භාවනා උගන්වා නිරන්තරයෙන් භාවනා කරන්නාහ. තුමුත් නිරන්තරයෙන් මරණසිහි භාවනා කරන්නාහ. එක් දවසක් බෝධිසත්වයෝත් පුතනුවෝත් සිසාන්ටයයි කියා ගොසින් බෝධිසත්වයෝ සීසාන්නාහ. බ්‍රාහ්මණකුමාරයා පරඬල් එක්කොට ගිනි ලන්නාහ. ඒ ගිණිදුම් ඒ අසල තුඹසෙක වසන්නාවූ නාගරාජයකුගේ නාසයේ වන. නාගරාජයා කිපී අවුත් ඒ බ්‍රාහ්මණකුමාරයා අත සතර දළ ඔබා දෂ්ට කළේය. ඒ කුමාරයාත් විෂමූර්ජාවෙන් විසඥව වැටී හුන, එවිට බෝධිසත්වයෝ පුතනුවන් වැටීහුන්නා දැක එතනට ගොසින් පුතනුවන් වඩාගෙණ ගසෙක් මුල ලා කඩපටින් මූන වසා තමනු සීසාන්නාහ එතනට එක්තරා පුරුෂයෙක් ආයේය. ඌ අතින් කොයි යව්දැයි විචාරා ගමටයෙම් කී කල්හි තමන්ගෙ ගෙට කියා යවන්නාහූ මෙතෙක්දා දෙන්නෙකුට බත් ගෙණන්නාහ. ඒ අද එක්කෙනෙකුන්ට බත් ගෙනෙන්ට කියාලව අපගේ බැමිණියත් දූවනියනුත් යෙහෙලනියනුත් කෙල්ලත් ඉස්සෝධා නා සුවඳ විලවුන් ඇරගෙණ එතනට කියා එවුහ. ඒ පුරුෂයාත් කියායවූ සැටියේම එක්කෙනෙකුන්ට බත් ඇරගෙණ ඉස්සෝධා නා දූවනියන්ද යෙහෙළියන්ද කෙල්ලන්ද යන සතරදෙනම මල්හඳ විලවුන්ගෙණබෝධි සත්වයන් සීසාන තෙනට ආහ. බෝධිසත්වයෝත් පුතනුවන් මිය වැදහොත් රූප්පයේ ඉඳ ම බත් කා පස්දෙනම සමාධි සමාධිව දර එක්කොට පුතනුවන් ගින්නේ ලා සතුටු සතුටුව මිණිය දවන්නාහ. උන් පස්දෙනාගේ ගුණානුභාවයෙන් ශක්‍රයෝ පාණ්ඩුකම්බල ශෛලාසනය උනුව ගියේය. ශක්‍රයෝ මනුෂ්‍ය ලෝකය බලා මුන් පස්දෙනා දැක මම එතනට ගොස් මුන්ගේ මරණ සිහි භාවනාවට මුන්ලවා සිංහනාද කරවා මුන්ගේ ගෙයත් සත්රුවනින් පුරා එමියි එක්තරා පුරුෂයෙකුමෙන් රූපයක් මවාගෙණ ඒ මිණිය දවන තෙනට අවුත් කියන්නාහු මේ කුමක්ද තොප ඇමදෙනම පුලුස්සන්නේ කින්දැයි විචාළාහ. මිණියක් දවම්හයි කීහ. ඒ කිම්ද තොපි කියන්නේ බොරුවට දඩමස් දෙම්හයි වඤ්චාකොට කියව්ද මුවෙකු හෝ ඌරෙකු හෝ පුලුස්සති සිතමි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහූ ඒ නැත මිණියක් දවන්නේයයි කීහ. එසේවීනම් තොපගේ වෛරී එකකු දවව්දැයි කීහ. ඒ තැන පුත්‍ර පේමයෙන් වඩාගත් මාගේ පුතනුවෝයයි කීහ. එසේකල මේ පුතනුවෝ  තොපට නොකී කරු වේදැයි කීහ. බෝධිසත්වයෝ කියන්නාහූ මට ඉතාම ප්‍රියයෝය. කීකරුවූ හයි එවිට ශක්‍රයෝ  කියන්නාහූ එසේ තොපට කීකරු ප්‍රිය දරුවන් කල වික්ෂෙපවක්වත් නොකරන්ට කාරණා කිම්දැයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු සර්පයෙකු සැවයක් ඇරපියා ගියකල දෙවෙනිව ඊට ආලයක් නෙකෙරේද මූ මෙතන කඳ තබා තමන්ගේ  කර්මානුකූළ දෙවනිව ඊට ආයලයක් නොකෙරේද මූ මෙතන කඳ තබා තමන්ගේ කර්මානුකරුප පරිද්දෙන් පරලොව ගියාහ. අප ඇඬූ නියා දනිද්ද, අපගේ දරුවෝ මේ දරසෑයෙහි ගින්නේ නොදන්නාහ. ඌ ගොසින් එක්තෙනක උපදින්නාහ. අප අඬා කාරිය කිම්දැයි කීහ. එවිට ශක්‍රයෝ බැමිණියන්දට කියන්නාහූ මැනියන් වහන්සේ මේ දවන්නාවූ පුරුෂයා කවුදැයි කීහ. පුතනුවනි මාගේ දසමසක් උසුලා ලෙයි වැඩූ පුතනුවෝයයි කීය. එසේ කල පුරුෂයෝ නම් කාරණා දන්නා හෙයිනුත් ධෛර්යය උපදවා නො අඬන්නාහ. ගෑණු නම් ස්වභාවයෙන්ම අඬන සුල්ලභ නුඹ කිසි

SANHIDA LANKA

විශේෂයක් නොවන්ට කාරණා කින්දැයි කීහ. එවිට බැමිණියන්දෑ කියන්නේ මුන් මාගේ බඩ පිළිසිඳ ගන්නා දවස් මට කීයේත් නැත. දැන් මිය යන ගමනේ මම මියෙමියි මට කීයේත් නැත. මාගේ දරුවෝ තෙල දරසෑයේ වැද හෙව දයිද? උෟ ගොසින් කැමති එක්තෙනක පිළිසිඳ ගත්තුව, උෟ අප ඇඬු නියාව දනිද්ද, විශේෂප වූ නියාව දනිත්ද? එසේහෙයින් මළවුන්ට ඇඩීමෙන් කාරණා කින්දැයි කිය. එවිට ශක්‍රයෝ බ්‍රාහ්මණ කුමාරයන්ගේ නැගනියන්ට කියන්නාහූ මේ දරසෑයේ දන්නාවූ පුරුෂයා තොපට කුමක්වේදැයි කීහ. මා හා එක්කුසෙහි උපන් බෑණන් වහන්සේ යයි කීහ. එසේහෙයින් ගෑනු නෑයෝ එක්කුසේ උපන් මල්බෑයන් මළ කල මාගේ බෑනන්දෑ මළ දූය යි කියා බොහෝ විශේෂපව අඬා මුරගා ශෝක කරන්නාහ. තොප එසේවූ ඇඩීමක්වත් විශේෂපයක්වත් නොකරන්නට කාරණා කින්දැයි විචාළාහ. එවිට නැගණියෝ කියන්නාහූ මාගේ ඇඩීමෙන් සිතට දුක්දී කයත් දුර්වලව බෑළුවන්ට අප්‍රිය කරවණ පමණක් විනා මිණිය දරසෑයේ දනසේක. උන් වහන්සේ ගොසින් එක්තැනෙක උපදිනා සේක. මා ඇඬුවයි මාගේ බෑණන් වහන්සේ ඉපිද එන්නේ නැත. මා අඬා කවර කටයුත්තෙක්දැයි කීහ. එවිට ශක්‍රයෝ මළ බ්‍රාහ්මණ කුමාරයාගේ භාර්යාව කරාගොස් කියන්නාහූ මේ මළවූ පුරුෂයා තොපට කුමක් වේදැයි කියා විචාළාහ. ස්වාමිනි මාගේ වල්ලභයානන් වහන්සේ යයි කීහ. එසේකල බන්ධූන්ටත් වඩා පුරුෂයා මළ කළ සෝක ඇත්තී බිරින්දය. තමාගේ වල්ලභයා මළකල තමා කනවැන්දඹු වන හෙයිනුත් තමාගේ සෙනහ වඩන්නාවූ පුරුෂයා හෙයිනුත් දෙගුණයක් ශොක ඇති වන්නාහ. තොපි කණස්සල්ලකවත් ඇඩීමක්වත් නොවන්ට කාරණා කින්දැයි කීහ. එවිට බැමිණි කියන්නී මාගේ වල්ලභයානන් වහන්සේ මිය පරලොව ගොසින් යම් තැනෙක උපදිනාසේක. කින්ද තෙල දරසෑයේ දන්නේය. උන් වහන්සේ මා ඇඬු නියාව දන්නාසේක්ද, සඳ නැගෙණහිරින් නැගී බස්නාහිරින් බසීද? යම් සත්වකෙණෙකුන් මරණින් මැකෙන්නේ නියමය. නටනා වස්තුවෙක් නස්නේමය. මළවුන්ට සොකකිරි මෙන් කාරිය කින්දැයි කීහ. එවිට ශක්‍රයෝ කෙල්ල අතින් විචාරන්නාහු මේ මළ පුරුෂයා තොපට කුමක් වෙද්දැයි විචාළාහ. කෙළි කියන්නී මාගේ ස්වාමි දරුවානන් වහන්සේයයි කීහ. එසේකල තොපට කණස්සල්ලෙක් නැත්තේ තොපට තදව මරා තලා මෙහෙවර ගත්හෙයින් ඒ කණස්සල්ලෙන් නාඩා නොදොඩා ඉඳිනේදැයි කීහ. එවිට කෙළි කියන්නි මාගේ දරුකෙණකුන් ලොයිලා වැඩිම් උන්වහන්සේ මට ලොංගතුසේක. මමත් උන්වහන්සේට ලෙංතුවෙමි උන්වහන්සේ දරසෑයේ වැදහෙව ගින්නේ දනසේක. මා ඇඬු නියාව දන්නාසේක්ද සෝක නියාව දන්නාසේක්ද, යම්සේ කළයක පැන්පුරා ලාගෙන යන කල බිම වැටි බිඳ ගියේද බඳිනු කළය දෙවනුව සාවේද එසේම මිළ තැනැත්තන්ට අප ඇඩීමෙන් කාරිය කින්දැයි කීහ. එවිට ශක්‍රයෝ තමන්ගේ ශක්‍රාත්මභාවයෙන් සිට තොප ඇමදෙනාගේ මරණ සිහි භාවනාව කළ නියාව යහපතැයි ප්‍රසංශා කොට බෝධිසත්වයන්ගේ ගෙය සත්රුවනින් පුරා මේ සම්පත් අරගෙණ දුක්පත් නොවි සැපසේ ජවත්වේවායි කියා තමන්ගේ දිව්‍යලෝකයටම ගියහයි වදරා මේ උරග ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කෙළින්ම ත්‍රිපිටකධාරීවූ ඛුජ්ජුත්තරා නම් මෙහෙනින්නාය. එසමයෙහි බ්‍රාහ්මණයාගේ පුත්‍රනම් රාහුලස්ථවිරය. දූනම් උපුල්වන් මහස්ථවිරය. එසමයෙහි බ්‍රාහ්මණයානන්ගේ භාර්යාවෝ නම් ඛේමානම් භික්ෂුණිය, බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# සන ජාතකය

තවද සිද්ධාර්ථ නම් සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ අමාත්‍යයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

කෝසල රජ්ජුරුවන්ගේ එක් අමාත්‍යයෙක් රජ්ජුරුවන්ට පක්ෂපාතිව ඉදිනේය. ඒ අමාත්‍යයා දුර්ජනයන්ගේ බසින් ඔහු කෙරේ කලකිරී සිරගෙයි ලැවුහ. ඒ අමාත්‍යයා සිරගෙයි ඉඳම සෝවාන් මාර්ගඵලයට පැමිණියේය. රජ්ජුරුවෝත් නොබෝ දවසකින් ඒ අමාත්‍යයාගේ ගුණ සඳහන්කොට දුර්ජනයන්ගේ බසින් මාගේ අමාත්‍යයා සිරගෙයිලැවූ පමණක් විනා ඌගේ වරදක් නැතැයි සිරගෙයින් අරවාපිහ. ඒ අමාත්‍යයාත් සිරගෙයින් ගැලවී ඉස්සෝධා නහා ගඳ විලවුන් ගෙණ ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේ වැඳපුදා එමියි ගියේය. සර්වඥයන් වහන්සේත් අමාත්‍යයානන් දැක දුඃඛයට පැමිණියාදැයි විචාරා වදාළසේක. ස්වාමිනි එසේය දුඃඛයට පැමිණත් සැපයක් උපදවා ගතිමියි සෝවාන් මාර්ගඵලයට පැමිණියෙ අනර්ථයට වැද අර්ථය උපදවා ගත්තෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ රජ්ජුරුවන්ට පුත්ව උපන්සේක. උන් වහන්සේට නම් තබන්නාහු සන කුමාරයෝ යයි නම් තුබූහ. උන් වහන්සේ වැඩිවිය පැමිණ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් අතින් සිල්ප නිමවා ඉගෙණ පියානන් ඇවෑමෙන් රාජ්ජයට පැමිණ දසරාජධර්මයට අකෝප්‍යව රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ අමාතයයෙක් අන්තඃපුරයට වැරදි ගියේය.රජ්ජුරුවෝ තමන්ගේ සියඇසපුරා ප්‍රත්‍යක්ෂයෙන් දැක ඌට කිසි ගහටක් නොකොට මාගේ රාජ්‍යයෙහි නොයිඳුවයි කියා නුවරින් නෙරපූහ. ඒ අමාත්‍යයා කොසොල්රට වංකනම් රජ්ජුරුවන් ලඟට ගොසින් පෙර ජාතිවල පරිද්දෙන් වංක රජ්ජුරුවන් හා සේනාව ඇරගෙණ බරණැස් නුවරට අවුත් බෝධිසත්වයන් අල්වා සිරගෙයිලා වංකනම් රජ්ජුරුවෝ රාජ්ජය ඇරගෙණ ඉඳිනාහ. බෝධිසත්වයෝත් සිරගෙයි ඉඳම පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ගත්හ. බෝධිසත්වයන් පංචාභිඥා අෂ්ටසමාපත්තියට පැමිණිවිටම වංකරජ්ජුරුවන්ට දාහ උපන්නේය. වංකරජ්ජුරුවෝ අතික්කෙනෙකුන් නිසාවූ දෙයක් නොවෙයි සිතා සිරගෙයි උන් බෝධිසත්වයන් සමීපයට ගියාහ. බෝධිසත්වයෝත් භාවනාකොට ධ්‍යානයෙන් උන්නාහ. වංකරජ්ජුරුවෝ කියන්නාහූ එම්බා සන රජ්ජුරුවෙනි. නුඹ මේසා රාජ්‍යශ්‍රියකින් පිරිහී කිසිසෝකයක් නැතිව ඉඳිනට කාරණා කිම්ද, මේසා රාජ්‍යශ්‍රීයකින් පිරිහුනු කල සෙසුකෙනෙක්විනම් අඬ දොඩා බොහෝ වික්ෂපයට පැමිණෙන්නාහ. නුඹ කිසි මුසුප්පුවක් නොකොට සමාධියෙන් ඉඳිනේ මට කාරණා කිම්දැයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහූ එඹා වංකරජ්ජුරුවෙනි මම කිසි පදාර්ථයකත් පළමුත් බැලීමක් නැත්තෙමි. යම් ව්‍යාශනයකට පැමිණකල අඬා දොඩා යම් කෙණෙක් වික්ෂේපවෙත් නම් තමන්ගේ ශරීරයටත් දුක පැමිණ සතුරන්ටත් අවසර පෙණෙන්නේය. එපමණක්විනා ඊට ලාභයක් නැත. පැමිණෙන දෙයක් පැමිණෙන්නේය. නටමනා දෙය නස්නේය. එසේහෙයින් ඓශ්වර්යයෙන් පිරිහී නිමියි කිසිසෝකයත් නැත්තෙමි කීහ. එවිට වංකරජ්ජුරුවෝ දුර්ජනයන්ගේ බසට මෙලෙස කෙළෙම් කියා බෝධිසත්වයන්ට රාජ්ජයද තමන්ගේ නුවරට ගියහ. බෝධිසත්වයෝත් පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යානලාභිවීම් මට රාජ්ජයෙන් ප්‍රයෝජන කින්දැයි රාජ්‍යය අමාත්‍යයන්ට පාවාදී හිමාලයවනයට ගොස් තපස් කොට කම්වූ පරිද්දෙන් බඹලොව ගියාහයි වදාරා මේ සන ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි වංක රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය. සන රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේකී.

SANHIDA LANKA

# කාරණ්ඩික ජාතකය

තවද සෞධොදනියවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් ධම්මසේනාපතිවූ සැරියුත් මහස්ථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සැරියුත් ස්වාමි වැද්දන්ට කෙවුලන්ට උන්ගේ අභිප්‍රාය නොදනම් සිල් දෙන සේක්. වැද්දෝත් කෙවුලොත් සැටියුත් ස්වාමිදෙන හෙයින් සිල්ගන්නා පමණක් විනා ශිලය තාවුරුකොට ගතනොහෙන්නාහ. එපවත් සැරියුත් ස්වාමින් තමන්වහන්සේගේ භික්‍ෂුන් වහන්සේට වදාරණසේක් මහණෙනි වැද්දන් කෙවුලන්ට අප සිල් දෙන පමණක් විනා ශිලය ඌ ඇම තාවුරු කොට ගත නොහෙන්නාහයි වදාළසේක. එවිට භික්ෂූන් වහන්සේ ස්වාමිනි, උන්ගේ අභිප්‍රාය නොදන ශිල්දෙන හෙයින් උන් ශිල් නොරක්ණෝය. එසේ නොව කියා ආරාධණා කළොත් විනා ශිල්දෙන්ට එපාය යි කියා වදාළසේක. මේ කථාව දම්සභාවට රැස්වූ මාළුවරන්වහන්සේ කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි
විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි.පෙරත් ශාරිපුත්‍රස්ථවිරයෝ අභිප්‍රාය නොදනම් ශිල් දුන්නෝ වේ දැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක්තරා බ්‍රාහ්මණ කුලයක ඉපිද කාරඩික නම් කුමාරව ඉපිද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් ලඟ සිල්ප ඉගෙණ උන්ගේ පන්සියයක් අතවැසින්ට නායකව වසන්නාහ. එසමයෙහි දිසාපාමොක් ආචාරී මනුෂ්‍යයන්ගේ පමණ නොදන අභිප්‍රායට සිල්දෙන්නාහ. ඒ මනුෂ්‍යයෝ සිල්ගන්නා පමණක් විනා සීලය තාවුරුකොට ගත නොහෙන්නාහ. උන්ගේ අභිප්‍රාය නොදන සිල්දෙන්ට එපයි ශිෂ්‍යයන් කීවත් නොනැවතම සිල් දෙන්නාහු එක්තරා මනුෂ්‍යයෙක් දිසාපාමොක් ආචාරීන් අතවැස්සන් පන්සියයට සෙට දවසට දන් මාගෙනැයි පැවරූහ. දිසාපාමොක් ආචාරී තුමූ නොගොස් තමන්ගේ කාරඩිකනම් අතවැස්සානන් ඇතුළුවූ අතවැස්සන් පන්සියය කැඳවා තොපි හැම ගොස් මේ පුරුෂයාට සාන්තිකොට දනුත් කා උන්ගෙන් දුන්නාවූ ලාභසත්කාර ඇත් නුමුත් ඇරගෙණ එවයි කියා යවූහ. එකියන අතවැස්සෝ ත් ඒ පුරුයාගේ ගෙට ගොස් දනුත් කා සාන්තිකොට ලාභත් අරගෙණ එන්නාහු අතරමග කඳු මුදුනෙක සැතපී උන්නාහ. එවිට කාරඩික නම් අතවැස්සානෝ සිතන්නාහු අපගේ ආචාරින් වහනසේ මනුෂ්‍යයන්ගේ අභිප්‍රාය නොදනම සිල්දෙනසේක. මා විසින් අරවන්ට උවමැනවයි සිතා එතනින් ගල්කැට ඇරගෙණ පාත එලන්නාහ. සෙසු අත වැස්සෝ මේ කුමක්දැයි විචාළාහ. උන්හැම කිසි බසකුත් බැන නොනැගී ගල්කැට පාත එලන්නේය. අතවැස්සෝ මුන් ඇඟට අපාසුවක් නිසා වේදැයි කියා එපවත් දිසාපාමොක් ආචාරීන්ට කිහ. දිසාපාමොක් ආචාරී ද එතනට ඇවිත් කියන්නාහු කාරඩික නම් අතවැස්සානෙනි. තොප කරන්නේ කිම්දැයි කීහ. එවිට අතවැස්සානෝ කියන්නාහු මේ පෘථිවිමණ්ඩලය හෙරිතලයක්සේ තනාපියන නිසාය යි කිහ. එවිට දිසාපාමොක් ආචාරීන් එසේකරන්ට බොහෝ දෙනා විසිනුත් නොලිළිවනැයි කීකල්හි එසේකල ආචාරින් වහන්ස නොයෙක් වර්ගයේ මිනිසුන්ට අභිප්‍රාය නොදන සිල්දුනැයි කියා සිල් රක්‍ෂා කෙරෙද්දැයි කීහ. එවිට ආචාරී තොප කී නියාව තොප කී නියාව ගිවිස්සම්හ. මෙතැන්පටන් අභිප්‍රාය ඇති කෙණෙකුන්ට විනා සීලය නො දෙම්හයි කියා දෙන්නම් තමන්ගේ ගෙට ගියාහයි වදාරා මේ කාරඩික ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි දිසාපාමොක් ආචාරී නම් ශාරිපුත්‍ර ස්ථවිරය. කාරඩික බ්‍රාහමණ නම් බුදුවූ මම්ම යයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ලටුකික ජාතකය

තවද ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ කවුරුන් කෙරෙත් දයාවක් නොකරති කිය කියා උන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි විචාරා එපවත් අසා දැන්මතු මතුනොවෙයි මහණෙනි පෙරත් දේවදත්ත ස්ථවිරයෝ කා කෙරෙත් දයා නොකළෝ වේදූයි වදාරා ඒ කෙසේදූයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ අසූදහසක් ඇතුන්ට නායක වූ ඇත්රජව උපන්නාහ. එක් කැටකිරිල්ලක් එක්මාවතෙක කැදැල්ලක් ඉදිකොට ගෙණ බිත්තරලා බිත්තර ගසා පැටවුන් පිහිඹා නොහෙන අවස්ථාවෙහි බෝධිසත්වයෝ අසූදහසක් ඇතුන් ඇරගෙණ ඒ ස්ථානයට පැමිණියාහ. කැටකිරිල්ල තමාගේ දරුවන් පාගා මරතියි බෝධිසත්වයන් ඉදිරියට තමාගේ පියාපත් දෙක මුදුනේ තබාගෙණ ගොස් කියන්නී සැට අවුරුද්දෙන් ගිලියන මද ඇති අසූදහසක් ඇතුන්ට නායකවූ නාගරාජයානෙනි. තොපට නමස්කාර කෙරෙමි මාගේ දරුවන් නෙනසව යී කිව, එවිට තමාගේ සතර පය අස්සේ කිරිල්ලගේ පැටවුන් ලාගෙණ අසූදහසක් ඇතුන් යනතුරු වැද සිට පසුව කැටකිරිල්ලට කියන්නාවූ පස්සේ එන්නාවූ ඇතෙක් චණ්ඩය පරුෂය තොපට පිළිවන් වීනම් ගලවා ගනුවයි කියා ගියාහ. ඒ කියන කැටකිරිල්ලි යහපතැයි ගිවිස සිටි අවස්ථාවට එකියන ඇත් එතනට පැමිණියේය. එවිට කැටකිරිල්ලී තමාගේ පියාපත් දෙක ඉස්මුදුනේ තබාගෙණ ඇතාට කියන්නී පර්වතවල වනාන්තරවල වාසය කොට පියා එන්නාවූ එකචාරී නාගරාජය තොපට මාගේ පියාපත් දෙකින් නමස්නාර වේවායි මාගේ දුර්වලවූ දරුවන්ට හානියක් නොකරවයි කියා නමස්කාර කළාහ. එවිට එකියන ඇත් කියන්නේ තොපසේ දුර්වලයන්ට මා කුමක් කළත් බරයෙක්දූයි කියා මට තොප කරන්නේ කිම්ද තොපගේ පැටවුන් පිරවා අතින් හා පස්සාපයිනුත් දකුණු පයිනුත් නොමඩිමි. වම්පසින් මඩිමි කියා වම්පසින් මැඩ මුත්‍රවතුරේ යවාපුහ. එකියන්නාවූ කැටකිරිල්ලිත් එකගසක අත්තක් පිට ඉඳගෙණ කියන්නී තාගේ බලයේ විචර හා මාගේ නුවනේ විචර හා බල තාගේ උදක් බලයෙන් මාගේ දරුවන් නසාපුවාට මාගේ නුවනින් තාත් නසන්නෙම් වේදූයි කියා තමන් ගොසින් එක් කවුඩෙකුට දෙතුන්දවසක් සේවාකම් කොට එකියනකවුඩු තී මට සේවාකම් කරන්නේ ඇයිදූයි කීහ. ස්වාමිනි මාගේ දරුවන් ඇතෙක් නසාපිය. එසේ හෙයින් එකී යන ඇතා එකාචාරීව ඇවිදිය. ඒ ඇතාගේ අවසරයක් බලා ඇස්දෙක විදපුවොත් යහපතැයි කීහ. එකියන කවුඩු යහපතැයි කියා ගිවිස්සේය. එවිට එකියන කැට කිරිල්ලී නිලවැස්සෙකු සමීපයට ගොස් කීපදවසක් උන්පස්සේ සේවාකම් කරන්නීය. එවිට එකියන නිලමැසි ඇයි තොප මා පස්සේ සේවය කරන්නේ ඇයිදූයි කීහ. එසඳ එක් කවුඩෙක් එකචාරීව ඇවිදිනා ඇතකුගේ ඇස්විදිනේය. තොප ගොසින් උන්ගේ ඇසේ ඉහඩ ලා එවයි කීහ. එයින් යහපතැයි ගිවිස්ස. පසුව කැටකිරිල්ල ගොස් මැඩියෙක් ආශ්‍රය කළාය. එකියන මැඩියා ආශ්‍රය කරන්නේ ඇයිදූයි කීහ. එවිට කැටකිරිල්ලී කියන්නී එක් තරා ඇස් කණව ඇවිදිනා ඇතෙක් පැන් පිපාසයෙන් ඒ ඒ තැන ඇවිදිනේය. ඒ වෙලාවට තෝ පලා ගොස් පර්වතයක උඩඉඳ අඬාලව. එවිට ඇත් මැඩියන් ඉඳ අඬන්නේ පැන් අති තැනක් වේදූයි පර්වතය උඩට නැගෙන්නේය. පර්වතය උඩට නැගිකල තොප අඹරා ගොසින් පර්වතය පාත ඉඳ අඬාලවයි කීහ. ඒ වේලාවට ඇත් තොපකරා එන්නේය. තොප විසින් මට කරන්නේ මෙතකැයි කියන්නා මැඩියා යහපතැයි කියා ගිවිස්සේය. පසුව කල්යාමකින් කවුඩු ගොසින් ඇතාගේ ඇස්දෙක විදපිය, විදපු නියාව දූන නිලමැසි ගොස් ඇස් දෙක ඉහඬලාපිය. එවිට ඇතාගේ ඇස්දෙක අන්ධව ගියේය. එවිට ඇත් බොහෝ වූ වේදනාවට පැමිණියේය. පැන් පිපාස ඉවසාගත නොහි ඒ ඒ තැන විමසා ඇවිදින්නේය. ඒ වෙලාවටම මඬුවා පර්වත මුදුනේ ඉඳ ඇඬීය. ඒ වෙලාවටම එකියන ඇත් මඬුවාගේ කටහඬ අසා පැන් ඇති ස්ථානයකැයි සිතා පර්වත මුදුනට නැංගේය. ඒ වෙලාවට මඬුවා පෙරලා පර්වත පාත ඉඳ ඇඬීය. ඒ වෙලාවේ මඬුවා ඇඬු තැනට පාත බසින්ටයයි තමාගේ පය රඳවා ගත නොහි වැටුනේය. එවිටම ජීවිතක්ෂයට පැමිණියේය. එවිට කැටකිරිල්ලි ඇතා මළබව දූන ඌ මහත් සන්තෝෂයට පැමිණියෙමියි ඇතාපිට සක්වන් කොට මාගේ මනෝරථය මුදුන් පැමිණියේයයි සිතා තමා වසන්නාවූ ස්ථානයට ගියාහ. ඒ අර්ථය දක්වන්නාවූ සර්වඥයන් වහන්සේ මහණෙනි කවුඩු හා කැටකිරිල්ලෙක් නිලමැස්සෙකු මඬුවකු ඇතුලුවූ ක්‍ෂුද්‍රප්‍රාණීන් සතරදෙනකු එක් වීමෙන් මහත්වූ හස්ති රාජයෙකු මරාගන්නාලද, එසේහෙයින් මහතුන් කෙරෙහි ති නිචයන් කෙරෙහි ත් වෛෂයක් නම් නොකරවයි වදාරා මේ ලාටුකික ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි එකචාරී ඇත්රජ නම් දේවදත්ත ස්ථවිරයෝය. අසූදහසක් ඇතුන්ට නායක ඇත්රජ නම් බුදුවූ මම්ම යයි වදාළසේකී.

SANHIDA LANKA

# චුල්ලධර්මපාල ජාතකය

තවද ශාක්‍යසිංහ නම් වූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද.

ඒ කෙසේ ද යත්

එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ දෙවදතත ස්ථවිරයෝ සර්වඥයන් වහන්සේට වෛරීව නසන්ට නොයෙක් ප්‍රයෝග කළෝ වේ දැයි කිය කියා වැඩඋන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් දැන මහණෙනි දැන් මතු නොවෙයි පළමුත් දේවදත්ත ස්ථවිරයෝ තමන්ට මා පුත්ව උපන් ගමනේ පවා අභිමාල නම් වධකරවාමැරෙව්වෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේ ද යත්

යට ගිය දවස බරණැස්නුවර මහාප්‍රතාප නම් රජ්ජුරුකෙණෙකුන් රාජජය කරණ සමයෙහි බෝධිසත්වයෝ රජ්ජුරුවන්ගේ අග්‍රමහෙසිකාවූ චන්ද්‍රාදේවී නම් බිසවුන් කුස පිලිසිඳ ගත්තාහ. බෝධිසත්වයන් දසඑකඩමසකින් වදා නම් තබන්නාහු ධර්මපාල කුමාරයෝ යයි නම් තුබූහ, බෝධිසත්වයන්ගේ මෑණියො චන්ද්‍රාදේවි බෝධිසත්වයන් සත් මැසි වූ ගමනේ නාවා අඳුන්ගාවා සරහා කිරි පොවමින් සුරතල් බල බලා සමාදියෙන් උන් කලට මහාප්‍රතාප රජ්ජුරුවෝ බිසවුන්ගේ ලෙට ගියාහ. විසව රජ්ජුරුවන් දැක නැගී නොසිටියායහ. රජ්ජුරුවෝ තමාගේ සත්මැස් පුතෙකු ලදිම් යි මා වැනි මා වැනි රජෙකු දැක උන්තැනින් නැගී නොසිටියාහ, මහත්ව ගියොත් තමා ව නොතකති යි මහත් වූ කෝපයෙන් රජ්ජුරුවෝ ආපස්සේ පලාගොස් තමාගේ සිංහාසනයේ ඉඳ වධකයා ගෙණව නියා යවුහ. වධක එන තැනැත්තේ එක්කෙණෙක රත්මල් තබා රතක් ඇඳ රතක් පෙරවා එක් අතකින් කඩුව කෙටේරිය දම් ගෙඩිය අරගෙණ අවුත් රජ්ජුරුවන් දැක ස්වාමින් කවුරුන්ට වධ කෙරෙම්දැයි කීය. රජ්ජුරුවෝ අතික් මට සතුරු කෙණෙක් නැත ධර්මපාල කුමාරයා අල්වාගෙණ වධකොට මරවයි නියෝග කළාහ. බිසව් රජ්ජුරුවන් වහන්සේ මහා කෝපයෙන් ගිය සේක. කුමකින් කුමක් වේදෝහෝයි ධර්මපාල කුමාරයන් වඩාගෙණ අඬ අඬා වැදහොත්තාහ. වධක ගොස් වැදහොත් බිසවුන් පිටට පාරක් ගසා බිය වුන් ඉවත්කොට ධර්මපාල කුමාරයන් දෙකකල අල්වාගෙණ රජ්ජුරුවන් සමීප යට ගියේය. බිසවු අඬාගෙණ රජ්ජුරුවන් ලඟට ගියාහ, රජ්ජුරුවෝ එවිට කියන්නාහු තෙල කුමාරයා දන්ගෙඩියේ වැද හොවා තුලු අත්දෙක කපවයි කීහ. එවිට බිසවු කියන්නාහු වරද කළාහු මාගේ අත්පා දෙක නොකපා මාල සත්මැසි කුමාරයන් දෑත කපන්නට කළ වරද කවරේද වැරදි කළ මාගේ අත්දෙක කපවයි කීහ. එවිට රජ්ජුරුවෝ වධකයාට කියනනාහු ප්‍රපඤ්ච නොකොට දෑත කපවයි කීහ. යහපතැයි කියා වධක කුමාරයන්ගේ දෑත කැපීය බිසව් අත්දෙක තුරුල්ලේ ලාගෙණ අඬ අඬා සිටියාහ, වධක කියන්නේ දේවයන්වහන්ස කුමක් කෙරෙම්දැයි විචාළේය. තෙල කුමාරයා දෙකකුල කපවයි කීහ. එවිට බිසව් අඬ අඬා ස්වාමින් වැරදි කළාවුනුත් ස්වාමිනි දැක නැගී නොසිටියත් මාවුව. මාගේ කකුල්දෙක නොකපා බාල සත්මැයි කුමාරයන් දෙපය කපන්ට කළ වරද කවරේද. වැරදිකළ මාගේ දෙපය කපවයි කීහ. එවිට රජ්ජුරුවෝ වධකයාට කියන්නාහු ප්‍රපඤ්ච නොකොට තුලු දෙපය කපව යි කීහ. යහපතැයි කියා වධක කුමාරයන්ගේ දෙකකුල කැපීය. එවිට කියන්නේ දේවයන් වහන්ස තම කළමනා වධ ඇද්දැයි විචාළේය. රජ්ජුරුවෝ තව කාරණ වධ ඇති තුළු ඉසකපවයි කීහ. බිසව් ස්වාමිනි මාගේ දෑත දෙපය නැති පුතනුවෝ රාජ්‍යය කළ නොහෙන්නාහ. කොට පුතනුවන් මට දිපුවොත් රැකගණිමැයි වැරදි කළ මගේ ඉසකපතොත් විනා මාගේ නිවරද පුතනුවන් ඉස නොකපවා වදාළ මැනවැයි ස්වාමිනි කීහ. වධකයාට කියන්නාහු තුලු ඉස ප්‍රපඤ්ච නොකොට කපාවයි කීහ. යහපතැයි කියා වධක කුමාරයන් ගේ ඉස කපා දැමීය. බිසව් දෑතත් දෙපයත් ඉසත් කුරුල්ලාගෙණ අඬ අඬා පෙරලෙන කලට වධකයා කියන්නේ දේවයන් වහන්ස මෙවර කුමක් කෙරෙම්දැයි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු තෙල සොරුන්ගේ ශරීරය ආකාශයට දමා කඩුවෙන් කප කපා අභිමාල නම් වධකරවයි කිහ. වධකයාත් යහපතැයි කුමාරයන්ගේ ශරීරය ආකාශයට දමා කඩුවෙන් කපා ශරීර මාංශ වදමල් පෙති සේ කපා දැමිය. බිසවු ඒ මාංශත් අරගෙණ දෑත දෙපස ඉසත් තුරුල්ලේ ලාගෙණ අඬ අඬා රජගෙයි වට ඇවිද කියන්නාහු රජ්ජුරුවන්ගේ නෑකෙණෙක්වත් හිතමිත්‍ර කෙණෙක්වත් අමාත්‍ය කෙණෙක් වත් නැත්තාහ. එසේවූ කෙණෙක් ඇත්නම් මාගේ නිවරද ඖරස පුත්‍රවූ පුතනුවන්ට මෙසේවූ වධ නොපැමිණෙන්නේ වේදැයි කිය කියා අඬ අඬා දරුවෙනි මාගේ ප්‍රාණය මේ සෝකයෙන් තිබෙයි නොසිතවයි කිය කියා ඇවිදිනා කල බිසව් ලයෙන් නැගී සෝකයෙන් හෘදයමාංශය උන්කිලිල්ලක්සේ ඉදි ලයපැලි ජීවිතක්ෂයට පැමිණියාහ. නුවරවාසීහු බිසවුනුත් කුමාරයන්ගේ ශරීරමාංශ දෑත

SANHIDA LANKA

දෙපය ඉස එක්වලා ආදාහන කළාහ. රජ්ජුරුවෝ සිංහාසනයේ උන්තැනැත්තෝ බිසව්කෙරේ හා පුත්‍ර ප්‍රේමයෙන් වැටුනාහු උඩුමාලේ පොරුපැලී ඉවත්ව ගියේය. එමාලෙන් පාතමාලේ වැටුනාහ. මේ නියායෙන් මලෙන් මලෙට වැටී බිම වැටුනාහ. දෙලක්ෂ සතලිස්දහසක් යොදුන් ඝනකඩ බොල් මහපොළොව පැල අවීචමහ නරකයේ වැටිනාහයි වදාරා මේ ධර්මපාලජාතකය වදාළ සේක. එසමයෙහි මහාප්‍රතාප රජ්ජුරුවෝ නම් දේවදත්ත ස්ථවිරය. එසමයෙහි චන්ද්‍රාදේවී නම් ප්‍රජාපතී එසහයෙහි ධර්මලා කුමාව උපන්තෙනටම බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# සුස්සෝන්දිය ජාතකය

තවද සූර්‍යවංශයට බන්ධුවූ සර්වඥයන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ස්ත්‍රියක කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

එක් භික්ෂූ කෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක කෙරේ පිළිබඳ ව ශාසනයෙහි උකටලීවුසේක් සර්වඥයන් වහන්සේ විචාරා වදාරන්නාහූ ගුරුළුවිමන ලා ත් රැකගත නුහුණුවාවූ ස්ත්‍රියක කෙරේ පිළිබඳ සිත් ඇති වෙද්දැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර තඹතාංග නම් රජ්ජුරුවන් හා කැටිව දූ කෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ නාගදිවයින වාසය කරන්නාවූ ගුරුළු රජව බරණැස් නුවරට ගොසින් තඹගාංග නම් රජ්ජුරුවන් හා කැටිව දූ කෙළනාහ. රජ්ජුරුවන්ගේ සුස්සෝන්දිය නම් බිසෝ කෙණෙක් ඇත්තාහ. ඒ බිසවුන්ගේ සේවක ස්ත්‍රී ඒ මානවකයාගේ රූපය යහපතැයි බිසවුන්ට විස්තරකොට කීවාහුය. බිසව් එර් මානවකය, දක්නා අභිප්‍රාව ඇතිව මිනිසුන් පස්සේ සිටියාහ. බෝධිසත්වයෝත් දූ දකිනා අභිප්‍රාව ඇතිව මිනිසුන් පස්සේ සිටියාහ. බෝධිසත්වයෝත් දූ කෙළිනා පරක්කුවෙන් බිසවුන් බැළුහ. බිසවුන් බෝධිසත්වයන් බලා පිළිබඳ සිත් ඇතිව එවිට බෝධිසත්වයෝ පවනක් හා අන්ධකාරයක් මවා මිනිසුන් පහකොට බිසවුන් තමන්ගේ ඇකයේ සඟවාගෙණ තමන්ගේ ගුරුළු විමානයට  ඇරගෙණ ගියේය. රජ්ජුරුවෝත් තමන්ගේ බිසවුන් නො දැක මාගේ බිසවුන් කොයිදැයි කියා පරීක්ෂා කොට නො දැක තමන්ගේ සර්ගික නම් ගාන්ධර්වයෙකු කැඳවා කියන්නාහූ මාගේ බිසවුන් ගිය තැනක් ආරංචිකොට දෙන්ටයයි භාරකළහ. ඒ ගාන්ධර්වයාත් ගොසින් භාරු නම් පටුන්ගමට බැස යාත්‍රා යන්නාවූ සෙට්ඨිවරුන්ට කියන්නේ මම විණා ගාන්ට දනිමි, තෙල නැවට නංවගණුවයි කීහ. සෙට්ඨිවරුන් යහපතැයි නැවට නන්වා ගෙණ මුහුදු මධ්‍යයෙන් යන්නාහු තොප අපට විණාගාවයි කීහ. එවිට ගාන්ධර්වයා කියන්නේ ගොඩබට තෙනදී විණා ගාමි. මච්ඡයෝ තොපගේ නැව යා නො දෙති කීය. එවිට උ ඇම කියන්නාහු කුඩමස්සො කුමක්කෙරෙද්ද විණාගාවයි කීහ. එවිට ගාන්ධර්වයා විණාගාන්ට වන. දැතිමෝරෙක් පඩව්වට පැන පඩව්ව බිඳපි ය. ඒ ගාන්ධර්වයා බිඳිගිය පෝරුයක් බඩ තබාගෙණ දිය පිනා බෝධිසත්වයන් ඉඳිනා නාගදිවයිනට පාවිය. එවෙලාවට ගරුළුත් රජ්ජුරුවන් හා දූ කෙළින්ට පළාගියේය. බිසව් ඇත මෑත ඇවිදිනාවූ ගාන්ධර්වයා දැක මාගේ ස්වාමින්ගේ ගාන්ධර්වයා යයි දැන උ ඉස්සෝදා නාවා ඔහු හා එක්ව ලෝකාස්වාද රතියෙහි යෙදී  බෝධිසත්වයන් එන වෙලාවට එක් තෙනක සඟවා ඉඳුවන්නාහ. මෙම නියායෙන් කීපදවසක් ගියකල්හි දඬු පත් ගන්ටයයි නැවක් ඇවිත් ඒ දිවයිනට වන. ගාන්ධර්වයා ත් ගියකල්හි දඬු පත් ගන්ටයයි නැවක් ඇවිත් ඒ දිවයිනට වන. ගාන්ධර්වයාත් එනැවට නැගී බරණැස් නුවට ගොස් තමාගේ රජ්ජුරුවන් දැක ගුරුළු හා රජ්ජුරුවන් දෙන්නා දූ කෙළිනා වෙලෙහි ගීතයකින් ගුරුළු විමානයේදී බිසවුන් දුටු  නියාව කියා ගුරුළු ගාන්ධර්වයා මූන බලා තෝ මුදුමධ්‍යයේ විමානයේ උන් බිසවුන් කෙසේ දුටුදැයි විචාළාහ. ගාන්ධර්වයා කියන්නේ මුදු මධ්‍යයේ නැවක් නැසී බෝරුවක් බඩතියාගෙණ පීණාගොසින් දිවයිනට බැස බිසවුන් හා කැටිව ලෝකාස්වාද රතියෙහි යෙදී රජ්ජුරුවන්ගේ මෙහෙවරින් ගොස් ආමිකීය. එවිට බෝධිසත්වයෝ ගුරුළු විචාළාත් රැකගත නොහැක්කාවූ ගෑනුන්ගෙන් ප්‍රයෝජන කින්දැයි බිසවුන් රජ්ජුරුවන්ටම පාවා දුන්හයි වදාරා මේ සුස්සොන්දිය ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි තඹතාංග රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. ගාන්ධර්වයා නම් මේ උකටලී මහණය.සුස්සොන්දිය බිසව් නම් මේ ස්ත්‍රිය. ගුරුළුව උපන්නේ නම් බුදුවූ මම් මයයි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# සවණ්ණමෘග ජාතකය

තවද ශක්‍යකුල තිලකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෑගසව්වන් වහන්ස්ට උප්ථාන කරණ එක්තරා කුලයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

දෑගසව්වන් වහන්සේට උපස්ථාන කරණ එක්කුලයක දුවනිකෙනෙක් ඇත්තාහ. ඌ තුමු විශිෂ්ට රූ ඇත්තාහ. බැලුවන්ට ප්‍රසාදනියහ. තුණුරුවන්ම මානය කොට වාසය කරන්නාහ. උපාසිකා ව දවසරිනාහ. එකියන කුමාරිකාව තිර්ථක කුලයෙක ඇත්තෝ තමන්ගේ පුතනුකෙනෙකුන්ට විවාහයට යයි කියා විචාළාහ. ඒකිහන කුමාරිකාවගේ දෙමව්පියෝ කියන්නාහු තොපි ඇම නම් පරම මිත්‍යාදෘෂ්ටිය. එසේ වුවන්ට අපගේ දරුවන් පාවා දුන් කල උන් සිතන සේ සංඝයා වහන්සේ වැඳ පුදාගන්ට දන්දි ගන්ට නුපුළුවන. එසේ හෙයින් තොපට පාවා නොදෙම්හය යි කීහ එබස් අසා තිර්තක කුලයේ ඇත්තෝ කියන්නාහු. තොපගේ දුවනියෝ අපගේ ගෙට ආ කල තමන් සිත සැටියේ දන් දෙත්වයි සිල් රකිත්වයි සංඝයා වහන්සේ වැද පුදා ගණිත්වයි ඊට අපගෙන් වාහකුලයෙක් නැතැයි කීහ. එසේවී නම් පාවා ගණුවයි මහමගුල් කොට සරණ පාවා දුන්හ.එකියන කුමාරිකාවත් සරණ ගිය නොබෝ කලකින් තමාගේ වල්ලභයාට කියන්නී ස්වාමිපුත්‍රයානෙනි. දෑගසව්වන් වහන්ස්සේ දක වැඳ පුදා දන් දෙන්නා කැමැත්තෙමි කීවාය. එකියන පුරුෂයාත් යහපතැයි කීයේය. එකියන උපාසිකා සැරියුත් ස්වාමින් මුගලන් ස්වාමින් වැඩමවා දන් දී දෑගසව්වන් වහන්සේට කියන්නී. යම් දවසක් මේ ගෙයි ඇත්තෝ තමන්ගේ මිත්‍යාදෘෂ්ටිය අරිද්ද. ඒ තාක්කල් මේ ගෙට සිඟන්නට වැඩිය මැනවැයි කිවා, යහපතැයි කියා ඒ ගෙට සිඟා වඩිනාසේක. එසමයෙහි තොමෝ කීප දවසක් පලා යන්නා තමාගේ ස්වාමිපුත්‍රයාට කියන්නී ඇයි දෑගසව්වන් වහන්සේ දවස්පතා වඩිනාකල උන්වහන්සේලා වැඩිකල මට කියාලවයි කීයේය. එකියන ස්ත්‍රින් දෑගසව්වන් වහන්සේට අසුන් පණවා වළදා අන්තයහි තමාගේ ස්වාමිපුරුෂයාට කියේය. එකියන පුරුෂයාත් එතනට අවුත් දෑගසව්වන් වහන්සේ වැඳලා එකත් පස්ව උන්නේය.ඉන් දම්සෙනෙවි සැරියුත් මහසවාමි එකියන කෙළෙඹි පුත්‍රයාට දාන කථා ආදීවූ කථායෙන් ධර්මදේශනා කළසේක. ඒ බණ අසා එකියන පුරුෂයාත් තමාගේ මිත්‍යාදෘෂ්ටිය ඇර එවක් පටන් දන්දෙමින් සිල්රැක වාසය කරන්නාහ. මේ නියායෙන් කල්යත් එකියන පුරුෂයාගේ දෙමව්පියෝ පටන් නෑ වර්ගයාද යටත් පිරිසෙයින් කෙල්ලන් කොල්ලන් දක්වා මිත්‍යාදෘෂ්ටිය හැර සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටියෝය. එක් දවසක් සැරියුත් ස්වාමින් වදාළ ධර්ම දේශනායෙන් එකියන පුරුෂයාත් ස්ත්‍රියත් දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටියේය. පසුව කල්යාමකින් එකියන ස්ත්‍රී කියන්නී ස්වාමිපුත්‍රයානෙනි. මා ගිහිගෙයි ඉන්ට අභිප්‍රාය නැත. මහණ වන්නා කැමැත්තෙමි කීව. එකියන පුරුෂයාත් යහපතැයි තොපිත් මහණවෙව, මමත් මහණවෙමියි මහත්වූ පෙළහරින් තමන්ගේ භාර්යාව මෙහෙණ වරට ගෙණගොස් මහණ කරවා තුමූත් බුදුන් කරා ගොස් මහණවූහ. මහණ වූ නොබෝ කලකින් මෙහෙණිත් එකියන මහණත් සියළු කෙලෙසුන් නසා රහත්වූහ. මේ කියන කථාව දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ අසවල් මෙහෙණින්න නිසා තමාගේ පුරුෂයා ගලවා තමනුත් ගැලවුනේ වේදැයි කිය කියා වැඩ උන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි. මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා මහණෙනි දැන්මතු නොවයි එකියන ස්ත්‍රි තමනුත් ගැලවි මහත්මයනුත් ගළවා ගත්තෝ වේදැයි වදරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකතුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ මෘගව උපන්සේක. ශරීරය රන් වන් වූ පැහැයෙන් යුක්තව. සතර කුකුල ලාක්ෂාරෂයෙන් තෙමාළුවාක්මෙන් රක්තය. මුඛය රත්පස්වටක් මෙන් රක්තිය. අත්දෙක රිදීපැහැයෙන් හා සමානය. නේත්‍රහි ඉන්ද්‍ර නීල මාණික්‍යය දෙකක් මෙන් වුයේය. මේ නියායෙන් රුවින් අග්‍රව ඉපිද මේ නියාවට විශිෂ්ටවූ රූපයෙන් යුක්ත මෘගංගනාවකුත් බෝධිසත්වයන්ට බිරින්ද ව ඉන්නාහ. අසූදහසක් මුවෝ සේවාකම් සිටිනාහ. එසමයෙහි එක් වැද්දෙක් වරපටින් මළලාළුයේය. බෝධිසත්වයෝ අසූදහසක් මුවන් පිරිවරා ගොචරග්‍රහණය කරන්නාවූ වැද්දා ළු මළේ පළමු යන්නාවූ බැඳුනාහ. මළ බැඳුනු ගමනේ මළ කඩාගත හැකැයි බෝධිසත්වයෝ පයගසලාා ඇදළු ගමනේ පය සම කැඩින දෙවනුව ඇදළු ගමනේ මාංශ කැඩින. තුන්වෙනිව ඇදළු ගමනේ නහරවල් කැඩි ඇටයේ තරව ඇසිර වැදගත් ගමනේ බෝධිසත්වයෝ මහණ හයින් හයපත්ව බංරාවයෙන් මහත්කොට ඇඬුහ. ඒ අඬ අසා අසූදහසක් මුවෝ හයින් තැතිගෙණ ඒ ඒ අත දිව පුහ. බෝධිසත්වයන්ගේ භාර්යාවූ මාගංගනාවත් එපරිද්දෙන්ම දිව මුවන් අතුරෙන් තමාගේ ස්වාමිපුත්‍රවූ මුවානන් නොදක මේ හය

SANHIDA LANKA

පැමිණියේ මාගේ ස්වාමිපුත්‍රයානන් වහන්සේටයයි යන සිතින් මළ බැඳුනු බෝධිසත්වයන් ළඟට අවුත් කියන්නාහු රන්වන් පැහැයක් ඇති මුවරජ්ජුරුවෙනි මා හුදකළාකොට මට දුක් නොදී මහත්වූ වේගයෙන් මළකඩා පියවයි කීහ. එවිට මුව රජ්ජුරුවෝ කියන්නාහූ හද්‍රාව මා කරණ යම් උත්සාහයක් කෙළෙමි. පය සම් මස් නහර කැඩී ඇටයේ මන්ද ඇසිරින. එසේ හෙයින් මන්ද කඩාගත නොහෙමැයි කීහ. එවිට මුවදෙන් කියන්නී ස්වාමිනි, නුඹ වහන්සේ නොබව මැනව, මාගේ ප්‍රාණය පරිත්‍යාග කොට වී නමුත් නුඹ වහන්සේ රකිමි. නොබාමැනවැයි කියා ඇඟ වතුරුවාගෙණ සිටි කලට වැදි කල්පාන්ත වහ්නියක්මෙන් තොප් ගත් අත් ඇතිව එන්නාවුන් දැක මුවදෙන් ස්වාමිනි, වැදිපුත්‍ර එන්නේය. නොබව මැනවයි බෝධිසත්වයන්ට කියා වැද්දවු ඉදිරියට ගොසින් නමස්කාර කොටලා සිට කියන්නී කියන්නී වැදිපුත්‍රයානන් වහන්ස. මේ මුවානෝ රන්වන්වූ ශරීර ඇත්තාහ. දස දහසක් මුවන්ට නායකයෝය. විශිෂ්ඨවූ රූ ඇත්තාහ. මාගේ ස්වාමිපුත්‍රයානන් වහන්ස, නොමරා ඇරපියව. ඉදින් මරන්ට සිතවි නම් මෙසේ කොල අතු කඩා අතුට මා මරා මාංශ ඇරගෙණ පසුව මාගේ ස්වාමිපුත්‍රයානන් වහන්සේ මරවයි කීහ. එවිට වැදිපුත්‍රයා මහාසමාධිව නැතත් කාලයක් මුවන් දුටු විරිමි මුවන් මනුෂ්‍යයන්ගේ භාෂාවෙන් කථා කරන්නවුන් ඇසුවිරිමි යි කියා කියන්නේ තොපගේ ස්වාමිපුත්‍ර වූ මුවත් තොපත් නොමරා අරිමි. තොප නොබව යි කියා මුවාලඟට අවුත් පය බැඳුනු මන්ද ගළවා නහරින් නහර හා මසින් මස් හා සමගින් සම හා තබා පිරිමැද ලේ සෝධා එ ගමනේ වැද්දන්ගේ මෛත්‍රී බලයෙන් හා බෝධිසත්වයන්ගේ පාරමිතාවෙන් හා මුවදෙනගේ කරුණාවෙන්ද කිසි කැලලක් නැතිව සුවච සැපයෙහි සිටියාහ. එවිට මුවදෙන් වැද්දවුට කියන්නී වැදිපුත්‍රයානෙනි. අපට වූ සමාධියෙන් තොපගේ අඹුදරුවන්ටත් සතුටුවේවයි ආවඩා සිටියහ. බෝධි සත්වයෝත් තමන් ගොචර භූමියෙහි දුටු මාණික්‍යරත්නක් වැද්දවුට දී වැදිපුත්‍රයානෙනි, තෙල ඇරගෙණ විකොට කව, ප්‍රාණඝාත නොකරව යි අවවාද වදාරා වනාන්තරයට ගියසේක. බුදුරජානන් වහන්සේ ස්වර්ණමෘග ජාතකය පූර්වාපර සන්ධි ගළපා නිමවා වදාළසේක. එසමයෙහි වැදිපුත්‍රයා ඡන්න නම් අමාත්‍යයාය. ඒ කියන මුවදෙන් නම් මේ භික්ෂුණිය. එසමයෙහි මුවරජ නම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# වර්ණරෝග ජාතකය

තවද ආදිච්චබන්ධු යන නම් වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සැරියුත් මුගලන් දෑගසව්වන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

සැරියුත් මුගලන් දෑගසව්වන් වහන්සේ පිටිසර ගමකට ගොස් වසනසේක. එක්තරා පුරුෂයෙක් මේ දෙන්නා වහන්සේගේ මිත්‍රධර්මය දැක දෙදෙනා වහන්සේ උනුඋනුන් හස්වා බිඳුවාපියන්ට උවමැනවයි සිතා සැරියුත් ස්වාමින් කරා ගොස් කියන්නේ ස්වාමිනි මුගලන් ස්වාමින් කරා එක් දවසකින් මම ගියෙමි. මා ගිය ගමනේ කියනසේක් මා හා සමාන ජාතිවංශයවත් ඉර්ධි ප්‍රාතිහාර්යය වත් නැතිසේක. උන් වහන්සේ කින්දැයි කියා නින්දා සැටියේ බස් කීසේක. උන් වහන්සේ එසේ කියේ නුඹ වහන්සේ කෙරේ කනස්සළුව වේදැයි කීය. උන්වහන්සේ අසා සිනාසී එසේ කීසේක් ද යහපත තොපි පලායවයි උන් එතනින් යවුසේක. එක් දවසක් මුගලන් සාමින් කරා ගොස් එම පුරුෂයා මෙම නියාවට කියා උන්වහන්සේත් අසා සිනාසී එසේ කීසේක්ද?. යහපත තොපි යවයි කියා යවා එක් දවසක් මුගලන් සාමින් සැරියුත් සාමින් කරාගොස් අසවල් පුරුෂයා මෙතනට ආද එකියන තැනැත්තේ කීයේ කින්දැයි විචාළ සේක. උන් කී සැටි වදාළසේක.මටත් මෙසැටි කිය යි උන් වහන්සේත් කියා මෙතන උවමනා එකෙක් නොවෙයි කියා එතනින් යවා තුන්මස එතන රදා වස්වැස සර්වඥයන් වහන්සේ කරාගොස් සර්වඥයන් වහන්සේ දැක තමන් දෙදෙනාවහන්සේ ගස්වා බිඳින්ට පුරුෂයා කී කළදෙය වදාළසේක. සර්වඥයන් වහන්සේ අසා වදාරා දෑගසව්වෙනි දැන්මතු නොවෙයි පළමුත් එකියන පුරුෂයා තොප දෙදෙනා ගස්වා බිඳින්ට උත්සාහ කළ ගමනෙත් තොපි දෙදෙනා ඒ අසා අදහා නොගෙණ උනුන් හා කනස්සළු නුවුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ වෘක්‍ෂදේවතාව උපන්සේක. එසමයෙහි සුදාඨ නම් සිංහ රජ්ජුරුකෙණෙකුන් හා සුබාහු නම් ව්‍යාඝ්‍රයකු හා දෙන්න උනුන් හා බලවත්වූ හිතමිත්‍රව වාසය කරන්නාහ. එසමයෙහි එක් කැණහිලෙක් සිංහයා හා ව්‍යාඝ්‍රයා ලඟටගොස් නොයෙක් සතාසතුන් කෑතැන ඇට මංශ කා මහත්වූ ශරීර ඇතිව ස්ථූලව සිතන්නේ කවර සතුන්ගෙත් මාංශ හා මහත්වූ ශරීර ඇතිව ස්ථූලව සිතන්නේ කවර සතුන්ගෙන් මාංශ කැමි සිංහමස් හා ව්‍යාඝ්‍රමස් කෑවිරූ නැත. දෙන්නා උනුන් හා ගස්වා මරවමියි සිතා සිංහ රජ්ජුරුවන් සමිපයට කැණහිල් ගොස් කියන්නේ ව්‍යාඝ්‍රයානන් දැකලා හිත විස්වාස කම් කිම්දැයි කීය. සිංහයා කියන්නේ හිතකමට අමුතු කිම්ද බලවත් හිතයම්හයි කීහ. නුඹ වහන්සේ කියන පමණක් විනා එක් දවසක් මම ව්‍යාඝ්‍රයානන් උන් තැනට ගිය ගමනේ නුඹ වහන්සේගේ නුගුණ විනා ගුනයක් නොකීවෝය. මාසේ ජාතිවන්ත ගුණවත් වික්‍රමවත් රූපයක්වත් උන්ට නැත. උන් කිම්දැයි කීසේක. සිංහයානෝ අසා එසේ කිවුදැයි සිනාසී මෙතනින් තොපි යවයි කියා යවුහ. එක් දවසක් කැණහිල් ව්‍යාඝ්‍රයානන් උන්තෙනට ගොස් ව්‍යාඝ්‍රයානන් දැකලා නුඹ දෙදෙනාගේ හිත මිත්‍ර කම් කිම්දැයි විචාළේය. මිත්‍රකමට අමුතු කිම්දැයි කියන්නා නුඹ වහන්සේ එසේ කියන පමණක්ව විනා එක් දවසක් මා එතනට ගිය ගමනේ නුඹ වහන්සේගේ නුගුණ විනා ගුණයක් කීයේ නැතැයි පළමු කීවාසේම ව්‍යාඝ්‍රයාට කිය. ව්‍යාඝ්‍රයා සිනාසී එසේ කීවිට තොපි මෙතනින් පළමු කීවාසේම ව්‍යාඝ්‍රයාට කිය. ව්‍යාඝ්‍රයා සිනාසී එසේ කිව්ට තොපි මෙතනින් පලායවයි කියා සුදාඨ නම් සිංහරජ්ජුරුවන් කරා ගොසින් සුබාහු නම් ව්‍යාඝ්‍රයා කියන්නේ සිංහරජ්ජුරුවෙනි, සිඟාලයා මා කරා අවුත් කියන්නේ නුඹ වහන්සේ මට නොයෙක්දෑ බොහෝව කිවයි කියා මට අවුත් කිය සැබෑද නුඹ වහන්සේ මට එසේ කීයේදැයි විචාළේය. සිංහ රජ්ජුරුවෝත් එවිට කියන්නේ තොපත් මට නොයෙක්දෑ කිවයි කියා ඇවිත් කිය. මම අදහා නොගතිමි තොපගේ අඥාන කමෙක විවර් මාගේ තත්වය දැන මෙසේවූ දෙයක් කියති කියන්නක් මෙතෙක් කාලයක් එකතැන ඉඳ නොදත් නියාද තොපගේ අඥාන කමෙකැයි කියා දෙන්නම උනුන් හා කථා කොට මේ නීච තැනැත්තහු ලංවීමෙන් වේද මෙසේවූ සැකයක් වුයේ යයි කියා ඌ මෙතන ඉඳ නොහැක්කා යි මෙතනින් පහකොට ව්‍යඝ්‍ර රජ්ජුරුවන් ක්‍ෂමා කරවා ගෙණ තමාගේ වාසස්ථානයට ගොස් සැපසේ වාසය කළහයි වදාරා මේ වර්ණ රෝග ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි සිඟාලව උපන්නේ මෙකියන පුරුෂයාය. එසමයෙහි සිංහව උපන්නේ ශාරීපුත්ත ස්ථවිරයන් ව්‍යාඝ්‍රව උපන්නේ මුගලන් මහා ස්ථවිරය. එසමයෙහි වෘක්‍ෂදේවතාව ඉපිද මේ කාරණය දුටුයෙමි බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# ශිලපරික්බ ජාතකය

තවද සමන්තභද්‍ර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සීලය පරීක්ෂා කල බ්‍රහ්මණයකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සැවැත්නුවර එක්තරා බ්‍රහ්මණයෙක් ශිලය යහපත්කොට රක්නේය. රජ්ජුරුවෝ මේ නියාව දන සෙසු බ්‍රාහ්මණයන් නියාවට මේ කියන බ්‍රාහ්මණයාට ආවේනික ඇතිව වාසය කරන්නාහ. බ්‍රාහ්මණ තමා කෙරේ රජ්ජුරුවන් ආවේනික ඇතිවී වාසය කරණ නියාව දන රජ්ජුරුවන් වහන්සේ මා කෙරේ ආවේනික ව මා රක්ෂාකරන්නාවූ ශිලය ආනුභාවයෙන් දෝහෝ නොහොත් මා බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ ඒ නිසාදෝහෝයි මා කෙරේ ආවේනිකය මේ මා පරීක්ෂාකරන්නට උවමැනවයි සිතා සෙට්ඨිවරුන්ගේ පිලට ගොස් තුන් දවසෙක රන් තුන්ගාණක් උකාගෙණ පළමුදා ආචාරීන් කෙරෙහි ගරුත්වයෙන් නොකීහ. දෙවෙනිදා මේ රන් සොරකම් කරණ සොරෙකැයි අල්වාගෙණ ගොස් රජ්ජුරවන්ට කීහ. රජ්ජුරුවෝ ආචාරීනි මේ කුමක් නිසා කළ දෙයක්දැයි විචාළාහ. ස්වාමිනි සීලය වැඩිදෝහෝයි පරික්ෂාකරණ නිසා කෙළෙමියි කීහ. රජ්ජුරුවෝ කිසිදෙයකුත් නොකීහ. එවිට බ්‍රාහ්මණ ස්වාමිනි මා රක්නාවූ ශිලය ම වැඩිය. එසේහෙයින් ගිහිගෙයින් මට ප්‍රයෝජන නැත. මහණවෙමි කියා රජ්ජුරුවන්ගෙන් අවසර ඉල්වාගෙණ සර්වඥයන් වහන්සේ කරා ගොස් මහණව උපසම්පදාව නොබෝ කලකින් විදර්ශනා වඩා රහත්වූසේක. මේ කථාව දම්සභා මණ්ඩපයේ රැස්වූ සංඝයා වහන්සේ ශිලමයගුණ වර්ණනා කර කර වැඩ උන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා පෙර මහෝත්තමයෝ පවා ශිලයම උතුම්දෝහෝයි විචාරා වදාරා එපවත් අසා පෙර මහෝත්තමයෝ පංච ශිලයම උතුම්දෝහෝයි පරීක්ෂා කොටම හුන් නෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයක ඉපද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් කරාගොස් ශිල්ප ශාස්ත්‍ර ඉගෙණ බරණැස් නුවරට අවුත් බෝධිසත්වයෝ රජ්ජුරුවන් දුටහ. රජ්ජුරුනක් විසින් බෝධිසත්වයන් පුරෝහිත ස්ථානාන්තරයෙහි සැලැස්වූශ. බෝධිසත්වයෝ අඛංඩවූ ශිලය රක්නාහ. රජ්ජුරුවෝ සෙසු බ්‍රාහ්මණයන් නිසා මට පුරෝහිත බ්‍රාහ්මණයන් කෙරේ මහත්වූ ආවේනික ඇත්තාහ. පුරෝහිතයෝ රජ්ජුරුවන් වහන්සේ මා කෙරේ ආවේනික ඇතිසේක. මේ මා පරීක්ෂාකරණට උවමැනවයි සිතා පළමු කථාව පරිද්දෙන් පරීක්‍ෂාකළාහ. රජ්ජුරුවෝ මේ කිම්ද.ආචාරීනි විචාළාහ. පුරෝහිතයෝ ස්වාමිනි ශිල්ප වැඩිදෝහෝයි ඇසූපිරූ ශාස්ත්‍රය වැඩිදෝ හෝයි සිතා පරීක්ෂාකෙළෙමි. ඉන් වඩිනේ ශිලයම දනිමි ස්වාමිනි කීහ. උතුම්වූ ජාති හා උතුම්වූ ශාස්ත්‍රය දනිතත් වඩිනේ ශිලයමයි කීහ. තවද රජ්ජුරුවෝ බ්‍රාහ්මණයෝ වෙළඳ සුද්‍ර ආදීවූ අය අධර්මයෙහි හැසිර සම්පත් උපදවා පොහොසත්ව රැකේනම් එසේවූ පොහොසත්වීමට වඩා දැහැමෙන් සෙමෙන් සීලය රක්ෂාකොට දවස් ඇරිම යහපතැයි ශීලයම වඩිනේය. තවද චතුර්වර්ණයෙහි ඇත්තන් හා නීචකුලයෙහි උපන්නෝද සියලු සත්වයෝම ශිලයෙහි යෙදී ශිල් වඩිනේ යයි කියා බරණැස් රජ්ජුරුවන්ට කියා අවසර ඉල්වාගෙණ පුරෝහිතයෝ වනාන්තරයට වැද ඍෂිප්‍රව්‍රජ්ජ්‍යාවෙන් පැවිදිව පඤ්චඍධි අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහිනු ධ්‍යානයෙන් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහයි වදාරා මේ ශිල්පරිකබ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# හිරි ජාතකය

තවද සකලගුණ නිධානවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අනේපිඬු සහසිටානන් විශ්වාසව ඉඳිනා පිටිසර සිටානකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

මෙහි වර්ථමාන කථාවත් යටකියන ලද ජාතකවල පෙනෙන්නේය. මෙහි වනාහී බරණැස් නුවර සිටානන්ගේ පිටිසර විශ්වාසවූ සිටානකෙණෙක් ඇත්තාහ. පිටිසර සිටානන් එවු පඬුරු බෝධිසත්වයෝ විකොට මල් යවන්නාහ. බෝධිසත්වයන් එවු බඩුවට නින්දාකොට නොවිකුණන්නාහ. බෝධිසත්වයන්ගේ මනුෂ්‍යයෝත් අපගේ සිටානන් වහන්සේගෙන් ගෙණගිය බඩු නො විකුට නින්දා කියනකල අපිත් උන්ගේ බඩු විකුණන්නේ නැතැයි කියා නො විකුට උන් යවා එපවත් බෝධිසත්වයන්ට කීහ. බෝධිසත්වයෝ එපවත් අසා මිත්‍රධර්මය තරකොට කියන්නාහූ මෙසේ බරණැස් නුවර සිටානෝ තමන් සමීපයට පැමිණියාවූ මනුෂ්‍යයන්ට කළමනා දෙය නොකරන්නාවූ මනුෂ්‍යයෝ ප්‍රත්‍යුපකාර නොසලක්නාවූ යයි කියන්නාහූ ලජ්ජාව ඉක්ම මිත්‍රභාවයට පිළිකුල් කරන්නාවූ මම නුඹ වහන්සේගේ මිත්‍රයෙමි හුදක් වචන මාත්‍රයකින් කියන්නාහු දෙමි කෙරෙමි යන වචනයට සුදුසුවූ උත්තම ක්‍රියා නොකරන්නාවූ මෙබඳුවූ පුද්ගලයා මේ මාගේ මිත්‍රයයි නො දතයුත්තේය. යම් සත්වයෙක් යමක් කෙරේ නම් එම කියාද යමක් නොකරේනම් නොකියාද නොකරන්නාවූ කාරිය කියන්නාවූ සත්වයෝ නුවනැත්තාවූ සත්වයෝ මූ කියන්නේ නැත්තයයි තමන්ගේ විශේෂ වූ ප්‍රඥාවෙන් දැන ගන්නාහ. යම්සත්වයෙක් තෙමේ ඇම කල්හිම අප්‍රමාදව භේද කිරීමෙහි සිතිවිලි ඇත්තේ ද රන්ධ්‍රගවේෂිව නුගුණ සොයන සුළුද එසේවූ සත්ව තෙමේ මිත්‍රයෙක් නොවන්නේය. යම් සත්වයෙක් තෙමේ මෙර මා විසින් කොතෙක් නුගුණ කියාත් බිඳුවාලීය නොහැකිවේද ලොහිලා වැඩු පුත්‍රයෙකුමෙන් යම් මිත්‍රයෙකු සමීපයෙහි සෙනහිවැ වෙසේද? එසේවූ  සත්වතෙම මිත්‍ර වන්නේය. යම් සත්වයෙන් තෙමේ තමා විසින් කෙතෙක් නුගුණ කියාත් බිඳුවාලීය නොහැකිවේද, නුවනැත්තාවූ කළ්‍යාණ මිත්‍රය හා සමඟ මිත්‍රභාවය ප්‍රීති ප්‍රාමෝදයද උපද වන්නේය. ප්‍රශාසාද ඵලවන්නේය. මෙලෝ පරලෝ දෙකෙහි කායික චෛතසික සැපයද ඵල වන්නේය. එසේහෙයින් මෙබඳුවූ විපාක නිශංසය දන්නාවූ කුල පුත්‍රතෙමේ ප්‍රඥාවන්ත උත්තමවූ පුරුෂයන් විසින් ඉසිළිය යුතුවූ දානය කුල පුත්‍රතෙමේ ප්‍රඥාවන්ත උත්තමවූ පුරුෂයාන් විසින් ඉසිළිය යුතුවූ දානය ශීලය භාවනාවය සංඛ්‍යාතවූ බලවත් ප්‍රිතියට කාරණාද මෙලොවින් පරලොවින් ප්‍රශංසාද කයට සිතට සැපද වන්නේය. නුවනැත්තන් හා සමග මිත්‍රභාවය බිඳ නොපියන්නේය. කායවිවේක චිත්තවිවේක උපාධිවිවේක සංඛ්‍යාතවූ රසය අනුභව කොට ඒ විවේක නිසා උපන්නාවූ සොම්නස් සාරසැප ආදිය අනුභව කෙරෙමින් නුවනැත්තාවූ සත්වතෙමේ සියළු කෙලෙස් පරිලාහයෙන් හුන් බැවින් කාය චිත්තයද රථරහිත වන්නේය. රාගාදී කෙලෙශයන් නැති බැවින්  නිෂ්පාපී වන්නේයයි මෙසේ මහබෝසතානෝ පාපමිත්‍ර සංසර්ගයෙන් කළකිරී  මට පැමිණියාවූ විවේකාවාස අමෘත්තමහා නිර්වාණයට පමුණුවා දේශනාවෙහි කුළු ගැන්වූවයි වදාරා මේ හිරි ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බරණැස් නුවර සිටුව උපන්නෙම් බුදුවූ මම් ම යයි වදාළසේක.

SANHIDA LANKA

# අහිකුණ්ඨක ජාතකය

තවද අසරණ සරණ වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මහළු භික්ෂූන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

මහළු භික්ෂූකෙනෙකුන් වහන්සේ එක් සාමණේර කෙනෙකුන් වහන්සේත් එක්ව විහාරයක වාසය කරණ සේක් සාමනේරයන් වහන්සේ මරාතලා නොයෙක් ගහට මහළු භික්ෂූන් වහන්සේ කරන්නා ඉවසාගත නොගී සිවුරුහැර සාමනේරයන් වහන්සේ ගිහිගෙට පලාගියසේක. මහළු භික්ෂූන් වහන්සේ සාමනේරයන් වහන්සේ ඇර වාසය කළ නොහි දෙවෙනිව යාඥාව නොයෙක් ද කියා මහණ කරවා ගෙණ පළමුසේම නොයෙක් ගහට කරණ සෙයින් සිවුරු හැර ගිහිව වාසය කරණ කල්හි දම්සභාවේ රැස්වූ සංඝයාවහන්සේ අසවල් මහළු භික්ෂූන් වහන්සේ සාමනේරයන් වහන්සේට නොයෙක් ගහට කරණ හෙයින් සිවුරුහැරපු යයි සිවුරෙහි සිටිනාකල එක්ව වාසයත් කළ නොහැකි, උන්හැර වාසයත් කළ නොහැකි. මේ නියාව කිය කියා උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතු නොවෙයි පළමුත් එකියන මහළු භික්ෂූහු ත් සමාබේරයෝත් දෙන්න එක්ව වාසයකල නොහෙකි. උයිත් හැර වාසයත් කළ නොහොත්යයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ වි විකුණන වෙළඳව උපන්සේක. එසමයෙහි බරණැස් නුවර අහිකුණ්ඨික නම් බ්‍රාහ්මණයෙක් වඳුරෙකු වඩා සර්පයින් නටවා ජීවත් වන්නේය. බරණැස් නුවර උත්සව කෙළියක් දවසෙක අහිකුණ්ඨික බ්‍රාහ්මණ වඳුරා වී විළෙදානන් සමීපයෙහි රඳවා තෙමේ උත්සවකෙළි කෙළිනට ගිය තැනැත්තේ සත් දවසකුත් රඳා ආය, වඳුරා තමා වැඩූ තැනැත්තා හෙයින් දැක ලඟට ආය. අහිකුණ්ඨික බ්‍රාහ්මණ වඳුරා මරා බැඳලීය.වඳුරා බැම්ම කඩාගෙණ අඹ ගසට නැංගේය. අහිකුණ්ඨික බ්‍රහ්මණ නිදා පිබිද වඳුරා නොදැක ගස උඩ බලා ගස උඩ ඉඳ අඹ කන්නාවූ වඳුරා දැක මූ සිත්ගෙණ බස්කියා පාත බාවාගෙණ අල්වා ගණිම් සිතා ගසමුලසිට කියන්නේ යහපත්වූ මූනක් ඇති වානරයාණෙනි මම දූ කෙළ පැරදපියා ආම් මට අඹකැණකුත් අරගෙණ මා කරා එවයි කීය. එවිට වානරයා කියන්නේ තෙපි කුමක් කියව්ද?, වඳුරන්ගේත් යහපත් මුහුණු ඇද්ද තොපි සිත්ගෙණ කියනබස් මම නොදනිම්ද තෝ ව්‍යාජ කියා මා ලඟට ගෙන්නා ගෙණ අල්වාගන්ට කාරණා උපාය මම දනිම්. මාගේ ස්වාමියා කියායයි සිතා තොප කරා ගොස් උපපත්තෙන් පාර කීපයක් ගසා කළ ගහට තව දක්වා මා සිත ඇත. තොප මට රාජ්ජයක් දෙමි කීවත් තොප ලඟට මා එන්නේ නැතැයි කීය ගස අත්ත අගට පලාගිය යි වදාරා මේ අහිකුණ්ඨික ජාතකය නිමවා වදාළසේක. ඒසමයෙහි වානරයා නම් මේ සාමනේරය. අහිකුණ්ඨක බ්‍රාහ්මණ නම් මහළු භික්ෂූහුය. වී වෙළඳ ව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# ගුම්බිය ජාතකය

තවද ශාස්තෘවූ තිලෝගුරු බුදුරාජනන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උකටලීවූ භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

භික්ෂූකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් නිසා උකටලී ව වාසය කරණ සේක. සර්වඥයන් වහන්සේ එපවත් දැන වදාරා සැබැද මහණ තා ස්ත්‍රියක් නිසා උකටලීවිම්යි කීසේක. සර්වඥයන් වහන්සේ එම්බල මහණ ස්ත්‍රීන් කෙරේ උකටලී වීම නම් ගුම්බිය නම් රාජක්ෂයා මගසලා තුබූ මී මෙනැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරුකෙකෙුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ වෙළඳ ව ඉපිද පන්සියයක් ගැල්පුරා බඩුගෙණ වෙළදාමට යන්නාහු මනුෂ්‍යයන්ට බෝධිසත්වයෝ කියන්නාහු මංවල මී මුළු ආදීවූ දෙයක් නොකෑ විරු එලජාතිත් මා විචාරා විනා කවුරුත් නොකවයි කියා වනාන්තරයට වන්නාහ. ගුම්බිය නම් රාක්ෂයා මී සලා මුළු වල බැඳ මගතබා තෙමේ පොරවක් ඇරගෙණ මී කොටමින් බැද්දේ සිටියේය. මනුෂ්‍යයෝ පුරුෂයෙකුගේ සැදහැ යහපතැයි කියමින් ම මුළු ඇරගෙණ කන් නටවන්හ. බෝධිසත්වයන් මා විචාරා විනා නොකවයි කීයද්දී මී මුළු කන්ට වන්කලට බෝධිසත්වයෝ ඒ දැක කමින් සිටිම් උගුරු අල්වාගෙණ දැමුහ. අතින්ගත් මී අතින් දැමුහ. පළමු කෑ අය නැසුනාහ. යත්තමක් කෑ අය බෙහෙත් පොවා නංවාපුවාහ. එකියන්නාවූ අර්ථය දකවන සර්වඥයන් වහන්සේ වදාරණසේක් ගුම්බිය රාක්ෂසයා මනුෂ්‍යයන් මරන්ට මී සලා මුළුබැඳ තිබීද එමෙන්ම මනුෂ්‍යයෝ අනුවනින් මිකා මළහ. සමහර නුවනැති මනුෂ්‍යයෝ නොකා නොකෑ විසින් සුවපත්වූහ. මනුෂ්‍යන්ට රාගචේතනාව නම් මාත්‍ර්‍යමාරයා විසින් ලාළුවාවූ මලක්හාද බලියක්හාද සමාන වන්නේය. පඤ්චකාමයට අසුවුනු කෙණෙක් ඇත්නම් මළවුන් හා සමානයයි වදාරා චතුසත්‍යය ප්‍රකාශකොට මේ ගුම්බිය ජාතකය නිමවා වදාළසේක. චතුරාර්ය සත්‍යාවසානයෙහි උකටලී භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක. එසමයෙහි සාන්තුනායක වෙළඳ ව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# සාලිය ජාතකය

තවද දේවාතිදේව වූ සර්වඥයන්වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද.

ඒ කෙසේද යත්

දම්සභාවෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ දේවදත්ත ස්ථවිරයන් වහන්සේ සර්වඥයන් වහන්සේ මරන්ට උත්සාහ කොට මරාගත නුහුනුවෝ වේදැයි කිය කියා වැඩ උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි පෙරත් දේවදත්ත ස්ථවිරයෝ අප මරන්ට උත්සාහකොට භය විවරකුත් කොටගත නුහුනුවෝ වේදැයි වදාරා ඒ කෙදේයැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක්තරා කෙළඹිපුත්‍ර කුලයෙක ඉපද වැඩිවිය පැමිණ කුඩාකොල්ලන් පිරිවරා නුගගසක් මුල කෙළනාහ. එක් වෙදෙක් ඒ නුවරට අවුත් වෙදකමක් නො ලැබ ඒ කුඩා කොල්ලන් කෙළිනා තැනට අවුත් සිටියේය. ඒ නුගගස සිදුරෙන් සර්පයෙක් කරා පොවා වැද ඔත්තේය. ඒ වෙදා සිතන්නේ මේ සර්පයා ලවා කුඩා කොල්ලන් කඩා කවා විබා ප්‍රයෝජනයක් විඳිමි සිතා කුඩාකොල්ලන්ට කියන්නේ, එම්බල කුඩා කොල්ලෙනි තෙල ගස්බිලියේ සැළලිහිණි පැටවෙක් ඉඳිනීය. ඌ අල්වාගෙණ කෙළුවහ යි කිය. බෝධිසත්වයෝත් යහපතැයි ගිසට නැගී සර්පයා නියාව දැන ඉසටිය තරයේ  අල්වාගෙණ බිමට දැමූහ. සර්පයාත් වෙදා කර දරණ ලා ගෙණ කා මැරීය. බොහෝ  මනුෂ්‍යයෝ එතනය එක්වුහ. ඒ එක්වූ මනුෂ්‍යයන්ට බණ කියන්නාවූ බෝධිසත්වයෝ මේ වෙදා මා සර්පයා ලවා කඩා කවන්ට ගසට නැංගීය. මම සර්වපයා නියාව තරයේ අල්වා බිමට දමාපිමි. ඒ සර්පයා ඒ වෙදා මැරීය. යම් කෙණෙක් නිරපරාධ කෙණෙකුන් නසන්ට උත්සහ කෙරෙත්නම් තමන් නසන්නා පමණමුත් අනුන් නසාගත නොහෙයි යම් කෙණෙක් රජය අරයගණ උඩුසුලඟට දැමුකල ඒ රජය දෙවැනිව අවුත් තමා ඇඟ වැදගනිද එසේහෙයින් නිරපරාධ කෙණෙකුන් නසන්ට උත්සාහ කළත් නසාගත නොහෙන්නේම යයි වදාරා මේ සාලිය ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි වෙදානම් දේවදත්ත ස්ථවිරය. කෙළඹි පුත්‍රව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# නවසාර ජාතකය

තවද ශක්‍රාති ශක්‍රවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් දවසක් දම්සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ සර්වඥයෝ ඉතා තීක්ෂණවූ නුවන ඇතිසේකැයි කිය කියා වැඩ උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි පෙරත් මූ කළානුනුව නෙහි පටන් තීක්ෂණ වූ නුවන ඇත්තෝම වේදැයි වදාරා එ කෙසේ දැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ කෙළඹි කුලයෙහි ඉපිද පළමු කී පරිද්දෙන්ම බෝධිසත්වයෝ සර්පයෙක් අරගෙණ වෙද ඇඟට දැමුහ. සර්පයාත් වෙදා කර දරණලා කා මැරීය. බොහෝ මනුෂ්‍යයෝ එක්ව මේ කුඩාකොල්ලා මිනිසා මරාපුය යි කුඩාකොල්ලන් බැඳගෙණ බරණැස් රජ්ජුරුවන් කරා ගෙණ ගියාහ. බෝධිසත්වයෝ මග යමින් සිටි කුඩාකොල්ලන්ට කියන්නාහු තොපි ඇම රජ්ජුරුවන් දුටුකළ නඬා නොදොඩා සිනාසිසී සන්තෝෂයෙන් සිඛුවයි කියා ඉගැන්වූහ. ඒ කියන කුඩා කොල්ලෙනි තොපි ඇම වෙද මරා පියා අවුත් කිසි භයක් මුසුප්පුවක් නොවි සිටින්නේ ඇයිදැයි කිහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු දේවයන් වහන්ස, දුර්මුඛවීමෙන් සතුරුව සිටන තැනැත්තේ වැරැදි කොට පියා මුන දුර්මුඛව සිටියේය යි සතුරාටත් අවසර පෙණෙයි. වැරදි කළ කලට දුර්මුඛ වුවයි වෙන දෙයක් වැලකුන් නැත. එසේ හෙයින් දුර්මුඛ වීමෙන් තමාගේ මූන බැළුවන්ට ප්‍රියකරු නොවන්නේය. මේ කාරණයෙන් සන්තෝෂව කෙළ සිනා සී සී සිටයම්හයි කීහ. එවිට රජ්ජුරුවෝ බෝධිසත්වයෙන් කී බසට සමාධිව තොපගේ වැරදි කියවයි වැරදි විචාරා අද්‍යතන අසා බෝධිසත්වයන් ඇතුළුවූ කුඩා කොල්ලන් බැඳූන් මුදා බෝධිසත්වයන් තමන්ට අමාත්‍ය තනතුරෙහි සලස්වා ගත්හ. සෙසු කුඩා කොල්ලන්ටත් තනතුරු දී තමන්ට සේවය කරන්ට සලස්වා ගත්හයි වදාරා නවසාර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය. කුඩාකොල්ලෝ නම් අසූමහසව්වෝය. කෙළෙඹි පුත්‍රව උපන් නෙම් බුදුවූ මම් ම යයි වදාළ සේකී.

SANHIDA LANKA

# මිත්තවින්දක ජාතකය

තවද බ්‍රහ්මාතිබ්‍රහ්මවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලෝභිවූ භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වර්ථමාන කථාව යට කියන මත්තවින්ද ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි වනාහී බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි එක්තරා මිනිසෙක් පඩව්ව නැගී මුහුදු පීනා යන තැනැත්තේ දිව්‍ය ස්ත්‍රීන් සතරදෙනකු වාසය කරණ තෙනට ගොසින් එතන ඉන්ද නොහී දිව්‍යස්ත්‍රීන් අටදෙනෙකු වාසය කරණ තෙනට ගියේය. එතනත් ඉන්ද නොහි දිව්‍ය ස්ත්‍රීන් සොළොස්දෙනෙකු වාසය කරණ තෙනට ගොස් ඉන් පැසෙන තැනැත්තට කියන්නෝ තොප කර තිබෙන පලඳනාව මා කරා පලඳවා පියවයි කීය. එවිට පැසෙන තැනැත්තේ මේ යාපත් පළඳනාවෙක් නොවෙයි නරකයේ උරචක්‍ර මාලාවය යි කීය. ඒ යහපත, මා කරලාපියව යි කියන්නා පැසෙන තැනැත්තේ ඌ කරලා ගැළවී පලා ගියේය. බෝධිසත්වයෝ දිව්‍යලෝකයෙහි ඉපිද නරකවල් බලා ගෙණ යන ගමනේ උරචක්‍ර මාලාව කරලා ගෙණ පැසෙන පුරුෂයා ලඟට ගියාහ. එවිට උරචක්‍රමාලාව පැලඳගෙණ සිටි පුරුෂයා කියන්නේ මා මෙසේවූ අකුශලයට පැමිණියේ කවර අකුශලයකින්දැයි විචාළේය. දිව්‍යපුත්‍ර කියනුයේ තොපගේ ලෝභයෙහි වූ අකුශලය දිව්‍යස්ත්‍රීන් සතරදෙනා අටදෙනා සොලොස්දෙනා දෙතිස්දෙනා වාසය කරණ තැන ඉඳ නොහි මේ මෙසේවූ අකුශලයකට පැමිණියේ තොපගේ ලොභ චේතනාවගේ විපාකයයි කීහ. එවිට උරචක්‍රමාලාවෙන් බොටුව කැපි අනික් බසක් කිය නුහුනුවහයි වදාරා මේ මිත්තවින්දක ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි මිත්තවින්දක නම් ලෝභි භික්ෂුහුය. දිව්‍යපුත්‍රව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේකී.

SANHIDA LANKA

# පලාස ජාතකය

තවද වන්දනෙයයාතිවන්දනෙයයාවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් නිසා උකටලී වූ භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් නිසා උකටලීව වාසය කරණ නියාව සර්වඥයන් වහනසේ දැන වදාරා සැබෑද මහණ තා ස්ත්‍රියක් නිසා උකටලීව වාසය කරන්නේ දැයි විචාරා වදාළ කල්යි සැබෑය ස්වාමිනියි කියන්නා එම්බල මහණ ස්ත්‍රියක් නිසා උකටලීවීම නම් කෑලගත් ඇතුලේ නුගගස් ඇතිව කැලෑගස් නැසුවා මෙනැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේ ද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ හංසව ඉපිද චිත්‍රකුට පර්වතයෙහි වාසය කොට ගෝචර භූමියට යන එන කල කෑලගස සැතපී ඉඳිනාහ. කැලෑගස සැතපී ඉඳිමෙන් ඒ ගස වාසයකරන්නාවූ දේවතාවා හංසයානන් හා බලවත් හිත මිත්‍රව වාසය කරන්නාහ. එසමයෙහි එක් පක්ෂියෙක් නුග ඵලයක් අනුභව කොට අවුත් වර්චස් කරන්නේ කැලෑගසේ ඇතුලේ බිලයෙක වර්චස් කෙළේය. ඒ වර්චස් කරන්නේ කැලෑගසේ ඇතුලේ බිලයෙක වර්චස් කෙළේය. ඒ වර්චසයෙහි තිබූ නුග ඵලයෙන් සතරඟුලක් පමණක් නුග ගසක් ඇතිවිය. හංස රජ්ජුරුවෝ කැලෑගස උන්නාවූ දේවතාවාට කියන්නාහූ මේ සතරඟුලක් පමණ නුග ගස නිසා මතුමේ කැලෑ ගස නස්නේය. දැන් මේ නුග ගස උදුරාපියවයි හංස රජ්ජුරුවෝ කීහ. දේවතාවා කියන්නේ මාගේ ඇකයපිට උන් දරු කෙණෙකුන් හා සමානය. එසේහෙයින් මම නම් පියාන කෙණෙකුන් හා සමානය මේ නුග පැලය නම් දරුකෙණෙකුන් හා සමානය එසේ හෙයින් මේ නුග ගස නුදුරුම් දේවතාවා කීය. හංස රජ්ජුරුවෝ එසේවීනම් තොප හා මා හා මිත්‍රකමුත් නැත. මා වෙත එන්නේත් නැතැයි කියා එතැන්පටන් කැලෑගසට හංස රජ්ජුරුවෝ නොඑන්නාහ. ඒ සිටි කාලාන්තරයකින් නුග ගස මහත්ව කැලෑගස නැසී ගියේය. දේවතාවා මාගේ මිත්‍ර හංසරාජ්ජුරුවන් කී අවවාද නොකොට මා ඉන්නා වාසස්ථානය නුවුයේය යයි එතනින් අනතර්ධාන විය. එවිට සර්වඥයන් වහන්සේ එම්බා මහණෙනි යම් සත්වකෙණෙක් පඤ්ච කාමයෙහි ලෝභිව අනුන් කීවා නෙකළෝ නම් දේවතාවාට හංසරජ්ජුරුවන් කී අවවාද නො ගිවිස්සෝ මෙනැයි වදාරා මේ පලාස ජාතකය වදාළසේක. මේ බණ අවසානයෙහි පන්සියයක් භික්ෂූන් වහන්සේ සියළු කෙලෙසුන් නසා රහත්වූසේක. එසමයෙහි හංසව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළ සේකී.

SANHIDA LANKA

# දීඝකෝසල ජාතකය

තවද පූජනෙයාාතිපූජනෙයාාවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වහන්දෑ දෙනමකගේ ඩබරයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

මෙහි වර්තමාන කථාවත් ජාතක කථාවත් සංඝභේද ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහි කොසොල්රට දීඝ රාජකුමාරයෝයයි යන රාජකුමාර කෙණෙක් ඇත්තාහ. ඒ රාජ කුමාරයන්ගේ ඇකය මත්තෙහි ඉස තබා දිග කෝසල නම් බරණැස් රජ්ජුරුවෝ වැද හොත්තාහ. එවිට දීඝ කුමාරෝ තමන්ගේ දෙමව්පියන් මැරූ සතුරා මරාපියම් සිතා එක් අතකින් රජ්ජුරුවන්ගේ ඉසකෙස් වැටිය එක් අතකින් කඩුවත් අල්වාගෙණ සිතන්නාහු මාගේ  පියානන් වහන්සේ මියන ගමනේ යමක් පරීක්ෂාකාරිව කරවයි කීයා මළසේක. මාගේ පියානන් වහන්සේ කිවා නොයික්මවයි සිතා රජ්ජුරුවන් පිටට කඩුපතකින් පිටට කඩුපතකින් ගසා රජ්ජුරුවන් පුබුද්දා ඉසකේ අල්වාගෙණ කියන්නාහු එම්බා රජ්ජුරුවෙනි. තොප මරම් සිතා ඉසකේ අල්වා කඩුව ඔසවා ගතිම් මාගේ පියානන් වහන්සේ මියන ගමනේ පරීක්ෂාකාරීව යමක් කරවයි වදාළසේක. එසේහෙයින් තොප නොමරම් කීහ. එබසට බරණැස් රජ්ජුරුවෝ කියන්නාහු මේ වෙලාවට තොප විනා මට බන්ධු කෙණෙකුත් නැත. මාරතොත් මරව, තොප කැමැත්තක් කරවයි කීහ. එවිට දීඝ කුමාරයෝ කියන්නාහු නුඹ වහන්සේ මරණ නිසා කළ දෙයක් නොවෙයි භය නොගත මැනවයි කියා යම්කෙණෙකුන්ට තමාගේ ජීවිතය නසා හිංසා කිරීමද අනුන්ට පරිහානියක් කිරීමද සත්පුරුෂයෝ  නොකරන්නාහයි කියා දෙන්නම් උන්න්ට කඩුව අත්ගසා දිවුට නොවරදිනා නියායෙන් තරය කළාහ. බරණැස් රජ්ජුරුවෝත් දීඝ කුමාරයන්ගේ බසට සමාධිව රාජකුමාරයන් බරණැස් නුවරට කැන්දා ගෙණ ගොස් මෙපවත් අමාත්‍යයන්ට කියා මේ දීඝ රාජකුමාරයෝ කෝසල රජ්ජුරුවන්ගේ පුතනුවෝය උන්ට උන්ගේ රාජ්‍යය දෙම්භයි තමන්ගේ දුවනියනුත් පාවාදී උන්ගේ පියානන්ගේ රාජ්‍යයත් දී යව්හ. එවක්පටන් දෙරට රජදරුවෝ දෙනම උනුන්ට රාජ්‍යය කොට කම් වූ පරිද්දෙන් මියපරලොව ගියායයි වදාරා මේ දීඝ කෝසල ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි දෙම්පියෝ නම් දූන් මේ දෙමව්පියෝමය, එසමයෙහි දීඝ රාජ කුමාරයෝ නම් බුදුවූ මම ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# මුවපෝතක ජාතකය

තවද සෞධෙදනීය වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් භික්ෂූකෙණෙකුන් වහන්සේට සාමණේර නමෙක් ඇත. ඒ සාමනේර නම් උන් වහනේසේට සුවච කීකරුව අත් පා මෙහෙවර කරණසේක. ඒ සාමණේර නම් නොබෝ කලකින් ව්‍යාධියක් ඇතිව මළසේක. ඒ තෙරුන් වහන්සේ සාමණේර නම් මළාවූ සෝකයෙන් අඬා දොඩා ඇවිදිනාසේක. මාළුවරුන් වහන්සේ අවවාද කීවත් නොගිවිස්නාකේයි යන මේ කථාව දම්සභාවෙහි රැස්වූ මහළුවරුන් වහන්සේ කිය කියා උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි මේ මහණ දැන්මතු නොවෙයි පෙරත් මේ සාමණේරයන්ට සෝකයෙන් අඬා ඇවිද්දෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්සේක. එසමයෙහි එක් තාපසකෙණෙක් හිමාලය වනයෙහි වාසය කෙරෙති. උන් වසන්නාවූ පන්සලට දෙමව්පියන්ගෙන් වෙන්වූ මුව පැටිටෙක් වන, ඒ තාපසයෝ මුව පැටියාට තමන්ට දරුකොට වඩන්නාහ. ඒ මුවා වැඩිවිය පැමිණ විශිෂ්ටවූ රූ ඇතිවිය. නොබෝ කලකින් එක් දවසක් බඩ පුරා තණ කා අජීර්ණව දිරවා ගත නොහි මළේය. ඒ තාපසයෝත් මුවා කෙරෙහි සෝකයෙන් අඬා දොඩා බොහෝ දුක් විඳිනාහ. ශක්‍රයෝ තමන්ගේ නුවණැසින් දහසක් නෙත්ලා මනුෂ්‍ය ලෝකය බලා තාපසයන් විඳිනා දුක් දැක ඒ තාපසයන් ලඟට ගොස් උන්ගේ සෝක සන්හිඳුවා එම් සිතා තාපසයන් සමීපයට අවුත් විචාරන්නාහූ ඇයි තාපසයන් වහන්ස, නුඹ වහන්සේ විකේෂ්පව ඉඳිනේ ඇයිදැයි විචාළාහ. එවිට තාපසයෝ කියන්නාහූ ශක්‍රදේවේන්ද්‍රයෙනි මා දරුකොට වැඩූ මුව පෝතකයෙක් මළේය. එසේ හෙයින් පුත්‍රසෝකයෙන් ඉවසාගත නොහි අඬා දොඩා ඇවිදිමි කීය. එවිට ශක්‍රයෝත් කියන්නාහූ නටනටා යම්දෙයක් නස්නා සුළුමය. මළවුන්ට සෝක කිරීමෙන් කාරිය කිම්ද, තමාගේ  කයට හිතට දුක්වෙන පමණක් විනා මළවුන්ට සෝක කිරීමෙන් කාර්ය කිම්දැයි කීහ. එවිට තාපසයෝත් තොප මනාකොට කියන්නාහූ වචනය ඉතා යහපත, මෙවක් පටන් ශෝක නොකරවයි කීයා එවක් පටන් සෝකනොකොට උන්නාහ. ශක්‍රයෝත් තාපසයන්ට අවවාද කියා දිව්‍යලෝකයටම ගියාහයි වදාරා මුවපොතක ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි මුව පැටවා නම් දැන් මේ සාමණේරය. තාපසයෝ නම් මේ භික්ෂූහුය. ශක්‍රදේවේන්ද්‍රව උපන්නෙම් බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළසෙක්.

SANHIDA LANKA

# මූසික ජාතකය

තවද සර්වලෝකෝත්තමනාථ වූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අජාතශත්‍රු රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වර්තමාන කථාව යටකියන ලද ථුස ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහී බිම්බිසාර රජ්ජුරුවෝ එක්දවසක් රාජකුමාරයන් වඩාගෙණ බණ අස අසා උන්නාහ. සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ ජව නම් රාජ කුමාර කෙණෙක් ඇත්තාහ. ඒ රාජ කුමාරයෝත් වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් ලඟට සිල්ප උගන්නා සඳහා ගියාහ. දිසාපාමොක් ආචාරී ඒ කුමාරයන්ට ඉදිරියේ වන අන්තරායක් දැක ඊටකාරණා උගන්වන සඳහා ගාථා කියමි, කාරණා සිතන්නා ඒ ආචාරීන්ගේ එක් අසෙක් ඇත, ඒ අසාගේ පය වුණයක් ඇත. වණය එක් මීයෙක් දවස්පතා ඇවිත් කඩා කයි එක් දවසක් අසා පය වුණය කඩා කන්ට යයි මියා ඇවිත් වුණය කඩාගෙණ කල්හි අසා තමාගේ පය කුරයෙන් ඇන මියා මරා එතන තුබූ ලිඳට දැමීය. අස්සලයෝත් එතනට අවුත් මියා කොයිදැයි නොදක සෙවුහ. බෝධිසත්වයෝත් මියා ගිය තැන් මම දනිමි ගාථාවක් බැඳ රාජකුමාරයන් ඉගැන්වූශ. එක් කොටළුවෙක් යව වපුළවූ හේනක ඉතිඅස්සෙන් කරපොවා යවකන්ට උත්සාහ කෙරෙයි. එයත් දැක ගාථාවක් බැඳ රාජ කුමාරයන් ඉගැන්වූහ. තමන්ගේ නුවනින් ගාථාවක් බැඳ ගාථා තුනම රාජ කුමාරයන් උගන්වා ආදියෙන් උගත් ගාථාව පොකුණේ නානාවිට කියව, දෙවෙනිව උගත් ගාථාව ඉනට නැගෙණවිට කියව තුන්වෙනිව උගත් ගාථාව ඉනි ඉස සිට කියවයි කියා රාජකුමාරයන් උගන්වා යවුය. රාජ කුමාරයෝත නුවරට ගොස් පියානන්ට සිල්ප දක්වා යුවරජ තනතුරු ලැබ පියානන් ඇවෑමෙන් රාජ්ජයට පැමිණ රාජ්ජය කරන්නාහ. රාජ කුමාරකෙණෙකුන් ලද්දාහ. ඒ රාජකුමාරයෝත් වැඩිවිය පැමිණ තමන්ගේ අමාත්‍යයන්ට කියන්නාහු මාගේ පියානන් වහන්සේ සග බාල සේක. උන් වහන්සේ ඇවෑමෙන් රාජ්ජය ලබන්නේ කවරකලද පියානන් වහන්සේ මරා රාජ්ජය ගණිමියි කීහ. අමාත්‍යයෝත් යහපතැයි ගිවිස්සාය. රාජ කුමාරයෝත් පියානන් මරමි කඩුවගත් අත් ඇතිව මගුල් පතස පවුර කොණ ඇලි සිටියාහ. පතසට නාන්ට යන්නාවූ රජ්ජුරුවෝ මූසික නම් කම්මිත්ත කැඳවා පොකුණවට රැකවල්ලා බලා එවයි යවුහ. රාජ කුමාරයෝත් කම්මන්ත දැක මේ මා දුටු නියාව කිවුනම් නපුරයි කඩුවෙන් දෙපලුකොට ලිඳ එලාපුහ. රජ්ජුරුවෝත් පතසට බස්නා දිසාපාමොක් ආචාරීන් පළමුකොට ඉගැන්වූ ගාථාව කිය කියා පතසට බටහ. බොහෝ මනුෂ්‍යයෝ වටකොට ගෙණ සිටියාහූ මූසිකාව දකින්නේ නැතැයි කියන්නාහ. ඒ ගාථාවෙහි අභිප්‍රාය නම්.

මූසිකාව ගිය තැන් තොප ඇම දන්නේ නැත. මම දනිමි මූසිකාව මරා ලිඳට දමාපුවවහයි කීහ. රාජ කුමාරයෝත් තමන් එතන සිටි කාරණයත් මූසිකාව මැරූ නියාවත් රජ්ජුරුවන් වහන්සේ දත්සේක්වනැයි සිතා ඔබ්බට පලා ගියාහ. ගොසින් එපවත් තමන්ගේ අමාත්‍යයන්ට කීහ. අමාත්‍යයෝත් කීප දවසක් ගිය කළ නුඹ වහන්සේට යමක් නොකළේ රජ්ජුරුවන් වහන්සේ නොදත් හෙයිනි. තවත් උත්සහ කළමැනවැයි කිහ. එවිට රාජ කුමාරයෝත් යහපතැයි ගිවිස කඩුව ඇරගෙණ පියානන් මරමි. ඉනිපාමුල ඇත මැත බලබලා සැඟවී සිටියාහ. රජ්ජුරුවෝත් ඉනිපාමුලට අවුත් දිසාපාමොක් ආචාරීන් ඉගැන්වූ දෙවෙනි ගාථාව කීය. ඒ ගාථාවෙහි අභිප්‍රාය නම්.

පළමු මූසිකාව මරා ලිඳට දමාපුසේම දැනුත් මරන්ට කග දික්කොට ගෙණ සිටිනා නියාදැයි යන අභිප්‍රාය වන්නේය. රාජ කුමාරයෝත් එවිට මාගේ පියානන් වහන්සේ තමන් වහන්සේ මරණ නිසා මෙතන මා සිටිනා නියාව දත්සේවනැයි සැඟවී ගොසින් එපවත් තමන්ගේ අමාත්‍යයන්ට කියා දෙපෝයක් විවර ගියකල දර්ව නම් ආයුධයක් අතින්ගෙණ තුන්වෙනිවත් පියානන් මරමි උත්සාහයෙන් ඉනි ඉස සැඟවී සිටියාහ. රජ්ජුරුවෝ ඉනිඉස දිසාපාමොක් ආචාරීන් ඉගැන්වූ තුන්වෙනි ගාථාව කීහ. එහි අභිප්‍රාය නම්.

SANHIDA LANKA

දෙවාරයක් තොපි මා මරන්ට උත්සාහ කොට සිටියාවද දැනුත් මා මරන්ට ඉනිඉස සැඟවී සිටියාවද ඒ මම නොදනිම්ද?.තොපි මේවලියේ කඩ කොට කපාපුවොත් කුමක් කෙරේදැයි කීහ. එවිට රාජකුමාරයෝ තමන් අනික් යාහැකි තැනක් නැතිත හෙයින් දර්වනම් ආයුධය රජ්ජුරුවන් ඉදිරියට දමා මා කළ අපරාධයට ජීවිත දානය දුනමැනවයි වැදගෙණ ඔත්තාහ. එවිට රජ්ජුරුවෝ තොපට කුමන ජීවිත දානය දෙන්නෝදැයි උන් අමාත්‍යයන් කැඳවා මෙපවත් කියා රාජකුමරයන් දඟගෙයි ලවා සිංහාසනාරූඪව හිඳ කියන්නාහු එම්බා අමාත්‍යයෙනි යම් ගෙයක ඉදිනේ නම් ඒ ගේ තමාට ආරක්ෂාව පිණිසය එසේවූ ගෙයත් මට සහය නුවූයේය.

තමාගේ පැමිණ යම් දුකකට සහයව සිටින්නෝ පුත්‍රප්‍රේමයෙන් තමා වදාගත් දරුවෝය. එසේවූ දරුවෝත් සට සතුරුව සිටියෝය. මෙසේ අවඩයට දිසාපාමොක් ආචාරීන් උගන්වාළු යම් කෙණෙකුන්ට පිටිවහල්ව සිටින්නේ ශාස්ත්‍රයමය, එසේ හෙයින් ඇමවෙලෙහිම ශාස්ත්‍රයම පුරුදුකල යුතුයයි කියා දැහැමෙන් සෙමෙන් රාජ්ජය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. ඒ අමාත්‍යයෝත් රජපුරුවන් අවෑමෙන් රාජකුමාරයන් මැසුන් කපා රාජ්ජයට තබාගෙණ රාජ්ජය කරවුහයි වදාරා මේ මුසික ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි දිසාපාමොක් ආචාරීව උපන්නෙම් බුදුවූ මම්ම වේදයි වදාළසේක.

SANHIDA LANKA

# චුල්ලධනුද්ධර ජාතකය

තවද සරණාසත වජ්‍රපජරවූ තිලෝගුරු බුදුරජානන් වහන්ස් ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් කෙරේ උකටලීවූ භික්ෂූකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

භික්ෂූකෙණෙකුන් වහන්සේ එක් ස්ත්‍රියක් කෙරේ ලෝභයෙන් උකටළිව වාසය කරණ සෙක්. සර්වඥයන් වහන්සේ එපවත් දැන වදාරා සැබෑද මහණ තෝ ස්ත්‍රියක් කෙරේ ලෝභයෙන් වාසය කරන්නේදැයි විචාළ කල්හි සැබැව ස්වාමිනි දැන්වූ කල්හි මේ ස්ත්‍රිය කෙරේ ලොභ කළේ තොප දැන්මතු නොවෙයි පළමුත් මූ තුමූ තාපට අනර්ථව සිටියෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි ගන්ධාර දේශයෙහි තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට බ්‍රාහ්මණ කුමාරයෙක් ගොස් සියලු සිල්ප ඉගෙණ ඉනුත් ධනුශ්ෂිල්පය නිමවා උගත. දිසාපාමොක් ආචාරී සමාධිව බ්‍රාහ්මණ කුමාරයන්ට චුල්ල ධනුද්ධර කුමාරයෝ යයි නම් තබා තමන්ගේ වැඩිවිය දුවනියන් පාවා දුන්හ. චුල්ලධනුද්ධයෝ තමන්ගේ බිරින්ද කැඳවාගෙණ මාවතෙක යන්නාහු  වනාන්තරයකට පැමිණියාහ. ඒ වනාන්තරයේ ත්‍රිමදගලිත හස්තියෙක් ඇත. ඒ හස්තියා ධනුද්ධරයන් දැක දිවගෙණ ආය. චුල්ලධනුද්ධරයෝ පඤ්චායුධ සන්නද්ධව ඊ දඬු පන්සියයකුත් ඇරගෙණ යන්නාහු හස්තියා දිවගෙණ එන්නා ඊ දණ්ඩක් ඇදපියා ඇරගෙණ විද්දාහු වාත කුඹයෙන් වැද පළවා ඇතා එතනම එලා නික්මුණු කලට, අනික් වනාන්තරයක සොරුන් පන්සියයෙක් දඩමස් මරා පුළුස්සා කනකලට චුල්ලධනුද්ධරයෝ එතනට පැමිණ තමන් බිරින්දට කියන්නාහු දඩමස් පුළුස්සා කන මිනිසුන් උන්තැනට ගොස් දඩමස් ඉල්වාගෙණ එවයි කීයා යවුහ. ඒ කියන සොරු පිලිස්සු දඩමස් නොදී අමු මාංශාදී යවුහ. චුල්ලධනුද්ධර කුමාරයෝ අමු මාංශ දැක කියන්නාහූ පිලිස්සු මාංශ නොදී අමු මාංශ දුන්නේ අප කෙරේ කනස්සළු වෙන්ද? යි කියා දෙවෙනිව බිරින්ද අත අමු මාංශ යවන්නා සොරු පන්සියය කෝපවන ඉන් එකෙක් අප පන්සියය වෙහෙසයි දැයි කියා කෝපයෙන් දිවුවාවූ චුල්ලධනුද්ධරයෝ එකින් එකාට සොරු පන්සියය එකක් අඩු ඊ දඬු පන්සියයෙන් විද එලුහ. සොරුන් නායක තැනැත්තේ ඉවත්ව සිට අවුත් චුල්ලධනුද්ධරයන් අල්වාගත සොරදෙටුවා හා චුල්ලධනුද්ධරයන් හා උනුන් කා සොරා යට කොට ඔබා ගෙණ චුල්ලධනුද්ධරයෝ සොඳූර කඩුව දිලවයි අත්දික්කොට ලන්නා සොරාට කඩුමිටදී චුල්ලධනුද්ධරයන්ට කොපුව දීලුහ. සොරා චුල්ලධනුද්ධරයන් ඉස කපා මරා යන්ට නික්මුනු කලට ගඟක් සමීපයට පැමිණියාහ. සොරදෙටුවා සිතන්නේ බාල කල පටන් පරණ පුරුදු පුරුෂයා මරවා මා කෙරේ ලොභකළාය. ඉදිරියේ අනික් පුරුෂයෙකු දුටත් මටත් මේ කාරණ මානයයි සිතා මෑගෙන් සට ප්‍රයෝජන නැතැයි මා මෙතනම ඇරපියා යෙමි සිතා සොඳූර තොප ඉනතුබූ ඉනකඩින් තොප පලන් ආභරණ ගලවා බැඳ දිලන්න එතර තිබා අවුත තොප කැඳවාගෙණ යෙමි කියන්නා යහපතැයි ඒ නියාවට තමා ඉන තිබූ ඉනකඩෙහි තමා පලන් ආභරණ ගලවා බැඳ දිලන්නා සොරදෙටු ඇරගෙණ ගඟින් එතරපීනා ගොස් යන්ට ආකාර දක්වා ලීය. ස්ත්‍රිය කියන්නී ඇයි ස්වාමිපුත්‍රයාණෙනි මා ඇරපියා නික්මුනු නියාදැයි කියන්නා තොපගේ පරණ සමණන්ට කළදෑ දුටුකල මට තමාම වේද තීගෙන් මට ප්‍රයෝජන නැතැයි කියා නික්මුණාහ. ස්ත්‍රී ගඟ සමීපයේ බැද්දේ උන්නීය. ශක්‍රයෝ මෙපවත් දැන පංචසිඛයා හා මාතලී දිව්‍යපුත්‍රයා කැඳවා කියන්නාහූ අසවල් ගඟ සමීපයේ උන් ස්ත්‍රී වෙහෙසන්ට උවමැනවැයි කියා පංචසිඛයා උකුසුවෙසක් හා මාතලී දිව්‍යපුත්‍රයා මත්ස්‍ය වෙසක් හා ශක්‍රයෝ තුමූ කැනහිල් වෙසක් මවාගෙණ කටින් දඩමස් කැටියක් ඩැගෙණ මම ගඟ සමීපයේ වෙරළ ගාවා යෙමි පංචසිඛය තොපි උකුසුවේසයෙන් ආකාශයෙන් ඇවිදුව මාතලිය තොපි මත්ස්‍ය වේසයෙන් මා යන ඉදිරියට දියෙන් ගොඩ පැනපියව මම කට තිබූ මාංශය දමා මත්ස්‍යයා ඩැගන්ට යෙමි පංචසිඛය තෝ උකුසුවේසයෙන් මා දමු මාංශ කැටිය ඩැගනුව මාතලිය තෝ මත්ස්‍ය වේසයෙන් දියට පැන පියවයි කියා තුන්දෙන අවුත් ඒ ස්ත්‍රිය සමීපයෙහි පෙණගියාහ. කැනහිල් මාංශ කැටියක් ඩැගෙණ ගඟ සමීපයේ ගොඩ අසල යන කලට මත්ස්‍යයෙක්  දියෙන් ගොඩට පැනපිය. උකුසු මාංශකැටිය ඩැගත එකියන සිඟාලයා මත්ස්‍යයාත් නොලැබ මාංශකැටියත් නොලැබ වික්ෂෙපව ගඟ සමීපයේ උන් ස්ත්‍රීයගේ මුන බල බලා සිටියේය. එවිට එකියන ස්ත්‍රී මහත් කොට සිනාසීපුවාහ. ඊට ශක්‍රයෝ කියන්නාහු මෙතන නැවිමක් ගී කීමක් කෙළිනළුවක් නැතිව මහත් කොට අස්ථානයේ සිනාසුනුයේ කිම්දැයි විචාළේය. එවිට ස්ත්‍රිය කියන්නි තොප කටින් ඩැගෙණ ආ මාංශ කැටිය මත්ස්‍යයා කම්යි කටින් දමා මත්ස්‍යයා ඩැගන්ට ගියකලට මාංශකැටිය උකුසු ඩැගත. මත්ස්‍යයා දියට

SANHIDA LANKA

පැනපීය, මේ කාරණය දැක සිනාසිමි කීව. එවිට ශක්‍රයෝ කියන්නාහු තොපි මට සිනාසෙන්ට කාරණ කිම්ද තොපගේ පළමු පිසවා කෑ සමුණනුත් නැතිව අළුත් සමුණනුත් නැතිව උභය භ්‍රෂටව ඉඳිනා තොපි මට නින්දා කියා සිනාසෙන්නේයයි ශක්‍රයෝ නින්දාකොට බිනූහ. ඊට ස්ත්‍රි කියන්නි පළමු මෙසේවූ කටයුත්ත කොට මෙසේ වූ දුක්කට පැමිණියෙමි ඉනිබ්බේ පතිව්‍රතා ධර්මය විනා මෙසේවූ දෙයක් නො කරමි කීව, ශක්‍රයෝත් පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ චුල්ල ධනුද්ධර ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර උකටලී භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක. එසමයෙහි චුල්ලධනුද්ධර යෝ නම් මේ භික්ෂුහුය. එසමයෙහි ස්ත්‍රී නම් මේ ස්ත්‍රීමය එසමයෙහි ශක්‍රව උපන්නෙම් බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# කපෝත ජාතකය

තවද කරුණාවට ආකාරවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ලෝභී භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

ලෝභී භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේට පානා සැබෑද මහණ තා ලෝභීව වාසය කරන්නේ යයි විචාළ කල්හි සැබෑව ස්වාමිනි මං ලෝභීව වාසය කරන්නේයයි කීය. සර්වඥයන් වහන්සේ එපවත් දන වදාරා දන්මතු නොවෙයි පළමුත් ලෝභීව බොහෝ දුඃඛයට පැමිණියෝයයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ පරෙවි ව ඉපද බරණැස් සිටානන්ගේ මුළුතැන් ගෙයි අරක්කැමියා පක්ෂීන් පිණිස සාල්ලක් ඉදිකොට බැඳ එල්වාලීය. බෝධි සත්වයෝත් ඒ සාල්ලෙහි වාසය කරන්නාහ. එතනට කවුඩෙක් අවුත් බෝධිසත්වයෝත් ඒ සාල්ලෙහි වාසය කරන්නාහ. එතනට කවුඩෙක් අවුත් බෝධි සත්වයන් හා එක්ව වාසය කෙරෙමි යි කියා එක්ව වාසය කරන්නේය. එක් දවසක් මුළුතැන්ගට බොහෝ දඩ මස් ගෙනාහ. ඒ දඩමස් කවුඩු දැක ඒ මාංශ ලෝභයෙන් කොයිත් නොගාසින් ඉඳ බොහෝ දුක්විඳිනේය. බෝධිසත්වයෝ ගෝචර භූමියට යන්නාහු තොපිත් ගොදුරුකන්ට එව එක්වයම්හයි කීහ. කවුඩු කියන්නේ ඊයේ මා කෑ ගොචර අජීර්ණව තිබූ හෙයින් මම ගොදුරු කන්ට නොයමි ස්වාමිනි නුඹ වහන්සේ වඩිනේ යහපතැයි කීය. යහපතැයි කියා බෝධිසත්වයෝ ගෝචර භූමියට ගියාහ. කවුඩු ගාථාවකින් කියන්නේ අසත්පුරුෂවූ පරෙවිය මෙතනින් පලාගියේ යහපතැයි මාගේ අභිප්‍රානුකූල පරිද්දෙන් මාංශ අනුභවකෙරෙමි යි සිතා උන්කලට අරක්කැමි දඩමස් විශේෂ කොට පිස නිවෙන්ට මුඩම්වල ලා තිබු තමාගේ ශරීරයේ දාහ නිවන නියායෙන් දොර ගොසින් සිටියේය. කවුඩු අරක්කැමියා දොරට පලාගිය නියාව දැන මුඩම මතුපිට උන්කලට මුඩම ක්‍රිං යන ශබ්ද විය අරක්කැමි ඒ ශබ්දය අසා මුළුතැන්ගෙට  වැද බැළුකලට කවුඩු මුඩුම පිට උන්නේය. අරක්කැමි කවුඩා අල්වාගෙණ ශරීරයේ ලෝම උදුරා මුදුනේ කුඩුම්බියක් තිබා ශරීරයේ මිරිස් එනු දුරු සිධිගුරු ආදීවූ දාහදෙය ගල්වා කිලෝගෙණගලා කැබිලිත්තක් විද කරබැඳ එල්වා සාල්ලට දැමිය. බෝධිසත්වයෝ ගොදුරු අනුභවකොට අවුත් කවුඩානන් වැදහොත් සැටිය දුක කවුඩානන් ලජ්ජාකරණ පිණිස කියන්නාහු කොක්ධේනුව අපගේ කවුඩානන් වාසය කරණ තැන තොප වාසයකරන්ට කාරණා නොවෙයි කියන්නා එවිට කියන්නේ සබඳ මට මෙසේවූ දුකක් පැමිණි තිබූ ගමනේ නුඹ වහන්සේ මට නින්දාකරන්ට කාරණා නොවෙයි කියන්නා බෝධිසත්වයෝ කියන්නා තොප ශරීරයේ සඳුන් ගාගෙණ පලඳනාවකුත් පැලඳගෙණ අවුත් උන්හෙයින් කොයිරට ගොසින් ගෙණා පලඳනාවෙක් දෝහොයි සිතා කී පමණක් විනා තොපට වෙහෙසන්ට නොවෙයි කීහ. එවිට කවුඩු කියන්නේ මේ මාලාවත් පලඳනාවත් මේ ශරීරයේ ගෑ හඳුනුත් නුඹ වහන්සේගේ පසමිතුරන්ටත් නොවේවයි කියා කෙඳිරි ගගා වැදඹත් තැනැත්තවුගේ ප්‍රාණය නිරුද්ධව ගියේය. බෝධිසත්වයෝ කියන්නාහු අප මෙතන ඉදිමෙන් සැකවෙයි කාරණාවෙයි කියා ඔබ්බට  ගොසින් වාසය කළාහයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ කපෝත ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යය දේශනාවගේ කෙළවර ලෝභී භික්ෂූන් වහන්සේ සෝවාන් වුසේක. එසමයෙහි කෘෂ්ණ කවුඩා නම් මේ භික්ෂූහුය. එසමයෙහි පරෙවිව උපන්නෙම් බුදුවූ මම් ම යයි වදාළසේක.

SANHIDA LANKA

# ආචාරි ජාතකය

තවද දහම්ලයැති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් එක් නැවියෙකු අරහයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් භික්ෂු කෙණෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේ අද දවස් මා දුටුව මැනවැයි යන සිතින් අවුදින් අචිරවති ගංතෙරට පැමිණ තොටියාට කියන සේක් එම්බල මම සර්වඥයන් වහන්සේ දක්නා අභිප්‍රාය ඇතිව යෙමි. වහා එතර කරවයි කී කල්හි ඒ තොටියා කියන්නේ නුඹ වහන්සේ මේ වෙලේ වඩින්නේ කිම්ද උදෑසන වැඩිය මැනවැයි කී කල්හි මෙතන මා සැතපෙන තැනක් නැත, වහා මා එතරකරවයි කී කල්හි තොටියා කිපී උන් වහන්සේ නැවට නන්වා ගෙණ තොටට නොවැද උන් වහන්සේගේ සිව්රුත් තෙමා කල්යවා තොටින් එතර කළේය. උන්වහන්සේ වහාරයට ගොස් රැවු හෙයින් සර්වඥයන් වහන්සේ නොදක දෙවැනි දවස් සර්වඥයන් වහන්සේ වැඳ එකත්පස්ව සිටිසේක. සර්වඥයන් වහන්සේ වදාරණසේක් ඇයි භික්ෂුවෙනි කවද අවුදැයි විචාළ කල්හි ස්වාමිනි ඊයේ ආමි යී කීසේක. එබස් අසා සර්වඥයන් වහන්සේ වදාරණසේක් ඊයේ අප නුදුටුයේ ඇයිදැයි විචාළකල්හි භික්ෂූහු කියනසේක් ගංතොට පදිනා තොටියා ගඟ පාතට ඔරුව පැද සිවුරු තෙමා මෙතර කළ හෙයින් සිවුරු වියලාගන්නා පිණිස ඊයේ දකින්ට නුවූයේය යි සැලකළ කල්හි සර්වඥයන් වහන්සේ වදාරණසේක් එම්බා, මහණ තොටියා තොපට මතු නොවෙයි ගහට කළේ. පෙර උත්තමයන්ටත් ගහටකළේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ හිමාලය වනයෙහි තපස්ව වාසය කරන්නාහූ ලුණු ඇඹුල් සපයා බරණැස් නුවරට අවුත් උයනේ වාසයකරන්නාහ. රජ්ජුරුවෝත් තාපසයන් ලඟට උයනට අවුත් දකිනාහ. ගියවිට දවස්පතා අවවාද කියන විට භූමිපාලොත්තමවූ රජජුරුවන් වහන්ස කාටත් නොකිපුණ මැනව. කා කෙරෙත් කෝපයක් නොකළ මැනව, එසේවූ කෝප නොවන්නාවූ රජ්ජුරුවන්ගේ යසස සදිසාන්තයේ පූජ්‍යවන්නේය යි කීහ. තවද ග්‍රාමයෙහිද නැවත වනයෙහිද ජලයෙහිද භූමියෙහිද යන සියල්ලෙහිම මෛත්‍රියක් මිසක් කෝපයක් රථොත්තම වූ රජ්ජුරුවන් වහන්සේ කා කෙරෙත් නොකළ මැනවැයි මේ නියායෙන් දවස්පතා රජ්ජුරුවන්ට අවවාද කරන්නාහ. රජ්ජුරුවෝත් තාපසයන් කෙරේ පැහැද ලක්ෂයක් නිමන ගමක් දුන්නාහ. තාපසයෝ නොයිවසූහ. දොළොස් අවුරුද්දක් උපස්ථාන කළාහ. තාපසයෝත් එතන රඳන්ට කලකිරි රජ්ජුරුවන්ට කීවොත් යානොදෙති. උයන්ගොව්වාට කියා සැරිසරා ඇවිදිමියි උයනින් නික්ම පළාගියහ. යන්නෝ බරණැස් නුවර ගඟ සමීපයට ගියාහ. ඒ ගඟ මිනිසුන් ඇත් මැත් කරන්නාවූ අපරිමාතු නම් නැවියා අඥාන එකෙක මිනිසුන් ගඟ එතරකළ කල එතරදී මිලදෙම්මැයි කියා එතරගොස් මිල නොදී පලායන්නාහ. මෙයින් මිල නොලදින් දුර්වලව ඉන්නේය. බෝධිසත්වයෝත් ගඟ අසල සිට මා එතර ලවයි කිහ. මට කුමන මිල දෙව්දැයි විචාළේය. තොපට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කෙරෙමියි කීහ. එවිට නැවියා ඒ වස්තුවෙක් දෝහෝයි සිතා තාපසයන් ගඟින් එතරලා මට වස්තු දෙවයි කීහ. තාපසයෝ කියන්නාහූ වනයෙහිම සියල්ලෙහිම මෛත්‍රී කරවයි අවවාද කියා තොපි මිනිසුන් එතරලා ගන්නාහෙයින් වේද මිල නොදී යන්නේ එතරදීම මිල ඇරගෙණ විනා මිනිසුන් එතර නොකරවයි අවවාද කීහ. එවිට නැවියා තොප මට දෙන වස්තු මේ දැයි කියා තාපසයන් අල්වාගෙණ මූනට ඇන්නේය. රජ්ජුරුවන්ට අවවාද කියා ලක්ෂයක් නිමන ගමක් ලද්දාහ. අස්ථානයේ කටයුතු නො දක්නාවූ මුර්ඛයාට අවවාද කියා ඇනුන් ලද්දාහයි සර්වඥයන් වහන්සේ වදාළසේක. ඒ නැවියාගේ අඹු ඇවිදින් ඇයි තෝ කුමක් කෙරෙයිද රජ්ජුරුවන් වහන්සේට කුලුපග තාපසයන් වහන්සේට උන් වහන්සේ කුමට මරව් දැයි කීව්. එවිට තාපසයන් ඇර අඹු මැරීය. අඹුවගේ බඩ දරු ගර්භය වැටී අඹුව මළාය. එවිට එතන සිටියෝ මිනීමරු තැනැත්තේය යි නැවියා බැඳගෙන ගොස් රජ්ජුරුවන්ට පෑවාහ. රජ්ජුරුවෝත් නැවියාට අඥානකර වුවයි සර්වඥයන් වහන්සේ වදාරා අඥානව තාපසයන් කී අවවාද නොගිවිස තමාගේ පුතුන් නොලැබ අඹුවන් නොලැබ ආඥා වීන්නේය යි වදාරා මේ ආචාරී ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි නැවියා නම් මෙසමයෙහි නැවියා මය. බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථිවිරයෝය, තාපසව උපන්නෙම් බුදුවූ මම් ම යි වදාළසේක. මේ දේශනාවසානයේ භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක.

SANHIDA LANKA

# සේවතකෙතු ජාතකය

තවද දෙව්බඹුන් මුදුනෙහි කෙළනා පාපියුම් ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් භික්ෂූන් කෙනෙකුන් වහන්සේ වඤ්චා ප්‍රයෝගයෙන් දවස් අරිණසේක. සෙසු භික්ෂූන් වහන්සේලා ඒ භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේට දක්වූ සේක. සර්වඥයන් වහන්සේ සැබෑද?. මහණ වඤ්චා ප්‍රයෝගයෙන් දවස් අරිතේ යයි විචාරා සැබෑව යනු අසා දන් මතු නොවෙයි මහණෙනි පෙරත් මේ මහණ වඤ්චා ප්‍රයෝගයෙන් දවස් හැරියේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර මහාප්‍රතාප නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුරෝහිතව ඉපිද පන්සියයක් අතවැස්සන්ගෙන් ශෙවතකෙතු නම් බ්‍රාහ්මණයෙක් ඇත, ඒ බ්‍රාහ්මණයා වංශවත් හෙයින් මානී ව ගර්වයක් ඇතිව වාසය කරන්නේය. එක් දවසක් බ්‍රහ්මණයා වීථියේ යන කලට චණ්ඩාලයෙක් ඉදිරියට එන්නේය. ඒ බ්‍රාහ්මණයානෝ තෝ කවරෙක්දැයි විචාරා මම චණ්ඩාලයකැයි යනු අසා තෝ චණ්ඩාල යෙක් වීනම් වහා යටිසුලඟට පලායවයි කීය. එයින් මේ මා කීව එකෙකැයි සිතා උඩුසුලඟින් ගියේය. බ්‍රහ්මණයාත් වහ වහා උඩුසුලඟින් ගොස් සිටියේය. එවිට චණ්ඩාල කියන්නේ නුඹගේ මේසේම මා කෙරේ ගර්ව කාරණා පසු මා විචාළ ප්‍රශ්නය කිව මැනවැයි කීහ. එවිට බ්‍රාහ්මණයා කියන්නේ ඇයි චණ්ඩාලය තා කී ප්‍රශ්නය කිය නොහෙම්දැයි කිවයි කීහ. එවිට කියන්නේ කියාගත නුහුනුවෝ නම් මාගේ යට පස්සෙන් යන්නේදැයි කීය. බ්‍රාහ්මණ කියන්නේ තාගේ ප්‍රශ්නය නොකියෙන් නම් යට පස්සෙන් යෙමි කියා. එවිට චණ්ඩාල කියන්නේ දිසාව කවරේදැයි විචාළේය. බ්‍රාහ්මණ කියන්නේ සතර දිගය සතර අනුදිගය යන මේ දිශා නමැයි කීය. එවිට චණ්ඩාල කියන්නේ මෙච්චරත් දැනගත නොහෙන්නා තොපිද ගර්වකරන්නේ යයි ඉස අල්වාගෙණ ගමාගේ පය අස්සෙන් කර අල්වා දැමිය. ඒ දුටු බොහෝ මනුෂ්‍යයෝ එපවත් පුරෝහිත බ්‍රාහ්මණයාහට කිවාහුය. සෙවතකෙතු බ්‍රහ්මණයා දැක සැබැද බ්‍රහ්මණය. තා ඉස අල්වා චණ්ඩාලයා තමාගේ පයට පස්සෙන් යවුයේදැයි විචාරා සැබෑව යනු අසා එම්බල බ්‍රහ්මණය චණ්ඩාල උවත් නුවනැත්තන් කෙරෙහි නින්දා කිරීම කටයුතු නොවෙයි ශාස්ත්‍රය නම් එක් කෙණෙකුන් නම් දනිති කියාත් නැත. ශාස්ත්‍රය නිමවා දැනගතහැකි දෙයක් නොවෙයි දිශාව නම් දෙමාපියන්ම ඇතිව උත්පත්තිනි වන හෙයින් පූර්වදිග නම් තමාගේ ආචාරී ගුරුවරයන් වසනා දිග දකුණුදිග නම් වෙයි. දාන ශිලාදී ගුණයෙන් යුක්තවූ සත්පුරුෂයන් වාසය කරන්නාවූ තැන් එක් දිගෙක් වෙයි. නුවනැත්තාවූ සත් පුරුෂයන් වසන්නාවූ තැන් එක් දිගෙක් වෙයි. කියා මේ ඇමට වඩා නිවනට යන්නාවූ මර්ගයම ඇති දිග ප්‍රධාන වන්නේයයි කීහ. එවිට බ්‍රහ්මණයාත් මේ පුරෝහිතයානන් මෙසේ චණ්ඩාලයකු මට නින්දා කළ කලදී බැන නොනැගී උන්නේය. මුන් ලඟ නොරඳමියි තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් ලඟට ගොස් ශිල්ප ඉගෙණගෙන බරණැස් නුවරට එන්නාහු අතරමග තාපසවරු ඉන්නා පන්සලට වැද ඒ තාපසවරුන්ට නායකව ඒ තාපසවරුන් ඇර ගෙන බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ගේ උයන සැතපී තාපසවරුන් උදැසන නුවරට සිඟා ගියාහ. රජ්ජුරුවෝත් තාපසවරුන් දැක සමාධිව තමන්ගේ උයනේ වාසය කරණ නියායෙන් සැලැස්වූහ. එක් දවසක් රජ්ජුරුවන්ගේ අභිප්‍රාය දැනගත්තොත් ඇතිතෙක් දවසට ජීවත්වන්ට පුළුවනි. එසේ හෙයින් රජ්ජුරුවන් එන වෙලාවට කණ්ඨක තපස් වවුල් තපස් උක්කුටික තපස් පඤ්ච තාප තපස් ආදීවූ තපස්රකුවයි විධාන කොට තුමූ කීකරු යාපත් තාපසවරුන් පස්දෙනෙකු තමන් සමීපයේ ඉඳුවා යාපත් දණ්ඩාසනයක් ඉදිරියේ තබා ඒ මත්තෙහි වර්ණයෙන් සිතියම් කරණ ලද වසා ලැලී ඇති පොතක් තුමූ බල බලා තාපසවරුන් පස්දෙනාට ප්‍රශ්න කිය කියා උන්හ. ඒ වෙලාවට රජ්ජුරුවෝ අවුත් තාපසවරුන්ගේ වෙන වෙනම ව්‍රත ත් දැක තාපසයන් සැලැස්මත් දැක සමාධිව මෙසේවූ තපස් කරන්නාවූ තාපසවරුන්ට මතු යහපත් විපාක වන්නේ වේදැයි පුරෝහිත බ්‍රහ්මණයානන් අතින් විචාළහ. පුරෝහිත බ්‍රාහ්මණයානෝ කියන්නාහු මෙසේවූ තපස්කරන්නාවූ තාපසවරුන්ට මින්මතු වන්නාවූ විපාකයකුත් නැත. මින්වන ඵලයකුත් නැතැයි කීය. එවිට තාපසයෝ කියන්නාහු විපාකයක් නැති කල අෂ්ටදශ ශිලයෙන් ද චතුර්වේදයෙන්ද කිසි ප්‍රයෝජනයක් නැති කල මහා බ්‍රහ්මයා විසින් මේ ශාස්ත්‍රය ඇති කරන්නට කාරණා කිම්ද පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති විනා සෙසු දෙයකින් ප්‍රයෝජන නැද්දැයි කීය. එවිට පුරෝහිත බ්‍රාහ්මණයානෝ කියන්නාහු තොප කෙතෙක් කීවත් තොපගේ ශාස්ත්‍රයෙන් මෙලොව විනා පරලොවින් කිසිම ප්‍රයෝජනයක් නැත. මුන්පන්සියකගේ අඳුන් දිවිසම ජටාමඩුළු අරවා අභ්‍යන්තර සේවාකමට

SANHIDA LANKA

සලස්වා වදාළොත් යහපතැයි රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් පුරෝහිත බ්‍රාහ්මණයා කීවාසේම තාපසවරුන් පන්සියය සේවා කමට සලසාගෙණ ආයුධ දීගණ වැසි රැකවලැයි කියා සැලසිනැයි දතයුතු. එතැන් පටන් ඒ තාපසවරු පන්සියය රජ්ජුරුවන්ට සේවාකම් කළහයි වදාරා මේ සේවතකෙතු ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි චණ්ඩාලයා නම් ශාරිපුත්ත ස්ථවිරය. සේවතකෙතු බ්‍රාහ්මණයා නම් වඤ්ඤා භික්ෂුහුය. පුරෝහිත බ්‍රාහ්මණයානන්ව උපන්නෙම් බුදුවූ මම් ම යයි වදාළසේක.

SANHIDA LANKA

# දරිමුඛ ජාතකය

තවද ලොවට සෙනහ ඇතිවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මහබිනික්මන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් දවසක් දම්සභා මණ්ඩපයේ රැස්වූ මාළුවරුන් වහන්සේ මේ නියා රාජ්‍යශ්‍රීයක් හැර මහබිනික්මන් කළ නියාව ඉතා යහපත ආශ්චර්යයෙකැයි කිය කියා උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි විචාරා එපවත් දන මහණෙනි දැන්මතු පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි විචාරා එපවත් දන මහණෙනි දැන්මතු නොවෙයි පළමුත් උත්තමයෝ රාජ්ජශ්‍රිය හැර මහණවුවෝ වේදූයි වදාරා ඒ කෙසේදූයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුත්ව උපන්නාහ. එකියන රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයානන්ගේ පුතනුකෙණෙකුන් ඇත්තාහ. එ කියන බ්‍රහ්මණ කුමාර විශිෂ්ටවූ රූප ඇති සොභාමත්වූ මුඛශ්‍රියක් ඇති හෙයින් දරිමුඛ නම් බ්‍රාහ්මණ කුමාරයත් බරණැස්න  රාජකුමාරයෝත් දෙන්නම් එක්ව වැඩී දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් ශාස්ත්‍ර ඉගෙණ බරණැස් නුවරට එන අවස්ථාවට බරණැස් රජ්ජුරුවෝ මළහ. රාජ කුමාරයෝත් බමුණුකුමාරයත් දෙන්නා ශාස්ත්‍ර ඉගෙණ භික්ෂාටනය කොට ගෙණ බරණැස්නුවරට අවුත් ගෙයකට වන්කලට එ 'ගෙයි එක් මැලි ස්ත්‍රියක් දෙන්නා දක චතුර්වේදයෙහි නිපුන නියාව දන පුටුදෙකක් තනාලා එක් පුටුවෙක සුදුකඩක් හා එක්පුටුයෙක රත්කඩක් හා අතුට ඉන්ට කිව. බ්‍රාහ්මණ කුමාර රජ්ජුරුවන්ට අද රාජ්ජය පැමිණෙයි මට සෙනවිරත් ධුරය පැමිණෙයි නුවනින් දන බ්‍රහ්මණ කුමාරයා රාජ කුමාරයන්ට සුදු ඉනකඩ අතුළ පුටුවඳී තුමු රතු ඉනකඩ අතුළ පුටුවේ උන්නේය. ඒ ගෙය මැලි ස්ත්‍රී බත් මාළු ඉදිකොට දෙන්නා බත් කැවුහ. දෙන්නා බත්කාලා මගුල් උයනට ගොස් රාජකුමාරයෝ මගුල් උයනේ සලවට පිට ඉනමඩ ඉසවසාලාගෙන වැදහොත්තාහ. බ්‍රහ්මණ කුමාර රාජකුමාරයන් ගාවා උන්නේය. බරණැස් නුවර වාසීහු පුස්සරථයසරහා නුවර අළහ. පුස්සරථය නුවර ප්‍රදක්ෂිණාකොට ගෙණ මගුල්උයනට ගොසින් රාජකුමාරයන් වැදොත් මගුල් සලවට පාමුල පුස්සරථය සිටියේය. බ්‍රාහ්මණකුමාර රාජකුමාරයන් පුබුද්දන්නා රාජකුමාරයෝ පිබිද මගුල්සල වට පිට ඉඳ කිමෙක්දූයි විචාළාහු නුවර වාසීහු ස්වාමිනි අපගේ රාජ්ජය කළ මැනවයි මේ නුවර රජ්ජුරුවන් වහන්සේ මළසේකැයි කියන්නා බෝධිසත්වයන් එපවත් අසා මේ නුවර රජ්ජුරුවන්ගේ රාජකුමාර කෙණෙක් රාජකුමාරී කෙනෙක අනැද්දූයි විචාරා නැතැයි අසා යහපතැයි ගිවිස්සාහ. බ්‍රාහ්මණකුමාර රජ්ජුරුවෝ රාජ්ජය කෙරෙති. මා සෙනවිරත් ධුරයේ සලසති. ඉන්මට ප්‍රයෝජන කින්දැයිසිතා ඉවත්ව සිටි කලට රාජ කුමාරයෝ රථයට නැගී බරණැස් නුවරට ගියපසු බ්‍රාහ්මණ කුමාර මගුල්උයනේ ඉඳ විලිසවැගිරගිය පතක් අතට අරගෙණ ඉඳ මේ පත්‍රය පළමු අංකුර පත්‍රයයි. පසු මූකළාවූ පත්‍රයය, දැන් ජිණිවග්ග පත්‍රයය, එසේහෙයින් සියළු සංස්කාරම අනිත්‍යයයි කිය කියා භාවනා කොට සිටිකලට පොළොව ගුගුරුවා සියළු කෙලශයන් නසා පසේ බුදුබවට පැමිණියේය ආකාශයෙන් තුන්සිවුරු පාත්‍ර අවුත් ශරීරයේ වැලඳගත පළමුශරීරය අන්තර්ධාන විය. පසේ බුදුවූ ශරීරයෙන් ආකාශයෙන් ගන්ධමාන පර්වතයට වැඩිසේක. රජ්ජුරුවෝ බරණැස් නුවර රාජ්ජයට පැමිණ සතළිස් අවුරුද්දක් බ්‍රාහ්මණ කුමාරයන්සඳහන් නැතිව ඉඳ මාගේ දරිමුඛ නම් බ්‍රාහ්මණ කුමාරයා කොයිදූයි සඳහන්කොට පරීක්ෂා කරන්නට උවමැනවැයි  කියා දසඅවුරුද්දක් පලාගියේය. එක්ව පණස්අවුරුද්දක් ගියකලට දරිමුඛ නම් පසේ බුදුන්වහන්සේ සිතනසේක් මාගේ මිත්‍රවූ බරණැස් රජ්ජුරුවෝ මා කොයිදූයි දක්නා අභිප්‍රාය ඇත්තෝය. මෙවක් පටන් රජ්ජුරුවන්ට වයසුත් මුහුකුරා දරුමල්ලනුත් ඇතිව වයස්මුහු කුරාව ගියේය. මාකී අවවාද ගිවිසතී මෙවිට ඔබ යෙමිසිතා බරණැස් නුවරට අවුත් මගුල් උයනේ දරිමුඛනම් පසේබුදුන් වහන්සේ වැඩඋන් කලට රජ්ජුරුවෝ උයන්ගොව්වා අතින් අසා දරිමුඛ නම් පසේ බුදුන් වහන්සේ කරා අවුත් වැඳ එකත්පස්ව උන්නාහ. පසේබුදුන් වහන්සේ රජ්ජුරුවෙනි දැහැමින් සෙමේන් රාජ්ජයකරව්දූයි විචාරා වදාර ඉක්බිති පසේ බුදුන් වහන්සේ පළමුවන ගාථාව වදාළසේක.

SANHIDA LANKA

ලෝකයෙහි යම් සත්වකෙණෙක් දියපීනන්නාවූ වැව් පොකුණු ගන් හෝ ආදියෙහි හටගත්තාවූ නෙළුම් ඇඹුල උපුල සෙවෙල් ආදියෙම් ගොඩනැගීයා නොහෙද්ද. තවද යම්සේ සණ මඩෙහි එරුණාවූ මෘගසුනබාදීහු නැගියා නොහෙද්ද එපරිද්දෙන් මේ සංසාරයෙහි ඇවිදිනාවූ වස්තුකාම කෙළෙශකාම නමැති හෙද්ද එපරිද්දෙන් මේ සංසාරයෙහි ඇවිදිනාවූ වස්තුකාම කෙලශකාම නමැති තෘෂ්ණා ශෛවලාදියෙහි ලග්නව සංසාර පංකයෙන් නැගී ස්වර්සමෝක්ෂාදියට පැමිණ යා නොහෙන්නාහ. තවද වස්තු කාම කෙලශකාමයෝ ලොභ වේෂ මෝහ යන ත්‍රිකරණා ත්‍රියුග්මුල්ලය යන පවත්නාහෙයින් සසර සිටිනා සියළු සත්වයෝ ස්වර්ගමෝක්ෂාදීයට පැමිණියා නොදි අපායෙහිම නැවත කරකවා එලන හෙයින් බලවත්වූ භයංකාරද වන්නේයයි බුද්ධාදී මහොත්තමයන් විසින් කියන ලදී. තවද මහරජ වස්තුකාම කේලේශකාමයෝ සුවඳසුනෙන් උලා නහා වස්ත්‍රාභරණාදීන් සැරසී සිට සත්වයාගේ ශරීරයෙහි ස්වභාව ඇසට අටිෂයවූ රජස්ධුලි වැටිමෙන් යම්සේ නිස්සොභාවට පැමිණේද පිරිසිදුවූ සුනුපිරියම් කරණ ලද්දාවූ සුධධාවල ප්‍රකාර යෙහි භිත්ති ආදිය එක්වම් දුම් වැදගැන්මෙන් කිලුටුවේද එපරිද්දෙන් මේ ලෝකයෙහි සත්වයන්ගේ සන්තානයෙහි හටගත්තාවූ කෙලෙස් නැමති රජස් ඒ ඒ සත්වයා විසින් පැමිණෙන ලද මාර්ගඵලාදියෙන් පිරිහෙලා නිස්සෝභා කරන්නේය. තවද ධ්‍යාන මෝක්ෂාදින් පිරිසිදුවූ චිත්තසන්තානය ඇති සත්වයාගේද සන්තානයෙහි හටගත්තාවූ සවල්පමාත්‍රවූද කෙලෙශයම ඒ සත්වයා කිලුටුකරන්නේය කෙලශ නැමති රජස්දූමය මා විසින් තොපට විස්තර වශයෙන් කියන ලදී. ඒ කටයුත්තෙකැයි තොපට සිතෙනම් වස්තුකාම කේලශ කාමයෙන් හැර තපසට යවයි යනාදීන් ධර්මදේශනා කළසේක. ඉක්බිති බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පසේ බුදුන් වහන්සේට ආමන්ත්‍රණය කොට ස්වාමිනි මේ වස්තුකාම කෙලශකාමයෙහි බැඳිනිමියි සක්තවිම් පංචකාම විෂයෙහි ඇලි මූර්ජාවට ගියෙමි. ඒ කාරණයෙන් පස්කම් ගුණයෙන් වෙන්ව ජීවත්ව යා නොහෙමි ගිහිගෙයි සිට දානාමානාදීන් බොහෝ කුසල් රැස්කෙරෙම්හයි මහණව තපස් රක්ෂා කළ නොහෙමි කීහ. දිපංකරපාදමුලයෙහිදි  තුන්වෙනිවූ නෛෂ්ක්‍රමය පාරමිතාව දක කියන්නාහු සුමේධ තාපසයෙනි යම්සේ සිරගෙයි වසාපුකෙණෙකුන කවරදා සිරගෙයින් ගැලවි යන්නෝදෝහෝයි සිතන්නාක්හුමෙන් තොපි මේ සංසාරයෙන් කවරදා ගොඩනැගෙම්දෝහෝ සිතා ඉටාගෙණ බුදුකුරුදම් පුරන්නාවූ බෝධිසත්වයන්ට පවා මෙසේවූ සිතුවිල්ලෙක් උපන. ඒ එසේමය මේ කොලයෙහි උන්මාද අටකින් විසංඥ වන්නාහ.

ඒ කෙසේද යත්.

මෝහයෙන් උපදනාවූ කාම උන්මාදය. අනිෂ්ට විනාස උපදනාවූ ක්‍රොධ උන්මාදය. සංඥාකරවන දර්ශන උන්මාදය. අඥාන භාවයට පමුණුවන මෝහ උන්මාදය. යක්ෂයන් වසඟයට පමුණුවන යක්ෂ උන්මාද චිත්ත අධික බවට පමුණුවන පිත්තෝන්මාදය. පාන වසඟ කරවන සුරා උන්මාදය සෝක අධික වීමෙන් වන ව්‍යසන උන්මාද ය යි කියන ලද උන්මාද අටකින් දීපංකර පාද මූලයෙහි පටන් විවරණ ලත් ඒ උත්තමයානන් වහන්සේට පසේ බුදුන් වහන්සේ විසින් කියනලද්දාවූ අවවාද කාමඋන්මාද හෙයින් මට මහණ වන්නට බැරියයි කී සේක. යම් සත්ව කෙණෙක් හිත පිණිස කිවාලු අවවාද නො ගිවිස්සෝ වී නම් ජාති බොහෝ වෙයි ගෙවිමක් නැත්තේය යි කියා පසේ බුදුන් වහන්සේ වදාරණසේක් මහරජ යම් සත්වයෙක් මව්කුස උපන්නේ වී නම් ඒ සත්වතෙම සංසාර භීරුක වූ යොගාවචර පුද්ගලයා විසින් ඒ කාන්තයේ අසුභය අපවිත්‍ර යයි දක්නාලද මල මුත්‍රයෙන් පිරිසිටිනා සතර අතින් අකිලන සත්මසක් හෝ දසමසක් හෝ උන්තෙනින් නො සෙලවී පිනොක්හි සිඳෙන තලපල මුවක්මෙන්  පැසී දුක් විඳිනාවූ මව්කුස් තිරයෙහි උපන්නේය. මහරජ ඒ මවුකුස් නිරයෙන් බිහිවන්නාවූ සත්වයෝ සිවුඳ ගඳ සුවඳ විලවුන් ගෙන සුගන්ධමාලධාරීව උපන්නාහු නොවෙති. වැලි කෙසේ උපදිද්දැයි යතහොත් පුරාණ ගූථයෙහිම වැකි රුධිරයෙන් ගැනී ඝන බොල් සොලොස්මායෙන් තැවරී බිහිවන්නාවූ එසේ බිහිවන වෙලෙහි මෙබඳූ අපවිත්‍රයෙන් මිශ්‍රවූ කම්ජ වාතයෙන් බැහැර හෙළන ලදුන යතොක්හිලා මිරිකන කලක්මෙන් මහදූක් විඳිමින් කෙසිව්දකින් අඳනා නාඹු ඇත්තක්හුමෙන් සඹාධයෙන් බිහිවීමෙන් දුක් විඳිතොත් විනා සැපයෙක් නම් නැත්තේමය. වස්තුකාම කේලේශකාමයෙහි ඇලුනු  සත්වයාට ගර්භා වක්‍රාන්ති දුක්ඛය වන්නේයයි දෙයාසංඛ්‍ය කල්පලක්ෂ්‍යක් දන්නා නුවන ඇති ප්‍රත්‍යෙකබෝධි ඥානයෙන් දැකම කිම්. අනික් කෙණෙකුන්ගෙන් ඇසීමෙන් කිදෙයක් නොවෙයි යනාදින් දරිමුඛ නම් පසේ බුදුහු විසිතුරු බණ කථාවෙන් විශිෂ්ටවූ නුවණ ඇති බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ට වස්තුකාම කේලේශකාමයෙහි ආදිනව ඇති නියාව කියා ගිවිසූසේක. ඒ නියාවට රජ්ජුරුවන්ට අවවාද කියා මහණ වෙතත්  තොපගේ අභිප්‍රායෙක. අප විසින් සියලු ආදිනව කියා ලුම්හයි කියා ආකාශයට පැන නැගී පස්වනක් වලා මඩිමින් පසේ බුදුන් වහන්සේ වඩිනට වන්සේක. රජ්ජුරුවෝ ආකාශයෙන් වඩිනේ පසේ බුදුන්වහන්සේ දර්ශනාතික්‍රාන්ත වනසේක් බලාසිට බරණැස් නුවර අමාත්‍යයන් ගෙන්වා ගමන් ගේ පුත්වූ බරණැස් රාජකුමාරයන් ගෙන්වා රාජ්ජයට පමුණුවා අමාත්‍යය මණ්ඩලයා ශොකයෙන් අඬ අඬා සිටිද්දී හිමාලය වනයට ගොස් මහණව පඤ්ච ඍද්ධි අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රාහ්මලෝකයෙහි උපන්හයි වදාරා මේ දරිමුඛ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බරණැස් රජව උපන්නෙම් තිලෝගුරු බුදුවූ මම්ම යයි වදාළසේක. මේ දේශනාව කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහ.

SANHIDA LANKA

# නේරු ජාතකය

තවද නිවනට දොරහළුවාවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක්තරා භික්ෂූකෙණෙකුන් වහන්සේ පිටිසර ගමකට වැඩිසේක. පිටිසර එක්තරා පුරුෂයෙක් ඒ භික්ෂූන් වහන්සේ දැක පන්සලක් ඉදිකොට වස්වසමින් ශාස්වත දෘෂ්ටි පරිබ්‍රාජකාවරු ආහ. එතැන්පටන් භික්ෂූන් වහන්සේ කෙරේ ආලිස්සන්ව පරිබ්‍රාජකාවරුන්ට සත්කාර සම්මාන කරන්නට වන. උන් සත්කාර සම්මාන කරන්ට වන්කලට උච්ඡේදවාදීහූ ආහ. එතැන්පටන් ශාස්වතාදීන් කෙරෙහි ආලිස්සන්ව උච්ඡේද වාදින්ට බොහෝ සත්කාර සම්මාන කරන්නට වන. උන්ට සත්කාර සම්මාන කරන්නට වන්කලට අචේලකාදී ආහ. එතැන්පටන් උච්ඡේදවාදීන් කෙරෙහි ආලිස්සන්ව අචෙලකාදීන් කෙරෙහි බොහෝ සත්කරා සම්මාන කරන්නට වන. මේ නියායෙන් උත්තමයා, මධ්‍යය අධසයයි යන තේරීමක් නැතිව සාමාන්‍යයෙන්ම උපස්ථාන කෙළේය. ඒ භික්ෂූන් වහන්සේ වස් තුන්මස එතන රඳා සර්වඥයන් වහන්සේ දුටුසේක. සර්වඥයන් වහන්සේ ඇයි මහණෙනි මෙතෙක්දා කොයි ගියේහිදැයි විචාරා එපවත් අසා මහණෙනි ඒ පුරුෂ උත්තම, මධ්‍යම, අධම යන තුන්පක්ෂය නොදන්නා ගමණ සවර්ණ පර්වතයෙහි උත්තම මධ්‍යම අධම යන පක්ෂින් උන්කලට එක වර්ණ වන්නාමෙමැනිය වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේත.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ සවර්ණහංසව උපන්නාහ. බෝධිසත්වයන්ගේ මලනුකෙණෙකුන් ඇත්තාහ. බෝධිසත්වයන් මලනුවන් වහන්සේ ගොචර භූමියට එන්නේ නේරු නම් ස්වර්ණ පර්වතයෙහි සැතපී එනකලට යන කලට සුදු පැහැය, කළු පැහැය, නිල් පැහැය, ආදිවූ නොයෙක් පැය ඇති පක්ෂි සිවුපාවෝ නේරු සවර්ණ පර්වතය ඡායාවෙහි උන්කලට ඒකවර්ණ වන්නාහ. මින් එක් දවසක් බෝධිසත්වයන් හා මලනුවෝ පර්වත සමීපයට පැමිණ බෝධි සත්වයන්ගේ මලනුවෝ විචාරන්නාහ බෑනන් වහන්ස, සිංහ ව්‍යාඝ්‍රාදී උත්තම සිව්පාවෝත් සිගාලාදීවූ සිවුපාවෝත් සවර්ණ වර්ණ වන්නෝය. අපගේ උත්තම වූ පක්ෂීත් කපුටු ආදීවූ නිචපක්ෂීත් මේ පර්වත සම්පයට පැමිණිකල ඒකවර්ණ වන්නාහ. මට කාරණා කවරේදැයි මේ කිනම් පර්වතයෙක්දැයි විචාළාහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහූ මෙකී පර්වතය නම් නේරු පර්වතය, උත්තම මධ්‍යම අධම යනාදී සිවුපාවුනුත් පක්ෂීනුත් මෙතනට පැමිණ කල ඒකවර්බ වෙයි. අනික් වෙසෙසෙක් නැත්තේයයි කීහ. බෝධිසත්වයන්ගේ මලනුවෝ මේ පර්වතයට නිද්දා වේවායි උත්තම මධ්‍යම අධම යන තුන් පක්ෂය ඒකවර්ණවෙයි. උත්තම මධ්‍යම අධමයෙන් තෝරලිය නොහෙයි. එසේහෙයින් මේ පර්වතයට නින්දා වේවයි වදාරා චතුස්සත්‍ය දේශනාවසානයෙහි ඒ භික්ෂූන් වහන්සේ සෝවාන්වූ සේක. එසමයෙහි බෝධිසත්වයන්ගේ මලනුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි ස්වර්ණහංසව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# අසංඛවතී ජාතකය

තවද සසරට ප්‍රතිපක්ෂ වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය සමයෙහි එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් භික්ෂූ කෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් කෙරේ උකටලීවූ සිත් ඇතිව වාසය කරණසේක් භික්ෂූන් වහන්සේ ඒ නම් සර්වඥයන් වහන්සේට පෑ සේක. සර්වඥයන් වහන්සේ සැබෑද මහණ තා ස්ත්‍රියක් කෙරේ පිලිබඳව උකටලීවූ සිත් ඇතිව වාසය කරන්නේ යයි විචාරා වදාළසේක. එපවත් අසා සැබෑව ස්වාමිනි කී කල්හි දූන්මතු නොවෙයි මහණෙනි පෙරත් මේ මහණ ස්ත්‍රී කෙරේ පිළිබඳ සිත් ඇතිව විසුයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වශයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ හිමාලය වනයෙහි තපස් කරණසේක. එසමයෙහි දිව්‍යලෝකයෙන් දිව්‍යපුත්‍රයෙක් මිය අවුත් බෝධිසත්වයන් වහන්සේ වසන්නාවූ පන්සල සමීපයෙහි පොකුනේ පියුමක් මත්තේ සර්වණ ප්‍රතිමාවක් මෙන් කුමාරිකාව උපන. බෝධිසත්වයෝත් කීප දවසක් පියුම පරනොවී තිබෙන හෙයින් මීට කාරණා කිදෙයි කියා නානකඩ ඇඳගෙණ දියට බැස පියුම් ලඟට ගොසින් පියුම මත්තේ වැදාත්තාවූ කුමාරිකාව දැක දරුවනැයි යන සංඥාවෙන් වඩාගෙණ පන්සලට ගෙණවිත් වඩා වර්ධනය කොට සොළොස් ඇවිරිදි වයසට පැමිණියාහ. ඒ කුමාරිකාව මනුෂ්‍ය ස්ත්‍රියට වඩා සිටීනිය. දිව්‍ය ස්ත්‍රින්ටම අනුව සිටිනීය. ඒ තාපසයෝ පියුමෙහි උපන් තැනැත්තන් බලන්ට ආසාවෙන් ගිය හෙයින් ආසංඛවතී යයි නම් තුබූහ. මෙසේ මේ කුමාරිකාවන් අනර්ඝ රූපයෙන් සජ්ජිතව වසන සමයෙහි ශක්‍රයෝ බෝධිසත්වයන් කරා කලින් කලට අවුත් දැක යන්නාවූ කල්යාමකින් තාපසයන් ලඟ අවුත් දැක වැද එකත්පස්ව ඉඳ කුමාරිකාව දැක මේ කුමාරිකා මෙතනට කෙසේ පත්වූ දැයි විචාළාහ. තාපසයෝත් තමන් දුටු සැටියත් තමන් දරුකොට වැඩූ නියාවත් ශාක්‍රයන්ට කීවාහ. ශක්‍රයෝත් මුන්ට කුමක් උවමනා දැයි විචාළාහ. තාපසයෝ කියන්නාහූ මුන් ඉඳිනට ගෙයක්ද වස්ත්‍රාභරණ අන්නපානාදී වූ ඛාද්‍ය භෝජ්‍යාදිවූ යන මේ සියල්ල උවමැනවයි තාපසයෝ කීහ.

එවිට ශක්‍රයෝත් යහපතැයි දිවානමය මාලිගාවක් ද වස්ත්‍රාභරණාදී ඛාද්‍ය භෝජ්‍ය අන්නපානාදීවූ දෙයද යන මේ සියල්ලම නිර්මිත කොට කුමාරිකාවට දී දිව්‍ය ලෝකයටම ගියහ. ඒ කුමාරිකාවන් තාපසයන්ට අත්පා මෙහෙවර කොට වසන්නීය, එක් වැද්දෙක් දඩගිය තැනැත්තේ ඒ පන්සලට වැද ඒ කුමාරිකාවන් දැක තාපසයන් සමීපයට ගොස් තාපසයන් වහන්ස මේ කුමාරිකාව කවුරුදැයි විචාළේය. තාපසයෝ මාගේ දුවනියෝය යි කීහ. වැදිත් එතනින් නික්ම බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ට කියන්නේ දේවයන් වහන්ස හිමාලය වනයෙහි එක් තාපසකෙණෙකුන්ගේ දුවක් විශිෂ්ටවූ රූ ඇත්තීය. බැළු බැළුවන්ට ප්‍රසාදවහණී යයි රූපශ්‍රී වර්ණනා කෙළේය. රජ්ජුරුවෝ උන්ගේ බස් අසා තෘෂ්ණාව උපදවා වැද්දහු මගලන නියායෙන් ඉදිරිකොට තාපසයන් කරා ගොස් වැද එකත්පස්ව ඉඳ කුමාරිකාව දැක මේ කුමාරිකාව කවුරුදැයි විචිරා මාගේ දුවනියෝයයි තාපසයන් කී කල්හි තාපසයන් වහන්ස ස්ත්‍රීහූ නම් තාපසයන් වහන්සේට කිළුටක් හා සරිය නුඹ වහන්සේගේ දුවනියන් පසු මට පාවාදුන මැනවයි මම නුවරට ගෙණගොස් ස්ථානාන්තර කෙරෙමි කීහ. එවිට තාපසයෝ එබසට නිහඬක් නොකියා කියන්නාහු මාගේ දුවනියන්ගේ නම කිවොත් පාවාදෙමි කීහ. රජ්ජුරුවෝත් තාපසයන්ට බොහෝ නම් කියන්නාහු තාපසයෝ එබසට නිහඬක් නොකියා කියන්නාහූ මාගේ දුවනියන්ගේ නම කිවොත් පාවාදෙමි කිහ. රජ්ජුරුවෝත් තාපසයන්ට බොහෝ නම් කියන්නාහු තාපසයෝත් මේ මාගේ දුවනියන්ගේ නම නොවෙයි කියති. මේ නියායෙන් රජ්ජුරුවොත් අවුරුද්දක් රඳා නම් කියාගත නුහුනුවාහ. රජ්ජුරුවන් හා කැටිව ආ ඇතුන්ට සිංහ ව්‍යාඝ්‍රයන් ගෙනුත් බොහෝ ගහට විඳිනේය. ඇට ලේ බොන මදුරුවන්ගෙනුත් මනුෂ්‍යයන්ට බොහෝ ගහටය. ශිත පිඩාදීයෙනුත් බොහෝ දුක්ඛය ගෙනා බත් සාල් නිමා ගිය හෙයිනුත් මනුෂ්‍යයන් විඳිනාවූ පීඩා දැක රජ්ජුරුවෝත් අවුරුද්දක් රඳා මේ කුමාරිකාවන්ගේ නම කියාගත නුහුනුම්හයි කියා තාපසයන් වහන්සේ වැඳ සමුගෙණ නුවරට යන්නාහු කුමාරිකාව වසන්නාවූ මාලිගාව සමීපයට ගොස් තොප නිසා අවුත් අවුරුද්දක් තිගේ නම පමණක් කියාගත නොහී දුක්විඳ නුවරට යම්හයි කීහ. එවිට කුමාරිකා කියන්නී යම්දෙයක ආසාවක් කළ කල ඒ ආසාව පසිඳගෙණ විනා යාම කාරණා නොවෙයි මාතරම් ස්ත්‍රියක් ලැබගත ඇත්ද මා කියන කථාවක් ඇසුව, මැනව, දිව්‍යාලෝකයෙහි චිත්‍රාලතා වනයෙහි අසා නම් ලියෙක් ඇත. ඒ ලිය දාසක් අවුරුද්දෙන් එල ගන්නේය. දිව්‍ය පුත්‍රයෝ දාසක් අවුරුද්දෙන් මේ සාලියය එලගත්කල එල අනුභව කරම්හයි දාසක් අවුරුදු දුක්විඳ ඇවිද එල

SANHIDA LANKA

අනුභව කොට තුන් මසක් උත්සවකෙළි කෙළෙනාහ. නුඹ වහන්සේ අවුරුද්ක් දුක්විඳ මා වැනි ස්ත්‍රියක් ඇරපියා යන සේක් වේදැයි කීහ. එබස් ඇස රජ්ජුරුවෝ ආසංඛවතී කුමාරිකාවන්ගේ බසෙහි බැඳී යා නොහී එකනම්කට නම් දහයක් සොයා නොදැක අවුරුද්දක් සොයා නම කීවත් තාපසයෝ ඒ නොවෙයි කිමෙන් අවුරුද්දක් පලාගියේය. මනුෂ්‍යයන්ට බොහෝ දුක් නිසා තාපසයන් වැඳ සමුගෙණ රජ්ජුරුවෝ තමන්ගේ නුවරට යන්ට නික්ම අසංඛවතී කුමාරිකාව කියන්නී රජ්ජුරුවෙනි මා කියන කථාවක් අසව, එක් කෙනෙක් පර්වතයක් මුදුනේ සැතපී ඉඳ සිතන්නේ මා උන්තෙනට ගංඟාවකුත් ගොදුරකුත් සැලසී ගියේ නම් යහපත්ව පැනුත් බී ගොදුරුත් කා චිත්ත සනෙතාෂ විනම් යහපතැයි සිතාගෙණ උන්නේය. ශක්‍රයෝ අසුර භවනය ජයගෙණ තමන් ශක්‍රභවනයට ඇවිත් සිතන්නේ මාගේ මනෝරථය සිද්ධවිය. කවුරුන්ගේ මනෝරථය සිද්ධනුවුයේ දැයි පරික්ෂා කළාවූ කොකා සිතාවුන් සිතිවිල්ල දැන කොකා උන් පර්වතය ගාවා ගංගා වතුරෙන් උසවා මහා ගංඟාවක් මැවීය. කොකා ගඟින් පැන්බී ගොදුරුත් කා චිත්ත සනෙතාෂ කෙළේය. තිරිසන් පක්ෂියා පවා තමාගේ මනෝරථය සිද්ධවාගෙණ ගියෝවේද එසේ හෙයින් නුඹ වහන්සේත් නුඹ වහන්සේගේ මනෝරථය සිද්ධකොටගෙණ ගියමැනවැයි කිව. යහපතැයි රජ්ජුරුවෝ ආසංඛවතී කුමාරිකාවන්ගේ බසෙහි බැඳි තමන්ගේ අමාත්‍යයන්ට කියන්නාහු එකී එකී නමට සියයක් නියායෙන් බඳුවයි කියා බන්දවාගෙණ තාපසයන්ට කිවත් ඒ නොවෙයි කියා මේ නියායෙන් අවුරුද්දක් පළාගියේය. රජ්ජුරුවෝ තමන්ගේ නුවරට යෙමි කියා තාපසයන් වැඳ සමුගෙණ නික්මුනාහු ආසංඛවතී කුමාරිකාවන් උන් ප්‍රසාදය බලා කියන්නාහූ එම්බල කුමාරිකාව තිගේ නම් සොයා කියමි යන උත්සාහයෙන් දැන් තුන් අවුරුද්දක් පලා ගියේය. මෙදාතුරේ තිගේ බසෙහි බැඳි උන් පමණක් විනා පඤ්චකාමයෙකුත් රැඳුනු ගමනෙක් නොවෙයි. නිකම් බසින් ප්‍රයෝජන කිම්ද මාගේ ආසවෙහි පූර්ණත්වයක් නැතිඋව මාගේ නුවරට යෙමි කිහ. ආසංඛවති කුමාරිකා කියන්නී රජ්ජුරුවන් වහන්ස. නුඹ වහන්සේ දැන් කියේ මාගේ නමය ඒ නම තාපසයන් වහන්සේට කියා මා කැඳවාගෙණ දැන් කීයේ මාගේ නමය ඒ නම් තාපසයන් වහන්සේට කියා මා කැඳවාගෙණ ගිය මැනවැයි කියා කිව. එවිට රජ්ජුරුවෝ එසේ විනම් මුන්ගේ නම අසංඛවතී නමැයි දැන තාපසයන් වහන්සේ සමීපයට ගොස් වැඳ ස්වාමිනි කුමාරිකාවන්ගේ නම ආසංඛවති නමැයි කීයේය.තාපසයෝ එසේය ආසංඛවතීය යි නමය උන් පාවාගෙණ යවයි කීහ. රජ්ජුරුවෝ අසංඛවති කුමාරිකාවගේ ප්‍රාසාදය සමීපයට අවුත් කියන්නේ තාපසයන් වහන්සේ තොප මටසමීපයට ගොස් වැඳ වැඳ සමුගෙණ රජ්ජුරුවන් හා කැටිව නුවරට ගියහයි. වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ අසංඛවතී ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍ය දේශනාවගේ කෙළවර ඒ භික්ෂූන් වහන්සේ සෝවාන්වූ සේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් මේ භික්ෂූහුය. එසමයෙහි ආසංඛවතී නම් කුමාරිකා නම් පුරාණ දුතීය. එසමයෙහි තාපසයෝ නම් බුදුවූ මම් මයි  වදාළසේක.

SANHIDA LANKA

# මිගාලොප ජාතකය

තවද පංචගතියෙන් විනිර්මුක්තවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි නොකීකරු භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද,

ඒ කෙසේද යත්

එක්තරා භික්ෂූකෙණෙකුන් වහන්සේ නොකීකරුව වාසය කරණසේක. එකල බුදුරජානන් වහන්සේ ඒ භික්ෂූහට සැබෑද මහණ තා නොකිකරුව වසන්නේ යයි වදාරා සැබැව ස්වාමිනි, කි කල්හි මහණ තෝ නොකිකරුවුයේ දැන්මතු නොවෙයි පෙරත් නොකිකරුය. ඒ තාගේ නොකිකරුකම නිසා නුව නැත්තන් කිවා නොකිරීමෙන් නොකීකරුව වේරම්බ වාතයට වැද බඩ බඩව විසිර ගියේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ගිජුලිහිණි යෝනියෙහි අප රාෂ්ට නම් ගිජුලිහිණිව බොහෝ ගිජුලිහිණියන්ට රජව උපන්නාහ. ඒ බෝධිසත්වයන්ගේ මිගාලොප නම් පුත්වූ ගිජුලිහිණි පැටවෙක් ඇත. ඔහු නොකීකරු හෙයින් බෝධිසත්වයෝ අවවාද කියන්නාහු මිගාලෝප නම් වූ ගිජ්ඣපෝතකය, තෝ, තාගේ, යාදිසීගති, යම්බඳුවූ ආකාශ ගමණෙක් ඇද්ද, තං, ඒ ගතිය මේ මට නරුච්චං නුරුස්නේය, තාත, පුත, අතුවචංපතසි, ඉතාඋස්වූ ආකාශයට පැනයෙයි, අහුමිං, පක්ෂීන්ට විෂයයි හරින්නාවූ අහමිය තාත පුත, සෙවසේ, සෙව්නේයි, තෝ, තට පඨවි, පෘථිවිය, තාත, පුත, චතුක්කණණ, කෙදාරාං, සිවුරුස් කෙතක පරිද්දෙන්, යදා යම්කලෙක්හි, පස්සසී, දක්නෙහි, තාත, පුත, (තෝ එයින්) නිවතතස්සු, වලකුව, ඉනො, මෙයින් පරංමත්තෙහි, මාගමා නොයවා අඤ්ඤපි අනිකුත් පත්තයානං පත්‍රයාන කොට ඇති විහංගමා පක්ෂිහු, වාතවෙගෙන, වාත වේගයෙන් අක්ඛිත්තා විසුරුවා දමන ලද්දාහු සස්සති, සමභූමිය හා සමානවූ ආත්ම තර්කනයෙන් ඇත්තාහු නට්ඨා විනාශයට පැමිණියාහ. අපජනකවූ වැඩිමාළු පියාගේ අවවාද නොකොට කෘෂ්ණ වාතය ඉක්ම, වේරඹ වාතයාගේ වසඟයට පැමිණියෝයි, මිගාලෝප නම් පක්ෂිහූ අවවාද ක්‍ෂම නොවන කල්හි ඔහුගේ පුත්‍රයෝද දාරාවෝද අනුව පවත්නාවූ යම් ගිජ්ඣ කෙණෙක් ඇද්ද ඔහු සියල්ලෝම ඛ්‍යසනයට පැමිණියෝ යයි එපරිද්දෙන් යමෙක් වෘද්ධයන්ගේ වචනය නොගිවිසිද අතික්‍රාන්තවූ අනුශාසනා ඇති සීමාතික්‍රමනය කොට ඇසිරෙනවාද මිගාලෝප නම්වූ ගිජ්ඣ පොතකයා පරිද්දෙන් වෘද්ධානුශාසනා නොකොට ඛ්‍යසන ප්‍රාප්ත වන්නේය යි වදාරා මේ මිගාලෝප ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි මිගාලෝප නම්වූ ගිජ්ඣ පෝතකව උපන්නෙම් බුදුවූ මම මයි වෙද්‍යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ශ්‍රී කාලකන්නි ජාතකය

තවද ශාන්ත වූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනා සමයෙහි අනේපිඬු මහා සිටානන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

අනේ පිඬුමහසිටානන් හා උන්ගේ අඹුදරුවන් හා වහල් පටන් බැල මෙහෙකොට සිටින්නන් පටන් එක්ව නිත්‍ය ශිල වශයෙන් පන්සිල් රැක පොහොය අටසිල් රක්නාහ. මේ කථාව දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ උන් මාළුවන් වහන්සේ අනේපිඬු මහාසිටානන් හා උන්ගේ පරිවාරයන් යහපත් නියායයි කියා කථාකොට උන්කලට සර්වඥයන් වහන්සේ එතනට වැඩි මහණෙනි අනේපිඬු සිටානන් තබා පෙර උත්තමයන්ගේ යහපත්වූ පරිවාර ඇත්තෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වාදළ සේක්.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එනුවර සිටුව උපන්නාහ. එසමයෙහි බෝධිසත්වයන් පටන් උන් අඹුදරුවන් හා වහල්පටන් බැලමෙහෙකොට සිටින්නන් පටන් එකසේම නිත්‍ය ශිල වශයෙන් පන්සිල් හා පොහොය අටසිල් රකිනා හෙයින් උන්ගේ පරිවාර සුචිවිසින් සුචිපරිවාර සිටානෝයයි කියා මේ නමින් ප්‍රසිද්ධව ඉන්නාහ. ඒ කියන සුචිපරිවාර සිටානෝ මට වඩිනා කෙනෙකුන් ආ කල ඉන්ට උවමැනවයි කියා අස්නක් පනවා තුබූහ. එසමයෙහි ධ්‍රතරාෂ්ට නම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූවූ ශ්‍රිකාන්තාවද විරූළහකනම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූවු කාලකන්නි නම් දිව්‍යස්ත්‍රියක්ද දෙදෙනාම අනොතත්ත විලට නාන්ට ගියහ. අනෝතත්ත විල වනාහී සර්වඥයන් නානා තොටද පසේබුදුවරයන් වහන්සේ නානා තොටද රහතුන් වහන්සේ නානා තොටද තාපසවරුන් නානා තොටවල්ද සදිව්‍යලෝකේ දෙවියන්ට වෙන වෙනම තොටවල් ඇත්තේය. මෙකී යන්නාවූ ශ්‍රිකාන්තාව කාලකන්නි යයි යන දිව්‍යස්ත්‍රීන් දෙන්නත් දිව්‍යස්ත්‍රීන් නානා තොටටඅවුත් දෙන්නම පළමුකොට බසිම් මම පළමුකොට බසිමියි කියා ඩබර කොට ගත්හ. ඉන් කාලකන්නි දිව්‍යස්ත්‍රි කියන්නී යම් මනුෂ්‍ය කෙණෙකුන්ට මාගේ අඥාවය එසේහෙයින් මම පළමුකොට බසිම් කීය. ශ්‍රිකාන්තාව යන දිව්‍යස්ත්‍රි කියන්නී මම මනුෂ්‍යකෙණෙකුන්ට පැමිණෙන ඓශ්වර්යය මම පමුණුව වන්නෙම් එසේ හෙයින් පළමු කොට බසින්නෙම් මම ය යි කිව දෙන්නම උතුන්ට කියා ගිවිස්වාගත නොහී සතරවරන් දෙවියන් ලඟටගොසින් අපගෙන් උතුම් කවුරුදැයි කියා විචාරා ගණුම්හයි කියා සතරවරන් දෙවියන් ලඟට ගොස් එපවත් කීහ. ධ්‍රතරාෂ්ට විරූළහක දෙදෙන අපගේ දරුවන් නුගුණ නොකියම්හයි කිහ. විරූපකඛ වෛශ්‍රවන දෙදෙන අප හා සරි දෙවියන්ගේ දරුවන්ගේ ගුණ නුගුණ නොකියම්හයි කියා අපගේ ස්වාමින් කරා යවයි කීය. එ කියන දිව්‍යස්ත්‍රීන් දෙදෙනාත් ශක්‍රයන් ලඟට ගොස් එපවත් කීහ. ශක්‍රයෝ කියන්නාහු දෙවියෝ දෙදෙන මාගේ කට යුත්තෙහි සිටිනා දෙවියෝය. උන්දෙන්නාගෙන් එක්කෙනෙක් වඩිති කිමනම් කටයුතු නොවෙයි කියා කියන්නාහු සුචිපරිවාර සිටිානන්ගේ නොයිදුල් අස් නෙක් ඇත. ඒ අස්න උන්ට කියා පළමු කොට අස්නලත් කෙනෙක් උතුමැයි කීහ. යහපතැයි කියා කාලකන්නි පළමුකොට නිල්පිළි ඇඳ නිල් ආභරණ ලා ගෙණ සිටානන්ගේ ගෙයි වැද සිටියාහ. සිටානෝ ඇදැක ප්‍රියව කියන්නාහු කී වනාහී කළුපැයක් හා කළු ආභරණ හා කළුපිළිඇඳගෙණ අප්‍රියකරුව සිඟනීය. තී වනාහී කාගේ දරුකෙණෙක්දැයි විචාළාහ. ඒවිට ඒ කාලකන්නි කියන්නි මම විරූළක නම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූවු කාලකන්නී නම් ඇති කාලකන්නි යයි කියන්නේ මටය එසේ හෙයින් නුඹ වහන්සේගේ නොයිඳුල් අස්නේ රැයක් මා ලඟින්ට අවකාස අලමැනවැයි කිව, එකියන්නා එවිට සිටානෝ කියන්නේ තොපගේ ගුණ කියවයි කාලකන්නි තමාගේ ගුණ කියන්නී සිටානන්වහන්ස යම් කෙණෙක් කෙලෙහිගුණ නොදනිද්ද, පව්වුවූ වාසය ඇද්ද කාලගුණ නොපායිද්ද, මිත්‍රාද්‍රෝහිද ලාමත වූ වාසය ඇද්ද. කා කෙරෙත් දයාවක් නැද්ද, කේලාම් කියන්ට දනිද්ද, තද මසුරු වූ බස් කියද්ද, නුවනැතිව මෝහව දවසරිද්ද, අනුන්ගේ සම්පතෙහි ඊර්ශ්‍යමාත්ශයයි ලෝභිසිත් සිතද්ද, මෙසේ වුවන් කෙරේ මාගේ වාසයයි කීහ. එවිට සිටානෝ කියන්නාහූ එසේ වී නම් මෙතන තිබා මෙනුවරත් ඉන්ට බැරියයි කීහ. එවිට කාලකන්නිත් කියන්නී මා ඇළුම්කරණ මනුෂ්‍යයන්ගේ ගුණ නුඹවහන්සේට නැත. එසේහෙයින් නුඹ වහන්සේට මාගෙන් ප්‍රයෝජනද කාරිය නැතයි කියා කාලකන්නි අනතර්ධාන වුවාහ. ඒ වෙලාව ශ්‍රිකාන්තාව රන්වන් ආභරණ පැළඳ රන්වන් වස්ත්‍රයක් ඇඳ රන්වන්වූ ශරීරශෝභාවෙන් එකාලෝකකෙරෙමින් රන්පියුමට බඳුවූ පාදයුග්මයක් ඇතිව සිටානන්ගේ දොර සිටියාහ සිටානෝත් ශ්‍රිකාන්තාව දැක මෙසේවූ ශ්‍රී සමුර්ධියකින් සියළු දිග එකාලෝක

SANHIDA LANKA

කෙරෙමින් ඇවිත් සිටියාවූ තොපි කාගේ දරුකෙණෙක්දැයි විචාළාහ. එ විට දිව්‍යස්ත්‍රී කියන්නී ධ්‍රතරාෂ්ඨ නම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූවූ ශ්‍රීකාන්තාවයයි කියන්නේත් මටය ලක්ෂමියයි කියන්නේත් මටමය පොළොව සමාන නුවන ඇති හෙයින් භූරිපඤ්ඤ යයි කියන්නේත් මටමය නුඹ වහන්සේගේ යාන එක දවසකට මාලගින්ට අවසර දුනමැනවයි කිය. එවිට සිටානෝ කියන්නාහු තොපට යාන දෙන්ට තොපගේ ආචාර සීලයද තොප වසන වාසයද මට කිව මැවය. තොපගේ ශීලවුත සමාධිය කා කෙරහි පිහිටාද ඒ මට නොදනෙයි, මට කිවමැනවැයි කීහ. එබස් ඇසූ ශ්‍රීකාන්තාතොම එඹා සිටානෙනි යම් සත්වයෙක් තෙම ශිත පීඩාවද උෂ්ණ පීඩාවද අවු සුළඟින් වන ආයාසයද මැයි මඳුරුවන් හා සර්පාදීන්ගෙන් වන උපද්‍රවයද සාපිපාසාදීන් වන්නාවූ උපද්‍රවයද යන සියල්ල තෘෂ්ණලවයක් කොටත් නොසිතා රෑ දවල් සියලුකාරියෙහි නියුකතාව ඒ ඒ කාලයට පැමිණ කෘෂිවනික් ආදී කර්මාන්ත හා දානාසීලාදීවූ ඒ ඒ ක්‍රියාවන් නොනසඳ එබඳුවූ සත්වතෙම මට අතිශයනන් ප්‍රිය වන්නේ ඔහු කෙරේහිම ඇලි වාසය කෙරෙමියි තවද සිටානෙනි යම් සත්වයෙක් ක්‍රෝධි නොවේද බොහෝ මිත්‍රයන් ඇත්තේද ත්‍යාගීද සිලාචාරයෙන් යුක්තද ශඨ ප්‍රවෘත්තියක් නැතිව සෘජුවූ කායවාක් සුචරිත සමාචාර ඇත්තේද සංග්‍රහ සීලද ප්‍රියවූ මටයි එටුවූ වචනයන් ඇත්තේද මහන්තත්වයට පැමිණියෙන් සියල්ලවුන්ට යටත්ව පවතීද සමුද්‍රය බලන්නාවූ සත්වයන්ට යම්සේ රලපතර බොහෝව පෙණේද එපරිද්දෙන් යථොක්තවූ ගුණ ඇති පුරුෂයා කෙරෙහිම වාසය කෙරෙමියි තවද යම් සත්වයෙක් මිත්‍රයන් කෙරෙහිද ජාතිග්‍රොත්‍රාදී ශ්‍රෙෂ්ඨයන් කෙරෙහිද සදෘශවූවන් කෙරෙහිද වැඩෙහි හැසිරෙන්නාවූන් කෙරෙහිද අවැඩෙහි නොහැසිරෙන්නවූන් කෙරෙහිද සම්මුඛ පරාංමුඛ දෙක්හි සංග්‍රහ කිරීමම සොභාකොට ඇත්තේද කිසිකලෙකත් පරුෂවචනයන් නොකියාද එබඳු ගුණ ඇති සත්වතෙම මලේ නමුත් ජිවත්ව ඉඳිනා නමුත් මම ඔහු අයිතියෙහි යම් නුවන මද සත්වයෙක් මෙබඳු ගුණයන් අතුරෙන් එක්තරා ගුණයක් ලැබ ශ්‍රී මට වසඟවයි සිතා ප්‍රමාද වශයෙන් පැමිණියාවූ ගුණය නසාද එබඳු පුද්ගලයා වැසිකිළියක්මෙන් දුරින් දුරුකෙරෙමි. සත්වතෙමේම තමාගේ යහපත් ගුණයෙන් ශ්‍රියා තමාට පමුණුවාගන්නේය. තමාගේ නුගුණයෙන්ම කාලකන්නියත් පමුණුවා ගන්නේය. එසේහෙයින් ශ්‍රීකාන්තාවය කාලකන්නිය යන දෙක එක්කෙනෙක් එක්කෙණකුන්ට පමුණුවන්කෙණෙක් නැත, තමන් තමන්ගේ ගුණ නුගුණ වශයෙන් තම තමන්කරා පමුණුවා ගන්නාහයි මෙසේ ශ්‍රී කාන්තා තමාගේ ගුණකීම වශයෙන් සිටාන්නට ධර්මදේශනා කළාය. මෙසේ මහබෝසතානෝ ශ්‍රී කාන්තාවගේ බසට පැහැද මේ කිසිකෙණෙකුන්ගේ ප්‍රයෝජන විඳිමෙන් ඉඳුල්නොවූ ආසනය හා යාන තොපට සුදුසු යයි අභිප්‍රාය සැටියේ සැතපෙවයි කීය. ශ්‍රී කාන්තාවත් සිටානන්ගෙයි එදවස් රෑ වැස අළුයම් වෙලෙහි නික්ම තව්තිසා දිව්‍යලෝකයට ගොස් අනෝතත්තවිල පළමුව ජලස්නානය කළාහ. එතැන් පටන් ලෝකයෙහි ශ්‍රීයාවත් ව්‍යාවහාර පළවුයේය. බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණ හැර වදාරා ශ්‍රී කාලකන්නි ජාතකය නිමවා වදාළ ේසේක. එසමයෙහි ශ්‍රී කාන්තාව නම් දැන් මේ උත්පලවණ්නා මහා ස්ථවිරිය. එසමයෙහි සුචිපරිවාර සිටානෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# බිලාළ ජාතකය

තවද අනන්ත වූ කරුණා ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් නිසා උකටලී වූ භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

ස්ත්‍රියක් නිසා උකටලී වු භික්ෂු කෙණෙකුන් වහන්සේ ගෙණ ගොසින් සර්වඥයන් වහන්සේට දක්වන්නා සැබෑද මහණ තා ස්ත්‍රියක් නිවා උකටලී වූයේදයි විචාළ කල්හි සැබෑව ස්වාමින් වහන්ස, මා ස්ත්‍රියක් නිසා උකටලි වුවේදයි විචාළ කල්හි සැබෑව ස්වාමින් වහන්ස, මා ස්ත්‍රියක් නිසා උකටලී වුයේ යයි කීහ. සර්වඥයන් වහන්සේ එම්බල මහණ ස්ත්‍රියක් නිසා උකටලිවීම දෝෂය ස්ත්‍රී බොහෝ මායමින් පුරුෂයන් ලබාගෙණ දුක් පමුණු වන්නාහ. යම්සේ බැලලෙකු ලබාගන්නට කළ උත්සාහය මෙනැයි වදාරා ඒ කෙසේද යත් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ වනාන්තරයෙහි බොහෝ කුකුළන් පිරිවරා වාසය කරන්නාහ. එසමයෙහි එතනට නුදුරු වූ ස්ථානයක බැළලක් වාසය කරන්නීය. ඕ තොමෝ බෝධිසත්වයන්ගේ බොහෝ කුකුලන් දවස්පතා කා බෝධිසත්වයනුත් අල්වාගන්ට බොහෝ උත්සාහ කරන්නීය. මෙසේ සිතුවාහ. මේ කියන කුකුලා මා විසින් කන්ට අල්වා ගත නොහැක්ක කුකුළාට භාර්යාව ඉඳිනා නියායෙන් සලස්වා ගතොත් කෑ ඇතැයි සිතා කුකුලන් වාසය කරන්නාවූ ගස සමීපයට ගොස් කියන්නී සණ පියාපත් ඇති රත්වූ කරමලක් ඇති, ආකාශයෙන් ගමන් යන්නා වූ පක්ෂිරාජයානෙනි, මම තොපට බිරින්දට වාසය කෙරෙමි කිව. කුකුළානෝ මෑ කියන්නේ වංචාවෙකැයි සිතා කියන්නාහු තොපි සිව්පාවෝය. අපි පක්ෂිය එසේ හෙයින් අපගේ වංශයෙන්ම අපට බිරින්ද වෙතොත් විනා තොපගෙන් අපට බිරිද්දව ඉන්ට කාරණා නොවෙයි බෝධිසත්වයෝ කිහ. එවිට බැලළ කියන්නී එසේ නොකිව මැනව, මම නුඹ වහන්සේට මිදි මෙහෙවර කෙරෙමි එසේ නොඅදහනසේක් වී නම් මේ බරණැස් නුවර වාසීන් දන්නා නියායෙන් නුඹ වහන්සේට මිදී මෙහෙවර කරණ නියාව කියා සලස්වා ගත මැනවයි කිව. බෝධිසත්වයෝ කියන්නාහු තී විසින් මාගේ බොහෝ කුකුළන් කා මාත් කන්ට කරණ උත්සාහ විනා මට මිදී මෙවෙහර කෙරෙමියි සිතන උත්සාහයෙක් නොවෙයි. අප පක්ෂින් හෙයින් අපගෙන් පක්ෂියකත් තොප සිව්පාවන් හෙයින් තොපගෙන් සිව්පාවෙකු විනා කාරණා නොවෙයි. බෝධිසත්වයෝ කීහ. සර්වඥයන් වහන්සේ එම්බල මහණ ඒ කුකුලා ඒ බැලළ කෙරෙහි ආසාවෙන් ඈ හා එක්වී නම් ජීවිතක්ෂය වන්නේය. එමෙන් යම් සත්ව කෙනෙක් ස්ත්‍රී වසඟ වූ නම් ජීවිතක්ෂයට පමුනු වන්නාහ. ස්ත්‍රී වසඟ නොවූ නම් බැලළගෙන් කුකුළා ගැලවුනා මෙනැයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ බිළාල ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යාගේ කෙළවර උකටලි භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක. එසමයෙහි කුකුළුව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළ සේක.

SANHIDA LANKA

# ධර්මධවජ ජාතකය

තවද සියලු සත්කාරයට භාජනවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වංචා ප්‍රයෝග දන්නා භික්ෂූකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

එක් වංචා ප්‍රයෝග දන්නා භික්ෂූකෙනෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට දැක්වූසේක. සර්වඥයන් වහන්සේ දැන්මතු නොවෙයි පෙරත් මේ මහණ වංචා ප්‍රයෝගයෙන් දවස් ඇරියේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ මුදු මධ්‍යයේ එක් දිවයිනක පක්ෂි කුලයක ඉපිද බොහෝ පක්ෂින් පිරිවරා වාසය කරණසේක. එසමයෙහි වෙලඳු පන්සියයක් නැව් නැගී ගියාහ. එක් කපුටුවෙක් ඒ දිවයිනට ගොස් ඒ පක්ෂින්ගේ බිජුවට කන්ට සිතා අවසරයක් නොලැබ උපායෙක් කෙරෙමි සිතා එක් උපායක් උඩ ඔසවා එක්පසකින් සිට උඩබලා කටදල්වා ගෙණ සිටියේය. පක්ෂි එතනට අවුත් මේ කිමෙක්ද තොපි කරන්නේයයි විචාළාහ. කපුටු කියන්නේ මාගේ ගුණානුභාවයෙන් පොළොව මා ධරාගත නොහෙයි. එසේ හෙයින් එක පයකින් සිටි වායු අනුභව කෙරෙමියි කීය. එවිට පක්ෂීහු මේ පක්ෂියාගේ තපසක් යහපත් නියායයි සමාධිව ගොදුරු කන්ට යන්නාහු ඒ කපුටුවා තමන්ගේ බිජුවට පාවාදී යන්නාහ. කපුටුවා පක්ෂින් පළායන්නා බඩ ගන්නා විවර බිජුවට තලා කා සිටින්නේය. මේ නියායෙන් කල්යාමෙන් බිජුවට අඩුවේගණ යන්නා මේ කපුටුවා යහපත් ගුණ ඇත්තේය. මොහු විසින් වන භයෙක් දොහෝයි සැක වුවාහු බෝධිසත්වයන් වහන්සේ මේ කා විසිනුත් වන භයෙක් නොවෙයි. මේ කපුටුවා විසින් මේ භය උපදනේ යයි එක් දවසක් පක්ෂීන් ගොදුරු කන්ට යාදී සැඟවී උන්නාහ. කපුටුවාත් පක්ෂි පලායන්නාම බිජුවට කන්ටවන. බෝධිසත්වයෝත් බලා සැඟවී ඉඳ පක්ෂීන් එන්නා මෙපවත් කීහ. පක්ෂී එක්ව කපුටුවාට ටොකු ඇන මැරූහ. එවිට බෝධිසත්වයෝත් එම්බා වඤ්චා ප්‍රයෝග දන්නවුන්ගේ ගුණ නුගුණ පරීක්ෂා කොට විනා විශ්වාස නොකට යුත්තේය. ධර්මධර යෙමි, පක්ෂීව ඉපිදත් මෙසේවූ දෙයක් කළෝ වේදැයි ධර්මදේශනාකොට ධර්මධවජ ජාතකය නිමවා වදාලසේක. එසමයෙහි ඒ කුපුටුවා වන් වංචා සහගත ප්‍රයෝග දන්නා භික්ෂූහුය, පක්ෂින්ට රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළ සේක.

SANHIDA LANKA

# කරපත්ත ජාතකය

තවද සාගරයක්සේ ගැඹුරුවූ ගුණ ඇති ත්‍රෛලොක්‍ය තිලකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ස්ත්‍රියක් නිසා උකටලී වූ භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් ස්ත්‍රියක් කෙරේ උකටලිවූ භික්ෂු කෙනෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට දැක්වූසේක. සර්වඥයන් වහන්සේ වදාරණසේක් දැන්මතු නොවෙයි පෙරත් තෝ ස්ත්‍රියක් නිසා ජීවිත විනාශයට පැමිණ උත්තමයන් කී කාරණය ගිවිස ප්‍රාණය ලද්දේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්ස් ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ දෙදෙව්ලොව දෙවියන්ට නායකවූ ශක්‍රදේවේන්ද්‍රව උපන්සේක. එසමයෙහි දිව්‍ය නාගරාජයෙක් ගොදුරු කන්ට යයි රජ්ජුරුවන්ගේ උයනේ ඇවිදිනේය. ඒ නාගරාජයා කුඩා කොල්ලෝ දැක වටකොට ගෙණ කැට මුගුරු ආදියෙන් තලන්ට වන්නාහ. රජ්ජුරුවෝත් ඒ වෙලාවට උයනට ආවාහු මේ කිමෙක්දැයි විචාරා එපවත් අසා නයා නොමරවයි මැරිය නොදි ගළවාපිය. නාගරාජයාත් තමාගේ නාගභවනයට ගොස් රජ්ජුරුවන් නිසා මාගේ ජීවිතය රැකුනේයයි සතුටුව එදා රෑම බොහෝ සම්පතුත් ඇරගෙන නාගමානවිකාවත් කැඳවා ගෙණ අවුත් රජ්ජුරුවන් දැක රජ්ජුරුවන්වහන්ස. නුඹ වහන්සේ නිසාය මාගේ ප්‍රාණය රැකුනේය. මෙවක් පටන් නුඹගේත් මාත් මිත්‍රව වාසය කරන්නට උවමැනවැයි මිත්‍රකමෙහි පිහිටා නුඹ වහන්සේට ආරක්ෂාවට සිටින්ටයයි නාගමානවිකාවත් පාවාදී මෝ ඉඳින් නුඹ වහන්සේට නො පෙණිගිය නමුත් ගිය ස්ථානය දකිනා පිණිස කියා ගත මැනවයි දිව්‍ය මන්ත්‍රයකුත් උගන්වා නාරජ තමාගේ නාගභවනයට ගියේය.

රජ්ජුරුවෝත් එක් දවසක් නාගමානවිකාවන් හා අන්තඃපුරයත් ඇරගෙන මගුල් උයනට දිය කෙළින්ට ගියහ. නාගමානවිකාවත් දියබරණකු දැක ඔහු හා කැටුව සංවාසයෙහි යෙදෙන අභිප්‍රාය ඇතිව වේසය හැර නාගවේසය මවා දිය බරියා හා කැටිව ලොකාස්වාද රතියෙහි යෙදුනාය. රජ්ජුරුවෝත නාගමානවිකාව නොදක කොයි ගියාදෝහෝයි පරීක්ෂා කොට දී දියබරියා හා සමග ලෝක ස්වාදරතියේ යෙදෙන නියාව දැක මෙයින් මතු මෙසේවූ නොකටයුත්තක් නොකරවයි උන්පත්තෙන් පරකීපයක් ගැසූහ. නාගමානවිකාව කිපී තමාගේ නාගභවනයටම ගියාහ. නාගරජ්ජුරුවෝත් ඇයි තී ආයේ කුමක් නිසාදැයි විචාළේය. නාගමානවිකා කියන්නී නුඹ වහන්සේ මා රජ්ජුරුවන්ට ආරක්ෂාවට සිටුවාලා ආ පමණක් විනා රජ්ජුරුවෝ තමන් හා ලෝකාස්වාදරතියෙහි යෙදෙන ලෙස අත ඇල්ලුහ. මම ඊට මැලිවීම් ඊට මා පිට පාරකීපයක් ගැසූහ. එසේ හෙයින් මම ආමි කිව, නාගරජ්ජුරුවෝත් මෑ කියන්නේ ඇත්තමය යි කිපී නාගමානවකයන් සතරදෙනෙකු කැඳවා තොපි සතරදෙනා ගොස් තොපගේ නාසයෙහි විෂධූමයෙන් දවා හස්මකරවයි කියා යැවිය. ඒ නාග මානවකයෝ සතරදෙනත් යහපතැයි කියා ගොස් රජ්ජුරුවන්ගේ රජගෙට වන්හ. රජ්ජුරුවෝත් ඒ වෙලාවට පිබිද අගමෙහෙසුන් බිසවුන් හා කථා කරන්නාහු සොඳුර නාගමානවිකාව මගුල් පොකුණේදී දියබරණ හා සමග ලෝකාස්වාදරතියේ යෙදෙන්නා දැක උණපත්තෙන් පාරකීපයක් ගැසීමි නා ලොවට පලා ගියාහ. ඔබ ගොස් නාගරජ්ජුරුවන්ට බොහෝ නුගුණ කියා මාගේ මිත්‍රධර්මය බිඳුවන්නීය. කුමක් වනු බවත් නොදනිමි. බොහෝ විකෂේපයයි බිසවුන්ට කීහ. නාග මානවකයෝත් බිසවුන් හා කරණ කථාව අසා නිරපරාධවූ රජ්ජුරුවන් නසන්ට කාරණා නොවෙයි කියා නාගභවනයට ගොස් නාගරජ්ජුරුවන්ට එපවත් කීහ. නාගරජ්ජුරුවෝත් එපවත් අසා නිරපරාධවූ රජ්ජුරුවන් වහන්සේට මා කළේ අපරාධයයි රජ්ජුරුවන් වහන්සේ කරා ගොස් කළාවූ අපරාධය ක්‍ෂමාකරවාගන්ට උවමැනවයි රජ්ජුරුවනමන්ත්‍රයෙක මා තොපට උගන්වන්නේය. මේ මන්ත්‍රය කිසිකෙණකුන්ට නුගවව, යම් කෙණකුන් ඉගැන්වූ නම් තොපි ගිනිවැද යවයි රජ්ජුරුවන්ට මන්ත්‍රය උගන්වා නාගරජ්ජුරුවෝ තමන්ගේ නාගභවනයට ගියාහ. එක් දවසක් රජ්ජුරුවෝ රන්මඩයේ මී හා කැවුම් මේ නිමවන කල්හිම බින්දුවකුත් කැවුම් පොඩියකුත් බිම වැටින, කුඹුවෙක් ඒ දැක තමාගේ සෙසු කුඹුවන්ට කියන්නේ රජගෙයි මී කල කීපයක් හා කැවුම් සැල කීපයක් බිඳිගියේය. තොපි වහා එකවයි කුඹුවන් එක්කොට ඇවිදිනේය. රජ්ජුරුවෝත් කුඹුවන් කරන්නාවූ ක්‍රියාව දැක සිනා පහළ කළහ. බිසව රජ්ජුරුවන් වහන්සේ සිනා පහළ කරන්නට කාරණ කිම්දැයි කියා සැකවූශ. එක් දවසක් රජ්ජුරුවෝ ඉස් සෝධා නහා උන්නාහ. මැස්සන් තමාගේ මැස්සකුට කියන්නී තොප හා මා ලෝකාස්වාදරතියෙහි යෙදුන මැනවයි කීහ. මැසි කියන්නේ රජ්ජුරුවන් වහන්සේ ඉස්සෝධා නාහා සුවඳ විලවුන් ගන්නාසේක. ඉන්

SANHIDA LANKA

බිමහුනු දෙයක ඇවිත් දූවට රජ්ජුරුවන් වහන්සේගේ පිට මධ්‍යයෙහි ලෝකාස්වාද රතියෙහි යෙදෙම්හයි කිහ. රජ්ජුරුවෝත් ඒ මැසි කී කථාව අසා සිනා පහළ කළහ. බිසවු ඒ දැක සැකවූහ. එක් දවසක් රජ්ජුරුවෝ මේ නිවමන්ට උන්නාහ. බිසවු රජ්ජුරුවන්ට බත් වැඩූහ. ඒ රන්තලියේ බතින් බත උලලක් බිම වැටින කුඹුවෙක් ඒ බත් උල දැක රජ්ජුරුවන්ගේ රජගෙයි බත්සැල කීපයක් බිඳී ගියේය. බත් කන්ට එවයි කිය. රජ්ජුරුවෝ ඒකියන බසටත් සිනාසුනාහ. බිසවු එවිටත් සැකව රජ්ජුරුවන් හා එක්ව යානේ පුරුදුව සැතපුනාහ. රජ්ජුරුවන්ගේ අතින් විචාරන්නාහු ස්වාමිනි නුඹ වහන්සේ සිනාසෙන්ට කාරණා කිම්දැයි විචාළාහ. රජ්ජුරුවෝ කියන්නාහු එම්බා සොඳුර මම දිව්‍ය මන්ත්‍රයක් දනිමි. එසේ හෙයින් කුඹුවන් මැස්සන් කී බසට සිනාසෙමි අනිකකට සිනා සුනෙමි නොවෙයි කීහ. එවිට බිසවු ඒ මන්ත්‍රය මා උග්නට උවමැනවයි කිහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු තොප මන්ත්‍රය ඉගැන්වුවොත් මා ගිණි වදින්නට උවමැනවයි කිහ. රජ්ජුරුවෝත් යහපතැයි රථයකට පැනනැගී බිසවුන් රථයකට නන්වා සේනාව පිරිවරා උයනට නික්මුනාහ. ශක්‍රයෝ මෙපවත් දැන තමන්ගේ සුජාතා නම් අසුර කන්‍යාව ඇරගෙණ සුජාතාවන් එළු වෙසක් මවා රජ්ජුරුවන් එන ඉදිරියෙහි සිට එළුදෙන පිටට නැගෙණ ආකාර දක්විය. රථය අදිනා අස්සු කියන්නාහු එළුවන් ආදි මැ ලජ්ජා නැතැයි අසා දකුම්හ. දූන් නියමයෙන් ඇසදුටුම්හ. ලෝකාස්වාද රතිය නම් රහසිගතව කල මනා දෙයය, මෙතෙක් දෙනා මැදයේ ලැජ්ජා නැතිව කරන්ට කාරණා කිම්දැයි කීහ. එවිට එළුවා කියන්නේ තොප අලජ්ජාව මට ලජ්ජා නැතැයි කියව්ද?. රජ්ජුරුවන්ට අසුව බන්ධනාදියට පැමිණ සිටියට ලජ්ජා නැත්තාවුයේ නම් රජ්ජුරුවන් රථයේ ඉඳුවාගෙණ අදුව. එසේවූ තොපට කවර ලජ්ජාවෙක් ඇද්දැයි කීහ. එවිට අස්සු කියන්නාහු අප වන්නා බන්ධානාදියට පැමිණ හෙයින් ලජ්ජා නැත්තම්හ අපගේ රජ්ජුරුවන් වහන්සේට ලජ්ජා නැතැයි කියන්ට කාරණා කිම්දැයි විචාළාහ. එවිට එළුවා කියන්නේ ස්ත්‍රියක් නිසා ප්‍රාණය නසා ගිණිවදින්ට යන්නාවූ රජ්ජුරුවන්ට ලජ්ජා නැතැයි නොකියා ලජ්ජා ඇතැයි කීය. එවිට රජ්ජුරුවෝ එළුවාට කියන්නාහු එසේකළ එළුවානෙනි ඊට කළමනා කිම්දැයි කීහ. එවිට එළුවා කියන්නේ එම්බා රජ්ජුරුවෙනි තමාගේ ප්‍රාණය ඇත්නම් සියලු වස්තූන් ඇත. බිසෝවරුන් ඇත. එක බිසෝකෙණකුන් නැතුවට සෙසු බිසෝවරුන් නැද්ද, තොපි බිසවුන්ට මන්ත්‍රය නොදෙවයි කීහ. එවිට රජ්ජුරුවෝ විචාරන්නාහූ එම්බා එළුවානෙනි තොපගේ සැටිය එළුවන්ගේ සැටියක් නොවෙයි. තොපි කවුරුන්දැයි විචාළාහ. එවිට ශක්‍රයෝ කියන්නාහු එම්බා රජ්ජුරුවෙනි. තොපට වන්නාවූ මරණ භයෙක් දැක භය සංසිඳුවන්ට ආවාවූ ශක්‍රදේවේන්ද්‍රයෙමි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු ශක්‍රයෙනි මම බිසවුන්ට මන්ත්‍රය දෙමි කියා කිමි, මන්ත්‍රය නුදුන් කළ බවට විරුද්ධවෙයි කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහු එම්බා රජ්ජුරුවෙනි බිසවුන්ට පාරකීපයක් ගසන්න තුමුම මට මන්ත්‍රය එපායි කියත්, ඒ නියාවට කරවයි රජ්ජුරුවන්ට උපාය කියා ශක්‍රයෝ දිව්‍යලෝකයට ගියහ, රජ්ජුරුවෝත් රථය පදවා උයනට ගොස් රථයෙන් බැස දරසෑය ළඟ සිට බිසවුන්ට කියන්නාහූ තොපට මන්ත්‍රය උවමැනවයි කිහ. බිසවු කියන්නාහු ගිනිවැදවත් මට මන්ත්‍රය දුන මැනවැයි කීහ. බිසවු කියන්නාහු ගිනිවැදවත් මට මන්ත්‍රය දුන මැනවයි කිහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු එසේවිනම් මන්ත්‍රය උගන්නා කල මන්ත්‍රයට කළමනා සත්කාර ඇත. මේ මන්ත්‍රය උගන්නා කල සැමිටියෙන් පාර කිපයක් ගසන්ට උවමැනවයි කියා මුරගාන්ටත් බැරියයි කීහ. බිසවු මන්ත්‍රාසාවෙන් යහපතැයි කීහ. රජ්ජුරුවෝත් කටු සැමිටි ගෙන්වා ළඟ සිටි රාජ පුරුෂයන් ලවා ගෙඩිගස්වන්ට වන්හ. බිසවු පාරකීපයක් ඉවසා මට මන්ත්‍රය එපායි කීහ. එවිට රජ්ජුරුවෝ මා ගිනිවැදත් මන්ත්‍රය උවමැනවයි කීයේයයි පිටතලා ගෙඩි දෙවා තමන් ගෙටස ගියහයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ කරපත්ත ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යයාවසානයෙහි උකටලී භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක. එසමයෙහි සේන නම් රජ්ජුරුවෝ නම් මේ උකටලි භික්ෂූහුය. බිසව් නම් මෙසමයෙහි පුරාණ දුතිකාවෝය. රථය පැද්දාවූ අශ්වයා නම් ශාරිපුත්‍රස්ථවිරය, ශක්‍රව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# නන්දිය මෘග ජාතකය

තවද පරාවාද මර්දන කළාවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ භික්ෂූන් කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ දෙමව්පියන්ට සිඟා ලද්දාවූ ආහාරයන්දී සමහර දවස් සුන්බත්ව ඉඳිනසේක. සැදැහැත්තන්දුන් කඩපොල්ලත්දී මෙසේ නිරන්තරයෙන් දුක්ගෙණ දෙමව්පියන් රකිනාසේක. භික්ෂූන් වහන්සේ මේ මහණ සැදැ ඇත්තන්ගෙන් දුන් ආහාරයද වස්ත්‍රයද ගිහින්ට දී ගිහින් පරිහරණය කරන්නේ යයි සර්වඥයන් වහන්සේට පෑසේක. සර්වඥයන් වහන්සේ සැබෑද මහණ තා ගිහින් පරිහරනය කරන්නේ යයි විචාළාරා වදාළසේක. සැබැව ස්වාමිනි මාගේ දෙමවුපියන් දෙදෙනා පරිහරණය කරන්නේයයි කීසේක. සර්වඥයන් වහන්සේ මේ භික්ෂූ තබා පෙර උත්තමයෝ දෙමව්පියන් පරිහරණය කළාහුය යි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස සාකෙත නුවර කොසොල් රජ්ජුරුවන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ මුවව ඉපිද වාසය කරන්නාහ. ඒ මුව රජ්ජුරුවන්ට නම තබන්නාහු නන්දිය මුව රජ්ජුරුවෝය්යි නම් තුබූහ. එසමයෙහි කෝසල රජ්ජුරුවෝ මුව මාංශයෙහි ඉතා ගිජුව ඇම දවස් මුව දඩෙහිම ලොල්ව ඇවිදිනාහ. මනුෂ්‍යයෝ ගොවිතැන් බත් කරන්නට අවසරයක් නොලබහයි මුව රැලක් ගෙනවිත් උයනේ එ෴ මෝ නම් ගොවිතැන් බත් කරන්ට අවසර ලබන්නමෝ වේදැයි කියා එක් බැද්දක් වටලා දණ්ඩ පත්තේ ගසා මුවන් රැලක් එක්කොට ගෙණ ගොස් බනන්නාහු නන්දිය නම් මුව රජ්ජුරුවෝත් මුවරැල එක්ව දෙමව්පියන් දෙදෙනා මේ බැද්දේ සඟවා මුව රැල හා කැටිවම සාකෙත නුවරට ගියේය. මුවරැල ගෙණ ගොස් අංජනනම් වනයෙහි ලා වට රැකවල් ලවා කෝසල රජ්ජුරුවන්ට ගොස් කියන්නාහු දේවයන් වහන්ස මුවරැලක් ගෙණවිත් අංජන නම් වනයෙහි ලා වට රැකවල්ලා ආම්හ. නුඹවහන්සේ ට අභිප්‍රායක් කළ මැනවැයි රජ්ජුරුවන්ට වැඳ සමුගෙණ තම තමන්ගේ ගම්වලට ගියාහ. රජ්ජුරුවෝත් එතැන්පටන් දවස මුවකු බැගින් මිනිසුන් යවා මරවා ගෙන්වා අනුභව කරන්නාහ. එසමයෙහි බ්‍රාහ්මණයෙක් සාකෙත නුවරට එන්නේය. බෝධිසත්වයන්ගේ දෙමව්පියෝත් තමන් සැඟවී උන් වලින් එලිබැස මග අස සිටියාහු බමුණා දැක කොයින්දැයි විචාරා සාකෙත නුවට යෙමි කී කල්හි එසේවිනම් අපගේ දරුවාන කෙණෙක් සාකෙත නුවර එන්නේය. බෝධිසත්වයන්ගේ දෙමව්පියෝත් තමන් සැඟවී උන් වලින් එලිබැස මග අස සිටියාහු බමුණා දැක කොයියන්නේදැයි විචාරා සාකෙත නුවරට වෙමි කී කල්හි එසේවිනම් අපගේ දරුවාන කෙණෙක් සාකෙත නුවර වසන්නාහ. යම් උත්සාහයෙක සැඟවී අප ඇස පෙණෙන්ට කියවයි කියා ඒ නන්දිය නම් මුවරජ්ජුරුවන්ට කියවයි කියා යැවූහ. ඒ බ්‍රාහ්මණයාත් අංජන නම් වනයට අවුත් මුවන් දැක දෙමව්පියන් රකින්නාවූ නාන්දිය නම්ව මුව රජ්ජුරුවෝ නම් කවුරුදැයි විචාළාහ. මම යයි කී කල්හි මුව රජ්ජුරුවන්ගේ දෙමව්පියන් කියා යවූ සරුප කීහ. මුව රජ්ජුරුවෝත් අසා රජ්ජුරුවන් වහන්සේගේ වනයේ තන පැන් කා රජ්ජුරුවන් වහන්සේට නොකියාම යාම කටයුතු නොවෙයි යම් දවසක රජ්ජුරුවන් වහන්සේට නොකියාම යාම කටයුතු නොවෙයි යම් දවසක රජ්ජුරුවන් වහන්සේ මුවන් මරන්ට ආ සේක් නම් උන් වහන්සේගේ ඊයාපථයට සිට මාගේ ජීවිත දානයත් ඉල්වා ගෙන මුවන් ජීවිත දානයත් ඉල්වා ඇරගෙණ යෙමි. බමුණා අස්වසා යවා සිටියේය. නොබෝ දවසකින් රජ්ජුරුවෝ මුව දඩයමට අවුත් මුවන් දැක දුටුවිට හියලා සිටියාහ. මුවෝ මරණ භයින් තැතිගෙණ දිවගත්හ. බෝධිසත්වයෝ රජ්ජුරුවන්ගේ හී පස්සට හමුව ගොස් සිටියාහ. රජ්ජුරුවෝත් බෝධිසත්වයන් දැක අනර්ඝ වූ රූපය බලා විදගත නොහී සිටියාහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු මහරජ ඇයි මා නොවිද සිටිනා මා තෙල සැරයෙන් විදපියව, මම තොප කෙරේ කනස්සල්ලක් නැත්තෙමි, මෛත්‍රී කෙරෙමි මා විද පියවයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහ. මම විදින්ට සිතන්නමුත් මා ඇතින් සැරය නො හැරෙන්නේමය. මාගේ සැරය තොපගේ ගුණ දත මම තොපගේ ගුණ නොදන්නෙම් කීහ. එවිට බෝධිසත්වයෝ එසේවී නම් මට අභයදානය දෙවයි කියා අභවදානය ඉල්වාගෙණ තමන් වහන්සේගේ මුවත්තත් ජීවිතදානය ඇගෙණ සෙසු සිවුපාවන්ටත් අභය දානය ඉල්වාගෙණ පක්ෂින්ටත් අභය ඉල්වාගෙණ දියෙහි වසන්නාවූ සියලු මච්ජයන්ටත් අභයදානය ඉල්වාගෙණ රජ්ජුරුවන්ට අවවාද කොට රජ්ජුරුවන්ට බණ කියන්නාහු දන්දීමය සිල්රක්ෂා කිරීමය වස්තු පරිත්‍යාගය කිරීමය, ඍජුව අවංකවීමය, මෘදුවිමය, තප්නය, ක්‍රෝධ නොකිරීමය, හිංසා පිඩා නොකිරීමය, ක්ෂාන්තිය යි යන ඉවසීමය, රාජධර්මයට විරුද්ධව නොකිරීමය. දසරාජ ධර්මයට අකෝප්‍යව රාජ්‍ය කරවයි රජ්ජුරුවන්ට අවවාද කියා රජ්ජුරුවන් සමීපයෙහි කීප දවසක් රඳා තමන්ගේ දෙමව්පියන් වසන්නාවූ වනයට

SANHIDA LANKA

ගියාහයි වදාරා එම්බා මහණෙනි ඒ නන්දිය මුව රජ්ජුරුවෝ නම් තමන් දෙමවුපියන් රක්නාවූ කුසලානුභාවයෙන් තුමුත් අභය දානය ලැබ මුවන් ඇතුලුවූ බොහෝ ප්‍රාණීන් මරණින් ගළවා රජ්ජුරුවනුත් ධර්මයෙහි යෙදුවෝ වේදැයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට නන්දිය මෘග ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යය දේශනාවගේ කෙළවර මාතුපෝසක භික්ෂූන් වහන්සේ සෝවාන් වූ සේක. එසමයෙහි බ්‍රාහ්මණයා නම් ශාරිපුත්ත ස්ථවිරය, කෝසල රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය, නන්දිය මුව රජ්ජුරුවන්ගේ පියානෝ නම් සුද්ධෝදන මහරජ්ජුරුවෝ ය, මෑනියෝ නම් මහාමයා දේවිය බොහෝ ප්‍රාණීන්ට අභය ඇර දුන්නාවූ නන්දිය මුව රජ්ජුරුවෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# සුචි ජාතකය

තවද ආකාශයසේ අනන්තවූ ගුණ ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ප්‍රඥා පාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

මෙහි වර්ථමාන කථාව උම්මග්ග ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි වනාහී සර්වඥයන් වහන්සේ පෙරත් තථාගතයෝ මහ නුවනැත්තේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේට දුක්ඛිතවූ කඹුරුවට ඉපිද වැඩිවිය පැමිණ පිටිසර ගමෙක වාසය කරණසේක. ඒ ගම නුදුරු තැනක ගමෙක කුඹුරු දාසෙක් වාසය කරන්නාහ. කුඹුරු දාසය නායකවූ කඹුරෙක් ඇත. ඒ කුඹුරු විහයවීය, රාජවල්ලභය, ඌගේ විශිෂ්ටවූ රූ ඇති දුවක් ඇත්තීය. ඒ කඹුරුගම ඇති ස්ත්‍රියන්ගෙන් වැඩිතරම් රුවින් යුක්තය. නොයෙක් ගම්වලින් කැති පොරෝ නොයෙක් යකඩ කරවන්ට ආ මනුෂ්‍යයෝ ඒ කුඹුරු දුවගේ රුව දැක තමතමන්ගේ ස්ථානවල ඉඳ රූප වර්ණනා කරන්නාහ. බෝධිසත්වයෝ ඇගේ රුව අසා තෘෂ්ණාවසඟව ඈ දැක තමාගේ ගෙට ගෙණෙන්ට උවමැනවයි සිතා යහපත්ව ඉදිකටුවක් ඉදිකොට විද ඒ ඉදිකටුව ලන නියායෙන් කොපු සතක් ඉදිකොට කොපුවෙන් කොපුව ඇතුලේලා ඉදිකටුවත් කොපුවේලා ඇර ගෙණ කඹුරන් දාසක් ඉදිනාගමට ගොස් කඹුරන්ට නායක තැනැත්තන්ගේ දොර කොයිදැයි විචාරා උන්ගේ ගේ දොර මිදුලේ සිට කියන්නාහු සියුම් මූනක් ඇති යසුනුලා උලා මට සිලුටුවූ ඍජුවූ යහපත්වූ ඉදිකටුවක් ඇත. ඒ ගනුවයි කිය කියා සිටියාහ. නායක කඹුරු බත්කාලා වැදහෝත්තේය. ඌගේ දුව තමාගේ පියාට තල්වැටක් සල සලා සිටියහ. බෝධිසත්වයෝ ඉදිකටු ඇරගණුවයි කියන බස අසමින්ම ඇගේ හිස සිය ගණන් පැන්කල වත්කරන්නාමෙන් චිත්තසනොතාෂව මා උන් බලන්ට උවමැනවැයි සිතා තල්වැට බිමතබා බෝධිසත්වයන් කථාව කියන තැනට ගොස් දැක කියන්නේ මෙකියන මානවකය. මේගම කඹුරන් දාසක් වාසයකරණ ගමඋල මේ ගම්තිබා කැති පොරෝ ආදිවූදෙය හා බිලි කටු ඉදිකටු ආදිවූදෙය හා විශේෂවූ ආයුධ හා ඇත. එසේ වූ තැන තොප ඉදිකටු ඇරගෙණ පෙරවරුවන් ඇවිද්දත් ඇරගන්නේ නැත, මෙතන ඇති සියලුයකඩ ඒ ඒ තෙන ගෙණගොස් විකුණන්නාහ. එසේ හෙයින් තොපගේ ඉදිකටුවක් ඇරගෙණ පිටිසරගමකදී විකුණවයි කිව බෝධිසත්වයෝ එවිට කියන්නාහු එඹල කුමාරිකාව මාගේ කර්මාන්තයෙහි විශේෂයත් මා ගත් දුකෙහි විවරත් තොපගේ පියාණන්ට දනෙයි තොපගේ පියානෝ මා කළ කර්මාන්ත දුටුවුනම් තොපත් මට පාවාදී තමන්ගේ ගෙයි සියලු සම්පතුත් මට දෙන්නේ වේදැයි කීහ. මේ කථාව කියන නියාව ඒ කුඹුරන්ට නායක තැනැත්තේ අසා තමාගේ දුව ගෙන්නා විචාරන්නාහු තොප කවුරුන්ලාද කථාකරන්නේයයි විචාළකල්හි ඒ කුමාරිකා කියන්නී එක්තරා මානවකයෙක් ඉදිකටුවක් ඇරගෙණ ඉදිකටුව ගනුවයි කිය කියා සිටින්නේ යයි කිව, ඒ අසා කාඹුරුනායක තැනැත්තේ උන් මෙතනට කැඳවයි කියා කයේය එවිට බෝධිසත්වයෝ එතනට අවුත් කඹුරුනායකයානන් වැඳලා සිටියහ. කඹුරුනායක තොපි කවුදැයි විචාළ කල්හි මම අවල්ගම කඹුරුනන්ගේ පුත කීමියි කියේය. එවිට කුඹුරුනායක තොපි කුමට අවුදැයි විචාළාහ. බෝධිසත්වයෝ කියන්නාහු ඉදිකටුවක් ඉදිකොටලිම් ඒ ඉදිකටුව ඇරගෙණ පානනියා ආමි කීයේය. කඹුරුනායක ඒ අසා කියන්නේ තෝ ඉදිකළ ඉදිකටුව ගෙණවයි කී කල්හි බෝධිසත්වයෝ ඉදිකටුව ඇරගෙණ මේ ගම ඇති කඹුරන් එක්වූ කල පාමි තනිව නොපාමි කී කල්හි ගම ඇති කඹුරන එකසි එක්වූ ගමනේ කඹුරුනායකයාණන් අතට දුන්හ. කඹුරුනායකයානෝ ඉදිකටුව බලා මේද තොපි ඉදිකළ ඉදිකටුවදැයි විචාළාහ. එසේය තෙල කොපුවය ඉදිකටුව ඇතුලේ යයි කීහ. කඹුරුනායකයා කොපුව අයන්ට උත්තාහකොට ඉදිකටුව අතට කොපුව අයාගත නුහුනුවාහ. බෝධිසත්වයෝ කොපුවෙන් කොපුව ආයකොපුසත කඹුරුනායකයානන් ඉදිරියේ තබා ඉදිකටුව බෝධිසත්වයෝ කඹුරුනායකයානන් අතට දුන්හ. එතනට එක්වූ දාසක් කඹුරෝ හා කඹුරුනායයානන් හා පිළිහිස සිසාරා අසුරුන්දි බොහෝ සතුටුව මේ ඉදිකටුයේ තරය කින්දැයි විචාළාහ. බෝධිසත්වයෝ ඉදිකටුව තරය පානානියායෙන් කිණිහිරක් ගෙන්වා ඒ කිණිහිර මුදුනෙහි ඉදිකටුව කුලකින් ගැසු ගමනේ කිණිහිර බැඳගෙණ පල්ලෙ තිබූ මඩෙහි පෙණෙයි ඉල්පෙමින් තිබූයේය. එවිට කඹුරන් හා කඹුරුනායකයානෝ පළමු නියාවට දියනක්ම චිත්තසනොතාෂව පිළිඉස සිසාරා අසුරුසන්දි සතුටුව කඹුරුනායකයානෝ තමන් විශේෂ රූ ඇත්තාවූ දුවනියන් පාවාදී තමන්ගේ බොහෝ සම්පතුත් දී බෝධිසත්වයන්ට පාවා දුන්හ. කඹුරුනායකයානෝ නොබෝ

SANHIDA LANKA

කලකින් මළහ බෝධිසත්වයෝ ඒ කඹුරු දහසට නායකවුහයි වදාරා මේ සූචි ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කඹුරු දූ නම් යසෝධරා ස්ථවිරයය. එසමයෙහි කඹුරුව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# තුඩිල ජාතකය

තවද මහපොළොවසේ විපුලවූ ගුණ ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ වේළුවනාරාමයහි වැඩ වසන සමයෙහි මරණභිරුක භික්ෂු කෙණකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද යත්

එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ රාත්‍රී ස්ථාන දිවාස්ථාන චංක්‍රමන ස්ථානයට ගියතෙන පරඬලාපතත්වත් කොටුවක්වත් පක්ෂිකෙණෙකුන් අඬාපුවක් වත් අසා මරණභයින්න හිරුකව වාසය කරණ කල්හි මේ කථාව දම්සභාමණ්ඩපයේ රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩඋන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා සර්වඥයන් වහන්සේ මහණෙනි මේ භික්ෂුහු දැන්මතුනොවෙයි පළමුත් මරණභයින් යුක්තව විසුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක් ඊරියකසේ කුස පිළිසිඳගත් කල්හි නොබෝකලනින් වැදූහ. දෙවැනිව කුඩා ඌරුපැටියෙකුත් වැදූහ. ඌරු පැටියන් දෙන්නා තුරුල්ලේ ලාගණ ඊරිය වැදොත්තැනට මැල්ලක් තමාගේ කපුසේනට ගොසින් කපුකඩාගෙණ එනතැනැත්තී ඊරිය වැදොත්තෙනට ආවා, ඊරිය තමා මරති යන භයින් පැටියන් දෙන්නා වැදොත්තදී පළාගියහ. මැලි ඌරුපැටියන් දෙන්නාගෙණ මහපැටියාට මහා ඩිලයෝය කුඩා පැටියාට කුඩාතුඩිලයෝයයි නම් තිබා ඌරු පැටියන් දෙන්නා පුත්‍ර ප්‍රේමයෙන් වඩන්නේය. එසමයෙහි රාසොඬුන් එක් දවසක් රා බී මාංශනොලැබ අසවල් මැල්ලාගේ ගෙයි ඌරෝ ඇත. උන් අතින් ඇරගෙණ මරාකම්මැයි කියා අවුත් කියන්නාහ. මැල්ල තොපගේ ගෙයි වඩන ඌරෝ ඇත අපගෙන් මිල ඇරගෙණ උන්දෙවයි කීහ. මැලි කියන්නී මාගේ දරුවන් දීපියා දමා සම්පත් ලබන්නේයයි කියා නොගිවිස්සා රා සොඬු මැල්ල රා පොවා මත්කොට කියන්නාහු අපට ඌරන් දෙව්වැයි විචාළේය. මැලි රා බී මත්ව යාපත දෙමි ඉනුත් මාගේ වැඩිමහළු තුඩිලයන් නොදෙමි කුඩා තුඩිලයන් දෙමි කීහ. යහපතැයි මැලි පුත්චුල්ල කුඩිලයෙනි මැත එවයි අගාළුහ. බෝධිසත්වයෝ සිතන්නාහු මාගේ මැනියෝ මෙතෙක් දවසක් පළමුවෙන් මට අඬාගාතොත් විනා චුල්ල තුඩිල්ලයන් අඬනොගාතිය අද යම්සේ මැනියන්ට භයෙක් ඇතමැනවැයි සිතා මල තුඩිලයෙනි තොපගේ මැනියෝ තොපට අඬගාතියි ඔබට යවයි කිව. යහපතැයි චුල්ල තුඩිලයෝ මැනියන් සිටිනා තැනට වෙවුලා බෑනන් කරා ගියහ. මහතුඩිලයෝ කින්දැයි විචාළකල මැනියන් හා රා සොඬු වටකොට ගෙණ සිටිනියාවත් බත් ඔරු තිබූනියාවත් දැක භයින් ත්‍රස්තව දිවආම් කීහ. බෝධිසත්වයෝ මළනුවන්ට කියන්නාහු මල ඌරන් ගෝනන් මුවන් ආදීවූ සිව්පාවන් වඩන්නේ අනික් නිසා නොවෙයි යමෙක්වේලේ මරන්ටමය එසේ පැමිණ මරණට හිරුකවිමෙන් කම්කිම්දැයි කියන්නාහු අවවාද බරණැස් නුවර මුලුල්ලට සැලව ගිය හෙයින් රජ්ජුරුවන් හා නුවරවාසීන් එක්වී බෝධි සත්වයන් උන්නාවූ බැද්ද වට කොට ගත්හ. බෝධිසත්වයෝ මලනුවන්ට අවවාද කියන්නාහු මලනුවෙනි යහපත්ව පැදී තිබෙන පැනෙන් ඉස්සෝදා නාහා ඇඟ කුණු ඇර පියව ශරීරයේ නොයෙක් සුගන්ධයන් ගාගනුවයි අවවාද කීහ. එවිට කුඩා කුඩිලයෝ කියන්නාහු අපගේ ඌරන්ගෙන් කුනුඅරවා වාසය කළ කෙණෙක් ඇද්ද? ශරීරයෙහි යහපත් සුගන්ධය ගෑ කෙණෙකුන් නැතිව ඉන්දදී බෑනන් වහන්ස. මේ කුමට කියන කාරණයෙක් දැයි විචාළාහ. බෝධිසත්වයෝ එවිට මා කීයේ විලට බැස අකුසල් නැමති ශරීර මලය පහකොට කුසල් නැමති මනාවූ තොටට බැස නාහා සියලු දවස් ශරීරය නොහැර පවත්නාවූ සිල් නැමති සුගන්ධය ශරීර යේ ගල්වන්ට මා කියේ යයි කියා මලනුවෙනි යම් කෙනෙකුන් අකුසලයක් කෙරෙත් නම් ඊට සතුටුවිමෙන් දුක් බොහෝ දෙලොවටම පැමිණෙන්නේය. යම් කෙණකුන් කුසලයක් කෙරෙත් නම් ඊට සතුටු වීමෙන් දෙලොවම සැප එලවන්නේය. එසේ හෙයින් අකුසලය කරණ කෙණෙකුන්ටවත් සිතන කෙණෙකුන්ටවත් සතුටුවීමෙන් මරණාසන්නයෙහිත් සෙසු වේලෙහිත් මහාභය පැමිණෙන්නේය. එසේහෙයින් එසේවූ අකුසලය ශීල නමැති සුගන්ධය ශරීරයේ ගල්වා ගනුවයි කීය. බෝධිසත්වයන් බුද්ධවිලාසයෙන් ඉඳ කියන්නාවූ අවවාද රජ්ජුරුවෝ අසා මහා සමාධිව බෝධිසත්වයන් යහපත් ඉනකඩකුත් අඳවා මාණික්‍යාභරණයකුත් පලඳවා බෝධිසත්වයන් වැවූ මැල්ලටත් බොහෝ සම්පත් දී බෝධිසත්වයන් හා මලනුවන් ද බරණැස් නුවරට ගෙණගොස් රජගෙයි ඉන්නට සලස්වා සියලු අධිකරණ ආදීවූ යුක්ති අයුක්ති බෝධිසත්වයන් විචාරා මැදහත්ව නිශ්චයකොට සියලු මනුෂ්‍යයන්ට පන්සිල් අටසිල් ආදීවූ දානාධ්‍යසයෙහි පිහිටුවා අපායට යානොදී සුගතියට පමුණවන්නාහ. බොහෝ කලකින් බරණැස් රජ්ජුරුවෝ මළහ. බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට කළමනා ආදාහණ කෘත්‍යකොට නිමවා ඉක්බිති අධිකරණ

SANHIDA LANKA

ශාස්ත්‍රය බෝධිසත්වයෝ පොත් බලා ලියවා මේ නියාවට අධිකරණ ඉදිරියේ විචාරවයි කියා නුවරවාසීන් එක්කරවා බොහෝ මනුෂ්‍යයන්ට අවවාද කියා බෝධිසත්වයන් හා මලනුවෝ බොහෝ මනුෂ්‍යයන් අඬ අඬා සිටියදී තමන්ගේ පළමුවිසූ වනාන්තරයට ගියහ. එදා උෟරුතුඩින් වදාළ බණ සැටදහසක් අවුරුදු පැවැත්තේ යයි වදාරා මේ තුඩිල ජාතකය නිමවා වදාළසේක. මේ දේශනාවසානයෙහි මරණ හිරුක භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය. එසමයෙහි චුල්ලතුඩිල්ල කුමාරයෝ නම් හිරුක භික්ෂුහුය. එසමයෙහි මහාතුඩිල්ලව උපන්නෙම් බුදුවූ මම්ම වේදයි වදාළසේක.

SANHIDA LANKA

# මය්හ ජාතකය

තවද චාමිකර සවිරණයට බඳුවූ ශරීර ඇති ස්ර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ආගන්තුක සිටානකෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

ආගන්තුක එක් සිටානකෙණෙකුන්ට බොහෝ සම්පත් ඇත්තේය. මසුරු වූහ. අනුන්ට දාහුයක් විවර නොදෙන්නාහ. ලෝභිය. ඒ සිටානෝ කල්යාමකින් එක්තරා ව්‍යාධියක් ඇතිව නටහ. ඒ සිටානන්ට පසු උන්ගේ සම්පත් රජගෙට අදින්නවුන්ට සත්රූ සත්දවාලක් ගියේය. රජ්ජුරුවෝ ඒ පරක්කු වෙන් බුදුන් කරා නොගොස් සත්දවසක් ඉකුත්වූ කල්හි සර්වඥයන් වහන්සේ කරා ගියහ. සර්වඥයන් වහන්සේ මහරජ මෙතෙක් දවස් පමාවුනැයි විචාරා වදාළසේක. ස්වාමිනි. අපගේ ආගන්තුක සිටානෝ නටහ. උන්ගේ සම්පත් අපගේ ගෙට අදිනවුන්ට සත්දවසකගියේය. එහෙයින් අවසර මඳ හෙයින් නො ආමි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු ස්වාමිනි මේ සිටානන් මෙතෙක් සම්පත් ඇතිව දන් නොදෙන්ට කාරණා කිම්ද? මෙතෙක් සම්පත් ඇති වන්ට කාරණා කිම්දැයි කීහ. සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහරජ මේ සිටානෝ එක් ජාතියෙක සිටුව ඉපිද තරගසිඛි නම් පසේ බුදුන් වහන්සේ විථියෙහි සිඟා වඩිනා දැක සිටානෝ උන්වහන්සේ ගෙට කැඳවාගෙණ ගොස් ගෙය ඇත්තන්ට කියා රජගෙට ගොස් එනකලට පසේ බුදුන් වහන්සේ දන් පිළිගෙණ සිටානන් ඉදිරියට වැඩිසේක.

සිටානෝ පසේබුදුන් වහන්සේ දැක දන් ලද්දේ ඇද්දැයි විචාරා එසේය. මහසිටානෙනි. දන් ලදුම්හයි කීසේක. සිටානෝ පාත්‍රය බලා මේ බත් මුන් වහන්සේට දුන්නේය. මාගෙන් එක් මනුෂ්‍යයෙක් මේ බත් කෑයේ නම් මට බොහෝ මෙහෙවර කරන්නේ වේද. මුන් වහන්සේට මේ දීමෙන් ප්‍රයෝජන කින්දැයි සිතූහ. දන්දුන් විපාකයෙන් සම්පත් ලද්දාහ. අන්තිම අවස්ථාවෙහි සිතිවිල්ල නපුරුව ගියහෙයින් සම්පතහි ප්‍රයෝජන විඳින්ටත් නොලද්දේයයි වදාළසේක. එවිට රජ්ජුරුවෝ කියන්නාහු ඒ වන්නා එසේමය. ඒ සිටානන්ට දරුකෙණෙකුන් ඇතිනුවුයේ මක්නිසාද විචාළහ. දරුකෙණෙකුන් ඇතිනුවුයේත් උන්නිසාමයයි ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වාදළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ගිහිගෙයහැර තාපසවූසේක. මලනුවන්ද බෝධිසත්වයන් වහන්සේගේ පුතනුවන් වඩා පෝෂ්‍ය කරන්නාහ. නොබෝ කලකින් උත්තමයන්ටත් දරුකෙනෙකුන් උපන්නාහ. උන් වැඩිවිය පැමිණිකල්හි මාගේ බෑනන් වහන්සේගේ පුතනුවන්ට කොටසකුත් මාගේ දරුවන්ට කොටසකුත් මාගේ සම්පත් දෙන්ට උවමැනවයි එසේහෙයින් දම්ම මරාපුවොත් යහපතැයි සිතා තමන්ගේ බෑනන්ගේ පුතනුවන් කැන්දාගෙන නාන්ටයම්හයි. පොකුණට ගොස් බෝධිසත්වයන් වහන්සේගේ පුතනුවන් දියෙහි ඔබා මරූහ. බෑදෑනියෝ විචාරන්නාහු ඇයි ස්වාමිනි මාගේ දරුවෝ කොයිදැයි විචාරන්නා නාන්ට බටගමනේ දිය බී මළහයි කියන්නා අඬා වැලප උන්නාහ.බෝධිසත්වයෝ මාගේ දානය පවතීදෝහෝයි දවසින් බලා දන්හාළුත් විදා මෙසේවූ අකර්මනයකුත් සැලසුනු නියාව දිවසින් දැක තාපසයන් වහන්සේ එතනට අවුත් පනවනලද ආසනයෙහි වැඩඋන්සේක. එවිට සිටානෝ තාපසයන් වැඳ එකස්පස්ව උන්නාහ. එවිට තාපසයන් වහන්සේ මාගේ පුතනුවෝ කොයිදැයි විචාරාවදාළසේක. සිටානෝ කියන්නාහු දියකෙළින්ටලා පොකුණට ගිය ගමනේ දියෙහි මළහයි කීහ. එවිට තාපසසේ කියන්නාහූ තොපල එසේ කියන්ට කාරණා කින්ද තොපගේ සම්පත් දෙකොටසක්ව බෙදෙම්දැයි තොපි නොවේද දියෙහි ඔබා මැරුවා. යයි කියා එඹා මේ සම්පත් නම් එක්කෙනෙකුන් සන්තක දෙයක් නොවෙයි හිමාලය වනයෙහි මහිසනම් පක්ෂියෙක් ගසින් ගසට පැණ මේත් මාගේයයි මේත් මාගේයයි කියති. උන්පසු පස්සෙහි පක්ෂීහු ඵල අනුභව කරන්න. තොපගේ සිතිවිල්ලෙන් ඒ පක්ෂීන් මෙන් මෙසේ අස්ථිර සම්පතකට මෙසේ වූ ප්‍රාණවධයක් නොකළෝවේදැයි මල නුවන්ට මතු මෙසේවූ වධයක් නොකරවිය අවවාද කියා හිමාල වනයට ගියාහ. එසමයෙහි සිටානෝ නම් මේ සිටානෝය. සිටානන්ගේ බෑනෝ නම් බුදුවූ මම්ම යයි වදාළසේක්.

SANHIDA LANKA

# ස්වර්ණ කර්කටක ජාතකය

තවද බැලූ බැලූවන් ඇස් නිමවන මනහර රූ ඇති සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ආනන්ද ස්ථවිර අරහයා මේ ජාතකය දක්වන ලද

ඒ කේසේද යත්

එක් දවසක් දම්සභාවේ රැස්වූ භික්ෂූන් වහන්සේ ආනන්ද ස්ථවිරයෝ සර්වඥයන් වහන්සේ මරන්ට එන්නාවූ ධනපාලයා ඉදිරියේ සිට ජීවිත පරිත්‍යාග කළෝ වේදැයි කිය කියා වැඩ උන් ප්‍රස්ථාවට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා ඒපවත් අසා දැන් මතු නොවෙයි මහණෙනි පෙරත් ජීවිත පරිත්‍යාග කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

රජගහ නුවර සාලින්දිය නම් ගම බෝධිසත්වයෝ බ්‍රහ්මණ කුලයක ඉපද වාසය කරන්නාහු දාසක් කිරියෙහි ඇවිදි ගොයම් බලන්නා හා ගොයම් බලා ඒ කුඹුරු අසා පොකුණෙහි ඇස මූන සෝදන්නා හා ඒ පොකුණෙහි රන්වන් කකුළුවෙක් වාසය කරන්නේය. බෝධිසත්වයෝ කකුළුවා ඉනලාගෙණ කුඹුරට ඇවිද ගෙට යන කල පොකුණට ඇර යන්නාහ. ඒ කිරියෙහි එක් තල්ගසක් උඩ වාසය කරන්නාවූ එක් කැව්ඩියක් තමාගේ කවුඩාට කියන්නී මේ බ්‍රහ්මණයාගේ පස්පැදිස්නාවූ ඇස් සඟල මට උපුටා දෙව, ඒ නොලදින් නම් මාගේ ජීවිතය නොලබමි කීව. එවිට කපුටුවා කියන්නේ නොමළා තැනැත්තවුගේ ඇස්දෙක කෙසේ උපුටා දෙම්දැයි කියාත් නො වළකින හෙයින් ඒ තල්ගස සමීපයෙහි තුඹුසෙක වාසය කරන්නාවූ නයෙකු ඒ දොළ පසිඳ මැනවැයි කිව. යහපතැයි ගිවිස පසු බෝධිසත්වයෝ කෙත්වත් බලන්ට යන්නාහු පොකුණට බැස ඇස මූන සෝධා රන්වන් කකුළුවානන් උත්තර සාටකයෙහි ලා එන්නාවූ බෝධිසත්වයන් සර්පයා තන අස්සේ සැඟවී බලා වැද හෙව පාදපිට දෂ්ටකොට තමා වැදොත්තාවූ තුඹසට පළා ගියේය. බෝධිසත්වයෝ විෂ මෑච්ඡාවෙන් වැටී උන්නහ. බෝධිසත්වයෝ වැටීමත් කකුළුවා බිමපිට පීනීමත් කපුටුවා බෝධිසත්වයන්ගේ ඇස්දෙක උපුටන්ට ඇවිත් ලයමත්තෙහි ඉඳීමත් එක්ෂණයෙහි ම විය. කකුළුවානෝ මේ කාරණය දැක මුන් නිසා මාගේ මිත්‍රයානන්ට වූ අලාභයකැ යි සිතා කපුටුවාගේ බොටුව නලින් අල්වා ගෙණ තරකොට මැඩළුහ. එවිට කපුටුවා සර්පයාට කියන්නේ රන්වන්වූ ශරීරයක් ඇත් ශරීරය පිටතින් නික්ම තිබෙන්නාවූ ඇස් ඇති නල දෙකක් ඇති ඇටම සම්කොට ඇත්තාවූ ලොම් හට නො ගත්තාවූ කකුළුවෙක් මාගේ බොටුව කතුරකින් මඩිනාක්මෙන් මඩිනේය. මා මරහුට ඇරපියා කොයි ගියාද වහා අවුත් මා ගලවා ගණුවයි සර්පයාට අඬගා කීහ. එවිට සර්ප රාජයා තමාගේ යහළුවා කී බස් අසා පෙණය මහත්කොට සුස්මමින් තමාගේ යහළුවා ගාවට ආය. එවිට කකුළුවා සර්පයාත් අඬුවෙන් ඩැගත. එවිට සර්ප රාජයා කියන්නේ එම්බා කකුළුවානෙනි. තොපට සර්පයන්ගේ මාංශයෙනුත් කම් නැත. කළමනා කවර කාරණයක් නිසා අප දෙන්නා අඬුවෙන් ඩැගතු දැයි විචාළේය. එවිට කකුළුවා කියන්නේ එම්බල මේ පුරුෂයා මාගේ ඉෂ්ට මිත්‍රයාය එසේහෙයින් ඌට පැමිණි මරණය මට පැමිණියා හාත් ශරීරය ඒ කාරණය නිසා කකුළුවාන්ගේ මාංශය නම් ඉතා කුලල්ව මොලොක්ව තිබෙන්නේය. ඒ මාංශය මනුෂ්‍යයෝත් කැමති වන්නාහ. කපුටුවෝත් බිඳකති. මුන් නැතිවිට මටත් බොහෝ උපද්‍රා වන්නේය. එසේහෙයින් මාගේ යාළුවූ බ්‍රහ්මණයානන්ගේ විෂබාන්නා උන් නිර්වාධි කරණ නිසා තොප දෙන්නා අඬුවෙන් ඇල්වීම් කිහ. එවිට සර්පයා උපායක් කියා අපි දෙන්නාම ගැලවී පළායම්හයි සිතා කියන්නේ එම්බා කකුළුවානෙනි. අපි දෙන්නාම ඇර පියන්නා විෂයත් උරාගෙණ පලා යම්ම අපි දෙන්නාම ඇරපියවෙයි කීහ. එවිට කකුළුවා සිතන්නේ මා වංඥාකොට ලා දෙන්නාම ගැළම් පළායන්ට උපායක් සිතූ නියාවේද එසේ නොහරම්යි සිතා කියන්නේ කපුටුවා තමාම නොහරිම් තොපත් විෂය ඇරගන්නා විචරට මඳක් ලිහිල් කෙරෙමියි. මාගේ යහළු බ්‍රාහ්මණයානන් නිව්‍යාධි කරවා සිටිවිට තොප දෙන්නා අරම් කියා කවුඩාත් තරකොට ඩැගෙණ සර්පයා මඳක් ලිහිල්කොට විෂය උරාගෙණ බෝධිසත්වයන් නිර්ව්‍යාධිව නැගී සිට කල්හි කකුළුවානෝ සිතන්නාහු මේ දුර්ජනයන් දෙන්නා ඇරපිනම් මත මාගේ යාළුවාට උපද්‍රව වන්නේ වේදැයි සිතා කතුරකින් ඇඹුල දණ්ඩ කපන්නාක්මෙන් කපුටුවාගේ ඉසටියත් නයාගේ ඉසටියක් පොලු ගසා එලුහ. බෝධිසත්වයෝත් මළාවූ නාගයාගේ කඳ ලියක අවුලා තුඹසෙහි ලා කකුළුවානන් එනතුරු පටලාගෙණ පොකුණට ඇර ඉස්සෝධා නාහා ගෙට ගියහ. කකුළුවානන් හා බෝධිසත්වයන් හා එවක්පටන් මිත්‍ර සන්තවය නතරවිය. කැව්ඩිත් එතනින් ඔබ්බට ගියහයි වදාරා මේ සව්ර්ණකර්කටක ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

එසමයෙහි කැව්ඩි නම් කිඤ්ඤවිමානවිකාය. කවුඩා නම් දේවදත්ත ස්ථවිරය. නයා නම් වසවර්ති මාරයයා. කකුළුවා නම් සුවාසුදහසක් ධරම්ස්කන්ධයට භාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරය. බ්‍රහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාල සේක.

SANHIDA LANKA

# ධජ විහෙඨ ජාතකය

වද දයාවට භාජනවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලෝකාර්ථචර්යාව අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද යත්

මෙහි වර්ථමාන කථාව කණ්හ ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය. මෙහි වනාහී ජාතක කතාවේ යටගිය දවස බරණස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහ. එසමයෙහි විද්‍යාධරයෙක් තමාගේ මන්ත්‍රානුභාවයෙන් රජගෙට වැද බිසවුන්හා ලෝකාස්වාද රතියෙහි යෙදී වාසය කරන්නේ බිසව් රජ්ජුරුවන්ට කියන්නාහු ස්වාමිනි රාත්‍රියෙහි ආගමනේ ලෝකාස්වාද රතියෙහි යෙදී උදෑසනයනගමනේ බිසව් ඉඟුලෝ අතගාලා විද්‍යාධරයා පිට අත එබූහ. රජ්ජුරුවෝ නුවර වාසීන්ට කියන්නාහු පිට ඉඟුල් අල්ලක් ඔබාඑෑ පුරුෂයෙකු දුටුවොතින් අල්වාගෙණ එවයි කීහ. විද්‍යාධරයා  උදෑසන සමසාන එත පයින් සිට සූර්යදිව්‍යපුත්‍රයන් වඳිමින් සිටියේය. රාජපුරුෂයෝ බලාගෙණ ගියාහු සමසානයෙහි සිටි පුරුෂ සූර්ය දිව්‍යපුත්‍ර වඳිනවුන් දැක වටලා ගෙණ අල්වන්ට වන්නාහ. විද්‍යාධර තමා අල්වන නියාව දැන මන්ත්‍රය සිහිකොට ආකාශයෙන් ගියේය. රජ්ජුරුවෝ එපවත් අසා කෙසේකෙණෙක්දැයි විචාළාහ. ස්වාමිනි ඉස මුඩුවෝය, තාපසකෙනෙකුන් සැටියයි කිහ රජ්ජුරුවෝ තපස්විකෙණෙකුන් මේ නුව ඉන්ද නොදෙවයි කියා රටින් තොරකළහ. එතැන් පටන් කුසල් කිරීමේ නැතිව අකුසලය බොහෝ කොට මනුෂ්‍යයෝ නරක යෙහි උපන්නාහු ශක්‍රයෝ තමන් දිව්‍යලෝකයෙහි උපදින උන් නැතිහෙයින් බරණැස් නුවරට අවුත් මේ නුවර තපස්වීකෙණෙකුන්වත් මෙලොව පරලොව මේයයි කියා බණදහමක් කියන කෙණෙකුන්වත් දනක් පිනක් කියා කරවන කෙණෙකුන් නැතිහෙයින් වේද මනුෂයෝ නරකයේ උපදින්නේයයි සිතා ශක්‍රයෝ නන්දමූලක ප්‍රාබාහරයට ගොස් බසේ බුදුන් වහන්සේගෙන් වැඩිමාළු පසේ බුදු කෙණෙකුන් වහන්සේ කැඳවාගෙණ ශක්‍රයෝ තුමු තරුණ මානවිකාවේශයක් මවාගෙණ පාත්‍රය ඇරගෙණ පසේ බුදුන් වහන්සේ ඉදිරිකොට ලා ආකාශයෙන් අවුත් බරණැස් නුවර තුන් විටක් ප්‍රදක්ෂිණාකොට රජ්ජුරුවන්ගේ රජගෙයි සිටියාහ. බොහෝ මනුෂ්‍යයෝ දෙදෙනාවහන්සේ දැක රජ්ජුරුවන්ට වයොවෘද්ධ තපස්වී කෙනෙකුන්සේත් තරුණ මානවක කෙනෙකුත් වහන්සේත් නමස්කාර කොට සිටිනාසේකැයි කීහ. රජ්ජුරුවෝත් එපවත් අසා අවුත් ශක්‍රයන් ආකාශයෙහි සිටියන් දැක කියන්නාහු මානවකය තෝ වනාහී බැළුවන්ට අප්‍රිය කරවූ ජින්නභින්න පටෂාරීවූ මාළුභික්ෂූකෙනෙකුන් වහන්සේට වැඳගෙණ සිටිනේ කවර කාරණයක් නිසාද මුන් වහන්සේගේ නම කවරේද තොපගේ නම කවරේදැයි විචාළාහ. ශක්‍රයෝ රජ්ජුරුවෙනි මුන් වහන්සේගේ නම මුන්වහන්සේ දැක්කදීම කියනොහෙමි. මාගේ නම කියමි. මම නම්  දෙදෙව්ලොවට නායකයාවූ ශක්‍රයෝ වෙමි. මුන්වහන්සේ පසේ බුදුන් වහන්සේයයි කීහ. එවිට රජ්ජුැවෝ කියන්නාහු දිව්‍යරාජොත්තමයානන් වහන්සේට වඳින්නේ පුදන්නේ කුමක් නිසාද නැසය කමත්කාද නොහොත් කවර කාරණයක් නිසාදැයි විචාළේය. ශක්‍රයෝ කියන්නාහු මුන්වහන්සේ මා වඳින්නේ පුදන්නේ නැසීයකමක් තකා නොවෙයි වැදීමෙන් පිදිමෙන් සවර්ගමෝක්ෂය සැප හා සියලු ඉෂ්ඨාර්ත සිද්ධවනහෙයින් හා කුල මූලික වූ පසේ බුදුන් වහන්සේ නිනමස්කාර කරම්හයි ශක්‍රයෝ කිහ. රජ්ජුරුවෝ එපවත් අසා ශක්‍රයෙනි පසේබුදුන් වහන්සේ හා තපස්වීන් වහන්සේ වැඳිම් විපාක ඇසිමි එසේ හෙයින් මෙතැන් පටන් තපස්වී වරයන් වහන්සේට දන් දෙමි වඳිමි පුදමි කීහ. පසේ බුදුන් වහන්සේ රජ්ජුරුවෙනි තපස්වීවරයන් නිසා සැලසුනු කිලුටෙක් නොවෙයි විද්‍යාධරයකු නිසාවූ කිලුටය, තපස්වීන් කෙරේ දානාමානාදීවූ කුසල් කරවයි අවවාද කියා පසේ බුදුන්වහන්සේ නන්ද මූලික ප්‍රාබාහාරයට වැඩිසේක. ශක්‍රයෝ තමන්ගේ ශක්‍රභවනයට ගියේය. රජ්ජුරුවෝ නුවරින් පිටත පලාගිය තපස්වීවරයන් වහන්සේ ගෙන්වා පුණ්‍ය සම්භාරයන් රැස්කොට දිව්‍යලෝකයෙහි උපන්නාහයි වදාරා මේ ධජවිහෙඨ ජාතකය නිමවා වුදාළසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි ශක්‍රයෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# පුෂ්පගන්ධ ජාතකය

තවද ජම්බූනද ස්වර්ණයට බඳුවූ ශරීර ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයයෙහි වැඩ වසන සමයෙහි එක් මල් පිදීමක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් භික්ෂූකෙණෙකුන් ජේතවනාරාමයෙන් පිටිසර වස්වසන්ට ගොස් වස්වැස එනසේක් එක් විලක මල්සුගන්ධයක් අස අසා අඝ්‍රාණය කොට සිටිසේක් එක් දේවතාවෙක් එතනට අවුත් ඇයි භික්ෂූකෙනෙකුන් නුඹ වහන්සේට මල් සුගන්ධයෙන් ප්‍රයොජන ඇද්ද මල් පලඳිනා අභිප්‍රායක් ඇද්දැයි කීහ. භික්ෂූන් වහන්සේට කී බසින් එතන නොසිට ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේට එපවත් කීසේක. සර්වඥයන් වහන්සේ දැන්මතු නෙවෙයි මහණෙනි දෙවතාවා පෙර උත්තමයන්ටත් කුකුස් ඉපදවූයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජ්‍යකරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ එක් බ්‍රාහ්මණ ගමෙක ඉපද ඍෂි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව වාසය කරණසේක් එක් දවසක් එක් පොකුණක් දැක ඒ පොකුණෙහි නාන්ට බැස නානසේක් එක් පියුමක් දැක ඒ පියුමලඟට ගොස් ඒ පියුම ඉඹ ඉඹ සිටිසේක. එවිට දේවතා දුවක් කියනනී ඇයි තාපසයෙනි තොප අදත්තාදානයෙන් ප්‍රයෝජන විඳින්ට කාරණාකින්දැයි කිව, එවිට තාපසයෝ කියන්නාහු පියුම් කඩාගත්තා නැත කැවා නැත ඊඹපු පමණකින් අදත්තාදානයවෙන්ට කාරණා කින්දැයි කීහ. අනුන්සන්තක විල මල් ඉඹී කල මේ අදත්තාදානය නොවේදැයි කීහ. ඒ වෙලාවට එක් පුරුෂයෙක් අවුත් විලට බැස මල් කඩා අලත් උදුර ඇඹුල දඹුත් කඩන්නට වන. එවිට බෝධිසත්වයෝ මල ඉඹපුවාට අදත්තාදානයයි කිව මලුත් කඩා අලත් උදුරණ තැනැත්තවුවට බැණනෙනැගෙයි සිතා දේවතාදුවට කියන්නාහු ඇයි තෝ මට මල ආඝ්‍රාණය කළපමණින් අදත්තාදානයයි කිව. මේ පුරුෂයාට බැණ නොනැගෙන්නේ ඇයිදැයි කීහ. එවිට දේවතා දූ කියන්නී එම්බා තාපසයෙනි කිරෙහි කසලක් හුනුකලක් පෙණෙයි සුදුකඩෙහි ගැලුනු කසලක් නමුත් පෙණෙයි කසලේ දූ කසලක් නොපෙණෙයි කිලුටු කඩෙහි ගැලුනු කසලක් නොපෙණෙයි එසේ මම අසත්පුරුෂයා කුමක් කලත් වැරදි කියනොහැක්ක තොප තාපසව යහපතක්ම කරණය නියැලී ඉඳිනා තැනැත්තන් හෙයින් තොපගේ වේසය නියාවට දවස් අරින්ට උවමැනවයි කිව. බෝධිසත්වයෝ දේවතා දූ කී බසට සමාධිව මෙයින් මතු මාගේ වැරැද්දක් දුටුකල කියවයි කීහ. දේවතා දූ කියන්නී මම තොපගේ වරද බලා පසුපස්සේ ඇවිදිම්ද තොප රකිනා ඍෂිප්‍රව්‍රජ්ජාව නියාවට සිහි ඇතිව වාසය කරවයි කිව, බෝධිසත්වයෝත් දේවතා දූ කී අවවාදය සිතෙහි තබා පංඥාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයට ගියහයි වදාරා මේ චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ පුෂ්පගන්ධ ජාතකය නිමවා වදාළ සේක. චතුස්සත්‍යය දේශනාවගේ කෙළවර ඒ භික්ෂූන් වහන්සේ සෝවාන් වූ සේක. එසමයෙහි දෙවතා දූ නම් උපුල්වන් මහාස්ථවිරය. තාපසව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# විඝාත ජාතකය

තවද සත්ගුණ මහාසවර්ණයක් බඳුවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ක්‍රිඩා ශිලිවූ භික්‍ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සර්වඥයන් වහන්සේ මතුමාලේ ප්‍රාසාදයෙහි වැඩ වසන සමයෙහි සාමණේර භික්ෂු කෙණෙකුන් වහන්සේ එක්ව යටමාලේ කෙළිනා අරගල අසා සර්වඥයන් වහන්සේ මුගලන් සාමින් ගෙන්වා මෞද්ගල්‍යාණය සාමණේරයන්ගේ ක්‍රිඩාව නවතාලවයි වදාළසේක. යහපතැයි මුගලන් සාමි යටමාලේ ඇඟිලිදෙකින් සොලවා භයගැන්වූසේක. ඒ කථාව දම්සභාමණ්ඩපයේ රැස්වූ භික්ෂූන් වහන්සේ කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාර වදාරා එපවත් අසා දැන් මතුනොවෙයි පෙරත් අශික්ෂිතව වාසය කරන්නවුන් පෙර උත්තමයෝ ඉක්මවුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්සේක. එසමයෙහි සත්බෑ කෙණෙක් ශක්‍රයෝ එපවත් දැන තාපසවරුන් ඉඳිනා මණ්ඩපයට අවුත් ඉඳ කියන්නාහ විඝාත නොවන තාපසවරුන්ට නමස්කාර කරම්හයි කිහ. ඉන් එක් තාපසයෙක් කුමක්දැයි විචාළේය. එවිට අවශේෂයෝ අප ඇමට නමස්කාර කෙරෙම්යි කියයි කිය එවිට ගිරවා කියන්නේ තොප ඇමට නොවෙයි මා කියේ විඝාතනොවන තාපසවරුන්ටයයි කීහ. එවිට තාපසවරු කියන්නාහු අපට වඩා අනික් තාපසකෙණෙක් ඇද්ද? අපි සිංහ ව්‍යාඝ්‍රයයන් කෑ ඇටකා දවස් අරිනෝය. අපගෙන් කවර අඩුවක් ඇතිව කියවුද අපට වඩා අනික්කවර තාපසකෙණෙක් ඇද්දැයි කීහ. එවිට ගිරවා කියන්නේ තොප ඇමනොයෙක් දෙනා කා ඉතිරි මාංශය කන්නාම තපස්ද? තපස්නනම් තමාලත් දෙයක් දන්දී සුශිලව වාසය කිරීමය. තොප ඇම ක්‍රිඩාශිලිව වාසය කිරීම දුශ්ශිලභාව යයි මෙතැන් පටන් එලෙස නොකරවයි තාපසවරුන්ට අවවාද කියා ක්‍රීඩා ශිලිකම් අරවා තමන්ගේ ශක්‍රභවනයට ගියමයි වදාරා මේ විඝාත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි සත්බෑයෝ නම් මේ ක්‍රිඩා ශිලි භික්ෂූහුය. ශක්‍රදේවේන්ද්‍රව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# වට්ටක ජාතකය

තවද සිතු සිතවන් සිත් නිමවන මනහර ගුණ ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලෝභිවූ භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

ලෝභි භික්ෂු කෙණෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට දක්වන්නා මහණෙනි මේ භික්ෂු දැන්මතු නොවෙයි පළමුත් ලෝභිව ඇත්කුණු මිණි කුණු ආදිවූ දෙය බොහෝ ව කමින් සිට තෘෂ්ණා වසඟව වනාන්තරයට ගියෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ  සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ වටුව ඉපද වනානාතරයෙහි වාසය කරණසේක. එක් කපුටෙක් බරණැස් නුවර ඉඳ ඇත්කුණු මීණි කුණු ආදීවු දෙය කමින් සිටි තෘස්ණාවසඟයෙන් වනාන්තරයට වැද බෝධිසත්වයන් මහත්වූ ශරීර ඇතව වාසය කරන්නාවූ වෘක්‍ෂය සමීපයට ගොස් උන්නේය. බෝධිසත්වයෝ සාමිචි නිසා කපුටුවානන් දැක ඇයි මයිලනුවෙනි මනුෂ්‍යභවනගේ නොයෙක් ඛාද්‍ය භෝජ්‍ය ඇතිව සැපසේ වාසය කළ කල දුර්වලවූයේ කවර කාරණයකින්දැයි විචාළාහ. කපුටුවා කියන්නේ නොයෙක් ඛද්‍ය භොජ්‍ය කැවත් මනුෂ්‍යයන් කාපුදෙයක් වහා දිරා නොයක් ආයාසයට පැමිණෙන හෙයින් දුර්වලව ගියෙමි. තෙපි කවර කාරණයක් නිසා මෙසේ මහත්වූ ශරීරයක් ඇතිසේක්දැයි විචාළාහ. එවිට වටුවා කියන්නේ අපිනම් අල්ප සන්තෝෂ සමහ. යම්තම් ආහාරයක් ලබන්නා ඉන්ම යපී යම්හ. අනිත් ආහාරයක් තව සොයන්නට උවමැනවැයි යන තෘෂ්ණාවක් නැත. එහෙයින් අපගේ චිත්තසන් තෝෂව තිබෙන හෙයින් ශරීරයක් ථුලව තිබෙයි  වදාරා මේ වට්ටක ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කපුටුවානම් මේ ලෝභී භික්ෂුහුය. එසමයෙහි වටුවා නම් බුදුවූ මම් යයි වදාළසේක. මේ ජාතකය අවසානයෙහි ලොල් භික්ෂූන් වහන්සේ සෝවාන් වුසේක.

SANHIDA LANKA

# කාක ජාතකය

තවද අසන්නවුන් කන්හි අමා නමන මධුර ධර්මදේශනා ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනා සමයෙහි ලෝභී භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වනාහි වර්ථමාන කථාව යට කියන ලද ජාතකවල පෙනෙන්නේය. මෙහි වනාහි.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ පරෙවිව උපන්නාහ. බෝධිසත්වයන් බරණැස් නුවර අරක්කැමියෙක් ගෙණවුත් වඩනේය. කවුඩකුත් බෝධිසත්වයන් උන් මැදිරියට අවුත් උන්නේය. කවුඩා අල්වාගෙණ පළමු ජාතකවල කිවාක්මෙන්ම නොයෙක් වධ පමුණවා ශරීරයේ පියාකොළ ඇම උදුරවා දම්මා සුදුපැකොට ඇති බෙල්ලේ කැබිලිත්තකුත් විද අමුණුවා බැඳ එතන ලා ගියහ. බෝධිසත්වයෝ කවුඩානන් දැක කියන්නේ නාපිතයන් ගෙන්වා ශරීරයේ ලොමුත් බා ඉන්ද්‍රනීල මාණික්‍යකුත් කරබැඳ කළඳැ යහපතැයි කිහ කපුටුවා කියන්නේ නාපිතයන් ගෙන්වා ලොමුත් බාවා ඉන්ද්‍රනීල මාණික්‍යකුත් තොපගේ කර බන්දවම්දැයි කියා විචාළේය. බෝධිසත්වයෝ කියන්නාහු මෙසේවූ ලොම් බැවිලිත් මෙසේවූ ඉන්ද්‍රනීලමානික්‍යයත් තටමවේද තරම් මට ඉන් ප්‍රයොජන කිම්දැයි කිහ. කපුටුවා කියන්නේ බොහෝ දෙන ඉන්ද්‍රනීල මානික්‍ය පලඳිති වෙහෙසන නිසා මේ කැබිලිත්ත විද කරබැන්දේ යයි කීහ. බෝධිසත්වයෝ මෙසේවූ දුස්ටයන් ඉඳිනා තැන ඉඳිම කාරණා නොවෙයි කියා වනාන්තරයට ගියහයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යය දේශනාවගේ කෙළවර ඒ ලොල් භික්ෂූන් වහන්සේ ආනාගාමි වූසේක. එසමයෙහි කවුඩානම් මේ ලෝභි වූ භික්ෂූහුය. එසමයෙහි පරෙවිව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# කුක්කු ජාතකය

ඒ කෙසේද යත්

අසන්නවුන්ගේ කන්හි අමානමන මධුර දේශනා ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි රජෝවාදයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

මේ කථාව විස්තර වශයෙන් තෙසකුණ ජාතකයෙහි පෙණෙන්නේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුසාසනා කරණ අමාත්‍ය ධුරයේ උපන්සේක. ඒ රජ වනාහි දශරාජ ධර්මයෙන් විරුද්ධව තමන් සිතුදෙයක්ම කරන්නේය. රාජ්ජය අධර්මයෙන් පිළි පන්නේය. බෝධිසත්වයන් වහන්සේ මේ රජ්ජුරුවන්ගේ අභිප්‍රාය කාරණයකින් ගිවිස්වා අරවාලතොත් විනා අවවාද කියා අරවාලිය නොහැක්කැයි සිතා කාරණා සොයන්නාහූ ඒ අවස්ථාවෙහි රජ්ජුරුවෝ එක් දවසක් උයන්බලන්ට ගියහ. උයනේ රජ්ජුරුවන් අමුතුව කරන්නාවූ මඩපයෙක් ඇත්තේය. රජ්ජුරුවෝ මඩපකර්මාන්ත බලන්ටයයි ඇතුලට වන්නාහූ ගොණැස් උරවාතුබූ කැණිමඬුල්ල දක වැටියේදෝහෝයි සිතා මෑතට අවුත් බෝධිසත්වයන් කැඳවා කියන්නාහූ එම්බා අමාත්‍යයානෙනි මේ කැණමඩල නොවැටෙන්ට කාරණා කිම්දැයි කීහ. බෝධිසත්වයෝත් රජ්ජුරුවන් වහන්සේට අවවාදය කින්නාට යහපත් කාරණායයි සිතා කියන්නාහූ දේවයන්වහන්ස, මේ එලය හැර යහපත්ව සැසහැර තරව උරවන ලද්දාවූ ගොනැස්බලයෙන් මඬුල්ල රඳන්නේය. කැණිමඩල බලයෙන් ගොනැස්ස නොවැටෙන්නේය. දේවයන් වහන්ස කැණිමඩල නම් රජ්ජුරුවන් වැන්නේය ගොනැස්සනම් අමාත්‍යමඩලයා වැන්නේය ඉන් එක් ගොනැස්සෙක් දිරාගිය නමුත් ඒ දිශාවට කැණිමඩල නැමියන්නේය. එමෙන් එක අමාත්‍යයෙකුට වැඩීමෙකුවීනමුත් රජදරුවන් වහන්ස්ට අලාභවන්නේ නොවෙයි. ලොකපාලවූ රජදරුවන් විසින් අමාත්‍ය මණ්ඩලය ඇතුළුවූ සියළු ප්‍රජාව නොමිරිකා දශරාජ ධර්මයට අකොපාව රාජ්ජය කළ යුත්තේයයි බෝධිසත්වයෝ කීහ. රජ්ජුරුවෝ බෝධිසත්වයන් කී බසට සතුටුව උන්අවස්ථාවට එක් පුරුෂයෙක් ලප්නාරංගෙඩියක් ගෙණවුත් රජ්ජුරුවන් අතටදින, බෝධිසත්වයෝත් මෙයිත් අවවාද කියන්ට නිසිකාරණයෙකැයි සිතා දේවයන් වහන්ස මේ ලප්නාරන්ගෙඩිය නුවැත්තේ තිත්තත් අර ඇඹුලත් ඇර අනුභව කෙරෙද්ද? නුඹ වහන්සේත් පැවැත ආ රාජධර්මය නොහැර රාජ්‍යවාසීන් ගෙන් කරවුවර ගතමනා දෙයහැරගෙණ රාජ්‍යවාසීන්ගෙන් අන්‍යායාගේ අර්ථය නුපදවනසේක්ද? ලප්නාරන්ගෙඩිය පොත්ත තුනීවිනම් තිත්ත රසවන්නේය. මස් ඝනවීනම් අමුල්රසවන්නේය තිත්තත් නොවි මස් අනුභවකරන්නාමෙන් රාජ්ජවාසින්ගේ කරවුවරගෙණ රට කන්නා රජ්ජුරුවන් අමාත්‍ය මණ්ඩලයා සිත් ගන්නාහයි බෝධිසත්වයෝ කීහ. බෝධිසත්වයන් කි බසට සතුටුව කථාකොට මඟුල් පොකුණට ගියහ. මගුල්පොකුණෙහි යහපත් පියුමක් පිපී දියට රියනක් විතර උස්ව සිටියේය. රජ්ජුරුවෝ කියන්නාහූ එම්බා අමාත්‍යයාණෙනි දිය හා මඩ ආධාරකොට ඇතිවූ මේ පියුම මඩෙහිත් දියෙහිත් දෙකින් වෙන් වෙන්ව පිපෙන්ට කාරණා කිම්දැයි විචාළාහ. බෝධිසත්වයන් වහන්සේත් එවිට කියන්නාහූ දේවයන් වහන්ස ලොකපාලවූ රජදරුවන් වහන්සේත් ලෝභ වේෂ මෝහ මද මානමාත්සර්යය යන සියල්ලෝම මේ පියුම පරිද්දෙන් ඇලීමක් නැතිව දශරාජධර්මයෙන් රාජ්ජය කරණසේක් වීනම් බ්‍රාහ්මණ, වෛශ්‍ය ග්‍රහපති යන සියල්ලෝම රජදරුවන් වහන්සේට ඉතා පක්ෂවන්නාහයි කීහ. රජ්ජුරුවෝත් බෝධිසත්වයන් කී අවවාදයෙහි පැහැද එතැන්පටන් දශරාජධර්මයෙන් අකොපාව දානාශිලාදී පින්කම්කොට දෙව්ලොව ගියහයි වදාරා මේ කුක්කු ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය, එසමයෙහි රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මනෝජ ජාතකය

තවද සිංගීවසර්ණයක් බඳුවූ සර්වඥයන්වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් විපක්ෂශීලී භික්‍ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන් වහන්සේගේ භික්‍ෂු කෙණෙකුන් වහන්සේ හා එක්ව හිතව වාසය කරණ සේක. මේ කාරණය එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ මේ මහණ කැඳවා ගෙණගොස් සර්වඥයන් වහන්සේට පැසේක. සැබෑද මහණැයි විචාරා වදාරා සැබැව ස්වාමීනි කී කල්හි දන්මතු නොවෙයි මහණෙනි පෙරත් මේ මහණ විපක්‍ෂ ශිලිව වාසය කළේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි එක් වනයක සිංහයෙකු හා සිංහ ධේනුවක් වාසය කරන්නීය. ඒ සිංහ ධේනුව දුවකු හා පුතකු වැදූහ. සිංහපෝතකයාට මනෝජ යයි නම් තුබූහ. ඒ සිංහයා වැඩිවිය පැමිණ කල අනික් සිංහ ධේනුවක් බිරින්දව ගෙණවිත් තබා මව්පියන් දෙදෙනා නැගනියන්ද බිරින්ද ද තුමූද යන පස්දෙනාටද ගොදුරු සොයා ගෙණවිත් දී රකිනාහ. එසමයෙහි එක්දවසක් ඒ මනෝජ් නම් සිංහයානන් ගොදරු සොයා ගෙණනේනට යන කල්හි එක් ගිරි නම් කැනහිලෙක් සිංහයා ඉදිරියට පැමිණියේය.තමා එනයන තැනක් නැතිහෙයින් සිංහයා වැඳගණඹත්තේය. සිංහයානෝත් හමුව කිමෙක්දැයි විචාරා නුඹවහන්සේට සේවයට ආමි කීකල්හි යහපතැයි තමන් වාසය කරන්නාවූ ගල්ලෙනට කැන්දාගෙණ ගියහ. සිංහයානන්ගේ පියවූ සිංහ රජ්ජුරුවෝ මේ නිචවූ සිඟාලයා කුමට කැන්දාගෙණ ගියහ. සිංහයානන්ගේ පියවූ සිංහ රජ්ජුරුවෝ මේ නිච වු සිඟලයා කුමට ගෙණාවුදැයි පුතනුවන්ට කීහ. මනොජ් නම් සිංහයානෝ පියානන් කීබස නොගිවිසම සිඟාලයා පෙෂ්‍ය කරන්නාහ. ඒ සිඟාලයා එක් දවසක් සිංහරජ්ජුරුවන්ට කියන්නේ සෙසු මස්කා අභ්‍යාසයෙමි අස්මස් කෑවා නැත. ස්වාමිනි මට අසකු අල්වා දුනමැනවයි කීහ. රජ්ජුරුවෝ යහපතැයි කියා විචාරන්නාවූ අසුන් ඇත්තේ කොයිදැයි විචාළාහ. කැණහිල් කියන්නේ බරණැස් ගඟ නාන්ට බරණැස් රජ්ජුරුවන්ගේ අසුන් ගෙණෙන්නාහ. ඉන් එකෙකු අල්වා ගෙණ එවයි කීහ. සිංහරජ්ජුරුවෝත් යහපතැයි බරණැස් ගඟ සමීපයට ගොස් නාන්ට ගෙණා අසුන්ගෙන් එකෙකු බෙල්ලබිඳ පිටට දමා ගෙණ ගල්ලෙනට ගොණගොස් මෑනියන් ඇතුළු ඇමදෙනාටත් බෙදාදී තමනුත් කා කැණහිලාටත් දුන්හ. වැඩිමාළු සිංහ රජ්ජුරුවෝ පුතනුවන් අතින් මේ අස්මස් කෑ සිංහයන් ගෙන් බොහෝ කලක් ජිවත්වූ කෙණෙක් නැත. අස්සුනම් රාජවාහනය. රජදරුවෝ තමන්ගේ රාජවාහනයට උපද්‍රා වූ කල කිපී විද්දවායති. යම් උපායකින් නසවතී මෙවක්පටන් අසුන්ගේමාංශය නොකවයි සිංහරජ්ජුරුවෝත් පියානන් කීවා නොකොට අසුන් අල්වා කන්නාහ. රජ්ජුරුවෝත් අසුන් ගෙන්වා රාජාංගනයේ අස්සල බැඳ ඇතුලේ පොකුණක් බිඳුවා අසුන් නාවන නියායෙන් සලස්වා තමන්ගේ දුනුවායන්ට විධානය කරන්නාහූ මාගේ අසුන් කා වනසන්නාවූ සිංහයා විදුවයි දුනුවායන්ට විධානය කළහ. දුනුවායෝත් යහපතැයි සිංහයා එන වේලාව පරීක්ෂා කොට ඇවිදිනාහූ පවුරු පැනනැග එන්නාවූ සිංහයා දැක දුන් විද්දමෝ නම් සැහැල්ලු හෙයින් වැරදයෙයි අස අල්වාගෙණ යනකල විදුම්හයි සිතා අසතු අල්වාගෙණ පැනයන්නාවූ සිංහයාට පස්සෙන් විද ඉදිරියෙන්  දඬවලා විද්දාහ. සිංහයාත් මරණභයින් මහත්කොට අඬගසා තමාගේ ගල්ගෙටම පිනීය. විදි තැනැත්තේ සිංහයා විද්දෙමි අඬගැසීය කැණහිලා සිංහයා මරණභයින් ගැසූ අඬත් අසා මනුෂ්‍යයා ගැසූ අඬත් අසා සිතන්නේ යාළුවූ සිංහයානෝ මළේයඨ මා ජීවත්වන්ට උපායකුත් නැත, මිය පරලොව ගියවුන් හා ඉතිකින් කවර විශ්වාසයක්ද මා අනිත් තැනකයෙමි සිතා පලාගියහ, සිංහයාත් තමාගේ ගල්ලෙනම වැටීහින සිංහයානන්ගේ මව් පියෝ දෙන්නත් නැගනියෝත් බිරින්දත් සතරදෙන සිංහයා වටකොටගෙණ ඉඳ කියන්නාහූ පුරීවු දුෂ්ටවූ ගිරිනම් සිඟාලයා කීවාකොට මනෝජ නම් සිංහයාත් විනාසයට පැමිණියෝවේද යම්සේ අසත්පුරුෂයන් හා සංවාසය නොකරවයි කී අවවාද නොගිවිස මාගේ පුත්වූ මනෝජ් නම් සිංහ රාජයා මරණයට පැමිණියෝයයි සිංහරාජයානෝ කීහ. සිංහයාගේ මෑනියෝ කියන්නාහූ යම්සේ වැදූ දරුවෝ නොකීකරුවෝ නම් මෑනියෝ උන් කෙරෙහි ඇල්මක් නැත්තාහ. මාගේ පුත් වූ මනෝජ නම් සිංහරාජයා කිවා නොකොට අසත්පුරුෂයාගේ බස් ගිවිස ලේ කටින් දමා වැද්දොත්තේ මේ දැයි කීහ. සිංහයානන්ගේ නැගනියෝ කියන්නාවූ යම්කෙණෙක් පාපිෂට යන්ගේ බස් ගෙණ කිරෙද්ද.  මෑනියන් වහන්සේ කීවාමෙන්ම මාගේ බෑණාන් වහන්සේට පැමිණියාමෙන් මරණයට පැමිනෙන්නේ වේදැයි කීහ. සිංහයානන්ගේ බිරින්ද කියන්නාහූ යම්සේ උත්තමයෝ උත්තමයන් හා භොජ්නය කෙරෙද්ද නීචයෝ නිචයන් හා වාසය කෙරෙද්ද නිචයා හා උත්තමයා කරන්නාවූ භජනය මේ දෙකම කුමක් මෙන්ද? යත් සිවුපාවන්ට

SANHIDA LANKA

ගියේයයි කීහ. ඒ අභිප්‍රාව දක්වන්නාවූ සර්වඥයන් වහන්සේ එඹා මහණෙනි නිචයා නිචයාම සෙවුනා ලබන්නේය. උත්තමයා හා නිචයාගේ විශ්වාසයද සිඟාලය හා සිංහයා මෙනැයි වදාරා මේ මනෝජ ජාතකය නිමවා වදාළසේක. ඒ විපක්ෂීල භික්ෂූන්වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් මාර්ගයට පැමිණිසේක. එසමයෙහි සිංහයා නම් මේ භික්ෂූහුය. සිංහයාට විශ්වාසව උන්නාවූ කැණහිලා නම් දේවදත්ත ස්ථවිරය, සිංහයාගේ බිරින්ද නම් ඛේමා නම් ස්ථවිරිය, සිංහයාගේ නැගනියෝ නම් යසෝධරා ස්ථවිරිය. සිංහයාගේ පියාවූ සිංහයා නම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# සුතනු ජාතකය

තවද ධර්මාධිපතිවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මව්පිය දෙදෙනාට උපස්ථානකරන්නාවූ භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වර්ථමාන කථාව විස්තර වශයෙන් සාමජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහී

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සෙ දුක්පත් ගොවිකුලයක උපන්සේක. උන්වහන්සේට නම් තබන්නාහූ සතනුකුමාරයෝ යයි නම් තුබූහ. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ අමාත්‍ය මණ්ඩලය හා සමග සේනාව ඇරගෙණ දඩයමට ගොස් එක් බැද්දක් වටකොටගෙණ රැකවල්ලවා විධාන කරන්නාහු යම් එකකු සිටිනාතැනින් මුවෙක් පළාගියේ නම් අඟු කරවමි හයගන්වා කොටුපතෙක තුමු සිටියහ. එක් එණිමුවෙක් රජ්ජුරුවන් සිටිකඩින් ඉදිරියට එන්නේය. රජ්ජුරුවෝත් විෂපෙවූ කුණුගිය දුනුපිටිලා ඇද මුවාට විද්දාහ. මුවා හිය වළහා හිය වැදහොත්තා මේන අඟවා වැටී හීන රජ්ජුරුවාත් මුවා විත්කා වැටහීනැයි සිතා ලගට ගියහ. රජ්ජුරුවන් ලඟ එන්නාවූ මුවා සිට දිවගත. වටසිටියෝ රජ්ජුරුවන් වහන්සේ සිටි තැනින් මුවා පළාගියේ යයි කියා වෙහෙසූහ. රජ්ජුරුවෝත් ලජ්ජාවී කඩුව අතට ගෙණ මුවා ලුහුබඳවා ගෙණ තුන් යොදනෙක ගොස් මුවා අසුකොට කඩුවෙන් දෙපළුකොට සිතන්නාහූ මුවා මැරූ නියාව කී නමුත් නුවරවාසී අදහා නොගණිති මුවා කදට බැද කරතබාගෙණ එන්නාහූ බරණැස් නුවරට නුදුරුතැන නුගගසක් මුල සැතපී ඉද යන්නට වන්නාහූ ඒ නුග ගසෙහි වසන මඛාදේව නම් යක්‍ෂයෙක් රජ්ජුරුවන් කරා ගොස් දඩමස්කද අල්වා රඳවා යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ ඇයි කුමක්නිසා රැඳවිදැයි විචාළාහ. යක්ෂයා කියන්නේ මේ නුගසෙවනයට වන්කෙණෙකුන් කණ තියායෙන් වෙසවුණු රජ්ජුරුවන්ගෙන් වරලදිමි මට ගොදුරු ව යානොහැක්කැයි කීය. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ මම එසේ කිනම් එකෙකිම් නොවෙමි. බරණැස් රජෙමි, අද මට මේ දඩමස් කද ගෙණ මා නුවරට යව්ව, තොපට දවස බත්තලියක් හා මිනිසකු එවමි කීහ. යක්‍ෂයාත් යහපතැයි ගිවිස රජ්ජුරුවන් නුවරට යැවීය. රජ්ජුරුවෝත් නුවරට ගොස් තමන් වැඩපසන්නා අමාත්‍යයකුට කීහ. අමාත්‍යයා කියන්නේ ස්වාමිනි අවධිය කීයේ ඇයිදැයි කීහ. රජ්ජුරුවෝත් නැතැයි කීය. අමාත්‍යයා කියන්නාහූ අවධියක් නොකියේ වැරැද්දැයි එසේවුවත් භයනොකළමැනව. නුඹ වහන්සේගේ ජීවිතය රැකදේමි. මට සිරගෙය දුන මැනවයි සිරගෙය ඇරගෙණ විධානය කරන්නාහූ රැකෙන්නා කැමති කෙණෙක් මේ බත්තලිය යක්ෂයාට දෙමි කියා යවන්නාහූ මෙම නියායෙන් තිරනතරයෙන් බත්තලියක් හා මිනිසකු බිලිදීමෙන් සිරගෙයි මනුෂ්‍යයෝත් නිමාවත් අමාත්‍යයා එපවත් රජ්ජුරුවන් වහනසේට කියා රජ්ජුරුවන් වහන්සේට කියා රජ්ජුරුවෝත් එපවත් අසා ජීවිතයට වඩා මනුෂ්‍යයෝ අර්ථයෙහි ලෝභ ඇත්තාහ. දහසින් බැඳි පියල්ලක් ඇතු පිට තබා මේ අයුරින් දහස ඇරගෙණ යක්ෂයාට බත්තලිය දෙවයි නුවර බෙරලවා මසුරන් දහස ඇරගත් කෙණෙක් ඇත්නම් ඌ අත බත්තලිය යවයි කීහ. අමාත්‍යයාත් එලෙස කළේය. බෝධිසත්වයන් වහන්සේ ඒ මසුරන් දහස ගෙණ යක්ෂයාට බත්තලිය දෙවයි නුවර බෙරලැවූ මසුරන් දහස ගෙණ මෑනියන්දෑට දී සිතන්නාහූ මේ මසුරන් දහස මෑනියන්දෑට දී ගියකළ යක්ෂයා දමනයෙහි ලා ගතහොතින් නම් බොහෝ සම්පත් ලැබෙමි. නැත මේ යක්ෂයාට බිලිවෙමි. මසුරන් දහස කිප දවසක් රැකෙන්ට ඇත්තේ වේදැයි සිතා මෑනියන්වහන්ස මම යක්ෂයාට බත්තලියක් ඇරගෙණ යෙමි කීහ. එවිට මෑනියන්දෑ කියන්නාහූ පුතඬ තොප කී මසුරන් දාසෙන් මට ප්‍රයෝජන නැත යක්ෂයා ලඟට තොපි නොයවයි කීහ. බෝධිසත්වයෝ කියන්නාහූ මෑනියන් වහන්ස භය නොකළමැනව, ඒ යක්ෂයා දමනයේලා අඬන්නාවූ නුඹවහන්සේගේ මූන සිනා සෙමින් එමි. මෑනියන් වහන්සේ කීපවාරයෙක කීවාවූ අවවාද නොගිවිස අස්වසා රජ්ජුරුවන් හා සමඟ රජගෙට ගියහ. රජ්ජුරුවෝත් දරුව තොපට උවමනා කිම්දැයි කීහ. ස්වාමිනි නුඹවහන්සේගේ මිරිවැඩිසඟල උවමැනවයි කීහ. කවර කාරණයකට දැයි කීහ. දේවයන් වහන්ස යක්ෂයා සන්තක බිම නොසිටිනා නිසයි කීහ. යහපතැයි මිරිවැඩි සඟලදී තව කුමක් උවමනාදැයි කීහ. සේසත උවමැනවැයි කීහ. ඒ කවරක්දැයි විචාළාහ. යක්‍ෂයාගේ ඡායාවට යට නොසිටිනා නිසායයි කීහ. යහපතැයි සේසතත් දී තව කුමක් උවමනාදැයි කීහ. ස්වාමිනි නුඹවහන්සේගේ මගුල්කඩුව උවමැනවයි කීහ. කවරකටදැයි විචාළාහ යක්ෂයා භයගන්වා ආරක්ෂාවටයයි කීහ. යහපතැයි කඩුවටත් දී තවකුමක් උවමැනාදැයි කීහ. නුඹවහන්සේගේ රන්තලියේ නුඹවහන්සේ මෙනිමවන්ට සපයන ලද රසමසවුලෙන් යුක්තවූ භෝජනය ලා දුන මැනවයි කීහ. ඒ කවරටදැයි රජ්ජුරුවෝ විචාළාහ. මා තරම් නුවනැත්තාවූ පුරුෂයකු ගෙණයන්නාවූ බත් ලෝ තලියෙන් සමාන බත ගෙණයාම යුක්ත නොවන හෙයිනැයි කීහ. රජ්ජුරුවෝ යහපතැයි රන්තලියේ බත් ලවා සරහාදී මෙකියන සියල්ලම ගෙණයන්ට මිනිසුන් සලස්වාදී යවුහ. බෝධිසත්වයෝත් මේ හැම ඇරගෙණ නික්ම ගොස් නුගගස සමීපයේදී මිනිසුන් රඳවා බත්තලිය අතට ගෙණ රන්මිරිවැඩි සඟල පයලා සේසත අතට ගෙණ කඩුව උරයේ බහාගෙණ බත්තලිය බිම තබා කඩුව අතට ගෙණ කඩුපතින් ඉත්තලිය නුග ඡායාව යටට කොට මේ ගස වසන්නාවූ මඛාදේව නම් යක්ෂයා අපගේ

SANHIDA LANKA

රජ්ජුරුවන්ගෙන් එවන ලද රසමසවුලෙන් යුක්තවූ මේ තිය ඇරගෙණුවයි අඬගැසීය. එවිට යක්ෂයා සිතන්නේ මෙතෙක්දා එන්නාවූ පුරුෂයන්සේ නොවෙයි වංචාප්‍රයෝග දන්නාඑකෙක, මා වංචා කොට ගැලවීයෙම් සිතාය යි කියා කියන්නේ තා ඉවත සිට කථාකරන්නේ ඇයිද, නුගගස යට සිට මා හා කථාකරව, බත්තලියත් මාගේය. තොපිත් මාගේ සන්තකමය, බත්තලියත් කම් තොපිත් කම්යි කීය. එවිට බෝධිසත්වයෝ කියන්නාහු එඹල රාක්ෂසය මා කයි නම් තටමය අඩුව බරණැස් නුවර මට වඩා නුවනැති පුරුෂයෙක් නැත. එසේ වූ සුතනුකුමාරයන් වැනි නුවනැති ගුණ ඇති පුරුෂයකු කාපු රාක්ෂසසයා අප තිබාදැයි කියා සෙට පටන් තට ගෙණෙනා බත්තලියත් නැත. මිනිසාත් නැත. ඉදින් මා නොකා අලවුනම් තොපට නිරන්තරයෙන් එවට බත්තලිය එවම් ඉදින් මා කන්ට සිතී නමුත් කෑ නැත, තාගේ බිම මා නොසිටිහෙයිනුත් තාගේ ඡායාව නොසිටි හෙයිනුත් කෑ නැත. නුගගස ඡායාවට වන්කෙණෙකුන් විනා කෑ නැති හෙයිනුත් තමාම කෑ නැත. ඉදිම් නොනවත අයිනම් කඩුවෙන් දෙකඩකෙරෙම් ඉඳින් අපගේ රජ්ජුරුවන්වහන්සේ ගොස් අල්වාගනිම්යි කී නමුත් තාගේ නුග ඡායාවෙන් ඉවත්ව සිටිහෙයින් කෑ නොහැක්කයි කීහ. එවිට යක්ෂයා මුන් කිසේ සැබෑව මුන් කෑයේ වින් නම් සෙට පටන් මට ගෙණන බත් තලියත්, මිනිසාත් නැත. එයින් අලාභයයි මා ගොසින් රජ්ජුරුවන් ඇල්ලිය නොහැක්කැයි මුන්කියේ කටයුතු යයි සිතා යහපත තාගේ ජීවිතදානය දිනිම් තෙල තලියත් සේසතත් කඩුවත් මිරිවැඩි සඟලත් රජ්ජුරුවන්ට දී ආඬන්නාවූ මැනියන් සතුටුකරවයි කීහ තොපි ගොසින් සෙට පටන් මට එවන බත් තලිය හා මිනිසා එවයි කීහ. එවිට බෝධිසත්වයෝ යක්ෂයා මාගේ බසට ලැබින මාසිතුවා මුදුන්පත්වීයයි සිතා එවිට කියන්නාහූ එම්බල යක්ෂවා ප්‍රාණඝාත කිරීම නම් මෙලෝ පරලෝ දෙකින්ම අලාභවන කටයුත්තය, ප්‍රාණඝාතාදීය නොකරවයි යක්ෂයා දමනයේ ලාගෙණ මෙතන වනයේ වාසයකොට කම් කිම්ද බරණැස් නුවර වාසල්දොර දේවාලයක් සරහා රජ්ජුරුවන් වහන්සේට කියා දෙවමින් යක්ෂයා ලවා සේසත්ද රන් තලියද ගෙන්වාගෙණ නුවරට නික්මුණාහ. මග දුටු දුටුවෝ සුතනුමාන වකයෝ මබාදේව නම් යක්ෂයාද දමනයේ ලාගෙණ එතියි නුවර වාසීන්ට කීහ. නුවරවාසීහූ රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝත් සතුටුව අමාත්‍ය මණ්ඩලය හා සේනාව පිරිවරා සුතනුමානවකයන් ඉදිරියට පෙර ගමන් කොට ගොසින් බෝධිසත්වයන් දැක සතුටුව රාක්‍ෂයාට වාසල්දොර දෙවොල යක්කර නුවර සියල්ලවුන්ගෙන් බත් දෙවනලෙස දි සලස්වා නුවරට ගොස් සුතනුමානවකයන්ගේ ගුණ කියන්නාහූ එම්බා අමාත්‍යයෙනි මාගේ ජිවිතය රැකදුන්නේත් නුවරවාසීන්ට සැපත දුන්නේත් සුතනුමානවකයන් නිසායයි ගුණ කියා බෝධිසත්වයන් වහන්සේට සෙනෙවිරත් තනතුරු දී ඒ තැන් පටන් බෝධිසත්වයන්ගේ අනුශාසනායෙහි දශරාජ ධර්මයෙන් රාජ්‍යකොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ සුතනුජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි රාක්‍ෂසයා නම් අංගුලිමාල මහා ස්ථවිරය. බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. සුතනුමානවකයෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේකී.

SANHIDA LANKA

## ද්විතීය ගිජ්ඣ ජාතකය

තවද ධම්මරත්නාකර වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මව්පියන්ට උපස්ථාන කරන්නාවූ භික්ෂූ කෙණෙකුන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

හේ කෙසේද යත්

එක් භික්ෂූකෙනෙකුන් වහන්සේ දෙමව්පියටන්ට උපස්ථාන කරණ සේක. භික්ෂූන්වහන්සේ සර්වඥයන් වහන්සේට එපවත් දැන්වූ සේක. සර්වඥයන් වහන්සේ දැන් මතු නොවෙයි මහණෙනි පෙර උත්තමයෝත් දෙමව්පියන්ට උපස්ථාන කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාල සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ගිජු ලිහිණිව ඉපිද අන්ධ වූ දෙමව්පියන් රක්නාහ. බරණැස් නුවර එක් වැද්දෙක් අමුසොහොනක් සමීපයෙහි මලක් ලාලීය. බෝධිසත්වයෝ ගොදුරු සොයා ඇවිදිනාහු ඒ මලකරලාගෙණමලෙහි බැඳී තමන් මලබැඳී සෝකයට වඩා තමන්ගේ දුක නොසිතා දෙමව්පියන්ගේ දුක සිතා අඬන්නාවූ අනේ මාගේ දෙමව්පියන් දෙදෙනා මා මල බැඳුනු නියාව නොදනිති ගොදුරු සොයාලන කෙනෙකුත් නැතදුක්බයෙත් ගල්ලෙන ඒ ඒ තැන වැටී අඬන්නාහයි කියා තමන්ගේ දුක් නොසිතා දෙමව්පියන්ගේ දුකට හැඬුහ. එවිට වැදි එතනට අවුත් බෝධිසත්වයන් අඬන අඬ අසා කියන්නේ ගිජුලිහිණියන් මනුෂ්‍ය භාෂාවෙන් කථාකරන්නාවුන් දුටු විරූත් නැත. ඇසූ විරූත් නැත තොපි තොප මල බැඳුන හෙයින් භයින් අඬව්ද නැත්නම් අනික් කවර කාරණයක් නිසා අඬ වැලපුදැයි විචාළාහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු මරණ භයින් අඬන්නේ නම් නොවෙයි, ඇස් අන්ධවූ දෙමාපියන් මා රකින්නේය. මාගේ මව්පියන් දෙදෙනා පැන්නොලැබ තළුවියලි මියන්න්නාහ. ඊට අඬමි කීහ. ඒ අසා වැදි කියන්නේ ඒ වන්නා එසේමය, ගිජුලිහිණියෝ නම් සියත් යොත්නෙක ආකාශයේ යමින් සිට බිමතිබු කුණු  දක්නාහ. තොපි මා ඈ මල නොදකින්ට කාරණා කිම්දැයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු යම් අකුශලයක් පැමිණෙන කල කිසිවකුත් නොපෙනෙන්නේය. වන්නාවූ විපත්තියම පැමිණෙන්නේයයි වැද්දාට කීහ. වැදි බෝධිසත්වයන්ගේ බසට සමාධිව කියන්නාහු තොප කී බසට සතුටුවූ මම තොප මලින් උනා අරිමි සැපසේ ගොසින් තොපගේ දෙමාපියන් රකුවයි කියා බෝධිසත්වයන් මලින් උනා අළ. එවිට බෝධිසත්වයෝත් තොපි තොපගේ බන්ධූන් සමඟ ජීවත්වයි වැද්දාට කියා තමන්ගේ තමන්ගේ දෙමාපියන්ට ගොදුරු ගෙණ වනයටම ගියාහයි වදාරා මේ ගිජ්ඣ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි වැද්දා නම් ජින්නස්ථිවිරය. බෝධිසත්වයන්ගේ මැනියෝ නම් මහා මයා දේවිය, පියානෝ නම් සුද්ධෝදන රජ්ජුරුවෝය. ගිජුලිහිණිව උපන්නේ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# දබ්බ පුෂ්ප ජාතකය

තවද කරුණාවට පිහිටවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ලෝභි භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද,

හේ කෙසේද යත්

එක් උපනන්ද සංඛ්‍යාත භික්ෂූකෙණෙකුන් වහන්සේට කියන කල භික්ෂූනිලාඝයෙහි ගිජු නොව ලද්දෙයකින් යැපෙව අල්පසනොතාෂව්ව බණ කියන සේක. තමන් වහන්සේ ගමකට වන්කල එක් ගෙයක පාත්‍රයද එක්ගෙයක සැරයැටියද එක් ගෙයක පොත් මිටියද එක් ගෙයක ඩබරාවදැයි කියා ගෙවල් සතරෙක පසෙක තමන්වහනස්සේ නතුකොට ලාභසත්කාරද ගරුභාණ්ඩ සපායාගෙණ උපාසකවරුන්ට අවවාද කියා බොහෝ වස්තු සොයා ගැලෙක පුරවාගෙණ සැවැත්නුවරට එනසේක. සැවැත් නුවර භික්ෂුන් වහන්සේ වැඩ හිදීනා විහාරයට අවුත් ගෙවල් එකක් දෙකක් පන්නා යනකලට වැලක් පය පැකිළින. එවිට මේ ගෙවල්වලින් මට ලාභයක් ඇතමැනවැයි ඒ ගෙට වන්සේක් ඒ ගෙයි වසන මාළු භික්ෂු දෙදෙනකුවහන්සේ සංඝිකව ලත් වක්කාරිදෙකකුත් ලක්ෂයක් වටනා පලසකුත් බෙදාගත නොහී තුබූයේය. ඒ දෙදෙනා වහන්සේ ස්වාමිනි මේ අපට බෙදාදුන මැනවයි කීහ. උන්වහනසේ ඒ වක්කාරී දෙක දෙදෙනාවහන්සේටදී තමන් වහන්සේ ඒ පල විනේධර කෙනෙකුන් සේට විනා ගතයුතු නොවෙයි කියා තමන් වහන්සේ ඇරගත්සේක. ඒ දෙදෙනා වහන්සේ ගිවිස්වා අරගත් දෙයක් නොවන බැවින් මුරගා භික්ෂූන් වහන්සේට කීසේක. භික්ෂූන් වහන්සේත් ධම්සභා මණ්ඩපයේ රැස්ව මෙපවත් කියා කියා වැඩ උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරාවදාළ කල්හි ඒ භික්ෂුන් වහන්සේ ස්වාමිනි අනික් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ උපනන්ද සංඛ්‍යාත නම් ස්ථවිරයෝ භික්ෂූ දෙදෙනකුට වක්කාරී දෙකක් දී තුමූද පලස අරග්ගත්තුය. යන මේ කථාව කියා කියා උනුම්හයි කීහ. සර්වඥයන් වහන්සේ එම්බා මහණෙනි මූ දැන්මතු නොවෙයි පෙරත් අනුන්ට ලාභයමදකොට දී තුමූ වැඩිතරම් ලාභය අරගත්තෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක් ගඟක් අසල වෘක්ෂදේවතාව උපන්නාහ. ඒ ගඟ අස දබ්බ පුෂ්ප නම් කැණහිළෙකු හා කැණහිල් ධේනුවක් වාසය කරන්නීය. ඒ කැණහිල්දෙන රේමස්කන්ට දොළමියි කැණහිළාට කිව, කැණහිලාත් ගඟ අස බලා අවිදිනකලට අනුචාරී නම් දියකාවකු හා ගම්භීරචාරී නම් දිය කාවකු හා දෙදෙනක් ඇත, ඉන් ගම්භීරචාරී නම් දියකාවා මසෙකු අල්වා ගත, ඒ කුඩමස්සා දියකාවොත් ඇරගෙන දියයට වදින්ට වන, ඒ දියකාවා අනුචාරී නම් දියකාවාට කියන්නේ එම්බා අනුචාරී නම් දියකාවනෙනි මේ මත්ස්‍යයා මාත් ඇරගෙණ දියයට වදින්ට උත්සාහ කෙරෙයි වහා අවුත් මට සහායව කුඩමස්සා අල්වවයි කීහ. එවිට දියකාවා කියන්නේ මේ තොපි නොබට ඇල්ලුගැන්ම ස්ථිල නොකොට තරයේ අල්වව මමත් එම් කියාගොස් කුඩ මැස්සා ඩැගෙණ දෙන්න කැටිවගොඩලා බෙදාගත නොහි උනුත් කණකලට කැණහිලා එතනට ආය. දියකාවෝ දෙන්නා කැණහිලා දැක එම්බා සබඳ මේ කුඩමැස්සා අපට සරියේ බෙදාලිලවයි කීහ. එවිට කැණහිලා කියන්නේ එම්බා මට බොහෝ අධිකරණ විචාරණයුක්ති පසිදිනා දනිමි මේ කුඩමස්සා ධර්මිෂ්ටව බෙදමි කියා අනුචාරී දියකාවට වල්පත දිසාාවාදී ගම්භීරචාරී දියකාවාට ඉස දිසාව කරමැයි කියා දී ධර්මිෂ්ටව බෙදූ මට මධ්‍යයේ කැබැල්ල යහපතැයි ඇරගෙණ කියාහ. දියකාවෝ දෙදෙනත් අප සැපසේ බෙදාගෙණ කන්නාවූ රේමස ඇරගෙන ගියේයයි මුරගෑය. ඒ කැණහිල් දෙනත් කැණහිලා ගෙණෙන රේමස දැක සමෘධිව කියන්නී මේ රේමස කොයින් සම්භවීදැයි විචාරා යුක්ති කියා ගෙණා නියාව අසා මේ රේමස සම්භවුනියාව සක්විති රාජ්‍යයක් ලත්විවර ඇත. මාගේ මනෝරථය මුදුන්පත්ව නියායයි කියාතමාගේ ස්වාමියිට ප්‍රසංසා කොට රේමස කෑව සර්වඥයන් වහන්සේත් එම්බා මහණෙනි භික්ෂූහු නම් අනුන්ට ලාභය නොවිඳුවයි අවවාද කියා තමා ලාභයත් කාරවිදිමි භික්ෂූන් කළ මනාදෙයක් නොවෙයි වදාරා මේ දබ්බ පුෂ්ප ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි දියකාවෝ දෙදෙන නම් දැන් මහළු භික්ෂූහු දෙදෙනාය. කැණහිලා නම් උපනන්ද ස්ථිවිරිය. මේ විත්තිය ප්‍රත්‍යක්ෂ කොට දුටුවාවූ වෘක්ෂ දේවතාවා උපන්නෙම් බුදුවූ මම්ම වදාළසේක.

SANHIDA LANKA

# දසන්නක ජාතකය

තවද මහත්වූ ධෛර්ය ඇති සර්වඥයන් වහන්සේත් ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්නව ලද.

ඒ කෙසේද යත්

එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇතිව වාසය කරන සේක. ඒ භික්ෂූන් වහන්සේ භික්ෂූ හූ ගෙණවිත් සර්වඥයන් වහන්සේ පෑ, ස්වාමිනි මේ මහණ ස්ත්‍රියක් කෙරේ පිළිබඳව වාසය කෙරෙයි දැන්වූ කල්හි සැබෑද මහණයැයි වදාරා දැන් මතු නොවෙයි පෙරත් අනාර්ථකාරීවූ මෑ නිසා චෛතසික රෝගයෙන් මරණ ලබන්නේ නුවනැත්තවුන් නිසා ජීවිතය ලද්දාහුයියි වදාරා ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ කල්හි පුරණ ලද බෝධිසම්භාර ඇති අප මහ බෝසතානන් වහන්සේ බමුණු කුලයක උපන්සේක, උන් වහන්සේට සේනක කුමාරයෝයයි නම් තුබූහ. උන්වහන්සේ වැඩිවිය පැමිණ තක්සලානුවරට ගොස් සියළු ශිල්ප ඉගණ අවුත් රජහට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකරන්නාවූ අමාත්‍යවූසේක. සේනක පණ්ඩිතයන් වහන්සේයයි කී කල්හි චන්ද්‍ර සූර්යයන් මෙන් ලොව ප්‍රසිද්ධ සේක. එකල්හි රජහුගේ පුරෝහිත බමුණුගේ පුත්‍රතෙම රාජ සේවයට ආයේය සර්වාභරණයෙන් සැරහුනාවූ උතුම්වූ රූප ශ්‍රී ධරන්නාවූ රජහුගේ අගමෙහෙසුන් බිසවුන් දැක පිළිබඳ සිත්වූයේ ගෙටගොස් නිරාහාරයෙන් හොත්තේය, යහළුවන් විසින් විචාරණලදුව එපවත් කීය. රජතෙම පුරෝහිත පුත්‍රයානෝ දැක එපවත් අසා කැඳවා ගෙන්වා මමතට මේ බිසව සත්දවසකට දෙමි, සත් දවසක් තොපගේ ගෙයි වස්වා අටවෙනිදා කැඳවාගෙණ එවයි කීහ. ඒ තෙමේ යහපතැයි පිළිගෙණ බිසව ගෙට කැඳවාගෙණ ගොස් එක තැන විසීමෙන් ඔවුනොවුන් කෙරේ පිළිබඳ සිත් අතිව කිසිවක් හට නොදන්වාම උදයහල දොරින් ඇම්ටපළමුනික්ම ගොස් අන්රජක්හුගේ ආඥාපවත්නා රකටක වන්නාහුය නැවත ගිය මගකක් මෙන් ඔවුන් ගිය මග කවුරුත් නොදන්නාහු වෙති. රජ නුවර බෙරලවා නොයෙක් පරිද්දෙන් නුවර පරීක්ෂා කරන්නේත් ගිය තැනක් දැනගතනොහී ඇ නිසා ඒ රජහට බලවත් සෝක උපන හෘදය උනුවිය, බඩින් ලේ යන්නට පටන්ගත, බලවත් වෙදවරු ඇවිත් පිළියම් කොට ගුණකරන්නට නොහැකිවූවාහුය. බෝසතනන් වහන්සේ ඒ දැක මෝහට වාත පිත්තාදියෙන් උපන් ව්‍යාධියෙක් නොවෙයි, භාර්යාව නුදුටුබැවින් මනෝ දුක්ඛයෙන් ආ ව්‍යාධියෙක, උපායකින් ඕහට පිළියම් කෙරෙමියි, ආයුරනම්වූද පුක්කසනම් වූද පණ්ඩිත අමාත්‍යයන් දෙන්නා කැඳවා රජහට මේ බිසව නොදැක්මෙන් උපන් ලෙඩ විනා වෙන ලෙඩක් නැත, මේ රජ අපට උපකාරී එකෙක, උපායෙන් පිළියම් කරම්හ. රජගෙයි මළුවේ නැටුම්වොදා කඩුවක් ගිලින්නට දන්නා එකෙකු ලවා කඩුව ගිළින්නට සලස්වා රජ සිව් මැදුරු කව්ළුව සමීපයෙහි ඉන්ට සලස්වා ඒ දක්වම්හ, ඒ දැක මීට වඩා දුෂ්කරයෙක් ඇද්දැයි විචාරන්නේය, යහළු අයුරපණ්ඩිතයෙනි තෙපි එබසට අසවල් දෙය දෙමි කියා ප්‍රතිඥාකොට කීම ඊටත් වඩා දුෂ්කරයයි කියාලව, එම්බා පුක්කුස පණ්ඩිතයෙනි තොපි යහක් දෙමි කියා ප්‍රතිඥාකොට ඔහුගේ ආසාවට වඩා නැවත නොදෙමියි කීයා අසා විච්ඡේදය කිරීම ඊටත් වඩා දුෂ්කරයයි කියාලව, එම්බා පුක්කුස පණ්ඩිතයෙනි, තොපි යමක් දෙමි කියා ප්‍රතිඥාකොට ඔහුගේ ආසාවට වඩා නැවත නොදෙමියි කියා ආසා විච්ඡේදය කිරීම ඊටත් වඩා දුෂ්කරයයි කියාලව ඉන් ඇත කිය යුත්ත මම දනිමි කියා වදාළසේක. එසේ කියා නැටුම් යොදා රජහුගේ සමීපයට ගොස් මහරජ්ජුරුවන් වහන්ස, නැටුම්බලා වදාල මැනව ශරීර දුක්ඛයත් මඳක් සනාත වෙයි කියා රජහු කැඳවාගෙණ සිව්මැදුරු කව්ළුව සමීපයේ නැටුම් බලා ඉන්ට සැලැස්වූවාහුය, බොහෝ දෙන නැටුම් පෑවාහූය එක් පුරුෂයෙක් තෙතිස් අඟුල් දිග ඇති තියුණු මුවහත් ඇති කඩුවක් ගිළිය, රජ ඒ දැක මේ පුරුෂතෙමේ තියුණු ධාරා ඇති සතුරන් ඇඟ රුධිරපානය කරණ දසන්නක දෙශයෙහි උපන්නාවූ මේ කඩුව ගිළිය, මේ ඉතා දුෂ්කරයෙක් ලොව ඇද්දැයි ආයුරා පණ්ඩිතයන් අතින් විචාළේය, එබසට ආයුරපණ්ඩිත තෙම දේවයන් වහන්ස මේ පුරුෂයා තමන් අභ්‍යාෂ කළ හෙයින් කඩුව ගිළින්නේය. ඒ ඉතා දුස්කරයෙක් නොවයි යමෙක් තමාට ආවේනික වූ ධනයක් අනිකක්හට දෙමි කියාද ඒ කිමම දුස්කර වන්නේය, ඉන් පිටත් දුස්කරයෙක් නැතෙයි කියේය. ඒ අසා රජ කඩුව ගිළීමට වඩා දෙමි කියන බස දුස්කරවේල මමද පුරෝහිත පුත්‍රයාට බිසව දෙමි කිමි මා විසින් දුස්කරයෙක් කරණ ලද සලකන්නහට මඳක් සෝකනැතිවිය, නැවත මේ දෙමි කීමට වඩා අනික් දුස්කරයෙක් ඇද්දැයි පුක්කුස පණ්ඩිතයන් විචාරණුයේ මේ අයුර පණ්ඩිතතෙම කඩුව ගිළීමට වඩා තමාසන්තක දෙයක් දෙමි කිම දුස්කරයෙක් වෙන ඇද්දැයි විචාළේය. එකල්හි පුක්කුසය පණ්ඩිත තෙම දේවයන් වහන්ස යමෙක් කාරිය සිද්ධියට නොපමුණුවන්නාවූ නිෂ්පලවූ තෙපුල් කියන්නේවිනම් ජනයෝ ඔහු ඇසිරුව ජීවත්වම්හයි නොසිතති එබැවින් යමෙක් දෙමි කියා

SANHIDA LANKA

ලබන අයගේ ආසාව වඩා  නැවත නොදෙමි කීමට වඩා දුස්කරයෙක් ලොව නැතැයි කිය. රජ ඒ බව අසා මම පුරෝහිත පුත්‍රයාට බිසව දෙමි පළමුකොට කියා දිනිමි. නැවත අර ගන්නා සිතින් පරීක්ෂා කරවීමි, මා කළේ ඉතා දුස්කරයෙකැයි සිතන්නාහූ රජහුගේ සිතෙහි සෝක මඳක් තුනිවිය. ඉක්බිත්තෙන් රජතෙම මේ සේනක පණ්ඩිතයන්ට වැඩි පණ්ඩිත කෙණෙක් ලොව නැත. එබැවින් මේ ප්‍රශ්ණය ඔවුන් අතින් විචාරමි සිතා එම්බා සේනකපණ්ඩිතයෙනි මේ පුක්කුස පණ්ඩිතතෙමෙ යමක් දෙමිකියා නොදෙමි කිම දුෂ්කරයෙකැයි කීය දුෂ්කරයට වැඩි අනික් දුෂ්කරයෙක් ඇත්නම් ඒ තොපි කියවයි කියේය. එකල්හිම මහබෝසතානන් වහන්සේ මෙසේ වදාළසේක. මහරජ යම් කිසිවක් මඳවුවද බොහෝවුද දානයක් දුන්නේද යමෙක් දන්දී පසුතැවිලි නොවේද එතෙම ඊටත් වැඩියෙන් දුෂ්කර වන්නේය. මෙසේ අප මහබෝසතානෝ රජහට දන්වනසේක් දාදානදී අපර චේතනාව පිරිසිදු කොට ගිනිනට දුස්කරබව වෙස්සන්තර ජාතකයෙහි දන්නේය. ජුජක නම් බ්‍රාහ්මණයාට පුත්‍රයන් දී ඔහු විසින් හිංසාව දකමාගේ පුත්‍රයන්ගෙන් එම්දෝදොයි බෝධිසත්වාදී මහොත්තමයෝ දන්දී කවරෙක් පසුතැවිලි වන්නේහිදැයි සිතූසේක. රජ්ජුරුවෝ බෝධිසත්වයන්ගේ වචනය අසා සලකාගත් සේක. මම මාගේ සිතින්ම පුරෝහිත බ්‍රාහ්මණ පුත්‍රයාහට මහේසිකාවදී සිත් දරාගන්නට නොහැකිවූයෙමි සෝක කෙරෙමි මිරිකුනෙමි මට මේ සුදුමු නොවෙයි ඉදින් මා කෙරෙහි ස්නේහ ඇත්නම් මේ ඓශ්වර්යය හැර නොයන්නීය මට ස්නේහ නොකොට ගියාහ. ඇගෙන් මට කවර ප්‍රයොජනදැයි සිතන්නාහුගේ පියුම්පත්හි දියබින්දු සෙයන් සියලු සෝකය පහව ගියේය එකෙණහි කුක්ෂිරෝගය සන්හිඳ සුවපත්වහිට බෝසතාණන්ට ස්තුති කරණ සේක් ආයුරපණ්ඩිතයෝද ප්‍රශනය ප්‍රකාශ කළෝය. පුක්කුස පණ්ඩිතයෝද එසේම ප්‍රශ්නය ප්‍රකාශ කළෝය. ඔවුන්ට වැඩියෙන් නුඹ වහන්සේගේ ප්‍රශ්න විසඳීම යහපතැයි සතුති කොට බෝසතානන්වහන්සේට සතුටුව බෝහෝ වස්තු දුන්සේක. ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේට සතුටුව බොහෝ වස්තු දුන්සේක. ශාස්තෘවූ බුදුරජානන් වහන්ස් මේ ජාතක ධර්ම දේශනාව ගෙණ හැර දක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශකොට මේ ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යාවසානයෙහි උකටලී භික්ෂූහු සෝවාන් ඵලයෙහි පිහිටිසේක. එකල්හි රජහුගේ අගමෙහෙසුන් බිසව් නම් දැන් මේ පුරාණ දුතිකාවන්නීය. එකල්හි රජ නම් උකටලී භික්ෂූහුය. ආයුර පණ්ඩිතයෝ නම් මෞද්ගල්‍ය යනස්ථවිරිය. පුක්කුස පණ්ඩිත නම් ශාරිපුත්ත ස්ථවිරියෝය. එකල්හි රජහට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළාවූ සේනක පණ්ඩිතයෝ නම් දැන් බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සත්තුභත්ත ජාතකය

තවද ස්වධර්මයන් සවායම්භූතඥනයෙන් දත්තාවූ අප තිලෝගුරු සම්‍යක් සම්බුදු රජොත්තමයානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද, මෙය වනාහී විස්තර වශයෙන් උම්මග්ග ජාතකයෙන් පෙණෙන්නේය.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රහමණ කුළයක ඉපිද වැඩිවිය පැමිණ සේනක නම්ව දිසාපාමොක් ආචාරීන් අතින් සිල්පයක් නිමවා ඉගෙණ රජ්ජුරුවන් කරා අවුත් රාජ්ජය දසරාජ ධර්මයෙන් අනුශාසනා කොට වස්සාරපෝයේ නුවර වාසින්ට ධර්මාසනාරූඪව බණ කියා බුද්ධ ලීලාවක් මෙන් සියළු ලොක වාසින් සතුටුකරමින් වාසය කරණ සේක. එසමයෙහි එක්තරා මාළු බ්‍රාහ්මණයෙක් මසුරන්දාසක් සිඟාගෙණ එක් බ්‍රහුමණයෙකුගේ ගෙයක තබා ගොසින් කල්යාමකින් මාගේ මසුරන් දෙවයි කීහ. ඉල්විය. ඒ බ්‍රහ්මණයාත් තමාටදෙන්ට රන්නැති හෙයින් තමා දුක්පත් හෙයිනුත් තමාගේ දුව තෙලේ රණට සිලව කොට රඳවා උන්නේය. බැමිණි තමන් කරුණ ස්ත්‍රී හෙයිනුත් කාමයෙහි අර්ථව පරපුරුෂයන් සේවනය බොහෝ කොට කරන්නීය. පරදාර පරපුරුෂ සේවනයෙහි තෘප්තියක් නැත්තේය. මේ ලෝකයෙහි නොපිරෙන්නාවූ වස්තු සොළසෙක් ඇත්තේය. ඒ කවරේද යත්? සාගරය තෙමේ සියලු ජලප්‍රවාහයෙන් තෘප්ති නිවාරණයකට නොපැමිණෙන්නේය. රජ්ජුරුවෝ රජ්‍යයෙන් තෘප්තියකට නොපැමිණෙන්නාහ. අඥානයා පව් කිරීමෙන් තෘප්ති නිවාරණයකට නොපැමිණෙන්නේය. ස්ත්‍රී මෛථුන ධම්මයෙන්ද සැරහීමෙන්ද දරුවන් වැදීමෙන්ද තෘප්තිනිවරණයකට නොපැමිණෙන්නීය. බ්‍රාහ්මණයා මන්ත්‍ර ඉගැන්වීමෙන්ද තෘප්ති නිවාරණයකට නොපැමිණෙන්නේය. ධ්‍යානයට සමවදින්නාවූ භික්ෂූන් වහන්සේ ධ්‍යානසමාපත්තියෙන් තෘප්තිනිවාරණයකට නොපැමිණෙන්නේය. ශෛක්‍ෂ පෘථග්ජනයන් වහන්සේ කෙලෙසුන් තවන්නාවූ වීර්යයෙන් තෘප්තියකට නොපැමිණෙන්න්ය. පටන්ගත්තාවූ විර්ය ඇත්තේ වීර්යරාමයෙන් තෘප්තියකට නොපැමිණෙන්නේය. ධර්ම කථිකයන් වහන්සේ ධර්මසාකච්ඡාවෙන් තෘප්තියකට නොපැමිණිසේක. බුහුවිධ ධර්යෝ පර්ෂිත් බොහෝයයි තෘප්තියකට නොපැමිණෙනාහ. සැදැහැ ඇත්තෝ සංඝයාවහන්සේට උපස්තාන කිරීමෙන් තෘප්තියකට නොපැමිණෙන්නාහ. ත්‍යාගී පුරුෂයා වස්තු පරිත්‍යාග කිරීමෙන් තෘප්තියකට නොපැමිණෙන්නාහ. නුවනැත්තා බණ ඇසීමෙහි තෘප්තියකට නොපැමිණෙන්නාහ. සිව්වනක් පර්ෂිත් බුදුන් දැකීමෙන් තෘප්තියකට නොපැමිණෙන්නාහ. බැමිණින් පුරුෂයන් කෙරෙහි තෘප්තියකට නොපැමිණෙන්හ. ඇගේ සොරසැමියෙක් ඇත්තේය. ඌ හා තමා හා සැපසේ දවස් අරිණ නිසා තමාගේ සැමියාට කියන්නී, එම්බල බමුණු තට නිරන්තරයෙන් දරගෙණෙන්නට පිසන්නට පරිත්තට මට බැරිය මෙරට සිඟාරනනේක් කොටගෙණ වහා මට කෙල්ලක ගෙණවයි කීව. බමුණුත් අඹුවට උත්තර කියාගත නොහී අඹුවට කියන්නේ එසේ වීනම් සොඳුර මට මාර්ගෝපකරණ සපයා දෙවයි කියා විලද අත්සුනු ආදීවූ දෙය සපයා පසුඹියේ ලාගෙණ ගම්නියම්ගම් රාජධානිවල ඇවිද මසුරන් සත්සියය සිඟාගෙණ කෙල්ලකු හා කොල්ලකු අරගණ්නට බරණැස් නුවරට එන්නේ අතරමග ගසක්මුල අත්සුනු පයිය තබා පයිය උනා අත්සුනු කා පැන් බොන්ට ගොස් පයියට වන. බමුණා පැන් බී ආ තැනැත්තේ පයිය බැඳ කරතබාගෙණ යන්ට වන. ඒ වෘක්ෂයෙහි වාසය කරන්නාවූ දේවතාවෙක් බෝධිසත්වයන් වහන්සේගේ නුවණ දඹදිව ප්‍රකාශ කරණු සඳහා අර්ධ ශරීරයක් දක්වා කියන්නේ එඹල බ්‍රාහ්මණය හෙට ගියෙය් නම් තාගේ අඹුමියෙහි අතර මග ලැග්ගේ නම් තෝ මියෙයන බස්දෙක කියා අන්තර්ධාන විය. බ්‍රාහ්මණයන් වට පිට බලා කාත් නොදක භයින් ත්‍රස්තව අඬ අඬා යන්නේය. එදවස් පසළොස්වක් ලත් දිනය පැමිණ බෝධිසත්වයෝ බණ කියන්නට වන්සේක .බොහෝ මනුෂ්‍යයෝද ගඳ දුම්මල් පහන් ගෙණ බණ අසන්නට යන්නාවූ බමුණු අන් ඇම දැක කොයියවුදැයි විචාරා බණ අසන්නට යම්හයි යනු අසා පණ්ඩිතයෝ නම් නුවනැත්තාහුතය. උන්ලඟට ගොස් මාගේ සෝක සන්සිඳුවාගණිම්යි පණ්ඩිතයන් බණ කියන්නාවූ ස්ථානයට ගොස් බණ පිරිස් කෙළවර අඬ අඬා බණ අසා සිටියේය. බෝධිසත්වයන් වහන්සේ විස්තර කොට බණවදාරා වට බලන්නාහු බණ පිරිස් කෙළවර අඬ අඬා සිටිනා දැක ඇයි තා අඬන්ටකාරණා කිම්දැයි තටකුමණ අලාභයෙක් කවර අර්ථහානියෙක් ප්‍රාණහානියෙක් සැලසිනිද මට කිය තාගේ සෝක සන්සිඳවා ලම් ඇයි තෝ සේනක පණ්ඩිතයාට නොදනිදැයි කීහ. එවිට බ්‍රාහ්මණයා කියන්නේ පණ්ඩිතයෙනි එක් දේවතාවෙක් මට කියන්නේ අතරමග ලැග්ගහොත් තෝ මියෙයි, ගෙට ගියොත් අඹු මියෙයි. එසේ හෙයින් ගෙටත් යානොහි අතර මගත් ලැග්ගනොහි මරණභයින් අඬමියි කීහ. බෝධිසත්වයෝ මිනිසුන්ට වන්නාවූ අන්තා පරීක්ෂා කරන්නාහූ සමුද්‍රයෙහි ගැළුනාහුද බැල මච්ඡයන් විසින් ගන්නා ලද්දාහුද ගග වැටී හුන්නාහුද කිඹුල්ලන් විසින් ගන්නා ලද්දාහුද රුකකින් හුනවාහුද කටුවෙන් විදිනාලද්දාහුද විෂකෑවාහුද කරවැල් එෑවාහුද ප්‍රපාතයෙහි වැටීද අතිශය අතිඋෂ්ණ ආදීරෝගයෙන් මඬනාලද්දාහුයයි යන මෙතෙක් අන්තරාය ඇත. කවරදෝහෝයි පරීක්ෂා කොට අන්තරායක් නොදක

SANHIDA LANKA

පරීක්ෂා කරණසේක් මූ කරතිබෙන පසුම්බි පයියේ අත්සුනුවන්ට කාරණාමු අතරමග ගසක් මුලදී අත්සුනු පයිය බිම තබා පයිය උනා අත්සුනු කා පැන්බොන්නට යාදි මේ පයිය ඇතුලට අත්සුනු ගන්ධයට සර්පයකු වන්නියාව අතරමග ලැග්ගහොත් මෙතෙම අත්සුනු කන්ට පයියේ අත එලීනම් සර්පය කඩා කා තෙමේ මියෙයි. ගෙට ගියොත් මෙතෙක් දවස් ගොසින් කුමක් ගෙණාදැයි පසුඹිය උනා අතලයි එවිට ඇගේ අත කඩා කා අඹුමියන්නීයයි කී නියයයි සිතින්ම පරීක්ෂා කොට සර්පයා දනගත නොහිකෘෂ්ණ සර්පයෙකුවන්ට උමමැනව නොසැලී නිශ්ශබ්ද දී දරණලා වැදහොන්නේය. ඒ කාන්තයෙන් නයාමයයි පරීක්ෂාකොට දිවසින් දුටු කෙණෙකුන්මෙන් සියල්ලම නුවනැසින් දක බොහෝ දෙනාට කියවන පිණිස බමුණා අතින් විචාරා බමුණ තාගේ පසුඹියේ කුමක් ඇද්දැයි විචාළසේක. ස්වාමිනි අත්සුනු යයි කිය, ඒ අතරමගදී කෑදැයි විචාලසේක. මග එක් ගසක් මුල පසුඹිය තබා අත්සුනු කෑම කිව තෝ පැන් බොන්නට ගියෙහිද නොගියෙහිදැයි විචාළාසේක. ගියෙමි ස්වාමිනි කීය. එම්බල බමුණ තෝ පැන් බී අවුත් අත්සුනු පයිය පරීක්ෂා කොට බැන්දෙහිදැයි විචාළසේක. බමුණා කියන්නේ ස්වාමිනි පැන් බොන්නට යන ගමනේත් සඳහන් මදව නොබැන්දෙමි. ආ ගමනේත් පරීක්ෂා නොකොට බැඳගෙණ කරතබාගෙණ ආමි කීය. එවිට බෝධිසත්වයන් වහන්සේ එම්බල බමුණ තා කර තිබෙන්නාවූ පසුම්බිය ඇතුළේ සර්පයෙක් වැද හොන්නේය. එයිත් නයෙක, දේවතාවා කියේ නම් එයින් තට සැකවිනම් පසුඹි පයිය බිම තබාඋනා දික් දණ්ඩකින් ගසා ගන්නා සුසු යන අනුකරණයෙන් මහත් පෙණයක් කොටගෙණ මේ බණ පිරිස් මධ්‍යයේ පිටවන්නේයයි කී සේක. බමුණා පසුඹියේ නාගයායයි කියන්නා මහ හයින් පසුඹිය බිමට දමා පසුඹිය උනා දණ්ඩකින් පසුම්යට ගසා ලීය නයා බෝධිසත්වයන් කී පරිද්දෙන් පෙණයකොට ගෙණ පිටත්විය. නයින් කෙළ වනසේ දන්නා අහිකුණ්ඩිකයෙක් නයා අරගෙණ වලට අළුයේය. එතන සිටියාවූ බොහෝ බණපිරිස් මධ්‍යයේ සේනක පණ්ඩිතයන් වහන්සේ බමුණා අතතුබූ පසුම්බියේ ඔත්තාවු සර්පයා යම් කෙණෙකුන් අතින් නා අසා දිවසින් දුටු කෙණෙකු මෙන් දන සර්පයා විභාගකොට නයාමයි වදාළසේක. යහපත නුවණ විශේෂයකැයි බොහෝ දෙනා සමාදිව පිළිඉස නටවා අත්පොලසන් දීම අසුරුසන් දිම ආදීවූ බොහෝ සන්තෝෂයට පැමිණියාහ. බමුණාත් සමාදිව සේනක පණ්ඩිතයෙනි මා අත කෙතෙක් සම්පත් තිබුයේ වී නමුත් එතකුන් දීපියන්ට සමාධි ඇත. මා සිඟා ලද්දේ මේ මසුරන් සත්යියය පමණයයි මින් තොපට පුජා කෙරෙමියි කීහ. බෝධිසත්වයෝත් එම්බල බමුණා ප්‍රශ්ණ කියා වස්තු උපයන්නේ නොවෙමි මේ තාගේ රණින් මට ප්‍රයෝජන කිම්දැයි කියා තමන් වහන්සේගෙන් මසුරන් තුන්සියයක් දී දාස පුරාමින් කොල්කු ඇරගෙණයැදී තා සිඟා ඇවිදින්ට කාරණා කිම්දැයි විචාළසේක. බමුණු කියන්නේ පණ්ඩිතයත් වහන්ස මාගේ බිරින්ද රට සිඟා කෙල්ලෙකු කොල්ලෙකු ගෙණවමැනවයි කී හෙයින් සිඟා ඇවිදිමි කීය. එවිට පණ්ඩිතයෝ විචාරන්නාහු තාගේ අඹුතරුණ ස්ත්‍රියක්ද මැහැළිදැයි විචාළසේක. බමුණු කියන්නේ ස්වාමිනි ලදරු ස්ත්‍රියයි කීය. බෝධිසත්වයෝ කියන්නාහු එම්බල බමුණ තාගේ අඹුවට සොරසැමියෙකු ඇති හෙයින් ඔහු තමා හා සයිචඡපරසේවනය කරන්නට උවමනා හෙයින් එතනින්  තා නෙරණ නියායි කියා එම්බල බමුණ මේ මසුරන් දාස ගෙට ගෙණා ගියෙයි නම් තාගේ අඹු තමා සොර සැමියාට දීපියන්නිය. තෝ ගෙට ගෙණ නොගොස් මසුරන් දාස ඉවතෙක සඟවාලා ගොට ගොස් බැණ නොනැගී ඉඳ තාගේ අඹුවට රන් ගෙණාමි නොකියයි උගන්වාලා යවුසේක. බමුණත් යහපතැයි ගිවිස අතරමග ගසක්මුල මසුරන් දාස සඟවා ගෙට ගොසින් පින්වත දොර ඇරවයි කීය. එවේලාවට බැමිණියත් සොරසැමියාත් වැදඹත්තාහ බැමිණි නැගීසිට පාණ නිවා දොරහැර සොරසැමියා දොරබා බොක්කේ සිටුවා බමුණා ගෙට කැඳවා සොරසැමි පිටතට යවා සමනන් ලඟ ඉඳ පසුම්බි පයිය බලා මෙතෙක් දවස් ගොසින් ගෙණා වස්තුයෙක් නැද්දැයි විචාළීය. එවිට බමුණා අඹුව කෙරේ හයින් සොඳුරු රැහැණි නොව මම රන් මසුදහසක් ගෙණාමි අසවල් තැන ගසක්මුල සඟවා තබාලමි උදෑසන ගෙණෙමි කීය. බැමිණි ඒ අසා දොරට ගොස් සැමියාත් ඈ කී සලකුණෙන් ගොස් රන් ඇරගෙණ ඔබ්බේ තිබීය. බමුණත් උදෑසනක්සේ රන්තුබූ තෙනට ගොස් නොදක බෝධිසත්වයන් කරා අඬා ගෙණ ගිය. එවිට පණ්ඩිතයෝ ඇයි බමුණ රන්තුබූ තැන් බැමිණයට කියාපිදී රන් ගෙණා නියාව නොකියන්ට උගන්වා යව් ගමනේ කියාපිද වන්නාට තොපගේ බිරින්දගෙන් බමුණන් සෙත්දෙනෙකුත් ඇතුලුවු දස සතරදෙනෙකුන් දවසක් දන්දී දවස දෙන්නකු නියායෙන් ඇර සත්වෙනි දවස් බමුණා තෝරා ගෙණ කියවයි සත්දවසකට වියදමත් දී යවුහ. බමුණාත් යහපතැයි ගිවිසගෙණ ගොස් බෝධිසත්වයන් කි සැටියට සත්වෙනි දවසක් දන්දී සත්වෙනි දවස බමුණා තෝරාගෙන  බෝධිසත්වයන්ට කීය. බෝධිසත්වයන් වහන්සේ තමන් වහන්සේ ගෙන් පුරුෂයන් යවා බමුණා ගෙන්වාගෙන ඇයි බමුණ මේ බමුණාගේ මසුරන් දාස සැඟවුයේදැයි විචාළසේක. ස්වාමිනි මම නොදනිමි කිය. පණ්ඩිතයෝ කියන්නාහු එම්බල බමුණ මා සේනක පණ්ඩිත නියාව නොදනිදැයි කිසේක. එවිට බමුණු සිතන්නේ පසුම්බි පයියේ උන් නයා කියාපු තැනැත්තා මේ තමායයි කියන්නාහයි හයගෙණ සැබැව ස්වාමිනි මම මසුරන් දාස ඇරගතිමි කියා දන් කොයිදැයි විචාරා ගෙන්වාගෙණ බමුණාට දෙවා සොරකම්කළවුනුත් පරදාර කළවුනුත් විඳාගතමනා ආඥාකරවා බමුණාට කියා බැමිණිත් ගෙන්වා මේ බැමිණිය තට උවමනාවේදැයි විචාරා උවමැනවයි කී කල්හි ඇටත් මතු මෙසේ දෙයක් නොකරවයි ශික්ෂා කරවා බමුණාට පාවාදී බොහෝ වස්තු ද තමන් වහන්සේගේ

SANHIDA LANKA

ගෙය ගාවා ගෙයක්දීදැයි රැක්කාහයි වදාරා මේ සත්තුභස්ත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බ්‍රාහ්මණයා නම් ආනන්ද ස්ථවිරය. එසමයෙහි දේවතාවා නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි පර්ෂිත් නම් බුදු පිරිසය. සේනක පණ්ඩිතයෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# අධිසේන ජාතකය

තවද ප්‍රඥා නැමති ප්‍රදීපයෙන් නසන ලද මොහ නැවති අන්ධකාර ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ අලව්නුවර අග්ගලා නම් චෛත්‍යයෙහි වැඩ වසන සමයෙහි කුටිකාර ශික්ෂාපදය අරභයා මේ ජාතකය දක්වන ලද.

හේ කෙසේද යත්

මෙහි වර්ථමාන කථාව මණිකණ්ට ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. මෙහි වනාහි

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රාහ්මණ කුලයෙක ඉපද අධිසෙන නම් නමක්ව දිසාපාමොක් ආචාරීන් වසන්නාවූ තක්සලා නුවරට ගොස් සියලු ශාස්ත්‍ර ඉගෙණ අවුත් ගිහිගෙයි කලකිරී හිමාලය වනයට ගොස් සෘෂි ප්‍රෘජ්ජ්‍යාවෙන් පැවිදිව වසන සමයෙහි ළුනු ඇඹුල් පිණිස අවුත් බරණැස් නුවර රජ්ජුරුවන්ගේ රජගෙයි වාසල සමීපයට පැමිණියාහ. රජ්ජුරුවෝ මතුමහල්තලයෙහි සිටියාහු තපස්වීන් වහන්සේ දමුනාවූ ඉන්ද්‍රියයන් දැක සමෘධිව රජගෙට ගෙන්වා වැලඳවූහ. තපසයන් වහන්සේ අනුමෙවෙනි බණ වදාළසේක. රජ්ජුරුවෝ සමාධිව තමාගේ මගුල් උයනේ ඉඳිනා නියායෙන් සලස්වා තාපසයන්ට  කියන්නාහු ස්වාමිනි මාගේ රාජ්‍යය උවමනා විනමුත් ඉල්වා ඇරගත මැනවයි ආරාධනාකළත් තාපසයන් වහන්සේ කිසි දෙයකුත් නොයිල්වනසේක. රජ්ජුරුවෝ තාපසයන්ට කියන්නාහු ස්වාමිනි මා නොඅඳුනන බොහෝ මනුෂ්‍යයෝ පවා මා සමීපයට අවුත් නොයෙක් සම්පත් ඉල්වාගන්නාහ, නුඹ වහන්සේත් උවමනා යම් දෙයක් අරගත මැනැවයි කීහ. එවිට තපසයන් වහන්සේ කියන සේක් හසගවිකාරයෙන් බත් දුන මැනවයි බඩ අතගෑමද පිළිදුනමැනවැයි ඉණ අත ගෑමද බුලත් දුනමැනවයි කට අතගෑමද යනමෙකී දෙයින් පැමත් කටින් කියා ඉල්විමත් තාපස් වරුන්ට අගනේ නොවෙයි. යම් අභිප්‍රායකින් සිඟා සිටිකල සිටියාවූ ක්‍රියා දැන පිළිගැන්වූ දෙයක් ඇත්නම් පිළිගෙණ අභිප්‍රාය සිද්ධවී නම් වු පමණක් විනා නුවූයේ නම් නුවූයේ යයි ඉඳිනා විනා හස්තවිකාරයෙන් වුවත් මුවෙන් කියාවුවත් ඇරගැන්ම කාරනා නොවෙයි. රජ්ජුරුවෙනි දෙමව්පියන් ගෙන් වුවත් යම් කෙණෙක් ඉල්වත්නම් ඉල්වනතැනැත්තන් කෙරෙහි සියල්ලෝම අප්‍රියවන්නාහ. නෑසියකෙණෙක් විනමුත් දසවිට යමක් ඉල්වත් නම් මුට ඇත්තේ ඇමවේලෙහිම ඉල්වා කෑමයයි ඔහු මෛත්‍රීයවත් නොකරන්නාහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු යාචකයන් නම් ඉල්ලුකල විනාදෙනකෙණෙක් නම් නැත්තාහ. ඉල්විමෙන් දෙනතැනැත්තෝ මා අතින් මෙසේවූ දෙයක් ඉල්වන්නේ යාචකයින් කෙරේ සමාධියෙන් දෙන්නෝය, එසේ හෙයින් ඉල්විම් යහපතැයි කීහ. තාපසයන් වහන්සේ ඉල්විමෙන් යාචකයන්ටත් දෙන්නන්ටත් ලාභය නොයිල්විමෙන් යාචකයන්ටත් අලාභය දෙන්නන්ටත් අලාභය නුඹ වහන්සේ බෑණානොනැගී වැඩ සිටිසේක. එසේ හෙයින් නුඹවහන්සේගේ අභිප්‍රායානුකුල වාසයටත් නුඹ වහන්සේගේ ධර්මයටත් සතුටුවූ මම රතු වෘෂභයෙකු ප්‍රධාන කොට ඇති ගෙරින් දහසක් දෙමිකීහ. තාපසයන් වහන්සේ මහා රජ අපි සරක් අසුන්කොට පටවිලා ඇවිදිමෝදැයි නොයිවසා වදාළසේක. රජ්ජුරුවෝත් තාපසයන්ගේ අනුශාසනාවෙහි පිහිටා කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ අටඨසේන ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. තාපසයෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# ඊතිය කපි ජාතකය

තවද සූර්යමණ්ඩලය නැති ආකාශයට පූර්ණ චන්ද්‍ර මණ්ඩලයක් බඳුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහනසේ පොළව ගිළු කථාවක් අරභයා මේ ජාතකය දක්වන ලද.

එක් දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්වූ භික්ෂූන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන් වහන්සේ සර්වඥයන් වහන්සේට විපරීතව පර්ෂිත් හා සමඟ පොළොව ගිලුනේ වේදැයි කිය කියා වැඩ උන්නෙනට සර්වඥයන්වහන්සේ වැඩ වදාරා විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි පෙරත් අපකීවා නොකොට පර්ෂිත් හා සමඟ මරණයට පැමිණියෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදතත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ සේවානරව ඉපිද රජ්ජුරුවන්ගේ උයනේ වඳුරන් පන්සියයක් ඇරගෙණ වාසය කරන්නාහ. අනිකුත් වඳුරෙක් පන්සියයක් වඳුරන් ඇරගෙණ වාසය කරන්නාහ. එක් දවසක් රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා උයනට අවුත් ඉස්සෝදා නගා ගඳවිලවුන් ගෙණ තමාගේ ගෙට යන්ටයයි නික්මින, එක් දුෂ්ට වඳුරෙක් බ්‍රාහ්මණයා යන්නාවූ මග තොරණ මත්තේ හිඳ බමුණා ඉස වර්චස් පිඩක් එළාපිය. මේ කිමෙක්දැයි උඩ බැළු කල කටේ වර්චස් පිඩක් එළිය. එවිට බ්‍රහ්මණයා වඳුරාට කිපී තමාගේ ගෙට ගියේය. බෝධිසත්වයන් වහන්සේ මෙපවත් අසා දුර්ජනයන් ඉඳිනා සමීපයෙහි ඉඳිම කටයුතු නොවෙයි කියා වඳුරන් දහස එක්කරවා අවවාද කියා හිමාලය වනයට යම්හයි තමන්ගේ වඳුරන් පන්සියය ඇරගෙණ එතනින් හිමාලය වනයට ගියේය. අනික් වදුරන් පන්සියයක් වඳුරෝත් මේ බ්‍රහ්මණයා වෛරීව අපට කුමක් කොටපියදැයි කියා බෝධිසත්වයන් කැටුව නොගොස් එම උයනේ රැඳුනාහුය. එසමයෙහි එක් මැල්ලක් වී ටිකක් අව්වේ වනාළුව, එක් සැඩ ඇති එළුවෙක් වී කන්ට වන, මැලි ගිණිපෙණෙල්ලක් බලා ගැසූය. ඒ ගිනි එළුවා ඇදගත, එළුවාත් දිවගෙන ගොස් ඇත්හලට වැද තණෙහි ගිණි ඇවිලින, ඒ ගිණි තණෙහි වැද ගෙණ ඇත්හල තණකොල සිත් දඬුපතුන් ගින්නෙන්දා ඇතුපිට වැටී පිටදා වණව ගියේය. වෙදවරු පිළියම් කොටත් වණ බොහෝව තිබූ හෙයින් රජ්ජුරුවෝ පුරෝහිත බ්‍රාහ්මණයා කැඳවා කියන්නාහූ බමුණානනි ඇතුන්පිට වණබොහෝය වහා ගුණවෙයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ වඳුරෝ කොයි ඇද්දැයි කීහ. ස්වාමිනි උයනේ වඳුරෝ ඇතැයි කීහ. රජ්ජුරුවෝත් දුනුවායන් ගෙන්වා වඳුරාත් විද මැරූහ. ඉන් නායකවඳුරා විත්කා දිවගොස් බෝධිසත්වයන් වසන්නාවූ වනයෙහි වැටී මලහ. බෝධිසත්වයන් වහන්සේ වඳුරා දක තමන් වහන්සේ හා කැටිව ආවාවූ වඳුරන් පන්සියයට බණ වදාරණ සේක් ගම් නියම් ගම් රාජධානියෙක්හි සතුරෝ ඇත්නම් නුවනැත්තෝ එතැන්හි නොවසන්නෝය. ඉදින් කිසියම් කාරියක් නිසා සතුරන් ලඟ දවසක් දෙදවසක් ඉදීනොවි නමුත් දුකසේ වසන්නේය, ලසුවූ අව්‍යවස්ථි සිත් ඇති නෑ කෙනෙකුන් හෝ මිත්‍රකෙණෙකුන්ගේ බස් ගිවිස යමෙක් සිතුවක් කරන්නේ වීනම් එතෙම බෝහෝදෙනාට සතුරුවන්නේය. කුමක් මෙන්දැයි යතහොත් නොකීකරු මේ වඳුරා වානර සමූහයාට පිඩා කෙළේය. සමූහය රකිණා නුවනැත්තෙමියන සිත් ඇති අඥනතෙම යහපත් නොවන්යයි. ඒ එසේවූ සත්වයා තමාගේ සිත්වූ පරිද්දෙන් ගොස් නොකටයුතු කොටපියා මිය වැදහොත් වඳුරා පරිද්දෙන් ව්‍යාශනයට පැමිණෙන්නේය. නුවනැති තැනැත්තෝ තමාගේ බන්ධූන්ට වැඩ කරන්නේය. නුවනැති ප්‍රජාව කරන්නාවූ උත්තමතෙම තව්තිසා වැසි දෙවියන්ට උත්මවූ සක්දෙව්රජහුමෙන් නුවනැත්තේත් නෑයන්ට මෙලෝ පරලෝ දෙකින් ඉෂ්ට වන්නේය. යම්සත්වයෙක් පිරිසිදු ශීලයද විශිෂ්ටවූ ප්‍රඥාවද බොහෝ ඇසූවිරු තැන් ඇතියෙම්. තමා දකිද එසේවූ සත්ව තෙම තමාටද අනුන්ටද යන දෙපක්ෂයේ ඇත්තන්ටම වැඩක්ම කරන්නේය. ඒ කාරණය හේතු කොට ගෙණ ශීලප්‍රඥාදී උතුම් ගුණයෙහි තමා පිහිටා ගෙණ බොහෝ දෙනාට අවවාද අනුශාසනාකොට රක්නේ හෝය ගණසංගනිකාවයෙන් දුරුව ඉඳ කුසල් හෝ පුරන්නේ යනාදීන් බෝධිසත්වයෝ ධර්මදේශනා කළෝ වේද මහණෙනි වදාරා මේ කපී ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි නොකිකරුව මරණයට පැමිණියාවූ වඳුරා නම් දේවදත්ත ස්ථවිරයෝය. වනාර රජව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# ගන්ධාර ජාතකය

තවද පඤ්චවිධඥෙය මණ්ඩලය විශේෂයෙන් දක්නාවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි භේසජ්ජ සන්ධිකාර ශික්ෂා පදයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

හේ කෙසේද යත්

සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පිලින්දි වච්ඡනම් මහා තෙරුන්වහන්සේ රජ ගහනුවර වසනසේක් රෝගී තැනට ගිලන් පසක් නිසා රජගෙට ගොස් රජගෙයි දොර සිඟාසිට තමන්වහන්සේගේ ශරීරාලෝකයෙන් රජගෙය රන්වන් කරවුසේක. එවිට රජ්ජුරුවෝ බිසෝවරු රජ යුවරජ මහා අමාත්‍යයෝත් සමාධිව උන්වහන්සේට චතු මධුරයෙන් කිරි පිඬු දුන්නාහ. උන් වහන්සේගේ විහාරයේ වැඩ හිඳිනා භික්ෂූන් වහන්සේ ඇම දෙනාවහන්සේට බෙදාදුන්සේක. භික්ෂූන් වහන්සේත් එදවස් වළඳනාදෙයත් වළඳා ඉතිරි දෙය පාත්‍රවල ලා පසු වදවස් වළඳන්ටයයි තුබූ සේක. උපාසක වරුද මේ දක භික්ෂූන් වහන්සේලාට අප දුන් චතුමධුර තබන්ට කාරණා කිම්දැයි උද්ඝෝෂණය කළාහ. සර්වඥයන්වහන්සේ එපවත් අසා වදාරා මහණෙනි, ආහාරය තබා එලගිතෙල් සකීරාම් ආදීවූ ගිලාන ප්‍රත්‍ය ගිලනුන්ටයයි සිඟාවැලඳිය කටයුතු නොවෙයි සත්දවසකින් ඔබ්බෙහි තිබූදෙය වැලදීමෙන් අකැප යයි වදාරා මේ භේසජ්ජ සන්නිධිකාර ශික්ෂා පදය පණවා එම්බා මහනෙනි පෙර උත්තමයෝ එනුසුනු විවරකුත් කැපකළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේද යත්

යටගිය දවස ගන්ධාර රට ගන්ධාර නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජය කරණසමයෙහි බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට පුත්ව උපන්නාහ. ඒ රාජ කුමාරයන්ටත් ගන්ධාර කුමාරයෝයයි නම් තුබූහ. එසමයෙහි මියලුනුවර වේදේහනම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරන්නාහ. ඒ ගන්ධාර රජ්ජුරුවෝත් වේදේහ රජ්ජුරුවෝත් දෙන්නම උනුන් නොදකම මිත්‍රව ඉඳිනාහ. එසමයෙහි එක් දවසක් ගන්ධාර රජ්ජුරුවෝත් අමාත්‍යමණ්ඩලයාත් පිරිවරා සඳල්ලේ උන්නාහ. එදවස් රජ්ජුරුවෝ සඳමඩල මහත් හෙයින් වේද මීට අනර්ථ පැමිණියේ කුඩා තරුවට හානියෙක් නැත්තේ වේද අපටත් මේ අන්තරාය පැමිණෙන්නේයයි එම අරමුණක් කොටගෙණ ගන්ධාර නුවරටත් කාශ්මීර රටත් හැර හිමාලය වනයට වැද ඍෂිප්‍රවෲජ්‍යාවෙන් පැවිදිවූහ. වේදේහ රජ්ජුරුවෝත් ගන්ධාර රජ්ජුරුවෝ මහණවූ නියාව අසා මාගේ යාළුවානන් මහණවූකල මමත් මහණවෙමියි ගමන්ගේ එක්සිය විසිගව්වක් දිග පලල ඇති වේදේහ රාජ්ජයත් කොටුළු පිරි සිටිනා සොළොස් දහසක් බත්ගම්ද අන්තඃපුර පිටිපුර යන සියල්ලම හැර හිමාලය වනයට වැද මහණවූහ. කල්යාමකින් ගන්ධාර තාපසයෝත් වේදේහ තාපසයෝත් දෙන්නම උනුන් දක වේදේහ තාපසයෝත් නොඅඳුනන හෙයින් ගන්ධාර තාපසයන්ට අත්පා මෙහෙවර කරන්නාහ. එක් දවසක් තාපසයන් දෙන්න කථාකොට කොට උන්කලට සඳමඩල නැගේය. රාහු ඇවිත් ඇවිත් සඳමඩල ගත ගන්ධාර තාපසොයෝ කියන්නාහු සඳපාන මදවන්ට කාරණා කිම්දැයි විචාළාහ. වේදේහ තාපසයෝ කියන්නාහු රාහු ඇවිත් සඳමඩල ඇල්ලු හෙයිනැයි කීහ. එවිට ගන්ධාර තාපසයෝ කියන්නාහු එම්බා වේදේහ තාපසයෙනි මහත් කෙණෙකුන්ටමය යම්හානියක් පැමිණෙන්නේය. මමත් මාගේ රාජ්‍යය හැර මේ වනයට එන්නෙම් මේ අරමුණක් කොටගෙණ මාගේ ගන්ධාර රාජ්ජය කාශ්මීර රට හැර ඇවිත් මහණවීමයි කීහ එවිට වේදේහ තාපසයෝත් එසේද නුඹ වහන්සේ ගන්ධාර තාපසයන්වහන්සේ නමැයි කීහ. එසේ වීනම් මමත් මියුලු නුවර රජකම් කළාවූ වේදේහ රජ්ජුරුවෝ නම් මමයයි කීහ. එවිට ගන්ධාර තාපසයෝ කියන්නාහු තොප මහණවූයේ ඇයිදැයි විචාළාහ. මාගේ යාළු ගන්ධාර රජ්ජුරුවන් මහණ වූ කළ මට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්දැයි සිතා මහණවීම් කියා දෙන්නම උනුනුන් ඇඳිනගණ සමාධිව එකතැන වාසය කරන්නාහු එනු ඇඹුල් සෙවුනා සඳහා නොබෝකලකින් පාසල්ගමකට ගොසින් දෙදෙනාම විථියේ සිඟායන්නාහ. ඒ ගම මනුෂ්‍යයෝ දවසක් එනුමුසුව ආහාරය පිළිගන්නාහ. දවසක් නිකම් ආහාරය දෙන්නාහ, එක් දවසක් සිඟා ගියකළ එනු බොහෝකොට දුන්හ. ඒ එනු වේදේහ තාපසයෝ ගන්ධාර තාපසයන්ට දිලා තමනුත් අනුභවකොට ඉතිරි එනු කෙහෙල් පතෙක ලා පලයේ සඟවා තුබූහ. පසුදවස් සිඟාගිය ගමනේ එනු නොලද්දාහ. එ දවස් වේදේහ තාපසයෝ තමන් තුබූ එනු ඇරගණ ගන්ධාර තාපසයන්ට පිළිගැන්වූහ. ගන්ධාර තාපසයෝ අප විථියෙහි සිඟා ගියගමනේ ලත් එනක් නැත මේ එනු කොයින්දැයි විචාර ඒයේ ගෙණා එනු තිබ්බමයි කී කල්හි එවිට ගන්ධාර තාපසයෝ කිපි තොප සොළොස් දහසක් බත්ගම් ඇරපියා මහණවූයේ කිසිදෙයකත් ආලය නැතිව වේද එසේවූ තොපි එනු සිඟිත්තක් නිසා ලෝභකරන්ට කාරණා කිම්දැයි භාසකොට කීහ. එවිට වේදේහ තාපසයෝ කිපි නුඹ වහන්සේ ලොකවාසීන්ට අවවාද අනුශාසනා කොටගත නොහෙම් කියා තපසට ආයේය. මම කෝප කරන්ට කාරණා කිම්දැයි කීහ. එවිට ගන්ධාර තාපසයෝ කියන්නාහු තොපි උරණ වූ නමුත් කුමක් කරවු නමුත් මා අවවාද කියන්නේ තොපකළේ ඉතා

SANHIDA LANKA

කාරණයෙක් නොවෙයි. තාපසවරු නම් ලත්දෙයකින් යපෙන පමණක් විනා මෙලෙස කිරීම කටයුතු වනාවෙයි කීහ. එවිට වේදේහ තාපසයෝ කියන්නාහු නුඹවහන්සේ මාගේ සිත කණස්සළු කරවා අවවාද කිරීම නම් නොකැපෙන කරයකින් හිස කපන්නාක් මෙනැයි කීහ. තෙපි කෙසේ කනස්සළුවීනමුත් මා කියේ කාරණයයයි වේදේහ තාපසයන්ට අවවාද කීහ. වේදේහ තාපසයෝත් කාරණා කියා ගිවිස බෝධිසත්වයන්ගෙන් කර්මස්ථාන ඉගෙන දෙන්නම් හිමාලය වනයට ගොස් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා කම්වූ පරිද්දෙන් මිය බඹලොව ගියහයි වදාරා මේ ගන්ධාර ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි වේදේහ තාපසයෝ නම් ආනන්ද ස්ථවිරයෝය. ගන්ධාර තාපසයෝ නම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# බක බ්‍රහ්ම ජාතකය

තවද මරසෙනඝට භයංකරවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බක බ්‍රහ්මයා අරභයා මේ ජාතකය දක්වන ලද.

හේ කෙසේද යත්

බක බ්‍රහ්මයෙක් වේහපඵල නම් බඹලොව පන්සියයක් කප් ආයුෂ විද එයින් චුතව සුභකිණ්හ නම් බඹලොව සුසැටක් කප් ආයුෂ විඳ එයින් චුතව ආභස්සර නම් බඹලොව අටකපක් අයුසංස්කාර විඳිමින් සිටිකල්හි මෙකියන බ්‍රහ්මයා මාතෘ ගර්භයකින් ප්‍රසූත විමක් නැති හෙයින් නිදා පුබුදිනා එකෙක්මෙන් බ්‍රහ්මලෝක තුනක ආයුසංස්කාර විඳිහෙයින් මෙතෙම සිතන්නේ බ්‍රහ්මලෝකයෙහි උපදිනාහට ජරාවිළියවත් ගර්භෝත්පත්තියක්වත් මරණයක්වත් නැති හෙයින් මේ බ්‍රහ්මලෝකයේ ආයුසංස්කාරය නිත්‍යප්‍රසවය මෙම ශාන්ති පුරයයි යනාදීන් පරමවූ මිථ්‍යාදෘෂ්ටියෙක් උපන, එපවත් සර්වඥයන් වහන්සේ දන වදාරා කූටාගාරයක් බිමවැටෙන්නේ සාරමසක් ගියකල එසේවූ කල බ්‍රහ්මලෝකයට ශක්ති සම්පන්න පුරුෂයෙක් දික්කල අතක් වක්නොකරණ කලින් වැඩ වදාරා බකනම් බ්‍රහ්මයාට පෙණී වදාළසේක. උන්වහන්සේ දැක බක නම් මහා බ්‍රහ්මයා කියන්නේ ගෞතම ගෝත්‍රයෙහි උපන්නාවූ නිදුකානන්වහන්ස වැඩියේ ඉතා යහපත මේ බ්‍රම්මලෝකයේ නිත්‍යවූ අචලවූ ස්ථානයෙන් අනිත් තැනක නැති හෙයින් නුඹ වහන්සේ වැඩි නියාව ඉතා යහපත් වන්නේයයි කියා එපවත් සර්වඥයන්වහනසේ අසාවදාරණසේක් එම්බල මහා බ්‍රහ්මයා තා වාසය කරන්නාවූ බ්‍රහ්මලෝකය නිත්‍යදාවද අපරාධිත ස්ථානද මෙසේවූ මිත්ථ්‍යාදෘෂ්ටියක් ගන්ට තට විනා අනික් කෙනෙකුන්ට බැරියයි වදාළකල්හි බක බ්‍රහ්ම සිතන්නේ මා විසින් තනිව කියා මුන්වහන්සේ සිතට නැන්විය නොහැක්කැයි සිතා කියන්නෙමා හා මිත්‍රව වසන්නාවූ බ්‍රහ්මයන් සත්‍යතාවයක් ඇති හෙයින් ඔවුන් ඇමදෙනාගේ අභිප්‍රාය මා කීයේයයි කිය එසේ හෙයින් මා කීයේ ඇත්තමයයි මේ බ්‍රහ්මලෝකය නිත්‍යදවය කිය නැවත සර්වඥයන් වහන්සේ වදාරණ සේක් එම්බල බ්‍රහ්මය තාගේ මේ ලෝකය ඉදින් තා විඳින්නාවූ ආයුෂය එක් ලක්ෂ දසදහසක් අවුරුදුය, එසේහෙයින් තාගේ ආයුසංස්කාරයද තා කළ කුසල් අකුසල් දෙකද මා විසින් දක්නාලද එසේ හෙයින් තා මේ මිත්ථ්‍යාදෘෂ්ටි ගැන්ම යුක්ති නොහෙයි වදාළකල්හි බ්‍රහ්මයා කියන්නේ මේ සර්වඥයන්වහන්සේ සියල්ලම දනිම් වදාරණ සේක. මුන් වහන්සේ අතින් මා කළාවූ කුසල් විචාරම් සිතා කියන්නේ සර්වඥයන් වහන්සේ මා කළාවූ කුසල් දනිම් වදාළේ ඇත්තේවේද ඒ මට වදාළමැනවැයි කීහ. ඒ අසා සර්වඥයන් වහන්සේ වදාරණ සේක් එම්බල බ්‍රාහ්මණය ගිය දවස එක්කල්පයෙක්හි තෝ එක්තරා වනයක් මධ්‍යයෙහි වාළුකා කාන්තරයෙක තපස්විභාවයෙන් පන්සලක් කොට ඒ තපස් රක්‍ෂා කරන්නේ එසමයෙහි එක්තරා වෙළෙන්දන් සමූහයෙක් ගැල් දහසක් බඩු පටවා ගමන්කරණ වෙළෙන්දු එකියන වාළුකා කාන්තරායට පැමිණ මත් වැරදින, ගැල්වල පැටවූ දර පැන් නිමවා බොහෝ දුක්ඛයට පමුණ ගැල් අඳිනා ගවයන් උනා ගැල් එක්තැන්කොට ඒ ඒ ස්ථානයෙහි වැටි වැදහොත්තාහ. එපවත් ඒ පන්සල වසන්නාව තපස්වී දැක මොහු මියයාදී බලායාම සත්පුරුෂ ධර්මයට පිට තැයි මහත්වූ සෘද්ධියෙන් ගංගාවක් මවා බොහෝ ජනයාට අන්නපානාදිය දරපැන් ආදිය දී රැක්කේ චේදැයි ඒ ජාතියෙහි තොප කළ දෙය අළුයම දුටු සිනයක් මෙන් දිටිම් වදාරා දෙවනු වදාරණසේක් තොප එක් ජාතියක තපස්වී එක් වනයක වාසයකරණ සමයෙහි සොරු පන්සියයක් එක්ගමක් පැහැරකොල්ල කා ඒ ගම ඉඳිනවුන් ලවාම උසුලාගෙණ යන්නාහ. තොපි මේ සොරුන් ගම් පැහැරපියා යන නියාව දැන මාවැනි එකෙකු මේතන ඉන්දදී මෙතෙක් දෙනාට ගහට විඳින්ට කාරණා නොවෙයි කියා තොපගේ ආනුභාවයෙන් ගැසීම පිඹීම් හා මහා සේනාව එන්නාක් මෙන් මවා සොරු ඉදිරියට ආකල්හි සොරු අප ආ නියාව රජ්ජුරුවන් වහන්සේ දැන අප ඉදිරියට එනසේක් වනැයි හයින් ඇරගත් කොල්ලත් ඇර මිනිසුනුත් ඇරගියහයි වදාරා තොපකළ දෙය අළුයම දුටු සීනයක් මෙන් දිටිම් වදාරා තවද එක්තරා ගඟක් අසල්වාසය කරන්නාවූ මනුෂ්‍යයෝ ඒ ගඟ කසල කරන්නාහ, දියකෙළිනාහ එක්දවසක් මිනිස්සු බොහෝදෙනා එක්ව ගඟට බැස ඔරු පාරු ආදීවූ දෙය ඇරගෙණ ඔබිනොබ කෙළිනට වන්නාහ. ඒ ගඟ වාසය කරන්නාවූ නාගරාජයෙක් කිපී මහා නාගවෙශයක් මවා ගෙණ දියකෙළි මිනිසුන් ඔබිනොබ ලුහුබඳවා භයගන්වා කඩා කන්ට වන. ඒ මනුෂ්‍යයෝ ඒ ඒ තැන සැඟවී අඬා මුරගාන්ට වන්නාහ. කඩා කන්ට වන. ඒ මනුෂ්‍යයෝ ඒ ඒ තැන සැඟවී අඬා මුරගාන්ට වන්නාහ. තෝ එසමයෙහි සෘද්ධිවන්ත තපස්වීව ඉපිද මනුෂ්‍යයන්ට වූ භය දැක ගුරුළුවේශයක් මවා ගෙණ ඒ නාය ලුහුබඳවා මිනිසුන්ගේ භය දුරු කෙළේය. ඒ තා කළාවූ කටයුත්ත අළුයම දුටු සිනයක්මෙන් දනිම් වදාරා, තවද තෝ එක් ජාතියෙක් කේසව නම් තාපසව උයනේ වාසය කරණ කල්හි මම තොපට එසමයෙහි කප්පින නම් ශිෂ්‍යව උපනිම්. එතැන්පටන් තොපගේ උත්පත්තිය දනිම් වදාළ සේක. බ්‍රහ්මයාත් තමාගේ උත්පත්තිය වදාළ බව තමාට දැනුදු හෙයින් සමාධිව වැඳවැතිර ගිය, සර්වඥයන් වහන්සේත් අන්ගේ මිත්ථ්‍යා දෘෂ්ටියබිඳ සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටවූසේක. එවිට බ්‍රහ්මයාත් බුදුන් බුදුවූ බව නියම්යයි ප්‍රත්‍යක්‍ෂ කොට බුදුන් කෙරේ පැහැද ගියවුන් ඇතුළුවූ දසකෙළදහසක්

SANHIDA LANKA

බ්‍රහ්මයෝ අමාමහා නිර්වාණයෙහි පිහිටුවා බ්‍රහ්මයන්ට දෙසූ ධර්මය ජේතවනාරාමයෙහි වැඩහිඳ අනද සාමින් ඇතුළුවූ බොහෝ භික්ෂූන් වහන්සේලාට වදාළසේක. බොහෝ භික්ෂූන් වහන්සේද අධිගම ආදීවූ දෙයට පැමිණිසේක. මේ ධර්මදේශනාව බොහෝ දෙනාට අභිවෘද්ධිය වීයයි වදාරා බක බ්‍රහ්ම ජාතකය නිමවා වදාළසේක.

SANHIDA LANKA

# මහාකපි ජාතකය

තවද අකුතොභයවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බන්ධු සමාගමයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වර්ථමාන කථාව භද්‍රකාල ජාතකයෙහි පෙනෙන්නේය. මෙහි වනාහී වනාහී මහළුවරුන් වහන්සේ දම්සභාවේ රැස්ව සර්වඥයන් වහන්සේ බන්ධූන් කෙරෙහි අනුග්‍රහකරන සේකැයි කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතු නොවෙයි පළමුත් මහෝත්තමයෝ බන්ධූන්ට අනුග්‍රහ කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි අරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

හේ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ වානරව උපන්නාහ. මහත්වූ ශරීරයක් ඇත්තාහ. අසූ දහසක් වඳුරන්ට නායකව වසන්නාහ. හිමාලය වනයෙහි ගංගාවක් සමීපයෙහි මහත්වූ අඹගසක් ඡායාසම්පන්නව මහත්වූ අතුපතර ඇතිව ඉන්ද්‍රනීල පර්වතයක් මෙන් ශෝභමත්ව සිටිනේය. මෙහි පල්ලවයෙන් සශ්‍රිකය මෙහි අඹ කල පමණ මහත ඇත්තේය. රස දිව්‍යාරසය. සුවඳ දිව්‍ය සුවඳය. බෝධි සත්වයන් හා අසූ දහසක් වඳුරෝ ඵලජාතිකා ගෙන ගියාහු අඹ ගස දැක දිව්‍ය රසවූ අඹ අනුභවකොට එහි වසන්නාහ. ඒ අඹගස එක් අත්තෙක අඹ ගොඩ වැගිරෙන්නේය. එක් අත්තෙක අඹ දියෙහි වැගිරෙන්නේය. බෝධිසත්වයෝ ඒ අඹ දියෙහි වැම්මිමෙන් මතු උපද්‍රවයෙක් සැලසුනි නම් නපුරැයි සිතා දියෙහි වැම්මෙන අඹ අත්තේ අඹ මැලයි අවස්ථාවේ නසවයි කියා වඳුරන්ට සම්මත කළාහ. අසූ හාරදහසක් වඳුරෝ ඒ නියාවටම අඹකන අවස්ථාවෙහි එක් අඹයෙක් දිමි කදළු අස්සේ තිබී මුකරා අසුදහසක් වඳුරන් ඇසට නොපෙණී විලිස්සව ගඟ දියෙහි වැටුනේය. ඒ අඹ ගෙඩිය  බරණැස් නුවර රජ්ජුරුවන් නාන්ට එන තොට සමීපයෙහි දෙපිල දැල එල්වා තුබූයේය. ඒ අඹ ගෙඩිය ලෝදැල බැඳින. ලෝදැල් අකුලන්නට ගිය කෙවුලෝ ඒ කියන අඹය දැක කවර ඵලාජාතියක් බවත් නොදැන රජ්ජුරුවන්ට ගෙනාගොසින් දුන්නහ. රජ්ජුරුවෝ මේ කවර ඵල ජාතියෙක් දැයි විචාරා නොදනුම්හයි කීමෙයින් වැද්දන් ගෙන්වාගෙණ මේ කවර ඵලජාතියෙක්දැයි විචාළාහ. ස්වාමිනි හිමාලයේ ගඟක් සමීපයේ අඹයෙකැයි කීහ. රජ්ජුරුවෝ ඒ වැද්දන් අත තුබූ සෙල්ලයෙන් අඹය සස්වා පළමුයෙන් වැද්දන්ට කවා පසුව නුවරුන් පටන් රජ්ජුරුවන් වහන්සේ මේ නිමවා ඒ වැද්දන් ඇරගෙණ ඒ ගස සමීපයට මගපාවයි කියා චතුරංගණී සේනාව ඇරගෙණ ඔරු පාරු පඩව් ආදියට නැගී ගඟ ඔස්සේ ගොසින් අඹ ගස මුලට බැස රජ්ජුරුවෝ අඹරස අනුභව කොට ලැගුම්ගෙණ වට චතුරංගනී සේනාව සලස්වා එතන බොහෝ ගිනිමැල බඳවා බොහෝ අරගල පැවැත්වූහ. මධ්‍යම රාත්‍රියේ අරගල සන්සිඳී ගිණිත් නිවී නිශ්ශබ්දව මනුෂ්‍යයෝ නිදන්ට වන්නාහ. බෝධිසත්වයන් ඇතුළුවූ අසූ දහසක් වඳුරෝ අඹ ගසට නැගී අඹ කන්ට වන්නාහ. බොහෝ වඳුරන් හෙයින් බොහෝ අරගලවූ ගමනේ රජ්ජුරුවෝ පිබිද මනුෂ්‍යයන් පුබුද්දවා අඹ ගස බොහෝ වඳුරෝය කොයිත් යානොදි නිදා නැගිකල්හි අඹ රසත් වඳුරු මසුත් කම්මැයි කියා වට රැකවල්ලවා දුනුවායනුත් ලැවූහ. වඳුරෝ ඒ කසි භයපත්ව බෝධිසත්වයන් සමීපයට ගොස් මෙපවත් කිහ. බෝධිසත්වයෝ  මෙපවත් අසා තොපි හැම භය නොගණුවයි කියා සන්තර්පණය කොට අඹගස අග අත්තට නැගී මහත්වූ වේග දක්වා එගොඩ කැලයකට පැනපූවාහ, බෝධි සත්වයෝ ගඟළුගොඩට පිනුගමනේම දුනු දිය නූළු දුන් නෙන් සියක් දුන්නයයි නියම දැන එච්චරටත් ගස බඳිනා විවරටත් වේවැලක් කඩාගෙණ වේවැල ගස බැඳි බෝධිසත්වයෝ තමන්ගේ ඉග බඳිනා පමණ පරීක්ෂා නොකොට ඉග බැඳ දෙවනුව පීනුවාහු අඹ අත්ත අල්ලා ගත්තාහ. ඉග බදිනා ප්‍රමාණය එහුඬුව ගිය හෙයින් බඳදීලා අත්ත අල්වාගෙණ වැදඹත්තාහ. බෝධිසත්වයෝ වඳුරන්ට කියන්නාහු ඉගබඳිනා ප්‍රමාණය පරීක්ෂා නොකළ හෙයින් අත්තපිට සැපසේ වැදහෝනට නොසේරුය තොප හැම කිසි සැකයක් නොසිතා මාගේ ඉඟ මැඩ ගෙණ සැපසේ ගඟින් එතර පලායවයි කීහ. වඳුරෝ කියන්නාහූ ස්වාමීනි අපගේ ප්‍රාණ ආසාවෙන් නුඹ වහන්සේගේ පිට මැඩගෙණ යනවිනා නුඹ වහන්සේට ලන්වන්නටත් බම්හයි කියා බෝධිසත්වයන් වැඳ වඳුරෝ එකින් එකා නියායෙන් අසූදහසම ගඟින් එගොඩ ගියාහ. දේවදත්තයා ඒ ජාතියේ එකියන වඳුරන් හා එක්ව ඉපද අග අත්තට නැගී උන්තැනැත්තේ ආරාලා බෝධිසත්වයන් පිටට පීනුගමනේ හෘදය මාංසයත් කඩාගෙණ තෙමේ පලා ගියේය. රජ්ජුරුවෝ නොනිදා උන්තැනැත්තෝ බෝධිසත්වයන්ගේ ක්‍රියාවත් වඳුරන්ගේ ක්‍රියාවත් දේවදත්තයන්ගේ ක්‍රියාවත් දැක පාන්වූ ගමනේ අටල්ලක් බාවා ඊටම මැස්සක් කලාව මැස්ස උඩට මිනිසුන් නංවා බෝධිසත්වයන් ඉග බැදි වැල් උනවා බිමට බාවාගෙණ වසටකඩක් වෙලා උලා නාවා මධුර ආහාර කවා සතපාක සහසු පාකතෙල් ශරීරයෙහි ගල්වා රජ්ජුරුවන් නමින් වැදහෝනා යානේ තෙලි සමක් ලා බෝධිස!නවක් එමි වැදහොවා රජ්ජුරුනක් කථා කරන්නාමු විර පුරුෂ වූ වඳුරාණන් වහන්ස නුඹ වඳුරන්ට කුමක් වන්නේද? වඳුරෝ නුඹට කුමක් වෙත්දැයි විචාලාහ. බෝධිසත්වයෝ කියන්නාහූ මේ අසූදහසක්

SANHIDA LANKA

වඳුරෝ මා නයකකොට තමන් ඇමට භයක් පැමිණියොත් අප ගලවාගත මැනවැයි මා රජ කොට තැබූහ. එසේ හෙයින් උන්ට පැමිණ භයින් සන් හිඳවිම, මාගේ වසට බැඳිවැල එබුඬුව ගියහෙයින් වසට ඇදතිබෙන හෙයිනුත් වඳුරන් අසූදහස මාගේ පිට මැඩගෙණ හිස ආයාසයෙකැයි නොදනිමියි මාගේ වඳුරන් සැපසේ පලාගිය ගමන්ම මට මහසන්තෝෂය සතුරන් මඩිනාහෙයින් අරින්දමයයි ගලවා දසරාජ ධර්මයට අකොපානොව රාජ්‍ය කිරීම විනා පැමිණ භයකට රාජ්‍යවාසීන් හැම මැරීම රාජ ධර්මයට ඇතුළත් නොවෙයි අවවාදා කිය කියා වැදොත් ගමනේ ප්‍රාණය නිරුද්ධ විය. රජ්ජුරුවෝ බෝහෝවිකේෂ්පයක් මෙන් කරවයි කියා ගැල් දහසකින්  දර අද්දවා සොළොස් දහසක් බිසෝවරුන් පිළි අඳවා ඉසකේ පිටිමුදාහෙලවා රන්මල් රීදිමල් විලඳ ආදීවූ දෙය ඉසිනා නියායෙන් සලස්වා නුවරවාසීනුත් සොළොස් දහසක් බිසෝවරුනුත් සූසාන භූමියට යවා බෝධිසත්වයන් ආදාහන කරවූහ. බෝධිසත්වයන්ගේ කපාලය නොදා තිබුවා රජ්ජුරුවෝ ගෙන්වා රන්පටක් ඉදිකරවා ජයකොන්තය හා එක්ව මස්වා බරණැස් නුවරට ගෙනගොස් ගඳදුම්මල් ආදීවූ දෙයින් විශේෂයෙන් නුවර සරහා රන් දාගැබක් බඳවා ශිෂකපාලය රන් දාගැබෙහි පිහිටුවා පූජාසත්කාරය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ මහාකපී ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයයෝය. එසමයෙහි වඳුරුව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# කුම්භකාර ජාතකය

තවද අද්භූත පුද්ගලවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ක්ලේශ විෂ්කම්භයක් අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වනාහී විස්තර වශයෙන් පුච්ඡන්ද ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි කෙළෙඹි පුත්‍රයෝ පන්සියයක් මහණව ජේතවනාරාමයෙහි වාසය කරන්නාහූ එක් දවසක් රෑ ඒ පන්සියයක් දෙනා වමන්සේම රාග චිතය උපදවා කෙළෙස් වසගවූ කල්හි සර්වඥයන් වහන්සේ අළුයම් වෙලෙහි බිජුරකිනා කිරලක මෙන්ද වාලධිය රක්නා සුනෙරක මෙන්ද එකපුතෙකු රකිනා මවක් මෙන් ද එක ඇසක් රකිනා එකකු මෙන්ද මාගේ භිකෂූහු කවර ලෙස වාසය කෙරෙද්දෝහෝයි කරුණා සමාපත්තියෙන් නැගී ලොවබලා වදාරණසේක් මේ පන්සියයක් භික්ෂූන් වහන්සේ රාගචිතය උපදවා ක්ලේශ වසගවූ නියාව දැක භික්ෂූන් පන්සියයම තනිවී කැඳවන්නම් මුන් ඇම අප සිතූ සිතුවිල්ල සර්වඥයන් වහන්සේ දානගත්වනැයි භය ඇතිව මා කියන්නාවූ ධර්මය නොඅසන්නාහයි සිතා වදාරා අනද ස්වාමින් කැඳවා ආනන්දයෙනි භික්ෂූන් එක්කරවයි වදාළසේක. අනද ස්වාමින් ජේතවනාරාමයෙහි වාසය කරන්නාවූ භික්ෂූන් වහන්සේ ධර්මසභා මණ්ඩපයට රැස් කරවූසේක. සර්වඥයන් වහන්සේත් එම්බා මහණෙනි යම්සේ ක්ලේශ වසගයෙන් රාගචිත්තයෙක් උපන්නේ වීනම් ඒ දළු නොලවාවහම නසාපිය යුත්තේ පෙර උත්තමයෝ යම්තම් අරමුණක් දැක උපන්නාවූ ක්ලේශයන් නසාපුවෝ වේදැයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ පසල් ගමක දුප්පත් කුඹල්කුලයෙක ඉපද වැඩිවිය පැමිණ බිරින්ද හා සමග තමන් හා දෙදෙන බැලමෙහෙකොට වාසය කරන්නාහ, එසමයෙහි කලිගුරට දන්තපුර නුවර කරණ්ඩක නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරන සමයෙහි ඒ රජ්ජුරුවෝ එක් දවසක් මිගුළුයන් යන්නාහු උයන් දොරකඩ පලගෙණ සිටියාවූ අමාත්‍යයන් හා සේනාව එකිහිම අඹ කඩා කැට මුගුරු ආදිය ගසා අතුපත්කඩා අඹගසට බොහෝ විනාශ කළාහ. රජ්ජුරුවෝත් රජගෙට යන්නාවූ අඹ ගස දැක මෙපවත් අසා සම්පත් ඇත්තවුන්ටත් වන්නාවූ අනර්ථය මේ අඹගසමෙනි, කුමකුත් නිතපේක්ෂව වාසය කරන්නාවූ තාපසවරුන්ට කිසිභයෙක්වත් සිතට දුකෙක්වත් නැත. සියල්ලම අනිත්‍යය දුක්කබ, අනාත්මයයිති ලකුණු භාවනාකොට එම අඹගස මුල සිට සියළුකෙලෙසුන් නසා පසේ බුදුවූ සේක. පසේ බුදුව ඉතිකිත් මේශරීරය දෙවනුව උත්පත්තියක් වන්නෙත් නැත, මේ ඇට සැකිල්ල මේ ජාතියෙයිහිම තිරපෙක්ෂව ඇරපිමි ඒ ඒ ජාතිවල ඇඬුකඳුළු කියතොත් සමුද්‍ර ජාලයටත් බොහෝව දුක්ඛයෙනුත් මිදුනේමයි තිලකුණු භාවනාකොට වැතිරගෙණ වැඩ සිටිසේක. එවිට අමාත්‍යයෝත් ඇයි ස්වාමිනි රජගෙට වැඩියමැනව මෙතන වැඩ සිටිනේ දැයි කීහ. රජ්ජුරුවෝත් එම්බල මම පසේබුදුව ගියෙමි මට රජ්ජුරුවන්ගයි නොකියවයි වදාළසේක. අමාත්‍යයෝ කියන්නාහූ පසේ බුදුවරුන්වහන්සේ නම් තුන් සිවුරු පාත්‍රධරව ඉසමුඩුව මනානොවේදැයි කීහ. එවිට ඉස පිරිමැද ඒ සේක. ඉස කෙසේසතරඟුල් දික්ව තුන්සවිරු පාත්‍රධරව ආකාශයට නැගී නන්දමූල පබ්භාරයට වැඩිසේක.

තවද එසමයෙහි ගන්ධාර රට සත්සලා නුවර නග්ගානම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවෝ එක් දවසක් සඳැල්ලේ අමාත්‍යයන් පිරිවරා උන්නාහ. විථියේ කුඩාකොල්ලෙක් වැලි පූ කරන්නීය. තමා අත තුබූ රුවන් වලළුදෙක එක් අත ඒ හෙයින් ශබ්ද පවත්වන්නට වන රජ්ජුරුවෝත් නිවීම යහපත සම්පත්නම් මිනිසුන්ට විනා සසරට සහයව සිටිනේ නොවෙයි. එසේ හෙයින් තනිව වාසය කරන්නාවූ තපස්වීවරයන් වහන්සේට කිසිභයෙක් නැත්තේය. එම අරමුණු කොට තිලකුණු භාවනා මේනෙහිකොට සියළු කෙලෙසුන් නසා පසේබුදුවූසේක. අමාත්‍යයෝත් ඇයි දේවයන් වහන්ස බැන නොනැගී ඉඳිනේ ඇයිදැයි කීහ. එවිට අමාත්‍යයෝ කියන්නාහූ පසේ බුදුන් කල අට පිරිකර ධරා සිටිය මනා වේදැයි කීහ. එසේ දැයි තමන්වහන්සේගේ ඍද්ධ්‍යානු භාවයෙන් අටපිරිකරධරා ආකාශයට නැගී ගන්ධමාදන පර්වතයට වැඩිසේක.

තවද මියළු නුවර වේදේහරට නිමි නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරන්නාහූ එක් දවසක් මතුමාල්තෙලහි උන්නාහූ අඟානියේ කෙල්ලක් දඩ මස් විකුණන්නීය. ඉන් එක දඩමස් කැටියක් උකුස්සෙක් ගසාගත, ඒ උකුස්සාගේ ඔළුවේ ඇන අනික් උකුස්සෙක් ගසාගත උෟ අතින් අනිකෙක් ගසාගත මස් කැටිය ඇරපූ උකුස්සාට ගහටයෙක් නැතැයි මේ පඤ්චකාම ඇල්මත් මේ උකුස්සා මෙන, ඇල්ම නැති තැනැත්තේ නම් මස්කැටිය ඇරපු උකුස්සා මෙනැයි මෙම අරමුණු කොටාගෙණ තිලකුණු සඳහන් කොට විදර්ශනා භාවනා කොට පසේ බුදුවූ සේක. අමාත්‍යයෝ ඇයි ස්වාමිනි බැනනොනැගී ඉඳිනේ ඇයි දැයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ එම්බා මම පසේ බුදුවිමි කී කල්හි පසේ බුදුවූ කළ මෙසේ ඉඳිනේ ඇයිදැයි විචාල කල්හි අටපිරිකර ධරව සිටින්ට උවමැනැරුයි කී කල්හි එවිට ඉස පිරිමැදළු සේක. අටපිරිකරධරව අමාත්‍යමණ්ඩලයාහා

SANHIDA LANKA

රාජ්‍යවාසීන්ට අවවාද කියාන නන්ද මූල පබ්භාරයට වැඩිසේක.

තවද පඤ්චාලරට උත්තරා පඤ්චාල නුවර දූර්මුඛනම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරන්නාහ. මතුමල්තල උන්නාහු විථියේ එක් වෘෂභයෙක් දෙනකට නැගේන්ටයයි වන අනික් මොල්ලිය මහත් වෘෂභයෙකු දිවගෙණ අවුත් ඒ ගොනා ඇන බඩ පලාපියා ඒ දෙනට නැංගේය. රජ්ජුරුවෝත් පඤ්චකාමයෙහි ලෝභකිරීමෙන් තෙලගොනා මරණට පැමිණියා මෙන් මරණට පැමිණෙන්නේ යයි අනිත්‍යය දුක්ඛය, අනාත්මයයි තිලකුණු භාවනාකොට විදර්ශනා වඩාපසේ බුදුවූ සේක. එවිට අමාත්‍යයෝ ඇයි ස්වාමිනී බැනාොනනැගී ඉදිනේයයි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු මම පසේබුදුවිමියි කීසේක. පසේ බුදුවූ කල මෙලෙස ඉදිනේයයි අටපිරිකරධරා උනමැනවැයි කීහ. එවිට ඉසපිරිමැදළුගමනේ අටපිරිකරධරව පාත්‍රයක් අතින්ගෙණ රාජ්‍යවාසින්ට අවවාදකියා නන්මූල පබ්භාරයට වැඩිසේක. පසේ බුදුන් සතරදෙනා වහන්සේම නන්දමූලපබ්භාරයෙන් නික්ම පසල්ගමකට බැස ගැටවටු ගන්නා බෝධිසත්වයන් ඉදිනා වුගෙට සිඟා වැඩිසේක. බෝධිසත්වයන් වහන්සේ උන්වහන්ස්ලා සතරදෙනා වහන්සේ වඩා ඉඳුවා දන්වළඳවා ස්වාමිනි නුඹ වහන්සේලා සතරදෙනාගේ ඉරියාපථයේ දැක සමාධිවිමි, නුඹ වහන්සේලා සතර දෙනා වහන්සේ කවර අරමුණක් දැක පසේබුදුවුයේදැයි විචාළසේක. එවිට වැඩිමාළු බුදුන්වහන්සේ මම මලාගෙණ සිටි අඹගසකටවූ හානිත් පලදා නොවුගසකට නුවූ හානිත් දැක අර්ථය ඇති නැතැන්තවුට වන්නාවූ අනර්ථයන් මේ අඹ ගසටවූ හානිය දැක අර්ථය ඇති නැතැන්තවුට වන්නාවූ අනර්ථයන් මේ අඹගසටවූ හානිය මෙනැයි අරමුණු කොට පසේ බුදුවිමියි වදාළසේක. දෙවෙනි බුදුන් වහන්සේ කුඩා කොල්ලක අත තනිවතුබූ වලල්ල නොඅඬන නියාවත් වලලුදෙක එක්වතුබූ ගමනේ අඬන නියාවත් දැන බොහෝ දෙනා හා වාසය කිරීමෙන් ඉන් ඊට ගැටීමෙන් සිතට වන්නාවූ ගහට මේ වලලු දෙකමෙනැයි මෙම අරමුණක් කොට පසේ බුදුවිමියි වදාළසේක. තුන්වෙනි පසේ බුදුන් වහන්සේ වදාරණසේක් එක් උකුස්සෙක් හස් කැටියක් ඩැගෙන ආකාශයට නැංගෙය්. අනික් උකුස්සෙක් උෟ ඔළුවේ ඇන ඒ මස්කැටිය ඇරගෙණ ගියේය. පඤ්චකාමයෙහි ආලය අළුවාවූ සත්වයා නම් මස් කැටියේ ආලය ඇරපූ උකුස්සා මෙන් පඤ්චකාමහෙි ඇල්ම කළාවූ සත්වයා නම් මස් කැටිය ඩැගෙණ යන උකුස්සාමෙනැයි මෙම අරමුණක් කොට පසේ බුදුන්වහන්සේ වදාරණ සේක් එක් ගොණෙක් දෙනකට නැගෙන්ට උත්සාහ කෙරෙයි ඉවතසිට අනික් ගොණෙක් දිවගෙණ අවුත් ඒ ගොණා අඟින් ඇණ බඩපලා මරා තෙමේ ඒ දෙනට නැංගේය පඤ්ඤ කාමයෙහි ඇළුම්කළාවූ යම් සත්වයෙක් ඇත්නම් මේ ගොණාමෙන් විනාශයට පැමිණෙන්නේයයි මේ අරමුණක් කොට පසේ බුදුවිමියි වදාළසේක. බෝධි සත්වයෝත් මේ නියාව අසා උන්වහන්සේ සතරදෙනාවහන්සේ කෙරේ සමාධිව උපස්ථාන කළසේක. පසේ බුදුන්වහන්සේත් බෝධිසත්වන් වහන්සේට අනුමෙවැනි බණ වදාරා නන්දමුල පබ්භාරයට වැඩිසේක. බෝධිසත්වයන් වහන්සේත් බොහෝ කලකින් මෙසේවූ රජදරුවෝ මහත්වූ සම්පත් හැර පසේ බුදුවිය මම වනයට ගොස් මහණ වෙමි තමන්වහන්සේගේ බිරින්දට කියනසේක් එම්බා භද්‍රාව. කලිගුරට දන්තපුර නුවර කරණ්ඩික රජ්ජුරුවෝද, ගන්ධාර රට හා කාශ්මීර රට නායක තක්සලා නුවර තග්ගාරි රජ්ජුරුවෝද වේදේහරට මියළු නුවර නිමිරජ්ජුරුවෝද පංචාල රට උත්තර පංචාල නුවර දූර්මුඛ නම් රජ්ජුරුවෝද යන මේ සතරදෙනාම තමන්වහන්සේගේ මහත් රාජ ඓශ්වර්යය හැර පසේ බුදු වූහ. එ තරම් මහාසම්පත් ඇති රජ දරුවන් පවා පසේ බුදුවූකල අපට කන්ට බත් නැතිව අඳින්ට පිළි නැතිව දුක්ඛ ජීවිකාවෙන් දවස් අරුම්හ. අපට තමා මේ ගිහිගෙන් ප්‍රයෝජන කිම්දැයි එම්බා භද්‍රාව මම් වනයට වැද ඍෂිප්‍රවෘජ්‍යාවෙන් පැවිදිවන්නා කැමැත්තෙමි කිහ. එවිට කියන්නාහු භග්ගව ග්‍රෝත්‍රයෙහි පැවිදිවන්නා කැමැත්තමි කීහ. එවිට කියන්නාහු භග්ගව ග්‍රෝත්‍රයෙහි උපන්නාවූ කුඹකාරයන් වහන්ස සිතුදේම යහපත ඊට බාදා නැතැයි කීයා සිතන්නාහූ මුන් වහන්සේ දරුවන් මා ඇගට දමා තමන්වහන්සේ මහණව ගියසේක්විනම් දරුවන් පෝෂ්‍ය කරන්නාට බැරිය මහණවිම්නම් සිතූ සිත හා සමග වූ වෝත්විනා පසුව බොහෝ සිතිවිලි සිතිගියේ නම් කාරණා නොවෙයි මුන්වහන්සේ අතින් අවසර ඉල්වාගෙණ යෙත්නම් යානොදෙන සේකැයි කලය ගෙණ පැනට යන්නාක්මෙන් ගොස් තාපසවරුන් වසන්නාවූ පන්සලට වැද පරිව්‍රාජිකාවුදැයි බෝධිසත්වයන් වහන්සේත් දරුවන් හැරපියා යානොහී මුන් වර්ධන වූ කල යෙමි සිතා මදක් වැඩි ගන්නා මාගේ දරුවෝ කටයුතු කාරිය දනිද්දෝහෝයි පරීක්ෂා කරණ නිසා දවසක් සාල්කරණසේක එක්දවසක් යහපත්ව පිසනසේක දවසක් සාල් කරණසේක. එක් දවසක් යහපත්ව පිසනසේක. දවසක් මාළුයේ ඵනු මදකරණසේක. දවසෙක ඇඹුල් මද කරණසේක. අද කඩුකොට පිසූසේක. අදයහපත්ව පිසුසේක. අද මාළුයේ ඵනු මදකල සේක අද ඇඹුල් මද කළසේකැයි කියන්නාහ. බෝධිසත්වයෝත් මාගේ දරුවෝ කටයුතු දැනගත්තුයයි කියා නෑයන් අතට දරුවන් පාවාදී තමන් වහන්සේ තාපස්වරුන් වසන්නාවූ පන්සලට වැද මහණවූසේක. එක්දවසක් තාපසයන් වහන්සේත්ල පරිබ්‍රාජිකා වහන්සේත් සිඟා වැඩිගමනේ විථියේදී උනුනුන් දැක මාගේ දරුවන් මරාපියා මහණවූසේක්ද නොහොත් දමාපියා මහණවූ සේක්දැයි විචාළසේක. මැරුයේත් නැත දැමුයේත් නැත උන්ගේ නෑයන් අතට පාවාදී මහණවිම් වදාළ තැන්පටන් මියනතුරා දෙදෙන උනුන් නොදැක කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ කුම්භකාර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බෝධිසත්වයන්ගේ කුඩා දියනියෝ නම් උපුල්වන් මහා ස්ථවිරිය. පුතනුවෝ නම් රාහුල මහාස්ථවිරිය. පරිබ්‍රාජිකාවෝ නම් යසෝධරා ස්ථවිරය. කුම්භකාරව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# දල්හ ධම්ම ජාතකය

තවද අප්‍රතිපුද්ගල වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ කොසඹෑනුවර ඝෝසිකාරාමයෙහි වැඩ වසන සමයෙහි උදේනි රජ්ජුරුවන්ගේ භද්‍රාවතී නම් ඇතින්නක් අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වනාහී විස්තර වශයෙන් මාතංග ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහි උදේනි රජ්ජුරුවන්ගේ භද්‍රාවතී නම් ඇතින්නක් ඇත්තීය. ඒ ඇතින්නී රජ්ජුරුවන්ට නොයෙක් කාරිය කොට දවස සියක්යොත්තක් ගොසින් එන්නීය. ඒ චණ්ඩප්‍රද්‍යෝත රජ්ජුරුවන්ගේ දුවනියනුත් ඒ ඇතින්නිය නිසා ලද්දාහ. රජ්ජුරුවෝත් ඒ ඇතින්න තමන්ට කටයුතු කරන්නට ශක්ති ඇතිව කාරණතෙක් දවස් සියලු හස්ත්‍යාලංකාරත්දී තමන් මෙහෙනිමවන්නා සේ ඇතින්නටත් කැවිලි සලස්වා ඇතින්න දුර්වලව ගිය අවස්ථාවෙහි ඇතින්නට තිබූ රාජවෘත්තියත් ඇරගෙන ඇතින්න උනා අලහ, ඇතින්න එක් දවසක් සර්වඥයන් වහන්සේ කරා ගොස් ස්වාමිනි මාගේ රජ්ජුරුවන් වහන්සේ මා නිසා බිසවුන් වහන්සේත් ලත්සේක. ජීවිතයත් ලත්සේක. මා තරුණ දවස් සියලු රාජකාරියම කරවා මට සියලු හස්ත්‍යාලංකාරයෙනුත් සරහා මා සිටිනා ඇත්හල පෝරුව පිට සිටින්නට පයට ආයාසයයි මොලකට තිල්ලත් තනවා තමන් වහන්සේ මේ නිමවනසැටියේ රසමසවුලෙන් යුක්තවූ ආහාරයත් මට නිරන්තරයෙන්ම දෙවා මල මුත්‍ර බිම වගුරුවන්ට නපුරැයි මිදිවලන් තබා මෙසේ නොයෙක් ඉසුරුදී මා රැකීසේක. දැන් මා දුර්වල අවස්ථාවෙහි තණ සුඟක් පමණකුත් නොලා උනා ඇරපූසේක මම වනයෙහි වැටකේ අත්තක් යම්කිසි කොල බොල කඩාකා ජීවත්වෙමි මාගේ පිරිහී ගියාවූ ඓශ්වර්යයෙහි පිහිටුවාලන්නට ස්වාමිනි නුඹ වහන්සේට විනා අනික් කෙණෙකුන්ට බැරියයි සර්වඥයන් වහන්සේට කිව සර්වඥයන් වහන්සේත් යහපතැයි පසුව දවස් රජ ගෙට සිඟා වැඩිසේක. රජ්ජුරුවෝත් සර්වඥයන් වහන්සේ ඇතුළුවූ මහා සංඝයා වහන්සේට දන්දී බණ අසා එකත්පස්ව උන්නාහ. සර්වඥයන් වහන්සේ රජ්ජුරුවන් අතින් විචාරණසේක් මහරජ තොපගේ භද්‍රාවතී නම් ඇතින්න දැන් නොදකුම්හයි ඔදන්කොයිදැයි විචාරාවදාළසේක, ස්වාමිනි දුර්වලවගිය හෙයින් පිටත උනාහළිමි කීහ. එවිට සර්වඥයන් වහන්සේ මහරජ තොපගේ බිසවුනුත් ඈ නිසා ලදුව තොපගේ ජීවිතයත් ඈ නිසා ලදුව එසේ වූ උපකාරි ඇතින්නට තිබූ තරන් අරගන්නට කාරණා කිම්දැයි කටයුතු කරන්නාවූ යම් කෙණෙකුන් තරුණ අවස්ථාවෙහි කටයුතුගෙණ දුර්වල අවස්ථාවෙහි උන් ස්ථානාන්තරය පිරිහෙළිම රජ්ජුරුවන්ට කටයුතු නොවෙයි නියා ඇතින්න ගෙන්වා පළමු තිබූ ස්තානාන්තරයෙක් ඇත්නම් ඒ සියල්ලම ඇතින්නට සලස්වා වදාළසේක. රජ්ජුරුවෝත් එර් නියාවට ඇතින්නට පළමු තිබූ තරන් නියාවට අඩු නැතුව පසිඳුවයි නුවර බෙරලැවුහ, එක් දවසක් දම්සභාවේ රැස්වූ භික්ෂූන් වහන්සේ සම්පත්තියෙන් පිරිහුනාවූ භද්‍රාවතී නම් ඇතින්න රජ්ජුරුවන්ට කියා සර්වඥයන් වහන්සේ පළමු සිටි ස්ථානාන්තරයෙහිම පිහිටීම පිහිටුවුසේක් වේදැයි කියා කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි පෙරත් භද්‍රාවතී නම් ඇතින්නිය ස්ථානාන්තරයෙන් පිරිහුනු තෙනැත්තිය සම්පත්තියෙහි පිහිටු වූයෙම් වේදැයි ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර දල්හධම්ම නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරන්නාහා බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යධුරයෙහි උපන්සේක. ඒ රජ්ජුරුවන්ගේ ආචාර මෙවරෙහි දක්ෂ වූ යුද්ධයට කඩුසොටි බැඳ සතුරන් මධ්‍යයට වැද යුද්ධ කරන්නට සමර්ථ වූ ඔටුදෙනක් ඇත්තීය. රජ්ජුරුවෝත් උදේනි රජ්ජුරුවන් භද්‍රාවතී නම් ඇතින්නට තිබූ යම් ස්ථානාන්තරයෙක් ඇත්නම් තමා රැක දුර්වල ව ගිය අවස්ථාවෙහි තුබු රාජවෘත්තිය ඇරගෙණ පිටතට අලහ, එක් දවසක් රජ්ජුරුවන්ගේ මුලුතැන්ගෙට වලන් ලන්නාවූ කුඹලා වලන් පමාකෙළේය. රජ්ජුරුවෝත් කුඹලා ගෙන්වා ගෙණ වලන් නොපසිඳින්නට කාරණා කිම්දැයි කීහ. ස්වාමිනි ගොමවැරටි අදිනා ගොන් නැතිහෙයින් වලන් නොපිළිස්සුනියාය. වලන් නොපසු නොවෙයි කිහා. රජ්ජුරුවෝත් එවිට කියන්නාහු අපගේ පරණ ඔටුදෙනෙක් ඇත්තීය. ඒ කොයිදැයි විචාළාය. කුඹලා කියන්නේ ස්වාමිනි ඕ ඉච්ඡාපරයේ ඈ සිටිනියයි කීහ. එසේ නම් ඈ බැඳගෙණ ගොමරිති අද්දවයි කුඹලාට පවාදුන්හ. කුඹලාත් එතැන් පටන් ඈ බැඳගෙණ ගොමරිති අද්දවන්නේය. එක් දවසක් බෝධිසත්වයන් දැක ඔටුදෙන කියන්නී මම පළමු රජ්ජුරුවන් වහන්සේට පක්ෂපාතිව සිට ලෙයි කඩු සොටි බැඳගෙණ සිට ඒ ඒ තැන යුද්ධත් කෙළෙමි සියක් යොත්නේ සන්තානයකටත් පත්ලියා කර බැඳලුකල ඒ රජ්ජුරුවන් ලඟට ගෙණ ගොස් සන්තාන පිරිමසාගෙණ උන්ගෙන් ලියා දුන් බස පතා අපගේ රජ්ජුරුවන් වහන්සේට ගෙණවිත් දී නොයෙක් රාජකාරිය පරිමසාදිනිමි. දැන් දුර්වලව ගිය අවස්ථාවෙහි මාගේ තරම් පදමුත් ඇරගෙණ මා පිටත තණකොලකා ජීවත්වන තෙනැත්තිය පිටතත් සිටියනොදී කුඹලාට වලන් පුළුස්සන ගොම වැරටි අදිනා නියායෙන් සලස්වා වදාළසේක. මේ විදිනා දුක්බයෙන් ඉදන්ටත් පළමු සිටි ස්ථානාන්තරයෙහි පිහිටුවන්ටත් නුඹවහන්සේට භාරයයි වැඳහෙව කිහ. බෝධිසත්වයන් වහන්සේ ඈ කී කටයුතු අසා යහපතැයි රජ්ජුරුවන්ට

SANHIDA LANKA

කියා තොප පළමු සිටි ස්ථානාන්තරයෙහි පිහිටුවා ලමි. නුවරට වැඳ රජ්ජුරුගෙයි පළමු සිටි ඕටුදෙන් කොයිදැයි විචාළසේක. රජ්ජුරුවෝ කියන්නාහූ දුර්වලව පිටත සිටි තැනැත්යි කුඹලා වලන් පුළුස්සන්ට ගොමවැරටි අදින්ට පාවාදුනුම් කීහ. බෝධිසත්වයන් වහන්සේ දේවයන් වහන්ස යම් අසත්පුරුෂයන්ට යම්කෙණෙක් අර්ථාලාභ වනම් උන්ට අනර්ථකිරීම් අසත්පුරුෂයන්ට සුදුසු පමණක් විනා නුඹවහන්සේ වැනි රජදරුවන් වහන්සේට තරම් නොවෙයි එසේ හෙයින් ඕටුදෙන නුඹ වහන්සේ ඒ ඒ තැන රජ දරුවන් ලඟට මෙවර ගොසින් කළ සන්තානත් ලෙයි ආයුධ බැඳගෙණ සතුරන් මධ්‍යයට වැද නොයෙක් වාරයේ කළාවූ යුද්ධත් නුඹ වහන්සේටම දනෙන්නේ වේද තමාට තරුණ අවස්ථාවෙහි රාජකටයුත්තක් කළාවූ යම් කෙණෙක් දුර්වලවයන්නාවූ උන්ගේ ස්ථානාන්තරයෙනුත් පිරිහෙලා උනුන් ඇරපුකල නුඹ වහන්සේට දුක් ගන්නා සියල්ලෝය මුන් වහන්ස්ට දුක්ගැනීමෙන් කවර ප්‍රයෝජනයෙක්ද තමන් වහන්සේට බොහෝ දුක්ගත් ඕටුදෙන පවා සිටි ස්ථානාන්තරයත් සියල්ලම පිරිහෙලා රැක්ක මැනව එවිට සියල්ලෝම නුඹ වහන්සේ කෙරෙහි තව අපගේ ස්වාමි අප කටයුත්තකට භව්‍ය වුවත් අභව්‍ය වුවත් රැකවදාරණසේකැයි රාජ අමාත්‍යාදීවූ සියල්ලෝම යම් අවසරයෙක නොහරණහයි රජ්ජුරුවන් වහන්සේට නොයෙක් කාරණාකියා අවවාදයෙහි පිහිටුවා ඕටුදෙනත් පළමු නියායෙන් ස්ථානාන්තරයෙහි පිහිටුවෝ වේදැයි වදාරා මේ දල්හධම්ම ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි ඕටුදෙන නම් මේ භද්‍රාවතී නම් ඇතිනන්නය, අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# සොමදත්ත ජාතකය

තවද මෛත්‍රී නැමති ජලයෙන් නිවන ලද කෝපාග්නි ඇති ලොකොත්තමවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් මහළු භික්ෂූන් වහන්සේ නමක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් මහළු භික්ෂූකෙණෙකුන් වහන්සේගේ අත්පාමේ හෙවර කරන්නාවූ එක් සාමණේර නමක් එක් ව්‍යාධියකින් කළුරිය කළසේක. ඒ මාළු භික්ෂූන් වහන්සේ උන් වහන්සේ මළාවූ ශෝකයෙන් අඬා වැළප ශාසනයෙහි සිතිවිල්ලක් නැතිව මහත් ශෝකයෙන් ඉඳිනාසේක, භික්ෂූන් වහන්සේ දම්සභාවේ රැස්ව ඉඳ අසවල් මාළු භික්ෂූහු තමන්ගේ සාමණේර නමක් මළාවූ ශෝකයෙන් අඬා වැලප ඉඳිනාහයි කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා මෙපවත් අසා දැන් මතු නොවෙයි මහණෙනි මේ භික්ෂූහු පෙරත් මේ සාමණේරයන් නිසා අඬා වැළප දුක්විඳින්නවුන්ම මම සන්හිඳුවූයෙමි වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහුය. එසමයෙහි එක් බ්‍රහ්මණයෙක් පංචකාමයෙහි ආදීනව දැක වනයට වැද තාපසව වාසය කරන්නාහ. එක් දවසක් එලාඵල කඩා ගියාහු එක් ඇත්පැටියෙකු දැක පන්සලට ගොණවුත් සොමදත්තයයි නම් තබා දරුකොට වඩන්නාහූ ඇත් පැටියා පන්සල රඳවා ගියහ. තාපසයන් වනයටයාදී තණකා අජීර්ණව දිරවා ගතනොහෙි තාපසයන් එන වේලාවට වැටීහිනි. තාපසයෝත් එලා එල ඇරගෙණ එන්නාහූ ඇයි මෙතෙක් දවස් සෝමදත්තයෝ මා ඉදිරියට එන්නාහා අද නාවෝය මේ වැද්‍රොතොළුවනැයි, ඇතාලඟට ගොස් මාගේ පුතනුවෝ වැද ගොනේය. නිදා වැදහෝත්තාමෙන් මා හා බැන නොනැගී වැඳහෝනාහයි බැගෑ පත් අඬා අතකරවැලඳගෙණ මහත්වූ ශෝකයෙන් නොකා නොබි අඬා වැලපුනාහ. ශක්‍රයෝත් තාපසයන් විඳිනාවූ ශෝකය දිවසින් දැක බමුණු වේසක් මවාගෙණ තාපසයන් කරා අවුත් විචාරන්නාහූ ඇයි තාපසයෙන් තොප අඹු දරුවන් ආලය හැර කිසිදෙයකත් නිරපේක්ෂව නොවේද තොප තපසට ආයේය එසේ වූ තොප මේ ඇතකු නිසා අඬන්නට දොඩන්ට කාරණා කිම්දැයි කීහ. එවිට තාපසයෝ කියන්නාහූ එම්බල ශක්‍රදේවේන්ද්‍රය යම් කෙණෙක් බොහෝ දවසක් එකතැනවැස ඇරගියෝ නම් උන්ගේ වියෝවූ කල ඇත්තාවූ ශෝකය ස්වභාව ලෝකධර්මයෙක. සියල්ලෝම අඬා වැලපෙන්නාහ. එසේ හෙයින් මාගේ පුතනුවන් කෙරේ ශෝක ඉවසාගත නොහි අඬමි කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහූ මේ වළාවූ ඇතාට ශෝකයෙන් තොප ඇඬූ නියාව දනිද්ද මළවුන්ට ඇඬීමෙන් තමාගේ ශරීරයට දුක්වන පමණක් විනා ඉන් ප්‍රයෝජන කිම්ද ඉඳින මල කෙණෙක් උපදිත්නම් නුඹ වහන්සේගේ බොහෝ නෑයෝ මළෝවේද ඌ උපදිත්නම් නුඹ වහන්සේත් මමත් දෙන්නම අඬමහයි කිහ එවිට තාපසයෝ කියන්නාහූ දේවේන්ද්‍රයෙනි තොප මාගේ පුත්‍ර ශෝකාග්නි නිවූ නියා ඉතා යහපතැයි වදාරාලා තෙල්වත් කොට දල්වන්නාවූ ගින්නක් නිවුකලක් පරිද්දෙන් ශෝකය තුනී කරණ ලද යම්සේ පයක ඇනුනාවූ හුලක් ඇර දුනමනා කලක් මෙන් මාගේ ලෙයිතුබූ ශෝක නමැති උල උදුරාපුද අද පටන් ශෝකත් නොකරමි නාඬමි. නොදොඩමි සන්හිඳුනුසේක. ශක්‍රයෝත් තාපසයන් වහන්සේ ශෝක සන්සිඳුවා තමන්ගේ දිව්‍ය ලෝකයටම ගියේය. එසමයෙහි තාපසයෝ නම් මේ මාළුවූ භික්ෂූන්හ. ඇත්පැටියා නම් සාමරණේරය. ශක්‍රව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මයයි වදාරා සෝමදත්ත ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# සුසීම ජාතකය

තවද සංසා චක්‍රය මිථනය කළවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ හිඳ සමයෙහි මහබිනික්මන් අරභයා මේ ජාතකය ලද්වන ලද.

එක් දවසක් දම්සභාවේ රැස්වූ භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේ, මේසා මහත් රාජෛශ්වර්යයත් තිබා පියා මහාබිනික්මන් කළේ වේදැයි කිය කියා වැඩ උන් ප්‍රස්ථාවට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි මහණෙනි පෙරත් මහබිනික්මන් කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි උන්ට පුත් රජ කුමාරකෙණෙක් උපන්නාහ. උන්ට බ්‍රහ්මදත්ත කුමාරයෝයයි නම් තුබූහ. ඒ රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රහ්මණයාගේ ගෙයි බෝධිසත්වයෝ උපන්නාහ. උන්ට සුසීම කුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරවරුහු දෙදෙනාම වැඩිවිය පැමිණ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් කරා ගොස් සියලු ශාස්ත්‍ර නිමවා ඉගෙණ නුවරට අවුත් යුවරජ තනතුරෙහි සිට පියානන් ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ මාගේ යාළුවූ සුසීම කුමාරයනුත් පුරෝහිත තනතුරෙහි පිහිටුවා දෙන්නම දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරන්නාහු එක් දවසක් රජ්ජුරුවෝ නුවර ප්‍රදක්ෂිණා කරන්නාහු තුමූ ඇත් කඳකට වී පැන් නැගී පුරෝහිත බ්‍රාහ්මණයා තමන් පිටිපසේ ඉඳුවා නුවර ප්‍රදක්ෂිණා කරන්නාහ, රජ්ජුරුවන්ගේ මැනියෝ සැඳැල්ලහෙි සිටියාහු රජ්ජුරුවන් පිටිපස්සේ ඇතුපිට උන්නාවූ සුසීම කුමාරයන් දැක උන්කෙරේ අභිලාෂා ඇතිව මුන් නොලදීන් නම් ප්‍රාණයෙන් කම් කිම්දැයි ගෙට වැද යහන් මතුයෙහි මුනින් වැදඹත්තාහ. රජ්ජුරුවෝ නුවර පැදකුණු කොට රජගෙට අවුත් මැනියන් ඉඳිනාවූ රජගෙට ගොස් මෑණියන් වහන්සේ කොයිදැයි විචාරා ලෙඩට වැදහෝනාසේකැයි යනුව මෑණියන් වහන්ස අළුාසු කිම්දැයි විචාළාහ, බිසවුන් පුතනුවන්ට කියයතු දෙයක් නොවන හෙයින් ලජ්ජා ඇතිව බැණනොනැගී උන්හ. රජ්ජුරුවෝත් මාලිගාවට අවුත් අගමෙහෙසුන් බිසවුන්ට කියන්නාහු මැනියන් වහන්සේට ඇති ආළුාසු විචාරා එවයි කියා බිසවුන් යවූහ. රජ්ජුරුවන්ගේ මැනියෝත් ස්ත්‍රී නම් උන්සිත ඇත්ත නොසඟවන හෙයින් යේ ලනියන්ට මෙපවත්කීහ. බිසවුන් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් එපවත් අසා සුසීම නම් පුරෝහිත බ්‍රාහ්මණයානන් කැඳවා කියන්නාහු එම්බා සුසීම නම් පුරෝහිත බ්‍රාහ්මණයානෙනි මාගේ මැනියන් වහන්සේට මෙසේවූ අභිප්‍රායක් ඇතිව ලෙඩසේක. උන් වහන්සේ ඒකදේවම්ම තොපට පුත්ව යුවරජ තනතුරෙහි සිටිම් කීහ. පුරෝහිත බ්‍රාහ්මණයානෝ කියන්නාහු ස්වාමිනි මෙලෙස කිම ආචාරයෙක් නොවෙයි, කියා නොගිවිස්සාහ, රජ්ජුරුවෝත් නොයෙක් කාරණා කියා සුසීම නම් පුරෝහිත බ්‍රාහ්මණයානන්ට මැනියන් පාවාදී උන් රාජ්ජයෙහි පිහිටුවා තුමූ යුවරජ තනතුරෙහි පිහිටියාහ. රජ්ජුරුවෝ එතැන් පටන් රාජ්‍යය කරන්නාහු ගිහිගෙයි කලකිරී කවර විටෙක මේ ගිහිබන්ධනයෙන් ගැලවියෙම්දෝහෝයි සිත සිතා තනිව සිටිනාහ. ඉඳිනාහ ඇවිදිනාහබිසව් සිතන්නාහු මා මැහැලිසෙයින් මා කෙරේ ආලයමදව ඉඳිනාසේක්වනැයි සිතා එක් දවසක් රජ්ජුරුවන් ඉස බලන්නාක්මෙන් බල බලා ඉඳ තමුන් ඉසින් නරකෙන්දක් ඇරගෙණ රජ්ජුරුවන්ට පෑ දේවයන් වහන්ස මම මතු නොවෙයි මැහැල්ලෙමි. නුඹ වහන්සේත් මහළුවගියසේකැයි රජ්ජුරුවන්ට කීහ. එවිට රජ්ජුරුවෝ මෘත්‍යුමාරයා අවුත් ඉසකේ අල්වාගත්තාක් මෙන් කොට සිතා භයින් ත්‍රස්තව තුමූ තමන්ට අවවාද කියන්නාහු එම්බා සුසීම කුමාරයෙනි තොපගේ කළුවූ කෙස් විලිස්සෙන්නට වන ඉතිකින් තොප මහණවන්ට යන්ට කලැයි කීහ. එවිට බිසව් කියන්නාහු දේවයන් වහන්ස මම නුඹ වහන්සේ වංචාකරණ නිසා මාගේ ඉසින් නරපතක් ඇරගෙන පෑමි, නුඹ වහන්සේ ඉස නරයෙක් නොවෙයි මා නිශ්රණකොට නුඹ වහන්සේ මහණවන්නට යනසේදැයි කියා නුඹ වහන්සේ ඉතා විශිෂ්ට රූ ඇති සේක. බැළුවන්ට ප්‍රියකරුසේක. මේ අවස්ථාවෙහි මහණවිමට කාරණා නොවෙයි. මහණවන්නට නොගිය මැනවයි කිහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු එම්බා මම මාළුවයසට පැමිණ සිටිනවුන් බොහෝ කොට දිටිමි. තරුණ අවස්ථාවෙහි අනුන් පොළඹාන්නාවූ ස්ත්‍රීහු මැහැලි අවස්ථාවෙහි සැරයටි දඬුගත් අත් ඇතිව තුමූ තමන් පෙළඹාගත නොහෙන්නාහ. මම ළදරුවනුත් මහල්ලනුත් දුටුවිරිම් තොප කෙසේ කීවත් මහණවන්නට යෙමි කියා රාජකුමාරයන්ට රාජ්‍යය පාවාදී වනයට ගොස් සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ සුසීම ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථිවිරයෝය. බිසව් නම් යසෝධරා ස්ථිවිරීය, පුරෝහිත බ්‍රාහ්මණවූයෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# කොටිසිඹලි ජාතකය

තවද සංසාර සාගරයෙන් පරතෙරට පැමිණියාවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ක්ලේශ නිග්‍රහයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් දවසක් පන්සියයක් භික්ෂූන් වහන්සේට කාමවිත්කර්යෙක් උපන ඒ උපන් කාමවිත්කය සර්වඥයන් වහන්සේ දැන වදරා මහණෙනි කාමවිතර්ක ව්‍යාපාද විතර්ක විහිංසාවිතර්කි සිතීමෙන් මාර්ග නැමති ඵලාවිපාකයට බාධකය යම් ගස්බිලයෙක පක්ෂියෙක් වර්චස් කළේ නම් ඒ වර්චසින් නුග පැලය ඇතිව ඒ ගස විනාශයට පැමිණෙන්නා මෙන් රහත් ඵල නැමති විපාක නසාපියන්නේය. එමෙන් කාමවිතර්ක නොසිතවයි වදාරා දේවතාවාතමාගේ ගස උන් පක්ෂියා දැක බාගියේද එමෙන් මහණෙනි කාමවිතර්කයන් උපන්කල ඊට හිරුකව වාසය කරවයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් වහන්සේ රාජ්‍යය කරණ සමයෙහි එක්තරා ඉඹුල්වනයක ගුරුළු රජ්ජුරු කෙණෙක් වාසය කරන්නාහ. ඒ ගුරුලා මහත්වූ ශරීරයක් ඇතිව සමුද්‍රජලය දෙබෑ කොට නාගභවනයට වැද මහත්වූ නාගරාජයෙකු ඩැගෙණ පිටත්ව ආකාශයෙන් යන කලට නාගයා මහත් වෘක්ෂයෙක් වෙලාගත ගසත් උදුරා ඇරගෙණ ගුරුළු රජ්ජුරුවෝ තමන්ගේ වෘක්ෂයේ ඉඳ නාගයා ඉස මොල ආදීවූ දෙය අනුභය කොට නාගයාත් වෘක්ෂයත් එලීය. වැටෙන වෘක්ෂය සමුද්‍රයෙහි වැටෙන්නට වන වෘක්ෂයේ උන් පක්ෂියෙක් ඒ ගසින් පිටත්ව ගුරුළු රජ්ජුරුවන් උන් වෘක්ෂයේ ගොසින් උන්නේය. ඒ වෘක්ෂයේ උන් දේවතාවා භයින් ත්‍රස්තව වෙවුලන්නට වන, එවිට ගුරුළු රජ්ජුරුවෝ දේවතාවා දැක ඇයි තොප මා වැනි කෙණෙකුත් මහත්වූ ශරීරයක් ඇති නාගරාජයෙකුත් ඇවිත් උන් ගමනේ නොවෙව්ලාදැන් වෙවුලන්නට කාරණා කිම්දැයි විචාළේය. දේවතාවා කියන්නේ මේ පක්ෂියා අනුභව කරන්නේ නුග දිඹුල් ආදි වූ ඵලජාතිය. මාගේ ගස ඉඳ ගස් බිලයෙක වර්චස් කෙළේ නම් නුග ගසෙක් හෝ යම් ගසෙක් ඇතිවි නම් මාගේ විමානය නසින්නේය. එසේ හෙයින් ඉදිරියේ වන උපද්‍රව දැක භයින් වෙවුලාගියෙමි කී සේයයි වදාරා මේ කොටිසිඹලි ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි ගුරුලා නම් ශාරිපුත්ත ස්ථවිරය. එසමයෙහි දේවතාවා නම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# ධූමකාරී ජාතකය

තවද නිර්මල වූ පස්පැදිස්නා ඇස් ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ ආගන්තුක සංග්‍රහයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

කෝසල රජ්ජුරුවෝ පරණ මහා අමාත්‍යයන් හා යෝධයන් හැර අමුතුව ඇතිකළ අමාත්‍යයන් හා යෝධයන් ඇරගෙණ පරණ ජනයන් කෙරෙහි නිස් සාරව පවත්නාහ, එසමයෙහි රජ්ජුරුවන්ට සොරුන් කැටි යුද්ධයෙක් පැමිණියේය. රජ්ජුරුවෝ පරණ අමාත්‍යයන් හා යෝදයනුත් අළුත් මුදලිවරුන් හා ඇම සේනාවත් ඇරගෙණ සටනට ගියාහ. පරණ අය කෙරේ රජ්ජුරුවන් වහන්සේ සරුකාරියක් නැතිව අලසේක. තමන් වහන්සේගේ අළුත් මුදලි වරුන් හා සේනාව ඇරගෙණ සටන් කරවා ගන්නාසේක් වායි මැලිවූහ. අළුත් මුදලි වරුන් හා සේනාව ඇරගෙණ සටන් කරවා ගන්නා සේක්වායි මැලිවූහ. අළුත් මුදලිවරුන් හා ඇමති සේනාවත් අපට වලගොඩ නොදනෙයි කියා තමන් නොදන්නාහෙයින් තොරතුරු නොදන පසුබටහ,සොරුන් සටන් කොට සේනාව බින්දවූහ. රජ්ජුරුවෝ සටනේ පැරද බිඳී නුවරට අවුත් පරණ මහ අමාත්‍යයන් හා යෝධයන් ඇරගෙණ උන්ගෙනුත් කටයුතු කරවා ගතත් නුහුණුයෙම් අළුතුන් ගොනුත් නුහුණුයෙම් මට වූයේ අලාභයෙකැයි කියා මේමට මතුවූ දෙයෙක් දොහෝ පෙරත් රජදරුවන්ට මෙසේ විදෝහෝයි, සර්වඥයන් වහන්සේ ලඟට ගොස් විචාරම්යි ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේ වැඳ එකත්පස්ව ඉඳ මෙපවත් කීහ. සර්වඥයන් වහන්සේත් මහරජ දැන්මතු නොවෙයි පෙරත් එසේම වියයි වදාරා ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස කුරුරට ඉඳිපත් නුවර ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරු කෙණෙකුන් රාජ්ජය කරන්නාහ, ඒ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාවූ විධුර නම් පණ්ඩිත කෙණෙක් ඇත්තාහ. ඒ රජ්ජුරුවෝත් පරණ අමාත්‍යයන් හා යෝධයන් හැර අළුත් අමාත්‍යයන් හා සේනාව ඇති කරන්නාහ. පළමු මුදලිවරුන් කෙරේ සාරයක්වත් විචාරයක්වත් නැත්තාහ, එසමයෙහි රජ්ජුරුවන්නේ පසල්ගම කුපිත විය. රජ්ජුරුවෝ උන් හා කැටිව යුද්ධයට ගියහ පරණ අමාත්‍යයෝ රජ්ජුරුවන් වහන්සේ අපකෙරේ විචාරයක් සමැන්මක් නැතිසේක. තමන් වහන්සේගේ අළුත් මුදලිවරුන් හා සේනාව ලවා යුද්ධ කරවා ගන්නාසේක්වයි කියා යුද්ධයට නොවැද සිටියාහ. අමුතුව ඇතිකළ අමාත්‍යයන් හා සේනාවද තමන්ට යුද්ධයෙහි තොරතුරු නොදනෙන හෙයින් සටන් කරණ සේ නොදැන පසු බටහ. සතුරු සෙනගත් රාජ සේනාව සටනට නොවදනා හෙයින් තරයේ යුද්ධයට වන්හ. ඒ සේනාව පසුස්නා සතුරු සේනාව බල වැඩී එන හෙයින් රජ්ජුරුවෝ සිටිය නොහී පසුබැස නුවරට ගොසින් තමන්ගේ විධුරපණ්ඩිතයන් අතින් විචාරන්නාහු පණ්ඩිතයෙනි මම පරණ මහා අමාත්‍යයන් හා සේනාව හැර අමුතම මුදලිවරුන් හා සේනාව ඇතිකොට පරණුන් ගෙනුත් නුහුනුයෙම් අලුතුන් ගෙනුත් නුහුණු යෙම් මාසේම පෙරත් අතින් කෙණෙකුන්ටත් මෙලෙස විදෑයි විචාළාහ. එවිට පණ්ඩිතයෝ කියන්නාහු යුධිෂ්ඨිර ගොත්‍රයෙහි උපන්නාහු ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන් වහන්ස මේ කුමක්ද මෙවිතරටත් වඩා විශිෂ්ට ගොත්‍ර ඇති ධූමකාරී නම් බ්‍රාහ්මණයාණන් කෙණෙක් ඇත්තාහ. උන්ගේ එළුපට්ටියෙක් ඇත. ඒ එළුවන්ට හිත අවදියෙහි වට ගිණිදුම් කරන්නාහ. සවස ගාලේලන්නාහට කිරි තෙල කන්නාහ, තනකොල ගෙනවිත් ලන්නාහ, එසමයෙහි වර්ෂා කාලය පැමිණියේය. වනයෙහි සිට මුවෝ පන්සියයෙක් බ්‍රාහ්මණයානන් වසන්නාවූ පන්සල ලඟට ආවාහ. බ්‍රාහ්මණයාත් යහපත්වූ මුවරැල දක එළුවන් කෙරේ ආලය හැර මුවන් එක්කොටගෙණ තණකොළකවා උන්පෝෂ්‍යා කර එළුවන් කෙරේ ආලය අලහ, එළුවොත් එතැන්පටන් ගාලේ ලන්නන් නැතිහෙයින් ඒ ඒ තැන ඉසිරගොස් සිංහ ව්‍යාඝ්‍රයන්ට වගුන් දිවියන් අතින් විනාශයට පැමිණියාහ, මුවෝත් වර්ෂා කාලය නිමායන්නා තමන් වසන්නාවූ වනයට පලාගියාහ. බ්‍රාහ්මණයාත් අළුත් මුවන් දක එළුවන් කෙරේ ආලය හැර ලබන කිරි ද කිරියෙනුත් නොවි එළුවන්ගෙනුත් නුවුයේයයි මුවන් ගෙනුත් නුවුයේයයි කියා රජ්ජුරුවන් වහන්ස අලුතුන් දුටුවයි පරණ අමාත්‍යයන් හා සේනාව වදුරු කිරීමත් කටයුතු නොවෙයි අමුතුව ඇතිකරන්නාවූ ප්‍රධානයෙන් හා සේනාවත් ඇතිකළ මනාමය, පරණ අමාත්‍යයන් හා සේනාවත් උන් උන්ගේ ස්ථානාන්තරයෙන් නොපිරිහෙලා තරම් පදම්දී රැක්කමැනව එසේ කල්හි පරණනුත් අළුතුනුත් සියල්ලෝම එක්සිත්ව නුඹවහන්සේගේ පැමිණ යම්ම කාරියක් පිරිමසන්නා හයි කීහ. රජ්ජුරුවෝත් විධුරපණ්ඩිතයන් කීවාවූ අවවාදයෙහි පිහිටා පරණ මහ අමාත්‍යයන් හා යෝධයනුත් නොහැර අමුතුව ඇතිකළ මුදලිවරුන් හා සේනාවත් වෙනසක් නොකොට රැක පණ්ඩිතයන් කෙරේ සමාධිව බොහෝ දෑසිදස් ආදීවූ වස්තු දී තමන් කළාවූ කම්පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ ධූමකාරිජාතකයනි මවා වදාළ සේක. එසමයෙහි බ්‍රාහ්මණයා නම් කෝසල රජ්ජුරුවෝය, ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය, විධුර පණ්ඩිතව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# ජාගර ජාතකය

තවද ප්‍රඥාවිෂයාතික්‍රාන්ත වූ ධම්මකාය ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි නොනිදා සක්මන් කරන්නාවූ උපාසකයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් සෝවාන් උපාසකයෙකුත් වෙළඳහු පන්සියයක් බඩු ගැල්පුරා වෙළඳාමෙහි යන්නාහු අතරමග පඩංගු බැඳ උන්නාහ, රැවයන්නා සොරු පන්සියයක් වෙලඳුන් මරාබඩු ඇරගනුම්හයි කැටමුගුරු දඬුපත් ආයුධගත් අත් ඇතිව ආවාහ. සෝවාප්පු වෙලඳානෝ සක්මන් කොට සිටියාහු පංපහරින්ට ආ සොරු මේ මිනිසා නිදාපුකළ සොරකම් කරම්හයි සිතා සිටිනාහ. ඒ වෙලඳා තුන්යම් රාත්‍රියෙහිම නොනිදා සක්මන් කොට පාන්කොටපුවාහ, සොරුන් සිටියාසේම සිට පාන්කොට පාන්වන්නා තමන්ගෙණා කැටමුගුරු දඬුපත් දමා වෙලඳුන්ට තොප ඇමම රැකුනේත් තොපවස්තු රැකුනේත් මුන්නිසාය බොහෝ උපකාර වයි කියා පළාගියාහ. වෙළඳුන් ගැල්ගෙණ වෙළඳාමට ගොස් වෙළඳාම් කොට ගෙණනුවරට අවුත් සර්වඥයන් වහන්සේ කරා ජේතවනාරාමයට ගියහ සර්වඥයන් වහන්සේත් ඇයි උපාසකය මෙතෙක් දවස් කොයිගියාදැයි විචාරා වෙළඳුන් වෙළඳාමට ගියනියාවත් අතරමග ලැගිනියාවත් නොනිදාම සක්මන් කළ නියාවත් සොරුන් ආ නියාවත් තමන් කළ නියාව දැක සොරු පාන්වනතුරු සිට පාන්වන්නා අත තුබූ කැටමුගුරු දමාගිය නියාවත් සර්වඥයන් වහන්සේට කීහ. සර්වඥයන් වහන්සේත් එම්බල උපාසකය පෙර උත්තමයෝත් නොනිදා සක්මන් කොට දේවතාවන් අතින් සාධුකරා ලද්දෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රාහ්මණ කුලයක ඉපිද පඤ්චකාමයෙහි ආදිනව දැක ඍෂිප්‍රව්‍ර්‍ජාවෙන් පැවිදිව වනයෙහි වාසය කරන්නාහු රෑ නොනිදා රාත්‍රිය තිස්පැයෙහි සක්මන් කරන්නාහ, එක් දේවතා දුවක් කියන්නී නිදන්නාවුන් අතුරෙන් නොනිදන තැනැත්තෝ කවුරුද නොදිදන්නවුන් අතුරෙන් නිදන්නෝ කවුරුදැයි දේවතාදුව විසින් විචාලකල්හි ඒ ප්‍රශ්නය විසඳන්නාවූ මහබෝධිසත්වයෝ දේවතාදුවට මේ ලෝකයෙහි යම් සත්වකෙණෙක් ශිලසඤ්ඤමයද ඉන්ද්‍රිය දමනයයි කියන ලද භාවනා මනස්කාරයෙන්ද සතරමග සතරඵලය නිර්වාණ ධර්මයෙහි කියන ලද නවලෝකෝත්තර සද්ධර්මය නොදන්නාහූ වි නම් සම්මොහනිද්‍රායෙන් නිදන්නාවූ සත්වයන් අතුරෙන් මම ඒ ධර්මතාවය දැන වාසය කරණ හෙයින් මම නොනිදන්නා නම් වෙමි යම්ක්ෂිණා ශ්‍රාවක කෙණෙකුන් වහන්සේ රාග වේෂ මොහෝහය කියන ලද යම් සකල ක්ලේශයන් දුරුකොට සම්මෝහ නිද්‍රායෙන් පිබිද වසන සේක්ද එසේවූ රහතුන් වහන්සේ අතුරෙන් ක්ලේශ විධිවංශනය කොට සම්මෝහ නිද්‍රායෙන් දවස් යවන හෙයින් මම නොනිදන්නා නම් වෙමියි මේ ප්‍රශ්න දෙක විසඳිමෙන් මහබෝධි සත්වයන් බණ කී කල්හිද සතුටුවූ දේවතාවා දු මාත්දන්නාසේමය. මහපුරුෂයාණෝ කීයේයයි සියළු වන දේවියන් සන්තුෂ්ටි කෙරෙමින් ස්තුති කොට සාධු කාර දුන්නීය. බෝධිසත්වයෝත් එතැන වැස කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ ජාගර ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි දේවතා ද නම් උපුල්වන් මහා ස්ථවිරය. තාපසව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# කුම්මාස පිණ්ඩි ජාතකය

තවද චක්‍රලක්ෂයෙන් චින්තිතවූ ශ්‍රීපාද ලක්ෂණ ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මල්ලිකා දේවින් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

මල්ලිකා දේවින්ගේ උත්පත්තිය මෙසේ දතයුතු එක් මාලාකාරයෙකුගේ විශිෂ්ටවූ රූ ඇති දුවක් ඇත ඇට නම් තබන්නාවූ මල්ලිකා දේවියයි නම් තුබූහ. ඕ තොමෝ තමාහා සමවයස් ඇති කුමාරිකාවරුන් ඇරගෙණ මල් වත්තකට යන්නී කොමුපිඩුසතරක් ගෙණගියාය, සර්වඥයන් වහන්සේ සිඟාවඩිනා දැක තමා අත තිබූ කොමුපිඩු සතර සර්වඥයන් වහන්සේ පාත්‍රාදාතුන්වහන්සේට පිළිගැන්නුවාය. සර්වඥවන් වහන්සේ කොමුපිඩු පිළිගෙණ සිනා පහල කොට වැඩිසේක. ආනන්ද සාමි සිනා පහළ කළ නියාව දැක ඇයි ස්වාමිනි සිනා පහළ කළේයයි විචාරා සර්වඥයන් වහන්සේ වදාරණ සේක් මේ කුමාරිකාවට අග මෙහෙසුන් තනතුරු අද දවස් පැමිණෙයි වදාරා ජේතවනාරාමයට වැඩිසේක. කෝසල රජ්ජුරුවෝ යුද්ධයට ගියාහු යුද්ධයෙහි පරාජයට අසකු නැගී ඇවිත් මල්වත්ත සමිපයට පැමිණියාහ. මාලාකාර කුමාරිකාවෝ රජ්ජුරුවන් දැක කාංසාවක් නැතිව සිට රජ්ජුරුවන් ලඟට අවුත් අසුගේ රැන අල්වාගෙණ සිටියාහ. රජ්ජුරුවෝ කුමාරිකාවන් දැක තොපි සස්වාමික දැයි විචාරා අස්වාමකයෙමි කී කල්හි මල් වත්තට අවුත් අසු පිටින් බැස සැකයක් නැතිව ඇකය පිට ඉසතබා ගමන්සන් නිවාගෙණ රජ්ජුරුවෝ රජගෙට ගොස් මහත්වූ පෙරහරින් එවා මල්ලිකා කුමාරින් ගෙන්වා රුවන් රැසක් පිට සිටුවා අභිෂේක ජලය වත්කොට සොළොස් දහසක් බිසෝවරුන්ට අගමෙහෙසිකා නියාවට සලස්වා මහත්වූ ස්නේහයෙන් වාසය කරන්නාහ, මල්ලිකා දේවිත් රජ්ජුරුවන් කෙරේ අධික ස්නෙහය ඇත්තාහ. සර්වඥයන් වහන්සේට උපාසිකා තනතුරෙහි සිටිනායා මල්ලිකා දේවින් අග්‍රමෙහෙසිකාවූයේ සර්වඥයන් වහන්සේට පිළිගැන්වූ කොමු පිඩයෙහි අනුසාසෙනැයි තොයෙක් තෙන ප්‍රකාශ විය. මේ කතාව දම් සභාවේ රැස්වූ මහණුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කතාවකින් යුක්තව උනුදැයි විචාර වලාදා එපවත් අසා මහණෙනි මැවැනි ලොව්තුරා සර්වඥයන්ට දන්දී එම්විට මහත් ඓශ්වර්ය ලද්දෝ වේදැයි. වාදරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේට දන්දි එව්ටම ඒ ඒවිට ඓශ්වර්ය ලද්දෝ වේදැයි වදාරා ඒ කොන්දේසි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ.

ඒකෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ දුප්පත් කුලයෙක ඉපද අනුන්ට බැල මෙහෙකොට ජිවත් වන්නාවූ එනු නැති තෙල් නැති කොමුපිඬු සතරක් ඇරගෙණ අනුන්ට බැලමෙහෙකොට හීසාන්ට යන්නාවූ පසේ බුදුන් දෙදෙනකුන් වහන්සේ වාසල සිඟාවඩින්ටයයි සිටිනියාව දැක සිතන්නාහු මා අත තුබූ කොමුපිඬු සතර පිළිගන්වමි සිතා ආරාථනා කොට පසේ බුදුන් සතර දෙනා වහන්සේ කැඳවාගෙණ ජායාසම්පන්න වෘක්ෂයක් සමීපයට ගොස් රුප්පය පිසවැලිපායා වැලිගොඩ සතරක් තනා වැලිගොඩ සතරපිට වඩා හිඳුවා ගොටුවෙන් පැන් ගෙණවිත් පිළිගන්වා ඉන තුබූ කොමුපිඩු සතර මැත්කොට ස්වාමිනි ගැත්තවුට අනුකම්පා කොට වලදා පින් පුරවා වදාළ මැනවැයි මහත්වූ ආදරයෙන් පාත්‍රසතරට කොමු පිඩු සතර පිළිගන්වා වැළඳවූහ. පසේ බුදුන්වහන්සේ කරුණාවෙන් වළඳා අනුමෙවෙනි බණ වදාළසේක. බෝධිසත්වයෝත් මහත් සන්තෝෂයෙන් බණ අසා මතු මෙසේ වූ දුක්ඛිත කුලයෙක නොයිපද ධනේෂ්වර වූ කුලයක උපදිම්වයි ප්‍රාර්ථනා කළාහ. පසේ බුදුන් වහන්සේත් තොපකළ ප්‍රාර්ථනාව සිද්ධ වේවායි කියා තමන් වහන්සේලා වසන ස්ථානයට වැඩ වදාළ සේක. එවිට ඒ සිට නොබොකලකින් බෝධිසත්වයෝ නැසී උපදිනාහු එම බරණැස් නුවර බිසවුන් කුස පිළිබඳ ගත් ගමනේ දසඑකඩ මසකින් වැදූහ. රාජකුමාරයෝ රාජ්‍යයට පැමිණ නුවර සරහා ඔටුනු පැලඳ ඒ ඒ තැන සිටිනා අමාත්‍ය මණ්ඩලයා හා බ්‍රාහ්මණ සමූහයා පඬුරු පාක්කුඩම් ගෙණ ඒ ඒ තැන සිටි නවුන් හා සොළොස් දහසක් බිසෝවරුත් සොළොස් දහසක් නාටක ස්ත්‍රීන් පංචාංගි තූර්ය නාදයෙන් පිරිවරණ ලද ශක්‍ර දේවේන්ද්‍ර විලාසයෙන් ඉඳ සිතන්නාහු ජාතිස් මහණ ඥාණ නුවණ පහළවූ හෙයින් මේ සියළු ඓශ්වර්යය මා ලද්දේ පසේ බුදුන් වහන්සේට පිළිගැන්වූ කොමු පිඩු සතරෙහි විපාකයෙනැයි සිතා සිංහාසනයේ ඉඳ ප්‍රිතිවේගයෙන් උදන් අනන්නාහු ගාථාදෙකක් කීහ. එහි අභිප්‍රාව නම් මම පසේ බුදුන් වහන්සේට ගිය ජාතියෙහි දුන්නේ එනු නැති තෙල් නැත්තාවූ පින්නෙහි තබා ඉදිකල කොමුපිඩු සතරක් දන්දී බ්‍රාහ්මණ ගෘහපති අමාත්‍ය මණ්ඩලයන් හා සොළොස් දාසක් බිසෝවරුන් සොළොස් දාහක් නාටක ස්ත්‍රීන් හා ඇත් අස් රථ පාබල චතුරංගිනි

SANHIDA LANKA

සේනාව හා පාංචවංගීක තූර්යනාද හා තුන් සියයක් යොදුන් මේසා බරණැස් නුවරයක් හා සියළු සමාපත්තින් අඩුවක් නැතිව  මා ලද්දේ පසේ බුදුන් වහන්සේට මා දුන් කොමපිඩු සතරිනැයි ගාථා දෙකින් රාජ්‍යයට පැමිණ ඔටුණු පලඳිනා ගමනේ කීහ. තුන්සියයක් යොදුන් නුවර බොහෝ මනුෂ්‍යයන් හා බ්‍රාහ්මණ ගෘහපති අමාත්‍යය මණ්ඩලය හා රජ්ජුරුවන් වහන්සේ ඔටුනු පැළඳ වැඩ ඉඳවදාළ ගාථා දෙකයයි කියා බොහෝ මනුෂ්‍යයෝ ඉගෙණ කියන්නාහු මෙහි අර්ථය නොදන්නාහ. කෝසල රජ්ජුරුවන්ගේ දුවනියන් රජ්ජුරුවන්ට අගමෙහෙසිකා කළහ. ඒ බිසව ගාථා දෙක ඉගෙණ එක්වන් කියන්නාහ. මෙහි අර්ථක වරවිටක විචාරම්දෝහෝයි සිතා උන්කලට එක් දවසක් බිසවුන් රජ්ජුරුවන්ට කළ සංග්‍රහයක් නිසා සමාධියෙන් බිසවුන්ට රජ්ජුරුවෝ කියන්නාහු තොප කැමති වරයක් ඇරගණුවයි කීහ. බිසව තෙසු මට අඩුකින්ද මට නුඹ වහන්සේ ඔටුනු පැලඳ ඉඳ වදාළ ගාථාකෙහෙි අර්ථ අසන්නා කැමැත්තෙමි, ඒ මට වදාළ මැනවැයි කීහ. රජ්ජුරුවෝ තොපට තනිව නොකියමි. දොලොස් යොදුනක් පමණ බරණැස් නුවර බෙර පියවිකරවා රාජ වාරයෙහි රත්නයෙන් විසිතුරු වූ මණ්ඩපයක් කරවා රත්න පර්යංක පණවා අමාත්‍යයන් හා බමුණු වෙළඳ ආදීන් විසින්ද නුවර වැස්සන් විසින්ද සොළොස් දහසක් පමණ පුරඟනාවන් විසින්ද පිරිවරණ ලදුව මේ කිවවුන් මැදයේ රත්න පර්යංකයෙහි හිඳ කියමි කිවුය. යහපත රජ්ජුරුවන් වහන්සැයි බිසවුන් පිළිගත්හ. රජ්ජුරුවෝද මෙපරිද්දෙන් සියල්ල සමුද්ධි කරවා දිව්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුව ශක්‍රදේවේන්ද්‍රයා පරිද්දෙන් මහත්වූ ජනසමූහයා පිරිවරණ ලදුව රත්නපර්යංකයෙහි උන්හ. මල්ලිකා දේවිද සර්වාභරණයෙන් සැරසී ස්වර්ණ යෙන් විසිතුරු කරණ ලද භද්‍ර පීඨයක් අතුට එකත් පසෙක ඇස් කෙළවරින් රජ්ජුරුවන් බල බලා කථා කරන්නට සුදුසු වූ ස්ථානයෙහිද රජ්ජුරුවන් වහන්ස නුඹ වහන්සේ සතුටු සතුටුව කියන්නාහු මංගල ගිතිකාවගේ අර්ථ මට ආකාශ තලයෙහි සම්පූර්ණ චන්ද්‍රයාසේ ගෙණහැර පාණ කලක් පරිද්දෙන් ප්‍රකාශකොට වදාළ මැනවැයි කියා කියන්තී මෙසේ කිවුය. කුසල ධර්මයෙහි අංධ්‍යාස ඇත්තාවූ රාපෝත්තමයානන් වහන්ස එක් වන් නුඹ වහන්සේ තර කොට සතුටු සිත් ඇතිව ගාථා දෙකක් වදාළ සේක්ද, රාජ්‍ය වර්ධනය කරන්නාවූ රජ්ජුරුවන් වහන්ස, ඒ ගාථාවෙහි අර්ථ නුඹ වහන්සේ අතින් විචාරමි, ඒ මට ප්‍රකාශ කොට වදාළ මැනවැයි කිවුය. ඉක්බිත්තෙන් බිසවුන්ට ගාථාවන්ගේ අපි ප්‍රකාශ කොට කියන්නාහු මහබෝසතාණෝ මෙපරිද්දෙන් කියාත්, එම්බා භද්‍රාව මම මේ බරණැස් නුවර නාම්ගෝත්‍රයෙන් අප්‍රසිද්ධ වූ එක්තරා දිළිඳු කුලයෙක්හි උපනිමි ඒ කුලයෙහි උපන්නාවූ මම ද දිලිදු බැවින් අනුන්ට මෙහෙවර කොට ජීවත්වන්නෙම් අනුන්ට මෙහෙකරුව උපන්නෙම් අනුන්ගේ දුක්පත් වියද මෙන් රැකෙන්නාවූ මමද දුශ්ශීල භාවය හැර පඤ්චශිල සංවරයෙහි පිහිටියෙමි, සිල්වත් මා විසින් එදවස් කළමනා කර්මාන්ත කරන පිණිස නික්මුණාවූ මම මහ මාවතකට නැග කර්මාන්ත භූමියට යන්නෙමි භික්ෂාව පිණිස බරණැස් නුවරට වදනා සමුද්ධි වූ ආචාරයන් හා ශිලයන් ඇති රාගාදි පරිලාහයන් සන් හිඳවිමෙන් සිහිල්වූ කාමාදී ආශ්‍රවයන් රහිත වූ බුදුන් වහන්සේ සතර නමක් දිටිමි. උන් වහන්සේලා කෙරෙහි සිත පහදවාගෙණ වැලිගොඩ සතුරක් කොට ඊ මත්තේ කොල අතුට වැඩ හිඳුවා දක්ෂිණෝදකය දී කර්මාන්ත භූමියෙහිදී මා කන්ටයයි ගෙණයමින්සිටි තෙල් මී සකුරු ආදී කිසිවකුත් රසයක් නැත්තාවූ කොමු පිඩු සතර සතරදෙනා වහන්සේගේ පාත්‍රවලට ස්වහස්තයෙන් සිතපත දවාගෙණ පිළිගැන්විමි, ඒ කුශල කර්මයාගේ විපාක මෙබඳු වන්නේයයි මෙබඳු කුසල විපාක හේතුකොට ගෙණ ධනධාන්‍යාදීන් හා වස්ත්‍රාභරණ ආදීවූ සියළු සම්පත්තින් පිරුණා වූ උතුම්වූ මේ පෘථිවි මණ්ඩලය අනුභව කෙරෙමි, භද්‍රාව තොප ප්‍රධාන කොට ඇති සොළොස් දහසක් පුරගනන් හා මාගේ මේ සියළු සමෘද්ධි මුළුල්ලම ඒ පසේ බුදුන් සතරදෙනා වහන්සේව චේතනාත්‍රය පුස්ධ කොට ගෙණ මා පිළිගන්වා එෑ කොමුපිඩු සතර නිසායි, යනාදීන් තමන් පූර්ජාතියෙහි කළ කුශලය ප්‍රකාශකොට කිවාහුයි. මෙපරිද්දෙන් මහබෝසතානන් තමන්ගේ පූර්වජාතියෙහි කල කුශලයාගේ විපාක විස්තර කොට කී කල්හි ඒ අසා පහන්වූ සිත් ඇති මල්ලිකා දේවි කියන්නාහු මහරජ්ජුරුවන් වහන්ස මෙලෙසින් ප්‍රත්‍යක්ෂකොට දානයෙහි විපාක දන්නාවූ නුඹ වහන්සේ මෙතැන් පටන් කොට එක බත් පිඩක් පමණකුත් ලැබ ධර්මික ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට දන්දීම අනුභව කළ මැනැවයි බෝධිසත්වයන් වහන්සේට ස්තුති කොට කියන්නි. කුශලයෙහි අධිපති වූ රජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේ ශ්‍රමණ බ්‍රාහ්මණ දුගී මගී යාචකයන්ට ලත් දෙයක් ශක්ති විචාරකින් දානපරිත්‍යාග කොට අනුභව කළ මැනව දානාදී කුශලයෙහි ප්‍රමාදයක් නුවුව මැනව පතිරූප දේසවාසාදී චතුර්විධවූ ධර්ම චක්‍රය පැවැත්වුව මැනව, යම්සේ අන්‍යවූ අඥානගතියට යන්නාවූ සත්වයෝ ලෝකවාසීන් උක් යතෙකලා පෙලන්නාකේ මෙන් පීඩා කොට වස්තු රැ ස්කරන්නහු අධර්ම රැස්කරන්නාහු අධර්මිෂට වෙත්ද නුඹවහන්සේද එපරිද්දෙන්ම අධර්මිෂ්ට නුවුව මැනව.

SANHIDA LANKA

දානං සීලං පරිච්චානං අජ්ජමං මද්දමං තපං

අකෝකධො අවිහිංසාච, ඛන්තිච අවිරෝධතා

කියන ලද්දා වූ මේ දසවිධවූ රාජ ධර්ම රැක්ක මැනව, කොකළ මැනවැයි විචාද කළාහ. ඒ මල්ලිකා දේවින් කී බස් පිළිගත්තාවූ මහබෝසතාණෝ මෙලෙස කියත් සොඳුර කෝසල රජ්ජුරුවන්ගේ දුවනියනි එම මා විසින්  දන්දෙන ලද්දේයයි තෘප්තියක් නොකොට නැවත නැවත බුද්ධාදී වූ මහාත්මයන් හැසුරුණාවූ දාන

මාර්ගයෙහි හැසිරෙම් අග්‍රදක්ෂිණෙයා බැවින් අර්හත්වූ ඒ උත්තමයෝ මම දක්නට මනාමය යහපත් එසේ හෙයින් ඔවුන්ම දක්නා කැමැත්තෙමි. ඒ මල්ලිකා දේවින්ගේ සියළු සමුර්ධිය දැක සොඳුර දැන් මා විසින් පූර්ව ජාතියෙහි කළාවූ මාගේ කුශල කර්ම තොපට ප්‍රකාශ කොට කියන ලද, තෙපි වනාහී මේ සොළොස් දහසක් පමණ පුරඟනාවන් හා නාටකස්ත්‍රී සමූහයා මධ්‍යයෙහි රූපයෙන්ද ලීලායෙන්ද ස්ත්‍රී විලාසයෙන්ද තොප හා සදෘශ්‍ය වූ එකද ස්ත්‍රියක් නැත. පෙති කවර කුශලයක් කොට මේ සම්පත්තිය ලද්දාහුදැයි විචාරන්නාහු බෝධිසත්වයෝ මෙසේ කියත්, සොඳුර කොසොල් රජ්ජුරුවන්ගේ දියණියෙනි තොපි රූප සමෘද්ධියෙන් ත්‍රසංත්‍රියත් දිව්‍යලෝකහෙි ශාක්‍රදේවේන්ද්‍රයන්ගේ එක්තරා දිව්‍යස්ත්‍රියක් මෙන් මේ ස්ත්‍රී සමූහයා මධ්‍යයෙහි සොභාමත්වූ පූර්වජාතියෙහි කවර නම් උත්තම කුශල කර්මයක් කළාද, කවර කාරණයෙකින් මෙ ලෙස රූපශ්‍රියෙන් යුක්ත වූවාහුදැයි විචාළාහුයි. ඉක්බිත්තෙන් බෝධිසත්වයන්ට ඒ මල්ලිකාදේවි පූර්ව ජාතියෙහි තමාකළාවූ කුශල කර්ම ජාතිස්මරණ ඥාණයෙන් දැක කියන්නී මෙසේ කියා, මහරජ්ජුරුවන් වහන්ස මම පූර්ව ජාතියෙන් දැක කියන්නී මෙසේ කියා, මහරජ්ජුරුවන් වහන්ස මම පූර්ව ජාතියෙහි එක් කෙළෙඹි කුලයක්හට දාසව උපනිම් අනුන් විසින් ඒ ඒ කටයුතු කරණ පිණිස නියෝග කරණ ලද එකකිම්, සෙසු කොල්ලෝ නම් දුශ්ශීලහ, මම වනාහී කායවක්මානා යන චාරත්‍රයෙන් කිසිත් අකුශල අකුශලයෙක් නොකොට නිරන්තරයෙන් පන්සිල් රක්ෂා කිරීමෙන් ශිලසම්පන්නයෙහි, පරවදියක් නොකොට දැහැමින් සෙමේන් පවත්වන ලද ජීවිකා ඇත්තෙමි ආචාර සම්පන්නයෙමි ගුණ ඇත්තෙම් යහපත්වූ දර්ශනයන් ඇත්තෙමි ප්‍රියවූ ස්වභාගයක් ඇත්තෙම්, ඉක් බිත්තෙන් මම එකල්හි ස්වාමි දරුවන් විසින් මට කොටස් කොට තබනලද්දාවූ මට පැමිණි බත් කොටස සිඳුනාලද ක්ලේශයන් ඇති පසේ බුදු කෙනෙකුන් වහන්සේට හටගත්තාවූ සොම්නස් ඇතිව ආහාරයෙහි ලෝභ තෘෂ්ණා රහිතව ආදි මධ්‍යවසානකොට ඇති චෙතනාත්‍රය සුද්ධකොටගෙණ පිළිගැන්විමි, හේ මම ආයුපමණින් එහි සිට කාලක්‍රියා කොට සැවැත්නුවර කොසොල් රජ්ජුරුවන් වහන්සේගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳගෙණ එයින් බිහිව දැන් නුඹ වහන්සේට පාදපරිචාරිකාව වෙසෙමින් මෙබඳු සම්පත්තියක් අනුභවකෙරෙමින් මෙසේවූ රූපසමුර්ධියකින් යුක්තයෙමි, රජ්ජුරුවන් වහන්ස ඒ පසේ බුදුන් වහන්සේට අනුන්ට දාසිව සිට සිත පහදවාගෙණ මා දන්දුන්නාවූ බත් කොටසෙහි විපාක මෙබඳු වන්නේයයි කියා තමාගේ පූර්ව චරිතය ප්‍රකාශ කළාහ. මෙසේ රජ්ජුරුවන් හා මල්ලිකා බිසව් හා සමග දෙදෙනා තමන් ගේ පූර්ව ජාතියෙහි කළාවූ කුශලකර්ම විස්තර කොට නුවර සතර වාසල් දොරහද නුවර මධ්‍යයෙහි ද මල්ලිකා දොරකඩද යන මේ ස්ථානවල්හි දන්හල් සයක් කරවා සියළු දස දහසක් යොදුන් ජම්බුද්විපයෙහි නගුල් උඩ බඳවා මහදන් පවත්වා පඤ්චශීල සංරක්ෂණයෙන් පේවස් රක්ෂාකොට ජීවිතයාගේ ආයුෂ කෙළවර ස්වර්ගයම පරම ප්‍රතිෂ්ඨා කොට ඇත්තාවූ හෙවත් දිව්‍යලෝකයෙහි උපන්නාහයි තිලෝගුරු බුදු රජානන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා කුම්මාසපිණ්ඩි ජාතකය නිමවා වදාළ සේක. එකල්හි මල්ලිකා දේවිය නම් රාහුල මාතාවෝය. රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# පරන්තප ජාතකය

තවද ලොවුතුරා සර්වඥයන් වහන්සේ රජගහ නුවර නිසා වේළුවනාරාමයෙහි වාසය කරණසේක් දෙව්දත් මහත්වරුන් වහන්සේගේ වධයට උත්සාහ කිරීමක් අරභයා මේ ජාතකය වදාළ සේක,

එකල්හි දම්සභා මණ්ඩපයෙහි මේ කථාව ඉපදවූහ, ඇවැත්නි දේවදත්ත ස්ථවිරයෝ සර්වඥයන් වහන්සේ මැරීම පිණිස උත්සහා කෙරෙති, දුනුවායනුත් මෙහෙයූහ. මුදුනට ගල් පෙරළූහ, නාලාගිරි නම් හස්තියාද සිඟායන ඉදිරියෙහි මෙහෙයූහ, සර්වඥයන් වහන්සේට විනාශය පිණිසම උපාය උත්සාහ කෙරෙතියි කථා කොට භික්ෂූන් වහන්සේ වැඩ උන්සේක, සර්වඥයන් වහන්සේ ධම්සභා මණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාළකල්හි මහණෙනි මේ දේවදත්ත ස්ථවිරයෝ දැන් මතු නොවෙයි පූර්වයෙහිත් උත්සාය කළේය. ඒ උත්සාහයෙන් මාගේ චිත්තොත්‍රාස පමණකුත් නසන්ට නොහැකි විය, තෙමේම දුක් අනුභව කෙළේ වේදැයි වාදරා ඉකුත්වත් ගෙණහැර දැක්වූයේය.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි මහා බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ මව් කුසින් බිහිව වැඩි විය පැමිණියාවූ තක්සලා නුවරට ගොසින් උගතමනා සියලු ශිල්පයන් උගත්තාහතයි, සියලු සතුන්ගේ ශබ්දය තෝරාගන්නට නිසි මාත්‍රයෙකුත් උගත්තාහ. ඒ බෝධිසත්වයෝ ආචාරීන්ට තමන් නික්ම යන නියාව කියා නැවත බරණැස් නුවරට ගියාහ පියරජ්ජුරුවෝ ඒ බෝධිසත්වයන් යුවරජ තනතුරෙහි තිබූහ. ඔවුන් එලෙස තිබුවත් මරවනු කැමැත්තේ, ඇස දකින්ට නොකැමැත්තාහ, ඉක්බිත්තෙන් එක් කැණහිල් බැල්ලක් තමාගේ පැටියන් දෙන්නෙක් ඇරගෙණ රාත්‍රියෙහි මනුෂ්‍යයන් නිදාපු කල්හි දිය යන හොරොව්වෙන් ඇතුළුනුවරට වන, බෝධිසත්වයන් වැදහෝනා ගබඩාවට නුදුරු ස්ථානයෙක්හි එක් ශාලාවෙක් ඇත. ඒ ශාලාවෙහි එක් මගී මිනිසෙක් තමා පයළු වහන්සඟල ගලවා පාමුල තබාගෙණ එක් පෝරුවක් මත්තෙහි වැදහොත්තේය. ඒතාක්කල් නොනිදුසේය, කැණහිල් පැටියෝ දෙන්න කියන්නාහූ අම්ම බඩසාය, අප කනදෙයක් දෙවයි කියන්නා කැණහිල්දෙන් කියන්නී තෙලේ ගෙයි වැදහෝනා පුරුෂයා ලඟ වහන්දෙකක් තිබෙයි උන් නිදාපියන්නා වහන් දෙක දිලිම් කීව. එකියන කථාව බෝධිසත්වයෝ අසා තෙලගෙයා කවුරුදැයි විචාරා ස්වාමිනි මමයි කියන්නා බිමතිබූ වහන්දෙකක් ඇත්නම් උඩ තබාලවයි කියන්නා වහන්දෙක උඩ තිබූහ. කැණහිල් මුන්ට මා කෙළේ කවර සතුරුකමක්දැයි කියා එතනින් පලාගියාහ. එතන සමීපයෙහි පොකුණක් ලඟට කැණහිල්දෙන හා දරුවෝ දෙන්න පැමිණ කැණහිල් පැටියෝ කියන්නාහූ අම්ම අප බඩසායයි කිවුය. කැණහිල් දෙන් කියන්නී තෙල පොකුණෙහි මිනිසෙක් මියගියේය. දැන් මදකින් ඉලිප්ප ගියකල මිනිය කම්හ, අත මුන්දක් හා කනලන මෙවර දෙකක් හා කඩපොල්ල ඇරගනිති මිනිය අපටයයි කිහ. බෝධිසත්වයෝ ඒ අසා මිනිසුන් ගෙන්වා තෙල පොකුණේ මිනිසෙක් මියගිය අතලන මුන්දක් හා කනලන මෙවරදෙක හා කඩපොල්ල ඇරගෙණ මිනිය නොයිල්පෙන නියායෙන් පොකුණේ දියයට තබවයි කීවාහ. ඒ කැණහිල් දෙන් බෝධිසත්වයන් කෙරේ වයිරබැඳ පළමුත් මාගේ දරුවන් කන්නට තිබූ වහනුත් උඩ බැඳ එල්වා අලාභ කළව, දැනුත් කන්ට උන් මිනියෙනුත් නොකාලව, අදට සත්වෙනි දවස් තොපගේ රජ්ජුරුවන්ට සටනට පසල් රටින් රජ්ජුරු කෙණෙක් එන්නාහ. සටනට තොප යවන්නාහ, තෙපි ඒ සටනේ වටෙන්නාහ, එවිට තොපගේ ඇගමස්කම් කියා කැණහිල්දෙන් පලාගියාය. බෝධිසත්වයෝත් මේ සිත තබා ගෙණ උන්නාහ. එද සත්වෙනි දවසට පසමිතුරු රජ්ජුරුවන් හා සේනාව සටනට අවුත් වාසල් දොකඩ කඳවුරු බැඳගත්හ. රජ්ජුරුවෝත් බෝධි සත්වයන්ට සේනාව ඇරගෙණ සටනට යවයි කීහ. බෝධිසත්වයෝ කියන්නාහූ පියානන් වහන්ස  අද මම නොසිහෙයි මම සටනට යවයි කීහ. බෝධිසත්වයෝ කියන්නාහූ පියානන් වහන්ස අද මම නොයිගෙයි මම සටනට නොයෙම් කීහ. සටනෙහි මියතත් රැකකෙතත් තොපිම යන්නාහයි කීහ. යහපත පියානන් වහන්ස යෙමි කියා සේනාව ඇරගෙණ අනික් වාසලකින් පිටත්ව කඳවුරු බැඳගෙණ වැද උන්සේක. රජ්ජුරුවෝ මාගේ පුතණුවෝත් නුවරින් පිටත්ව මට විපක්ෂව උන්නාහ, සතුරෝත් ඇවිදින් ඉඳිති, ඉතිකින් මාත් මාගේ ජීවිතය රැක ගණුත් යහපතැයි අග්‍රමෙහෙසිකා බිසවනුත් පුරෝහිත බමුණන් පරන්තපනම් කොල්ලකුත් ඇරගෙණ නුවරින් පිටත්ව වනාන්තරයට වැද පන්සලෙක වාසය කළාහ. බෝධිසත්වයන් වහන්සේත් පිය රජ්ජුරුවන් නුවරින් පලාගිය නියාව අසා නුවරට අවුත් සතුරන් සාධා නුවරට වැද රාජ්‍යය කරමින් උපන්නාහ. එසමයෙහි බරණැස් නුවර රජ්ජුරුවෝත් පුරෝහිත බ්‍රාහ්මණයාත් දෙන්න පරන්තප නම් කොල්ලාත් බිසවුනුත් පන්සල රඳවා එලාඑල කඩාගියාහ. මෙසේ නිරන්තරව උන් දැකීමෙන් බිසව් පරන්තප නම් කොල්ලා  කෙරේ අභිලාෂා උපදවා ඔහු සමග ලෝකාස්වාද රතියෙහි යෙදුනාහ, මෙසේ නිරන්තරයෙන් වාසය කරන්නාහූ එක් දවසක් පරන්තප නම් කොල්ලාට බිසව් කියන්නාහු තොප හා අප හා කරණ කටයුත්ත රජ්ජුරුවන් වහන්සේ දන්නාසේක් නම් කටයුතු නොවෙයි. රජ්ජුරුවෝ තොප අතට කඩුවත් අඳන කඩත් දී නාන්ට යන්නාහ. එවිට රජ්ජුරුවෝ දියට බටවිට ඉස අල්වා කඩුවෙන් දෙකඩ කොට කපාපියවයි කීහ. ඒ පරන්තප නම් කොළුත් යහපතැයිකියා

SANHIDA LANKA

උන්නේය. ඒ බිසවුන් බරණැස් රජ්ජුරුවන් අයිතිවූ දරුගර්භයක් ඇත්තේය. එක් දවසක් රජ්ජුරුවෝ පන්සල රදා පුරෝහිත බමුණා එලාළුල කඩා යවා තුමූ නාන්ටයයි පරන්තප නම් කොල්ලා අතට අඳනාවත් කඩුවත් දී ගඟට ගොස් අඳනාකඩ ඇඳගෙණ සන්නායට ගඟට බැස නානකල්හි පරන්තපයාත් කඩුව අතින් ගෙණ දිවගොස් රජ්ජුරුවන්ගේ ඉසකේ අල්වාගත, මරණභයින් තැති ගෙන මහත් කොට අඬ ගැසූහ. පුරෝහිත බ්‍රාම්මණයාත් එලාළුල කඩාගියේ එතනට නුදුරුවූ තැන උස් ගසක් උඩ පළාළුලකඩා උන්නේ රජ්ජුරුවන් ගැසූ අඬ අසා භයින් බිම වැටී කැලැයෙක ඉවත සැඟවී උන්නේය. පරන්තපයාත් රජ්ජුරුවන් ඉස කපා පොළුකොට ගසා වලෙකලා වස ගස අත්ත සැලීගියා දැක මේ ගස අත්ත සැලෙන්ට කාරණා කිම්දැයි ගසමුලට ගොස් ගසවටා බලා කාත් නොදැක බිසවුන් ඉඳිනා පන්සලට ගොස් රජ්ජුරුවන් මැරූ නියාව බිසවුන්ට දන්වා දෙන්නම් සැකයක් නැතිව එකතැන්හිම වාසය කරන්නාහ ඒ බ්‍රාහ්මණයාත් ඇස්දෙක නැසීගියාක්මෙන් ඇසපියාගෙණ ඒ ඒ තැන වැටි වැටි සැරයටියක් අතට ගෙණ බිසවුන් ඉන්නාවූ පන්සලට ගියේය. පරන්තප නම් දාසියාත් ඇයි බ්‍රාහ්මණය මේ තට කුමක් වුනියාදැයි විචාළාහ, බ්‍රාහ්මණයා කියන්නේ රජ්ජුරුවන් නොඅඳුනන කෙනෙකුන් මෙන් දේවයන් වහන්ස එලාළුල කඩාගිය ගමනේ ඇස්දෙක අන්ධවියයි කීහ. එසේ වීනම් නයෙකු අල විෂධුමයකින් ඇස්දෙක අන්ධවූ නියායයි කියා භය නොගනුවයි මම තොපි රකිමි බිසවුනුත් පුරෝහිත බ්‍රාහ්මණයාත් දෙන්නා පන්සල ඉඳවා පරන්තපයා වනයට ගොස් එලාළුලකඩා ගෙණෙන්නේය. මේ නියායෙන් දවස් අරිනාකල්හි එක් දවසක් එම්බා දෙවිනි රජ්ජුරුවන් මරන්ටයයි ඉසකේ අල්වා කඩුව කොපුවෙන් අයන විට එක් ගසෙක ඉඳ මිනිසෙකු හෝ ශාඛා මෘගයෙකු හෝ නොදැනෙහි බිම වැටිහින, මේ අත්ත සැලීමෙන් යම් දවසෙක මට අනර්ථ වන්නේයයි බිසවුන්ට ගාථාවකින් කියා බ්‍රහ්මණයා නිදන එකකු මෙන් වැදහෙව, එක් දවසක් පරන්තපයා එලාළුලයටයාදී තමාගේ බිරින්ද කෙරේ ශෝකයෙන් අඬන එකකු මෙන් කියන්නේ මාගේ විශිෂ්ටවූ රූ ඇති ප්‍රියවූ දර්ශනයක් ඇති මාගේ හෘදයක් වැනි මාගේ භාර්යාවන් නොදැක තැවෙන්නාවූ මාගේ හෘදය අත්ත සැලීගිය සංකාවෙන් තැවෙන්නාවූ පරන්තපයාගේ හෘදය මෙනැයි අඟවාකීහ. බිසව් ඒ අසා කුමක්ද තොපි කියන්නේ යයි විචාළාහ. පුරෝහිත බ්‍රාහ්මණයාත් තමාගේ බිරින්ද කෙරේ අඬමි කියා පිරිමසා තිබිය බිසව් බඩ දරුගර්භයක් මුකුරා දස එකඩමස කුමාරයකු වැදූහ. ඒ කුමාරයාත් වැඩිවිය පැමිණ සොලොස් ඇවිරිදි වූ කල්හි එක් දවසක් කුමාරයන්ට කියන්නේ කුමාරයෙනි ඔයට නාන්ට යම්හ මාගේ සැරයටිය කෝණ අල්වාගණුවයි කුමාරයන් අතට සැරයටිය අගදී ඔයට ගොස් දිය්ගසා කුමාරයන් බැළුැයේය. එවිට රාජ කුමාර තෙම බමුණා අන්ධ නොවන්නේහිදැයි විචාළේය. රාජ කුමාරයාන් වහන්ස දැස් අන්ධයයි මේ උපායෙන් රැකුනෙම් කියා නුඹ වහන්සේගේ පියානන් වහන්සේ දන්නා සේක්දැයි විචාළ කල්හි එසේය දනිම් කියා කීයේය. එවිට බමුණු කියනුයේ මේ පුරුෂතෙම තොපගේ පියා නොවන්නේය, තොපගේ පියානෝ බරණැස් රජ්ජුරුවෝය. දාසවූ පුරුෂයා තොපගේ මෑනියන් කෙරෙහි වර දවා පැවත මේ ස්ථානයෙහි තොපගේ පිය රජ්ජුරුවන් මරා වැලළුැයේයයි ඇර ගෙණවුත් පෑයේය. එවිට කුමාරයාට බලවත්වූ ක්‍රෝධ ඉපිද දූන් කුමක් කෙරෙම්දැයි බ්‍රාහ්මණයා අතින් විචාළේය. එවිට බ්‍රාහ්මණයා කියනුවේ ඒ දාසයා විසින් තොපගේ පිය රජ්ජුරුවන්ට මේ තොටේදීයමක් කරන ලද ද රිද්දෙන් කරවයි කියා රජ්ජුරුවන් මැරූ සියලු ප්‍රවෘත්තිය රාජ කුමාරයන්ට කියා එදවස් පටන් බංගලි ශිල්පයෙහි හික්ෂා කරවුයේය ඉක්බිත්තෙන් නොබෝ දවසකින් රාජ කුමාර තෙමේ කඩුවත් අඳනා කඩත් ගෙණ පියාණන් වහන්ස නහන පිණිස ගඟට යම්හයි කීයේය. එවිට පරන්තපයා යහපතැයි කියා රාජ කුමාරයා එක්ව නහන තොටට ගොස් ඔහු ස්නානය පිණිස ගඟට බට කල්හි රාජ කුමාර තෙමෙ දකුණතින් කඩුව හයා වමතින් ඔහුගේ කෙස් වැටිය හෙණ මාගේ පියාණන් වහන්සේ මේ ස්ථානයෙහිදී ගංගාවා මැරෙයෙහිය. මමද තා එපරිද්දෙන්ම මරමි කීයේය.එවිට මරණ භයින් භයපත් විලාපයකුත් කියා අඬන්නාවූ පරන්තපයාද මා රජ්ජුරුවන් මරන්නාවූ කාලයෙහිම මනුෂයෙකු විස්න් හෝ මෘගයෙකු විසින් හෝ ගසෙක ශාඛාවෙන් සොලවන ලද ඹහු විසින් ඉදිර මෘගයෙකු විසින් හෝ එක් ගසෙක ශාඛාවෙක් සොලවන ලද ඔවු විසින් ඉදිරි භායෙක් උපදින්නේ යයි කල්පනා කරන ලද ඒ භය දූන් මා කරා පැමිණියේයයි ආගමානූන සෝ භවේවා යි ගාථා දෙක කියා හැඬුයේය. ඉක්බිති කුමාර තෙම කියනුයේ කොල දුෂ්ට වූ දාසය ස්නානය පිණිස ගඟට යම්හයි විශ්වාසයෙන් මාගේ පියාණන් වහන්සේ කැඳවාගෙණ ගොස් ස්නානය කරන්නාවූ උන් වහන්සේ මරා කඩ කඩ කොට කපා වලලන්නාවූ තෝ මේ ක්‍රියාව කවරෙක් දන්නේද ඉදිරි මට මෙබඳූ භයෙක් වන්නේයයි යා වඤ්චා කෙළෙහිය, ඒ උන් වහන්සේට පැමිණියා වූ මරණ දූන් තා කරා පැමිණියේයයි කියා ඔහු එතැනිම ජීවිතක්‍ෂයට පමුණුවා වළලා කොල අතු කඩා වසා කඩුව සෝධා ස්නානය කොට පන්සලට ගොස් ඔහු මැරූ බව පුරෝහිත බමුණාට කියා මෑනියන්ට පරිභව බැණ වෙනෙහි වාසය කිරීමෙන් කවර ප්‍රයෝජනයෙක්දැයි ඔවුන් තුන්දෙනාම බරණැස් නුවරට ගියාහුය, බෝධිසත්වයෝ තුමූ රාජ්‍යයට පැමිණීම නුවන්ට යුවරජ තනතුරු දී දානාදි කුසල් කොට දිව්‍යලෝකයෙහි උපන්නේයයි තිලෝගුරු බුදුරජානන් වහන්ස් මේ පරන්තප ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාළ සේකී. එකල්හි පියරජ නම් දේවදත්ත ස්ථවිරය. ඹහට පුත්‍රව උපන්නාවූ රාජ කුමාරයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේකී.

SANHIDA LANKA

# කච්චානි ජාතකය

තවද මේ අටවැනි නිපාතය දක්වමි කෙසේද යත් අෂ්ටෝත්තරගත මංගල්‍යාලක්ෂණයෙන් විරාජ මාන වූ ශ්‍රීපාද පද්ම ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මව්පියන්ට උපස්ථාන කරන්නාවූ උපාසකයකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් උපාසකයෙක් දෙමව්පියන්ට සකසාම උපස්ථාන කරන්නෙහිය. උන්ගේ දෙමව්පියෝ පුතුනුවන්ට කියන්නාහු පුතණ්ඩ උපස්ථාන කිරීමකුත් ගොවිතැන් බත් කිරීමකුත් තොපට මහ ආයසය තොපි තොපට සුදුසු තෙනකින් බිරිඳක් ගෙණඑරව උන් ගෙනාකළ උන් අපට උපස්ථාන කරන්නාහ. තොපි ගොවිතැන් බත් කරන්නාවේදැයි කීහ. ඒ උපාසකයා කියන්නේ මා උපස්ථාන කරණසේ උපස්ථාන කළ එද්ද මා විනා අනිත් කෙණෙක් මාගේ සිත සැටියට උපස්තාන කෙරෙත්දැයි නොගිවිස්සාහ, උන් නොගිවිස්සත් දෙමව්පියෝ සුදුසු කුලයකින් බිරින්දක් ගෙණවිත් එැවාහ ඒ ස්ත්‍රීන් ආදවස් පටන් සමනන්ටත් ඉතා ලෙන්ගතුව වාසය කොට නැදිමයිලන්ටත් සැපසේම උපස්ථාන කරන්නී කල්‍යාමකින් නැන්දනියන් කෙරේ කලකිරී උනුපැන් ඉල්එවොත් ඉතාම ඇඟ සම්යන ලෙසට උනුපැන් දෙන්නීය. ඇල්පැන් ඉල්ලුවොත් ඉතා සීතයෙන් වෙව්ලන ලෙසට ඇල් පැන් දෙන්නීය. මාළුයේ ලුනු මදයයි කීවොත් ඉතා එනු බෝ කරන්නීය. එනු බෝයි කිවොත් ඉතාම මද කරන්නීය. ඇඳ මකුණෝයයි කීවොත් අසල ගෙවල ඇත්තන්ට නුඹ ඇමට ඇසෙන නියායෙන් නොවේද මා ඇඳ මකුණන් ගැසුයේයයි කියන්නීය. තොමෝම ඒ ඒ තැන  සෙම් සොටු කාරා දමා කවුරුදැයි විචාළ කල නුඹගේ මැනියන්දැයයි කියන්නීය. එක් දවසක් සමණයන්ට කියන්නී නුඹගේ මෑනියන්දැට පිස පැර තිබන්ට හා සෝපත්ති තිබන්නට අපට බැරිය. නුඹගේ මැනියන්දෑ මෙතන ඉදිතොත් මම නොඉදමි උන් මෙගෙන් යව්වමැනවැයි කීහ. එවිට උපාසකයා කියන්නේ තොපි නම් සග බාලහෙයින් තොපට කොයිත් ගොසින් ඉන්දැහැකි. මාගේ මැනියන් වහන්සේ මැහැලිව දුර්වල සේක. උන්දෑ කොයි යන්නද. තෝ යෙයි නම් පලායවයි කියා තමාගේ බිරින්දට කෝප කළාහ. එතැන් පටන් පළමු නියාවට දියුණුවක්ව නැන්දනියන්ට උපස්ථාන කරන්නාහ. උපාසකයා එක් දවසක් ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේට වැඳ එකත්පස්ව ඉඳ බණ අසා සර්වඥයන් වහන්සේට එපවත් කීයේය. සර්වඥයන් වහන්සේ වදාරණ සේක් තොප අඹුවන් කීවා නොවිසයි පමණක් විනා පෙරතා ගේ බිරින්දෑ ගේ බස් ගෙණ මෑණියන් පහකොටුපුවේ වේදැයි වදාරා ඒ කෙසේද යත් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාලසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ශක්‍ර දේවේන්ද්‍රව උපන්නාහ. යටකී ප්‍රවෘත්තිය මෙන් වන්නාහ. මෙහි වනාහී උපාසකයා තමාගේ බිරින්දගේ බසට මැනියන් හෙයින් පහත්කොට වුපවාහ. උයුත් එතැන්පටන් ඈත මෑත ඇවිද බැලමෙහෙකොට කීවත් වන්නාහ. එසමයෙහි උන්ගේ යෙහෙලියන්ටදරු ගර්භයක් ඇති විය. දස එකඩ මසකින් දරුවන් ලැබ දවසින් දවසට සියලු සම්පත්තීයෙන් අඩුවක් නැතිව දවස් අරණාහු මේ මැහැලි මාගේ ගෙයි ඉන්නා තෙක් අපට කිසි වැඩෙක් නොසැලසින, උන්දෑ ගියදවස් පටන් දරුවනුත් ලැබී සැපසේ අභිවෘද්ධියම සැලසුනැයි කීවාහ. එවිට උපාසකයාගේ මව් තමාහෙයින් පිටත් කළ පසු දරුවන් ලද්දැයි අසා මෙසේ සිතුවාය, ඉදින් මේ ලෝකයෙහි ධර්මය නොනැසී පවතී නම් බිරින්දගේ බසට මවුන් තලා හෙයින්  පිටත් කළ දරුවෝ මෙලෙස දරුවන් ලැබ සුවපත් වෙත්ද, එසේ හෙයින් ධර්මය නැසුනේ වන, ඒ නැසුනාවූ ධර්මයට පිතෘ පිණ්ඩක දානය කෙරෙමි සිතා ඒ මැහැලි එක් දවසක් තල මුං සාල් වලින් සැදි සාළු අරගෙණ අමුසොහොනකට ගොස් ලිප් කැටට මිණි ඉස්කබල් තිබාාගිණිමොලොවා ගඟට ගොස් ඉස් සෝධා නාගශන් පෙරවි පිළි සෝධා බැඳි ලිපගාවට ඇවිත් ඉසකේ මුදාහෙලා සාල් දොවුන් අරින්ට පටන්ගත්තීය. එකල්හි පුරණ ලද බෝධිසම්භාර ඇති බෝධිසත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව ඉපිද එදවස් දිවසින්ම මනුෂ්‍යලෝකය බලන්නාහූ ඒ මැහැල්ල කරන්නාවූ ක්‍රියාව දැක බමුණුවෙසක් මවාගෙණ මගයන එකෙකු මෙන් ඒ ඈ සිටිනා තැනට ගොස් සොහොනේදී බස් පිසන කෙණෙක් නම් නැත. එම්බා කච්චානි නම් තැනැත්තෙනි ඉස සෝධා නාහා සුදු පිළි හැඳ මිනි ඉස්කබලින් ලිප් බැඳ තලකිරිබත් පිසන්නේ කාටදැයි විචාළේය. එවිට මැහැලි කියන්නී බමුණානෙනි මේ ලෝකයෙහි වැඩි මහළු නෑයන්ට ආදර සත්කාර කිරීම ආදීවූ සුචරිත ධර්මය නැසුනේය. එසේ හෙයින් මම ඒ නැසුනාවූ ධර්මයට පිතෘපිණ්ඩ දානය කෙරෙමි කී කල්හි ශක්‍රබ්‍රාහ්මණතෙම කියනුයේ එබ්බා කච්චානිය අසදෘශවූ ආනුභාව හා දහසක් නුවනැන් ඇති සද්ධර්ම ස්වරූපවූ සක්දෙව්රජ තෙම ධර්මය පවත්වමින් ජීවත් වන්නේය. එසේ හෙයින් ධර්මය නොනැසුනේයයි කියේය. එබස් අසා මැහැලි කියන්නී බමුණානෙනි කුමක් කියව්ද මේ ලෝකයෙහි යම් සත්වකෙණෙක් කුශලධර්මයෙහි නොයෙදි පාපයෙහි යෙදී වාසය කෙරෙත් ද එබඳුවූ සත්වයෝම පුත්‍රදාරා දැසි දස් ගවමහිසාදී ධනධාන්‍ය සම්පත්තීයෙන් සමෘද්ධිවෙති පළමු වඳවූ මාගේ යෙහෙලියන් අද්‍රෝහී වූ කුලජ්‍යෝෂ්ට වූ මා තලා ගෙයින් පිටත් කොට දරු වදා සියලු අපගේ කුලයට ප්‍රධානයවූවාය. තොප කුමක් කීවත් ධර්මය නැසුනැයි යනු ඒකාන්තයෙන් මට සැකයක් නැතැයි කීවාය. ඉක්බිති සක්දෙව්රජ කියනුයේ කාත්‍යායනීය, තෝ යම් ධර්මයක් මළායයි කිවුනම් ඒ ධර්මය නම් අනිකෙක් නොවෙයි ජීවමාන වූ මම්මය අන් කාරියක් නැතිව තොප නිසාම මෙතැන්හී පැමිණියෙම් යම් ස්ත්‍රියක් තොප තළා ගෙයින් නෙරා දරුවන් ලැබ ප්‍රබල

SANHIDA LANKA

වූද ඈ දරුවන් හා එක්ව මාගේ ධර්ම තේජසින් දවා අළුකෙරෙමි කිවුය. එවිට මැහැලි අනේ මේ කුමක් කියන නිසාද මාගේ පුතාද යේළිද මුනුබුරාද අපි හැමදෙන ඔවුනොවුන් හා සමග සතුටුව යම්සේ වාසය කරමෝද එම නුඹ වහන්සේටත් කැමතිවේවයි කිකල්හි උන් විසින් දුකට පමුණුවනු ලැබූ තෝ සත්පුරුෂ ධර්මය නොහැර ඔවුනොවුන්ට යහපතක් කැමති වූයේයයි සන්තෝෂව තොපි හැමදෙනාම ඔවුනොනුන්ට යහපතක් කැමතිවුයේ යයි සන්තෝෂව තොපි හැමදෙනම ඔවුනොවුන් හා සමග සතුටුව එක්තැන්හි වාසය කරවයි කියා සක්දෙව්රජ ශක්‍රාත්මභාවයෙන් සැදී පැහැදි අහස්හි සිට කියනුයේ නොබට කාත්‍යයනිය තොපගේ පුතනුවන් හා යෙහෙලනියෝ මාගේ ආනුභාවයෙන් පෙරමගට අවුත් ක්‍ෂමා කරවා තොප කැඳවාගෙණ යෙති. කුශලධර්මයෙහි අප්‍රමාදව වසවයි අවවාදකොට තමා වාසය කරන්නාවූ දිව්‍යලෝකයටම ගියේය. ඔවුන් දෙදෙන ශක්‍රානුභාවයෙන් මැනියන්ගේ ගුණ සිහිකොට අපගේ මැනියන් වහන්සේ කොයිදදයි ගම මනුෂ්‍යයන් අතින් විචාරා අමුසොහොන දිසාවට ගියයි යනු අසා අඬාගෙණ ගොස් දක පසෙක අඬා වැටී මෑනියන් වහන්ස අපගේ දෝෂක්‍ෂමාකළ මැනවයි කීවාහුය. ඒ මැහැලි ප්‍රෙමයෙන් මුනුබුරා වඩාගත්තීය. මෙසේ සමගිව ඔවු හැමදෙන ගෙට අවුත් ශක්‍රයන්ගේ ආනුභවයෙන් ඒ කාත්‍යායනී තොප යෙහෙළියන්ද පුතනුවන් මුනුබුරානන් විසින් ඒ ශක්‍රානුභාවයෙන් කරණ ලද උපස්ථාන විඳ සැපසේ වාසය කළෝ වේදැයි චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ ජාතකය පූර්වාපර සන්ධි ගළපා නිමවා වදාළ සේක. චතුස්ත්‍ය ධර්මදේශනාවගේ අවසානයෙහි උපාසකතෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය. එකල්හි මෑනියන්ට උපස්ථාන කළ පුරුෂයානම් දැන් වර්ථමාන කාලයෙහි මාතෘපස්ථායක වන්නේය. එකල්හි භාර්යාවූ ස්ත්‍රීතොම දැන් මේ ස්ත්‍රිය ශක්‍රදේවේන්ද්‍ර නම් සම්‍යයක් සම්බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# අෂ්ටශබ්ද ජාතකය

තවද කරුණා නිධානවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරණසේක් මධ්‍යම රාත්‍රියෙහි කොසොල් රජ්ජුරුවන් විසින් අසන ලද විභාග නැති භයානක ශබ්ද අටක් අරභයා මේ ජාතකය දක්වා වදාළ සේක. මෙහි වර්ථමාන කථාව යට ලෝහ කුම්භි ජාතකයෙහි පෙණෙන්නේය මේ ජාතකයෙහි කොසොල් රජ්ජුරුවන් විසින් ස්වාමීනී තිලෝගුරු බුදුරජානන් වහන්ස මේ ශබ්දයන් ඇසුවායින් කුමක් වන්නේදැයි විචාළ කල්හි නොබව මහරජ මෙයින් කිසි අන්තරායෙක් නොවන්නේය. මෙබඳුවූ භයානක ශබ්ද තොපිම නොඇසුවව පෙරත් රජදරුවෝ මෙබඳු ශබ්ද අසා බමුණන්ගේ බස් ගෙණ සර්වතුෂ්කනම් යාගයක් කාරණු කැමැත්තාහූ නුවනැත්තවුන්ගේ බස් අසා යාගයට මරණු පිණිස ගෙණාවූ සත්වයන් නොමරණ පිණිස නුවර බෙරලවා අභයදානය දුන්නාහූ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකී.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද වැඩිවිය පැමිණ ගිහිගෙයි කලකිරී හිමාලය වනයට වැද ඍෂි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව වාසය කොට ඵනු ඇඹුල් පිණිස බෝධිසත්වයෝ බරණැස් නුවර ආ ගමනේ රජ්ජුරුවන්ගේ මගුල් උයනේ වාසය කරන්නාහ, එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ මධ්‍යම රාත්‍රිවෙලෙහි ශබ්ද අටක් ඇසූහ. ඒ ශබ්ද අට කවරේද යතහොත් පළමු කොට රජ්ජුරුවන්ගේ උයන සමීපයෙහිදි දිය සුන් පොකුණක් සමීපයෙහි හිඳ කොකොක් අඬාලීය. දෙවෙනිව ඒ අඬට අනතුරුව රජ්ජුරුවන්ගේ ඇත්හල තොරණ සමීපයේ ඉඳ කැවිඩිධේනුවක් අඬළුව, තුන්වෙනිව ඒ අඬට අනතුරු වම රජ්ජුරුවන්ගේ රජගෙයි කැණිමඩලේ කඳ පණුවෙක් අඬලීය. සතරවැනිව ඒ අඬට අනතුරුව රජ්ජුරුවන්ගේ රජගෙයි මැදිරියේ ඉඳිනා කොවුල්ලෙක් අඬාලීය. පස්වෙනිව ඊට අනතුරුව රජජුරුවන් වඩනා මුවෙක් අඬාලීය. සවෙනිව ඊට අනතුරුව මැදිරියේ හිඳීනා වඳුරෙක් අඬාලීය. සත්වැනිව ඊට අනතරුව මැදිරියේ හිඳිනා කින්නරාවක් අඬළුව, අටවැනිව ඊට අනතුරුව රජ්ජුරුවන්ගේ මගුල් උයනට ආකාශයෙන් වඩනාවූ පසේ බුදු කෙණෙකුන් වහන්සේ උදන් ගාථා වදාළ සේක. මේ ශබ්ද අටම ඒ රජ්ජුරුවන් ඇසූහ. ඒ අසා රජ්ජුරුවෝ තුන්යම රාත්‍රියෙම් භයින් නොනිදාම පාන්කළහ, පුරෝහිත බ්‍රාහ්මණයාත් පාන්වූ පසු රජගෙට අවුත් රෑ නිදිලත් සැටිය විචාළේය. රජ්ජුරුවෝ කියන්නාහූ මට සැපයෙක් නම් කොයින්ද රෑ මෙසේවූ ශබ්ද අටක් අසා භයපත්ව නිදි නොලද්දෙම් කීහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා සිතන්නේ අප කන්ට කැවිල්ලක් ලා ගියේයයි බමුණානන් සත්කාර එක්කොට කියන්නේ මේ මහා භයංකරවූ ශබ්දයෙක මිට සර්වතුෂ්ක නම් යාගයක් කළොත් විනා නපුරුයි රජ්ජුරුවන්ට කියා බොහෝ ප්‍රාණීන් එක්කරවාගෙණ යාගයක් කර වන්ට උවමැනවැයි නොයෙක් සතා සතුන් පක්ෂීන් මිනිසුන් ඇතුළුවූ අය යාගයට එක්කරවූහ. එවිට ඒ පුරෝහිත බ්‍රාහ්මණයාගේ අතවැසිවූ බමුණෙක් කියන්නේ ආචාරීන් වහන්ස අප උගත් වේදශාස්ත්‍රයෙහි ප්‍රාණයක් නසා කරන්ට කී යාගයක් දුටුයේ නැත, මෙතෙක් ප්‍රාණ නසා පව්කරන්නාවූ කාරණා කිම්දැයි කීහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ තොපිම රජ්ජුරුවන්ට පක්ෂපාතව ගියාද මෙතෙක් දෙනාට වන්නාවූ ලාභ අලාභ කරවුදැයි කෝප කළාහ, ඒ අතවැසිත් ආචාරීන් අතින් කෝප අසා කෙතෙක් කෝප කළත් මා මේ ප්‍රාණවධයට එක් වන්නේ නැතැයි පලාගොස් මේ පුරෝහිත බ්‍රාහ්මණයාටත් රජ්ජුරුවන්ටත් පිරෙන්නාවූ පාප සංසිඳුවාපියන්ට නිස්සෝ කව්රුදැයි පරීක්ෂා කොට රජ්ජුරුවන්ගේ උයනට යන්නාවූ තාපසයන් කරා  ගොස් කියන්නාහූ තාපසයන් වහන්ස අපගේ රජ්ජුරුවන් වහන්සේ ඊයේ රෑ ශබ්ද අටක් අසාවදාරා ඒ ශබ්ද අට ඇසූ නියාව පුරෝහිත බ්‍රාහ්මණයාට කීසේක. පුරෝහිත බ්‍රාහ්මණයාත් තමා රෑ කෙන උපායට සර්වතුෂ්ක නම් යාගයක් කළ මැනවැයි ප්‍රාණීන් රැස්කරවාගෙණ මරන්ට උවමැනවැයි යාග ශාලාවක් ඉදි කරවා ඒ ශාලාවෙහි මෙකී අය බැඳගෙණ ප්‍රාණවධයට එක්කරන්නාහ. ඔබ වහන්සේ වැනි ඍද්ධි ඇති තාපසයන් වහන්සේ මෙතන වැඩ ඉන්දදී රජ්ජුරුවන් වහන්සේට පිරෙණ පාපය නැතිකොට හික්මවා වදාළ මැනවැයි කීහ. එවිට තාපසයෝ කියන්නාහූ රජ්ජුරුවෝ අප ලඟට අවුනම් මේ ශබ්ද අටෙහි විපාකත් කියා රජ්ජුරුවන් හික්මවන පමණක් විනා අප ඉස අකුස්සක් බැඳගෙණ රජ්ජුරුවන් ලඟට ගොස් හික්මවන්දැයි කීහ. එවිට බ්‍රාහ්මණයා මම ගොසින් රජ්ජුරුවන් වහන්සේ කැඳවාගෙණ එම් කියා රජ්ජුරුවන් ලඟට ගොස් කියන්නේ ස්වාමිනී නුඹ වහන්සේ ඇසූ ශබ්ද අටේ අර්ථ විභාගකොට කියන්නට දන්නාවූ තාපස කෙණෙකුන් වහන්සේ මගුල් උයනේ වැඩ ඉඳිනාසේක. නුඹ වහන්සේ එතනට ගොස් අර්ථ විචාළ මැනවැයි කීහ. රජ්ජුරුවෝත් යහපතැයි උයනට ගොස් තාපසයන් වැඳ ඇසූ සබද අටෙහි අර්ථ තාපසයන්ට කීහ. තාපසයෝ ඒ ශබ්ද අටෙහි අර්ථ විසඳන්නාහූ පළමුවන ශබ්දයෙහි කොකෙකු ඇඬූ කාරණය නම් පළමු මේ පොකුණේ මත්ස්‍යයන් කාපැන්බී වාසය කෙළෙම් දැන් මැඩියන් කා ජීවත්වෙමි, තමාගේ වික්ෂේපයෙන්

SANHIDA LANKA

අඬාලීය, මින් රජ්ජුරුවෙනි තොපට වන්නාවූ අනර්ථයෙක් නැත, පොකුණ බිඳුවා පැන් පුරවා පියන්න දනුත් කොකා විසින් කිසි වික්ෂේපයක් නැතිව සැපසේ ඉඳිනේයයි කී කල්හි රජ්ජුරුවෝ පොකුණේ කසල හරවන්ට අමාත්‍යයන්ට කීහ. මින් තොපට වන්නාවූ භයෙක් නැතෙයි කියා බෝධිසත්වයෝ දෙවෙනි ශබ්දයේ අර්ථ විසඳන්නාහූ රජ්ජුරුවෙනි ඇත්හල තොරණ වසන්නාවූ කැවිඩි තමාගේ දරුවන් ඇතුන් මරාපූ හෙයින් පුත්‍රස්නේහයන් ඇඬූහ. තොපට මින් අනර්ථයෙක් නැතැයි කියා තුන්වැනි ශබ්දයෙහි අර්ථ විසඳන්නාහූ රජ්ජුරුවෙනි තොපගේ රජගෙයි කැණිමඬුල්ලේ කඳ පණුවෙක් වාසය කරන්නේය. ඒ තමා යන එන තැනක් නැතිහෙයින් මම මින් කවර දවසෙක ගැලවී පලායෙම්ද ගොදුරක් කවර කලක බඩ පුරා ලබම්දැයි කියා ඇඬීය. මිනිසෙකු ගෙන්වා කැණිමඬුල්ල බිඳවා කඳපණුවා ඇරගෙණ ඔබ්බේ ලවාපියවයි සැපසේ තමා කැමති තැනක ඇවිදිනේය, මින් තොපට වන අන්තරාය නැතැයි කීහ. සතරවන ශබ්දයේ අර්ථ කියන්නාවූ බෝධිසත්වයෝ මහරජ්ජුරුවෙනි තොපගේ මැදිරියේ ඉඳිනා කොවුළු මම මේ මැදිරියෙන් ගැලවී ගියේ නම් සැපසේ ඒ ඒ ගස් උඩවල හිඳ එලා එල අනුභවකොට සැපසේ ඇවිදිමි කියා ඇඬුව, මින් තොපට වන්නාවූ අනර්ථයෙක් නැතැයි කියා පස්වැනි ශබ්දයෙහි අර්ථ කියන්නාහූ මුවා මුවරැලට නායකව වනයේ වාසය කරන්නේ වැද්දෙකුට අසුව මේ සා බන්ධනයකට පැමිණියෙමි ඉදින් මිදිගියෙන් නම් සැපසේ වනයෙහි වාසය කරන්නෙම් වේදැයි කියා ඇඬීය. මින් තොපට වන්නාවූ අන්තරා නැතැයි කියා සවෙනි ශබ්දයේ අර්ථ කියන්නාවූ තාපසයෝ රජ්ජුරුවෙනි මේ වඳුරු වැඳිරියෙක නිසා කාමයෙහි ගිජුව අවුත් බන්ධනයකට පැමිණියෙමි ඉදින් මේ දුකින් මිදී ගියෙමි නම් සැපසේ වනයේ ඇවිදිනෙම් වේදැයි කියා ඇඬීය. මින් තොපට වන්නාවූ භයෙක් නැතැයි කියා සත්වන ශබ්දයේ අර්ථ කියන්නාහූ මේ කින්නරයා එක් දවසක් පර්වතයකින් ඇඳිරියෙහි බස්සේ තමාගේ කින්නරාංගනාවට අතදී බැස තමාගේ ස්ථානයෙහි සැපසේ වැදහෙව ලෝකස්වාදරතියෙහි යෙදී වාසයකොට දූන් එසේ වූ කින්නරාවක් හැර බන්ධනයට පැමිණියෙමි, මින් මිදී ගියෙන් නම් සැපසේ වනයට වැද වාසය කරන්නෙම් වේදැයි ඇඬීය. මින් තොපට වන්නාවූ භයෙක් නැතැයි අටවැනි ශබ්දයෙහි අර්ථ කියන්නාහූ එක් පසේ බුදු කෙනෙකුන් වහන්සේ හිමාලය වනයේ සිට කාල ක්‍රියාවට ආසන්න හෙයින් මනුෂ්‍යාපතයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන්ගේ උයනේ කාලක්‍රියා කෙරෙමි උයනට යනසේක් මේ ජාතියෙන් දෙවැනි ජාතියෙක උත්පත්තියෙක් නොවන්නේය. මින් චුතව නිර්වාණ පුරයට පැමිණ නිවන් සැප අනුභව කෙරෙමියි ප්‍රීති වාක්‍ය කිය කියා උදන් අන අන, වැඩිසේක. මින් තොපට වන්නාවූ අන්තරායෙක් නැතැයි කියා මේ ශබ්ද අටෙහි අර්ථ විසඳා වදාළ සේක. රජ්ජුරුවෝ තාපසයන් වහන්සේ කෙරේ සමාධිව පසේ බුදුන් වහන්සේගේ කඳ ආදාහන කරවා බන්ධනාගාරයෙහි සිටියාවූ සතුන් බන්ධූනයෙන් උනාහැරවුවයි වදාරා මේ අෂ්ට ශබ්ද ජාතකය නිමවා වදාළ සේකී. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරියෝය. බ්‍රාහ්මණ මානවකයා නම් ශාරිපුත්ත ස්ථවිරියෝය. එසමයෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# සුලසා ජාතකය

තවද දිගුපුළුල්වූ නුවන් ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අනේපිඬු මහා සිටානන් වහන්සේගේ දාසියක අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

අනේපිඬු මහා සිටානන්ගේ පුණ්‍යලක්‍ෂණයෙන් දියනිකෙනෙක් ඇත. උන්ගේ දාසියක් උයන් කෙළියට යෙමි. තමාගේ ස්වාමි දුව අතින් ලක්‍ෂයක් වටනා පළඳනාව ඉල්වා අත කරලාගෙණ උයන් කෙළියට යන්නිය දැක එක් සොරෙක් ඈ අත කර තිබූ ආභරණ දැක ඒ ආභරණයෙහි ලොභකොට මෑ මරා පියා ආභරණ ඇරගතිමි. ඈ හා කැටිව ක්ලේශ වසඟයෙන් කථාකොට ඈට රා මස් ආදිවූ දෙයදෙන්නේය. ඔයිත් ක්ලේශ වසඟයෙන් දෙතියි ඇරගන්නීය. ඒ සොරාත් ඈ උයන් කෙළිකෙළ ඉක්බිතිව ඈ හාලොකස්වාදරතියෙහි යෙදෙනා ලෙස එක් තෙනකට ගෙණගොස් කියන්නේ මෙතන නපුර ඔබ්බට යම්හයි කියා එවිටත් සිතන්නී රහසිගතව කරණ දෙයකට මෙතනට වඩා නිසි තැනක් නැත, මෙතනින් මා ඔබ්බට ගෙණයන්නේ මරන්ට වනැයි සිතා තීක්‍ෂණ උපායක් සිතා කියන්නී රා මස් කා මාගේ සර්වාංගය වියලිගියේය මට පැන් උකාදීලා මට පැන් පොවා ලවයි ළිඳක් කරාගෙණගොස් කලය හා ලනුව සොරා අතට දින. සොරාත් සැබැවින්ම කියන දෙයක්වනැයි සිතා ලනුවෙන් කලය කට බැද කලය ලිදටලාලීය. එවිට පිටිපස්සේ සිටි ස්ත්‍රිය දෑතින් තරයේ ඇන ළිඳය තා එලා ඉසට උළුකැටකින් ගසා මරා ගෙට ගොස් තමාගේ ස්වාමි දුවට මෙපවත් කියා ආභරණ පාවා දුන්නාය. ඒ ඇසූ සැටිය පුණ්‍යලක්‍ෂණ දේවී පියාණන්ට කීය. අනේපිඬුමහා සිටානෝ ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේට එපවත් කීහ. සර්වඥයන් වහන්සේ දැන්මතු නොවෙයි සිටානෙනි පෙරත් ඒ ස්ත්‍රිය පුරුෂයා මැරුවිරුයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි ඒ නුවර සුලසා නම් වෛශ්‍යා ස්ත්‍රියක් ඇත ඒ නුවර සඬුකා නම් සොරෙක් නිරන්තරයෙන් ගෙවල් සොරකම් කොට ඇවිදිනේය. රජ්ජුරුවෝ එපවත් අසා ගම් රැකවලුන් විධාන කරවා ඒ සොර අල්වාගෙණ උල අන්ට විධාන කළහ. ගම් රැකවලුන් විසින් උඟු ඇරගෙණ උල අන්ට ගෙණයන කල්හි සුලසා නම් වෛශ්‍යාව තමාගේ ගෙයි උඩුමාලේ සිටින තැනැත්තිය ඒ සොරු දැක කනේරුජාතකයෙහි කී පරිද්දෙන් ඔහු කෙරෙහි අභිලාෂා ඇතිව සිතන්නී මෙසේවූ විරපුරුෂයෙකු ගලවා ගතිමි නම් සැපසේ ඇතිතෙක් දවසට ඉච්ඡාපරයෙන් වාසය කරන්නෙම් වේදැයි සිතා තමාගේ ගෙයි පළමු සිටි සිටුපුත්‍රයෙකුත් මසුරන් දාසකුත් ගම්රැකවලුන්ට දී ඒ සොරු ගලවා ගෙණ තමාට ස්වාමිකොට ගෙයි රඳවාගෙණ උන්නීය. සොරුත් කීපදවසක් ඇගේ ගෙයි වැස සිතන්නේ මෙතන මා ඉඳ ප්‍රයෝජන කිම්ද මෑ මරාපිය මෑ අත කර ලන ආභරණ ඇරගෙණ යෙමි සිතා වෛශ්‍යාවට කියන්නේ එම්බා හද්‍රාව මා ඒ දවස් පිටතොලහයා බැඳලා උල අනින්ට ගෙණයන දවස් පර්වතයක වසන දේවතාවෙකුට ආරාධනාවක් කෙළෙමි. ඒ ආරාධනාවට බලි දුන මැන වැයි බොහෝ මිනිසුන් හා බත්තලියක් ඇරගෙණ තොප හා මා හා දෙන්නාම සර්වාභරණයෙන් සැරසී රුක්දෙවියාට බලිදෙන්ට උවමැනවයි කිහ. වෛශ්‍යා ස්ත්‍රී කියන්නී යහපත නුඹ වහන්සේගේ අභිප්‍රාය නියාවට බලි දුන මැනවැයි කියා බොහෝ පූජා භාණ්ඩ ඇරගෙණ සොරතෙමේ පඤ්චායුධ සන්නද්ධව පර්වතය ලඟට ගොසින් කැටිව ගියවුන්  පර්වතය පාතරඳවා සාධුකනම් සොරා සුලසා නම් වෛශ්‍යාව ඇරගෙණ පර්වතය උඩට නැගීගණ ගොස් ගලමත්තේ තබා කියන්නේ තොප ශතප්‍රමාණ උස ඇති පර්වතය උඩට බලිදෙන්ට ගෙණායෙමි නොවෙයි තොප මරා අතකර තිබූ ආභරණ අරගන්ට අයේයයි කීය. එවිට සුලසා කියන්නී තොප කෙරේ ස්නෙහයෙන් මාරුදී ගලවාගතිමි. තොප ඒ මරණින් ගැලවූ මා මරා ප්‍රයෝජන කිම්ද, මාගේ ආභරණත් ඇරගෙණ මා තොපට වහල් නියාවට බොහෝ දෙනා මැදයේ කියා වහල් කොටගණුවයි කිව එවිට සාඬුකයා කියන්නේ මම මේසා වනතුරු මිනියක් නොමරා වස්තුවක් ඇරගත් විරූ නැත, සොරු මිනීනොමරා වස්තු ඇරගැණිමි. ආචාර නොවෙයි, තොපගේ තෙල උතුරු සළුව බිම තබා තොප ආභරණ ගලවා කඩෙයි ලා පොදිය බැඳලවයි කිය, එවිට සුලසා කියන්නී මා මැරුණුපසු මා කටයුතු දැන පුරුෂයන් හා කැටිව වාසයෙන් යෙදෙන අවස්ථාවෙහි පටන් තොප කෙරෙන් ඇති ස්නෙහයට වඩා ස්නේහයක් ඇත්තේ නැත. ඉතිකිනි මේ දුක්මෙන් අනික් දුක්මක් නොවත්වූව, තොප සතර තැනක සිට වැඳ පැදකුණුකොට සිපගෙණ සනාපියන්ට උවමැනවයි කිව, සොරුත් යහපතැයි ගිවිස්සේය. ඒ වෛශ්‍යාවත් කී පරිද්දෙන් ම වැද පැදකුණු කොට ඉදිරියෙන් සනාපියා පිටිපස්සට ගොසින් වඳින්ට නැඹුරු වන්නාක් මෙන් නැඹුරුව පටිපස්ස අල්වාගෙණ ශත ප්‍රමාණ පර්වතයෙන් හෙලාපුව එවිට ඇට බැට සුනුවිසුනුව කැඩී ප්‍රාණය විනාශ විය. ඒ බලාසිටියාවූ වෘක්‍ෂදේවතාවා හැමතැන්හිම පුරුෂයන්ම නුවනැතැයි කියාම නැත. ස්ත්‍රීන් නුවනැත්තෝමය, සාඬුකා නම් සොරා සුලභවන් මරන්ට උත්සාහකොට තෙමේ නුනුවනින් මෙළේය. සූක්‍ෂමවූ නුවණ ඇතිව

SANHIDA LANKA

දුටු ප්‍රසථවකට කාරිය සිතාගෙණ නොහෙන්නාවූ යම්කෙණෙක් ඇත්නම් සාඬුකයාමෙන් නස්නාහුයයි දේවතාවා කීයේය. ඒ සුලසානම් වෛශ්‍යාත් පර්වතයෙන් බැස තමාගේ පර්ෂිත් සිටි තැනට ගියාය. ඒ පරිවර ස්ත්‍රි කියන්නාහූ නුඹ වහන්සේගේ ස්වාමින් වහන්සේ කොයිද්දයි විචාළාහ. උන්ගේ දෙයක් මට නොකියවයි කියා රථයකට පැනනැගී තමාගේ ගෙට ගියායි මේ ජාතකය ගෙණහැර දක්වා වදාර මේ සුලසා ජාතකය නිමවා වදාළ සේක. ඒ සමයෙහි සොරා නම් සොරාමය, එසමයෙහි සුලසා නම් මේ දාසිමය, එසමයෙහි වෘක්ෂ දේවතාවා උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# සුමංගල ජාතකය

තවද අසමසමවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි රාජෝවාදයක් අරභයා මේ ජාතකය දක්වන ලද

ඒ කෙසේද යත්

සර්වඥයන් වහන්සේ කෝසල රජ්ජුරුවන්ට වදාරණසේක් මහරජ දරු වන් නම් සන්හිඳී වාසය කටයුතු පෙරත් රජදරුවෝ සන්හිඳිවාසය කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ නුවරට පසේ බුදු කෙණෙකුන් වහන්සේ වැඩිසේක. රජ්ජුරුවෝ පසේ බුදුන් වහන්සේ දැක තමන්ගේ උයනට වඩා ගෙණගොස් උයනේ වැඩහිඳිනා නියායෙන් සලස්වා තමන්ගේ සුමංගල නම් උයන් ගොව්වා පසේ බුදුන්වහන්සේට අත්පා මෙහෙවර කරණ නියායෙන් සැලැස්වූහ. ඒ උයන් ගොව්වාත් ආදරය සම්භාවනා ඇතිවිම රජ්ජුරුවන් කී සැටියේම පසේ බුදුන් වහන්සේට අත්පා මෙහෙවර කරන්නේය. පසේ බුදුන් වහන්සේත් රජගෙන් වළඳා උයනේ වාසය කරණ සේක. කීප මසක් වැස උයන් ගොව්වාට කියා පිටිසර ගමකට වැඩිසේක. උයන් ගොව්වාත් උන්වහන්සේ පිටිසර ගමකට ගිය නියාව කියා උයනට නොගියේය. පසේ බුදුන් වහන්සේත් පිටිසර ගිය කීප දවසකින් උයනට වැඩිසේක. පසේ බුදුන් වහන්සේත් පිටිසර ගිය කීප දවසකින් උයනට වැඩිසේක. උයන් ගොව්වා උන් වහන්සේ වැඩි නියාව නො දන්නේය. උදැසන තමාදෙන අමුතු බතකට මුවන් විදින්ටයයි ගියේය. පසේ බුදුන් වහන්සේ උයනේ සලවට සිව්රෙන් මොට්ටක්කිලිය ගසා වැඩ උන්සේක. උයන් ගොව්වාත් මේ වැදහෝනේ මහාමුවෙකැයි සිතා ඇදගෙණ විද්දේය. ඒ හීය ලෙන් ඇනී පිටින් නැංගේය. එවිට පසේ බුදුන් වහන්සේ ඇයි සුමංගලය මමයි වදාළ සේක. එවිට උයන් ගොව්වා අත දුන්න දමාපියා ස්වාමිනි මහා මුවෙකැයි සිතා විද්දෙමි කියා ක්‍ෂමා කළ මැනවැයි කියා වැඳ වැතිර ගියේය. පසේ බුදුන් වහන්සේ ඉතිකින් කළමනාකිම්දැයි කියා මා ඇඟ ඇනීගිය මේහීය ඇද දමාපියටයි කී සේක. එවිට හීය ඇදපු කීප පැයකින් ප්‍රාණය නිරුද්ධ විය. උයන් ගොව්වාත් පසේ බුදුන් වහන්සේට විදි නියාව රජ්ජුරුවන් වහන්සේ ඇසූ සේක්වි නම් මට ආඥාකරණ සේකැයි භයින් අඹු දරුවන් ඇරගෙණ වලට වැද ගියේය. ඒ උයනේ වසන්නාවූ අනික් කෙණෙක් නැත්තාහ. දේවතාවෝ පසේ බුදුන් වහනසේට විත් කා මළසේකැයි බරණැස් නුවර මුළුල්ලේ සැලකළාහ. රජ්ජුරුවෝත් එපවත් අසා අමාත්‍යමණ්ඩලයා හා සමග උයනට ගොස් පසේ බුදුන් වහන්සේ ආදාහන කරවා නුවරට ගියාහ. උයන්ගොව්වා අවුරුද්දක් සැඟවි ඉඳ තමා සිතළුක් අමාත්‍යයෙකුට පෙණී රජ්ජුරුවන් වහන්සේ මා කෙරේ කෝප ඇතිසේක් දෝහෝයි නියමකළ මැනැවයි කිය. ඒ අමාත්‍යයාත් රජ්ජුරුවන් කරා ගොස් ස්වාමිනි සුමංගල නම් උයන් ගොව්වා උයනට එලාඑල ඇතිකරන්නට ඉතා සමර්තය. ඌ ගිය තැන් පටන් උයන ඉතාම නපුරුව ගියේයයි කීය. රජ්ජුැවෝ ඌ දිසාවට මුනත් නොලා උන් කියන බසුත් නොඇසුවාහ. ඒ අමාත්‍යයාත් ගෙට අවුත් තව කෝප සන්නොසිඳුනේය. නැවත අවුරුද්දක් සැඟවි ඉඳුවයි කියා යවිය. එයින් අවුරුද්දක් සැඟවි ඉඳ පළමු පරිද්දෙන්ම ඇවිත් ඒ අමාත්‍යයා දිට ඒ අමාත්‍යයාත් පළමු පරිද්දෙන්ම රජ්ජුරුවන්ට කීයේය. රජ්ජුරුවෝ දෙවෙනිවාරයේත් නොඇසුවාහ. ඒ වාරයේත් තව අවුරුද්දක් සැඟවි ඉඳුවයි කියා යැවිය. එවකත් ගොසින් අවුරුද්දක් සැඟවි ඉඳ තුන්වෙනි වාරයේත් ඇවිත් දිට ඒ අමාත්‍යයාත් තුන්වෙනි වාරයේත් රජ්ජුරුවන්ට කිය රජ්ජුරුවෝ තුන්වෙනිවාරයේ උගේ පවත් අසා ගෙන්වා ගෙණ පාවයි අමාත්‍යයාට කීහ. ඒ අමාත්‍යයාත් තමාගේ ගෙයි උන් උයන් ගොව්වා රජ්ජුරුවන්ට ගෙණවිත් පෑහ. රජ්ජුරුවෝත් උයන්ගොව්වා දැක ඇයි තා පසේ බුදුන් වහන්සේ කුමට විද්දෙදැයි විචාළාහ. ස්වාමිනි පසේ බුදුන් වහන්සේ උයනට ආ නියාව නොදත්තෙමි මම මුවෙන් විදින්ටයයි ගියෙමි. ඉස වසා සිවුර ලාගෙණ වැඩ උන් තැනැත්තන් වහන්සේ මහමුවෙකැයි සිතා නොදැන විද්දෙමියි කීහ. රජ්ජුරුවන් වහන්සේ නොදැනකළ වරදට කරන්නේ කිමදැයි කියා ඌට බොහෝ වස්තු දී පළමුසේම උයන රැකවලට සැලැස්වූශ. ඒ අමාත්‍යයාත් ඇයි ස්වාමිනි දෙමුරෙක මා දන්වන ගමනේ බැණ නොනැගී වැඩ ඉන්ටත් දැන්වූ කලි මූට ප්‍රාසාද දෙන්ටත් කාරණා කිම්දැයි විචාළාහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු එම්බා ඉසුරුමතුන්නම් යම් කෙණෙකුන්ගේ වැරැද්දක් ඇසූ කල තමාගේ කෝප නිවිගිය අවස්ථාවේ ගෙන්වාගෙණ ඌගේ වැරදිවිචාරා නිවැරදි හෙයින් මූට ප්‍රසාදත්දී ඌට උයනත් සැලැස්වීම රජ්ජුරුවෝ කීහ. එතන උන්නාහූ අමාත්‍ය මණ්ඩලයා සාධුකාර දී බොහෝ කෝලාහල කළාහ. අරගල සන්හිඳියන්නා උයන් ගොව්වා නැගිසිට රජ්ජුරුවන් වහන්සේ වැඳ ස්වාමිනි නුඹ වහන්සේ ශ්‍රී කාන්තාත් ලක්‍ෂමිත් නොහැර පවතිත්වයි නිරන්තරයෙන් සියල්ලවුන් කෙරේ කෝපයෙන් නොවි දැහැමින් සෙමෙන් රාජ්‍යය කරණසේක්වයි සියක් අවුරුද්දක් සැපසේ බොහෝ දෙනා

SANHIDA LANKA

කෙරේ මෛත්‍රී කොට මින් චුතව දිව්‍යලෝකයට ගොස් දිව්‍යසම්පත් අනුභව කරණසේක්වයි ආවඩා ස්තුති ඝෝෂා කෙළේයයි වදාරා මේ සුමංගල ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි පසේ බුදුන් වහන්සේ ආදාහන කරවා පූජා කළාවූ රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ගංගාමාල ජාතකය

තවද අප්‍රතිවාදීවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පෙහෙවස් රකී උපාසකයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද යත්

එක් උපාසකයෙක් පෙහෙවස් රක සර්වඥයන් වහන්සේලඟ බණ අස අසා උන්නාහ, සර්වඥයන් වහන්සේ පෙර උත්තමයෝ යන්තම් වේලෙකත් පෙහෙවස් රක්කෝ වේදැයි වදාරා ආරාධිත සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජ්‍ය පාලනය කරණ සමයෙහි ඒ නුවර සුචිපරිවාර නම් සිටාන කෙණෙක් ඇත්තාහ. උන්ගේ පරිවාරත් තමනුත් නිරන්තරයෙන් පන්සිල් රකිණාහ. පෝය. අටසිල් රක යටත් පිරිසෙයින් බැල මෙහෙකරන්නන් දව්වාත් පන්සිල් රකුවයි පන්සිල් රක්වන්නාහ. එසමයේදී බෝධිසත්වයෝ එක්තරා දුක්පත් කුලයක ඉපද ඉන බඩ පැදගන්නා විවරකුත් නැතිව දවසරින්නාහු සුචිපරිවාර සිටානන්ගේ ගෙයි බැලමෙහෙ කරන්නාටයයි කීයා ආවාහ. සිටානෝත් බෝධිසත්වයන් දැක කුමට අවුදැයි විචාරා බැලමෙහෙකරන්නට ආමි කී කල්හි සිටානෝ බෝධිසත්වයන් දැක උවමනා කෙනෙකැයි පන්සිල් රකුවයි නොකියාම මේ බැලමෙහෙ දෙවයි විධාන කළාහ. බෝධිසත්වයෝ එතැන් පටන් බැලත් ඇරගෙන මෙවර කරන්නාහ. එක් දවසක් සිටානෝ තමන්ගේ ගෙට විධාන කරන්නාහූ ස්වාමිනි හෙට අටවක පෝයය. වේලාපසම බත් පිස කා අවසර ඇමදෙනම පෙහෙවස් රකුවයි කියා විධාන කළාහ, බෝධි සත්වයෝ එබස් නොඇසූහ. උදෑසනක් සේම තමන් කර්මාන්ත කරන මේබිමට ගොස් කර්මාන්ත කරන්නාහ, සිටානෝත් බෝධිසත්වයන් නොදැක එම්බල බැල මෙහෙකරන තැනැත්තන් දුටුයේ නැතැයි කියා උන්ට බත් තබවයි කීයා බත්තුබූහ. බෝධිසත්වයෝ මෙතෙක් දවස් මේ වෙලාවට මේ ගෙයි කන බොන අරගල බොහෝව තිබෙයි අද අරගලයකුත් නැතිව කන බොන කෙනෙකුන් නැතිව ඉන්ටකාරනා කිම්දැයි විචාළාහ. බත්ලන කෙලී කියන්නී අද අටවක පෝය හෙයින් ඇමදෙනාම පේවුය. එසේ හෙයින් වේලපසම කා බී පෙහෙවස් රකිනාහයි කිව, බෝධිසත්වයෝ එපවත් අසා මේ වේලාවට පෝය ඇද්දැයි විචාරා ඊ තිස්පැය පෝය ඇතැයි යනු අසා සුචිමහපරිවාර සිටානන් කරා ගොසින් මම පෙහෙවස් රැකිම්යි මා පෙහෙකරවා එව මැනවයි සිටානන් අතින් අටසිල් ඇරගෙන පේවස් ඉටාගෙන වැදඹත්තාහ, දාවළුත් බත් නොකන හෙයිනුත් ඊ මධ්‍යම රාත්‍රි වෙලාවට හසිලාකනම් රුජාවෙක් පහරින්ටවන, සිටානෝ එපවත් අසා මා හා විලඳ හා සකිරා එල ගිතෙල් අනුභව කරවයි ගෙණගියාහ. බෝධිසත්වයෝ මා දුකසේ රකිනා ශිලය අර්ධ දවසක මා සමාදන්වූයේය. මම මේ ඇම අනුභව නොකරමි නොකළාහ. රුජාවත් තරකොට ගන්ටවන, සිටානෝත් චුතවන අවස්ථා හෙයින් විරීයෙහි සිලය වාපුහාව බරණැස් රජ්ජුරුවෝ පසුව දවස් මහත්වූ සේනාවාහනයෙන් හා මහත්වූ ඓශ්චර්යෙන් නුවරට පිටත්වූවාහ. බෝධිසත්වයෝ රජ්ජුරුවන්ගේ ඓශ්චර්යව දැක එහි ලොභ ඉපදවූහ. එක්ෂණයෙහි ප්‍රාණය නිරුද්ධ විය. චුති සුද්ධව ප්‍රාණය නිරුද්ධ වූවා සමග අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගත්තාහු දස එකඩමසකින් වැලුවාහ. ඒ කුමාරයන්ට නම් තබන්නාහූ උදය කුමාරයෝයයි නම් තුබූහ. ඒ රජකුමාරයෙත් වැඩිවිය පැමිණ පියානන්ගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණියාහ, එක් දවසක් මතුමාල්තෙලෙහි හිඳ තමන්වහන්සේ කළාවූ පින් දැක මෙසේවූකුශලයක් කොට මෙසේවූ ඓශ්චර්යයක් ලදිම් උදන් අනා ඉන්නාසේක. ඒ නුවර උතුරුදිග දොරටුපාලයා රත්‍රන් සතරවියටත් උපායගත දකුණුදිග දොරටුපාලයාගේ අඹුත් එසේම රත්‍රන් සතරවියටත් සොයාගෙණ උතුරු දිග වාසල පව්රේ වලත් කැණ නිධාන කළාහ. එක් දවසක් නුවර උත්සව කෙලියෙක් ඇතිවිය. එවිට අඹුකියන්නී නුඹ වහන්සේ අත යම් වස්තුයෙක් ඇත්නම් ඇරගෙණ විකොට උත්සව කෙළි කෙළුම්හයි කිහ. එවිට දොරටුපාලයා උතුරුදිග දොරටුවේ රත්‍රන් සතර විය. වෙක් නිධාන කෙළම් ඒ ගෙණෙන්ටයෙම්යි කණ මල්ගන්වාගෙණ දොළොස් ගව්වක් දිග පලල ඇති නුවර හෙයින් වහ වහා යන්නේය. රජ්ජුරුවෝ මතු මාල්තෙලෙහි උන්නාහුය. දොරටුපාලයා කන මල්ගන්වාගෙණ යන්නාහු දැක රජ්ජුරුවෝ සිතන්නාහූ මෙසේවූ තද අව්වේ කකියාගිය වැල්ලේ දොළොස් ගව්වක් සමාධිව කිසි ආයසයක් නැති කෙණෙකුන් මෙන් යන්නේය. මා මූ අතින් විචාරන්ට උවමැනවැයි ලඟ සිටි පුරුෂයෙකු කැඳවාගෙණ මල් ගෙන්වා ගෙණ සමාධි සමාධිව යන්නේය. ඒ පුරුෂයා කැඳවාගෙණ එවයි කියා යැවූහ. ඒ පුරුෂයාත් ගොසින් දොරටුපාලයාට කියන්නේ ස්වාමි තොප කැන්දූසේකැයි කිය. එවිට දොරටුපාලයා කියන්නේ ස්වාමි කුමට කැන්දූසේක්දැයි කියා එසේදවුවත් ඒ ගිය පුරුෂයා කැඳවාගෙණ අවුත් රජ්ජුරුවන්ට පෑය. රජ්ජුරුවෝත් දොරටුපාලයා දැක එම්බල දොරටුපාලය තෝ ඉතා රත්ව ගියාවූ භූමියෙහි කකියන වැල්ලේ පය බිම ඔබාගත් නොහැකි මගයන්නාවූ තෝ හී කිය කියා

SANHIDA LANKA

සමාධි සමාධිව කණ මල් එල්වාගෙණ යන්නේය, තට කවර සමාධියකින් පිණ පිණා යන්නෙහිදැයි විචාළාහ. එවිට දොරටුපාලයා කියන්නේ ස්වාමිනි භාර්යාව උත්සව කෙළියක් කෙළුම්හයි කිව, එසේ හෙයින් මාගේ නිධානයෙක් දකුණු දිග දොරටුව කෙරේය. ඒ ඇරගෙණ එන නිසායෙම් කීහ. පණස් දහසකට අද්දැයි විචාළාහ, එහෙත් නැතැයි කිහ. එසේ කල සතළිස් දහසකට ඇද්දැයි කිහ. එසේත් නැතැයි කීය. තිස් දහසකට විසි දහසකට ඇද්ද දස දහසකට ඇද්ද පන්දහසකට ඇද්දැයි විචාළාහ. එසේත් නැතැයි කිය, ක්‍රමයෙන් විචාරා දහසකට ඇද්දැයි විචාළාහ. එසේත් නැතැයි කිය එසේ කල නවසියයෙක්ද අටසියයෙක්ද සසියයෙක්ද තුන්සියයෙක්ද දෙසියයෙක්දැයි විචාළාහ. එසේත් නැතැයි කිහ. එසේ කල සිය යක්ද අනුයෙක්ද අසූයෙක්ද සැත්තෑවෙක්ද සැටෙක්ද පණසෙක්දැයි විචාරා දසකලදෙක්දැයි කීහ. එසේත් නැත ස්වාමිනි කිය. එසේ කල පස්කලඳෙක්ද සතරකලඳෙක්ද තුන්කලඳෙක්ද දෙකලදෙක්ද කලදක්ද දසකෙක්ද පසකෙක්ද තුන්කෙක්ද අකෙක්දැයි විචාළාහ. එසේ නැත ස්වාමි නිතිය එසේ කල විසිවියටෙක්දැයි කිය, එසේත් නැත ස්වාමිනි කිය දසවියටෙක්දැයි කීහ. එසේත් නැත ස්වාමිනි කීහ. එසේ කල මදවෙක්දැයි කීහ. එසේත් නැත. ස්වාමිනි කිය එසේ කල සතරවියටෙක්දැයි කීහ. එසේය ස්වාමිනි කියා, එවිට රජ්ජුරුවෝ කියන්නාහූ රත්‍රන් සතරවියටක් නිසා දූන් සඟව්වක් ආයේ වේද ඉදිරියෙත් සඟව්වක් ආයේ වේද ඉදිරියෙත් සඟව්වක් ගියමනාවේද මම තට රත්‍රන් සතරවියටත් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ මම රත්‍රන් අටවියටත් දෙමි ඇරගෙණ පළායවයි කීහ. එවිට කියන්නේ මේ රත්‍රන් අටවියටත් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කිය එවිට රජ්ජුරුවෝ කියන්නාහූ මම රත්‍රන් සොළොස්වියටත් දෙමි කිහ. මම සොළොස්වියටත් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කීහ. එසේ කළ රත්‍රන් අකක්දෙමි කීහ. මේ රත්‍රන් අකත් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කීය. එසේ වීනම් රත්‍රන් කලඳක් දෙමි කීහ. මේ කලඳත් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කීය. එසේ කල දෙකලඳක් දෙමි කීය, මේ දෙකලඳත් ගණිම් මාගේ රත්‍රන් සතර වියටත් ගණිම් කීහ. එසේ කල අටකලඳක් දෙමි කීහ. මේ අටකලඳක් ගණිම් මාගේ රත්‍රන් සතර වියටත් ගණිම් කීය. එසේ විනම් සොළොස් කලඳක් දෙමි කීහ. මේ සොළොස් කලඳක් ගණිම් මාගේ රත්‍රන් සතර වියටත් ගණිම් කීය. එසේ කල දෙතිස් කලඳක් දෙමි කීහ. මේ දෙතිස් කලඳත් ගණිම් මාගේ රත්‍රන් සතර වියටත් ගණිම් කීය, එසේවිනම් සැටසතර කලඳක් දෙමි කීහ. ඒ සැට් සතර කලඳක් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කීය. එසේ කල රත්‍රන් සියයක් දෙමි කීහ. ඒ රත්‍රන් සියයක් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කීය. එසේකල රත්‍රන් දෙසියයක් දෙමි කිහ. මේ රත්‍රන් දෙසියත් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කිය එසේකල රත්‍රන් සාරසියයක් දෙමි කීහ. මේ සාරසියයක් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කීය. එසේ කළ රත්‍රන් අටසියයක් දෙමි කීහ. මේ රත්‍රන් සරවියටත් ගණිම් කීය. එසේ කල රත්‍රන් අටසියයක් දෙමිකීහ. මේ රත්‍රන් අටසියයක් ගණිම් මාගේ රත්‍රන් සතර වියටත් ගණිම් කීහ. එසේ කල රත්‍රන් දාසක් දෙමි කීහ. මේ රත්‍රන් දාසත් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කීය, එසේ කල රත්‍රන් දෙදාසක් දෙමි කීහ. මේ රත්‍රන් දෙදාසත් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කීය. එසේ කල රත්‍රන් දෙදාසත් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම්කීය. එසේ කල රත්‍රන් සාරදහසක් දෙමි කීය. මේ රත්‍රන් සාරදහසක් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කීය. එසේකල රත්‍රන් අටදහසක් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගණිම් කිය. එසේ කල රත්‍රන් සොළොස් දහසක් දෙමි කිය, මේ රත්‍රන් සොළොස්දාහක් ගණිම් මාගේ රත්‍රන් දෙතිස්දසක් ගණිම් මාගේ රත්‍රන් සතරවියටත් ගනිම් කීය. එසේකල රත්‍රන් සූසැටදහසක් දෙමි කිහ, මේ රත්‍රන් සූසැටදහසක් ගනිම් මාගේ රත්‍රන් සතරවියටත් ගනිම් කීය. එසේකල රත්‍රන් එකසිය විසිඅටදාසක් දෙමි කීහ. මේ රත්‍රන් එකසිය විසිඅටදාසත් ගනිම් මාගේ රත්‍රන් සතරවියටත් ගනිම් කීහ. එසේ කල රත්‍රන් පන්ලක්‍ෂයක් දෙමි කීහ. මේ රත්‍රන් පන්ලක්‍ෂයත් ගනිම් මාගේ රත්‍රන් සතරවියටත් ගනිම් කිය එසේ කල රත්‍රන් දසලක්ෂයක් දෙමි කීහ. ඒ රත්‍රන් දසලක්ෂයත් ගනිම් මාගේ රත්‍රන් සතර වියටත් ගනිම් කීය. එසේ කල රත්‍රන් විසිලක්‍ෂයක් දෙමි කීහ. ඒ රත්‍රන් විසිලකෂයත් ගනිම් මාගේ රත්‍රන් සතර වියටත් ගනිම්. කිය එසේ විනම් රත්‍රන් සතලිස් ලක්ෂයක් දෙමි කීහ. මේ රත්‍රන් සතළිස් ලක්ෂයත් ගනිම් මාගේ රත්‍රන් සතර වියටත් ගණිම් කීය. එසේ වී නම් රත්‍රන් අනූලක්ෂයක් දෙමි කීහ. මේ රත්‍රන් අනූලක්ෂයක් ගනිම් මාගේ රත්‍රන් කෙල ගනිම් මාගේ රත්‍රන් සතරවියටත් ගනිම් එසේ වීනම් රාජ්‍යයෙන් කැබැල්ලක් දෙමි කීය. එවිට දොරටුපාලයාත් යහපතැයි ගිවිස්සේය. රජ්ජුරුවෝ ඔහු දූලිඅන්දම් තබ්බවා ඔහු ඉස් සෝධා නහවා සළු අඳවා රාජ්‍යය කණුගස්වා දුන්හ. ඒ රාජ්‍යයත් තමාගේ රත්‍රන් සතරවියටත් තුබූ භාගය නොහැර ගත. එසේ හෙයින් අර්ධ මාස රජ්ජුරුවෝ යයි නම් තුබූහ. ඒතැන් පටන් උදය රජ්ජුරුවෝත් අධර්මාස රජ්ජුරුවෝ යයි නම් තුබූහ. එතැන් පටන් උදය රජ්ජුරුවෝත් අර්ධ මාස රජ්ජුරුවෝත් නොවෙනස්ව රාජ්‍යය කරන්නාහ. එක් දවසක් උයනට ගියාහ. උදය රජ්ජුරුවෝ අධර්මාස රජ්ජුරුවන්ගේ කලවයෙහි ඉස තබා වැදහෙව නිදාපුවාහ. අධර්මාස රජතෙම මොහු මරාපියා රාජ්‍යය මම ඇරගණිම් . රජ්ජුරුවන්ගේ ඉස කපාපියම් කඩුව අතට ගෙණ සිතන්නාහූ මා රත්‍රන් සතරවියටත් පමණ වස්තු ඇති තැනැත්තහූ මේසා මහත් රාජ්‍ය ශ්‍රීයක පිහිටවූ තැනැත්තෝයයි කඩුව බිම තබා දෙවැනිවත් තුන්වෙනිවත් ක්‍ෂමා කළ මැනවයි කීහ. එවිට උදය රජ්ජුරුවෝ කියන්නාහූ යාළුමට කළ වැරැ

SANHIDA LANKA

ද්දක් නැත. ක්‍ෂමා කරන්නේ කිම්දැයි කීහ. එවිට අර්ධමාස රජ්ජුරුවෝ තමන් කළ සැටිය කියා උදය රජ්ජුරුවන් ක්‍ෂමා කරවූහ. උදය රජ්ජුරුවෝත් එසේ කළ රාජ්‍යය තොපම හැරගනුවයි කිය. අර්ධමාස රජ්ජුරුවෝත් තොපගේ රාජ්‍යයෙන් මට ප්‍රයෝජන නැතැයි රජ්ජුරුවන්ට රාජ්‍යය පාවාදී වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූහ. උදය රජ්ජුරුවෝත් අර්ධ රාත්‍රියෙහි පේවස් රැක පමණකින් මේසා මහත් රාජ්‍ය ශ්‍රියක් ලදිමයි මාගේ යහළුවූ අර්ධමාස රජ්ජුරුවෝත් තපසට පලාගියාහ. මම ගිහිගෙයි සිටියෙම් ඇමවෙලේම ගාථා වක් කිය කියා ඉඳිනාහ. බිසව් ගාථාවෙහි අභිප්‍රාය අහන්නා කැමැත්තාහ. ඒ රජ්ජුරුවන්ගේ හංගමාල නම් නාවිසයෙක් ඇත්තේය. රජ්ජුරුවෝ එක් දවසක් බිසවුන්ට කියන්නාහූ ගගාමාලයා මාගේ ඇඟ ලොව්ලා දැළිකපන වේලෙහි ඌ ඉල්වූ යම් වරයක් දෙන්ට අභිප්‍රාය නාසයේ ලොම් උදුරණ වෙලෙහි ඉසකපන අභිප්‍රායයි කීහ. බිසව් නාවිසයා කැඳවා කියන්නාහූ ගංගා මාලය අද පටන් රජ්ජුරුවන් වහන්සේගේ දැළි කපන කල පළමු කොට නාසයේ ලොම් උදුරා පසුව දැළි කපා ඇඟලොස් බාවාළු විට රජ්ජුරුවෝ තොපට කොල තා කැමති වරයක් ගනැයි කියති. එවෙලෙහි ස්වාමිනි මට අනික්වරයකින් ප්‍රයෝජන නැත. නුඹ වහන්සේ කියන්නාවූ ගාථාවේ අර්ථ කිවමැනවැයි කියා කියවයි බිසව් උගන්වා ඇරිකල්හි නාවිසාත් එක් දවසක් රජ්ජුරුවන්ගේ දැළි බාන්ට ගොසින් ආදි කොට නාසයේ ලොම් උදුරන්ට වන. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ මේ කිමෙක්දැයි ආදිකොට නාසයේ ලොම් උදුරන්නේයයි කීහ. නාවිසයාත් කියන්නේ නාසා කර්මාන්ත නම් අපූර්ව දත් දෙයක් කරන්නාහයි කියා ආදී කොටනාසයේ ලොම් හා පසුව දැලිය කපා ඇඟ ලේම්බැය, රජ්ජුරුවෝ සමාධිව තා කැමති වරයක් ගණැයි කීහ. ගගා මාලයා ස්වාමිනි මට සෙසු වරයකින් කම්නැත. නුඹ වහන්සේ ඇමවිට කිය කියා ඉඳිනාවූ ගාථාවෙහි අර්ථ කිවමැන වැයි කීය. රජ්ජුරුවෝත් කුම්මාසපිණ්ඩ ජාතකයෙහි අර්ථ කිවාක්මෙන් ගාථා වෙහි අර්ථ කියන්නාහූ අධිරාත්‍රියෙහි රැකි පෙහෙවස් ආනුභාවයෙන් මේ සා මහත් සම්පතක් ලදිමි මාගේ යාලුවූ අර්ධමාස රජ්ජුරුවෝත් තපසට ගියාහුය. මා ගිහිගෙයි සිටියෙමියි මේ ගාථාවෙහි අර්ථයයි කීහ. ඒ ගංගාමාල නාවිසයා එපවත් අසා හිමාල වනයට ගොස් ඍෂි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව විදර්ශනා වඩා සකලක්ලේශයන් නසා පසේ බුදුවූ සේක. පසේ බුදුව බරණැස් නුවර උයනට ආවාහ. රජ්ජුරුවෝත් ගගාමාලනම් පසේ බුදුන් වහන්සේ උයනට වැඩිසේකැයි අසා මහා සේනාව හා සමග උයනට ගියාහ. රජ්ජුරුවන්ගේ මෑනියෝත් උයනට ගියාහ. ගංගාමාල නම් පසේ බුදුන් වහන්සේ බ්‍රහ්මදත්තයෙනි සැපසේ උනුදැයි විචාරා වදාළ සේක. රජ්ජුරුවන්ගේ මෑනියෝ ඇයි ගගාමාලය තොපි පසේ බුදුව ගියයි ජාතිය පලාගියේද මාගේ දරුවන්ට බ්‍රහ්මදත්තයයි කියන්නේ තෝ තාගේ විචර නොදනිදැයි බිසව් කියාකීහ. රජ්ජුරුවෝ එලෙස නොකිව මැනව මෑනියන් වහන්ස උන් වහන්සේ සියලු කෙලෙසුන් නසා පසේ බුදුවගිය සේක. උන්වහන්සේට ජාතියෙන් කම්කිම්දැයි මෑනියන් අස්වැසූහ. සේනාවත් එලෙස දොඩන්ට වන්හ. රජ්ජුරුවෝ සේනාවත් අස්වසා තුමූ පසේ බුදුන් වහන්සේට වැඳ වැතිරගියාහ. රජ්ජුරුවන් ඇතුලුවූ සියල්ලවුන්ම පසේ බුදුන් වැඳ එකත්පස්ව සිටියාහ. එවිට රජ්ජුරුවෝත් ස්වාමීනි මාගේ මෑනියන් වහන්සේත් නුවර වාසීනුත් නොදන කී දෝෂයට ක්‍ෂමා කළ මැනවැයි ක්‍ෂමා කරවාගත්හ. රජ්ජුරුවෝත් පසේ බුදුන් වහන්සේත් රජ්ජුරුවන්ට අවවාද කියා නන්දමූලක පබ්භාරයට වැඩිසේකැයි වදාරා මේ ගංගා මාල ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි උදය රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයයි වදාළ සේක.

SANHIDA LANKA

# චේතිය ජාතකය

තවද විතාරාගී වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේ පොළොව ගිළුෑ කථාව අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

ධම්සභාවේ රැස්වූ මාළු වරුන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන් පොලොව පලාගෙණ නරකයට ගියේයයි කිය කියා වැඩ උන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහනෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදූයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි පෙරත් දේවදත්ත ස්ථවිරයන් පොලව පලාගෙන නරකයට ගියේයයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යට ප්‍රථම කල්පයෙහි මහා සම්මතය, රොජය, වරරෝජය, කල්‍යාණය, වරකල්‍යාණිය, උ෧පොසථය, මන්ධාතුය, වරමන්ධාතුය, චරය, උපචරයයියන රජ දරුවෝ දස දෙනෙක් වූහ. ඉන් උපචරනම් රජ්ජුරුවන්ගේ පුත් චෙතිය නම් රජෙක් චේතිය රට සොත්තිය නම් නුවර රාජ්‍යය කරන්නේය. ඒ රජ්හුගේ කපිල නම් පුරෝහිත බ්‍රාහ්මණයක් ඇත. ඒ පුරෝහිත බ්‍රහ්මණ මම වෘද්ධයෙමි රජ්ජුරුවෙනි දිවපැන යානොහෙම් මට මින් කම්නැතැයි තුමූ පැවිදිව පඤ්ච, හිඤ්ඤා අෂ්ට සමාපත්ති උපදවා උයනෙහි තාපසව වාසය කරන්නාහ, තමන්ගේ පුරෝහිත ධුරය අනික් කෙනෙකුන්ට නොසලස්වා තමන්ගේ පුතනුවන්ටම භාරකොට තපසට ගියාහ. කපිල තාපසයන්ගේ කොරකළඹ නම් මලනු කෙනෙක් ඇත. රජ්ජුරුවන් හා කොරකලඹයන් හා බලදා පටන් පුරුද්දාහ රජ්ජුරුවෝත් කොරකලඹයාට කියන්නේ ඇයි තොපගේ බෑනන් වහන්සේ සිටි පුරෝහිත ධුරයට තොපි සිටුවයි කීහ. එවිට කොරකළඹයෝ අපගේ බෑනන් වහන්සේ තාපසවූ පමණක් විනා තමන් වහන්සේ ධුරයට නොසැලැස්වූ සේක. ඉන් උන් වහන්සේ සැලසුවොත්විනා ධුරයට සිටින්නේ කෙසේදැයි කිහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ තොපි මම්වැඩි මාළු කෙරෙමි තොපගේ බෑනන් තොපට බාල කෙරෙමි කීහ. එවිට කොරකළඹයෝ කියන්නාහූ ස්වාමිනි උන් වහන්සේ ප්‍රයෝග දන්නා සේක. නුඹ වහන්සේට ආකාශයෙන් වැටෙන්නාසේ දක්වන සේක. පොලොව ගලන්නාසේ දක්වන සේක. ඊට භය නොගෙණ තරයේ සිටිනාසේක් නම් යහපතැයි කීහ. එවිට රජ්ජුරුවෝ කවර විෂ්මයෙක් පැවෝතිනුත් තරයේ සිටිමි සැකයක් නොසිතවයි කීහ. ඒ කවර දවස්ද කියන්නේයයි විචාළේය. අදට සත්වෙනි දවස්යයි කීහ. මේ කථාව නුවර මුළුල්ලේ සැලව අපගේ රජ්ජුරුවන් වහන්සේ අදට සත්වෙනි දවස් බොරුවක් කියන සේකල, බොරු නම් උල්ද වටද සතරැස්ද නිල්ද සුදුදූයි කියා නුවර වාසී මැසි පිට මැසි ලමින් ඒ ඒ තැන රැස්වූහ. තාපසයන්ගේ පුතනුවෝත් තාපසයන් ලඟට ගොස් සෙට රජ්ජුරුවන් වහන්සේ බොරු කියනසේකැයි පියානන් වහන්සේට කීහ. උන් වහන්සේත් උයනින් අවුත් ආකාශයේ වැඩ සිටිසේක. රජ්ජුරුවෝත් සර්වාභරණයෙන් සැරසී ආකාශයෙහි සිටියාහ, තාපසොය් කියන්නාහූ මහරජ බොරු කිකල සතරදිග රැකගෙණ සිටිනා දෙවියෝ පලා යන්නාහ, මෙලෝ පරලෝ දෙකින්ම අවැඩ පැමිණෙන්නේය, එසේ හෙයින් බොරු නොකියව මැනැවයි කීහ. තාපසයන් එසේ කීවත් රජ්ජුරුවෝ නුඹ වහන්සේ බාලසේක. කොරලඹයෝ වැඩි මහළුයයි කීහ. එවිට සතර දිග රැකවල්ගෙණ සිටි දෙවියෝ සතරදෙන තමන් අත තුබූ කඩු සතර රජ්ජුරුවෙන් පාපිට දමා පළාගියාහ. රජ්ජුරුවෝ ඒ දැක භයපත්ව කොරකලඹයන් මූන බැළුෑහ. එවිට කොරකලඹයා කියන්නේ ආදිමකියම්වේද නුඹ වහන්සේ භය ගන්නා නියායෙනැයි කීහ. එවිට රජ්ජුරුවෝ තාපසයන්ට කියන්නාහූ තාපස යන් වහන්ස නුඹ වහන්සේ බාල සේක,කොරලකළඹයා වැඩිමාළුයයි කීහ. එවිට තාපසයෝ කියන්නාහූ මහරජ එකවිට කී බොරුවෙන් රැකවල සිටි දෙවියන් පලා ගිය නියාව දුටුවාවේද දෙවැනි බොරුවෙන් බිම වැටීහුනුව මුඛයෙන් හමන මහනෙල්මල් සුවඳ නැතිව දුර්ගන්ධහමන්ට වන, සඳුන් සුවඳ හමන්නාවූ ශරීරයෙන් අසුචිගන්ධ හමන්නට වන, මේ දැකත් තොපට ප්‍රත්‍යක්ෂ නොවේද පළමුසේම සැබෑවයෙහි සිටුව, බොරු කියා අවිචියට නොයවයි කීහ. ඒ අසා රජ්ජුෑවෝ කොරලකළඹයන් මුනබැළුෑහ, කොරකළඹයා කියන්නේ නොබව මැනව රජ්ජුරුවන් වහන්ස මේ මායමැයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ තාපසයන් වහන්ස නුඹ වහන්සේ බාලයා සේක කෝරකළඹයා වැඩිමාළු යයි කීහ. එවිට රජ්ජුරුවන්ගේ දන දක්වා පොලොව ගැලපිය. එවිට තාපසයෝ කියන්නාහූ මහරජ පළමුසේ සැබෑවයෙහි පිහිටා තොපගේ අභිවෘද්ධිය පළමුසේම වන්නේයයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ මහ තාපසයන් වහන්සේ බාලසේක. කොරලළඹයා වැඩි මාළුයයි කීහ. එවිට උකුල දක්වා පොලොව ගැලපීය. එවිට තාපසයෝ කියන්නාහූ මහරජ බෙරුකීම නම් මෙලෝ පරලෝ දෙකින්ම අවැඩ සැලසෙන්නේය. බොරු කියන තැනැත්තවුට දරුවෝ ඇතිනොවෙන්නාහ. ඉදින් ඇතිවෙත්නම් ගැණු දරුවෝ ඇතිවන්නාහ. ඉදින් පිරිමි පුතෙක් ඇතිවී නමුත් නොකිකරුවන්නාහ. බොරු කියන තැනැත්තවුගේ මුඛයෙන් උපනුපන් ජාතියෙහි දුගී දුර්ගන්ධ වැහෙන්නේය. බැළුෑවන්ටා අනිහිප්‍රායවන්නේය. මහරජ සැබැවයෙහි පිහිටා පෙරසේම රාජ්‍ය

SANHIDA LANKA

ශ්‍රීයෙහි පිහිටිය මැනවැයි කීහ. එවිට රජ්ජුරුවෝ මේ තාපසයන්ගේ සෘර්ධියෙන්ම වන දෙයැකැයි සිතා කියන්නාහු තාපසයන් වහන්ස කොරකළඹයා වැඩි මාළුය. නුඹ වහන්සේ බාලයයි කීහ. එවිට තනමත්ත දක්වා ගැලපීය. එවිට තාපසයෝ කියන්නාහූ මහරජ බොරු කියා අවීචිනරකයට නොගොස් සැබෑවයෙහි පිහිටා නුඹ වහන්සේ ඓශ්වර්යයෙන් නොපිරිහී පළමු රාජ්‍යශ්‍රිය වින්ද මැනවැයි කීහ. එපවත් රජ්ජුරුවෝ කියන්නාහූ නුඹ වහන්සේ බාලයයි යන බසම කීහ. එවිට සෙනෙහැති මවක පුතකු රත්පලසකින් වසාගෙණ යන කලක් පරිද්දෙන් අවිචිමහනරකයෙන් ගිණිකදෙක් අවුත් රජ්ජුරුවන් වටකොටගෙණ අවිචිනරකයට ඇරගෙණ ගියේය. ඒ රජ්ජුරුවන්ගේ රාජකුමාරවරු පස්දෙනෙක් ඇත්තාහුය. ඒ පස්දෙනම එතනට ආවාහුය. ඒ තාපසයෝ රාජකුමාරය්නට කියන්නාහූ තොපි ඇම මේ නුවර නොයිදුවයි කියා වැඩිමාළු රාජ කුමාරයන්ට කියන්නාහූ මේ දිසාවට ගිය කල්හි අසවල් තැන ඇත්රුවෙක් ඇත. එතන නුවරක්කොටගෙණ ඉඳුවයි කීහ. එහි වනාහී හස්තිපුර නම් වෙයි දෙවැනි  රාජකුමාරයන්ට කියන්නාහූ මේ දිසාවෙහි ගියකල අස්රුවෙක් ඇත. එතන නුවරක් කොටගෙණ ඉඳුවයි කීහ. ඒ වනාහී අශ්වපුරය නම් වෙයි තුන්වෙනි කුමාරයන්ට කියන්නාහූ මේ දිසාවේ අසවල් තැන සිංහ රුවෙක් ඇත. තොපි එතන නුවරක් කරගෙණ ඉඳුවයි කීහ. ඒ වනාහී සිංහපුර නම් වේය.සතරවෙනි කුමාරයන්ට කියන්නාහූ අසවල් තැන පර්වත දෙකක් ඇත. ඒ පර්වතයෙන් වැටෙන්නාවූ ජලධාරා දධ දධයයි වැගිරෙන්නේය. තොපි ඒ ස්ථානයෙහි නුවරක් කොටගෙණ ඉඳුවයි කීහ. ඒ නුවර දද්ධරනම් නුවරවෙයි, පස්වෙනි කුමාරයන්ට කියන්නාහූ තොපි මේ නුවර පස්කොටා කන්දක් කොට පවුරු ලවා මාලිකා ඉදිකොට වසවයි කීයා යවුහ. කුමාරයෝ පස්දෙනත් තාපසයන් කී සැටියෙන් ඒ ඒ තැන නුවරකොට ගෙණ දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ චේතිය ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි චේතිය රජ්ජුරුවෝ නම් දේවදත්ත ස්ථවිරයෝය. කපිල තාපසයෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# ඉන්ද්‍රිය ජාතකය

තවද විතදෝෂවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳසිත් ඇති කෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙස්ද යත්

එක් කෙළෙඹි පුත්‍රයෙක් ඉතා වෘද්ධ අවස්ථාවෙහි මහණ වෙමියි සර්වඥයන් වහන්සේ කරා ගොස් මහණවන අභිප්‍රා ඇත්තෙමියි කියා, සර්වඥයන් වහන්සේත් තුළු මහණකරවයි එක්කෙණකුන් වහන්සේට භාරකළසේක. උන් වහන්සේත් ඒ කෙළඹි පුත්‍රයා මහණකළසේක. ඒ මහණ භික්ෂූන් වහන්සේ හා සමග දන් වළඳන්ට ගියකල සෙසු භික්ෂූන් වහන්සේට යහපත් අසුන් පණවන්නාහ. මේ භික්ෂූන් වහන්සේට එකව්වර කොළොඹුවක් හා පුටුවක් ලන්නාහ. කැඳ පිළිගන්වනකළ සැන්දෙන් උළුගැටිගිය සැලිපත්ලේ තිබූ කැඳ වත් කරන්නාහ. අවුළුපත් පිළිගන්වන කලත් කැඩිකැඩිගිය පොඩි පිළිගන්වන්නාහ. බත් පිළිගන්වන කළ දඹකඩ මඩුබත් දෙන්නාහ, එයින් යපෙන විවරට නොලබන්නාහ, මෙසේ විඳ තමන්ගේ පුරාණ දුතිකාව වසන්නාවූ ගෙට යන්නාහ. ඒ දුතිකාවන් පාත්‍රය බලා යහපත් බත් මාළු පිස වළඳවන්නිය. ඒ මහණත් දවස් පතා ආසාව පිස වළඳවන බතෙහි ආසාත්‍රිෂ්ණවෙන් නිරන්තරම ඒ ගෙට සිගා එන සේක. ඒ ස්ත්‍රී මුන්වහන්සේ මා කෙරේ ඉතකම් ඇතිසේක්දෝහොයි පරීක්ෂා කරන්නට උවමැනවයි පුරුෂයන් සතරදෙනෙකුට අමුබතක් දෙමි උන් ඇමත් ගෙයි රඳවා තොමෝ පිසනගෙයි වට තිරයක් බඳවා කැවුම් පිසින්නීය. ඒ වෙලාවට ඒ භික්ෂූන්වහන්සේ සිගාවැඩිසේක. උන් වහන්සේට ආරුණු කීහ. උන් අරුණු කීවත් නොයනසේකැයි කීහ. දෙවෙනිවත් තුන්වෙනිවත් අරුණු කිවත් නොයනහෙයින් නොදන්නා කෙනෙක් මෙන් තිරය ඉවත් කොට එළියට අවුත් අපගේ දරුවන්ගේ පියානන් වහන්සෙයයි කියා ගෙට වඩාගෙණවුත් උන් වහන්සේ වඩා ඉඳුවා දන්වළඳවා කියන්නාහු නුඹ වහන්සේ මහණව ගිය සේක. ස්ත්‍රී නම් කණවැන්දඹුව ඉඳිනා කල ඉතා ආළුසුව මා කැඳවා පිරිසරින් ආවාවූ පුරුෂයෝ මූ ඇම සිටිනෝය. නුඹ වහන්සේ දහවිටක් මාගේ ගෙට වඩිනාසේක. ඒසේ හෙයින් අන්පුරුෂයෙක් මෙතනට එන්ට නොසිතන්නාහ. මේ පුරුෂයන් හා සමගවම පිරිසරයෙමි නුඹ වහන්සේ ගිහිකල මා කී කළදෙයක් ඇත්නම් ක්‍ෂමා කළ මැනැවැයි නුඹ වහන්සේ රකිණා ශිලය යහපත් කොට රක්ක මැනව. මම පිරිසර යෙමි . එවිට භික්සූන් වහන්සේ එබස් අසා ලෙන් ඇනිගිය හීයක් මෙන් මහත්වූ ශෝකයට පැමිණ මම තොප ඇර වාසය කළනොහෙමි මේ මාගේ තුන්සිවුරු පාත්‍රා ගුරුන් වහන්සේට දෙන්ට යෙමි මම අසවල් තෙනදී සිවුරු අරිමි. එතනට පිළිසගලක් එවයි කියා ගුරුන් වහන්සේට පාත්‍රා සිවුරු අරක්ගන්නට කීසේක. ගුරුන්වහන්සේ ඇයි කුමක්නිසාදැයි විචාළ සේක. ඒ භික්‍ෂුන් වහන්සේ කියන සේක් මම මාගේ පුරාණ දුතිකාව ඇර වාසය කළ නොහෙමි. මට ශාසනයෙන් ප්‍රයෝජන නැත. සිවුරු අරමි කීහ. එවිට උන් වහන්සේටත් ගුරුන් වහන්සේ උන් වහන්සේ නොකැමැති කරවාම සර්වඥයන්වහන්සේට දැක්වූ සේක. සර්වඥයන් වහන්සේ ඇයි මේ මහණුහු නොකැමැති කරවා අපට පෑයේ ඇයිදැයි විචාළ කල්හි ස්වාමිනි මේ මහණ තමාගේ පූරාණ දුතිකා කෙරේ අභිලාෂයෙන් සිවුරු අරිමියි කීහයි වදාළසේක. සර්වඥයන් වහන්සේ දැන්මතු නොවෙයි පෙරත් මේ මහණ මේ ස්ත්‍රිය නිසා ධ්‍යානයෙන් පිරිහී ප්‍රාණ විනාශ ට පැමිණ තෙනැත්තවුන්ට ප්‍රාණ රැකදුනුමෝ වේදැයි වදරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්‍ජ්‍ය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන් වහන්සේ ගේ පුරෝහිත බ්‍රාහ්මණයාට පුත්ව උපන්නාහ. උන් උපන් දවස් රාත්‍රියෙහි නුවර මුළුල්ලෙහි ආයුධ දිළිහී ගියේය. එසේ හෙයින් උන්ට නම් තබන්නාහු ජෝතිපාල කුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරයන් වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් ශිල්ප ඉගෙණ රජ්ජුරුවන්ට ශිල්ප දක්වා පුරෝහිත ධූරයට පැමිණ මට ගිහිගෙයින් කාරිය නැත තපසට යෙමි උතුරුවාසල් දොරකඩට නික්ම ගිවුළුවනයට ගොස් ඍෂිප්‍රවජ්‍යාවෙන් පැවිදිව ජෝතිපාල තාපසෝ යයි මේ නමින් ප්‍රසිද්ධ පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා වාසය කරන්නාහු බොහෝ දහස් ගණන් තාපස වරුන් පිරිවරා ඉන්නාහ. උන්ගේ අතවැසි ශ්‍රේෂ්ඨවූ තාපසවරුන් සදෙනෙක් ඇත්තාහ. ඉන් සාලිස්සර නම් තාපසයෝ තමන් වසන්නාවූ ගිවුළුවනයෙන් නික්ම සුරංධතිය නම් ජනපදයෙහි සාදෝ දිකා නම් ගංගාව සමීපයෙහි සිය දහස් ගණන් තාපසයන් පිරිවරා වාසය කරන්නාහ. දෙවැනි මෙණ්ඩිස්සර නම් තාපසොය් පජ්ජරක්ඛ රජ්ජුරුවන්ගේ විජිතයෙහි ලා මුබවුල්කනම් නියම්ගම නිසා සියදහස් ගණන් තාපසවරුන් පිරිවරා වාසය කරන්නාහ. ඉන් පර්වත නම් තාපසොය් වනාන්තරයක ජනපදයක් නිසා සියදහස් ගණනි තාපසවරුන් පිරිවරා වසන්නාහ. කාලදේවල තපස්වීන් වහන්සේ අවන්ති නම් රට දක්ෂිණාපථයෙහි සියදහස් ගණන් තාපසවරුන් පිරිවරා වාසය කරන්නාහ. කිස වච්ඡ නම් තාපසොය්

SANHIDA LANKA

දණ්ඩකිනම් රජ්ජුරුවන්ගේ කුම්භවතී නම් නුවර නිසා උයනෙහි එකාලව වාසය කරන්නාහ. අනුශිෂ්‍යනම් තාසයෝ බෝධිසත්වයන්ට උපස්ථායකට සමීපයෙහි වාසය කරන්නාහ. කාලදේවල තාපසයන්ගේ ලේවූ නාරදනම් තපස්වී මධ්‍යදේශයෙහි ආරඤ්ඤගිරි නම් පර්වතවනාන්තරයකි. එක් ගල්ගුහාවෙක උදාකලව්වාසය කරන්නාහ. ආරජගිරි නම් පර්වත සමීපයෙහි බොහෝ මනුෂ්‍යයෙන් ගැවසී ගත්තාවූ එක් නිය ගමෙක් ඇත. ඒ පර්වතයටත් ගමටත් අතුරෙහි එක් ගංගාවක් ඇත. ඒ ගංගාවට ජලස්නානය පිණිස බොහෝ මනුෂ්‍යයෝ බස්නාහ, උතුම් රූ ඇති සටවෙටිකාවොත් පුරුෂයන් පොළොඹවමින් ඒ ගංතෙර ඉඳිනාහ. එකල නාරද නම් තාපසයෝ ඉන් එක් කුම්භදාසියක් දැක ඈ කෙරේ පිළිබඳ වූ සිත් ඇතිව ධ්‍යානයෙන් පිරිහී නිරාහාරව වීරිය කෙරෙමින් ක්ලේශ වසඟයට පැමිණ සතියක් වැදහොත්තාහ. එකල ඒ තාපසයන්ගේ කාලදේවල නම් තාපසයෝ දිවසින් පරීක්ෂා කොට ඒ ඒකාරණය දැන ආකාශයෙන් අවුත් නාරද නම් තාපසයන් උන් ගල්ලෙනට වන්නාහ. නාරද නම් තාපසොය් බැනන් දැක පින්වාතානන් වහන්ස කුමක් පිණිස ආසේක්දැයි කීහ. එබසට කාලදේවල තාපසයෝ කියන්නාහූ පින්වත්වූ තොප අනාථනියාව දැක තොප රක්නා පිණිස ආමි කීහ. එබසට නාරද තාපස තෙම පින්වත් තෙම සිස්වූ අවස්තුකවූ බොරුව කියන්නේය. තුමූ බොරු වෙන් තාපසයන් තැතිගැන්හූහ. එසේ ද වූවත් කාලදේවල තාපසයෝ මොහු ඇරපීම නොවටනේයයි සාලිස්සරනම් තාපසයන්ද මෙණ්ඩිස්සර නම් තාපසයන්ද පර්වතතිස්ස නම් තාපසයන්ද යන තාපසවරුන් ද මෙණ්ඩිස්සර නම් තාපස යන්ද පර්වත තිස්ස නම් තාපසයන් ද යන තාපසවරුන් තුන්දෙනා ගෙන්වූහ. නාරද තාපස තෙම ඔවුන් තුන්දෙනා දැකත් මුසාවාදයෙන් තැතිගැන්වූයේය. තවද කාලදේවල තාපසයෝ ආකාශයෙන් ගොස් සරභංගසතානන් වහන්සේ කැඳවාගෙණ ආහ. උන් වහන්සේ නාරද නම් තාපසයන් දැක උන් ඉන්ද්‍රිය වසඟයට පැමිණියා දැන ඉන්ද්‍රිය වසඟයට පැමිණියෙහිදැයි විචාරා ඔහු විසින් එබස් අසමින් හුනස්නෙන් නැගී වැඳ ස්වාමිනිදැන්වූ කල්හි එම්බල නාරදය ඉන්ද්‍රිය වසඟයට ගියාවූ සත්වයෝ ඒ ආත්ම භාවයෙහිම වියලෙමින් මතුමත්තෙහි මහත්වූ දුක් අනුභව කොට දෙවැනි ආත්මභාවයෙහි ම වියලෙමින් මතු මත්තෙහි මහත්වූ  දුක් අනුභව කොට දෙවැනි ආත්මභාවයෙහි නරකයෙහි උපදනේ වේදැයි වදාරා ධර්මදේශනා කරන්නාහූ එම්බල නාරදය මේ ලෝකයෙහි යම් පුරුෂයෙක් තෙම රූපාදියෙහි සුභවූ සෝකයෙන් දුකට පැමිණෙන්නාහයි ධර්මදේශනා කළ සේක. එබස් අසා නාරදතාපසයෝ ආචාරීන් වහන්ස කාමයෙහි යෙදීම නස් සැපවන්නේය. එබඳුවූ සැපයක් කුමක් පිණිස දුකැයි කියනසේක්දැයි විචාළාහ. සාරංගශාස්තෘන් වහන්සේ එසේ වීනම් නරදයෙනි අසවයි කියන්නාහූ එම්බා නාරදයෙනි මේ ලෝකයෙහි සැපයට අනතුරුවූ දුකකුත් ඇත. දුකට අනතුරු වූ සැපයකුත් ඇත. ඒ කවරේදැයි යතහොත් යම් සත්වයයෙක් ස්වල්පවූ කාම සැපය පිණිස නරකයෙහි උපදනේය. සමහර සත්වයෙක් ශිල්රක්ෂාකරණ අවස්ථාවෙහි විදර්ශනා කර්මස්ථාන වැඩීමෙන් මිරිකී දුක්විඳ සිල් රක්ෂාකොට ඒ ශිල බලයෙන් යට කියන ලද බොහෝ දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිර්වාන සැපයට පැමිණෙන්නාහ. එසේ හෙයින් තොපි දුක්බමූලික වූ කාමසැපය හැර දිව්‍යලෝක සම්පත් හා නිර්වාණ සැපයට පැමිණෙන්නට නිසිවූ සිල් රක්ෂාකොට ධ්‍යාන සැප ප්‍රාර්ථනා කරවයි කීහ. එවිට නාරද තාපසෝ කියන්නාහූ ආචාරීන් වහන්ස මේ දුක්බය ඉතා සහනයකොටගත නොහැක්කේය. එසේ හෙයින් මම සහනයකලනොහෙම් කීහ. ඉක්බිති බෝධිසත්වයෝ කියන්නාහූ නාරදෙයෙනි දුකක් නම් උපන් කල ඉවසිය යුතුයයි ධර්මදේශනා කරන්නාහූ මෙසේ කියත්, එඹා නාරදයෙනි යම් සත්වයෙක් තෙම කායිකවූද චෛතිසික වූධ දුකැයි කියන ලද කටයුත්තක් උපන් කල්හි අප්‍රමාදවම ඒ කටයුත්ත හරණ වූ උපායකන්නේය. සහානසීලීවූ ඒ කටයුත්තට අනුව නොපැවත ඒ ඒ උපායෙන් ඒ කටයුත්ත මැඩ විනාශයට පමුණුවා නුවණැත්තාවූ පුරුෂයා ආකෘත්‍යයාගේ අන්තිමයයි කියන ලද ධ්‍යාන සැපයට පැමිණෙන්නේය. එසේ පැමිණෙතත් නොමිරිකී පැමිණෙන්නේයයි කීහ. නැවත නාරදතපසයෝ ආචාරීන් වහන්ස කාමසැපය නම් උතුම් වූ සැපයෙක එසේ වූ සැපය මම අල නොහෙම් කීහ. නැවත බෝධිසත්වයෝ කියන්නාහූ එම්බා නාරද තාපසයෙනි වස්තුකාමයෙහි ප්‍රාර්ථනා පිණිස ධර්ම හැරපීම සුදුසු නොවන්නේය. යම් අනර්ථයෙක් උපන් කල්හි ඒ අනර්ථය වලකනු කැමැත්තේ අවැඩට සිටියාවූ ධර්ම ඇරපීම සුදුසු වන්නේය. තවද අසවල්  අනර්ථයෙක් මට උපනේයයි මෙසේ අනර්ථය පිණිසත් සුදුසු නොවන්නේයයි ව්‍යායාම කිරීමෙන් මුදුන් පැමිණෙන ලද ධ්‍යාන සැපය ඇරපීම නසාපීම සුදුසු නොවන්නේය. යනාදීන් මෙසේ සරභංග ශාස්තෘන් විසින් ගාථා සතරකින් ධර්මදේශනා කල කල්හි කාලදේවල තාපසයෝත් තමන්ගේ මලනුවන්ට අවවාද කරන්නාහු එම්බා නාරදයෙනි, යම් ගෘහපතියෙක් කෘෂිවනික් ආදීවූ වස්තු උපදවන පිණිස යම් දුකක් ගන්නේ වීනම් ඔහු විසින් ගන්නාවූ දුක දුකෙක් නොවන්නේය.යහපත්ම වන්නේය. එසේම උපයාගත්තාවූ වස්තුව ශ්‍රමණ බ්‍රාහ්මණපුත්‍රකලත්‍ර මිත්‍රාදීන්ට සංවිභාගකොට පරිත්‍යාග කිරීම දුක් නොවන්නේය. යහපතක්ම වන්නේය. එසේවූ වස්තු ලැබීමෙහි උඩගු නොවීමත් යහපත් වන්නේය. ඒසේවූ අර්ථයාගේ විපත්තියෙහි සෝක නොකිරීමටත් යහපත් වන්නේය. එසේ හෙයින් නාරදතාපසයෙනි තොපි මාගේ ධ්‍යාන පිරිහුනේයයි සෝක නොකරවය, ඉදින් තොප ඉන්ද්‍රිය වසඟයට නොගියා නම් නටුවාවූ තොපගේ ධ්‍යානය නැවතත් පෘකෘතිවන්නේයයි කීහ. මෙසේ කාලදේවල තාපසයෝ නාරද තාපසයන්ට අවවාද කී නියාව තථාගතවූ සර්වඥයන් වහන්සේ බුදුව වැඩ ඉඳ වදාරණසේක්

SANHIDA LANKA

එම්බා මහණෙනි ඒ කාලදේවල තාපසතෙම මෙසේ මේ මහණ අවවාදයක් කිද යම් සත්වයෙක් තෙමේ ඒ අවවාදය පිළිනොගෙණ ඉන්ද්‍රියන්ගේ වසඟයට පැමිණියේ වීනම් ඒ සත්වයාට වඩනාවූ ලාමක සත්වයෙක් නැත්තේ වේදැයි වදාළසේක. ඉක්බිති සරහන ශාස්තෘන් වහන්සේ වදාරණ සේක් මෙසේ එව නාරද තාපසයෙනි මා කියන්නක් අසව යම් සත්වයෙක් තෙමේ පළමුව කළමනා කටයුත්තක් නොකෙරේද එසේවූ සත්වතෙම වල්වන්නාවූ මානවක යක්හූ මෙන් ශෝක ගන්නේය. අඬන්නේය. විලපින්නේය යයි කියා, මින් තවද පෙරවුවක් කියන්නාහූ එම්බා යටගිය දවස කසීනම් නියම් ගමෙක තරුණ වූ එක් බ්‍රාහ්මණ කුමාරයෙක් විශිෂ්ටවූ රූ ඇත්තේය. ඇත්බල ඇත්තෝය. එක් දවසක් ඒ පුරුෂතෙම සිතන්නේ කිමෙක්ද මා විසින් සී සෑම ආදී කොට දෙමව් පියන් විසින් පෙළෙන ලද්දෙමි, එසේ හෙයින් මට දෙමව්පියන්ගෙනුත් ප්‍රයෝජන කිම්ද පුත්‍රදාරාවන් ගෙනුත් මට ප්‍රයෝජන කිම්ද, දන් පින් කිරීමෙනුත් මට ප්‍රයෝජන කිම්ද, එසේ හෙයින් කිසිකෙණෙකුන් පොෂ්‍යයක් නොකොට පිණකුත් නොකොට වලට වැද මුවන් මරා කාගෙණ හිමාලය මධ්‍යයෙහි වැන්දඹු නම් ගංතෙර ගලින් වටකරන ලද පර්වත ජාලාවකට පැමිණ මුවන් මරා අගුරෙහි පැළවූ මස් කමින් වාසය කරමින් එක් දවසක් සිතන්නේ ඇමදා ශක්තිසම්පන්නයෙමි නොවෙමි. දුර්වල කාලයෙහි ඇවිදගත නොහෙමි, එසේ හෙයින් දැන්ම නොයෙක් මෘග ජාතින් මරා ඇරගෙණ පර්වත ජාගයෙහි ඇතුළෙහිලා දොරක් ඉදිකොට අගුළු ලා මුවන් මරවාගෙණ වනයෙහි නොඇවිදම අභිප්‍රාය වූ පරිද්දෙන් මෘග ජාතින් මරාකම් සිතා එපරිද්දෙන්ම වාසය කරමින් කල්‍යාමකින් ඔහු විසින් කරන ලද අකුශල කර්මය මුදුන් පැමිණෙන්නේය. ඉහජාතියෙහිම දෘෂ්ටධර්ම වේද්‍යයෙහි පැමිණියේය. තමාගේ අතපයත් නොලද්දේය. ඇතින් මෑත පෙරලී ගතත් නොහෙන්නේය. කිසි කෑමක් පීමක් වේවායි නොදන්නේය. ශරීරය ඉතා මළානික වූ දුර්වල වූයේය. නොමියම් මනුධ්‍ය ප්‍රේතවූයේය. නියගෙහි පොළොව පැළෙන්නාක් මෙන් ඔහුගේ ශරීරය ඒ ඒ තැනින් පැලී ඉරා වැටුනේය. මෙසේ කල්‍යාමකින් සිවිනම් රට සිවිනම් රජ්ජුරු කෙණෙකුන් වලට වැද අඟුරු පැලහූ මිස්කම් කියා අමාත්‍යයන්ට රාජ්‍යය පාවාදී පංචායුධ සන්නද්ධ වලට වැද මුවන් මරා මස්පහා කමින් පර්වත ජාලන්තරයට පැමිණ ඒ පුරුෂයා දක හයින් ත්‍රස්තව ධෛර්ය උපදවාගෙන එම්බල පුරුෂය තෝ කවරෙක්දැයි විචාළාහ. ඒ කියන්නේ ස්වාමිනි මම මනුෂ්‍යප්‍රෙතයෙකිම. මා විසින් කරණ ලද අකුශල කර්මයාගේ විපාකය ඉහාත්මභාවයෙහිම අනුභව කෙරෙමි. තොපි වනාහී කවුරුන්දැයි විචාළේය. රජ්ජුරුවෝ මම සිවිනම් රජ්ජුරුවෝයයි කීහ. නැවත ඒ පුරුෂයා එසේකල කුමක් පිණිස මේ ස්ථානයට අව්දැයි විචාළෝය. මුවන් මස් කණ පිණිස ආම්හයි කීහ. නැවත ඒ පුරුෂ තෙම කියන්නේ රජ්ජුරුවෙනි මමත් ඒ කරණ කොටගෙණ මේ ස්ථානයට අවුත් මනුෂ්‍ය ප්‍රේත වීම් යනාදීන් තමාගේ අද්‍යාන්ත රජ්ජුරුවන්ට විස්තර වශයෙන් කියන්නේ රජ්ජුරුවන් වහන්ස. මම මේ ලොකයෙහි ඓශ්වර්ය දෙන්නාවූ කටයුතු කොට ශිල්ප ශාස්ත්‍ර නොයිගෙණ උපායෙන් වස්තු නුපදවා ආවාහ විහාහ කොට ශිල්රක්ෂා නොකොට මාගේ ක්‍රියා වලක්වන්ට සුදුසු වූ කල්‍යාණ මිත්‍රයන් භජනය නොකොට මෙසේ යස දායකවූ ලෝකධර්මයට නින්දාකොට හැර මේ වනයට වැඳ මට සැප කැමතිව අනුන්ට දුක්දීමෙන් ඉහාත්මභාවයෙහිම මනුෂ්‍ය ප්‍රේත වීම්, තොපි වනාහී අකුසල්නොකොට තොපගේ සියනුවරට ගොස් දානාදී කුසල් කරවයි කීයේය. රජ්ජුරුවෝ ඔහු කී බස් යහපතැයි ගිවිස සිය නුවරට ගොස් දානාදී ව කුසල් කොට සවර්ගයොත්පත්තියට ගියහයි යනාදීන් මේ කාරණය ගෙණ හැර දක්වා තාපසයන් සන්හිඳුවූහ. තාපසයෝ සැරංගශාස්තෘන් වහන්සේ කථාවෙන් සංවේගයට පැමිණ වැද ක්‍ෂමා කරවාගෙණ කිසිනුපිරියම් කොට නටුවාවූ ධ්‍යානය උපදවාගත්හ. සරංග ශාස්තෘන් වහන්සේ ඒ තාපයන් එතන රැදීය නොදී කැඳවාගෙණ තමන් වහන්සේගේ ආශ්‍රමයට වැඩිසේක. මෙසේ බුදු රජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා මේ ඉන්ද්‍රිය ජාතකය පූර්වාපර සන්ධි ගලපා නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර ශාසනයෙහි උකටලී වූ භික්ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටිසේක. එසමයෙහි නාරද තාපසයෝ නම් දැන් ම් ශාසනයෙහි උකටලී මහණය. එසමයෙහි කාලිස්සර තාපසයෝ නම් දැන් මේ ශාරීපුත්ත ස්ථවිරයෝය. එසමයෙහි පර්වත තාපසයෝ නම් දැන් මේ අනුරුද්ධ ස්ථවිරයෝය. එසමයෙහි කාලදේවල තාපසයෝ නම් දැන් මේ කත්‍යායන ස්ථවිරයෝය. එසමයෙහි අනුශිෂ්‍ය තාපසෝ නම් දැන් මේ ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි කිසවච්ඡ තාපසයෝ නම් දැන් මේ මෞද්ගල්‍යායාන ස්ථවිරයෝය. එසමයෙහි සරංග තාපසයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි වදාළසේකී.

SANHIDA LANKA

# ආදිත්ත ජාතකය

තවද ලෝකත්‍රයට ප්‍රදීපයක් බඳුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ අසදෘසදානයක් අරභයා මේ ජාතිකය දක්වන ලද.

මෙහි විස්තර වශයෙන් මහාගෝවින්ද ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහී කෝසල රජ්ජුරුවෝ කෂේත්‍රය දැනම දානය දුන්නාය. දැන් දුන් නියාව ඉතා යහපතැයි දම්සභාවේ රැස්වූ භික්ෂූන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි මහණෙනි පෙර උත්තමයෝත් කෂේත්‍රය දැනම දන්දුන්නෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර සිව්රට විරන්ද නම් නුවර හතර නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ සමුද්‍රවිජයානම් අග්‍රමෙහෙසිකා කෙණෙක් ඇත්තාහ. දන්දී එක් දවසක් බිසවුන් රජ්ජුරුවෝත් එකතැන ඉඳ කියන්නාහූ මෙතෙක් දෙන්නාවූ දානය නිසිතෙනකට දෙන්ට නොලඹම්හ. අප සිතට සමාධියක් නොවන්නේයයි කීහ. බිසව් කියන්නාහූ මම දැන් ඉදිකරවම් නුඹ වහන්සේ පසේ බුදුන් වහන්සේ වඩනා නියායෙන් ආරාධනා කළ මැනැවැයි කීහ. රජ්ජුරුවෝ කෙසේ ආරාධනා කෙරෙම්දැයි කීහ. මල් සතරමිටක් ඇර ගෙණ නැගෙණහිරට දමා ආරාධනා කළ මැනැවයි කීහ. ඒ දිග පස් බුදුන් වහන්සේ නැතිහෙයින් නොවැඩි සේක. පසුව දවස් දකුණු දිගට මල්දමා ආරාධනා කළහ. ඒ මල් නන්ද මූල දිගත් පසේ බුදුන් වහන්සේ නැති හෙයින් නොවැඩිසේක. තුන් වෙනි දවසුත් බස්නාහිට මල් දමා ආරාධනා කළහ. ඒ දිග පසේබුදුන් වහන්ස් නැති හෙයින් නොවැඩිසේක. සතරවෙනි දවස උතුරු දිගට මල් සතරමිටක් දමා ආරාධනා කළාහ. ඒ මල් නන්දමූල පබ්භාරයට ගොස් පන්සියයක් පසේ බුදුන් වහන්සේ වඩනා තැනට ගොස් වැගිරින. පසේ බුදුන් වහන්සේ මේ කාරණය දැක දිවසින් බලා හරත රජ්ජුරුවෝ අපට ආරාධනා කරන්නාහයි කීයා පසේ බුදුන් සතරදෙනෙකුන් වහන්සේ තොරා හරත රජ්ජුරුවන්ගේ ආරාධනාවට ගොස් සිඟවයි යවුසේක. උන් වහන්සේලා සත්දෙනා වහන්සේත් ගැටවුගන්වා ආකාශයෙන් අවුත් රජ්ජුරුවන් ගේ රජගෙයි සමීපයෙහි සිඟා වැඩි සිටි සේක. රජ්ජුරුවොත් පසේ බුදුන් වහන්සේලා දැක ප්‍රීතියෙන් පිනා දන්දී පසුවදවසටත් ආරාධනා කොට ශ්‍රමණ පරීෂකාර ඉදිරියෙහි තිබූහ. උන් වහන්සේලාත් ශ්‍රමණ පරිෂ්කාර පිළිගෙන වඩනා පසේ බුදුවරයන් වහන්සේලාගෙන් පළමු වඩනා පසේ බුදුන් වහන්සේ රජ්ජුරුවන් වහන්සේට අනුමෙවැනි බණ වදාරණසේක් ගාථා දෙකක් කීසේක. මහරජ යම් ගෙයක් ගිණි වැදගත් කල ගෙයි තුබූ වස්තු ගින්නේ දැනහෙයින් වහ වහායෙන් පිටත ලද්ද එමෙන් ජරාමරණ තමාට පැමිණෙන්නාට පළමුව තමා සෙව්ව වස්තුව දානවිෂයෙහි පරිත්‍යාග කොට මහරජ දිව්‍යලෝක සම්පත්තිය විඳුවයි රජ්ජුරුවන්ට අවවාධ කොට තමන්වහන්සේට දුන් පිරිකරත් ඇරගෙණ කැණිමඩල පලාගෙණ ආකාශයට පැණනැගී නන්දමූලක පබ්බාරයට වැඩිසේක. දෙවැනිව වඩනා පසේ බුදුන් වහනසේ රජ්ජුරුවන්ට අනුමෙවැනි බණ වදාරණසේක්. මහරජ දන්දෙන්ට ශ්‍රමණබ්‍රහ්මණයන් ඇතිව වස්තුව දන්නොදී වෙතරණී සව්ර්ග මෝක්ෂ සම්පත් විඳුවයි රජ්ජුරුවන්ට අවවාද කියා ආකාශයට පැණනැගී පස්වනක් වලා මඩිමින් තමන් වහන්ස්ට දුන් පිරිකරගෙණ නන්දමූලක පබ්භාරයට වැඩිසේක. තුන්වැනිව වඩනා පසේ බුදුන් වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවැණි බණ වදාරණ සේක් මහරජ දන්දීමද යුද්ධකිරීමද සමාන වන්නේය. ඒ කවරහෙයින්ද යත් සෞරවීර්ය ඇති පුරුෂයෝ බොහෝ සතුරන් ජයගන්නේය. ස්වල්ප වූ පුරුෂයෝ බොහෝ මසුරු සිත් ජයගන්නේය. මහරජ එසේ හෙයින්ම දානාමානාදී බොහෝ පින්කම්කොට සවර්ගමෝක්ෂ සැප විඳුවයි රජ්ජුරුවන්ට අවවාද කොට තමන්වහන්සේට පිළිගැන්වූ පිරිකරත් ඇරගෙණ ආකාශයට පැණනැගී නන්දමූල පබ්භාරයට වැඩිසේක. සතරවෙනිව වඩනා පසේ බුදුන් වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවැනි බණ වදාරණ සේක් මහරජ යහපත් ගුණ ඇති ශ්‍රමණ බ්‍රහ්මණයන්ට දුන්නාවූ දානය පරලොවෙහි යහපත් විපාක දෙන්නේය. ඒ එසේමය. යහපත්වූ භූමියෙහි වපුලාවූ බිජුවට යහපත් සස්‍යඵලය දෙන්නේද එමෙන් යහපත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දුන්නාවූ දානයත් මහවිපාක දෙන්නේයයි රජ්ජුරුවන්ට අවවාද කියා තමන් වහන්සේට දුන් පිරිකරගෙණ ආකාශයට පැණනැගී නන්දමූල පබ්භාරයට වැඩිසේක. පස් වැනිව වඩනා පසේ බුදුන් වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවැනි බණ වදාරණ සේක් මහරජ උත්තමයන් සිටිනා තරම් පදමටත් තමන්ගේ ජාතිග්‍රෝත්‍රශයටත් නපුරුයි කියාත් පරලොව භයත් මෙලොව අප කීර්තිය නිසා පවු නොකරන්නාහ. සමහර කෙණෙක් එකෙකු මරාපුවයි එකෙක් අප නසාපියාද පව් නම් කුමක්ද පින් නම් කුමක්ද උදාර සිතින් පවුකරන්නාහ. මහරජ එලෙස පවුනොකොට පින්කම් කොට සැප විඳුවයි රජ්ජුරුවන්ට අවවාද කොට තමන් වහන්සේ අටපිරිකරගෙණ නන්දමූලක පබ්බාරයට වැඩිසේක. සවෙනිව වඩනා පසේ බුදුන් වහන්සේ රජ්ජුරුවන්ට

SANHIDA LANKA

අවවාද කියා අටපිරිකරගෙණ ආකාශයට නැගී නන්දමූලක පබ්භාරයට වැඩිසේක. සත්වැනිව වැඩි පසේ බුදුන් වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවැනි බණ වදාරණ සේක් මහ රජ යම් දෙයක් ලබම් කරන්නාවූ හීනවූ බ්‍රහ්මචර්යායෙන් රජව උපදනාහ. මධ්‍යමව කරන්නාවූ බ්‍රහ්මචර්යාවෙන් දිව්‍යලෝක සැපත් ලබන්නාහ.උත්තම වූ බ්‍රහ්මචර්යායෙන් නිර්වාණ සම්පත්තිය ලබන්නාහ. මහ රජ ඒ උත්තම බ්‍රහ්මචාර්යයන් නිර්වාණසම්පතියට උත්සාය කරවයි අවවාද කියා ආටපිරිකර ගෙණ ආකාශයට නැගී නන්ද මූලක පබ්භාරයට වැඩිසේක. රජ්ජුරුවෝත් ආකාශයෙන් යන්නාවූ පසේ බුදුන් වහන්සේ බලාසිට මහත්වූ ප්‍රීතියෙන් පසේ බුදුන් වහන්සේ වදාළ අවවාද සිත තබා දසරාජ ධර්මයෙන් රාජ්‍යය කොට පරලොව ගියාමයි වදාරා මේ ආදිත්ත්‍ය ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි ඒ සම්බුදු විජයා බිවස් නම් රාහුලෝමාතාවූ යසෝධරා ස්ථවිරය. භරත රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# දිවි ජාතකය

තවද පරහිත නිරතවූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එළුදෙනක අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

වටකොට ගල්වැටක්සේ තිබෙන්නාවූ එක දොරකඩක් ඇති ගිරිගර්භ නම් විහාරයෙහි මුගලන් සාමි වාසය කරණසේක්. එළුගොපොල්ලොත් මෙතන එළුවන්ට උපද්‍රව නැතැයි ඒ ගල් අස්සේ එළුවන් ලාලා පලායන්නාහුය. උදැසනක් පාසා එළුවන් තණට අරණාහ. මෙසේ එක් දවසක් එළුවන් ගාලෙන් ඇරපුකල්හි එළුවන් පලායන්නාහ. එක් එළුදෙනක් පසුවෙලා යන තැනත්තිය දිවියෙක් දැක අල්වාගෙණ කමි සිතා ගල්පසුර දොරකඩ රැක ගෙණ එලිගෙණ උන්නේය. එළුදෙනත් දුරදී දිවියා දැක මේ දිවියා රැකඉඳිනේ මා අල්වාගෙණ කන්නටයයි සිතා අපස්සේ යන්නාමුත් මා ලුහුබඳන්දා අල්වාගෙණ යන්නේය. මූ උන් දොරකඩින්ම යෙමි කිළිපොලා අන්දෙක කෙළින් ඉඳුවා දිවියාගේ ඇස්වර බලා මහත්වූ වේගයෙන් පැනගෙණ දිවගොස් තමාගේ බල එළුවන් හා සමග එක්ව ගියාහ. මේ දුටු මුගලන් සාමින් සර්වඥයන් වහන්සේට මෙපවත් දැන්වූ සේක. සර්වඥයන් වහන්සේ එම්බා මුගලාන දැන් ගැලවිපලා ගියා පමණක් විනා පෙර මේ දිවියා එළුදෙන අඬව අඬවා බෙල්ල කඩාකා මැරූයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස මගධරට බෝධිසත්වයෝ එක්තරා දුප්පත් කුලයෙක ඉපද තාපසව මුගලන් සවාමින් වාසය කරන්නාවූ ගිරිගර්භ නම් පර්වත වලල්ලසේ මහල් වැටක් ඇතුලේ වාසය කරන්නාහ. එසමයෙහි එළුගොපොල්ලෝ ඒ ගල්වලල්ල ඇතුලෙන් තණට පිටත්කරන්නාහ. එක් දවසක් එළුවන් ගාලෙන් පලාගියහ. එළුදෙනක පසුව පිය යන්නීය දැක එක් දිවියෙක් අල්වාගෙණ කමි සිතා ඇවිත් දොරකඩ රැකගත එළුදෙන් මුන්ට උපායක් කියා ගැලවෙමි සිතා කියන්නී කිමෙක්ද මයිලනුවන් වහන්ස නුඹ වහන්සේට පාසු අපාසු නැද්ද නුඹ වහන්සේගේ සුවදුක් විචාරාගන්නා ලෙස මාගේ මෑනියන් වහන්සේ මා එවූසේකැයි කීහ. එවිට දිවිකියන්ගේ වල්පතද මිරිකාගෙණ ඇවිත් මා ඉදිරියේ සිට නෑකම් බණවූදැයි කීය. එවිට එළුදෙන් කියන්නී නුඹ වහන්සේ නැගෙණහිරට මූනලා උන් හෙයින් නුඹ වහන්සේ ඉදිරියට ආමි මා වල්පත මිරිකුයේ කෙසේ දැයි කිව සප්තමහා සාගරයද සප්ත කුල පර්වතයෝද සක්වලගලද යන මේ සියල්ල වටකොට මාගේ වල්පතමය. තොප මා වල්පත නොමිරිකා ආයේ කෙසේදැයි කීය. එවිට එළුදෙන් මම භයගතින් නම් ආකාශයෙන් ඇවිත් බැස පියමි නුඹ වහන්සේගේ වල්පත මා මිරිකුයේ කෙසේදැයි කිව, එවිට දිවියා කියන්නේ තොප මෙතනට එන වෙලාවට මුවන් හා ඌරෝ ගොණෝ මෙතන සිටිය ඉවත පලාගියෝය උන්මට ගොදුරුව සිටියවුන් ඉවත පළාගියහෙයින් ඉන් තොප උන් මාරුවට කම්කීහ. එවිට එළුදෙන් අඬ අඬා කියන්නී මා මෙසේ වූ කන්නලව් කිය කියා යාච්ඤා කළදී කුමට මා කන්නේදැයි කිව, එවිට දිවියා කියන්නේ අප දරුණුවූ කෲරවූ සත්වයන්ට තොපගේ කන්නලව්වෙන් කම් කිම්දැයි කියා එළුදෙනගේ බොටුවට පැණ බෙල්ල කඩාගෙණ මස් කැයේ සර්වඥයන් වහන්සේත් ඒ අසත්පුරුෂවූ දිවි ඒ එළුදෙන කී කන්නලව්ව නොඅසා ඈගේ ජීවිතක්ෂය කෙළේ වේද මුගලනැයි වදරා මේ දිවි ජාතකය නිමවා වදාළ සේක.

SANHIDA LANKA

## තෘතීය ගිජ්ඣක ජාතකය

තවද එක් කලක සකල ගුණ නිධාන වූ විසුද්ධ චිත්තසන්තාන ඇති අප තිලෝගුරු බුදු රජානන් වහන්සේ දෙව්රම් වෙහෙරේ සිව්බඹ විහරණයෙන් යුක්තව වාසය කරණ සේක් නොකීකරුවූ භික්ෂුවක් අරභයා මේ ජාතකය දක්වා වදාළ සේක. එක් කුළ පුත්‍රයෙක් නෛර්යානික බුදුසස්නෙහි මහණව ආචාර්ය උපාධ්‍යයෙන් විසින් හා සබ්‍රහ්මචරුන් විසින් මෙපරිද්දෙන් හිඳුව මෙපරිද්දෙන් හැසිරෙව් මෙසේ පාසිවුරුධරව මෙසේ පිඬුසිඟව මෙසේ පස් එකාවලඳව පසිඳු රන්වසඟ නොකරව ය දෙවේලෙහි නිදිවර්ජිතකොට ග්‍රන්ථධුර විද්ර්ශිනාධුර පූර්ව මේ ආගන්තුක වත මේ ගම්කවත මේ තුදුස් කඳුවත අසූවක් මහාවත එහි තොප විසින් මනාව පැවත යුත්තේය. තෙලස්ධූතාංග ගුණයෝ දරක්‍ෂා කටයුත්තාහයි අවවාද කරණු ලබන්නේ කීකරු නුවයේය ඔවුන් කී අවවාද ආදරයෙන් නොපිළිගන්නේය තොපි මට අවවාද කරණුවාද මම මට වැඩ අවැඩම මම දනිම් කීයේය. භික්ෂූන් වහන්සේ ඔහු නොකීකරුබව දම්සභා මණ්ඩපයෙහි කිය කියා වැඩ උන්සේක. එබස් සර්වඥයන් වහන්සේ දිවකනින් අසා දම්සභා මණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තවුවැදිය විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි යනු අසා ඔහු කැඳවා සැබැද මහණතෝ නොකිකරුයෙහිදැයි විචාරා එසේය ස්වාමිනි දැන්වූ කල්හි කවර හෙයකින් මහණ තෝ මේ බුදුසස්නෙහි මහණව තමාට වැඩි කැමැත්තවුන්ගේ බස් නොකරන්නෙහිද පෙරත් තෝ නුවනැත්තවුන්ට නොකීකරුව වෙරම්භ වාතයට පැමිණ සුනුවිසුනුවූයෙහිදැයි වදරා ඉකුත්වත් දක්වා වදාළ සේකී.

ඒ කෙසේද යත්

පෙරගිජ්ඣ නම් පර්වතයෙක මහාබෝසතානන් වහන්සේ ගිජුලිහිණිව උපන්සේක. උන් වහන්සේගේ පුත්‍රවූ සුපත්‍ර නම් ගිජු රජෙක් නොයක් දහස් ගණන් ගිජුලිහිනියන් පිරිවැරුයේ ශක්ති සම්පන්න වූයේ වයෝවෘද්ධවූ මව් පියන් පිඹුරුමස් ආදී ගොදුරු ගෙණවුත් දී රක්ෂා කරන්නේය. එසේ රක්ෂා කරන්නාවූ අහස ඉතා දුරතැන් නැගී යාමට සමර්ථවූ තමන් වහන්සේගේ පුත්‍රවූ සුපත්‍රනම් පක්ෂිරාජයාට අවවාද කරණ මහාබෝසතානන් වහන්සේ එම්බා පක්ෂිරාජය, තොප අහස්කුසට නැගී කල්හි මේ දඹදිව මුළු පොළොව දියපිට ඉළුපුලක් මෙන් පෙණේද නැවත යම් තැනකට පැමිණියාවූ තොපට සාගරජලයෙන් පරිවජින්නවූ මෙමජම්බු විපසරථසකත් මෙන් වටව පෙණෙන්නේය. එතැනින් නැවත ඈත නොයවයි වදාළසේක. ඒ පක්‍ෂිතෙම ඒ අවවාදය යහපතැයි පිළිගත්තේය. එක් දවසක් අළුත වට වැස්සෙහි ගිජුලිහිණියන් හා සමඟ අහසට පැනනැගී ඔවුන් පසුකොට අහසට ඉතා දුර තැනට ගියේය. ඕ හට බෝසතානෝ වදාළ පරිද්දෙන් දඹදිව රථයකක්මෙන් වටව පෙණුනේය. එ සේත් නොනැවත නොකීකරුව පක්ෂිරාජ තෙමේ ගොස් වෙරම්භ වාතයට පැමිණ සුනු විසිනුවුයේය. ඒ නොකීකරුවූ පක්ෂි රාජයා නිසා පීවත් වන්නාවූ පක්ෂිහුද ඔහුගේ මව්පියෝද අඹදරුවෝද යන සියල්ලම විනාශයට පැමිණියෝය. එමෙන් මේ ශාසනයෙහි යමෙක් වැඩිමහල්ලන්ගේ අවවාද වචනය පිළිගෙණ එපරිද්දෙන් නොපවත්නේ වීනම් ඒ ගිජුලිහිනියාගේ අවවාදගෙණ එසේ නොපැවත විනාශයට පැමිණියාවූ ලිහිණි රජුමෙන් මහත්වූ ව්‍යසනයට පැමිණෙන්නේය. එසේ හෙයින් මහණ තෝ ද ඒ නොකීකරු ගිජු ලිහිණියාමෙන් නොව් වැඩ කැමැත්තාවූ මහතුන්ගේ අවවාද වචනය කරවයි වදාළ සේක. මෙසේ බුදුන් විසින් අවවාද කරණ ලද ඒ මහණ තෙම එතැන් පටන් කීකරුවුයේය. සර්වඥයන් වහන්සේ මහණෙනි එකල්හි නොකීකරු ගිජුලිහිණියා නම් දැන් මේ නොකීකරු මහණවන්නේය. එකල්හි අවවාද දුන් ගිජුලිහිණියා නම් දැන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි මේ ජාතකය පූර්වාපර සන්ධි ගළපා නිමවා වදාළ සේක.

SANHIDA LANKA

# කොසම්බ ජාතකය

තවද චන්ද්‍ර මණ්ඩලය මත්තෙන් යන්නාවූ සූර්යරශ්මි පරිද්දෙන් සියළු ලොව මැඩගෙණ පවත්නා ගුණ ප්‍රබන්ධයෙක් ඇති විසුද්ධවී සම්‍යයක් සම්බුදුරජෝත්තමයානන් වහන්සේ එකසමයෙක්හි කොසඹෑ නුවර සමීපයෙහි ඝෝෂිතානම් සිටානන් විසින් කරවා පිළිගන්වන ලද  ආරාමයෙහි වාසය කරණ සේක් කොසඹෑ නුවරවැසි කළහාකාරී භික්ෂූවක් අරභයා මේ ජාතකය දක්වා වදාළ සේක. බුදුන් එහි වැඩ වසන සමයෙහි විනයපිටකය නොපිරිහෙලා ධරන්නාවූ එක්තෙර කෙණෙකුන් වහන්සේ ද එසේම සූත්‍රපිටකය ධරන්නාවූ එක් තෙර කෙණෙකුන් වහන්සේද, යන මේ දෙදෙනෙකුන් වහන්සේ එක් සේනස්නේ වාසය කරණ සේක එකල ඒ දෙදෙනා වහන්සේගෙන් සූත්‍ර පිටකය ධරන්නාවූ තෙරුන් වහන්සේ එක් දවසක් නහන ගෙට ගොස් උදක කෘත්‍යාකොට ඉතිරිදිය භාජනයෙහි තබා නික්ම ගියසේක. ඉක්බිති විනයධර තෙරුන් වහන්සේද නහනගෙට වැද එබදූනෙහි තුබූ දිය දැක ඇවැත්නි නහන කොටුවේ බඳූන්හි ඉතිරිදිය තබා ආවෝ තොපි දැයි වදාළසේක. එසේය ඇවැත්නි අපි යයි කී කල්හි එබසට විනයධර තෙරුන්වහන්සේ මෙහි ඇවැත් ඇතිබව තොපි නොදැනුදැයි කී සේක. එසේය ඇවැත් වන බව කිසේක. එබස් අසා සූත්‍රධර තෙරුන්වහන්සේ එසේවී නම් ඇවැත්නි ආපත්තියට පිළියම් කෙරෙමි කීසේක, එබසට විනයධර තෙරුන් වහන්සේ ඇවැත්නි තොපි නොදැන සිහි නැතිව අවනම් ආපත්ති නැතැයි වදාළසේක. එබස් ඇසූ සුත්‍රාන්තික තෙරුන් වහ්සේ අනාපත්ති යන සංඥා ඇතිවුසේක. ඉක්බිති විනේධර ස්ථවිරතෙම තමන්ගේ අතවැසි භික්ෂූන්ට මේ සුත්‍රාන්තික ස්ථවිරතෙම ආපත්තියට ඇවදත් අවැත් ඇති බව නොදත්තේයයි කීසේක. එබස් ඇසු භික්ෂූහු සුත්‍රාන්තික තෙරුන් වහන්සේගේ අත වැස්සන් දැක තොපගේ උපධ්‍යස්ථවිරයෝ ආපත්තියට වැදවත් එහි ඇවැත් ඇතිබව නොදනිතියි කීවාහුය. එබස් ඇසූ අතවැසි භික්ෂූහූ එපවත් තමන්ගේ උපාධ්‍යයන් වහන්සේට කීවාහුය. එබසට තෙරුන් වහන්සේ වදාරණසේක් මේ විනය ධර තෙරුන් වහන්සේ පළමුවෙන් ආපත්ති නැතැයි කියා දූන් ආපත්ති  ඇතැයි කියනසේකැයි බොරු කියන කෙනෙකැයි කීසේක. එසඳ ඔහුගේ අතවැසි භික්ෂූහූ ගොස් විනයධර තෙරුන්වහන්සේගේ අතවැස්සන් දැක තොපගේ උපාධ්‍යස්ථවිරයෝ බොරු කියන කෙණෙකැයි කියා මෙසේඹ වූ නොවුන් හා විවිධකොට ඒ සුත්‍රාන්තික තෙරුන්වහස්සේට අවසරයක් බලා ලැබගෙණ ඇවැත් ආපත්ති නොදැක්මෙහි උක්‍ෂේපනිය කර්මය කළාහුය.  එතැන් පටන් ඒ දෙදෙනා වහන්සේට උපස්ථාන කරන්නාවූ උපාසකවරුද උන් වහන්සේගේ අවවාද පිළිගන්නා භික්‍ෂු භික්‍ෂුණීහූද අරක්ගත් දෙවියෝද ඔවුන්ට දෘෂ්ටමිත්‍ර දෘඨමිත්‍රවූ දෙවියෝද ආකාසස්ථ දෙවියෝද අගනිටා බඹලොව වැසි බ්‍රහ්මයෝදැයි යන සියළු පෘථග්ජනයෝද දෙපක්ෂයකට බෙදී මහත් කෝලාහල පැවැත්වුවාහුය. එකල එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ බුදුන් කරා එළඹ ස්වාමිනි මේ සුත්‍රධර තෙරුන්වහන්සේට උක්‍ෂේපනීය කර්මය කළේ ධර්මයෙන අධර්මයෙන් නොවෙයි එතකුදු වුවත් මේ සුත්‍රධර තෙරුන් වහන්සේගේ පක්ෂයෙහි භික්‍ෂූහූ අධර්මයෙන් කළ උක්‍ෂෙපනීය කර්මයැකැයි සිතා ඒ තෙරුන් වහන්සේ උසස්කොට පිරිවරාගෙණ ඇවිදිනාහුයයි දැන්වූසේක. එකල භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ භිනෙනා භික්බුසංඝෝ යි වදාරා ඒ භික්ෂූන් සමීපයට වැඩ ඒ විනයධර තෙරුන් වහන්සේ විසින් කළාවූ උක්‍ෂෙපනීය කර්මයෙහිද සුත්‍රධර තෙරුන් වහන්සේගේද අවත් ඇවැත් නොදැන්මෙහිද දෝෂවදාරා වැඩිසේක. ඉක්බිති භික්ෂූන් එතන එකසීමාවෙහිදී පෝය පවුරුණු ආදිය කොට භෝජනශාලාවෙහි හිඳිනා අසුන් පිණිස විවාධකළ කල්හි දෙවෙනි වත් එතැන්හී වැඩ දබරකරන්නාවූ දෙන්නෙකු එකතැන නොහිඳිනා පරිදි ශාලාවෙහි වත් පණවා මහණෙනි විවිද කිරීමෙන් ප්‍රයෝජන නැතැයි ඒ හි දෝෂ වදාරා වැඩිසේක. එකල්හි සර්වඥයන් වහන්සේට වන වෙහෙස නොදකැමැත්තාවූ එක්තරා ධර්මාවාදී වූ භික්‍ෂු කෙනෙකුන් වහන්සේ ස්වාමිනි තිලෝගුරු බුදු රජානන් වහන්ස මදක් කල් ඉවසා වදාළ මැනව නිරුත්සාහට ඵලසමාපත්ති සපැ අනුභව කළ මැනව, අපි මේ විවිදයෙන් වන යහපතක්වත් නපුරක්වත් දන්නෝමෝ වේදැයි කී සේක. එබස් අසා ඒ භික්ෂූහට ධර්මදේශනා කරන්නාවූ සර්වඥරාජෝත්තමයානන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

මහණෙනි. පෙර බරණැස් නුවර උපභෝග පරිභෝග වස්තුයෙන් හා සියළු සේනාවාහන ධන සමුර්ධියෙන් සමන්විත වූ බ්‍රහ්මදත්ත නම් රජකු රාජ්‍යය කරණ කල්හි කොසොල් රට සේනාවාහන ආදිය නැත්තාවූ දීඝතිස්ස නම් රජෙක් රාජ්‍යය කරන්නේය. එකල ඒ බ්‍රහ්මදත්ත නම් කසී රජ තමාගේ හස්ත්‍යාශවාදී චතුරංගිණී සේනාවාහනයන් සන්නද්ධකොට සරහා දීඝතිස්ස නම් කොසොල් රජු කරා සටනට නික්මින එකල්හි කොසොල් රජතෙම බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සෙනගගෙණ තමාකරා සටනට එති යනු අසා සිතනුයේ මේ රජ උපභෝග පරිභෝග වස්තුවෙන් හා නිධාන කොට තිබූ කෙළකෝටිගණන් ධනයෙන් අඩ්‍යයහ. මහත් සේනා වාහන ඇත්තේය මම වනාහී එබදූ සේනාවාහන ධනසමෘද්ධියක් ඌනතිහෙයින් ඒ රජු හා යුද්ධකරන්ට නොහැක්කෙමි, එසේ හෙයින් බැහැරගොස් ජීවත්විම උතුම්වන්නේයයි සිතා තමාගේ අගමෙහෙසුන් බිසවුන්

SANHIDA LANKA

කැඳවාගෙණ ඔහු එන්නට පළමුකොට තෙමේ නුවරින් නික්ම ගියේය. ඔහු ගිය ඉක්බිති ඒ බ්‍රහ්මදත්ත රජ තමාගේ සේනාවාහන සමඟ ඒ කොසොල් රජහුගේ නුවරගෙණ වාසය කළේය. ඉක්බිති කොසොල් රජ්ජුරුවෝ තමන්ගේ  බිසවුන් හා සමග අනුක්‍රමයෙන් බරණැස් නුවරට ගොස් එහි එක්තරා කුඹුලුන්ගේ ගෙයක වාසය කරන්නාහු එකල රජහුගේ බිසවුන්ට දරුගැබක් පිහිට ඉරුඋදාවන වෙලෙහි සන්නාහ සන්නද්ධවූ සිව්රඟ සෙනග යහපත් තෙනක සිටියාදක්නට ද ඔවුන් ආයුධ සේදූදිය බොන්නටද දොළොක් උපන. එකල බිසව්තොම දේවයන් වහන්ස මම ගර්භිණී වූයෙහි මට මෙවැනි දොළකුත් උපන්නේයයි තමන්ගේ කොසොල් රජහට කිවාහුය. රජු එබස් අසා සොදුරු දිලිඳුවූ අපට සන්නාහයෙන් සන්නද්ධවූ සිව්රඟ සේනඟ යහපත් තෙනක සිටියා දකීම් හා ඔවුන් ආයුධ සේදු දිය බොන්නට කොයින් ලැබෙන්නේදැයි කීහ. බිසව් එසේවිනම් දේවයන් වහන්ස මාගේ ජීවිතයනොතිබෙන්නේයයි කීවාහ. එසමයෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ පුරෝහිත බමුණෙක් ඒ දීඝතිස්ස නම් කොසොල් රජහට මිත්‍රව වාසය කරන්නේය. එකල ඒ කොසොල් රජ තමාගේ මිත්‍රවූ පුරෝහිත බ්‍රාහ්මණයා ලඟට ගොස් එම්බා යහළුව තොපගේ යෙහෙලනි වූ අපගේ බිසවුන්ට ගැබෙක් පිහිටා මෙසේ දොළොක් උපන්නේයයි කහ. එසේ වීනම් දේවයන් වහන්ස මම ඒ බිසුන් දක්නා කැමැත්තෙමි. බමුණා කී හෙයින් කොසොල් රජ තමාගේ බිසව් කැඳවාගෙණ ඒ බමුණුන්කරා ගියේය. පුරෝහිත බ්‍රාහ්මණයාද එන්නාවූ බිසවුන් දුරදීම දැක උනස්නෙන් නැගීසිට උතුරුසළුව ඒකාංශ කරගෙන බිසවුන්ට නමස්කාර කොට සිට තොපගේ කුස පිළිබඳගත්තේ කොසොල් රටට අධිපතීවන්නීවූ මහා පිනැති රජෙකැයි තුන්යලක් උදන් අනා දේවයන් වමන්ස සතුටු උවමැනව සූර්යෝද්ගමන වේලයෙහි සන්නාහයෙන් සන්නද්ධව සිටියාවූ චතුරංගී සේනාව දක්නට ලද ඔවුගේ ආයුධ හේදු දිය බොන්නටද ලැබෙන්නේයයි කොසොල් රජහට කියා ගිවිස්සා තෙමේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් කරා ගොස් දේවීන් වහන්ස සෙට උදෑසන චතුරංගිණී සේනාව සන්ධව සිටිමද ඔහුන් තමන්ගේ ආයුධ සේදීමටද කාරණයක් දිටිමි ඊට විධාන කළ මැනැවයි කියේය. එසේ වීනම් සගයෙනි තොප පුරෝහිත බමුනන් කියාලු පරිද්දෙන් සැරහිගණුවයි රජ සේනාවට නියෝග කළේය. ඔහුද රජහුගේ නියෝග වූ පරිද්දෙන් සැරහී තමන් වහන්සේගේ ආයුධ සේදුවාහුය. එකල දීඝ තිස්ස නම් කොසොල් රජහුගේ අගමෙහෙසුන් බිසවුන්ට ඉරුඋදයෙහි සන්නාහයෙන් සන්නද්ධ සිව්රඟසෙනඟ දැකීමද ඔවුන් ආයුධ සේදු දිය බීමටද සිද්ධවිය. ඉක්බිති බිසව් මුහුකළ ගැබ් ඇතිව දස එකඩ මසකින් පුත්කුමරුවකු වැදුවාහුය. ඕහට දිඝායූ කුමාරයෝ යයි නම් තබා වැඩිවිය පැමිණ නුවැනැතිවූ කල්හි පියරජතෙම සිතනුයේ බ්‍රහ්මදත්ත රජ අපට බොහෝ අනර්ථ කළේය. මොහු විසින් අපගේ බලවාහන ජනපද රන් රුවන් ගබඩා කොටුගෙවල් ආදිය පැහැරගන්නාලද ඉඳින් අප අඳූනන්නේවීනම් අප තුන්දෙනා මරන්නේය. එසේ හෙයින් දීඝායු කුමාරයන් නුවරින් පිට වාසයකරවුව මැනවැයි සිතා ඔහු පිටිනුවරට වැස්සුයේය. ඒ දීඝායු කුමාරයාද අප්‍රසිද්ධ වේසයකින් වසන්නේය. කොසොල් රජු හා බිසවුන් එහි වසන්නා දැක බ්‍රහ්ම දත්ත රජ හට දක්වූවාහුය. එසේ වී නම් කෙළෙතෙපි ඒ රජ හා බිසවහා සමග අල්වාගෙණ එවයි නියෝග කොට මිනිසුන් ගමන් කරවා ගෙන්වාගෙණ වධයට විධාන කරණුයේ සගයෙනි මේ රජු බිසව් හා සමග දැඩි ලනුවකින් පිටිතොල හයා බැඳ කරයෙන් ඉසකේ මුඩුකොට වධබෙර ගස්වමින් විථියෙන්  විථියෙන් ගෙණ ගොස් දකුණු වාසල් දොරින් නික්මයා එතනදී දෙදෙනා සතරකඩක් කොට පොළු ගසා වලසතරකලා එවයි කීයේය. එබස් ඇසූ ජනයා යහපති දේවයන් වහන්සැයි රජුහුගේ නියෝගවූ පරිද්දෙන් බිසව හා එකකොට රජුපිටිතොල හයා බැඳ ඉසමුඩුකොට විථියෙන් විථියට ගෙණයන්ට පටන් ගත්හ, ඒ වෙලෙහි දිඝායු කුමාර තෙම තමාගේ මව්පිය දෙනො බොහෝ දවසක් නොදැක්න ලදහ. ඔවුන් දක්නෙම් බරණැස් නුවරට ගොස් පිටිතොලහයා බැඳ විථියෙහි යන්නාවූ මව්පියන් දැක ලඟට යනුව අභිමුඛවිය. එකල කොසොල් රජ එන්නාහූ ඔහු දුර දැක පුත්‍ර දීඝායූ කුමාරය දුරබලව ලඟ නොබලව වෛයිරයෙන් වෛයිරය නොසන්හිඳෙයි වෛයිරනොකිරීමෙන් වයිර සන්හිඳෙයි කීයේය. ඔහු  එසේ කී කල්හි මනුෂ්‍යයෝ මේ කොසොල් රජු උන්මත්ව නම් දොඩන්නේය මෝහට දීඝායුවක් නම් කොයින්ද කවුරුන් දැක මෙ මෙස් කියන්නෙහිදැයි කීවාහුය. එකල ඒ රජගෙම සඟයෙනි මම උමතුව නන්දොඩන්නෙමි නොවේමි යමෙක් නුවැත්තේ වී නම් ඒ දන්නේයයි නැවත නැවතත් කීයේය. ඉක්බිති මනුෂ්‍යයෝ ඒ රජහුගේ බිසව හා සමග රජුහුගේ නියෝගවූ පරිද්දෙන් නුවර ඇවිදුවා දකුණු වාසලන් පිටතට ගෙණගොස්  සතරකඩක්  කොට කපා වලසතරක ලා රැකවල්ලා ගියාහුය. එකල දීඝායු කුමාරතෙම බරණැස් නුවරට වැද ආ ඇරගෙණ රැකවලුන් පොවා ඔවුන් රා මදින් මත්ව ඒ ඒ තැන හුනුකල්හි තෙමේ දරසෑයක් බැඳ මව්පියන්ගේ මෘදදේහ දරසෑයට නැග ගිණිදල්වා දොහොත් මුදුනෙහි බැඳ තුන්යලක් වටකොට ඇවිද්දේය. එසඳ බ්‍රහ්මදත්ත  රජ ප්‍රසාදයෙහි මතුමහල් තලයෙහි සිට එසේ දරසෑය වට ඇවදිනා කුමාරයා දැක සැක නැතිවය කොසොල් රජුගේ නැනෙක මොහු කෙරෙන් මට අනර්තයක් වන්නේය. කවුරුත් මොහු ඇතිබව මට නොකිවාහුයයි සිතුවාහුය. ඉක්බිති ඒ කුමාරතෙම වලට ගොස් කැමති පමණක් අඬා වැලප බරණැස් නුවරට වැද එහි වාසය කෙරෙමින් එක් දවසක් ඇත් හලට ගොස් ඇත් ගොවවා දැක ආචාරීනි මම හස්ති ශිල්පය උගන්නා කැමැත්තෙමි කියා යහපති උගණුවයි කී කල්හි එදා රෑ ඒ ඇතහල ලග අළුයම නැගි සිට මියුරු කට හඬින් ගී කිය කියා විනාගෑවෝ කවුරුන්දැයි විචාරා දේවයන්

SANIDA LANKA

වහන්ස හස්තිචාරීහුගේ අතවැස්සෝයයි අසා ඔහු කැඳවාගෙණ එවයි කියා ගෙන්වාගෙණ ඇත්හල ගී කිය කියා විනාගෑවෝ තොපිදැයි විචාරා එසේය දේවයන් වහන්ස අපියයි කී කල්හි එසේ වී නම් දැනුත් ගී කය විනාගායනා කරවයි නියෝග කළේය. එකල දීඝායූ කුමරතෙම බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සිත් ගන්නා කැමතිව මධුරස්සවරයෙන් ගී කිය කියා විනාගායනා කෙරෙමින් රජහුගේ සිත් ගෙන උපස්ථාන කරන්නේ රජහට පළමු නැගීසිට ගායනා කෙරෙයි රජහට ඉක්බිතිව තෙමේ සැතපෙයි කටයුතු කවර්දැයි රජහූ විචාරවයි රජහට සිත්වූ පරිද්දෙන් ප්‍රිය තෙපුල් කියයි මෙසේ දීඝායූ කුමාරතෙම නොබෝ කලකින් බ්‍රහ්මදත්ත රජහට අභ්‍යන්තරව විස්වාසවූයේය. ඉක්බිති එක් දවසක් බ්‍රහ්මදත්ත රජහු විසින් දිඝායූ කුමාරය මම මුව දඩයමට යනු කැමැත්තෙමි රථය යෙදාවයි කී කල්හි යහපත දේවයන් වහන්සැයි රථය යොදා රජහු රථයට නංවා තෙමේ රථය පදිනේ සේනාව හෝ රථයක් හෝ ආසන්න නොවන පරිද්දෙන් වහා රථයම පැදගෙන ගියේය. එසඳ රාජකුමාරයට කියනුයේ කොල මම මිරිකුණු ශරීර ඇත්තෙමි මදක් සැතපෙණු කැමැත්තෙමි රථය රඳවාපියවයි කීයේය. එකල ඒ රාජ කුමාරතෙම යහපත දේවයන් වහන්සයි රථය අතහැර තෙමේ රැක් සෙවනක අසරණ මිනිය බැඳගෙණ උන්නේය. එකල රජ දීඝායූ කුමාරයා උකුලේ හිස තබා සැතපී විඩාවගිය ශරීර ඇති හෙයින් වහා නිද්‍රාවට පැමිණියේය. එකල දීඝායු කුමාරතෙම සිතනුයේ බ්‍රහ්මදත්ත රජ අපට බොහෝ අවැඩ කෙළේය. මොහු විසින් අපගේ යාන වාහන ජනපද කොෂාටාභාදිය පැහැර ගන්නා ලද අපගේ මව්පිය දෙදෙන මොහු විසින් මරණ ලද්දාහුය. දැන් මට ඒ වෛරය සිද්ධ කරන්නට කල්වන්නේයයි කොපුවෙන් කඩුව හමාගෙණ සිතනුයේ මාගේ පියරජ්ජුරුවන් වහන්සේ මරණ කාලයේහිදී දීඝායු කුමරාය තෝ දුරබල ලඟ නොබලව වෛරයෙන් වෛරය නොසන්සිඳෙනේය. වෛර නො කිරීමෙන්ම වෛර සන්හිඳෙන්නේයයි කී සේක. ඒ මාගේ පියානන් වහන්සේගේ බස් ඉක්මවන්ට නුසුදුසුයයි කඩුව කොපුවෙහි බහා ගෙණ මෙසේ දෙවැනි තුන් වැනිව කඩුව කොපුවෙන් හයාගෙණ පියා රජහු කී තෙපුල් සිහිකොට නැවතත් කොපුවේ බහා ගත්තේය. එකල බ්‍රහ්මදත්ත රජ භයින් තැතිගෙණ වහා නැගී සිටි කල්හි දිඝායු කුමාරතෙම දේවයන් වහන්ස භයින් තැතිගෙණ නැගී සිටියේ කුමක් නිසාදැයි කීයේය. ඒ පුරුෂයාට කියනුයේ මාසැතපුන කල්හි දිඝතිස්ස නම් කොසොල් රජහුගේ පුත් වූ දීඝායු නම් කුමාරයෙක් කඩුවක්ගෙණ මා දෙපළු කොට එළුයේයයි ස්වප්නයෙන් දිටිමි එයින් මම භයගෙණ නැගී සිටියෙමි. කීයේ, එසඳ දීඝායු කුමාරතෙම වමතින් බ්‍රහ්මදත්ත රජුගේ ඉසකෙස් කැටිය ගෙණ දකුණතින් කඩුව තියාගෙණ දිගතිස්ස කොසොල් රජහුගේ පුත්වූ දීඝායු කුමාරයා නම් මමය. තොපි අපගේ පියරජ්ජුරුවන් හා මැනියනුත් මරා සේනා වාහන ජනපද ආදියත් පැහැරගෙණ බොහෝ අවැඩ කළෝ වේද මම යම් පුරාණ වෛරයක් සිත තබා ඒ සිද්ධ කරණු කැමැති වන්නේ නම් දැන් ඊට කල්වන්නේයයි කීයේය. එකල බ්‍රහ්මදතත් රජ භයගෙණ දිඝායු කුමාරයෝ පය වැඳ ගෙණ හෙව එම්බා දීඝායු කුමාරයානෙනි මාගේ ජීවිතය දෙවයි කීසේක. එබසට දීඝායු කුමාරයා විසින් නුඹ වහනසේග් ජීවිතය දෙන්ට මම කවරෙක්ද මාගේ ජීවිතය නුඹ වහන්සේ දුන මැනවැයි කී කල්හි එසේ වී නම් තෙපිත් මාගේ ජීවිතය දෙව මම තොපගේ ජීවිතය දෙමි කියා රජ්ජුරුවන් හා කුමාරයන් දෙදෙන ඔවුනොවුන් ජීවිතදානයාදී මතු විරුද්ධ නොවන ලෙස සත්තය කළාහුය. ඉක්බිති බ්‍රහ්මදත්ත රජතෙම දීඝායූ කුමාරය නුවරට යම්හ රථය පදවාගෙණ සේනා වාහන ලඟට අවුත් ඔවුනොවුන් හා සමග බරණැස් නුවරට වැද ඇමති මණ්ඩලය පරිවරා හිඳ සගයෙනි තොපි කොසොල් රජහුගේ පුත්වූ දිඝායු කුමාරයා දුටුවාහු නම් ඕ හට කුමක් කරව්දැයි විචාළේය. එබසට සමහර කෙණෙක් දේවයන් වහන්ස අපි ඔහුගේ අත් කපම්හයි කීවාහුය. සමහර කෙණෙක් කන් සිදුම්හයි කීවාහුය. සමහර කෙණෙක් නාසා සිඳූම්හයි කීවාහුය. සමහර කෙණෙක් කන්නාසා සිඳූම්හයි කීවාහුය. සමහර කෙණෙක් ඉස සිදුම්හයි කීවාහුය. එසඳ බ්‍රහ්මදත්ත රජගෙම කියනුයේ සගයෙනි දීඝතිස්ස කොසොල් රජහුගේ පුත්වූ දිඝායු කුමාරයා නම් මෙය මෝහට කිසිවකුත් නොකොට යුත්තේය. මොහු විසින් මාගේ ජීවිතය දෙනලද්දැයි කියා ඉක්බිත් බ්‍රම්දත්ත රජතෙම දීඝයු කුමාරයා තොපගේ පිය රජ්ජුරුවන් විසින් දුරමල ලඟ නොබල වෛරයෙන් වෛරයෙන් වෛරය නොසිඳෙයි වෛරකිරීමෙන් වෛර සන්හිසෙඳයි කීවේ කුමක් නිසාදැයි විචාළේය. එබසට දීඝායූ කුමාරතෙම කියනුයේ දේවයන් වහන්ස අපගේ පිය රජ්ජුරුවන් වහන්සේ විසින් දුරබලවයි කීයේ නම් බොහෝ කල් වෛර නොකරවයි කීනියාය ලඟ නොබලවයි කීයේ නම් මිත්‍රයන් භේදනොකොරවයි කියාය. වෛරයෙන් වෛර නොසන්හිඳෙයි වෛර නොකිරී මෙන්ම වෛර සන්දිදෙයි කීයේ නම් නුඹ වහන්සේ විසින් මාගේ මව්පියන් මරණ ලද්දාහුයයි ඉදින් නුඹ වහන්සේ මැරුයේ වීනම් නුඹ වහන්සේට වැඩ නැමැත්තාහූ කෙනෙම් මා මරන්නාහුය. එසඳ මට වැඩ කැමැත්තාවූ නෙකෙනකුත් ඔහුත් මරති මෙසේ වෛරයෙන් වෛර නොසන්හිඳෙන්නේය. දැන් නුඹ වහන්සේ විසින් මාගේ ජීවිතය දෙනලද මා විසිනුත් නුඹ වහන්සේගේ ජීවිතය දෙන ලද එසේ වෛරයෙන් වෛර නොසන්සිඳන්නේය. වෛර නොකිරීමෙන්ම සන්හිඳෙන්නයේයයි කියා දේවයන් වහන්සැයි කීයේය. එකළ බ්‍රහ්මතත්ත රජතෙම මේ කුමාරයා පියානන් සංක්ෂේපයෙන් කී දෙයෙහි අර්ථ විස්තරයෙන් දන්නේය ඉතා නුවනැත්තාවූ පුරෂයෙකැයි විෂ්මයපත්ව පිය රජ්ජුරුවන් සන්තකවූ සේනා වාහන ජනපද කොෂාටාගාරාදිය තැන්පත් කොට දී තමාගේ දියනි කෙණෙකුත් පාවාදී මිත්‍රව

SANHIDA LANKA

විසුයේයයි අප තිලෝගුරු බුදුරජානන් වහන්සේ ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ හා දීඝායු කුමාරයන්ගේ මේ කථාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි සත්වයන්ට වධබන්ධනාදී දණ්ඩ නිග්‍රහකොට ආයුධ බලයෙන් ආඥාචක්‍රය පවත්වා රජ කරණ රජ දරුවෝ පවා මෙබඳුවූ ඉවසීමට හා කීකරු බවට පැමිණෙන්නාහුය. තොපි අවිපරිතවූ ධර්ම විනය ඇති ශාසනයෙහි මහණව කවර කාරණයකින් ඉවසාගත නොහෙව්ද කීකරු නොවව්දැයි දෙතුන් වෙනිවත් විවාද නොකරණසේ අවවාද වදාරා එසේත් නොසන්හිඳෙන හෙවියින් මේ භික්ෂු වෙෂයෙන් මඩනා ලද සිත් ඇත්තාහ. මොහු සන්හිඳුවන්ට නොහැක්කේයයි එතැනින් වැඩ දෙවෙනි දවස් වළඳා ඉක්බිති ගඳකිළියෙහි මදක් සැතපී සෙනසුන් පිරිකර තැන්පත් කොට තබා තමන් වහන්සේ පාසිවුරු ගෙණ ඒ අසමගි භික්ෂු සංඝා මධ්‍යයේ ආකාශයෙහි වැඩ සිට වදාරණ සේක් මේ කලහකාරී භික්ෂු සංඝයා තෙම වටින් එකවිටමත් ශබ්ද පැවැත්වීමෙන් මහ හඬ ඇත්තාහුද වෙති. ගුණයෙන් සමානත්වෙති මොහුව්න අතුරෙන් කිසිවකුත් මම නුවනැත්තෙමි නොසිතා පණ්ඩිත මැණිව භික්ෂු සංඝයා බෙදන කල්හි මා නිසා මේ භික්ෂු සංඝයා වහන්සේ බිඳෙන සේකැයි කිසි කාරණ දෙයකුත් නෙසිතුයේය. තවද මෙහි භික්ෂු සංඝයා තෙම වේෂයෙන් සිහිමුළාව අපි නුවැණැත්තම්හ. සතර සතිපට්ඨානාදීවූ ආර්ය ධර්මයන් අරමුණු නොකොට කටහයා යමක් කියනු කැමැත්තේ විනම් එපමණක් බස් සබමැද ගෞරවයක් නැතුව කියමින් අලජ්ජි බවට පැමිණෙත් ඒ විවාදය මෙබඳු මහත් ආදීනව ඇත්තේ යයි සලකාගත නොහෙන් නේද, තවද මට අක්‍රොස කළේය. හස්තපාදාදීයෙන් තැළුයේය. කුළුදෙයි ආදිය කියවා මා පැරදවුයේය. මාගේ පරිභෝග වස්තු පැහැරගත්තේයයි යමෙක් තණ පිදුරු ආදියෙන් කුණුමස්වසාලන්නෙකු මෙන් නැවත නැවත වෛර බිඳිද ඔහුගේ වෛරය නොසන්හිඳි ඔහු දුකට පමුණුවන්නේය. යම්කෙණෙක් එබඳු වෛරය තමන් සිත්හි නුපදවා පවතින්ද ඔහුගේ වෛරය වහාසන් හිඳිමට පැමිණෙන්නේය. තවද මේ සත්ව ලෝකයෙහි අන්ත්‍යමෙම අකාරී යනාදීවූ  නව අඝාත වස්තුන් කරණකොටගෙණ උපදනා වෛරයෝ කෙළ කුණු මලමුත්‍රාදී අසුචි වැකිතැන් එම අසූචියෙන් සොධා පිරිසිදුකොට ගත නොහැක්කාමෙන් වෛරයෙන් වෛර සන්හිඳිය නොහැක්කාහ. එබඳු අසුචි වැකිතැන් පිරිසිදු දියෙන් සෝදා පිරිසිදු කරන්නාසේ ක්ෂාන්තිමෛත්‍රී ආදීවු ගුණයෙන්ම සන්හිඳවිය හැක්කාහ. අවෛරයෙන් වෛර සන්හිඳවීම් පෙර බුදුවරයන් ගියාවූ මාර්ගයෙක්ම තවද සඟමැද කෝලාහල කරණ කල්හි අපරීක්ෂාකාරීව නුවනැති භික්‍ෂුහු අපි හැමවෙලේම මරු මුඛයට යම්හයි නොසලන්නාහ. මෙයින් යම් නුවනැති භික්ෂූකෙණෙක් අපි සතනයෙන් මරුමුඛවය යම්හයි නොසලකා ඒ විවාද සන්හිඳිමට උත්සාහ නොකරෙත්නම් ඔවුන් නිසා ඒ විවාදය සන්හිදෙන්නේය. තවද සත්වයන්ගේ ඇටබිඳ තළා පණගන්වා රජදරුවෝ පවාත් අවාහ විවාහ සම්බන්ධයෙන් මිත්‍රභාවයට පැමිණ සමගව වාසය කෙරෙතියි, මහණෙනි ක්ෂන්තිය ගුරුකොට පැවිදිවූ තෙපි කවරහෙයකින් එසේ නොවව්ද, ඉදින් යමෙක් නුවනැතිව තුනුරුවන්හි හටගත් සැදැහැති තමා හා එක්ව වසන්ට නිසිවූ ධෛර්යය සම්පන්න කල්‍යාණ මිත්‍රයෙකු ලද්දේවීනම් ඒ තෙම තමාටවන්නාවූ සියළු උපද්‍රව දුරුකොට සතුටු සිත් ඇතිව සිහිනුවනින් යෙදී වාසයකරන්නේය. තවද මෙලෝපරලෝ වැඩ නොදන්නා අඥනයන් හා එක්ව විසීමට වඩා ඇත්රලින් වෙන්ව වල්හි උදාකළාව වසන්නාවූ මේ පාරිලෙය්‍ය නම් හස්තිරාජයාගේ ගණය හැර තනිව විසීම උතුම්වන්නේයයි තිලෝගුරු බුදුරජානන් වහන්සේ නොයෙක් කාරණා කියාත් ඒ කලහාකාරී භික්ෂූන් සමගි කොටගත නොහී බාලකලෝනා කාරනම් ගමට වැඩ එහි භගුනම් තෙරුන්වහන්සේට සමගිව විසීමෙහි අනුසස් වදාරා එයින් තුන්කල පුතුන් වසන තැනට වැඩ සමගවාසයෙහි අනුසස්වදාර එයින් පාරිලෙය්‍ය නම් වනයට වැඩ එහි තුන්මසක් වාසයකොට නැවත කොසඹෑ නුවරට අවුත් සැවැත්නුවරට වැඩිසේක. එකල කොසඹෑ නුවර උපාසකවරු මේ භික්ෂූහු අපට අනර්ථකාරීහ. මුන්කරණා පීඩා ඉවසාගත නොහි අප බුදුරජානන් වහන්සේ වැඩිසේක. අපි මුන්වහන්සේලාට නමස්කාර නොකරම්හයි සිඟා ආකල ආහාර නොදෙම්හ, එකල මොහු දුරයාමක් හෝ සිවුරු ඇරීමක් බුදුන් පැහැදවීමක් හෝ කරතියි. සනිටුහන්කොට එසේම කළාහුය. භික්‍ෂුහුද ඔවුන් පැවැත්වූ දඬුවමින් පීඩාවට පැමිණි සැවැත්නුවරට ගොස් බුදුන් ක්‍ෂමා කරවාහුය. මෙසේ භාග්‍යවත් වූ සර්වඥයන් වහන්සේ මේ ජාතකය ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා වදාළසේක. එකල්හි දීඝායු කුමාරයාගේ පිය රජ්ජුරුවෝ නම් දැන් සුද්ධෝදන මහරජ්ජුරුවෝය. එකල්හි ඔහුගේ මෑනියෝ නම් දැන් මහමායා දේවිය එකල්හි දිඝායු කුමාරයෝ නම් සියළුසත්වයන් කෙරෙහි පහළ කරුණායෙන් සමතිස් පෙරුම්පුරා සවාසනා සර්වකේළශයන් ප්‍රහීණකොට බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ වදාළසේකී.

SANHIDA LANKA

# මහගිරා ජාතකය

තවද ආත්මාර්ථ පරාර්ථ සාධනයෙන් ලෝකොත්තමවූ ගෞතමනම් අප බුදුරජානන් වහන්සේ එක්සමයෙක දෙව්රම්වෙහෙර වැඩවසන සමයෙහි එක් මහනකු අරභයා මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාළසේක. ඒ මහණතෙම බුදුන් කෙරෙන් කමටහන් ගෙණ කොසොල් දනව්වට ගොස් එක් පසල්ගමක් නිසා විසිය. ඒ ගම්වැසි මිනිස්සු ඒ භික්ෂූහට යාම ඊමට සැප තැන්හී හෝනා ඉඳිනා සෙනසුන් කරවාදී උපස්ථානකළාහුය. ඔහු වස්විසූ පළමුවෙනි මස ඒ ගම ගින්නෙන් දා ගියේය. වපුර බිජු පමණකුදු නොවීය. එයින් ඒ ගම්වැස්සෝ ඒ මහණට පිණ්ඩ බොජුන් දෙන්ට නොහැකිවූ ඒ මහණද සැපසේ සෙනස්නෙහි වසන්නේ සැපද අහර නොලැබීමෙන් සතර මග සතරඵලයට පැමිණෙන්ට නොහැකිවිය. වස් තුන්මස ඉක්බිති බුදුන් විඳිනට ගියාහ ඕහට සර්වඥයන් වහන්සේ පිළිසඳර කථාකොට කිමෙක්ද මහණ අහරින් දුකෙක් නැද්ද. සෙනෙසුන් සැපදැයි විචාරා වදාළසේක. ඒ මහණ ද එපවත් බුදුන්ට දැන්විය. එකල්හි බුදුරජානන් වහන්සේ මහණ මහණුන් විසින් නම් සැප සෙනස්නක් ඇත ප්‍රත්‍යයෙහි ලොල්ව හැසිරීම්හැර ලද මේ කිසිවක් අනුභව කොට මහණ දම් පිරිය යුත්තේය. පෙර නුවනැත්තෝ තිරිසන් යෝනියෙහි ඉපිද තමා වසන රුක මළ කල්හි එහි සුනු අනුභවකන්නාහුම ලෝභ සංචාරය හැර මිත්‍රධර්ම නොබිඳ අන්තැන්හි නොගොස් විසුවාහුය. තෝ කවරහෙයකින් ආහාර ස්වල්පය රුක්ෂය සැප සෙනස්නහැර ආයෙහි දැයි වදාරා ඔවුන් විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේද යත්

එක්සමයෙක්හි හිමවත දිඹුල්වනයක නොයෙක් ලක්ෂ ගණන් ගිරව් විසූහ. එහි එක් ගිරා රජෙක් තමාවසන රුක ගෙඩි ඇතිකල්හි ගෙඩි අනුභව කොට ඒ නැතිකල්හි දළු සුඹුලු අනුභවකොට ගඟින් පැන්බී අනික් රුකකට නොගොස් ඉතා අපිස්සතොස්වවසන්නේය. ඔහුගේ අපිස් සතොස් ගුණයෙන් ශක්‍රභවන කම්පා විය. සක්දෙව් රජ විමසනුයේ ගිරා රජ්හු දිවසින් දැක ඔහුගේ ගුණ විමසනු සඳහා තමාගේ ආනුභාවයෙන් දිඹුල් රුක දිරවා අතුවෙලෙප් නැතිකණු පමණක් කෙළේය. ඒ තෙම උඩින් යටින් කළ සිදුරෙන් වැහෙන සුනු පමණක් ඇතිව සිටියේ ඒ ගිරාරජද ඒ සුනු අනු භවකොට ගඟින් පැන්බී අවුසුලගින් වන් දුක නොතකා දිඹුල් කණුව මත්තෙහි උපන්නේය. ඒ දුටු සක්දෙව්රජ ඔහුගේ උතුම් ගුණය දැක ඔහු ලවා මිත්‍ර ගුණය කියවා වරයක්දී දිඹුල් රුක අමා ඵලකොට එමියි සිතා එක් හංසරාජවේසයක් මවාගෙණ එම හංසධෙනුව සුජාතානම් අසුර කන්‍යාවත් ඉදිරිකොට දිඹුල් වනයට ගොස් ඒ මළ රුකට නුදුරු තෙනකහිඳ ඒ ගිරා රජහු හා සමඟ කථා කරණුයේ එම්බා ගිරා රජ්ජුරුවෙනි මිත්‍ර භාවය නැසුනුරුක යම්කළෙක මධුර ඵල ඇත්තේද එකල පක්ෂීහු අත්තෙන් අත්තට පැන ඇවිද ඵල අනුභව කෙරෙති. යම් කලෙක ඵල නැත්තේද එකලඵල නැතැයි දැන ඒ ඒ දිගයන්නා හුවෙති. පබළු කළඹක් මෙන් රත්වූ මුඛතුඩයක් ඇතිව වසනකල වෙනෙහි පලාවන් පැයමෙන් නිල්වූ පියාපත් ඇති එම්බා ගිරා රජ්ජුරුවෙනි කුමක් නිසා තෙපි වනාහි හැසීරීම් යහපත, කුමට මෙහි නිරාහාරව ඉඳ මියව්ද? තොප මෙම කණුවේ නොහැර ඉඳිනා කාරණය මට කියවයි කියේය. ඒ ගිරාරාජ හංසයාට තමා කෙළෙහිගුණ දන්නා බව හා එයින් ඒ රුක නොහරනා පරිදි කියන්නේ එම්බල හංසය යම් කෙණෙක් යම් කෙණෙකුන්ටය හළු වුනම් නුවනැති මහතුන් ගුණ සිහිකරන්නාවූ ඔහු තමන්ගේ යහළුවන් භෝගසම් පත්තියෙන් පිරිහුනත් ජීවිතාන්තය දක්වා සුව දුක්හි ඔවුන් නොහැරණහුමය මමත් ඒ සත්පුරුෂයන් අතුරෙන් එක්තරා එකකම් එයින් මේ රුක මට ප්‍රිය වඩන හෙයින් ඥාතීද වන්නේය. එක්ව බොහෝ කලක් පුරුදු බැවින් මිත්‍රද වන්නේය. එබැවින් මාගේ දිවිරැකීම නිසා පිරිහුනාවූ මේ රුක්කාණුව හැර අන් තැනකට නොයෙමි එසේයාම ගුණධර්මයෙක් නොවෙයි කීයේය. එකල සක් දෙව්රජවරයෙක් දෙනුකැමැත්තේ පක්ෂ පත්‍රයම යානාවක් කොට අහස සචාරණය කරන්නාවූ එම්බා ගිරාරජ්ජුරුවෙනි මිත්‍රභාවය ස්නෙහය ප්‍රකාශවූ විශ්වාසය යන මේ ගුණ තුන යමෙක් කැමැත්තේ විනම් ඒ නුවණැත්තවුන් විසින් ප්‍රසංශා කරණු ලබන්නේය. ඒ සියලු ගුණයෝ තොප කෙරෙහි ඇත්තාහුය. එසේ හෙයින් තොපට වරයක් දෙනු කැමැත්තෙමි. තොප කැමති දෙයක් ගණුවයි කීයේය. ඒ අසා ගිරාරජ්ජුරුවෝ වර ඉල්වන්නාහු එම්බල හංසය මේ රුක නැවත ඕජා සහිතවේද විහිදුනු අතුපතරින් හා හටගත් මධුරඵලායෙන් යුක්තවේද ඒ වරය කැමැත්තෙමි කීහ. එසේකී ගිරාරජහට වරදෙන්නාවූ සක්දෙව්රජ තෙම එම්බා ගිරා රජ්ජුරුවෙනි එසේ වූවහොත් මහත් අතුපතරෙන් හා ඵලපත්‍රයෙන් යුක්තවූ මේ රුක නොදත්තෙහිය. මේ රුක හා තාගේ සහවාසයද වන්නේය. ඇසිල්ලකින් මේ රුක නොදත්තෙහිය. මේ රුක මධුර ඵලගෙණ සිටින්නේයයි කියා ඒ ශක්‍රදේවේන්ද්‍රතෙම් තමාගේ හංසවේසය හැර සුජාතාවන් හා සමග දිව්‍ය රූපයෙන් සිටි ගඟින් දිසාගෙණ දිඹුල් කණුවෙහි වත්කළේය. එණෙහි ඒ කණුව අතුවෙලෙප් දළු කොල මිහිරි ඵල ගෙණ මුඩු නිල්මිණි පවුරක්මෙන් බබලමින් සිටිසේක. ඒ දැක සක්දෙව් රජහට ස්තුති කරණ ගිරාරජ්ජුරුවෝ එම්බා ශක්‍රදේවේන්ද්‍රයෙනි අද මේ ඵල පත්‍රශාඛාවෙන් විචිත්‍ර වූ මේ රුක දැක මම්මය බඳු සතුටකට පැමිණියෙම්ද තොපිද එසේ තොපගේ නෑයන් හා සමඟ සතුටුවයි කීයේය. ඉක්බිති මෙසේ ඒ වෘක්ෂය සත්‍රශාඛාවෙන් සරහා තමාගේ දිව්‍යපුයටම ඒ ශක්‍රදේවේන්ද්‍ර තෙමෙ ගියේය. අප තිලෝගුරු සම්‍යයක් සම්බුද්ධ සර්වඥරාජෝත්තමයන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි මෙසේ පුරාතනයෙහි නුවනැත්නාහු තිරිසන් ජාතියෙහි ඉපිද ප්‍රත්‍ය ලෝභය හැර වාසය කළාහුය. තෝ මේ නෛයිර්නික ශාසනහි මහණව කවර හෙයකින් ප්‍රත්‍ය ලෝභයෙන් යුක්තව හැසිරේදැයි අවවාද කොට කමටහන් දී ඔහු පළමු විසුතෙනටම ගමන් කැරවූසේක. ඒ මහණද එතැන්හි ගොස් පඤ්චස්කන්ධය බවවයහෙයින් දක්නේ රහත් ඵලයට පැමිණියේය. එකල සක්දෙව්රජානෝ නම්

SANHIDA LANKA

දැන්මේ ශාසනහේි අනුරුද්ධ ස්ථවිරයෝය. ගිරා රාජ නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සුළුසුව ජාතකය

තවද එක් සමයෙක්හි බිය සසර හරණ අසරණ සරණ කරුණා නිධානවූ අප බුදුරජානන් වහන්සේ විපත්තියට සැවැත්නුවර නොහැර දෙව්රම් වෙහෙර විහරණය කරණසේක් තමන් වේරංජා නුවර විසූ කරුණු අරභයාමේ ජාතක ධර්මදේශනාව දක්වා වදාළසේක. බුදුන් වේරංජා නුවර වස්වැස වස් පවරා ඒ පුරහැර දෙව්රම් වෙහෙරට පැමිණි කල්හි ධම්සභා මණ්ඩපයෙහි රැස්ව උන් භික්ෂූහු ඇවැත්නි අප තථාගතයන් වහන්සේ විපත්තියට නොපත් සම්පත්තියෙන් මහත් කැත්කුලෙහි උපන් ලත් බැවින් හාසදෙස් කෙලෙස් සතුරන් නසා නිදොස් පිරිසිදු බුදුබැව්ලත් බැවින් ඉතා සිව්මැලිසේක. මහත් සෘද්ධිමහිම ඇතිසේක. එතකුදු වුවත් වේරංජා නුවර වැසි වේරංජා නම් බමුණගේ පැවරීමෙන් වස්ලැබ වසවත් මරු කළ සිත් පෙරළියෙන් සිහිනොලත් ඒ බමුණාගේ එක දවසකුත් මදකුත් ආහාරයක් නොලැබද ලොහසංවාරය හැර දවස් පතා නැලියක් යවසාලින් කලපිටි දියත්තකින් එපමණකින් වස් තුන්මසක් අන් තැනකට නොගොස් විසූසේක. බුදුන්ගේ අපිස්සතොස් ගුණය ඉතා ආශ්චර්ය යයි කීවාහුය යම් සර්වඥයන් වහන්සේ එබස් දිවකනින් අසා දම්සභා මණ්ඩපයෙහි වැඩ බුද්ධසාසනයෙහි වැඩ හිඳ එම්බා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි මෙතැන්හි කවර කථාවක් පහළකොට උනුදැයි විචාරා මෙනම් කථාවකින් යෙදී උනුම්හයි දැන්වූ කල්හි මහණෙනි දැන් සව්නේ දැන බුදුවූ බුදුවරයන්ගේ ලොල් සසරින් දුරුවීම ආශ්චර්ය නොවෙයි, පෙරතිරිසන් යෝනියෙහි උපන්නා හුද ඔහු ලෝභසංචාරය හැර විසුවාහුවේදැයි වදාරා ඒ අසනු කැමති මහණුත් විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

පෙර එක්කලෙක හිමවත තුමුල් දිඹුල්වනයෙක නොයෙක් දහස් ගණන් සුවගණයා විසූහ. ඔවුන් අතුරෙහි එක්ගිරවෙක් තමාලත් නාරුක එල කල එල අනුභවකොට සෙසු කල කොල දළු සුඹුළුකා ගඟදියබිහැපි උන් රුකින් අන් රුකකට නොගොස් අපිස්සතොස් ගුණයෙන් වෙසෙයි ඔහුගේ මෙම ගුණමහිමයෙන් මහමෙර ගිරිමුදුනෙහි පිහිටි පුරඳුරුපුර කම්පාවිය. එවිට දහස් නැනසකින් සක්වළ බලන සක්දෙව්රජානෝ එබඳු ගුණවතුන් ඒ බෝසතුන් දැක ඔහු ගුණ විමසනු නිසා තමා මහිමයෙන් හිමවත සුහුඹුල් දිඹුල් රුක නොවෙලා වියලා වෙලෙප් දලු කොළ සුඹුළු නැති උඩින් යටින් ඇඳුරු සිදුරු නැති සිදුරුව සුනු වැහෙන දිරුණු කණු පමණක් කෙළේය. ගිරා රජද එසේ වුවද එහි සුනුඅනුභවකොට ගගින් පැන් බී ලොබින් අන්රුකත් කරා නොගොස් අවුසුලඟින් දිඹුල් සිදුරු ඇතිව එම දිඹුල් කණුව මත්තෙහි උන්නේය. එසඳ සක් දෙව්රජද පෙරසේ ඔහුගේ මිත්‍ර ගුණය ලොවට දන්වා ඒ රුක අමා එලගන්වා එම්ය සංසාරද වෙසින් එම වෙස්ගත් සුජාතාවන් හා සමග අවුත් ඒ දිරුණුතුරට නුදුරුතුරු අතුරෙක හිඳ මහබෝසතානන් වහන්සේ සමඟ කථාකරණුයේ එම්බා ගිරා රජ්ජුරුවෙනි තොපගේ පියාපතර මෙන් නිල්වූ අතුපතුරෙන් නිලඹරසේ හොබිනාවූ තොපගේ තුඩවැනි රන්විලිකුන් එලයෙන් පියුම් රා මිණිරුවන් ගහණ නිල් ජලතලාවක් මෙන් බබලන බොහෝ දිඹුල් රුක් මෙහි හාත්සප රැඳි සිටියේය. එතකුදු වුවත් තෝ මළ කණුවෙහි බැඳි ඉන්නාක්මෙන් මේ මළ කණුවෙහි උන්නේය. කවරහෙයකින් මේ කණුමරවැල්ලෙහි ආලය කෙළෙහිදැයි විචාළේය. එබසට ගිරා රජ්ජුරුවෝ එම්බල හංසය බොහෝ දවස් මේ ගස වැස රසඑල විලිකුන් අනුභව කළම්හ. එයින් රුක එල නැතත් පළමුවෙන් සිත්ම දැනුත් තරකරම්හ. හංසරාද මේද එක් සත්පුරුෂ ධර්මයෙකැයි කීයේය. එබසට හංසරාජතෙම එම්බා ගිරා රජ්ජුරුවෙනි වගුල කෙල ඇති වියළි සළ ගස පකක්ෂිහූ විපක්ෂී මෙන් නිරපේක්ෂය හැරයෙති. ඒ පක්ෂීන් එසේ යා මෙහි තොපි කවරදෝෂයක් දැක නොයව් යයි විචාළේය. එසේ විචාළාවූ සංසයාට කාරණා රක්වන්නාහු රුක සේවනය කෙරෙද්ද, එල නැති කල නිෂ්පලයයි හරිද්ද අත්වැඩ මිස ජරා වැඩ නොතකන ඒ පක්ෂීහු මිත්‍ර පක්ෂය නසන හෙයින් පක්ෂපාත නම් වෙතියි වදාළසේක. එබසට ඒ හංසතෙම එම්බා ගිරා රජ්ජුරුවෙනි යහළු බවද මෛත්‍රීයද කාමරාග විස්වාසයෙන් අන්‍යවූ ප්‍රකාශ විශ්වාසයද යන මේ උතුන් ගුණයන් යමෙක් කැමැත්තේ වී නම් ඒ නුවනැත්තවුන් විසින් මරාමිනින්නිපන්නාක් වැනි පියාපතරින් හා රන් මැනිකෙන් කලාක් වැනි මුව තුඩින් රුවන් රුවක් මෙන් බබලන අනගි ගුණ මිණිගණ ගිහිණි ගිරා රජ්ජුරුවෙනි තොපට සතුටුවූ වරයක් දෙන්නෙම් තොප කැමැත්තක් ඉල්වා ගණුවයි කීයේය. එබසට බෝසතානන් වහන්සේ වදාරණසේක් එම්බල හංසරද අද යම් වරයක් දෙනු කැමැත්තෙහි නම් හුනු දිරුණු මේ රුක්කණුව පිරුණු රුකක්මෙන් එල පත්‍ර ශාඛා වෙත් සැරහුනා දක්නා කැමැත්තෙමි. ඒ එසේමය, මා හැඟි නිධානයක් ලද දිලින්දක් හුමෙන් මෙවන් රුකදැක නිරන්තරයෙන් සතුටුවෙම්ද එබඳු වරයක් දෙවයි වදාළසේක. එසඳ සක්දෙව්රද හංස වේසය හැර දිව්‍යවේසය ගෙණ සුජාතාව හා සමග නොපමාව දියගෙණවුත් අමාවක්මෙන් ඒ රුක්හිනි මාලය එකෙණෙහි ඒ රුක්කණුව බෝසතානන්ගේ සිහිල් කුලුනු ගුණවත් සෙවන කෙරෙමින් පිරුණු බුදුකුරුදම් ලොවට පහලවන්නාක් මෙන් තුරුණු අකුරු දළුපතර මියුරු රසඑල විහිදී අතුපතර ඇතිව පෙණුනේය. එසේ පහළවූ රුක දැක සක්දෙව්රජහට සතුටුව ස්තුතිකරණ මහබෝසතානන්

SANHIDA LANKA

වහන්සේ එම්බා සක්දෙව්රජානෙනි. අද මේ නොමද පෙලෙන් මනනද මෙරු කලක් මම පැහැද යම් සැපයකට පැමිණියෙම්ද එසේම තොතපිද පුරරද ඉසුරෙන් ඇමසඳ සුවපත් වේවායි වදාළසේක. එසඳ සක්දෙව්රජානෝ මෙසේ බෝසතානන්ගේ සිත සතුටුකොට අහසට පැණනැගී අවට පිහිටි රුවන් දොරටු දහසකින් හැඳුම්ලත් තමන්ගේ පුරයටම ගියේය. මෙසේ සියළු ලොව පතල මහාකරුණා ඇති බුදුරජානන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර නිමවා වදාළ සේක. පෙර ඒ අපලත් රුක සඵල කළ සක්දෙව්රජානෝ නම් දැන් මේ ශාසනයෙහි කිසිකෙණෙකුන් විසින් විරුද්ධ නොකොටහැකි ගුණමහිම ඇති අනුරුද්ධ ස්ථවිරයෝය. දිරාමගුලතුර නොහැර මිතුරු ගුණ පුරා ඒ ගිරා රජ්ජුරුවෝ නම් දැන් සව්නේ දැන විනේ දැනනිවන් පුරලන මම්ම වේදැයි තමන් වහන්සේ ගෙණ හැර දක්වා වදාළසේකී.

SANHIDA LANKA

# හාරිත ජාතකය

තවද එක්සමයෙක්හි තුන්ලොවට පහළවන නව අරහාදී බුදුගුණයෙන් අප්‍රතිමයවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි චතුර්විද ආර්යවිහ වර්ණයෙන් යුක්තව වාසය කරණ සේක් වස්ත්‍රාභරණයෙන් සැරහී සිටි මාගමක දැක සිත උපන් බලවත් රාගයෙන් සස්නෙහි දුකින් දිවිපවත්වන මහණෙකු අරභයා මේ ජාතකය දක්වා වදාළසේක. දික්නිය ලොම් කෙස් ඇති සිව්ර හරණා කැමතිව සිටියාහු දැක අඳුරු තෙරුන් විසින් නොකමා පරිද්දෙන් තමාකරා කැඳවාගෙණ ආ ඒ මහණහට හැබෑද මහණ තෝ සස්නෙහි උකටලී වූ යෙහිදැයි විචාරා ස්වාමිනි සැබැවයි දැන්වූ කල්හි ඊට කාරණා කවරේදැයි වදරා සැරහුනු ස්ත්‍රියක දැක සිත උපන් කෙලෙස්නිසායයි දැන්වූ සඳ මහණ කෙළෙස් නම් සියළු ගුණනගණ කෙණෙක මඳ අස්වාදයක් නැත්තේය සතර අපායෙහි උපදනේය. කේල්ශයෝ කවර හෙයකින් තා මැඩනොපවත්නේද ඒ එසේ මය මහමෙර පැහැර උපුටාගෙණ යන තරම් මහ පවණ පරණලාපතෙක පැකිල සිටින්නේ නොවෙයි. මේ කේලශයා නිසා බෝධිසත්වයන් පුරණ ලද පඤ්චාභිඥා අෂ්ට සමාපත්තියෙන් පිරිසිදු මහපුරුෂයෝ පවා ස්ත්‍රීරූපය දැක සිහි එලවා ගතනොහි ධ්‍යානයෙන් පිරිහුනාම වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

පෙර බරණැස් නුවර බඹදත්ත නම් රජක්හු රජ කරණ සමයෙහි අප මහා බෝසතානන් වහන්සේ අසූකෙළක් ධන ඇති බමුණුකුලයක උපන් සේක. රන් වන්වූ ශරීර ඡවි ඇති බැවින් ඕහට හාරිත කුමාරයෝ යයි නම් තුබුවාහුය. ඒ තෙම වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන්ගෙන් උගත් ශිල්ප ඇත්තේ දාරපරිග්‍රහකොට මව්පියන්ගෙන් ඇවෑමෙන් රැස්කොටතිබූ අසූ කෙළක් වස්තු දැක මේ වස්තුව පෙණෙන්නේය. මේ වස්තුව ඉපදවූ පුරුෂයෝ දක්නා නොලැබෙති. මා විසිනුත් මරහු මුඛයට පැමිණ සුනුවිසුනු විය යුතුයයි මරණ හයින් හයපත්ව මහදන්දී හිමවතට වැඳ තවුස් පැවිදිවූ සත්වෙනිදා පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා වනමුල් වනඵල අහරින් එහි කලක් වැස එනු ඇඹුල් සෙවුනා පිණිස හිමවතින් බැස ගම් නියම්ගම් පිළිවෙළින බරණැස් නුවරට පැමිණ රජ උයන්ලැග දෙවෙනිදවස් බරණැස් සිඟා ඇවිදිනාසේක් රජගෙයි දොරට පැමිණිසේක.  බඹදත් රජ උන් වහන්සේ දැක පන්සියක් ඇත්තේ කැඳවා නගන ලද සේසත් ඇති සිංහාසනයෙහි වඩා හිඳුවා නොයෙක් රස බොජුන් වලඳවා අනුවෙමැනි බණ අසා ඉතා පැහැද වහන්ස කොයි වඩනාසේක්දැයි විචාරා මහරජ වස්වසන තැනක් බලායම්හයි වදාළ කල්හි වහන්ස එසේ දැයි විචාරා එසේයයි වදාළ ඉක්බිති උන්වහන්සේ කැඳවා ගෙණ උයනටගොස් උන් වහන්සේට හෝනා හිදිනා සෙනසුන් කරවාදී උයන් ගොව්වා අත්පා මෙහෙවර කරණුකොට සලස්වා වැඳ අවසරගෙණ ගියේය. මහබෝසතානන් වහන්සේ එතැන්පටන් දොලොස් අවුරුද්දක් නිබද රජගෙයි වළදා උයන්හි වාසය කළ සේක. එක් දවසක් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සතුරන් ගෙන් කිපුනු පසල් දනව්ව සන්හිඳුවා ලනු පිණිස යනුවෝ අපගේ පින්කෙත නොනාසා රක්ෂා කරවයි කියා මහබෝසතානන් වහන්සේ අගමෙහෙසුන් බිසවුන්ට භාරකොට ගියෝය. එතැන් පටන් දේවිතොම මහබෝසතානන් සිය අතින්  වළඳවන්නීය. ඉක්බිති එක් දවසක් මධුරාහාරය සපයා තිබා බෝසතානන් කල්යවනුයෙන් තොමෝ වඳ පැන් නහා සීන් සිළුටු සළුවක් හැඳ සිව් මැදුරු කව්ළු දොරහැර ඇඟ පවන්ගසමින් මිටි ඇඳෙක ගොත්තිය. බෝසතානන් වහන්සේද ඉතා දහවල් කොට හැඳ පෙරව භික්ෂාභාජනය ගෙණ අහසින් ඇවිත් කවුළුදොර සමීපයට පැමිණි සේක. වඩනා ඒ බෝසතානන් වහන්සේගේ වාක් විචාරයෙහි ශබ්දය අසා වෙලෙව්ව, ඇඳින් නැගී සිටියා බිසවුන්ගේ සිළුවූ මදක් ලිහිල්ව ඉනින් ඉනිහිණි ඒ විෂභාග රම්මණය මහබෝසතානන් වහන්සේගේ ඇසට අරමුණ විය. නොයෙක් කෙළ ලක්ෂගණන් අවුරුදු මුළුල්ලෙහි සිත් සනහා විසූ රාගය පෙට්ටියක හොත් සර්පයෙකු මෙන් උත්ගතව ධ්‍යානය නැසීම. ඒ තෙම සිහි එළවා ගත නුහුනුයේ ගොස් බිසව අතගෙණ ලෝකාස්වාද රතියෙන් යෙදී ආහාර වළඳා නැවත උයනටම ගියේය. එතැන් පටන් දවස්පතා එසේම පැවැත්තේය. එසේ පවත්නා තාපසයන් වහන්සේගේ ඒ රහස මුළු නුවර ප්‍රකාශ වුයේය. නුවර රැකවල සිටි අමාත්‍යයෝ ඒ බව පත්‍රලියා රජ්ජුරුවන්ට ගමන්කරවුවාහුය. රජ්ජුරුවෝ ඒ අසා අමාත්‍යයෝ තාපසයන් කෙරේ මා බිඳුවනු කැමැත්තාහුවනැයි අදහා නොගෙණ පසල් දනව්ව සෙමෙහි තබා බරණැස් නුවරට නැවත අවුත් නුවර පැදකුණුකොට රජගෙට වැද බිසවුන් වසන ගෙට ගොස් සැබෑද සොඳුර අපගේ ආර්ය වූ තාපසයන් වහන්සේ තොප කෙරෙහි වරදවා පැවතිසේක්දැයි විචාළේය. එසද බිසව සැබැවයි දේවයන් වහන්ස කීවාය. එත් රජ්ජුරුවෝ අදහා නොගෙණ තාපසයන් වහන්සේම විචාරම්යි උයනට ගොස් බෝසතානන් වැඳ එකත්පසව හිඳ කාරණය විචාරන්නාහු එම්බා තාපසයන් වහන්ස නුඹ වහන්සේ අසධර්ම සේවනය කෙරෙතියි අප විසින් අසන ලද කිමෙක්ද එය සැබෑබසෙක්ද. නොහොත් බෙරු බසෙක්දැයි විචාළේය. එකල්හි බෝසතානන් වහන්සේ ඉදින් මේ රජ මා බොරුයයි කීවත් අදහාගන්නේය. එසේද වුවත් සත්‍යවචනය වැනි මෙලොවට පිහිටෙක් නම් නැත්තේය. සත්‍ය වචනයෙන් දුරුවූ කෙණෙක් බෝමැඩ ඉඳ බුදුවන්ට නොහැකිවෙති එයින් මා විසින් සැබෑවක්ම

SANHIDA LANKA

කියයුතුයයි සිතුසේක. ඒ එසේමය බෝධිසත්වයන්ට කිසිකලෙකත් ප්‍රාණඝාතයද, අදත්තාදානයද කාමමිත්‍යථාචාරයද, සුරාපානයද, සිද්දවන්නේය. කවර කලෙකත් තුන් අගින් යුක්ත එම්බා මහරජ්ජුරුවෙනි තොප විසින් යමක් ඇසිමියි කියන ලද ඒ සැබෑ දෙයක්ම එය සියළු සත්වයන් මෝහකරවන්නාවූ කාය ගුණයෙහි මමත් මුළාව අසත්ථයට පැමිණියෙමි වදාළසේක. එබසට රජ්ජුරුවෝ එම්බා තාපසයන් වහන්ස මෙලොවගිලන් මිනිස්සු තමන්ට උපන් ව්‍යාධිය ඖෂධයෙන් සන්සිඳූවා ගනිති. උපන් පිපාසය දියෙන් සන්සිඳූවාගනිති. නුඹ වහන්සේ වූ කලි සිත උපන්නාවූ රාගය කිසිසේත් දුරුකොට ගත නුහුනුසේක. එසේ කල මේ සූක්‍ෂම අර්ථ සිතීමට සමර්ථ වූ නුවනින් ප්‍රයෝජන කවරේදැයි කීයේය. එසේ කී රජහට ඒ කෙළෙසුන්ගේ දැඩි බව හා එහි නුවන නොපවත්නා බව දන් වන්නාවූ මහබෝසතානන් වහන්සේ.

චත්තාරො මෙ මහරාජ ලොකෙ අතිබලා භුසා

රාගො යදාසො මාදො මොහො යත්ථ පඤ්ඤා නාගාධති

යන මේ ගාථාවෙන් එම්බා මහරජ්ජුරුවෙනි මේ ලොව්හි සියළු සත්වයන්ට අනර්ථ කිරීමට අසමර්ථ වූ අධික බල ඇති වස්තුහූ  සතරදෙනෙක් වෙති. ඔහු කවරේද ශිලසමාධ්‍යාදී බොහෝ ගුණ එකවිට නසන හෙයින් රාගයද එක් බලවත් එකෙක ක්‍ෂාන්ති මෛත්‍රී ආදීවූ විශිෂ්ට ගුණයන් නසන හෙයින් වෙෂයද එක් බලවත් එකෙක. බොහෝ කලක් පුරුදු ශිලසංවරාදීවූ සති විප්‍රවාසයට පමුණුවා අනර්ථකාරී හෙයින් පුරුෂමදාදීවූ මදයද ඉතා දැඩි බලවත් එකෙක. අමෘත මහා නිර්වාන ප්‍රතිලාභයට කාරණ වූ අනිත්‍ය දුක්ඛ අනාත්ම ස්වභාව පරිඥානය මැඩ පවත්නා හෙයින් මෝහයද දැඩි බලවත් එකෙක යම්සේ ගැඹුරු මහවතුරෙහි වැටුන එකෙක් එහි පිහිාන සිටිය නොහේද එසේම මේ කෙලෙසුන් උපන් සිත නසන පැවති ප්‍රඥාවෙන් පිහිට නොලබන්නේයයි වදාළසේක. ඒ මහබෝසතානන් වහන්සේගේ තෙපුල් අසා බඹදත් රජ්ජුරුවෝ ස්වාමිනි තාපසයන් වහන්ස නුඹ වහන්සේ පිරිසිදුයයි කියාද ශිල්වත් කියාද නික්ලේශී යයි කියාද ස්භාවික ප්‍රඥා ඇතිසේකැයි කියාද අප විසින් සලකණ ලද්දේ පව්දැයි කීයේය. එබසට හාරිත තාපසයන් වහන්සේ එඹා මහරජ්ජුරුවෙනි ශුභාකාරයෙන් රාගයහා පැවැත්තාවූ ලාමකවූ අකුශල විතර්කයෝ ධ්‍යානසමාපත්ති ආදී විශේෂ ගුණයෙන් යුක්ත බලවත් නුවනැති සෘෂිවරයනුත් නස්නාහුම්යයි වදාළසේක. ඉක්බිති ඒ මහබෝසතානන්ගේ සිත උපන් කෙලෙසුන් දුරුකිරීමෙහි උත්සාහ වඩන්නාවූ බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෝ එම්බා තාපසයන් වහන්ස නුඹ වහන්සේගේ සිත උපන් මේ රාගය නම් ශරීරවර්ණය හා ගුණවර්ණය නසන්නේය. ඒ දුෂ්ටවූ රාගචේතනාව දුරුකළ මැනව. ඒ එසේමය, නුඹ වහන්සේ ලොව බොහෝ දෙනාට නුවැනිත කෙණෙකැයි අභිමතසේක් මයයි කීයේය. ඉක්බිති පුරණ ලද බෝධිසම්භාර ඇති ඒ මහබෝසතාණන් වහන්සේ සිහි එලවා වස්තුකාම ක්ලේශකාමයෙහි ආදීනව සලකා වදාරණ සේක් එම්බා බ්‍රහ්මදත්ත රජ්ජුරුවෙ නුවනැති ඇස අන්ධකරණ හෙයින් මේ රාගාදී ක්ලේෂයෝ අන්ධකාරයක් වැන්නේය. තමන් උපන් චිත්තසන්තානයෙහි කුසල් නසන හෙයින් හා කෘරවූ විපාක දෙනහෙයින් විෂයක් වැන්නේය. දෙලොව නසනයෙක් දුක්ඛදායකවෙති එසේ හෙයින් ඔවුන් නසනු කැමැත්තාවූ මම නුවනින් මෙනෙහි කිරීමයයි කියන ලද ඔවුන්ගේ උත්පත්ති කාරණා සොයන්නෙමි. මෙසේ රාරෝත්පත්ති කාරණය දුටුවාවූ මම සුභනිමිත්තාදී බන්ධනයෙන් යුක්ත රාගය ප්‍රඥා නමැති බද්ධයෙන් කපා හරිමි. මහරජ මට මදක් අවසර දෙවයි අවසරගෙණ පන්සලට වැද කිසුනු මඩුල්ල බලා නුවතත් රූපරූප ධ්‍යානයන් උපදවා අහස බද්ධපර්යංකයෙන් වැඩ හිඳ රජ්ජුරුවන්ට ධර්මදේශනා කොට මහරජ මම අවස්ථානයෙහි විසුනියා මහජනයා මැද මෙබදුවූ නින්දාවට පැමිණියෙමි. එසේහෙයින් සත්ව සංචාර විරහිතවූ හිමාලවනයටම යන්නෙම් තෙපිද කුසල් කිරීමෙහි පමානොවෙයි කියා රජහු අඬ අඬා සිටියදීම සත්පරාක්‍රම ඇති එර් තාපසයන් වහන්සේ නැවත හිමාලවනයටම ගොස් නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයෙහි උපන්සේකැයි චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ ජාතක ධර්ම දේශනාව නිමවා වදාළ සේක. මේ චතුස්සත්‍ය ධර්මදේශනාවගේ අවසානයෙහි උකටලී ඒ මහණ රහත් බැව්හි පිහිටියේය. නැවත සර්වඥයන් වහන්සේ එම්බා මහණෙනි එකල ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ නම් දන් මේ ශාසනහෙි ධර්මභාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරයයෝ. හාරිත තාපසයෝ නම් දන් මේ ලොව්තුරා බුදුවූ මමම වේදැයි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# රජොවාද ජාතකය

තවද මහර්ෂිවූ සර්වඥරාජෝත්තමයානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් රාජෝවාදයක් අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වනාහී රාජෝවාදය විස්තර වශයෙන් තේ සකුණ ජාතකයෙහි පෙණන්නේය. මෙහි සර්වඥයන් වහන්සේ කෝසල රජ්ජුරුවන්ට වදාරණ සේක් මහරජ පෙර රජදරුවෝ දසරාජ ධර්මයෙන් අකෝප්‍යවරාජ්ජය කළෝ වේදූයි වදාරා ඒ කෙසේදූයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක. යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරන්නාවූ දසරාජධර්මයෙහ්න යෙදි රාජ්ජය කෙරෙමින් තමන්ගේ නුගුණයක් කියනකෙණෙක් ඇද්දෝහෝයි අන්තඃපුර පිටිපුර විපීපුර නුවර මුලුල්ලෙහි පරීක්ෂා කොට තමන්ගේ නුගුණයක් කියන කෙණෙක් නැතිහෙයින් පිටිනුවර ගොස් පිටිනුවරත් තමාන්ගේ නුගුණයක් කියනකෙණෙකුන් නොදක වනාන්තරයට යෙමි හිමාලයට ගොස් බෝධිසත්වයන් වහන්සේ තපස් කරණ පන්සලට පැමිණියාහ. බෝධිසත්වයානන් වහන්සේත් රජ්ජුරුවන් දක ගමන් ශ්‍රමදාහ නිවාමේ නුගපත් ශකිරා රසවැන්නමේ අනුභවකොට පැන් බී සැතපී ගණුවයි කියා දුන්සේක. රජ්ජුරුවෝත් නුගපත් අනුභව කොට තාපසයන් වහන්ස නුගපත් නම්තිත් රසය. මේ පැනිරසවන්ට කාරණා කිම්දූයි විචාලාහ. එවිට බෝසතානන් වහන්සේ වදාරණ සේක් පින්වත් පුරුෂය රජදරුවන් ධර්මිෂ්ඨවරාජ්ජය කරණ හෙයින් මේ නුගපත් තිත්රසය නැතිව පැණිරස වන්නේයයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ රජ්ජුරුවන් ධර්මිෂ්ට කල නුග පත් පැණිරස වන්නේත් අධර්මිෂ්ට කල තිත්ත රස වන්නේත් ඊට කාරණා කිම්දූයි විචාළාහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු පින්වත් පුරුෂය රජදරුවන් අධර්මිෂ්ඨවූකල පොලොවරසයද සරියනක් පාතබැසපොලොව ඕජාව නැතිවෙයි. එහෙයින් නුගපත් තිත්ත රසවන්නේ යයි කීහ. එවිට රජ්ජුරුවෝ රජ දරුවන් අධර්මිෂ්ට වූ කල නුග පත් තිත්රසය වේදූයි කිය රජ්ජුරුවෝ තමන් රජබව නොහඟවා තමන් බරණැස් නුවරට ගොස් තාපසයන කීබස පරීක්ෂා කෙරෙමි සිතා නොබොදවසක් අධර්මිෂඨව රාජ්ජ්‍යය කොට තාපසයන් කී බස සැබෑව පොරුව පරීක්ෂාකෙරෙමියි ඉඳින් නුගපත් කවයි දුන්කල රජ්ජුරුවන්ට තිත්තට ගියේ නම් තපසයන් කී බස සැබෑව් පැණිරස විනම් තාපසයන් කි බස බොරුයයි සිතා මේ නියායෙන් නොබෝ දවසක් අධර්මිෂ්ටව රාජ්ජ්‍යකොට දෙවැනිවත් හිමාලවනයට බෝධිසත්වයන් ලඟට ගියාහ. බෝධිසත්වයෝ පළමු පරිද්දෙන් නුගපත් කවයි දුන්හ. රජ්ජුරුවෝ නුගපත් සපා තිත්තරස හෙයින් කෙල සමග නුගපත් තාපසයන් වහන්ස නුගපත් තිත්රසයයි කීහ. එවිට බෝධිසත්වයන් වහන්සේ වදාරණ සේක් පින්වත් පුරුෂය රජ්ජුරුවන් අධර්මිෂ්ඨ වූ සැටිය, එසේ හෙයින් නුගපත් තිත්තරසයි කීහ. දියෙහි  පිනනලෙස තොටකින් ගොන් එළුෑකල පළමු පිනන්නාවූ ගොණා එල්ල තොටටම නොපීනා පාත්ව ඉවත පිණාද සෙසු ගෙරිත් ඔහු පස්සේ පීණාත්ද එසේහෙයින්ම රජ්ජුරුකෙණෙක් අධර්මිෂ්ටව රාජ්ජය කෙරෙත්නම් ඒ රාජ්‍ය වාසීන් අධර්මිෂ්ඨවන්නාහ. එසේකල් හි රාජයවාසීන්ටත් රාජ්‍යයටත් සැපයක් වත් වැඩක්වත් නොසැලකෙන්නේය. යම් තොටකින් ගොණෙකු දියපිණන ලෙස දියෙහි එළුෑද පළමු පීණන්නාවූ ගොණා වැනියක් නැතිව යපිණා ගොඩ නැගේද පසුපස්සෙහි පිණනගෙරින් ඉඳුරාම පිණායෙත්ද එමෙන්ම රජ්ජුරු කෙණෙක් අධර්මිෂ්ටව රාජ්‍යය කෙතේද රාජ්‍ය වාසී එපරිද්දෙන්ම වාසය කරන්නාහ. එසේ හෙයින් රාජ්‍යටත් මනුෂ්‍යයන්ටත් සියළු අභිවෘද්ධියත් සැපත් එලවන්නෙයයි කීහ. එවිට රජ්ජුරුවෝ ද ස්වාමිනි ආදීමේ නුගපත පැණිරස කෙළෙමුත් මමය. දෙවැනිව තිත්ත රස කෙළෙමුත් මම්මයයි තමන් රජ නියාව අඟවා නුවරට ගොස් දසරාජධර්මයෙන් රාජ්‍යය කළාහයි වදාරා මේ රාජෝවාද ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයන්ය. තාපසව උපන්නෙම් නම් බුදුවූ මම්ම වේදැයි වදළ සේක.

SANHIDA LANKA

# පදමානවක ජාතකය

තවද කරුණා නිධාන වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පියවර අසවළුන්ගෙයයි දැන්වීම අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සැවැත්නුරව සිටානකෙණෙකුන්ගේ පුතෙක් ඇත. ඒ පුත්වනාහි සත් අවුරුද්දක් ගිය යම්ම කෙණෙකුන්ගේ පියවර අවසළුගේයයි පියවර සලකුණෙන් ගොස් උන්සිටි යම්ම තෙනකට ගොසින් සිටිනා නුවන පහළවිය. එසේ හෙයින් ඕහට පදමානවක කුමාරයෝයයි නම් තුබූහ. පියාණෝ පුතනුවන් පරීක්ෂා කරණ පිණිස අනික් ගෙයක සැඟවි උන්නාහ. පුතනුවෝ අවුත් පියානන් විචාරා ගෙයි නැතැයි කී හෙයින් පියානන් උන්තෙනට පියවර සලකුණෙන් ගොසින් සිටියාහ. දෙවැනි මුරයකුත් පුතනුවන් පරීක්ෂා කරනු පිණිස සිටානන්ගේ ගෙටවැද පැලැදොරින් අනික් ගෙයකට වැද ඒ ගෙයි පැලදොරින් ගොසින් තමන් ගෙට වැද විථීයට බැස විථීයෙන් පිටත මගබලා ගොස් ජේතවනාරාමයට ගොස් බුදුන් වැඳ සිටියාහුය. පුතනුවෝ ගෙට අවුත් පියානන් විචාරා නුදුටුම්හයි කීහෙයින් සිටානන් ගිය පියවර සලකුණෙන් ගොස් අනික් ගෙයකට වැද ඒ ගෙයි පැලදොරින් තමන්ගේ ගෙට අවුත් විථීයට බැස පිටමග ඔස්සේ ගොසින් ජේතවනාරාමයට ගොසින් පියානන් ලඟ සිටියාහ. සිටානෝ සර්වඥයන් වහ්සේට දන්වන්නේ ස්වාමිනි මාගේ පුත්‍රයාට සැඟවි මෙතනට ආමි මාගේ පියවර සලකුණෙන් සොයාගෙණ අවුය. මුන්ගේ නුවන යහපත් නියායයි දැන්වූහ. සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

හේ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනකුන් රාජ්‍යය කරණ කල්හි රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසිකා බිසව් අනාචාරයෙහි යෙදී වාසය කරන්නාහුය. රජ්ජුරුවන් විසින් එපවත් අසාකෝප වූ කල කියන්නාහු අනාචාරයේ සිට රජ්ජුරුවන් වහන්ස මම එසේ නොකෙලෙමි. එසේවූ අනාචාරයක් කෙළෙත් නම් අස්මුහුණක් ඇතිව යක්ෂණිව උපදිත්වයි කියා බොරු දිව්ලිය දිවුල නොබෝ කලකින් මිය ඒ දිවල පරිද්දෙන් අස්මුහුණක් ඇතිව යක්ෂණිව ඉපිද වෙසමුණි රජ්ජුරුවන්ට දොළොස් අවුරුද්දක් පැන් ඇද දිගින් තිස්ගව්වක් හා පලලින් පස්ගව්වක් ඇති වනාන්තරයක් මිණිකණ නියායෙන් තමාගේ පිරිවර හා සමගින් ගමනක් යන්නේ ඒ වනාන්තරයට පැමිණිසේක. ඒ යකින්නී දුර එන්නාවූ බ්‍රාහ්මණයා දැක එතනට පැමිණ කර ඉඳුවාගෙන තමාගේ ගුහාවට ගියාය. බ්‍රාහ්මණයාගේ ශරීර පහස තමා ශරීරයේ වැදගත් ගමනේ සමාධියෙන් බ්‍රාහ්මණයා තමාට ස්වාමිපුත්‍රකොට තබා ගෙණ ඔහුට බත් මුලක් ආදිවූදෙය බැගින් ගෙනගොස් බ්‍රාහ්මණයාට දෙන්නීය. තොමෝ මිණිමස් කන්නීය. ඒ කියන බ්‍රාහ්මණයා හා යක්ෂණී මහත් සන්තෝෂයෙන් වාසය කරන්නාහ, එසමයෙහි ශ්‍රීමත් වූ බෝධිසත්වයෝ බ්‍රාහ්මණයානන් නිසා යකින්න බඩ පිළිසිඳ දස එකඩ මසකින් වදාපුව බෝධිසත්වයෝ වැඩිවිය පැමිණියාහ. යකින්නී මස්කන්ට යනකල පුතනුවන් හා ස්වාමිපුත්‍රයානන් ගල්ගුහාවේ ලා සැඟවි පලා යතියි සිතා මහත් ගල්ලෑල්ලකින් දොර කඩා වසා යන්නීය. එක් දවසක් බෝධිසත්වයෝ ගල්ලෑල්ල  ඉවත් කොට දොරමිදුලේ සිටියාහ. යකින්නී අවුත් වැද ගියාය. බෝධිසත්වයෝ ගල්ගුහාවට වන්නාහ. යකින්නී කවුරුද මේ ගල්ලෑල්ල ඉවත්කළෝයයි කිව. බ්‍රාහ්මණයා කියන්නේ තොපගේ පුතනුවෝ තුලු ගල්ලෑල්ල ඉවත්කළෝයයි කීහ. යකින්නී පුත්‍ර සෙනෙහයෙන් කුමක් නොකිව. එක් දවසක් බෝධිසත්වයෝ පියානන්ට කියන්නාහු මපියානන් වහන්ස නුඹ වහන්සේගේ මුහුනත් මාගේ මුහුනත් එකපෑ මුහුනුවරය මෑනියන් වහන්සේගේ මුහුනුවරය වෙනය මට කාරණා කිම්දැයි කීහ. එවිට බ්‍රාහ්මණයා කියන්නේ තොප හා අප හා මිනිස්සුව මෝයකින්නීයයි කියන්නා බෝධිසත්වයෝ මුන් යකින්නී කල අප එකෙතෙන වාසය කරන්නේ කෙසේදැයි කියා බෝධිසත්වයන් වහන්සේ පියානන් ඇරගෙණ නික්මුණකලට යකින්නී වහා අවුත් ගල්ලෙන බලා නොදැක මගට ගොසින් දෙන්නා එක්ව අල්වාගෙණ ඇයි බමුණ කුමක් කෙළේදැයි විචාරන්නා මම නොවෙයි දරුවෝයයි බ්‍රාහ්මණයා කීයේය. යකින්නී පුත්‍රසෙනහයෙන් කුමකුත් නොකළීය. මේ නියායෙන් තුන්වාරයක් මගටගිය ගමනේ යකින්නී ගෙණාව. පසුව දවසෙක බෝධිසත්වයෝ සිතන්නාහු මේ නියාවට ගොසින් ගැලවිය නොහැක්ක. මාගේ මෑනියන් අතින් ඉම විචාරාගෙණ යෙමි සිතා බෝධිසත්වයෝ මෑනියන්ට සුරතල් කොට විචාරාගණිමි සිතා මෑනියන් වහන්ස දෙමාපියන් සන්තක වස්තුනම් දරුවන් සන්තකය, එසේ හෙයින් නුඹ වහන්සේ මීනි කණ ඇතුලත ඉම ගම සට කියන්ට උවමැනවයි කියන්නා යකින්නී බෝධිසත්වයන්ට අසවල් පර්වතය අසවල් ගස ඇතුළුතැන මාගේ ඉමය. දිගින් තිස්එක්ගව්වක් හා පලලින් පස්ගව්වක් හා ඇතුළතැන ඉම කිව. බෝධිසත්වයෝ එක් දවසක් යකින්නී ගොදුරු කන්ට යාදී පියානන් කරා ඉඳුවා ගෙණ පවනට බඳුවේගයෙන් දිවගෙණ ගොස් යකින්නියගේ ඉම මධ්‍යයට පැමිණ සිටිකලට යකින්නී ගල්ලෙනට අවුත් බලා නොදැක මහත් වේගයෙන් ඉම ඉවරට අවුත් කියන්නී පුත තොප

SANHIDA LANKA

හා තොපගේ පියානන්ට මාගේ ජීවිතය තිබෙයි යන්නක් නොසිතවයි කියද්දීම ගඟින් එගෙඩ බසැ බෝධිසත්වයෝ කියන්නාහු මැනියන් වහන්ස නුඹ වහන්සේ යකිණියක අපි මිනිස්සුය එක තැන වාසය කිරීම අපාසුයයි කීහ. එවිට යකින්නි කියන්නී පුත තොප හා වියෝවිමෙන් මාගේ ජීවිතය නොතිබෙයි කියද්දීත් බෝධිසත්වයෝ මැනියන් වහන්ස නුඹ වහන්සේ කෙසේ කීවත් නුඹ යකකුව අපි මිනිස්සුව එක තැන වාසය බැරියයි කියා නික්මෙමයි කීහ. යකින්නි පුත තොපි ගිහිගෙයි වාසය කිරීම නොයෙක් දේ ඉගෙණ ගෙණ වාසය කරන්ට උවමැනව දොළොස් අවුරුද්දක් කල් සොරකමෙන් වී නමුත් පදලාංජනයකින් අල්වා ගන්නා නිමිත්ත කියන්නාහු චින්තාමාණික්‍යයක් මෙන් පෙනෙන්නාවූ යහපත් දිව්‍ය මන්ත්‍රයක් ඇත ඉගෙණ ගෙණයවයි කීහ. ඒ යහපතැයි කියා වැදඹත්තේය. මන්ත්‍රය ඉගෙණගෙණ වැඳලා මෑණියන් වහන්ස වැඩියමැනවයි කියා බෝධිසත්වයන් නික්මෙන අකාර දක්වූ ගමනේ පුත මා ඇරපියායව්දැයි කියා ලෙයි අතගැසූ ගමනේම ලය දෙකක්ව පැලී මළාය. බෝධිසත්වයන් හා පියානෝ දෙවෙනිව ගඟන් මෙගොඩට ඇවිත් ආදාහණකොට අඬා වැලප නික්මුනාහුය. යක්දරුවෝ වැවෙති යක්දෙමව්පියෝ නොවැවෙති කියත. එසේ හෙයින් පියානන් හා සමගව බෝධිසත්වයන් හා දෙනො වෙති කියත, එසේ හෙයින් පියාණන් හා සමගව බෝධිසත්වයන් හා දෙනො බරණැස් නුවරට ගොසින් රජ්ජුරුවන් ගේ වාසල සිට කියා යවුහ. රජ්ජුරුවෝ කියන්නාහු සොරාගේ පියවර සලකුණෙන් ගොස් සොරකම් අසුකරන්නට වූ පදමානවකයෝ නම් තොපි දැයි විචාළාහ. සඹඳ දරුව තොපි සොරකම් අසුකරන්නේයයි විචාරන්නාවූ එවෙළෙහි බෝධිසත්වයෝ සැබැව ස්වාමිනි දොළොස් අවුරුද්දක් කළ සොරකමුත් පලාඤ්ජනයකින් අල්වා පෘවාදෙමි කීහ. රජ්ජුරුවෝ යහපති මා හා කැටිව සේවය කරවයි කිගමනේ ස්වාමිනි සේවාකමට සිටිමට මස්සෙන් දාසක් නියාවට පඩි දුන මැනවි කියා සලස්වාගෙණ රජ්ජුරුවන්ගෙන් පඩිකා සේවය කරන්නාහ. එසමයෙහි එක් දවසක් රජ්ජුරුවන්ගේ පුරෝහිත බමුණා රජ්ජුරුවන්ට කියන්නේ ස්වාමිනි මූ සොරකම් අසු කරමි කියති. ඒ සැබැවත් බොරුවත් නොදෙනෙයි. ඒ පරික්ෂා කරන්ඩ උවමැනයි කියන්නා රජ්ජුරුවෝ යහපතැයි කියා පුරෝහිතයානොත් රජ්ජුරුවෝත් මතුමහලට නැගී භාණ්ඩ තුබු ගබඩාවේ දොර හැර ඉන් සම්පත් ඇරගෙණ ඉනිමගින් පාත බරස රජගේවට තුන්විටක් ඇවිද පහුරේ ඉනිමග වතුරුවා ඊපිටින් බැස අධිකරණ ශාලාවේ තැනක්වෙලාසිට දෙවැනිව ඉනිමගින් ඇතුළට අවුත් මගුල් උයනේ පතසවටකොට තුන් විටක් ඇවිද පතය ඇතුලේ ගෙණගිය සම්පත් සඟවා තබා රජගෙට ගියාහ. පසුව දවසක භාණ්ඩාගාරේ සොරක්මකළෝයයි නුවර මුලුල්ල ප්‍රකාශ විය රජ්ජුරුවෝ බෝධිසත්වයන් කැඳවා කියන්නාහු ඊයේ රෑ උඩුමාලේ ගබඩාවේ සොරකම් කොට ගත්තාහ, අපට අල්වාදෙවයි කීහ. බෝධිසත්වයෝ උඩුමහලට නැගී මන්ත්‍රය දුන් මැනියන්වහන්සේට නමස්කාර කොට කියන්නාහු දේවයන් වහන්ස මෙතැන සොරුබෑය. අධිකරණ ශාලාවේ මදක් වෙලා සිට දෙවැනිව එම ඉනිමගින් පතසටගොසින් පතසවට තුන්විටක් ඇවිද පතසට බැස දියෙහි තුබූ සම්පත් ඇරගෙන රජ්ජුරුවන්ට දුන්හ. එවිට සියදහස්ගණන් මනුෂ්‍යයෝ දාස සියගණන් පිළිඉසිසාරා නැටුම් ඔල්වරසන් දී මහත්වූ සන්තෝෂවූහ. රජ්ජුරුවෝත් එවිට සොරකම් කල සොරුන් නම අපට කිව මැනවයි කී කල්හි ස්වාමිනි සම්පත් තිබුපසු සොරුන්ගෙන් ප්‍රයෝජන කිම්ද සොරකම් කල සොරුන් නම මම දනිමි. මම නොකියමි මෙතනමයයි කීහ. රජ්ජුරුවෝ සොරුන්ගේ නම අසන්ට උවමැනවයි තත්පරව කියන්නාහු බෝධිසත්වයෝ ස්වාමිනි සොරුන් නම කියනොහැක්කේය. බොහෝ සම්පත් ඇති මනුෂ්‍යයෙක සොරකම් කළේය. නම් කී කල බොහෝ දනා විපක්ෂවන බැවින් අසවල්හු යයි නම කිය නොහැක්ක කාරණයෙක් දක්වමි කියා කියන්නාහු රජ්ජුරුවන් වහන්ස යටගිය දවස බරණැස්නුවර පාඨළී නම් විද්දතෙක් ඇත. ඒ විද්දතා ගඟින් එතර ගමනක් යන්ටයයි කියා යන තැනක් තේ ගඟට බසිනාගමනේ ගඟවතුර හෙයින් විනාව තමාගේ බොටුවේ බැඳ ගෙණ අඹුව උරෙහි එල්වාගෙණ ගඟනි එගොඩ පිනන කලට ගඟමධ්‍යයෙහි විනාවට දිය ඉකිමියන්ට වන්කලට අඹුව අතහැර ගොඩපිනා සිට කියන්නේ දැන් මදකින් තොප පැන්බී මියෙයි තොප බොහෝ හිදන්නෙහිවේද ඉන් හීයක් මා රැකෙණ නියායෙන් උග්වාලවයි කිව. එවිට විද්දතා කියන්නේ මියෙන කල තොපට කුමන ගීද උගන්වන්නේයයි කීය. කියන්නනේ පැන් මුල්ව පිපාසා පටන් ආදීවූ දෙයද අනිකුත් බොහෝ වැඩියේ යෙදෙන්නාවූ පැනින් මා මරණ කල මා කළමනා කින්දැයි කීයේය. එමෙන් සියළු මනුෂ්‍යයන්ට අභිවෘද්ධිදායකවූ කෙණෙකුන් විසින් වුදෙයක, එසේ හෙයින් සොරකම් කළවුන් කයනොහැක්ක. ස්වාමින්ඩම දැනෙයි කියද්දීත් තත්පරවම රජ්ජුරුවෝ සොරුන්ගේ නම කියන්ට උවමැනවැයි කියන්නාහ. එවිට බෝධිසත්වයෝ රජ්ජුරුවහන්ස අසවළුනැයි කිමෙන් බොහෝ උපද්‍රව සැලසෙයි කියන්නාහු රජ්ජුරුවන්වහන්ස මෙම නුවර එක් කුඹලෙක් වලකින් පස් කපා මැටිගෙණ පිටත්ව යන්නේ එම මැටිගත් වල දවසක් වැසීමෙන් දියපුරා වැසින. කුඹලා මැටිකපමින් සිට කියන්නේ මට ප්‍රතිෂ්ඨාවූ හැටිය නිසා මට භය පැමිණෙන්නේයයි කීය. එමෙන් රජ්ජුරුවන් වහන්සේ මේ සොරකම කළඋන්නේ නම කිය නොහැක්ක. නම් කීමෙන් බොහෝ අලාභයට මූලික වෙයි. නුඹ වහන්සේටත් සෙරුන්ගේ නම් දැනෙයි කියාදිත් මට මේ ව්‍යාඛ්‍යාණ කීමෙන් ප්‍රයෝජන නැත සොරුන්ගේ නම මට කියන්ට උවමැනැවයි කීහ. නැවත බෝධිසත්වයෝ කියන්ට භයකෙරෙයි කියා අනික් කාරණාවක් දක්වමින් කියන්නාහු රජජුරුවන් වහන්ස මෙම නුවර පුරුෂයෙකුගේ ගෙයක් ගින්නෙන් වැදගෙණ ඒ ගෙයි

SANHIDA LANKA

ගිණි වැදගත් පුරුෂයා තමාගේ ගෙයි සම්පත් දොරට දෙමින් සිට අනික් පුරුෂයෙකු කැඳවා තමාගේ සම්පත් ඇද පිටතට ලාපියවයි කියන්නා යහපතැයි සහායවගෙන් පිටතට සම්පත් අදිනාකලට දොර වැසිගිය හෙයින් දුම් සීසාරී සිත කාලයෙහි සිත නිවාරණය වන්නාවූ සියළු ආහාරයන්ද පිසන්නාවූ සීත කාලයෙහි සීත නිවාරණය වන්නාවූ සියළු කුණප දවා අනතර්ධාන කරන්නාවූ ගින්නෙන් මෙසේවු භය කරන්නේ කිම්දැයි කීවාසේම රජ්ජුරුවන් වහන්ස සොරකම් සැලසුනේ සියලු සතුන්ට ප්‍රතිෂ්ඨාවූ තැනකින මා අමුතුව අසවළුනැයි කීවමනාදැයි කීහ. එසේ කියෙද්දීත් රජ්ජුරුවෝ මට වඤ්ඤාකොට කීමෙන් ඒ දොනැනෙයි සොරු අහවළුයයි කියමැනවැයි කීහ. බෝධිසත්වයෝ නැවත කාරණක් දක්වා කියන්නාහු රජ්ජුරුවන් වහන්ස මේ නුවර පුරුෂයෙකු වාතව්‍යාෂි රුජාවෙන් පීඩිතව පෙළමින් සිට කියන්නේ සියළු සත්වයන්ටද දාහකරණ අවස්ථාවෙහි දාන සන්හිඳුවන්නාවු පවනින් මට ආයාස පමුණුවන්නාහුය. එමෙන් සියළු මනුෂ්‍යයන්ට වැඩදායක කෙනෙකුන් කළ සොරකමය. එසේ හෙයින් කියානොහැක්කැයි කීහ. මේ ව්‍යාඛ්‍යානකීමෙන් මට ප්‍රයොජන නැත සොරුන් අසවළුවයි කීයවයි කීහ. බෝධිසත්වයෝ නැවත කාරණ දක්වන්නාහු රජ්ජුරුවන් වහන්ස මෙම නුවර එක්පුරුෂයෙක් බත් අජීර්ණකොට කා දිරවා ගත නොහැකි තැනැත්තේ කියන්නේ සියළු මනුෂ්‍යයන් ජීවිතාරක්ෂාවන්නේය එසේවූ බත්කා දිරවාගත නොහි ප්‍රාණය යන්නේයයි ඇඬීය. එමෙන් සියළු මනුෂ්‍යයන්ට ප්‍රතිෂ්ඨාව යසදායක තැනකින්ම කළ සොරකමය. එසේ හෙයින් කිය නොහැක්කේයයි කියදිත් තත්පරවම සොරුන්ගේ නම කියවමැනයි කීහ. නැවතත් බෝධිසත්වයෝ අනික්කාරණක් කියන්නාහු රජ්ජුරුවන් වහන්ස හිමාලය වනයෙහි එක් මග වෘක්ෂයෙක බොහෝ පක්ෂි වාසය කරන්නාහ. ඒ වෘක්ෂයේ අතු දෙකක් ඊ ඊ ගැටී ගිනිවැදගත ඊ පක්ෂීන්ට නායක වූ පක්ෂියා කියන්නේ තොපට පළමු ප්‍රතිෂ්ඨාවූ වෘක්ෂයෙන්ම ගිණි හැටි වෘක්ෂය දවන්නේය තොප දන්නා යම් අතකට ගොස් ජීවත්වයි කී කල්හි ඒ ඒ අත ගියහ. එමෙන් රජ්ජුරුවන්වහන්ස සියළු මනුෂ්‍යයන්ට ප්‍රතිෂ්ඨා කෙණෙකුන් වහන්සේ කී කල සොරකමහෙයින් කිය නොහැක්කෙම් කීහ. රජ්ජුරුවෝ වංචාවෙන් මෙසේ කිවයි අදහා නොගණිමියි සොරකම්කළෝ අසවල්ලුයයි කීයවයි කීහ. බෝධිසත්වයෝ නැවතත් කියන්නාහු රජ්ජුරුවන් වහන්ස කාරණාවක් දක්මයි කෙසේද යත් මේ නුවර බොහෝ කිඹුලන් ගගනවූ ගඟක් සමීපයෙහි ගමෙක ඒක්තරා පුරුෂයෙක් තමාගේ කණවැන්දඹු මවක් රකින්නේය. එකියන පුරුෂයාගේ මවු දරුවෝ මට බොහෝ දුක්ගෙණ පෝෂ්‍ය කරන්නාහ. එසේහෙයින් මුණ්ඩ බිරින්දක් ගෙණෙමි සිතා එක්තරා ස්ත්‍රියක් ගෙණවිත් සරණපාවා දුන ඒ ස්ත්‍රිය පුරුෂයාට දරුවන් වදා ඒ ගෙට වල්ලභ ස්ත්‍රි වූහ. ඒ ස්ත්‍රි තමා නැන්දාට කණස්සළුව බොහෝ නුගුණ කියන්නී නුඹ දූගේ මෑනියන්ද මෙහෙයි ඉන්ද නම් මා මෙගෙයි ඉන්නේ නැත ඒ කාන්තව කියන්නීය, ඒ පුරුෂයා කියන්නේ එසේ කල කුමක් කරමෝදැයි කීහ. කිඹුල්ලු බොහෝ ඇති ගඟ දමාපුවොත් යහපතැයි කියා තොපගේ මෑනියෝත් අපගේ මෑණියෝත් එකතැන සැතපෙති එසේ හෙයින් ඇඳ සලකුණට වැලක් බඳවයි කීහ. යහපතැයි කියා ගොසින් නැන්දා වැදොත් ඇඳ වැලක් බැඳ අවුත් සැමියාට කිව, ඒ පුරුෂයා කියන්නේ මිනිසුන් වැදෝනා තුරු නිදාපියවයි කියා බිරින්දා අස්වසාලා නිදිගන්වා මධ්‍යම රාත්‍රී වෙලෙහි තමාගේ මෑනියන් ඇඳ බැඳලු ලනුව තමාගේ බිරින්දගේ මැනියන් වැදෝනා ඇඳ බැඳලා අඹුව පුබුදුවාගෙණ ගොසින් දම්ම කියා ලනුව අල්වාගෙණ ගොස් ඇඳ ඔසවාගෙණ ගඟට ගෙණගොස් මැල්ල ගංමධ්‍යයට දැමූහ. මැල්ල දැමු ගමන් කිඹුල්ළු ගසා කාපූහ. පසුවදා පාන්වූ පසු ස්ත්‍රිගේ මෑනියන් නැතිව පුරුෂයාගේ මෑනියන් උන්නා දැක මාගේ මෑනියන් දමාපුවේය. තොපගේ මෑනියෝ උන්නේය. උනුන් මරන්ට උවමැනවයි කීහ. එසේ කල කෙසේ මරමෝදැයි උන්නේය. උනුත් මරන්ට උවමැනවයි කීය. එසේ කල කෙසේ මරමෝදැයි විචාලෝය. ගඟට දමන්ට බැරිය අමුසොහොනක දමාපියවයි කිවුය. යහපතැයි කියා මැල්ල වැද නිදන කලට මධ්‍යම රාත්‍රියෙහි දෙන්න කැටිව ඇඳ ඔසවාගෙන අමුසොහොනට ගෙණ ගොස් ඇඳ තබලා පුරුෂයා කියන්නේ ගිණිගෙණාවේ නැත තොපි ගොසින් ගිණි ඇරගෙණ එවයි අඹුවට කිව, අඹුව තිනිව ගිණිගෙණ නොහෙමි කිව. එසේ වීනම් දෙන්නම ගොසින් ගෙණම්හයි කියා දෙන්නම ගියාහුය. ඒ පවත් ඇතිතෙන පවන් ඇවිත් ඇඟ වැදගත්තේය. මැහැලි වහන්සේ පිබිද නැගිසිට වටපිට බලා අමුසොහොනන නියාව දැන මා මරන්ට කළ උපායක් වේදැයි සිතා එතන තිබූ මිනියක් ඔසවා ඇඳ තබාලා ඉනකඩකින් වසාගිය තැනැත්තී සොරුන් සොරකම්කොට අවුත් වස්තු තුබු ගල්ලෙනට වැදගියාය. දෙමල්ලෝ ගිනිගෙණ විත් මැල්ලයයි සිතා දවාපියා ගෙට ගියාහ. සොරුන් තමන් වස්තු තිබූ ගල්ලෙනට අවුත් එහි උන් මැල්ලක දැක යකින්නියකැයි යන භයින් යකදුරකු ලඟට ගොසින් මේසැටි යකින්න පහකරන්නට මට භාරයයි කියා ගල්ලෙන සමීපයට ආකල්හි මැලි කියන්නී මම යකකු නෙවෙමි තොපසේම මිනිස්සුයයි කිව එසේ වී නම් තොප අදහාගන්නේ නැතැයි කීය. මැලිකියන්නී එසේ වී නම් තොප හා මා හා දිවෙන්දිව ගැවොත් වනා නැත්නම් සැක ඇත්තෙමියි කී හෙයින් යකදුරාත් එම නියාවට සිටිසඳ දිව දික්කොටලී. මැහැලි දිව ඩැගත්තීය. තමන් කටට දිවින් කැබැල්ලක් කඩාගත්තාහු එවිට යකදුරා භයින් දිව අවුත් කියන්නේ යකින්න නියාව සැබෑමයයි කියන්නා සොරු දිවපුවාහුය. මැහැලි ගල්ලෙන තුබූ රත්‍රන් අතකරලාගෙණ යාපත් පිළිහැඳ යහපත් පිළි පෙරවගෙණවුත් තමාගේ පුත්‍රයාගේ ගෙට වන්හ. එවිට යෙහෙලනියෝ දිවගෙණවුත් වැඳ ඇයි නැන්දනියෙනි නුඹ දවාපුවෝවේද. කෙසේ ආදැයි

SANHIDA LANKA

විචාළීය. මැලි කියන්නි අමුසොහොනේ දුවුවන් මම මගට එනමානයයි කීව. එබසට යෙහෙළනියෝ තමන්ගේ සමන්නට කියන්නාහු මාත් එසේම සැරහීගෙණ එනනියායෙන් එම අමු සොහොන දවාපුව මැනවැයි කීව, යහපතැයි කියා තමාගේ අඹුව ගෙණගොස් අමුසොහොනේ දවාපුව පසුව දවස් තමාගේ මැනියන් ආවෙලාවට නොඑන හෙයින් කියන්නේ මැනියෙනි මාගේ බිරින්ද නේනට කාරනා කිම්ද. ඊයේ නුඹ මේ වෙලෙහි ආයේවේද, අද මුන් නේනට කුමන කාරණායෙක්දැයි විචාළේය. මැලි කියන්නී දවාපු මිනිස්සු ගෙට එද්දැයි පුතනුවෙනි තොප වඩා වර්ධනය කොට තොපගේ ඓශ්චර්යය බලමි සිතා තොපට බිරින්ද ගෙණවිත්ලා රැකෙන්ට උන්නෙමි තොපගේ බිරින්දගේ බස්ගෙණ මා මරන්ට උත්සාහ කළා වේදැයි කියා එමෙන්ම ප්‍රතිශ්ඨාවූ ස්ථානයෙකින්ම මේ සොරකම් පැමිණෙන්ට උවමැනවැයි කිය. එවිට රජ්ජුරුවෝ මෙසේ සඟවා කිමෙන් අපට නොදනෙයි සොරා අසවලායයි අපට කිවමැනවයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු සොරකම් කළෝ අසමල්ලුයයි කියව, නොකීවොත් තෙපිය සොරකම් කෙළේයයි කීහ. එවිට බෝධිසත්වයෝ ඒසේ වීනම් මාගේ වරද නැතැයි නුවරවාසීන්ට දෙස්ගන්වා කියන්වාහු අසව මේ නුවර සොරකම් කළෝ රජ්ජුරුවන් හා පුරෝහිතයාය. තමා සොරකම්කොට අනුන් සොරකම්කරති කිහ. එවිට අසාසිටි සේනාව ඉසකට කැටක් කැබලිත් තක් බැගින් ගසා රජ්ජුරුවනුත් පුරෝහිතයාත් ජීවිතක්ෂයට පමුණුවාපුව හයි වදාරා මේ පදමානවක ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි බෝධිසත්වයන්ගේ පියානෝ නම් සුද්දෝධන රජ්ජුරුවෝය. මැනියෝ නම් මහාමහා දේවිය. එසමයෙහි සොරකම ඇල්ලු බෝධිසත්වයෝ නම් බුදුවූ මම්මයයි වදාළ සේකී.

SANHIDA LANKA

# ලොමස කාශ්‍යප ජාතකය

තවද එක් සමයෙක්හි විශුද්ධ ගුණමහිමයෙන් ලෝක ප්‍රසිද්ධවූ සම්‍යක් සම්බුදුරාජෝත්තමයානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් උකටලී මහණකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වා වදාළසේක. ඒ මහණහට සැබෑද මහණතෝ උකටලීයෙහිදැයි වදාරා සැබැව ස්වාමිනී දැන්වූ කල්හි මහණ කේලශයෝ තමා මහත් යසවතුන් ද අහසට පමුණුවති පිරිසිදු සතුන්ද සකලිටු කෙරෙති තොපවැන්නවුන් කුමකැයි උකටලී නොකරැද්දැයි වදාරා ඉකුත් වත් දක්වා වදාළසේක.

හේ කෙසේද යත්

පෙර බරණැස බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ පුත්වූ බ්‍රහ්මදත්ත කුමාරද පුරෝහිත බමුණාගේ පුත් වූ කාශ්‍යප නම් කුමාරද යනමොහු දෙදෙන යාළුව එකගුරුන්ගේ සමීපයෙහි ශිල්පයෙහි ශිල්ප උගන්නාහුය. ඔවුන් දෙදෙනා අතුරෙන් බ්‍රහ්මදත්ත කුමාරතෙම පියරජ්ජුරුවන් ඇවෑමෙන් රාජ්‍යශ්‍රියට පැමිණියේය. බ්‍රහ්මදත්ත කුමාර වනාහී මාගේ යහලු රාජ කුමාර තෙම රාජ්‍ය සම්පත්තියට පැමිණියේය. එතෙම මට බොහෝ ඓශ්වර්ය දෙන්නේය. අකුශල වර්ධනයට කාරණාවූ ඒ සම්පත්තියෙන් මට කවර ප්‍රයොජනද මම මව්පියන් ද රජ දරුවන්ද විචාරා පැවිදිවෙමි සිතා ඒ තමා සිතූ ලෙසම මව්පිය දෙදෙනා හා රජ්ජුරුවන් විචාරා හිමාලය වනයට ගොස් තවුස් පැවිදිවූ සත්වෙනිදා පංචාභිඥා අෂ්ට සමාපත්ති උපදවා නමින් ලෝමසකාශ්‍යපයයි ප්‍රසිද්ධව ඇවිදිලි අහරින් යැපී දවස් හරණේය. එතෙම වසඟවූ පසිඳුරන් ඇත්තේය. ඝෝරවූ තපස් ඇත්තේය. ඔහුගේ තපෝ තේජසින් ශක්‍රභවනය තම්පාවූයේය. ඒ විමසා බලන්නාවූ සක්දෙව් රජතෙම ඒ ලෝමස කාශ්‍යපයන්ගේ තපෝ තේජසින් බිඳපුව මැනවයි මධ්‍යම රාත්‍රියෙහි බරණැස් රජ්ජුරුවන්ගේ ශ්‍රියහන් ගබඩාට තමාගේ ශරීරසෝභා වෙන් බබුලුවා අහස සිට මහරජ නැගිටුවයි කීයේය. තෝ කවරෙක්දැයි කී කල්හි ශක්‍රදේවේන්ද්‍රයෝ නම් මමයයි කිය කුමට ආයෙහිදැයි විචාළකල්හි මහරජ තොපි සියළු දඹදිව එක්සත්කොට රජකරණු කැමැත්තෙහිදැයි විචාරා ඒ කුමක් නිසා නොකාමැතිවන්නේදැයි කී කල්හි එසේ වී නම් මහරජ තෝ ලෝමසකාශ්‍යපයන්ගෙන්වා ගෙණ පසු ඝාතනය කරව. එයින් තෝ මා මෙන් අජරාම වෙයි. සියලු දඹදිව එක්සත්කරන්නේයයි කීයේය. ඔහුගේ බස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ යහපතැයි පිළිගත්තාහුය. ශක්‍රදේවේන්ද්‍රයාද එසේ වී නම් මහරජ පමා නොවයි කීයා දිව්‍ය පුරයටම ගියේය. දෙවැනි දවස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සයහ නම් අමාත්‍යයා කැඳවා යහළ තෙපි මාගේ ප්‍රියයහළු වූ ලෝමස්කාශ්‍යප තාපසයන්ගේ සමීපයට ගොස් අපගේ රජ්ජුරුවන් වහන්සේ තාපසයන්ලබා පසුඝාත යාගය කරවා සියලු දඹදිව එකරජකරණ කැමතිසේක. නුඹවහන්සේ යම් පමණක් රට කැමැතිසේක් වී නම් සියල්ල දෙනසේක. මා හා සමග වැඩිය මැනවයි කියා කැඳවාගෙණ එවයි කීයේය. ඒ අමාත්‍යාද යහපතැයි පිළිගෙණ තාපසයන් වසන තැන නොදන නුවර බෙර හසුරුවා පිරිවරින් ඒ බෝසාතානන් වසන තැනට ගොස් තාපසයන් වහන්සේ වැඳ එකත්පස්ව හිඳ රජ්ජුරුවන්ට කී අසුන් දැන්වූයේය. එකල්හි ඒ ලෝමහංස කාශ්‍යපයන් වහන්සේ එම්බා සයහ අමාත්‍යායෙනි තොපි කුමක් කියව්ද සක්වල ගළ අවසන් කොට ඇති මහාසමුද්‍රයෙක්හි පලනාලද රත්න කුණ්ඩයක්මෙන් මලා සියළු ජම්බුද්වීපය මට දෙතත් පසුඝාතයාගෙන් ප්‍රාණඝාත කොට නින්දිතව ලබන්නාවූ ඓශ්වර්ය මමත් නොකැමැත්තෙමි යම් ජීවිකාවක් තොප අපායට පමුණුවනු කරන්නේම් ඒ එසේමය. මෙලොව යමෙක් ලග්නා පැල් පමණක් නැතිව භික්‍ෂා පාත්‍රය අතින්ගෙණ සිඟා ජීවිකාව කෙරෙද්ද යමෙක් අධර්මයෙන් මුළු ලොව වසඟකොට රාජ ශ්‍රී විඳිනේද ඔහුගේ ඒ රජසුව වැලඳීමට වඩා භික්ෂා වාරයෙන් ජීවත්වන්නාවූ ඒ දුක්බිතයාගේම ජීවිකාවම සියදහස් ගුණයෙන් උතුම් වන්නේයයි වදාළසේක. උන් වහන්සේ බස් ඇසූ සයහ අමාත්‍ය තෙම නැවත බරණැස් නුවරටගොස් රජ්ජුරුවන්ට එපවත් දැන්වීය. එසේ නොවඩිනා කල කුමක් කරමෝදැයි රජ් නිරුත්සාහ විය. නැවත ශක්‍රදේවේන්ද්‍ර තෙම මධ්‍යම රාත්‍රියෙහි අවුදින් අහසි සිට කිමෙක්ද මහරජ ලෝමය කාශ්‍යප තාපසයන් කැඳවා යාග නොකරන්නේහිදැයි විචාළේය. ශක්‍රදේවේන්ද්‍රයෙනි කැඳවා ගමන් කරවුම්හ. නොවඩනාසේකැයි කීයේය. ඒ බිසව ශක්‍රදේවේන්ද්‍රයෝ එසේ වී නම් මහරජ තොපගේ චන්ද්‍රාවති කුමාරිකාවන් සර්වාභරණයෙන් සරහා සයන අමාත්‍යයා හා සමඟ ගමන් කරවා ඉඳින් යාගකළ හොත් තොපට රජ්ජුරුවෝ මේ කුමාරිකාවන් දෙන්නාහුයයි කියවා ලව. ඒකාන්තයෙන් මේ කුමාරිකාවන් කෙරහි පිළිබඳ සිත් ඇති තාපසයෝ එන්නාහුයයි කීයේය. එබසට බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද එබස් අසා යහපතැයි පිළිගෙණ දෙවැනි දවස් චන්ද්‍රාවතී කුමාරිකාව සරහා සයන අමාත්‍යා හා සමඟ ගමන් කරවුහ. එසඳ ගොස් මහබෝසතානන් වැඳ පිළිසඳර කථාකොට දිව්‍ය කණ්‍යාවක් වැනිවූ රාජ කුමාරිකාවන් තාපසයන් දක්වා තෙමේ එකත් පසෙක සිටියේය. ඒ ලෝමස කාශ්‍යපයෝද ඉන්ද්‍රිය සංවරය බිඳ ඒ කුමාරිකාවන් දෙස බැළුවාහුය. ඈ කෙරෙහි පිළිබඳ සිත් උපන් හෙයින් ධ්‍යානයෙන් පිරිහුණාහුය. සයන අමාත්‍යයා තාපසයන් කුමාරිකාව කෙරෙහි පිළිබඳ සිත් ඇති බව දැන තාපසයන් වහන්ස නුඹ වහන්සේ ඉඳින් යාග කරනසේක් වී නම් අපගේ රජ්ජුරුවෝ තොපට මේ කුමාරිකාවන් අත්පා මෙහෙකරණ පිණිස දෙනනාහුයයි කීයේය. එබසට

SANHIDA LANKA

තාපසයෝ රාග චේතනාවෙන් කම්පාවුවාහු කිමෙක්ද මේ කුමාරිකාවන් මට දෙද්දැයි විචාරා එසේය යාගකරන්නාවූ තොපට දෙන්නාහුයයි කී කල යහපත එසේ විනම් යාගකරමැයි කියා කුමාරිකාවන් හා සමඟ රථයානාවකට නැගී ජටාමඩුලු නොහැර තවුස්වෙසින්ම බරණැස් නුවරට ආයේය. එසඳ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද තාපසයන් දැක එම්බා තාපසයෙනි සෙට යාගය කරම්හ ශක්‍රයාගේ අජරමරව යාගය කළ අවසන් තොපට දියනියන් පාවාදෙමි කීයේය. ලෝමස කාශ්‍යපයෝද යහපතැයි පිළිගත්තාහු බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද දෙවැනි දවස් තාපසයන් කැඳවාගෙණ චන්ද්‍රවතී කුමාරිකාවන් හා සමඟ යාගකරණ තැනට ගියේය. එතැන්හි හසත්‍යසවභව මහිසාදීවූ සියළු සිවුපාවෝ බැඳ සිටුවන ලද්දාහුය. ඒ ලෝමය කාශ්‍යප තාපසයෝද ඔවුන් මරා යාග කරන්නට පටන්ගත්තාහු ඉක්බිති එතැන්හි රැස්වූ මහජනයෝ එම්බා තාපසයෙනි මේ තොපට සුදුසු නොවෙයි තපස්වීව සිට ප්‍රාණඝාත කර්ම නොකරවයි කියා නැවතත් කියන්නාහු මෙලොව ගණාන්‍ධකාර නැසීමට ඉර සඳ දෙදෙනාහැර වෙන බලවත් දෙයක් නැත්තේය. චන්ද්‍ර සූර්යයෝ එම්බා තාපසයෙනි බලවත්වෙති. ඉෂ්ටා නිෂ්ටවූ අරමුනු වේග ඉවසීමෙහි හෙවත් සිත උපන්නාවූ රාග වේෂයන් සන්හිඳිමෙහි ශිල්වත් මහණ බමුණෝම ලොව බලවත් වෙති මහමුහුද දියකඳ නවතාලීමට වෙරල බලවත් වන්නේය. මේ සියලු බලවත් සතුන්ට වඩා සියල්ලවුන් තමාවසඟකරණ හෙයින් ස්ත්‍රිහුම ඉතා බලවත් වෙති දැන් මෙලොවට ප්‍රත්‍යක්ෂවන නියාය ඒ එසේමැයි සියල්ල නිරාලයව හැර උදකලාව මහවලට වැද පැවිදිව උග්‍රවූ තපෝ තේජස් ඇතිව අහසින් යනතරම් ඍධිමහිම ඇතිව වසන මේ ලෝමසකාශ්‍යප නම් තාපසයානන් චන්ද්‍රවතී නම් රාජ කුමාරිකාතොමෝ තමාවසඟකොට පියානන් උදෙසා වාචපෙය්‍ය යාගය කරණ සේක් යොදා සතර අපායෙහි උපදවා දුක් දෙන්නාවු ප්‍රාණඝාත කර්මය කරන්නී වේදැයි කිවාහුය. එසමයෙහි ඒ ලෝමස කාශ්‍යප තාපසයෝ යාග කරණු පිණිස මංගල හස්තියාගේ ග්‍රීවයගෙණ දකුණතින් කඩුව ගෙණ ඔසවාගත්හ. එකෙණෙහි හස්තිරාජතෙම මරණභයින් තැතිගෙණ මහත්කොට නාදකෙළේය. ඔහුගේ බැගෑ අඬ අස අසා සෙසු චතුපොද ජාතිහුද එසේම නාදකළාහු.ඒ දුටුවාවූ මහජනයෝ මහත් අඬින් ඇඬුවාහුය. තාපසතෙම ඔවුන්ගේ අඬ අසා මහත් කොට කළකිරීමට පැමිණියේය. තමාගේ තවුස් වෙස් බැලීය. එකෙණහි පළමුවෙන් සිත උපන් රාගය මුළාව සලකාගත නුහුනු ජටාමඩුල්ලද දික්ව තිබෙන දැලි රැවුළුද ලෙහි රෝමයන්ද දැක තවුස් වෙස් නියාව දැන ඉතා නුසුදුසු පාපකර්මයක් මා විසින් කරණ ලදැයි සිත උපන් උවේගය එතැන්හි ප්‍රකාශකොට කියනුයේ චන්ද්‍රවතී කුමාරිකාව කෙරෙහි ලෝභය උපදවා ඒ නිසා මා විසින් යම්මේ අකුශල කර්මයක් කරණ ලදද, ඒ දැඩිවූ දුක්ඛ විපාක දෙන්නේය. මෙසේ අකුශල කිරීමට කාරණා කවරේදැයි බලන්හූ මම නුනුවනින් සලකාගැන්මයයි කියන ලද අයෝනිසෝ මනස්කාරයම දුටිමි. එසේහෙයින් මේ කඩුවෙන් මට කම් නැත. ප්‍රඥා නැමති කඩුව ගෙණ හැර සුභනිමිත්තය හා බැඳි පවත්නාවූ මේ රගය කපාහරින්නෙම් කීයේය. එබස් ඇසූ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එඹා තාපසයන් වහන්ස දැන්ද මේ චන්ද්‍රවතී කුමාරිකාවන්ද මේ රාජ්‍යයද සත්රුවන් රැසක්ද දෙමි තොපි භයනොගෙණ යාගය කරවයි කීයේය. එබසට තාපසයන් වහන්සේ එඹා රජ්ජුරුවෙනි ඉතා බොහෝ ඓශ්චර්ය දෙමි කීවත් කාමසම්පතතියට මම නොකැමැත්තෙමි තොප දෙමි කී චන්ද්‍රවතී කුමාරිකාවන්ද රාජ්‍යයද තොපටම වේවයි මම වනාහි අපේෂාවක් නැත්තෙම් කියා ඒ ජනමාධ්‍යයෙහිම සිට කිසුනු භාවනාකොට ධ්‍යාන උපදවා අහස ඌරුබධාසනයෙන් ඉඳ රජහට ධර්මදේශනා කොට පින් කිරීමෙහි පවානොවන ලෙස අවවාදකොට යාග ශාලාව බිඳුවා සියලු මහජනයාට අභය ඉල්වා දී රජහු යාඥාකළදී අහසින්ම තමා වසන තැනටම ගොසින් ජිවිතිනාන්තය දක්වා බ්‍රහ්ම විහාර භාවනාකොට බඹලොව උපන්සේකැයි මෙසේ මේ ජාතක ධර්මදේශනාව දක්වා චතුස්සත්‍යය ප්‍රකාශකොට පූර්වපාර සන්ධිගලපා නිමවා වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනා අවසානයේ උකටලී මහණ රහත් ඵලයට පැමිණිසේක. එකල්හි සයන අමාත්‍යයෝ නම් දැන් මේ ශාසනයෙහි ශාරීපුත්ත ස්ථවිරයයෝය. ලොමස කාශ්‍යප තාපසයෝ නම් දැන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ ගෙණ හැර දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# සක්වාදා ජාතකය

තවද එක් සමයෙක්හි දෙව් ඹබ හා සුරගරුඬ ගුරුළු කිරුළු මිනිගස් දියෙන් දෙව්සිරිපා පියුම් ඇති ගොයුම්ගොත්හි උපන් අප බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර සිට බඹ විහරණයෙන් විහරණය කරණසේක් ප්‍රත්‍යයෙහි ලෝභී සිත් ඇත එක්තරා මහණකු අරභයා මේ ජාතක කථාව ගෙණහැර දක්වා වදාළසේක. ඒ මහන ඉතා තමා ප්‍රත්‍යයෙහි ලෝභි හෙයින් ඇදුරුවන් තෙරවත් ආදිය උදාහීනව නොකෙර හැර උදෑසනම සැවැත්නුවරට විශාඛා මහා උපාසිකාවන්ගේ නිවෙසනට ගොස් වැඩ හිඳ නොයෙක් අවුළුනා සමග ළලවූ කැඳ වළඳා දහවල් රසමසවුලෙන් යුත් පිණි බොජුන් අනුභව කොට එයින් තෘප්තියට නොගොස් සුළු අනේ පිඬු සිටානන් කොසොල් රජුන් ආදීන්ගේ ගෙවල පසලොල්ව ඇවිදිනේය. එකල්හි එක් දවසක් දම්සභා මණ්ඩපයට වටින් ඇවිත් රැස්ව උන් භික්ෂූන් ඔහුන්ගේ ලොල් අතර අරභයා කථාවක් කිය කියා උන්නාහුය. එකල බුදුරජානන් වහන්සේ දම්සභාවට වැඩ මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි තෙපි කිනම් කථාවක් කිය කියා උනුදැයි විචාරා වදාල ස්වාමිනි අපි අසවල් භික්ෂුන්ගේ ප්‍රත්‍යයෙහි ලොල් බහුලබව කිය කියා උනුම්හයි දැන්වූ කල්හි ඔහු කැඳවා සැබෑද මහණ තෝ ලෝභසඞ්කාර ඇත්තෙහිදැයි විචාරා සැබැව ස්වාමිනි දැන්වුකල්හි මහණ කවර හෙයකින් ප්‍රත්‍යයෙහි ලොභකේරෙහිදැයි පලමුත් තෝ ආමිසයෙහි ලොල්ව බරණැස් නුවර මහත් ඇත්කුණු ආදිය සිත්සේ අනුභවකොටත් නොපිරුණු සිත් ඇතිව එයින් ගොස් ගංගා තීරයෙහි සඤ්චරණය කෙරෙමින් අසවල් පසල් දනව්නැති හිමවූ පියසට පිවිසියෙහි වේදැයි වදාරා එපවත් අසනු කැමැති මහනුන් විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බඹදත් නම් රජකු රජකරණ සමයෙහි එපුර මළ ඇත් අස් ආදීන්ගේ කුණපයෙන් දිවිවටා නොපසුබට ඇවිටියෙන් ඇවිදිනා කපුටුවෙක් එයින් නොසතුටුව ගොස් මසු අනුභවකෙරෙමින් ගංතෙරට පැමිණ මළ මසුන් කා කීපදවසක් එහි වැස නැවතත් එහි කළ ආලයෙන් හිමාලයට වැද නොයෙක් වනමුල් වනඵල අනුභව කෙරෙමින් ගොස් මස්කැස් බන්ගෙන් ගැවසිසුවිපුල් ඈ පස්පියුමෙන් සැදුම් ලත් පියුම්විලකට පැමිණ එහි සෙවෙල්කමින් පෙමින් උනුන් නොහැර එක්ව වසන සක්වාන් දෙදෙනකු දක මොහු මනාවර්ණ සම්පත්තිතෙයන් සමන්විතය. මොවුන්ගේ භොජ්නය ඉතා සිත පිනවන්නේයයි එයින් මොවුන් කණ ගොදුරු විචාරා මමත් එම අනුභව කරන්නට වන්නම් මැනැවැයි සිතා ඔවුන් සමීපයට ගොස් අදරින් පිළිසඳර කථාකොට විසිතුරු අතුරෙකහි හිඳ ඔවුන්ට ප්‍රසංශායුත් තෙපුල් බණනේ. එම්බා පක්ෂිනි රන්වන් පිළිපෙරවියෙවුන් බඳුව යුක්මට එක්ව සතුටුසිතින් මේ තැන්හි ඇවිදිනා තොපට මනුෂ්‍යයෝ කවරපක්ෂිකෙණෙකුනැයි කියද්ද, ඒ අපට වහා කියයි කියේය. ඔහුහට තමා වංශය දක්වා කියන්නාහු සක්වාලිහිණිතෙම ආමිස ලෝභයෙන් මිනිසුන්ට මෙහෙකොට හැසිරෙන්නාවූ එම්බල කපුටුව ප්‍රියසංවාසයෙන් එක්ව කිසිභයක් නැතිව පියුම් විල් හි වාසය කරන්නාවූ අපට සක්වා ලිහිණිනම් පක්ෂිජාතියකැයි කියාද සියළු පක්ෂීන් කෙරෙන් මොහු කල්‍යාණගුණ ඇත්තාහුයයි කියාද මනුෂ්‍යයෝ කියන්නාහුයයි කියේය. එබසට කපුටුතෙම අනින්දිතවූ එම්බා චක්‍රවාකයෙනි තාගේ මේ ශරීර වර්ණය හා කායබල ඉතා අනල්පය, කිමෙක්ද, තොපි මේ සුපිපි තඹරකයෙහි කවර ඵලයක් අනුභව කරවුද නොහොත් ස්වර්ණ වර්ණවීමට නිසි කවරප්‍රාණීන්ගේ ශරීරමාංශයක් අනුභවකරව්දැයි විචාළේය.එසඳ චක්‍රවාකතෙම කියනුයේ එම්බල කපුටුව මේ තටාකයෙහි අනුභව කිරීමට නිසි පලාඵලයෙක්ද නැත මේ චක්‍රවාක ජාතකයෙහි උපන් අපට මාංසයක් නම් කැලම නැත එයින් අපි මේ පියුම්විලෙහි සෙවෙල් පමණක් අනුභවකොට වසම්හ. තොපි කපුටුවන් මෙන් දිවිවැඩුම් පිණිස පරපණ නොනසම්හයි කියේය. එබසට කපුටුතෙම කියනුයේ එම්බා චක්‍රවාකයෙනි තොපගේ මේ ආහාර අපට අරුචිකරන්නේය. රන්වන් සිරුරු ඇතිව මේ චක්‍රවාක ජාතියෙහි උපන්නාවූ තෙපි නින්දිත වූ ආහාර අනුභව කිරීමට සුදුසු නොවව, ඒ කාරණයෙන් තොපගේ මේ ශරීර වර්ණයට අපට විමැතිවුයේය. අපි වනාහි රණමුඛයෙහි නිර්භිතවූ සුරපුරුෂ යන්මෙන් මිනිසුන් කෙරෙත්ම සඵල රස හා එනු තෙල් මුසු මියුරු රස ආහාර රැගෙණ කැමතිලෙස අනුභවකරම්හ. එතකුදුවුවත් තෙල තොපගේ ශරීරය පැහැවනි පැහැයෙක් අපට නැත්තේය. එසේහෙයින් සෙවෙල් පමණක් අනුභවකොට වසම්හයි කීවාවු තොපගේ බස් අදහා නොගනිම් කීවාහුය. එකල්හි කපුටුවාගේ වර්ණසම්පත්තිය නොවිමට හා තමාගේ ශරීර වර්ණ සෞන්දර්යයට කාරණා කියන්නාවූ ඒ සක්වාලිහිණි තෙම එම්බල කපුටුව තොපි අනුන් අයිතිදෙය පැහැරගෙණ කණ හෙයින් නොපිරිසිදු ආහාර ඇතිව ඒ මතුද නොවෙයි ජනයාගේ කිසිප්‍රමාදයක් දුටුකෙණෙහි ඔවුන් සතුවූ ආමිෂයෙහි හෙන්නේහිය. එකල්හි ඔහු කැටකැබලිති ආදියෙන් පැහැර එහුබඳවති, එයින් තොපට කණබොනදු දුකසේ ලැබෙන්නේය. ඒ තමා අමුසොහොන්හි දමු මිණිමස් ආදියෙනුත් සතුටු නොවව. තවද එම්බල කපුටුව යමෙක් අනුන් වෙහෙසදී ලත්දෙයින් දිවිපවත්වාද ඒ තෙමේ එයින් නින්දිතව පසුතැවුලියට පැමිණ ශරීරවර්ණයෙන් හා කාය බලයෙන් පිරිහෙන්නේය. ඉදින් එම්බල කපුටුව යමෙක් අනුන්ට පීඩා නොකොට දැහැමෙන් සෙමෙන් ලදදෙය අනුභව කරන්නේ වීනම් ඒ නුවනැති උත්තමයාගේ කායබල හා වර්ණසම්පත්තිය

SANHIDA LANKA

වැඩෙන්නේය. එසේහෙයින් මේ ශරීරවර්ණය නම් අනේකප්‍රකාර ආහාරයෙන්ම වන්නේය නොවෙයි කර්ම චිත්ත සෘතුවෙනුත් වැඩෙන්නේ යයි කීයේය. මෙසේ ඒ සක්වාලිහිණිතෙම නොයෙක් කාරණයෙන් ඒ කපුටුවාට අපහාස කළේය. එකල ඒ කපුටු තෙම අපගේ අවර්ණ තොපගේ වර්ණයෙන් අපට ප්‍රයෝජන කවරේදැයි ඕහට දොඩාගෙණ ගියේ යයි කියා මෙසේ සියළු ලෝක අනුශාසන ශාක්‍යකුල තිලකවූ අප තථාගතයන් වහන්සේ චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ ජාතක ධර්මදේශනාව දක්වා වදාළසේක. ඒ සිව්සය වර්ණ දෙසුන් අවසන්හි පසලොල් ඒ මහණ අනාගාමී ඵලයෙහි පිහිටියේය. එකල කපුටුවා නම් ප්‍රත්‍යාලෝහිවූ මේ කල මේ මහණ වන්නේය. සක්වා ලිහිණි නම් දූන් මේ සවනෙන් ගිහිනි මේ රාහුලය මාතාවන්නීය. ඒ සක්වාලිහිණියා නම් සව්සතවෙක පතල කරුණා ඇති මෙත් සමතිස් පෙරුම්පුරා විදුරසුන් අරා පස්මරුන් මරා ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# හලින්දිය ජාතකය

සමස්ත ලෝකෙ නායකවූ විශුද්ධගුණ ගණාධාර සද්ධර්ම රාජාන්වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරණ කල්හි පතිකුලයට නොගොස් දෙමාපියන්ගේ ගෙයි වැඩුනු වයසින් මහත් එක කුමාරිකාවක් විසින් එක්තරා මහණක්හුගේ චිත්ත ලෝභයක් අරභයා වදාලසේක. මෙහි වර්ථමාන කථාව මතුකියන චුල්ලනාරද ජාතකයෙහි වර්ථමාන කථාව හා සමාන වන්නේය. අතීත කථාව වනාහී මේ මතු කියන ආකාරයෙන් දතයුතු

හේ කෙසේද යත්

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජක්හු රාජ්‍ය ශ්‍රී අනුභවකරණ කල්හි පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතානන් වහන්සේ කසී රට එක් බමුණු මහසල් කුලයෙක ඉපිද උගත් ශිල්ප ශාස්ත්‍ර ඇතිසේක් දාර පරිග්‍රහ කොට විසුසේක. උන්වහන්සේගේ භාර්යාව වූ බ්‍රාහ්මණ කුමාරිකාතොමො පුතකුවදා එක් දරුවා වයසෙහිම නැසුනාය. එකල බ්‍රාහ්මණ කුමාරතෙම සිතනුයේ මාගේ ප්‍රිය භාර්වාය වූ මේ කුමාරිකාවන් කාරා පැමිණියාවූ මරණය කුමකැයි මා කෙරේ ලජ්ජාවෙද එබැවින් මට මේ ගිහිගෙයි විසිමෙන් කම්නැත. කාමසම්පත්තිය හැර පැවිදිවෙමි සිතා සිතූ ලෙසම සියල්ල හැර ඒ බ්‍රාහමණ කුමාරයා පමණක් කැඳවාගෙණ හිමාලය වනයට ගොස් ඔහු හා සමඟ තවුස් පැවිද්දෙන් පැවිදිව ධ්‍යානාභිඥා උපදවා වනමුල් ඵල ආහාරකොට එහි වාසය කෙළේය. එකල්හි පසල්දනම්වෙහි වසන්නාවූ බොහෝ සොරහු ගම්පැහැර එහි මනුෂ්‍යයන් අල්වාගෙණ උන් ලබා බඩු පොදි ගෙන්වාගෙණ තමන් වසනතැනට එන්නාහුවෙති. ඔවුන් අතුරෙන් රූපශ්‍රී සාරවූ ශඨප්‍රයෝග දන්නාවූ එක් ස්ත්‍රියක් මොහු අල්වාගෙණ දාසිකොට මෙහෙගන්නාහුවෙති, එබැවින් එක් උපායකින් මොවුන්ගෙන් මිදි යායුතුයයි සිතා ස්වාමිනි සිරුරු කිස කරුණු කැමැත්තෙමි. මදක් දුරුව සිටිය මැනවැයි කියා සොරුන් වලහා සැඟවිගොස් වල්හි ඇවිදිනි මහබෝසතානන් වහන්සේ තාපස කුමාරයා පන්සල සිටුවා ඵලාඵල පිණිස වැඩිකල්හි පෙරවරු පන්සලට අවුත් තමාගේ රූපශ්‍රියෙන් තාපස කුමාරයා පොළොඹා ඔහුගේ ශිලභේදකොට ඔහු තමා වසඟවූ බැව් දන මොහු රවටා මිනිස් පියසට කැඳවාගෙණ යෙමියි සිතා කථාකරන්නාවූ ඒ කුමාරිකාතොමෝ එම්බා තාපස කුමාරයෙනි ජන සංචර රහිතවූ මේ මහා වල්හි රූපාදීවූ පංචවිධ කාම කොට්ඨාසයෝ බොහෝසේ නොලබනහෙයින් නැවත නැවත විසිය නොහැක්කේය. යමෙක් ගම්හි වාසය කොට ඒ රූපාදීවූ පඤ්චකාම කොට්ඨාසය ඉවසන්නේ විනම් ඒ මහත්වන්නේය. හෙවත් ඔහුගේ ශීලයම මහත්ඵල වන්නේයයි කිවාහුය. එබසට ඒ ඇසූ තාපස කුමාරතෙම මාගේ පියානන්වහන්සේ ඵලා ඵල පිණිස වලට වැඩිසේක. ආකල්හි උන්වහන්සේ විචාරම් කීයේය. එකල්හි ඒ ස්ත්‍රිතොම මේ කුමාරයාට පියානකෙණකුන් ඇත්ල ඉදින් ඒ තාපසතෙම මා දුටුයේ වීනම් ඵලාඵල ගෙණෙන කලත් දඬු කෙළෙවරින්ම තළා විනාශයට පමුණුවන්නේය. එබැවින් මා පළමුකොට යායුතු යයි සිතා එම්බා කුමාරයෙනි මම මග අතුසන් කඩා පළමයන්නෙමි තොපි පසුව එවයි කීයා ගියාය. ඒ ස්ත්‍රිය ගියකල්හි එපන්සල සැපවිය යුතු දරදිය නොසපයා උදක් සෝක කරමින් උන්නේය. ඵලාඵල ගෙණ එන තාපසයන්ට පෙර ගමන් පමණකුත් නොකෙළේය. එයින්ම තාපසයන් වහන්සේ මේ ස්ත්‍රී වසඟයට වියයි දන කුමක් නිසා තෝ දරදිය නොසපයා සෝකකොට උන්නෙහිදැයි විචාළසේක. එබසට කුමාරතෙම ස්වාමිනි බැද්දෙහි ඉඳ රක්‍ෂා කළාවූ සිල් මහත්ඵල නොවෙයි කියාද ගම ඉඳ රක්ෂා කළාවූ සිල් මහත්ඵල වෙයි කියාද ඇසිමි. එබැවින් මම ගමට ගොස් සිල් රක්ෂා කරණු කැමැත්තෙමි. මාගේ යාළුවානෝද මා එන්ඩ කියා තුමු පළමුවෙන් ගියෝය. ඔවුන් හා සමග මමද යනු කැමැත්තෙමි. එම්බා තාපසයන් වහන්ස මේ මහවලින් ගමට ගියාවූ මම කෙබඳු සීලයක් කෙබඳු වාතයක් ඇති පුරුෂයෙකු සේවනය කෙරෙම්ද, කෙබන්දක්හූ සේවනය කිරීමට මට යහපත්ද වදාළ මැනැවයි කීයේය. එබසට තාපසයන් වහන්සේ එම්බල කුමාරය මෙලොව යමෙක්හට කයින් සිද්ධවන්නාවූ ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිතථ්‍යාචාරයයි කියන ලද අකුශලයෝද වචන යෙන් සිද්ධවන චතුර්විධ අකුශලයෝද මනසින් සිද්ධවන්නාවූ ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිත්‍යාචාරය යයි කියන ලද අකුශලයෝද වචන යෙන් සිද්ධවන චතුර්විධ අකුශලයෝද මනසින් සිද්ධවන්නාවූ අභිද්‍යාය ව්‍යාපාදාදීවූ ත්‍රිවිධ අකුශලයෝද සිද්ධනොවෙද්දී හෙවත් නැත්තාහුද එබඳු සත්වයා මවගේ ලෙහි වැතිරි මට භජනය කරන්නාවූ ප්‍රිය පුත්‍රයෙකු මෙන් මෙයින් ගමගියාවූ තෝ භජනකර නැවත යමෙක් දැහැමෙන් හැසිරේද එසේ දැහැමෙන් හැසිරෙන්නෙත් අනුන්ට නින්දා නොකෙරේද පිරිසිදුවූ චාරිත්‍ර ඇති තෙනැත්තහු ඒ පුරුෂයා භජනය කර එම්බා තාපස කුමාරය සියලු දසදහසක් යොදුන් දඹදිව සියළු මනුෂ්‍යයෝම නැසී එක පුරුෂයෙක් පමණ සිටියේවී නමුත් ඒ පුරුෂ කසායෙන්වූ පැහැය අවු ආදියෙන් නැසී බොහෝ කලක් නොපවත්නේද ඒ මෙන්ම වහා නැසෙන්නාවූ සෙනහස ඇත්තේද වඳුරන්සේ චංචලවූ ප්‍රවෘත්ති ඇත්තේද එක අරමුණක පවත්නා සිත් නැත්තේද ඒ පඤ්චාකාම ගුණ කොට්ඨාශයෙහි ඇවිල එකෙණහි විරත්ත වීම ස්වභාවකොට ඇත්තේද එබඳුවූ පුරුෂයා භජනය නොකර යම්සේ ගැල් ආදීවූ යානාවෙන් යන්නාවූ සත්වයෝ

SANHIDA LANKA

වලගොඩ කණුපහණ ආදියෙන් සමනොවන්නාවූ මාර්ගයද අපවිත්‍රයෙන් ගැවසීගත්තාවූ මාර්ගයද හැර තමන්ට සැපවූ මාර්ගයෙහි යෙද්ද එපරිද්දෙන් දඬෙන් ගැසූකල කිපෙන්නාවූ සර්පයකු මෙන් කාරණා කාරණා නොදන මදකින් කිපෙන අසත්පුරුෂයා භජනය නොකාර හෙවත් දුරු කරවා තවද එම්බල තාපස කුමාරය නුවනැත්තාවුන් විසින් භජනය නොකොට යුතුවූ අමිත්‍ර වූ අඥාණයා අතීතානාගත වර්තමාන කාලත්‍රය සංඛ්‍යාත හැමකල්හි නිරන්තරයෙන් ඔහු හා සමඟ භජනය සමාගමයයි කියන ලද විස්වාසය නොකර ඒ එසේමය එබඳු අඥාණයා භජනය නොකර ඔහු භජනය කරන්නාහට බොහෝ දුක්වන්නේය. යනාදීන් මෙසේ අවවාද කොට මේ මාගේ අවවාදවූ පරිද්දෙන් මෙසේ පිළිපදුව මාගේ වචනයෙහි පිහිටුවයි කීයේය. මෙසේ පියාණන් විසින් අවවාද කරණලද්දාවූ ඒ කුමාර තෙම කියනුයේ මම මනුෂ්‍ය පථයට ගියෙම් වීනම් නුඹ වහන්සේ වැනි පණ්ඩිතකෙණෙකුන් වහන්සේ ලැබගත නොහැක්කෙම් එතැන්හි යාමට භය ඇත්තෙම් එසේ හෙයින් නුඹ වහනසේ සමීපයෙහි වාසය කෙරෙමි කීයේය. ඔහු එසේ කී කල්හි නැවතත් අවවාද දෙන්නාවූ තාපස තෙම කිසුනු පිරියම් ඉගැන්වූයේය. ඒ කුමාර තෙම නොබෝ කලකින් පංචාභිඥා අෂ්ට සමාපත්තීන් උපදවා තමන්ගේ පිය තාපසයන් හා සමඟ බ්‍රහ්ම ලෝකයට ගියේයයි. මෙසේ දේවාති දේව වූ අප තිලෝගුරු සම්‍යක් සම්බුදුරජානන් වහන්සේ මේ දර්මදේශනාව ගෙණහැර දක්වා චතුස්සත්‍යය ප්‍රකාශකොට ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යාවසානයෙහි උකටලී වූ මහණ තෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය. එකල්හි මනුෂ්‍යපථයට යෙමියි කැමතිවූ තාපස කුමාරයෝ නම් මේ උකටලී මහණය. එකල්හි මනුෂ්‍යපථයට කැඳවූ කුමාරිකාව නම් මෙකල්හි මොහු උකටලීකරුවූ මේ කුමාරිකාවන්නීය. එකල්හි ඒ බ්‍රාහ්මණ කුමාරයන්ට අවවාදදුන් පියතාපසනම් දූන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාල සේකී.

SANHIDA LANKA

# සමුග්ග ජාතකය

තවද මහානියා මහානුභාව ගුණොපේත නවාධ්‍ය විද්‍යාචරණ ධම්මයෙන් නිර්මලවූ අප තථාගතයන් වහන්සේ එක්සමයෙක්හි කේලශ සම්මාභිතප්ත සත්වයන් ධර්මාමෘත පාණය කරවිමින ජේතවන විහාරයෙම් චතුර්විධ බ්‍රහ්ම විහරණයෙන් වාසය කරණසේක් දුදසුන් නිවන් දක්වන බුදු සසුන් වැද පැවිදිවද කෙළෙසුන් වසඟවෙමින් සස්නෙහි කලකිරී වසන එක් මහණකු අරහයා මේ ජාතකය දක්වා වදාළසේකි.

එක් දවසක් සර්වඥයන් වහන්සේ ශාසනහෙි ලාශය හා සමග කෘශවූ දේහ ඇති සිතෙහි උපන් රාගය හා සමග ගතෙහි ඉපිලි නහර ඇති කෙලශයන් හා සමග වැටුනාවූ කෙලශයන් ඇති ශාසනයට මුබවුසිත් හා සමග දික්වූ නබ ඇති සිල් හා සමග කිලුටුවූ සිවුරු ඇති ඒ භික්ෂූහු ශික්ෂාවෙහි අපේක්ෂා නැතිව වසන බව දැක කිමෙක්ද මහණ තෝ ශාසනයෙහි උකටලී වුයෙහි වේදැයි විචාරා වදාරා එසේය ස්වාමිනි දැන්වූ කල්හි මහණ ස්ත්‍රීහු නම් මායා සාඨ්‍යායාදී නොයෙක් වංචාප්‍රයෝග දන්නා කෙළෙහි ගුණ නොදන්නා අයෙක එසේ හෙයින් තෝ කුමට ප්‍රාර්ථනා කෙරෙයිද පෙර දරුණුවූ දානව රාක්ෂයෝ පවා ඔවුන් කුක්ෂියෙහි තබා රක්ෂා කරන්නාහු තමන් අයිති කොට ගත නුහුනුවාහුය. තෝ කෙසේ අයිතිකොටගත හැකිවන්නේහිදැයි විචාරා මේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

හේ කෙසේද යත්

සියල් සිරින් තිදස් පුර පසස්කළ දොළොස් යොදුන් බරණැස් නුවර පෙර බ්‍රහ්මදත්ත නම් රජකු රාජ්‍ය ශ්‍රී අනුභවකරණ සමයෙහි පුරණ ලද බෝධිසම්භාරයන් ඇති අප මහා බෝධිසත්වයන් වහන්සේ වස්තුකාම කේල්ශ කාම හැර නිල්මහ මේ කුළුමෙන් බබලන ගණසා මඬලෙන් හෙබනා විදුලිය මෙන් සුපිපිලිය වැලඳී විසිතුරු පතරින් හා ලපළුකමින් තමන් සුතන් කවමින් පෙමින් ඔවුනොවුන් ඇඟ තොළු තබා කෙලනා මුවකැලන්ගෙන් හා සුනිල් මිණිගල් මුදුනෙහි රඟනාලිය කිඳුරන්ගේ මියුරු ගියේහි ලොබින් ගොදුරෙහි ලොභ නොකොට සිටනා සිරලන්ගෙන් හා විමල්වැලි තලාවල මොණර කිකිලින් මැදෙහි පිලඹර බලවත් මොණරුන්ගෙන් හා පිපිමල් ගජන් ඇනැරිරු වැකී දලින් මදමත් ඇත්මුලින් හා සුපුල් පලොල් මිදෙලි සල් විසල් වනපොතින් වගුල නොයෙක් සුවඳ මුව රදගෙණ වැහෙන සිගින් ගඟුලැල්ලෙන් සැදුන් ලත් විවිධ ජනාලයවූ හිමාලයට වැද කෙලශ තාපයට හේතුවූ තාපස ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා වනමුල් ඵලාහාරාම ආහාරකොට වාසය කරණසේක්. එකල උන් වහන්සේ වසන පන්සල අසලතුමුල් ගල්ගුහාවෙක වසන මනුෂ්‍ය මාංශ භක්ෂණය කරණා ජේෂ එක් රාක්ෂයෙක් අතුරතුරෙහි මහ බෝසතානන් වහන්සේ කරා එළඹ බණ අසන්නේය. ඒ බණ අස අසාත් තමා පරහිංසාවෙහි සතුටුවන පව්ටුජන්මයෙහි උපන්හෙයින් මහවනමැද මහජනයා එන යන මග රැකසිට දනන් ලුහුබඳවා අල්වාගෙණ සල්වාසල්වා දෙක පොළින් ලේ වගුරුව වගුරුවා කන්නේ එකල කසීරට වාසීවූ දුටුදුටුවන් විසින් කරණ රූසිරින් නොවූ එක්තරා කුමාරිකාවක ප්‍රත්‍යන්ත ජනපදයෙක සරණ ගොස් වාසය කරන්නී එක්දවසක් තමාගේ දෙමාපියන් දකිනු පිණිස පිරිවර ජනයා හා සමග අවුත් නැවත තමා වසන පන්සල් දනව්වට යෙමින් ඒ වන මැදට පැමිණියාය. එකල්හි ලෙලන දිවි නැමති සලවිදුලිය ඇති චක්ව තිබෙන බැම නැමති දිලියන්නාවූ ඉදුසැව් ඇති උදුළඳලයුවල නමැති භජන බලපොළ ඇති උරීරු පානය කිරීමෙන් කෙසරු සලාවෙහි රැඳි මදින් වැහෙන ලේබිඳු නමැති පොද පතර ඇති පතල සැඬංහ නමැති මිහිගුම් ඇති කුරිරු දරුණුවෙස් ඇති ඒ දානව රකුස්තෙම අහස් කුසලහළ නිල් මහමෙකුලක්මෙන් අවුත් ඒ වනමැද මගට බටුයේය. එවෙලෙහි ඒ පරිවාර ජනයෝ තම තමා අතතුබූ අවිදමා ඒ ඒ අත දිව්වාහුය. එසද ඒ දානව තෙම යානාවේ යානොහි උන් උතුම්වූ රූපශ්‍රියෙන් කාන්තවූ ඒ කාන්තාව ඒ කාන්තකොට තමාවසන තැනට ගොස් ප්‍රිය භාර්‍යාවකොට තබාතෙල් මී සකුරු සාල් ආදීවූ නොයෙක් තොසකරණ උපකරණ ගෙණවිත් පෝෂ්‍ය කෙරෙමින් විචිත්‍ර වස්ත්‍රාභරණයෙන් සරහා අනිකකු නොදන්නාලෙස රක්නා කැමතිව නොඅඩුවූ සෙනහසින් කරඬුවෙකලා ගැල කුක්ෂියෙහි තබා රක්ෂා කරන්නේය. මෙලෙස රක්නාවූ එතෙම එක් දවසක් ජලස්නානය කරණු කැමතිව සිහිල් සිලිල් පිරිනිමල් කමල් විලකට ගොස් බඩතුබූ කරඬුව වමාරා එයින් ඈ පිටතටගෙණ පළමු කොට නහවා නොමද සුවඳ විලවුන් ගල්වා නන්විසිතුරු රුවන් ආභරණ පලඳවා මදක් තොප ශරීරයෙහි තෙත් සිඳුවාගණැයි තෙමේ එතැන්හී සැක කටයුතු කිසිකෙණෙකුගෙන් නැති හෙයින් නහන තොටට බැස දුරවසිට දිය නාන්නේය. එසඳ ඒ කුමාරිකාවෝ වයස්පුත්‍රනම් වූ උතුම් රූපශ්‍රීධර විද්‍යාධරයෙකු බංගායුධ ගන්නද්ධව අහසින් එනවා දැක ඔහු කෙරෙහි පිළිබඳ සිත් ඇතිව මෙසේ එවයි අත්සන් කොට කැඳව්වාය. එසඳ විද්‍යාධර තෙමෙ සුරපුරෙන් බස්නා සුරකුමරෙකු මෙන්ද ගුවන් කුසින් එන රුවන් රුවක්මෙන්ද ඈ කෙරෙන් ඒ රකුසාගේ මතු වෙන්වීමට පෙර නිමිතිව පතිතවන උල්කා පාතයක් මෙන්ද වහ අහසින් බටුයේය. එකල ඒ කුමාරිකාවෝ ඔහු කරඬුවේ හිඳුවා දානවයාගේ ආගමනය බලමින් කරඬුව මත්තේ හිඳ දියනා ගොඩනැගී එන්නාවූ ඒ දානවයාට තමා දක්වා ඔහු ලඟට එන්නට පළමුකොට ගතගබ්ගිලි විදුලියක් මෙන් ඒ කරඬුව ඇතුළට වැද තමා අත සළුවෙන්

SANHIDA LANKA

ඉසවසා පෙරව නොවලසා ඔහු වසාගෙන ඔත්තාය. ඒ ක්‍ෂණයෙහි ඒ රාක්‍ෂතෙම අවුත් පරීක්ෂා නොකොට පළමු පරිද්දෙන්ම කරඬුව ගැල තමාවසන ගුහාවට යෙමින් අතරමගදී සිතනුයේ ඒ අපගේ තාපසයන්වහනසේ බොහෝ කලක් නොදක්නාලද ඉන් උන් වහන්සේ කරා ගොසින් දැක පැහැද වැඳපුදා බණ අසා යෙමි පන්සලට ගියේය. තාපසයන් වහන්සේද එන්නාවූ ඔහු දුරදීම දැක දෙදෙනකු කුස තුල වසන බව දිව්‍යං චක්‍ෂුභිඥානයෙන් දැක අඥානවූ ඕහට විඥාපණ කරණු කැමැතිව වදාරණසේක්. එම්බා පින්වත්නි තොපි තුන්දෙනා කොතැන්හි අවුද බෝහො කලකින් අද මෙතැන්හි තොපගේ පැමිණීම වුයේය. කිමෙක්ද තොපි නිදුක් නිරෝගීවව්ද යහපත මෙසේ අවුත් තෙල අස්නෙහි හිඳුවයි වදාළසේක.එබස් අසා ඒ දානව රාක්‍ෂතෙම මේ තාපසයන් වහනසේ එකලාව මෙතැන්හි ආ මට තුන්දෙනෙකැයි වදාරණසේක. කිමෙක්ද තත්වය දැන කියනසේක්ද නොහොත් උන්මත්ව නන්දොඩනසේක්දැයි සිතා තාපසයන් කරා එලඹ වැද එකත්පස්ව හිඳ එපවත් පුළුස්නා අදහසින් කථාකරණුයේ කිමෙක්ද තාපසයන් වහන්ස නුඹ වහන්සේ කිසි සහයක් නැතිව මෙතැන්හි ආම්ට තෙපි තුන්දෙනා කොයිසිට අවුදැයි වදාළේය. එබසට තාපසයන් වහන්සේ එම්බාරක්‍ෂය තෝ මේ කාරණය ඉදූරා අසුනු කැමැත්තෙහිදැයි වදාරා ආදරයෙන් එසේය ස්වාමිනි දැන්වූ කල්හි පළමු තෝද තාගේ කුක්‍ෂිගත කරංකයෙහි තබා පේම භාරයෙන් රක්ෂා කරණ ලද භාර්යාවද යන දෙදෙනා තනිවම විසූහ දැන්වනාහී ඕ තොමෝ වයස්වූ පුත්‍රනම් වූ විද්‍යාධරයකු හා සමග පාපයෙහි ලැජ්ජානොකොට තමා අධ්‍යාසය වූ පරිද්දෙන් ලොකස්වාදරතියෙහි යෙදී ඉන්නීය. එසේ හෙයින් තොප තුන්දෙනෙකුයයි කිම්යි වදාළසේක. එබස් අසා දානව රක්‍ෂතෙම සිතුනයේ විද්‍යාධරයෝ නම් අනල්පවූ මන්ත්‍ර ජපනය කොට මායාකාරයන් සංවාරණය කරණා අයෙක ඉඳින් මාගේ කුක්‍ෂිගතවූ ඔහුගේ කංගය ස්වහස්ත ගතවීනම් බඩපලාගෙණ පලායන්ටත් සමර්ථවෙන්නේයයි භයින් තැතිගෙණ සිත් ඇතිව වහා කරඬුව වමාරා තාපසයන් වහන්සේගේ ඉදිරියෙහි තබා නිදානයක්මෙන් රක්‍ෂා කළ ඒ කරඬුයෙහි පිධානය හළුයේය. ඒ ක්‍ෂණයෙහි ඒ විද්‍යාධරතෙම කූටයන්ත්‍රයකින් නික්මුනු ශරීරයක්මෙන් මන්ත්‍ර ජල්පනය කොට අහසට පැනනැගේය. එසඳ ඔහු දැක මහබෝසතානන්ට බොහෝ සේ සතුටුව ස්තුතිකරණ ඒ දානව රාක්‍ෂතෙම. උග්‍රවූ තපෝ තේජසින් අග්‍රවූ තාපසයන් වහන්ස නුඹවහන්සේ මේ කාරණය දත්පරිදි ඉතා යහපත නිරන්තරයෙන් මාගේ ප්‍රාණයමෙන් කුක්‍ෂියෙහි තබා රක්ෂා කරණලද්දාවූ මේ ස්ත්‍රිපවාමිත්‍රදෝහී කම්කොට අනුපුරුෂයෙකු කරා සරාගව එළිය, එසේ හෙයින් මේ ලෝකයෙහි අන්සත්වකෙණෙකුන් විසින් කෙලෙස් ප්‍රවේශනයෙන් අවසඟව ස්ත්‍රීවසඟයට පැමිණියාහුද ඔහු ඉතා නින්දාවට පැමිණෙන්නාහුය ඒ එසේමය. සවස උදැසන ගිනිදෙවියාට යාගකොට වෙනෙහි වාසය කරණ තාපසයන් විසින් රක්‍ෂා කරණ ලද වහ්නියක් පරිද්දෙන් තොමෝ මා විසින් නිරන්තරයෙන් ආදරයෙන් රක්ෂා කරණලදුව, මබන්දෝ පවා ඔවුන් කුසතුළ තබා රැකගත නුහුනුවාහුය එසේවූ ස්ත්‍රිද පතිවෘතා ධර්මය කවරෙක් අප විසින් රක්ෂා කරණ ලද්දේයයි සිතා විස්වාස කරන්නේද ඒ එසේමය ස්ත්‍රීහු නම් ලෝකස්වාදය රතියයන් සම්පූර්ණ නොවන්නාවූ සිත් ඇති බැවින් අගාධම්වූ මහා සමුද්‍රයාගේ පාත්තලය වැන්නේමය, එසේවූ ඔවුන්කෙරෙහි  රාගවශයෙන් බැදුනාවූ නුවනැත්තාවූ සත්වතෙම මෙලෝ පරලෝ දෙක්හි මහත් දුක්ඛයට පැමිණෙන්නේය. එසේ හෙයින් විසුද්ධ වූ ධ්‍යාන ප්‍රතිලාභය ප්‍රාර්ථනා කරන්නාවූ ප්‍රඥාවන්ත උත්තම සත්වයෝ සියලු දෝෂයට වාසස්ථාන වූ පඤ්චඉන්ද්‍රියන්ට උත්සව ක්‍රීඩාවූ භවසාගරයට දියසලාවූ ලෝභ ලතාවට තුමුල් මුල්වූ අපායට වහසල් දොරවූ සසර මහවෙනෙහි සරණ සත්ව වර්ගය නැමැති මෘගයන්ට පාසවූ අපායය නමැති සමුද්‍රයට ගෙණයන ජලප්‍රවාහ බඳුවූ අවිස්වාශ වූ ස්ත්‍රීන් විස්වාස නොකරන්නාහුයයි කියා ඒ දානට රාක්‍ෂතෙම මතු ආලවක සුචිරෝම ඛරරෝමාදීවූ චණ්ඩ සත්වයන් අභිමාන හැර නමස්කාර බහුමාන කිරීමට පූර්වනිමිත්ත දක්වා යුගාන්ත වාතවේගයෙන් පතිතවූ පර්වතකූටයක්මෙන් ලෝසත්හට බෝසත්කරණ බෝසත්වූ ඒ තාපසයන් වහන්සේගේ ශ්‍රීපාදය වැඳ හෙව මෝහන  මැති ගණඳුරට දිවයුරුහු බඳුවූ කේලශ නමැති දාවනලයට මහා මේඝයක් බඳුවූ මෛත්‍රී නමැති ලතාවට තෝතැන්නක් බඳුවූ කරුණා නැමති ගංගාවට හිමාලය බඳුවූ ශිලාදිගුණරත්නයට රත්නාකරයක් බඳුවූ දහම් නමැති අමාවට මහමුහුද බිඳුවූ නුවන නමැති පහණට රන් පහයක් බඳුවූ නිවන්මඟට රුවන් ගිණක් බඳුවූ තුන්ලොවට තිලකවූ ස්වාමිනි තාපසයන් වහන්ස නුඹ වහන්සේ නිසා අද මාගේ දිවි ලබනලද නැතහොත්, මේ විද්‍යාධරය ලවා මදකලකින් මේ මා මවාපුවා වේදැයි මහබෝසතානන් වහන්සේට ප්‍රසංශා කෙලේය. ඉක්බිති මහබෝසතානන් වහන්සේද ඒ දානව රක්‍ෂසයාට ධර්මදේශනා කොට මැ කෙරෙහි හෝත රෝයනයෙන් කිසිරෝසයක් නොකරවයි අවවාද කොට ඔහු පංචශීලයෙහි පිහිටවූ සේක. එකල ඒ දානව  රක්ෂතෙම මම තී කුසතුල තබා රක්ෂාකරන්නෙම්ද අධර්මසේවනයෙන් වලකාගත නුහුනුයෙම් අන්කවරෙක් තොප එයින් වලකා රක්‍ෂාකොටගත හැකිවන්නේදැයි කියා ඈ ගමන්කරවා තෙමේ තමාවසන තැනටම ගියේයයි මෙසේ අතීතානාගත වර්තමාන යන කාලත්‍රය වර්තිවූ ස්වධර්මයන් ස්ර්වාකරාරයෙන් අවබෝධකළාවූ අප බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේකී. මේ ධර්මදේශනා වසානයෙහි උකටලී ව ඒ මහණතෙම දහසක්නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටියේය. එකල්හි රාක්‍ෂයාගේ කුක්‍ෂියෙහි දෙදෙනකු වසන බව දිව්‍යඥානයෙන් දැක

SANHIDA LANKA

ඕහට වන අවැඩ වලකා ප්‍රාණඝාතාදී පාපකර්මයන් නොකරණ ලෙස අවවාදකොට පඤ්චශීලයෙහි පිහිටුවූයෙම් දූන් අසාරවූ සංසාර සාගරයෙහි නිමග්නව සංරණය කරන්නාවූ සත්ව වර්ගයා එයින් ගොඩලා අමාමහ නිවන් පුරයට පමුණුවන්නාවූ මම්ම වේදූයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# පූතිමාංශ ජාතකය

තවද එක්සමයෙක්හි සකල සත්වයන් කෙරෙහි ආකාරණ පරමවත් සලවූ අප තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසන සේක්, ඉන්ද්‍රිය සංවරය අරභයා මේ ජාතකය වදාළසේක.

එක්සමයෙක්හි බොහෝ භික්ෂූහු චක්ෂුරාදී ඉන්ද්‍රියෙහි සිහි නමැති දොරනොවසා වාසය කරන්නාහ. එකල සකලගුණ නිධාන වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ මේ භික්ෂූන්ට අවවාද කරන්නට වටනේයයි ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙහෙවර වදාරා ඒ වෙහෙරෙහි සියළු භික්ෂූන් රැස්කරවා සරහන ලද උතුම්වූ බුද්ධාසනයේ හිඳ වදාරණසේක්, මහණෙනි මහණුන් විසින් රූපාදීවූ අරමුණු සුභනිමිත්තා කාරයෙන් නොගතයුත්තේය. ඉදින් ඒ අරමුණු සුභාකාරයෙන් ගෙණ කාලක්‍රියා කෙළේ වීනම් අපායෙහි ඉපද බොහෝ දුක් විඳින්නේය. එසේ හෙයින් මහණෙනි තෙපි අසුභ වූ රූපාදි ආරාමණයන් සුභාකාරයෙන් ගෙණ කාලක්‍රියා කෙළේ වීනම් අපායෙහි ඉපිද බොහෝ දුක් විඳින්නේය. එසේ හෙයින් මහණෙනි තෙපි අසුභවූ රූපාදී ආරාමමණයෙන් සුභාකාරයේන් ගෙන වාසය කරව. තවද මහණෙනි රූපාදී අරමුණු ගොදුරුකොට වාසය කරන්නාහු පුද්ගල තෙම ඉහාත්ම භාවයෙහිම මහත් විනාසයට පැමිණෙන්නේය. එසේ හෙයින් රූපාදීන් සුභාකාරයෙන් බැලීමට වඩා ගිණිගෙණ දිලියෙන අය සලාකයෙන් චක්ෂු ප්‍රසාදය පිරීමැදීම උතුම් වන්නේයයි කියා වදාරා මහණෙනි තොප විසින් රූපය බැලියයුතු කල්හි සුභාකාරයෙන් නොබලා අසුභාකාරයෙන් බලව, එසේකල්හි තොපි සතර සත්පධානය ආර්යවූ අෂ්ටාංගික මාර්ගය නවවිධවූ ලෝකෝත්තර ධර්මය යන ගොචරයන් නොපිරිහෙව එසේ නොපිරිහි ඒ ගොචරයෙහි හැසිරෙන්නාවූ තොප කරා කේලේශමාරතෙම පැමිණෙන්ට අවසරයක් නොලබන්නේය. ඉදින් තෙපි කෙලෙසුන් වසඟ බවට පැමිණ සුභ නිමිත්තාකාර වශයෙන් ඒ රූපය බැලුවාහු වී නම් පූතිමාංශ නම්වූ සිගාලයා මෙන් තොපගේ ගොචරයෙන් පිරිහෙන්නාහුයයි වදාරා එපවත් අසනු කැමති මහණගණයා විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකු රාජ්‍ය කරණ සමයෙහි හිමාලයවනප්‍රාන්තයෙහි එක් අරණ්‍ය ප්‍රදේශයෙක ගල්ගුහාවෙක්හි නොයෙක් සියගණන් එළුවෝ වාසය කරති. ඔවුන් වාසනාතෙනට නුදුරු තැන්හි එක් ගල්ලෙනක පුත්මාංස නම්වූ කැණහිලෙක් තමාගේ වේනිනම් වූ භාර්යාව හා සමග වාසය කෙරෙමින් එක් දවසක් ඈ හා සමග ඒ වනාන්තරයෙහි ගොදුරු සොයා ඇවිදිනේ ඒ ගුහාවෙහි වසන එළුවන් දැක එක් උපායකින් මොවුන් මරා මස් කෑ යුත්තේයයි සිතා ගොස් දවස දවස එකී එකී එළුවකු ඇතිව මහත් ශක්තිසම්පන්න වූවාහුය. මෙසේ කල්යාමකින් ඒ සියලු එළුවෝ විනාශයට පැමිණියාහුය. ඔවුන් අතුරෙන් මෙලමාන නම්වූ එක් එළුදෙනෙක් නුවනැත්තීය. උපායෙහි දක්ෂවන්නීය. එම කැණහිල්තෙම ඈ මරා කන්ට නොහැකිව ඒ තමාගේ භාර්යාවූ වේනිනම් විසින් සීවල්දේනුව හා සමග මන්ත්‍රනය කරණුයේ සොඳුර සියළු එළුවෝම අප විසින් මරා කණලදින් නිමාවට ගියාහුය, මේ එළුදෙන එක් උපායෙකින් මරන්ට වටනේය. එසේහෙයින් තෝ තනියම ගොස් ඒ එළුදෙන හා සමඟ මිත්‍රව තොප ඈ හා සමඟ විස්වාසවූ කල්හි මම මළ ආකාර දක්වා හෙව දනිමි. එකල තෝ ඈ ළඟටගොස් යෙහෙළිය මාගේ ස්වාමිපුත්‍රයා මළේය. මමද කිසි පිළිසරණයක් නැත්තෙමි. දැන් තොප ඇර අනික් කෙණෙක් මට නැත. එසේහෙයින් අපි දෙදෙන ගොස් අඬා වැලප ඔහුගේ ආදාහණකෘත්‍ය කරම්හයි කියා ඈ කැඳවාගෙණ මෙතැන් එව එසේකල්හි මම හොත්පලින් පැන නැගී ඇගේ බොටුව ඩැහැ මරමි කීයේය. එසඳ ඒ වෙනී නම් සියල්දෙන් තොම යහපතැයි ඔහුගේ බස් පිළිගෙණ ඒ එළුදෙන හා සමඟ මිත්‍ර විස්වාසය උපන්කල්හි පළමු ඒ සිගාලයා කී සියල්ලම එළුදෙනට කීවාය. එසඳ ඒ එළුදෙන් තොම කියන්නී යෙහෙළි තීගේ ස්වාමි පුත්‍රයා විසින් මාගේ සියළු නෑයෝ මරා කණලද්දාහුය. එසේ හෙයින් ඔහු කරායන්නට මම භය ඇත්තෙමි කීවාය. යෙහෙළි තෝ භය නොව මළාවූ ඒ තෙම තොපට කුමක් කරන්නේදැයි කීවාය. එබසට නැවතත් ඒ එළුදෙන කීයන්නී තොපගේ ස්වාමිපුත්‍රතෙම ඉතා දැඩිවූ මන්ත්‍රන ඇත්තේය. එසේහෙයින් මම ඔහු සමීපයට නොයම් කියාද නැවතත් ඒ සිවල්දෙන විසින් යාච්ඤාකරණ ලදුව මෙසේ කියන්නේ, ඒකාන්තයෙන් මළනියාව වේදැයි සිතා ඇගේ බස් ගිවිසා ඈ එක්ව නින්ම ගියාහ. එසේ යන්නීන් කුමකින් කුමක් වේදෝහෝයි ඒ කැණහිලා කෙරෙහි සැකයෙන් සිවල්දෙන ඉදිරිකොට විමසමින් යන්නීය. එකල ඒ සිගාලතෙම එන්නාවූ ඔහුන්ගේ ශබ්දය අසා එළුදෙන් ආවාහෝයි ඉස ඔසවා ඇස දල්වා බැලුයේය. එකල ඒ එළුදෙන් තොම එසේ බලන්නාවූ ඔහු දැක මේ පාපිෂ්ට ගුණ ඇති දුෂ්ට තෙනැත්තේ මා රවටා මරාකණු කැමතිව මළවෙස්ගෙණ හොත්තේයයි නැවත යන්ට නික්මුනාය. එකල සිවල්දෙන විසින් යෙහෙළි තෝ කවර හෙයකින් නැවත යන්නෙහිදැයි විචාරණ ලදුව තමා යන කාරණා සිවල් දෙනට කියන්නාවූ ඒ එළුදෙන එම්බල යෙහෙළි තීගේ ස්වාමී පුත්‍රවූ පූති මාංශ නම්වූ සිගාලයාගේ බැලීම මට යහපත් නොවන්නේය. එසේහෙයින් මෙබඳුවූ වංචා ප්‍රයෝග දන්නා අසත්පුරුෂයා කෙරෙන් දුරුවීම

SANHIDA LANKA

යහපතැයි කියා තමා වසනතැනට ගියාය. ඒ සිඟාල දෙනුව ඒ එළුදෙනගේ ගමන් වලකාගතනොහී කිසිත් නැතිව තමාගේ ස්වාමිපුත්‍රයා ලඟට ගොස් සෝක කෙරෙමින් නොයෙක් සිතිවිලි සිතා කලකිරී උන්නාය. එකල එසේ උන්නාවූ ඒ සිවල්දෙනට විධාන කරන්නාවූ ඒ සිඟාලතෙම එම්බල වේනීය තෝ පළමු මාගේ යෙහෙළියවූ එළුදෙන් මට බොහෝ සෙනහ ඇත්තීය. මා කීවා කරන්නීයයි ගුණ වර්ණනා කොට අප ලඟට කැඳවාගෙණ එම්කියා ගොස් දූන්වනාහී අප සමීපයට නොඇවිත් දුරසිටම නැවත යන්නාවූ ඈ වලකාගත නොහී තෝ මෙතැන්හි අවුත් උමතුවාක් මෙන් ඉඳ කුමට සෝක කරන්නහේදැයි කීයේය. එබසට සිවල්දෙන්තොම කියන්නී එම්බල ස්වාමිපුත්‍රය තෝ පළමුවෙන් මළවුන්ගේ ආකාර දක්වා හෙව ඈ ලඟට ආ කල්හිම නැගී සිට බොටුව ඩැහැමරම් මන්ත්‍රණය කොට දූන් ඈ සමීපයට එන්ට පළමුවෙන් ඉස ඔසවා බැළුයෙහිය. එසේ හෙයින් පරීක්ෂා නුවනැත්තෙහිත් තෝමයයි කීවාය. මෙසේ ඒ වෙනි නම් සිවල් දෙන් තොම තමාගේ ස්වාමිපුත්‍රයානන් හිඳුවා ඉක්බිති ස්වාමිපුත්‍රයානන් වහන්ස නුඹ වහන්සේ සෝක නොකල මැනව, නැවතත් මම ඈ උපායකින් මෙතනට කැඳවාගෙණ එමි. එකල නුඹ වහන්සේ ඈ පමානොවී අල්වාගත මැනවයි කියා ඈ සමීපයට ගොස් කියන්නී එම්බල යෙහෙළිය පළමු ආ තොප ගියගමනින් බොහෝ වැඩ විය. තොප එතැන්හි ගොස් ආ තැන්හි මාගේ ස්වාමිපුත්‍රයා දූන් සිහි ලැබ ජීවත්වන්නේය. එසේ හෙයින් ප්‍රිය පඬුරක් ලදින් සතුටු කරන්නාක් මෙන් ඒ අපගේ ස්වාමිපුත්‍රයා කරාගොස් පිළිසඳර කථාකොට එවයි කීවාය. එසඳ ඒ එළුදෙන්තොම මේ පවිටු තෙනැත්තී මා රවටා කණු කැමැත්තීය. මොවුන් වෛරකරවා ගැන්ම සුදුසු නොවන්නේය. එසේ හෙයින් උපායෙන්ම මෑ රවටා දුරු කෙරෙමි සිතා කියන්නී යහපත යෙහෙළිය තොප සතුටුකොට එමි එසේ එන්නමුදු බොහෝ පිරිවර ගෙණ එමි ඒ එන්නාවූ අපට කෑ යුතුවූ භෝජනයන් සපයා තබවයි කීවාය. ඉක්බිති ඒ සියල්දෙන් තොම විචාරන්නී මම තොප කීවාවූ පර්ෂිදටයම් භෝජනයක් පිසමි. ඒ තිගේ පරිවාරජනයෝ කෙබඳූ වන්නාහුද කිනම් ඇත්තාහුද ඔවුන් අපට නොවලහා කියවයි කීයා කීවාය. එබසට එළුදෙන් තොම තමාගේ පිරිවර කියන්නී එම්බල වෙනිය සුනඛයන් පන්සියයක් පිරිවරකොට ඇත්තාවූ මාලිය නම් වූද චතුරංබ නම්වූද පිඟිය නම් වූද ජම්බුක නම්වූද යන මොහු සතරදෙන මාගේ පිරිවර වන්නාහ. මේ සියල්ල වුන් පිරිවරාගෙණ එන්නාවූ මට තෝ ගොස් අහර සපයා තබව. ඉදින් තෝ ආහාර සපයා නොතිබුවා නම් මාගේ පිරිවරවූ දෙදාසක් බල්ලෝ තොප දෙදෙනා මරා මස්කන්නාහුයයි කිවාය. එබස් අසා ඒ සිඟාල දේනුතොම යහපත ඉදින් තොමෝ එතැන්හි ගියා නම් අපට මහත් අනර්ථ වන්නේය. එසේ හෙයින් නොයන පරිද්දෙන් කෙරෙමි සිතා කියන්නී. එම්බල යෙහෙළිය තොප මේ වසන තැනින් නික්ම ගියකල්හි තොපගේ උපකරණ විනාශවන්නේය. එසේහෙයින් තොපගේ යහළුවූ ඒ සිඟාලයාට තොප නිදුක් නිරෝගී බව මම කියාලමි තෝ අනික් තැන්හී නොගොස් මෙතැන්හිම සැපසේ වාසය කරවයි. ඒ එළුදෙනට කියා තොමෝ මරණ භයින් තැතිගෙණ වේගයෙන් ස්වාමිපුත්‍රයා ලඟට ගොස් ඔහු කැඳවාගෙණ අන්තැනක විසීමට ගොස් නැවත ඒ ගුහාවට නොආචාරහුයයි සර්වඥයන් වහන්සේ ම් ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක. ඒ අසරණ ප්‍රදේශයෙහි වනස්පති ඇසූවාවූ දේවතාවා නම් ලොව්තුරා බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වාදාළ.

SANHIDA LANKA

## චතුපෝසත ජාතකය

මේ ජාතකය සම්පූර්ණයෙන් පූර්ණ ජාතකය මෙනි. එය විධුර ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය.

SANHIDA LANKA

# තිත්වටු ජාතකය

තවද එක්සමයෙක්හි මහනීය ගුණ මහිම සම්‍යක් සම්බුද්ධ රජෝත්තමයානන් වහන්සේ ධර්මමාතෘ පර්ෂාවෙන් කෙලේශ දහන නිර්වාපනය කොට වෛනෙය ජනයන් මනදොල පුරමින් ලකුළු ගිජුකුළු පව්වෙහි ආර්ය ඊයාපථ විහරණයෙන් වාසය කරණසේක් මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාළසේක. එසමයෙහි ප්‍රසිද්ධ දම්සභා මණ්ඩපයෙහි විසුද්ධ බුද්ධාසන පිරිවරා උන් ශික්‍ෂාකාමී භික්ෂූහු බලා ඇවැත්නි මේ දේවදත්ත ස්ථවිරයෝ නම් ලජ්ජා නැති එකෙක. ඔහු සිත සංජාත උතුම් ගුණාලවයකුත් නැත්තේය. එසේ සිටන් බුදුවනු කැමැත්තේය. මුළු ලොවට පතල අපමණ ගුණ ඇති බුදුරජානන් වහන්සේගේ සසුන් වැඳ කෙලෙසුන්ම දූරිය, අජාසත් රජු හා සමඟ නිවන් මඟ වලකන්නාක් මෙන් බුදුන් විදීමට දුනුවායන් යෙදීය. අපාය මග එළිකරවන්නාක්මෙන් ගල් පෙරළිය. අධර්ම නමැති රජ ප්‍රදක්ෂිණා කරන්නාක් මෙන් මදතු බුදුන් සිඟා වඩනා පුරවිථියෙහි හැරවුයේය. තමාගේ සිල්සෙනඟ භග්න කරන්නාක් මෙන් සංඝභේද කළේය. යනාදීන් සත්ගුණයෙන් අස්ථිර වූ දේවදතත ස්ථවිරයාගේ නුගුණ පහළ කලාහුය. එබස් දිවකනින් අසා ලොවට මතුවන වැඩ නිසා අසාධාරණ වූ බුද්ධිමහිමයෙන් ධර්මරාජාන්වූ සර්වඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ ප්‍රඥප්තවූ බුද්ධාසන මස්තකයෙහි වැඩ හිඳ රත්න ප්‍රතිමාවන් මෙන් නිශ්ලව උන් භික්ෂු ගණයා බලා එම්බා භික්ෂුනි මා එන්නාට පළමුවෙන් මෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි අසා මහණෙනි මා නිසා අසාරවූ දේවදත්ත ස්ථවිරතෙම දූන් මතු වද යෙදුයේ නොවෙයි. බෝසත් කලක් මහත් වදයේදුයේ වේදැයි වදාරා සංක්ෂේපව පැවති එපවත් විස්තරයෙන් අසනු කැමති ගණයා විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකි.

ඒ කෙසේද යත්

පෙර දොළොස් යොදුන් බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජක්හු රාජ්‍ය ශ්‍රී අනුභව කරණ කල්හි වෙද වෙදාහ සමය සමයාංග ශිල්ප ශාස්ත්‍රයෙහි නිෂ්පත්තියට පැමිණ දිසාපාමොක් ආචාරියෙක් ඒ බරණැස වසන පන්සියයක් පමණ මානවකයන් ශිල්ප උගන්වනුයේ, එක් දිනයෙක සම්බාධවූ මේ ග්‍රහවාසය මටත් පළිබෝධය ශිෂ්‍යයන්ගේ ශිල්ප ඉගැන්වීමටත් බාධාය, එබැවින් හිමවත් වනයට යෙමි සිතා එපවත් අතවැස්සන්ට කියා වල්හි කල්යවා විසීමට නිසි තල සහල් තෙල් මී සකුරු වස්ත්‍රාභරණ නොහැරගෙණ පිරිවර අතවැස්සන් හා සමඟ මහමග ගෙවා විවේක ජනාලය වූ හිමාලයෙහි ජනමන නන්දනවනයක් මෙන් හොබනා එක් අරණ්‍ය ප්‍රදේශයකට පැමිණ මග අසල්තැනෙක පන්සල කරවා විසීය. ඒ පන්සියයක් අතවැස්සෝද පන්සල්කොට එතැන විසුවාහුය, ඔවුන්ගේ නෑයෝද තමන්ගේ උපකරණ ඔවුන්ට එවන්නාහුවෙති ඒ පන්සලට අසල්වූ පසල්දනව්වෙහි වසන ජනයෝද ශිල්ප උගන්වා වසන්නාවූ ඒපන්සලට අසල්වූ පසල්දනව්වෙහි වසන ජනයෝද ශිල්පඋගන්වා වසන්නාවූ ඒ ආචාරීන්ගේ ගුණ කථා අසා ප්‍රසන්න වූ සිතින් අනනාපානාදීවූ උපකරණ එවන්නාහුය. තවද එයින් එක් මිනිසෙක් මෙයින් ආචාරීයහට නිදුක් වේවායි කියා කිරි දෙනෙකු හා වසෙසකු එවීය. ඒ ඇදුරා වසන මැදුරට නුදුරු තැන්හි එක් තුරු සිදුරෙක දරුදෙදෙනාකු ගොරුකවා ගෝ දෙනෙක් වාසය කරන්නිය. ඒ වනයෙහ වසන උග්‍රවූ සිංහ ව්‍යාඝ්‍රයෝද ව්‍යඝ්‍රවිග්‍රහනොවී ඕහට උපස්ථානයට එති, නොමදහත්වද ලොවට මහත් මහිම දක්නට මෙත් බෝසත්වූ අප මහබෝසතානෝ තිත්වටූ ජන්මයෙහි ඉපද ඒ මානවකයන් හා කැටුව විස්වාසීන්ට වසන්නාවූ ඒ ඇදුරුහු හදාරවන වෙදත්‍රය විස්තරයෙන් දූන චිත්‍ර කථිකව තිත්තිර පණ්ඩිතවුසේක.ඉක්බිති අතවැසි මානවකයන් වෙදප්‍රමාණය නිමවා නිපුණ කරන්නාට පළමුකොට දිසා පාමොක් ආචාරීතෙම මරහු විසින් වසඟගකරණලද්දේ වීය. අතවැස්සෝ ඔහුගේ ආදාහන කෘත්‍ය නිමවා වැල්ලෙන් චෛත්‍යයක් කොට නිත්‍යයෙන් පූජාකොට විලාප කියා හඬති. බෝසතානන් වහන්සේ අඬන කාරණ විචාරා මිත්‍රයෙනි වේදත්‍රය තව විස්තර කොට වදරා නොනිමියේය. එසේ හෙයින් හඬම්හයි මානවකයන් කී කල්හි එසේවුවහොත් තොප උගත් ඒ වේදත්‍රය දූන් කියවයි කී කල්හි ලෝකෙක නෙත්‍රවූ ඒ තිත්තිර පණ්ඩිතයන් වහන්සේ විශේෂවත්වූ මනුෂ්‍ය භාෂාවෙන් ග්‍රන්ස්ථාන නිශ්ශේකොට පර්වත මස්තකයකින් ගඟා ප්‍රාවාහයක් බානා පරිද්දෙන් වේදමන්ත්‍රොධාරණය කළ සේක. එසඳ මානවකයෝ තුටුපහටු සිත් ඇතිව තිත්තිර පණ්ඩිතයන්ගේ සමීපයෙහි වේදමන්ත්‍ර ඉගැන්මට පටන්ගත්තාහුය. ඒ බෝසතානෝ දිසාපාමොක් තනතුරෙහි සිට ශිල්ප උගන්වනසේක. ඔහුද උන්වහන්සේට ඇදුරු නොවනතරම් සොඳුරු පැහැසර රන්මැදිරියක් කරවා පුදා හැමද මනනද මහත්සත්කාර කෙරෙති තිත්තිර පණ්ඩිතයෙකු පන්සියයක් මානවකයන්ට ග්‍රන්ථ හදාරති උදාරවූ කීර්ති ඝෝෂාව බුද්ධොත්පාදකාලයක් මෙන් ලොව පතළේය. ප්‍රසිද්ධ සම්පත්ති භාරයෙන් හා සුරනරවර සුරපුරයක්සේ බබලන රජගහනුවර ගිරිසිබර සුරන්ට බිලි දෙන පිණිස අවුරුදුපතා කරණ මහපුදමෙන්

SANHIDA LANKA

එකල සකල ජම්බුද්වීපයෙහි වසන මිනිසුන් විසින් සන්තෝෂව මහත් උත්සවයට උද්ඝෝෂණය කරණ ලද ඒ උත්සව ක්‍රීඩාව නිසා තමන්ගේ මව්පියන් විසින් කියා එවුකල්හි ඒ බ්‍රාහ්මණ මානවකයෝ පන්සියයද පන්සලක් බෝසතානනුත් හොඳනට රක්ෂා කරණ පිණිස නියෝග කොට පණ්ඩිතයන් වැඳ අවසරගෙණ ගියෝය. එකල කලිඟුරටින් සටකපට දුෂ්ටාපාපිෂ්ට මනුෂ්‍යයෙක් උදවිත වංචා සංක්සේ උස්වූ ජටාවක් බැඳ තමා මුවාකොට මුවන් මැරීමට ඇඟ වැසූ වල්කැලෑවක් ඇඳියේ වල්කැලෑ පෙරව චිත්ත විවේක විභාග නොනොදන්මෙන් කරුණාවෙන් තොරව මස්පලහා කණ අග්ණිකපාලකයක් මෙන් භික්ෂා පාත්‍රයක්ද ශුෂ්කමාංස ගුප්තකොට තබන ගබඩාවක් බඳු ඩබරාවක්ද තුංකමල් සිත වංක බව දක්වන්නාක්මෙන් වංකත්‍රයක් ඇති පිරිකරක්ද අපායට මානයට යෂ්ටියක් බඳුවූ වාරයෂ්ටියක්ද ගෙණා තමා මැරූ ගණනට එබූ බින්දු වැනි තිත්පෙලිං නුදුන් අඳුන් දිවිසමක් ඒකාංශයෙහි කොට රුධිරපානයෙහි ලේ රැඳී රත්ව ගියාක්වැනි මහත් තඹ රැවුලකින් හා වෑහෙන ලේ බින්දුවට තිබූ පිහිල්ලක්සේ දික්වූ දැලිවලල්ලකින් යුක්ත සත්ව සන්තාප වංචා තාපසවෙසකින් උපායෙන් සතුන්ට දුක්දෙන අපායෙහි යමපල්ලකුමෙන් ඒ පන්සලට පැමිණියේය. ඔහු දැක ගොදෙන්ද සොයායන ගොදුරු තබා දයාබර සබා තාපසයෙකැයි නොබා ගොස් ඔහු කෙරහි භක්තියෙන් බත්පිස කවයි සහල් ආදිය දක්වා දී ගොදුරු පිණිස ගියාය. ඒ තාපසයාද එදා උදෑසන බත්පිස හැමකලම සංග්‍රහකළාවූ ජනයන්ට නිග්‍රහකරණ දුර්ජනගුණය අවබෝධ කරන්නාක් මෙන් ඒ ගෝධෙනුවගේ දරු දෙදෙනා මරා මස්රසයෙන් බස් අනුභව කොට දහවල් මැදිරියෙහි උන් ලොවට කල්‍යාණ මිත්‍රවූ කුශලයට පත් මක්ෂේත්‍රවූ සද්ධර්මයට ඒකච්ඡත්‍ර මෛත්‍රියට පාත්‍රවූ චාරිත්‍රයෙන් ජන්මක්ෂේත්‍රවූ සද්ධර්මයට ඒකච්ඡත්‍ර මෛත්‍රියට පාත්‍රවූ චාරිත්‍රයෙන් පවිත්‍රවූ පක්ෂපත්‍රයෙන් විචිත්‍රවූ තිත්තිර පණ්ඩිතයන්වහන්සේ ඒ තාපසතෙම තමාගේ පූර්ව වෛරය හා සමග එලියටගෙණ වනදේවතාවන් හා සමග හඬවහඬවා ඒ වෙනෙහි සිංහව්‍යාඝ්‍රයෙන් හා සමඟ වික්ෂේප කොට අත වැස්සන් හා සමඟ දුකට පමුණුවා තුමූගේ අකුශල් හා සමඟ ගිණිදල්වා කුසල් මුල් හා සමඟ එලභාවිර රිව්බව හා සමඟ අනුභව කොට එසේද වස්සාද මරා කා නැවත දරුවන් මැරූ බැව් නොදන කිරිදෙන පිණිස පැමිණි දෙනද මරා හවස මස් අනුභවකොට පරලොව යාත්‍රාවට ගමන් ගතවන්නාසේ පන්සලින් නික්ම ගස්මුලෙකහෙව වස්සාගේ හා දෙන්නාගේ බැගෑපත් හඬසේ ප්‍රධාවනි නාදයේ ගොරව ගොරවා නිදන්නට පටන්ගත. ගොදෙන් ගොදුරු බිමන් අවුත් දරුවන් දෙදෙනා නොදැක බලා ඇවිදිනිය. එසේ තමා ලග්නා බිලෙන් පාවා ඇවිදිනා ඒ ගෝදෙන දැක වන දේවතාවෙක් විසිතුරු අතුරෙකින් පෙණී මනහර සොඳුරුවන් දිව්‍යරූපයෙන් සිට මියුරු තෙපුලින් කථාකරනුයේ එම්බල තොප විසින් යමෙක්හට අදරින් ආහාර සපයාදී මහත් සත්කාර කරණ ලදද කෲරවූ ඒ චෝරපුරුෂතෙම තොපගේ දරුදෙදෙනා මරා කා තෙල තුරුමුලෙහෙව නිදන්නේය. දැන් තොප ගොසින් දලින් ඩැහැ එයින් ජීවිතක්ෂයට පමුණුවව ප්‍රාණවධ කැමති ඔහු ජීවත්වීම තොපට නොකැමැතිවෙයි කීවේය. එබසට ගෝදන දේවතාවට කියන්නී එම්බල දිව්‍යපුත්‍රය මේ කුලපුත්‍රතෙම බාලපුත්‍රයන් වඩනා දාසී ස්ත්‍රියකගේ මලමුත්‍රයෙන් රැඳුනු වස්ත්‍රයක් මෙන් අපවිත්‍රවූ චාරිත්‍ර ඇති රෞද්‍රවූ එක් වැදිපුත්‍රයෙක දුෂ්ටකර්මයෙන් කඨින්වූ මොහුගේ ශාත්‍රයෙහිද මොලොක් තැනක් නොදන්නෙමි එයින් ඩැහැ මරන්ට නොකැමැත්තෙමි කියා නැවතත් ඔහු කෙළෙහිගුණ නොදන්නා බව පෙන්වා කියන්නී එම්බල දේවතාව තවද මෙලොව යමෙක් උපකාරී ජනයන්ට ප්‍රත්‍යුපකාර හෙයින් ආකෘතඥවෙද නිරන්තරයෙන් ගොදුරු සොයා යන පක්ෂියෙකු මෙන් විපක්ෂව සියල්ලවුන්ගෙන් සිරුරම දක්නා සුළුවේද එබඳු දුර්ජනයාට වස්තුසාගර පරියන්ත නගර නිගම ග්‍රාම රමණීය සමස්ත සම්පත්ති සම්භාර සමලංකෘත සකල පෘථිවි මණ්ඩලය සත්කාර පූර්වාංගමකොට දුන්නේ විනමුත් එසේත් ඔහුගේ සිත්ගත නොහැක්කේයයි මෙසේ රුක් දෙවියාට කියා ගෝදෙන ඒ තවුසා නිසා භයින් අන්තැන්හි ගියකල්හි බෝසතානන්ගේ මෛත්‍රී මහිමයෙන් මිත්‍රව වෙනෙහි වසන සිංහ ව්‍යාඝ්‍රයන් දෙදෙනා අතුරෙන් සිංහරාජතෙම කියනුයේ එම්බා ව්‍යාඝ්‍රරජය ධර්මධර්ම විභාගය දේශනඥනයෙන් ප්‍රතිමණ්ඩිතවූ අපගේ තිත්තිර පණ්ඩිතයන් වහන්සේ දැන් සත්අටදවසක් නුදුටුම්හ. තොපිගොස් ඒ ගුණවත්හුගේ පවත් දැන එවයි ව්‍යාඝ්‍රරාජයා ගමන් කරවිය. එසේද ගෝදෙන ගිය වේලෙහිම ගොස් මිනිස් බඳින් රඳන පවුකඳක් මෙන් නිදන ජඩවූ ඒ තාපසයාගේ විපත්ති ලතාවෙහි හටගත් විචිත්‍රාංකුර පත්‍රයක් මෙන් ජටාතුරෙහි පෙණෙන තිත්තිරපණ්ඩිතයන්ගේ පක්ෂපත්‍රයන්ද පැතිරගිය ඔහුගේ කර්මරාෂියසේ විසිරගිය දෙනගේ හා වස්සාගේ ඇට රාශියද ගුණෙන් සිස්වු මහතාපසයාගේ සිතුසේ බෝසතුන්ගෙන් සිස්වූ මැදිරිය දැක මේ පාපිෂ්ටයාගේ දුෂ්ටකර්මයෙනැයි රුෂිටව පයින් ඇන පිබිදවිය ඒ තාපස නැගීසිට තමාගේ බෝසතුන් මරා රැස්කළ අකුශල කර්මය දෘෂ්ට ධර්මවෙද්‍යා මූර්තිමත්ව පෙණුනාක් මෙන් භයංකාරව සිටි ව්‍යාඝ්‍රයා දැක භයින් තැතිගත්තේය. එසඳ ව්‍යාඝ්‍රතෙම මේ සත්වයින් මරා කෑවේ තෝ වේදැයි විචාරා ඔහු නොමැරීම් කීකල්හි මේ සතුන් තා නොමැරුව මේ වෙනෙහි වෙන මරන්නෝ නැත. එයින් බොරු නොකියවයි කියා භය ගැන්විය. හෙද භයපත්ව සෙස්සවුන් මැරීම් තිත්තිර පණ්ඩිතයන් නොමැරීම් කියා නැවතත් එය ගිවිස්වනු පිණිස කලිගුරට තමා උපන්තැන් පටන් වට නොයෙක් රට ඇවිද තමාකළ පව්වුකම් ආදිය කී කල්හි එසේත් නොගිවිස අනිස තෝ මෙසේ කියයිදැයි අවිස සිංහ රජ්ජුරුවන් සමීපයට එවයි කියා පව්වු තවුසා තමන්හට පෙරටු කොටගෙණ ගියේය. ඔහු ඉදිරිකොට එන ව්‍යාඝ්‍රරාජයාට

SANHIDA LANKA

කථාකරන්නාවූ සිංහරාජතෙම රාහුමුඛයවට නොපැමිණි පූර්ණ චන්ද්‍රයා මෙන් සම්පූර්ණ වූ පූර්වගාත්‍රයන් ඇති හෙයින් සුබාහුනම්වූ එම්බා ව්‍යාඝ්‍රරජ්ජුරුවෙනි ඉතා සීඝ්‍ර වූ මනුෂ්‍යයෙකු කැඳවා ගෙණ මෙතැන්හි ආයෙහිය ක්‍රියාවික්‍රිය කිසි කර්මාන්ත රහිත මේ වනාන්තරයෙහි වසන තොපට මනුෂ්‍යයන්ගේන් කවර ප්‍රයොජනයෙක්ද එබැවින් සැබැවින් මොහුගෙන් සිද්ධවන යම් ප්‍රයෝජනයෙක් ඇද්ද ඔහුට නෙවලහා කියවයි කීයේය. එබසට ව්‍යාඝ්‍ර රජගෙම එම්බා සිංහරාජ සත්ගුණ රත්නයට නිධාන වෙදත්‍රයට උපදේශවූ සද්ධර්මයට අසාධාරවූ තොපට කල්‍යාණ මිත්‍රවූ යම් තිත්තිර පණ්ඩිත කෙණෙක් ඇද්ද ඕහට පැමිණියාවූ වධය අධමවූ මේ අසත්පුරුෂයා විසින් කළ පාපකර්මයෙන් ඇසූවාවූ මම මොහුගෙන් පැමිණියායයි සිතමි. ඒ එසේම සකල ඡන්දකින්නර මධුර ලාබයෙන් මනෝහරවූ ඒ තිත්තිර පණ්ඩිතයන් මේ වනාන්තරයෙහි දැන් ජීවත්ව ඉන්නාහු නොවෙති කීයේය. එබසට සිංහරාජතෙම විචාරණුයේ එඹා ව්‍යාඝ්‍රය තා විසින් අසන ලද මේ පුරෂයාගේ ජීවිකාවෘර්තිය නිසා ප්‍රවෘත්තී වූ කර්මයෝ නම් කවරහුද පාපනිවරණ කාරනාවූ ශ්‍රමණ වේසයෙන් සිටිනා මේ මානවකයා කවර ප්‍රතිඥාවක්ගෙණ තිත්තිර පණ්ඩිතයන්ගේ විනාශයට මොහු සැකකරන්නෙහිදැයි විචාළේය. එකල සියල්ල ප්‍රකාශ කොට කියන්නාහු ව්‍යාඝ්‍රතෙම කියන්නේ මනෝහර රූපහාර විහාරබල පරාක්‍රමයෙන් මෘගරාජන්වූ එඹා සිංහරජ්ජුරුවන්ස මේ පුරුෂ තෙම කලක කලිගුරට වසනකල කපට වෙළඳුන්ගේ බඩුපොදි ඉසින් උසුලා බඩ වැඩිම පිණිස ගමින් ගම ඇවිද දාසයකුමෙන් වාසය කළේය. කාලෙක තුලාකූට මානකූට කෂාපනාදී චාටුක්‍රියාවෙන් වෙළදාම් කළේය. කලෙසා කණුගසා වේවැල්බැඳ එලියායුතුවූ දුර්ගමාර්ගයෙහි සබා මෘගයෙකු මෙන් සංචාරයද කෙළේය. කලෙක මුළු මුළුව නටා ඇවිදිනා නළු නාටකයන් හා කැටුව වැටුප් නිසා යටත්ව ඇවිද්දේය. කලෙක නිරය ගිණි දැල් ඉසලීමට පෙරනිමිත්ත පානාක්මෙන් වරදැල් වැද්දන් හා වල්වැඳ දැල් ඉසලීය. කලෙක සිරුරෙහි අඟුරු ගුරු තවරකර දොරින් දොර මුගුරු සරඹපෑ අගුරු තරවෙසින් ඇවිද්දේය. කලෙක විකිණීමස් පිණිස ගිහිනි වල්වැද නොමද මලිති ලිහිණියන් බදා දිළිඳු වැදිවෙසින් ඇවිද්දේය. කලෙක වී මැනදීමෙන්ගෙණ දිවිපවත්වා කොටගුළු රක්ෂා කළේය. කලෙක අනර්ථයට හැරී දොරසේ බෙදූ දුකෙල ඇවිදිනා ධූර්තියන්ට පැහැද පසඇට ගෙණදී ඇවිද්දේය. කලෙක දිවසැපතට පැමිණ මැඩියන් අණුකලෙක රජුන්ට අපරාධකෙරෙන් අත්පා කපාහළ නරන්කරා සොරමැදුම් රැගොස් කුඩා ආජීවකයන් කෙරෙහි පැවිදිව උනු බත් වළදා දැන් දවා ඇවිද්දේය. මොහු විසින් ජීවිකාවෘත්තිය නිසා කරණලද මේ යථොක්ත අනාචාර ප්‍රවෘත්තිය ඇසුහෙයින්ද වත්තයෙහි කේලශ ජටාවෙන් අවුල්වූ මොහුගේ ජටා අතුරෙහි කින්නර පණ්ඩිතයන්ගේ පක්ෂ පත්‍රයන් දුටු හෙයින්ද ලොවට වධහිංසා නොව බැවින්ද මරන්ට නුසුදුසු දෙන හා දරුවන් මරාකෑහෙයින්ද, තිත්තිර පණ්ඩිතයන්ගේ වධයට දැන් මොහුම සැකකෙළෙමියි කීයේය. එකල්හි සිංහරාජතෙම කොපුයේ හයාලන කඩුපත්සේ භයානක තියුණු නබ පන්තීන් නික්මවා සබඳ කොල තෝ අපගේ තිත්තිර පණ්ඩිතයන් මැරූයෙහිදැයි විචාළේය. එකල්හි ජරාමරණ හැරයා නොහැකි ක්‍රෑරවූ සිංහ ව්‍යාඝ්‍ර දෙදෙනාගේ අතුරෙහි සිට භයින් අනිකක් කිය නොහි බිලියක් වමාරණ මත්ස්‍යයෙකුමෙන් මහත් උත්සහයෙන් ස්වාමිනි සැබවයි කීයේය. එබස් අසා සාධාරණ සිංහරාජතෙම නොමරා හරණ අභිප්‍රාය වීය ව්‍යාඝ්‍රතෙම නොමරා හරණ අතිදුෂ්ටයාගේ ජීවත්විම ලොවට ඉෂ්ටනොවන්නේයයි කියා ධර්මනැමැති ශරීරයෙහි මට ගන්නාවූ පුංඩරීකයක්සේ ක්‍රෑරවූ ඒ පුරුෂයා වෛද්‍යාචාර්යයකු සැත්කම් කරන්නාක්මෙන් දලගින් පැහැර පලා ඒ වෙනෙහි සත්වයන්ට සාන්ති කොට අපායට යන්නාවූ ප්‍රාණයට පසුගමන්කරන්නාකේමෙන් පතිතවූ ඔහුගේ මෘතදේහය දැක මේ පරිභවකටයුතු ද්‍රෝහී පුරුෂතෙම අනුභව නොකටයුතු එකෙකැයි ඔහුගේ මෘදදේහයත් අපායේ හෙලන්නාක්මෙන් භූමිවිදාරණයකොට එහිබහා පස්වසාලමින් වනදේවතාවන් අස්වසාලය. ඉක්බිති උත්සව ක්‍රීඩාවට ගිය පන්සියයක් මානවකයෝ පන්සලට පැමිණ බෝසතානන් නොදැක අනේ අපගේ පණ්ඩිතයානන් වහන්සේ කොයිවැඩි සේක්දැයි තැනින්තැන වැටී පෙරලී ගතින්ගත් වැල්ලෙන් අතින් ගත් කුසින් ඉසින්ගත් පරණලින් නෙතින්ගත් කඳුලෙන් සිතින්ගත් සෝකීන් ඒ පන්සල හාත්පසින්බලා නැවත පන්සලට වැද ගාන්ධර්වයන්ගේ ගීතිකා මෙන් මනෝහර ශක්‍රයන්ගේ සභාමණ්ඩපයමෙන් පළමු පණ්ඩිතයන්ගේ මධුරා ලාපයෙන් ප්‍රතිමණ්ඩිතවූ මෙපන්සල දැන් නිරිඳුන් හැරගිය කඳවුරමෙන් නිශ්‍රීතවුයේය. පෙරමානික්‍ය රත්නයෙන් ඒකාලෝකවූ වෛවුල්ල පර්වත ගුහාවසේ බබලන මේ රන්මැදිරිය දැන් ඇඳිරියක්සේ තිබුයේය. පෙර වෙද සැදෑරීමෙන් එක කෝලාහලවූ මේ ආශ්‍රමය දැන් රැල සුමුහුදක්සේ නිශ්ශබ්ද විය, සද්ධර්මප්‍රදීපය නිවුනු නියාය වෙදත්‍රය මුථුපුල නියාව, සුගති මාර්ය වැසු නිසාය, අපායට දොර හළුනියාය, ගුරු ප්‍රදේශ විනාසවූ නිසාය, මෙබඳු පණ්ඩිත කෙනෙකුන් කවර කලෙක දකීමෝද මෙවැනි වචනමාතයක් කවර කලෙක ලබමෝද, මෙබඳු ශාස්ත්‍රාත්ථයක් කවර කලෙක අසමෝද, මේ මහතානන්ගේ මධුර ශබ්දයෙහි බැඳිඋන් මේ වෙනෙහි පක්ෂිහූ දැන් කවරක්හුගේ ශබ්ද අසා සතුටුවේද්ද, මුන් වහන්සේගේ මෛත්‍රී මහිමයෙන් මිත්‍රවවිසූ නිත්‍යවිරෝධි සත්වයෝ මතු කෙසේ විස්වාසව වෙසෙන්ද, මුන් වහන්සේගේ සද්ධර්ම ගංගාවෙහි ගිලි සැනසුනු වනදේවතාවෝ මතුකෙසේ සැනසෙද්ද, යනාදීන් මෙසේ වෙනවෙනම විලාපකියා ඇඬීමෙන් යුගාන්තව වාත ප්‍රභාත සමුද්‍රයාගේ තරඟ ඝෝෂවසේ ඒ සියලු මහවනය එකකෝලාහලකොට ඒ පන්සියයක් බ්‍රාහ්මණ මානවකයෝ තමන්ගේ වාසස්ථානවලට ගියාහුය. මෙසේ

SANHIDA LANKA

ක්‍රෝධයෙන් ප්‍රමත්තවූ දහම්හි අව්‍යක්තවූ දේවදත්ත ස්ථවිරතෙම පෙරත් වධයෙදුයේම වේදැයි මේ ජාතක ධර්මදේශනාව පූර්වාපර සන්ධි ගළපා නැවතත් විසුද්ධ විද්‍යාචරණ ගුණයෙන් ප්‍රශස්ත ලොකෙක නායක සාන්ති ප්‍රදායක ශාක්‍යකුලතිලක ශාස්තෘවූ තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ රාජොත්තමයානන් වහන්සේ එම්බා මහණෙනි එකල තාපස වේසයට පැමිණ ප්‍රාණවධකළාවූ අධම පුරුෂනම් මෙකළ මේ ශාසනයට පැමිණ මහණදම් තබා අකුසල් කරන්නාවූ දේවදත්ත ස්ථවිරයන් වන්නේය. එකල තාපසයා කෙරෙහි භයින් පලාහැර අන්තැන්හි ගිය ගොධෙනුව නම් මෙකල මේ ගෞතම ගෝත්‍රයෙහි ඉපද සසර භයින් ගිහිගෙය හැර ශාසනයෙහි මහණවූ කිසාගෝතමී ස්ථවිරවන්නේය. එකල ඒ තවුසා නසා මිතුරුගුණ මහිම දැක්වූ ව්‍යාඝ්‍රරාජයා නම් මෙකල මේ කෙලෙසුන් නසා ඍද්ධිමහිම දැක්වූ මෞද්ගල්‍යාන ස්ථවිර වනනේය. එකල ඒ වෙනෙහි සියළු මෘගයන්ට උතුම්වූ සිංහරජ්ජරුවෝ නම් මෙකල මේ ශාසනයෙහි සියලු නුවනැත්තන්ට උතුම්වූ ශාරිපත්‍ර ස්ථවිර වන්නේය. එකල ඒ වෙනෙහි සියළු මෘගයන්ට උතුම්වූ සිංහරජ්පුරුවෝ නම් මෙකල මේ ශාසනයෙහි සියලු නුවනැත්තන්ට උතුම්වූ සිංහරජ්පුරුවෝ නම් මෙකල මේ ශාසනයෙහි සියලු නුවනැත්තන්ට උතුම් වූ ශාරිපුත්‍රස්ථවිර වන්නේය. එකල ශිල්පයෙන් අගතැන්පත් දිසාපාමොක් ආචාර්යනම් මෙකල සියළු ධුතාංගයෙන් අගතැන්පත් මහාකාශ්‍යප ස්ථවිර වන්නේය. එකල පන්සියයක් කුලපුත්‍රයන්ට වෙදත්‍රයෙන් අනුශාසනා කළාවූ තිත්තිර පණ්ඩිතයෝ නම් මෙකල භුවන්ත්‍රය වාසීවූ ජනයන්ට පිටකත්‍රයෙන් අනුශාසනාකොට අජරාමර වූ අමාත්‍යමහා නිර්වාණයට පමුණුවන්නාවූ බුදුවූ මම්මවේදැයි තමන් වහන්සේ දක්වා වදාළසෙක්.

SANHIDA LANKA

# චතුවාර ජාතකය

තවද දසවන නිපාතය දක්වමු ඒ කෙසේද යත් ?

තවද සුරාසුරවර චක්‍රවාට චූඩමණි මරිචි සච්ඡය පරිචුම්භිත වරණ නඛ මයුඛ ඇති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි නොකීකරු භික්ෂූකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වනලදී. මෙහි විස්තර වශයෙන් නවවැනි නිපාතයෙහි ගිජ්ඣ ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.මෙහි වනාහි සැබෑද මහණ තා නොකිකරුව වාසයකරන්නේයයි විචාරා සැබැව ස්වාමිනි කී කල්හි දැන්මතුනොවෙයි මහණ තෝ පෙරත් නොකිකරුව වාසය කළේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස කාශ්‍යප සර්වඥයන් වහන්සේගේ කාලයෙහි එක් ගමෙක දුක්පත් උපාසකයෙකු හා උපාසිකාවක් ඇත්තීය. උන්ගේ මත්තවින්දක නම් පුතෙක් ඇත්තේය. ඔහුගේ දෙමව්පියෝ තුමූ ශ්‍රද්ධා සම්පන්නයක ශිලාචාරයෙන් යුක්තයහ. ඒ මිත්තවින්දක නම් කුමාර ඉතා අනාචාර ශිලීව දවස් අරනේය. එසමයෙහි ඒ උපාසකයා මළේය. උපාසිකාව සැමියා මළත් කළමනා දම්පින් අඩුවෙක් නැතුව කරන්නාහුය. පුතනුවන්ට එම්බාපුත මෙලොව ඇති පරලොව ඇති දන්පින් කරවයි අවවාද කිහ. ඒ මිත්තවින්දක තෙම පින්කම් කොට කුමන කාරියෙක්ද පින්කම්කොට ලබන්නේ කිම්දැයි මෑනියන් කීවා නොකොට දසවිධ පින්කම් කළවුන්ට නම් තබා මාසේ වූවාය. පව්කලවුන්ට මෙසේවූ නපුරුකැයි කීහ. ඒ යාපත නපුර මම්ම දනිමි නුඹට ඇයිදැයි කියා අනාචාර ශිලිව වසන්නේය. එක්දවසක් පිරුණු පසළොස්වක් ලත් පෝය පැමිණියේය. මිත්තවින්දකයාගේ මෑනියේ කියන්නාහු එම්බා අද පෝහෝදවසය තොපට මසුරන්  දහසක් දෙමි විහාරයට ගොස් බණ අසා එවයි පුතනුවන්ට කීහ. පුතාත් යහපතැයි සම්පතෙහි කළලෝභයෙන් දාවල් මුළුල්ලේ ඈත මෑත ඇවිද දුෂ්ටකම්කොට සවස් වේලෙහි ගණයට ගොස් තමාට බණ නොඇසෙන තෙන දුරවැදහෙව නිදා නැගී උදෑසනක් සේ ඇසමුව සෝදා ගෙට ආයේය. උන්ගේ මෑනියෝය. අද මාගේ පුතනුවෝය. බණ අසා තෙරුන් වහන්සේ කැඳවාගෙණ එන්නාහුයයි කැඳ අවුළුපත් ඉදිකොට උන්නාහුය. ඒ මිත්ත වින්දකයාත් තනිවම ගෙට ගියේය. මෑනියෝ කියන්නාහු ඇයි පුත තෙරුන්නාන්සේ කැඳවාගෙණ නොආයේදැයි කීහ. එවිට කියන්නේ මම මසුරන් දහසනිසා බණ අසන්ට ගියපමණක් විනා තෙරුන් වහන්සේ කැඳවා ගෙණ එන්ට ගියෙන්දැයි කීහ. එසේ වීනම් තොප බණ ඇසුයේම මට ලාභය තොප මේ කැඳත්බී අවුළුපතුත් අනුභව කරවයි කීහ. මට මසුරන් දාස දුනහොත් විනා කැඳ අවුලුපත් අනුභව නොකෙරෙමියි කියා මසුරන් දාස ඇරගෙණ අවුළුපත් අනුභවකොට වෙළඳාමට ගොස් වෙළඳාම්කොට මසුරන් එක්ලක්ෂ විසිදාසක් සොයාගෙණ මෑනියන්ට ගොස් කියන්නේ මෑනීයන් වහන්ස මම වෙළඳාමට යෙමි කීහ. පුත සමුද්‍රයෙහි නැව්නැගී කරණ වෙළඳාම් නම් විස්වාස කළ නොහැක්ක මාගේ ගෙයි අසූදහසක් සම්පත් ඇත වෙළඳාමට යන්නේ මේ සම්පත් මදිවැදැයි පුතනුවන් එකරුත්ත අල්වා ගත්තාහ. ඒ මිත්ත වින්දකයා මෑනියන් අතගලවා කන්යට පාරක් ගැසීය. ඒ පාර කා මෑනියන් මූර්ජාවට පැමිණ වැටි යන්නා තෙමේ පඩව් නැගී සදවසක් මුද යාත්‍රා කළ කල්හි ඒ නැව සමුද්‍ර මධ්‍යයේ ඇනක් ගසාපුවාක් මෙන් නොසැලවී සිටියේය. ඒ නැවට නැංගාවූ බොහෝදෙනා මේ නැවට නැංගාවූන්ගෙන් අකුශල්කල කෙණෙකුන් ඇති නියාය කියා කුශපත්ලා බැළුහ. ඒ මිත්තවින්දකයා නම ලිව් කුශපත ගිලි ගියේය. ඔහු ලෑල්ලෙක ඉඳුවා සමුද්‍රයට අලහ. ඒ ලෑල්ල බඩතබා පීනන්න් දුවාණමය ප්‍රාසාදයක විමානප්‍රේතනම් ඒ මිත්තවින්දකයා දැක තමන්ගේ ප්‍රාසාදයට ඇරගෙණ කවා විමාණ ප්‍රේතයන් විසින් සත්දවසක් සැපවිඳ සත්දවසක් දුක් විඳිනාහ. එසේ හෙයින් දුක්විඳිනට යන්නාවූ අපි ඇම අපගේ කටයුත්තට යම්හ. අප එනතුරු උකටලී නොවවයි ඔහු ඒ ප්‍රාසාදයේ රඳවා ගියාහ.

ඒ දිව්‍යස්ත්‍රීන්ගේ ප්‍රාසාදයෙහි සම්පත් වින්දනොහි ඒ ලෑල්ල බඩතබා පීනාගෙණ යන්නේ දිව්‍යස්ත්‍රීන් අටදෙනෙකු ඉඳුනාවූ රිදීමය විමානයකට ගියේය. එතනිනුත් උන්හැම දුක්විඳිනට යාදී එතනත් නොරදා අනික් සොළොස් දෙනෙකු දීනා මැණික්මය ප්‍රාසාදයකට ගියේය. එතනිනුත් නොරඳා උන් හැම දුක්විඳිනට යාදී දිව්‍යස්ත්‍රීන් දෙතිස් දෙනෙකු ඉඳිනා රත්‍රංමය විමානයකට ගියේය. එතනිනුත් උන්සැම දුක්විඳිනට යාදී ලෑල්ල බඩ තබාගෙණ පීණායන්නේ වට පවුරක් ඇති වාසල් සතරකින් යුක්තවූ නුවරක්සේ බොහෝ නරකයෙහි පෙණෙන්නාහු මනුෂ්‍යයන් දැක එතනට පැමිණියේය. එතන එක්පවුලක පුරුෂයෙක් උරචක්‍රමාලාවක් ඉසතබාගෙණ පැසෙන්නේය. ඒ මිත්තවින්දකයා නෙළුම්මලක් ඉසතබාගෙණ සිටින්නාසේ පෙනී ඔහු ලය පස්තැනකින් යදමකින් මසා තිබෙන්නේය. ඒ මූට අවුල්හරක්සේ පෙණෙන්නේ ඌගේ ඇඟ මුළුල්ල උරචක්‍රමාලාවෙන් කැපී ලෙයින් තැවරී පිරී තිබෙන්නේය. ඒ මූට රසඳුනක් ඇග ගැල්වූ වාක්මෙන් පෙණෙන්නේය. ඒ තාමගේ වේදනාවෙන් මුරගානේ ගී කියන හඬක්සේ ඇසින. ඒ මිත්තවින්දක පුරුෂයා ඔහු කරා ගොස් කියන්නේ එම්බල පුරුෂය මේ නෙළුම්වල මට දිපියව නැතක් දවස තා අත තිබෙන්නේයයි කීය. ඒ පුරුෂයා කියන්නේ එම්බල නෙළුම්මලෙක් නොවෙයි. තට ඒ කුමටදැයි කියා සිතන්නේ මුන් මාසේ මෑනියන් මරා ආ කෙණෙකැයි සිතා මාගේ අකුශල ගෙවුමට පැමිණෙන නියාවවේදැයි සිතා එසේ වීනම් අරගනැයි ඌ ඉසට දැමිය. ඌ ඉස තබාගෙණ තැවෙන්ට වන මේක නෙළුම්මල නොව හැරගණැයි  වේදනාව ඉවසාගතනොහි වටපිට දිවයන්ට වන, ඒ පුරුෂයා අනතර්ධානවිය, බෝධිසත්වයෝ දිව්‍යපුත්‍රව ඉපිද සමුද්‍රයෙහි ඇවිදිනාහු එතනට පැමිණියාහ ඒ පුරුෂයා දිව්‍යපුත්‍රයා අතින්  විචාරන්නේ

SANHIDA LANKA

එම්බල දිව්‍යාරාජය මම කුමන අකුශලයක් කොට මෙතනට පැමිණියෙම් මේ දුක්කය. විඳිම්දැයි ඒ මට නොදනෙයි මට කියවයි බෝධි සත්වයන් අතින් විචාළේය. එවිට බෝධිසත්වයෝ කියන්නාහු එම්බල තෝ මසුරන් එක්ලක්ෂ විසිදාහසක් සොයාගෙණ දෙමව්පියන් කීවා නොකොට මැනියන් කන්සට ගසා මූර්ජා කරවා පඬවුනැගී සමුද්‍රයෙහිදි පටවව නොයන හෙයින් තොප මුදට දමාපුහ. තෝ ලැල්ල බඩතමාගෙණ දියපිනා දිව්‍ය ස්ත්‍රීන් සතරදෙනෙකු ඉඳිනා විමානයට ගියේය. එතනිනුත් තෘෂ්ණා බලයෙන් රඳාගතනොහි දොළොස් දෙනෙකු ඉඳිනා විමානයට ගියේය. එතනිනුත් තෘෂ්ණාවලයෙන් මැනියන් කනස්ට ගැසු අකුශලින් එතනින් රඳාගත නොහි දෙතිස් දෙනෙකු ඉඳිනා විමානයට ගියේය. එතනිනුත් තෘෂ්ණාබලයෙන් රඳාගතනොහි මෙතනට පැමිණ තාගේ තෘෂ්ණාබලයෙන් රඳාගත නොහි මෙතනට පැමිණ තාගේ තෘෂ්ණාබලයෙන් මෙසේවූ දුක්බයට පැමිණියේය. තෘෂ්ණා නමැති වල කෙතෙක් උත්සාහකර පිරුවෝතිනුත් පල්ලපුරා ගතනොහැක්කේය, ඒ තාගේ තෘෂ්ණා බලයෙනුත් මැනියන්ගේ කන්සට ගැසූ අකුශල් බලයෙනුත් මේ උරචක්‍ර මාලාව ඉස තබාගන දුක්විඳින්ට පැමිණියේයයි කීහ. එවිට මිත්තවින්දක තෙමෙ මේ දිව්‍යපුත්‍රයා මාගේ උත්පත්ති සියල්ලම දන්නේය. මා මේ දුකින් මිදෙන කළුත් දන්නේය. මුන් විචාරමි සිතා කියන්නේ එම්බල දිව්‍යරාජය මම මේ අකුශලයෙන් කෙතෙක් දවසින් ගැලවෙම්දැයි විචාළේය. එවිට බෝධිසත්වයෝ කියන්නාහු එම්බල මිත්තවින්දකය තා මේ දුනික් මිදෙනාකල් මෙතෙකියි කියන්ට නොදනුම්හ. අනන්තපරිමාන කලක් මෙහි පැසෙන්නේ වේදැයි දිව්‍යරාජයා අන්තර්ධාන වීයයි වදාරා මේ චතුවාර ජාතකය දිමවා වදාළසේක. එකල ඒ මිත්තවින්දක නම් දූන් මේ නොකිකරු භික්ෂුහුය.. එසමයෙහි දිව්‍යරාජයන්ව උපන්නෙම් බුදුවූ මම්මයයි  තමන්වහනසේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# කෘෂ්ණ ජාතකය

තවද ශාක්‍යකුල නායකවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ කිඹුල්වත් පුර නිග්‍රෝධාරාමයෙහි වැඩ වසන සමයෙහි සිනාවක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සර්වඥයන් වහන්සේ භික්ෂුසංඝයා පිරිවරා කිඹුල්වත්පුර ඒ ඒ ස්ථානවල් බලා ඇවිදිනා ගමනේ එක්තරා භූමියක් දැක එතන මදවෙලා වැඩ හිඳ සිනහ පහළකළසේක. අනදසාමින් සර්වඥයන් වහන්සේ සිනා පහළ කළ නියාව දැන සර්වඥයන් වහන්සේ සිනා පහළ කළ නියාව දැන සර්වඥයන් වහන්සේ නොකාරණයෙක සිනා පහළකළ සේක. ඒ කාරණය විචාරමියි සිතා සර්වඥයන් වහන්සේ සමිපයට අවුත් ස්වාමිනි මෙතන වැඩ සිට සිනා පහළකලේ කවර කාරණයකින්දැයි විචාළ සේක. එම්බා ආනන්දයෙනි පළමු මෙතන උග්‍රවූ තේජස් හා පචර්ඩ් අෂ්ට සමාපත්ති ඇති ක්‍රිෂ්ණ තාපස කෙණෙක් උන්නාහ. උන් සිතා සිනා පහළ කෙළෙමි වදාළසේක. ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ උතුම්වූ බ්‍රාහ්මණකුලයෙක උපන් සේක. ශරීරය ඉන්ද්‍රකීල මාණික්‍යයකට බඳුන්වූ පැහැ ඇති හෙයින් ක්‍රිෂ්ණ කුමාරයෝ යි නම් තිබූහ. බෝධිසත්වයෝ වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් උගතමනා ශිල්පශාස්ත්‍ර ඉගෙනගෙණ අවුත් තමන් පියානන්ට ශිල්පශාස්ත්‍ර පෑකල්හි පියානන්ගේ අයාමෙන් පුරෝහිත ස්ථානානන්තරයට පැමිණ තමන්ගේ දෙමව්පියන් මුතුන් මිමුතුන් ඇතුළු වන්නේ නොයෙක් වස්තු ලියා තුබූ ස්වර්ණ පත්‍රය ගෙන්වා බලා මේ වස්තු නම් රජදරුවන්ගේ සොරුන්ගෙන් සතුරන්ගෙන් දියෙන් ගින්නෙන් ඇතුළුවූ පංචප්‍රකාරයට පැමිණ නස්නේය. මෙසේවූ සම්පත් දානමුඛයට පමුණුවා පචර්ඩ් අෂ්ටසමාපත්ති උපදවා සැපසේ වාසය කරමි. මාගේ මෙතෙක් වස්තු රජ්ජුරුවන් වහන්සේට කියා දෙන්නෙමි. රජ්ජුරුවන් සමීපයට ගොස් ස්වාමිනි මාගේ දෙමාපියන් මුතුන්මිමුතුන් ඇතුළුවන්ගේ බොහෝ සම්පත් ඇත. ඒ සම්පත් ඔබ වහන්සේ ගෙන්වාගත මැනවයි කීහ. රජ්ජුරුවෝ බමුණු මාගෙන් තා කැමති සම්පත් හැරගණුව තාගේ සම්පත් මට හැයිදැයි රජ්ජුරුවෝ කීහ. බමුණානෝ කියන්නෝ ස්වාමිනි මාගේ බොහෝ සම්පත් දානමුඛයට පමුණුවා තපස්කරන්නෙමියි කීහ. රජ්ජුරුවෝ තොපගේ සම්පත් කැමති සැටියේ දානමුඛයට පමුණුවයි කී ගමනේ යහපතැයි බෝධි සත්වයෝ ගෙට අවුත් සම්පත් තිබූ ගබඩාවල යතුරු අරවා සියළු යාචකයෝ ඇවිත් කැමති සැටියට සම්පත් ගෙණ යෙත්වයි විධාන කළාහ. යාචකයෝ අවුත් සත් රෑ සත් දවාලක් සම්පත් ඇද නිමාවෙක් නුදුටු හෙයින් බෝධි සත්වයෝ සම්පත් බලා සම්පත් දන්දී යෙත්නම් ජරාව හෝ පැමිණෙයි ව්‍යාධිය හෝ පැමිණෙයි සිතා කැමති සත්වකෙණෙකුන් ගෙණයෙත්වයි කියා ගබඩාවල යතුරු හරවා තපසට නික්ම එක් වානාන්තරයෙක මුඬනම් ගසක් මුල වාසය කරන්නාහ.

බෝධිසත්වයෝ ඒ ගසමුල විනා අනික් ගසක් මුල කට පලාඵල කඩා නොයන හෙයින් රුකඩ මූලිකාංගයක් පුරන්නාහ. වනාන්තරයෙහි වාසයකරණ සෙයින් ආරණ්‍යකාඟයත් පුරන්නාහ. එක් ගමෙක නොවසන හෙයින් අබෙභාකාසිකාංගයත් පුරන්නාහ. පලාඵලයක් එකතැනක ඉඳ විනා සිතූ සිතූ තැනක ඉඳ නොකණ හෙයින් ඒකා සනිකාංගයත් පුරන්නාහ. නොනිදා ඉන්නා හෙයිනුත් ඉඳින් නිදන නමුත් භූමියෙහි විනා මැසෙසක ඇඳෙක නොසැතපෙන හෙයින් නෙසජ්ජිකාංගයත් පුරන්නාහ. මෙසේවූ ධුතාංගයෙන් හා ප්‍රථමධ්‍යාන චිතියද්ධ්‍යානාදී පචාභිදා අෂ්ටසමාපත්ති උපදවා වාසයකරන්නාහ. තවද බෝධිසත්වයෝ තමන් ගස එළජාතී අමුවුවත් විලිකුන්වුවත් එම අනුභව කරන්නාහ. මල් ඇතිදා මල් අනුභවකෙරෙති. මල් නැතිදා සඛාජාති අනුභව කරන්නාහ.තමා ඉදිරියේ තිබුදෙයෙක් විනා ඉවත තිබුදෙයකට අත නොපොවන්නාහ. ඇල්ළ අත්තෙම තිබූ ඵලාජාතිවුවත් මල්ජාතිවුවත් අනුභවකොට මේ නියායෙන් ඝෝරවූ තපස්කොට පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා වාසයකරන්නාහ.

SANHIDA LANKA

එසමයෙහි මේ කියන කෘෂ්ණ තාපසයන්ගේ ආනුභාවයෙන් ශක්‍රයාගේ පණ්ඩුකම්බල ශෛලාසනය හුණුවිය. ඒ කියන ආසනය හුනුවන්නේ සතර කාරණයකින්ය. හේ කෙසේද යත්, ශක්‍රයාගේ ආයුෂ මද අවස්ථාවේ

හුණුවන්නේය. යම් කෙණෙක් ශක්‍රසමාපත්ති ප්‍රාර්ථනා කෙරෙත් නමුත් හුණවන්නේය.යම් තපස්වී කෙණෙකුන්ගේ ශිල තේජසින් හුණුවන්නේය.මහා ගුණවතුන් කුකුස් ඉපදවීමෙන් උණුවන්නේය. මේ සතර කාරණයෙන් ශක්‍රයන් නොකමැතිකරවා පාණ්ඩුකම්බලශෛලාසනය හුණු  වන්නේය. එවිට ශක්‍රයෝ තමන්ගේ ආසනය නොකැමැතිකරවා හුණුවූ හෙයින් පරීක්ෂාකළ ගමනේ මෙකියන කෘෂ්ණ තාපසයන්ගේ ආනුභවයෙන් උණුවූ නියාව දැන එතනට අවුත් බෝධිසත්වයන්ගේ පිටිපස්සේ සිට කියන්නාහු ඒ කාන්තයෙන් මේ පුරුෂතෙම කෘෂ්ණාවූ ශරිර ඇත්තේය. කෘෂ්ණවූ එල අනුභව කරන්නේය. කෘෂ්ණ භූමියෙහි සෙයාාව කරන්නේය. එසේහෙයින් මේ පුරුෂයාගේ ක්‍රියාව මාගේ සිතට ප්‍රිය නොවන්නේය. කියා බෝධිසත්වයන් පිටිපස සිට කියන්නාහු ඒකාන්තයෙන් මේ පුරුෂ තමන්ගේ නුගුණ කී කල්හි කීපෙද්දෝහෝයි කීපෙන්ට නිසිබස් කීහ. කෘෂ්ණ තාපසයෝ ශක්‍රදේවේන්ද්‍රයන් කී බස් අසා ඒ මා හා සමග කථා කරන්නේ කවරෙක්දෝහෝයි දිවසින් පරීක්ෂාකරණ තැනැත්තේ ශක්‍රදේවේන්ද්‍රයන් නියාව දැන කරකැවී ශක්‍රදේවේන්ද්‍රයන්ගේ මූන නොබලාම කථා කරන්නාහු ශක්‍රදේවේන්ද්‍රයෙනි ඇඟ සම කළුවුවයි සත්වතෙමේ කෘෂ්ණ නම් නොවන්නේය. යමෙක් අභ්‍යන්තරයෙහි ශිල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥාන දර්ශනයෙන් සමන්විත වුයේ නම් එබඳුසත්වතෙම සන්තානයෙන් පිටත්කරණ ලද රාගද්වේෂාදී අකුශල ධර්මයන් ඇතිබව හේතුකොටගෙණ බ්‍රාහ්මණ නමුදු වන්නේය තපස්වී නමුදු වන්නේය. යම්සත්වයෙක්හු සන්තානයෙහි රාගද්වේෂා දී වු අකුශල ධර්මයන් බහුලව පවතීනම් ඒ සත්වතෙමේ ක්ෂත්‍රිය බ්‍රාහ්මණනාදීවූ යම් කිසි උත්තම කුලයක උපන්නේ වි නමුත් සවර්ණරූපයක් හා සමානවු රන් වන් ශරීර සෝභාවෙන් යුක්තවූයේ වී නමුත් කෘෂ්ණවූ අකුශල ධර්මයෙන් සමන්විත බැවින් කෘෂ්ණ නම් වන්නේයයි කීහ.

මෙසේ කියා මේ ලෝකයෙහි සත්වයන් කෘෂ්ණභාව කරන්නාවූ අකුශල ධර්ම අනේකප්‍රකාරයෙන් විස්තරකොට කියා ඒ අකුශල ධර්මයන්ට නින්දාකොට ශිලාදී ගුණ ධම්මයන්ට ප්‍රශංසාකොට ආකාශයේ සඳමඩල ගෙණහැර පාණාසේ ශක්‍රදේවේන්ද්‍රයන්ට ධර්මදේශනා කළාහ. ශක්‍රදේවේන්ද්‍රයෝ බෝධිසත්වයන්ගේ ධර්මකථා අසා සතුටුවූ සිත් ඇතිව වරයෙන් ආරාධනා කරන්නාහු තපස්වීන් වහන්ස ලොව්තුරා බුදුකෙණෙකුන් වහන්සේ මෙන් නුඹ වහන්සේ විසින් මනාකොට කියන ලද්දාවූ මේ සභාසිත වචනට නිසා නුඹ වහන්සේට වරදෙනු කැමැත්තෙමි. නුඹ වහන්සේ සිතුයම් වරයෙක් ඇත්නම් මාගෙන් ගතමැනවයි සියළු වරම් දෙමි කීහ. එබස් අසා මහාබෝසතානෝ කියන්නාහු සියළු දෙවියන්ට අධිපතිවූ ශක්‍රදේවේන්ද්‍රයෙනි ඉඳින් තෙපි මට වරදෙනු කැමැත්තානම් නොකිපිම් වශයෙන් කිසිසේත් කොපකටයුතු වස්තුයෙහි කෝපනොකිරීම ගැටෙන්නට නිසි වස්තුයෙහි නොමගැටිමය, ද්වේෂයෙන් ද්වේෂය නොකිරීමය. අනුන්සන්තක වස්තුයෙහි කිසිදෙයකත් ලෝභනොකිරීමය දු දරුවන් ආදීවූ විඥ්ඥාණක වස්තු හා ධනධාන්‍යාදීවූ අවිඥ්ඥාණක වස්තුයෙහි ලෝභ නොකිරීම, ඉඳින් ඒ සියල්ලම මා සන්තක වී නමුත් ඒ කාන්තයෙන් එහි ලෝභ නුපදවා මෙබඳුවූ චතුරාංගයෙන් සමන්විතවූ මාගේ ප්‍රවෘත්තිය කැමැත්තමේ. එසේ හෙයින් ශක්‍රදේවේන්ද්‍රයෙනි ක්‍රෝධනොකිරීමය. ද්වේෂය නොකිරීමය, පරසම්පත්තියෙහි ලෝභනොකිරීමයයි යන මේ වරසතර මට දෙවයි ඉල්වුහ. එබස් අසා ශක්‍රදේවේන්ද්‍රයෝ කියන්නාහු තාපසයන් වහන්සේ කෝධය ද්වේෂය ලෝභය සෙනෙහය යන මේ සතරෙහි ආදිනවයන් දුටුසේක්ද අපි එහි ආදිනවයන් නොදනුම්හ මා විසින් විචාරණලද්දාවු නුඹ වහන්සේ ඊට කාරණා කිවමැනවැයි කීහ.

ඉක්බිති මහබෝසතානෝ එසේවීනම් ශක්‍රදේවේන්ද්‍රයෙනි අසව කියා කාරණා කියන්නාහු නොයිවසන්නාවූ ස්වභාව ඇති සත්වයාගේ අක්ෂාන්තියෙන් උපන්නාවූ ක්‍රෝධය තෙමේ පළමුකොට ස්වල්පව ඉපද පසුව ඊමත්තේ බොහොව උපදනේය. යමක්හට උපන්නේ වී නම් ඒ සත්වයා එහිම අලවන්නේය. ඒ කෝප කටයුතුවූ වස්තුව ඇරය නොදෙන්නේය. පෙරලා පෙරලා ආක්‍රෝෂ පරිභවාදිය කරවන්නේය. නැවත කායික චෛතසික දුක්ඛසංඛ්‍යාතවූ පිඩා වෙන් සමන්විත වූ ක්‍රෝධය නිසා ප්‍රාණඝාතාදිය අකුසල කමර්මයන්කොට දානා ශිලාදි වු සුචරිත ධර්මයෙන් දුරුව මෙලෝ පරලෝ දෙකින් වධබන්ධන චිත්ත පීඩාදීයට පැමිණ දුක්කම්කටුල් ආදී බොහෝ දුක් අනුභව කරන්නේය. එසේ හෙයින් ක්‍රෝධ නම් මෙසේ අනේකප්‍රකාර ආදිනව ඇත්තේයයි දැන කෝපයෙන් නොකැමැත්තෙමි. තවද ශක්‍රදේවේන්ද්‍රයෙනි කිපිම ස්වභාව කොට ඇති ක්‍රෝධයෙන් කිපි පසුව අප්‍රතිකාර ස්වභාවවූ ද්වේෂයෙන් නොසතුටුවූ සිත් ඇති සත්වන්ට පළමුකොට එම්බල කොල තෝ දාසියා නොවේ දැයි පරුෂ වචනයෙන් පිටත්වන්නේය. ඒ පරුෂ වචනයට අනතුරුවම ඇත මෑත ඇවිදිම් වශයෙන් අතින් අත ගැන්ම වන්නේය. ඊට අනතුරුව උපක්‍රම වශයෙන් ප්‍රාණි ප්‍රහාරය වන්නේය. ඊට අනතුරුව ඔවුනොවුන්ට දණ්ඩෙන් පැහැරීම වන්නේය. දණ්ඩ ප්‍රහාරය ඉක්ම ඒකතෝධාර උගතෝධාර ඇති බණ්ඩිතල කණ්ඩු ආදීවූ ආයුධයෙන් ඔවුනොවුන්ගේ ජිවිත විනාශකෙරේද එසඳ ද්වේෂ මස්ත ප්‍රාප්තවූයේ වේයි යම්සේ ඇඹුල් නොවන්නාවූ මොරුවත් කාඩිවත් කල්යාමෙන් පාකයට ගොස් නැවත ඇඹුල්වේද එක ජාති ඇත්තා වුම මෝරුන් හා කාඩි ඇඹුල ඇඹුල් නැත්තේයයි කියනු ලැබේද එපරිද්දෙන්ම පළමුකොට

SANHIDA LANKA

උපන්නේ ක්‍රෝධනම් වෙයි මුකුරා ගොස් මතු මත්තෙහි උපදනේ වෛෂ නම් වෙයි. ඒ තෙමේ අකුශල මුක්ත වශයෙන් සමාන ජාති ඇත්තේ වී නමුත් ක්‍රෝධය වෛෂයයි වෙන් වෙන්කොට කියනුලැබෙයි ඇඹුල් නැති වස්තුවෙන් යම්සේ ඇඹුල උපන්නේද. එපරිද්දෙන් වෛෂයෙන් කෝපයත් උපන්නේ යම්හෙයකින් ඒ වෛෂය අනේකප්‍රකාරවූ ආදිනව ඇත්තේද එසේ හෙයින් වෛෂයත් නොකමැත්තෙමි. තවද ශක්‍ර දේවේන්ද්‍රයෙනි දෙවැනිදාවල් ගම් පැහැර කොල්ලකා මනාද ආයුධ ශරීරයෙහි තබා මෙන්ම දෙයක් සාහසික ක්‍රියාවෙන් වස්තු ගැම්මද රන් නොවනදෙය රත්තරනැයි ඒ හා සමාන වූ වස්තුවක් පෑ අනුන් සන්තක වස්තු ගැම්මද, නැවත අනේකප්‍රකාර වංචා ප්‍රයෝගයෙන් රෙමා මෝහ පමුණාවා වස්තු ගැම්මද යන මේ පාපධර්මයෝ ලෝභයෙන් මඩනා ලද්දාවූ සත්වයන් කෙරෙහි පෙණෙන්නාහ. ලෝභරහිතවූ සත්වයෝ මෙබඳු වූ අකුශල කර්මය නොකෙරෙති. මෙසේ ලෝභනම් අනේකප්‍රකාර ආදිනව ඇත්තේය. එසේ හෙයින් ලෝභයත් නොකමැත්තෙමි.

තවද ශක්‍රදේවේන්ද්‍රය අරමුණෙහි ඇලෙන්නාවූ ස්වාභාව ඇති සෙනෙහයෙන් ග්‍රන්ථිතවූ නැවත උත්පත්ති වශයෙන් ගැලවුනාවූහුයින් මල් ගෙතුවාක් මෙන් අනේකප්‍රකාර ආලම්බනයෙහි පවත්නාවූ අභිදාකාය හස්තයෙන් ගෙතුනාවූ සර්වණාදියෙන් උපන් නාවූ ස්වර්ණාභරණාදියෙන් මෙන් මනසින් උපන් බැවින් මනෝමයට අභිජඣා කායග්‍රන්ථාදීහු ඒ ඒ අරමුණෙහි පවත්නාහ. ඒ ලෝභාදී ධර්මයෝ සන්තානයෙහි ඉඳ බලවත්වූ සන්තාපය උපදවමින් අත්‍යන්තයෙන් සත්වයන් මිරිකා පීඩාකරන්නාහ. මංගල බෝධිසත්වයන්ට දරුවන් දන්දී බලවත් සෝක යෙන් පා උපන වෙස්සන්තර බෝධිසත්වයන්ට දදරුවන් දන්දී මහත්වූ දොම්නස් උපන මෙස්පිරූ පාරමිතා ධර්මයන් ඇති මහබෝධිසත්වයන්ට පවා මෙසේ සංඛ්‍යාත අකුශලධර්මයෝ තැවිලි කරන්නාහ. මේ සෙනෙහෙයෙහි ආදිනව වන්නේය. එසේ හෙයින් සෙනෙහයත් නොකැමැත්තෙමි කීහ. එබස් අසා ශක්‍රදේවේන්ද්‍රයෝ කාෂ්ණ පණ්ඩිතයෙනි තොප විසින් මේ ප්‍රශ්ණය සර්වඥ විලාසයෙන් මනාකොට කියනලද තොප කෙරෙහි ඉතාසටුතුවීම් එසේහෙයින් නැවතත් තොපට වරයක් දෙමියි කීහ. එබස් අසා මහබෝසතානෝ කියන්නාහු දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රදේවේන්ද්‍රයෙනි ඉදින් තොපි මට වරයක් දෙනු කැමැත්තානම් නිරන්තරයෙන් උදකලාව මේ වල්හි වසන්නාවූමාගේ තපසට අන්තරාය කරන්නාවූ ව්‍යාධියෙක් නුපදිවයි එසේවූ වරයක් දෙවයි කීහ. ශක්‍රදේවේන්ද්‍රයන්ගෙන් කාෂ්ණ පණ්ඩිතයෝ වරගන්නා තැනැත්තෝ ආමිස නිශ්‍රිතවූ වරයක් නොගනිමි තපෝකම් නිශ්‍රිත වූ වර ගණිති කියා වඩ වඩාලා ප්‍රසන්නව නැවතත් වරයෙක් දෙමි කීහ. බෝධිසත්වයෝ වරගන්නාහු ව්‍යාජයෙන් ධර්මදේශනා කෙරෙමි සිතා ධර්මදේශනා කරන්නාහු ශක්‍රදේවේන්ද්‍රයනි මා නිසා මට වැඩ කැමති බැවින් කිසි සත්වයක් හට කිසිකලෙක කායචාරය, වචිචාරය මනෝ චාරය යියන ත්‍රිවිධවූ කර්මචාරයන් උපන්නාවූ ප්‍රාණඝාතාදීවූ දශ අකුසල කර්මථයෙහි මිදි පිරිසිදු චිත්ත සන්තාන ඇතිවෙම්වයි කියා මෙසේ මහබෝසතානෝ යථොක්තවූ කාරණයන් කියා වරගන්නා තැනැත්තෝ ප්‍රව්‍රජ්‍යාවෙන් සුදුසුවූ වරගත්තාහ. ශක්‍රයෝ කෘෂ්ණ තාපසයන්ට වරදී නිදුක් නිරෝගීව මේ වෘක්ෂමූලයෙහි ඉඳ සැපසේ වාසයකරවයි කියා වෘක්ෂයෙන් එල එල්ලවයෙන් නිර්මිතකොට ශක්‍රයෝත්තමන්ගේ ශක්‍රභවනයට ගියාහ.කෘෂ්ණ තාපසයෝත් එම වෘක්ෂමූලයෙහිම ඉඳ නොපිරිහුනු ධ්‍යානයෙන් බඹලොව ගියහයි වදාරා මේ කෘෂ්ණ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ශක්‍රයෝ නම් දැන් අනුරුද්ධ මහාස්ථවිරයෝය. එසමයෙහි කෘෂ්ණ තාපසයෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# සංඛ ජාතකය

තවද ශාක්‍ය කුල කේතුවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සර්වපරිෂ්කාර දානයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සැවැත්නුවර එක්තරා උපාසකයෙක් සර්වඥයන් වහන්සේ ඇතුළුවූ සියළු භික්ෂූන් වහන්සේ පවරා සත්දවසක් දන්දී ඉක්බිති ස්වර්පරිෂ්කාර දානයක් දින ඉන් වහන්දානය විශේෂයෙන් දුන්නේය. ඉන් සර්වඥයන් වහන්සේට දුන්නාවූ වහන්සඟලෙහි අගය දහසක් වටනේය. දෑගසව්වන් දෙදෙනා වහන්සේට දුන්නාවූ වහන්සඟල පන්සියයක් වටනේය. භික්ෂූන් වහන්සේට දුන් වහන්සඟල සියය සියය වටනේය. මේ නියායෙන් උපාහණ දානය මහත්කොට දින සර්වඥයන් වහන්සේ උපාසකය තොප දුන්නාවූ වහන් දානය තොපි කැමති යම් ප්‍රතිෂ්ඨාවවකට පැමිණෙයි එසේහෙයින් තොපට මහත්වූ විපාක දෙන්නේය. පළමු උත්තමයෝ පසේබුදුන් වහන්සේ සඟලක් හා පත්කුඩයක් දන්දී සමුද්‍ර මධ්‍යයෙහි ප්‍රතිෂ්ඨාව ලද්දේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර එසමයෙහි මෝලිය නුවර නම් බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුනක් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට සංඛ නම් පුරෝහිතව මහත්වූ සම්පත්තින් වාසය කරන්නාහ. සතර දන්හල් කරවා දවස්පතා මහත්වූ දානය දුගි මගි යාචකයන්ට දුන්නාහුය. එසේ දන්දෙමින් සිතන්නාහූ මාගේ සම්පත් යම් නියායෙක අඩුව ගියේ නම් ඒ දවස් මාගේ දානය පිරිහෙයි. ඊට පළමු වෙළඳාම් ආදියෙන් සම්පත් උපදවා එමයි සිතා අරිටය්පුරයට ගොස් වෙළඳාම් කොට සම්පත් ගෙණෙන්ට උවමැනවයි පඩව් තොටට යන සංඛ නම් බ්‍රාහ්මණ තෙම පයවහන් සඟලක් ලා පත්කුඩයක් ගෙණ පසුඹිය කරලාගෙණ මධ්‍යාහ්න වේලේ පඩව් තොටට යන්නාහ. එ දවස නන්දමූලක පබ්භාරයෙහි වාසය කරන්නාහූ පසේබුදුන් වහන්සේ ලොවට කාරුණාවෙන් බලා වදාරණසේක් සංඛ නම් බ්‍රාහ්මණයානන් පඩව් නැගී යාත්‍රාවට යන නියාව දැන වදාරා යාත්‍රා ගියකල මුන්ට වන උපද්‍රව ඇද්දෝහොයි නැද්දෝහෝයි පරීක්ෂාකොට සමුද්‍ර මධ්‍යයෙහිදී මුන්ට වන උපද්‍රව දැක ඒ උපද්‍රවම මා එතනට ගියකල වහන්සඟලක් හා පත්කුඩය දන්දිමෙන් වැලකි ප්‍රතිෂ්ඨාව ලැබේතියි, දැන වදාරා එතනට එන්නාවූ  පසේ බුදුන් වහන්සේ ගිණි අඟුරු මෙන් කකියනන්වූ වැලි මැඩගෙණ මධ්‍යහ්න වේලේ අවුත් සංඛනම් බ්‍රාහ්මණයානන් දුටුසේක. බෝධිසත්වයෝ පසේ බුදුන් වහන්සේ දැක ඡායා සම්පණ්ණ වෘක්ෂයක් සමීපයට ගොස් පසුඹියෙහි තිබූ තෙලින් පසේ බුදුන් වහන්සේගේ ශ්‍රී පාදය මැඩ වහන්සඟල පසේ බුදුන් වහන්සේගේ ශ්‍රී පාදයේ ලා පත්කුඩයත් අතටදී ස්වාමිනි පත්කුඩය ඉසට ගෙණ වහන්සඟල පයලා නොමිරිකි කරුණාවෙන් වඩනේ යහපතැයි කීහ. පසේබුදුන් වහන්සේ බෝධිසත්වයන්ට අනුමෙවෙනි බණ වදාරා තමන් වහන්සේ පළමුවිසූ නන්දමූල පබ්භාරයට පස්වනක් වලාමඩිමින් ආකාශයෙන් වැඩිසේක. බෝධිසත්වයෝ බොහෝ මනුෂ්‍යයන් හා සමගින් යාත්‍රාකරන්නාහු සමුද්‍ර මධ්‍යයට පඩව්ව ගිය කලට එක් ඇලයකින් පඩව්ව බිඳි පැන් ඉසෙන්ට වන, මනුෂ්‍යයෝ පැන් ඉසින්ට වන්නාහ. පැන් ඉසගත නොහැකිව පඩව්ව නැසෙන්ට වන්කලට මනුෂ්‍යයෝ අඬන්ට වන්නාහ. බෝධිසත්වයෝ කිසි සැකයක් නැතිව එළඟි තෙලින් සර්කිරා අනා බඩ පුරා කා තලතෙල් ශරිරයේ ගල්වා පිළි තරකොට ඇඳ අතවැස්සාත් මේ නියායෙන් සලස්වාගෙණ කුඹ උඩට දෙන්නම පැණ නැගී තමන්ගේ නුවර අසවල්දීසායයි නියම දැන මනුෂ්‍යයන් කන්ට එක්වූ මස් කැස්බන් වලහා ඉස්බක්තැන් බෝධිසත්වයන් අතවැස්සා හා පැණපුවා, සත් රෑ සත් දවාලක් සමුද්‍රයෙහි පිණන කලට සතරවරන්  දෙවියන් විසින් දෙමවුපියන් පඤ්චශිල අෂ්ඨංග ශිලය රක්ෂා කරන්නාවූ දානාධ්‍යස කරන්නාවූ යම්ම සත්වයෙක් සමුද්‍රයෙහි වැටුනේ වී නම් උන්ට ප්‍රතිෂ්ඨායයි සැලැස්වූ මණිමේඛලාද අපරික්ෂිතව උන්නී සත්වෙනි දවස සමුද්‍රය බලා සත් රෑ සත්දවාලක් පිණන්නාවූ බෝධිසත්වයන් දැක තුමුද දිව්‍යභාරණයෙන් සැරහී රන්තලියකින් බත් ඇරගෙණ බෝධි සත්වයන් සමීපයට අවුත් ආකාශයේ සිට එඹල පුරුෂය තෝ නිරාහාරයෙන් මුදාපිණන්නේ සත් රෑ සත්දවාලෙක මා ගෙණා මේ රන්තලියේ බත් අනුභවකරවයි කිහ. බෝධිසත්වයෝ එඹල ස්ත්‍රිය මම පේවිම් වෙලා නොවරද්දා විනා වේලා වරද්දා බත් නොකමි තෝ පලායයි කීහ.

SANHIDA LANKA

එවිට පස්සේ පීනුයේ අතවැසි මනිමේඛලාදුව අවුත් සිටිනා නියාව නොපෙණෙන්නේය. බත්කන්ට කීවාද

නොඇසෙන්නේය. බෝධිසත්වයෝ වේලා වරද්දා බත් නොකම් රන්තලියේ බත් තෝ ඇරගෙණ පළායයි කී බස් අසා අත වැසි සිතන්නේ සංඛනම් බ්‍රහ්මණයානන් වහන්සේ සුඛුමාල හෙයින් හා සත් රෑ සත් දවාලක් නිරාහාර හෙයින් නිනම් ප්‍රලාප කියනසේකැයි සිතා කියන්නේ සංඛනම් බ්‍රාහ්මණයානන් වහන්සේ බොහෝ ඇසූපිරූ තැන් ඇතිසේක. බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන් මා කථාආදියෙත් ඇතිව දානාධ්‍යාශය කළසේක. සත් රෑ සත් දවාලක් බත් නොකෑවයි මරණාසන්නයෙහි නිකම් ප්‍රලාප කුමට දොඩනසේක්ද, වේලා වරද්දා බත් නෙකම් තොප ඇරගෙණයයි මෙසේවූ ප්‍රලාප කියන්ට නුඹ වහන්සේට මා විනා අනික් කෙණෙකුන් නැතිව ඉඳ මේ කියන්නේ කාටදැයි විචාළේය එවිට බෝධි සත්වයෝ මේ දිව්‍ය ස්ත්‍රී මුන්ට නොපෙණෙන නිසා වේදැයි සිතා එඹල සබඳ මා ඉදිරයෙහි දිව්‍යස්ත්‍රියක් බවත් නොදනෙයි සෘධි ඇති මනුෂ්‍ය ස්ත්‍රියක් බවත් නොදනෙයි රන්තලියකින් බත් ඇරගෙණ සෘද්ධි ඇති මනුෂ්‍ය ස්ත්‍රියක් බවත් නොදනෙයි රන්තලියකින් බස් ඇරගෙණ කන්ට කියයි ඈ හා කැටිව කථාකෙළෙමි. නිකම් ප්‍රලාපයක් නොකියම් කීහ. එවිට අතවැසි කියන්නේ දිව්‍යස්ත්‍රියෙක බව මනුෂ්‍ය ස්ත්‍රියෙක බව විචාරන්ට උව මැනවැයි දෙපයින් පිණ පිණා දතින් නමස්කාරකොට අපට ගැලවිමක් ඇද්දැයි විචාළ මැනවයි කීයේය. සංඛනම් බ්‍රාහ්මණයාත් මුන් කියේ කටයුතුයයි විචාරම් සිතා වෘක්ෂ ස්ථාල ඇති සිහින් වූ සිගුවාලගයක් ඇති දේවදූනුහා සමානවූ භ්‍රැයුග්මයක් ඇති සූර්ය මණ්ඩලයක්මෙන් ශරීර සෝභා ඇති සර්වාලංකාරයෙන් සැරහෙන ලදුව මා ඉදිරියේ සිටිනා තෙපි දිව්‍ය ස්ත්‍රියෙක්ද සෘද්ධි ඇති මුනුෂ්‍ය ස්ත්‍රියක්දැයි විචාළේය. එවිට දිව්‍යස්ත්‍රී කියන්නී සතරවරම් දෙවියන් විසින් සමුද්‍රහුනු මේ සත්වකෙනෙක් ඇත්නම් උන්ට ප්‍රතිෂ්ඨාවට සිටුවන ලද මණිමේඛලා දූ නම් මමය. තෙපි කිසිභයක් නොවි තොපට උවමනා වස්ත්‍රාභරණ අන්නපාණාද ඇත්වාහණ අස්වාහණ ඇතුළුවූ වාහණයක්ද ඇරගණුව කිසිභයක් නොගණුවයි කීව. බෝධිසත්වයෝ එඹල දිව්‍ය ස්ත්‍රිය මට උවමනා දෙයක් දෙමි කියන්නේ මාගේ ජාතිගේත්‍ර බලාද නොහොත් මා කළ කුශලයක් බලාදැයි විචාළේය. දිව්‍යස්ත්‍රී කියන්නී තොප පඩවි නැගෙන්ට එනගමනේ තොප පසේබුදුන් වහන්සේට දුන් පත් කුඩය හා වහන්සගළේ ආනුභාවයෙන් මා තොපට කැමති දෙයක්දෙමි කියේත් තොපට මෙතන පෙණි ප්‍රතිශ්ඨාවූයේත් ඒ කුශල බලයෙනැයි කිව. එවිට බෝධිසත්වයෝ කියන්නාහු අපට අනික් දෙයකින් ප්‍රයෝජන කිම්ද අපගේ මෝලිනි නම් නුවරට පළායන නියායෙන් යහපත් වරය ඇති රිටි පළුපත් ඇති පඩව්වෙක අපලා අපගේ නුවරෙහිලා පියවයි කීහ. එවිට දිව්‍ය ස්ත්‍රී යහපතැයි කියා අටඉස්බක් දිගද සතරඉස්බක් පලලද ඉස්බක්  ගැඹුරුද ඇති සත්රුවන් නැවක් මවා මැනික්මය කුඩයකින්ද රත්රන්මය රෑණද රිදිමය රුවලද මවිතකොට සත්රුවන්ද ඒ නැවපුරා බෝධිසත්වයන්ට නැවපා එහි වඩා හිඳුවූහ.බෝධිසත්වයෝ අතවැස්සා නැවලන්ට කී ගමනේ මනිමේඛලාදූ කියන්නි උන්කල කුශලයක් නැතිව ඉන්දදි නැව ලන්නේ කෙසේදැයි කිව. බෝධිසත්වයෝ තමන්කල කුශලයන් පින්දෙන්හ. පින් අනුමෝදන් වු ගමනේ දෙව්දූ අතවැස්සාත් උස්වා නැවලාගෙණ බෝධිසත්වයන් මෝලිනි නම් නුවරට ගෙණගොස් උන්ගේ ගෙය සත්රුවනින් පුරාලා මනිමේඛලාදූ ගියාය. බෝධිසත්වයෝ සම්පත්ගෙණ නොයෙක් කුශල් කොට කම්වු පරිද්දෙන් මියපරලොව ගියහයි වදාරා මේ සංඛ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි මණිමේඛලා දූ නම් දූන් උපුල්වන් මහාස්තවිරයි. එසමයෙහි අතවැස්සානම් දූන් මේ ආනන්දස්ථවිරය, එසමයෙහි සංඛ බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# චුල්ලබෝධි ජාතකය

තවද ශිලසමාධි ප්‍රඥායෙන් යුක්තවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝපී භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

එක් භික්ෂූකෙනෙකුන් වහන්සේ තද රළු පරුෂව කිවන්ගේ බසට කෝපීව වාසයකරන්නේය. සර්වඥයන් වහන්සේ එපවත් දැන වදාරා සැබෑද මහණ තෝ කෝපිව වාසය කරන්නේයයි විචරා වදාරා සැබැව ස්වාමිනි කී කල්හි මහණ තා කෝපයෙන් නැත්තාවූ බුද්ධශාසනයෙහි මහණව කෝපවන්ට කාරණා කිම්ද පෙර උත්තමයෝ බුද්ධශාසනයෙන් පිටත් තාපසභාවයෙහි සිටත් කෝපකළමනා ස්ථානයෙහි කෝපනුවුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් වහන්සේ රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක් බ්‍රහ්මණ කුලයෙක උපන්හ. උන්ට නම් තබන්නාහු බෝධිසත්ව කුමාරයෝයි නම් තුබූහ. ඒ කුමාරයෝත් වැඩිවිය පැමිණ තක්ලසා නුවර දිසාපාමොක් ආචාරීන් කරා ගොස් උගතමනා ශිල්ප නිමවා ඉගෙණ දෙමව්පියන්ට ශිල්ප පෑවාහ.දෙමව්පියෝත් පුතනුවන් කෙරෙහි සතුටුවූ සුදුසු කුලයකින් බිරින්දක් ගෙණවිත් පාවාදෙන්ට උත්සාහ කළාහ. ඒ කුමාරයෝ මට බිරින්දගෙන් කාරිය නැත. මම තපසට යෙමි නොගිවිස්නාහ, දෙමව්පියෝත් උන් නොගිවිස්සත් සමානකුලයකින් කුමාරිකාවක් ගෙණවිත් විවාමගුල් කරවා පාවා දුන්හ. බිරින්ද පාවා දුන් පමණක් විනා කෙළෙස් වසගයෙන් මූන පමණකුත් නොබලා එකගෙයි වාසය කරන්නාහ. එසමයෙහි දෙමව්පියෝ දෙදෙනාම කාලක්‍රියා කළාහ. බෝධිසත්වයෝ බොහෝ සම්පත් බලා කියන්නාහු මේ සම්පත් තෙපි ඇරගණුවයි බිරින්දට කීහ. කුමාරිකාව කියන්නී ඇයි ස්වාමිනි නුඹ වහන්සේ කොයි වඩනා සේක්ද, මට සම්පත් පාවාගන්ට කියන්නේ යයි කීහ.බෝධිසත්වයෝ කියන්නාහු මම හිමාලයවනයට තපසටයෙමියි කීහ. ඇයි ස්වාමිනි ස්ත්‍රීන්ට තපස්කරන්ට නපුරුදැයි විචාළාහ. නපුරු නොවෙයි තොපට පුළුවන්වීනම් තපස්කරවයි කීහ. එවිට දෙන්නම ඒ දෙමව්පියන්ගේ සම්පත් හැර හිමාලයවනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව දසඅවුරුද්දක් අඛණ්ඩ ශිලය යහපත්ව රක්ෂා කල පමණවිනා පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවාගත නුහුනුවාහ ඇඹුල් ලුනු සෙවුනා පිනිස මනුෂ්‍යපථයට ගොස් බරණැස් රජ්ජුරුවන්ගේ උයණෙහි වාසය කරන්නාහ. ඒ උයන රක්නා උයන්ගොව්වා උයනේ යහපත්වූ පලාඵල ඇරගෙණ රජ්ජුරුවන් කරා ගොස් රජ්ජුරුවන්ට පලාඵල දින රජ්ජුරුවෝ කියන්නාහු එඹල උයන් ගොව්ව අප කීප දවසකින් උයන්කෙළියට එම්හ. උයන යහපත්කොට සරසවයි කීහ.

උයන්ගොව්වාත් යහපතැයි උයනට ගොස් උයන කසලකර සරසාලීය. රජ්ජුරුවෝත් උයනටගොස් උයන්කෙලි කෙළ ඒ ඒ තැන ඇවිදිනාහු තාපසයන් හා පරිවාජිකාවන් දැක වැඳ එකත්පස්ව සිටියාහු පරිව්‍රාජිකාවන් දැක උන්කෙරෙහි පිළිබඳ සිත් ඇතිව පරිව්‍රාජිකාවන් පවත් තාපසයන් අතින් විචාරන්නාහු ස්වාමිනි මේ පරිව්‍රාජිකවන් වහන්සේ නුඹ වහන්සේට කුමක්වන සේක්දැයි විචාළාහ. මහරජ කුමක්වෙද්ද එක්ව තපස් කරණ තැනැත්තෝය. එසේදවුවක් මා ගිහිකල පාදපරිචාරිකාවෝයයි කීහ. එවිට රජ්ජුරුවෝ මේ තාපසයන් වහන්සේ කෝප ඇතිසේක්දෝ නැති සේක්දෝහෝයි පරීක්ෂාකරන්ට උවමැනවැයි සිතා කියන්නාහු තාපසයන් වහන්ස ඉදින් යමෙක් පරිව්‍රාජිකාවන් වහන්සේ බලයෙන් උදුරාගෙන යන කෙණෙක් වීනම්ද ඇත්නම්ද කෝප ඇද්ද නැද්දැයි විචාළාහ. තාපසයෝ කියන්නාහු මහරජ රහත් නුයේයින් කෝපනැත කියද්ද ඉදින් කෝපයක් ඇතිවුවත් මම වනාහි ඇවිලෙන ගින්නෙක පැන්කල සලා ගිණි නිවන්නාසේම සන්තානයෙහි කෝපය අඩුකරණ පමණක්විනා අනුන්ට දැනෙන නියායෙන්කෝප නොකෙරෙමි මාගේ ජිවිතය දක්වාත් කෝප නොකෙරෙමියි කීය. රජ්ජුරුවෝත් තමන්ගේ එක්තරා අමාත්‍යයෙකු කැඳවාගෙණ තෙල පරිව්‍රාජිකාවන් ඇරගෙණ රජගෙට ගෙණයවයි කීහ. ඒ අමාත්‍යයාත් පරිව්‍රාජිකාවන් අත අල්වාගෙණ මුරගාවා මෙසේවූ අධර්මයෙක් ඇද්ද මෙසේවූ අධර්මියෙක් මේ ලෝකයෙහි පවත්නා නියායයි කියා මුරගාවා මුරගාවා රජගෙට ගෙණ ගොස්ලීය. තාපසයෝත් කරඹඔසවාලා බැණනොනැගී උන්නාහ. රජ්ජුරුවෝත් කල්යවා එතන නොසිට රජගෙට ගොස් පරිව්‍රාජිකාවන්ට කියන්නාහු මාගේ සොළොස්දහසක් පුරඟනාවන්ට නායකකොට

SANHIDA LANKA

අගමෙහෙසුන් තනතුරෙහි පිහිටුවාලිම් මේ තපස් කිරීමෙන් කුමණ කාරියෙක්දැයි කීහ. පරිව්‍රාජිකාවෝ කියන්නාහු මහරජ තොපගේ සම්පත්තීන් මට කුමණ ප්‍රයෝජනද තපස්කිරීම උත්තමයයි කියා නොගි විස්සාහ. රජ්ජුරුවෝත් ඒ පරිව්‍රාජිකාව නොගිවිස්නා හෙයින් එක්ගෙයක ලවා තාපසයෝ උරණ ඇද්දෝහෝයි නැද්දෝහෝයි පරීක්ෂා කොට උවමැනවැයි තනිව උයනට ගොස් පදසන් නො ඇසෙන නියායෙන් තාපසයන් වසන ස්ථානයට ගියාහ. තාපසයෝ පරණ වල්කලාවක් ඇරගෙණ ගෙත්තම්කරන්නාහු රජ්ජුරුවන් එන නියාව නොදත් හෙයින් බැණනොනැගී උන්නාහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහූ ඇයි තාපසයන් වහන්ස මාගේ ජිවිතාන්තය දක්වාත් කෝප නොකෙරෙමියි කියාවේද නුඹ වහන්සේ කියේය. මා ඇවිත් සිටිනා මෙතෙක්වෙලා බැණනොනැගේ කෝප නැත්තෙන්දැයි කීහ. එවිට තාපසයෝ කියන්නාහු මහරජ එවිට උපන්නාවූ කෝපය එවිටම නැගාවූ ධූලිරැසක් වැසිගිය නිවාපුවාසේම සන්හිඳුවාපිමි කීහ. එවිට රජජුරුවෝ කියන්නාහු තාපසයන් වහන්ස මෙසේවූ කෝපයට අඩුවන්නට කාරනා කිම්දැයි කීහ. තාපසයෝ කියන්නාහු මහරජ දඬුදෙකක් එක්වගැකල ගිණි වැටෙන්නේය. නැවත ඒ ගිණිදඬුදෙකම දවන්නේය. මහරජ එමෙන් මේ කෝපය ඇතිවූකල එවිටම නිවාපියතොත් විනාකෝපය දිවුනුකල තමාටම ආයසවන්නේය. එසේවූ කොපයවහා නසාපිය යුත්තේ යයි බොහෝ නය දක්වා කෝපයෙන් ආදිනව කීයේය. රජ්ජුරුවෝත් තාපසයන් වහන්සේ විසිෂටකොට කීයන ලද්දාවූ ධම්මයෙහි සතුටුව තමන්වහන්සේ පරිව්‍රාජිකාවන් උදුරාගෙන ගියාවූ මා කෙරෙහි කෝපයක් නොකොට බණ වදාළසේකැයි සතුටුව අමාත්‍යයකු කැඳවා පරිව්‍රාජිකාවන් ගෙන්වා තාපසයන්ට පාවාදී උයනේ වාසය කරණ නියායෙන් ආරාධනා කොට වස්වා උපස්ථාන කළාහ. නොබෝ කලකින් පරිව්‍රාජිකාවෝ මළහ. තාපසයෝත් හිමාලය වනයට ගොස් පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් බඹලොව ගියහයි වදාරා මේ චුල්ලබෝධි ජාතකය නිමවා වදාළසේකි. එසමයෙහි පරිව්‍රාජිකාවෝ නම් යසෝධරා ස්ථවිරිය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. චුල්ලබෝධි තාපසයෝ නම් බුදුවූ මම්යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# කණ්හදීප ජාතකය

තවද ශාක්‍යකුල චූඩාමාණික්‍යවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ශාසනයෙහි උකටලීවූ භික්ෂූකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලදී. මෙහි වනාහි ජාතක කථාව කුසජාතකයෙහි විස්තවශයෙන් පෙණෙන්නේය. මෙහි වනාහි සර්වඥයන් වහන්සේ භික්ෂූන් වහන්සේ ගෙන්වා තෝ වනාහි ශාසනයෙහි උකටලිවූයේ සැබෑදැයි වදාළ ගමනේ සැබෑව ස්වාමිනි සාසනයෙහි සිටින්ට අභිප්‍රාය නැත්තෙමි සිව්වනක් පෂින් මධ්‍යයෙහි කීසේක. සර්වඥයන් වහන්සේ එවිට වදාරණසේක් පෙර උත්තමයෝ පණස් අවුරුද්දක් ශාසනයෙහි අභිප්‍රාහ සිටිනා ගමනේ මෙහි වාසයකරන්ට අනභිප්‍රායෙමි යන බස කියාගතනොහි සිටියේවේදැයි තොපි භික්ෂූ භික්ෂූණී උපාසක උපාසිකාය යන සිව්වනක් පර්ෂිත් මධ්‍යයෙහි ශාසනයෙහි උකටලී විෂයි නිර්ලජ්ජාවම කියෙහි වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස වත්සරනම් රට කොසඹෑ නුවර රජ්ජුරුකෙණෙකුන් රාජ්ජයකරණ සමයෙහි බෝධිසත්වයෝ එක්තරා බ්‍රාහ්මණකුලයක ඉපිද වැඩිවිය පැමිණ අනික් බ්‍රහ්මණ කුමාරයෙකු හා දෙන්න පංචකාමයෙහි ආදිනව දැක හිමාලය වනයට ගොස් ඍෂි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව දිනපතා පසයෝය මධ්‍යපතාපසයෝයයි මේ නමින් දෙන්නාම වාසය කරන්නාහ. එනු ඇඹුල් පිණිස බරණැස්නුවර පසල් ගමෙක අවුත් මඬප්ප උපාසකයාගේ ගෙට අවුත් වන්හ. ඒ දෙදෙනා වහන්සේ පළමුත් ඒ උපාසකයා අඳුනන හෙයින් දෙදෙනාවහන්සේට සිව්පසයෙන් දන්දෙන්නේය. මණ්ඩප තාපසයෝ ඒ ගමසිට බරණැස් නුවරට අවුත් ඒ නුවර අවිමුක්ත නම් සුසුන භූමියෙහි වාසය කරන්නාහ. ඒ නුවර සොරු සොරකම්කොට ගෙණයනකලට මනුෂ්‍යයෝ දැක සොරුන් එහුබඳවා ගත්කලට සොරුපව්රුයට සොරුව්වෙන් දිවගෙණ ගොස් මණ්ඩප තාපසයන් වසන සුසාන භූමියට තමන් ගෙනයන සම්පත් දමා දිවුහ. මනුෂ්‍යයෝ සොරුන් නොදැක තාපසයන් දැක එසේද දාවල් සිඟාකා රෑ සොරකම් කරන්නේදැයි කියා අල්වාගෙණ ගොස් රජ්ජුරුවන්ට පෑහ. රජ්ජුරුවෝ කියන්නාහු ගෙණගොස් උලඅනපියවයි කීහ. යහපතැයි එම සුසාන භූමියට ගෙණගොස් කිහිරි උලක් ඉදිකොට අන්නට වන්නාහ. ඒකියන උල නො ඇනෙන්නේය. කොසඹ උලක් ඉදිකොට උල්අන්ටවන්ගමනේ එකියන කොසඹඋලත් නොහැනෙන්නේ යහුලක් ඉදිකොට අන්ටවන් ගමනේ යහලත් නොඇනෙන්ය. තාපසයෝ එවිට මා නොකළ කර්මය මං විඳිනේයයි මම කුමන අකුශලයක් කෙළෙම්දැයි පරීක්ෂාකල කල්හි දිවැස් පහළවිය. එවිට පරීක්ෂා කළාහු තමන් යටගිය ජාතියෙහි වඩුවකුට පුත්ව උපන් ගමනේ කොබෝලීල දඬුසයින තැනැත්තේ කොබෝලීල කුරක් ඇරගෙණ මැස්සකු අල්වා උල ඇනි අකුශලය දැක කළකර්මය විපාක දෙන්නේයයි දැන් කවර උලක් ඉදිකොය ගෙණ උල අනිතත් නොහැනෙයි කොබෝලීල උලක් ඉදිකොටගෙණ අනුවයි කීහ.

යහපතැයි එකියන පුරුෂයෝ කොබෝලීල උලක් ඉදිකොටගෙණ තාපසයන් උල ඇන එතනට එන්නෝ ඇදෝහෝයි පරීක්ෂාකරන්නට උන්නාහ, දිප තාපසයෝ මාගේ මණ්ඩප තාපසයන් නැතක්දා මා නොදකීනේ වයි සිතා දක්නට එන්නාහු අතර මගදී මණ්ඩප තාපසයන් උල ඇනි නියාව අසාවහා අවුත් මණ්ඩප තාපසයන් දැක කියන්නාහු තාපසයෙනි තොපකළ කර්මයෙක්ද තොපට විපාකදෙන්නේයයි විචාළගමනේ එවිට තාපසයෝ මා කළ අකුශලයේ විපාක දිනැයි නොකළ දෙයෙක් විපාකදෙද්යැ කීහ. එවිට දීප තාපසයෝ කියන්නාහු තොප කළ අකුශල විපාක දුන්නේය. රජ්ජුරුවන් කෙරේ අමෛත්‍රියක් සිතුදැයි විචාල කල්හි මාකළ අකුශලය විපාක දුන්නේය. රජ්ජුරුවන් කෙරේවත් වදකළවුන් කෙරේවත් අමෛත්‍රියක් නොසිතම් කීහ. දීප තාපසයෝ මෙසේ වූ මෛත්‍රියක් ඇත්තවුන්ගේ සෙවනේ ඉදිම යහපත් වන්නේයයි සැතපි උන්නාහ. මණ්ඩප තාපසයන්ගේ ලේබින්දු දීප තාපසයන් ඇඟ වැම්ම කළු පෑයට ගැලසුනේය. මේ නියාව රජ්ජුරුවන්ට ඉවත බලාඋන් මනුෂ්‍යයෝ කී කල්හි රජ්ජුරුවෝ  අපරීක්ෂිතව මණ්ඩප තාපසයන් උල අන්ට කියෙමි බලන්ට යෙමි කියා අවුත් දීප තාපසයන්ට රජ්ජුරුවෝ කියන්නාහු තාපසයන් වහන්ස මේ ලේවැම්මෙන මෙතන නුඹ වහන්සේ උන්නේ කුමක් නිසාදැයි විචාළ ගමනේ දිප තාපසයෝ කියන්නාහු මේ නිරපරාධ මණ්ඩප තාපසයන්ට මේ අකුශලය සැලසුනු හෙයින් උන්ඩ ආරක්ෂා පිණිස මෙතන උනිමි කීහ. රජ්ජුරුවෝ එවිට මා පරීක්ෂා නොකොට තාපසයන්ට උලඅන්ට කියේයයි සිතා මණ්ඩප තාපසයන් උලින් ගලවන්ට උත්සාහ කළ ගමනේ උලින් නොහැරෙණ හෙයින් එවිට මණ්ඩප තාපසයෝ තමන් මැස්සා උලඇනි ගමනේ නොමිය උලකඩාගෙණ පලාගොස් ජීවත්වූ නියාව දිවසින් දැක රජ්ජුරුවෙනි මේ උල මා බඩින් නොහැරෙන්නේය. මා රකිණා

SANHIDA LANKA

කැමැත්තානම් සමසරියේදී කියතතින් මේ උල කප්පවයි කීහ. එවිට රජ්ජුරුවෝ කියතත් ගෙණවයි කියත ගෙන්වා කැප්පු උල් කැබැල්ල බඩම තිබුයේය. එසේ හෙයින් එතැන් පටන් ආනි මණ්ඩප්ප තාපසයෝයයි කියත් දීප තාපසයන් ශරීරයේ ලේ වැම්මී කළුවූ හෙයින් කණාග දීප තාපසයෝයයි මේ නමින් ප්‍රසිද්ධවූහ. රජ්ජුරුවෝත් තාපසවරුන් වැඳ ක්ෂමාකරවාගෙණ රජගෙට ගියහ. තාපස වරුත් මඟුල් උයනේ වරුත් මඟුල් උයනේ ඉඳ වනමුනතට බෙහෙත් කොට සුවකොටගෙණ මඩප්ප තාපසයන් උන්ගමට ගියාහ. මඩප්ප උපාසක තාපසවරුන් දෙදෙනා එන නියාව අසා පෙරගමන්කොට වඩාගෙණගොස් වලඳවා වැඩහිඳිනා අසුන් පණවා උල ඇනි කථාව කිය කියා උන්නාහ. මඩප්ප උපාසකයාගේ යඤ්ඤදත්තනම් පුතෙක් ඇත. ඒ පින් බඹරක් ඇරගෙණ කෙළිමින් සිටිකලට ඒ ගැසූ බඹරා ගොස් එතන සමීපයෙහි තුඹසෙක නයෙකුගේ ඉස වැදගත ඒ කුමරා  බඹරා ගෙණෙන්ට ගිය තැනැත්තේ තුඹස ඇතුලේ වැටිගිය බඹරය දැක අරගන්වයයි අතපොවා එකලට කොපවිපියා වැදහොත් නයා කුමාරයාගේ පොවාඑ අත ඇඟිල්ල දෂ්ට කෙළේය. කුමාර විෂමූර්ජාව වැටිගිය තැනැත්තහු දීප තාපසයන්ගේ පාමුලලා කියන්නාහු තාපසවරු නම් බොහෝ මන්ත්‍ර හා ඖෂධ දනිති එසේ හෙයින් තෙලකුමාරයාගේ විෂබෑව මැනවැයි කිහ. එවිට තාපසයෝ සත්‍යක්‍රියා කරන්නාහු මා මහණවූ සත්  දවසක් මාගේ අභිප්‍රායෙන් වාසය කෙළෙමි මේ පණස් අවුරුද්දක් මුළුල්ලෙහි අනභිප්‍රායෙන් තපස් කෙළෙමි අසවල් තාපසයෝ අනභිප්‍රායෙන් තපස් රක්‍ෂා කෙරෙති කිසිකෙණෙකුන්ටත් නොහඟවා වාසය කෙළෙමි. මේ සැබෑවීනම් මේ සත්‍ය ක්‍රියායෙන් මේ යඤ්ඤදතත නම් කුමාරයාගේ විෂ බසී වයි සත්‍යක්‍රියා කළ ගමනේ කුමාරයාගේ තනමත්ත පමණට විෂ බැස ගියේය.

බෝධිසත්වයෝ මම මට පිළිවන් විවර සත්‍යක්‍රියා කෙළෙමි, මඩප්ප උපාසකයෝ කියන්නාහු මම දුටු යම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙකුන්ට දන්දෙමි එදවසුත් මාගේ අභිප්‍රායෙන් දන්පින් කෙළෙමි අසවල් උපාසක අනභිප්‍රායෙන් දන්පින් කරන්නේයයි කිසිකෙණෙකුන්ටත් නොහැඟුනේය. ඒ සැබෑවිනම් යඤ්ඤදත්ත කුමාරයාගේ විෂ බසීවයි කියා සත්‍යක්‍රියා කල ගමනේ ඒ කුමාරයාගේ විෂ උකුළසරියට බැස ගියේය. මඩප්ප උපාසක තමන්ගේ භාර්යාවට කියන්නේ තෙපි තොපගේ සත්‍යක්‍රියාව කොට විෂ බාවයි කී කල්හි එකියන භාර්යාව කියන්නී තොප දක්කදී මා සත්‍ය ක්‍රියා කරන්නේ කෙසේදැයි කිව එවිට මඩප්ප උපාසක කියන්නේ තොපි කිසි සැලයක් නැතිව සිත ඇත්තකියවයි කී කල්හි ඒ ස්ත්‍රී කියන්නි එඹලපුත තොප සකසා කැනයාකෙරේ මම අසමාධියෙන් නම් තොපගේ පියානන් කෙරෙත් මම අසමාධියෙමි, උන්කෙරේ මම අසමාධි නියාව තොපගේ පියානෝ නොදන්නාහ. පිටතකින් කෙණෙකුන්ටත් නොහඟවා වාසයකෙළෙමි. මේ සැබැවි නම් යඤ්ඤදතත කුමාරයන්ගේ විෂ බසීවයි සත්‍යක්‍රියා කළ ගමනේ විෂ බැස සැපසේ ඇවිද්දාහ. එවිට මඩප්ප උපාසක බෝධිසත්වයන්ට කියන්නේ ස්වාමිනි මේ පණස් අවුරුද්දේ ආලය නැතිව තපස් රක්ෂාකළේ කෙසේදැයි විචාළකල්හි තාපසයෝ කියන්නාහු මෙලෝපරලෝ ඇතැයි මම මහණවීම් මහණවූ ගමනේ සිවුරු ඇරපියත්තම් කෙලෙතොල්ලා සිවුරුපොරව සිටිය නුහුනුයේයයි නින්දා පරිහාර අසාගතනොහි අනභිප්‍රායෙන් වුවත් වාසයකෙළෙමි කීහ. ඊට බෝධිසත්වයෝ මණ්ඩප උපාසකයෙනි තොප අප ඇම ඇතුළුවූ ශ්‍රමණ බ්‍රහ්මණයන්ට මෙතෙක් දවස දන්දෙන්නාහු අනභිප්‍රායෙන් දන්දුන්නේ කුමක් නිසාදැයි විචාළාහ. මණ්ඩප උපාසක කියන්නේ මාගේ සත්මුතත පරම්පරාවේ පැමිණ ආ කුශලය හෙයින් කෙළෙමි නොකෙළොත් මට නින්දා කෙරෙති සිතා කෙළෙමි කීහ. එවිට මඩප්ප උපාසක තමන්ගේ භාර්යාව අතින් විචාරන්නේ භාර්යාවෙනි තොපි කුමාරි අවස්ථාවේ අවිත මෙතෙක් දවස් මා කෙරෙහි නිරාලයෙන් වාසය කොට එක් දවසකුත් ආලය නැති නියාව නොහඟවා වයෝවෘද්ධ වයසට පැමිණෙන කල කෙසේ වාසය කළාදැයි විචාළකල්හි එවිට ස්ත්‍රී කියන්නී මාගේ සත්මුත්තන් පරම්පරාවේ එකසරණක විනා දසරණක උන්කෙණෙක් නැත්තාහ. එසේ හෙයින් තොප කෙරේ ආලය නැත්ත නොහඟවා උනිම් කීහ. එවිට බෝධිසත්වයන්ට ස්වාමිනි මා කීයේ පුරුෂයන් දක්කදී කිවමනා දෙයක්ද මාගේ  දරුවන් නිසා මා කියේය ඊට ක්ෂමා කළ මැනවැයි කීව. එවිට බෝධි සත්වයෝ තොප එසේ සිතිය යුතු නොවෙයි මෙතැන් පටන් උන්කෙරේ ආලය ඇතිව වාසය කරවයි කියා එබැවින් ඒ පුරුෂයා කියන්නේ ඉනිබ්බේ මට අවිස්වාස නොවවයි කියා ක්ෂමා කෙළේය. එවිට ස්ත්‍රී යහපතැයි කියා ක්ෂමා කරවා ගත්තාහ. එවිට මඩප්ප උපාසක බෝධිසත්වයන්ට කියන්නේ ස්වාමිනි නුඹ වහන්සේත් අපි හැම දුන්නාවූ දානය අනුභව කොට සැපසේ වික්ෂේප නොවී ශීලය රැක්ක මැනැවැයි අවවාද කීය. තාපසයන් වහන්සේත් යහපතැයි එතැන්පටන් ශීලය රක්ෂා කරණසේකැයි එවිට තාපසයන් වහන්සේ මඩප්ප උපාසයක්නට කියනසේක් තමා අභිප්‍රායෙන්ම කුසල් කරන්නේය. උපාසකයෙනි තොප දෙන දානය යහපත්ව සිත පහදවාගෙණ දෙවයි කීය. අවවාද කිසේක. එතැන්පටන් සිත පහදවා දන්දෙන්නේය. ස්ත්‍රීන් එතැන්පටන් තමාගේ පුරුෂයා කෙරෙහි සෙනෙහයෙන් වාසය කරන්නීය. මඩප්ප උපාසකයාත් තමා අභිප්‍රායෙන් කුශල් කරන්නේය. බෝධි සත්වයෝත් නොපිරිහුණු ධ්‍යාණයෙන් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගියහයි මේ කණ්හදීප ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි  ස්ත්‍රී දන් විශාඛාවෝය. එසමයෙහි මඩප්ප උපාසක නම් ආනන්ද ස්ථවිරය. යඤ්ඤදත්ත කුමාරයෝ නම් දන් මේ රාහුල ස්ථවිරය. එසමයෙහි මඩප්ප තාපසයෝ නම් ශාරීපුත්ත ස්ථවිරයව. එසමයෙහි කණහදීපායන තාපසයෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# නිග්‍රෝධ ජාතකය

තවද සියළු සත්වයන්ට අභිවෘද්ධිදායක වූ සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් වහන්සේගේ කථාවක් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද යත්

එක් දවසක් භික්ෂූන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන් වහන්සේට කියන සේක් දේවදත්ත ස්ථවිරය සර්වඥයන් වහන්සේ තොපට බොහෝ උපකාරව උපසම්පදාවත් උන්වහන්සේගෙන් ලැබ ප්‍රථමධ්‍යාණයත් ලදුව එසේ බොහෝ උපකාර කළාවූ සර්වඥයන් වහන්සේට තොප අනුපකාරීවන්ඩ කාරණා කිමදැයි වදාළසේක. එවිට දේවදත්ත ස්ථවිරයෝ වදාරණ සේක් සර්ඥයන් වහන්සේ තනපතක් අග වැදගත් තෙල් බින්දුවක් විවරත් උපකාර මට කෙළේ නැතැයි කීසේක. එවිට භික්ෂූන් වහන්සේ මේ දේවදත්ත ස්ථවිරයන් නපුර කියා බුදුන් තමන්ට තෙල් බින්දුවක් විවරත් උපකාරයක් නොකළැයි කියති නුගුණ කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතුනොවෙයි පෙරත් දේවදත්ත ස්ථවිරයන් කළ උපකාර මකා කළ ගුණ නොදත්තෝවේදැයි වදාරා හේ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස රජගහනුවර මගධනම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ නුවර එක් සිටාන කෙණෙක් ඇත්තාහ. ඒ සිටානන්ගේ පුත්වූ සිටු කුමාරයෙක් ඇත්තේය. ඒ සිටු කුමාරයාට එක් සමාන කුලයකින් සිටුදුවක ගෙණවුත් සරණපාවා දුන්හ. ඒ සිටු කුමාරයාගේ ගෙයි වසන්නාවූ ඒ සිටුදුවට දරුකෙණෙක් නැත්තාහ. ඒ සිටු පුත්‍රයාගේ දෙමව්පියෝ කියන්නාහු මේ වඳ තැනැත්තිය අපගේ ගෙයි ඉඳ කාරිය කිම්දැයි කියා ඉඳිනාහ. ඒ සිටු කුමාරිකා තමාගේ කිරි මැණියන් කැඳවා විචාරන්නී අම්ම දරුවන් ඇතිවූ ගැණුන්ට කවර ක්‍රියාවක්දැයි විචාරා ඒ ක්‍රියාව උන් අතින් අසා දූරි ඇත්තෙම් අඟවා ඔසප් සඟවා බඩපිළි තබා බැඳ තලා අතපය උදුම්මා දොළදුකැයි ඇඹුල්කා ප්‍රයෝගයකින් තනපුඩු කළුකොට ගෙණ ඉඳ නවමස් පිරී දසමසට පැමිණ කල්හි වදනකල්විය. ප්‍රසවන්ට කවර ක්‍රියාවක්දැයි විචාරා දෙමව්පියන්ගේ ගමට යෙමි කීහ. එවිට සිටුපුත්‍රයාත් රථයක් සරහා ඒ රථයට සිටුකුමාරිකාව නන්වා බොහෝ දැසි සද් පරිවාර පිරිවරා යන්නාහ. උන්ට ඉදිරියේ වෙළඳහු කෙණෙක් වෙළඳාම්කොට ගෙණ යන්නාහු දෙගව්වෙන් දෙගව්වට ඉදිරියේ ලැග ලැග යන්නාහ. උන් දෙගට වෙන් දෙගව්වට අල අල තැන සිටු කුමාරිකා ලගිනීය. වෙළඳුන් හා කැටුව යන්නාවූ ස්ත්‍රී වෙළඳුන් යාදී නුගගසක් මුල ඉඳ දරුවන් වදා තමා හා කැටුව ආ වෙළඳුන් පලාගිය හෙයින් දරුවන් නිසා රැඳිනි නම් මාගේ බොහෝ කටයුතු කාරිය නස්නේයයි වැදමසින්ම දරුවන් නුගගසමුල තබා ගියාහ. ඔහු දුක්පත් ස්ත්‍රිය බඩ පිළිසිඳන පමණක් විනා ක්‍රකාධිකාර බුද්ධාංකුරයානන් වහන්සේය. එසේ හෙයින් කවුඩෙක් බල්ලෙක් ඒ ලේගඩුව අන්තරාය කළ නුහුනුයේය. ඒ සිටුකුමාරිකාවත් වෙලඳුන් හල ලැග්මේ ඇර නුගගස මුලට ගිය තැනැත්තී පොලවෝ වසා ඔත් කුමාරයන් දැක කාත් නොහගවා ඒ දරුවන් වඩා බඩබිලි පහරින්ට වනැයි අඟවා වට තිර බඳවා විලිලා ඇඟ ලේත්ගාගෙණ දරුවන් වඩා මැත ඇරගෙණ නොවා කිරීපොවා එතනම රඳා තමන්ගේ සමනන්ට පත්ලියා යවුය. ඒ සිටු කුමාරයාගේ දෙමව්පියෝත් එතනට අවුත් දරුවන් වදන නියාවේද ගමට යන්ට ආයේය. දරුවන් වදාපු පසු ගමට යන්නේ ඇයිදැයි තමන්ගේ සමනන්ගේ ගමට ගියාය. ඒ කුමාරයා නුගගසමුල උපන්හෙයින් නිග්‍රෝධ කුමාරයයි නම් තුබූහ. එමදාම ඒ නුවර අනික් සිටානකෙණෙකුන්ගේ බිරින්දක් අත්තක් අල්වාගෙණ පුතනුකෙණෙකුන් වැදූහ. අත්ත අල්වාගෙණ සිට උපන්හෙයින් සබාකුමාරයෝ යය් නම් තුබූහ. එමදාම සිටානන්ට මෙවර කරන්නාවූ සන්නාලියාගේ බිරින්දක් කැපූ කෙළවර රෙදිගොඩක් පිට පුතනුකෙණෙකුන් වැදූහ. උට නම් තබන්නාහු මුත්තිය කුමාරයෝයයි නම් තුබූහ. එවිට සිටානෝත් ඒ එකඳ උපන් කුමාරයන් තුන්දෙනාට කිරිමවුන් සලස්වා සියලු වැටුප් උත්තාංති සලස්වා වැඩිවිය පැමිණිකළ දිසාපාමොක් ආචාරීන් ලගට ශිල්ප උගන්වා නිසා යවුහ.

සිටු කුමාරයෝ දෙන්න තමන් අත සම්පත් ඇතිසෙයින් දීලා ශිල්ප උගන්නාහ. මුත්තිය කුමාරයා තම අත සම්පත් නැතිහෙයින් නිග්‍රෝධ කුමාරයෝම ශිල්ප උගන්වන්නාහ. මෙසේ තුන්දෙනා ශිල්ප නිමවා ඉගෙණ නුවරට යන්නාහු රටවල් බලාගෙණ නුවරට යම්හයි ඒ ඒ තැන ඇවිදිනාහු බරණැස් නුවරට යන්නාහු එක්තරා

SANHIDA LANKA

දේවාලයක රෑ වැදඹත්තාහ. ඒ කුමාරවරුන් ඒ නුවරට එන්නාට පළමු සත්දවසෙක බරණැස් නුවර රජ්ජුරුවෝ මළාහ. ඒ නුවර රජකමට නිසිකෙණෙකුන් නැතිහෙයින් අමාත්‍යවරු පුස්රථය නුවර අරුම්හයි කථා කළාහ. ඒ කුමාරවරුන් දේවාලයේ වැදොත් කලට එතන ගසක් උඩ කුකුලෝ දෙන්නෙක් වැදහොත්තාහ. උඩ අත්තේ වැදොත් කුකුළා වර්චස් පාරක්ලාහ. පාත අත්තේ වැදොත් කුකුළාගේ ඉස වැගුරුණේය. එවිට කුකුළුකියන්නේ තෝ මාගේ විවර නොදනිද මාගේ ඉස නානගෙයක්කොට සිතාගෙණිදැයි කෝප විය. එවිට අග අත්තේ වැදොත් කුකුළු කියන්නේ මම නොදත්තෙමි තොපි පාත අත්තේ වැදොත් නියාය. ඊට ක්‍ෂමා කරව නොදැන කෙළෙමි කියාදීත් කෝප විය. එවිට මාගේ තත්ව තමා නොදනිද තමා මට කෝප කරන්නේයයි කියා තා මෙසේම මානීපසු තාගේ තත්ව කියාබලහයි අගඅත්තේ වැදොත් කුකුළු කීය. පාත වැදොත් කුකුළු එවිට කියන්නේ මාගේ තත්ව අසව යම් කෙණෙක් මා මරා මාගේ මස්කැවුනම් එදවසම සේසත් දාසෙන් ලැබෙන්නේයයි කීහ. එවිට උඩ අත්තේ වැදොත් කුකුළු කියන්නේ තාගේ මස්කෑ කෙණෙකුන් ලබන්නේම සේසත් දාසෙක් වේද මෙපමණක්ගෙණ තාපෑය. මාගේ පඤ්චමධුර මාංශය යම් කෙණෙක් කැවෝනම් රාජ්‍යය ලබති සණමාංශය කැකෙණෙක් සෙනෙවිරත් ධුරය ලබති ඇට නහර මුසු මස් කැවුනම් භාණ්ඩාගාරයේ නායකකම් කරන්නේ වේදැයි කීයේය. එවිට කුකුලන් දෙනා කථාකරණ කලට නිග්‍රෝධ කුමාරයොත් ශාඛා කුමාරයෝත් දෙන්න වැදහෙව නිදන්නාහ. මුත්තිය කුමාරයෝ නිග්‍රෝධ කුමාරයන්ගේ පය උකුලේ තබාගෙණ මැඩ මැඩ උන්නාහූ මේ කුකුළන් දෙන්නාගේ කථාව අසා දවස දාසලැබෙන කුකුලන් කිම්ද රාජ්ජය හා සෙනෙවිරත්ධුරය හා භාණ්ඩාගාර නායකකම් ලබන්නා මෙසේවූ කුකුළාවේද යහපතැයි සිතා නිග්‍රෝධ කුමාරයන්ගේ පය උකුලෙන්බා සෙමින් ගසට නැගී අත්තේ වැදොත් කුකුළා අල්වාගෙණ මරා පඤ්චමධුර මාංශය වෙනම පිස තබා සණමාංශය වෙනම පිස තබා ඇට නහර මාංශය වෙනම පිස තබා වැදහෙව නිදන කුමාරවරුන් දෙන්නා පුබුදුවා නිග්‍රෝධ කුමාරයන්ට රාජ්ජය ලැබෙන මාංශ ලා සබාකුමාරයින්ට සෙනෙවිරත් ධුරය ලැබෙන මාංශය ලා තුමු භාණ්ඩාගාරයේ නායක කම් ලැබෙන මාංශ ලාගෙණ කා මුත්තිය කුමාරයෝ කියන්නාහු නිග්‍රෝධ කුමාරයන්ට රජ්ජය ලැබෙයි. සබා කුමාරයන්ට සෙනෙවිරත් ධුරය ලැබෙයි මට භාණ්ඩාගාර නායකකම් ලැබෙන්නේයයි කීහ.

එවිට නිග්‍රෝධාරාමයන් හා ශාඛා කුමාරයෝ  කියන්නාහු තොපට දැනෙන්නේ කෙසේදැයි විචාළාහ. එවිට මුත්තිය කුමාරයෝ කුකුළා කී ප්‍රවෘත්තිය කීයේය. නිග්‍රෝධ කුමාරයෝ යහපතැයි කියා පාන්වන්නාට පළමු මූන සෝදා තුන්දෙනම මගුල් උයනට ගොසින් නිග්‍රෝධ කුමාරයෝ මගුල් ශාලාවට නැගී ඉවසා කඩලාගෙණ වැදොත්තාහ. ශාඛ්‍යකුමාරයන් හා මුත්තිය කුමාරයා හා දෙන්නම බිම වැදොත්තාහ. ඒ වෙලාවට පුස්රථයපිට පඤ්චරාජකකුධ භාණ්ඩ තබා පුස්රථය අලහ. රථය මගුල් උයනට ගොසින් මගුල්සල වට වැදොත් නිග්‍රෝධ කුමාරයන් පාමුලට ගොසින් රථය පස්සැපෑ නුවරට මුනලා සිටියේය. එවිට පුරෝහිත බ්‍රාහ්මණ වැදොත් නිග්‍රෝධ කුමාරයන් පාමුලට ගොස් පයවසා තුබු ඉන්කඩ ඉවත්කොට පය ලක්‍ෂණ බලා බරණැස් නුවර තබා ජම්බුද්වීපය එකච්ඡත්‍රකොට රාජ්‍ය කරන්ට ලක්ෂණ දැක. ධෛර්ය පරීක්ෂාකරන්නට උවමැනවයි සිතා පඤ්චාංගික තූර්යනාදය එකවිට පැවැත්වූහ. එවිට නිග්‍රෝධ කුමාරයෝ කිසි චකිතයකින් නොවී ඉවසා තිබූ ඉනකඩ ඉවත්කොට බලා ඇලටනැමී මදක්වැදහෙව නැගීසිට ආසනපිට උන්නාහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ ස්වාමිනි නුඹ වහන්සේට රාජ්ජය පැමිණියේය. රාජ්‍යය කළමැනවයි කීහ. නිග්‍රෝධ කුමාරයෝ මෙනුවර රජ්ජුරුවන් වහන්සේ කොයිදැයි විචාළාහ. එපවත් අසා මළහයි කීහ. රාජකුමාරවරු නැද්දැයි කීහ. රාජකුමාරවරු නැත නුඹ වහ්නසේ රාජ්‍යය කළමැනවයි කීහ. එවිට යහපතැයි ගිවිස වටතිර බඳවා දලියවුළු අන්දම් තබා රුවන් රෑසක් පිට සිටුවා අභිෂේකකොට රාජ්‍යයට පැමිණිවූහ. එවිට නිග්‍රෝධ රජ්ජුරුවෝ ශාඛා තුමාරයන්ට සෙනෙවිරත් ධුරය දුන්නාහ. මුත්තිය කුමාරයෝ රජ්ජුරුවන් හා කැටිව රජගෙට ගියහ. රජ්ජුරුවෝ ශාඛා සෙනෙවි රදුන්ට කියන්නාහු අපගේ දෙමව්පියනුත් කැඳවාගෙණ එවයි කීහ. ශාඛා සෙනවිරද්දු මට බැරිය නොයමි කීහ. රජ්ජුරුවෝත් මුත්තිය කුමාරයන් කැඳවා රජගහනුවරට ගොසින් අපගේ දෙමාපියනුත් තොපගේ දෙමව් පියනුත් කැඳවාගෙණ එවයි කිහ. මුත්තිය කුමාරයෝ යහපතැයි ගිවිස රජගහනුවරට ගොස් රජ්ජුරුවන්ගේ දෙමව්පියන් කැන්දූහ. අපගේ සම්පත් ඇත. අප එන්නේ නැතැයි කීය. ශාඛා කුමාරයන්ගේ දෙමව්පියනුත් කැන්දූහ.  ඔයිත් කියන්නාහු අපට පොහොසත්කම එපයි අප එන්නෙනැතැයි කීහ. මුත්තිය කුමාර තමාගේ දෙමව්පියන් කැන්දුගමනේ සන්නාලි මෙවර පමණ ඇත අප එන්නේ නැතැයි කීහ. මුත්තිය කුමාරයෝ දෙවෙනිව බරණැස් නුවරට අවුත් ශාඛාසෙනෙවිරදුන්ගේ ගෙට අවුත් බත්කා ගමන් විඩා නිවාගතිම් සිතා සෙනෙවිරදුන්ගේ ගෙටගොස් දොරකඩ සිට කියන්නේ ශාඛාසෙනෙවිරදුන්ගේ යහළුවූ මුත්තිය කුමාරයෝ ආවෝයයි කියාලවයි මිනිසුන් අත කියායවූහ.

එවිට සෙනෙවිරදු බත් කමින් ඉඳ සිතන්නේ රාජ්‍යයට පැමිණෙන මාංශය නුදුන්නේය. සෙනෙවිරත්ධුරයට පැමිණෙන මාංශයදුන්නේයයි කෝපයෙන් බස් කා ඉක්බිති දොර අවුත් කියන්නේ මුත්තිය කුමාරයෝ නම්

SANHIDA LANKA

කවුරුද මුන් අඳුනන්නේ කවුරුදැයි කියමින් මුන් සෙව්වෝද අපට මිත්‍රයෝය තුළුෑ අනුභව කියා අන්නවා බන්දවා පිටකර ගෙණ නෙරපූහ. එවිට මුත්තිය කුමාරයෝ සෙනවිරදුන්ගෙන් සංග්‍රහ ලදිමි. රජ්ජුරුවෝ කුමක් කෙරෙද්දෝහෝයි එයිත් පරීක්ෂාකරමි සිතා රජ ගෙට ගොස් රජ්ජුරුවන්ඩ කියා යවීය. එවිට රජ්ජුරුවෝ සිංහාසනයෙන් උන්නාහු මුත්තිය කුමාරයන් ආ නියාව අසා ගොස් මුත්තිය කුමාරයන් සිපගෙණ යහළු කිමෙක්ද මාගේ දෙමව්පියෝ නොයෙද්ද විචාළාහ. තමා කීපවතුත් නොවෙම්මැයි කීපවතුත් රජ්ජුරුවන්ට කීයේය. ශාඛාසෙනෙවිරද්දු මුත්තිය කුමාර තමාට කළදෙය රජ්ජුරුවන්ට කියා බිඳවාපු නම් නපුරැයි සිතා තමා කළ දෙය මා කෙරේ භයින් දක්කදී කිය නොහෙන්නේ වේදැයි සිතා මුත්තිය කුමාරයන්ට පස්සේ ආයේය. මුක්තිය කුමාර රජ්ජුරුවන් දුටු ගමනේ රජ්ජුරුවන් වහන්ස නුඹ වහන්සේත් රාජ්ජය ලද්දේ මා නිසාය. ශාඛා සෙනෙවිරදුන් සෙනෙවිරත් ධුරය ලද්දේත් මා නිසාය. එසේහෙයින් ගමන් විඩාව ශාඛා සෙනෙවිරදුන්ගේ ගෙටගොස් ගමන් විඩාව සන්හිඳුවා ගණිම් සිතා ගියෙමි මටනොකී නොකළ ගහටයෙක් නැත නුඹ වහන්සේට කියා කළෝද නොකියා කළෝදැයි කියේය. රජ්ජුරුවෝ කියන්නාහු උන් මට කීයේ නැත. මාලත් රාජ්ජය තාපසන්තකය. තොප නිසාය. මා රාජ්ජය ලද්දේයයි කියා මම මෙසේවූ අමැදහත්කම් කරම්දැයි කියා රජ්ජුරුවෝ කියන්නාහු එඹල මුත්තිය කුමාරයෙනි අසත්පුරුෂයාගේ ගුණ නම් බැදපු බිත්තරරෙයක් සේය. බැදපු බිත්තර වපුට සස්‍ය ඵලදෙයක් දක්ක නොහැකිද, එමෙන් දුර්ජනයාට කෙතෙක් සත්පුරුෂකම් කලත් ඒ අසත් පුරුෂම වන්නේය. සත්පුරුෂයෝ නම් යහපත් බිජුවක් සාරභූමියක වපුළකල යහපත් සස්‍යඵල ලබන්නාසේ සත්පුරුෂයාට කළ උපකාර මහත් ඉෂ්ටවිපාක දෙන්නේයයි කියා රජ්ජුරුවෝ වට සිටි අමාත්‍යයන්ට කියන්නාහු අමාත්‍යයෙනි මා රාජ්ජය ලද්දේත් උන් නිසාය. ශාඛා සෙනෙවිරදුන් සෙනවිරත් ධුරය ලද්දේත් උන් නිසාය. එසේවූ තැනැත්තන් මුන් ගෙට ගිය ගමනේ බොහෝ සංග්‍රහකොට උපස්ථාන කළමනා තැන මුන්ට නොකී නොකළ ගහටයක් නැත්ල මෙසේවූ අමැදහත් කෙළෙහි උපකාර නොදන්නා තෙනැත්තහු මෙතන සිටින මා අභිප්‍රාය නැත තුළුෑගෙණගොස් අඩයටි තෝමරාදීයෙන් ඇන මරාපියවයි කියා මුත්තිය කුමාරයෙනි තොපි සෙනවිරත් ධුරය කරවයි කීහ. එවිට මුත්තිය කුමාර රජ්ජ්රුවන් වහන්සේ මා නිසා සෙනෙවිරදුන් ජීවිතක්ෂයට පමුණා සෙනවිරත් ධුරයෙනුත් පිරිහෙන්නේයයි සිතා මා නිසා මුන්ගේ ජීවිතයටත් අර්ථයටත් විනාශයක් නොපැමිණේවයි රජ්ජුරුවන් වහන්සේ ඒ කවරේද වරදක් කළායයි මුන් ජීවිතක්ෂයටම පැමිණිවූ කල ඉදිරියේ මුන්ලවා කරවාගත මනා කටයුත්තක් පෙණුනුවිට මුන් උපදවාගත හැකිද මූ බිනුයේ මට වේද නුඹ වහන්සේ ක්ෂමාකළ මැනැවයි කීහෙයින් එසේ වීනම් ජීවිතදාන දුනුම්හ. උන්ගේ සෙනෙවිරත් ධුරය තෙපි කරවයි කීහ. එවිට මුත්තිය කුමාරයෝ ස්වාමිනි මූ කටයුතු කිරීමෙහි දක්ෂයෝය. සෙනවිරත් ධුරයෙහිම සිටිත්වයි කියා ස්ථානාන්තරයෙන් නොපිරිහෙණලෙසට සැලැස්වූහ. එවිට රජ්ජුරුවෝ මුත්තිය කුමාරයෙනි තොපි එසේවිනම් සේනාවට පඩි ප්‍රසාද දීමෙන් නායකත්වය ඇති භාණ්ඩගාර නායකකම් කරවයි කියා භාණ්ඩාගාරික නායක කමට මුත්තිය කුමාරයන් සැලැස්වූහ. එතැන්පටන් භාණ්ඩාගාර නායක කම් ඇතිවිය. මුත්තිය කුමාරයන්ට ගෙවල් දොරවල් හා අඹුදරුවන් ඇතිවී මහත් විභවයකට පැමිණ තමන් දරුවන් ට අවවාද කියන්නාහු දරුවෙනි යහපත උවත් නපුර උවත් නිග්‍රෝධ රජ්ජුරුවන්ට සේවය කොට ඉඳිතොත් විනා ශාඛා සෙනෙවිරදුන් හා භජනය නොකරව, ශාඛා සෙනෙවිරදුන් ගෙන් කෙතරම් යසස් ලබන්නා බලාත් නිග්‍රෝධ රජ්ජුරුවන්ගෙන් ආඥානය නොකර නිග්‍රෝධ රජ්ජුරුවන්ටම සේවය කරවයි තමන්ගේ දරුවන්ට අවවාද කියා තුන්දෙන කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ නිග්‍රෝධ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ශාඛා සෙනෙවි රදු නම් දේවදත්ත ස්ථවිරය. මුත්තිය කුමාරයෝ නම් ආනන්ද ස්ථවිරයෝය. නිග්‍රෝධ රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# තක්කාරි ජාතකය

තවද ශාක්‍යකුල ප්‍රසාදනීය වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පිතෘ උපස්ථාන කරන්නාවූ කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

එක්තරා පුරුෂයෙකුගේ දරුවෝ ඇත්තාහ. ඇමටම බාල පිරිමි පුතෙක් ඇත්තේය. ඔහුගේ මැනියනුත් සහෝදර නෑයනුත් මළගමනේ පියාට උපස්ථාන කරන්නේය. එකියන පුරුෂයා තමාගේ පුතාට කියන්නේ එඹල පුත තොප ඇමදාම දුක්විඳිනනට මහා ආයාසය, එසේහෙයින් තොපට බිරින්දක් ගෙණවයි කීයේය. පුත්‍රයා කියන්නේ බිරින්දක් එපායයි කීහ. එසේකීවත් පියා සුදුසු කුලයකින් බිරින්දක් ගෙණවුත් පාවාදුන්නේය. එකියන ස්ත්‍රීත් තමාගේ මයිලාට කැවිලි පෙවිලි සැපසේ සලස්වා වාසයකෙරෙයි පුරුෂත් තමාගේ බිරින්ද තමාගේ පියාට කැවිලි ආදිවූ දෙයින් අඩුවෙක් නොකරණ හෙයින් මධුර රසයක් ගෙණාවත් තමාගේ බිරින්ද අතට දෙන්නේය. ස්ත්‍රීන් තමාගේ මයිලාට උනුපැන් සිහිල් පත් කැවිලි පෙවිලි ආදිවූදෙය අඩුවක්නොව පිරිමසන්නීය, කල් යාමකින් මයිලා කෙරේ කලකිරි  කැවිලි ආදිවූ දෙයිනුත් අපාසුව කෙළේය. සෙම් සොටු ආදීවූ දෙයත් ගේ මුලුල්ලේලා තමෝ තමාගේ සැමියාට කියන කල නුඹගේ පියානන්ද ගෙයි මුළුල්ලේ සෙම් සොටු ලා නරක්කරණදැයි උන් රඳවා ගණ මා ඇරපියන්න. තමාගේ සැමියාට කියන්නීය, පුරුෂ කියන්නේ තෝ පලාගියනම් අනික් බිරින්දක් ගෙණෙම් මාගේ පියානන්ද කුමට යවත්දැයි කෝපකොට කීයේය. එසේ කීවත් මාරඳවාගෙණ උන්දෑ ඇරපියන්න, නොහොත් උන්දෑ රඳවාගෙණ මා ඇරපියන්නැයි තමාගේ සැමියාට කියන්නි නැවතත් කෝපකළ කල්හි ස්ත්‍රී භයපත්ව පළමුසේ තමාගේ මයිලාට කැවිලි පෙවිලි ආදියෙන් සැපසේ උපස්ථාන කරන්නීය. පුරුෂතෙම බිරින්දගේ අඬදබරයෙන් සර්වඥයන් වහන්සේ දකින්ට කීපදවසකින් ගොස් දිට සර්වඥයන් වහන්සේ එකියන පුරුෂයා දැක ඇයි පුරුෂය තා කීපදවසක් නොආයේයයි වදාරා වදාළකල්හි තමාගේ බිරින්ද තමාගේ ගෙන්නාරින්ට කී කථා ප්‍රෘත්තිය කීයේය. සර්වඥයන් වහන්සේ එපවත් අසා වදාරා එඹල පුරුෂය, තෝ පළමු ජාතියෙහි තාගේ පියා මරා වලලා පස්ගසන්ට වන් ගමනේ හත්ඇවිරිද්දෙන් මා කී අවවාද තොප සිත් තිබූහෙයින් තෝ ගිවිසි පමණක් විනා පළමු ජාතියෙහි මේ නියාවට වන්නේ වේදැයි වදාරා ඒ කසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි එක්තරා ගමෙක පුරුෂයෙක් තමාගේ පියාට වර්ථමාන කථාවමෙන් අත්පා මෙහෙවර කරන්නේයයි දතයුතු මෙහි වනාහි පිටිසර ගමෙක පියා හා පුතා හාපුතාගේ බිරින්ද හා තුන්දෙන වාසය කරන්නාහු යෙලි මයිලාට නුරුස්සා තමාගේ ස්වාමියාට කියන්නී නුඹගේ පියානන්ද මැරුවොත් විනා මා ඉන්නේ නැතැයි කීවාය. පුරුෂ කියන්නේ මිනියක් නිකම් අනාථයේ ගසා මරන්නේ කෙසේදැයි කීයේය. එවිට ස්ත්‍රී කියන්නී නුඹගේ පියානන්දැට නුඹ කියනකල පියානන්වහන්ස නුඹ වහන්සේ පළමු පිටිසරගමෙක අසවළුන්ට දීපු ණය ඉල්වා ගියෙම් අපට දෙන්නේ නැතැයි කියා නුදුන්නෝය. නුඹ වහන්සේ ඇතිව ඉන්දදි දීපු නය නොලැබෙන කල නුඹ වහන්සේ මළ කල තමාම නොලබන්නේ වේදැයි රථයක ලාගෙණ ඒ නය ඉල්වාගෙණ එන්ට යම්මැයි කියා ගොසින් අමුසොහොනක වල සාරා වළලා පස්වසා ඔළුවතලා මරාපියා එවයි කිව. එකියන කෙළෙඹි පුත්‍රයාගේ සත් ඇවිරිදි පුතෙක් ඇත. ඒ පුත් තමාගේ මව තමාගේ පියාට කියන කථාව අසා මාගේ පියානන් වහන්සේ මාගේ මුත්තනුවන් මරන්ට උත්සහ කරණසේක. උන් වහන්සේ මැරීමෙන් බොහෝ අකුශල් පිරෙයි ඒ අකුශලය මා වලකන්ට උවමැනවයි සිතා තමාගේ මුත්තනුවන් මරන්ට උත්සහ කරන්නවුන් දැක මුත්තනුවන් වහන්සේ හා එක්ව එදා රෑ වැද හොත්තේය. පසුවදා එකියන පුරුෂ තමාගේ බිරින්ද කී සැටියේ තමා පියා රථයක ලාගෙණ යන්ට වන එවිට එකියන පුතා රඳන්ට කීවත් නොරඳා රථයට නැගී තුන්දෙන නික්මුනාහ. අමුසොහොන සමීපයට ගොස් පුතනුවන් හා පියානන් රථයේ ඉන්දදී රථයෙන් බැස අමු සොහොනේ සතරැස් වලක් සාරන්ට වන්හ. එවෙලෙහි උන්ගේ පුතනුවෝ රථයෙන් බැස පියානන් සමීපයට ගොස් පියානන් වහන්ස මෙතන වල සාරන්නේ කවරේටද මෙතන පෙණෙන්නාවූ කටු අලවැල් අල ආදිවූ දෙයත් පෙණෙන දෙයක් නැත වලසාරන්නේ කවරේටදැයි විචාළේය. එවිට පුරුෂ කියන්නේ එම්ඹල පුත මපියානන් වහන්සේ ලෙඩ දුක් අතිවැ ඉතා දුර්වලව ගියසේක. වයොවෘද්ධව ගියහෙයින් මා පියානන් වහන්සේට දුක් දෙන්නේ ඇයිදැයි සිතා මරා වළලන්ටයයි කීයේය.

SANHIDA LANKA

එවිට කුමාර පියානන් වහන්ස නුඹ වහන්සේ සිතු සිතිවිල්ල යාපත් නොවෙයි කියා පියානන් අතතුබූ උදැල්ල ඇරගෙණ තුමුත් වලක් සාරන්ට වන්හ. එවිට පියා කුමාරයාගේ විශිෂ්ටවූ කාරණා බල කියන්නේ ඇයි පුත තෙපි මේ වල සාරන්නේ කවරකටදැයි විචාළසේක. එවිට කුමාරයා කියන්නේ ඇයි පියානන් වහන්ස දරුවෝ දෙමව්පියන්කොට එන චාරිත්‍රකරන්ට උවමනාවේද, නුඹ වහන්සේගේ පියානන් මරා වළලන්ට වළසාරණකල නුඹ වහන්සේත් ඔබලත් වූකල වළලන්දැයි මම වළ සාරාතිබිම කීහ. එවිට පුරුෂ කුමාරයා කියන්නේ ඇයි පුත මට සුතප්‍රේමයෙන් වදාගත් දරුවෝ වේද නොකම් කළුවූ බස් කියන්නේ කවරේදැයි විචාළේය. කුමාර කියන්නේ නුඹ වහන්සේ අවලක්‍ෂණයක් නිසා මා කීයේ නොවෙයි නුඹ වහන්සේ මෙලෙස කරන්නා මමත් ඒ ලක්ෂණයෙකැයි සිතා කෙළෙමි, නුඹ වහන්සේ ඊට ක්‍ෂමා කළ මැනවැයි පියානන් වහන්ස යම්කෙනෙක් දෙමව්පියන්ට නොකලමනාදෙය කෙරෙත් නම් ඉන් වැඩෙක් නැත අවඩමයයි කීයේය. ඒ වෙළෙහි කෙළෙඹි පුත්‍ර කියන්නේ පුත මා සිතාගෙණ කළදෙයෙක් නොවෙයි තොපගේ මැනියන් වහන්සේ මටඑක්වන් කන්සන් කරණහෙයින් කෙළෙමි, තොප කීයේ ඉතා ඇත්තමය, මෙවක් පටන් මෙසේවූ දෙයක් නොකෙරෙමි කෙළෙඹිපුත්‍ර කියේය කුමාර ඒ වෙලෙහි තමන්ගේ පියානන්ට කියන්නේ පියානන් වහන්ස ස්ත්‍රීන් කිවා කිරීමෙන් කටයුතු නොවෙයි මතු මෙසේවූ දෙයක් නොකියන්නේයයි කියා අපගේ මැනියන් වහන්සේ භයගන්වා කෝපකොට ගෙන්යවාපුව මැනව මෙසේවූ නොකටයුත්තක් නොකියනසේකැයි කුමාර කීයේය. යහපතැයි කියා තුන්පිතු පියෝ රථයට නැඟි ගොට එන්ට වන්නාහ. කෙළෙඹිපුත්‍රයාගේ අඹු මාගේ ගෙන් අද කාලකණ්නියා පහව ගියේයයි මහා සමාධියෙන් ගෙයි ගොම පැන් සඳුන් ඉස තුමුත් පිරිසිදුව කිරිබත් ආදිවූ දෙය පිසමින් සිටිකලට තුන්පිතුපියන් දුරඑන්නාවුන් දැක මහා කණස්සළුව මාගෙන් පහව ගිය කාලකන්නියා දෙවෙනිව එන නියාවේදැයි සෝකයෙන් සිටියාහ. තුන්පිතුපියෝ රථයෙන් බැස පියානන් හා පුතනුවන් ගෙට යවා රථයේ බැඳි ගොන්ගෙන් උනා රථය එතන තිබා පුරුෂයා ගෙට ආයේය. ස්ත්‍රී පුරුෂයා දැක මාගෙන් පහව ගිය කාලකන්නියා ගෙණායේ ඇයිදැයි කියා මම ගෙන්යමි කියා ස්ත්‍රී කළහ කළහ. පුරුෂ කියන්නේ දුෂ්ටකාලකන්නිය තී කීවද මා පියානන් කෙසේ මරාපියම්දැයි කියා ස්ත්‍රීගේ ඉසකේ පත අල්වාගෙණ බිමහෙලා අතින් පයින් තළා මාගෙන් පළායවයි කියා ගෙන් යවා තුන්පිතුපියෝ ගෙයි පිසතුබු කිරිබත් සුදුබත් ආදිවූ දෙය ලාගෙණ කාලා උන්නාහ, ස්ත්‍රි ඉවත ගෙයක උන්නීය. කුමාර තමාපියාට කියන්නේ පියානන් වහන්ස මාගේ මැනියෝ ඉක්මුනේ නැත උන්වහන්සේ ඉක්මෙන්නේ නුඹ වහන්සේ කියනකල තීමට ඇයිද මාගේ මයිලනු කෙණෙකුන්ගේ දියනිකෙණෙක් ඇත. උන්ගෙණෙන්ට එමීය කියා පිරිවර ගොස් ඉඳ පියා අවමැනව එවිට මාගේ මැනියන් වහන්සේ ඉක්මෙන සේකැයි කීහ. පුරසයාත් යහපතැයි කියා ඒ කි නියාවට තී මට එපයි මාගේ මයිලනුවන්ගේ දියනියන්ගෙණම් කියා නික්මුනේය. අසලගෙවල ඇත්තෝ ඒ ස්ත්‍රිට කියන්නේ එම්ඹල ස්ත්‍රිය තීගේ සැමි තී ඇර අනික් බිරින්දක් ගෙණෙන්ට ගමට ගියේය. තී පිසවා ගෙණ නොකන්නේයයි කී ගමනේ ස්ත්‍රී මහත්වූ සෝකයට පැමිණ අනික් මට පිහිටක් නැත කුමක් කෙරෙම්දෝහයි සිතා ගෙට අවුත් පුතනුවන් පයවැටී අඬා පුතනුවෙනි තොපගේ පියානෝ මා ඇර අනික් බිරින්දක් ගෙණෙම් කියා ගියේය. මා කළ වැරැද්දෙක්දැයි කිව කුමාර කියන්නේ මැනියන් වහන්ස මෙවක් පටන් නුඹ වහන්සේගේ මයිලනුවන් වහන්සේට අමෛත්‍රී නොසිතා උන්ගේ සුවදුක් විචාරව මපියානන් වහන්සේට කියා ගෙණ්වාගණිම් කියා යවා ගෙට පියානන් එන්නාදැක කුමාර කියන්නේ පියානන් වහන්ස මැනියන් වහන්සේ ඉක්මගියසේක. උන් වහන්සේ ගෙට ගෙන්වාගත මැනවයි කීයේය. කෙළෙඹි පුත්‍ර යහපතැයි තමාගේ බිරින්ද ගෙටගෙණායේය. එකියන ස්ත්‍රී තමාගේ මයිලනුවන් හා ස්වාමිපුත්‍රයා වැඳ මම ගිය දවස නොදැන කෙළෙමි ඊට ක්‍ෂමා කළ මැනවැයි කියා වැඳ ක්‍ෂමා කරවාගෙණ එතැන්පටන් ස්වාමිපුත්‍රයාටත් මයිලනුවන්ටත් දාගැබට පූජා සත්කාර කරන්නාක් මෙන් අඩුවක් නොකොට පෝෂ්‍යය කෙළේයයි වදාරා මේ තක්කාරි ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි පුරුෂයා නම් දැන් මේපුරුෂයාය. එසමයෙහි ස්ත්‍රී නම් දැන් මේ ස්ත්‍රීය. එසමයෙහි අවවාද කී කුමාර නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ වදාළසේක.

SANHIDA LANKA

# මහා ධර්මපාල ජාතකය

තවද ශාක්‍යකුලාලෝකවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයෙහි වැඩවසන සමයෙහි සුද්ධෝදන රජ්ජුරුවෝ අදහානොගත් දෙයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

සර්වඥයන් වහන්සේ විසිදහසක් රහතන් වහන්සේ පිරිවරා විථියෙහි සිඟා වඩනා ගමනේ සුද්ධෝදන රජ්ජුරුවෝ අසා සර්වඥයන් වහන්සේත් විසිදහසක් රහතන් වහන්සේත් පවරා රජගෙට ගෙණෙගොසින් කැඳ වළඳවා ඉක්බිතිවූ ගමනේ බත් වළඳනතුරු සර්වඥයන් වහන්සේ හා සුද්ධෝදන රජ්ජුරුවෝ කථාකරමින් උන්නාහු ස්වාමිනි නුඹ වහන්සේ දුෂ්කර ක්‍රියා පුරණ අවස්ථාවෙහි එක් දවසක් දාවල් මා වැදහෙව නිදන ලද දේවතා දුවක් ඇවිත් මට කියන්නී සිද්ධාර්ථ කුමාරයෝ දුෂ්කර ක්‍රියා භූමියෙහි මළෝයයි අවුත් මට කිව එවිට මම සිද්ධාර්ථ කුමාරයෝ බුදුව කාලක්‍රියා කළෝද නුබුදුව කාලක්‍රියා කළෝදැයි විචාළෙමි. නුබුදුව කාලක්‍රියාකළෝයයි දේවතා දුව කී නියාව අසා එසේ වීනම් බුදුව විනා කාලක්‍රියා  කළෝයයි දේවතා දුව කී නියාව අසා එසේ වීනම් බුදුව විනා කාලක්‍රියා නොකෙරති අදහා නොගත් තෙමියි රජ්ජුරුවෝ කීහ. සර්වඥයන් වහන්සේ වදාරණසේක් රජ්ජුරුවෙනි මේ ජාතියේ තබා පළමු ධර්මපාල ජාතකයෙහි දිසාපාමොක් ආචාරින් සමීපයට ශාස්ත්‍ර උගන්ට ගිය ගමනේ මා මළැයි කියා එළු ඇටයක් ගෙණැවිත් දිසාපාමොක් ආචාරීන් තොපට පෑ ගමනේ දක්වා අදහා නොගත්තෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි සුද්ධෝදන මහරජ්ජුරුවන් විසින් ආරාධිත සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ධර්මපාල නම් ගමෙක ධර්මපාල නම් බ්‍රාහ්මණයෙක් ඇත. ඒ ගමට ධර්මපාල නාමය කෙසේවිදයත් ඒ ගම ඉඳිනා ධර්මපාල නම් බ්‍රාහ්මණයා පටන් උන්ගේ නෑදෑයන්ද ගෙයි වහල් ඇතුළුවූ අය පටන්වම පොහොයෙන් පොහොයට අටසිල්ද දවස්පතා පංචශීලයද  දස පින් කිරියවත්ද කරන්නාහ. එසේහෙයින් ඒ කියන ගමටත් බ්‍රාහ්මණ කුලයටත් නම ධර්මපාල යයි සැලසින. එසමයෙහි බෝධිසත්වයෝ එකියන ධර්ම පාලයානන් බිරින්දගේ කුස පිළිසිඳ ඉපද වැඩිවිය පැමිණියාහ. වැඩිමාළු ධර්මපාල බ්‍රාහ්මණයෝ තමන්ගේ පුතනුවන් ධර්පාල  කුමාරයන්ට ශාස්ත්‍ර උගන්න්ට දිසාපාමොක් ආචාරීන් සමීපයට යවන්නාහූ මසුරන් දහසක් දී යවුහ. එකියන ධර්මපාල කුමාර තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් මසුරන් දහස දීලා ශිල්ප උගන්නා කැත්තෝ පන්සියයක් අතවැස්සෝ තුමුට ආචාරීවන නියාවට ශාස්ත්‍ර උගන්නාහ. එසමයෙහි දිසාපාමොක් ආචාරීන්ගේ පුතනු කෙණෙකුන් මළහ. උන් මළ සෝකයෙන් දිසාපාමොක් ආචාරීන් හා පන්සියයක් අතවැස්සන් ආදීවූ අය අඬා ආදාහනකොට අතවැස්සෝ කථාකොට උන්නාහු ආචාරන්වහන්සේගේ බාලතරුණවූ පුත්‍රයා මළේයයි කියා උන්තෙනට ධර්මපාලකුමාරයෝ අවුත් කියන්නාහු බාල මනුෂ්‍යයෝත් මියෙත් ද ඒ කෙසේවූ දෙයෙක් දැයි කීයේය. එවිට සෙසු කුමාරයෝ කියන්නාහු ඇයි ධර්මපාල කුමාරයෙනි මරණයට බාලයයි වැඩිමාළුයයි නොපැමිණේද මරණ තමා කරා එන නියාව නොදනිදැයි කියා ධර්මපාල කුමාරයෝ කියන්නාහු මරණ පැමිණෙන නියාව දනිමි මේ බාල අවස්ථාවෙහි අපගෙන් මියන්නෝ නැතැයි කීහ. මේ නියාව අතවැසි පන්සියය දිසාපාමොක් ආචාරීන්ට කීහ.

දිසාපාමොක් ආචාරින්ට එපවත් අසා ධර්මපාල කුමාරයන් ගෙන්වා සැබෑද තොපගේ වර්ගයේ මාළුව විනා බාල අවස්ථාවෙහි මියෙන්නෝ නැත්තේදැයි විචාළේය. එවිට ධර්මපාල කුමාර කියන්නාහු එසේය ආචාරීන් වහන්ස අපගේ වර්ගයේ මාළුව විනා බාලේ අවස්ථාවෙහි නොමියති කී කල්හි ඒසේ වීනම් ඒ පරීක්ෂා කරන්ට උවමැනවැයි සිතා දිසාපාමොක් ආචාරී මළාවූ එළුවකුගේ ඇටයක් සෝධා අතවැසියා අත පිසුඹිතලා ධර්මපාල බ්‍රාහ්මණයානන්ගේ ගමට ගොස් වැඩි මාළු බ්‍රාහ්මණයානන්ගේ ගෙය කොයිදැයි විචාරා ගෙට අවුත් ආචාරීන්ට ඉඳින්ට අසුන් පණවා හිඳ කථාකොට කොට උන්නාහ. ඒ වෙලෙහි  දිසාපාමොක් ආචාරී ධර්මපාල බ්‍රහ්මණයන්ට කියන්නාහු තොපගේ පුතනුවෝ යහපත්ව ශාස්ත්‍රය හා ත්‍රිවේදයත් ඉගෙණ උන් අවස්ථාවට එක් තරා ව්‍යාධියකින් මළාහයි කීහ. එවිට වැඩිමාළු ධර්මපාල බ්‍රාහ්මණයෝ අතින් අතපැහැර සිනාසී කියන්නාහු අපගේ දරුවෝත් බාල අවස්ථාවේ මියෙද්ද ඒ කෙසේවූ දෙයක්දැයි කීහ. දිසාපාමොක් ආචාරී දෙවෙනිව ධර්මපාලයෙනි තොපි මා කීවා අදහානෙගණුද මේ තොපගේ පුතනුවන්ගේ ඇටනොවේද

SANHIDA LANKA

මේ දකත් අදහා නොගණුදැයි කීහ. එවිට ධර්මපාල බ්‍රාහ්මණයෝ කියන්නාහු මේ එළුවකුගේ ඇට හෝ බල්ලෙකුගේ ඇට හෝ වේද අපගේ දරුවෝත් මියෙත්දැයි ධර්මපාලයන් හා උන්ගේ නෑයන් හා ගෙයිවාල් ආදී හැම සිනාසුනාහ.

එවිට දිසාපාමොක් ආචාරීන් තොපගේ දරුවන් නෑයන් බාල අවස්ථාවෙහි නොමියන්ට කාරණා කවරේදැයි විචාරන්නාහු කුමන උපායෙක්ද කුමන බ්‍රහ්මචර්යාවෙක්ද කුමන කාරණයක් නිසාද බ්‍රහ්මණය තොපගේ දරුවන් නොමියෙන්නේයයි විචාළේය. ඊට කාරණා කියන ධර්මපාල බ්‍රහ්මණයෝ කියන්නාහු දස කුශල ධර්ම කරම්හ. කෙළිපණිසත් බොරු නොකියම්හ. දස අකුශල පථයන් නොකරම්හ. එක්කෙණෙකුන් නපුරැයි කියන දෙයකුත් නොකරම්හ. එසේ හෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද අපි දන්දෙන අවස්ථාවෙහිත් සන්තොෂ වම්හ. දන්දෙමින් සිටත් සන්තෝෂවෙමින. දන්දී ඉක්බිති සන්තෝෂවම්හ. දන්දී පශ්චාත්තාපයට නොපැමිණෙන හෙයින් අපගේ වංශයෙහි නොමියන්නාහ, තවද ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහිද වන්දිභට්ටයන් කෙරෙහිද දුගී මගී යාචකයන් කෙරෙහිද සමසිතින් දන්දෙම්හ. එසේ හෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද අපගේ බිරින්ද හැර ඹබ්බේ ස්ත්‍රියකට ආලය නොකරම්හ. අපගේ බිරින්දත් ඹබ්බේ පුරුෂකෙණෙකුන් කෙරෙහි ආලය නොකරන්නාහ. අපි වනාහි ඹබ්බේ ස්ත්‍රින්ට බඹවස් රකිණා සරියම්හ. ඹබ්බේ ස්ත්‍රි අපට මවුන් හා සරියෝය. එසේහෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද එසේවූ ස්ත්‍රීන්ගේ බසින් වැදූ දරුවෝත් නුවණින් ප්‍රාප්තව ත්‍රිවේදයෙහි නිපුණවන්නාහ. එසේ හෙයින් අපගේ  වංශය බාල අවස්ථාවෙහි නොමියෙන්නාහ. තවද අපගේ මව්පිය නැඳි මයිලන් බෑ බුත් දු දරු යනාදි සියල්ලෝම ධර්මයෙහිම පරලොවට බා හැසිරී වාසය කරම්හ. එසේහෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද අපගේ සේවකයෝද බැලමෙහෙකරන්නෝද කුලියට මෙහෙකරන්නෝද යනාදී සියල්ලෝම පරලොව අදහා ධර්මයෙහි හැසිර වාසය කරන්නාහ එසේ හෙයින් අපගේ වංශයෙහි මාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද අර්ථය දක්වන සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහරජ යම් කෙණෙක් ධර්මය රැකිත්ද ඒ ධර්මය පෙලා උන් දෙලොවම රකිණේමය. මේ ධර්මය අනිසංසයම මිලකලත් දුගතියට නොගොසින් සුගතියට යන්නාහ. තවද බ්‍රාහ්මණයා කියන්නේ ධර්මය රකිනා තැනැත්තවුන් ධර්මය පෙරලා රකිණේමිය, ඊට කාරණා කෙසේද සත් මහත් වරුෂාවට ඡත්‍රයක් සේය. ඔහුට ප්‍රතිෂ්ඨාවේද එමෙන් පුතිෂ්ඨාවෙයි, එසේ හෙයින් මාගේ පුත්වූ ධර්මපාල කුමාරයෝත් ධර්මයෙහි පිහිටියාව. එසේ හෙයින් මේ ඇටය අනික්කෙණෙකුන්ගේ ඇටයක මාගේ දරුවෝ සැපසේ උන්නාහ. මේ අපගේ චාරිත්‍රය සම්බුද්ධ පරමාර්ථයෙන් ආයේයයි කීයේය. එවිට දිසාපාමොක් ආචාරීන් ආගමනේ ලාභ ලදිමි සිතා තොපගේ පුත්හු සැපසේ උන්නාහ. මම තොප විමසන පිණිස එළ ඇටය ගෙණායේය. ඊට ක්‍ෂමා කරවයි කියා ක්‍ෂමා කරවාගෙණ මේ තොප දවස් අරණා සැලැස්මව පත ලියවාගෙණ එතන කීප දවසක් රඳා දිසාපාමොක් ආචාරී තමන් වසන තක්සලා නුවරට ගොස් ධර්මපාල කුමාරයන් නොනිමි අකුරුකරවා මහත්වූ පෙරහරින් උන්ගේ නුවරට එව්වාහයි වදාරා මේ මහා ධර්මපාල ජාතකය දක්වා චතුස්සත්‍ය ප්‍රකාශකොට වදාළසේක. මේ ධර්ම අවසානයෙහි සුද්ධෝදන රජ්ජුරුවෝ අනාගාමිඵලයෙහි පිහිටිසේක. එසමයෙහි ධර්මපාල කුමාරයන්ගේ දෙමාපියෝ දෙන්නානම් මේ සමයෙහි සුද්ධෝදන රජ්ජුරුවන් හා මහා මායා දේවිය එසමයෙහි දිසාපාමොක් ආචාරී නම් දැන් ශාරීපුත්ත ස්ථවිරය. පන්සියයක් අතවැස්සෝ නම් දැන් මේ බුදුපිරිසය. එසමයෙහි ධර්මපාල කුමාරයෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# කුක්කුහ ජාතකය

තවද විරාජමාන වූ සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වධයට උත්තාහයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

එක් දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන් වහන්සේ තමන්ට බැරිවුවත් සර්වඥයන් වහන්සේ නසන්ටම උත්සහ කෙරෙති කීය. කියා වැඩ උන් තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් මා දේවදත්ත ස්ථවිරයෝ නසන්නට උත්සහකොට නසාගත නුහුණුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස කොසඹෑරට කොසඹියනම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඇටිකුකුල්ව ඉපද බොහෝ ඇටිකුකුළන් පිරිවරා හුන වනයක වාසය කරන්නාහ. ඒ වනාන්තරයට නුදුරු ස්ථානයක උකුස්සෙක් වාසය කරන්නේය. ඒ උකුසු බෝධිසත්වයන් ලඟ උන් ඇටිකුකුළන් දවස එකෙකු බැගින් නිමවා බෝධිසත්වයන් පමණක් තනි වුහ. බෝධිසත්වයන් නසාගත නොහි මිත්‍රව නසාගනිම් සිතා උකුසු එක් දවසක් බෝධිසත්වයන් සමීපයට ගොස් කථාකරන්නාහු සබඳ තොප හා මිත්‍රව ඉන්ට උවමැනව එසේ හෙයින් අසවල් වනාන්තරයේ නොයෙක් මධුරවූ ඵලාඵලා ඇත්තේය. එතනට ගොසින් තොපි ඵලාඵල අනුභවකරවයි කියේය. ඇටිකුකුල් කියන්නේ සබඳ තොප හා මා හා කෙසේ ද විස්වාසය කරන්නේ. තොප විසින් මාගේ බොහෝ ඇටිකුකුලන් කා මා තනිකොට හිඳ දැන්ද තොප මිත්‍රවන්නේයයි ඇටිකුකුල් කියේය. එවිට උකුසු කියන්නේ සැබැව තොපගේ ඇටිකුකුළන් නසනලදැයි තොප මා කෙරේ සාංකා විය යුතුය. එසේ වුවත් මෙතැන් පටන් සංකා නොකරවයි මිත්‍රවන්නේ යයි ඇවිත් කිහ. බෝධිසත්වයෝ මා තොප කෙරෙහි වාසය කරන්නාට සැක ඇත්තෙමි කියා වනාන්තරයෙහි සියළු දේවතාවන් සන්තෝෂ කරවා බෝධි සත්වයෝ බුද්ධලිලායෙන් කියන්නාහු පළමුකොට කරණ ලද බොහෝ අකුශල් ඇති පුද්ගලයා කෙරෙහි සත්පුරුෂයන් විසින් විස්වාස නොකොට තමා පිණිස ප්‍රඥාසෙනෙහයෙන් විස හජනය නොකරේද යමක් කැමතිව හජනය කෙරේද එසේවූ ධානර්ථ සත්වයන් කෙරෙහිත් විශ්වාස නොකොට යුත්තේය. යම් සත්වයෙක් ඇතුලෙන් සාන්ත දාන්ත ගුණයෙක් නැතිව තිබැද්දී පිටතින් සන්සුන් ගුණය දැක්වීමෙන් සාන්තිස්වරූපයට ඇත්තේද එබදු සැඟ උනාවූ කියා ඇති තුඹසින් වැසි නොපෙන්නාවූ සර්පයින් හා සමාන කුහකවූ පාපපුද්ගලයා තමාකෙරෙහිත් විශ්වාස නොකටයුත්තේය. යම්සේ පාප වාසීන්වූ ගෙරි තොටට බැස මුබයපුරා පැන් බී ස්නානය කොට සන්තර්පවෙද්ද ස්ණාන ප්‍රාණයට සුදුසු වූ ජලය පිහිටුවා වැව් පොකුණු ආදිය බැඳිම් වශයෙන් ඊට කලමනා කිසි කර්මාන්තයක් නොකෙරේද එපරිද්දෙන්ම මේ ලෝකයෙහි සමහර කෙණෙක් තොපට මෙසේවූ යහපතක් කරම්හයි මධුරවූ වචනයෙන් මිත්‍රයන් අනුභව කරන්නාහු මෙන් හදාරන්නාහ. ප්‍රිය වචනයට සුදුසු කාරිය නොකරන්නාහ. එබදුවූ කටින් එකක් කියා සිතින් එකක් සිතන්නාවූ ස්ථාවාදීතථාකාරී නොවන්නාවූ පුද්ගලයා කෙරෙහිත් විශ්වාස නොකොට යුත්තේය. ඉදින් විශ්වාස කළොත් මහත්වූ අවැඩට පැමිණෙන්නේය. යම් සත්වකෙණෙක් බංධාංජලීව දොහොත් මුදුනෙහි තබාගෙණ ස්වාමිනි නුඹ වහන්සේට මෙනම් මෙනම් දෙයක් දෙම්හ. කරම්හයි කියා බසින්ම වෙලාගෙණ සිස්වූ දොහොත් මුදුනේ තිබීම පමණකින්ම සිත්ගනිද්ද එබඳු නිස්සාරවූ පිරඹක් හා සමානවූ පුද්ගලයන්කරා පැමිණ විශ්වාස නොකොට යුත්තේය.යම් සත්වකෙණෙක් අනේකප්‍රාකාරවූ ලඝු චිත්ත ඇතිව කාර්යමාර්ගයෙක නොපවතිත්ද එබඳුවූ පරුෂයන් කෙරෙහි විශ්වාස නොකොට යුත්තේය. යම් සත්වකෙණෙක් මොහු හා එක්නොවී විනාශයක් යොදන්ට නොපිළිවනැයි. සිතා අන්තරාය කරණ පිණිස නොයෙක් කාරණයෙන් සංසගීනොවි විශ්වාස තරව ගිය ගිය කල්හි ඉතිකින් මේ මාර්ගය අන්නොහරනේයයි, සිතට දැනිගිය කල්හි පසුව ඔහු නසන්ට උත්සහකොට ජීවිතාන්තරය කෙරේද එබඳු පුද්ගලයා කෙරෙහිත් විශ්වාසය නොකොට යුත්තේය. තවද යම් සත්වකෙණෙක් අනාචාරවූ පාප පුද්ගලයන්ගේ ක්‍රියාව කෙරෙමින් ප්‍රාණඝාතාදීවූ අකුශල ධර්මයන් කෙරේද අස්ථිරවූ බස් අත්තේද අවසරයක්ලදින් සියල්ලවුන් විසින්ම නසන්ට සිතාද කොපුවෙන් හෝ රෙද්දකින් හෝ වසා තබන ලද තියුනුවූ මුවහත් ඇති කඩුවක් මෙන් තමාගේ ඇති පුරුදු ගුණය සඟවාද එබඳු අමිත්‍ර ප්‍රතිරූපකවූ පුද්ගලයා කෙරෙහිත් විශ්වාසය නොකට යුත්යේ. තවද යම් සත්වකෙණෙක් මට සිළුටුවූ ප්‍රිය වචනයෙන් යුක්තවේද තවද පුරුෂද අනේකප්‍රකාරවූ උපායෙන් තමාට යහළුවූ පුද්ගලයාට අනර්ථය කරන්ට අවසරයක් බලා ඇවිද්ද එබඳුවූ අමිත්‍රයක්හු  හා සමාන පුද්ගලයා කෙරෙහි විශ්වාස නොකොට හැක්කේය.

SANHIDA LANKA

තවද යම් සත්වකෙණෙක් අනුභවකරන්ට නිසිවූ ආහාර පාණ  වර්ගයක් හෝ අවශේෂවූ ඇඳ පුටු කොට්ට මවුලා ආදීවූ වස්තුවක් හෝ තමාගේ යහළුවා ගෙයි යම් තැනක තිබූයේ වීනම් එහි ලෝභය කොට ඒ වස්තුව සොරා ඇරගනීද අවසරයක් පෙණිගියේවී නම් තමාට යහළුව සිටි පුද්ගලයාත් නසාපියායේද එබඳුවූ සත්වයා කෙරෙහිත් විශ්වාසය නොකොට යුත්තේය. තවද ඒ අර්ථය දක්වන්නාවූ සර්වඥයන් වහන්සේ වදාරණ සේක් එඹාමහණෙනි යම් සත්වකෙණෙක් තමන්ගේ සිත නුගුණ හඟවා  ගුණප්‍රකාශ කොට සත්වයන් භජනය පර්යුපාසනය කෙරෙති එබඳු අසත් පුරුෂයන් ඇටිකුකුළා උකුස්සා දුරුකළාක්මෙන් නුවනැත්තාවූ සත්වතෙමේද දුරින් දුරුකරන්නේය, යම් සත්වයෙක් තමාට උපන්නාවූ අනර්ථය අවැඩක් වහා දැනගත නොහෙන්නේ වීනම් ඒ සත්වතෙමේ සතුරන්ගේ වසඟයට පැමිණෙන්නේය, නැවත පශ්චාත් තාපයටත් පැමිණෙන්නේය. යම් සත්වයෙක් තමාට උපන්නාවූ වැඩට නිසි අභිවෘද්ධි කාරණයක් වහා දැන ගණිද ඒ සත්වතෙමේ උකුස්සාගෙන් ගැළවුනාවූ ඇටිකුකුළා මෙන් සතුරන්ගෙන් වන පීඩාවෙන් ගැලවෙන්නේය. තවද වනයෙහි මුවන් බඳන පිණිස අටවන ලද මලක්වැනිවූ අනවරතයෙන් අනුන්ට අවැඩක්ම කියන කරණ සුළුවූ අනර්ථකාරීවූ යම් පුද්ගලයෙක් ඇත්නම් එබඳු සත්වයා නුවන නැත්තේය. යම්සේ උන් වනයේ වසන්නාවූ ඇටිකුකුළා තමාට ප්‍රතිඎපවූ උකුස්සා දුරින්ම දුරුකෙළේද එපරිද්දෙන් තමාට සතුරුව සිටි පුද්ගලයාද දුරිනි දුරුකරන්නේයයි මෙසේ ඒ ඇටිකුකුළා උකුස්සාට ආමන්ත්‍රණය කොට කියන්නේ යහළු තෝ ඉදින් මෙතන වසුයෙහි වීනම් තට කළමනා කාරිය දනිම්යි භයගැන්වූයේය. එබස් අසා උකුස්සාද එතනින් පළාගොස් අනික් තෙනක වාසය කෙළේයයි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි දේවදත්ත ස්ථවිරයෝ පෙරත් මට වධයට උත්සහකළෝ වේදැයි වදාරා මේ කුක්කුභ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි උකුස්සා නම් දැන් මේ දේවදත්ත ස්ථවිරයෝය. එසමයෙහි ඇටිකුකුළුව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# බිළාර කෝෂිය ජාතකය

තවද කාලත්‍රයවර්තීවූ සර්වධර්මයෙන් සර්වාකාරයෙන් දත්තාවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දන්දී අනුභව කරන්නාවු භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

එක්තරා භික්ෂූකෙණෙකුන් වහන්සේ බත් ආලෝපයක්වත් උප්පතක් වත් යම්දෙයක් දන්දී වළඳනසේක. උන් වහන්සේ දන් දී වළඳන නියාව එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන් වහන්සේ ඇවැත්නි අසවල් භික්ෂූහු දන්දී මිසක් අනුභව නොකරෙති කියාම කථාව කොට උන්සේක. එතනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා මහණෙනි මේ කියන්නාවූ භික්ෂූහූ මහා ලෝභිය මාගේ අවවාදය අසා ඒ ජාතියෙහි ලෝභිකම් අලහ. එසේ හෙයින් මේ ජාතියේත් ලෝභිකම් නැත්තේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ නුවර එක්තරා සිටානකෙණෙක් සදමහල් කරවා දන්දී තමාගේ පුතාට කියන්නේ මාසෙම දන්දී සිල්රකුවයි පුතාට භාර කොට තෙමේ මියගොස් ශක්‍රභවනයෙහි ශක්‍රභවනයෙම් ශක්‍රදේවේන්ද්‍රව ඉපද දිවඉසුරු විඳිනා කල්හි ඔහුගේ කුමාරයත් සිටුසේසත් ලදින් පියානන්සේම දන්පින් කොට මියගොස් චන්ද්‍රපුත්‍රව උපන්නේය. ඔහුගේ පුතාත් එසේම දන්පින් කොට මියගොස් සූර්යදිව්‍යපුත්‍රව උපන්නේය. ඔහුගේ පුතාත් එසේම දන්පින් කොට මියගොස් සූර්යදිව්‍යපුත්‍රව උපන්නේය. ඔහුගේ පුතාත් එසේම දන්පින් කොට මියගොස් සූර්යදිව්‍යපුත්‍රව උපන්නේය. ඔහුගේ පුතාත් එසේම දන් පින්කොට මියගොස් මාතලී දිව්‍යපුත්‍රව උපන්නේය. ඔහුගේ පුතාත් එසේම දන්පින් කොට මියගොස් පංචශිඛ දිව්‍යපුත්‍රව උපන්නේය. ඔහුගේ පුතා වනාහි තමාගේ පරම්පරාවෙන් ආවාවූ දාන වාහනය නසා දන්හල් ගිණිසිඟා ආ ජනයන් බොටුව අල්වාදමා මේ නියායෙන් තදපරුෂව කිසිදායාවක් නැතිව යටත්පිරිසෙයින් තනඅගක් තෙලෙහි ශාලාවත් එක්කෙණෙකුන්ටත් නොදී මසුරුව වාසය කරන්නාහ. එසේ හෙයින් උන්ට බිලාරකොෂිය සිටානෝයයි කියා මෙනමින් ප්‍රසිද්ධ දවස් අරිනාහ. එක් දවසක් ශක්‍රදේවේන්ද්‍රතෙම මම කුමක් පිණිස මේසා සම්පත් ලද්දේනැයි දිවැසින් ලොව බලන්නාහු බරණැස් නුවර සිටුකුලයෙහි ඉපිද දන් දී උපන් නියාව දැක මාගේ පුතනුවෝ කොයිදැයි කොතැන්හි උපන්දෝහෝයි බලා චන්ද්‍ර දිව්‍යපුත්‍රව උපන්නියාව දැක උන්ගේ පුතනුවෝ කොයි උපන්දෝහෝයි බලා සූර්ය දිව්‍යපුත්‍රව උපන් නියාව දැක උන්ගේ පුතනුවෝ කොයි උපන්දෝහෝයි බලා පංචශික දිව්‍යපුත්‍රව උපන් නියාව දැක ඔහුගේ පුත් කොයි උපන්දෝහෝයි බැලුවාහු පරම්පරාවෙන් ආවාහූ දන්හල් දවා සිඟන්නන් මරා එහුබඳවා ලෝභිව වසතියි දැක මා දක්වා මේ දිව්‍යපුත්‍රයන් සතරදෙනත් මමත් ගොසින් ලෝභිකම් අරවාපියා එම් සිතා චන්ද්‍ර සූර්ය මාතලී පංචශිල දිව්‍යපුත්‍රයන් සතරදෙනා තමන් කරා කැඳවා කියන්නාහු අපගේ දානාවංශය නසා ලෝභිව වාසය කෙරෙති එසේහෙයින් අපි පස්දෙනා උන්කරා ගොසින් උන්ගේ ලෝභය අරවා දන් පින් කරණා නියායෙන් සලස්වා එම්මැයි කියා අපි පස්දෙනා එකවිට ගියකල භයින් මූර්ජාවෙයි එකවිට නොගොසින් එක්කෙණෙකුන් නියායෙන් බ්‍රහ්මණ වේශයෙන් යම්හයි කියා සිටානන් රජගෙට අවුත් තමන්ගේ ගෙට ගියකල යම්හයි කථාකොට සිටානන් තමන්ගෙට අවුත් සත්වෙනි දොරටුවේ විථිය බලබලා සිටිකලට ශක්‍රයෝ බ්‍රාහ්මණ වේශයෙන් අවුත් සිටානන්ගේ සමීපයට පැමිණ සිටාණෙනි සාදුකෙන් ඉතාම පීඩිතව ගියෙමි. මාගේ දුක්බය නිවා දෙවයි කී කල්හි සිටානෝ ශක්‍ර බ්‍රාහ්මණයා කී බස හා සමඟ මාගේයයි පිසුබතුත් නිමාගියේය. පිසන්ට සාළුත් නැතැයි කීහ. ශක්‍රබ්‍රාහ්මණයා කියන්නේ සිටාණෙනි මා කියන්නාවූ සොලෝවෙක් ඇත අසවයි බ්‍රාහ්මණයා කීය. සිටානෝ මට සොලොවෙන් ප්‍රයෝජන කිම්ද මම නොඅසමි කීවත් බ්‍රාහ්මණයන් වලක්ව වලක්වා කියන්නාහු පින්වත් මහසිටානෙනි පිස අනුභව නොකරන්නාවූ සත් පුරුෂයෝ සිඟාල භෝජනය දෙනුකැමැතිවෙති උදාකළාව නොකෙරෙති පිස අනුභව කරන්නාවූ තොපි තොපගේ වස්තුව ඇතිව තිබැද්ද තමා සමීපයට පැමිණියාවූ යාචකයන්ට දන්නොදෙව් නම් එසේ නොදීම තොප වැන්නවුන්ට සුදුසු නොවන්නේය. දානමානාහි මසුරු බැවින් ප්‍රමාද බැවින් යන මේ දෝශදෙකින්ම නොදනෙන්නාහ. කුසල් කැමැත්තවු නුවනැත්තාවූ සත්වයන් විසින් ස්වල්පවූ දෙය ධර්මයෙක් ඇතිනම් එයින් භාග යක් වත් දියයුත්තේයයි කීහ.

SANHIDA LANKA

එබස් අසා සිටානෝ ගෙටවැද ඉදූවයි යන්තමක් ලබන්නේ වේදැයි කිය ශක්‍රබ්‍රාහ්මණයෝ ගෙට වැද සිටානන්ට තමන් කාරණය මෙනෙහි කරමින් සෝලෝව කිය කියා උන්නාහුය. ඉක්බිති චන්ද්‍ර දිව්‍යපුත්‍රයෝ අවුත් බත් ඉල්වා තොපට බත් නැතැයි යවයි කී කල්හි මහ සිටාණෙනි ඇතුළුගෙයි එක් බමුණෙක් සිටිති බමුණන් පවරා

දන්දෙන තෙනකැයි සිතිමි. එසේ හෙයින් මමත් ගෙට වදිමි කීහ. බමුණන්ට දෙන දනෙක් නැත මෙතන නොසිට පළායවයි සිටානන් කියමින් සිටියදි එසේ විනම් සොලෝවක් කියන්නාවූ චන්ද්‍ර දිව්‍යපුත්‍රයෝ මසුරුසිත් ඇත්තාවූ සත්වතෙම යම් ක්‍ෂුධා පිපාස දෙකට හයින් හයපත්ව දන් නොදෙන්නාවූ සත්වයාට ඒ තෙම හයනොවන්නේය. කුමක් නිසාදයත් මම මා සන්තක වස්තුව අනුන්ට දන්දීපියා ක්‍ෂුධා පිපාස දෙකින් පීඩිතවම දූයි සිතා හයපත්වේද ඒ ක්‍ෂුධා පිපාස සංඛ්‍යාතවූ හය අඥානවූ සත්වයා උපන් තැන්හි මෙළොව පරලොව දෙකෙහිම පීඩාවට පමුණුවන්නේය. ඉතා දිළිදු බවටත් පමුණුවන්නේය. එසේ හෙයින් තමාගේ සන්තානයෙහි උපන් මාත්සර්‍යය මලය මැඩගෙණ නුවනැත්තාවූ සත්වයින් විසින් දන්දියයුත්තේය. සියළු සත්වයන්ට කුශල නම් බලවත් පිහිටෙක් වන්නේයයි කීහ. එබස් අසා සිටානන් විසින් එව ගෙට වැද ඉඳුව මදක් ලබන්නේ වේදැයි කී කල්හි චන්ද්‍ර දිව්‍ය පුත්‍රයෝ මගට වැද ශක්‍රයන් සමීපයෙහි උන්නාහ. ඉක්බිත්තෙන් මදක්කල් යවා සූර්ය දිව්‍යපුත්‍රයෝ බත් ඉල්වා සිට කියන්නාහු දානය නම් මත්ස්‍යමණ්ඩලය මැඩගෙණ දියයුතු හෙයින් නොදිය හැකි දෙයක් වන්නේය. නැවතද දානය නම් යුද්ධයක් හා සමාන වන බැවින් නොකොට හැකි කාරියෙක් වන්නේය. එසේ හෙයින් නොදිය හැක්කක් කරන්නාවු සත්පුරුෂයෝ දන්දිගත නොහෙන්නාහ. එසේ හෙයින් සත්පුරුෂ බෝධි සත්වවරයන්ගේ ස්වභාව අන්‍යසත්වයන් විසින් ගතනොහැක්කේය, මේ කාරණයෙන් සත්පුරුෂයන්ගේ ගතිය ෙ මෙයින් පරලොව ගියකල්හි වෙනවෙනම වන්නේය. අසත්පුරුෂයෝ තමා මාත්සර්‍යය වශයෙන් දන්නොදී නරකයට යන්නාහ. සත්පුරුෂයෝ දාන ඵලය තමන්ට ප්‍රත්‍යක්‍ෂව දනෙන හෙයින් මත්ස්‍යනොව දන්දී ස්වර්ගලෝකයෙහි උපදනාහයි ධර්මදේශනා කළහ. එබස් අසා සිටානෝ අනිකක් කියා කොටගත හැකිකාරණය නොදක එසේවී නම් ගෙට වැද සමීපව ඉඳුව මදක් ලබන්නා වේදැයි කිය.

ඉක් බිත්තෙන් මදක්කල් යවා මාතලී දිව්‍යපුත්‍රයා අවුත් බත් ඉල්වා නැත පලා යවයි කී කල්හි එබස් හා සමඟ අවවාද වශයෙන් කාරණා කියන්නේ මහා සිටානෙනි මේ ලෝකයෙහි සමහර නුවනැත්තාවූ සත්වකෙණෙක් තමන්ගේ ගෙවල ස්වල්පව තිබෙද්දී දන්දෙනු කැමැත්තාහුවෙති. සමහර සත්වකෙණෙක් තමන්ගේ වස්තුව බොහෝවීනම් දන්දෙනු කැමැත්තාහ. එසේ හෙයින් මේ ලෝකයෙහි කම්පල අදහා දෙනලද්දාවූ සැන්දක් පමණවත් මහත්ඵල මහානිසංස වන බැවින් සහසින්ගේ දානය හා සමානවන්නේයයි කීහ. එබස් අසා සිටානෝ එසේ වීනම් ගෙටවැද ඉඳුවයි කීය. ඉක්බිත්තෙන් මදක්කල් යවා පංචශික දිව්‍යපුත්‍රයා අවුත් බත් ඉල්වූහ. නැත පලා යවයි කී කල්හි මම තාගේ ගෙට ගොසින් දුන්දෙය ගෙණාවිරු එකෙකි කිම්ද මේ ගෙයි බමුණන්ට ආරාධනාකොට දන්දෙන තෙනැකැයි කියා සිටානන්ට ධර්මදේශනා කරන්ට පටන්ගත්තාහු මෙසේ කීහ. සිටානෙනි මේ ලෝකයෙහි යම් සත්වයෝ ත්‍රිවිධ සුචරිත ධර්මයෙහි හැසිරේද ගමසිඟා ඇවිද වී සාල් ආදීවූ දෙයෙන් හා බත් ආදියෙන් ජීවත් වේද වනයේ ආවිද ඵලා ඵල ආදිවූ දෙය ගෙණවුත් ජීවත් වේද එසේ ඇවිලි ආහාරයෙන් ජීවත් වන්නාවු සත්වයාත් ධර්මයෙහි හැසිරෙන්නේම වෙයි යම් සත්ව කෙණෙක් තමාගේ වස්තුව ස්වල්පව තිබැද්දී ධාම්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් හා දුගී මගී යාචකයන්ට දන්දේද එම ස්වල්ප වස්තුවෙන් පුත්‍රදාරාවන් පෝෂ්‍යය කෙරේද ඒ සත්වයාත් හැසිරෙන්නේ නම් වෙයි මෙර මා හට හය හා පීඩා කොට නොබද කරවූ වරද ආදියෙන් වස්තු රැස්කොට දවස දහසක් වස්තු වියදම්කොට දන්දෙනහෙයින් සහශ්‍රයාගී නම්වූ ඉසුරුමතුන් ලක්ෂයක් දෙනාගේ දානය දැහැමෙන් වස්තු උපදවාගෙණ ඒ මනා වස්තුවෙන් දන් දෙන්නාවු දුක්ඛිත මනුෂ්‍යයාගේ දානයෙන් සොළොස්වන  කොට්ඨාසයෙන් කොට්ඨාසයකුත් නොඅගනේයයි කීහ. පංචශිකයන්ගේ බස් අසා බිළාර කෝෂිය සිටානෝ කාරණා සලසා දුගී පුරුෂයාගේ ස්වල්පදානයට සහශ්‍රා දීන් ලක්ෂයක් දෙනාගේ දානට නොඅගනා කාරණා විචාරන්නාහු බමුණානෙනි සහශ්‍ර වශයෙන් ඉතා මහත් බැවින් දැහැමින් සෙමින් වස්තුව උපදවා දන්දෙන්නාවූ පුරුෂයාගේ ස්වල්ප වූ දෙය ධර්මයෙහි සොළොස්වන කොට්ඨාසයෙන් කොට්ඨාසයකුත් නො අගන්ට කාරණා කවරේදැයි විචාළාහ. ඉක්බිති ඊට කාරණා  කියන්නාහු පංචශිඛ දිව්‍යපුත්‍රයෝ සිටානෙනි මේ ලෝකයෙහි සමහර සත්වකෙණෙක් ප්‍රාණඝාතාදී දශ අකුශල කර්මයෙහි පිහිටියාවූ අනුන් තලා මරා දඬුමුගුරුගෙණ නොබද අය පඬුරුගෙණ සත්වයන් සන්තානයෙහි සෝක ඉපදවිමෙන් සම්පත් රැස්කොටගෙණ ඒ බලාත්කාරයෙන් උපයනා ලද වස්තුවෙන් ශ්‍රමණබ්‍රාහ්මණයන්ට දන්දෙන්නාහ. සත්වයන්ටද දණ්ඩණයකොට උපදවාගත් වස්තුවෙන් දෙනලද්දාවූ දානය දැහැමෙන් දෙන වස්තුවට සරිනොවන්නේය. මෙසේ යථෝක්ත ක්‍රමයෙන් පරහට පිඩා කොට වස්තුව උපදවාගෙණ දන්දෙන්නාහු ලක්ෂයක් දෙනාගේ දානය දැහැමෙන් වස්තුව උපදවා දන්දෙන දුගී පුරුෂයාගේ දානය දුන් නාවූ කාරණා වශයෙන් සොළොස්වන කොට්ඨාසයෙන් කොට්ඨාසයකුත් නොඅගනේයයි සිටානන්ට ධර්මදේශනා කළාහ. පංචශිකයන්ගේ ධර්ම කථාව අසා සිටානෝ එසේ වීනම් යව ගෙට වැද ඉඳුවයි මදක් ලබන්නේ වේදියි කීහ.

එබස් අසා පංචශික දිව්‍යපුත්‍රයෝ ගොස් ශක්‍ර බ්‍රාහ්මණාදී සතර දෙනාගේ සමීපයෙහි උන්නාහ. ඒ වෙලෙහි බිළාල කෝෂිය සිටානෝ තමන්ගේ ගෙයි කෙල්ල කැඳවා කියන්නාහු තෙලහිඳිනා බමුණන් පස් දෙනාට

SANHIDA LANKA

බොල්මුසු වී පස් නැලියක් දිපියවයි කීහ. යහපතැයි කියා කෙලිව් පස්නැලියක් ගෙණ ගියාය. බමුණෝ පස්දෙන පස්නැලිය දක අපට ඒ එපායයි ලාවානොගත්තාහ. ලවා නොගත් නියාව කෙලී සිටානන්ට කීවාය. සිටානෝ නිවුඩු සාල් පස් නැලියක් ලවා පියවයි කීහ. එවිට කෙලි සාල් පස් නැලියක් ගෙණ ගියහ. බ්‍රාහ්මණයෝ සාලුත් අප ලවා ගන්නේ නැතැයි කියා නොගත්තාහ. සාල්ලවා නොගත් නියාවත් සිටානන්ට කෙලි කිව බතකත් නම් අසුන්ට උයාපු නිවුඩුසාලේ බත්ලා පියවයි කිහ. යහපතැයි කියා බමුණන් පස්දෙනා ඉඳුවා අසුන්ට ඉවු නිවුඩු සාලේ බත්ලු ගමනේ බත් පිඩි කට තබා ගෙලගත්තාක්මෙන් ඇස් උඩ ඉඳුවා වැටී වැදඹත්තාහ. කෙලි එමවිට බ්‍රාහ්මණයන් ඇස්උඩ ඉඳුවා වැටිවැදහොත් නියාවදක මළහයි සිතා සිටානන්ට බමුණෝ බත් ගිලේ ගැණි මළෝයයි කෙලි කිව් සිටානෝ මට අප කිර්තියෙක අසුකෙළක් සම්පත් ඇති සිටානෝ සුබුමාලයවූ බමුණන් පස්දෙනාට ඉඳූරා බත් සුගක් ලවාලිය නොගි අසුන්ට ගෙරි මීවුන්ට පිසු බත්ලා බ්‍රාහ්මණයන් මරාපුහයි ප්‍රසිද්ධ බොහෝ මට අප කිර්තියයි කියා කෙල්ලට කියන්නාහු උන්ගේ තැටිවල නිවුඩු බත් හැර මට පිසු සුවඳ ඇල් සාලේ බත් තැටි පසේලවයි කීයේය. කෙළි ඒ නියාවට නිවුඩුසාලේ බත් හැර සිටානන්ට පිසු බත් බමුණන් පස්දෙනාගේ තැටිවල ලුව සිටානෝ දොරකඩ වැද සිට යනඑන බොහෝ මනුෂ්‍යයන් කැඳවා කියන්නේ මේ බමුණන් පස්දෙනාට මට පිසු සුවඳ ඇල්සාලේ බත් ලැවිම්, බමුණෝ නම් ලෝභී ජාතියෙක නිසා මහත්කොට බත්පිඩකා ගිලේගෙණ මළහ. අපගේ  වරදකින් මලගමනෙක් නොවෙයි තොපිහැම දනුවයි සිටානෝ කීහ. එවිට බ්‍රාහ්මණයෝ පස්දෙන බොහෝ මනුෂ්‍යන් එක්වූ නියාව දන නැගී සිට එසේද සිටාණෙනි තොපගේ මිවුන් ගෙරින් ආදින්ට ඉවුබත් අපිටලා  දන්තැටිවල කැකුළුසාලේ බත්ලා තොප කළද නොදනුදයි කටතුබු නිවුඩු සාලේ බත් පිඩු පස බිමට එලුහ. එවිට බොහෝ මනුෂ්‍යයෝ හයපත් තොපගේ දානාධ්‍යසය එකවිවරය, තොපගේ සත්මුතු පරම්පරාවේ පැවත ආකුශලයක් නැත්ල බොහෝ උත්සහයෙන් දෙවනවන්දානෙක මෙසේ වූ බ්‍රාහ්මණයන්ට තොපට පිසු බතින් බත්ලා යවාපුවොත් කවර වැරදිද තොපසේ අඥාණයෙකුත් නැතැයි කියා බොහෝ නින්දා කීහ. එවිට ශක්‍ර යෝ කියන්නාහු මේ සිටානෝ මෙතෙක් සම්පත් ඇතිව තිබැද්දී අපට ලැබුනු බතේ සැටිය මේ සම්පත කාගේ සම්පත්දැයි දනුදැයි විචාළේය. එවිට මනුෂ්‍යයෝ නොදනුම්හයි කීහ. බ්‍රාහ්මණයෝ කියන්නෝ පළමු මේ නුවර සතරදිග සතර දන්හල් කරවා දන්දුන් අසවල් සිටානන් තම ඇසූව්රුදැයි විචාළාහ. ඇසූවිරු මනුෂ්‍යයෝ ඇසුම්හයි කීහ. බ්‍රාහ්මණ කියන්නේ එසේ වීනම් ඒ කුශලය කළාවු සිටානෝ නම් ඒ කුසලමුලයෙන් ශක්‍රභවනයෙහි උපන් ශක්‍රයෝ නම් මම්මයයි  කියමින් සිටියදීම බ්‍රාහ්මණ වේෂය හැර පස් දෙනාම දිව්‍ය ආත්මභාවයෙන් සිට කියන්නාහු ඒ සිටානෝ නම් ශක්‍රවූ මම්මය. මාගේ පුත්‍රය නම් මාකළ කුශල්කොට චන්ද්‍ර දිව්‍යපුත්‍රව උපන්නේ තුළුැය. තුළුවන්ගේ පුත්‍රයානෝ එම මේ කුශලය කොට මාතලි දිව්‍යපුත්‍රව උපන්නේ තුළුැය, තුළුන් පුත්‍රයානෝ එම කුශලය කොට පංචශිඛ දිව්‍යපුත්‍රය උපන්නේ තුළුැය. මේ සිටානන්ගේ පියානෝය. එසේ හෙයින් මේ සම්පත් මාගේ සම්පත් මෙතෙක් සම්පත් තිබැද්දීත් නිවුඩු බතෙහි වවර දුටුවාදැයි කියා මට බත් නැති හෙයින් මුගේ බත්කන්ට ආයේ නොවෙමි බොහෝ කාලයක් පැවත ආ දානය නුදුන් හෙයින් ඉදිරි ඇතිවුනු කෙණෙකුන් නොදෙති එසේහෙයින් මුන් හික්මවන් ආමිකියා ශක්‍රයන් ඇතුළුවු දිව්‍ය පුත්‍රයෝ මහත්වූ සෝභායෙන් ආකාශයෙහි සිටයාහ. සිටානෝ එවිට එසේවිද මා ඉක්මවනනිසා ආසේක්ද සැබැව මෙතෙක් දවස දන්කඩකොට නුදුන්නෙමි මෙතැන්පටන් මා පැවත ආ දානය කෙරෙමි කියා ගිවිස්සේය. ශක්‍රයෝ බොහෝ මනුෂ්‍යයන්ට දන්පින්කොට අපසේම දිව්‍යලෝකයෙහි උපදවයි කියා අවවාදකොට ශක්‍රයන් ඇතුළුවූ දිව්‍යපුත්‍රයෝ තමන්ගේ දිව්‍යලෝකයටම ගියාහ. එතැන්පටන් කෝෂිය සිටානෝ පළමු නියාවට දන්හල් කරවා දානධ්‍යාශයකොට දිව්‍යලෝකයට ගියහයි වදාරා මේ බිළාර කෝෂිය ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බිළාරකෝෂිය සිටානෝ නම් දන් පින්කරන්නාවූ මේ භික්ෂුහුය. පංචශිඛ දිව්‍යපුත්‍රයෝ නම් ආනන්ද ස්ථවිරය, මාතලී දිව්‍යපුත්‍රයෝ නම් අනුරුද්ධ මහාස්ථවිරය, සූර්ය දිව්‍ය පුත්‍රයෝ නම් මුගලන් මහාස්ථවිරය.  එසමයෙහි චන්ද්‍රදිව්‍යපුත්‍ර නම් සැරියුත් මහාස්ථවිරය, එසමයෙහි ශක්‍රයෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# මට්ටකුණ්ඩලි ජාතකය

තවද සංසාර ප්‍රතිෂ්ඨාවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් පුත්‍රයෙකු මළසෝකයෙන් ඉන්නා උපාසකයෙකු අරභයා මේ ජාතකය දක්වනලදි.

ඒ කෙසේද යත්

එක්තරා උපාසකයෙක් තමාගේ පුතෙකුමළ සෝකයෙන් නොකා නොබි වික්‍ෂෙපව ඇයි පුත මට නොකියා පලාගියාදැයි කිය කියා බොහෝ වික්ෂේපයට පැමිණ ඇඳින් සිටියනොහි වැදහොත්තාහ. එක් දවසක් අළුයම් වෙලෙහි මහාකරුණා සමාපත්තීන් සමවැද ලොව බලා වදාරණසේක් ඒ කියන උපාසකයා සෝවාන් වන්ට නිසි හේතු ඇති නියාව දැක වදාරා සැවැත්නුවර සිඟාවළඳා පස්වරු භාගයෙහි අනදසාමින් පසුව මහණකොට එකියන උසාකයාගේ ගෙට වැඩිසේක. එකියන පුරුෂයාගේ ගෙයි මනුෂ්‍යයෝ සර්වඥයන් වහන්සේ වැඩ හිඳිනා ලෙස බුද්ධාසනයක් පණවා එකියන පුරුෂයා අතපය ඔලොම්බාගෙණවුත් සර්වඥයන් වහන්සේ ලඟඑැහ. සර්වඥයන් වහන්සේ ඇයි පුරුෂයා තා එක පුතෙකුට ඇඬුයේයයි වදාළ කල්හි එසේය ස්වාමිනි මාගේ ඇත්තේ එකපුත්‍රයාය. එසේ හෙයින් මට කීකරුය.එසේ හෙයින් සෝකයෙන් ඇඬිම් කියේය. එවිට සර්වඥයන් වහන්සේ පළමුත් බ්‍රාහ්මණයෙක් තොපසේම පුත්‍රප්‍රෙමයෙන් අඬා සෝකාතුරව උන් අවස්ථාවේත් උත්තමයන්ගේ බස්ගිවිස සෝකතුනිකළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සරවඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසෙක්.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ නුවර එක්තරා බ්‍රහ්මණයෙකුගේ පසළොස් හැවිරිදි අවස්ථානෙහි පුතෙක් මළ තැනැත්තේ දිව්‍යලෝකයෙහි උපන එකියන බ්‍රාහ්මණ තමාගේ පුත්‍රයාටා සෝකයෙන් අඬ අඬා නොකා නොබි දුක් විඳම දවස්පතා සුසුනා භූමියට ගොස් වට තුන්විටක් ඇවිද මහත්වූ දුකින් සොකාතුරව වාසය කරන්නේය. දිව්‍යලෝකයෙහි උපන් දිව්‍යපුත්‍ර මම මාගේ කුශලයෙන් දිව්‍යලෝකයෙහි උපනිම් මාගේ පියානෝ කෙසේ ඉඳින්දෝ හෝයි සිතා දිවැසින් බැළුයේය. තමාගේ පියානන් නිමින්ට සෝකයෙන් වලපිණා නියාව දැක තමාගේ පියානන් සුසානභූමියට යන්නාට පළමු වෙන් යෙමේ සිතා මට්ටකුණ්ඩලියාමෙන් සැරහි බ්‍රාහ්මණයන් සුසානභූමියට එන්නාට පළමුකොට දිව්‍යපුත්‍රයා සැරහී සුසාන භූමියෙහි සිටියේය. ඒ වෙලෙහි එකියන බ්‍රාහ්මණ තමාගේ පුත්‍රයා ගැණ අඬ අඬා සුසුන භූමියෙහි ආ තැනැත්තේ තමාගේ පුතාමෙන් සැරහි සිටි මට්ටකුඩලියා දැක බ්‍රාහ්මණ කියන්නේ මම වනාහි මාගේ පුත්‍රයාට සෝකයෙන් අඬමි තොපි වනාහි කවරේදැයි විචාළේය. එවිට මට්ටකුඩලි කියන්නේ මම දෙවතාවක්ම සත්රුවන් රථ මැදිරියක් ලදිම් ඊලන්ට රථසක් දෙකෙක් නැත්තෙන් සිටියෙමියි කීයේය. බ්‍රාහ්මණ තොපට රථසක්දෙක රත්රනින් රිදියෙන් යකඩින් මුතුයෙන් ලෝකඩින් මැනිකකින් කවරකින් ඉදිකරවා දෙම්දැයි කී යේය. එවිට මට්ටකුඩලි දිව්‍යපුත්‍රයාද කියන්නේ මාගේ රථ මැදිරිය ඉතා සෝභමානය එසේ හෙයින් අනික් රථයකින් මට ප්‍රයෝජන නැතහිරුමඬල සඳමඬල දෙක මට දෙවයි කීයේය. බ්‍රාහ්මණ කියන්නේ ඇයි මට්ටකුඩලිය තෝ උමතුවපියා දොඩවයිද හිරුමඬල සඳමඬල ඇරගෙණ තොප ගේ රථසකට දෙන්නේ කෙසේදැයි කීයේය. මට්ටකුණ්ඩලියා හිරුමඬල සඳමඬල නැගෙණ දිසාවටද බස්නා දිසාවටද යන අවදි පෙණෙන්නේය. එසේ වූ හිරුමඩල සඳමඩල මට දුන මැනවැයි කිම්ද උමතුව නන්දොඩම්ද තොපගේ මළාවූ පුතනුවන් කොතනක උපන් බවත් නොදැනෙන්නාවූ පුතනුවන්ට අඬන තොපිද උමතුව කියන්නේය. මම්ද උමතුව කියන්නේ නොවෙම් කියේය. බ්‍රහ්මණ කියන්නේ සැබෑව මට්ටකුණ්ඩලියෙනි කියන්නේ ඇත්තමය උමතුව දෙඩුයේ මම්මය. තෙල්කල සියගණන් වත්කොට දල්වන්නාවූ මහා ගින්නක් පැන්කල සියගණන් වත්කොට ගිණි නිවුවාසේ මාගේ සෝකග්නි නිවුනියා යහපත තොප මට කළ උපකාරය යහපතැයි ඉනිබ්බේ මාගේ පුත්‍රයාව සෝක නොකරෙමියි බ්‍රාහ්මණයා කියේය. එවිට මට්ටකුණ්ඩලිය දිව්‍යපුත්‍රයා කියන්නේ බ්‍රාහ්මණයාණෙනි මළවුන්ට සෝක කිරීමෙන් ප්‍රයෝජන නැත. තොපගේ මළාවූ පුතානම් මම්මයයි තමන් වහන්සේ දක්වා සෝක නොකරවයි බ්‍රාහ්මණයානන්ට අවවාද කියා දිව්‍යලෝකයට ගියේය. එකියන බ්‍රාහ්මණයාත් තමාගේ මළාවූ පුත්‍රයාට සෝකහැර දානාදි කුශලයන් රැස්කොට පරලොව ගියහ. මේ මට්ටකුණ්ඩලි ජාතකය පූර්වාපර සන්ධි ගලපා නිමවා වදාළසේක. එසමයෙහි මට්ටකුණ්ඩලි නම් දිව්‍යපුත්‍රව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# කාක ජාතකය

තවද ශාක්‍ය කුල චිත්තමාණික්‍යවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලෝභී භික්ෂූකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ලෝභිවූ භික්ෂූ කෙණෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේට පෑ ගමනේ සැබව ස්වාමිනි තෘෂ්ණා වශගයෙන් එඹා මහණෙනි මූ දැන්මතුනොවෙයි පළමුත් තෘෂ්ණා වශගයෙන් ඇත්කුණු අදීවූ නොයෙක්කුණු ඇතිව තිබැද්දී හිමාලයවනයට ගොදුරු සොයා ගියේ වේදැයි ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත් නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි මෙම නුවර කපුටුවෙක් ඇත්කුණු මිණිකුණු ආදිවූ දෙය කා ඉන් තෘප්තියකට නොපැමිණ ගොදුරු සොයා වනාන්තරයට ගිය තැනැත්තේ එක්තරා විලෙක වාසයකරන්නාහු සක්වාලිහිණි යුගලයක් දැක කියන්නා සක්වාලිහිණියුගල තොපගේ ශරීරවර්ණය හා පැහැපත යහපත් වුයේය. පෙට්ටියන් පලායින් කණයින් මුදුමස් ආදීවූ මාංශකන්නේවේද තොපගේ වර්ණය යහපත් වුයේයයි කීහ. සක්වා ලිහිණියෝ එවිට කියන්නාහු තොප කියන්නාවූ ගොදුරු අප කන්නේ නැති සෙවෙල් ආදීවූ දෙයයි කි කල්හි කවුඩුකියන්නේ තොප කීබස් අදහාගන්නේ නැත සෙවෙල් කා මෙසේ සෝභාවණී ඇතිවුකල මා කන්නේ  මනුෂ්‍යයන් කැවමනා එනු ඇඹුල් ලා පිසුමාළු ආදිවූ කැවුම් ආදිවූ රසභෝජනය මා කන්නේය. මා කෙසේවූ අවර්ණවුයේ කවර නිසාදැයි කීහ. එවිට සක්වාලිහිණි කියන්නේ තොප කවර කැවිලි කතක් හයින් කනහෙයින් හා කැවිලි තොපගේ හෘදය මාංශය උණුව තිබෙන හෙයින් වහාම දිරායෙයි නොයෙක් දෙනාගෙන් තොපට භය ඇතිහෙයින් කෑ කැවිලි ශරීරයෙහි ප්‍රත්‍යයට යන්ට නැතිව දා භස්මවන්නේය. අපට එසේවූ භයකුත් නැත. ඇමවෙලේ චිත්ත සන්තෝෂව තිබෙන හෙයින් ශරීරයේ ඡවිවර්ණයත් යහපත්වකෑ දෙයත් ප්‍රත්‍යය වන්නේය. අපට භයකුත් නැත. අපට විපාක කුමක් සිතුකෙණෙක් ඇත්නම් අන් තමන්ට විනා අපට වෙන අනාසයක් නැතිහෙයින් මෙසේ යහපත්ව වාසය කරම්හයි. වදාරා මේ කාක ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි කවුඩානම් මේ භික්ෂූහුය. එසමයෙහි සක්වාලිහිණි නම් යසෝධරා ස්ථවිරය. එසමයෙහි සක්වාලිහිණියා නම් බුදුවූ මම්මයයි වදාළසේක.

SANHIDA LANKA

# මහා මඞගල ජාතකය

තවද ශාක්‍යකුල තිලකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මහාමංගල සූත්‍රය අරභයා මේ ජාතකය දක්වනලද

ඒ කෙසේද යත්
එක් දවසක් ශාලාවෙක බොහෝ මනුෂ්‍යයෝ එක්ව උන්නාහ. ඉක්එක් මිනිසෙක් තමන්ගේ ගෙයි මගුල් ඇතැයි නැගී සිට පළාගියේය. එතන උන් මනුෂ්‍යයෝ කියන්නාහු මගුල් තමා කවරේදැයි කීහ. ඉන් එකෙක් කියන්නේ නැති කිරිදෙන බැමිණි දෙනක හා එලගිතෙල් හෝ වෘෂභයෙකු හෝ සුදුකුඩක් හෝ සර්වාභරණයෙන් සැරසුනාහු ස්ත්‍රීයෙක්, යනාදින් මෙකිදෙයින් යමක් දුටුහොත් මේ මගුලැයි කීය. එකෙක් එසේනොව ඇසින් දුටුදෙය මගුල් නොවෙයි නිදානැගී පුණ්‍යයයි කියාවත් වඩ්ඪයයි කියාවත් යන මේ ශබ්දයෙන් එකක් කනවැටිනි නම් මගුලැයි කීය. එකෙක් කියන්නේ කණට ඇසුනු දෙයක් මගුල්ද, ඒ මගුල් නොවෙයි යමෙක් නිදා නැගිසිට ගෙණ පොළොව අල්වා රත්‍රන් අල්වාද සුවඳ විලවුන් අල්වාද රේමස් අල්වාද මෙකීදෙයින් එකෙක් කෙළේවී නම් ඒ මගුලැයි කිය. මේ නියායෙන් මේ මනුෂ්‍යයෝ තුන්කොට්ඨාසයක්ව දිට්ඨමංගල්‍යය, සුගමංගලය, මුත මංගල්‍යයි, මේ මගුල් තුනින් මේ මගුල්යයි, විභාගයක් කොට දැනගතනොහී උනුත් විචාරා මනුෂ්‍යයෝද සදිව්‍යලෝකයෙහි දෙවියෝද සොළොස් බඹතලෙහි බ්‍රහ්මයෝද යන සියල්ලෝම තුන් කොටසක්ව බෙදී ගියාහ, එවිට ශක්‍රයෝ මේ මගුලැයි දෙව් මිනිසුන් සිතට නංවා කියාලන්ට අනික් කෙණෙක් නැත, සර්වඥයන් වහන්සේ කරාගොස් වැඳ බහුදේවා මනුස්සාව යනාදින් ගාථායෙන් මංගල ප්‍රශ්නය විචාළ ශක්‍රයන්ට සර්වඥයන් වහන්සේ අසේවනාද බාලානං යනාදි ගාථා දොළොසකින් එකමංගල්‍ය ප්‍රශ්නය විචාළ ශක්‍රයන්ට ගාථා දොළසකින් දෙතිස් මඟුල් වදාරා දෙවිබඹුන් ඇතුළුවූ සියල්ලවුන්ගේ සැක දුරුකොට මහමංගල ප්‍රශ්නය විසඳා වදාරා මංගල ප්‍රශ්නය අවසානයෙහි කෙල දහසක් සත්වයෝ රහත්ව අමාමහනිවන් දුටහ. සෙසු සෙදගැමි අනාගාමි සතරමග සතර එලයට පැමිණ සත්වයන්ගේ මෙතැකැයි පමණ නැත්තේය. එතැන්හි රැස්වූ භික්ෂූන් වහන්සේ දෙවිබඹුන් ආදිවූ බොහෝ සත්වයන්ට සැක උපන්නාවූ මංගල සූත්‍ර ප්‍රශ්නය සර්වඥයන් වහන්සේ විසඳා වදාළ නියාව ඉතා යහපතැයි කිය කියා උන් තැනට සර්වඥයන් වහන්සේ විසඳා වදාළ නියාව යහපතැයි කිය කියා උන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි පෙරත් දෙව් මිනිසුන් සිත සැක මුදා මේ මංගල ප්‍රශ්නය විසඳූයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්
යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මණ කුලයෙක බෝධිසත්වයන් වහන්සේ උපන්සේක. උන්වහන්සේට නම් තබන්නාහු රක්ඛිත කුමාරයෝ යයි නම් තුබූහ. ඒ බ්‍රාහ්මණ කුමාර වැඩිවිය පැමිණ පංචකාමයෙහි ආදිනව දැක හිමාලය වනයට ගොස් ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා තාපසවරුන් පන්සියයක් පිරිවරා වාසය කරණසේක. ඒ තාපසවරු ඒ රක්ඛිත තාපසයන්ට කියන්නාහු ස්වාමිනි තපස්කාලය ආසන්න හෙයිනුත් එනු ඇඹුල් සෙවුනා පිණිසත් ජිනචාර්යව පිණිසත් මනුෂ්‍යපථයට යම්හයි කීහ, රක්ඛිත තාපසයෝත් යහපතැයි අවසර දුන්හ. ඒ තාපසවරුත් අවසර ගෙණ නියම්ගම් රාජධානිවල ඇවිද බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ගේ උයනේ වාසය කරන්නාහ. එසමයෙහි පළමු මංගල සූත්‍රයෙහි ක්‍රමයෙන් බරණැස් නුවර දඨමංගල සුතමංගලය, මුතමංගලය, යන තුන්දෙනෙක් මගුල් කාරණා කියා ඇවිදිනා මම කථාව නුවර ප්‍රකාශ කොට රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ මගුල් විභාගකොට ගතනොහී ඉඳිනාහු තමන්ගේ උයනට තාපසවරු ආනියාව අසා තාපසවරුනම් මහානුවන ඇත්තාහ. මේ මංගල ප්‍රශ්නය විචාරමි උයනට ගොස් තාපසවරුන් වැඳ එකත්පස්ව සිට මේ කාරණය විචාළාහ. තාපසවරු කියන්නාහු මේ මංගල ප්‍රශ්නය අපට නොදැනෙයි අපගේ ආචාරීවූ රක්ඛිත තාපසයන් වහන්සේ හිමාලයවනයෙහි වාසයකරන්නාහ. උන් වහන්සේ ප්‍රශ්න විසඳා වදාරණ සේක.. ඔබයවයි කිහ. රජ්ජුරුවෝ කියන්නාහු හිමාලවනය නම් ඉතාදුරය අපි යානොහෙම්හ නුඹ වහන්සේලා ගොසින් විචාරා එන්නේ යහපතැයි කිහ. රක්ඛිත තාපසයෝත් තාපසවරුන්ගේ දුක් සැප විචාරා ඉක්බිති තාපසවරුන් පන්සියයකට ජ්‍යෙෂ්ට තාපසයෝ තාපසයන් වැඳ නමිනව සිට තමන්ගේ ආචාරීවූ රක්ඛිත තාපසයන් අතින් විචාරන්නාවූ දිඨමංගලය. සුතමංගලය, මුතමංගලය, මගුල් තුණක් කියති මේ මගුල් තුනින් කවර මංගල්‍යයක් කළකල ඉහලෝක දෙකින් වැඩ සැප දෙන්නේය. මේ මගුල් තුනින්වත් මේ හැර අනික් මංගල්‍යයකින් වත් වැඩ එලවන්නේත් සුවදායක වන්නේත් මෙසේවූ මංගල්‍යයෙකිනැයි වදාළ මැනවැයි රජ්ජුරුවන් කළ ආරාධනා තාපසයන්ට කිහ. එවිට රක්ඛිත නම් තාපසයෝ කියන්නාහු එඹල දිව්‍යපුත්‍රයන්ටද තමන්ගේ දෙමව්පියන්ටද තමාකෙරෙහි වෛරව ඉඳිනා සත්වයන්ටද මෛත්‍රී කරන්නාවූ

SANHIDA LANKA

සත්වයෙක් ඇත්නම් එසේවූ තැනැත්තවුන්ට මෙලොවින් වැඩ සාදන්නේය. මේ උතුම් මගුලැයි කියා තවද කියන්නාහු එඹල යම්කෙණෙක් නිබඳ තමාට වැඩිතරම්ව සිට ආක්‍රොශ පරිභව බෙණේද එසේ වූ තැනැත්තවූ කෙරේ ක්‍රෝධනොව ඉවසාදඑසේවූ පුරුෂයාට මේ ලොව පරලොව දෙකින් වැඩසැදෙන්නේය. මෙයින් එක් උතුම් මංගල්‍යයෙකැයි නැවත කියන්නාහු එඹල යම් කෙණෙක් මේ නිවය මුට යටතැයි නොසිතා ඌ දන්නාවූ යම් ශාස්ත්‍රයක් ඉගෙණගණිද ඌ කෙරේ අහංකාර නොවේද හෙලා නොකෙරේද එසේවූ පුරුෂයාට මෙලෝ පරලෝ දෙකින් වැඩ සැදෙන්නේය, මෙයිත් එක් උතුම් මංගල්‍යයෙකැයි කියා නැවත කියන්නාවූ යම් මිත්‍රයෝ නම් මෙලොව පරලොව දෙකින්ම සුව නොඑල වන්නාවූ අසත්පුරුෂ මිත්‍රයන් හැර සජ්ජනවූ මිත්‍රයන් හා හජනය කිරීම් නම් මෙලෝ පරලෝ දෙකින් වැඩ දෙන්නේය.

එසේවූ මිත්‍රයන් ඇතිවිමක් උතුම් මංගල්‍යකැයි කියා නැවත කියන්නාහු එඹලය නම් ස්ත්‍රියක් තමා හා සමවූ වයස් ඇත්තීය යහපත්වූ රූප ශ්‍රී ඇත්තීය. වංක නැත්තිය, ආචාර ශිලයෙන් යුක්තද පතිවෘතා ධර්මය, රකිද එබඳුවූ ස්ත්‍රිය පාදපරිචාරිකාව ලබන්නාවූ පුරුෂයාට මෙලෝ පරලෝ දෙකින් වැඩසැදෙන්නේය. මෙයින් උතුම් මගුලැයි කියා නැවත කියන්නාහු එඹල යම් භූමිකම්පාලවූ රජදරුවන්ට යම් අමාත්‍යයෙක් රජ්ජුරුවන්ට අභිප්‍රාය ක්‍රියාව ඉහලොවින් පරලොවින් වැඩ පසස්නා කටයුතු කියාද වැඩෙහි හැසිරේද එසේවූ තෙනැත්තවුට මෙලෝ පරලෝ දෙකින් වැඩ සැදෙන්නේය. මෙයිත් එකමංගල්‍යයෙකැයි කියා නැවත කියන්නාහු යම් තපස්විකෙණෙක් ආචාරශිලයෙන්ද පංචශිල අෂ්ටාංග ශිලය කෝටියක් සංවරශිලය යනාදිවූ අර්හත් මාර්ගයෙන් රහත්වන්ට නිසිවූ ක්‍රම දනින්ද මෙයිත් උතුම් මංගල්‍යයයකැයි කියා මේ මංගල ප්‍රශ්නය අරහන්ත දේශනාවන් කුළුගෙණ එඹාතාපසවරුණි මේ අටකාරණයෙන් දවස් අරණ යම්කෙණෙක් ඇත්නම් ඉහලෝක පරලෝක දෙකින්ම වැඩ සැදෙන්නේ යයි ඒ තාපසවැරන්ට බණවදාරා දිට්ඨමංගල්‍යය ශතමංගල්‍යය මෘත මංගල්‍යයි කියන ලද මගුල් බ්‍යර්ථය, ඉන්වන ප්‍රයෝජනයෙක් නැත. මගුල් නම් මේයයි කිසේක තාපසවරු කීපදවසක් රඳා බරණැස් නුවරට ගොස් උයනේ සැතපුනාහ. රජ්ජුරුවෝ තාපසවරුන් ආනියාව අසා සමෘධිව උයනට ගියාහ. තාපසවරු බෝධිසත්වයන් කී ලෙසම මංගල්‍ය කාරණයන් විස්තර වශයෙන් කියා බොහෝ මනුෂ්‍යයන් සිතට නංවා හිමාලවනයට ගියාහ බරණැස්නුවර වාසීන් හා රජ්ජුරුවෝ තාපසවරුන් කීසැටියේම දවස් යවා මිය දිව්‍යලෝකයට ගියහයි වදාරා මේ මංගල ජාතකය නිමවා වදාල සේක එසමයෙහි තාපසවරුන්නම් දැන් මේ බුදුපිරිසය ජ්‍යෝෂ්ට අතවැස්සානෝ නම් ශාරිපුත්‍රස්ථවීරයෝය රක්ඛිත තාපසයෝනම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක

SANHIDA LANKA

# ඝත ජාතකය

තවද ශාක්‍ය කුල කල්පදා මවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පුත්‍රයෙකු මළ පියෙකු අරභයා මේ ජාතකය වදාරන ලද
ඒ කෙසේද යත්
මෙහි වර්තමාන කථාව මට්ටකුණ්ඩලී ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය මෙහි වනාහි පෙර උත්තමයෝත් කී අවවාදයෙහි පුත්‍ර සෙනෙහය ඇත්තෝ පවා සෝක සන්හිඳුවා උන්නෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක
ඒ කෙසේද යත්
යටගිය දවස උත්තරාපථයෙහි කංසභෝග නම් රට අසිතජ නම් නුවර මහා කංසනම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ කංසය උපකංසයයි පුත්තු දෙන්නෙක් ඇත්තාහ. දේවගර්භා නම් දියනි කෙණෙක් ඇත්තාහ. ඒ දියනියන් උපන්ගමනෙම නැකැත් කියන්නාවූ බමුණෙක් ලක්ෂණ දැක කියන්නාහු මේ කුමාරි නිසා මේ රාජවංශය නස්නේය. දූන්ම නසාපුවොත් යහපතැයි කීහ. එවිට රජ්ජුරුවෝ මේ මාගේ දුවනියන් රාජ්ජයට පැමිණිකල නසතත් වචනත් උගම දනිති මම නොදනිමි සෙනෙහයෙන් ඒ කස්ථ මහා මාලිගාවක් කරවා අඩ වෙනහු නම් කොල්ලා නන්දගෝපාල නම් කොල්ල හා දෙන්නා අත්පා මෙහෙකරන්නට සැලැස්වූහ. එවිට කල්යාමකින් මහාකංස රජ්ජුරුවෝ මළහ. උන්ගේ වැඩිමහළු පුත්‍රවූ කංස නම් කුමාරයෝ රාජ්ජයට පැමිණ තමන්ගේ මලනු වන් යුවරජතනතුරෙහි තබා පළමු බ්‍රාහ්මණයන් නැගනියන් නිසා රාජවංශය නසති කිවාදන දනත් නැගනියන්කෙරෙහි සෙනෙහයෙන් නොනැසුනාහ. ඉක්බිති උත්තරා මධුරා නම් නුවර මහාසාගර නම් රජ්ජුරුවෝ රාජ්ජ්‍ය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ සාගරය උපසාගරයයි දරුවෝ දෙදෙනක් ඇත්තාහ. මහා සාගර නම් රජ්ජුරුවන් මළපසු සාගරනම් කුමාරයෝ රාජ්‍යයට පැමිණි තමන් මළනුවන් උපසාගර නම් රාජකුමාරයන්ට යුවරජතනතුරු පැමිණ උපසාගර නම් කුමාරයෝ තමන්ගේ බෑනන් වහන්සේගේ අන්තඃපුරයට වැරද ගියහ. සාගර නම් රජ්ජුරුවෝ තමන්ගේ අන්තඃපුරයට මලනුවන් වැරදගිය ගමනේ එහුබඳවාගත්හ, උපසාගර කුමාරයෝ  අසිතජ නම් නුවරට ගොසින් එකසථමහා මාලිගාව දැක මේ කාගේ මාලිගාවෙක්දැයි විචාළගමනේ දේවගර්භ නම් බිසවුන් විසින් ඉදිනා එකමාලිගාවයයි අසා නම ඇසූ පමනෙම්ම ප්‍රතිබද්ධ වූ සිත් ඇති නන්ද ගෝපාල නම් කෙල්ල සමීපයට ගොස් කථාකොට බිසවුන් පොළඹවා ගත්තාහ. රාජ කුමාරයෝ දේව ගර්භා නම් බිසවුන් හා ප්‍රතිබද්ධව එක් උනායෙන් දරුගර්භයෙක් ඇති විය. එපවත් රජ්ජුරුවන් හා යුව රජ්ජුරුවෝ අසා නැගනියන් කෙරේ සෙනෙහයෙන් උන්ට උත්තර නොකියා පිරිමිපුතෙක් උපනිම් නම් මරම්හ ගෑනුදුවක් වී නම් නොනසන්ට යයි කියා උප සාගර කුමාරයන්ට සෙනෙවිරත් ධුරය දී තමන්ට සේවාකම් කරන්ට සලස්වා නැගනියන් උන්ට පාවා දුන්නාහ. දේවගර්භා නම් බිසව් නොබෝකලකින් දුවනි කෙණෙකුන් වැදුහ. රජ්ජුරුවෝ දෙන්න අසා සමාධිව අංජන දේවියයි නමකුත් තබා ගෝවර්ධන නම් නමකුත් දුන්නාහ.
ඒ නුවර එක් දිසාවෙක ගංගාවය. එක් දිසාවෙක පර්වතය, එක් දිසාවෙක සමුද්‍රය, ඒ නුවර ගන්ට යම් සතුරුකෙණෙක් අවුනම් ඒ නුවර පවුරුපිට යක්ෂණියෙක් සිට කොටළුවේෂයෙන් අඬළුගමනේම නුවරත් පැති ආකාශයට හෝ පැණ නැගී සමුද්‍ර මධ්‍යයෙහි හෝ ගොසින් සිටින්නේය.එසේ හෙයින් සතුරු කෙණෙකුන් විසින් ඒ නුවර ගතනොහැක්කැයි කීප මුරයෙක උත්සාහකොටත් චාරවතී නුවරට අරගතනොහි පලාගොස් එපවත් කණ්හදීපායන තපසයන්ට කීහ. එවිට තාපසයෝ ඒ නුවර ඇරගන්ට උපාය පරීක්ෂාකොට කී ගමනේ යහපතැයි කියා දසබෑයෝ ගොසින් කොටළුවාට කියන්නාහු තොපි නොහඬව මේ නුවර ඇරගන්ටයයි කීහ.කොටළු කියන්නේ මා නොහඬන්ට බැරිය. මම උපායක් කියාලම් මිනිස් පමණක් උස යානාරාසන සතරයක් ඉදිකරවා වාසල් සතරේ පිටත බිම ඉදුවා එලිපතුවල කඹලාලා බදවන්නාවු නුවර නොයෙයි මේ නියාවට නුවර ඇරගෙණ ඒ නුවර ඉඳ තෙසැට දාසක් රාජධානි සාදා දසබෑයෝ දස කොටසක් බෙදා රාජ්‍යය කරන්නාවූ ඒ අවධියෙහි මනුෂ්‍යන්ට විසිදාසක් අවුරුද්දට ආයුෂ ඇතිවිය. දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරණ සමයෙහි අපගේ බුහුනනියන් වහන්සේට කොටසක් දුන්නේ නැත උන්ටත් කොටසක් දෙන්ට උවමැනවැයි කියා එකොළොස් කොටසක් කොට බෙදා දෙම්හයි කීහ. එවිට බාල අංකුර රජ්ජුරුවෝ කියන්නාහු මාගේ කොටස දෙමි නුඹ වහන්සේලාගේ රාජ්‍යයේ වෙළඳාම් ආදීවු දෙයක් කොට රැකෙම් සුංගම් චිවරක් ඇරෙන්නා පමණකැයි කීයා අරවාගෙණ ඒ නියාවට සලස්වා තමන්ගේ බෙත්මරට අංජන දේවීන්ට සලස්වා අංකුර රජ වෙළෙදාමෙන් වැඩෙයි වාසුදේව රජහුගේ කුමාරකෙණෙක් මළහ. උන් මල සෝකයෙන් නොකා නොබි මහත්වූ සෝකයෙන් ඉදිනාහ. සන්හිඳුවාලන කෙණෙක් නැති හෙයින් ඝතනම් පණ්ඩිතයෝ ඒ සෝක සන්හිඳුවම් සිතා තුමූ අපස්මාර උනුකෙණෙකුන්මෙන් වියරුවෙස්ගෙණ ආකාශය බලාමට සාවෙකුදෙන්ට කිය කියා මුරගානේය. එවිට රෝහිනි නම් අමාත්‍යයා වාසු දේවනම් රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නේ රජ්ජුරුවන් වහන්ස නුඹ වහන්සේගේ මලනුවෝ වියරුවැටි ඒ ඒ තැනවිථියේ ඇවිදිති කීයේය.

SANHIDA LANKA

එපවත්  රජ්ජුරුවෝ අසා එවිට පුත්‍රසෝකය හැරී මාගේ මලනුවෝ කොයිදැයි කියා විරීයෙහි ඒ ඒ තැන ඇවිදිති දැක සිපගෙණ කියන්නාහු මලනුවෙනි තොපි කෙසේවූ  සාවකුද තොපි වියරුවැටී සාවෙකු දෙවයි කියන්නේ රත්රණින් රිදියෙන් මුත්තෙන් මැණිකෙන් යකඩින් තඹකඩින් පබුළුවෙන් සාවෙකුද නොහොත් බැද්දේ ඉඳිනා සාවෙකු දෙන්ටයයි කියා වාසුදේව රජ්ජුරුවෝ විචාළාහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු මම එසේවූ සාවෙකුට බැද්දේ ඉඳිනා සාවෙකුට වියරුහුනුයෙම් නොවෙමියි, චන්ද්‍රයා මධ්‍යයෙහි තිබෙන සාවාටය උත්සාහ කරන්නේයයි කීහ. එපවත් රජ්ජුරුවෝ අසා මුන් වියරුවැටුනේ සැබැව ජීවිතය නුමුත් අරගත නොහැක සාවාට මුන් උත්සාහකොට වියරු වැටුනේ සැබෑවයි සිතා කියන්නාහු මළනුවෙනි තොපි නුවනැති තැනැත්තන් මෙසේ කියන්නේ කවර නිසාද කෙසේ තෙපි කීවත් චන්ද්‍රයා මධ්‍යයේ තුබූ සාවා ඇරගත නොහැක්කැයි කීහ. ඝත පණ්ඩිතයෝ කියන්නාහු රජ්ජුරුවන් වහන්සේ පෙණෙන්නාවූ චන්ද්‍රයා මධ්‍ය යේ තිබූ සාවා ඇරගත නියාවට දෙස් නුඹ වහන්සේට කීසේක් වෙද එසේකල පෙණෙන සාවා ඇරගත නොහැකි කල නුඹ වහන්සේගේ මළාවූ පුතනුවෝ කෙසේ එද්දැයි උන්නිසා නොකා නොබී සෝකයෙන් ඉන්ට කාරණා කවරේදැයි කීහ. එබස් අසා වාසුදේව රජ්ජුරුවෝ එසේද කී සේක් වෙද මලනුවෙනි මාගේ පුත්‍රශෝකය අරවන නිසා මේ වියරු වෙස්ගෙණ කළ උපායද මාගේ පුත්‍රශෝකය නැමති වඟ්නිය බොහෝ තෙල්කල වත්කොට ඇවිලෙන ගින්නට පැන්කල දහස්ගණන් වත්කොට නිවුවාසේ නිවිගියේය. මාගේ පුත්‍රසෝකය නැමති සල්ලයමාගේ හෘදයේ වැදගත් හලනියාව ඉතා යහපතැයි මෙතැන් පටන් මාගේ පුත්‍රශෝකය අරිමිකියා එතැන් පටන් සෝක නොකොට ඝත පණ්ඩිතයන් කී අවවාද සිත තබාගෙණ රාජ්ජය කරන්නාහ. එසමයෙහි දසබෑ රජ්ජුරුවන්ගේ රාජකුමාරවරු එක්ව කෙළි නාහු උනුන් හා කථාකොට කන්හදීපායන තාපසයන් වහන්සේ දිවැස් ඇතිසේකැයි කියා අසන්නේය. ඒ අපට පරික්ෂාකරන්ට උවමැනවැයි ඉන්ම රූ ඇති රාජ කුමාරයකෙණෙකුන් ස්ත්‍රී පළඳනා සරහා බඩපිළිබැඳ දූරි ඇති නියාවට සලස්වාගෙණ ගොසින් කියන්නාහු තාපසයන් වහන්ස නුඹ වහන්සේ දිවැස් ඇතැයි කියා අසන්නේය. මේ කුමාරිකාව දූරි ඇතිය මුන්ගේ බඩදරුවෝ පිරිමිද ගැනුදැයි විචාළේය. එවිට තාපසයෝද මුන්ගේ බඩ කිහිරි ගැටයක් ඇතිව ඒ උන්ගේ බඩින් වැටෙයිදැන රාජකුමාරවරුන්ට කියන්නාහු මුන්ගේ බඩ ගෑනු දරුවන් කිම් පිරිමිදරුවන් කිම් තොපට ඇයි දැයි තාපසයෝ කීහ. එවිට රාජ කුමාරවරු අපට තත්වූ පරිද්දෙන් කියන්ට උවමැනවයි කියන්නාහු තමන්ට මරණ කවරදා පැමිණේදැයි පරීක්ෂා කළාහු එමදා පැමිණෙන නියාව දැක එසේ වීනම් තත්වූ පරිද්දෙන් කියමි සිතා මුන්ගේ බඩ කිහිරි ගැටයක් ඇත. ඒ කිහිරිගැටය සත්දවසකින් වදති ඒ වැදූකල මුන්ගේ රාජවංශයට විනාශ පැමිණේයි ඒ කිහිරි ගැටය වනලා කොටා ධූලිකොට දවා අළුකොට දියෙහි ලා පියවයි තාපසයෝ කිහ. එවිට කුමාරවරු මේ තාපසයෝ මහකූට තාපසයෝය, පිරිමිත් දරුවන් වදද්යි කියා අතින්පයින් තළා මැරූහ. එවිට දසබෑ රජ්ජුරුවෝ තාපසයන් මැරූ නියාව අසා හයින් ත්‍රස්තව රාජ කුමාරවරුන් ගෙන්වා විචාළගමනේ තාපසයන් කී නියාව තත්වූ පරිද්දෙන් කීහ. රජ්ජුරුවෝ එපවත් අසා රාජ කුමාරවරුන්ට ර කවල්ලවා උන්කලට සත්වෙනි දවසින් ඒ රාජ කුමාර කිහිරි ගැටය වනලාකොට දවා අළුකොට ගඟට දැමුහ. ඒ දැමු අළු ගඟහලින් ගොස් එක් ගල්හස්සෙක සුඟක් වැලි මුසුව රැඳි ගියේය. එතන බේරු පඳුරෙක් ඇතිවුහ. රාජකුමාරවරු නොබෝ දවසකින් ගඟට දියකෙළියට  ගියාහු දියකෙළිමින් සිට උනුන් හා ඩබරක් වී ඒ ඩබර මහත්විය. ඒ ඩබර රජදරුවෝ එක්ව ගිහාය. ඒ රාජකුමාර වරුන්ගෙන් එක්කෙණෙක් ගඟ අස තිබූ බේරු පඳුර දැක බේරු පඳුරෙන් දඬික් කඩාගත්හ. ඒ කැඩු බේරු පඳුර කිහිරිදණ්ඩ විය. ඒ ඇරගෙණ ගැසූහ. සෙසු රජ දරුවෝත් ඒ බේරු පඳුරෙන් අතුකඩා ගෙණත් කිහිරිදඬුවිය, පත්‍ර කඩාගත්තන් කිහිරි දඬුවිය. මේ නියායෙන් කිහිරි දඬුගෙණ උනුන් මරා ජීවිතක්ෂයට පැමිණවුහ. ඉන් ගැලවුනාවූ වාසුදේව රජ්ජුරුවෝය. බලදේවය, අඤ්ජනදේවිය, පුරෝහිත බ්‍රාහ්මණයාය, යන මේ සතර දෙන රථයකට නැඟී නුවර තැනකට යන්නාහු කාලමුත්ති නම් වනයට පැමිණියාහ. බලදේවයන් හා මල්ලව අල්වා මළාවූ මුෂ්ටි නම් මල්ලවයා ඒ වනයෙහි රාක්ෂසව උපන්නේය. මාගේ සතුරා කවර දවසෙක මරම්දෝහෝයි සිත සිතා උන් තෙනට වාසුදේව රජ්ජුරුවන් නැඟී රථය පැමිණියේය. මුෂ්ටි මල්ලව බලදේවයන් දැක මල්ලව වේශයෙන් අවුත් අත් පොලසන්දී මල්ලවයාට සිටියේය. බලදේවයෝ ඔහුදැක මල්ලව අල්වමි රථයෙන් බස්නට වන්කල වාසුදේව රජ්ජුරුවෝ මල්ලව අල්වයි වලක්ව වලක්වා කියදිත් නොවැලක මල්ලව අල්ලන්ට බැසපු කලට රාක්ෂසයා බලදේවයන් අල්වාගෙණ උණ කිළිල්ලක්සේ සපාකාපිය, වාසුදේව රජ්ජුරුවන් හා අඤ්ජන දේවින් හා බ්‍රාහ්මණයා හා තුන්දෙන රථයට නැඟී අනික් ගමකට ගොස් රජ්ජුරුවෝ තුබූ බැද්දට වැද තුමු ඉනකඩින් ඉසවසාගෙණ තනට  වසාගෙණ අඤ්ජන දේවින් හා බමුණාත් බත් පිසගෙණ එන නියායෙන් යවුහ.

SANHIDA LANKA

ඒ ගම ජරා වැද්දෙක් දඩයමට ගිය ගමනේ ඌරෙකැයි සිතා තෙබින් ඇතිකලට මිනි සෙකු නියාව දැන හයින් ත්‍රස්තව දිවන්ට වන්කලට නොයව නොබවයි තමන් ලඟට ගොන්වාගෙණ තාගේ නම කිම්දැයි විචාළ ගමනේ ජරා නමැයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු එඹල මාගේ ජාතකයෙහිති ජරා නම් එකෙකු අතින් ඇන්මක් කා මියති කීහ. එසේ හෙයින් නොබවයි කීයා රඳ වාගෙණ ඌ ලවාම තෙබ අද්දවා බේත් බඳවාගෙණ උන්කලට අඤ්ජන දේවින් හා බ්‍රාහ්මණ ආයේය. එවිට රජ්ජුරුවෝ කියන්නාහු මට මරණ

මෙතනදී නියමයයි එපවත් කියා තෙපි දෙන්න යම් තැනක ඉඳ රැකෙවයි කියා උන් හැම රක්නා විචරට ශාස්ත්‍රයක් උගන්වා යවා තුමු එතනම මළහ. එම්බා මහණෙනි මෙතෙක් රජ දරුවන්ගෙන් ගැලවුනේ අඤ්ජන දේවිමය. වදාරා මේ සත ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රෝහිනි නම් අමාත්‍ය ආනන්ද ස්ථවිරය. එසමයෙහි වාසුදේව නම් රජ ශාරිපුත්‍රස්ථවිරයෝය. එසමයෙහි සනපණ්ඩිතයෝව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මාති පොසක ජාතකය

තවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වැඩ වසන්නාවූ සර්වක්ලේශයන් සර්වාකාරයෙන් නැසුවාසූ සියළු පදාර්ථනයන් සවයම් භූඥාණයෙන් දත්තාවූ සර්වඥයන් වහන්සේ විසින් දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වර්ථමාන කථාව සාම ජාතකයෙහි විස්තර වශයෙන් කියනලද එපරිද්දෙන්ම සර්වඥයන් වහන්සේ තමන් සමීපයට ඒ මාතුපෝසක භික්ෂූන් වහන්සේ කැඳවාගෙණ ආවාවූ භික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කොට වදාරණසේක් එම්බා මහණෙනි ඒ භික්ෂූන්ට නින්දා නොකරව. පුරාතනයෙහි තිරිසන්ව උපන්නාවූ පවා මෑනියන්ගෙන් වෙන්වූවාහු සතියක් මුළුල්ලෙහි නිරාහාරව වියලෙන්නාවූ රජදරුවන්ට සුදුසුකොට එලවන ලද ආහාරය ලැබත් මෑනියන් ඇරපියා අනුභව නොකෙරෙමි කියා මෑනියන් දැක ගොදුරු කැවෝ වේදැයි වදාරා එක්තරා භික්ෂූකෙණෙකුන් වහන්සේ විසින් ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි අප මහ බෝසතාණෝ හිමාලය වනයෙහි ඇත් කුලයක ඉපද සර්වාංගය ධවලව විශිෂ්ට රූපයක් ධරන්නාවූ අසූදහසක් පමණ ඇත්තු නිරන්තරයෙන් පිරිවරන්නාහ. මහබෝසතාණන්ගේ මෑනියෝ ඇස් අන්ධවූයේය. එකල බෝධිසත්වයෝ මිහිරිවූ පලාඵල ඇතුන් අතට කඩා දී මෑනියන් සමීපයට යවන්නාවූ ගෙණයන්නාහු ඇත්තු තුමූ තුමූම අනුභවකොට පියාගෙණගොස් නොදන්නාහ. ඒ මහබෝසතාණෝ පරීක්ෂා කොට ඒ බව දැන ඇත්සමූහයා ඇර මාගේ මෑනියන් මම්ම පෝෂ්‍යය කෙරමි කියා රාත්‍රියෙහි සෙසු ඇතුන්ට නොහගවා මෑනියන් කැඳවාගෙණ චින්ඩෝර නම් පර්වත පාදයට ගොස් එතන හුණුපඳුරක් සමීපයෙහි පිහිටියාවූ ගල් ගුහාවෙක මෑනියන් රඳවා නිරන්තරයෙන් පලාඵල ගෙණවුත් පෝෂ්‍යය කරන්නාහ. එකල බරණැස් නුවර වසන්නාවූ වැදිපුත්‍රයෙක් වලට වැද මන්මුළාවූයේය. දික්නියවයක්කොට නොහෙන්නේ මහහඬින් ඇඬූයේය. මහබෝසතාණෝ ඔහු ඇඬූ අඬ අසා මේ පුරුෂතෙම අනාථයකින් මා වැනි එකෙකු විද්‍යාමානව සිටියදී මියගියේ වී නම් සුදුසු නොවන්නේයයි ඔහු කරා ගොස් තමන් දැක භයගෙණ යන්නාවූ විට එඹල පුරුෂය මා නිසා තට භයක් නැත්තේ යයි ඔහු රඳවා තෝ මේ වනයෙහි කුමක් පිණිස අඬා ඇවිදීදැයි විචාරා ඔහු විසින් ස්වාමිනි මන් මුළාවූයේ අදට සතියෙකැයි කී කල්හි මහබෝසතාණෝ එඹල පුරුෂය, තොපට භයෙක් නොකොට ගෙණ ගොස් මනුෂ්‍යාපථයෙහි පිහිටුවාලමි කියා ඒ මිනිසා පිටට නන්වාගෙණ වලින් මගට බාවා මහබෝසතාණෝ නැවත වල්වන්නාහ. පාපී වූ ඒ පුරුෂයාද මම නුවරට ගිය කල්හි රජ්ජුරුවන්ට කියමි සිතා තමායන්නාවූ මහවෘක්ෂයෙන් හා පර්වත සලකුණු පරීක්ෂාකොට ගෙණගියේය, එකල බරණැස් රජ්ජුරුවන්ගේ මඟුලැතා වැටුනේය. රජ්ජුරුවෝද ඒ දවස් නුවර බෙරලවන්නාහු ඉදින් යම් කෙණෙක් කොතනක මගුලැත්කමට සුදුසු ඇතකු දුටුවා වීනම් කියවයි නුවර බෙරලැවූහ.

එසඳ ඒ පුරුෂතෙම රජ්ජුරුවන් කරා ගොස් දේවයන් වහන්ස නුඹවහන්සේට ආරෝහනයට නිසි සර්වාගධවලවූ ඇත් රුවන් එවා ගෙන්වාගත මැනවැයි කීහ. රජ්ජුරුවෝ යහපතැයි ඔහු හා කැටිව ඇතරුවන් එවා ගෙන්වාගත මැනවැයි කීය. රජ්ජුරුවෝ යහපතැයි ඔහු හා කැටිව ඇතරුවන් යැවූහ. ගියාවූ ඇතරුවෝ ඔහු සමඟ ගොස් බෝධිසත්වයන් විසින් පියුම් විටල ගොස් අනුභව කරන්නවුන් විසින් දුටහ. බෝධිසත්වයෝද ඇතරුවන් දැක මට මේ උපන්නාවූ භව අනික් කෙනෙකුන් නිසා උපන්නෝ නොවෙයි මා විසින් මනුෂ්‍යාපථයට පමුණුවා සංග්‍රහ කරණ ලද පුරුෂයා සමීපයෙන් උපන්නේය. මම වනාහි හස්තින් දහසක් දෙනා බිඳුවා පියනතරම් මහ බල ඇත්තෙම් ඉදින් මම කිපියෙන් වන්නම් බලවාහණ සහිතවූ සියළු රාජ්‍යය නසාපියන්ට සමර්ථයෙමි එසේම කිපි යෙන් චින්නම් මා විසින් රක්ෂා කරණ ලද ශීලය බිඳෙන්නේය. එසේ හෙයින් මේ සත්වයෝ අද මට ශස්ත්‍ර අඩයටිවලින් කොටන්නමුත් නොකී පෙමි සිතා අධිෂ්ඨානකොට ගෙණ කරබා නිශ්චලව සිටියාහ. එකල ඇත රුවෝද පියුම්විලට බැස මහබෝසතාණන් ලක්ෂණ සමුර්ධිය දැක මෙසේ එව දරුවයි කියා රිදී දමකට බඳුවූ සොඬ අතින් අල්වාගෙණ නික්ම සත්වෙනි දවස් බරණැස් නුවරට පැමිණියෝය. බෝධිසත්වයන්ගේ මෑනියෝ පුතනුවන් නොයන හෙයින් මාගේ දරුවන් රාජ රාජාදී මහ අමාත්‍යයන් විසින් ගෙණයන ලද්දේවන දැන් මාගේ දරුවන්ගේ වියෝගය මේ වන ලැහැබ වැඩෙන්නේයයි කියමින් අඬන්නාහු මෙසේ කියත් මේ දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ ඇත්රජ්ජුරුවන්ගේ බැහැරයාමෙන් මේ වන යෙහි හිසළු කිළිඳු කනේරු ආදිවූ අනේකප්‍රකාර පුෂ්පජාතිහු අතු පතු නොකැඩීමෙන් සලෝලව වැඩී සිටිනාහ. වන නෙළුම් අලගොඩ මහ මූ කිනි හිරි ආදීවූ වෘක්ෂජාතිහුද අතමුල අතුපතරත් නොකැඩීමෙන් මනාව හටගෙණ මලින් සැදිසිටිනාහුය. යම් බඳුවූ මා පුතනුවන් පිට උන්නාවූ රජයුවරජ ඇමති ආදීවූ අය නිර්භිතව පස මිතුරන් බිඳ මරා රාජ්ජය ගන්නාහ. සවර්ණාලංකාරයෙන් සැරහුනාවූ එබඳු රාජ රාජ මහා කුමාරාදිහු තමන්ගේ පරසතුරන් සාදුන්

SANHIDA LANKA

හෙයින් සතුටුව රජ්ජුරුවන්ගේ මෙහෙ නිමවන ලද රසමලවුලෙන් යුක්ත කොට සමුර්ධි කරණ ලද උතුම් භෝජනයෙන් පෝෂ්‍යය කරන්නේ වේදැයි යනාදින් කියමින් අඬන්නාවුහ. බෝධිසත්වයන් ගෙණ යන්නාවූ ඇත්රුවෝද ඇත්රජ්ජුරුවන් ගෙණන නියාව රජ්ජුරුවන්ට කියා යවුහ. රජ්ජුරුවෝද නුවර අලංකාර කොට සැරසවුහ. එකල හස්ත්‍යාචාරීහුද මහබෝසතානන් ගෙණ නුවරට වැද පිරිබඩගෙණ සරහා පිළියෙල කරණලද ඇත්හලට ගෙණගොස් සිටුවා විසිතුරු තිරබඳවා රජ්ජුරුවන්ට දන්වා යවුහ. රජ්ජුරුවෝද සතුටුව නොයෙක් රසයෙන් අග්‍රවූ භෝජනය ගෙන්වාගෙණ ගොස් මහබෝසතානන්ට දෙවුහ. බෝධිසත්වයෝද මෑනියන් නැතිව ගොදුරු අනුභවනොකරමැයි ආලෝපයකුත් නොගත්තාහ. මෙසේ ගොදුරු අනුභව නොකරන්නාවූ ඇතානන්ට යාඥාකරන්නාවූ රජ්ජුරුවෝ මෙසේ කියත්. එඹා ඇත් රජ්ජුරුවෙනි යම් රාජ්‍ය කටයුත්තක් නිසා ගෙන්නුවෝ විනම් එසේවූ තොප විසින් සිද්ධකරවන රාජකාරිය බොහෝය. එසේහෙයින් තොපගේ ශරීරය දුර්වල නොකොට ගොදුරු අනුභව කරවයි කීහ. එබසට බෝධිසත්වයෝ කියන්නාහු රජ්ජුරුවන් වහන්ස මාගේ වියෝගයෙන් බැගෑපත් කිසි පෝෂ්‍යයක් කරණ කෙණෙකුන් නැතිව අන්ධහෙයින් චන්ඩෝර නම් පර්වත ප්‍රාන්තයට පැමිණ එතැන්හි උල් පහන් මඩිමින් ඇවිදින්නාහු කනේරු ධෙනුවකමෙන් ඒ කාන්තයෙන් අඬා ඇවිදිනිය.

එසේ හෙයින් මා ගොදුරු අනුභව කරන්නේ නැතැයි කීහ. නැවත රජ්ජුරුවෝ කියන්නාහු එඹා ඇත් රජ්ජුරුවෙනි එසේ ඇත් අන්ධව පෝෂ්‍යය කරන්නාවූ කිසිකෙණෙකුන් නැතිව චන්ඩෝරනම් පර්වත සමීපයෙහි උල්පහන් මඩමින් ඇවිදිනාවූ ඇතින්නි තොප කවරේක්දැයි විචාළාහ. එවිට බෝධි සත්වයන්වහන්සේ කියන්නාහු රජ්ජුරුවන් වහන්ස ඇස් අන්ධව එලෙස ඇවිදිනාවූ ඇතින්නි නම් මා විසින් ගොදුරුගෙණවිත් ලා පෝෂ්‍යය කරණ ලද මාගේ මෑනියෝයයි කීහ. එබස් ඇසූ රජ්ජුරුවෝ අමාත්‍යයන්ට කියන්නාහු එඹා ඇස් අන්ධවූ මෑනියන් පෝෂ්‍ය කරමියි මා විසින් පෝෂ්‍ය කරණ ලද ඒ මාගේ මෑනියන් ගොදුරු නොලත්තේ ආදීන් සත් දවසය. එසේ වූ ගොදුරු නොලබන්නාවූ මාගේ මෑනියන් වියලි මියන්නාහුය. උන් මළදී ගොදුරු අනුභව කරන්නේ නැතැයි කියන ලද මෙම ඇතාන කෙණෙක් ඇද්ද උන්වහා මුදා ඇරපියාව ඒ ඇත් රජතෙමේත් තමාගේ මෑනියන් හා අවශේෂ බන්ධුන් හාද එක්ව සතුටුව සැපසේ යෙමියි කියා බන්ධනයෙන් මුදාපුව. ඒ බන්ධනයෙන් මිදුනාවූ ඇත් රජ්ජුරුවෝද මදක් සැතපීගෙණ රජ්ජුරුවන්ට දසරාජ ධර්මයෙන් බණ කියා අවවාද කොට මහජනයා විසින් ගඳමල් ආදියෙන් පූජා කරමින් සිටියදී නුවරින් පිටත්ව එදවස්ම පියුම් විලට ගොස් මාගේ මෑනියන් ගොදුරු අනුභව කරවා විනා මම ගොදුරු නොගණිමි බොහෝ නෙළුම් මල් ඇරගෙණ ගොස් ගල්ලෙනින් පිටත්ව දොරකඩ සමීපයෙන් උන් මෑනියන් සමීපයට ගොස් නිරාහාරයෙන් වියලි ගිය ශරීරයට සෙනෙහ පිණිස ඉස්මුදුනේ පැන් සැළුහ. එකල මහබෝසතානන්ගේ මෑනියෝ වැසිවසති යන සිතින් කියන්නාහු යම් බඳුවූ මට්පෝෂ්‍යය කරන්නාවූ මා වදාගත් මාගේ පුතනුවෝ දනියන්ව ගියහ. එසේ හෙයින් සෝක කරව මා සමීපයෙහි දුෂ්ටවූ අනාචාර්ය ස්වරූප ඇති කෙසේවූ නොකල් වැස්සෙක්ද වසිනේ යයි යනාදීන් අක්‍රෝධ කළාහ. එකළ මහබෝසතානෝ අස්වන්නාවූ මෑනියෙනි වැදූරට වාසිවූ යස පිරිවර ඇති ඒ කසි රජ්ජුරුවන්ගෙන් මිදිනිමි මම නුඹ වහන්සේගේ පුතනුවෙමි ආයෙම් එසේ හෙයින් නැගී සිටිමින් කිමෙක්ද ගොදුරු අනුභව කරන්නැයි කීය. එකල බෝධිසත්වයන්ගේ මෑනියෝ රජ්ජුරුවන්ට අනුමෙවැනි කරන්නාහු යම්සේ මට නිරන්තරයෙන් වැඩ පසස්නාවූ මාගේ පුතනුවන් කසීරට වැඩ පසන්නාවූ යම් රජ්ජුරුකෙණෙක් මුදවා අරවාපුද ඒ රජ්ජුරුවෝ බොහෝ කලක් ජීවත් වෙත්වයි කියමින් ස්තුති කළාහ. රජ්ජුරුවෝද බෝධිසත්වයන්ගේ ගුණයෙහි පැහැද පියුම්විල සමීපයෙහි ගමක් කරවා මහබෝසතානන් හා මෑනියන්ට නිරන්තරයෙන් වුර්ති තිබුහ. ඉන් මෑතභාගයෙහි බෝධිසත්වයන්ගේ මෑනියන් කළුරිය කළ කල්හි මහබෝසතානෝ ශරීරය අදාහණ කෘත්‍යය කොට කුන්ක නම් ආශ්‍රම පදයට ගියාහ. ඒ ස්ථානයෙහි පන් සියයක් පමණ තපස්විවරහු හිමාලයෙන් අවුත් වන්නාහු බෝධිසත්වයන්ට ලැවූ වාර්තිය ඒ තාපසවරුන්ට සැලැස්වූහ.රජ්ජුරුවෝ මහබෝසතානන්ගේ රූපය හා සමාන රුවක් ගලින් කරවා නිරන්තරයෙන් මහත්වූ සත්කාර පවත්වන්නාහ. ජම්බුද්වීප වාසීවූ අවුරුදුදක් පාසා හස්තිපුරනම් පූජාවක් කරන්නාහ, ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණ හැර දක්වා වදාරා චතුසත්‍යය ප්‍රකාශ කොට මේ මාතිපෝසක ජාතකය නිමවා වදාළ සේක. චතුස්සත්‍යයාගේ කෙළවර මාතිපෝසක භික්ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටි සේක. එකල රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එදවස් ඇතිනි නම් දැන් මේ මහමායා දේවිය, එදවස් මෑනියන්ට උපස්ථාන කළ ඇතානෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේකි,

SANHIDA LANKA

# ජුන්හ ජාතකය

තවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වසන්නාවූ බුදුරජානන් වහන්සේ විසින් ආනන්ද සාමින් විසින් ලබන ලද වර අටක් අරභයා මේ ජාතකය දක්වන ලද.
ඒ කෙසේද යත්.
සර්වඥයන් වහන්සේට බුදුවූ විසි අවුරුදු වනතුරු නිරන්තරයෙන් නියම උපස්ථාන කරන්නාවු එකද භික්ෂූකෙණෙකුන් වහන්සේයයි නැත සමහර දවසක් නාගමාල නම් තෙරුන් වහන්සේ නියමයක් නැතිව උපස්ථාන කරණ සේක. එක් දවසක් සර්වඥයන් වහන්සේ භික්ෂූන් වහන්සේ සමීපයට කැඳවා වදාරණ සේක් එම්බා මහණෙනි මම දැන් වයෝවෘද්ධයෙමි සමහර භික්ෂූකෙණෙකුන් මා හා සමඟ යමින් සිට මේ මගින් යම්හයි කිවෝත් ඔහු අන්ගමකින් යන්නාහ. සමහර කෙණෙක් මාගේ පා සිවුරු බිමට දමාපියා යන්නායහ. එසේ හෙයින් මට නිරන්තරයෙන් උපස්ථාන කරන්නාවූ එක් භික්ෂූකෙණකුන් නියම දනුවයි වදාළසේක. එසේකල මම උපස්ථාන කෙරෙමි දොහොත් මුදුනේ බැඳ සිටියාවූ සැරියුත්සාමි ආදිකොට ඇති භික්ෂූන් වහන්සේලාට වදාරණ සේක් එම්ඹා තොප තොපගේ ප්‍රාර්ථනා මුදුන් පැමිණියේයයි වළකා වදාළසේක. නැවත භික්ෂූන් වහන්සේ එක්ව අනදසාමින්ට ඇවැත්නි තොපි උපස්ථාන කරන්නාවු ධානාන්තරයට යාඥා කරවයි කීසේක. එකල අනද සාමි වදාරණ සේක් ස්වාමිනි බුදුහු ඉදින් තමන් ලත් සිවුරු මට නොදෙන සේක් වි නම් තමන් ලත් ආහාරයක් මට නොදෙන සේක්විනම් එකගද කිළියේ වාසය කළ නොදෙනසේක්වීනම් මා කැඳවාගෙණ තමන් වහන්සේට ආරාධනාවට වඩනාසේක් විනම් ඉදින් දුරුරටවලින් බුදුන් දකින්ට අවුත් පැමිණි සත්වයන් ඒ වෙලෙහි කැඳවා ගෙණගොස් දකින්ට ලැබේ නම් යම් කලෙක්හි මට සැකයෙක් උපනී නම් ඒ වෙලෙහි මම බුදුන් කරායන්ට අවසර ලැබේ නම් බුදුහු ඉදින් මානෝ මැදයේ බණවදළසේක් වි නම් ඒ බණ අවුදින් මට වදාරණ සේක් විනම් එවිට මම ද බුදුන්ට උපස්ථාන කෙරෙමි. මේ ප්‍රතික්‍ෂප වරසතරක්ද යාඥා වරසත රක්දැයි වර අටක් ඉල්වූසේක. බුදුහු වර අට දෙවා වදාළසේක. ඒ දවස් පටන් අනදසාමි පස්විසි අවුරුද්දක් බුදුන්ට නිරන්තරයෙන් උපස්ථාන කළ සේක. මේ ආනන්ද සාමි පංචස්ථානයකින් ඒ තද අග්‍රපාලියෙහි තිබිය යුතු ධානාන්තරයට පැමිණිසේක. අංගසම්පදාය, අධිගමසම්පදාය, අර්ථපරිපුච්ඡා සම්පදාය, යොනිසෝමනස්ස සම්පදාය, බුද්ධිපණිශ්‍රය සම්පදායයි, මේ සප්තවිධ සම්පදාවෙනුත් යුක්ත සේක. සර්වඥයන් වහන්සේගෙන් වරඅටක් ලැබ ශාසන නැමති ආකාශයෙහි පැනනැංගාවු පුන්සඳ මඬලක් මෙන් ප්‍රසිද්ධව වසන සේක්. එකල්හි එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ හුන් භික්ෂූන් වහන්සේ ඔවුන් වහන්සේට ආමන්ත්‍රණය කොට වදාරණසේක් එම්බා ඇවැත්නි බුදුහු ආනන්ද ස්ථවිරයන්ට වරදීමෙන් සන්තර්පණය කළසේකැයි කියමින් උන්සේක. එකල සර්වඥයන්වහන්සේ ගඳකිළියෙහිවැඩහිඳහ ඒ බව දිවකණින් අසා තුන්තරාගමණින් දම්සබාමණ්ඩපයට වැඩ බුද්සන මස්තකයෙහි වැඩහිඳ වදාරන සේක් එම්බා මහණනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි කිනම් කථාවෙක් තොපට අඩාලවීදැයි විචාරා වදාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් ස්වාමීනි නුඹවහන්සේ විසින් නොකියන්නට වදාළ දෙතිස් කථාවෙන් එක්තරා කථාවකින් යුක්තව උනුමෝනොවම්හ. දැන් මේ ආනන්දස්ථිවරයන් වරලත් නියාව කිය කියා උනුම්හයි කීකල්හි හම්බා මහණෙනි ආනන්දස්ථිවරයන් වරලද්දේ දැන්මතු නොවෙයි පෙරත් වරලද්දේවේදැයි වදාරා භික්ෂූන්වහන්සේ අතුරෙන් එක්තරා භික්ෂූකෙණෙකුන්වහන්සේ විසින් ආරාධිත වූ සර්වඥයන්වහන්සේ විසින් ඉකුත්වත් දක්වා වදළසේක
එම්බා මහණෙනි.
යටගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ය කරණ සමයෙහි පුරණ ලද බෝධි සම්බාර ඇති අප මහ බෝසතානෝ බරනැස් රජ්ජුරුවන්ට පුත්ට ඉපිද ජුන්හ කුමාරයයි මේ නමින් ප්‍රසිද්ධ තක්සලා නුවරට ගොස් ශිල්ප උගන්නාහු එක්දවසක් රාත්‍රිභාගයෙහි ආචාරීට වනපොත් දී තමන්වසන්නාවූ ගෙට වහ වහා යන්නාහු එක්තරා බමුණකු බත් සිගාගෙන තමා වසනතෙනට යන්නාහු අන්ධකාරයේ උරයෙන් පැහැර බමුණා හා සමඟ බත් ලබ්බත් බිඳපූහ බමුණුද වැටී හුණුයේය බැගෑපත් හැඬින් ඇඬුයේය ජුන්හ කුමාරයෝත් ඔහු දැක උෟ කෙරේ කරුණාවෙන් ආපස්සේ අවුදින් බමුණා අත අල්වා නගාසිටුවා බමුණුද කුමාරයන් එකරුත්ත අල්වාගෙන එම්බා දරුව තොප විසින් මාගේ භික්ෂාභාජනය බිඳපියන ලද එසේහෙයින් මාගේ බත් මිළ දෙවයි කීහ එබසට ජුන්හ කුමාරායෝ කියන්නාහු එම්බා මහණෙනි දැන් තොපගේ බත් දියනොහෙමි මම වනාහී කසී රජ්ජුරුවන්ගේ පුත්වූ ජුන්හ කුමාරයෝය, රාජ්‍යයෙහි පිහිටිකල මා සමීපයට අවුදින් වස්තු ඉල්වා ගණුවයි කීහ. එතනින් පහව ශිල්ප ඉගෙණ නිමවා ආචාරීන් වැඳ සමුගෙණ බරණැස් නුවරට ගොස් පියරජ්ජුරුවන්ට ශිල්ප දැක්වූහ. රජ්ජුරුවෝද ජීවත්ව උන්නාවු මා විසින් මාගේ දරුවෝ දක්නාලද රාජ්‍යශ්‍රීයට පැමිණි යාහුන් දැකිමි සිතා කුමාරයන් රාජභිෂේක කළාහ. එකල ජුන්හරජ්ජුරුවෝයයි මේ නමින් ප්‍රසිද්ධව දසරාජ ධර්මයෙන් රාජ්ජය කරන්නාහ බමුණු එපවත් අසා දැන්

SANHIDA LANKA

වනාහි මාගේ බත්මිල ගෙණෙම් කියා බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන් සර්වාභරණයෙන් සැරහී නුවර පැදකුණු කොට යන කල්හි දැක එක් උපසකට පැනනැගී අත්නගා ජයතුභවංමහරාජ යනාදීන් ආශිවර්ණයකොට සිටියේයි රජ්ජුරුවෝ ඔහු නොදකම නික්මුණාහ. රජ්ජුරුවන් නොබලා නික්මුණු නියාව දුටු බමුණු රජ්ජුරුවන් හා සමග කථා කරන්නට පටන්ගත්තේය. මෙසේ කියා ජනප්‍රධානවූ රාජෝත්තමයානන් මා කියන්නාවූ බස් ඇසුව මැනව එක් කටයුත්තක් පිණිස මම මෙතනට පැමිණියෙමි එසේහෙයින් කතරගෙවා ආවාහු අප වැනි බමුණන් සිටියදී පිටිපාලා යාම සුදුසු නොවෙයි කීව. රජ්ජුරුවෝ ඔහු කීබස් අසා වීදුරු අකුස්සගෙණ ඇති කොට රඳවා බමුණා හා සමඟ කථාකරන්නාහු මෙසේ කියත්. එම්බල බමුණු සමකටයුත්තක් පිණිස තෝ මා සම්පයට පැමිණියේ වීනම් ඒ මට කියවයි මම සිට අසමි. තෝ මා කවර ප්‍රයෝජනයක් පිණිස ප්‍රාර්ථනා කොට සමීපයට ඇයිද. ඒ බැවින් විචාළ මට නොවලහා කියවයි කීහ. එබසට බමුණු කියන්නේ රජ්ජුරුවන් වහන්ස මට ගංවතුර පසක්ත දුනමැනව කෙල්ලන්සියයක් දුන මැනව කිරිදෙනුන් පන්සියයක් දුන මැනව ගොන් සත් සියයක් දුන මැනව රත්‍රන් සත් විසිදාසක්ද, තවද කුලයෙන් මා හා සාදිසෲවූ බිරින්ද කෙණෙකුන් දුන මැනවයි කීහ. එබසට රජ්ජුරුවෝ කියන්නාහු බමුණ තාගේ භයානකවූ ස්වරූප ඇති තපසෙක ඇද්ද නොහොත් විසිතුරු ස්වභාව ඇති සිතුදෙය සිද්ධකොට දෙන යක්‍ෂයෙක් ඇද්ද, නොහොත් තොප විසින් මට කරණ ලද උපකාරයක් සිහිකරවුදැයි විචාළාහ.

එකල බමුණු කියන්නේ භයානක ස්වරූප ඇති තපසකුත් මාකෙරෙහි නැත, සිතූ සිතුවා සිද්ධකරදෙන මන්ත්‍රයකුත් නැත, මා කිවා සිද්ධකොට දෙන කෙනෙක් නැත. නුඹ වහන්සේට මා විසින් පෙර කරණ ලද උපකාරයකුත් නොදනිමි. බලඑකෙක් ඇත්නම් නුඹ වහන්සේ හා මා හා පෙර ඔවුනොවුන් හා කරණ ලද කථා ස්වරූප මාත්‍රයෙක් ඇතැයි කීහ. නැවත රජ්ජුරුවෝ කියන්නාහු එඹල බමුණ තාගේ හා මාගේ පළමුවන දැකුමවන්නේය මට පළමු තා දන්නේ නැත. එසේහෙයින් කවරකලෙක තා හා මා හා සංගමයෙක් ඇද්දැයි ඒ කාරණා විචාළවු මට කියවයි කීහ. නැවත බමුණු කියන්නේ ගන්ධාර රාජ්‍යයෙහි සිත්කළුවූ තක්සලා නුවරදී රාත්‍රියෙහි ගණවූ අන්ධකාරයෙහි අපි දෙන්න උරය ගැටී ගියම්හ. එකළ අපි දෙන්නාම එතනසිට මතු කල්පනා කටයුත්තක් සිහිකළම්හ අපදෙන්නාගේ මිත්‍රසථවයෙක් නම් එපමණෙක්මය ඊට පසුව පළමු මා දන්නා සත්වයෙක් නැතැයි කීය එකළ ඒ රජ්ජුරුවෝ කියන්නාහු එම්ඹල බමුණ යම්කළෙක්හි සත්පුරුෂ සත්‍වයන් හා සමග සංග්‍රහයෙක් වීනම් නුවනැත්තෝ ඒ නොනසන්නාහුය අඥානයන් හා සමග මිත්‍රසන්ථවයෙක් ඇත්නම් වේවයි පළමු කරනලද කෘතෝපකාරයෙක් වේවයි අඥාණයන් විෂයෙහි බොහෝකොට කරණලද්දාවූ උපකාරයෙක් ඇත්නමුත් නස්නේය ඒ එසේමය අඥාණයෝ කෙලෙහිගුණ නොදන්නාවූ ස්වභාව ඇත්තාහුය නුවණැත්තාවුන්ගේ වනාහි මිත්‍රසන්ථවයෙක් ඇත්නම් වේවයි පළමු කරණලද උපකාරයෙන් ඇත්තේවීනම් නොනස්නේය එසේහෙයින් නුවණැත්තෝ ස්වල්ප මාත්‍රවූ කෘතෝපකාරය නොනස්නායුය ස්වභාව ඇත්තාහයි කියා ඔවුන්  විසින් ඉල්වනලද වර දාන දෙන්නාහු මෙසේ කියත් එම්ඹල බමුණ තට ලක්‍ෂයක් ලක්‍ෂයක් නිමන්නා වූ ගම්වර පසක්ද කෙල්ලන් සියයක් දෙමි දෙනුන් පන්සීයක් දෙමි ගොන් සත්සීයක් දෙමි මැණික් දහසක් දෙම් කුලයෙන් තොප හා සාදෘශ්‍යවූ භාර්යාවෝ දෙන්නෙකු දෙමි කියා ඒ සියල්ලම අනූනව දුන්හ එසේ සම්පත් ලද්දාවූ බමුණු  රජ්ජුරුවන්ට ස්තුති කරන්නේ කසී රට අධිපතිවූ රජ්ජුරුවන්වහන්ස පැලවිය පටන් පසළොස්වක දකිණාතෙක් තාරකාවන් මධ්‍යයෙහි පිහිටියාවූ පුන්සඳ මණ්ඩල යම්සේද සම්පූර්ණවේද රසේම නුඹවහන්සේ විසින්  දෙනලද ගම්වරලත් මමද එපරිද්දෙන් මාගේ මනෝරථය අදමුදුන් පැමිණි යෙමි එහෙයින් තොප හා මා හා අදවූ සංග්‍රහයක් මෙන් මහත් වූ සන්තෝෂයට පැමිණියෙමි කියා රජ්ජුරුවන්ට ස්තුති කළේය මහබෝසතාණෝද බමුණාට මහත් වූ යසශ්‍රී දී කම්වූ පරිද්දෙන් මිය පරළොවගියහයි වදාරා පූර්වාපර සන්ධිගලපාමේ ජුන්හ ජාතකය නිමවා වදාලසේක එකල්හිගම්ර ලද්දාවූ බමුණානෝ නම් දැන් ආනන්ද ස්ථවීරයෝය එකල්හා ඒවා දුන් රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයා තමන්වහන්සේ දක්වා වදාළ සේක

SANHIDA LANKA

# ධර්ම ජාතකය

තවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වසන්නාවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්දත් තෙරනුන්වහන්සේ පොළොව පලායාම අරභයා වදාරණලද

ඒ කෙසේද යත්

එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ උන්නාවූ භික්ෂූන් වහන්සේ කථාවක් පලකරන සේක් එම්බා ඇවැත්නි දේවදත්ත ස්ථිවරයෝ බුදුන් හා සමග විරුද්ධව පොළොව පළා වන්නෝ වේදැයි කියමින් උන් සේක එකළ සර්වඥයන්වහන්සේ දම්සභාමණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා මේ නම් කථාවක් කොට උනුම්දැයි කී කල්හි එම්බා මහණෙනි දැන් මාගේ සර්වඥයන් චක්‍රයෙහි පැහැර පොළොවට වන්නේය. පළමුත් මාගේ ධර්මචක්‍රයෙහි පැහැර පොළොවට වැද අවිචි නරකයෙහි උපන්නෙහි වේදැයි වදාරා එක්තරා භික්ෂුකෙණෙකුන් වහන්සේ විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණකුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයෝ කාමාවචර දිව්‍යලෝකයෙහි ධර්ම නම් දිව්‍යපුත්‍රව උපන්නාහුය. එකල දේවදත්තයෝ එම දිව්‍යලෝකයෙහි අධර්මනම් දිව්‍යපුත්‍රව උපන්නාහුය. එකල දේවදත්තයෝ එම දිව්‍යලෝකයෙහි අධර්මනම් දිව්‍යපුත්‍රව උපන්නාහුය. ඔවුන් දෙදෙනා අතුරෙන් ධර්ම නම් දිව්‍ය පුත්‍රතෙම මිනිසුන් සවස්වෙලෙහි බත් අනුභව කොට තමන් ගෙදරවල සැපවූ කථාකොට උන්කල්හි තුමු සර්වාභරණයෙන් සැරහි දිව්‍ය රථයකට පැන නැගී දිව්‍යගනාවන් විසින් පිරිවරණ ලදුව මැදිපොහොදවස් ගම් නියම් ගම් රාජධානිවල්හි ආකාශයෙන් අවිද ප්‍රාණඝාතාදී දස අකුසල්වලන් දුරුව මව්පියන්ට උපස්ථාන කිරීමෙන් දිව්‍යලෝකවල ඉපිද මහත්වූ සම්පත් අනුභව කරවයි කියා මනුෂ්‍යයන් දශ කුශල පථයෙහි සමාදන් කරවමින් ජම්ඹුද්වීපය පැදකුණු කෙරෙමින් ඇවිදිනාහ. එකල අධර්ම නම් දිව්‍යපුත්‍රයා ජම්බුද්වීපය වාමාවෘතකොට ඇවිදිමින් ප්‍රාණඝාත කරව යනාදින් දශ අකුශල කර්මයෙහි යොදවමින් ඇවිදිති, එසේ ඇවිදින ධර්මනම් දිව්‍යපුත්‍රයාගේ රථයට අභිමුඛව පැමිණියේය. එකල ඔවුන් දෙදෙනාගේ පිරිවර ඔවුනොවුන් දෙදෙනාගේ පිරිවර ඔවුනොවුන් අතින් තොපි කාගේදැයි විචාරා අපි ධර්ම නම් දිව්‍ය පුත්‍රයන්ගේය. අපි ධර්ම නම් දිව්‍ය පුත්‍රයන්ගේයයි කියමින් දෙභාගාව සිටියහ. එකල ධර්ම නම් දිව්‍යපුත්‍රයානෝ කියන්නාහු එම්බල යහළු අධර්මනම් දිව්‍ය පුත්‍රය, මම් ධර්මයෙහි හසුරුවමින් ශ්‍රමණ බ්‍රාහ්මණාදීවූ සත්වයන්ට සිය අතින්ම යසස්දානය කෙරෙමි එසේ හෙයින් මම ධර්ම නම් විමි දෙව්මිනිසුන් කෙරේ ප්‍රසිද්ධ හෙයින් සත්පුරුෂයන්ට වඩා බල ඇත්තෙමි එසේවූ මට පළමුකාට මග අරණට සුදුසුය, එසේ හෙයින් තෝ මේ මගින් සඟව මග ඇරපියවයි කීහ. එකල අධර්ම නම් දිව්‍යපුත්‍රතෙම කියන්නේ එම්බල ධර්ම නම් දිව්‍යපුත්‍රය මම දෘඩවූ අධර්මයානාවකට නැගී ආයෙමි සත්පුරුෂ ධර්මයෙක් මාගේ නැත එසේ හෙයින් සත්පුරුෂයාට වඩා බල ඇත්තෙමි, එසේ වූ මම කවර කාරණයකින් තොපට අද මග අරිව්ද මට පළමු කිසි කෙණෙකුන්ටත් අලවිරු නැත මගනොහරිමියි කීයේය.

එකල ධර්ම නම් දිව්‍යපුත්‍රතෙම කියන්නේ එඹල සබඳ මේ ලෝකයෙහි ප්‍රථම කල්පයෙහිම දශකුශල කර්මපථ සංඛ්‍යාත ධර්මයම පළමු පැණවිය. අධර්ම පසුව උපන. එසේ හෙයින් ධර්ම ජ්‍යෙෂ්ඨය නමුත් මමය, එසේවු මට මග හැර කණිෂ්ඨ වු තෝ මගින් පහවයි කීය. එකල අධර්ම නම් දිව්‍යපුත්‍රතෙම කියන්නේ එඹල සබඳ අප දෙන්නා යාඥා කොට ඉල්විමක් තරම්නොවෙයි ඉල්විමට තොපට මගදිමත් තරම් නොවෙයි බල එකෙක් කියම් අපි දෙන්නම අද යුද්ධ කරම්හ. ඒ යුද්ධයෙන් අප දෙන්නා අතුරෙන් යැමෙක් ජයගත්තේ වීනම් මේ මාර්ගය ඔහට වන්නේ යයි කීහ. එබසට ධර්ම දිව්‍යපුත්‍රතෙම කියනුයේ එම්ඹල අධර්මයකොට වනාහි මේ සසර දුක් බබුළුවන්නාවු ගුණයෙන් ප්‍රසිද්ධ වෙමි මහත්වූ කාය බල සේනාබල ඇත්තෙමි ප්‍රමාණාතික්‍රාන්තවූ යසපිරිවර ඇත්තෙමි. කිසි කෙණෙකුන් හා අසදිසවෙමි සියළු ගුණයෙන් සමෘද්ධියෙමි එසේවූ අධර්මය කොට තෝ කෙසේ ජයගණිදැයි කීහ. එකල අධර්මතෙම කියන්නේ එඹල යහළු ඒකාන්තයෙන් ලෝභයෙන් රන් රුවන් නසීද රන් රුවනිණින් ලෝභය නසීද එපරිද්දෙන්ම සත්වයන්ට දර්ශනියවූ රත්‍රන් යම්සේ යකඩින් නසීද එපරිද්දෙන්ම මාගේ නම පුරුදුකරණ අධර්මගුණයෙන් තොපගේ යහපත් ධර්මගුණය නසා රඳවයි කීහ. එබසට ධර්ම නම් දිව්‍ය පුත්‍රතෙම කියනුයේ එඹල සබඳ තෝ ඉඳින් යුද්ධයට සමර්ථයේ වී නම් තට වැඩිකෙණෙක් වේවයි ගරුකටයුතු කෙණෙක් වේවයි නුවනැති කෙණෙක් වේවයි නැද්ද එසේ තට මම මග අරිමි තාගේ රළු රූක්ෂවූ බවටත් ක්ෂමාකෙරෙමි කිහ. මෙසේ ඒ බෝධිසත්වයන් කී බස් අසා අධර්මතෙම රථයෙහි සිටියනොහි බිම හිම හිස බිමලා පය උඩුකොට වැටි පොළොව විවරවූ කල්හි පොළොවට වැද අවිචිමහනරකයෙහි උපන්නේය. ඒ බව වදාරන්නාවූ බුදුරජානන් වහන්සේ එඹා මහණෙනි ඒ අධර්ම නම් දිව්‍ය පුත්‍රතෙම දිව්‍යපුත්‍රයා කි බස් අසමින් රථයෙහි සිටියනොහි හිස බිම බලවා පයඋඩුකොට වැටී පොළොව

SANHIDA LANKA

පළාගෙණ ගොස් නරකයෙහි උපන්නේ වේදැයි වදාරා මතු මත්තෙහි ධර්මදේශනා කරණසේක් ක්‍ෂාන්ති බලයෙන් යුද්ධ බල ජයගෙණ ඒ අධර්මයා නසා එවු පරාජයට පමුණුවා සැබෑ බසම පෙරදැරිකොට ඇති මහත්වූ බල ඇති ඒ බෝධිසත්වයෝ ඍජුවු මාර්ගයෙහි ගියේ වේදැයි වදාරා තවද යම් සත්වකෙණෙක් ක්‍ෂාන්ති නොකිරීමෙන් තෙමේ දෙමව්පියන්ටද ශ්‍රමණ බ්‍රාහ්මණයන්ටද ස්වකීයවූ තමාගේ ගෙයිදී කිසිසත්කාර සම්මානයක් නොකොට කාබුන් මරණින් මත්තෙහි කලේබරය මෙලොවහිම දමා යම්සේ අධර්මයෙන් අධෝශිෂව නරකයෙහි ඉපද වැටෙන්නාහයි වදාරා එම්බා මහණෙනි මේ දේවදත්ත ස්ථවිරයෝ ප්‍රතිවිරුද්ධව පොළොව පළා නරකයෙහි උපන්නේ වේදැයි පෙරත් නරකයට ගියෝ වේදැයි වදාරා මේ ධර්ම ජාතකය නිමවා වදාළසේක. එකල්හි ඒ අධර්ම දිව්‍ය පුත්‍රයා නම් දැන් මේ දේවදත්ත ස්ථවිරයෝය. ඔහුගේ පර්ෂිත් නම් දැනුදු දේව දත්ත ස්ථවිරයන්ගේ පර්ෂිදය, ධර්ම නම් දිව්‍යපුත්‍රයානෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# උදයභද්ද ජාතකය

තවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වැඩ වසන්නාවූ බුදුරජානන් වහන්සේ විසින් ශාසනයෙහි උකටලීවූ එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා වදාරණ ලද.

එහි වර්තමාන කථාව කුස ජාතකයෙහි විස්තර වශයෙන් කියනලද මේ ජාතකයෙහි භික්ෂූන් වහන්සේ විසින් ශාසනයෙහි උකටලීවූ භික්ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයට ගෙණහැර දැක්වූ කල්හි සැබෑද මහණ තා ශාසනයෙහි උකටලී වූයේයයි විචාරා වදාරා සැබෑව ස්වාමිනි දැන්වූ කල්හි එඹල මහණ කුමක් නිසා කේලශ වසඟයෙන් මෙබඳුවූ නෛර්යානික ශාසනයෙහි මහණව උකටලීද පුරාතණයෙහි නුවණැත්තෝ දොළොස් යොදුනක් පමණ ඇති සියල්ලෙන්ම සමුද්ධවූ සුරන්ධ නම් නුවර රාජ්‍යය කරන්නාවූ පවා සුරාංගනාවක හා සමාන ස්ත්‍රියක සමග සත්සියයක් අවුරුදු එක ගබඩාවෙහි වසන්නාවූ ඉඳුරන් බිඳ ලෝභවශයෙන් නොබැළුවෝ වේදැයි වදාරා එක්තරා භික්ෂූ කෙණෙකුන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස සූරන්ධ නම් නුවර කසී නම් රජකෙනෙකුන් රාජ්ජය කරන්නාහ ඒ රජ්ජුරුවන්ගේ එකද දූ පුත් කෙණෙක් නැත්තාහ එකළ රජ්ජුරුවෝ දරුවන් ප්‍රාර්ථනාකරවයි නියෝග කළාහ එකල බෝධිසත්වයෝ බ්‍රහ්මලෝකයෙන් චුතව අවුත් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ උපන්නාහ ඒ කුමාරයන්ට නම් තබන්නාහු බොහෝදෙනාගේ සිත් සතුටු කරවමින් උපන්හෙයින් උදයභද්‍ද්‍ර කුමාරයෝයයි නම් තුබූහ. කුමාරයන් පියවරනගා කෙළ ඇවිදින අවස්ථාවෙහි අනික් බ්‍රහ්මයෙක් බ්‍රහ්ම ලෝකයෙන් චුතව එම රජ්ජුරුවන්ගේ එක්තරා බිසෝ කෙණෙකුන් මගධ කුමාරිකාවක්ව උපන්නාහ. ඒ කුමාරිකාවන්ට උදය භද්‍රදේවියයි නම් තුබූහ. උදය භද්‍රාවෝ වැඩිවිය පැමිණි කල්හි ශිල්ප ශාස්ත්‍රයෙහි නිපුණවූහ. ජාතියෙන් බ්‍රහ්මචාරිකාවක්ව උපන්නාහ. ඒ කුමාරිකාවන්ට උදය භද්‍ර දේවියයි නම් තුබූහ. උදය භද්‍රාවෝ වැඩිවිය පැමිණිකල්හි ශිල්ප ශාස්ත්‍රයෙහි නිපුණවූහ. ජාතියෙන් බ්‍රහ්මචාරීහ. ස්වප්නයෙනුත් මෛථුනයන් නොමදන්නාහ. කෙලිගවසඟ චිත්තයෙන් නූපදනේය, එකල රජ්ජුරුවෝ පුතනුවන් රාජ්‍යයෙහි අභිෂේක කොට නාටකස්ත්‍රීන් පිරිවරමි සිතා පුතණුවන් සමීපයට අස්නක් යවූහ. මහ බෝසතානෝ කියන්නාහු මට රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත. කෙලශයෙහි මාගේ සිත ඇත්තේ නැත කියා ප්‍රතික්ෂ්ප කළාහ. දෙමව්පියෝ නැවත නැවත කියායවූහ. එකල මහබෝසතානෝ ජාම්බොනද ස්වර්ණමය ස්ත්‍රී රුවක් කරවා මෙබඳු ස්ත්‍රී රුවක් ළදහොත් රාජ්‍යය පිළිගණිමි. දෙමව්පියන් සමීපයට යැවූහ. ඔහු ඒ රන් රුවන් මුළු දඹදිව ඇවිදුවා පරීක්ෂාකරවා එබඳු ස්ත්‍රියක නොලැබ උදයභද්‍රාවෙන් සරහා ඒ රන් රුව සමීපයෙහි සිටුවූහ. ඕ තොමෝ ඒ රන්රුව ඉක්ම සිටිනීය. එකල ඔවුන් දෙදෙනාම නොකැමැති පරිද්දෙන් කුඩා මෑනියන්ගේ දුව කුමාරිකාවන් නැගනියන් උදය භද්‍රානම් කුමාරිකාවන් අග්‍රමෙහෙසිකා කොට බෝධිසත්වයන් රාජාභිෂේක කළාහ. ඒ දෙදෙන බ්‍රහ්මචාර්යාව වාසය කරන්නාහ. කල්යාමකින් දෙමව්පියන් ඇවෑමෙන් බෝධිසත්වයෝ රාජ්ජය කරන්නාහු දෙදෙනාම එක ගබඩාවෙහි වසන්නාවූ ලෝභසිතින් ඔවුනොවුන් මුන පමණකුත් ඉඳුරන් බිඳ නොබැළූහ එතකුදුවුවත් අප දෙදෙනා අතුරෙන් යම්කෙණෙක් පළමු කොට මළෝ වි නම් ඔහු තමන් උපන්තෙනින් අවුත් මම අසවල් තෙන උපනිමි කියත්වයි කතිකාවක් කළාහ.

ඉකිබිත්තෙන් බෝධිසත්වයෝ රාජ්‍යයට පැමිණි සත්සියයක් අවුරුදු ඇවෑමෙන් කාලක්‍රියා කළාහ. අනික් රජ්ජුරුකෙණෙක් නැත්තාහ. උදය භද්‍රාවෙන් ආඥාවම පවත්නේය. අමාත්‍යයෝ රාජ්‍යය අනුශාසනා කරන්නාහ. බෝධිසත්වයෝද තව්තිසා භවනයෙහි ශක්‍රව ඉපද ඓශ්වර්යමදයෙන් සතියක් උදය භද්‍රාවෙන් සිහි නොකළාහ මෙසේ මනුෂ්‍ය ගණනාවෙන් සත්සියයක් අවුරුදු ගිය කල්හි සිහිකොට උදය භද්‍රානම් රා කුමාරිකාවන් වස්තුවෙන් විමසා සිංහනාද කරවා ධර්මදේශනා කරමින් කතිකාවෙන් මිදි එම් සිතූහ. එකල්හි වනාහි මනුෂ්‍යයන්ට දස දහසක් අවුරුද්දට ආයුෂය ඇතිකල් වන්නේය. කුමාරිකාද එදවස් රාත්‍රියෙහි මනාකොට වසන ලද දොරකවුළු ඇති වටලන ලද රැකවල් ඇති සත්මාල් ප්‍රාසාදයෙහි උතුම්වූ මතුමාලේ ශ්‍රී යහන් ගබඩාවෙහි උදකළාව නිශ්චලව තමන්ගේ ශීලය අවර්ජනා කෙරෙමින් උන්නාහ. එකල ශක්‍රයෝත් රන් මසු පුරවන ලද එක් රන්තලියක් ඇරගෙණ අවුත් ශ්‍රීයහන් ගබඩාවට පහළව එකත්පස්ව බිසවුන් හා කථාකරන්නාහු මේ ජාතකයෙහි පළමුවන ගාථාවෙන් මෙසේ කියත්, මනාවූ වස්ත්‍රයක් ඇඳි ඇත් සොඬකට බඳුවූ ආකාර ඇති මට සිළුටුවූ ඌරු යුගලයක් ඇති පංච ප්‍රාසාදයකින්ද හෙබියාවූ කින්නරාංගනාවන් ඇසි හා සමාන ඇස් ඇති පාදාන්තයෙහි පටන් කේසාන්තය දක්වා සියළු අංගප්‍රතංගයෙන් කිසි ඌනතාවක් නැතිව හෙබියාවූ උතුම් ප්‍රාසාද තලයෙහි උදකලාව උන්නාවූ උත්තමාගියන්ට යාඥාකෙරෙමි, අද එක රාත්‍රිය අලංකෘත වූ මේ යහන් ගබඩාවෙහි තී හා මා එක යහන වැස සෙයාය කරම්හයි කීහ. ඉක්බිති රාජකුමාරිකාතොමෝ කියන්නී මේ දොළොස් යොදුන් පමණ සුරන්ධ නම් නුවර අතුරෙහි දිය අගල ආදි අගලින්ද මහත් දොරටු අටල්ලෙන්ද ගැවසී ගත්තේය. ආයුධ ගින්නාලද අත් ඇති දස දහසක් යොධයන් විසින් රැකවල් ගන්නා ලද එසේ හෙයින්

SANHIDA LANKA

මේ සියළුම නුවරට ඇතුළෙහි කරණ ලද මාගේ නිවාස පුරයටද යන මේ දෙකටම කිසිකෙණෙකුන් වැද්ද නොහෙක්කේය. තවද ලදරුවේවයි වෘඬවේවයි ශක්තිසම්පන්න යෝධයෙකු වේවයි අනිකුත් කිසි මහත්වූ පඬුරක් අරගෙන එන්නෙකුගේ ඊමෙක්නම් නැත එසේවූයේමේ ස්ථානයට අවුදින් මා හා සමග නැමතිවන්නාවූ තෙපි කවරෙක්හිදැයි කෙසේනම් ආයිද්දය විචාළාහ එවිට ශක්‍රයෝ කියන්නාහු එම්බල සොඳුර මම එක් දේවතාවෙක්මි දිව්‍යානුභාවයෙන් මේ ස්ථානයට ආමි තොපවනාහි අද කාහාස්වාදයෙන් සතුටු කරව තොපට මම රන්මසු පුරණලද මේ රන් තලිය පඬුරුකොට දෙමි කීහ එබස් අසා කුමාරිකාවෝ කියන්නාහු එම්බා දිව්‍ය රජ්ජුරුවනි මම මාගේ උදය රජ්ජුරුවන්හැර අනික් දෙවියෙකුවේවයි යක්‍ෂයෙකුවේවයි ප්‍රාර්ථනා නොකරමි එසේ හෙයින් මෙතන නොසිට පලායව තොපගේ පඬුරෙන් මට ප්‍රයෝජන නැත මතු මෙතනට නොයෙවයි කීහ ශක්‍රයෝද බිසවුන්ගේ සිංහ නාදයක්වැනිවූ බස් අසා නොසිට පළාගියාක් මෙන් එතනම අන්ථධානව සිට දෙවනි දවස් එමවෙලාවට රන්මසු පුරනලද රිදී තලියක් අරගෙන දෘශ්‍යමානව සිට බිසවුන් හා කථානරන්නාවූ එම්බල භද්‍රාව කාමභෝගී නම් වූ සත්ව කෙනෙක්යමක් කරණකොට ගෙණ කායදුශ්චරිතාදියෙන් හරසිරෙද්දී එසේවූ සත්‍වයාගේ යම් ඇලීමකින් මේ කාම රතියෙහි කරණලද ඇල්ම වන්නේද එසේවූ කාමරති දෙන්නවුන්ගෙන් තෙපි මනාකොට දෙනලද දෑ මම ඒ ලබනු කැමැත්තෙමි ඒ නිසා තොප සමීපයට එන මම සිස් අතින් නොයායෙමි ඊයේ දවස රන්මසු පුරණලද රන් තලියක් ගෙනාමි අද රන්මසු පුරණලද රිදී තලියක් ගෙනාමි ඒ දූනි තොපට දෙමි එක රාත්‍රිය මා හා සමඟ සෙයහාව කරවයි කීහ

එබස් අසා බිසව සිතන්නනාහු මේ තෙම කථාකරන්නට ලැබෙන්නේවීනම් නැවත නැවතත් එන්නේය එසේහෙයින් මම දූන් මොහු හා සමග බැනනොනැගෙමි සිතා මුවෙන් නොබැනම උන්නාහ ශක්‍රයෝ උන් බැණ නොණැගෙන නියාවදූන වී දවසුත් එතනම අන්තර්ධානව සිට දෙවන දවසුත් එම වේලාවට ලොහෝ තලියක කහවනු පුරා ඇරගෙන සිට සොඳුර අද මා හා කාමරතියෙන් සතප්පව තොපට මේ කහවනු පිරූ ලෝහතලිය දෙමි කීහ එබස් ඇසා බිසව කියන්නාහු එම්බල පින්වත් වූ පුරුෂය තෝ අඥණයෙහිය සත්‍වයෝ නම් ස්ත්‍රියක කෙලශ වශයෙන් වස්තුවෙන් ගිවිස්වන්නාහු යම් වස්තුවෙක් ගෙණායේවී නම් එසේවූ වස්තු දවස දවස වඩ වඩා ගෙණවුත් වර්ණා කෙරෙමින් ගිවිස්වා පොළඹන්නේය තෝ වනාහි දවසින් දවස අඩු අඩු කෙරෙමින් තාගේ ස්වභාවටත් විරුධකරන්නෙහිය පළමු දවස් රන් මසු පිරූ රන්තලියක් ගෙණායෙහිය දෙවනි දවස් රිදීතලියක් ගෙනායෙහිය තුන්වන දවස් නහවනු පිරූ ලොතලියක් ගෙණායෙහිය ඊට කාරනා කිම්දැයි විචාලාහ එකළ බෝධිසත්‍වයෝ කියන්නාහු එම්බල සොඳුර රාජකුමාරිකාව මම වනාහි වෙළඳාමෙහි ඉතාක්‍ෂවෙමි අත්‍රය නොනසමි ඉදින් තොපි ආයුෂයෙන්ද ශරීරවර්ණයෙන්ද දවසින් දවස වැඩූ නම් මමත් තොපට පඬුරු වඩ වඩා ගෙණෙන්නෙමි තොපිවනාහි දවසින් දවස හානියට පැමිණියව එසේ හෙයින් මම තොපට පඬුරුත් අඩුකොට ගෙණාමි කියන්නාහු එම්බල සොඳුර මනුෂ්‍යලෝකයෙහි සත්වයන්ගේ ආයුෂ ද ශරීරවර්ණයද පෙර හරෙනෙක්හි වත්නළ ජලයක් මෙන් චක්‍ෂුප්‍රාසාදියෙහි දවසින් දවස අඩුවන්නේය තොපගේ වනාහි පළමු දවස් ආවේලේ පැවැත්තාවූ ආයුෂද ඊයේ දවසට නොපැමිණ කෙටේරියක්ගෙන සුන්කථාක්මෙන් එසවස් අතුරු දන් විය ඊයේ දවස් පැවති ආයුෂද අද දවස් නොපැමිණ ඊයේම නිරුධවිය එසේ හෙයින් තොප පෙරවී දවස් ඈර අද දූන් මා බල බලා සිටියදීම තොපගේ ශරීරවර්ණය නපුරුවන්නේය එසේහෙයින් මෙතැන් පටන් රාත්‍රි දින යම් ඉකුත් වීමෙන් නොබෝ දවසකින් තොපි ජරිවට පැමිණෙව සොඳුර තොපි ඊට පළමුව තොපගේ රන්වන් ශරීරය ජරාවෙන් නොකෙළ සෙනතෙක් ශ්‍රේෂ්ඨ වූ ශ්‍රමණ ධර්මයන් පුරා වඩ වඩා මතු මත්තෙහි වර්ණවත් වනපරිදි කරවයි කීහ

ඉක්බිති බිසවුන් කියන්නහු එම්බල දේවතාව යම්සේ මනුෂ්‍යයෝ ජරාවට පැමිණෙත් නම් දෙවියෝ එසේ ජරාවට නොමැමිණෙත්හ ඔවුන්ගේ ශරීරයෙහි විලිපිළි නැත එසේහෙයින් මහත්වූ ආනුභානු ඇති දේවතාවෝ අතින් විචාරමි ඒ දෙවියන්ගේ ශරීරය නවර ප්‍රකාරයක් ඇත්තේදැයි විචාළහ ඒ බව ප්‍රකාශකොට කියන්නාවූ ශක්‍රයෝ එම්බළ සොඳුර මනුෂ්‍යයෝ රූපයෙන්ද ඡවිවර්ණයෙන්ද චක්‍ෂු ප්‍රසාදයෙන් ද යන මේ සියල්ලෙන් යම්සේ පිරිහී ජරාවට පැමිනෙත්ද දෙවියෝ එසේ නොවෙති ඔවුන්ගේ ගාත්‍රයෙහ විළිපිළි නැත සිළිටිවූ ගණරන් පටක් හා සමාන ශරීර වර්ණ වන්නේය දවසක් පාසා දිවුන දිවුනා ඓශ්චර්යද වැඩෙන්නේය යම් සේ පිරිහෙන්නාවූ ස්වභාව ඇත්තේය එසේ හෙයින් තොපි ජරාවට නොපැමිණ ගිහිගෙන් නික්ම මහණව එසේ කල්හි තොපි මේ ක්‍ෂය ස්වභාව ඇති මනුෂ්‍යලෝකයෙන් චුතව වර්ධන ස්වභාව ඇති දිව්‍යලෝකයෙහි උපදවාදැයි කීහ බිසව් දිව්‍යලෝකයෙහි යම් වර්ණණා අසා ඊමයන්ට මන්ච්චාරන්නාවූ දිව්‍යරජ්ජුරුවෙනි ක්‍ෂත්‍රියාදී නොයෙක් කුලජාති භේද ඇති මනුෂ්‍ය ජනසමූහ කුමට හයින් හා කාකෙරේ හයින් හා යන ස්වභාව ඇති මනුෂ්‍ය ලෝනයෙන් දිව්‍යලෝකයට යෙත්ද ඒ තමා දිව්‍ය ලෝකයටත් යන්ට මන් නුවනැත්තා කියනලදහ ඒ මාර්ගයන් අතුරෙන් කවර මාර්ගයෙක්හි සිටි සත්‍වතෙම නොබා පරලොවට යන්නෙහිදැයි විචාළාහ දිව්‍යලෝකයට යන්නාවූ ශක්‍රයෝ මෙසේ කියත් එම්බල සොඳුර උදයභද්‍රාව යම්සත්‍වකෙනෙක් කායවන් මාන්යන් වාරත්‍රය සකස්කොට පිහිටුවා අකුසල් නොකොට කුශලධර්මයන් සමාදන්ව පවත්වන්නේද බොහෝ

SANHIDA LANKA

ආහාර පාණ වර්ගයන් දානවිභාග සැදැහැයෙන් යුක්තව ශ්‍රමණ බ්‍රහ්මණාදීන්ට දන්දේද සතර සංග්‍රහවතින් ජනරංජනය කෙරේද යන මෙතෙක් ගුණයෙහි පිහිටියේපරලොවට නොබා යන්නේයයි කීහ බිසව්එබස් අසා උන්ට සතුටුව ස්තුති කරන්නාහු යම්සේ මැණිකෙණෙක් තමාගේ වැදූ දරුකෙනෙකුටත් වැඩ කැමතිව අවවාදකෙරෙත්ද ඒ පරිද්දෙන්ම තොපිත් මටත් වැඩකැමතිව අනුශාසනාකළාහ මට එසේ අවවාද කරන්නාවූ විපුල වූ ශරීරසෝභා ඇති මනාවූ වෘත සම්දානය ඇති තෙපි තමා කවුරුදැයි විචාරමි මට කියවයි කීහ ඉක්බිති බෝධිසත්වයෝ කියන්නාහු එම්බල සොදුරුදැකුම් ඇති භද්‍රාව මම වනාහි මේ මා උපන් ජාතියට පළමු ජාතියෙහි තොපට වල්ලභවූ උදය රජ්ජුරුවෝ නම් මමය ඒ මම තී සමීපයෙන් මියගොස් තව්තිසා භවනයෙහි ශක්‍රදේවේන්‍ද්‍රව උපනිමි එතනින් තොප සමීපයට එන්නාවූ මම කෙලශ වසඟ චිත්තයෙන් ආයෙන් නොවෙමි තොපවිමසා පියා පළමු කතිකාවක් කළමෝවේද ඒ කතිකාවෙන් මිදි තොපට මම අසවල්තෙන උපනිමි කියා පියා යන පිණිස ආමි, දැන් ඉන් මිදිනිමි එසේ හෙයින් මම දෙව්ලොවට යෙමි කිහ, එසඳ බිසව් කඳුළුධරා වගුරුවමින් ස්වාමිනි නුඹ වහන්සේ උදය රජ්ජුරුවෝද නුඹවන්සේගෙන් වෙන්ව මා විසියහෙන්නේ නැත යම්සේ පෙර නුඹ වහන්සේ මා හා එක්ව වාසය විනම් දැනුම් එපරිද්දෙන්ම එක්වන නියායෙන් මට උගන්වා කතිකාවෙන් මිදි වැඩිය මැනවැයි කීහ. නැවත බිසවුන්ට අනුශාසනා කරන්නාවූ ශක්‍රයෝ මෙසේ කියත්, එඹල සොඳුර උදයභද්‍රාව මේ ලෝකයෙහි සත්වයන් ආදී මධ්‍යම අන්තිමයන් මෙතුන්වයසය සිඝ්‍රව වහනය කරන්නාවූ ගංගාවක් මෙන් නොනැවත වහාම ඉක්ම ගෙවෙන්නේය. උපන්නාවූ සත්වයන්ට නොනැසී සිටිමෙක් නැත. බුදුන් ආදීකොට ඇති සියළු සත්වයන්ගේ ජීවිතය අස්ථිර වන්නේය. සියල්ලවුන්ම රන්වන්වූ මට සිළුටු වූ ශරීරයක් ඇත්නම් එයින් නිරන්තරයෙන් ම ජරාවට පැමිණ නස්නේය. ඒ කාරණාවෙන් උදයභද්‍රාවෙනි තොපිත් මේ සියල්ලම පැමිණෙයි සිතා වහා නොපමාව දසකුශල කර්මපථයෙහි යෙදෙව. තවද සොඳුර යම් එකම සත්වයක්හට මේ පෘථිවි මණ්ඩලය හා සියළු යසසෙක් පැමිණියේ වීනම් එහි තෘප්තියක් සෑහෙයි යන්නක් නොසිතා පහනොවු කේලශ චිත්තයෙන් කළුරිය කරන්නේය.

එසේ හෙයින් තෘෂ්ණාවෙහි තෘප්තියක් නැතිනියාව දනුව. තවද මෑනියන් පුතනුවන්ටද පුතනුවන් මෑනියන්ටද පියානෝ පුතනුවන්ටද පුතනුවෝ පියානන්ටද බෑනෝ නැගනියන්ටද නැගනියෝ බෑනන්ටද වල්ලභයා ස්ත්‍රීන්ටද ස්ත්‍රී වල්ලභයාටද ස්වාමියා වස්තුවටද වස්තුව සත්වයාටදැයි මේ සියල්ලම මරණ කාලයෙහි පළමුවශයෙන් ඔවුනොවුන් නොබලා යාමෙන් ස්ථිරයක් වීමක් නැතිබව දනුව, තවද මේ සංසාරයෙහි කපුටු ආදී තිරිසනුන්ගේද මනුෂ්‍යයන්ගේද ආදීවූ සියළු සත්වයන්ගේද යන මේ දුගතී සුගති දෙක්හිම සත්ව යන්ගේ භෝජනද යසසද එක්ව කරන්නාවූ වාසයද ජීවිතයද යන මේ සියල්ලම අස්ථිරයයි දැන අප්‍රමාදව දසකුශල කර්මපථයෙහි යෙදෙවයි කියා මෙසේ මහබෝසතානෝ අවවාද කළාහ. බිසව්ද බෝධිසත්වයන්ට අවවාද කියන්නාහු දේවතාවෙනි තොප කියේ ඉතා යහපත මේ සත්වයාගේ ජීවිකාව නම් ස්ථිරනොවෙයි ස්වල්ප දුකින් මිශ්‍රය එසේ හෙයින් මම කසීරට හා සුරන්ධපුරය ඇර උදකළාව තපටස යෙමි කීහ. බෝධිසත්වයෝ බිසවුන්ට අවවාදදී දිව්‍යලෝකයටම ගියාහ. බිසව්ද දෙවන දවස් උදෑසන අමාත්‍යයන්ට රාජ්‍යය පාවාදී තමන්ගේ එම නුවර සිත්කළුවූ උයනෙහි සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධර්මයෙහි හැසිර අයුසංස්කාරයාගේ කෙළවර තව්තිසා භවනයෙහි බෝධිසත්වයන්ටම පාදපරිචාරිකාව උපන්නාහ. සර්වඥයන් වහන්සේ ද මේ උදය භද්ද ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශකොට පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර ශාසනයේ උකටලීවූ භික්ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටිසේක. එසමයෙහි උදයභද්‍රාදේවී නම් දැන් මේ රාහුලමාතාවෝය. එසමයෙහි ශක්‍රදේවේන්ද්‍රයෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේකී.

SANHIDA LANKA

# පාණීය ජාතකය

තවද මේ ජාතකය ශාන්තවූ දාන්තවූ ගුණ ඇති බුදුන් වහන්සේ කේලේශ නිග්‍රහයක් අරභයා වදාළසේක. එක්සමයෙක්හි සැවැත්නුවර වැසි පන්සියයක් පමණ පුරුෂයෝ සර්වඥයන් වහන්සේගෙන් බණ අසා මහණ උපසම්පදා ලැබ විහාර සීමා ඇතුලේම වාසය කරන්නාහු මධ්‍යම රාත්‍රීවෙලේහි කාමවිතර්කයක් උපදවාහු මෙහි වර්ථමාන කථා යටකියන ලද්දා හා සදෘශවන්නේය. මෙහි බුදුන් නියෝගයෙන් ආනන්දසාමින් විසින් සංඝයා වහන්සේ රැස්කළ කල්හි බුදුහු පණවන ලද ධර්මාසනයෙහි වැඩ හිඳී භික්ෂුකෙණෙකුන් වහන්සේ උදෙසා සාමාන්‍යයෙන් වදාරණසේක් එඹාමහණෙනි කේලශයෝ නම් ක්ෂුද්‍රයයි යන්නෙක් නැත. භික්ෂූන් විසින් නම් උපන්නාවූ කෙලශයන් එමවිටම නිග්‍රහමකටයුතුය. පුරාතණයෙහි නුවනැත්තෝ අබුද්ධෝපාද කාලයෙහි පවා ක්ලෙශ නිග්‍රහ කොට පසේබුදුවුවෝ වේදැයි වදාරා එක්තරා භික්ෂුකෙණෙකුන් වහන්සේ විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.
ඒ කෙසේද යත්
යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි කසීරට එක්ගමෙක්හි යාළුවෝ දෙදෙනෙක් පැන් ලබූ දෙකක් ඇරගෙණ කුඹුරට ගොස් එක්තැනෙක තබා නියර ආදීවූ දෙය කොටා පැන් පිපාසවූ කල්හි පැන් තිබූ තෙනට ඇවිත් පැන් බී යන්නේය. එකල උන්දෙදෙනා අතුරෙන් එකෙක් පැන්බොන පිණිස අවුත් තමාගේ පැන් නොනසන පිණිස අනිකාගේ පැන් ලබ්බෙන් පැන් බී මෙහෙකොට සවස ගෙට යන පිණිස ගොස් එක්තෙනකින් නහා ගොඩනැගී සිට අද මාගේ කායවාරයෙන් කිසි පාපයක් පිරුනේදෝහෝයි සිතා පරීක්ෂාකොට සොරා පැන් බු නියාව දැන කලකිරිමට පැමිණ මේ මාගේ තෘෂ්ණ වඩනේ මා අපායට දමාපියන්නක් මෙන්ය. එසේ හෙයින් ලෝභ නිග්‍රහ කෙරෙමි සිතා සොරා පැන්බී මම අරමුනුකොට විදර්ශනා වඩා පසේ බුදු බවට පැමිණ තමන් විසින් ලබන ලද ප්‍රත්‍යෙක බෝධිඥාණය ආවර්ජනාකොට සිටියාහ. එකල බඳවු අනික් පුරුෂයා නහා ගොඩනැගී සිට ඇයි යහළු ගෙට යම්හයි කීය. එබසට පසේ බුදුහු වදාරණසේක් තොපි ගෙට යව මට ගෙන් ප්‍රයෝජන නැත අපි පසේබුදු වුනමැයි වදාළසේක. එබසට ඒ පුරුෂයා කියන්නේ පසේබුදුහුනම් තොපසේ නොවෙතියි කීය. පසේබුදුහු වදාරණ සේක් එසේකල පසේ බුදුහු කෙබඳුදැයි වදාළසේක. ඒ පුරුෂයා කියන්නේ පසේ බුදුන්ගේ දැගුල් මනා ඉසකෙස් වන්නේය. කාසය වස්ත්‍රය අඳිනේය. උතුරු හිමාලයෙහි නන්දමුලක නම් පබ්භාරයෙහි වසන්නාහයි කීහ. එකල පසේබුදුන් අතින් ඉසපිරිමැද එසේක ඒ ක්ෂණයෙහි ගිහිවේෂ අන්තර්ධානව මනාවූ රන්වූ සිවුර දෙපට අඳනා ලද්දේමවිය. විදුලියවන් පටිය බඳනා ලද්දේමවිය බුදුවද පෙත්තක් සමාන පැහැ ඇති පොරෝනා සිව්රද ඒකාංශයෙන්හි උරයෙහිම විය. මේඝවර්ණවූ පාංශුකූල සිව්ර කරණලද්දේම විය. මුන්වන්වූ මැටිපාත්‍රය වංඋරයෙහිම එල්වන ලද්දේම විය. මෙසේ ඒ පසේ බුදුහු ආකාශයෙහි සිට ධර්මදේශනා කොට නන්දමුල පබ්භාරයට වැඩිසේක. එසේම අනිකුත් කසිගම්වැසි එක් කෙළඹි පුත්‍රයෙක් සල්පිල උන්ගේ එක් පුරුෂයෙකු තමාගේ භාර්යාව ඇරගෙණ යන්නාහු දැක උතුම්වූ රූ ඇති ස්ත්‍රියක ඉඳුරන් බිඳ ලෝභයෙන් බලා නැවත සිතන්නේ මෙලෝභයසේ මෙසේ වඩනේ වී නම් මා නරකහි එලන්නේයයි කලකිරී විදර්ශනා වඩා පසේ බුදුව ආකාශයෙහි සිට ධර්මදේශනා කොට නන්දමුලක නම් ගල්ලේනටම වැඩිසේක. තවද කසීගම්වැසි දෙපුතුපියන් එක්ව ගමනක් නික්මුණාහ.
එක් මහාවනයෙහි සොරු සිට දෙපුතුපියන් කෙණෙක් ලදුනම් පියා රඳවා ගෙණ තාගේ පියා වස්තු ගෙණවිත්දී ගලවාගත සිට පුතුයවන්නාහ. පුතු රඳවාගෙණ පියා යවන්නාහ, දෙබෑ කෙණෙක් ලදුනම් මළු රඳවාගෙණ බෑයා යවන්නාහ. ශිෂ්‍ය දෙදෙනකු ලදුනම් ගුරුන් රඳවාගෙණ ශිෂ්‍යා අරින්නාහ. ශිෂ්‍යතෙම ශිල්පලෝභයෙන් වස්තු ගෙණවිත්දී ගුරුන් ගලවාගෙණ යන්නේය. එකළ ඔහු දෙපුතුපියන් ඒ සොරු වන්මුඛයෙහි සිටියාදැක ඔවුනොවුන්ට පියානෝය පුතනුවෝයයි නොකියම්හයි කථිකා කොට සෙරුන්ට අසුව තොපි ඔවුනොවුන්ට කුමක් කියව්දැයි විචාළ කල්හි අපි කිසිනෑකමක් නැත්තම්හයිදැන බොරු කියා සොරුන්ගෙන් ගැලවී සවස නාහා ගොඩ නැගී සිට පුතනුවෝ තමන්ගේ ශීලය පරීක්ෂා කරන්නාහු තමන් කී බොරුව දැන මේ අකුශලය වඩනේ මා නරකයෙහි එලන්නේයයි මේ කේළශයට නිග්‍රහ කෙරෙමි විදර්ශනා වඩා පසේ බුදුව ආකාශයෙහි සිට පියානන්ට ධර්මදේශනා කොට නන්දමුලක පබ්භාරයට වැඩිසේක. තවද කසී ගම්වැසි එක් ගම්දෙටුවෙක් ප්‍රාණඝාත නොකරන්නේය. එකල බිලියම් කරණ පිණිස මහජනයා රැස්ව ගම්දෙටුවාට කියන්නාහු ස්වාමිනි අද බිලියම් කරණ දවසය එසේ හෙයින් අප ඇම ඌරන් මුවන් මරා බිලියම් කරම්හයි කීහ. එබසට ගම්දෙටුවානෝ කියන්නාහු පෙර තොප කරණ සැටියේ කරවයි කිහ. මනුෂ්‍යයෝද බොහෝ මච්ඡමාංශ දැක මේ සත්වයෝ මෙතෙක් ප්‍රාණ වධ කරන්නාහු මාගේ එකවචනය නිසාම කළහයි කුකුස්ව කවුළුදොර සිට විදර්ශනා වඩා පසේබුදුව ආකාශයට නැගී ධර්මදේශනා කොට නන්දමූලක නම් පබ්භාරයට වැඩිසේක. තවද කසීගම් වාසී ගම් දෙටුවෙක් සැනකෙළි පිණිස එක්වූ දනව්වාසීන්ට සුරාපානාදිය දී කෙළුහයි අවසරදී ඔහු රාබී මත්ව ඔවුනොවුන් මරා දණ්ඩනයට පැමිණියාහ. එකල ගම්දෙටුවානෝ ඒ බව

SANHIDA LANKA

දැක සිතන්නාහු මා නොකිවොත් මොහු මෙතෙක් දුක් නොවින්දෝ වේදැයි මෙපමණකින් කුකුස්කොට විදර්ශනා වඩා ප්‍රත්‍යෙක බොධිඥානය උපදවා මහජනයාට ධර්මදේශනාකොට ආකාශයට පැනනැගී නන්ධමුලක පබ්භාරයට වැඩිසේක. මෙසේ කල්යාමකින් පසේබුදුහු පස්දෙනා වහන්සේ එක්ව පිඬුසිඟාන පිණිස බරණැස් නුවර දොරට බැස මනාකොට හැඳ පෙරව ප්‍රසාදවහවූ යාම ඊමෙන් පිඬුසිඟා ඇවිදිනාසේක් රජගෙයි දොරකඩට පැමිණිසේක. රජ්ජුරුවෝ උන්වහන්සේලා දැක මහසතුටුව රජගෙට වඩාගෙණගොස් පයසෝධා සුවඳතෙල් ගල්වා මධුරවූ ආහාර පාණ වර්ගයෙන් සතප්පා එකත්පස්ව ඉඳ ස්වාමිනි නුඹ වහන්සේලා අභිවෘයෙහිම් පැවිදි හොබනේය. මේ වයසේම මහණවනසේක් කාමයෙහි කෙසේ ආදිනවයක් දැක කුමක් අරමුණුකොට වු සේක්දැයි විචාළසේක. එකල ඔබ හැමත් වෙන් වෙන් කොට වදාරණසේක් එඹා රජ්ජුරුවෙනි අපි දෙයාළු කෙණෙකුන් මෝ පැන් ලබුදෙකක් ඇරගෙණ ගොවිමේවරයට ගිය මෝ පිපාස කල එකෙක් ගොඩ නැගී පැන් බෝම්හ එකල මම මාගේ පැන් රක්නා පිණිස මිත්‍රයාගේ ලබ්බේ පැන් නොකියා බිපීම. ඒ අකුශලයෙහි කල කිරිය, මා පැවිදිවූයේයයි වදාළසේක. අනික් පාසේබුදුහු වදාරණසේක් රජ්ජුරුවෙනි මම පෙර ස්ත්‍රියක දැක ලෝභය උපදවා ඒ අකුශලයෙහි කිරි මෙබන්දක් නැවත මාකරා නොඑවයි කියා මා පැවිදිවුයේයි. වදාළ සේක.

තවද එක්කෙණෙකුන් වහන්සේ වදාරණසේක් පෙර අපි දෙපුතුපිය කෙණෙකුන්මෝ වනයෙහි සොරුන්ට අසුව විචාළකල්හි අපි නොනෑයම්හයි බොරු කිහ. ඒ අකුශලයෙහි කලකිරී මෙබන්දක් මාකරා නොවයි කියා මා පැවිදිවුයෙයි වදාළසේක. තවද එක්කෙණෙකුන් වහන්සේ වදාරණසේක් මහරජ පෙරමම ගම්දෙටුවක්ව දේවතාවන්ට බිලිදෙන පිණිස සත්වයන්ට ප්‍රාණඝාත කරන්ට අනුදක්කෙමි, ඔහු හැමදෙනාම බොහෝ ප්‍රාණඝාත කරන්ට අනුදක්කෙමි, ඔහු හැමදෙනාම බොහෝ ප්‍රාණඝාත කළාහ. ඒ දැක මානිසාවේද මෙතෙක් තිරිසනුන් නටුයේයයි ප්‍රාණඝාතයෙහි කලකිරි මතු මා කරා මෙසේවු අකුශලයක් නොවවයි කියා මා මහණවුයේයයි වදාළසේක. තවද එක්කෙණෙකුන් වහන්සේ වදාරණසේක් මහරජ පෙර මම ගම්දෙටුවක්ව සැනකෙළි දවසෙක බොහෝ දෙනාට අනර්ථයට කාරණාවු සුරාපානය බොන්නට අවසරදිනිමි. ඔහු ඇම රා බි මත්ව ඔවුනොවුන්ට හිංසා පීඩාකොට බොහෝ දෙන දණ්ඩනයට පැමිණියාහ. ඒ අකුශලය දැක නැවත මෙබන්දක් මා කරා නොඑවයි කියා මහණ වුයේයයි වදාළසේක. රජ්ජුරුවෝ පස්දෙනාවහන්සේම ධර්මය අසා සතුටුව සිවුරු පිළිඳ බෙහෙත් පසද පිළිගැන්වුහ. උන්වහන්සේලාත් රජ්ජුරුවන්ට අනුමෙවැනිබණ ධර්මදේශනාකොට නැවත වාසස්ථානයට වැඩි සේක. එදවස් පටන් රජ්ජුරුවෝ වස්තුකාමයෙහි කලකිරී ඇල්මක් නැතිව නොයෙක් රසයෙන් උතුම්වු ආහාරය අනුභවකොනොකට ස්ත්‍රින් හා බැණ නොනැසීම නොකැඳවා ශ්‍රියහන් ගබඩාවට වැඳ සුදුවූ භිත්තිය බලා තිසුනුපිරි යම්කොට ධ්‍යාන උපදවා පංචකාමයෙහි නින්දාකරන්නාවු බොහෝ පසමිතුරන් ඇති පිළිකුල් දුර්ගන්ධවු මේ කයටනින්දාවේවයි මෙබඳුවු මම කාමයෙහි සෙව්නේම් මෙබදු ධ්‍යාන සැපයක් නොලබම්ද, එසේවු කාමයට නින්දාවේවයි කියමින් උන්හ,

ඉක්බිත්තෙන් බිසව් රජ්ජුරුවෝ පසේබුදුන්ගෙන් බණ කථා අසා කලකිරුණාවූ ස්වරූපයෙන්ද අප හා සමග කථානොකොට යහන් ගබඩාවට වන්හ. ඒ මා පරීක්ෂාකරන්ට උවමැනවැයි සිතා ශ්‍රි යහන් ගබඩාව දොරකඩට ගොස් කාමයට නින්දාකොට උදන්අනන්නාවු රජ්ජුරුවන්ගේ බස් අසා රජ්ජුරුවෙනි කාමයට නින්දානොකරව, කාම සැපසේවු සැපයෙක් ඇද්දැයි වර්ණනා කරන්නාවු රජ්ජුරුවෙනි මේ කාමය නම් මහත් ආස්වාද ඇත්තේය. කාමයට වඩනාවු එකද සැපයෙක් නැත. එසේ වු කාම සැපයට යමෙක් සිටියේ වී නම් සත්වතෙම අපායට නොගොස් සර්වගයෙහිම උපන්නේයයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ බිසවුන්ට රැහැනිව නැගි සිටියාවු චණ්ඩාලිය කුමක් කියවුද, කාමයෙහි සැපයෙක් නම් කොයින්ද පෙරලෙන්නාවු ස්වභාව ඇත්තේයයි නින්දාකරන්නාවූ මේ කාමය ස්වල්ප සැප ඇත්තේය. කාමයට වැඩ දුකකුත් නැත. එසේ වුවේ වී නමුත් ඒ සත්ව තෙම නරකයෙහි උපදනේය.තවද නොකොට මුවහත් ගානාලද විෂපෙවු කඩුවක් යම්සේද ශස්ත්‍රයක් යම්සේද ලය එල්ලට බැඳ එල්ලන ලද්දේ යම්සේද කාමයත් එපරිද්දෙන්ම මහත්වුභය හා දුක් ඇත්තේය. තවද පුරුෂ ප්‍රමාණයටත් වැඩි ගැඹුරුවු සාලගුරුවලෙක්හි හුනුවාවු සත්වයෙකුට දවසක් මුලුල්ලෙහි රත්කරණ ලද යකබලෙක්හි හුනු සත්වයෙකුට යම්සේ දුක්ද කාමය නම් ඊටත්වඩා දුක් ඇත්තේය. හලාහල විෂයෙන් යම්සේ කකියන තෙලක් යම්සේද පිරිගිය තඹ ලෝහාදිය යම්සේ සත්වයන් හුනුකල දුක්දේද මේ කාමය ඊටත් වඩා දුක් ඇත්තේයයි යනාදින් බිසවුන්ට ධර්මදේශනා කොට අමත්‍යයන් රැස්කරවා එඹා පින්වත් අමාත්‍යයෙනි තොපි ඇම රාජ්‍යය පිළිපදුව මම මහණවෙමි කියා අමාත්‍යයන්ට රාජ්‍යය පාවාදී මහජනයා හඬමින් වලපමින් සිටියදී නැගිසිට අවවාදකොට ආකාශයෙන් උතුරුහිමාලයට ගොස් සිත්කළු තෙනක පන්සල් මවා සෘෂි ප්‍රවෘජ්‍යාවෙන් පැවිදිව ආයුෂයාගේ කෙළවර ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය. සර්වඥයන් වහන්සේ මේ පාණි ජාතකය ගෙණහැර දක්වා වදාරා එම්බාමහණෙනි කේලශ නම් කුඩායයි නැත ස්වක්පමාත්‍රයකුදුව නුවනැත්තන් විසින් නිග්‍රහ කටයුතුයයි වදාරා චතුස්සත්‍ය ප්‍රකාශකොට වදාළ සේක ඒ ධර්මයන්ගේ කෙළවර පන්සියයක් භික්ෂූන් වහන්සේ රහත්වු සේක එකළ පසේ බුදුන් වහන්සේ පිරිනිවී සේක එකළ බිසව් නම් දැන් මේ රාහුල මාතාවෝය එකළ රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළ සේක

SANHIDA LANKA

# යුඩජ්ජය ජාතකය

තවද මේ ජාතකය සත්‍වයන් ජාතිකාන්තරාදීන් තරණය කොට සාත්තුවක් වැනි වූ හෙයින් ශාස්තෘ නම් බුදුරජාණන් වයන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මහාභිනික්මන් අරභයා වදාළ සේක.
ඒ කෙසෙද යත්
එක් දවසක් දම්සබා මණ්ඩපයෙහි රැස්ව උන් භික්‍ෂූන් වහන්සේ එම්බා ඇවැත්තනි ඉදින් සර්වඥයන් ගිහිගෙහි වසනසේක් වී නම් සියළු චක්‍රාවාට ගර්භයට නායකවූ සප්ත රත්නයෙන් සමන්විතව සෘධියෙන් සමන්විතවූ පුත්‍රයන් දහසක් පරිවාරකොට ඇත. සක්විති රජවනසේක, එසේවූ ශ්‍රී විභූතියක් හැර කාමයෙහි ආදීනව දක මධ්‍යම රාත්‍රිවෙලෙහි ඡන්න නම් අමාත්‍යයාගේ සහායෙන් කන්ථක නම් අශ්වරාජයාට නැගී මහබිනික්මන් නොඅවානම් ගංතෙරදී මහණව සාවුරුද්දක් දුෂ්කර ක්‍රියාකොට සර්වඥතා ඥානයට පැමිණ සේකැයි බුදුන්ගේ ගුණ කථාව කියමින් උන්සේක. එකල බුදුහු දිවකනන් අසා වදාරා තුන්තරා ගමනකින් එක්තරා ගමනකින් දම්සභා මණ්ඩපයට වැඩ ධර්මාසන මස්තකයෙහි වැඩ හිඳ මා එන්නට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා මෙනෙම් කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි එඹා මහණෙනි බුදුහු දැන්මතු නොවයි පෙරත් මහබිනික්මන් නික්මුනෝ වේදැයි වදාරා එක්තරා භික්ෂූකෙණෙකුන් වහන්සේ විසින් ආරාධිතවූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.
ඒ කෙසේද යත්
යටගිය දවස බරණැස් නුවර තෙම උදය ජාතකයෙහි සුරුන්ධන නම් චුල්ල සුතසෝම ජාතකයෙහි සුදස්සන නම, සොනන්නද ජාතකයෙහි බ්‍රහ්මවර්ධන නම, බණ්ඩහාල ජාතකයෙහි පුෂ්වතීම නම් මේ යුවරජය ජාතකයෙහි රමේ නම් නුවරයක් විය. එහි සබ්බදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි උන්ගේ දහසක් පමණ පුත්‍රයෝ වන්නාහ. ඔවුන් හැමදෙනාට වැඩිමාළු පුතනුවෝ යුද්ධජ්ජය කුමාරයන්ට යුවරජ දුන්නාහ. ඒ යුද්ධජ්ජය කුමාරයෝ එක් දවසක් උදෑසනක්සේ උතුම්වූ රථයකට පැන නැගී මහත්වූ ශ්‍රී සමෘද්ධියෙන් උයන් කෙළියට යන්නාහු ඒ මග තණ අග මකුළුදැල් ආදියෙහි මුතුදැල් ආකාරයෙන් එල්ලෙන්නාවූ පිණිබිංදු දක යහළු රථාචාර්ය මේ කිමෙක්දැයි විචාරා දේවයන් වහන්ස මේ හිමකාලයෙහි වැටෙන්නාවූ තුසාර බින්දුයයි යනු අසා දිවාමාන උයන් කෙළි කෙළ සවස් වෙලෙහි නැවත නුවරට එන්නාහු පිණිබිඳු නොදක රථාචාර්යයා අතින් ඒ නොපෙණෙන්ට කාරණාකිම්දැයි විචාරා දේවයන් වහන්ස ඒ පිණිබිඳු ඉරනැගී කල්හි සිඳි බිඳි යන්නේයයි කී කල්හි මේ සත්වයන්ගේ ජීවිත සංස්කාරයත් තණ අග රැඳි පිනිබිඳු පරිද්දෙන් අස්ථිරවන්නේයයි කල කිරීමට පැමිණ මා විසිනුත් ජාතිජරා මරණය යන මේ සියල්ලත් නොපෙණෙන තෙක් දෙමව්පියන් අනුදන්වා මහණවන්නට වටනේයයි තුශාර බින්දු අරමුණුකොට මේ භවත්‍රය ගිණිගෙණ දිලියෙන්නාවූ ගෙයක් මෙන් සිතා තමන්ගේ ගෙට ගොස් මනාකොට සරහන ලද ශාලාවෙහි උන්නාවූ තමන්ගේ පියානන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිට මහණවන්නට යාඥාකරන්නාහු මෙසේ කියත්.
මිත්‍රයන් හා අමාත්‍යයන් විසින් පිරිවරණ ලද රථොත්තමවූ දේවයන් වහන්ස නුඹ වහන්සේ වැඳ දන්වම් මම මහණවනු කැමැත්තෙම් නුඹ වහන්සේ අනුදන වදාළ මැනවැයි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ ප්‍රතිෂේප කොට වලකා කියන්නාහු එඹා පුත තොපට ඉදින් පංචකාමයෙන් යමෙක් අඩුවිනම් මම ඒ සම්පූර්ණකොටලම් යමෙක් තොපව හින්සාවක් පීඩාවක් කරන්නේ වී නම් එයිත් මම වලකම් එසේ හෙයින් තොප මහණ නොවවයි කීය. එබස් අසා කුමාරයෝ කියන්නාහු දේවයන් වහන්ස මට පංචකාමයෙන් අඩුවෙකුත් නැත. හින්සාවෙක්කරණ කෙණෙකුත් නැත. බල එකෙක් නම් ජරා මරණ මාකරා නොඑන්ගෙන් පළවුම මම මට ප්‍රතිෂ්ඨාවක් කරණා කැමැත්තෙම් කෙසේවූ පිහියෙක් ඇද්දැයි යතහොත් යම්විපයෙත් ජරාමරණ නැවති සොරහු නොපරීනම් එසේවූ නිර්වාණ නැමති විපයට යනු කැමැත්තෙම් මා නොවැලකුව මැනවයි කීහ. මෙසේ පියානෝ පුතනුවන් වලක්නාවූ පුතනුවෝ පියානන්ට යාඥාකන්නාහයි යනාදින් බොහෝ ප්‍රත්‍යුපකාර කොට නැවත කුමාරයෝ කියන්නාහු රථොත්තමවූ දේවයන් වහන්ස කාමයෙන් මත්වූ කාම වසඟයට පැමිණි යාවු ජරා වසඟයට පමුණුවාද යම්සේ මම සර්වඥතාඥානය සමධිගමය කළ හෙන්නම් එපරිද්දෙන් මා නොවලකා මහණ වන්ට අවසර දුනමැනවැයි කීය. මෙසේ කී කල්හි රජ්ජුරුවෝ කිසිවක් මුවෙන් නොබැන උන්හ.
එකල කුමාරයන්ගේ මව් බිසව් පුතනුවන් පියානන් අතින් මහණවන්නට අවසර ඉල්වන නියාව අසා කුමක්කිව්ද දරුවෙනි කියමින් වියළිනාවූ හෘදයවස්තුව හා මුඛ ඇතිව රන්සිවි ගෙයකට නැගී වහ වහා අධිකරණ ශාලාවට අවුත් පුතනුවන්ට යාඥාකරන්නාහු එඹා පුත තොපට යාඥාකොට වලකාකියම් මම තොප බොහෝ කාලයක් දක දක ඉන්නා කැමැත්තෙම් එසේ හෙයින් පුත යුද්ධජ්ජය කුමාරයානෙනි තොප මහණ නොවවයි කිහ. ඒ අසා කුමාරයේ කියන්නාහු එඹා මැනියෙනි තණ අග පිණිබින්දු යම්සේ ඉරුනැගිකල්හි සිඳි බිඳි විනාශයට පැමිනේද එපරිද්දෙන්ම සත්වයන්ගේ ආයුෂයත් විනාශයට පැමිණෙන්නේය. එසේ

SANHIDA LANKA

හෙයින් මා නොවැලකුව මැනවැයි කීහ. බිසවු මෙසේ කී කල්හි නැවතත් යාඥාකර පියා නන්ට කියන්නාහු රථොක්තමවු රජ්ජුරුවන් වහන්ස සංසාර කාන්තාරයෙන් එතරවන්නාවු මා වලකන මේ මාගේ මැනියන් වහා යානාවකට නැගි රජගෙට යන පරිද්දෙන් සම්මත කළ මැනවැයි කීහ. රජ්ජුරුවෝ පුතනුවන්ගේ බස් අසා බිසවුන්ට කියන්නාහු සොඳුර තොප වහා රන්සිවි ගේකට පැනනැගී රතිවර්ධන ප්‍රාසාදයට නැගෙවයි කීහ. බිසව රජ්ජුරුවන්ගේ බසට සිටියනොහි සිවිගේකට පැනනැගී ස්ත්‍රිසමුහයා පිරිවරා ගොස් ප්‍රාසාදයට නැගී කුමකින් කුමක් වේදෝහෝයි විනිශ්වය ශාලාවේ දොර බලබලා සිටියාහ. බෝධිසත්වයෝ මැනියන් ගියකල්හි නැවත පියානන්ට යාඥාකොට පියානන් වහන්සේ විසින් වැලකිය නොහි එසේ වීනම් තොපගේ මනෝ රථය බුදුන් පමුණුවා ගණුවයි අනුදත්කල්හි බෝධිසත්වයන්ගේ මනෝ රථය මුදුන් පමුණුවා ගණුවයි අනුදත් කල්හි බෝධිසත්වයන්ගේ මල්වු යුදිටසීල කුමාරයෝද පියානන් වැඳ පියානන් වහන්ස මට පැවිද්ද අනුදත මැනැවැයි අනුදන් වාගෙණ දෙබෑයෝම පියානන් වැඳ සමුගෙණ පංචකාමය හැර මහජනයා පිරිවරා විනිශ්වය ශාලාවෙන් නික්මුණාහ. බිසව් යන්නාවු බෝධිසත්වයන් දැක මාගේ පුතනුවන් මහණාවුකල්හි මේ රම්‍ය නුවර සිස්වන්නේයයි අඬන්නාහ. එඹා වටකොට සිටිනා ස්ත්‍රීන් සබ්බේ දත්ත පියරජ්ජුරුවන් විසින් අනුදන්නාලද මාගේ පුතනුවෝ තපසට යන්නාහ. උන් තපසට ගියකල මේ රම්‍ය නුවර සිස්වන්නේය. තොපි හැම වහා ගොස් වලකවයි කීහ. බෝධිසත්වයෝ තවම මහණාව නොවුනාව දෙමව්පියන් වැඳ මලනුවන් යුධිටඨල කුමාරයන් කැඳවාගෙණ නුවරින් පිටත්ව මහජනයා වලකා හිමාලයවනයට වැද සිත්කළුවු තැනක පන්සල්මවා සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධ්‍යානභිඥාවෙන් උපදවාගෙණ වනමුල් පලාඵලයෙන් ජීවත්වන්නාහු ආයුෂයාගේ කෙළවර බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය. ඒ අර්ථය ප්‍රකාශ කරන්නාවු බුදුරජානන් වහන්සේ යුධිජජය යුධිට්ඨිලය යන කුමාරවරුන් දෙදෙන දෙමව්පියන් හැර මරහුගේ සංගමය සිඳ මහණාවුවෝ වේදැයි වදාරා එඹා මහණෙනි බුදුහු මහබිනික්මන් කළේ දැන් මතු නොවෙයි පෙරත් මහබිනික්මන් කළෝ වේදැයි වදාරා මේ යුද්ධජජය ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි දෙමව්පිය දෙදෙන නම් දැන් මේ ශුද්ධෝදන රජ්ජුරුවන් හා මහා මායා දේවිය. එසමයෙහි යුධිටඨිල කුමාරයෝ නම් දැන් මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි යුඬජ්ජය කුමාරයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# දසරථ ජාතකය

තවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වසන්නාවූ සුන්දර ගතියක් ඇති හෙයින් සුගත නම්වූ සර්වඥයන් වහන්සේ පියා මළ සෝකයෙන් අඬන්නාවූ එක් කෙළෙඹි පුත්‍රයෙකු අරභයා වදාළසේක.
ඒ කෙසේද යත්
ඒ කෙළෙඹි පුත්‍රයා පියා මළකල්හි සෝකයෙහ් මඩනාලද්දේ කලමනා සියළු කර්මාන්ත හැර සොකයම අනුව පවත්නේය. සර්වඥයන් වහන්සේ අළුයම් වෙලෙහි මහා කරුණා සම්පත්තියෙන් නැගී ලොව බලාවදාරණ සේක් ඒ පුරුෂයාගේ ශෝතාපත්තිඵලයට උපනිශ්‍රය ඇතිනියාව දැන දෙවන දවස් උදෑසනම සැවැත් නුවර පිඬුසිගා වළඳා කරණ ලද ආහාර කෘත්‍යය ඇති සේක් භික්ෂූන් වහන්සේ යවා එකම භික්ෂූකෙණෙකුන් කැඳවා කෙළෙම් පුත්‍රයාගේ ගෙට ගොස් ඔහු විසින් වැඳ එකත්පස්ව උන්කල්හි මිහිරිවූ කට හඬින් කථාකරණසේක් සෝකය කිම්ද උපාසකයයි වදාරා ඔහු විසින් එසේය ස්වාමිනි පියාකෙරහි කරණලද සෝකයෙන් මා පෙළෙන්නේයයි කී කල්හි එඹා උපාසකය පුරාතනයෙහි නුවනැත්තෝ අෂ්ටලෝක ධර්ම තත්වහෙයින් දන්නාහු පියානන් කළුරිය කළ කල්හි ස්වල්ප මාත්‍රයකුත් සෝක නොකොළෝ වේදැයි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.
ඒ කෙසේද යත්.
යටගිය දවස බරණැස් නුවර දසරථ නම් මහරජ්ජුරුකෙණෙකු අගති ගමනින් දුරුව දස රාජ ධර්මයෙන් රාජ්ජය කරන්නාහුය ඒ රජ්ජුරුවන්ගේ සොළොස් දහසක් පුරාගනාවන්ට නායක අග්‍රමහේසිකා බිසව් පුතුන් දෙදෙනෙකු හා එකම දියනි කෙණෙකුන් වැදූහ. ඔවුන් අතුරෙන් වැඩිමාළු පුතනුවෝ රාමපණ්ඩිත නම්වෙති, මලනුවෝ ලක්ෂමණ කුමාර නම් වෙති, දියනියෝ සිතාදේවින් වන්නාහ. මෙසේ වයස ගිය බිසව් කළුරියකළාහ එකල රජ්ජුරුවෝ බොහෝ සෝකයට පැමිණ අමාත්‍යයන් විසින් සන්හිඳුවන ලද්දාවූ බිසවුන්ගේ ආදාහන කෘත්‍යකරවා අනික් බිසෝකෙණෙකුන් අගමෙහෙසුන් තනතුරෙහි තිබූහ. එකල ඒ බිසව්ද රජ්ජුරුවන්ට ප්‍රිය වන්නාහුය මන වඩන්නාහු කල්යාමකින් දරුගැබක් ඇතිව පුතනුකෙණෙකුන් වැදූහ. ඒ කුමාරයන්ට භරත කුමාරයෝයයි නම් තුබූහ. එකල රජ්ජුරුවෝ පුත්‍ර සෙනෙහෙයන් බිසවුන්ට කියන්නාහු සොඳුර තොපට වරයක්දෙමි ගණුවයි කීහ. බිසව් වරගන්නෝ කුමාරයන් සත් අට ඇවිරිදි අවස්ථාවෙහි රජ්ජුරුවන් සමීපයට ගොස් දේවයන් වහන්ස නුඹ වහන්සේ විසින් මට වරයක් දෙන ලද්දේ වේද දූන් මට ඒ දුනමැනවයි කීහ. රජ්ජුරුවෝත් යහපත දේවින් ගණුවයි කීහ. එකල බිසව් කියන්නාහු දේවයන් වහන්ස නුඹ වහන්සේ විසින් මාගේ පුතනුවන්ට රාජ්ජය දුන මැනවැයි කීහ. එබසට රජ්ජුරුවෝ රැහැනිව අසුරගසා නැසීගියාව් චණ්ඩාලිය මාගේ පුත්‍රයෝ දෙදෙනෙක් ගිණිකලඳක්සේ දිලියෙන්නාවූ ඔවුන් මරවා තිගේ පුතාට රාජ්ජය ඇරදෙනු කැමැත්තෙහිදැයි භය ගැන්වූහ. බිසව් භයපත්ව ශ්‍රියහන් ගබඩාවට වැද දෙවැනි දවසෙක නැවත රාජ්ජය ඉල්වන්නාහුය රජ්ජුරුවෝද බිසවුන්ට ඒ වරය නොදි සිතන්නාහු ගැනු නම් කෙළෙහිගුණ නොදන්නාහ මිත්‍රද්‍රෝහිය තෝ මාගේ නැයෝ යයි කියා සොරපතක්ගෙණ අත්සල් හෝ දී මාගේ දරුවන් මරාපු නම් නපුරුයි සිතා කුමාරවරුන් දෙන්නා සමීපයට ගෙන්වා ඒ බව කුමාරවරුන්ට කියා දරුවනි තොපි මෙහි වසනකල අන්තරායෙක් වී නම් නපුරුයි තෙපි දුරුරටකට හෝ වලකට හෝ ගොස් මාගේ ඇවැමෙන් අවුදින් තොපගේ කුලසන්තක රාජ්‍යය ගණුවයි කියා ලක්ෂණ පාඨකයන් ගෙන්වා තමන්ගේ ආයුසංස්කාරට විචාරා ඉදිරියෙන් දොළොස් අවුරුද්දක් පවතීන්නේයයි අසා එඹා දරුවෙනි මට දොළොස් අවුරුද්දක් ගියකල අවුදින් සේසත් තන්වා රාජ්ජය කරවයි කීහ. කුමාරවරුන් යහපතැයි පිය රජ්ජුරුවන් වැඳ සමුගෙණ අඬමින් වලපමින් ප්‍රාසාදයෙන් බටහ.
එකල සිතාදේවි මමත් බෑනන් වහන්සේලා කැටුව යෙමි කියා පියානන් වැඳ සමුගෙණ දඬමින් වලපමින් නික්මුණාහ. මෙසේ තුන් බිත්තෝම මහජනයා පිරිවරා නික්ම මහජනයා රඳවා අනුක්‍රමයෙන් හිමාලයට ගොස් සමුර්ඩිවූ ජලාශයෙන් ඇති සුලඟවු පලාඵලයෙන් ඇති ස්ථානයෙක්හි පන්සල් මවා පලාඵලයෙන් යැපෙමින් වාසය කරන්නාහුය. එකල ලක්ෂණපණ්ඩිතයෝ සීතාදේවින්ටද රාමපණ්ඩිතයන්ටද යාඥාකරන්නාහු නුඹ වහන්සේ අපට පිතෘපස්ථානයෙහි සිටිසේක. එසේහෙයින් ආශ්‍රමයෙහි නුඹ වහන්සේ රැඳුන මැනව පලාඵල ගෙණහැර නුඹ වහන්සේ පෝෂ්‍යකරම්හයි ප්‍රතිඥා ගෙණ එදවස් පටන් ආශ්‍රමයෙහි රාම පණ්ඩිතයන් රඳවා තුමු දේවත් පලා ඵල ගෙණහැර පෝෂ්‍ය කරන්නාහ. මෙසේතුන්බිත්තෝම පලාපලයෙන් ජීවත්ව වසනකල දසරථ රජ්ජුරුවෝ පුත්‍රස්නෙහයෙන් පෙළෙමින්ම නවවෙනි අවුරුද්දෙහි කාල ක්‍රියා කළාහ. එකල බිසව් රජ්ජුරුවන් ආදාහන කරවා ඉක්බිති මාගේ පුතනුවන් භරත කුමාරයන් රාජාභිශේක කරන්නට වන්හ. එකල අමාත්‍යයෝ රාජ්‍යස්වාමිහු වල්හි වසන්නාහ එසේහෙයින් භරත කුමාරයන්ට රාජ්‍යය නොලැබෙයි වැලක්කාහ එකල භරත කුමාරයෝ මාගේ බෑනන් වලින් ගෙණවුත් අභිෂේක කරවමි පංචකකුධාභාණ්ඩය යනුත් ගෙන්වාගෙණ සිවුරඟසේනා ගෙණ රාමපණ්ඩිතයන් වසන තැන්ට ගොස් නුදුරු තෙනක කඳවුරුබැඳ

SANHIDA LANKA

අමාත්‍යයන් කීපදෙනෙකු හා සමග ලක්ෂණ කුමාරයන්ද සිතාදේවින්ද වල්ගිය වේලාවට ආශ්‍රමයට වැද පන්සල් දොර කඩ තබන ලද රන්රුවක් වැනිව උන්නාවූ රාමපණ්ඩිතයන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිටියාහුය. දසරථ රජ්ජුරුවන් මළ නියාව කියා අමාත්‍යයන් මා සමඟ රාමපණ්ඩිතයන් පාමුල්හි වැටි ඇඬූහ. රාම පණ්ඩිතයෝ නොහැඬූහ. සොකමාත්‍රයකුත් නොකළාහ, භරත කුමාරයන් අඬා වලපමින් උන්කලට සවස් වෙලේ වල්ගිය කුමාරවරු දෙදෙන පලාඵල ඇරගෙණ ආහ. එකල රාමපණ්ඩිතයෝ කියන්නාහු මේ කුමාරවරුදෙදෙනම බාලයෝය සෝක සහනයකළ නොහෙන්නේයයි සිතා සනිකෙම තොපගේ පියානෝ මළෝයයි කීකල්හි සෝක ඉවසිය නොහී ලැයපැලී මියන්නාහ.
එසේ හෙයින් උපායෙන් මුන් දයට බාවා මේ ප්‍රවෘත්තිය කියම්සිතා කුමාරවැන් දෙදෙනා ඉදිරියේ එක්වන් පොකුණක් දක්වා තොපි ඇම ඉතාකල්යවා ආහෙයින් තොපට දඬුවමැයි කියන්නාහු ලක්ෂණ කුමාරයන් හා සිතා දේවින් හා දෙන්නම මෙසේඑව තොප පමාවූවාට දඬුවන් පිණිස කරවටක් දියට බැස දිටුවයි කීහ. එබසට හා සමග ඔහු දෙදෙනම දියට බැස සිටියාහ. කුමාර එකල පියානන් මළනියාව කියන්නාවූ රාමපණ්ඩිතයෝ එඹා ලක්ෂණ කුමාරයන් හා සීතාදේවිනී මේ භරත කුමාරයෝ දසරථරජ්ජුරුවන් මළහයි කීයති කීහ. ඔවු දෙදෙනා පියානන් මළහයි කියන බස අසමින් විසඥව දියපිට හුනහ දෙවෙනිවත් තුන්වෙනිවත් නගා සිටුවා එපවත් කියා දියෙන් ගොඩ නගා මදක් අස්වැසිලිලත් කල්හි ඇම එක්ම අඬාවැලප උන්කල භරත කුමාරයෝ සිතන්නාහු මාගේ බෑනන් වහන්සේ ලක්ෂණ කුමාරයෝද මාගේ නැගනියෝ සිතාදේවිද පියානන් මළනියාව අසා සෝක සහනයකළනොහි විසඥව ගියහ. රාමපණ්ඩිතයෝ වනාහි නොහඬන්නාහුය. සෝක නොකරන්නාහු උන් සෝක නොකරණ කාරණා විචාරන්නාහු රාමපණඩිතයෝ වහන්ස නොකටයුත්තෙහිද නුඹ වහන්සේ සෝකි නොකරන්නේ කවර ආනුභාවයකින්ද නුඹ වහන්සේ පියානන් මළනියාව අසාත් සෝකයෙන් නොපෙලෙන්නට කාරණා කිම්දැයි විචාළාහ.
ඉක්බිත්තෙන් රාමපණ්ඩිතයෝ තමන් සෝකනොකරණ කාරණා කියන්නාහු එම්බල භරත කුමාරයෙනි ජීවත්වන්නාවූ සත්වයෙකුගේ මරණ කාලයෙහි සෝකයෙන් අඬන්නාහු කිසි සත්වයෙක් ඨකගතනොහේද සෝක සන්හිඳුවාගත නොහේද එසේහෙයින් දූන් අෂ්ටලෝකධර්මය සත්වහෙයින් කියන්නාහු මෙබඳුවූ නුවනැති ප්‍රාඥායක්හු මරණාන්තරයාගේ කෙළවර මළාවූ සත්වයක්හු මළැයි තමා තැවිමෙන් කිම්ද කිසිම උපකාරනැති සෝකකිරීමෙන් කවර ප්‍රයෝජනද මළ භරත කුමාරයෙනි මේ මහණ නම් රන්රුවන්ට බඳුවූ රූ ඇති ලදරුයයිද කුමාරාදී කුල ඇත්තන්ද වැඩිසිටි සක්තිසම්පන්න යෝධයන්ද නුවනැත්තාවූ ප්‍රථජ්ජනයන්ද බුද්ධාදීවූ ප්‍රාඥයන්ද චක්‍රවර්ති ආදිවූ ඉසුරුමතුන්ද වස්ත්‍ර අන්නපාන නොලබන්නාහු දිළිඳුයයියන මේ සියල්ලවුන් කෙරෙහි වෙනසක් නැත්තෝය. ඒ සියල්ලෝම මරු හා කිසි ලැජ්ජාවක් නැතිව එහිම හෂ්මවන්නාහ. තවද මළ භරතයෙහි යම්සේ විලික්ෂව ගියාහු එලයෙන් විලික්ෂුනු තැන්පටන් තුවටුවෙන් දූන් ගිලිහෙයි කියා භයවේද එහි වැටීම ඒකාන්තයෙන් නියමද ජීවත්වන්නාවූ සත්වයාගේ ජීවිතයත් ඒකාන්තයෙන්ම අසවල් වෙලෙහි අසවල් ඇසිල්ලෙක මියෙති නියමයක් කළනොහැක්කේය, තවද උදෑසන දුටුවාවූ බොහෝ සත්වයෝ සවසට නොපෙනෙන්නාහ. සවස දුටු බොහෝ සත්වයෝ උදෑසන නොපෙණෙන්නාහ. මරුමුඛයට පෙනෙන්නාහ තවද මාගේ පියානෝය පුතනුයයි අඬන්නාවූ යම් සත්ව කෙණෙක් තෙම ගතිමුඩව තෙමේ තමා පෙලෙන්නේය ස්වල්ප මාත්‍රයකුත් වැඩක් ඵලවාගත නොහෙන්නේය. ඕහට අනික්වැඩකුත් කළ නොහෙන්නේය මළාවූ සත්වයා ගෙන්වාගතත් නොහෙන්නේය. තවද යම් සත්වයෙක් අඬන්නේවිනම් එසේ වූ සත්වතෙම කෘශවන්නේය නපුරු ශරීරවර්ණ ඇතිවන්නේය. එසේ හෙයින් තමාගේ කායචිත්ත දෙකටම තාපනය කරණ විවරක්මවන්නේය. ඒ ඇඬීමෙන් මළාවූ සත්වයා ජීවත්වන්නේත් නැත ඕහට ඇඬීමම වන්නේය. තවද යම් නුවණැති සත්වයෙක් තෙමතමා වසන්නාවූගෙයි ගිණිගත්කල්හි මදකුත් මලිතක්මක්නොවි සියදාස් ගණන් පැන්සල සලා ගිණිනිවාද එපරිද්දෙන්ම නුවනැතිසත්වතෙම නැංගාවූ සෝකාග්නිය නිවන්නේය. වාතමුඛයෙහි අරණලද පුළුම් රැල්ලෙක් යම්සේද නුවනැත්තෝ එපරිද්දෙන්ම සෝකය නසා දුරුකරන්නේය. තවද යම්සත්වයෙක් තෙම පරලොවයන්නේ උදාකලාවම යන්නේය ක්ෂත්‍රියාදී යම් කුශලයෙක් උපන්හොත් උදකලාවම උපදනේය. එතන මාගේ මිත්‍රයෝය නෑයෝය මැනියෝය පියානෝයයි එක්ව සන්වාසය කරණ පමණක් විනා සියළුම සත්වතෙම කළාවූ කුසල් අකුශල් දෙකම ප්‍රාණප්‍රතිෂ්ඨාකොට ඇත්තේය. ඒ කාරණය හේතුකොටගෙන බොහෝ ඇසූ පිරූ තැන් ඇති නුවනැති සත්වතෙම අෂ්ටවිධවූ ලෝක ධර්මද මෙලොව පරලාව දෙක්හි බලන්නේ විනම් ඕහට මහතවූ සෝකයකුත් ශරීර තාපනය නොකරන්නේය. තවද සත්වයාහට ලාභ අලාභයද, අයසද යසසද, නින්දාවද, ප්‍රශංසාවද සැපයද, අසැපයද යන මේ සියල්ලම නිත්‍යබව සත්වයන්ගේ ස්වභාව ධර්මයෙක් වන්නේය. එසේ හෙයින් සෝකනම් නොකටයුතු වන්නේය. තවද මළ භරත කුමාරයෙනි නුවනැත්තා අන්ධවූ අඥාන සත්වයන් මෙන් ඇඬීම වැල පීම් සුදුසු නොවන්නේය. මම වනාහි මාගේ පියානන්ගේ ඇවෑමෙන් උන්ගේ තනතුරෙහි සිට දුගී මගී යාචකයින්ට දන්දීම්ද යසපිරිවර දෙන්ට නිස්සන්ට යසසද මාගේ පියානන් අනුභවකළාසේම යසස් අනුභව කෙරෙමින් නෑයන් පෝෂ්‍යය කෙරෙමි අවශේෂවූ මාගේ පරිවාර ජනයන් රකිමි ධාර්මිකවූ ශ්‍රමණබ්‍රාහ්මණයන්ට රක්ෂාවරණයෙන් රකිමි

SANHIDA LANKA

මෙතන කර්තව්‍ය දන්නාවූ ප්‍රාඥයන්ට සුදුසුවන්නේය.

එසේ හෙයින් මා සෝකකරන්නේ නැතැයි කීහ. එකල සිටියාවූ පර්ෂිත් රාමපණ්ඩිතයන්ගේ අනිච්ඡතාව ප්‍රකාශ කරන්නාවූ ධර්මදේශනාව අසා නිස්සෝ කීවුහ. ඉක්බිති භරතකුමාරයෝ රාම පණ්ඩිතයන් වැඳ බරණැස් රාජ්ජය පිළිපැදද මැනැවැයි කීහ. රාමපණ්ඩිතයෝ කියන්නාහු එඹල ලක්ෂණ කුමාරයන් හා සීතාදේවින් කැඳවාගෙණ ගොස් රාජ්‍යානුශාසනා කරවයි කීහ. එබසට භරත කුමාරයෝ කියන්නාහුදේවයන් වහන්ස නුඹ වහන්සේ යනුයි කීහ. රාමපණ්ඩිතයෝ කියන්නාහු මාගේ පියානන් වහන්සේ මට දොළොස් අවුරුද්දක් ගියකල අවුත් රාජ්‍යයට කරවයි කීසේක. මම දැන්ම ගියේවිනම් උන්වහන්සේට නොකීකරුවා නම්වෙයි එසේහෙයින් අනික් තුන්අවුරුද්දක් ගියකල එම් කීහ. නැවත භරත කුමාරයෝ කියන්නාහු එසේකල මේ දතුරු රාජ්‍යය කරන්නෝ කවුරුදැයි කීහ. රාම පණ්ඩිතයෝ තෙපි රාජ්ජය කරවයි කිහ. භරත කුමාරයෝ අපි රාජ්ජය නොකරම්හයි කීහ නැවත රාමපණ්ඩිතයෝ කියන්නාවූ එසේවීනම් යම්තාක් මාගේ ඊමවේද ඒතාක් රාමපණ්ඩිතයෝ කියන්නාවූ එසේ වීනම් යම්තාක් මාගේ ඊමවේද ඒතාක් මේ මිරිවැඩිසඟල රාජ්ජය කරවන්නේ යයි තමන්ගේ මිරිවැඩිසඟල පාවාදුන්හ. එකල ඔහුදෙන්නා හා භරත කුමාරයන් හා මිරිවැඩිසඟල ඇරගෙණ රාමපණ්ඩිතයන් වැඳ සමුගෙණ මහජනයා පිරිවරා බරණැස් නුවරට ගොස් තුන් අවුරුද්දටම මිරිවැඩිසඟල තබා රාජ්‍යය කළාහුය. ඒ අමාත්‍යයෝ මිරිවැඩිසඟල පර්යාංකයෙහි තබා යුක්ති විචාරන්නාහු ඉදින් ඒ විනිශ්වය නපුරුවිනම් මිරිවැඩිසඟල ඇරගෙණ ඉන් ඉන්වි වැදගන්නේය. ඒ සලකුණෙන් අමාත්‍යයෝ නැවති විනිශ්වය කරන්නා මනාකොට විනිශ්වය කරණ ලද්දේවීනම් නිශ්වලව තිබෙන්නේය. රාමපණ්ඩිතයෝද තුන් අවුරුද්දක් ඉකුත්වූකල වලනි නික්ම බරණැස් නුවරට ගොස් උයනට වැද උන්හ. ඒ බව දත් කුමාරවරහු අමාත්‍යයන් පිරිවරා උයනට ගොස් සීතාදේවින් අග්‍රමෙහෙසිකාකොට දෙදෙනාම අභිෂේක කළාහ. මෙසේ අභිෂේකයට පැමිණියාවූ මහබෝසතානෝ සරහා පිළියෙළ කරණලද්දාවූ උතුම්වූ රථයට පැන නැගී සිටියාහු මහත්වූ පෙරහරින් නුවරට වැද පැදකුණු කොට සුචන්ද්‍රා නම් ප්‍රාසාදයෙහි මතුමාලට නැගී එතැන්පටන් සොළොස් අවුරුද්දක් දැහැමෙන් රාජ්ජය කොට සර්වරග ලෝකය පිරුවාහුය. ඒ අර්ථය ප්‍රකාශ කරන්නාහු බුදුරජානන් වහන්සේ එඹා මහණෙනි රන්මිරිඟු බෙරක් හා සමානවූ ග්‍රිවයක් ඇති මහත්වූ බාහු යුග්මයක් ඇති ඒ රාම රජ්ජුරුවෝ දස දහසක් හා නැවතී සසියයක් සම්බන්ධවූ සදාසක් ඇතුළුවූ සොළොස් දහසක් අවුරුදු ධර්මයන් රාජ්‍යයකළෝ වේදැයි වදාරා මේ දසරථ ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර සෝකාතුර වූ කෙළෙඹි පුත්‍රතෙම සෝවාන් ඵලයෙහි පිහිටියාහ. එසමහේ දසරථ රජ්ජුරුවෝ නම් දැන් මේ ශුද්ධෝදන රජ්ජුරුවෝය. එසමයෙහි මව් බිසව නම් දැන් මේ මහාමායා දේවිය, එසමයෙහි සිතාදේවිනම් දැන් මේ රාහුලමාතාවෝය. එසමයෙහි භරත කුමාරයෝ නම් ආනන්ද ස්ථවිරයෝය. එසමයෙහි ලක්ෂණ කුමාරයෝ නම් දැන් මේ ශාරිපුත්ත ස්ථවිරයයෝය. එසමයෙහි පර්ෂිත් නම් දැන් මේ බුදුපිරිසය, එසමයෙහි රාමපණ්ඩිතයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සංවර ජාතකය

තවද පිරිසිදු ගුණ ඇති බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පසුබට වීර්ය ඇති භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.
ඒ කෙසේද යත්.
සැවැත්නුවර කුලපුත්‍රයෙක් බුදුන්ගේ බණ අසා මහණව ආචාරීවත් උපාධ්‍යායවත් පුරන්නේ උභයමාතෘකා වනපොත්කොට පීරුණාවූ පශ්වස් ඇතිව කර්මස්ථාන ඉගෙණ වල්හි වාසය කෙරෙමින් ආචාර්ය උපාධ්‍යයන් ගෙන් අවසරගෙණ කොසොල්රට එක් පසල් ගමකට ගොස් තමන්ගේ සාන්ත දාන්ත ගුණයෙහි පැහැද ඒ ගම උපාසකවරුන් විසින් කොටාදෙන ලද පන්සල්හි වාසය කෙරෙමින් උපස්ථාන කෙරෙමින් උපස්ථාන විඳ වස්වැස විදර්ශනා වඩා ඉතා ආයාසකොට වඩනා ලද වීර්යයෙන් තුන් කර්මස්ථාන භාවනා කොට අපහාස මාත්‍රයකුත් උපදවාගත නොහි සිතන්නාහු ඒ කාන්තයෙන් සර්වඥයන් වහන්සේ දෙසූ පුද්ගලයන් සතරදෙනා අතුරෙන් මම පාළිඉගැන්වීමෙන් මෙහි දක්‍ෂවෙමි එසේ හෙයින් මට වල්හි වාසය කිරීමෙන් කම්කිම්ද බුදුන්ගේ රූපශ්‍රී බල බලා මිහිරිවූ පණ අස අසා දවස් යවමි සිතා වීර්ය හැර එතනින් නික්ම අනුක්‍රමයෙන් ජේතවනාරාමයට ගොස් අචාරී උපාධ්‍යයන් සන්දිෂ්ට සම්භක්තයන් විසින්ද, ආකාරණය විචාරණලදුව තමන් කර්මස්ථාන ඇර ආ නියාව කියා ඔවුන් ඇම විසින් මහණ තෝ කුමක් පිණිස කර්මස්ථාන යෙදීමෙන් පසුබටදැයි නින්දාකොට බුදුන් සමීපයට ගෙණගොස් බුදුන් විසින් මහණෙනි මේ භික්ෂූහු කුමක් පිණිස නොකමැතිකරවා ගෙණාහුදැයි කී කල්හි එපවත් අසා මහණ තෝ කුමක් පිණිස පසුබට වුවාවූ වීර්ය ඇත්තෙහිවීදැයි මේ ශාසනයෙහි වීර්ය නැත්තාවූ කුසීත පුද්ගලයන්ට අග්‍රඵල අරහත්වයෙක් නම් නැත පටන්ගන්නාලද වීර්ය ඇති මහණතෙම ධර්ම ක්‍ෂාත් ක්‍ෂාත් කරන්නේය. තෝ වනාහි පෙර වීර්ය ඇත්තෙහිය. අවවාද ක්‍ෂමායෙහි එම කාරණයෙන් බරණැස් රජ්ජුරුවන්ගේ පුතුන් සියයකට බාලමල්වන් නුවනැත්තන්ගේ අවවාදයෙහි සිට රාජ්ජයට පැමිණියෝ වේදැයි වදාරා ඒ භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.
ඒ කෙසේද යත්
යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් වහන්සේ රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ පුතුන් සියයකට බාල සංවර කුමාරයෝයයි යන පුතනුකෙණෙකුන් වන්නාහුය. එකල රජ්ජුරුවෝ එකී එකී අමාත්‍යයෙකුට පාවාදී ශිල්ප උගන්වයි සම්මත කළහ. එසේ පාවාදෙන සංවර කුමාරයන්ට ආචාරීකමට බෝධිසත්වයෝ සැලැස්වාහුය. ප්‍රාඥවූ ව්‍යක්තවූ ඒ බෝධිසත්‍වයෝ ඒ රාජකුමාරයන්ට පිතෘස්ථානයෙහි සිට හින්මවන්නාවූ අවශේෂ අමාත්‍යයෝ රාජකුමාරවරුන් ගන්වා රජ්ජුරුවන් දක්නාහුය රජ්ජුරුවන් කුමාරවරුන්ට දනව් දී යවන්නාහුය එකළ සංවර කුමාරයෝත් ශිල්ප ශාස්ත්‍ර ඉගෙණ නිමවා බෝධිසත්වයන් අතින් විචාරන්නාහු ආචාරීන් වහන්ස ඉදින් මාගේ පියානන් වහන්සේ මට ජන පදයක්දී යවනසේක් වී නම් කළමනා කිම්දැයි කීහ. මහබෝසතානෝ කියන්නාහු දරුව තොපි දනවගම්දෙන්ට වත්කල ඒ නොගෙණ දේවයන් වහන්ස මම ඇමටම බාලයෙමි මාත් ගියකල නුඹ වහන්සේගේ ශ්‍රී පාද සෙවන සිස් වන්නේය එසේ හෙයින් මම සමීපයෙහි වෙසෙමි කියවයි කීහ. ඉක්බිති එක්දවසක් සංවරකුමාරයන් වැඳ එකත්පස්ව සිටිකල්හි රජ්ජුරුවෝ කියන්නාහු පුත තොප ශිල්ප ඉගෙණ නිමියේදැයි කීහ. කුමාරයෝත් එසේය දේවයන් වහන්සැයි කීහ. එසේ වී නම් පුත තොපට ජනපදයක් ඇරගණුවයි කීහ. කුමාරයෝ කීයන්නාහු දේවයන් වහන්ස ඒසේ කල්හි නුඹ වහන්සේගේ සමීපය සිස්වන්නේය. මම සමීපයෙහි වෙසෙමි කීහ. එබසට රජ්ජුරුවෝ සතුටුව යහපතැයි පිළිගත්හ.
එදවස් පටන් රජ්ජුරුවන් සමීපයෙහි වාසය කෙරෙමින් බෝධිසත්වයන් වහන්සේ අතින් ආචාරීන් වහන්ස තවත් මා කල මනා කිම්දැයි විචාළාහ. බෝධිසත්වයෝ කියන්නාහු රජ්ජුරුවන් අතින් පරණ උයනක් ඉල්වාගෙණ එහි අටගත් මල් හා පලාඵලයෙන් නුවර වැස්සන් ඉසුරුමතුන් සිත්ගනිමින් නැවත කළමනා කිම්දැයි ගුරුන් අතින් විචාළාහ. දරුව රජ්ජුරුවන්ගේ අන්තඃපුරයටත් වැටුප් පසිඳුවයි කීහ. කුමාරයෝත් එපරිද්දෙන්ම කළාහ. නැවතත් බෝධිසත්වයන් විචාරා රජ්ජුරුවන්ගෙන් අවසරගෙණ අන්තඃපුරයෙහි ඇතුන්ටද දැසි දසුන්ටද සියළු පාබල සෙනගටද නිරන්තරයෙන් වැටුප් නොවරදවා නොපිරිහෙලා පසිඳිනාහ නොයෙක් රටවල් ආචාවූ දූතයන් ආදීන්ට නවාතැන් ආදියද වෙළඳුන් ආදීන්ගෙන් ගතමනා සුන්වත් ආදිය යන මේ සියල්ලම තමන්ගේ විධානයෙහිම තිබූහ. මෙසේ සංවර කුමාරයෝ බෝධිසත්වයන්ගේ අවවාදයෙහි පිහිටා සියළු අන්තඃපුර ජනයාද පිරිසර වැස්සන්ද ගන්වර වැස්සන්ද ජනපද වාසීන්ද නොයෙක් තැනින් ආ ආගන්තුක ජනයාද උපස්ථාන කිරීමෙන්ද සංග්‍රහ වස්තුයෙන්ද සිත්ගෙණ සියල්ලවුන්ට මනාව වැඩව හැසිරෙන්නාහ. මෙසේ කල්‍යාමකින් මරණ මඤ්චකයෙහි සිටිකල අමාත්‍යයෝ දේවයන් වහන්ස නුඹ වහන්සේගේ ඇවෑමෙන් රාජ්ජය කොට පමුණුවමෝදැයි විචාරා රජ්ජුරුවෝ කියන්නාහු එඹා දරුවෙනි මාගේ දරුවෝ ඇමෝම අභිෂේකයට නිස්සාහ එසේ හෙයින් යම් කෙණෙක් තොපගේ සිතට ප්‍රියයෝ වී නම් තොප ඇමසිත් ගෙණ

SANUDA LANKA

වෙසෙත්නම් උන්ට රාජ්ජය පමුණුවයි කියා කාලක්‍රියා කළාහ. උන් කළුරිය කල කල්හි ආදාහන කෘත්‍යය කොට සත්වෙනිදවස් අමාත්‍යයෝ ඇම එක්ම යම්කෙණෙක් තොපගේ සිතට ප්‍රියයෝ වී නම් තොප ඇම සිත් ගෙණ වෙසෙත්නම් රාජ්ජය උන්ට දෙවයි කීහ. එසේ හෙයින් දූන් සංවරකුමාරයන් කචන මාලාවෙන් හෙබියාවු සේසත් නන්වා අභිෂේක කළාහ. සංවර රජ්ජුරුවෝ බෝධිසත්වයන්ගේ අවවාදයෙහි සිට දැහැමෙන් රාජ්ජය කළාහ. අවශේෂ කුමාරවරු තමන්ගේ පියානන් මළ බවත් සංවර කුමාරයන් අභිෂේක කළ බවත් අසා උඉ ඇමට බාලයෝය එසේහෙයින් උන්ට රාජ්ජය නොපැමිණෙයි ඇමට වැඩිමාළු තැනැත්තන්ට රාජ්ය පමුණුවම්හහි ඇවිත් පිටිනුවර රාජ්‍යය හෝ දෙව යුද්ධ හෝ කරවයි  කියා සිංහ රජ්ජුරුවන්ට අසුන් යවා නුවර වටළුහ. එකල සංවර රජ්ජුරුවෝ බෝධිසත්වයන්ට එපවත් කියා කළමනා කිම්දැයි කීහ. බෝධිසත්වයෝ කියන්නාහු මහරජ තොපට බෑයන් හා යුද්ධයෙන් කම්නැත පියානන් සන්තක වස්තුව සියක් කොටස බෙදා එකුන්සියයක් පමණ මේ කුමාරවරුන්ට තොපගේ පියානන් සන්තක සම්මත කළාහ. සංවර රජ්ජුරුවෝ එපරිද්දෙන්ම කළහ.

එකල ඇමට වැඩිමාළු බෑනෝ උපොසථ නම් කුමාරයෝ අවශේෂ කුමාරවරුන් තමන් සමීපයට කැඳවා එඹා මල්නි රජදරුවන් ඉක්ම පවතින්ට සමර්ථ කෙණෙක්හිම නැත මුයිත් අපට බාල සිට මලනුවෝය. අපට සතුරුත්නොවි පියානන් සන්තක වස්තුවක් එවා සටන් නොකෙරෙති කියා එවන්නාහ. අපි ඇමත් එකවිටම අභිෂේක කරන්නෝමෝ නොවම්හ. එකක් හට ඒ අභිෂේක කරම්හ. එසේ හෙයින් මුන්ටම රාජ්‍යය වන්නේය. යම්හ උන්සමීපයට ගොස් දැක රජ්ජුරුවන්ගේ අන්තඃපුරය උන්ට පාවාදී අපි අපගේ ජනපදවලට යම්හයි කීහ. එකල ඒ කුමාරවරු ඇමදෙනම යහපතැයි නුවර දොර අරවා යතුරු නොව නුවරට වන්න. සංවර රජ්ජුරුවෝද උන් ඇමට සත්කාර සම්මාන අමාත්‍යයන් ලවා ගෙණ පෙරමගට යවුහ. කුමාරවරුද මහපෙරහරින් පයින්ම රජගෙට ගොස් වැඳ සංවර රජ්ජුරුවන්ට ආදර දක්වා මටිවු අසුන්වල උන්හු සංවර රජ්ජුරුවෝ නගනලද දලපුඩු සේසත් ඇති සිංහාසනමස්තකයෙහි උන්හ. උන්නාවු ඒ රජ්ජුරුවන්ගේ මහත්වූ යසස්ද ශ්‍රීසොභාද විය. බැළු බැළු දිසාව කම්පාවනනේය. එකල උපෝසථ කුමාරයෝ සංවර රජජුරුවන්ගේ ශ්‍රී සමුර්ධිය දැක අපගේ පියානන් වහන්සේ තමන් වහන්සේගේ ඇවෑමෙන් සංවර කුමාරයන්ට රාජ්‍යය සිතාවන අප ඇමට ජනපදදී යවා මුන්ට නුදුන්නාහු නුවනැයි සිතා සංවර රජ්ජුරුවන් හා සමග කථාකරන්නාහු. මහරජ්ජුරුවෙනි අපගේ පිය රජ්ජුරුවෝ එකුන් සියයක් පමණ කුමාරවරුන්ට ජනපදවලින් පුජාකොට යවන්නාහු තමන්ගේ ඇවෑමෙන් තෙමේ රාජ්‍යයට පැමිණෙන්නේයයි දැනම තොපට කුඩා වු ජනපදයක් නුදුන්නේවන. තවද මහ රජ්ජුරුවෙනි තොපි රාජ්ජය පතන්නාහු අපගේ පිය රජ්ජුරුවෝ තමන් ජිවමානව ඉන්නා කලම තැකූහ. නොහොත් උන් ඇවෑමෙන් අමාත්‍යයන් හා ජනපද වාසීන් හා තොපගේ නෑයෝ තමන්ට වැඩ සඳහා රාජ්‍යයට පැමිණිවුහ. තවද සංවර රජ්ජුරුවෙනි තොපගේ කවර ශිලවුත සමාදානයකින් තොප කෙරෙහි හටගත් කවර ගුණයකින් මෙතනට රැස්වූ එකුන් සියයක් කුමාරවරුන් ආදි කොට ඇති සියළුනෑයෝ තොප හික්මයෙද්ද, තොප උන්ට පැවැත්තෝද, ඒ මට කියවයි කීහ. එබස් අසා සංවර රජ්ජුරුවෝ තමන් ගුණ ඇති කියන්නාහු එඹා රාජකුමාරයෙනි මම කිසි සත්වයක්හට ඔහුගේ යසස් දැක මේ සම්පත් මෝහට නොවෙවයි මා සොම්නම් උනේ නැත, තවද සමීත පාපි හෙයින් ශ්‍රමණනම්වුද මහත්වු ශිලස්කන්ධයන් එෂ්ණ ගවේෂණ කරණ හෙයින් මහණ නම්වු ශ්‍රමණ බ්‍රාහ්මණයන් දුටුකල පසඟ පිහිටුවා උන්ගේ පාදයන් වැඳ දන්නමුත් උන් ඇමට ධාර්මිකවූ රක්‍ෂාවරණ ගුප්තිය එලවමින් පුජා කරන්නාවු මම්ම ඇමට සකස්කොට පුජා කෙරෙමින් තවද ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මෙබඳු ගුණ ඇති මා මෙසේවු ගුණයක් ඇතැයි දැන මෙබන්දක් කරවයි මෙබන්දක් නොකරවයි අනුශාසනා කරන්නාහ මමද මහා සෘෂිවු ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ බස් අසා කිසිවක්ම නොකරමි මාගේ චිත්තය කුසලයෙහිම නිරතකෙරෙමි, තවද ඇත්රුවන් අසරුවන් හැනිනායක වැන් රථාචාරීවරුන් පාබලසෙනඟද යන මේ සියල්ලවුන්ට නිරන්තරයෙන් දියයුතු යම්වස්තුවෙක් ඇත්නම් නොපිරිහෙලා දෙමි, තවද බෑනන් වහන්සේ මාගේ නුවණැති මන්ත්‍රණයෙහි දක්ෂ අමාත්‍යයෝද අවශේෂ පිරිවර ජනයෝද ඇත. නුඹ වහන්සේලා ඇම ප්‍රඥාසම්පන්න පණ්ඩිතවරුන් නොලත් හෙයින් සේක. අපගේ ආචාරී නුවනැත්තෝය. උපායෙහි දක්ෂයෝය. උඉ රාජ්‍යයෙහි පිහිටුවුහ. තවද බෑනන් වහන්ස මා අභිසේක කළතැන් පටන් අපගේ  රජ්ජුරුවෝ ධාර්මිකයෝය. උන්ගේ රට සාරපෝයෙහි වැසිවස්නේය උන්රට සමුර්ධිබල ඇත්තේය. බරණැස් නුවර ආදීවු බොහෝ රටවලින් ආඪ්‍යවු වෙළෙඳවරුන් ඇවිත් මෙහි වසන්නාහ, එසේහෙයින් උන්ගෙන් මට ආරක්ෂා ඇත. තවද හස්තිරත්නය අශ්වරත්නය මුතු මැණික් ආදිය හැර ගෙණ ඇවිත් නිරුපද්‍රිතව වෙළඳමුත් කරන්නාවු වෙළඳනුන් බොහෝව බෑනන් වහන්ස මම මෙතෙක් කාරණයෙන් ඇමට බාලවත් මාගේ බෑනන් හැමට මැඩගෙණ රාජ්ජයට පැමිණියෙමි ඒ බව දැනුවයි කීහ. ඉක්බිති සංවර රජ්ජුරුවන්ගේ ගුණ අසා උපෝසථකුමාරයෝ කියන්නාහු මල සංවර රජ්ජුරුවෙනි තොපි වනාහි එකුන්සියයක් පමණ වැඩිමාළු බෑයන් ආනුභාව මැඩ ධර්මබලයෙන්ම පවතුව තෙන්පටන් තොපිම රාජ්‍යය කරව නුවනින්යෙදී වසව බන්ධුන්ටත් හිතව වසව. තවද ඒ ගුණයෙන් සමුර්ධව තෙපි අප එකුන් සියයක් ඇති ඤාති සමුහයා පිරිවරා සප්තවිධරත්නයෙන් සමන්විතවූ තව්තිසා වැසි දෙවියන් පිරිවරකොට ඇති ශක්‍රදේවේන්ද්‍රයන් අසුරයෝ ජයගත නොහෙන්නාසේ

SANHIDA LANKA

තොපත් එපරිද්දෙන්ම පරසතුරෝ ජයගත නොහෙන්නාහ, එසේහෙයින් තුන්සියයක් පමණ යොදුන් කසී රට දොළොස් යොදුන් බරණැස් නුවර සැපසේ රාජ්ජය කරවයි කීහ. ඉක්බිති සංවර රජ්ජුරුවෝ එකුන් සියයක් පමණ තමන්ට වැඩිමාළු රජකුමරුන්ට මහත් සම්පත් දුන්හ. ඔහු ඇමදෙනත් මසක් පෝයක් රජ්ජුරුවන් කෙරේ වාසය කොට මහරජ ජනපදවලින් සතුරෝ ඇත්නම් ඊට නිහඬ අප දනුම්හ නුඹ වහන්සේ රාජ්‍යයකළ මැනවැයි කියා තමන්ගේ ජනපදවලටම ගියාහ. සංවර රජ්ජුරුවෝද බෝධිසත්වයන්ගේ අවවාදයෙහි සිට රාජ්‍යය පරිපාලනයට ආයුෂයාගේ කෙළවර දෙව්ලොව පුරමින් ගියාහ. සර්වඥයන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා මහණ තෝ මෙසේ අවවාදක්‍ෂමායෙහි දූන් කුමක් පිණිස වීර්ය නොකරන්නෙහිදැයි වදාරා චතුස්සත්‍ය ප්‍රකාශකොට මේ සංවර ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙලවර ඒ භික්ෂුතෙම සෝවාන් ඵලයෙහි පිහිටියේ. එදවස් සංවර රජ්ජුරුවෝ නම් දැන් මේ මහණ වන්නේ. එසමයෙහි උපෝසථ කුමාරයෝ නම් සාරිපුත්ත ස්ථවිරයෝය. අවශේෂ අටුනුවක් කුමාරවරු නම් අසුමහා සව්වන් හා අනුරුද්ධ ස්ථවිරයෝය. එසමයෙහි රජ පිරිස නම් දැන් මේ බුදු පිරිස් වන්නාහ. එසමයෙහි සංවර කුමාරයන්ට අවවාද දුන් අමාත්‍යයෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සුප්පාර ජාතකය

තවද මේ ජාතකය ස්වධර්මයෙන් සර්වකාරයෙන් පරෝපදේශ රහිතව ස්වයම්භූඥානයෙන් දත්තාවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් ප්‍රඥා පාරමිතාව අරභයා වදාළසේක.
ඒ කෙසේද යත්
එක් දවසක් සවස්වේලෙහි සර්වඥයන් වහන්සේ ධර්මශාලාවට වැඩිම පෙර මග බල බලා උන් භික්ෂූන් වහන්සේ ඇවැත්නි අනේ බුදුන්ගේ ඥාණයෙක් යහපත් නියාව මහත්වූ ප්‍රඥා ඇතිසේක. තීක්ෂණ ප්‍රඥා ඇතිසේක් නිව්‍යාජවූ ප්‍රඥා ඇතිසේක. ඒ ඒ උපායෙහියෙදෙන්ට නිසි ස්ථානොචිතප්‍රඥා ඇතිසේක. පොළොව සේ පතලවූ ප්‍රඥා ඇතිසේක. සියළු දඹදිව උපන්නාවූ ප්‍රශ්නයන් බුදුන් ඉක්මයන්ට සමර්ථයෙක් නැත. යම්සේ සමුද්‍රයෙහි නැංගාවූ තරඟ ඉක්ම  නොගොස් වෙරලාන්තයෙහිම භග්නවේද එපරිද්දෙන්ම කිසිවෙක් බුදුන් ඉක්ම යන්නෙක් නම් නැත පාදමුලයට පැමිණිම භග්නවන්නේ යයි බුදුන්ගේ මහත්වූ ප්‍රඥා පාරමිතාවන් වර්ණනා කොට කොට උන්සේක. බුදුහු එකල තුන්තරා ගමනින් එක්තරා ගමනකින් දම්සභා මණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකක් කොට උනුදැයි විචාරා වදාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි එඹා මහණෙනි බුදුහු දැන්මතු නුවනැත්තෝ නොවෙයි පෙරත් නුමුහුකුරුනාවූ නුවනැති කලක් අන්ධව මහාසමුද්‍රයෙහි ජන සභිඥාවෙන්  මෙනම් සමුද්‍රයෙහි මෙනම් රුවක් ඇත්තේයයි දත්තෝවේදැයි වදාරා එක්තරා භික්ෂූකෙණෙකුන් වහන්සේ විසින් ආරාධිත වූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍ය කරන්නාහුය. එනුවර භරුකච්ඡ නම් පටුනුගමකුත් ඇත්තේය. එකල අප මහබෝසතානෝ භරුකච්ඡ නම් පටුන්ගම නියමුන්ට නායකවූ නියමුවාට පුත්‍රව  උපන්නාහු දුටුවන්ට ප්‍රසාද එලවන්නාවූ රන්වන් ශරීර ඇත්තාවූ කුමාරයන්ට නම් තබන්නාවූ සුප්පාර කුමාරයෝයයි නම් තුබුහ. මෙසේ ඒ සුප්පාර කුමාරයෝ මහපෙරහරින් වැඩෙන්නාහු සොළොස් ඇවිරිදි වයසම ශිල්පයෙහි පරතෙරට පැමිණ කල්යාමකින් පියානන්ගේ ඇවෑමෙන් නියමුවන්ට නායක කම් පැමිණ නියමු නායකම් කරන්නාහු ප්‍රාඥයෝය. නුවනැත්තාහුය. උන් විසින් නැගී නැවක් නොනස්නේය. මෙසේ කල්යාමකින් එනුදිය ගැසීමෙන් මහබෝසතානන්ගේ ඇස්දෙකම නටුයේය. එතැන් පටන් නියමු දෙටුවෝ නියමුකම් නොකොට රජ්ජුරුවන් නිසා ජීවත්වෙමි සිතා රජ්ජුරුවන් සමීපයට ගොස් වන්නාහ. රජ්ජුරුවෝත් බෝධිසත්වයන් වස්තු අගය කරන්නාවූ තනතුරෙහි පිහිටුවුහ. එතැන් පටන් බෝධිසත්වයෝත් රජ්ජුරුවන්ගේ හස්ති රත්නය අශ්ව රත්නය මුකාතාමාණික්‍ය රත්නය ලක්ෂණ බලා අගය කරන්නාහු එකල එක්දවසක් රජ්ජුරුවන්ට මගුලැත් තනතුරෙහි අඤ්ජන කුටයේ කඳුළු ඇතකු ගෙණාහ. රජ්ජුරුවෝද ඒ ඇතු දැක සුප්පාර පණ්ඩිතයන්ට පාවයි කීහ. යහපතැයි ගෙණගොස් බෝධිසත්වයන්ට පෑහ. බෝධිසත්වයෝ ඇතුගේ ශරීරය අතින් පිරිමැද බලා කියන්නාහු මේ තෙම මගුලැත් කමට නොනිසිය පසකුඹින් සිටිනේය. මේ ඇතුගේ මව වදන ගමනේ ඇකයෙන් රඳවාගත නුහුනුවන. එසේහෙයින් මෙතම බිම වැටි පස්කඩින් මිටිව ගියේයයි කීහ. ඒ බව ඇතුගෙණා පුරුෂයන් අතින් විචාළාහු ඔහු ඇමත් පණ්ඩිතයන් කියේ සැබැවයි කීහ. රජ්ජුරුවෝ එපවත් අසා සතුටුව පණ්ඩිතයන්ට කහවනු අටක් දුන්හ. තවද එක් දවසක් රජ්ජුරුවන්ට මගුල් අස් තන තුරටයයි අසකු ගෙණාහ. ඔහුත් රජ්ජුරුවෝ බෝධිසත්වයන්ට යවුහ. බෝධිසත්වයෝ අශ්වයාත් අතින් පිරිමැද මගුලස් වන්ට සුදුසුනොවෙයි මොහු උපන් දවස් මව් මැලිවන, එසේ හෙයින් මවගේ කිරි නොලදින් ඉඳූරා වැඩුනේ නොවෙයි කීහ. ඒ බව ගෙණා පුරුෂයන් අතින් විචාරා සැබැවයි කීහ. ඒ බව අසාත් රජ්ජුරුවෝ කවහනු අටක් දුන්හ. තවද එක් දවසක් රජ්ජුරුවන්ට මගුල් රථයයි රථයක් ගෙණාහ. රජ්ජුරුවෝ දැක පණ්ඩිතයන් සමීපයට යවුහ. පණ්ඩිතයෝ රථයද අතින් පිරිමැද කියන්නාහු මේ රථය සිදුරු ඇති ගසකින් කරණලද්දේය. එසේ හෙයින් මේ රථය මගුල් රථයට සුදුසු නොවෙයි කීහ. ඒ බව විචාරා සැබෑම වුයේය. රජ්ජුරුවෝ ඒ අසාත් කහවනු අටක් දුන්හ.
තවද එක්දවසක් මාහැගි පලසක් ගෙණාහ. ඒ ද පණ්ඩිතයන්ට පෑහ. අතින් පිරිමැද බලා මේ පලස මියන්ගෙන් දෂ්ටයෙක් ඇතැයි කීහ. ඒ පරීක්ෂා කොට බලා දැක රජ්ජුරුවන්ට දැක්වුහ. රජ්ජුරුවෝ සතුටුව කහවනු අටක් දුන්හ. එකල පණ්ඩිතයෝ මොහුගේ තැගී කරණවෑමියෙකුගේ දීමක් මෙන, එසේ හෙයින් මේ කරණවෑමියෙකුට දෑ එකකු වනැයි සිතා මෝහට උපස්ථාන කොට ප්‍රයෝජන කිම්දැයි මා වසන්නාවූ ගමට යෙමියි භරුකච්ඡ නම් පටුනුගමට ගියාහ. මෙසේ ඒ බෝධිසත්වයන් වාසය කරණකල වෙළෙන්දූ නැවක් සරහා කවරක්හු නියමු කරමෝදැයි කථාකරන්නාහු සුප්පාර පණ්ඩිතයන් නැගී නැවක් නොනස්නේය. උෟ තුමූත් නුවණැත්තෝය. උපායෙහි දක්ෂයෝය. ඇස් අන්ධවිනමුත් සුප්පාර පණ්ඩිතයෝ අපට උත්තමයෝයයි බෝධිසත්වයන් සමීපයට ගොස් අපට නියමුකම් කළමැනවැයි කියා බෝධිසත්වයන් විසින් මම අන්ධයෙමි කෙසේ නියමුකම් කෙරේම්දැයි කී කල්හි ස්වාමිනි අන්ධවුවත් නුඹ වහන්සේම අපට උත්මසේකැයි නැවත නැවත යච්ඥාකළ කල්හි යහපත

SANHIDA LANKA

දරුවෙනි තොප ඇම කී සලකුණෙන් නියමුකම් කෙරෙමියි ගිවිස නැවට නැගී නික්මුන කල්හි නැව් මහාසමුද්‍රයෙහි සත්දවසක් උපද්‍රව නැතිව ගොස් සත්වෙනි දවස් අකාල වාතයක් නගා නැව් සාරමසක් මුළුල්ලෙහි පිටවී සමුද්‍රයෙහිම ඇවිදුවා ඛුරමාලි නම් සමුද්‍රයට පැමිණවුයේය. ඒ සමුද්‍රයෙහි මත්ස්‍යයෝ මනුෂ්‍ය ශරීර ඇත්තාහුය. දියෙහි හැලෙමින් ඉලිප්පෙමින් ඇවිදිනාහ. එකල වෙළඳුන් එම සත්වයන් දැක බෝධිසත්වයන් අතින් සමුද්‍රයෙහි නම් විචාරන්නාහු මෙසේ කියත්. කරමුවාතට බඳුවූ නාසා ඇති මනුෂ්‍යයෝ යටවත් කුමුදුනාග උඩවත් කුමුදුනාග සුප්පාර පණ්ඩිතයන් වහන්සේ නුඹ වහන්සේ අතින් විචාරම්හ. මේ සමුද්‍රය කවර සමුද්‍රයක්දැයි කීහ. මේ එසේ ඒ වෙළඳුන් විචාළකල්හි බෝධිසත්වයෝ තමන්ගේ නියමු ශාස්ත්‍රයෙන් බලා දැක කියන්නාහු වස්තු වෙළඳාම් පිණිස හරුකච්ඡ නම් පටුන්ගමින් ආවාවු තොපි ඇම නැව්නැගී පැමිණ මේ සමුද්‍රය ඛුරාමාල් යයි කියති කීහ. ඒ සමුද්‍රයෙහි විදුරු උත්සන්න වන්නේය. බෝධිසත්වයෝ සිතන්නාහු ඉදින් මම මුන්ට විදුරු සමුද්‍රයයි කිම නම් මු හැම වස්තු ලෝභයෙන් බොහෝ විදුරු උකා නැව නසා ගන්නාහයි උන්හැමට නොකියාම නැව රඳවා උපායෙන් එක් යොතක් එලා මසුන් අල්ලන්නාසේ දැන් දම්මා විදුරු ගොඩනාංවා නැවෙයි බහා නැව තුබුවායෙන් ස්වල්පවු බඩුවක් දම්මවා නික්මුනුකල්හි ඒ සමුද්‍රය ඉක්මගොස් මත්තෙහි අග්නිමාලී නම් සමුද්‍රයට ගියාහ. ඒ සමුද්‍රයට ගියාහ. ඒ සමුද්‍රයතෙම දිලියෙන්නාවු ගිණිකඳුමෙන්ද මුදුන් පැමිණි ඉරුමඬලක් මෙන්ද රැස්මි පවතිමින් සිටියේය. ඒ සමුද්‍රය දැක වෙළඳහු විචාරන්නාහු යම්සේ ගිණිදල් පෙණේද යම්සේ සූර්යමණ්ඩලය පෙණේද එපරිද්දෙන් මේ සමුද්‍රය පෙණෙන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්සේ නුඹ වහන්සේ අතින් විචාරම්හ මේ සමුද්‍රය කවර සමුද්‍රයෙක්ද අපට කිවමැනවැයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු විදේසීව ආවාවූ තොප ඇම පැමිණි මේ සමුද්‍රය අග්නිමාලයයි කියති කීහ. ඒ සමුද්‍රයෙහි රත්රන් බොහෝකොට ඇත්තේයයි බෝධිසත්වයෝ එතනින් රත්‍රනුත් පෙර පරිද්දෙන් උපායෙන් නැවට නංවාගත්හ. නැවත ඒ සමුද්‍රයත් ඉක්ම දධිමාලි නම් සමුද්‍රයට පැමිණියේය. ඒ සමුද්‍රය දුටු වෙළඳහු විචාරන්නාහු කිරෙහි පැහැයක් යම්සේද දියෙහි පැහැයද එපරිද්දෙන්ම වන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්සේ නුඹ වහන්සේ අතින් විචාරම්හ මේ සමුද්‍රය කිනම්දැයි විචාළාහ.

බෝධිසත්වයෝ කියන්නාහු හරුකච්ඡ නම් පටුන්ගමින් නික්මධන සොයා ඇවිදිනාවු තොප ඇම වෙළඳුන් විදේශිව ආවාවු මේ නැව පැමිණ සමුද්‍රය දධිමාලීයයි කියති කීහ. ඒ සමුද්‍රයෙහි රිදී බොහෝ වන්නේය, එයින් බබලන්නේය. එයින් උපායෙන්ම ගොඩනංවා නැවට නංවා ගත්හ. නැව සමුද්‍රය ඉක්ම කුසමාලි නම් සමුද්‍රයට පැමිණියේය. වෙළඳහු ඒ සමුද්‍රය දැක විචාරන්නාහු හිතණ වනයක්ද නිල්ගත් හෝමයන්සේද මේ සමුද්‍රයත් ඉන්ද්‍රනිල මැණික් පරිද්දෙන්ම බබලන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස නුඹ වහන්සේ අතින් විචාරම්හ මේ සමුද්‍රය කිනම්දැයි විචාළාහ. බෝධිසත්වයෝ කියන්නාහු හරුකච්ඡ නම් පටුන්ගමින් නික්ම වස්තු සොයා යන්නාහු තොප ඇම වෙළදුන් විදේශිව ආවාවූ අය මෙතනට පැමිණ මේ සමුද්‍රය කුසි මාලී නමැයි කීහ. ඒ සමුද්‍රයෙහි ඉන්ද්‍රනීල මාණික්‍ය බොහෝ වන්නේය. ඒද උපායෙන් නැවට නංවාගත්හ. නැවත ඒ සමුද්‍රයෙන් ඉක්මගෙණ නලමාලී නම් සමුද්‍රයට පැමිණියේය. ඒ සමුද්‍රය වෙළඳහු දැක විචාරන්නාහු යම්සේ උන වනයෙක් බට වනයෙක් පෙනේද එපරිද්දෙන්ම ඒ සමුද්‍රයත් පෙණෙන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස නුඹ වහන්සේ අතින් විචාරම්හ මේ සමුද්‍රය කිනම් දැයි විචාලාහ. බෝධිසත්වයෝ කියන්නාහු හරුකච්ඡ නම් පටුන්ගමින් නික්ම වස්තු සොයා විදේශිව නැව් නැගී තොප ඇම පැමිණ මේ සමුද්‍රය නලමාලී නමැයි කිහ. ඒ සමුද්‍රයෙහි වෛඩ්‍ය මාණික්‍ය බොහෝ වන්නේය. බෝධිසත්වයෝ එද උපායෙන් නැවට නංවා ගත්හ. වෙළඳහු නලමාලී සමුද්‍රය ඉක්ම ඔබට ගියකල වළබාමුඛ නම් සමුද්‍රය දුටහ.ඒ සමුද්‍රයෙහි ජලය ඒ ඒ ස්ථානයෙහි හාත්පසින් කඩාගෙණ යනකලක් පරිද්දෙන් යන්නේය. වියලි ගිය හෙබසේ පෙණෙන්නේය. රැල නැගූ කල්හි එක් පාර්ශවයකින් ප්‍රතාපවත් වන්නේය. භයජනක ශබ්ද උපදනේය. කන්සිලි වන කලක් මෙන් ලය පැලි යන කලක් මෙන් සමුද්‍රය දැක වෙළෙඳහු භයින් ත්‍රස්තව බෝධිසත්වයන් විචාරන්නාහු මහත්වු භය උපදවන්නාවු අමානුසිකවූ ඝෝරවූ මහත් ශබ්ද ඇසෙන්නේය. යම්සේ ගැඹුරුවූ හෙප් පෙනෙද එපරිද්දෙන් භයජනක ප්‍රපාත ඇති සමුද්‍රයෙක් පෙණෙන්නේය. සුප්පාර පණ්ඩිතයන් වහන්ස නුඹ වහන්සේගෙන් විචාරම්හ මේ සමුද්‍රය කිනම් සමුද්‍රයෙක්දැයි විචාළාහ. බෝධිසත්වයෝ කියන්නාහු එම්බා දරුවෙනි තොප මේ පැමිණි සමුද්‍රය වළබාමුඛනම් මේ සමුද්‍රයට පැමිණ කෙණෙකුන්නේ ආපසුයාමෙක් නම් නැත මේ සම්පත හා නැව ගලා විනාශයට පමුණුවන්නේයයි කීහ. ඒ නැවෙහි සත්සියයක් පමණ නැංගාවූ මනුෂ්‍යයෝ ඇමදෙනම මරණභයින් තැතිගෙණ අවිචිමහනරකයෙහි සත්වයන් මෙන් එපරිද්දෙන් ඉතා බැගෑපත්ව එකපැහැර භයින්ම හඬන්ට පටන්ගත්හ,

SANHIDA LANKA

එකල මහබෝසතානෝ මා ඇර අනික් මුන් ඇමටම සැපතක් කරන්නට සමර්ථකෙණෙක් නැත සත්‍යක්‍රියායෙන් මුන් ඇමට සැපයක් කරන්ට සිතා වෙළඳුන් තමන් සමීපයට කැඳවා එම්බා දරුවෙනි මා වහා සුවඳපැනින් සිතා වෙළඳුන් තමන් සමීපයට කැඳවා එම්බා දරුවෙනි මා වහා සුවඳපැනින් නාවා අළුත් වස්ත්‍රයක් හඳවා තලියක් පැනින් සම්පුර්ණකොට සරහා නැව්ගිය තබවයි කීහ. වෙළඳහුත් වහ වහා එපරිද්දෙන්ම කළහ. බෝධිසත්වයොත්තේ දෙඅතින් පිරුණු තලියගෙණ නැව්හිස සිට සත්‍යක්‍රියා කරන්නාහු යම් තෙනෙක්හි පටන්

මම නවාමිනාව දනිම්ද එතැන්පටන් මම සිහිකෙරෙම්ද දූන දූන එකමද ප්‍රාණියකු නැසුනියාවත් නොදනිමි පස්පවින් එකක්කළ නියාවත් නොදනිමි ඒ සත්‍යක්‍රියාව හේතු කොටගෙණ මේ නැව සැපසේම සියනුවරට යෙවයි කියා තලියෙහි පැන් නැව්ගිස වත්කළාහ. එක්ෂණයෙහි සාරමසක් මුළුල්ලෙහි සමුද්‍රයෙහි ඇවිදි නැව ආපස්සේ නික්ම ඉර්දිමත් කෙණෙකුන්ගේ ඉද්ධ්‍යානුභාවයක්සේ එක දවසකින්ම හරුකච්ඡනම් පටුනුගමට ගියේය. ගොසිනුත් අට ඉස්බක් පමණ තැන්ගොස් නැව ඇති තැනැත්තවුගේ ගේදොර සිටියේය. එකල බෝධිසත්වයෝ වෙළඳුන්ට ඒ සම්පත් බෙදාදී තොපහැමට මෙතෙක් සම්ත් සෑහෙයි මින්මතු යාත්‍රාවක් නොකරවයි අවවාද කොට දිවිපමණින් කුසල් කොට කා බුන් මරණින් මත්තෙහි දෙව්ලොව උපන්හ. සර්වඥයන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි බුදුහු පෙරත් නුවණැත්තෝම වේදැයි වදාරා මේ සුප්පාර ජාතකය නිමවා වදාළසේක. එකල නැව් නැගී පිරිස්නම් දූන් බුදුපිරිස් වන්නාහ. එසමයෙහි සුප්පාර පණ්ඩිතයෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

## චුල්ල කුණාල ජාතකය

තවද චුල්ල කුණාල ජාතකය මහා කුණාල ජාතකයේ පෙනෙන්නේය.

SANHIDA LANKA

# භද්දසාල ජාතකය

තවද හුදු ක්‍ෂාන්තියෙන් මවාලු රුවක් වැනිවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ඥාති සංග්‍රහයක් අරභයා මේ ජාතකය දක්වන ලද.
ඒ කෙසේද යත්
එක්සමයෙක්හි අනේපිඬු මහ සිටාණන්ගේ ගෙයි භික්ෂූන් වහන්සේ පන්සියයක් දෙනා වහන්සේටත් විශාඛාවන්ගේ ගෙයි පන්සියයක් දෙනා වහන්සේටත් නිරන්තරයෙන් දන්දෙන්නාහු කෝසල රජ්ජුරුවෝ එපවත් අසා භික්ෂූන් පන්සියයක් දෙනා පවරා නිරන්තයෙන් දන්දෙන්නාහ. දන්දෙන පමණක් විනා විස්වාස ඇදහිලි ඇතිව නොදෙන්නාහ. භික්ෂූන් වහන්සේත් දන් පිළිගෙණ කුළුපග උපාසක වරුන්ගේ ගේවලින් අනේපිඬු මහ සිටානන්ගේ ගෙට ගොසින් හෝ විශාඛාවන්ගේ ගෙට ගොසින් වළඳා එනසේක. එක්දවසක් කොසොල් රජ්ජුරුවෝ මිහිරි දෙයක් දක භික්ෂූන් වහන්සේ කෙණෙකුන් නොදක එපවත් රජ්ජුරුවන්ට කීහ. ඇයි භික්ෂුන් වහන්සේ මාගේ දානශාලා වේදි නොවළඳා මහළුවරුන් වහන්සේ ඔබ්බේදී වළඳන්ට කාරණා කිම්දැයි කියා ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේ අතින් විචාරන්නාහු ස්වාමිනි භික්ෂූන් වහන්සේ මාගේ ගෙයි නොවළඳන්ට කාරණා කිම්දැයි කීහ. එවිට  සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහරජ විස්වාස නැත්තෙන් නොවළඳන්නේයයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු භික්ෂුන් වහන්සේ විස්වාස ඇත්තේ කවුරුන් කෙරෙහිදැයි විචාළාහ. සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහරජ බන්ධූන් කෙරෙහි විස්වාස ඇත්තාහ. ඇදහිලි ඇති උපාසකවරුන් කෙරෙහි විස්වාස ඇත්තාහ. සෝවාන්වූ කෙණෙකුන් කෙරෙහි විස්වාස ඇත්තාහයි වදාළසේක. එබස් අසා කෝසල රජ්ජුරුවෝ කියන්නාහු මම ශාක්‍යවංශයෙහි රාජකුමාරියකු ගෙණායේ වීනම් බුදුන්ට නෑවුනුසෙයින් භික්ෂූන් වහන්සේ මා කෙරෙහි විස්වාසවනසේකැයි සිතා ශාක්‍යවංශයෙහි රජදරුවන්ට තමන්ගේ ශාක්‍යවංශය හා විස්වාසවන්ට අභිප්‍රාය ඇත්තෙම් ශාක්‍යරාජකුමාරිකාවක එවුවමැනවැයි පත් ලියා දූතයන් අත යවුහ. ශාක්‍ය රජ දරුවෝ එර් පත් අසා අප ඉඳිාන් කෝසල රජ්ජුරුවන්ගේ සීමාවේය. එසේහෙයින් රාජකුමාරිකාවක පාවා නුදුනමෝය නමුත් දෝෂය, පාවා දුනුමෝ නුමුත් ජාති භින්නවන හෙයින් එයිත් කටයුතු නොවෙයි. කුමක්කරමෝදැයි වික්‍ෂේපව උන්නාහු එවිට මහානාම නම් ශාක්‍ය රජ්ජුරුවෝ කියන්නාහු මුසුප්පුනොව ඊට උපායෙක් ඇත. මාගේ කණිමුණ්ඩ නම් කෙල්ලක් ඇත මටම දා වාසභඛත්තියා නම් දුවක් ඇත්තීය. ඈ මට දා දුවහෙයින් අනික් සැකයෙක් නැත පෑ පාවා දෙම්හයි කථාකොට කෝසල රජ්ජුරුවන්ගෙන් ආ දූතයන්ට කියන්නාහු රජ්ජුරුවන් වහන්සේගෙන් අප හා විස්වසවූව මැනවැයි කියා ආකල රාජ කුමාරිකාවක් පාවා දුනමැනව පාවාදෙන්ට කුමන අමුත්තක්දැයි රාජකුමාරිකාවක් ගෙණවයි කිහ.

එවිට දූතයෝ සිතන්නාහු ශාක්‍යයෝ නම් මහා මායම් දන්නාහ. කෙල්ලකගේ දුවක් පාවාදුන්නු නුමුත් කාරණා නොවෙයි සිතා කියන්නාහු අපට පාවාදෙන්නාහු රාජ කුමාරිකාවන් හා අප දැක්කදී කැව මැනව එසේ වී නම් පාවාගෙණ යම්හයි කීහ. රජ්ජුරුවෝ එබසට සැකව උන්නාහ. එවිටත් මහානාම රජ්ජුරුවෝ තොපි ඇම සැක නොකරව මම ඊට උපායක් දනිමි මා බත්කන්ට සරසා උන්විට වාසභඛත්තියාවන් මාගේ දුවනියන් ගෙණෙවයි කියමි ඒ වෙලාවට සවර්ණාභරණයෙන් සරහා බත්කන්ට උන් වෙලාවටත් බත් පිඩක් අනා පළමුකොට අනුභව කොට තොපි බත්කවයි  කියමි. එවිට ප්‍රත්‍යන්ත රටකින් ගෙණා පතක මේ පත බලා වදාළමැනවැයි ස්වාමිනි කියා ඒ පත මා අතට දී ලව මම ඒ පත බල බලා ඉදිමි එතකොට මූ බත්කා පියති එකල දූතයන්ට සැකනැතැයි කියා සනිටුහන්කොට දූතයන්ට කියන්නාහු මාගේ දරුවන් හා කැටිව කන්නට කුමන අමුත්තෙක්ද යහපත වෙල්ල සරහවයි කියා වේල්ල සරහවා බත් කන්නට ඉඳ මාගේ දුවනියන් වාසභඛත්තියාවන් ගෙණෙවයි කීහ. ඒ වෙලෙහි සර්වාභරණයෙන් සරහා වේල්ල ලඟ සිටවුහ. මහානාම රජ්ජුරුවෝත් දියනියෙනි බත්කන්ට ඉඳුවයි කියා බත්කන්ට උන්කල තුමු පළමුකොට බත්පිටක් කටතුබූහ. ඒ වෙලෙහි පළමුකී පරිද්දෙන් ප්‍රත්‍යන්ත ජනපදයෙන් ගෙණා පතෙක මේ පත බලාවදාළ මැනැවයි කියා මහානාම රජ්ජුරුවන් අතට දුන්හ. රජ්ජුරුවෝත් ඒ පත බල බලා අම්ම නුඹ බත්කන්නෙහි කිය කියා උන්හ. කුමාරිකාවන් පියානන් පළමු කොට බත්කෑහෙයින් තුමු බත්කා නිමවුහ. මහානාම රජ්ජුරුවෝත් බත් කා නිමවන තුරු පත බල බලා උන්නාහ. දූතයෝත් මහානාම රජ්ජුරුවන් අතත් කටත් බත් ගැවී තිබෙන හෙයින් බත් කෑවිට නැගිසිට හෙයිනුත් දනගත නුහුනුවාහ, කැටුවම බත් කැවුය. රාජකුමාරිකාව නියාවට අමුතු නැතැයි සැකනැතිවුහ. මහානාම රජ්ජුරුවෝත් දුවනියන්ට දුනමනා බොහෝ දැසිදස් පරිවාරද රන්රුවන් ආදී වස්ත්‍රාභරණද යන සියල්ලම දී මාගේ දුවු වාසභඛත්තියාවන් ගෙණවයි පාවාදුන්හ. අමාත්‍යයෝද රාජ කුමාරිකාවගෙණ ඉතාම උභයකුලපරිශුද්ධවූහයි කියා රජගෙට ගොස්  රජ්ජුරුවන්ට පාවාදුන්හ. රජ්ජුරුවෝත් ඒ කුමාරිකාවන් රුවත් රැසක් මත්තෙහි සිටුවා අභිෂේකජලය වත් කොට අගමෙහෙසුන් තනතුරෙහි තුබූහ. බිසවුන් රජ්ජුරුවන්ට ප්‍රියව වාසය කරන්නාහ. නොබොකලකින් පුතනුකෙණෙකුන් වැදූහ. ඒ වෙලෙහි කෝසල රජ්ජුරුවෝ අමාත්‍යයකු කැඳවා කියන්නාහු මේ කුමාරයන්ගේ මුතුන්වූ මහානාම රජ්ජුරුවන්ගේ

SANHIDALANKA

කිඹුල්වත්නුවරට ගොසින් උන් වහන්සේගේ පුතනුකෙනෙකුන් වැදූසේක. උන් වහන්සේට නුඹ වහන්සේගේ රාජ වංශයෙහි තිබිය යුතු නමෙක්වේද එවමැනවැයි විචාරා එවූසේකැයි කීහ. එවිට බිසව් කියන්නාවූ වාසභඛත්තියායෝ රජ්ජුරුවන් වහන්සේට ආදිම ප්‍රිය වල්ලභයහ. දූන් දිවුනක් වල්ලභ වන්නීය ඉතා යහපතැයි කිහ. එවිට අමාත්‍යයෝ බිසවුන් වල්ලභවන්නීයයි කී බස් විඩුඪභයයි කීවාසේ අසා සැවැත්නුවරට ගොස් කෝසල රජ්ජුරුවන්ට කියන්නේ ස්වාමිනි බිසවුන් වහන්සේ විඩුඪභ කුමාරයෝයයි නම් තබන්ට කීසේකැයි කීහ. එවිට කෝසල රජ්ජුරුවෝ ඒ වංශයෙහි තිබී ආ නමෙකැයි සිතා විඩුඪභ කුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරයෝත් රජපෙරහරින් වැඩෙන්නාහ. සෙසු බිසෝවරුන්ගේ රාජකුමාරවරු ඇත්තාහ. උන්ට උන්ගේ මුතුන් මිත්තන්ගේ රාජ්ජයෙන් කෙළිනා ඇත් අස් රුව ආදීවූ කෙළින්ට නිසිදෑ එවන්නාහ. රාජකුමාරවරු ඒ ඇරගෙණ කෙළිනාහ.

විඩුඪභ කුමාරයෝ මෑනියන්ට කියන්නාහු මෑනියන් වහන්ස නුඹ වහන්සේගේ මෑනියන් පියානන් නැද්ද මට පඬුරක් නේවන්ට කාරණා නිම්දැයි කීහ. බිසව් කියන්නාහු පුත තොපගේ මුතුන් මිත්තෝනම් ශාක්‍යවංශයේ රජදරුවෝය උන් වහන්සේලාගේ නුවර මෙතනට ප්‍රත්‍යන්තව තිබෙයි එසේ හෙයින් දසවිට මිනිසුන් එවන්ට දුරුහෙයින් නේවන්නේයයි කීහ. ඒ අසා විඩුඪභ කුමාරයෝ කියන්නාහු එසේ විනම් මෑනියන් වහන්ස මම මාගේ මුතුන් මිත්තන් දකින්ට යෙමි කීහ. ඊට බිසව් කියන්නාහු දූන් ගොසින් කවර ප්‍රයෝජනද පසුව යවයි ඒ කුමාරයෝත් තත්පරව යෙමි කීහ. බිසව් යහපත යවයි කියා ශාක්‍ය රජ්ජුරුවන්ට පත් ලියා පළමුකොට මිනිසෙකු අත යවන්නාහු ස්වාමිනි මම ආදවස් කිසි අවසරයක් නොපෑ සැපසේ වාසය කෙළෙමි. මේ කුමාරයෝ නුඹ වහන්සේලා දකිණා පිණිස ඔබ සැපසේ වාසය කෙළෙමි මේ කුමාරයෝ නුඹ වහන්සේලා දකිණා පිණිස ඔබ එන්නාහ. මාගෙන් කිසි තොරතුරකුත් උන්ට නොනැගුව මැනවැයි පත් යැවූහ. ශාක්‍ය රජ දරුවෝත් වැඩිමාළු රජ්ජුරුවොන් විනා බාල කුමාරවරුන් මෙතන රැඳුනු කල උන්ට ආදර සම්භාවනා කළමැනවයි ඒ නියාවට වැඩිමාළු රජදරුවන් විනා බාල කුමාරවරුන් එකහිම පිටිසර ගම්වලට යවා රජදරුවෝ අධිකරණ ශාලාවෙහි එක්ව උන්නාහ, විඩුඪභ කුමාරයෝත් පියානන්ගෙන් අවසර ඉල්වා ගෙණ බොහෝ සේනාවාහනයෙන් කිඹුල්වත් නුවරට ගොස් රජදරුවන් උන්නාවූ ශාලාවට වන්හ. රජ දරුවෝත් විඩුඪභ කුමාරයන් දැක මුන් වහන්සේ තොපගේ මුත්තනුවන් වහන්සේයයි පෑවාහ. විඩුඪභ කුමාරයෝත් වසට කැඩෙනතුරු වැඳ එකත්පස්ව සිට තමන්ට ආදර සම්භාවනාකරණ කෙණෙකුන් නොදැක කියන්නාහු ඇයි ස්වාමිනි නුඹ වහන්සේගේ බාල කුමාරවරු නැද්දැයි විචාළාහ. එවෙලෙහි මහානාම රජ්ජුරුවෝ කියන්නාහු කුමාරයෙනි බාල කුමාරවරු ඈත තොප එන්නාට පළමුවෙන් පිටිසර පළාගියෝයයි කියා අස්වලා උන්කැටිව ආවාවූ පිරිසට හා පරිවාර ජනයාට බත්වියදම් ආදීවූ දෙයද රාජකුමාරයන්ට දූනමනා පඬුරු පාක්කුඩම් යන සියල්ලම අඩුවක් නැතිව දෙවා රාජ කුමාරයන් යවුහ. රාජ කුමාරයෝත් කිසිසැකයක් නොසිත රජ්ජුරුවන් කරා ගියාහ. උන් හා කැටිව ආ සේවායෙක් ඒ ශාලාවේ අයුධයක් තබා ගියේය. ආයුධය ගෙණයන්නට උඅ එන වෙලාවට එක්කෙල්ලක් විඩුඪභ කුමාරයන් උන් පෝරුව කිරිපැණින් සඳුන් පැණින් සෝදන්නීය. අප හා සරි කෙල්ලකගේ පුතා උන් පෝරුව අපි සෝදම්හයි කිය කියා පෝරුව සෝදන්නීය. ඒ සේවකයා ඈ කියන්නාවූ බස් අසා තී කියන්නේ කිම්දැයි විචාරා තොරතුරු මුළුල්ලම ඈ අතින් විචාරාගෙණ මෙපවත් සැවැත්නුවර මුළුල්ලේම ප්‍රකාශ කළේය. එපවත් කෝසල රජ්ජුරුවෝ අසා බිසවුන්ට තිබූ තරමුත් ඇරගෙණ කුමාරයන් ටත් පරිවාර තරමට පඩිවියදම් තිබූහ.

කෝසල රජ්ජුරුවෝ එක් දවසක් ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේ වැඳ එකත්පස්ව ඉඳ කියන්නාහු ස්වාමිනි ශාක්‍ය රජදරුවන් ලඟට රාජ කුමාරිකාවක් ඉල්වා යවා අපට තමන්ගේ කෙල්ලකගේ දුවක් එවූයයි කියා විඩුඪභ කුමාරයන් මෑනියනුත් සිටි තරමින් පිරිහෙලා පරිවාර තරමට පඩි තරමුත් තිබූ නියාව කීහ. ඒ වෙලෙහි සර්වඥයන් වහන්සේ වදාරණ සේක් මහරජ ශාක්‍ය රජ්ජුරුවන් කෙළෙත් කටයුතු නොවෙයි, එසේදවුවත් මහරජ පෙර රජදරුවෝ මණ්ඩශාල නම් කෙල්ලක සිටි තරමින් පිරිහෙලා නැවත අගමෙහෙසුන් තනතුරු දුන්නෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ මණ්ඩශාල ජාතකය ගෙණහැර දක්වා වදාර මහරජ මේ වාසභඛත්තියාවන්ගේ මෑනියන් කෙල්ල පමණක් විනා මුන් තමුන් දා මහනාම රජ්ජුරුවන්මය, විඩුඪභ කුමාරයන් උපන්නේ තොපටය. එසේහෙයින් මවුපක්‍ෂය විනා පියපක්ෂය රාජවංශය, එසේ හෙයින් අඩුවක් නැතැයි රජ්ජුරුවන්ට කියා වාසභඛත්තියාවනුත් විඩුඪභ කුමාරයනුත් දෙන්නාම පළමු සිටි ස්ථානාන්තරයෙහි පිහිටුවා වදාළසේක. විඩුඪභ කුමාරයෝ සිතන්නාහු හා උන් පෝරුව මමත් සෝදවමි සිතා ශාක්‍ය රජදරුවන් කෙරෙහි වෛර බැන්දාහ. ඒ කෝසල රජ්ජුරුවන්ගේ බන්ධුල සේනාධිපතියයි යන සෙනවිරත් කෙණෙකුන් ඇත්තාහ. උන්ගේ බන්ධුලමල්ලිකා දේවියයි යන බිරින්දක් ඇත්තාහ. උන් වඳ හෙයින් බන්ධුල සේනාධිපති තෙම වඳ තැනැත්තන් මාගේ ගෙයි ඉඳිනට කාරණා කිම්දැයි තොපි තොපගේ දෙමව්පියන්ගේ ගමට යවයි කිය. බන්ධුල මල්ලිකාවොත් යහපතැයි කියා දෙමව්පියන්ගේ ගමට යන්නාහු සර්වඥයන් වහන්සේ දැක වැඳ පුදා අවසර ඉල්වා ගෙණ යෙමියි ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේ වැඳ එකත්පස්ව සිටියාහ. සර්වඥයන් වහන්සේ ඇයි මල්ලිකා දේවිනි කොයි යව්දැයි

SANHIDA LANKA

විචාළසේක.

මල්ලිකාදේවි කියන්නාහු ස්වාමිනි බන්ධුලසේනාධිපති මිඩියට දරුවන් නැතැයි කියා මිඩියාගේ දෙමව්පියන්ගේ ගමට යන්ට කිවුය. මිඩිය ගමට යන තැනැත්තී ස්වාමින් දක වැදපුදා අවසර ඉල්වාගෙණ යන පිණිස ආමි කීහ. සර්වඥයන් වහන්සේ වදාරණ සේක් මල්ලිකාදේවිනි දරුවන් නිසාවිනම් ගමට නොගොස් තොපගේ ගෙට ආපස්සේ යවයි වදාළසේක. මල්ලිකාදේවිත් යහපතැයි තමන්ගේ ගෙට ගියහ. බන්ධුල සේනාධිපති තොප ආයේ ඇයිදැයි විචාරා සර්වඥයන් වහන්සේ දරුවන් නිසා විනම් ගමට නොගොස් ගෙට යවයි කී හෙයින් ආමි කීහ. බන්ධුල සේනාධිපති සර්වඥයන් වහන්සේ විසින් කාරණයක් දක්නාලද්දේයයි කියේය. බන්ධුල මල්ලිකාවෝ නොබෝ කලකින් දරුගැබ ලැබ උපන් දොළ ඇතිව මට දොළෙක් ඇත්තේයයි දැන්වුවාහ. බන්ධුලයෝ කවර දොළොක්දැයි කී කල්හි ස්වාමිනි විශාලා නුවරහි ගණ බන්ධනයෙන් රජකම් කරණ රජකුලයන්ගේ ස්නානය කරණ මගුල් පොකුණට බැස ස්නානය කොට බොන පැන් පානය කරණ කැමැත්තෙමි කීවාය. බන්ධුල සේනාධිපති මේ මට බැරි දෙයක්දැයි දහසක් නගණ දුන්න ඇරගෙණ රථයට පැනනැගී මල්ලිකා දේවිනුත් රථයට නංවා විශාලා නුවරට ගොස් ලිච්ඡවි රජ්ජුරුවන්ගේ වාසල්හි පඩියේ රථය ගසා නුවරට වන්හ. මලල සේනාධිපතින් හා කෝසල රජ්ජුරුවන් හා එක්ව ශිල්ප උගන්නාවූ ඇස් අන්ධව ඉදිනා මහාළි නම් ලිච්ඡවි රජ්ජුරුකෙණෙකුන් ඇත්තාහ. ඒ රජ්ජුරුවෝ නුවර වාසලක ඉදිනාහ. රථය අඬ අසා බන්ධුලසේනාධිපති මේ නුවරට අවුය ලිච්ඡවි රජ්ජුරුවන්ට බොහෝ අනර්ථ වන්නේයයි සිතූහ. බන්ධුල සේනාධිපතින් නුවරට වැද උයනට ගොස් කඩුපත වෙවුල්වා උයන රැකවල් සිටවුන් භයගන්වා ගිය ගිය අත පළවා ලෝදැල් හීරැස්ස රැසක් පොළුගසන්නාසේ සිඳහෙලා පොකුණට බැස මල්ලිකාදේවින් ඉස්සෝධා නහවා පැන්පොවා රථයට නංවා රථය පැදගෙණ නුවරින් පිටත්ව නික්මුණාහ. උයන රැකවල සිටියෝ එපවත් ලිච්ඡවි රජ්ජුරුවන්ට කීහ. ලිච්ඡවි රජ්ජුරුවෝ කිපී සන්නාහ සන්නද්ධව රථ පන්සියයක්ට පැන නැගී බන්ධුලසේනාධිපතින් ලුහුබඳවා අල්වම්හයි නික්මුණාහ. මහලී නම් රජ්ජුරුවෝ එපවත් අසා රාජකුමාරවරුනි බන්ධුලසේනාධිපතින් තොප හැම විසින් අල්වාගත හැකිකෙණෙක් නොවෙයි පස්සේ නොයවයි කීහ. රාජ කුමාරවරුන් තනි බන්ධුලසේනාධිපතියා අපට කුමක් කොට ගතහේද අප පන්සියයක් නොවේදැයි කියා රාජමානයෙන් බන්ධුලයා නැගී සුරුබුහුටි කමිනුත් පස්සේ නික්මුණාහ. එවිට මහාලිනම් ලිච්ඡවි රජ්ජුරුවෝ කියන්නාහු තොපි හැම නොනැවති යනපසු බන්ධුලයා නැගී රථය පොළොව ගිලියේ පෙණෙයි. ඒ දක නොයවයි කීහ. නොනැවත යනපසු ඉදින් ඔබ්බට ගියානම් අකුණක් ගැසූ අඬසේ ඇසෙයි එවිට නොයවයි ඉන් ඔබ්ට ගියානම් රථහිස්වල සිදුරු දුටුවිට රඳයවයි කී. රාජ කුමාරවරුන් අස අසාම නොනැවත නික්මුණාහ. මල්ලිකාදේවි පස්සේ එන්නාවූ රථ දක ස්වාමිනි  රථ පන්සියයක් පස්සේ එති කීහ. එවිට බන්ධුල සේනාධිපතීන් බිරින්ද අතට අසුගේ රැන දී දාසක් නගාලන දුන්නට දන එබූහ. එවිට රථය රථ නාභිය අතට අසුගේ රැන දාසක් නගාලන දුන්නට දන එබූහ. එවිට රථය රථ නාභිය දක්වා පොළොව ගිලිනා ඒ දකත් නොරඳා යන්නාහ. එවිට දුන්නගෙණ අත දුනුදිය පොළාපුහ. එද අකුණක් ගැසූ අඬයේ ඇසින. ඒ අසාත්  නොරඳා යන්නාහ. ඒ වෙලෙහි හීයක් අතටගෙණ ඈද මැඩ විද්දාහ. ඒ රථහිස් පන්සියයක් රජදරුවන් පන්සියයද විදගෙණ පොළොව ගිලින. ඒ දකත් නොරදා යන්නාහ. ඒ රථහිස්වල සිදුරු දැකත් නොරඳා යන්නාහ. ඒ වෙලෙහි බන්ධුලසේනාධිපති කියන්නාහු තොපි ඇමදෙනම මලවුන් මා පස්සේ එන්නේ ඇයිදැයි කීහ. එවිට රාජකුමාරවරු කියන්නාහු මලවුන් මෙසේ සිටිනෝදැයි කීහ. එවිට බන්ධුල සේනාධිපති කියන්නාහු තොපි ඇම දෙනාට පස්සේ රථයේ එන රජ්ජුරුවන් සන්නාහය මුදා උනාපියවයි කීහ. එවිට යහපතැයි උනාපුහ. ඒ රජ්ජුරුවෝ සන්නාහය ඉනුවහා සමඟ වැටී හුන්හ. බන්ධුල සේනාධිපති කියන්නාහු තෙපි ඇමදෙනම තෙලසේම නුවරට ගොසින් අඹු දරුවන්ට කාරිය කටයුතු කියා තමාගේ යාන්පිට ඉඳ සන්නාහය උනාපුව මැනවැයි කීහ. උනාපුවිටම රජදරුවෝ පන්සියයම මළහ. බන්ධුල සේනාධිපති සැවැත්නුවරටම ගියාම. මල්ලිකාදේවි සොළොස්වාරයෙක දෙන්න දෙන්නා නියායෙන් දෙතිස් දෙනෙකු වැදූහ. ඒ පුත්තු දෙතිස්දෙනම ලයෙන්ද රුවින්ද උසමහතියෙන්ද පියානන් හා සම බල ඇත්තාහ. බන්ධුල සේනාධිපති දරුවන් දෙතිස්දෙනාට දාස සාද නියායෙන් සේවායන් ආණ්ඩු කර දුන්නාහ. බන්ධුල සේනාධිපතින් හා පුත්තු දෙතිස්දෙනා හා සේනාව රාජසේවයට ගිය කල රාජාංගනය උන්ට අවසර වන්නේය.

මේ නියායෙන් දවස් අරණා කල්හි එක් දවසක් බන්ධුලසේනාධිපතින් රාජසේවය එන කල්හි ඒ වෙලාවට එක් මිනිසෙක් තමා හිමි වස්තුවක් අහිමිකොට අත්ලස් කා අධිකරණ නායකයන් කළ අන්‍යායයි ඉස තබා ගෙණ මොරගා බන්ධුල සේනාධිපතින්ගේ පාපිට අඬාහින, බන්ධුල සේනාධිපතින් යහපත විත්ති පසිඳුවාලමි කියා ආපස්සේ අවුත් අධිකරණ ශාලාවේ හිඳ යුක්තිය විචාර හිමි තැනැත්තවුටම හිමි කළාහ. එතන සිටියාවූ බොහෝ දෙනාම යුක්තිය පසුනනියාව ඉතා යහපතැයි සාධුකරා දුන්නාහ. කෝසල රජ්ජුරුවෝ මේ අරගලයත් විචාරා මෙපවත් අසා අද පටන් තෙපි අධිකරණ විචාරවයි බන්ධුල සේනාධිපතින්ට සැලැස්වූහ. එතැන් පටන් බන්ධුල සේනාධිපතිම යුක්ති විචාරන්නාහ. පළමු අධිකරණ විචාළ අමාත්‍යයෝ තමන් ලවන අත්සල් නැතිහෙයින් බන්ධුල සේනාධිපතින් කෙරෙහි වෛර බැඳ රජ්ජුරුවන්ට කියන්නාහු බන්ධුලසේනාධිපතිහු

SANHIDA LANKA

නුඹ වහන්සේගේ රාජ්‍යය ප්‍රාර්ථනාකරන්නාහයි නිරන්තරයෙන් කියා බන්දුල සේනාධිපතින් කෙරෙහි රජ්ජුරුවන් බිඳවාපුහ. රජ්ජුරුවෝත් බන්ධුල සේනාධිපතියා නික්ම අල්වා මරාගත හැකි එකෙක් නොවෙයි උපායකින් මරන්ට උවමැනවැයි කියා තමන්ගේ යොධයන් කැඳවා කියන්නාහු තෙපි ඇම පිටිනුවරට ගොස් සොරුන් ගම් පහරණුවා බඳුකොට ගම්පැහැර සැඟවී ඉඳුව. මම බන්ධුල සේනාධිපතින් හා දරුදෙතිසත් ඔහුගේ පිරිවරත් එවාලමි තෙපි ඇම සැඟවී ඉඳ උන් අල්වා මරාපියවයි කීහ. යෝධයෝත් යහපතැයි ගිවිස ගොසින් පිටිසර ගමක් පැහැරපුහ. එපවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් බන්ධුල සේනාධිපතීන් කැඳවා කියන්නාහු පිටිසර ගමක් සොරුන් පැහැරපුවා ඇසූම්හ. එබැවින් තොපිත් තොපගේ දරුවෝත් පිරිසත් ගොසින් එරට සොරුන් ගෙන් උපන් භය සන්හිඳුවා එවයි කියා යවුහ. බන්ධුල සේනාධිපතින් යහපතැයි ගිවිස දරුවන් දෙතිසත් කැඳවාගෙණ පසල්ගමට ගියාහ. සොරුන් බන්ධුල සේනාධිපතීන් එති කියා අසා වල් නැංගාහ. බන්ධුල සේනාධිපතී එගම මිනිසුන් සෙමෙහි තබා සැවැත්නුවරට නික්මුණාහ. ඒ යෝධයෝත් වලින් එලි බැස බන්ධුල සේනාධිපතින් දරුවන් දෙතිස්දෙනත් අල්වා මැරූහයි නියාව කියා මල්ලිකා දේවින්ට අස්නක් යවුහ. මල්ලිකාදේවි ඒ වෙලාවට සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ ඇතුළුවූ පන්සියයක් දෙනාවහන්සේ ගෙයි වඩා හිඳුවා දන් දෙන්නාහ. එක් කෙල්ලක් එළඟිතෙල් කළයක් ගෙන යන තැනැත්තී බිඳපුහ. සැරියුත් ස්වාමි මල්ලිකා දේවිනි නස්නා සුළුදෙය නස්සේනය. තොපි ඊට කනස්සළු නොවවයි වදාළසේක. ඒ වෙලෙහි මල්ලිකා දේවි ස්වාමිනි මාගේ මේ තෙල් කළයට මුසුප්පු වන්නේද මේ මාගේ ස්වාමි පුත්‍රයානන් හා දරුවන් දෙතිස් දෙනාද මරාපු නියාවට ගෙණා පත නොවේදැයි ඉන තබාගත් පත පෑවීමට පවා මුසුප්පුනුවු මම තෙල් කළයට මුසුප්පු වෙම්දැයි කීහ. සැරියුත් ස්වාමි සමාධිව උන්ට බණ වදාරා ජේතවනාරාමයට වැඩිසේක. මල්ලිකාදේවින් තමන් යෙහෙලියන් දෙතිස්දෙනා කැඳවා කියන්නාහු එම්බා තොප තොපගේ ස්වාමිපුත්‍රයෝ  දෙතිස්දෙනාම රජ්ජුරුවෝ නිස්කාරණයේ නසාපුසේක, තෙපි ඇම මැරපූ රජ්ජුරුවන් කෙරෙහිද විස්කම් කියා බිඳූවුවන් කෙරෙහිද කනස්සල්ලක් නොව, ගිය ජාතියෙහි තම තමා කළ අකුසල් විපාක දින, කිසි වරදනොව මෙබන්දක් වුයේයයි සිතා ඉදින පමණක්විනා කිසිකෙණෙකුන් කෙරේ කණස්සල්ලක් නොව මෛත්‍රී කරවයි අවවාද කීහ. එපවත් නුවරවාසී අසා නිරපරාධ බන්ධුලසේනාධිපති නුඹ වහන්සේ විසින් නිෂ්කාරණයේ මරවා දමන ලදැයි කීහ. රජ්ජුරුවෝත් සැබෑව නිරපරාධ බන්ධුලසේනාධිපතීන් හා දරුවන් දෙතිස්දෙනාත් මැරූයේ ඉතාම අයුක්තියයි භයින් බන්ධුල මල්ලිකා දේවින් ඉන්නා ගෙට ආහ. මල්ලිකාදේවින් යෙහෙලියන් දෙතිස් දෙනාත් කැඳවාගෙණ රජ්ජුරුවන් වැඳ සිටියාහ, කෝසල රජ්ජුරුවෝත් කියන්නාහු මල්ලිකා දේවිනි තොපගේ ස්වාමිපුත්‍රවූ බන්ධුලසේනාධිපතීන් දරුවන් දෙතිස්දෙනාත් මා විසින් නිස්කාරණයේ මරවණලද තොපි කැමති වරයක් ගණුවයි කීහ. මල්ලිකා දේවි යහපතැයි ස්වාමිනි පසුව දන්වන්නෙම් වේද වැඩ වදාන්නේ යහපතැයි රජ්ජුරුවන් රජගෙට යවා තුමූ පසුව දවස් රජගෙට ගොස් ස්වාමිනි අපට කැමති වරයක් ගණුවයි වදාළසේක්වේද අප අපගේ ගම්වලට යන්ට අවසර දෙවා වදාරණසේ මැනවැයි කීහ. රජ්ජුරුවෝත් යහපතැයි අවසර දුන්නාහ. මල්ලිකාදේවිත් යෙහෙලියන් දෙතිස්දෙනාත් උන් උන්ගේ දෙමව්පියන්ගේ ගම්වලට යවා තමුන්  තමන්ගේ දෙමව්පියන්ගේ ගමටම ගියාහ, ඉක්බිති කෝසල රජ්ජුරුවෝ එකියන බන්ධුලසේනාධිපතීන්ට බෑනාවු දීඝීතායි නම් කෙනෙක්  ඇති, උන්ට සෙනෙවිරත් ධුරය දුන්නාහ. ඒ දිඝීතී නම් සෙනෙවිත් තමාගේ මයිලනුවන් නිස්නාරණයේ මැරූසේකැයි රජ්ජුරුවන් කෙරෙහි වෛර බැන්දාහ. එසමයෙහි සර්වඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසනසේක. ඒ විහාරය වනාහී ධර්මචේතිය ජාතකයෙහි විස්තර වශයෙන් පෙනෙන්නේය. කෝසල රජ්ජුරුවෝත් සර්වඥයන් වහන්සේ වැඩ හිඳිනා විහාරයට බණ අසන්ට ගියහ. සෙනෙවිරද්දු රජ්ජුරුවන් බණ අස අසා ඉන්දදී සේනාවත් ඇරගෙණ සැවැත්නුවරට ගොස් පඤ්චකකුධ භාණ්ඩය වඩුඝභ කුමාරයන් අතට දී වාසල් අගුල්ලාගෙණ උන්හ. කෝසල රජ්ජුරුවෝ පිටිපස්ස බැළුවාහු බිසවුන් හා බුලත් කවන තැනැත්තවු විනා කිසි කෙණෙකුන් නොදක සෙනෙවිරදුන් දුන් නිසාවු දෙයෙකැයි සිතා ඉතකින් මා නුවරට ගොස් කරන්නේ කිම්දැයි මාගේ බෑනන්වු රජ්ජුරුවන් හිඳිනා නුවරට ගොස් සේනාව ඇරගෙණ සටනට යෙමි බෑනනුවන්හි දිනා නුවරට යන්ටයයි නික්මුණාහ. රජ්ජුරුවෝ පිටිපස්ස බැළුවාහු බිසවුන් හා බුලත් කවන තැනැත්තවු විනා කිසිකෙණෙකුන් නොදක සෙනවිරදුන් නිසාවු දෙයකැයි සිතා ඉතකින් මා නුවරට ගොස් කරන්නේ කිම්දැයි මාගේ බෑනන්වු රජ්ජුරුවන් හිඳිනා නුවරට ගොස් සේනාව ඇරගෙණ සටනට යෙමි බෑනනුවන්හිඳිනා නුවරට යන්ටයයි නික්මුණාහ. රජ්ජුරුවෝ මඟ යමින් සිටියදී රෑව ගියහෙයින් අතරමග ශාලාවක රඳා බුලත් කවන්නහු පළමුකොට යවුහ. රජ්ජුරුවන් ථුලක හෙයිනුත් දුරුමග ගෙවා පයින් ආහෙයිනුත් වටින් සුලං ගසනහෙයිනුත් ඒ ශාලාවෙහි වැදහෙව අලුයම් වෙලාවට ප්‍රාණය නිරුද්ධ විය, බෑණා රජ්ජුරුවොත් එතනට ආවාහ. බිසව් රජ්ජුරුවන් පාපිට අඬ අඬා හුන්හ. රජ්ජුරුවෝත් කෝසල රජ්ජුරුවන් ඒ ශාලාවෙහිම ආදාහණ කරවා මුන් වහන්සේ නටපුසු සටනට යන්නෝකාටදැයි තමන්ගේ නුවරට ගියාහ. වඩුඝභ කුමාරයෝත් රාජ්‍යයට පැමිණ ශාක්‍ය රජදරුවන් කෙරේ ඇති කනස්සල්ල සඳහන් කොට කිඹුල්වත්පුයරට ගොසින් මා උන් පොරුව සඳුන් කිරිපැණෙන් සේදූ ශාක්‍යයන්ගේ ගෙල ලෙහෙයෙන් ඒ පොරුව සේදුව මැනවැයි කියා සටනට යන්ට

SANHIDA LANKA

සේනාව සරහා නික්මුණාහ. ඒ වෙලෙහි සර්වඥයන් වහන්සේ එදවස් අළුයම් වෙලෙහි ලොව බලා වදාරණසේක් තමන් වහන්සේගේ ඥාති සමුහයා විනාසයට පැමිණෙන බව දැක වදාරා නැයන්ට සංග්‍රහ කෙරෙමි සිතා එදවස් පුර්වභාගයෙහි පිඬු පිණිස හැසිර විහාරයට වැඩ වළඳා ඉක්බිති ගඳකිළියට වැඩ සිංහ සෙයාවෙන් සැතීපි මදක්කල් යවා සවස්වෙලෙහි අහසින් වැඩ කිඹුල්වත් නුවර සමීපයෙහි එක් ඡායාවක් නැත්තාවු වෘක්‍ෂයෙක් මුල වැඩ උන්සේක, එතනට නුදුරු තැන්හි විඩුඪභ රජ්ජුරුවන්ගේ සීමායෙහි යහපත් ඡායාව ඇති මහානිග්‍රොධ වෘක්‍ෂයෙකුදු ඇත්තේය. විඩුඪභ කුමාරයෝත් සර්වඥයන් වහන්ස් දැක ඇයි ස්වාමිනි මේ ඡායාසම්පන්න නුග ගසක් තිබෙද්දී මෙවිට ඡායාවේ ඉදල්ගසමුල වැඩ ඉඳිනේ ඇයිදැයි විචාළාහ. සර්වඥයන් වහන්සේ වදාරණසේක් මහරජ කිඹුල්වතින් හමන්නාවු පවන ඉතා මිහිරියයි වදාළසේක. රජ්ජුරුවෝත් සර්වඥයන් වහන්සේ බන්ධුන් කෙරෙහි කරුණාවෙන් වැඩ හිඳිනා සේකැයි ආපස්සේ නුවරටම ගියාහ. මේ නියායෙන් තුන් වාරයක් අවුත් තුන්වාරයෙක බුදුන් දැක පළා ගියේය. සතරවෙනි වාරයේත් ගමන් සැරහුහ. සර්වඥයන් වහන්සේත් මුන් නොනවත්නා කාරණය කවරේ දොහෝයි පරීක්ෂාකොට පළමු එක් ජාතියෙක සාක්‍යයන් එක්ව වලකට වසගැසුවා දැක බෑණ නොනැගී වැඩ උන්සේක. විඩුඪභ රජ්ජුරුවෝත් කිඹුල්වත් නුවරට ගොසින් ශාක්‍ය රජ්ජුරුවන් එක්හි මරා යටත් පිරිසෙයින් කිරිබොන දරුවන් දක්වාත් මැරූයේය. ධර්මශාලාවේ රැස්වු භික්ෂූන් වහන්සේ සර්වඥයන් වහන්සේ බන්ධුන්කෙරෙහි ඇති කරුණාවක බලවත් නියායයි කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උන්දැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන් මතු නොවෙයි පෙරත් බන්ධුන් දුකින් ගලවා ගත්තෙමියි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාල සේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරනැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවෝ තමන් ගේ වඩුවන් කැඳවා කියන්නාහු තෙසු රජදරුවෝ බොහෝ කප් හිඳුවා මාලිගා නංවා ඉඳිනාහුය. මට එසේ නපුර එක් කපක් හිඳුවා එකසතමහ මාලිගාවක් ඉදිකරන්ට උවමැනවැයි කීහ වඩුවොත් යහපතැයි ඊට නිසි දඬු බලා ඇවිදිනාහු කඳු මුදුනක ගස් කීපයක් දැක කපා ඒ ලී බාගත නොහැකි හෙයින් එපවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් උත්සහකොට ඒ ලි බාවයි කීහ. ස්වාමින් බැරියයි කිහ. එසේකල ඔබ්බෙක නිසි දඬුපත් ඇත්තෝ කොයිදැයි විචාළාහ. ස්වාමිනි මගුල් උයනේ මගුල් සල්ගස් නිසියයි කීහ. එසේවිනම් අනික් සල් ගසක් සලස්වා ගණුම්හයි පාන්ලා සඳුන් සුවඳ මල් පැණින් පුජාකොට ගසයට මල් වළු එල්වා මන්ත්‍ර කියා කියන්නාහු මේ ගස වසන්නාවු දේවතාවානෙනි රජ්ජුරුවන්ට එකසත්මහා මාලිගාවක් කරවන සඳහා මේ ගස කපම්හ. ඔබ්බකට පළාගිය මැනවැයි කියා ගියාහ. ඒ ගස වසන දේවතාවාත් මේ ගස නැත්නම් මාගේ ජීවිතය ගිය සරියයි අඬ අඬා සිට මා කුමක් කියම් මේ මාගේ ගස ආශ්‍රය උන්නාවු බොහෝ දේවතාවෝත් ඇත. උන්ට බොහෝ අද්දුවන් සැලසෙයි කියා රජ්ජුරුවන් වහන්සේට කියා මාගේ නැයන්ට වන්නාවු අලාභත් වලකා මාගේ ගසත් කැපියනොදී ගලවා ගණිම් රූ මධ්‍යම වෙලේ රාත්‍රියෙහි රජ්ජුරුවන් වැදහෝනා ශ්‍රී යහන් ගබඩාවට වැද තමන් ගේ දිව්‍යානුභාවයෙන් මාලිගාව ඒකාලෝක කෙරෙමින් සිටියාහ. රජ්ජුරුවෝත් භයින් ත්‍රස්තව නැගීසිට, අඬ අඬා මාගේ ඉස්දොර සිටියාවු තොපි කවුරුදැයි විචාළාහ. දේවතාවා කියන්නේ තොපගේ උයනේ සස්ගස වාසය කරන්නාවු භද්‍රශාලා දිව්‍ය පුත්‍රයා නම් මමයයි කීහ. ඇයි තොපි මේ වෙලේ මෙතනට ආයේ ඇයිදැයි කිහ. මා බොහෝ දවස් උන්නාවූ සල්ගස කුමට කපවිදැයි විචාළාහ. ඇයි තොපි මා එකස්ථමහ මාලිගාවක් ඉදිකරවන නියාව නොදුනද මාලිගාව ඉදිකරණ නිසා කපමි කිහ. මා ඉඳිනා ගස කපාපුවිට මාගේ ප්‍රාණය හා සරියයි කීහ. රජ්ජුරුවෝත් කියන්නාහු මාලිගාව ඉදිකළ කල තොප හා අප හා එක්ව ඉඳුම්හයි කීහ. එවිට දිව්‍ය පුත්‍රයා කියන්නේ මෙවකට සැට දහසක් අවුරුදු මා මේ සල්ගස වසන්නේය. මට පළමු මේනුවර රජකම් කළ රජදරුවන්ගෙන් මේ ගස මල් පහන් පූජා කළාවු කෙණෙක් විනා ගස කැපු කෙණෙකුන් නැත. තොප තත්පරව මහගස කප්පන පසු තුරු ආදිකොට එකී එකී අත්තක් නියායෙන් කපා පසුව ගස කපවයි කීහ. එසේ කැපුකල මට සැපවනනේයයි කිහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු එවිට මට කුමක්වේවා මාගේ ප්‍රාණ හා සරියයි කියා දැන් අත්තෙන් අත්ත කපන්ට කියන කාරණා කිම්දැයි අත් පා කන් නාසා ඉස කපන කල සැප කවරේද එකවිටම ඉසකපාපු කල පාසුදා තොප එසේ කියන්ට කාරණා කිම්දැයි කීහ. එවිට දිව්‍යපුත්‍රයා කියන්නේ මට කුමක්වේවා මා නිසා ඒ ගස වට සිටින්නාවු බොහෝ පැලැටි ගල්වල ඉඳිනා මාගේ බොහෝ බන්ධුහුත් ඇත මට කුමක් වෙතත් උන්ට දුකක් නොවන්නා පමණැයි සිතා මා කියේයයි කීහ. එවිට රජ්ජුරුවෝ තමන්ට වන්නාවු දුකට වඩා තමන්ගේ බන්ධුන්ට වන්නාවු දුකට අඬතියි සමාධිව තොපගේ සල්ගසත් තොපට හලුම්හ. තොපගේ නැයන්ටත් කිසි ගහටයක් නැතිව ඉඳුවයි රජ්ජුරුවෝ ඒ සල්ගස දිව්‍යපුත්‍රයාටම කළාහ. රජ්ජුරුවෝත් ඒ දිව්‍ය පුත්‍රයානන්ගේ අවවාදයෙහි පිහිටා දසරාජධර්මයෙන් රාජ්‍යයකොට පරලොව ගියහයි වදාරා මේ භද්දශාල ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවො නම් ආනන්ද ස්ථවිරයෝය. රජ්ජුරුවන්ට කන්නලව් කිය නෑයන් දුකින් ගලවාගත්තාවු භද්දශාලා දිව්‍ය පුත්‍රයා නම් බුදුවු මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# සමුද්දවානි ජාතකය

තවද හුදු ප්‍රඥාවෙන් මවාලු රුවක් වැනිවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන් පොලොවට වන් නියාව අරභයා මේ ජාතකය දක්වන ලද.
ඒ කෙසේද යත්.
මුගලන් සාමින් සැරියුත් සාමින් දෙදෙනාවහන්සේ දේවදත්ත ස්ථවිරයන් ලඟ උන් පන්සියයක් භික්ෂූන් වහන්සේට බණ කියා ඇරගෙණ ගියසේක. කෝකාලිකයන් වහන්සේ දේවදත්ත ස්ථවිරයන් වැදහෙව නිදනකල්හි තා කුමන මරනිද්දැයි කියා විලුඹෙන් ලැමැද්දට ඇනළු ගමනේ ලේ නගා ලෙටින් වැදහෝනා ගමනේ නව මසකින් අනේ මට කිසි සරණයෙක් නැතිව අනාථ අසරණව ගියෙමි සර්වඥයන් වහන්සේත් මා කෙරෙහි කලකිරුණු සේක. අසූමහ සව්වන් වහන්සේත් මා කෙරෙහි කලකිරුණුසේක. මාගේ බෑණවූ රාහුලස්ථවිරයන් වහන්සේත් මා කෙරෙහි කලකිරුණුසේක. මාගේ ශාක්‍යවංශය හා කෝලිය වංශයෙහිත් මාගේ නැයෝත් මා කෙරෙහි කනස්සළුවුහ. කවුරු මා කෙරෙහි කනස්සළුවුවත් මාගේ සර්වඥයන් වහන්සේත් මට මෛත්‍රී නොකරණසේක, උන් වහන්සේ සරණයෙමි, උන් වහන්සේ දක ක්‍ෂමා කරවාගනිමි සිතා ලාගෙණ සැවැත්නුවරට ගොස් සර්වඥයන් දක්වයි කියා ඇඳපත්තෙක ලාගෙණ සර්වඥයන් වහන්සේ දකින්ට ජේතවනාරාමයට නික්මුණාහ. මේපවත් අසා ආනන්ද සාමින් සර්වඥයන් වහන්සේට දැන් වුසේක. සර්වඥයන් වහන්සේ ආනන්දයෙනි දේවදත්ත ස්ථවිරයෝ අප දක්ක නොහෙතියි වදාළසේක. භික්ෂූන් වහන්සේ ලවා උසුලවාගෙණ සැවැත් නුවරට අවුත් වන්හ. එපවත් අනදසාමින් අසා දෙවනිවත් සර්වඥයන් වහන්සේට දැන්වුසේක. සර්වඥයන් වහන්සේ ආනන්දයෙනි දේවදත්ත ස්ථවිරයෝ ජේතවනාරාමයට අවුනුමුත් අප දක්ක නොහෙතියි වදාළසේක. දේවදත්ත ස්ථවිරයන් වහන්සේ උසුලාගෙණ ජේතවනාරාමයෙහි වාසල ස්වමීපයට ආකල ශරීරයේ දාහ වැදගෙණ ඩාදිය සෙලවින. ඒ වාසල සමීපයේ පොකුණෙක් ඇත්තේය. ඒ පොකුණෙන් ස්නානයකොට යෙමි සිතා ඇඳ බාවයි බිම තබවා පය බිම තිබුකලට පොලොව පැලි නරකයෙන් ගිණිදැල් ඇවිත් සිවුරක් පිට අනික් සිවුරකින් වසන්නාසේ ශරීරය ගින්නෙන් වසා පොලොව ගලනකලට ගලහර ඇට දක්වා ගලැපුකල දේවදත්ත ස්ථවිරයෝ මට බුදුන්ගේ සරණ විනා අන් සරණෙක් නැතැයි සිතා ගාථාවකින් කියන්නාහු.

ඉමේහි අටෙඨහි තමග්ග පුග්ගලං
දේවාති දේවං නරමදම්මසාරථිං
සමන්ත චක්ඛුං සතපුඤ්ඤ ලක්ඛණං
පාණෙහි බුද්ධං සරණං උපෙමි

යන ගාථාව කිය කියා බුදුන්ගේ සරණ ගියාහ. බුදුන්ගේ සරණ ගියත් අවිචිමහ නරකයෙහි වැටුනාහ. දේවදත්ත ස්ථවිරයන්ට පක්‍ෂපාතව සර්වඥයන් වහන්සේට නොයෙක් පරුෂ බිනූ පන්සියයක් පමණ මනුෂ්‍යයෝත් ඒ වෙලෙහි අවිචිමහනරකයෙහි වැටුනාහ. දේවදත්ත ස්ථවිරයන් හා එක්වූ මනුෂ්‍යයින් පන්සියයත් දේවදත්ත ස්ථවිරයනුත් නරකයෙහි වැටුනු නියාව ධම්සභාවේ රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහනෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා දැන්මතු නොවෙයි පෙරත් තමන් හා එක්වූ අය ඇරගෙණ නරකයට ගියේවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වු සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.
ඒ කෙසේද යත්.
යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ ගම ඉඳිනා වඩුවෝ දහසක් දෙනෙක් ඇත්තාහ. ඒ වඩුවෝ ඒ ගම මනුෂ්‍යයන්ට ඇඳ පුටු ගෙවල් දොරවල් ඉදිකරම්හයි කියා බඩුගෙණ කර්මාන්ත නොකරන්නාහ. මනුෂ්‍යයෝ වඩුවන් තමන්ට කර්මාන්ත නොකරණ හෙයින් අපගේ මිල දෙවයි කිහ. මිලත් දී ගත නොහෙන්නාහ. කර්මාන්තත් නොකරන්නාහ. මේ නියාවට කොටගත නොහී වීක්ෂපව වනාන්තරයට ගොසින් මහපඬවුවක් ඉදිකොට ගඟඔස්සේ ගෙණවිත් තමන් ගේ අඹුදරුවන් අය පවුරු පඬවුවට නංවා වඩුවෝ දහසක් නැගී ගඟ ඔස්සේ පඬව්ව ගෙණගොස් සමුදුයේ එහ. සමුදුයෙන් යන්නාවූ අමෘත අඹ කොස් කෙහෙල් උක්දඬු වැල වරකා සයංජාත ඇල් ආදී නොයෙක් මධුර රසඵලයෙන් සජ්ජිතවූ දූවක් දක. ඒ දූව සමීපයට අවුත් මේ දූව මනුෂ්‍යවාසයෙක් දොහෝයි සිතා ඒ බලන්ට ශක්ති සම්පන්න පුරුෂයන් සත්දෙනකු ආයුධ සන්නද්ධකොට යවුහ. ඒ කියන දූවට පළමු එක් පුරුෂයෙකු එම දූවට බැස සැපසේ අභිප්‍රායානුකුල පරිද්දෙන් සයංජාත ඇල්සාලේ බත්කා උක් පැණි බී රීදීපටක් සමානවූ වැල්ලේ වැතිර සිතන්නේ මට ඇති සැප කවුරුන්ට ඇද්දැයි පිළිනැති පමණක් විනාය. දඹදිව බොහෝ මනුෂ්‍යයෝ බඩ නිසා සී සා වැපිරීම ආදියෙන් දුක්විඳිති මට එසේවූ ආයාසයෙක් නැතැයි සිතා උදන් අනා

SANHIDA LANKA

වැදහොත් තෙනට පුරුෂයෝ සත්දෙන ගියාහු ඒ පුරුෂයෝ දැක යකෙක් දොහෝයි සිතා විඳින්ට ගිය දුනුපිට නගාගත්කලට පුරුෂයා කියන්නේ මා නොවිදුව මම යක්ෂයෙක් නොවෙමි කීහ. එවිට පුරුෂයෝ සත්දෙන කියන්නාහු මනුෂයෙක්විනම් නග්නයෙන් ඉඳිද දිලිරවුළු ආදීවූ දෙය මෙසේ දික්ව තිබේදැයි කීහ. පුරුෂයා කියන්නේ පඩවු නැගී ආ මම මෙතෙන රැඳිනිමි කීහ. එවිට පුරුෂයෝ කියන්නාහු මෙතන ඇති එාසු කිම්දැයි වාචාළ ගමනේ මෙතනට වඩා නොයෙක් ඵලා ඵල ඇති තෙනකුත් රම්‍යවු ස්ථානයකුත් යක්‍ෂ රාක්‍ෂ භය නැති තෙනකුත් මීට වඩා නැත. තොප ඇම විසින් කළමනා කටයුත්තක් ඇත මෙතෙන ඉතා රම්‍යව සිත්කළුවූ හෙයින් දේවතාවෝ මෙතනට ඇලෙන්නාහ. එසේ හෙයින් මලමුත්‍ර එලියේ නොකොට වලක්සාරා එහි මලමුත්‍ර කරව ඒ විවරක් පිරිමසාගතොත් මිට වඩා එාසුතෙනක් ඇත්තෝ නොවෙයි. මෙසේ ඒ පුරුෂයා කියේය. ඒ පුරුෂයෝ සත්දෙන පඩව්නැගී මේ නියාවට වඩුවන් දාසත් තමන්ගේ අඹුදරුවනුත් පඩුවවෙන් ගොඩබාවා එකියන දුවේ ගෙවල් ඉදිකොට සැපසේ සයංජාත ඇල් හා නොයෙක් මධුර ඵලාඵල කා වාසය කරන්නාහු ඒ වඩුවන් දහසට නායකවු දෙදෙනක් ඇත්තාහ. ඉන් එක වඩුනායකයෙකුත් පන්සියයක් වඩුවෝත් අල්පසනෙතාසයහ, ඉන් එක වඩු නායකයෙකුත් පන්සියයක් වඩුවෝත් අලපසනෙතාසයහ,ඉන් එක වඩු නායකයකුත් පන්සියේකුත් තෘෂ්ණාවසගයහ, විපීයත් ඒ නියාවටම දෙමොත්තමව ඉදිරිකොට වාසය කෙරෙමින් සිට නැතැක්දාය අප රා නොබොන්නෝය රා බොම්හයි කියා උක් පැණින් පෙරූ රා ඉදිකොට බී මත්ව නොකේතෙන මලමුත්‍රකොට කසල කළහ. දේවතාවෝ අපගේ මේ රම්‍යවු ස්ථානය මලමුත්‍රකොටපුය සමුද්‍රයෙන් දිය උල්පවා ගලම්හයි කියා අව පස ළොස්වක දෙපෝයදා සම්පූර්ණ චන්ද්‍රයා නැගීකල සමුද්‍රයෙන් දිය නාගාලම්හයි දේවතාවෝ කථාකළහ. එකියන දේවතාවන්ගෙන් සත්පුරුෂ වු දේවතාවෙක් සිතන්නේ මා වැනි සත්පුරුෂ එකකු ඉන්දදී මෙකියන මනුෂ්‍යයෝ නොනසිත්වයි සිතා තෙමේ සර්වාභරණයෙන් සැරසි උතුරු දිසාවෙහි සිට විමානය ඒකාලෝක කොට බුබුළුවා සිට කියන්නේ එම්බල පුරුෂයෙනි දේවතාවෝ එක්ව කථාකරන්නාහු මේ දිවයින මලමුත්‍රකොට කසළ කළහයි කියා සමුද්‍රයෙන් වතුර යවා ගලම්හයි කීහ. එසේ හෙයින් තෙපි ඇම අනික් තෙනකට යවයි කියා දේවතාවා කීයේය. ඉක්බිති පාපිෂ්ටවූ දේවතාවෙක් සර්වාභරණයෙන් සැරසී දකුණුදිග සිට කියන්නේ පුරුෂයෙනි තොපි ඇම ලඟට දේවතාවෙක් ඇවිත් කුමක් කිදැයි එපවත් අසා තෙමේ කියන්නේ මූ කීයේ බොරුය තෙපි ඇම මෙහිම සිත් අලවා වාසය කරවයි සමුද්‍රයෙන් ජලය අවුත් කවරදා මේ දිවයින ගලාද ඒ බොරුය එහිම වාසය කරවයි කියා කීයේය. ඒ දේවතාවා ගිය ඉකිබිති ලොභිවු වඩුනායකයා කියන්නේ පළමු දේවතාවා කියේ අපි මෙතන නොයින්නා අභිප්‍රාය, පසුදේවතාවා කීයේ ඇත්තමය. එසේ හෙයින් අපිත් තොපිත් ගොසින් මෙතෙන ඉඳුම්හයි කීහ. පණ්ඩිත වඩුනායකයා තමන්ගේ පන්සියය එක්කොට කියන්නේ එක් දේවතාවෙක් යන්ට කිය, එක් දේවතාවෙක් රඳන්ට කිය, දෙන්නා කිවායින් කවුරුන් කීවා ඇත්ත බොරු නොදනෙයි අපගේ නස්නේ කිම්ද පඩුවක් ඉදිකොට තබන්නාහ. සමුද්‍ර ජලයෙන් මෙතෙන ගලා නම්පඩව්වට නැගී යම්හයි නොගලා නම් මෙතනම ඉඳුම්හය, එසේ හෙයින් පඩව්වක් ඉදිකරම්හයි කියා පඩව්වක් ඉදිකරන්නාහු රිටි පළු පත්ලා තබා ගත්හ. අනික් වඩුනායකයන් හා වඩුවෝ කියන්නාහු තාලියේ කිඹුලුන් සොයන්නාසේ කිමෙක්දැයි කියා උන්කලට පසලොස්වක් දිනය පැමිණ ගමනේ චන්ද්‍රයා නැගීකලට සමුද්‍රයෙන් රැල අවුත් දන පමණ ගලායණ ගියේය. එවිට පණ්ඩිත වඩුවානෝ තමන්ගේ පන්සියයයක් වඩුවානුත් අඹුදරුවනුත් පඩව් නැගී නික්මුනාහ. පඩව් නායකයානෝ ඉතිකින් එනරැල එතන මෙතන ඉඳුම්හ කුණුසෝධාගෙණ පළාගියේයයි කියා උන්නාහ. දෙවෙනිව උකුල පමණ රැල ආය, තනමත්තක් පමණකය. කරවටක් පමණයයි අවුත් කලෙක දෙතලෙකැයි කියා සන්තලක් ගලා වඩුවෝ පන්සියයත් උන්ගේ අඹුදරුවනුත් මාලාහුය. පණ්ඩිත වඩුවානන් හා වඩුවෝ පන්සියය සැපසේ නැව් නැගී ගැලවුනාහයි වදාර මේ සමුද්දවාණිජ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි දකුණුදිග සිට නොයන්ට කී දේවතාවා නම් කෝකාලික ස්ථවිරයෝය. එසමයෙහි පඩව්නැගී ගිය වඩුවෝ පන්සියය නම් බුදු පිරිසය. එසමයෙහි පණ්ඩිත වඩුවානෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# කාම ජාතකය

තවද ත්‍රිභුවනාධිපති සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් බ්‍රාහ්මණයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.
ඒ කෙසේද යත්
සැවැත්නුවර වාසීවූ එක් බ්‍රාහ්මණයෙක් කුඹුරක් එලිකරන්ටයයි වල්කොටම් ගොස් වල්කෙටීය. සර්වඥයන් වහන්සේ එතනට ගොස් ඇයි බ්‍රාහ්මණය කුමක් කෙරේදැයි විචාරා වදාල සේක බමුණු කියන්නේ ශ්‍රමණභවත් ගෞතමයෙනි කුඹුරක් එලිකරණ නියාවට වල්කොටම් කීහ. සර්වඥයන් වහන්සේත් යහපතැයි වැඩිසේක. වල්කොටා ගිණිලාපු දවස් වැඩ බ්‍රහ්මණය කුමක් කෙරේදැයි විචාරා වදාළසේක. ශ්‍රමණ භවත් ගෞතමයෙනි වල් ගිණිලාපියම් කිහ. යහපතැයි කියා වැඩිසේක. ගිණිලා කුඹුර එලිකරන්ටවන් දවස් වැඩ බ්‍රහ්මණය කුමක්කෙරෙහිදැයි වදාළසේක. ශ්‍රමණ භවත් ගෞතමයෙනි කුඹුර එලිකරම් කීය. යහපතැයි කියා වැඩිසේක. කුඹුර එලිකොට ඇල අරමුණු බඳිනා දවස් වැඩ බ්‍රහ්මණය කුමක්කෙරේදැයි වදාළසේක. ශ්‍රමණ භවත් ගෞතමයෙනි ඇල අමුණු බඳිම් කීයේය. යහපතැයි කියා වැඩිසේක. ඇල අමුණු බැඳ නියර බඳින්ට වන, එදවසුත් වැඩ බ්‍රාහ්මණය කුමක් කෙරෙති දැයි වදාළසේක. ශ්‍රමණභවත් ගෞතමයෙනි නියර බඳිම් කිය. යහපතැයි කියා වැඩිසේක. නියර බැඳ වපුරණ දවසුදු වැඩ බ්‍රාහ්මණය කුමක්කෙරේ දැයි වදාළසේක. ශ්‍රමණභවත් ගෞතමයෙනි කුඹුර වපුරම් කිය. යහපතැයි කියා වැඩිසේක. මෙසේ බ්‍රාහ්මණයාගේ කුඹුර වපුර ගොයම් ඇතිව කිරි වදින අවස්ථාවෙහි ගොයම් බලා ඇවිදිනේය. සර්වඥයන් වහන්සේ එතනට වැඩ බ්‍රාහ්මණය කුමක් කෙරේදැයි වදාළසේක. ශ්‍රමණභවත් ගෞතමයෙනි ගොයම් බලා ඇවිදිම් කියා කියන්නේ ශ්‍රමණභවත් ගෞතමයෙනි තොප ඇතුළුවූ භික්ෂූන් වහන්සේට හොයන් දා මැඩි දවස් දන්නෙම් කියා තමාගේ ගෙයි ගොසින් උන්නේය. ඒ බ්‍රාහ්මණයා සර්වඥයන් වහන්සේ එකාවන් දැකිමෙන් බලවත්වු සිත විස්වාසව ඇදහිලි ඇතිව ගෙයි ඉඳ සිතන්නේ සෙට ගොයම්දා මැඩ ශ්‍රමණභවත් ගෞතමයන් ඇතුළුවූ භික්ෂූන්ට දන්දෙම් සිත සිතා රෑ ගෙයි වැදහොත්තේය. එවෙලෙහි මහත් මේඝයක් වැස අචිරවති ගංගාවෙන් වතුර ඇවිත් පැසීගිය කුඹුර ගොයම් එක ගසකුත් නොතබා ඇරගෙණ ගොස් මුදාලාපියා බ්‍රාහ්මණයාත් නිදානැගී කුඹුර බලන්ට ගොස් කුඹුර ගොයම් නොදැක ලෙයි බඩ අත්ගසා අඬා මුරගා බොහෝ වික්ෂේපයට පැමිණියේය. සර්වඥයන් වහන්සේ බ්‍රාහ්මණයා වික්ෂේපයට පැමිණ නියාව දැක වදාරා මුගේ සෝක සන්සිඳවම් අළුත මහණවූ භික්ෂූකෙණෙකුන් කැඳවාගෙණ බ්‍රාහ්මණයාගේ දොරට වැඩිසේක. බ්‍රහ්මණයාත් සර්වඥයන් වහන්සේ දැක ශ්‍රමණයාගේ ගේ දොරට වැඩිසේක. බ්‍රාහ්මණයාත් සර්වඥයන් වහන්සේ දැක ශ්‍රමණභවත් ගෞතමයෙනි මට වුයේ මහා සෝකයෙක ඒ සෝක සන්සිඳුවාලන්ට අවාහු වනැයි සමාධිව ඉඳිනා අසුන් පණවා වඩාහිඳු වූහ. සර්වඥයන් වහන්සේ වදාරණ සේක් ඇයි බ්‍රාහ්මණය වික්ෂේපව උනුදැයි විචාරා වදාළසේක. බ්‍රහ්මණයා කියන්නේ ශ්‍රමණ භවත් ගෞතමයෙනි මා කුඹුර එලිකරන්නට වන් තැන් පටන් තමන් එතනට එනහෙයින් මහත් දුකෙක් විවර දන්නේවේද, එසේ දුකක් කුඹුර ගොයම් පැසී තුබූ අවස්ථාවෙහි ඊයේ රෑ අචිරවති ගංගාවෙන් වතුර ඇවිත් ගොයම් එකගසකුත් නැතිව මුදට ඇරගෙණ ගියේය. ගොයම් නොනැසී තිබුයේ වීනම් දාසක් ගැල්පුරා ධාන්‍යය ලබම් සෙට දවස් ගොයම් මැඩ තමන් ඇතුළුවූ භික්ෂූන් වහන්සේට දන් දෙන්නටයයි සිතා ඉඳ මා සිතුවාවු සිතිවිල්ලත් නුවුහෙයින් වික්ෂේපව උනිම් කීහ. ඒ වෙලෙහි සර්වඥයන් වහන්සේ බ්‍රාහ්මණය නටමනාදෙය නස්සේනය. ඊට සෝකකිරීමෙන් කාරිය නැතැයි කාමසුත්‍රය ගෙණහැර දක්වා වදාරා ධර්මදේශනා කොට වදාළසේක. ඒ බ්‍රහ්මණයාත් බණ අසා දාසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් මාර්ගයට පැමිණියේය. එදවස් ධර්මශාලාවේ රැස්ව උන් භික්ෂූන් වහන්සේ මෙසේ මහත්වු සෝකයට පැමිණියාවු බ්‍රාහ්මණයාගේ සෝක සංහිඳුවා බණ වදාරා සෝවාන් මාර්ගයට පමුණුවා වදාළසේකැයි කියා වැඩ උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි පෙරත් මේ බ්‍රහ්මණයාගේ සෝක සංහිඳුවුයෙම් වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.
ඒ කෙසේද යත්.
යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ රාජකුමාරවරු දෙන්නෙක් ඇත්තාහ. ඉන් වැඩි මාළු පුතනුවන් යුවරජ තනතුරෙහි තබා බාල පුතනුවන් සෙනවිරත් තනතුරෙහි තැබූහ. එසමයෙහි රජ්ජුරුවෝ එක්තරා ව්‍යාධියකින් නටහ. උන්ට පසු රාජ්‍යවාසීහු වැඩිමාළු කුමාරයන් රාජ්‍යයට තබා රාජ්‍ය කරන්ට වන්හ. පසු රාජ්‍යවාසීහු වැඩිමාළු කුමාරයන් රාජ්‍යයට තබා රාජ්‍ය කරන්ට වන්හ. ඒ රාජ කුමාරයෝ මම රාජ්‍ය නොකරමි. මාගේ මලනුවන්ට රාජ්‍යය දෙවයි කීහ. අමාත්‍යයෝත් නුඹ වහන්සේ වැඩිමාළු රාජකුමාරයන් වහන්සේ සිටියදී මලනුවන් වහන්සේට රාජ්‍යය දිය

SANHIDA LANKA

හැකිදැයි කිවත් මට රාජ්‍යය නොකැමැත්තේයයි නොගිවිස්සාහ. එසේ වී නමුත් යුවරජ තනතුරට හෝ සෙනවිරත් තනතුරට හෝ සිටිය මැනවැයි කිහ. මට යුවරජ තනතුරක් එපයි සෙනෙවිරත් තනතුරෙත් එපයි මට මාගේ අභිප්‍රාය නියාවට ඇවිදිමි මාගේ මලනුවන්ට රාජ්‍යය දෙවයි බාලකුමාරයන්ට රාජ්‍යය පමුණුවාපුහ. තුමු පිටිසර ගමකට ගොස් සිටානකෙනෙකුන්ට බැලමෙහෙකොට සිටිනාහ. සිටානෝ කල්යාමකින් රාජකුමාරයන් නියාව දැන බැලමෙහෙකිරීම හැර රාජකුමාරයන් නියාවට සියලු වෘත්ති තබා රාජ කුමාරයන් පෝෂ්‍ය කරන්නාහ. එසමයෙහි බරණැස් නුවර බදු එලවායයි මනුෂ්‍යයෝ එම සිටානන්ගේ ගමට ගියාහ. සිටානෝත් රාජ කුමාරයන්ට කියන්නාහු ස්වාමිනි නුඹ වහන්සේ පෝෂ්‍ය කරන්නාවූ අප අතිනුත් බදුඑලවන්නාහ. නුඹ වහන්සේගේ බලනුවන් වහන්සේට කියා අපගෙන් එලවන්නාවූ බද්ද අරවා වදාළ මැනැවයි කීහ. රාජ කුමාරයෝත් යහපතැයි රජ්ජුරුවන්ට කියා යවන්නාහු මේ සිටානන් විසින් මා පෝෂ්‍ය කරන්නාහ, උන්ගෙන් එලවන්නාවූ බදු ඇර වදාළමැනවැයි මලනුවන්ට කියා යවුහ. ඒ රජ්ජුරුවෝද යහපතැයි ඒ සිටානන්ගේ ගමින් එලවන්නාවූ බද්ද ඇරපුහ. සිටානන්ගේ බද්ද ඇරපුනියාව අසා සෙසු අසල ඇත්තෝත් රාජකුමාරයන්ට කියා රජ්ජුරුවන්ට කියා යවා බද්ද අරවාගත්හ. මෙම නියායෙන් වටගම්වල බද්ද අරවාගෙණ අර්ථය බොහෝව එම ගම් තමන්ට අරින්ට උවමැනවැයි කියා යවා එම ගම තමන්ට අරවාගෙණ සිතන්නාහු මේ තනි ගමන් කම්කිම්ද වට තෙසු ගම්වලත් අරවාගෙණ තෘෂ්ණාව වැඩි වැඩි සෙනවිරත් ධුරය ඕනැයයි කියා යවුහ. යහපතැයි සෙනවිරත් ධුරය දුන්හ. සෙනෙවිරත් ධුරයත් ඇරගෙණ මෙයින් නොසෑහෙයි යුවරජ තනතුරු දුනමැනවැයි කියා යවුහ. යහපතැයි යුවරජ තනතුර දුන්නාහ.

යුවරජ තනතුර ඇරගෙණ නැවත සිතන්නාහු මෙතෙක් නොසෑහෙයි රාජ්‍යය ඇරගණිමියි තෘෂ්ණා ලෝභයෙන් පසල් දනව් වාසීන් එක්කොටගෙණ බරණැස් නුවරට ගොස් නුවර වටලාගෙණ රාජ්‍යය අරිනේය යුද්ධ හෝ කරන්නේයයි කියා යවුහ. රජ්ජුරුවෝ තමන් වහන්සේ ඇරපියා ගිය රාජ්‍ය නොවේද සට පැමිණියේ මලනුවෝ බෑනන් මරාපුවයි යන අපකීර්තිය අසම්ද තමන් වහන්සේගේ රාජ්‍යය නුඹ වහන්සේ ඇරගත මැනැවයි බෑනන් නුවර ගෙන්වාගෙණ රාජ්‍යය පාවාදුන්හ. ඒ රාජකුමාරයෝ රාජ්‍යයට පැමිණ මලනුවන්ට සෙනෙවිරත් ධුරය දෙවා මෙසේ අර්ථලෝභයෙන් මේ එකරාජ්‍යයෙන් දැන් මට ප්‍රයෝජන කිම්ද තවද රාජ්‍ය දෙකක් තුනක් මා ලබන්ට නැතැයි කීය කියා සිත උන්නාහ එසමයෙහි ශක්‍රයෝ දන්පින් කරන්නෝ කවුරුදෝහෝයි දෙමව්පියන්ට උපස්ථාන කරන්නෝ කවුරුදෝහෝයි ධර්මිෂ්ටව වාසය කරන්නෝ කවුරු දෝහෝයි මනුෂ්‍යලෝකය බැළුවාහු මේ රජ්ජුරුවන් සිතන සිතිවිල්ල දැක උන්ගේ සිතිවිල්ලට දෙවනු වත් සෝක උපදවා නිග්‍රහකරවා එන්ට උවමැනවැයි බ්‍රාහ්මණ වේශයක් මවා ගෙණ වාසල්දොර සිට බ්‍රාහ්මණ මාණවකයෙක් වාසල සිට දකින්ට අභිප්‍රාය ඇත්තෙමියි කියා යැවිය. රජ්ජුරුවෝත් කැඳවයි කියා ගෙන්වාගෙණ කිමෙක්ද මානවකයයි විචාළාහ. ශක්‍රයෝ කියන්නාහු ස්වාමිනි තව දන්වන්නාවූ කටයුත්තක් ඇතැයි කීය. යහපතැයි මිනිසුන් බාවා කියවයි කිය. ස්වාමිනි නුඹ වහන්සේට රාජ්‍ය තුනක් ඇරගෙණ දෙන්ට අභිප්‍රාය ඇතිව ආමි කීහ. රජ්ජුරුවෝ යහපතැයි සමාධිව ඊට කළමනා කිම්දැයි කිහ, සේනාව සමෘද්ධ කරවාගත මැනවැයි කිහ. රජ්ජුරුවෝ යහපතැයි කියා ශක්‍රයන්ගේ ආනුභාවයෙන් මේ බමුණාට නවාතැන් ලවා බත් බුලත් දෙවයි යන බසක් නොකීවාහ. ශක්‍රබ්‍රාහ්මණයාත් යහපතැයි වාසලින් පිටත ගොස් තමන්ගේ ශක්‍රභවනයට ගියාහ. රජ්ජුරුවෝත් පසුව දවස් සේනාව සන්නද්ධකරවා ගෙණ ගමන් සරහා බ්‍රාහ්මණ මාණවකයා කැඳවයි කීහ.එවිට අමාත්‍යයෝ කියන්නාහු නුඹ වහන්සේට රාජ්‍ය තුනක් දෙමි කී බ්‍රාහ්මණ මාණවකයාට බත් බුලත් දෙවාලව පඩියක් පිළියත් දෙවාලවයි අපට නුඹ වහන්සේ වදාළ මෙහෙවරක් ඇද්දැයි කීහ. මට මතක නැතිව තොප ඇමට එසේවු මෙහෙවරයක් නොකිම් කිහ. එසේ කල අප උන් දන්නේ කෙසේදැයි කීහ. එසේ වුවත් මේ නුවර යම්තෙනක ඉදිනම් පරීක්ෂා කරවයි කියා යවුහ. ගියෝ අපි එක තැනකත් නුදුටුම්හයි කියා ආවාහ. රජ්ජුරුවෝත් මා නිසා මෙසේවු රාජ්‍ය තුනක් නොලද්දේයයි මහත් සෝකයට පැමිණ ළය වියලී අක්මා පසු තදව උන්නාවු සෝකාග්නියෙන් කල්යාමකින් රක්ත අතිසාර ඇතිව මම්ම යයි යන බොහෝ වෙදවරු පිළියම්කොටගත නුහුනුවාහ. එසමයෙහි බෝධි සත්වයෝ බ්‍රාහ්මණ කුලයක ඉපිද තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් අතින් ශිල්ප නිමවා ඉගෙණ බරණැස් නුවරට ඇවිත් රජගෙයි වාසල සිට රජ්ජුරුවන් ව්‍යාධි ඇති නියාව මම ගුණකෙරෙමියි කියා යවන්නාහු වෙදනකෙණෙක් වාසල් දොරකඩ සිට දකිනා අභිප්‍රාය ඇත්තෙම් කියා යවුහ. රජ්ජුරුවෝ කියන්නාහු මිට පළමු මම්මයයි යන වෙදවරු ඇවිත් පිළියම් කොටගත නුහුනුවාහ, තුමු බාලදරුවෝද ව්‍යාධිය ගුණකරන්නේයයි අර්ථයක් නිසා අවුනම් උන්ට යම්තම් අර්ථයක් දිලා යවාපියවයි කීහ. රජ්ජුරුවන්ට බෝධිසත්වයෝ කියන්නාහු මට වෙදුන්ට දෙන වැටුමෙන් කම්නැත, මම පිළියම් කෙරෙමි, උදක් බෙහෙදට මිල මාත්‍රයක් දෙත්වයි කීසේක. රජ්ජුරුවෝ ඒ අසා යහපතැයි කියා බෝධිසත්වයන් කැඳවා ගෙන්වුසේක.

SANHIDA LANKA

බෝධිසත්වයෝ රජ්ජුරුවන්ට වැඳ මහරජ නොබව මැනව මම නුඹ වහන්සේට පිළියම් කරමි කීහ. එතකුදුවත් දේවයින් මෙම ව්‍යාධිය ඇතිවූ කාරණා මට කිවමැනවැයි කිහ. රජ්ජුරුවෝ කියන්ට ලජ්ජා ඇතිව මැලිවූහ. බෝධිසත්වයෝ කියන්නාහු දේවයන් වහන්ස වෙදකම් කිම්ද නිදන් දැක කරන්ට උවමැනව, නිදන් නොදැක

කාරණා වෙදකමින් ප්‍රයෝජන නැතැයි කීහ. රජ්ජුරුවෝත් යහපතැයි කියා බ්‍රාහ්මණ මානවිකායෙක් දුටුනියාවත් රාජ්‍ය තුනක් ඇරදෙමි කී නියාවත් මට සවනට යන්ට සේනාව සදන්ට කී නියාවත් බ්‍රාහ්මණ මාණවකයා පසු නුදුටු නියාවත් මේ කාරණා බෝධිසත්වයන්ට කීහ. බෝධිසත්වයෝත් මුන් වහන්සේට මේ ව්‍යාධිය ඇති වුයේ 'ලෝභය මුල්කොටසයි දැන ඊට නිසි කාරණා කියා ලෝභය සන්සිඳුවා ව්‍යාධිය සන්සිඳුවමි කියන්නාහු මේ තෘෂ්ණාව වනාහී මතුමත්තෙහි වඩා ගෙණ යන්නේවීනම් සතර අපායෙන් ඉස ඔසවාලිය නොහෙන්නේය, මෙසේ මහබෝසතානෝ රජ්ජුරුවන්ට අවවාදකොට නැවත ධර්මදේශනා කරන්නාහු ඉදින් වස්තුකාම කේලශකාමය ප්‍රාර්ථනා කරන්නාවු සත්වයන්ට ත්‍රිවිධ කාමය ඔහුගේ අදහසවූ පරිද්දෙන් සමෘද්ධි වුයේ වීනම් සත්වතෙම ඒකාන්තයෙන්ම ඊප්සිතාර්ථය සිද්ධවු හෙයින් බලවත්වු සොම්නසට පැමිණෙන්නේය. නැවත නැවත යම්සේ ග්‍රිස්ම කාලයෙහි අවුසුලගින් මිරිකුණා වූ සත්වතෙම බලවත්වු පැන් පිපාස ඇතිවේද එපරිද්දෙන්ම මතු මත්තෙහි රූපතෘෂ්ණාදිවූ ඒ කාමයෙන් මත්වු සත්වයාහට මතු මත්තෙහි වඩාගෙණ යන්නේ, යම්සේ වර්ධනවන්නාවු එලවස්සාගේ ශරීරය සමග ඉසුමුදිනෙන් පළාගෙණ නැගෙන්නාවු අංදෙක වැඩීගෙණ යේද එපරිද්දෙන් නුවණැත්තාවු සත්වයාහට අප්‍රාප්ත වස්වෙහි කාම තෘෂ්ණාවද පැවැත්වු රූප ශබ්දාදියෙහි කාම පිපාසාවද නැවත වැනත වැඩෙන්නිය. තවද මේ පොලොතෙලෙහි යම් සත්වයෙක් ශාලි ව්‍රිහි ආදීවු  සප්තවිධ ධාන්‍යායෙන් සම්පුර්ණ වු ක්ෂේත්‍ර වස්තු ඇතුන් අසුන් ගව මිහිසාදින්ද දැසි දසාදින්ද අවශේෂ මුක්තා මාණික්‍යාදීවු දසවිධ රත්නයෙන් සම්පුර්ණ වු මුළුලොව කිසිවක්හට දී ගියේ වීනම් මෙපමණවු සර්වඥනක අවිඥනක වස්තු එක් සත්වයෙක් හුගේ සිත්පුරා ලන්නට නොසෑහෙන්නේය. එසේ හෙයින් මේ තෘෂ්ණාව නම් පඤ්චමහා ගංගාවෙන් අනවරතයෙන් වදනා ජලයෙන් මහාසමුද්‍රය පුරා උතුරුවාලිය නොහැක්කාසේ කෙතෙක් වස්තු ලදත් මෙතෙක් සෑයෙහි යන්නක් නැති හෙයින් පුරාලිය නොහැක්කේය. එසේ හෙයින් මේ කාරණය දන්නාවු සත්වයා විසින් තෘෂ්ණාවසඟනොව කාය සමාචාරාදිය පුරමින් ත්‍රිවිධ සුචරිතයෙහි හැසිර වාසය කටයුත්තේය, තවද මේ කෝලයෙහි රජ දරුවෝ තමන්ගේ සේනාවාහනාදීවු පරිද්දෙන් පරසතුරන් මැඩ මුළු පොළොව සාදා ජයගෙණ චතුස් සමුද්‍රය අවසානකොට ඇති දස දහසක් යොදුන් ජම්බුද්වීපයෙහි රාජ්‍යශ්‍රී අනුභව කෙරෙමින් වසන්නාහු සමුද්‍රය ඇතුළත රාජ්‍යය සෑහෙන්නේයයි එහි තෘප්තියකට නොපැමිණ මතුමත්තෙහි අන්‍ය දීපාන්තරවල රාජ්‍යය උවමැනවැයි ප්‍රාර්ථනා කරන්නාහ. එසේ හෙයින් සත්වයන්ට තෘෂ්ණාවසඟවු සත්වයෝ කිසිලෙසකිනුත් පුරාලිය හැකි කෙණෙක් නොවන්නාහ. මහරජ්ජුරුවන් වහන්ස පුරුෂයෙක් ප්‍රමාණාත්‍රික්‍රාන්ත වු කාමය තමා තමා විසින් සිහිකරගන්නේවි නම් තෘප්තියකට නොපැමිණෙන්නේය, නැවත නැවත ඒ කාමය පැමිණෙන කැමැත්තේය. එසේ හෙයින් වස්තුකාම ක්ලෙශකාමයෙහි තෘෂ්ණාව වඩුත් අඩුවෙක් නොවන්නේය. වස්තුකාමී කෙලශකාමයෙන් කයින් සුදුසුවූ ප්‍රතික්‍රියා කොට ඥනයෙන් ආදිනව දැක යම්කෙණෙක් ප්‍රඥාවෙන් සම්පූර්ණවුද එබඳූ නුවනැත්තෝ තාප්තියකට පැමිණියාහු නම් යම් හෙයකින් ප්‍රඥාවෙන් සම්පූර්ණීවු පුරුෂයා කාමය නිසා බලවත්වු පීඩාවට නොපැමිණෙන්නේය. එබඳුවු පුරුෂයා තෘෂ්ණාව තමා වසඟයෙහි පවත්වාගන්ට අසමර්ථවන්නේය. එබඳූවු ප්‍රඥාවන්ත වූ පුරුෂතෙම මේ තෘෂ්ණාවෙහි ආදිනව දැක ගංගාමාලනම් ප්‍රත්‍යෙක බුද්ධාංකුරයානන් මෙන්ද, අර්ධමාශක නම් රජ්ජුරුවන් මෙන්ද තෘෂ්ණා වසඟත්ථයෙහි නොපවතින්නේය.

මහත්වු  ප්‍රඥාවෙන් යුක්ත බැවින් සමුද්‍රයසේ මහත්වු සත්වතෙම වහ්නිස්කණ්ධයෙන් සමුද්‍රජලය තවා උනුකොටලිය නොහැක්කාසේ කෙලශකාම නැමති වහ්නින් තවාලිය නොහැක්කේය. යම්සේ වස්කාරයෙක් වහන් නිපදවන්නේ ඒ වර්ෂයෙහි යම් යම් තෙනක නොගයුතු වීනම් ඒ ඒ තැන් කපාහැර වහන්කොට විකිනීමෙන් වහනයට සුදුසුවු මිල ලැබ පුත්‍ර  දරාදීන් පෝෂ්‍යයකොට සුඛිත මුදිතව වෙසේද, ඒ පරිද්දෙන්ම නුවණැත්තාවු සත්වතෙම සොම්මර නියතයක් හා සමානවූ ප්‍රඥාවෙන් ඒ ඒ වස්තුකාම කෙලශ කාමයෙන් කපා සිඳිමින් කාමයන්ගේ ඒ ඒ පරිච්ඡේදය සිඳිනේය, එසේ හෙයින් ඒ ඒ කාමච්ඡේච්දයෙන් පුරුදුවු කායවාක් මනඃ යන තුන්දොර අකුශල කාමයෙන් වෙන්වු සත්වයාහට සැපසේ සිද්ධවන්නේය, ඉදින් සත්වතෙම සියළු කාය කාර්මාදිය කාම පරිලාහයෙන් දුරුකොට  සැපයෙහි පිහිටුවනු කැමැත්තෙහි වී නම් කිසුනු පිරියම් කිරීමෙන් භාවනාකොට ධ්‍යාන උපදවා සියළු කාමයන් හැර බ්‍රහ්මලෝකයෙහි උපදනේයයි මෙසේ ධර්මදේශනා කළහ. බෝධිසත්වයන් මේ කාරණයන් කියමින් සිටියදීම මහරජ්ජුරුවන්ගේ ධවලාත්‍රපත්‍රය අරමුණු  කොට ඕදතකසින සමාපත්තියෙන් යුක්තවු ධ්‍යාන උපදනේය. රජ්ජුරුවෝ නිරෝගීව සතුටුවූ සිතින් යහනින් නැගීසිට කියන්නාහු මෙතෙක් වෙදවරු මට පිළියම් කරන්ට අසමර්ථවුහ. ප්‍රඥාවන්තවු මානවකයා තමාගේ ප්‍රඥා නැමති ඖෂධයෙන් මා නිර්ව්‍යාධි කෙළේයයි බෝධිසත්වයන් හා සමග මෙසේ කථා කළාහ. බමුණානෙනි තොප විසින් කාමයෙහි ආදිනව දක්වා කියන ලද්දාවු ගාථා අටදහසක් වස්තු වටනේය. එසේ හෙයින් තොපගේ වචනයට පූජාකොට අටදහසක් වස්තු දෙමි කිහ. ප්‍රයෝජන නැත. රථකාරාව වසම්සස යනාදීන් මේ ගාථාව කියමින් සිටියදීම වස්තු කාම කෙලශකාමයෙන් මාගේ සිත වෙන්ව ගියේය. මම වුකලි පස්විම් ගාථාව කියමින් සිටියදීම මාගේ ධර්මදේශනාවෙන් ධ්‍යාන ඉපදවිම මහරජ්ජුරුවන් වහන්සැයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ වඩ වඩා සතුටුවුහ. මහබෝසතානන්ට ප්‍රසංශා කරන්නාහුය. නුවණැති  පුරුෂයෙක්

SANHIDA LANKA

කර්මවට කෙලෙස්වට විවටයයි කියන ලද ත්‍රිවිධ වෘත්ත දුක්ඛය උපන්නාවු මේ තෘෂ්ණාව විශේෂයෙන් පිරිසිද කෙලශ විස්කම්භනය කොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ඉපදවීද, ඒ මානවකතෙම ඉතා යහපත්වූ අදහස් ඇත්තේයයි සියලුලොව නුවනින් පිරිසිඳ දන්නාවු තපස්වියකැයි වර්ණනා කළාහ. මහබෝධිසත්වයෝද රජ්ජුරුවන් වහන්ස ධර්මයෙහි හැසුරුනු මැනවැයි  රජ්ජුරුවන්ට අවවාද කොට ආකාශයෙන් හිමාලය වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්ජ්‍යාවෙන් පැවිදිවු පමණින් බ්‍රහ්මවිහරණ භාවනාකොට බ්‍රහ්මලෝකයෙහි උපන්නාහ. ශාස්තෘවු බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෛනි පළමුත් මේ බමුණා නිසෝසක කෙළෙම් වේදැයි වදාරා කාම ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් මේ බමුණුය. නුවණැති මානවකවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ජනසන්ධව ජාතකය

තවද හුදු සද්ධර්මයන් මවාලු රුවක් වැනිවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ට කී අවවාදයක් අරභයා මේ ජාතකය දක්වන ලද.
ඒ කෙසේද යත්
කෝසල රජ්ජුරුවෝ කාමයෙහි තෘෂ්ණා වසඟව කළමනා සියළු කට යුත්තෙහි විචාරයත් මදව සර්වඥයන් වහන්සේටත් කරණ බුද්ධෝපස්ථානයෙහි ප්‍රමාදව වාසය කරන්නාහු. එක් දවසක් සර්වඥයන් වහන්සේගේ ගුණ සඳහන් කොට බුදුන් දක්නට ගියාහු. සර්වඥයන් වහන්සේ කෝසල රජ්ජුරුවන් දැක ඇයි මහරජ මෙතෙක් දවස් නුදුටුවිරුමෝනැයි විචාරා වදාළසේක. රජ්ජුරුවෝ ස්වාමිනි අපරික්ෂිතව උනිමි කීහ. සර්වඥයන් වහන්සේ මහරජ මාසේවූ තිලෝගුරු සර්වඥ කෙණෙකුන් තොපගේ නුවර හිඳ දන්පින් කරවයි අනුශාසනා කරමින් ඉන්දදී තොපි දන් පින් නොකොට ප්‍රමාදව දවස් අරිනා පමණක් මිසක් පෙර අබුධෝත්පාද කාලයෙහි උත්තමයෝ තමන්ගේ රාජ්‍යසීමායෙහි සියළු මනුෂ්‍යයන්ට අවවාද කියා දානාධ්‍යාශයෙහි යොදා රාජ්‍යය කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.
ඒ කෙසේද යත්
යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසිකා බිසවුන් කුස පිළිසිඳ දසළුකඩ මසකින් වැදූහ. ඒ කුමාරයන්ට නම් තබන්නාහු ජනසන්ථව කුමාරයෝ යයි නම් තබා ඒ රාජ කුමාරයන් වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් උගතමනා ශාස්ත්‍රයන් ඉගෙණගෙණ තමන් ගේ නුවරට ආ ගමනේ පියානන් ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ දස රාජධර්මයට ආකොප්‍යව සඳහන් හල් කරවා මුළු නුවර දඹදිව සියළු යාචකයින්ට දවස සලක්‍ෂයක් ධන වියදම් කොට දන්දී රාජ්‍යය කරන්නාහු ජනසන්ථව රජ්ජුරුවෝ තුමූ දවස්පතා පඤ්චශීලය රැක පොහොය අටසිල් රැක සියළු මනුෂ්‍යයනුත් පඤ්ච ශිලයේද අෂ්ටාංග ශිලයේද සියළු ගුණයෙහි පිහිටුවා ධර්මප්‍රීතියෙන් වාසය කරන්නාහු, අමාත්‍යයෙනි දෙමව්පියන් නැදිමයිලන් බෑබුන්හු ආදීවූ වැඩිමාළු නෑයන්ට ආචාර සමාචාර කරව දවස දවස්පතා පඤ්චශීලය පොහොයෙන් පොහොයට අෂ්ටාංගශීලය රකුවයි මනුෂ්‍යයන්ට අවවාද කියා මනුෂ්‍යයන්ට කියන්නාහු සිරගෙයි දොරහැර තියෙන්නේය, දම්ගෙඩිය දිරාතිබෙන්නේය, එක් දවසක් රජ්ජුරුවෝ පොහොදා පෙහෙව උඩුමාලේ හුන්නාහු මුළු නුවර බෙරලවා මනුෂ්‍යයන් එක් කරවා රජ්ජුරුවෝ අවවාද වශයෙන් බණ කියන්නාහු මනුෂ්‍යයෙනි පශ්චත්තාප වන්නාවූ කාරණයෝ දශදෙනෙක් වන්නාහ. ඒ කාරණ දසය නම් කෙසේදයත්, තරුණ අවස්ථාවෙහි මනුෂ්‍යයෝ සේවාකම් හා වෙළඳාම් ආදීයෙන් වස්තු උපදවන්නාහ, ඒ වෙලෙහි තම තමාගේ පැමිණි වියදමකටදී වස්තුවක් වයෝවෘද්ධ අවස්ථාවෙහි රැකෙන්ටයයි සොයා නොතිබු නම් සම්පත් සොයා තබාගෙණ සැපසේ රැකෙන්නවුන් දැක තුමු කිසි කටයුත්තකට අයෝග්‍යවූ අවස්ථාවෙහි කිසි සම්පතක් නැතිව දුක්ඛිතව සිට අප විසින් මේ නියාවට වස්තු සොයා නොතිබුයේයයි පශ්චත්තාපයට පැමිණෙන්නාහ.
තවද යම් සත්වකෙණෙකන් බාල අවස්ථාවෙහි තමන් උගමනා ශාස්ත්‍ර ඉගෙණ තමන්ගේ ශාස්ත්‍රබලයෙන් සැපසේ යම් සත්වකෙණෙක් රැකෙත් නම් ශාස්ත්‍ර නුගත්තාවූ යම් කෙණෙක් ශාස්ත්‍ර උගත්තවුන් බලා අපිත් ශාස්ත්‍ර උගතුමෝ නම් මුන්සේම සැපසේ ශාස්ත්‍ර උගත්තවුන් බලා අපිත් ශාස්ත්‍ර උගතුමෝ නම් මුන්සේම සැපසේ ශාස්ත්‍ර පෑ රැකෙන්නමෝ වේදැයි පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්වකෙණෙක් බොරු හා කේලාම් කියා අත්ලස් ඇරගෙණ තදපරුෂව වාසයකළෝ නම් මරණ පැමිණ අවස්ථාවෙහි අනේ අපි බොහෝ අත්ලස්ගෙණ තදපරුෂව වාසය කළම්හ, අපට කුමක් වේදෝහෝයි මරණාසන්න කාලයෙහි ඒ පුරුෂ තෙමෙ පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්වකෙණෙක් ප්‍රාණඝාත කළම්හ. අනුන් අඬ අඬා සිටියදීම අදත්තා දානයෙන් උදුරා ගතුම්හ, කුමක්වේදෝහෝයි මරණාසන්න කාලයෙහි එසේ පුරුෂතෙම පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්වකෙණෙක් බොහෝ ස්වාමික ස්ත්‍රී ඉන්දදී පරදාරාදීන් සේවනය කළෝ නම් මරණාසන්න යෙහි එසේවූ පුරුෂයන් මම බොහෝ පරස්ත්‍රී සේවනය කෙළෙමියි පසුතැවිලියට පැමිණෙන්නාහ. තව ද යම් සත්වකෙණෙක් දන්පින් කරත් බොහෝ සම්පත් ඇතිවුවත් පරලොවට පිහිටක් වුවමැනවයි සිතා දනක් පිනකත් නොකොළෝ නම් එසේවූ පුරුෂයන් මරණාසන්නයෙහි මාගේ බොහෝ සම්පත් ඇතිව තිබෙද්දී පරලොවට ප්‍රතිශ්ඨාවන පිණිස දනක් පිනක් නොකෙළෙමියි මරණාසන්න කාලයෙහි පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්ව කෙණෙක් මෙසේ කව මෙසේ ඉඳුවයි උගන්වන හෙයින් ගුරුන් හා සමානයෝය. උන්ට වන්නාවූ ඉෂ්ටානිෂ්ට කියන්නාහු උන් කැමති අන්නපානාදියත් දෙන හෙයින් ඉෂ්ටදේවතාවෙකු හා සමානවූ පියාණකෙණෙකුන් කීවා නොගිවිස උන්ට ආක්‍රොශපරිභව බෙනේනම් එසේවූ පුරුෂයන් මරණාසන්නයෙහි මාගේ දේවතාවෙකු හා මට හිතවූ පියානන්ට ආක්‍රොශ පරිභව බිණිමි කුමක්වෝදෝහෝයි එසේවූ පුරුෂයන් මරණාසන්නයෙහි පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්වකෙණෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දනක් පිනක් නොකොට ආක්‍රොෂ පරිභව බෙණේනම් එසේවූ පුරුෂයන්

SANHIDA LANKA

උතුම්වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට මාගෙන් දනක් පිනක් නොකොළෙමි නිකම්ම ආක්‍රොශ පරිභව බිණිමි කියා එසේවූ පුරුෂයත් පසුතැවිලියට පැමිණෙන්නාහ. තවද යම් සත්වකෙණෙක් සිල්වත් ගුණවත් තැනකට ගොස් තමාට ප්‍රතිශ්ඨා පිණිස ස්වාමිනි මා කළමනා කිම්ද ගැලවෙන නියායෙන් නිසි අවවාද මට කිවමැනවැයි නොකියා මෙහෙයෙන් නිකම් වාසයකළෝ නම් එසේවූ පුරුෂයත් මරණාසන්නයෙහි සිල්වත් ගුණවත් තෙනින් නිසි අවවාදයක් ඉගෙණගත නුහුනුයෙමි පසුතැවිලියට පැමිණෙන්නාහ. සර්වඥයන් වහන්සේ මහරජ ඒ ජනසන්ධව රජ්ජුරුවෝ තමාගේ අමාත්‍යයන් ඇතුළු නුවරවාසින්ට දෙපෝයෙන් දෙපොයට මෙසේ අවවාද කියන්නේ වේදැයි වදාළසේක. ජනසන්ධව රජ්ජුරුවෝත් දැහැමෙන් සෙමෙන් රාජ්‍යකොට පරලොව ගියාහයි වදාරා මේ ජනසන්ධව ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රාජ්‍යවාසීනම් දැන් බුදු පිරිසය, එසමයෙහි ජන සන්ධව රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මහා කණ්හ ජාතකය

තවද හුදු සමෘද්ධියෙන් මවාලු රුවක් වැනිවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලෝකාර්ථචරියාවක් අරභයා මේ ජාතකය දක්වන ලද.
ඒ කෙසේද යත්.
එක් දවසක් ධම්සභාමණ්ඩපයෙහි රැස් වූ භික්ෂූන්වහන්සේ සර්වඥයන් වහන්සේ අඤ්ඤාකොණ්ඩඤ්ඤ භික්ෂූන් වහන්සේ ඇතුළුවූ පස්වග මහනුන් නිසා අටසාළිස් යොත්නක් ගොසින් මහණකරවා වැඩිසේක. මහාකප්පින්න රජ්ජුරුකෙනෙක් නිසා එක්සිය විසියොත්තක් කතරගෙවා වැඩිසේක. අලව් යක්ෂයා නිසා එතෙක් කතර තමන් වහන්සේම පාසිවුරු ගෙණගොසින් ඔවුන් හික්මවා වැඩිසේක. වෛනයජන කෙණෙකුන් නිසා ගොස් මහණකරවා ගෙණ වැඩිසේකැයි එසේ හෙයින් සර්වඥයන් වහන්සේගේ පරොපකාරය යහපත් නිසායයි කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දූන්මතු නොවෙයි පළමුත් උත්තමයෝ තමන්ගේ උත්සාහයෙන් බොහෝ දෙනා අපායට යන්නාවුන් ගොඩලුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්ස් ඉකුත් වත් දක්වා වදාළ සේක.
ඒ කෙසේද යත්.
යටගිය දවස බරණැස් නුවර උසීරථ නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයහි කාශ්‍යප සම්මා සම්බුදු රජානන් වහන්සේගේ ශාසනය බොහෝ කලක් පැවත එන අවදියෙහි පිරිහෙන්ටවන. සර්වඥයන් වහන්සේ නොකරන්ට කී අවවාද එක් විස්සක් කාරණායෙන් මනුෂ්‍යයන් විසින් සිත් ගෙණ මෙහෙනියන් හා එක්ව සමෝගය කිරීමෙන් දරුවන් වදා ගිහින් හා සරිව වාසය කොට භික්ෂූන් වහන්සේ මහණ ධර්මය හළසේක. භික්ෂුනින් වහන්සේත් තමන් වහන්සේගේ භික්ෂුනි ධර්මය හළසේක. භික්ෂූනීන්වහන්සේත් තමන් වහන්සේගේ භික්ෂූනි ධර්මය අලසේක. භික්ෂුණින් වහන්සේත් තමන් වහන්සේගේ භික්ෂූනි ධර්මය අලස්ක. උපාසකවරුත් තමන්ගේ උපාසක ධර්මය අළහ. උපාසිකාවරුන් තමන්ගේ උපාසිකා ධරම්ය අළහ. බ්‍රහ්මණයෝත් තමන්ගේ බ්‍රාහ්මණ ධර්මය අළහ. සියලු මනුෂ්‍යයෝත් දශකුශල ධර්මයන් හැර දශ අකුශල ධර්මය කරන්නාහ.එසමයෙහි මළ සත්වකෙණෙක් නරකයෙහි උපදින්නාවුන් විනා දිව්‍යලෝකයෙහි උපදිනා කෙණෙක් නැති නියාව ශක්‍රයෝ දූන කාශ්‍යප සර්වඥයන් වහන්සේගේ ශාසනය පිරිහෙයි මනුෂ්‍යයන් භයගන්වා හික්මවමියි සිතා මාතලි දිව්‍යපුත්‍රයා කැඳවා මෙපවත් කියා ඔහු අස්නාම්බකු සා බළුවෙසක් මවාගෙණ ඇඹුල් කෙසෙල්ගෙඩි පමණ දළ මවාගෙණ දම්පට පසකින් එකියන බල්ලා පස්තැනකින් බැඳගෙණ ශක්‍රයෝ තුමූ වැදිවෙසක් මවාගෙණ බල්ලා අතින් ඇරගෙණ බරණැස් නුවරට පැමිණිගමනේ එකියන බලු මෙනුවර නස්නේයයි මහත්කොට ශබ්ද පැවැත්වුයේය. බොහෝ මනුෂ්‍යයෝ ඇතුළු නුවරට වැද රජ්ජුරුවන්ට එපවත් කිහ. රජ්ජුරුවෝ එපවත් අසා එසේවිනම් වාසල් අගුළු ලවයි කියා වාසල් අගුළුලා ගත්හ. අටළොස් රියන් පහුර ශක්‍රයෝ තමන්ගේ ශක්‍රානුභාවයෙන් පැණ ඇතුළුනුවරට වැද විථියේ ඉල්ලා ඇරයන්ට වන්හ. මනුෂ්‍යයෝ භයින් ත්‍රස්තව දොරවල් අගුළුලාගත්හ. බලුත් රජ්ජුරුවන් ලඟසිට දසදහසක් යොදුන් දඹදිවට ඇසෙන නියායෙන් මහත්කොට හඬගැසුයේය. රජ්ජුරුවන් ඇතුළුවූ බොහෝ මනුෂ්‍යයෝ භයින් ත්‍රස්ත වූහ. රජ්ජුරුවෝ රාජධෛර්යය උපදවා කියන්නාහු එම්බල වැද්ද මේ කළුපැහැයෙන් හා මහත්වූ දළ ඇති තොපගේ බල්ලා කුමක් නිසා ගෙණාවුද බළු කුමක් නිසා මොරගාදැයි විචාළාහ. ඒ වැදි පුත්‍රයා කියන්නේ රජ්ජුරුවෙනි මේ බළු තමාගේ බඩසාය හෙයින් මු මුරගාන්නේයයි කීහ.
එවිට රජ්ජුරුවෝ තමන්ට හා ඇතුළුනුවරගෙයි සියල්ලවුන්ට ඉදිකළ බත් ගෙන්වා ලූ ගමනේ එකකටින් කා මුරගාන්නේය. එවිට රජ්ජුරුවෝ මූ මුරගාන්නේ කුමටදැයි විචාළසේක. වැදි කියන්නේ බඩ ගින්නෙන් හඬයි කීහ. ඇතුන්ට අසුන්ට ඉදිකළ බත් ලූ ගමනේ එකකටින් කා මුරගාන්නේය. රජ්ජුරුවෝ වැද්ද තාගේ බළු මුරගාන්නේ කුමටදැයි විචාළේය. එවිට වැදි කියන්නේ බඩගින්න් මුරගාන්නේයයි කීයේය. රජ්ජුරුවෝ බරණැස් නුවර බොහෝ මනුෂ්‍යයන්ට ඉදිකළ බත්ලූ ගමනේ එක් කටින් කා මුරගාන්නේය. රජ්ජුරුවෝ වැද්දවුට කියන්නාහු තොපගේ බල්ලා මුරගාන්නේ කුමටදැයි විචාළේය. එවිට වැදි කියන්නේ බඩගින්නේයයි කීහ. රජ්ජුරුවෝ සිතන්නාහු මේ බල්ලා බල්ලෙක් නොවෙයි මෙතෙක් බත් කා තෘප්තියකට නොපැමිණියේය. මහත් තේජස් ඇති යක්ෂයෙකැයි සිතා කියන්නාහු එම්බල වැද්ද තොපගේ බල්ලාට බත් ලා තෘප්තිය කට පමුණුවාලිය නොහැක්ක. මු මුරගාන්නේ ඌරන් මුවන් ගොනුන් ගේ මස් කන්ටද ඒ නැතිනම් මිණිමස් කන්ටදැයි විචාළේය. එවිට වැදි කියන්නේ මේ බල්ලා මුරගාන්නේ ඌරන් මුවන් ගෝනන් කන්ට නොවෙයි මිනිසුන් කන්ටයයි කීයේය. එවිට රජ්ජුරුවෝ කියන්නාහු, තොපට වෛරී මනුෂ්‍යයන්ද අවෛරී මනුෂ්‍යයන්දැයි විචාලේය. එවිට වැදි කියන්නේ මට වෛරී මනුෂ්‍යයෝ යයි කීයේය. තොපට වෛරී මනුෂ්‍යයෝ කවුරුදැයි රජ්ජුරුවෝ කීහ. යම් කෙණෙක් දුශ්ශීලයෝ වි නම් එසේවු මනුෂ්‍යයෝයයි කීහ. රජ්ජුරුවෝ මට එසේ

SANHIDA LANKA

කිමෙන් නොදනෙයි විස්තර වශයෙන් කියවයි කීහ. ශක්‍රයෝත් අසවයි මහරජ කියා කියන්නාහු යම් කෙණෙක් සඟලසිවුරු වැලඳ පටිබැඳ පාත්‍රය අතින් ගෙණ භික්‍ෂාටනය කෙරෙද්ද එසේ වූ භික්ෂූන් වහන්සේලා සීසෑම් වැපීරීම් ආදිවූ දෙය කොට ගිහින්සේ වාසය කෙරෙත්නම් එසේවූ අලජ්ජිවූ භික්ෂූන් වහන්සේ කෙරෙහි වෛර ඇතියෙම් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තව යම් භික්ෂූණිකෙණෙක් සඟලසිවුර පොරවා පටිය බඳිද්ද පාත්‍රය අතින් ගෙණ භික්ෂාටනය කෙරෙද්ද එසේවූ භික්ෂුනින් වහන්සේලා ලොකස්වාදයෙහි යෙදී දරුවන් වදා වාසය කෙරෙත් නම් එසේවූ අලජ්ජි භික්ෂූණීන් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් තාපසකෙණෙක් මැලිවූ දන්තයන් හා රජස්වැකුණු ශරීරයෙන් හා අවුල්වූ ජටා ඇතිව තපස්කරන්නාවූ තාපසකෙණෙක් ගිහින්ට නයතුරුස් දී ගිහින් හා සරිව වාසය කෙරෙත්නම් එසේවූ තාපසයන් කෙරේ වෛර ඇත්තෙමි, මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් බ්‍රාහ්මණකෙණෙක් තමන්ගේ ත්‍රිවේද හා යාග හෝම ආදීවූ දෙය උන්ගේ ඉෂ්ටානිෂ්ට දෙක නොබලා තුමූම සම්පත් නිසා මෙසේවූ යාගහෝමයක් කරම්හයි මනුෂ්‍යයෝ නොකියාවාම කොට උන්ගේ සම්පත් ඇරගණිත් නම් වේවා තමන් හා යාගහෝම බ්‍රාහ්මණ ධර්මයෙහි නොපිහිටියේ නම් එසේවූ බ්‍රාහ්මණයණුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ

තවද යම් සත්වකෙණෙක් තමන්ගේ දෙමව්පියන්ට අත් පා වෙහෙවර නොකරත් නම් එසේවූ මනුෂ්‍යයනුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් සත්වකෙණෙක් තමන්ගේ දෙමව්පියන්ට ආක්‍රොශ පරිභව බෙණත් නම් එසේවූ මනුෂ්‍යයනුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් සත්වකෙණක් තමන්ගේ කුඩා මවුන් කෙරේද යාළුවන්ගේ බිරින්ද කෙරෙහිද, තමන් බිරින්දගේ මෑනියන් කෙරෙහිද, ගුරුන්ගේ බිරින්ද කෙරෙහිද, දොෂ කෙරෙද්ද එසේවූ මනුෂ්‍යයනුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් බ්‍රාහ්මණ කෙණෙක් කඩුපලග ආදීවූ ආයුධ ගෙණ මංවල සිටි මිනිමරා වස්තු උපදවද්ද සේවක කම්කොට නොකරණදෙය කරණ බ්‍රාහ්මණයනුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් ස්ත්‍රියක් පරදාරාදීවූ බොහෝ නොකටයුතු කෙරේද එක් පුරුෂයෙකු දිලූ සම්පත් ඒ ස්වාමිපුත්‍රයා අතුරෙ ඉඳ දිරවාගත නොහී අනික් පුරුෂයෙකු සම්පත් දෙමි කියන්නා ඒ පුරුෂයා කරායේද එසේවූ ස්ත්‍රීනුත් මේ බල්ලා ලවා කවා මරවමි කීහ. තවද යම් පුරුෂයෙක් පස්පව් පුරා දශ අකුසල් කෙරේද එසේවූ පාපිෂ්ටයා කෙරෙහිත් මම වෛරයෙමි මේ බල්ලා ලවා කවා මරවමි කියා මෙසේවූ පුරුෂයන් කරා මෙහෙයා කඩා කන්නාක්මෙන් මනුෂ්‍යයන් භය ගන්වා ඉක්බිති ශක්‍රයෝ තමතන්ගේ වැදිවේශය හැර ශක්‍ර ආත්මභාවයෙන් සිට රජ්ජුරුවන්ට ගාථා සතරකින් අවවාද කියා රජ්ජුරුවෙනි බුද්ධශාසනය පසු බස්නා දක පෙරලා ශාසනය අභිවෘද්ධි කරණු සඳහා ආමි කීයා බොහෝ මනුෂ්‍යයන්ට අවවාද කොට ශක්‍රයෝ තමන්ගේ ශක්‍රභවනයටම ගියාහ. එතැන් පටන් මනුෂ්‍යයෝ තමන් කරන්නාවූ දශ අකුශල ධර්ම හැර දශකුශල ධර්මයෙහි යෙදී දානධ්‍යානයෙන් වාසය කරන්නාහ. භික්ෂූ භික්ෂූණින් වහන්සේලාත් සර්වඥයන් වහන්සේ වදාළ ධර්මය නියාවට ප්‍රතිපත්ති පුරා අඛණ්ඩ ශිලය රක්ෂා කරන්නාහ. ශක්‍රයන්ගේ අවවාදයෙන් ශාසනය දාසක් අවුරුදු නිස්කලංකව පැවැත්තේයයි වදාරා මේ මහාකණ්හ ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි ශක්‍රයෝ නම් බුදුවූ මම්ම යයි වදාළසේක.

SANHIDA LANKA

# මහා පදුම ජාතකය

තවද කොසිය ජාතකය සුධාභොජන ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. තවද මෙණ්ඩක ප්‍රශ්න ජාතකය උමන්දාවෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

තවද සද්ධර්ම මහා කිරීටවු සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි චිඤ්චමානවිකාව අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්.

සර්වඥයන් වහන්සේ බුදුවූ පසු තීර්ථකයන්ට වන්නාවූ ලාභය පිරිහින. තීර්ථකයෝ මේ භවත් ගෞතමයන් බුදුවූ තැන්පටන් අපට වන්නාවූ ලාභයෙක් ඇත්නම් පිරිහින ඉදින් අභව්‍යකරවාපුමෝ නම් අපි ලබන්නාවූ ලාභ ලබන්නමෝ වේදැයි සිතා තීර්ථකයෝ ඇම එක තැනකට එක්ව කථාකරන්නාහු ඒ ශ්‍රමණ  භවත් ගෞතමයෝ දුටු දවස් පටන් අප ලබන්නාවූ ලාභයෙන් පිරිහී ගියම්හ. යම් උපායකින් ගෞතමයන් අභව්‍ය කරවාපුමෝ නම් අපි ලාභ ලබන්නෝ මෝ වේදැයි කීහ. ඉන් එක තීර්තකයෙක් කියන්නේ ශ්‍රමණ  භවත් ගෞතමයන්ට කිළුටක් කියා අභව්‍ය කරන්ට උවමැනවැයි කියා එසේ වි නම් මේ හැම චිංචිමානවිකා නම් පරිබ්‍රාජිකාවක් ඇත්තීය. බැළුවන්ට ප්‍රසාද වහන සිත්කළුය ඈ නිසා ශ්‍රමණ භවත් ගෞතමයන්ට කිළුටක් උපදවා අභව්‍ය කරවා පිරිහෙලා පියම්හයි කථාකොට උන්නාහ, ඒ තීර්ථකයෝ උන්නාවූ ශාලාවට ආවාවූ චිංචිමානවිකාව තීර්තකයන්ට වැඳ එකත්පස්ව උන්නාහ, තීර්තකයෝ උන් වැඳිමටත් බැනනොනැංගාහ. දෙවෙනිවත් වැඳලා සිටියාහ, ඒ වෙලෙත් බැණනොනැංගාහ, තුන්වෙනිවත් බැනනොනැංගාහ, ඒ වෙලෙහි චිංඤ්චිමානවිකා විචාරන්නී ඇයි ස්වාමිනි මා විසින් කවර අපරාධයක් කරණලද ද කවර වැරැද්දක් නිසා බැණනොනැගෙන්නේදැයි විචාළාහ. එවිට තීර්ථකයෝ කියන්නාහු තොප විසින් කළ වැරැද්දක් නැත. ශ්‍රමණ භවත් ගෞතමයන් බුදුවූ දවස් පටන් අප ලබන්නාවූ ලාභයෙන් පිරිහුනු නියාව නොදනුදැයි කිවාහුය. දනිමි ස්වාමිනි කීහ. එවිට කියන්නාහු එසේ විනම් උපායකින් බොහෝ මනුෂ්‍යයන්ට දනෙන නියායෙන් කිළුටක් කියවයි කීහ. චිංඤ්චිමානවිකාත් යහපතැයි තමාගේ ගෙට ගොස් සවස්වෙලෙහි රතුකඩක් ඇඳ ජේතවනාරාමයට යන මග ඔස්සේ ගොස් රෑ තමාගේ තීර්තකයන් ඉදිනා ගෙයක ලැග පාන්දොර එතනින් පිටත්ව ජේතවනාරාමයෙහි ලැග එන කෙණෙකුන්මෙන් අඟවා තමාගේ ගෙට යන්නීය. ඈ දුටු මනුෂ්‍යයෝ තොපි කොයි යව්දැයි විචාළාහ. මා කොයියත් කිම තොපට ඇයි දැයි කියන්නීය. නැවතත් කොයි ගොසින් එව්දැයි විචාළ කල කොයි ගොසින්  එත්කීම, තොපට ඇයිදැයි කියන්නී මේ නියායෙන් තුන් සාරමසක් ඇවිද බොහෝ දෙනාට සැක උපන් පසු තොපි කොයටි ගොසින් එව්දැයි විචාළකල්හි මම ජේතවනාරාමයෙහි බුදුන් ලඟ ශ්‍රියහන් කුටියේ ලැග එන නියායයි කියන්නීය, මෙසේ කියා බඩ කෝටුමිටියක් බැඳගෙණ ඒ බඩ වසා කඩක් බැඳ දැන් මාගේ දෙමසය තුන් මසය බුදුන් දා දරුවෝයයි කියා බස ප්‍රකාශකොට තන පුඩු  කළුකොට ගෙරිඇටින් තවා පය උදුම්මවා දසමසක් ගියකළ බඩ මහත් කොට ගෙණ සර්වඥයන් වහන්සේ බණ වදාරමින් වැඩ උන් ධර්මශාලාවට ගොස් බණ පිරිස් මධ්‍යයෙහි සිට බුදුන්ට කියන්නී නුඹ වහන්සේ බණ පිරිස් පිරිවරා ඉඳ බණ කියනසේක්ද මාගේ බඩ දරුගැබ මුකුරා දසඑකඩ මස පිරුනේය, මා වදන්ට ගෙයක් කොයිද ඉස්තෙල් පාන් තෙල් කොයිද නුඹ වහන්සේ දන්නේ මා හා කැටිව රාත්‍රියේ ක්‍රීඩාවෙහි යෙදෙන්නටමද දරුවැදීමේ තොරුතුරු නුඹ වහන්සේ නොදන්නාසේක. කෝසල රජ්ජුරුවන්ට කියාවත් මා අනේ පිඬුමහසිටානන්ට කියාවත් විශාඛා මහ උපාසිකාවන්ට කියාවත් මා පෝෂ්‍ය කරණ නියායෙන් පාවා නොදී කුමක් කරණසේක්ද නුඹ වහන්සේ මම පෝෂ්‍යනොකළ මා දරුව දන්නේ කොතනදී දැයි කිව සර්වඥයන් වහන්සේත් වදාරණ බණ තබා ගෙණ වදාරණසේක් නගා තොපලා මාලා දන්නා පමණක් විනා අනික් දන්නෝ කවුරුදැයි වදාළසේක.  එවිට කියන්නී නුඹහෙලා මාලා දන්නා පමණක් විනා අනික් දන්නෝ කවුරුන්දැයි කිව, සර්වඥයන් වහන්සේත් නිෂ්කාරණයේවු අපඛ්‍යානයෙකැයි කරබාගෙණ උන්සේක. එවෙලෙහි ශක්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුනුවිය ශක්‍රයෝ දිව්‍යපුත්‍රයන් සතර දෙනෙකු චිංචිමානවිකාවන් බඩ බදනා ලද දර මිටිය බැදූම් කපාපියවයි කියා යවුහ. දිව්‍යපුත්‍රයෝ සතර දෙනා මීවෙස් මවාගෙණ ගොස් දරමිටිය කපාළුහ. සුලඟක් මවා බඩ වසා පෙරමිකඩක් පහකළහ. එතන රැස්වූ බණ පිරිස නිස්කාරණයේ බුදුන්ට සැලැස්වූ අපක්‍යානයක් බලවයි කැටමුගුරු ආදියෙන් මරා වාසලින් පිටත් කළහ, පොළොව පලාගෙණ අවිචිමහනරකයෙන් ගිණිකන්දක් අවුත් නරකයට ගෙණ ගියේය. ධර්මශාලාවේ රැස්වූ භික්ෂූන් වහන්සේ චිංචිමානවිකාවන් නිෂ්කාරණයේ බුදුන්ට අපඛ්‍යානය සලසා නරකයට ගියාවේදැයි කිය කියා උන්තෙනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි පෙරත් චිංචිමානවිකාවෝ බොරු කියා අභව්‍ය වුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ  ඉකුත්වත් දක්වා වදාළසේක.

SANHIDA LANKA

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳගෙණ දස එකඩ මසකින් වැදූහ. ඒ කුමාරයන්ට නම් තබන්නාහු පදුම කුමාරයෝයයි නම් තුබූහ. උන් උපන් නොබෝ කලකින් බිසවුන් මළහ. උන් මළ පසු රජ්ජුරුවෝ අනික් බිසෝකෙණෙකුන් අගමෙහෙසුන් තනතුරට තුබූහ. ඒ බිසව් රජ්ජුරුවන්ට ප්‍රියව මනවඩති. එසමයෙහි පසල් ගමෙක සොරුන් විසින් භයෙක් උපන රජ්ජුරුවෝ ඒ සොරුන්ගෙන් උපන් භය අසා සංහිඳුවන්ට නික්මුණාහු බිසව් කියන්නාහු මම මෙතන රැඳී නොයිදිම් කැටිව එම් කීහ. රජ්ජුරුවෝ කියන්නාහු අප යන්නේ සටනටයි එසේ හෙයින් තොප කැටිව කැඳවාගෙණ යන්ට සේරුවා නොවෙයි කියා තොපගේ දුක්සැප දෙක දක්නට පදුම කුමාරයෝ දකිති කියා බිසවුන් රඳවා පදුම කුමාරයන්ට නුවරත් පාවාදී සේනාව සන්නද්ධ කරවා පසල්ගමට සටනට නික්මුණාහු සොරුන්ගෙන් උපන් භය සන්සිඳවා පෙරලා නුවරට අවුත් නුවරලඟ කඳයුර බැඳගෙණ උන්නාහ. පදුම කුමාරයෝත් රජ්ජුරුවන් ආ නියාව අසා අලංකාරකොට නුවර සරහවයි අමාත්‍යයන්ට විධාන කරවා තනියම රාජනිවාසයට ගොස් රාජනිවාසයේත් ඒ ඒ තැන කළමනා වෙවරත් කරවා අගමෙහෙසුන් බිසවුන් වහන්සේ ඉදිනාගෙට ගොස් වැඳලා සිටියාවූ මෑනියන් වහන්සේගේ එාසු අඑාසු කිම්දැයි විචාළාසේක. බිසව් පදුම කුමාරයන් දැක පිළිබඳ සිත් ඇතිව මට ඇම්මැයි කියාද කියන්නේයයි මෙසේ අවුත් යානමත්තේ වැදහිඳුමයි කීහ.

පදුම කුමාරයෝ කියන සේක් මෑනියන් වහන්ස කටයුතු දන්නා තැන් පටන් අන් ස්ත්‍රියකට කෙලෙස් වසයෙන් මුනමැළු විරුත් නැත නුඹ වහන්සේ මාගේ මෑනියන් වහන්සේය පියානන් වහන්සේගේ බිසවුන් වහන්සේ හෙයිනුත් මෑනියන් වහන්සේය, එසේ හෙයින් නුඹ වහන්සේගේ කෙතෙක් කිවත් මම එසේවූ අනාචාරය කරන්නේ නැතැයි කීහ. බිසව් බොහෝ යාච්ඤා කළාහ. කෙතෙක් යාච්ඤා කළත් නුඹ වහන්සේ හා අනාචාරයට මා යෙදෙන්නේ නැතැයි කීහ. බිසවු කියන්නාහු මා කරා තොප නොකළ පසු රජ්ජුරුවන් වහන්සේට කියා ඉස කප්පාලම් කීහ. ඉස කප්පන්නේ මේ එක ජාතියෙකවේද නුඹ වහන්සේ ඉස කප්පන්නා තබා කැමති යම් වධයක් කරවුව මැනව මා කනස්සල නැතැයි කියා පදුම කුමාරයෝ පිටත පළා ගියාහ. ඒ කුමාරයන් පළා යන්නා තමන්ගේ ඇඟ තබා ප්‍රහාරයකට තෙල් ගල්වා කිළුටු කඩක් ඇදගෙණ වැදහෙව රජ්ජුරුවන් වහන්සේ මා විචාළ සේක් වී නම් ලෙඩට වැද හෝනාසේකැයි කියවයි අන්තඃපුර වාසීන්ට උගන්වා වැදහොත්තාහ. රජ්ජුරුවොත් නුවරට වැද නුවර ප්‍රදක්ෂිණාකොට රජගෙට වැද බිසවුන් කොයි දැයි විචාළාහ. අන්තඃපුරයේ ඇත්තෝ කියන්නාහු ලෙඩට හෝනා සේකයි කීහ රජ්ජුරුවෝත් බිසවුන් ඉන්නා ගෙට ගොස් යානාපිට ඉඳ තොපට අපාසු කිම්දැයි, බිසව් බැනනොනැගී වැදහෙව කියන්නාහු සස්වාමික කෙණෙක් වීනම් මෙසේ ඉඳමෝද අපට ස්වාමිකෙණෙක් ඇද්ද නුඹ වහන්සේ ඇති නියාව දන්නේ දුටුවිටයයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු ඇයි තොපට ගහටකළෝ කවුරුදැයි කීහ. අනික් කවුරුද නුඹ වහන්සේ මේ නුවර රැකවලට රඳවාගියෝකාදැයි විචාළාහ. පදුම කුමාරයෝයයි කීහ. එසේ විනම් තමන් කිවාම නොකළහයි කියා මාගේ ඇඟ පත නසා ඉසකේපත අල්වා ඇත මැත ඇද කල ගහටයෙ විවර කියනපාමනේ ඇද්දැයි කීහ. එවිට රජ්ජුරුවෝ කිපී යව ගොස් පදුම කුමාරයා අල්වාගෙණ ගෙණවයි කීහ. එවිට අමාත්‍යයෝ මෙවර අසා ගෙණ පදුම කුමාරයන් අල්වාගෙණ පිට තලහයා බැඳ තලා රත්මල් වඩම් කරලා පාවටව කියවා රජ්ජුරුවන් ලඟට ගෙණාහ. අතරමග දුටු මනුෂ්‍යයෝ මේ කිමෙක්ද ස්වාමිනි නුඹ වහන්සේටත් මෙසේවූ දෙයක් පැමිණියේදැයි අඬ දොඩා බොහෝ මනුෂ්‍යයෝ එක්වූහ. පදුම කුමාරයන් ගෙණ ගොස් රජ්ජුරුවන්ට දැක්වූහ. රජ්ජුරුවෝත් පදුම කුමාරයන් දැක මේ සොරුන් එළනප්‍රපාතයේ එලවයි කීහ. එවිට පදුම කුමාරයන් කියන්නාහු පියානන් වහන්ස මම මෙසේ වූ දෙයක් කළේ නැත ගෑනුන්ගේ බසට නිස්කාරණයේ නොනසව මැනවයි කීහ. රජ්ජුරුවෝ කිපී මේ සොරාගේ බස් තබා සෙලින් එලවයි කීහ. එලවයි කී බස් හා සමඟ අන්තඃපුර වාසින් හා අමාත්‍යයෝත් අඬා රජ්ජුරුවන්ට කියන්නාහු දේවයන් වහන්ස රජ්‍යයකරන්නාවූ රජ දරුවන් වහන්සේ නම් පරීක්ෂාකාරී වුවමැනව ඇසු ඇසුවන් පස්සේ නොයායුතුය. තීක්ෂණ කෝපී නොවියයුතු නිග්‍රහ කළ වුන්ට නිග්‍රහ කළ යුත්තේය. සංග්‍රහකළවුන්ට සංග්‍රහ කළයුත්තේය. ජන්දයෙන් භයෙන් මෝහයෙන් වේෂයෙන් උපන්නාවූ බසට පරීක්ෂා කළ මැනව පෙර රජ දරුවන්සේ එක්විවර වරදට මසුරන් සියයක් දඬගන්නාසේක, උග්‍රව දෝෂකළ උන්ට නුවරින් පිටත යවනසේක, මේ නිග්‍රහ සැලසුනෙත් මෑතය, පළමු රජදරුවන් වහන්සේ සමයෙහි මෙසේවූ නිග්‍රහයෙක් නැත. ගෑණියකගේ බස්ගෙණ ශිලයෙන්ද ආචාරයෙන්ද නිසිවූ රාජ්‍යයක් රකිණාවූ නුඹ වහන්සේගේ පුත්වූ පදුම කුමාරයන් වහන්සේ නිස්කාරණයේ නොනැසුව මැනවයි කීහ. මෙසේ බොහෝකොට කන්නලව් කීවත් රජ්ජුරුවෝ නොගිවිස පදුම කුමාරයන් නොමරවයි කීහ.

එවිට සොළොස් දහසක් බිසෝ වරුන් අමාත්‍යයෝත් රාජ්‍යවාසීන් මහහඬින් හඬා සිටියාහ. එවිට රජ්ජුරුවෝ සිතන්නාහු රාජ්‍යවාසීන් හා අන්තඃපුරවාසීන් එකගිව පදුම කුමාරයන්ට ලැබී සිටින්නේය, මටත් බිසවුන්ටත්

SANHIDA LANKA

ලැබ් සිටි එකෙකුත් නැත මුන් හැමවිත් තමුන් නොමැරුවෝ නම් නපුරැයි රජ්ජුරුවෝත් චතුරංගිනිසේනාවත් ඇරගෙණ පදුම කුමාරයනුත් ඇරගෙණ සොරුන් එලන්නාවූ පර්වත යට නැගී පදුම කුමාරයන් දෙපය අල්වා ඉස බිම බලවා සොරුන් එලන්නාවූ ප්‍රපාතයෙහි එළුහ. ඒ පර්වතයේ වාසය කරන්නාවූ දේවතාවා පදුම කුමාරයෙනි තොපි නොබවයි කියා පියාන කෙණෙකුන් පුතනු කෙණෙකුන් වඩන්නාසේ ලෙයිලා වඩාගෙණ පර්වතයේ ඉදිනා නාරජ්ජුරුවන් පෙනගබ මත්තේ තුබූහ. ඒ නාගරාජයාත් පදුම කුමාරයන් නාග භවනයට ගෙණගොස් රාජ්‍යය සරියේ බෙදාදී අවුරුද්දක් රාජ්‍යයකොට සිතන්නාහු මෙතන ඉඳ කාරිය කිම්දැයි සිතා මනුෂ්‍ය පථයට යෙහි කීහ. රජ්ජුරුවෝත් යහපතැයි බෝධිසත්වයන් විචාරන්නාවූ මනුෂ්‍ය පථයෙන් කවර ගමෙක තොපි ගෙණගොස් ලන්නේදැයි කීහ. මා හිමාල වනයේ ලාපියවයි කීහ. යහපතැයි කියා නා රජ්ජුරුවෝත් පදුම කුමාරයන් හිමාල වනයෙලා ගියහ. බෝධිසත්වයෝ ඍෂිප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව නොබෝ දවසකින් පංඥාභිඥා අෂ්ටසමාපත්ති උපදවා හිමාලය වනයෙහි වාසය කරන්නාහ. එක්තරා වල්වැද්දෙක් තමාගේ කාරියකට වලට ඇවිදිනේ පදුම කුමාරයන් වාසය කරන්නාවූ පන්සලට වැද පදුම කුමාරයන් දැක ඇඳින ගෙණ නුඹ වහන්සේ පදුම කුමාරයන් වහන්සේදැයි වාචාළාහ. එසේයයි කීසේක. ඒ වැදිත් තාපසයන් කෙරේ කීපදවසක් රඳා නුවරට ගොස් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ සැබෑදැයි විචාරා නියම දැන චතුරංගිණිසේනාව ඇර ගෙණ හිමාලය වනයට ගොස් සේනාව රඳවා අමාත්‍යයනුත් ඇරගෙණ පන්සලට ගියාහ. ඒ පන්සල දොරකඩ පිටසිට රන්පිළිමයක්සේ දොරකට උන් නාවූ බෝධිසත්වයන් දැක එකත්පස්ව උන්නාහ. අමාත්‍යයෝත් බෝධිසත්වයන් දැක වැඳ එකත්පස්ව උන්නාහ. බෝධිසත්වයෝ කියන්නාහු එම්බල මේ වනයෙහි මිහිරි පලාවුල ඇත යහපත්වූ මිහිරි පැන් ඇත ගමන් ශ්‍රමදාහ නිවා කව බොව සැතපී ඉඳුවයි කීහ. ඒ අසා සහපිරිවරින් රජ්ජුරුවෝත් අමාත්‍යයෝත් බෝධිසත්වයන් හා කථාකරන්නාවූ තාලවෘක්ෂ ප්‍රමාණය කටත් උසවූ මහත්වූ ප්‍රපාතයකින් මාගේ සිය අතින්ම එලාපියන ලද එම්බා පුත පදුම කුමාරයෙනි තොපි කෙසේ ජීවත් වුයේදැයි කියා නැවත කියන්නාහු මා අපරීක්ෂිතව කළාවූ වරදක්ෂමාකරවා පුත පදුම කුමාරය මා හා කැටිව නුවරට අවුත් දැහැමෙන් සෙමෙන් රාජ්‍ය කරවයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු මහරජ්ජුරුවෙනි යම් මිනිසෙක් බිලියක මස් කැටියක් අමුනා දියයට දමාද ඒ බිලිය මත්ස්‍යයෙක් ගැල නැවත වමාරා ගැලවී ගියේද එමෙන් මමද දුකසේ ගැලවී දෙවනුව රාජ්ජයට පැමිනෙද්දැයි මහ රජ්ජුරුවෙනි කීහ. ඒ වෙලෙහි රජ්ජුරුවෝ කියන්නාහු ඒ කිම්ද බිලිය නම් කින්ද, මස් කැටිය නම් කින්ද, බිලිය ගිළු කුඩ මස්සා නම් කින්ද, ඒ මට නොදනේයයි කිවමැණවයි කීහ. එවිට බෝධිසත්වයෝ කියන්නාහු මහරජ බිලිය නම් පඤ්චකාම නැමති බිලියය, මස් කැටිය නම් හස්ති අශ්ව රථ පත්තිය යන සේනා නැමති මස් කැටියට ඒ ගැල පියා වමාරා පලාගියාවූ කුඩා මස්සා නම් මමය මහරජ්ජුරුවෙනි තෙපි ගෑනියකගේ බස්ගෙණ මා පර්වතයෙන් එලාපුව ඒ දවස් මාගේ මෛත්‍රී බලයෙන් රැකිනිමි. එසේ වු මරණින් මිදුන මම නැවත රාජ්‍ය ලෝභයෙන් වලවැටෙම්ද, මම රාජ්‍යයට නොයමි තොපි ගොසින් දැහැමෙන් රාජ්‍යය කරවයි කීයා යවුහ. රජ්ජුරුවෝත් අමාත්‍යයෝත් බෝධිසත්වයන් වැඳ අඬා වැලප නුවරට යන්නාහු බෝධිසත්වයන් එළු පර්වතය ලඟට පැමිණියාහු පර්වතය දැක අමාත්‍යයන් අතින් විචාරන්නාවූ එම්බා අමාත්‍යයනි මාගේ කිසිවරදක් නැත්තාවූ ගුණයෙන්ද ආචාරයෙන්ද ශීලයෙන්ද සමන්විත වූ පදුම කුමාරයන් නොලද්දේ කා නිසාදැයි විචාළාහ. අමාත්‍යයෝ කියන්නාහු ස්වාමිනි නොදන්නාසේක්ද, නුඹ වහන්සේගේ බිසවුන් වහන්සේ නිසායයි කීහ. ඒ වෙලෙහි මාගේ නිව රඳවූ පදුම කුමාරයන් නිස්කාරණයේ වරදලැවූ ඈ ගෙණවිත් මේ පර්වතයෙන් දමවයි කියා එතනම සිට ගෙන්වා ගෙණ බිසවුන් පර්වතයෙන් එලවා නුවරට ගොස් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ මහා පදුම ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බිසව් නම් චිංචිමානවිකාය, රජ්ජුරුවෝ නම් දේවදත්ත ස්ථවිරය, පර්වතයේ වසන්නාවූ දේවතාවා නම් ශාරිපුත්‍ර ස්ථවිරය, නා රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරය. පදුම කුමාර වු තාපසයෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මිත්තා මිත්ත ජාතකය

තවද හුදු නුවණින් මවාළූ රුවක් වැනිවූ තිලෝගුරු බුදුරජානන් වහන්ස් ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ අමාත්‍යයකු අරභයා මේ ජාතකය දක්වන ලද.
ඒ කෙසේද යත්
කොසොල් රජ්ජුරුවෝ එක් අමාත්‍යයෙකුට බොහෝ සම්පත්දී අධික කරුණා ඇත්තාහ. සෙසු අමාත්‍යවරු රජ්ජුරුවන් අමාත්‍යයාට අධික කරුණා ඇතිනියාව දැන නොයෙක් දෝෂකියා බිඳවාපුවාහ. රජ්ජුරුවෝ අමාත්‍යයාගේ දෝෂ පරීක්ෂා කොට කිසි දෝශයක් නැතියෙහින් බුදුරජානන් වහන්සේ කරාගොස් ස්වාමිනි මිත්‍රයාගේ යහපත හා අමිත්‍රයාගේ දෝෂත් අසනු කැමැත්තෙමි කීහ. මහරජ පළමුත් තොපගේ රජ දරුවෝ නුවනැත්තන් අතින් විචාළගමනේ නුවණැත්තෝ විසඳා කිව්වෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.
ඒ කෙසේද යත්
යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට පණ්ඩිත අමාත්‍යය උපන්නාහ. ඒ රජ්ජුරුවෝ එක්තරා අමාත්‍යයෙකුට අධික කරුණා ඇත්තාහ, සෙසු අමාත්‍යවරුත් ඒ අමාත්‍යයකෙරෙහි එරිස්සාව බැඳි නොයෙක් දෝෂ රජ්ජුරුවෙන්ට කියා බිඳවුහ. රජ්ජුරුවෝත් ඒ අසා අමාත්‍යයාගේ දෝෂ පරීක්‍ෂා කොට කිසි දෝශයක් නොදැක සිතන්නාහ. මිත්‍රයාගේ යහපතින් අමිත්‍රයාගේ දෝෂයත් පණ්ඩිත අමාත්‍යයාගෙන් අසනු කැමැත්තෙමි කියා ගෙන්වා විචාරන්නාහු මේ ලෝකයෙහි නුවැණැත්තාවූ සත්වතෙමේ කෙසේ වු කාරියක් කරන්නාවු සත්වයා ඇසින් දැකවත් කණින් අසාවත් මේ මට අමිත්‍රයයි දැනගණිද ඒ මිත්‍රයයි දැනගණිද ඒ මිත්‍රයා දැනගන්නා පිණිස නුවණැත්තාවූ සත්වතෙමේ කෙසේ වීර්ය කෙරේදැයි විචාලාහ. එබස් අසා රජ්ජුරුවන්ට අමිත්‍ර ලක්ෂණ කියන්නාහු බෝධිසත්වයෝ මහරජ්ජුරුවන් වහන්ස මිත්‍ර ප්‍රතිරූපකවු සත්වතෙමේ මිත්‍රවු දැක සන්තෝෂාකාරයක් නොදක්වා ද ඒ මිත්‍රයාගේ කථා පිළිගෙණ සතුටු නොවේද මිත්‍රයා තමා මූන බැළු අවස්ථාවෙහි තෙමේ මූන බලාද මිත්‍රයාගේ කථාවට විරුද්ධ වේද ඔහුගේ සතුරන් භාජනය කෙරේද මිත්‍රයාගේ බලවත් කාර්යයකට වර්ණනානොකෙරේද ඔහුගේ ප්‍රඥාවට ප්‍රසංසා නොකෙරේද මිත්‍රයාට අවැඩක්වු කල්හි සතුරන් සේ සතුටුවේද වැඩක්වු කල්හි නොසතුටුවේද නොලදහැකි භොජනයක් ලත්කල්හි මිත්‍රතෙම මෙයින් ස්වල්පදෙයක් ලද්දේ නම් යහපතැයි ඔහු සිහි නොකෙරේද යන මේ කාරණා සොළොස්දෙන අමිත්‍රයා කෙරෙහි පිහිටියාහ. නුවනැත්තාවු සත්වතෙම මේ සොළොස් ආකාරයෙන් අමිත්‍රයා දැකත් ඔහුගේ  ගුණ අසාත් අමිත්‍ර ලක්ෂණ දැනගන්නේයයි රජ්ජුරුවන්ට අමිත්‍ර ලක්ෂණ කීහ. නැවත රජ්ජුරුවන් විසින් නුවනැත්තාවු සත්වතෙමෙ කෙසේවු කාරියක් කරන්නාවු පුද්ගලයා ඇසින් දැකත් ඔහුගේ කාර්යය අසාත් මේ මිත්‍රයතා යයි දැනගණිද ඔහු මිත්‍ර නියාව දැනගන්නට කෙසේ උත්සාහ කෙරේදැයි විචාළ කල්හි මිත්‍රලක්ෂණ කියන්නාවු බෝධිසත්වයෝ මහ රජ්ජුරුවන් වහන්ස මිත්‍ර තෙම තමාගේ මිත්‍රයා අන්‍යදෙශයකට ගිය කල්හි ඇමවෙලෙහිම සිහිකෙරේද බැහැර ගොස් ආතැනැත්තවු දැක සතුටු වේද ඔහු කෙරේද මිත්‍රයන්ගේ මිත්‍රභජනය කෙරේද මිත්‍රයාගේ නුගුණ කියන්නාවුන් වලකා ගුණ කියන්නාවුන්ට ප්‍රසංසා කෙරේද තමාගේ රහස් මිත්‍රයාට කියාද ඔහුගේ රහස් තෙමේ සඟවාද මිත්‍රයාගෙන් ස්වල්ප මාත්‍රවූ දෙයක් ලද්දේ නම් ඊට වර්ණනා කෙරේද ඔහුගේ ප්‍රඥාවට ප්‍රසංශා කෙරේද මිත්‍රයාට වැඩක්වු කල්හි සතුටුවේද අවැඩක්වු කල්හි දෝම්නස්වේද නොලද ආහාර පාණවර්ගයයක් ලත් කල්හි මාගේ මිත්‍රතෙම මේ භෝජනයෙන් ස්වල්ප මාත්‍රයක් ලද්දේ නම් යහපත් වන්නේයයි ඔහු සිහිකොට අනුභව කෙරේදැයි යන මේ කාරණ සොළොස මිත්‍රයා කෙරෙහි මානව පිහිටියේය. නුවනැත්තාවූ සත්වතෙමෙ මේ මිත්‍රයා දැකත් ඔහුගේ කාර්යය අසාත් මේ සොළොස්කාරණයෙන් මිත්‍රලක්ෂණ දැනගන්නේයයි මහබෝසතානෝ රජ්ජුරුවන්ට මිත්‍රයාගේ ලක්ෂණ ප්‍රකාශකොට කීහ. රජ්ජුරුවෝ මහබෝසතානන්ගේ බසට සතුටුව මහත්වූ ඓශ්චර්යය දුන්නාහ. ශාස්තෘවු තිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාල මෙසේ මහරජ්ජුරුවෙනි පෙරත් මිත්‍ර අමිත්‍රව දෙදෙනාගේ ලක්ෂණ දැනගන්නට සුදුසුවූ ප්‍රශ්න පහළවිය. එසමයෙහි නුවණැත්තෝම ප්‍රශ්න විස්සජ්ජරනය කොට මෙයාකාරයෙන් මිත්‍ර අමිත්‍ර දෙදෙනාගේ ලක්ෂණ දතයුතුයයි කිවෝ වේදැයි වදාරා මේ මිත්තාමිත්ත ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයයෝය. එසමයෙහි නුවණැත්තාවු අමාත්‍යයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජු වූ මම්ම යයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# ද්වීතීය අඹ ජාතකය

ධර්ම රාජයාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන කල්හි දෙව්දත් තෙරුන් අරභයා මේ ජාතකය වදාළ සේක.

දෙව්දත් තෙරුන් වහන්සේ මම ද බුදු වෙමි. බුදුන් මාගේ ආචාරීන් නොවන්නේය. උපාධ්‍යයන් නොවන්නේයයි ධ්‍යානයෙන් පිරිහී සංඝ භේද කොට පොළව පලා අවීචියට ගෙනයාම ගැන දම්සභා මණ්ඩපයෙහි භික්ෂූණ් අතර කතාවක් උපන් කල්හි එහි වැඩි බුදුරජාණන් වහන්සේ මහණෙනි, පෙරත් දෙව්දත් තෙරණුවෝ ආචාරීන් ප්‍රත්‍ය බ්‍යානය කොට මහත් වූ විනාශයට පැමිණියෝ වේ දැයි ඉකුත් වත වදාළ සේක.

යටගිය දවස බරණැස උසීරථ නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හි එක් සැඬොල් ගමක මහ නුවණැති නොකල්හී අඹ එල ගන්වන්නා වූ මන්ත්‍ර දන්නා කෙනෙකු සිටියේය. ඔහු උදෑසන කද කරට ගෙන වනයට ගොස් අඹ රුකක් සමීපයට සත් පියවරක් ඈතින් සිට මන්ත්‍රය ජප කොට අඹ රුකට පැන් අතලොස්සක් ගසන්නාහාම එහි අලුත් දළු දා කොළ හට ගන්නේය. මල් පිපී ගෙඩි හට ගන්නේය. එකනෙහි ම අඹ පැසී ඉදී බිම වැටෙන්නේ ය. දිව්‍ය එල හා සමාන වූ ඒ අඹ ඇති තරම් අනුභව කොට ඉතිරි අඹ කද පුරවා ගෙන ගොස් විකුණා ජීවත් වන්නේ ය.

එක් බ්‍රාහ්මණ මානවකයෙක් මේ නොකල්හී අඹ හට ගන්නා වූ මන්ත්‍රය ලබා ගැනීම සඳහා මොහු ළඟට පැමිණ එය ඇයදී ය. මේ මානවකයාගේ පුරුෂ ලක්‍ෂණ දුටු මන්ත්‍රකරු මේ මන්ත්‍රය ඔහු අත නොතිබෙන්නේය. එය නොහැකැයි තම භාර්යාවට කීය. මානවකයා මේ ආචාරීන්ට උපකාරීව ලබා ගනිමියි සිතා ගෙයි බැල මෙහෙ කොට අත් පා මෙහෙවර කරන්නේය. දිනක් මන්ත්‍රකරු මානවකයා අමතා තමා වැදහොත් ඇඳට පා අලුවක් ගෙනත් දෙවයි කී කල සොයා කිසිවක් නොදැක මුළු රාත්‍රියෙහි ම තම කලවය මත්තෙහ් ඇඳ පය තබාගෙන උන්නේය. ඊටපසු මන්ත්‍රකරුගේ බිරිය වදන අවස්ථාවෙහි මේ මානවකයා සියළු කටයුතු නිම කළේය. දිනක් මන්ත්‍රකරුට තම බිරිය කියන්නේ ස්වාමීනී, මේ බ්‍රාහ්මණ මානවකයා මන්ත්‍රය ලබා ගනු සඳහා තම ජාතියවත් නොසලකා බැල මෙහෙ කරන්නේය. මොහුට මන්ත්‍රය දුන මැනවයි කීය. ඒ අසා මන්ත්‍රකරු ඔහුට මන්ත්‍රය දී මානවකය මේ මන්ත්‍රය ඉතා වටිනා එකකි. මෙයින් මහත් ලාභ සත්කාර ලැබෙන්නේය. රාජ රාජ අමාත්‍යාදීහු තොපගේ ආචාරී කවුදැයි විචාල කල්හි මා බැව් නොසඟවා කියනු මැනවි. සැඬොල් කුලයෙහි වූ මගෙන් උගත් බැව් කීමට ඔබ ලැජ්ජා වුවහොත් මේ මන්ත්‍රයෙන් තිසි ප්‍රයෝජන විනාශ වන්නේ යැයි කීය. මානවකයා සියල්ල අසා එසේ පොරොන්දු වී වැඳ අවසර ගෙන තම නුවරට ගොස් මන්ත්‍රානුභාවයෙන් නොකල්හී අඹ හට ගන්වා එය විකුණා ජීවත් වන්නේය. දිනක් රජුගේ උයන් පල්ලා ඔහු අතින් අඹ මිළයට ගෙන රජ්ජුරුවන්ට දුන්නේය. රජතුමා ඒ ගැන අසා මානවකයා ගෙනවා දිනපතා තමා වෙත අඹ ගෙන එන ලෙස නියම කොට හැරියේය. මෙසේ ක්‍රමයෙන් මානවකයා රජතුමා සමග විශ්වාසී විය. රජතුමා දිනක් ඔහු අඹ ගෙන ආ විට මානවකය, තොපට මේ අඹ දෙවියෙක් නාගයෙක් දේද? මන්ත්‍රානුභාවයෙන් ලැබීමෙක් දැයි විචාළේ ය. මහරජතුමනි, මා ළඟ අනර්ඝ වූ මන්ත්‍රයෙක් ඇත. නොකල අඹ ලැබීම සිදුවනුයේ එහි ආනුභාවයෙන් යැයි කියා රජතුමාගේ ඉල්ලීම පිට දිනක් උයනට ගොස් මන්ත්‍ර බලයෙන් අඹ මවා පෙන්වීය. ජනයෝ සාධුකාර පැවැත් වූහ. රජ්ජුරුවෝ මහත් වස්තුව දී මේ මාහැගි මන්ත්‍රය කාගෙන් උගත්තෙහි දැයි විචාළා හ. මානවකයා ඉදින් මම සැඬොලෙකුගෙන් උගත්තේ යැයි කීයේ වී නම් මා ලජ්ජා කටයුතු වන්නේය. මට නින්දා කරන්නාහ. දැන් මම මේ මන්ත්‍රය හොඳින් අභ්‍යාස කොට ඇත්තෙමි. දැන් නොනස්නේ යැයි සිතා තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් අතින් උගතිමියි තමා ආචාරීන් අමතක කොට අත්හැර කීය. ඒ හා සමගම මන්ත්‍රය අන්තර්ධාන විය. රජ්ජුරුවෝ ඉතා සතුටුව මානවකයා කැඳවාගෙන නුවරට ගොස් නැවත දිනක මඟුල් සල්වට හිඳ මානවකය අඹ ගෙනවයි කීය. මානවකයා යහපතැයි කියා අඹ රුක සමීපයට ගොස් මන්ත්‍රය සිහිකළ මුත් සිහි නොවූයෙන් එය අන්තර්ධාන වූ බැව් දැන ලජ්ජාව සිටියේය. අඹ ප්‍රමාද බැවින් රජතුමා එහි ළඟා වී කරුණු විචාළා හ. මානවකයා බොරුවන් රජ්ජුරුවන් වංචා කෙරෙමියි සිතා මම නැකත් යෝගයක් බලමින් සිටියෙමි. නැකත උදා වූ විට ඔබ වහන්සේ ට බොහෝ අඹ ගෙනවුත් දෙන්නෙමි වේ දැයි කීහ. රජතුමා මානවකය පෙර තොප කිසිම නැකත් යෝගයක් නොබලා අඹ එල ගෙන්වා දුන්නේ ය. දැන් නැකත් යෝග බලන්නෙහි ය. දොඩන්නේ කුමන බසෙක් දැයි විචාළ හ. මානවකයා මහ රජතුමනි, බොරුවෙන් ජය ගත නොහැක. මම සත්‍ය කී කල්හි රාජ ආඥා කරවන සේක. නමුත් මම දැන් සත්‍යයම කියමි. මහ රජතුමනි දැහැමි සැඬොල් පුත්‍රයකුගෙන් මම මේ මන්ත්‍රය උගත්තෙමි. යම් දිනක මාගේ නම් ගොත් සඟවා කීයෙහි නම් තාගෙන් මේ මන්ත්‍රය අතුරුදහන් වන්නේ යැයි හේ මට අවසාන වශයෙන් අවවාද කළේ ය. මම ඒ අවවාදය නොතකා පෙර දා මහ පිරිස මැද දී ගුරුන් අමතක කොට එය දිසාපාමොක් ඇදුරන්ගෙන් උගත් බැව් කීමෙන් මන්ත්‍රය අතුරුදහන් විය. දැන්

SANHIDA LANKA

මම දුක් වෙමියි කීහ. එබස් අසා රජතුමා ලාමක වූ පව්ටු අදහස් ඇති මේ අසත්පුරුෂයා ගුරු ද්‍රෝහිව තමාගේ වටිනා මන්ත්‍රය නැති කර ගත්තේ ය. මේ කාලකණ්නියා ව රටෙන් එළවා දමව් යැයි නියම කළේ ය. රාජ පුරුෂයෝ උණ පත්තෙන් දෙපැත්ත හසු කොට පත්තේ පොත්ත පැත්තකට යන ලෙස තලා සම උපුටවා වද කොට බොටුව අල්වා නුවරින් එළවා දැමූ හ.

මානවකයා නැවත අසරණව සිතන්නේ ආචාරීන් වහන්සේ හැර මට අන් පිළිසරණක නැත. චණ්ඩාල ග්‍රාමයට ගොස් නැවත මන්ත්‍රය ඉල්වා ගනිමියි අඬමින් එහි ගියේය. දුර එන ඔහු දුටු මන්ත්‍රකරු බිරිය අමතා සොඳුර ඒ පව්ටු පුරුෂයා මන්ත්‍රයෙන් පිරිහී නැවත එන හැටි බලවයි කීහ. මාවයකයා එහි ළඟා වී වැඳ සිදු වූ සියල්ල කියා නැවත මන්ත්‍රය ඉල්ලමින් මෙසේ කීය. ස්වාමීනී, ආචාරීන් වහන්ස යමෙක් විෂම තැන් සම කොට සිතා - වලෙක - දැදුරෙක - නරවලෙක - නරක ප්‍රපාතයක වැටේ ද දඬෙක - වැලෙක යන සංඥාවෙන් සර්පයෙකු පයින මඩීද ගින්නෙහි පය තබා ද එසේ ම මම ප්‍රඥා ඇස නැතිව අන්ධ වූයෙන් ඔබ වහන්සේ සඟවා කීමෙන අපරාධ කළෙමි. මන්ත්‍රයෙන පිරිහුනෙමි. ප්‍රඥා සම්පන්න වූ බවට නැවත යාඥා කරමි. මන්ත්‍රය දුන මැනවයි කීය. එබස් අසා ආචාරී කියනනේ මානවකය, තගෙන් කිසි ධනයක් නොගෙන මන්ත්‍රය දුනිමි. මන්ත්‍රය පිරිහෙන ක්‍රමය ද තට කියා දුනිමි. තා සත් පුරුෂ වූයෙහි නම් මන්ත්‍රය අතුරුදහන් නොවේ. අඥාන වූ මුඞ වූ අකෘතඥ වූ බොරු කියන කාය වාග් සමාචාරයක් නැත එබඳු සත්ත්වයන්ට අපි මන්ත්‍ර නොදෙමි හ. තා අසත් පුරුෂ හයින් දැක්මත් මට අප්‍රිය කරුයැයි එළවා දැමූහ. මානවකයා දැන් මට ජීවිතයේන් ප්‍රයෝජන කිම්දැයි වලට වැද අනාථ මරණින් මළේය.

එසමයෙහි මානවකයා නම් දැන් දෙව්දත් තෙරණුවෝය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝ ය. සැඬොල් මන්ත්‍රකරුව උපන්නේ බුදුන් වහන්සේය.

SANHIDA LANKA

# එන්දන ජාතකය

බුදුරජාණන් වහන්සේ රෝහිනී නම් ගංතෙර වැඩහිඳ නෑයන්ගේ කලහයක් අරභයා මේ ජාතකය වදාළ සේක.

මෙහි නිධාන කථාව කුනාල ජාතකයෙහි මෙනි.

පෙර බරණැස බ්‍රහ්මදත්ත නම් රජකෙනෙක් රාජ්‍ය කරන කල්හි පිටි නුවර එක් වඩු ගමක එක් බමුණු වඩුවෙක් වලින් දඬු ගෙනවිත් රථ ඉදිකොට ජීවත් වන්නේ ය. එකල හිමාල වනය සමීපයෙහි මහා කොලොන් ගසක් ඇත. එක් වලහෙක් ගොදුරු සොයා යන්නේ ඒ ගස මුල වැදහොත්තේ ය. එදින හට ගත් මහත් සුළගින් ඒ ගසෙන් වියළි අත්තක් කැඩී වලසාගේ කරපිට වැටී බෙල්ල තැලීගියෙන් බියපත්ව මදක් දුර දුව ගොස් නැවතී සිට තමා ආ මාර්ගය දෙස බලා කිසිවෙක් නොදැක. කිසි සතුරෙක් මා එළවා එන්නේ නැත. මේ රුකෙහි ඇති දේවතාවා මා මෙහි සිටීමට නොකමැත්තේ යයි සිතමින් ඒ ගස කෙරෙහි වෛර බැද ගස නිය වලින් සූරා අන් සතුන්ගේ මෙහි සැතපීම කැමැත්තෙහිය. මාගේ සැතපීම පමණක් නොකමැත්තෙහිය. මාගේ දෝෂය කුමක්ද? තව කීප දිනකින් ගස උදුරා බිම දමා කඩ කඩකර දමමියි රුක් දෙවියා බියගන්වා ගියේය. බමුණු වඩුවා මිනිසුන් කැටිව ලී සෙවීමට වනයට පැමිණ රථය එක් තැනක නවතා වෑ පොරෝ ගෙන ගස් බලමින් කොලොන් රුක සමීපයට ගියේය. වලසා ඔහු දැක සතුරු ගස අද විනාශ කරමියි ගස මුල සිටිය වඩුවාද ඈත මෑත බලමින් සිටිය වඩුවා අමතා පුරුෂය, මේ වනයෙන් තොප කුමන දණ්ඩක් කැමැත්තෙහිදැයි විචාළේ ය. වඩුවා වලසාණෙනි, පුදුමයකි. මීට පෙර වලසකු මිනිස් බසින් කථා කරනු නොදුටුවෙමි. තොප ලී දන්නෙහිය. රථයෙහි නිම්වලල්ලට කෙසේ හෝ දඬු තරම් වන්නේදැයි විචාළේය. වලසා තම අදහස දැන් මුදුන් පමුණුවා ගනිමියි සිතා පින්වත රථයෙහි නිම්වලල්ලට සල්- කිහිරි- මුරු- තඹල ආදී ගස් සුදුසු නොවෙයි. කොලොන් දඬු සුදුසු වන්නේ යයි කීය. වඩුවා සතුටට පැමිණ අද හොඳ දවසකි. තිරිසනෙක් රථයට සුදුසු දඬු කියන්නේ  යහපතැයි සිතා තොප කියන කොලොන් ගස් කෙබඳු ද හැඳන ගන්නේ කෙසේදැයි විචාළේය. පුරුෂය, යම් ගසක එලී තිබේ ද නැමේ ද නොබිදේද ඒ කොලොම් ගස් නම්. මේ කොළොම් දඬු රථ දෑ වියට ද සක් නැබට ද නිම් වළල්ලට ද රථයට ද කර්මක්ෂම වන්නේ යැයි කීය. වඩුවා සතුටුව ගස් කපන්නට පටන් ගත්තේය. එහි වසන දේවතාව සිතන්නේ මා විසින් මේ වලසා ඇඟ කිසි දඬු පතක් නොදමා අස්ථානයේ වෛර බැඳ මාගේ විමානය නැසීමට සූදානම්වේ. එබැවින් මම එක් උපායකින් මේ වලසා නසමියි කියා එක් පුරුෂයකුගේ වෙස් ගෙන ඒ සමීපයට අවුත් තොරතුරු විමසා මේ ගස රථයට සුදුසු බැව් කීවෝ කවුරු දැයි අසා වලසකු විසිනැයි කී කල මේ රුකින් රථ කිරීම ඉතාම යහපත. එසේම වලස් කරේ සම ගලවා නිම් වළල්ල වට කොට බැඳ සදාළු කළ එය ඉතාම ශක්තිමත් වන්නේ ය. බොහෝ වස්තු ලබන්නේය කීය. වලස් සම් කෙසේ ලබම් දැයි කී කල්හි රුක් දෙවි කියන්නේ මන්ද නුවණ නැත්තෙහි ද මෙ ගස් නම් අන් තැනකට එලා නෙයයි. මේ රුක රථයට යහපතැයි යමෙක් විසින් කියන ලද්දේ වී නම්  ඔහු සමීපයට ගොස් ස්වාමීනී ඔබ විසින් දක්වන ලද වෘක්ෂය කෙබඳු තැනක දී කැපිය යුතු දැයි වංචා කොට කැඳවා ගෙන එනු මැනවි. ඔහු සැකයක් නැතිව ඔහු සැකයක් නැතිව පැමිණ මෙතැනින් කපවයි කියා ඔලුව දික්කොට කියන්නාහාම සියුම් මහ පොරවකින් එක් විටම ගසා මරා සමගෙන මිහිරි මස් අනුභව කොට ගස දෙවනු කපා ගනුවයි කියා වෛරය පහකොට ගියේය. වඩුවා එබස් අසා මට අද මඟුල් දවසකැයි සතුටුව වලසාත් මරා කොළොම් ගසත් කපාගෙන තමා වසන තැනට ගියේය. මේ සියල්ල ඒ වනයට අධිපතිව සිටි දේවතාවා ප්‍රත්‍යක්ෂ කොට දැක්කේය.

ඒ වන දේවතාවා නම් බුදු රජාණන් වහන්සේ ය.

SANHIDA LANKA

# ජවනහංස ජාතකය

සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි දල්හධර්ම සූත්‍ර දේශනාව අරභයා මේ ජාතකය දක්වන ලදී.

බුදුරජාණන් වහන්සේ දල්හධර්ම සූත්‍රය වදාළ දෙවෙනි දවස දම් සභා මණ්ඩපයෙහි රැස් වූ භික්ෂූණ් අතර ඇවැත්නි, බුදුහු තමන් වහන්සේ ගේ බුද්ධ විෂයෙහි සිට සියළු සත්ත්වයන්ගේ ආයු සංස්කාරය ස්වල්ප කොට ප්‍රකාශ කොට වදාරණ සේක්. පෘථග්ජන භික්ෂූණ් අතිශයින් සසර බියෙන් බියපත් වන්නාහ. බුද්ධ මහිමයේ හැටි බලවයි කථා කරමින් උන් තැනට වැඩි බුදුරජාණන් වහන්සේ මහණෙනි, පෙරත් හංසයෝනියෙහි ඉපිද ආයුසංස්කාරය ස්වල්ප නියාව දක්වා බරණැස් රජ ප්‍රධාන පිරිසට ධර්ම දේශනා කළේ වේදැයි ඉකුත් වත වදාළ සේක.

එදා බරණැස බ්‍රහ්මදත්ත නම් රජෙක් රාජ්‍ය කරන කල්හි තුන්දහසක් හංසයන් පිරිවරාගත් රාජ හංසයෙක් චිත්‍රකූට පර්වතයෙහි වසන්නාහ. රාජ හංසයා පිරිවර සමග ගොස් දඹදිව එක විලෙක සයංජාත ඇල අනුභව කොට අහසින් චිත්‍රකූට පර්වතයට යන්නාහ. එකල බරණැස් රජ්ජුරුවෝ මේ රාජ හංසයාව දැක මුනුත් මා හා සමාන රජෙක් විය යුතු යැයි ඇමතියන්ට කියා මල් ගඳ විලවුන් ගෙන රාජ හංසයා එන තුරු බලා සිට තූර්ය නාදයෙන් පූජා කළහ. රාජ හංසයා මේ බැව් දැක පිරිවෙර හංසයන් අතින් විචාරන්නාහු රජ්ජුරුවෝ මට මෙබඳු සත්කාරයක් කරන්නේ කුමක් පතාදැයි විචාළා හ. ස්වාමීනී, ඔබ සමග මිත්‍රකම් පතා යැයි කී කල එසේ රජ්ජුරුවන් සමග මිත්‍රබව වේවයි කියා රජ්ජුරුවන් සමග මිත්‍ර ධර්මය පිහිටුවා ගියාහ. දිනක් රජ්ජුරුවන් උයනට ගිය කල තුමු අනවතත්ත විලට ගොස් එක් පියාපතකින් පැන් හා  එක් පියාපතකින් සඳුන් සුනු හා ගෙනවිත් රජ්ජුරුවන් පැනින් නහවා සඳුන් සුනු ශරීරයෙහි ගල්වා මහජනයා බල බලා සිටිය දී ම සහ පිරිවරින් චිත්‍රකූට පර්වතයට ගිය හ. එතැන්පටන් රජතුමා මාගෙ මිත්‍රයා අද එතියි අද එතියි පෙරමඟ බල බලා හිඳින්නා හ. එකල රාජ හංසයාගේ සොයුරන් වූ හංස පෝතකයෝ දෙදෙනෙක් ඉරු හා සමග දුවම් හයි කතා කොට රාජ හංසයාට අපි ඉරු හා දුවන්නෙමු යැයි කීහ. රාජ හංසයා කියනනාහු දරුවනි, තෙපට ඉරු සමග දිවිය නොහැක. අතරමගදී නැසී යති. එබැවින් නොයවයි එය වැළකූහ. හංස පෝතකයෝ දෙවන තුන්වන වරටත් යාඥා කලහ. රාජ හංසයා අවසර නොදුන්නේ ය. උන් දෙදෙන රාජ හංසයාට නොකියාම ඉරු සමග දුවම්හයි කියා ඉරු පායන්ට පළමුකොට ගොස් යුගඳුරු මුදුනෙහි උන්හ. රාජ හංසයා උන් නොදැක සොයා එහි ගිය බැව් දැන මුන් දෙදෙනා මෙයින් විනාශයට පැමිණෙති. උන්ට ජීවිත දානය දිය යුතු යැයි සිතා තමන් ද එහි ගොස් තොපි නිසා මම ද පැමිණියෙමියි හිරු මඬල නැගී කල්හි උන් දෙදෙනා දුවන්ට පටන් ගත් විට තමා ද උන් සමග දුවන්නට විය. උන් දෙදෙනාගෙන් බාල මලණුවෝ පෙරවරුයෙන් බාගයක් දුව ආසන්නව ගියහ. පියාපත් සන්ධිවල ගිනි නගින්නාක් මෙන් විය. ඔහු රාජ හංසයා අමතා ස්වාමීනී බෑණන් වහන්ස, දිවගත නොහෙමියි කීහ. එසඳ රාජ හංසයා මළන්ඩ තොපි භය නොගනුවයි චිත්‍රකූට පර්වතයට ගෙනගොස් තබා හිරු කරා පැමිණි දෙවන මළනුවන් සමග දිවූහ. ඒ මළනුවෝ ද මධ්‍යහ්නය දක්වා දිවීමෙන් දාහ වැදෙමින් එහා දිවීමට අසමත් බැව් රාජ හංසයාට දැන්වීය. ඔහුව ද පෙරසේම චිත්‍රකූට පර්වතයට ගෙන ගොස් තැබූහ. එකෙනෙහි ඉරු මුදුනට නැංගේය. එවිට රාජ හංසයා මාගේ බලය පරීක්ෂා කෙරෙමියි සිතා එක් වරම දූව යුගඳුරු මුදුනේ සිට එයින් නැඟ ඉරු කරා පැමිණ වරෙක ඉරුට පෙරටුව ද වරෙක ඉරුට පස්ව ද දිව සිතන්නේ ඉරු සමග දිවීම ව්‍යර්ථ වන්නේය. නුනුවණින් උපදවා ගත් ජවයක් වන්නේය. මේ ජවයෙන් ප්‍රයෝජන කිම් ද? බරණැස් නුවරට ගොස්  මාගේ මිත්‍ර රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කර එමියි සිතා හිරු හා දිවන ගමන් වළකා බරණැස් නුවරට පැමිණ රජ මාලිගාවේ රජ්ජුරුවන් විසින් පණවන ලද රන් පුටුවේ වාඩි වී රජතුමා විසින් කරන සත්කාර ඉවසා පිළිසඳර කථා කොට කොයි සිට අවුදැයි විචාළ ගමනේ ඉරු සමග දිව් ගමන විස්තර කොට කීහ. ඉක්බිති රජ්ජුරුවෝ රාජ හංසයාට කියන්නේ හංස රජ්ජුරුවෙනි, ඉරු හා සමග දිවූවේ ද දක්වාලවයි කීහ. රජ්ජුරුවෙනි ඒ වේග දක්වන්නට නොපිළවන. හංස රාජය එසේ නම් ඒ හා සමාන සුළු වේගයක් දැක්වුව මැනව. යහපත මහරජ. දෘශ්‍ය මාත්‍රයක් පෙන්වමියි අක්ෂණවේදී ධනුර්දරයන් රැස් කරවා රාජ හංසයා ඒ ධනුර්දරයන්ගෙන් ඉතා සමත් සතර දෙනෙකු තෝරා ගෙන රාජංගනයේ ගල් කුළුනක් සිටුවා තමන් කර මිණි ගෙඩියක් බඳවා ගෙන ගල් කුළුන මතුයෙහි හිඳ ධනුර්දරයන් සතර දෙනාව ඒ ළඟට කැඳවා තෙපි සතර දෙන සතර දිශාවට එකවරම ඊතල සතරක් විදිනු මැනවි. මම ඒ ඊ දඬු සතර බිම වැටීමට පෙර ඇරගෙන විත් තොප සතර දෙනා පාමුල තබමි. මාගේ නියාව මිණි ගෙඩියේ නාදයෙන් දැන ගනුව. මම තොපට නොපෙනෙන්නෙමියි කියා ඔවුන් ලවා ඊ විද්දවා ඒ සැනින් එය ගෙනවුත් දී රජ්ජුරුවන් අමතා මාගේ වේගය දුටුවෙහි දැයි අසා මහරජ, මාගේ මේ වේගය උත්තමත් මධ්‍යමත් නොවේ. ඉතා ස්වල්ප වූ වේගයක. අපගේ ස්වභාව වේගය මීට වඩා සීඝ්‍ර වන්නේ ය. එවිට රජතුමා හංස රජතුමනි, තොපගේ වේගයට වඩා සීඝ්‍ර වූ තවත් වේගයක් ඇත් ද? රජතුමනි,

SANHIDA LANKA

ඒසේ ය. අපගේ අධික වේගයට වඩා සිය දහස් ගුණයකින් මේ සත්ත්වයාගේ ආයු සංස්කාරය වහා ගෙවෙන්නේය. බිඳෙන්නේ ය. විනාශයට යන්නේ නිරෝධ වශයෙන් රූප ධර්මයන්ගේ භේදය දැක්වූහ. රජතුමා මෙය අසා මරණ භය පත්ව සිහි එළවා ගත නොහී බිම වැටී උන්නා හ. මහජනයා තැති ගෙන රජ්ජුරුවන්ගේ මුහුණට පැන් ඉස සිහි එළවූහ. ඉක්බිති හංස රාජයා ඔවුන් අමතා තෙපි බය නොවව්. මරණානුස්මෘතිය වඩව්. දශකුශල කර්මයෙහි හැසිරෙව්. දානාදී පින් කරව් යැයි අවවාද කළේය. රජතුමා එබස් අසා හංස රජ්ජුරුවෙනි, ඔබ වැනි වූ නුවණැති ආචාරී කෙනෙකුගෙන් වෙන්ව විසිය නොහැක. චිත්‍රකූට පර්වතයට නොගොස් මෙහිම නවතුවයි රජ මාලිගාවේම නවත්වාගෙන හංසරාජයාගේ අවවාද අනුශාසනා පරිදි රාජ්‍ය කෙළේය. හංස රාජයා ටික දිනක් ධර්ම දේශනා කොට චිත්‍රකූට පර්වතයට ගියේ ය.

එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයේය. මළුණුවෝ මුගලන් තෙරුන් වූ අතර සැරියුත් තෙරුන් වූයේ මැදි මළනුවෝ වූහ. සෙසු හංස සමූහයා නම් දැන් බුදු පිරිසය. ජවන හංසරාජ වූයේ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# චුල්ල නාරද ජාතකය

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක්. චුල්ල කුමාරිකා පලොභයක් අරභයා මේ ජාතකය වදාළ සේක.

සැවැත් නුවර එක් ගෙදරක සොළොස් හැවිරිදි රූපත් දුවක් වූවාය. ඈ කෙතරම් රූපත් වුවද සරණයට විචාළ කෙනෙක් නැත. එබැවින් ඈමක් දමා මසකු බා ගන්නාක් මෙන් මේ රූපත් දුව කාලා භික්ෂුවක් සිවුරු හරවා ඒ කුල පුත්‍රයා නිසා ජීවත් වෙමියි ඇගේ මව කල්පනා කොට දිනක් ගෙයි කැද බත් අවුළු පත් ආදී දේ සපයා තබා දොරකඩ සිට වීථි මධ්‍යයෙහි වඩින භික්ෂූන් අතුරින් රස තෘෂ්ණාවෙන් බැඳ ඇර ගන්ට සුදුසු වූ එක් භික්ෂුවක් පරීක්ෂා කරන්නේ මහ පිරිවරින් වඩින ත්‍රිපිටකධර දූතාංගධාරී භික්ෂූන් අතර දුහුල් අඳනයක් ඇඳ මටසිළුටු සිවුරක් පොරවා ඉඳුනිල් මිණිවන් පාත්‍රයක් ගෙන ඈත මෑත බලමින් එන භික්ෂුවක් දැක මුන් වහන්සේ වසඟ කර ගත හැකියි සිතා ඉදිරියට ගොස් පාත්‍රය ගෙන කැඳවා ගෙන අවුත් වළඳවා ස්වාමීනී අද පටන් මෙහිම වැඩිය මැනවැයි ආරාධනා කළාය. භික්ෂුවද එතැන් පටන් ඒ ගෙට ගොස් කල්‍යාමෙන් බලවත් විශ්වාස භාවයට පත් විය. ඇගේ දුව වන රූපස්ථූල කුමාරිකාව ද තම ස්ත්‍රී විලාස දක්වා භික්ෂුව කාම රාගයෙහි අල්වා ගත්තාය. ඇගේ ශරීරය මහත බැවින් ස්ථූල නම යෙදුනා නොව රාගයෙන් ස්ථූල බැවින් ඒ නම ව්‍යවහාර විය. ඒ තරුණ භික්ෂුවද කෙළෙස් වසඟව මම වනාහි දැන් බුද්ධ ශාසනයෙහි පිහිටක් ලබන්නට අසමර්ථයෙමියි සිතා විහාරයට ගොස් පා සිවුරු පාවා දී අසවල් තැනට වස්ත්‍රය එවයි කියා විහාරයට ගොස් පා සිවුරු ගත මැනවැයි සිවුරු හරිමි කැමැත්තෙමියි ආචාරී උපාධ්‍යයන් වහන්සේට කීයේය. උන් වහන්සේ ඒ භික්ෂුව කැඳවා ගෙන බුදුන් සමීපයට ගොස් එපවත් දැන්වූ සේක. සර්වඥයන් වහන්සේ මහණ මේ ශාසනයෙහි ඇළුම් නැති කවරවුවෝ  කවුරුදැයි විචාර ස්ථූල කුමාරිකාව විසිනැයි කී කල්හි පෙරත් ඈ වනයෙහි විසූ තොපගේ බ්‍රහ්ම චර්යාවට අන්තරා කොට මහත් වූ අනර්ථ කරවූය. නැවත නැවතත් තොප ඈ නිසා ශාසනයෙහි කළකිරී සිවුරු හරනා කැමැත්තෙහි දැයි වදාරා ඉකුත් වත වදාළ සේක.

යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රාජ්‍යය කරන කල්හි කසී රට මහත් සම්පත් ඇති එක් බමුණෙක් තම බිරිඳ මළ පසු එකම පුතණුවන් කැඳවා ගෙන හිමාල වනයට ගොස් පැවදිව විසූහ. එකල සොරු ගම් පැහැර කොල්ල කා මිනිසුන් අල්ලා ගෙන බඩු මිටි උන් ලවාම ඔසවා ගෙන තමාට උවමනා තැනට අරගෙන යති. දිනක් එසේ අල්ලා ගෙන යන එක් රූපත් කුමාරිකාවක් සිතන්නී මේ සොරු අප අල්වා ගෙන මෙහෙවර ගනිති. එක් උපායකින් මුන් පලා යා යුතු යයි සිතා ස්වාමීනී ශරීර කෘත්‍ය කරනු සඳහා මදක් ඉඩ දුනමැනවැයි කියා සොරුන් වංචා කොට උන් කෙරෙන් පලා ගොස් තැන තැන ඇවිදින්නී ඉහත කී අසපුව දැක එහි පැමිණ පිය තවුසා පලා පලයට ගිය කළ තාපස කුමාරයන් කාමක්‍රීඩාවෙන් පොළඹවා ශීල භේද කොට තම වසඟයට ගෙන තොප මෙහි විසීමෙන් කුමන පලයෙක් ද ගමට ගොස් පස්කම් සැප විඳිමින් සැපසේ ඉඳිමු යැයි කීවාය. කුමාරයා එබස් අසා යහපත පියා ආ කළ අවසර ගෙන දෙදෙනාම යම්හයි කීය. ඈ එබස් අසා මේ ළාබාල කුමාරයා කිසිවක් නොදනී. පිය තවුසා ආ කළ මා තලා පෙලා එළවා දමතියි සිතා කුමාරයාණෙනි මම කලින් ගොස් මඟ සිටිමි. තොප පසුව එවයි මඟ සලකුණු කියා ගියාය. කුමාරයෝ ඈ ගිය පසු වත් පිළිවෙත් නොකොට ඉස වසා පොරවා ගෙන ඈ ගැන සිතමින් මුසපත්ව හොත්හ. පිය තවුසා අසපුවට එන්නේ ඇගේ පියවර සටහන් දැක මාගේ පුත්‍රයාගේ සිල් බිඳීමට ආ ස්ත්‍රියකැයි සිතා අසපුවට වැද පුතා අමතා පුත්‍රය වෙනදා මෙන් පැන් දර සකස් නොකොට පහන් නොදල්වා කුමක් නිසා වැදහොත් දැයි විචාල ගමනේ පියාණෙනි වනයෙහි වසන්නට නොකැමැත්තෙමි ජනපදයට යාමට අදහස හෙයින් ඊට සුදුසු අවවාදයක් දුන මැනවැයි වැද සිට ඉල්ලූහ. පුත්‍රය දේශ චාරිත්‍රය කියමියි.

1. විෂ අනුභව නොකරව.
2. ප්‍රපාත ගම් වෛර දුර කරව.
3. මඩෙහි නොගිලෙව.
4. සර්පයන් දුරු කරවයි කීහ.

අර්ථ නොවැටහුණ කුමාරයා පියාණෙනි ඒ කරුණු සතර මට නොවැටහෙයි. එය විසඳා වදාළ මැනවැයි කීය.

SANHIDA LANKA

1. පුත මේ ලෝකයෙහි පුස්පාසවාදී මත්වන දෑ සුරා යයි කියති. ඒ සිත්කළු සුවඳැති මධුර වූ රස ඇති එබඳු සුරා උතුමෝ බ්‍රහ්මචර්යාවට විෂයෙකැයි කියති.
2. පුත මේ ලෝකයේ ස්ත්‍රීහු නම් පස්කම් සැපතෙහි ඇළුන වුන් වැන්න. ගසින් වැටුණ පුළුන් සුළඟින් ගසා ගෙන යන්නා සේ තරුණ සිත පැහැර ගෙන යන්නාහ. නාරද නම් තපස්විනයි බ්‍රහ්මචර්යාවට ස්ත්‍රීහු නම් ප්‍රපාතයක් සමාන යයි කියන ලදහ.
3. පුත ලාභ-පූජා, ප්‍රසංසා-සත්කාර යනාදිය ඇත්නම් මේ බ්‍රහ්මචර්යාවට මඩෙකැයි කියන ලදහ.

4. පුත මේ පොළෝ තලයෙහි මහත් යසපිරිවර සහ තේජස ඇතිව රජ දරුවෝ වෙසෙති. එබඳු ආශ්චර්යයෙන් හා අධිපතිභාවයෙන් යුත් රජ දරුවන් සමීපයේ රාජ කුළුපගව නොවසව. බ්‍රහ්මචර්යාව කරන්නාවුන්ට ඒ රජ දරුවෝ නම් සර්පයන් හා සමානය.

පුත ආහාර කැමතිව බත් අනුභව කරන වේලෙහි ගෙයකට එළඹියොත් ඒ ගෙයි හොඳ නරක දැන එබඳු ගෙයින් අනුභව කටයුතුය. එහිදීද පමණ දැන බත් පැන් ගත යුතුය. එසේම අන්‍ය ස්ත්‍රී රූපයෙහි සිත් නොඇලිය යුත්තේ යැයි මෙසේ පුත්‍රයාට අවවාද කළේය.

පුත්‍රයා පියාගේ බසට කන් දී පියාණෙනි මට ජනපදයෙන් කම්නැත. මෙහිම ඉඳිමියි එහි සිට සමාපත්ති උපදවා ඉන් මිය ගොස් බඹලොව උපන්හ.

එසමයෙහි කුමාරිකාව නම් දැන් මේ ස්ථුල කුමාරිකාවය. තාපස කුමාරයෝ නම් උකටලී මහණය. පිය තාපසයෝ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# දූත ජාතකය

ධර්ම රාජයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි තමන්ගේ ප්‍රඥාව අරභයා මේ ජාතකය වදාළ සේක.
දිනක් දම්සභා මණ්ඩපයෙහි බුද්ධ ප්‍රඥාවෙහි මහිමතාවය ගැන භික්ෂූන් අතර කථාවක් උපන් කල්හි එහි වැඩි බුදුරජාණන් වහන්සේ මහණෙනි ප්‍රඥාවෙන් උතුම් වූයේ දැන් මතු නොවේ. පෙරත් එසේම වූයේ වේදැයි ඉකුත් වත වදාළ සේක.
යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍යය කරන කල්හි එනුවර රන් හිඟ විය. එකල කසීරට එක් බමුණු මානවකයෙක් තක්සලා නුවරට ගොස් ශිල්ප නිමවා ආචාරීන් වහන්සේට ගුරු පූජාවට වස්තු ගෙනමියි කියා නික්ම ගොස් තැන තැන ඇවිද මැණික් සතරක් ලැබ එන්නේ අතරමඟ ගඟකින් එතෙර වනු සඳහා ඔරුවක නැංගාහ. ගඟ මැද දී ඔරුව පෙරළී ඒ මැණික් දියෙහි වැටී ගියේය. බමුණු මානවකයා සිතන්නේ ජනපදයෙහි මැණික් දුර්ලභ වන්නේය. නැවත ආචාරීන්ට ගුරු පූජා සෙවීම දුෂ්කර වන්නේය. මේ ගංගා තීරයෙහි උපවාස කොට උපායකින් රජ්ජුරුවන්ගෙන් වස්තුව ලබා ගෙන ගොස් ගුරු පූජා කරමියි අධිෂ්ඨාන කොට උතුරු සළුව බිම හෙලා ඒ මත්තේ හොත්තේය. මේ මනවකයාය දුටු අසල්වාසීහු මෙහි පැමිණ එසේ වැතිර සිටීමට හේතුව විමසූහ. ඒ කිසිවක් කතා නොකළේය. මෙසේ අවට ජනපද වාසීහු ප්‍රභූහුද ඇමතිවරු ද පැමිණිය මුත් පෙර මෙන්ම නිශ්ශබ්ද විය. මේ බව ඇමතිවරුන් අතින් දැනගත් රජතුමා බියපත්ව වහාම ඔහු ළඟට පැමිණ බමුණාණෙනි කුමක්හෙයින් නිරාහාරව උනුදැයි විචාළහ. එවිට බමුණු මානවකයා රජතුමනි ඉඳින් ඔබට දුකක් උපන්නේ වී නම් ඒ දුකින් මුදවා ගැනීමට නොහැක්කෙකු හට එය නොකිය යුත්තේය. එයට දැහැමින් පිහිට වන සත්ත්වයාටම ඒ දුක කිය යුත්තේය. තවද රජතුමනි කැනහිලන් පක්ෂීන් ආදීහු තිරිසනුන්ගේ බස් සැබවයි අදහාගත නොහැක්කේය. මේ ලෝකයේ ටික කලක් මිතුරු වාසය කළා වූ සත්ත්වයෝ පසුව සතුරු වෙති. සතුරෝ මිතුරු වෙති. මේ ආදී වචනයෙන් ධර්ම දේශනා කොට ගුරු පූජාවට වස්තු ලබා ගත් ක්‍රමයක් එය  ගඟේ ගිලුණු බවක් දන්වා රජතුමනි මා සමීපයට මෙතෙක් ආ පුරුෂයෝ මේ දුකින් මුදාලන්නට අසමර්ථයෝ යයි දැන උන්ට මෙපවත් නොකීමි. ඔබ වහන්සේ වූකලී මට පිහිට වීමට සමත් බව දන්වා හෙයින් කීමියි දැන්වීය. රජතුමා ඒ බ්‍රාහ්මණ මානවකයන්ගේ ධර්ම කථාවෙන් ප්‍රමුදිත වූයේ ඔහු සනසා බොහෝ වටිනා මැණික් තුදුසක් දුන්හ. බ්‍රාහ්මණ මානවකයා ඒවා ගෙන ගොස් ආචාරීන්ට පුදා බොහෝ පින්කම් කළහ.
එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. ආචාරීන් නම් සැරියුත් තෙරුන්ය. බ්‍රාහ්මණ මානවකව උපන්නේ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# කාලිංගබෝධි ජාතකය

සුගතයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන සේක්. අනද තෙරුන් විසින් කරන ලද මහත් වූ බෝධි පූජාවක් අරභයා මේ ජාතකය වදාළ සේක

භාග්‍යවතුන් වහන්සේ සැවැතින් නික්ම ජනපද චාරිකාවෙහි යෙදුන දිනක බොහෝ උපාසක උපාසිකාවෝ පුද පූජා ගෙන බුද්ධ වන්දනාව සඳහා දෙව්රමට ආවාහු. බුදුන් නොදැක ශෝකීව ඒ පුද පූජා පිදිය යුතු අන් තැනක් නැත්තෙන් විහාරය සමීපයෙහි රැස් කොට තබා ගියහ. අනේපිඬු සිටු ආදීහු ඒ දුටුවෝ බුදුන් වහන්සේ පිටත වැඩි විට උන් වහන්සේ සිහිකොට පුදනු සඳහා පූජා වස්තුවක් ඉල්ලා ගන්ට සිතුහ. නැවත භාග්‍යවතුන් වහන්සේ පෙරලා ජේතවනයට වැඩි විට ඔවුහු රැස්ව පූජා වස්තුවක් ඉල්ලීමෙහි ආනන්ද තෙරුන් මෙහෙයූහ. ඒ තෙරණුවෝ ගොස් පූජා වස්තු කවරේදැයි විචාර බුදුන් වෙනුවට පූජ්‍ය දැයක් ඉල්ලූහ. ආනන්ද ශාරීරික උද්දේසික පාරිභෝගික යයි පූජ්‍ය වස්තු තිදෙනෙකි. ඉන් ශාරීරික ධාතු පූජාව බුද්ධ පරිනිර්වාණයෙන් පසු වන්නේය. උද්දේසික පූජාව නම් ධර්මයට බුද්ධ ප්‍රතිමාදියට වෙයි. පාරිභෝගික ධාතු පූජා නම් පරිභෝග කළ පාත්‍ර චීවරාදියට ද බුද්ධත්වයේ පිටදුන් බෝධි වෘක්ෂයට ද කරන සත්කාරයයි. එබැවින් ජය ශ්‍රී මහා බෝධියෙන් ඵලයක් ගෙන්වා මේ ජේතවනාරාමයෙහි රෝපිත කරවා ඊට සත්කාර කරතොත් ඒ මට කළ සත්කාර හා සමයයි වදාළ සේක. කොසොල් රජ ආදී හට අනද තෙරණුවෝ මෙපවත් දන්වා ජේතවන දොරටුව සමීපයෙහි වළක් කණවා ජයසිරි මහා බෝ රුකින් ඵලයක් ගෙනවුත් දෙන්ට මුගලන් තෙරුන් අයදූහ. මුගලන් තෙරණුවෝ තමන් එය බෝ රුකින් ගෙනෙන සැටි සියල්ලට පෙනෙන සේ ඉටා එකෙනෙහි සෘධියෙන් ගොස් උරුවේලායෙහි ජයශ්‍රී මහා බෝ සමීපයට වැද එහි නටුයෙන් ගැලවී එන ඵලයක් බිම වැටිය නොදී සිවුරු පටින් පිළිගෙන එකෙනෙහිම අවුත් ඒ අනද තෙරුන්ට දුන්හ. කොසොල් රජතුමා එය රන් කරඬුවකින් ගෙන වළ තෙවරක් පැද කුණු කොට අනේපිඬු සිටු අතට දුන්නේය. සිටුහු සන රන් තලියක සුවඳ කළල් පුරවා තලිය පතුල සිදුරු කොට වළ මැද තබා එහි බෝ පැළය සිටුවූහ. මෙය අනඳ තෙරුන්ගේ නියෝගයෙන් සිටුවන ලද බැවින්ද මහජනයාගේ සිත ආනන්දය ඇති කරමින් වැඩුන හෙයින්ද ආනන්ද බෝධි නම්වී. දිනක් අනද තෙරුන්ගේ අයදනින් භාග්‍යවතුන් වහන්සේ ඒ බෝ රුක මුල රෑ තුන් යම්හි සමාපත්ති සුඛයෙන් වැඩහුන් සේක. මෙසේ ආනන්ද බෝධිය පාරිභෝගික චෛත්‍යයෙක් විය.

දම්සභා මණ්ඩපයෙහි රැස්වූ භික්ෂූන් අතර ආනන්ද ස්ථවිරයෝ සර්වඥයන් වහන්සේ ජීවත්ව සිටියදීම බෝධි පූජාවක් කළේ යැයි කතාවක් උපන් කල්හි එහි වැඩි බුදු රජාණන් වහන්සේ මහණෙනි පෙරත් ආනන්ද ස්ථවිරයෝ පිරිවර සහිතව සතර මහාද්වීපයෙහි මනුෂ්‍යයන් ගෙන්වා ගද දුන් මල් පහන් ගෙන බෝ මැඩ බෝධි පූජාවක් කරවූවෝ වේදැයි ඉකුත් වත වදාළ සේක.

යටගිය දවස කලිඟු රට දන්ත නුවර රාජ්‍ය කළ කලිඟු රජ්ජුරුවන්ට මහා කාලිංඝ, චුල්ල කාලිංඝ නමින් පුත්‍රයෝ දෙදෙනෙක් වූහ. පියාගේ ඇවෑමෙන් මහා කාලිංඝ කුමාරයා රාජ්‍ය කරන බවත් චුල්ල කාලිංඝ කුමාරයා සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව භික්ෂාටනයෙන් කල් යවන අතර ඔහුට දාව උපදින පුතණුවෝ අනාගතයේ දී කාලිංග චක්‍රවර්තීව රාජ්‍ය කෙරෙතියි නිමිති පාඨකයෝ කීහ. මෑත භාගයෙහි පියාගේ ඇවෑමෙන් මහා කාලිංඝ කුමාරයෝ රාජ්‍යයට ද මළනුවෝ යුව රජ තනතුරටද පැමිණියාහ. යුව රජ්ජුරුවෝ තමාගේ පුත්‍රයා චක්‍රවර්තී රාජ්‍යයට පැමිණියේ යැයි ඉතා ප්‍රීතියෙන් පුත්‍රයා නිසා ආඩම්බරව පසුවන දුටු රජතුමා එය ඉවසා ගත නොහී යුව රජ්ජුරුවන්ව අල්ලා ගෙන එවයි වැඩෙහි හැසිරෙන එක් ඇමතියෙකුට නියෝග කළහ. ඒ ඇමති ගොස් යුව රජ්ජුරුවන්ට මේ බව දන්වා ඔබතුමා මේ නුවරින් නික්ම ගොස් ජීවිතය රැකගත මැනැවැයි කීය. යුව රජ්ජුරුවෝ පේරැස් මුද්දත් සියුම් වූ පලසත් මඟුල් කඩුවත් තුනම ඒ ඇමති හට පෙන්වා මේ සංඥාවෙන් මාගේ පුතණුවන්ට රාජ්‍යය පාවා දෙවයි කියා වලට වැද ගංතෙරක පන්සලක් කොට ගෙන පැවිදිව වාසය කළහ. එකල මධු රට සාගල නුවර මධුරජ්ජුරුවන්ගේ දියණියගේ ලක්ෂණ බැල නිමිති පාඨකයෝ මේ කුමාරිකාව පැවිදිව සිඟා ජීවත් වන්නීය. මුන්ගේ බඩ උපන් කුමාරයෝ චක්‍රවර්තී රාජ්‍යයට පැමිණෙන්නේය කීහ. ඒ සියළු දඹදිව රජ දරුවෝ එපවත් අසා ඈ ලබා ගැනීමේ අදහසින් එකවිට අවුත් නුවර වටලා ගත්හ. මධුරජ්ජුරුවෝ සිතන්නේ ඉදින් මම දියණිය එක කුමාරයෙකුට පාවා දුනහොත් සෙසු අය කිපෙන්නාහ. එබැවින් ඈ රකිම්යි සිතා දියණිය සහ බිසව අප්‍රසිද්ධ වේසයකින් නුවරින් ගෙන ගොස් වලට වැද කාලිංග කුමාරයන්ගේ අසපුවට නුදුරින් උඩුගඟ පන්සලක් කොට ගෙන පැවිදිව තිදෙනම එහි කල් යැවූහ. දෙමව්පියෝ දියණිය පන්සලෙහි රඳවා පලාඵල පිණිස යන්නාහ. ඈ දෙමව්පියන් ගිය කල නොයෙක් මල් ගෙන මාලා ගොතා ගං තෙරවූ අඹ රුකට නැඟී දියට දමන්නාහ. දවසක් මල් මාලයක් පාවී ගොස් ගඟට බැස නාන්නා වූ කලිඟු කුමාරයන්ගේ හිසෙහි දැවටින. කුමාරයෝ මල් පට බලා මෙය තරුණ ස්ත්‍රියකගේ කර්මාන්තයෙකැයි නිශ්චය කොට පරීක්ෂා කෙරෙම්යි සිතා ක්ලේශ වසඟයෙන් උඩු ගඟට ගොස් ඈ දැක සොඳුර තෙපි කවුරුදැයි විචාළහ. ස්වාමීනී මම මිනිස් ලියක්මියි ඈ කීවාය. මෙසේ ඔවු

SANHIDA LANKA

නොවුන්ගේ සියළු තොරතුරු අසා දැන දෙදෙනාම ක්‍ෂසත්‍රීය වංශයට අයත් බැව් දැන ගසින් බැස එකතු වී දෙමව්පියන් ආකළ සියළු විස්තර කීය. ඔවුන්ද ඉතා සතුටුව කුමාරිකාව රාජ කුමාරයන්ට පාවා දුන්හ. ඈ ටික කලකින් මහ පින් ඇති පුත් රුවණක් වැදුවාය. ඒ කුමාරයා වැඩිවිය පැමිණ පියාගෙන් සහ මුත්තණුවන් සමීපයෙහි සියළු ශිල්ප ඉගෙන නිම විය. පියා දිනක් ඔහු අමතා තම පේරුස් මුද්ද පළස හා මඟුල් කඩුව අතට දී පුත දන්තපුර නුවර අසවල් වීදියේ අපට හිතවත් එක් ඇමතියෙක් ඇත. ඔහු ලඟට ගොස් මේ ලකුණු පෙන්වා මාගේ පුත්‍ර නියාව කියව. ඔහු තොපව රාජ්‍යයෙහි පිහිට වන්නේය. කුමාරයෝ වැඩිහිටියන් වැද අවසර ගෙන කුසලමය වූ ඍඬියෙන් ගොස් අමාත්‍යාගේ සමීපයට පැමිණ සියළු පුවත් දන්වා ලකුණු දැක්වූහ. ඇමති තෙමේ එපවත් රජ පිරිසට දන්වා ඔහු රාජ්‍යයට පත් කළහ. කාලිංග භාරඬාජ නම් වූ පුරෝහිත බ්‍රාහ්මණයාගෙන් පිළිපැදිය යුතු දසවිධ චක්‍රවර්තිවත් දැන ඒ පිරුහ. ඊට අනතුරුව පැමිණ පසළොස්වක් පොහෝ දිනයෙහි චක්‍රවර්ති රජ කෙනෙකුට නියමිත සප්තවිධ රත්න පහළ විය. ඒ රජජුරුවේ සියළු සක්වළ ගැබ රාජ්‍යය ගෙන මහ පිරිස පිරිවරන ලදුව අති ධවල වූ හස්ති රත්නය පිටින් දෙමව්පියන් සමීපයට ගියාහ. එම හස්ති රාජයා සියළු බුදුවරුන්ට ජය භූමිය වූ බෝ මැඩට මතු භාගයෙන් යන්ට අසමත් විය. රජතුමා කොතෙක් උත්සාහ කළත් ඇත් රජ යන්ට මැළිවිය. එවිට පුරෝහිත බ්‍රාහ්මණයාගෙන් ඊට හේතුව විචාළේය. අහසින් බැස පරීක්‍ෂා කරන්නේ එහි එක පැලෑටියක් වත් නොමැති ධවල වූ රිදී පටක් බඳු වැල්ලෙන් ශෝභාමත් වූ විටින් එදෙසට නැමුන. තෘණතලාදියෙන් හෙම් බෝමැඩ දැක පුරෝහිත බ්‍රහ්මණයා රජ්ජුරුවන් අමතා මහ රජතුමනි සියළු බුදුවරු සකල කෙලශයන් නසන්නා වූ ස්ථානය මෙය වන්නේය. මෙහි මතු පිටින් ශක්‍රයකුට පවා යා නොහැක. දස ලක්‍ෂ සතලිස් දහසක් යොදුන් ඝනකඩ බොල් මහ පොළවට නාභියක් හා සමාන වූ අචල ස්ථානයක් වූ මෙය කප මුලහටගත්තේය. නස්නා කල්හි පසුව නැසෙන්නේය. මේ ස්ථානයට නමස්කාර කට යුත්තේ ය. මේ උතුම් හස්ති රාජයා වජ්‍රාකුසයෙන් කොටා මෙහෙයතත් මේ බෝධි මංඩලය මත්තෙන් නොයන්නේය. මාගේ කීම සැබෑදැයි බලනු සඳහා මේ උතුම් හස්ති රාජයා විදුරු එබූ අකුස්සෙන් කොටා මෙහෙයා බලනු මැනවයි කීයේය. චක්‍රවර්තී රජ්ජුරුවෝ එබස් අසා පරීක්‍ෂා කර බලනු සඳහා ඇතු මෙහෙයාලූහ. එවිට ඇත් රජ කුඤ්චනාද කොට පසු බැස අහසෙහිම උක්කුටකයෙන් උන්නේය. චක්‍රවර්තී රජ්ජුරුවෝ වීදුරු එබූ අකුස්සෙන් නැවත නැවතත් අනින්ට වන් කල්හි වේදනාව ඉවසා ගත නොහී ඇතු අහසෙහි කළුරිය කෙළේය. රජතුමා ඇතු මළ නියාව නොදැන ඔහු පිටම උන්නේ පුරෝහිත බ්‍රාහ්මණයා රජතුමනි ඔබේ ඇත්රජ නිරුඬව ගියේය. ඔබ කෙතෙක් උත්සාහ කළත් මේ බෝ මැඩ මතුයෙන් යාමට නොහැක. වෙන ඇතෙකු එනසේ සිතුව මැනවයි කීහ. රජ්ජුරුවන්ගේ ආනුභාවයෙන් අනිත් ඇත් රජෙක් අවුත් පිට පෑයේ රජතුමා ඒ ඇතු පිට නැංගේය. එකෙනෙහි මළ ඇත් රජ බිම පතිත විය. ඊට පසු රජතුමා වහා බිමට බැස බෝධි මණ්ඩලයේ වූ ප්‍රාතිහාර්යය දැක බ්‍රාහ්මණයාට බොහෝ ප්‍රශංසා කොට බමුණානෙනි තෙපි නම් සියල්ල දත්තා වූ සම්‍යක් සම්බුදු වරයෙක්මයයි ස්තුති කළාහ. බ්‍රාහ්මණයා රජතුමනි අපි ශාස්ත්‍රයෙන් දැන කියන හෙයින් ශ්‍රැත බුද්ධ නම් වම්හ. බුදුවරු තුන් කල්හි වූ සියළු පදර්ථයන් දක්නාහු වෙති. සර්වඥ ඥාණයෙන් සියල්ල දන්න හු වෙති. පඤ්චවිධඥෙය්‍ය මණ්ඩලය කරතලා මලක ආකාරයෙන් දනිතියි බුදුගුණ වර්ණනා කළහ. චක්‍රවර්තී රජතුමා බුදු ගුණයෙහි පැහැද සොම්නස් වී සියලු සක්වල වාසීන් ලවා ගඳ දුම් මල් පහන් ගෙන්වා ගෙන මහ බෝමැඩ සතියක් මුළුල්ලෙහි බෝධිපූජා කරවූහ. සත්රුවන්මය වූ පහන් කනු ප්‍රාකාර කරවූහ. මෙසේ පූජා පවත්වා ගොස් දෙමාපියන් කැඳවා ගෙන තම රාජ්‍යයට ගොස් දානාදී පින්කම් කොට ආයු කෙළවර තව්තිසා දෙව්ලොව උපන්හ.

එසමයෙහි කලිඟු රජ්ජුරුවෝ නම් දැන් මේ ආනන්ද ස්ථවිරයෝය. කාලිංග භාරඬාජ පුරෝහිත බ්‍රාහ්මණයා නම් තිලෝගුරු බුදුරජාණනන් වහන්සේය.

SANHIDA LANKA

# අකීර්ති ජාතකය

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් සැවැත් නුවර වැසි සිවුදානපති පුරුෂයෙක් අරභයා මේ ජාතකය වදාළ සේක.

ඒ උපාසක තෙමේ බුදු පාමොක් මහ සඟනට සතියක් දන් පිරිනමා කෙළවර පිරිකර දන් දුන්නේය. බුදුරජාණන් වහන්සේ ඔහුට සිව් පිරිස මැද දී අනුවෙනි ධර්ම දේශනා කරන සේක් උපාසකය තොපගේ පරිත්‍යාගය ඉතා උසස් වන්නේ ය. දානය ගිහිපැවිදි කා විසිනුත් කටයුත්තේ ය. පෙර නුවණැත්තෝ තවුස්ව වනයට ආ යාචකයන්ට තමන් සතු ලුණු නැතිව තැම්බූ කරකොළ පවා ඉතා ප්‍රීතියෙන් දන් දී සැපසේ දවස් යැව්වෝ වේ දැයි දක්වා ඉකුත් වත වදාළ සේක.

ඉහත බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හි අසූකෙළක් මහා සම්පත් ඇති බමුණු මහා සාරකුලයක උපන් අකීර්ති නම් බ්‍රාහ්මණ මානවකයෙක් තම දෙමව්පියන්ගේ ඇවෑමෙන් සියලු වස්තුව දානමුඛයෙහි පරිත්‍යාග කොට තම බන්ධු වර්ගයා අඬ අඬා සිටිය දී යසවතී නම් වූ තම එක ම නැගෙණිය ද කැඳවාගෙන බරණැස් නුවර වාසල් දොරින් නික්ම තුන් යොදුනක් පමණක් ගොස් පන්සලක් කොට ගෙන නැගෙණියත් සමග පැවිදි ව කල් යැවූ හ. ඔවුන් එනුවරින් පිට වී ගිය දොර අකීර්තිචාර නමින් ද ගඟට බැස එතෙර වූ තොට අකීර්ති තීර්ත යන නමින් ද ප්‍රසිද්ධ විය. ඔහු මහණ වූ තැන් පටන් බොහෝ ගම් නියම් ගම් රාජධානි වල මනුෂ්‍යයෝ එහි පැවදි වූහ. මහ පිරිවර හා ලාභ සත්කාර උපන. බුද්ධෝත්පාද කාලයක මෙන් පැවැත්තේ ය. අකීර්ති මහා තාපසයන් වහන්සේ මෙහි ලාභ සත්කාර ඉතා මහති. පිරිසත් අධික ය. හුදකලාව ම විසිය යුතුයැයි සිතා තම නැගෙණියටවත් නො දන්වා රාත්‍රී කාලයේ පිටත්ව ගොස් ක්‍රමයෙන් සොළී රට කාවීර නම් පටුන් ගම සමීපයෙහි උයනක වැස පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති උපදවා ගත් හ. එහි ද මහත් ලාභ සත්කාර හට ගත්තේ එය ද පිළිකුල් කරමින් අහස් නැගී නාගදීපය සමීපයේ කාර දිවයිනට බටහ. එකල කාර දිවයින අහිදීප නම් විය. තාපසයන් වහන්සේ එහි වූ මහා කර ගසක් යට පන්සලක් කොට ගෙන වාසය කළා හ. ඒ බැව් කිසි කෙනෙකුන් නො දන්නා හ. නැගෙණියෝ තම සහෝදරයන් වහන්සේ සොයමින් ක්‍රමයෙන් සොළී රටට ගොස් එහි නොදැක උන්වහන්සේ කලින් විසූ තැන ම විසූ හ. ධ්‍යානයක් ලබා ගත නොහැකි විය. තාපසයන් වහන්සේ අල්පේච්ඡ බැවින් අන් තැනකට නොගොස් කර ගස මුල ම එහි එල හට ගත් කල්හි එල අනුභව කරමින් ද කොළ හට ගත් කල්හි දියවත් කොට තම්බා ඒවා ද අනුභව කරමින් කල් යවන්නේ ඔහුගේ සීල තේජසින් ඒ දුටු සක්‍රයා අකීර්ති තාපසයෝ කුමක් පතා උග්‍ර තපස් රකී ද සක්‍ර සම්පත්තිය උදුරාගනු සඳහා ද නොදනිමි පරීක්ෂා කළ යුතුය. ඔහු දුක සේ ජීවත් වෙති. ඉදින් සක්‍ර සම්පත් පතා නම් තමාට තැම්බූ කරකොළ මට දෙති නැත්නම් නොදෙතියි සිතා බමුණු වෙසකින් තාපසයන්ගේ ඉදිරියට ගියහ. තාපසයන් වහන්සේ කරකොල තම්බා නිවුණු පසු අනුභව කරමියි සිතා පන්සල් දොරකොඩ උන්නේ එහි ළඟා වූ සක්‍රයා දැක සතුටුව මට වූයේ මහත් ලාභයෙක. අද දනක් දෙමියි කරකොළ තැම්බූ භාජනය ගෙනවුත් මේ දන් දීම බුදුබව ලැබීම පිණිස ම හේතු වේවයි තමන්ට තබා නොගෙන ම සක්‍ර බමුණාගේ පාත්‍රයෙහි ලූහ. බමුණා දන් ගෙන මඳ දුරක් ගොස් අතුරුදහන් විය. තාපසයන් වහන්සේ දන් දී නැවත කරකොළ නොතම්බා ප්‍රීතියෙන්ම කල් යැවූ හ. මෙසේ දෙවන තෙවන දවස් හි ද පැමිණි සක්‍ර බමුණා ට කරකොළ දන් දී තෙදිනම නිරාහාරව දුර්වල ව ගියේ පන්සලින් නික්ම තමන් දුන් දන් ගැන සලකමින් පන්සල් දොරකොඩ උන්නේ සක්‍රයා ඔහු දැක මුන් තෙදිනක් ම දන් දී නිරාහාරව සිටියදීත් ප්‍රීතියෙන් ම කල් යවයි. කුමක් පතා දන්නේ දැයි විමසා දැන ගතිමියි සිතා සක්‍ර වෙසින් අවුත් තාපසයෙනි, මෙවැනි දුෂ්කර ස්ථානයක කුමක් පතා තපස් කරවුදැයි විචාළ හ. තාපසයන් වහන්සේ උන් සක්‍ර නියාව දැන මම සක්‍ර වේශය පතන්නෙක් නොවෙමි. බුදු බව පතා තපස් කෙරෙමි. සක්‍රය ඉපදීම, ජරාව, මරණය නැත්තා වූ නිවන පතා මේ වනෙහි තපස්කෙරෙමි. සක්‍රයා සතුටට පත් ව පණ්ඩිතයෙනි, මේ යහපත් වචනය හේතුකොට ගෙන තොපට වර දෙමි. කැමති වරයක් ගනුවයි කීහ. එබසට තාපසයන් වහන්සේ සක්‍රයෙනි, මාසිත කිසි දිනෙක ලෝභයෙක් නූපදීවයි කෝපයෙන් නූපදීවයි ආදී වශයෙන් වර ලබා ගෙන සක්‍රයාට ධර්ම දේශනා කළහ. සක්‍රයා ඉතා සතුටුව දෙව් ලොවට ගිය හ. තාපසයන් වහන්සේ භාවනා කොට මියගෝ බඹ ලොව උපන්නා හ.

SANHIDA LANKA

එසමයෙහි සක්‍රයෝ නම් දැන් අනුරුද්ධ තෙරුන් ය. අකීර්ති පණ්ඩිතයෝ නම් බුදුරජාණන් වහන්සේය.

# තක්කාරි ජාතකය

ශාන්ති නායකයන් වහන්සේ දෙව්රම්හි දී කෝකාලික තෙරුන් අරභයා මේ ජාතකය වදාළ සේක.

එක් වස් සමයක අගසව් දෙදෙනා වහන්සේ විවේක ව වසනු කැමතිව කෝකාලික තෙරුන් වසන තැනට ගොස් ඔහු අමතා ස්ථවිරයිනි, තොප නිසා අපටත් අප නිසා තොපටත් යම් සේ සැප වූ විහරණයක් වේ නම් එපරිද්දෙන් මෙතුන් මස මෙතැන් හි වසනු කැමැත්තෙමුයි වදාළ සේක. කෝකාලික තෙරුන් එබස් අසා ඇවැත්නි, මානිසා තොපට වන සැප විහරණ කවරේද, දෑගසව්වන් වහන්සේ, කොකාලික ස්ථවිරයෙනි, තොපි අගසව්වන් දෙනොවහන්සේ මෙතැන් හි වසන බව කිසිවෙකුට නොකියතොත් අප සැපසේ වසම් හ. තොපගෙන් අපට ලැබෙන පහසුව එයම වේ. අප තොපට මේ වස් තුන්මස මුළුල්ලෙහි සූත්‍ර අභිධර්ම දෙකින් බණ කියම්හ. ඒ අපෙන් ඔබට ලැබෙන උපකාරය වේ යයි වදාළසේක. එසඳ කෝකාලික තෙරුන් වහන්සේ අගසව් දෙනමට උතුම් වූ සෙනසුන් එලවීය. ඒ දෙනම විහාරයෙහි වසන නියාව කිසිවෙක් නොදනිති. වස් කෙළවර බුදුන් වඳින්ට යම්හයි කෝකාලික තෙරුන්ට කීබස් පිළිගෙන දෙනම කැඳවාගෙන සමීප ගමකට සිඟා වැඩි සේක. අගසව් දෙනම වළඳා පිටත නික්මුණු විට කෝකාලික තෙරුනු නැවත ගමට පැමිණ උපාසකවරුනි, තොප තිරිසනුන් හා සරිවේද අගසව් දෙනම තුන් මසක් තුළ මේ සමීපයෙහි වසන නියාව නොදනු ද? දැන් ඒ දෙදෙනා වහන්සේ පෙරළා වැඩිසේකැයි කීහ. එසේ ඇසූ මනුෂ්‍යයෝ බොහෝ කණගාටුවට පත්ව පිරිකර ගිතෙල් ආදී දේ ගෙන අගසව්වන් කරා ගොස් වැඳ නමස්කාර කොට ඔබ දෙනම අගසව් දෙනම බැව් දැනගත නොහැකි විය. අපට අනුකම්පාවෙන් මෙය පිළිගත මැනවයි ඒ පිළිගැන්වූහ. අගසව් දෙනම ඒ පිරිකර ප්‍රතික්ෂේප කළ සේක. කෝකාලික තෙරුන්ට ද එය නොදෙවාපු සේක. උපාසක වරු, එසේනම් නැවත වරක් එගමග මඩිනා සේ ආරාධනා කොට ගියහ. කේකාලික තෙරුන් වහන්සේ, අගසව් දෙනම තමන් ද පිරිකර නොගත්තාහ මටත් නුදුන්නේ යයි, අගසව් දෙනම කෙරෙහි අඝාත බැඳි සේක. අගසව්වන් වහන්සේ බුදුන් වහන්සේ සමීපයෙහි ටික කලක් වැස තම පිරිස  පන්සියයක් ගෙන ඉන් පිට වී කෝකාලික රටට පැමිණි සේක. උපාසකවරු දිනපතා සිව්පසයෙන් උවටැන් කරති. අගසව් දෙනම හා ගිය භික්ෂූන් වහන්සේලා සිවුරු පිළි කැටුව ගිය භික්ෂූන් වහන්සේටම බෙදා දෙන සේක. කෝකාලික තෙරුන්ට නොදෙන සේක. එයින් කිපුනු ඒ තෙරුන් වහන්සේ කියන්නේ සැරියුත් මුගලන් දෙනම පවිටු අදහස් ඇතතේය. උපාසකවරු දුන් පිරිකර කලින් පිළනොගෙන දැන් පිළිගනිති. ඇති කමක් ද නොපෙනෙයි. අන් අයට ද නොදෙති. දුෂ්ට අදහස් ඇත්තේ යැයි අගසව් දෙනමට අක්‍රොෂ පරිභව බනන සේක. අගසව් දෙනම මේ කෝකාලික තෙරණුවෝ අප නිසා බොහෝ අකුසල් පුරා ගනිතියි සිතා සහ පිරිවරින් නික්මුණාහ. උපාසකවරු හඬා වැලපෙද්දී කිසිත් නොබැන වඩිනසේක් ලඳරු භික්ෂුවක් කියනනේ උපාසකවරුනි, අගසව් දෙනම මෙතන කෙසේ වසන සේක් ද? තොපගේ කුළුපග කෝකාලික තෙරුන් වහන්සේ නොකැමති සේකැයි කීහ. උපාසකවරු කිපී කෝකාලික තෙරුන් සමීපයට ගොස් අගසව් දෙනම ක්ෂමා කරවාගෙන මෙහිම රැඳවුව මැනව නැත්නම් ඔබ වහන්සේ මින් පිටව ගිය මැනවයි කීහ. ඒ තෙරණුවෝ උපාසකවරුන්ට බියෙන් ගොස් අගසව් දෙනම රඳවන්නට ආරාධනා කළේය. ඒ දෙනම ඇවැත්නි, තොප පළායව. අපි නොරදම්හයි කියා වැඩි සේක. කෝකාලික තෙරුන්වහන්සේ හුදකලාවම විහාරයට ගියේ උපාසකවරුන්ගේ අකමැත්තෙන් එහි වසනු නොහැකි ව අසරණ ව පා සිවුරු ගෙන බුදුන්ගේ සරණ සොයා ජේතවනාරාමයට ගොස් ස්වාමීනී, සැරියුත් මුගලන් දෙනම පවිටු අදහස් ඇති ඉතා ලාමක ඉච්ඡාවන්ගේ වසඟයට පැමිණියාහයි කීවේය. එවිට බුදුරජාණන් වහන්සේ කෝකාලිකයෙනි, එසේ නොකියව. ඒ දෙනම ඉතා උසස් ගුණවතුන් යයි වදාළ සේක. කෝකාලික තෙරුන් වහන්සේ කියන්නේ ඔබගේ අලසව්වන්ගේ බස් ඉතා පවිටුය. මම එය දනිමි. ඔවුන් දුශ්ශීල යයි සර්වඥයන් වහන්සේ වළකමින් සිටියදී ම තුන්වරක් කියා හුනස්නෙන් නැගී ගියේ නොබෝ වේලාවකින් ඔහුගේ සකල ශරීරයෙහි අඹ ඇට පමණ ගෙඩි නැගී බෙලි ගෙඩි තරමට ලොකු වී ලේ සැරව ගලන්ට පටන්ගත් කල්හි වේදනාවෙන් කෑ ගසමින් ජේතවන දොරටුවෙහි වැදහොත්තේය. ඔහුගේ අපකීර්තිය බඹ ලොව දක්වා පැතිර ගියේය. බඹ ලොව උන්ගේ උපාධ්‍යා වූ තුදු නම් බ්‍රහ්මණයෙක් ඇත. මේ කරුණ දුටු ඔහු මම වහා ගොස් ක්ෂමා කරමියි සිතා අහසෙහි සිට කෝකාලිකයිනි, තොප විසින් කරන ලද්දේ රෞද්‍ර කර්මයකි. වහාම ක්ෂමාව ලබා ගන්නැයි කීහ. ඇවැත්නි, තෝ කවරෙක් දැයි විචාලේ මම තුදු නම් බ්‍රහ්මයෙමි කී කල බ්‍රහ්මය තෝ අනාගාමී යැයි බුදුන් විසින් වදාරන ලද්දේය. අනාගාමී නම් බ්‍රහ්මලෝකයෙන් මේ මනුෂ්‍ය ලෝකයට පෙරලා නොඑන්නාහු යැයි කියන ලද්දේ නොවේද? තෝ වූ කලී කසළ ගොඩ ඇවිදිනා වූ පිසාචයෙක් මෙනැයි කියා බ්‍රහ්මයාට අපහාස කළ සේක. ඒ බ්‍රහ්මයා තොපගේ බස් තොපම විඳුවයි සුඬාවාසයට ගියේය. කෝකාලික තෙරණුවෝ කාලක්‍රියා කොට පරම නරකයෙහි උපන්හ. ඔහු එහි උපන් නියාව දුටු සහම්පති මහා බ්‍රහ්මයා ඒ බව බුදුන්ට දැන්වීය. මේ ගැන දම් සභා මණ්ඩපයෙහි උපන් කථාවක් අරභයා කෝකාලිකයන් තමන්ගේ බස් නිසා පෙරත් නටුයේ වේ දැයි ඉකුත් වත වදාළ සේක.

SANHIDA LANKA

යටගිය දවස බරණැස බ්‍රහ්ම දත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හි ඒ රජුගේ පුරෝහිත බ්‍රාහ්මණයා පිටතට නික්මුණු දළ ඇත්තේය. ඔහුගේ බිරිඳ වෙන බමුණෙකු සමග සංවාසය කරන්නීය. පුරෝහිතයාගේ මෙන් ඔහුගේ ද මුඛයෙන් පිටතට නික්මුණු දළ ඇත්තේය. පුරෝහිත බ්‍රාහ්මණයා මේ බමුණාගෙන් බිරිඳ බේරාගත නොහී උපායකින් බමුණා මරවමියි සිතා රජ්ජුරුවන් ළඟට ගොස් කියන්නේ රජතුමනි මෙතරම් විශාල රාජ්‍යයක දකුණු වාසල දොර පිහිටුවා තිබෙන නියාව ඉතා අයහපත්ය. මෙනුවර අග රජ වූ ඔබ වහන්සේට ඉන් අපල ගෙන දෙන්නේය. එය කඩා දමා හොඳ නැකැත් යොගයකින් වාසල් දොර පිහිට විය යුතු යැයි කීහ. ඊට කළමනා කවරේ දැයි විචාළ කල්හි සුභ නැකතක් බලා එහි අධිගෘහිත දේවතාවන්ට බිලි දිය යුතුයැයි කීහ. එසේ නම් එලෙස කරවයි රජතුමා අණ කළහ. එකල මහා පිණැති තක්තාරී නම් මානවකයෙක් ඒ පුරෝහිත බ්‍රාහ්මණයා ළඟ ශිල්ප උගන්නාහ. පුරෝහිත බ්‍රාහ්මණයා පරණ දොරටුව බිඳ දමා අලුත් දොරක් සූදානම් කොට සෙට නැකත යහපත. බිලියම් කොට දොර සිටවිය යුතු යැයි රජතුමාට දැන්විය. ආචාරීනි, කුමක් බිලියම් කළ යුතු දැයි විචාල කලහි දේවයන් වහන්ස මේ දොරටුවෙහ් මහේශාක්‍ය දේවතාවෝ අධිගෘහිතය. එබැවින් මුඛයෙන පිටතට නිකමුණා වූ දළ ඇතිව උභය කුළ පාරිශුද්ධ වූ බමුණකු මරා ඔහුගේ මස් හා ලෙයින් බිලියම් කොට දොර සිටුවන වළට හෙලා ඒ මත්තේ දොර සිටවිය යුත්තේ යැයි කීයෙන් රජතුමා ඊට විධාන කළහ. පුරෝහිත බ්‍රාහ්මණයා ඉතා සතුටුව අද සතුරා විනාශ කරමියි සිතා වේගවත්ව ගෙට ගොස් මුඛය රැක ගත නොහී වහා භාර්යාවට කයන්නේ පව්ටු චණ්ඩාල ස්ත්‍රිය අද පටන් තී කවරෙකු සමග අභිරමණය කෙරේද? සෙට තිගෙ සොර පුරුෂයා මරා බිලියම් කෙරෙමි කීය. නිරපරාද උන් කුමක් නිසා මරව් දැයි විචාල ගමනේ පිටතට නික්මුණු දළ ඇති ඇස් වපර බමුණකු මරා බිලි දී දකුණු වාසල දොර පිහිටුවන්නේ යැයි කීහ. එබස් අසා ඈ තම සොර සැමියාට කියා යවන්නේ පිටතට නික්මුණු දළ ඇති බමුණු මරා බිලියම් කොට දකුණු වාසල් දොර පිහිටුවන්ට රජතුමා අණකළ සේක්ල. එබැවින් තා හා සමාන වූ බමුණන් ද ගෙන සෙට උදෑසනින්ම නුවරින් පළා යවයි කියා යැවූහ. ඔහු ද එලෙසම කළේ ය. ඒ බව නුවර ප්‍රකට විය. පුරෝහිත බමුණාගේ සතුරා පළා ගිය නියාව නෙදැන උදෑසන රජුන් ළඟට ගොස් කියනතේ රජතුමනි, අසවල් තැන දළ ඇති බමුණෙක් ඇත. අල්වා ගෙන්වා ගත මැනවයි කීහ. රජතුමා මනුෂ්‍යයන් යැවූහ. මනුෂ්‍යයෝ අවුත් ඔහු පළා ගිය බව කීහ. නුවර සෑම තැනම එවැනි කෙනෙකු බලා නැතිව පුරෝහිත බ්‍රාහ්මණයා හැර අන් එබඳු කෙනෙකු නැතැයි කීහ. පුරෝහිත බමුණා මරන්ට නොපිළිවන් වේදැයි කී කල්හි රජතුමනි කුමක් කියන සේක් ද පුරෝහිතයා නිසා අද මේ නැකතින් දොර නොපිහිටවා නැකත ඉක්ම ගියහොත් නැවත නැකැත් නොලැබෙන්නේය. දොර නැතිව තුබූ කල්හි සතුරන්ට ඇතුල් විය හැක. එහෙයින් කවරකු හෝ අල්ලා ශාස්ත්‍රයෙහි නිපුනු බමුණකු ලවා බිලි පූජා කරවම්හයි කීහ. මහජනයාගේ මෙබස් ඇසූ රජ්ජුරුවෝ කිමෙක්ද පුරෝහිත බමුණා හා සමාන උගතෙක් ඇත්දැයි විචාළ ගමනේ ඔහුගේ අතවැසි තක්කාරී මානවකයා ශාස්ත්‍රයෙහි කෙළ පැමිණිබව දැන උන් කැඳවා සම්මාන කොට පුරෝහිත තනතුර දී දොර පිහිටුවන්ට විධාන කළහ. තක්කාරී මානවක නව පුරෝහිත බමුණා මහා පෙරහරින් දොර පිහිටුවන තැනට ගියාහ. පරණ පුරෝහිත බමුණා රජ අණින් බැඳගෙන වුත් දෙදෙනාම බිළිදෙන වළ වටකොට ඇඳි තිරය තුළට වී සිටියහ. මහළු පුරෝහිතයා වළ බලා මගේ කට නිසා මටම සිදුවූවිපතක මහත. දුෂ්ට ස්ත්‍රියට නොකියේ නම් මේ අනතුර සිදු නොවේ. වනේ වසන මැඩියෝ ඇඬීමෙන් තමා ළඟට සර්පයන් කැඳවන්නාක් මෙන් මම ද මෙය බිරිඳට කියා මරුවා කැඳවා ගතිමියි කීය. තක්කාරී පුරෝහිත බමුණා ආචාරීන් වහන්ස, බොහෝ කොට දොඩන පුද්ගල තෙමේ අන්දු බන්ධන රජ්ජු බන්ධන සංඛලික බන්ධන ආදියටත් අත් පා සිඳීමටත් මරණයටත් පත් වන්නේය. ඔබට පැමිණ ඇත්තේ එයමය. මුඛය රැක ගත නොහී දුකට පැමිණියෝ ඔබ පමණක් නොව සෙස්සෝත් පැමිණියෝම වේදැයි මේ කථාව ගෙන හැර දැක්වීය.

ඒ කෙසේ ද යත් ,

පෙර බරණැස් නුවර දවස දහස බැගින් වස්තු උපයන කාලි නම් වෙසඟනක් වූවාය. ඈට ස්ත්‍රී ධූර්තව ඇවිදින තුණ්ඩිල නම් මළණු කෙනෙක් විය. ගණිකාව ඔහුට නිතර වස්තුව දෙන්නී ඔහු සියල්ලම විනාශ කර දමන්නේ ය. ඔහුගේ දූකෙළිම නතර කොට නොහැකි වූයේ දිනක් ඔහු ඉන තුබූ වස්ත්‍රය ද උගස් කොට කඩ රෙද්දක් පමණක් ඇඳ ගෙන ගෙට ආයේය. තුණ්ඩිලයාට කිසිවක් නොදී බෙල්ලෙන් ඇද එළියට දමන ලෙස ගණිකාව එහි වැසි කෙල්ලන්ට නියම කළාය. තුණ්ඩිලයා දොරකඩ අඬමින් උන්නේ නිතර ගණිකාවට මසුරන් දහසක් ගෙන එන එක් සිටු පුත්‍රයෙක් තුණ්ඩිලයා දැක ඇඬීමට හේතුව විචාරා ගණිකාවට එය දන්වා ඈ නොකැමැත්තෙන් තමාට දුන් පිළි හැඳ තමා කලින් හැඳි වස්ත්‍ර තුණ්ඩිලයාට දුන්නේය. ඔහු ඒ වස්ත්‍ර හැඳ නටමින් රා බොන්නට ගියේය. ගණිකාව එය දැක කෙල්ලන්ට විධානය කරන්නේ සෙට මේ සිටු පුත්‍රයා යන වේලෙහි මා දුන් පිළි උදුරා ගනුවයි විධානය කළාය. කෙල්ලෝ ද ඔහු නික්මෙන වේලෙහි ඇතිත් මැතින් දිව අවුත් පිළි උදුරා ගෙන සුටු පුත්‍රයා නග්න කොට යැවූහ. ඔහු මහජනයාගේ නින්දා පරිභව ලබමින් කට නිසා මට වූ විපතකැයි කියා

SANHIDA LANKA

හඬමින් ගියේය. ඔබට ද වූයේ සිටු පුත්‍රයාටමෙන් දෙයකැයි කතාව හමාර කොට නැවත උදාහරණයක් පෙන්වනු සඳහා පෙර එළුවන් දෙදෙනෙක් පොර අණ ගන්නට පටන් ගත් කල්හි එක් කෑරලෙක් තව මොහොතකින් මුන් දෙදෙනා ඔළු පළාගෙන මිය යන්නාහ. එබැවින් වළකම්යි සිතා සබඳනි, පොර නානුවයි වලක්වා එය නොඅසා නැවත නැවතත් පොරට වන් කල්හි එසේ නම් මා මරා යුධ කරවයි කියා දෙදෙනාගේ නළල් අතරට වී උන්නේ ගලක ලා ඇඹරූ කලක් මෙන් නළල් දෙක අතරට හිර වී විනාශයට පැමිණියේය. එය ද ඔබ කළ මෝඩකම හා සමානය.

තව ද බරණැස් නුවර ගෝපල්ලෝ රැළක් එල ගත් තල් ගසක් දැක එයට නැගී ගෙඩි කඩමින් උන්නේ සර්පයෙක් තල් ගසට නැගෙන්නා දැක බිම උන් ගොපල්ලෝ තණ වලින් කරන ලද එක් කඩක් සතර කොණින් අල්ලා ගෙන වහාම ඒ මත්තට පැන සර්පයාගෙන් මිදෙවයි ගස උඩ උන් ගොපල්ලාට කීහ. ඔහු හයින් ඊට පැන්නේ තණ ඇතිරිය කඩා ගෙන ඔවුන් මත්තට වැටී ඔලු පැලී ජීවිතක්ෂයට පත් වූහ. ඔබට ද වූයේ මෙබඳු දෙයකැයි කීහ.

තව ද බරණැස් නුවර සොර සමූහයක් එළුවකු අල්ලා මුඛය බැඳ වනයට ගෙන ගොස් මරාකම්යි උණ කැළයක් අස්සේ තබා දෙවෙනි දවස එහි ආවාහු ආයුධ අමතකව සිතන්නාහු අයුධ නැතිව මූ මරා කන්නේ කෙසේ ද? එබැවින් එළුවා හැර දමමි. අප හැමට කුසල් ඇතැයි කියා හැර දැමූහ. ඒ අතර එක් කුළුපොත්තෙක් උණ දඬු කපා කැත්ත උණ කැළය අස්සේ තබා ගියේ ය. එළුවා සොරුන්ගෙන් මිදී ඉතා සතුටුව උණ කැළය අසල කෙළිමින් සිටියේ පා පහර වැදී අසළ වූ කැත්ත විසිවී ගොස් දුර වැටුනි. ඒ හඬ ඇසුණු සොරු පරීක්ෂා කොට එහි දුවවිත් එළුවා හා කැත්ත දැක වහා ඌ අල්ලා ඒ කැත්තෙන් කපා මරා කෑවාහුය. එළුවා තමා කළ දෙයින්ම මරුමුවට පත් විය. ඔබට ද වූයේ එබඳු දෙයකැයි දක්වා තමාගේ කට රැකගත් සත්ත්වයෝ මරණ දුකින් මුදුනු නියාව දක්වන සඳහා තව කතා වස්තුවක් ගෙනහැර දැක්වූහ.

ඒ කෙසේ ද යත්,

බරණැස් නුවර එක් වැදි පුත්‍රයෙක් හිමාලයට ගොස් උපායකින් කිම්පුරුෂ කින්නරාංගනා දෙදෙනෙකු අල්ලා ගෙන අවුත් රජ්ජුරුවන්ට දුන්නේය. රජතුමා පෙර නොදුටු විරූ කිඳුරන් දැක වැදි පුත්‍රය මොවුන්ගේ ගුණ කවරදැයි විචාළාහ. රජතුමනි, මොහු මනුෂ්‍යයන්ට නොහැකි ලෙස මිහිරි හඬින් ගායනා කරති. ලීලෝපේතව නටතියි කීහ. රජතුමා සතුටුව ඔහුට වස්තුව දී කිඳුරන් නටවයි ගී කියවයි විධාන කළහ. ඒ ඇසූ කිඳුරෝ අක්ෂර සම්පූර්ණ කොට ගායනා කරන්නට නටන්නට නෙහැකි වුවහොත් නපුරු වන්නේය. එවිට අපිට නින්දා කරති. මරති. එබැවින් අපි එය රැක ගත යුතු යැයි සිතා නිහඬ වූහ. නැවත නැවත කියත් දීත් නිහඬවන කිඳුන් දුටු රජතුමා මුන්ගෙන් කවර පලයෙක්ද? එකකු සවසට පිස අනෙකා හෙට උදෑසන පිසවයි විධාන කළහ. මෙයින් බියට පත් කිඳුරෝ රජතුමා අමතා තමන් නො නැටීමට හේතුව දක්වා ධර්ම දේශනා කොට අභය ලබා රජ්ජුරුවන්ට ද යහපතක් කොට ගියහ. නුසුදුසු අවස්ථාවේ කථා කෙළේ නම් නින්දාවට ද මරණයට ද පත් වන්ට සිදුවනු ඇත. ආචාරීනී, ඔබ ද කට රැක ගත නොහී අද වැටුන විපතක මහත බලනු මැනවි. ඔබට මම ජීවිත දානය දෙමියි මධ්‍යම රාත්‍රිය වන තුරු සිට මළ එළුවකු ගෙන්වා බමුණා රහසින් එරටින් පිට කොට යවා එළු මසින් බිලියම් කොට වාසල් දොර පිහිට වූහ.

එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා නම් දැන් කෝකාලික තෙරුන්ය. තක්කාරී පණ්ඩිතයෝ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# රුරුමෘග ජාතකය

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සෙක් දෙව්දත් තෙරුන් අරභයා මේ ජාතකය වදාළ සේක.

දෙව්දත් තෙරුන් බුදුන් නසන්නට යෙදූ උපක්‍රමයක් ගැන දම්සභා මණ්ඩපයෙහි උපන් කථාවක් අරභයා ඔහු අකෘතඥවූයේ දැන් මතු නොවෙයි. පෙර උන්ට මා ජීවිත දානයදීත් කළගුණ නොසැළකුවෝ වේදැයි ඉකුත්වත වදාළ සේක.

යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජකෙනෙක් රාජ්‍යය කරන කල්හි කෙළක් ධනය ඇති එක් සිටුවරයෙකුගේ එකම පුත්‍රයා කිසිශිල්ප ශාස්ත්‍රයක් නොඉගෙන දෙමව්පියන්ගේ ඇවෑමෙන් පව්වූ මිතුරන් සමඟ දුරාචාරයෙහි හැසිර සියළු ධනය වනසා ණයද ගෙන එය දී ගත නොහී සිතන්නේ මට දැන් ජීවත් වීමෙන් කම් නැත මැරෙමියි සිතා නය හිමියන් අමතා තොපගේ නය දෙමි ගඟ අසබඩ මා සතු නිධාන් පෙන්වමියි කැටුව ගොස් මෙතන එක් නිධානයෙක, මෙතැන එක් නිධානයකැයි දක්වමින් ඔවුන් රවටා ගඟට පැන්නේ මහා ජල පහරට අසු වී යටි ගන් බලා යන්නේ මහත් හඬින් හැඬුයේ ය. ඒ ගඟ අසල අඹ වනයක වාසය කළ රුරුමෘග යෝනියෙහි උපන් රන්වන් මුව පෝතකයෙක් මේ හඬ අසා මා සිටියදී මොහු මරණයට පත්විය යුතු නොවේ යැයි වහා එහි ගොස් ගඟ පීනා ඔහු කරපිට හිඳුවා ගොඩට ගෙනවුත් පලාඵල දී දෙතුන් දිනක් නවතා තම පිට උඩම හිඳුවා බරණැස් නුවරට යට මාර්ගයට ඇරලා පින්වත, මෙහි රන් මුවකු වසන බව වස්තුව නිසා කිසිවෙකුට නොකියවයි කියා යැවීය. ඒ පිළිගත් එම පුරුෂයා බරණැස් නුවරට වන් දින බරණැස් රජ්ජුරුවන්ගේ ඛේමානම් අගබිසව අළුයම රන්වන් මුවකුගෙන් බණ අසනවා සීනෙන් දැක උදේ ඒ බව රජ්ජුරුවන්ට දන්වා තම ජීවිතය රැකගත යුතු නම් රන්වන් මුවකුගෙන් බණ අසන්නට සලස්සාලවයි ඇයදීය. රජතුමා බිසව අස්වසාලා මේ ලෝකයේ රන්වන් මුවන් ඇති බැව් බමුණන් අතින් දැන රන් මුවෙක් වසන තැනක් කී කෙනෙකුට දහසින් බැඳි පියල්ලක් සමඟ බොහෝ වස්තුව දෙන බැව් කියා යැවූහ. වනයේ සිට එන සිටු පුත්‍රයා මෙය අසා අමාත්‍යයා සමීපයට ගොස් මම එබඳු මුවකු වසන තැන් දනිමියි ඔහු සමඟ රජ්ජුරුවන් ළඟට ගොස් රන්මුවා පිළිබඳ තොරතුරු කීය. රජතුමා බොහෝ සතුටට පත්ව අවි ආයුධ ගත් මහ පිරිසක් සමඟ වනයට ගොස් වට කොට ඝොෂා කෙළේය. මහ පිරිසගේ හඬ ඇසුන රන්මුව පෝතකයා මේ මම අභය දානය දුන් අසත් පුරුෂයා නිසා සිදු වීමට යන විපතකැයි සිතා එළියට පැමිණ පිරිස දැක රජ්ජුරුවන් ලඟින්ම යමියි සිතා පැමිණ දුන්න තමා දෙසට මානා සිටි රජු අමතා රජතුමනි, මා නොමරා ජීවග්‍රහයෙන් අල්වා ගත මැනවයි කීහ. රජතුමා රන්මුව පොතකයාගේ මිහිරි බසින් පැහැද තමා ලඟට ගෙන පිළිසඳර කථා කරමින් සිටිනා අතර රජ්ජුරුවෙනි මාගැන ඔබට කීවෝ කවුරුදැයි විචාළේය. එවිට ඒ අසල සිටි පුරුෂයා මඳක් ඉවත් වී අහක බලා ගත්තේ ය. රජතුමා තොප ගැන දැන්වූයේ මේ පුරුෂයායයි පෙන්වීය. මුවපොතකයා රජ්ජුරුවෙනි, දියෙහි පාවීයන දණ්ඩක් ගොඩ ගැනීම යහපත් වන්නේය. අසත් පුරුෂයෙකුට පිහිටවීම නොහොබින්නේ යැයි ඔහුව මරණයෙන් මුදාගත් හැටි කීවේය. රජතුමා ඒ අසත් පුරුෂයා ගැන කිපී විදමැරීමට නියම කළේය. මුව පොතකයා රජ්ජුරුවන්ට කියා ඔහුට නැවතත් අභය ලබා දී දීමට පොරොන්දු වූ වස්තුවද ඇතිව ඔහු පිටත් කර යවා රජතුමනි, මාගේ මස් අනුභව කරන සේක් වීනම් මා මරා අනුභව කළ මැනව. මා සමඟ කෙළිනා කැමති නම් එසේ කළ මැනව. ඒ සියල්ල ඔබට අනුකැපව පවතීයයි කීහ. රජතුමා සතුටු සිත් ඇතිව මුව රජ්ජුරුවෙනි, තොපට හිරිහැර කළ ඒ අසත් පුරුෂයාට තොප මෛත්‍රී කළාද එයින් ම තොප ගැන මම පැහැදුනෙමි. තොප නම් බුද්ධාදී මහොත්තමයන් අතුරෙන් කෙනෙක. එබැවින් තොපට මම අභය දෙමි. සෙසු මුව වර්ගයාටත් සියළු සතුන්ටත් අභය දීමට පොරොන්දු වෙමියි කියා මුව රජ්ජුරුවන් ගෙන මාලිගාවට ගොස් බිසව ඇතුලු එම හැමටත් නුවර වැස්සන්ටත් ධර්ම දේශනා කිරීමට සලස්වා තමාද ඔහුගේ අවවාද පරිදි දශරාජ ධර්මයෙහි පිහිටා රාජ්‍යය කළේය.

එසමයෙහි සිටු පුත්‍රයා නම් දෙව්දත් තෙරුන් ය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝ ය. රුරුමුව රජ්ජුරුවෝ නම් බුදු රජාණන් වහන්සේ ය.

SANHIDA LANKA

# සරභමිග ජාතකය

සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් තමන් වහන්සේ කොටින් විචාළ ප්‍රශ්නයක් සැරියුත් තෙරුන් විසින් විස්තර වශයෙන් ප්‍රකාශ කිරීමක් අරභයා මේ ජාතකය වදාළ සේක. සර්වඥයන් වහන්සේ සත්වන වස තව්තිසා දිව්‍ය ලෝකයෙහි වාසය කොට මාතෘ දිව්‍ය රාජයන්ට තුන්මසක් අභිධර්මය දේශනා කර වස් පවරා සංකස්ස නගරාද්වාරයට වැඩිය සේක් එහි වැඩ සිටි තම ශ්‍රාවකයන් දැක සැරියුත් තෙරණුවෝ මහත් වූ ප්‍රඥාවෙන් යුක්තය මා හැර මුන් හා සමාන වූ නුවණැති කෙනෙක් තුන්ලෝකයෙහිම නැත. එබැවින් මුන්ගේ ඥාණ ගුණය ලොවට ප්‍රකාශ කරමියි සිතා පළමු පෘථග්ජනයන්ට විෂය වූ ප්‍රශ්න විචාළ සේක. ඒ පෘථග්ජනයෝම විසඳූහ. මෙසේ ක්‍රමයෙන් සෝතාපන්න සකෘදාගාමි අනාගාමි සහ මහශ්‍රාවක යන මොවුන්ට විෂය වන ප්‍රශ්න විචාළ සේක. ඒ ඒ ප්‍රශ්න ඒ ඒ තත්වයට පත් ශ්‍රාවකයන් විසින් විසඳූ ඉක්බිති සැරියුත් තෙරුන් වහන්සේට විෂය වූ ප්‍රශ්න විචාළ සේක. ඒ පැන තෙරුන් වහන්සේ විසඳූ සේක. සෙසු තැනැත්තෝ නොදත් සේක. මහාජනයා බුදුන් සමඟ ප්‍රශ්න දක්ෂ ලෙස විසඳන මුන් වහන්සේ කවර කෙනෙකුන් වහන්සේදැයි විචාරා දම් සෙනෙවි සැරියුත් තෙරුන් වහන්සේ යයි අසා දැන ප්‍රඥාවක මහිම යයි ප්‍රසංසා කළහ. එතැන් පටන් දෙව් මිනිසුන් අතර සැරියුත් තෙරුන්ගේ ප්‍රඥා ගුණය ප්‍රසිද්ධ විය. මේ ගැන දිනක් දම් සභා මණ්ඩපයෙහි කථාවක් උපන් කල්හි මහණෙනි, පෙරත් සැරියුත් තෙරණුවෝ කෙටින් කියන ලද වචනයෙහි ඇර්ථ විස්තර වශයෙන් කීවෝ වේදැයි ඉකුත්වත වදාළ සේක.

යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජකෙනෙක් රාජ්‍යය කරන කල්හි සරභ මෘගයෝනියෙහි උපන් මුව රජෙක් බොහෝ මුවන් පිරිවරා වනයෙහි වසන්නාහ. එකල බරණැස් රජ්ජුරුවෝ පිරිවර සමඟ මුව දඩයමෙහි යන්නාහ වනය වට කොට යමෙක් සිටින තැනින් මුවෙක් පලාගියා නම් ඒ මුවා ඔහු විසින් දියයුතු යැයි නියමයෙක් ඇත. තමා ලඟින් යාමට එන මුවා විද මැරිය යුතුයි. එසේ හෙයින් යම් උපායකින් රජ්ජරුවන් වහන්සේ සිටින තැනට මුවා පන්නමියි කථාකොට එන මුවන් එතනින් පලා යෑමට එක් දිනක කටයුතු සැලැස්සූහ. පළමු කොටම සාරභමෘගයා යාමට අවසරයක් බලා රජ්ජුරුවන් සමීපයෙන් දිවගෙන ආයේය. රජතුමා ඊයක් විද්දේ ඒ වැරදුනි සරභ මෘගයෝ ඊ පහර වළක් වන්ට සමර්ථහ. තමා ළඟින් මුවා පැනගිය හයි සෙස්සන්ගේ කවටකම් වලින් පීඩාවට පත් රජතුමා මුන් මාගේ තරම නොදැන නින්දා පරිභව කෙරෙතියි කඩුව පමණක් ගෙන පයින් ම ගොස් සරභ මෘගයා අල්වමියි වේගයෙන් දිව ගත්තාහ. සරභ මෘගයා තුන් යොදුනක් දිව ගොස් වලට වන්නේ ය. එහි සැට රියනක් පමණ මහත් වූ තිස් රියනක් යෙන් පිරි තනපතින් වැසී ගත් නරාවලෙක් ඇත. සරභ මෘගයා ඒ අසලින් දුවන්නේ එහි දුර්ගන්ධය ආඝ්‍රාණය කොට ඉන් ඉවත්ව හැරී පලාගිය නමුත් ඉවක් නැති රජතුමාව එහි ගිලී ගියේය. පිටුපසින් ආ පාශබ්දය නැති බැවින් හැරී බැලූ සරභමෘගයාට රජතුමාව නරාවලෙහි වැටුන බව දැන තමා මරන්ට ආ සතුරා කෙරෙහි මෙත් වඩා දැන් මා පිහිට විය යුතුයයි සිතා වහා එහි ගොස් දරුවකු ගොඩ ගන්නා පියෙකු මෙන් ඉතා ආරයෙන් එහි බැස තම පිට උඩ සිඳුවා රජතුමාව ගොඩගෙන පිරිස හමුවට ගෙන ගොස් තබා අවවාද දී පංචශීලයෙහි පිහිටුවිය. රජතුමා සරභමෘගයන් පැහැදී රාජ්‍යයෙන් පිදීය. සරගමෘග රජ්ජුරුවෝ රජතුමනි, ඔබගේ රාජ්‍යයෙන් තිරිසන් වූ අපට කම්නැත. මට සැලකීමට අවශ්‍ය නම් පන්සිල් කඩ නොකොට ආරක්ෂා කළ මැනවි. නුවර වාසීන් ලවාද පන්සිල් ආරක්ෂා කරවනු මැනවයි කියා වනයට වන්හ. රජතුමා මේ කිසිවක් කිසිවෙකුට නොදන්වා දුකෙන් යුතුව පිරිවර සමඟ රජමාලිගායට පැමිණ අද පටන් නුවර වාසීහු පන්සිල් රකිත්වායි අණබෙර යවා ආහාර ගෙන ශ්‍රී යහන් ගබඩාවට වැද නුවණැති පුරුෂයා විසින් වීර්ය හැර නොපියා තමා පටන් ගත් කාර්යයෙහි ඉෂ්ටඵල දකිනතුරු කළ යුත්තේය. මා නරාවලෙහි වැටී ඉන් ගොඩවනු එය එසේ ඉටුවිය. එසේ නමුත් නොසිතූ දෙය සිදු වෙයි. සරභමෘගයා මැරීමට මම ගියෙමි. නමුත් නරාවලෙහි වැටුනෙමි. මෙසේ නොයෙක් දේ කියමින් උදන් අනමින් සිටියදී හිරු නැංගේය. පුරෝහිත බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ගේ සුවදුක් බලනු පිණිස උදේ ආවේ මේ සියල්ල අසා සිට තත්වූ පරිද නරාවලේ වැටුන බවත් සරභමෘගයාගේ පිහිටින් ගොඩට පැමිණ අවවාද ලබා පැමිණි බවත් දැන නිය පිටින් දොරට තට්ටු කොට රජතුමාගේ අණින් ගබඩාවට පැමිණ රජතුමනි, ඔබතුමාට ඊයේ සිදු වූ සියල්ල දනිමියි කියා කැඩපතකින් බලා කියන්නාක් මෙන් පෙරදින සිදු වූ සියල්ල රජුන් ඉදිරියේ කීය. එබස් අසා රජතුමා ඉතා පුදුමයට පත්ව මේ බමුණානෝ මා සමඟ ඊයේ මුව දඩයමේ නොගියේ ය. නමුත් සියළු පවත් දනී. බමුණ, මෙපවත් තොපට කීවේ කවරෙක් ද තොපගේ බලය ඉතා බලවත් ය. බුදු කෙනෙක් වැනිය. බමුණා එවිට කියන්නේ රජතුමනි, මම බුදු කෙනෙක් නොවෙමි. ඔබ කී ප්‍රීති වාක්‍ය අසා එහි අර්ථය මට පහන් එළියක් මෙන් බොහෝ කොට වැටහුනේ යයි කියා දහම් දෙසා අවවාද දුන්නේ ය. රජතුමා පැහැදී සැප සම්පත් දී යැවූය. දිනක් රජතුමා විදිමියි සිතා පුරෝහිත බමුණත් කැටිව උයනට ගියහ. එකල බොහෝ අභිනව දිව්‍ය පිරිස දුටු ශක්‍ර දේවේන්ද්‍රයෝ ඊට කාරණා බලන්නේ සරභමෘගයා විසින් පන්සිල්හි පිහිට වූ රජතුමාගේ නියෝගයෙන් රටවාසීහු පන්සිල් රැක මිය ගොස් දෙව්ලොව උපදින බව දුටහ. නැවත රජතුමා විදින්නට ගියාහ. රජතුමා විදිමියි දුන්න අතට ගත්තේ ශක්‍රයාගේ ආනුභාවයෙන් ඒ අසල සරභමෘග රූපයක් මැවීය. රජතුමා මුවා දැක දුන්න පහත හෙළීය. ඉක්බිති ශක්‍රයා පුරෝහිත බමුණාගේ ශරීරයට ප්‍රවිශ්ටව, රජ්ජුරුවෙනි, සරභමෘග මාංශය රජ්ජුරුවන්ට අග්‍ර භෝජනය ඔබතුමා ඌ නොවිද පසු බැස්සේ මන්දැයි ඇසීය. රජතුමා බමුණ, සරභමෘග මාංශය යහපත් බැව් මම දනිමි. නමුත් මේ මුව රජ්ජුරුවෝ මට කළ උපකාරය අමතක නොවේ යයි කීය.

SANHIDA LANKA

ශක්‍රයා- රජතුමනි මේ මුවෙක් නොවෙයි. අසරණයන්ට ජ්‍යෙෂ්ඨ වූ ශක්‍රදේවේන්ද්‍රයෝය. එබැවින් තෙපි ශක්‍රයන් මරා එම පදවිය ලබා ගනු මැනවි. තෙපි මූ මාගේ යාළුවෝයයි නොමරන්නෙහිද? තොපගේ පුත්‍ර දාරාවන් සමඟ වෙතරණී නරකයෙහි උපදින්නේ වේදැයි තැතිගැන්වූහ.

රජතුමා- බමුණාණනි, අප හැම දෙනෙක් එම නරකයෙහි උපදිතත් ඒ සුළු දෙයකි. මට ජීවිත දානය දුන්නා වූ මේ මුව රජ්ජුරුවන් නොමරමි. මා දැන් මෙතරම් ඓශ්චර්ය විඳිනුයේ මේ මුව රජ්ජුරුවන් නිසාවෙනි. මට කළ උපකාරය නිතරම සිහි කරමි.

ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රයෝ පුරෝහිත බමුණාගේ ඇඟෙන් පහව අහස් නැගී රජ්ජුරුවන් අමතා ප්‍රසංසා කොට ධර්ම දේශනා කොට දිව්‍ය ලෝකයටම ගියහ.

එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝ ය. පුරෝහිත බමුණානම් සැරියුත් තෙරුන් ය. සරභමෘග රාජයා නම් තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ය.

SANHIDA LANKA

# සාලිකෙදාර ජාතකය

අංගීරස ශාන්ති නායක බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් මව්පිය උපස්ථානයෙහි යෙදුන භික්ෂුවක් අරභයා මේ ජාතකය වදාළ සේක.

බුදුරජාණන් වහන්සේ එම භික්ෂුව තමා සමීපයට කැඳවා දෙමාව්පියන් පෝෂ්‍ය කරන්නේ සැබෑදැයි විචාරා තුන්විටක් සාධුකාර දී මහණ, පෙර තිරිසනුන් පවා ජරාවට පැමිණි තම දෙමාපියන් පෝෂ්‍ය කළේ වේදැයි ඉකුත්වත දක්වා වදාළ සේක.

යටගිය දවස මගධරට රජගහ නුවර මගධ නම් රජකෙනෙක් රාජ්‍යය කරන කල්හි එනුවර ඊසාන කොන වූ සාලින්දිය නම් ගමේ මගධක්ෂෙත්‍ර නම් කුඹුරක් ඇත. කෝෂික ගෝත්‍ර ඇති බ්‍රාහ්මණයෙක් ඒ කෙතෙහි ඇල් වැපුරූහ. ඒ කෙත අසල මහත් ඉඹුල් වනයක ගිරවුන් සමූහයක් පිරිවරාගත් ගිරා රජ්ජුරු කෙනෙත් වාසය කරනනාහ. ඒ රජ්ජුරුවෝ දිනපතා හිමාලයට ගොස් ආහාර සොයා ගෙනවුත් දෙමින් තමා විසින් ම තම මහළු මව්පියන්ව පෝෂ්‍ය කරන්නාහ. මෙසේ කල් යවන අතර ඉහත කී කුඹුරෙහි ඇල් පැසී ඇති බැව් දැනගත් ගිරා රජ්ජුරුවෝ මහත් වූ ගිරා පිරිස සමග එම කුඹුරට ගොස් හැකි තරම් ඇල් කා සෙසු ගිරව් හිස් මුඛයෙන් යන අතර ගිරා රජ්ජුරුවෝ බොහෝ ඇල් කරල් කඩා ගෙන තුඩින් ගෙන ගොස් දෙමාපියන්ට දෙන්නාහ. ඒ කෙත රකින්නා ගිරව් මෙසේ තව දින කීපයක් අවු නම් මෙය හිස් වන්නේය. වහාම ගොස් අයිතිකරුට කිවයුතු යැයි සිතා ගොස් එපුවත දැන්වීය. ඒ ඇසූ කෝෂික ගෝත්‍රික බමුණා ගිරා රජ්ජුරුවන්ගේ පුදුම ක්‍රියා ගැන පැහැදී මළ පුඩුවක අටවා එම ගිරවා නොමරා අල්ලා ගෙන එවයි අණ කළේය. ඒ පුරුෂයා ගොස් ගිරා රජ්ජුරුවන් ඇවිත් බසිනා තැන බලා මළක් අටවා ගිරා රජ්ජුරුවන් අල්වා ගෙන ගොස් බමුණාට පෑහ. බමුණා බලවත් ස්නේහයෙන් ගිරා රජ්ජුරුවන් දෑතින් වඩා ගෙන ඇකයේ හිඳුවා ගිරා රජ්ජුරුවෙනි, අවශේෂ ගිරව් තමන් පමණක් අනුභව කොට නැගී යන්නාහ. තොප වනාහී අනුභව කොට කරල් මිටියකුත් කඩාගෙන යන්නේය. තා මෙසේ කරන්නේ මා කෙරෙහි වෛරයෙන්ද? නැතිනම් ඉඹුල් වනයෙහි වී කොටුවක් පුරවනු සඳහා දැයි විමසීය. එබස් අසා ගිරා රජ්ජුරුවන් වහන්සේ බමුණා අමතා පින්වත් බමුණ නුඹ හා සමග වෛරයකුත් නැත. පුරවන්නා වූ කොටු ගුලකුත් නැත. ඔබගේ ඇල් කරල් ගෙන යන්නාවූ මම ණයකින් මිදී ණයක් දෙමි. තවත් නිධානයකුත් තැන්පත් කරමියි කීය.

බමුණා - සබඳ ඔබ ගේ ණය දීම ණයෙන් ගැලවීම නිධාන කිරීම මේ විසඳා දුනහොත් මේ උගුලෙන් නිදහස් කර යවමි.

ගිරා - බමුණ තවම පියාපත් නැති ගොදුරු සොයා ඈත මෑත යා නොහැකි මාගේ බාල දරුවෝ ඇත. උන්ව මම පෝෂ්‍ය කරමි. මම මහළු වූ කල උන් මාව රැක බලා ගනු ඇත. එය මතු ලබා ගැනීම සඳහා දෙන ණයක් මෙනි. මාගේ මහළු දෙමාපියන්ව දැන් මම රැකබලා ගනිමින් ආහාර ගෙනගොස් දී පෝෂ්‍ය කරමි. එය ගත් ණය දීමකි. තව ද ඉඹුල් වනයේ ඈත මෑත යා නොහැකි අසරණ ගිරව් ඇත. උන්ට පින් පිණිස ආහාර සොයා දෙමි. එය නිධන් කිරීමකි.

බමුණා - උතුම් වූ පක්ෂි රාජය, මිනිසුන් තුළවත් නැති උසස් ගුණධර්ම රකින තෙපි ඉතා ධාර්මිෂ්ටය. ඔබගේ දර්ශනය අපට ඉතා ප්‍රියය. මෙතැන් පටන් ඔබගේ බන්ධු වර්ගයා සමග කිසිම සැකක් නැතිව පැමිණ ඇල් අනුභව කළ මැනව. එසේම අතරතුර පැමිණ අපට ධර්ම දේශනා කළ මැනවයි ධර්ම ගෞරවයෙන් ආරාධනා කොට දහසක් කිරිය ඇති කුඹුරක් පූජා කොට පය බැඳි මළ පුඩුව ලිහා සතපාක තෛලයෙන් පාද සම්භාහනය කොට මී හා විළඳ කවා ශර්කරා පැන් පොවා මහත් වූ ආදරයෙන් බලා උන්හ. එවිට ගිරා රජ්ජුරුවෝ බමුණානෙනි, තොප ගෙන් බොහෝ උපකාර ලද්දා වූ මම නොනැසෙන උපකාරයක් කරමියි ඔහුව පංච ශීලයෙහි පිහිටුවා දන් දීමෙහි අනුසස් දක්වා ධර්ම දේශනා කොට යහපත් ගුණධර්ම වල පිහිටුවා තමා වසන ඉඹුල් වනයට ගොස් දෙමාපියන් ඇතුළු පිරිවර සොම්නස් සාගරයෙහි ගිල්වා සියළු තොරතුරු පවසා සුව සේ විසූහ.

එසමයෙහි ගිරා සමූහයා නම් දැන් බුදු පිරිසය. මව්පිය දෙදෙනා වූයේ සුද්ධෝදන මහාමායා දෙදෙනාය. කුඹුර රැකි පුරුෂයා නම් ඡන්න ඇමතිය. කුඹුර හිමි කෝෂක බ්‍රාහ්මණයා අනඳ තෙරුන්ය. ගිරා රජ්ජුරුවෝ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# චන්‍දකින්නර ජාතකය

සුගතයන් වහන්සේ කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි වැඩ වසන සේක්. යශෝධරා දේවීන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක.

බුදුරජාණන් වහන්සේ ප්‍රථමයෙන් යශෝධරා දේවීන් වහන්සේගේ මාළිගාවට වැඩි ගමනේ සුද්ධෝදන රජතුමා බිම්බා (යශෝධරා) දේවියගේ ගුණ කියන්නේ ස්වාමීනී මාගේ මේ යෙහෙළිය ඔබ කෙරෙහි ආදරයෙන් මහභිනික්මන් කොට කාෂාය වස්ත්‍ර ඇඳි බව අසා පට සලු පැළඳීමෙන් වෙන් වූවාය. එක් වේලේ වළඳතියි අසා ඈද එක් වේලක් ආහාර ගැනීමෙන් දවසරන්නීය. බිම සයනය කරන බැව් අසා බිම සයනය කරන්නීය. ඔබ පැවිදි වූ බැව් අසා සෙසු රජ දරුවන් එවූ පඬුරු පිළි නොගෙන ඔබ වහන්සේට ස්නේහයෙන් වැන්දඹුව ජීවත් වූයේ ඉතා අශ්වයර්යයි සිතමියි යනාදීන් බිම්බාවගේ ගුණ වර්ණනා කෙළේය. පිය රජතුමනි ඈ මේ කෙළවර අත් බැව්හි මා කෙරෙහි ස්නේහයෙන් ක්ලේශ වසඟ නොවී අනුන් නොපැතීම පුදුම නොවෙයි පෙර තිරිසන් යෝනියෙහි ඉපිද පවා මා කෙරෙහි ස්නේහයෙන් අන් අය නොපැතුවේ වේදැයි ඉකුත් වත වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍යය කර කල්හි හිමාල වනයෙහි රිදී පව්වක මහ පිනැති සඳ කිඳුරෙක් සහ සඳ කිඳුරියක් වාසය කළහ. දිනක් බරණැස් රජ්ජුරුවෝ ඇමතියන් අතර රාජ්‍යය පවරා කළු පිළි හැඳ පඤ්චායුධයෙන් සැරසී හිමාල වනයට වැද මුවන් මරා කා ඇවිදිනේ වස්කුලක් පිඹිමින් ගී කිය කියා මනහර ලෙස නටන සඳ කිඳුරු යුවල දැක කිඳුරංගනාව කෙරේ සිත් ඇතිව මේ කිඳුරා විද මරා මෑ හා සමඟ වාසය කරමියි සිතා සැඟවී සිට කිඳුරාට හීයක් විද්දේය. එයින් ගලන ලේ ඇති වේදනාවෙන් යුතු වූ කිඳුරා තම සොඳුරිය අමතා ප්‍රිය චන්ද්‍රිකාව මාගේ ප්‍රාණය තව ස්වල්ප වේලාවකින් නිරුඬ වන්නේය. එයින් ශෝක නොකරව තොපගේ ක්‍රීඩා බල සැනසීමක් මින් මතු නොවන්නේ යයි කියමින් සිට අඬා මල් ඇතිරිය මත්තෙහි පෙරලී වැඳහොත්තේය. රජද වීදි තැනම සිටියේය. කිඳුරා ඊ පහර කා මෙසේ හඬතත් කිඳුරු ලිය මේ කිසිවක් නොදත්තී නටමින්ම සිටියාය. ටික වේලාවකින් විසඳුව වැදහොත් කිඳුරා දැක මාගේ රැගුම් නොබලා වැදහෝනට හේතුව කුමක් දැයි බලන්නී. ගලන ලේ දැක ශෝකය දරාගත නොහී අක්‍රොෂ බෙනෙමින් මහ හඬින් හඬන්නට වන්නීය. සැඟවී සිටි රජ කිඳුරා මළේ යයි හෙළින් බැස තී හඬන්නට වන්නීය. සැඟවී සිටි රජ කිඳුරා මළේ යයි හෙළින් බැස තී හඬන්නට කාරණා කවරේ ද මම තී පාදපරිචාරිකාව කොට සොළොස් දහසක් පුරාංගනාවන්ට අග මෙහෙසිය කරමියි කීය. කිදුරංගනාව මේමාගේ සැමියාට විදි සොරා යයි දැන භය ශෝකය දෙකින් යුතුව වෙවුලමින් දිවගෙන ගොස් පර්වතය මුදුනට නැඟී අඬමින් මේ සා දුකක් උපදවන ලද සාපිෂ්ට වූ දෝහිය මාගේ ස්වාමියාව මා උදෙසා මැරී නම් මාගේ ස්වාමියාට පැමිණ මරණ දුක තට වේවා මට පැමිණියා වූ මරණ ශෝකය තගේ අඹුවට වේවා පාපිෂටය. තාගේ මව්ද නොදැක සොහොනට යේවා. දුෂට මහරජ තට ශාප වේවා යනාදී වශයෙන් කියමින් විලාප බස් දොඩන්නට පටන් ගත්තාය. රජ ඈ සනසමින් චන්ද්‍රිකාව තොප ශෝක නොකරව. තොප මට බිරින්ද වී රජ ගෙට එනු මැනවි.

කිඳුරිය - අවලක්‍ෂණ වූ තෝ මා නිසා නිරපරාධ වූ මාගේ සමනා මැරීද? ඔහු කෙරෙහි ස්නේහයෙන් අඬා මිය යතත් තොපගේ බිසව නොවෙමියි කීවාය. රජතුමා කිඳුරිය කෙරෙහි කිපී තිරිසන් වූ තිට රජ සැප විඳීමට භාග්‍යයක් ඇද්දැයි කියා යන්ට ගියහ. රජ ගිය නියාව දුටු කිඳුරිය පර්වතයෙන් බැස කිඳුරා ලඟට පැමිණ ඔසවා පර්වතය මුදුනට ගෙන ගොස් හිස තම ඇකයෙහි තබා ගෙන අඬන්නී. ආදර ස්වාමීනී පෙර ඔබ හා පර්වත ගුහාදියෙහි සිත් සේ ක්‍රීඩා කරමින් ඇවිද දැන් ඔබෙන් වෙන්ව මම කෙසේ සැනසෙම්ද? අපි මෙතෙක් කල් ක්‍රීඩා කළ ඇළ දොළ ගංගා වැලි තලා මල් ගොමු ලියවැල් ආදිය මට අද අඳුරු ගුහා මෙන් හතර විටින් දිස්වේ. අනේ හිමියනි කාගේ මුහුණ බලා ඉතින් මම දුක නිවා ගන්නෙම්ද? අහෝ ලෝකපාලන දෙවියනි මේ දුක මට ගෙන දුන්නේ කවරෙක්ද? ඉතින් දෙවි කෙනෙක් මෙළොව ඇත්නම් මහිමිට පැමිණ දුක නොපෙනේදෝ කියමින් අඬා උන්සඳ බමුණු වෙසින් එහි පැමිණ සක්දෙව් රජ කෙන්ඩියෙන් පැන් ඉස විෂබාටා ඉන් නැගිටුවා මේ මනුෂ්‍ය පථයෙන් තොරව චන්ද්‍රගිරි පර්වතයට ගොස් වාසය කරවයි පෙරසේම වාසය කළහ.

එසමයෙහි බරණැස් රජු නම් දැන් අනුරුද්ධ තෙරුන්ය. කිඳුරිය නම් යශෝධරා දේවීය. සඳ කිඳුරුව උපන්නේ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# මහා උක්කුස ජාතකය

සද්ධර්ම රාජයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් මිත්‍රගන්ත නම් උපාසකයකු අරභයා මේ ජාතකය වදාළ සේක.

සැවැත් නුවර සම්පත්තියෙන් පිරී ගිය එක් කුල පුත්‍රයෙක් කුල දුවක් පාවා ගෙන කිසි කටයුත්තකට පිහිටවන්නට සුදුසු මිත්‍රයෙක් විචාර නැතැයි කී කල ඇගේ අවවාද අනුව ක්‍රමයෙන් සතර වාසල් රකින දොරටු පාලයාගේ පටන් මහ රජ්ජුරුවන් දක්වා ද අසූ මහා සව්වන් වහන්සේ පටන් සර්වඥයන් වහන්සේ දක්වා ද මිත්‍රවී ලෞකික ලෝකෝත්තර සම්පත් ලබාගත්තේය. මේ කරුණ ගැන දම් සභා මණ්ඩපයෙහි උපන් කතාවක් අරභයා මහණෙනි, පෙර තිරිසන් යෝනියෙහි පවාඉපිද මැගේ බසින් බොහෝ මිත්‍රව පුත්‍ර සෝකයෙන් මිදුනේ වේදැයි ඉකුත් වත වදාළ සේක.

යටගිය දවස බරණැස බ්‍රහ්ම දත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හී දඩයමින් ජීවත් වන මිනිසුන් වසන එක් ගමක නුදුරින් මහා සයංජාත විලෙක් විය. ඒ විලට දකුණු පසින් එක් උකුසෙක් ද බස්නාහිර පැත්තෙන් එක් උකුසු දෙනක් ද උතුරින් සිංහ රාජයෙක් ද දකුණින් කර සුදු තඹ වලින් ලිහිණි රජෙක් ද විල මැද ඇති දූපතෙහි කැස්බෙක් ද වාසය කරන්නා හ. දිනක් උකුස්සා උකුසු ධේනුව සමග සරණ විචාළේය. ඈ උකුස්සා අතින් මිත්‍රයෙක් ඇත්දැයි විචාරා නැතැයි කී කළ එසේ නම් සබඳ අපට යම් බියක් උපන් විට ඉන් ගලවා පියන්ව සමත් මිත්‍රයකු ලැබීම මැනවයි කියා ඒ අවට වාසය කරන ඉහත කී සතුන් තිදෙනා හා මිත්‍රව ඒ අසළ ඇති කොළොන් ගසෙක කැදැල්ලක් බැඳ වාසය කරන්නාහු දරු පැටවුන් දෙදෙනෙකු ලද්දා හ. දිනක් දඩයමේ ගිය මිනිසුන් සමූහයක් ඇවිද කිසිවක් නොලැබ හිස් අතින් ආපසු විල අසලින් යන්නේ කුඩ මසුන්වත් අල්ලා ගෙන යමු යයි කථා කොට එහි නතර වී රාත්‍රී ගිණි ගොඩක් මොලවා ගත්හ. ඒ දුම් ඉහළ ගොස් උකුසු පැටවුන් කෑ ගසන්නට වන් හ. ඒ ඇසූ මිනිස්සු තෙල පක්ෂීන් මරා පුළුස්සා අනුභව කොට බඩගිනි නිවා ගනිමු යයි කරණ කථා ඇසුන උකුසු දෙ මේ මිනිස්සු මාගේ පැටවුන් මරා කනු කැමැත්තාහ. ඒ බව වහා ගොස් අපගේ මිත්‍ර ලිහිණි රජ්ජුරුවන්ට දන්වා එවයි උකුස්සා අමතා කීවාය. උකුස්සා ගොස් වැඳ නමස්කාර කොට ඉතා බැගෑපත්ව තමන්ට දඩයම් කරුවන්ගෙන් පැමිණෙන්නට යන විපත කියා වහා පිහිට වන ලෙස අයැද සිටියේය. ලිහිණි රජ්ජුරුවෝ වහා පැමිණ ඒ මිනිස්සු හුළු එළි බැඳ ගහට නගින අයුරු බලා සිට මුදුනට ළඟාවන කල්හී අසල විලෙන් පියාපත් තෙමාගෙන මුඛයෙන් ද පැන් ගෙන පියාඹා ගොස් හුළු එළියට ඉලය ඉස නිවා දමන්නාහ. මිනිස්සු නැවත බිමට බැස හුළු එළි දල්වා ගෙන ගසට නගින්නාහ. නැවත ද පෙර සේම නිවාපීහ. මෙසේ මධ්‍යම රාත්‍රිය ද ඉක්ම ගියේ ලිහිණි රජ්ජුරුවන්ගේ යට බඩේ මයිල් දා ගියේය. ඇස් රතුවන් විය. මේ බව දුටු උකුසු ධේනුව ලිහිණි රජ්ජුරුවන්ට ස්තූති කොට ඔහු යවා උකුස්සා අමතා කැස්බෑ ළඟට ගොස් මේ කාරණය දන්වා තමාට පිහිටක් වන ලෙස ඔහු කැඳවාගෙන එන්නැයි කියා යැවීය. උකුස්සා ගොස් කැස්බෑ අමතා මේ උවදුර දන්වා මෙයින් ගැලවුව මැනවයි කීය. කැස්බෑ ඒ අසා උකුස්සා අස්වසා එහි යාමට සූදානම් වන අතර ඊට නුදුරින් සිටිය කැස්බාගේ පුතණුවෝ පියාණන් වහන්ස වෙහෙස නොවුව මැනවි යයි කියද්දී ඔහු වලකා මාගේ මිත්‍රයන් සඳහා මමම යා යුතු යැයි කියා එම විලෙහි පතුලට ගොස් ඉස සහා සෙවෙල් ඇඟ ගල්වාගෙන අවුත් එම ගිණිගොඩ නිවා වැද හොත්තේ ය. එවිට මිනිස්සු මේ මහා කැස්බෑ දැන කුරුළු පැටවුන්ගෙන් කම් නැත. මේ කැස්බෑ මරා කමු යයි කියා සෙවෙල් මඩ ආදිය නිසා පෙරළාගත නොහී දුනු ආදියෙහි වූ වරලනු කඩා බැඳ අලිවනා කල්හි මහා බලැති කැස්පා ඔවුන් හා සමග පොකුණු දියටම ගියේය. ඒ මිනිස්සු මාංශ ලෝභයෙන් කැස්බා අත නොහැරියේ දියඹට ම ගියේය. නැවත ඔවුන් ක්‍ෂුධා පිපාස බලවත්ව අවුත් ගිනි දල්වා ගසට නැගෙන්නට උත්සහ කළහ. මෙය දුටු උකුසු ධේනුව තම මිත්‍ර සිංහ රජ්ජුරුවන් සමීපයට ගොස් උපකාර වන ලෙස දන්වන මෙන් කියා උකුස්සා යැව්වාය. තම මිත්‍රයාගේ ඉල්ලීම පරිද ඔවුන් පැමිණි දුකින් වහා මුදවා ගැනීමට සිංහ රජ්ජුරුවෝ කැමතිව ඒ මිනිසුන් සිටින සමීපයට පැමිණ තුන්යලක් නාද කොට ඉදිරියට ආහ. එකල්හි මනුෂ්‍යයෝ සිංහ රජ්ජුරුවන් දැක මරණ භයින් ඉස් ලූ ලූ අත දිව ගත්හ. සිංහ රජ්ජුරුවෝ ගස මුලට පැමිණ කිසිවෙකු නොදැක උන්නේය. එවිට ලිහිණි රජ්ජුරුවෝ ද කැස්බා ද පැමිණ වැඳ සිටියහ. සිංහ රජ්ජුරුවෝ ඒ හැමදෙනා එක් කොට මිත්‍ර ධර්මයෙහි අනුසස් ප්‍රකාශ කොට තවත් මිත්‍ර බව තහවුරු වන සේ අවවාද කොට ගියහ.

SANHIDA LANKA

ඒ සමයෙහි උකුසු දෙමහල්ලෝ නම් දැන් මිත්තගත්තයන් හා ප්‍රජාපතීය. මහා කැස්බා නම් මුගලන් තෙරුන් වූ අතර කැස්බා ගේ පුත්‍රයෝ නම් රාහුල කුමාරයෝ ය. ලිහිණි රජ වූයේ සැරියුත් තෙරුන්ය. සිංහ රජ්ජුරුවෝ නම් බුදුරජාණන් වහන්සේය.

# උද්දාල ජාතකය

තිලෝගුරු බුදු රජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් වංචාසහගත භික්ෂුවක් අරභයා මේ ජාතකය වදාළ සේක.

ඒ භික්ෂුව සිව්පසය නිසා තුන් වැදෑරුම් වූ කුහකගුණ පුරන්නේ ය. මේ ගැන දිනක් දම්සභා මණ්ඩපයෙහි උපන් කථාවක් අරභයා එහි වැඩි බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා මහණෙනි, පෙරත් ඔහුගේ පවත් එසේම වේදැයි ඉකුත් වත වදාළ සේක.

පෙර බරණැස බ්‍රහ්මදත්ත නම් රජකෙනෙක් රාජ්‍ය කරන කල්හි එරජුට ඉතා පණ්ඩිත ව්‍යක්ත පුරෝහිතයෙක් සිටියේය. ඔහු දිනක් උයන් කෙළියට ගියේ මනා රූපත් වෛශ්‍යාවක් දැන ඈ සමඟ එරහැන්ද ගසක් යටදී ලෝකාස්වාද රතියෙහි යෙදුනේ ය. මේ නියායෙන් දින දෙකතුනක් කල් යැවූයේ ඈට දරුගැබක් ඇති විය. ඒ බව දැන ස්වාමීනී, මට දරු ගැබක් පිහිටි කල කෙසේ වූ නමක් තබම්දැයි විචාළී ය. පුරෝහිත බමුණා වෛශ්‍යාවන්ට උපන් දරුවන්ට කුලගොත් අනුව නම් තැබිය නොහැකැයි සිතා එරහැන්ද ගසට වාතගත වෘක්ෂයයි කියන හෙයින් මේ ගස යටදී ගැබ්ගත් දරුවාට උද්දාල යයි නම්තබවයි කියා ඇඟිල්ලෙහි වූ පේරැස් මුද්ද දී දුවක් නම් මෙය විකුණා පෝෂ්‍ය කරව. පුතෙක් නම් වැඩිවිය පැමිණි පසු මා ලඟට එවන්නැයි නියම කොට යැවීය. ඈ නොබෝ දිනකින් පුතණු කෙනෙකුන් වදා උද්දාල යන නම තබා වැඩිවිය පැමිණි පසු ශිල්ප ශාස්ත්‍ර උගන්වා පේරැස් මුදුව දී තොපගේ පියා අසවල් පුරෝහිත බමුණායයි හඳුන්වා දී යැව්වාය. ඔහු ප්‍රඥාවෙන් අග්‍රව පිරිවර තාපසයන් පන්සියයක් ඇතිව ක්‍රමයෙන් පියා සිටන නුවරට පැමිණ එම රජ උයනෙහි රඳා නිදා උදය ගම දොරකට සිඟාවන්හ. මනුෂ්‍යයෝ බොහෝ දන් දුන්හ. උද්දාල තාපසයෝ පැමිණි ජනයාහට අනුමෙවෙනි දම්දෙසති. මොහුගේ පණ්ඩිත බව මුළු නුවරව පැතිරගියේ රජතුමා ද පුරෝහිත බමුණා සමඟ උයනට අවුදින් තැන තැන හිඳ කුහක තපස්කම් කරන්නා වූ ඔහුන් දැක පැහැදී මොහු අපාය භයින් මිදී ගියෝවනැයි සතුටුව උද්දාල තපස්වීන් කරා ගොස් පිළිසඳර කථා කොට එකත්පසව හිඳ සතුටු සිතින් පුරෝහිතයන් සමඟ කථා කරන්නේ පුරෝහිතයෙනි, ඒකාන්තයෙන් මොවුන් සසර දුකින් ගැලවෙන්නාහයි කීහ.  එපවත් අසා පුරෝහිත බමුණා මේ රජ අස්ථානයෙහි ප්‍රසාදයට පත් විය. මෙහිද නිහඬවීම යුක්ති නොවෙයි සිතා රජතුමෙනි ත්‍රිවේදය හැදෑරීමෙන් සසර දුකෙන් ගැලවිය නොහැක. සසරින් ගැලවීමට නම් මේ මිත්‍යා තපස් හැර පංචාභිඥා අෂ්ටසමාපත්ති ගුණයන් පුරුදු කළහු නම් සසරින් එතෙර විය හැකියි කීහ. උද්දාල තාපසයෝ මේ අසා රජතුමා අප කෙරෙහි පැහැදුනමුත් මේ බමුණා ඒ වලකාලීය. මොහු සමඟ කථාකර බලමියි පුරෝහිත බමුණා අමතා ආචාරිනි, මේ හදාරණ ලද වේද ශාස්ත්‍රයෙන් ප්‍රයොජනයක් නොවේයයි ඔබ කියන්නෙහිදැයි ඇසීය. එවිට පුරෝහිත බමුණා තපස්වීනි, එසේ නොකියමි. වේද ශාස්ත්‍රයෝ නිෂ්පල නොවන්නේ ය. ඒ වේද ශාස්ත්‍රය කරන කොටගෙන මෙලොව කීර්තියට හා යසසට පැමිණෙන්නාහුය. එනමුත් ශීල සංයමය හා නොවරදවා දැන කරන කසින පරිකර්මාදී භාවනා මනස්කාරයෙන් ඇතිව ඉක්මුණා වූ සත්වතෙම නිවන් පුරයට පැමිණෙන්නේ යයි කීහ. එපවත් අසා උද්දාල තාපසයෝ සිතන්නාහු මොහු සමඟ කථාකොට ජයගත නොහැක්ක. දරුවෝයයි කී කල ඔවුන් ස්නේහ නොකරන්නාහු යමෙක් නැත. එබැවින් මුන්ගේ දරුනියාව කියමියි පේරැස් මුදුව පෙන්වා එරහැන්ද සෙවනැල්ලේදි තොප නිසා උපන් මම තොපගේ කුලවංශය පාලනය කරන්ට යෝග්‍ය වූ පුත්‍රයෙක්මියි කීහ. එවිට පුරෝහිත බමුණා ඔහුට බ්‍රාහ්මණ ධර්මය කියා අවවාද කොට තවුස්වෙස් අස්කොට උපපුරෝහිත තනතුරෙහි තබා අනෙක් හොර තවුසන් පන්සියයට කඩු පලිහ දී රාජ්‍ය සේවයෙහි යොදවා ගත්හ.

එකල  උද්දාල නම් දැන් මේ මහණය. රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝ ය. පුරෝහිත බමුණා වුයේ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# මහීස ජාතකය

සද්ධර්මරාජයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරන සේක් උකටලී භික්ෂුවක් අරභයා මේ ජාතකය වදාළ සේක.

බුදුරජාණන් වහන්සේ ඒ අමතා බුද්ධ ශාසනයෙහි උකටලී වූයේ සැබෑ දැයි විචාරා සැබැවැයි කී කළ මහණ පෙර ගුණ දහම් පුරුදු වූයේ කෙලෙස්කම් නිසා උපන් පසයට නින්දා කොට හලෝ වේදැයි ඉකුත්වත වදාළ සේක.

ඉහත බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හි අසූ කෙළක් පමණ ධනය ඇති මහසල කුලයක උපන් මහාකංචන මානවකයා වැඩිවිය පැමිණ සිප් සතර නිමවා මා පියන්ගේ ඇවෑමෙන් සියළු ධනය අත්හැර උපකසුප් තම බාල සහෝදරයන සය දෙනා ද කංචන දේවී නම් තම නැගෙණිය ද එක් දාසයකු හා දාසියක් ද එක් මිතුරෙක ද ගෙන හිමාල වනයට වැද පියුම් විලක අසල පන්සලක් කොට තවුස්දම් රකිමින් වාසය කරනනාහ. එකල පළාපල නෙලීමට යන වනය අසළ එක් ගමෙක මහත් අරගලයක උපන්නේය. එවිට මහා කංචන තාපසයෝ ඔවුන් අමතා කිසිවෙක් එක්විට වනයට නොගොස් එකිනෙකාට මුර වශයෙන් බෙදා ගෙන ඵල වැළ සොයාගෙන වුත් කොටස් එකොළසකට බෙදා ගෙඩිය ගසා ලූ කළ සියළු දෙනා එක් වී තම කොටස් ගෙන තමන් වසන තැනට ගෙස් ඒ අනුභව ගොට සිතු සේ මහණදම් කරව් යයි නියමකොට තමා ද හුදකලාව සිට උසස් ලෙස ගුණදහම් පුරන්නාහ. කල් යාමෙන මෙම තවුස් ජනයාගෙ සීල තේජස දුටු සක් දෙව් රජ මේ තපස්වීන් කාමයෙන මිදුනෝ ද නො මිදුනෝ දැයි පරීක්ෂා කොට බලමියි යැයි සිතා දිනක නායක තාපසයන් උදෙසා වෙන් කළ පළතුරු කෙටස් අතුරුදහන් කළේය. ඔහු නිහඬ විය. දෙවැනි තුන්වෙනි දින ද තම පළතුරු කොටස අතුරුදහන් වූ පසු ගෙඩිය ගසා සියළු දෙනා එක්රැස් කොට විමසා බලා ඔවුන් තමා උදෙසා පළතුරු කොටස වෙන් කළ බවත් ඒ අතුරඅදහන් වූ බවත් දැන කවරෙක් හෝ තම පිරිසේ කෙනෙක් එය වංචා කර ගන්නට ඇතැයි සිතා පංචකාමය හැර මහණ වූවන් විසින් මෙවැනි දේවල් කිරීම නුසුදුසු යැයි කීහ. එපවත් අසා සියළු දෙනාම නොසතුටු වූහ. වනයෙහි ඒ තාපසයන් සමග මිත්‍ර වූ වනස්පතී රුක් දෙවියෙක් ද සමූහයෙන් වෙන් වූ ඇත් රජෙක් ද අහිගුණ්ඨිකයා අතින් මිදුනු එක් වඳුරෙක් ද එදින පැමිණ සිටියහ. සක්‍රයා ද පැමිණ නොපෙනී සිට ගත්හ. මෙවිට උප කසුප් නම් මල් නැගිට වැඳ සපථ කරමින් කියන්නේ යමෙක් තොප සතු පළතුරු සඟවා කෑ නම් ඔහුට පස්කම් සැපතින් පිරුණු ගිහිගෙයි සොඳුරු අඹු දරුවන් සමග එක් වීමට නැවත ලැබේවායි දිව්ලාහ. හැම කෙනෙක් එයින් ඔහු නිවැරදිකරු ලෙස පිළිගත්හ. දෙවෙනි සොහොයුරා නැගිට යමෙක් තොපසතු පළතුරු කොටස සැඟවූයේ නම් ගිහිගෙයි බොහෝ දරු සුරතල් බලා සැනහෙනුයේ ඉන් කිසිවක් අඩු වූ කල දොම්නසට නොපැමිණෙන්නෙක් වේවායි දිව්ලේය. මෙසේ හැමදෙනා දිව්ල පසු සක්දෙව් රජ මොවුන් අලුයම දැමූ කෙළපිඩක් මෙන් පස්කම් සැප හැර දැමූ යයි පෙනේ යයි සිතා සක්‍ර වෙසින් පෙනී සිට තපස්වීනි, ගොවිකම් වෙළඳාම් ආදී නොයෙක් දෙයින් දිවිපෙවෙත ගෙනයන මනුෂ්‍යයෝ ඉතා ප්‍රිය වූ පස්කම් සැපතට කුමක් නිසා නින්දා කළ යුතු දැයි පුළුවුත් හ. නායක තාපසයන් වහන්සේ ඔහුට පංචකාමයෙහි ආදීනව පෙන්වා ධර්ම දේශනා කළේය. එවිට සක්‍රයා බිය වී ස්වාමීනී මම ඔබ හැම දෙනෙක් පරීක්ෂා කිරීම සඳහා ඔබ සතු පළතුරු කොටස සඟවා කීමි. කිසිවෙක් සොරා ගත්තේ නැතැයි කියා ප්‍රසංසා කොට තමා වෙනුවෙන් කරදරවීම ගැන ක්ෂමාව ලබා ගෙන දෙව් ලොවට ගියහ.

එකල සහෝදරයන් සය දෙනා නම් මෙකල සැරියුත්, මුගලන්, මහ කසුප්, අනුරුද්ධ, පුණ්ණ සහ ආනන්ද යන සය දෙනා වහන්සේලාය. නැගෙණිය වූයේ උපුල්වන් ස්ථවිරිය. තාපස දාසිය නම් උත්තරාය . දාස තවුසා නම් චිත්‍ර කෙළෙඹි පුත්‍රයාය. රුක් දෙව් රජ වූයේ සාතාගිර යක් සෙනෙවිය. ඇත් රජ පාරිලෙය්‍ය නම් ඇතුය. වඳුරා වූයේ දැන් මී පිළිගැන් වූ වඳුරාය. සක්‍රයෝ නම් කාලුදායි තෙරුන්ය. නායක තාපසයන් වහන්සේ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# සුරුචි ජාතකය

සර්වඥ රාජයන් වහන්සේ සැවැත් නුවර මිගාර නමින් ප්‍රසිද්ධ වූ විහාරයෙහි වැඩවසන සේක් විශාඛාවන් ලබන ලද වර අටක් අරභයා මේ ජාතකය වදාළ සේක.

දිනක් විශාකාවෝ විහාරයට ගොස් බණ අසා දනට ආරාධනා කොට ගෙට වඩමවා මහා දන් දී බුදුන් වැඳ වර අටක් ඉල්ලීය. කවර වර අටක් ද යත් දිවි පමණින් සඟනට වස් වැසි සිවුරු දීම, ආගන්තුක බත් දීම, ගිලන්පස දීම, ගිලනුන්ට උවටැන් කිරීම, ඔවුන්ට වුවමනා බෙහෙත් සපයා දීම, සඟනට නිතර කැඳ අවුලුපත් දීම, මෙහෙණින්ට නානාකඩ දීම සහ ගමික බත් දීම යන වර අට වෙති. බුදුහු විශාකාව කවර අර්ථයක් සඳහා එසේ වර ඉල්ලන්නේදැයි අසා ඈ එහි අනුසස් කී කලහී තුන් යලක සාධුකාර පවත්වා අට වරය දී වදාළ සේක. දිනක දම් සභා මණ්ඩපයෙහි රැස් වූ භික්ෂූණ් අතර ඇවැත්නි, විශාකා මහ උපාසිකාව ගෑණු ආත්මයෙහි සිට බුදුන් අතින් අට වරයක් ලද යැයි ඈගෙ ගුණය ගැන කථා කරමින් උන් තැනට වැඩි බුදුරාණන් වහනසේ මහණෙනි, ඈ පෙරත් මා සමීපයෙහිම වරප්‍රසාද ලද්දී යයි ඉකුත්වත වදාළ සේක.

ඉහත මිථිලා නම් නුවර සූරුචි නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හි ඔහුගේ පුත්‍ර සූරුචි කුමාරයෝ වැඩිවිය පැමිණ ශිල්ප හැදෑරීමට ගොස් සිටිය දී බ්‍රහ්මදත්ත රජුගේ බ්‍රහ්මදත්ත කුමාරයා සමග එහිදී මිත්‍ර වී ඉගෙනීම අවසානයේ දී දෙදෙනාම ඔවුනොවුනගේ නුවරවල් වලට යනු පිණිස පිටත් වූයේ තම මිත්‍ර ධර්මය මතු නොසිදී පවතිනු සඳහා කුමාරයෝ දෙදෙනා නමින් උපදින දියණියන් සහ පුතණුවන් ආවාහ විවාහ කරමු යැයි කතිකා කොට ගෙන තම නුවර වලට ගොස් පියවරුන් ගේ ඇවෑමෙන් රාජ්‍ය කරන්නාහු සුරුචි මහ රජ්ජුරුවන්ට පුතණු කෙනෙකුන් උපන්නාහුය. උන්ට ද එම නම තැබූහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට දියණියක උපන්නී ඈයට සුමේධ දේවී යැයි නම් තැබූහ. සුරුචි කුමාරයෝ වැඩිවිය පැමිණි කල්හි බ්‍රහ්මදතත රජ්ජුරුවන්ට පත් යවා සුමේධා කුමරියගෙන් හා අග මෙහෙසුන් කොට රාජාභිෂේකයට පත් කිරීමෙන් පසු සූරුචි රජ්ජුරුවෝ යන නමින් ප්‍රසිද්ධ ව දැහැමින් රාජ්‍ය කරමින් විසූහ. ඒ බිසව දස දහසක් අවුරුදු වසන්නේ දරුවෙක් නොලද්දීය. නුවර වැස්සෝ නිතර රාජාංගනයට පැමිණ රජ පෙළපත නස්නේය. දරුවෙක් වහා ලබා දෙවයි මුර ගාන්නේය. රජතුමා තම බිසව කැඳවා දරුවන් ප්‍රාර්ථනා කරවයි කීහ. බිසව පොහෝ දින පෙහෙවස් ඉටා ගෙන ශ්‍රී යහන් ගබඩාවට පැමිණ තම ශීලය සිහිපත් කරමින් උන්නාය. ඇගේ ශීල තේජස දුටු සක්දෙව් රජ ඈ පුතුන් බලාපොරොත්තු වන බැව් දැක මහා පින්වත් දරු කෙනෙකුන්ට දෙන්ට වුවමනාවයි සිතා නලකාර දෙව්පුතුන් අමතා ඇගේ කුසේ පිළිසිඳෙන ලෙස දන්වා ඔහුගේ ප්‍රතිඥා ගෙන තෙමේ සෘෂි වෙසකින් රජ උයනට ගොස් ආකාශයෙහි සක්මන් කරමින් පුත්රුවන කාට වුවමනාදැයි අසා උයනේ සිටි දොළොස් දහසක් බිසෝවරු එකවිට අත් ඔසවා අපට වුවමනා වූ කල්හි තොපගේ ශීලය කවරේදැයි සිල්වත් කෙනෙකුට දෙමියි කියා සුමේධ දේවියගේ හැර අපගේ ශීලයක් නැතැයි කී කල්හි ශක්‍රයා ඈ වසන සිව් මැදුරු කවුලුව සමීපයෙහි අහසෙහි සිට තොපගේ ශීල ගුණය කුමක්දැයි විමසා හිත, කය, වචනය යන තිදොරින් කිසිම අකුසලයක් නොකෙළෙමි. මේ රජහුගේ මව්පිය දෙදෙනාට අත් පා මෙහෙවර කෙළෙමි. නිති පන්සිල් ආරක්ෂා කෙළෙමි. මේ සත්‍ය වචනයෙකි. මේ ශීල ගුණය කරණකොට ගෙන මට දරු සම්පතක් ලබා දේවා. මා කී එකක්වත් අසත්‍ය නම් මාගේ හිස සත්කඩ පැලේවායි කීවාය. ශක්‍රයා මෙය අසා ඉතා සතුටට පත්ව තොප කෙරෙහි මම පැහැදුනෙමි. තොපගේ රාජවංශය ගෙනයාමට සමත් දීර්ඝායුෂ්ක පුත් රුවනක් දෙමියි පුත්‍ර වරප්‍රසාද දී තමා ශක්‍රයා බැව් දන්වා ප්‍රසංශා කොට ගියහ. නලාකාර දිව්‍යපුත්‍රයෝ අලුයම් වේලෙහි දෙව් ලොවින් චුතව ඒ බිසව් කුස පිළිසිඳ ගත්තේය. මේ නලාකාර දිව්‍ය පුත්‍රයා වනාහී පෙර අත් බැව්හි බරණැස් නුවර ඉපිද තම පුත්‍රයා සමග පසේ බුදු කෙනෙකුන්ට පන්සලක් සහ සක්මනක් කොට දී වස් වසවා තුන් මසක් උවටැන් කොට සිවුරු පිළිගන්වා යැවූහ. මෙසේ සත් පසේ බුදු කෙනෙකුන් වහන්සේ ඒ පන්සල වස් වසවා තුන් සිවුරු පුදා දෙව් ලොව ගොස් ඉපදුන මහා පින්වතෙකි.

බිසවගේ ගර්භයට දස එකඩ මස් ඇවෑමෙන් පුතනු කෙනෙකු වැදූහ. ඒ කුමාරයන්ට මහාපනාද කුමාරයෝ යැයි නම් තැබූහ. මියුළු බරණැස් දෙරට ඇත්තෝ කුමාරයාට කිරි මිළ යයි එක් එක් කහවනුව රාජාංගනයට දැමූහ. ධන ගොඩෙක් විය. පිය රජ්ජුරුවෝ මහාපනාද කුමාරයා වැඩි විය පැමිණි කල රාජාභිෂේකයට පෙර රම්‍ය වූ ප්‍රාසාදයක් කරවා දෙම්හයි වාස්තු විද්‍යාචාරීවරුන් කැඳවා අපගේ මාලිගාවට SANHIDA LANKA නුදුරු තන්හි ප්‍රාසාදයක් කරවයි නියම කළහ. ඔහු ද යහපතැයි සුදුසු බිමක් පරීක්ෂා කරන්ට පටන් ගත්හ. ශක්‍ර දේවේන්ද්‍රයෝ එපවත් දැක විශ්වකර්ම දිව්‍ය පුත්‍රයන් කැඳවා මහාපනාද කුමාරයන්ට දිග පළල අඩ අඩ යොදුන් පමණ උසින් පස් විසි යොදුනක් ඇති සියක් මාල ඇති සත් රුවන්මය ප්‍රාසාදයක් මවා එවයි කියා යැවූහ. ඔහු ද වඩු ආචාරී වේශයක් මවා ගෙන පැමිණ බිම බලමින් වඩුවන් බත් කා පියා එවයි යවා තෙමේ රියන් දණ්ඩ ගෙන බිමට ගැසීය. එකෙනෙහි ඉහත කී පරිදි අලංකාර ප්‍රාසාදයෙක් පහළ විය. මහාපනාද කුමාරයන්ට ප්‍රවේශ මඟුල් අභිෂේක මඟුල් එක්වරම සත් අවුරුද්දක් දෙරට වැස්සෝ එක්ව කළහ. මෙසේ

සත් අවුරුද්දක් ඇවෑමෙන් උභය රජුවාසීහු ස්වාමීනී, මඟුල සමාප්ත වන්නේ කවරදාදැයි විචාළා හ. ඉක්බිති රජ්ජුරුවෝ මෙතෙක් මාගේ දරුවා සිනා සෙනවා නොදුටුවෙමි. ඔහු සිනාසුන දිනෙක මඟුල අවසන් කරන්නෙමි. එදින තොප තොපගේ රට රටවලට යවයි කීහ. ඉක්බිති නළුවෝ රැස් වී නව නෘත්‍ය ලක්ෂණයෙන් නෘත්‍ය දක්වන්නා හු මහාපනාද රජ්ජුරුවෝ සතුටකට පත් නොවූයේ බොහෝ කාලයක් දිව්‍ය නළුවන්ගේ නැටුම් දැක පුරුදු ඇති හෙයින් මේ නැටුම් අප්‍රිය බැවිනි. එකල ශක්‍ර දේවේන්ද්‍රයන් රජ්ජුරුවේ සිනාසෙවිය නොහී මනුෂ්‍යයන් විඳින වෙහෙස දැක රජ්ජුරුවන් සිනස්වා එවයි දිව්‍ය නළුවකු යැවූහ. ඔහු ගොස් රාජාංගනයෙහි සිට ශරීරයෙහි එක් අංශයක් නැටවීම නම් වූ අර්ධ රංග නෘත්‍යයක් දැක්වීය. අනෙක් අර්ධව නිශ්චලව තිබෙන්නේය. මේ නෘත්‍ය දුටු රජ්ජුරුවෝ මදක් සතුටට පත්ව මදක් සිනා සුනෙන් මඟුල ද සමාප්ත විය. මෙසේ මහාපනාල රජ්ජුරුවෝ අසංඛයක් අවුරුදු දිව්‍ය සම්පත් බඳු රජ සම්පත් අනුභව කොට ආයු කෙළවර ගොස් දෙව්ලොව උපන්නාහුය.

එකල්හී මහාපනාද රජ්ජුරුවෝ නම් දැන් භද්දිය තෙරුන්ය. සුමේධා දේවිය නම් විශාකා මහා උපාසිකාවෝය. ශක්‍ර දිව්‍ය පුත්‍රයා නම් තිලෝගුරු බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# පංචුපෝසත ජාතකය

ශාන්ති නායකයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක් එක් දවසක් පෙහෙවස් විසූ පන්සියයක් උපාසකවරුන් අරභයා මේ ජාතකය වදාළ සේක.

දිනක් බුදුරජාණන් වහන්සේ සිව්වනක් පිරිස මධ්‍යයෙහි පනවන ලද බුද්ධාසනයෙහි වැඩහිඳ උපාසකවරුන් අමතා කිමද උපාසකවරුනි, පෙහෙවස් සමාදන් වූයේදැයි විචාර එසේ යයි කී කලහි තෙපි හැම කරන ලද්දේ පෙර උතුමන්ගේ සිරිතක්මී යයි පසසා ඉකුත්වත වදාළ සේක.

යටගිය දවස කසී - කොසොල් - මගධ යන රටවල් තුනට මධ්‍යයෙහි මහ වනයක් විය. ඒ අසළ පන්සලක එක් තාපසකේ ද ඊට නුදුරු උණ පඳුරෙක තම අඹුව හා එක් පරවියෙක තුඹසෙක සර්ප රාජයෙක් වන ලැහැබක කැනහිලෙක් සහ වලසෙක් ද වසන්නේය. මෙකී සතර දෙනා තාපසයන් කරා එළඹ බණ කථා අසන්නාහ. දිනක් ගොදුරු සොයා ගිය පරෙවි ධේනුව උකුසෙක් ගසාගෙන ගියේ ය. ඇගේ වියෝගයෙන් සෝකයට පත් පරෙවියා ගොදුරු බිම හැර තාපසයන් කරා එළඹ පෙහෙවස් සමාදන්ව එකත්පසෙක හොත්තේය.

දිනක් සර්පයා තණ බිමෙක ගොදුරු සොයා ගියේය. ඒ අතර එක් ගොනෙක් පැමිණ තුඹසට අඟින් අනිමින් කෙළ කෙළ සිටියේ ඒ හඬින් වහා දුව ආ නාගයාව ගොන් අඩියට පෑගී ගියේය. එයින් කිපුණ නාගයා ගොනාට දෂ්ට කළේ ඌ එතනම ජීවිතක්ෂයට පත් විය. බොහෝ දෙනා එහි පැමිණ අඩා වැලප සුවඳින් මලින් හරසර දක්වා ගොනා වළලා දමා ගියේය. මම ක්‍රෝධය නිසා මෙතරම් අපරාධයක් කොට බොහෝ දෙනෙක්ව ශෝකයට පත් කෙළෙමි යි කම්පා වී ගොදුර නොකමියි සිතා අසපුවට පැමිණ ක්‍රෝධයට නිග්‍රහ පිණිස පෙහෙවස් ගෙන එකත්පසෙක උන්නේය. කැනහිලා ද ගොදුරු සොයා ගියේ මළ ඇතෙකු දැක බොහෝ කලෙකින් වටිනා ගොදුරක් ලබන ලදැයි සතුටුව සොඬය සපා බැලීය. එය කණුවක් මෙන් තදය. දළ සපා බැලීය. ඒ ගලක් මෙන් ය. මෙසේ යටිබඩ නගුට ආදී තැන් වික විකා බලා තද බැවින් තව දුරටත් පරීක්‍ෂා කර බලන්නේ වර්චස් මාර්ගය දැක එතන විකා බලා උණු තෙල් කැවුමක් මෙන් මොළොක් බව දැන ඉතා සතුටුව ඒ මාර්ගය ඔස්සේ කාගෙන බඩ තුළට ගොස් මස් කමින් පිපාසයට ලේ බොමින් ඒ තුළම බොහෝ දිනක් වාසය කළේය. මේ අතර අවු සුළඟින් ඇත් කුණ වියළී වර්චස් මාර්ගය ඇහිරී ගියේ ය. කැනහිලාට ඉන් පිට වීමට මාර්ගයක් නොදැක කෑමට ද දෙයක් නොමැතිව සුදුවූ ශරීර ඇතිව ශෝකයෙන් පසුවිය. ටික දිනකින් මහා වර්ෂාවක් වැටී ඇත කුණ මොළොක වී පුරුෂ මාර්ගයෙන් සිදුරක් පෙනී බොහෝ ප්‍රීතියට පත්ව ඒ මාර්ගය දිගේ ඉතා අමාරුවෙන් හිස දමා එළියට ඇදී ආයේ ශරීරයේ සියල් ලෝම ඒ මාර්ගයේ හිරවී තල් කඳක මෙන් සුදුවූ ශරීර ඇතිව මම දැඩි ලෝභකම නිසා මෙතරම් දුකට පැමිණියෙමි යි ලෝභයට නිග්‍රහ කිරීම සඳහා තාපසයන් ළඟට ගොස් පෙහෙවස් සමාදන්ව එකත්පසෙක හොත්තේය. වලසා ද වනයෙන් නික්ම ගොදුරෙහි දැඩි ලෝභයෙන් මලය රට පසල් ගමකට අවුත්වන. වලසා දුටු ගම්වැස්සෝ ද දුනු අවි මුගුරු ගෙන වනය වටකොට සිටගත්තාහ. වලසා ගම්වැසි ජනයා තමා වටකළ බැව් දැක එක් පසෙකින් කඩාගෙන පැන දුවන්නාහු ලුහුබැඳ දුනු ආදියෙන් තල තලා පස්සෙන් එළවාගෙන ගියහ. වලසා තුවාල වලින් යුක්තව තමා වසන තැනට ගොස් මේ භය මට අතිච්ඡතාව හේතුකොටගෙන ඇති විය. ඊට නිග්‍රහ කළ යුතු යැයි සිතා ආශ්‍රමයට ගොස් පෙහෙවස් ගෙන එකත්පසව හොත්තේය. ඒ තපස්වී ද ජාති මානයෙන් ධ්‍යාන උපදවා ගත නොහී කල්යවන්නේ ය. එක් පසේ බුදු කෙනෙක් මේ කාරණය දැක මොහු ලාමක සත්ත්වයෙක් නොවේ. බුද්ධාංකුරයක ඉනුත් මෙතෙම ලොව්තුරා බුදුවන්නේය. එබැවින් මොහුගේ අභිමානයට නිග්‍රහ කොට අභිඥා සමාපත්ති උපදවන ලෙසත් කරවමියි සිතා එහි වැඩ ගල් අස්න මත්තේ උන්නාහ. ඒ තපස්වීහු තමා ජාති මානයෙන් යුතු හෙයින් නොසතුටෙන් ඒ සමීපයට ගොස් අසුර ගසා කාලකණ්ණි චණ්ඩාල ශ්‍රමණය, කුමක් පිණිස මාගේ අස්නේ උන්නේ දැයි ඇසීය. ඉක්බිති පසේ බුදුහු ඕහට සත්පුරුෂය කුමක්නිසා මාණ නිශ්‍රිතවීද? මම පසේ බුදුවරයෙක්මි. තෙපි ද මෙම කල්පයෙහිම ලොව්තුරා බුදුවන බුද්ධාංකුර කෙනෙකි. පුරන ලද පාරමී ධර්ම ඇත්තේ ය. මතු බුදු වී ලොවට ශාන්තියක් කරන්නේ ය. ඉදින් පින්වත කුමක් නිසා මානයෙන් මත් වී සිටින්නෙහි දැයි අවවාද දුන්හ. මේ අවවාද අසාත් පසේ බුදුන්ට වැඳීමක් කළේවත් තමාගේ බුදු වීම පිළිබඳ විචාළේ වත් නැත. ඉක්බිති පසේ බුදුහු පින්වත, තාගේ ජාති විශේෂය හෝ මාගේ ගුණ විශේෂය මින් බලව. තොපද ගුණ ධර්ම වඩා අප සේම අහසෙහි ඇවිද බලවයි අහසට නැගී තම ශ්‍රීපාද ධූලි තවුසාගේ ජටා මඬුල්ලෙහි විසුරුවමින් හිමවතට වැඩියහ. ඒ පසේ බුදු වැඩි පසු තපස්වීහු මහත් සංවේගයට පැමිණ පසුතැවිලි වී තමාගේ මානයට නිග්‍රහ කොට සමාපත්ති උපදවා මිස මෙන් නොනැගිටිමියි පන්සලට වැඩ දඬු මැස්ස මත්තේ හිඳ භාවනා කොට නොබෝ වේලාවකින් සමාපත්ති උපදවා පන්සලෙන් එළියට පැමිණ සක්මන කෙළවර ගල් අස්න මත්තේ දැරූහ. මැණිකක් සෙයින් වැඩ උන්හ. මේ අතර ඉහත කී පරවියා ආදී සතර දෙනා සමීපයට එළඹ වැඳ උන්හ.

SANHIDA LANKA

තාපසයන් වහන්සේ උන් සතර දෙනා අතින් ගොදුරු සොයා නොගොස් පෙහෙවස් විසීමට හේතු විමසා දැන තමා ගැන උන් විචාර ලදුව තම මානය පසේ බුදුන් නිසා පහල කළ බැව් දන්වා අවවාද කොට තම තමන් වසන තැන් වලට යවා පන්සලට වන්හ. ඔවුන් කලින් කළ පැමිණ බණ අසා යන්නාහ. තාපසයන් වහන්සේ නොපිරුහුණ ධ්‍යානයෙන් බඹ ලොව වැඩියාහ.

එසමයෙහි කැනහිලා නම් දැන් මුගලන් තෙරුන්ය. සර්ප රාජයා නම් සැරියුත් තෙරුන්ය. තවුසානෝ නම් ලොව්තුරා බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# මහා මයුර ජාතකය

බුදු රජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් ශාසනයෙහි උකටලී භික්ෂුවක් අරභයා ජාතකය වදාළ සේක.

ඒ භික්ෂුව ස්ත්‍රීයක් දැක සුභ නිමිත්තග්‍රහ වශයෙන් බලා ලොභ උපදවා ශාසනයෙහි කළකිරි වත් පිළිවෙත් අතපසු කොට බුදුන් ඉදිරියට කැඳවූයේ මහණ, මෙසේ වූයේ සැබෑදැයි වදාරා පෙර සත් සියයක් අවුරුදු මුළුල්ලෙහි ක්ලේශයන් අභ්‍යන්තරයෙහි සඟවා විසූ සුඬ සත්වයන් පවා මේ ක්ලේශයට වසඟව පසුව නිදහස් වූයේ වේදැයි ඉකුත්වත වදාළ සේක.

ස්වර්ණ මයුර ජාතකය මෙනි.

SANHIDA LANKA

# තච්ඡසූකර ජාතකය

ධර්ම රාජයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක් මහළුතෙර දෙනමක් අරභයා මේ ජාතකය වදාළ සේක.

වඩ්ඪ සූකර ජාතකය මෙනි.

SANHIDA LANKA

# මහා වානිජ ජාතකය

අප සර්වඥ රජෝත්තමයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සෙක් එම නුවරම වසන වළෙඳුන් පන්සියයක් අරභයා මේ ජාතකය වදාළ සේක.

ඒ වෙළඳුහු දිනක් බුදුන්ට මහදන්දී සරණ ශීලයෙහි පිහිටා පන්සියයක් ගැල්භා නික්ම වෙළදාමට යන්නාහු මහාකාන්තාරයකට පැමිණ පැන් නැතිව සයින් මුලාව ඇවිදිනා කළ නාගපරි ගෘහිතවූ නුග ගසක් දැක එහි ගැල් මුදාහැර ඒ ගස පැන්ඇතිව වැඩුන එක් ශාඛාවක් දැක එකතු ගසට නංවා එය කපාපීය. ඉන් තල් කඳක් පමණ වූ දිය කඳක් ගලා බැස්සේය. හැම පැන් බී දකුණු ශාඛාව කැපූහ. ඉන් නොයෙක් රස භෝජන පිටත්වීය. ඒ අනුභව කොට පශ්චිම ශාඛාව කැපූහ. ඉන් සර්වාකාරයෙන් සැරසුන් ස්ත්‍රීහු පිටත් වූහ. උන් හා සමඟ අභිරමණිය කොට උතුරු දිග ශාඛාව කැපූහ ඉන් සත්රුවක් නික්මිණ ඒවායින් ගැල් පුරවා ගෙන සැවත් නුවරට නැවත අවුත් ඒ සම්පත් සඟවා තබා පුද පූජා ගෙන ජේතවනයට අවුත් බුදුන් වැඳබණ අසා දෙවන දවස් මහ දන්දී මේ පින් වෘක්ෂ දේවතාවට දෙම්හයි කියා තමා සම්පත්ලත් නියාව දැන්වූහ එවිට බුදුරජානන් වහන්සේ, තෙපි තෘෂ්ණා වසඟ නොවී සම්පත් ලබාගෙන ආවාහුය. පෙර තෘෂ්ණවට වසඟවූවෝ සම්පතින්ද ජීවීතයෙන්ද පිරිහුනෝ වේදැයි ඉකුත් වත වදාළ සේක.

යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍යකරන කල්හි එනුවර නුවණැති එක්සාත්තු නායකයෙකු සමඟ පන්සියයක් වෙළඳුමට යන්නේ නිධාන කථාවෙහි මෙන් පැන් නොලැබ ඇවිදින අතර එවැනි නුග ගසක් දැක පෙර සේම අතු කපා සියලු සම්පත් ලබා තවත් වැඩියෙන් සම්පත් ලැබීමේ බලවත් තෘෂ්ණාවෙන් ගස මුලින් සිඳ දැම්මේ අදහසින් පොරෝ ගෙන ඊට සුදානම් වූහ. එවිට සාන්තු නායක වෙළෙඳා පින්වත්නී, තොපට ජීවිතය පවා රැක ගැනීමට උපකාර වූ මේ ගස සම්පූරණ විනාශ කර දැම්ම මහත් අකෘතඥකමකි. නුවණැත්තෝ සෙවණ දුන් ගසක අත්තක් පවා සිඳ නොදමන්නාහ. එබැවින් මේ භයාණක ලාමක අකුසලය නොකරවයි දෙඅත් හිස තබා කීහ. ඒ නොඇසු අඥානයෝ ගස මුලින් කපන්ට වන්හ. මේ බව දුටු රජ්ජුරුවෝ මුන්ගේ අකෘතඥ භාවය දැක සාත්තු නායකයා හැර සියළු දෙනාවම ඇණබිඳ ජීවිතක්‍ෂයට පත්කොට දවා අළු මිටක් කොට පියවයි කීහ. නාගයෝ ඒ සියල්ල ඉටුකොට මිනිස් වෙසින් අවුත් සාකත්තු නායකයාව ඒ සියළුම වස්තු ව සමඟ ගැල් පන්සියය බරණැස් නුවරටම කැඳවාගෙන ගොස් ඔහුගේ ගෙයි තැන්පත් කොට අවසර ඉල්ලාගෙන තම නාග භවනයටම ගියාහ.

එකල නාග රජ්ජුරුවෝ නම් දැන් සැරියුත් තෙරුන්ය. සාන්තු නායකව උපන්නේ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# සාධීන ජාතකය

තවද සංසාර සාගරයට ක්‍ෂෙම නවුකාවක් වැනිවූ තවද සංසාර නැමති විෂ වෘක්ෂයෙහි හටගත් අමා ඵලයක් වැනි වූ හීනවූ කලියුග කාල නැමති හිණිවල පළානැගී සශ්‍රීකවූ පියුමක් බඳුවූ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජාණනන් වහන්සේ එක්සමයෙක්හි සුළුපා මහපා චංක්‍රමණ රාත්‍රි ස්ථාන දිවා ස්ථානදීන් විසිතුරුව සැඳුම්ලද ජේතවන මහා විහාරයෙහි වැඩවසන සෙක් එක්දවසක් පෙහෙවූ බොහෝ උපාසක වරුන් අරභයා මේ සාධීන ජාතකය ධර්ම දේශනාව කළ සේක.

ඒ කෙසේද යත් එක්සමයෙහි බුදුහු පෙරවරු දන්දී සවස් වේලෙහි ගඳ දුම් මල් පහන්ගෙන දෙවුරමට ගොස් බණ අසන පිනිස බුද්ධාසනය පිරිවරා උන් උපාසක වරුන්ට ආමන්ත්‍රණය කොට උපාසකවරුනි පෙර පණ්ඩිතවරහු තමන් සකසා වැසි පෙහෙවස් හි අනුසසින් මිනිස් කය නොහෙළා දිව්‍යලෝකයට ගොස් බොහෝ දවස් විසුයේ දේදැයි වදාරා උපාසකවරුන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත් වත් දක්වන සේක්.

යටගිය දවස මිථිලා නුවර සාධීන නම් රජ කෙනෙක් සතර සඟරාවතින් වියෝනව දසරාජධර්මයට අකොප්‍ය ව රාජ්‍ය කරන්නාහුය. සතර වාසල් දොරය නුවර මැදය තමන්ගේ දොරය යන සතන් හි සදන්හල් කරවා දවස ලක්ෂයක් ධන වියදම් කොට සියලු ජම්බුද්වීපයෙහි නඟුල් විය දඬු උඩ බඳවා සියලු සත්වයන්ට දන් දෙන්නාහුය, තවද දවස් පතා පංචශීලය ද පොහොය අටසිල් ද රක්නා හ, රාජ්‍ය වාසි ද ඒ රජහුගේ අවවාදයෙහි පිහිටා ධාන දී වූ පින්කම් කොට මල මල යම් කෙනෙක් දිව්‍ය ලෝකයෙහි උපදනාහුය, මෙසේ සුදම් දෙව් සභාව පුරාගෙණ උන්නාවූ තරුණ දෙවියෝ ඒ සාධීන රජ්ජුරුවන්ගේ ධාන ශීලචාර ගුණයෝ වර්ණණා කරන්නාහ, එපවත් අසා පළමු දිව්‍ය ලෝකයේ උපන් දේවතාවෝ රජ්ජුරුවන් දක්නා කැමති වූවාහුය. එසඳ ශක්‍රයෝ දෙවියන්ගේ අදහස් දැන රජ්ජුරුවන් දක්නා කැමැත්තාදැයි විචාරා ඒසේදැයි කී කල්හි මාතලී සංගහයකයා කැඳවා සාධීන රජ්ජුරුවන් කැඳවා එවයි විධාන කළහ. එසඳ යහපතැයි පිළිගෙන යෙළ සියයක් යොදුන් වෛජයන්ත නම් රථය යොදා වේදේහ රටක නික්මිණ. එදවසත් පුණුපොහෝදවස විය. එසඳ මාතරී දිව්‍ය පුත්‍ර තෙම මනුස්සයන් සවස බත්කා තම තමන්ගේ මිදුලුවල සැප කථාවෙන් යුක්තය උන් කල්හි යුගඳුරුමුදුනෙන් නැගෙන්නාවූ පුන්සඳ මඩල හා සමඟ රථය පදනට පටන් ගත. මනුස්සයෝ ඒ දැක අද දවස් දෙසඳෙක් නැගේයැයි කියමින් කතා කොට උන් කල්හි නැවත සඳමඩල පසුකොට රථය එන නියාව කොට ඒ තෙම සඳ මඩලෙක් නොවෙයි. රථයක එක් දිව්‍ය පුත්‍රයෙක් පෙනෙයි. මේ මනෝමය සෛන්ධවයන් යෙදූ දිව්‍ය රථය කාට ගෙනද්දෝහෝයි සමහර කෙනෙකුන් ආශ්චර්යාවකින් යන්ට වන් කල්හි ඉන් කිසි කෙනෙක් අනික් කාට ගෙනෙද්ද ධාර්මික වූ අපගේ රජ්ජුරුවන් වහන්සේටයැයි සතුටුව දෙහොත්මුදුනෙහි බැඳ ගෙන යස පිරිවරින් යුක්ත වූ අපගේ සාධීන රජ්ජුරුවන්ට දීව්‍ය රථයෙක් පළවීය, පෙර මේ ලෝකයේ නොදුටු විරූ අපූර්වදෙයෙක අපගේ ශරීරයේ ලොමු දහගත්තේ බලවයි කියමින් රථයට සුවඳින් මලින් පූජා කරන්නට පටන්ගත්හ.

මාතලී දිව්‍යපුත්‍රද මනුෂ්‍යයන් පූජාකරමින් සිටියදීම සත් යොදුන් මියුළු නුවර තුන් විටක් පැදකුණු කොට රාජද්වාරයට ගෙණගොස් රථය කරකවා රථයෙහි පසු භාගය මතුමාල්තලෙහි නැගෙණහිර සිවුමැදුරු කවුළුවට යොමුකොට නැඟෙන්නට යෝග්‍ය කොට තිබීය, එදවස් රජ්ජුරුවෝ දන්හළ බලා මෙම ක්‍රමයෙන් දන් දෙවැයි නියුතයන්ට විධාන කොට පෙහෙවස් සමාදන්ව දිවාභාගය යවා සවස ඇමති මඬුළු පිරිවරා අලංකෘත වූ මාල්තලෙහි නැගෙණහිර සිවුමැදුරු කවුළුවට අභිමුඛව ධර්මදානය දෙන කථාවෙන් යුක්තව උන්නාහ.

එද මහත් වූ ඉර්ධ්‍යානුභාව ඇති මාතලී නම් දිව්‍ය පුත්‍ර රජ්ජුරුවන් කරා එළඹ දික්පතල යසෝකිර්ති ඇති රජ්ජුරුවන් තව්තිසා භවනයෙහි වූ සුධර්මා නම් දෙව් සභාවෙහි පුරා උන් ශක්‍ර රජ්ජුරුවන් ප්‍රධාන කොට ඇති සියලු දෙවියෝ නුඹ වහන්සේ දක්නා අභිප්‍රා ඇත්තාහ, එසේ හෙයින් වහා අවුත් සිටිය මැනව, නුඹවහන්සේ දැක්මෙහි සතුටු දෙවියන් කරා මා සමඟ වැඩිය මැණවැයි ආරාධනා කෙලේය.

මෙසේ ඔහු පැවරූ ඉක්බිති සාධීන රජ්ජුරුවෝ රථයට නැංගාහ. එසඳ ඕහට දිව්‍ය ශරිරය පහළවිය, එකල්හි රථය ජනයා බලාසිටියදීම ආකාශයට නැගී තව්තිසා දෙව්නුවරට ගියේය.

SANHIDA LANKA

එකල්හි දිව්‍යලෝකයට ගියාවූ රජ්ජුරුවන් දැක දෙවියෝ මහත් වූ සොම්නසට පැමිණ මහරජ නිදුක්ව සැපයේ ආබව ඉතා යහපතැයි නැවත සතුටුව වැඩිය මැනවැයි ශක්‍රයන් හා සමඟ වැඩහුන මැනවැයි පැවරූහ.

ශක්‍රදෙවින්ද්‍රයෝද විශේෂයෙන්ම සතුටුව සමීපයට ගොස් කැඳවා එකහස්නේ හිඳුවාගෙන මහරජ කරන ලද පූණ්‍ය වශිතාවන් ඇති දේවතාවන් කරා නුඹවහන්සේ ඇවිත් පැමිණබව ඉතා මැනව, එසේ හෙයින් රජෝත්තමයානෙනි සියලු වස්තුකාම ක්ලේශකාමයෙන් අනූනවූ තව්තිසා භවනෙහි දිව්‍ය සම්පත්ති

අනුභවකොට විසුව මැනවැයි සාධීන රජ්ජුරුවන්ට ආසනයෙන් නිමන්ත්‍රණයකොට ශක්‍රදේවින්ද්‍රයන් විසින් රජ්ජුරුවන්ට දහසක් යොදුන් ශක්‍රභවනයද, අඩු තුන්කෙළ පුරඟනාවන්ද වෛජයන්ත ප්‍රාශාදය හා සමඟසියළු ශක්‍රබවන සම්පත් දෙකක්කොට බෙදා දුන්හ. මේ සම්පත් අනුභව කරන්නාවූ මහබෝධී සත්වයන්ට මනුෂ්‍ය ගණන, වෙන් සත්සියයයක් අවුරුදු පිරීගියේය.

ඒ ආත්ම භාවයෙන් දිව්‍යලෝකයෙහි වසන කුශල් ගෙවීන, ඒ කාරණයෙන් ශක්‍රයන් හා කැටුව කථාකරන්නාවූ බෝධිසත්වයෝ ශක්‍රදේවින්ද්‍රයෙන් මේ දිව්‍යලෝකයට පැමිණියාවූ මම පෙර තොපගේ මේ සුවිසි කෝටියක් පමණ නළුනාටකයන්ගේ නෘත්‍ය ගීත මාධ්‍යාදියෙහි සිත් අල්වා වාසය කෙරෙනුයි, එසේ වූ මම දැන් මේ දිව්‍යලෝකයෙහි ඇළුම් නැත්තෙමි කාරණා කිම්හොත් උචේඡ ද කර්මම වශයෙන් මරණ පැමිණියේද නැත. මම සිහිමුලාව ගියෙම් දැයි විචාළහ, ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රයෝ වියෘවන්තවූ උතුම් වූ රජ්ජුරුවෙනි තොපගේ ආයු ගෙවී ගියේත් නැත, සිහිමුලා බවකුත් තොප කෙරෙහි නැත්මය, එතකුදු වුවත් බල එකෙක් ඇත්තේය. ඒ ආත්ම භාවයෙන් මේ දිව්‍ය ලෝකයෙහි වින්ද යුතු කුශල් විපාක ස්වල්ප විය. එහෙයින් මහරජ තට අනභිරති උපනැයි කීහ.

මෙසේ කියා නැවත දික්පති වූ රජ්ජුරුවෙනි මම පෙර මේ ශක්‍රආත්මය පතා කුශලයක් කෙලෙන් නම් එම කුශලය දෙකක් කොට බෙදා පියා නුඹ වහන්සේට දෙමි. ඒ මාගෙන් දෙන ලද කුශලානුභාවයෙන් මේ නියා භවයෙහි අමානුසික වූ දිව්‍ය සම්පත් අනුභව කොට විසුව මැනවැයි පැවරූහ. ඉක්බිති ප්‍රතික්ශේප කරන්නාහ් ඒ බෝධිසත්තවෝ ශක්‍රදේවේන්ද්‍රයාණනි අනුන්ගෙන් පිරුළු වශයෙන් ඉල්වා ගන්නා ලද්දාවූ ඉදෝලිකුනම් ආදී යාන වාහන වස්ත්‍රාභරණාදියද යන මේ සියල්ලම සතුටු විට දී රුස්වූ විට එමෙන්ම අනුන්ගෙන් පිරුළු වශයෙන් දෙන ලද්දා වූ සම්පත් නොකැමැත්තෙමි. ඊට කාරණා කිම්ද යත් තමා කරන ලද කුශල් තමා හට ආවේනික වූ සම්පත් වන්නේයැයි කීහ. තවද ශක්‍ර දේවෙන්ද්‍රයෙනි ඉෂ්ටවිපාක දායක වූ කුශලයක්කොට සුවපත්නොවේද පසුතැවිලි වේද එබඳු කුශල් කරනු සඳහා මනුෂ්‍යලෝකයට යම් වදාලාහ.

එපවත් අසා ශක්‍රදේවේන්ද්‍රයෙනි මාතලී කැඳවාගෙන ගොස් සාධීන රජ්ජුරුවන් මිථිලාවෙහි උයනට රථයෙන් ගෙණගොස් තබා පීයා එවයි විධාන කළහ, එයින් එලෙසට කෙළේය.

රජ්ජුරුවෝ උයන්හි සක්මන් කරමින් සිටියාහ, උද්‍යානපාලයා දැක තත්ව විචාරා දැක ගොස් එවකට රජ කරන්නාහු නාරජ්ජුරුවෝ ඒ බව දැන තෝ පළමු කොට ගොස් උන්වහන්සේ මටත් ආසන දෙකක් පණවාලවයි නියෝගකොට උද්‍යාණපාලයා යවූහ. එසඳ එලෙස කෙලේය.

රජ්ජුරුවෝ එලෙස අසුන් දැක කවුරුන්ටදැයි විචාළහ. උද්‍යානපාලයා කියන්නේ එකක් නුඹවහන්සේටය එකක් අපගේ රජ්ජුරුවහන්සේටයයි කීය, එපවත් අසා සාධීන රජ්ජුරුවෝ මෙලොව කවරෙක් මා ඉදිරියෙහි අස්නක ඉන්ට ඒදැයි එක් ආසනයෙක ඉඳ එක් ආසනයක පයතුබූහ.

නාරද රජ්ජුරුවෝද මහපිරිවරින් අවුත් රජ්ජුරුවන් ශ්‍රිපාදය වැඳ එකත් පසෙක ඉඳ රජ්ජුරුවෝද ඒ සාධීන රජ්ජුරුවන්ට සවෙනි මුණුබුරානෝය. මහබෝධිසත්වයෝ තමන්වහන්සේගේ කුශල බලයෙන් මෙතෙක් කල් දෙවු සම්පත් අනුභව කළහ, එකල මනුෂ්‍යයන්ට පන්සියයක් අවුරුද්දට ආයුවන්නේය, ඉක්බිති සාධීන රජ්ජුරුවෝ නාරද රජ්ජුරුවන් අත අල්වාගෙණ උයනේ සක්මන් කරන්නාවූ පුත නාරද රජ්ජුරුවෙනි මේ භූමිභාගය පුෂ්පු පග එලු පග වෘක්ෂයෝද සොභමාන වූ රජ මෙල්පලාතිබෙන බිසෝකොටු වාරි මාර්ගාදියද, උභයපාර්ශ්වයෙහි නීල පීත මල්ගැවසී හඬා බස්නාවූ ගං හෝ ඇල කඳුරැලි ආදියද, තවද පියුම් මුලින් ගැවසී ගත් චක්‍රවාකාදීන් කුල්නාද සිත් කවුළු මේ පොකුණු පතස්වීල් ආදී වූ මේ උද්‍යානයට වා සිටි යථොක්ත වචනසට පත්තීහුද යන මේ සියල්ලම රජකරණ සමයෙහි භූමිභාගාදී වස්තුහුමය.

එසමෙහි මා විසින් සලස්වා සිටුවන ලද ඇපා මාපා යුවරජ සෙනෙවිරත් ලෙනා මහලෙනා ආදී වූ අමාත්‍යමණ්ඩලයද, තවද මාණික්‍යකුණ්ලහරණාදියෙන් සැදුම්ලද උතුම්ලද භාව භාව ලීලා කටාක්ෂයෙන් විරාජමානවූ අන්තඃපුර වනිතාවූ සියල්ලවුන් නොදක්නාවූ මට බැළු බැළු සියලු දික්හි ද්ස්වගියාවූමෙන් වැටහෙන්නේය, ඌ තෝ විසින් කවරක්දික්හි දේශයකට යවා පියන ලද්දැයි විචාළහ.

SANHIDA LANKA

ඉක්බිති නාරද රජ්ජුරුවෝ මහරජ නුඹවහන්සේ මෙවකට දිව්‍යලෝකයට ගියේ සත්සියයක් අවුරුදුය ඒ නුඹවහන්සේ ගේ උපස්ථායකයෝ සියල්ලෝම මරුමුඛයට ගියෝය. ඉන් නුඹවහන්සේ සන්තක රාජ්‍යය අනුශාසනා කළ මැනවැයි කීහ.

එපවත් අසා මහාබෝධිසත්වයෝ පුත නාරද රජ්ජුරුවෙනි දහසක් යොදුන් ඇති වෛජයන්ත නම් ප්‍රාසාදයෙහි ශක්‍රයන් හා නොවෙනස්ව අර්ධරාජ්‍යසම්පත්ති අනුභව කරන්නෙමි මා විසින් තවුතිසා වැසි සියළු දෙවියන්ගේ

කුශලයෙන් පහලවූ කණක රජතේන්ද්‍රිය ලෝහිතංක මසාරගල්‍යාදී නොයෙක් දිව්‍ය විමානයෝ දක්නාලදහ, තවද ඒ අමානුසික දිව්‍යසම්පත් ඇරපියා කුශල් කරණ සඳහා ආයෙමි, එසේහෙයින් මටද රාජ්‍ය සම්පත්තියෙන් ප්‍රයෝජන නැත, පුත නාරද රජ්ජුරුවෙනි මනා ආචාර වෘත ඇති උත්තමයෝ යම් මාර්ගයකින් නිවන්පුරයට වදිද්ද එසේවූ සම්‍යක් සම්බුඬයන් විසින් වර්ණාකරන වධබන්ධක රහිත සමයක්දෘෂ්ටි පෙර දැරිකොට අෂ්ටාංගිකමාර්ගානුසාරයෙන් විසුඹපරම්පරාවෙන් පැමිනිය මනා ඒ නිවන් මාර්ගය පසක් කරුණු කැමතියෙමි,එම බෝධිසත්වයෝ සර්වඥතාඥාණයෙහි පැහැඳ බණ වදාරා පුත නාරද රජ්ජුරුවෙනි සම්පත්තීන් මටප්‍රයෝජන නැති සත්සීයක් අවුරුදු පිරිහී ගිය දානය සත් දවසක් ඇතුළත දෙන්නා කැමැත්තෙම් වදාළසේක. නාරද රජ්ජුරුවෝද යහපතැයි එලෙසම දන් පිළියෙළ කළහ, මහාබෝධිසත්වයෝ සත්දවසක් මුළුල්ලෙහි මහදන් දී සත්වෙනි දවස කළුරිය කොට තවුතිසා දෙව්ලොව උපන්නාහයි යනාදී බුදුහු මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා උපාසකවරුනි පෙහෙවස් නම් එසේ මෙසේ කටයුතුදෙයක් වේදැයි වදාරා ජාතකය පූර්වාපරසන්ධිගලපා උපාසකවරුන්ගේ කිසිකෙනෙකුත් සෝවාන් මාර්ගයෙහිද කිසිකෙණෙකුත් සකෘතාගාමීමාර්ගයෙන්ද පිහිටුවා ජාතක ධර්මදේශනාව නිමවා වදාරා එකල නාරද රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථිවරයෝය, එකල උපඬ්ඩ රාජ්‍යය දුන් ශක්‍රයෝ අනුරුඬ ස්ථිවීරයෝය, සාධින රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# දස බ්‍රාහ්මණ ජාතකය

ධර්ම රාජයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් අසදෘස මහා දානය අරභයා මේ ජාතකය වදාළ සේක.

කොසොල් රජතුමා බුදුන් ප්‍රමුඛ මහ සඟණට මහ දන් පිරිනැමීමෙන් ඔහුගේ ගුණය ගැන දිනක් දම්සභා මණ්ඩපයෙහි කථාවක් උපන් කල්හි එහි වැඩි බුදුරජාණන් වහන්සේ මහණෙනි, මේ නුවනැති රජතුමාගේ දැන් දන්දීම පුදුමයක් නොව පෙර පඬිවරහු සුදුස්සන්ම තෝරා දන් දුන්නේ වේදැයි ඉකුත්වත දක්වා වදාළ සේක.

ඉහත ඉඳිපත් නුවර යුධිෂ්ඨිල ගොත්‍ර ඇති කොරව්‍ය රජකෙනෙක් රාජ්‍යය කරන කල්හි ඒරජුට මහ නුවණනැති විධුර නම් ඇමතියෙක් සිටියේය. කෝරව්‍ය රජතුමා නිති දන් දෙන්නාහ. ඒ දන් පිළිගන්වුන් අතර පන්සිල්වත් රක්නා කෙනෙක් නැත. දුශ්ශීලයෝය. මේ හේතුවෙන් නොසතුටට පත් රජතුමා පසුදා විධුර පණ්ඩිතයෝ තමා හමුවට ආ කල ඔහු අමතා පණ්ඩිතයන් වහන්ස, සිල්වත් වූ අය තෝරා දෙන දෙන මහත් ඵල මහානිශංස වන්නේය. එබැවින් සිල්වත් අයට දන් දෙනු කැමැත්තෙමි. ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙකු සොයා මට කියවයි කීහ. විධුර පණ්ඩිතයෝ මහරජ තුමනි, එවැනි සිල්වත් අය සෙවීම දුෂ්කරය මෙලොව බ්‍රාහ්මණයෝයයි ප්‍රසිද්ධ දස කොටසක් ඇත. මෙසේ ඔවුන්ගේ විභාග දත යුත්තේය.

1 නොයෙක් ඖෂධ වර්ග පසුබිම්වල දමා එල්වාගෙන ගෙන්ගෙට ගොස් අසවල් රෝගයට මේ මේ බෙහෙත් හොඳයයි නියම කරමින් අමනුෂ්‍ය උපද්‍රව දුරුකරමින් වෛද්‍ය කෘත්‍ය කරමින් ඇවිදින බ්‍රාහ්මණයෝය.

2 තමන්ගේ බ්‍රාහ්මණ ධර්මය හැර රජ ඇමතියන් කරා එළඹ තාලා ගෙණ ගී කියමින් ඔවුන්ගේ මෙහෙවර කරමින් ජීවත්වන බ්‍රාහ්මණයෝය.

3 කෙන්ඩිය අතින් ගෙණ රජ දරුවන් අනුව ගොස් මේ වස්තුව නුදුන්නොත් විනා නැගී නොසිටිම්හයි කිය ඉඳ ගම් වැද කැමති සම්පත් ගෙණ සහාසිකව හැසිරෙන බ්‍රාහ්මණයෝය.

4 දික්වූ හිසකෙසින් හා නියවලින් ගැවසීගත් මැලිවූ දත්වලින් අශෝභන වූ දා ගිය ශෝකයෙන් දැලි කණුවක් බඳු වූ දොර දොර සිඟා ඇවිදින බ්‍රාහ්මණයෝය.

5 අරළු බුළු ඇඹුල අඹ දඹ දෙල් පොල් තල් ඈ විකුට වෙළෙන්දන් මෙන් ජීවත්වෙන බ්‍රාහ්මණයෝය.

6 කෘෂි වණික් කර්මාන්ත කරමින් එළු ගවයින් හදමින් අඹු දරුවන් පෝෂ්‍ය කරමින් වෙළෙඳ ගොවීන් මෙන් ජීවත්වන බ්‍රාහ්මණයෝය.

7 නැකත් ලිවීම ආදීය කරමින් සතුන් මරා මස් විකුට සම්පත් උපදවා ගන්නාවූ බ්‍රාහ්මණයෝය.

8 මගරැක සිට වෙළෙඳුන් ගෙන් මුදල් පැහැරගෙන ජීවිතය ගතකකරන බ්‍රාහ්මණයෝය.

9 වනයට වැද දුනු හී යොදා තිරිසන් සතුන් මරා කමින් වැද්දන් මෙන් කල් ගෙවන බ්‍රාහ්මණයෝය.

10 අනුන් කල පව් නැති කරම්හයි සෝම නම් යාගයන් උපදවා බොහෝ සම්පත් රැස්කර ගන්නා වූ බ්‍රාහ්මණයෝයයි

මෙසේ දස කොට සක් ඇත්තාහ. මුන්ට ආරාධනා කොට දන් දෙමුවැයි විචාළහ. රජතුමා පණ්ඩිතයෙනි , මුන් තුළ බ්‍රාහ්මණ ධර්මයෙක් නැත. එබැවින් ශිලයක් ඇති කෙනෙකුන්ම පරික්ෂා කරවයි කීහ.

මහරජ, මම මෙතෙක් ඔබ වහන්සේට ව්‍යවහාර නාම මාත්‍රයකින් පමණක් බ්‍රාහ්මණයෝයයි සම්මත අය ගැන කීවෙමි. මේ ලෝකයෙහි නියම වශයෙන් පව් නැසු උතුම් ගුණ ඇති කෙළෙසුන් නැති කළාවූ මහා පින්වත් බ්‍රාහ්මණයෙක් ඇත. ඒ නම් ප්‍රත්‍යෙක සම්‍යක් සම්බුද්ධ වරයෙක්ය එසේ නම් ඒ උතුමන් අමතා දන් දුන මැනවැයි කීහ. ඒ ඇසූ රජතුමා ඉතා සතුටුව කොහි වෙසෙන්දැයි අසා උතුරු හිමවන නන්ද මූලක නම් පබ්භාරයෙහි වෙසෙනා බව දැන පණ්ඩිතයෙනි තොපගේ බලයෙන් ගෙන්වවයි කීහ. විධුර පන්ඩිතයෝ නුවර සරසවා පෙහෙවස් සමාදන් කරවා දන්පිළියෙළ කොට දෑසමන් දෝතක් ගෙන පසේ බුදුන්ගේ ගුණ සිහිකොට පසඟ පිහිටවා වැඳ දන් පිළිගැනීමට වඩිනා ලෙස ආරාධනා කොට දෑසමන් මල් අටමිටක් අහසට දැමුහ. ඒ මල් අට මිට අහසින් ගොස් පසේ බුදුන්ගේ මත්තෙහි හීන. පසේ බුදුවරයන් වහන්සේලා උන්ගේ අදහස් දැන අහසින් වැඩ රාජාඞගනයෙහි බැස පිළිවෙළින් වැඩ සිටියාහ. රජතුමා ඉතා සතුටට පත්ව මහ

SANHIDA LANKA

දන් දී සතියක් ම දන් දෙමියි ආරාධනා කොට දන් දී හත්වන දිනයෙහි පිරිකර පුදා වැඳ සිටියාහ. පසේ බුදුවරහුද අනුමෙවෙනී දම්දෙසා අහසින්ම වැඩි සේක. පිරිකර ද අහසටම නැගී ගියේය.

එකල කොරව්‍ය රජ්ජුරුවෝනම් දැන් ආනන්ද ස්ථවිරයෝය, විධුර පණ්ඩිතයෝ නම් බුදුරජාණන් වහන්සේය

SANHIDA LANKA

# භික්ඛා පරම්පර ජාතකය

තවද ශාක්‍යකුල තිලකවූ දසබලධාරීවූ ගෞතම ගොත්‍රයෙහි උපන් සම්මාසම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් කෙළෙඹි පුත්‍රයක්හු අරභයා මේ භික්ඛා ප්‍රම්ප්‍රා ජාතකය ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

ඒ කෙළෙඹිපුත්‍රතෙම ශ්‍රද්ධා ඇත්තේය, තුනුරුවන් කෙරේපණ බුදුන්ටද භික්ෂු සංඝයාටද නිරන්තරයෙන් සත්කාර සම්මාන කරන්නේය, ඉක්බිති එක් දවසක් සිතන්නේ බුද්ධරත්නයටද, සංඝරත්නයටද ප්‍රණීත භෝජන දීමෙන් ද සිහින් පිළි දීමෙන්ද බොහෝ සත්කාර කෙළෙමි, දැන් වනාහි ධර්ම රත්නයට සත්කාර කළ මැනවැයි සිතා ඒ තෙම බොහෝ ගඳ දුම් මල්පහණ් ගෙන්වාගෙණ දෙව්රන් වෙහෙරට ගොස් බුදුන්වැඳ එකත්පසව ඉඳ ස්වාමිනී ධර්මරත්නයට සත්කාර කරනු කැමැත්තෙමි, ධර්මරත්නයට සත්කාර කරන්න වුන් කලමනා කවරේදැයි බුදුන් අතින් විචාළේය. ඉක්බිති බුදුහු ඉඳින් ධර්ම්මරත්නයට සත්කාර කරනු කැමැත්තෙම් වී නම් ධර්මභාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරයන්ට සත්කාර කරවයි වදාළ සේක. එද යහපතැයි මුදුනෙන් පිළිගෙණ අනදමහතෙරුන් වහන්සේට ආරාධනා කොට පසුදවස මහත් වූ පූජාසත්කාරයෙන් ගෙට වඩාගෙණවුත් මහත්වූ ආසනයෙහි වඩාහිඳවා සුවඳින් මලින් පූජා කොට අනසි රසමසවුලෙන් යුක්තවූ ආහාරය පිළිගන්වා මාහැඟිවූ පිළිතුන් සිවුරට සෑහෙනපරිද්දෙන් පිළිගැන්වීය.

තෙරුන්වහන්සේ ද මේ සත්කාරය ධර්මරත්නයට කරනලද මට සුදුසු නොවෙයි විහාරයට ගෙණවුත් දම් සෙනවි සැරියුත් මහතෙරුන්වහන්සේට සුදුසුයැයි ඔබට පිළිගැන්වූ සේක, ධර්මයට කරන ලද සත්කාරය, ඒ සෙයින් මට සුදුසු නොවේ. ඒකාන්තයෙන්ම ධර්මස්වාමීවූ බුදුන්ට සුදුසුයයි පිළිගැන්වූ සේක. බුදුවූ තමන් වහන්සේට උත්තම කෙණෙකුත් නැති හෙයින් පිඬු වළදා සිවුරු පිළිගත්සේක. භික්ෂූන් වහන්සේ දම්සභාවෙහි කථාප්‍රවෘත්තනය කරණසෙක් අසෝ කෙළෙඹි පුත්‍ර තෙම ධර්මරත්නයට සත්කාර කෙරෙමි කියා අනදමහතෙරුන්වහන්සේට දන් දුන, ඔහු තමන්ට නුසුදුසු යැයි ධර්ම සේනාධිපති ස්ථවිරයන්ට දුන්හ. ඔහු තමන්ට නුසුදුසුයැයි බුදුන්ට පිළිගැන්හුහ, බුදුහු තමන් වහන්සේට උත්තර කෙණෙකුන් නැති හෙයින් ආහාර පිළිගෙණ වදාළ සිවුරු පිළිගත්සේක මෙසේ ඒ දාන පරිත්‍යාගය සුදුසු තැනට පැමිණියේයැයි, කථා කොට උන් සේක බුදුහු කථා ප්‍රබන්ධය අසා වදාළා තුන්තරාගමනින් එක්තරා ගමනෙක ධර්මසභා මණ්ඩපයට වැඩ පණවන ලද උතුම් වූ බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනු දැයි විචාරා මෙනම් කථාවකින් යුක්තව උනුහයි කී කල්හි මහණෙනි දැන් මතු නොවෙයි පෙරත් ප්‍රම්ප්‍රාවශයෙන් නිසිතැනට පැමිණියේවේදැයි වදාරා ඒ භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාරාණසේක් මහණෙනි,

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුත් සතර අගතියට නොගොස් දස රාජධර්මයෙන් වියෝනොව සතර සංග්‍රහවතින් යෙදී දැහැමින් රජ කරන්නාහුය. ඒ රජ්ජුරුවන්ගේ සභා ශාලා ආදිය සිස්ව ගියාක් මෙන් අයුක්ති පමුණුවන කෙණෙක් නැත්ල එතකුදු වුවත් ඒ රජ තමාගෙන් අගුණයක් සොයා ගන්නට උවමනැවැයි තමාගේ රජ ගෙයිද අන්තඃපුරයෙහිද ඇතුළු නුවරද පිටි නුවරද ගම්වලද නොයෙක් තැන් පරික්ෂා කොට තමන්ගේ නුගුණයක් කියන කෙණෙකුන් නැති හෙයින් තමන් සතු දීප දීපාන්තර වල පරික්ෂා කොට බලමිසිතා අමාත්‍යයන්ට රාජ්‍ය පාවා දී පුරෝහිතයා හා දෙදෙන තනිව අප්‍රසිද්ධ වේශයෙන් කශීරට ජනපදවල ඇවිදිනාහු තමන්ගේ නුගුණයක් කියන කිසි කෙණෙකුන් නොදැක පසල් දනව්වෙන් එක් නියම්ගමකට ගොස් පිටත ශාලාවෙක උන්හ.

එකෙනෙහි ඒ නියම් ගම් වැසි අසුකෙළත් ධන ඇති කෙළෙඹි පුත්‍රයෙක් ස්නානය කරන්නට තොටට යන්නෙහි ශාලාවෙහි උන් රන්වන් වූ සිවුමැලි ශරිරඇති රජ්ජුරුවන් දැක උපදනා ලද බලවත් වූ සෙනහ ඇතිව ශාලාවට වැද මෙසේ ඉඳුවැයි කියා ගෙට දිවගෙන ගොස් නොයෙක් රසමසවුලෙන් යුක්ත වූ ආහාරය සම්පාදනය කොට මහපෙරහැරින් බත්මසුන් ගෙන්වා ගෙන ශාලාවට නික්මුණාහ. එකෙනෙහි හිමවත වසන්නාහු පඤ්චාභිඥ අෂ්ටසමාපත්තිලාභීහු තපස්වී කෙණෙහි එම ශාලාවෙහි උන්හ. ගඳ පහන් පවුවෙන් අවුත් පසේ බුදු කෙනෙකුත් එතැන්හිම උන්හ, කෙළෙඹි පුත්‍රයාණෝ ගස්තධෝවයේදී තලියෙහි රසමසවුලෙන් යුක්ත වූ ආහාරය පුරා රජ්ජුරුවන්ට දුන්හ. රජ්ජුරුවෝ ඒ ගෙන ගොස් පුරෝහිතයාට දුන්හ, පුරෝහිතයෝ ගෙන තපස්වීන්ට පිළිගැන්හුහ. තපස්වීන් තලිය ගෙන දකුණතින් කමණ්ඩලාව පැන්ගෙන පසේ බුදුන් කරා ගොස් දකුණතින් පැන් වත්කොට පාත්‍රයෙහි බත් පුරාලූහ, ඒ පසේ බුදුහු කිසිකෙණෙකුන් නොකැඳවාම කාත්

SANHIDALANKA

නොවිචාරා වැළඳූහ, ඉක්බිති කෙළෙඹි පුත්‍ර සිතන්නේ මා වසින් රජ්ජුරුවන්ට දෙන ලද රජ්ජුරුවෝ පුරෝහිතයාට දුන්හ, පුරෝහිතයා තපස්වීන්ට දුන්හ, තපස්වීන් පසේ බුදුන්ට පිළිගැන්වූහ, පසේ බුදුහු කාත්නොවිචාරා නොබැණ ඉඳ වැලඳූහ, මුන් මුන්ට දෙන්ට කිමෙක් දෝහෝයි උන් නොබැණ ඉඳ වළඳන්නට කාරණා කවරේ දෝ හෝයි අනුක්‍රමයෙන් විචාරම් සිතා පලමු කොට රජ්ජුරුවන් කරා එළඹ

උතුම්වූ ප්‍රාසාදයෙහි කූඨාගාර අභ්‍යන්තරයෙහි අසුරන ලද සැප වූ ආස්ථරයන් ඇති ශ්‍රී යහන්හි සැතපෙන්නාහු සියුමැලි උතුම් වූ රූ ඇති කිසිම දුකකට අයෝග්‍ය වූ රජ්ජුරුවන් රමණිය වූ රාජ්‍ය හැර නිරුදක වූ වනයක් හා සදිසවූ පසල් ගමකට පැමිණියා වූ නුඹ වහන්සේ කෙරෙහි ප්‍රේම උපදවා ගත්තා වූ මම රසමසවුලෙන් යුක්ත වූ පවිත්‍ර වූ සිනිඳු වූ ඇල්සාලේ බත පිළිගැන්වීමි. ඒ නුඹ වහන්සේ අනුභව නොකොට බමුණන්ට දුන් සේක. මහරජ නුඹට නමස්කාරවේවැයි ඒ කෙසේ ධර්මතාවෙක්දැයි විචාළාහ. ඉක්බිති රජ්ජුරුවන් කියන්නාහු කෙළෙඹි පුත්‍රය මේ බ්‍රාහ්මණ තෙම මට ශික්ෂා ඉගැන්වූ ආචාරීව සිටියේය. උභය ලෝකාත්ව සිද්ධකරන්නාවූ යම් කටයුත්තක් විචාරා ගන්නට සුදුසුය. තවද මාගේ සියලු කෘතයෙහි ව්‍යවෘත්තය, එසේ හෙයින් ගරු වූ ගුණ ඇති ආචාරීහට භොජනය දෙනු කැමති වීමි කීහ.

ඉක්බිති කෙළෙඹි පුත්‍රයෝ පුරෝහිතයන් කරා එළඹ ගොයුම් ගෝත්‍ර ඇති පූජිත වූ පුරෝහිතයෙනි රජ්ජුරුවන් විසින් දෙන ලද රාජභොජනය තපස්වීන්ට පිළිගන්වන්ට කාරණා කිම්දැයි විචාළාහ. එසඳ බ්‍රාහ්මණයානෝ කියන්නාහු මම ගිහිගෙයින් වැස පුත්‍රදාරාදීන් පෝෂ්‍ය කොට අපමණ සම්පත පිහිටා පඤ්චකාමානුභව කෙරෙමි, එහෙයින් මට භොජන ප්‍රතිලාභ අරුම එම්බල කෙළෙඹි පුත්‍රයාණෙනි මහත්වූ වල වසන්නාවූ බොහෝ කලක් තපනිශ්‍රිත වූ ඉන්ද්‍රියන් මැඩ භාවිතකරන ලද සුවසන්තාන උතුම් වූ තපස්වීහට භෝජනය ලැබීම ආයාසයේ දැක පිළිගන්වාපීමි කීහ. ඉක්බිති කෙළෙඹි පුත්‍ර තෙම තපස්වීන් කරා එළඹ දුර්වල නහරවැල් ඉපිළගිය සිරුරු ඇතිව වැඩී ගියා වූ කක්ෂ ලෝමයන් හා නිය ඇති මැලි වූ දත් ඇති රජස්ධූලීවගුල ඉසකේ ඇති තපස්වීනි හුදකලාව වසන්නාවූ තොපි ජීවිතයෙහි ශාංකාවක් නැති ජීවිත නිරපේක්ෂ වූ තොපට කවර ගුණයක් හේතු කොට ගෙන මේ භික්ෂුන් වහන්සේට පිළිගැන්වූදැයි විචාළාහ.

ඉක්බිති තපස්වී කියන්නාහු එම්බල කෙළෙඹි පුත්‍රය, කටුඅල මෙනල තල් කලන් කඳු ගෙඩිය අල ආදී වූ අල මුල් කැණ ගෙන තවද ගොඩ හමු දියසිටි තැන ඇති වූ කුඩා ගැරවුරු එල එයින් බිමට ගලපා හැර ගෙන කුළු වලින් පොලා හැරගෙන පැහැස ගෙන පිසගෙන තවද ව්‍යංජන සඳහා කරපළා ආදීවූ ශාබාජාතිද නෙළුම්මලද නිමමීද සිංහ ව්‍යාඝ්‍ර ආදීන් කාහළ මස් කැබලිද කකාරාගෙන ජීවිකා ප්‍රවෘත්තිය පිණිස සුවපිල් රෝධීව ජීවත් වෙමි. එසේ විස හැර හැක්කාවූ මම සහසථ පාවනයක් නැත්තා වූ රාග ද්වේශ මෝහා දී සකල ක්ලේෂ වීධ්වංශනය කළ පසේ බුදු වහන්සේට මා ලද්දා වූ භොජනය දිපියනු කැමති වීම් කීහ. ඉක්බිති කෙළෙඹි පුත්‍රයා පසේ බුදුන් කරා එළඹ මනා වූ ආචාර වෘත වූ නිශ්ශබ්දව හිඳිනාසුළුවූ පසේ බුදුන් විචාරමියි, ඍෂින් විසින් දෙනලද රසමසවුලෙන් යුක්තවූ සිනිඳුවූ ආහාරය පිළිගෙන කිසිකෙනෙකුනුත් මන්ත්‍රණය නොකොට නොබැණ ඉඳ වැළඳූයේය. ඒ කවර ධර්මතාවෙක්දැයි විචාළාහ.

ඉක්බිති පසේ බුදුහු වදාරන සෙක් කෙළෙඹි පුත්‍ර තපස්වීද දකුණතින් පැන් ගෙන වමතින් භොජනය ගෙන දක්ෂිණෝදකය පිළිගැන්වූහ. මෙතැන් පටන්ගෙන අවසාන දක්වා ගුණෙන් උතුම් කෙණෙකුන්ට මේ භොජනය ප්‍රම්ප්‍රාවෙන් පැමිණ ආයේය. එසේ හෙයින් මමද මට මෙතැන් හි ගුණයෙන් වැඩි කෙනෙකුන් නැති හෙයින්ද නැවත දායක ව සිටි තොපනට හැම නිමන්ත්‍රණය කිරීමය, ප්‍රත්‍යනික පටිපදාවක ඇතුළත්ව පිණ්ඩ ප්‍රති පිණ්ඩයට ඇතුලත් වන හෙයින් එක් විසි අන්වේශණයට ඇතුලත් නොවූ හෙයින් නොබැණ ඉඳ වැලදුමහයි වදාළහ.

එපවත් අසා කෙළෙඹි පුත්‍ර තෙම මහත් වූ සොම්නසට පැමිණ මීට පූර්වභාගයෙහි යම් තැනකට දුන් දානය මහා එල මහානිසංස වන්නේයයි නොදත්මි, සබඳ රජ්ජුරුවෝ රාජ්‍ය ලෝභය ඇත්තාහ, බ්‍රාහ්මණයෝ කෘත්‍යාකෘත්‍යයෙහි ව්‍යාවෘතයහ, ඍෂිවරහු පලා එලයෙහි ලෝභයහ, මේ බුදුහු කිසිදෙයකත් අලග්නයහයි සියලු භවයෙන් මිදී නිවන් පසක් කළහ. සතුටුව උදම් ඇණිය.

පසේ බුදුහු ඕහට ධර්මදේශණා කොට ස්වකීය ස්ථානයට වැඩපීය. තපස්වීන් එසේම හිමාල වනයට වැඩියාහ. රජ්ජුරුවෝ කීප දවසක් ඒ කෙළෙඹි පුත්‍රයාණන් ස්වමීපයෙහි වැස බරණැස්නුවරටම ගොස් දැහැමින් රාජ්‍ය කලේය. යනාදීන් බුදුහු මේ ජාතක දේශනාව ගෙනහැර දක්වා මහණෙනි, දැන් මතු නොවෙයි පෙරත් ශික්ෂාව නිසි තැනට පැමියේ වෙදැයි පූර්වාපරසන්ධි ගලපා මහණෙනි එකල කෙළෙඹි පුත්‍රයාණන් ධර්මයට සත්කාර කළ කෙලෙඹි පුත්‍රයාය, එකල රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය, පුරෝහිතයා නම් සාරිපුත්ත ස්ථවිරයෝය, එකල්හි අභිඥාලාභී තපස්වීහු නම් දැන් ලොව්තුරා බුදුහු මම්ම වේ දැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# මාතඞග ජාතකය

බුදු රජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් උදේනි වංශයෙහි උපන් එක් රජෙකු අරභයා වදාළ සේක.

දිනක් පිණ්ඩෝල භාරද්වාජ මහ තෙරුන් වහන්සේ කොසැඹෑ නුවර උදේනි රජ්ජුරුවන්ගේ උයනට වැඩ එහි ධ්‍යාන සැපයෙන් උන් සේක. එදින එනුවර රජකරන අන්තඃපුර ස්ත්‍රීන් සමග උයන් කෙළියට පැමිණියේ නොබෝ වේලාවකින් රා මදයෙන් මත්ව එක් අඟනක ඇකයෙහි හිස තබා වැඳහොත්තේය. අනිත් පුරඟනෝ රජතුමාට නින්ද ගිය බැව් දැන තූර්‍ය්‍යය භාණ්ඩ පසෙක දමා උයන් සිරි නරඹමින් යන්නාහු සල් රුක මුල සමාපත්ති සුවයෙන්කල් යවන පිණ්ඩෝල භාරද්වාජ හිමියන් දැක වැඳ එකත්පස්ව උන්හ. තෙරුන් වහන්සේ ඔවුන්ට බණ දෙසූ සේක ස්වල්ප වේලාවකට පසු පිබිදී රජතුමා අවට බලා චණ්ඩාල කෙල්ලෝ කොයිදැයි විචාරා තෙරුන් ලඟ බණ අසමින් උන්නා දැක තෙරුවන් ගුණ නොදත් ඔහු වහා කිපී එහි පැමිණ එම්බල තවුස් වෙස්ගත් හොර මහණ, කෙලෙසුන් කෙරෙන් දුරුවූයෙමියි ලොවට පෙන්වා මේ නව යොවුන් ස්ත්‍රීන් සමඟ විනෝද වන්නේයැයි අක්‍රොශ පරිභවකොට අවටින් බොහෝ දිමි කූඩු ගෙනවුත් තෙරුන්ගේ ඇඟට දැමූහ. මෙයින් පීඩාවට පත් තෙරුන් වහන්සේ මහත් සෘඬි ඇතිව ආකාශයට නැගී ජේතවන දොරටුව සමීපයට බට සේක. බුදුරජාණන් වහන්සේ ඔවුන් දැක කාරණය දන්වා සේක් වීනමුත් විචාරීමෙන් ජාතක ධර්මයන් දෙසීමට අත්පේ්‍රාත්පත්ති වේදැයි සිතා තෙරුන් අමතා කොතැන් සිට කුමක් නිසා මෙහි පැමිණියෙහිදැයි අසා විස්තර දැන මහණෙනි, උදේනී රජතෙම ප්‍රවෘජිතයන් වෙහෙසුයේ දැන්මතු නොවෙයි පෙරත් හිංසා පීඩා කොට පෙලුයේ වේදැයි ඉකුත් වත දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජකෙනෙක් රාජ්‍යය කරන කල්හි එරට චණ්ඩාල කුලයක උපන් මාතඞග පණ්ඩිත යන නාමයෙන් ප්‍රසිද්ධ මානවකයෙක් විය. බරණැස් සිටාණන්ටද රුවින් අගතැන්පත් දිට්ඨමංගලිකා නමින් ප්‍රසිද්ධ දුවක් වූවාය. ඕතොමෝ මානවකයන් දැකීම මඟුලයි යන අදහසෙකින් සිටියාය. දිනක් ඈ පිරිවරින් යානාවකට නැගී උයන් කෙළියට යන්නීය. ඒ අතර මාතඞග පණ්ඩිත තෙමේ කිසි කටයුත්තක් සඳහා නුවරට යන්නේ ඇතුල් වාසල් දොරදී දිට්ඨමංගලිකාව දැක ඉවත ගොස් ඇලි ඇලී සිටියේය. ඈ තිරය අස්සෙන් වට පිට බලන්නී පණ්ඩිතයන් දැක කවුරුදැයි විචාරා චණ්ඩාල පුත්‍රයෙකැයි දැන අනේ නොදැක්කයුතු නීච පුරුෂයෙකු දුටුවිනිමැයි සුවඳ පැණින් ඉස් සෝදා නා උයන් කෙළියට නොගොස් කල කිරී ආපසු ගෙටම ගියාය. එහි සිටි බොහෝ ජනයා මේ දෘෂ්ඨවූ චණ්ඩාලයා නිසා නොමිළේ අපට ලැබෙන රාමස් ආදිය අද නැතිවගියේයයි කිපී පණ්ඩිතයන්ට අතින් පයින් ගසා දුර්වල කොට දමා ගියහ. පන්ඩිතයෝ ද ඇසිල්ලක් එහිම කල් යවා ඇගේ පිරිවර ජනයා නිවරදවූ මට හිරිහැර කළහ. මුන් මට දුන් වෙහෙසට මොවුන්ගේ ස්වාමී දුව වූ දිට්ඨමංගලිකාව ලදොත් මිස මින් නොයමියි අධිෂ්ඨානය කොට එබැව් දන්වා සිටාණන්ගේ දොරකඩ වැදහොත්තේය. මෙසේ දින හතක් ඉක්මී ගිය තැන සිටුතුමා දිට්ඨමංගලිකාව ඔහුට පාවා දුන්හ. ඈ පණ්ඩිතයන් අමතා ස්වාමිනි නැගී සිටුවයි කීහ. සොඳුර තොපගේ පරිවාර ජනයා මට බොහෝ හිංසා කළහ. නැගී සිටිය නොහැක්ක තොපගේ පරිවාර ජනයා මට බොහෝ හිංසා කළහ. නැගී සිටිය නොහැක්ක තොපගේ වාරුවෙන් මා ගෙන යවයි කියා ඇගේ ආධාරයෙන් නැගී සිට චණ්ඩාල ග්‍රාමයට ගියහ. පණ්ඩිතයෝ ඈ ජාතිභෙද නොකොට කීප දවසක් ගෙවා මම වනයට යමි එනතෙක් කලනොකිරී වසවයි වල්වැද ශ්‍රමණ ප්‍රවෘජ්‍යාවෙන් පැවිදිව භාවනාකොට ධ්‍යාන උපදවා සත්වන දවස්හි දිට්ඨමංගලිකාවට පිහිටවෙමියි සිතා සෘඬියෙන් අහසින් පැමිණ සැඩොල් ගම දොරෙහි බැස ගේ දොරට ගියේය. ඕතොමෝ ස්වාමියා ලඟට ගොස් ස්වාමිනි, මා අනාථකලේ මන්දැයි ඇඬුවාය. පණ්ඩිත තෙම සොඳුර, තොපට කිසි අඩුවෙක් නැත. නොබියව්, තොපට පෙරටත් වඩා සැප සම්පත් ලබා දෙමි තොප පිරිස මැද මෙසේ කියව, මාගේ ස්වාමියා එසේ මෙසේ කෙනෙක් නොව, මහා බ්‍රාහ්මයයි කියව දැන් තොපගේ ස්වාමියා කොයි දැයි විචාළ කල්හි බ්‍රහ්ම ලෝකයට ගියේය. අදින් සත්වන ලබන පසළොස්වක දිනයෙහි සඳ මඬල පලාගෙන එන සේකයි කියවයි නියමකොට හිමාලයට වැඩි සේක. දිට්ඨමංගලිකාවද බරණැස් නුවර මහජනයා මැඳට ගොස් පළමු සේ කියා ඇවිද්දාය මහ ජනයාද මෙයින් පුදුමයටත් ප්‍රීතියටත් පත්ව නියමිත දිනයෙහි රාශීභූත වෙමින් උන්හ. පණ්ඩිතයන් වහන්සේ පසළොස්වක දිනයෙහි සඳ අහස් මැදට වන් කල්හි බ්‍රහ්මාත්ම භාවය මවාගෙන සියළු කසීරටද දොළොස්යොදුන් බරණැස් නුවරද එකාලොක කොට චන්ද්‍ර මණ්ඩලය පලාගෙන බැස බරණැස් නුවර මත්තෙහි තුන් යලක් පැදකුණු කොට මහ ජනයාගෙන් පුජා ලබමින් සැඩොල් ගමට අභිමුඛවූ සේක. බ්‍රහ්ම භක්ති ඇත්තෝ සැඩොල් ගමට ගොස් දිට්ඨමංගලිකාවගේ ගෙය සුදු වස්ත්‍ර වලින් සරසා මල් ඉස සුවඳ දුම් දී වියන් බැඳ මහත් යානාවක් පනවා සුවඳ තෙලින් පහන් දල්වා පණ්ඩිතයන් වඩා හිඳවූ සේක.

SANHIDA LANKA

ටික වේලාවක් යහන් මත්තෙහි හුන් දිට්ඨමංගලිකාවෝ මල්වර වුවා දැන ඇඟිලි අඟින් ඇගේ නාභිය පිරිමැද්දේය. ඒ වේලෙහි ඇගේ බඩ ගැබ පිහිටියේය. පණ්ඩිතයන් වහන්ස ඈ අමතා සොඳුර, තොප ගැබ දරු ගැබක් පිහිටියේය. පුතකු වදන්නීය. තොපද යසසින් අග තැන්පත් වන්නේය. තොප පය සේදූ ජලය දඹදිව රජ දරුවන්ට අභිෂේක ජලය වන්නේය. තොප නහන ජලය වනාහි අමා ඖෂධ වන්නේය. යමෙක් ඒ ජලය ස්නානය කරයිද රෝග සන්සිඳ සියළු භාග්‍ය උදාවන්නේය. තොගේ පාපිටි හිස තබා වඳින අය දහසක් පුද දෙති ශබ්දය ඇසෙන තැන සිට වඳින අය සීයයක් දෙති. ඇස හමුවෙහි සිට වඳිනාවූ එක් කහවනුවක් දෙති. ප්‍රමාද නොවවයි අවවාද දීගෙන නික්ම මහ ජනයා බලා සිටියදීම අහසට පැන නැගී සඳමඩලට වන් සේක. එතැන් පටන් දිට්ඨමංගලිකාව නොයෙක් පුද පූජා ලබමින් හැසිරෙන්නී අටලොස් කෙළක් ධනයට හිමිකාරියක් වූවාය. නුවර මැද සත් මහල් මහා පායක වසන ඕතොමෝ පින්වත් පුත්‍රයෙක් වැදුවාය. විශේෂයෙන් පිළියෙල කළ මඩුවක උපන් හෙයින් මණ්ඩව්‍ය කුමාරයා යන නමින් ප්‍රසිද්ධ විය. ඔහුට අට හැවිරිදි වූයේ දඹදිව ප්‍රසිද්ධ ආචාරීන්ගෙන් වෙදත්‍රය හදාරා නිමි කොට සොළොස් වයස් වූ තැන පටන් දහසක් බමුණන්ට නිබඳ දන් පැවැත්වූයේය. භික්ෂුන් වහන්සේ ට හෝ ධ්‍යානලාභී තාපසවරුන්ට නොසලකන්නේය. දිනක් මාතඞග පණ්ඩිතයන් වහන්සේ හිමාල වනයේ සිට දිට්ඨමංගලිකාවත් පුතණුවන්වත් සිහිකොට බලන්නේ ධ්‍යානලාභී තාපසවරුන්ට බුහුමන් නොකර බ්‍රාහ්මණයන්ගේ ලබ්ධියම ගෙන ඇවිදින්නේයැයි දැක මම එහි ගොස් ඔහු මුදාලමියි සිතා පාංශකූලයෙන් කරන ලද සඟල සිවුරක් ඇතිව මැටි පාත්‍රයක් අතින් ගෙන ආකාශයෙන් අවුත් මණ්ඩව්‍ය කුමාරයන් බ්‍රාහ්මණයන්ට දන් දෙමින් සිටි ධාන ශාලාව සමීපයට බැස පිඬු සිඟනාකාරයෙන් සිටියේය. කුමාර තෙමේ ඈත මෑත බලනුයේ මොහු දැක කසල ගොඩක අධිගෘහිත ප්‍රේතයකු බඳු ප්‍රව්‍රජිතයා කොයි සිට මෙතනට පාත් වීද කුමකට ආයේදැයි විචාළේය. මාතඞග පණ්ඩිතයන් වහන්සේ පින්වත් මණ්ඩව්‍ය කුමාරයා තොපවිසින් උසස් කොට පිළියෙල කළ මේ ආහාර පාන පාපයට ගෙන සත්වයෝම කමින් ප්‍රීති වන්නාහ. කෙලෙස් සතුරන් මැඩ පවත්වන්නාහු චණ්ඩාලයකු දොරින් රැක සිට තොපගෙන් ආහාරයක් ගැනීමට සුදානම් වෙත්ද ජාති සම්පන්න අයව තෝරා දන්දෙන ලාමක සිත් ඇති තොප චණ්ඩාල අයට කවුරු දෙත්දැයි සිතත්ද එහෙයින් තොපට අවශ්‍ය ව සිටි මට දිවි රැකෙනා තරම යමක් දුන මැනවයි කීවේය. කුමාරයා එම්බල චණ්ඩාලය මේ මිහිරි ආහාර පාන උතුම් ජාතියෙහි උපන් බ්‍රාහ්මණයන් සඳහාමය. තොප වැනි අධමයන්ට නොවේ. මින් වහා පිටත යව. කුමාරය ධාන්‍ය කැමති ගොවීහු ගොඩකුඹුරු වපුරන්නාහ. වැසි නැති කල්හී වල කුඹුරු අස්වද්දන්නාහ. ජල ප්‍රවා භූමියෙහි හැම කල්හිම වපුට ඵල දකින්නාහ. එබැවින් මම දෘෂ්ඨාත්ත කොට සියල්ලෝන්ට දන් දෙව දෙලොවින්ම සැප ලැබෙන්නේය.

එම්බා අධමවූ ශ්‍රමණය, පුණ්‍යක්‍ෂෙසත්‍ර තොපට වඩාමම දනිමියි එබැවින්මේදොළොස් දහසක් උතුම් බමුණන් කෙරෙහි ධානමය කුසල් බිජුවට වපුරමි තොප නිහඬව පලායව.

එම්බා කුමාරය මම උතුම් ජාති ඇත්තෙක්මියි උඩඟුවෙද්ද විද්‍යාසම්පත්තීන් තමා උසස් කොට තියාම රූපා දියෙහි ඇලුම් කෙරේද තමාට නොයෙස්නා අය කෙරෙහි ද්වේෂ කෙරේද ඒ සියල්ලෝම දන් දීමට සුදුසු නොවෙති කීය.

කුමාරයාණන් මේ කිසිවක් පිළිනොගෙන කිපී මේ චණ්ඩාලයා බොහෝ දොඩන්නේය. මේ වාසල රැකවල්හු කොහේ ගියේදැයි ගුගුරා වාසල් තුනේ රැකවල්ගෙන සිටි උජ්ජානීය උපජ්ඣාය භඬකුක්ෂීය යන මුරකරුවන් තිදෙනා අමති මේ චණ්ඩාලයා අල්ලා උණපත්තෙන් සහ මුගුරෙන් තලා බෙල්ලෙන්ගෙන වාසලින්පිටත දමවයි නියම කළේය. එකෙනෙහි පණ්ඩිතයන් වහන්සේ අහස් නැඟ එම්බල කුමාරය අප වැනි ශාන්තවූ සිත් ඇති තපස්වීවරයන්ට නිග්‍රහ කරන්නට සිතන තෙපි තද ගල් නියෙන් කඩන්නේහිය යකඩ කටින් හපන්නේහිය ගිනි අඟුරු ගිලින්නේහියයි කියා සියළුම පිරිස බලා සියළුම පිරිස බලා සිටියදී වලාකුල් අතරට වැදී නැගෙනහිරට ගොස් එක් විථියකට බැස පියවර සලකුණු නොමැකෙන ලෙස අධිෂ්ඨානකොට වාසල් දොර සමිපයෙහි පිඬු සිඟා ගොස් මිශ්‍ර භෝජනයක් ලැබ එක් ශාලාවක්හි හිඳ අනුභව කෙළේය. නුවර අධිගෘහිත දේවතාවා කිපී තමාගේ පමණ නොදැන අපගේ පණ්ඩිතයන් වහන්සේට නිග්‍රහ කෙලේ වේදැයි යක්සෙන් සමග නුවරට බැස ප්‍රධානම යක්ෂයා පණ්ඩව්‍ය කුමාරයන්ගේ හිස පිටි අතට කරකවා පණ්ඩිතයන්ගේ පුත්‍රයා බැවින් නොමරා හළේය. කුමාරයන්ගේ සියළුම අංග විකල්වී ගියේය. සෙසු යක්ෂයෝ සොළොස් දහසක් බ්‍රාහ්මණයන්ගේ හිස් පිටි අතට කරකැවූහ. ඒ බ්‍රාහ්මණයෝද කෙළ වගුරමින් ඇත මෑත පෙරෙළෙමින් වැටි හොත්තාහ.

SANHIDA LANKA

පරිවාර ජනයා වහා ගොස් දිට්ඨමංගලිකාවට මේ පුවත දැන්වූයෙන් එහි පැමිණි ඇය සියල්ල පරික්ෂා කොට බලා කරුණු විමසා සෙසු කෙනෙකුන්ට මේ තරම් බලයෙන් නැත මේ පැමිණියෝ මාතඞග පණ්ඩිතයෝමයයි සිතා කුමකි හො මුන්ගේ වරදකින් මේ විපත්තිය සිදුකරගෙන ඇතැයි පණ්ඩිතයන් වහන්සේව සොයන අදහසින් ඔවුන් ගිය මග අසා පැන් පිරුණු රන්තලියද ගෙන මලාවද ගෙන දැසි දැස් පිරිවරා මහජනයා

පිරිවරනා ලදුව පියවර සටහන් අනුව ගොස් තාපසයන් වහන්සේ දැක වැඳ එකත්පස්ව සිටියේය. තාපසයන් වහන්සේ පාත්‍රයෙහි මදක් බත් ඉතිරි කෙළේය. ඈ තාපසයන් අමතා තම දරුවා ප්‍රධාන බමුණන්ට සිදුවී ඇති විනාශය විස්තර කරමින් අඬා වැලප පිළිසරණ වුව මැනවයි දෙපා ළඟ වැටුනාය.

දිට්ඨමංගලිකාවෙනි, උසස් අයට නිග්‍රහ කිරීමෙන් කිපුණ යක්ෂයන්ගේ අනතුරක් යක්ෂයන් විසින් තෙපගේ දරුවන්ට කළ විප්‍රකාරයෙකැයි කීහ.

ස්වාමීනි, මා කෙරෙහි අනුකම්පාවෙන් ඒ පුත් කුමරුවාට ක්ෂමාව දුන මැනවි පළමුත් දැනුත් මම ඔබවම සරණ ගියෙමි නමුත් මම දැන් පුත්‍ර සෝකයෙන් මඬනා ලද්දෙමි. වහාම ක්ෂමා කළ මැනවයි දැන්වූවාය පණ්ඩිතයන් වහන්සේ, එසේනම් යක්ෂ උවදුරු පිණිස ඖෂධයක් දෙමියි කියා ඉඳුල් කාඩි බත් දිට්ඨමංගලිකාවගේ අතෙහි තබා පළමුකොට තොපගේ දරුවන්ගේ මුඛයෙහි මින් භාගයක් තබා ඉතුරු ඉඳුල් බත් දිය සමග කලතා සෙසු බ්‍රාහ්මණයන්ගේ මුඛයෙහි වත්කරව එකල්හි සියල්ලම සුවපත් වන්නේයයි කියා ආකාශයට නැඟී හිමාලයට වැඩියහ. දිට්ඨමංගලිකාව ද පඬිවරයා කී පරිදි පළමු  පුත්‍ර කුමාරාට ඉඳුල් බත්දී සුවපත් කර ගත්තීය. මණ්ඩව්‍ය කුමාරයා ඇස් පිස දමමින් නැගී සිට මෑණියනි, මේ කිමෙක්දැයි ඇසීය. මව ඔහු අමතා පුත, දක්ෂිණාව පිළි ගැනීමට සුදුසු උතුමන්ට නින්දා කිරීමේ විපාක මොහොතකින් දුටුදැයි කියා මාතඞග පණ්ඩිතයන්ගේ පුවත කීය. පුත්‍රයා අතිශයින් කලකිරී මෑණියන්ගේඅවවාද අසා නැගී සිටියහ. දෙවනු මෑණියෝ තම පුත්‍ර අමතා එව දරුවෙනි, තොපගේ අනිත් බ්‍රාහ්මණයනුත් දුකින් මුදා ගනිමුයි ඉතුරු ඉඳුල් බත් දිය කලතා සොළොස්දහසක් බ්‍රාහ්මණයන්ගේ මුඛයෙහි වත්කරවූහ. ඒ සියළු දෙනාම ක්‍රමයෙන් ඇස් පිසදමින් නැගී සිටියාය. එකණෙහි ඒදේශයෙහි සෙසු බ්‍රාහ්මණයෝ මොහු හැම චණ්ඩාලයාගේ ඉඳුල් බත් කෑහයි බ්‍රාහ්මණයන්ට රැවටූහ. මොහු මෙයින් ලැජ්ජාවට පත්ව බරණැස් නුවරින් නික්ම මෙජ්ඣ නම් නුවරට ගොස් එහි මෙජ්ඣ නම් රජ්ජුරුවන්ට සේවයකොට විසුහ මණ්ඩව්‍ය කුමාරයා ඒ නුවරම විසුවේය.

එකල වෛත්‍රවතී නුවර ගොදුරු ගම්කොට වෛත්‍රවත ගංතෙර බ්‍රාහ්මණ කුලයෙන් පැවිදිවූ ජාතිමත්තය යන නමකින් ප්‍රසිද්ධ ව එක් තාපසයෙක් ජාති නියම කරමින් වසන්නේය. මෙය දුටු මාතඞග තාපසයන් වහන්සේ මොහු මාන බිඳිමියිසිතා ඒ ගඟ සමීපයට අවුදින් උඩුගඟ වසන්නේ එක් දවසක් උදෑසන දැහැටි කා මේ දැහැටි පොතු යට ගඟ ස්නානය කරන ජාතිමත්ත තාපසයන්ගේ ජටාවෙහි රැඳෙවයි අධිෂ්ඨාන කොට දියට දැමුවේය. එය එසේම විය. ඉන් කිපුනු ජාතිමන්ත තාපසයා ඒ පරික්ෂාව කොරමියි සිතා උඩුගං බලා යනුයේ පණ්ඩිතයන්ව දැක තෙපි කවර ජාති කෙනෙක්දැයි විචාළේය.

මාතඞග :- ස්වාමීනි මම චණ්ඩාලයෙක්මි

ජාතිමන්ත:- මේ ගඟ දැහැටි පොතු දැමුයේ තෙපිද?

මාතඞග :- එසේය මම දැමීය.

ජාතිමත්ත:- නැසීයා, පාළුවයා, කාලකණ්ණිවූ චණ්ඩාලයා මෙහි නොඉඳ යව, තා නොයන්නේ හීනම් යටගඟ වසව, මාතඞගයන් වහන්සේ යටගඟ වසන්නාහු කලද ඔහුගේ අධිෂ්ඨානයෙහි දැහැටි පොතු උඩුගං බලා විත් ජාතිමත්ත තාපසයන්ගේ ජටාවෙහි වැදගත්තේය. ජාතිමත්ත තාපසයා පෙරසේම ඔහු සොයා ගොස් තා මෙහි නොසිට යව, නොයන්නේහීනම් සත්වෙනි දවස තාගේ හිස සත්කඩකට පැලී යනන්නේයයි කීය. මාතඞගයන් වහන්සේ, මොහු කෙරේ මා නොකිපී උපායෙන්ම මානය බිඳිමියි සිතා සත්වන දවස හිරු නොනැගෙන සේ හිරු වැලකුයේය. මෙයින් බියවූ මනුෂ්‍යයෝ කිමෙක්ද මේ භූත උවදුරක්ද මහ සෘෂි කෙනෙකුගේ සාපයක්දෝයි ජාතිමන්ත තාපසයන් ලඟට ගොස් ස්වාමීනි, මෙය කෙළේ ඔබදැයි විචාළේය. ජාතිමත්ත තාපසයා නැත මම නොවෙමි. යට ගංහි චණ්ඩාලයෙක් වෙසෙයි ඔහුගේ යම්කිසි ප්‍රයෝගයකින් විය යුතුයැයි කීයේය. මිනිස්සු එහි ගොස් ස්වාමිනි හිරු නොනගින්නේ මන්දැයි ඇසූහ. මාතඞගයන් වහන්සේ පින්වත්නි, අනිකක් නිසා නොවෙයි තොපගේ මේ නුවර ගොදුරු ගම් කොට වසන ජාතිමත්ත තාපසයන් මට ආක්‍රොෂ කලේය. ඔහු ඇවිදින් ක්ෂමා කරවා ගත් කල්හි ඉරු මඩුල්ල උදා වන්නේයැයි කීහ. ඒ ඇසු ජනයෝ නැවත ගොස් ජාතිමත්ත තාපසයන්ට මේපවත් කියා මේ තාපසයන් ක්ෂමා කරවන්ට මැලි හෙයින් බලයෙන් ඇදගෙන අවුදින් පණ්ඩිතන්ගේ පාදමුලයෙහි වැද හොවා ක්ෂමා කරවා ඉර උදාකර වුව මැනවයි කීහ. එවිට මාතඞග පණ්ඩිත තෙම මෙසේ හිරු උදාකළ හොත් එම තාපසයන්ගේ ඉස සත් කඩක්ව ගැලෙන්නේයයි කීයේය. කළමනා කිම්දැයි පැමිණි පිරිස විචාළ විට මැටි පිඩක් ගෙන්වා කරවටක් දියෙහි තාපසයන් සිටුවා උන් හිසපිට මැටිපිඬ තබා රැඳවූ හිරු මඬල අලහ හිරු රැස වැදගත් පමණින් ඒ මැටිපිඬ සත් කඩකට පැළුනේය. තාපසයා පළමු මානය බිඳී සොළොස් දහසක් බමුණෝ කොයි දැයි බලනුයේ මෙජ්ඣ නම් රජ සමීපයෙහි වෙසෙතිය දැන මොහු හැමද දමනය කරමියි සෘඩියෙන් ගොස් නුවර කෙළවරට

SANHIDA LANKA

බැස පාත්‍රය ගෙන පිඬු සිඟා හැසුරුනේය. බ්‍රහ්මණයෝ ඔහු දුක මොහු මෙහි කීප දිනක් සිටියහොත් අපට පාඩු වන්නේයයි වහා රජ්ජුරුවන් ලඟට ගොස් ස්වාමිනි, වංචාකාර විද්‍යාධර තාපසයෙක් නුවරට ආයේය. ඔහු වහා ඇල්ලුව මැනවයි කීහ. රජතුමා එය පිලිගෙන මරණු පිණිස සේවකයන්ට විධානය කළහ. පිඬු සිඟාගෙන එක් පසෙක හිඳ බත් අනුභව කරන්නේ එහි පැමිණි රාජ පුරුෂයන්ගේ කඩුපහරින් දෙපළුවී මරණයට පත්විය පණ්ඩිතයන් වහන්සේ නොපිරිහුණු ධ්‍යානයෙන් ගොසින් බඹ ලොව උපන්නේය. පරාත්‍රී වරණයෙහි නීරතවූ හෙයින් ආත්මාරක්ෂාවෙහි සිත උපෙක්ෂා වීමෙන් ජීවිත විනාශයට පැමිණියේය. නිරපරාධ තාපසයන්ට කළ හිංසාව නිසා කලකිරුනු දෙවියෝ අනේක විධ වර්ෂා වැස්සවීමෙන් රට විනාශයට පත් කළහ. එය මෙජ්ඣ ආරණ්‍ය නමින් ප්‍රකටවීය.

එසමයෙහි මණ්ඩව්‍ය කුමාරයා නම් මේ උදේනි රජය මාතඞග පණ්ඩිත වූයේ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# චිත්ත සම්භූත ජාතකය

අනාථ නාථ වූ සර්වඥ රාජයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක් මහා කාශ්‍යප හිමියන් සමග වසන දෙනමක් අරභයා මේ ජාතකය වදාළ සේක.

ඒ දෙනම ඉතා මිත්‍රව එකටම කල් ගත කරන්නේ ය. ගිහි කලද එසේමය. මොවුන් දෙදෙනාගේ විශ්වාස වන්තභාවය ගැන දිනක් දම්සභා මණ්ඩපයෙහි කථාවක් උපන් කල්හි එහි වැඩි බුදුරජානන් වහන්සේ මහනෙනි, මේ දෙනම පෙර ආත්ම කිහිපයක්ම මෙසේ විශ්වාසය නොහැර පැවැත්තේ වේදැයි ඉකුත් වත වදාළ සේක.

යටගිය දවස උදේනි නුවර අවන්ති නම් රජකෙනෙක් රාජ්‍යය කරන කල්හී ඒ නුවර සමීපයෙහි චණ්ඩාල කුලයෙහි උපන් චිත්ත, සම්භූත නම් මිත්‍රයෝ දෙදෙනෙක් වූහ. උන් දෙදෙනා වැඩි විය පැමිණ වංශධොවන නම් ශිල්පයක් ඉගෙන එකෙක් උතුරු වාසල් දොරද එකෙක් නැගෙනහිර වාසල් දොරද ශිල්ප දක්වමින් කල් යවති. එකල එනුවර යහපත් දැකීම මගුලැයි පිළිගත් දිට්ඨමංගලිකාවෝ ශිල්ප දක්වන චණ්ඩාල පුත්‍රයන් දෙදෙන මුහුණ බලා චණ්ඩාල පුත්‍රයන් අසා නුදුටුමනා දෙයක් දුටුම්හයි දොම්නස්ව සුවඳ පැනින් නා උයන් කෙළියට නොගොස් නතර වූහ. පිරිවර ජනයා චණ්ඩාලයන් නිසා අපට වූයේ බලවත් පාඩුවකැයි උන් දෙදෙනාට තලා ඉවත ඇද දමා ගියහ. ටික වේලාවකින් උන් දෙදෙන සිහි ලැබ අපට ගැහැට වූයේ හීන ජාතිය නිසා නේද ජාති සඟවා ශිල්ප ඉගෙන ගනිමුයි රහසින් බමුණු මානවකයන් දෙදෙනෙක් බැව් හඟවා තක්සලා නුවර දිසාපාමොක් ඇදුරන් වෙත ගොස් ශිල්ප උගන්ට පටන් ගත්හ. එකල චණ්ඩාලයෝ දෙදෙනෙක් ජාති සඟවා ශිල්ප උගනිතියි මුළු දඹදිව ප්‍රසිද්ධ විය. ඔවුන් දෙදෙනාගෙන් චිත්ත පණ්ඩිතයෝ වහා ශිල්ප නිම විය. දිනක් ගම්වැසි පුරුෂයෙක් බමුණන්ට දනක් දෙමියි කියා ආචාරීන්ට ආරාධනාවක් ලැබුණේ කලින් දින වර්ෂාව ඇති වූ හෙයින් තමාට එහි යා නොහැකිව චිත්ත පණ්ඩිතයන් අමතා සෙසු මානවකයන් කැටුව එහි ගොස් දන් වළඳා යාග කොට අපටද අහරක් ගෙන එවයි නියම කළේය. ඒ මිනිස්සු උණු කිරිබත් තලිවල දමා බමුණන් ලඟ තිවෙන්ට තිබූහ. සම්භූත කුමාරයා කෑමෙහි ඉතා ගිජු හෙයින් ඉවසාගත නොහී උණු කිරිබත් ගුලියක් මුවෙහි ඔබා ගත්තේ ය. දිව හා තල්ල දා ගියේය. සිහිය එළවා ගත නොහැකි වූ ඔහු චිත්ත පණ්ඩිතයන් මුහුණ බලා චණ්ඩාල භාෂාවෙන් එළු යයි යන බසක් කීයේය. චිත්ත පණ්ඩිතයෝත් ඊටම සරි බසක් ගැලපීය. එකෙනෙහි සෙසු පණ්ඩිතයෝ උන් මුහුණ බලා මේ කුමන භාෂාවක්දැයි විචාළාහ. චිත්ත පණ්ඩිත තෙම අභිවෘද්ධි වේවායි යන මංගල වචනයකැයි කීයේය. එසේ වුවත් සෙසු මානවකයෝ සාකච්ඡා කොට චණ්ඩාල භාෂාවයයි දැන බොල දුෂ්ඨ වූ චණ්ඩාලයෙනි බ්‍රාහ්මණයයි කියා අපට වංචා කළේ වේදැයි කිපී අතින් පයින් තලා දුර්වල කළහ. එක් සත්පුරුෂයෙක් ඔවුන් වළකා තොපගේ ජාති නිසා පැමිණි දෝෂයකි. මතු මෙබන්දක් නොකොට තපස් කොට ජීවත් වෙවයි ඔවුන් යවා ආචාරීන්ටද එය නොහඟවා උන්හ. චණ්ඩාලයෝ දෙදෙන වලට වැද ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ටික දිනකින් මිය ගොස් නෙරංජරා නම් ගංතෙර මෘග ධෙනුවක කුස පිළිසිඳ ගත්තාහ. මුව පැටැව් දෙදෙන එක්වම ඇවිදිමින් එකට කෙළෙමින් කල් යැවූහ. දිනක් වැද්දෙක් එකම ඊ පහරකින් මුව පැටව් දෙදෙනාම මරා දැමීය. ඉන් චුතව නර්මදා නදීතීරයෙහි උකුස් ධෙනුවක බඩ පිළිසිඳ එකට හැසිරෙන්නේ ඒ ආත්මයේද වැදි පුත්‍රයෙකුට අසුවිය. එකෙක් කොසඹෑ නුවර රජ්ජුරුවන්ගේ පුරෝහිත බමුණාට පුත්වද, එකෙක් උත්තර පංචාල නුවර රජ්ජුරුවන්ට පුත්වද උපන්නේය. උපන් දෙදෙනම ජාතිස්මරණඥාන ඇතිව සිටින්නාහ. රාජ පුත්‍රයා සතරවන ජාතිය දක්වා පමණක් දක්නේය. පුරෝහිත පුත්‍රයාට බොහෝ ජාති දැක්ක හැක. ඔහු වැඩිවිය පැමිණ සියළු නිමවා හිමවත් පෙදෙසට ගොස් පැවිදිව ධ්‍යාන උපදවා විසීය. රාජපුත්‍රයා පියාගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ අභිෂේක දවස මහජනයා මැද උදන් අනනු වශයෙන් මංගල ගී දෙකක් කීයේය. සියළු නුවරවාසීහුද ගාන්ධර්වයෝද ඒ ගී ඉගෙන ගායනා කෙරෙති. දිනක් තාපසයන් වහන්සේ තම මිත්‍ර රාජපුත්‍රයා ගැන බලනුයේ බාල වයසින්ම රාජ්‍යයට පත් බැව් දැන දැන්ම දමනය කළ නොහැක්ක ඔහු මහළු වූ කල ඔහු කරා ගොස් බණ කියා හික්මවා මහණ කරවමියි සිතා පනස් අවුරුද්දක් කල් බලා හිඳ දිනක් අහසින් අවුත් රජ උයන මත්තෙහි රන්පිළිමයක් මෙන් හුන්නේය. එකෙනෙහි එක් ළදරුවෙක් ඉහත කී ගාථා දෙක කියමින් යන්නේය. තාපසයන් වහන්සේ ඒ ළදරුවා ළගට කැඳවා මේ කුමන ගාථාවක් දැයි විචාරා දැන තොපගේ රජ්ජුරුවන්ගේ ගීයට ප්‍රතිඋත්තර ගීයක් කියන කෙනෙක් නැද්දැයි විචාරා නාතැයි කීකල එසේ නම් මේ ගීය කියව තොපට රජතුමා මහත් වස්තුව දෙන්නේයැයි කීයේය. ළදරුවාද ගෙට ගොස් මෑණියන්ට කියා මනාව සැරසී රජුන් ඉදිරියට ගොස් වැඳ අවසර ගෙන මහත් පිරිස මැද හිඳ ස්වාමීනි ඔබේ ගී දෙක ප්‍රථම වදාළ මැනවි. මාගේ ගීය පසුව කියමියි දැන්වීය.

SANHIDA LANKA

රජතුමා- 1 මෙලොව සියලු සත්වයන් විසින් කරන ලද සියළුම කුසලාකුසල කර්ම විපාක හිස් නොවී පල දෙන්නේය. මේ ජාතියට සතරවන ජාතියෙහි චණ්ඩාලව ඉපද රැකි සිල් බෙලෙන් මෙවැනි රජ සිරියකට පැමිණියෙමි. එබැවින් කළ කුසල් සියල්ලම පල ලද්දෙමි.

2 සැඩොල් කුලයෙහි ඉපිද එක්ව සිල් රැකි මාගේ මිත්‍ර චිත්ත පණ්ඩිතයන්ට කුමක්වීද ක්ලේශ වසඟවීද ඔහු කොයි ඉපදී ඇද්ද? යන අදහස් වලින් යුත් සර්ව නගරංසළුලං යන ගාථා දෙක ප්‍රකාශ කළහ. එවිට,

ලදරුවා- කළ කුසලාකුසල දෙක පලදීම ඒකාන්තයයි තොප කීවේ සැබෑ වචනයක්මය. එසේ හෙයින් තොප රැකි සීලයේ බලයෙන් සම්භූත නම් රජව සැප විඳින්නෙහිද එපරිද්දෙන් චිත්ත පණ්ඩිතයෝ යන නමින් ප්‍රසිද්ධව කාමයෙහි ආදීනව දැක සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධ්‍යානලාභීව දැප විඳිමින් සිටින්නෙමි. එබැවින් අප දෙදෙනා සතර වන ජාතියෙහි කළ කුසල විපාකය විඳිමින් සිටින්නෙමු. යන අර්තය ඇති ගීය කීයේය. රජතුමා එබස් අසා තොප චිත්ත පණ්ඩිතයන්ගේ බෑණනුවන් වේදෝයි සතුටට පත්ව ධනයෙන් ආඪ්‍ය වූ ගම්වර සියයක් දී පිරිස පිරිවරා දී මනා වූ රථයකට නැඟී ගොස් උයන් දොර සමීපයෙහි රථය නවතා චිත්ත පණ්ඩිතයන් ලඟට ගොස් වැඳ තාපසයන් වහන්ස ඔබගේ ගීය අසා ප්‍රීති වීමි ඔබව දැන් දැකීමෙන් බොහෝ ලාභ ලද්දෙමියි. කියා එහිම නතරවන ලෙස ආයචනා කොට තම රාජ්‍යයෙන් භාගයක් පිළිගෙන සුවසේ වන්නැයි ආරාධනා කළේය. එවිට චිත්ත පණ්ඩිතයෝ සම්භූත රජ්ජුරුවෙනි, මම වස්තුව ප්‍රාර්ථනා නොකරමි. පැතිය යුත්තේ දුකින් ගැලවෙන ලෙසක්මයයි. කාමයෙහි ආදීනව දක්වා ධර්ම දේශනා කොට අහස් නැඟී හිමාල වනයට වැඩි සේක. සම්භූත රජතුමා සසර කලකිරී තම වැඩමහළු පුත් කැඳවා රාජ්‍යය භාරදී හැමට අවවාද දී තපසට නික්ම ගියේය. චිත්ත පණ්ඩිතයන් වහන්සේ බොහෝ සෘෂි ගණයා පිරිවරා ඉදිරියට පැමිණ රජුන් කැඳවා ගෙන ගොස් කිසුණුපිරි යම් භාවනා උගන්වා ප්‍රව්‍රජ්‍යාවයට පත් කළහ. ඔහුද නොබෝ දිනකින් ධ්‍යානලාභී වූහ. දෙදෙනාම මිය ගොස් බඹ ලොව උපන්නාහ.

එසමයෙහි සම්භූත රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. චිත්ත පණ්ඩිතයෝ නම් බුදුරජානන් වහන්සේ ය.

SANHIDA LANKA

# සිවි ජාතකය

ධර්ම රාජයන් වහන්සේ ජේතවන මහා විහරයෙහි වැඩවාසය කරන සේක් එක් බුදු කෙනෙකුන් විසින් දෙවරක් ලැබ නොහැක්කා වූ අසදෘස මහාදානය අරභයා වදාළ සේක.

කොසොල් රජතුමා අසදෘස මහා දානය පිරිනමා සත්වන දිනයෙහි පිරිකර පුදා අනුමෙවෙනි බණට ආරාධනා කළේය. බුදුරජානන් වහන්සේ ඔවුන් සිත් දිවසින් බලා මේ බණට කල් නොවේයයි සිතා නිහඬව විහාරයට වැඩි සේක. රජතුමා සවස විහාරයට ගොස් බුදුන් වැඳ පුදා ධර්මදේශනා නොකිරීමට හේතුව විචාළේය. පිරිස අසුබ හෙයිනැයි වදාළ බුදුන් වහන්සේ,

නවෙ කදරියො දෙව ලොකං වජන්ති
බාලා හවෙ නප්ප සංසන්ති දානං
ධීරොච දානං අනුමොද මාණො
තෙනෙව සො හොති සුඛී පරත්ථ

මේ ගාථාවෙන් ධර්ම දේශනා කළ සේක. එයින් පැහැදුන රජතුමා ලක්ෂයක් වටිනා සීවෙය්‍යක උතුරු සළුවකින් පූජාකොට ගියේය. මේ ගැන දිනක් දම්සභා මණ්ඩපයෙහි කථාවක් උපන් කල්හි එහි වැඩි බුදු රජානන් වහන්සේ මහනෙනි, බාහිර වස්තු දන්දීම අරුම නොවෙයි. පෙර නුවණැත්තෝ දඹදිව නගුල් උඩ බඳවා දවසට හය ලක්ෂයක් වස්තු දන් දී බාහිර දානයෙන් තෘප්තියකට නොපැමිණ පැමිණි යාචකයන්ට සිය ඇස් උපුටා දුන්නේ වේදැයි ඉකුත්වත වදාළ සේක.

යටගිය දවස සිවිරට අරිට්ඨපුර නුවර සිවි නම් රජකෙනෙක් සිවිනම් රජ කෙනෙක් දසරාජ ධර්මයන් කොට දැහැමෙන් රජ කරන්නේය. සතර වාසල් දොර දවසට සාර ලක්ෂයක් වියදම් කොට මහා දන් පවත් වන්නේය. පෝය දිනවල තමා අතින්ම දන් දෙන්නේය. දිනක් සිංහාසනයෙහි හිඳ තමා දුන් දන් ගැන සිතන්නේ බාහිර වස්තුවෙන් නුදුන් දෙයක් නැත. නමුත් මා සිත නොපිරුණේය. අධ්‍යාත්මික දානයක් දෙන පරිද්දෙන් අද මා දන්හලට යන වේලෙහි මුතු මැණික් ආදාය නොයිල්වා මාගේ ශරීරයෙන් කිසි අවයවයක් ඉල්ලුයේවිනම් රාජාභිෂේකයට වඩා එම උතුම් කොට සිතමි. යමෙක් මාගේ හෘදය මාංශය ඉල්ලුයේ වීනම් කඩුවකින් ලය පලා පියුමක් උදුරා ගන්නා මෙන් ලේ බිඳු වගුරව වගුරවා හෘදය මාංශය දන් දෙමි. මස් ඉල් වී නම් මස් දන් දෙමි. ලේ ඉල්වී නම් භාජන පුරා ලේ දන්දෙමි. යමෙක් හදවත ඉල්ලීනම් එය ගලවා දෙමි. මට මෙහෙ කරවයි කීයේ වි නම් මෙහෙ කරමි. ඇස් ඉල්ලුයේ වී නම් ඇස් උපුටා දන්දෙමියි. මෙසේ කල්පනා කොට සුවඳ පැන් නා රාජාභරණයෙන් සැරසී භොජන අනුභව කොට ඇතුපිට නැගී සිවි රඟ සෙනඟ පිරිවරා නික්මුණේය. එකෙණෙහි සක්දෙවිඳු රජතුමාගේ අදහස් දැන මුන්ගේ සිත පරීක්ෂා කරමියි සිතා ජරා දුර්වල වූ අන්ධ බමුණු වෙසක් ගෙන දන්හලට යන මග රජුන්ට අභිමුඛව සිට ජයතු භවං මහාරාජ යි යනාදීන් ආශිර්වාද කොට සිටියේය. රජතුමා එහි නතර වී බමුණ, තට කුමක් අවශ්‍යදැයි විචාළේය. මහරජ මට දැන් වස්තුවකින් කම් නැත. මම ඉතා දුර සිට ඔබගේ ශ්‍රද්ධා මහිමය දැන ඇස් ඉල්වා ආමි. මට ඇස් දෙකම නැත. තොපට ඇස් දෙකම ඇත. එබැවින් මට එකක් දුන මැනවයි කීයේය. එවිට රජතුමා ඉතා සතුටට පත්ව මගේ අදහස මුදුන් පැමිණියේ මැයි සිතා බමුණ තා යම් කාර්යයක් නිසා මෙහි පැමිණියෙහිද ඒ සියල්ල සමුර්ධ වෙයි. මාගේ ඇස් දන් හැරගනුව, එක ඇසක් ඉල්ලුවාලූ තොපට ඇස් දෙකම දන් දෙමි තොපි එය ලබා ගෙන පෙනීමේ ශක්තියෙන් තවත් කැමති දෙයක් ලබා ගෙන යවයි කීයේය. රජතුමා අන්ධ බමුණා කැටුව රජමාලිගයට ගොස් සිංහාසනයෙහි ඉඳුවා සීවක නම් වෙදා කැඳවා භවත, මේ ඇස් දෙක උපුටා දෙවයි කීයේය. එවිගස අපේ රජතුමා ඇස් උපුටා බමුණෙකුට දන් දෙතියි සියළු නුවර ඒක කෝලහල විය. ඉක්බිති සෙනෙවිරත් රජ, යුව රජ, ඇමතියෝ රජ්ජුරුවන් ළගට පැමිණ දේවයන් වහන්ස, ඔබ වහන්සේ අපරික්ෂාකාරී කෙනෙක එක යාචකයෙක් නිසා මෙතරම් අපරාධයක් කරන්නේ කුමක් හෙයින්ද? ආයුෂ පතා ඇස් දන් දෙන්නාහුද? තරුණභාවය නොනැසි වර්ණ සමුර්ධව පවත්නා පරිද්දෙන් ඇස් දන් දෙන්නාහුදැයි විචාළාහුය.

SANHIDA LANKA

ඇමතියෙනි, යසස් නසා හෝ වස්තුව පතා ඇස් දන් නොදෙමි. පංච මහා පරිත්‍යාගය නොකොට බුදු වූ කෙනෙක් නැත. එබැවින් සමත්‍රිංසත් පාරමී ධර්ම සම්පූර්ණ කොට බුදු වූ සියළු සතුන් භව සාගරයෙන් ගොඩ නගනු පිණිස දෙන දනකි මේ, මගේ මේ ඇසටත් වඩා සර්වඥතා ඥාන නැමති ඇසම ප්‍රිය හෙයින් එය පතා දෙමියි කීයේය. මෙබස් අසා ඇමතියන්ට කියන්ට නොවැටහි සිටි කල්හි සීවක නම් වෙදහු කැඳවා තොප

වෙදකමෙහි සමර්ථයහ. මට ඉතා මිත්‍රව සිටින්නෙහිය. මට කීකරුව තල් ලොඳක් උපුටා ගන්නා කලක් මෙන් මාගේ ඇස් දෙක තියුණු වූ සතින් උපුටා මේ බමුණට දෙවයි කීයේය. මහරජතුමනි ඇස් දන්දීම ඉතා උගහටය. එබැවින් පරීක්ෂාකර දුන මැනවයි දැන්වීය. සීවකය, බොහෝ දොඩා මා වෙහෙසට පත් නොකොට වහා ඇස උපුටවයි කීයේය. එවිට වෙදතෙම බොහෝ බෙහෙත් එක්කොට නිලුපුලෙක්හි ගල්වා දකුණුනාසයට එලුයේය. එකෙනෙහි ඇස්බැම වැටී නහර වැලෙහි එල්ලී සිටියේය. ඇස් දෙකෙහි අධික වේදනා උපන්නේ ය. ලේ දහරින් සළු තෙමුණේය. රජ පිරිස මහ ජනයා සමඟ රජු පාමුල ඇද වැටී හැඬූහ. වෙදතෙම වමතින් ඇස අල්ලා දකුණතින් සැතගෙන නහරය කපා රජ්ජුරුවන්ගේ අතෙහි තැබීය. රජතුමා තවමත් එල්ලෙමින් තිබෙන ඇසින් ඒ ඇස බලා බමුණා කැඳවා බුදුබවම ලැබේවායි පතා එය බමුණාට දුන්නේය. එතෙමේත් බොහෝ දෙනා බලා සිටියදී තමා ඇස් වලෙහි එය ඔබා ගත්තේ එකානෙහිම පෙනීමේ ශක්තිය ලද්දේය. රජතුමා ඉතා සතුටට පත්ව අනිත් ඇසත් ගලවා දුන්නේය. මහළු බමුණා එයද තම ඇස් මත්තේ තබා ප්‍රකෘතිමත් කොට ඉන් නික්ම ටික දුරක් ගොස් අන්තර්ධාන වී ගියේය. රජ්ජුරුවන්ගේ ඇසවල මස් පිරී කීප දිනකින් වේදනාව පහව ගියේය. ඉක්බිති රජතුමා අන්ධ වූ මට මේ රාජ්‍යයෙන් කම් කිම්ද තපසට යමියි සිතා ඇමතියන් කැඳවා තමාට කනවැල ඇල්ලීම සඳහා එකකු ඉල්ලාගෙන තපසට නික්මුණේය. අමාත්‍යයෝ රජතුමා සිව් ගෙයකින් ගෙනගොස් පොකුණු තෙර හිඳවා රැකවල් ලවා පැමිණියහ. අන්ධ වූ සිවි රජතුමා පලක් බැඳ හිඳ තමාගේ දානය සිහිකෙළේය. එකෙනෙහි එහි පැමිණි සක්දෙව් රජතුමා තමා සක්‍රයා බැව් හඟවා රජතුමනි කැමති වරයක් ගනුවයි කීය.

සක්‍රයෙනි, ඇස් අන්ධ හෙයින් මරණය කැමැත්තෙමි.
රජතුමනි, දානය පරලොව පමණක් නොව මෙලොවත් විපාක දෙන්නේය.
සක්‍රයෙනි, තෙපි මට ඇස් දෙනු කැමැත්තෙහි නම් අනිත් උපමාවකින් කම් නැත. මගේ දානානුභාවයෙන් ඇස් පහළ වෙතොත් යහපති.
රජතුමනි, සක්‍රයායි කියා අනුන් ඇස් දිය නොහැක්ක. දුන් දනෙහි පලයෙන් ඇස් ලබව.

මෙබස් අසා රජතුමා සත්‍යක්‍රියා කරන්නාහු මාගේ දානය ඉතා සපලය. මම සෑම කෙනෙකුටම ඉල්ලූ ඕනෑම වස්තුවක් අහිතක් නොසිතා පරිත්‍යාග කෙළෙමි. මේ සත්‍ය වශයෙන් මට ඇස් පහළ වේවයි කීයේය. මොහොතකින් පලමු ඇස පහල වූයේය. ඉක්බිති රජතෙම අන්ධ බ්‍රාහමණයා පැමිණ ඇස් ඉල්ලූ විට එය දන් දී සොම්නසින්ම කල් ගෙවීද, ඒ සත්‍යයෙන් දෙවෙනි ඇසත් පහළ වේවයි කීයේය. එවිට දෙවන ඇසත් පහල විය. ඒ පහල වූයේ කලින් තිබුණ ප්‍රකෘති ඇස් නොව දිව ඇස් ය. ඇස් පහළවීම හා රජ පිරිස අවුත් පිරිවරා ගත්හ. සක්‍රදේවේනද්‍ර තෙම මහ ජනයා මැද රජ්ජුරුවන්ට ස්තුති කරනුයේ හැමට වැඩ සිද්ධ කර දෙන සිවි රජ්ජුරුවෙනි, තොපගේ සත්‍යය වචනය හේතු කොටගෙන යොදුන් සියයක් ඈත දේ ළඟ මෙන් දැක ගැනීමේ ශක්තිය ඇති දිවැස් ලද්දේයයි ස්තුති කොට මතුද කුසලයන්ගේ ඇලෙවයි අවවාද දී දෙව්ලොවට ගියේය. රජ්ජුරුවන්ට නැවත ඇස්ලත් නියාව මුළු රට පතල විය. මුළු රටවාසීහු පුද පඬුරු ගෙන රජතුමාව දක්නට ආ වේලේ ඔවුන් අමතා දන්දීමේ අනුසස් පෙන්වා ගමා ලත් දිවැස් සාධක කොට අවවාද කොට දැහැමින් රජය කොට මියගොස් දෙව්ලොව උපන්හ.

එසමයෙහි සීවක වෙදතුමා දැන් ආනන්ද ස්ථවිරයෝය. ශක්‍රව උපන්නේ අනුරුද්ධ තෙරුන් ය. සිවි රජ්ජුරුවෝ නම් බුදුරජානන් වහන්සේ ය.

SANHIDA LANKA

# සිරිමන්ද ජාතකය

ත්‍රෛලෝක්‍ය තිලක වූ බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් ප්‍රඥා පාරමිතාව අරභයා මේ ජාතකය වදාළ සේක.

විස්තර වශයෙන් උම්මග්ග ජාතකයෙහි මතු පලවන්නේය.

SANHIDA LANKA

# රොහන්ත මෘග ජාතකය

සද්ධර්ම රාජයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවාසය කරන සේක් ආනන්ද තෙරුන්ගේ ජීවිත පරිත්‍යාගයක් අරභයා වදාළ සේක.

දෙව්දත් තෙරුන්ගේ නියමයෙන් බුදුන් මැරවීම සඳහා නලාගිරි ඇත්රාජා රා මදයෙන් මත්ව  බුදුන් සමීපයට ආ කල්හි ආන්නද තෙරුන් වහන්සේ මේ අලියාගෙන් බුදුන්ට යම් හිරිහැරයයක් වේදෝයි බුදුන් පසුකොට ඇතු ඉදිරියට ගොස් පොළොව කුඹල් සකක් මෙන් පෙරලා පහරණ තුරුත් ඉවත්නොව ජීවිතය පරිත්‍යාග කොට සිටි මේ පුවත එදින දම්සබා මණ්ඩපයට රැස්වූ භික්ෂූන් අතර පැනනැගී කල්හි එහි වැඩි බුදු රජාණන් වහන්සේ ද ඒ කථාව අසා මහණෙනි, ආනන්ද ස්ථවිරයෝ අපට ජීවිත පරිත්‍යාග කළෝ දැන් මතු නොවෙයි පෙරත් එසේ වේදැයි ඉකුත් වත වදාළසේක.

යටගිය දවස බරණැස රාජ්‍යය කළ බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ට ඛේමා නම් මහ ගුණවත්බිසවක් වූවාය. එකල හිමාල වනයෙහි අන්ධවූ දෙමාපියන් රකින රොහන්ත නම් රන්වන් මුවරජෙක් විය. ඒ මුවරජුට චිත්ත නමින් සහෝදරයෙක්ද සුතනු නමින් නැගණියක් ද සිටිති. ඒ දෙදෙනා රන්වන්පාටින් බබළන්නාහ. ඊට නුදුරු වැදි පලෙක්හි වසන එක් වැද්දෙක් මේ රන්වන් මුව රජ්ජුරුවන් දැක පුතු අමතා හිමාල වනයෙහි තුන්වන පර්වත වලල්ල අතරෙහි රන්වන් මුවෙක් වසන්නේය. යම් කාරියක් සඳහා රජ්ජුරුවෝ විචාළෝ වීනම් කිවයි කියා පරලොව ගියේය. දිනක් ඛේමා බිසව් රන් පුටුවක් උඩ හිඳගත් රන්වන් මුවෙකුගේ බණ අසනවා සීනෙන් දැක වහා පිබිඳ රජ්ජුරුවන් අමතා රන්වන් මුවෙකුගෙන් බණ අසනා දොලක් උපනී යයි කියා සුසුම් ලමින් සෝකාතුරුව වැද හොත්තීය. රජතුමා අමාත්‍ය මණ්ඩලය කැඳවා රන්වන් මුවන් ඇති බව බමුණන් අතින් දැන වැද්දන් රැස්කරවා රන්වන් මුවෙකු දුටුවෝදැයි විචාළහ. එක් වැද්දෙක් තම පියාගේ බස් පරිදි අහවල් තැන මුවෙක් වසන්නේයැයි රජ්ජුරුවන්ට දැන්වූයේය. රජතුමා ද ඒ වැදි පුත්‍රයාට බොහෝ වස්තුදෙන බවට පොරොන්දුව ඉක්මණින් එම මුවා අල්ලාගෙන එනලෙසට නියම කළේය. වැදි පුත්‍රයාද පියා කලින් කියා ඇති මග සලකුණු අනුව ගොස් මුවන් පැන් බොන තොටෙහි උගුලක් අටවා තැබීය. පසුදා පැන් බීමට පැමිණි රන් මුවා එහි අසුවී මිදී පැන යාගත නොහැක්කේ මහත් හඬින් කෑගැසීය. සෙසු මුවෝ භයින් හිස් ලූ ලූ අත පැනගිය අතර චිත්‍ර නම් සහෝදර මුවාද සහෝදරිය වූ සුතනු නම් මුව ධේනුවද එහි පැමිණ තම සහෝදරයා ලඟම සිට මලෙහි බැඳුනාවූ තොප වෙනුවෙන් අපිදු ජීවිතය පූජා කරමු තොප හැර නොයමුයයි ලඟම සිටිහ. රොහන්ත මුව රජ්ජුරුවෝ උන් අමතා මෙහි පමාවීමෙන් කම් නැත. අන්ධවූ දෙමාපියන් බලා ගැනීමට අපි තිදෙනා මරණයට පත් වීමෙන් කිසිවෙක් නැත. එබැවින් වහා එලායවයැයි අවවාද කෙළේය. නමුත් ඒ දෙදෙනා දෙපසින් දෙවුරෙහි ඇලි ඇලි සිටියා මිස ඉන් ඉවත් නොවූහ. ටික වේලාවකින් දුනු හී අතින් ගත් වැදි පුත්‍රයා එහි පැමිණ කවදාවත් නොදුටු විරූ මේ පුදුමය දැක මුව රජ්ජුරුවොත් වැදි පුත්‍රය අපව සෙසු මුවන් හා සරි කොට නොසිතවයි කීයේය. එවිට චිත්‍ර නම් මළනු තෙම මේ රොහන්ත නම් මුව රජ්ජුරුවෝ අසූ දහසක් මුවන්ට නායකව සියළු සත්වයන් කෙරෙහි මෛත්‍රී සිත් ඇති මොහු අන්ධවූ දෙමාපින් දෙදෙනා පොෂ්‍ය කරන්නේය. ඉදින් මේ මුව රජ්ජුරුවන් මරපුයෙහි වීනම් එකවිට මව්පිය දෙදෙනා සහ අප දෙදෙනා දැයි පස්දෙනම මැරුවාහූනම් වන්නේහියැයි කීය. ඒ කරුණාවන්ත වැදි පුත්‍රයා එබස් අසා වහා මුව රජ්ජුරුවන් ලඟට ගොස් මෙවැනි ගුණවත් මුවෙකු මරාපීනම් මා පොළොව ගිලී යන්නේය. හිසට හෙන වදින්නේය. මට රජ්ජුරුවන්ගෙන් සම්පත් උවමනා නැත, මොහු මුදා හරිමියි සිතා මුව රජ්ජුරුවන්ගෙන් වර පොටවල් ලිහා මුව බදාගෙන සිඹ වරපටින් වූ තුවාල පිරිමැද සුවපත් කොට සිටියේය.

මුව රජතුමා වැදි පුත්‍රය, මා ඇලිවූයේ තොපගේ ජීවිත ක්‍රියාව නිසාමද නැතහොත් අනිකෙකුගේ නියමයකින්ද?

මුව රජතුමනි, බරණැස රජ බිසව ඔබගෙන් බණ අසමියි දොළක් උපදවා වැදහොත්තීය. එබැවින් රජ්ජුවන්ගේ නියමයෙන් ඇල්විමි.

මිත්‍ර වැදි පුත්‍රය, තොපට ලැබෙන සම්පත් ගැන නොසිතා මා මුදාහැරීම තොපට පාඩුවකි. මා කැඳවාගෙන ගොස් රජ්ජුරුවන්ට දක්වා දේවියගේ දොළ සංසිඳුවා තොපගේ සම්පත්තිය ලබාගත මැනවි.

SANHIDA LANKA

මුව රජ්ජුරුවනි, මහ රජ්ජුරුවෝ නම් ඉතා චණ්ඩ පරුෂයෝය. එබැවින් ඒ සැපතින් මට කම් නැත. ඒ කිසිවක් නොසිතා තෙපි හැම පලා යව,

උතුම් වැදි පුත්‍රය තොප මට උපකාර කෙළෙහිය. මාත් ඊට උපකාර කටයුතුය. එබැවින් මා පිට පිරිමදිනු, එවිට තොපගේ අත රන්වන් ලොමින් පිරෙන්නේය. එය ගෙන ගොස් රජ බිසවට පෙන්වා මා පිළිබඳ විස්තර කියා මේ ගාථාවෙන් ධර්මදේශනා කරවයි, ධම්මංචර මහාරාජ, යනාදී ගාථා උගන්වා පන්සිල්හි පිහිටුවා යැවූ සේක.

වැදිපුත්‍රයා පැදකුණුකොට වැඳ රන්වන් ලොම් නෙළුම් පතෙක්හි බහා බැඳගෙන රජ මාලිගාවට ගොස් රන්මුවා පිළිබඳ විස්තර කියා ඔහුගේ රන්වන් ලොම් ශාක්ෂි වශයෙන් ඉදිරිපත්කොට ඒ ගාථා ධර්මයන්ගෙන් බණ කියා ඛේමා දේවියගේ දොළ සංසිඳෙව්වේය. රජතුමා බොහෝ සතුටට පත්ව, බොහෝ වස්තු සම්පත් තෑගිකොට තොප කී පරිද්දෙන් දසරාජ ධර්මයෙන් රාජ්‍යයක් කෙරෙමි. තොපිත් මෙතැන් පටන් පාප ධර්මවලින් මිදී සැපසේ වසවයි කියා ඕහට සමු දුන්නේය. වැදි පුත්‍රයා එබස් අසා මට ගිහිගේ විසීමෙන් කම් නැතයි හිමාලයට වැද පැවිදිව ධ්‍යාන උපදවා බඹ ලොව ගියේය.

එසමයෙහි වැදි පුත්‍රයා වූයේ ඡන්න නම් ඇමතිය, බරණැස් රජුජ්රුවෝ නම් ආනන්ද ස්තවිරයෝය. බිසව නම් ඛේමා මෙහෙණියන්ය. දෙමව්පිය දෙදෙනා නම් උත්පලවණී මෙහෙණිය සහ ආනන්ද ස්ථවිරයෝය. රෝහන්ත මෘග රජ්ජුරුවෝ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# ද්විතීය ස්වර්ණහංස ජාතකය

සර්වඥයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වාසය කරනසේක් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කළ ජීවිත පරිත්‍යාගයක් අරභයා මේ ජාතකය වදාළ සේක.

රොහන්ත මෘග ජාතකයෙහි මෙනි.

ඉහත බරණැස රාජ්‍ය කළ බහුපුත්තකනම් රජ්ජුරුකෙනෙකුන්ට ඛේමා නම් ප්‍රිය වඩන බිසවක් වූවාය. එකල අනූදහසක් හංසයන් පිරිවරා ගත් රන්වන් හංස රාජයෙක් චිත්‍රකූට පර්වතයෙහි වසන්නේය. දිනක් ඛේමා බිසව ස්වප්නයෙන් රන්වන් හංසයෙක් සිංහාසයේ හිඳ මිහිරි කටහඬින් බණ කියනවා දැක වහා පිබිඳ අසනීප බවක් හඟවා රන් හංසයෙකුගෙන් බණක් අසනා දොළක් උපනැයි රජ්ජුරුන්ට දන්වා යහනෙහි ම වැදහෙව සිටියාය.

රජතුමා රන්වන් හංසයෙක් චිත්‍රකූට ප්වතයෙහි වසන බැව් අසා හංසයන් එහි ගෙන්වනු සඳහා ඇමතියන් බණවා පංච විධ පදුමයෙන් ගැවසීගත් අලංකාර පොකුණක් කරවා හුරු ඇල් ආදී ධාන්‍ය වර්ග තබ්බවා පක්ෂීන්ට ගෝචර බීමක් මෙන් සමුර්ධිකොට මල දුනු හී රැගත් වැදි පුත්‍රයෙකු විල් තෙරම නතර කළහ. ක්‍රමයෙන් ඒ විලට පැන් බොනු සඳහා පක්ෂීන් එන්නේ දිනක් හංස රාජයන් බවට නියාව දැක දුටු වැදි පුත්‍රයා වහා ගොස් රජ්ජුරුවන්ට දන්වා වලක් අටවා තැබීය. ඊට පසුදින හංස රාජයා ඊට අසුවිය සෙසු හංසපිරිවෙර හිස් ලූ ලූ අත පැන දිවූ නමුත් සුමුඛ නම් හංස සේනාධිපතියා වහා එහි පැමිණ දුක්වී උරෙනුර ගැටී සිටියේය. හංස රාජයා ඔහු අමතා සුමුඛයෙනි, මා මලෙහි බැඳුන බැවින් සෙසු සියළුම හංසයෝ පැන ගියහ. තෙපිද වහා පැන ගොස් ජීවිතය බේරා ගනු මැනවි.

ධෘතරාෂ්ඨ හංස රජ්ජුරුවෙනි, අද තොප දුකට පැමිණි කල්හි මමද දුකට පැමිණියෙමි. භයින් පැනයාම මිත්‍ර ධර්මයක් නොවේ.

සුමුඛයෙනි, තොපලඟ ඇත්තේ උතුම් මහත් ගතිගුණය, තොප මා හැර නොයන නියාව නොදනිමියි මෙසේ කථා කරමින් උන් කලට වැදි පුත්‍රයා පැමිණියේය. සුමුඛ හංසයා වැදි පුත්‍රයා අමතා සබඳ, ධෘතරාෂ්ට හංස කුලයට සතර සංග්‍රහ වස්තුවෙන් අනුශාසනා කරන මේ හංස රජ්ජුරුවන් විනාශ කෙළෙහිනම් සියළුම හංසයෝ කිසි පිහිටක් නොලබන්නාහු යයි හංස රජ්ජුරුවන්ගේ ගුණ වැනීය. එබස් ඇසීමෙන් මොලොක් වූ සිත් ඇති වැදි පුත්‍රයා හංස රජ්ජුරුවෙනි අහසින් යන තෙපී කුමක් නිසා මල බැඳුනෙහිදැයි විචාළේය.

සබඳ වැදි පුත්‍රයෙනි, වින්ද යුතු අකුශලයක් පැමිණි කල්හි ඊට අයත් විය යුතුය. එහි බැඳෙන තුරු එය මළෙක්ද දැළෙක්දැයි දැනගත නොහැක්කකේය. වැදි පුත්‍රයා වඩාත් ම සතුටට පත්වූයේ සුමුඛයන් අමතා සබඳ හංසය, මේ හංස රජ්ජුරුවන් මල බැඳුන වේලෙහි තොප පැන නොගොස් කුමක් නිසා මෙහි රැඳී සිටියෙහිද? මොහු ගේ බන්ධුව සිටියෝ තොප පමණක්ද?

වැදි පුත්‍රය, මේ මාගේ රජ්ජුරුවෝය. එක් අතකින් මිත්‍රයානෝය. මාගේ ප්‍රාණය හා සමානය. දිවි ඇති තෙක් මොහුගෙන් වෙන් නොවෙමි. ශරීරයෙන් වෙන් වූවා මිස ප්‍රාණයෙක් එකය.

හංස රජ්ජුරුවෙනි, තොප අල්ලාගෙන ගියහොත් පොළොව පලා ගෙන මා ගිලෙන්නේය. රජ්ජුරුවන්ගෙන් මට ලැබෙන සම්පත්තීන් කම් නැත. තොපව මා නිදහස් කරමි සුවසේ ගොස් වසවයි නියම කොට මල මුදා පා තෙල් ගා සුවපත් කෙළේය. ඊට පසු හංස රජ්ජුරුවෝ වැදි පුත්‍රයෙක් අමතා තමා කුමක් නිසා අල්ලගත්තේදැයි විචාරා ඛේමා බිසවගේ දොළ සංසිඳුවීම පිණිසයයි අසා තමා රජ්ජුරුවන් සමීපයට යාමෙන් ඛේමා බිසවගේ දොළ සංසිදෙනා බවත් වැදි පුත්‍රයාට වස්තුව ලැබී විල අභය ස්ථානයක් වන බවත් සුමුඛ හංසයාගේ මිත්‍ර ධර්මය ප්‍රකාශ වන බවත් දැන මිත්‍ර වැදි පුත්‍රය, අප දෙදෙනාව කදක තබාගෙන බහුපුත්තක රජ්ජුරුවන් සමීපයට ගෙනයව, ඉන් යහපතක් වන්නේයයි කීයේය. වැදි පුත්‍රයා අසතුටෙන් නමුදු හංස රජ්ජුරුවන්ගේ ඉල්ලීම පරිදි ගෙන ගොස් රජ්ජුරුවන්ට දැක්වූයේය. ඔවුන් දුටු රජතුමා මහත් සතුටට පත්ව රන් පුටුවක හිඳුවා මී හා විලඳ කවා තෙල් ගල්වා බණ අසනා පරිද්දෙන් වැඳ ආරාධනා කෙළේය. හංස රජතෙම රජ්ජුරුවන් අමතා රජ්ජුරුවෙනි තොපගේ සැප කිම්ද? රාජ්‍යය දැහැමෙන් අනුශාසනා කරවුද?

SANHIDA LANKA

හංස රජ්ජුරුවෙනි, මට දුකෙක් නැත රාජ්‍යය දැහැමෙන් අනුශාසනා කෙරෙමි

රජ්ජුරුවෙනි, තොපගේ අමාත්‍ය මණ්ඩලය කෙරෙහි දෝෂයක් නැද්ද? තොපට පක්ෂ පාතව වෙසෙත්ද? සතුරෝ නැද්ද?

හංස රාජය අමාත්‍ය මණ්ඩලය මා කෙරෙහි පක්ෂය, සතුරෝත් නැත

රජතුමනි, තොපගේ බිසව තොපට අනුකූලද? සියළු ස්ත්‍රී ගුණයෙන් සම්පූර්ණද?

හංස රාජය, එසේය උන් අපට අනුකූලය, ගුණයෙන් යුතුය.

රජතුමනි, තොපගේ දරුවෝ නුවණැත්තෝද? සමගිව වෙසෙත්ද?

හංස රාජය, මාගේ දරුවෝ සියයක් පමණ ඇත. උන්ට අවවාද කොට සැපතෙහි හසුරුව මැනවි.

හංස රජ්ජුරුවෝ පුත් කුමාරවරුන් අමතා කුමාරවරුනි ලෝකයෙහි ඇති උගත මනා ශිල්ප ශාස්ත්‍ර හදාරා ගුණ ධර්මවලින් සම්පූර්ණව වන්නේය. එබැවින් මේ ගැන සිතට ගතයුත්තේය. නුවණැස ඇති අයම ලෝකයෙහි බැබලෙන්නේය. උට්ඨාන වීයර්යෙන් යුතුව කල් යැවිය යුතුයයි කියා පුත් කුමාරවරුන්නටද රජ්ජුරුවන්ටද සියළු රාත්‍රියෙහිම අවවාද කොට බිසව දොළක් සංසිඳවා ශීලයෙහි පිහිටුවා ඉන් නික්ම චිත්‍රකූට පර්වතයටම ගියහ. වැදි පුත්‍රයා බොහෝ සම්පත් ලැබ විසුවේය.

එසමයෙහි වැදිපුත්‍රයා නම් දැන් ඡන්න අමාත්‍යයාය බහුපුත්නක රජ්ජුරුවෝ නම් සැරියුත් තෙරුන්ය. ඛේමා බිසව නම් මේ ඛේමා මෙහෙණියමය. හංස සේනාධිපති නම් ආනන්ද තෙරුන්ය. හංස රජ්ජුරුවෝ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# සත්තිකුම්භ ජාතකය

තවද එක් සමයෙකි නානානය නිපුන අනෙකාධ්‍යාශය ශ්‍රවණීය මධුර වචනයෙන් දේශනා නැමති දිව්‍ය ඖෂධයෙන් සත්වයන්ගේ සංසාර දුක්ඛ නැමති රෝගය සමනය කෙරෙමින් ලෝකාභිවෘද්ධිය කොට රැස්කරන ලද මහා කරුණාවෙහි ඵල සැප විදිනාහු තථාදී ගුණයෙන් යුක්ත වූ තිලෝගුරු බුදුරජාණණ් වහන්සේ ශ්‍රොතෘ ජන්මයෙන් ප්‍රසාදජනක ධර්මදේශනාව මඬකුච්ඡි නම් පර්වත ප්‍රාන්තයෙහි මුවන්ට තබා දෙන අභය ඇති හෙයින් මිගදාය නම් වූ වනයෙහි චතුර්විධ බ්‍රහ්මවිහරණයෙන් දවස් යවමින් වැඩ වසන සේක් දෙව්දත් තෙරුන් වහන්සේ අරඹයා වදාළ සේක.

නිස්කාරණයෙහි බඬවෛර ඇති දේවදත්ත ස්ථවිරයන් විසින් බුදුන් මරමියි යන නුනුවණ සිත් ඇතිව ගිජුකුල පව්ව මුදුනෙන් බුදුන් හිසට පෙරළු ගල භූමියෙන් ගල් දෙකක් නැගී පිළිගන්නා කල්හි එයින් සිදී ඉවත පණන සිලා ඛණ්ඩයක් බුදුන්ගේ පාදයෙහි පැහැර බලවත් වේදනා උපන් කල්හි බුදුරජාණන්වහන්සේ දැක්ම පිණිස බොහෝ භික්ෂුන්වහන්සේ රැස්වන්නට වන් සේක. ඒ දැක බුදුරජාණන්වහන්සේ එම්බා මහනෙනි මේ සෙනස්න ඉනාහයක විෂමස්ථානව තිබෙයි. රැස්වන්නා වූ පෂීන් බොහෝ වන්නේය. එබැවින් මඬකුච්ඡිනම්වූ ප්‍රදේශයට මා සිවු ගෙයකට නංවා වඩාගෙන යවයි වදාළ සේක. භික්ෂුන් එපරිද්දෙන් කළාහ, ජීවක නම් වෛද්‍ය තෙම බුදුරජාණන්වහන්සේගේ පාදය ගුණ කළේය. බුදුරජාණන්වහන්සේ සමීපයෙහි භික්ෂුහු කථාවක් පහල කරන්නාහු ඇවැත්නි, දේවදත්ත ස්ථවිරතෙම මේ පාපී වූ පව්ටු වූ පෂීදීනුත් යුක්ත යැයි කිය කියා උන් සේක. ශාස්තෘ වූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ කුමක් කියමින් හුන්නාහුද, මහණෙනි, විචාරා මෙනම් ගාථාවකින් යුක්තව උනුම්හයි කී කල්හි මහණෙනි මේ දේවදත්ත ස්ථවිරයෝ දැන් මට පව්ටු වූයේ නොවෙයි පූර්වයෙහිත් පව්ටු වූයේ ය. එසේම පව්ටු වූ පෂීදින් යුක්තව විසුවෝ වේදැයි වදාරා මුවෙන් නොබැන වැඩවුන් කල්හි භික්ෂුන්වහන්සේ විසින් මොහු පෙර පව්ටු පරිදි කෙසේදැයි වදාළහොත් යහපතැයි ආරාධිත වූ සේක් ඉකුත්වත් වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස සකල සමුර්ඬීන් නිරුත්තර වූ උත්තර පඤ්චාලනම් නුවර මිගතරිපු සංචාර ඇති පඤ්චාලනම් රජෙක් තෙම රාජ්‍යශ්‍රීන් පිණනුයේ පවිත්‍ර චාරිත්‍ර ඇති මිත්‍රඅමාත්‍යයන් හා සමඟ රාජ්‍යපරිපාලනය කරන්නේය. එකල්හි පුරනලද පාරමිතා ඇති අනන්‍ය සාධාරණ වූ මහා සත්‍ය ඇති විවිධ තරු සඬමණ්ඩිතාඬගණ වර්ණ ගුණ ඇති රමණීය වූ ආරණ්‍යප්‍රාදේශයෙක්හි පාංසු මිශ්‍රවූ ආඛණ්ඩ පර්වතයෙහි හටගත් කොලඉඹුල් වනයෙක්හි එක් ගිරා රජක් හට පුත්ව උපන්නේය. ඕහට සහෝදර මල් වූ දෙදෙනෙක් ඇත්තාහ. ඒ ගිරවුන් වසන පර්වතයට යට පන්සියයක් තාපස වරුන්ට නිබඳ වාසස්ථානය වූ ආශ්‍රමපදයෙක් ඇත්තේය. ඒ ගිරා පැටවුන් පියාපත් හට ගන්නා වූ කාලයේදී ඒ පර්වතයට උඩු සුළඟත් යට සුළඟත් එක්ව භූමියෙහි තන පරඬලා ආදිය අහස්හි බමවමින් සුළං ඇල්ලෙක් ගැසුයේය, එයින් පහරදින් එක් ගිරාපැටවෙක් එතනට උඩු සුළඟ සොරුන්ගේ ගමෙහි ඔවුන්ගේ ආයුධ අතුරෙහි වැටුනේය, ඒ ගිරා පෝතකයා අඩයටි මත්තෙහි වැටුනහෙයින් සැක්තිකුඹයයි ඕහට නම් නැබූහ, එම සුළඟින් ගිරාපෝතකයෙක් වැටෙනුයේ ඒ ස්ථානයට යටසුළඟ තපස්වීවරයන්ගේ ආශ්‍රම පදයෙහි සඬඛ්‍යානුෂ්ඨානය එලවනලද මල්සමූහ ඇති වැලි තලාවෙක්හි මල්මත්තෙහි වැටුනේය.එතැන් වසන තාපසවරහූ දැක මල් රැසෙහිදී දුටුහෙයින් පුෂ්පකයයි නම්තුබූහ, සැක්තිකුඹනම් ගිරවා තෙමේ සොරුන් අතුරෙහිම වැඩෙන්නේය, පුෂ්පක නම් ගිරවා තෙම තාපසවරු ලඟ වැඩෙන්නේ ය. මෙසේ දෙදෙනා වැඩෙනකල්හි රාජ්‍යය හිමිවූ පඤ්චාල රජ තෙම එක් දවසක් සර්වාලංකාරයෙන් සැරහුනේ එසේම අලංකෘතවූ රථවාහනය කට නැගී මහත් වූ පිරිවරින් මුව දඩ යනුයේ නුවරට නුදුරු තැන්හි සමුල්‍යා සලපල්ලව පුෂ්පභාර හරිත තරුවෙනි රඤ්ජිත වනප්‍රදේශයකට පැමිණ ඒ රජ තෙම තමාගේ සේනාවට නියෝගකරනුයේ යමක්හු සමීපයෙන් මුවා ගියේවීනම් ඕහට දඩයයි කියා සම්මතකොට තුමුත් රථයෙන් බැස කොලින් මුවා කොට ඉදිකරණ කොටුපතෙහි හිය දුනුපිට ලාගෙණ වේගවත්ව සිටයේය, එකෙණෙහි මුවන් පන්වනු පිණිස නියුක්ත පුරුෂයන් විසින් කැලෑ එලවන කල්හි එක්වෙනි මෘගයෙක් නැගී යන මඟ සැක බලනුයේ රජ්ජුරුවන් සිටි තෙනම මදක් මිනිසුන් තුරුල් නියාව බලා ඒ ස්තානයෙන්ම පවනට බඳු වේගයෙන් පැණගෙණ දිවුයේය, එකෙණෙහි අමාත්‍යයෝ කවුරුත් ලඟින් මුවා පළාගියේ දැයි විචාරන්නාහු රජජුරුවන් ලඟීනැයි යනු අසා රජ්ජුරුවන් සමඟ වෙහෙසෙමින් කෙළියාහ, රජ්ජුරුවෝද අභිමාණයෙන් ඇමතියන්ගෙන් වෙහෙසුන් ඉවසිය නොහෙනුයේ දැන්ම මුවා අල්වාගෙණ එම් රථයට පැණනැගී වහා රථය පදුවයි රථාවායර්‍යාහට නියෝගකෙරෙමින් ගොස් මුවා ගිය හසරට බටුයේය, වේගයෙන් යන්නාවූ රථය සේවකයෝ ලුහුබඳවා ගන්ට අසමත්වූහ, රජ්ජුරුවෝද රථාවායර්‍යා දෙවෙනිකොට ඇතියේ මඬ්‍යාහ්නකාලයෙහි දක්වා දිවදිව විඩාව මුවා නොදැක නැවත එනුයේ ඒ සොරුන් වසන්නාහු ග්‍රාමයට බටුයේය, නුදුරුවූ ස්ථානයෙක සිත්කළුවූ කඳුරැලියක් දැක රථයෙන් බැස සන් දනකොට නොනැගී සිටීයේය, ඉක්බිති රථාවායර්‍යතෙම රථයෙහි

SANHIDA LANKA

අතුරණලද පළසගෙණ සිත්කළුවූ රුක්සෙවනෙක්හි අතුලේය, විඩාවූ රජ්ජුරුවොත් එහි ගොස් සැතපුනේය, එකෙණෙහි රථාචාර්යයාත් රජ්ජුරුවන් පයමැඩ උන්නේය, රජ්ජුරුවොත් නිදාපිබිද මෙපරද්දෙන්නිදනිනෝත් වෙති පුබුදින්නෝත් වෙති ඒ ගිම්හි වසන්නා වූ සොරහුද රජ්ජුරුවන්ට ආරක්ෂා පිණිස වනයවට කොට ර කවල්ගත්හ, සොරුන්ගේ ගමෙහි වසන්නා වූ සැක්තිකුම්බ නම් ගිරා තෙම ගමින් නික්ම රජ්ජුරුවන් වැදහෙව නිදන්නාවුන් දැක සිතනුයේ මුන් නිදනුයදී මරවාපියා මොහු පැළඳගත් ආභරණ ගෙන්වාගණිම්යි සිතා පතී කොළඹනම් සොරහු බත්පිසන තෙනටගොස් වැද පතීකොළඹය වහාවර එක් තරා පුරුෂයෙක් එක් රුකක්මුලක විඩාව නිදන්නේය, නැගෙන්නාවූ අස් වාහනයකින් යුක්තව වූ තෙමේ ලදරු බාලය, බහා පළඳනාලද කුණ්ඩලාභරණ ඇත්තේය, ජාම්බෝනද ස්වණියෙන් හා පද්මරාගමාණික්‍යයෙන් කරණලද බොහෝ පැලදගත් නලල්පටක් මුදුන්පත් හිරුමෙන් බබලන්නේය. මේ තෙම මඬ්‍යාහ්නකාලයෙහි රුක්සෙවනෙක රථාචාර්යයහු දෙවෙනිකොට ඇතියේ වැද හොත්තේ ය, මේ අවසරයෙහි මොහුමරා පැළඳිආභරණ ගලවාහම්හයි කියා මේ වේලාවට ඔහු වැදහොත් ස්ථානය මධ්‍යමරාත්‍රියෙහි සොරකම්කරන වේලක් මෙන් ජන විවික්තව මරණට අවසර පෙණිතිබුනේය. එබැවින් නොපවාම ඔහු මරා පැළඳි ආභරණ ගලවාගෙණඑම්හයිකියා වේගයෙන් ඔහුම දුවන්නේය, විටෙප්ති පතීකොළඹ ලඟදිවන්නේය, ඒ තෙමෙත් ඔහු බස් අසා වැලිපලින් නික්ම ගිරවා කීතෙනට ගොස් බලනුයේ ඔහු රජ්ජුරුවන් නියාව දැක හයින් තැනිගෙණ කීමෙන්ද සැක්තිකුම්හයෙනි තොපි වීයරුහී දොඩවීද මේලෝකයේ රජ්ජුරුවෝනම් දිලිසෙන ගිණිසේ, සිටයුත්තාහ එබැවින් ළංවන්නට කාරණා නොවන්නේයැයි කීයේය. ඉක්බිති ගිරවා තෙම එසේ කල සබඳ පතීකොළඹය සොරුන් බී ඉතිරි සූරාවෙක් ඇත්නම් අනුභව කොට මත්වපියා මහත් කොට ගර්ජනා කරන්නෙහි මාගේ මැණියන් කොළඅතු වසාගෙන නග්නයෙන් ඉන්දවීත් සොරකම් කරන්න වැගි තොපට කැත කරන්නේ නොවේදැයි කීපී දෙඩුවේය. රජ්ජුරුවෝ ඒ වේලාවට පිබිද මනුෂ්‍ය භාෂාවෙන් කියන බස් අසා මේ ස්ථානයේ ඉති හය සහිත යැයි රථාචාර්යා හට කියනුයේ සබඳ රථාචාර්යය දැන් නැගී සිටුව මෙතනින් යායුතු වන්නේය. එබැවින් රථය යොදාළව මේ ග්‍රාමයෙහි මගේ සිත්නැලෙන්නේය. අනිත් ආශ්‍රමයකට යම්හයිකීයේය. රථාචාර්ය තෙම වහා නැගී සිට රථය යොදා වැඩිය මැනව දේවයන්වහන්ස අන්‍යස්ථානයකට කී හෙයින් එකල්හි සැකතිකුම්හ ගිරවා තෙම රථයට පැන නැගී යන්නාහු රජ්ජුරුවන් නොයිවසනුයේ මේ ස්ථානයේ වසන්නා වූ සොර දෙටුවානම් ඇතුළු වූ සොරහු කොයි පලා ගියාහුදැයි ඔවුන් නොදුටු බව හේතු කොට ගෙන පංචාල දේශවාසිවූ රජ තෙම ගැලවී යන්නේය. කොල වහා නික්ම ඔහු වට කරවා අල්වයි දුනු අඩ යටි තෝමර ආදීය ගෙන වහා මොහුගේ ජීවිත විනාශ කරවා නොහැරවයි මෙපරිද්දෙන් සොරුන්ට අඬගා විධාන කෙරෙමින් තමා නුසුදුසු තෙන වැඩි ගත් ගුණය ප්‍රකාශ කළේය. මෙසේ මොහු මොර ගාමීන් ඇත මැත දිවෙමින් සිටියදී ඒ පර්වතයට යට සුළඟ තාපසවරු වසන්නාහු ආශ්‍රම පදයට පැමිණියේය. ඒ ක්ෂණයට තපස්වීවරයෝ පලාඵල පිණිස වනයට ගියාය. පුෂ්පක ගිරවා පමණක් ආශ්‍රමපදයෙහි උන්නේය. ඒ තෙම රජ්ජුරුවන් තෙම පෙර ගමන්කොට සන්තෝසයෙන් ආදර දක්වා පිළිසඳර කථා කරනුයේ මහා රජ්ජුරුවෙනි මෙතනට ආ තොපගේ ර්ම යහපත් වන්නේය. පැමිණියාවූ තෙපි ආගන්තුග යැයි නොසිතව තෙපි මේ ස්ථානයට නායකයෙම්යි සිතව මෙතනින් යමක් කැමතියානම් ඒ කිව මැනවැයි තවද රජ්ජුරුවන් වහන්සේ මේ විලික්ෂුනු තඹිරද පියල්ලද නොහොත් මොරද මධුර වූ ඵලද විලිසුණු එරමිණියාද යන සියල්ලද දඹුඵල්බෑයට බඳු වූ රස ඇතියාහ. මෙයින් යහපත් පලාඵල අමුත්තක් නොසිතා ඇරගෙන අනුභව කළ මැනවැයි පටිසත්කාර කළේය. රජ්ජුරුවෝ මොහු බස් අසා පැහැද මේ පක්ෂි රාජ තෙම ඉතා යහපත් එකෙක විශේෂයෙන් ධාර්මිකය පලමු අප දුටු ගිරවා තෙම රූපයෙන් මොහු වැනියේ නුමුත් අප දැකලා මොහු කොටව මරව යා නොදෙවයි කියමින් සිටියදී මෙතනට දුක සේ පලා ආම්යි කීයේය. එබස් අසා පුෂ්පක ගිරවා තෙම සබඳ මහ රජ්ජුරුවෙනි ඒ තොප දුටු ගිරවා නම් එකම මැණියන කුස හෙව එක පියානන්ට දාව එක් රුක්සිදුරෙක්හි වාසය කළ අපි දෙදෙනාමෝමය සහෝදර මල්බෑය මෝවම්හ එතකුදු වුවත් ස්ථාන වශයෙන් වෙන්වුම්හ තුමු නමින් සත්තිකුම්හ නම් වෙති. ඒ තෙම චණ්ඩපරුෂ වූ සොරුන් ළග වැඩී වර්ධනය වූයේය. මම වනාහි නමින් පුෂ්පක නම් වීමි. කරුණා ගුණයෙන් තෙත් වූ සිත් ඇති තාපසවරුන් කෙරෙහි වැඩී වර්ධනය වීමි. ඒ ගිරවානෝ අසත්පුරුෂයන් විසින් එක්ව වැඩුණු හෙයින් එබඳු වූ ගුණ ඇති වූයේය. මම වනාහි සත්පුරුෂයන් ළග වැඩුන හෙයින් මෙබඳ වූ ගුණ ඇති වීමි. ඒ සත්තිකුම්හ නම් ගිරවානෝ සොරහු සොර කමින් අනාචාරයෙන් තදපරුෂ ගුණයෙහි ඉක්මවූහ. මම වනාහි මේ තාපසවරහු ශිලාචාර ගුණයෙන් හික්මවූහ. එබැවින් ස්ථාන වශයෙන්

SANHIDA LANKA

ගුණ වශම වූ යැයි කීයේය. සොරු ළග වැඩුනු ගිරවා තෙම නොයෙක් වධ බන්ධන හා සොරකම් වංචාප්‍රයෝග නොයෙක් සාහසික ක්‍රියාවන් ඉගෙන එතැන්හි උන්නේය. මම වනාහි මෙතැන්හි සබඳ පියබස් කීම්ද සුචරිත ධර්මයෙහි හැසිරවීම්ද මෛත්‍රීපූර්වගමව විසීමද ශිලසංයදයද ඉන්ද්‍රිය දමනයද පැමිණි අමුත්තන්ට ඉඳිනා අසුන් දීමද පයට පැන් දීමද යන මේ සියල්ලේ හික්මවන ලදින් මේ තලස් වීම් කෙරෙහි වැඩිනිමියි කීයේයි. ඉක්බිති ඒ ගිරවානෝ තුමු රජ්ජුරුවන්ට ධර්මදේශනා කරනුයේ පංචාළ දේශයට නායක වූ රජ්ජුරුවෙනි මේ ලෝකයේ සත්පුරුෂ වූ හෝ අසත්පුරුෂ වූ හෝ යම් සත්වයෙක් භජනය කරන්නේ වීනම් ඒ මුල් ආචාරීන්ගේ ගුණයම ශික්ෂ්‍යා හට පැමිණෙන්නේය. එබැවින් ඒ සිල්වතුන් ගුණවතුන් වැඩියා වූ ගුණ ඇතිවෙති දුශ්ශිලයන් කෙරෙහි වැඩියත් එබඳු දුශ්ශීල ගුණයම පුරුදු කොට අයසට පිහිටවන්නාහ. තවද රජ්ජුරුවෙනි යම් බඳු වූ හික්මුනාහුවෝ නොහික්මනාහුවෝ එකෙකු යමෙක් මිත්‍ර කොටගෙන වෙසේද එයිත් එබඳ වූගුණයටම පැමිණෙනුයි , සත්පුරුෂයන් හා එක්වූයේ සත්පුරුෂ ගුණයෙන් ප්‍රකාශ වන්නේය, අසත්පුරුෂයන් හා එක් වූයේ ආකාරියෙහි ඇසිවීමෙන් අයසට පැමිණෙනේය. එතකුදු වුවත් සත්පුරුෂ ගුණ ඇත්තවුන් හා එක්වීමෙන් අසත්පුරුෂ ගුණය නොපැමිණෙන්නේය නොහික්මුණු අසත්පුරුෂයන් හා එක් වූ පමණකින් සත්පුරුෂ ගුණ ඇති උත්තම තෙම තමා පලමු හික්ම සුසික්ෂවූහෙයින් අසත්පුරුෂයන් විසින් පසුව එක්වූ පමණකින් අසත්පුරුෂවූ පවිටු තැනැත්තන්ගේ ගුණ නොගන්නේය. ඊට දෘෂ්ටාන්ත කවරේද මැටිභාජනයෙහි ලනලද සුවඳ මල් තෙම මැටි සුවඳ කරන්නේය. මැටි සුවඳක් නොකරන්නේය. එපරිද්දේන් හික්මුණු සත්පුරුෂ තෙම නොහික්මුනු අසත්පුරුෂයන් හා එක්වුණු පමණකින් නපුරට නොයන්නේය. තවද රජ්ජුරුවෙනි මේ ලෝකයේ යම් යම් ගුණයක් සෙවුනා එකෙක් තමා සෙවුනා වූ සත්වයන් එබඳු ගුණයට වන්නේය. ඒ කුමක් මෙන්දැයි විෂ පෙවූ හීදඬු මිශ්‍රවූ හීකට්ටුව තෙම විෂ නොපෙවූ සෙසු හීදඬු සම්පර්කවශයෙන් විෂ භාවයට පමුණු වන්නේය, එපරිද්දෙනි. තවද රජ්ජුරුවෙනි යම් සත්වයෙක් කුස තන අගකින් කුණුමසක් පිරිමැන්දේ වීනම් ස්පර්ෂලද්දාවූ තණත් අපවිත්‍ර වන්නේය, පූතිමාංශතෙම කැලම කුණුක වන්නේය. එපරිද්දෙන් අඥාන සත්වයා හා එක් වූ තැනැත්තොත් අඥානව අසත්පුරුෂ බවට පැමිණෙන්නේය. ඒ තෙමේත් කැලම අසත්පුරුෂයයි කීයේය. තවද යම් සත්වයෙක් තුවරලා කස්තුරි කපුරු ආදී වූ සුවඳපාත්‍රයෙහි වැසුයේද ඒ සුගන්දය හා ස්පර්ශ ලත් පමණකින් පාත්‍රය සුවඳ වන්නේය. ඒ තෙමේ සුවඳ බැවින් සුවඳ වන්නේය. එපරිද්දෙන්ම යම් ශිල්ප වූත් යම් ධීරප්‍රඥාත් කෙනෙකුන් හා එක් වීද ඒතෙමේ ප්‍රඥාවන්ත වන්නේය. එසේ හෙයින් සත්පුරුෂයන් හා එක්වීම භජනය කිරීම උත්තමයැයි කියති. තවද මත්තෙහි අනුශාසනා කරන පුෂ්පක නම් ගිරවා තෙම රජ්ජුරුවෙනි යම්සේ ඒ පත්‍ර පුටයෙහිම සිට තමා සුගන්දය භාවිතා කරන්නාක් මෙන් සත්පුරුෂයන් හා එක්වීම භජනය කිරීම උත්තම යැයි කීහ. ඔහු ගුණ තමා කෙරෙහි පුරුදුකිරීම් වශයෙන් සත්පුරුෂයන් සෙවියයුතුය, අසත්පුරුෂයන් දුරුකටයුතුයැයි මෙසේ පක්ෂවීමට කාරණා කිමෙක්ද යනහොත්? අසත්පුරුෂතෙම තමා හා එක්වූවත් නරකයට ගෙණ යන්නේය, සත්පුරුෂ තෙම තමා හා එක්වූවන් දිව්‍යලොකසම්ප්‍රත්තියට පමුණුවන්නේය. එබැව්න් සත්පුරුෂයන් සෙවිය යුතුයැයි මෙපරිද්දෙන් ධර්මදේශනා කළේය. රජ්ජුරුවෝ ඒ ගිරවාණන්ගේ ධර්මදේශනාවෙහි ප්‍රසන්නවූහ. ඒ කියමින් සිටි නොබෝ කලකින් තාපසවරහුත් පලාඵල ගෙන ආහ. තමන්ගේ තපෝ වනයට ආ රජ්ජුරුවෝද තාපස වරුන්ට වැද උන් ගේ ඉරියව්වේ පැහැඳ මාගේ නුවරට වැඩිය මැනවැයි තපස්වීන්වහන්සැයි ආරාධනා කොට සිය නුවරට වැද අමාත්‍යමණ්ඩලයා මධ්‍යයෙහි ගිරවාණන්ගේ ගුණ කථනය කොට ඒකල්හි ගිරවානන් කෙරෙහි ගත් සෙනහයෙන් තමන්ගේ රාජ්‍යයෙහි කිසි තැනකත් ගිරවෙකු මැරිය නොහැක්කයයි ගිරවුන්ට අභය දානය දෙවූහ. ඉක්බිති තාපස වරුන්ගේ රජ්ජුරුවන්ගේ ආරාධනා නිසා ඒ නුවරටම ආහ. රජ්ජුරුවෝ ද තමන්ගේ උයනෙහි පන්සල් කරවා දී සිවු පසයෙන් උපස්ථාන කොට ස්වර්ගපදප්‍රාප්ත වූහ. ඒ රජ්ජුරුවන්ගේ පුත්‍රයෝනෝද අනතුරුව රාජ්‍යාභිෂේකයට පැමිණ ඒ තාපස වරුන්ට උපස්ථාන කළේය. මෙපරිද්දේන ඒ රාජ්‍යවංශයෙහි රජ සත් පරම්පරාවක මේ දන් වැට පැවැත්වූහ. මහ බෝධි සත්ත්වයො ඒ වනයෙහි වාසය කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ජාතක ධර්ම දේශනාව ගෙන හැර දක්වා වාදාරා මහණෙනි පෙරත් දේවදත්ත ස්ථවිරතෙම පාපිෂ්ටව එසේම පවිටුව පිරිවර ඇති වූයේ වේදැයි වාදාරා මේ ජාතකය පූර්වාපරසන්ධි ගලපා නිමවා වදාළ සේක.

SANHIDA LANKA

ඒ සමයෙහි සත්තිකුම්භ නම් ගිරවා තෙම දේවදත්ත ගිරවා තෙම සොරහු දැන් මොහුට පිරිවර උපන් පර්ෂත්වූහ එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝ එකල්හි තාපස වරහූනම් දැන් මේබුදුපිරිස් වන්නාහ, එකල්හි පුෂ්පකනම් ගිරවාතෙම දැන් මෙකල්හි බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේක්.

SANHIDA LANKA

# හල්ලාටික ජාතකය

තවද එක්සමයෙක්හි සකලලෝක සන්නිවාස නෛක සුරා සුර චක්‍රමස්තකොත්තුංග පද්මායමාන මානනීය පද්මා ඇති අප බුදුරජාණනන් වහන්සේ නදුනුයන් වැනි ජේතවනාරාමයෙහි ආර්ය බ්‍රහ්මවිහරණයෙන් දවස යවමින්වැඩ වසන සේක්. මේ චිත්‍රලලාස ජාතකය හල්ලාටි ජාතකය මල්ලිකා දේවීන් අරභයා වදාළ සේක

මල්ලිකා දේවින්ට වනාහි එක් දවසක් රජ්ජුරුවන් හා සමඟ ශාසනයෙහි පැවති පොරක් නිසා ඩබරයක් වූයේය. රජ්ජුරුවෝ කිපී නැවත ඒ දේවින් හා නොලන්වූය. එකෙනෙහි මල්ලිකා දේවිය තුමු රජ්ජුරුවන් මා කෙරෙහි කිපී නියාව බුදුහු නොදන්නා සේකැයි සිතුහ. මුන් සිතූ සිත දන්නා බුදුරජාණන්වහන්සේ දෙවෙනි දවස් භික්ෂු සංඝයා වහන්සේ පරිවරන ලදුව මහත් වූ බුදු සිරින් දිලියෙමින් පිඬුසිඟා වන්සේක ක්‍රමයෙන් රජ්ජුරුවන්ගේ මාලිගා දොරකඩට වන්සේක. රජ්ජුරුවොත් ඒ ඉදිරියට අවුත් පාත්‍රය ගෙන ශාස්තෘවූ තිලෝගුරු බුදු රජාණනන් වහන්සේ ප්‍රාසාදයේ මතු මහල් තලයට වඩා ගෙන ගොස් සිංහාසන මස්තකයෙහි වඩා හිඳුවා භික්ෂුන් වහන්සේත් පිළිවළින්වඩා හිඳුවා දක්ෂිණෝදයකදී මදුර වූ අන්නපානයන් වළඳවා භක්තකෘත්‍යාවසානයෙහි රජ්ජුරුවෝත් එකත්පස්ව උන්නාහ. එකෙනෙහි බුදුහු කිමෙක්ද මහ රජ මල්ලිකා දේවීන් නුදුටුවෝ වනැයි වදාරා ස්වාමිනි ඕ තොමෝ තමාගේ ඉසිරුමදෙන් මත්ව ඇවිදිනීයයි රජ්ජුරුවන් කී කල්හි කිමෙක්ද මහ රජ තෙපි පෙර කී දුරු යෝනියෙහි ඉපිද පවා එක් දවසක් කින්නරාංගනාවගෙන් වෙන්ව විඳි විරහ දුක් සිතමින් සත් සියයක් හවුරුදු අඩා වැලප ඇද්දෙහි වී දැයි වදාරා ඒ රජ්ජුරුවන් විසිනුත් ස්වාමිනී බුදුරජාණන් වහන්ස පෙර මා කිඳුරුව ඉපද එක රැයක් වූ වියෝ දුක සිතා ඇඩු පරිදි කෙසේදැයි වදාලහොත් යහපතැයි ආරාධිත වූ සේක් ඉකුත් දක්වා වදාරා සේක.

ඒ කෙසේද යතහොත්

යටගිය දවස බරණැස් නුවර හල්ලාටික රජෙක් දසරාජ දහමින් රජ කරනුයේ එකදවසක වනයේ ඇවිද උළුපැලහු මෘගමාංශය හා මී අනුභවකොට ඇවිදිමියි යන සිතින් සනිටුහන් ඇතියේ රාජ්‍යය අමාත්‍යයන්ට පවා දී පඤ්චායුධ සන්නඬව ඉතා හික්මුණු කීණබල්ලන් විසින් පිරිවරණ ලදුයේ නුවරින් නික්ම ක්‍රමයෙන් හිමාල වනයට වැද හිමවතින් වැටුනු ගංගා අනුව උඩුගම්බලායනුයේ යා නොහැකි දුර්ගස්ථානයකදී එම ගඟට වැටිහුණු කුඩා ගඟක් බැස ඒ අනුසාරයෙන් ගං වැල්ලෙහි ගොස් මුවන් හා ඌරන් මරාගෙන අඟුරු පැලහු මස් අනුභව කෙරෙමින් උත්සව තිබෙන රමයවුණි වනාහි සකටවැද ඒ ඒ දිගින් වැටෙන ගඟුල් ඇලි හා ගිරිකුළු සියන් බල බලා විස්ම පත්ව සිටියේය. ඒ සිත් කළු වූ ගඟතෙමේද වතුර ආ කල තනමතු පමණ දියගලා යන්නේය. සෙසු කල දනපමණ දිය යන්නේය. අනේක ප්‍රකාර වූ මස් කැලන් හා ඉදුඹුවන් ආදී ජලතල සත්වයන් හා හංස චක්‍රවකාදී පක්ෂිහුත් සැරහෙන්නාහ. නැවත ඉඳුනිල් වූ දිය කෙලවර රිදීපට හැඳුලුවාමෙන් සුදුවැලි තලාවෝ දෙපස වොරජනාහ, මෙම ගඟ දෙතෙරෙහි මල් බරින් පළු බරින් නැමී සිටිනා අතු පතර ඇති අනේකවිධ වූ තුරු සමුහයෝ දෙවියන් හා වන දෙවිදුන් මනනෙත් පොළඹමින් සෑදී සිටියාහ. ඒ මල් මුවරද රැස්බී මත් වූ බමර ගණද සුපක් මී අඹ තුඩුලා මත්ව කෙළිනා කොවුල් සන නෙයෙක් පුෂ්ප රසයෙන් ඵල රසයෙන් මත්ව රැවුපිලිරැවු දෙමින් තුරු හිසට හඬා බස්නා ජීවං ජීවක සැළලිහිණි ගිරා බොකල යනාදී පක්ෂින්ගෙන් ගැවසුනේය. මධ්‍යහ්න කාලයෙහි තුරු සෙවනැලි යට වැලිතලායෙහි ලැගුම් ගෙන සිටිනා නොයෙක් මෘගජාතීන්ගෙන් සිත් කලුය. මෙසේ ක්‍රාමදේවයා හට සරහන ලද ආපන භූමියක් වැනි වූ හේමවන නම් ගංතෙරෙහි කිඳුරෝ දෙන්නෙක් ඔවුනොවුන් වැලඳ සිඹසනහා අනේකප්‍රකාර විලාපකියා එඬන්නාහ, වල පිනාහ ඒ කෙණෙහි ඒ හල්ලාටික රජ්ජුරුවොත් හේමවත නම් ගඟ ඔස්සෙහි ගඳමහත්පවුවට නැගෙණුයේ එ වැලප සිඹ සනහා හඩන කිඳුරා හා කිඳුරංගනා දැක මේ කින්නර යුගලය මෙපරිද්දෙන් හඬනුයේ කවර කාරණයෙක්දැයි පිලිවිසිණි සිතා තමා හා කැටිව එන බල්ලන් මූණ බලා මදක් අසුරුසන් ලූයේය. එකෙණෙහි සුසික්ෂිත වු හෙයින්ම වැඩී ගිය බල්ලෝ ඒ සලකුණෙන් ලැගහොත්තාහුය. ඒ රජ තෙම ඔවුනොවුන් නිසොල්මන්ව ලීගත් නියාව දැන දුන්න හා ර් කටුව ද සෙසු ආයුධයන්ද සිටියා වූ රුක මුල වතුරුවා සෙමෙන් සෙමෙන් පියවර තබමින් ඒ කින්නර මිථුනය ස්වාමී පයට ගොස් කුමක් නිසා තොපි ඔවු නොවුන් වැලඳගෙන ඇඬුයැයි විචාරන හල්ලාටික රජ තෙම කියනුයේ කිඳුරෙනි මේ හේමවන වූ ගංගා තීරයෙහි මෙසේ වූ වසන්ත කාලයෙහි මෙබඳු රමණීයවූ වැලි තලාවෙහි මෙබඳු මල්පල්ලෙන් සැදුණු වන ස්ත්‍රී තොපි දෙදෙනම නොසතුටු සිත් ඇතියාවු ඔවුනොවුන් වැලද ගෙන ඉලව් ගන්නවුන් මෙන් විටක හඬව විටක කෙළිමින් සෙමින් හිඳුවා මේ කවර කාරණයක් දැයි විචාරණ තවද කිඳුරෙනි තොප දෙදෙනම යොවුන් පත් ස්ත්‍රීන්ගේ රූපශ්‍රී පරදවන විලස්ඇතියාව මෙබඳු රූපශ්‍රීන් ඇති මිනිසුන්ගෙන් යම්තම් භේදයත් ඇති තොපට මිනිස් ලොව සත්වයෝ කෙසේ බැවහාර කෙරෙද්දැයි විචාළේය. රජ්ජුරුවන්ගේ බස් අසා කිඳුරු

SANHIDA LANKA

තෙම චකිතව මුවෙන් නොබැන උන්නේයි, කිඳුරංගනා තොම රජ්ජුරුවන් හා සමග කථා කරන්නේ රජ්ජුරුවෙනි සුපුස්පිතවූ මලින් ගැවසී ගත් මේ මලාවන නම් පර්වතයද පඬරක නම් පර්වතයද චිත්‍රකූටනම් පර්වතයද සිහිල් මදුර පැන් හඬාබස්නා දොළින් හා නදී ආදීන්ද යන මේ ස්ථානයෙන් අසවල් තැනට සැප නොවිඳුම්හය යන තැනෙක් නැත්තේය. අප මිනිසුන් බඳු වූ රූ ඇති පමණක් විනා තිරිසන්ව විනා කිඳුරෝයැයි මිනිස් ලොව සත්වයෝ කියන්නාහයි කිව ඉක්බිති හල්ලාටික නම් රජ තෙම පිලිවදන් දෙනුයේ කිම් පුරුෂයෙනි තෙපි දෙදෙන බොහෝ අවුලා මූලාවෙක ගැසී දුක්විදපුකෙනෙකුන් මෙන් විටක කිඳුර තෙම කින්නරාව වැළඳ ගෙන හඬන්නේයැයි කිසිවිටෙක කින්නරාංගනා තෙම කිඳුරා වැළඳ ගෙන හඬන්නීයැයි මේපරිද්දෙන් ඒ ක්‍ෂණ ක්‍ෂණයෙහි වැලපුව සෝක කරව කීමෙක්ද විඳි දුක් සිතා ඉදිරියේ වන දුක් සිතා හඬවදැයි විචාළේය.

එකෙණෙහි කින්නරාඞගනාතොම රජ්ජුරුවෙනි තොප කී පරිද්දෙන්ම විඳිදුක් සිතායයි කියාත් කයහැක්කේය. ඉදිරියෙහි එසේවූ දුකක් පැමිණියේ නම් නපුරැයි යන සිතින් තැවෙන හෙයින් ඉදිරියේ සිතා අඬතියි කියහැක්කයි කාරණාකියන්නැයි සබඳ පුරුෂයාණෙනි පෙර එක් දවෙසක රාත්‍රියෙහි ඔහු නොවුන්නොමැතිකැවාම ක්‍ෂණ ක්‍ෂණයෙහි දුර දකිමින් ඔවුනොවුන් සිතින් සලකමින් වියෝවින් රැයක්සැලසී ගියේනම් කෙසේ ඒ දුක් ඉවසමෝදැයි ඉදිරි සිතාත් අඬන්නම්හ, එබැවින්විඳි දුක් සිතාත් ඉදිරියෙහි දුකෙන් වෙදෝහෝයි යන භයින් හඬම්හයි කියා සාබාග්‍රහයෙහි උන්නීය නැවත ඊට කාරණා පිළිවිස්නා රජතෙම සබඳ කිම් පුරුෂයාණෙනි යම් එක රාත්‍රියෙහි වියෝවට පැමිණ තැවෙමින් එතැන් පටන් නැසී ගිය සම්පතකට සෝකකරණ ලද්දක් මෙන් ද දෙමව්පියන් මලහයි සෝක ගෙණ හඬනකලක් පරිද්දෙන්ඉතා බැගෑපත්ව තෙපි දෙදෙනම හඬව මනුෂයන්ට බඳ ආකාර ඇති තිඳු රතී එක් රාත්‍රියෙහි වියෝවූයේ කුමක් නිසාදැයි කාරණා විචාළේය.

ඉක්බිති වියෝ වූ පරිදි කියන්නාවූ කින්නරාඞගනාතොම එම්බා රජ්ජුරුවෙනි මේ වේග වූ ජලප්‍රවාහන ඇති දෙතෙර සිට නොයෙක් තුරුපෙල ඇති යම් මේ ගංගාවක් තෙපි දකුද මෙසේවූ වර්ෂාකාලයෙහි රම්‍යවූ පර්වත සථල යෙහි සිරිවිඳ සවස් වෙලෙහි ගඟින් එතරව මාගේ වල්භතෙමා පසුපස්සේ එති සිතා එකවර ගියේය. මම වනාහි මොවුන් එතරවූ නියාව නොදැන මල්යහන්අතුට සැතපී සැප විඳිනා පිණිස පිපීගියාහු අගුණ මල්ද පිපී කැණහිල්මල්ද රන්වන් හල්මලින් නිති ඉද්දමල්ද නොහොත් යොහොඹුමල්ද කඩන්ට වන්මී, කුමක්නිසාද නොහොත් මාගේ වල්භයාත් මල්පැළඳ මලින් සැරහෙන්නේය, මමත් මල්පැළඳ මල් රොන් පියයුරෙහි තවරා මොවුන්ට ගැගෙමි, මල් බඳිනා නිසා පසුවීම්, තවද මේ අකාල මේඝය නිසා මේ ඇසිල්ලෙහි වතුර එයි යන්නාක් නොදැනුනු හෙයින් මාගේ වල්ලභයාත් මල්සුවඳින් සැරහී සැපවිදුම්හයි යන ලෝභයෙන් මේ වනහිස පිපුණු රත්කරවූ මල්ද එරහැන්ද හෙවත් ඇසල මල්ද නිකමල්ද පලොල් මල්ද කඩනුයෙන් මදක් පමාවීම්

තවද රජ්ජුරුවෙනි එම දවස් සුපිපි මල් ගස්වලින් නොමදකොට මල්බිදිනෙමි මෙයින් මල්වඩම් ගොතා මාගේ වල්ලභයාත් පළඳවා මමත් පැළඳමල් යහනෙනි සැතපී මේ මලින් අඬමුකුලුමලු ගෙණ මුතුහර ලෙසින් අමුනා මාගේ ස්වාමීහුත් පළඳවා මමත් මුතුහර ලෙසින් පළඳිමි ඉදිරියෙහි විඳිනාසැප පිණිස ලෝභයෙන් මල්බිඳින්නට පසුවීම්, එබැවින් රජ්ජුරුවෙනි අප සැරසෙන්නාහු පුෂ්පාභරණයට කිනිහිරිමල් රත්රන් වියයලා පලුදල අක්ම පියුම්රාම්ණිවිය, නිකමල්මට මුක්ත ඵල විය. මෙපරිද්දනේ පුෂ්පාභරණයෙන් සැරහී සැපවිඳිම්හ, මම වනාහි කලුවැල් සඳන්හර මේ ගඟ හස්ත ගල තෙලෙහි ගහා එකෙණෙහි කාමයෙන් මත් වූ මාගේ වල්ලභයාත් සියලඟ සඳුන් කරවා සුරක්තවූ අඞගප්‍රත්‍යඞග ඇතිවහිඳිනේය. මමත් පියවුරු සඟලෙහි රත්සඳුන් තවරා මලින් සැරහී රජසිරිහා සමාන මොහු අභිමරණීය කෙරෙමින් මේ විඳ ආ සැපලෙසට එදවසුත් දවස්හරණා ලෙසට මල් සුවඳ ආදිය නිසා මාගේ ස්වාමීහු එතර වියඳී මම් පමාවිම්, එදතුරෙහි පර්වත  දෙක අතුරෙන් හුනුමෙවනනම් නදී යෙහිදීවන කවතුරෙන් ගන්වැල්ලෙහි කැටි කොට තුබූ සුපිපි කිණිහිරි මල් ද සලල මල්ද පැහැරගෙණ යෙමින් ගඟ දෙතෙර ගලාගෙණ නික්මුනේය. එකෙණෙහි ඇසිල්ලකින් කින්නරාඞගනා තොම සබඳ පුග්‍රය අපට අවුරුදු දාසෙක් පරමායුස ඇත්තේ ය. මේදැතුරෙහි කිසි අන්තරායකුත් නැත්තේය, කිසි රෝගයකුත් නැත්තේය. මේ අවුරුදු දාස මුලුල්ලලෙහි දුකෙන් ඇති නමුත් යන්තමෙක් වන්නේය. බොහෝසේම සැප ඇත්තේය. එබැවින් රාගයෙහි ඇලුම්තබා වියන පමණක්විනා සිතකින් ඔවුනොවුන් කකෙරෙහි වෙන් වන්නේ නැත. එසේහෙයින් තිරිසනුන් කෙරෙන් අපසේම සැපවිඳිනාසේ දන්නේ නැත. තමන්විඳිනා සැප කියා රජ්ජුරුවන් කාමබන්ධනයෙන් උමතු කළාහ. එබස් අසා හල්ලාටික කනම් රජ තෙම මොහු තිරිසන්ව එකදවසක වියෝගයෙන් ම තැවී සත්තියයක් හවුරුදු හඬාවැලප ඇවිද්දේය. මම වනාහි තුන්සියයක් හවුරුදු කසීදේශයට නායකව රාජ්‍යශ්‍රී විඳිමින් ඒ ඒ සැපත් හැරපියා නිස් ප්‍රයෝජනව වනයෙහි ඇවිදිමින් සිටියෙමි, මේ මාකරන්නේ කටයුක්තෙක් නොවෙයි කියා එයින් වැලක බරණැස්නුවරට අවුදින් පෙර පරිද්දෙන් රජඉසුරු විඳිමින්

SANHIDA LANKA

සිට රජ්ජුරුවන්වහන්සේ හිමවත් වෙනෙයි නුඹවහන්සේ දුටු ආශ්චර්ය්‍යා අමුතු කීමෙක්දැයි විචාළ අමාත්‍යයන්ට මේ කින්නර යුගලයාගේ ස්වරූප ආද්‍යන්තනහෙයින් ක්‍රියා එතැන්පටන් දන්පින්කම් කෙරෙමින් රාජ්‍යශ්‍රී අනුභව කෙළේය මෙසේ පූර්වකථා දෘෂ්ටාන්තකොට දක්වා අනුශාසනාකරණ බුදුරජාණන් වහන්සේ කොසොල් රජ්ජුරුවන් වෙනා මේ තිරිසනුන්ගේ පවා ඔවුනොවුන් කෙරෙහි ඇති රාගය අසා දැන සමග සතුටුව කලහ නොකරව, යම්සේ කිඳුරෝ තමන්ගේ අප්‍රමාදවීමෙන් සන්තෝෂයට පැමිනේද එපරිද්දෙන් තෙපි හැම නොතැවෙව, සොකයට නොපැමිණේවයි වදාළසේක.

මල්ලිකා දේවි බුදුරජාණන් වහන්සේ දේශනාව අසා හුනස්සෙන් නැගී දොහොත් මුදුනෙහි බැඳ දසබලධාරීවූ බුදුරජාණන්වහන්සේ ස්තුති කරන්නී බුදුරජාණන් වහන්සේ විසින් අනේකප්‍රකාරයෙන් දෙසනලද අත්වැති දේශනාව ප්‍රසන්නවූ සිතින් අසම්හ, මේ මධුරවූ ධර්මදේශනාව ඇසීමෙන් සිත දුක නිවී ගියේය. කන්ලැබීමෙන් එල ලබනලද සත්වයන්ට මෙලොවින් සැප එලවන්නේය. බුදුරජාණන් වහන්සේ බොහෝ කාලයක් ජීවත්වුව මැනවැයි ස්තුති කළාය.

කොසොල් රජ්ජුරුවෝත් එතැන් පටන් මල්ලිකා දේවීන්ට සතුටුව දවස් අළුවාහ, තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්වාපරසන්දිගලපා මේ හල්ලාටික ජාතකය නිමවා වදාළ සේක

එසමයෙහි කිම් පුරුෂයා නම් දැන් මේ කොසොල් රජ්ජුරුවෝය, එකල්හි කින්නරාගනා නම් දැන් මේ මල්ලිකා දේවිය, එසමයෙහි හල්ලාටික රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

SANHIDA LANKA

# සෝමනස්ස ජාතකය

අංගීරස ශාන්ති නායකයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරද්දී දෙව්දත් තෙරුන් අරභයා මේ ජාතකය වදාළසේක.

නිධාන කථාව:- දිනක් දම්සභා මණ්ඩපයෙහි භික්ෂූන් අතර දෙව්දත් තෙරුන් බුදුන් නසන්ට කළ උත්සාහයක් ගැන කථාවක් කරමින් උන් කලට එහි වැඩි බුදුරජාණන් වහන්සේ මහණෙනි, දෙව්දත් තෙරුන් මට වධයට උත්සාහ කළේ දැන් මතු නොවෙයි පෙරත් එසේ උත්සාහ කළෝ වේදැයි ඉකුත්වත වදාළ සේක.

ආරාධනය:- භික්ෂූන් වහන්සේ

ජාතක කථාව:- යටගිය දවස උත්තර පංචාල නුවර රේණුක නම් රජ කෙනෙක් රාජ්‍යය කරන කල්හි මහාරක්ෂිත නම් මහානුභාව සම්පන්න තාපස කෙනෙක් පන්සියයක් තාපසවරුන් පිරිවරා හිමාල වනයේ වසනුයේ ලුණු ඇඹුල් සෙවුනා පිණිස  පිරිස සමඟ මනුෂ්‍ය වාසයට බැස ගම්  නියම් ගම් වල ඇවිදින්නේ රජ්ජුරුවන්ගේ උයනෙහි සැතපී පසුදා පිඬු සිඟා රජ උයනට පැමිණියේය. රජ්ජුරුවන් තාපස වරුන් දැක පැහැද වැසි සාර මස උයනෙහිම නතරවුවමැනවයි ආරාධනා කොට පන්සල් කරවාදී උවටැන්කළහ. ඒ තාපසවරු වස් අවසානයෙහි හිමවත් පෙදෙසට යම්හයි රජ්ජුරුවන්ට දන්වා හිමාල වනයට යන අතර මග මධ්‍යාහ්න වේලාවක එක් රුකක් මුල පිරිවර සමග උන්නේය. එකල්හි සෙසු තාපසවරු කථාකරන්නාහු අපට උවටැන්කළ රජ්ජුරුවන්ට තමාගේ වංශය ගෙන යාමට දරුවෙක් නැත. ප්‍රාර්ථනා කොටත් නොලද්දේ වේදැයි කීහ. එවිට නායක තාපසයන් වහන්සේ එම්බා තාපසවරුනි, අමුත්තක් නොසිතව හෙට දවස් පහන්වෙන වේලාවට එක් දිව්‍ය පුත්‍රයෙක් චුතව අග මෙහෙසිය කුස පිළිසිඳ ගන්නේයයි කීයේය. එබස් අසා එක් සොර තාපසයෙක් රජරට රාජ ගුරුකම්කෙරෙමියි සිතා අනිත් තාපස වරුන් විඩා සංසිඳවා රුක් මුලින් යන වේලෙහි තමා යාමට අපහසුයයි හොර ලෙඩ ගෙන එහිම හොත්තේය. නායක තාපසයන් වහන්සේ මොහුගේ වංචනික අදහස දිවසින් දැක කිසිත් නොකියා " යම් දවසක ආයේ එවුනම් එදා පලායව"යි කියා සෙසු තාපසවරුන් සමඟ හිමාල වනයට ගියේය. ඔවුන් ගිය කෙනෙහි හොර තවුසාද වහා නැගිට රජ මාළිගාව කරා දුවගොස් මහාරක්ෂිත තාපසයන්ගේ අතවැසි තවුසෙක් ආහයි පණිවුඩ යවා ගොස් මතු මහල් තලයට ගොස් පනවන ලද ආසනයේ උන්නේය. තාපස වරුන්ගේ සුවදුක් පිළිවිස නුඹ වහන්සේ නැවත ආයේ මන්දැයි විමසු විට රජතුමනි, ඔබට දරුවෙක් ලැබෙද්දෝ හෝයි මා දිවසින් බැලුවිට මහත් සෘඞ් ඇති දිව්‍ය පුත්‍රයෙක් තොපගේ අගමෙහෙසිය වූ සුධර්මා බිසවුන් කුස පිළිසිඳ ගන්නේයයි දැක මෙපවත් නොදැන දරු ගැබ නසාපු නම් නපුරුයි සිතා එපවත් තොපට කියන පිණිස ආමි ඉදින් ආ කාරිය සිඹවීය. යම්හ මහ රජ්ජුරුවෙනියි කීහ. රජතුමා මහත් ප්‍රිතියට පැමිණ මා වෙනුවෙන් පැමිණි ඔබතුමාව නැවත නොයවමි මෙහිම වසනු මැනවයි උයනට කැඳවා ගෙන ගොස් පන්සල හා පිරිකර පවා දුන්නේය. එතැන් පටන් තවුසන් දිනපතා මාලිගාවට පැමිණ වළඳමින් සිටියේ මේ තෙමේ දිව්‍ය චක්ෂු තාපසයෝ නමින් ප්‍රකට විය. දස මස් ඇවෑමෙන් බිසව මහා පින්වත් කුමරයෙක් වැදුවා සොමනස්ස කුමාරයෝ යයි නම් තැබූහ. කුහක තාපසයා උයනෙහි එක් පෙදෙසක එළවළු වවමින් විකුණා මුදල් උපයා ගන්නේය. කුමාරයාට සත්හැවිරිදි කල්හි එක් පසල් දනව්වක කැරැල්ලක් ඇති විය. රජතුමා කුමාරයාට හොර තවුසාව භාර දී කැරැල්ල සංසිඳ වීමට ගියේය. දිනක් සොමනස්ස කුමාරයා තාපසයන් දකිමියි කියා උයනට ගියේ කසාවත් හැඳ ජටාවක් හිසෙහි බැඳ දැතින් කල දෙකක් ගෙන එලවළු වලට පැන් වත්කරන්නාහුන් දැක "මේ හොර තවුසා මහණ දම් නොකොට පලා විකුට සම්පත් උපයතියි දැන කුමක් කොරයිද පලා කොළ ගොයියාණනි" යි කියා වෙහෙසා ලජ්ජා කරවා නොවැඳ ගියේය. එවිට කූට තාපසයා සිතනුයේ මේ කුමාරයා කුඩා කලම මෙබඳු ගුණ ඇත්තීය. වැඩි වයසට පැමිණි කල කුමකින් කුමක් කෙරෙද්දැයි නොදනිමි දැන්ම මොහු නැසිය යුතුයයි සිතා තමා හිඳිනා ගල් පෝරුව ඉවත පෙරළා පැන් කල බිම ගසා දමා කුණු කසල ඇද දමා හිස වසා පොරවාගෙන වැදහොත්තේය. රජතුමා පසල් දනව්ව සංංසිඳවා රජගෙට නොගොස්ම තාපසයන් වසන තැනට ගොස් තාපසයන්ගේ පය පිරිමදිමින් තාපසයන් වහන්ස කිමෙක්ද? කවර කෙනෙක් හිංසා පීඩා කළේද? ආක්‍රොශ පරිභව කෙළේද? වදාළ මැනවි. තාපසයන් වහන්ස, අද කාගේ දෙමාපියන් හඬා වැළප ගනිද්ද වදාළ මැනවි ඔහට කළමනා නිග්‍රහ දන්නෙමි වේදැයි කීහ. එබස් අසා කූට ජටිලයා කෙඳිරිගාමින් නැඟිට රජතුමනි, තොප දැකීමෙන් දින කීපයකින් සතුටට පත් වූයෙමි. තොප නැති අතර පුත්‍ර සෝමනස්ස කුමාරයා පන්සලට කළ විනාශය බලනු මැනවි මට කළ විනාශය බලනු මැනවි එසේම මට නින්දා කළේය. යනාදීන් කුමාරයන් ගේ නුගුණ කීයේය. රජතුමා වචහා කිපී මාගේ මගේ ගුරුවරයන් කෙරෙහි කිසි සැකයක් නැතිව මෙසේ කළ තැනැත්තේ මතු අප කෙරෙහිත් භයක් සරුවක් නොකරන්නේය. දැන්ම මොහුට දඬුවම්

දිය යුතුයයි වධයට නියෝග කරන රජතෙමේ වධකයන් ගෙන්වා වදකයෙනි සෝමනස්ස කුමාරයන් වහා අල්වා හිස කපා ගෙනවුත් ඉදිරිපත් කරවයි නියම කළහ.ඒ නියෝග ලත් වධකයෝත් වේගයෙන් ගොස් මව් ඇකයෙහි හුන් කුමාරයන්ට රාජ නියෝගය කියා සිටියහ. කුමාරයා දුකින් යුතුව නැගී සිට වධකයෙනි, මා නොමරා ගෙන ගොස් රජ්ජුරුවන්ට පැලවයි කීයේය. එසේ ගෙනගිය කුමාරයා පිය රජ්ජුරුවන් අමතා රජතුමනි, මම කළ වරඳ විචාරා නිග්‍රහ කිරීම රාජ ධර්මයක් බැවින් එය දැනගනු පිණිස ආමියි කියේය. ඇමතියෝද රට වැස්සෝද මව් බිසවද කුමාරයාට පක්ෂව සිටියහ. රජතුමා කුමාරයා අමතා ලොව ඇති වරද වලින් තොප කළේ ඉතාම උග්‍රවූ දෙයකියි තාපසයන් කළ පැමිණිල්ල ඉදිරිපත් කෙලේය. එවිට කුමාරයා රජතුමනි ගොවිකම් කොට රැගෙන හෙයින් ගොවියාණනි, කීනම් ඉන් ඇති මාගේ වරද කුමක්ද? මොහු එළවළු විකුට මුදල් උපයන්නේය. මෙය නො අදහන්නෙහි නම් එළවළු විකුණන්නවුන් ගෙන්වා විචාළ මැනවි. එවිට අසල සිටි බොහෝ දෙනෙක් එය ස්ථිර කළහ. රජතුමා රාජ පුරුෂයෝ යවා තාපසයන්ගේ පලා කොළ වත්ත බලා සැක අලහ. සේවකයෝද පන්සලට වැද එක්කළ කහවනු ගෙනවුත් රජ්ජුරුවන්ට දැක්වූහ. රජතෙම කුමාරයන් නිවැරදි බව දැන කුමාරයාණෙනි තොප කීවා සැබෑය මොහුලඟ සැබෑ තපසෙක් නැතැයි කීයේය. ඉක්බිති කුමාරයා මේ නුවණනැති පිය රජ්ජුරුවන් ලඟ වසනුවට වඩා හිමාලයට ගොස් පැවිදීවීම යහපතැයි සිතා සියළු පිරිස අමතා මේ රජතෙමේ මේ අඥාණවූ තාපසයාගේ බස් අසා මා නිකරුනේ මරන්නට නියම කෙලේය. එබැවින් මේ නුවණ නැති රජ්ජුරුවන් ලඟ වසනවට වඩා පැවිදිවීම යහපතියි කියා පියා වැඳ අවසර දෙවයි කීයේය. පිය රජතුමාතමාගේ රාජ්‍යය භාරදෙමි නොයවයි කියද්දීත් තමා පෙර ආත්මයෙහි විඳි දිව්‍ය සම්පත් වර්ණණා කොට රාජ්‍යය ප්‍රතික්ෂේප කර පියාට ධර්මදේශනා කොට අපරික්ෂාකාරිව ක්‍රියා නොකරන ලෙස කියා එහි ආදිනව පෙන්වා මව්පියන් වැඳ අවසර ගෙන තාපසයන්ටද අවවාද දෙන ලෙස නියම කොට හිමාල  වනයට ගොස් විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා විසින් මවාලූ පන්සලට ගොස් එම තවුස් පිරිකර හැඳ පැවිදිව ධ්‍යාන ලබා සිට මියගොස් බඹ ලොව උපන්නේය. රට වැස්සෝ එක්වී සොර තවුසා තලා පෙලා මර දැමූහ.

එසමයෙහි හොර තවුසා නම් දැන් දෙව්දත් තෙරුන්ය. මව්පිය දෙදෙනා නම් සුඬෝදන මහමායා දෙදෙනාය. සෝමනස්ස කුමාරයෝ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# චම්පෙය්‍ය ජාතකය

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් උපොසථ ශිල රක්ෂණයක් අරභයා මේ ජාතකය වදාළ සේක.

නිධාන කථාව:- දිනක් පෙහෙවස් රැකි උපාසක පිරිසක් අමතා උපාසකවරුනි, තොප රැකි ශිලය ඉතා යහපත පෙර නුවණැත්තෝ මහත්වූ නාග සම්පත්තිය හැරදමා අවුත් උපෝසථ ශිලයම රැක්කෝ වේදැයි ඉකුත් වත වදාළසේක.

ආරාධනය:- භික්ෂූන් වහන්සේ

ජාතක කථාව:- යටගිය දවස අඟුරට අඟු නම් රජ්ජුරුවන් රාජ්‍යය කරන සමයෙහි අඟු මගධ දෙරට අතරෙහි චම්පා නම් ගඟක් වුයේය. ඒ යට නාග භවනයෙහි චම්පෙය්‍ය නම් නාග රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. එසමයෙහි කිසි කලෙක අඟු රජ්ජුරුවෝ මගධ රට ගන්නාහ. මෙසේ කල් යාමකින් දිනක් මගධ රට ගන්නාහ. මෙසේ කල් යාමකින් දිනක් මගධ රජ්ජුරුවන් හා යුධ කොට පැරදී අසකු නැගී දුවනුයේ අඟු රජ්ජුරුවන්ගේ යෝධයන් විසින් ලුහුබඳවන ලදුව දියපිරි ඉතා ගැඹුරු වූ චම්පානම් නදිය ලඟට පැමිණ සතුරන් අතින් මිය යනවාට වඩා මේ නදියට පැන මියයාම යහපතැයි සිති ගඟට පැන්නේය. එවිට චම්පෙය්‍ය නා රජ්ජුරුවෝ නාලොව රුවන් මණ්ඩපයක තම පිරිස සමග මහා පානයක් බොමින් කෙළිමින් හුන් ඉදිරියට වැටුනේය. එකෙනෙහි නා රජ තෙම ස්වර්ණාභරණයෙන් සැරසුනු රජ්ජුරුවන් දැක සියළු විස්තර අසා දැන තම ආසනයෙහි වඩා හිඳුවා ඔහු අස්වසා රජ්ජුරුවෙනි, තොප අඟු මගධ දෙරට නායකයා කරවා ලමියි පොරෙන්දුවී සතියක් එහි සිට සත්වන දින නාග භවනයෙන් නික්ම යුඬාභිමුඛ වුහ. එකෙනෙහි මගධ රජතෙමේ නා රජ්ජුරුවන්ගේ ආනු භාවයෙන් අඟු රජ්ජුරුවන් අල්ලාගෙන විනාශකර දෙරටෙහිම නායකයා වී රාජ්‍යශ්‍රී වින්දේය. එතැන් පටන් මගධ රජ්ජුරුවන්ගෙත් නා රජ්ජුරුවන්ගෙත් විශ්වාසය ස්ථිරවුයේය, එබැවින් අවුරුද්දක් පාසා චම්පා නම් ගංතීරයෙහි මහත් වූ බලි පුජා පවත්වන්නේය. නාරජතෙම පිරිවරින් පැමිණ එම බලි පුජා පිළිගන්නේය. මහ ජනයා එම ශ්‍රී විභූතිය බලා ප්‍රීති වන්නාහ. එසමයෙහි දිළිඳු කුල පුත්‍රයෙක් නා රජ්ජුරුවන්ගේ ඓශ්වර්‍ය්‍ය දැක ලොභ උපදවා මහා නාග සම්පත්තිය පතා දන් දී සිල් රැක චම්පෙය්‍ය රජු කාලක්‍රියා කළ සත්වන දිනයෙහි මිනිස් ලොවින් චුතව නාලොව ඕපපාතිකව උපන්නේය. තම මහත් වූ ශරිරය දුටු අළුත් නා රජ්ජුරුවෝ තව වේශය ගැන කලකිරි දෙව්ලොව සැප විදීමට කුසල් ඇති මා තිරිසන් යෝනියෙහි උපනිමි මේ ජිවිතයෙන් මට කම් කිම්දැයි මියයනු කැමති වූයේය. ඉක්බිති සුමන නම් මානවිකා තෙම මොහු දැක මහත් සතුටට පැමිණ ගී ගයමින් නටන්නට වන්හ. එවිට ඕහට නාග භවනය ශක්‍ර භවනය මෙන් වැටහුනේය. මියයාමෙහි සිත පසුබට වූයේය. ඒ නාග ශරිරය අතුරුදහන් කොට සියළු අභරණින් සැරසී යහන මතුයෙහි එලක් බැඳ උන්නේය. එතැන් පටන් උන්ගේ යසස මහත් වූයේය. ඉක්බිති නැවත වරක් එහි කළකිරි මිනිස් ලොව ඉපද සතුස්සත්‍ය අවබෝධ කරමියි සිතා එහි ඉඳ පෙහෙවස් රකින්නේය. මාවත යන එන සත්වයෝ මේ දිව්‍ය නාගයෙකැයි මල් පුදා යන්නාහ. පසල් ගම්වැසි මිනිස්සුද තුඹස මැදිකොට මණ්ඩපයක් කොට වට වැලි මලුවක් කොට පුදා ගියහ. මෙසේ නාග භවනයට යමින් එමින් බොහෝ කාලයක් සිල් රක්ෂා කලහ. දිනක් සුමනා නාග මානවිකාව ස්වාමිනි, ඔබතුමා පෝයක් පාසා මිනිස් ලොවට ගොස් සිල් රැක එන සේක. මිනිස් ලොව භය සහිතය ඉදින් ඔබට කිසි භයෙක් සැලසිනි නම් අපි කෙසේ දැනගනුමෝද? ඊට කිසි සලකුණක් කිව මැනවයි විචාළීය. එවිට නා රජ තෙම මඟුල් පොකුණ සමීපයට ඈ කැඳවා ගොස් සොඳුර, මා මිනිස් ලොව ගියකලට යමෙක් මට ගැහැටක් කළෝ වී මේ පොකුණෙහි පැන් අප්‍රසන්න වන්නේය. ඉදින් ගුරුළෙක් ගසාගෙන ගියේ නම් පොකුණ පැන් කැකෑරී නැගෙන්නේය. අහිගුණ්ඨකයෙක් අල්ලා ගත්තේ වී නම් පොකුණේ පැන් ලේ පාට වන්නේ යයි ඈට මේ සලකුණු තුන කියා පෝය දින නාග භවනයෙන් නික්ම මිනිස් ලොව තුඹස මතුයෙහි ශරිර ශෝභාවෙන් අවට හොබවමින් වැදහොත්තේය. මේ අතර බරණැස් නුවර එක් මානවකයෙක් නයින් අල්ලා කෙළවන ආලම්බන යන මන්ත්‍රයක් ඉගෙන තමාගේ ගමට එනුයේ මේ නා රජ්ජුරුවන් දැක මොහු අල්වා කෙළවා බොහෝ සම්පත් රැස් කෙරෙමියි සිතා දිවෙන් ඖෂධයකක් ගෙන සපා මන්ත්‍රය ජපකොට ඔහු සමීපයට ගියේය. දිව්‍ය මන්ත්‍රය ඇසු වේලෙහි පටන් කණ ඇතුළෙහි රත්වූ යවුලකින් විදින්නාක් මෙන් වේදනා වූයේය. හිස ගිනිගත්තාක් මෙන් විය. එකෙනෙහි මේ කිමෙක්දෝයි බලනු සඳහා දරණ වැල අස්සෙන් හිස ඔසවා බලනුයේ අහිගුණ්ඨිකයා දැක මාගේ විෂය ඉතා උග්‍රය, මා කිපී විෂ වාතයක් හළෝනම් මොහුගේ ශරිරය අළුවන්නේය. එවිට මාගේ ශිලය කැඩෙන්නේය. මොහු බලන්නට නොකැමැත්තේය. දරණවැල අස්සේ හිස සඟවා ගෙන ඕනෑ දෙයක් කෙරේවායි සිතා වැදහොත්තේය. එවිට අහිගුණ්ඨකයා ඖෂධයක් සපා මන්ත්‍රය පුරවා නාගයාට ගැසුයේය. නා රජ්ජුරුවන්ට මහත් වේදනා උපන්නේය.

SANHIDA LANKA

ඊට පසු අහිගුණ්ඨකයා නාගයා අල්ලා තලා දුර්වල කොට හිස අල්ලා ඖෂධ ගල්වා දළ බිඳදැමීය. කට ලෙයින් පිරී ගියේය. ශරීරයද තලා පුරුක් බිඳ හිසවට කරකවා බිම ගසා ඉතා දුර්වල කළ නමුත් ශීල භෙදයක් වේදෝයි වේදනා ඉවසා සිටියේය. අහිගුණ්ඨකයා නා රජ්ජුරුවන්ව ගෙන ගොස් කෙළවා මහත් මුදල් උපයා ගත්තේය. නටන වේලෙහි ඔහුගේ නියමය පරිදි නොයෙක් පාට ගනිමින් නටන්නේය. ලොකු කුඩා වෙස් ගනිමින් නටන්නේය. මහ ජනයා ඉතා පුදුම වී මුතු මැණික් ආදිය අහිගුණ්ඨකයාට දෙන්නාහ. මෙසේ ක්‍රමයෙන් නයි නටවමින් බරණැස් නුවර උග්ගසේන රජ්ජුරුවෝ සමීපයටද පැමිණියේය. රජතුමා නයා ගැන අසා තමා ඉදිරියේ කෙළවයි විධානය කෙළේය. ඒ තෙමේත් යහපත, රජතුමනි සෙට පසළොස්වක දිනයෙහි කෙළවා පාමියි කීයේය. රජ්ජුරුවෝ අණබෙර යවා මහා ජනයා රැස් කරවා දෙවනි දින ඊට අණ කලේය. අහිගුණ්ඨකයා නයාව පිටතට ගෙන නටවන්නට පටන් ගත්තේය. රජතුමා ඇතුළු පිරිස ඔල්වරසන් දෙමින් ප්‍රීතියෙන් එය නැරඹුහ. නා රජ්ජුරුවන් ඇල්ලූ දින පටන් මසක් පිරුනේය. මෙදැතුරේ කිසිම අහරක් නැත. එකල්හි සුමනා මානවිකා තොම මසක් ඉක්මීත් තම ස්වාමියා නේන්නට කාරණා කිම්දැයි පොකුණු තෙරට ගොස් පළමු කී සලකුණ බලන්නී ලේවන්ව තිබූ පොකුණෙහි දිය දැක අහිගුණ්ඨකයෙක්හු විසින් අල්වා ගත් නියාව දැන ඔහු මිනිස් ලොව පෙහෙවස් ඉටා වැද හෝනා තුඹස සමීපයට ගොස් එහි නොදැක අඬා වැලප ක්‍රමයෙන් රාජාඞගනයට ගොස් පිරිස මඬ්‍යයෙහි ආකාශයේ අඬ අඬා සිටියාය. නා රජ්ජුරුවෝ නාග මානවිකාව දැක ලජ්ජාවට පත්ව  වහා පෙට්ටිය තුළට වන්නේය. බරණැස් රජ්ජුරුවෝ මේ කුමණ කාරණයක් දැයි ඈත මෑත බලන්නේ අහසෙහි සිටියාවූ නාග මානවිකාව රජ්ජුරුවන් වහන්ස, මා තොප සිතන කිසිවෙක් නොවෙමි. නාග කන්‍යාවක්ම රජතුමනි, මෙතැන්හි අල්වා නටවන නාග රජ්ජුරුවොත් මාගේ ස්වාමී පුත්‍රයෝය. සියළු යසසින් පිරුණු නාගලොව සිල්රැකීමට බැරියයි සිතා මිනිස් ලොව තුඹසක් ලඟ සිල් ඉටා වැඳහොත්තේය. පර හිංසාවෙන් වැලකී මොහුට මේ අහිගුණ්ඨකයා අල්ලා ගත්තේය. රජතුමනි, මාගේ ස්වාමි පුත්‍රයාව වහාම මේ බන්ධනයෙන් මුදා හරින්නැයි යාඥ කොට සිටියාය. නාග මානවිකාවෙනි, යොදුන් තුන්සියයක් වූ නාග භවනයට නායකවූ මොහුට එක විෂ මුඛයකින් මේ අහිගුණ්ඨකයාව නැසීමට හැකිව තිබියදී එසේ නොකලේ මන්ද? සිල් රැකිමට හැක්කේ තමා රැකුනොත් නොවේද? රජ්ජුරුවන් වහන්ස, එක ධූමයකින් මේ නුවරම අළුකර දමන්නට දැනුදු ශක්කිය ඇත. නමුත් තමාගේ ශිලය බිඳී යේදෝ හෝයි යන භයින් යහටක් නොකළාහුය. නාග මානවිකාවෙනි, තොපගේ ස්වාමී පුත්‍රයා නිබඳව සිල් රකීද යම් දවසෙක සිල් රකීද? රජ්ජුරුවෙනි,  නිබඳව සිල් රකින්නේ නැත. මසක් පාසා පසළොස්වක පෝය නොවරදවාම මිනිස් ලොවට අවුදින් සිල් රකින්නේය. රජ්ජුරුවන් වහන්ස මේ නා රජ්ජුරුවන් සෙසු නයින් හා සරිකොට නොසිතනු මැනවි. මොවුන් පංච කාමයෙන් පිනවනු නාග මානවිකාවෝ සොළොස් දහසක් ඇත්තාහ. මහා බල ඇත්තේය එබැවින් මාගේ ස්වාමීවූ මොහු මේ බන්ධනයෙන් ගලවාහළ මැනවයි යාඥා කළාහ.

උග්ගසේන රජතුමා අහිකුණ්ඨකයා තමා සමීපයට කැඳවා තොපට මැණික් සීයයක්ද ගම් බිම් දැසි දැස් ආදී සියලු වස්තුවද දෙමි ඒවා භාරගෙන මේ නා රජ්ජුරුවන් මුදා හැරපියවු කියේය. එබස් අසා අහිගුණ්ඨකයා රජතුමනි, ඔබ අවසර දෙතොත් වස්තු ඇතිව මුත් මුදා හරිමියි නා රජ්ජුරුවන් පෙට්ටියෙන් මුදා හළුයේය. එකෙනෙහිම නා රජ තෙම නාග වේශය අතුරුදහන් කොට දිව්‍ය ආත්මයක් මවාගෙන සියළු ආභරණවලින් සැරසී සුමනා නාග කන්‍යාව සමග උග්ගසේන රජ්ජුරුවන් සමීපයට අවුත් වැඳ රජ්ජුරුවන් වහන්ස ඔබ  වහන්සේ මට කළාවූ උපකාරයට මම කවර උපකාරයක් කළත් නොසෑහෙන බව දනිමි. ඒ කෙසේ වෙතත් මාගේ නාග භවනයට වැඩිය මැනවයි ආරාධනා කළේය. නා රජ්ජුරුවන්ගේ බස පිළිගෙන උග්ගසේන රජතෙම නා රජ්ජුරුවෙනි, මේ ලෝකයේ මිනිසුන් කරන මිත්‍ර සන්ථවය නම් පිළිගත නොහැක්කෙමි. නමුත් ඔබ යාඥා කරන හෙයින් එන්නේමියි කීවේය. එකෙණෙහි නා රජ තෙම තමා කෙරෙහි සැක නැති වන ලෙස සපථ කරවා ගෙන උග්ගසේන රජ්ජුරුවන්ද කැටුව සිව්රඟ සෙනඟ හා නාග භවනයට ගියහ. එකෙණෙහි නාග කන්‍යාවෝ රජහු සිත් ගනිමින් නටන්නට වන්හ. මේ සියළු දිව්‍ය ඉසුරු වළඳමින් සතියක් ඉකුත්වුවාට පසු උග්ගසේන රජතෙම නා රජ්ජුරුවන්ගේ යසශ්‍රී වර්ණනා කරනුයේ මිත්‍රොත්තමය, මෙතරම් සැපතක් හැර මිනිස් ලොවට ගොස් තපස් කරනුයේ කුමක් නිසා ද මෙතරම් සැප මිනිස් ලොව ලද නොහැක්කේය. තොප කුමක් පතා තපස් කරහුදැයි විචාළේය. ඉක්බිති නාරජ්ජුරුවෝ ඊට කාරනා කියනුයේ රජ්ජුරුවෙනි, මිනිස් ලොව හැර අන්කිසි නැකතක් ඉන්ද්‍රිය දමනය කොට කෙළෙස් සතුරන් පරදවා පිරිසිදුව නිවන් සිද්ධකොට ගත නොහැක්ක. එබැවින් මිනිස් ලොව ජාති ජරා මරණාදී දුක් කෙළවර නිවන් සැප සාදා ගනු කැමැත්තෙමියි කීයේය. එබසින් සතුටට පත් උග්ගසේන රජතෙම ඒකාන්තයෙන් බහුශ්‍රැතවූ නුවණ ඇති මෙබඳු උතුමෝම සෙවිය යුත්තාහ. භජනය කළ යුත්තාහ. තොපගේ මේ බසින් මමද රාජ්‍යයට ගොස් බොහෝ කුසල් කරමියි කීයේය. නා රජ තෙම කුසල් දහම්හි යෙදීමට නැවතත් අවවාද දී බොහෝවූ මුතු මැණික් ආදී වස්තු ගැල් දහසක් පමණ පරිත්‍යාග කොට බරණැස් නුවරට පිටත් කොට යැවීය. එතැන් පටන් ජම්බුවීපයෙහි හිරණ්‍යස්වණයෙන් සම්පූර්ණ වූයේය.

එසමයෙහි අහිගුණ්ඨකයා නම් දෙව්දත් තෙරුන්ය. සුමනා නාග මානවිකාව නම් රාහුල මාතාවය. උග්ගසේන රජ්ජුරුවෝ නම් සැරියුත් තෙරුන්ය. චම්පෙය්‍ය නා රජ්ජුරුවෝ නම් බුදු රජාණන් වහන්සේය.

SANHIDA LANKA

# මහා පලොභන ජාතකය

තවද එක්සමයෙක්හි සූරා සුරවර මකුට මණිරාජායමාන ශ්‍රීපාද පද්ම ඇති හෙයින් අරහත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ සකලජන නයනාභිරාම ජේතවනාරාමයෙහි සතර ආර්‍ය්‍ය බ්‍රහ්ම විහරණයෙන් දවස් යවමින් වැඩ වසන සේක් මේ මහාපලොභන ජාතකය ශිලවිශුද්ධියෙන් කිළුටුවීමක් අරභයා වදාළසේක.

මෙහි වර්තමාන කථාව යටකියනලද චුල්ල පලොභන ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. ඒ වනාහි ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මෙවෙනි නෛර්‍ය්‍යාණික ශාසනයෙහි පැවිදිව ක්ලේශවසඟයට පිළිපන් මහණ භික්ෂුහු නොකැමකි පරිද්දෙන් ගෙණවුත් සෙසු භික්‍ෂුන් විසින් ආරාධිතවූයේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස්නුවර රජකරන කසීරජ්ජුරුවන්ට කිසි රජ බිජුවටක් නැතිව රාජ්‍යය මතු නොපවත්නේයැයි නුවර වාසීන් උග්ඝොසනය කොට පැමිණිනියාවද, ඒ අසා රජ්ජුරුවන් අන්තඃපුරයෙහි සමුර්ධිකොට පුත්‍ර ප්‍රාර්ථනා කළ නියාවද, යන මේ සියල්ල යටකියන ලද චුල්ල පලොභන ජාතකයෙහි විස්තර වසයෙන් දැන්විය යුතු වන්නේය.

උපන්නාහු ඒ කුමාරයන්ට නම් තබන්නාහු අනිත්ථිගන්ධ කුමාරයෝයයි නම් තුබුහ. උපන් වේලෙහි පටන් ස්ත්‍රී ජාතීය ඇසින් නොදකින්නේය. ඔවුන් අත නොසැනහෙන්නේ ය. එබැවින් දැලිරැවුළු ආදී වශයෙන් පිරිමි වෙස් ගෙන තනය සඟවා වෙස්වලා කිරි පොවන්නාහ, බොහෝ ජනයාගේ ආකුලස්ථානයෙහ සිත් නැලවෙන හෙයින් උදකලාව ජනසූන්‍ය ස්ථානයෙක්හි ධ්‍යානාගාරයෙක්හිම වෙසෙති, ස්ත්‍රීන්ට ලන්විය නොදෙන්නේය, ඒ කුමක්දැයි යතහොත්? මීට පූර්ව ජන්මයෙහි බ්‍රහ්මලෝකයෙහි වැස කාමයක්වත් කාම චේතනාවක්වත් නොවිඳි හෙයින් පළමු සිටි ධ්‍යානචේතනාවෙහි අභ්‍යාස වශයෙන් පඤ්චකාම සැපය පිළිකුල්කොට දක්වන්නේය, මුළුල්ල දුටුවාම රජතෙම පුත්‍රශෝකයෙන් පෙළෙමින් දුකසේ ප්‍රාර්ථනා කොට එක දරුකෙනෙකුන් ලදිමි, ඒ තෙම වස්තු කාම ක්ලේශකාමයෙහි ඇල්මක් නැත්තේය. ශෝකයට කවර කෙණෙක් කවර උපායකින් මාගේ දරුවන් කාමයෙන් පොළඹවා රාගශ්‍රීයට පමුණුවා පියද්දෝහෝයි මීට උපායක් දන්නා කෙණෙක් ඇත්නම් බොහෝ සැපත් දී ඉසුරට පමුණුවන්නෙමි වේදැයි කියා ශෝකාතුරව විසුයේය.

එකල්හි එම අන්තඃපුරයෙහි වර්ණයෙන් රූපයෙන් අසදෘශවූ නවයොවුන්පත් ලදැරියක් තොම නැටීමෙන් ගී කිමෙන් ද සිනා හා අඩැසිබැලීම් ආදී ස්ත්‍රී විලාසයෙන් පුරුෂයන් බැඳගන්ට සමර්ථව තැනැත්තී රජ්ජුරවන් ලඟට අවුත් දේවයන් වහන්ස ඉදින් කුමාරයා මට වල්ලභවෙයි යන නියමයක් ඇත්නම් මම මොහු කාමයෙහි පොළවාදීලමියි කීවාය.

ඒ කුමාරිකගේ බස් අසා සතුටු සිත් ඇති රජ තෙම නව යෞවනයෙන් මත්වූ කුමාරිකාව ඉදින් තොප කී පරිද්දෙන් මොහු කාමයෙන් පොළඹවා මොහුට කාමරසය උගන්වයි එලෙසසැරහෙන පරිද්දේන කුමාරිකාව එතැනින් යවා ඒ අන්ත්ථිගන්ධ කුමාරයන් වැඩෙන කුමාරයන්ට ඒ කුමාරි යම් පරිද්දෙන් පොළන්නේ වීනම් එලෙස උන්ට අවසරකොට දෙවයි සම්මත කොට දෙවුයේය.

ඕ තෝමෝත් දෙවනි දවස් උදෑසනක්සේම දිව්දුහල් හා සමාන සිහින් වස්ත්‍ර හැඳ එසේහෙයින් වස්ත්‍රයක් කරටදමා පොළොව පලානැඟීනාගදේවියක්මෙන් තමන්ගේ යොවුන්පත් වයසට නිසිවූ ශෘංගාර විලාස දක්වමින් දුටිවන් මනනෙන් අදිමින් වීණාවක් අතිනගෙණ අනිත්ථිගන්ධ කුමාරයන්ගේ ශ්‍රීයහන් ගබඩාවට පිත නුදුරුව සිට නිය අඟින් වීණාතත් පහරමින් මිහිරිවූ කටහඬින් සමන්විත කාමනිශ්‍රිත වූ සිත්කළු වූ ගිතීකා කිය කියා සිටියාය.

ඒ ගායනා කුමාරිකාවන්ගේ තන්තිස්වරයෙන් ගීතස්වරයද නොඉක්ම පවත්නා මිහිරි ශබ්දය අසා බොහෝ කලක් සැඟවීතිබු කාමරාගයතෙම නිදා පිබිදිකලක් පරිද්දේන් සිත්හි පහළවූයේය, එකෙණෙහි අනිත්ථිගන්ධ කුමාරතෙම තමන් සමීපයෙහි සිටි පුරුෂයන් මුහුණබලා මේ සිත් කළුවූ ප්‍රේමනීයවූ කන්හි අමාවන්නාක් බඳු SANHIDA LANKA මේ මධුර ශබ්දය කවුරුන්ගේ ශබ්දයෙක්ද? මේ කෙසේවූ දෙයෙක්දැයි විචාළේය. එකෙණෙහී ඒ පුරුෂයෝද එම්බා රාජකුමාරයෙනි මේ ලෝකයෙහි සත්වයන් සිත් අල්වන ක්‍රීඩා නමුත් මේය, ස්ත්‍රීහුයයි කියන්නේත් මොවුන්ටයයි ඉදින් මේ ගීතිකායෙහි තොපගේ සිත් ඇලේනම් ශබ්දරසයෙන් සැපවුව මැනැවැයි කීවාහුය. ඒ අසා කුමාරතෙම ස්ත්‍රියයි යන බසින් සමීපයට කැඳවා එසේවීනම් ධ්‍යානාගාරය සමීපයට අවුත් ගායනා කරන්නට කියවයි සම්මත කෙළේය.

තොමෝත් හික්ති සමීපයෙහි සිට ගායනාකොට ඔහුගේ සිත් තමාගේ වසඟයෙහි ලාගෙණ සමීපයට කැඳවූ කල්හි ඕතොමෝත් මාගේ මනදොළ මුදුපත්වන්නේයයි සිත් ඇතිව පුලුළු කුල කෙළෙනා මිණි මෙවුල්දම් හා කෙකුම් රාග තැවරු මතුයෙහි කෙළින, මුතුහරීන් හා කොපුලන ලෙලදෙන මිණිකොඩලින් යුක්තව ධ්‍යානලාභීන් වී නමුත් සිත් අවුල් කරණනම් රූපවිලාසත් ඇතිව ඒ ධ්‍යානාගාරයට වැද බෝධිසත්වයන් හා එක්ව යහන්පත්ව බොහෝ දවසක් පඤ්චකාම සැපනම් මේයයි නොදත් බෝධිසත්වයන් තමාගේ රූපයෙන්ද ශබ්දයෙන්ද සප්‍රෂ්ටව්‍යයෙන්දැයි යනාදී පස්කම් ගුණයෙන් බැඳගෙණ වනයෙහි ලෝභ ඇත්තාහුමල පයකින් බැඳගත් කලක් පරිද්දෙන් තමා වසඟයෙහි ලාගෙණ කාමරසයෙන් උමතුකරවුව. ඒ රසදත් බෝධිසත්වතෙම මෙවැනි රසයක් විඳිතොත් මාවුත් අතික් සෙස්සවුන් විඳිනේ කම් කිම්දැයි දුටු දුටු පුරුෂයන් කෙරෙහි ඊෂ්‍යාව උපන්නේය, පළමු ස්ත්‍රියක ඇසින් නොදකිනාවූ බෝධිසත්වයන්ට පසුව පිරිමියකු ඇසින් නෙදෙකිනා පරිද්දෙන් වේෂ උපන්නේය ඉක්බිති ඒ රාජකුමාර තෙම මේ කාමරසය මොවුත් අනික් පිරිමියෙක් නොවිඳවයි යන ලෝභයෙන් තියුනුවු කඩුවක් අතින්ගෙන දුටු පිරිමින් මරා දෙකඩකරමින් ඇවිදින්නට වන්නේය.

ඉක්බිති දේවයන්වහන්ස මේ රාජතෙම නිරපරාධවූ සත්වයන් මරමින් කාමයෙන් මත්ව ඇවිදින්නේයැයි මොරගාමින් පැමිණියහ. ඉක්බිති ඒ ඇසු රජ්ජුරුවෝත් අමාත්‍යයන් හා කථාකොට මොහු මැරිය නොහැක්ක මාගේ රාජසීමාව ඇතුලත ඉන්ට නොදෙවයි සම්මත කොට රටින් නෙරපූහ.

එදවස් රාජකුමාර තෙම ඒ කියන භාර්යයාව කැඳවාගෙන දුරුව වනගහණයෙන් ගෙවා ගොස් සමුද්‍රතීරයෙහි රම්‍ය වූ ස්ථානයක පන්සලක් කොට ගෙණ වනමුල් ඵලාහරයෙන් යැපෙමින් දෙදෙනම සමගව වසන්නාහ.

එක් දවසක් රාජකුමාරයන් ඵලාඵල ගෙණෙන්ට යද්දී එක් ඍඬිවන්ත තාපසකෙණෙක් සමුද්‍ර මතුයෙහි ආකාශයෙන් යනුසේ පන්සලින් නැගෙණදුම් සලකුණෙන් පිඩු සිඟන පිණිසයයි පන්සල් දොරකඩට බටුයේය.

ඒ කුමාරි තොමෝත් තාපසයනි දැන පිණා විචික්ත ස්ථානයෙහි හෙයින් ඒ තාපසයන් කාම රතියෙහි බදාගෙණ තමාගේ වසඟයෙහිලාගත, ඒතාපසයෝත් බ්‍රහ්මචර්‍ය්‍යායෙනුත් ඍඬියෙනුත් පිරීහි එතැනින් පය ඇදයානොහී සිටියේය. ඒ රාජ කුමාරයෝත් මිහිරි ඵලාඵල අල මුල් ආදියත් බරහී කඳක් බැඳගෙණ සවස් වේලෙහි පන්සලට පැමිණියේය. ඒ තාපසයෝත් අතික් හසරක් නොදක්නා හෙයින් රාජකුමාරයන් දැක බයින් දිවගොස් සමුද්‍රයට වන්නේය. පළමු ආ පරිද්දේන අහස් කුසට නැගෙමියි උඩුකුරුවූයේය. දියෙහි ගැලෙන්ටන්ය, ඔහු බඳවාගෙනයි රාජකුමාරයෝත් මේ නියාව දැක මේ තාපසයෝ පළමු ආකාශයෙන් ඍධියෙන් ආ කෙණෙක්වන මේ කුමාරිකාව දැක ධ්‍යානයෙන් පිරීහී පෙර පරිද්දෙන් යන්ට උත්සාහකොට යා නොහෙන්නේයයි අනුකම්පා කොට තාපසයෙනි, නොබවයි අස්වසා පළමු තොපි මුහුදු දිය දෙබෑ කොට දි මතුයෙන් ඇවිත් දැන් ස්ත්‍රීන් සමග කාමයෙන් බැඳී ගිය බවට පැමිණ පළමු පරිද්දෙන් දැන් මතුයෙන් යානොහී දියෙහිම ගැලෙමින් දුක්විඳිනෙහිය, එබැවින් මේ ස්ත්‍රීජාතිය නම් උත්තම වූ සත්වයන් සසරින් ඉක්ම නැගීයා නොදී එහිම ලග්න හෙයින් සලාවැටුමක් හා සමානයෝය, සත්වයන් රූප ශබ්ද ආදී ආලම්බනයෙන් වඤ්චාකොට යථාස්වභාවය දැක්ක නොදෙන හෙයින් ඉන්ද්‍රජාලයක් වැන්නාහ, බ්‍රහ්මචර්‍ය්‍යාවගේ බිදීම සුල්ලභ.

තවද මේ ස්ත්‍රීහුනම් තමාලඟට පැමිණි උත්තමයන් අධමයන් නොතෝරා එකගුණ කරන හෙයින් ගින්නක් වැන්නාහ, ඇතුළත්හි කිඹුලුන් ආදී ගැවසීගත් පිටතින් හිදිබෙණ හෙල්වල්වෙමින් මෘදුබස් කීමෙන් මෘදුවිලාසය දැක්වීමෙන් යුක්තය වස්ත්‍රාභරණාදීන් දීමෙන් පූරාලිය නොහැකි හෙයින් රසාතලයේ දුෂ්පුරයහ, සුචි අසුචි නොහැර ඇදගෙණ යන ගඞ්ඩාප්‍රවාහයන් මේන් උත්තම අධමයන් නොතෝරා සමව පවත්නා ගුණ ඇත්තාහ, මෙසේ තමා වසඟවූ සත්වයන් සංසාරයෙහි නිමග්න කරණ ස්ත්‍රී වසඟය දුරුකටයුතුමය. යම් කෙණෙක් මේ ස්ත්‍රී ඡන්දයෙන් වේවය් ධනයෙව් වේවයි සිත්රැනිද්දී වසඟවෙද්ද එසේවුව මේ ස්ත්‍රීපිරිහෙලත්, කුමක් මෙන් යත් තමා පිහිටි ස්ථානයට පැමිණ යම් දෙයක් දවා හස්මකොට නසන ගින්නෙන් මෙනි එබැවින් මේ ස්ත්‍රී වසඟනොව තමාසිත් වසඟකොට ගන්නට උත්සාහ කළ මැනවයි රාජකුමාර තෙම තාපසයන්ට අවවාද කළේය.

මේ රාජකුමාරයාගේ අවවාද ඇසු තාපසතෙම තමා පළමුව පුරුදුව සිටි ධ්‍යාන උපදවාගෙන ආකාශයට පැණනැගී නික්මුනේය. ඒ දුටු අනිත්‍රීගන්ධ කුමාර තෙම සසර කලකිරි පස්කම් ගුණයෙන් ලෝභය හැර පැවිදි වීනම් යහපතැයි සිතා බිසවුන් මනුෂ්‍යස්ථානයෙහි පිහිටවා නැවත වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව කාමවිරාග භාවනාකොට ක්‍රමයෙන් පඤාභිඥා අෂ්ටාසමාපත්තීලාභීව ධ්‍යානසුවයෙන් එම ආරණ්‍යයෙහිම බොහෝ දවසක් වැස නොපිරිහුනු ධ්‍යානයෙන් පූර්වජාතියෙහිත් පුරුදු බ්‍රහ්මලෝකයට ගොස් උපන්සේක.

SANHIDA LANKA

ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මහණෙනි මේ මතුගාමයෝ නම් කෙසේ වූ පිරිසිදු සතුනුත් කිලිටුකෙරෙතියි කියා මේ ජාතකය පූර්වාපර සන්ධිගලපා නිමවා වදාළසේක. මේ දේශනාවන්ගේ අවසන්හි ශාසනයෙහි උකටලී මහණ අරහත්ඵලයෙහි පිහිටා ගියේය. එකල්හි අනිත්ථිගන්ධ කුමාරයෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

SANHIDA LANKA

# හත්තිපාල ජාතකය

සුගතයන් වහන්සේ ශ්‍රාවස්ති පුර සමීපයෙහි වූ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්. තමන් වහන්සේගේ මහාභිණිෂ්ක්‍රමයක් අරභයා වදාළ සේක.

නිධාන කථාව :- දිනක් දම්සභා මණ්ඩපයෙහි මේ ගැන උපන් කථාවක් අරභයා දෙසිතය.

ආරාධනය :- භික්ෂූන් වහන්සේ

ජාතක කථාව:- යටගිය දවස බරණැස් නුවර දසරාජ ධර්මයෙන් රාජ්‍යය කළ එකායුරී නම් රජ කෙනෙක් වැලි කෙළියෙහි පටන් තමන් හා මිත්‍ර වූ පුරෝහිත බමුණා සමඟ එක්වම වසන්නේය. දෙදෙනාටම දරුවන් නැත. දිනක් පිළිසඳර කථාවෙහි යෙදී උන්නාහු පුරෝහිතයා රජ සැපතෙහි ඇළුණු අපට දරුවෙක් නැත. තොපට පුතනු කෙනෙකුන් උපන්නාහු වී නම් මාසනතත රාජ්‍යයට හිමි වෙති. මට පුතනු කෙනෙකුන් උපන්නාහු වී නම් තොපගේ සම්පතටත් රාජ්‍යයටත් හිමි වන්නාහ. මෙසේ ඔවුන් දෙදෙනා ගිවිස ගත්හ. ටික කලකට පසු පුරෝහිත බමුණා ගමට ගොස් නැවත නුවරට එන්නේ බහු පුත්තික නම් එක් දිළිඳු ගැහැණියක් මග යනවා දුටුවේය. ඈට නිරෝගී දරුවන් සත්දෙනෙක් වූහ. එයින් එකකු අත සිඟා කන කබලද එකකු අත වැද හෝනා කලාල් රෙද්දක්ද ඇත. පුරෝහිත බමුණා ඈ අමතා එම්බල හදාව මේ දරුවන්ගේ පියාණෝ කොයිදැයි විචාළේය. ස්වාමීනී මුන්ගේ පියාණෝ මූ යයි නියම කෙනෙක් නැත. තී කවර උපායකින් මේ දරුවන් සත්දෙන සොයා ගත්තෙහිද? ඒ දිළිඳු ස්ත්‍රී තොම කීමට කිසි කාරණයක් නොදනී. වාසල් දොර සමීපයෙහි වූ මහත් නුගගසක් දක්වා ස්වාමීනී මේ නුග රුකෙහි අධිගෘහිත දේවතාගෙන් ලදිමි කීවාය. පුරෝහිත බමුණා යහපත තෙපි යවයි ඈ යවා රථයෙන් බැස ඒ නුග ගස මුලට ගොස් අත්තක් අල්ලාගෙන දිව්‍ය පුත්‍රය තොපට රජ්ජුරුවන් ගෙන් කවර නම් අඩුවෙක්ද? දහසක් වියදම් කොට අවුරුදු පතා මහත් වූ පූජාවක් කරවන සේක. රටවැස්සෝ නොයෙක් පූජෝපහාරයන් කරන්නාහ. එසේවූ රජ්ජුරුවන්ට දරුවෙක් නොදී කිසි පඬුරක් නොදෙන දිළිඳු තැනැත්තියට කමක් නිසා දරුවන් සත්දෙනෙක් දුන්නෙහිද? ඉදින් අප රජ්ජුරුවන්ට පුතනු කෙනෙක් නුදුන්නෙහි වීනම් අදින් සත්වන දිනයෙහි මේ වෘක්ෂය මුලින් උදුරා සුනු විසුනු කොට දමමියි රුක් දෙවියා මෙලෙස භයගන්වා නික්මුනේය.

මෙසේ තමන්ගේ ගෙට ගොස් නැවත දෙවෙනි තුන්වෙනි ආදි වශයෙන් හත්වෙනි දින දක්වා නුගරුක මුලට ගොස් රුක් දෙවියා භය ගන්වා සිටියේය. මෙවිට රුක්දෙවියා සිතන්නේ පුරෝහිතයා කෙලෙසින් රජතුමා දරුවන් නොලද්දේ වීනම් සෙට දවස මා විමන නසන්නේයයි සිතා සතර වරම් රජ දරුවන් ලඟට ගොස් පුරෝහිතයා කී බස් කීයේය. ඔවුන්ගෙන්ද පලක් නොවුයෙන් ක්‍රමයෙන් සාතාගිර හේමවතාදී අටවිසි යක්ෂ සේනාධිපතීන් ලඟටද ගියේය. ශක්‍රදේවේන්ද්‍රයෝ ඊට නිසි පින් ඇති කෙනෙකු බලා දිව්‍යපුත්‍රයන් සතර දෙනෙකු දැක උන් අමතා මිනිස් ලොව සූකාරි රජ්ජුරුවන්ගෙන් අගමෙහෙසුන් කුස පිළිසිඳගන්නට වටන්නේයයි කීයේය. එකී දිව්‍ය පුත්‍රයෝ සතර දෙනා එබස යහපතැයි පිළිගෙන අපට රජ කුලයෙහි ඉපදීමෙන් හැර පියා පැවිදිව වසම්හයි කීහ. ශක්‍ර දේවේන්ද්‍රයෝ යහපතැයි උන් අතින් ප්‍රතිඥා රැගෙන රැක් දෙවියාට කීහ. එවිට රැක් දෙවියා අර්ධ ශරීරයෙන් සිට සබඳ පුරෝහිත බ්‍රාහ්මණය, තොපට එක පුතකු නොව පුතුන් සතර දෙනෙකු දෙමියි කීය. බමුණු කියන්නේ මට දරුවන්ගෙන් කම් නැත. රජ්ජුරුවන්ට දුන් මැනව එසේ අපහසුන නම් රජ්ජුරුවන්ට දෙදෙනෙකු සහ මට දෙදෙනෙකු දුන මැනවයි කීයේය. බමුණ, දරුවන් සතර දෙනම දෙන්නේ තටය. තොප දරුවන් ලබනු පමණක් විනා ඔවුන් කුඩා කලම පැවිදිවන්නේයයි කියා අතුරුදහන් විය. එතැන් පටන් දේවතාවන්ට මහත් පූජා සත්කාර විය. දිව්‍ය පුත්‍රයන්ගෙන් ප්‍රථම දිව්‍ය පුත්‍රයා පුරෝහිත බැමිණියගේ කුස පිළිසිඳ උපන්නේ හත්ථිපාල කුමාරයෝයයි ඔහුට නම් තබා පැවිදි නොවන පිණිස ඇත්තලයන්ට පාවා දුන්හ. දෙවනි වරට උපන් කුමරා අශ්වපාල නමින් හැඳින්වූයේ අස්ගොව්වට භාර දුන්හ. ගෝපාල් නම් තුන්වෙනි කුමරාව ගොපල්ලාටද සතරවෙනි අජපාල කුමාරයාව එළුවන් රකින්නාටද පාවා දුන්හ. ඔහුන් සතර දෙනා වැඩිවිය පැමිනි කල්හි පැවිදි වෙතියි යන බියෙන් තම නුදුරින් සියළුම තපස්වී -වරයන් පිටත් කරවූහ. ඒ කුමාරවරු ඉතා සැඩ පරුෂය. වැඩිමල් කුමරා සොළොස් අවුරුදු වූ කල්හි මොහු පරික්ෂා කොට රජය දෙමියි කියා රජ්ජුරුවන් හා පිය බමුණා තවුස් වෙස්ගෙන සිඟා යමින් කුමාරයන්ගේ ගේ දොරට ගියාය. කුමාරයන් ඔවුන් දෙදෙනා දැක ඉතා ප්‍රීතියට පත්ව වැඳ එකත් පසව සිට ශාන්ත ඉඳුරන් ඇති තපස් වී කෙනෙකුන් අද දිටිමි. මෙහි වැඩ හිඳිනු මැනවයි කියා වඩා හිඳුවා වතාවත් කළේය. එවිට පුරෝහිත බමුණා කුමාරයා අමතා පුත හත්ථිපාල කුමාරයෙනි, අපි තපස්වීවරයො නොවෙමු මේ සූකාරි රජ්ජුරුවන් වහන්සේය. මම තොපගේ පියා වෙමි. අපි දෙන්නා වෙස් ගෙන තොප පරික්ෂා කරනු පිණිස ආම්හයි කීහ. පියවරුනි, මට රාජ්‍යයෙන් කම් නැත පැවිදිවෙනු කැමැත්තෙමි. පුත කුමාරය, තරුණ කල රජ වී මහලු වූ කළ තපස් රක්ෂා කරව පියාණනි, මේ රාජ්‍ය සම්පත් නම් සතර දික් කරන සුළු මායාවල්ය. මෙහි

SANHIDA LANKA

ම මෙහොතකදු රැඳෙනු නොකැමැත්තෙමි ව්‍යාධි ජරා මරණාදීවූ මා පසුපස්සෙහි පෙනී එන්නේ යයි පියා සහ රජ්ජුරුවන් වැඳ අවසර ගෙන පිරිවර සමඟ තපසට නික්මුනේය. ඊටපසු අශ්වපාල කුමාරයන් පරික්ෂා කිරීමට තපස් වෙස්ගෙන ගිය රජ්ජුරුවන් ගේ හා පුරෝහිත බමුණගේ උත්සාහයෙන් නිශ්ඵල කරමින් ඒ කුමාරයාද එසේම අනිත් කුමාරවරුන් දෙදෙනාදැයි හතරදෙනාම මහත් වු පිරිසක් පිරිවරාගෙන ගඟක් අද්දර වාසය කරන්නාහ. දෙවෙනි දවස පුරෝහිත බ්‍රාහ්මණයාද පුත්‍ර වියෝගයෙන් හටගත් ශෝකය දරාගනු නොහැක්කේ සියළු සැප හැර දමා පැවිදිවනු කැමැත්තෙමි තොපිහැම කුමක් කරහුදැයි විචාළේය. බමුණො කියන්නාහු නරක ගිනිනම් අපටත් උරුමය අපිද ඔබ කැටුවම ගොස් මහණ වෙමියි කීහ. එසඳ බමුණු අසුකෙළක් වස්තුව බැමිණියටද පාවාදී පිරිවර සමඟ තම පුත්‍රයන් සමීපයට ගොස් පැවිදි විය. දෙවනි දින බැමිණියද ස්වාමියාගෙන් සහ දරුවන්ගෙන් වෙන් වී කුමන සතුටක්ද මම මේ සියල්ල අත්හැර දමා ගොස් පැවිදිවෙමියි තම යෙහෙලියන්ද කැටුව පුත්‍රයන් සමීපයට ගොස් නික්මුණහ. හත්ථිපාල මහා තාපසයන් ලඟ පැවිදි වූ බමුණු බැමිණියන්ගෙන් යොදුනක් තැන් පිරී ගියේය.

පසුදින රජතුමා පුරෝහිත බ්‍රාහ්මණයා කොහිදැයි විචාරා වස්තුව හැර තපසට ගියායයි කී කල්හි එසේනම් අස්වාමික භාණ්ඩ අපට නොවේදැයි ඔවුන්ගේ සම්පත් ගෙනවුත් රාජාඞගනයෙහි ගොඩ කරන්නට නියම කෙලේය. එවිට රජ්ජුරුවන්ගේ අග මෙහෙසිය සිතන්නේ රජතුමා වස්තු ලෝභයෙන් මුලාව බමුණන් විසින් දුරුකළ වස්තුව තම ගෙට ගෙන්වා ගන්නේය. මෙය උපායකින් නතර කළ යුතුයයි සිතා මස් ගෙනවුත් රාජාඞගනයෙහි දමා දැල් ඇද්දවූවාය. අහසින් ගිය ගිජුලිහිණියෝ මේ මස් දැක වහා එහි අවුත් මස් අනුභවකොට යාමට පිටත් වූ කල තම ශරිරය මහත් වූ හෙයින් දැල් කවුළු වලින් යා ගත නොහී මස් ලොබින් එහිම උන්හ. නුවණැති ලිහිණි මස් වමාරා දමා ඉන් ගැලවී ගියහ. බිසව ඉන් පක්ෂියෙක් ගෙන රජ්ජුරුවන් ලඟට ගොස් මහරජ, එක් ක්‍රියාවක් බලනු මැනවි. රාජාඞගනයෙහි මස් කෑමට පැමිණි සමහර ලිහිණි දැල් ඇති නියාව බලා කෑ මස් වමාරා නිරාහාරව දැල් අස්සෙන්පලා ගියහ. ලෝභකමින් බඩපුරා මස් අනුභවකොට හුනු ගිජුලිහිණි මගේ හස්තයට අසුවිය. එපරිද්දෙන් බමුණා වස්තු කාමයන් වමාරා කෙළෙස් නැමති දැලින් ගැලවී ගියේය. ඔබ වහන්සේ වූ කලී ගිජු ලිහිණියන් වමාරන ලද මස් නැවත අනභව කරන කලක් මෙන් කරන සේක. තෘෂ්ණා වසඟවූ අඥාණ වූ පුදගලයන්ට බුද්ධාදී උතුමන් විසින් ප්‍රශංසා කරනු ලද්දාහූ නෙවෙති එබස් ඇසු රජතුමා මහත් සතුටට පත්ව බිසවට ස්තුතිකොට සියළු සැප හැර දමා පැවිදිවන්නට වටනේ යයි සිතා ඇමති මණ්ඩලය රැස්කරවා ඇමතියෙනි, මම හත්ථිපාල කුමාරයන් සමීපයට ගොස් පැවිදි වෙමි. කැමති කෙනෙක් රාජ්‍යය කරවයි කීයේය. එවිට ඇමතිවරුද ඔබ වහන්සේ පැවිදිවන්නට යතොත් අපිත් පැවිදිවන්නෙමුයි කියා සිටියහ. රජතුමා සියළු සම්පත් අතහැර දමා තිස් යොදුනක පැතිර සිටි පිරිස හා ගොස් පැවිදිවූහ. දෙවනි දින බිසවද ඇමති ගණයාගේ භාර්‍යාවෙන් සමඟ සියළු වස්තුව අත්හැර දමා ගොස් පැවිදිවූවාය. ඍධි ඇති හත්ථිපාල තාපසයන් වහන්සේ දොළොස් යොදුනක් පැතිර සිටි සියළුදෙනාම රැ ගෙන හිමාල වනයට ගිය සේක. ඔවුන් එහි එන බව දුටු සක්දෙව් රජුගේ නියමයෙන් විස්කම් දෙව්පුතුන් සියළුදෙනාටම ප්‍රමාණවත් පන්සල්ද තවුස් පිරිකරද මවා ගියේය. සියළුදෙනාම සුවසේ මහණ දම් පුරමින් පසුවන අතර බරණැස් නුවර බැලීමට පිට රාජ්‍යයකින් පැමිණි කුමාරවරු හයදෙනෙක් අත්හැරදමා ගොස් තිබු වස්තු දැක තමා කෙරෙහිම කලකිරී ඒ හය දෙනාද හත්ථිපාල තාපසයන් සොයාගෙන ගොස් පැවිදිවූහ. සතිස් යොදුනක පමණ තැන් මහත් පන්සල් අතුරු නැතිව පිරුණේය. මේ මහා පිරිස අතුරෙන් යම් කෙනෙක් කාමවිතර්කාදියක් සිතනම් හත්ථිපාල තාපසයන් වහන්සේ වහා ඔහු ළඟට ගොස් අවවාදකොට සමාපත්ති උපදවන්නාහ. ඔවුන් අතුරෙන් දෙකොටසෙක් බ්‍රහ්ම ලෝකයෙහිද දෙකොටසෙක් කාම ස්වර්ගයේද උපන්නාහ. තපස්වීවරයන්ට අත් පා මෙහෙවරකළ මනුෂයයෝ මිනිස් ලොව උතුම් කුළවල ඉපිද සැප විඳින්නාහ. අවවාදයෙහි නොපිහිටි අය නරකාදී සතර අපායෙහි ඉපිද දුක් විඳින්නාහ.

එසමයෙහි සූකාරි රජ නම් දැන් සුදෝවුන් රජය. පුරෝහිත බමුණා නම් කාශ්‍යප තෙරුන්ය, අජ කුමරා අනුරුද්ධ තෙරුන්වූ අතර මුගලන්තෙරුන් වුයේ ගෝපාල කුමරායි, අශ්වපාල කුමාරයා නම් සැරියුත් තෙරුන්ය, හත්ථපාල නායක තාපසයන් වහන්සේ නම් බුදු රජාණන් වහන්සේය.

SANHIDA LANKA

# අයෝඝර ජාතකය

සද්ධර්ම රාජයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරන සේක්. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව අරභයා දේශනා කරන ලදි.

දිනක් දම්සභා මණ්ඩපයට රැස් වූ භික්ෂූන් සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ සක්විති රජ සැපත් හැර මහාබිනික්මන් කළ සේ ඉතා යහපතැයි වර්ණනා කරමින් උන් අතර එහි වැඩි බුදුරජාණන් වහන්සේ මහණෙනි, දැන් එය පුදුමයක් නොවෙයි. පෙර නුමූ කළ නුවණෙහි සිටත් සියළුම සැප හැර අභිෂ්ක්‍රමණය කෙළෙමි වේදැයි වදාරා ඉකුත්වත වදාල සේක.

යටගිය දවස බරණැස රාජ්‍යය කළ බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ බිසව රන්රුවක් සරි පුත්රුවනක් වැදුවාය. ඒ බිසවුන්ට පෙර ආත්මයකදී ස්වාමිපුරුෂයෙක් නිසා වෛර බැඳි ස්ත්‍රියක් පැතුම් බලයෙන් යකින්නියක් වී බලා හිඳ අවසරයක් ලැබ රජගෙට වැද බිසවුන් බලා සිටියදීම කුමාරයා හැරගෙන ලපටි උනගොබයක් කඩාකන පරිද්දෙන් මුරු මුරු යන අනුකරණයෙන් ලේ පෙර පෙරා කා දමා නොයෙක් විකාර පා බිසවුන් බය ගන්වා නික්මුණාය. දෙවන වාරයේද මෙසේම සිදු විය. තුන්වෙනි වරට බිසව ගැබ් ගත් පසු රජ්ජුරුවෝ මහජනයා රැස්කරවා දරුවන් කන යකින්නට මක්කරමෝදැයි විචාළේය. එක් පුරුෂයෙක් බිසවගේ අත්පා වල තල්පත් බඳින්නට කියේය. එක් පුරුෂයෙක් යකඩ ගෙයක් තනා බිසව එහි නතර කරන ලෙස කීය. එබස් ඇසූ රජ්ජුරුවෝ යහපතැයි ගිවිස ඇතුලු නුවර ඉතා අලංකාර අයෝමය මාලිගාවක් නවමසක කර්මාන්තයෙන් පසු නිමකරවූහ. බිසව නොබෝ දිනකින් පින්වත් පුතකු වැදූහ. ඒ කුමාරයා අයෝමය මාලිගාවෙහි උපන් බැවින් අයෝඝර කුමාරයෝ යන නමින් ප්‍රසිද්ධ විය. පෙර කී යකින්න වෙසමුණු රජහට පැන්ගෙන යන අතර මඟදී විනාශයට පැමිණියාය. කුමාරයා වැඩිවිය පැමිණ ඉගෙන නිමවූ විට පිය රජ්ජුරුවෝ පුත්‍ර කුමාරයා අමතා රාජ්‍යය භාරගන්නා ලෙස නියම කළේය. කුමාරයා පිය රජ්ජුරුවන්ට වැඳ පියාණෙනි මට මේ රාජ්‍යයෙන් කම් නැත. නුවණැතියන් විසින් ප්‍රශංසා කරන ලද තපස් පිණිස සුදුසු පෙදෙසකට යනු කැමැත්තෙමි අවසර දුන මැනවයි කීයේය. කිමද කුමාරය මෙවැනි රජ සම්පත් හැර කුමක් නිසා තපස් කරන්ට යවුද? පියාණෙනි මම අමේධ්‍ය නරකයක් හා සමාන වූ මව්කුස දසළුකඩ මසක් වැස බිහිවී යක්‍ෂ භයින් දොලොස් වර්ෂයක් සිරවී සිටියෙමි. පිට බලාපිය පමණකුත් නොලදිමි. යකින්න අතින් ගැලවුණු පමණින් ජරා මරණ දෙකෙන් මිදුනෙමි නොවෙමි. මරණ තෙමේ කිසිවක්හු විසින් ජයගත නොහැක්කේය. රාජ්‍යයෙන් මට කම් නැත. මහණවන්ට යමියි පංචකාමසම්පත්තියෙහි ආදීනව නොයෙක් අයුරින් දක්වා දෙමව්පියන් වැඳ තපසට නික්මුණේය. පිය රජ්ජුරුවන් වහන්සේද මටත් මේ රජ සැපතින් කම් නැතැයි සියල්ල හැර දමා නික්මුනේය. ඊට පසු බිසවද අන්තඃපුර ස්ත්‍රීහුද යුවරජ සෙනෙවිරත් ආදීහුද බ්‍රාහ්මණ ගෘහපති ආදීහුද සිටු අනුසිටු ආදී සියල්ලෝමද තම තමා සතු සියළු සම්පත් හැර දමා අයෝඝර කුමරයන් හා කැටිවම නික්මී හිමාල වනයටම ගියාහ.මහත් වූ පිරිස් දොළොස් යොදුනක් තැන් ගැවසී ගත්හ. ඒ සියළු දෙනාම පැවිදි වී ධ්‍යාන වඩා සුගතිගාමී වූහ.

එසමයෙහි මව්පිය දෙදෙනා නම් සුද්දෝධන මහාමායා දෙදෙනාය. අයෝඝර පණ්ඩිතයෝ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# පඤ්ච පණ්ඩිත ජාතකය

මෙම ජාතකය සවිස්තරව උම්මග්ග ජාතකයේ එන්නේ ය.

නැවත සේනකාදී සතරදෙන යශසට පත් මහෞෂධ පණ්ඩිතයන් කෙරෙහි ඊෂ්‍ර්‍යාකොට ඔහුට කුමක් කරමෝදැයි කුමන්ත්‍රණය කළහ. ඉක්බිති සේනකයෝ අනිත් තුන්දෙනා අමතා කියන්නාහු රජ්ජුරුවන් කෙරෙහි ඔහු බිඳුවා පියන්ට මා උපායක් කියමි. අපි සිව්දෙන ඔහු සමීපයට ගොස් "රහස් නම් කාට කිවහොත් යහපත්දැයි" විචාරම්හ. ඔහු මහා මන්ත්‍රී හෙයින් "කිසිවෙක් හට රහස් කිව නොහැක්කැයි" ඉදින් කීයේ වීනම් එය රජ්ජුරුවන්ට කියා ඔහු බිඳුවමුයි කතිකාකොට සිංහ රජකු සමීපයට යන ජරාවට පත් සිවලුන් සතර දෙනෙකු පරිද්දෙන් පණ්ඩිතයන් සමීපයට ගොස් පණ්ඩිතයෙනි! පුරුෂයා විසින් පළමු කොට කුමක් කටයුතුදැයි විචාළහ. සත්‍ය භාවයෙහි පිහිටිය යුතු යයි වදාළ සේක. එහි පිහිටිය උන් විසින් කුමක් කටයුතුදැයි විචාළහ. වස්තුව සෙවිය යුතුදැයි වදාළසේක. වස්තුව උපයාගෙන කුමක් කටයුතුදැයි පිළිවිස්සාහ. මන්ත්‍රණ උගත යුතුයයි වදාළ සේක. පසු කුමක් කටයුතුදැයි විචාළ ගමනේ තමාසිත රහස් කටයුතු අනුන්ට නොකිය යුතුයයි වදාළසේක.

ඔවුන් සතරදෙන යහපත පණ්ඩිතයෙනි!යි සතුටුව රජ්ජුරුවන් සමීපයට ගොස් දේවයන් වහන්ස මහෞෂධ පණ්ඩිතයෝ ඔබ වහන්සේට විරුද්ධව සිටිනේයයි කීහ. රජ්ජුරුවෝ මම තොපගේ බස් නොඅදහමි. උන් මට විරුද්ධ නොවේයයි නොගිවිස්සාහ. දේවයන් වහන්ස! අප කී බස් නො අදහනසේක් වී නම් උන් මෙහි ආකල "තමා සිත උපන් රහස කාට කියයුතුදැයි උන්ගෙන් විචාළ මැනව. ඉදින් ඔබ වහන්සේට විරුද්ධ නොවෙත් නම් අසවලුන්ට කිව යුතුයයි කියති. ඉදින් ද්‍රෝහී වෙත්නම් කිසිවක් හට නොකිව යුතුය. මනදොළ පිරුණ කල කියයුතුයයි කියති. එවිට අප අදහාගෙන සැක හළ මැනවයි කීහ. රජ්ජුරුවෝ යහපතැයි උන් ගිවිස පසුදින රාජසභාව රැස්වූකල රජ්ජුරුවෝ උන් අමතා මම ප්‍රශ්නයක් අසමි. නින්දා කටයුතු හෝ ප්‍රශංසා කටයුතු රහසක් කාට කිව යුතුදැයි විචාළහ. එවිට සේනකයෝ රජ්ජුරුවන් මුහුණ බලා දේවයන් වහන්ස! නුඹවහන්සේම ආදිකොට වදාළ මැනව ඔබ වහන්සේගේ අදහස් බලා පණ්ඩිතවරු පස්දෙනාත් කියන්නාහයි කීහ.

ඒ අසා රජ්ජුරුවෝ තමන් කෙළෙස් වසඟ හෙයින් යම්ස්ත්‍රියක් පතිව්‍රතා ධර්මය රක්‍ෂා කරන්නීද පුරුෂයාගේ අදහස් දනීද එසේවූ තමාගේ අඹුවට සියළුම රහස් පැවසිය යුතුයයි කීහ. ඉක්බිති සේනකයෝ රජතුමනි! දුක සැප දෙකෙහි පිහිටවන මිත්‍රයාට රහස් කිව යුතුයයි පැවසූහ. කාවින්දයෝද යම් පුත්‍රයෙක් අනුජාතව හැසිරේද අලාමකවූ නුවණ ඇත්තේද එවැනි පුතුට රහස කිවයුත්තේයයි කීහ. දේවින්දයෝද රජතුමනි! හිතකාමී වූ තම මෑණියන්ට රහස් කිවයුතුයයි කීහ. ඉක්බිති මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවෙනි රහස් දෙය නම් නින්දා කටයුතුවත් කිම? ප්‍රශංසා කටයුතුවත් කිම? සැඟවීමම උතුම්ය. රහස් ප්‍රකාශ කිරීම නුවණැත්තන් විසින් ප්‍රශස්ත නොවන්නේය. තමා සිතුදෙය මුදුන් නොපැමිණියේ වීනම් නුවණැති තෙම ඒ තාක්කල්ම කිසිකෙනෙකුන්ට ප්‍රකාශ නොකරන්නේය. එය මුදුන් පැමිණියේ වීනම් එය සභා මධ්‍යයෙහි සැකහැර කියන්නේයයි ප්‍රකාශ කළහ. රජ්ජුරුවෝ මෙය අසා නොසතුටුව සේනකයන්ගේ මුහුණ බැලූහ. එවිට පණ්ඩිතයන් වහන්සේ උන් දෙන්නාගේ ක්‍රියාව දැකලා මුන් සතර දෙනාම මුසා කියා මා කෙරෙහි රජ්ජුරුවන් බිඳුවාපී වන්හ. වහා මෙතැනින් නැගී යාම සුදුසු යයි සිතා රජ්ජුරුවන් වැඳ අවසර ගෙන පලාගොස් සේනකාදීන්ගේ කුමන්ත්‍රණ ගැන පරීක්ෂාකාරී වන්නේ උන් නිතර කථාකරමින් සිටිනා මහ ඔරු කඳක් දැක ඒ යට සැඟවී සිට උන්ගේ රහස් දැනගත යුතුයයි සම්මත කරගත්හ. ඒ අතර සේනකයෝද රජ්ජුරුවන් අමතා දේවයන් වහන්ස දැන් අප කීවා සැබෑදැයි විමසීය. රජතුමා හයින් ත්‍රස්තව ඉදින් කුමක් කරමෝදැයි විචාළහ. කල් නොයවාම රහසින් මරවාපීම යහපතැයි සේනකයෝ කීහ. සේනකයෙනි! තොප විනා අනිකෙක් නැත. මිත්‍රයන් සමග ගොස් ඔහු රාජසේවයට එනවිට මේ කඩුවෙන් කපා මරාදමවයි තමන්ගේ මගුල් කඩුව සේනකයන්ට දුන්හ. උන් සතරදෙනා ගොස් ඔරුකඳ මත්තේ සිට කථාකරන්නාහු සේනක පඬිතුමනි ඔබගේ රහස් යහළුවාට කිවයුතුයයි වදාළේ මන්දැයි කීහ. සබඳ පණ්ඩිතවරුනි! මේ රහස රජතුමා දැනගතහොත් අපගේ දිවි නොරැකෙයි. නමුත් මේ ඔරුවයට මහෞෂධ පණ්ඩිතයෝ සැඟවී ඇද්දැයි ඔරු කඳට නිය පිටින් ගැසීය. සේනක පණ්ඩිතයෙනි මහෞෂධ පණ්ඩිතයෝ මහත් සම්පත් ඇත්තෙක. මේ අපවිත්‍ර තැන කුමට ලගීද? ඔබගේ රහස සැක හැර කියවයි කීහ. එවිට සේනකයෝ මම දිනක් මගුල් සල් උයනේදී අසවල වෛශ්‍යා දූ සමඟ මෛථුන සේවනය කොට ඇගේ පළඳනා ලෝභයෙන් ඈ මරා ඇගේ රෙදිකඩින් ඒ

SANHIDA LANKA

ඔතාගෙන අපගේ ගෙයි ගබඩාවක මුව අංකොක්කේ එල්වාලීමි. මේ දක්වා කිසිවක් ඉන් අලෙවි කළේ නැත. පරණවනතුරු බලා ඉදිමි. මේ රාජඅපරාධය මාගේ යහළුවකුට කීමි. ඌ කිසිවෙකුට නොකී විරුය. මේ කාරණයෙන් යහළුවාට රහස් කිවයුතු බව කීමියි කීහ.

පුක්කුසයෝ තමන් රහස ප්‍රකාශකරන්නාහු එම්බා මගේ කලවයේ අසාධ්‍ය කුෂ්ටයෙක් ඇත. මගේ මලණුවෝ උදෑසනින් ඒ වනය කසටින් සෝදා බේත් ගල්වා බඳනාහ. රජ්ජුරුවෝ මා කෙරෙහි මොලොක් සිතින් මා කැඳවා මගේ කලවයෙහි හිසතබා සැතපෙන්නාහ. මේ නොකටයුතු දෙය දන්නෙහිනම් මා මරාපියන්නාහ. ඒ කාරණය හේතුකොටගෙන රහස් නම් මලණුවන්ට කිවයුතුයයි මා විසින් කියන ලදැයි කීහ.
කාවින්‍දයෝද මා වරද අසව් අව පසළොස්වක් දවසේ නරදේව නම් යක්ෂයෙක් මා ඇඟට ආරූඪ වන්නේය. ඒ යක්ෂයා වැහුන කල්හි මම වියරු බල්ලකු මෙන් හඬමි. මම ඒ බව පුතණුවන්ට කීමි. ඌ ඒ හඬ නො ඇසෙනු පිණිස දොරළඟ සිට නොයෙක් භාණ්ඩ වාදනය කරන්නාහ. මේ කාරණය නිසා රහස නම් පුතුන්ට කිවයුතුයයි මා කියෙමියි කීහ.

දේවින්ද පණ්ඩිතයෝ යහළුවනි! ශ්‍රක්‍රයා විසින් කුස රජ්ජුරුවන්ට දුන්නාවූ මාණික්‍ය රත්නය පරම්පරාවෙන් පැවත අවුත් භාණ්ඩාගාරයේ තුබුවා මා විසින් සොරා ඇරගෙන මාගේ මෑණියන්ට දුනිමි. රජගෙට යන වේලේ මෑණියෝ රහසින් එය මට දෙන්නාහ. මම ඒ මැණිකේ ශොභාවෙන් මුහුණ ආලෝකමත් කරගෙන රජගෙට යන්නෙමි. රජ්ජුරුවෝ කා සමගවත් නොදොඩා මා හා සුව දුක් දොඩන්නාහ. දිනපතා තෑගි දෙන්නාහ. ඉදින් එය සොරාගත් බව කිසිවෙක් දතුනම් මාගේ දිවි නැසෙයි. එබැවින් රහස්කම් මෑණියන්ට කිවයුතු යයි මම කීවෙමියි කීහ. මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ ඔරු කඳයට සිට සියළු දෙනාගේ රහස් සිතේ තබාගත් සේක. උන් හැම කතාකොට පමානොව මහෞෂධයා මැරීමට උදෑසනම එවයි කියා තමතමන්ගේ ගෙවලට ගියාහ. උන්ගියපසු පණ්ඩිතයන් වහන්සේ තමපුරුෂයන්ගේ ආධාරයෙන් එළියට පැමිණ ගෙටගොස් සැතපී ගත්හ.

රජ්ජුරුවෝද මහෞෂධ පණ්ඩිතයන්ගේ ගුණ සිහිකරන්නේ සත්හැවිරිදි කල් පටන් මට යහපතක්ම මිස අවැඩක් නොකළේය. දේවතා දූ විචාළ පැනයෙහි ඔහු නැත්නම් මාගේ ජීවනයද නැත. වෛරී පසමිතුරන්ගෙන් බස්ගෙන මහා නුවණැති පණ්ඩිතයන් මරවයි කඩුව දුනිමි. මා කළේ මහා අයුත්තියෙක. සෙට පටන් ඒ පණ්ඩිත රත්නය මට නැතිවන්නේයයි ලය පැලීයන පරිද්දෙන් ශොක ඉපදවූහ.ඬා වැගුරුනේය. චිත්තාස්වාදයක් නොලද්දාහ. උදුම්බරා දේවියද ඒ යහනේ පසෙකින් උන්නී රජ්ජුරුවන්ගේ වික්ෂිප්තභාවය දැක රජ්ජුරුවෙනි! මාගෙන් හෝ යමෙකුගෙන් ඔබතුමාට වරදක් උනීද? ඒ මට කියවයිකීහ. රජ්ජුරුවෝ සොඳුර! සේනකාදී සතරදෙන පැමිණ මහෞෂධ පණ්ඩිතයෝ මා මරා රාජ්‍ය ගන්ට සිතතියි මට කීහ. මා තත්වය පරීක්ෂා නොකොට එසේ වීනම් ඌ මරාපියවයි මගුල් කඩුව අතට දීලා පිටත් කළහ. දැන් උන්ට පෙර මාගේ මරණය උනිනම් යහපත්ය. මින්පසු උන් නොදකින බැවින් ශෝක වෙමියි කීහ.

එවිට බිසවුන් වහන්සේද මහෞෂධ පණ්ඩිතයන් කෙරෙහි ව්‍යාජ වෛරයක් පලකොට උපායකින් රජ්ජුරුවන් අස්වසා නින්දට සලස්වා වහා එතනින් පිටව ගොස් තල්පතක සියළු විස්තර ලියා අග්ගලයක් තුළ ලා එය බැඳ නැවුම් සැලියක දමා යෙහෙළිය අතක් රහසින් මහෞෂධ පණ්ඩිතයන්ට යවා වහා පැමිණ රජ්ජුරුවන් සමග සැතපුනාය.

මහෞෂධ පණ්ඩිතයෝ අග්ගලාව තුළවූ ලිපිය බලා තත්වූ පරිදි දැන කළයුතු සියල්ල විමසා සැතපුනහ. සේනකාදී සතරදෙන ඒ රාත්‍රිය වර්‍ෂයක් මෙන් සිතසිතා ගතකොට උදෑසනම කඩුව ගත් අත් ඇතිව වාසල ඇලී රැකසිට පණ්ඩිතයන් වහන්සේ නොදැක රජ්ජුරුවන් සමීපයට ගොස් රජතුමනි මහෞෂධ පණ්ඩිතයන් නොදුටුවෙමුයි කීහ.
මහෞෂධ පණ්ඩිතයෝද හිරු නැගෙන්නාහාම මුළු සත්යොදුන් මියුළු නුවරම වසඟ කොට ඒ ඒ ස්ථානයෙහි රැකවල් තරකොට තබා බොහෝ දෙනා විසින් පිරිවරණ ලදුව සර්‍වාභරණයෙන් සැරසී උතුම් රථයකින් අවුත් රජ්ජුරුවන් වැඳ සිටිසේක. රජ්ජුරුවෝද ඉදින් පණ්ඩිතයෝ මට සතුරුවෙත්නම් මා නොවඳනාහයි සිතා මපුතණුවෝ වහා එවත්වයි වහා කැඳවාගෙන ගොස් අසුන්ගන්වා පුත මහෞෂධ පණ්ඩිතයෙනි! ඊයේ සන්ධ්‍යාවෙහි ගියෙහිය. අද හිරු නැගී මෙතෙක් වේලෙන් අවුත් මා දුටුවෙහිය. තොපගේ සිතට කුමන සැකයෙක්වීද කවරෙකු තොපට රජ්ජුරුවන් දැක්මට නොඑවයි බසක් කිව්ද තොප පමාවූ කාරණය කියවයි විචාළහ.

SANHIDA LANKA

දේවයන් වහන්ස ඔබ විසින් මට සතුරු වූ සේනකාදී සතරදෙන බස් ගෙන මා මරන්ට නියෝග කරන ලද්දේ වේද එසේ හෙයින් නොආයෙමි'යි රජ්ජුරුවන්ට චෝදනා කරනසේක් ජන ප්‍රධාන වූ දේවයන් වහන්ස ඔබ වහන්සේ විසින් ප්‍රඥාසම්පන්නවූ මහෞෂධ පණ්ඩිතයෝ මැරිය යුත්තෝයයි නියෝගකර යම්හෙයකින් ඊයේ මධ්‍යම රාත්‍රී වේලෙහි බිසවුන්ට රහසිගතව කියන ලදද එබදු වූ ඔබවහන්සේගේ රහස් කටයුත්ත මා විසින් අසන ලදැයි වදාළ සේක. රජ්ජුරුවෝ එය කණ වැකුණු ඇසිල්ලෙහිම කිපී බිසවුන් මූණ බැලූහ. රජ්ජුරුවෝ බිසවුන්ට කිපි නියාව දැන පණ්ඩිතයන් වහන්සේ දේවයන් වහන්ස! බිසවුන් වහන්සේට කුමට කිපෙනසේක්ද? මම කාලත්‍රයෙහිවූ සියල්ලම දනිමි. ඔබවහන්සේගේ රහස් මට බිසවුන් වහන්සේ විසින් කියන ලද්දේ වේවා! සේනකාදී සතරදෙනාගේ රහස් මට කා විසින් කියන ලදද? උන්ගේ රහසුත් දනිමියයි කියා ඊටපෙර ඔරුකඳ යට සිට අසාගත් උන්ගේ රහස් සියල්ලම පිළිවෙළින් හෙළිකළහ. රජ්ජුරුවන් වහන්සේ උන්වෙන වෙනම ගෙන්වා සැබෑදැයි විචාරා දඟගෙයි ලවාපීහ. උන් සතරදෙනා පණ්ඩිතයන් වහන්සේ මරම්හයි හැම දෙනම හිරගෙට වන්හ. දේවයන් වහන්ස! "තමන් සිත උපන් රහස මුදුන් පැමිණෙනතුරා අනුන්ට නොකිය යුතුය"යි කීයේ මේ නිසා යයි කියා සේනකාදීන් රහස් අනුන්ට කීම නිසා විනාශයට පත්වූ නියාව දක්වා ධර්මදේශනා කරන්නේ රජතුමනි! විශේෂයෙන් රහස් නොකිය යුත්තන් අසා වදාළ මැනව. මේ ලෝකයෙහි ස්ත්‍රීය හදවතක්සේ වෙසේ. නමුත් ගැහැණිටත්, යමෙක් ආමිශයෙන් සිත් ගතයුතුනම් ඔහුටත් යමෙක් සතුරකුව මිතුරකුසේ හැසිරේනම් ඔහුටත් රහස් නොකියන්නේය. රහස් කීමෙන් නිතර තමා ඔහුට දාසයකු මෙන් බියෙන් කල් යැවීමටද නින්දා ඉවසීමටද සිදුවන්නේය. දහවල් රහස් කියනු කැමතිනම් එළිමහණකදීද රාත්‍රී රහස් කියනු කැමති නම් උන්ගේ කණින් බැහැරට නොයනසේද කිවයුතු වන්නේයයි වදාළසේක.

රජ්ජුරුවෝ පණ්ඩිතයන් වහන්සේගේ ධර්ම කථාව අසා සේනකාදී සතරදෙන මට විරුද්ධව රාජද්‍රෝහීව නිරපරාධවූ මේ පණ්ඩිතයන් මට ද්‍රෝහියයි මුසා කීවෝයයි කිපී යව කොල! මුන් සිව්දෙනා මරමරා නුවරින් පිටතට ගෙනගොස් හුල හිඳුවා හිස්කපා දමාපියවයි නියම කළහ. උන් පිටිතලහයා බැඳ සිය ගණන් පහර ගසගසා මරන්ට ගෙනයන වේලෙහි පණ්ඩිතයන් වහන්සේ දේවයනි! මුන් පෙර ඇමතියෝය. ක්‍ෂමාකළ මැනවයි වදාරා උන්ගෙන්වා උන්නිදහස්කොට තමාගේ දාසකමට පවරා දෙද්දීත් එය ප්‍රතික්‍ෂෙප කොට උන්ගේ පෙර තනතුරුමදෙවා මෛත්‍රීය පතුරුවා සතුටුවූහ. එතැන් පටන් සේනකාදී සතරදෙන දළසුන් සර්පයන් මෙන් ප්‍රභූ ශක්තියක් නැතිව පණ්ඩිතයන් වහන්සේට කිසිවක් කියන්ට අසමර්ථවූහ.

SANHIDA LANKA

# කිංඡන්ද ජාතකය

සඟමී රාජයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් උපාසක වරුන්ගේ පෙහෙවස් රැකීමක් අරභයා මේ ජාතකය වදාළ සේක.

නිධාන කථාවः- දිනක් බුදුරජාණන් වහන්සේ බණ අසනු පිණිස දම් සභා මණ්ඩපයට පැමිණ පෙහෙවස් රැකී උපාසකවරුන් අමතා පින්වත්නි, තෙපි පෙහෙවස්රැකීමේ විපාකයෙන් බොහෝ යසස් ලද්දාහු වේදැයි වදාරා මේ ජාතකය ගෙනහැර දක්වා වදාළ සේක.

ආරාධනයः- උපාසකවරු

ජාතක කථාවः- යටගිය දවස බරණැස් නුවර දසරාජ ධර්මයෙන් රාජ්‍යය කළ බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන්ට අලල්ස් කන සුළුවූ අධර්මිෂ්ට අධිකරණ නායකයෙක් වූයේය. එක් පොහෝ දිනයෙක්හි රජතෙම ඇමති ආදීන් කැඳවා පින්වත්නි, උපෝසථ ශිලය සමාදන් වුයේ දැයි විචාළේය. එදින අධිකරණ නායකයා පෙහෙවස් සමාදන්ව නොව අල්ලස් ගෙන නඩුවිසදා අයුක්ති කොට රාජ සේවයට ආයේය. ඔහු අතිනුත් පෙහෙවස් සමාදන් වූයේදැයි විචාළේ එසේයි පෙහෙවස් සමාදන් වීමියි කියා මාලිගයෙන් බටුයේය. ඔහු සිල්සමාදන් නොවූ නියාව දත් එක් ඇමතියෙක් ඇයි? ආචාරණී බොරු කීයේ ඇයි දැයි තින්දු කළේය. එවිට අධිකරණ ඇමති මම උදෑසන බත් අනුභව කොට ගියෙමි. දැන් ගෙට ගොස් මුව සෝදා සිල් සමාදන් වන පමණක් වේදැයි කියා ගෙට ගොස් අඩපෝයක්සිල්සමාදන්වීය පෙහෙවස් රැකි ස්ත්‍රියකට අඩ කැනක්දින බමුණා කළපින් මෙපමණක්ම වූයේය. ඔහු කල් යාමෙන් කළුරිය කොට හිමාල වනයෙහි කොසිනික නම් ගංගා ප්‍රදේශයෙහි එක් වනයක රන් විමනෙක්හි ශ්‍රී යහන් මතුයෙහි නින්දා පිබිදියාක් මෙන් ගොස් උපන්නේය. දොළොස් දහසක් දෙවගනක් විසින් පිරිවරන ලදුව භාගයෙහි රාත්‍රී අපමණ වූ දිව්‍ය සම්පත් විඳින්නේය. විමන් ප්‍රේත භාවය හේතු කොට ගෙණ අරණු නැගී කල්හි දිව්‍ය ආත්ම භාවය අතුරුදහන් වී සියළු ශරිරයම ගිණිගෙන දිලිසෙමින් සුපිපිමලින් ගැවසි ගත් කැල රැකක් වන්නේය. ඔහුගේ අත් දෙකෙහිම එක එක ඇඟිලි වන්නේය. එහි මහත් උදළු පමණ නිය ඇත්තේය. ඒ නියෙන් තමාගේ පිට මස්පලා උපුටා කමින් මහත් වේදනාවෙන් පීඩිත වූයේ බැගෑපත් හඬින් හඬමින් දිවා භාගයෙහි ප්‍රේත දුක් විඳින්නේය. හිරු අස්තයට ගිය කල්හි ඒ ප්‍රේත ශරිරය පහළ වී දිව සැප විඳින්නේය. පූර්ව ජන්මයෙහි පෙහෙවස් රකින ස්ත්‍රියකට දුන්නාවූ අඹ කැනෙහි අනු හසින් තුන් යොදුන් වූ පමණ වූ අඹ උයනක් ලද්දේය.  අල්ලස් ගෙන අධර්මයෙන් නඩු විසඳූ පාපයෙන් තමාගේ පිට මස් තමාම උපුටා කමින් දිවා භාගයෙහි මහත් වූ දුක් විඳින්නේය. අඩ පොහෝ සිල් රැකි අනුහසින් රාත්‍රියෙහි සොළොස් දහසක් දෙවඟනුන් පිරිවරා ප්‍රීති වන්නාහ. එසමයෙහි බරණැස් රාජ කාමයෙහි ආදීනව දැක සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ විමාන ප්‍රේතයා වසන කොසිනික ගංගාව අසල පන්සලක් කොට ගෙන දවස් හරනේය. දිනක් තාපසයන් ජලස්නානය කරන ගංතෙරට කලයක් හා සමාන අඹ ගෙඩියක් ලැබී එය ගෙන ගොස් වෙන අහරයක් නොසොයා දින කීපයක්ම එයින් ම රැකුනේය. ඒ නිමාගිය කල්හි වෙන ඵලයක් කෑ නුහුණුයේ අඹරස තෘෂ්ණාවෙහිද බැඳි එම අඹම අනුභව කරමියි ලෝභයෙන් ගංතෙරට ගොස් උන්නේය. මෙසේ නිරාහාරව සය දවසක්ම ඉක්ම් ගියේය. සත්වෙනි දවසෙහි මෙය දුටු ගංතෙරට අධිගෘහිත දෙව්දුව මේ සිල්වත් තාපසයන්ට අඹ ඵලයක් ම දී යුක්ති නොවන්නේය. මොහු එය නොලද්දේ වීනම් මෙතැන්හිම මිය යන්නෙයයි සිතා පැමිණ අහසෙහි සිට තාපසයෙනි, කුමක් පතා මෙහි පසුවන්නෙහිදැයි විචාළීය. තාපසයන් වහන්සේ තම අභිප්‍රාය දෙව්දුවට දන්වා තී කවුදැයි විචාළේය. මම මේ ගංගාවට අධිගෘහිත දෙව්දුවයි පවසා තාපසයන් අමතා තාපසයෙනි, රජ සැප හැර තවුස් වෙස් ගත් තොප මේ සුළු රසයක් කෙරෙහිම ලෝභ කිරීම යෝග්‍ය නොවන්නේය. ඒ රස තෘෂ්ණාවෙන් වලකු මැනවි. මෙයින් තොපගේ නුවණැති භාවයක් නොපෙනේ. තපසුන්ට නුසුදුසුව මේ රස බන්ධනය දිව්‍ය බ්‍රහ්මයෝ තොප නොකීවත් තමන්ගේ ආනු භාවයෙන් දන්නාහ. කිසි කලෙකත් රහසින් පවක් නොකළ තාපසයන් පසුතැවිලි දක්වා කීයේය. දෙව්දුවගේ බස් ඇසු තාපසයෝ කියන්නාහු උතුම් ගුණ ඇති මා කෙරෙහි නින්දා වචනායන් අපහාස කරන තෙපි පාපයට හිමිකාරියක් වන්නීය. ඉදින් මම තොප අධිගෘහිත ගංතෙරෙහි නැසුනොත් මෙසේ තපස් වී කෙනෙකුන් නිරාහාරව මිය යද්දී බලා හුනැයි තොපට අයස් පැමිණිමෙනුත් ප්‍රාණයක් නොරැකීමෙන් වන පාපයෙනුත් වලකිනු මැනවයි කීයේය. එබස් ඇසූ දේවතා දුව හොඳයි තොපට කැමති තාක් රස අඹ දෙමියි පිය පුත්‍රයන් වඩා ගන්නා මවක් මෙන් ඔසවාගෙන අහසින් ගොස් තුන් යොදුනක් පමණ වූ එම අඹ උයනෙහි තාපසයන් සිටුවා අඹ වනය වර්ණනා කොට අඹ කැමති පමණ අනුභව කොට තෘෂ්ණාව නිවා ගතමැනවයි කියා දෙව්දුව තමා වසන විමානයට ගියාය. ඒ තාපසයෝද තෘෂ්ණාව පූරා අඹ අනුභව කොට වෙනෙහි ඇවිදිනා කල්හි දවල් දුක විඳින විමාන ප්‍රේතයා දැක භයින් කිසිවක් කියාගත නුහුණුයේ

SANHIDA LANKA

රාත්‍රිය දිව්‍ය සම්පත් විඳිනවා දැක එහි ගොස් ඊට හේතුව විචාරා එම තාපසයන් වහන්සේ පෙර බරණැස් රජව සිටියදී අධිකරණ ඇමති ව කරන කුසල් අකුසල් දෙකට ලැබී ඇති සැප විපාකය පෙන්වා තමා විඳිනා දුකෙහි භයානක කම පෙන්වා තාපසයන් වහන්සේ ප්‍රව්‍රජ්‍යාවට ආ තැන් පටන් අඹ උයනට ආතෙක් සියළු විස්තර තාපසයන් අතින් අසා දැක කිමෙක්ද තාපසයෙනි, මෙහිම රඳනු කැමති සේක් දැයි විචාළේය. එබස් ඇසූ තාපසයෝ මෙතැන්හි වසනු නොකැමැත්තෙමි. පෙර මා සිටින පන්සලට යනු කැමැත්තෙමියි කීයේය. එකල්හි විමාන ප්‍රේත තෙම හොඳයි ස්වාමිනි වැඩිය මැනවයි මමත් දිවි පමණින් අඹ දෙමියි තමාගේ ආනුභාවයෙන් පන්සලට ගෙනවුත් තබා ගොස් දින පතා අඹ ගෙනවුත් පිළිගන්වන්නේය. තාපසයෝ නොබෝ දිනකින් ධ්‍යාන වඩා සමාපත්ති උපදවා මිය ගොස් බඹලොව උපන්නාහ.

එසමයෙහි දෙව් දූ නම් උපුල්වන් මෙහෙණින් වහන්සේය තාපසයෝ නම් බුදු රජාණන් වහන්සේය.

SANHIDA LANKA

# කුම්භ ජාතකය

තව ද එක් සමයෙක්හි භක්ති ප්‍රේමාති භාරාවනත සුරා සුරවර මහොසයන්ගේ මුදුනෙහි රැඳි කුරුළු කුළු මිණියෙක් සැදුම්ලද ශ්‍රීපාදයන් ඇති කරුණාමණි ප්‍රභානාථවූ ශාක්‍යකුල තිලක වූ මාගේ ස්වාමිදරුවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජනනයනරසායන තරුගණොපසොභිත ජෙතවනාරාමයෙහි වැඩවසන සේක්. ශ්‍රොතාපත රසායන වූ මේ කුම්භ ජාතකය විශාඛාවන්ගේ යෙහෙළි වූ සුරාපානය කළ පන්සියයක් පමණ ස්ත්‍රීන් අරභයා වදාළ සේක.

ඒ කෙසේ ද යත්?

එක්සමයෙක්හි සැවැත් නුවර රා බී කෙළනා කෙළියක් පිණිස නුවර බෙර ගැසුරුවූහ. එකල්හි විශාඛාවන්ගේ යෙහෙළිවූ පන්සියයක් පමණ ස්ත්‍රීහු තමන්ගේ වල්ලභයන් සැණකෙළි කෙළ ඉක්බිති තුබූ පමණකින් මත්ව යන තරම් තීක්ෂණ වූ සුරාවක් සැණකෙළි කෙලුම්හයි සියල්ලෝම විශාඛාවන් සමීපයට ගොස් විශාඛාවෙනි රා බී සැණකෙළි කෙලුම්හයි කීහ. එසඳ විශාඛාවෝ කියන්නාහු එම්බල යෙහෙලියනි මම මේ සුරායෙහි දෝෂ දක්නා බව හේතු කොට ගෙන සුරාපාන නොකරම්හයි කීහ. ඔහු කියන්නාහු එසේ වී නම් තුඹ වහන්සේ බුදුරජාණන් වහන්සේට දන් දී බණ ඇසුව මැනව අප රා බී සැණකෙළි කෙළුම්හයි කීහ. විශාඛාවෝත් යහපතැයි ගිවිස සර්වඥයන් වහන්සේ පවරා දන් දී පස්වරු ගඳදුම් මල් පහන් ගෙන්වා ගෙන බණ අසනු පිණිස පන්සියයක් පමණ ස්ත්‍රීන් විසින් පිරිවරන ලදුව ජේතවනාරාමයට නික්මුනාහ. ඒ පන්සියයක් පමණ ස්ත්‍රීහු ද ඔවුන් කැටිව ගොස් විශාඛාවන් වාසලින් ඇතුලට වදුත්ම ඒ ස්ත්‍රීහු එකී එකී දෙන තම තමන්ගේ කෙල්ලන් සඟවා ගෙන ගොස් දූන් සුරාව සඟවා බී විශාඛාව සමඟ ගොස් බුදුන් සමීපයට එළඹියාහ. එසඳ විශාඛාවෝ ගෙන ගිය ගඳ දුම් මල් පහන් ආදියෙන් බුදුන් පුදා එකත්පස්ව උන්නාහ. සුරාපානය කොට කැටිව ගිය ස්ත්‍රීන්ගෙන් බුදුන් ඉදිරියෙහි සිට රා මදින් මත්ව සමහර කෙනෙක් නටන්ට වන්හ. සමහර කෙනෙක් ගායනා කරන්නට වන්හ. සමහර කෙණෙක් ඩබර කරන්නාහ. එවේලෙහි ස්ත්‍රීන්ට සංවේග උපදනා පිණිස තමන් වහන්සේගේ භෘයුග්මයෙන් රැස්විහිදුවා වදාළ සේක. ඒ නික්මුණා වූ රශ්මිකදම්බයෝ ලෝකාන්ධනරකය පරිද්දෙන් ඒකාන්ධ කළ කල්හි රා බී නටන්ට වන් පන්සියයක් පමණ ස්ත්‍රීහු මරණ භයින් තැති ගත්හ. ඒ කාරණය හේතු කොට ඔවුන්ගේ රා මද සිඳුනේය. භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ වැඩ උන් බුද්ධාසමනමස්තකයෙන් අතුරුදන්ව මහමේරු පර්වත මස්තකයෙහි වැඩ සිට ඒ ස්ත්‍රීන්ව බවයෙහි කළකිරීමට මෙම පරිද්දෙන් ධර්ම දේශනා කොට වදාරන සේක.

කොනුහාසව කිමානන්‍දො නිච්චං පජ්ජලිතෙසති

අන්‍ධකාරෙන ඕනද්ධා පදීපං නගවෙසසථ

යන මේ ගාථාව වදාළ සේක. ඒ ධර්ම දේශනාවගේ කෙළවර ඒ පන්සියයක් පමණ ස්ත්‍රීහු සෝවාන් ඵලයෙහි පිහිටියාහු. බුදු වූ නැවත ක්ෂණයෙහි වැඩ ගන්ධක ගන්ධ කුටි ඡායාවෙහි පනවන ලද බුද්ධාසන මස්ථකයෙහි සරා හීරුමෙන් දිළිහි දිළිහි වැඩහුන්සේක. ඉක්බිති විශාඛාතොමෝ බුදුරජාණන්වහන්සේට නමස්කාර කොට විචාරන්නේ ස්වාමීනී මේ හිරිඔතත් මසන්නා වූ සුරා පානය කවර දවසක ඇතිවීදැයි විචාළීය. විචාලා වූ ඒ විශාඛාවන්ට සුරා පානය උපන්නා වූ පරිදි වදාරන්නා වූ බුදුරාජාණන් වහන්සේ මේ පූර්ව කතාව ගෙනහැර දක්වා වදාළ සේක. ඒ කෙසේදැයි යතහොත් බරණැස බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍ය කරන සමයෙහි කසීරට වසන සුර නම් වල් වැද්දෙක් බඩු සොයනු පිණිස හිමාල වනයට ගියේ ඒ හිමාල ප්‍රදේශයෙහි එක් මහා වෘක්ෂයෙහි මිනිස් පමණක් විවරඳී තුන් බලයෙක් විය. ඒ බල තුන අතුරෙහි මහා සැලක් පමණ වලෙක් වූයේය. ඒ වල තුළ වැසි වටක්හි දියෙන් පිරුණේය. ඒ ගස වට ඇඹුල් අරළු මිරිස් වැල් ආදියෙන් තුරු ලිය හිව් සිටිනේය. ඔහුගේ ඵල ජාතීහු තුවටුවෙන් ගිලිහි වල අතුරෙහි පිරී සිටි පැනෙහි වැගිරෙන්නා වූ එතැනට නුදුරු තැන්හි සයංජාත හැල් වනයෙක් ඇත්තේය. එයින් ගිරවුන් කරල් කඩාගෙන අවුත් ඒ ගසමුල බොහෝ සේ කන්නාහ. ඔවුන් තුඩින් වගුල ඇල් කරල් ද ලියට සාව ඒ ගස් විදුරෙහි පිරී සිටි තැනෙහි වැටී සූර්යයපාකයෙන් පැසෙන බව හේතු කොට ගෙන සාවුන්ගේ ලෙහෙවන් පැවූයේය. ග්‍රීස්ම කාලයෙහි පිපාසිතව ගිරා බොකල සැලලිහිණි ආදී පක්ෂි සමූහය ගස් ඉදිරියෙහි තිබූ තැන්හි සිදුරෙහි මත බිමෙහි ගසමුල රා මදයෙන් සුගත් නිදා රා මදී සන්හිදුන් කරලි උදව්ව අහසට පැන නැගී යන්නාහ. අවශේෂ රැක ඉඳ වඳුරෝ එපරිද්දෙන්ම පැන් බී මනාව ගසමුල රා මද සිදුනු කල එතැන්හි කෙල ඇවිදිනාහ. එකල්හි වන සුරනම් මල් වැදි තෙම මේ ප්‍රවෘත්තිය ද ඇත. ඒකාන්තයෙන් මේ විෂය එක්වීමෙන් සියළු ප්‍රාණීහු මියන්නාහ. දැන්වූ කලී මේ පක්ෂි පටන් සියළු ප්‍රාණීහු මේ පැන් බී මූර්ජාව නැගී යන්නාහ. එසේ හෙයින් මේ විෂ නොවේ කියා තෙමේ බීමත්ව මස් කනු කැමති විය. ස්ථානයෙහි ගිණි මොලව ඒ පැන් බී මූර්ජාව උනු තිත් වටුවන් වලිකුකුළු දිය කුකුළු ආදී පක්ෂීන් මරා අගුරෙහි ලා පලහ එක් අතකින් මස් කකා එක්

SANHIDA LANKA

අතකින් අභිනව දක්ව දත්වා නටන්නේ දෙතුන් දවසක් ඒ ගසමුල වැස එතැනට නුදුරු ස්ථානයකින් වරුණ නම් එක් තාපසයෙක් වෙසේ. ඒ රා බී මත්ව කෙලෙනා වැදි පුත්‍ර තෙම එක් දවසක් තාපසයන් සමීපයට ගොස් කථාකොට අවුත් නැවතත් දවසෙක්හි ඒ තාපසයන් සමීපයට යනුයේ මේ මධුරවූ රස ඇති පානය තාපසයන්ට ගෙන යෙමි සිතා උණ නලේක පැනුත් පුරාගෙන අගුරෙහි පැලහු මස් හා සමඟ පන්සලට ඇරගෙන ගොස් තාපසයෙනි පැන් මධුරව තිබුයේය. ගෙන ගිය රා මස් දෙදෙනම අනුභව කළාහ. මෙසේ මේ සුරානන් වැද්දා හා වරුණ නම් තාපසයන් විසින් පළමු කොට දක්නා හෙයින් සුරා යයි කියාද වරුණ යයි කියාද නම් වූයේය. ඔහු දෙදෙනම කලක් එහි වැස මනුෂ්‍ය පථයට එනු කැමැත්තාහ. මේ සුරාව කෙසේ යනුමෝහෝයි පරීක්ෂා කොට වන්නාට උපායෙක් ඇති හුන නලවල පුරාගෙණ පසල් දනව්වට ගොස් ක්‍රමයෙන් රාජධානියට ගොස් වැද ප්‍රානසාරිකයැයි යන අමුතු අයෙක් ආහයි රජ්ජුරුවන්ට කියා යව්හි. රජ්ජුරුවෝ ඔවුන් ගෙන්වා දුටහ. දෙදෙනම තමන් ගෙන ගියා වූ පැන් රජ්ජුරුවන්ට දුන්හ. රජ්ජුරුවෝද පැන් දෙතුන් වාරයක් බී මත්ව දෙතුන් දවසක් කල් යැවූහ. ඉක්බිති රජ්ජුරුවෝ ඔවුන් අතින් තවත් මේ මධුර පැන් ලැබ හැක්ක දැයි විචාළාහ. දේවයන් වහන්ස හිමාලයෙහි ඒ කියන රුක වෙලක් සිදුරක තිබෙන ලද්දේ ඇතැයි දැන්වූහ. එසේ වී නම් ගෙනවයි මෙහෙවර ඇසූ ඔහු දෙදෙන තමන් කියන සුරා පළමු දෙනාත් සිදුරෙන් ගෙනවුත් දෙතුන් වාරයක් පෙවූහ. තවද එක් වාරයෙක ගෙනෙන්නට කී කල්හි හිමවත් පෙදෙස නිතියන්ට ඉතා දුරු හෙයින් වරින් වර යා නොහෙම්හ. එතකුදු උවත් ඒ මධුර වූ ජලය නිපදවන කාරණා දනුම්හ. රුක් සිදුරෙහි තිබූ අරළු, නෙල්ලි, වී ආදී සියළු සම්භාරයන් දැක විභාග කොට ගෙන ඒ ගසෙහි සුඹුළුත් ඇරගෙන රාජධානියට අවුත් මහසැල බහා නුවරෙහි සුරාව ඇති කළහ. නුවර වැස්සෝ සුරාව අනුභව කොට රා මදයෙන් මත්ව කල්යාමකින් ප්‍රමාද වීම හේතු කොට ගෙන සත්ත්වයෝ දිළිඳි වූහ. සුඛිත මුදිත සත්ත්වයන් නැති වීමෙන් ඒ නුවර යකුන් කෙළි සිස් පිටියක් මෙන් නිශ්‍රීක වූයේය. පළමුවෙන් සුරාව මනුෂ්‍යපථයට ගෙන වැදිපුත්‍රතෙමේම ඒ නුවරින් නික්ම බරණැස් නුවරට ගොස් වැද පානගාරිකයෝ යයි අපූර්ව වෙළෙඳ කෙනෙක් ආහයි රජ්ජුරුවන්ට දක්වා යැවූහ. රජ්ජුරුවෝ ඒ පුරුෂයන් තමා කරා ගෙන්වා ඒ තොප ඉදිකරන්නා වූ පානය නම් කෙසේ වූ දෙයක්දෝහෝයි වැටුප් වියදම් දුන්හ. ඒ රා සොඬහු දෙදෙන සුරාවට උවමනා සියළු සම්භාරයන් එක් කොට සුරාව ඉදි කළහ. එසඳ ඒ දෝෂ නොදන්නා නුවරවාසී සත්ත්වයෝ සුරා පානය කොට මත්ව කෘෂිවනිජජයාදී කර්මාන්තයෙහි ප්‍රමාද වූහ. ඒ කාරණය හේතු කොට ගෙන සත්ත්වයෝ දිළිඳු වූහ. නුවර සැපත් පිරිහීමෙන් තටු වූයේය. පෙර පරිද්දෙන්ම සුරා ඉදි කරන්නා වූ පුරුෂ තෙම බරණැස් නුවරින් නික්ම සාකෙත නුවරට පැමිණ ඒ නුවර දී රා ඉදි කොට සත්ත්වයන් පොවා ක්‍රමයෙන් ඒ නුවර ද නටනකල්හි ඉක්බිති සැවැත් නුවරට ගියාහ. එකල්හි සැවැත් නුවර සබ්බමිත්ත නම් රජෙක් විය. ඒ රජ්ජුරුවෝ ද ඕ හට සංග්‍රහ කොට තොපට රා ඉදි කරන්ට කුමක් වුවමනාදැයි විචාළ කල්හි සුරාවට නිසි නෙල්ලි අරළු ඇතුළු වූ සියළු උපකරණද සාල් පිටි ද පන්සියයක් පමණ මහසැලවල් ද වුවමනවැයි කීහ. ඔහුගේ සියළු උපකරණයන් රජ්ජුරුවෝ දෙවූහ. ඔහු පන්සියයක් පමණ සැලවලෙහි රා නගා සැලවල් රක්නා පිණිස එකී එකී සැලක් සමීපයෙහි එකී එකී බළලකු තියායෙන් බැන්දවූහ. සැලවලෙහි රා පැසී ඉතිර වැගිරෙන කල්හි සැලපිටින් වැගිරෙන රා පෙන බොමින් මත්ව මූර්ජාව හොත් බළලුන් කන් නාසා ද වාලදයද යනාදී වූ අවයව මීයෝ ලියා කෑහ. ඒ රා මඩලෙහි රැකවල් ගෙනසිටි පුරුෂයෝ බළල්ලු රා බී මළහයි රජ්ජුරුවන්ට දැන්වූහ. එබස් ඇසූ රජ්ජුරුවෝ මොහු දෙදෙන විෂ ඉදි කරන දෙන්නෙක් වනැයි කියා උන් දෙන්නාගේම ඉස් සිඳූහ. ඔහු දෙදෙනා රා දෙව අමා ගෙනවයි කිය කියා මළහ. රජ්ජුරුවෝ ඔවුන් මරවා අනතුරුව රා සැලවයි ගසා බිඳුවයි කියා නියෝග කළා. ඒ විධාන ඇසූ මිනිසුන් යන කළට රා මද සිඳුනු බළල්ලු උදානව කෙළිමින් සිටියාහ. නැවත ඔවුන් කෙළනා වූ දුටු පුරුෂයෝ අවුත් රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ එවේලෙහි සිතන්නා වූ ඒකාන්තයෙන් මේ විෂයෙක් වී නම් මේ බළල්ලු මිය යන්නාහුය. එක්තරා මඳුර පානයක් විය යුතු යයි ඒ නොදමා පානය කරම්හයි සනිටුහන් කොට නුවර සරහා රාජාංගනයෙහි මණ්ඩප කරවා එහි නඟන ලද දළපුඬු සේසතෙන් යුක්ත සිංහාසන මස්තකයේ හිඳ ඇමැති මඬුළු පිරිවරා උත්සවයෙන් සුරා පානය කරන්ට යයි පටන් ගත්හ. එකල්හි ශක්‍ර දේවේන්ද්‍ර තොමෝ මිනිස් ලොව කවර සත්ත්වයෙක් දෙමව්පියන් නැදිමයිලන් බැබුන් සිල්වත් ගුණවත් ආදීන්ට උපස්ථාන කෙරේද කවර සත්ත්වයෙක් ත්‍රිවිධ සුචරිතයෙහි යෙදී වෙසෙත්ද කවර සත්ත්වයෙක් දාන මාන ආදී සුචරිතයෙහි යෙදී වෙසේදෝහෝයි දහසක් නුවණැස් යොමා බලනුයේ ඒ සබ්බමිත්ත නම් රජහු සුරා පානය කරන්ට උන්නා දැක මේ රජහු බීමෙහි පුරුදුව ගියේ නම් ජම්බුද්වීපය හැම නස්නේය. එසේ හෙයින් මේ රජ සුරා පානයෙන් වළකමියි සිතා රායෙන් පිරුණු කළයක් අත්ලේ තබා ගෙන බ්‍රාහ්මණ වේෂයෙන් අවුදින් ආකාශයෙහි සිට මේ කළය මිලයට අරගනුවයි මෙපරිද්දෙන් අඬගා කීයේය. එවේලෙහි සබ්බමිත්ත නම රජ තෙමෙ ආකාශයෙහි සිට කියන සක්දෙව් රජහු දැක මේ බමුණු කොයි සිට කෙසේ ආවේ දැයි පිළිවිස්නා රජතෙම මෙලෙස කියන්නේය. බ්‍රාහ්මණයාණෙනි රාත්‍රියෙහි වූ දෙවෙනි පුන්සඳ මඬලක් මෙන් අහස බබළන්නේය. තොපගේ ශරීරයෙන් නික්මෙන රැස්කළඹ සියරැළි විදුලිය සොභාවක් මෙන් දිගුම් හොබනේය. එසේ හෙයින් තොපි තව්තිසා

SANHIDA LANKA

දිව්‍යලෝකයෙහි සිට ආ දිව්‍ය පුත්‍රයෙක් හිඳ නොවලහා කියව. තවද කිසි පිහිටක් නැති ආකාශයෙහි පවන් අනුව යන වලා කඩෙක දෙවියන් මෙන් සිටින්නෙහිය. සක්මන් කරන්නෙහිය. තොප විසින් මඬනා ලද ඍද්ධි තෙම හසරක් නැතිව අහසෙහි හැසිරෙන දෙවියන්ට සමකළ භූමියක් වැනි විය. නැවත ආකාශයෙහි පියවර දක්වමින් ඇවිද මේ සාලය විකුණ ගනුවයි කීහ. මෙලෙස කියන තෙපි කවර දිව්‍ය පුත්‍රයෙක් ද මේ කළයේ පිහිටියේ කෙසේ වූ දෙයක් දැයි විචාළේය. එකල්හි ශක්‍රදේවේන්ද්‍ර තොමෝ එසේ කළ අසවයි සුරායෙහි දෝෂ වූ සැටි මෙලෙස කියන්නේය. රජ්ජුරුවෙනි මේ කළය  තෙල් පිරුණයි කියා නොසිතව. නැවත තල තෙල් ආදිය මුත් පිරුණේ නොවේ. උත් පැනින් පිරුණේ නොවේ. මීයෙන් පිරුණේත් නොවේ. එසේ හෙයින් මේ යහපත් දෙයකැයි නොසිතව. මේ කළයෙහි පිරුණු සුරා ආදියද දෝෂ අසවයි කියා විස්තර වශයෙන් දෝෂ දක්වන්නා වූ ශක්‍ර දේවේන්ද්‍රකයා මතු කියන ක්‍රමයෙන් කියන්නේ රජ්ජුරුවෙනි යම් සේ සුරා පානයක් කොට සම භූමියෙහි හිත් පැකිල වැටෙන්නේ හිඳ නිරාලම්බන වූ ආකාශයෙහි එල්බෙන්නේය. ප්‍රපාතයෙහි ද මත්ව වැටෙන්නේ ගල් දැදුරෙහි ද කුණු මොලෙහි ද ගවර වලිහිද සූචි අසූචි නොදැන හෙන්නේය. නොකැයුත්ත කන්නේය. එසේද වූ දෙයින් පිරුණු මේ කළය විකුණාම් ගනුව. තවද යම් සේ සුරා පානයෙන් ද තමාගේ සිතට ඉසුරුණේය. සුරා කළ ආදිය අනුභව කොට ගොදුරු බිම බලා ඇවිදිනා ගොනකු මෙන් කිසිවක් වත් නොදැන බාන්ත්‍රව ඇවිදීද කිසි කෙනෙකුන් විසින් නොකියනු ලදුව ඔවුන් සමීපයෙහි වැද ගී කියන්නේය. යන්ත්‍ර රූපයක් මෙන් විලි නැතිව නටන්නේය. නැවත මේ සුරාව බී උමතු වූයේ අන් පිළිදමා නග්නයෙන් ගම්හිද රාජවීදියෙහි ද නැවුණ මනා වුන් මැදයෙහිද නුසුදුසු වදන් කියමින් ඇවිදිනේය. කිසිවෙක් මේ දෙයින් මූර්ජා වූයේ පනකද නැත්තක් වූ මෙන් බොහෝ වේලාවක් වැඳ හොත්තෝය. එසේ වූ සුරායෙන් පිරුණු මේ කළය විකුණාම් ගනුව. නැවත සුරාවක් යම්සේ අනුභව කොට පහළ ගුරෙහි වැටී පැහෙන්නේත් වේද නිදිමත් මූ තැන්හි කැනහිලුන් ආදීන් විසින් කනු ලබන්නේ වේද අකාරී කාරී මෙන් නොයෙක් වදබන්නධානියත් පැමිණෙන්නේය. අසූචි වැකුණු සිරුරු ඇත්තේ නැලිනගමින් කටින් පෙන දමා බොහෝ දුකට පැමිණෙන්නේ එසේ වූ සුරා පිරුණු කළය ඇරගනුවයි කීයේය. තවද රජ්ජුරුවෙනි මෙතෙම අධම වූයෙන් රා මදයෙන් මත් ව මම උත්තමයෙම් අහංකාරයට පැමිණෙන්නේය. ඇස් රත්ව කැළඹෙන්නේය. චතුස් සමුද්‍රය අවසන් කොට ඇති භූමි මණ්ඩලයෙහිනුත් මම පොහොසතිම්. මම්ව නායකයෙනි සිතන්නේ අධික වූ මානයෙන් කලහා වඩා කේළාම් ආදී වූ පිය ශූන්‍ය වූ බස් කියන්නේය. නපුරු වූ පැහැ ඇතිව නග්නය නොකරුණෙහි ඇත මෑත දිව විඩාවන්නේය. මෙබඳු ගුණ උපදවන සුරායෙන් පිරුණු මේ කළය විකුණාම් ගනුව. තවද යම් මේ සුරාවක් අනුභව කළ සත්ත්වයෝ තමන්ගේ කුලයන් නසා වස්ත්‍රාභරණ ධන ධාන්‍යාදී සම්පත්තියෙනුත් පිරිහී විනාශයට පැමිණෙත්ද යම් සේ සුරාවක් අනුභව කොට මත් වූයේ මෑණියන් පියාණන්ටත් අක්‍රොශ කෙරේද රාගයෙන් රත්ව නොලග විය යුතු නැදි බුහුන්ගේ හස්තග්‍රහණයෙන් කරන්නේය. තව ද යම් මේ සුරා පානයක් කළ ස්ත්‍රීහු තමන්ගේ ගෙයි දාසියෙකුත් මට ස්වාමීවයි කියා අල්ලන්නීය යම් මේ සුරාවක් අනුභව කොට මහත් වූ කුසල ධර්මයෙහි පිහිටි ශ්‍රමය බ්‍රාහ්මණයන්ටත් හිංසා පීඩා කෙරේද ඒ මුල් කොට නරකාදී සතර අපායට ගොස් බොහෝ දුක් විඳින්නේය. එසේ වූ සුරායෙන් පිරුණු මේ කළය විකුණාම් ගනුව සුරා මදයෙන් මත් වූ සත්ත්ව තෙම අනවරතයෙන් කයෙන් වචනයෙන් මනසින් පවුම කරන්නේය. එයින් නරකාදී දුක්‍යට කාරණා වූ පවු රැස් කරන්නේය. මෙසේ වූ සුරායෙන් පිරුණු කළය විකුණාම් ගනුව යම් සත්ත්වයෙකු බොහෝ මුතු මැණික් රන් රිදී ආදිය දෙම්හ. එක බොරුවක් කියා පියවයි කී කල්හි සක්විති රාජ්‍යයක් දෙකත් බොරු නොකියම්හ සාහසිකව බොරු නොකියාද එසේ වූ කෙනෙක් සුරාව වූ කල්හි බොරුම කියන්නාහ. නැවත තමාගේ කර්මාන්ත කරන යම් මෙහෙවරය විය යුක්තක් අකාරියවි නොමෙහිවරෙහි යෙදී මෙන් තමාගේ සියළු කාර්යය නසා ගන්නේය. තවද ලැජ්ජා හිරිඔතප් රක්නා සත්ත්වයෝ ද සුරාමදයෙන් මත්ව මුබාපන්න දෙයක් බෙනෙමින් ලජ්ජා හිරි දෙක නසන්නාහ. නැවත මේ සුරා පානයෙන් මත්ව චණ්ඩාලාදී නුසුදුස්සන් හා එක්ව කමින් බොමින් හුරු පැටවුන් මෙන් ඉස්පැන් නැති වස්තු පහෙනවන් දන්නාහ. මධුරානීය පානියෙක්හි රස නොලැබ ගෙඩලි ආදියෙහි දැමූ දඬු කොට්ට සේ වැද හෙව බොහෝ ආයාසයට පැමිණෙති. යම් මේ සුරාපානයෙන් මත්වූ සත්ත්ව දුන් කඳට ඇති ඒ කුලින් පාරලත් ගෙරින් මෙන් කිසිවක් නොකාම වැදහෙන්නා වූ එසේ වූ සුරා පිරුණු කළය විකුණාම් ගනුව. තවද ද සැබෑ රජ දරුවෝ රා බී මත්ව පොළු මුගුරු ඔවුනොවුන් පැමිණ ජම්බුද්වීපයෙන් තෙසැට දහසක් රාජධානියෙහි පැවති අනසකින් යුත් රාජශ්‍රීයෙන් පිරුණා වූද එසේ වූ සුරායෙන් මේ කළය පිරුණේය. තව්තිසා දිව්‍යලෝකයෙහි පළමු දෙවියෝ සුරාපානයෙන් මත්ව සමුද්‍ර මාධ්‍යයට දමන ලද්දාහු දිව ඉසුරෙන් පිරිහුණාහ. එසේ හෙයින් සුරායෙහි මෙබඳු දෝෂ දත් තොප වැනි නුවණැත්තෝ කෙසේ නම් වෙත්දැයි මෙහි ඇති සැටිය මා විසින් නොවලහාම කියන ලදැයි සක්දෙව් රජතුමා කීයේය. මෙපරිද්දෙන් සුරා පානයෙහි දෝෂ ඇසූ සබ්බමිත්ත නම් රජකෙනෙක් සන්තුෂ්ටව ශක්‍රයාට මෙලෙසින් කීයේ යි යම් සේ මෙලොව පරලොවින් මට හිතියට කාරණා වූ මෙතෙක් අවවාද කළාද එබැවින් මෑණි පියාණ කෙනෙකුන් මෙන් හිත කැමතිවීය. මෙසේ නුඹ වහන්සේගේ මෙකී වචන පරිද්දෙන් කෙරෙමි පිළිගෙන මේ ප්‍රිය තෙපුලට පඬුරකුත් දෙමි විධාන කරන්නාවූ වස්ත්‍රාභරණ ධන

SANHIDA LANKA

ධාන්‍යාදියෙන් සමුඞීව පිරුණු ගම්වර පසක් ද දෙමි, කෙල්ලන් කොල්ලන් දෙසියයක් ද ගෙරින් පන්සියයක් ද අජානීය සෛන්ධවයන් යෙදූ රථ දහසය යන මේ සියල්ලම අත්‍ථකාමී නුඹ වහන්සේට දෙමි, ඇරගත මැනවැයි කීයේය, එබස් අසා ශක්‍ර දේවේන්‍ද්‍රයෝ තමාගේ දිව්‍යාත්මභාවය මවා දක්වා තමන් වූ නියාව අඟවා ආකාශයෙහි සිට මට මෙකී ගම්වර සියල්ලම තොපටම වේවයි ඇත් අස් රථ සියල්ල ද තෙපිම පිළිගනුව, බල එකෙක් ඇත මා කී අවවාද ලෙසට සුරාපානය ඇර ධර්මයෙහි ඇලී රසමසවුලෙන් යුක්ත වූ ආහාරය අනුභව කොට කිරි තෙල් නොයෙක් පූජා පූපයෙහි පිනා කුසලයෙහිම යෙදෙවයි කියා තමන්ගේ දිව්‍යලෝකයට ගියාහ.

ඒ රජ්ජුරුවෝ ද සුරාපානය නොකොට රා සැලවල් බිඳුවා දන්දී සිල් රැක ඒ කුසළයෙන් ශවගීපදප්‍රාපතවූහු, එසේ වුවත් ක්‍රමයෙන් දඹදිව සුරා පානය බොහෝ බවට පැමිණියේය, බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්ම දේශනාව ගෙනහැර දකවා වදාරා පූර්‍වාපරසන්‍ධි ගලපා වදාල සේක. එකල්හ සබබමිත්‍ර නම් රජ ආනන්‍ද ස්ථවිරයෝය, ඕහට අවවාද දුන් ශක්‍ර දේවේන්ද්‍ර නම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# ජයද්දිස ජාතකය

බුදුරජාණන් වහන්සේ මව්පිය උවටැන් කළ භික්ෂුවක් අරභයා මේ ජාතකය වදාළ සේක.

නිධාන කථාවː- දායකයන් පූජා කළ අහාර පාන මව්පිය දෙදෙනාට දෙමින් පෝෂ්‍ය කරන භික්ෂුවක් දැක සෙසු භික්ෂුහු එම්බා මහණ, දායකයන් දුන් දෙය ගිහියන් පෝෂ්‍ය කිරීම නුසුදුසුයයි නිග්‍රහ කොට බුදුන් හමුවට කැටුව ගොස් එපවත් සැළකළහ. බුදුරජාණන් වහන්සේ මහණෙනි, මව් පිය උවටැන ඉතා උසස් ධර්මයෙක පෙර උතුමෝ රජ සිරි හැර ගොස් මව් පිය උවටැන් කළෝ වේදැයි ඉකුත්වන වදාළ සේක.

ආරාධනයː- භික්ෂුන් වහන්සේ

ජාතක කථාවː- යටගිය දවස කම්පිල්ල දේශයේ උත්තර පංචාල නුවර දස රාජ ධර්මයෙන් රාජ්‍යය කළ පංචාල නුවර දස රාජ ධර්මයෙන් රාජ්‍යය කළ පංචාල රජහුනේ අග මෙහෙසිය දරු කෙනෙකුන් වැදූහ. පෙර ජන්මයෙහි ඇගේ සැතිරිවූ එක් ස්ත්‍රියක් කෝපයෙන් තොප උපන් ජන්මයෙහි කොප වැදූ දරුවන් කන්ට සමත් වෙම්වයි පතා යකිනිව උපන්නීය. ඈ මේ ආත්මයෙහි වේලාවක් බලා සිට පැමිණ ලේ කැටි කුමරා උදුරාගෙන මැණියන් බලාසිටයදී ගිල දමා ගියාය. දෙවනි තුන්වෙනි වාරයෙහි මෙසේම සිදුවියැයි සතරවෙනි වාරයෙහි වැදූ දරුවන් පැහැරගත් කල්හි රාජ පුරුෂයෝ යකින්න ලුබඳවා ගෙන ගියහ. ඈට දරුවා කන්ට ඉඩක් නොලැබ දිය බැස යන සොරොව්වක සැඟවී සිටියාය. කුමාරයෝද මැණියෝය. යන සංඥාවෙන් ඇයගේ තණය කටින් ගත්තේය. එකෙනෙහි ඈ දර ආදරය උපදවා කිරි පොවා තමා වනස සොහොනෙහි ගල් ලෙනක තබා පොෂ්‍ය කරන්නීය මෙසේ ක්‍රමයෙන් වැඩුන කුමාරයා තමා මිනිස් බව නොදන්නේය. මිනී මස් කමින් යකින්න සමඟ ජීවත් වන්නේය. දිනක් මව් යකිනිය අන්තර්ධාන වීමට හැකි බෙහෙත් මුලක් මොහුට දුන්නීය. ඔහු ඒ බෙහෙත් මුලේ ආනුභාවයෙන් අනුන් ඇසට නොපෙනී ගොස් මිනී මස් කමින් ඇවිදින්නේය. යකින්න වෙසමුනි රජහට මෙහෙයට ගියේ එහිම කාලක්‍රියා කළාය.

එනුවර පංචාල රජ්ජුරුවන්ගේ බිසව සතරවෙනි වාරයෙහි තව දරු කෙනෙකුන් වැදූවා, මැණියන්ට සැතිරි වු යකින්න ජයගෙන උපන් හෙයින් ජයද්දිස කුමාරයෝ යන නමින් ප්‍රකට විය. ඔහු වැඩි විය පැමිණ ශිල්ප නිමවා රාජ්‍යයට පත්විය. ටික කලක් යාමෙන් එම රජ්ජුරුවන්ගේ බිසවද මහත් පින් ඇති කුමරෙක් ලැබුවාය. ඒ කුමරා අලීනසත්තු නම් විය ඔහු වැඩිවිය පැමිණ යුවරජු තනතුරට පැමිණියේය. ඒ දුටු මිනිස්සු භයට පත්ව රජුන් හමුවට පැමිණ දේවයන්වහන්ස එක් මිනිසෙකු මිනිසුන් මරා කා ඇවිදින්නේය. ප්‍රමාද වුව හෝත් නුවර තුළටද වදින්නේය. උපායකින් මොහු අල්ලවා ගත යුතුයයි දැන්වූහ. රජ්ජුරුවන්ගේ නියෝගයෙන් බල සෙනඟක් සොහොන වට කොට ගත්හ. යකින්ගේ පුත්‍රයාද මරණභයින් තැතිගෙන මුරගාමින් මනුෂයන් අතරට වේගයෙන් අවුත් වන්නේය. ඒ දුටු මිනිස්සු මේ මහා යක්ෂයෙකැයි කියා හිස් ලූ ලූ අත පැන ගියහ යකින්නගේ පුත්‍රයා එතැනින් දුවගොස් වලටවැද කිසි දිනක මනුෂ්‍ය පථයට නොපැමිණ මග යන එන මිනිස්සු අල්ලාගෙන මරා කමින් එක් නුග ගසක් මුල වාසය කළේය. දිනක් යක්ෂ තෙමේ මනුෂ්‍යයෙක් ලුහුබඳවා යන්නේ එක් පාදයක් නියුණු වූ හුලක් ඇනී වේදනාව උසුලාගෙන නොහී නුග රැක මුලටමගොස් වැද හොත්තේය. දින හතක් පසුවිය. මෙදින ජයද්දිස රජ්ජුරුවෝ මුව දඩයම සඳහා පිරිස් පිරිවරා නික්මුණෝ තක්සලා නුවර සිට නන්ද බමුනෙක් ධර්මය ප්‍රකාශිත ගාථා සතරක් ඉගෙන රජ්ජුරුවන් හමුවට පැමිණ ගාථා කියනු කැමතිබැව් දැන්වීය. රජ්ජුරුවෝ ඉක්මනින් එන බැව් පවසා මාලිගාවේ ඉන්නට සලස්වා වනයට ගොස් මුවන් වටකොට අඩන්නේ රජ්ජුරුවන් සමීපයෙන්ම එක් මුවෙක් වනයට පැන දිව්වේය. රජතුමා තමා කෙරෙහි එන අපවාදයෙන් මිදෙනු සඳහා මුවා ලුහුබඳවාගෙන වනයට ගොස් විඩා සංසිඳුවා ගනු සඳහා මනුෂ්‍ය යක්ෂයා උන් ගස මුදුනට පැමිණ එහි මදක් හිඳ යෑමට සතුටුවිය. එවිට යක්ෂයා රජ්ජුරුවන් අමතා එම්බල පුරුෂය මට තා ගොදුරු වූයේහිය මිනිසුන් අල්ලාගත නොහී නිරහාරව දින හතක් ගතකෙළෙමි. දැන් මට නිරායාසයෙන්ම ආහාර ළඟට ලදිමි තෙපි කොහි සිට ආයෙහිද ජාතිය කුමක් දැයි විචාළේය සබඳ යක්ෂය, මුව දඩයම සඳහා පිටත්ව විඩාව ගියෙන් මේ රැක් මුලට පැමිණි මම පංචාල දේශයට අධිපති ජයද්දිස නම් රජ වෙමි එබැවින් මේ මුව මස් ගෙන මාහැර පියව, රජ්ජුරුවෙනි තෙපි නුවණැත්තෙකි මේ මුව මස් මට දී තොප ගැලවීයන්නට උත්සාහ කරන්නෙහිද? එසේ නොසිතව දැන් දින දෙකකට ආහාර මට ලැබී ඇත. තොපව දැන් අනුභවකොට පසුව මුව මස් කන්නෙමි. මෙසේ මරණ භයින් දෙඩවීම තොප වැනි ශ්‍රේෂ්ඨ පුරුෂයන්ට යෝග්‍ය නොවේ. යක්ෂය, මම මුව දඩයමේ එන කලට ධර්මගාථා සතරකින් දහම් දෙසීමට පැමිණ නන්ද නම් බමුණාට මා ඉක්මණින් එන බැව් පවසා මාළිගාවේ නතරකරගෙන පැමිණියෙමි. එබැවින් එහි ගොස් ඒ පොරෝන්දුව ඉටුකොට ධර්ම ධානය ලබාගෙන තොපට ආහාර පිණිස එන්නෙමි. අවසර දෙව මට මරණ බියෙක් නැත මා ගැන සැක නොසිතව රජතුමනි, සත්‍ය බස රැක්ක යුතුය. ගොස්

SANHIDA LANKA

නොවරදිම එව. යක්ෂය අලුයම එන්නෙමි වේදැයි එතැනින් නික්ම කඳවුරු බැඳවුන් මහා සෙනඟ සොයා ගොස් ඔවුන් සමඟ මාළිගාවට පැමිණ බමුණා කැඳවා වඩා හිඳවා බණ අසා වස්තුව පූජා කොට ඔහු යවා පුතණුවන් කැඳවා අලීන සත්තු කුමාරයෙනි, අදම තොපට රාජ්‍යය භාරදෙමි දසරාජ ධර්මයෙන් රාජ්‍යය කරවයි කීයේය. පිය රජතුමනි, මේ නොසිතු අන්දමින් කුමක් කිරීමට සිතන සේක්ද ඔබ වහන්සේ හැර රාජ්‍යය කරනු නොකැමැත්තෙමි කීයේය. පුත්‍ර කුමාරයාණෙනි තොපගේ හෝ රට වැස්සන්ගේ වරදකට රට හැර නොයන්නෙමි ඊයේ යක්ෂයකුටවූ පොරොන්දුව ඉටු කරනු සඳහා යා යුතු හෙයින් මෙසේ කරමි. එබැවින් රාජ්‍යය කරව පිය රජතුමනි, මා වැනි පුතකු සිටියදී ඔබව යක්ෂයෙකුට බිලිදීම කෙතරම් නින්දිත දෙයක්ද? එබැවින් මම යන්නෙමි තොප රාජ්‍යය කරනු මැනවි. කුමාරයෙනි තොප කීවේ සත්පුරුෂ ධර්මයෙකි. එනමුත් තොප එහි යවා මට ජීවත් විය නොහැක. මම ම ගොස් යක්ෂයා අතින් මියයාම යහපති තොප මෙහි රැඳී සිටිනු මැනවි පියාණනි, එසේ නොකියනු මැනවි මාගේ ප්‍රාණය ඔබටදී ඔබගේ ප්‍රාණය මට ගනුදෙනු කරන හෙයින් ඔබ වහන්සේ එහි යතත් මරණයට පැමිණෙන්නේ මම ය. මේ කාරණයෙන් මා කෙරෙහි ස්නේහයක් ඇත්නනම් මෙහි රඳා මා පිටත් කරනු මැනවි පුත්‍ර කුමාරය, ඔබගේ බල මහිමය මම දනිමි. එබැවින් හොඳයි යව'යි අවසර දුන්නේය. කුමාරයන් දෙමාපියන් වැඳ අවසර ගෙන හැමට අවවාද දී පංචායුධ සන්නද්ධව රාජ්‍යය වාසීන් අඬ අඬා සිටියදී පිටත් වී ගොස් වවනය මධ්‍යයට පැමිණි යක්ෂයා වසන ස්ථානයට ලඟාවීය. යක්ෂයාටද ඒ වේලාවට වෘක්ෂය කට නැගී රජ්ජුරුවන් එන පෙර මග බල බලා උන්නේ පිය වලකා පුත්‍රයා එන හෙයින් මට භයෙක් නැතැයි කල්පනා කොට ගසෙන් බැස ඔහුට පිටිපාහුන්නේය. කුමාරයා යක්ෂයාගේ ඉදිරියට කිසිම භයක් නැතිව ගොස් සිටියේය. යක්ෂයා කුමාරයෙනි , රෞද්‍රවූ මිනීමස් කන මා වසන ස්ථානයට සැප කැමැත්තාහු කිසම පුද්ගලයෙක් නොඑන්නේය තෙපි නොදැන ආවයි සිතමි. තෙපි කවුරුද කොයි සිට ආයෙහිද? කුමාරයා මිනීමස් කන පෝරිසාදයෙනි, තෙපි මෙහි වසන භව දැනගෙනම පැමිණියෙමි. මාපියාණන්ගේ ජීවිතය වෙනුවෙන් කැපවීමට මා ආ බැවින් මා අනුභව කොට ඔහුව නිදහස් කරනු මැනවි කුමාරයෙනි රජ්ජුරුවන්ගේ පුතණුවන් බැව් නුවණින්ම දනිමි පියා වෙනුවෙන් ජීවිතය දීමට සිතීම මහත් බරපතල දෙයකි. නොසිතිය හැක්කකි. යක්ෂයා පියා වෙනුවෙන් හෝ මව වෙනුවෙන් ජීවිතය දන්දීම එතරම් පුදුමයක් නොවේ. මව් පියාණන්ට සැලකීමෙන් දෙලොවම සැප ලැබෙන්නේය. කුමාරයෙනි, නොභය සත්වයෙක් නම් මිහිපිට නැත තොපි කවර හෙයින් භය නැත්තේද? යක්ෂය, මම රහසින් වත් පවක් නොකෙළෙමි. එබැවින් පරලොව දුකට කාරණා නොදනිමි. යක්ෂයා මරණය ඒකාන්තයෙන්ම මෙලොව යම්සේ ජාති ජරා මරණදී වන්නේද පරලොවක් එසේම වන්නේය. එබැවින් මරණය අසවල් ජාතියකටයයි නියමයෙක් නැති හෙයින් මම මරණයට බිය නොවෙමි. මේ ශරීරය ගෙන තොපට කැමති දෙයක් කරගනු මැනවි. තොපට මරා ගත නොහැකි නම් මේ ගසින් පැන මැරෙමියි කීයේය. යක්ෂතෙමේ ඔහුගේ බස් අසා මම තෙමේ මහා පුරුෂයක මොහු කා දිරාලිය නොහැක්කේය. උපායකින් මොහු යැවිය යුතුයයි සිතා කුමාරයෙනි, ඇත ගොස් දර කඩා ගෙනවුත් ගිනි දල්වනු එකල්හි තොප මරා අඟුරු පිට පලහා කන්නෙමි වේ දැයි කීය. කුමාරයා යුහුව ගොස් දර ගෙනවුත් ගිනිකොට අඟුරු බස්වා යක්ෂයාට ගොස් කීයේය. ඔහු කුමාරයන්ගේ මුහුණ බලා මේ පුරුෂ සිංහයෙක මරණයෙහි භය නැත්තේය. මා මෙතෙක් කල් මෙවැනි අභිත පුරුෂයෙකු නුදුටුවෙමියි සතුටින් යුතුව කුමාරයා දිසාව බල බලා හුන්නේය. කුමාරයා නැවතත් යක්ෂයා අමතා යක්ෂය, බලා හිඳිනෙ මන්ද? මේ ශරීරය මස්කොට අභිප්‍රාය ලෙස අනුභව කරව කුමාරයෙනි, ගුණ ධර්මයෙහි පිහිටි ධෛර්‍ය සම්පන්න පුරුෂයෙක්හු මැරීනම් ඔහුගේ හිස සත් කඩකකට පැලී යන්නේය. එබැවින් තොපව මැරීමට බැරිය. එසේ නම් යක්ෂය, මා ලවා ගිනි මොළවා ගත්තේ මන්ද? කුමාරයෙනි, අවසරයක් ලැබ තොප පලා යෙදිදොහෝයි සිතාය කුමාරයෙනි, මම තොපගේ ජීවිතය විනාශ නොකරමි. යව ගොස් දෙමව්පියන් සතුටු කරවයි අවසර දුන්නේය. කුමාරයා ඔහුට ප්‍රාණඝාතයෙහි ආදීනව පෙන්වා අවවාද කොට පන්සිල් ගන්වා මදක් ඈත් වී සිට මේ යක්ෂයෙක්දෝහෝයි විමසනුයේ යක්ෂයාගේ ඇස් ඔලිඳ ඇට මෙන් රතුවන්නේය. ඇසිපිය නොමරන්නේය. ඡායාව නොපෙනෙන්නේය. කිසිවෙක්හි භය නැත්තාහ. මේ සලකුණ වලින් ඈත් වූ හෙයින් මොහු මේ යක්ෂයෙක් නොව මිනිසෙක්මයයි සිතා පරික්ෂා කරනුයේ අපගේ ප්‍රිය රජ්ජුරුවන්ගේ වැඩිමාලු සහෝදරියන් තුන්දෙනෙක්ව යකින්නකෑ විසින් ගෙන දෙන්නෙකු අනුභව කොට කෙනෙක් දරුවන්මෙන් වඩන මාපියාණන් වහන්සේ කියා රාජ්‍යයෙහි පිහිටුවීමයි අදහස් කර හවත් තෙපි යක්ෂයෙකැයි නොසිතව මාපියාණන්ගේ වැඩිමහලු බෑයෝය. එබැවින් මා හා සමඟ වැඩිය මැනව. කුසතු රාජ්‍යයෙහි අභිෂේක කොට සැපවත් වුව මැනවි. කුමාරයෙනි, ෆෝපි කියන්නේ කුමක්ද යක්ෂයකු වුවත් නොවුවත් තොපගේ බස් නොඅදහමි. එසේනම් පින්වත අසවල් තැන දිවැස් ඇති තාපස කෙනෙක් වෙසෙති එතනට යම්හයි යක්ෂයා කැඳවාගෙන ගියේය. එකෙනෙහි තාපසයෝ ද මොවුන් දෙන්නා දුර එන්නා දැක පියාණන් හි පුතණුවන් මේ වනයෙහි කුමක් සඳහා ඇවිදිනා තියාදැයි කියන බසින්ම නැදෑබව හැඟුනේය. එකනෙහි පෝරිසාදයා එබස් අසා දරුවෙනි, තෙපි නුවරටම යව මම එක ආත්මයෙහිම

SANHIDA LANKA

දෙවදෑරුම්ව උපනිමි. මට රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත. පැවිදි වෙමියි තාපසයන් සමීපයෙහි පැවිදිවිය කුමාරයා ඔහු වැඳ සමුගෙන නුවරට ආයේය. එකල්හි නුවර වැස්සෝ අභය ලබාගෙන එන කුමාරයා දැක දොහොත් මුදුන්දී වඳිමින් සිව්දිගින් රැස්වූහ. පිය රජ තෙම ඉතා සතුටට පත්ව පෝරිසාදයා අතින් ගැලවූ නියාව අසන්නේ තමාගේ වැඩිමහලු බෑයන් බව පුත්‍ර කුමාරයාගෙන් දැනගෙන මහා පිරිස් පිරිවරා දිවැස් ඇති මහානුභාව තාපසයන් ලඟට වැඳ බෑයන්ගේ සියළු ප්‍රවෘත්තිය අසා රාජ්‍යය භාරගන්නා ලෙස ඇයදීය. එයට නොසතුටු තාපසයන් වහන්සේ තමගේ උයනට කැටුව ගොස් එහි පන්සලක් කරවා සිව්පසයෙන් උවටැන් කිරීමට සළස්වා ඔහු විසූ වනය මහ ගමක් කොට වැවක් බඳවා තාපසවරුන්ගේ විහරණයට සැළැස්වූහ. එසමයෙහි මව්පිය දෙදෙනා නම් සුද්ධෝදන මහාමයා දෙදෙනාය. දිවැස් ඇති තාපසයෝ නම් සැරියුත් තෙරුන්ය. පෝරිසාදයා නම් අංගුලිමාල ස්ථවිරයෝය. අගමෙහෙසිය නම් රාහුල මාතාවය. අලීන සත්තු කුමාරයෝ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# ඡද්දන්ත ජාතකය

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්. ලදැරි මෙහෙණින්නක් අරභයා මේ ජාතකය වදාළසේක.

නිධාන කථාව

සැවැත් නුවර එක් කුල දුවක් පැවිදිව සෙසු මෙහෙනින් නත් සමග බණ අසනු පණි ගොසින් දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් යුත් බුදුන්ගේ ශරීරය දැක සසර ඇවිදින්නාවූ මාමේ උත්තමයාට කවර ආත්මයක හෝ භාර්‍යාව වූයේ දෝහෝයි බලන්නී. එවිටම ජාතිස්මරණ ඥාණය පහළ වී ඡද්දන්ත හසතිරාජව උපන් කාලයෙහි බිරින්දවූ බව දැක ඉතා ප්‍රීතියට පත්ව නැවත තම ස්වාමියාට තමා හිතවත්ව සළකා ඇද්දැයි සිහිපත් කරන්නී. යම්තම් දෝෂයක් සිත්හි තබා ඇත් රජ්ජුරුවන්ට සෝනුත්තර නම් වැද්දා ලවා විෂ පෙවූ හීයකින් විදුවා ජීවිත විනාශයට පත් කළා දැක ශෝකය දරා ගත නොහී මහා හඬින් හඬන්ට පටන් ගත්තාය. එවිට බුදුරජාණන් වහන්සේ සිනහවක් පහළ කොට සිනාසීමට කරුණු කිම්දැයි භික්ෂූන් වහන්සේ විචාරණ සේක්. මහණෙනි මේ බාල මෙහෙණී තොම එක් ජන්මයෙක්හි මට කළ තදකමක් සිතා හඬන්නීයයි වදාරා ඉකුත් වත වදාළ සේක.

ආරාධනය :- භික්ෂූන් වහන්සේ

ජාතක කථාව

යටගිය දවස හිමාල පර්වතය සමීපයෙහි ඡද්දන්ත කුලයෙහි උපන් ඍද්ධිමත් වූ ආකාශයෙන් ඇවිදින සැටදහසක් පමණ වූ මහත් ඇත් රැලෙක් විසූහ. එහි යූථපති නම් ඇත් රජුට රිදී පර්වතයක් මෙන් බබලන අට අසූරියන් පමණ උස ඇති එක්සිය විසි රියනක් පමණ දිග ඇති අට පණස් රියන් දිග ඇති සොඬින් යුත් පුතෙක් ඇත. දළ වනාහි පහළොස් රියන් වටය තිස් රියන් දිගය සවණක් රැස් විහිදෙන්නේය. අටදහසකට තෙමේද නායකය ඔවුන් පිරිවරා ගොස් පසේ බුදුන්ට උවටැන් කරන්නේය. මේ ඇත් රජුට චුල්ල සුභද්‍රාය මහ සුභද්‍රායයි ඇතින්නියෝ දෙදෙනෙක් අගමෙහෙසුන් වූහ. ඒ වනයෙහි පනස් රියන් වූ ඡද්දන්ත නම් විලෙක් ඇත. ජලය ඉඳුනිල් මිණි කැට සේ පැහැපත්ය. පස් පියුමෙන් ගැවසී ගත්තේය. ඒ විල වට කොට පර්වත සතක් ඇත. විලට ඊසාන කොනෙහි පස් යොදුන් පමණ වු කඳ ඇති නුග ගසෙක් පිහිටියේය. විලට බස්නාහිර දෙසින් වර්ෂා කාලයෙහි වාසය කිරීමට රන් ගල්ගුහා ඇත. ග්‍රීෂ්ම කාලයෙහි නුග රුක මුල කල් යවන්නාහ. වන සිරිවිඳිනා ඇත් රජුට සල් වනය මල් පිපී සිටින්නේය. දිනක් ඇත් රජ බිසවුන් පිරිවරා සල් වනයට කෙළිනු පිණිස ගොස් මල් පිපි සල් රුකක් දැක දලින් පහළේ නම් තැලෙයි සිතා කුම්භසථලයෙන් පහළේය. එවිට යටි සුළං හමන අත සිටි චූලසුභද්‍රානම් ඇතිනිය ඇඟ කොළ ඉපල් දිමි කැදලි ආදිය ද උඩු සුළං හමන අත සිටි මහා සුභද්‍රාවන් ඇඟ මල් රොන් සමඟ පෙති ද වැටුනේය. චූල සුභද්‍රාවන් නිකරුණේ මේ කරුණෙන් ඇත් රජු කෙරෙහි වෛර බැන්දාය.

නැවත දවසක් ඇත් රජ්ජුරුවෝ නහනු පිණිස පිරිවර සමඟ ගොස් ඡද්දන්ත විලට බැස නගා ගොඩ නැගී කල්හි අටදහසක් පමණ මතැත්හු ඒ විලින් නොයෙක් වර්ණයෙන් යුත් මල් ගෙනවිත් රිදී දාගබක් සරහණ පරිද්දෙන් ඇත් රජ්ජුරුවන්ට සරහා ඉක්බිති ඇතින්නන් දෙන්නා සැරසූහ. එවිගස දියකෙළ ඇවිදිනා එක් ඇතෙක් සත්බුමු මහ පියුමක් ඇත් රජ්ජුරුවන්ට පිළිගැන්විය. ඇත් රජ්ජුරුවෝ එය දමා අසලින් සිටි මහා සුභද්‍රාවන්ට දුන්නේය. මෙය දුටු චූල සුභද්‍රාව මා බල බලා සිටියදී තමන්ගේ ප්‍රිය භාර්‍යාවට ඒ පියුම දුන්නේයයි ඇත් රජ්ජුරුවන් කෙරෙහි නැවතත් වෛර වූවාය. නැවත දිනක් මිහිරි පලාඵල හා නෙලුඹු දැලි පොකුරු මී හා එක්ව යොදා පන්සියයක් පසේ බුදුවරයන් වහන්සේලා වළඳවන ඇත් රජ්ජුරුවන්ව දුටු චූල සුභද්‍රාවොත් තමන් ලද මිහිරි පලාඵලාදිය පසේ බුදුවරයන් වහන්සේලාට දන්දී මම මෙම ආත්ම භාවයෙන් චුතව ගොස් මඬරාජ කුලයෙහි ඉපිද සුභද්‍රා රාජ කන්‍යාව වැඩිවිය පැමිණ බරණැස් රජහට අග මෙහෙසියව ඔහුට කියා එක් වැදි පුත්‍රයෙකු මෙහි වීමත් පෙදෙසට යවා මේ ඇත් රජහු විෂපෙවූ සැරයකින් විද ජීවිත විනාශයට පමුණුවා සවණක් රැස් විහිදුනා වූ දළසඟල ගෙන්වාගන්ට සමත් වෙම්ව" ය කියා ප්‍රාර්ථනා කළාය.

SANHIDA LANKA

එතැන් පටන් ගොදුරු නොකා ඊර්ෂ්‍යාවෙන් වියලී නොබෝ කලකින් කාලකියා කොට මධුරජ බිසව කුස පිළිසිඳ ගත්හ. දසසේ ඇවෑමෙන් උපන්නා වූ කුමාරියට සුභද්‍රායයි කියා නම් කොට වැඩිවිය පැමිණි පසු බරණැස් රජහට පාවා දුන්හ. ඕතොම රජහට ප්‍රියව මනවඩන්නී සොළොස් දහසක් පුරඟනන්ට ප්‍රධානව ජාති සමරණ ඥානය ලදින් වාසය කරන්නී. දිනක් සිතන්නී මාගේ පැතුම් සමුර්ධිවිය. දැන් ඒ ඇත්රජු විඳ දළ සඟල ගෙන්වා ගනිමියි සිතා බොරු ලෙඩ පෙන්වා ශරීරයෙහි තෙල් ගල්වා ගෙන කිලිටි වස්ත්‍රයක් ඇඳ ගෙන

ඔබලන් වේසයක් දන්වා යහන් මතුයෙහි වැද හොත්තීය. එකෙනෙහි එහි පැමිණි රජතෙම සුභද්‍රා නොදැක විචාරා ලෙඩයයි අසා ශ්‍රී යහන් ගබඩාවට වැද යහනෙහි හිඳ අෑ අමතා පිට පිරිමදිමින් අපහසුව කිමෙක් දැයි විචාළේය.

ස්වාමීනී මහත් දොළෙක් උපන්නේය. එය ලබාගත නොහැක්කකි. එනමුත් එය නොලද්දේ වී නම් ජීවිතය නොතිබෙන්නේය.

මා ප්‍රිය  බිසවුනි මේ මිනිස් ලොව යම් සැපතෙක් ඇත්නම් එය මා සතුය. එය ඔබට ලබා දෙමි. ශෝක නොකරව.

ප්‍රිය රජතුමනි මට උපන්නේ ලබාගත නොහැකි දොළකි. දැන් නොකියමි. ඔබේ විජිතයෙහි යම් පමණ වැද්දන් ඇද්ද ඔවුන් හැම රැස්කළ මැනව. එහිදී දොළ ඔබවහන්සේට කියමි.

එසඳ රජතෙම ඇමතියන්ට විධාන කොට තුන් සියයක් පමණ යොදුන් කසී රට අණබෙර යවා වැදි පුත්‍රයෝ සැට දහසක් පමණ රැස් කොට බිසවට දැන්වීය. බිසව රජ්ජුරුවන් සමීපයට වැදි පුත්‍රයන් ගෙන්වා වැදි පුත්‍රයෙනි සවණක් රැස් විහිදුවනා ලද දළ සඟලක් ඇති ඇත් රජෙක් සීනෙන් දුටිමි. ඔහුගේ දළලදින් නම් ජීවත් වෙමි. නොලදින්නම් මාගේ ජීවිතය නොතිබෙන්නේ යයි කීවාය. එබස් ඇසූ වැදි පුත්‍රයෝ කියන්නාහු දේවීන් වහන්ස ඔබවහන්සේ එවැනි ඇත් රජෙක් දක්නා ලදද එවැනි ඇතෙක් අපේ  මුතුන් මිත්තන් විසිනුත් දුටුවයි ඇසුවේ නැත. එබැවින් ඔබ වහන්සේ දුටු සැටි පහදා දුනමැනව සතරදිග, සතර අනුදිග, උඩ, යට යයි යන දස දිසාවෙන් කවරදෙසක ඇත්දැයි වදාළ මැනවයි කීහ. එවිට සුභද්‍රා තොමෝ රැස් වූ වැදි සමූහය දෙස බලා ඔවුන් අතුරෙන් පළල් වූ පතුල් ඇති මහත් වූ සොඬ හා දන මඬුලු ඇති කොරසැටිවූ මහත් ශරීරයක් ඇති දඹවන් දැලි රැවුල් ඇති පිඟුවන්  ඇස් ඇති අවලක්‍ෂණ ස්වරූප ඇති පිළිකුල් වූ වෙස් ඇති සියළු වැද්දන්ට වඩා උස්ව පෙනෙන මහා බෝසතුන්ට ජන්මාන්තරයෙහි වෛරීවූ සොනුත්තර නම් වැදි පුත්‍රයා දැක මේ කටයුත්තට මොහු සුදුසු යයි රජ්ජුරුවන්ට දන්වා ඔහු කැඳවා ගෙන සත්මහල් ප්‍රාසාදයෙහි මත මාලයට නැගී උතුරු දිග සිව්මැදුරු කව්ළුව හැර හිමවතට අත දිගුකර ඒ ඇත් රජු වසන තැන් දක්වමින් වැදි පුත්‍රය මෙතැන් සිට උතුරු දිගට බොහෝ තැන් ගිය කළ චුල්ල කාලය, මහාකාලය යනාදී පර්වත හමුවෙයි. ඒ ඉක්ම ගිය කල්හි ස්වර්ණ පර්වතයෙක් ඇත. ඒ පර්වත මුදුන ගායනා කොට කෙළනා කිඳුරාංගනාවන්ගෙන් හා රන් මොණරුන්ගෙන් සැරහුනේය. මෙලෙස දිව්‍ය ක්‍රීඩා භවනයක් සමානවූ සත් යොදුන් උස ඇත් පර්වත මුදුනට නැගී එහි ප්‍රාන්තය බලව. එවිට තොපට ඡද්දන්ත විලද ඒ වටා සිව් හෙල් මැලි ඇඹුල උපුල රත් පියුම් හෙල පියුම් වනයෙන් සැදූ මලස්නක් මෙන් පෙනෙයි. ඒ විලට ඊසාන කොනෙහි නිල් පාටින් දිලිසෙන අටදාසක් අරලූ ඇති නුග ගසෙක් පෙනෙයි. ඒ රැක් මුල්හි රිදී පර්වතයක් මෙන් සවනක් රැස් විහිදෙනා දළසඟලක් ඇති ප්‍රතිහස්තීන් විසින් මැඩලිය නොහැකි ඡද්දන්ත නම් හස්තිරාජ තෙම ග්‍රීෂ්ම සමයෙහි සිසිල් පවන් විඳිමින් සිටින්නේය. ඒ වට අටදහසක් පමණ ඇත්හු රැකවල් ගෙන සිටිනාහ. කිසියම් ශබ්දයක් ආ පමණින් මහත් කොට නාසා වාතයන්  හරිමින් බිම අත් පැහැර ගුගුරමින් වනය එකනින් නාද කොට සොයන්නාහ. මිනිස් කෙනෙක් හමුවූ නම් සුණු විසුණු කොට ධූලි පමණකුත් නොතිබෙන්නාහයි කියා එබස් ඇසූ සොනුත්තර නම් වැදිතෙම මරණ භයින් තැතිගෙන දේවීන් වහන්ස රාජ කුලයෙහි මහත් වටිනා රන් මුතු මැණික් තිබියදී මේ දළකඩ කුමණ ප්‍රයෝජනයකට දැයි විචාළේය. එවිට බිසව කියන්නී වැදි පුත්‍රයාණෙනි මම මීට පළමුවන ජාතියෙහි මේ ඇත් රජුට අග මෙහෙසුන්ව මා බලා සිටියදීම අනික් අගමෙහෙසියට කළ සැළකුම් දැක ඊර්ෂ්‍යාවෙන් මඩනා ලද සිතින් දුකට පත්වී මෙසේ ඉපද වියලෙමින් සිටිමි. මා සිතූ අභිප්‍රාය සාදා දුනහොත් තොපට ධනධාන්‍යයෙන් සමුඪවූ ගම්වර පසක් දෙමි. තවද වැදි පුත්‍රය මේ දළ ලබා ගන්ට හැකිවේවා'යි කියා පසේ බුදුවරයන් වහන්සේට දන් දී කළ ප්‍රාර්ථනාවක් ද ඇත. මෙය මා සීනෙන් දුටුවක් නොවේ. එවැනි දොළක් ද නැත්තේය. එතකුදු වුවත් පැතූ ප්‍රාර්ථනාව එසේම සිඬ වන්නේය. එබැවින් තොපට ගැහැටක් නොවේ. බියට පත් නොවවයි. අස් වැසුවාය. එවිට වැදිපුත් රජ බිසව අමතා එකී බස් මුදුනින් පිළිගෙන ඇත් රජු යන එන තැන් මඟ සළකුණු නැවතත් විමසා දැන විලෙන් නා නුගරුක් මුල සැතපෙන වේලාව අසා යහපත ඒ ඇතා මරා දළ ගෙනෙමියි ගිවිස්සේය. ඉක්බිති ඕහට දහසින් බැඳි පියල්ලක් තුටු පඬුරු කොට දී මෙයින් සත්වන දවස පිටත් වන්නටයයි නියම කොට එතැන් පටන් අවශ්‍ය මාර්ගෝපකරන සූදානම් කොට සම් පසුම්බියකට පුරවා වැදි පුත්‍රයාට දී යාමට සමුදුන්නාය. වැදිපුත්‍රයා රජ්ජුරුවන් වැඳ අවසර ගෙන පිරිවර සමඟ මහ වනය දක්වා රථයෙන් ගොස් ඉන් බැස හුදකලාව යන්නේ තිස් යොදුනක් පමණ ඉලුක් වනය වී ව ලුක් වනය තන වනය, බට වනය, කිහිරි වනය යනාදී කටු ලැහැබින් යුක්ත වූ වන සයක් ද, කටු වනය, මහ මිශ්‍ර වනය, බට වනය, සිත් බට වනය යනාදී මහත් කටුක වන ගහන යන්ද මඩ කලල්ද, ජල දුර්ගයන්ද පර්වත ගහණයන් දැයි අටලොස් ගහණයෙන් පසුකොට ඉතා දුකසේ මග

SANHIDA LANKA

කතර ගෙවා යොතත් උඩ රඳවා එහි එල්ලී කදුසිබර නගිමින් ඉතා දුකසේ බැස මෙසේ වනගහන සතලොසක් ද පර්වත වලළු සතද නැගී ස්වර්ණ පර්වතය මුදුනට නැගී බිසව කී ලකුණු අනුව නුගරුක් මුල අටදහසක් ඇතුන් පිරිවරා සිටි ඡද්දන්ත නම් ඇත් රජු දැක පර්වත වලල්ලෙන් ඇතුළට බටුයේය. සත් අවුරුදු සත්මස් සත් දවසකින් මෙසේ ඡද්දන්ත විල සමීපයට ගොස් ඇත් රජු වසන එක් පෙදෙසක් නියම දැන මෙතන උගුල් අටවමියි නියම කොට වනයට වැඳ අවශ්‍ය ලී දඬු සපයා ඇතුන් දිය කෙළියට ගිය කල්හි එතැන වලක් සාරා ඒ පස් දියෙහි පාකර හැර වල තුළ කණු සිටුවා පෝරු අතුරුවා මැදින් හීයක් යැවීමට සිදුරක් තබා පස් අතුරා පෝරු මත්තෙහි වසා තමාට යා හැකි මගක් ඉවතින් තබා අළුයම් ඉස ජටා බැඳ කසාකඩක් පෙරව විෂ පෙවූ ඊය හා දැඩි දුන්නත් ගෙන වලට බැස සිටියේය. ඇත්රජ තෙමේ දෙවෙනි දවස් පිරිවර සමඟ ගොස් දිය නා තමා සැතපී සිටිනා මහසල් මලුයෙහි වැදි පුත්‍රයා මෙහෙය වූ පෝරුව මත්තෙහි සිටියාහ. ඇත්රජහු ඇඟෙන් වැහෙන දියබින්දු නැබ පෙදෙසින් එක්ව පෝරු මැද සිදුරෙන් වැදී පුත්‍රයාගේ ඇඟෙහි වැටුනේය. වැදි ඒ සළකුනෙන් සිටි තැන දැන මහ සැරයකින් විද්දේය. ඒ ඊ පහර ඇත් රජ්ජුරුවන්ගේ පපු කැන් අකුනු බහන් සිඳ නාභියට පොරවකින් ගැසූ කලක් මෙන් අහසට නැංගේය. ලේ වගුරුනේය. වේදනාව ඉවසා ගත නොහී තුන්යලක් කුඤ්චනාද කෙළේය. එකෙනෙහි අටදහසක් පමණ මතැත්හු එකවිට ගුගුරා පැන නැංගාහ. අට දිසාවම සුණු විසුණු කරමින් පස මිතුරා අල්වම්හයි බලන්ට වූහ. ඇත් සමූහයා ඒ ඒ දිග විසුරුන බව දැන සුභද්‍රා නම් අග මෙහෙසිය ඇඟ මදක් ඇලවී සිට වේදනා ඉවසාගත නොහී ඊ පහර ආ තැන් විමසනුයේ ඉදිරියේ ආයේ නම් කුම්භස්ථලය බිඳගෙන පිටුපසින් නික්මෙයි. ඇලයකින් ද නොආයේය. මෙය පෙකණියම විදගෙන අහසට නැංගේය. එසේ හෙයින් මෙය පොළොවෙන් නැගිය යුතුය. එය පරීක්ෂා කරමියි සිතා ඊට පෙර තම සතුරා කෙරෙහි කරුණාවෙන් තම සුභද්‍රාව එතනින් පහ කරනු කැමතිව සොඳුර අට දහසක් පමණ ඇත්තු මාගේ පසමිතුරා අල්වම්හයි අටදික්හි දිවපුවාහ. තොපි මෙතන කුමක් කරව්දැයි කීයේය. ස්වාමීනී නුඹ වහන්සේ දරා ඉවසා සිටියෙමි. ඊට ක්ෂමාකළ මැනවයි ඇත් රජුන් තුන්යලක් පැදකුණු කොට ගියාය. ඇත්රජ තෙමේ එවිට පයින් භූමිය සාරා බැලීය. එකෙනෙහි පෝරු ඉගුළුනේය. එසඳ රිදී දමක් සේ ධවල වූ සොඬ දිගු කොට වලතුළ විමසා බලන්නේ වැදි පුත්‍රය වහා තමා හැඳි කාෂාය වස්ත්‍රය ගලවා සොඬෙහි තැබීය. ඇත්රජු එය ගෙන බලා සිතනුයේ අර්හත් ධව ජ ය කා විසිනුත් පූජා කටයුතුය. එබැවින් මොහු නොමැරිය යුතු යයි සිතා වලෙන් ගොඩ ගෙන තමා ඉදිරියෙහි තබා එම්බල වැඳි පුත්‍රය රාගාදී කසටින් පිරුනු ඉඳුරන් නොදැමූ යමෙක් කාෂාය වස්ත්‍රය දරා නම් වඳුරෙක් පෙරෙව් සිංහ සමක් මෙන් ඊට යෝග්‍ය නොවන්නේය. උතුම් පුද්ගලයන්ට පමණක්ම මේ ධව ජය වටනේය. නමුත් තොපව මම නොමරමි. කීමෙක් ද තොපටම ප්‍රයෝජනයක් නිසා මා විද්දාහුද අනික් කෙනෙකුන් විසින් මෙහෙයන ලද්දේ දැයි විචාළේය. එකෙනෙහි වැදි පුත්‍ර තෙම කියනුයේ ඇසුව මැනව. ඇත් රජ්ජුරුවන් වහන්ස කසී රජ්ජුරුවන්ගේ සුභද්‍රා නම් අග මෙහෙසුන් බිසවක් ඇත. ඕතොමෝ සිහිනෙන් තොප දැක සවනක් රැස් විදිදෙනා මේ දළ දෙකින් පළඳනාවක් කරනු කැමැත්තෙමියි දොළක් ඉපදී රජ්ජුරුවන් වහන්සේට දන්වා මං සළකුණු කියා මා පිටත් කර එවූහ. එබැවින් විද්දෙමියි කීය.

එබස් ඇසූ ඇත රජ තෙම ඒකාන්තයෙන් මේ චූලසුභද්‍රාවන්ගෙ මෙහෙවරක් නියාවේදැයි ඈට මාගේ දළින් ප්‍රයෝජන නැත. මා මැරවීමට යෙදූ උපායෙක මා කළ සුළු වැරැද්දක් සිත්හි තබා තමා බැඳි වෛරයම ඉටු කර ගැනීමට මෙරෞද්‍ර ක්‍රියාව කළාය. එබැවින් මා මිය යෑමට පෙර වහා දළ කපා ගනුවයි කීයේය. එබස් ඇසූ වැදි පුත්‍ර තෙම උන්තැනින් නැගී සිට කියන ගෙන ඇත් රජුන් සමීපයට ගියේ. එතෙම අසූරියනක් පමණ අස ඇත්තේය. එසේ හෙයින් දළ තිබූ තැනට අත දිගු කරන්ට නොහැක්කේය. එබැවින් ඇත් රජු ශරීරය නමා ඉස මිටි කොට වැදහොත්තේය. වැදි පුත්‍ර තෙම රිදී දමක් සමාන සොඬ වනමින් කෙලාසකූටයක් බඳු කුම්භසථතලය පිට සිට කපොලයෙහි මාංශය දනින් ඇන ඇතුළට කොට ඇතුළු මුඛයට ඔබා ලේ වගුරුව වගුරවා කපන්නට වන්නේය. ඇත් රජුට බොහෝ වේදනා උපන්නේය. වැදි පුත්‍රයාට එය කපා ගත නොහැකිව ලතවන්නට වන්නේ ඇත් රජතෙම කීමෙක්ද සබඳ කපාගත නොහැකිදැයි? අසා සොඬින් කියත ගෙන කිලිල් කඩක් මෙන් දෙදළ කපා සොඬින් අල්වාගෙන සබඳ වැදි පුත්‍රය "මේ දළ තොපට දෙන්නෙම් මට අප්‍රිය නිසා නොවෙමි. ශක්‍ර සම්පත් - බ්‍රහ්ම සම්පත් පතාත් නොවෙමි, සර්‍වඥතාඥානය නමැති දන්තයෝ පතාමය. එබැවින් මේ දානය බුදුබවට කාරණා වේවා"යි දළ දෙක ඔහු අත තබා තොපට මෙහි ඒමට සත්වස් -සත්මස්- සත්දිනක් ගියමුත් මේ දෙදළෙහි ආනුභාවයෙන් සත් දවසකින් බරණැස් නුවරට යා හැකැයි සත්‍යක්‍රියා කොට දී පිටත් කෙළේය. ඔහු ගිය ඉක්බිති ඇත් රජ්ජුරුවෝ කාලක්‍රියා කළහ.

SANHIDA LANKA

එසඳ පස සතුරා සොයා ඇවිදි ඇත් සමූහයා එහි අවුත් ඇත් රජු මිය වැදහොත් මහවිසල් මළුවට පැමිණ අඬා

වැලපෙන ඇත් රජු උවටැන් කළ පසේ බුදුවරයන් පන්සියයක් වැඩමවා ඇත් රජුගේ ශරීරය ඔසවා පසේ බුදුවරයන් වඳවා දරසෑයට වැඩූහ. පසේ බුදුහුද තුන්යම් රාත්‍රී මුළුල්ලෙහි එහි වැඩ හිඳ පිරිත් දෙසූ සේක.

සොනුත්තර නම් වැදි පුත්‍රයාද අසිරිමත් දළ දෙකේ රන්වන් රැසින් හාත්පස බබුළුවමින් දින හතක් ඇතුළත බරණැස් නුවරට ලංව රජ බිසවට පණිවුඩ යවා පෙළහරින් මාළිගාවට ගොස් දළ දෙක බිසවුන්ට දී කියනුයේ බිසවුන් වහන්ස ඔබ වහන්සේගේ පූර්ව ජාතියෙහි ස්වාමී වූ ඇත් රජ්ජුරුවන් කළ මනා වරදක් සිත දරා වෛර බැඳ මරන්ට සිතූ පරිද්දෙන් මළ නියාව අත මැනව. මේ ඔහුගේ දළ වේදැයි කීයේය. බිසව රශ්මියෙන් බබලන ඒ දළ තම කළවා මත්තෙහි තබා ගෙන පෙර මාගේ ස්වාමියා සුළු වරදකින් මරා දැමීමට තරම් නපුරු වූ මා කෙළේ වරදෙකැයි ගුණ සිහිකරත්, සිහිකරත්, ශෝකාග්නියෙන් දිලිහුනේය. එයින් හෘදය වස්තුව තැවී එදවස් කාලක්‍රියා කළාය.

එබව දත් බුදුරජාණන් වහන්සේ පිරිස මැද වැඩහිඳ සිනහ පහළ කළසේක. මේ බාල මෙහෙණිය එක් ජන්මයෙක්හි මට පාද පරිචාරිකාව උපන්නී සෙනේහ සන්තෝෂයෙන් සිනාසී තම කළ තද කමක් දැක හඬාපුව. මේ කාරණය දැක සිනහ පහළ කෙළමියි කියා මේ ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි සොනුත්තර වැදි පුත්‍රයා නම් දැන් දෙව්දත් තෙරුන්ය. දළ ගෙන්වූ සුභද්‍රා බිසව නම් මේ මෙහෙණින් ඇත්රජු වූයේ බුදුරජාණනන් වහනසේය.

SANHIDA LANKA

## සම්භව ජාතකය

තවද එක් සමයෙක්හි වෘනද්‍රාරකවෘන්ද වන්දනීය වරණාරවින්ද ඇති සුඬාචාර සුඬානතඃ කරණ සුඬොදන නන්දන ශ්‍රී සමනතභද්‍ර අප බුදුරජාණන් වහන්සේ විවිධ ගුණ ගණාධාර තපොධනාධිවාස ජේතවනාරාමයෙහි සතර ආයර්‍යබ්‍රහමවිහරණයෙන් දවස් යවමින් වැඩවසන සේක්. ශ්‍රවණරමනීය වූ මේ සමභව ජාතකය තමන් වහන්සේගේ අසාධාරණ ප්‍රඥා පාරමිතාව අරභයා වදාල සේක. එහි වර්තමාන කථාව මහා උම්මග්ග ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය.

යටගිය දවස කුරුරට ඉදිපත්නුවර ධනඤ්ජයකොරව්‍ය නම් රජෙක් දස රාජ දහමින් රාජ්‍යය කරන්නේය. ඒ රජගහ සුචීරතර නම් පුරෝහිත බ්‍රාහ්මණයෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නේය. දාන සීලාදී කුශලයෙහි යෙදෙන ඒ රජතෙම එක් දවසක් ධම්ම යාග නම් ප්‍රශ්නයක් කල්පනා කොට සුචීරතනම් බමුණානන් අස්නෙක්හි හිඳුවා ප්‍රශ්නය විචාරණුයේ මෙලෙස කියා ආචාරීනි මේ සත්යොදුන් පමණ ඉදිපත් නුවරෙහිද තුන්සියයක් යොදුන් පමණ කුරුරටෙහි ද ඇති සියළු ඓශචර්‍යයට පැමිණියෙමි. මෙබඳු ඉසුරෙහි සිටත් තව ගම් නියම්ගම් රාජධානි සෑදුනු දසදහසක් යොදුන් දඹදිව එක්සත් කොට රජහරණ ලොභයෙන් දික් විජය කරන්නා කැමැත්තෙමි. ඒ තමාත් ධර්මයෙන් මුත් අධර්මයෙන් දිනනු නොකැමැත්තෙමි. එබැවින් අනින්දිතවූ නොනස්නා ධර්මය රැස්කරුණු කැමැති මම යම් කටයුත්තකින් මෙලොවින් නින්දා නොඅසම්ද, අයසකට නොපැමිණෙම්ද, එසේ අර්ථ ධර්ම දෙකම සිඬ කරුණු කැමැත්තෙමි, මෙසේ සිඬ කිරීමෙන් නරකාදියෙහි නීපද දිව්‍ය මනුෂ්‍ය ලෝකයෙහි ඓශචර්‍යයට පැමිණ සැපවිඳීමට කාරණා වූ ධර්මය ද ඔහුගේ විපාකමය වූ අර්ථයදැයි මේ දෙකට කාරණා කවරේදැයි විචාරමි. විචාළාවූ මට කිව මැනවැයි කියා බ්‍රාහ්මණයා අතින් ධර්මයාග ප්‍රශ්නය විචාලේය. මේ ප්‍රශ්නය තෙමේත් ඉතා ගැඹුරුය. බුදුනුවනටම ගොදුරුය. එබැවින් ලොව්තුරා බුදුකෙණෙකුන්ගෙන් හෝ විචාළ යුතුය නොහොත් බෝධිසත්ත්ව කෙනෙකුන්ගෙන් හෝ විචාළ යුතුය. මෙසේ ගම්භීරාර්ථයෙන් යුක්ත වූ ප්‍රශ්නය සූචීරත නම් පුරෝහිත බමුණුතෙම කෙසේනම් විසඳන්ට සමත් වේද එතකුදුවුවත් පණ්ඩිත මානයක් නොකොට අපවැනි නුමුකළ නුවණෙහි සිටි කෙණෙකුන් විසින් කියහැක්කේ නොවෙයි. ඉදින් මෙපැනය විසඳන්නේනම් ගණඅඳුරෙහි දිලිසෙන ගිනිකඳක් මෙන් නුවණින් දිලිසෙන විධුර පණ්ඩිතයෝ නසනෝය. අපට වූකලී අඳුරු ගබඩාවකටවත් කලක් පරිද්දෙන් මේ පැනයෙහි අගෙක් මුලෙක් නොපෙණෙන්නේය. බරණැස් රජ්ජුරුවන්ට පුරෝහිත ධූරයෙහි සිටි විධුර පණ්ඩිතයෝම නිස්සෝයි දෙවෙනිවත් දැන්වූයේය. එබස් ඇසූ රජතෙම එසේකල ආචාරීන් තෙසු කෙණෙකුන් යවා ප්‍රයෝජන නැත්තේය, තෙපිම ගොසින් ඒ විධුර පණ්ඩිතයන්ට ආරාධනා කොට මේ ධර්මයාග ප්‍රශ්නය විචාරා ඔවුන් විසින් අර්ථය නම් මෙය දැහැමෙන් වර්ධනය කරන්නේය. මෙලෙසය ධර්මය නම් මේය ඒ නොනසා පවත්නේය. මෙලෙසය යන කාරණා විසඳා ප්‍රශ්න විසර්ජනය කළ කල්හි මේ පසළොස්දහසක් පමණ ජාමොබානද ස්වර්ණයෙන් ධර්මයට පූජාකරවයි කියා විධාන කොට පඬුරුත් දී මාගෞපකරණත් සමුඞකොට යන පරිද්දෙන් කියා විධුර පණ්ඩිතයන් ප්‍රශ්න විසඳූ පරිදි ලියා ගෙනෙන පිණිස ලක්‍ෂයක් වටිනා රන්පතක් කරවාද නැගෙන පිණිස වාහනයකුත් පරිවාර ජනයන් සේවාවන් සලසා පඬුරු පාක්කුඩමුත්දී එකෙණෙහිම යැවූයේය. ආචාරී ද ඉදිපත් නුවරින් නික්ම ඉඳුරා බරණැස් නුවර බලා ගොසින් යමතැණෙක්හි නුවණින් ප්‍රසිද්ධව පණ්ඩිතවරහු වෙසෙද්ද ඒ ගම්නියම්ගම් රාජධානි විමසමින් ක්‍රමයෙන් දඹදිව මුළුල්ලම විමසමින් කියතැනකත් මේ ප්‍රශ්නය විසඳන පණ්ඩිත කෙනෙකුන් නොදැක අනුක්‍රමයෙන් බරණැස් නුවරට ගොස් එක් තෙනක්හි ලැගුම් ගෙන පාන්වූ කල්හි සියළු පිරිවර හැර කීපදෙනෙකු හා සමඟ දහවල් බතට විධුර පණ්ඩිතයන්ගේ දොරට ගොස් තමන් ආනියාව කියාවූහ. ඔවුන්ගෙන් අවසරලදීන් ගෙටවැද අනුන්ගේ ඉඟිතාකාර දැනීමෙහි දක්ෂ වූ භාරද්වාජ ගොත්‍ර ඇති සුවිරතන නම් පුරෝහිත බ්‍රාහ්මණතෙම බත්කමින් විධුර පණ්ඩිතයන් දුටුයේය. ඔහු දෙන්නම එක ආචාරීන් කෙරෙහි ශිල්ප ඉගෙන එක්කම වැඩියාහ. එබැවින් එක්ව ඉඳ බත් අනුභව කොට ඉක්බිති සැපසේ ඉඳ කථාකරනුයේ කුමක්පිණිස අවුද ආචාරීනි විචාළේය. ආ කාරණය කියන සුචීරත නම් බ්‍රාහ්මණතෙම මෙලෙස කියා සබඳ විධුර පණ්ඩිතයෙනි එක් දවසක් අපගේ කොරව්‍ය රජ්ජුරුවෝ මා අතින් ධර්මයාගය නම් ප්‍රශ්නයක් විචාළසේක. මම එහි අර්ථ නොදැන බරණැස්නුවර රජ්ජුරුවන්ගේ පුරෝහිත ධුරයෙහි පිහිටි විධුර පණ්ඩිතයන් විනා මේ පැනය විසඳිය කෙනෙක් නැතැයි කීමි. එබස් අසා රජතෙම කියනුයේ ආචාරීනි තෙපම ගොස් මේ පැනයෙහි අර්ථ විචාරවයි කියා සේනාවාහනත් පඬුරුත් පාක්කුඩමුත් දී එවූයේය. එබැවින් මේ ප්‍රශ්නය විසඳුව මැනවැයි කීයේය. එවේලාවට බමුණුතෙම මහජනයා සිත්ගෙන අධිකරණ විචාරන්නේ මෝහට පැන විසඳීමේ දී අවසරයක් නැත, හෙතෙම ඊට කාරණා මෙලෙසින් කියන්නේය. බ්‍රාහ්මණයෙනි මහජනයාගේ නොයෙක් සිත් නැමැති ගංගාවන් එකගුණ කරනුයෙම්හු වසඟ කෙරෙමියි, එසේහෙයින් ඔවුන් සිත් නැමැති ගංගාවන්ට සමුද්‍රය සේ නොවී සිටිය නොහෙමි, එබැවින් අවසරයක් නැතිව ඒකග්‍රතාවයක් නැතිව කෙසේනම් මේ ප්‍රශ්නය විසඳම්දැයි මෙලෙසින් කියා එතකුඳු වුවත් මාගේ පුතණුවෝ පණ්ඩිතයහ. වියත්හ. බහුශෘතහ. මට වඩා නුවණැත්තාහ. ඔවුන් සමීපයට ගොස් පිළිවිසුවයි

SANHIDA LANKA

ඔහු යවනුයේ මෙලෙසෙ කීයේය. මාගේ ඖරස පුත්‍රම් භද්‍ර කනම් පුතනු කෙනෙක් ඇත ඔවුන් සමීපයට ගොස් විචාරව, මා පුතණුවෝද තොප විචාල අර්ථ ධර්ම දෙක කියති යවයි කීයේය. එබස් අසා සුචීරත නම් බ්‍රාහ්මණ තෙම විදුර පණ්ඩිතයන්ගේ ප්‍රසාදයෙන් නික්ම භද්‍රකනම් මානවකයා පෙරවරු බත් අනුභව කොට තමාගේ පෂීත් මධ්‍යයෙහි සකලෙලශවයර්‍යයෙන් පිනමින් හුන් තැනට ගොස් ඔහු විසින් කරන ලද සත්කාර සම්මාන ඇතිව හිඳ පිළිසඳර කතා කොට කුමක් නිසා වුවද ආචාරිනී විචාළ කල්හි සුචිරත නම් පුරෝහිත තෙම කියනුයේ භද්‍රක මානවකයානෙනි තොපගේ පියාණන් විධුර පණ්ඩිතයන් සමීපයට ප්‍රශ්නයක් විචාරනු පිණිස අපගේ රජ්ජුරුවන් වහන්සේගේ නියෝගයෙන් ඉදිපත් නුවර ආමි, ඒ විධුර පණ්ඩිතයෝ තමන් බොහෝ යුක්ති විචාරන හෙයින් තොපගේ නුවණ ගුණ වර්ණනා කොට තොප සමීපයට එවූ හෙයින් ප්‍රශ්න විචාරන්නට ආමි කීයේය. ඉක්බිති භද්‍රක නම් මානවකතෙම කියනුයේ සැබව ආචාරිනී තෙර එසේම තියුණු සිතිවිලි ඇත්තෙමි දැන් වනාහි පරදාර කිරීමෙහි සිත් බැඳී ගොස් අන් කිසි කාර්‍යයෙක්හි නොයදී සිත බිය වුව තිබෙන හෙයින් තොපගේ ප්‍රශ්න විසඳිය නොහෙමි, එසේ වුවත් මාගේ මළනුවෝ සංජය කුමාරයෝ මේ ප්‍රශ්නය පමණක් විසඳා කියා ලති උන් සමීපයට යවයි කියා තවද සුචීරත නම් බ්‍රාහ්මණයාණෙනි යම්සේ පුරුෂයෙක් යහපත් මුවමස් කඳක් ගෙන යනුයේ අතර මග ගොයෙකු දැක මස් කඳ දමා මහත් වේගයෙන් ගොයා ලුහුබැඳ යන්නේද එපරිද්දෙන්ම මාගේ ගෙයි මාගේම වසයෙහි පවත්නා ප්‍රියවූ බිරන්ඳ ඉන්දීත් අනුන්ගේ රක්ෂිත ගොපිත පරස්ත්‍රීන් අනුබැඳ ඇවිදිමි, එබැවින් අර්ථය ද ධර්මය ද විසඳා කියන්නට නොපොහොසත්මි, මාගේ මයිලනුවන් සමීපයට ගොස් විචාරවයි කීයේය. එකෙනෙහි පුරෝහිත බමුණු සංජය නම් මානවකයාගේ ගෙට ගොස් ඔවුන් විසින් කරන ලද සත්කාර සම්මාන ඇතියේ පිළිසඳර කථා කොට මදක් උන්නේය සංජය මානවකය ද කුමක් නිසා අවුද ආචාරිනී යි විචාළේය. එකල්හි සුචීරත නම් පුරෝහිත තෙම ඉදිපත් නුවර සිට කොරව්‍ය රජ්ජුරුවන්ගේ නියෝගයෙන් ප්‍රශ්නයක් පුළුවුස්නා පිණිස බරණැසට අවුත් විධුර පණ්ඩිතයන් අතින් විචාළ නියාවද උන්ගේ කියමනින් දෙවෙනිව භද්‍රක නම් මානවකයා කරා ආනියාවද ඔවුන් විසින් තොප සමීපයට එවූ විසින්ආමියි යනාදීන් ආ කාරණා කීයේය ඒ සංජය කුමාරයන් එකල්හි පරදාරය කොට ඇවිදිනේය, එබැවින් ඒ මානවක ද කියනුයේ ආචාරිනී මමත් පරදාර සේවනය කොටම ඇවිදිමි, ස්ත්‍රීධූර්තකම් කරන්නේ මුත් ගඟක් පීනා එගොඩව පරස්ත්‍රී සම්පර්කය කොට එමි, එසේ උදෑසන සවස දැති මෝරු කිඹුලන්ගේ ගැවසීගත් ගඟ පිහිනීම මරහු ගලන්නාහු වැන්නෙමි, එබැවින් මාගේ සිත වියවුල්ව ප්‍රශ්නය තොපට විසඳා කියන්ට නොහැක්කේ, එසේද වුවත් සම්භව කුමාර නම් වූ මාගේ සත් හැවිරිදි මළනුවෝ අප ඇමට සත්ගුණයෙන් සහස්‍ර ගුණයෙන් නුවණින් අග්‍රයෝය. එසේ හෙයින් උන් ළඟට ගොස් විචාරා ගනුවයි කියා උදෑසන සවස මරහු ගලවන හෙයින් මේ ප්‍රශ්නය කියා ගත නෙහෙමි, මාගේ මළනුවන් සමීපයට ගොස් විචාරවයි කීයේය. එබස් අසා සුචීරත නම් පුරෝහිත බමුණු කියන්නේ තොපගේ පියාණන් ඇතුළු වූ තුන්දෙනාම කියා ගත නුහුණු ප්‍රශ්නය මෙවිට කටින් කිරි නොහල බාලදරුවෝ කියා පියද්ද, මේ වනාහි තොපවැන්නවුන් කියාලිය හැකි දෙයක් නොවෙයි, ඉතා ගැඹුරුය, සූක්‍ෂමය, කියාලීම, ආශචර්‍ය, එබැවින් කියාගත නොහෙම්මැයි නොකියා නිකම් දෙඩීමෙන් කම්කිම්ද, බැන නොනැගී වැදහිඳුවයි කීයේය, එබස් අසා සංජය කුමාරතෙම ආචාරිණී සමභව කුමාරයන් ළදරු බාලයයි නොසිතව, ඉඳින් ප්‍රශ්නය සැක හැරගන්නා කැමැත්තා නම් මාගේ මලනුවන් සම්භව කුමාරයන් සමීපයට යවයි කියා ඔවුන්ගේ නුවණට ප්‍රශංසා කරනුයේ මෙලෙසින් කියා සුචිරත නම් පුරෝහිතයානෙනි යම් සේ උදාගිරි මුදුනෙන් අහස් කුසටවන් සඳමඬල තරුපතර සිරිපරයා දසදිගුන් හොබනේද, එපරිද්දෙන් මාගේ මලනුවෝ සම්භව කුමාරයෝ නුවණසිරින් බබලනුයේ මෙලොව ඇති සියලු නුවණැත්තන් මැඩ පවතිති, එබැවින් මහත් උත්තමයෝ බාලයෝ වී නමුත් අනාදර කටයුත්තෝ නොවෙති දැන ගොසින් අර්ථ ධර්මදෙන දැහැමෙන් උපදෙවන ක්‍රම විචාරාගණුව ආචාරීනි කියා, තවද මත්තෙහි මොහු ගුණවණනුයේ පුරෝහිතයානෙනි යම්සේ ඍතූන් සදෙනා කෙරෙන් වසන්ත කාලය තෙම මල් පල්ලෙන් සැරහි සිටි කල්හි වර්ෂා කාලයටත් වඩා බබලන්නේද, එපරිද්දෙන්ම සම්භව කුමාරයෝ ලොව ඇති සෙසු නුවණැත්තන්ටත් වඩා තුමූම බබලති. තවද ආචාරීණී යම්සේ හිමාලයෙහි ප්‍රතිසුගන්ධයන් දරණ ගන්ධමාදන පර්වතයතෙම නොයෙක් කුළුපහරින් ගැවසූනේය, නොයෙක් සිඬවිද්‍යාධරයන්ට වාසස්ථාන වූයේය, නොයෙක් දිව්‍ය ඖෂධයෙන් ශ්‍රී‍රඟ රුකින් සැදුම්ලැබ දසදිගුන් සුවඳ කෙරෙමින් බබලන්නේය. එපරිද්දෙන් සම්භව කුමාරයෝ නුවනින් බබලන්නේය. තවද මෙසේ රාත්‍රියෙහි ඝනාන්‍ධකාරයෙහි පර්වත මුදුනෙහි දිලිහෙන ගිණිකදක්මෙන් නුවණින් දිලිහෙන සමභව කුමාරයන් බාලයහයි නොසිතා ගොසින් ප්‍රශ්නය විචාරගණුව, තවද ආචාරීණී බාලවූ අජානීය සවින්ධයා ජවයෙන්ම දැන ගත්තාහ, ශරීරමාංසයෙන් දැන ගන්නෝ නොවෙති, වෘෂභරාජයා ද භාරොද්වාහනයෙන්ම දනිති, ආකාරයෙන් දැනගත හැක්කේ නොවෙයි. ධෙනුබුරුල්ල දුටු පමණකින් දන්නාහු නොවෙති, කිරිදෙව බැලීමෙන් දන්නාහ, එපරිද්දෙන්ම නුවණැත්තවුන් කථා කිරීමත් නුවණ විමසීමෙන් දැන ගන්නාහ. උස මහත සැටියෙන් දැන ගන්නාහු නොවෙති, එසේ හෙයින් මාගේ මළනුවන් බිළිඳුයයි නොසිතා ගොසින් ප්‍රශ්න විචාරා උන්ගේ නුවණ තොරතුරු දනුවයි කියා මෙලෙසින් සම්භව කුමාරයන්ගේ නුවණ

SANHIDA LANKA

වර්ණනා කරත් කරත්ම වන්නාට ගොසින් විචාරා සාමර්ථ්‍යය දතහැක්කේවේද, ඒ තොපගේ බාල මළනුවෝ කොයිදැයි විචාළේය. ඉක්බිති සංජය මානවකතෙම ප්‍රාසාදයෙහි සිව්මැදුරු කවුළුව හැර අතදිගු කොට බමුණානෙනි මේ ප්‍රාසාදයට ඉදිරි වීථියෙහි සමවයසැති කුමරුන් හා සමග කෙළනා ජාමෙබානද ස්වර්ණයට බඳුවූ ඡවිවර්ණ ඇති කුමරුවා නම් මාගේ මළනුවෝය, තොපි ඔහු බාලයයි නොසිතා ගොසින් සැක විචාරව, එතෙම සර්වඥ විලාසයෙන් කියන්නේ යයි දැක්වූයේය. සුචීරත නම් බ්‍රාහමණතෙම සංජය කුමාරයන් බස් අසා ප්‍රාසාදයෙන් බැස කුමාරයන් සමීපයට ගියේය. එවේලාවට සම්භව කුමාරතෙම ඉන තිබූ කඩ කරට දමාගෙන වැලිදෝතක් අතින් ගෙන සිටියේය. සුචීරත නම් පුරෝහිත බමුණෝත් සමීපයට ගොසින් සිටියාහ. ඔහු ඇවිදින් ඉදිරියෙහි සිටියාහු දැක උත්තමයානෙනි කුමක් නිසා ආ කෙණෙකුදැයි විචාරා සිටිකල්හි සුචීරත තෙම කියනුයේ පුත සම්භව කුමාරයෙනි මම මුලු දඹදිවෙහි පැනයක් විචාරණු පිණිස ගම් නියම්ගම් රාජධානියෙහි ඇවිදිනෙම් මා විචාළ ප්‍රශ්නය විසඳන්ට සමර්ථයක්හු නැති හෙයින් තොපි සමීපයට ආමි කීකල්හි කුමරතෙම සිතනුයේ - මුළු දඹදිවෙහි නුවණැත්තවුන් විසින් කියාගත නුහුනු ප්‍රශ්නයක් විචාරණු මා සමීපයට ආහ, එබැවින් මම නුවනින් වැඩිමහල්ලෙමි හිරිඔතප් උපදවාගෙන අත තුබූ වැලි දමාගත් කඩ හැඳ, විචාරව බ්‍රාහ්මණයානෙනි බුද්ධිවිලාසයෙන් මම ඒ ප්‍රශ්නය විසඳමි, සර්වඥ ප්‍රචාරණයෙන් පැවරූහ. එසඳ පුරෝහිත බමුණුතෙම ඉඳිපත් නුවරින් පිටත්වූ තැන් පටන් දඹදිව ඇවිද නියාවද, සබඳ බරණැස් නුවරට ඇවිත් විධුර පණ්ඩිතයන් හා භද්‍රකාර නම් මානවකයා හා සංජය මානවකයන් අතින් විචාළතෙන ඔවුන් කියාගතනොහී තොපලඟට එවූ හෙයින් ආමි ප්‍රශ්නය විසඳවයි ආරාධනා කෙළේය. ඔහු විසිනුත් තමන්ගේ රජ්ජුරුවන් කියාලු පරිද්දෙන් ප්‍රශ්නය කීකල්හි අහස් මැද පුන්සඳ මඬලක් මෙන් මේ මහා බෝධිසත්වයා හට ප්‍රශ්නයෙහි අර්ථ වැටහුනේය, එබැවින් අසව ආචාර්ණි කියා ධර්මයාග ප්‍රශ්නය විසඳුයේ මෙලෙසයයි කියන්නේය. ආචාර්ණි මේ නිසා යම්හෙයකින් සිය නුවරින් අවුද, එබැවින් සියල්ල දත් බුදු කෙණෙකුන් දෙසන කලක් පරිද්දෙන් විසඳා කියමි, තවද තොපගේ රජ්ජුරුවෝ මේ ප්‍රශ්නය යම් පරිද්දෙකින් අසා දනිද්ද එපරිද්දෙන් කියා පිළිපැදීම ද නොහොත් නොවරදවා කිරීම ද යන දෙකම තොපගේ රජ්ජුරුවන්ටම භාරය මාගේ වනාහි වරිදෙක්තැත ප්‍රශ්න වූ පරිද්දෙන් අර්ථ කියමියි ධර්මයාග ප්‍රශ්නය විසඳා කිනුයේ මෙලෙසින් කියන්නේය. සුචීරත නම් පුරෝහිත බ්‍රාහ්මණයානෙනි ඉඳින් තොපගේ රජ්ජුරුවෝ අද දන් දෙම්හ, සිල් රකුම්හ, පෙහෙවස් වසම්හයි, වීචාරණ ලද්දේ වී නම් තොපිත් ඊට අද ප්‍රාණඝාත කරම්හ කාමාස්වාදය කරම්හයි තොප කී දන් පින් සෙට කරම්හයි කීයෙහිවී නම් තොප බඳුවූ මහ අමාත්‍යයානන් කීයේ කටයුතුයි නොගෙන එබඳු ප්‍රසථාවෙහිත් ප්‍රමාදයෙන් දවස් නොයවා උපන් කුසල් සිත නොපිරිහෙලා තොපගේ රජ්ජුරුවෝ කුසල්ම කෙරෙත්වයි එසේකල්හි අර්ථ ධර්මදෙක නොනසා රක්නා නම් වෙයි කියා මත්තෙහිද මේ ප්‍රශ්නය මෙලෙසින් ප්‍රකාශ කරන්නේය. තවද සුචීරත නම් පුරෝහිත බමුණාණෙනි තොපගේ රජ්ජුරුවන් විධුර පණ්ඩිතයන් මේ ප්‍රශ්නය විසඳුයේ කෙසේදැයි විචාළකල්හි ආධ්‍යාත්මිකයයි කියන ලද රූප වේදනා සඤ්ඤ සංඛාර විඤ්ඤානයයි යන පඤ්චස්කන්ධයන් ඇතිව නැති වන හෙයින් අනිත්‍ය නියාවද කියා මේ සියලු සංස්කාර ධර්මයෝම අසාරයහ අසර්‍රයහ විසිකළ නොහැක්කැයි තත්වූ පරිද්දෙන් යම් දවසෙක නුවණැසින් දුටුයේද, එකල්හි සියලු භවයෙහි කලකිරී නිර්වාණාභිමුඛ වන්නේ යයි කිව

අජෙජවකිච්චං ආතපපං කො ජඤ්ඤා මරණං සුවෙ,
න හි නො සංගරනෙතන මහාසෙනෙන මච්චුනා

අපපමාදො අමතපදං පමාදො මච්චුනොපදං,
අපපමතතා නමීයනති යෙ පමතතා යථා මතා

යනාදීන් ගාථා දෙකකින් අවවාද කොට අධ්‍යාත්මික චිත්තයය පිරිසිදු කොට ඇතුලත්හි කාම ක්‍රොධාදී සතුරන් ජය ගන්ට කියවයි ඔහු උගන්වා "අනිච්චාවත සංඛාරා උපපාදවයධම්මිනො" යනාදී ගාථාවෙනුත් අනිත්‍යතාවයම ප්‍රකාශ කොට මත්තෙහි ද ප්‍රශ්නය විසඳනුයේ - අඥබාලව පෘථජ්ජනයෙක් සිහිමුළාවූයේ මිථ්‍යාදෘෂ්ටියයි කියන ලද නොමගෙහි යේද එලෙස නොකොට තොපගේ රජ්ජුරුවන් ද දසකුසලධර්මපථයයි කියනලද සත්පථය මතු පැමිණියාවූ කුසල් නැමති ශරීරය නොයික්මවා උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කරන්නාක් මෙන් උපකාරී වූ කුසලයම වර්ධනය කරන්ට කියව. තවද කායවාක්මනඃ යන ඝාරත්‍රයෙන් සිඬවන අකුසල් දුරුකොට දානසීල භාවනාදී සුචරිත ධර්මයම පුරුදු කරන ලෙස තොපගේ රජ්ජුරුවන්ට දන්වව, තවද උච්ඡෙදදෘෂ්ටි ශාස්වතදෘෂ්ටි නැමැති අතීර්ථවයට අස්ථානයට තොපගේ ප්‍රජාවන් නොබස්වව තොපිත් නොබසුවයි කියව. තවද ආචාර්ණි අනුන්ට අවැඩෙක අනර්ථයෙක නොහැසිර සත්ත්වයන් තමා හා කරුණාවෙන් සමාන කොට දකිනා පරිද්නේ දන්වවයි කියා මෙලෙසින් තොපගේ රජ්ජුරුවෝ ධර්මයාග ප්‍රශ්නයෙහි කියන ලද අවවාද වූ පරිද්දෙන් පවතිත් නම් යෙහෙක යම් රජ්ජුරුකෙනෙක් මෙලෙස දැන පවතිත් නම් ඔහුගේ යසස පෙර දෙපෝයෙහි සඳ මෙන් වර්ධන වන්නේය, මෙතෙම සීලාදී ගුණයෙන් සෙස්සවුන් මැඩ බබලන්නේය. මෙසේ මහ බෝධිසත්ත්වතෙම අහස් කුස සඳ මඬල දක්වන කලක් පරිද්දෙන්

SANHIDA LANKA

සර්වඥ විලාසයෙන් පුරෝහිත බ්‍රාහ්මණයාට හට ප්‍රශ්න විසඳීම් වශයෙන් දම් දෙසූහ. මෙසේ බෝධිසත්ත්වයන්ගේ ධර්මය ඇසූ බොහෝ ජනයෝ ඔල්වර හඬ ගසමින් බොහෝ උළෙල පැවැත්තේය, එතැන්හි රැස්වූ ජනයා විසින් මහබෝධිසත්ත්වයන් කෙරෙහි සන්තෝෂව ගලවා දමන ලද හන්පලන් වස්ත්‍රාභරණයෙන් කෝටි ගණන් සම්පත් රැස්වූයේය, රජ්ජුරුවෝද බොහෝ යසස් තනතුරු දුන්නාහ, සුචීරත නම් පුරෝහිත බ්‍රාහ්මණයාද පසළොස් දහසක් රත්තරනින් පූජා කොට රන්පත දැහිගුලෙන් ප්‍රශ්නය විසඳූ පරිදි ලියා තමාගේ ඉඳිපත් නුවරටම ගොසින් ධර්මයාග ප්‍රශ්නය විසඳූ පරිදි කීයේය, රජ්ජුරුවෝද ධර්මය වූ පරිදි දෙන් පැවත සිය සෙන් හා සමඟ ස්වර්ග පද පිරූහ. මෙසේ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා මහණෙනි තථාගතතෙම දැන් මතු නුවනැත්තො නොවෙයි, පෙරත් මහ නුවණැති යේමයයි වදාරා ජාතකය පූර්වපරසන්ධි ගලපා නිමවා වදාළ සේක. එකල්හි ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ නම් දැන් මේ භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයෝය, සුචීරත බ්‍රාහ්මණයා නම් දැන් මේ අනුරුඬ ස්ථවිරයෝය, එසමයෙහි විධුර පණ්ඩිතයෝ නම් දැන් මේ මහා කාශ්‍යප ස්ථවිරයෝය, භද්‍රකාරක මානවකයා නම් මෞද්ගල්‍යායන ස්ථවිරයෝය, සංජය කුමාරයෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# මහාකපි ජාතකය

ශාස්තෘන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සේක්. දෙව්දත් තෙරුන් විසින් බුදුන් මුදුනට ගලක පෙරලීම අරභයා වදාළ සේක.

නිදාන කථාව

දිනක් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ භික්ෂූන් අතර බුදුගුණව වර්ණනා කොට දෙව්දතුන්ගේ නුගුණ කිය කියා උන්කල්හි එහි වැඩ බුදුරජාණන් වහන්සේ මහණෙනි දෙව්දත් තෙම මෙලෙස කෙළේ දැන් මතු නොවෙයි. පෙරත් හිසට ගල් පෙරළුයේම වේදැයි ඉකුත් වත ගෙනහැර දැක්වී

ආරාධනයඃ-භිකෂූන් වහන්සේ

ජාතක කථාව

යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක රාජ්‍යය කරන කල්හි කසී දනව්වෙහි සීසා ජීවත් වන එක්තරා බමුණෙක් දිනක නැතිවූ ගොන් බානක් සොයමින මහ වනයට වැද මංමුලා වූයේ සතියක් නිරාහාරව ඇවිද එක් තිඹිරි රුකකට නැගී නොපැසුණු එල අනුභව කරනුයේ ඇඟ බල නැති හෙයින් අතු අගින් ගිලිහී බිහිසුනු මහත් ඇඳිර නරාවලකට වැටුණේය. මෙහිද දින හතක් ඉකුත් වූ කළට ගුණවත් එක් වානර පෝතකයෙක් පල අනුභව කරමින් ඒ සමීපයෙන් යන්නේ  ඒ මිනිසාගේ කෙඳිරි හඬ ඇසී මහත් අනුකම්පා කොට ඒ වලට පැන ඒ මිනිසා ගොඩගෙන මහත්සේ විඩාවට පත්හෙයින් ඒ මිනිසාගේ උකුලෙහි හිසතබා වැදහොත්තේය. එසඳ ඒ කළගුණ නොදත් මිනිසා සිතනුයේ දින ගණනක් නිරාහාරව පසුවූයෙමි. පලාඵල කෑමෙන් ශරීර ශක්තිය වහා ලබා ගත නොහැක. මේ වඳුරා මරා මස් අනුභව කිරීමෙන් කාය ශක්තිය ලබා ගෙන මගටත් ඉතුරු මස් ගෙනයාමට හැකියි සිතා අසලවූ ගල් පතුරක් ගෙන ඒ වඳුරු උතුමාගේ හිසට පහර දුන්නේය. එවිට වඳුරු තෙම වහා නැගිට අතු අගට පැන ඒ ද්‍රෝහියා කළ අකටයුත්ත දැක මිත්‍රද්‍රෝහී වූ එම්බල දුෂ්ට බ්‍රාහ්මණය තට මා කළ උපකාරයට තා කළදේ ඉතා නොහොබින්නේය'යි නින්දා කොට ඉදින් මා මෙතන හැරපියා ගියේ නම් මොහු නපුරු සතුන්ට ගොදුරුව මිය යන්නේ යයි සිතා එම්බල පුරුෂය තා කෙරෙහි මම සැක ඇත්තෙමි. එනමුත් මම ගස් උඩින් පැන යමින් මනුෂ්‍ය වාසයට පාර පෙන්නන්නෙමියි කියා ඔහු කැඳවා ගෙන ගොස් වනයෙන් එළියට යවා තම හිසෙහි වූ තුවාල වලින් පීඩා විඳිමින් තමා වසන පර්වත ප්‍රාන්තයට ගොසින් වන්හ. ඒ අපරාධය කළ පුරුෂයා ද සෙවත කුෂ්ටරෝගයක් සෑදී එම ආත්මයේම මනුෂ්‍ය ප්‍රේතයෙක්ව සත් වර්ෂයක් මුළුල්ලෙහි දුකින් පෙළී ඇවිදින්නේ ක්‍රමයෙන් බරණැස් නුවරට වැද මිගාචිරම් උද්‍යානයට වී කෙහෙල්පත් අතුට වේදනාවෙන් වැදහොත්තේය. උයන් සිරි නරඹමින් ඇවිදින බරණැස් රජතෙමේ දිනක් මනුෂ්‍ය ප්‍රේතයා දැක එම්බල පුරුෂය වැදූ මව්පියන් විසිනුත් බැලිය නොහැකි පිළිකුල් වූ කුෂ්ට රෝගයකින් පෙළෙන තා කවරෙක්ද? මෙසේ වීමට තා කළ අකුසල කර්මය කුමක්ද? කීසියම් උත්තමයෙකුට හිංසා පීඩාවක් කෙළේදැයි විචාළේය. ඉක්බිති බමුණු තෙමේ තමා මේ ජන්මයෙහි කළ අකුසලින් නොමීය. දුක් විඳිනා නියාව කියා කළ අපරාධය ද මුලපටන් පහදා රජතුමනි එදින පටන් පිපාසා ඇතිව දිය ඇති තැනකට ගියෙම්වී නම් ඒ ජලය ගිනිගෙන දිලිසෙන්නාක් මෙන් වැටහෙන්නේය. ලේ මුසු සැරවමෙන් පිළිකුල්ව පිය නොහැක්කේය. දිය බින්දු ඇගේ වැදී කල්හි එතැන ශරීරය පැලී සැරව ගලන්නේය. මා දකින ස්ත්‍රී පුරුෂයෝ දඬු මුගුරු ගෙන එළවා දමති. මේ සියල්ල මේ ජාතියේ කළ පව්න් ම සිදුවිය. එබැවින් රජතුමාටත් රැස්වූ ජනයාටත් අවවාදයක් කියමි. මිත්‍රද්‍රෝහී වීම අත්පිට විපාක දෙන ඉතා නපුරු පාපයකි. පරලොව ගිය කල්හි ද අපමණ දුක් විඳින්නේ යයි තමා දෘෂ්ටාන්ත කොට කීයේය. මෙසේ කථා කරමින් උන් කලට පොළව විවර වී ගිනිකඳක් පැමිණ ඉන් සැව අවීචි මහා නරකයෙහි උපන්නේය.

එසමයෙහි මේ දේවදත්ත තෙම කළගුණ නොදත් මනුෂ්‍යයා වූ අතර වානර පෝතකයා වූයේ ශාන්ති නායක බුදුපියාණන් වහන්සේය.

SANHIDA LANKA

# පණ්ඩනාග ජාතකය

සද්ධර්ම රාජයාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වසන සේක්. දෙව්දත් තෙරුන් පොළව ගිලීම අරභයා දේශනා කළ සේක.

නිදාන කථාව
දිනක් දම් සභාවේ රැස් වූ භික්ෂූන් විසින් දෙව්දත් තෙරුන්ගේ නුගුණ කියමින් උන් කලට එහි වැඩි බුදුරජාණන් වහන්සේ මහණෙනි, බොරු කීමෙහි පොළවට වන්නේ දැන් පමණක් නොවෙයි. පෙරත් බොරු කියා පොළව පළාගෙන ගියේ වේදැ යි ඉකුත් වත නේ වූ සේක.
ආරාධනය - භික්ෂූන් වහන්සේ

ජාතක කථාව - ඉහත බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හි පන්සියයක් වෙළඳහු නැව් නැගී යාත්‍රා කරන්නාහු. සත්වෙනි දවස් ගොඩ නොපෙනෙන කල්හි කුණාටුවකට අසු වී නැව බිඳුනේ ඒ වෙළඳුන්ගෙන් එක්කෙනෙකු හැර සෙස්සෝ මසුන්ට ගොදුරු වූහ. ඉතුරු වූ තැනැත්තා දිය වේගයෙන් පාවී අවුත් කණ්ඩිය පට්ටන නම් තොටට පැමිණියේ ඇඳුම් නැතිව නග්නව එගම සිඟන්නට වන්නේය. එගම මනුෂ්‍යයෝ මොහු දැක මේ තාපස තෙම උසස් ගුණ ඇත්තේය. යටත් පිරිසයෙන් පිළිත් නොහඳනේය. මහත් පින් කෙතකි. සතුටුව මධුරාන්නපාන පිළිගන්වති. එතෙම ජීවත් වීමට මඟක් පෑදුනෝයයි සතුටුව පිළි දුන්නත් නොපිළිගෙන දායකයක් විසින් කරවා දුන් පන්සලෙහි කණ්ඩියාවේල යන නමින් ප්‍රසිද්ධව වසන්නේය. එකල එක් නාග රාජයෙකුත් ගුරුළු රජෙකුත් මුන්ට උපස්ථානයට එති. දිනක් ගුරුළු රජ තෙම ඔහු අමතා තාපසයන් වහන්ස අපගේ නෑයෝ නයින් අල්වම්හයි බොහෝ දෙනා මුහුදට බැස නසිති. නයින් අල්ලන උපාය නොදනුම්හ. එහි යම් රහසක් ඇත. ඔබ නා රජ සමඟ කථා කොට ඒ රහස දැනගනුවයි කීයේය. ඒ තාපස තෙම එය පිළිගෙන ගුරුළු රජහු වැඳ අවසර ගෙන ගිය කල්හි නා රජු පැමිණි වේලේ සබඳ නා රජ්ජුරුවනි, ගුරුළු පිරිස තොපහැම අල්වනු පිණිසයයි ගොස් බොහෝ දෙන නසිති. එහි රහස කුමක්දැයි විචාළේය. නා රජ වහන්ස ඒ අපගේ නොකියයුතු රහසකි. එය අපි සැලකළේ නම් අපගේ නා කුලයේ නයින්ට මරණය අප විසින් ලඟා කර ගත්තා සරිය. එබැවින් නොකියමි. කියා නැවත විචාරන්නේ කිමෙක් ද? වහන්ස අප අතින් මේ රහස විචාරා අන් කෙනෙකුට කියන අදහසෙක් ඇද්දැයි විචාරා එසේ නැත. මාගේ අදහසින් විචාරමියි කී කල්හි නා රජ්ජුරුවෝ ටිකක්වේලා ඉඳ නා භවනයටම ගියේය.
මෙසේම දෙවන දිනයෙහිද විචාරා දැන ගත නොහැකිවූයේ තුන්වෙනි දින පැමිණි නා රජ්ජුරුවන් අමතා කිමෙක්ද? නා රජතුමනි, මෙතරම් සුළු දෙයක් තෙදිනක් විචාරාත් දැනගත නොහැකි වූයේ අප කෙරෙහි ආදරය මදනිසා නේදැයි ඇසීය. නා රජ තෙම කියනුයේ තාපසයෙනි, නෙකීවේ අනාදරයකින් නොවේ. ඔබ යම් ප්‍රමාදයකින් කිසියම් කෙනෙකුන්ට කීයේ නම් නපුරයි සිතා නොකියමියි කීයේය. නා රජ්ජුරුවනි, තොප කියලූ රහස් දෙයක් තොපට වඩා තවත් ඔබ්බෙහි කීමට තරම් නිසි විශ්වාස කෙනෙක් නැත. සැක නොකොට කියවයි කීයේය. එවිට නා රජ තෙම තාපසයෙනි, මේ රහස රකීවයි කියා විස්තර කරන්නේ අප හැම මහත් ගල්ගිල බරව වැද සිටින්නෙමු. ගුරුළුන් ආ කල කට ඇර දත් නියවමින් උන්ට දෂ්ට කරන්නට පනින්නෙමු. උන් අපගේ හිස් ඩැහැගෙන උඩට නැගෙන්නට උත්සාහ කෙරෙති. බරව වැදහොත් අපව සොලවන්නට දඟලන කල්හි මුහුදු දියට හසු වී මිය යන්නාහ. මෙලෙසින් බොහෝ ගුරුළුන් නසිති. ඉදින් අප හැම වැදහොත් කල්හි වලිගයෙන් අල්වාගෙන ඔසවා ඉස පහත් කොට බඩ තිබූ ගල් කටින් එලා සැහැල්ලු කොට යන්තම් උන්ගෙන් ගැලවිය නොහැක්කැයි මේ රහස දුස්සීල වූ මේ තාපසයන්ට කීය. මෙසේ කියා නා රජු ගිය කල්හි ගුරුළු රජ්ජුරුවෝ ඇවිත් තවුසා වැඳ රහස ඔහු අතින් අසා දැන සිතනුයේ නා රජහු විසින් කළ දේ ඉතා නුසුදුසුය. තමන්ගේ නෑයන් නස්නා රහස අනුන්ට නොකිය යුතු වන්නේය. මේ රහස හෙළි කිරීම දෝෂය ඔහුටම අඟවමියි වහා ගොස් පණ්ඩර නම් නා රජහු අල්වා වලිගයෙන් අල්ලා ඉස යටිකුරු කොට ගල් බිම හෙලව හෙලවා අහසට පැන නැංගේය. නාරජතෙම එල්ලෙමින් සිතන්නේ මම්ම මට භය උපදවා ගතිමි. ඒ දුස්සිලයා තාපසයෙකැයි, ජනයා විසින් පුදන ලද එකෙකැයි, ඉන්‍ද්‍රිය දමනය කරන ලද එකෙකැයි, ඔහු කෙරෙහි සැක නොකොට මේ රහස පිට කොට ටික වේලාවකින් එහි අනර්ථය පැමිණියේය. එබැවින් කිසිවෙකුට රහස් එළිනොකොට යුත්තේමය. දැන් එය වරදවා වටහාගත් කල්හි බලා කුමක් කළ හැක්කේ දැයි මේ ආදීන් කියා අඬා අන් පිහිටක් නොලදින් ඕ හටම යාඥා කරනුයේ ගරුඩ රජ්ජුරුවනි, මාගේ විමානහෙි ඇති සියළුම වස්තුකාම ක්ලේශකාමයෙන් මම අද තොරවූම්හ. ඒ සැප අදින් පසු නොලැබෙයි. එසේ වුවත් සබඳ ගරුඩ රාජයාණෙනි, මාගේ ප්‍රාණය තවත් ඇති හෙයින් නෑයන්ට පිහිට වෙන්ට කල්වේදැයි කියා ගාථා අටක් කිය කියා ඇඬූහ. එකල්හි ගුරුළු රජ තෙම නා රජ්ජුරුවන්ගේ ඇඩීම වැලපීම අසා තොප

SANHIDA LANKA

විසින් රැක්ක යුතු රහස ඒ අලජ්ජි හොර තවුසාට කියා දැන් කුමට තැවේදැයි නින්දා කරනුයේ නා රජ්ජුරුවනි, අපි තිදෙනාගෙන් කාට නින්දා කරව්ද? වරද කාගේදැයි සිතව්ද? තාපසයන් උපායෙන් රහස විචාරාගත් හෙයින් ඌගේ දෝෂත් නැත. මා සතුරුව සිටි හෙයින් මාගේ දෝෂත් නැත. රහසකි තොපගේම දෝෂය. තොපිම තොපිට අවැඩ කර ගත්තේය. අපි ඊට කලමනා කිමෙක්දැයි කීයේය. ඒ අසා නා රජ තෙම කියන්නේ ගරුඩාණෙනි, ඒ තාපස තෙම සිල්වත් බව හඟවා වසන්නේය. එබැවින් රහස සැක නැතිව කියාපීමි. දැන් වූයේ විනාශයකැයි නින්දා කළේය. නා රජතුමනි, මෙලොව උතුමන්ගේ වෙස්ගෙන ඉන්නා උතුමෝද උතුමන්ගේ වෙස් ගෙන ඉන්නා අධමයෝද ඇත. එබැවින් විමසා බලා නින්දා කටයුතුය. හෙතෙම බොරු තපසේ සිටි නමුත් අනුන් ධර්මය කියන්නේය. එබැවින් ඔහුට නින්දා නොකර තොපිම නින්දා කර ගනුව. ඌ උපායෙන් රහස විචාළේය. නා රජතුමනි, මවුපියන්ට වඩා උසස් නෑයෙක් නැත. එසේ වූ දෙමව්පිය දෙදෙනාගෙනුත් රහස් එළිවෙයි. පියකරුව හුන් බිරිඳටත් රහස් නොකිය යුතු වන්නේය. එසේ වූ රහස් මේ අචෙලකයාට විශ්වාස කොට කීමේ වරදම විය. නා රජතුමනි, සිත ඇති රහස නිධානයක් මෙන් රැක්ක යුතුය. ස්ත්‍රීන්ටද මිතුරන්ටද රහස් නොකිය යුතුයි.

නා රජතුමනි, යම් සත්ව කෙනෙක් සඟවන ලද රහස් ඇත්තේද නොහරණ ලද බස ඇත්තේද ස්ථිර බුද්ධිය ඇත්තේද එසේ වූ සත්වයා කෙරෙන් මනුෂ්‍යයන් දුරුවන්නාක් මෙන් යයි කීයේය. එකල්හි පණ්ඩර නම් නා රජ තෙමේ කියන්නේ ගුරුළු රජතුමනි, ඔහු සැබෑ මහණෙකැයි උපන් විශ්වාසය නිසා රහස් නොසැලවීමි. එයින්ම අර්ථයත් ධර්මයත් නැසුනේ යයි කියා තමාගේ ජීවිත දානය ඉල්ලන්නේ බිළිඳු දරු කෙනෙකුන්ව සිඹ සනහා ආදරය කරන්නාක් මෙන් නොව මා අල්වාගෙන හිංසාවක් නොකොට අවවාද කළේද එසේ වූ පක්ෂිරාජයාණනි, මට ජීවිත දානය දේවයි කීයේය. නා රජතුමනි, තොප මට දරු වූ බැවින් මේ හයින් තොප මුදවමියි කියා අහසින් බැස බිම හිඳුවා මෙතැන් පටන් සියළු භයක් නොවන පරිද්දෙන් අරක්ගෙන ආරක්ෂා කෙරමියි කියා නාග භවනයට යවා තෙමේ ගුරුළු භවනයට ගියේය. දිනක් ගුරුළුරජ නා රජු විමසමියි සිතා නාගභවනයට ගොසින් පියාසර කෙළේය. ඒ දුටු නා රජ තෙම මා අල්වන්ට ගුරුළුරජ තෙම ආවනැයි සිතා බඹදහස් ගණනක් දිග ආත්ම භාවයක් මවා ගෙන බොහෝ ගල් සහ වැලි ගිල බරව දරණ ගසා ඒ මතුයෙහි මහත් පෙණගැබක් මවාගෙන ගුරුළු රජ්ජුරුවන් භය ගන්වනාකාරයෙන් දක්වා සිටියේය. ඒ දැක ගුරුළු රජ තෙම කියනුයේ බිජුවටින් උපන් සතුරු වූ තොප හා පළමු සමඟි ගිවිසුමක් කළහ. දැන් තොපි දිවදළ සොල්වමින් භයගන්වා වැද හොත්තේය. මේ භය කොයින් පැමිණියේදැයි විචාළේය. තපස්වීහු කෙරෙන් උපනි භයකි. සතුරු මිතුරු පමණක් විශ්වාස කළ නොහැක්කේය. ආදී වශයෙන් කථා කරමින් සිට දෙදෙනාම දිව්‍යමානවක වේශයන් මවාගෙන අත්වැල් බැඳගෙන හොර තවුසාගේ පන්සලට ගොස් ගුරුළු රජ පිටත සිට නා රජ්ජුරුවන් තවුසා සමීපයට යැව්වේය. නා රජතෙම ඔහු දැක බොරු කියන සුළු වූ සොර තවුසෙකැයි නින්දා කළේය. ඉක්බිති තවුසා කියනුයේ නා රජ්ජුරුවනි, තොපට වඩා ඒකාන්තයෙන් ගුරුළු රජ්ජුරුවෝ මට ප්‍රියයෝය. එසේ හෙයින් ඔහු කෙරෙහි ඇළුනු සිතින් මේ පාපකර්මය කෙළෙමියි කීයේය. එම්බල මෝඩ වූ දුස්සීලය, තපස් කරන අන් අය මෙලොවත් පරලොවත් බලා පෙර අපර දෙපක්ෂයම සමකොට දැක වසන්නේය. තෝ වනාහි සිල්වතුන්ගේ වෙස්ගෙන නොසන්සුන්ව මෙලොව සතුන්ට වංචාකොට වෙස්පානා නළුවෙක් මෙන් ජීවිත වන්නෙහි යයි නින්දා කොට සාපලනුයේ බොරු තපස්වීනයෙනි, නිදොස් වූ මට දෝෂ කිරීමෙන් මිත්‍රද්‍රෝහී විය. රහස් හෙළි කිරීමෙන් කේළමුත් සිදුවිය. මේ සතළ වචනයෙන් තාගේ හිස සත් කඩකට පැලීයෙත්වා කියා සාප කළේය. මෙසේ නා රජු බල බලා සිටියදීම අචෙලකයාගේ හිස සත්කඩකට පැළුණේය. උන්තැන භූමිය විවර උනේය. පොළෙව යට අවීචි මහ නරකයෙහි වැටුනේය. නා ගුරුළු දෙදෙනා තම තමන්ගේ භවනයටම ගියහ.

එසමයෙහි අචෙලකව උපන්නේ දෙව්දත් තෙරන්ය. නා රජ වූයේ සැරියුත් තෙරුන් වූ අතර ගුරුළු රජව උපන්නේ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේය.

SANHIDA LANKA

# සම්බුලා ජාතකය

ධර්මරාජයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක් කොසොල් රජ බිසවු මල්ලිකා දේවීන් අරභයා වදාළසේක.

නිධාන කථාව-: දිනක් දම්සභා මණ්පයෙහි රැස්වූ භික්ෂූන් වහන්සේලා අතර මෙබඳු කථාවක් පහළ වූයේය. ඇවැත්ති මල්ලිකා දේවිය මව්පිය නෑදෑයින්ට සහ තම ස්වාමියාට කළ මනා වතාවත් ආචාර ආදිය කිසිම අඩුවක් නැතිව කරන්නීය. බුද්ධ උපස්ථානයද මඟ නොහරන්නියයි කථා කරමින් උන්සඳ එහි වැඩි බුදු රජාණන් වහන්සේ බුද්ධශාසනයේ වැඩ හිඳ මහණෙනි, මොතොමෝ පති දේවතා කොට විසුවේ දැන් මතු නොවෙයි. පෙරත් මෙලෙසම විසුවා වේදැයි ඉකුත් වත වදාළ සේක.

ආරාධනයඃ- භික්ෂූන් වහන්සේ

ජාතක කථාව:- බරණැස බඹදත් රජ තමාගේ පුත් සොත්ථිසේන රජකුමරු වැඩිවිය පැමිණි කල්හි යුවරජ තතනතුරෙහි පිහිටුවා ඉතා රූපත් සම්බුලා නම් රාජකුමාරිකාව ඔහුට අගමෙහෙසුන් කොට පාවා දුන්නේය. කල් යාමකින් සොත්ථිසේන යුවරජ හට අසාධ්‍ය වූ කුෂ්ට රෝගයක් ඇති වූයේය. කරන ලද පිළියම් වලින් ගුණයක් නොවුයේ ශරිරය පැලි පැලී දිය බසින්නට වන. එකල්හි අනුන්ට පිළිකුල් වූ මේ ව්‍යාධියෙන් පෙළෙන මට රාජ්‍යයෙන් කම් නැත. වලට වැද අසරණ ව මිය යාම යහපතැයි පිය රජ්ජුරුවන්ට දන්වා සියළු සම්පත් හැරදමා සිය කැමැත්තෙන් ආ සම්බුලාවද කැටුව වනගතව රම්‍ය භූමි ප්‍රදේශයෙක්හි පන්සලක් කොට වාසය කලාහ. සම්බුලා බිසවද දිනපතා අත්පා මෙහෙවර කිරීමෙන් ද උනුපැන් සිසිල් පැන් සපයාදී මිහිරි පලාඵල ගෙන වළඳවමින්ද සුරතල් බසින් සිත් සනසවමින්ද ස්වාමි පුත්‍රයාට උපස්ථාන කරන්නීය. මෙසේ දවසරින කුමාරිකාව දිනක් ඵලාඵල නොලාගෙන එන්නී අතරමග සිත්කලු දියඇළියක් දැක ඉස තුබු පැස තබා ස්නානය කොට ගොඩ නැගී වල්කැල ඇඳගෙන සිටියාය. ඇගේ ශෝභාවෙන් වන ලැහැබ ඒකාලෝක වූවාය. එකල දානව රාක්ෂයෙක් අහසින් යන්නේ ඇගේ ශරිර ශොභාය දැක ඈ පිළිබඳ සිත් ඇති මෙසේ කීය. මනා රූපත් ස්ත්‍රිය, තිගේ නාමගොත්‍රය කුමක්ද? මේ වනය හාත්පස බබුලුවමින් සිටින තිට නමස්කාර කරමි. තී කවරෙක්දැයි විචාළේය. බරණැස් රජුගේ සොත්ථිසේන නම් පුතුණු කෙනෙක් ඇත. ඔහුගේ භාර්යාාව සම්බුලාව මම වෙමි. අසාධ්‍ය රෝගයකින් පීඩිතව වනගතව මේ වනයේ පන්සලක වසන ඔහුට පලාපලයන් සහ සතුන් කා දමන මස් ගෙනවුත් දීමෙන් ද අත්පා මෙහෙවර කිරීමෙන්ද පෝෂ්‍ය කරමි. අද මා පලවැල ගෙන නොගිය කල්හී කිසිවක් නොලදින් හුණු වැල්ලේ කඩාහෙලු පත්මයන් ලෙසින් මලානිකව යන්නේයයි බිසව රාක්ෂයාට කීය. රාක්ෂයා ඒ බසට කියනුයේ රෝගීයෙක් වනයෙහි අසරණව ඉන්නා ඔහුලෙන් තීට ඇති පලය කිම්ද? මාගේ මේ විමානයෙහි සියලු සම්පත් පිරී ඇත. සියගණන් දිවනළුවන් පිරී ඇත. මාගේ අන්තඃපුර ස්ත්‍රීන්ට අගමෙහෙසුන් කෙට තබමි. මෙතැන් පටන් රෝගීයා කෙරෙහි නොසිතව, මම තීට ස්වාමියා වෙමියි. කීයේය. එකල සම්බුලාවෝ කියන්නී රාක්ෂය මාගේ ස්වාමියාගේ රෝගය ගැන සිතා කල්යවමි. වල්කැලෑ ඇඳිමෙන් නපුරු තුනපහස ඇති මා කවර හෙයින් රූපක්යයි කියයිද? මනා රූපත් සිඬාඞගනාවන් දිව්‍ය ස්ත්‍රීන් හා නාග කන්‍යාවෝ මේ වනයෙහි සංචාරය කරන්නාහ. ඔවුන් අතරෙන් තට පියවූ ස්ත්‍රියක් තබා යනුව මාගෙන් තට ප්‍රයෝජන කිම්ද? මෙසේ කී කල්හි ඇගේ රූපයට වසඟවූ රාක්ෂයා නොයෙක් ලෙසින් කියාත් තමා වසඟයට ගත නොහැක්කේ තී බලහත්කාරයෙන් මාගේ විමානයට ගෙන යමි. මා සමඟ වාසයට අකමැති වනයෙහි නම් තී මට ගොදුරු වන්නේ වන්නේයයි කියා එක්වරම පැන අසරණව සිටි ඒ රජදුවගේ අත අල්වා ගත්තේය. සතුරාගේ වසඟයට පත්වී සිටින බිසව තම ස්වාමියා ගැන ම සිතා හඬන්නී"මේ අන් පුරුෂයෙක් හා සමඟ ලෝකෂ්වාද රතියෙහි යෙදී සිටියේ යයි රජතුමා සිතනසේක් වීනම් ඊට වඩා මට දුකෙක් නැතැයි" හඬා වැලප දෑත් අහසට දිගුකොට ලෝකපාල දෙවියන්ට අඬගා කියන්නී අද ලෝකපාල දෙවි කෙනෙක් ලොව නැත්තාහ. මේ ලෝක පාල දෙවි කෙනෙක් ඇත්නම් "මාගේ ස්වාමියාගේ හැර රාග විනයෙන් අන් පුරුෂයෙකු මුහුණ නොබැලූ ප්‍රාණඝාතයක් නොකළ මුසාවාදයෙන් වැලකී පතිවත ගතී මා වැනියකට මේ රාක්ෂයා කරන දුරාචාරය නොවළකා බලා හිඳිහුද? ලෝකපාල ශබ්දය විනා ඒකාන්ත දෙවි කෙනෙක් මෙලොව නැතැ යි මුරගා දේවතාවන්ට යැදියාය. ඇගේ ශිලානුභාවයෙන් හා ප්‍රතිව්‍රතාධර්මයෙහි ආනුභාවයෙන් සක්දෙව් රජුගේ පඩුපුල් අස්න හුණු වී මේ කාරණය නුවණැසින් දැක ඒ ක්ෂණයෙහි වජ්‍රායුධය හැරගෙන බියකරු වේශයක් මවාගෙන රාක්ෂයාගේ අග බිසව පැමිණ"එම්බල රාක්ෂය, ස්ත්‍රීන් කෙරෙන් උතුම් ගුණ ඇති බොහෝ යසස් පිරිවර ඇති ප්‍රතිඥතා ධර්මය මැනවින් රැකි මේ රජදුව අතහැරව, තා මේ රජදුව සමඟ අසඬර්මයෙහි යෙදුනේව් නම් වේවයි ගොදුරු කොට අනුභව කෙළේව් නම් වේවයි මේ වජ්‍රායුධයෙන් තාගේ හිස සත් කඩක් කොට පලාපිය මියි හය ගන්වා කීයේය.එබසින් තැති ගත්

SANHIDA LANKA

රාක්ෂයා බිසවුන් අතහැර බලාගෙණ සිටියේය. එවෙලෙහි සක්දෙව් රජ නැවතත් මේ රාක්ෂයා, මෙබද්දක් කළේ වීනම් නපුරයි, මතු නොඑන පරිද්දෙන් තුන්වන පර්වතය ඇතුළෙහි දමා ඉක්බිති සම්බුලාවන්ට අප්‍රමාදව පතිව්‍රතාධර්මය පුරවයි අවවාද දී දිව්‍ය ලෝකයට ගියේය. සම්බුලාව ද ඉර අවරට ගිය කල්හි සඳ පහන් ආලෝකයෙන් පන්සලට එන්නීය. රජ්ජුරුවෝද ඈ එන ශබ්දය අසා මෝ අන්‍ය පුරුෂයකු සමඟ විත් මා මරාපු නම් නපුරයි සිතා සැඟවී සිටියේය. පන්සලට පැමිණි ඈය තමාගේ ස්වාමියා නොදැක මහත් ශෝකයෙන් අඬ අඬා මුරගා ඒ අවට ඇවිදිනී මේ වනයෙහි සිව්පා සතෙක් ඇත්ද දේවතා කෙනෙක් ඇත්ද ඔහු මාගේ ස්වාමියා වහා පෙන්නත්වා, ඔවුන්ට මාගේ නමස්කාරය කරමි. ඔවුන් සරණයෙමි. පර්වත ගිරි ගුහා වල වාසය කරන දේවතා කෙනෙක් ඇත්නම් සොත්ථිසේන රජු වහාම ඇස දක්වව, මෙසේ කුමාරිකාව ලය පැලී යන තරම් ශෝකයෙන් අඬමින් වැලපෙමින් දෙවියන් වැඳ වැඳා බැගෑපත්ව අඬන බිසවුන් දැක සොත්ථිසේන නම් වූ රජ්ජුරුවෝ සිතන්නාහු මේ බිසව අතිශයින් බැගෑපත්ව අඬන්නීය. මම මෙතන නියාව නොඇඟවී නම් ශෝකයෙන් ලය පැලී යන්නේය. ඇගේ අදහස දනිමියි සිතාගොස් පන්සල දොරකඩ උන්නේය. ඈ ස්වාමියා දැක දෙපයේ හිස තබා ගෙන දේවයන් වහන්ස මෙතෙක් වේලා මා අඬමින් සිටියදී ප්‍රිය තෙපුලක් නොකියා ඉන්ට මා කළ වරද කිම් දැයි විචාළීය. එම්බා සොඳුර තෙපි කිසි දිනක මේ වේලාවට නොආවාය. අද වූකලී පැමිණියේ බොහෝ රෑබෝවීය. එකාන්තයෙන් අද අන්‍ය සම්බන්ධයක් ඇතිව පසු වූ බැව් පෙනේ. මට වඩා තෙපට ප්‍රියයෝ කවරහුද කියව, මෙසේ රජු විචාළ කල්හි බිසව තමාට වනයේ වූ ගැහැට කියා ශක්‍රයා නිසා ජීවිත දානය ලැබ මාගේ ජීවිතයටත් වඩා ප්‍රියව සිටි නුඹ වහන්සේ ලදිමියි කී කල රජ්ජුරුවෝ කියන්නාහු එම්බා සොඳුර ගැහැනුන් කෙරෙහි සත්‍ය බසෙක්නම් කොයින්ද? එය අහසට පොලොව මෙන්ම මුහුදෙහි එතෙර මෙතෙර මෙන්ද දුර වන්නේය. හිමාල වන ප්‍රදේශයෙහි වල් වැද්දන් තාපස වරුන් හා සිඬවිද්‍යාධරයින් ගැවසෙන්නාහ. එබැවින් මෙය කෙසේ අදම්හද? මොහොතින් මොහොත නොයෙක් සිතිවිලි සිතන බොහෝ නුවණැති ස්ත්‍රීන් කෙරෙහිත් සත්‍ය බසෙක් නැත්තේමය. මෙසේ කී කල්හි සම්බුලාව සත්‍යක්‍රියා කරන්නේ ස්වාමිනි නුඹ වහන්සේ මා කී වචනය නොවදහන කෙනෙක් වේ නම් මාගේ සත්‍යක්‍රියා බලයෙන් නුඹ වහන්සේට පිළියම් කරමියි කියා පැන් කලයක් ගෙන මා මෙතෙක් කීයේ සත්‍ය බසෙක්මය. ඒ සත්‍ය වචනයේ බලයෙන් පඤ්චවෛද්‍යකුලයා විසින්ම පිළියම් කළ නුහුණු මේ අසාධ්‍ය රෝගය වහාම ගුණ වේවායි සිතා පැන් කලය රජුගේ ඉස් මුදුනෙහි නැමුවාය. ඇගේ සත්‍යක්‍රියා බලයෙන් හා ප්‍රතිව්‍රතාධර්මයෙන් ආනුභාවයෙන් ඒ මෙහොතෙහිම ඇඹුල් ගා සෝදන ලද තඹ මලක් මෙන් රජුගේ රෝගය සන්සිඳුනේය. රජතුමා ඉතා ප්‍රීතියට පත්ව කීප දිනකින් බරණැසට ගොස් මඟුල් උයනට වැදවුන් කල්හි පිය රජ්ජුරුවෝ උන් ආ නියාව අසා මඟුල් කොට ගෙන්වා රාජ්‍යයෙහි අභිෂේක කොට තුමු මඟුල් උයනට වැද තවුස් වෙස් ගෙන වසන්නාහු නිතර රජගෙන් වළඳන්නාහ. සොත්ථිසේන රජ්ජුරුවෝ තමන් හා එක්ව දුක් ගෙන ඇවිදි සම්බුලාවන්ට අගමෙහෙසුන් තනතුර පමණක් දී සෙසු කිසි වෘත්තියක් නොදුන්නාහ. තවද බිසව ගැන නොසලකා සෙසු ස්ත්‍රීන් සමඟ අභිරමණය කොට ඇවිදින්නාහ. මේ හේතුවෙන් කල කිරුණු සම්බුලාවො දිනෙන් දිනම දුර්වල භාවයට පත්වූහ. දිනක් රජගෙට දන්වැළදීමට පැමිණි තාපසයෝ ඈ දැක දුර්වලවූ කාරණා විචාරන්නා වු රාජ කුමාරිකාවෙනි තොප වනයේ වාසය කොට ආ අවධියෙහි රූපශ්‍රීයෙන් ඉතා යහපත දැන් මේ රාජ්‍යයට පැමිණ කවර හෙයින් සුදුමැලි ශරීර ඇති ව දුර්වල ගියාද? මට කියවයි කීහ. කුමාරිකාවන් කියන්නේ තාපසයන් වහන්ස ඔබගේ පුත්‍රයා මා ස්වාමියා පෙර සේ මා කෙරෙහි ඇදහිලි නැත්තේ සිත්කලු අන්‍ය ස්ත්‍රීන් කෙරෙහිම ඇලී වසන සේක. මා කෙරහි නොසිතන සේක. වනයේ දී මාකළ උවටැන් සිහිවන්නේය. ඔහුට එය සිහි නොවන්නේය. මට වනය මීට වඩා වටින්නේය. කෙතරම් සැප ඇතත් ස්වාමියා අප්‍රිය නම් සියළු සැපත් හැර මියයාම ඉතා මැනවි, දුක්ඛිත පුරුෂයෙක් තමාගේ භාර්‍යාවට හිතවත් නම් මෙබඳු රාජ්‍ය සැපතකට වඩා ඒ බැගෑපත් බවම ස්ත්‍රියකට උතුම් වන්නේයයි තාපසයන්ට තමා දුර්වල වීමට හේතුව කී කල්හි තාපසයෝ තම පුත්‍ර සොත්ථිසේන රජ්ජුරුවන්ගෙන් ලඟට කැඳවා එම්බා පුත්‍රයෙනි, තොප රෝගයෙන් පීඩිත වූ කලී තොප අත් නොහැර වලට ගොස් උවටැන් කොට තම සත්‍යක්‍රියා බලයෙන් රෝගය සුව කොට රාජ්‍යය කරන ලෙස සැපතෙහි පිහිටුවා තොපට උපකාරීව සිටි බිසවුන් උන්හිටි තැන් පමණකුත් නොවිචාරා තොප කළ සේ ඉතා අයහපත්ය. මිත්‍රද්‍රෝහීකම බරපතල වරදක්ම වන්නේය. ස්ත්‍රීන් කෙරෙහි ස්වාමියාට පක්ෂ කෙනෙක් සොයා ගැන්ම දුෂ්කරය. ඈ ඉතා විශ්වාසීය. ඈ කෙරෙහි සත් පුරුෂව බොහෝ කාලයක් සැපසේ වසවයි අවවාද දී පන්සලටම ගියහ. ප්‍රිය රජ්ජුරුවන් ගිය කල්හි තම අග මෙහෙසිය කැඳවා කියන්නාහු එම්බා සොඳුර, තොපට වඩා මට උපකාරි කෙනෙක් නැත. මෙතෙක් කල් මා නොකළ වරදට ක්ෂමා කරව්, මෙතැන් පටන් මේ සියළු සැපත් සහ රාජ්‍යන් තොපට දෙමියි රාජ්‍යය බිසවුන්ට පාවාදී බිසවුන් සමඟ ඉතා ප්‍රීතියෙන් ධානාදී වූ සුචරිතයන් කොට කම් වූ පරිදි මිය පරලොව ගියහ. එකල්හි සම්බුලාවෝ නම් මේ මල්ලිකා දේවිය වන්නාහ. කොසොල් රජ්ජුරුවෝ එකල සොත්ථිසේන රජු විය. උයනේ තපස් කල පිය රජ්ජුරුවෝ නම් දැන් ලොව්තුරා බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# ගණ්ඩ තින්දු ජාතකය

තවද එක් සමයෙක්හි ත්‍රිභුවණාභරණ ප්‍රවනතඃකරණ සමුද්ගපූරිත ගුණමණිකිරණ රංජිත නෛකවිධ තෙජනයන් ඇති සියලු සතුන් කෙරෙහි පතල කරුණා ඇති ලෝකස්වාමී වූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ ප්‍රවිතත තරුවරොපසොභිත ජෙතවනාරාමයෙහි වැඩ වසනසේක්. රජ දරුවන්ට දිය යුතු අවවාදයක් අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාව රජෝවාද ජාතකයෙහි විස්තර වශයෙන් ආයේය. අතීත කථාව මෙසේ දතයුතු

යටගිය දවස කම්පිල්ලරට උත්තර පඤ්චාලනුවර පඤ්චාලනම් රජ්ජුරුකෙණෙකුන් ඡන්දයෙන් අගතියට ගොස් අධර්මයෙන් රාජ්‍ය කරන්නේය. ඒ රජ්ජුරුවන්ගේ යුවරජ සෙනෙවිරත් ආදීහු අධර්මයෙහි නිරතව දනව්වා සී සත්ත්වයන්ගේ අපමණ බඳු පඬුරු ගෙන බොහෝ පීඩා කරන්නාහ. එකල්හි රාජ්‍ය වාසී සත්ත්වයෝ රාජ පුරුෂයන් කෙරෙහි භයින් තමන්ගේ අඹුදරුවන් ඇරගෙණ වල්වැද ඒ ඒ තැන්හි ඇවිදිනාහ. එකල පෙර මනුෂ්‍යවාස තැන් අමනුෂ්‍යවාසකොට සත්ත්වයෝ ඒ ඒ තැන පැල් ගසාගෙන ඉඳිනාහු. රාජපුරුෂයන් කෙරෙහි  භයින් දවල්දවස එහි වසන්ට නොපොහොසත්ව තමතමන්ගේ පැල් වටකොට කටුගසා අහුරා වලට වැද එහිත් සොරුන් කෙරෙහි භයින් ඊ දවස අවුත් ගෙයි ලැග පාන්වූකල්හි අඹු දරුවන් ඇරගෙණ වල් වදිනාහ. මෙසේ වසන්නා වූ සත්ත්වයන් දවල් දවස රාජසේවකයෝ දැක අල්වාගෙන අතමිට තුබූ දෙය උදුරා ගෙන මරා තලා බොහෝ ගැහැට කරන්නාහ. රාත්‍රියෙහි සොරහුද සත්ත්වයන් උන් තැනින් තැන බලා අල්වා ගෙන බොහෝ ව්‍යසනයට පමණු වන්නාහ. මෙපරිද්දෙන් සත්ත්වයන්ට කිසි අස්වැසිල්ලක් නැතිව මහත් වූ දුකින් පෙළෙමින් වසන කල්හි පුරණ ලද බෝධිසම්භාර ඇති මහාබෝධිසත්වයෝ එනුවර සමීපයෙහි ගැට තිඹිරි ගසෙක්හි දෙව්ව උපන්නාහ. එකල්හි නුවර රජ්ජුරුවෝ ඒ වෘක්ෂදේවතාවාට අවුරුද්දක් පාසා දහසක් අගනා බිලිපූජාවක් කරන්නාහ. මෙසේ පූජාවිඳ වසන ඒ දිව්‍ය පුත්‍ර එක් දවසෙක්හි සිතනුයේ මේ රජතෙම රාජ්‍ය විචාරීමෙහි ප්‍රමාදව ඡන්දයෙන් අගතියට ගොස් සත්වයන්ට දුක්දී වසන්නේය. ඒ කාරණයෙන් සියලු රාජ්‍යයම නස්නේය. රාජ්‍යවාසීනුත් මේ දුක්ඛයෙන් මුදා මොහුත් පරලොවින් ගලවා දැහැමින් රාජ්‍යය රකිනා ලෙස අවවාද දෙමියි දිව්‍ය පුත්‍රතෙම රාත්‍රියෙහි රජු වැදහොත් ශ්‍රීයහන් ගබඩාවට වැද ඉස්දොර සමීපයෙහි සිට තමාගේ ශරීරයෙන් රන් රැස් විහිදුවා ආකාශයෙහි සිටියේය. එවේලෙහි යහන ඔත් රජ්ජුරුවෝ ළහිරු කලඹක් මෙන් දිලිසෙන දිව්‍ය පුත්‍රයා දැක මෙතැන්හි දිලිහි දිලිහි සිටිනා වූ තෝ කවරෙක්දැයි විචාළකල්හි ඉක්බිති රුක්දෙවි කියනුයේ රජ්ජුරුවෙනි අවුරුදු පතා තොප ගෙන් බලි ග්‍රහණය කොට මේ තිඹිරිගස  වසන්නාවූ වෘක්ෂ දේවතාවානම් මමය, තොපට අවවාද දෙනු පිණිස ආමි කීයේය. එසඳ ඒ රජ කියනුයේ දිව්‍ය පුත්‍රය තෝ මට කෙසේවූ අවවාදයක් දෙයිදැයි විචාළේය. එවේලෙහි රජහට අවවාද දෙන දිව්‍ය පුත්‍රතෙම මෙලෙස කීය. රජ්ජුරුවෙනි තෙපි රාජ්‍ය ධූරයෙහි ඉතාම ප්‍රමාදව රාජ්‍යය කරව ඒ කාරණාවෙන් තොපගේ සියලු රාජ්‍යය පරසතුරන් විසින් පැහැර කොල්ලකෑ කලක් පරිද්දෙන් විශේෂයෙන් නටුයේය.

තවද රජ්ජුරුවෝ ප්‍රමාදව රට විචාරන්නාහු වීනම් තමන්ගේ රාජ්‍ය වලටත් හිමි නොවෙති. ඒ ආත්මභාවයෙහි ම බොහෝ අනර්ථ වලට පැමිණ පරලොව්හිත් නරකාදී දුක් විඳිනාහ. ඒ රජ දරුවන්ට විචාරීමෙහි මදක් ප්‍රමාද වූ විට අනතඃපුර ස්ත්‍රීහු ඇතුළු නුවර පිටි නුවර සත්ත්වයෝ දැයි යන සියල්ලෝම උන් වහන්සේ රාජ්‍යධූරයෙහි ප්‍රමාද සේක. අප කළ මේ කටයුතු නොකටයුතු විචාරන්ට නුඋන්සේකැයි ස්වෙච්ඡාවෙන් දවස් යවා අකාරියෙහි ම නිරන්තරව වසන්නාහ. එබැවින් රජ දරුවන් විසින් පමාවක් නැතිව රාජ්‍යය විචාළ යුතුය. තවද රජ්ජුරුවෙනි සමෘතියගේ අවිප්‍රවාසය නිර්වානයට පිහිටවන්නේය. සිහිමුලාව විසීම මරණයට ඒකාන්තයෙන් පිහිට වන්නේය. කුසල කරණයෙහි ප්‍රමාද සත්ත්ව තෙම විදර්ශනාදිය පුනරුත්පත්තිය සිඳගත නොහෙන්නේය. සංසාරයෙහි ඉපදීමය. යම් වශයෙන් බොහෝ දුකට පැමිණෙන්නේය. අප්‍රමාදසීලී විදර්ශක පුද්ගලතෙම භවයෙහි ඉපදීම් නසා ජාතිදුකඛය සිඳිනේය. තවද රජ දරුවෙනි ආරොග්‍යාදී වූ ජීවිත මදයයි කියන ලද ත්‍රිවිධ මදයෙන් ප්‍රමාද වූ සත්ව තෙම මනුෂ්‍යඝාතාදීවූ ත්‍රිවිධ දුශචරිතයෙහි නිරන්තරව ස්ව කෘතියෙහි ප්‍රමාදව කතීව්‍ය නොදැන වසන්නාහු රජදරුවෝ හස්ත පාදචෙඡදය කිරීමෙන් හා සර්‍ව සංහරණය කිරීමෙන් හා ඥාති ධන ජීවිතාදී අනර්ථයක් කොට අරණ ලද්දේ ඉදින් ජීවත් වීනම් තමාගේ ජීවිකාවෘත්ති කොට ගතනොහී සොරකම් කිරීම් මං පැහැරීම් ආදිය කරන්නේ දිලිඳු වීමෙන් පව් කරන්නේය. රාජ්‍යය විචාරීමෙහි ප්‍රමාද වූ බොහෝ රජ දරුවෝද අවශේෂ වූ බොහෝ සත්ත්වයෝද රාජ්‍ය ශ්‍රීයෙන් හා තමන්ගේ සැපතින් හා ජීවිතයෙන් පිරිහුනු බව ක්‍ෂාන්තිවාද ජාතක සරංග ජාතක, චෙතිය ජාතකාදියෙන් අසා දතයුතුවන්නේය. රටට වැඩ හැසිරීමෙහි ප්‍රමාද වූ රජහුගේ සියලු ගම මහිස ධන ධාන්‍යාදී සම්පත් නස්නාහ. යසභොග පිරිහීමෙන් කායික චෛතසික දුකඛයට පැමිණෙන්නේයයි මෙලෙස කියා නැවත අවවාද කරන්නාවූ දිව්‍ය පුත්‍රතෙම රජ්ජුරුවෙනි තොපගේ මේ රාජ්‍යය විචාරීමෙහි ප්‍රමාද වූ පක්‍ෂග්‍රාහී බවද ප්‍රභූන්ගේ ගහටවිඳ

SANHIDA LANKA

දිළිඳු සත්වයන් අවුත් මුර ගෑ කල්හි නොවිචාරීමද කටයුතු පරීක්‍ෂා නොකොට සහසිකිම්ද ගුණායුණු නොදැන්මද නීතියෙහි කොවිඳ නොවන බවද ප්‍රජාවට යම් දුකක් පැමිණි කල්හි සමකොට නොසිතීමද යන මේ සියල්ල රාජධර්මයෙක් නොවන්නේය. එසේවූ රජහට දරුවෝ ඉදින් ඇතිවූනම් අධර්මිෂ්ට රජහුගේ පුත්‍රවූ මේතෙම මතු අපට කවර වැඩක් කරන්නේද ඕහට ශෙවතචඡත්‍රය හා රාජ ඉසුරු නොදෙම්හයි රාජ්‍යයට නොපමුණුවන්නාහ. මෙපරිද්දෙන් ප්‍රවේණි රකිනා දරුවෝද ඕහට ඇති නොවන්නාහ. සියලු සැපතින් පිරිහුණු රජහු ඤාති මිත්‍රයෝද සහෘදයෝ ද සිව්රඟ සෙනඟද යන මොහු රජ දරුවන් නම් සියලු ප්‍රජාවගේ දෙමව්පිය තනතුරෙහි සිටියාහ. මෙරජ පක්‍ෂපාතීයයි සිතා මානය නොකරන්නාහ. පරීක්‍ෂාකාරී නොවන කටයුතු ඇති හිත පක්ෂ මූල මාත්‍රයන් නොවිචාරා කටයුතු කාරිය නොදන්නා අඥාන මන්ත්‍රීගේ මන්ත්‍රණයෙහි පවත්නාහු. පොරණ සැවපටය හැර යන සර්පයාමෙන් ශ්‍රී කාන්තාව ඔහු ඇර යන්නීය. තවද මෙකී සියලු දෝෂයෙන් වැලකී කායඓාරාදියෙන් අකුසල් නොකොට කරණ රාජ්‍ය ධුරයෙහි ප්‍රමාද නොව මේ වෙලාවට මේවා කළමනා කටයුතු යයි පරීක්‍ෂාකාරීව දවසරිනාහු රජහට සියලු සැපත්හු පෙර මසසඳසෙයින් දවසින් දවස වඩනාහ. මෙපරිද්දෙන් රජහට අවවාද දී දිව්‍ය පුත්‍ර කියනුයේ මහ රජ තොපගේ දෝෂ තොපි මේයයි නොදන්නේය. පිටිනුවර අප්‍රසිද්ධ වේසයෙන් ඒ ඒ තැන ඇවිද රජ්ජුරුවන් වහන්සේ මෙබඳු ගුණ ඇති සේකැයි වත් නුගුණ ඇතිසේකැයි වත් කියන සත්ත්වයන්ගේ බස් අසා තත්වූ පරිද්දෙන් දැන රාජ්‍යය විචාරා වසවයි අවවාද දී අනතර්ධානවූයේය. එවේලෙහි දිව්‍ය පුත්‍රයා කී බස් අසා රජ්ජුරුවෝ ද කල කිරුණු සිත් ඇතිව දෙවෙනි දවස් රාජ්‍යය අමාත්‍යයන්ට පාවාදී පුරෝහිත බමුණා හා සමඟ වෙස්වලා නැගෙනහිර වාසලින් පිටත යොදුනක් තැන් ගියේය. එතැන්හි එක්තරා පිටිසර වැසි මහලු පුරුෂයෙක් වලින් කටු හැරගෙණ ඇවිත් ගෙය වටකොට අවුරා දොර පිටින් අයා බැඳ තමාගේ බිරින්ද හැරගෙණ වලට වැද සවස රාජ පුරුෂයන් ගෙවල් ඇර ගිය කල්හි  තමාගේ ගෙයි දොරකඩ කටු ඇද දමන්නාවූ ඒ පුරුෂයා පය කටුවෙක් ඇනුනේය. එවේලෙහි එතෙම පඤ්චාල රජහට අව අවා කටුහරිනේ යම්සේ මම මේ කටුවෙන් ඇනී දුක්විඳිනා ලදිම්ද එපරිද්දෙන් පඤ්චාල දේශවාසී රජද සංග්‍රාම භූමියෙහි පැරද සතුරන්ගෙන් පැරද තියුණුවූ හීයෙන් විදුනා ලදුව මා සේම දුක් අනුභව කෙරෙත්වයි ඇතිවූයේය. එසඳ අප්‍රසිද්ධ වේශයෙන් රජහු හා සමඟ ගියා වූ පුරෝහිත බමුණු කියනුයේ එම්බල මහලු පුරුෂය වයොවෘඬ හෙයින් තාගේ ඇස ඇඳුරු බව හේතුකොට ගෙන පය කටු ඇනගෙන නිරපරාධවූ රජ්ජුරුවන් වහන්සේට නිස්කාරණයෙහි බෙණෙයි කිමෙක් ද තා යන මග කටු අවුලා දමා මග තනන්නේ රජ්ජුරුවෝදැයි විචාළේය. එවේලෙහි පුරෝහිතයා කී බස් අසා මහලු පුරුෂ කියනුයේ බ්‍රාහ්මණය අධර්මිෂ්ට රජහු විසින් අනුශාසනා කරන ලද මේ රාජ්‍යය විචාරයක් නැති බව හේතු කොටගෙන අධර්මිෂ්ටයෙන් ගන්නා කරවූ වරයෙන් පෙලෙන ලද රාජ්‍ය වාසීන් දවල් දවස සේවකයන් විසින් බොහෝ වධ බන්ධනයට පමුණුවන ලද්දාවූ රාත්‍රියෙහි දූ සොරුන් විසින් කොල්ලකා නොයෙක් ව්‍යසනයට පමුණු වන ලදුව දවල් දවස දොර පිටින් හයා බඳ අඹුදරුවන් හා සමඟ වල්වැද සැඟවී රෑ දවස සොරුන් කෙරෙහි භයින් ගෙවලට අවුත් ගෙයි ලගින මම එසේම දවල් දවස වල හිඳ දැන් අවුත් දොරකඩ ගැසූ කටු හැර දමන වේලෙහි මා පය කටු ඇනුනේයයි කියා රජ්ජුරුවෝ දැහැමින් රාජ්‍යය කරන්නාහුවී නම් අමාත්‍ය සේවිකාදීහු එපරිද්දෙන්ම ධර්මිෂටයාහ ඔවුන් ධර්මිෂට වුවහොත් සත්වයන්ට අන්‍යාය නොවදීනම් සත්ත්වයෝ වල් නොවැද තම තමන්ගේ ගෙයි සැපසේ දරුවන් උකුලෙහි නටවමින් විභවානුරූපවූ පරිද්දෙන් වසන්නාහු. රජ්ජුරුවන් වහන්සේ නිසා වේද අප සැපසේ වසන්නේයයි රජ දිවසුව විඳිවයි ආවාඩ වඩා  ඉඳිනාහ. මේ රජහු එලස විචාරණකමක් නැති හෙයින් වේද ගේ නැතිව දොර නැතිව අප දුක් විඳිනේයයි කියා තොපගේ රජ්ජුරුවන්ගේ ගහටයේ ඇවිදිනාහෙයින් වේද මේ කටු ඇනුනේ යයි මෙලෙස රජ්ජුරුවන්ට දෝෂාරෝපණය කොට කීයේය. එකල්හි රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා ආචාරීනි මහලු පුරුෂයා කීයේ ඇත්තමය. අපගේම දෝෂය මෙතැන් පටන් දස රාජධර්මයෙන් රාජ්‍යය කරම්හයි කියා නුවරට නික්මේවයි කියත්ම, පුරෝහිත බමුණුද බෝධිසත්ත්වයන්ගේ ආනුභාවයෙන් දේවයන්වහන්ස නැවතත් පරීක්‍ෂා කරම්හයි කීයේය. ඒ රජ යහපතැයි ගිවිස අනික් මගකට යනුයේ අතරමග එක් දුක්ඛිත මැහැල්ලක් කියන මෙබඳු බස් ඇසුයේයි . එක්තරා වයොවෘඬී ස්ත්‍රියක් තමාගේ වැඩි වයසට පැමිණි දූන් දෙන්නෙකු ගෙහිම රඳවාගෙන වලින් දර පලාගෙණවුත් විකොට රකින්නී. එක්දවසක් වලට ගොස් පලා කඩන්නී. කැලයෙන් අතවැරද පෙරලී බිමවැටී ඇඟ කඳුලු වැලිත් ඇසකඳුලුත් පිස පිස රජ්ජුරුවන්ට ආක්‍රොෂ කරන්නී. මෙලෙස කියා මේ අධර්මිෂට බ්‍රහ්මදත්ත රජ කවර දවසේ විනාශයට යන්නේද, මේතෙම මළේ නම් සත්වයෝ සැපසේ ඉඳිනාහ. එසේ කල්හි මාගේ දරුවෝ සැපසේ රැකීහිඳිනාහු. මාත් රැක සැපසේ තුමූත් රැකී ගන්නාහ. මේ පවිටු රජහුගේ විජිතයේ ඉඳ දරුවෝත් මමත් දුක් විඳුම්හයි හඬ හඬා සිට මෙ පරිද්දෙන් කියන්නාහු. ඒ මැහැල්ලගේ බස් අසා පුරෝහිත කියනුයේ වෘඬ තැනැත්තිය තීරජ්ජුරුවන්ට පරිභව දොඩන්ට කාරණා කිම්ද, තොපගේ දරුවන්ට සැමියන් සරාලන්නෝ උන්වහන්සේදැයි විචාළේය. එවේලෙහි බමුණාට පිටිසර වැසි මැහැලි කියන්නී රට අවිචාරමත්ව කරවුවර ගැන්මෙන් හා රෑ දවස සොරුන්ගෙන් අනවකාශයෙන් පෙළෙන ලද රාජ්‍ය වාසීන්ගෙන් මාගේ දරුවන් පිසවා කන්නෝ කවුරුද? කවර සත්ව කෙනෙකුන් කයට සිතට සැපයෙක්

SANHIDA LANKA

ඇද්ද, ඉඳින් මෙකිය දුක් නැතිව හිඳිත් නම් සැපසේ ගෙවදොරව ඉඳිනාහු කුටුම්බ සණ්ඨාපනයෙහි සිත් අලවා වෙසෙති. එසේකල්හි මාගේ දරුවෝත් ගෙව දොරව රැකෙන්නාහු. තුමූත් රැකී මාත් රකිනාහයි මෙපරිද්දෙන් ඈ කී බස් අසා රජ්ජුරුවෝ කියන්නාහු ආචාර්යීනි මෑ කීයේ කාරණාමය නුවරට ගොස් මෙතැන් පටන් දැහැමෙන් රාජ්‍යය කරම්හයි නික්මුණු කල්හි අතරමග එක්තරා ගොවියකු කියන ශබ්දයක් ඇසුවාහුයි සානා ගොවියාගේ සාලී නම් ගොනෙක් සීවැල පය ඇනී යා නොහී එතනම වැටින. ඒ සානා ගොවියා රජහට අවා කියන්නේ මේ ගොනා සීවැලින් මිදුනා ලදුව පයබිඳී යම්සේ යානොහී වැදහොවීද, එපරිද්දෙන් මේ පඤ්චාල රජද යුඬයෙහි සතුරන් විසින් පරදවන ලද්දේ අඩයටියෙන් ඇමනී මේ ගොනා සේම අනාථ අසරණව වේදනාමත්ව මරණ බිම්හි වැටී වැදහොව්වයි කියා මෙපරිද්දෙන් ඇඬූයේය. ඉක්බිති පුරෝහිත බමුණු කියනුයේ කාසිවලය තෝ ඉතා අඥානයෙහිය. සීසානාවූ තෙමේම ගොනා පය සීවැලින් ඇන පය බිඳ කිසි අපරාධයක් නැති නිර්දෝෂී රජහට අවන්නෙහිය. එබැවින් තෝ ඉතා අධර්මිෂ්ට එකෙකැයි කීය. එවේලෙහි ගොවියා කියනුයේ එම්බල පින්වත් වූ බ්‍රාහ්මණය, ප්‍රජාව රැකීමෙහි නිරාභිලාසිවූ අධර්මයෙන් බදු පඬුරු ගෙන සත්ත්වයන් පෙලන්නාවූ රාජ චොර හයින් පීඩිතව මද වැසිල්ලක් නොලබන දනව්වාසීන් ඇන මේ රජහට දෙඩූවයි තොපි මට කනස්සළු නොවව, මාගේ වචනය ඇසූ පමණක් වීනා අවශේෂ සත්ත්වයන් කියන අක්‍රොෂපරිභව නොඇසුව. බොහෝ සත්ත්වයෝ මෙපරිද්දෙන් පංචාල රජහට පරිභව බෙණෙති, තවද බමුණානෙනි, තෙපි මාගේ වැරැද්දෙන් ගොනා පය බිඳුනැයි කිව් නම් එසේ නොවෙයි මාගේ ස්ත්‍රීය දවල් බත් ඇරගෙණ එන්නී අතරමගදී දැක රාජ සේවකයන් විසින් බත් උදුරණ ලද්දේවන, ඒ කාරණයෙන් නැවත ඕතොමෝ ගෙට ගොස් දර පැන් සපයා මට බත් පිස ගෙණෙන් නී වන, දවල් වල කල් බත් නොලැබ ක්ෂුධාවෙන් පීඩිතව ඈ එන පෙරමග බල බලා ගොනාට අස්ථානයේ පාර ගසාපීමි, ඒ ගොනා පය ක්ෂණයක ඇද සීවැල ඇනගත, මේ කාරණයෙන් මා විසින් පහරන ලද්දේ නොවෙයි අධර්මිෂ්ඨ රජකම් කරන ඒ පඤ්චාල රජහු විසින් පහරණ ලද්දේ යයි කීයේය. එසේ ඔහු කී බස් අසා කීයේ කාරණාමය, මෙතැන්පටන් දැහැමින් සෙමින් රාජ්‍ය කරම්හයි කියා යන්නාහු. අතරමග ලැගුම්ගෙන උදාසන නික්මුනු කල්හි කුළු දෙනකගෙන් කිරි දෝමින් සිටි ගොපල්ලා ගොන් පයින් පැහැර කිරි මුට්ටියක් බිඳ ගොපල්ලාත් එලා ගෙන දිව පුව. එකල්හි එඬෙරා වැලි පිස පිස නැගී සිට මෙලෙස කියන්නේ යම්සේ මේ දෙන් කිරිමුට්ටිය හා සමඟ මා ඇන එලාපුද එපරිද්දෙන් මේ පඤ්චාල රජහු යුඬ භූමියෙහි තියුණු මුවහත් ඇති කඩුවෙන් දෙකඩ කොට ගසත්වයි කියා අක්‍රොෂ කෙළේය. එසඳ ඔහු කී බස් අසා බමුණු කියනුයේ පින්වත් වූ ගොපල්ල මේ දෙන කිරිමුට්ටිය බිඳ තා ඇන එලාගෙන ගියාය. මේ රජහුගේ කවර දෝෂයක් දැක දෙඩීද ඒ කාරණය මට කියවයි කීයේය. එවේලෙහි කාරණා කියන ගොපලු පින්වත් වූ බ්‍රාහ්මණය, පඤ්චාලරජ ඡන්දයෙන් අගතියට ගොස් රාජ්‍ය ධුරයෙහි ප්‍රමාදව ජනපදවාසීන්ට බොහෝ පීඩා කරන්නේය. ඔහුගේ සේවකයෝ පසල් දනව්වවට ගියා හුදු පීඩා කරන්නාහ. එසේ හෙයින් මම ද ඒ සේවකයන් විසින් බොහෝ කොට කිරි ගෙනේවයි පෙලෙන ලද්දෙම් චණ්ඩ වූ අනට අසු නොවන කිරි දෙවිය නොහෙන දෙනකගේ කිරි දොවන්ට වනැයි කීකල්හි අප්‍රසිද්ධ වේෂයෙන් ගිය රජ්ජුරුවෝ බමුණාට කියන්නාහු ආචාර්යීනි මේ පුරුෂයා කීයේ කටයුතුමය, මෙතැන් පටන් එලෙස නොකරම්හයි කියා තමන්ගේ නුවරට අභිමුඛව නික්මුණාහ. මෙසේ ඔවුන් දෙදෙනා යන කල්හි අතරමග ගමෙක බදු එලවා සිටි එක් රජපුරුෂයෙක් කඩු කොපුවට යහපතැයි කඹුරුවන් වස්සෙකු මරා සම උපුටා ගත්තේය. එසඳ ඒ වස්සාගේ මව් දෙන් පුතා කෙරෙහි ශෝකයෙන් තන නොකා පැන් නොබී අනවකාශයෙන් අඬ අඬා පුතු මැරූ තෙන වටකොට ඉව ල ලා මහත් ශෝකයෙන් ඇවිදිනීයා එකල්හි ශෝකයෙන් අඬමින් සිටි දෙන දැක ඒ ගම කෙළ ඇවිදිනා කුඩා කොල්ලෝ රජ්ජුරුවන්ට පරිභව බනන්නාහු යම්සේ මේ දෙන් තොමෝ දරු ශෝකයෙන් නොකා නොබී අඬා ඇවිදීද එපරිද්දෙන් මේ පඤ්චාල රජ දරු ශෝකයෙන් ශෝකාතුරව නොකා නොබී අඬා ඇවිදිවයි කීහ. ඒ කුමාරවරුන්ගේ බස් අසා කියන්නාහු බමුණු පින්වත් වූ කුමාරයෙනි ධෙනුව තනපැන් නොකා අඬා ඇවිදින්ට රජ්ජුරුවන් කළ දෝෂ කවරේද, ඒ දෝෂ මට කියවයි කීයේය. මෙසේ විචාළ බමුණාට කාරණා කියන්නාවූ කෙළ ඇවිදිමින් සිටි කුමරවරහු එම්බල බ්‍රාහ්මණය රජහුගේ අමැදහත්කමින් හා පුස්නා පමණ බලි ග්‍රහණයෙන් උපද්‍රව වූ රෑ දවල් සොර සතුරු හයින් මුලාවූ දනව්වාසීහු එම රජහුගේ සේවකයන් විසින් ගහට කරණ ලදහ. තවද මේ ධෙනුවගේ කඹුරුවන් පැහැ ඇති බාල වස්සා මරා බදු එලවීමෙහි සිටි පුරුෂ සම උපුටා ගත්තේය. විචාරමත් කමෙක් ඇත්නම් අන්‍යාය මෙලෙස නොපවතී, ඒ කාරණයෙන් රජ්ජුරුවන් වහන්සේට අප දෝෂාරෝපණය කොට කීයේ යයි කීහ. එසඳ රජ්ජුරුවෝ ආචාර්යීනි බාලදරුවන් කීයේ කාරණායයි කියා නුවරට අභිමුඛව නික්මුනාහ. එකල්හි අතරමග දිය සුන් එක් පොකුණෙක මඬුවන් කපුටුවෝ තුඩින් බිඳ කන්නාහ. එවේලෙහි ඔවුන් දෙදෙනා එතන සමීපයට වන් කල්හිම බෝධිසත්ත්වයන්ගේ අනුභාවයෙන් මඬුවෝ කියන්නාහු තියුණු මුවහත් ඇති යවුලට බදු කපුටුවන්ගේ තුඩින් බිඳුනා ලද යම් සේ අපි කන ලදුමෝද එමෙන් පඤ්චාල රජහු යුද්ධයෙන් පරදන ලද්දාහු යම්සේ අපි කල ලදුමෝද එමෙන් පඤ්චාල රජහු යුද්ධයෙන් පරදනලද්දාහු අඩ යටියෙන් ඇන දෙපලුකරත්වයි කියාකීහ. ඒ අසා මඬුවා හා සමඟ කථා කරන්නාවූ බමුණු මෙලෙස කියා මණ්ඩූකයා මනුෂ්‍ය

SANHIDA LANKA

ලෝකයෙහි රජදරුවෝ සියලු සත්ත්වයෝ කෙරෙහි ආරක්‍ෂාව කරන්නාහු නොවෙති. එසේ හෙයින් මෙපමණකින් රජ්ජුරුවෝ අධර්මිෂ්ඨයෝ යයි කීයේ අයුක්තියයි කීය. මෙසේ බමුණු කී බස් අසා මඬුවා කියනුයේ බමුණු ඉතාම පක්‍ෂග්‍රාහී එකෙක, සියළු රාජ්‍යය අලලා බොහෝ වධ බන්ධනයෙන් සත්ත්වයන් පෙලෙන ඡන්දයෙන් අගතියට ගොස් ප්‍රජා පාලකව හිඳිනා මේ රජහට මා කීයේ වැරැද්දයයි ඉඳින් බමුණ මේ රජ දසරාජධර්මයෙන් රාජ්‍යය කරන්නේ වී නම් මේ රාජ්‍යය වස්ත්‍රාභරණ ධන ධාන්‍යයෙන් සමෘද්ධවන්නේය. වැඩ සස්‍යයෙන් යුක්ත වන්නේය. සියලු වැව් පොකුණු හෝ කඳුරැලි ආදිය ප්‍රසන්න ජලයෙන් පිරී සිටිනේය. සත්ත්වයෝ සුඛිත මුදිතවූවාහු බත් අනුභවකරන කල්හි අග්‍රපිණ්ඩය ඇර කපුටුවන්ට දෙන්නාහ. කපුටුවෝ බත් අනුභව කොට මෙලෙස ප්‍රාණවධ නොකරන්නාහයි යනාදීන් රජ්ජුරුවන්ගේ අමැදිහත්කමින් මේ සියල්ලවන්නේයයි වෘක්‍ෂ දේවතාගේ ආනුභාවයෙන් කීහ. මෙසේ මඬුවා කීබස් අසා රජ්ජුරුවන් හා පුරෝහිත බමුණා හා දෙන්න ඔවුනොවුන් කථාකොට වල වසන තිරිසනුන් පටන් කොට සියල්ලෝම අපට පරිභව බෙණෙතියි කියා එතනින් වැලප නුවරට ගොස් එතැන්පටන් දසරාජ ධර්මයෙන් රාජ්‍ය කොට බෝධිසත්ත්වයන්ගේ අවවාදයෙහි පිහිටා දානාදී සුචරිතයෙහි  යෙදී සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කොට විසූහයි භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ කොසොල් රජහට මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා මහ රජ්ජුරුවෙනි රජ දරුවන් විසින් නම් සතරමහද්වීපයෙහි එක පැතිර වස්නා චාතුර්ද්වීපික මහා මේඝයක් මෙන් සියලු සත්ත්වයන් කෙරෙහි සර්වසාධාරණව පැවත රාජ්‍යය කටයුතු යයි වදාරා මේ ජාතකය පූර්වාපරසන්ධි ගලපා නිමවා වදාළසේක. එකල්හි රජ්ජුරුවන් දාන ධර්මයෙහි අප්‍රමාදව වසන ලෙස අවවාද දුන් වෘක්ෂ දේවතාවා නම් බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාලසේක.

SANHIDA LANKA

# තෙසකුන ජාතකය

බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වාසය කරන සේක්. කොසොල් රජ්ජුරුවන්ට අවවාද වශයෙන් වදාරන ලදී.

නිදාන කථාව - දිනක් බණ අසනු පිණිස විහාරයට ගිය කොසොල් රජ්ජුරුවන් අමතා මහරජතුමනි, මහ රජදරුවන් විසින් දසරාජ ධර්මයෙන් රාජ්‍ය කටයුතු වන්නේය. රජ්ජුරුවෝ අධර්මකාරී වුවාහු නම් රාජපුරුෂයෝද අධර්මික වන්නාහයි අවවාද කොට පෙර අබුඩොත්පාද කාලවල පවා රජදරුවෝ නුවණැතියන්ගේ අවවාදයෙහි පිහිටා රාජ්‍යය කොට දෙව්ලොව ගියෝ වේදැයි ඉකුත්වත වදාළ සේක.
ආරාධනය - කොසොල් රජ්ජුරුවෝ

ජාතක කථාව - යටගිය දවස බරණැස රාජ්‍යය කල බ්‍රහ්මදත්ත රජතුමා දේවතාරාධනය කොටත් දරු කෙනෙක් නොලදින් දිනක් උයන් කෙළියට ගොස් සල් ගසක් උඩ පක්ෂීන් කැදැල්ලක් දැක පුරුෂයෙකු ගස උඩට නංවා බලා බිජුවට තුනක් ඇති නියාව දැන ඒ කුමන බිජුවට දැයි වැද්දන් ගෙන්වා විමසා එකක් බකමූණු බිජුවක්ය, එකක් ගිරා බිජුවක්ය, එකක් සැළලිහිණි බිජුවක් යයි අසා මොහු මාගේ දරුවෝ වන්නාහයි ඒ තුනම අමාත්‍යයන්ට තුන්දෙනෙකුට පාවාදී මා දරුවෝ මේ බිජුවට වලින් උපන් කල්හි මට කියවයි නියම කළහ. ඒ අමාත්‍යයෝද ඒ බිජුවට මනා කොට රැක බකමූණු පැටවා උපන් කල ස්ත්‍රී, පුරුෂ බව වැද්දන් ගෙන්වා විමසා බලා රජ්ජුරුවන් සමීපයට ගොස් රජතුමනි, ඔබට පුතෙක් උපන්හයි කීය. ඒ අසා රජ්ජුරුවෝ බොහෝ සතුටට පත්ව බොහෝ වස්තුව දී මනා කොට රකුවයි නියමකොට යැවූහ. වෙස්සන්තර කුමාරයෝ යයි නමක්ද තැබූහ. දෙවනුව උපන් සැළලිහිණි පැටවා බලා ස්ත්‍රී බව අසා කුණ්ඩලී යන නමද තෙවනුව උපන් ගිරා පුත්‍රයාට ජම්බුක යන නමද තබා ඒ ඒ තන්හිම මනා සේ ආරක්ෂා ඇතිව ඇතිදැඩි කරන්නාහ. මාගේ පුතණුවෝය. මාගේ දියණියෝය අමතන්නාහ. අමාත්‍යයෝ බොහෝ විට රජ්ජුරුවන්ට සිනාසෙන්නාහ. රජ්ජුරුවෝ දිනක් සිතන්නාහු මේ අමාත්‍යයෝ මාගේ දරුවන්ගේ තරම නොදනිති. මුන්ගේ ප්‍රඥා මහිමය දක්වමියි සිතා එක් ඇමතියෙකු කැඳවා එම්බල ඇමතිය, තෝ වෙස්සන්තර නම් මාගේ දරුවන් සමීපයට ගොස් ඔබගේ පියාණන් වහන්සේ, ඔබ අතින් ප්‍රශ්ණයක් විචාරනු කැමති සේක. කවර දවසක පැමිණිය යුතු දැයි දැනගෙන එවයි කියා යැවූහ. ඒ අමාත්‍යයාද ඒ බව ගොස් වෙස්සන්තර කුමාරයාණන්ට දැන්වීය. වෙස්සන්තර කුමාරයා එය අසා තමා අතින් ප්‍රශ්න විචාරනු පිණිස මෙහි එන සේක. එතුමා ආ කල සත්කාර කල යුත්තේ ය. එබැවින් උන්ට කවර දා එන්ට කියමෝදැයි අසා අදට සත්වන දිනය හොඳ යයි සම්මත කොට කියා යැවූහ. රජතුමා නුවර බෙර පියවිකරවා චතුරංගනී සේනාව සමඟ තම පුත්‍ර වෙස්සන්තර නම් පක්ෂියා වසන තැනට ගියහ. වෙස්සන්තර කුමාරයා තමා පෝෂ්‍ය කරන අමාත්‍යයන් ලවා රජ්ජුරුවන් ප්‍රධාන හැමට සත්කාර කරවූහ. රජතුමා සිංහාසනාරූඪව වෙස්සන්තර පක්ෂියා රන් පුටුවක හිඳුවා පිරිස මධ්‍යයෙහි පක්ෂියා අමතා වෙස්සන්තර නම් පක්ෂියාණෙනි, රාජ්‍ය කරන්නා වූ රජ දරුවන් විසින් කවර කෘත්‍යයන් මනාකොට කරන ලද්දේ උතුම්ද එය තත්වූ පරිද්දෙන් කියවයි කීහ. එවිට වෙස්සන්තර කුමාරයෝ එය නොවිසඳා පළමු කොට පියරජ්ජුරුවන්ගේ ප්‍රමාදය ගැන චෝදනා කරන්නාහු, පියාණන් වහන්ස, බොහෝ කලක් නුවර වාසීන්ට අනුශාසනා කරන සේක්. නුවර වැස්සන් විසින් රජ්ජුරුවෝ තිරිසනුන්ට පුතා යයි ව්‍යවහාර කෙරෙතියි කියා අපහාස කරන කල්හිත් තොප සමීපයෙහි මම වැනි නුවණැතියෙකු සිටියදීත් ප්‍රශ්න විචාරා ඔවුන්ගේ විමතිය දුරු කිරීමට ප්‍රමාදවීම නොහොබියි දොස් කියා පියරජතුමනි, රජදරුවන් විසින් රාජ ධර්මයන් තුන්දෙනෙකු කෙරෙහි පිහිටිය යුත්තේය. පළමු කොට බොරු නොකිය යුත්තේය. බොරුකීම හේතු කොට ගෙන එම රාජ්‍යයෙහි තණ වෘක්ෂ ලතාදියෙහි ඕජා නැති වන්නේය. භූමියෙහි ඕජාව සත් රියනක් පහත බසින්නේය.

එකල සත්වයන් අනුභව කරන තෙල්, මී, සකුරා, ආදී ඕජාවද හීන වන්නේය.ඕජාව රහිත ආහාර ගන්නා සත්වයන්ට බොහෝ ව්‍යාධි ඇතිවන්නාහ. වස්තුව හීනව රජදරුවෝ දිළිඳු වන්නාහ. එබැවින් ජීවිතය සඳහාවත් බොරු නොකියයුතු වන්නේය. සැබෑ වූ බස් මධුර වූ රස ඇත්තේය. එබැවින් රසායනයක් වන්නේය. මුසාවාදය දෙවන ආත්මයෙහි නරකයෙහි උපත ලබා දෙන්නේය. තවද පියාණනි, රජදරුවන් විසින් කෝපය වැළකිය යුත්තේය. ක්ෂාන්තියෙන්ද, මෛත්‍රීයෙන්ද, දයාවෙන්ද යුක්තව එකම පුතෙකු ඇති මවක මෙන් ප්‍රියදර්ශනයෙන් ලෝ වැස්සන්ට අනුශාසනා කටයුතු වන්නේය. එසේම රජදරුවන් විසින් ක්‍රීයාශීලී නොවිය යුතුය. එහි ගැලී වාසය කිරීමෙන් රාජ්‍ය පාලනය දුර්වල වන්නේය. අප්‍රමාදව රාජ්‍යයෙහි කටයුතු කරවයි කීය. මෙසේ වෙස්සන්තර පක්ෂියා රජ්ජුරුවන්ට සර්වඥ විලාශයෙන් ප්‍රශ්න විසඳූ නියාව දුටු දහස් ගණන් මහ

SANHIDA LANKA

ජනයා සාධුකාර පැවැත්වූහ. රජ්ජුරුවෝ සොම්නසට පැමිණ අමාත්‍යයන් අතින් විසින් විමසා වෙස්සන්තර පක්ෂියාට අයකැමි තනතුරෙහි පිහිටවූහ. නැවත රජ්ජුරුවෝ කුණ්ඩලී නම් ලිහිණිය සමීපයට කල් දන්වා යවා සත්වෙනි දින එහි ගොස් සත්කාර විඳ ඈ සවණ පීඨයෙහි හිඳුවා ඈ අමතා ලිහිණිය ප්‍රශ්ණයක් විචාරමියි, විසඳුව රාජ්‍යය කරනු කැමැත්තාවූ රජදරුවන් විසින් කවර කාරියක් කළ කල උතුම් වේද තත්වූ පරිද්දෙන් කියවයි කීහ. එවිට ලිහිණියා කියන්නී පියාණනි, ඔබවහන්සේ ස්ත්‍රීහු නුවණ මඳ හෙයින් පරීක්ෂා කිරීම වශයෙන් විචාරතියි සිතමි. එබැවින් මම ඔබට සියළු රාජධර්මය පද දෙකකින් කියමියි කියාලා රජතුමනි, පෙර නොලබන ලද ලාභයාගේ ලැබීමය, ලබන ලද ලාභය නෑ සිය නොදී රක්ෂා කිරීමය යන දෙක වන්නේය නූපන් ලාභය උපදවා ගැනීමට බැරි නොවන්නේය. උපන් ලාභය සොර සතුරු ආදීන්ගෙන් නැසීමට නොපමුණුවා රැක ගැනීම බැරැරුම් වන්නේය. සමහර සත්වයෝ මානයෙන් ප්‍රමාදවූයේ අකුසල ධර්මයන්හි යෙදුනේ කොල්ල කා ඇවිදින්නේය. එකල්හි ඔහු රජදරුවෝ අල්වා ගෙන මහත් වූ විනාශයට  පමුණුවන්නාහ. වස්තුව නිමා ගිය කල්හි දොර දොර සිඟා ඇවිදින්නේය. සමහර සත්ව කෙනෙක් ලාභ සත්කාර උපදවා අප්‍රමාදව සිට කුසල කර්ම වල යෙදී වාසය කරන්නේ වී නම් ඔහුගේ යසස කලාවෙන් කලාවට වැඩෙන සඳ මෙන් අභිවෘද්ධියට පැමිණෙන්නේය. එබැවින් රජතුමනි, ඔබ වහන්සේත් අප්‍රමාදව දැහැමින් රාජ්‍යය කරමින් උපන් යසස් රැක්ක මැනවයි දක්වා ක්‍රෝධයෙහි ආදීනව පෙන්වා මෙසේ ඒ කුණ්ඩලී නම් ලිහිණී තොමෝ රජ්ජුරුවන්ට ධර්මය දේශනා කළාය.

රජ්ජුරුවෝ එබස් අසා සතුටුව ඇමතියන් අතින් විචාරා කුණ්ඩලී ලිහිණිය භාණ්ඩාගාරික තනතුරෙහි තුබූහ. ඊට නොබෝ දිනකින් ජම්බුක පණ්ඩිතයන් සමීපයට ගොසින් උන් දුන් මහ සම්පත් අනුභව කොට රන් පුටුවක හිඳුවා පුත ජම්බුකයෙනි, තොපගේ බෑණන් හා බූණනියන් අතින් රාජධර්මය විචාළෙමි. තොප අතිනුත් විචාරමියි. උතුම් රාජධර්ම බලයෙන් කියවයි කියා සෙසු දෙනා අතින් විචාල සැටියේ නොවිචාරා විශේෂ කොට විචාළහ. එවිට ජම්බුක පණ්ඩිතයෝ එසේ නම් රජතුමනි, කන් යොමා අසවයි කියා ධර්මයෙන් දේශනාවට පටන් ගත්හ. මේ සත්ව ලෝකයෙහි මහත් වූ අධ්‍යාස ඇති පුරුෂයා කෙරෙහි පඤ්චවිධ බලයක් වන්නේය. එයින් කාය බලය ඉතා මහත් වී නම් ලාමක වන්නේය. මන්ද? අඥාන බල බැවිනි. ඉදින් කාය බල මහත් නමුත් කුඩා කැටකිරිල්ලියගේ ප්‍රඥා බලයෙන් හස්ති රාජයා ජීවිතක්ෂයට පත්වූයේය. එබැවින් සෑමතැනම කාය බල ප්‍රයෝජන නැත. කාය බලයට වඩා භොග බලයම මහත් වන්නේය. ඒ භොග බලයට වඩා භෙද බවට නොපමුණුවන්නා වූ මන්ත්‍රණ ඇති සෞර වීර්‍යය ඇති සන්හුන්නා වූ අමාත්‍ය මණ්ඩලයා ඇති හළ කියන ලද බලය පූර්ව බලයට වඩා ඉතා වටනේය. බ්‍රහ්ම - වෛශ්‍ය - ක්‍ෂුද්‍ර යන ත්‍රිවිධ කුලයන් ඉක්ම ක්‍ෂත්‍රිය කුලය වශයෙන් ත්‍රිවිධ බලයටම වඩා මහත් වන්නේය. මේ සතර බලයටම වඩා ප්‍රඥා බලය මහත් ශ්‍රේෂ්ඨ වන්නේය. ඒ සත්වයා අභිවෘද්ධියට පැමිණෙන්නේය. පියාණෙනි, නුවණ නැත්තාට සත්ත රත්නයෙන් පිරිපුන් පෘථිවි මණ්ඩලය ලද්දේ වී නමුත් ඉතා පලක් නොවන්නේය. කිසිවෙකුට ඔහු අසමර්ථ වන්නේය. උපායෙහි දක්ෂ නොවන බැවින් දුක්පත් වන්නේය. යනාදී වශයෙන් මෙසේ ප්‍රඥාවෙහි ගුණ කියා ගාථා දහසකින් අවවාද කොට දෙමාපියන්ට උවටැන් කොට ස්වර්ගමෝක්‍ෂ සමාපත්තියට උත්සාහ කළ මැනව. දරුවන්ට ශිල්ප ශාස්ත්‍රය උගන්වා නිසි වයස පැමිණි විට අවාහ විවාහ කොට දායාද දී යුතුකම් ඉටු කළ මැනව, අගබිසව ඇතුළු අනතඃපුර ස්ත්‍රීන්ව ධර්මයෙහි යෙදවුව මැනව, කළ්‍යාණ මිත්‍රයන් ඇසුරු කොට දෙව්ලොවට පැමිණ සම්පත් අනුභව කළ මැනවයි ආකාශ ගංගාව ගෙනහැර පාන පරිද්දෙන් රජ්ජුරුවන්ට ධර්මදේශනා කළහ. දහස් ගණන් ජනයා සාධුකාර නාද පැවැත්වූහ.

ඉන් ප්‍රමුදිතවූ රජතුමා ඇමතියන් අතින් විචාරා සෙනෙවිරත් තනතුරදී සම්මාන කළහ. ඔහු තුන් දෙන රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළහ. ටික කාලයකට පසුව රජතුමා මිය පරළොව ගිය කල්හි ජම්බුක පණ්ඩිතයනට ලත් රාජ්‍යය තිරිසන් බැවින් ප්‍රතික්‍ෂෙප කොට තොපි හැම අප්‍රමාදව රාජ්‍යය කරවයි මහජනයා ශීලයෙහි පිහිටුවා මෙපරිද්දෙන් වසවයි කියා අධිකරණ ශාස්ත්‍ර රන්පත දැ හිඟුලෙන් ලියවා රාජ භාණ්ඩාගාරයෙහි ලවා වනයට වන්හ. ජම්බුක පණ්ඩිතයන්ගේ අවවාදය සතළිස් දහසක් අවුරුදු මුළුල්ලෙහි පැවැත්තේය.

SANHIDA LANKA
එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. කුණ්ඩලී නම් උපුල්වන් මෙහෙණිය වූ අතර වෙස්සන්තර පක්ෂියා දැන් සැරියුත් තෙරුන් විය. ජම්බුක පණ්ඩිතයෝ නම් සර්වඥයන් වහන්සේය.

# ශරභඞග ජාතකය

ධර්මරාජයන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන සමයෙහි මුගලන් තෙරුන්ගේ පරිනිර්වාණය අරභයා මේ ජාතකය වදාල සේක.
මුගලන් තෙරුන් වහන්සේ ඍධියෙන් කෙළ පැමිණියන් හට අගතැන් පත්වීම හේතුකොට ගෙන දිව්‍ය ලෝකයෙහිද නරකයෙද ඇවිද සත්වයන් විඳින සැපදුක් දැනගෙන විත් අසවල් අසවල් අය මේ මේ කුසල් කොට දෙව්ලොව ඉපිද සම්පත් අනුභව කරන්නාහ. තීර්ථක ශ්‍රාවකයන් අතුරෙන් අසවල් අය නරකයෙහි ඉපිද දුක් අනුභව කරන්නාහයි යනාදීන් පින් කළ සත්වයන් විඳිනා පව්කළ සත්වයන් විඳිනා දුක් ද මනුෂ්‍යයන්ට වදාරණ සේක්. මේ හේතුවෙන් සර්වඥ ශාසනයට මහත් වූ සත්කාර බහුල විය. තීර්ථකයන් හට සත්කාර පිරිහී ගියේය. එකල්හි තීර්ථකයන් මුගලන් තෙරුන් මරම්හයි කියා සමණකුත්ත නම් වූ සොරෙකුට මසුරන් දහසක් දී ඒ සදහා කලාසියා නම් ගල්ලෙන සමීපයට යැවූහ. තෙරුන් වහන්සේ එන්නා වූ ඔහු දැක ඍධි බලයෙන් අහසට වැඩිසේක. මෙසේ හය දවසක්ම සොරුගේ පැමිණීමත් තෙරුන්ගේ අහසට වැඩීමත් සිදු විය. සත්වෙනි දින පෙර ජාතියෙහි කරන ලද අපරාපර්‍යවේදනීය කර්මයෙන් අවකාශ ලද්දේය.
ඒ පාප කර්මය කෙසේද යත්?
පෙර ආත්මයක තම භාර්‍යාවගේ බස් ගිවිස තම  අන්ධ දෙමාපියන් මරණු පිණිස රථයකට නංවාගෙන වලට ගෙන ගොස් සොරු වටලා ගත්තාක් මෙන් හඟවා හිංසා කරන්නට තලන්නට පටන් ගත්හ.
අන්ධ දෙමාපියන්ද තලන්නේ සොරුයයි සිතා අනේ පුතේ, සොරු වටලා අපට තලති තොප බේරී පලායවයි අඬමින් කීහ. පුත්‍රයාද දෙමාපියන්ගේ අදෝනා බස් අසා සිත උණු වී තමා දුරසිට එන බව හඟවා මම සොරුන් පලවා හැරියෙමි. දැන් බිය නොවවයි නැවත ගෙදරට කැඳවාගෙන ගොස් උවටැන් කළහ. ඒ කලාවූ අකුසල කර්මය අන්තිම ආත්මය දක්වා ලුහු බඳිමින් අවුත් සත්වන දින සොරුන්ට අසුවිය. සොරහුද තෙරුන් වහන්සේ අල්වාගෙන ඇටතලා පිඳුරු බිස්සක් පරිද්දෙන් හකුලා මලහයි සිතා ඇද දමා සොර දෙටුවා සමග ගියහ. තෙරුන් වහන්සේද සිහි එලවාගෙන ධ්‍යානයෙන් ශරීරය වෙළාගෙන ආකාශයට පැන නැගී බුදුන් සමීපයට ගොස් වැඳ අවසර ගෙන පැමිණ එහිදීම පිරිනිවන් පා වදළ සේක්. එකෙනෙහි සදෙව් ලොව දෙවියෝ එක්ව අනූනම රියන් සඳුන් දර සෑයක් තනා අදාහන කෘත්‍ය කරවූහ. සර්වඥයන් වහන්සේ මුගලන් තෙරුන්ගේ ධාතු පිහිටුවා වේළුවනාරාම දොරටුව සමීපයෙහි දාගැබක් බැන්දවූ සේක.

මේ පිළිබඳ දිනක් දම්සභා මණ්ඩපයෙහි කථාවක් උපන් කල්හි එහි වැඩ සිටි බුදුරජාණන් වහන්සේ එම්බා මහණෙනි, මේ මුගලන් තෙරුන් සත්කාර ලද්දේ දැන් මතු නොවෙයි පළමුත් ලද්දේ වේදැයි ඉකුත් වත වදාල සේක.

යටගිය දවස බරණැස රාජ්‍ය කළ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයාට පුත්‍රයෙක් උපන්නේය. දොළොස් යොදුනක් පමණ දුර බරණැස මුළුල්ලෙහි සියළුම ආයුධ මේ කුමාරයා උපන් ඇසිල්ලෙහිම දිලිහී ගිය බැවින් ජොතිපාල කුමාරයෝ යයි නම් තැබූහ. තවද එම කුමාරයා උපන් දින ඇති වූ නක්ෂත්‍ර යෝගය අනුව මුළු දඹදිව දුනුවායන්ට අග්‍ර වන්නාහ යයි දැන බරණැස් රජතුමාද ඉතා ප්‍රීතිමත්ව කිරි මිළ දහසක් යවා වැඩිවිය පැමිණි කල්හි කැඳවාගෙන අවුත් අපට දක්වාලවයි නියම කළහ. සොළොස් හැවිරිදි වයස් වූ ජොතිපාල කුමාරයා ශිල්ප සඳහා තක්ෂලා නුවරට ගොස් සතියක් ඇතුලත ශාස්ත්‍රයාගේ පරතෙරට පැමිණ දිසාපාමොක් ආචාරිණී විසින් දෙන ලද ඛඩ්ග රත්නයද සඟි ඇති මැඩහගු දුන්නද එසේම සඟි ඇති ඉයවුරක්ද තමන් ඇඟ බඳන ලද්දා වූ සන්නාහයක්ද නළල් පටක්ද ලබාගෙන ඔහුගේ ඉල්ලීම පිට ශිල්ප ඉගැන්වීම සඳහා පන්සියයක් මානවකයන්ද කැටිව බරණැස් නුවරට පැමිණ දවසට දහසක් වැටුප් ලබමින් රජුන්ට සේවාකම් කරන්නාහ. එකල අවශේෂ රාජ සේවකයෝ එක්ව ජොතිපාල කුමාරයන් විසින් කරන ලද කටයුත්තක් නොදුටු වෙමු. නමුත් දවසට දහසක් වැටුප් ලබති. එබැවින් අප හැම උන්ගේ ශිල්ප දකිනු කැමැත්තම්හයි කීහ. කුමාරයෝද අදින් සත්වන දින ශිල්ප දක්වමි. සියළුම දුනුවායන් රැස්කරනුවයි රජ්ජුරුවන්ට දැන්වූහ. ජොතිපාල කුමාරයෝද එදින නියමිත වේලාවට තමාට ගුරුන් අතින් ලැබුණ දුන්න ඉයවුර නළල්පට සන්නාහ යන මේ සියල්ල ඉණ යට තබා ගෙන කඩුව පමණක් ගෙන පියවි ස්වභාවයෙන් රජ්ජුරුවන් සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිටියාහ. රැස්ව සිටි දුනුවායෝ ජොතිපාල කුමාරයෝ ධනු ශිල්පය දක්වන්නට එන්නාහු දුන්නක් නොගෙනා හෙයින් අපගෙන් දුන්නක් ඉල්ලුවද දුනු නොදෙම්හයි ඔවුනොවුන් කතිකාකර ගත්හ. රජ්ජුරුවෝ ජොතිපාල කුමාරයන් කැඳව දරුව, ශිල්ප දක්වවයි කීහ.
කුමාරයේද යහපතැයි වට තිර අදවා ඒ මැදට වී සන්නාහ සන්නද්ධව නළල්පට බැඳ මැඩහගු දුන්නෙහි පබුළුවන් වූ දුනු දියත් නගි ඉයවුර වුරපිට බැඳ කඩුව වම් උරයේ එල්වා විදුරු අක් ඇති නාරාචනයක් නියපිට

SANHIDA LANKA

නටවමින් වට තිරය පහ කොට  පොළව පළා නැගි අලංකාර නාගමානවකයෙකු පරිද්දෙන් ගොස් රජ්ජුරුවන්ට ආදර දක්වා සිටියහ. ඒ දුටු මහජනයෝ ඔල්වරසන් දෙන්නට වූහ. කුමාරයෝ පැමිණි දුනුවායන් අතුරෙන් අක්‍ෂණවේධිය, වාලවෙධිය, ශබ්දවෙධිය, ශරවෙධිය යන සතර පක්‍ෂයෙහි දුනුවායන් සතර දෙනෙකු කැදවා රාජාඞසනයෙහි මණ්ඩපයක් කරවා සතර කොන ඒ සතර දෙනා සිටුවා එක් එක් දුනුවායාට තිස් දහස බැගින් ඊ දඩුදීමට ඒ ලඟ සතර දෙනෙකු සිටුවා තුමූ වීදුරුපීරු අත් ඇති නාරාවනයක් අතින් ගෙන මණ්ඩපය මධ්‍යයට පැමිණ කියන්නාහු රජ්ජුරුවන් වහන්ස මේ දුනුවායන් සතර දෙනා එකවිට ඊ වලින් මට විදිත්වයි මම මොවුන් විදිනාලද ඊ පහරවල් වලකමියි කීහ. රජ්ජුරුවෝද යහපතැයි කීහ. දුනුවායන් කියන්නාහු රජතුමනි, අපි දුනු ශිලිපයේ දක්‍ෂයෝ වම්හ. ජොතිපාල කුමාරයෝ තරුණ පුරුෂව සිටියාහ. එබැවින් අපි නොවිදුම්හයි කීහ. එකල කුමාරයෝ එසේ එකවිට විදින්නට පටන් ගත්හ. කුමාරයෝද තමා වෙත එන්නා වූ ඊ තල නාරාවනයෙන් ගසා එහෙ මෙහෙ නොයා බොධි කොටුවක් පරිදි තමන් වට කොට වට තිරයක් මෙන් සිටින්නට කළහ. දුනුවායන්ගේ ඊ දඩු නිමා ගිය පසු ඒ බව දැන ගත් කුමාරයෝ ඊ පවුර නොබිද උඩ පැන රජ්ජුරුවන් සමීපයට ගොස් සිටියාහ. පැමිණි මහජනතාවගෙන් එවිට ලත් පූජා වස්තු අටලොස් කෙලකි. එකල රජ්ජුරුවෝ මේ කිනම් ශිල්පයක් දැයි විචාළහ. රජතුමනි, මේ සරහඩග නම්. මේ දඹදිව මා හැර මේ ශිල්පය දන්නා අනිත් කෙනෙක් නැතැයි කීහ. රජතුමනි මේ සතර දෙනෙක් සිට එකෙකුටවත් මා විදගත නොහැකි විය. මම මේ සතර දෙනාවම එක ඊ පහරින් විදමියි කීහ. එකල දුනුවායෝ ඊට අකමැති වූහ. කුමාරයෝ සතර කොන කෙසෙල් කඳකට විද්දාහ. ඒ ඊය කෙසෙල් කඳ විදගෙන දෙවෙනි තුන්වෙනි සහ සතරවෙනි කදන්ද විද ගෙන වටේ ගොස් නැවතත් විදගෙන පළමු විදි කද විදගෙන කුමාරයාගේ අත්හිම පිහිටියේය. කෙහෙල් කඳ වල් රතු නූලෙන් වටකරන ලදුව සිටියේය. ඒ චක්‍ර නම් ධනුස් විදමන විය. එසේම සැරලබිධි, සැරඅජ්ජුන, සැරවෙනි, සැරප්‍රසාද, සැරමණ්ඩප, සැරසොපාන, සැරපුෂ්කර, සැරපුම ආදී සිල්පද මහත් රාශියක් දක්වමින් සිටියදී හිරු අවරට ගියේය.

ඉක්බිති රජ්ජුරුවෝ ඕහට සෙනෙවිරත් තනතුර දෙමැයි නියම කොට කුමාරයෙනි, අද වේලා නොවෙයි. සෙට දවස සෙනෙවිරත් තනතුර ගනුව. දැලි රැවුල කපා ස්නානය කොට එවයි කියා එදවස් පටන් වියදමට ලක්‍ෂයක් දුන්නාහ. කුමාරයෝත් මෙයින් මට ප්‍රයෝජන නැතැයි ලත් සතුටු පඩුරු ඒ ඒ අයටම දී ගොස් ස්නානය කොට ස්වර්ණාභරණයෙන් සැරසී ආහාර අනුභව කොට ශ්‍රී යහනට නැඟ සැතපී පශ්චිම යාමයෙහි පිබිදී හිඳ සිතන්නේ මා උගත් දුනු ශිල්පයෙහි මුල අනුන්ගේ මිය යෑම පෙනෙන්නේය. කෙළවර නරකොත්පත්තිය පෙනෙන්නේය. ප්‍රාණඝාත කිරීමෙන් නරකව උපන්නේය. රජතුමා මට සෙනෙවිරත් තනතුරු දීමන් වස්තුවද අඹු දරුවෝද බොහෝ වන්නාහ. පසුවට මෙය හැරළිය නොහැක්කේය. මින් මට ප්‍රයොජන නැත. දැන්ම ගිහිගෙයින් නික්ම හුදකලාව වනයට වැද ඍෂි ප්‍රවෘජාවෙන් පැවිදිවෙමියි සිතා රහසින් ගෙයින් පිටවී ගොධාවරී නම් ගංතෙර තුන් යොදුනක් පමණ ඇති වූ දිවුළු වනයට ගොස් තමන් නිසා විස්කම් දෙව්පුත් මැවූ තවුස් පිරිකර ගෙන මහණව තවුස් වෙසින් වනයට හොබවා ඉන් සත්වන දින පංචාභිඥ අෂ්ට සමාපත්ති උපදවාගෙන වාසය කරන්නාහ. එකල ජොතිපාල කුමාරයන් සොයමින් අඩා වැලපෙන මව්පිය හිතවතුන්ට කුමාරයෝ පැවිදිව කවිඪ නම් වු වනයේ වසන බව එක වැදි පුත්‍රයෙක් අතින් දැන ගන්නට ලැබී රජ්ජුරුවෝ ප්‍රධාන මහත් පිරිසක් එහි ගොස් බණ අසා පැවිදි වූහ. ප්‍රධාන තාපසයන් සමීපයෙහි සැළිස්සර, මෙධිස්සර, පවීත, කාළදෙවල, කිශවච්ඡ, අනුසිස්ස, නාරද යයි අතවැසි තපස්වරු සත්දෙනෙක් වන්නාහ. ටික දිනකින් එම කවිඪ නම් වූ වනය තපස්වීවරයන්ට වසන්නට ඉඩ නැතිවන අන්දමින් පිරී ගියේය. ඉක්බිති නායක තාපසයෝ එක් එක් තාපසයන් අමතා පිළිවෙලින් ඔවුන් අත වැස්සන් කැටුව පජ්ජොත රජ්ජුරුවන්ගේ ලම්භචූලක නම් නියම් ගමටද, සුරඨා නම් ජනපදයෙහි සාතොදිකා නම් ගංතෙරට ද අඤ්ජන පර්වතය සමීපයටද දක්‍ෂිණ පර්වතයෙහි අවන්ති රට ඝනසේන නම් පර්වතය සමීපයටද දණ්ඩකී රජ්ජුරුවන්ගේ විජිතයෙහි කුම්භවතී නුවර මධ්‍ය දේශයෙහි ආරජගිරි පර්වතය සමීපයටද යවා අනුශිෂ්‍ය තාපසයෝ තමා සමීපයෙහි නතර කර ගත්හ. දණ්ඩකී රජ්ජුරුවන්ගේ විජිතයට ගිය කිසවච්ඡ තාපසයන්ට එනුවර සෙනෙවිරදුන් උවටැන් කරන්නාහ. එනුවර තනතුරෙන් පහ කරන ලද වෛශ්‍යාවක් වූවාය. ඈ මාළිගාවට යන්නී කිසවච්ඡ තාපසයන් දැක මොහු කාලකන්නියෙක් වන්නේය. මොහුගේ ශරීරයේ පාපප්‍රවාහ කොට ඉස් සොධා නහා යෙමියි කියා දැහැටි දඬු විකා තාපසයන්ගේ ජටා මතුවට කෙළ ගසා දැහැටි පොතු දමා ඉස් සෝදා නහා ගියාය. රජ්ජුරුවෝද කිසි කාරණයකින් ඈ සිහි කොට නැවත ඒ තනතුරම ලබා දුන්නාහ. මෝහයෙන් මුලා වූ ඈ තාපසයන්ගේ ශරීරයෙහි ප්‍රාපප්‍රවාහ කොට යසස ලද්දේ යයි සිතුවාය.

SANHIDA LANKA

නොබෝ දිනකින් තනතුරෙන් පහ වූ පුරෝහිතයාද ඇගෙන් උපදෙස් ගෙන තාපසයන් සමීපයට ගොස් දැහැටි කා කෙළගසා ඉස්සෝදා නා රජගෙට ගියේ රජතුමා කිසි කාරණයකින් ඔහුටද එම තනතුර නැවතත් දුන්නේය. මෑත භාගයෙහි රජ්ජුරුවන්ගේ පසල් දනව්ව කුපිත වූයේ ය. රජ්ජුරුවෝ සිව්රග සෙනඟින් යුක්තව යුද්ධයට සූදානම් වූහ. මූඪ පුරෝහිත බමුණු රජු අමතා දේවයන් වහන්ස, යුද්ධයෙන් ජය ගනු කැමති නම් ඔබගේ උයනේ වසන කාලකන්නී තාපසයාගේ ශරීරයෙහි ප්‍රාපප්‍රවාහ කොට යනු මැනවැයි කීයේය.

රජ්ජුරුවෝද එය පිළිගෙන සේනාවට එසේ කරන සේ නියම කොට තුමූ පළමු කොට දැහැටි පොතුද කොලද ජටා මතුයෙහි ගසා ඉස් සෝදා නා ගියහ. සියළු දෙනාම එසේ කලහ. ඔවුන් සැමදෙනා ගිය කල්හි සෙනෙවිරදුන් තාපසයන් සමීපයට අවුත් දැහැටි පොතු ආදිය දැක වහා ඒවා අස් කොට මනාකොට නහවා තාපසයන් වහන්ස, මෙසේ දුෂ්ඨකම් කලාවූ රජ්ජුරුවන්ට කුමක්වේදැයි විචාළේය. එම්බා උපාසකයෙනි, දෙවියෝ කළකිරී ගියහ. අදින් සත්වන දවස මේ සියළු රට නැසී යන්නේය. එසේ හෙයින් තෙපි වහා අන් රටකට යවයි කීහ. සෙනෙවිරදුන්ද බියපත්ව ගොස් ඒ බව රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ එබස පිළිනොගත්හ. සෙනෙවිරදුන් අඹුදරුවන් කැටුව වහා පළාගියහ. ඒ බව දැනගත් ශරභඞග ශාස්තෲන් වහන්සේ තාපසවරුන් දෙදෙනෙක් යවා කිශවච්ඡ තාපසයින් යහනාවකට නංවා ගෙන්වා ගත් සේක. රජ්ජුරුවෝ යුද්ධ කොට ජයගෙන නුවරට පැමිණි කල්හි හැම දෙවියෝ එක්ව වැසි වස්වා සියළු කුණු සෝදා හැර ශුද්ධ වූ පසු සුදුවැලි මත්තෙන් මල්වැසි වැස්වූහ. ඒ මත මසුරන් වැසිද, ඒ මත කහවනුද, ඒ මත දිව්‍යාභරණද වැස්වූහ. ඒ දුටු මනුෂ්‍යයෝ ප්‍රීතියෙන් ඒවා ගැනීමට පටන් ගත්හ. එවිට ඔවුන්ගේ ශරීර මතුවට ගිණිගෙන දිළිසෙන මහත් අවු වැසිද, ආයුධ ද අඟුරු ද, මහත් පර්වත කැටද, වැස ඉන්පසු සැටරියනක් උසට සියුම් වැලිවැස්සවූහ. මෙසේ සැටරියනක් උසට සියුම් වැලි වැස්සවූහ. මෙසේ සැට යොදුනක් රාජ්‍ය විනාශයට පැමිණ අරාජිත වූයේය. මේ රාජ්‍ය විනාශ වූ බව සියළු දඹදිව ප්‍රසිද්ධ විය. එකල ඒ රාජ්‍ය ආසන්න වූ රටවල කාලිංග, අඨක, භීමරථ යන රජවරු තුන්දෙන එක්වී කියන්නාහු පෙර දවස බරණැස ක්ෂාන්තිවාදී තාපසයන්ය හිංසාකොට පොළව පළාගෙන ගිය කළාබු නම් වූ කසී රජ්ජුරුවෝද එසේම පන්සියයක් තාපසවරුන්ව බල්ලන් ලවා කවන ලද නාලිකීර නම් රජ්ජුරුවෝද එසේම අංගීරස තාපසයන්ට හිංසා කොට විනාශයට පත් හශ්‍රබාහු අර්ජුන නම් රජ්ජුරුවන්ද එසෙම මේ කිසවච්ඡ තාපසයන්ට හිංසා කොට රාජ්‍යයත් සමඟ විනාශයට පත් දණ්ඩකී රජ්ජුරුවන්ද උපන්තැන් අපි නොදනිමු. අපිට දැන ගත හැක්කේ ශරභඞග ශාස්තෲවරුන් වහන්සේගෙන් පමණි. එසේ හෙයින් උන්වහන්සේ කරා එළඹ විස්තර විචාරම්හයි කියා ඒ රජදරුවෝ තුන්දෙනා වෙතවෙනම ගොස් ගොධාවරී ගංතෙරදී එක් වූහ.

එකෙනෙහි ශක්‍ර දේවේන්ද්‍රයෝ මේ රජදරුවන් තිදෙනා විචාරන්නට යන ප්‍රශ්නය සමග විචාරමියි අන්‍ය ප්‍රශ්න සතරක්ද ගොත් ගෙන දෙව්ලොවින් බට වූයේය. එදවස කිසවච්ඡ තාපසයන් කළුරිය කොට ඍෂිගණයා එක්ව ආදාහන කෘත්‍ය නිමවා ශ්‍රාවකයන් පිරිවරා උන්සේක්. රජදරුවන් එන පෙරහරේ හබ්දය ඇසී අනුශිෂ්‍ය තාපසයන් කැඳවා කුමක්දැයි බලන ලෙස නියම කෙළේය. ඒ තාපසයෝද යහපතැයි කලයත් ගෙන ගඟට ගියාහු, ඒ රජදරුවන් අතින් ආ පුවත අසා ප්‍රශ්න අසන්නට ආ බැව් දැන යහපත ජලස්නානය කොට දහනිවාගෙන එවයි නියම කොට එන්නේ ශක්‍ර දේවේන්ද්‍රයන් ප්‍රධාන දිව්‍ය සමූහයාද අහසින් එන්නා දැක කුමක් පිණිස ආවහුදැයි විමසා ප්‍රශ්න විසඳාගනු සඳහා පැමිණියෙමුයි කී කල්හි යහපත පස්සේ එවයි දන්වා තුමූ පැන් කලය ගෙන ආශ්‍රමය පැමිණ පැන් කලය තබා ඒ බව නායක තාපසයන්ට දැන්වූහ. ශරභඞග තාපසයෝ ඍෂි ගණය පිරිවරා මහ විසල් මළුවෙහි උන්නාහ. එකල රජදරුවෝ තිදෙනාද, ශක්‍රදේවේන්ද්‍රයෝද පැමිණ දොහොත් මුදුන් දී වැඳ තපස්වී වරයන්ගේ බඹලොව තෙක් පැතිරී ඇති ශීලගුණය වර්ණනා කොට අවසර ලබා ගෙන ප්‍රශ්න විචාරන්නාහු මෙසෙ කීහ. ශරභඞග ශාස්තෲන් වහන්ස, කුමක් නසා සත්වයා කිසිකලෙකත් ශෝක නොකෙරේද? කවර ධර්මයක්හුගේ ප්‍රහාණය ඍෂිවරයෝ වර්ණනා කෙරෙත්ද? මෙලොව කවරෙකු විසින් කියනලද පරුෂ වචන ඉවසිය යුතුද? ඒ කාරණය මට කියවයි කීහ. ශාස්තෲන් වහන්සේ ප්‍රශ්න විසඳන සේක්. ශක්‍ර දේවේන්ද්‍රයෙනි, සත්වතෙම ක්‍රෝධය නිසා කිසිකලෙකත් ශෝක නොකරන්නේය. තමාට කරන ලද ගුණමැ කීම ඔහුගේ ප්‍රහාණය ඍෂිවරයෝ වර්ණනා කරති. හීන මධ්‍යමෙත්කෘෂ්ට සියල්ලන්ගේම පරුෂ වචනය ඉවසිය යුතුය. පෙර නුවණැත්තෝ මේ ක්ෂාන්තියම උතුම්යයි කීහ. නැවතද ශක්‍රදේවේන්ද්‍රයෝ ශාස්තෲන්වහන්ස, තමාට උසස් හෝ තමාට සමාන අයගේ පරුෂ වචන ඉවසිය හැක්කේය. තමාට පහත් වුවන්ගේ පරුෂ වචන කෙසේ ඉවසිය හැක්කේද? එය මට කියවයි කියන්නාහ. ශක්‍රදේවේන්ද්‍රයෙනි, තමාට උතුම් අයගේ වචනය භය නිසා ඉවසිය යුතුය. සමාන අයගේ වචනය මත්තෙහි වන යමක් බලා ඉවසිය යුතුය. තමාට පහත් අයගේ පරුෂ වචනට ඉවසීම සත් පුරුෂයෝ උතුමැයි කියතියි කීහ. නැවත ශක්‍රයේ ස්වාමීනි, තවත් විමසමියි සැක තැන් විමසා දැන ඉවසීමෙන් වෛරය සන්සිඳෙන්නාහයි අසා ප්‍රීතියට පත් වූහ. ඉක්බිති අනෙක් රජදරුවෝ තුන්දෙන මේ ශක්‍රදේවේන්ද්‍රයෝ තමන්ගෙන් ප්‍රශ්න විචාරමින් කල් යවති. අපට අවකාශ නොදෙතියි සිතූහ. ශක්‍රයෝ උන්ගේ අදහස දැන තමන් සිතූ ප්‍රශ්න තබා ස්වාමීනී, අන් ප්‍රශ්නයක් විචාරමි. එය වදාල මැනවයි කියා දණ්ඩකී, නාලිකීර, අර්ජුන සහ කලාබු යන රජවරු බොහෝ අකුසල් කොට විනාශයට පත්වූහ. ඒ රජදරුවෝ කොයි උපන්නාදැයි විචාළාහ. ශාස්තෲන් වහන්සේ ඒ ප්‍රශ්න විසඳන්නේ ශක්‍රයෙනි, දණ්ඩකී රජ්ජුරුවෝ යොදුන් සියයක් පමණ කප අටගත්දා පටන් හළු නරකයෙහි ලා පැසෙන්නාහ. ඔහුගේ හිස මුදුනෙහි මහත් ගිණි පුපුරු වැගිරෙන්නේය. නාලකීර රජ්ජුරුවෝ එම අකුසල කර්මයෙන් තුන්ගව්වක් උස ශරීර ඇතිව නරකයෙහි උපන්නේ සුනඛයෝ නෙයෙක් තැනින් දිව අවුත් අල්වා සල්ව සල්වා ඇට පමණක් තිබියදී මාංශය අනුභව කරන්නාහ. අර්ජුන රජ්ජුරුවෝ සත්ත්සුල නම් නරකයෙහි

SANHIDA LANKA

පා උඩුකොට වැටී මහ දුක් අනුභව කරන්නේය. කලාබු නම් කසී රජ්ජුරුවෝ අවීචි මහා නරකයෙහි ඉපිද මහදුක් විඳින්නාහ. ඍධියෙන් උන් උපන් අපායවල් පෙන්වා නැවත අන්තර්ධාන කොට එහෙයින් නුවණැත් අය පින් කිරීමෙන් දෙව්ලොව ඉපිද සම්පත් අනුභව කරන්නේයැයි කියා ප්‍රශ්න විසඳූහ. රජවරුන් තිදෙනාගේ සැක දුරුව ගියේය.

ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රයන් වහන්ස, අවශේෂ ප්‍රශ්න සතරක් විචාරමියි. විසඳා වදල මැනවයි කියා, කෙබදු සත්වයා සිල්වතැයි කියත්ද, කෙබඳු සත්වයා නුවණැත්තේ යයි කියත්ද, කෙබඳු සත්වයා සත්පුරුෂ යයි කියත්ද කෙබඳු පුරුෂයා කරා පැමිණි ශ්‍රී තොමෝ ඔහු හැර නොයේදැයි විචාළේය. ශක්‍රයෙනි, යමෙක් තිදොරින් අකුසල් නොකෙරේද එබදු සත්වයා සිල්වත් යයි කියති. යමෙක් ධර්මාවබෝධ කොට අනුන්ට කියන්නට සමත් වේද පාපකර්ම වලින් වෙන්ව දානශීලාදි වූ පින්කම් කෙරේද එබදු සත්වයා නුවණැත්තේ යයි කියති. යමෙක් කළගුණ සලකාද, කළ්‍යාණ මිත්‍රද, දුකේදී පිහිට වේද එබඳු සත්වයා සත්පුරුෂ යයි කියති. යමෙක් සියළු ගුණයෙන් යුක්තද සතර සංග්‍රහ වස්තුවෙන් පුදන පුද්ගලයා කරා පැමිණි ශ්‍රී තොමෝ පලා නොයන්නේ යයි කීහ. එයින් ප්‍රසන්න වූ ශක්‍රදේවේන්ද්‍රයෝ ස්වාමීනී මේ ධර්ම හතරෙන් කවර ධර්මයක් ශ්‍රේෂ්ඨ වන්නේදැයි විචාළහ. එම්බා ශක්‍රයෙනි, තාරකාවන්ට අධිපති චන්ද්‍රයා මෙන් නුවණැත්තෝ සියළු ධර්මයන්ට වඩා ප්‍රඥාව ශ්‍රේෂ්ඨ යයි කියති. ස්වාමීනි, තව ප්‍රශ්ණයක් විචාරමි. කවර කුසලයකින් ප්‍රඥාව ලැබේද දැන ගනු කැමැත්තෙමියි කීහ. එවිට තාපයෝ පින්වත් ශක්‍රයෙනි, බහුශ්‍රැත පුද්ගලයින් සේවනය කෙරේද, පාලි උගනීද ගල කෙටූ අකුරක් මෙන් රන් බදුනෙහි වූ සිංහතෙල් මෙන් මනා කොට සුභාෂිතය දරාද අසාද එවැනි සත්ව තෙම් නුවණැති වන්නේය. එසෙම පංචකාමයෙහි නොඇලී ඉන්වෙන් වී ආදීනව දැනගත යුත්තේයයි ධර්ම දේශණා කළහ. එහි පැමිණි රජවරු තිදෙනා ප්‍රධාන පිරිසේ පංචකාම ගුණයන් ප්‍රහීනව ගියහ. ඒ දුටු තාපසයන් වහන්සේ ඔවුන්ට ප්‍රශංසා කොට තොපගේ ඒම සඵල වී යයි කීහ. ඒ පිරිස පරසිත් දත් තිපසයන් ගැන පැහැදී පැවිදිවීමට අවසර ඉල්ලාගෙන එහිම පැවිදිව භාවනා කොට ධ්‍යාන උපදවාගෙන ප්‍රීතියෙන් වාසය කලාහ. ශක්‍රයෝ වැඳ අවසර ගෙන දෙව්ලොවටම ගියහ.

එදවස සාලිස්සර, මෙධිස්සර, දේවල, නාරද, අනුශිෂ්‍ය සහ කිසවච්ඡ යන ප්‍රධාන අතවැසි තාපසයන් සත්දෙනා පිළිවෙලින් දැන් සැරියුත්, මහා කාශ්‍යප, අනුරුද්ධ, මහා කාත්‍යායන, උපාලි, ආනන්ද සහ මුගලන් යන ශ්‍රාවකයන් වහන්සේලා වූ අතර ශරභඞග ශාස්තෘ වූයේ දැන් ලොවුතුරා බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# අලම්බුසා ජාතකය

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් පළම් හරන ලද ස්ත්‍රීයක කෙරෙහි ලෝභ ඉපද වූ භික්ෂුවක් අරභයා මේ ජාතකය වදාළ සේක.

නිධාන කථාවः- තමාගේ නොකැමැත්තෙන් බුදුන් හමුවට ගෙන ආ ඒ භික්ෂුව අතින් මහණ, සැබෑද තොප පුරාණ දූතිකාව කෙරෙහි ලෝභ කෙළේදැයි විචාරා සැබවයි කී කල්හි එම්බා මහණ, මේ ස්ත්‍රීය තොපට අනර්ථව යෙදුනේ දැන් පමණක් නොවෙයි, පෙරත් ඈ නිසා ධනයෙන් පිරීහී තුන් අවුරුද්දක් මුළුල්ලෙහි විසඳව වැදහෙව සිහි ලැබගෙන මහ හඬින් හැඬුයේ වේදැයි ඉකුත්වත වදාළ සේක.

ආරාධනයः- භික්ෂූන් වහන්සේ,

ජාතක කථාවः- යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍යය කරන කල්හි කසීරට බමුණු මහසල් කුලයක ඉපිද වැඩිවිය පැමිණ ශිල්ප හදාරා වනගතව පැවිදිවූ එක් තාපසයෙක් වීය. ඒ අසළ වාසය කළ එක් මුවදෙනක් තාපසයන් මුත්‍රා කල ස්ථානයක තුබූ තණ අනුභව කොට පැන්බී පමණකින් තාපසයන් පිළිබඳ දරු ගැබක් හටගෙන එතැන් පටන් පන්සල සමීපයෙන් පිටත නොගොස් සිටීන්නී කල්යාමෙන් කුමාරයකු වැදුවාය. තාපසයෝ ඒ කුමාර යන් කෙරෙහි පුත්‍ර ස්නේහය උපදවා ඉසිසිඹග තාපසයෝ යයි නමක් තබා මනාකොට ඇතිදැඩි කොට වැඩිවිය පැමිණි කල්හි තමාම ශිල්ප උගන්වා පැවිදිකොට තමන්ගේ මහළු අවස්ථාවෙහි තාපස කුමාරයන් වද කැටුව නාරිවාහන නම් වනයට ගොස් එහි පිපියාවූ මල්කැන් දක්වා පුත, මේ හිමාලයෙහි මල් හා සමාන ස්ත්‍රීහුනම් ඇත. උන්ගේ වසඟයට ගියහොත් මහත් විනාශයට පත්වන්නේය. එබන්ඳන්ට වසඟ නොවීය යුතුයයි අවවාද කොට සිට ටික දිනකින් මියගොස් බඹ ලොව උපන්හ. එකල ඉසිසිඹග තාපසයෝ ධ්‍යාන උපදවා සොරවූ උන්ගේ තේජසින් ශක්‍රභවන උණුව ගියේය. ඒ බව දුටු ශක්‍ර දේවේන්ද්‍රයෝ "මොහු උග්‍ර තපස් රැක මාගේ ශක්‍ර පදවිය උදුරා ගත හොත් නපුරැයි වරදවා සිතා තාපසයන්ගේ සීල හෙද කරනු පිණිස දිව්‍යාඞගනාවක් යවම්යි අදහස් කොට දෙව්ලොව හැමතැනම බලන්නාහු අලම්බුසා නම් දෙවඟන ඊට සුදුසුයි නියමකොට ඈ අමතා උග්‍ර තපස් කම් කරන ඉසිසිඹග ළඟට ගොස් තොපගේ මායමින් ඔහුගේ ශීල භේදකොට දෙව්ලොවට එන මාර්ගය වලකවයි කීහ. අලම්බුසාව මුලදී එය නොඉසු නමුත් ශක්‍ර දේවේන්ද්‍රයාගේ ඇවිටිල්ල නිසා එය පිළිගෙන ඉසිසිඹග තාපසයන්ගේ පන්සලට ගොස්, අළුයම ධ්‍යානයෙන් නැගී සිට ගිනිහල් ගෙය අමදනාවූ තාපසයන් කරා පැමිණ ස්ත්‍රී විලාස දක්වමින් අභිමුඛයෙහි සිටියාය. තාපසයෝ ඈ දැක විචාරන්නාහු විසිතුරු ආභරණ වලින් සැරසී ඕසධී තාරකාවක් මෙන් බබළන තී කවර දිව්‍ය නිකායකට අයත් දිව්‍ය ස්ත්‍රියක්ද තොපගේ ශෝභාමත්වූ අඟ පසඟ දැකීමෙන් මාසිත බැඳී ගියේය. තී කවරෙක් දැයි විචාළහ. එවිට ඈ කියන්නී තපස්වීන් වහන්ස, ඔබගේ සිත මා කෙරෙහි බලවත්ව ඇළුන බැවින් විචාරන්ට කල් නොවෙයි, වහාම එනු මැනව. අපි දෙදෙනා එක්ව වැළඳගෙන පංචකාම රතියෙන් අභිරමණය කරම්හයි කියා තාපසයන්ව ඉක්මන් කරවනු සඳහා තමා ආ මඟටම යාමට පිළිපන්හ. ඈ යතියි සිතූ තාපසයෝ වහා දිවගොස් ඇගේ කෙස් වැටියෙන් අල්ලා ගත්හ. අලම්බුසාව වහා හැරී තපස්වී වැළඳගත්තිය. එකෙනෙහිම තාපසයන්ගේ ධ්‍යාන අන්තර්ධාන විය. බ්‍රහ්ම චාය්‍යීවෙනුත් චුතවූහ. ශක්‍රයන්ගේ අදහස්ද ඉටුවීය අලම්බුසාව ඉටුවූ සීල හෙදය නිසා ප්‍රීතියට පැමිණ තාපසයන් වැළඳගෙන සිටම අප දෙදෙනාට සැතපෙන පිණිස යහනක් එවුසේක් වීනම් යහපතැයි සිතන්නී අලංකාර ස්වර්ණ ෂය්‍යීඞකයක් එවූහ. ඈ එහි හිඳ ඉසිසිඹග තාපසයන් තමා ලෙහිලා දරාගෙන මිනිස් ගණනින් තුන් අවුරුද්දක් එසේම සිටියාය. ඒ කාලය මුළුල්ලෙහි තපස් වී විසංඥ භාවයට පැමිණි සිටියහ. මේ තුන් අවුරුදු කාලය අලම්බුසාවට එක් මොහොතක් තරම්වත් කාලයක් නොවීය. තුන් වර්ෂය ඉක්මී සිහිය යථා තත්වයට පත්වේගෙන එන අවස්ථාවේ තපස්වී අතපය සොළවා පුබුදින්නට පටන්ගත් කල්හි ඒ බව දැනගත් අලම්බුසාව යහන අතුරුදහන් කොට තොමෝත් අතුරුදහන් වූවාය. තාපසයෝ පිබිදී වටපිට බලා වර්ෂ තුනක් මුළුල්ලෙහි වල් බිහිවී මල් පිපී ගිය අවට බලා තමාගේ සීලය විනාශ භාවයට පත්වූ බැව් දැන මහ හඬින් හඬා කඳුළු වැගුරූහ. මෙතෙක් කල් හෝමයත් මන්ත්‍ර පිරීමත් නොකළෙමි. ගිනි දෙවියාට පූජාත් පිරිහෙළිමි. මෙතෙක් කල් කුමක් වූයේදෝයි මහත් හඬින් විලාප කියන්නට වූහ. ඒ වාක් විලාප අසා අලම්බුසා සිතන්නී ඉදින් මා එහි නොගියේ නම් ඔහු මට දොස් තවන්නාහ. මම ඔහුගේ ශිල භේදය කළබැව් කියම්යි සිතා එහි ගොස් තපස්වීන් වහන්ස, ඔබගේ ශිලය හෙද කරනු පිණිස ශක්‍රයන්ගේ නියමයෙන් පැමිණි මම ඔබව පොළඹවා මාගේ වසඟයට පමුණුවා ගෙන ශිල භේදයට පැමිණවිමි, මාගේ ශරිරස්පර්ශයෙන් මත් වූ ඔබ මෙතෙක් කල් කිසිවක් නොදත්තේයයි කීවාය. එබස් ඇසූ තාපසයෝ පියා දුන් අවවාද සිහිකොට මහත් ශෝකයට පැමිණ මාගේ ජීවත්වීමෙන් කවර ප්‍රයෝජනයක්ද මරණයට හෝ පැමිණෙමි. නැත්තම් නටුවාවූ ධ්‍යාන නැවත උපදවා ගනිම්යි සිතා වීය්‍යී වඩා

SANHIDA LANKA

නැවත ධ්‍යාන ඉපදවූහ එකල්හි තපස්වීන්ගේ තේජසින් ධ්‍යාන ඉපදවූ නියාව දැන අලම්බුසාව භයින් ත්‍රස්තව වහා පැමිණ ශක්‍රයන්ගේ ඉල්ලීම පිට කළ වරදට ක්ෂමාව ලබාගෙන දෙපය අල්ලා වැඳ පැදකුණු කොට ගියාහ. ශක්‍රයෝ ඈ දැක ඉතා සතුටුව කැමති වරයක් ගනුවයි කීහ. ඈ වර ගන්නී නැවත තපස්වී කෙනෙකුගේ සීල භේදය කරනු සඳහා තමාව මතු නොයවන ලෙසට පොරොන්දු කරවා ගන්නා වරයක් ලබා ගත්තාය.

එසමයෙහි අලම්බුසාව නම් මේ පූරාණ දූතිකාවය, ඉසිසිඞග තාපසයෝ නම් මේ උකටලී භික්ෂුවය. අවවාද දුන් තාපසයෝ නම් තථාගතයන් වහන්සේය.

SANHIDA LANKA

## සංඛපාල ජාතකය

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි උපාසක වරුන්ගේ පෙහෙවස් විසිමක් අරභයා මේ ජාතකය වදාළ සේක.

ආරාධනයඃ- උපාසකවරු

ජාතක කථාවඃ- යටගිය දවස රජගහ නුවර රාජ්‍යය කල මගධ රජ්ජුරුවන්ට දුයෝධ නමින් පුත් කුමරෙක් උපන්නේය. ඒ කුමාරයා වැඩිවිය පැමිණ ශිල්ප ශාස්ත්‍රය ඉගෙන නිමවූයේ පිය රජ්ජුරුවන්ගේ නියමයෙන් රාජ්‍යයට පත්විය. පිය රජ්ජුරුවෝ තාපසව එම උයනෙහිම වාසය කරන්නාහ. පුත් රජ්ජුරුවෝද දවසට තෙවිටක් පිය තාපසයන් සමීපයට ගොස් දුක් සැප විචාරා එන්නාහ. ඒ හේතුවෙන් තාපසයන්ට ලාභ සත්කාර බහුල විය. කිසිම ගුණයක් වඩාගත නොහැකි විය. එයින් කළකිරුනු තාපසයෝ පුත්‍ර රජ්ජුරුවන්ටද නොදන්වා අන් තැනකට යෙමියි සිතා නික්මී මහිංසක රාජ්‍යයෙහි සංඛපාල නම් වූ විලිනන් නික්මුණු කත්තපේත නම් ගංතෙර චන්දන නම් පර්වතය අසළ පන්සලක් කොට එහි වැඩ ධ්‍යාන උපදවා ගෙන වාසය කරන්නාහ. එකල සංඛපාල නම් විලින් නා රජ්ජුරු කෙනෙක් පිරිවර සමග තාපසයන් සමීපයට අවුත් බණ අසා යන්නාහ. දිනක් තාපසයන්ගේ පුත් රජ්ජුරුවෝ පියා සොයාගෙන පිරිවර සමඟ තාපසයන් සමීපයට අවුත් බණ අසා යන්නාහ. දිනක් තාපසයන්ගේ පුත් රජ්ජුරුවෝ පියා සොයාගෙන පිරිවර සමඟ ආශ්‍රම පදයට පැමිණියාහු බණ අසමින් හුන් නාරජු දැක තොරතුරු අසා තුමුද නාග සම්පත්තියට කෙරෙහි ලොභ උපදවාගෙන පිය තාපසයන්ට කීප දිනක් උවටැන් කොට රාජ්‍යයට පැමිණ වඩ වඩාත් පින්කොට මිය ගොස් නාග භවනෙහි සංඛපාල නම් නාරජව උපන්හ. ටික දිනකින් අළුත උපන් නා රජ්ජුරුවෝ තම නාග සම්පත්තිය කෙරෙහි කළකිරි නැවත මනුෂ්‍යාත්ම භාවය පතා පින් කරන්නාහු පෙහෙවස් වසනු සඳහා පසළොස්වක් දින නා භවනින් නික්ම කන්ත පේත නම් වූ ගඟට නුදුරු එක් මාවතක් හා අඩිපාරක් අතරවූ තුඹසක් බලාගෙන පෙහෙවස් ඉටා "මාගේ සම හෝ මස් උවමනා කෙනෙක් ඇරගනිත්වා "යි ශරිරය දාන මුඛයෙහි යොදවා තුඹස මතුයෙහි හිස තබාගෙන පෙහෙවස් රකින අතර දඩයම සඳහා වලට ගිය සොළොස් දෙනෙක් කිසිවක් නොලැබ එන්නේ තුඹස මත්තෙහි හොත් නාරජුන් දැක කිසිවක් නොලද අපි මෙයින් යැපෙමුයි කියා දරණ උලින් අමුණා ගෙන යෑමට ලඟට ගියාහ. නා රජ්ජුරුවන්ගේ ශරීරය දඬු ඔරුවක් සා පමණය. ඉද්ද මල් දමක් වූ ශෝභා ඇත්තේය. දෙඇස් ඔළිඳ ඇට සේ බබළන්නේය. තමා සමීපයට එන භොජ පුත්‍රයන් දුටු නා රජ්ජුරුවෝ අද මාගේ අදහස සමෘද්ධි වන්නේයයි සිතා ඉස දරණ වැල ඇතුළෙහි තබා හොත්තාහුය. ඒ පුරුෂයන් නා රජ්ජුරුවන් බිම හොවා අට තැනකින් උල් ගසා වේවැලින් ලීයක බැඳගෙන ඔසවා ගෙන මහා මාර්ගයට බටහ. නා රජ්ජුරුවන්ගේ හිස බිම ඇදෙන්නේය. ඒ දුටු පුරුෂයෝ දැඩි හුයක් ගෙන නාසා පුටුයෙන් අමුනා එය ලී කෙළවර ගැටගසා ගෙන යන්නාහ. නා රජ්ජුරුවෝ මේ සියල්ලක් ඉතා මෛත්‍රියෙන්ම ඉවසූහ. මෙසේ යන මාර්ගයෙහිද පන්සියක් ගැල් පටවාගෙන යන වැදැරට මියුළු නුවර වාසීහු ආලාර නම් එක් කෙළඹී පුත්‍රයෙක්ද තඩලාගෙන ගෙනයන නා රජ්ජුරුවන් දැක කරුණා උපදවා ඔවුන් අමතා ගොන් සහිත ගැල් සොළසක්ද තව බොහෝ වස්තුවද දී නා රජ්ජුරුවන් ගලවාපුව. නා රජ්ජුරුවෝ නාග භවනයට ගොස් අප්‍රමාදව පිරිවර සමඟ අලාර කෙළඹී පුත්‍රයා සමීපයට පැමිණ එහි සම්පත් වර්ණනා කොට ඔහුව එහි කැඳවා ගෙන ගොස් තුන්සියයක් නාග කන්‍යාවන් පාවා දී දිව්‍යමයවූ කාම ගුණයෙන් සන්තර්පණය කළහ. ආලාර කෙළෙඹී පුත්‍රයාද අවුරුද්දක් සම්පත් විද කියන්නේ රජ්ජුරුවන් වහන්ස, මම මහණවූ කැමැත්තෙමි කියා තවුස් පිරිකර ඇරගෙණ නාග භවනයෙන් නික්ම හිමාල වනයට ගොස් පැවිදිව බොහෝ කල් එහි වැස මෑත භාගයෙහි බරණැසට ආවහු එරට රජ්ජුරුවෝ තාපසයන් දැක ඊර්‍යාපථයෙහි පැහැද රජගෙට කැඳවා දන් වළදවා සතුටු සාමිචිව කථාකොට සියළු තොරතුරු විමසා නාග භවනයෙහි සිට ඒ සම්පත් අතැර මහණවූ නියාව අසා මගධ රට උපන් දුයෙයීාධන රජතුමා පින් කොට සංඛපාල නම් නා රජව උපන් බව දැන වඩාත් සතුටට පත්ව කියන්නාහු තාපසයෙනි, නුවණැති ඔබව ඇසුරු කළ මේ ස්වල්ප වේලාවෙන් බොහෝ දේ දැන ගතිමියි තව තවත් පින් කෙරෙමියි කියන්නා තාපසයෝ මත්තෙහි ද අවවාද කොට බණ කියා තුන්මසක් එහි වැස හිමාලයට වැ මියගොස් බඹලොව උපන්නාහ.

SANHIDA LANKA

එසමයෙහි පියා වූ තාපසයෝ නම් දැන් කාශ්‍යප ස්ථවිරයෝය. බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. සංඛපාල නා රජ්ජුරුවෝ නම් බුදුරජාණන් වහන්සේය.

# චුල්ල සුතසොම ජාතකය

දෙව්රම් වෙහෙර වැඩ වාසය කළ බුදුරජාණනන් වහන්සේ විසින් මහභිනික්මන් අරභයා මේ ජාතකය වදාළ සේක.

මහා ජනක ජාතකයේ මතු එන්නේය.

භික්ෂුන් වහන්සේ

යටගිය දවස බරණැස් නුවර සුදර්ශන නම් නුවර රාජ්‍යය කළ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට පුන්සඳ මඬලකට බඳු ශොභාමත්වූ මුහුණක් ඇති හෙයින් සෝමනස්ස යන නම ලත් පුත් කුමාරයෙක් විය. ඒ කුමාරයෝ වැඩිවිය පැමිණ පසුව ශ්‍රවණය කිරීමෙහි ඉතා කැමති හෙයින් සුතසෝම නම් වූහ. සුතසෝම කුමාරයෝ සියළු ශිල්ප නිමවා රාජ්‍යයට පත්ව චන්ද්‍ර දේවීය නම්වූ තම බිසව සමඟ දස රාජ ධර්මයෙන් යුතුව බොහෝ කාලයක් රාජ්‍යය කොට දූ දරුවන් ඇත්තාහු ගෘහ වාසයෙහි කලකිරී මහණ වූ කැමතිව දිනක් කපුවා කැඳවා කපුව, යම්දිනක මාහිස නර කෙසක් දුටුයෙහි වීනම් මට කියාලවයි කියා මැත භාගයෙහි කපුවා හිස නර කෙස ගෙන රන් අඩුවෙන් පෑ කල්හි මාගේ ශරිරය ජාවෙන් මඬනා ලදැයි මහත් බියට පැමිණ රටවාසීන් රැස්කොට "මා හිස නර කෙසක් හට ගත්තේය. මම මහළුව ගියෙමි. එසේ හෙයින් මහණවනු කැමැත්තෙමි"යි කීහ. එබස් ඇසූ ඇමති ගණයාද මව්පිය දෙදෙනාද සොළොස් දහසක් අන්තඃපුර ස්ත්‍රීහුද තමාගේ චන්ද්‍රා නම් අග බිසවද දූ දරුවෝද නොයෙක් කරුණු කියා එය වළක්කන්ට උත්සාහ කරද්දී මහජනයා බිම පෙරළි පෙරළි හඬද්දී උන්ට නොයෙක් ලෙසින් බණ කියාත් නම්මවා ගත නොහැක්කේ තම මළණුවන් වූ සෝමදත්ත කුමාරයන්ට රාජ්‍ය පවරා උඩුමහලේ සිට කෙස් වැටිය කපා මහජනයා මැදට විසිකොට ම තොප හැම කිසිම සම්බන්ධයක් නැත්තෙමි.

තොපගේ රාජ්‍යය තොපම බලා ගනුවයි කියා පරිවාර ජනයන් ලවා සල්පිලින් තවුස් පිරිකර ගෙන්වාගෙන කපුවා ලවා දැලි රැවුල බාවාගෙන කාෂාය වස්ත්‍රය හැඳ මැටි මැටි පාත්‍රට වම් උරෙහි එල්වාගෙන සැරයටියක් අතින් ගෙන ප්‍රාසාදයෙන් බිමට බැස විථි මධ්‍යයෙන් නික්මුණාහ. ඒ වේලාවේ රජ්ජුරුවන්ව කිසිකෙනකුට හැඳිනගත නොහැකි විය. ප්‍රාසාදයට නැගි සෑම කෙනෙක්ම රජ්ජුරුවන් නොදැක විසිරීගිය රාජාභරණ දැක මහත් ශෝකයට පත්වූහ. මුළු නුවරම ශෝකයෙන් ඇලලී ගියේය. රාජාඞගනයට රැස්වූ මහජනයා අපේ සුතසෝම රජ්ජුරුවන් වහන්සේ රාජ්‍යය හැර මහණවූහ. අපිත් ඒ අනුව යම්හයි දූ දරුවන් අත අල්වාගෙන තාපසයන් වසන්නාවූ ස්ථානයම් සොයාගෙන ගියාහ. රජමාළිගාවේ සියලු දෙනාද අඬා වැළෙමින් එපරිද්දෙන් පිටත්වූහ. තාපසයන් වහන්සේ ශක්‍රයාගේ නියමයෙන් හිමාලය ප්‍රදේශයෙහි විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් මවා දුන් ආශ්‍රමයට ගොස් වැඳ තුමු ඒ පිරිකර ඇඳ මහණව අවශේෂ ජනයාව මහණ කරවූහ. කල්යාමෙන් ඍෂි ගණයාගෙන් තිස්යොදුන් ආශ්‍රම භූමිය පිරී ගියේය. තාපසයන් වහන්සේ ඔවුන්ට නිතරම පංච කාමයෙහි ආදීනව දක්වමින් අවවාද කරන සේක. ඔවුන් සියළුදෙනාම ධ්‍යාන උපදවා ඉන් චුතව ගොස් බඹලොව උපන්නාහ.

එසමයෙහි දෙමව්පිය දෙදෙනා නම් දැන් සුද්ධෝදන, මහාමායා දෙදෙනාය, චන්ද්‍රා බිසව වූයේ යසෝදරා දේවීයයි. වැඩි මහළු පුතණුවෝ නම් රාහුල කුමාරයෝය. කිරීමව්වූයේ ඛුජ්ජුත්තරා වෝය. කුලවර්ධන කපුවා නම් මුගලන් තෙරුන් වූ අතර සෝමදත්ත කුමරු වූයේ ආනන්ද තෙරුන්ය. සුතසෝම රජ්ජුරුවෝ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# නලිනි ජාතකය

සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන සේක්. පුරාණ දූතිකාවක් කෙරේ ලොබ කළ භික්‍ෂුවක් අරභයා මේ ජාතකය වදාල සේක.

නිදන කථාව - දිනක් බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි පනවන ලද බුද්ධාසනයෙහි වැඩ සිටි සේක් භික්‍ෂූන් විසින් කැඳවාගෙන එන ලද එම භික්‍ෂුව අමතා සැබෑද මහණ, ශාස්ත්‍රයෙහි කළකිරුනෙහිදැයි අසා සැබව ස්වාමිනී, පුරාණ දූතිකාව නිසා යයි කී කල්හි මහණ පෙරත් තොප ඈ නිසා ධ්‍යානයෙන් පිරිහී විනාශයට පැමිණියේවේදැයි ඉකුත්වත වදාල සේක.

ආරාධනය- භික්‍ෂූන් වහන්සේ

ජාතක කථාව - යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හි කසීරට බමුණු මහසල් කුලයක උපන් උතුමෙක් ශිල්ප නිමවා වැඩිවිය පැමිණ හිමාලයට වැද පැවිදිව ධ්‍යාන උපදවා වසන්නේය. එකල එක් මුවදෙනෙක් ඒ තාපසයන්ට මුත්‍රා කලාවූ ස්ථානයේ තිබූ තණ අනුභව කොට එපමණකින් දරුගැබ පිළිසිඳ තාපසයන් කෙරෙහි ස්නේහයෙන් දුර නොගොස් එහිම වසන්නී. නොබෝ දිනකින් කුමාරයකු වැදූවාය. තාපසයෝ කුමාරයන්ව ලෙන වඩා වර්ධනය කොට ඉසිසිංග තාපසයෝ යයි නම් තබා මහණ කොට කිසුණු පිරියම් ඉගැන්වීය. ඒ තාපස කුමාරයෝත් නොබෝ දිනකින් ධ්‍යාන භාවනා කොට සමාපත්ති උපදවා ගෙන දමනය ලද ඉඳුරන් ඇතිව ධ්‍යාන සැපයෙන් කල් යවන්නාහ. දිනක් ඒ තාපසයන්ගේ තේජසින් ශක්‍රයන්ගේ අසුන උන් නොකැමැති පරිද්දෙන් කම්පිත වූයේය. ඒ දුටු ශක්‍රයන් මුන්ගේ ශීලය කවර හෝ උපායකින් බිඳුවම්යි සිතා තුන් අවුරුද්දක් මුළුල්ලේ කසීරට වැසි වට නොදී නැවතුහ. එකල සියළුම රාජ්‍යය ගින්නෙන් ද ගියාක් මෙන් වූයේය. ගොයම් බත නැති විය. පීඩිත වූ මනුෂ්‍යයෝ රාජාංගණයට රැස්ව මෙය පැමිණිලි කළහ. රජ්ජුරුවෝ එබස් අසා පෙහෙවස් රක්‍ෂා කොටත් වැසි වස්වා ගත නොහැකි වූවාහුය. දිනක් සක් දෙවිඳු මැදියම් රෑ රජ්ජුරුවන්ගේ ශ්‍රී යහන් ගබඩාවට වැඳ ආකාශයෙහි සිට තමා ශක්‍රයන් බැව් හඟවා කිමෙක්ද? රජතුමනි, වැසි නොවස්නා කාරණය දන්නෙහිදැයි විචාරා නැතැයි කී කල්හි එම්බා රජ්ජුරුවනි, ඉසිසිංග නම් වූ මහා තපස් ඇති එක් තාපසයෙක් හිමාලයෙහි වසන්නාහ. ඔහු නිතර වැසි වස්නා කල්හි කිපී අහස දෙස බැලූහ. ඒ කාරණයෙන් වැසි නොවසින්නේ යයි කීහ. එවිට රජ්ජුරුවෝ මීට කුමක් කළයුතුදැයි විචාරන්නා ශීලය භෙද කළයුතුය. මහරජ, නලිනී නම් වු තොපගේ දුව ඊට සමර්ථ වන්නේය. ඈ කැඳවා ඊට කරුණු කියා පිටත් කළ මැනවැයි කියා ශක්‍රයෝ තමාගේ සථානයට ගියහ.

රජ්ජුරුවෝ දෙවන දින නලිනී නම් වු තම දියණිය කැඳවා දියණියෙනි, තොපගේ මේ රාජ්‍යයද ජනපදවල්ද දුර්භීක්‍ෂව නසින්නේය. එබැවින් වැසි වට නොදෙන්නා වූ ඒ තාපසයන්ව තොපගේ වසඟයට ගෙන සීලය බිඳ ඔහුව මා සමීපයට කැඳවාගෙන එවයි කීහ. කුමාරිකාවද එබස් අසා යහපතැයි පිළිගෙන ඇමති පිරිවර සමග පිටත් වී වැද්දන් පෙන්වන ලද මාර්ගයෙන් හිමාලයට ගොස් පූර්වාහණ වේලෙහි පිරිස මඟ ආරක්‍ෂා පිණිස නතර කරවා කුමරිය පමණක් ආශ්‍රම පදයට පැමිණියාය. ඒ වේලෙහි පිය තාපසයන් වහන්සේ පලවැල සදහා වනයට ගියේ පුත් වූ ඉසිසිඞග තාපසයන් පමණක් ආශ්‍රමයෙහි සිටියේය. කුමාරිකාවද හුයින් වෙළන ලද පෙද වටක් ගෙන ඉන් ක්‍රීඩා කරමින් ස්වර්ණාභරණයෙන් සැරසී පන්සල් දොරකඩට පැමිණියාය. එවිට ගල්පෝරුවක් මත වූ ඉසිසිඞග තාපසයෝ එන්නා වූ කුමරිය දැක භයින් ත්‍රස්තව පන්සලට වැඳ සිටියේය. කුමාරිකාව පෙද වට ගෙණ කෙළිමින් පන්සල් දොරකඩ සමීපයෙහිම සිටියාය. තාපසයෝ සිතන්නාහු මේ යක්‍ෂණියෙක් නම් බිය වී පලාගිය මා අල්ලා මුරු මුරු ගා කන්නේය. මේ යක්‍ෂණියෙක් නොව තාපසයෙක් වන්නේ යයි සිතා එළියට පැමිණ මීට පෙර තමා පෙදවට නුදුටු හෙයින් ගසක ගෙඩියකැයි සිතා තොප අත ඇත්තේ කුමන ඵලයෙක් දැයි විචාළාහ. එවිට කුරිය බොරු ගොතා කියන්නී. තාපසයෙනි, ගන්ධමාදන පර්වතය සමීපයෙහි මාගේ පන්සලෙහි මෙවැනි පල ඇති බොහෝ ගස් ඇත. මේ පල මෙසේ දුර දමන ලද්දේ සමීපයටම එන්නේය. අත්හැර නොයන්නේ යයි කීවාය. තාපසයෝද එබස් අසා ඈද තාපසයෙක් යයි සිතා පිළිසඳර කථා කොට පන්සල තුළට පැමිණ වැඳ හිඳුව, මුව සෝදා විඩා හැර මේ මිහිරි පල අනුභව කරවයි කීහ. කුමරියද යහපතැයි ඒ තුළට වැඳ කොළ ඇතිරියෙක්හි උන්නේය. එසේ උන්නාවූ කුමාරිකාවන්ගේ දුහුල් වස්ත්‍ර පහව ලැජ්ජා ස්ථානය පෙනෙන්ට විය. තාපසයෝ ස්ත්‍රීන්ගේ යෝනි කිසිදිනෙක නුදුටු හෙයින් පහවූ වස්ත්‍රයෙන් ඒ අවයවය දැක ඒකාන්තයෙන්ම මේ තුවාලව වනයෙක්ම යයි සිතා විචාරන්නාහු. එම්බා තාපසයෙනි, තොපගේ මේ දෙකලව අතර කළු වූ පැහැ ඇති මනාකොට පිලියම් කරන ලද සිප්පි මුබයක් බඳුදෙයක් පෙනෙන්නේය. ඒ කුමන තුවාලයක්ද තොපගේ උත්තමාඞගයයි කියන ලද නිමිත්තස්ථානය නොපෙණෙන්නේ මන්ද? එය ශරීරය තුළට වැද ගියේ දැයි විචාළහ. එවිට ඈ කියන්නී තාපසයෙනි, මෙතැන වනව ගොස් කණ්ඩුතිය ස්වාභාව කොට ඇති මම නිතර සැපයක් නොලබමි.

SANHIDA LANKA

පින්වත් ඔබට එය ගුණ කරන්නට හැකි නම් එසේකොට මගේ දුක දුරු කරවයි කීහ. තාපසයෝද ඈ කී බොරු බස් සැබෑවක් යයි සිතා ඉදින් ඔබට මාගෙන් සැපයක වී නම් එය කෙරෙමියි කියා ඇගේ සියුම් වස්ත්‍ර අස්කොට දෙකලව විවරකොට ලජ්ජා ස්ථානය හොඳින් බලා කියන්නාහු එම්බා තාපසයෙනි, තොපගේ මේ තුවාල වූ වනය ඉතා ගැඹුරුය. ලේ සහිත කුණෙන් ගැවසී ගත්තේය. මදක් දුර්ගන්ධයද ඇත්තේය. එබැවින් මේ වනයට මම කොළ සුඹුළු ආදිය ගෙන යොදා සුව කරන්නෙමියි කීහ. එබසට ඈ කියන්නී තාපසයෙනි, මන්ත්‍ර යෝගයක් වේවයි ඖෂධ යෝගයක් වේවයි මේ වනයට සුවයක් ගෙන නොදෙයි. එබැවින් තොපගේ අඞගජාතය මෙහි ඝෂ්ටනය කොට ඔබා මට සැපයක් ලැබෙන පරිදි කරවයි කීහ. ඒ ඇසූ තාපසයෝද එයද වෙදකමෙකැයි සිතා මෛථුන ධර්මයෙන් සිල් බිඳීමක් වන්නේය, ධ්‍යාන පිරිහෙන්නේය, යනාදී ආදීනව නොදැන මෛථුන ධර්මයෙහි සිත් සේ යෙදුනාහ. එකෙණෙහි සීලයෙන් බිඳී ධ්‍යානයෙන් පිරිහුණාහ. මෙසේ දෙතුන් විටක්ම සංසර්ගයෙහි යෙදී දෙදෙනාම පන්සලින් පිටව ජලස්නානය කොට විඩා සංසිඳුවාගෙන නැවත පන්සලට වැද තාපසයෙකුයි යන ස්ථිර හැඟීමෙන් යුතුව සිටින තැන් විචාළහ. ඈ කියන්නී තාපසයෙනි, මේ අසපුවට උතුරු දික් භාගයෙහි ඛේමා නම් වූ ගඞගා තීරයෙහි මිහිරි පලවැලවලින් පිරි උයන් පිරිවැරූ ගී ගයන කිඳුරු ලියන්ගෙන් අවට ශොභාමත් වූ ආශ්‍රමයෙක් ඇත. මම එහි වාසය කරමි. කැමත්සේක් නම් තොපද එහි යාමට ආව මැනව, නොයනු කැමති සේක් නම් මම යෙමියි නලිනි කුමාරිකාව පිටත් වූවාය. එවිට ඉසිසිඞග තාපසයෝද ඈ අමතා තපස්වීනි, මගේ පියා වනයට ගියේය. දැන් එන සේක. උන්වහන්සේ පලාඵල ගෙණකල අවසර ගෙන අප දෙදෙනම තොප වර්ණනා කළ අසපුවට සැපසේ යම්හයි කීහ. එවිට ඈ සිතන්නී මේ තාපසයෝ වූ කලි වනයේම වැඩී වර්ධනය වූ බැවින් ස්ත්‍රීත්ව නොහඳුනති. මුන්ගේ පියාණෝ මා දුටු විට ස්ත්‍රී නියාව හඳුනා මගේ ඔළුව පලාපියා එළවා දමන්නටද හැක්කේය. එබැවින් උන් එන්නට පළමුව යාමට වටනේය. මම ආ කාරිය සමුර්ධව ගියේයැයි සිතා තපස්වීන් මා හා කැටව ඒමට උපායක් කියන්නී. තාපසයන් වහන්ස, මට මෙහි පමාවිය නොහැක. මාගේ පන්සලට යන මාර්ගය බොහෝ උතුම් තපස්වීවරයන් වසන්නාහ. නුඹවහන්සේව එහි කැඳවාගෙන යන ලෙස මම ඔවුන්ට දන්වා යෙමි. උන් අතින් විචාරා වඩිනු මැනවයි. කියා ඈ ආ මාර්ගයෙන්ම අමාත්‍යයන් සමීපයට ගොස් ඔවුන් සමඟ බරණැස් නුවරට ලඟා වූවාය. ශක්‍රයාද ඉතා සතුටුව සියළු රට වැසි වැස්සූහ. ඉසිසිඞග තාපසයන්ගේ සියළු ශරීරය ඇගේ පලා යෑමෙන් පසු දැවෙන්නට විය. වැහැරී සිවුර හිස පාදාන්තය දක්වා වසාගෙන වැදහොත්තාහුය.

පියාණෝ සවස් වේලෙහි පැමිණ පුතනුවන් සොයා වැදහොත් තැන් දැක හිස පිරිමැද වතාවත් පිරිහෙළා උකටලීව සිටින්නට හේතුව විචාළහ. එබසට ඉසිසිඞගයෝ කියන්නාහු පියාණෙනි, මේ පැමිණියේ ශරීරාලෝකයෙන් මේ පෙදෙස පිරී ගියේය. ඉඳුනිල් මැණිකක් වන් කෙස්වැටියෙන් පිරි හිස ශෝභාවත්ය, දැලි රැවුල් නැත්තේය, පැවිදි වූ නොබෝකල් ඇත්තාහුය, බොහෝ පළඳනාය, පපුවෙහි මනාව වැඩුණු මස්ගඩු දෙකක් ඇත, පියාණෙනි, අපි මේ වැහැරී චීවර දරතත් ඒ තපස්වී රන්වන් සිවුරු දරන්නාහ. ඔහුගේ දන්තයෝ ඉතා විසිතුරුය. අලමුල් නොකෑමෙන් සකක් මෙන් විසිතුරුය. කථාව ඉතා මිහිරි වන්නේය. ඒ මධුර ස්වරයෙහි මාගේ සිත තදින් ඇලුනේය. උන් නැවත දකින්නට බලවත් අභිලාෂ ඇත්තෙමි. තවද පියාණෙනි, ඔහුගේ දෙකලව අතර එක් තුවාල වූ වනයක් ඇත. එහි බෙලි තුඩක් මෙන් සිප්පි වැදගෙන තිබෙන්නේය. හාත්පස මට සිළුටුය, සියුම් කැකුළක් හා සම වන්නේය. ඒ තාපයන්ගේ ඉල්ලීමෙන් මාගේ මාගේ අඞගජාතය එහි ප්‍රවිෂ්ට කොට කටියෙන් පෙලුයෙමි. පියාණෙනි, ඒ තාපසයා ගිය වේලේ පටන් යාග ක්‍රියා මාගේ සිතට අභිප්‍රාය නොවන්නේය. මන්ත්‍ර නොවැටහෙන්නේය. ඔහු නොදැක මට මෙහි සිටිය නොහැක. මම ඔහු සිටින දිශාව දනිමි. එහි පමුණුවාළුව මැනව, පියාණෙනි පමාවුවහොත් මා මෙහි දිවිහරිමි. ඊට පෙර මා ගෙන ගොස් තරුණ තපස්වීන් වසන පන්සලට එවමැනවයි ඉසිසිඞගයෝ විලාප කියන්නට වන්හ. ඒ බැගෑහඬ අසා පිය තාපසයන් වහන්සේ එක් ස්ත්‍රියක විසින් මුන්ගේ ශීල භේදය කරන ලද්දේය. මුවදෙනෙකගේ බඩින් ඉපිද වනයේම ඇතිදැඩි වූ හෙයින් පිරිමින් මිස ස්ත්‍රීන් දැක නැත. අද මොහු ස්ත්‍රියකට වසඟ වී ඇත. ඉන් ගලවා ගත යුතුයයි සිතා අවවාද කරන්නේ පුත, ඉසිසිඞගයෙනි, ගිනිදෙවියාට කරන ලද පූජාවෙන් ඒකාලෝක වූ ගාන්ධර්වයන් හා දිව්‍යාප්සරාවන් විසින් නිතර සෙවිනා ලද සෘෂින්ගේ මෙබඳු ආශ්‍රම පෙදෙසෙහි වසන්නා වූ තෙපි යම් රතියකට පැමිණියාහු වී නම් එබඳු උකටලීයව නුවණැත්තෝ නොපැමිණෙන්නාහ. පුත, මේ මිනිස් ලොව යම් යක්ෂණී සංඛ්‍යාත වූ භූතයෝ නා නා වෙසින් ඇවිද තම වසඟයට පැමිණියවුන් අල්ලාගෙන අනුභව කරන්නාහ. ඒ භූතයන් නුවණැත්තා වූ සත්වතෙමේ සේවනය නොකරන්නේය. එසේ හෙයින් තෙපි ඒ යක්ෂණිය විසින් දක්නා ලදුව තොප දැක අල්වාගත් ගමනේ නොකා ඇරපුයේ තොපගේ පින් නිසාමයයි අවවාද කළහ. ඉසිසිඞගයෝ පියාණන්ගේ බස් අසා ඕ තොමෝ යක්ෂණියක් යයි භයින් ත්‍රස්තව ඈ

SANHIDA LANKA

පිළිබඳ සිත පහ කොට පියාණෙනි, මම ඈ නිසා මෙතනින් පිට නොවෙමි. මින්මතු නොසිතමි. මට ක්ෂමාකළ මැනවයි වැද පියාණන් ක්ෂමා කරවා ගත්හ. පිය තාපසයන් වහන්සේ ඔහු අස්වසා පුත, තෙපි මෙසේ වූ මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්ෂා යන සතර බ්‍රහ්ම විහාර භාවනාවන් වඩවයි කීහ. ඉසිසිඞග තාපසයෝ ඒ වඩා ධ්‍යාන ලබා බඹලොව උපන්නාහ.

එසමයෙහි නලිනි කුමාරිකාව නම් මේ පුරාණ දූතිකා වන්නීය. ඉසිසිඞග තාපසයෝ නම් උකටලී මහණය. පිය තාපසයන් වහන්සෙ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# සොනක ජාතකය

තවද විචිතොපචිත පාරමිතා ඇති ගෞතම ගොත්‍ර ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි දිව්‍ය බ්‍රහ්ම ආර්‍ය්‍ය ඊර්‍ය්‍යාපථ විහරණයෙන් දවස් යවන සේක්. මේ ජාතක ධර්ම දේශනාව තමන් වහන්සේගේ මහබිනික්මන් අරභයා වදාළසේක.

සර්වඥයන් වහන්සේ දම්සභාමණ්ඩපයෙහි රැස්ව නෛෂ්ක්‍රම්‍ය පාරමිතා වර්ණනා කරමින් වැඩහුන් මහා කාශ්‍යප ස්ථවිර ප්‍රමුඛ භික්ෂූන් වහන්සේ මධ්‍යයෙහි පනවන ලද බුඬාසනයෙහි යුගඳුරු මුදුනෙහි දිලිසෙන ළහිරු මඬලක් මෙන් සවණක් ඝන බුඬරස්මීන් විහිදුවමින් වැඩහිඳ මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා සර්වඥයන්ගේ මහබිනික්මන් වර්ණනා කරමින් හුනුම්දැයි දැන්වූ කල්හි මහණෙනි සර්වඥයෝ දැන්මතු මහබිනික්මන් කළාහු නොවෙති, පෙරත් ගිහිගෙය ඇරගොස් මහණ වූවෝ වේදැයි වදාරා භික්ෂූන් විසින් ආරාධිත වූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්?

යටගිය දවස මගධ රට රජගහ නුවර මගධ නම් රජ්ජුරු කෙනෙකුන් දාන ප්‍රිය වචනාර්ථචරියා සමානාත්මතාය යන සතර සංග්‍රහ වස්තුවෙන් ජන රංජනය කරන කල්හි පුරණ ලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන් අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ උපන්හ. ඕහට නම් තබන්නාවූ දෙමව්පියෝ අරිඳ කුමාරයෝයයි නම් තුබූහ. ඒ බෝධිසත්ත්වයන් උපන්දාම පුරෝහිත බ්‍රාහ්මණයන්ටත් පුතනු කෙනෙක් උපන්හ, ඕහට නම් තබන්නාහු සොනක කුමාරයෝයයි නම් තුබූහ. ඒ දෙදෙන එක්ව සියලු දෘෂ්ටි භේද ඇති සමය චාරිත්‍ර හා දේශ චාරිත්‍ර දැනගණුම්හයි අනුක්‍රමයෙන් ගම් නියම් ගම් රාජධානියෙහි සැරිසරා ඇවිදිනාහු බරණැස් නුවරට සම්ප්‍රාප්තව මඟුල් උයනෙහි රෑ සැතපී දෙවන දවස් උදාසන්හි නුවරට වන්හ, එදවස් නුවර වැසි සමහර සත්ත්ව කෙණෙක් බමුණන්ට දන්දී සාන්ති කරම්හයි කියා කිරිබත් ආදී දානොප කරණ සපයා ඉඳිනා අසුන් පනවා බමුණන් බලා උන්නාහුය, ඒ කුමාරයන් දෙදෙනා දැක ගෙට කැඳවා ගෙණගොස් අතුරණ ලද ආසනයෙහි ඉඳුවූහ. ඒ බෝධිසත්ත්වයන්ගේ ආසනයෙහි සුදු වස්ත්‍රයෙන් ද සෝනක කුමාරයන්ගේ අස්නෙහි රන් පලසක් ද අතුරන ලද්දේය, ඒ නිමිත්ත දැක අද දවස් මාගේ මිත්‍ර වූ අරිඳම නම් කුමාරයෝ බරණැස් නුවර රජව මට සෙනෙවිරත් ධුරය දෙන්නේයයි දැන ඒ සෝනක කුමාරයෝ කරන ලද ආහාර කෘත්‍යය ඇතිව උද්‍යානයටම නැගී ගියාහුය. ඉක්බිති එදවස් බරණැස් රජ්ජුරුවන් කළුරිය කළ දවසට සත්වන දවස වන්නේය, රාජ්‍යයට නිසි දරුවෙක් නැත්තාහ, එකල අමාත්‍යාදීහු ඉස්සෝධා නහා රැස්ව රාජ්‍යයට සුදුසු කෙනෙකුන් කරා යන්නේ යයි මඟුල් රථය සරහා නලල් පටය මඟුල් කඩුවය මිරිවැඩි සඟලය සේසතය යන පඤ්චරාජකුධ භාණ්ඩයන් රථයෙහි තබා ගමන් ගත් සඳ උයනට ගොස් කරකැවී නැගෙන්නට සුදුසුව ගෙන සිටියේය. එකල්හි ඉසවසා පෙරව මඟුල් ශාලාව මත්තේ වැදහොත් ඒ බෝධිසත්ත්වයන් සමීපයෙහි උන් සෝනක කුමාර තූර්‍ය්‍ය ඝෝෂාව අසා අරිඳ කුමාරයන්ට පුරස්සරව ආයේය, අද දවස් මුතු මූ රජව මට සෙනෙවිරත් ධුරය දෙති මට වනාහි ඒ ඓශ්චර්‍ය්‍යයෙන් ප්‍රයෝජන නැත්තේය, මුන් රජව නුවරට වන් කල්හි මෙයින් නික්ම මහණ වෙමි සිතා පිළිසන් තැනෙක සිටියේය. එකල්හි පෙළහර ගෙන්වා ගෙණ ගිය පුරෝහිත බ්‍රාහ්මණ උයනට වැද ශාලාවෙහි ඕත් බෝධිසත්ත්වයන් දැක ඔහුගේ ධෛර්‍ය්‍ය පරීක්ෂා කරනු පිණිස එකවිටම නොයෙක් තූර්‍ය්‍ය නාද කරවීය, එකල බෝසතාණෝ පිබිද අනික් ඇලයට නැමී මදක් කල් වැද හොවා නැගී සලවටෙහි පලක් බැඳ උන්නාහුය. ඉක්බිත්තෙන් පුරෝහිත බ්‍රාහ්මණ බෝධිසත්වයන්ට නමස්කාර කොට සිට දේවයන්වහන්ස, රාජ්‍යය නුඹවහන්සේට පැමිණෙන්නේයයි කීයේය. ඔහු බස් අසා කිමෙක්ද තොප රජ්ජුරුවන්ගේ කුමාරකෙණෙක් නැද්දැයි බෝධිසත්වයන් වහන්සේ විචාල කල්හි එසේය දේවයෙනි රාජකුමාර කෙනෙක් නැතැයි කී සඳ එසේ නම් යහපතැයි පුරෝහිත බමුණන්ගේ බස් බෝධිසත්වයෝ පිළිගත්තාහුය. ඉක්බිති ඒ පුරෝහිත බ්‍රාහ්මණයා ඇතුළුවූ අමාත්‍යයෝ බෝධිසත්වයන් එතැන්හිදීම අභිෂේක කොට රථයට නන්වාගෙන මහත් වූ පෙළහරින් නුවරට පැදකුණු කරවා රජමැදුරට ගෙණ ගියාහුය. ඒ අරින්දම රජ්ජුරුවෝ යස මහත්වයෙන් මත්ව සොනක කුමාරයන් සිහි නොකළාහුය. ඒ රජ්ජුරුවන් නුවරට වන් පසු සොනක කුමාරයෝ සලවටෙහි ඉඳන් සල් ගසින් විලික්ෂ තුවටුයෙන් ගිලිහී ඉදිරියෙහි වැටී හුනුවාවූ පතක් දැක ඒ අරමුණු කොට සසර කලකිරී යම්සේ මේ පත්‍රය ජරාවට පැමිණ ගියේද එපරිද්දෙන්ම මාගේ ශරීරයද ජරාවට පැමිණෙන්නේය යනාදීන් සිහිකරමින් සිටි කල්හි ගිහිවෙස් අතුරුදන්ව මහණ වෙස් පහලවීය, එකල්හි සොණක නම් පසේ බුදුරජාණන් වහන්සේ ඉතිකින් භවයෙහි උත්පත්තියක් නැතැයි යනාදීන් ප්‍රීති වාක්‍ය පවත් වමින් පසේ බුදුවරයන් වසන්නා වූ නන්ද මූලක නම් ගල්ලෙනක වැඩ වදාල සේක. මහා බෝධිසත්වයෝද රාජ්‍ය ශ්‍රී විඳිමින් සාලිස් අවුරුද්දක් ගිය කල්හි සිහිකොට මාගේ යහළුසෝණක කුමාරයෝ කොයිදෝ හෝයි නොයෙක් වර විචාරා දිටිම් ඇසිම් කියන කෙනෙකුන් නොදැක සරහා පිළියෙල කරන ලද මතු මහල් තලයෙහි නොයෙක් නටුනාටකාදීන් විසින් පිරිවරන ලදුව සිංහාසනයෙහි ඉඳ රාජ්‍ය ශ්‍රී විඳිමින් සොනක

SANHIDA LANKA

කුමාරයෝ අසවල් තැන වෙසෙති. යමෙක්කුගෙන් යමෙක් අසා කීයේ වීනම් ඹහට සියයක් රන් මසු දෙමි යමෙක් දිටිමි කියාද ඹහට දහසක් දෙමි යන මේ අර්ථයෙන් යුක්තා වූ ගාථාවක් බැඳ ප්‍රීති වචනයෙන් කීයේය.එකල්හි එක් නාටක ස්ත්‍රියක් ගාථාව රජ්ජුරුවන්ගේ මුඛයෙන් උදුරාගන්නාක් මෙන් ඉගෙන ගෙන ගායනා කළාය, ඇගෙන් අනිකෙකු අනිකෙකැයි සියලු අන්තපුර වාසීහුද යන සියල්ලෝම අපගේ රජ්ජුරුවන්වහන්සේ එක්වන් ගායනා කරන ප්‍රීති ගීතිකාවෙකැයි ඉගෙන තුමූත් එක්වන් කියන්නාහුය. මෙලෙසින් දීඝායු නම් කුමාරයන් ප්‍රධාන වූ බොහෝ දූ පුත් දරුවන්  ඇතිව රාජ්‍ය ශ්‍රී විඳිමින් ඒ රජ්ජුරුවන්ට පණස් අවුරුද්දක් විවර ඉක්ම ගියේය. ඒ කායෙහි සොනක නම් පසේ බුදුරජානන්වහන්සේ රජ්ජුරුවන්ගේ  අභිප්‍රාව දිවසින් දැක අරින්දම නම් රජ්ජුරුවෝ මා දක්නා කැමැත්තාහුය, එහි ගොසින් ඹහට පඤ්චකාම විෂයෙහි ආදීනවද මහණදම් පිරීමෙහි ගුණ ද දක්වා උන් මහණ වන ලෙස කෙරෙමි සිතා වදාරා පස්වනක් වළාකුළු මඬිමින් ආකාශයෙන් අවුත් මඟුල් උයනෙහි වැඩ උන්සේක. එදවස් සියලු ශිල්පනම් සත්ඇවිරිදි කුමරුයෙක් මැනියන් විසින් නික්මවන ලද්දේ මඟුල් උයන සමීපයෙහි දරකෝටු අවුලමින් නැවත නැවත ඒ ගීතිකාව ගායනා කෙළේය, ඒ අසා පසේ බුදුරජානන්වහන්සේ ඔහු සමීපයට කැඳවා කිමෙක් ද කුමාරයෙනි, අනිකක් නොකියා එකම ගීයක් නැවත නැවත කියන්නෙහිය, අන් ගීයක් නොදන්නෙහි දැයි විචාරා වදාල සේක. සාමිනී එතකුදුවුවත් අපගේ රජ්ජුරුවන් වහන්සේට මෙම ප්‍රිය හෙයින් නැවත නැවත කියමි කීහ. ඒ අසා පසේ බුදුරජානන් වහන්සේ තොපගේ මේ ගීතිකාවට ප්‍රතිගීයක් කියන කෙනෙකුන් දුටු විරුදැයි විචාලා නුදුටු විරීම් සාමිනී කී කල්හි රජ්ජුරුවන් වහන්සේ කරා ගොස් පටිගීතය කියා එයි නම් තා උගන්වාලමියි වදාල සේක. එසඳ කුමරුවා විසින් යහපත ස්වාමීනී වදාළ මැනවයි කී කල්හි ඒ පසේ බුදුරජානන් වහනසේ ප්‍රති ගීතියක් උගන්වා කුමාරයෙනි මේ ප්‍රතිගීතිකාව රජ්ජුරුවන් හා එක්ව කියව රජ්ජුරුවෝ තොපට සමාධිව බොහෝ සම්පත් දෙති. වහා නික්මෙවයි වදාළසේක.

එකල කුමාරතෙම යහපතැයි ගීතිකාව ඉගෙන පසේබුදුරජානන්වහන්සේ වැඳ ස්වාමීනී මම යම්තාක් රජ්ජුරුවන්වහනසේ කැඳවාගෙන එම් ද ඒ තාක් මෙහිම වැඩඋන මැනවැයි ආරාධනාකොට වහා ගෙට ගොස් මැනියන්වහන්ස, මා ඉස්සෝදා නාවා සරහාලව මැනවැයි, අද දවස් දිළිඳු බැවින් නුඹවහන්සේ මූලෙමි, කියා මැනියන් සතුටු කෙළේ, එකල ඔහු බස් අසා සමාධි වූ මැනියන් විසින් සරහා පිළියෙලකරණ ලදුව රජගෙයි වාරයට ගොස් ආයර්‍ෂ්වාරපාලය එක් කුඩා සුගෙක් නුඹ වහනසේ හා සමඟ ප්‍රතිගීතිකාවක් කියමියි අවුත් වාසල් දොර සිටියේයයි රජ්ජුරුවන්වහන්සේට දක්වාලුව මැනවැයි කීයේය. එබස් අසා දොරටු පාලයා වහ වහා ගොස් එපවත් රජ්ජුරුවන්ට කීයේය. එබස් අසා රජ්ජුරුවෝ ඔහු ගෙන්වා ගෙන දරුව තොපි මා හා සමඟ ප්‍රීති ගීතිකාවක් කියව් දැයි විචාරා කියමි දේවයන්වහන්සැයි කීකල්හි එසේ කල කියවයි කියේය. එබසට දේවයන්වහන්ස නුවර බෙරපියවි කරවා මහජනයා රැස්කරවුව මැන වැයි කීයේය. ඒ බොහෝ දෙනා මධ්‍යයෙහි කියමි කීයේය. රජ්ජුරුවෝත් එලෙසම කරවා විසිතුරු කොට සරහන ලද මණ්ඩපයෙහි සිංහාසනයෙහි ඉඳ කුමරුවාද සුදුසු අස්නක හිඳුවා මෙවිට කියවයි කීහ. දේවයන්වහන්ස නුඹ වහන්සේ පළමු කොට ගායනා කල කල්හි පසුව මම පටි ගීතය කියමි කීයේය. එබස් අසා සතුටු වූ රජ්ජුරුවෝ මාගේ ප්‍රිය මිත්‍රවූ  සොණක කුමාරයෝ අසෝ තෙනෙක වෙසෙති, උන්ගේ වාසස්ථානයක් වූ කෙරෙන් අසා මට කියන්නා වු කවරක් හට රන් මසු සියයක් දෙම්ද , නොහොත් අතන සොණක කුමාරයන් මම දිටිමි දැක අවුත් කියන්නා වූ කවරක් හට දහසක් දෙමි දැයි යනාදීන් අර්‍ථ ඇති උදන් ගීතිකාව පළමු කොට කීවාහුය, ඉක්බිති ඒ පසුව සියළු කුමාර තෙම දේවයන් වහන්ස, නුඹ වහන්සේ සොණක කුමාරයන් උන් තැනින් අසා ඇවිත් කීවුන්ට ඉදින් සියයක් දෙන සේක්  වී නම් මට දෙවා වදාළ මැනවැයි ඉදින් දැක ඇවිත් කීවුන්ට දාසක් දෙනසේක්වී නම් එයින් මට දෙවා වදාළමැනව කුමක් නිසාද යත් නුඹවහනසේට සබඳවූ වැලිකෙළියෙහි පටන් එක්ව කෙලවැඩියා වූ සොනක නම් යහළුවා නම් නුඹවහන්සේට ප්‍රත්‍යක්‍ෂකොට දැන්ම දක්වාලමි, යනාදි අර්‍ථයෙන් උපලක්ෂිත පටිගීතය කීයේය ඒ අසා සතුටුව කුමාරයෙනි කවරරටක කවර ජනපදයක මාගේ යහළු සොනක කුමාරයන් දුටුයෙහිද ඒමට කියවයි කීයේය ඹහට ප්‍රතිවචන දෙන්නා වූ කුමාර තෙම දේවයන් වහන්ස නුඹවහන්සේගේ රට නුඹවහන්සේගේ මඟුල් උයනෙහි ඍජු වසලලව කඳ ඇති මේඝ කූටයක් බඳු වූ නිල් වූ සොභා ඇති සිත් කළු වූ අතු පතර ඇති කඳ වෙළෙප් හා මුලින් ඔවුනොවුන් හා ගිවි සිටියා වූ වෘක්‍ෂ මූලයෙහි කාමුපාදානාරහිතව - ප්‍රාණඝාතය අදත්තා දානය කාම මිත්‍යාචාරය, මුසාවාදය, සුරාපානය, කේළාමය, පරුෂ වචනය, සම්ඵප්‍රලාලය අභිද්‍යාව්‍යාපාදය මිත්‍යා දෘෂ්ඨි යැයි කියන ලද එකොළොස් වැදැරුම් වූ ගින්නෙන් දන්නා වූ සත්වයන් කෙරෙන් වෙන්ව සියළු කෙළෙස් ගින්නෙන් නිවුනා වූ සිත් ඇති ඒ සුනබ කුමාර තෙම ධ්‍යාන භාවනාවෙන් යෙදී රන් පිළිමයක් මෙන් මඟුල් සළ වට මත්තේ යැයි කීයේය. එබස් අසා සමාධිව රජ්ජුරුවෝ නුවර සිට උයනට මඟ තනවා චතුරංගනී සේනාව විසින් පිරිවරන ලදුව උද්‍යාන භූමි ප්‍රදේශයට ගොස් නිවී සිත් ඇතිව උන් සොනක නම් පසේ බුදුන් දැක නොවැදම  එකත් පස්ව හිඳ තමන් කෙලශයෙහි තරව ඇළුන හෙයින් උන්වහන්සේට මේ මහළු තෙමේ ඉස මුඩුව දෙපට පවුළක් පෙරවගෙන මවුපියන් නැති වෘක්ෂ මූලයෙහි දුක්කිත එකෙකු මෙන් සිතාගෙන ඉදිනේ

SANHIDA LANKA

යැයි කීහ. එබස් ඇස් සොනක පසේ බුදුන් වහන්සේ රජ්ජුරුවෙනි යම් කෙනෙක් නව ලොවුතුරා දහම් තමා සිතින් ප්‍රතිවෙද වශයෙන් දකීද, එතෙම දුක්කිත නොවන්නේය. යමෙක් වනාහි දස කුශලධර්මය සන්තානයෙන් දුරුකොට අධර්මයෙහි පවතීද එතෙම දුක්ඛිත නම් වන්නේයයි, එසේ හෙයින් රජ්ජුරුවෝ තමන් වහන්සේට කළ නින්දාව නොදන්නාක් මෙන් පිළිසඳර කථා වශයෙන් තමන් වහනසේගේ නාම ගොත්‍රාදිය වදාළසේක, එවිට රජ්ජුරුවෝ මෙතනට පැමිණියා වූ නුඹ වහන්සේට කිසිඅඑාසුවෙක් නැද්දැයි යනාදීන් විචාළාහුය. ඕහට ප්‍රතිවචන දෙන්නා වූ පසේ බුදුරජානන්වහන්සේ මහරජ මෙතන තබා කොයිත් මට අඑාසුවෙක් නැතැයි වදාරා ඒ රජහට ශ්‍රමණබ්‍රාහ්මණ නම් බණ කියන්සේක් මහ රජ අගාරියයි කියන ලද ගිහිගෙය හැර මහණද නිස්පලිබොධවූ මහණහට ඇමවේලෙහිම සැපවන්නේය. තවද එක් කොටුවෙක සැලිතාලි මලුපැස් ආදියෙහිද ධන ධාන්‍යාදීන් පටවාගෙණ තබා රැකෙන්නාහු නොවෙති, වැලි කෙසේ රැකෙන්නාහුද යත්? දෙපටපව්ලක් පෙරව මැටිපාත්‍රයක් අතින් ගෙන ගෙයි සපයන ලද ආහාරය ගෙපිළිවෙළින් සිඟාගෙන පරියේෂණය පරිභොගය ආසයය ධ්‍යානයය පරිපක්වතාවයය ඵලය නිස්සන්‍දනය සම්මක්ඛණයයි කියන ලද වලා පටලයක් පරිද්දෙන් අග්‍රපටලයෙන්ද  වෙන් වූ චන්‍ද්‍රයා පරිද්දෙන්ද වස්තු කාම කෙලෙශ කාමයන් හැර මහණව ගම් නියම්ගම් රාජධානියෙහි භික්‍ෂාචනය කොට ඇවිදිනා වූ යම් භික්‍ෂුවක්හට සහනන්හිවශයෙන් කිසිතෙනෙක්හි ඇල්මෙක් නැද්ද එබඳු මහණහට සතරවෙනින්වත් කලමනාවන්නේය, යම් භික්‍ෂුවක් හට තුන් සිවුරු පාත්‍රාවිනා උපාසක කුලයෙක්හි තබන ලද චීවරාදී පරිස්කාරයක් නැති හෙයින් ඒ මහණහට පස්වෙනි පාසුවන්නේය. තවද මහරජ යම් මහණෙක් සකුණා ප්‍රවෘර්තීන් කායප්‍රතිබංද වූ චීවරාදී පරිස්කාරය හැර අන්තැනක තබන ලද කිසිවක් නැති හෙයින් සොරුන් වැද නුවර එකහී කොල්ල කා ගණ යතත් ඔවුන්ගේ ගෙණයන දෙයක් නැද්ද එසේ හෙයින් සවෙනිවත් භික්‍ෂූ හට පාසුවන්නේය.

තවද මනා වූ වෘත සමාදානය ඇති මහණ තෙමතිකිම් පෙරලීම් අනුවා පත් ආදී තරකරණ ලද පාශුකූල චීවර පටි පාත්‍රාදී අෂ්ටපරිකාරධරව යන්නේ සොරුන් අයසුන් ගම් ගන්නවුන් කරා පැමිණත් මෙකී මහණ පිරිකරින් ඔවුන්ට කිසිප්‍රයෝජනයක් නැතිහෙයින් කිසිකෙනෙකුන් වාහකුලක් නැතිව කැමති තැනකට සැපසේ යන්නේය. මේ කාරණයෙනුත් ඕහට සත්වැනිවත් සැපවන්නේය. තවද මහරජ ගෙයහැර මහණව තිස්වනවූකුලෙහි ගෙණහි අලග්න වූ මහණ තෙම යම් යම් දිසාවකට යනු කැමති වී නම් එකෙනෙහි ගමෙක බිමෙක දොරක පිරිකරක යන කිසිවෙක් හි ඇල්මක් නොකොටම යන්නේය, ඒ කාරණයෙන් අටවෙනිවත් මහණ හට බද්‍ර වන්නේ යයි යනාදීන් අර්ථයෙන් යුක්ත සමණබද්‍රනම් ගාථා අටෙකින් බණ වදාළ සේක.  ඒ සොනබ නම් පසේ බුදුරජානන්වහනසේ අනෙකුත් සමණ බද්‍ර සියදාස් ගණනකුත් කියන්ට සමත්ව සේකමය, රජ්ජුරුවෝ වනාහි කාමයෙහි සක්ත හෙයින් උන්වහනසේගේ කථා විචෙඡදය කොට මේ සමණ බද්‍ර ගාථාවෙන් මට ප්‍රයෝජන නැත්තේ යැයි තමන් පස් කම් ගුණෙහි ගිජු බව ප්‍රකාශ කෙරෙමින් තපස්වීන් වහන්ස, මානුෂික වූ ද දිව්‍ය වූද වස්තු කාම කෙලෙෂ කාමයෝ මට ඉතා ප්‍රියහ, එසේ හෙයින් කවර කාරණයකින් එදොළ සම්පත් ලැබේ දැයි විචාළේය. පසේ බුදුහු එම්බා රජ කාමයෙහි ගිජු වූ විෂ්‍යාස්වාදයෙහි සක්ත වූ කාමයෙන් මත් වූ සත්වයෝ කාම දුශ්චරිතාදි වූ නොයෙක් පව් කොට ස්වප්නයෙනුත් සැපයක් දැක්ක නොහැකි දුගතියෙහි උපදනාහ.  යම් සත්ව කෙනෙක් වස්තු කාම කෙලෙස කාම අළුයම දමාපු කෙළපිඩක් මෙන් නිරපේක්‍ෂව හැර ගිහිගෙන් නික්ම රාගාදීන් පැමිණෙන කිසි බයෙක් නැත්තාහු ගණ සංගනිකාව හැර කාය විවේකයට පැමිණ වාසය කෙරෙත් ද එබඳු වූ ප්‍රවෘජ්ජිතයෝ දුගතියට නොයන්නාහු යයි වදාරා මහ රජ මේ ලෝකයේ සමහර නුවනැත්තෝ උපමාවෙනුත් කාරණා දැනගන්නාහ, එසේ හෙයින් තොපට දෘෂ්ටානතයක් ගෙණහැර කියමි, අසවයි වදාරණ සේක් භගීරතී නම් ගඟාප්‍රවාහයෙහි වැටී ඉල්පයන්නාවූ ඇත් කුණපයක් නුවන නැති කපුටුවෙක් දැක මා විසින් මහත් යානාවකුත් විපුල වූ ගෙවරයකුත් ලබන ලද්දේයයි සතුටුව සම්ප්‍රාප්තව මේ මස් අනුභව කෙරෙමින් පැන් ගඟ බීමෙන් උභය පාර්ශවයෙහි වන සොභා දක්වමින් රැ දාවල් මෙහිම වාසය කෙරෙමින් නොගොස් කුණපයෙහිම උන්නේය, ප්‍රමාද වශයෙන් කුණපයෙහි ලොල් වූ කපුටුවා ඇත් කුණ හා සමඟ පක්ෂීන්ට අවිෂය වූ මහ සමුද්‍රයට ගංගා ප්‍රවාහයෙන් ගොස් පැමිණ ඇත් කුණෙහි සම් මස් නහර සිඳී ඇටසැකිල්ල දියෙහි ගිලුන හෙයින් ප්‍රහාරය කොට සතර දිගට ගොසිනුත් කිසි පිහිටක් නොලබන විඩාව ජලතලයෙහි වැටීහුනුවාහු සමුද්‍රයෙහි දැති මෝර ආදී මත්ස්‍යයෝ සල්ව සල්වා කෑවාහුය, එපරිද්දෙන් මහා රජ තෙපිද අනිකුත් කාම භෝගී යම් කෙනෙක් වස්තුකාම ක්ලේශකාමයන් හැරපියා නොයෙත්ද ඔවුන් බුද්ධාධි උත්තමයෝ ඒ කපුටුවා හා සමාන නුවණ නැත්තාහුයයි කියති, මහරජ මා විසින් මේ උපමාව දෘෂ්ටාන්ත වශයෙන් දක්වන ලද්දේය, ඉදින් මාගේ මේ අවවාදය පිළිගෙන වස්තුකාම ක්ලේශකාමයෙහි ලෝභය හළුයේ වීනම් ස්වර්ගි ලෝකයට පැමිණෙන්නෙහියැයි ඉදින් නොහලුයේ වී නම් කාබුන් මරණින් මත්තෙහි නරකාදි අපායට යන්නේය. ඒ උපමාවෙහි ගංගාව අනවරාග්‍ර සංසාරය වන්නේය, ප්‍රවාහයෙන් යන්නාවූ ඇත් කුණ පංචකාම ගුණය වන්නේය, කපුටු තෙම අඥාන සත්ත්වයා වන්නේය. කපුටුතෙම මස් අනුභව කොට පැන් බී සතුටු වූ කාලයේ අඥානගේ විෂයාස්වාදයෙන් සතුටු වූ කාලය වන්නේය, කුණපයෙහි සක්ත වූ කපුටුවාගේ  වන සොභාව දිගු කාලය කාම තෘෂ්ණායෙන් යුක්ත වූ

SANHIDA LANKA

අඥානයාගේ අටතිස්වැදෑරුම් වූ පටවිකසිනාදී අරමුණු දක්නා කාලය වන්නේය, ඇත්කුණ ගොස් සමුද්‍රයට වන්කල පිහිටක් නොලැබ කපුටුවා දියෙහි හුණු කාලය කාමයෙහි ගිජු වූ පවිටු නුවණ නැත්තාහුගේ කුශල ප්‍රතිෂ්ටාවක් නොලදින් නරකොත්පත්ති කාලය වන්නේ යි මෙලෙසින් පසේබුදුරජාණන් වහන්සේ මේ උපමාව ගෙනහැර දක්වා අවවාද කොට නැවතත් අවවාද කරුණු පණීය මහරජ අනුකම්පා ඇති සත්ව තෙම අවවාද වශයෙන් වැඩ අවැඩ එකවරක් කියන්නේය, එයින් මත්තෙහි නොකියන්නේ ය, ඉදින් වඩා කීයේ වී නම් සාමි දරුවක් වූ ඉදිරියෙහි සිට කියන්නා වූ ද යමෙකු මෙන් නිස්සාර වන්නේ යයි යනාදීන් නොයෙක් අවවාද අනුශාසනා කොට ඒ පසේබුදුරජාණන්වහන්සේ ආකාශයෙන් වැඩ වදාළසේක. මහාබෝධිසත්වයෝද පසේ බුදුන් පෙනෙන තෙක් බලා සිට උන්වහන්සේ ඇසට අවිෂයව වැඩි කල්හි සසර කළකිරී බ්‍රාහ්මණ වංශයෙහි උපන්නාවූ මේ මහණතෙම අසම්භින්න රාජවංශයෙහි උපන් මාගේ මස්තකයෙහි තමාගේ පාද දූවිලි වගුරුවමින් ගියේය, මා විසින් මහණ වියයුතු යයි සිතා රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත්තේය, අද දවස මම මහණ වෙමි මරණය අද වන බෝ සෙත වන බෝ දැනගත නොහැක්කේය, මේ සසර සිට ඒ නුවණ නැති කපුටුවා පරිද්දෙන් කාම වූ සැපය නොපැමිණේයි රාජ්‍ය පාවා දුන්හ. එබස් ඇසූ අමාත්‍යයෝ දේවයන්වහන්ස, නුඹ වහන්සේගේ පුත්‍ර වූ දීඝායු කුමාරයන් වහන්සේ ගෙන්වා ගෙන අභිෂේක කැරවුව මැනව. උන්වහන්සේ අප රජකම් කරන සේකැයි කීවාහුය. එසඳ රජ්ජුරුවෝ දීඝායු කුමාරයන් එතැනට ගෙන්වා ගෙන ඕ හට ආමන්ත්‍රණය කොට එම්බා කුමාරයෙනි, ධන ධාන්‍ය මුක්තා මාණික්‍ය සංඛසිලා ප්‍රවාලාදී සියලු උප භෝග පරිභෝග වස්තුවෙන් සමුඪවූ සැටදහසක් ගමින් යුක්ත වූ මේ මගධ රටද රන්සැත් රන්පොරෝද සන්නාහයෙන් සරහන ලද කෝල හා අකුස් ගත් අත් ඇතිව ඇත්රුවන් විසින් නැගෙන ලද සැටදහසක් පමණ ඇත්තුද, සියළු අශ්වාලංකාරයෙන් සරහන ලද සීඝ්‍ර වූ ජව හා වේග ඇති ඇත් පඨ හා දුනු හියවුරෙන් උපලක්ෂිත වූ අසරුවන් විසින් නැගෙන ලද සැට දහසක් පමණ අජානීය සෛන්ධව අශ්වයන්ද සිංහ සම්, දිවි සම්  වලස් සමින් කරන ලද පිරියම් ඇති නගන ලද නොයෙක් ධජමාලාවන් ඇති සියළු රථාලංකාරයෙන් කරන ලද සැරහුම් ඇති සන්නාහ සන්නද්ද වූ දුනුගත් අත් ඇති රථවරුන් විසින් නැගෙන ලද සැටදහසක් පමණ රථයා නාවන්ද ප්‍රධාන වූ වෘෂභ රජයක් වූ විසින් උපලක්ෂිත වූ බඳුන් පුරා කිරි දෙන්නා වූ සැටදහසක් පමණ රතිදෙනුද විචිත්‍ර වස්ත්‍රාභරණයෙන් සැරහුනා වූ බහා පැළඳ කුණ්ඩලාභරණ ඇති සියළු ස්ත්‍රී පළඳනායෙන් සැරහෙන ලද සොළොස් දහසක් පමණ පුරංගනාවන්ද යන මේ සියළු ඓශ්වර්‍ය්‍ය පාවා ගෙන රාජ්‍ය කරව. මම තපසට යෙමියි කීවාහුය. එබස් අසා දීඝායු කුමාරයෝ මේ කිමෙක්ද පියාණන් වහන්ස, මා බාල අවස්ථාවෙහිම මාගේ මෑණියන් වහන්ස මළයි  ඇසීමි. එසේ හෙයින් නුඹ වහන්සේ හැර ජීවත් වියා නොහෙමි. ඉදින් නුඹ වහන්සේ තපසට යන සේක් වී නම් යම් සෙයින් වනයෙහි සම විෂම වූ ගිරිදුර්ගයෙහි සඤ්චාරණය කරන්නා වූ හස්තිරාජයා අනුව ඇත් පොවු තෙම පසුපස්සේ ගියේද එපරිද්දෙන්ම නුඹ වහන්සේගේ පාත්‍රය ඇර ගෙන නොකීකරු නොව කීකරුව නුඹ වහන්සේ පසුපස්සේ ඇවිදිමියි කීයේය. එබස් අසා ඕ හට දැහැමිව කාරණා කියන්නාවූ රජ්ජුරුවෝ යම්සේ වස්තු ගවේෂණය පිණිස ජලයාත්‍රා කරන්නා වූ වෙළෙඳුන්ගෙන් දැතිමෝර ආදී මත්ස්‍යයන් විසින් හෝ උදකරාක්ෂයෙකු විසින් හෝ දියසලාවෙන් මසන ලද කල්හි ඒ වෙළෙඳහු ව්‍යසනයට පැමිණෙන්නාහුය, එපරිද්දෙන් නොකීකරු දරුවෝද මාගේ තපසට අන්තරාය කරන්නේය, එසේ හෙයින් මේ දරුවන් විසින් සිත්කළුවූ මාළිගාවට කැඳවා ගෙන යව. ඒ ස්වර්ණාලංකාරයෙන් අලංකෘත වූ නාටක ස්ත්‍රීහු ශක්‍රදේවේන්ද්‍රයා පරිද්දෙන් මොහු සිත් ඇලවන්නහුයයි මහාබෝධිසත්වයෝ මෙලෙස කියා එතනදීම රාජ කුමාරයන් අභිෂේක කරවා නික්මවා තුමු උදකලාව උයනින් නික්ම හිමාල වනයට වැද සිත්කළු වූ ප්‍රදේශයෙක්හි පන්සලක් කොට ගෙන තබා ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිගෙන වන මුල් ඵලාහාරයෙන් දවස් යවූවාහුය.

ඉක්බිති අමාත්‍යයෝ මහත් වූ රාජ පෙළහරින් දීඝායු කුමාරයන් නුවර ප්‍රදක්ෂිණා කරවා ප්‍රාසාදයට කැඳවා ගෙන ගියාහ, එකෙනෙහි සොළොස්දහසක් ඇති පුරංගනාවෝ ස්වර්ණාභරණයෙන් විභූසිතව පැමිණියා වූ රජ්ජුරුවන් දැක මනෝඥවූ රූපශ්‍රීන් යුක්ත වූ තෙපි දේවතාකෙනෙක්ද නොහොත් ගන්ධර්විද්‍ය පුත්‍රයාන කෙනෙක්ද නොහොත් ශක්‍ර දේවේන්ද්‍ර කෙනෙක්ද තොපි කවුරුන්ගේ දරු කෙනෙක් ද තොපි කවුරුන්දැයි දැනගනුමෝදැයි විචාළාහුය. එබස් අසා රාජ කුමාරයෝ දෙවියකුත් නොවෙමි. ගාන්ධර්වයෙකුත් නොවෙමි. ශක්‍රදේවරාජයෙකුත් නොවෙමි. කසී රජ්ජුරුවන්ගේ පුත් වූ දීඝායු කුමාරයෝ නම් මමය. අත්පා මෙහෙකෙරමින් මට උපස්ථාන කරව. මම තෙපි ඇමට වල්ලභ වෙමි, ස්වාමි වෙමි කීවාහුය, එබස් අසා පුරංගනාවෝ රජ්ජුරුවන් වහන්සේ කොයිගියේ සේක්දැයි විචාරා ඔවුන් විසින් රජ්ජුරුවන් වහන්සේ වස්තුකාම ක්ලේශකාමයන් නැමැති පංචදුර්ගයෙන් නැගී ප්‍රව්‍රජ්‍යා නැමැති ස්ථලයෙහි පිහිටා රාගාදී ක්ලේශසන්ටක සහිත වූ මිථ්‍යාලබ්ධි නැමැති සහරන රහිත සඟමොක් මඟට පැමිණිසේක මම වනාහි  ක්ලේශ කටුකයෙන් ගැවසීගත්තාවූ දෘෂ්ටිග්‍රහණයෙන් නිබින වූ දුගතියට පමුණුවන්නාවූ ගෘහවාස නැමැති මාර්ග පිළිපන්මි රාජකුමාරයෝ කීයේය. එබස් අසා පුරංගනාවෝ රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේගේ කීම යහපත් වන්නේය රන්ගල් ගුහාවට සිංහ රාජයෙකු පරිද්දෙන් අප ඇතුළු වූ මේ සියළු රාජ්‍යයට අනුශාසනා කොට වදාළ මැනව

SANHIDA LANKA

මෙවක් පටන් හැම දෙනාම නුඹවහන්සේ නායක යනාදීන් නොයෙක් ප්‍රිය වචන කියමින් නෘත්‍ය ගීත වාදිතාදිය පවත්වමින් සිත් ඇලවූවාහුයි. ඉක්බිති දීඝායු නම් රජ්ජුරුවෝ මහත් වූ රාජ්‍යශ්‍රී විඳිනාහු රජ ඉසුරෙන් මත්ව පිය රජ්ජුරුවන් සිහි නොකොට දසරාජ ධර්මයෙන් දිවිපමණින් රාජ්‍යකොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහුය මහා බෝධිසත්වයෝ පඤ්චාභිඥාඅෂ්ටසමාපත්ති උපදවා ගෙන බ්‍රහ්ම විහාර භාවනාවන් කොට කාබුන් මරණින් මත්තෙහි බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුයයි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්ම දේශනාව ගෙනහැර දක්වා වදාරා මහණෙනි සර්වඥයන් මහාභිනික්මන් කළේ දැන් මතු නොවේ පෙරත් මහාභිනික්මන් කළෝවීදැයි වදාලා ජාතකයෙහි පූර්ව කතාවත් අපර කතාවත් සන්ධි ගලපා සොනක ජාතක ධර්මදේශනාව නිමවා වදාළසේක. එසමයෙහි පසේබුදුහු පිරිනිවන් පෑවාහුය. එසමයෙහි පසුව රාජ්‍යප්ප්‍රාප්ත වූ දීඝායු කුමාරයෝ නම් දැන් මේ රාහුල ස්ථවිරයෝය. පසේ බුදුහුයෙන් බණ අසා තපසට ගියාවූ අරින්ද රජ්ජුරුවෝ නම් තිලෝගුරු බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සංකිච්ච ජාතකය

ධර්මරාජයන් වහන්සේ ජීවකයන්ගේ අඹ උයනෙහි වැඩ වාසය කරන සේක්. අජාසත් රජහුගේ පිතෘඝාතක කර්මය අරභයා වදාළ සේක.

නිධාන කථාව:- ඒ අජාසත් වනාහී දෙව්දත් තෙරුන්ගේ බස් ගිවිස පියරජහු මරවා සඞස භේදකොට සඟ පිරිසෙන් වෙන්වී මහත් ශෝකයෙන් ව්‍යාධියට පැමිණ බුදුන් වැඳ සමාකරවා ගනිමියි සිතා ඇඳක් පිටින් සැවැත් නුවරට ගියේ දෙව්රම් වෙහෙර දොරටුව සමීපයෙහි පොළොව පැලී අවීචියට ගිය නියාව අසා මමත් මෙසේ නරකයට යම්දෝහෝයි භයින් ත්‍රස්තව නිදි නොලැබ ජීවකයන්ගේ බස් අදහා බුදුන් සමීපයට ගොස් ශ්‍රමණපල සූත්‍ර දේශනාව අසා බුදුන් සමාකරවා ගෙන උපාසක බවට පත්ව නිති පින් කරමින් වාසය කරන කල්හි ඒ ගැන දම්සභා මණ්ඩපයෙහි දිනක් උපන් කථාවක් අරභයා මහණෙනි, පෙරත් මේ රජ පියා නසා දුකට පැමිණ මා නිසා සැපයෙන් විසුයේ වේදැයි ඉකුත්වත වදාළ සේක.

ආරාධනය:- භික්ෂූන් වහන්සේ

ජාතක කථාව:- යටගිය දවස බරණැස් නුවර රාජ්‍යය කළ බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුට පුත්‍රයෙක් උපන්නේය. ඔහුගේ නම ද බ්‍රහ්මදත්ත කුමරයා විය. ඒ දවසම පුරෝහිත බමුණාටද පුත්‍රයෙක් උපන්නේ ඔහුට සංකිච්ච කුමාරයෝ යයි නම් තැබූහ. මේ කුමාරයන් දෙදෙනාම රජගෙයි එක්ව වැඩෙන්නාහු සියළු ශිල්ප නිමවා බ්‍රහ්මදත්ත කුමාරයා යුවරජ තනතුරෙහි පිහිටියේය. දිනක් ඔහු පිය රජ්ජුරුවන් සමඟ උයනට යන්නේ පිය රජ්ජුරුවන්ගේ යසශ්‍ර දැක එහි ලෝභය උපදවා පියා මියගිය කල මට රාජ්‍යය ලැබෙන්නේ ය. වෘඬව ලද්දාවූ රාජ්‍යයෙන් කම් නැත. එබැවින් පිය රජ හු මරා රාජ්‍යය ගනිමියි සිතා සංකිච්ච කුමාරයන්ට එපවත් කීයේය. එබස් ඇසූ සංකිච්ච කුමාරයෝ පියා මැරීමේ ආදීනව පෙන්වා තුන් වරක් එය වළකාත් පිළිනොගත් කල්හි මෙහි සිටීමෙන් මට කම්නැතැයි කිසිවෙකුට නොහඟවා වනයට ගොස් පැවිදිව වාසය කලාහුය. ඉන්පසු බ්‍රහ්මදත්ත යුව රජ්ජුරුවෝ පිය රජ්ජුරුවන් මරවා රාජ්‍යයෙහි පිහිටා සැප විඳින්නේය. එරට බොහෝ දෙනා සංකිච්ච කුමාරයෝ මහණ වූයේයයි අසා ඒ අනුව ගොස් මහණවූහ. බ්‍රහ්මදත්ත නව රජ්ජුරුවෝ ටික කලක් සැපසේ සිට පියා මැරුවෙන් බියට පත්ව නරකයෙහි පීඩාවට පැමිණියාහු මෙන් සිත් තැවුලින් යුතුව මාගේ මිත්‍ර සංකිච්ච කුමාරයෝ පියාණන්ව මැරීමෙන් මා වලක්වාගත නොහී මට නොහඟවාම පලා ගියේය. නොගියේ නම් මේ අකුශලය මට කිරීමට ඉඩ නොදෙති. මේ භයින් දුරු කරනට උන් විනා අන් කිසිවෙක් සමත් නැත. දැන් සොයා ගනිමියි සිතා තැන තැන උන්ගේ ගුණ කියන්නට පටන් ගත්හ. මෙපරිද්දෙන් දවස් යවන කල්හි රජ්ජුරුවන්ගේ අදහස් දැනගත් සංකිච්ච තාපසයන් වහන්සේ පණස් අවුරුද්දක් ව්වරකින් පන්සියයක් තපස් වී වරයන් විසින් පිරිවරන ලදුව අහසින් අවුත් එනුවර සමීපයෙහි මිගදා නම් වූ මගුල් උයනට බැස සල්වට මත්තේ වැඩ උන් සේක. ඒ බැව් උයන්ගොව්වා අතින් දැනගත් රජ්ජුරුවෝ පෙළහරින් එහි ගොස් පිළිසඳර කථා කොට සංකිච්ච පණ්ඩිතයන් වහන්ස, මා විසින් පිතෘඝාතක කර්මය කරන ලද්දේය. මෙබඳු සත්වයෝ පරලොව කවර ගතියක ට ගොස් කෙසේ වූ දුකට පැමිණෙන්නාහු දැයි විචාළේය. මහරජ, උවදුරු ඇති මාර්ගීය හැර නිර්භීය මගින් ගියාවූ සත්වතෙම ව්‍යසනයට නොපැමිනේද එපරිද්දෙන් අකුශල යෙහි යෙදී වාසය කරන්නාහු සත්වයෝ නුවණැත්තන් විසින් එයින් වලකා කුශල පථයෙහි පිහිටුවන ලද්දා වූ අගතියට නොයන්නාහුය. මහරජ, පළමු මාගේ බස් නොගිවිස පියා මරා දැන් ශෝකයෙන් පෙළෙමින් මහ ව්‍යසනයකට පැමිණෙන්නේ වේ දැයි අවවාද කොට මත්තෙහි ද ධර්මදේශනා කොට දසකුශල ධර්මයෙහි ආනිශංසද පව් කිරීමෙහි ආදීනවද දක්වා අටමහ නරකයද එකි එකි නරකයට ඇති සොළසක් ඔසුපත් නරකයන්ද එහි දුක් විඳින්නාහු සත්වයන්ද සෘඬ්‍යානු භාවයෙන් රජහට දක්වා උතුමන්ට ආක්‍රොෂ පරිභව බිනීමෙන් දරුනු අකුසල් කළ සත්වයෝ නරකයෙහි වැටී දුක් විඳිනා බැව් දැන්වීමට ගෞතම සෘෂීන්ට ගැහැට කල ධනු ශිල්පයෙහි දක්ෂ සහශ්‍ර අර්ජුන රජ්ජුරුවන් ගැනද කිගවච්ඡ තාපසයන්ට වරදකොට නරකයෙහි දුක්විඳින දණ්ඩකීරජ්ජුරුවන් ගැනද මාතඞග පණ්ඩිතයන් කෙරෙහි සිත් කළකිරවා ගෙන පිරිස සමඟ අපාගතවූ මෙධ්‍ය නම් රජ්ජුරුවන් ගැනද කණ්හපායි නම් සෘෂීන් කෙරෙහි අපරාධ කළාවූ අන්ධවේන්ද්‍රක රජතුමා විඳින ගැහැටද කපිල සෘෂින්ට ඡන්දයෙන් පක්ෂව බොරු කියා නරකයෙහි ඉලදුන චතුර්විධ සෘඬි ඇති චෙතිය නම් රජු ගැනද විස්තර කථා දක්වා ධර්මදේශනා කොට පියා මැරීමේ ආදීනව පෙන්වා පොළොව විවර කොට ඒ සත්වයන් ඉපිද දුක් විඳින තැන් දක්වා ඉක්බිති මවුන් මැරූවන් ඉපිද දුක් විඳිනා සැටි ද උපක්‍රම වලින් දරුගැබ ගබ්සාකොට නැසුවන් උපන් තැන්ද තමාගේ ස්වාමියාට නොසළකන සැර පරුෂ වචන කියන ස්ත්‍රීන්ද වැඩිහිටි අයට බැනවදින අයද ඉපිද දුක් විඳින තාප නම් නරකයද ක්‍රමයෙන් පෙන්වා ධර්මදේශනා කොට ශෝකය දුරුකොට හිමාලයට වැඩියහ. රජතුමා එතැන් පටන් දැහැමින් ජීවත්විය.

SANHIDA LANKA

එසමයෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ නම් දැන් මේ අජාසත් රජ්ජුරුවෝය. තාපස සමූහයා නම් බුදු පිරිසය, සංකිච්ච පණ්ඩිතයෝ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# කුස ජාතකය

තවද දසබලදාරී සුරාසුරව චක්‍රාචාරු චූඩමානි මරීචිසචිච පරිචුම්භිත චරණ යුගල ඇති සර්වඥයන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතනම් රාජ කුමාරයන්ගේ උයන්හි අනේපිඬු මහා සිටානන් විසින් සිව්පණස්කෙළක් ධන වියදම් කොට කරවා පිළිගන්වන ලද රාත්‍රිස්ථාන දිවාස්ථාන චංක්‍රමන මණ්ඩප මාලාකාදීන් විරාජමානවූ පද්මෝද්පල කුවලකුමුදු කල්හාර කුසුමොපශෝභිත පුෂ්කරනීන් රම්‍යවූ භූමිප්‍රදේශ ඇති ජේතවන මහා විහාරයෙහි බ්‍රහ්ම ආර්ය ඊර්යාපථ විහරණයෙන් දවස් යවනසේක් සස්නෙහි උකටලීවූ එක්තරා භික්ෂු කෙණෙකුන් අරභයා මේ කුස ජාතකය ධර්මදේශනාව වදාළසේක.

ඒ කෙසේද යත්

සැවැත් නුවර වසන්නාවූ එක්තරා කුලපුත්‍රයෙක් බුදු සස්නෙහි යෙදී මහණව එක් දවසක් සැවැත්නුවර පිඬුසිගා ඇවිදිනේය. සර්වාභරණ විභූසිතවූ එක් මාතුගාමයෙක් දැක සුභ නිමිත්ත ග්‍රහණයෙන් බලා කෙලශවසඟව ශාසනයෙහි ඇලුම් නැතිව දික්වූ නිය කෙස් හා ඉළුපුනු නහරබහන් කිළුටුවූ සිවුරු හා සුදු මැලිවූ සිරුරු ඇතිව වසන්නේය. යම්සේ දිව්‍යලෝකයෙන් චුතවන්නාවූ දිව්‍යපුත්‍රයන්ට පැලඳි මල් මලානිකවීමය දිවසළු කිළුටුවීමය ශරීරය දුර්වර්ණයට පැමිණවීමය දෙකිසිල්ලෙන් ඩා වැහීමය දිව්‍යලොකයෙහි ආලය මදවීමය යන මේ පඤ්චපූර්වනිමිත්තයෝ පහළවෙද්ද එපරිද්දෙන්ම උකටලීවූ සිත් ඇතිව ශාසනයෙන් පිරිහෙනු කැමති භික්ෂූන්ටත් සැදෑ නමැති මල් මලා නිකවීමය කැරබැම්හ සිල් කිගිටිවීමය කැරබැම්හ නුගුණ පැතිරෙමින් විරූප බවට පැමිණීමය කේලශ නමැති ඩා වැහීමය විවෙකස්ථානයෙහි නොඇලීමය යන මේ පඤ්චපූර්වනිමිත්තයො පහළවන්නාහ. ඒ මහණහටද එකියනලද පස් වැදෑරුම්වූ ගුණයෝද පහළවූහ. එබව දැන සෙසු භික්ෂූන් වහන්සේ ඒ මහණ නොකමැතිකරවා බුදුන් සමීපයට කැඳවාගෙන ගොස් ස්වාමිනී මූ ශාසනයෙහි උකටලීවූයයි දැන්වූ සේක.

එකල සර්වඥයන්වහන්සේ මහණ තා ශාසනයේ උකටලීවූයේ සැබෑදැයි විචාරා වදාරා සැබෑව ස්වාමීනියි දැන්වූ කල්හි මහණ කේලශවසඟව නොපවතුව මේ මාතුගාමයෝ නම් පච්ටු සත්ව කෙනෙකැයි ඔවුන් කෙරෙහි පිළිබඳ සිත් හැර ශාසනයෙහි ඇලීවාසයකරව. ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත් නිසා තේජස්වී වුත් පූරාතනයෙහි නුවනැත්තෝ තේජසින් පිරිහී නොයෙක් ව්‍යසනයට පැමිණියාහු වෙද්දැයි වදාරා භික්ෂූන්වහන්සේ විසින් ආරාධිත වූ පරදුක්ඛ දූක්ඛිතවූ කරුණා නිධාන වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කඩතුරාවක් පහකොට විචිත්‍ර චිත්‍රකර්මාන්තයක් දක්වනකෙනෙකුන් පරිද්දෙන් භවයෙන් ප්‍රතිච්ජන්න වූ ඉකුත්වත් කථාව ක්‍රතයුග මහමේඝයක් නැගී වස්නා කලක්මෙන් ගෙනහැර දක්වා වදාරණසේක්:-

යටගිය දවස මලල රට කුසාවතී නම් නුවර ඔක්කාක නම් රජ්ජුරු කෙනෙක් දසරාජ ධර්මයෙන් දැහැමෙන් රාජ්ජය කරන්නාහ. ඔහුගේ සොළොස් දහසක් පුරාඞගනාවන්ට ප්‍රධාන වූ සිලවතී නම් අගමෙහෙසුන් බිසෝ කෙනෙක් වූහ. පුත් දරුකෙනෙක් නැත්තාහ. එකල නුවර වැස්සෝ හා රාජ්ජවාසීන් හා පූරදොරට රැස්ව රට නසන්නේය. විනසේනයයි මහත්කොට කොලාහල කළාහුය. ඒ කොළාහල ඇසූ රජ්ජුරුවෝ සීමැදුරු කවුළුව හරවා මා රාජ්ජය කරමින් සිටියදී අන්‍යායක් කරණ කෙනෙක් නැත්තාහ. කුමක් නිසා මොරගැවූදැයි විචාළාහ.

එකල ඔවුන් විසින් සැබව ස්වාමිනි දේවයන් වහන්ස අධම්මකාරී කෙනෙක් නැත වංශ පරිපාලනය කරන්නට නිසි දරු කෙනෙක් නැත්තාහ. අනික් කෙනෙකුන් අප රාජ්ජය ඇරගෙන අධර්මයෙන් රාජ්‍යය නසති ඒ කාරණයෙන් දැහැමෙන් රාජ්ජය කරන්නට නිසි පුතනු කෙනෙකුන් පැතුව මැනවයි කීහ. එසඳ රජ්ජුරුවෝ ද පුතනුවන් ප්‍රාර්ථනාකරන්නාවූ මා විසින් කුමක් කටයුතු දැයි විචාළාහුය. දේවයන් වහන්ස නුඹවහන්සේගේ තුන්වැදෑරුම්වූ නාටක ස්ත්‍රීන්ගෙන් පළමුකොට රැකවල් ඇතිව පිටත ඉන්නාවූ සුළු නළු මුළු රැකවල් හැර ස්ත්‍රියක් සිතසේ ඇවිදිනාව හැර වදාළ මැනව ඉදින් ඉන් සුන් බිසවුන්වහන්සේ හැර අවශේෂ ස්ත්‍රීන් හළමැනව ඒකාන්තයෙන් මෙතෙක් දෙනා අතුරෙන් කුසල් ඇති කෙනෙක් දරු කෙනෙකුන් ලබතියි කීවාහුය. එකල රජ්ජුරුවෝ ඔවුන්ගේ බසින් එලෙස කරවාත් දරුකෙනෙකුන් නොලදීන් නොසතුටුවූහ. නැවත නුවර වැස්සෝ රැස්ව කොළාහළ කළාහ. ඒ අසා රජ්ජුරුවෝ තොප හැම කීමෙන් පුරාඞගනාවන් රැකවල් හරවාත් එතෙක් දෙනාගෙන් දරුකෙනෙකුන් ලබන කෙනෙකුත් නැත. දැන් කුමක් කරමෝදැයි විචාරා ඔවුන් විසින් දේවයන් වහන්ස මේ සියලු ස්ත්‍රීහු දුරාචාරවූ කුසල් මද සත්ව කෙනෙක් මොවුන්ට දරුපින් මද නැතැයි නුඹවහන්සේ නිරුත්සාහ නුවුව මැනව. අගමෙහෙසුන් වූ සීලවතී දේවීන්වහන්සේ සීලාචාර සම්පන්න සේක. උන්වහන්සේ රැකවලින් හළමැනව දරුකෙනෙක් ඇතිවෙතියි කීසඳ රජ්ජුරුවෝ එබස් පිළිගෙන

SANHIDA LANKA

නුවරවැසියන් රැස්කරවා සීලවතී දේවීන්වහන්සේ සර්වාභරණයෙහි සරසා මාළිගාවෙන් පිටත් කළාහුය. එකෙනෙහි බිසවුන්ගේ සීලානුභාවයෙන් සරසා මාළිගාවෙන් පිටත්කළාහුය. එකෙණෙහි බිසවුන්ගේ සීලානුභාවයෙන් ශක්‍ර දේවෙන්ද්‍රයන්ගේ පාණ්ඩු කම්බල ශෛලාසනය උන් නොකැමති පරිද්දෙන් හුණුවිය. එකණෙහි මීට කාරණා කම්දෝහෝයි තමන්ගේ දහසක් නුවණැස් මෙහෙයා බලා සීලවතී දේවීන් දරුවන් පතන නියාව දැන මා විසින් උන්ට දරුකෙනෙකුන් දියයුතුයැයි සිතා සියලු තව්තිසා භවනය බලාගෙන ගොස් එයින් චුතව මත්තෙහි දිව්‍ය ලෝකයට යනු කැමතිව සිටියාවූ බෝධිසත්වයන් දැක ශක්‍රදේවේන්ද්‍රයෝ ඔහුගේ විමන්දොරට ගොස් සබඳ තොප විසින් මනුෂ්‍යලෝකයට ගොස් ඔක්කාක රජ්ජුරුවන්ගේ අග මෙහෙසුන් බිසවුන් කුස පිළිබඳ ගතයුතුයයි කියා ගිවිස්සා අන් දිව්‍යපුත්‍රයෙකුත් එලෙසම ගිවිස්සා කවුරුත් බිසවුන්ගේ සීලභේදය නොකරත්වයි සිතා තුමූ මහළු බමුණු වෙසක් මවාගෙන රජ්ජුරුවන්ගේ මාළිගා දොරට ගියාහුය. එසඳ රැස්වූ බොහෝ දෙන ඒ ශක්‍ර බ්‍රාහ්මණයා දැක කුමක් නිසා තෝ මෙතනට ආයෙහිදැයි යනාදීන් පරිභවබැණ විචාළහ. ඒ අසා ශක්‍රදේවේන්ද්‍රයෝ ද කුමැයි මට නින්දාකරව්ද? ශරීරය ජරප්‍රාප්ත පමණක් විනා රාගය තරුන වන්නේය. ඉදින් සීලවතීදෙවීන් ලදින්නම් ගෙනයෙමියි සිතා ආම් කියා තමන්ගේ ආනුභාවයෙන් හැමදෙනාටද පෙරටව සිටගෙන පිටත් වූ බිසවුන් අත අල්වාගෙන ඒ සියළු ජනයා නින්දා පරිභව කරමින් සිටියදී නිකුමුනේය. එසඳ බිසව්ද මේ මහළු බමුණු මා ගෙනයන්නෙයයි පිළිකුලෙන් පෙළී ලජ්ජාවට පැමිණියෝය. රජ්ජුරුවෝද බමුණු මාල්ලා විසින් ගෙනයනලද බිසවුන් දැක නොසතුටුවූය ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රයෝ බිසවුන් ඇරගෙන නුවර වාසලින් පිටත්ව වාසල් සමීපයෙහි පනවන ලද දඩුමැසි ඇති හරණාලද දොරපැලලි ඇති පැල්පතක් මවා ඒ විල සමීපයට ගියේය. එකල බිසව් මේ නුඹගේ ගෙදරදැයි විචාරා බමුණු විසින් එසේය සොඳුර පළමු මම උදකලායෙමි දැන් අපි දෙදෙන මොවුම්හ, එහෙයින් මා සාල් මලු ආදිය සිඟාගෙන එනතෙක් මේ මැස්සේ වැදොවැයි කියා බිසවුන් මොලකතින් පිරිමැද දිවපහස් පතුරුවා නිදිගන්වා දිවපහස් ලැබ විසංඥව නිදන්ට වන්සඳ තමන්ගේ ආනුභාවයෙන් බිසවුන් තව්තිසා භවනයට ගෙනගොස් සරන ලද දිව්‍ය විමානයෙක්හි අතුරණලද දිව යහන්හි සතප්පාලහ.

ඉක්බිති බිසව් සතියකින් පිබිද එහි දිව්‍යලෝකයෙහි සම්පත් දැක මේ මා ගෙනායේ මිණිසෙක් නොවෙයි ශක්‍රදේවේන්ද්‍රයෝවනැයි සිතා යහනින් නැගී නොයෙක් දිවනලුවන් විසින් පිරිවරණලදුව පරසතුරුක මුල පඩු ඇඹුල්සල අස්නෙහි ඉඳ දිව ඉසුරු විඳිනාවූ සක්දෙව්රජුහු කරාගොස් වැඳ එකත්පස්ව සිටියෝය.

එකල ශක්‍රදේවේන්ද්‍රයෝ තොපට වර දානයක් දෙමි කැමති වරයක් ඉල්වා ගනැයි කීහ. එබස් අසා සතුටුවූ බිසව් දේවයන් වහන්ස පුත්‍ර වරයක් දුන මැනවයි ඉල්ලුහ. එකල ශක්‍රදේවේන්ද්‍රයෝ දේවිනි එක් කෙණෙකුන් තබා දරුවන් දෙන්නෙකු දෙමි. බල ඉන් එක් කෙණෙක් නුවණැතිව රූ නැති වෙති. එක් කෙණෙක් රූ ඇතිව නුවණැතිවෙති. ඔවුන් දෙදෙනාගෙන් පළමුව ලබන්නා කැමැත්තෙම් කී සඳ එබස් ශක්‍රදේවේන්ද්‍රයෝ පිළිගෙණ ඒ බිසවුන්ට කුසතණ මිටක්ද දිවසළුවක්ද දිවසඳුන් හරයක්ද පරසතු මදාරා මල්ද කොකනද නම් විණාවක්ද දී බිසවුන් කැඳවාගෙණ අවුත් රජ්ජුරුවන්ගේ ශ්‍රී යහන් ගබඩාවට වැද රජ්ජුරුවන් හා එක් යහන් කරවා තමාගේ පය මහපට ඇඟිල්ලෙන් බිසවුන්ගේ පෙකණිය පිරිමැද සුරපුරටම නැගී ගියාහ. එකෙණෙහි පුරණ ලද බෝධිසම්භාර ඇති අප මහා බෝසතාණෝ තව්තිසා භවනයෙන් චුතව අවුත් සීලවතී දේවින් බඩ පිළිසිඳ ගත්හ.

බිසවුන් තමන් කුස දරුගැබ පිහිටිබව දත්හ. ඉක්බිති රජ්ජුරුවෝ පිබිද බිසවුන් දැක දේවිනි කවුරුන් විසින් ගෙනයනලද දැයි විචාරා ශක්‍ර දේවේන්ද්‍රයන් විසිනැයි කී කල මේ කිමෙක්ද  මහළු බමුණෙකු ගෙනගිය නියාව මම දිටිමි කුමක් කියා මට වලහා කිව්දැයි කිව්ය. දේවයන් වහන්ස අදහාගත මැනව, ශක්‍රදේවේන්ද්‍රයො මා හැරගෙණ දිව්‍ය ලෝකයට ගියාහුයැයි දෙවැනි තුන්වෙනිවත් කියා ගිවිස්වාලිය නොහි ශක්‍රදේවේන්ද්‍රයන් විසින් දෙනලද කුස තණ හා දිව සළු ආදිය පෑ ගිවිස්වා වන්නාට ශක්‍රදේවේන්ද්‍රයෝ තොප ගෙන ගියෝය. දරුකෙණෙකුන් ලදුදැයි විචාරා එසේය දේවයන් වහන්ස දරුකෙනෙකුන් ලදිමි කීවිය. එබස් අසා සතුටුවූ රජ්ජුරුවෝ බිසවුන්ට ගබ පෙරහර දුන්හ.

ඉක්බිති ඒ බිසව්ද ක්‍රමයෙන් දස එකඩමසක් ඇවෑමෙන් පුතනු කෙනෙකුන් වැදුහ. ඒ කුමාරයාහට කුසකුමාරයෝ යයි නම් තුබූහ. ඒ කුස කුමාරයන් පියවරනහා ඇවිදිනා කාලයෙහි අනික් දිව්‍ය පුත්‍රයෙක් දෙව් ලොවින් අවුත් බිසවුන් කුස උපන්හ. ඕ හට ජයම්පතී යයි නම් තැබූහ. ඒ රාජ කුමාරවරු දෙදෙන මහත්වූ පෙරහරින් පෙරඩමස සඳසේම වැඩිවිය පැමිනි යාහ. මහාබෝධිසත්වයෝ තමන් නුවණැතිහෙයින් සියළු සිල්පයන්ම ආචාරී කෙණෙකුන් ගෙන් නොඉගෙන සියනුවනින්ම දන නිමවුහ. ඉක්බිති මහා බෝධිසත්වයන් සොළොස් හැවිරිදි වයසට පැමිණිකල්හි පියරජ්ජුරුවෝ කුමාරයන් රාජ්‍යයෙහි අභිෂේක කරණු කැමැතිව බිසවුන් කැඳවා දේවීනි තොපගේ පුතනුවන් අභිෂේක කරවා නාටක ස්ත්‍රීන් හා ඓශ්වර්යය පාවාදී ජීවත්වන්නාවූ අපි රාජ්‍යයෙහි පිහිටියාහුගේ ශ්‍රී විභූතිය දකුම්හ. මේ මුළු දඹදිව යම් රජක්හුගේ දුවක කැමතිවේද උන්

SANHIDALANKA

ගෙන්වා අගමෙහෙසුන් කරම්හ කවර රජ්ජුරුකෙනෙකුන්ගේ කුමාරිකාවක කැමැත්තෝද උන්ගේ අභිප්‍රාව දැන කියවයි කීහ. බිසවුන් යහපතැයි ගිවිස කුමාරයන්ට මෙපවත් කියා අභිප්‍රාය විචාරාගෙන එවයි කියා කම්මිත්තක යවුහ. ඒ ස්ත්‍රී ගොසින් බෝධි සත්වයන්ට එපවත් කිව්ය. ඒ අසා මහා බෝසතානෝ මම රූ නැත්තෙමි රූපශ්‍රීන් යුක්තවූ රාජ කුමාරිකාවන් ගෙනෙන ලද්දෝවූ නම් මා දැක යකකුමෙන් විරූපවූ මොහුගෙන් මට කම් කිම්දැයි පලායන්නීය. ඒ අපට ලජ්ජා කටයුතු වන්නේය. එහෙයින් මට ගෘහවාසයෙන් ප්‍රයෝජන නැත මා පිය දෙදෙනා ජීවත්වනතෙක් උපස්ථානකොට ගුරුදෙදෙනා ඇවෑමෙන් ගොස් මහණවෙමියි සිතා මහබෝධිසත්වයෝ තමන්ගේ මේ අදහස ඒ කම්මිත්තියට කිව්ය. ඕ තොමෝ ගොස් එපවත් බිසවුන්ට කිව. බිසවු එපවත් රජ්ජුරුවන්ට කිහ. ඒ අසා රජ්ජුරුවෝ නොසතුටුව නැවත කීප දවසකින් එමලෙසම කියා යවුහ. බෝධිසත්වයෝ නොකමැත්තෙයයි තුන්යලක් වළකා සතරවෙනි වාරයෙහි දෙමාපියන් කීවා නොකොට වරදවා පිළිපැදීම කටයුතු නොවෙයි ඊට නිසි උපදෙසක් කෙරෙමියි සිතා මහා බෝධිසත්වයෝ තරාල් දෙටුවකු කැඳවා බොහෝ රත්රන්දී එක් ස්ත්‍රීරූපයක් කොට ගෙනවයි කියා ඔහු නික්මවා තුමු රත්රනින් ස්ත්‍රීරූපයක් කළෝය.

බෝධිසත්වයන්ගේ අභිප්‍රාය සිතූ පැතූලෙසම සිද්ධවන බැවින් ඒ රන් රුව කියා නිමවිය නොහැකි රූපසෝභා ඇත්තෝවිය. එකල මහ බෝධිසත්වයෝ ඒ රන්රුව සුරත් කොමු පිළියක් අඳවා ශ්‍රී යහන් ගර්භයෙහි සිටවුහ. ඉක්බිති බෝධිසත්වයෝ ගර්භයෙහි තුබු ස්වර්ණරූපය ගෙනෙවයි ස්වර්ණකාරයාහට නියෝග කළේය. එසඳ ඒ ගොස් ශ්‍රී යහන් ගර්භයට වැද ඒ රන්රුව දැක කුමාරයන් වහන්සේ හා සමඟ ක්‍රීඩා පිණිස ආ දිව්‍යප්සරාවක් වනැයි සිතා අත දික්කරන්ටත් නොපොසත්ව බෝධිසත්වයන් කරාගොස් දේවයන් වහන්ස බිසවුන් වහන්සේ තනිව වැඩ සිටි සෙයින් වැද්ද නොහෙමියි කීය. නැවත බෝධිසත්වයන් විසින් ඇදුර එරන්රුව සැක නැතිව හැරගෙන එවයි කියා යවන ලදුව ගොස් ගෙනායේය. ඉක්බිති බෝධිසත්වයෝ බඩලා ගෙනා රුව රත්‍රන් ගබෙහි ලා තමන් කළ රුව ආභරණ ආදීන් සරහා රථ යානාවෙක්හි තබා මෙබඳු රූප ශ්‍රී ඇති කෙනෙකු ලදින් නම් පාවාගනිමි කියා රන්රුව මෑනියන් සවමීපයට යවුහ. ඒ දැක බිසව් සතුටුව අමාත්‍යයන් රැස්කරවා සගයෙනි මපුතනුවෝ නම් මහ පිණැත්තාහ. ශක්‍රදේවේන්ද්‍රයන් විසින් දෙනලද කෙනක එහෙයින් සුදුසු කුමාරිකා කෙනෙකුන් ලැබෙති තෙපි හැම මේ රන්රුව පිළිසන් රථ යානාවෙක තබා ගෙන මුළු දඹදිව ඇවිදිමින් යම් රජ්ජුරු කෙනෙකුන්ගේ මෙබඳු රූ ඇති කුමාරිකාවකය දුටු නම් ඒ රජහට මේරන්රුව දී ඔක්කාක රජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේ හා සමඟ විවාහ සම්බන්ධයක් කරණු කැමැතිසේකැයි කියා දවසක් නියමකොට එවයි නියෝග කළාහුය.

එසඳ ඒ නියෝගයක ලද ඇමතියෝ මහපෙරහරින්ම ඒ රන්රුව හැර ගෙන අවිදිනාහු යම් නුවරකට පැමිනෙද්ද එහි සවස්වෙලෙහි බොහෝදෙනා රැස්වන තෙනක ඒ රුව වස්ත්‍රාභරණ කුසුමාදින් සරහා රන්සිවි ගෙයක් හි තබා  පාන්තොටට යන එන මංහස සිටුවා තුමු ඉවත්ව යනු එන්නන් බස් අසනු පිණිස සැඟවී සිටියාහ. එකල බොහෝදෙන ඒ රුව දැක රන්රුවැකැයි නොදැන මනුෂ්‍යවුත් මෝ තොමෝ දිව්‍යප්ෂරාවක් මෙන් ඉතා හොබනීය මෝ තොබෝ කොයිසිට අවුදැයි කුමක් නිසා මෙතන සිටියෝද අපගේ නුවර මෙබඳු රූපශ්‍රී ඇති කෙනෙක් නැතැයි යනාදීන් ප්‍රසංසාකෙරෙමින් යන්නාහ. එකල අමාත්‍යයෝ ඉදින් මෙනුවර මෙබඳුවූ කුමාරිකා කෙනෙක් ඇත්නම් අසෝ රජ්ජුරුවන්ගේ අසෝ අමාත්‍යයන්ගේ දියනියන් වැනියෝයයි කියති. එලෙස නොකියේ ඒකාන්තයෙන් මෙබඳූ රූ ඇතිකෙනෙකුන් මෙනුවර නැති හෙයිනැයි ඒ රුව හැරගෙන අනික් නුවරකට යන්නාහ මේ ලෙස ක්‍රම යෙන් ගොස් මදුරට සාගල නුවරට පැමිණියාහුය.

එනුවර මදු රජ්ජුරුවන්ගේ දිව්‍ය ස්ත්‍රීන් හා සමානව උතුම්වූ රූපසෝභා ඇති දූ අටදෙනෙක් ඇත. ඔවුන් අටදෙනාට වැඩිමාළු ප්‍රභාවතිගේ ශරීරයෙන් හැමවෙලෙහිම බාලාකීරසමියට බඳුවූ පැහැ විහිදුනේය ඝනාන්ධකාරවුත් රාත්‍රියෙහි සතරරියන් ගෙයක් හි ප්‍රදීපාලෝකයක් නැතිව ශරීරාලොකයෙන්ම එකාලොක වන්නේය. උන්ට කිරිමව්වූ කුදු තොමෝ ප්‍රභාවතීන්ට නහණ පැන් ගෙණෙන පිණිස ස්ත්‍රීන් අටදෙනෙකු ලවා රන්කළ අටක් ගෙන්වාගෙන සවස් වෙලෙහි පැණට යන්නීය. ඔක්කාක රජ්ජුරුවන්ගේ රන්රුව ගෙනා පුරුෂයන් විසින් මංහස සිටුවන ලද රුව දැක ප්‍රභාවතියයි යන සිතින් ලඟට ගොස් මේ නොකිකරු දරුවෝ අප පැණට එවා තුමු මේ වෙලේ පළමු කොට අවුදින් මෙතන සිටියෝය. රජ කුලයට පරිභව උපදවන්නාවූ කෙල්ල ඉදින් රජ්ජුරුවන් වහන්සේ දත්සේක්වින්නම් අප හැම නසාපියනසේකැයි කියා කිපි කොපුලතෙහි පාරක් ගැසූව. එකෙණෙහි අත්ල පැලියනකලක් පරිද්දෙන් වේදනා වට පැමිණ රන්රුවකැයි දැන ලජ්ජාව සිනාසෙමින් බලග මා කලදෙයෙක මම් මාගේ දියනියැනැයි සිතා පාරක් ගැසිමි මෝ තොමෙ මාගේ දරුවන්ගේ රුවට කුමක් අගීද මාගේ අතට අස්සවු පමණැකැයි තමා හා එක්ව බිසවුන්ට කියව එබස් අසා රාජපුරුෂයෝ මාගේ දියනියෝ මීටත් වඩා රූ ඇත්තාහයි කියන්නාහු තොපි කුමක් කියව්දැයි විචාළාහුය.

SANHIDA LANKA

එකල ඔවුන්ට මෙරන් රුව මදුරජ්ජුරුවන්ගේ දියනියන් ප්‍රභාවතීන්ගේ රූපශ්‍රීන් සොළොස්වන කලාවෙන්

කලාවකුත් නොහගනේයයි කුද කිව ඔහු එබස් අසා සතුටුව රජගෙයි වාසලට ගොස් ඔක්කාක රජ්ජුරුවන්ගෙන් ආ දූතයෝ වාසල සිටියාහුයයි මද්දුරජ්ජුරුවන්ට කියා යවුහ. එබස් අසා මද්දු රජ්ජුරුවෝ උනස්නෙන් නැගී සිට ගෙනෙව ගෙනෙවයි වහා ගෙන්වාගත දූටහ. එකල දූතයෝ දේවයන් වහන්ස අපගේ රජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේගේ සුවදුක් විචාළසේක. යනාදීන් කථාකොට කරණලද සම්භාවනා ඇතිව රජ්ජුරුවන් විසින් කුමක්පිණිස අවුදයි විචාළකල්හි අපගේ රජ්ජුරුවන් වහන්සේගේ සිංහ ගර්ජනාවට බඳුවූ අභිතනාද ඇති කුස නම් කුමාරයෙක් ඇත, අපගේ රජ්ජුරුවන් වහන්සේ උන් වහන්සේට රාජ්ජය දෙනු කැමතිසේක් නුඹ වහන්සේ සමීපයට එවුසේක. නුඹ වහන්සේගේ ප්‍රභාවතී නම් කුමාරිකාවන් වහන්සේ මේ රන්රුව වියදමට ඇරගෙනදෙවා වදාළ මැනවැයි කිවුය. ඒ අසා මද්දුරජ්ජුරුවෝ මෙබඳුවූ මහරජ්ජුරුකෙණෙකුන් හා සමඟ විවාහ සම්බන්ධයෙක් වන්නේයයි සතුටුව මැනව මැනවයි ගිවිස්සාහ. එකල දූතයෝ අප විසින් කල් යැවිය නොහැකැයි වහාගොස් රාජ කුමාරිකාකෙනෙක් ඇති නියාව අපගේ රජ්ජුරුවන් වහන්සේට කියම්හ. උන් වහන්සේම අවුත් කැඳවාගෙන යනසේකැයි කිව්ය. ඒ රජ්ජුරුවෝත් යහපතැයි පිළිගෙන දූතයනට ප්‍රසාදදී යවුහ. ඔහු ගොස් එපවත් රජ්ජුරුවන්ට හා බිසවුන්ට කිවුය. එපවත් අසා ඔක්කාක රජ්ජුරුවෝ මහපිරිවරින් කුසාවතී නුවරින් නික්ම ක්‍රමයෙන් ගොස් සාගල නුවරට පැමිණියාහ. එබව අසා මද්දු රජ්ජුරුවෝ සිවුරඟ සෙනඟ පිරිවරා පෙර ගමන් ගොස් නුවරට කැඳවාගෙන ගොස් මහත් සත්කාර සම්භාවනා කළාහුය. කීප දවසකින් ඔක්කාක රජ්ජුරුවන්ගේ සිලවතී දේවිතොමෝ නුවණැති බැවින් කවුරු දනිද්දැයි සිතා රජ්ජුරුවන් වහන්සේ යෙහෙලනියන් දක්නා කැමැත්තම්හයි මද්දු රජ්ජුරුවන්ට කිවුය. රජ්ජුරුවෝත් මැනවැයි පිළිගෙන දියනියන් කැඳවා යවුය. එසඳ ප්‍රභාවතී සර්වාභරණයෙන් සැරහී කිරිමවුන් විසින් පිරිවරණ ලදුව අවුත් නැන්දනියන් දැකලා සිටියාහ. සීලවති දෙවි ප්‍රභාවතීන් දැක මේ කුමාරිකා යහපත් රූ ඇත්තීය. මපුතනුවෝ විරූපයක ඉදින් උහු දිටවු නම් එක් දවසකුත් නොරඳා පලායන්නාහ. ඊට නිසි උපායක් කෙරෙමියි සිතා ඉක්බිති බිසව් මහරජ මාගේ යෙහෙලනියෝ මපුතනුවන්ට නිස්සාහ. එතකු උවත් අපගේ වංශපරම්පරාවෙන් පැවත එරන චාරිත්‍රයෙක් ඇත. ඉදින් මූ ඒ වුලෙස පිළිපදිත් නම් කැඳවාගෙනයම්හයි මද්දු රජ්ජුරුවන්ට කිවුය. ඒ අසා මද්දු රජ්ජුරුවෝ කවර ආචාරයයෙක්දැයි විචාළාහ. අපගේ වංශයෙහි දරුගර්භයක් පිහිටනාතෙක් ස්ත්‍රීහු දාවල් සාමිපුත්‍රයා දකින්ට නොලබති. ඉදින් මුන් එලෙස පවතින් නම් කැඳවාගෙන යම්හයි කිවුය. ඒ අසා රජ්ජුරුවෝ දියනියෙනි එලෙස පවතින්ට පිලිවන්දැයි විචාළාහ. ප්‍රභාවතී යහපතැයි ගිවිස්සාහ. ඉක්බිති ඔක්කාක රජ්ජුරුවො මද්දු රජ්ජුරුවන්ට බොහෝ සම්පත්දී ප්‍රභාවිතීන් කැඳවාගන ගියහ. මද්දු රජ්ජුරුවෝත් මහ පෙරහරින් දියනියන් නික්මුවුහ.

ඔක්කාක රජ්ජුරුවෝ ගොස් කුසාවතී නුවර දිව්‍යපුරයක් මෙන් සරහා බන්ධන ගත සියළු සත්වයන් මුදාහැරවා පුතනුවන්ට ප්‍රභාවතීන් අගමෙහෙසුන් කොට අභිෂේක කරවා කුස රජ්ජුරුවන්ගේ ආඥාවයයි අණබෙර ලවා සේසත් නැංවුහ.

දඹදිව සියළු රජ දරුවෝ තමන් තමන්ගේ දරුවන් කුස රජ්ජුරුවන්ට සේවය පිණිස එවුහ. එකල බෝධිසත්වයෝ නළුනාටකාදී මහත් පිරිවරින් යුක්තව අපමණවූ ඓශ්වර්යයෙන් රාජ්‍ය ශ්‍රී විඳිනාහ.

එසඳ කුස රජ්ජුරුවන් හා ප්‍රභාවති දේවි හා දෙදෙනා දිවාභාගයෙහි ඔවුනොවුන් නොදැක රාත්‍රියෙහිම දක්නාහ. ඒ ප්‍රභාවතීන්ගේ ශරීර සෝභාව මහබෝධිසත්වයන් තේජසින් සූර්යාලෝකයෙහි කදෝපැණියන් මෙන්ද දිවා චන්ද්‍රයා පරිද්දෙන්ද නිෂ්ප්‍රභා විය. කුස රජ්ජුරුවෝත් ශ්‍රී යහන් ගබින් පහන් වන්නට පළමුව පිටත්වන්නාහ. මෙලෙසින් කලක් ගියසඳ ප්‍රභාවතීන් දාවල් දක්නා කැමතිව මෑණියන්ට කිවුය. මෑණියෝත් ඔහු බස් අසා පුතනුවෙනි දරුකෙනෙකුන් ලබනකල් ඉවසුවයි නැවතූහ.

බෝධිසත්වයෝ නැවත නැවතත් ඇවිටිලිකොට කිවුය. එකල මෑණියෝ දක්නා කැමැතහොත් ඇත්හලට ගොස් ඇත්ගොව්වන් හා එක්ව සිටුව මම එතනට උන් කැඳවාගෙන එම් එකල ඇස්පුරාදැක පියව තොප වූ නියාව නොහඟවයි කිව්ය. බෝධිසත්වයෝත් යහපතැයි පිළිගෙන ඇත්හලට ගියාහුය. එකල්හි සීලවති දේවි ප්‍රභාවතීන් ඇත්හලට කැඳවාගෙන ගොස් මේ අසවල් ඇතාය. මේ අසවල් ඇතායයි නම් කිය නියා දක්ව දක්වා යනසඳ කුස රජ්ජුරුවෝ ප්‍රභාවතින්ගේ පිට ඇත් ඉලත්තියක් ගැසුහ. එකල ප්‍රභාවතී රජ්ජුරුවන් වහන්සේට කියා තොපගේ අතකප්පාලම් යනාදින් කියා බිසවුන් ලවාත් කොප කැරවුහ. එසඳ බිසවු ප්‍රභාවතින්ගේ පිට අතින් පිරිමැද තම ඇත්හල කොල්ලෝනම් ඉතා චපලයෝය. නුඹ වහන්සේට උරණවන්නේයයි යනාදින් කියා අස්වසා රජගෙට ගියාහුය.

තවද කාලෙකින් බෝධිසත්වයෝ ප්‍රභාවතීන් දක්නා කැමතිව පෙර පරිද්දෙන්ම මෑණියන්ට කියා අස්සලට ගොස් අස්සලයක්හු පරිද්දෙන් සිට ප්‍රභාවතීන් දැක එතනදීත් අස්බෙට්ටක් ගැසුය. එදවසද කිපියාවූ ප්‍රභාවතීන් බිසව සන්සිඳුවුය. ඉක්බිති කල්යමෙන් ප්‍රභාවතී බෝධිසත්වයන් දක්නා කැමතිවනැයි නැන්දනියනට කියා උන් විසින් වලකනලදුව නැවතත් යාච්ඤා කොට බිසවුන් විසින් එසේවී නම් කුස රජ්ජුරුවෝ සෙට නුවර

SANHIDA LANKA

පැදකුණු කෙරෙති තෙපි ඒ වෙලාවට සී මැදුරු කවුළුවෙන් දකුවයි කියා දෙවන දවස් නුවර සරහවා රජ්ජුරුවන්ගේ මලනුවන් ජයම්පති කුමාරයන් රාජාභරණයෙන් සරහවා මගුලැතුපිට හිඳුවා බෝධිසත්වයන් ඇත්ගොව් වේශයෙන් පශ්චිමාසනයෙහි ඉඳුවා නුවර පැදකුණු කරවා පභාවතීන් කැඳවාගෙන සී මැදුරු කව්ළුවෙන් බලමින් තොපගේ ස්වාමිපුත්‍රයානන්ගේ ශ්‍රී විභූතිය බලවයි කිවුය. එකල ප්‍රභාවතී ජයම්පති කුමාරයන් දැක මට සුදුසු වල්ලභයාන කෙනෙකුන් ලදිමි සතුටුවුය. එදවස් ඇත්ගොව් වෙසින් පිටිපස උන් බොධි සත්වයෝ සිත්වූ පරිද්දෙන් ප්‍රභාවතීන් දකිමින් හස්තවිකාර මුඛවිකාරයෙන් උසුළු විසුළු පෑ කෙළියහ.

එලෙස ඇතා ගිය පසු තොපගේ ස්වාමිපුත්‍රයානන් දුටුදැයි ප්‍රභාවතීන් විචාරා ඔහු විසින් ස්වාමිනි දිටිමි පිටිපස්සේ උන් ඇත්ගොවු ඉතාම චපලය මට උසුළු විසුළු පෑයේය. එබඳුවු නොහික්මුනු පින්මද තැනැත්තවු කුමක් පිණිස රජ්ජුරුවන්ට පිටිපස්සේ ඉඳුවුදැයි කිවුය. එබස් අසා බිසව් දියනියෙනි රජ්ජුරුවන්ට ආරක්ෂා පිණිස සැලසු ඇත්ගොව්වායයි වලහා කිව්ය. ඒ අසා ප්‍රභාවතී මේ ඇත්ගොව්වා ඉතා නිර්භිතය රජ්ජුරුවන්ට රජ්ජුරුකෙනෙකැයි නොසිතති. මේ කිමෙක්ද කුස රජ්ජුරුවෝ නම් මුවනැයි ඒකාන්තයෙන් උන් රූ නැති කෙනෙකුන් වියයුතුය. ඒ කාරණයෙන් මා නොදක්වති සිතා කුද කැඳවා යව මෑනියෙනි කුස රජ්ජුරුවෝ ඇතුපිට ඉදිරියෙ උන් තැනැත්තෝද නොහොත් පිටිපස්සේ උන් තෙනෙත්තෝදැයි නියම දැනගෙන එවයි කිව්ය. එවිගස මම කෙසේද දැනගතිම්දැයි විචාළාහ. කුදට පළමුයෙන් ඇතු පිට බට තෙනෙත්තෝ රජ්ජුරුවෝය මෙලෙස සලකුණෙන් නියම දැනගෙන එවයි කිවුය. ඒ නියොග ලද කුදු ගොස් එක්තෙනක සිට පළමුකොට බෝධිසත්වයන් හා දෙවෙනිව ජයම්පතී කුමාරයන් බට නියාව දුට. එකල බෝධිසත්වයෝ ඈත මෑත බලා දුරසිටි කුද දැක මෑ ආයේ මේ පරීක්ෂාකරන්ට යයි දැන ලඟට කැඳවා මේ තොරතුරු නොකියවයි කියා නික්මවුහ. ඕ ගොසින් පෙර ආසනයේ උන් තෙනත්තෝම පළමුකොටම බටුයයි කියා ගිවිස්වාලූහ. නැවත කල්යාමකින් බෝධිසත්වයෝ ප්‍රභාවතීන් දක්නා කැමතිව මෑනියන්ට කිවුය. බිසෝ නවතාගත නොහි එසේවී නම් අප්‍රසිද්ධ වේශයෙන් උයනේ ගොස් සිටුවයි කිවුය. එබස් අසා කුස රජ්ජුරුවෝ උයනට ගොසින් මගුල් පොකුණෙ කරවටක් දියට බැස නෙලුම්පතක් ඉසවසාගෙන නෙලුම් මලකින් මූන වසාගෙණ සිටියාහුය. බිසවුන් ප්‍රභාවතින් උයනට කැඳවා ගෙන ගොස් සවස් වෙලෙහි පුෂ්ප ඵල පල්ලවයෙන් සජින්නවු සපු දුනුකේ නා පනා සිනිද්ද බෝලිද්ද දෑසමන් ආදි ගස්ලියද ගිරා බෝකල් ඈ පක්ෂීන්ද දක්වමින් මගුල් උයන් ඇවිදගෙන ඇගේ සිත් පොළඹමින් පොකුණුතෙරට ගියෝය. එකෙණෙහි ප්‍රභාවතී තොමෝ පස්පියුමෙන් ගැවසීගත් පොකුණ දැක නහණු කැමතිව පිරිවර හා සමඟ පොකුණට බැස කෙළිමින් මහබෝධිසත්වයන් මූන වසාගෙන සිටි පියුමට අත දික්කලාය එකල්හි රජ්ජුරුවෝ නෙළුම්පත ඉවත් කොට මම කුස රජයයි ප්‍රභාවතීන් අත ඇල්ලුය. ඔහුගේ මුඛය දැක යක්ෂයෙක් මා අත අල්වාගතැයි මුරගාමින් භයින් මූර්ජව ගියාහ. එසඳ රජ්ජුරුවෝ අත ඇරපීහ. ඉක්බිති බිසෝ සිහිලදින් සිතන්නාහු මා අත ඇල්ලුවුවෝ ඉදින් කුස රජ්ජුරුවෝ වි නම් ඇතතලදී ඉලත්තියනුත් අස්සලදී අස්බෙට්ටියෙනුත් මුන් විසින්ම ගසන ලදිමි. ඇතුගේ පශ්චිමාසනයෙහිද මා වෙහෙසවුයෙත් මුඛය මෙසේ විරූපවු දුර්මුඛවු වල්ලභයාගෙන් මට ප්‍රයෝජන කිම්ද ජීවත්ව උනින් නම් මට වල්ලභයන් අරුම නොවන්නේයයි සිතා තමන් හා එක්ව ආ අමාත්‍යයන් යවා යානාවාහන සරහවා අද දවස්ම නික්මෙමි කීහ.

ඔහු එපවත් අසා රජ්ජුරුවන්ට කිවාහුය. ඒ අසා රජ්ජුරුවෝ මූ යන්ට අවසර නොලද්දු නම් පැලි මියයන්නාහ. වන්නාට දැනට යෙත්වයි නැවත මාගේ බලයෙන් ගෙන්වා ගනිමි සිතා ගමන් අනුදත්හ. එකල්හි ප්‍රභාවතී පිරිවර හා සමඟ පිය රජ්ජුරුවන්ගේ සාගල නුවරට ගියෝය. ප්‍රභාවතී තොම ජාතියෙහි කල ප්‍රාර්ථනාවෙන් නොකමැතිවිය. බෝධිසත්වයෝද පූර්වයෙහි කරණ ලද අකුශල බලයෙන් විරූපව ගියහ.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවරට නුදුරු ගමෙක්හි විථිදෙකක කෙළෙඹි කුලදෙකක් ඇත්තේ ඉන් ගෙයක පුත් දෙන්නෙක් වුහ. ඉක්බිති බෝධි සත්වයෝ බාල මලනුවෝහ.

අනික් කෙළෙඹි කුලයෙහි දියනි කෙනෙක්වුහ. ඒ කුමාරිකාව බෝධිසත්වයන්ගේ බෑණන්ට සරණ ගෙන්වුහ. බෝධිසත්වයෝ වෙන ගෙයක් දොරක් නැතිව බෑණන්ගේ ගෙයි වාසය කෙරෙති ඉක්බිති එක්දවසෙක අතිරස කැවුම්පිස කිසි කටයුත්තක් නිසා වලගිය බෝධිසත්වයන්ට තිබා තුමු දෙදෙන අනුභව කලහ.

SANHIDA LANKA

එවෙලෙහි සිඟා වැඩි පසේ බුදු රජකෙනෙකුන් වහන්සේ දැක බෝධි සත්වයන්ගේ බෑදනියෝ උන්ට කැවුම් පසුව පිස දිනහැක්කැයි සිතා බෝධි සත්වයන්ට තිබූ කොටස පිළිගැන්වුහ. බෝධිසත්වයෝ තොපසන්තක කොටස කාපියා මාගේ කොටස දන්දෙන්ට කාරණා කිම්දැයි කිපී ලුහුබඳවා ගොසින් පසේ බුදුන් වහන්සේ ගේ පාත්‍රයේ තුබූ කැවුම් ඇරගත්තුය. එකල ස්ත්‍රී මෑණියන් ගෙට ගොස් සපුමල් පෙත්තක්සේ සනරන්වන්වූ අළුත් දව ගිතෙල් ගෙන පාත්‍රයෙහි පුරා සතුටුව ස්වාමිනි මා උපනුපන් ජාතියෙහි මාගේ ශරීරයෙන් ආලෝක

පැතිරෙවයි උතුම්වු රූ ඇතිවෙම්වයි අසත්පුරුෂයා හා එකතෙන වාසය නොකෙරෙම්වයි කියා කළ ප්‍රාර්ථනා වශයෙන් ප්‍රභාවතී බෝධිසත්වන් නොකමැතිවුහ.

බෝධි සත්වයෝද පසේ බුදුන් වහන්සේගේ පාත්‍රයට කැවුම් කොටස පිළිගන්වා ස්වාමින් ඉදින් යොදුන් සියයක උනත් මුත් මාගේ බලයෙන් ගෙන්වාගෙන මට පාදපරිචාරිකා කරන්ට සමර්ථවෙම්වයි ප්‍රාර්ථනා කළෝය.

කිපී ගොස් පසේ බුදුන්ගේ පාත්‍රයේ තුබූ කැවුම් හැරගත් හෙයින් මුඛය විසූළුව ගියේය. මේ තෙම මොවුන්ගේ පූර්වක්‍රියාවන්නේය. බෝධි සත්වයෝ ප්‍රභාවතින් ගිය නියාව අසා සොකයට පැමිණියාහ. අවශේෂ නාටක ස්ත්‍රීන් නොයෙක් ප්‍රකාරයෙන් සිත්නලවන්නාහු පෙළඹාගත නුහුණුවහ.

ප්‍රභාවතීන් නැති රජගෙය කුසරජ්ජුරුවන්ට සිස්වුවාක් මෙන් වැටහෙන්නේය. මෙලෙසින් රාත්‍රියෙහි බොහෝ දුක් විඳ අලුයම් නැගිසිට සාගල නුවරට ගොස් ප්‍රභාවතීදේවි කැඳවාගෙන එම් කියා මා එනතෙක් රාජ්ජ්‍යය පියානන් වහන්සේට වේවයි මලනුවන්ට වේවයි පාවාදීලින්නම් නැවත ඇර ගැන්ම ආයාසවේදැයි සිතා මෑණියන් සීලවතී දේවින් සමීපයට ගොස් මෑණියන් වහන්ස ධන ධාන්‍ය දින් හරිත වූ ඇත් ඇණි අස් ඇණි රියබලයයි සිව්රඟසෙනගින් යුක්තවූ පංචක්කුධභාණ්ඩයන් ඇති සියලු උපභෝග පරිභෝග වස්තුවෙන් සමෘද්ධවූ මේ රාජ්ජ්‍යය ප්‍රභාවතී කැඳවාගෙන එනතෙක් පාවාගත මැනවැයි මෑණියන්ට කියා අවසර ඉල්වුහ.

එබස් අසා බිසෝ බියපත්ව පුත ස්ත්‍රිහුනම් නොයෙක් වංඤ්චා දනිති. යනාදින් අවවාද කියා මගදී අනුභවකරණ පිණිස  අනගිරසයෙන් යුක්තවූ රාජ භෝජනය රන්මුඬමක පුරාදුන්හ. එසඳ මහාබෝධිසත්වයෝ මෑණියන් තුන්යලක් පැදකුණු කොට පසඟ පිහිටුවා වැඳ ජීවත්ව උනිම්නම් සැපසේ අවුත් දකිනෙම් වේදැයි කියා අවසර ඉල්වාගෙන ශ්‍රී යහන් ගබඩාවට වැද දුනු මුගුරු කඩු කොන්ත  යන පංචායුධ සන්නද්ධව ගෙන බත්මුඬමහා සමග කහවනු දහසක් පයියෙහි ලාගෙන කොකනද නම් විණාව අතින්ගෙන නුවරින් පිටත්ව මගට පිළිපන්ව මහත්වූ බලවිර්යය ඇති මහා බෝධිසත්වයෝ එදවස් දාවල් බතට පණස් යොදුන් මග ගෙවාගෙන ගොස් බත අනුභව කොට පස්වරු භාගයෙහි තුබූ පනස්යොත්න ගෙවා ගොස් සවස් වෙලෙහි සාගල නුවරට වන්හ. බෝධිසත්වයන් එනුවරට වන්කෙණෙහිම ප්‍රභාවතී උනස්නෙහි ඉඳ නොගී යහනෙන් බිමට බැසපුවා එකල නුවරට වැද විඩාපත්ව යන්නාවු බෝධිසත්වයන් දැක එක්තරා ස්ත්‍රියක් තමාගේ ගෙට කැඳවාගෙන ගොස් ඉඳිනා අසුන්දී පයසෝධවා සැතපී හුන්කල්හි බත් මාළු සපයා අනුභවකරවුය. එසඳ සතුටුවූ මහබෝධි සත්වයෝ රන් මුඩුම හා සමග මසුදාස ඒ ස්ත්‍රියටදී ගෙනගියපඤ්චායුධය එමගෙයි තබා මාගොස් ආයුතු තැනෙක් ඇතෙයි කියා විනාව අතට ඇරගෙන ඇත්හළට ගොස් මේ රාත්‍රියෙහි සැතපෙන තෙනක් දෙව්නම් තොපට විනා ගායනා කෙරෙමි කියා ඇත්ගොව්වන් විසින් අනුදන්නාලදුව එක්තෙනක වැදහෙව මදක් නිදා පිබිද ගමන් විඩා සන්සිඳුවාගෙන විණාව තත් සරහා සියළුනුවර වාසී සත්වයෝ මේ අසත්වයි සිතා ගී කියමින් විණාගායනා කරන්නාහ.

එකල්හි බීමවැදහොත් ප්‍රභාවතීද ඒ ශබ්දය අසා මේ අනික් කෙනෙකුන්ගේ විනාශබ්දයෙක් නොවෙයි ඒ කාන්තයෙන් කුසරජ්ජුරුවන් වහන්සේ මා නිසා මේ නුවරට ආසේක්මයයි  යන්නාහුය.

මදු රජ්ජුරුවෝද විනාශබ්දය අසා ඉතා මිහිරිකොට ගායනා කරන්නේය. සෙට ඔහු කැඳවා ගායනා කරන්නට උවමැනවයි සිතුහ. බෝධි සත්වයෝ මෙතන විසිමෙන් ප්‍රභාවතින් දක්ක නොහැක්ක එහෙයින් අසථානයයි උදාසනක්සේම ඇත්හලින් නික්ම සවස බත් අනුභව කළ ගෙන්ම පෙර බත් අනු භවකොට විණාවගෙයි තබා මදු රජ්ජුරුවන්ගේ මගුල් කුඹලාගෙට ගොස් ඕහට අතවැසිව එක දවසින්ම මැටිගෙනහැර ආචාරීනී වලත් කෙරෙම්දැයි විචාරා එසේය කළ මැනවැයි කිසඳ මැටි පිඩක් හැරගෙන සකෙහි තබා සක කැරකවුහ. එකවිට කරකවන ලද ඒ සක ඉරමුදුනට එනතෙක්ම කරකැවින. මහබෝධිසත්වයෝ නොයෙක් ප්‍රකාර ඇති කුඩා මහත් බොහෝවලන් රූ නගා කොට මේ රූ ප්‍රභාවතීන් විනා අනික් කව්රුත් නොදකිත්වයි අධිෂ්ඨාන කළාහුය.

මෙලෙසින් වලන් උකා වියළා පලහා කුඹල්හල පිරුය එසඳ කුඹල් දෙටුවා නොයෙක් විසිතුරු අත්කම් දක්වා කරණ ලද වලන් ගෙන්වාගෙන ගොස් රජ්ජුරුවන් දැක්විය. එකල මදුරජ්ජුරුවෝ නුදුටුවිරූම් වලින් දැක සතුටුව මේකළෝ කවුරුදැයි විචාරා කුඹුලා විසින් මමය ස්වාමිනි කී කල්හි තොපගේ කර්මාන්ත මම නොදනිම්ද නොවලහා කියවයි තරව විචාළසඳ දේවයන් වහන්ස මාගේ අතවැස්සා විසින් කරණලදැයි කීය. එඹල ඒ තට අතවැසි කමට නිසි එකෙක් නොවෙයි ඇදුරුකමට නිස්සෝය තෝ මෙතැන් පටන් උන් ගෙන් සිල්ප උගනුව තවද එතෙම මෙතැන්පටන් මාගේ දරුවන්ට කෙළිවලන් කෙරේවයි නියෝගකොට මේ ඕහට දෙවාලවයි බෝධිසත්වයන්ට රන් මසුදහසක් යවා මේ කුඩාවලන් දරුවන්ට දෙවයි යවුහ.

SANHIDA LANKA

කුඹලාද ඒ වලන් ඇරගෙන අන්තඃපුරගෙට ගොස් කෙළිවලන් ගෙනාමිකියා යවුයේය එබස් අසා රාජ කුමාරිකාවරු එතනට රැස්වුය ඒ කුඹලා විසින් වලන් බෙදන සඳ බෝධිසත්වයන්ගේ ආනුභාවයෙන් ප්‍රභාවතින් උදෙසා රූ නගා කරණ ලද වලන්ම උන්ට දින. එසඳ ප්‍රභාවතී ඒ වලන්වල මහා බෝධිසත්වයන්ගේ හා තමන්ගේ හා කුදගේ රූ දක මේ අනික්කෙනෙකුන් විසින් කළ දෙයෙක් නොවෙයි කුසරජ්ජුරුවන් විසින්ම කරණලදූයි දන කිපි මෙයින් මට ප්‍රයොජ්න නැත කැමතිකෙනෙකුන්ට දිපියවයි කිවුය එසඳ උන්ගේ නගුන් කිපිබව දන මේ කුස රජ්ජුරුවන් වහන්සේ විසින් කළ දෙය කැයි සිතව්ද මේ කුඹලා විසින් කළාය ඇරගනුවයි යනාදීන් කිව්ය ඒ ප්‍රභාවතී තොම කුස රජ්ජුරුවන් එනුවර ගියබවද එවලන් උන් විසිත් කළබවද ඔවුන්ට නොකිව ඉක්බිති කුඹලා රජ්ජුරුවන්ගෙන් යවන  ලද මසුදහස ගෙනගොස් බෝධිසත්වයන්ටදී සබඳ රජ්ජුරුවන් වහන්සේ තොපට සමාධිවුසේක. මෙතැන් පටන් රාජකුමාරිකාවරුන්ටම තෙපි වලන් කරව මම ඒ ගෙනගොස්දෙමි කියේය. ඒ අසා බෝධිසත්වයෝ ප්‍රභාවතීන් මෙතනවසාත් දක්ක නොහැක්කැයි සිතා ඒ කහවනුදහස ඕහටමදී එතනින්ගොස් රජ්ජුරුවන්ට මගුල් මෙහෙ කරණ නලකරුවා ලඟට ගොස් ඕහට අතවැසිව තල්වැටක්කොට එහිම සේසතය, රාහලය, රා උඩ මගෙන සිටි ප්‍රභාවතීන්ගේ රූපය යනාදි විසිතුරුවු අත්කම් දක්වුය. නලකරුවා ඒ තල්වැට ආදී බෝධිසත්වයන් විසින් කරණ ලද කර්මාන්ත විශේෂය ගොස් දක්විය.

රජ්ජුරුවෝ ඒ කර්මාන්ත විශේෂය දක මෙ තල්වැට ආදිය කවුරුන් විසින් කරණ ලද්දේදූයි යනාදීන් පෙර පරිද්දෙන් විචාරා මසු දහසක් දී මෙ තල් වැට ආදිය මාගේ කුමාරිකාවරුන්ට දෙවයි නියෝග කළහ. ඒ කර්මාන්තයෙන් බෙදාදෙන නලකරුවාද බොධිසත්වයන් විසින් ප්‍රභාවතින් උදෙසා කරණ ලද තල්වැට උන්ටම දුන්නේය. එසඳ ප්‍රභාවති ඒ විසිතුරු රූපයෙන් දක කුස රජ්ජුරුවන් විසින් කරණ ලද බව දන කැමති කෙනෙක් ඇරගනුවයි බිමට දමුව ඒ දක ඉතිරි කුමාරිකාවරුන් වෙහෙසන ලද  නලකරුවා රජ්ජුරුවන් විසින් දෙනලද මසුදහස ගෙනගොස් බෝධිසත්වයන්ට දුන්නේය.

ඉක්බිති බෝධිසත්වයෝ මෙයින් මට අස්ථානයයි සිතා ඒ රන් ඕහට දී එතනින් ගොස් රජ්ජුරුවන්ගේ මාලාකාරයාට අතවැසිව නොයෙක් ප්‍රකාර ඇති මල්පැණි ගොතා ප්‍රභාවතීන් පිණිස නොයෙක් රුවින් විසිතුරු කොට මල් සුඹුලක්ද කළාහුය මල්කරුවාත් ඒ සියල්ල හැරගෙනගොස් රජ්ජුරුවන්ට දුන්නේය.

රජ්ජුරුවෝත් විශේෂ කර්මාන්තය දක මේ ගෙතුවෝ කවුරුදූයි විචාරා දේවයන් වහන්ස මා විසිනැයි කී කල්හි තොපගේ මල්ගෙතීම් අපි නොදනුමෝද මේ ගෙතුවන් කියවයි තරයේ විචාරන ලද්දේ අතවැස්සා විසින් ගොතන ලදූයි කීයේය. එබස් අසා රජ්ජුරුවෝ එතෙම අතවැස්සෙක් නොවෙයි තොපට ඇදුරුකමට නිසිය ඔහු කෙරෙන් මල් ගෙතීම් ඉගෙනගනුව ඔහු ලවාම මෙතැන්සිට මාගේ දරුවන්ට මල්ගොතාලවයි සතුටුව මසු දහසක්දී මේ මල්කම් දරුවන්ට දෙවයි යවුහ.

ඒ මල්කරුවාද බෝධිසත්වයන් විසින් ප්‍රභාවතින් උදෙසා රූ නගා කරන ලද මල් සුඹුල උන්ටම දුන්නේය ප්‍රභාවතී ද ඒ මල් සුඹුලෙහි කුසරජ්ජුරුවන්ගේ හා තමන්ගේ හා නොයෙක් රූ දැක කුසරජ්ජුරුවන් කළ බව දන කිපි බිමට දමුව තෙසු නගු පෙරපරිද්දෙන්ම වෙහෙසුහ. මල් කරුවාද මසු දහස ගෙණගොස් බෝධිසත්වයන්ටදී එපවත් කීයේය. බෝධි සත්වයෝ මෙයිත් මට අස්ථානයයි එරත් ඕහටදී එතනින් රජ්ජුරුවන්ගේ අරක්කැමියා කරාගොස් ඕහට අතවැසිව දවසක් අරක්කැමියා රජ්ජුරුවන්ට මේ වඩාගෙන යමින් තමහට පිසන පිණිස බෝධිසත්වයන්ට ඇටමුසු දඩමසක් අප දීලා ගියේය. බෝධිසත්වයෝද ඒ ඇටය පිසපුය, මුළු නුවර සුවඳ පැතිරෙනසේ දුන් කරවුහ. එසඳ රජ්ජුරුවෝ සුවඳ අසා කිමෙක්ද මුළුතැන්ගෙයි අනික් මාළුවකුත් පිසද්දූයි විචාරා අරක්කැමියා විසින් දේවයන් වහන්ස අනික් පිසන මාළුවෙක් නැත්තේය එතකුදු උවත් ඇටමුසු මසක් අප ඇමට පිසන ලෙස අතවැස්සාටදීලා ආමියි එහි සුවඳ වියයුතු යයි කිසඳ රජ්ජුරුවෝ ඒ ගෙන්වාගෙන ඉන් සුඟක් අනුභවකොට බැලුය. එකෙණෙහි එහි රස සත්සියයක් පමණ රසනහරවල පැතිර සිටියේය. රජ්ජුරුවෝ ඒ රස තෘෂ්ණාවෙහි බැඳී ඕහට මසෙසන් දහසක්දී මෙතැන් පටන් තොපගේ අතවැස්සා ලවා මටත් මාගේ  දරුවන්ටත් බත් මාළු පිස මා දරුවන්ට ඔහු විසින් ගෙනදෙන්නට කියව තෝ අපට ගෙනේවයි නියෝග කෙළේය. අරක්කැමි ගොස් බෝධිසත්වයන්ට කියේය. එබස් අසා බෝධි සත්වයෝ දන් මාගේ මනෝරථය මස්තකප්‍රාප්තව ගියේයයි සතුටුව මෙතැන් පටන් ප්‍රභාවතින් දකිමි සිතා ඕහට රන්දහසදී දෙවන දවස් බත්මාළු පිස රජ්ජුරුවන්ටදී අරක්කැමියා අත යවා රාජ කුමාරිකාවරුන්ට ගෙනයන වසුන් කද තුමූ හැරගෙනගොස් ප්‍රභාවතීන්ගේ මාලිගාවට නැංගෝය. එසඳ ප්‍රභාවතී වසුන්කද ගෙනයන බෝධිසත්වයන් දක මුන් වහන්සේ තමන් වහන්සේට නුසුදුසුව වහල් කළ මනාදෙය කරණසේක ඉදින් මම දවස් ගණනක් බැණ නොදී උන්නෙම් මු මා කැමත්තෝවනැයි සිතා අන්තෙනකට ගොස් මාදක මෙහි වාසය කරණසේක එනොකට මෙහි ඇසිල්ලකුත් නොරදා යන සැටිය බැණ දොඩා නික්මවමි සිතා දොර අඩවල කොට ගෙනගොස් එක් අතකින් දොර අල්වාගෙන අගුළු කනුවේ වැතිරී සිට කුස රජ්ජුරුවන්

SANHIDA LANKA

වහන්ස මෙබඳුවූ කාරියක් ඉදින් ජීවිතය යෙනමුත් නොකරණසේක. එතකුදුවුවත් මා නිසා උදා සනය සවසය මධ්‍යම රාත්‍රිය මධ්‍යාහ්නය යන විභාගයක් නැතිව දියදර සැපයීම පිසීම් පෙවීම් ආදී ගිනික්‍රියාවෙන් හා දුර්භෝජන දුක්ඛසෙය්‍යාවෙන් දවස් යවමින් මෙහි සිට දුක්නොවිඳ නුඹ වහන්සේගේ කුසාවතී නුවරටම නැගී ගොස් මා කෙරෙහි සිතිවිල්ලක් නොසිතා නුඹ වහන්සේ වැනි සතුරු පුවක්සේ දාහැලි ගිය මුහුණු ඇති යකින්නක අභිමෙහෙසුන් කොටගෙන රාජ්‍යය කළ මැනව ඉදින් විරූපවූ නුඹ වහන්සේ කෙතෙක් කල් මී ඉඳ දුක් උනත් මම නොකමැත්තෙමි නොරඳා වහා නික්මුණුමැනවයි කිවුය. එකල්හි මහාබෝධිසත්වයෝ ප්‍රභාවතීන්ගෙන් මෙව්වර කථාසම්භාෂණයක් ලදිමියි සතුටුව මුවපොල්ලන්ට බඳුවූ ඇස් ඇති හෙමාභරණ විභූෂිත ශාත්‍ර ඇති මනාවූ කටිප්‍රදේශ ඇති රන්කමින් විසිතුරු වූ වස්ත්‍රයෙන් සොභමාණ වූ දෙහ ඇති ප්‍රභාවතීනි තොපගේ රූප සෞන්දර්යයෙන් පැහැරගන්නා ලද සිත් ඇති කෙලශාන්ධකාරයෙන් වසන ලදුව දික්විභගයෙහි අසමර්ථ හෙයින් කුසාවති නම් රාජ ධානියට යා නොඑමි ඒ රාජ්‍ය ශ්‍රියෙන් මට ප්‍රයොජන නැත්තේය මෙරටම වාසය කරමි කීහ.

බෝධිසත්වයන් විසින් මෙලෙස කී කල්හි මූ විපිළිසරව නැගීයෙති පරිභවකොට කියමින් සිටියදී මා කෙරෙහි ඇලීම කථාකෙරෙති ඉදින් මූ මම කුසරජයයි අවුත් මා අත අල්වාගත්තුනම කවුරු වලකන්දැයි ගෙට වැද දොර අගුළුගත්තුය.

බෝධි සත්වයෝද වස්න හැරගෙන ගොස් තෙසු රාජ කුමාරිකාවරුන් බත්කැවූහ. ඉකිබිති ප්‍රභාවතී කුසරජ්ජුරුවන් විසින් සපයන ලද ආහාරය ගෙනෙවයි කුදට විධාන කොටගෙන්වාගෙන මේ බත් අනුභව නොකෙරෙමි තොප ලත් බත් මට දීපියා මේ බත් තොපි කාපියව කුස රජ්ජුරුවන් වහන්සේ මෙනුවරට ආ බව කාටත් නොහඟවයි කිවුය. එතැන් පටන් කුදත් ප්‍රභාවතීන්ගේ බත් කොටස තුමූ අනුභව කොට තමන්ගේ බත් ප්‍රභාවතීන්ට දෙන්නීය.

කුස රජ්ජුරුවෝ එතැන් පටන් ප්‍රභාවතීන් නොදක්නාහුය මා කෙරහි ප්‍රභාවතීන් සෙනහ ඇති නැති බව පරීක්ෂා කෙරෙමි සිතා එක් දවසක් රාජ කුමාරිකාවරුන් බත් කවා වලන් කදගෙන යමින් ප්‍රභාවතීන්ගේ දොර සමීපයෙහි අඩි ඇන වලන් අඬවා පැකිල වැටිහි කෙඳිරිගාමින් ඔත්තාහුය එකල ප්‍රභාවතී බෝධිසත්වයන්ගේ කෙඳිරිගෑවිලි අසා ගෙයි දොර ඇර බලා කද කර තබාගෙණ වැදහොත්තවුන් දැක මුන් වහන්සේ මුළු දඹදිවට අග්‍රරජන්සේක. මා නිසා රෑ දවල් දුක්විඳිමින් සිව්මැලි බැවින් වසුන් කද බරින් මැඩී වැටී ගිය සේක. ඉදින් අමුත්තෙක් වන්නම් මට මීට වඩා වැරැද්දක් නැත ප්‍රාණය ඇද්ද නැද්ද පරීක්ෂාකෙරෙමියි සිතා භයගෙනගෙන් පිටත්ව බෝධිසත්වයන්ගේ ස්වාසය පරීක්ෂා කරණු පිණිස නැඹුරුව මුහුණ බැළුව එසඳ කුසරජ්ජුරුවෝ කෙලකටත් පුරාගෙන ප්‍රභාවතීන් මුහුණට දැමූහ. එකල ප්‍රභාවතී බැණ දොඩා ගොස් ගෙට වැද දොර අඩවළු කොට රජ්ජුරුවන් වහන්ස යමෙක් විරූපීව රූ ඇත්තන් ප්‍රාර්ථනා කෙරේද නොකමැති කැමතිවේද ඕහට අවැඩ වන්නේ යනාදීන් ප්‍රභාවතීන් විසින් නොයෙක් ලෙස බැණ දොඩා පරිභව කළත් බෝධිසත්වයෝ උන් කෙරෙහි නොකලකිරී එඹා ප්‍රභාවතීනි මේලෝකයෙහි යම් පුරුෂයෙක් ලොකස්වාද රතිවශයෙන් තමා නොකමැතිවුද කැමතිවූද ස්ත්‍රිය ගෙන් දර්ශනය ස්පර්ෂය සම්භාෂණය සම්භෝගයයි යන මෙයින් එක්තරා ස්නෙහාෂ කාරණයක් ලැබද එසේ ලබන ලද ලාභය මනාවූ ලාභයකැයි ප්‍රසංසා කරම්භ. තමා නොකමැතිවත් ස්ත්‍රිය කෙරෙන් ප්‍රිතියක් නොලැබීම නපුරු වන්නේය. එහෙයින් තොපගේ දර්ශනලාභාදී ඓශ්චර්ය විඳිමින් මෙහිම වාසය කෙරෙමි කීහ.

බෝධිසත්වයන් මෙලෙස කී කල්හිත් ප්‍රභාවතී මදකුත් පසුනොබැස තදකොටම කියා මොහු පලවම් සිතා මඳකුත් සෙනහරතිවශයෙන් නොකැමැත්තාවුත් මා කෙරෙහි පිළිබඳ සිතින් කැමතිව යන්නාවූ තොපි පිපාසාවෙන් පිඩිතව බොළඳකමින් කිහිරි උලක් ඇරගෙන ගල්පොත්තක් කැණ පැන්හැර ගන්නා කැමැතියක්හුද ධර්මයෙන් පිඩිතව දූලක් බැඳ සුලන් රඳවන්නක් හු හා සමානය යනාදින් තදපරුෂ බස් කියා දෙඩූහ.

එබස් අසා කුස රජ්ජුරුවෝ මනොඥවූ අංගප්‍රත්‍යංගදී ස්ත්‍රිසෞභාග්‍යයෙන් යුක්තවූ ප්‍රභාවතිනී අනෙක කොටි වාටු නාටක ස්ත්‍රීන් හා අනන්ත සාමන්තචක්‍ර මෞලිමාලලාලිත පාද පීඨ ඇති රාජ්‍ය ශ්‍රීද හැර පෙර තොප කෙරෙහි බැඳුනු සිතින් නොරටට පැමිණ දුක්විඳිමින් තොප හා සමග ප්‍රෙමාන්විතවූ කථා සම්භාෂණ මාත්‍රයකුත් නොලද්දාවූ මම භවභාව ලීලාකටාක්‍ෂ නිරීක්ෂණ මන්දස්මිත මධු මධුරභාෂිතාදී සෞභාග්‍යයෙන් යුක්ත කෞමලාංග ඇති තොපගේ ලය ගලකින් කරණලදැයි සිතමි. තවද ප්‍රභාවතීනි තොප යම් පමණ කලක් කොපයෙන් රුෂ්ටව බලන්නිද ඒතාක් මදු රජ්ජුරුවන්ගේ මේ භවනයෙහි දුක්විඳිමින් අරක්කැමිව වාසය කෙරෙමි යම් කලෙක්හි සිනාපහළ කර සනිද්ධවූ නිරීක්ෂණයෙන් සතුටුව බලන්නෙහිද එකල චිත්තසන්තාපයෙන් දුරු කොට රාජ්‍යශ්‍රියට පැමිණියාක් මෙන් වෙමි එහෙයින් සොඳුර මෙතැන් පටන් මෙබඳුවුතද බදකම් නොකරව යනාදීන් යාචඥව කිවාහුය. එබස් අසා ප්‍රභාවතී තොම මෙතෙම වඳුරුවලාවෙහි බැඳුනු වානරයක්හු පරිද්දෙන් මා කෙරේ ඉතා ශක්තව කියන්නේය. උපදෙසකින් බොරුවක් කියා මෙයින්

SANHIDA LANKA

නික්මවමි සිතා මහරජ කුසරජ්ජුරුවන් වහන්සේ මට ස්වාමි වනසේක්ද නොවනසේක්දැයි නිමිත්ත විචාලතෙන ඒ නිමිත්ත පාඨකයෝ නුඹ වහන්සේ සත් කඩක් කොට කැපුවත් උන් වහන්සේට අග මෙහෙසුන් වන්නේ නැතැයි තරයේම කිවුය එහෙයින් නොයෙක් කාරණයෙන් නොකමැතිවූ මා නිසා දුක් නොවිද නුඹ වහන්සේගේ රටටම පලාගිය මැනවැයි කිවුය. ඒ අසා කුස රජ්ජුරුවෝත් ඔවුන්ට කී බස් පත්‍යුත්තරයෙන් පසු බස්වමින් සොඳුර මා විසිනුත් නිමිත්ත විචාලතැන මාගේ රට නිමිත්ත පාඨකයෝ තොපවිනා උන්ට වල්ලභ කෙණෙක් නැත්තාහයි කරයේම කිවුය. එකී නිමිත්තයෙනුත් මා දුටු කාරණයෙනුත් මා විනා තොපට අනික් වල්ලභකෙනෙක් නැත. ඒ කාරණයෙන් තොපගේ තදමින් හැරපියවයි කීහ.

ප්‍රභාවතී කුස රජ්ජුරුවන්ගේ බස් අසා කවර ලෙසකිනුත් මුන් ලජ්ජා වට පමුණුවාගෙන නොහැක්කේය යේවා නොයේවා මුගෙනුත් මට කම් කිම්ද සිතා දොර අගුළු ලාගත්තුය. එකල බෝධිසත්වයෝ වලන්කද කරතබාගෙන පලාගියාහුය.

එතැන් පටන් දකුමුත් නැතුව අරක්කැම් කම් කරමින් දුඹුලු විසූ සිල් බත් කමින් බත් නිවන ඔරුව පිට සයනයකෙරෙමින් දර පලමින් පැන් ගෙනෙමින් වලන් සෝදමින් උදෑසන කැඳ අවුළු දාවල බත් මාළු අවුළු පිසගෙන ගොස් කවමින් පොවමින් මධුරනන පාන වස්ත්‍රාභරණාදියක් නැතිව කාම තෘෂ්ණානුරාගයෙන් බැඳී බොහෝ දුක් විඳිමින් එක් දවසක් මුළුතැන්ගෙයි මිදුලෙන් යන්නාවූ කුද දැක කැඳවා ප්‍රභාවතී කෙරෙහි හයින් නොඇසූකන්ට යුහුවව යන සඳහා ගොස් ඈ රඳවා කුද තොයිත් තිගේ සාමිදුවමෙන් තදව ගියෙහිය මෙතෙක් දවස් මුළුල්ලෙහි තොප හැම සමීපයෙහි වැසුව දුක් විචාරිම් විවරකුත් නොලදුම්හ. සෙසු ලාභයෙක් කැළමවේද එතකුදුළවත් ප්‍රභාවතින්ගේ තද මන් අරවා දක්වා ලියාළුවිදැයි විචාළිය. ඒ අසා කුදිත් යහපතැයි කිව එකල බෝධිසත්වයෝ සතුටුව ඉදින් ඇත්සොඬක්මෙන් ක්‍රමොන්නතව මට සිළුටුවූ ඌරු යුගළයක් ඇති ප්‍රභාවතී තොම තොපසමවයෙන් ප්‍රේමදෘෂ්ටියෙන් මා බැලුනම් වේවයි මහා සන්තෝෂයෙන් යුක්තව ප්‍රියකථාවක් කළා නම් වේවයි නොයෙක් සෙනෙහයෙන් මන්දස්මිතයන් පවත්වා මා සෙවාපු නම් වේවයි තවද මා දැක සතුටුව මා හාසිනායේ යුත්තව බැලුම් නම් වේවයි ඉදින් තරුණාකීර්සමින් ප්‍රවිකසිත සරසිරුහ සොඳුර සමාදු කොමලාපාණි පල්ලවයෙන් මාගේ ශරීරය ස්පර්ෂ කළා නම් සැපසේ මාගේ කුශවතී නුවරට ගොස් වන් දවස්ම මෙතිගේ කුද හැරයන පරිද්දෙන් හාරා කෙයුර කනක කටක නූපුරරයානා තැලි මුදු ආදී සර්වාභරණයෙන් තී සාරහා ලමි තොපි ප්‍රභාවතීන්ට කාරණා කියා මාගේ වසයට පමුණුවාලවයි කීහ.

කුදුත් බෝධිසත්වයන්ගේ බස් අසා දේවයන් වහන්ස නුඹ වහන්සේ සැකයක් නොසිතුව මැනව කීප දවසකින් උන් නුඹ වහන්සේගේ වයසට පමුණුවා මාගේ සමාර්ථය දක්වාලමියි බෝධිසත්වයන්ට කියා තමා ගිය කාර්ය සමෘද්දිකොටගෙන ප්‍රභාවතීන් කරාගොස් උන්ගේ ගෙය කසල අරින්නියක මෙන් යටත්පිරිසෙයින් ගසාලන්ට නිසි කැටක් විවරකුත් ගෙයි නොතිබා වහන් පටන් සියල්ලම දොරලා ගෙය හැමදා කසළ දමා දොරට පිටලා එලිපත් පඩියගාවා උස් පුටුවක්ලා ඊට මිටිව ප්‍රභාවතීන්ට අස්නක් පනවා දියණියෙනි මෙසේ අවමැනව ඉස බලම්හයි ප්‍රභාවතී මිටි අස්න පුටුවෙක ඉඳුවාගෙන තොමෝ උස්පුටුවෙක තමාගේ දනදෙකින් උන්ගේ ඉස වහල්කොටගෙන මදක් ඉසනියගා අනේ මුන්ගේ ඉස උකුණෝ බෝහෝව ගියේයයි කියමින් තමාගේ  ඉසින් උකුණන් හැරගෙන ප්‍රභාවතීන්ගේ අත්ලෙහිලා තොපගේ ඉස උකුනන්ගේ විවර බලවයි යනාදීන් නොයෙක් කථාකොට බෝධිසත්වයන්ගේ ගුණ කියමින් මේ ප්‍රභාවතී තොමෝ කුස රජ්ජුරුවන්ගේ නුවර වසන සමයෙහි එකුශරජ්ජුරුවන් වහන්සේගෙන් අන්නපාන වස්ත්‍ර භරණ ගෙන්ධමාලා තාම්බුලාදී කිසි සත්කාරයකුත් මුන් නොලදැයි සිතමි කාරණා කිමයත් ස්ත්‍රීහු  නම් එකද වසකුත් ආකායෙහි වැතිර ඔත් ස්වාමිපුත්‍රයාගේ සිත් නොකලකිරුවතී මේ කුස රජ්ජුරුවන් වනාහි අරක්කැම්ව තොප නිසා රාජ්ජ්‍යශ්‍රිය හැර අවුත් බැලමෙහෙකොට දුක් විඳිමින් සිටියදීත් සුවදුක් විචාරීමකුත් නොකරව ඉදින් උන් වහන්සේ කෙරෙහි සෙනෙහස නැතත් මුළු දඹදිවට අග්‍රරාජන්වූ මේ කුස රජ්ජුරුවන් වහනසේ මා නියාම දුක්ගන්නාසේකැයි දැන උන් වහන්සේට කිසි සත්කාරයක් කරන්ට උවමැනවැයි කිව. එබස් අසා ප්‍රභාවතී කිපි සඳ කුදත් නැගී සිට ප්‍රභාවතීන් කරටිය අල්වා ඇතුළුගෙට දමා තොමෝ පිටත්ව දොරවසා දොර අදිනාලනුව ඇද අල්වාගෙන පින්මද නොකිකරු කෙනත්තිය තිගේ රුව කාට කුමක් කෙරේද අපි තොපගේ රූපයෙන් කා බී රකෙන දෙයෙක් ඇද්ද යනාදීන් දොඩා බෝධිසත්වයන්ගේ ගුණ වර්ණනා කෙරෙමින් තෙල ප්‍රභාවතිය ආරොග පරිහානයෙන් යුක්තවූ සිද්ධංගණා ප්‍රතිභාගවූ විශිෂ්ටවූ රූ ඇත්තෙමියි තිගේ රූප සෞන්දර්ය හා ඒ රාජාධි රාජවූ කුස රාජෝත්තමයන් හා සම්මානකොට නොසිතව කුස රජ්ජුරුවන් වහන්සේ අපරිමිත බලවානන්ද මහානුභාවද මුක්තාමාණික්‍ය සංඛසීලාප්‍රවාල කනක රජතාදී මහාධන ඇතිසේක තිමද ගලිත හස්තිරාජයකු පරිද්දෙන් කිසිවක්හු විසින් වැලකිය නොහැකි කායබල ඇතිසේක අන්නපාණ වස්ත්‍රාභරණ ග්‍රාමක්ෂේත්‍රාදී සියළු උපභෝග පරිභෝග වස්තුවෙන් සමෘද්ධවූ කාශිකොශලාදීවූ බොහෝ රාජ්ජ්‍යයට අධිපති සේක. සකලජන්න නමැති මත්තහස්තීන් මධ්‍යයටවන් සිංහරාජයෙකු පරිද්දෙන් අභිත සිංහනාද ඇතිසේක කුරටිකෙවිල්ලන්ට බදුවූලීලොපෙත ගීතස්වර ඇති සේක. ගම්භිරෝධාර මධුරශ්‍රවණ්‍ය කමණයෙ ප්‍රථ්‍යණයා

SANHIDA LANKA

මධුරස්වර ඇතිසේක. සවයමහගුඥානයෙන් ප්‍රතිවෙධ කරණ ලද අක්‍ෂර ලිඛිත ගණිත ගාන්ධාර්වාද අෂ්ටාදශ විද්‍යස්ථානාදී අනෙක ශත ප්‍රභේද භින්න ශිල්පයෙන් ඇතිසේක උභය කුල පරිශුද්ධ අනන්‍ය සාධාරන සුභගුණ මණිගණකීර්ණ ඉක්ෂවාකුවංශ සම්භූතවූ ක-ස රජ්ජුරුවන් වහන්සේගේ ඇති ගුණ සලකා තොපගේ රූ ඇත්තෙම් යන තද මත් හැර උන් වහන්සේ කෙරෙහි සිහි දස පතුරුවාලවයි යනාදීන් බෝධිසත්වයන්ගේ නොයෙක් ගුණ කියා අවවාද කළාය.

ඉක්බිති එබස් අසා ප්‍රභාවතී තොමෝ කෝපයෙන් දිළිහි කුදතෝතිගේ පමණ නොදැන ගර්ජනා කරන්නෙහිය අතට පැමිණියාවී නම් ස්වාමි දරුවන් ඇතිනියාව අඳුන්වාලමි යනාදීන් කියා කුද භයගැන්වුව එසඳ කුදුත් එඹල තී රක්නා නියා මෙතෙක් දවස් මුළුල්ලේ තුසරජ්ජුරුවන් මෙනුවරට ආනියාව තොපගේ පියාණන්වහන්සේ ට නොකීම් උන්නාට අද දවස් රජ්ජුරුවන් වහන්සේට නියා තීටනිහඬ කියවන්නෙම් වේදැයි මහත් කොට උන් භයගැන්වුව ප්‍රභාවතී එසඳ භයින් වෙව්ලා මෑණියනි එසේ නොකියව මැනවයි කියා අස්වැසුව.

මහාබෝධිසත්වයෝද ප්‍රභාවතීගේ දැකුමුත් නොලැබදු බොහාජන දුක්ඛ සෙයාාදීන් සත්මසක් මුළුල්ලෙහි දුක්විඳත් මැගේ දැකුම් විවරත් නොලබම් ඉතා තදපරුෂ ගත් හැඟිවූ මැගෙන් මට ප්‍රයෝජන කිම්ද මාගේ රටට ගොස් මව් පිය දෙදෙනා දැක වාසය කරම්යි සිතූහ.

එසඳ මනුෂ්‍යලොකය බැලූ ශක්‍රදේවේන්ද්‍රයෝ කුස රජ්ජුරුවන් සත් මසක් මුළුල්ලෙහි දුක්විඳත් ප්‍රභාවතීන් දැක්ක නොහි උකටලීවූ නියාව දැක ඈ ලැබෙන්ට කිසි කාරණයක් කෙරෙම් සිතා මද්‍ර රජ්ජුරුවන්ගෙන් ගිය දූතයන් බඳු කොට ප්‍රභාවතී තොම කුස රජ්ජුරුවන් හැරගොස් පියා පලාඅවුය වහා අවුත් උන් කැඳවාගෙන යවයි සත් රජ්ජුරුකෙනෙකුන්ට වෙන වෙනම පත් අසුන් ඇතිව දූතයන් යවූහ. ඔවුන් දැක රජ්ජුරුවෝ සතුටුව වෙන වෙනම සිය සෙනඟ පිරිවරා සාගල නුවරට අවුත් වටලාගෙන උනුන් දැක තොපි කුමක් නිසා අවුද තොපි කුමක් නිසා අවුදැයි ඔවුනොවුන් විචාරා ප්‍රභාවතීන් නිසා මද්‍ර රජ්ජුරුවන් විසින් කැඳවා යවුනොවුන් විචාරා ප්‍රභාවතීන් නිසා මද්‍ර රජ්ජුරුවන් විසින් කැඳවා යවුහෙයින් ආම්හයි යනු අසා මෙතෙම තමාගේ එක දුව අප සත්දෙනාටම දේල මුගේ නොකටයුත්තක් බලව අප වෙහෙසුයේයයි දණ්ඩගත විෂඝෝර සර්පයන් පරිද්දෙන් කිපි වෙන වෙනම අපට ප්‍රභාවතීන් හෝ දෙව යුද්ධ හෝ කරවයි පත් අසුන් යවූහ.

ඒ අසා මදුර්ජ්ජුරුවෝ බලවත් භයපත්ව අමාත්‍යයන් කැඳවා කුමක් කරමෝදැයි විචාළාහ. එකල අමාත්‍යයෝ දේවයන් වහන්ස මේ රජ දරුවෝ සත්දෙනා ප්‍රභාවතීන් නියාම අවුය ඉදින් නුදුනහොත් පවුරු පදනම් වාසල් බිඳගෙන නුවරට වැදගෙන ජීවිතක්ෂයට පමුණුවා රාජ්ජය හැරගනුම්හයි කියා සේනාව සන්නද්ධ කොට ගෙන යුද්ධාභිමුඛව සිටිනාග වඩින්නාට පළමුකොට ප්‍රභාවතීන් යවම්හයි කිවාහුය.

එබස් අසා රජ්ජුරුවෝ එක් කෙනෙකුන්ට ප්‍රභාවතී පාවාදීනුමෝ නම් තෙස්සෝ යුද්ධ කරන්නාහ. එහෙයින් එක් කෙනකුන්ට දී සත් හිඳිවිය නොහැක්ක මුළු දඹදිව අග්‍රරාජත්ව සිටි කුස රජ්ජුරුවන් හැරපියා ආගමණට විපාක දක්වම් මෑ සත්කඩක් කොට කපා රජදරුවන් සත්දෙනාට දී පියා ගැලවෙම් වයි කිවුය.

එලෙස රජ්ජුරුවන් කී බස් රාජාගණය මුළුල්ලෙහි ප්‍රකාශව ගියේය. එපවත් ඇසූ පරිවාර ස්ත්‍රීහු ගොස් ප්‍රභාවතීන්ට කීහ එබස් අසා ප්‍රභාවතී මරණ භයින් පෙරළි හඬමින් උනස්නෙන් නැගී ජා මබනද ශවර්ණයට බඳුවූ රන්වන් පැහැ ඇති රන් කමින් විසිතුරු වස්ත්‍ර ධාරීව නගුන් හා පරිවාර ස්ත්‍රීන් විසින් පිරිවරණ ලදුව මෑණියන්ගේ ගෙට ගොස් නමස්කාර කොට අඬ අඬා සිටි මෑණියන් වහන්ස මාගේ සඳුන් තුවරලා කසතුරු කපුරු ආදි සුවඳ සුන්නෙන්උලා ඔප් නගන ලද ප්‍රියකරුවූ මනා ඇස් සඟලක් ඇති නිර්මලවූ කිසි කැලලක් නැති පෙම්බර වූ දළ කඩම්ටු ඇති කැඩපතින් බල බලා සරහන ලද මාගේ මේ මුඛ බිම්බය මේසත් රජ්ජුරුවන් විසින් දමන ලදුව වලාතිබෙන්නේවේද?.

තවද මෑණියන් වහන්ස බමරවැල සලාමෙන් අක්බඹුරු සිනිදු මොලොක් දික්වූ සඳුන් සාංදුජබාදු ආදීවූ සුවඳ ගන්වන ලද මේ මාගේ කෙස් වැටිය අමුසොහොන්හි දමන ලදුව උකුස්සෝ ගිජුලිහිණි ආදී පක්ෂි සමූහයෝ නියයන් වහන්ස මාගේ සඳුන් තුවරලා කස්තුරු කපුරු ආදී සුවඳ සුන්නෙන් උලා ඔප්නගන ලද ප්‍රියකරුවූ මනා ඇස් සඟලක් ඇති නිර්මල වූ කිසි කැලලක් නැති පෙම්බරවූ දළකඩම්ටු ඇති කැඩපත් බල බලා සරහන ලද මාගේ මේ මුඛ බිම්බම මේ සත් රජ්ජුරුවන් විසින් දමන ලදුව වලාතිබෙන්නේ වේද.

SANHIDA LANKA

තවද මෑණියන් වහන්ස බමර වැලසලාමෙන් අක්බඹරු සිනිදු මොලොක් දික්වූ සඳුන් සාංද ජබාදු ආදීවූ සුවඳ ගන්වනලද මේ මාගේ කෙස් වැටිය අමු සොහොන්හි දමන ලදුව උකුස්සෝ ගිජුලිහිණි ආදී පක්ෂි සමූහයෝ නියපසුරෙන් බදාගෙන ආකුල වැකුලකොට ඇත මැත අදින්නෝවේද,

තවද මෑණියන් වහන්ස පබළුදළු මෙන් රත්වූ නිය ඇති සාවුන් බට ලොම්ලොස් මෘදු කෝමල තුනුලොවින්

ගැවසී ගත් රත් සඳුන් වන ලද මනෝඥවූ මාගේ හස්ත යුගලය මෙරජුන් විසින් කපාදමන ලදුව කොක්නාවුන් ඒකාන්තයෙන් ඩැහැගෙන යන්නෝ වේද.

තවද මැණියන් වහන්ස මාගේ මේ සවර්ණකාලඵලයට බඳුවූ උපමා ඇති මුඛ පද්මයෙහි ලොල්ව උඩබලා උන් සවර්ණ චක්‍රවාත යුගලමෙන් නුහුනුවාවූ වටමටවූ සඳුන් කොකුමගරා මුතුහරින් හොබනාවූ  මෙමා තනයුගලය කපා වල දමන ලද කල්හි මැණියන්ගේ තනයේ එළුනු බාල දරුවන් පරිද්දෙන් කැනහිල්ලු එලෙන්නාහු වේද.

තවද මැණියන් වහන්ස මෙමාගේ රන් පොරුවක් මෙන් පලල්වූ කලාහඹමෙලව මනොඥකොට කරණ ලද රන් රසුදලින් යුක්තවූ මෙවුල්දමින් සශ්‍රිකවූ කටිප්‍රදේශය මේ රජුන් විසින් කපා වලදමන ලදුව කොක්නහඩු ඩැහැගෙන කැමති තෙනකට ගෙනගොස් කන්නේ වේද.

තවද මැණියන් වහන්ස බල්ලෝය. කොක්නහවුය, කැණහිල්ලුය. යනාදිවූ දළ ඇති සත්වකෙනෙක් ඇත්නම් ඒ සියලු සත්වයෝ ප්‍රභාවතීන්ගේ ශරීරමාංස නැමති රසායනය අනුභවකොට ඒකාන්තයෙන් අජරාමර වෙති සිතමි.

තවද මැණියන් වහන්ස මේ එක්වූ රජදරුවෝ සෙනෙහයෙන් ඉඳින් මාගේ ශරීර මාංශය ලියාගෙන ගියාහු නමුත් ඔවුන්ට යාඥව කියාත් ඇට හැරගෙන දෙමං අතුරෙක්හි දමාපුව මැනව. තවද මැණියන් වහන්ස ඒ සොහොන් බිම මල්වතු කරවා එහි උඳු කිණිහිරි ගස් මෑ ඇතිකරවා හිමකාලයාගේ කෙළවර මැදින්මය පිපී වැනි ගිය මල් ගෙන්වාගෙන රන්සුමුහක් පුරා ඔරපිට තබාගෙන මාගේ දියණියන් ප්‍රභාවතීන්ගේ ඡවිවර්ණය මෙබඳුයයි බල බලා මා සිහිකළ මැනවැයි යනාදීන් බලපාමින් මැණියන්ගේ සමීපයේම හිඳ ඇඬුය.

එසඳ මදුරජ්ජුරුවන්ගේ නියෝගයෙන් වධකයා තමාගේ පොරවත් කොළඹුවත් ඇරගෙණ රජගෙට ආයේය. ඒ වධකයා ආබව රාජංගණයෙහි ප්‍රකාශවිය. ඒ අසා ප්‍රභාවතීගේ මැණියෝ රජ්ජුරුවන් කරා අඬ අඬා ගොස් පොරව හා කොළඹුව දැක දේවයන් වහන්ස මනාව හැදුනු සිඟුවලහ ඇති මාගේ දියණියන් මේ පොරොවෙන් කපා බෙදා මේ සත් රජ්ජුරුවන්ට දෙවනසේක්දැයි විචාළාහ.

ඉක්බිති රජ්ජුරුවෝ බිසවුන් ගිවිස්වමින් දේවිනි ප්‍රභාවතීන් කපා නොදී අනික් කුමක් කරවුද තොපගේ දියනියෝ සියළු දඹදිවට අග්‍ර රජ්ජුරුවන් විරූපයයි හැරපියා ගිය මහළු මපියානෝම කෙතෙක් මරණය නලල තිබාගෙන අවුය දැන් තමාගේ රූ නිසා කරණ ලද ඊර්ෂ්‍යාවෙහි විපාක ලබන්නී වේදැයි කීහ.

එබස් අසා බිසෝ දියණියන් ලඟට ගොස් අඬමින් වලපමින් දියණියෙනි තොපට අමනාපයක් සිතිනුත් නොසිතන්නාවූ මාගේ බස් නොගිවිස තොප දැන් ලේ පෙරා පෙරා සත්කඩක්කොට කපා මේ රජදරුවන්ට දෙන ලදුව යම්පුරයට යන්නී වේද.

තවද මේ ලෝකයෙහි යම් සත්වයෙක් වැඩෙහි හැසිරෙන හිතේසින්ගේ කිම නොකරන්නේද එතෙම මෙබඳුවූ දුක් කම්කටළු නොයෙක් අනය ව්‍යසනයටද පැමිණෙන්නේය. තවද රන්කාමින් නුදුල මාණික්‍ය මෙබලාදාමයෙන් විරාජමානවූ ප්‍රභාතීනි ඉඳින් තමා තොප හෙයින් පස්සේ නොගොස් උභයකුල පරිශුද්ධ අසම්භින්න සූර්ය වංශප්‍රසූත ගෙරවය වික්‍රාන්ත සමන්විත කුශ රජ්ජුරුවන් හා එක්ව තොප හා සමාන රූපශ්‍රීන් ඇති දැකුම්කටයුතුවූ කුමාර කෙනෙක් ලදහොත් අප ඇම ඇතුළුවූ බොහෝ ඥාතිවර්ගයා විසින් සත්කාර සම්භාවනා කරණලදුව සියළු දුක් දුරුකොට බොහෝ කාලයක් සැපසේ වාසය කරන්නී වේද?.

තවද මාගේ සොඳුරු වූ දියණියෙනි යම් කුශ රජකුගේ මණි කණක රජතාදීවූ විචිත්‍රවූ කර්මාන්තයෙන් යුක්ත රාජභවනයෙහි සවර්ණාභරණයෙන් සැරහුනාවූ දිව්‍යාංගනා ප්‍රතිභාග පුරාංගනාවන් විසින් වයන ලද පඤ්චාංගික තූර්යනාද අනවරතයෙන් පවතීද මනාවූ ලක්ෂණාන්විත මංගල හස්තීහු ප්‍රධාන කොට ඇති කෛලාසකූට ප්‍රතිභාග අනෙක ශත මත්ත හස්තීහු නාද කෙරෙද්ද.

තවද ප්‍රභාවතිනී රාජාංගනයෙහි උද්‍යානමනාවූ ලක්ෂණයන් ඇති මංගල අශ්වරාජයා ප්‍රධානවූ ක්ෂිර සාගරයෙහි තරංග පරම්පරාවෙන් විරාජ මානවූ නොයෙක් දහස් ගණන් අශ්වයෝ කුල්මතින් හේෂාරව පවත්නාහුද.

SANHIDA LANKA

තවද යම් කුශාවතී රාජධානියෙක්හි ඒ ස්ථානයෙහි ස්වර්ණාභරණ විභූෂිත සිද්ධ විද්‍යාධරයන් වැනි නළු නාටක සමූහයෝ නොයෙක් ප්‍රභේද ඇති තූර්යභාණ්ඩියන්ගෙන හැමවෙලෙහිම සුඛිතමුදිතව සේවය කෙරෙද්ද.

තවද ප්‍රභාවතිනි කුශ රජ්ජුරුවන්ගේ යම් ගෘහොද්‍යාන විද්‍යුල්ලතා සශ්‍රිකව විරාජමානවූ ස්වර්ණමයුර  රාජයන් විසින් මිහිඟු බෙරහඬින් මත්ව පවත්වන ලද කොකානාදයෝද කොස්ලිහිණියන් විසින් පවත්වන ලද අනුරාගයෙන් හරිතවේද එබඳුවූ ශ්‍රී සෞභාග්‍යය හා ඓශ්වර්යය හා විශේෂය ඇති ඒ කුශාවති රාජධානියෙහි

ඉසුරු හැර ඊට වඩා කවර සැපයෙක් කොයි ඇති හෙයින් මිට අවුද යනාදීන් ප්‍රභාවතීන්ට අවවාද වශයෙන් කුශාවතීයෙහි විභූතිය වර්ණනාකොට ඉදින් ඒ කුශ රජ්ජුරුවෝ අද මෙතෙන වී නම් මේ සත් රජ දරුවන් මරා ලුහුබඳවා මාගේ දියණියන්ට පැමිණි මේ දුක් දුරුකොට කැඳවා ගෙන යන්නෝ කපුටු රැළක් කැටක් ගසා පලවා ලන්නාක්මෙන් තමන්ගේ වචන මාත්‍රයකින්ම සකල ශතෲමදීනය කරන්නාවූ ඉදින් සිතුව හොත් එක් සියක් රාජධානිනුත් හැරගන්ට නිසිවූ සමර්ථ ඇති විශිෂ්ඨවූ ප්‍රඥානුභාව ඇති ඒ කුශ රජ්ජුරුවෝ අද මෙනුවර වූනම් අප හැමට පැමිණ මේ දිකින් ගලවා යන්නාහුයයි යනාදීන් කුශ රජ්ජුරුවන්ගේ බොහෝ ගුණ කථනය කළාහුය.

එකල්හි ප්‍රභාවතී තොමෝ කුශරජ්ජුරුවන්ගේ ගුණ කියන්නාවූ මාගේ මැණියන් වහන්සේගේ මුබ නොසැහෙන්නේය. එහෙයින් උන් වහන්සේ අරක්කැමි කම්කොට මේ ගම වසන බව මැණියන් වහන්සේට කියම්යි සිතා මැණියන් වහන්ස අන්‍ය සාධාරණ ගුණ ගර්ණාභරණ විභූෂිත ශෞරවීය බල පරාක්‍රම ප්‍රතාප ප්‍රඥාගුණ ඇති මේ සතුරන් නසා අපහැම රකින්ට නිසිවූ කුශ රජ්ජුරුවන් වහන්සේ අපට ආළාරිකව මෙතනම වාසය කරණසේක. උන් වහන්සේ කැඳවම්දැයි විචාළාය.

ඉක්බිති ප්‍රභාවතිනි මරණභයින් පිඩිතව නන්දොඩවුද අඥානයෙන් මුඪවූ ප්‍රලාප දොඩවුද බොලඳකමින් කියමිනා දෙයතබා අනිකක් කියවුද තොප මේ කියන්නේ කිම්ද ඒ කුශ රජ්ජුරුවෝ ඉදින් මේ නුවරට අවුනම් අපට නොදැනෙන්ට කාරණා කිම්ද ඉදින් එත්නම් අපට කියා එවා තමන්ගේ සේනාවාහනයන් පිරිවරා නේත්ද මැගේ කුමන නන් දෙඩිමක්ද යනාදීන් දෙඩුය.

එසඳ ප්‍රභාවතී මැණියන් වහන්සේ කුමක්කීවත් අදහානොගන්නා සේක. ප්‍රත්‍යක්ෂයෙන් දක්වාලා කියමි සිතා මැණියන්ගේ අත අල්ලාගෙන මතුමාලතලයට නැගීගොස් සීමැදුරු කවුළුව හැර පිටත බලා වලන් සොධමින් සිටි බෝධිසත්වයන් දිසාවට අත දිගු කොට මැණියන් වහන්ස තෙලෙ කුමාරිකාවරුන්ගේ අන්තඃපුර ආසන්නයෙහි මුළුතැන්ගෙයි මිදුලෙහි තරයේ කැසපටගන්වා අරක්කැමි වේශයෙන් නැඹුරුව සිට වලන් සොධනයෙක් කුශ රජ්ජුරුවන් වහන්සේයයි දැන්වුය.

එකල බෝධිසත්වයෝ ප්‍රභාවතීන් නිසා සත් රජ්ජුරුකෙනෙක් මෙනුවර වටලාගත්තායයි අසා අද දවස් මාගේ මනොරථය මුදුන් පැමිණෙන්නේයයි මාගේ මේ ගමට ආ නියාව අද දවස් ප්‍රභාවතී දෙමව්පියන්ට කියන්නීය. ඒ අසා මා ගෙන්වාගෙන උන් මට පාවාදෙති, එකල මා ගත් දුක් සාර්ථකවන්නේයයි වලන් සෝධා තැන්පත්කොට තබම් සිතා පැන් ගෙනවුත් වලන් සෝධන්ට පටන්ගත්හ. එසඳ වලන් සෝධමින් සිටි රජ්ජුරුවන් දැක දියනියන්ට උරණව කොල තෝ චණ්ඩාල එකක්ද අවශෙෂ හීනජාතියෙහි එකක්ද නොහොත් මෙබදු රාජවංශ නසත්මයයි උපන් එකක්ද මුදු රජකුලයෙහි උපන් තෝ සකල රාජ මෞලිමාණික්‍යකාන්තීන් බබලනලද පාදපීඨ ඇති තොපගේ වල්ලභවූ කුශ රජ්හු දාස ක්‍රියා කරව්දැයි පරිභව බණුහ. ඉක්බිති ප්‍රභාවතීතොමෙ මාගේ මැණියන් වහන්සේ මා නිසා මේ කුශ රජ්ජුරුවන් වහන්සේ අවුත් මෙනුවර වසන බව නොදන්නාසේක්වනැයි සිතා මැණියන් වහන්ස මම චණ්ඩාල ස්ත්‍රියකුත් නොවෙමි, තෙසු හිනජාති එකකුත් නොවෙමි, නුඹ වහන්සේගේ රාජ වංශය නසන එකකුත් නොවෙමි, මේ ඉක්ෂවාකුරජවංශයට නගන ලද කෙතුවක් වැනි රජ්ජුරුවන් වහන්සේයයි දනිමි ඉදින් නුඹ වහන්සේ දාස කෙනෙකුනැයි නොසිතම් කියා බෝධිසත්වයන්ගේ ඓශ්චර්ය වර්ණනා කරන්නාවූ ප්‍රභාවති තොමෝ මැණියන් වහන්ස මේ කුශ රජ්ජුරුවන් වහන්සේ ත්‍රිවිධ වෙද පාරප්‍රාප්ත සදාචාර නිරතවූ විසි දහසක් පමණ බ්‍රාහ්මණයන් මාලිගා යෙහි මධුරාන්නපාණයෙන් සන්තර්පණය කරවන සේක්ද.

තවද රන්පොරෝදු සන්නාහයෙන් සාදන ලද කනගිරි සිබර සුන්දරවූ ත්‍රිමද ගලිත වූ විසි දහසක් පමණ හස්තිහු සන්තයෙන් සැරහී සිටිද්ද යම් රජ්ජුරුවන් වහන්සේගේ ප්‍රචණ්ඩමාරුතයෙන් මෙහෙයවන ලද ශරත්කාලයෙහි මෙඝකුට නිකර සුන්දර වූ මනෝඥ ලක්ෂණාන්විත රාජවාහන යෝග්‍යවූ නොයෙක් අශ්වාලංකාරයෙන් සරහන ලද විසි දහසක් පමණ අශ්වයෝ හැම වෙලෙහිම සන්නද්ධව සිටිද්ද.

තවද යම් රජ්ජුරුවන් ගේ සුරලොකවතීර්ණ සුන්දර විමාණයක් මෙන් සොභමාන වු නගන ලද ධවලාත්‍රපත්‍රයෙන් විරාජ මාන වු සරහන ලද සිංහාසනයෙන් සශ්‍රික වූ සුරසුන්දරී සමාන පුරසුන්දරීන් විසින් සලසන ලද චාරුචාමර නිකාරා කීර්ණ වූ සියළු රථාලංකාරයෙන් විචිත්‍රකොට සරහණ ලද එලවන ලද මලෝලඹු මල්දම් රන්මිණි කිකිණිදැලින් සොභමානවු විසිදහසක් පමණ රථ නිරන්තරයෙන් සැදී සිටි.

තවද යම් රාජෝත්තමයක්හුගේ ධරණිතලාව තීර්ණනෙක වර්ණණා ඇති අභ්‍රකූට සහස්‍රයෙන් සෝභමානවූ ඝනශජ්ජිනාකාර වෘෂගර්ජනා ඇති නිසාන තැම්මට එකස් බෙරආදීන් සරහණ ලද පිටු ඇති විසි දහසක් පමණ වෘෂභ රාජයෝ මතත්හස්තීන් මෙන් තප්ලා කුර ඇන සිටිද්ද.

SANHIDA LANKA

තවද රක්ත නීල සෙවත කෘෂණාදී අනෙක වර්ණනා ජවලිත අනවරතයෙන් වැහෙන්නාවූ ක්ෂිර ධාර සහස්‍රයෙන් සන්හිඳුවන ලද ශ්‍රී මේඝසන්තාපසයන් ඇති සක්තවු තුඩග තුරංග භංගාකර ඇති විසි දහසක් පමණ දෙනුන් සන්තයෙන් රජත ස්වර්ණමය හජනපුරා ක්ෂිර දොහණය කෙරෙද්ද යනාදීන් ප්‍රභාවතී කුශරජ්ජුරුවන්ගේ යශෝ විභූතිය ප්‍රසංශාකොට මෙබඳුවූ ඓශ්වර්යය ඇති රාජාධිරාජයා නුඹ වහන්සේම දස්කොට සිතන පමණ විනා මම එලෙස නොසිතම් යනාදීන් බෝධිසත්වයන්ගේ ගුණ කථනය කළාහුය.

එකල බිසෝ මෝ තොමෝම අසම්හිතව කියන්නියයි ඒකාන්තයෙන් අදහාගෙන මදුරජ්ජුරුවන් කරාගොස් එපවත් කිවුය. එබස් අසා රජ්ජුරුවෝ යුහුව ප්‍රභාවතීන් කරාගොස් දියනියෙනි කුශ රජ්ජුරුවන් මෙනුවරට ආයේ සැබෑදැයි විචාළාහ. එසඳ ප්‍රභාවතීන් එසේය පියානන් වහන්ස උන් වහන්සේ මෙනුවරට අවුත් රාජ කුමාරවරුන්ට අරක්කැමි කම් කරන්නේ දැන් සත්මසෙකැයි කිවුය. ඒ අසා මදු රජ්ජුරුවෝ උන්ගේ බස් අදහානොගෙන කුද කැඳවා විචාරා නියම කොට දැන එඹල කෙල වෙස්වලා මුඩුවෙසින් පැමිණි විෂඝෝර සර්ප රාජයකු පරිද්දෙන් සකලභුවන සේඛරවූ විශිෂ්ට කායබල ඤාණබල ඇති ඒ කුශ රජ්ජුරුවන් වෙස්වලා තොප නිසා මිට අවුත් සත්මසක් මුළුලෙහි දුක් ගනිමින් සිටියදී අපට නොකියා කළද ඒකාන්තයෙන් වැරැද්දේය. යනාදීන් දියනියන්ට දොඩා වේගයෙන් ඉක්මන්ව බෝධිසත්වයන් කරාගොස් සුවදුක් විචාරා බද්ධාඤ්ජලීව සිට මහරජ්ජුරුවන් වහන්ස සත් මසක් මුළුල්ලෙහි දුක් ගනිමින් සිටියදී නුඹ වහන්සේ වෙස් වලා අවුත් මෙගම සිටිබව නොදනුම්හ. ඒ අප නොදැන කළ අපරාධය ක්ෂමා කොර වදාළමැනවැයි යාච්ඤාකළහ.

එබස් අසා මහාබෝධිසත්වයෝ ඉදින් මම තද කොට කිම්නම් මොහුගේ ලය පැලියන්නේය. එහෙයින් අස්වසා කියමි සිතා වලන් අස්සෙහි සිට දෙවයන් වහන්ස මෙබඳුවූ මම සම්ප්‍රාප්තවූ රාජ්‍යශ්‍රිය හැර ප්‍රභාවතීන් කෙරෙහි බඩහිලාෂයෙන් වෙස්වලා අවුත් අරක්කැමි කම් කෙරෙමින් දුක්වුනිම්ද මා කළ ඒ අකර්තව්‍යයම අධිරාජයන්ව සිටි මා බඳුන්ට නුසුදුසු හෙයින් මගේම වැරදි විනා නුඹ වහන්සේගේ වැරැද්දෙක් නැත්තේය. එහෙයින් මේ මා කළදෙයට නුඹ වහන්සේම ක්ෂමා කොට වදාළ මැනවැයි කීහ.

එසඳ මදුරජ්ජුරුවෝ මහාබෝධිසත්වයන් විසින් ප්‍රියවචනයෙන් කියන ලද පිළිසඳර කථා ඇතිව සන්තෝෂ ප්‍රාප්තව ප්‍රාසාදයට ගොස් ප්‍රභාවතීන් කැඳවා නුවණනැති තැනැත්තිය මහබලපරාක්‍රම ඇති කුශ රජ්ජුරුවන් කරා ගොස් ක්ෂමා කරවා ගනුව ක්ෂමා කරවා ගනුවයි කීහ.

එසඳ ප්‍රභාවතී පිය රජ්ජුරුවන් ගේ බස් අසා නගුන් හා පරිවාර ස්ත්‍රීන් විසින් පිරිවරා බෝධිසත්වයන් සිටි තෙනට ගියාය කුශ රජ්ජුරුවෝද මෙහෙ කරමින් සිටි ප්‍රභාවතීන් තමන් කරා එන නියාව දැන දැන් මම මැගේ මන්බිඳ මාගේ පාපිට මඩෙහිම වැදහොවම් සිතා වලන්වල තිබූ පැන් බිමනමා කල විටක් පමන තැන් පාගා බෙරකොට බොරමඩෙයෙහි සිටියාහුය එකල ප්‍රභාවතී ගොස් බෝධිසත්වයන්ගේ පත්ලෙහි ඉස තබා මහපවනින් මුලින් උපුටා එලන ලද ස්වර්ණ තාලස්කන්ධයක් පරිද්දෙන් මඩෙහි වැතිර තමාගේ සුරකත පල්ලවාභි රාමවූ මෘදුකොමලපාණි යුගලයෙන් බෝධිසත්වයන්ගේ තරුණාරුබ කිරණ සමපකර්කීයෙන් ප්‍රව්කිසිත වූ සන්ධ්‍යාරාග නිර්විශේෂ ප්‍රභාභාසුර පාද පද්ම යුගලය අල්වාගෙන මරණ භයින් පිඩිතව මහ හඬින් හඬ හඬා දේවයන් වහන්ස මාගෙන් වෙන්ව නුඹ වහන්සේ විසින් රාජ්‍ය ශ්‍රී විභූතිය හැර අපමණ දුක්ඛයෙන් යම් පමණ කලක් ඉක්මවන ලද එපමණ කාලයක් මුළුල්ලෙහි මා විසිනුත් දුර්ජන දුක්ඛසෙය්‍යාදීන් හා ස්නානපාන රහිතවීමෙන් නුඹ වහන්සේ සේම දුකින්ම දවස් යවන ලද්දේය. එහෙයින් මට  නොකිපී ක්ෂමා කොට වදාළ මැනව.

තවද මහරජ්ජුරුවන් වහන්ස මාගේ සත්‍යවචනයන් ඇසුව මැනව මම මෙතැන් පටන් දිවිහිමියෙන් කයින් වචසින් මනසින් අමනාපයක් නොසිතම්, නොකරම් ඉදින් මා මෙසේ යාච්ඤාවෙමින් සිටියදී මට ක්ෂමා නොකොට මාගේ බස් නොපිළිගත්සේක් වී නම් දැන් මපියානන් වහන්සේ මේසත් රජදරුවන්ට මා සත් කඩක්කොට කපා දෙන සේක. එහෙයින් මට ක්ෂමා කොට රැක්ක මැනවැයි යාච්ඤාකළහ.

එකළ කුශ රජ්ජුරුවෝ ප්‍රභාවතීන්ගේ බස් අසා ඉදාන් සබඳ තෙපිම වෙද දන්නා ඒ මට ඇයිදැයි කීමනම් මුන්ගේ ලයපැලී යන්නේය.එහෙයික් මුන් අස් වසා කියමියි සිතා ප්‍රභාවතිනි තොප මෙලෙස යාච්ඤාවෙමින් සිටියදී කුමක් නිසා තොප කීවා කෙරෙම්ද තොප කෙරෙහි මාගේ මදකුත් කොපයෙක් කනස්සල්ලෙක් නැත්තේය. තවද තෙපි කිසිවකටත් නොබව තවද කලණ ගුණයෙන් ඇති රාජ්‍යපුත්‍රිය සත්‍යවචනයක් ඇති කියම් මමත් මෙතැන් පටන් කයින් වචසින් මනසින් අප්‍රියයක් නොකෙරෙමි මේ එක මදු රජකුලය තබා මෙබඳු නොයෙක් සියගණන් රාජකුලයන් මර්දනය කොට මා කැමති පරිද්දෙන් තොප ඇරගෙනයන්ට සමර්ථවුවත් මම තොප නිසා මාගේ රාජශ්‍රිය හැර හීනක්‍රියා කෙරෙමින් මෙතෙක්දවස් මුළුලෙලහි දුක් වින්දෙමි. එබඳුවූ මා පෙනිසිටියදී තොපට කිසියම් භයකුත් නැත්තේයයි යනාදීන් ප්‍රභාවතීන් අස්වසා සියළු රජ පිරිවරින් පිරිවරණලදුව ක්ෂත්‍රිය මාන උපදවාගෙන මා ජීවත්ව සිටියදී මාගේ භාර්යාව අනිකෙක් ඇරගෙන යෙතැයි කෙශර සිංහ රාජයකුමෙන් පැලඹෙමින් මේ සියළු සාගල නුවර වාසීහු මා මෙතනට ආ බව දනිත්වයි ඇත මැත පැනමින් අභිතනාද පවත්වමින් අත්පොලසන් දෙමින් දැන් දැන් ඒ කොල්ලන්

SANHIDA LANKA

ජීවග්ග්‍රාහයෙන් අල්වාගෙන එම් සියළු අන්තඃපුර වාසීන් අස්වසා තවද මණිකන්ක රජතාදී විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් විරාජ මානවූ නික්මුනාවූ විරාජමානවූ රථයානාවෙක්හි නික්මුනාවූ කිකරු සියළු අශ්වාලංකාරයෙන් සරහන ලද අශ්වයන් යොදව දැන් දක් ශත්‍රැ මථනය කරන්නාවූ මාගේ බල පරාක්‍රම සමාර්ථය බලව යනාදීන් අභීත නාද පවත්වමින් ශත්‍රැමථනය කිරීමට භාරය තොපි තොපගේ මාලිගාවෙට ගොස් ඉස්සෝධා නහා සැරහීගන වැදහිඳුවයි ප්‍රභාවතීන් එතන නික්ම වූහ. එකල මදු රජ්ජුරුවෝද කුශ රජ්ජුරුවන්ට පිරිස්සරහන පිණිස අමාත්‍යයන් යවුහ. එනියෝග ලද අමාත්‍යයෝ ගොස් මුළුතැන් ගෙයි මිදුලෙහි වටතිරයක් බැඳ එලවන ලද ඒ මගුල් කපුවා විසින් කරණ ලද දූලි රැවුළු අන්දම් තිබීම් ඇතිව ඉස්සෝධා නහා සියළු රාජාභරණයෙන් සැරහී ඇමති මඩුළු ආදී දශ මේ තැන් පිරිවරා මාලිගාවට යෙමින් අත්පොලසන් දෙමින් සියළු අන්තඃපුර සත්වයන් බල බලා සතුටුවන පරිද්දෙන් අභීතනාද පැවැත්වූහ.

එකල මදුරජ්ජුරුවෝ මනාව ඉක්මවන ලද රන්සැත් රන් පොරොදු රන්සන්නාහ කර්ණ චාමරාදී සියළු හස්ත්‍යාලංකාරයෙන් සහන ලද්දාවූ නගනලද ධවලාත්පත්‍ර ඇති මගුලැත් සරහා බෝධිසත්වයන් නැගෙන පිණිස යවුහ. එකල කුශ රජ්ජුරුවෝ ඒ ඇතුපිටට පැන නැගී ප්‍රභාවතීන් පශ්චිම ආසනයෙහි හිඳුවාගෙණ චතුරංගිනි සේනාව විසින් පිරිවරණලදුව නුවර නැගෙනහිරි වාසලින් පිටත්ව කැනහිල් රැසක් මධ්‍යයටවන් කෙශර සිංහරාජයකු පරිද්දෙන් යුද්ධභූමියට වැද මම කුශරජය ප්‍රාර්ථනා කෙණෙක් බසින් තලවයෙත්වයි කියා අසනිසම්පාත නිගොසෂ ඝොරකොට තුන්යලක් සිංහනාද ස්වරයෙන් අභිතානාද පැවැත්තුහ.

එසඳ කුශ නරේන්ද්‍ර සිංහයාගේ ඒ සිංහනාදය අසා භයපත්ව ඉස්ලුලුඅත පලාගොස් පර්වත ඝනවන ගහනාදියට වන් මාගසූකරාදීන් පරිද්දෙන් ශත්‍රැ රජ්ජුරුවන් පිරිවරා සිටිනොයෙක් සියදහස් ගණන් ඝන ගර්ජනාකර හිමනාද ඇති හිමසෙනානුකාරීයෝධාධිරූඪ ස්ත්‍රීමදිගලිත තරුණ කරුණාකර වාරනේන්ද්‍ර සේනාවද ප්‍රලයකාල ප්‍රවුතොතාදර චණ්ඩ මාරුතා භිසාත සින්ධු තුඩග තරංග භංගානුකාරී රංගත්තුරංගානු සිතවූ යුද්ධමංනභිලාස ඇති දහස් ගණන් අසරුවන් විසින්ද උපලක්ෂිත අශ්වසේනාවද වේරම්බ වාතයෙන් ප්‍රේරිතව ඝෝරනිගොසෂ පවත්වමින් දිගාන්තරාභිධාවනය කරණ විද්‍යුල්ලතා සහස්‍රයෙන් සශ්‍රීකවූ මේඝකූටානුකාරීවූ රථාලංකාරයෙන් සරහන ලද විචිත්‍ර ධජ පතාකාභි කිරණ ගම්භීරචක්‍රධවනි ඇති ප්‍රචණ්ඩදොදීණාඩ කොදණ්ඩ කාණ්ඩභි ලක්ෂිත ප්‍රභල යොධා ධිෂ්ටිත රථසෙනගද නානාවේශ ග්‍රහණාභිෂණවූ දුර්වාරගොධත පවනාති පාතවෙග ඇති බංගමුද්ගර තොමර කුන්තචාරුවා පබනාදී විවිධායුධ ග්‍රහණාතිභිෂණ අනෙකකොටි පාබල සේනාවදැයි යනාදී මේ සේනාව මරණ භයින් ත්‍රස්තව සිටි පිය සිටියනොහි භයොන්මාදයෙන් මූර්ජාවට පැමිණ ඔවුනොවුන් ඇඳිනගත නොහි සිය සෙනගම් කොටා වටා දිව පැන විඩාපත්ව ඒ ඒ අත දිවපුහ.

එසඳ මේරු සාරවූ කුශරජ්ජුරුවෝ මන්දරපර්වතයෙන් අල්ලන ලද මහා සමුද්‍රය පරිද්දෙන් නිරායාසයෙන් තමන්ගේ සිංහනාද මාත්‍රයෙන් ඒ ශත්‍රැසාගරය මථනයකොට ප්‍රභාවතීන් ගේ පාණිග්‍රහණය පිණිස ආ සත්රජුන් ජීවග්‍රහයෙන් අල්වා ජයගෙන සිටියද ශක්‍රදේවේන්ද්‍රයෝ තමන්ගේ දහසක් නුවණැස් මෙහෙයා මනුෂ්‍යලෝකය බලා ඒ රණධරණිමධ්‍යයෙහි ශත්‍රැරජදරුවන් හා සමග විජයශ්‍රී කාන්තාවගේ පාණිග්‍රහණකළ අපගේ විසුද්ධ ශ්‍රී මහා බෝධිසත්වවූ කුශ රජාධි රාජෙ තත්මයා පරහිංසාවක් නොකොට සිංහනාද පමණකින් කැටත් ගැසු කපුටුරැසක් පලවන පරිද්දෙන් නිරායාසයෙන් කරණ ලද ශත්‍රැ සෙනා මර්දනය දැක සඤ්ජාත ප්‍රීතිප්‍රමෝදයෙන් ප්‍රමුදිතව මේ උත්තම පුරුෂයාගේ විරූපතව දුරුකොට උතුන් රූප සෞන්දර්යෙන් සරහන්නට උමවැනවයි සිතා තරුණාකී රසමින් ප්‍රදානයක් මෙන් දිප්තිමත්ව විරොචන්නම්වූ අෂ්ටවංක මාණික්‍යරත්නයක් තුෂ්ටිදානයෙක් ගෙනහැර උර සත්ලයෙහි පැළඳවූහ.

එසඳ මහා බෝධිසත්වයෝ එසත් රජුන් අල්වා ඔවුනොවුන්ගේ උතුරු සළුවෙන් පිටිතොල අයා බැඳගෙණ ඒ රණභූමියෙන් නොයෙක් ජයඝෝෂා පවත්වාගෙණ මාණික්‍ය රත්නයෙහි ආනුභාවයෙන් දිව්‍යලදීන් ඔප්නගා කරණ ලද සවර්ණ ප්‍රතිමාවක් මෙන් විරාජ මානව අන්‍ය සාධාරණ ශ්‍රී විභූතියෙන් යුක්තව සුරයෙන් පිරිවරා සුජාතාවන් හා ඓරාවණ වාහණ රූඪව අසුර විජයකොට අවුත් වෛජයන්ත ප්‍රාසාදයට වදනා ශක්‍රදේවේන්ද්‍ර විලාසයෙන් මාලිගාවට වැද මදුරජ්ජුරුවන් දැක මයිලනුවන් වහන්සේට විරුද්ධ අවුදින් නුවර වටලාගත් ශත්‍රැ සේනාව මථනය කොට රජදරුවන් සත්දෙනා ජීවග්‍රහයෙන් අල්වාගෙන ආමි මොවුන් මරතන් මැරුව මැනවයි අරිතත් අලමැනව වහල්මේ ගනිතත් ගතමැනවැයි කැමැත්තක් කළමැනවැයි කීහ.

SANHIDA LANKA

එබස් අසා මදුරජ්ජුරුවෝ මහරජ්ජුරුවන් වහන්ස අප ඇමදෙනාම ප්‍රධානව සිටිහෙයින් මොහු නුඹ වහන්සේටම සතුරෝය මරතන් තබනත් අරිතක් නුඹ වහන්සේටම කැමැත්තක් කළ මැනවැයි කීහ.

මදුරජ්ජුරුවන් විසින් මෙලෙස කී කල්හි මහබෝධිසත්වයෝ මොවුන් මරාලබන්නේ කිම්ද මුන් හැම මෙනුවරට ආගමන් බ්‍යර්ථනොවෙවයි ප්‍රභාවතීන්ගේ නඟුන් සත්දෙනා මෙරජ්ජුරුවන් සත්දෙනාට දෙවාලම් සිතා දෙවයන් වහන්ස දිව්‍යස්පාරාවන් සමාන රූප සෝභා ඇති නුඹ වහන්සේගේ දූන් සත්දෙනා මෙරජ්ජුරුවන්ට

පාවාදී මුන්හැම බැණාකොටගත මැනවයි කිවුය. ඒබස් අසා මදුරජ්ජුරුවෝ මහරජ්ජුරුවන් වහන්ස අපටත් උන්ටත් නුඹ වහන්සේම ප්‍රධානසේක ඉදින් කැමතිසේක්වීනම් දේවාවදාළ මැනැවයි කිවුය.

ඉක්බිති කුශ රජ්ජුරුවෝ ඒ ක්‍ෂත්‍රිය කන්‍යාවන් සත්දෙනා ස්වර්ණාභරණයෙන් සරහා රජදරුවන් සත්දෙනා සර්වාභරණයෙන් සරහා රජ දරුවන් සත් දෙනාට මහමගුලන් පාණිග්‍රහණය කරවා දුන්හ.

එසඳ රජ දරුවෝ සත්දෙනා ස්ත්‍රීරත්න ප්‍රතිලාභයෙන් අතිශයෙන් සතුටුව කුශරජ්ජුරුවන් වැද අවසර ඉල්වාගෙන තම තමන්ගේ රාජ්ජයටම ගියාහ.

ඉක්බිති උපාය කෞශල්‍යඥානය ඇති මහාබෝධිසත්වයෝ කීපදවසක් එහි වාසයකොට මයිල් රජ්ජුරුවන්ගෙන් අවසර ඉල්වාගෙන ප්‍රභාවතීන් කැඳවාගෙන චතුරංගනී සේනාව විසින් පිරිවරා මහත්වූ රාජානුභාවයෙන් සාගල නුවරින් නික්ම මනාව සරහා පිළියෙළ කරණලද්දාවූ නගනලද ධවලාතපත්‍ර ඇති විචිත්‍ර චිත්‍ර කමෙමාජවලිතවූ රථයානාවකින් ගොස් මාණික්‍යරත්න කාන්තීන් ප්‍රභාවතීන් හා විශිෂ්ටවූ රූපසෞන්දර්ය සෝභාවෙන් විරාජමානව විමාණස්ථව ගමන්ගත් සිද්ධ යුගලයක් පරිද්දෙන් කුශාවතී රාජධානියෙහි සියළු සත්වයන්ට නෙත්‍රොත්සව කෙරෙමින් නුවරට වන්හ.

එසඳ බෝධිසත්වයන්ගේ මෑණියෝ සීලවතීදේවි කුශරජ්ජුරුවන් ප්‍රභාවතීන් කැන්දාගෙන නුවරට ආහයි යනු අසා කෑම් පීම් ආදී බොහෝ උපකරණ ඇරගෙන මහපිරිවරින් පෙරගමන්කොට ගොස් දැක සතුටුව බෝධිසත්වයන් කැඳවාගෙන නුවර පැදකුණුකොට මාලිගාවට වැද රාජ්‍යශ්‍රියෙහි පිහිටවූහ.

එතැන්පටන් ප්‍රභාවතීන් හා කුශරජ්ජුරුවන් හා දෙදෙන එකාත්මිකව සමග වාසයෙන් දිවිපමණින් දසරාජදහමින් යුක්තව රාජ්‍යශ්‍රී අනුභව කොට කෙළවර කම්වුපරිද්දෙන් සංසාර යාත්‍රාව කළාහුයයි තිලෝගුරු බුදුරජානන් වහන්සේ ධම්සභාමණ්ඩපයට රැස්වූ ශාසනයෙහි උකටලීවූ ඒ භික්ෂූන් වහන්සේ ප්‍රධානකොට ඇති සිව්වනක් පර්ෂිදට මේ අතීත කථාව ගෙණහැර දක්වා ධර්මදේශනාකොට වදාරා දුක්ඛ සත්‍යය සමුදය සත්‍යය නිරෝධ සත්‍යය මාර්ග සත්‍යය යන චතුරාර්‍ය සත්‍යයන් ප්‍රකාශකොට මේ ජාතක ධර්මදේශනාව පූර්වාපර සන්ධි ගළපා නිමවා වදාළසේක.

චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උකටලීවූ භික්‍ෂූන් වහන්සේ දහසක් නයින් හෙබියාවූ සෝවාන් පලෙහි පිහිටා නිවන් දුටුසේක.

එකල මව්පිය දෙනෙ සුද්ධෝදන රජ්ජුරුවන් හා මහාමායා දේවිවුහ. ජයම්පතී කුමාරයෝ නම් ධම්මභාණ්ඩාගාරික වූ ආනන්ද ස්ථිවිරයෝවුහ. එසමයෙහි කුත් දූන් බුජ්ජත්තරා නම් භික්ෂූණිවුහ. ප්‍රභාවතී තොමෝ රාහුලස්ථවිරයන්ට මව් බිම්බාදෙවිවුය. එසමයෙහි රජපිරිස් දූන් බුදු පිරිස්විය. ප්‍රභාවතී නිසා සත්මසක් දුග්ගෙන සත්රජුන් මන්මැඩ සෙමෙහිතබා ප්‍රභාවතීන් ගෙනුවුත් රාජ්‍යකළ කුශ රජ්ජුරුවෝ නම් තිලෝගුරු බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

SANHIDA LANKA

# සෝණ නන්ධ ජාතකය

ජාතිකාන්තාරාදීන් සත්වයන් එතරකොට නිර්වාණ ක්‍ෂෙමභූමියට පමුණුවනහෙයින් ශාස්තෘ නම්වූ දේවාතිදේව සමන්තභද්‍ර ශාක්‍යසිංහ කරුණානිධාන සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් මේ සෝණනන්ද ජාතකය දුප්පත් මව්පිය දෙදෙනෙක් හට උපස්ථාන කරණ භික්ෂූන් වහන්සේ කෙනෙකුන් අරභයා වදාළසේක.

මෙහි වර්ථමාන කථාව සමාජාතකයෙහි පෙණෙන්නේය එකල සෙසු භික්ෂූන් වහන්සේ ඒ නමට මහණ තෝ නෛර්යාණිකවූ බුද්ධශාසනයෙහි මහණව සැදැහැයෙන් දෙනලද සිව්පසයගෙන ගිහින් පෝෂ්‍ය කරන්ට කාරනා කිම්දැයි දොඩානොකැමති පරිද්දෙන් බුදුන් සමීපයට කැඳවාගෙණ ගොස් දක්වා ස්වාමිනි මේ මහණ ගිහින් පෝෂ්‍ය කෙරෙමින් වෙසෙසින් දූන්වූසේක. ඒ අසා සර්වඥයන් වහන්සේ මහණෙනි මේ භික්ෂූහට නොදඬවා පුරාතනයෙහි නුවණැත්තෝ මුළුදඹදිවට පැමිණියාවූ රාජ්‍යශ්‍රීහැර මව්පියන් පෝෂ්‍ය කෙරෙමින් වාසයකළාහු වේදැයි වදාරා ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිතවූ තිලෝගුරු සර්වඥයන් වහන්සේ විසින් අතීතකාලයෙහි පැවති කථාන්තරය පාංශුප්‍රතිච්ඡන්න ජාතිරංගමාණික්‍යයක් ගෙනහැර දක්වන්නාක් පරිද්දෙන් වදාරණසේක් මහණෙනි යටගිය දවස බාරනාශිතොම බ්‍රහ්මවර්ධන නම් නුවරෙක් විය එහි මනෝජ නම් රජජුරු කෙණෙක් දාන ප්‍රියවචන අර්ථචරියා සමානාත්මතාය යන චතුස්සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කරන්නාහුය එනුවර අසූ කෙළක් ධන ඇති එක්තරා බ්‍රාහ්මණ මහාසාරකුලයෙක දරුකෙණෙකුන් නැති බැමිණියකගේ කුසපිළිසිඳගෙණ ප්‍රසූතවූහ. උපන්නාවූ ඒ බෝධිසත්වයන්ට මව්පියෝ සෝණක කුමාරයෝයයි නම් තුබූහ. ඔහු පියවරනගා ඇවිදිනා කල්හි අනික් බ්‍රාහ්මණයෙක් බඹලොවින් අවුත් බැමිණිය කුස උපන්නාහුය. ඔවුන්ට නම් තබන දවස් නන්දකුමාරයෝයයි නම් තිබූහ. දෙදෙනා වැඩිවිය පැමිණ වෙදත්‍රයෙහි පරාප්‍රාප්තව රූපශ්‍රීයෙන් අග්‍රප්‍රාප්තවුවන් දැක බමුණානෝ බෝධිසත්වයන් ගෘහවාස බන්ධනයෙන් බදුම්හයි සිතා බැමිණියට එපවත් කිහ.

ඒ අසා බ්‍රහ්මණි සතුටුව එපවත් සොණක කුමාරයන්ට කිවුය. ඒ අසා බෝධිසත්වයෝ මෑණියන් වහන්ස මට ගෘහවාසයෙන් කම්නැත, නුඹ වහන්සේලාට මා ජීවත්වනතෙක් අත්පා මෙහෙකොට ඉක්බිති හිමාලය වනයට ගොස් මහණවෙමියි කීහ.

දෙමව්පිය දෙදෙන මොහු බාලකලම පඤ්චකාමගුණයෙහි ආලයහැර තපසට යනු කැමැත්තාහ මේ අවස්ථාවට පැමිනියාවූ අපි කැලමවෙද එසේ හෙයින් දරුවෙනි අපගේ ඇවෑමෙන් පැව්දීමෙන් පසු දැන්ම එක්වලා මහණ වම්හයි කථාකොට එපවත් රජ්ජුරුවන්ට කියා සියළු ධන ධාන්‍යාදී සමෘද්ධිය ශ්‍රමණ බ්‍රාහ්මණ දුගීමගී යාචකයන් විෂයෙහි දාන පරිත්‍යාගකොට සියලු දැසි දස් පරිවාර නිදස් කොට බන්ධු වර්ගයාට දුනමනා සම්පත් බෙදාදී බමුණානෝය බැමිණිදේවිය බෝධිසත්වයෝය නන්දකුමාරයෝයයි යන සතරදෙනම බ්‍රහ්ම වර්ධන නම් නුවරින් පිටත්ව හිමාලය වන ප්‍රදේශයෙහි පස්පියුමෙන් විරාජමානවූ මස්කැස්බෑන් විසින් ගැවසීගත්තාවූ මනාවූ තීරාන්තර ඇති විලක් ඇසුරුකොට පුෂ්පපල පල්ලවයෙන් සඤ්ජන්නවූ සපුනා පනා තාලහින්තාල උක් පුවක් එල්කෙහෙල් ඈ තරුවරභාණ කීර්ණ රම්‍යවූ වනප්‍රදේශයෙහි අසපුවක්කොට ගෙන තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව එහි වාසය කළාහුය.

එකල බෝධිසත්වයන් හා මලනුවෝ දෙදෙනා උදෑසන නැගීසිට පන්සල හා මළුව හැමදා කසලදමා උණුදිය සිහිල්දිය ගෙනහැර දෙමව්පියන්ට දැවටී දඬු මුව දෝවනාදිය දී වලින් මධුර වූ පලාඵලගෙන උන් අනුභව කරවා උනුදිය සිහිල් දිය තබා, ඉස්සෝධා , නාවා ඉසකෙස් අවුලකඩා වියලමින් පිට මඩිමින් මව්පිය දෙදෙනහට උපස්ථාන කරන්නාහ.

මෙලෙසින් කලක් ගියසඳ බෝධිසත්වයන්ගේ මල්නන්ද පණ්ඩිතයෝ තමන් ගේ පලාඵල දෙමව්පියන් අනුභව කරවා රකිමියි සිතා ඊයේ පෙරව් දවස් ගෙනතැනින්ම ලද යම් පලාඵලයක් පළමුකොට ගෙනවුත් අනුභව කරවති ඔවුන් අනුභවකොට මුවසෝධා අටසිල් සමාදන් වන්නාහ.

සෝණපණ්ඩිතයෝ දුරගොසින් මියුරු පලාඵලගෙනෙති එකල මව්පිය දෙදෙන සෝණ පණ්ඩිතයෙනි තොපගේ මලනුවෝ පලාඵලගෙනවුත් දුන්නාහ. ඒ අනුභවකොට පෙහෙව සැතපීගතුම්හයි ප්‍රතික්ෂේප කරන්නාහ. එපරිද්දෙන්ම නන්ද පණ්ඩිතයෝ දුටු පලා එල ගෙණවුත් පළමුකොට වලඳවතියි බෝධිසත්වයන්ගෙනා පලාඵල අනුභවනොකරති මෙසේ කීප දවසක්ම අනුභව නොකිරීමෙන් නිෂ්ප්‍රයෝගවිය එකල බෝධිසත්වයෝ සිතන්නාහු මාගේ දෙමව්පියන් ඉතා සිව්මැලි බැවින් නන්දපණ්ඩිතයන් විසින් තමන් අසුවූ නොවිලිකුන් පලාඵලයන් ගෙනහැමට පළමුකොට අනුභවකරවති මු දිගටම මෙලෙස කෙරෙත්නම් මෙතන මුන් වහන්සේලා බොහෝ කලක් ජීවත්වන්ට කාරණා නොවන්නේයයි සිතා නන්දයෙනි මෙතැන්පටන් පලාඵලගෙනාකල මා

SANHIDA LANKA

එනතෙක් බලව අපි දෙදෙනාම එක්ව සිට අනුභව කරවම්හයි මලනුවන්ට කීහ.

බෝධිසත්වයන් විසින් එලෙසකීයන ලද්දාවූ නන්දපණ්ඩිතයෝ තමන්ටම කුශල් කැමතිව බෝධිසත්වයන් කී බස් නොපිළිගත්හ. එසඳ නන්දයෝ මා කීවා නොගිවිස අකාරියමකෙරෙතියි එසේහෙයින් මොහු මෙයින් නෙරපා දෙමව්පියන්ට උපස්ථාන කෙරෙමියි සිතා නන්දයෙනි තොපි නොකීකරුව නුවණැත්තන් කී බස් නොගිවිසුව මම තොපට වැඩිසිටියෙම් එහෙයින් දෙමපියන්ගේ කාරිය මට භාරය මම්ම මොවුන් පෝෂ්‍යකෙරෙමියි තොපි මෙහි වාසය නොකර අන්තැනකටයවයි අසුරු ගැසූහ. එසඳ නන්දපණ්ඩිතයෝ බෑණන් විසින් නෙරණලදුව ඇසිල්ලකුත් රඳානොහී බෑණන් වැඳ අවසර ඉල්වා ගෙණ ගොස් මව්පියන්ට මෙපවත් කියා තමන්ගේ පන්සලට වැද කිසුණු භාවනාකොට එම දවස්ම පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති අපදවාගෙන ප්‍රිතිවාක්‍ය පවත්වා ඉදින් මම රුවන්වැලි ගෙණවුත් බෑණන් වහන්සේගේ පන්සල් මළුවෙහි අතුට ක්ෂමා කරවාගන්ට සමාර්ථයෙම් නොහොත් අනොතත්ත විලින් දියගෙනහැරදී ක්ෂමා කරවාගණිතත් තිස්සෙමි එයින් මට සුදුසු නොවන්නේය. ඉදින් බෑනන් වහන්සේගේ ගුණ සකල ලොකයෙහි පැතිත චන්ද්‍ර සූර්යයන් පරිද්දෙන් ප්‍රකාශවන සේකැයි සිතා ඒ නන්දපණ්ඩිතයෝ එක්ෂණයෙහිම ධ්‍යාන භාවනාවෙන් ආකාශයෙන් ගොස් බ්‍රහ්මවර්ධන නම් නුවර මනොජ රජ්ජුරුවන්ගේ රාජාංගණය බැස එකතාපසකෙණෙක් දක්නාකැමතිව අවුයයි රජ්ජුරුවන්ට කියා යවුහ.

ඒ අසා රජ්ජුරුවෝ තපස්වීවරයන්ට මා දැකීමෙන් ප්‍රයෝජන කිම්ද අහරනිසා ආකෙණෙක් වනැයි සිතා බත් යවුහ. ඒ නොගන්නාහෙයින් සාල් පිළි වෙන වෙන යවා කිසිවකුත් නොගන්නාහෙයින් කුමක් නිසා අවුදැයි මිනිස් කෙනෙකුන් යවා විචාරා රජ්ජුරුවන්ට සේවය පිණිස ආමියනු අසා මට සෙවය කරන්නෝ බොහෝය තමන්ගේ තපසම රක්ෂාකෙරෙත්වයි කියා යවුහ. ඉක්බිති නන්දපණ්ඩිතයෝ රජ්ජුරුවෝ කැමැත්තෝ නම් සකල ජම්බුද්වීපයෙහි රාජ්ජය ඇරදීලන්ට සමාර්ථවෙමියි කියා යවුය.

එබස් අසා රජ්ජුරුවෝ තාපසවරහු නම් නුවණැත්තෝය ඊට නිසි උපායක් දනිත් නම් යහපත් වේදැයි සිතා ඔහු කැඳවාගෙත්වා ආසනයෙක්හි හිඳුවා වැඳපුදා ආගන්තුග සත්කාරකොට පිළිසඳර කථාකෙරෙමින් මුළුදඹදිව රාජජ්‍ය ඇරදෙන්ට පිළිවනැයි කීසේක්දැයි විචාළෝය. එසේය මහරජ පිළිවනැයි කිසඳ කෙසේ ඇරගෙනදෙනසේක්දැයි සිතා ඔහු කැඳවා ගෙන්වා විචාරා මහරජ කිසිකෙනෙකුන්ගෙන් ඇට ලේ මැස්සක බොන විවරලේ පොදකුත් නොසොල්වා තොපගෙන් කහවනුවක් විචාරවත් හානියක් නොකොට මාගේ ඍද්ධ්‍යනු භාවයෙන් ඇරදෙමියි කැමැතහොත් ප්‍රපඤ්ච නොකොට දැන්ම නික්මෙවයි කීහ. එබස් ගිවිස රජ්ජුරුවෝ සිව්රඟ සෙනඟ පිරිවරා නන්දපණ්ඩිතයන් පෙරදැරිකොට නික්මුනාහුය ඉදින් සේනාව ග්‍රීස්මයෙන් පීඩිත නම් නන්ද පණ්ඩිතයෝ තමන්ගේ ආනුභාවයෙන් සිතලච්ඡයව කරන්නාහුය ඉදින් වැසි වසීනම් වට නොදෙන්නාහ, මහ කටු කනු ආදිය තමන්ගේ ඍද්ධානුභාවයෙන් දුරුකොට හෙරිතලයක් මෙන් සමකොට තුබූ ආකාශයෙහි පත්කඩ සමඅතුට ගෙපලක් බැඳහිඳගෙන පලමුව නික්මෙන්නාහුය. මෙලෙස සේනාව හැරගෙන කොසොල් රටට ගොස් නුවරට නුදුරුතන්හි කඳවුරු බැඳ හිඳ යුද්ධ හෝ කරව නොහොත් අපවාසයෙහි පවතුවයි අසුන් යවුහ.

ඒ අසා කොසොල් රජ්ජුරුවෝ කිපී මමත් රජෙක් නොවේදැයි සියළු සේනාව සන්නද්ධ කරවාගෙන යුද්ධයට වැද උභයසේනාව යුද්ධකරන්ට පටන් ගත්කල්හි නන්දපණ්ඩිතයෝ තමන්ගේ ආනුභාවයෙන් පත්කඩ සම්මහත්කොට මධ්‍යයේ අල්වාගෙන දෙපක්ෂයේ විදී ඊ දඬු කිසිකෙනෙකුන් ඇඟටත් වැද නොගන්නා සැටියේ නැවතුහ.

දෙසෙනාවෙහි ඊ දඬු නිමාගියකල්හි දෙපක්ෂයේ ඇත්තෝම ඔවු නොවුන් කෙරෙහි භයින් අත්සීන් මසකට හැක්කක් නැතිව සිටියාහුය. එසඳ නන්දපණ්ඩිතයෝ නොබව මහරජ යනාදින් මනොජ රජ්ජුරුවන් අස්වසා කෙසොල් රජ්ජුරුවන් කරා ගොස් මහරජ නොබව තොපට කිසිභයෙක් උපද්‍රවයෙක් නැත්තේය. තොපගේ රාජ්ජය තොපටවන්නේය මනොජ රජ්ජුරුවන්ට මිත්‍රව වසගීවවයි කිවුය. එබස් අසා කොසොල් රජ්ජුරුවෝ යහපතැයි පිළිගත්හ. ඉක්බිති කොසොල් රජ්ජුරුවෝ නන්දපණ්ඩිතයන් කැඳවා ගෙන මනෝජ රජ්ජුරුවන් කරාගොස් මහරජ කොසොල් රජ්ජුරුවන් තමන් වසඟත්වයෙහි පවත්වාගෙන ඒ රාජ්ජය උන්ටම පාවාදී දෙසෙනඟ පිරිවරා අඟුරට හැරගෙන මගධරටයයි මෙලෙසින් සියළු ජම්බුද්වීපයෙහි රජදරුවන් සත් අවුරුදු සත්මස් සත්දවසකින් තමන්ගේ වයසට පමුණුවාගෙන එක් සියයක් රජදරවන් පිරිවරා බ්‍රහ්මවර්ධන නුවරට අවුත් ජයපාණය අනුභවකොට ජය ක්‍රීඩාවට පටන්ගත්හ. එකල නන්දපණ්ඩිතයෝ රජ්ජුරුවන් වහන්සේට උත්සව ක්‍රීඩාවට සතියක් අවසරදී තුමූ උතුරුකරු දිවයිනටගොස් අහර සිඟාගෙන අනුභව කරමින් හිමාලයෙහි රන්ගල්ගුහාවක විසූහ.

SANHIDA LANKA

ඒ සත්වන දවස් මනොරජ්ජුරුවෝ තමන්ගේ මහත්වූ ඓශ්චර්ය විභූතියම දැක මේ ආශ්චර්යය මාගේ

මව්පිය කිසිවක්හු විසින් දෙන ලද්දේ නොවෙයි නන්දපණ්ඩිතයන් නිසාම පැමිණියේය. එසේවූ උන්වහන්සේ නොදකින මගේ  සත් දවසෙක මෙසේ මහත් යසසක් පමුණුවාලූ සබඳ පණ්ඩිතයන් වහන්සේ කොයිදැයි සිහිකළාහ.

ඒ තාපසයාත් රජ්ජුරුවන් සිහිකළ නියාව දැක හිමාලයෙන් අවුත් රජ්ජුරුවන්ගේ ඉදිරියෙහි සිටියහ. එකල්හි රජ්ජුරුවෝ මම මුන් වහන්සේ දෙවතාවාන කෙනෙකුන් බවත් නොදනිම් ඉදින් මනුෂ්‍යයාන කෙනෙකුන් වී නම් සියළු ජම්බුද්වීපයෙහි රාජ්‍යයමුන්ට දෙමියි නොහොත් දෙවතාන කෙනෙක්ද නොහොත් ගාන්ධර්වනිකායෙහි උපන්සේක්ද නොහොත් සක්දෙව් රජෙක්ද නොහොත් මනුෂ්‍යයානකෙනෙක්ද මෙබඳුවූ සාද්ධ්‍යානුභාව ඇති නුඹ වහන්සේ කවුරුණැයි දනිමෝදැයි විචාළාහ. ඒ අසා නන්දපණ්ඩිතයෝ මහ රජ මම දෙවියෙකුත් නොවෙමි ගාන්ධර්වනිකායෙහි උපන් දිව්‍යපුත්‍රයෙකුත් නොවෙමි සෘද්ධ්‍යානුභාව ඇති මනුෂ්‍යයෙක්මි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ තපස්වීන් වහන්ස මහා මේඝනගා වස්නා කල්හි වැසි වලකමින් ඉතා දරුණුවූ අවුසුලන් පහරණ කල්හි සෙවන කිරීමෙන්ද ශත්‍රු සේනාව මධ්‍යයෙහි අනෙන්‍යන්‍යශර වර්ෂාව නිවාරණ කිරීමෙන්ද සියළු ධන ධාන්‍ය වස්ත්‍රාභරණාදීන් සමෘද්ධවූ රාජ්ජ්‍යශ්‍රිය හැරදීමෙන්ද එක් සියයක් රජ දරුවන් අපට පිරිවර කරදීමෙන්ද කාරණාලද උපකාරයට සතුටුවූ හස්ති වාහනය සර්වාභරණ විභූෂිතවූ භාව භාව ලීලාකටක්‍ෂ විලාශ ඇති නාටක ස්ත්‍රීහු සුරභිවන සුන්දර පවර ප්‍රාසාදයන් දැයි සියළු විභූතියද නොහොත් අඟුරට හෝ මගධ රට හෝ අස්සකරට හො 'අවන්තිරට හෝ රාජ්ජයයෙන් භාගයෙක් හෝ දෙමි මෙයින් කැමති දෙයක් වදාළ මැනවැයි නොහොත් රාජ්ජ්‍ය ශ්‍රී හෝ කළ මැනව කඩුපලාගගෙන නුඹ වහන්සේ ලඟ මම සේවය කොට සිටිමියි කීහ.

එබස් අසා නන්දපණ්ඩිතයෝ මහරජ මට රාජ්‍ය ශ්‍රීයෙන් හෝ ජනපදයෙන් හෝ නුවරකින් හෝ සම්පත්තියකින් හෝ ප්‍රයෝජන නැත්තේය. ඉදින් මා කෙරෙහි මෛත්‍රියක් ඇත්නම් මා කී දෙයක් කර කවරේදැයි යතහොත් අපගේ කිසියම් අපරාධයක් නිසා මෙහි නොවසවයි කොපකොට නෙරපූසේක. අපගේ බෑණන් වහන්සේ එතැන්පටන් ගෙන පූර්වාචාරීවූ ඒ මව්පියන්ට අත්පා මෙහෙවර කිරීමෙන් කුශලසඤ්චය කරණ කල්හි සෝණපණ්ඩිත නම් මාගේ බෑණන් වහන්සේ තොපගේ ආඥාපවත්නා මෙරට වනප්‍රදේශයෙක්හි මාගේ මව්පිය දෙදෙනා වහන්සේ පන්සලෙක්හි වාසය කරණසේක. ඔවුන් වහන්සේලාට අත්පා මෙහෙවර කිරීමෙන් පින්කොට ගන්ට අවසරයක් නොලදීන් බම්තොප පිටිවහල්කොටගෙන තොපගේ පරෑත්තයෙන් මා බෑණන් වහන්සේ ක්‍ෂමාකරවාගන්නා කැමැත්තෙමි ඊට සහායවයි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ නන්දපණ්ඩිතයන් වහන්සේට සියළු ජම්බුද්විපයේ රාජ්ජ්‍යය දෙමි කී මම මෙව්වර කටයුත්තක් කුමකැයි නොකෙරෙම්ද කොතෙක් දෙනා විවර කැඳවාගෙන යමෝදැයි විචාළාහ. එකල නන්ද පණ්ඩිතයෝ මහරජ තොප එක්සියයක් රජ දරුවන් හා එපමණවූ බ්‍රාහ්මණයන් හා ගෘහපතීන් විවරක් පමණයයි කීහ.

එකල්හි රජ්ජුරුවෝ ඇත් අස්රිය පාබල සෙනෙහයයි කියන ලද චතුරංගිනි සේනාව සන්නද්ධව කොට ධජපතාක තම්මැට තිසාන ආදීය හා බ්‍යාද හෝද්‍යාදී මාර්ගෝපකරණ දරුවන් හා සූවිසි අක්‍ෂෞහිණියක් සේනාව විසින් පිරිවරණ ලදුව නන්ද පණ්ඩිතයන් පෙරදැරිකොට නුවරින් නික්මුණාහ.

එසඳ නන්දපණ්ඩිතයෝ තමන්ගේ ආනුභාවයෙන් නුවරෙහි පටන් ආශ්‍රම පදය දක්වා අටඉස්බක් පමණ පලලින් මග කණු කටු ආදිය පහකොට තනා සරහා පිලියෙලකොට ආකාශයෙහි පත්කඩ සමඅතුට එහිවැඩහිඳ සරහණ ලද ඇතුට නැගී යන්නාවූ රජවරුන් හා ධර්මාන්විත කථාකෙරෙමින් සියල්ල මුන්ටම ශීතොෂ්ණාදී පිඩාවක් වැද්දනොදි ක්‍රමයෙන් කතරමග ගෙවා ගොස් ආශ්‍රම පදයට වදනා දවස් සොණපණ්ඩිතයෝ මාගේ මලනුවන් මා ලගින් ගියේ මෙවකට සත් අවුරුදු සත්වස් සත් දවසකැයි සිහිකොට මෙවකට ඌ කොතන වෙසෙත්දෝහෝයි දිවසින් බලා එක්සියයක් රජ දරුවන් හා සූවිසි ආකොෂහිණියක් සෙනාව විසින් පිරිවරණ ලද මනෝජ රජ්ජුරුවන් මට පැරෑත්තයට කැඳවාගෙන එන්නාහුයයි දැක ඔවුන් හැම විසින් මාගේ මලනු වන්ගේ නොයෙක් පෙළහර හා ආනුභාව දක්නාලද මෙතෙනට අවුත් මාගේ කිසිවිශෙෂයක් නුදුටුවහොත් මාගේ විශ්වාභාව විශේෂය දැක මේ සොර තාපසයා තමාගේ කිසි ආනුභාවයක් නැතිව තිබැදි මහානුභාව සම්පන්න්වූ අපගේ තපස්වීන් හා සමගත් පඨාකෙරෙක්ලයි මා කෙරෙහි සිත නපුරුකොටගෙන නින්දාකොට අපායට ගියාහු නම් නපුරැයි සිතා මොවුන්ට පළමුකොට සෘද්ධි ප්‍රතිහාර්යක් දක්වාලිය යුතුයයි සිනා කද හැරගෙන අනොත්තවිලින් පැන් ගෙනෙන්ට යන බඳුවන තමන්ගේ කරසරියේ සතුරඟුලක් තැන සිස්කෙරෙහි රඳවාලා කැටිව යන සැටියේ අධිෂ්ඨානකොට රජ්ජුරුවන්ගේ ඉදිරියෙහි ආකාශයෙන් නික්මුණාහුය. එසඳ නන්දපණ්ඩිතයෝ එන්නාවූ බෑණන් වහන්සේ දැක ඉදිරියෙහි සිටියනොහි උන්තැනින් අන්තර්ධානාව හිමාලය

SANHIDA LANKA

වනයට ගියාහුය.

එසඳ මනොජ රජ්ජුරුවෝ ආකාශයෙන් එන සෝන පණ්ඩිතයන් දැක කොළොක් දඬෙන් කරණ ලද කද කරවැද නොගන්නා පරිද්දෙන් ආකාශයෙහි රඳවාගෙන එන්නාවූ තොපි කොයිසිට කොයියන්නාවූ කවුරුදැයි විචාළෝය. එබස් අසා බෝධිසත්වයෝ මහරජ ශිලව්‍රත සමාදානයෙන් යුක්තව තාපසවෙසධාරීවූ මට සෝණපණ්ඩිතයෝයයි කියති තොපගේ විජිතවූ මෙවෙනෙහි මධුර වනමුල් වනඵලාදීන්ගෙන වයොවෘද්ධවූ මව්පිය දෙදෙනාහට රෑ දවල් නොපමාව ඔවුන් මට ගත් දුක් සිහිකොට එනයින් මිදි කුශල පුරා ගන්නා පිණිස පෝෂ්‍යකෙරෙමි කීහ.

එබස් අසා සෝණපණ්ඩිතයන් හා මිත්‍රසන්ථව කරණු කැමතිව කෞශික ගොත්‍ර ඇති සෝණපණ්ඩිතයන් වහන්ස නුඹ වහන්සේගේ ආශ්‍රමයට යන්නා කැමැත්ත අපට මග කියාළුව මැනවැයි කීහ.

ඉක්බිති මහාබෝධිසත්වයෝ පියවර සටහන් ඇති මංහසරක් මවා එඹා මහරජ තෙල මංහසරින් ගියකල යම්තෙනෙක්හි මේඝකූටයන් හා සමානවූ ඝනවනවඡයා ඇති කොබෝලීල පොල මිලිල මිලිල අඹ දඹ නා පනා කෙහෙල් පුවගු නෙරළු මුහුළුආදී පුෂ්පජාති ඵල එල්ලවයෙන් සඤජන්නවූ තරු වරගණාකීර්ණ වනසටයෙක් ඇද්ද. එතැන්හි කෞශික නම්වූ පියානන් වහන්සේ ඉඳ තපස්කරණසේක් එතෙම මාගේ තපෝවනය වන්නේයයි රජ්ජුරුවන්ට මංසලකුනු කියා සෝණ පණ්ඩිතයෝ යුහුව අනොතත්ත විලට ගොස් ඇරගෙන පලමුකොට පන්සලට අවුත් සපු දුනුකේ සිනිද්ද පොලොල් මල් ආදීන් සුවඳ ගෙන්වා තැන්පත්කොට තබා ගෙය මළුව හැමද පන්සල්දොර පියානන්ට උස්පුටුවකුත් ඊට පසුකොට මෑණියන්ට මිටිපුටුවකුත් පනවා පන්සලට වැද පියානන් වහන්ස එක්සියයක් රජ දරුවෝ මහ පිරිවරින් යුක්තව අප දක්නා පිණිස එන්නාහ ඔබ වහන්සේ එලියේ වැඩ උනමැනවැයි කීවාහුය. ඒ අසා කෞශික තාපසයෝ පන්සලින් පිටත්ව පනවන ලද අස්නෙහිඳ මෑණියෝ මිටි අස්නෙ හිඳ උන්නාහුය.

ඉක්බිති බෝධිසත්වයෝද මිටි අස්නෙහි එකත්පස්ව උන්හ එකල නන්ද පණ්ඩිතයොත් බෑණන් ගියපසු මනොජ රජ්ජුරුවන් ප්‍රධාන වූ එක්සියක් රජ දරුවන් කරා අවුත් ආශ්‍රමයට නුදුරුතැනෙක්හි සේනාව සන්නිවෙසකොට රැඳවුහ.

ඉක්බිති මනෝජ රජ්ජුරුවෝ පැන්සනහා සර්වාලංකාරයෙන් සැරහී රජ දරුවන් පිරිවරණ ලදුව නන්ද පණ්ඩිතයන් කැඳවාගෙන සෝණපණ්ඩිතයන් ක්ෂමා කරවනු පිණිස මහත් ශ්‍රී සෞභාග්‍යයෙන් යුක්තව ආශ්‍රමයට ගියාහ.

එසඳ මහබෝධිසත්වයන්ගේ පියානන් වහන්සේ රජ දරුවන් පිරිවරණ ලදුව ශක්‍රදේවේන්ද්‍ර විලාශයෙන් එන්නාවූ මනොජ රජ්ජුරුවන් දැක පඤවංගිකතූර්ය මිහිගුබෙර තූර්යයන් දහසක් කළාහ ආදීවූ නොයෙක් ඝෝෂාවන් පවත්වා ඝනපලල් මේඝකූටයක්මෙන් විනිර්ගිත විද්‍යුල්ලතා සශ්‍රිකවූ තරුණාකීර්සම් ප්‍රතාපයක්මෙන් විරාජමානවූ නලල්පට ආදී නානාභරණයෙන් සැදි පැදී දුනු ඉයවුරෙහි සන්නද්ධව උදුනෙහි බහාතබනලද නාමජාමෙබානද ස්වර්ණණයට බඳුවූ සොභා ඇති සගල ගරුඵස්කමෙන් තේජස් දීප්තිමත්වූ මුඛ සොභාවෙන් විරාජ මානවූ නගන ලද ධවලාධපත්‍ර ඡායාවෙන් දුරුකරණ සූර්ය කාන්ති ඇති උභය පාර්ශවයෙහි විහිදුවන ලද චාමිකර වාරුවමාරයන් ඇති විසිතුරු සන්නාහයෙන් සරහන ලද සෛනධව සමාරූඪව නගන ලද ධවලාතපත්‍ර ඇති නොයෙක් රජ දරුවන් පිරිවරණ ලදුව අකමප්‍යසවභාව ඇති මහාසමුද්‍රයෙහි තරංග පරම්පරාවෙන් පරිද්දෙන් අපමණ වූ චතුරංගිනි සේනාව විසින් පිරිවරණ ලදුව අනූනවූ ශ්‍රී විභූතියෙන් යුක්තව එන්නාවූ මූ කවරෙක්දැයි විචාළාහ.

එසඳ මහාබෝධිසත්වයෝ පියානන් වහන්ස එක්සියයක් රජ දරුවන් පිරිවරා සූවිසි අක්ෂෞහිණියක් පමණ සේනාව පිරිවරණ ලදුව අසුරයන් පිරිවැරූ සුරෙන්ද්‍රයා විලාශයෙන් මුළු දඹදිවට අධිපති රාජන්වූ මනෝජ රජ්ජුරුවෝ මාගේ මලනුවන් නන්ද කුමාරයන්ගේ කීමෙන් මා ක්ෂමා කරවන පැරැත්තයට එන්නාහුයයි කිවුය එකල තාපසයන් මෙලෙස ඔවු නොවුන් කථාකරමින් ඉන්දදී මනෝජ රජ්ජුරුවන් ප්‍රධානවූ එක් සියක් රජ දරුවෝ සෘෂිවරයන් කරාගොස් නමස්කාර කොට සිටියාහ.

SANHIDA LANKA

ඉක්බිති මනෝරජ්ජුරුවෝ සෘෂිවරුන් පසඟ පිහිටුවා වැඳ එකත් පස්ව ඉඳ කිමෙක්ද තපස්වීන් වහන්ස නුඹ වහන්සේලාට සැපද රොගවැසන නැද්ද වනමුල ඵල ඵලාදිය ඇවිලි ආහාරය සුලභද මෙවනයෙහි වාසය කරන්නාවූ නුඹවහන්සේලාට මැසි මදුරු ආදීවූ නයි පොලොන් සිංහ ගව වලස් ආදී දුෂ්ට සත්වයන්ගෙන් පීඩානැද්දැයි යනාදීන් සුවදුක් විචාළාහ.

එබස් අසා කෞශික තාපසයෝ මහරජ්ජුරුවෙනි අපට බලවත් ලෙඩ දුක් නැත්තේය, වනමුල් වන ඵලාහාරයන් සුලභව තවද මහරජ මැසි මදුරු දුක්ද සිංහ වග වලසුන්ගෙන් පීඩ දුකකුත් නැත්තේය. තවද මහරජ

මේතපොවනයෙහි බොහෝවාකාලයක් මුළුල්ලෙහි වාසය කරන්නාවූ අපට කිසි පීඩාවකුත් නැත්තේයයි කියා මහරජ තොපගේ ඒම යහපත් ගමනෙක් වේවයි මේ තපෝ වනයට පැමිණියාවූ තොපසියල්ලන් විසින් සත්කාර කටයුතු බැවින් ප්‍රධානයම්හ මේ තපොවනයෙහි යමකින් තොපට ප්‍රයෝජනයෙක් ඇත්නම් තොපගේ අභිප්‍රාය අපට කියව තවද මහරජ දඬුවැල්බෑ මී හා සමානවූ මධුර රස ඇති රන්වන් තිඹිරියකටු එරමිණිය යනාදීවූ යහපත් ඵලාඵල යෙන්ද අනොතත්ත විලින් ගෙනවිත් සුවඳ නවා සිහිල්බස්වනලද මිහිරිපැන්ද යන මෙයින් කැමති අනුභව කරවයි යනාදීන් ආගන්තුක සාද කළාහ.

ඒ අසා රජ්ජුරුවෝ තපස්වීන් වහන්ස නුඹ වහන්සේ විසින් අපට අර්ඝ්‍ය සත්කාර පිණිස දුන් ඵලාඵල ආදියෙක් ඇත්නම් ඒ සියල්ල අප විසින් පිලිගන්නාලද නන්ද පණ්ඩිතයන් වහන්සේ යම් කටයුත්තක් කියනසේක් වීනම් ඒ වචනයත් ඇසුව අපි ඇමදෙනමෙන් අන් කිසිකාරියක් නැතිව නන්ද පණ්ඩිතයන් වහන්සේගේ කීමෙන් සොණ පණ්ඩිතයන්ට පැරැත්ත කියා ක්‍ෂමා කරවන පිණිස අම්හයි කීහ.

රජ්ජුරුවෝ එකල සකිසඳ නන්දපණ්ඩිතයෝ උනස්නෙන් නැගී සිට දෙමව්පියන්ටද සෝණ පණ්ඩිතයන්ටද නමස්කාර කොට රැස්වූ පිරිස අභිමුඛව අධිකරණ රාජයන්වූ මනොජ රජ්ජුරුවන් ප්‍රධානව මේ එසියක් රජ දරුවන් හා බ්‍රහ්මණ ග්‍රහපතියන් ඇතුළුවූ මේ සියළු පර්ෂිත්ද අතිකුත් මේ වනයෙහි ඇත්තාවූ සියළු දෙවියෝද මා කියන්නක් අසත්වයි දෙවියන්ට බන්ධාඤ්ජලීව සෝණපණ්ඩිතයන් වහන්ස මම නුඹ වහන්සේට මල්ව සිටි හෙයින් දක්ෂිණ බාහුව සමානයෙමි එසේ හෙයින් මා කළ අපරාධ ක්‍ෂමා කළ මැනව බෑණන් වහන්ස විර්ය ඇති නුඹ වහන්සේ කුශලාක්‍ෂෙත්‍ර මව්පිය දෙදෙනාට උපස්ථාන කොට කුසල් රැස්කරණු කැමතිවූ මානොවැලකුව මැනව බෑණන් වහන්ස දෙමව් පියන්ට උපස්ථාන කිරීම නම් නුවණැත්තන් විසින් උතුමැයි ප්‍රතිසංසාකරණ ලද ඒ කුශලය නුඹ වහන්සේ විසින් බොහෝ දවසක් කරණලද මෙතැන් පටන් ගෙන මටත් උපස්ථාන කරන්නට අවසර දීමෙන් සුරලොව සැපමටත් බෙදාදුන මැනවැයි කියා යාච්ඤා කළාහ.

මෙ ලෙස නන්දපණ්ඩිතයන් විසින් කී කල්හි මහාබෝධිසත්වයන් වහන්සේත් මුන් විසින් කීබස් ඇමදෙනා විසින් ඇසුවා ඇත්තේවේද මුන්ගේ කීමෙන් මට පැරැත්තයට ආ හැමදෙනාම මා කියන්නක් ඇසුව මැනවැයි පර්ෂිදට අභිමුඛව මහරජ කුලයෙහි බාල වෘද්ධ දුප්පත් පොහොසත් සියළු සත්වයන්ගේ පෝෂ්‍යය එකුලයෙහි වැඩි සිටි කෙනෙකුන්ට භාර වන්නේය. මේ ලෙස නොකොට ඒ ස්වභාව ධර්මය පිරිහෙලන්නාවූ වර්ගීග ජ්‍යොෂ්ඨ සත්වතෙම නරකාදී සතර අපායට පැමිණෙන්නේය.

තවද මහරජ යම් සත්වයෙක් මව්පිය බන්ධුන් ආදී වර්ග ජ්‍යොෂ්ඨත්වයන්ට අත්පා මෙහෙවර කිරීම් ආදීන් උපස්ථාන කොට රැක්කේවිනම් එසේවූ සත්ව තෙම මරණින් මත්තෙහි නරකාදී අපායට නොගොස් සුගතියට පැමිණෙන්නේයයි වදාළහ.

තවද මහරජ මෑණියෝය පියාණෝය බූනණියෝය යන මේ සියල්ලෝම නැයෝයයි යන මේ හැමදෙනම ඒ ඒ වර්ගයාට ජ්‍යොෂ්ඨනැත්තන්ට භාර වන්නාහ යම්සේ නැවෙක්හි බොහෝ බඩු පටවාගෙන සමුද්‍රයෙහි යාත්‍රාකරණ කල බඩු හා මනුෂ්‍යයන් ඇතුළුවූ සියල්ලම නොනසා අභිමතාර්ථයට ගෙන යාම නැවියාට භාරවේද එපරිද්දෙන්ම මම මේ වංශයට ප්‍රධානයෙමි එසේ හෙයින් මව්පිය දෙදෙනාහට පෝෂ්‍ය කිරීම මට භාරයයි මම්ම රකිමියි යනාදීන් මව්පියන් රැකීමෙහි අනුසස්කීමෙන් ධර්මදේශනා කළාහ.

එබස් ඇසූ හැම රජ්ජුරුවෝම සමාධිව අභිඥානන්ධයෙන් වැහෙන ලද නුවණැස් ඇති අපි ඇම යම්සේ පර්වතාග්‍රයෙහි දීප්තිමත්වූ වහනිස්කන්ධය සියළු සතුන්ට ප්‍රකාශ කෙරේද යම්සේ උදය පර්වතයෙහි පළමු සූර්යාලෝකය ඉෂ්ටානිෂ්ටවූ සියළු වස්තූන් ප්‍රකාශකෙරේද එපරිද්දෙන් සෝණ පණ්ඩිතයන් වහන්සේගේ ධර්මශ්‍රවණය කොට ජ්‍යොෂ්ඨ පවායන ක්‍රියායෙහි ඉෂ්ට විපාක ඇත්තේයයි යනාදී මනෝජ රජ්ජුරුවන් ප්‍රධානවූ සියළු සත්වයෝ සෝණ පණ්ඩිතයන්ට ස්තුතිකොට කුල්මත් වචනයන් පැවැත්වූහ.

මෙතෙක්කල් මුළුල්ලෙහි නන්දපණ්ඩිතයන්ගේ ප්‍රාතිහාර්යය දැක උන් කෙරේ ප්‍රසන්නවූ රජ දරුවන් මෙහබෝධිසත්වයෝ තමන්ගේ නුවණ බලයෙන් තමන්ගේ වසඟයට පමුණුවාගත්සේක. එහෙයින් මුන් වහන්සේ විනා මට අන් පිළිසරණක් නැත්තේය. මුන් වහන්සේට යාච්ඤාව අවසරයක් ලදින්නම් යෙහෙකැයි සිතා දොහොත් මුදුණෙහි බැඳ බෑණන් වහන්ස මෙලෙස මා යාච්ඤා කරමින් සිටියදී නොපිළිගන්නාසේක් වී නම් නුඹ වහන්සේම මව්පිය දෙදෙනාට උපස්ථාන කළ මැනවැයි මම නුඹ වහන්සේට අත්පා මෙහෙවර කරමි සිතා කියා යාච්ඤාකළහ.

SANHIDA LANKA

මහාබෝධිසත්වයන් කෙරෙහි වෛරයක් වේෂයෙක් නැත්තේය. තවද රූක්‍ෂවූ බස් කීමෙන් මානනිග්‍රහ කෙරෙමියි කිපියාක්මෙන් පැවත නිහතමානිව මලනුවන් විසින් කියන යාච්ඤාව අසා සතුටුව ක්‍ෂමා කෙළෙමි මෙතැන්පටන් උපස්ථාන කරන්ට ලැබෙවයි යනාදීන් කියා මත්තෙහිදු ඔහුගේ ගුණ කියන්නාහු

මහාබෝධිසත්වයෝ නන්දපණ්ඩිතයෙනි තොපි ඒකාන්තයෙන් බුද්ධාදී සත්පුරුෂයන් විසින් දේශනා කරණ ලද සද්ධර්මය යහපත්කොට දන්නෙහිය එහෙයින් එහෙයින් උඩකායවාක් ප්‍රසන්නවිම්යනාදීන් නන්ද පණ්ඩිතයන් අස්වසා දෙමාපියන් දසාවට නමස්කාර කොට පින්වත්වූ නුඹ වහන්සේලාත් මා කියන්නාක් අසා වදාළ මැනව නුඹ වහන්සේලා නිසා කිසිලෙසකිනුත් මට බැරෑරුමෙක් නොවන්නේය. එතකුදු උවත් මා උපස්ථාන කරමින් සිටියදී මේ නන්ද පණ්ඩිතයෝ මෙතෙක් දෙනා පැරෑත්තයට ඇරගෙන අවුත් මට යාච්ඤාව නුඹ වහන්සේලාට උපස්ථාන කරන්නට අවසර ඉල්වති අප දෙදෙනාම නුඹ වහන්සේගේ පුත්‍රයම්හ මා විසින් තෙපි එක්කෙනෙක්ම උපස්ථාන කරවයි කිම සුදුසු නොවෙයි අප දෙදෙනාගෙන් කවුරු උපස්ථාන කරන්නට අභිප්‍රායද නන්දයෝ කවුරුන්ට උපස්තාන කෙරෙද්දැයි විචාළාහ.

එකල සෝණපණ්ඩිතයන්ගේ මෑණියෝ හුනස්නෙන් නැගී දරුව සෝණ පණ්ඩිතයෙනි තොපගේ මලනුවෝ බොහෝ දවසක් අපහැම කෙරෙන් වෙන්ව විසූය. එසේද වුවත් බොහෝ කලකින් දුටුවාවූ මුන් කෙරෙහි සෙනඟ ප්‍රකාශ කරන්ටත් තොප පිළිබඳව සිටිහෙයින් නොහැක්කෙම් ඉදින් තොපගේ අභිප්‍රායෙක් ඇත්නම් තොපගේ මලනුවන් ලාංකොටගෙන මුදුනෙහි සිඹසනහන්නා කැමැත්තෙම් කිවුය. එබස් අසා බෝධිසත්වයෝ මෑණියන් වහන්ස මා කනස්සළුවෙතියි නොසිතා නුඹ වහන්සේගේ පුතනුවන් ලංකොටගෙන සනහා සිත ඇති සෝකදුක්ඛයෙක් ඇත්නම් දුරුකළමැනවැයි කිවුය. එසඳ බෝධි සත්වයන්ගේ මෑණියෝ නන්දපණ්ඩිතයන් මහජනයා මධ්‍යයෙහි නන්ද පණ්ඩිතයන් ලංකොටගෙන දරුව සෝණපණ්ඩිතයෙනි තොපගේ මලනුවන් බොහෝ කලක් නුදුටු හෙයින් මාගේ ලය ඇසලමස මගපවනින් පහරණ ලද බෝගසක පලුපතක්මෙන් කම්පාවන්නේය යම්කලෙක්හි රාත්‍රියෙහි සීනෙනුත් මේ නන්ද පණ්ඩිතයන් අපගේ ආශ්‍රමයට ආනියාව දැක බලවත්වූ සන්තෝෂයට පැමිණිය මෝද ඒ නන්දයෝ දැන් අපගේ ආශ්‍රමයට ඒ කාන්තයෙන් ආහෙයින් අපමණ සන්තෝෂයට පැමිණියෙමි ඉදිරියෙහිත් මේ නන්දයෝ යම්ලෙසකින් වෙන්ව ගියෝ නම් සොකදුක්ඛය දියුණු වන්නේය. මොහු දැක්ම තොපටත් මටත් පියාණන් වහන්සේටත් ප්‍රියය එහෙයින් මෙවක් පටන් නන්දයෝ තොපගෙන් අවසර ලැබෙත්වයි මෙතැන්පටන් තොපි තොපගේ පියානන් වහන්සේට උපස්ථාන කරව නන්දයෝ මට පෝෂ්‍ය කෙරෙත්වයි බෝධිසත්වයන්ට යාච්ඥාකොට කීහ.

ඒ අසා සෝණ පණ්ඩිතයන් වහන්සේ මෑණියන් බස් පිළිගෙන නන්දයෙනි තොප විසින් ප්‍රධානකොට්ඨාසය ලබන ලද මව් නම් දරුවන් ප්‍රාර්ථනාකොට ඉෂ්ට දේවතාවන්ට අයදිමින් කවර ඍතුයෙහි කවරමස කවරනකතක කවරදව සේක. උපන් දරුවෝ දිගාවෙද්ද යනාදීන් නකත්මොහොත් විචාරමින් දුක් විඳිති තවද මෙලෙස සත්පුරුෂාකාරයෙහි නිරතවූ පුත්‍රලාභයට කාරණා ඇති නැත්නම් මල්වරගෙන සතරවෙනි වාරයෙහි ගර්භයාගේ පිළිසිඳිම වන්නේය. එලෙස පිහිටි ගර්භෝත්පත්තිය නිසා දොළදුක් උපදනේය. උපන් ඒ දරුදොළ නිසා සුවපත් වන්නේය. දස එකඩ මසක් මුළුල්ලෙහි එදරුගැබ උසුලමින් ගබ පෙරහර කෙරෙමින් වදා කිරිපොවමින් අත්පා කන් නාසා ඇඹීමෙන් සිරුරු පිළියම් කිරීමෙන් ශීතොෂ්ණාදී උපද්‍රව වැද්දනොදි පෝෂ්‍යය කෙරෙමින් මාත්‍රසන්නකවුවත් යම් ධනයෙක් ඇත්නම් සියල්ල ඔහු සන්තකකොට රැක්මෙන් කවාපොවා වඩා වර්ධනකොට ඉඳිම් සිටිම් ඇවිදිම් පැළඳිම් ආචාර සමාචාරයෙහි හික්මවමින් ඔහු යෞවන අවස්ථාවට පැමිණිකල්හි පරදාරාදී දෝශයෙන් විඳිනා උපද්‍රවයෙන් වලකමින් කිසියම් තැනකට ගියසඳ අවමනාකලට වෙලාවට නුදුටුහොත් අඬා දොඩා වැලප සෝකයෙන් පිඩාවිඳිමින් මේ ආදී නොයෙක් ආයාසයෙන් වඩා වර්ධනකොට දරුපෝෂ්‍යකරන්නාහුය.

මෙලෙසින් නොයෙක් දුක්ගෙන වර්ධනය කල මවුපියන්ට සත්වයෙක් අත්පා මෙවෙර කිරීමෙන් ආදී පෝෂ්‍යනොකොට අනාචාරීව පවතිද්ද එර් සත්වතෙම නරකාදි සතර අපායට යන්නේය. තවද යම් සත්වයෙක් කෘෂි වනිජ්ජාදින් ධනාර්ජනයකොට දෙමව්පියන්ට උපස්ථාන නොකෙරේද ඔහු සම්පත් වහා නැසෙන්නේය. සුගතියට නොපැමිණෙන්නේය. තවද යම් සත්වයෙක් මවුපියන්ට උපස්තාන කෙරේද එතෙම මෙලොව ජීවත්වනතෙක් සුඛිත මුදිතව සියල්ලන් විසින් නින්දා පරිභවයට නොපැමිණි සැපසේ ජීවත්ව සුගතියට පැමිණෙන්නේය. තවද නන්දයෙනි මේ ලෝකයෙහි යම් සත්වයෙක් ශ්‍රමණ බ්‍රාහ්මණ මවුපිය බෑ බුන් නැදිමයිල් මේ ආදීවූ ඒ ඒ සත්ව විශේෂයෙහි ශක්තිවූ පරිද්දෙන් බත් පිලි ආදී දිමය කන් කටලුනොවූ බසින් යුක්තව බැණ නැගීමය ඔවුන්ගේ පැමිණ ලෙඩදුක් ආදිය සියළු කාරියෙහි උපෙක්ෂානොවී බැලීමෙන් වැඩෙහි හැසිරීහය. ඒ ඒ තැන්හි වන්‍දනමානය සම්භාෂණ පෝෂණාදීවූ තමා තමාහා සමානකොට තැකීමය යන මේ සතර සංග්‍රහවස්තුවෙන් නොපවතිත්ද ඒ සත්වයාගෙන් මවුපියන්ට කිසි ප්‍රයොජනයෙක් නැත්තේය. මවු පියන් නිසා ඕහට ද වැඩක් නැත්තේය ඔහුට සුගතියාමකුත් නැත්තේය. එහෙයින් මවුපියන්ට උපස්ථාන කරන්නාවූ සත්තෙම සියල්ලවුන්ගෙන්ම මෙලොප්‍රසංසාවද පරලෝ සුගතියද ලබන්නේය.

SANHIDA LANKA

තවද නන්දයෙනි දරුවන් කෙරෙහි අනුකම්පාව ඇති මවුපියෝ ශ්‍රෙෂට හෙයින් ප්‍රධාන හෙයින් බ්‍රාහ්මයා හා සමානයයි කියාද උක්ත ප්‍රකාරහෙයින් පූර්වාචාරියයි කියාද ඉදින් දුරස්ථව උනුන් උන්තැනින් කැඳවා ගෙන්වාගෙණ කරන්නාවූ සියළු සම්භාවනාවට යොග්‍යයයි කියාද බුද්ධාදී උත්තමයන් විසින් කියන ලද ඒ කාරණයෙන් ප්‍රාඥවූ සත්වතෙමේ දෙමව්පියන් ආදීන්ට වැඳිම් පිදීම් අන්නපානාදී වස්ත්‍රාභරණාදීය දීමෙන් ඇඳ පුටු ආදීයදීමෙන් ඇඟ ඉලීම් ඉස්සේදීම් පයසේදීම් තෙල් ගැවීම් ආදී උපස්ථාන කිරීමෙන් නුවණැති සත්වයෝ කුසල් පුරාගෙන මෙලොව ප්‍රසංසාවටද පරලොව සවර්ගොත්පත්තියටද බැම්ණෙන්නේයයි යනාදීන් මහබෝධිසත්වයෝ නන්ද පණ්ඩිතයන්ට මහවෙර පෙරලන්නාක්මෙන් මහොත්සාහයෙන් ධර්මදේශනා කළහ. ඒ අසා මනෝජ රජ්ජුරුවන් ප්‍රධානවූ සියලුසත්වයෝ සාධුකාරනාද පවත්වමින් සතුටුවූහ.

එකල මහබෝධිසත්වයෝ එහි සියළු සත්වයන් පන්සිල් පිහිටුවා දානාදී සුචරිතයන් පුරා අප්‍රමාදවවයි අවවාද කොට නික්මුනාහ. එකල මනොජ රජ්ජුරුවන් ප්‍රධාන වූ සියළු රජ පිරිස දශ කුශල ධර්මයෙන් පිහිටා සොණ පණ්ඩිතයන්ගේ අවවාද අනුශාසනා වූ පරිද්දෙන් දිවි පමණින් වාසය කොට මරණින් මත්තෙහි ස්වර්ග පද ප්‍රාප්ත වූහ.

සෝණ නන්ද පණ්ඩිතදෙන ජිවිතාන්තය දක්වා දෙමව්පියන්ට උපස්ථාන කොට ජිවිතාන්තයෙහි බ්‍රහ්මලෝකයෙහි ගොස් උපන්නාහුයයි තිලොගුරු බුදුරජානන් වහන්සේ අතීත කථාව ගෙනහැර දක්වා දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ ඒ භික්ෂූන් වහන්සේ ප්‍රධාන වු සිව්වනක් පර්ෂිද්ට ධර්මදේශනාකොට මේ සෝණ නන්ද ජාතකය නිමවා වදාළ සේක. .

එකල්හි මව්පියන්ට උපස්ථාන කල භික්ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි සිහිටිසේක. එකල්හි මව්පියෝ දෙදෙන දැන්මේ සුද්ධෝදන රජ්ජුරුවන් හා මහා මායා දෙව්වුහ. නන්ද පණ්ඩිතයෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. මනෝජ රජ්ජුරුවෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය. සියක් රජ දරුවෝ නම් අසූමහසව්වන් හා අවශේෂ ස්ථවිරයෝය. සූවිසි අක්‍ෂොභිණියක් සේනාව දැන් බුදු පිරිස් වුහ. එසමයෙහි සෝණ පණ්ඩිතයෝ නම් දැන් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# චුල්ලහංස ජාතකය

තවද ජාති කාන්තාරාදීන් සත්වයන් තාරණයකොට නිර්වාණ ක්ෂෙමභූමියට පමුණුවන හෙයින් ශස්ත්‍රූනම්වූ ත්‍රිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සේක් ආයුෂ්මත්වූ අනදමහතෙරුන් වහන්සේ විසින් සර්වඥයන් වහන්සේ උදෙසා කරණ ලද ජීවිත පරිත්‍යාගය අරභයා මේ චුල්ලහංස ජාතක ධර්මදේශනාව වදාළසේක.

දෙව්දත්තෙරහු විසින් සර්වඥයන් නසන පිණිස මෙහෙයන ලද්දාවූ දුනුවායන්ගෙන් පළමුගිය තැනැත්තවූ අවුත් මහානුභාව සම්පන්නවූ ලෝකාග්‍ර ප්‍රාප්ත ශාක්‍යරාජවංශ ප්‍රසූත ඒ බුදුන් විෂයෙහි අපරාධයක් කරන්නා තබා කිපි සිතින් ආසන්නයට වැද්දත් නොහැක්කැයි යනාදීන් කීසඳ ඒ අසා දෙවදත්ත ස්ථවිරයෝ තොපට බැරිවී නම් මම්ම ඊට උපායක් කෙරෙමියි සිතා එතැන් පටන් උත්සාහකෙරෙමින් එක් දවසක් බුදුරාජනන් වහන්සේ ගිජ්ඣකූට පර්වත ප්‍රාන්තවූ පච්ඡිමඡායාවෙහි සක්මන් කෙරෙමින් වැඩ සිටි නියාව දැක පර්වත මස්තකයට පැන නැගී සක්මන් කරණ සර්වඥයන් මස්තකයෙහි ගල් කුළක් පෙරලා ජීවිතක්ෂයට පමුණුවාලමියි සිතා මහත් වටකුළුගලක් රුකුලක් දක්වා දණ්ඩකින් පෙරලා එළුවාහුය. එසඳ භූමියෙන් ගල්පර්වත දෙකක් පැන නැගී එගල පිළිගත්තේය. එසඳ ඉන් ගල්පැහැල්ලෙක් ඉපිරගොස් සර්වඥයන් වහන්සේගේ ශ්‍රී පාදයෙහි වැටි පිටිපත්ලෙහි ලේ ඉපදවා මහත්වූ වේදනාවට පමුණුවාලූයේය. එකල ජීවකයෝ සර්වඥයන් වහන්සේ ශ්‍රී පාද බලවත්වේදනා ඇති නියා අසා සැත්කම්කොට දෝෂහැර ඖෂධයෙන් සමනය කළාහුය.

ඉක්බිති සර්වඥයන් වහන්සේ පළමු පරිද්දෙන් භික්ෂු සංඝයා පිරිවරා මහත්වූ සර්වඥ විලාසයෙන් පැලඹෙන්නාද දැක දේවදත්ත ස්ථවිරයෝ මහානුභාව සම්පන්නවූ මේ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ රූපශ්‍රීවිභූති දැක කවුරුන් කිසි උපද්‍රවයක් කොටගත නොහී එති රජ්ජුරුවන්ගේ නාලාගිරි නම් ඇත්තෙම ඉතාම චණ්ඩය පරුෂය කර්කශය තුනුරුවන්හි ගුණ නොදන්නා ඒ ඇතා ලවා ජීවිතක්ෂයට පමුණුවාලමියි සිතා එපවත් අජාසත් රජ්ජුරුවන්ට කියා ගිවිස්සවූහ. එකල රජ්ජුරුවෝ ඇත්ගොව්වන් කැඳවා ගෙන්වාගෙන සබඳ සෙට දවස් නාලාගිරියා රාපොව ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ වඩනා වීථියෙහි ඇරපියවයි නියෝග කළහ.

එසඳ දේවදත්ත ස්ථවිරයෝ මෙතෙක් දවස් රා කී කලයක් බෝද්දැයි විචාරා අටකලයකැයි යනු අසා සෙට දවස සොළොස් කළයක් රාපොවා ඇත් කොල් සෙණ්ඩුආදීන් ඇන කුප්පා බුදුන් පිළිපන් වීථිය අභිමුඛයට මෙහෙයාලව රජ්ජුරුවන්ට කියා තොප කැමති ස්ථානාන්තරයකට පමුණුවාලන්ට නිසෙසමියි ඇත්තලයන්ට සම්මත කළහ.

ඒ කථාව සියළු නුවර ප්‍රකාශවුයේය. එකල තුනුරුවන් කෙරෙහි මමත්වය ඇති උපාසකවරුහු බුදුන් කරා එළඹ ස්වාමින් දේවදත්ත ස්ථවිරයෝ අජාසත් රජ්ජුරුවන් හා එක්ව සෙට නුඹ වහන්සේ සිගා වඩනා විථියෙහි නාලාගිරි ඇතු අරවති එහෙයින් පාන්වූ දවස් සිගානොවැඩ විහාරයෙහිම වැඩහුන මැනව අප ඇම බුදු පාමොක් භික්ෂු සංඝයා වහන්සේට අහර විහාරයටම ගෙනවුත් දෙම්හයි ආරාධනා කළාහ.

එකල සර්වඥයන් වහන්සේ යහපත සිගානොයම්හයි නොවරදවා බුද්ධඥානයෙන් බලනසේක් මම සෙට නාලාගිරියා දමනයෙහිලීමෙන් ප්‍රාතිහාර්ය කොට තීර්ථකයන්ගේ මන්බිඳ රජගහ නුවර නොසිගාම භික්ෂූ සංඝයා විසින් පිරිවරණ ලදුව වෙළුවනාරාමයටම එම් රජගහ නුවර වාසී උපාසකවරහු බොහෝ බත් බඳුන් ගෙන්වාගෙන වෙළුවනාරාමයටම එති සෙට දවස් විහාර යෙදීම වැළඳීම වන්නේයයි සිතා වදාරා මේ කාරණය හේතුකොටගෙන උපාසකවරුන් කළ ආරාධනාව මුවෙන් නොබිණිමෙන් ඉවසා වදාළසේක. උපාසකවරුන් ආරාධනාව බුදුන් ඉවසූ නියාව දැන සෙට දවස් වැළඳීමට විහාරයට දන් ගෙන්වාගෙණ එම්හයි බුදුන් වැඳ අවසරගෙන නික්මුණාහ.

ඉක්බිති සර්වඥයන් වහන්සේ පෙරයම් දසපැයතෙක්ම භික්ෂූ භික්ෂූණී උපාසක උපාසිකායයි යන සිව්වනක් පර්ෂද්ට අභිප්‍රානුකූලවූ ධර්මදේශනා කොට මැදිවියම් දසපැයෙදී දිව්‍ය බ්‍රහ්මාදී දෙවියන්ගේ ප්‍රශ්න විසර්ජනය කිරීමෙන් බණ වදාරා අලුයම් දස පැය පළමුවන කොට්ඨාශය සිංහසෙය්‍යාවෙන් සැතපී වැඩ හිඳ දෙවෙනි කොටස ඵලසමාපත්තියෙන් වැස තුන්වෙනි කොට්ඨාශයෙහි මහා කරුණා සමාපත්තියට සම වැද සමාපත්තියෙන් නැගී මාගෙන් බණ අසා මාර්ග ඵලයට පැමිණෙන්ට නිස්සෝ කවුරුදෝහොයි වෛනෙයජන බන්ධූන් බලාවදාළ සේක් නාලාගිරි දමනය නිසා සුවාසූ දහසක් සත්වයෝ නිවන් දක්නාහුයයි දැක ඒ රාත්‍රිය ඉකුත්ව අරුණු නැගි කල්හි සිරුරු පිළිදැගුම්කොට ආයුෂ්මත් වූ අනද මහ තෙරුන් වහන්සේට නියෝග කොට රජගහ නුවර අටළොස් විහාරයෙහි වසන ඇම භික්ෂූන් රැස්කරවා භික්ෂූ සංඝයා වහන්සේ පිරිවරා සර්වඥ රාජොත්තමයන් වහන්සේ එදවස් රජගහනුවරට වන්සේක. එකල ඇත් ගොව්වොත් අජාසත් රජ්ජුරුවන් හා දෙව්දත් මහතෙරුන් වහන්සේ කී සැටියේ ඇතා රා පොවා කොල් ආදියෙන් ඇණ කුප්පවා බුදුන් වඩනා

SANHIDA LANKA

ඉදිරියට ඇරපූහ.

එකල්හි ශ්‍රද්ධා සම්පන්න බෞද්ධයෝ අද දවස් බුද්ධහස්ති රාජයා හා තිරශ්චීන හස්තිහුගේ යුද්ධයක් වන්නේල අනෝපම වූ බුද්ධානුභාවයෙන් කරන්නාවූ නාලාගිරි දමනය බලම්හයි සතුටුව මතුමහල් සඳළුගෙපල ආදියට නැගී බෝ දෙන රැස්ව සිටියාහුය.

තුනුරුවන් කෙරෙහි අග්‍රඩවූ මිත්‍යාදෘෂ්ටි ඇති සත්වයෝ නාලාගිරි ඇත් චණ්ඩය පරුෂය බුද්ධාදී උත්තමයන්ගේ ගුණයක් නොදන්නේය. එහෙයින් ඒ ඇත් ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ රන්වන්වූ රූපය කඩා සුණු විසිණු කොට ජීවිත විනාශයට පමුණුවන්නේය. අදසතුරු පිටුදකුම්හයි සඳළු ආදියෙහි බොහෝදෙන රැස්ව සිටියාහුය. මේ නියායෙන් රැස්වූ බොහෝ සමාගමය ඇති කල්හි නාලාගිරි හස්ති අභිමුඛව වඩනාවූ සර්වඥයන් වහන්සේ දැක කෝපයෙන් දිලිහි මනුෂ්‍යයන් භයගන්වමින් ගෙවල් විදාදමමින් ගැල් කඩා වඩා දමමින් සොඬ ඔසවා කන්තල හා වාලාදිය කෙලින් ඉඳුවාගෙන ප්‍රලායකාල ප්‍රවෘත්ති ප්‍රචණ්ඩ මාරුතයෙන් මුලින් උපුටාගෙන යන ලද පර්වතයක් පරිද්දෙන් මිරිකාගෙන බුදුන්ගේ ඉදිරියට දිවමින් ආයේය. මෙලෙසින් එන්නාවූ ඔහු දැක සැරියුත් මුගලන් ඉදිරියට දිවමින් ආයේය. මෙලෙසින් එන්නාවූ ඔහු දැක සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේ ප්‍රධානවූ අසූමහසව්වන් වහන්සේ ස්වාමිනි මනුෂ්‍ය ඝාතක චණ්ඩපුරුෂවූ නාලාගිරි හස්තියා මේ විථියට පැමිණියේය. එතෙම බුද්ධාදීන්ගේ ගුණයක් නොදන්නේය. එසේ හෙයින් භාග්‍යවත්වූ සර්වඥයන් වහන්ස සුගතවූ සර්වඥයන් වහන්ස ඉවත්ව වැඩ සිටිය මැනව අපි ඇම ඒ ඇත්හු දමනයෙහිලන්ට සමර්ථයම්හයි වෙන වෙනම බල කියා යාච්ඤාකළසේක. එකල බුදුහු මහණෙනි තෙපි භයනොගනුව. කෙළදහසක් ඇතුන්ට බල ඇති මම එකී නාලාගිරියා පමණක් සරුකෙරෙම්දැයි වදාරා ඉදිරිවඩනාසේක. එකල්හි සසර බොහෝ කලක් හිත විශ්වාසව කුශල්කොට වඩනා ලද මෛත්‍රී සිත් ඇති අනඳ මහතෙරුන් වහන්සේ ස්වාමිනි පියන්හට පැමිණිකාරියක් ප්‍රධාන පුත්‍රයාට භාර වන්නේය. එහෙයින් මම ඔහු දමනයෙහිලම් වැඩ සිටිය මැනවැයි ආරාධනා කළසේක. එකල්හි බුදුහු සාරිපුත්‍ර ස්ථවිරාදීවූ අසූමහසව්වන් වහන්සේට වෙන වෙනම ආමන්ත්‍රණය කොට එඹා මහණෙනි බුදුන් බල නම් අනෙකක එහෙයින් තොප ඇම සිටුවයි වෙන වෙනම කියා හැමදෙනා වහන්සේම නැවතූ සේක. එකල්හි අනඳ මහ තෙරුන් වහන්සේ බුදුන් කෙරෙහි බලවත්වූ සෙනහයෙන් ඉවත සිටියනොහි මේ හස්තියා පළමුකොට මාමරාවයි බුදුන් පිණිස ජීවිත පරිත්‍යාගකොට ගොස් ඉදිරියෙහි සිටිසේක. එකල බුදුහු ආනන්දයෙනි ඉවත්ව ඉදිරියෙහි නොසිටුවයි වදාළසේක. දෙවෙනිවත් අනඳ මහතෙරුන් වහන්සේ මේ ඇත් මිනීමරණ චණ්ඩපරුෂය කෝපයෙන් දිලිහි ප්‍රලායනලවේගයෙන් එන්නේය. පළමුකොට මා මරා පසුව නුඹ වහන්සේ කරා එවයි කියා යාච්ඤාකොට කියා ඉදිරියෙහි සිටිසේක. තුන්වෙනිවත් පහවව ආනන්දයෙනි ඒ ඇතු දමනයෙහිලීම අපට භාරයයි වදාළදීත් සෙනගබන්ධනයෙන් බැඳි ඉවත්ව යා නොහි සිටිනා හෙයින් බුදුන්ගේ ඍඛ්‍යනුභාවයෙන් අනඳ මහතෙරුන් වහන්සේ වැඩ සිටි භූමිය කුඹල් සකක් මෙන් කරකැවි පසුව ගොස් භික්ෂූන් වහන්සේ මධ්‍යයෙහි සිටුවාලූ කල්හි එකල්හි එක් ස්ත්‍රියක් නාලාගිරියා දැක මරණ භයින් භීතව දිවන්නී උකුලෙහි උන් දරුවන් ඇතුටත් සර්වඥයන් වහන්සේටත් අතුරේ දමාගියාය. ඒ ලුහුබැඳගෙනගිය ඇත් දරුවන් දැක කරකැවි ආයේය. එකල ඒ කුමරුවා ඇතු තමාලගට එන්නා දැක මහ හඬින් අඬන්ට පටන්ගත්තේය.

එසඳ සර්වඥයන් වහන්සේ පඤ්ච මහා ගංගා ප්‍රවාහය එක් මුවදොරකින් සමුද්‍රයට වදනාකලක් පරිද්දෙන් සියලු සත්වයා කෙරෙහි පවත්නාවූ මෛත්‍රිය ස්වර ඝෝෂය පවත්වා එඹල නාලාගිරිය තා සොළොස් කලයක් රාපොවා මත් කරවන්නාවූ අනෙකක්හු පිණිස කළානොවෙයි මා පිණිස කළාහුය. එහෙයින් තෝ නිස්කාරණයේ ඇත මැත දිවපැන කකුල්වලට ආයාසනොකොට මෙහි එවයි වදාළසේක. එකල නාලාගිරිතෙම සර්වඥයන්ගේ මධුරස්වර අසා දැස දල්වා බුදුරජානන් වහන්සේ චංත්‍රිංශත්වය මහාපුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනුව්‍යජනබ්‍යාමප්‍රභා කේතුමාලාලංකාරයෙන් සමලංකෘතවූ ශාන්ත දාන්ත රූපශ්‍රිවිභූතිය දැක බුද්ධානුභාවයෙන් දිවෞෂධස්පර්ෂයෙන් සංහිඳුවන ලද විෂ තේජස් ඇති නාගරාජයකු පරිද්දෙන් මද පරිශේෂව භයට පැමිණ කළසේ වැරුද්දැයි කලකිරී සොඬ බිමඑලා කන්තල නොසොල්වමින් අවුත් සර්වඥයන් වහන්සේගේ ශ්‍රී පාද යුගලයෙහි වැතිරගියේය.

එකල්හි සර්වඥයන් වහන්සේ දක්ෂිණ ශ්‍රී හස්තය දික්කොට කුම්භස්ථලය පිරිමදිමින් නාලාගිරිය තෝතිරශ්චීන හස්තිය ය මම බුද්ධාවාරණයෙමි එහෙයින් මෙතැන් පටන් තද පරුෂනොවව සත්වයන් කෙරෙහි මෙත්සිත් පතුරුව එඹල නාලාගිරිය බුද්ධාවරණවූ සර්වඥයන්ට පිඩානොකර සර්වඥයන් විෂයෙහි අපරාධ කිරීම අපායදුක්ඛයට කාරණ වන්නේය. සර්වඥයන් කෙරෙහි අපරාධ කළාහට ඒකාන්තයෙන් සුගතිගමනෙක් නැත්තේය. තෝ මෙතැන් පටන් සුරාමදයෙන් මත්ව ප්‍රමාදවශයෙහි යෙදී ප්‍රාණඝාතාදී අකුසල් නොකර ප්‍රමාදවශයෙන් යුක්තවූ සත්වයෝ සම්පකාම ස්වර්ගීයටත් නොයන්නාහුය තොප වනාහි එලෙස මාගේ අවවාද අනුශාසනායෙහි පිහිටා පරහිංසා පරපීඩාදියක් නොකොට දිව්‍ය මනුෂ්‍ය සංඛ්‍යාත සප්තකාම ස්වර්ගයෙහි

SANHIDA LANKA

ඉපද සැපවිඳ සංසාර සාගරයෙන් ගොඩ නැගෙවයි යනාදීන් ධර්මදේශනා කළසේක.

එකල මධුර වූ ධර්මදේශනාව අසා නාලාගිරිහුගේ සකල ශරීරය පස්වනක් ප්‍රීතින් පිනාගොස් ඉදින් ඒ ඇත් තිරිසන් ජාතියෙහි නොසිටි එකෙක් වී නම් සෝවාන් ඵලයට පැමිණෙන්නේය. මෙලෙසින් සර්වඥගන්ධහස්තී රාජයානන් වහන්සේ නාලාගිරි නම් තිරශ්චින හස්තිහු රැස්වූ සියලුසත්වයන්ගේ සාධුකාර නාද ශතසහශ්‍රයෙන් සියළු නුවර සතුටු කරවමින් දමනයෙහිලා පන්සිල්දී ධර්මදේශනාවසානයෙහි සුවාසුදහසක් සත්වයන් අමාමහ නිවන් දක්වා වදාළ සේක.

එතනට රැස්වූ එනුවර වාසී රජ යුවරජ ඇමති යෝද අන්‍යාවූ බොහෝ සත්වයෝම කුට කටකාභාර කෙයුරවලයාදී අනෙකප්‍රකාර ආභරණාදියෙන් බුදුන්ට පූජාකළහ. ඒ ආභරණ රාසියෙන් ඒ ඇත් සැඟවී ගියේය. එතැන් පටන් ඒ ධනරාසියෙන් පරික්ෂිප්තහෙයින් ඒ ඇත් ධනපාලය නමින් ප්‍රසිද්ධ විය.

ඒ ඇත් සදාචාර සුක්ෂිත ශ්‍රද්ධා බුද්ධිසම්පන්න උදියෙකු පරිද්දෙන් සර්වඥ රාජෝත්තමයානන් වහන්සේගේ ශ්‍රී පාද ධූලීන් ගුණාංග්‍රයෙන් හැරගෙන තමා හිස මුදුනෙහි තවරමින් චක්‍රවර්තී රජක් සමීපයට පැමිණ චණ්ඩාලයකු පරිද්දෙන් වාලධියෙන් කැසපටගන්වමින් සොඬි අකුලවාගෙන සර්වඥයන් දිසාවට අවනතව ඇකිලෙමින් පිටින් සෙමෙන් පසුබැස ගොසින් ඇස් අමුයෙහි සිට බුදුන්ට නමස්කාර කොට තමාගේ ඇත්හලට නැගීගියේය.

එතැන් පටන් ශාන්ත දාන්තව කිසිවක්හට කිසි පීඩාවක් නොකරන්නේය. සර්වඥරාජයානන් වහන්සේත් සිඟා වැඩි කාරිය සම්පාදනයකොට පූජා පිණිස දමන ලද ධනරාසිය ඔවුනොවුන්ටම වේවයි ඉටාගෙන අද මා විසින් බොහෝ ප්‍රාතිහාර්ය කරණ ලද එහෙයින් අද දවස් මෙනුවර සිඟිම් සුදුසු නොවන්නේයයි සිතා කුල්මත්ව සතුටින් රැස්වූ තීර්ථකයන් මුහුණ දොම්නස් දැලිගාමින් මානමදනයකොට ශාරිපුත්‍ර මහාමෞද්ගල්‍යාන මහා කාශ්‍යපස්ථවිර ප්‍රමුඛ ප්‍රවර නෛකභික්ෂු සංඝයා පරිවෘතව සංග්‍රාමභූමියෙහි විජය ශ්‍රිකාන්තාව විසින් වලඳනා ලදුව සෝභමානවූ රාජොත්තමයක්හු පරිද්දෙන් අනොපමවූ බුද්ධ ශ්‍රී විලාශයෙන් විරාජ මානව සියළු සත්වයන්ගේ සිත් සතුටුකරමින් සවණක් ඝන බුදුරැස් විහිදුවමින් කුලගිරි පරම්පරායෙන් පරික්ෂිප්තව ගමන්ගත් මෙරු පර්වත විලාශයෙන් වෙළුවනාරාමයට වැඩ වදාළසේක.

නුවර වැසි උපාසකයෝ බද්‍ය භෝජ්‍යාදී මධුර අන්නපාණ ඇරගෙන විහාරයට ගොස් බුදුපාමොක් මහා සංඝයාවහන්සේට මහදන් පැවැත්වූහ. එදවස් පසුබත්වෙලෙහි ධම්සභා මණ්ඩපයට රැස්වූ ශාරිපුත්ත ස්ථවිර ප්‍රමුඛ ප්‍රවර භික්ෂු සංඝයාවහන්සේ ඇවැත්නි අද දවස් රාබී ත්‍රිමදගලිතව අට්ටාල වෙට්ට නම් පවුරු පදනම් වාසල් ඵලමින් සියලු සත්වයන් හයින් පලවමින් මූර්තිමත්වූ මාත්‍යුහු පරිද්දෙන් බුදුන් කරා එන්නාවූ නාලාගිරිහු දැක සර්වඥයන් විසින් ආනන්දයෙනි ඉවත්වයි තුන්යලක් වදාරණ ලදුවත් ඉවතනොවී ඉදිරියෙහි සිට බුදුන් උදෙසා ජිවිත පරිත්‍යාග කෙරෙමින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් විසින් ඉතා දුෂ්කර ක්‍රියාවක් කරන ලද යනාදීන් අනද මහතෙරුන් වහන්සේගේ ගුණ කථනය කෙරෙමින් වැඩ හුන්සේක.

එකල ගඳ කිළියෙහි සැතපුණාවූ සර්වඥයන් වහන්සේ ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ භික්ෂූහු ආනන්ද ස්ථවිරයන්ගේ ගුණ කථනය කෙරෙති මා විසින් එතනට යා යුතුයයි සිතා වදාරා රත්ගල් ගුහාවකින් නික්මුණු කේසර සිංහරාජයකු පරිද්දෙන් ගඳකිළියෙන් නික්ම තුන්තරාගමනිින් එක්තරා ගමනකින් ධම්සභා මණ්ඩපයට වැඩ පනවන ලද බුද්ධාසන මස්තකයෙහි යුගදුරු මුදුනෙහි දිලියෙන්නාවූ හිරු මඬලක් පරිද්දෙන් සවණක් ඝන බුදුරැස් විහිදුවමින් වැඩ හිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා භාග්‍යවතුන් වහන්ස අනික් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. ආනන්ද ස්ථවිරයන් විසින් බුදුන් උදෙසා කරණ ලද ජිවිත පරිත්‍යාග ප්‍රශංසා කරමින් උනුම්හයි දැන්වූ සඳ මහණෙනි මේ ආනන්ද ස්ථවිරයෝ දැන් මතු මා නිසා ජිවිත පරිත්‍යාග කළාහු නොවෙති යටගිය දවස තිරිසන් යෝනියෙහි උපන්නාහුත් මා නිසා ජිවිත පරිත්‍යාග කළාහු නොවෙති යටගිය දවස තිරිසන් යෝනියෙහි උපන්නාහුත් මා නිසා ජිවිත පරිත්‍යාග කළෝවේදැයි වදාරා ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ හිමගර්භයක් පලා චන්ද්‍රබිම්ඹයක් මැත්කොට දක්වන්නාක්මෙන් ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස මහිසනම් රට සකුල නම් නුවර සකුල නම් රජ්ජුරුකෙනෙක් දානාර්ථ ප්‍රිය වචන සමානාත්මතා යන සතර සංග්‍රහ වස්තුවෙන් ජනරංඤ්ජනය කෙරෙමින් රාජ්ජය කරන්නාහුය. එසමයෙහි පුරන ලද බෝධි සම්භාර ඇති අප මහා බෝසතානෝ ධ්‍රෑතරාෂ්ට්‍ර හංස රාජාන්ව එකුලයෙහි උපන්නාහුය, එකල එනුවරට නුදුරුවූ එක් වැදි ගමෙක්හි එක්තරා වැදිපුත්‍රයෙක් මල අටවා පක්ෂින් නුවරට ගෙනගොස් විකුණමින් ජිවකාව කරන්නේය. එනුවරට නුදුරු තෙනෙක්හි වටින් දොළොස් යොත්නෙක් පමණ ඇති සිතලාමල ජලහරිත පස්පියුමෙන් සැදුනු හංස චක්‍රවාකසාර සකාරණ්ඩවාදීවූ නොයෙක් පක්ෂිය සමූහයාට වාසස්ථානවූ මානස නම් වූ විලෙක් ඇත්තේය. ඒ විල්හි ඒ වැදි පුත්‍රතෙම සාමාන්‍යයෙන් පක්ෂින්ට මල ඇටවිය. එකල ඒ

SANHIDA LANKA

ධෘතරාෂ්ට්‍ර නම් හංස රජ්ජුරුවෝ සුමුඛ නම් සෙනෙවිරත් රජුන් ප්‍රධානවූ සයානූදහසක් හංස ශ්‍රේණීන් විසින් පිරිවරණලදුව චිත්‍රකූට පර්වතයෙහි රන්ගල් ගුහාවෙක වසන්නාහුය, ඉක්බිති එක් දවසක් හංස සමූහයෙන් හංසයෝ කීපදෙනෙක් ගෝචරග්‍රහණය පිණිස ඒ ඒ තැන ඇවිදිනාහුය. බොහෝවූ ගොදුරු ඇති ඒ මානස නම් විලට පැමිණ සිත්වූ පරිද්දෙන් ගොදුරු අනුභව කොට පිරුණාවූ චිත්‍රකූට පර්වතයට ගොස් ධෘතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන් දැක දෙවයන් වහන්ස මනුෂ්‍ය පථයෙහි අනෙක ප්‍රකාරවූ ගොදුරු ඇති මානස නම් විලෙක් ඇත්තේය. එහි ගොදුරු අනුභව කරන්ට යම්හයි කීහ.

එබස් අසා බෝධිසත්වයෝ එම්බා හංසයෙනි මනුෂ්‍ය පථය නම් ඉතා භය සහිතය. සැකකටයුතුය. ඒ නොකමැත්තේයයි වලකාත් නැවත නැවත කියන ලදුව ඉදින් තොපහැමට අභිප්‍රාය වී නම් යම්හයි ගිවිස පිරිවර හා සමග ඒ විලට ආකාශයෙන් බස්නාහු පය මලෙහිම එලාගෙන බටුවාහුය එකල බෝධිසත්වයන්ගේ පය යපටකින් මැසුකලක් පරිද්දෙන් ඇසිර ගියේය. ඉක්බිති මල කඩා ගනිම්යි සිතා ඇදි ඇදි සේ පළමුකොට කකුලේ සම් කැඩී ගියේය. දෙවෙනිව මස් ඇට කැඩී ඇටයෙහි ඇසිර සිට ලේ වැහෙන්නට පටන්ගෙන බලවත්වූ දුක්ඛවේදනා පැවැත්තේය. එකල බෝධිසත්වයෝ ඉදින් මම බැගෑපත්ව ඇඬීම් නම් මාගේ බන්ධූහු භයපත්ව ගොදුරු නොකා දුකින් පැලියන්නාහු දුර්වලව සමුද්‍රයෙහි වැටී යන්නාහයි බන්ධූන් කෙරෙහි කරුණාවෙන් දුක්ඛයෙන් වෙදනාව ඉවසා හංස සමූහයා කැමති පරිද්දෙන් කා බී කෙළින්ට පටන්ගත් කල්හි බෝධිසත්වයෝ බඩරාවයෙන් මහහඬින් හැඬූහ. ඒ අසා හංස සමූහයෝ මරණ භයින් තැතිගෙන තුන් මුලක්ව බෙදී චිත්‍රකූට පර්වතයට යන්නා ගියාහුය.

මෙසේ ඒ හංසයන් නික්මුණුකල්හි සුමුඛ නම් හංස සේනාධිපති කිමෙක්දොහෝයි මේ භය හංස රජ්ජුරුවහන්සේට පැමිණියේවනැයි පරීක්ෂාකෙරෙම්හයි වේගයෙන් ගොස් පළමුවෙන් යන්නාවූ හංස සමූහයා අතුරෙහිද මධ්‍යයෙහි යන්නාවූ හංස සමූහයා මුළුල්ලෙහිද ඇමට පස්සේ නික්මුනාවූ හංස සමූහයා මුළුලෙහිත් බෝධිසත්වයන් නොදැක ඒකාන්තයෙන් මේ භය හංස රජ්ජුරුවන්ට පැමිණිවනැයි ශොකයෙන් පීඩිතව නැවත ආපස්සේ විලට එන්නාහු පය බැඳි ගොස් ලෝභයෙන් වැකි ගියාහු සිරුරු ඇතිව දුක්ඛයෙන් පීඩිතව මඩමත්තේ වැදහොත් මහා බෝධිසත්වයන් දුරදීම දැක මහරජ භයනොගත මැනව මම මාගේ ජීවිතය දීපියා නමුත් නුඹ වහන්සේ මලින්ගලවාලම්යි අස්වසා කියමින් සමීපයට බැස මඩමත්තේ වැඩ උන්හ. එකල සෙනවිරත් රජුගේ සිත් පරීක්ෂා කරන්නාවූ මහබෝධිසත්වයෝ සුමුඛ නම් සෙනෙවිරදිනි. මාගේ බන්ධූහු මේ අනූදහසක් පමණ හංසයෝ මා පාසබන්ධනයට අසුව මේසා දුකක් විඳිමින් සිටියදී කින්ද කුමනදැයි යන බසක් විචරකුත් නොකියා අභිප්‍රායානුකූලවූ පරිද්දෙන් නික්මුණාහ. පාස වසගවූ මා කිසි උපායකින් ගලවාගන්නෝ නිසි වුව එසේහෙයින් කිසි සැපයක් නොකොට තොපිත් නොරදා පලායවයි කීහ.

එකල්හි හංස සෙනාධිපති දේවයන් වහන්ස නුඹ වහන්සේ හැර මෙතනින් මම ගියෙම් නමුත් නොගියෙම් නමුත් මියෙන්නෙම් වෙම් සුවපත්වූ නුඹ වහන්සේට සේවයකොට දුකට පැමිණ වෙලෙහි ඇරපියා ඒකාන්තයෙන් නොයම්. නුඹ වහන්සේ මරණපාසයෙන් බැඳුනුසේක. මම සෙනෙහපාසයෙන් බැඳි ගියෙම්.

එහෙයින් මියතත් එක්වමය ගැළවියතත් නුඹ වහන්සේ හා එක්ව යෙම්යි ඉදින් ඇරපියා ගොස් මාගේ ජීවත්විමට වඩා නුඹ වහන්සේ හා එක්ව යෙම්යි ඉදින් ඇරපියා ගොස් මාගේ ජීවත්විමට වඩා නුඹ වහන්සේ හා එක්ව රඳා මියයාම උතුම්වන්නේය. හංසරජ්ජුරුවන් වහන්ස මෙබඳුවූ දුකකට පැමිණ නුඹ වහන්සේ ඇරපියා යාම අප වැන්නවුන්ට තරම්නොවෙයි එහෙයින් නුඹ වහන්සේට යමක් පැමිණියේ වී නම් මමත් ඒ විඳිනා කැමැත්තෙම් යනාදීන් තමන්ගේ දෘඪමිත්‍රත්වය බෝධිසත්වයන්ට ප්‍රකාශකොට කිවුය.

එකල බෝධිසත්වයෝ එම්බා සුමුඛයෙනි තොප එලෙස කියන්ට කාරණා කිම්ද මලින් බැඳි සතුරන් අතට පැමිණියාහට මුළුතැන්ගෙට පැමිණිම විනා අන්සරණෙක් කොයින්ද එබඳු මරණ දුක්ඛයෙන් සතුරන් අතින් ගැලවී සිටියාවූ විශිෂ්ටවූ නුවණ ඇති තොපට කුමකැයි රුස්නේද තවද සුමුඛයෙනි අප ගේ ඥාති වර්ගයාටද ඇසුරුකළ අවශේෂ පක්ෂීන්ටත් කවර වැඩෙක් කවර ප්‍රතිෂ්ඨාවෙක් දක්නෙහිද තවද රන්වන්වූ උභයපක්ෂයක් ඇති සුමුඛයෙනි මලෙහි බැඳි ජීවිතක්ෂයට පැමිණෙන්ට සිටි මා නිසා තොපගේ ජීවිතය පරිත්‍යාග කිරීම අඳුරුගෙයෙක්හි අන්ධයක්හු කළ දෙයක් මෙන් කවර අර්ථසිද්ධියක් දැක මරණ කැමැත්තෙහිදැයි කීහ.

SANHIDA LANKA

එකල හංස සේනාධිපති මහාබෝධිසත්වයන්ට පක්ෂිරාජයාණන් වහන්ස සත්පුරුෂ ධර්මයෙහි ප්‍රයෝජන කුමක් නිසා නොසලකනසේක්ද පුදන ලද්දාවූ ගුණධර්මය සත්වයන්ට ලෞකිකලෝකෝත්තරවූ අභිවෘද්ධිය දෙන්නේය. එහෙයින් මා විසින් පුදන ලද ගුණ ධර්මයෙන් මෙලෝ පරලෝ දෙකින් මටවන වැඩ හා නුඹ වහන්සේ කෙරෙහි සෙනහ පක්ෂපාතයක්ද දක්නෙම් ජීවිත විනාශයෙහි සැකයක් නැත්තෙම්යි කීහ.

ඒ අසා මහාබෝධිසත්වයෝ එම්බා සුමුඛයෙනි යම් මිත්‍රයෙක් තමාගේ මිත්‍රයාට දුකක් පැමිණකල්හි එදුකෙහි අත්නොහැර එක්ව විඳුනේ වී නම් එසේ කිරීම ඒකාන්තයෙන් බුද්ධ බෝධිසත්වාදී උත්තමයන්ගේ ස්වභාව

ගුණයෙක තොප විසින් උත්තමයන් ගුණධර්මයන් පුරණලද මා කෙරේ සෙනහ ඇති නියාව විශේෂයෙන් දනිමියි මෙමල එබූ වැදීමට කැමැත්තක් කෙරේවයි තොප විසින් කී බස මා නිසා ජීවිතය දුන් නියාවම ඉතිකින් නික්මෙවයි. අනුදත් වේලෙහි පටන් නොරඳානික්මෙව තවද මෙබඳු දුක්ඛයට පැමිණියෙහින් මාගේ බන්ධුවර්ගයෙහි ඇත්තන්ට යම් අඩුයෙක් පෙනුනේවිනම් ප්‍රඥා ගුණ ඇති තොප ගේ සමවාසයෙන් කිසි අඩුවෙක් උන්ට නොපෙනෙන්නේය. එහෙයින් මෙතනින් වහා නික්මවෙයි කී සඳ නුඹ වහන්සේ ඇර මම නොයමියි යනාදීන් උත්තර ප්‍රත්‍යුත්තර වශයෙන් ඒ උත්තමයන් දෙදෙන කථා කෙරෙමින් සිටියදී මෘත්‍යුමාරයා පරිද්දෙන් වැදි පුත්‍රයා අවුත් ඒ හංසයන්ට පෙනුනේය. බොහෝ කාලයක් ඔවුනොවුන් කෙරෙහි හිත විශ්වාසිව ආ පක්ෂිරාජයෝ දෙදෙන මුගුරක් ඔසවාගෙන වාත වේගයෙන් දිවන්නාවූ සතුරා දක උන්තෙනින් නොඉගිලීම මුවෙන් නොබැන උන්හ. එකල්හි වැදි පුත්‍රයා මහත් වේගයෙන් පක්ෂිරාජයා කරා දුවන්නේ දුරදීම දෙන්නෙකු එක්තැන දක ඉගිල  පලායෙද්දෝහෝයි යන සැකයෙන් සෙමෙන් සිට සමීපස්ථව මලෙහි බැඳි උදකලාව තොපි නැගීයානොහි උන්නාවු ඔහුකෙරෙහි සෙනෙහපාසයෙන් බැඳි ඇරපියයානොදී බල බලා ඉඳිනාවුද පක්ෂිරාජයන් දක සුමුඛයන්ට ආමන්ත්‍රනයකොට මම වනාහි මලෙහි බැඳුනුහෙයින් නොගියේය සාක්‍ෂාත් තොපට සතුරු මා එන නියාව දක දක තොප නොගොස් ඉඳිනට කාරණා කිම්ද මේ තොපට  සතුරු මා එනනියාව දක දක තොප නොගොස් ඉඳිනට කාරණා කිම්ද මේ තොපට කුමක්වේද සෙසු පක්ෂින් එක්ව පලායාදී උදකලාව තොපි උන්නේ කුමක් නිසාදැයි විචාළේය.

එබස් අසා සුමුඛ සෙනාපතිහු එඹල ප්‍රාණඝාතකොට ජීවත්වන්නාවු වැදි පුත්‍රයාණෙනි මුන් වහන්සේ මට රජසෙක ජීවිත සමානවූ මිත්‍රයෙක ඒ කාරණයෙන් මාගේ ජීවිතාන්තය දක්වාත් ඇරනොයෙමි කිවාහුය. එබස් අසා වැදි මුන් තොපට රජ්ජුරුවනැටි කියව රජ්ජුරුවෝ නම් කාරියකාරිය ඥානයෙන් යුක්තයහ. පරික්ෂාකාරියහ මෙලෙස නුවනැත්තාවු තොපගේ මේ රජ්ජුරුවෝ කවරකාරණයක් නිසා අටවන ලද්දාවු මල නුදුටුවාහුද යසසින් නුවණින් වැඩිසිටියවුන් විසින් තමන්ට පැමිනෙන්නාවු ආපදාව පරික්ෂා කටයුතු නොවේද එසේවු තෙනෙත්තන් බැඳෙන්ට හේතු කවරේදැයි විචාළේය.

එකල වැදිපුත්‍රයාගේ බස් අසා සුමුඛනම් හංසසේනාධිපතිද එඹා පුරුෂය සත්වයන්ට විනාශකාලය පැමිණ සිටිකල්හි තමන්ට උපද්‍රව පිණිස සරහා තබන ලද්දාවු දැල් මල ආදින්ගේ සමීපයට පැමිණ කල්හි නෙපෙනෙන්නේය. ඉදින් දුටත් කර්මප්‍රත්‍යය ඒකාන්තයෙන් පැමිණ  සිටිකල්හි සොරමල කවුරුවත් බැඳියන්නේය යනාදින් වැදිපුත්‍රයා හා සම්භාෂණය කිරීමෙන් ඔහුගේ ලය මොලොක් කොටගෙන මහාබෝධිසත්වයන්ගේ ජිවිතදානය ඉල්වන්නාහු සබඳ තොප හා කරණලද සම්භාෂණය අප දෙදෙනාහට අභිවෘද්ධි කාරණා වේද චිත්‍රකූට පර්වතයට ගොස් අපගේ ඥාතිසමූහයා හා සමග සතුටුව වාසය කරණු පිණිස අප දෙදෙනාගේ ජීවතදානය දිපියා එව්දැයි විචාළාහ.

ඒ අසා වැදිපුත්‍රතෙම හංස සේනාධිපතින්ගේ මධුරවු ධර්මශ්‍රවනයෙහි බැඳි එඹාහංසයාණෙනි තොපමා බැඳූයේත් නැත්තේය. තොපගේ වධයෙක් නො කැමැත්තෙමි වහා මෙතනින් පලාගොස් නිර්ව්‍යාධිව ජීවත්වයි කීයේය. ඒ අසා සුමුඛතෙම එඹා වැදිපුත්‍රයෙනි මේ හංස රජ්ජුරුවන් වහන්සේ හැර ජීවත් වන්නාවු ජීවිකා ඇසිල්ලකුත් නොකමැත්තෙමි ඉදින් එක් කෙනෙකුන්ගේ මස් පොහොනේ නම් මුන් වහන්සේ හැරපියා මාගේ මස් අනුභවකරව ඉදින් එලෙස කැමැත්තා නම් මුන් වහන්සේ උසමහතින් වයසින් වර්ණයෙන් සමානයම්හ තොපගේ ලාභයට අඩුවකුත් නැත්තේය. එසේ හෙයින් මා හැරගෙන හංසරජ්ජුරුවන් හැරපියව ඉදින් උන් වහන්සේ මලින් මුදවා මාත් පලායෙති යන්නක් නොසිතා පළමුකොට මා බැඳගෙන පසුව මුන් වහන්සේ හැරපියා එලෙස කළානම් තොපගේ ලාභයක් අඩුවෙක් නැත්තේය. මාගේ යාච්ඤාවත් සමෘද්ධිවන්නේය. ධෘතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන් හා මිත්‍රසංසත්ව වාසයකරණ ලද්දේවෙයි යනාදින් කරණ ලද ධර්මදේශනාව අසා ප්‍රසන්නව ගිතෙල බහාලන ලද සියක් වර පොලනලද කපුපුළුන් පෙදක් පරිද්දෙන් මොලොක්කරණ ලද සිත් ඇති මහබෝධිසත්වයන් හංස සේනාපතීන්ට තුෂ්ටිදානයෙන් හරණාවු වැදි පුත්‍රතෙම එඹා සුමුඛසේනාධිපතිනි තොප විසින් මට කන්නලවු කියා හරණ ලද්දාවු මේ හංස රජ්ජුරුවන් දක ඥාති මිත්‍ර බන්ධූ පුත්‍රදාරාදින් වු සියළු හංස සමූහයෝ සතුටුවෙත්වයි තවද සුමුඛය මේ හංස රජ්ජුරුවන්ට යම්සේ ඒකාත්මිකවු මිත්‍රවිද මේ ලෝකයෙහි කිසි කෙනෙකුන්ටත් එබඳු මිත්‍ර කෙනෙක් නැත්තාහ. එහෙයින් තොපගේ මිත්‍ර ධර්ම පරිපාලනය හේතුකොට ගෙන සන්තුෂ්ටවූ මම තොපට සබඳවු හංස රජ්ජුරුවන් හරිමි කැඳවාගෙන වහා ගොස් ඥාති සමූහයාගේ කඳුලුමුසු මුහුණ සතුටු කරවමින් පැලඹෙවයි යනාදින් කියා පක්ෂිරාජයන්ගේ සිත් සනහවා සෙනෙහසින් මොලොක්වු සිතින් බෝධිසත්වයන් කරා ගොස් බැඳුන් කපා වඩාගෙන සිඹ සනහා විලින් ගොඩනැගී මියර පිට සිනිඳු මොලොක් ඊතන මත්තෙහි ඉඳුවා මල පුඩුව සෙමින් ගලවා වලදමා මහාබෝධිසත්වයන් කෙරෙහි බලවත් මෙත් සිත් පතුරුවා නෙලුම්පතකින් පැන් ගෙනුවුත් පය සෝධා නැවත නැවත පිරිමැද්දේය. එසඳ ඔහුගේ මෛත්‍රිබලයෙනුත් බෝධිසත්වයන්ගේ පාරමිතා භාග්‍යයෙනුත් පයවනයෙන් නහරින් නහරමාංසයෙන් මාංස හා සමින් සම හා ගැලපී පළමු පරිද්දෙන් ප්‍රකෘතිමත් වුයේ විය.

SANHIDA LANKA

ඉක්බිති සුමුඛනම් හංසසේනාධිපති සුබිතමුදිතව උන් බෝධිසත්වයන් දැක සංජාතවූ ප්‍රීතිප්‍රමෝද්‍ය ඇතිව වැදි පුත්‍රයා හට ස්තුති කරන්නාහු එඹා වැදි පුත්‍රයාණෙනි යම්සේ මම තොප විසින් මුදාරහරණ ලද හංස රජ්ජුරුවන් වහන්සේ දැක සතුටුවීම්ද, එපරිද්දෙන් තෙපිත් තොපගේ ඤාති වර්ගයා හා සමග සතුටුවවයි යනාදින් කන්කළුවූ මධුර වචනයෙන් සතුටුව තෙපුල් බැණ හංස රජ්ජුරුවන්ට අභිමුඛව මහරජ්ජුරුවන් වහන්ස මේ පුරුෂයා විසින් අපට බොහෝ උපකාර කරණ ලද මෙවනාහි අපගේ යාච්ඤාව නොඅසා අප හැරගෙන ගොස් ක්‍රීඩාහංසයන් කොට යමෙකුට දිපුවේ විනම් බොහෝ සම්පත් ලැබෙන්නේය නොහොත් මරාපියා මස් විකුටත් බොහෝ සම්පත් ලැබෙන්නේය. තමාගේ ලාභය නොසලකා අපි කීවාම කළේය. මොහු මෙරට රජ්ජුරුවන් කරා කැඳවා ගෙන ගොස් සුවපත් කරම්හයි දෙදෙන කථාකොට වැදි පුත්‍රය හට ආමන්ත්‍රණය කොට සබඳ තා මළ ඇටවුයේ කුමක් නිසාදැයි විචාරා ධන සම්පාදනය කොට මා රකෙන පිණිසයයි කීසඳ එසේවිනම් අප ඇරගෙන ගොස් දේවයන් වහන්ස මූ ධෘතරාෂ්ට්‍ර නම් හංස රජ්ජුරුවෝය මූ උන් සුමුඛ නම් සේනාපතියයයි රජ්ජුරුවන්ට දන්වාලව අප හැම දැක සතුටුවූ රජ්ජුරුවෝ තොපට බොහෝ සම්පත් දෙතියි වැදි පුත්‍රයා හට නියෝග කළහ.

ඒ අසා වැදිපුත්‍ර ස්වාමිනි රජ්ජුරුවන් දකීම් නොකමැත්තේය. රජ්ජුරුවෝ නම් චඤ්චලවූ සිත් ඇත්තෝය. වචනායුධයහ. නුඹ වහන්සේලා ක්‍රීඩා හංසයන් කොට රඳුනා නමුත් මරාමස් අනුභව කළාහු නමුත් ඊට වඩා අලාභයෙක් නැත්තේය. එහෙයින් මම ධන නොකැමැත්තේය. නුඹ වහන්සේලා සැපසේ වැඩපුවමැනවයි කීය. ඒ අසා සුමුඛයෝ සබඳ භයනොගනුව රූක්‍ෂවූ ක්‍රෑරවූ ක්‍රියා ඇති ලෙයින් තෙත්වූ අත් ඇති තොප පවා මධුරවූ මාගේ ධර්මකථනයෙන් මොලොක්කොට පා පිට එලා වසඟ කෙළෙම් රජ දරුවෝ නම් මහපින් මහානුවනැත්තාහ. සුභාෂිත දුර්භාෂිත වචනයෙන් දන්නාහුය. තෙපි අනිකක් නොසිතා වහා අප ගෙනගොස් රජ්ජුරුවන්ට දක්වාලවයි නියෝග කළහ.

එසඳ වැදිපුත්‍ර එසේවිනම් යහපතක් නපුරක් විනමුත් මට නොකිපුන මැනවැයි හංස රජ්ජුරුවන් හා සුමුඛයන් කදක හිඳුවාගෙන ගොස් රජ්ජුරුවන් දක්වා දේවයන් වහන්ස මූ සයානුදහසක් හංසසේනාව පිරිවරකොට ඇති ධෘතරාට්‍ර නම් හංස රජ්ජුරුවෝය මූ උන්ගේ සුමුඛ නම් සෙනෙවිරද්දුය. නුඹ වහන්සේ වැඳ දක්වනු පිණිස බදාගෙන ආමියි රජ්ජුරුවන්ට දැක්විය ඒ අසා රජ්ජුරුවෝ අතිශයින් ආශචර්‍ය්‍යයට පැමිණ එඹල වැදි පුත්‍රය මහත්වූ ඓශ්වර්යයෙහි පිහිටි මේ හංස රජ්ජුරුවන් හා සෙනවිරදුන් තොප අපට කවර උපදෙසෙකින් පැමිණියාහුදැයි විචාළාහ.

ඉක්බිති වැදිපුත්‍ර ජනප්‍රධාන වූ රජ්ජුරුවන් වහන්ස යම් තෙනෙක්හි මුළු මුළුව බැස ගොදුරු අනුභව කෙරෙද්ද ඒ ඒ ස්ථානවල්හි නියම දැන මල අටවා පක්ෂීන් මරා විකොට ජීවත්වන්නාවූ මම මානසය නම් විලට බොහෝ හංසයන් ගොදුරු පිණිස බසිනා නියාව දැක මල ඇටවීම් ඒ මලෙහි මේ හංස රජ්ජුරුවෝ බැඳුනාහ. එකල අවශේෂවූ හංසයෝ තමන්ගේ වාසස්ථානයටම ගියාහුය. මේ සුමුඛ නම් සේනාධිපති තුමූ මලෙහි නොබැඳි මේ හංස රජ්ජුරුවන් කෙරෙහි සෙනෙහපාසයෙන් බැඳි යානොහි උන්නාහු මා දැක නොඉගිලි තමන්ගේ ස්වාමිපුත්‍රයානන් නිසා ජීවිත පරිත්‍යාග කොට තිරිසන්ව ඉපිදත් සමහර මනුෂ්‍යයන් විසිනුත් කොටගත නොහැක්කාවූ දුෂ්කර ක්‍රියාව ප්‍රකාශ කෙරෙමින් මා හා සමඟ කථාකොට මලෙහි බැඳි උන් හංස රජ්ජුරුවන්ගේ ජීවිතදානය ඉල්වුහ.

එකල මොහුගේ සුභාෂිත වචනයන් අසා සතුටුව හංස රජ්ජුරුවන් මලින් මුදා හංස රජ්ජුරුවන්ට කැමති පරිද්දෙන් නැගී යනලෙස අවසර දිනිම් එසඳ මා කෙරෙහි සතුටුව මේ සුමුඛනම් සෙනෙවිරත්තෙම තොපගත් ආයාසය ව්‍යර්ථ නොවන ලෙස අප ඇරගෙන රජ්ජුරුවන් වහන්සේ කරා ගොස් දක්වාලව බොහෝ ලාභ ලබන්නෙහියයි යනාදින් මුන්ගේ කීමෙන් ගෙනාම් මේ උත්තම ගුණ ඇති පක්ෂි උවමනා කෙනෙක ඇතිවක් පටන් සත්ව ඝාතනය කොට ජීවත්වන්නාවූ මාගේ ළයපවා තමන් මධුර කථාවෙන් මොලොක් කොට ගත් කෙනෙක. මෙබඳු ආශ්චර්යමත්කර පඬුරක් මා ඇතුළුවත් සියළු වැද්දන්ගෙන් පෙර ගෙනා කෙනෙක් වේවයි ඉදිරියෙන් ගෙනෙන කෙනෙක් වේවයි නැත්තාහ. එහෙයින් මේ අත්භූතවූ හංසයන් දැක වදාළමැනවැයි වැදි පුත්‍රද රජ්ජුරුවන්ට දන්විය. එකල රජ්ජුරුවෝ මහබෝධිසත්වයන්ට මාහැඟි වූ සිංහාසනයක්ද සුමුඛයන්ට රත්බඳවෙළුවක් පනවා මොවුන් එහි ඉඳුවා රන් තැටියෙන් මී හා විලඳ හා සකිරා මුසු පැන් අනුභව කරවා සන්තර්පනය කරවා නමස්කාර කොට ධර්මදේශනාවට මහාබෝධිසත්වයන්ට ආරාධනා කොට මිටි අස්නක උන්නාහුය.

SANHIDA LANKA

එකල හංස රජ්ජුරුවෝ මධුරවූ මනුෂ්‍යභාෂාවෙන් මහරජ පින්වත්වූ තොපට කිසි දුකෙක් නැද්ද ව්‍යාධි බාහුල්ලයෙක් නැද්ද තොපගේ මේ රාජ්ජය අන්නපාණ වස්ත්‍රාභරණ ධනධාන්‍යාදීන් සමෘද්ධද තොපගේ රාජ්ජය සැපසේ රක්නෙහිද තොපගේ අමාත්‍ය සේවකාදින් අතුරෙන් කිසි අමනාපයක් කරණ කෙනෙක් නැද්ද යුද්ධ ආදීවූ කිසිකාරියක් පැමිණ කල්හි තමන් ගේ ජීවිතයට නොසිතාත් තොපට වැඩෙහි ඇසිරෙද්ද

තවද මහරජ අගමෙහෙසුන් බිසවු තොප හා සමාන ජාතිගොත්‍ර ඇතියෝද කීකරුව කන්කළුවූ බස් කියද්ද දුන් පුතුන් දරුවන් ආදීහු ශ්‍රද්ධා ඇත්තාහුද තොපගේ අභිප්‍රාය නොමිරිකා වෙසෙද්ද යනාදින් සාමිචි කථාකිරීමෙන් සුවදුක් විචාළාහ.

එකල රජ්ජුරුවෝ එසේය හංසරාජයන් වහන්ස මාගේ කයට කිසි දුකෙක් නැත්තේය. ධනධාන්‍යාදීන් සමෘද්ධවූ රට දැහැමෙන් සෙමෙන් අනුශාසනා කෙරෙමින් අමාත්‍යාදීහුත් කිසි අමනාපයක් නැතිව මා පැමිණි කාරිය ඇර නොපියා සිද්ධකෙරෙති අගමෙහෙසුන් බිසවුන් රූප යෞවනාදීන් මා හා නොවෙනස්ව අභිප්‍රාය සැටියේම වාසය කෙරෙති යනාදී තමන්ගේ එසු කීහ.

ඉක්බිති බෝධිසත්වයන්ගේ සුවදුක් විචාරන්නාවූ රජ්ජුරුවෝ මහජවවේග සම්පන්නවූ බොහෝ හංසයන් විසින් පිරිවරණ ලද්දා වු ධෘතරාෂ්ට්‍ර හංස කුලයෙහි උපන්නාවූ නුඹ වහන්සේ මේ සතුරා අතට කවරහෙයකින් පැමිණිසේක්ද මේ තෙම මලෙහි බැඳුනු අවස්ථාවෙහි ඔබට දණ්ඩකින් ලීයකින් ගසා ආයාසයක් නොකෙළේද මෙවැදි කොල්ලෝ නම් සතුන් අසුවූ අවස්ථාවෙහි පළමුකොට ගැසීම ස්වභාවධර්මකොට ඇත්තාහුය. මොහුගෙන් ආයාසයෙක් නුවුයේදැයි විචාළාහුය.

එසඳ බෝධිසත්වයෝ මහරජ්ජුරුවෙනි මෙවැනි වූ ආපදාවක් පැමිණ තෙනදීත් මෙතෙම විරුද්ධ නොපැවැත්තේය. මේ වැදි පුත්‍රයා දැක මධුර වූ කථා ප්‍රවෘත්ති ඇති ස්ථානොචිත ප්‍රඥාවෙන් යුක්ත වූ මේ සුමුඛයෝ මොහු හා කථා කළහ. ඔහුගේ මධුර වූ කථා ශ්‍රවණය කොට ප්‍රසන්නවූ මේ වැදි පුත්‍රතෙම මා මලින් මුදා සැපසේ නැගීගිය මැනවැයි නියෝග කළේය. මෙතනට ඒමත් මෝහට අභිවෘද්ධි පිණිස අපගේ මේ සුමුඛයන්ම සිතන ලද්දේයයි යනාදින් මධුර වචනයෙන් කථාකළාහුය. ඒ අසා රජ්ජුරුවන් වහන්ස පක්ෂින්ට ශ්‍රේෂ්ඨ වු නුඹ වහන්සේ ඒම මනාගමණෙක් වේවයි නුඹ වහන්සේගේ දැක්මෙන්ම සතුටුවිමියි මේ වැදිත් බොහෝ සම්පත් ලැබෙන්නේහයි කියා අමාත්‍යයෙකු ගේ මුහුණ බැලුහ. ඔහු විසින් කුමක් කෙරෙමිද දේවයන් වහන්සැයි විචාළ සඳ මේ වැද්දාවූ දිලිරුවුළු අත්දන් තබා ඉස්සෝධා නහවා සුවඳ විලවුන් ගන්වා වස්ත්‍රාභරණාදින් සරහාවා වහා ගෙනවයි කීහ.

ඒ නියෝග ලද අමාත්‍යයා විසින් සරහා ගෙනාසඳ ඕහට අවුරුද්දකට ලක්‍ෂයක් නියම්වන ගම්වරයක් හා උභය පාර්ශවයෙහි මහා විථියකින් සැරහුණාවූ ගෙයක් හා රථයානාවක් හා බොහෝ රත්රන්දී පිණවා ඉක්බිති රජ්ජුරුවෝ හංස රාජයානන් වහන්ස අභිප්‍රාය සැටියේම වැද්දවුට සම්පත්තීන් පුරාලමියි කිහ.

ඉක්බිති මහාබෝධිසත්වයෝ රජ්ජුරුවන්ට සතුටුව බණ කියා දශරාජ ධර්මයෙන් අනුශාසනා කළහ.

එකල බණ අසා සතුටුව රජ්ජුරුවෝ මහබෝධිසත්වයන්ට බණට පූජා කෙරෙමින් සේසත් නංවා රාජ්ජ්‍යය පාවාදෙන්නාහු මේ රාජ්ජයෙහි මා අයිතිවූ යම් වස්තුවෙක් ඇද්ද ඒ සියල්ල නුඹ වහන්සේට ධර්ම පූජාකොට දිනිමියි මේ සියළු රාජ්‍ය සම්පත් කැමති කැමති කෙනෙකුන්ට දන් දෙතත් දුන මැනව රාජ්‍යයකරතත් අනුශාසනා කළ මැනව මම ආයුධගෙන නුඹ වහන්සේට සේවාකම් කොට සිටිමියි කීහ.

එකල මහාබෝධිසත්වයෝ මෙතැන් පටන් මා සන්තක රාජ්‍යය නොබඳු බඳු ගැනීමෙන් ජන පීඩා නොකොට දැහැමෙන් රාජ්‍යය කළ මැනවැයි රජ්ජුරුවන්ට පාවා දුන්හ. ඉක්බිති රජ්ජුරුවෝ මා විසින් හංස රජ්ජුරුවන්ගේ බණ කථා අසන ලද වැද්දහු විසින් සුමුඛනම් හංස සේනාධිපතිහු මිහිරි බණ කථා දන්නාහයි විශේෂකොට ප්‍රශංසාකරණ ලද හෙයින් උන්ගෙනුත් බණ කථා අසනු කැමැත්තෙමියි කීහ.

එසඳ සුමුඛ නම් හංස සේනාධිපති මහරජ නුඹ වහන්සේ සියළු මනුෂ්‍යයන්ට නායකසේක. මුන් වහන්සේ සියළු හංසයන්ට නායකසේක. මුන් වහන්සේ සියළු හංසයන්ට නායකසේක. එසේවු උත්තමයන් කථාකරන්නාවු ස්ථානයට පැමිණියාවු මම පෙරලා බන්ධනයට අසුඋනාහ. රජක්හු පරිද්දෙන් සෙල්විගත නොහෙමි. තවද මට ස්වාමිව සිටියවුන් හා කථාකරණ තැන්හි දාසව සිටියවුන් විසින් අතුරෙහි කථා කිරීම ස්වාමි පක්‍ෂපාත අපවැත්නවුන්ට ආචාරනොවන්නේය. එසේහෙයින් තුෂ්ණිම්භූතව උනිමියි කීහ.

එබස් අසා සතුටුවූ රජ්ජුරුවෝ නුඹ වහන්සේ විශිෂ්ටවූ නුවනැතිසේකැයි යනාදින් ප්‍රසිද්ධවූ මේ කිර්ති ඝෝෂාව ඒ ස්ථානයෙහිම ප්‍රසිද්ධ විය. එසේ හෙයින් මේ මිත්‍රද්‍රෝහිවු අව්‍යස්ථින සිත් ඇති කෙනෙකුන්ගේ ගුණය මෙසේ නොවන්නේය. එසේහෙයින් මෙසේවු ස්වාභාවික උත්තම ගුණ ඇති කෙනෙකුන් මම නුදුටිමියි එසේහෙයින් නුඹ වහන්සේගේ මිහිරි කථාවෙහිද සතුටුවූ මට පැමිණ සනොතාෂය බොහෝ කලක් පවත්නා නියායෙන් දෙදෙනාම ඇම වෙලෙහිම දක්නා කැමැත්තෙමි කීහ.

SANHIDA LANKA

එබස් අසා රජ්ජුරුවන් කෙරෙහි පැහැද ප්‍රශංසා කරන්නාවූ හංසරජ්ජුරුවන් වහන්සේ මහරජ මිත්‍රයන් විසින් තමන්ගේ මිත්‍රයන්ට යම් උපකාරයක් කළ යුතු වීනම්. ඒ සියළු උපකාරය තොප විසින් කරණ ලද්දේය. අපිත්

සැක නැතිවම සියළු උපකාරය ලදුවෝ වුම්හ. එසේ හෙයින් අප ඔවුනොවුන් කෙරෙහි ඇති භක්ති ප්‍රේමය එකතැන උනත් වෙන්ව ගියත් අඩුවක් නොවන්නේය. තවද අප දෙදෙනාගේ වියෝගයෙන් අපගේ බන්ධුවූ හංස සමූහයාට බොහෝ දුක් පැමිණියේය. මහරජ ශෝකයෙන් පීඩිත වූ බන්ධුන්ගේ ශෝකදුරු කෙරෙමි අප නික්මවා පියන්නා කැමැත්තම්හයි පින් වත්වූ මහරජ්ජුරුවන් දකීමෙන් බලවත්වූ සනොතාෂයට පැමිණයෙමියි යම් බන්ධු සංග්‍රහයෙක් ඇත්නම් ඒ ඥාති සමාගමයත් මට බලවත්වූ වැඩිය. එසේහෙයින් මහරජ අප නික්මවා පියවයි කීහ.

එලෙස බෝධිසත්වයන් කී කල්හි රජ්ජුරුවෝත් යහපත නික්මුණ මැනවැයි අවසර දුන්හ. එකල්හි මහා බොධිසත්වයෝ රජ්ජුරුවන්ට ප්‍රාණඝාතාදීවු පඤ්ච දුස්සීල කර්ම දුගතියට පමුණුවන්නේය යනාදින් එහි ආදිනව හා ප්‍රාණඝාතාදීන් වැලැකීමාදිවු පඤ්චසීලයාගේ ඉෂ්ටඵලය ප්‍රකාශකොට කියා මහරජ සිල්රක්ෂා කරව දැහැමෙන් රාජ්‍යයකොට සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජය කරවයි අවවාද කොට ඉක්බිති දෙවැනි දවස් අරුණ නැගෙන වේලෙහි මී හා විලඳ සකිරා පැන් අනුභව කොට රජ්ජුරුවන් හා බිසවුන් විසින් රන් තල් වැඩ දෙකක් හිඳුවාගෙන සුවඳින් මලින් පුජා කොට නික්මෙන්නේ යහපතැයි අවසර දුන් කල්හි රජ්ජුරුවන් පැදකුණු කොට සීමැදුරු කවුළුවෙන් පිටත්ව මහත්ගමන් වේග ඇතිහෙයින් චිත්‍රකූට පර්වතයට ගොසින් බන්ධුන් දුටහ. එකල්හි නිදුක් නිරෝගිව සැපසේ අවුත් පැමිණ හංස රජ්ජුරුවන් හා සුමුඛයන් දැක ප්‍රීතියෙන් පිණාගියාහු ලබන ලද පිහිට ඇති හංස සමුහයෝ සනෙතාෂරාවයෙන් මත්ව කොකාධවනි පවත්වා ඉක්බිති හංසයෝ ස්වාමිනි සතුරන් අතින් කෙසේ ගැලවී ගිය සේක්දැයි විචාළේය.

ඒ අසා මහබෝධිසත්වයෝ සුමුඛයන් නිසා ගැලවී ගියෙමි යනාදින් බැඳුනු වෙලෙහි පටන් රජ්ජුරුවන්ගෙන් අවසර  ගෙනඑන වෙලාව පටන් මේ දෙඅතුරෙහි පැවති යම් කාරියෙක් ඇත්නම් සියල්ලම වෙන වෙනම කීහ. ඒ අසා සතුටුවූ හංස සමූහයා සුමුඛනම් සෙනාපතිහුද අපගේ රජ්ජුරුවන් වහන්සේද වැදි පුත්‍රයාදැයි යන මේ හැමදෙනාම සුවපත්ව නිදුක් නිරෝගීව බොහෝ කාලයක් පවතීත්වයි ස්තුති කළාහයි යනාදින් බුදුරජානන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙනහැර දක්වා මහණෙනි මේ ලෝකයෙහි යම් කෙණෙක් මිත්‍ර ධර්මය අඛණ්ඩකොට රකිත්ද ඔවුන්ට සියළු අභිමතාර්ථය මේ හංස රජ්ජුරුවන්ගේ අභිමතාර්ථය සිද්ධවුවාක්මෙන් සමෘද්ධ වන්නේයයි යනාදින්  අනදමහාතෙරුන් වහන්සේගේ ජීවිත පරිත්‍යාගය නිසා කථා ඉපදවු භික්ෂූන් වහන්සේ ඇතුළුවු සිව්වනක් පර්ෂිද්ට මේ චුල්ලහංස ජාතක ධර්මදේශනාව වදාරා මහණෙනි ආනන්දයෝ පෙරත් මා නිසා ජිවිත පරිත්‍යාග කළෝවේදැයි වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ චුල්ලහංස ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි වැදි පුත්‍රයා නම් ඡන්න ස්ථවිරයෝය. එකල රජ්ජුරුවෝ නම් ශාරිපුත්ත ස්ථවිරයෝය. තිරිසන්ව සිට ජිවත පරිත්‍යාග කළ සුමුඛ නම් හංසයානෝ නම් මේ ආනන්දස්ථවිරයෝය. එසමයෙහි අනුදහසක් හංසයෝ නම් දැන් මේ බුදුපිරිසය. මරන්ට බදාගත් වැද්දාවු ඇතුළුවූ සියළු සත්වයාහට මෙළෝ පරළෝ දෙකින් වැඩකළ හංස රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවු මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේකී.

SANHIDA LANKA

# මහා හංස ජාතකය

ඓහලෞක්ක පාරලෞකිකාර්ථයෙන් අනුශාසනා කොට සියළු සත්වයන් ස්වර්ග මෝක්ෂ සම්පතට පමුණුවන හෙයින් ශාස්තෘ නම්වූ සර්වඥරාජොත්තමයානන් වහන්සේ බිම්සර රජ්ජුරුවන් විසින් කරවා පිළිගන්වන ලද වේළුවනාරාමයෙහි දවස්යවා වදාරණසේක. ආනන්ද මහතෙරුන් වහන්සේ විසින් බුදුන් උදෙසාම ජීවිත පරිත්‍යාග කිරීම අර්ථොත්පත්තිය කොට මේ මහා හංස ජාතක ධර්මදේශනාව වදාළසේක.

මෙහි වර්ථමාන කථාව යට චුල්ලහංස ජාතකයෙහි කථාව හා සදෘශ වන්නේය. මේ ජාතකයෙහි අතීත කථාව ගෙනහැර දක්වන්නාහු සර්වඥයන් වහන්සේ එඹා මහණෙනි යටගිය දවස බරණැස් නුවර සෙය්‍යංසක නම් බරණැස් රජ්ජුරුවන්ගේ ඛේමා නම් අගමෙහෙසුන් බිසෝකෙණෙක් වූය. එකල්හි පුරණලද බෝධිසම්භාර ඇති මහාබෝධිසත්වයෝ හංස ජාතියෙහි ඉපිද අනූ දහසක් හංසයන් පිරිවරා චිත්‍රකූට පර්වතයෙහි වසන්නාහ. ඉක්බිති එක් දවසක් ඛේමා නම් බිසව් අළුයම් රාත්‍රියෙහි ස්වප්නයක් දක්නාහු රන්වන් හංසයෝ දෙදෙනක් අවුත් සිංහාසන මස්තකයෙහි හිඳ මිහිරිවූ කටහඬින් බණ කියති තුමුත් සාධුකාරදිදී බණ අසමින් ඉඳදීම රාත්‍රිය ඉකුත්විය හංසයෝ බණකථාව කියා සන්ධි නොගලපා සී මැදුරු කවුළුවෙන් පිටත්ව නික්මුණාහුය. එකල බිසව් හංසයන් අල්ලවයි කියමින් මහත් වේගයෙන් දෑත දික්කොට පුබුදිමින් දෑත දික්කොටගෙණ නැගීසිටියාහ. බිසවුන්ගේ මෙබස් අසා පරිවාරස්ත්‍රීහු හංසයෝ කොයිද කොයිදැයි කියා මදක්වෙහෙසූය. එවෙලෙහි බිසවු මාදුටුයේ ස්වප්නයෙන් වේදැයි සිතා ඒකාන්තයෙන්ම මා නැත්තක් නොදකිමි. මේ ලෝකයෙහි රන්වන් හංසයෝ ඇත්තාහුය. ඉදින් මම සවර්ණ හංසයන්ගෙන් බණ අසන්නා කැමැත්තෙමි. රජ්ජුරුවන් වහන්සේට දැන්වීනම් අප විසින් රන්වන් හංසකෙණෙකුන් දුටු විරූ නැත තිරිසන් වූ හංසයොත් මනුෂ්‍යයන්ට දැනෙන ලෙස කථාවක් කෙරෙද්ද මේ ඇත්තෙක් නොවෙයි කියා මා කිවා සරුවක් නොකරණසේක. රන්වන් හංසයන්ගෙන් බණ අසන දොලෙක් උපනැයි කියත්නම් යම්කිසි උපදෙසකින් පරීක්ෂාකොට ගෙන්වන සේක. එකල්හි මාගේ මනෝරථය සිද්ධවන්නේයයි ස්වප්න දුටුවෙලෙහි පටන් බිසවුන් කිසිවක් නොකියා ගිලන් ආකාර දක්වා මා විචාල කෙනෙකුන්ට ලෙඩ නියාව කියවයි නියෝගකොට පරිවාර ස්ත්‍රීන්ට නියෝගකොට ලෙඩවී වැදහොත්තීය.

රජ්ජුරුවෝ සිංහාසනයේ උන්නාහු රාජසේවයට එනවේලෙහි බිසවුන් නොදක ඛේමා දේවී කොයිදැයි විචාරා ලෙඩහයි යනු අසා යුහුව උනස්නෙන් නැගී බිසවුන් සැතපුණු ගබඩාවට ගොස් යහනෙහි එක් ඇලයෙක ඉඳ අතින් පිට පිරිමදිමින් බිසවුනි කෙසේවූ අපාසුවෙක්දැයි විචාළාහ.

එකල බිසව් දේවයන් වහන්ස මට අනික් අපාසුවෙක් නැත දොලෙක් උපනැයි කිවුය. ඒ අසා රජ්ජුරුවෝ සමාධිව බිසවුනි යමක් කැමැත්තාහු නම් ඇසිල්ලකින් ගෙන්වාදීලම් කීහ.

එකල බිසවු කැම්පීම් ආදි කිසිවක් නිසා උපන් දොලෙක් නොවෙයි නගනලද සේසත් යට පනවන ලද සිංහාසන මස්තකයෙහි හිඳ බණකියන්නාවූ ස්වර්ණ හංස රජ්ජුරුකෙනෙකුන්ට සුවඳින් මලින් පූජාකොට සාධුකාරදිදී බණ අසන්නා කැමැත්තෙමි ඉදින් බණ අසන්නට ලදින්නම් යහපත නොලදිත් නම් මාගේ ජීවිතය තිබෙන නොසිතුව මැනවැයි කීහ.

එකල්හි රජ්ජුරුවෝ ඉදින් මනුෂ්‍යලෝකයෙහි ඇත්නම් ලබව නොලබමියි සෝක නොකරවයි බිසවුන් අස්වසා ශ්‍රියහන් ගෙන් පිටත්ව අමාත්‍යයන් හා සමග මන්ත්‍රණය කරන්නාවූ එඹා අමාත්‍යයෙනි ඛෙමා නම් බිසවුන් රන්වන් හංසයකුගෙන් බණ අසන්නට ලදින්නම් ජීවත්වෙමි නොලදින් නම් රැකියා නොළුම් කියති. කිමෙක්ද රන්වන් හංසයෝත් ඇද්දැයි විචාළහ. එකල අමාත්‍යයන් විසින් දේවයන් වහන්ස හිමාලය වනයෙහි චිත්‍රකූට පර්වතය ඇසුරු කොට රන්වන් හංසයෝ වෙසෙති මුඛ පරම්පරාවෙන් කියා එබස විචාරත් දනිමියි කීවාහ.

එකල රජ්ජුරුවෝ ඒ හංසයන් අල්වන්ට නිසි උපදෙසක් දනිද්දැයි විචාරා නොදනිමුය කී හෙයින් එකල්හි නුවණැති බමුණන් ගෙන්වාගෙන රන්වන් හංසයන් චිත්‍රකූට පර්වතයෙහි වාසය කෙරෙති ඇසුම්හයි උන් අල්වා ගෙන්වා ගන්නා උපදෙසක් දනුදැයි විචාළාහ. එකල බ්‍රාහ්මණයෝ මහරජ මිනිසුන් යවා ගෙන්වාගනුම්හයි ආයාස නොගත මැනවැයි උපදෙසයකින් හංසයන් මෙනුවර ආසන්නයට ගෙන්වාගෙන ක්‍රමයෙන් අල්වාගනුම්හයි කීහ.

SANHIDA LANKA

කවර උපදෙසක්දැයි විචාළ මහරජ නුවරට උතුරුදිග තුන්ගව්වක් පමණ දිග පලල ඇති ඛේමා නම් විලක් ඇතිකොට දියපුරවා නොයෙක් ධාන්‍ය ජාතීන් ඇතිකොට පංචවණී පද්මයෙන් සජ්ජිතකරවා නුවනැති එක් වැද්දක් හට පාවාදී මනුෂ්‍ය කෙනෙකුන් විල ආසන්නයට ආනොදී උදෑසන සවස විලසතර කොනයෙහි සිට ඛෙමා නම් විලට සියළු පක්ෂීන් ඇවිදින් කැමති සැටියේ ගොචර ග්‍රහණයකොට වාසය කළයුතුය. කිසි

කෙනෙකුන්ගෙන් උපද්‍රව නොවන්නේයයි ඝෝෂාකරවුවමැනව එසේකල්හි නොයෙක් පක්ෂිහු රැස්වෙති එරන්වන් හංසයොත් පරම්පරාශ්‍රැතියෙන් එවිල නිර්භය නියාව අසා සැකනැතිව එන්නාහුය. එකල හංසයන් මලින් බැඳ ගෙන්වාගත මැනවැයි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ බමුණන් කීතෙනම කියන ලද ප්‍රමාණ ඇති විලක් කරවා නොයෙක් ගොචරයෙන් සමුර්ධිකොට දක්‍ෂවු වැද්දන් හට පාවාදී දහසින් බඳ පියල්ලක් දී ඔහු සනොතාෂකොට තෝ මෙතැන්පටන් තාගේ ක්‍රියාවෙහි ඇවිද දුක්නොවිඳ තොපගේ අඹු දරුවන්ට උවමනා බත් පිළි ආදීවු රැකීමත් මට භාරය නොපමාව තෝ ඛේමා නම් විල රකිමින් මනුෂ්‍යකෙනෙකුන් ලංවියනොදී ඒ ඒ ස්ථානයෙහි ඛෙමා නම් විලට ආ පක්ෂි කෙනෙකුන්ට කිසි භයෙක් නැත්තේයයි ඝෝෂා කෙරෙමින් ඒ ස්ථානයෙහි වාසයකොට ආ පක්ෂි කෙණෙකුන් ඇත්තම් මට කියාලව රන්වන් හංසයන් ආනිසාද කී දවස් තට බොහෝ සම්පත් දෙමියි අස්වසා ඛේමා නම් විල වැද්දහුට පාවාදුන්හ.

එවැදිත් එතැන්පටන් රජ්ජුරුවෝ කී සැටියේ පිළි පැදත් විල රකිනේය. එතැන්පටන් ඛේමා නම් විල රකිනහෙයින් වැද්දහුත් ඒ නමින් ප්‍රසිද්ධ විය. එතැන් පටන් අනෙකප්‍රකාරවූ පක්ෂි සමූහයා එවිලට අවුත් ගොචර අනුභවකොට තමන් තමන්ගේ වාසස්ථානයට ගොස් ගෝචර සම්පන්නවු ඛේමා නම් විල නිරුපද්‍රවයයි වර්ණනාකොට කියන්නාහ.මෙසේ පැවති පරම්පරා ඝෝෂාව අසා පළමුවෙන් තෘණ හංසයො අවුය. උන්ගෙන් අසා පාඩු වර්ණ හංසයෝ අවුය. උන්ගේ කීමෙන් රන්සිරියෙලහි පැහැසමානවූ රන්වන් හංසයො අවුය. උන්ගේ බසින් සෙවත හංසයෝ අවුය. උන්ගේ ඝෝෂායෙන් පාක හංසයෝ අවුය උන් ආ ඉක්බිති ඛෙමා නම් වැදි රජ්ජුරුවන් කරා ගොස් දේවයන් වහන්ස පංචවර්ණ හංසයෝ අවුත් විල ගොදුරු අනුභව කෙරෙති පාක හංසයන් කී බැසින් අනික් කීප දවසකින් සවර්ණ හංසයෝ එති එහෙයින් සැක නොකළ මැනවැයි කීයේය.

ඒ අසා රජ්ජුරුවෝ අනික් කිසි මිනිස්කෙනෙකුන් එවිල සමීපයට නොයායුතුය. ඉදින් ගිය කෙනෙකු ඇත්නම් අත්පාකම් නොහොත් ගෙවල් කොල්ලකෑම් ආදී ව්‍යවසනයට පැමිණෙන්නේයයි බෙරලුහෙයින් කිසි මනුෂ්‍ය කෙනෙකුන්ගෙ සංචාරයෙක් නැත්තේය.

චිත්‍රකුටයට ආසන්නයෙහි රන්ගල් ගුහාවෙක පාක හංසයෝ වෙසෙති ඔවුත් මහත්වූ කායබල ඇත්තාහ. ධෘතරාෂ්ට්‍ර නම් හංසයන් හා ඔවුන්ගේ ශරීර වර්ණය විවරෙක් වෙනස ඇත්තෝය. එහෙයින් පාක හංසරජ්ජුරුවන්ගේ දියණිකෙනෙක් රන්වන් පෑ ඇත්තාහ. එසේහෙයින් මාගේ දියනියෝ ධෘතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන් වහන්සේටම සුදුස්සහයි උන්ට පාද පරිචාරිකා කොටගෙන දෙකුලෙහි හංසයෝ ඔවුනොවුන්ට ඉතා විස්වාසීව ඉඳිනාහුය.

ඉක්බිති එක් දවසක් බෝධිසත්වයන්ගේ පරිවාර හංසයෝ පාක හංසයන්ට තෙපි හැම මෙතෙක් දවස් කොයි ගොසින් ගොදුරු අනුභව කළාහු දැයි විචාළාහ. ඒ අසා පාක හංස රජ්ජුරුවන්ගේ සේවක හංසයෝ බරණැස් නුවරට නුදුරුතෙන ඛෙමා නම් විල ගොදුරු ඉතා සුලභය. ඊගොස් ගොදුරු අනුභවකොට ආම්හ. එවග තෙපි හැම කොයි ඇවිදුද එවිල ඉතා සිත්කළුය හංසචක්‍රවාකසාරසාදී නොයෙක් පක්ෂින් විසින් ගැවසීගත්තේය. පංචවර්ණ පද්මයෙන් හා නොයෙක් ධාන්‍යජාතියෙන් සමෘද්ධිය පඤ්චවර්ණ හංසයන් විසින් මකරන්දග්‍රහණය කොට සන්තෝෂයෙන් කුල්නාලද්දේයයි සතරකොන සිට නිරන්තරයෙන් පවත්නා අභය ඝෝෂා ඇත්තේයයි එසේහෙයින් එවිල සමීපයට ලංවෙනකෙනෙක් නැත අනික් උපද්‍රවයෙක් කැලම නැත්තේය යනාදීන් එවිල ඇති ගුණ වර්ණනාකොට කීහ.

ඒ හංසයෝ තමන් ඇසු ප්‍රවෘත්තිය සුමුඛ නම් හංස සේනාධිපතීන්ට කිවුය. ඔහු එපවත් හංස රජ්ජුරුවන්ට කිවුය. ඒ අසා සවර්ණ හංස රජ්ජුරුවෝ මනුෂ්‍යයෝ නම් බොහෝ මායම් හා උපාය දන්නාහුය. මෙතෙක් කල් මෙනම් විලෙක් නැත්තේය, කාරණයක් නිසා අමුතුව ඇතිකරණලද ඒකාන්තයෙන් අප හැම අල්වාගන්නා පිණිස කරණ ලද්දේවනැයි සිතා එම්බා සුමුඛයෙනි එවිල නම් උදක් සැඳැහැයෙන් කළදෙයක් නොවන්නේය. මනුෂ්‍යයෝ නම් තීක්ෂණ මන්ත්‍රීව උපායක් දන්නාහ. එසේහෙයින් එවිලට ගොසින් ගොදුරු අනුභව කරම්හයි නොසිතව තොප හැම මෙතෙක් දවස් ගොදුරු අනුභව කරණ තෙනටම ආලය කරවයි කීහ.

එතැන් පටන් ස්වර්ණහංසයෝ ඛේමා නම් විලට ගොස් ගොදුරු කන්නා කැමැත්තම්හයි දෙතුන්වැනිවත් සුමුඛ නම් සේනාධිපතීන්ට කිවුය. උයිත් හංසයන් එවිලට යනුකැමතිව දෙතුන්වැනිව පෙරත්ත කියන නියාව බෝධිසත්වයන්ට කීහ.

SANHIDA LANKA

එකල මහාබෝධිසත්වයෝ මාගේ බන්ධුහු මා නිසා පීඩා නොවි ඉඳිත්වයි හැමදෙනාම තත්පරවු පසු යහපත නික්වෙත්වයි අනුදහසක් හංසයන් පිරිවරා එවිලට ගොස් ගොදුරු අනුභව කොට හංස ක්‍රීඩා කෙළ නැවත චිත්‍රකුට පර්වතයටම ගියාහ.

ඛේමා නම් වැදිත් ඒ සවර්ණ හංසයන් ගොදුරු අනුභව කොට ගිය කල්හි එපවත් රජ්ජුරුවන්ට කියේය. ඒ අසා සතුටුව රජ්ජුරුවෝ සබඳ ඛේමය හංසයන් එකකු හෝ දෙන්නකු අල්වාගනිත්නම් තට බොහෝ සම්පත් දෙමි කියා කී බසට සතුටුව පඬුරුදී වැද්දහු නික්මවුහ. එවැදීත් සතුටුව විලට ගොස් ත්ලියක ඉඳ හංසයන් ගොදුරු අනුභව කරණ තැන් පරික්ෂා කරන්නේ බෝධිසත්වයෝ ගොදුරු අනුභව කිරීමෙහි ස්වභාවයෙන්ම ලොල් බවක් නැත්තාහුය. එහෙයින් මහාබෝධිසත්වයෝත් ගෙපිළිවෙලින් සිඟා සපදානචාරිකාංගය පුරණ භික්ෂු කෙනකුන් වහන්සේ මෙන් විලට බැසපු තැන් පටන් පන්තියෙන් ඇල් අනුභවකිරීමෙන් යෙති සෙසු හංසයෝ ඇතමෑත ඇවිද කන්නාහ. මූ ඒ දැක ලොළුප්පචාරයක් නැතිව හැමදවස්ම පන්තියෙන්ම කාගෙනයෙති මුන් බදාගත හැක්කැයි සිතා දෙවෙනි දවස් හංසයන් විලට නෙළුනතුරුම තාලියෙන් එතනට ගොස් නුදුරුතන්හි හංසයන්ගේ ඊම සැල සිදුරෙන් බලාගෙන උන්නේය. එකල්හි මහාබෝධිසත්වයෝ අනූදහසක් හංසයන් පිරිවරා ඊයේ දවස් ගොදුරු අනුභව කළ සීමාවට බැස ගොදුරු කන්ට පටන්ගත්හ.

එකල්හි සැලසිදුරෙන් බලාගෙන උන් වැදිපුත්‍රතෙම රූපයෙන් අග්‍රප්‍රාප්ත බෝධිසත්වයන් දැක මේ හංසරජ්ජුරුවෝ බන්ධුගැලක් සා පමණ මහත ඇත්තාහ. රන්වන්වූ පැයෙන් හා කරවටකොට රන් රේඛා තුනක් පිට ඔස්සේ තුනක් ඇතුළුවූ රන් ගිරින් පරික්ෂිප්තවූ මහබෝධිසත්වයෝ රන් පලස් හුයින් කරණලද සැලෙක් තුබූ රන් පිඩවල්ලක්සේ ඉතා බබලන්නාහු මේ කාරණයෙන් මුන් හංසයන්ට රජ්ජුරුවන්වූවමැනව මුන්ම අල්වමි සිතුයේය.

එකල හංසරජ්ජුරුවෝත් යපෙන විවර ගොදුරු කා දිය කෙළිනා කළ හංස සමූහයා පිරිවරණ ලදුව චිත්‍රකූට පර්වතයට ගියාහ. මේ නියායෙන් සත් දවසක් ගොදුරු අනුභව කළාහ. සත්වෙනි දවස් වැදිපුත්‍රතෙම කළුගස් හීලයෙන්ද ලනුවක් අඹරා උගුළු මලක්කොට සෙට හංසරජ්ජුරුවෝ අසවල් තෙනට බස්නාහුයයි තත්වයෙන් දැන දිය ඇතුලෙහි උගුළුමල එබූයේය. දෙවැනි දවස හංසරජ්ජුරුවෝ ඇවිදින් බස්නාවූ මල ඇතුලෙහි පය ඔබාගෙන බටහ.

එකල්හි බෝධිසත්වයන්ගේ පය යහපතකින් වෙලාගත් පරිද්දෙන් මල බැඳී ඇසිර ගියේය. එසඳ මල කඩාගනිමියි වෙග උපදවා ගසා ඇදලූයේය. රන්වන් සම ඉපිට ගියේය. දෙවැනිවත් රත්වූ මාංස කැඩීගියේය. තුන් වෙනිව නහර කැඩී වෙන්ව ගියේය. සතරවැනිව මලගසලා ඇද්දහොත් පය කැඩී යන හෙයින් රජව සිටුයවුන් විසින් අසථානයේ ජීවත නසාගැන්ම කටයුතු නොවෙයි සිතා මලකැඩීමට උත්සාහ නොකොට දුටුවක් දකිමියි වැදහුන්නාහුය. බලවත්වූ දුක්ඛ වේදනා උපන්නේය. එකල්හි මහ බෝධිසත්වයෝ ඉඳින් මම පඬරාවයෙන් බැගෑපත්ව හැඬීම් නම් මාගේ බන්ධුවර්ගයෙහි හංසයෝ හයින් ත්‍රස්තව ගොදුරු අනුභවනොකොට සාකුසිත් ගොස් විඩාව සමුද්‍රයෙහි ගොස් වැටියන්නාහුයයි සිතා බන්ධුසෙනහයෙන් දුක්ඛ වේදනාව ඉවසා උගුල ලීය. මැඩ ඔබාගෙන ගොදුරුකන කෙනෙකුන්මෙන් ඉඳ හංසයන් ගොචර ග්‍රහණයකොට දියකෙළිනට පටන්ගත්කල්හි මහත්වූ ශබ්දයෙන් බඬරාව පැවැත්වූහ. ඒ හයානක ශබ්දය අසා සියලු හංසයෝම තුන් මුල්ලක්ව ආකාශයෙහි නික්මුණාහ. සුමුඛ නම් සේනාධිපති මේ භය කවරකෙනෙකුන්ට පැමිණිදෝහෝයි මහත්වූ වේගයෙන් තුමු තුන්මුලෙහි හංසයන් බලා මහබෝධිසත්වයන් නොදැක ඒ කාන්තයෙන් මේ භය හංස රජ්ජුරුවන් වහන්සේට උපන්නේවනැයි ආපස්සෙහි අවුත් බැඳීපියා උන් බෝධිසත්වයන් දැක මහරජ භය නොකළමැනව මාගේ ජීවිතය දීපියා වී නමුත් නුඹ වහන්සේ ගලවමි කියා අස්වසමින් සමීපයට බැස මඩ පිට වැඩහුන්හ. එකල්හි මහබෝධිසත්වයෝ මෙතෙක් හංසයන් බලායාදී උදාකලව මම ලඟට ආ වැද්දහු ආ වේලෙහිත් හැරපියා නොයේදොහෝ යෙද්දෝහෝයි පරීක්ෂා කරනු පිණිස රන්වන්වූ ශරීරයක් හා සොඳ මුහුණක් ඇති සුමුඛයෙනි සියළු හංසයන් හයින් ත්‍රස්තව ඉස් එෑ එෑ අත පලායාදි තොපි උදකලාව පාසවසඟවූ මා සමීපයෙහි කුමට ඉඳුද එහෙයින් සතුරන් අතට අසුව ගියාවූ මාගේ සහායෙක් පිටිවහලෙක් ඇතැයි නොසිතා සතුරන්ගෙන් ගැලවී සිටි තොපි ව්‍යර්ථයේ නොනැසී මෙතනින් වහා පලායවයි කීහ.

එබස් අසා සුමුඛයෝ හංස රජ්ජුරුවන් වහන්සේ මාගේ තරම් නොදන අනුප්පියභාණි මිත්‍රයෙකැයි නොසිතනසේක. සෙනහ පක්ෂපාත බව මුන් වහන්සේට දන්වමි සිතා හංසරජ්ජුරුවන් වහන්ස මියතත් ැ කෙතත් එක්ව විනා දුකට පැමිණි නුඹ වහන්සේ හැරපියා යෙති නොසිතා මිත්‍රද්‍රෝහීවූ අසත්පුරුෂයන් හා මා සරිනොකළ මැනවැයි මම වනාහි බල්‍යාවස්ථාවෙහි පටන් එක්ව වැඩි යහළුව සිත්සේ වාසයකොට බන්ධු සත්වයකුත් ඇතිව සියළු හංස සේනාවට සෙනෙවිරත් ධුරය කෙරෙමින් සිට නුඹ වහන්සේ තනිව සතුරන්ට පාවාදිලා නැයන් මධ්‍යයෙටගොස් හංස රජ්ජුරුවන් වහන්සේ කොයිදැයි විචාළ කල කුමක් කියම්ද එසේ හෙයින් නුඹ වහන්සේ කම්මපාසායෙන් බැඳුනුසේක. මම සෙනෙහෙපායෙන් බද්ධවීමි. මියතත් ැකෙතත් එක්ව විනා තනිව යන්නේ නැතැයි කියා දළුවූ මිත්‍රත්වය ප්‍රකාශ කළාහ.

SANHIDA LANKA

මෙසේ හංස සේනාධිපතීන් අභිතනාදයක් පැවැත්වූ කල්හි හංස රජ්ජුරුවෝ කියන්නාහු එඹා සුමුඛයෙනි තොපට සාමීව අතිවිස්වාසීවූ මං දුකේහිදි අත් නොහැර නම් එසේකිරීම උත්තමයන්ගේ ගුනයෙක තොප දැක

දැක ඉන්නාවූ මට කිසි භයෙක් නැත්තේය. එසේද වී නමුත් මෙබඳු මැසනයට පැමිණ ගිය මාගේ ජීවිතය තොප විසින් ගලවාගත නොහැක්කේය. අප දෙදෙනාගේ වියෝගයෙන් දුක්ඛයට පැමිණ බන්ධුන්ගේ සෝක නිවමින් වහා නික්මෙව යනාදි කථාකරණ කල්හි විල් කෙලවර සිටි වැදි හංසයන් තුන් මුලක්ව ආකාශයෙන් නික්මුණාවුන් දැක කිමෙක්දෝහෝයි මල දිසාව බැලූයේ උගුල යටෙහි බැඳී එල්ලෙන්නාවූ බෝධිසත්වයන් දැක බලවත්වූ සතුටුව කැසපට තරයේ ගන්වාගෙන මුගුරක්ගත් අත් ඇතිව කල්පාන්ත වහ්නියක් මෙන් මැඩගෙන විළුඹෙන් නික්මුණු මඩකැටි ගොස් ඉදිරියෙහි ඉදිරියෙහි වැටෙන පරිද්දෙන් වේගයෙන් දිවෙමින් ගොස් හංසයාට ආසන්න විය.

එකල වේගයෙන් එන්නාවූ වැද්දහු දැක සුමුඛ නම් හංසසේනාධිපති හංස රජ්ජුරුවන් වහන්ස වැදි එන්නේය නුඹ වහන්සේ භයනොකල මැන වැයි අස්වසා කියමින් අමෝරාගෙණ එන මුගුරන් හංසරජ්ජුරුවන් වහන්සේට ගසාපී නම් නපුරුයි යන විශ්වාසය ප්‍රකාශ කෙරෙමින් පිටිපස්සේ උන් තැනැත්තෝ බෝධිසත්වයන් ඉදිරියෙහි සිට මාගේ ඥානණවිචරීන් නුඹ වහන්සේ ගැලවෙනි තියාවන් උත්සාහ කරන්නෙමි මාගේ උත්සාහයෙන්ම වහා ගැලවෙන සේක. එහෙයින් භයපත් නොකොට වැද්දහුන මැනවැයි බෝධිසත්වයන් අස්වසා වැද්දහු ලඟට අභිමුඛව ගොස් මිහිරිවූ මනුෂ්‍ය භාෂාව විහිදුවා සබඳ තෝ කිනම්දැයි විචාරා රන්වන් හංසයෙනි බෙමයයි කියන්නේ මටයයි කී හෙයින් එකල සුමුඛයෝ යහලු බෙමා තා විසින් එබු මලෙහි එසේ මෙසේ ලසු හංසයෙකු බැඳුනයි නොසිතව අනුදහසක් හංසයන්ට රජවූ ධෘතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන් වහන්සේය නුවනින්ද ගුණයෙන්ද සමන්විත සේක. බොහෝ දෙනාට උපකාරීව සිටිහෙයින් මරාපියපුතු නොවනසේක. ඉදින් තෝ මුන් වහන්සේගේ පියාපත් ඇරගන්නා කැමැත්තෙහි වීනම් මාගේ ඇඟපත් උදුරායන්වයි ඉදින් සම් මස් නහර ඇට ආදීන් කිසිවක් ගන්නා කැමැත්තෙහි වී නම් මාගේ ඇගින්ම හැරගනුව ඉදින් ක්‍රීඩාහංසයින් කරනු කැමැත්තෙහි වීනම් මාම සලසාගනුව. නොමරා විකොට සම්පත් ලබනු කැමැත්තෙහි වීනම් මා විකොටපියා හැරගනුව ජාතිගොත්‍ර කුලවර්ණස්ථානාදියෙන් මම සරි හෙයින් තොපට කිසි අලාභයෙක් නොවන්නේය. එහෙයින් ගුණ නුවණින් යුක්තවූ හංසරජ්ජුරුවන් වහන්සේ නොමරා හැරපු නම් මෙලෝ පරලෝ දෙකෙහි බොහෝ වැඩ වන්නේය. ඉදින් මැරුයේ වීනම් නරකාදි සතර අපායට පැමිණ බොහෝ දුක්විඳිනෙහියයි යනාදින් මිහිරිවූ කථා කියා වැද්දහුගේ සිත මොලොක් කොට නැවත බෝධිසත්වයන් දිසාවට නැමී ස්වාමිනි ඉතිකින් භය නොකළ මැනවැයි අස්වසා කීහ.

සුමුඛ නම් හංස සේනාධිපතින් විසින් කියන ලද සුභ සිතවූ බණ කථාව අසා සනොතාෂයෙන් ලොමහාෂිත් ගමනයට පැමිණ සූර්ය දිව්‍ය පුත්‍රයාට නමස්කාර කරණ කෙණෙකුන් පරිද්දෙන් බලවත් ආදර ගෞරවයෙන් දොහෝත් මුදුනෙහි බැඳී තිරිසන්ව උපන් කෙනෙකුන් මනුෂ්‍යභාෂාවන් මිහිරිකොට මෙසේ කථාකරණ කෙණෙකුන්මෙන් උපන්ජාතියට මා දුටුවිරුත් නැත්තේය. ඇසූවිරුත් නැති සබඳ මෙතෙක් හංසයන් මුලුල්ලම ඇරපියාදීත් උදකලාව ඉඳ ජීවිත පරිත්‍යාග කෙරෙමින් කියන්ට මේ හංස රජ්ජුරුවෝ තොපට කෙසේවූ බන්ධුත්වයක් ඇත්තාහුදැයි වැදි පුත්‍රයා විචාළේය.

එබස් අසා සුමුඛ නම් හංසසේනාධිපති මේ වැද්දහුගේ සිත මොලොක්වූයේය. දැන් වන හී මොළොක්කොට ගන්නා පිණිස මාගේ ගුණය ප්‍රකාශ කෙරෙමියි සිතා එම්බල වැදිපුත්‍රය මේ හංසරජ්ජුරුවන් වහන්සේ මා ඇතුළුවූ සියලු හංස සමූහයාට රාජයෙක එසේම මට ස්වාමිව සිටියාවූ උන් වහන්සේට උදකලාව වැසනයට පැමිණියාදී අපසේවූ ස්වාමි පක්ෂපාත උත්තමයෝ ඇර නොයන්නාහ. එසේ හෙයින් මම උන් වහන්සේ සමීපයෙහි රඳා එක්ව දකිනා දෙයක් විනා තනිව ගැලවීයන්ට නොසිතමි කීහ.

එසඳ උන් වහන්සේ විසින් කියන ලද ධම්මාන්විතවූ කථාවන් අසා සන්තෝෂයෙන් ලොමහෂෝත්ගමණයට පැමිණියාවූ වැදි ඉදින් මම මෙබඳුවූ සිලාචාර ගුණ ඇති හංසරජ්ජුරුවන් මැරීන් නම් සතර අපායෙන් ගැලවියා නොහෙමි රජ්ජුරුවන් වහන්සේ බඳාගත් හංසයා ඇරපුවේ ඇයිදැයි කිපී මට කැමැත්තක් කරණසේක්වයි මම හංස රජ්ජුරුවන් සුමුඛ නම් හංසයා ඇරපුවේ ඇයිදැයි කිපි මට කැමැත්තක් කරණසේක්වයි මම හංසරජ්ජුරුවන් සුමුඛ නම් හංස සේනාධිපතින්ට සතුටු පඬුරුකොට අරිමියි සිතා ස්වාභාවවූ මිත්‍රධර්මයන් රකිනා උතුම්වූ ගුණ ඇති සුමුඛ නම් සේනාධිපතිනි යම්බඳු තෙපි ස්වාමිව සිටි හංස රජ්ජුරුවන් නිසා ජීවිතය දෙමි කිවුද ඒ ගුණයෙහි සන්තුෂ්ටවූ මම දෙදෙනාම බන්ධුනයෙන් හරිමි කඳුළුහුනු මුහුණින් අඬන්නාවූ බන්ධුන් සන්තුෂ්ටි කෙරෙමින් දෙදෙනාම වහා නික්මවෙයි කියා මොළොක්වූ සිතින් මහබෝධිසත්වයන් කරාගොස් උගුල ලිය නමා මඩමත්තේ බෝධිසත්වයන් ඉඳවා උගුල ලිය මුදාහැර දැතින් වඩාගෙණ විලින් ගොඩ නැගී අළුත අටගත් සුවපහස් ඇති ඊතණ මත්තෙහි හිඳුවා බැඳිගිය මල බාල දරුකෙනෙකුන්ගේ කනමැලියම් බැඳිගියාවූ ලනුවක් අදනා සෙනහ මැනිකෙනෙකුන්මෙන් සෙමෙන් මලපුඩු ගලවා හැර බලවත්වූ හිත සිතින් විලින් පැන් ගෙනවුත් ලේ සෝධා හැර නැවත පය අතින් පිරිමැද ලූයේය. එක්ෂණයෙහි වැද්දහුගේ මෛත්‍රීන් හා බෝධිසත්වයන්ගේ පාරමිතා බලයෙන් සම් මස් නහර ගැලපී පය වණය සුවව නොබැඳුනු පට

SANHIDA LANKA

හා සරිව ගියේය.

එකල මහා බෝධිසත්වයෝ පය නොබැඳුනු වෙලෙහි පරිද්දෙන් නිදුක්ව උන්හ.

එසඳ සුමුඛ නම් සේනාධිපතීන් තමන් හංසරජ්ජුරුවන් සැපයට පැමිණ නියාව දැන බලවත්වූ සනොතාෂයෙන් පිනා මේ වැදිපුත්‍රහු විසින් අපට බොහෝ උපකාර කරණ ලද අප විසින් උපකාර කරණවුන්ට කළකිසි සංග්‍රහයක් නැත්තේය. ඉදින් මෙතෙම රජ යුවරජ ඇමතිකෙනෙකුන්ට දෙන පිණිස අප ඇල්වීනම් ඔවුන්ගෙන් බොහෝ සම්පත් ලබන්නේය. නොහොත් තමා නිසා ඇල්වීනම් විකොට පියාත් ලබන්නේය. එසේ හෙයින් වැද්දාට උපකාර කරණු කැමතිව මේ කාරණය විචාරන්නාවූ හංස සේනාධිපති එම්බල වැදිපුත්‍රය තාගේ අභිප්‍රායෙන්ම හංසයන් බදනපිණිස මල එබි නම් තොප විසින් දුන් අභයදානය සැපසේ පිළිගනුම්හ. ඉදින් අනුන්ගේ කීමෙන් බැඳුයෙහි වී නම් දූන් තොප විසින් ඇරපුකල අප බදාදෙම්හයි කියා අනුන්ගෙන් විඳපු යම් ප්‍රයෝජනයෙක් ඇත්නම් ඒ සියල්ල තොප නය වේදැයි කීහ.

එබස් ඇසූ වැදිපුත්‍රතෙම සුමුඛයෙනි මාගේ ප්‍රයෝජනයක් තකා බැඳුයෙම් නොවෙමි බරණැස් නුවර රජ්ජුරුවන් වහන්සේගේ අගමෙහෙසුන් බිසවුන් වහන්සේ රන්වන් හංසයන්ගෙන් බණ අසන්ට දොලක් අටගත්සේක. එනිසා මට බොහෝ ප්‍රසාදදී හංසයන් එකකු හෝ දෙන්නකු හෝ බදාගෙන එවයි කළ රාජසම්මතයෙන් බැඳිමියි කීයේය.

එකල හංස සේනාධිපති සබඳ එසේකල අප අරින්ට කටයුතු නොවෙයි යම් කෙනෙකුන්ට සේවකව සිටියානම් උන්ටම ගෙනගොස් පාවාදෙව ඒ රජ්ජුරුවෝම අභිප්‍රාවක් කෙරෙති, එසේහෙයින් සැකනොකොට ඔබම ගෙනයවයි කීහ. එකල වැදි හංසරජ්ජුරුවන් වහන්ස රජ දරුවන්ගේ දූකීම යහපතැයි නොසිතූ මැනව ඉසුරු ව සිටියෝ නම් නුඹ වහන්සේලා දක කෙළි හංසකොට රඳවා ගනිති මරවාපියා මස් හෝ අනුභව කරපියති. එසේ හෙයින් රජ දරුවන් දූකීමෙහි උත්සාහ නොකළ මැනවැයි කීහ.

එකල සුමුඛ නම් හංස සේනාධිපති එම්බා වැද්දානෙනි තොපසේවූ තද රැක්ෂකෙනෙකුන් පවා බණ කථාකිරීමෙන් මොලොක්කොට ගතිමි විශිෂ්ටවූ පින් හා නුවණ ඇති රජ දරුවන් මොලොක්කරවා ගැන්ම මට ආශ්වර්යය නොවන්නේය. රජ දරුවෝ නම් නුවන ඇත්තාහ. සුභාසිත වචනයෙහි එල ඇති නියාව දනිති ඒ කාරණය හේතුකොටගෙනම රජ්ජුරුවන් කරාම අප ගෙනයන වෙලෙහිත් බැඳලා නොහෙන ගොසින් හංසරජ්ජුරුවන් වහන්සේට මැදිරියක් ඉදිකොට එලපියුමෙන් සාදා මට කුඩා මැදිරියක් කොට එල රත්පියුමෙන් සදා මැදිරියෙක කදෙහි බැඳ අප දෙදෙනා එහි හිඳුවාගෙන හංස රජ්ජුරුවන් වහන්සේ ඉදිරිකොට උස්කොට මා උන් මැදිරිය පසුකොට මදක් මිටිකොටගෙන ගොස් ඒ රජ්ජුරුවන්ට පාවාලවයි කීහ.

එබස් අසා වැදිපුත්‍රතෙම මේ සුමුඛ නම් හංසයාණෝ රජ්ජුරුවන් වහන්සේ දූක මට බොහෝ සම්පත් දෙනුකැමැත්තෝවනැයි බලවත් සන්තෝෂයට පැමිණ කි සැටියේම කදෙක්හි සලසාගෙන රජ්ජුරුවන් සමීපයට නික්මුනේය. මෙසේ ගෙණයන්ට වන්කලහි හංසරජ්ජුරුවන්වූ පාක හංස රජ්ජුරුවන්ගේ දියනියන් තමන්ගේ භාර්යාවවූ හංසධේනුව සිහිකොට කෙලශ වසඟවූ සෝකයෙන් පිඩිතව එඹාසුමුඛයෙනි අපට පැමිණ මේ දුක්ඛයන්ටත් වඩා ලක්ෂණාන්විතවූ ඌරුවන්දයක් ඇති ස්වර්ණපත්‍රයෙන් සඤජන්න හෙයින් සුහෙමායයි කියනලද හංසධෙනුතොම අපට පැමිණිමේ දුක්ඛය අසා සමුද්‍රයෙහි වැටිගිය සාම්පුත්‍රයා කෙරෙහි සෝකයෙන් වෙරළඔස්සේ අඬා ඇවිදිනා කොස්ලිහිනියක පරිද්දෙන් අඬාමිය කියන මේ දුක්ඛය මා සහනයකළ නොහෙන්නේයයි කීහ.

ඒ අසා සුමුඛයෝ මේ හංස රජ්ජුරුවන් වහන්සේ අනුන්ට අවවාද අනුශාසනා කරන්ට කිසිවසිටිසේක් ස්ත්‍රියක නිසා කෙලශවසඟව දියෙන් ගිනි නැගී කලක් පරිද්දෙන් වැටගොස් ගොයම් කන කලක් පරිද්දෙන් නන්දොඩන සේක. එබඳූවූ මුන් වහන්සේ මාගේ බලයෙන් අස්වසමි සිතා අවවාද කරන්නේ සියලු හංස සමූහයාට ගණ ශාස්තෘවූ ගුණ ඇති හැමසත්වයන්ටම ප්‍රධානව සිටි නුඹ වහන්සේ එක හංසධෙනුවක නිසා සෝක කිරීම නුවනැත්තවුන්ට තරම් නොවන්නේය. තවද මහරජ ස්ත්‍රී ජාතිහු නම් සුවඳ බඩුතනා තිබූ සල්පිලෙක්හිද අමෙධ්‍ය පිරුණු භූමියෙක් හිත්නොතෝරා පවතිනා පවනක් පරිද්දෙන් අඹ දඹ ආදීන් එලහරිත ගසක්යට උන් බාලදරුකෙනෙක් අමුවිලකුන් එලමෙය අතට අසුවුදෙයක්ම ගෙන නොතෝරායම්සේ අනුභවතෙරෙද්ද ඇස්නැති අන්ධයෙක් ආහාරයක්ගෙන අභිමුඛයෙහි තිබූ කල්හි යහපත නපුරැයි නොතෝරා රසතෘෂ්ණායෙන් බැඳි අතට අසුවූ දෙයක්ම අනුභවකොරෙද්ද එපරිද්දෙන් මාතුගාමයෝත් කෙලශවසඟව පුරුෂකෙණෙකුන් කැමැතිවූ නම් පොහොසත්හුද දුප්පත්හුද හින ජාතිහුද උත්තම ජාතිහුද විශිෂ්ටවූ රූපශ්‍රී ඇත්තාහුද බලන්ට අප්‍රිය විරූපවුද යම්සත්වකෙනෙකුන් දූක නොතෝරා භජනය කරණ පාපී ගුණ ඇත්තාහ.

තවද මහරජ මේ ස්ත්‍රී ජාතිහු නම් සියල්ලවුන්ට සාධාරණ බැවින් සුරාපාන සාලාවක් වැන්නහ. සියලු

SANHIDA LANKA

පුරුෂයන් වඤ්චාකොටපියන හෙයින් ඉන්ද්‍ර ජාලාවක් වැන්නහ. දුරසිට බැලුවන්ට අත් අල්වාගත හැකි වස්තුවක්සේ පෙනී සමීපස්ථවූයේ කිසිවක් නැත්තාහු මිරිගු ජලයක් මෙන් කිසිස්වාභාවි ගුණය නැත්තාහ. තමන් වසඟවූ කෙනෙකුන්ට හැමවෙලෙහිම සෝක හා කාස්සවා සාදීවූ රෝගයෙන් උපදවන හෙයින් අමුනුෂ්‍ය කෙණෙකුන් වැනියාහ. මාතෘ මාරයා විසින් පුරුෂයන් තමා සමීපයට බෙදාගෙන එන පිණිස ගෙයි ගෙයි තබන ලද පාස බන්ධනයක් වැනියහ. එසේවූ ස්ත්‍රීන් කෙරෙහි යම් පුරුෂයෙක් සක්තව මමය මාගේ යයි සිතානම් එතෙම මනුෂ්‍යයන්ගෙන් අධම වන්නේය. එසේ හෙයින් කාරණ කාරණා දන්නවූ නුඹ වහන්සේ මේසා දුකකට පැමිණ ගියවෙලෙහි ඉන්ගැලවියන්ට නිසි උපදේශයක් නොසිතා නුවණ මදකෙණෙකුන් සේ ස්ත්‍රියක නිසා සෝක කරණ සේක. මේ නුඹ වහන්සේ කරණ කාරිය රා බී මත්ව අඬා වියරුහුනු රා සොඬක්හු කියන දෙයක්සේ විනා නුඹ වහන්සේ වැනි උතුම් ගුණ ඇතියවුන්ට මේ අවස්ථාවෙහි මෙබඳු බස්කීම තරම් නොවන්නේයයි රුහැනිව කීයේය.

එකල මහ බෝධිසත්වයෝ බලවත්ව ස්ත්‍රී වසඟවූ සිත් ඇති හෙයින් මෙතෙක් කාරණා කීවත් ඒ නොඅසාම එඹා සුමුඛයෙනි මාතෘගාමයන්ගේ ගුණ තොපට නොදනෙන්නේය. නුවනැත්තෝ දන්නාහ. එසේහෙයින් ස්ත්‍රී ජාතීහු නම් ප්‍රථම කල්පයේ පහළවන්නාවූ සත්වයන්ට පළමුව ස්ත්‍රී ලිඟු පහළවූහෙයින් ප්‍රධානවූ ගුණ ඇතියහ. තවද යම් ක්‍රීඩාවිනොදයෙක් ඇත්නම් ඒ හා කාම ගුණ රතිය යනාදි මේ සියල්ලත් උන් කෙරෙහි පිහිටියේය. තවද බුද්ධප්‍රත්‍යෙක බුද්ධ ආර්යය ශ්‍රාවක චක්‍රවර්ති ආදී දරු බිජුවටෙක් පහළවෙනම් උන් ගේ කුස ඉපිද වැඩිවිය පැමිණෙන්නේය. එසේහෙයින් මෙතෙක් ගුණ ප්‍රයෝජන ඇති මාතෘගාමයන් ලදින් කවර නුවනැති සත්වයෙක් තමාගේ ජීවිතය හරණේවිනමුත් උන් කෙරෙහි කලනොකිරෙන්නේය. එහෙයින් සුමුඛයෙනි සෙස්සෝ මතුනොවෙයි තොපත් ස්ත්‍රී වසඟව ඇවිදිනා නියාව මමත් දනිමි. දූන් තොපට බය පැමිණි වෙලෙහි ඒ අභිප්‍රාය ඇරිගියේද යම්කිසි සත්වකෙනෙක් ජීවිත සංසයවන්ට නිසිවූ සායකට පැමිණියා නමුත් ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳවූ සිත් ඇති සියලු දුක් සහනය කරන්නාහ. එහෙයින් ඉසුරුව සිටියෝ නොකටයුත්තෙහි අභිප්‍රාය වී නම් ඒ කරන්නා කැමැත්තහ. එහෙයින් රජ දරුවන් ආදී ආවඩ්ඩකෙනෙක් තමන්ට පැමිණ ආපදාවක් දුරුකොට ලන්ට නිසිවූ මන්ත්‍රීවූ ඉන් මිත්‍රකෙනෙකුන් තමන්ගේ තනතුරු හා සරිකොට තබා රකිනාහුය. එහෙයින් සුමුඛයෙනි තොපිත් මා විසින් ඉසුරෙහි පිහිටුවනු ලදුව ඒ කාරණයෙන් රජ්ජුරුවන්ගේ අරක්කැමියෝ අප මාංශය පිණිස මරම්හයි යම්සේ නොකියත්නම් එපරිද්දෙන් උත්සාහ කරවා දූන් අපට පැමිණ නාරිය විදගිය උනගසක් එල ජාතිය හා එක්ව නැසෙන්නාසේ තෙපිත් නොනසී මාත් නොනසව කුමක්නිසාදැයි යතහොත් වැද්දහු විසින් මලින් ගලවා  කැමති සැටියේ චිත්‍රකූට පර්වතයට පලායවයි මා හා සමඟ ඇරපියන ලදුවත් පලානොගොසින් රජ්ජුරුවන් දකිනා කැමැත්තම්හයි තොපිම නැවත බන්ධනයට පැමිණියාවූ හෙයින් මේ භය තොප නිසා පැමිණෙන්නේය. ඉතිකින් මේ බන්ධුනයන් යම්සේ ගැලවියමෝ නම් නිසි උත්සාහ කරතොත් විනා ස්ත්‍රීන්ගේ ගුණ කියම් කට නොසොල්වව යනාදින් අවවාද කිහ.

මාතෘගාමයන්ගේ ගුණ කියා සුමුඛයන් කිසි උත්තරයක් කියනොහී කරබා වික්‍ෂෙපවූ නියාව දූන උන්ගේ සිත් ගන්නා කැමතිව මහබෝධිසත්වයෝ සබඳ සුමුඛයෙනි තොපි මා මලෙහි බැඳිගිය වේලෙහි මාගේ උත්සාහයෙන් ගලවාලම් සැකනොසිතව මැනවැයි කීවා නොවේද දූනුත් තොපගේ උත්සාහයෙන් ගැලවෙතොත් විනා මාගේ සමර්ථයෙන්  ගැලවීයෙතියි නොසිතා අප දෙන්නාගේ ජීවිතය රැකීමෙහි උත්සාහකරවා යනාදින් මොලොක් බස්කීමෙන් සතුටුකළහ. එකල්හි සුමුඛයෝ මේ හංස රජ්ජුරුවන් වහන්සේ මරණට ඉතාභය ඇතිසේක. රජ්ජුරුවන් දැක බසක් කියා පියන විවරට අවසර ලදින් නම් ගලවාගැන්ම මට කුමන අරුමයෙක්ද එසේහෙයින් අස්වසම් පක්‍ෂිරාජයානන් වහන්සේ භයනොගත මැනව දන්නා යම් උත්සාහයෙකින් ගලවාගැන්ම මට භාරයයි කියා මරණ සෝක දුරුකෙළේය.

මෙසේ ඒ හංසයන් දෙදෙනා පක්‍ෂින්ගේ භාෂාවෙන් කරණ කථා කිසිවකුත් නොදූනම කඳෙහි හිඳුවාගෙන ගොස් බරණැස් නුවරට වැද්දහුවන් කල්හි රන්වන් හංසයන් දකිමින් විස්මයට පත්ව දොහොත් මුදුනෙහි බැඳ ප්‍රියවූ කථා කෙරෙමින් පිරිවරාගත් මහජනයා එක්ව රජගෙයි වාසලට පැමිණ ධ්‍රතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන් හැරගෙන ඛේමා නම් වැදි වාසල සිටියේයයි දන්වාලවයි කී හෙයින් දොරටුපාලයා ගොස් එපවත් රජ්ජුරුවන්ට දූන්විය. එසඳ රජ්ජුරුවෝ බස් අසමින් වහාගෙනෙවයි නියොග කොට අමාත්‍යමණ්ඩලයා විසින් පිරිවරණලදුව නගන ලද ධවලාතපත්‍ර ඇති රාජායන මස්තකයෙහි උන්නාහ. ඛේමා නම් වැද හංසයන් කඳින් ඇරගෙන මතුමාල්තලයට නැංගාහු දැක රන්වන් හංසයන් බලා මාගේ මනෝරථය සමුර්ධිව ගියේයයි වැද්දහු කෙරේ සමාධිවූ රජ්ජුරුවෝ  අමාත්‍යයක්හට මොහු සරහා ගෙනවයි විධානකළහ. ඒ නියෝගලත් ඇමති වැද්දහු කැඳවාගෙන ගොස් දූලි රවුළු අනදම්තිබා සරහා ඉස්සෝධා නහවා චන්දන කුංකුම ආදීවූ සුවඳ ගල්වා වස්ත්‍රාභරණාදීන් සරහා රජ්ජුරුවන් දක්වාලුයේය. එකල්හි රජ්ජුරුවෝ වැද්දහුට අවුරුද්දෙන් ලක්ෂයක් බැගින් නිමනගම්වර දොළොසක්ද මංගල අශ්වයන් යොදනලද සියලු රථාලංකාරයෙන් සැරහුනු රථායානක්ද

SANHIDA LANKA

සියලු ගෘහෝපකරණයන් සමුර්ධිවූ ගෙයක් හා දාසි දස් පරිවාර ආදී බොහෝ සම්පත් දුන්හ.

බලවත් අභිප්‍රායෙන් දක්නා කැමතිව ගෙන්වාගත් හංසයන් හා කථා නොකොට ම තුෂට රුෂ්ට දෙක්හි සංග්‍රහ නිග්‍රහය එකෂණයෙහි කිරීම රජ්ජුරුවන්ගේ ස්වභාව ගුණයක් හෙයින් මේසා ලාභයක් මට පැමිණියේ වැද්දහු නිසායයි වස්තුයෙන් පළමුකොට ඔහු සන්තුෂ්ට කළහ.

එකල වැදිපුත්‍රතෙම සමාධිව දේවයන් වහන්ස මා විසින් එසේ  මෙසේවූ හංසයෙකු බඳුගෙන ආවයි නොසිතුව මැනව. මූ අනුදහසක් හංසයන්ට නයකවූ ධ්‍රතරාෂ්ට නම් හංස රජ්ජුරුවෝය, මූ උන්ගේ සුමුඛ නම් හංස සේනාධිපතියයි වෙන වෙනම තරම් කීයේය. එබස් අසා සතුටු රජ්ජුරුවෝ එඹා ඛේමායෙනි අනුදහසක් පමණ හංසයන්ගෙන් මධ්‍යවර්තීව ඇවිදිනා හෙයින් බලවත්වූ ආරක්ෂා ඇතිව උත්තමවූ හංස රජ්ජුරුවන් කරා මලක් ඇරගෙන හංස සමූහයා කරා මැද වැද කෙසේ බදාගතිදැයි විචාළාහ.

එබස් අසා වැදි පුත්‍රතෙම දවසක් මුළුල්ලෙහි ගොචරභූමිය බලා ඇවිදිනා මම උතුම්වූ ගුණ ඇති හෙයින් හැමදවස්ම එකතෙනට බැස පන්තියෙන් ගොදුරු අනුභව කොටයන හංස රජ්ජුරුවන් වහන්සේගේ ගමණ දැක සත්වෙනි දවස් ඒ අසරෙහි මළඹබා බදාගතිමියි කීයේය. එබස් ඇසූරජ්ජුරුවෝ මේතෙම දොරකඩ සිට කියා එන්නෙත් ධ්‍රැතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවන් ගෙනාමියි කියාඑවිය දන් බැදු සැටිය කියන තැනැත්තෝ මේ හංස රජ්ජුරුවෙන් බැඳු නියාව කියන්නේයයි එඹා වැද්දනෙනි තොප ගෙනාසේ හංසයන් දෙන්නේකුය කියන්නේ එක්කෙනකුන්ගේ කාරියය කිමෙක්ද අන්ද මන්ද කියයිද නොහොත් මට එකක්හුදී අනික්තෙනකට අනිකා දෙනුකැමැතිව කියන්නෙහි දැයි විචාළාහ.

ඒ අසා වැදිපුත්‍රතෙම දේවයන් වහන්ස මාගේ චිත්ත වික්ෂේපයකුත් නැත්තේය. මින් එක් කෙනෙකුන් අනික් තෙනකට දෙන අභිප්‍රායකුත් නැත්තෙමි. එතකුදුවුවත් කරවට සිට පිට ඔස්සේ නික්ම විනිවිද සිට රෙඛාමාත්‍රයකින් සැරහුනු කලඹක්සේ පදවුනාවූ මේ හංස රජ්ජුරුවන් මලෙහි බැඳි දුකට පැමිණියා දැක ඉස්ලුලු අත යන හංසයන් හා එක්ව නොගොස් බඬරාවය අසා මුගුරක් ගත් අත් ඇතිව සමීපයට එන්නාවූ මා දැකත් මුන් වහන්සේ ඇරපියා නොගොස් මා ඉදිරියට අවුත් මිනිස් කෙනෙකුන් කථා කරණ පරිද්දෙන් මිත්‍රධර්මයේ ගුණ කියා මාගේලය මොලොක්කොටගෙන මේ හංස රජ්ජුරුවන් ගැලවුසේකුත් මෙතනට කැඳවාගෙන ඊමක් කොළොත් මේ සුමුඛ නම් හංස සේනාධිපතීන්ගේ කිමෙනැයි යනාදින් උන්ගේ බොහෝ ගුණ කීයේය.

එබස් ඇසූ රජ්ජුරුවෝ සුමුඛයන්ගෙන් බණ අසනු කැමතිවුවාහුය වැද්දහුට සත්කාර කරණ කලින් ඉරුහස්තයට ගියේය යහපත් ආලෝක පැවැත්වුහ. එකල්හි රජ දරුවෝ බොහෝ රැස්වුහ. ඛේමා නම් බිසවුන් චුල්ල නාටකය මජ්ජිම නාටකය තමන් හා සමාණ ජාති ඇති නාටක ස්ත්‍රීන් හා යන තුන් පක්ෂයෙහි කම්මිත්තන් පිරිවරණලදුව අවුත් රජ්ජුරුවන් දකුණු අතින් පාර්ශවයෙහි උන්හ. එකල රජ්ජුරුවෝත් සුමුඛයන් හා කථා කරනු කැමතිව ඇයි සුමුඛයෙනි මිහිරිවූ කථා දනිතියි යන තොප මුයෙන් නොබැන ඉදිරියේ අස්ථාන භයින්ද කවර නිසාදැයි විචාළාහ.

එබස් ඇසූ සුමුඛයෝ කසීදේසයට අධිපතිවූ මහරජ නුඹ වහන්සේගේ පර්ෂිද් මධ්‍යයට පැමිණ අස්ථාන භයින් බැණ නොනැගෙමි නොවෙමි. මා හා කථාකරවන්ට සුදුසු ප්‍රස්ථාවක් අවසරයක් බලා උනිමි කිවුය. එබස් ඇසු රජ්ජුරුවෝ සුමුඛයන්ගේ බස් බොහෝ කරණු කැමතිව වෙහෙසන්නාවූ සුමුඛයෙනි නොබාමි කියන්ට තොපට රකවල්ගෙන සිටි රථසේනාව කොයිදසන්නාහ සන්නද්ධව කඩුපලග හා දුනු දඬුගත් සේනා සමුර්ධියක්වත් රත්‍රන් රිදී මුතු මැණික් ආදී වස්තු සමුර්ධියටත් අප දකිනා නැතිකල නොබමියි කියන්ට කාරණා කින්දැයි විචාළහෙයින් සුමුඛයෝ කියන්නාහු දේවයෙනි අපට රැකවල් දහවල් ආදියකින් මේවයි ගෙවල් දොරවල් සම්පත් ආදී කිසිවකින් ආකාසචාරිව ඇවිදිනා අප හැමට ඉන් ප්‍රයෝජන නැත්තේය. තවද ධ්‍රතරාෂ්ට කුලයෙහි හංසයෝ නුවනැත්තාහුයයි ඇසූයේ ඇත. ඒ කාරණය හේතුකොට ගෙන බණ අසනු කැමතිව අප අල්වාගෙන්වූසේක. අදින් සබවසේ පිහිටි සේක්වීනම් කාරණා නිශ්‍රිතවූ බස් කියම්හ. බසවිවරකුත් රැකගත නොහි මාෂාවෘදීවූ නුඹ වහන්සේට සුභාසිතවචනය ඇසීමෙන් ප්‍රයෝජන කින්දැයි කීයේය. එබස් අසා රජ්ජුරුවෝ බොරු කියති අධම ගුණ ඇත්තාහයි කුමක් නිසා මට කිව්දැයි විචාළාහ.

SANHIDA LANKA

එකල්හි සුමුඛ නම් හංස සේනාධිපතීතෙම එසේ නම් ඇසුව මැනව මහරජ නුඹ වහන්සේ බ්‍රාහ්මණයන්ගේ කීමෙන් ඛේමා නම් විලක්කරවා නිරන්තරයෙන් අභය ඝෝෂාකරවුසේක. එහෙයින් සියලු පක්ෂි ජාතිය විලට බැස ගොදුරු කා ගිය ස්ථානයෙහි ඉඳ විල නිරුපද්‍රවයයි කියති, ශාතපරම්පරාවෙන් ගෝචර ග්‍රහණය පිණිස පැමිණියාවූ අපි පාසබන්ධනයට අසුව ගියම්හ. එහෙයින් පලමුකී අභයදානයට මේ බෙරුනොවේද මෙබඳුවූ බොරුවක් මුල්කොට  ඇති ලෝභ තෘෂ්ණා සංඛ්‍යාත පාපකර්මයෙන් යුක්ත සත්වයෝ දිව්‍ය මනුෂ්‍ය සම්පත්තීන් ඉක්ම සහනය කළනොහැක්කාවූ නරකාදී අපායෙහි දුකට පැමිණෙන්නාහ යනාදීන් කියා පර්ෂිත් මධ්‍යයෙහිම

ලජ්ජාකරවූයේය. එකල්හි රජ්ජුරුවෝ එම්බා සුමුඛයෙනි තොප මරා මස් කන පිණිස ගෙන්වූයෙම් නොවෙමි විශිෂ්ටවූ නුවණ ඇත්තාමයි අසා සුභාසිතවූ මිහිරිකථාවන් අසන පිණිස ගෙන්විමියි කීහ. එබස් අසා සුමුඛයෝ මහරජ අපි මරු කරා ගෙන ගියත් මරුකරා ඇවිත් පැමිණියේ විනමුත් එහි නයක් නැත්තම්හ. බණ අසන්නා කැමතිකෙනෙක් ධර්මකථිකයන් මරාතලා වධබන්ධනකොට නසන්නාහු දැයි එහෙයින් තොප විසින් කාලෙයුක්තියෙක් නෙවෙයි තවද යම් සත්වයෙක් වනාහි සෙමුවන් පැමුවන් මැරීමද පක්ෂීන් පැ පක්ෂීන් ජාතිනි මැරීමද අභයදානයයි බසින් කියා භය ඉපදවීම්මද යනාදීවූ මේ කාරිය කරන්නේ විනම් ඊට වඩිනා අනික් වැරැද්දදෙක් නැත්තේය, මෙබඳුවූ සත්ව උභයලෝකාර්ථ සිද්ධියෙන් පිරිහෙන්නේයයි යනාදීන් ධර්මදේශනා කළහ.

එබස් අසා සතුටුවූ රජ්ජරුවෝ හංසයන් දෙදෙනා ඉදිනා නියායෙන් විශිෂ්ටවූ ආසන පනවා අනුභවයට නිසි ගොදුරු එලවා යම්සේ මේ සුමුඛ නම් සේනාධිපති හංස රජ්ජුරුවන්ට සැපවේලේ සැපවිඳ දුක් වේලෙ දුක්විඳිමෙන් ජීවිතය හා සමාන යහපත්වූද මනුෂයන්ගෙනුත් මෙබඳුවූ ගුණ ඇති කෙනෙක් ඉසුරුව සිටි සාමින්ගෙන් වැටුප් වියදම් කාරීදිරවාගන්ට නිස්සාහය යනාදීන් ගුණ ඇති කෙනෙක් ඉසුරුව සිටි සාමින්ගෙන් වැටුප් වියදම් කාරිදිරවාගන්ට නිස්සහනය යනාදින් ගුණ කීහෙයින් අමාත්‍යයන් විසින් එක්ෂණයෙහි සරහණ ලද රන් කමින් විසිතුරුවූ පා අටකින් උපලක්ෂිතවූ මෘදුකොමල සිනිඳු පහස් ඇති පිරිසිදු කසීසලුවක් අතුරණලද පුටුයෙහි බෝධිසත්වයෝ උන්හ. දිව්සමින් වලඳනා ලද රන්කමින් විසිතුරු බඳවෙලුයෙක්හි සුමුඛයෝ උන්හ. කසීරට වාසී බොහෝ දෙනා රන්තැටිය අනේකප්‍රාකාරවූ රසයෙන් යුක්තව ආහාර දම් හා විලඳ ශර්කරා පැන් ආදීන් එලවා සන්තර්පිත කරවුහ.

එකල්හි හංසරජ්ජුරුවෝ බරණැස් රජ්ජුරුවන් විසින් කරන ලද ආදර හා සත්කාර දැක පිළිසඳට කථා කරන්නාහු මහ රජ සුවදුක් කිම්ද තොපගේ රාජ්‍යය ධන ධාන්‍යයෙන් සමුර්ධිවූ අමාත්‍ය සේවකාදීහු පක්ෂපාතව පැමිණි කාරියක් තමන්ගේ ජීවිතයට නොසිතා කෙරෙද්ද අගමෙහෙසුන් බිසවු රූපයෞවනාදියෙන් නොනැස්ව දූ පුත් දරුවන්ගෙන් සමෘද්ධිව වෙසෙද්ද යාගය ක්‍රියාවක් නැතිව පරීක්ෂා වට දෝෂානුරූප පරිද්දෙන් දුෂ්ට නිග්‍රහ ශිෂ්ට පරිපාලනය කෙරෙමින් දැහැමෙන් සෙමෙන් රාජ්ජයවාසීන් රැක සවර්ගමෝක්ෂ බාධක කටයුත්තෙහි යොදන්නාවූ දුර්ජනයන් දුරුකොට මෙලෝ පරලෝ වැඩ පසන්නාවූ ශ්‍රමණ බ්‍රාහ්මණාදින්ට උපස්ථාන කරන්නාවූද ධර්මාන්විතවූ වෘත්තියෙන් ජනරඤ්ජනය කරවුදැයි දීර්ඝ දර්ශවඑපත් කාලයෙහි ආයුහංස්කාරාදී සියලු ප්‍රවෘත්තිය අර්ථයයි මෙනෙහිකරවූ දරුපාදී ඇල්ම බන්ධනයෙහි සක්තව රාගද්වේශාදීන් වසඟයෙහි නොපැවතෙනහිද පරලො සිස්නොකොට භය ඇතිව වාසය කරවුදැයි යනාදින් මහබෝධිසත්වයෝ පිළිසඳර කථාවශයන් රජ්ජුරුවන්ට ධර්මදේශනා කළහ.

ඒ අසා රජ්ජුරුවෝ හංසරජ්ජුරුවන් වහන්ස නුඹ වහන්සේ විසින් විචාරන ලද්දාවූ සියල්ලෙහිම විරෝධයක් නැතිව පවතිමින් සිටියෙම් තවද ශ්‍රමණ බ්‍රාහ්මණාදී උත්තමයන් විසයෙහිද දානයද නිරන්තර වශයෙන් පඤ්චශීලාදිවූ සිල්රැකීමය දුගීමගියාචක පුත්‍ර මිත්‍ර කලත්‍ර බන්ධුවර්ගයාදී සියලු සත්වයන්ට උපභෝග පරිභෝගාද වස්තුදීමය සැලසිත් නැතිව ඍජුවූ පැවතුම් ඇති බවය. තද මසුරුනොවී මොලොක්බවය. පෝයක් පාසා පෙහෙවස් රැකීමය. කිපිසුළු නොවීමය. අනුන්ට හිංසා පීඩා නොකිරීමය සහනසිලී බව සර්වසාධාරණයයි කියන ලද දසරාජ ධර්මයන්ට විරෝධයක් නොකොට මා කෙරෙහිම පිහිටියා දකිමි මේ කාරණය හේතුකොට ගෙණ හැමවෙලෙහිම සතුටුව වාසය කෙරෙමි යනාදින් මහා බෝධිසත්වයන්ට අභිනන්දනය කෙරෙමින් මේ සුමුඛ නම් හංසසේනාධිපති අපගේ සිත් භය නොදන සභාමධ්‍යයෙහි පරීක්ෂානොකොට කිපී දෙඩුය. එතෙම නුවනැත්තවුන්ට තරම් නොවන්නේයයි කීහ.

එබස් ඇසූ සුමුඛයෝ උනස්නෙන් නැගී බැස දෙපියායෙන් ඇඳිලිබැඳ මහරජ හංසරජ්ජුරුවන් වහන්සේ මලෙහිවබැඳි දුක් විඳිනා දැක මාගේ සිතට බොහෝ දුක් පැමිණි හෙයින් යුහුසුළුව වරදවාකිම් දරුවන්ගේ වැරදි ඉවසන මව්පියන් මෙන්ද පොළොව පැකිල හුණුවන්ට පොළොවම පිහිටවූවාක්මෙන් නොදන කීවාවූ අපට ක්ෂමා කළ මැනවැයි යාච්ඤා කළහ.

ඉක්බිති ඒ අසා රජ්ජුරුවෝ ප්‍රිය පුත්‍රාක්හු සනහන්නාවූ පෙම්බර මවක පරිද්දෙන් සුමුඛයන් දෝතින් වඩාගෙන සිංහසනහා රන්පුටුයෙහි හිඳුවා එම්බා සුමුඛයෙනි තොපගේ ඍජුභාවයෙහි ප්‍රසන්නවූ මම තොපට ක්ෂමා කෙළෙමියි ක්ෂමා කොට මහබෝධිසත්වයන්ගේ ධර්මකථාවෙන් හා සුමුඛයන්ගේ ඍජුභාවයෙන් ඇති ප්‍රසන්නව සතුටු ආකාර දක්වමින් හංසරජ්ජුරුවන් වහන්ස මාගේ මේ රාජභවනයෙහිද රාජ්ජයෙහිද යම් රත්‍රන් මුතු මැණික් වස්ත්‍රාභරණ යකඩ ලෝකඩ ආදීවූ සියලු ඓශවර්යයෙන් යුක්තවූ රාජ්‍ය ශ්‍රී ධවලාතපත්‍රය හා සමඟ පාවාදෙමි අද පටන් රාජ්‍ය කළ මැනවැයි රාජ්‍යයෙන් පූජා කොට ආරාධනා කළහ.

SANHIDA LANKA

ඒ අසා ධ්‍රතරාෂ්ට්‍ර හංස රජ්ජුරුවෝ බරණැස් රජ්ජුරුවන්ට ජන ප්‍රධාන වූ රජ්ජුරුවෙනි ඒකාන්තයෙන් තොප විසින් සත්කාර සම්මාන කරණ ලද්දේ මොවුන් දැහැමෙන් ජීවත්වන්නාවූ අපට තොපි ආචාරීව එහෙයින් ආචාරී වූ තොප විසින් අනුශාසනා කරණලද්දාවූ අප ඥාතිසමූහයා දක්නා කැමැත්තෙම්හයි කීහ.

මෙලෙස මහාබෝධිසත්වයන්ගේ ධම්ම කථාව අසමින් සිතට ඇති සැක විචාරමින් රාත්‍රියෙහි කල්යවා සතුටුව අවසර දුන්හ.

මහා බෝධිසත්වයෝ පංචශීලයෙහි පිහිටුවා කුසල කරණයෙහි නිෂ්ප්‍රමාදවයි අවවාද අනුශාසනා කොට රජ්ජුරුවන් විසින් රන්තැටියෙන් එලවන ලද මහා විලද අනුභවකොට මී පැන් බී සන්තර්පිත වුහ. ඉක්බිති රජ්ජුරුවෝද බියවුද බෝධිසත්වයන් හා සුමුඛයන්ට සුවඳින් මලින් පුජාකොට රජ්ජුරුවෝ බෝධිසත්වයන් කරඬුපියන්නේ හිඳුවාගෙන ඔසවාගත්තාහ. බිසවුන් සුමුඛ නම් හංස සේනාධිපතීන් එපරිද්දෙන් ඔසවාගෙන සිවුමැදුරුකවුළුවේ දොර හැර අරුණෝද්ගමනයෙහි සැපසේ නැගීගිය මැනවැයි කියා ආශීර්වාද කොට ආකාසයෙහි හැරපූහ.

එකල මහාබෝධිසත්වයෝ ආකාශයෙහි සිට දෙවෙනිව රජ්ජුරුවන්ට අනුශාසනා කොට සුමුඛයන් කැඳවාගෙන චිත්‍රකූට පර්වතයට ගියාහුය.

එසඳ අනුදහසක් පමණ ඇති හංස සමූහයා රත්ගල්ගුහායෙන් පිටත මග බලා උන්නාහු ආකාශයෙහි පක්ෂප්‍රහාරකොට එන්නාවූ බෝධිසත්වයන් හා සුමුඛයන් දැක පෙරගමන් කොට ගොස් පිරිවැරූහ.

එකල සමාධීන් කුල්නාද පවත්වන්නාවූ හංස සමූහයා විසින් පිරිවරණ ලදුව චිත්‍රකූට පර්වතයට ගියාහුය. එපරිද්දෙන් මිත්‍ර ධර්මය අබන්ඩකොට රක්නා සත්වයන්ගේ සියලු අභිමතාර්ථය මේ හංස රජ්ජුරුවන්ගේ අභිමථාර්ථය සුමුඛයන් නිසා යම්සේ සමූර්ධිවීද එපරිද්දෙන් කල්‍යාණමිත්‍ර සම්පත්තිය හේතුකොට ගෙන සියලු අභිමතාර්ථය සිද්ධවන්නේය යනාදීන් සම්ප්‍රාප්ත පර්ෂිදට මේ අතීත කථාව ගෙනහැර දක්වා වදාරා පූර්වාපර සන්ධිගලපා මේ මහා හංස ජාතකය නිමවා වදාළ සේක.

එකල වැදිපුත්‍රතෙම මෙකළ ඡන්න ස්ථවිරය, බිසවු ඛේමා නම් අග්‍රශ්‍රාවිකාය. සෙයාංසකනම් බරණැස් රජ්ජුරුවෝ සාරිපුත්‍රස්ථවිරය අනුදහසක් හංස පිරිස නම් දැන් බුදු පිරිස් වන්නාහ. සුමුඛයෝ නම් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයෝය. ධ්‍රතරාෂ්ට්‍ර හංස රජ්ජුරුතෙම නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

SANHIDA LANKA

# සුධා භොජන ජාතකය

ජාතිකාන්තාරාදීන් සත්වයන් තරනය කරවා නිර්වාණක්ෂේමභූමියට පමුණුවනහෙයින් ශාස්තෘ නම්වූ සම්‍යක් සම්බුදු රජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් දන්දීමේ බලවත් අදහසක් ඇති එක්තරා භික්ෂුකෙනෙකුන් අරභයා මේ සුධාභොජන ජාතකය වදාළසේක.

සැවැත් නුවර එක්තරා කුල පුත්‍රයෙක් බුදුරාජනන් වහන්සේ ධර්මශ්‍රවණයකොට පහන් සිත් ඇතිව බුදුසස්නෙහි මහණව අඛණ්ඩකොට සිල් රක්‍ෂා කරන්නේ යෙහෙන් පමණ ධුතාංග ගුණයෙන් යුක්තවූයේ සබ්‍රංසරුන් වහන්සේ කෙරෙහි පවතින ලද මෙත්සිත් ඇතිව දවස තුන්වෙලේ තුනුරුවන් විසයෙහි කළමනා උපස්ථානයෙහි අප්‍රමාදවූයේ ආචාර සමාචාරයෙන් යුක්තවූ දානාධ්‍යාසය ඇතිව සාරණීයධර්මයන් පුරමින් තමන් විසින් ලබන ලද ආහාරය පිළිගැන්වුන් දක සුන්බත්ව දන්දෙන්නේමය. ඔහුගේ දානඬ්‍යාසය ඇති නියාව භිකෂුන් වහන්සේ කෙරෙහි ප්‍රසිද්ධව ගියේය.

ඉක්බිති එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ උන්නාවූ මහා කාශ්‍යප ප්‍රමුඛ භික්ෂූ සංඝයා වහන්සේ ඇවැත්නි අසවල් නම් මහණ දානාඬ්‍යාසයෙන් යුක්තව ඉදින් පැන් සරළුවක් විවරවත් ලදක් එහිලෝභය හැර සබ්‍රම සරුන් වහන්සේට දන්දෙන්නේය. බෝධිසත්වයන්ගේ අධ්‍යානය හා සමානවූ අදහස් ඇත්තේය යනාදීන් ඒ භික්ෂූන්ගේ ගුණ කථනය කෙරෙමින් උන්සේක. එසඳ ගඳකිළියෙහි සැතපී වැඩඋන්නාවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ භික්ෂූන් වහන්සේගේ කථා ප්‍රවෘත්තිය දිව කණින් අසා වදාරා මා ගිය කල බොහෝ සත්වාභිවෘද්ධි වන්නේයයි දන ධම්සභාමණ්ඩපයට වැඩ පනවන ලද බුද්ධාසන මස්තකයෙහි පිපීවැනීගියාවූ රත්පියුම් වන මධ්‍යයෙහි පැමිණ ස්වර්ණ හංස රාජවිලාසයෙන්ද උදයගිරි පර්වත මුදුනෙහි තෙවුනාවූ ලහිරුමඬලක් මෙන්ද සවණක්සන බුදුරසින් සිල්ලෝ ධාතු එකළුකෙරෙමින් වැඩ ඉඳ තමන් වහන්සේ විසින් සාරසංඛ්‍ය කප්ලක්‍ෂයක් මුළුලෙහි සකසා පුරණලද සත්‍ය පාරමිතාවන් නැමති සුගන්ධ වාතයා විසින් සුවඳ ගන්වන ලද ශ්‍රී මුඛයෙන් නික්මුනාවූ සුගන්ධයෙන් ධම්සභා මණ්ඩපය එක සුවඳකෙරෙමින් මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කතාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා මෙනම් කථාවකින් යුක්තව උනුම්හයි දන්වූ කල්හි මහනෙනි මේ භික්ෂූතෙම පළමු දානාධ්‍යාසයක් නැත්තේය. තද මසුරුය තන අග තෙල් බින්දුවක් විවරකුත් අන්කෙනකුන්ට නොදෙන්නේය. එකල මොහු මම දමනෙහිලා මසුරුසිත් හරවා දන්දීමෙහි අනුසස් කියා දානයෙහි පිහටවීම එකල පැන්සරලුවක් ලැබත් දන්නොදී අනුභව නොකෙරෙම් මාගෙන් වරලද්දේය. ඒ කාරණයෙන් දානාඬ්‍යාසය ඇතිව දානයෙහිම ගැලී වාසය කරන්නේයයි වදාරා එක භික්ෂූන් වහන්සේ විසින් ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි දාන ප්‍රියවචන අර්ථචරියා සමානාත්මතායයි යන සතර සංග්‍රහවස්තුවෙන් ජනරංජනය කරන කල්හි එක්තරා කෙළෙඹි පුත්‍රයක් ඉතා ප්‍රසිද්ධව අසූකෙලක් සම්පත් ඇත්තේය. එකල රජ්ජුරුවෝ ඕහට සිටු තනතුරු දුන්හ. එතැන්පටන් රාජ්‍යසම්මතව සියලුසත්වයන් විසින් පුදන ලදුව වෙසෙමින් එක් දවසක් තමන්ගේ සම්පත් මහත්‍යෙව බලා මේ සමුර්ධියට ජාතියෙහි මා විසින් කරණලද කාය දුශ්චරිතාදිය නිසා ලබනලද්දේ නොවෙයි සුචරිත ධර්මයෙන් ලබනලද්දේ වෙයි මතුත් මට පිහිටක්කොටගත මැනවැයි සිතා රජ්ජුරුවන් කරාගොස් දේවයන් වහන්ස මාගේ ගෙයි අසූකෙළක් සම්පත් ඇත්තේය. ඒ ගෙන්වාගත මැනවැයි කීය. රජ්ජුරුවන් විසින් තොපගේ ධනය මට ප්‍රයෝජන නැත නොකැමැත්තෙම් කීය. මාගේ සම්පත් බෙහෙවඉන් සම්පත් කැමතහොත් ඇරගනුවයි කියද එසේවිනම් දේවයන් වහන්ස මාගේ සම්පත් දන්දෙනු කැමැත්තෙමියි කීය. රජ්ජුරුවන් විසිනුත් කැමැත්තක් කරවයි කියා අවසර දුන්හ. එකල්හි නුවර සතර වාසල මධ්‍යයේය. තමන්ගේ ගෙදරයයි සඳහන් කරවා දවස සලක්ෂයක් ධන වියදම් කරවා දුගී මගී යාචකාදීන්ට ශ්‍රමණ බ්‍රාහ්මණයන් විෂයෙහි ජීවිතාන්තය දක්වා මහදන් පවත්වමින් මේ දානවංශය නොකඩව පවත්වාලවයි තමන්ගේ දරුවන්ට අනුශාසනාකොට ජීවත්වන්නේ එයින් සැවගොස් ශක්‍රදේවේන්ද්‍රව උපන්නේය.

ඉක්බිති ඔහුගේ පුත්‍රතෙම පළමුපරිද්දෙන් දන්දී පින්කොට චන්ද්‍ර දිව්‍ය පුත්‍රව උපන්නේය.

SANHIDA LANKA

ඔහුගේ පුත්‍රයාද සූර්ය දිව්‍යපුත්‍රව උන්නේය. ඔහුගේ පුත්‍රද මාතලී දිව්‍යපුත්‍රව උපන්නේය. ඔහුගේ පුත්‍ර පඤසිඛදිව්‍යපුත්‍රවිය. ඔහුගේ පුත්‍රවූ මච්ජරිය කෝසිය නම් සිටුපුත්‍රයෙක්ව තමාගේ අසූකෙළක් සම්පත් දැක ඒතෙම තමාගේ පියමුතුන් ආදීහු නුවනැත්තාහ. දුකින් රැස්කරණලද ධන සමූහය නොදන නැසුහ. මම වනාහි කිසිවක්හට කිසිවකුත් නොදී ඉඳුරා තබා රකිමියි සිතා දන්හල් ගිණිලානසාතද මසුරුවූ සිත් ඇතිවිය. එකල සියලු යාචකයෝ ඔහුගේ දොරකඩ රැස්ව සිටානන් වහන්ස නුඹ පියතුමාන් මී මුතුන් ආදි සිටුවරුන්

නොනසා පවත්වන ලද දාන වංසය නොනසාා දන්දුනමැනවැයි දෝත් ඔසවා මහත්කොට කොලහාල කලාහුය. එනුවර වාසී බොහෝ දෙන එකොලොහකල ශබ්දය අසා මේ නුවන නැති මසුරු කෝසිය සිටානෝ තමන්ගේ පරම්පරාවෙන් නෙකඩකොට පවත්වන ලද දානවංශය නැසීයයි යනාදීන් නින්දාකළහ.

එතෙම ලජ්ජාවට පැමිණ එතැන් පටන් තමන්ගේ ගෙදරට යාචක කෙනෙකුත් නොවදිනා නියායෙන් රැ කවල් සැලැස්විය. එතැන් පටන් සියලුම යාචකයෝ කිසියම් දෙයක් නොලැබ ඔහුගේ ගෙය ඇසදල්වාත් නොබලන්නිහුය. එතෙම එතැන් පටන් ධනය රැස් කෙරෙමින් තෙමේත් අනුභව නොකරන්නේය. පුත්‍රදාරාදීන්ටත් නොදෙන්නේය. කාඩිදෙවනකොට ඇති නිවුඩුසාලේ බත් අනුභව කරන්නේය. තුඹුවැල්සාහුයින් වියන ලද චක්කාරි කඩම අදනේය. පත් කුඩයක් ඉසට කරවාගෙන ජරාගොන් යොදන ලද දිරාගිය රථයකට නැගී ගමන්කරන්නේය. මෙලෙසින් පාපීවූ අෂත්පුරුෂයා විසින් ලබන ලද ධනය බල්ලන්ට පොල් නොබලා ලූකලක් පරිද්දෙන් නස්ප්‍රයෝජන විය. ඒ මසුරු සිටානෝ එක් දවසක් රාජසේවයට යන්නේ අතවැසි සිටානන් කැඳවාගෙන යෙම් සිතා ඔහුගේ ගෙට ගියේය. එකල අතවැසි සිටාණෝ තමන්ගේ අඹුදරුවන් හා සමඟ ගිතෙල් ශකීරායෙන් සකස්කරණ ලද පැන් නුමුසු කිරිබත් අනුභව කෙරෙමින් උන්නාහ. සිටානෝ මසුරු කොසිය සිටානන් දැක උනස්නේ නැගී සිටාණන්වහන්ස මෙසේ වැඩිය මැනව මේ අස්නේ ඉඳ කිරිබත් අනුභව කළ මැනවයි කීයේය. එසඳ මසුරු කෝසිය සිටානෝද කිරිබත් දැක මුඛ පිරුණු කල ඇතිව කනු කැමැතිවත් අද දවස් මේ බත් කෑයෙන් නම් මොහු මාගේ ගෙට ගිය වේලෙහි ප්‍රත්‍යුපකාර කළ මැනවැයි සිතා එහෙයින් නොකම්යි සිතා නැවත නැවත යාචිඤාකරණ ලදුවත් දැන් බත් කාලා ආ හෙයින් සායමදය යනාදීන් කියා ප්‍රතික්ෂප කොට ඔහුබත් අනුභව කරණතෙක් බඩ පුරා කෙළ උරාබොමින් බලාහිඳ බත් කෑ ඉක්බිති ඔහු හා සමග ගොස් රාජ්‍යසේවය කොට නැවත තමන්ගේ ගෙට ගොස් කිරිබතෙහි කළ ලෝභයෙන් පෙළෙමින් ඉඳින් කිරිබත් අනුභව කරන්නා කැමැත්තෙමියි කීනම් බොහෝ දෙන කනු කැමතිවෙති බොහෝ සාල් ආදීවුදෙය නස්නේය. එහෙයින් කිසිකෙණෙකුන්ටත් නොකියම් සිතා රැ දවල් කිරිබතෙහි කළලෝභයෙන් දුක්විඳිමින් කිසිකෙනෙකුන්ටත් නොහඟවා ඉවසාගෙන දවස් යවන්නාහුය. ඉක්බිති කල්යාමෙන් දුක්බ වේදනා ඉවසිය නොහී සුදුමැලිව කිසිකෙනෙකුන්ටත් නොහඟවා මෑත භාගයෙහි දුර්වල ඇඳ වැලඳ සිපගෙණ වැදහොත්තේය. එකල ඔහුගේ භාර්යාතොම සිටානන් කරා ගොස් අතින් පිට පිරිමදිමින් සිටානන් වහන්ස නුඹ වහන්සේට කවර අළුසුවෙක්විද කුමන අභිප්‍රායෙක් ඇද්දැයි විචාළාය. තොපට යම් අපාසු ඇතිනියාය මට අළුසුයෙක් නැතැයි දොඩමින් සිටිද්දී සිටානන් වහන්ස ඉතා සුදුමැලිව ශරීරය දුර්වලව ගියේය. නුඹ වහන්සේට සිතුවිල්ලෙක් ඇද්ද නොහොත් රජ්ජුරුවන් වහන්සේගෙන් උදහසෙක් ඇද්ද නොහොත් දරුවන් විසින් අවඥාවක් කරණ ලද්දේද නොහොත් නුඹ වහන්සේට තෘෂ්ණාවෙක් විද මට කිව මැනවැයි යනාදීන් විචාළාය. ඒ අසා එසේය සොඳුර මට ත්‍රිෂ්ණාවෙක් උපණ ඒ අනිකෙකුන්ට නොකියා රකින්ට පුළුවන්දැයි විචාරා උන් විසින් රැක්කයුත්තෙක් වීනම් රකිමියි කී කල්හිද සම්පත් ලෝභයෙන් නොකියා නැවත නැවත දැවිටිලිකොට විචාරන ලදුව එසේ වී නම් සොදුරු එක් දවසක් අපගේ අතවැසි සිටානන්ගේ ගෙට යම් කිසි කටයුත්තක් නිසා ගොස් තෙල් සකීරාමීයෙන් සකස් කරණ ලද කිරිබතක් අනුභව කරන්නා දැක එතැන් පටන් එහිකළ තෘෂ්ණාවෙන් මෙවැනි දුර්වලතාවට පැමිණියෙමියි කීහ.

ඒ අසා සිටුදියනියෝ සත්පුරුෂවූ සිටානන් වහන්ස මා ඉන්දදී මෙවැනි දුර්වලතාවට පැමිණෙන්නට කාරණා කිම්දැයි බරණැස් නුවර වැසි සත්වයන්ට සෑහෙන පරිද්දෙන් කිරිබත් පිසන් පුළුවනැයි කිව ඒ අසා සිටානන් ඉසමුල මුගුරකින් පහකරණ කලක් පරිද්දෙන් බොහෝ දුක්බ වේදනාවට පැමිණ තොපගේ විසාරද කම් පලමුත් දැනුම්හ තොපගේ දෙමව්පියන් ගෙනා දායාදයෙක් ඇත්නම් පිසවාදෙවයි සිටුදියනියන්ට කීහ. එසේ වීනම් එක විරීයක ඇත්තන්ට සෑහෙන පරිද්දෙන් පිසවා දෙමෝද්දැයි විචාරා ඊටත් කිපී ඔවුන්ගෙන් තීට ප්‍රයෝජන කිම්ද ඔහු කැමැත්තෝ නම් තමන් තමන්ගෙන් සම්පත් වියදම් කොට කන්නාහුයයි කී සඳ එසේ වීනම් දෙපිටින් ගෙවල් සතරක් විචරට පිසම්දැයි විචාරා ඊටත් නොලැබෙන හෙයින් මෙගෙයි මිනිසුන් විචරට පිසෙම්දැයි විචාරා ඒ හැමදෙනා කෑමෙන් මට ප්‍රයෝජන කිම්දැයි කී හෙයින් නුඹ වහන්සේ විචරට ඉදිකෙරෙම්දැයි නොහොත් එසේ වී නම් අපගේ දරුමල්ලන් විචරට පිසමෝදැයි විචාරා ඔහුන්ගේත් ප්‍රයෝජන කිම්දැයි නොලබන හෙයින් නුඹ වහන්සේටත් මටත් විචාර පිසම්දැයි විචාරා තොප කෑමෙන් ප්‍රයෝජන කිම්දැයි කී හෙයින් නුඹ වහන්සේ විචරට ඉදිකෙරෙම්දැයි විචාළ හෙයින් වන්නාටය මා විචරය මේ ගෙයිදී පිසන්ට

SANHIDA LANKA

වන්කළ බොහෝ දෙන කන්ට ප්‍රාර්ථනා කෙරෙති මට වනාහි සාල් නැලියක්ද කිරි සතර නැලියක්ද සකිරා ඇසුරක්ද ගිතෙල් මුළු තුනෙක්ද මී මුළු තුනෙක්ද පිසන්ට නිසි භාජනයෙක්ද දෙව මම වලට ගෙණගොස් පිස කම්හයි කිවුය. සිටු දියනියෝත් එපරිද්දෙන් සපයා දුන්හ. ඒ සියල්ලම කුඩා කොල්ලකු අතට දී මේ හැරගෙණ ගොස් අසවල් තැන සිටුවයි සලකුණු කියා පළමුත් ඔහු නික්මවා තුමූ උදකලාව ඉසවසා පෙරට අප්‍රසිද්ධ වේසයෙන් ගොස් ගඟක් සමීපයෙහි එක් කැලබඩෙක උදුනක් බැඳ ගිණි දර පැන් ගෙණ තෙපි පළාගොස් දමංසංන්ධියෙහි සිට යන එන කෙණෙකුන් ඇත්නම් සලකුණක් කරවා මා කැන්දූකල එවයි ඔහු නික්මවා

ගිණිමොලා කිරිබත් පිසන්ට පටන්ගත්තාහුය.

එක්ෂණයෙහි සක්දෙව් මහරජතෙම දස දහසක් යොදුන් අවට ඇති සර්ව සමුර්ධියෙන් සමන්විත වූ තව්තිසා භවනයද සැටයොදුන් පමණ දිග ඇති ස්වර්ණ විථියද පන්සියයක් යොදුන් උස ඇති සුදර්මා නම් දිව්‍යසභාවද සැට යොදුන් පමණ උස ඇති පාන්ඩුකම්බල ශෛලාශනයද පණස් යොදුන් පමණ ඇති රන්මුතුදැලින් හෙබනාවූ ධවලාතපත්‍රදෙකද ලදපණස් ලක්‍ෂයක් පුරඟනාවෝද සරහා පිළියෙල කරණ ලද්දාවූ තමන්ගේ දිව්‍යාත්මභාවයද යනාදි උදාරවූ ශ්‍රී විභූතිය බලා කවර කුශලයක් කළ හෙයින් මේ සා සම්පත් ලබණ ලද්දේදැයි සිතා පරීක්ෂා කරන්නේ බරණැස සිටුපුත්‍රව ඉපිද පවත්වනලද දානය දැක ඉක්බිති මාගේ දරුමුණුබුරු ආදීහු කොයි උපන්නාහුදැයි බලන්නේ මපුතුනුවෝ චන්ද්‍රදිව්‍යපුත්‍රව උපන්හ. ඔහුගේ පුතනුවෝ සූර්යපුත්‍රව උපන්නාහයි යනාදින් සියල්ලවුන්ගේ උත්පත්තිය දැක පංචසිඛ දිව්‍යපුත්‍රයාගේ පුත්‍රතෙම කුමක් කෙරෙද්දැයි බලා තමන්ගේ දානවංගය නසාපු නියාව දැක මේ අඥාන සත්වයෝ තුමූත් අනුන්ටත් නොදි තද මසුරුව නරකාදී සතර අපායට යන්නෝයයි මෝහට අවවාද කොට මාගේ දානවංශය පවත්වා මොහු ශක්‍රභනයෙහි උපදනා උපායක් කරවමි සිතා චන්ද්‍ර දිව්‍යපුත්‍රාදීන් කැඳවා මසුරු කෝසිය සිටුතෙම අපගේ දානවංශයත් නසා දන්හල් ගිණිදල්වා තෙමේත් නොකා අනුන්ටත් නොදි දුන් කිරිබතක් අනුභව කරණු කැමතිව ගෙයිදි පිසුකල අනුන්ටත් දීලුව මැනවයි යන ලෝභ සිතින් උදකලාව වලට ගොස් තෙමේම කිරිබතක් පිසන්නේය. මනුස්‍යලෝකයට ගොස් ඔහු දමනයෙහි ලා දානයෙහි විපාක ඕහට කියා එකවිට ගොස් ඉල්ලුවෝ නම් එතනදි මලය පැලීයන්නේය මා පළමුව ගොස් කිරිබත් ඉල්වා උන්කල තෙපි හැමත් බ්‍රාහ්මණවේශයෙන් ඔහු කරා ගොස් ඕහට පෙනිසිට පින්වත්නි බරණැස් නුවර යන මග කවරෙක්දැයි විචාළාහුය. ඒ අසා මසුරු කොසිය සිටුතෙම තෝ උමතුව ගිය එකෙක්ද බරණැස් නුවරට මගක් නොදනීද මග තබා මෑත කුමට එවුද?. ඈත පලායවයි යනාදීන් දොඩන්ට පටන්ගත්තේය. ශක්‍රබ්‍රාහ්මණද ඔහුගේ බස් අසණ කෙණෙකුන් මෙන් කුමක් කරව්දැයි ළඟට ගියාහ.

එකල සිටුද එඹල බමුණ නොබිහිරි ගිය එකෙක්ද මෑත නොඑව මෑත නෙඑවයි මහත්කොට මොරගාමින් සිටියෙදීම  ඔහු සමීපයට ගොස් ඇයි තොප මොරගානේ කුමක්නිසාද දුමුත් නැගෙන්නේය. ගිනිත් පෙනෙන්නේය. කිරි බතුත් පැසෙන්නේය. බමුණන්ට දන්දෙන තෙනක් වියයුතුය. බමුණන්ට දන්දෙනවිට ඉන් සුඟක් ලැබෙමි මා කුමට නෙරනෙහිදැයි කියේය. ඒ අසා මසුරු සිටානන් විසින් මෙතන බමුණන්ට දානෙක් නැතැයි කිය එසේවිනම් කුමක් නිසා දොඩවුද තොප බත් අනුභව කරණ කල මමත් මඳක් ලබමි කී යේය. ඒ අසා මම් තොපට මින් බත් උලක් විවරත් නොතබමි මෙයින් සුහෙක මා විවරට විනා වඩානැත්තේය. මාත් ඔබකින් ඉල්වා ගෙනාදෙයක තොපිත් ඔබකින් ඉල්වාගනුව මා මෙවක් පෙරටුව මා අනුන්ට බතක් විකිර්ණවිරුත් නැත. අනුන්ගෙන් විකිනි ගත්විරුත් නැත. මාගේ රැයෙ දාවලට තිබීමකුත් නැත. මෙතෙම මා විසින් ඉතාදුකසේ ලබනලද්දේය. ඉතා ස්වල්ප සාල් නැලියකින් පිසන ලදහෙයින් දෙන්නෙකුට නොසෑහෙන්නේයයි යනාදින් දෙඩුයේය. ඒ අසා ශක්‍ර බ්‍රාහ්මණයෝ මම තොපට මිහිරි සොලොවක් කියමි ඒ අසවයි ඔහු නවතමින් සිටියදී ඒ නැසුතැන්ව එඹා සිටාණෙනි මේ ලෝකයෙහි කෙනෙක් ස්වල්පමාත්‍රාවුත් ආහරයක් ලදින් භාගයෙන් භාගයක් වේවයි බොහෝ දෙයක් ලදින් බොහෝ කොට වේවයි දුන් දෙයක් දානමයවන්නේය එහෙයින්ම කෝසිය සිටානෙනි සෑහෙන පමණක් ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් විෂයෙහි දානපරිත්‍යාග කෙරෙමින් තෙපිත් අනුභවකොට මේ උතුම්වූ ප්‍රතිපත්තියෙන් ආර්ය මාර්ගයට පැමිණියව යමෙක් උදකලාව තමාට පැමිණියාවූ ආහාරය අනුන්ට නොදි අනුභව කෙරේද එම උපළපන් ජාතියෙහි කිසි කායික මානසික සැපයක් නොලබන්නේයයි යනාදින් මධුර වචනයෙන් ධර්මදේශනා කළහ.

ඒ අසා කොසිය සිටානෝ මදක් මොලොක්වූ සිත් ඇතිව බමුණානෙනි තොප කී බස් ඉතාම මැනවැයි ප්‍රශංසාකොට කිරිබත පැසෙනතෙක් වැඩහිඳුවයි කියනලදුව ශක්‍රබ්‍රාහ්මණයානෝ එකත්පස්ව උන්නාහ.

ඉක්බිති චන්ද්‍ර දිව්‍යපුත්‍රයා බ්‍රාහ්මණවේශයෙන් අවුත් ඔහු හා සමග කථාකොට ඔහු නවතමින් සිටියදීම මිහිරිතෙපුලෙන් එඹා කොසිය සිටාණෙනි මේ ලෝකයෙහි සා පිපාසයෙන් පීඩිතවූ අමුත්තන් ඉන්දදී උලතලාව අනුභව කෙරෙද්ද ඔහු විසින් කරණ ලද අර්ඵසත්කාරද සම්පත් ඉපදී මෙහි කරණ ලද උත්සාහය නිෂ්ප්‍රයෝජන වන්නේය. පින්වත්වූ සිටාණෙනි ඒ කාරණය හේතුකොටගෙණ මෙතැන් පටන් ශ්‍රමණ බ්‍රාහ්මණාදී දුගී මගී යාචකයන් විෂයෙහි ශක්ති පමණින් දානමානාදිය කෙරෙමින් තෙපිද සැපසේ අනුභවකොට සවර්ග මෝක්ෂ දෙක අත්කොට ගනුවයි යනාදීන් අවවාද කීහ. එබස් අසා සිටානෝ තතනමින් දුකසේ කටහැර මදක් වැඩ හිඳුවයි කීහ.

SANHIDA LANKA

ඒ අසා චන්ද්‍ර දිව්‍යපුත්‍රයා ශක්‍රදේවේන්ද්‍රයන් සමීපයෙහි උන්නාහ.

ඉක්බිති සූර්ය දිව්‍යපුත්‍රයෝත් බමුණුවෙසක් ගෙනවුත් පැමිණ ඔහු හා කථාකොට නොයෙක් පරුෂ වචනයන්

කියා බැණ නවත්ව නවත්වා භාග්‍යවත් සිටාණෙනි මේ ලෝකයෙහි යම් සත්වයෙක් සාදුකින් පීඩිතවූ අමුත්තන් දැක උදකලාව අනුභව නොකරන්නේය. ඔහුගේ දානමානාදියද කෘෂි වණිජ්‍ය දී නිසා කරණ ලද උත්සාහය වීර්යයද සැබෑම වන්නේය. සාර්ථක වන්නේය. ඒ කාරණයෙන් දානමානාදියක් කොට තෙපිත් අනුභවකොට සත්පුරුෂ ගුණයෙහි පිහිටියවයි යනාදීන් සුභාෂිත වචනයෙන් කීහ.

සිටානෝ ඔහුගේද බස් අසා කෙඳිරිපරගාමින් මදක් වැඳහිඳුවයි නියෝග කළහ.

එකල සූර්ය බ්‍රාහ්මණද ගොස් චන්ද්‍ර දිව්‍යපුත්‍රයන් සමීපයෙහි උන්හ. ඉක්බිති මාතලී දිව්‍යපුත්‍ර අවුත් බණමින් දොඩමින් එඹා පින්වත යම් සත්වයෙක් යක්ෂ රාක්ෂසාදීන්ට බලිකර්මය කරමි කියා බාහුකා නම් ගංතෙර පයාගයනම් පොකුණය දොනතිඹරුය යන තීර්ථස්ථනයෙහි ගංගා ප්‍රවාහයෙහිද යාගකෙරේද ඒ මෙකී තෙන ඔහු විසින් කරණ ලද්දාවූ යාගය ඉදින් යාගයටම සැලසේ නම් ඔහුගේ උත්සාහ විර්යයන් ව්‍යර්ථ නොවේනම් ඉෂ්ට විපාකයට කාරණා වී නම් යමෙක් ශ්‍රමණ බ්‍රාහ්මණ දුගී මගී යාචකයන් විෂයෙහි කරණ ලද සත්කාර සම්භාවනා සාර්ථකවෙති කිවමැනවයි නැවත ඒ කාරණයෙන් කොසිය සිටාණෙනි දානාමානාදි සුචරිත කර්මකොට බුද්ධාදී උත්තමයන් විසින් පසස්නා ලද සත්පුරුෂපථයෙහි පිහිටා සගසුව මොක් අත්පත්කරව යමෙක් අඳුරු ගෙයෙක්හි හිඳ අපවිත්‍රයක් අනුභව කරන්නාක් පරිද්දෙන් කිසිකෙනකුන්ටත් නොදී උදකලාව අනුභව කෙරෙද්ද එතෙම කිසි කලෙකත් දිව්‍ය මනුෂ්‍ය සම්පත්තියට නොපැමිනෙන්නේයයි යනාදීන් ධර්මදේශනා කළහ. ඔහුගේ සුභාසිත වචනයන් අසා ඉක්මවියනොහි පර්වතයකින් මඩනාලද කෙනෙකුන් පරිද්දෙන් තතනමින් මදක් වැද ඉඳුවයි කීයේය. මාතලී දිව්‍යපුත්‍ර ගොස් සූර්යදිව්‍යපුත්‍රයානන් සමීපයෙහි උන්නේය.

ඉක්බිති පංචශිඛ දිව්‍යපුත්‍ර අවුත් ඕහට පෙනී ඔහු වලකමින් සිටියදී පළමු පරිද්දෙන් කථාකොට එඹා භාග්‍යවත්වූ සිටානෙනි මේ ලෝකයෙහි යම් සත්වයෙක් මෙතනට පැමිණ දුගී මගී යාචකයන් බල බලාඉන්දදී තෙමේ අනුභව කෙරේද එතෙම තරවූ යොත් ලනු ඇති අමුණුනලද ගොදුරු ඇති මහත්වූ බිලිකටුව ගන්නාවූ මත්ස්‍යයෙකු වැන්නේය. ඒ කාරණයෙන් කොසිය සිටානෙනි පැමිණ යාචකයන්ට දානපරිත්‍යාග කෙරෙමින් මසුරුසිත් දුරුකොට සැපසේ අනුභවකොට අනන්තපාන වස්ත්‍රාභරණාදිය දීමෙන් පුත්‍ර මිත්‍ර කලතා බන්ධු වර්ගයා පෝෂ්‍යකෙරෙමින් සත්පුරුෂපථයෙහි පිහිටා දිව්‍ය මනුෂ්‍ය සම්පත් සාධුගනුවයි යනාදින් මධුර වචනයෙන් කථා කළාහ.

ඔහුගේ ධර්ම අසා මසුරු කෝසිය සිටානෝ මසුරු බරින් පුරණලදුව දුක්ඛ වේදනාවෙන් පෙලී තතනමින් කෙඳිරිගාමින් මදක් වැදහිඳුවයි කීහ. ඒ අසා පන්සිළු දෙම්පිත් ගොස් මාතලී දිව්‍යපුත්‍රයන් සමීපයෙහි උන්නේය. මෙසෙයින් ඒ බ්‍රහ්මණ වේශ ඇති දෙවියන් පස්දෙනා එක්තැන්ව උන් කල්හි කිරිබත් පැසීගියේය. එකල කොසිය සිටානෝ කිරිබත උදුනෙන් බහා තබා පත්කඩාගෙන එවයි බමුණන්ට විධාන කළහ.

බමුණෝ පස්දෙන උන්තෙනම වැදහිඳ දිව්‍යානුභාවයෙන් අතදික් කොට හිමාලවනයෙන් මාලුවාපත් ගෙනාහ. ඒ දැක කොසිය සිටානෝ කිපී ඒ දමා කිහිරපත් කඩාගණිත්වයි කීහ. ඔහුත් මහකුඩයක් පමණ දිග පලල ඇති කිහිරිපත් ගෙන්වූහ. සිටානෝද බමුණන් පස්දෙනට එකී එකී බත් හැන්දක් බැගින් ඉඳුන් පස්දෙනාටත් දී සැලියේ බත් අඩුවක් නුදුටුවාහුය. තුමු සැලිය පිටින් තිබාගෙණ කන්ට වැදඋන්හ, එක්ෂණයෙහි පංචශිඛ දිව්‍යපුත්‍රයාද නැගී සිට බ්‍රාහ්මණ වේශයෙන් හුන්නාහු හැර බලු වෙශක් මවාගෙණ ඔවුන් ඉදිරියෙහි දියසලින් නික්මුණාහුය. බමුණා තම තමන්ගේ බත් පතින් වසාගත්හ. සිටාණොත් සැලිය අතින් වැසූහ.

එසඳ සිටානන්ගේ පිටි අත්ලේ වැදගත එකල බමුණෝ කෙන්ඩිකාවිල පැන් ඇරගෙන පැන් හිස බත් අනුභවකරණ ආකාර දැක්වූහ. එසඳ සිටාණන්ගේ අතට පැන් ඉල්වා නොලැබ තොපත් පැන් ගෙණවුත් අතසෝදා පිසවයි කී විසින් මා කිරිබත් දුන්කල මා අත පැන් වත්කළෝ කිම්දැයි කීහ. අපි ඔවුනොවුන් හා ගණුදෙනුනොකරම්හයි කිවාහුය. ඒ අසා සිටාණෝ මා අත සෝදාපියා එනතෙක් මේ සැලිය බලවයි කියා ගඟට ගියාහ. එකෙණෙහි බලුතෙම සැලියපුරා දිය සැලුයේය. එසඳ දියසලන්නාවුන් දැක මහත් දඬුකඩක් හැරගෙන භයගන්වමින් ළඟට ගියාහුය, එකෙණෙහි බලුතෙම ආජානීය සෛන්ධවයකුමෙන් මහත්වූ ශරීරයක් මවාගෙන කලුය සුදුය රන්වන් කඹුරුවන් යනාදීපැහැයෙන් යුක්තව උස්වෙමින් මිටිවෙමින් මහත් වෙමින් නොයෙක් ආකාරයෙන් භයගන්වා තැතිගන්වමින් ලුහුබඳවා ගත්තේය.

SANHIDA LANKA

එසඳ සිටාණෝ මරණභයින් පීඩිතව මහ හඬින් මොරගාගෙණ බමුණන් කරා ගියාහුය. ඔහු ලඟට යන්නාහ උන්තෙනින් නැගීසිට බමුණෝ ආකාශයට පැනනැංගාහ.

එසඳ සිටානෝ බමුණන්ගේ ඉර්ධියානුභාවයෙන් සිටියාහු දැක මහත් ඉර්ධියානුභාව ඇති විශිෂ්ටවූ රූ දරන්නාවූ බ්‍රාහ්මණයෙනි මේ තොපගේ බලුතෙම මා භයගන්වමින් අනෙකප්‍රකාරවූ සටහන් ඇති ආත්මභාවයක්

දක්වන්නේය. ඊට කාරණා කවරේදැයි තොපි හැම කවුරුදැයි විචාළේය.

එබස් අසා ශක්‍රදේවේන්ද්‍රයා ඔවුන් දිසාවට අතදික්කොට මොහු චන්ද්‍ර සූර්ය පුත්‍රදෙදෙනාය මෙතෙම මාතලී දිව්‍යපුත්‍රය මම වනාහි දෙදෙව්ලොව දේවතාවන්ට අධිපතිවූ ශක්‍රදේවේන්ද්‍රවෙමියි මෙබඳු වේෂයෙන් පෙනුනේ පඤ්චශිඛදිව්‍යපුත්‍රය යනාදීන් තම තමන්ගේ හැමගේ ඇති ස්වභාවය කියා පංචශිඛ දිව්‍යපුත්‍රයාගේ යස වර්ණනා කියන්නාහු එඹා සිටාණෙනි මොහුගේ ප්‍රසාදය උදය කාලයෙහි මනාවූ ධවනි ඇති ගැට පහ වූ බෙරය යනාදි පංචාංගික තූර්ය නාදයක් පවත්වන්නාවූ සිය දහස්ගණන් දිව්‍ය නාටකස්ත්‍රීහු නෘත්‍ය ගීත වාද්‍ය පවත්වමින් මොහු පොබයන්නාහුය යනාදින් අනේක ප්‍රකාරයෙන් පංචශිඛ දිව්‍යපුත්‍රයාගේ ඓශ්වර්යය වර්ණනා කළහ.

සිටානෝද ඒ අසා විශ්මය පත්ව මෙබඳුවූ දිව්‍යසම්පත් කුමක් කළ කෙණෙක් ලබන්නාදැයි විචාළහ.

ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රයෝ එඹා සිටාණෙනි මේ ලෝකයෙහි යම් සත්ව කෙණෙක් දනා සීලාදී ගුණ නොදන්නාහුද මසුරු සිත් ඇත්තහුද ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට නින්දා පරිභව කෙරෙද්ද එබඳු පාපී සත්වයෝ දිව්‍යලෝකයෙහි නූපදනාහ. කාබුන් මරණින් මත්තෙහි නරකාදී අපායෙහිම උපදනාහුය යනාදි පාපි සත්වයන් උපදනා නරකාදී දුක් දක්වා සිටාණෙනි යම් සත්වකෙණෙක් දශකුශලධර්මයෙහි පිහිටා දාන සංවිභාග සීලව ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට දාන මානාදිය කොට සුගතිය කැමතිවෙද්ද ඒ සත්වයෝ මිය පරලොව ගියකල්හි දිව්‍යලෝකයෙහි උපදනාහුය.

තවදසිටාණන්ට කියන්නාහු දිව්‍යලෝකයෙහි සිට එන්නාවූ අපි ඇම තොපගේ මේ කිරිබත් නිසා ආමෝ නොවෙම්හ. තෝ වනාහි පූර්වජාතියෙහි අපට බන්ධුත්වයක් ඇත්තවද තද මසුරුව ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් විෂයෙහි කෝපිය පාපි ධර්මයෙහි ගැලී වාසයකරණුය. ඒ කාරණයෙන් තොපකෙරේ අනුකම්පායෙන් මේ කාලකන්නි සත්වතෙම පව්කොට නරකාදී අපායට යන්නේයයි එයින් වලකණ පිණිස අපි ආම්හයි කීහ.

ඒ අසා කෝසිය සිටානෝ මොහු මට හිතකැමැත්තාහ. පව්කොට නරකාදී අපායට යන්නාවූ මා එයින් වලකා ස්වර්ගයෙහි පිහිටුවන නිසා ආ කෙණෙක්ලයි සතුටුව ඒකාන්තයෙන් මට හිතකැමති නුඹ වහන්සේලා යහක් වදාළසේක්ද එපරිද්දෙන්ම පිළිපදිමි අද මේවේලේ පටන් මාගේ මාත්සර්යය සිත හැර සියලු පාපයෙන් දුරුව ඉදින් පැන් පමණකුත් අනිකෙකුන්ට දාන විෂයෙහි නොදී අනුභව නොකෙරෙමියි කියා තවද ශක්‍රදිව්‍යරාජයානන් වහන්ස මාගේ ඇති සියළු සම්පත් මුළුල්ලම දානමුඛයෙහි යාචකයන්ට දී නිමවා ඉක්බිත්තෙන් වස්තුකාම කේලශකාමයෙහි ලොභහැර තපසට යෙමි යනාදීන් කීහ.

ශක්‍රදේවේන්ද්‍රයෝද සිටානන්ට ධර්මදේශනාකොට අකුසල් කිරීමෙහි අනිෂ්ටවිපාක හා කුසල් කිරීමෙහි ඉෂ්ට විපාක ප්‍රකාශ කොට මසුරුසිත් හරවා දමනයෙහි ලා තෙසු දෙවියන් හා සමග දිව්‍යභවනයටම ගියාහුය.

ඉක්බිති කෝසිය සිටානෝ නුවරට වැද රජගෙට ගොස් රජ්ජුරුවන්ට දන්වා නුවර බෙර පියවි කරවා රැස්වූ සියලු දුගී මගී යාචකයන්ගේ ගෙන ගෙනා භාජන මුක්තා මාණික්‍ය සංඛ සිලා ප්‍රවාලාදී සත් රුවනින් පුරාදී එදවස්ම ගිහිගෙය හැර නික්ම ගොස් හිමාල පර්වතයට දකුණුදික්භාගයෙහි ගංගාවකටත් එක් විලකටත් අතුරෙහි සිත්කළුවූ ගෙන වනමුල් ඵලාහාරයෙන් ජීවත්වෙමින් බොහෝ කලක් වාසය කොට ජරාවට පැමිණියාහුය.

එකල සක්දෙව්රජහුගේ අසාය, ශ්‍රද්ධාය, හිරිය, සිරියයි යන නම් ඇති දූ සතරදෙනෙක් වූහ. ඔහු සතරදෙන බොහෝ වූ මල් සුවඳ විලවුන් හැරගෙණ ජල ක්‍රීඩාව පිණිස අනොතප්ත විලට ගොස් එහි දියකෙළ රත්ගල් තලා මුදුනෙහි උන්නාහුය. එකල නාරද නම් බ්‍රාහ්මණ තාපස කෙණෙක් දිවා විහාරය පිණිස තවුතිසා භවනයට ගොස් නන්ද වන චිත්‍රලතා වනයෙහි දිවා විහාරය කොට පරසතුමදාරා මලක් කුඩයක් මෙන් ඡායාව පිණිස ඉසව්කොට ගෙණ දිව්‍යාංගනාවක උන්නාවූ සල්වට මුදුනෙන් තමන් වසන්නාවූ රත්ගල් ගුහාවට යන්නාහුය, එසඳ දිව්‍යාංගනාවෝ නාරද තාපසයන් අත තිබූ මනාවූ ප්‍රබුද්ධවූ විශිෂ්ඨවූ දේවියන් විසින් පළඳනා ලබන්නාවූ අනික් මනුෂ්‍ය නාග යක්ෂාදින්ට නොලැබෙන්නාවූ පරසතු මදාරා මල දැක ජාඹොනද ස්වර්ණයට බඳුවූ ඡවිවර්ණය ඇති උත්තමරූ දරන්නාවූ ඒ දිව්‍යප්සරාවෝ නැගීසිට උත්තම ගුණ දරන්නාවූ මහත්වූ තපස් තෙජස්ඇති බ්‍රාහ්මණයන් වහන්ස නුඹ වහන්සේ විසින් එක්කෙණෙකුන්ටයයි නොඋදෙසන ලද්දේවීනම් ඒ අපට දී අපගේ අභිප්‍රාය සිද්ධකොට එපරිද්දෙන් නුඹ වහන්සේ අභිප්‍රායෙක් ඇති නමුත් සිද්ධකොට ගත මැනව තවද මේ පරසතු මදාරා මල අපට දීමෙන් අපට පියවූ ශක්‍රදේව රාජයානන් වහන්සේ පරිද්දෙන් අපගේ මනෝරථය පූර්ණය කළ මැනවයි කීහ.

ඒ අසා තාපසයෝ එම්බා දිව්‍යප්සරාවෙනි මේ මල මාගෙණා පමණක් විනා කිසිකෙණෙකුන් උදෙසන ලද්දක් නොවෙයි මාලාගන්ධ විලොපනයෙන් වැලකී හෙයින් මටත් ප්‍රයෝජන නැත්තේය. තෙපි හැම මා නිසා විවිද නොකොට මේ මල හැරගෙන තොප හැමගෙන් වැඩිමහළු කෙණෙක් පලදිත්වයි කීහ.

SANHIDA LANKA

ඒ අසා දිව්‍යාංගනාවෝ තාපසයාණන් වහන්සේ නුඹ වහන්සේ අප සතර දෙනාගෙන් යම් කෙණෙකුන්ට දෙනු කැමතිසේක්ද උන්ට දුන මැනවැයි ඔහුම ප්‍රධාන වෙතියි කීවාහුය. ඉක්බිති නාරද තාපසයෝ දිව්‍යප්සරාවෙනි එසේ කොට විවාද වැඩිම තපස්විවරයන්ට සුදුසු නොවන්නේය. තොප හැම අතුරෙන් උත්තමකෙනෙකුන් තෝරණු කැමැත්තා නම් තොප හැමට පියවූ දෙදෙව්ලොව දේවතාවන්ට නායකවූ ශක්‍රදේවේන්ද්‍රයන්ම විචාර නියම දැන ගනුවයි කීවාහුය.

ඒ අසා දිව්‍යාංගනාවෝ මළ නුදුන් හෙයින් හා තොපගේ පියාණන් අතින් විචාරා නියමදනුවයි කීහෙයින් තාපසයන්ට කිපී ශක්‍රදේවේන්ද්‍රයන් සමීපයට ගොස් පියානන් වහන්ස අප සතරදෙනාගෙන් ශ්‍රේෂ්ට කවුරුදැයි විචාළාහුය. එසඳ බංජාලිව සිට විචාළවූ දිව්‍යප්සරාවන්ගේ බස් අසා හද්‍රා වෙනි තොපි සතරදෙනා රූපයෙන් වර්ණයෙන් වයසින් ඓශ්වර්යයෙන් සමානය කවරෙක් තොප ඔවුනොවුන් හා විවාද ඉපදවූදැයි විදාළාහුය.

ඉක්බිති දිව්‍යප්සරාවෝ පියාණන් වහන්ස දිව්‍යලෝක මනුෂ්‍යලෝකාදීයෙහි අසබලිතවූ ගමන් ඇති උතුම් තාපස ධර්මයෙහි පිහිටියාවූ තපස්තේජස් ඇති නාරද නම් තාපසයානන් වහන්සේ ගඳමහන් පව්වෙහි අප සතරදෙනා දැක මෙලෙස කිවුය. ඉදින් නුඹ වහන්සේ දක්නා සේක් වී නම් විශිෂ්ටවූ කෙනෙකුන් කිවමැනවැයි කීවාහුය.

ඒ අසා ශක්‍රදේවේන්ද්‍රයෝ මොහු සතරදෙනා මාගේ දරුවෝය. ඉන් මොවුන්ගෙන් එක්කෙණෙකුන් ගුණයෙන් විශිෂ්ටයයි කිනම් තෙස්සෝ කිපෙන්නාහුය. මේ තෝරා කියන්ට නොපිළිවන මොවුන් හිමාලය වනයෙහි කෝසිය තාපසයන් සමීපයට යවමියි ඒ තාපසයෝ මොවුන්ගේ විවාද සන් සිඳුවන්නාහුයයි සිතා දරුවෙනි මේ විවාදය මා විසින් විචාළ නොහැක්කේය. හිමාලය වනයෙහි කෝසිය නම් පසකෙණෙක් ඇත. ඕහට මම සුධා භෝජනය යවමි තාපසයෝ අන්කෙනෙකුන්ට නොදී අනුභව නොකෙරෙති ගුණවත් කෙණෙකුන්ටම දෙන්නාහුය. තොප හැම අතුරෙන් යමක් ලබන්නීදහේ තෙම උතුම්වන්නීයයි කියා ඔවුන් එතනින් නික්මවා මාතලී දිව්‍යපුත්‍රයා කැඳවා එඹල රථාචාරීනි හිමාලය වනයට දකුණු දික්භාගයෙහි ගංගාතීරයෙහි කෝසිය නම් තාපසකෙණෙක් තපස්කෙරෙති උෟතුමූ අමනුෂ්‍ය වාසයෙහි වසන හෙයින් කිසි අන්නපානාදියක් නොලබන්නාහුය. මේ සුධාභොජනය ගෙනගොස් ඒ තාපසයන්ට දෙවයි විධාන කළහ.

ඒ නියෝගලත් රථාචාරීතෙම සුධාභොජනය ඇරගෙන දහසක්ම මනොමය සෛන්ධවයන් යොදන ලද්දාවූ දිව්‍යරථයට පැනනැගී ආශ්‍රමයට ගොස් තුමූ නෙපෙනී උදය කාලයෙහි ශරීරකෘත්‍යය කොට ගිණිදෙවියාට පුදා සූර්යදේවතාවාට නමස්කාර කරමින් සිටි තාපසයන් අතට සුධාභොජනය දුන්නේය. එසඳ කෝසිය තාපසයෝ තමන් අතට දුන්නාවූ ඒ සුධාභෝජනය දැක ගිණිදෙවියා පුදා සූර්යවචනය කෙරෙමින් සිටියාවූමා අතට දෙන ලද සක්සේ සුදුවූ ඉතා පිරිසිදුවූ අසදෘශවූ දිවසුවඳ විහිදුනාවූ ආශ්චර්ය ස්වරූපවූ පෙර නුදුටුවිරුවාවූ සුධාභෝජනය ශක්‍රදේවේන්ද්‍රයෝ දෝහෝ නොහොත් අන්‍යවූ දේවතාවෙක්ද මධුරවූ මේ අමෘතභොජනය මා අතට දුන්නෝ කවුරු දැයි යනාදීන් කථාකළාහ.

ඒ අසා මාතලී දෙව්පුත්තෙම මා දෙදෙව්ලොව දේවතාවන්ට නායකවූ සක්දෙව් රජ්ජුරුවන් වහන්සේගේ නියෝගයෙන් සුධාභෝජනය ගෙනාවාවූ මාතලී දිව්‍යපුත්‍රයායයි දතමැනව මේ උතුම්වූ කිරිබත අනික් සැකයක් නොකොට අනුභවකළ මැනව තවද තපස්වීන් වහන්ස භෝජනය අනුභව කළකල සාදුක්ද පැන් පිපාසද ගැන්මය නොහැල්මය කුසිතකම විධාවයකොපයනැවත වෛරබැඳීමය ඔවුනොවුන් හා විවාද කිරීමය කේලාම් කීමය සීතපීඩාව උෂ්ණ පීඩාවය මැලිකමය කියන ලද දොළොස්වැදෑරුම් වූ නුගුණ දුරුකරන්නේය. ඒ කාරණයෙන් මේ සුධා භොජනය අනුභව කළ මැනවැයි කීය.

එබස් අසා කොසිය තාපසයෝ එම්බා මාතලී නම් දිව්‍යපුත්‍රයාණෙනි පළමු මා විසින් ලබන ලද ආහාරය අන්කෙනෙකුන්ට නොදී අනුභව නොකෙරෙමි යන ව්‍රතසමාදානය කරනලද්දේය. එහෙයින් අන්කෙනෙකුන්ට නොදී අනුභවකිරීම සට නොවටනේය. තවද උදකලාව අනුභව කිරීමද උත්තමයන් විසින් පසස්නාලද්දේ නොවෙයි තවද ලබන ලද ආහාරය අන්කෙණකුන්ට නොදි අනුභව කරන්නාවූ සත්වතෙම කිසිකලෙකත් සැපයක් නොලබන්නේ යයි යනාදී කීහ.

ඒ අසා මාතලී දිව්‍යපුත්‍රද තපස්වීන් වහන්ස නුඹ වහන්සේ විසින් අනුන්ට නොදී අනුභව කිරීමෙහි කවර දෝෂයක් දැක මේ ව්‍රතසමාදානය කරණ ලදැයි විචාළේය.

SANHIDA LANKA

ඒ අසා කෝසිය තාපසයෝ එම්බා දිව්‍යරථාචාරීනි මේ ලෝකයෙහි යම් කෙණෙක් ස්ත්‍රීවධාදීවූ ප්‍රාණවධද මිත්‍රද්‍රොහීකම්ද පරදාර කර්මයද ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට නින්දා පරිභවයද තද මසුරුකමයයි යන මෙකී දෙයින් යුක්තවූ මේ පස්දෙන අතත්‍යන්තයෙන් අධර්ම නම් වෙති. ඒ කාරණයෙන් පැන් පමණක් ලදින් අන්කෙනෙකුන්ට නොදී අනුභව නොකෙරෙති තවද මේ දානව්‍රතය සමාදන්වූ තැන්පටන් නුවැණැත්තාවූ බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධාදී

ශ්‍රාවකාදීන් විසින් උතුමැයි පසස්නාලද දානය ස්ත්‍රීන්ට වේවයි පුරුෂයන්ට වේවයි දන්දෙම්මයි මේ දානපරිත්‍යාගයෙන් යුක්තවූ සත්වයෝද ඇත්තාහ. පහවූ මසුරුසිත් ඇත්තාහ මනාවූ සත්වධර්මයන් යුක්තයමයි උත්තමයන් විසින් උපස්ථාන ලද්දේයයි කීහ.

එකල කෝසිය තාපසයන් විසින් කියනලද සුභාෂිත වචනයන් අසා දිව්‍යපුත්‍රතෙම සතුටුව තාපසයන්ට පෙණෙන පරිද්දෙන් සිටියේය.

එකල ශක්‍රදේවේන්ද්‍රයන් විසින් නියෝග කරණලද ඒ දිව්‍යාංගනාවෝ සතරදෙන ආශ්‍රමයට ගොස් රන්වන්වූ ශරීරශෝභාවෙන් දසදිගුන් බබුළුවමින් දකුණුදිග අසාය, බටහිර සද්ධාය, උතුරුදිග හිරිය, නැගෙනහිර ශ්‍රියයි සතර දෙන සතරදිසාවෙහි සිටියහ.

එසඳ කොසියතාපසයෝ මනාවූ ශරීරශෝභාවෙන් දසදිගුන් බබුළුවා වහ්නිශිඛාවක්මෙන් දිලියෙන්නාවූ හාවභාවලීලා කටාක්‍ෂ මන්දසම්තාදීවූ චතු රාගයෙන් යුක්තවූ ඒ දිව්‍යාංගනාවන් සතරදෙනා දැක උතුම්වූ සනෙතාෂයට පැමිණියාවූ සවර්ණාභරණයෙන් සැරසී ඔසධිතාරකාවන් පරිද්දෙන් දීප්තිමත්වූ ශරීර ශොභාවෙන්ද මන්දමාරුතයෙන් ලෙලදෙන්නාවූ සවර්ණලතිකාවකට බඳුවූ සෝභාව දරන්නාවූ ශරීර ඇති දිව්‍යාංගනාව පූර්වදිග්හී සිටියාවූ තෝ කවරෙක්හිද මට කියවයි විචාළාහ.

ඒ අසා ශ්‍රී තොමෝ තාපසයන් වහන්ස සියළු සත්වයන් දමනලද ආලාමක සත්වයන් සෙවුනාවූ තවද තාපසයන් වහන්ස මේ ලෝකයෙහි යම් සත්ව කෙනෙකුන්ට සැපකැමතවීද ඒ සත්වතෙම සර්වාකමයෙන් සමන්විතව සන්තුෂ්ටවන්නේය. එහෙයින් මා ශ්‍රීකාන්තායයි කියා දතමැනව සුධාභෝජනයෙහි විවාදයක් නිසා නුඹ වහන්සේ සමීපයට ආමියි උතුම්වූ ප්‍රඥාවිශේෂ ඇති තපස්වීන් වහන්ස සුධාභොජනය දීමෙන් මා උතුම්කොට තෝරා වදාළ මැනවැයි කිව.

ඒ අසා කොසිය තාපසයෝ මේ ලෝකයෙහි හස්තිශිල්ප අශ්වශිල්පාදීවූ නොයෙක් ශිල්පාද අක්‍ෂර ලිඛිත ගණිත ගාන්ධර්වාදී අනෙකප්‍රකාර විද්‍යාස්ථානද ආචාරසිලයෙන්ද විශිෂ්ටවූ ප්‍රඥාවිශේෂයෙන්ද යන මෙයින් යුක්තවුද කෘෂි වනිද්‍යාදී ස්වකීයවූ කුලක්‍රියාවෙන් සමන්විතවූ සත්වයෝ තොපගේ පරම්මුඛතාවෙන් දිළිඳුබවට පැමිණෙන්නාහුය. ඒ තොපගේ අකාරියෙක තවද මේ ලෝකයෙහි කුසීතවූ තමාගේ බඩ පමණ නොදන්නාවූ වංශයෙන් යටත්වූ විරූපීවූ දුර්ජනසත්වයෝද තොප හා එක්වීම හේතුකොටගෙණ විශිෂ්ටවූ ආශ්චර්ය හා යස්සට පැමිණ වංශයෙන් ගුණයෙන් ගුණයෙන් ගොත්‍රයෙන් ආචාර සමාචාරයෙන් සමන්විතවූ සත්පුරුෂයන් තමන්ට දාසත්වයෙහි පමුණුවන්නාහ. එද තොපගේ නොදැන්මෙක ඒ කාරණයෙන් සබ රක්නාවුන් කෙරෙහි නොහැලෙන්නාවූ සත්වයන්ගේ ගුණ පරීක්ෂාකොට සෙවුනාවූ උත්තමයන් එලදාක්නාවූ තොප අඥානයයි දනිමි එබදුවූ කිසි ගුණයක් දහමක් පුරුෂවිශේෂයක් නොදන්නාවූ තොපි සුධාභොජනය තබා ඉඳිනා අස්නක් හා බිපියන පැන් විවරකුත් අපගෙන් නොලබව තොපසේ අසත්පුරුෂයන්ට මාගෙන් දනක් නෙදෙම් වහා මෙතනින් නැගීයවයි කීවාහුය.

එසඳ තාපසයෝ කී බස් අසා ශ්‍රී තෙම බත් ලබන්නා තබා ක්‍ෂණමාත්‍රය කුත් එතන ස්වභාවයෙන් සිටපිය නොහී අතුරුදහන් වුහ.

ඉක්බිති කොසිය තාපසයෝ දකුණුදිගසිට චන්ද්‍රමරීචියේ අතිපාරිශුද්ධවූ දනතපංකතියෙන් හා පලඳනාලද මිණිකොඩොලෙන් හා විසිතුරු වූ අගු පළඳනාවෙන් හා අනෙකප්‍රාකාරවූ ද්‍රව්‍යමයවූ සවර්ණාභරණයෙන් විරාජමානවූ ගොත්‍රඇති සරත් වලාකඩක් බඳුවූ ධවලචඡත්‍රයන් දරන්නාවූ කුසතණින් කරණ ලද ගිණිසලක්මෙන් අතිරක්ත එල්ලව සහිතවූ හෝපලු මල් කැණක් කර්ණවතංසකොට පළඳින්නාවූ භයින් ත්‍රස්තවූ මෘගංගනාවක් බඳු නරීක්ෂණයන් ඇති දිව්‍යාංගනා තෝ කවරෙක්හිඳ තිගේ වල්ලභයා කොයිද මේ වන මධ්‍යයෙහි භයනැතිව කුමක් පිණිස අවුදැයි විචාළාහුය.

ඒ අසා කෝසිය තාපසයන් වහන්ස මේ ස්ථානයෙහි මාගේ ස්වාමිපුත්‍රයාන කෙනෙකුන් නැත්තාහුය මම ද ශක්‍රභවනයෙහි ජාතවූ අසා නමින් ප්‍රසිද්ධවූ දේවතාවෙක්මි අමෘතභෝජනයෙහි ආසනයෙන් නුඹ වහන්සේ කරා අසිම් නුවනැත්තාවූ තාපසයන් වහන්ස මට අමෘත්භොජනය දීමෙන් මා ශ්‍රෙෂ්ඨ කොට තබා වදාළ මැනවැයි කීව.

SANHIDA LANKA

එබස් අසා තාපසයෝ මේ ලෝකයෙහි වෙළඳහුද ධනාර්ථව වස්තුලෝභයෙන් සමුද්‍රයාත්‍රා කෙරෙමින් සමහර කලෙක්හි නැව්නැගී නස්නාහ සමහර කලෙක්හි නස්නාලද ධන ධාන්‍ය ඇතිව දුකසේ තුමූ පමණක් ගැලවියන්නාහ. ඔවුන්ට පැමිණියාවූ විනාශයද අර්ථ ආසාවෙන් වුහෙයින් තොප නිසාම වන්නේය. තවද කෘෂිකර්මාන්තයෙන් ජීවත්වන්නාවූ ගොවිකෙණෙක් වත් ආදිය ධන්‍යලෝභයෙන් සැව පුට රැක බලා බොහෝ ආයාසයට පැමිණත් සමහර කලෙක්හි වැසි සුලන් හැමීමය කොකකන කලටිරෝගය වැසිනැතිවීමය

යනාදී රෝගයෙන්ද මීයන් පලගැටියන්  ගොළුබෙළුවන් ආදී නොයෙක් සත් ගැහැණියෙන් නස්නා ලදුව දුග්ගන්නාවු සත්වයෝ ඉන්කිසි සස්‍ය ඵලයකුත් නොලබන්නාහුය. උන්ගේ ආසා විනාශයද තොප විසින් කරණලද්දේය. මේ ලෝකයෙහි සමහර සත්වයෝ පොහොසතුන්ට සේවාකම්කොට සම්පත් ලැබගණුම්හයි සතුරන් මධ්‍යයට වැද පුරුෂපරාක්‍රමය කෙරෙමින් සතුරන් අත නැසී ආශාචෙඡදයට පැමිණ මහදුක්විඳ නස්නාහ. උන්ගේ විනාශයද තොප නිසාම වන්නේය.

තවද මේ ලෝකයෙහි යම් සත්වයෙක් තමන් විසින් රැස්කරන්නාවු ධනධාන්‍යාදියද පුත්‍ර මිත්‍ර කලත්‍රාදීවු බන්ධුවර්ගයාද යන මේ සියලු වස්තු කාම කෙලසකාමයන් හැර දිව්‍යලෝක මනුෂ්‍යලෝක සැප කැමතිව රැක්‍ෂවු අජව්‍රතගෝව්‍රතාදිවු ව්‍රතසමාදානයන් කොට නුනුවණින් නොමගගොස් මෙලොවත් පරලොවත් අනෙකප්‍රකාරවූ දුක්විඳ මියපරලොව ගියකල්හිද අපාදුක්ඛයට පැමිණ තමන් විසින් ප්‍රාර්ථනා කරණ ලද දිව්‍යම මනුෂ්‍ය සම්පත් තබා අනෙකප්‍රකාරවු දුක් විඳිනාහ. එයින් තොප නිසාම වන්නේය. ඒ කාරණයෙන් අසා නම් දිව්‍යංගනාව අපගෙන් අමෘත භෝජනයක් ලැබෙම් යන ආසාවෙක් ඇත්නම් හැර මෙතනින් වනාහි නැගී යවයි කියා යවුහ.

එසඳ කෝසිය තාපසයන්ගේ බස් අසා ඕතොමෝද සුධාව හැර එතැනදීම අතුරුදහන්ව ගියාය. ඉක්බිති තාපසයෝ පස්විමදික්හි සද්ධා නම් දිව්‍යංගනාව දැක අපමණවු වස්ත්‍රාභරණ මාලාදිය හා සපිරිවරින් රන් ලියකට බඳුවු මනොඥවු ශරීර ශෝභාවෙන් දිලිසෙමින් බටහිර දිසාවෙහි සිටියාවු තෝ කවරෙක්දැයි විචාළාහුය. ඉක්බිති ඒ දිව්‍යංගනාතොම විශිෂ්ටවූ ප්‍රඥාවිශේෂ ඇති තාපසයන් වහන්ස උත්තම සත්වයන් විසින් සෙවුනාලද මම සද්ධා නමින් ප්‍රසිද්ධියෙමි. මේ භෝජනයෙහි වාදයක් නිසා නුඹ වහන්සේ කරා ආමි මට සුධාභෝජනය දීමෙන් මා උතුම්කළ මැනවැයි කිව.

එබස් අසා කොසිය තාපසයෝ මේ ලෝකයෙහි සමහර සත්වයෝ කිසි කලෙක්හි තොප හා සමඟව කම්කල අදහා දන්දීමය සිල්රක්ෂා කිරීමය යන මෙයින් යුක්තව සත්පුරුෂ ධර්මයෙහි පිහිටා වාසයකෙරෙත් කිසිකලෙක්හි එම සත්වයෝ තොපගේ වියෝගයෙන් අදත්තාදානය මුසාවාදය තුලාකුට මාණකුටය කේලොම්කීමය යනාදී අනෙක ප්‍රකාරවු දුශ්චරිතයෙහි හැසිරෙන්නාහ.

තවද ආචාරශීලයෙන් යුක්තවු තමා හා සමානවු කුලගෝත්‍රාදී ඇති පතිව්‍රතාධර්මය අඛණ්ඩකොට රක්ෂාකරන්නාවු කුල ස්ත්‍රීන් කෙරෙහි ඇදහිල්ල හැර කලම්ඩියක් කෙරෙහිත් විශ්වාසය කරන්නාහ. ඒ කාරණයෙන් සියලු සත්වයෝ අස්ථානයෙහි උපදනා ශ්‍රද්ධාව නිසා පරදාරාදීවු අනෙක ප්‍රකාර වූ දුෂ්චරිතයන් කරන්නාහ. එහෙයින් කුශල් දුරුකොට අකුසල්ම කරන්නෙහිය මේ පරිද්දෙන් දුරාචාරවූ තොපට ශ්‍රද්ධාභෝජනය දෙන්ට මාගේ අභිප්‍රායෙක් නැත. මෙතනින් වහා නැගී පලායායි යනාදීන් ඇති නුගුණ කියා දෙඬුහ. එසඳ තාපසයන්ගේ බස් අසා එතනදීම අන්තර්ධානව ගියාහ.

ඉක්බිති කෝසිය තාපසයෝ උතුරුදිග සිටි හිරි නම් දිව්‍යංගනා දැක ඇය හා සමඟ කථාකරන්නාහු.

ග්‍රීස්ම සමයෙහි නවදළි සේනෙක්හි අගපටන් මුලදක්වා හටගත් රත්නාකුරයෙන් සොභමාන මන්දමාරුතයෙන් සෙලවෙනලද කලු වැලියයක් සේ ලීලෝපෙතව අරුණෝද්ගමනයෙහි දිලියෙන්නාවු ලහිරු රැස් කළඹක් මෙන් උතුම්වු රූ දරන්නාවු අඩස්බැල්මෙන් යුක්තවූ බැනනැගෙන්නාක් මෙන් සිතා පෙරදැරිකොට සිටියාවු තෝ කිනම් දිව්‍යංගනාවක්දැයි විචාළාහ.

එබස් අසා හිරිනම් දිව්‍යස්ත්‍රීතොම තමාට වුපරිදි කියන්නී සෘෂීන් වහන්ස හැමකල්හිම අලාමක සත්වයන් විසින් සෙවුනාලද්දාවූ සියලු සත්වයන් විසින් පූජ්‍යවූ මම හිරිනම් දිව්‍යස්ත්‍රීවෙමි, සුධාභෝන විවාදයක් පිණිස නුඹ වහන්සේ සමීපයට ආමියි ස්ත්‍රීජාතීන්ට ඉල්වීම නම් රහසිගතය හා ප්‍රකාශ කරනකලක්මෙන් ලජ්ජාඑලවනහෙයින් නුඹ වහන්සේගෙන් තෙස්සන්මෙන් සුධාභෝජනය ඉල්වන්ට අසමර්ථයෙමි කීව.

එපවත් අසා සතුටුවූ කෝසිය තාපසයෝ කියන්නාහු රන්රුවකට බඳුවු උපමා ඇති සුන්දරාංගිය තෝ ස්වභාවෙන්ම සුධාභොජනය ලබනෙහිය. කාරණා කිම්යත්?, තෙස්යෝ විළිහැර ඉල්වූ බව නිසා සුධාභෝජනය නොලද්දාහුය, තී වනාහී නොඉල්වුබවම උතුම් ගුණයෙකැයි ප්‍රසන්නයෙකැවු මම්ම තිට සුධාභොජනයෙන් ආරාධනාකෙරෙමි, සුධාභොජනයක් පිදිය යුතු යයි යම් පමණක් නොකමැත්තෙහි වී නම් එපමණකින්ම තොප සන්තර්පනය කරවා ඉදින් අවශෝෂයෙක් ඇත්නම් මමත් අනුභව කරන්නෙම් වේදැයි කියා සුධාභෝජනයෙන් පැවරූහ.

SANHIDA LANKA

ඉක්බිති කෝසිය තාපසයන් විසින් ආරාධනාකරණලද හිරි නම් දිව්‍යංගනාතොම මුල් පටන් අග දක්වා සහ මල්පල්ලෙන් සැදුම්ලද අඹ දඹ නා පනා කැල මුරුගා ලොප් සුඹුළු පියුම් වැටකේ දුනුකේ ඕකේ කරාකේ ආදිවු පංචවිධ කෙතකාදීන් හා තවද ලුණුවරණ ඇසළ කොසඹ බක්මී සල් එල ගිරිතතකොල වල්මහදඹ

දියදඹ ඇසතු මී කල එරහාන්ද පලොල් සිඳුවර ආදීවූ මනාසුවඳ ඇති නොයෙක්ලියකතුන් විසින් පලදනාලද රුක්රජුන් විසින් ප්‍රතිමණ්ඩිතවූ වනඝටපංකකිතිවූහ, තවද එහි අන්තරන්තරයෙහි කැමති තිඹරා ලබු කොමඩු ආදීවූ පලගෙන මල්පිපෙන්නාවූ අපරව්කජාතිද, මල්ගෙණ පලගත්තාවූ මූං මෑ ආදීද වරා පොර තිඹිරි ආදී ගොඩහමු උෟරුහැල් මහවි ස්වංජාතසාල් ආදීන් සමන්විතවූ නිරන්තරයෙහි කෙසෙල් ඇටකෙසෙල් අළුගත් සමන්විතවූ නෙයෙක් පිලීපංකතින් හා තන්හි තන්හි සන්තාපනයට යෝග්‍යවූ සුගන්ධසීතල හරතවූ ජලාශ්‍රීයෙන් හා තවද උතුරුදිග අතිශයින් සෝභමාණවූ මස් සෙවෙල් ආදී ආකකිශවූ ශාන්තවූ නුසුන් මිරස ඇති බස් නට යෝග්‍යවූ මනාකොට ඇති අනවරතයෙන් වගුල කුසුම් මුවරද පෙතිපතරින් යුක්තව සුවඳවැකි තිබෙන්නාවූ ජලයෙන් පිරී ඇඹුල ඉපුල කල්හාර හෙල්මැලි ආදීන්ද විවිධවූ පද්මජාතිද ත්‍රිවිධවූ උත්පල ජාතිද යන මේ පද්ම ජාතිගනධයෙන් සැදුම්ලද මහත් බමර පිය රුවින් අතිරම්‍ය සුලභ ගොදුරු ඇති කොස්ලිහිණියෝ මොනරුය ඇටිකුකුලුය විසිතුරු ජීවන්ජීවකයෝ ගිරා බෝකල කුණාලක හංස පංචක්‍රවාක නොයෙක් පක්‍ෂිසමුහයන්ගෙන් සංචාරණයෙන් ඉතා ශෝභමානවූ තවද නිර්භය වූ සුලභගෝචරයන් ඇති සුංසුමාර මසුන් ලුහුල් මසුන් ඉස්සත් ආදී රෙගෙ මසුන් තෙලයින් කොරලුවන් ආදීවූ ලැහැල්බැඳ ඇවිදිනාවූ නොයෙක් මස් කැලන් ඇති ඉතා දකුම්කළුවූ ඒ පුෂ්කරණියෙහි පැන්බොන පිණිස සියලු දිගින් අවුත් බස්නා සිංහ ව්‍යාඝ්‍ර වගවලස් කොනතශා කග වෙසනුන් හා ඇති ඇහුරුවල් මී රෙහෙමුව තිප්මුව සරහමුව කෙහෙල්මුව කොහොණ ඇට හුරුවල් බාම්විනි සාවුය යන නොයෙක් ජාතීයෙහි මුව ජාතින් විසින් ගැවසීගත්තාවූ තවද ඒ පොකුණවට සිටි තුවටුවෙන් ගිහිහුනාවූ මලසුන්මෙන් මුවරදපෙති පතරින් සැදුම්ලද අතල ගල් මුදුනෙන් හිස බට සමූහයා පිරිවරා බැගෑවි නැටුම්ගත් මත් මයුර මණ්ඩලයන්ගේ කෙකධවනියෙන් කන්කළුවූ අති රම්‍යවූ භූමිභාගඇති ඒ කෝසිය නම් ඍෂිහුගේ ආශ්‍රමය සමීපයට වන එසඳ තාපසයෝ තමන් සමීපස්ථවූ දහසක්වර දිවිලදින් ඔප්කල ජාඹොනද ස්වර්ණරූපයක් මෙන් උතුම්වූ ඡවි වර්ණ ඇති තවද මේඝකුටයෙක්හි හැසිරගිය විදුලියක්මෙන්ද නිලශාඛාවෙන් ප්‍රතිමණ්ඩිතවූ වෘක්ෂයක් පිරිමදිමින් නිල්වූ ගුවන්කුසට වන් පුන්සඳ මඩලක් මෙන් විරාජමානවූ හිරීනම් දිව්‍යංගනාවට සතුටුව කොසිය තාපසයෝ සුවඳහොට බබුස්තණ ආදීන් මිශ්‍රව මදින් මදකොට ගොතා බඳනාලද හෙයින් නැතිවූ මුදුනෙහි අතුරන ලද ඇඳුම් දිවිසම් ඇති ත්‍රිණ සඟලක් අතුට සුන්දරාංගිය මේ ආසනය ඉතා සැපය මෙහි ඉඳුවයි බහුමාණයෙන් නිමන්ත්‍රණය කළහ.

ඉක්බිති හිරීනම් දිව්‍යංගනා පනවන ලද කොච්ඡාසන මස්තකයෙහි බැසඋන.

එසඳ දළමඩුළු අඳුම් දිවිසම්දරු ඒ තපස්වි වරතෙම වහා පොකුණට බැස අළුත් නෙළුම්පතකින් පැන්ගෙණවුත් දක්ෂිණෝදකයදී සුධාභෝජනය පිළිගැන්වූහ.

එසඳ සුධාභොජනය ලැබීමෙන් සතුටුවූ ඒ දිව්‍යස්ත්‍රීතොම මෙතැන් නුඹ වහන්සේ විසින් පුජා ලබනලද්දාවූ මම දිව්‍යලෝකයට යෙමි අවසර ඉල්වා ගෙන තපස්වීන් විසින් අනුදන්නා ලදුව වර්ණමන්දයෙන් මත්වූ හිරි නම් දිව්‍යාංගනාතොම ඇසිල්ලකින් තවුතිසා භවනයට ගොස් තමා ප්‍රියවූ ශක්‍රදේවේන්ද්‍රයන් සමීපයෙහි සිට මේ කොසිය තාපසයන්ගේ සුධාභෝජනය ලදිමි නුඹ වහන්සේද මට වහා ජයදේවා වදාළමැනවැයි කීව.

එපවත් අසා ශක්‍රදේවේන්ද්‍රයෝ සතුටුව තමන් දෙදෙව්ලොව දේවතාවන් හා සමාන ගුණෙන් උතුම්වූ ඒ දිව්‍යංගනාව සවර්ණ පිඨයෙක්හි වඩා හිඳුවා පුජා කළහ.

මෙසේ ඒ හිරිනම් දිව්‍යස්ත්‍රිතොම දිව්‍ය මනුෂ්‍යාදීන් විසින් පුජලි කරණ ලද මහත්වූ පුජා සත්කාර විඳිමින් උදයගිරි පර්වතය මුදුනෙහි දිලියෙන්නාවූ සරද චන්ද්‍ර මණ්ඩලයක් මෙන් සවර්ණමයවූ භද්‍රපීඨ මස්තකයෙහි උන.

මෙසේ ශක්‍රදේවේන්ද්‍රයෝ සුවඳින් මලින් පුජාකොට සිතන්නාහු කෝසිය තාපසයන් වහන්සේ අවශේෂයන්ට සුධාභෝජනය නොදී මැගේ ගුණයෙන් අපේක්ෂාකොට සුධාභොජනය දුන්සේක් දෝහෝයි සිතා ඒ කාරණය දනගෙන එවයි නැවත මාතලී දිව්‍යපුත්‍රයා තපසවීන් ලඟට යවුහ.

එසඳ මාතලී දිව්‍යපුත්‍රතෙම ශක්‍රයන්ගේ වචනය මුදුනෙන් පිලිගෙණ ජාඹොනද ස්වර්ණමය රිය ඇස් ඇතියන් රුවන් මයවු කර්මාන්තයෙන් විසිතුරු වු තවද ඝනරන්මයවු අටමගල සොළොස් මහළයෙන් සැදුම්ලත් ළහිරුරැස් කළඹක්මෙන් දිලියෙන්නාවු මුදුනෙන් කෙළෙනා සියක් සියක්යොදුන් ධජමාලා ඇති තම තමන්ගේ මුළු මුළු හා සමඟ දිවන්නවුන් වෛඩුයය කර්මාන්තයෙන් විසිතුරු වූ තවද ඝනරන්මයවු අට මහල සොළොස් මහලයෙන් සැදුම්ලත් ළහිරු රැස් කළඹක්මෙන් දිලියෙන්නාවු මුදුණෙහි කෙළනා සියක් යොදුන් ධජමාලාවන් ඇති තම තමන්ගේ මුළු මුළු හා සමඟ දිවන්නාවුන් වෛඩුර්ය කර්මාන්තයෙන් කරණ ලද නොයෙක් ජාති පර්ෂියට වෘෂභ සටාදීවූ විසිතුරු කර්මාන්තයෙන් සෝභමානවූ මුදුනෙහි යෙලසියයක් යොදුන් උස ඇති වෛජයන්ත නම් රථය තබා සුවසේ යන පිණිස තුබු පලින් හා ඒ රථයෙහි විසිතුරු කර්ණඩුලාලංකාරයෙන්ද රන්රසුදල් උරසන් ආදීවූ සියලු අලංකාරයෙන් සරහනලද කැට සන්ධිමක් නැතුව උදුබ්දමාත්‍රයකින් සම ගමන්

SANHIDA LANKA

කරන්නාවූ තරුණ හස්තිපොතකයන් හා සමාන බල ඇති දහසක් පමණ මනොමය සෛන්ධවයන් යොදන ලද උතුම්වූ ඒ රථයානට නැගී රථයෙහි චක්‍ර නාදයෙන් හා අශ්වසන්ගේ හෙසරාවයෙන් හා ආකාශයද වෘක්ෂපර්වතාදීන්ද හිමාලයද සමුද්‍රයද පොළොවද යන සියල්ලද විශේෂයෙන් කම්පාකෙරෙමින් ඇසිල්ලකින් අවුත් ආකාශයෙහි රඳවා තමා පෙර දිව්‍යමයවූ උතුරුසලුව ඒකාංශකොට බහාගෙණ බොහෝ ඇසුරුතැන් ඇති ආචාරසම්පන්නවූ තපස් වීන්ට නමස්කාරකොට ස්වාමිනි ආසය සද්ධා ශ්‍රීය යන තුන්දෙනා විවරට කවර ගුණයකින් වැඩි හිරීනම් දිව්‍යස්ත්‍රී සුධාබෝජනය ලද්දීදැයි විචාරාගෙණ එවයි ශක්‍රදේවේන්ද්‍රයන් වහන්සේ වදාළ මෙහෙවර ඇසුව මැනව කීව.

එපවත් අසා කෝසියතාපසයෝ මාතලිය ශිල්ප ජාති ගොත්‍රාදීන් උත්තමයනුත් අධමයනුත් සෙවුනාහෙයින් ශ්‍රීකාන්තාව අන්ධවකෙකැයි සිතමි ඇදිලි කළ මනා වස්තුවහැර අනිකක් අනික්ම ප්‍රාර්ථනාකරණ හෙයින් ශ්‍රද්ධාව විනාශකාරීයයි සිතමි. යම්හෙයකින් ධනර්ථීහු අසාචේජදයට පැමිණෙත්නම් ඒ කාරණයෙන් අසාව අසත්‍යවාදීයයි කියමි. ඒ කාරණයෙන් සුධාභෝජනය ලැබීමට මොහු තුන්දෙනම අයොග්‍යයයි කියා හිරි නම් දිව්‍යංගනාවගේ ගුණකියන්නාවූ මාතලිය ප්‍රවේණි ධර්මය රක්‍ෂා කරන්නාවූ කුලගෙයි වැඩෙන ලද යම් කුමාරිකාකෙණෙක් ඇත්නම් ඔහුද තවද වැන්දඹු ස්ත්‍රීහු ස්වාමීහු කෙරෙහි වසන්නාවූ තරුණ ස්ත්‍රීහුද යන මෙතුන්පක්ෂියෙහි ස්ත්‍රීජාතිහුද පුරුෂාන්තයෙහි උපන්නාවූ තමන්ගේ රාගෙත්සන්තතාව මේ අපට සුදුසු නොවෙයි කියා වාසනා සහිතවූ ඒසා මහත් තමන්ගේ රාග චේතනාව ලජ්ජායෙන් වලකන්නාහුය.

තවද මාතලීය මුත්හරාදී නොයෙක් ආයුධ ප්‍රහාරයෙන් භයානකවූ සංගාරාම භූමියෙහි පැරද පලායන්නවුන් වැටෙන්නවුන් යම් ලජ්ජා සම්පන්න කෙණෙක්ම පැරද පලායම්හයි යන අපකීර්ති විවරට රණමැදට වැටී හුණුම හයි යන බස උත්තමයයි ලජ්ජාවෙන් දිවිපුදා තමන්ගේ ස්වාමීහු සතුරන් අතින් ගලවන්නාහ.

තවද මහාසමුද්‍රයෙහි මහත්වේග ඇති සියදහස්ගණන් තරංග පරම්පරාව යම්සේ වෙරළගැසී භන්නාවේද එපරිද්දෙන්ම හිරි නම්වූ පාපක්‍රියාවෙහි ලජ්ජාකොට සත්වයන්ගේ සන්තානයෙහි අටගත් රාග වේෂ මෝහාදීවූ අකුශල නමැති තරඟයන් භග්නාවන්නාවූ ස්ථානයෙකැයි යන බව තොපගේ ශක්‍ර දේවේන්ද්‍රයන්ට කියවයි කීහ.

මෙසේ තපස්වීන් විසින් වර්ණනාකරණ ලද හිරියාගේ ගුණසංඛ්‍යාත ධර්මකථාව අසා මාතලී දිව්‍යපුත්‍රතෙම ස්වාමිනි නුඹ වහන්සේ සමීපයෙන් සුධාභෝජනයන් ලත්තැනින් පටන් හිරි මේ දිව්‍යස්ත්‍රීතොම ශක්‍රදේවේන්ද්‍රයන් සමීපයෙන් රන්බඳ පුටුවක් ලදින් මහා පූජාසත්කාර ලද්දේය. එසේ හෙයින් දෙවියන්ගේ නුවනටත් නුඹ වහන්සේගේ නුවණවැඩියයි ස්තුති කෙළේය.

මෙසේ ඒ දෙදෙන කථා කෙරෙමින් සිටියදීම තාපසයන් ආයුගෙවී චුතවන ස්වභාවය පහළවිය. එපවත් දැන මාතලී දිව්‍ය පුත්‍රතෙම ස්වාමීනි නුඹ වහන්සේගේ ආයුසංස්කාරය ගෙවින මනුෂ්‍ය භූතව පිරියයුතු දානශීලාදීවූ සුචරිත ධර්මයෙන් මුදුන්පත්වූහ. එබැවින් මා විසින් ගෙනෙනලද ඉතා උතුම්වූ ප්‍රියවූ මනාපවූ රථයට නැගී වදාළමැනවැයි ශක්‍රදේවේන්ද්‍රයන් වහන්සේද ස්වකීය ගෝත්‍රවූ නුඹ වහන්සේ දකිනා අභිප්‍රාය ඇතිසේක. එසේහෙයින් වහා අදම දිව්‍යලෝකයට වහා වැඩිය මැනවැයි කී..

ඒ ඒ වචනාන්තරයෙහිම කෝසිය තාපසයෝ චුතව ඖපපාතිකව දිව්‍ය පුත්‍රව වෛජයන්ත නම් රථයෙහි පෙනීගියහ. ඉක්බිති මාතලී සංඝහහෙතෙම ඒ දිව්‍යපුත්‍රයාණන් ශක්‍රදේවේන්ද්‍රයන් සමීපයට වඩා ගෙණගියේය.

ශක්‍රදේවේන්ද්‍රයෝ තමන්ගේ සහගොත්‍රවූ තරුණ දිව්‍යපුත්‍රයා දැක සන්තෝෂයෙන් පිනාගොස් තමන්ගේ දුව කිරි නම් දිව්‍යාංගනාට ඕහට අග්‍රමහේසිකාකොට පාවා දුන් කල්හි ඕහට ප්‍රමාණාතික්‍රාන්තවූ දිව්‍ය ඓශ්වර්යය පැමිණියේය.

යනාදීන් සර්‍වඥයන් වහන්සේ භික්ෂූන් වහන්සේට මේ අතීත කථාව ගෙණ හැර දක්වා එපරිද්දෙන්ම මහණෙනි අලාමක සත්‍වයන්ගේ ක්‍රියා විශේෂයෙන් අභිප්‍රාය සිඬවන්නේ යයි යනාදීන් ධර්ම දේශනා කොට පූර්‍වාපරසන්ධි ගලපා මේ සුධාභොජන ජාතක ධර්ම දේශනාව නිමවා වදාරා මහණෙනි එසමයෙහි හිරී දේවතා ද මෙසමයේ උපුල්වන් මහා ස්ථවිරීවූහ. කොසිය තාපසයෝ නම් මේ ධානපති භික්ෂූහුය. පංචශිඛ දිව්‍යපුත්‍රයා නම් දිවසින් අගතැන්පත්වූ අනුරුද්ධ ස්ථවිරහුව. මාතලි දිව්‍යපුත්‍ර නම් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයෝය. සූර්ය දිව්‍යපුත්‍ර නම් ධුතංගයෙන් අගතැන්පත්වූ මහසුප් මහතෙරහුය. චන්ද්‍ර දිව්‍යපුත්‍රයෝ නම් වමත් සවුවූ මුගලන් මහතෙරහුය. එසමයෙහි දිවාවිහාර පිණිස දිව්‍යලෝකයට ගොස් මදාරාමල් ගෙනා නාරද තාපසයෝ නම් දකුණත් සව්වූ සාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි මසුරු කෝසයි සිටානන් දමනයෙහිලූ ශක්‍රදේවේන්ද්‍ර නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි දක්වා වදාළසේක.

SANIDA LANKA

# කුණාල ජාතකය

ත්‍රිභූමනෙක තිලකවූ සකලඥෙය සාගර පාරප්‍රාප්තවූ අනන්ත ගුණ ගණාධාර භුවනත්‍රයගත සකල සත්ව හිතොපදේශකවූ ජාති ජරා ව්‍යාධි මරණාදී සකල දුක්ඛසලීංලාස සම්පූර්ණවූ සංසාර ජලනිධිගමන සමස්ත සත්වයා අමෘත මහා නිර්වාණ පුරප්‍රවේශය කරන්නාවූ ලොව්තුරා බුදුහූ කුණාලවිල සමීපයෙහි පැළපස සැටයොදුන් උස ඇති රන්සිරියෙල් ගලතලමුදුනෙහි කල්පස්ථායි සත්යොදුන් උස ඇති සල්රුක් මුල වැඩඋන්සේක් ශාසනයෙහි ඇලුම් මදව වෙහෙස විඳිනාවූ පන්සියයක් භික්ෂූන් අරභයා මේ කුණාළ ජාතක ධර්මදේශනාව වදාළසේක,

මෙහි පිළිවෙළ කථාව ශාක්‍යකොලිය දෙනුවර ඇත්තෝ වනාහි කිඹුල්වත්නුවර හා දෙවුදූහැනුවරට අතුරෙහි රෝහිණී නම් ගංගාව දෙනුවර ඇත්තෝ එක්ව අමුණුබැඳ ගොයම්කරන්නාහුය.

ඉක්බිති පොසොන්මස නියගෙන් ගොයම් මියන්ට වන්කල්හි තොපටත් අපටත් නොසෑහෙන්නේය, අපගේ ගොයම් එකදියවරකින්ම පැසෙන්නේය. එහෙයින් මේ දිය පළමුකොට අපට හැරපියවයි කීහ.

එබස් අසා කිඹුල්වත්පුර ඇත්තෝ තොප ගොයම් පැසවා අටුවපුරා ගත්කල්හි අපි රත්රන් රිදි මැණික් කාවනුගෙණ කඩගම්පැසගෙන තොපගේ දොර දොර ඇවිදින්ඩ නොහැක්කම්හ. අපගේද ගොයම් එක දියවරකින් පැසෙන්නේය. එබැවින් අපට හැරපියවයි කී කල්හි කෝලිය නුවර වැස්සො අපි නොදෙම්හයි කීහ. කිඹුල්වත ඇත්තෝද අපි නොදෙම්හයි කීහ. මෙසේ ඒ කාරණයෙහි ඇත්තෝ ඔවුනොවුන් හා සමඟ කලහ වර්ධනයකොට එකෙක් නැගී සිට එකෙකුට ගැසීය. එද පහරලැබ නැවත ඕහට ගැසියයි යනාදීන් මෙසේ ඔවුනොවුන් මරා රජ දරුවන්ට ජාතිසඝ්ඨන බණන්නාහු කෝලිය නුවර ඇත්තෝ කිඹුල්වත රජ දරුවන්ට කොල තෙපි කැනහිලුන් බල්ලන් මෙන් නගුන් බූන් රක්ෂාකොටගෙණ විසුවවුන් හැරගෙන ගජ්ජිනාකරාද උන්සේ වුවන්ගේ ඇතුන් අසුන් හා කඩුපලඟ ආදිය ඇතිද අපට කුමක්කොටගත එද්දැයි කීහ. ශාක්‍ය රජ දරුවන්ගේ ගොවීද තොපි දූන් අපට තිරිසනුන්මෙන් නිරාසව වදනා අත් නැති කොලොන් ගස් සිදුරෙහි වාසයකළාවූ කුෂ්ට කොල්ලන් හැරගෙන භයගත්වවුද උන්ගේ ඇතුන් අසුන් හා කඩුපලඟ ආදීය අපට කුමක් කොටගතහෙද්දැයි කීහ.

මෙසේ ඒ ගොවි දරුවෝ ඔවුනොවුන් හා වාදකොටගෙන එකට යුත්තෙහි නියුක්ත අමාත්‍යයන්ට කීහ. ඔහුද රජ දරුවන්ට ගොස් දැන්වූහ. ඉක්බිති ශාක්‍යරජදරුවෝ නඟුන් බූන් හා විසුව වුන්ගේ බල හා ශක්ති දක්වම්හයි සටනට සැරහී නික්මුණාහ. කොලිය රජ දරුවෝ කොළොම් ගස් සිදුරෙහි විසුවවුන්ගේ බල පැමුත් නොහරිමියි කියා යුද්ධයට නික්මුණාහ. මෙසේ ඒ දෙනුවර වාසීහු සවස්වෙලෙහි ගන්තෙරට අවුත් වන්හ.

එසමයෙහි භාග්‍යවත්වූ බුදුරජානන් වහන්සේ සැවැත්නුවර නිසා දෙව්රම වැඩ වෙසෙමින් එදවස් ප්‍රත්‍යුෂකාලයෙහි සූවිසිකොළ ලක්ෂයක් නයින් ප්‍රතිමණ්ඩිතවූ මහාකරුණා සමාපත්තියට සමවැද ලොව බලාවදාළසේක් උභය නගරවාසීන්ගේ සටන් දැකවදාරා තමන්වහන්සේ එතනට වැඩි කල මතුවන්නාවූ මහත් අභිවෘද්ධියක් දැක වදාරා සිරුරුපිළිදැග සැවැත්නුවර පිඬු සිඟා වළඳ ගඳ කිළියෙහි සැතපි වදාරා සවස්වෙලෙහි රත්ගල්ගුහාවෙන් පිටත්ව නික්මුණු කේසර සිංහරාජයෙකු මෙන් තමන් වහන්සේගේ පාත්‍රාචිවර දරා තමන් වහන්සේම එතන පෙණිවදාරා දෙසෙනඟ මැද ආකාශයෙහි පලක්බැඳ වැඩහිඳ ඔවුන්ට භයඋපදවන පිණිස නිල්කිසුණු සමවත් සමවැද තමන්වහන්සේ කෙශධාතුයෙන් නික්මුණාවූ නිල්රැස් පතරින් සියල්ලෝ දාකුස් අන්ධකාරකොට භය උපදවා වදාළසේක.

මෙසේ අන්ධකාරයෙන් මුඩවූ ඒ රජදරුවන්ට උදාගල් තෙලෙන් අඳුරු බිඳ පහළවූ ළහිරුමඬලක් මෙන් තමන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් සවණක් ඝණ බුදුරැස් විහිදුවා තමන් වහන්සේ දක්වා වදාළසේක.

එකල කිඹුල්වත් නුවර ඇත්තෝ සර්වඥයන් වහන්සේ දැක අපගේ මේ විවාද කාරණය දැකදෝ ඥාතිශ්‍රෙෂ්ටවූ අපගේ ස්වාමිදරුවානන් වහන්සේ වැඩ වදාළසේක, අපි මුන් වහන්සේ වැඩ සිටියදී අනිකකෙණෙකුන්ගේ ශරීරයෙහි ශස්ත්‍රප්‍රහාරයක්දීම අප විසින් නොපිළිවෙන කෝලිය නුවර ඇත්තෝ අප පරදවත්වා කපත්වා දවත්වා කිසිවකුත් නොකරම්හයි ආයුධ දැමූහයි. කෝලිය නුවර ඇත්තෝත් එමලෙසම ආයුධ දමා දෙපක්ෂයෙහි ඇත්තෝ බුද්ධාලංබන ප්‍රීතීන් ප්‍රජාලීව සිටියාහ.

SANHIDA LANKA

ඉක්බිති බුදුහූ ආකාශයෙන් බැස ගංතෙර රම්‍යවූ ප්‍රදේශයක්හි වැලි තලාවක් මත්තෙහි පනවන ලද උතුම්වූ බුද්ධාසන මස්තකයෙහි අවරන් ගිරි තලා මුදුනෙහි බබලන්නාවූ සූර්ය මණ්ඩලය පරිද්දෙන් අනොපමෙය්‍යවූ බුද්ධශ්‍රීන් විරාජමානව වැඩ හුන්සේක. ශාක්‍ය කෝලිය රජ දරුවෝ බුදුන් වැඳ පිරිවරා උන්හ.

ඉක්බිති බුදුහු දන දනම රජදරුවන් රැස්වුයේ කුමක් පිණිසදැයි විචාළසේක, ස්වාමීනි ගංගාවේ දියකෙළිනා පිණිස නොවෙයි සංග්‍රාමයක් අරභයා රැස්වුම්හයි දැන්වුකළහි තොපගේ සටන් කුමක් පිණිසදැයි විචාළසේක. ස්වාමින් දිය දබරයකැයි කීහ. රජදරුවෙනි පැන් නම් කුමක් අගිදැයි වදාළසේක, ස්වාමීනි ජලය නම් අල්පාර්ඝිවස්තුවෙකැයි කීහ.

ඉක්බිති බුදුහූ පොලාව කුමක් අගිදැයි වදාළසේක, පොළොව අනර්ග වස්තුවෙක්වේදැයි කීහ. නැවත රජ දරුවෝ කුමක් අගිදැයි වදාළසේක. ස්වාමිනි රජදරුවෝ ඉතා අනර්ඝයෝයි කීහ. බුදුහු වදාරණසේක් ස්වල්පාර්ගීවු දිය පිණිස මාහැඟි රජදරුවන් ඔවුනොවුන් හා කලහ කොට නැසෙන්ට කාරණා කිම්දැයි තවද රජදරුවෙනි කලහයෙහි ආශ්වාදයෙක් කවර කලෙකත් නැත. තවද අසව රජදරුවෙනි නිස්කාරණයෙහි උපදවාගත් විවාදය පිණිස එක්තරා වෘක්ෂදේවතාවෙකු හා වලහකු බැඳගත් බද්ධවෛරය සියලුකප මුළුල්ලෙහි පවතීන්නේයයි කියා එන්දන ජාතක ධර්මදේශනාකොට නැවතත් රජදරුවන්ට අනුන් කීවා කටයුතු යයි ගිවිසීම යුක්තනොවෙයි අනුන් කිවාහි විසීම හේතුකොටගෙණ එක් සාවකුගේ බස් ගිවිස තුන්දාසක් යොදුන් පමණ හිමාලය වනයෙහි සියලු සිංහ ව්‍යාඝ්‍රාදී චතුස්පාද ජාතිහු මුදුබත්වන්ට පටන්ගත්තා හුය. එසේහෙයින් රජදරුවෙනි අන්‍යවචනයන් ප්‍රමාණකළයුතු නොවෙයි කියා දද්දහ ජාතකය දේශනාකොට තවද රජදරුවෙනි දුර්වල සත්ව කෙනෙකුන් මහත්බල ඇත්තවුන්ගේ සිදුරු දන්නාහුය. කිසිකලෙක මහබලඇත්තෝ දුර්වලයන්ගේ අතුරක් දක්නාහුය. කෙසේද යත්.

එක්තරා කැටකිරිල්ලක් ත්‍රිමදගලිත හස්තිරාජයෙක් ජීවිතක්‍ෂයට පමුණුවාලුදැයයි ලටුකික ජාතකය දේශනා කළසේක. මෙසේ රජ දරුවන්ගේ කලහ සන්සිදුවන පිණිස ජාතක තුනක් දේශනාකොට නැවත සමගිකරණ පිණිස රජදරුවෙනි සමගීවු සත්වකෙනෙකුන්ට කිසි කෙනෙකුන් අවකාශයක් දක්ක නොහෙන්නාහුයයි වෘක්‍ෂධර්ම ජාතකයද නැවත සමගි සත්වයන්ගේ බිඳීම දත් වැදි පුත්‍රයෝ වටුවන් ජීවිතක්ෂයට පමුණුවා තමන්ගේ අභිමතය මුදුන්පත් කෙළෝ වේදැයි වට්ටක ජාතකයද යන ජාතක දෙක දේශනාකොට උභය නගරවාසී රජ දරුවන් සමඟ සතුටුවූකොට මෙසේ ඡන්‍දවජාතක දේශනාව කෙළෙවර ස්වස්තානා වර්තීහු දෝෂ මදිනය කරුණු පිණිස ලැවුගිනි නිවා බස්නා ආකාශගංගා ප්‍රවාහයක්සේ අන්ත දණ්ඩ සුත්‍රය දේශනා කොට රජදරුවන් සතුටුකරවුයේය.

එසඳ වර්ගී ශ්‍රේෂ්ඨවු සර්වඥරාජෝත්තමයානන් වහන්සේගේ එතැන්හි ප්‍රවෘත්තිතවු ධර්මදේශනා ශ්‍රිතයෙහි ඇස් තබන මගුලට රැස්වු රජ දරුවෝ සතුටු සොම්නසින් පිණා ඉදින් ස්වාමිදරුවෝ මෙතනට නොවැඩිසේක්විනම් අපි හැමදෙනාම ඔවුනොවුන් මරා ලේ ගඟක් කරම්හ. බුදුරජානන් වහන්සේ නිසා අපි දිවි ලද්දේයයි සතුටුව ඉදින් මුන් වහන්සේ ගිහිගෙයි විසුසේක් විනම් දෙදෙහසක් කොදෙව් පිරිවරණ ලද සකල චක්‍රවාට ගර්භයෙහි අසදෘශාභිෂේක ප්‍රාප්තව තමන් වහන්සේ හා සමබල දහසක් පුතුන් ඇතිවනසේක. අපි හැමද පිරිවර රජදරුවෝම්හය. එසේවු සත්දවසකින් පහළවන්නාවු සක්විති රාජ්‍යය හා කිඹුල්වත් පුරය වැනි ජයභූමිය හා සතළිස් දහසක් නළුවන් හා එක්ගව් දෙගව් තෙගව් සිව්ගව් පමණ මුවවැටිය ඇති සංඛය එලකය කුමුදාය පුණ්ඩරිකය යන දියපොළොව දක්වා එරිසිටි සත්රුවන් නිධාන සතරක් හා සමඟ රාජ්ජය හැරගොස් අප ඇමදෙනා කෙරෙහි කළ කරුණාවෙන් උතුම්වූ සර්වඥපද ප්‍රාප්තවුසේක. දැනුදු රජසිරි හා සමග වසනසේක්වයි දෙනුවරවාසීවූ රජ්ජුරුවෝ එක්ව දෙසිය පණහක් දෙසිය පණසක් බැගින් පන්සියයක් රාජ කුමාරවරුන් දුන්හ. බුදුහූ ඒ පන්සියයක් දෙනා මහණකොටගෙන හිමාලය හා ඒකාබද්ධවු අඹදඹ කොළඹ කරඹ රඹ සමුනාපනා කොබොලිල පලොල් කිණි හිරි හෝපලු ඇසළඑරහැන්ද කණේරු දුනුමඬලාවැටකේ කරාකේ ඇතුළුවූ අමු ලාග්‍රාස මල්එල්ලෙන් සැදුම් ලද්දාවු නොයෙත් ලියකතුන් විසින් වැළඳි තුරු පතරින් ප්‍රතිමණ්ඩිතවූ ඒ ඒවෘක්ෂාග්‍රයෙහි ඉඳ මකරද පලාපස අනුභවකිරීමෙන් මත්වැරාවක ප්‍රතිරාවක දෙනලද ගිරා බෝකල මොණර සැළලිහිණි සක්වා ලිහිණිකුණාල චිත්‍රාචිත්‍රවූ නොයෙක් ජාතියෙහි පක්ෂි සමුහයන්ගෙන් රමණිය මඩුළු යටන්හි සමහර තෙනෙක්හි සම සුභ්‍රවාළුකාථලයෙන් කිසිතෙනෙක්හි නොයෙක් ජාතියෙහි කුසුම් මුවරද පෙති පතරින් සැදුමුලද අතල ගල්මුදුනෙහි සෙබඩ සමූහයා පිරිවරා බහවී නැවුම්ගත් මත්තමයුරයන්ගේ නාද යෙන් කන්කළුවු තවද ඒ වනයෙහි ලාතඹපලුවත් ඇ නොයෙක් ගොදුරු අනුභව කෙරෙමින් ස්වකීයවූ මෘගංගනාවන් හා සමඟ බැහැවි ගමන්ගත් වරහ මෙහෙවර සමර රුරු එණි පාදාදීවු නොයෙක් ජාතියෙහි වස්තු පදයා විසින් සමරතවූ හංසචක්‍රවාකද්‍යනෙකප්‍රකාර විජගණෛප කුජිත ප්‍රසන්න සිතල මල ජලහරිත පූර්ණවූ ඇඹුල ඉපුල කල්හාර හෙල්මැලි ආදීවු නොයෙක් ජලකුසුමයෙන් සොහමානවූ තවද තීරන්තයෙහි නදුන් සඳුන් කළුවැල් කපුරු දෙවුදුරු තුවරලා ආදීවු වනසට පංත්තින් විරාජමානවු පුෂ්පකරණීශතසහශ්‍රයෙහි අනවරතයෙන් පිපිසිටිනා පංචවර්ණ පද්මසුගන්ධයෙන් හා අහසින් අඬාබස්නා භාංගසමූහයාගේ නාදයෙන් සෝභමානවූ අතිරම්‍යවු රළ නමාති අතින්ගෙණ බුපූජාවට උඩට ඉස්නාවු මුක්තාතිලකාවන් බදුවු සිහිල් ජලබින්දුයෙන් දෙහයන් සොභමාණවු ඒ ඒ පර්වත ප්‍රාන්තයෙන් වැගිරෙන්නාවූ ස්ඵටික මාණික්‍ය ප්‍රභානිර්විශේෂ සුවඳ මුවරද රොණින් වළදනා නොයෙක් ඇලි සියගණනින්

SANHIDA LANKA

හෙබියාවූ ඇල හෝ කඳුරැලි සිය දහස්ගණනින් හා ඇමකල්හි වසනෙතාද්‍යානයක් මෙන් සැදුම්ලද මහවනයට වැඩ වදාරා ඒ පන්සියයක් දෙනා විසින් පිරිවරණලද බුදුහු දෙවෙනි දවස් පටන්ගෙණ සදවසක් කිඹුල්වත් නුවරටය. දවසක් කෝලිය නුවරටයයි කියා සිඟාවඩනා සේක. මෙසේ දෙනුවර ඇත්තෝ මහත් පූජාසත්කාර කරන්නාහුය. බුදුපා මොක් මහසංඝයා දවස දවස මෙසේ වසනසඳ ඒ මහණවූ පන්සියයක් දෙනා වහන්සේ නොසිතින් මහණවූ හෙයින්ද ශාසනයෙහි උකටලීවූසේක. උන් වහන්සේගේ අභිප්‍රාය දන්නා පිණිස පූර්වදුතියිකාවූ ස්ත්‍රීවූ කෙළෙස් පිළිබඳව් ඒ අසුන් යවූහ. එකල ඒ දැක ඒ භික්ෂූන් වහන්සේ විදුරුලායේ ඇළුණාක් මෙන් පුරාණ දුතියිකාවක් කෙරෙහි සක්තව අතිශයෙන්ම උකටලීවූසේක. බුදුහු උන්වහන්සේලාගේ චිත්තාචාර පරීක්ෂාකරණසේක් අනභිරතොත්පාදය දැන මෙභික්ෂූහු මාබඳු සර්වඥකෙණෙකුන් හා එක්ව වසන්නාහුන් උකටලීවූහ. මුන්ගේ අනභිරතිය හරවන්ට කෙසේවූ ධර්මදේශනාවක් රම්‍ය දෝහෝයි පරීක්ෂා කරණ සේක් කුණාල දේශනාවන් නිසියයි දැන වදාරා ප්‍රභාතකාලයෙහි සිරුර පිළිදැගුම් කොට කයින් සිවුරු හා අතින් පාත්‍රයගෙන කිඹුල්වත පිඬු පිණිස වැඩ ආහාරකෘත්‍ය නිමවා වදාරා පසුබත පන්සියයක් දෙනාවහන්සේ තමන් වහන්සේ සමීපයට කැඳවා මහණෙනි සිත්කළුවූ හිමාලය වනය දුටුවිරුදැයි වදාළසේක. ස්වාමිනි දුටුවිරුනැතැයි දැන්වූකල්හි හිමාලය වන චාරිකාවට එවුදැයි විචාරා වදාළ සේක. ඉක්බිති භික්ෂූන් වහන්සේ ස්වාමිනි එබඳු ඍද්ධියක් අපට නැති හෙයින් කෙසේයමෝදැයි දැන්වූකල්හි ඉදින් කෙණෙක් කැඳවාගෙන යෙත් නම් යවුදැයි විචාරා යහපත ස්වාමිනි දැන්වූකල්හි බුදුහු පන්සියයක් දෙනා වහන්සේ තමන් වහන්සේගේ ඍද්ධියානුභාවයෙන් හැරගෙණ පියුම් විලකට දුවන්නාවූ රාජහංස සමූහයක්මෙන් ආකාශයෙහි පැනනැගී හිමාලයවනයට ගොස් ආකාශයෙහි වැඩ සිටිසේක්ම ආයාමවිස්තාරයෙන් තුන් දහසක් යොදුන් පමණ හිමාලය පර්වතයෙහි පිහිටියාවූ රන්පර්වත රිදීපර්වත මැණික් පර්වත ඉගුල් පර්වත අජන පර්වත පාංශු පර්වත ස්ඵටික පර්වතාදී නොයෙක් සුවාසු දහසක් රුවන් කූළුද ගංගා යමුණා අචිරවති සරභූ යනාදිවූ පඤ්ච මහා ගංගාවන් හා කර්ණ මුන්ඩ රථකාරා සිංහ ප්‍රතාප ජද්දන්ත මන්දාකිනි කුණාල ආදීවූ විල්ද තියග්ගලා නම් අතළගල තවද පණසක් රුවන් ආකාරයද යන සියලු හිමාලය විස්තරයද තාක් එකවිටම පෙණිගියාක්මෙන් තමන් වහන්සේගේ ආනුභාවයෙන් පන් සියයයක් දෙනා වහන්සේට දක්වා වදාළසේක.

මෙසේ ඒ බුදුන් විසින් පානා හිමාලය වනයශ්‍රිය දුටුවාවූ පන්සියයක් දෙනා වහන්සේට පුරාතණ භාර්යාවන් කෙරෙහි බඩාභිලාෂව තුනීව ගියේය.

ඉක්බිති සර්වඥයන් වහන්සේ  ඒ භික්ෂූන් වහන්සේ හැරගෙන අකාශයෙන් බැස හිමවත පශ්චිමභාගයෙහි සැටයොදුන් පමණ ගලතලමුදුනෙහි සත්යොදුන්  උස ඇති සල්රුක්මුල තුන්යොදුන් පමණ රන්සිරියෙල් ගලතල මත්තෙහි පන්සියයක් භික්ෂූන් පරිවරණලදුව සවණක් ඝණ බුදුරැස් විහිදුවාමින් සමුද්‍රජලතලය හොබවන්නාවූ සහස්‍රරස්මීන් විරාජමානවූ තරුණසූර්ය මණ්ඩලය පරිද්දෙන් වැඩ හිඳ අංගසමන්විතවූ කුරවිකනාද නිර්විශේෂ බ්‍රහ්මස්වර විහිද මුඛසුගන්ධයෙන් සියළු හිමාලය එකසුගන්ධකරමින් භික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කොට මහණෙනි මේ හිමාලය වනයෙහි අනික් තොප නොදුටුවිරූ දෙයක් ඇත්නම් කියවයි වදාළසේක..

එසඳ විසිතුරු කෙවිල්ලෝ දෙදෙනෙක් දඬුකෝටුවක් දෙකෙළවර ඬැහැගෙණ කොවුල් රජක්හු ඊ හිඳවාගෙණ ගමන්ගත් සඳ ඉදිරියෙහිය. පස්සෙහිය. දලයෙහිය. යටයයි යනතැන්හි කෙවිල්ලන් අට දට දෙනා බැගින් අටසාලිසක් පමණ කෙවුලග'නන් හාත්පසින් පිරිවරා ආකාශයෙහි නික්මුණාහුය. ඒ භික්ෂූන් වහන්සේ ඒ ආශ්චර්යය දැක මේ කෙසේවූ පක්ෂිකෙණෙකුන්දැයි විචාළාසේක. ඉක්බිති සර්වඥයන් වහන්සේ මහණෙනි මේද යටගිය දවස මාගේ වංශයෙක පෙර අපටත්  මෙලෙසම උපස්ථාන කළෝය. එකලට පක්ෂීහූ බෙහෙව එකි එකී දිසාවෙහි පන්සියයක් පන්සියයක් බැගින් උපස්ථාන කරන්නාහුය. ඒ කුණාල රජවූ මා නොම්රිකෙන පිණිසයයි කෙවුලගනන් දෙදෙනක්හු විසින් දණ්ඩක් ඬැගෙණ එහිහිඳුවාගත් කල්හි පන්සියයක් පමණ පක්ෂිකන්‍යාවෝ ඉදින් මුන්වහන්සේ අසනයෙන් ගිලිහි වැටෙනසේක්විනම් අපගේ පියායෙන් පිළිගණුම්හයි යටින් නික්මෙන්නාහුය. තවද පන්සියයක් පමණ කෙවුලඟණෝ අව්ව වලකන පිණිස ආකාශය වියනක් මෙන් මුදුනෙන් ඒකාබද්ධව නික්මුණාහුය.  තවද පන්සියයක් පමණ කෙවුළඟනෝ අපගේ රජ්ජුරුවන් වහන්සේට සීත සුලං ග්‍රිෂ්ම රජස් පරඬලා ආදියෙන් පිඩාවෙන් නොවේවයි දලයෙහි බැඳි තිරමෙන් නික්මෙන්නාහුය. තවද පන්සියයක් කෙවුලඟනෝ වනයෙහි හැසිරෙන්නාවූ හොපලු වැදි වනකර්මකාදීවූ වල්මී මියලුන් සියල්ලන් විසින් කැට කැබලි පොලු මුගුරු ලිදඬු ආදින් වන්නාවූ උපද්‍රව වලකන පිණිස වෘක්ෂ පර්වත ලතාදීයෙහි නොගැසෙන පිණිසදැයි රැකවල්ගෙණ ඉදිරියෙහි නික්මෙන්නාහුය. තවද පන්සියයක් පමණ පක්ෂිකන්‍යාවෝ අඹ දඹ එල්කෙහෙල් ආදි නොයෙක් පලවැල නොයෙක් දිගින් ගෙන හැර ක්ෂුධාසන්තර්පණය කරවමින් මෙසේ තුන්දාස් පන්සියයක් කෙවුලඟනෝ ඒ කුණාල රජ්ජුරුවෝත් උයනින් උයනටද ගංතෙරින් ගංතෙරටද පර්වතයෙන් පර්වතයටද අඹ වනයෙන් දඹ වනයටද දඹ වනයෙන් දෙල්වනයටද දෙල් වනයෙන් පොල් වනයටද පොල් වනයෙන් තල් වනයටද තල් වනයෙන් ඉදිවනයටද මෙසේ ඒ රම්‍යස්ථානයෙහි කුණාල රජ්ජුරුවන් සිත අසුරුවන පිණිස හැරගෙන ඇවිදිනාහුය. ඒ කුණාල

SANHIDA LANKA

රජතෙම පක්ෂි කන්‍යාවන් විසින් පිරිවහණ ලදුව යථොක්තවූ සම්භාවනාවන් විඳිනේද හැමවෙලෙහිම කෙවුලඟන්නට නීචකෙල්ලෙනි සෙර කෙල්ලෙනි ධූර්තීකෙල්ලනි අසත්පුරුෂකෙල්ලෙනි දුරාචාරකෙල්ලෙනි කෙළෙහිගුණ නොදන්නාවූ සියලු දිග අමන්නාවූ පවනක්මෙන් සිත් හුණු තැනකටම යනසුළුවූ චණ්ඩාලකෙල්ලෙනි නැසියව නැසීයවවැයි නොසතුටු බණන්නාහුයයි වදාරා මහණෙනි මම තිරිසන් නමුදු ස්ත්‍රී ජාතිය කෙළෙහිගුණ නොදන්නා බවද බොහෝ වඤචාවන්හි නිපුණ බවද අනාචාරසීලීබවද දන උන්ගේ වසඟයෙහි නොපැවත මාගේ වසඟයෙහි පමුණුවා විසූයෙම් වේදැයි වදාරා භික්ෂූන් වහන්සේගේ අනභිරතිය තුනුකොට නොබැන වැඩ උන්කල්හි.

එකල කැලිකෙවිල්ලෝ දෙදෙනෙක් යටකීයන ලද ක්‍රමයෙන් කෙවිලි රජහු දණ්ඩක් ඔසවාගෙන පළමු කියනලද ෂට්විධවූ දික්හි සතරදෙනා බැගින් පිරිවරණලදුව ඒ ස්ථානයට අවුත් වන්නාවුන් දැක ඒ පන්සියයක් දෙනාවහන්සේ පළමුපරිද්දෙන් මොහු කවුරුන්දැයි විචාළසේක. මහණෙනි යම් කලෙක මම කුණාල රජවීම්නම් එකල මාගේ මිත්‍රවූ පූර්ණමුඛනම් වුස්සකොකිලයයි යනකෙනෙක් ඇත. මේ උන්ගේ වංසයයි වදාරා පළමුපරිද්දෙන්ම ඒ භික්ෂූන් ඒ උන්ගේ ප්‍රවෘත්තියද ඇසීමෙහි උත්සාය ඇතිබව දන මහණෙනි නොයෙක් ජාතියෙහි ජලජ කුසුමයෙන් විවිධවූ පද්මජාතියෙන් ත්‍රිවිධවූ උත්පල ජාතියෙන් සැදුම්ලද මේ කුණාලවිල වටාසිටි දෙල්එලකිදි ඇසතු පියුම් තුරු නා කීණ ඇසළ බක්ම සපු දුනුකේ ආදිවූ නොයෙක් ජාතියෙහි තුරු පතරින් සැදුම්ලද්දාවූ තවද යක්ෂ රාක්ෂස නාග සුපර්ණ ලියකිඳුරු සිද්ධවිද්‍යාධරාදීන් විසින්ද අතිගහණවූ මේ හිමවත් වනයෙහි අතිශයින් දුරවූ ශබ්ද ඇති මනොඥවූ ඇස්සඟලක් ඇති සම්පූර්ණ වූ මුඛයක් ඇති පූර්ණමුඛනම් වුස්සකොකිල රජ්ජුරුකෙණෙක් වාසය කරන්නාහු මහණෙනි එකල වුස්ස නම් කෙවිලි දූට කියනලද ක්‍රමයෙන් පණස් පණස් දෙනා බැගින් උඩය යටය ඉදිරියෙහිය පස්සෙහිය දලයෙහියයි යථොක්ත දසදිග රැ කවල්ගෙණ නික්මෙන්නාවූ කෙවුල්ලෝ තුන්සියයෙක නොයෙක් එලාඑල ගෙනවිත් කවන්නාවූ කොවුලෝ පණස් දෙනෙකැයි මෙසේ තුන්සිය පණසක් කෙවුලගනෝ පසුපස්සෙහි කෙවිලි දූ කුණාල රජ්ජුරුවන් මෙන් ආරාමයෙන් ආරාමයට උද්‍යානයෙන් උද්‍යානයට අඹ වනයෙන් දඹ වනයට දඹ වනයෙන් තල් වනයට තල් වනයෙන් පොල් වනයට පොල්වනයෙන් දෙල් වනයට ගලින් ගලටද විලින් විලටද ගංතෙරින් හෝ තෙරටද වඩාගෙණගොස් ඔහුගේ චිත්ත ප්‍රීති වර්ධනය කෙරෙමින් දවස් යවන්නාහුය.

මෙසේ ඒ වුස්සකෝකිල රජ්ජුරුවෝ කෙවුලගණන්ගේ උපස්ථාන විඳමනැවත මෙබඳුවූ වස්තුස්වාමිහු පොෂ්‍යාකිරීම තොපබඳු කුලංගනාවන්ට සුදුසුයයි දවස්පතා ගුණ කියමින් වාසයකරන්නාහුය. එක්දවසක් මිත්‍රවූ කුණාල රජ්ජුරුවන් දක්නා පිණිස සපිරිවරින් නික්ම එන්නාවුන් දුරදීම දැක කුණාල රජ්ජුරුවන්ගේ පක්ෂිකණ්‍යාවෝ පෙරගමන්කොට අවුදින් ආදර දක්වා ස්වාමිනි මේ කුණාල රජ්ජුරුවෝ අතිශයින්ම පරුෂයහ. තදවූ තෙපුල් ඇති යහ. රාත්‍රීන් දිවාභාගයෙහිත් මෙලෙස නොයෙක් පරිද්දෙන් අපි උපස්ථාන කරන්නාවුන් අපි කිසිදවසෙකත් ප්‍රියවචනයෙන් අස් වැසිලි නොලදුම්හයි කිවාහුය.

එපවත් අසා පූර්ණමුඛ රජ්ජුරුවෝ වන්නාට ඇසු බැවින් හැක්කේවෙයි, දන් කෙවුළඟනන් අස්වසා කුණාල රජ්ජුරුවන් කරා ගොස් පිළිසඳර කථාකොට ඉක්බිති කියන්නාහු.

සබඳ කුණාල රජ්ජුරුවෙනි උගතෝයුජාතවූ හෙවත් මනාවූ ජාති ඇති ස්වාමි පුරුෂයන් කෙරෙහි මනාවූ පිළිපැදීම් ඇති උත්තමාංගනාවන්ට එක්වන් බැණ දෙඩීම් සුදුසුනොවෙයි මිත්‍යාප්‍රතිපන්නවූ අනාචාර ස්ත්‍රීන්ට ආචාර තබා කියයුතුම්යයි සිතම්හයි කීහ.

මෙසේ කී කල්හි කුණාල රජ්ජුරුවෝ වුස්සකෝකිල රජ්ජුරුවන්ට නොසතුටුව අනාචාරීවූ චණ්ඩාලය නැසීයව නැසියව කොල සබඳ කවර නම් නුවණැත්තෙක් ස්ත්‍රීයකට යටත්ව පැවතුම් ඇත්තෙහිදැයි නොසතුටුව දොඩනලද්දාවූ බස් අසන්නාවූ ඇතිකල කිසිවක් කියනොහි නැවැත්තාහ.

ඉක්බිති නොබෝ දවසකින් වුස්සකොකිල රජ්ජුරුනට ලේ අතීසාරයෙක් ඇතිවිය. බලවත්වූ ශරීරවේදනාව උපන මෙසේ අටවන නවවන අවස්ථාවට පැමිණිකල්හි ඒ රජු පිරිවර පක්ෂිකන්‍යාවෝ මෙතෙම් අතිශයෙන් රෝගි විය. මොහුගේ ජීවිතය රැකෙන්නාසේ නොවෙයි ඉනිඹ මොහුගෙන් අපට කින්දැයි ඔහු අත්හැර එකකුත් නොරඳා කුණාල රජ්ජුරුවන් කරා ගියහ.

SANHIDA LANKA

සමූහ වශයෙන් තමන්කරා එකපැතිර එන්නාවූ කෙවුළඟනන් දැක දුරදීම චණ්ඩාල කෙල්ලෙනි තොපගේ ස්වාමිපුරුෂයෝ කොයිදැයි විචාළාහ.

එසඳ කොවුලඟනෝ ස්වාමිනි අපගේ වුස්සකෝකිල රජ්ජුරුවන්ට ලේ ග්‍රහණියක් ඇතිව ජීවත් වියනොහෙන හෙයින් නුඹ වහන්සේ අප රැක වදාරණසේක්දෝහෝයි සිතා නුඹ වහන්සේ සමීපයට ආම්හයි කීහ.

එපවත් අසා කුණාල රජ්ජුරුවෝ ගින්නට දැමු එනු මෙන් කිපි සෙරවූ ධූර්තීවූ අසත්පුරුෂවූ නුවණ නැති ලසුවූ

සිත් ඇති කෙළෙහිගුණ නොදන්නා සුළගක්මෙන් වහා කරකැවෙන සුළුවූ චණ්ඩාල කෙල්ලෙනි නැසියව නැසියවයි බෙණෙමින් දොඩමින් වහා නැගිසිටව ඵුස්සකෝකිලයන් වසනතැනට ගොස් සමීපයට එළඹ සබඳ පූර්ණ මුඛරජ්ජුරුවෙනි බණවා ගිලන් බැවින් මහත් දායාසයෙන් මුහුණබැලූකල මමය කුණාල රජ්ජුරුවෝයයි වදාරා ඉක්බිති ලෙඩ තැනැත්න් තුඩින් හා දෙමාපියායෙන් හා ඔලොඹා තමන් වහන්සේගේ ශරීරයෙහි වතුරුවාගෙන හිඳ ව්‍යාධියට අනුරූපවූ නොයෙක් බෙහෙත් ගෙන්වා ගෙන කවා පොවා ලෙඩින් ගොඩනගා සුවපත් කොට වදාළසේක.

ඉක්බිති පළමු අත්හැරගියාවූ උන්ගේ පක්ෂිකණ්‍යාවෝ උන් නිරෝගිබව දැන පළමුසේම ඇවිත් උන් පිරිවරාගත්හ. කුණාල රජ්ජුරුවෝද කීප දවසක් මියුරු ඵලාපල ගෙනකවා ශරීරයෙහි බලහිඳගත්කල්හි සබඳ තෝ නිදුක්වූ යෙහි සබඳ තාගේ පිරිවර ස්ත්‍රීන් හා සමඟ සුවසේ වසව මමද මාගේ වාසස්ථානයට යෙමි වදාළසේක.

එසඳ පූර්ණ මුඛ  රජ්ජුරුවෝ සබඳ මේ මාගේ කෝකිලාංගනාවෝ මා අතිශයින් ගිලන්වූව හැරපියා මුන නොබලා පැලඟ එබඳවූ ධූතිර්ත කෙල්ලන් ගෙන් මට ප්‍රයෝජන නැතැයි කීහ.

ඒ අසා බෝධිසත්වයෝ තොපගේ සිතට නැගීපසු මමද මාදත් විවරක් ස්ත්‍රීන්ගේ නුගුණ කියාබලමි. ඒසේකල අසාබලවයි ඵුස්සකෝකිලයන් කැඳවා ගෙණ මහණෙනි මෙම හිමවත් පසක් යොදුන් පර්වත මුදුනෙහි එම යොදුන් පමණ සල්රුකක්යට තුන්යොදුන් රත්සිරියහල් ගලතල මුදුනෙහි ගොසින් උන්හ.

එක්පාර්ශවයක ඵුස්සකෝකිල රජ සහපිරිවරින් බැස උන ඒසා මහත් සියළු හිමාලය වනයෙහි පර්ස්ථ දෙවියෝ අද දවස් කුණාල රජ්ජුරුවෝ මනොසිල තලමස්තකයෙහි හිඳ සර්වඥවිලාසයෙන් ධර්මදේශනා කෙරෙත්ලා ඒ ධර්මදේශනාව අසනු පිණිස රැස්වවයි ඔවුනොවුන්ට මහත්ඝෝෂා පැවැත්වූහ.

ඒ ශ්‍රැත පරම්පරාවෙන් චාතුස්හාරාජිකාදීවූ සදෙව්ලොව දෙවියෝද බොහෝසේ එතනට රැස්වූහ. බොහෝ නාග හුපර්ණාදිහුද හිමාලය වනයට ආසන්නව වනයෙහි වසන්නාවූ බූමාටුදෙවියෝද මහත්වූ උද්ඝෝෂණය කළාහුය. අනදනම් ගිජුලිහිණි රජෙක් දස දහසක් පමණ ගිජුලිහිණියන් පිරිවරා ගෙණ ගිජුකුළු පව්වේ වසන්නේ මේ ධර්ම දේශනාකාලය අසා මම ඔහුගේ විසිතරු ධර්මදේශනාව අසමි. සහ පිරිවරින් අවුත් එකත්පසෙක උන.

තවද දස දහසක් තපස්වින් හා සමග අභිඥාලාභිව ඒ හිමාලය වනයෙහි වසන්නාවූ නාරද නම් තපස්වි කෙණෙක් දෙවියන්ගේ උද්ඝෝෂණය අසා මාගේ මිත්‍රවූ කුණාල රජ්ජුරුවෝ ස්ත්‍රීන්ගේ නුගුණ සංඛ්‍යාතවූ ධර්මදේශනාවක් කෙරෙත්ල. මා විසිනුත් ඒ ධර්මදේශනාව ඇසිය යුතුයි දස දහසක් තපස්වින් හා සමග අවුදින් එකත්පසෙක උන්හ. සර්වඥකෙණෙකුගේ දේශනාවෙහි සන්නිපාතයක් මෙන් එදවස් වහා සමාගම විය.

ඉක්බිත්තෙන් කුණාල නම් බෝධිසත්වයෝ ජාතිස්මරණඥාණයෙන් ස්ත්‍රීන් දෝෂ ප්‍රතිසංයුක්තව ගිය දවස බොහෝසේ තමන්ම දුටුවාවූ කාරණයන් පූර්ණ මුඛ රජ්ජුරුවන්ට සාක්ෂි කොට කියන්ට පටන්ගත්තාහුය. සබඳ පූර්ණමුඛයෙනි ගිය දවස දඹදිව පියන් දෙදෙනකු ඇති ස්වාමිපුරුෂයන් පස්දෙනෙකු ඇති ක්‍රිෂ්ණා නම් රාජ කුමාරිකාවක් ඇති ඇගේ ස්වාමිපුරුෂයෝ පස්දෙනෙක් ඇත්තහුය. ඒ කෙසේද යත්.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් මහත්වූ සේනාවාහන ගෙන කොසොල්රජ්ජුරුවන් මරා රාජ්‍යයගෙන ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් තමන්ට අග්‍රමෙහෙසිකා කළහ. බිසවු මැත භාගයෙහි තමන්ට දියණිකෙණෙකුන් වැදුහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේද පළමු දූදරු කෙණෙක් නැතිහෙයින් දරුවන් දැක සමාධිව සොඳුර වරයක් දෙමි හැරගණුවයි අභිමත වරයකින් නිමන්ත්‍රණය කළහ.

බිසවුවරය හැරගත්තාක්කොට තබා ඒ කුමාරිකාවන් ක්‍රිෂ්ණා නම් තබා ඈ වැඩිවිය පැමිණිකල්හි එක් දවසක් බිසවු දියනියන් කැඳවා පුත තොපබාල කළ තොපගේ පියාණන් වහන්සේ තොප උදෙසා කැමතිවරයක් හැරගණුවයි වදාළසේක් තොප අභිප්‍රාය වරයක් දැන් ඇරගණුවයි කීහ.

SANHIDA LANKA

ඉක්බිති ඒ ක්‍රිෂ්ණා නම් රාජකුමාරිකාතොම මට අවිද්‍යමානවූ කිසි වස්තුවෙක් නැත. කෙසේවූ වරයක් හැරගනිම්දෝහෝයි කල්පනාකොට තමා කෙලෙස් වසඟ බැවින් හිරි ඔතප් බිඳ සමන කෙණෙකුන් උවමැනවයි මෑණියන්ට කිව බිසවුද රජ්ජුරුවන්ට එපවත් දැන්වූහ. රජ්ජුරුවෝද අභිප්‍රායයන්ට කිව බිසවුද රජ්ජුරුවන්ට එපවත් දැන්වූහ. රජ්ජුරුවෝද අභිප්‍රාය පුරුෂයක්හුම ඕ ලැබවයි නුවර බෙරපියවිකරවා පුරුෂයන් රැස්කරවූහ. ක්‍රිෂ්ණා නම් කුමාරිකාද මල් සුමුගක් අතින් ගෙන උතුරු සිවුමැදුරු කවුළුවෙහි සිට සර්වාලංකාරයෙන් ප්‍රතිමණ්ඩිතව රාජාංගනයෙහි රැස්වූ හැම පුරුෂයන් බලා තමා රුස්නා එකෙකුන් නැතිහෙයින් බලාගෙන

සිටියාහ. එදවසම පාණ්ඩව රාජගොත්‍රයෙහි අර්ජුන යන කුලය හිමසේනය. යුද්ධිෂ්ටිරය සහ දෙවය යන රාජකුමාරයෝ පස්දෙන තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි සකල ශාස්ත්‍ර ඉගෙන නිමවා දේසාචාර පරීක්ෂා කරම්හයි දඹදිව ඇවිදිනාහු ක්‍රමයෙන් බරණැස් නුවරට පැමිණ ඇතුලු නුවර කොලහලය අසා කිමෙක්දැයි විචාරා එපවත් දැන අපිදු එතනට ගොස් බලම්හයි ස්වර්ණප්‍රතිමා බඳු උතුම්වූ රූ ඇති කුමාරවරුහු පස්දෙනම පිළිවෙලින් ගොස් සිටගත්හ. ඒ ක්‍රිෂ්ණතොම පස්දෙනා කෙරෙහිම පිළිබඳසිත් ඇතිව මෑණියන් වහන්ස මේ පස්දෙනා අතරෙහිම අභිප්‍රාය ඇත්තෙමි කියා ඒ පස්දෙනා මල්දම් එළුව බිසවුද එපවත් රජ්ජුරුවන්ට කිවාහුය. රජ්ජුරුවන්ද එපවත් අසා නොසතුටු වත් පළමුව වරදුන් හෙයින් වැලකීයානොහි වන්නාට මොහු කවරකුන් පුත් දැයි විචාරා පාඩව රාජකුමාරුවන් බව අසා සතුටුව මහත්වූ සත්කාර සම්මාන කොට ඒ කුමාරිකාව රාජ කුමාරවරුන් පස්දෙනාට පාදපරිචාරිකා කොට පාවා දුන්හ.

ඒ කුමාරිකාද සත්මහල් ප්‍රාසාදයෙහි පස්දෙනා හා සමඟ කෙලෙශාභිරතියෙන් දවස් යවන්නීය, එකල එම ප්‍රසාදයෙහි දොරකඩ රැකවල්ගෙන සිටියාවූ විසුළු මුහුණු ඇති බුන්කඳට ඇති බැවින් බඩරූපමෙන් ලෙහි තිබෙන්නාවූ මුහුණු ඇති පිලකු කෙරෙහි ප්‍රේමකොට ඒ රාජකුමාරවරුන් පස්දෙනා පිටත නික්මුණු වෙලෙහි අවකාශලදින් කෙලස වසඟව උන් හා සමඟ දුරාචාරයෙහි යෙදි සමඟ ප්‍රියකරන්නී ස්වාමිනි නුඹ වහන්සේ හා සමාන ප්‍රියකෙණෙක් නැත. මේ රාජ කුමාරවරුන් පස්දෙනා මරාපිය උන්ගේ ගලලෝහිතයෙන් නුඹ වහන්සේගේ ශ්‍රිපාදය ධොවනා කැමැත්තෙමියි යනාදීන් කියන්නීය. අවශේෂයෙන් අතුරෙනුත් වැඩිමාළු රාජකුමාරයන් එක්වූ කල්හි ස්වාමිනි මුන් සතර දෙනා විචරට නුඹ වහන්සේ මට ප්‍රියකරුසේක. මාගේ ජීවිතයත් නුඹ වහන්සේ නිසා පරිත්‍යාග කරන්නා කැමැත්තෙමියි මාගේ පියරජ්ජුරුවන් වහන්සේගේ ඇවෑමෙන් රාජ්‍යය නුඹ වහන්සේට මම දෙමියි යනාදින් කථාකොට අවශේෂවූ සතරදෙනා හා කැටුවත් එක්වූ කල්හිත් මෙලෙසම කියන්නීය. ඔහු වෙන වෙනම සිතනකල මෝ අප කෙරේම සෙනහ ඇත්තීය. මත්තෙහි අපට වන්නාවූ රාජාභිවෘද්ධියත් මෑ නිසාම පැමිණෙන්නේයයි ඇය කෙරෙහි අතිශයෙන්ම වෙන වෙනම සෙනෙහස වර්ධනය කෙරෙති. මෙසේ දවස් යවන කල්හි ඈට ලෙඩක් ඇතිවිය. ඉක්බිති රාජ කුමාරවරුන් පස්දෙන කෙරෙන් වැඩිමාළු අර්ජුන කුමාරයෝ ඉස ඔර තබාගෙන උන්හ. තෙසු සතරබෑයෝ දෑත දෙපය මඩිමින් උන්හ. කුදාදාපාමුල සිටියේය. එකල ඉස අල්වාගෙන උන්නාවූ අර්ජුන කුමාරයන්ට ස්වාමිනි නුඹ වහන්සේ තරම් මට ප්‍රියකෙණෙක් නැත. නුඹ වහන්සේ මළතෙනමියමි. ඉදින් සුවසේ උන්නේම්විනම් පියරජ්ජුරුවන් වහන්සේගේ අයාමෙන් රාජ්ජය නුඹ වහන්සේට ගෙණදෙමියි ඉසින්සන් කරන්නීය වැඩමාළු රාජකුමාරයන් සිප ගත. අවසේෂවූ සතර බෑයන්ටත් මෙම වචනයන් උන් උන් අල්වාගෙන උන් හස්ත පාදාදින් එලෙසම සංඥාකොට පාමුල සිට කුදුට තොප මට ඉතා ප්‍රිය යේය. ඉදින් මෙලෙසින් මාගේ ජීවිතය තිබෙන්නේ විනම් තාකෙරෙහි සෙනඟනැයි දිවින් සංඥාකළහ. මෙකී සදෙනම් පෙර තමන් තමන්හාම වෙනවෙනම කථාකොට තබුහෙයින් තම තමන්ට කළ සංඥා මතුදත්හ. වැඩිමාළු අර්ජුන කුමාරයෝ වනාහි ඇගේ හස්තපාද ජුව්හා විකාරයෙන් දැක යම්සේ දැක මට සංඥා කළානම් මෙකුදු ඇතුළුවූ තෙස්සන්ටත් මෑ කෙලේ මේ සලකුණුමයයි දැන කුදු හා සමගත් මෑගේ සම්බන්ධය ඇති නියාවනැයි දැන මල්බෑයන් කැඳවා ගෙන පිටතට නික්ම විචාරණසේක් පබපතිකාව විසින් මට ඉසින් කරණ සලකුණු දුටුදැයි විචාළසේක. ස්වාමිනි අපි සතරදෙනම දුටුම්හයි කීහ. වන්නාට ඒ කාරණය දැනුදැයි විචාරා නොදනුම්හයි කී කල තමන්වහන්සේට කළ සංඥායට කී පරිද්දෙන්ම ඒ සතරබෑයන්ට කියා තොප ඇමට හස්තපාදාදීන් කළ සංඥය දනුදැයි කියා ස්වාමිනි අපටත් එම කාරණමයයි වෙන වෙනම කී කල කුදුටකළ ජිව්හා සංඥාව දුටුදැයි විචාළසේක. එයිදු අපි නොදනුම්හයි කී කල අප හැමටම කළ සංඥාවෙක් ඇත්නම් ඕහටත් කෙලේ එම ලෙසමයයි වදාරා උන්හැම නොඅදහාගන්නා හෙයින් පිලා ගෙන්වාගෙණ විචාළසඳ එයිත් තත්වූ පරිද්දේත්ම කීයේය. මෙසේ ඒ රාජ කුමාරවරුහු පස්දෙනම ඇගේ අනාචාර ප්‍රවෘත්තිය ප්‍රත්‍යක්ෂකොට දැක අපබඳු ජාතිසම්පත් උතුම් රූ ධරන්නාවූ පස්බෑකෙනෙකුන් කෙරෙහිද මෙබඳුවූ ඇදකුදුවූ විසුලුකුනු වැකුනු සිරුරු ඇති පිළුද හා සමග නිල්පජ්ජව අනාචාරයෙහි යෙදී වසන්නාවූ මිනී කුණෙහි ඉවලත් කැණහිල් බැල්ලකසේ අනාචාරසේවූ ස්ත්‍රීන් කෙරෙහි නුවනැති කවරෙක් සෙනහතබා වසන්නේයයි යනාදීන් ස්ත්‍රීන්ට නින්දාකොට තව අපට ගිහිගෙයි වාසය එහෙත් සැහෙන්නේයයි පස්දෙනාම පිටත්වුවාසේම ආපසු නොබලා හිමාලය වනයට වැද ඍෂි ප්‍රව්‍රජ්ජාවෙන් පැවිදිව කිසුණු පිරියම් භාවනාකොට ආයුසංස්කාරයාගේ කෙළවර කම්මානුරූපවූ පරිද්දෙන් සංසාර යාත්‍රාකළාහුයයි වදාරා එම්බා මහණෙනි ඒ අර්ජුන කුමාරයෝ නම් මෙදවස කුණාලරජව තමන් දුටු කාරණය ප්‍රුස්ස කෝකිලයන්ට කියා නැවතත් අතීත භාවයෙහි තමන්ම දුටු කාරණයක් කියන්නාවූ කුණාල රජ්ජුරුවෝ මහණෙනි යටගිය දවස බරණැස් නුවර පණ්ඩිත පාලිනියයි කියන එලකඩ පෙරව ශිලය රකින්නියක් සොහොනෙක්හි පන්සලක් කරවාගෙන සතරදවසකින් දවස බත් අනුභවකරන්නී බරණැස් නුවර නිසා ඒ සුසාන පර්ණශාලාවෙහි උග්‍රවූ තපස් කරන්නී බරණැස් චන්ද්‍රසූර්යයන් මෙන් ප්‍රසිද්ධ විය. එනුවර යම්කිසි සත්වකෙනෙක් කිඹිසපියා වේවයි පැකිලපියා වේවයි යම්කිසි චකිතයක් උපන් කල්හි නමෝ පණ්ඩිත පාලිනියයි කියති. මෙසේ ඈ සියළු රාජ්‍යවාසීන් විසින් පූජ්‍යව වසන කල්හි එක් සමයෙක්හි සැණකෙළියක් කෙළින්ට පටන්ගත් කල්හි

SANHIDA LANKA

පළමුදවස්ම තරහල් දරුවෝ එක්ව එක්කෙනෙක්හි මණ්ඩපයක් කරවා රාමසවුලු කැටිකොට සඳුන් සුවඳ ආදීවූ දෙයින් විභවානුරූපවූ පරිද්දෙන් ඒ මණ්ඩපයෙහි ද සුරා බොන්නට පටන්ගත්කල්හි එක්තරා තරහල් දරුවක්හු අතින්ගත් රාඹඩමලීපිය වැටිගිය කල්හි නමොපණ්ඩිත පාලිනියයි කිය. එය වත් අසා එම රාජ්‍යමණ්ඩලයෙහි රා බොන්නවුන් අතුරෙන් එක් පණ්ඩිත පුරුෂයෙක් අඥනවූ කාලකන්නිය මලසිත් ඇතිස්ත්‍රීන්ට නමස්කාර කිරීම අඥානයන්ට සුදුසු කටයුත්තෙකැයි කිය.

මෙසේ කී කල්හි සබඳ එසේ නොකියව උතුම් ගුණ ඇති උන්වහන්සේට වරදවා කියා නරකයෙහි නූපදිවයි කියා ඉක්බිත්තෙන් පණ්ඩිත පුරුෂතෙම නුවණැත්තව තෝ බැන නොනැගෙවයි කිව.

නැවත වට්ටඩිකොට දහසක් දනතබයිනම් තා කියන ඒ පණ්ඩිත පාලි නියම යටසත්වන දවස් ඇගේ තවුස්වෙස් හරවා සර්වාලංකාරයෙන් සැරහී මෙම කමඩලයෙහිදි රාවඩමක් අතින්ගෙන නටට නටවා රාබොන පරිද්දෙන් කෙරෙමියි කියා එඹල පැවැත්තව ස්ත්‍රී ජාතිහුනම් ස්ථිරශිල නොවන්නාහුයයි කීය.

එපවත් අසා ඒ පුරුෂතෙම ඒකාන්තයෙන් උන්ගේතපස් කාවිසිනුත් උගුලුවාපිය නොහැක්කැයි කියා ඉදින් එලෙස කරවාපිනම් දහසක් දෙමියි ගිවිස්සේය. මෙසේ ඔවුනොවුන් හා සමග ගිවිස අනිකුත් තරාලුන් කීපදෙනෙකු සාක්ෂිකොට පසුව දවස් තපස්වි වෙසක්ගෙණ සොහොන් ළඟ ඇගේ පන්සලට නුදුරුතැන්හි සූර්යනමස්කාර කෙරෙමින් සිටියාහුය. ඕතොමෝ සිඟායන්නී ඔවුන් දක මුන් වහන්සේ මහානුභාව ඇති තපස්වි කෙනෙකුන් වහන්සේ වනැයි සමීපයට එළඹ මමද ස්වාමිනි මේ සමසාන මධ්‍යයෙහි උග්‍රවු තපස් නිශ්‍රිතව වසන්නා එකෙකිමි නුඹ වහන්සේ ශාන්තගුණයෙහි පැහැද ආදරයෙන් වඳිමි වැඳගෙන ඔත්තීය. ඒ දක හොරතවුස්තෙම ඈ හා කථා කරන්නක් ඈ දිසාව බලන්නාවක්වත් තමා ඉතා අපිස්බව අඟවනු පිණිස දෙවෙනි දවසුත් එලෙසම කෙළේය. තුන්වෙනිදවස් බහුමානයෙන් ඇවිත් වැඳලා සිටිකල්හි කියන්නේ කථා බොහෝ නොකොට කරතබාගෙන නැගියායිකිය. සතරවෙනිදවස් වැඳලා සිටි තැනැත්තිට කිමෙක්ද භික්ෂාවෙන් යපෙදැයි යන බස් විචරකින් පිළිසඳර කථාකොට ඕතොමෝ තපස්විහු කෙරෙන් සාමිවිලදිමියි සතුටු සතුටුව ගියාය. පස්වෙනිදවස් ඇගේ සිත පැහැරගැන්මෙහි අභිප්‍රාය ඇතිව ඔහු විසින් බොහෝ කොට පිළිසඳරකථා ලදින් එතැන් හිඳලා පලාගියාය. සවෙනි දවස් අවුත් වැඳලාඋන් තැනැත්තිය හා කථාකරන්නේ නඟණ්ඩ අද බරනැස්නුවර මහත්වූ ගිතවාදිත ශබ්දයක් උපන්නේය. ඒ  කුමක්දැයි විචාළ ස්වාමිනි නුඹ වහන්සේ දැන වදාරන්නේ නැත්තේවේද නුවර සැණකෙළියට පටන්ගත් හෙයින් කෙලෙනාවූ මනුෂ්‍යයන් කොලාහලයයි කිවුය. ඉක්බිති ඒ අපෙක්‍ෂා නැති කෙනෙකුන්ගෙන් පරිද්දෙන් ඉන් අපට කිම් කිම්දැයි නගණ්ඩ කිදවසකින් බත් අනුභවකළාදැයි විචාළේය. ස්වාමිනි සතරවෙනි දවසින් දවස බත් අනුභව කරන්නෙමියි කිව තොමෝද නුඹ වහන්සේද කීදවසින් දවස අනුභවකරණසේක්දැයි විචාළාය. ඉන්බිති තරහල් තවුස්තෙම නිරන්තරව අනුභවකොට නොකෑවාසේ දහවල් දවස තපස් සිටිහෙයින් නගඩ සත් දවසින් දවස බත් අනුභව කරන්නෙමි සාවුරුද්දක් උග්‍රතපස් කෙළෙමි ඉන්මා උපදවාගත් ගුණ විශේෂයෙක් නැත. නග තෙපිද දොළොස් අවුරුද්දක් සොරතපස් රැක කවර ගුණ විශේෂයක් උපදවාගතුදැයි විචාරා ඈ විසින් ස්වාමිනි මා විසින් උපදවාගත්තහුද අධිගම විශේෂයෙක් නැතැයි කී කල නගඩ පංචකාම සම්පත් නැතිකල නෛෂ්ක්‍රමය සැපයක් නැතිකල පලකින්ද නරක සන්තාපය ඇත්තේ අපටමද බොහෝදෙනා අනුභව කරන්නාවූ අතිශයින් මධුරවූ පංචකාම සැපය අනුභව කරම්හ. මාගේ කුශලක්‍රියා ගතවු බොහෝ දෙනා අනුභව කරන්නාවූ අතිශයින් මධුරවූ පංචකාම සැපය අනුභව කරම්හ. මාගේ කුශලක්‍රියාගතවු බොහෝ දෙනා ඇත. එබැවින් මම ගිහිසම්පත් අනුභවකෙරෙමි දුක්විඳගත නොහෙමි කීහ. එපවත් අසා චපලවූ සිත් ඇතිහෙයින් තමන්ගේ බොහෝදවසක් පුජ්‍යව සියළු සත්වයන් කෙරේ ආශ්චර්යමත්ව පැවැත්තාවූ ගුණධර්මයෙහි පවත්නා උත්තමත්වය පරීක්‍ෂාකොටගතනොහි උන්කෙරෙහි පිළිබඳ සිත් ඇතිව ආර්යය මමත් තපසෙහි ඉතා උකටලීවිමි. ඉදින් නුඹ වහන්සේ නොහරණසේක්විනම් මම නුඹට අඹුවෙමි කීව. එපවත් අසා නීනොහරිමියි ප්‍රතිඥාකොට මලෙක බැඳුනු මුවදෙනක්මෙන් වචන නැමති සොර මලෙහි බැඳුනු ඈ නුවරට ගෙන වුත් දුරාචාරයෙහි යෙදී සුරාපාණමණ්ඩලයට ගොස් රාඹඩමක් ගෙන්වාගෙන ගොස් එකට ඉඳ සුරා පුවාහුය.

අවනික්‍ෂුහු තෙනැත්තේ තමාගිවිසි දහසක් වස්තුදින මෙසේ ඒපඩිත පාලිනිය පසුව අපංඩපාලිනීව ඔහු පිණිස ගර්යක් ලදින් දූ දරුවන් හා සමඟ වැඩි පංචකාමරසය අනුභවකළායයි එදවස් කුණාල රජ්ජුරුවෝ සුරාධූතීරවූ තරහල් දරුව ඉපද ඈ ස්ථිරශිලීනොවන බව ලොවට ප්‍රකාශකෙළෙම් මම්යයි තමන්ම දුටු කාරණය වුස්ස කෝකිල රජ්ජුරුවන් ප්‍රධාන කොට ඇති සියළු දෙවි මිනිසුන්ට ප්‍රකාශ කෙළේයයි වදාරා -

SANHIDA LANKA

තවද මහණෙනි යටගිය දවස කසීරට බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් කොසොල් රජ්ජුරුවන් මරා රාජ්‍යයගෙන උන්ගේ දැරි ඇති අගමෙහෙසුන් බිසවුන් බරණැස් නුවරට ගෙනවුත් උන් ගර්භනීබව දැනදැනම අගමෙහෙසුන් කළා හුය ඔහුද මුකළ ගබ ඇති රන් රුවක් හා සමාන පුතණුකෙනෙකුන් වදා සිතන්නාහු මේ බරණැස් රජතෙම මුන් වැඩි වයසට පැමිණියත් මාගේ පසමිතුරාගේ දරුවෝයයි මරාපියන්නාහුය. අනුන් අත

නැසෙන්නාහුය අනුන් අත නැසෙන්නා බලාත් මාගේ දරුවන් නිරායාසයෙන් නැසීයාම යහපතැයි සිතා කිරි මව කැඳවා අම්මා මේ දරුවන් රෙදි කඩක් අතුරලා අමුසොහොනෙහි වැදහොවා පියා එවයි කිව ඕද මෙලෙසම කොට ඉස්සෝධා නහාපියා රජගෙට පලාඅව කොසොල රජ්ජුරුවෝද මියගිය තමන් පුතනුවන්ට ආරක්ෂා දේවතාව ඉපද එදවස් සෝනට වැද එදවස් පටන්ගෙනම රැකවල්ලාගත්හ. ඒ ආරක්ෂා දේවතාවානන්ගේ ආනුභාවයෙන් එළුගොපල්ලක්හුගේ එතැන්හි ගොදුරු කන්නාවූ එළුවන් අතුරෙන් එක් එළුදෙනෙක් තොම කුමාරයන් සතර කුකුල් අස්සෙහි තබාගෙන පුත්‍ර සෙනහ උපදවා දන බිම ඇනගෙන කිරිපොවා මෙසේ දවසකට තුන් සතරවිටක් කිරිපොවා දුර නොගොස් මව ඇවිද දවටී ගොදුරු කන්නීය. ඒ එළුගොපල්ලාද ඒ එළුදෙන කරන්නාවූ ක්‍රියාව දැක සමීපයට ගොස් පිරික්ෂාකරණුයේ වැදහොත් දරුවන් දැක පුත්‍රසෙනහ උපදවාගෙන ගෙට ගෙනවුත් අඹුව අතට වැඩිය ඔද වඳහෙයින් තනයෙහි කිරි නැත්තේය එහෙයින් එළුදෙන්ම කිරිපොවන්නිය. ඒ කුමාරයන් ගෙට ගෙනාවක් පටන් ගෙන එළුදෙන්නු දෙතුන්දෙනෙකු දවසකට මියයන්නාහුය. එපවත් දැන ගොපළුතෙම මේ දරුවන් ගෙට ගෙනවුත් වඩන්නටවන් තැන් පටන් මාගේ එළුදෙන්නු හැම මියන්ට වන්නාහුය. මුන්ගෙන් මට ප්‍රයෝජන කිම්දැයි සැළියක් ඇතුළෙහිලා මලාවකින් වසා කඩබැද උදුපිටියෙන් පැන් නොවදිනාසේද පිධානය නොහරණසේද තරකොට අල්වා ගඟ දියට හැරපිය. මෙසේ දියෙන් යන කල්හි එම රජ්ජුරුවන්ගේ රජගෙයි කටුකොල් කර්මාන්ත කරන්නාවූ වණ්ඩාලයෙක් අඹුව හා සමඟ යටිගඟතොට වැව මුණ සෝධන්ට බටුවාවූ සැල දැක වේගයෙන් දුවගොස් හැරගෙන අවුත් ගොඩතබා පියන්පත ගලවා බලා ඒ කුමාරයන් දුටුයේය. අඹුද දැක පුත්‍රසෙනඟ උපදවාගෙන ගෙට ගෙන වුත් වඩා සත් අට ඇවිරිදි වයස්වූ තැන් පටන් ඒ වැඩූ දෙමව්පියන් හා කැටිව රජගෙට ගොස් පුරුදුව සොළොස් ඇවිරිදි වයසට පැමිණිකල බොහෝසේ තනිවම ගොස් රජගෙයි කටුකොල් ආදීවූ දෙය කර්මාන්ත කරන්නේය. ඒ රජහුගේ අනික් අගමෙහෙසුන් බිසවුන්ගේ කුරඟවි නම් දුවක් ඇත්තීය. ඔද උතුම් වූ රූ ධරන්නීය. කුමරාද සැඩොල් ගෙයි වැඩිවර්ධනයද උතුම් රජකුලෙහි උපන් හෙයින් විශිෂ්ටවූ භාවනාව හා ශග්‍රිකවූ වචනයන් ඇත්තේ ඒ කුරඟවිතොම ඒ කුමාරයන් දුටුතැන් පටන්ගෙන පිළිබඳසිත් ඇතිව අනික්කෙනෙකුන් කෙරේ මද ඇල්මක් මදව ඔශු කර්මාන්ත කරණතෙන අවුදින් සිටින්නීය.මෙසේ ඔවුන් දෙදෙනම ඔවුනොවුන් එක්වන් දැකීමෙන් බංධාසිලාස ඇතිව ඇතුළු රාජහට නයෙහි මුවාතැන්හි ඉඳ දුරාචාරයෙහි පවත්නාහුමය. මෙසේ කල්යාමසක් පලාගිය කල්හි පිරිවාර ස්ත්‍රීහු රජ්ජුරුවන්ට දැන්වූ කල්හි රජ්ජුරුවෝ කිපි අමාත්‍යයන් රැස්කරවා මේ චණ්ඩාල පුත්‍රයා විසින් මෙබඳුනොකටයුත්තක් මෝහට කෙසේවූ වධයක් කළ යුතුදැයි විචාළාහ. අමාත්‍යයන්ද මහරජ මේ කරණ ලද මෝහට නොයෙක් නොකළමනා වධකොට පසුව මරාපුවහොත් යහපතැයි කීහ.

එක්ෂණයෙහි කුමාරයන්ගේ පියවූ ආරක්ෂා දේවතාවානෝ එකුමාරයන් මව්වූ තමන්ගේ පූර්වජාතියෙහි අඹුවූ බිසවුන් ඇඟ ආවේශවගෙන රජ්ජුරුවන් කරා ගොස් මහරජ මේ දරුවෝ වැලිත් චණ්ඩාලපුත්‍ර නොවෙති කොසල රජ්ජුරුවන්ට දාව බඩින්ගෙන ඒත් නුඹ වහනසේගේ මේ රජගෙයිදී වැදූ දරුවෝය. එදවසම මාගේ දරුවන් මරාපියනසේක්දෝහෝයි සිතා මලහයි කියා වංචාකොට අමුසොහොනකට දමාපියම් එතනදී එළුගොපල්ලෙක් ගෙනගොස් පොෂ්‍යකෙළේය එතෙම තමාගේ එළුදෙනුන් මියනහෙයින් සැළියකලාදීයෙන් යවාපිය ඉක්බිති දියෙන් යන දරුවන් දැක අපගේ රජගෙයි කටුකොල්කරන්නාවූ චණ්ඩාලයා දැක හැරගෙණ පෝෂ්‍යය කරවිය.

එපවත් අසා ඉදින් නුඹ වහන්සේ අදහනොගන්නාසේක්විනම් හැම දෙනාම ගෙන්වාලා විචාළ මැනවැයි බිසවුන් ලවා දේවතාවා කියවිය.

එපවත් අසා රජ්ජුරුවෝ කිරි මවය එළුගොපල්ලාය චණ්ඩාල පුත්‍රයා යයි කියන තුන් පක්ෂයෙහි ඇත්තවුන් ගෙන්වාගෙණ විචාරා තත්වයවූ පරිද්දෙන් අසා දැන ජාතිසම්පන්නවූ කුමාර කෙනෙකුනැයි සුවඳ පැන් සොළොස් කලයකින් ඉස් සෝධා නාවා ආභරණයෙන් සරහා රාජ කුමාරිකාව උන්ටම පාවාදුන්හ.

ගොපල්ලාගේ එළුවන් මළකාරණයෙන් රාජකුමාරයන්ට එළකකුමාරයෝයයි නම් තුබුහ. ඉක්බිත්තෙන් බ්‍රහ්ම දත්ත රජ්ජුරුවෝ උන්ගේ පියරජ්ජුරුවන්ට සන්තකවූ සේනාවාහනාදීවූ තොපගේ පියාණන් සන්තක රාජ්ජය ගනුවයි යවුහ.

ඒ එළකුමාර රජ්ජුරුවෝද කුරඟවිනම් බිසව කැඳවාගෙන මහපෙළ හරින් ගොස් ප්‍රවෙනි රාජ්ජයෙහි පදසථවුහ.

SANHIDA LANKA

ඉක්බිති බරණැස් රජ්ජුරුවෝ මෙතෙම අනාථව වැඩුනුහෙයින් කිසි ශිල්පයක් නොදන්නේයයි ඔහු ශිල්ප උගන්වන පිණිස ජලඟ කුමාරයෝයයි යන කෙනෙකුන්ට ආචාරී තනතුරදී ඔහු කරා යවිය. ඒ එළ කුමාර රජ්ජුරුවෝද උන් සමීපයෙහි උගන්නාලද ශිල්ප ඇතිව මාගේ ආචාරීයයි ගෝචරයෙන් සෙනෙවිරත් තනතුර දින.

මැත භාගයෙහි කුරඟවි නම් බිසෝතොම ඒ ජලඟකුමාරයන් හා සමඟ සැලසිතින් අනිවාර්යකෙළිනිය,

ඉක්බිති ජලඟ නම් සෙනෙවි රජදූ තමන්ගේ ධනනෙවාසිකම් අතවැස්සහු අත කුරඟවිනම් බිසවුන්ට වස්ත්‍රාභරණාදිය සොරායවන්නාය. ඒ ධනනෙතවාසිකයා හා සමඟ අනිවාර්ය කළාව.

මෙසේ කුණාල රජ්ජුරුවෝ එකල ජලඟකුමාරව ඉපද තමන් ප්‍රත්‍යක්‍ෂකොට දුටුවාවූ ඒ කුරඟවිනම් අඟනාවගේ අනාචාරය එදවස් රැස්වූ පර්ෂිදට ප්‍රකාශකොට කීවාහුය.

තවද තමන්ම ස්ත්‍රීන්ගේ නුගුණ ප්‍රකාශකොට කියන්නාහු යටගිය දවස රජ දරුවෝ කොසොල් රජ්ජුරුවෝ බරණැස් රජ්ජුරුවන් මරා රාජ්‍යගෙණ ගර්භිනිදේවින් තමන්ට අගමෙහෙසුන් කොට තමන්ගේ නුවරටම ආවාහුය. ඉක්බිති ඒ බිසව් දසමස් පිරුණුසඳ පුතනුකෙනෙකුන් වැදූහ. රජ්ජුරුවෝ තමන්ට දරුවන් නැති හෙයින් ඒ කුමාරයා පුත්‍රසෙනහයෙන් වඩා සියළු ශිල්පශාස්ත්‍ර උගන්වා වැඩි සොළොස්වයසට පැමිණිකල්හි තොගේ පියානන් සන්තක රාජ්‍ය ගනුවයි ප්‍රවේනි රාජ්‍යය දී යවූහ. ඒ කුමරාද බරණැස් නුවර රාජ්‍යය කරන්නේය.

ඉක්බිති ඔහුගේ මව් බිසව් පුතනුවන් දක්නට යෙමියි කොසොල් රජ්ජුරුවන් අනුදන්වාගෙන මහපෙළහරින් බරණැස් නුවරට යන්නී කොසොල් බරණැස් දෙරටට අතුරෙහි එක්තරා නියංගමෙක්හි ලැගුන්ගත්හ. ඒ ගම විශිෂ්ටවූ රූ ඇති පඤ්චාලවර්ණඩ නම් බ්‍රාහ්මණ කුමාර කෙණෙක් ඒ බිසවුන්ට පඬුරු යවා ඒ බිසවුන්ට සිත් ඇත්ත ඇඟවූහ. බිසව්ද ඒ පඬුරුදක උන්ගේද ස්වරූපය දක පිළිබඳ සිත් ඇතිව උන් හා සමඟ ලෝකාස්වාද රතියෙහි යෙදී දවස් යවන්නීය. කීප දවසක් එහිම වැස බරණැස් නුවරට ගොස් පුතනුවන් දක උන්ගේද ස්වරූපය දක නැවත එම ගමට අවුත් එතනින් කිප දවසක් එහි වැස බ්‍රාහ්මණ කුමාරයන් හා සමඟ අනාචාර ශිලීව දවස්යා කොසොල් රටට අවුය. මෙසේ ඒ බිසව් එතැන්පටන් කොට නොයෙක් කටයුතු කියාගෙන රජ්ජුරුවන් දක්නටයෙයි ලදින් එනකල එමගම උන් හා සමඟ දෙපෝයක් පමණකල් උන් හා සමඟ වැස යන්නී එන්නීයයි මේ අතීත කථාව ගෙණ හැර දක්වා සබඳ පුණ්ණමුඛයෙනි ස්ත්‍රී ජාතිහුනම් දුස්සීලවූ බොරු කියන්නාවූ සුළුද නොයෙක් සඨප්‍රයෝග ඇත්තාහයි යනාදීනි තමන් ගියදවස පංචාල වර්ණඩ නම් බමුණිව ඉපද ප්‍රත්‍යක්‍ෂ කොට තමන් දුටු ස්ත්‍රීන්ගේ නුගුණ දක්වා තවද කියන්නාහු සබඳ පූර්ණමුඛය යම්සේ පොළොව රන්රුවන් මුතු මැණික් ආදීවූ සත්රුවන්ද වෘක්‍ෂ පර්වතාදී ද සියළු සුගන්ධ නොයෙක් දුර්ගන්ධ යන නොයෙක් උත්තමාධව වස්තූන්ට පිහිටවේද එමෙන්ම ස්ත්‍රිජාතිහුත් කෙලෂ වශයෙන් සියළු රජ බමුණු වෙළඳ ගොවි ආදී උත්තමයන්ද රදා පදු කෙවුළු කිඩ එනා ආදීවූ නොයෙක් අධමයන්ද යන සියල්ලන්ටම කාමරතිවශයෙන් පිහිටවන්නාහුය.

තවද සබඳ යම්සේ චණ්ඩවූ සංහතෙම සතර පසුරෙන් හා මුඛය යන පංචස්ථානයෙන් මෘගදින් තරකොට අල්වාගෙන ලේ මස් අනුභව කෙරෙද එපරිද්දෙන්ම මේ ස්ත්‍රිහුත් රූප ශබ්ද ගන්ධ රස ස්පර්ෂය යන පස ගැන්මෙන් කෙතරම් සවර්ණිදාස පණ්ඩිතයන් වැනි විරශිල පුරුෂයනුත් අල්වාගෙන ශිල සංවර නමැති ලෝහිතමාංස භක්ෂණය කරන්නාහුය.

තවද සබඳ මහත්වූ අටවිමධ්‍යයෙහි පංචායුධ සන්නද්ධව සිටියාවූ සොරහු එතනට පැමිණියාවූ සත්වයන් පැහැර එලවා වස්තුවිළුම්පනය කෙරෙද්ද එමෙන් ස්ත්‍රීජාතිහුද තමන් විෂයෙහි පවත්නාවූ රූපාදී පස් අරමුණෙන් පුර්ෂියන් පොළඹවා විද්‍යාමානවූ උන්ගේ වස්තුව පැහැරගන්නාහුය. තවද සබඳ විෂ මිශ්‍රවූ රා අනුභව කළ සුරාධූර්තීයන්ට වූ විෂපත්තියක්මෙන් පස්කම් නමැති විෂරායෙන් පිරුණු ස්ත්‍රී වසඟවූ පුරුෂයෝ කටයුතු නොකටයුතු දනගත නොහී කළමනා කටයුතු විවරට නොකටයුතෙතිහම බොහෝසේ ව්‍යාවෘත වන්නාහුය.

තවද පූර්ණමුඛයෙනි යම්සේ වෙළඳහු තමාගේ බඩුයෙහි වර්ණනාව කෙරෙද්ද එපරිද්දෙන්ම ස්ත්‍රී ජාතිහුද තමන්ගේ බොහෝ නුගුණ සඟවා නැති ගුණ වර්ණනා කෙරෙමින් විකපත කරන්නාහ.

ඉස්සනම් මුවන්ගේ කරකැට නැගෙන්නාවූ අගමෙන් ලඝු ප්‍රවෘත්තීවූ සිත් ඇත්තාහුය. බොරුකීමම ස්වභාව කොට ඇති හෙයින් දෙදිව් ඇති සර්පයන් වැන්නහ. බොරු අතට සඟවනුලද අසුචි වලක් මෙන් වස්ත්‍රාලංකාරයෙන් පිළි සන්ව කෙලෙ පැටිකොට ඇවිදිනා කසල පිරුණු වලක් වැන්නහ.

ලක්ෂ ගණන් ගංගාවෙහි ජලය අනවරතයෙන් වැදත් නොපිරෙන්නාවූ සමුද්‍රය මෙන් මේ ස්ත්‍රී ජාතිහුද මෛථුන සංවාසයෙන්ද දරුවන් වැදීමෙන්ද සැරහිමෙන්ද පුරාලිය නොහැකි සිත් ඇත්තාහ. යම්සේ රාක්‍ෂ සඳ මාංස අනුභවයෙන් ගිජුහෙයින් සම්පත්දීමෙන් වැලකිය නොහැකිව මාංසයම ප්‍රාර්ථනා කරන්නේද එපරිද්දෙන්ම මේ ස්ත්‍රී ජාතිහුද ලෝකාස්වාද රතියෙහි ගිජු බැවින් බොහෝ සම්පත් ඇත්තන් කෙරෙහි වැසදූ තද කාමාස්වාදයම ප්‍රියකොට ඇත්තාහ.

SANHIDA LANKA

යම්සේ යමරජ තමා කරා පැමිණි සියළු සත්වයන්ගේ ගුණ ගුණ පරික්ෂා නොකොට මරුමුඛයට පමුණුවාද එපරිද්දෙන්ම මේ ස්ත්‍රී ජාතිහුද කුලගෝත්‍ර ගුණ විශේෂ පරික්ෂා නොකොට කේලශවසඟයෙන් සිල විපත්තියට

පමුණුවා දෙවනුව නරකයෙහි උපදනාහුය. යම් ගිනි ඇත්කුණු අස්කුණු මිනිකුණු බලු කුනු ගැරඬි කුණු ආදියෙන් භක්‍ෂණයකොට පියන්නේ විනම් උත්තම අධමයන්ගේ විපාකයක් නැතිව කෙලෙස් නමැති ගින්නෙන් භක්ෂණය කරන්නාහුය.

අසූචි භූමියත් පියුම් වනයත් නොහැර අමන්නාවූ පමණක් මෙන් චණ්ඩාල කුලපුත්‍රාදීන් කෙරෙහි කාමරතියෙහි එක් සිත්හ.

සිනේරු පර්වතය ආශ්‍රය කළාවූ කපුටුවන් එක්පැයුවාසේ තමන් කරා පැමිණ යම් කෙනෙකුන් තමන් වැනියාව කරන්නා හා අඹ ගස් වැනි එකසට හන් ඇතිවූ වසවෘක්‍ෂය මෙන් සදා ඵලිත බැවින් සහ මල්පල්ලෙන් සැදුන් බැලුවදුන්ට රම්‍යවූ දර්ශනය ඇතිව පෙනෙනහෙයින් වර්ණගන්ධයෙන් නොවෙනස් බව අනුභව කළ සත්වයා වහා මියෙද්ද එමෙන්ම පස්කම් ගුණයෙන් ඇළුනු සිත් ඇතියහයි ස්ත්‍රීන් වසඟවූ වහා විභව විනාශයට පැමිණෙන්නාහුය.

තවද පූර්ණමුඛය විභව ඇති ස්වාමිහු ජරාවෙන් මිරිකී රතික්‍රිඩාවට අයොග්‍යකල්හි ඔහු සන්තක වස්තුව ගෙන අනුන්ට යවා උන් හා සමග අතිචාර යෙන් මිත්‍ර ප්‍රිය කරන්නාහුයයි මෙසේ කුණාල බෝධිසත්වයෝ අනෙකප්‍රකාරයෙන් තමන්ගේ ධර්මවිලාසය දක්වා මත්තෙහිද ස්ත්‍රීන්ගේ නුගුණ දක්වන්නාහුය.

සබඳ මේ ස්ත්‍රී ජාතිහු නම් මුළුලොව බඳපිණිස මාරයා එලූ සොරමලක් වැන්නය. එසේහෙයින් එසේවූ ස්ත්‍රී ජාතින් කෙරෙහි ලෝභය කරන්නාවූ සත්වයෝ මිරිගුයෙහි ජලබුද්ධිකරන්නාවූ මෘගයන් වැන්නහ.

තවද ශෝකයට කාරණය හා රෝගයට වාසස්ථානය හා උපද්‍රවයට මරුවවැන්නාහ තවද දඟගෙයක් වැන්නහ. මායමටගුහාවක් වැන්නහ. එබඳුවූ ස්ත්‍රීන් කෙරෙහි විශ්වාසීවූ කෙනෙක් ඇත්නම් ඔහු සත්වයන් කෙරෙහි අධමහයි යනු පුරාගනයෙහි සත්පුරුෂයන්ගේ වචනයෙක් වන්නේය.

සබඳ පූර්ණමුඛයෙනි මේ ලෝකයෙහි ස්ත්‍රීන්ගේ නුගුණ බොහෝවුවද බඹලොව හැර තෙසුතැන්හි ස්ත්‍රීන් ඇති හෙයින් නුවණැති පුරුෂයෙක් ස්ත්‍රීන්ගේ ප්‍රයෝජන විඳින්නේ චතුවිධස්ථ නයෙක්ති සුශික්‍ෂිතව රක්නේය.

ඒ කෙසේද යත්

අනුන්ට පිරුළු වශයෙන් දෙනලද්දාවූ රථය ප්‍රමාණාතික්‍රාන්තවූ වාහනයෙන් චක්‍රභංසය කෙරෙද්ද එසේම ගොන්ද පමණ ඉක්මවා ඉසිලීමෙන් නසා පියද්ද එසේම දෙනුන්ගේ අතිදොහනයෙන් වස් සනාපියද්ද එමෙන් බන්ධු කුලයට ගොස් කල්යවන්නාවූ පතිනි අඹුවක වුවද පාපමිත්‍ර සමවායෙන් චිත්ත දූශ්‍යකරන්නාහුයයි දැන නුවණැත්තෝ මේ සතරකායෙන් ස්ත්‍රිය දුරුනා හරින්නේය.

තවද සබඳ ස්ත්‍රී ජාතිහු ස්වාමිපුරුෂයා දිළිඳුකලක් ලෙඩරෝගීකලක් යොවුන් සිඳුනුකලක් සුරාධූර්තිවූකලත් මාත්‍යුකලත් සම්පත් සෙවිමෙහි සියළුම කටයුත්තෙහි නොබෙඳනාකලය යන අටවැදැරුම්වූ තැන්හි ස්වාමිහු අරිනාහුය තවඳ සබඳ පූර්ණමුඛය ස්ත්‍රී ජාතීන්ගේ පාපක්‍රියාවෝ බොහෝදෙනය. ඔහු කවුරුදයත් ස්වාමින් නොවිචාරාම පුෂ්ඵාරාමයට ගොස් එතැන්හි චෞර පුරුෂයන් හා කැටුව වාසයකොට අදම අත්සා වෘක්‍ෂදේවතාවාට යාග බලි කර්මාන්ත දිය කරන්ට ගියෙමි. ස්වාමිහු සන්හිඳුවන්නාහුය. තවද අසොභිත මිත්‍රයන්ගේ ගෙයි කියාලු කටයුත්තෙක් ඇත. දිලුනයෙක් ඇත. ඉල්වාගන්ට ගියෙමි යනාදීන් ස්වාමිපුරුෂයන්ට වඤ්චාකොට ගොස් චෞරපුරුෂයන් කරා ලැගීසිත ඇති දුක් පහකොට එන්නාහුය. කවුළුදොර ආදීයෙහි සිටගෙන තමාගේ අග්‍රප්‍රත්‍යංගයන් බැහැර සිටියාවුන්ට දක්වන්නාහුය.

තවද උන්ගේ සතළිසක් පමණ ස්ත්‍රීලීලා ඇත්තෝය.

ඒ කෙසේද යත්.

පුරුෂයෙකු හා කැටිව පළමුව මේ ආකාරය කළ කල්හි අවකාශ ඇත්ත නැත්ත දැනගත මැනවැයි කථාකොට තබාගත් හෙයිනුත් කථාකෙළේද ඔහු සිත්ගත මැනවැයි යන අදහසින් ස්වාමිපුරුෂයා සමීපයෙහි සිට විජමහනය කරන්නිය.

SANHIDA LANKA

තවද යම්කිසි වස්තුවක් බිම එලාවේවයි හැරගන්නා පිණිස නැඹුරු වන කෙණෙකුන් පරිද්දෙන් නැමි පිටදිසාවට පානාහුය. යාම් හිම් ඉඳිම් සිටිම් සක්මන් කිරීම් පලන් ආභරණ කැනීම් වශයෙන් විලාස දක්වන්නාහුය.

ලජ්ජා ඇත්තවුන්මෙන් වහා උතුරුසළුව පෙරව හික්ති කවුළු දොර ආදියෙහි ඇලෙන්නාහුය.

හස්තපාතාදියෙහි නියඟින් ඊපාන්නාහුය. දණෙඩන් බිම ඉරි අඳනාහුය. තමන්ගේ හෝ අනුන්ගේ හෝ දරුවන් වඩාගෙන උඩට එසවීමය පාතට බෑමය උන් හා තමන් කෙළිමය තමන් හා උන් කෙළිමය සැනීමය සැනුම්

හැරගැන්ම උන් කැවිමය තමන් කවාගැන්මය තවද බාලදරුවන් අතට යම්කිසි මලක් හෝ ඵලයක් හෝ දිලීමය නැවත එය ඉල්ලීමය උන් කෙළි පිණිස කළ කළ යම්දෙයක් තමන් පෙරලා කිරීමය නැවත එම දරුවන්ගේ සුරතල්විඳ සෙනෙහයෙන් වදනක වලදනකමක් උසස්කොට කථාකිරීම ඒ හැම සමඟ සිටි ඇත්ත අඟවා සමීපයෙහි සිටි සොර පුරුෂයන්ගෙන් ආරහසියන්ට කියයිත්තක්කියාම්ය. බොහෝ දෙනා මැදයෙහි කෙළි පිණිස ව්‍යාජවශයෙන් බොරුයයි අඟවා ඇයි යුද්ධය සමහන් කොට කීමය නැවත විවේකීව ඇත්ත ඇතිසැටියේ කිමය නැටීම වෙණවැයිමා බෙරගැසීමෙන් ගී කිමෙනැයිද වැසි වස්නා දවසෙක පළමුකියා තබාගත් කටයුතු නියාවට වැස්සතෙමිනා නා කැමතිව අඬාපියා ගිවිස්සාගෙන සීමැදුරු කවුළුයෙන් පිටත්ව සිටුකුමාරයා අතමාරුකරද්දී රාජ කුමාරයා හා කැටිව ගිය කුමාරිකාවමෙන් ඇඩීමෙන් හා කිසිලිඹසවා පැමෙන් පිටිතොල ඩැහැමෙන්ද බැම ඉස්සීමෙන්ද ඉසකෙහෙ බැඳීමෙන්ද පිලිම්දීමෙන්ද ඇදීමෙන්ද යටසින් එක්වන් බැලිමෙන්ද උකුල මදක් නටවා බැලීමෙන්ද රහසිනාහය චලිතකිරීමෙන්ද කලවා පලල් කිරීමෙන්ද නැවත වහා අකුළුවා ගැම්මෙන්ද පයෝදරයන් සෙලීමෙන්ද පිලී සිරීලකොට පෙකනී පැමෙන්ද අත්දික්වු පෙරලා කැමෙන්ද දිවු ලෙලීමෙන්ද යනාදීන් දක්වන ලද සතලිසක් පමණ චෞර ස්ත්‍රීවිලාසයෙන් පුරුෂයන්ට බැවෙන්නාහුය.

තවද පූර්ණමුඛය ස්ත්‍රී ජාතීහු අවකාස ලබනු පිණිස අසෝගමට නයදුන් වස්තුව ඉල්වාගෙන එවයි කියාද අසොක කටයුත්ත පිරිමසාගෙන එවයි කියා ස්වාමිහූ යවනලද අවකාශ ඇතිව දුරාචාරයෙහි යෙදෙන්නාහුය තවද ස්වාමිහු පිළිබඳව කෘෂිවර්ණ්‍යාජාදීවු කටයුත්තෙහි අවැඩක්ම නොකළමනා දෙයක්ම යොදන්නීය.

පිලීතරකොට ඇද පිටිපැවැදළුව කෝලාහල කොට සමීපයෙහි වැදහොත් මිනිසුන් පුබුදුවා පහන් ලවා ඉසරුජාය බඩ රුජාය යනාදීන්වු ප්‍රලාප කියා ස්වාමිහුගෙ කෙලෙසරතිවිනාසය කරන්නීය. ස්වාමිහු සීත උෂ්ණභොජන කැමති උනුභෝජනය එලවන්නීය. උනුකැමති සිහිල්එලවන්නීයයි යනාදීනි ප්‍රත්‍යනික ප්‍රවෘත්තීය ස්වාමිහු දුකින් උපයන ලද සම්පත් රා මස් මල් සුවඳ ආදියෙහි කරණ ලද ලෝභයෙන්ම විසුරුවන්නීය. හැමවෙලෙහිම අතීචාරීවුවන් කරා ගමන් ගෙණ සිටිනීය.

තවද සබඳ තොරඹුරක් ලදහොත් යටත්පිරිසෙයින් කුණු පණු හුණු ශරීර ඇතිකරගන්නා සාමුලින්ම නැති දෙඅත් දෙපා හුන් සත්වයකුදු නොහරණ බව පදුම ජාතකයෙහි කී නියායෙන් දතයුතු

යටත් පිරිසෙයින් ඉතා පිලිකුල්වු පිළුන්කෙරෙහිම මහත්වු ස්නෙහයෙන් ස්ත්‍රීජාතීන් වාසය කළ තැන් බොහෝ සේ ඇත.

ඒ කෙසේද යත්

සබඳ යටගිය දවස බරණැස් නුවර කඩාරීනම් රජෙක්විය. එතෙම වසවත් දෙවුපුතුමෙන අති මනෝහරවු රූපසොභා ඇත්තේ එතෙමහැම වෙලෙහිම පස්කම් ගුණයෙහි ඇලි වෙසෙයි. ඔහුගේ විභවසක්තියත් දවස්පතා ඇමතියන් ගෙණහැර එලවන ලද දහසක් සුවඳ කරඬුපලා සුවඳ දරින් ගිනිදල්වා රාජභෝජනය සපයා මේ වඩන්නාහුය. මෙරජහුගේ ආවර්ණනියාවු රූප ඇති කිනනරාදෙවි නම් අගමෙහෙසුන් බිසවක්වුව ඒ රජහු හා සමවයස් ඇති ඒකාචාරීවු කුලෙහි සිල්ප උගත් පංචාලවණ්ඩ නම් පුරෝහිතයෙක් ඇති විය.

ඒ රජ්ජුරුවන්ගේ ප්‍රාසාදය ගාවා පවුර ඇතුලෙහි කඳවෙලෙප් සහිතවූ පවුරු මුදුනට එල්ලෙන්නාවු ශාඛාපතර ඇති දඹරුකක් විය. එදඹරුක සෙවනැල්ලෙහි ඉතා පිලිකුල්වු බැලිවනොහැකි ශරීරාවයවයන් ඇති සතර ගාතය කොරවු පිලෙක් වසන්නේය. එක් දවසක් කින්නරාදෙවිද සීමැදුරු කවුළුයෙන් පිටත බැළුවාහු ඔහු දැක පිළිබඳ සිත් ඇතිව රාත්‍රිභාගයෙහි රජ්ජුරුවන් කෙලෙසරතියෙන් සතපා යානට වැඩපිකල නිදිවරබලා සෙමෙන් නැගී සිට නොයෙක් රසමසවුලෙන් යුක්තවු ආහාරය රන්තැටියෙහි පුරාගෙණ එතුරතු පොට අස්සෙහි තබාගෙණ කඩරැනක් සීමැදුරු කව්ළුයෙහි සිරිගම්පයෙහි බැඳ ප්‍රාසාදයෙහිම පලයට වැඩිතිබෙන්නාවූ දඹ අත්තට බැස අත්ත ඔස්සේ ගොස් බිමට බැස පිලා බත්කාවා ඌ හා සමඟ පාප ක්‍රියායෙහි යෙදී පළමු බටුවාවු ක්‍රමයෙන්ම ප්‍රාසාදයට නැගී ශරීරයෙහි වැකීගියකුණු පැටිකරණු පිණිස සඳුන් සුවඳින් ඇඟ උලා රජ්ජුරුවන් හා එක්යාන් පුරුදුව සැතපෙන්නීය. මෙම ක්‍රමයෙන් නිරන්තරම ඌ හා සමඟ නොකටයුත්තෙහි හැසිරෙන්නීය. රජ්ජුරුවෝද නොදන්නාහුය.

SANHIDA LANKA

එකල එක් දවසක් රජ්ජුරුවෝ නුවර පැදකුණු කොට රජගෙට වන්නාහු එදඹසෙවනේ එල්ලේ වැදහත්තාවු පැහැපත්වු එපිලා දැක තමන් හැමවෙලෙහිම ගොචර හෙයින් පුරෝහිතයන් මූන බලා බලව මනුෂ්‍යප්‍රෙතයක-ගේ සැටියෙක සබඳ මෙසේවු ප්‍රතිකුලයන් හා සමග වාසයකරන්නාවු ස්ත්‍රීන් මේ ලෝකයෙහි ඇද්දෝහෝයි කීහ. එපවත් අසා පිලා මහත්වු අභිමාන උපදවාගෙන දොහොත් මුදුනෙහි තබාගෙණ මේ දඹ ගස අධිගෘහිත දේවතාවාණෙනි ඇසුව මැනව නුඹ වහන්සේමය දන්නේයයි කීය.

පුරෝහිත බමුණානෝ ඔහු කල ක්‍රියාව දැක සිතන්නාහු ඒ කාන්තයෙන් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන්වූ බිසවුන් දඹගසින් අවුදින් මු හා සමඟ නොකටයුතු කරන්නාහුවනැයි දැන මහරජ රාත්‍රීභාගයෙහි බිසවුන් ශරීර පහස් කවරේදැයි විචාළේය. ඒ අසා රජ්ජුරුවෝ සබඳ අනික් කාරණයක් නොදනිමියි මධ්‍යම රාත්‍රියෙහි බිසවුන්ගේ ශරීරය සීතලයයි කීහ.

එසේ විනම් රජ්ජුරුවෙනි තෙසු ස්ත්‍රීන් තබා තොපගේ අගමෙහෙසුන් කින්නරාදේවීම් මුන් හා සමඟ කෙලෙස සංගර්ය ඇත්තාහුයයි කීහ.

එසඳ රජ්ජුරුවෝ කිමෙක්ද පුරෝහිතය ඉතා සොභණවූ රූ ඇති උත්ත මාංගනාව ඉතා පිළිකුල් වූ මොහු හා කෙසේ වෙසෙද්දැයි කීහ

ඉක්බිති පුරෝහිතයෝ මහරජ මාගේ වචනයෙහි ඇදහිලි නොකරණ සේක් වී නම් මෙතැන් පටන් පරීක්ෂාකළ මැනවැයි කීහ.

එසඳ රජ්ජුරුවෝ යහපතැයි ගිවිස එදවස් රෑ මෙහෙනිමවා බිසවුන් හා සමඟ සැතපී අදකලි මෙම පරීක්ෂාකරන්ට උවමැනවැයි පළමු නිදනවෙලාවට නිදාපුකෙණෙකුන් මෙන් ඇඟවුහ. බිසවුද රජු නිදන්නේ කවරවිටකදෝහෝයි සිත සිතාම ඉඳිනාහෙයින් නිදාපිවනැයි නැගීසිට රන්තැටියේ බත් ඉන තබාගෙණ කඩරුනෙන් එපිට බටුවාහුය. රජ්ජුරුවෝ දඹසෙවනැල්ල හස හා සමඟ ඇලී සිටියාහ. පිලාතෙම බිසවුන්ට කිපී ඉතා කල්යවා එන්ට කාරණා කවරේදැයි තමාගේ කොර අතින් කංසට ගැසිය ඉක්බිති බිසවු ස්වාමිනි රජ්ජුරුවන් නිදාපියනතෙක් කල්යවමියි නොකිපුන මැනවැයි යනාදීන් උන්ගේගෙයි ඇතිදා ඇති පාදපරිචාරිකාවක මෙන් ඔහු අස්වසා අවන්තවුව ඒ ගැසු පහර හා සමඟ බිසවුන්ගේ කනපලන් සිඟමුබ කුණ්ඩලාභරණය රජ්ජුරුවන්ගේ පයසමීපයට පැනපියා රජ්ජුරුවෝ මෙතෙක් මට සෑහෙන්නේයයි ඉනිඹ උන්ගේ ඕලාරික ක්‍රියාව නොදක්වම් රජගෙට පලාආහ.

බිසවුද ඔහු හා සමඟ අනිවාරයෙහි යෙදී පළමුපරිද්දෙන්ම අවුදින් රජ්ජුරුවන් හා සමඟ සැතපෙන්නට උත්සහබලහ. රජ්ජුරුවෝ තමන් සමීපයට වැද්දනොදී පසුව දවස් කින්නරාදේවීන් මා විසින් දෙනලද ස්වරණාලංකාරයෙන් සැරගීගෙන එන්ට කියවයි විධානය කළහ.

එසඳ බිසවු කුණ්ඩලාභරණය බඩාල්ගෙදරයයි කියන්නාහුය. පසුව තත්පරවම එන්ටකියවයි විධාන කරණහෙයින් පලම්කුණ්ඩලාභරණයෙම්ම අවුත් සිටියාහුය. එසඳ රජ්ජුරුවෝ ඇයි සොඳුර තොපගේ කුණ්ඩලාභරණය කොයිදැයි විචාළාහුය. ස්වාමිනි කොතුරක් ඉගිලීගියහෙයින් බඩාලුන් අතට ලැවීමයි කීහ.

එසඳ රජ්ජුරුවෝ බඩාලුන් ගෙන්වාගෙණ බිසවුන්ගේ ආභරණ තාගෙගෙයි බොහෝදවසක් තබාගෙණ නොදෙන්ට කාරණා කවරේදැයි කීහ. එසඳ තරහල් හයින් ඇකීලි නොගත්මි ස්වාමිනි කිය. රජ්ජුරුවෝ මෙසේ බිසවුන්ගේ දෝස ගිවිස්වා චණ්ඩාලකෙල්ල මෙවකට බඩාල්ලු තොපට අපිසයයි තමන් වහන්සේ අතතුබු කුණ්ඩලාභරණය ඉදිරියට දමුහ. එවිට බිසවු කරබැහැ එබස්ද රජ්ජුරුවෝ පුරෝහිතයන් කැඳවා සබඳ තොප කීයේ සැබෑවැයි උන් කෙරෙ පැහැද බිසවුන්ට කිපී තෙල ගෙනගොස් ඉසකපා පියවයි සම්මත කළහ.

එසඳ පුරෝහිතයෝ බිසවුන් එම රජගෙයි එක්තෙනක්හි සඟවා ඉදුරා රජ්ජුරුවන් කරා එලඹ මහරජ බිසවුන් කෙරෙහි නොකිමුණ මැනවැයි සියලු ස්ත්‍රීන්ගේ නුගුණ මෙතෙක්මය. ඉදින් නුඹ වහන්සේ ස්ත්‍රීන්ගේ නුගුණ හා නොයෙක් සටප්‍රයෝග දක්නා අභිප්‍රාය ඇතිසේක්විනම් අප්‍රසිද්ධ වේසයෙන් දනවු සැරිසරා ඇවිද පරීක්ෂා කරම්හයි කීහ.

රජ්ජුරුවෝද මැනවැයි ගිවිස මෑණියන්ට රාජ්‍යය පාවාදී පුරෝහිතයන් හා සමඟ අප්‍රසිද්ධවේශයෙන් නුවරින් නික්ම යොදනක් පමණතැන් ගොස් මාවත සැතපී උන්කල්හි එක් කෙළෙඹි පුත්‍රයෙක් තමාගේ පුතුට එක් කුමාරිකාවක මහත් මගුල්කොට පිළිසන් යානාවෙක්හි ඉඳුවාගෙන මහපෙරහරින් යන්නේය. එපවත් දැක පුරෝහිතයෝ මහරජ ඉදින් නුඹවහන්සේ කැමති සේක්විනම් පෙරපුරුෂයන් හා නොහසලවිරූ කුමාරිකාව නුඹ වහන්සේ හා සමඟ සතප්පාපියම් කීහ.

SANHIRA LANKA

එපවත් අසා රජ්ජුරුවෝ සබඳ කුමක් කියයිදැයි මහපෙරහරින් එන්නියට කෙසේ අවකාස ලැබේද නොපිළිවනැයි කීහ. එසඳ පුරෝහිතයෝ එසේ වී නම් මාගේ සපත්කම බැලුවමැනවැයි කියා පෙරෙත්තුව ගොස් මගින් ඉවත්ව තිරයක් බැඳ රජ්ජුරුවන් තිරය ඇතුලේ හිඳුවා තුමු මගට බැස දෙපය දික්කොට අඬමින් උන්නාහුය. ඉක්බිති කෙළෙඹිපුත්‍ර අඬමින් උන් බමුණානන් දැක කුමක් පිණිස අඬාදැයි විචාළේය.

පින්වත්නි මාගේ බරින්ද ගර්භනිහ. අපි උදකලා හෙයින් උන්ගේ දෙමව්පියන්ගේ ගෙයි හැරලාපියන පිණිසයයි කැඳවාගෙන මගට ආකලට අතරමග විලිපහරින්ට වන ඕතොමෝ තීරය ඇතුලෙහි මහත්වූ ආයාස විඳිනීය.

කිසි භයකුත් නැත. මාත් එතනට නොයාහැක්ක එක ස්ත්‍රියක ලද්දොත් යහපතැයි කීහ. වන්නාට බොහෝ ස්ත්‍රීහු අප හා කැටුව ඇත. ඉන් එක්කෙනෙකුන් ප්‍රසව කරතියි තෙපි නොහඬවයි කීහ. ඒ අසා බමුණු තවද අපගේ කුලක්‍රමගතවූ චාරිත්‍රධර්මයෙක් ඇත. කන්‍යාස්ත්‍රියක විසින් ප්‍රසව කලයුතුය එතමාත් උන්ට මහත්වූ වැඩෙයි කීහ. එපවත් අසා කෙළෙඹිපුත්‍රතෙම මුන්කියේ සැබැවයි සිතා මේ පූර්වනිමිත්තයෙන් අපගේ පුතනුවන්ට දරුවන් ලැබෙගෙදල ස්ථිරවන්නේයයි චතුර්වේදයෙහි නිෂ්පණ්ණ බමුණු දැනමකීයේයයි සතුටුව තමාගේ යෙහෙළි කුමාරිකාවම ප්‍රසව කරවයි යවිය. ඕතොමෝ තිරය ඇතුල්වන්නී මලවියා බඳු උතුම් රූ ඇති සශ්‍රීක වූ රූ ඇති රජ්ජුරුවන් දැක පිළිබඳසිත් ඇතිව රජ්ජුරුවන් හා සමඟ ව්‍යාතික්‍රමයේ යෙදුනාය. රජ්ජුරුවෝද ඇගෙ අභිනව ක්‍රියාව පවා මෙසේ වනැයි ඈකෙරේ සතුටුව තමන්ගේ ලක්ෂයක් වටනා පේරුස් ගලවා ඇඟිල්ලෙහි ලූහ. ඉක්බිති කරන ලද ව්‍යාතිචාර ඇතිව පිටත්වූහ. ඇගෙන් කුමක්ද වදාපුදැයි විචාළහ. එසඳ ඕතොමෝ එසේය රන්රුවන් පුතනුකෙනකුන් වදාපුවයි කීහ. කෙළෙඹි පුත්‍රද ඈ කැඳවාගෙන නික්මින පුරෝහිතයොදා රජ්ජුරුවන් සවමීපයට ගොස් රජ්ජුරුවෙනි පෙර පුරුෂයන් හා නුපුරුදු කන්‍යාස්ත්‍රී කුමාරිකාවරුන්ගේ පාපක්‍රියාව මෙසේ කල පුරාතන ස්ත්‍රීන්ගේ සොර කම් කියනුම කිම්දැයි රජ්ජුරුවන් සිතට මනංවා ඇඟිල්ලෙහි තුබූ පේරුස්මුද්ද නොදැක මහරජ ඈට දුන්කිසිවක් ඇද්දැයි විචාළෝය. එසේය පේරුස්මුද්ද දෙන ලදැයි කී කල්හි එසෙර කෙල්ලට දෙන්ට කාරණා කවරේදැයි කී කල්හි ඒ සොර කෙල්ලට දෙන්ට කාරණා කවරේදැයි පසෙසහි ලුහුබඳවාගෙණගොස් ඈ නැගී යන්නාවූ යානාව අතින් අල්වාගෙන රැඳවූහ. ඇයි මේ කුමක්දැයි විචාළ කල මේ කුමාරිකාවෝ බැමිණියගේ ඉස්දොර තිබූ මුන්ද හැරගෙණ පලාඅවුයයි කියා ලුහුබඳවාගෙන ගොස් ඈ නැගී යන්නාවූ යානාවේ තිබූ මන්ද අම්ම මෙසේ දෙන්නැයි ඉල්ලුකල මුදූදෙන්නාවූ කුමාරිකාවෝ අනේ තාගේ සොරකමකැයි ඕහට අඟවනු පිනිස බමුණාගේ අත්ල නියෙන් කණලාදුන්හ.

මෙසේ ඒ පඤ්චාලවර්ණද නම් පුරෝහිතයා නොයෙක් නොයෙක් උපායන් බොහෝ උපායෙන් ස්ත්‍රීහුගේ ගුණ ඒ රජ්ජුරුවන් සිතට නංවා තවද ස්ත්‍රීන්ගේ නුගුණ පරීක්ෂා කරණු පිණිස දඹදිව ඇවිදිම්හයි කීහ.

එකංගරීනම් බරණැස් රජ්ජුරුවෝ සබඳ සියලුම දඹදිව ඇවිදිත් ස්ත්‍රීන්ගේ නුගුණ මෙසේ මෙසේම දැක්කහැක්ක. ඉන් අපට ප්‍රයෝජන කින්දැයි වැලක නැවත බරණැස් නුවරට අවුත් මහරජ ස්ත්‍රී ජාතිහූ නම් මෙසේවූ පාප අදහස් ඇත්තාහුමයයි එසේ හෙයින් කින්නරාදේවීන් කෙරෙහි ක්ෂමා කොට වදාළ මැනවැයි පුරෝහිතයන් විසින් යච්ඤාකරණ ලද රජ්ජුරුවෝ ක්ෂමාකොට තනතුරු පිරිහෙලා රජගෙන් පිටත්කොට අනික් බිසවක අගමෙහෙසුන් කොට එපිළිද මරා නෑර දඹගස රජගෙ දසාවට නැමුනු අත්ත කප්පවා පුරෝහිතයන්ගේ අනුශාසනාවෙන් රාජ්ජය අනුශාසනාකළහයි මෙසේ මහණෙනි කුණාල බෝධිසත්වයන් පඤ්චාලවර්ණඩ නම් පුරෝහිතව තමන් ප්‍රත්‍යක්ෂකොට දුටුකාරණය ගෙනහැර දක්වා ස්ත්‍රීන් ගේ නුගුණ ප්‍රකාශ කළහ.

තවද යටගිය දවස අනික් බරණැස බකනම් රජ්ජුරුකෙණෙකුන් ධර්මිෂ්ඨයෙන් රාජ්ජය කරන්නාහුය.

එකල එමනුවර නැගෙනහිර වාසල් දොරන් පිටත විථියෙහි එක් දිලිඳුකුල යෙහි ඉපිද මැටි අනාගෙන හිතතියෙහි මැටිගසනකල්හි එක්පසේබුදුතෙනෙකුන් වහන්සේ වැඩ වසන ප්‍රාග්භාරයෙහි වැලි මැටිලන පිණිස මැටිකෙසේලැබේදැයි ආවර්ජනාකරනසේක් බරණැස් නුවර සවමීපයෙන් ලැබගත හැක්කැයි දැන වදාරා ගැටවවූ ගන්වාගෙන පාත්‍රය සිවුරු අසෙස ධරා ඈට නුදුරු තෙනක වැඩහුන්සේක බත් උදෙසා වැඩිසේක්වනැයි අහරනැති බව ඇඟවූවද නොවැඩ සිටි හෙයින් ඕතොමෝ කිපී බලන්නී මහණ තට මැටිත් අරුමනියා වේදැයි මහත් මැටිපිඩක් ගෙණගොස් පාත්‍රයෙහි ලාපුව ඔබද එ මැටිගෙණගොස් තමන් වහන්සේ වසනතෙන වැලිමැටි ලාවදාළසේක. මෙසේ එපසේබුදුන්ට නොඅදහත් මැටි පිලිගැන්වූ කුශල ඵලයෙන් දිව පහස් බඳු ශරීර පහස් ඇති විය කිපී බැළුහෙයින් මුන්ද නාසයද දැත දෙපයද යන පඤ්චස්ථානය විරූපවිය. ඒ කාරණය හේතුකොටගෙන පඤ්චපාපයයි නම් තුබූහ.

එකල බක නම් බරණැස් රජ්ජුරුවෝ රාත්‍රී භාගායෙහි අප්‍රසිද්ධ වේසයෙන් නුවර පරික්ෂා කරනු පිණිස පිටත්වූහ. රජ්ජුරුවෝ ඇගේ ගෙදරට පැමිණියාහුය. ඒ පඤ්චපාප නම් කුමාරිකාද කෙළිමුලන් හා සමඟ කෙළින්නී රජ්ජුරුවන් නොදැන ගොස් අත ඇල්ලුව රජ්ජුරුවෝද හස්ත පර්ෂියෙන් දිවපහස් වැදගත් කෙනෙකුන් පරිද්දෙන් ස්වභාවයෙන් සිටපිය නොහිපහසෙහි ඇලුනාහු විරූපවත් ඈ අත අල්වාගෙන තෙපි කාගේ දියනිකෙනෙක්දැයි විචාරා දොර වසන්නාවූ දුප්පත් කුලයෙක එකකිම් කී කල අස්වාමික භාවය විචාරා නියම දැන මම තිට ස්වාමිපුරුෂවෙමියි ගොස් තිගේ දෙමව්පියන්ට තත්වූ පරිද්දෙන් කියාලයි කීහ. ඕද දෙමව්පියන් කරා ගොස් එක් පුරුෂයානකෙනෙක් මා කැමතිව විචාලහ. කලමනා කින්දැයි කිහ. එපවත් අසා ඇගේ දෙමව්පියෝ අනේ ඔහු අපටත් වඩා දුක්පත් එකෙකු නියාවේද වන්නාට තොපසේ වුවනුත් කැමතිවූ නම් ඉතාම යාපත්වේදැයි කී කල්හි ඕගොස් එපවත් රජ්ජුරුවන්ට කී කල්හි එදවස් රජ්ජුරුවෝද උන්ගේ ගෙයි සැතපී උදෑසන රජගෙට ගියාහ. එතැන් පටන් නිරන්තර වසයෙන්ම අප්‍රසිද්ධ වේශයෙන් රජගෙන් පිටත්ව ඇය සමඟ සැතපෙන්නාහුය. අවසේස ස්ත්‍රීයක මුනත් නොබලන්නාහුය. මෙසේ කලක් ගියකල ඇගේ පියාට

SANHIDA LANKA

ලේග්‍රහණියක් ඇති විය. ඊට බේත් වෙදවරුන් විචාලකල වෙදවරුන් කියන්නාහු පැන්නුමුසු කිරි මී ගිතෙල් කිරා බහා පිසන ලද කිරි බත් අනුභව කිරීමට මීට බෙහෙත් වේදැයි කීහ. ඔහු තමන් දිළිඳු හෙයින් උපදවා ගත නොහී පංච පාපාවන්ගේ මැණියෝ පුත තොපගෙ සමනෝ මෙබඳු කිරි බතක් අපට උපද වාලිය එද්දැයි විචාරා බලවයි කීහ. එබස් අසා ඕතොමෝ අම්ම අපට වඩා උන් දුක්පපත් කෙනෙකුනැයි සිතෙයි එතකුදු උවත් විචාරා බලමි නුඹ සොකනොකරන්නෙහි අස්වසා රජ්ජුරුවන් එන වේලාවට දුර්මුඛවගෙන උන්නීය. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ අවුදින් දොම්නස් කරනු කින්දැයි විචාල කල්හි එපවත් කිව ඒ අසා රජ්ජුරුවෝ සොඳුර ඉසුරුමත් බේදක අනේ මේ කෙසේ ලැබගත ඒමෝදෝහෝයි කියා නැවත සිතන්නාහු මට හැමදවස්ම මේ සැටියේම මැනිසා ඇවිදිනාකල්හි අතරමග යම්කිසි උපද්‍රවයෙක් පැමිණියෙනු මුත් නපුර තවද මෑ අන්තපුරයට ගෙනගොස් තිබී නම් අපගේ රජ්ජුරුවෝ යකින්නක ගෙවුත් අන්තඃපුරයේ රැඳෙවුහයි පුරවනිතාවෝ මා හා කෙළනාහුය. එබැවින් සියලුනුවරවාසීවු සත්වයන්ට මැගේ ශරීර පහස්වු පරිදි දක්වා නින්දාවෙන් මිදිගෙනයායුතුයයි සිතා ඈට කියන්නාහු සොඳුර තොපි ඊට සොක නොකරව එබඳු කිරිබත් ගෙනෙමි කියා ඈ හා සමඟ රමණයකොට සැතපී පසු දවස් රජගෙටගොස් යටකී පරිද්දෙන් කිරිබත් ඉදිකරවා පත්ගෙන්වා දෙමුලක් කොට බඳනාහු එක්මුලෙක බත් අතුරෙහි සිබාමාණික්‍යලා බත් මුළු දෙක හැරගෙණ පළමුසේම රෑ පලාගොස් සොඳුර අපි ඉතා දුක්පතුම්හ. මේ මහා ආයාසයෙන් සපයාගත් බත තොපගේ පියාණන්දෑ අද මේ මුලෙහි බත් කා සෙට මේ මුලෙහි බත්කන්ට කියවයි. මුළුදෙක වෙන වෙනම පැලා දුන්හ. උයිත් එලෙසම කියා පියාණන්ට දුන්හ. මහත්වු ඕජාසමපන්නවු බත හෙයින් සුගක් අනුභවකොට සිත්නිවී ගියේය. අවශේෂවු බත් මැණියෝද තුමුද අනුභවකළාහ. සිළුමිණිය බහලු බත්මුල පසුව දවසට තුබූහ.

රජ්ජුරුවෝද පසු දවස් රජගෙටගොස් මූණට පැන් වඩා පලඳනට චූඩා මාණික්‍ය ගෙනවයි කී කල්හි ස්වාමිනි නුදුටුම්හයි කියා කී කල්හි වහා ඇතුලු නුවර රැකවල් ලවා පරීක්ෂාකරවයි කී කල්හි එලෙස පරීක්‍ෂාකොට නුදුටුම්හයි දැන්වු කල්හි එසේවීනම් පිටිනුවර යටත්පිරිසෙයින් දිළිඳුකුලවල පටන් සැලි වලින් ආදියෙහිද පත බැඳි බත් මුළු ආදියෙහිද වහා පරික්ෂාකරවයි කීහ. මෙලෙස පරීක්ෂාකරන්නාහු එගෙයිම මැණික දැක ඇගේ දෙමව්පියන් බැඳලා සොරුයයි ගෙනගොස් රජ්ජුරුවන්ට පෑහ. ඇගේ පියානෝ කියන්නාහු ස්වාමිනි අපි නොවෙයි අනිකෙක් බත් මුලෙහි ලා මැණික ගෙනගියේයයි කීහ.

ඒ කවරකේදැයි විචාළ කල අපගේ බෑණෙකැයි කීහ. දැන් ඒ කොයිදැයි විචාලහෙයින් ස්වාමිනි අපගේ දියනියෝ දනිති කීහ. එසේකල උන් විචාරා නියම දන කීයාලවයි සම්මතකළ කල්හි දියණියන් කැඳවා පුත තොපගේ ස්වාමිපුරුෂයා දනුදැයි විචාළ ඕතොම ස්වාමිනි රාත්‍රියෙහි අව්දින් රාත්‍රියෙහිම පිටත්වන හෙයින් අඳුනාගත නොහෙමි කීව.

රාජ පුරුෂයෝ එපවත් රජ්ජුරුවන්ට දැන්වුහ. එපවත් අසා නොදන්නා කෙනෙකුන් පරිද්දෙනේ එසේවීනම් ඒ ස්ත්‍රිය රාජංගණය ඇතුලෙහි ලා අත පමණකට කවුළුවක් කොට නුවරවැස්සන් රැස්කරවා තිරසඳුරෙන් අතඇතු ලට පොවා හස්තපර්ෂයෙන් සොරුන් අල්වාදෙන්ට කියවයි විධානකළහ. අමාත්‍යයෝද එලෙසම කරම්හයි ඈ සමීපයට  පලාගොස් ඇගේ රුවදැක නොසතුටුවුවාහු ඉතා පිළිකුල්ව අතින් නොඅල්ලාම වටකොට ලාගෙනවුත් රාජාංගනයෙහි තීරය ඇතුලෙහිලා නුවර වැස්සන් කැටිකොට කවුළුවෙන් තීරය ඇතුලට අතපොවන්ට සම්මත කළහ.

ඕ තොමෝ ඇතුලෙහි සිට පෙවු අත අල්වා බලා ඒ නොවෙයි කියා අල්ලා හරිනීය ඈත අතපෙවු යම් පුරුෂයෙක් ඇත්නම් දිවපහස් බඳු හස්ත පහසෙයි බැඳි ඈත පලා නෙළුන්නාහුය. ඉදින් මෑට දඩ ඉනිනම් දඩ අපි දිත් මැනියා වහල්වත් අපගෙගෙහි පාදපරිචාරිකා කරම්හයි සිත සිතා යානොහි සිටිනාවුන් රාජපුරුෂයෝද දඬුගෙන මරා ඉවත්කරවන්ට පටන්ගත්හ. සෙනෙවිරත් ඈපා මාපා යුවරජ්ජුරුවන් ආදිකොට සියල්ලෝම වියරුහුණුවන්මෙන් වුහ. සියළුම නුවරවාසීන් තේරිගියකල්හි ඉක්බිති රජ්ජුරුවෝ මාවිනා අනික් තෙරණුකෙනෙකුන් නැත. එසේවිනම් සොරහු මානියාවේදැයි නැගී සිට ගොස් තීරය අස්සෙන් අතපෙවුහ.

රජ්ජුරුවන්ගේ අත අල්වාගෙන දැන් අතපෙවු තැනැත්තා සොරුයයි අල්වාගෙන මහත්කොට අඬගෑව රජ්ජුරුවෝ ඈට අතදීලාම සිට අමාත්‍යවරුන් කැඳවා හැමකුමක් සිතත්දැයි විචාළහ. අමාත්‍යවරහුත් තමන්සිතු සිත් තත්වු පරිද්දෙන් කීහ. එසඳ රජ්ජුරුවෝ එඹා අමාත්‍යවරුනි මැගේ පහස පලමුනොදන්නාවු තොපි හැම නින්දාකෙරෙති. යන සිතින් මාගේ අන්තඃපුරයට ඇරගන්නා පිණිස මෙලෙස කෙළෙමි තෙපි හැමම කියව මෝ කාටනිස්සීදැයි විචාළාහ. ස්වාමිනි නුඹ වහන්සේට නිස්සීයයි කීහ.

SANHIDA LANKA

ඉක්බිති ඈ සත්රුවන් රැසක් මත්තෙහි පිහිටුවා ත්‍රිවිධ සංඛායෙන් පැන් වත්කොට අගමෙහෙසුන් තනතුරෙහි තුබූහ.

ඇගේ දෙමව්පියන්ට මහඉසුරු දුන්හ. ඒ පංචපාප නම් බිසවු අගමෙහෙසුන් තනතුරෙහි තුබූ තැන් පටන් ඒ

රජ්ජුරුවන්ගේ අධිකරණයෙහි ඉදිමෙක් කාරිය කාරිය විදීවිරීමෙක් නැත්තේය. අන්තරවූ සොළොස් දහසක් බිසොවරුන් කෙහෙි එක් කෙනෙකුන්ගේ මුණත් අනුරාගයෙන් බලනගමනෙක් නැත.

ඒ තෙසු ස්ත්‍රීහු සම්පත් නිරෝෂයෙන් තොරතුරු පරීක්ෂාකරන්නාහුය. ඉක්බිති එක් දවසක් පංචපාප නම් බිසවු රජදරුවන් දෙදෙනකුට අගෙමෙසුන් වන බව ස්වප්නයෙන් ලක්ෂණයක් දැක රජ්ජුරුවන්ට දැන්වුහ. රාජ්ජුරුවෝ ස්වප්නයෙහි අර්ථදන්නාවුන් ගෙන්වා බිසවු රාත්‍රීභාගයෙහි ස්වප්නයෙන් ඇලිඇතකුපිට ඉඳ සඳපිරිමදිනුදුටුල ඒ ස්වප්නය ගැන කියවයි විචාළහ.

ඒ නිමිත්තපාඨකයා අවශේෂවු ස්ත්‍රීන්ගෙන් පලමුව අත්ලස් ඇරගත් හෙයින් ස්වප්නයෙවු පරිදි තබා විරුද්ධකොට කියන්නාහු ස්වාමිනි බිසවුන් ඇලි ඇතුපිට උන් බවනම් නුඹ වහන්සේට මෘත්‍යුකාරණයට පූර්ව නිමිත්ත ඇතුපිට ඉඳ සඳ පිරිමැදිනම් නුඹ වහන්සේගේ සතුරුවු රජ්ජුරුවන් අතට අසුවන නිමිත්තතයහයි කීහ.

එසඳ රජ හයපත්ව ඉනිඹකලමනා කින්දැයි විචාළෝය. මහරජ ස්ත්‍රීවධකළ නොහැක්ක බල එතකුදුවුවත් බිසවුන් නැවකලා ගඟට හැරපුවොත් යහපතැයි කීහ. එපවත් අසා රජ්ජුරුවෝ කැම්පීම් ආදිය හා වස්ත්‍රාලංකාරය හා සමග බිසවුන් නැව ඉඳුවා මධ්‍යම රාත්‍රියෙහි ගඟදියට හළහ. ඒ ගඟ දියෙහි යන්නාවු බිසවු යටිගඟ නැවුනැගී දියකෙළිනාවු පාවාරිය රජ්ජුරුවන් සමීපයට පැමිණියාහ. ඉක්බිති ඒ රජ්ජුරුවෙන්ගේ සෙනවිරද්දු දියෙහි එන්නාවු නැව දැක පළමුව නැව මාසන්තකයයි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ නැවෙහි තුබූ වස්තුවෙක් මා සන්තකයයි කීහ.

මෙසේ කථාකෙරෙමින් සිටියදී සමීපයට ඇවිත් වන් නැව උන් බිසවුන් දැක යකින්නකබඳු තෙපි කවුරුදැයි විචාළාහ. ඉක්බිති බිසවු සිනාසී බකරජ්ජුරුවන්ගේ අගමෙහෙසුන්වු පංචපාපිකා නම් මමයයි යනාදීන් ස්වප්නය දුටු තැන්පටන් සියළු කටයුතු පරිද්දෙන් රජ්ජුරුවන්ට කියව පළමුවම ඈ පාංචපාපීයයි ප්‍රසිද්ධහෙයින් මුන් බිසවුන් නියාවේදැයි අත අල්වාගෙන එවුහ.

අත ඇල්ලු ගමණ හා සමග ශරීරපහසෙහි රක්තව එරජද අගමෙහෙසුන් කොට අනික් ස්ත්‍රියක මූණ නොබලා දවස් යවන්නේම ඒ පංචපාපී තොම පාවාරිය රජහට ජීවිත සමානවුහ. බක රජ්ජුරුවෝ එපවත් අසා මහත්වු අභිමාන උපදවා ගෙන එරජහට අගමෙසුන් වූවිය. නොදෙම් සේනා රැස්කරවා ගෙණ පාවාරිය රජ්ජුරුවන්ගේ නුවර මෙගෙඩහ නුවරක් කරවාගෙන ඉඳ මාගේ බිරින්ද හෝ එවුවමැනව සටන් හෝ කළ මැනවැයි අසුන් දුන්හ. එපවත් අසා පාවාරිය රජද සටනට සැරසුණෝය. එපවත් දැක රජ්ජුරුවන් දෙදෙනා ගේ මන්ත්‍රීවරහු ඔවුනොවුන් හා කථාකරන්නාහු පළමු සස්වාමික හෙයින් මේ බිසව් බක රජ්ජුරුවන් සන්තකයෙහ. නැවිත් ලත්හෙයින් පාවාරිය රජ්ජුරුවන් සන්තකයහ ඒ කාරණය හේතුකොට ගෙන එකී එකී රජ්ජුරුකෙනෙකුන්ගේ ගෙයි සත් සත් දවස විසිය යුතුයයි රජ දරුවන් දෙදෙනාම සන්හිඳුවුහ.

ඇමැත්තවුන්ගේ වචනය අසා රජ දරුවන් දෙනො සමාධිව එතෙරමෙතර යන එනකල රජදරුවන් දෙනො මදහෙයින් ඔරුපදිනා මාලු කබර කොර කෙව්ලා හා සමඟ ගංමධ්‍යයට පැමිණිකල්හි පාපක්‍රියායෙහි යෙදින්නියයි මෙසේ කුණාල රජ්ජුරුවෝ එකල බකනම් රජව ඉපිද තමන් දුටු කාරණය ගෙනහැර දක්වා කීහ.

තවද පුණ්මුඛය යටගිය දවස බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන්ගේ පිංගියානි නම් අගමෙහෙසුන් බිසවු සීමැදුරුකවුළුව හැර බැලුවාහු මගුල් අස් ගොව්වා දැක රජ්ජුරුවන් නිදාපිකල්හි සිමැදුරුකවුළුයෙන් බැස ඌ හා සමග අනිචාරයෙහි යෙදී නැවත ප්‍රාසාදයට අවුත් සඳුන් සුවඳින් ඇඟලලා රජ්ජුරුවන් හා සමඟ සැතපෙන්නීය ඉක්බිති එක් දවසක් රජ්ජුරුවෝ සිතන්නාහු මධ්‍යමරාත්‍රියෙහි බිසවුන් ශරීරය සිතලය පරීක්ෂාකළයුතුයි සිතා එක් දවසක් නිදාපුකෙනෙකුන් පරිද්දෙන් ඇඟවුහ. එවිට සෙමෙන් නැගීසිට යන්නාවුන් දැක උන් හා කැටිවම ගොස් අස්සලයා හා සමග නොකටයුත්තෙහි යෙදෙන්නීය දැක නැවත අවුදින් යානට වැඩියහ. බිසවුද අවුත් සුළුයහන ඔත්හ. දෙවෙනි දවස් රජ්ජුරුවෝ අමාත්‍යමණ්ඩලයා මධ්‍යයෙහිම හොනාකටයුත්තක් ප්‍රකාශකොට ස්ත්‍රී ජාතිහු නම් මෙබඳු ගුණ ඇත්තෙහියයි කලකිරි ඇගේ වධ බන්ධනයට සුදුසු වරද ක්ෂමාකොට තනතුරෙන් පිරිහෙලා අනික්බිසවක අගමෙහෙසුන් කෙළේයයි මෙසේ ඒ කුණාල බෝධිසත්වයෝ බ්‍රහ්මදත්ත රජව තමන් දුටුකාරණය ගෙණහැර දක්වා අන්නතරවු නොයෙක් කාරණයෙන් ස්ත්‍රීන්ගේ නුගුණ කියන්නාහු සබඳ ලහුවස්තුවක් පිණිස ස්වාමිපුරුෂයන්ගේ ජීවිතාන්තය කරන්නාහු ප්‍රාණය සමානවු මහත්වු අනුකම්පා ඇති බොහෝ දවසක් පුරුදු පුරුෂයන් හැර ඉදින් අවකාශයක් ලදුනම් ඔහු මැඩපවත්නාහ. තවද වඳුරන් මෙන්ද සුලගින් සැලෙන අතුපතර මෙන්ද වහා පෙරලන්නාවු ගැල් සකක් මෙන්ද වහා පෙරලෙන සුළුවූ වඤ්ඤාසිත් ඇත්තාහ.

බොහෝ දෙනා බැස ස්නානය පාණයකරන්නාවු ගංතෙරක් මෙන්ද රා මණ්ඩලයක් මෙන්ද සන්තාගාරයක් මෙන්ද සියළු සත්වයන්ට සාධාරණයහ.

SANHIDA LANKA

කෙතෙක් දවස් පුරුදු උවද රජ දරුවන් සෙයින්ද සර්පයන් මතතුන් සෙයින්ද විසවාස නොකොටහැක්කැයි යනාදීන් කුණාල රජ්ජුරුවෝ සර්වඥ විලාශයෙන් අනෙකපර්යායෙන් තමන් දුටුවාවූද ලෝකයෙහි පැවත එන්නාවූද ස්ත්‍රීන්ගේ නුගුණ සංඛ්‍යාතවූ ධර්මදේශනා කළහ.

මෙසේ කී කල්හි එතැන්හි රැස්වූ මහජනයා වදාළයේ යහපතැයි යනාදීන් දොහොත් මුදුණෙහි බැඳ සියදහස් ගණන් සාධුකාරනාද පැවැත්වූහ.

එපවත් අසා එතැන්හි ඔබගේ අනදනම් ගිජුලිහිණි රජ්ජුරුවෝ කුණාල රජ්ජුරුවන්ගේ ආදිමධ්‍යය පරියෝසාන මනාකොට දෙසානාකළ ධර්මය අසා තවද තමන් දත් විතරත් සබඳ මේ සත්වලෝකයෙහි මේ කිසි සත්වයෙක් තමාගේ සත් බවද හේතුකොටගෙණ අනේකවිධ රත්නයෙන් පිරුණාවූ සතරමහා සාගරය කෙළවරකොට ඇත්තාවූ මේ පොලෝතලයෙහි රාජ්‍යශ්‍රීය යම් ස්ත්‍රියකට දුන්නේ විනම් ඔහු කෙරෙන් අවකාශයක් ලදහොත් එවැන්නවුන් ඉක්ම අතිකකු කරා ලැගෙන්නීය තවද කුමාර අවස්ථාවෙහි පටන් පුරුදුව ප්‍රියවූ ස්වාමිපුරුෂයන් කටයුත්තක් පිණිස ඉවත්වූ කල්හි ඔහු හැර අනිකක්හු ලැගීමක් ස්වභාවකොට ඇත්තාහ. තවද මේ ස්ත්‍රී මා කැමත්තිවද මා දුටුකල්හි මෙතෙක් දවස් නුඹ කෙරෙව්යොව උන්නෙමි යනාදින් සෙනහ අඟවා සමීපයෙහි සිට අඬන්නිද විනමුත් ස්ත්‍රීන්කෙරෙහි විශ්වාස නොකොට හැක්ක පලමු අතුට තිබු කෝල ඇතිරියද පළමු මිත්‍රයයි ගම් පහරණ සොරහුද අපට ඉසිරුදී සෙනෙහයෙන් රක්නාහුයයි රජ්ජුරුවන්ද බාලයෙහි පටන් පුරුදුවූද පුතුන් දසදෙනෙකු වදාගෙන උන් අඹුවෝයයිද විශ්වාසය නොකොට හැක්ක. තවද සෙරයඟ චපලය වකුවූ අදහස් ඇත්තාහ. කිසිත් අභිවෘද්ධි කාරණ කාරණයක් නොදන්නාහ. හැමවෙලෙහිම මිනිසුන් වංඤාකරණ සුළුය ඉදින් සැබෑවසක් කියත් නමුත් බොරු මුසුකොට මුත්නොකියන්නාහ. තණබිම් නොඑළු සරකට ඉදිරි ඉදිරියෙ තණ යහපත්සේ වැටහෙනහෙයින් සියක්යාල පමණ බිම පසුකොටකොට කෙළවර නොඑඇන වලක්නාසේ සබඳ මේ ස්ත්‍රී ජාතිහුත් හීනය උත්තමයයි යනාදීන්වූ සියළු සත්වයන් දැක මේ උතුම් මේ උතුමැයි වැටහෙනහෙයින් එක්කෙනෙකුන්සේ ලැගීමෙන් කෙළවර දැක මහරනහ යනාදීන් ගිජුලිහිණි රජ්ජුරුවෝ තමන්ගේ ඥානබලයෙන් දත් විවරක් ස්ත්‍රීන්ගේ නුගුණ දේශනාකළහ.

එසඳ නාරදනම් තපස්විහු තමන්ගේ නුවණ බලයෙන් ස්ත්‍රීන්ගේ නුගුණම දක්වන්නාහුය. යම්සේ දහසක් ගංගාවෙහි ජලය අනවරතයෙන් වදුත් නොපිරිහෙන්නාවූ සමුද්‍රය පරිද්දෙන් චතුර්වේදය අදාරත් රිසිනොයෙන්නාවූ බමුණන් මෙන්ද අනේකවිධ රත්නයෙන් උපසොභිතවූ සියලු පොළාව ජයගෙනත් පරතෙර පතන්නාවූ රජ දරුවන් මෙන්ද ස්ත්‍රීජාතිහුත් පුරාලිය නොහැකි සිත් ඇත්තාහ. එකී කල ස්ත්‍රයකට සෞරවිර්ය ඇති මහත්වූ කායබල හා ඥාන බල අර්ථබල තන්ත්‍රබල ආදී සියලු වස්තුකාම කෙලහකාමයන් අනුනකොට දිලින්ට සමර්ථවූ සැමියෝ අට අට දෙනෙක් ඇත්ත මුත් නවවැනිය සොර සැමියා පතන්නීය.

තවද චෞරක්‍රියා ඇති බොහෝ සිතිවිලි ඇති ස්ත්‍රීන්ගේ සැබෑගුණයක් නොලබහැකි හෙයිනුත් දියෙහි යන මසුන් මෙන් ස්වභාවය නොදන හැකි හෙයි නුත් තමන්ගේ වසඟත්වයට පැමිණියවුන් කෙලශ නමැති ගංගාවෙහි ගලා මරණ හෙයිනුත් මහත්වූ වඤ්චාදෙන්නාහෙයිනුත් බ්‍රහ්මචර්යාව විනාසකරණ හෙයිනුත් ස්ත්‍රීජාතින් දුරින් දුරුකළ යුතුය තවද යම්පුරුෂයකු කරා ප්‍රෙමයෙන් වේවයි ධනලෝභයෙන් වේවයි ලැගුනහොත් ගිණිපුපුරක් තිබු තෙනින් දාගෙණ නික්මුණාසේ කෙලෙස් නමැති ගින්නෙන් වහාම ඔහු දවන්නාහුයයි දැන නුවණැත්තෝ ඒකාරණයෙන් ස්ත්‍රීජාතිය දුරින් දුරුකරන්නාහුයයි යනාදීන් තමන් දත් විවරක් නුගුණ කීහ.

ඉක්බිති බෝධිසත්වයෝ නැවත වදාරණසේක් සබඳ යම් පණ්ඩිතවූ පුරුෂයෙක් සියුම් මුවහත් ඇති කඩුගත් සොරහුහාද මිනීකන රාක්ෂදුන් හාද උග්‍ර විසතේජස් ඇති සර්පයින් හාද කථාකරන්නේවිනමුත් ස්ත්‍රීන් හා මනාව කථා නොකරන්නේය.

තවද මහත්වූ තේජස් ඇති ස්ථානෝචිත ප්‍රඥා ඇති බොහෝ දෙනා විසින් සත්කාර සම්මාන ලබන්නාවූ ලෝකපුජවූ උත්තම පුරුෂයෙක් වී නමුදු ස්ත්‍රී වසඟවූයේ නම් රාහුමුවපත් සඳක්මෙන් නිෂ්ප්‍රභාවන්නේයයි වදාරා නැවත මේ ආදී නොයෙක් කාරණයෙන් ස්වර්ගමෝක්ෂ බාධවූ ස්ත්‍රීයකට නොපැමිණ හිරිඔතප් පිහිටුවා සත්පුරුෂධර්මයෙහි පිහිටි උත්තම පුරුෂතෙම ස්ත්‍රීවසඟනොව විසුයේ වී නම් සරාගී හිරුමෙන් ලොවබැලී සියලුදුක් නිවූ අතිසයෙන් සාන්තවූ නිවන්පුරයට වැද සැනහෙන්නේයයි කුනාල රජ්ජුරුවෝ සර්වඥතා ඥාණයෙන් පැහැර අමාමහනිවන් මිලකොට දේශනාව කුළුගෙනවදාළහ.

SANHIDA LANKA

එදවස් එකුන්දහසක් යොදුන් පර්වතයෙහි කින්නරාරහ සිද්ධවිද්‍යා ධරාදීහුද ආකාශ කුහරය පුරාසිටි සදෙවුලොව දෙවියෝද මහත්වූ සාධුකරා දී බෝධිසත්වයන්ට ස්තුතිකොට වැඳ සමුදුන්හ.

අනද නම් ගිජුලිහිණි රජ්ජුරුවෝ නාරද නම් බමුණු තවුසානෝද ඵුස්ස කොවුල් රජද තමතමන්ගේ පිරිවර හා සමග ස්වකීය ස්ථානවලට ගියාහ.

බෝධිසත්වයෝද තමන්ගේ පිරිවර හා සමඟ වාසස්ථනයට ගියහ. මෙසේ කුණාල නම් බෝධිසත්වයන්ගේ ත්‍රිවිධකල්‍යාණයෙන් උපලක්ෂිතව දේශනා කරණලද්දාවුද ධර්මයෙහි පැහැද යථොක්තවූ සියලු දෙව්මිනිස් පර්ෂිත් දිව්‍යලෝකයෙහිම උපන්නායි යනාදීන් බුදුහු ගාථාශතප්‍රතිමණ්ඩිතවූ මේ කුණාල දේශනාව ගෙනහැර දක්වා එදවස් වුස්සකොවුල් රජ නම් උදායි ස්ථවිරයද එකල්හි ගිජුලිහිණි රජ්ජුරුවෝ නම් මෙකල ආනන්ද ස්ථවිරයෝය. එකල නාරද ඍෂි මෙකල දක්ෂිණ ශ්‍රාවකවූ ශාරීපුත්‍ර ස්ථිවිරය. එදවස් මුඛවිලාශයෙන් ධර්මදේශනා කල කුණාල රජ්ජුරුවෝ නම් දැන් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි වදාර ජාතක දේශනාව කෙළවර එපන්සියයක් දෙනාවහන්සේ නිසෝසාකවූ සෝවාන් මාර්ගයෙහි පිහිටුවා ගෙන යන තමන් වහන්සේගේ ආනුභාවයෙන් වැඩි එපන් සියයක් දෙනාවහන්සේට ඉර්ද්ධි දේවාවදාරා අලුත පියාසර උගන්නාවූ ගුරුළු පැටවූ සමූහයන් පස්සෙහිලාගෙන ආකාසයෙහි නැවත මගා වනයට වැඩ වදාරා ඒ පන්සියයක් දෙනා වහන්සේට කර්මස්ථානාදී රහත්කොට රාජ අරහන්ත සමාගමයෙහි සතුටුවූ රැස්වූ දසසහශ්‍රී ලෝකධායෙහි දෙවියන්ට ආවික්ඛස්සාමි භික්ඛවේ දේවකයානං නාමැනි යනාදිවශයෙන් මහා සමය දේශනාව වදාළසේකි.

SANHIDA LANKA

# සුතසෝම ජාතකය

තවද දීපංකර පාදමුලයෙහි අත්පත් නිවන් හැර සත්වකරුණාවෙන් සසරට වැද ගින්නෙහි පැසී මිහිරිවූ කිරියොදයක් සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි සසර නමැති ගින්නෙන් පැසී සර්වඥ නමැති අමායොදය ඉදි මිහිරිවූ අල්පභක්‍ෂනිරුදක චොරඅමනුෂ්‍යාදී සංකතරින් සාර්ථක වාහකයෙක් යම්සේ සතුන් එතෙරකරේද එමෙන් ජාති ජරා ව්‍යාධි මරණ සංඛ්‍යාත සසරමහකතරින් සත්වයන් ගොඩලා නිවන්කැමති පටුන්ගමට පමුණුවන්නාවූ බුදුහු එක්සමයෙක්හි දෙව්රම්වෙහෙර වැඩවසනසේක්. අඟුල්මල් තෙරුන් අරභයා මේ ජාතකය දේශනා කළසේක.

ඒ අඟුල්මල් තෙරුන් වහන්සේගේ උත්පත්තියද මහණවිමද අඟුලිමාල සූත්‍රයෙහි වදාළ ක්‍රමයෙන් දතයුතු. උන් වහන්සේ වනාහී සත්‍යක්‍රියාබලයෙන් ස්ත්‍රියගේ දරුගැබ සුවපත්කොට එතැන්පටන් සුලභව ලබන ආහාරයන් ඇතිසේක් විවේකිව විදර්ශනා වඩා රහත්ව අසීතමහාශ්‍රවකයන් වහන්සේට ඇතුලත්වූසේක. එකල්හි ධර්මසභාවෙහි වැඩහුන් භික්ෂූන් වහන්සේලා ඔවුනොවුන් හා කථාකරණසේක් ඇවැත්නී අඟුල්මලයන් වැනි හැමවෙලෙහිම ලේවැකුණු දත් ඇතිව ඉතා දරුණුවූ සොරක්හු පවා අදණ්ඩයෙන් අශ්‍රසත්‍රයෙන් දමනෙලා වදාළසේක. ලොවුතුරා බුදුන්ගේ ගුණයෙන් ඉතා ආශ්චර්ය සේයයි බුදුන්ගේ ගුණ වර්ණනාකොට ධම්සභා මණ්ඩපයෙහි වැඩහුන්සේක.

බුදුහූ ශ්‍රී ගන්ධ කුටියෙහි වැඩහුන්සේක් ධම්සභාමණ්ඩපයෙහි පැවතී කථාව දිවකබින් අසා වදාරා අනොපමේයයවූ බුද්ධිවිලාසයෙන් ධම්සභාවට වැඩ පනවන ලද උතුම්වූ බුද්ධාසන මස්තකයෙහි පලක්බැඳ වැඩ හිඳ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි වදාරා භික්ෂූන් වහන්සේ විසින් ස්වාමිනි නුඹ වහන්සේ නොකියන්ට වදාළ දෙතිස්කථාවන් අතුරෙන් එක් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. ඉතා තදවූ එරුෂවූ අඟුලිමාලයන් නිරායාසයෙන් මහණකොට උන්ගේ ගුණය ඉරසඳසේ ලෝකප්‍රසිද්ධකොට වදාළ පරිදි කිය කියා උන්මිහයි දන්වූ කල්හි මහණෙනි උතුම්වූ සම්‍යක් සම්බෝධියට පැමිණි අවස්ථාවෙහි මුන් දමනේලීම ආශ්චර්යයෙයි සිතව්ද පෙර මේ සර්වඥතාඥානය පිණිස සසර ඇවිදිනේම් ලෞකික ඥානයෙහි සිට මොහු ඉක්ම වුයෙම්වේදැයි සර්වඥප්‍රවාරණයෙන් පවරා නොබැණ වැඩ උන්කල්හි ඒ අතීත කාලයෙහි වර්තීවූ ධර්මදේශනා ශ්‍රවණයෙහි කෞතුහල සිත් ඇති ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිතවූ බුදුහු හිමගර්භයක් පලා චන්ද්‍රමාණික්‍යයක් ගෙනහැර දක්වන්නාවූ කලක් පරිද්දෙන් ඉකුත්වත් කථාව ගෙනහැර දක්වනසේක් මහණෙනි,

යටගිය දවස කුරුරට ඉදිපත් නුවර කොරව්‍ය නම් රජ්ජුරුකෙණෙකුන් දුන ප්‍රියවදන අර්ථචරියාව සමානාත්මතාවයයි දක්වන ලද සතරසංග්‍රහ වස්තුවෙන් සත්වයන් සිත්ගෙන රාජ්‍යය අනුශාසනා කරන්නාහුය. එකල පුරණ ලද පාරමිතා ධර්මයන් ඇති අප මහා බෝසතානෝ එරජුහුගේ අගමෙහෙසුන් බිසව බඩ පිළිසිඳ උපන්හ. වේදත්‍රය හා ලොකස්මයාන්තරයෙන් ඇසීමෙහි සතුටු සිත් ඇති හෙයින් සුතසෝම කුමාරයෝයි නම් තුබූහ.

ඉක්බිති සුතසෝම කුමාරයන් සිල් උගන්නා සඳහා තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට පත්කුඩයක්ද වහන්සඟලක්ද මසුරන් දහසක්ද දී යවූහ. ඒ කුමාරද තක්ෂලා නුවරට යන මගට පිළිපන්හ. එසමයෙහි බරණැස කසීරජ්ජුරුවන්ගේ පුත්වූ බ්‍රහ්මදත්ත කුමාරයෝද පියරජ්ජුරුවන් විසින් සිල්ප උගන්නා පිණිස යවන ලදු එම මගට පිළිපන්හ.

එකල්හි සුතසෝම කුමාරයෝ සියක් යොදුන් මගගෙවාගොස් තක්සලා නුවර වාසල් දොර ශාලාවෙක්හි සැතපී උන්හ. බ්‍රහ්මදත්ත කුමාරයෝද ගොස් සුතසෝම කුමාරයන් හා සමඟ එක් අස්නෙහි උන්හ ඉක්බිති සුතසෝම කුමාර සබඳ මග මිරිකුණෙහි කොයිසිට අවුදැයි පිළිසඳර කථාකළහ. එසඳ බරණැස් නුවර සිට ආමි කීහෙයින් තෙපි කාගේ දරුකෙනෙක්දැයි විචාරා කසීරජහු පුත් බ්‍රහ්මදත්ත කුමාරයෝයයි කී කල්හි කවර කාරණයෙන් අවුදැයි විචාරා ශිල්ප උගන්නා සඳහායයි කියා නැවත බ්‍රහ්මදත්ත කුමාරයෝත් සුතසෝම කුමාරයන්ගේ පවත් විචාරා දැන අපි දෙදෙන රාජ කුමාරම්හයි මිත්‍රසෙනෙහ උපදවා ගෙන එක ආචාරීවරකෙනෙකුන් සමීපයෙහි සිල්ප උගනුම්හයි සනිටුහන් කොට ඇතුළු නුවරට වැද දිසාපාමොක් ආචාරීන් කරා එළඹ ආචාරීන් වැඳ තමන්ගේ ජාතිය හඟවා සිල්ප උගන්නා පිණිස ආබව කීහ. ඒ බව අසා ආචාරීනුත් යහපතැයි ගිවිස්සකල්හි ආචාරීන්ට දුනමනා වස්තුභාගය දී සිල්ප උගන්ට පටන් ගත්හ.

තවද එම මතුනොවෙයි ඒ දඹදිව එකසියයක් රාජධානියෙහි රජදරුවන්ගේ අනිකුත් රාජකුමාරවරහු එම ආචාරීන් කෙරෙහි සිල්පඋන්නාහ. ඒ එක්සියයයක් රාජ කුමාරවරහු එම ආචාරීන් කෙරෙහි සිල්පඋගන්නාහ. ඒ එක්සියයක් රාජ කුමාරවරුන් කෙරෙහි සුතසෝම කුමාරයෝ නොබෝදවසකින්ම සිල්ප ඉගෙන නිමවා

SANHIDA LANKA

තුමු පෘෂ්ඨආචාරිව නැවත තමන්ගේ අති මිත්‍රවූ බ්‍රහ්මදත්ත කුමාරයන්ට වහා සිල්ප ඉගැන්වූහ. අවසේෂවූ කුමාරවරුනුත් ක්‍රමයෙන් උගන්වා නිමවූහ. මෙසේ ඒ එක්සියයක් රාජ කුමාරවරුහු අදළතැන් වන පොතක්කොටදී ආචාරීන් වැඳ සමුගෙන සුතසෝම කුමාරයන් පිරිවරා නික්මුනාහ. ඉක්බිති සුතසෝම කුමාරයෝ උන් උන් රටට යන්නාහු මංසන්ධිවලදී සිට කුමාරවරුන්ට අවවාදකරන්නාහු තොපි හැම තොප තොපගේ රාජ්‍යයෙහි පිහිටිකල සාරපෝයෙ පෙහෙව පොහෝ දවස් ප්‍රාණවධ ආදීය නොකොට සතර සංග්‍රහ වස්තුයෙන් වියෝනොව රජකරවයි අවවාද දුන්හ. එක්සියයක් රාජ කුමාරවරුහම් යහපත ආචාරීන් වහන්සැයි මුදුනෙන් පිළිගත්හ. බෝධිසත්වයෝ ද අංගලක්ෂණ දන්මෙහි දක්ෂහෙයින් මතු බරණැස් කුමාරයන් පිණිස දඹ දිවට හියෙක් උපදනේයයි දන උන් උදෙසාම ඒ ඒ රාජ කුමාරවරුන්ට අනුශාසනා කොට යවුසේකැයි දත යුතු

එකල එක්සියයක් රාජ කුමාරවරහු තම තමන්ගේ රටට ගොස් පියරජදරුවන්ට සිල්පදක්වා රාජ්‍යයෙහි පිහිටා තමන්ට කල අවවාදයෙහි පිහිටා රාජ්‍ය කරණ බවද දක්වා පඬුරු හා සමග සුතසෝම රජ්ජුරුවන්ට සන්දේශ යවූහ.

බෝධිසත්වයන් වහන්සේද වැලිත් අපගේ අවවාදයෙහි ප්‍රමාදනොවවයි නැවත රජ දරුවන්ට කියායවන සේක.

ඉන් බෝධිසත්වයන්ගේ අති විස්වාසීවූ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මස් නැතිව බත් අනුභවකරන්නාහ. පොහෝ දවසට පළමුදවස්ම මස් ගෙනවුත් මුළු තැන්ගෙයි තමන්නාහ. ඉක්බිති එක් දවසක් පොහෝ දවස මෙහෙවඩන්ටයයි ඇර තිබූ මස් අරක්කැමියාගේ ප්‍රමාදයෙන් රජගෙයි වඩනා බල්ලා කාපිහ. අරක්කැමි මස් නොදක කම්පාව රන්මිටක්ගෙන අඟානි මුළුල්ලෙහි ඇවිදිනේ මස් නොලදිනි මස් මාළු නැතිව බස් මේවැඩිම් මාගේ ජීවිතය නැත කුමකින් කුමක් කෙරෙම්දෝහෝයි සිතන්න් උපදේශයක් ඇතැයි පස්වරු අමුසොහොනට පලාගොස් ඇසිල්ලක මියගිය මිනිසක්හුගේ කලවයෙහි මස් ලියාගෙන යහපත්කොට පියරජ්ජුරුවන්ට මෙහෙවඩිය රජ්ජුරුවෝද මස් බිත්තක් ගෙන දිවුඅග තිබූ කල්හි සත් දහසක් නහර ඉල්ප සියලු ශරීරය පිණවා ගියේය. ඊට කාරණා කවරේද යත් ඒ රජ්ජුරුවෝ වනාහී අනතුරු අත්බව යක්ෂව ඉපිද බොහෝ මනුෂ්‍යමංස අනුභවකළාහුය. මෙසේ පූර්වජාතිය කරණ ලද මාංශ භක්ෂණය හේතුකොටගෙණ එරහට මිනිමස් ප්‍රියවිය. ඉක්බිති ඒ රජ්ජුරුවෝ මුවෙන් නොබැණ මේ අනුභවකලෙන්නම් මේ මස් වූ පරිදි මට නොකියන්නාක් සිතා කෙළ හා සමඟ කාරා බිමට දැමූහ. ඉක්බිති අරක් කැමියා විසින් මහරජ නිර්දෝශය සැකනොවි මේ නිමවා වදාළමැනවැයි කී කල්හි රජ්ජුරුවෝ සමීපයෙහි සිටි මිනිසුන් ඉවත්කොට මේ මස් යහපත් බව දනිමි. මේ මස් කෙසේවූ මසෙක්දැයි විචාළාහ. ඉක්බිති අරක්කැමියා කියන්නේ ස්වාමිනි ඊයේ දවස මේ වැඩු මසේ මසමයයි කීහ. එසේ මෙතෙක් දවස් මෙබඳු රසයෙක් නැතැයි විචාළාහ. මහරජ අද යහපත්කොට පිසුහෙයින් රස වැඩියයි කීහ. එපවත් අසා රජ්ජුරුවෝ පෙරත් මෙමලෙසම නොවෙද තා පිසන්නේයයි ස්වාභාවය නොකිය වී නම් දන් තාගේ ජීවිතය නැතැයි කීහ. ඉක්බිති අරක් කැමි අභය ඉල්වාගෙන තත්වූ පරිද්දෙන් නොවලහා කිහ. එසඳ රජ්ජුරුවෝ කාටත් නොකියවයි පළමු පිසන මස් අනුභවකොට නිරන්තරයෙන් මිනි මස් පිස මේවඩවයි කීහ.

මහරජ නොලැබහැක්කැයි කීය. රජව සිටි අපට ලැබීම ආයාසය කිම්දැයි කියා සිරගෙවල් සතරෙහි බොහෝ සත්වයෝ ඇත. දවස ඉන් එන්ක්හුමරා මස් ගනැයි කීය. එද එතැන්පටන්  ඉන් එකකු නිසායෙන් මරා මේ වඩන්නෝය.

මෙසේ කල්යාමකින් සිරගෙයි මනුෂ්‍යයන් නිමාගියකල්හි ඉනිබ කළමනා කවරේදැයි විචාළේය. අතරමග දහසින් බැඳ පියලිඑලා යමෙක් ඇරගත් නම් ඔහු සොරයයි කියා අල්වාගෙන මරාලවයි කියා මෙසේ කල්යාමක් ගිය කල්හි දහසින් බැඳි පියලි අල්වන කෙනෙකුන් නැතිහෙයින් තවද කලමනා කිම්දැයි විචාළේය.

සවස ධුරය කරණ වෙලාවට නුවර අකුල්වා තිබෙන්නේය. ඒ වෙලාව කොවේ මාවේ ආදියෙහි සැඟවිසිට මිනිසුන් මරා මස් ගෙනැයි කීහ. එසඳ යහපතැයි ගිවිස සන්ධිවල සැඟවි සිට මිනිසුන් මරාලවයි කීය. ඝනවතුමු මස්පිඩු ලියාගෙන ඇටසැකිල්ල දමාපියා යන්නේය. ඒ ඒ තැන්හි දමාපියා තිබෙන්නාවූ ශරීරයන් දැක දන් මාගේ මැනියන් දුටිමි. පියානන් දුටිමි මලනුවන් දුටිමි බෑනන් නැගනියන් බූනනියන් දුටිමි එක්වන් මනුෂ්‍යයන් අඬන අඬින් නුවරපැලීයන්නාක් මෙන් නුවර වැස්සෝ හයින් තැතිගෙන අනේ මනුෂ්‍යයන් සිංහයන්ගෙන කාදෝ ව්‍යාඝ්‍රයෙක් අනුභවකෙරේදෝහෝ යක්‍ෂයෙක් අල්වාගෙන කාදෝහෝයි මිනි වටින් පිටින් පෙරළා බලන්නාවූ ඇනකොටා ප්‍රහාර මුබදක්නාහු මේ මිනිසුන් මනුෂ්‍යයෙක් මරාකන්නේයයි දන බොහෝ නුවරවාසීහු රාජංගනයෙහි රැස්ව මුරගෑහ. රජ්ජුරුවෝ කිමෙක්දැයි විචාරා මහරජ මෙනුවර මිනී මස් අනුභවකරන්නාවූ සොරෙක් ඇත. වගා පරීක්ෂාකරවා ඇල්ලුවමැනවයි කී කල්හි කිමෙක්ද මම කෙසේ නුවර පරීක්‍ෂාකොට ඇවිදිම්දැයි කියා නොලැබුනු කල්හි ඉක්බිති නුවර වසීහු රජ්ජුරුවෝ නුවර පරීක්‍ෂාවෙහි

SANHIDA LANKA

අපේක්ෂාවෙක් නැත්තේයි කාලහස්ති නම් සෙනවි රජුන් කරා ගොස් ස්වාමිනි මෙනුවර නොකටයුත්තෙක් පහළවිය. වහා සොරුන් පරීක්ෂාකොට ඇල්ලුව මැනවැයි කීහ. ඉක්බිති සෙනවිරදු එපවත් අසා කම්පාව සත්දවසින් මත්තෙහි සොරහු අල්වාදිලම් අස්වසා යවා තමන්ගේ අනුචරයන් ලඟට කැඳවා එපවත් කියා තෙපි හැම ඒ ඒ ස්ථානයෙහි සැඟවිසිට සොරහු අල්වාදීලවයි තන්හි තන්හි රැකවල්ලැවුහ. එතැන්පටන් සෙනවිරදුන්ගේ යෝදයෝ ඒ ඒ ස්ථානයෙහි සැඟවිසිට රාත්‍රියෙහි දිවාභාගයෙහි අප්‍රමාදව පරීක්ෂාකරන්ට පටන් ගත්හ. එකල්හි අරක්කැමි එක් විපීකොටසක්හි සැඟවි සිටගෙන එක් ස්ත්‍රියක කඩුයෙන් පැහැර එලාසණමස් ලියා පැස්පෙට්ටියේ පුරන්ට පටන්ගත. ඉක්බිති රැකවල සිටියාවු පුරුෂයෝ දැක අල්වාගෙන පිටතල හයා බැඳ මිනි මරන්නාවු සොරවු අල්වාගතිම්හයි මුරගාලුකල්හි ජනයෝ රැස්ව සොරහු අතින් පයින් පැහැර මස් පැස බොටුයෙහි බැඳ මර මරාගෙනගොස් සෙනෙවි රදුන්ට පාවාදුන්හ. ඉක්බිති කාලහස්ති නම් සෙනවිරදු අරක්කැමියා ඇඳින කම්පාව කර්මකලමුග්ධය ස්ත්‍රීපුරුෂයෙන් මරන්නාවු තෝ මේ මනුෂ්‍යමාංසය අනුභවකෙරෙයිද නොයෙක් නිකුත්මස් හා මිශ්‍රකොට වස්තු උපදවයිද නැත. අනික්කෙනෙකුන්ගේ වචනයෙන් මරා අනේපිනැත්තව බෙඳුවු දරුනු ක්‍රියාවක් කුමක් සඳහා කෙරේදැයි විචාළාහ.

ඉක්බිති අරක්කැමිතෙම තත්වුපරිද්දෙන් කියන්නේ සාමිනි මරන්නාවු මම මා අනුභවකරණ පිණිස මරන්නේමුත් නොවෙයි මිත්‍ර පුත්‍රකාලත්‍රාදීවු  බන්ධු පෝෂණය පිණිස මරන්නේමුත් නොවෙමි. වැලිකුමක් පිණිසදයත් ජගත්පාළවු නුඹ වහන්සේගේ මේ රජ්ජුරුවෝ මිනිමස් අනුභව කරන්නාහුය. උන්ගේ කිමෙන් මරමියි කීයේය.

එපවත් අසා සෙනෙවිරද්දු මොහු විසින් මේ වචනය සැබෑ කියේදෝහෝයි නොහොත් මරණ භයින් බොරුකියාදෝහෝයි විමසනු පිණිස වන්නාට ඉඳින් අරක්කැමියාට තෝ භක්තිස්වාමිහු රජ්ජුරුවන්ගේ මෙහෙවරින් මිනිමරන්නෙහි වි නම් සෙට උදාසනක්සේම අන්තඃපුරයට ගෙනගොස් රජ්ජුරුවන් සම්මුඛයෙහි ලා විචාළකල්හි එපවත් අසා අරක්කැමිතෙම සෙනෙවිරත්තී නුඹ වහන්සේට වඩ වඩා අභිවෘද්ධියෙක් වේවයි ඉඳින් සැබැවටම නුඹවහන්සේ උදෑසන රජ්ජුරුවන් කරා ගියසේක් වි නම් තත්වු පරිද්දෙන්ම කියාලමියි කීයේය.

ඉක්බිත්තෙන් සෙනවිරද්දු උගේ අභීත වචනය අසා බැඳුමෙන්ම රාත්‍රීයෙහි වැදහොවා පහන්වු කල්හි අමාත්‍යවරුන් හා ද නුවර වැස්සන් හා ද කථා කොට ඇමදෙනාම, එකවචනයෙහි පිහිටිකල්හි නුවර සිසාරා රැකවල් ලවා නුවර තමන් හස්තප්‍රාතකොට අරක්කැමියාගේ බොටුවෙහි මස්පැස බැඳවාලා අල්වාගෙණ මර මරා රජගෙට බලගෙනයන්ට පටන්ගත්හ. සියලුනුවරවාසීහු මහ හඬින් හඬාගෙන මහවතුරක් මැඩගෙන නික්මෙන කලක් පරිද්දෙන් කැටිවම වැටුනාහ.

රජ්ජුරුවෝද ඊයේදවස පෙරවරු මේ නිමවුනම් රැසයින් වැදහෙව අරක්කැමි දැන් ඒදෝ දැන් ඒදෝහෝයි උන් එලමඉඳම රාත්‍රිය යවා පහන්ව ගිය කල්හි ඔහු නොඑනහෙයින් කාරණාකවරේදෝහෝයි සීමැදුරු කවුලුව හැර බලන්නාවු නුවර වැස්සන්ගේ මහත්වු කෝලාහලයද ඔහු බැඳලාගෙනන නියාවදැක මෙතෙක්දවස් අපකළ නොකටයුත්ත ප්‍රකාශව ගිය නියාවේදැයි භව පත්ව නැවත රාජධෛර්ය උපදවාගෙන රාජසන මස්තකයෙ ගොසින් උන්හ.

එකල්හි සෙනෙවිරජු රජ කරා එළඹ කියන්නාහු මහරජ නුඹ වහන්සේ අරක්කැමියා යවා ස්ත්‍රි පුරුෂයන් මරා මස් ගෙන්වා කන්නේ සැබෑදැයි විචාළාහ.

ඉක්බිති මහත්වු තේජස් ඇති සෙනවිරදුන් විචාළ වචන සඟවා කියනොහි සැබෑය සෙනවිරත්නි මා කීවාකළ තැනැත්තහු අල්වාගෙන හාස කරන්ට කාරණා කවරේදැයි තොපි සැපත්වුවොතින් සොරකුනොවේද අල්වාපුව මැනවැයි භයගන්වා කීය. එපවත් අසා සෙනෙවිරද්දු රජ තමාගේ මුඛයෙන්ම නොහඟවා කීය. මොහුගේ සගය ක්‍රියාව ඉතා ආශ්චර්ය මොහු වලකා අවවාදයක් ගෙනහැර දක්වමියි මහරජ නොකළහැක්ක මිනි මස් කෑමෙන් වැලකුවමැනවැයි කීහ.

ඉක්බිති රජ්ජුරුවෝ සෙනෙවිරත්නි කුමක් කියවුදැයි මින් මට වැලැක්ක නොහෙමියි කීහ.

SANHIDA LANKA

එකල්හි සෙනෙවිරද්දු එසේවිනම් මහරජ නුඹ වහන්සේගේ රාජ්‍යයේනුත් ජිවිතයෙනුත් නොවනසේකැයි කීහ.

එසේවත් මිනිමස් කෑහෙමි වැලැක්කනොහෙමි කීහ. එපවත් අසා සෙනෙවිරද්දු රජ්ජුරුවන් සන්හිඳුවාගත නොහැක්කැයි සිතා කථාවක් ගෙණහැර දක්වන්නාහු.

මහරජ යටගිය දවස මහසමුද්‍රයෙහි මහාමත්ස්‍යයෝ සදෙනෙක්වුහ. උන් අතුරෙන් ආනන්දය නිම්නදය

අජකධාරෝහය යන මස්සු තුන්දෙන පන්සියයක් පන්සියයක් යොදුන් දිග ඇත්තාහ. තිමිය තිමිංගලය තිමිරපිංගලයයි යන මස්සු තුන්දෙනා දාසක් දාසක් යොදුන් දිග ඇත්තාහ.

මෙම මස්සු පහනසෙවලම ගොදුරුකොට ඇත්තාහ. මොවුන් අතුරෙන් පන්සියයක් යොදුන් දිග ඇති ආනන්ද නම් මත්ස්‍යරජතෙම සමුද්‍රයෙහි එක් කන්නෙකවෙසෙයි ඔහු දක්නා පිණිස බොහෝ මත්ස්‍යයෝ එක්වන්නාහුය.

එක් දවසක් ඒ මත්ස්‍යජාතිහු එක්ව කථාකරන්නාහු මේ සත්වලෝකයෙහි සියලු දීපද චතුස්පද ජාතින්ට රජ දරුවෝයයි කියා නැත්තාහ. මිට පළමු අපට රජදරුකෙනෙක් ඇත්තාහ. අපිදු අපට රජ්ජුරුකෙනෙකුන් ඇතිකොට වසම්හ. ඇමදෙන එක් අදහස්ව ආනන්දනම් මත්ස්‍යයා රජ කළහ. එතැන්පටන් ගෙන සවස උදෑසන මත්ස්‍යජාතීහු ඕහට උපස්ථානයට එන්නාහ.

ඉක්බිති එක් දවසක් ආනන්ද නම් මත්ස්‍යරජතෙම පර්වතයෙහි ගල්සෙවෙල් අනුභවකරන්නේ සෙවෙල් කඳයයි යන සංඥාවෙන් නොදැකම කුඩා මස්සකු සපාපිහ. එක්ෂණයෙහි ඔහුගේ ශරීරය පිණාගියේය. එක මගේ මේ මධුර රසයකැයි පරීක්ෂාකළමැනවයි සිතා මුඛයෙන් පිටත්කොට බලන්නේ මස්කඩ දැක මම මෙතක්කල් නොදැන මේ නිසා රසයක් අනුභව නොකොළෙම් මෙතැන්පටන්ගෙන සවස උදෑසන මසුන් මට උපස්ථානකොට ආකල එක් මසෙකු දෙමසෙකු අප්‍රකාසව අනුභවකෙරෙමින් පසුව ප්‍රකාශව අනුභව කරන්ට පටන්ගත්තෙම් වින්නම් එක්කෙනෙකුත් මා කරා නොඑළඹ සැඟවී පලායන්නාහුයයි සනිටුහන්කොට දවස්පතාම මතස්‍ය සමූහයාත් තමන් සමීපයට නික්මෙන අත්පස්සෙහි යන මසුන්ගෙන් කීපදෙනෙකු අල්වාගෙන කාපියන්නේය. මෙසේ කල්යාමකින් මත්ස්‍ය සමූහයෝ අඩුවත් අඩුවත් සිතන්නාහු මෙසේ භය අපගේ බන්ධු වර්ගයාට කෙසේ උපන්දෝහෝයි මන්ත්‍රනය කරන්නේ ඔවුන් අතුරෙන් එක් නුවනැති මසෙක් නිමා විචාරණ ප්‍රඥාවෙහි දක්ෂහෙයින් ආනන්ද නම් මත්ස්‍යරජුගේ කටයුත්ත මට අභිප්‍රාය නොවෙයි පරීක්ෂාකළ මැනවැයි සිතා එක් දවසක් මසුන් උපස්ථානයට ගිය කල්හි තෙමේ මස් රජහුගේ කන්පතමුවාවෙහි සැඟවිගෙන සිටියේය. එකල්හි ආනන්දනම් මස්තෙම මසුන් නික්මවා පස්සෙහි යන්නවුන් අල්වාගෙන කෑය ඒ කාරණය සැඟවී සිටි මසා දැක තෙස්සවුන්ට ගොස් කීය. සියලු මස්සු භයින් තැතිගෙන එදවස් පටන් උන්කරා එනගමනක් නොකොට ගිය ගිය අත පලාගියාහුය.

ඒ අනද නම් මස්රජතෙම එතැන්පටන් මස්රස ලෝභයෙන් අනික් ගොදුරක් අනුභව නොකරන්නේය. සයින් පීඩාව වෙහෙස විසිමින් මත්ස්‍ය සමූහයා හා හැර කොයි පලාගියෝදෝහෝයි ඒ ඒ තැන බලා ඇවිදිනේ මැද මුද පර්වතයක් දැක ඒ මච්ඡයො මා කෙරෙහි කළ භයින් මේ පර්වතය නිසා වෙසෙද්දෝහෝයි සිතම්. පර්වතය පරික්ෂාකොට බලම්යි සිතා වාලාධියෙන් හා ඉසින් පර්වතය වටාගත් කල්හි අනික් දිසාවෙන් වටකොටගෙන අවුදින් ඉස කෙරෙම පැමිණියාවූ තමාගේ වලධිය දැක මේ මසෙකැයි යන සංඥාවෙන් මෙතෙම මා වංචාකොට පර්වතය ආශ්‍රය කොට විසි නියාවේදැයි කිපී කිරිකිරියේ කන තැනැත්තේ පනස්යොදුන් තැන් අල්වාගෙන සපාකාපීය.

ඉක්බිති බලවත්වූ දුක්ඛවේදනා උපන සියළු මුහුද ලේ මුහුදක්සේව ගියේය. රුධිරගන්ධයෙන් සියළු මත්ස්‍ය සමූහයෝ ඇදකන්ට පටන්ගත්තාහු ඉසදක්වා කා නිමවාපුය. එද මහත්වූ ශරීරහෙයින් වැලකිය නුහුණුයේය. එතැන්හිම ජිවිතක්ෂයට පැමිණියේය. පර්වතයක් පරිද්දෙන් මහත්වූ ඇටගොඩ විය. ආකාශයෙහි යන්නාවූ තපස්විවරහු දැක මෙම ලෙස මළාවූ මත්ස්‍යයාගේ ඇටගොඩයයිද මනුෂ්‍යයන් අතුරෙන් ප්‍රසිද්ධ කල මහරජ සියළු ජම්බුද්විපවාසීහුද ආනන්ද නම් මස් රජතෙම ස්වකීය මාංශ තෘෂ්ණාවෙහි බැඳී මච්ඡය පාර්ෂිද ක්‍ෂයව ගිය කල්හි තෙමේ තමා ඇගමස් කා මිලේයයි දක්ණාහුය.

එසේහෙයින් මහරජ ඒ ආනන්ද නම් මත්ස්‍යයා පරිද්දෙන් රස තෘෂ්ණාවෙහි බැඳුනාවූ අඥාන සත්වතෙම එනදවස තමාට වන්නාවූ අනභිවෘද්ධිය දැන ගත නොගී තෘෂ්ණාවසඟව පුත්‍රදාරාදී බන්ධුවර්ගයා කෙරේද අද තමාට පැමිණියාවූ මහා යසශ්‍රියෙන්ද පිරිහී මහත් විනාශයට පැමිණෙන්නාහුය. එබැවින් මහරජ මේ කාරණය අසා දැන මිනිමස් අනුභවකිරීමෙන් වැලකුණු මැනව ඉදින් නොවලක්නාසේක් විනම් ආනන්ද නම් මත්ස්‍යයා පරිද්දෙන්ම රාජ්‍ය සම්පත්තීන්ද පිරිහෙන්නේයයි යනාදින් උදාහරණ ගෙණහැර දක්වා අවවාද කීහ.

SANHIDA LANKA

එපවත් අසා රජ්ජුරුවෝ කළාහසති නම් සෙනෙවිරත්නි උපමාදන්නෝ තොපිම නොවෙයි මමත් දනිම්යි කියා තමන් මිනිමස් කෑමෙහි ලොල් බැවින් වැලැක්කනොහි සෙනවිරදුන් ගිවිස්වන පිණිස උදාහරණයක් ගෙණහැර දක්වන්නාහු සෙනෙවිරත්නි යටගිය සවස සුජාත නම් කෙළෙඹිපුත්‍රයෙක් මහත්වූ සම්පත්තීන් ආඪ්‍යය එතෙම ලුණු ඇඹුල් සෙවුන පිණිස හිමාලය වනයෙන් වැඩි පන්සියයක් තපස්විවරයන් තමන්ගේ උයනෙහි වස්වා උපස්ථාන කරන්නේය. ඔහුගේ ගෙයි නිරන්තරව පනවන ලද අසුන් හා දන්සැපවුවනම් තිබෙන්නේය.

එතකුදුවත් ඒ තපස්විවරහු කිසිදවසක බොහෝදෙනාට කුසලානු ග්‍රහ පිණිස දනව් සැරිසරා සිඟාවඩිති සමහර දවසෙක අකාශයෙන් හිමාල වනයට ගොස් දඹදිවට සලකුණුවු සියක්යොදුන් ඇති මහදඹගසින් මහදඹ ඵල ගෙනවුත් වළඳන්නහුය. මෙසේ එක් දවසක් තපස්විවරයන් දඹ ගෙණවුත් වළඳන කල්හි සුජාතනම් සිටුදරු ස්වාමිදුරුවන් මාගේ ගෙට නොවඩනේ තුන් සතර දවසෙක කොයි වැඩිසේක්දෝහෝයි සිතා කෙල ඇවිදිනාවු පුතු  දක ඇඟිල්ල අල්වාගෙන ආරාමයට ගියේය. එකල්හි වැඩිමාළු තපස්වරුන් කට සෝදන්ට පැන්දී බලා තාපසයෝද දඹ අනුභව කරමින් උන්හ. සුජාත නම් කෙළඹිපුත්‍රයාද තාපසවරුන් දක වැඳ එකත්පස්වහිඳ ස්වාමිනි වළදන්නේ කුමක්දැයි විචාළේය. ඇවැත්නි දඹයයි කීය. එපවත් අසා බාල කුමාරතෙම දඹකම් ඇවිටිලිගත. ඉක්බිති වැඩිමාළු තාපසයෝ සුගක් ඕහට දුන්හ. ඒ අනු භවකොට උතුම්වු රසතෘෂ්ණාවෙහි බැඳී දඹ දෙව දඹ මටදෙවයි ඉල්ලන්ට පටන්ගත. කෙළෙඹිපුත්‍රතෙම බණ අසමින් උන්නේය. පුත නොහඬව ගෙට ගීයකල දිලියහැකැයි පුතු නලවා තපස්විවරුන්වැඳ අවකාශ ඉල්වාගෙන ගෙට ගියේය. ඒ දරුද ගියවේලෙහි පටන්ගෙන දඹ පිණිස මොරගානේය. සෘෂි වරුද බොහෝ දවසක් මනුෂ්‍යපථයෙහි විසුම්හයි හිමාල වනයට නැගීගියහ. සිටුදරුද එක්වන්ව පුතු අඬනා වලප්නා හෙයින් තපස්වින්කරා එලඹ දඹ ඉල්වා දෙමි ආරාමයට ගියේය. තපස්විවරුන් නෙ දක මෙසේ කොටත් නලවා ගතනොහි කුමක්දෝහෝයි ඒ උයනෙහි අඹ දඹ වැල වරකා ගෙන ඒ ශකිර්රා හා පින්කොට තම පුතුට මේ දඹයයි කියාදෙන්නේය. එතෙම ඉන් සුඟක් දිවඟ තබාලු කල්හි හලාහල විෂයක්සේ දැනෙන හෙයින් කාරා බිමට දමා සත් දවසක් නිරාහාරව මළේය.

එසේහෙයින් සෙනෙවිරත්නි උතුම්රසයෙන් යුක්තවූ මිනීමස් නොලදින් නම් මාගේ ජීවිතය නොරැකෙයි සිතමි කිහ.

ඉක්බිති කාලහස්ති නම් සෙනෙවිරත් අතිශයින්ම මේ රජ ත්‍රිෂ්ණාවෙහි ගිජුවිය අනිකුත් උදාහරණයක් ගෙණහැර දක්වා බලමි සිතිමි. ඉදින් මහරජ මීනිමස් කැමෙහි නොවැලකීසේක් වි නම් මී නියාවු අමාත්‍ය මණ්ඩලයා කෙරෙන්ද මෙබඳු රාජ්‍යශ්‍රීයකින්ද පිරිහෙනසේකැයි අවවාද කරන්නාහු

යටගිය දවස මෙම බරණැස් නුවර උපන්හිමන් පංචශීලය රක්නාවු උතුම්වු සොත්ථියනම් බමුණු කුලයෙක් ඇත්තේය. ඒ කුළයෙහි ඒ පුතනුකෙණෙකුන් ඇතිකල්හි ඒ කුමාරතෙම දෙමව්පියන්ට ඉතා ප්‍රිය නියාවය ඉතා ව්‍යක්තය වෙදත්‍රය නිමවා දත්තේය. ඒ කුමාරතෙම සමවයස් ඇති එක්කෙළිමංඩලයෙහි වැඩි කුමාරවරුන් සමඟ බොහෝසේ එක්ව ඇවිදිනේය. සෙසු කුමාරහු රා මස් අනුභව කරන්නාහුය. මේ කුමාරතෙම රා මස් වේවයි මස්වේවයි අනුභව නොකරන්නේය. ඉක්බිති සෙසු බාලයෝ සිතන්නාහු මේ තමා රානොබොන හෙයින් අපට මිල නොදෙන්නේය. එසේ හෙයින් වංචාවෙන් රා පොවාපු වොත් යහපතැයි දැන එක්ව දවසක් හැමදෙනා රැස්ව සබඳ සැනකෙළි කෙලුම්හයි කීහ. ඉක්බිති සොත්ථිය කුමාරයෝ කියන්නාහු තොපි හැම රා බොව මම රා නොබොව. එබැවින් උත්සවයෙහි මා එක්විමෙන් ප්‍රයෝජන නැත. තෙපි හැමදෙනාම කෙළිවයි නීහ. ඉක්බිති ඒ කුමාරවරහු සබඳ නුඹ වහන්සේට පානවර්ගය පිණිස කිරි ගෙන්වාගත මැනවැයි කීහ. රා බොන බවමුත් ක්ෂිරපානය කෙරෙමින් සැණකෙළි කෙළියයි වරද කවරේදැයි යහපතැයි ගිවිස්සාහ. සෙසු ධර්තියෝද සරහණ ලද උයනකට ගොස් නෙළුම්හත තීක්ෂණ රාමුළු බන්ධවා තුබූහ. ඉක්බිති රාබොන වෙලෙහි කුමාරයන්ට කිරි එලවුහ. ඉන් ධූර්තියෙක් පින්වත්නි මට පොකුරුම් ගෙනවයි කියා ඉන් ර මුලක් ගෙන්වාගෙන පල්ලෙන් කුඩා සිදුරුකොට මුල අල්වාගෙන කට තබාගෙන කටඋඩටකොට බොන්නට වන සෙස්සෝත් අපටත් පොකුරුම් ගෙනෙවයි කියා ගෙන්වාගෙන රාමුල කටතබාගෙන බොන්නට වන්හ. ඉක්බිති කුමාරයෝ මේ කුමක්දැයි විචාළාහ. එවිට ධූතිර්ථයෝ පොකුරුමිනම් මේ වේදැයි කීහ. එසේවිනම් මටත් ඉන් සුගක් දෙවයි ඉල්වු හෙයින් වැලි බොවයි රාමුලක් දුන්හ.

ඉක්බිති කුමාරයෝ පොකුරුනම් සංඥාවෙන් රාපුහ. ඉක්බිති ඕහට අඟුරෙන් පැලහු මස් දුන්හ. එසඳ අනුභවකළහ. මෙසේ කුමාරයන් නැවත නැවත බොන්නට පටන්ගත් කල්හි කුමාරද රාමත්විය. මත්වු බවදත් ධූර්තියෙ මේ පොකුරුමී නොවෙයි රායයි කීහ. එපවත් අසා කුමාරයෝ මෙතෙක්කල් මුළුල්ලෙහි රා නම් මෙසේවු රසයක් ඇති නිසා නොදන්නෙමි. ගෙනව රායයි කියා ගෙන්වාගෙන පූහ.

SANHIDA LANKA

මෙසේ කුමාරයන්ට රා පිපාසාව මහත්විය. ඒ බව දැන නැවත ඉල්වත්ම නැතැයි කියා දුන්නහ. එසේ විනම් ඇති තෙනකින් රාගෙනවයි කියා ඇඟිල්ලේ තිබු පේරුස් ගලවා දුන්හ. මෙසේ ඒ දවස් මුළුල්ලෙහිම උන් හැම හා සමඟ රාබී මත්ව ඇස් රතුකොටගෙන සවස වෙවුල වෙවුලා ගෙටගොස් වැදහොත්තේය. ඉක්බිති පියානෝ රා පු නියාව දැන කම්පාව රා මද සිඳිගිය කල්හි පුත උත්තම වංශයෙහි උපන්නාවු තොප විසින් රා බිවයුත්ත නොවෙයි මෙවක් පටන් එලෙස නොකරවයි අවවාද කීහ.

එබස් අසා මාණවකතෙම පියාණන් වහන්ස කුමක්කියන සේක්ද මිනිසා රසයෙක් මෙතෙක්කල් නොදත්බව

මාගේ පවෙක රායෙන් වැලැක්කනෙහෙමියි කීය. පියානෝ නැවත නැවතත් යාඥාකොට නොවළකමියි කිහෙයින් අපගේ වංශයටත් කැලලවිය සම්පත්තිය නැසෙන්නේයයි සිතා පුත් උතුම්වූ කුලයෙහි ඉපද විසිතුරුවූ රූවින් අග්‍රප්‍රාප්තව නොකානොපියයුතු රාමස්කැපූ වට අපගේ වංශයට යෝග්‍ය නොවෙයි තෙපි රාජීමෙන් නෙවලක් පසු අපගේ ගෙන් පිටත්වයි පිටත්කරවා මුත් අපට නෙනැබව ලියවයි අධිකරණ සමස්ථයේ ලියවා තමන්ගේ කුලයෙන් පිටත්කරවූහ.

ඒ කුමාරද සප්තවිධවූ රසයන් අතුරෙන් උතුම්වූ රසයෙක ඉනියා රසයක් නොලබන්නාවූ මට මධුර රසයෙන් අර්ථ රසයෙන් වංශ රසයෙන් ප්‍රයෝජන කිම්දැයි යථොක්තවූ කිසිවෙක් අපෙක්‍ෂාවක් නැතිව රා මදයෙන් උපෙක්‍ෂාවූයේ තමා කෙරේ නිරපේක්‍ෂවූ දෙමව්පියන් කෙරෙන් නෙරනා ලදුව මැතභාගයෙහි කිසි පිටිවහලක් නැතිව රෙදිකඩක් ඇඳගෙණ ඔබ්බේ තුබූ රා මස් තබා නුබේ තිබූ බත් විවරකුත් ලැබගත නොහි කබලක් අතින්ගෙන සිඟාකා ඇවිදිනේ කල්යාමකින් පිලකවැදහෙව අනාථව මියගියේය. සෙනෙවි රද්දූ මේ කාරණය ගෙනහැර දක්වා ඉදින් මහරජ මා කී යමක් නොගිවිසිසේක් වි නම් මේ රාජවාසීහු නුඹ වහන්සේ රාජ්ජය හැරගෙන ඒ රාසොඬ මාවකයා මෙන් නුඹ වහන්සේද මේ රටින් නෙරණාහුයයි කීහ.

මෙසේ කිවද මිනිමස් කෑම වැලකිය නොහි රජ්ජුරුවෝ තුමුද උදාහරණයක් ගෙණහැරදක්වන්නාහු සෙනෙවිරත්නි සියළු සමයාන්තර අපි දනුම්හ. එම්බා පෙර ගිය දවස පාසියයක් තපස්විවරහු එණු ඇඹුල් සෙවුනා පිණිස මනුෂ්‍යපථයට අවුත් දනව් සැරිසරා ඇවිදිනාහු පළමුසේම සුජාතා නම් කෙළෙඹි පුත්‍රයන්ගේ ආරාධනාවෙන් ඔහුගේ උද්‍යානයෙහි අර්ම්කොට වෙසෙති ඒ දවස් පතාම උපස්ථානකොට බණ අසා එන්නේය. ඉක්බිති දවස්ගණනක් තපස්වි වරහු ඉවත ගොස් සිඟා වළඳා තමන්ගේගෙට නොආ හෙයින් ආර්යයන් නොවැඩිකරණු කිම්දෝහෝයි ගොස් වෙහෙරවිනම් බණ අසා එමියි ගියේය. වැඳ ගෙන දෙටු තවුසානන් සමීපයෙහි ඉඳ බණ අසා අසා ඉරගල වැටී ගියකල්හි ඇයි ඇවත ගියමනා කල් වේදැයි ස්වාමිනි අද මේ වෙලෙහි වෙහෙර ලම් තපස් විසමුහයා වද ඇතුළු පන්සල සමීපයෙහි වැද සැතපුනේය. තපස්විවරහු ධ්‍යාන භාවනාවෙන් යුක්තව සක්මන් මළුව සිසාරා උන්හ. ඉක්බිති දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රදේවේන්ද්‍රයෝ දේවතා සමූහයන් විසින් පිරිවරණලදුව තමන්ගේ වල්ලභ ස්ත්‍රීන් සමග තපස්විවරුන් වැඳ බණ අසන්ට ආහ. ඉක්බිති එකල්හි දෙවියන්ගේ ශරීරාලෝකයෙන් සියළු අරමොද්‍යානය එකාලෝකව බබලන්ට පටන්ගත් කල්හි පන්සල් ඇතුලට වැදගිය රසම්දක සුජාතා නම් කෙළෙඹිපුත්‍රතෙම පන්සල් සිදුරෙන් බැලුයේ තපස්වීවරුන් වැඳ සිටියාවූ ශක්‍රදේවේන්ද්‍රයන් උන් පිරිවරා සිටි දිව්‍යස්ත්‍රීන් දැක දිව්‍යප්සරාවන් දර්ශනයෙහි රාගරත්විය. ශක්‍රයෝද බණ අසා වැඳ සමුගෙන තමන්ගේ දිව්‍යභවනයටම ගියාහ.

ඉක්බිති කෙළෙඹිපුත්‍රද තපස්විවරුන් වැඳ ස්වාමිනි රාත්‍රීභාගයෙහි නුඹ වහන්සේ වඳිනට ආවෝ කව්රුදැයි විචාළේය. අවැත්නි ශක්‍රදේවේන්ද්‍රයෝ යයි කීහ. උන් පිරිවරා උන්නෝ කවුරුදැයි විචාළකළ උන්ගේ දිව්‍යස්ත්‍රයයි කිහ.

එතෙම තපස්වීවරුන් වැඳ ගෙට ගියවෙලෙහි පටන්කොට මට දිවසරන් දෙව මට දිවසරන් දෙවයි මුරගානේය. එපවත් අසා බන්ධු වර්ගයා අවුත් පිරිවරගෙන අඳෝනා මයා මේ දරුවා බණ අසන්ට ගිය ගමනේ යක් කෙනෙකුන් දැකපුනිසා වේදැයි වටට අසුරුනේට වන්හ. ඉක්බිති කෙළෙඹි පුත්‍රතෙමේ කොලෙනි තෙළ අසුරුනොවෙයි මා ඉල්වන්නේය. දිව්‍යප්සාරාවන් ගෙනවුත් මට දෙවයි කීහ.

එපවත් අසා බන්ධුහු උතුම් රූ ඇත්තාවූ වෛශ්‍ය ස්ත්‍රීන්ද ඔහු තමාගේ අඹුදරුවන්ද සර්වාලංකාරයෙන් සරහාගෙණ ඇවිත් මොහු දිව්‍යස්ත්‍රියක්යයි පැලූ කල්හි බලාපියා මුණ ඉවත්කොටගෙණ මොහු දිව්‍යප්සරාවෝ නොවෙතියි කියන්නෝයයි ප්‍රේත දූවදැයි කෑතව අච්ඡාරාප්‍රතිබද්ධ චේතනාව වලකාගත නොහෙන්නේය. දිව්‍යප්සාරාවන් මට දෙවයි කීයාම මියගියේය.

එපරිද්දෙන්ම කාලහස්ති නම් සෙනෙවිරද්දුනි උතුම්වූ රස ඇති මිනිමස් නොලදින්නම් මාගේ ඒ තපස්විරුන්ගේ ශ්‍රාවකවූ සුජාතා නම් කෙළෙඹි පුත්‍රයා අජාතවූ දිව්‍යස්ත්‍රීන් පතා මලාසේ මියමියි කීහ.

එපවත් අසා කාලහස්ති නම් සෙනෙවි රද්දූ මේ රජ අතිශින්ම මාංස යෙහි ලුබ්ධවිය. තවද අනිකුත් උපමාවක් කියා වලකාලිය හැක්කනම් උත්සහකොට බලමි කාරණයක් ගෙණහැරදක්වන්නාහු ඇසුව මැනව මහරජ පෙර ඉකුත්කල චිත්‍රකූට පර්වතයෙහි රන්ගල් ගුහාවෙහි අනූදහසක් පමණ හංසයෝ වසන්නාහුය ඔහු වැසි සාරමස ගුහායෙන් පිටත්නොවන්නාහුය. ඉදින් පිටත්වූවාහු වි නම් පියායෙන් ගත් පැතින් පක්ෂ ප්‍රහාරකොටගත නොහි මුහුදුම වැටී මියයන හෙයින් ඒ කාරණයෙන් හංසයෝ පිටත් නොවෙති දතයුතු.

SANHIDA LANKA

වැල් කෙසේ ඒ සාරමස පිවත්වෙද්දැයි සිතතොත් නියං සමයෙහිම සයංජාත හැල්ගෙණ හැරගෙණ රත්ගල්ගුහාව පුරාගෙන අනුභවකොට වසන්නාහුය. මෙසේ හංසයන් ගුහාව ඇතුලට වැද ඇකිලිගිය කල්හි රථ සකක් සා

පමණ මහත ඇති උන්නාභිමුඛ නම් මකුළුවෙක් ගොදුරු සා පමණ උයින් මසකට එකී දැලක් නියාවට ගුහාවාරයෙහි දැල් බඳනේය. ඒ බව දත් ධෘතරාෂ්ට්‍ර හංසයෝ ඒ දැල් කඩන පිණිස කරුණ හංස පෝතකයන්ට ගොදුරු දෙකොටසක් තබා දෙන්නාහුය. මෙසේ වැසිසාරමස ඉකුත්වූ කල්හි ඒ තරුණ හංසයා පළමුකොට ගොස් දැල සිඳිනේය එමගින් තෙස්සවුන් පිටත් වන්නාහුය.

මෙසේ වසනකල්හි එක්කලෙක පස්මසක් වැසි වටුයේය. එකල්හි සාර මසට ප්‍රමාණ දැන ගොදුරු ගෙනහැර පිරූ හංසයෝ සාරමස ඉකුත්වූසඳ ගොදුරු නිමාගිය හෙයින් ඉනිබ්බකල කළමනා කවරේදෝහෝයි ඔවුනොවුන් හා මන්ත්‍රණය කරන්නාහු ජීවත්ව උනුමෝනම් දරුවන් ලැබගනුම්හයි පළමුකොට බිජුවට තුඩින් පැහැරකෑවාහුය. ඉක්බිති අළුතගැසු පැටියන් කෑවාහුය. එසේත් මස නොනිමුණු හෙයින් පසුව මාළු හංසයන් කෑවාහුය.

මෙසේ පස් මස ඇවෑමෙන් වැසිනිමුණුකල්හි ඒ මකුළුවා පස්මසට ගුහාවාරයෙහි දැල් පසක් බැන්නේය, එකල්හි හංසයෝද ස්වකීය ජාතියෙහි මස් අනුභව කිරීමෙන් බඳවූහයි දිවුනු කොටස ලැබසිට තරුණහංස දැල් පැහැර සතර කඩාපියා පස්වැනි දැල් සිඳගත නොහී එම බැඳී ගියේය. මකුළුවාද හංසයා හිස පැහැර ලේපිය ඇතිකෙන්ද අවුදින් දැල කඩමයි බැඳී එලෙසම මකුළුවා අතට මෙම ක්‍රමයෙන් සියළු හංසයෝ පසුව ජීවිතක්ෂයට පැමිණියහ.

මෙසේ ස්වජාති මාංසය අනුභව කිරීමෙන් බල මදව එකදැල විවරක් කඩාගත නොහි ධතරාෂ්ට්‍ර කුලයෙහි හංසයෝ නැසිගියහයි කියනු ලොව පැවැත්තේය.

එසේහෙයින් මහරජ ආකාශචාරීහු රන්වන්වූ ශරීර ඇති උතුම්වූ ජාත ධතරාෂ්ට්‍ර කුලයෙහි හංසයෝ තමන් පෙර නොකෑ විරූවූ ස්වකීය මාංසය අනුභවකොට විනාසයට පැමිණියාහුද මහරජ එමෙන්ම නුඹ වහන්සේද නොකෑයුතු මිනිමස් අනුභව කිරීම හේතුකොටගෙණ මිනිසා රජසැපතින් පිරිහෙලා වැලිත් රටින් නෙරනාහුයයි කීහ. මෙසේ නොයෙක් පරිද්දෙන් උදාහරණ ගෙණහැර දක්වා අවවාද කිවද නොගිවිසද රජ්ජුරුවෝ තුමුත් අනික් උපමාවක් කියන්ට උත්සහ කළහ. එකල්හි නුවරවාසීහුද මංගලීක මහාමාත්‍යාදිහුද වහා එක්ව නැගීසිට සාමිනි සෙනෙවි රදුන් වහන්ස මේ තමා කරන්නේ කුමද මිනිමස් කන සොරහු ඇරගෙන නුඹ වහන්සේට කරුණු කින්ද මේ තෙමේ සබාව මිනීමස් කෑමෙන් නොවලකීනම් වහා රටින් නෙරපුව මැනවැයි රජ්ජුරුවන් බසක් බැනනැග නුදුන්හ.

රජ්ජුරුවෝද බොහෝ දෙන කිපී ඇලලිගිය බවදැන හයින් ත්‍රස්තව නැවත බසක් කියනු නුහුනුවාහුය. තවද ඉක්බිති කාලහස්ති නම් සෙනෙවිරජ්ජු තමන් උතුම්වූ ගුණ ඇති හෙයින් සාමිනි කෑමෙන් වැලැක්ක මැන වැයි රජ්ජුරුවන් විචාරා වැලැක්ක නෙහෙමියි කීහෙයින් මෙසේත් වලකා ගත හැක්දෝහෝයි රජ්ජුරුවන්ගේ කුමාරවරුන්ද අන්තඃපුර ස්ත්‍රීන්ද සොළොස් දහසක් බිසෝවරුන්ද සර්වාලංකාරයෙන් සරහා ගෙනුවුත් රජ්ජුරුවන්ට පෑ මහරජ නුඹ වහන්සේගේ බන්ධුජනයාද පිරිවරා ටිසි අමාත්‍ය මංඩලයාද මෙබඳුවූ රාජ්‍යශ්‍රියක් බලා වදාළමැනවැයි රජ්ජුරුවෙනි නිකම් අනාථයේ නොනැසී මිනිමස් කෑමෙන් වැලකුණු මැනවැයි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ මේ සියලු රාජ්‍යශ්‍රිය විචරට මිනිමස් කෑම මට ප්‍රියයයි කීහ. එපවත් අසා සෙනෙවිරද්දු එසේ වීනම් මෙනුවරින්ද රටින්ද නික්මුන මැනවැයි කීහ. ඉක්බිති රජ්ජුරුවෝ මට සෙනෙවිරත්තී රාජ්‍යසම්පත්තියෙන් ප්‍රයෝජන නැත රටින් නික්මෙම්මය බල එකකදු උවත් මට අඩුවෙක් නම් කඩුවෙක්මය. කඩුව හා අරක්කැමියා විචරක් දෙවයි ඉල්වූහ. එසේද කඩුවකිත් මිනිමස් පිසන්ට සැලියකුත් අරක්කැමියාට පැසකතබා දී රටින් මරා නෙරපුහ. රජ්ජුරුවෝද අරක්කැමියා කැඳවාගෙන නුවරින් නික්ම වනයටවැද එක් නුගරුකක් මුල වසන්නාහු අවට මාර්ගයෙහි සිට මිනිසුන් මරා අරක්කැමියාට ගෙනවුත් දෙන්නාහුය. අරක්කැමියා මිනිමස් පිස රජ්ජුරුවන්ට ලන්නේය. මෙසේ ඔහු දෙදෙන ජීවත්වන්නාහුය. මමය කොල පෝරිසාදයායයි අඬගසා කඩුව ඉසවට සිසාරා පිණුතල්හි කවර කෙනෙකුන් සභාවෙන් පිටපිය නොහිමුණින් වැටී යන්නාහුය. එසේ වැටී හුණු මනුෂ්‍යයන් අතරෙන් අභිප්‍රාකෙණෙකුන් අල්වාගෙන ඉස යටිබැල්ලිකොට එල්වාගෙනගොස් අරක්කැමියාට දෙන්නේය.

පෝරිසාද නම් සොරෙක් මිනිමරා කන්නේයයි සියලු දඹදිව ප්‍රකාශවිය සියළු සත්වයෝම බොහෝසේ වදිනාතැන් සොන්නාහුය. වලගමන් නිස්ස වාරය කළහ. එසමයෙහි එක් දවසක් වනයෙහි කිසි මිනිස්කෙනෙකුන් නොලදින් අවුත් ලිපගිණිමොලවවයි කිව එපවත් අසා අරක්කැමිතෙම මස් කොයිදැයි විචාළේය. මසුන් දැන් දැන් ලබහැක්කයි කීය. එපවත් අසා අරක්කැමි ඉතිකින් මාගේ ජීවිතය නැත්තේ වේදැයි හයින් වෙවුලා ලිප ගිණි මොලවා බඳුන උදුනට නැගිය පොරිසාදයෝ කඩුවෙන් අරක්කැමියා දෙකඩකොට ගසා එදවස්ම මස් අනුභවකොට එතැන්පටන් උදාකලාවිය.

SANHIDA LANKA

එකල්හි මහත්වූ සම්පත් මැති බමුණෙක් පන්සියයක් ගැල්පුරාගෙණ වෙළඳාම් කරනුයේ නැගෙනහිරින් බටහිරට යන්නේය. පෝරිසාදයාගේ උපද්‍රව අසා ඒ අඹ සමීපයෙහි වසන්නාවූ මනුෂ්‍යයන්ට දාසක් වස්තු දී

මේ වනාහි මිනිමරන්නාවූ සොරුන් අතින් මා ගලවායවාපියවයි ගිවිස්වාගෙන එම මනුෂ්‍යයන් හා සමග මගට පිළිපන්නේය. ඉස්සෝදා නාහා ගඳ විලවුන් ගන්වා සර්වාලංකාරයෙන් සැරහීගෙන ගොස් යොදනලද සැපයානකට නැගී ගැල්සාත්තුවා පෙරටුකරවා තමන් අල්ලස් දුන් පුරුෂයන් විසින් පිරිවරණ ලදුව හැමටම පසුබලා නික්මුනේය. පෝරිසාදයාද ගසක් උඩ නැගී යන එන්නවුන් බලන්නේ ගැල්සාත්තුයෙහි එන්නවුන් දැක එතෙක් මනුෂ්‍යයන් අතුරෙන් එක්කෙණෙකුන් කෙරෙහි ඡන්දයක් නැතිව බමුණා දුටුවෙලේ පටන්ගෙණ උන්ගේ මස් කනු කැමතිව කෙලගැලම ඉඳිනේය. එකල්හි සමීපවූ බැව් දැන ගසින් බැස පැනව මී මමය කොල පෝරිසාදයයි තමාගේ නම් කිය අඬගසා විදුලිය පටක්මෙන් කඩුව ඉස සිසාරා දිවන වේගයෙන් විළුම් පහරින් ඇස වැලිපුරන්නක්හු මෙන් දිවගෙන ආයමඅගේ ශබ්දය ඇසූ ගමන් හා සරියේම සෙනහඬ ඇසූ මුවපොල්ලන්සේ හයින් තැතිගෙණ මුනින් වැගිරගිය සත්වයන් අතුරෙන් නැගීසිටිනට සමර්ථවූ එකද සත්වකෙණෙක් නැත එකල්හි පෝරිසාද නම් සොර බමුණා පය වලළුගර කෙරේදී අල්වා පිටට දමාගෙන ඉස් ගොප් මස පැහැර දිවගන එනකල්හි නොබෝ වේලකින් සිහිලැබ නැගී සිටියාවූ මනුෂ්‍යයන් අතුරෙන් සමහර කෙළෙහිගුණ දන්නා කෙණෙක් පින්වත්නි අපි මේ සොරහු අතින් බමුණන් ගලවනුපිණිස දහස් ගණන් ගතුම්හ එසේවූ තැනදී අප මෙසේකල පුරුෂවික්‍රම කවරේද පිලිවන් වේවයි බැරිවේවයි සුඟක් තැන් ලුහුබඳවා බලාලම්හයි පස්සේ වැටී හුණු පෝරිසාදනම් සොර මදක්තැන් දිවපියා ආපස්සේ බැලුයේ පස්සේ එනකෙණෙකුන් නොදැක සෙමෙන් යන්ටවන එකල්හි පස්සේ ලුහුබඳවා දිවන්නාවූ මනුෂ්‍යයන් අතුරෙන් එක් ලදර පුරුෂයෙක් ඇමදෙන පසු කොට පියා දිවගෙන ගොස් පෝරිසාදයාට සමීපවිය සොරාද ඔහු දැක වේග උපදවා එක් වැටකඩක් පන්නේ කිරිඋල්ක් පිටට පැනපිය ඒ කිහිරි උලද යටිපල්ලෙන් ගෙන පිටිපල්ලෙන් නැංගේය. එද ලේ ගස ගසා දිවන්ට පටන්ගත්තේය. ඉක්බිත්තෙන් එලවූ ඒ පුරුෂතෙම වැගිරෙන්නාවූ ලේ දැක එම්බල කොල පෝරිසාදයා විදපිම් සනිකෙ නොබා දිව වහා එවයි කියා අඬගෑය ඔහු දුර්වල බව දැන පසුපස්සෙහි ලුහුබඳවාගත්හ. සොරද ඒ බව දැන බමුණා ඇරපියා තෙමේ දිවගත අතිවාහකපුරුෂයෝද බමුණා ලත්තැන් පටන් සොරුන්ගෙන් අපට කම්කිම්දැයි කියා වැලැක්කාහුය. පෝරිසාදයාද තමා වසන නුගගසකමුලට ගොස් අරලු අරණව වැදලා වැදහෙව ආරාධනා කරන්නේ ස්වාමිනි වෘක්ෂදේවතාවානෙනි සත් දවසක් ඇතුළත මාගේ පය වනය සුව කොට පූසෙක්විනම් සියලු ජම්බුද්වීපයෙහි රජ දරුවන්ගේ උගුරු සුන් ලෙයෙන් නුගකඳ සෝධා උන්ගේ බඩවැලින් කඳවෙලා පංචමධුර මාංසයෙන් බිලියන්නෙම් යැදගත්හ.

මෙසේ ඔහු සත් දවසක් ආහාර අනුභව නොකිරීමෙන් කය වියලී පය වනය සුවව ගියේය. එතෙම දෙවියන්ගේ ආනුභාවයෙන් සුවවනැයි සිතා සතුටුව කීප දවසක් මිනීමස්කා ශරීරයෙහි බලලාගෙන මට බොහෝ උපකාර කළාවූ දේවතාවන්ට යදියඥ දරදියෙන් මිදුන මැනවැයි සිතා කඩුව සරහා ගෙන රජ්ජුරුවන් අල්වන්ටයෙමි නික්මින. ඉක්බිති පූර්වජාතියෙහි එක්ව මිනීමස්කා ඇවිදි මිත්‍රයක්‍ෂයෙක් දැක මෙතෙම පෙරජාතියෙහි මහා සමඟ මිනී මස්කා ඇවිදි මිත්‍රයායි කියා ඇඳින සබඳ තෝ මා අඳුනේදැයි විචාළේය. පෝරිසාදයෝ ඇඳිනගත නෙඑම් කීහ. ඉක්බිති යක්‍ෂතෙම පෙර ජාතියෙහි කලකටයුතු හිකැරවිය ඉක්බිති ඔවුනොවුන් ඇඳින පිළිසඳර කථාකොට යක්‍ෂයා විසින් කොයි උපනුදැයි විචාළකල්හි කසීරට රජකුලයෙහි ඉපද රාජ්‍යයෙහි පදස්ථව මිනීමස්කෑම පිණිස රටින් නෙරිබවද නුගගසමුල වසන බවද කියා පය උල ඇනුනුබවද දෙවියන්ට ආරාධනා කළ බවද වනය සුවවූ බවද යාදිනියෙන් ගුණවූ බවද යාදිනියෙන් මිදෙන පිණිස රජ දරුවන් අල්වන්ට යන බවද කියා සබඳ තොපිත් මට මිට සහයවන්ට උවමැනවැයි කීහ.

ඒ සඳ යක්ෂතෙම මට ඉක්මන් කටයුත්තෙක් ඇත. එසේ හෙයින් තොපට සහායවන්ට අවකාශමද එතකුදුවුවත් මම වනාහී අනර්ඝවූ පදලක්ෂණ දනිමි පවහා ආඥසම්පන්නවූ මන්ත්‍රයක් දනිමි ඒ මන්ත්‍රයතෙම කායශක්තියද පවන් හා සමාන ජවද තේජසද වඩන්නේයයි මන්ත්‍රියෙහි ආනුභව වර්ණනා කොට මන්ත්‍රය අරගනැයි කීය.

සොරද  යහපතැයි පිළිගෙණ යක්ෂයාද පෝරිසාදයන්ට මන්ත්‍රය දී අභිමත ස්ථානයට නැගීගියේය. පෝරිසාදයාද මන්ත්‍රය ඉගෙන එතැන් පටන් උඟරන් තුඩ සීවැල් තිබූවාසේ මහත්වූ ශක්තිසම්පන්නව අතිසුරව සත් දවසක් ඇතුළත එක්සියයක් රාජධානියෙහි රජ දරුවන් උයන් කෙළි ආදියට ගියකල්හි පවන් හා සමාන වේගයෙන් දිවගෙනගොස් මමයි පෝරිසාදයයි අඬගසා බෙණෙමින් ගර්ජනාකෙරෙමින් හයගන්වා කකුල් අල්වාගෙන හයගන්වා ඉස් යටිබල්ලා දනඋතුසන්ධි තමාගේ දෙකර තිබෙන සේ මාගේ විලුඹෙන් කොණ්ඩයෙහි ඉස්පහරණාසේගෙන පවන්වේගයෙන් නුගගසමුලට ගෙවුත් අඤ්ජලීපකළ කලක්මෙන් අතුල්පත එක්කොටවිද අමුණා පය මාපට ඇඟිලි අක් බිමගෑවෙනසේ නුගගස මැද එක්වාගත් තේය. ඒ එක්සියයක් රජ දරුවෝ ඉතා කොමල බැවින් වාතවේගයෙන් පහරණලද කටුකරඬු මඩදම්සේ සිත් මලානිකව කරකැවෙමින් එල්ලෙන්නාහුය. ඒ එක්සියයක් රාජධානියෙන් රජදරුවන් කෙරෙන් සුතසෝම රජ්ජුරුවන් බාලකාල සිල්ප ඉගැන්වූ ප්‍රිස්ට් ආචාරීන් සෙයිනුත් දඹදිව රජදරුවන්ගෙන් සිස්නුහුවමැනවැයි සිතාත් මේ කාරණා දෙක අපෙක්ෂාකොට අල්වා නොගන්නාසේය. මෙසේ සුතසෝම රජ්ජුරුවන් හැර එක්සියයක් රජ දරුවන් අල්වා ගස උඩ බැඳ එල්වා ඉනිඹ බිළියම් කළමනාකලැයි සිතා මහත්වූ දරසෑයක් බැඳ ගිණි අඟුරු බස්නා පිණිස මොලවා ඇණ

SANHIDA LANKA

මස් පහළන්ට උලක් සස්මින් උන්නේය.

එතැන්හි වෘක්ෂ දේවතාවා එපවත් දැන මෙතෙම මා උදෙසා බිලියම් දෙමියි පටන්ගත්තේය. සුවකළ වණයකුත් නැත. දැන් වනාහී මෙසා මහත් විනාශයක් කරන්ට පටන්ගත්තේය. මේ වනාහි මා විසිනුත් වලකාගත හැක්කේ නෙවෙයි සතරවරම් රජ දරුවන් කරා යම් සිතා සිවුමහා රාජ්‍යයට ගොස් සතරවරම් රජ දරුවන්ට එපවත් කීය. එපවත් අසා අප විසිනුත් වැලකිය නොහැක්කැයි ඔහු කැඳවාගෙන ශක්‍රයන් සමීපයට ගොස් දැන්වූහ. ඒ අසා ශක්‍රදේවේන්ද්‍රයෝත් ඒ මමත් වලකාලිය නොහෙමියි ඉටා සමර්ථකෙණෙකුන් කියාලම් කියා කවුරුදැයි විචාළ හෙයින් දෙව් මිනිසුන් සහිතවූ ලෝකයෙහි කුරුරට ඉඳිපත් නුවර ධනඤ්ජය කෝරව්‍ය රජ්ජුරුවන්ගේ පුත්වූ සුතසෝම රජ්ජුරුවන් විනා අනික් සමර්ථවූ කෙණෙක් නැත, ඒ සුතසෝම රජ්ජුරුවෝ පෝරිසාදයනුත් දමනේලා ඒ සියයක් රජ දරුවන්ගේ ජීවිත දානය දී සියලු ජම්බුද්වීපයෙහි ධර්ම නැමති අමෘත ජලයෙන් අභිෂේක කරන්නාහුය. ඉදින් රජ දරුවන්ගේ ජීවිතය ගලවනු කැමැත්තෙහි විනම් සුතසෝම රජ්ජුරුවන් බිලියම් කළොත් විනා තොපි නොපිලිගනිමියි කියාලවයි කීය. දේවතාවන් ශක්‍රයන්ගේ බස් යහපතැයි පිළිගෙන එක්ෂණයෙහි අවුත් තපස්වි වේශයකින් පෝරිසාදයන්ට නුදුරුතෙන ගමන්කෙළේය. එකල්හි පෝරිසාදයෝ තපස්වින්ගේ පාද ශබ්දයෙන් රජ්ජුරු කෙණෙක් ගැලවී නික්මුනෝ දෝහෝයි බැලුයේ මහණ වේශයෙන් සිටි දෙවතාවා දැක තපස්විවරයෝ නුමුත් රජදරුවෝමය. එසේහෙයින් මේ තපස්වින් අල්වාගෙණ එක්සියයක් දෙනා සම්පූර්ණකොට බලිපූජා කෙරෙමියි සිතා කඩුවගෙන තුන් යොත්නක් ලුහුබැඳත් අල්වාගනොහි විඩාවගිය ශරීර ඇතිව මම පෙර මහවේගයෙන් දිවන ඇතකු අසකු විනමුත් ඇසිල්ලකින් අල්වාගන්ට සමර්ථවූයෙමි දැන් මේ පියවියනින් යන්නාවූ තාපසයන් වෙර ඩා සොල්වා මහවේගයෙන් දිවත් අල්වාගත නොහෙමි ඊට කාරණා කිම්දැයි සිතා ඉක්බිති තපස්විවරයෝ නම් කිවා කෙරෙති, එසේයින් මොනවට සිටුවයි කියා රඳවාගෙන සිටි තැනැත්ත වුහු අල්වාගනිමියි කල්පනාකොට මහණ සිටුවයි කීයේය.

ඒ අසා දෙවතාවා මම වනාහී සිටියෙමි නොසිටින්ට උත්සාහ කරවයි කීහ. එබස් අසා පෝරිසාදතෙම එම්බල තපස්විවරයෝ නම් ජීවිතය පිණිස බොරු නොකියන්නාහුය. තමා විසින් සිටුවයි කියන ලද්දෙහි සිටිපෑ පියා නික්මුණෙහිය ගමන් යෙමින් සිටත් සිටියෙමි කියන්නේය. මෙසේ වෙහෙසා කියන්ට මා අත තිබෙන මේ කඩුව කොස් පතක්කොට සිතයිදැයි තපස්වි භයගැන්නුයේය. ඉක්බිති දේවතාවා එම්බා පෝරිසාදයෙනි මම කුසලධර්මයෙහි පිහිටි හෙයින් සිටිදානම් වෙමි, තොපසේ නාමගෝත්‍ර පෙරළි නමක් නොකෙරෙමි පාණාතිපාතාදී අකුසල්කොට මෙයින් චුතව නරකයෙහි උපදනු තොපසේ වුවන් සිටි තෝ දනිනුත් සසරින් ගැලවීමක් නැතිහෙයින් සිටියත් ඇවිදිනා නම් වෙයි බුද්ධාදීවූ උත්තමයෝ කියන්නාහුය. ඉදින් මහරජ ඒකාන්තයෙන් බිලියම් කරණ කැමැත්තෝ නම් සුතසෝම රජ්ජුරුවන් ඇරගෙනවුත් බලියම් කරව උන් එක්කොටගෙන බිලියම් කළානම් එක්සියයක් රජ්ජුරුවන්ගේ ගල ලෝහිතාදියෙන් බිලියම් කෙරෙමි කී සත්‍යවචනයෙන් හා බලි විධනාගේ සදිව්‍යලෝකයට පැමිණෙන්නා වේදැයි මෙසේ කියා දේවතාවා තපස්වි වේශයෙන් අන්තර්ධාන කොට තමාගේ දිව්‍යවේශයෙන් නභෝමණ්ඩලගත සූර්යමණ්ඩලයමෙන් දීප්තිමත්ව සිටියේය. පෝරිසාදතෙම දේවතාවාගේ කථාස්වරූපයද දිව්‍යවේශයද බලා තෙපි කව්රුදැයි විචාළේය. ඔහු විසින් මේ නුග ගස වාසයකරණ දේවතාවා නම් මම්මයි යනු අසා මාගේ දේවතාවානන් සිය ඇසින් දුටිමියි සතුටුව සාමිවූ දිව්‍ය රාජයානන් වහන්ස සුතසෝම රජ්ජුරුවන් නොලබම් නොසිතා නුඹ වහන්සේගේ විමානයට වන මැනවැයි කීයේය. එකෙණෙහි දේවතාවාත් පෝරිසාදයන් බල බලා සිටියදීම නුග ගසට වන්නේය. ඒ ඇසිල්ලෙහි ඉරත් බටුයේය, සඳත් නැංගේය. පෝරිසාදයෝද වේදවේදාංගයෙහි දක්ෂව නක්ෂත්‍රයෝග තමන්ගේ දන්නා සෙයින් ආකාශය බලා සිට පුස නැකත ලැබෙන්නේය. සුතසෝම රජ්ජුරුවෝ ජලස්නානය පිණිස උයනට යනතෙනදී උන් අල්වාගනිමියි සියලු ජම්බුද්විප වාසීවූ සත්වයෝ තුන් යොත්නක් අවට රැකවල් ලවාගෙන සිටිනා හෙයින් බලවත් ආරක්ෂා ඇත්තේය. එසේහෙයින් උයනට රැකවල් සැලසෙන්ට පළමුකොට පෙරයම් දසපැය ඇතුළත මිගාරචිර නම් උයනට ගොස් මගුල් පොකුණට බැස සිටිම් සිතා එපරිද්දෙන්ම ගොස් මගුල් පොකුණට බැස සිටිම් සිතා එපරිද්දෙන්ම ගොස් මගුල් පොකුණට බැස නෙළුම්පතකින් ඉස වසාගෙන සිටියේය. ඒ පෝරිසාද රජ්ජුරුවන්ගේ ආනුභාවයෙන් පොකුණෙහි ඇති මස් කැස්බෝ තාක් පසුබැසගෙන ගොස් දිය කෝල් බඩාලන් බැඳි සිටිනාහුය. මෙසේ තිරශ්චීනයන් දක්වා භය ඇති වන්ට පෝරිසාදයන්ගේ ආනුභාවයෙක් කෙසේ පැමිණියේද යත්?. පූර්වයෙහි කුසලානුභාවයෙන් පහළවූයේ කෙසේවේදැයි යතහොත්? ඒ පෝරිසාදයෝ පෙර කාශ්‍යප බුදුන් සමයෙහි බුදුපාමොක් භික්ෂුසංඝයාට කිරිපිඬු දුන්හ. ඒ කුශලානුභායෙන් මහබල ඇතිසේය. ගෙවල් කරවා භික්ෂුසංඝයාවහන්සේට සිත පිඩා දුරුකරණ පිණිස ගිණි කබල්ද දර පලන වෑ පොරෝ ආදිය දන්දුන්නේය. ඒ කුශල බලයෙන් තේජස් ඇතිවූයෙම් මෙබඳුවූ කුශල බලයෙන් තේජස් ඇතිවූයෙමි, මෙබඳුවූ කුශල බලයෙන් තේජස් ඇතිවූයේ පෝරිසාද රජ්ජුරුවන් උයනට යන්ට පැමිණි කල්හි පාන්වන්ට පූර්වභාගයෙහිම තුන් යොදුනක් අවට රැකවල් ගත්තාහුය. ඉක්බිති සුතසෝම රජ්ජුරුවෝත්

SANHIDA LANKA

පෙරවරු බත් මේ නිමවා සර්වාභරණයෙන් විභූෂිතව මඟුලැතු නැඟී සිවුරඟ සෙනඟ පිරිවරා උයනට යන්ට නුවරින් පිටත්වුයේ එකෙණෙහි තක්සලා නුවරින් නන්ද නම් බමුණානකෙණෙක් ගාථා සතරක් ඇරගෙන එක්සිය විසි යොත්නක් කතර මග ගෙවා අවුත් නුවරට ආසන්නයෙහි ගමක ලැගදෙවෙනිදා ඉරනැගි වෙලෙහි නුවරට වදනේ නැගෙනිහිරි  වාසලින් පිටත්වූ රජ්ජුරුවන් දැක දකුණත ඔසවා ජයතුභවං මහාරාජ යනාදින් ආශිර්වාද කෙළේය. ඒ ඒ දිග බල බලා එන රජ්ජුරුවෝ ගොඩමත්තේ සිට අත ඔසවා ස්තුති වචනය කළ බමුණා දැක ඇතු  වජ්‍රාංකුසයෙන් සන්කොට මෙහෙයා සමීපව සිට එම්බල බ්‍රාහ්මණය තා උපන් වැඩි රට කවරේද?. කවර කාරණයක් නිසා මෙතනට අවුත් සිටියේහිද ඒ කාරණය මට නොවලහා කියව, කුමක් කැමැත්තෙහිද තා අභිප්‍රානුකූල දෙයක් දුන් දෙමි කියා විචාළාහ.

එබස් අසා බමුණු පෘථවිශ්වරවු රජ්ජුරුවන් වහන්ස ඉතා දුරව ආහ. අර්ථ ඇති හෙයින් සාගරය හා සමානවු කාශ්‍යප සර්වඥයන් විසින් වදාරණ ලද සතාරහ ගාථාවන් සතරනෙ තොප සුභාෂිත ඇසිමෙහි අභිප්‍රා ඇතැයි යනු අසා හැරගෙන තොප කරා ආමියි මෙලෝ පරලෝ දෙකින් අභිවෘද්ධි කරන්ට නිසි මධුරවු අර්ථ ඇති ගාථාවන් අසව මහරජයි කියේය. ඒ අසා රජ්ජුරුවෝ සතුටුව ආචාරීනි තොප කළදෑ ඉතා යහපත උයනට ගොස් වුස්ස යෝගයෙන් ජලස්නානයකොට ආකල ඒ ගාථාවෙන් අසමියි කීය. නැවත බත් බුලත් ආදීවු සියළු පෝශ්‍ය බමුණන්ට කරණ ලෙස විධාන කොට ගොස් උයනට වන්නාහ.

උද්‍යානයත් අටලොස් රියන් උස පවුරෙන් වටකරණ ලද්දේය. එබඳුවු පවුරෙන් පිටත කන්තලින් කන්තල ගසා වටාසිටි ඇත්සේනාවය, අස්සේනාවය, රථසේනාවය, පාබලසේනාවය යි යන චතුරංගනි සේනාව විසින් ඇලලී ගිය සමුද්‍රයක්මෙන් ඉතා බහලවු සේනාසන්නි වේශයෙන් යුක්තවුයේය. සුතසෝම රජ්ජුරුවෝත් උයන සුරක්ෂිතවු පසු හාරකේයුර කිරීටාදී මහා ඇඟි ආභරණ ගලවා දූලිරවුළු අන්දම් කපා සරහවා සදන්සුනු ආදියෙන් උළනාලද සිරුරු ඇතිව මගුල් පොකුණට මහ පිරිවරින් බැස ජලස්නානය කොට ගොඩ නැගී දියසළුයෙන් සිටියාහුය. එකල්හි සුවඳ දුම් කවන ලද කසීසළු හා මාලාගන්ධ විලෝපනාදිය එලවු කල්හි පෝරිසාදයෝ සිතන්නාහු සර්වාභරණයෙන් සැරහී ගියකල්හි රජ්ජුරුවෝ ඉතා බරවන්නාහුය. සැහැල්ලු වෙලෙහිම අල්වා ගෙනයෙමි පෝරිසාද තෙම පෝරිසාදයා නම් මම්යයි අඬගසා පැණී මසකු අල්වා ඉසයට සිසාරණ කලක් පරිද්දෙන් කඩුව තිරිප්පුකොට  අහංමාරෙපොරිසාදෝයි තමා තමන් කියා ගර්ජනා කෙරෙමින් පෙනෙමින් තමන්ට පෙර ප්‍රිෂ්ටි ආචාරීව සිටි රජ්ජුරුවන් හෙයින් තමුන් උතුම්වු රාජකුලයෙහි උපන් හෙයින් ආචාර පිණිස එක් ඇඟිල්ලක් නලල තබාගෙන දියෙන් ගොඩනැගී සුතසෝම රජ්ජුරුවන් කරා දිවත් එසඳ ඔහුගේ කෲරවු භයංකාර නාදය අසා ඇත්තු ඇතුන් පිටම වගුලහ, අස්සු අසුන් පිටමෙ වගුලහ. රථ රථපිටම වගුලහ. බල ඇති සේනාවද තම තමන්ගේත් ආයුධ දමා මුනින් වැතිරගිය, පොරිසාදද සුතසෝම රජ්ජුරුවන් කරා එළඹ නැඹුරුව ඔසවා කරහිඳුවාගෙන වාසලින් යන්ට පමායයි අටළොස් රියන් පවුර පැන වැටී වැදහොත් මත්තහස්තීන්ගේ තුඩින් පෙනෙමින් අසුන් යටපසු කෙරෙමින් ඇත්පයට අසුවු මලපරඬලායේ රථ මැඩ සුනුවිසුනු කෙරෙමින් පවන් හා සමාන වේගයෙන් තුන් යොදුන් පමණ තැන් දිවගෙන ගොස් සුතසෝම රජ්ජුරුවන් උදෙසා පස්සෙහි දුවන කෙණෙක් ඇද්දෝහෝයි බැළුයේ නොදැක එතැන් පටන් සෙමෙන සිට යන්ට පටන්ගත්හ. එසඳ සුතසෝම රජුහුගේ සිඹාව ඉනි කෙසේ අගින් බැන් බින්දු තමාගේ පිට වැගිරෙන්නා දැක මේ රජ මහණ භයින් භයපත්ව අඬන්ටවන, මා පිට වැගිරෙන්නේ අඬන්නාවුන් කඳුළු නිසා වේදැයි අනේ මරණට නොබන්නාවු එකද සත්වකෙනෙක් නැතැයි සිතා විචාරන්නාවු තැනැත්තේ මෙසේ කියා සුතසෝම රජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේ වැනි බොහෝ ඇසූපිරූ තැන් ඇති කාලත්‍රයවර්තතීවු බොහෝ කාරණා කාරණයන් සිතාපියන්ට සමර්ථවු එසේහෙයින් ස්ථානොචිත ප්‍රඥාවෙන් යුක්තවූ නුවනැත්තවුන් ඉදින් මේ සත්ව ලෝකයෙහි නුනුවනින් යුක්තව යම්කිසි සෝකකාරණයක් හේතුකොට ගෙණ අඬන්නාවු සත්වයන්ට සමුද්‍රයෙහි නැව් නැගිවුවන්ට දිවයිනක් මෙන් පිහිට වන්ට නිස්සහ. ඒසේවු නුඹ වහන්සේ වැන්නක් මරණ භයින් අඬන්නා කල අඥානයෝ කෙසේ නම් නොහඬද්ද සුතසෝම රජ්ජුරුවන් අඬන්නාවු තොපි තොපගේ ජිවිතය පිණිස අඬන්නාවුද නොහොත් අඹුදරුවන් කෙරෙහි සෝකයෙන් අන්ධවු දැයි විචාරණ ලද්දාවු මට තත්වු පරිද්දෙන් කියාළුව මැනවැයි විචාළේය.

එපවත් අසා සුතසෝම රජ්ජුරුවෝද මමද සියලු සංස්කාරධර්මයන් අනිත්‍යසේ ඒ කාරණයෙන් දක්නෙම් මම පිණිස වේවායි පුත්‍රදාරාදීන් පිණිස වේවයි ධන ධන්‍යාදී සම්පත් පිණිස වේවයි රාජ්‍ය පිණිස වේවයි සෝකයෙන් කරන්නෙම් නෙවෙමි වැලි එතකුදු උවත් ස්වකීයාදී ප්‍රවුත්ථි වූ රාජ්ජයෙහි ඓශ්වර්යයෙහි පිහිටියාවු මම පුරාතනයෙහි පැවැතගෙන එන සත්පුරුෂ ධර්මයක් පඬුරුකොට දුරදේශයෙන් මා සමීපයට එනලද බමුණක්හු ජලස්නානය පිණිස නික්මුනෙන් අතරමගදී දැක ආකල අසමියි කියා ඕහට සත්කාර කොට දියකෙළියට ආමියි  ඒ මා විසින් කරණ ලද මනුත්‍රණයට කැලලයෙක් දෝහෝයි සෝක කරණ බවමුත් අන්‍යතර වස්තුවක් සඳහා සෝක නොකරමි වදාරා ප්‍රශ්නකොට නැවත එම්බල පෝරිසාදය තක්සලා නුවර සිට එක් වයෝවෘද්ධ බමුණෙක් කසුප් සම්මා සම්බුදුන් දේශනාකළ ගාථා සතරක් පඬුරුකොට ඇරගෙන මා

SANHIDA LANKA

සමීපයට ආය මමද ඕහට ආගන්තුග සත්කාරකොට ආකල අසම් ඔහු සන්හිඳුවා උයනට ජල ක්‍රීඩාව පිණිස එනලද්දාවූ මා ඒ ඇසියනොදී තොපි හැරගෙන නැගී ආව, ඉදින් මා හැරපු නම් මාගේ සබාබසට කැලලක් නොකොට ගොස් ඔහුගේ ධර්මදේශනා අසා සත්කාරකොට නැවත තොපකරා එමි වදාළ සේක.

එපවත් අසා පෝරිසාදතෙම කොරව්‍ය ශ්‍රෙෂ්ඨවූ රජ්ජුරුවෙනි තොපි මම බඳු වූ මිනීමරන්නාවූ සොරක්හු අතින් ගැලවි සියනුවරට ගොස් අතිමධුරවූ ප්‍රියවූ ජීවිතය ලදින් ප්‍රණිතවූ ජීවිතය පඤ්චකාම සැප කැමැත්තාවූ තෙපි පසමිතුරුවූ මා සමීපයට කෙසේ නම් එවුද මෙතොප කියන්නා වචනය ඇද හිලි නොකරමියි කීයේය.එපවත් අසා ශ්‍රී මහා බෝධිසත්වයෝ රත්ගල්තලා මුදුනෙක්හි ඉඳ සිංහනාද කරන්නාවූ ශ්‍රිගාල ශබ්දයෙහි සිට නිස්සංකවූ හාසකරරයම් සිංහරාජයෙකු පරිද්දෙන් එම්බල පෝරිසාදය පාණනිපාතාදීවූ පව්වූ ගුණයම් ස්වභාව ධර්මයකොට වාසය කරන්නාවූ හීන ජාතින්ගේ ජිවත් විමට වඩා පිරිසිදු සීලයෙහි සිට මියන මරණ උතුමැයි මා ඇතුළුවූ සියලු සත්ව යන්ගේ බස එබැවින් සබඳ මම ජිවිතය පිණිස බොරුකිය. එකෙකින් නොවෙමියි කියා නැවත තමන් වහන්සේගේ ස්ථිරත්වය වදාරණ ලද්දාවූ බෝධි සත්වයෝ ඉදින් මන්ද මාරුතයෙන් වජ්‍ර පර්වතය සෙලවි වැටිගෙමුත් චක්‍රවාට පර්වතයෙහි හොමා යාත්‍රා කරන්නාවූ චන්ද්‍ර සූර්ය දෙදෙනා ආකාශයෙහි ගිලිහී බිම වැටියේ නමුත් ගංගා යමුනා ආදීවූ සියලු ගංගාවෙන් ජලය උඩුගංගට නික්මෙනමුත් මාගේ වචනෙයහි බොරුයෙක් නැතැයි කීහ.

මෙසේ කිවොතින් පෝරිසාදතෙම බෝධිසත්වයන්ගේ වචනයෙහි ඇදහිලි නොකළේය. එපවත් දැන බෝධිසත්වයෝ මේ තෙමේ මෙසේ කියයුතු මාගේ වචනය අදහා නොගන්නාහ. සපථයක් කොට මොහු ගිවිස්වා මාගේ සත්‍ය වචනය රකිමි. ඒ මාහසත්තෙම තමා ඔහු කරපිටින් බිමට බස්වාගෙන සපථය කොට වදාරණසේක්.

එබසට පෝරිසාදය ඉදින් මම බොරුවක් කිත්නම් කඩ වහා බඳපාරාගත් නොයෙක් දහස්ගණන් යෝධසේනාව විසින් ගන්නාලද රකවල් ඇති උතුම්වූ රාජ්‍යශ්‍රියෙන් නොවෙම්වයි මාගේ මගුල් කඩුවෙන්ද මට වැඩෙක් නොවේවයි ඉදින් තොපි මෙසේ කරණ ලද මාගේ සපථය අසා මා ළහුවිනම් බමුණන්ට ආ කල අසම් කී සත්‍ය වචනයන් රැක තොප සමීපයට එමි කී සත්‍ය වචනයන් රක්නා පිණිස නැවත තොපකරා එමියි වදාළසේක. එපවත් අසා පෝරිසාදතෙම මේ සුතසෝම රජ්ජුරුවෝද රජදරුවන් විසින් නොකළමනා සපථයක් කරණලදුව හැර රජ්දරුවෝ නම් ජිවිතයත් කඩුවත් ගෙන බොරුව නොදිවුරන්නාහ. එයින් එබඳුවූ සපථයක් කරමින් සිටියදී මුන් වහන්සේ නොහරන්ට නොපිළිවන, එනසේක්වා, නොඑන සේක්වා, ආවොත් ආ සැටියේ දකිමියි ඉදින් නොම ආවොත් මාත් රජක්හු බැවින් මාගේ දකුණුතල යෙන් දේවතාවා මාරුවට බිලියම් කෙරෙමියි සිතා මහරජ වෙහෙසෙන්නට නොකමැත්තෙමි වහා ගොස් බමුණා හා සමඟ කරණ ලද මන්ත්‍රණයෙන් ගැලවීමටද කී බස බොරු නොකොට වහා පලා අව මැනවැයි සමුදින.

එපවත් අසා සුතසෝම රජ්ජුරුවෝ සබඳ තෝ අමුත්තක් නොසිතා සතාරහ ගාථා සතර අසා ඒ ධර්ම කථිකයාට පුජාකොට එමියි වදාළසේක.

ඉක්බිති පෝරිසාද මහරජ නුඹ වහන්සේ විසින් කරණලද්දේ රජදරුවන් නොකළමනා සපථයෙක, වැලිත් සිහි ඇතිවුව මැනවැයි කීය. එපවත් අසා බෝධිසත්වයෝ සබඳ තෝ මා බාල අවස්ථාවෙහි පටන් පුරුද්දෙහි සිතාවකටවත් බොරුවක් නොකී බව දත්තෙහි වෙද්ද දැන් වනාහී මම රාජ්‍යයෙහි පිහිටා ධර්මාධර්ම දෙක ඉඳුරා දන්නෙම් කුලම බොරු නොකියන්නෙම් වේද සෙට දවස තට බිලියමට අසුවෙමියි ඔහු ගිවිස්වා රාහුමුඛයෙන් ගැලවුනු උනු පනස් යොදුන් සඳ මඬලයේ නැවත අවුත් පොරිසාදයා දමනේ ලිම් නමැති උනුවූ අභිමානයත් ඇතිසේක් මහත්වූ කායබල ඇති හෙහින් වහා අවුදින් නුවරට පැමිණිසේක. රජ්ජුරුවන්ගේ චතුරංගනි සේනාව සුතසෝම රජ්ජුරුවන්ගේ නුවරට පැමිණිසේක. රජ්ජුරුවන්ගේ චතුරංගනි සේනාව සුතසෝම රජ්ජුරුවෝ නම් ඉතා පණ්ඩිතයෝය. ව්‍යක්තයෝය. මධුරවූ ධර්ම කථා ඇත්තාහුය. එක් දෙබසක් කියාපියන්ට අවකාශ ලද්දාහු වි නම් ඒ සොරහු අතින් යෙහෙන් ගැලවි එන්නාහුයයි කියා සිතාත් රජ්ජුරුවන් පෝරිසාදයාට දිපියා ආ නියා වේදැයි බොහෝදෙනා නින්දා කෙරෙත් දෝහෝයි යන භයින්ද පිටි නුවරටම කඳවුරු බැඳගෙන හුන්නාහුය. දුර එන්නාවූ රජ්ජුරුවන් දැක සතුටුව පෙර ගමන්කොට ගොස් වැඳ ස්වාමිනි කෙසේ ගැලවුනසේක්දැයි පිළිසඳර කථා කෙරෙමින් වටකොට පිරිවරාගත්හ. ඒ බෝධිසත්වයෝ එබඳුවූ චණ්ඩ පරුෂවූ සාහිසිකවූ ක්‍රියා ඇති පෝරිසාද පවා මාගේ ධර්ම කථා අසා මා පසුව යන ලෙසට අවකාශ දිනැයි වදාළසේක්.

SANHIDA LANKA

ඉක්බිති ඇමැත්තෝ රජ්ජුරුවන් සර්වාභරණයෙන් සරහා ඇතු පිටට නංවා නුවරට වඩාගෙනාහ. එකල්හි සියලු නුවරවාසීහු චන්ද්‍රකාන්තිය දුටු ක්ෂිර සාගරය මෙන් මහබෝසතානන් දැක සතුටුවුහ.

ඒ මහා බෝධිසත්වයෝද තමා ඉතා දම්සොඬ සෙයින්ද පළමුශ්‍රත සන්තෝෂයෙහි දඹදිව ප්‍රසිද්ධ හෙයින්ද

දෙමව්පියන් දක්නට නොගොසින් ම රජගෙට ගොස් බමුණා කැඳවා දූලිරුවුළු අන්දම් තබා සුවඳ පැනින් ඉස්සෝධා නහවා ඇඟර ගල්වා වස්ත්‍රාලංකාරයෙන් සරහා තමන් වහන්සේට මේ වඩන රාජ භෝජනය අනුභව කරවා පසුව තමන් වහන්සේ මේ නිමවා නගන ලද රන්පුඩු සේසත් ඇති මාහැඟි රාජාසනයෙහි වඩා හිඳුවා ධර්ම ගෞරවයෙන් සුවඳින් මලින් පූජාකොට තමන් වහන්සේ මිටි අස්නෙක්හි වැඩහිඳ දොහොත් මුදුනේ තබා ආචාරීනි නුඹ වහන්සේ මට ගෙනා සතර ගාථා අසනු කැමැත්තෙමි ආරාධනා කළහ.

එසඳ මහබෝසතානන් විසින්ම ආරාධිතවූ නන්ද බ්‍රාහ්මණ තම සුවඳින් අත උලා පසුම්බියෙහි තුබූ සිත්කළුවූ පොත අතට ඇරගෙන දැතින් අල්වා ගෙන කාශ්‍යප සර්වඥයන් දේශනා කළ ක්‍රමයෙන්ම රූපමදය ඓශ්වර්ය මදය යෞවන මදය පුරුෂමදය යනාදීන්වූ මදමාන භංගය කරන්නාවූ තවද සංසාරවර්තනී සියලු සත්වයන්ගේ රාගාදී චන්ද්‍රසාග්ගියම මහ මේඝයක් බඳුවූ සසර ඉපදීම නැමති තෘෂ්ණා දළුවට ග්‍රීස්ම කාලයක් බඳුව, තවද සංසාර වෘත්තියෙහි අචිලිපත්ව අමෘතමහා නිර්වානය පමුණුවන්නාවූ ඒ ගාතා සතර පොත බලා දේශනා කෙළේය.

ඒ කෙසේද යත්

සකිදේව සුතසොම සබ්භිහෝතු සමාගමෝ,

සතං සංගති සාලෙති නසබ්භිබහු සංගමෝ,

සබ්භිරෙව සමාසොථ සබ්භිකුබේබළු සන්තවං.

සතං සද්ධම්මඤ්ඤය සොයොහොති න පාපියෝ.

ජීර්නතිවෙ රාජ රථාසුචිත්වා අථො සරිරම්පි ජරං උපෙති,

සත්ඤ්ච ධමොමාන ජරං උපෙති සනෙතා හවේසබ්භි පාවෙදයන්ති,

නභාවදූරෙ පඨවිවදූරෙ පාරං සමුද්දස්ස තදාහු දූරෙ,

තතෝ හවේදූරතරං වදන්ති සත්ංච ධම්මං අසතංච රාජා

යනාදි වශයෙන් බමුණානෝ තුමු පොත කියවා මුවෙන් නොබෑණ හුන්හ. එසඳ මහාබෝධිසත්වයෝ ගාථා අසා එන ගමන සඵලයයි සතුටුව සිතන්නාහු මේ ගාථා සතර සාවක භාසිතයකුත් නොවෙයි, කවින්ගේ බන්ධනයකුත් නොවයි. බුදුහු සර්වඥාසිතය එබැවින් පූජා මිට මිලකවරේදෝහෝයි සිතන්නාහු ඉදින් මේ සතිස්ලක්‍ෂ දස දහස් තුන් සිය පණස් යොදුන් චක්‍රාවාටාභිය භවාග්‍රය දක්වා සත්රුවන් පුරා දුනෝතිනුත් මෙතෙක් අගිදෝහෝයි සිතු සිතට දඬුවමටත් නොසෑහෙන්නේය. පූජාවේ අගේ කියනුම කිම්ද?. එසේ හෙයින් එතකුදු උවත් මාගේ ආඥාව පවත්නාවූ තුන්සියයක් යොදුන් කුරු රට හා සත් යොදුන් ඉදිපත් නුවර හා සියලු සම්පත්තිය දීපියන්ට පොහොසත්මි රාජයාට සුදුසුව කුසල් ඇද්දෝ හෝ නැද්දෝ හෝ ලක්ෂණ මන්ත්‍ර වශයෙන් පරීක්ෂාකොට වදාරණසේක් එබඳු භාග්‍යයක් නැති නියාව දන සෙනෙවිරත් ඇපා මාපා ආදී මනායෙක් තනතුරු බලා ඊටත් කුසල් නැති බව දන සම්පත්තීන් කෙළෙස් වස්තුයෙහි පටන් පරීක්ෂාකොට සාරදාසක් පමණ මසුරන් ලබන්ට සුදුසු කුසල් දක දාසින් බැඳි පියලි සතරකින් පූජා කොට අචාරීනි තෙසු දඹදිව කුසල් දක දාසින් බැඳි පියලි සතරකින් පූජාකොට ආචාරීනි තෙසු දඹදිව රජදරුවන්ට මේ ගාථා දේශනා කළ කල කෙසේ වස්තු ලැබේදැයි විචාරා මහරජ සියයක් මසුරන් ලැබෙමි, එසේහෙයින් සතාරහ නම් වියයි කී කල. එපවත් අසා මහාබෝසතානෝ අචාරීනි තොප ගෙන ඇවිදිනා බඩුයෙහි අගය තොපි නොදන්නාව, එසේ හෙයින් මෙතැන් පටන් මේ ගාථාවෝ සහස්සර ගාථා නම් වෙති, සාරදහසකින් පූජාකොට ඉක්බිති බමුණාන්ට සැප යානාවක් දී ගෙට යවුහ. එසඳ සුතසෝම රජ්ජුරුවෝ සතරහ ගාථාවට සහස්සරාහ පූජා කළහයි මහත්වූ සාධුකාර නාද පැවැත්තේය.

ඉක්බිති බෝධිසත්වයන් දෙමව්පියවූ රජදරුවෝ දෙදෙන එපවත් අසා තමන් සම්පතෙහි ලෝභ බැවින් නොසතුටු වන්නාහ. එද බෝධිසත්වයෝ බමුණා යවා තමන් වහන්සේ දෙමව්පිය දෙදෙනා කරා ගොස් වැඳලා එකත් පසෙක සිටිසේක. ඉක්බිති සොරහු අතින් ගැලවුනේ කෙසේදැයි පිළිසඳර කතා මාත්‍රයකුත් නොකොට තමන් වස්තුලෝභී බැවින් ගාථා සතරක් අසා සාරදහසකින් පූජාකළේ සැබෑවදැයි විචාළාහ. එසඳ බෝධිසත්වයන් වහන්සේත් පියානන් වහන්ස මම වනාහී සියලු ගංගාවන්ගේ දිය වැදීමෙන් නොපිරෙන්නාවූ මහා සාගරය මෙන් යම් සත්පුරුෂ කෙණෙක් මා සමීපයට එළඹ මනාවූ භාසිතයක් කියන්නාහු විනම් ඒ ඇසීමෙහි සතුටුවූ පමණක් මුත් සම්පත්තින් ප්‍රයෝජනයක් නැත්තෙමි. ඊට කාරණා කිම්ද යත් වස්තුව නම් සොරුන්ට සතුරන්ටත් දියටත් ගින්නටත් වස්තු ස්වාමි හටත් සර්වසාධාරණය. එසේ හෙයින් අනෛයර්නිකවූ

SANHIDA LANKA

සම්පත්තිය මනාවූ සද්ධර්මයට පූජාකොට අනුගාමික නිධානයක් නිධානකිරීම කෘතපුණ්‍යයන්ගේ ලක්ෂණයකැයි කියා දෙමව්පියන්ටත් අස්වසා වදාළසේක.

මෙසේද කියා මහාබෝසතානන් වහන්සේ පියාණන් වහන්ස සම්පත් කරණාකොටගෙන මට නින්දා කරණ සේක්ද මම වනාහි බණ අසා නැවත තා සමීපයට එමියි සොරහට සපතකොට නැගීආමියි. එබැවින් සමබසට දිවිපුදා ආයුතුමවෙයි. නුඹ වහන්සේ සන්තකවූ මේ ඇත්, අස් , රථ පාබල සෙනඟ හා සමඟ වල්විදුනාවය, නලල් පටය, මගුල් කඩුවය, සේසත් ඡත්‍රය, මිරිවැඩිසඟලය,යි දක්වන ලද පංචරාජ කකුධ භාණ්ඩයද සියළු වස්තුකාම කෙලශකාමයෙන් ධමුර්ධ වූ මේ රජ්‍යය ආනුභව කළ මැනවැයි පියරජහට රාජ්‍යය පාවා දුන්සඳ රජහුගේ ලය ඉලිලහුණ. එසඳ මහත්වූ සෝකයෙන් කුමක් කියව්ද දරුවෙනි හස්ති ආශ්වාදි චතුරංගනී සේනාව හා මහත්වූ ධනුද්ධර යෝධයන් ඇත්තේ මෙසේවූ අපදාර්ථයට පැමිණියාවූ තමාගේ ජිවිතය ගලවාගන්නා පිණිස වේද එසේහෙයින් සියළු කසී රාජ්‍යය වාසීවූ සිව්රඟසෙනඟ සරහාගෙන ගොස් අපට පස මිතුරු වූ සොරහු ජිවිතක්‍ෂයට පමුණුවම්හ. තොප ඔහු කරා යා නොහැක්කැයි කීය. ඒ රජ්ජුහුගේ සොළොස් දහසක් නාටක ස්ත්‍රීහුද අවශේසවුන් පරිවාර ජනයෝද කඳුළු හුණු මුහුණු ඇතිව නැවත රජ්ජුරුවෝ පෝරිසාදයා සමීපයට යෙත්ලයි මහ හඬින් හඬා යුගාන්ත වාතයෙන් පැහැර වගුරුවාවන ලද මහසල් වනයක් සෙයින් එක පැතිර මොරගනාන්ට පටන්ගත්හ.

එසඳ මහබෝසතාණෝ පියානන් වහන්ස ඒ පෝරිසාදතෙම නොමරා අල්වාගෙන ගොසිනුත් මාගේ බස් ඇදහිලි කොට මාගේ ධර්මශ්‍රවණයට බාධා වක් නොකොට නැවත එවුව ඒ ඉතා අරුමය. එසේහෙයින් ඔහු කරණලද විශ්වාසය සඳහන් කරන්නාවූ මම ඔහුට දුෂ්ටකමක්ද මාගේ බසට කැලලක්ද නොකෙරෙම්මියෙයි දෙමාපියන් අස්වසා මහරජ මම කරණලද මහත්වූ කුසල් ඇත්තෙමි. එසේ හෙයින් චාතුම්හාරාජිකාදීවූ සදිව්‍යලෝකයෙහි දිව්‍යමයවූ පඤ්චකාම සැපය නම් මට කොෂටාගාරයෙහි පිරූ ධාන්‍ය සඤ්චයක් මෙන් මට ප්‍රත්‍යක්‍ෂව තුබූයේය. එසේහෙයින් රජ්ජුරුවන් වහන්ස ක්‍රිත ක්‍රිත්තව සිටියාවූ අප වැන්නවුන්ට රාජ්‍ය සම්පත්ති නම් ඉතාලමකය. එහෙයින් මම පෝරිසාදයා සමීපයට යෙමේයි දෙමව්පියන් දෙදෙනා වැඳ සමුගෙන ගම නියම්ගම වැසි සියලු සත්වයන්ද අස්වසා සියලු සංස්කාර ධර්මයන් අනිත්‍යය සේ ධර්මදේශනාකොට මහබෝසතානෝ සැබෑබසට දිවිපුදා එදවස්ම රජගෙයි ලැග දෙවෙනි දවස් අරුණෝදය නික්මුණසේක. එසඳ පසුපස්සෙහි අඬා ගෙන හුණු අන්තඃපුර වන්නාදිවූ සියලු ජනයන් වලකාගන්ට නොපොහොසත්ව තමන් නික්මුණු මහපිත අවුරා හිරි හැඳ මා කෙරෙහි සෙනෙහ ඇති කෙනෙකුන් මේ ඉර පැනපියා නෙළුව මැනවැයි වදාළසඳ සිල්වත්වූ මහතේජස් ඇති මහබෝධිසත්වයන්ගේ අණ ඉක්මවාපිය නොහිම මහහඬින් මොරගා සිංහ විජ්‍රාමානයෙන් නික්මුණු මහබෝසතාණන් බල බලා දර්ශන පථය ඉකුත්වනතෙක් සිට හඬා වැලප නුවරට වන්හ. මහබෝසතානෝ තමන් නුවරට වැඩි මගින් පෝරිසාදයා සම්පයට ගියහ. යන්නාවූ තැනැත්තන් වහන්සේද සුතසෝම රජ්ජුරුවෝ එත්වා නෙඑත්වා රුක් දේවිය යමක් මට කැමැත්තෝ නම් තමා හැඟුනවක් කෙරෙවයි මේ රජදරුවන් මරාපියා පඤ්චව මධුර මාංශයෙන් බිලියම් කෙරෙමි දර සෑයක් බැඳ අඟුරු බස්නා පිණිස ගිනි මොලවා මස් පලගන්ට උල් සයිමින් උන් තැනැත්තවුන් පිටිපස්සෙහි ගොසින් සිටිසේක. එසඳ පෝරිසාද පදසඟිඥාවෙන් කරකැවී බැලුයේ දෙපෝමැදනැගී පුන්සඳ මඬලක් සෙයින් දිලිසෙන්නාවූ මහබෝසතාණන් ගේ මණ දැක චන්ද්‍රකාන්තියෙන් පිපීගිය කෞමදයක් මෙන් සතුටු සොම්නසින් පිනා මහරජ නුවරට ගිය නුඹ වහන්සේ කළමනා කටයුතු කොට වැඩි සේක්දැයි විචාරා එසඳ ශ්‍රීමහා බෝධිසත්වයෝද සබඳ ඓහලෞකික පාරලෞකිකාර්ථ සිද්ධි ප්‍රසවයකරන්නාවූ කසුප් සම්මාසම්බුදුන් දේශනාකළ සතාරහ ගාථා සතර අසා සහස්සාරහ පූජා කොට සබවසට පුජා කොට තාකරා නැගී එමියි කියා ඉනිබ්බ තෝ මා මරා යාගය කරතත් මස් අනුභව කරතත් කරවයි වදාළසේක.

එපවත් අසා පෝරිසාද මේ රජ්ජුරුවෝ කිසි භයක් නැතුව මා සම්මුඛයෙහි කථාකෙරෙති. ඒකාන්තයෙන් මොවුන් ඇසූ බණෙහි ආනුභාවයෙක් විය යුතුයයි සිතා මමත් උන් අතින් අසා නිර්භය විය යුතුයයි සිතා මහරජ දුම් රහිතව බස්නාලද සහ අඟුරෙහි පහන ලද මස් තෙමි ගිරිය. එබැවින් මෙදා රුචිතකය අඟුරුබට කල පලාහකත් පිළිවම්වේද එතකට තොප ඇසූ සතරහා ගාථා මට කියව. අසන්නට අභිප්‍රා ඇත්තෙමි කීය. එපවත් අසා මහබෝසතානෝ පෝරිසාදතෙම තමාගේ පව්ටුගුණ ස්වභාවකොට ඇත්තේය. එබැවින් (මෙදා රුචිතකයේ අඟුරු බට කළ) මදක් ඔහු නලවා නිග්‍රහකොට ලජ්ජාකරවා පසුව කියම්යි සිතා පෝරිසාදය තෝ ඉතා අධර්මිෂ්ටසේක. බඩ පිණිස තෘෂ්ණාවට ගැතිව ඊනියා රාජ්ජ සම්පත්තියෙන්ද පිරිහුණෙහිද එසේ හෙයින් නිරන්තරයෙන් මලවැකුණු අත් ඇතිව අනුභව කරන්නෙහිය. එසේහෙයින් තා කෙරෙහි සත්‍යවාදී ගුණයෙක් නැත. අධර්මිෂ්ටවූ දරුණුවූ තට නවලෝකෝත්තර දහම් ඇසීමෙන් ප්‍රයෝජන කවරේද. එම්බල ධර්මාධර්ම දෙක සමුද්‍රයෙහි එතරට මෙතර සෙයින්ද රසාතලයට භවාග්‍රයසේයි සමානොවන්නේය. එසේහෙයින් පෝරිසාදයා සිංහතෙල් රදත් කසුන් බඳුන සුදුසු උනබවමුත් මැටි බඳුන්හි රැඳවිය නොයෙක්මය. එසේහෙයින්ම අප වැනි සත්තිස් බෝධිපාක්‍ෂික ධර්මයන් පුරුදුකරන්නාවූ සව්ර්ගගාමිව සිටි මහත්මයන් විසින් අසා දරු

SANHIDA LANKA

නවලෝකෝත්තර දහම් තොප වැනි අපාය මාර්ග ප්‍රතිපන්නව සිටියාවූ තොප වැනි වුවන්ට ඇසීමෙන් කම් කින්දැයි වදාළසේක. එසේ නිග්‍රහකොට වදාළ මහබෝසතානන්ගේ මෛත්‍රී ආනුභාවයෙන් කිපියානොහි තමාද ශිෂ්‍ය බ්‍යකත හෙයින් අනික් උපමාවක් ගෙනහැර දක්වන්නේම් මහරජ සියලු දඹදිව්තලයෙහි රජ දරුවෝ සර්වාලංකාරයෙන් සැරසී මහත්වූ බල ඇති සෙනඟ පිරිවරා උතුම් පුරවලට පැනකැගී පුවදඩගොස් තියුණුවූ ගැරයෙන් මුවන් විද ජීවිතක්ෂයට පමුණුවන්නාවූ සම්භාරකෙනෙක් නොකන බවමුත් අර්ථය පිණිස පුරුෂයන් මරන්නාවූ මෙදකින්ම පරලොව විපාක සරිය. එසේහෙයින් නුඹ වහන්සේ  කුමක් පිණිස මාව අධර්මිෂ්ඨ කොට කියනසේක්ද ඉදින් ඒ මාගමාංශචාජව මුවන් මරාකන්නාවූ තෙසු රජ දරුවෝ නිර්දෝෂයෝ විනම් පූරිෂමාකරණය කරන්නාවූ මමත් නිර්දෝශ වෙම්මයයි කියා එපවත් අසා සුතසෝම රජ්ජුරුවෝ ඔහුගේ ලබ්ධියබිඳ උදාහරණයක් ගෙනහැර දක්වන්නාවූ සබඳ පෝරිසාදය රාජ ධර්මයන් රක්නා රජ දරුවෝ ඇතුල් වලසුන් දිවියන් බල්ලන් බලලුන් ආදිවූ පස්නිය ඇති සතුන්ගේ මස් නොකන්නාහුය.

යථෝක්තවූ පස්ජාතියද තම තමන්ගේ  මස්ද නොකන්නාහු තෝ වනාහි පස්නිය ඇති නොකැයුතු ස්වජාතියෙහි මස් අනුභවකරන්නෙහි තිරිසන් සතුන් විවරටත් අඩුවෙහිදැයි වදාළසේක. එපවත් අසා පෝරිසාද බලවත් නිග්‍රහයට පැමිණ අනික් ග්‍රන්ථයක් නොදක්නේ තමා කළ පව්සමාකොට අනික් උදාහරණයක් ගෙණහැර කියන්නේ මහරජ නුඹ වහන්සේ මා වැනි එක්කහු අතින් ගැලවිගෙණ සියලු පංචකාමසම්පතියෙනි සමෘද්ධවූ සවකීයවූ භවනායට ගොස් පසමිතුරු වූ මා සමීපයට නැවත ආසේක. ඒ තමා රාජධර්මයට ඇතුළත්දැයි කීහ. ඉක්බිති මහබෝසතානෝ සබඳ රාජධර්මයෙහි දක්ෂ කෙණෙකුන් මට වඩා මෙලෙව්හි නැත. දවස්පතා උදය රේඛාව නොවරදවා නැගෙණහිරක් සෙයින් දස රාජ ධර්ම නැමති රේඛාව නොරදවා පවතීද සකලලෝකයෙහි ව්‍යාප්තවූ කීර්ති ඝෝෂා ඇත්තෙමි. එසේ හෙයින් දසරාජ ධර්මයට ඇතුළත්ව සිලයෙහි අන්තහිතව සබවරක්නා පිණිස තොප වැනි චණ්ඩ සත්වයකු කරා නැගි ආමි. ඉදින් මාගේ සබවසට කැලලෙක්වී නම් තොවැනි පාපිෂ්ට සත්වයන්ටම නියමවූ තර්කයට යන්නෙම්වේද. එසේ හෙයින් ලාමක ක්‍රියාවට ඇතුළත්නොවන පිණිස සබවසට දිවි දිමියි වදාල සේක. ඉක්බිති පෝරිසාද තෙම මහරජ වස්ත්‍රාභරණ ධන ධාන්‍යාදියෙන් පිරුනාවූ සියලු පොලොවද තුන්සෘතුවට කරණලද්දාවූ දිව් විමන් බඳුවූ උතුම්වූ ප්‍රාසාත්වයද සොළොස් දහසක් පමණ දෙවඟනන් බඳුවූ වරඟණන්ද අප්‍රමාණවූ ඇත් අස් රථ පාබල සෙනඟද ගවමහිසාදීවූ සම්පත්තියද තුන්වෙලෙහි ගෙණහැර පමුණුවනලද රක්තවන්‍දනාදීවූ නොයෙක් ආහාරදැයි යන මේසා මහත් රාජසමෘද්ධිය හැර සබවසයෙහි කවර ආනිසංසයක් දැක සබවසට දිවිපිදුසේක්දැයි විචාළේය. එසඳ මහබෝසතානෝ ලැව්ගිනි නිවා බස්නා ආකාසගංගා ප්‍රවාහයක්මෙන් විචාළ බසට අනුරූපවූ ධර්ම කථාවක් ගෙනහැර දක්වනසේක් සබඳ මේ පොලෝතෙලෙහි විද්‍යාමාන වූ යම්කිසි රසයක් ඇත්නම් ඒ සියලු රසයන් කෙරෙන් සත්‍යවචන නමැති රසයම උතුම ඊට කාරනා කින්දයත් සබවසෙහිම පිහිටියාවූ ශ්‍රමණ බ්‍රාහ්මණාදීවූ හැම ජාති ජරා ව්‍යාධි මරණාදීවූ සකලදුක්ඛ නමැති සාගරය මෙන් එතරව සාන්තිපුරයට පැමිණෙන්නාහුයයි මෙසේ ඒ මහ බෝධිසත්වයෝ සර්වඥතාඥානයෙහි පැහැර කඩාකන්ට ආ බළලකුට තමා අතතුබු ඝනරන් සැරයටියකින් පහරදුන්නාසේ උතුම් ධර්මයෙන් නිශ්‍රිතවූ ඕහට ධම්මදේශනාකොට වදාළසේක.

එසඳ පෝරිසාදතෙම බුද්ධප්‍රමුඛ ප්‍රබුද්ධවූ පද්මයන් පරිද්දෙන්ද නගෝ මධ්‍යගතවූ චන්ද්‍රමණ්ඩලය පරිද්දෙන්ද දහසක්වර වරදිවිදලින් ඔප් නැගූ ඝන රන් කැටපතක් සරිද්දෙන් දිලියෙන්නාවූ මෛත්‍රීපූර්වාගමනයට බද්ද අස් මිත්‍ර ප්‍රකාසකෙරෙමින් කරණලද කථා ඇති මහබෝධිසත්වයන් මූණ දැක මේසා අඟුරුැරැසක් හා සසනාලද උල් අදීවූ නොයෙක් කන්කටුල් බල බලා බනදේශනා කරන්නාවූ චන්ද්‍රකාන්තිය දුටුසඳකැන් මිනියක් සෙයින් මෛත්‍රීන්  අද්දාවූ මේ මුහුණු කිසිත් චිත්තො ත්‍රාස මාත්‍රයකුත් නැත. කිමෙක්දෝහෝ මේ සතරහා ගාථායෙහි අනුසස්දෝ නැත. සබවසයෙහි අනුසස්දෝ නොනොත් කවර ආනුභාවයෙක්දෝහෝයි විචාරමි සිතා මහරජ මෙබඳු මිනීමරණ සොරක්හු සමීපයෙන් ගැලවි මධුරවූ පංචකාම ගුණයෙන් ගැවසීගත් නුඹ වහන්සේගේ රජගෙට ගොස් එබඳු රාජශ්‍රිය අපේක්ෂානොකොට නැවත මාකරා ආසේක. එසේහෙයින් නුඹ වහන්සේ මරණභය නැති සේක් කාරණා කින්දැයි විචාළේය.

ඉක්බිති බෝධිසත්වයන් වහන්සේ සබඳ මා විසින් බුද්ධාදීවූ සත්පුරුෂයන් විසින් ප්‍රශංසා කරණලද දාන ශිලාදි දසපුණ්‍යක්‍රියා වස්තු නොකඩකොට පුරණලද තවද පෝරිසාදය දෙමව්පිය දෙදෙනාවහන්සේටද මනාකොට උපස්ථාන කරණලදිමි තවද බන්ධුවර්ගයා මිත්‍ර පුත්‍ර කලත්‍රාදීන්ද උන් උන්ගේ අභිප්‍රානුකූලවූ පරිද්දෙන් පෝෂ්‍යකරණලදිමි. එසේ හෙයින් සබඳ නිවන්පුරයට යන්නාවූ මග මාසේ එලිකරණලදිමි. එසේ හෙයින් සබඳ නිවන් පුරයට යන්නාවූ මග මාසේ අනුභව කෙරෙම්යි නමුත් යාග කෙරෙයි නමුත් නා අගුණෙ කැයි වදාළසේක.

මෙසේ මහබෝසතානන් බණවදාරාත් පොරිසාද සිතන්නේ මේ සුතසෝම රජ්ජුරුවෝ උතුම්වූ සත්පුරුෂ ධර්මයෙහි පිහිටියාහ. ඥානසම්පන්නයහ. මධුරභාසිතයහ. ඉදින් මොහු මරා යාගකෙළෙන්නම් මාගේ ඉස

SANHIDA LANKA

සත් කඩක්ව පැලියන්නේය. නැවත පොළොව හෝ විවරදී ගැලියන්නේයයි හයින් ත්‍රස්තව මහරජ නුඹ වහන්සේ වැනි සත්‍යවාදී රජක්හු යමෙක්මැරුයේ වීනම් හලාහල විෂයක් අනුභාව කලානම් වැන්නේයයි හිනිගෙන දිලියෙන යවටක් ගිලුවා වැන්නේයයි කීහ.

නැවත සතරාහ ගාථා අසනුකැමතිව අදාර ගෞරවයෙන් මහරජ සත්වලෝකයෙහි යම්කිසි සත්වකෙනෙක් බණ ඇසීමෙන් කුසලා කුසල විපාක දන්නාවූ එබැවින් මමද නුඹ වහන්සේගෙන් සතර හා ගාථා අසනුකැමැත්තෙමි මාගේ සිතද දූන් දහමට ඇලෙයි කියා යාඥාකෙළේය.

ඉක්බිති මහබෝසතානෝ දූන් වනාහි මොහුගේ ලය අදදවිය ඉනිධබන්කීම මනාකලයි සිතා  වදාරා සබඳ එසේවිනම් කන් යොමුකොට අසයි කියා නන්දබ්‍රාහ්මණයා කීලෙසම ගාථා සතර දේශනාකොට තමන් සූක්ෂමවූ නුවනින් විනිවිද දත්තාවූ අර්ථ දක්වා වදාරණසේක.

සබඳ කල්‍යාණමිත්‍රයන් සමග එකවාරියක් කරණලද සමාගමය බොහෝ දවසක් ඓහෙලෞකික පාරලෞකිකාර්ථ සිද්ධි ප්‍රසවයකොට රැකලන්ට සමර්ථය යනු එකෙක තවද අසත්පුරුෂයන් හා සමඟ සියක් අවුරුදු එකතැනක විසුවත් දවසක් රැකලන්ට අපොසත යනුදුළුකෙක.

තවද මහරජ සියලු ඉරියම්වෙහිම නුවණැති පණ්ඩිතවරු හා එක්වම වාසයකළ යුතුමය. ඒ ඒසේමයයි සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් පුරුදු කරන්නාවූ සත්පුරුෂයන් හා එක්වූ සත්වතෙම එම ධර්මතෙම උතුම්සේ දැක පුරුදු කරණ ලදුව සවුපසේ බුදුතැන් ලැබෙයි එසේහෙයින් ඒ ධර්ම පුරුදුකරන්නාවූ සත්පුරුෂයන්ට සියලු ලෙසින් සළුලවන්නේය.

තවද පොරිසාද රජ්ජුරුවෙනි රජදරුවන්ට අග්‍රවාහනයවූ මනාවූ කර්මාන්ත ඇති රථයය මෙසේ කිසිකලෙක දිරායෙද එමෙන්ම චත්‍රිංශත් කුණපොකොටඨාසයන් සමාධානවූ මේ ශරීරයද කලෙක ජරාවට පැමිණෙයි. වැලි ජරාවට නොපැමිණෙනේ. කවරදයත් සත්පුරුෂවාසයෙන් පැමිණෙන්ණාවූ ගුණ ධර්ම රාජප්‍රාප්ත නොවෙයි. කවරකාරණයෙන් දූයි යත් එසත් ධර්මය පුරුදුකලාවූ ජරාවුවද ජාති ජාතියෙහි ඒ ධර්මගෙන බොහෝ සම්පත්තියෙහි රූපයෙහි යෞවනයෙහි ඓශ්වර්යයෙහි ආධිපත්‍යයෙහි පිහිටු වනලද හෙයිනැයි දනුව.

ආකාශයට පොළොව සෙයින්ද සමුද්‍රයෙහි එතරට මෙතර සෙයින්ද ධර්මා ධර්මදෙක එක් නොවෙතියි නුවනැත්තෝ කියති. අසත්පුරුෂ සමාගයෙන් පිහිටියාවූ අධර්ම සමාදානයෙන් ඇත්තාහුද ඉදින් සත්පුරුෂ සමාගමෙන් ලත් අවවාද පිළිගෙන විසුවහොත් සසර සයුරෙන් එතරවියහැකියයි යනාදීන් සියලු වනදේවතාවන් ලවා සාධුකාර දෙවමින් ඕහට සතරහා ගාථා අර්ථ වදාළසේක.

මෙසේ මහබෝධිසත්වයන් මිහිරිවූ කටහඬින් ධර්මදේශනා කරත් කරත් තමාද ව්‍යක්ත බැවින් මේ හිමියානෝ මතුලොවුතුරා බුදුවන කෙනෙකුන් සැටියයි සිතත් සියලුශරීරය පස්වනක් ප්‍රීතියෙන් පිනාගියේය. එසඳ මහබෝසතාණන් කෙරෙති මොළොක්වූ සිත් ඇතිව රාජ්ජය දූන් පියාණන්  සතුටුව ඇසින් බලා මම නුඹ වහන්සේට දිපියන්ට සුදුසුවූ රන්රුවන් මුතු මැණික් ආදීවූ වස්තුවක් නොදකමි. මේ මා අර්ථ ව්‍යජන සහිතවූ ගාථා අසා සතුටුවූයෙම් නුඹ වහන්සේට ගාථාසතරට වර සතරක්දෙමි ගතමැනවැයි කීයා එපවත් අසා මහබෝධිසත්වයෝ සබඳ තොපට වන්නාවූ මරණයත් නොවන්නේ හිතට වන්නාවූ මෙලෝ පරලෝ දෙක්හි වන්නාවූ අර්ථ අනර්ථ නොදක්නෙහිය. සබඳ මේ සත්වලෝකයෙහි මා ඇතුළුවූ සියලු සත්වයෝ මරණ ධර්මයෙන් නිර්මුක්තවූ සත්වකෙනෙක් නැත. එහෙයින් නුවනැත්තාවූ සත්වයෝද  මරණ ඒකාන්තසේදක මරණින් මත්තෙහි තමන්ට හිතකැමතිව රෙලෙව්හි සුවසඳහා පර්ණිවාආදීවූ පස්පවින් වැලකෙන්නාහුය. මරණවත් මරණ මත්තෙහි වන්නාවූ සවර්ගීපාය දෙකත් අපෙක්ෂාව නැත්තෙහි මින් මට වැඩෙක් අවඩෙක් වන්නේයයි නොසිතා අකුසලධර්මයෙහිම ව්‍යවෘතව මිණිමරා අනුභවකරන්නෙහිය. එසේවූ තැනැත්තවූ විසින් දෙම්මැයි කී වරය තිරයයි සිතා හැරගැන්ම පණ්ඩිත කමට ඇතුළත් නොවන්නේවේදැයි වදාළසේක.

ඉක්බිති පොරිසාද කියන්නේ මහ රජ ජීවිතය තොත්වා නුඹ වහන්සේට මාදුන් වරයට හානියෙක් කිසි කළෙකත් නොවේ මා ශක නැතිව වරගත මැනවැයි කීය.

එසඳ බෝධිසත්වයෝ මේ තෙම ඉතා බුහුටිව කියන්නේය. එබැවින් ඉනිබ්බ වර ගතමනාකල එතකුදු උවත් මිනිමස් නොකැයුතුයයි යනවර පළමු කොට ගතිමි නම් බලවත්ව මිරිකෙන්නේය. එසේහෙයින් පළමුකොට අවශේෂවූ වරතුණ ගෙණ පසුව එකියන වරය ඉල්වාගනිමියි සිතා සබඳ උත්තමයෝ උත්තමයන් හා මිත්‍රධර්මය කෙරෙති. එසේම චණ්ඩාණවන්තයන් එක්වන සුල්ලභ උත්තම ජාති දෙපක්ෂයෙහි ඇත්තවුන් සමග වාසය ගංගා නම් ගංගාවෙහි ජලයත් යමුණා නම් ගංගංවෙහි ජලයත් එක්වූවාසේ උතුම් වන්නේය. එබැවින් අවුරුදු සියයක් ජීවත්වන්නාවූ තමාගේ ඇසින් දක්නා අභිප්‍රා ඇත්තෙම් ඒ වරය පළමුකොට දෙවයි පෝරිසාදයන්ගේ ජීවත්වීමක් කැමති උවක්හුමෙන් තමන් වහන්සේ ඉතා ව්‍යක්ත බැවින් මාගේ ජීවිතය දෙවයි නොඉල්වා ඔහු

SANHIDA LANKA

අවුරුදු සියයක් ජීවත්වීම තමාදක්නේ තමාගේ ජීවිතය ඇවිති හෙයින් වේදැයි ප්‍රසන්නකොට අවුරුදු සියයක් ජීවත්වන්නාවූ තා දක්නා කැමැත්තෙමි. මේ කියන වරය පළමුකොට ඉල්ලුසේක.

එසඳ පොරිසාදයෝ මේ රජ්ජුරුවෝ තමන්ගේ එබඳුවූ තමන්ගේ යසඓශ්වර්යකින් පිරිහෙළා අල්වාගෙණ මරාකාපියන්ට සිතු මාසුබිසුවපත් වන්නා කැමැත්තම්හ. අනේ මුන් පරාර්ථයෙහිම ශරහුනුබවක් ඉතා යහපත් නිසායයි සතුටුවූ සිත් ඇත්නම් වංචාකොට වරයගත්බව නොදන වරදෙන්නාවූ තැනැත්තේ.

එසේම මහරජ උතුම්වූද නුවන ඇත්තවුන්ගේද සහ වාසය යනු නුඹ වහන්සේ වදාළ ලෙසම උත්තමය අවුරුදු සියයක් ජීවත්වන්නාවූ මා සුවසේ දක වදාළ මැනවැයි යන මේ පළමුවන වරය දිනිමියි ඇරගතමැනවැයි දින ඉක්බිති මහබෝධිසත්වයෝ දෙවෙනි වරය ඉල්ලන්නාවූ මහරජ යම්සේ එක් සියයක් රාජධානියෙහි රජදරුවෝම පැමිණෙන ලද්දාවූ අභිසේක ඇත්තාවූ තම තමන්ගේ නමින් ඒ ඒ ස්ථානයෙහි පළමු ස්තුතිඝෝෂා ඇත්තා හා මහත් ඓශ්වර්යයෙහි පිහිටියාවූ ඒ රජදරුවන් රජෙකු විසින් මැරිය හැක්කේ නොවෙයි එහෙයින් එක්සියයක් රජදරුවන්ගේ ජීවිතය දානය දෙවයි දෙවෙනි වරය ඉල්ලුසේක. ඉක්බිති පොරිසාදයෝ ඒ වරයත් නුඹ වහන්සේට දිනිමියි මෙසේ දෙදෙනා කරණකථාව රජ දරුවෝ සමහරක් සමහරක් අසන්නාවූපුරා නොව අසන්නට කාරණා කවරෙදෙයක් පොරිසාදයෝ ගසට දුම්වැදගනිත්දැයි යන භයින් මදක් දුරුකොට දරසය බැඳ ගිනිකළ හා එසේ හෙයින් නුග ගසට හා දරසෑයව අතුරෙහි දෙදෙනා කරණ කථාවෙන් සමහරක් අසා සතුටුව නොබෝලකින් සුතසෝම රජ්ජුරුවන් වහන්සේ පෝරිසාදයන්ද දමනය ලනසේක. නොබවයි අසුවැසූහ.

ඉක්බිති බෝධිසත්වයෝ තුන් වෙනිවරය ඉල්ලනසේක් මහරජ සියයක් රජ දරුවෝ තා විසින් අල්වාගෙණ අතුල්තල විද නුගගස එල්ලෙන ලද්දාවූ තම තමන්ගේ ජීවිතයටද සෝකයෙන් හැමවෙලෙහිම මුණ හුණු කඳුලෙන් හඬන්නාහුය. එසේ හෙයින් බන්ධුනගතවූ ඒ රජදරුවන් උනාහැර උන් උන්ගේ රාජ්‍යයෙහි පිහිටුවාලුව. මනා වරය තුන්වෙනිව ඉල්වමි වදාළසේක.

කුමක් පිණිසදයත් රජ්ජුරුවන්ගේ ජීවිත දානය දුන්ද වෛරයක් උන් හැම තමාට දස්කොට මෙනෙහිම රදවන්නාක් වත් නැත්නම් ජනපදවලට ගොස් විකෝටපි යන්නක් වත් කෙළෙම් නම් නපුරැයි උන් උන්ගේ රාජ්‍යයෙහි පිහිටුවන්නාවූ වරය තුන්වෙනි වරය ගත්සේකැයි දතයුතු.

පොරිසාද යහපතැයි මහරජයි ගිවිස ඒ වරත් දින.

ඉක්බිති සුතසෝම රජ්ජුරුවෝ සතරවැනි වරය ඉල්ලනසේක් මහරජ මේ දඹදිව එක්සියයක් රාජධානිය සම්බන්ධවූ නොයෙක් ගම් නියම් ගම්වැසි මනුෂයෝ පෝරිසාදයත් අවුදින් අප අල්වාගන්නේය. දන් අවුදින් අප අල්වන්නේයයි සිතා තා කෙරෙහිත් භයින් රක්ෂාස්ථානග වෙසෙිවවන ගහනාදියටව සියලුරට ජනසුන්‍යව ගියාසේම ගියේය. එහෙයින් ඉතා ප්‍රතික්කූලවූ මිණිමස්කෑමෙන් වැලකුවයි කියා සතරවැනිව මේ වරය ඉල්ලමි වදාළසේක.

මහබෝසතානෝ මෙසේ වදාළකල අතින් අත පැහැර සිටියා සබඳ සුතසෝම රජ්ජුරුවෙනි තොපි තමා කුමක් කියව්ද මම ඒ වරය කෙසේද පියම්ද ඉදන් ගන්නා අභිප්‍රා ඇත්නම් අනික්වරයක් පැහැරගනුව. ඒකාන්තයෙන්ම මේ මනුෂ්‍ය මංශය මට ප්‍රිය මනාමය. මේ කාරණාකොට ඒ නියාවූ රාජ්‍යශ්‍රීයක් ඇර උදකලාව වනයට වන්මියි එසේ හෙයින් මම ඉන්කෙසේ නම් වැලැක්කහෙමද අනික් වරයක් ඉල්වාගනුවයි කීහ.

ඉක්බිති මහබෝධිසත්වයෝ මෙතෙම මිනීමස් තමාට ඉතා ප්‍රියහෙයින් වැලැක්කනෙඑම්. තමාගේ නුනුවනින් කියනබවමුත් අකුසලය මුන්ට මේ නිසා පිරෙන බවමුත් තෙසු මුන්ගේ අනාචාර ප්‍රවෘත්තියෙක් නැත. ඉදින් යම් කාරණයකින් මෙයින් වලකත් මා විනා කිසිකෙණෙක් නැත, යම් උපායකින් වලකම් සිතා ඕහට බණ වදාරණසේක් මහරජ තාබඳුවූ ළදරුවයස පිහිටි ඉතා විශේෂවූ අතිමහත්වූ ඓශ්වර්යයෙහි මහරජ තා බඳුවූ ළදරුවයස පිහිටි ඉතා විශේෂවූ අතිමහත්වූ ඓශ්වර්යෙහි පිහිටියාවූ තෝ මෙමට ප්‍රියයයි පාපකර්මයෙහි ව්‍යාවෘතව මතුවන්නාහු දිව්‍ය මනුෂ්‍යලෝක සම්පත් හා නිවන් සම්පත්තීන් පිරිහී ඉතා භයානක ස්වරූප ඇත්තාවූ නරකයෙහි ඉපිද අනේවා සුව හස් ගණන් අවුරුදු මුළුල්ලෙහි සතර අපායෙන් ගොඩනැගෙනොහි දුක් අනු භව කරන්නෙහි එහෙයින් මහරජ තමාහට නොකැමැත්තවුන් විසින් තමාගේ කය තමාටම ප්‍රියවන බවමුත් අනික් වස්තුවක් පියනොවන ඉව තාගේ නුවනිනුත් පරීක්ෂාකොට බලා එසේ හෙයින් තමා තමාට නොසිතා ප්‍රියවස්තුයෙහි ලග්නව අකුසලය පුරා අපායභාක්වන්නෙහි එම්බල නුවනැති බවනම් ප්‍රියවූවදද යමෙක් අකුසල් පිරේ නම් එහි චින්තාව හැර ඓහලෞකික පාරලෞකික ශාපය සාධාදෙන්නාවූ පරම මධුර වූ කල්‍යානකර්මයෙහි ඇසිරිණ යුතුය. එසේ හෙයින් ස්වකීයාධිප්‍රත්‍ය ප්‍රවෘත්වූ රාජ්‍යයෙහි පිහිටි තොප විසින් විඳිනා ලද ඒ සාරාජ්‍යය සම්පත්තියකින් පිරිහෙලා නැවත මේ ජාතියෙහි චුතවූ තොප නරකයෙහි උපදවන්ට

SANHIDA LANKA

නිසිවු තෘෂ්ණාවට වසගනොව මතු දිව්‍ය මනුෂ්‍යලෝක සම්පත් සාධා තට සුදුසු වූ කුසල කර්මයෙහි යෙදී මිනීමස් කෑමෙන් වලකුවයි බණ වදාරා සතරවැනි වරය ඉල්ලුසේක.

මෙසේ මහබෝසතානන් මෙලොව හගවා වදාළ කළ නරක හයින් ත්‍රස්ථලම සුතසෝම රජ්ජුරුවන්ට දෙමි කි වරය නොදෙන්ටත් නොපිළිවන. මිනිමස් කෑමෙන් වලකින්ටත් නොපිළිවන. කුමක් කෙරෙම්දෝහෝයි කඳුළු පිරුනුවූ දසින් යුක්තව මහරජ මිනීමස් ඉතා ප්‍රිය වචන බව වදාරා අනික්වරයක් ඉල්ලුව මැනවැයි මෙයින් වැලැක්ක නොහෙමියි ඇසීය.

බෝධිසත්වයෝ එපවත් අසා වදාරණසේක් සබඳ යම් සත්වකෙණෙක් මෙමට ප්‍රියයි ආත්ම සෙනහයහැර අකුසල කර්මයෙහි ව්‍යවෘතව කාරණා කාරණා පරීක්ෂාකොට ගත නොහෙන්නාවු ප්‍රිය වචනයට පිණිස විසම්ශ්‍රවුරා අනුභව කොට එතනම මියවැටෙන්නාවු රා සොඬුන් පරලොවිහි නරකයෙහි උපදනාහුය.තවද මහරජ මේ ලෝකයෙහි යම් සත්වකෙනෙක් නුවනින් පරීක්ෂාකොට සුරාපානාදීවු ප්‍රියකාරණය කායික චෛතසිකවු දුකට හේතුයයි නුවනින් දැන එබඳුවු අර්ථව්‍යඤ්ජනයෙන් දුරුව උත්සාහයෙන් දාන ශිලාදීවු සුචරිතයෙහි යෙදෙන්නේය. එසේවු සත්වතෙම තිත්ත කටුකාදී ඖෂධ අනුභවයෙන් නිර්ව්‍යාධි වන සත්වයක්හු මෙන් තමාකල සුචරිතයාගේ මෙලොවත් සුවවිඳ මිය පරලොව ගිය කල්හිත් දිව්‍ය මනුෂ්‍යාදී සම්පතට පැමිණ සුවපත්වන්නේයයි වදාළසේකී.

එපවත් අසා පොරිසාදතෙම බැගෑපත්ව අඬන්වන්ය. මහාපුරුෂයාණෙනි මේ මිනිස්මසෙහි කල ලෝහයෙන් ජිවිතය හා සමකොට සිතන්නාවු මව්පිය දෙදෙනාද මනොඥවු වස්තුකාම ක්ලේශකාමයෙහිද ආලයහැර උදාකලාව වනයට වැද මේ නියාවු එබඳු මිනීමස් කෑමෙන් වැලකියෙම්යි යතන වරය කෙසේදීපියන්ද ඒ මට නොපිළිවනැයි කීයේය.

නැවත ඉක්බිති මහබෝධිසත්වයෝ එම්බා පොරිසාදයෙනි නුවනැත්තාවු උත්තමයෝ දෙබසක් නොකියාම සත්‍යවචනයෙම කියති. එබඳුවු තොපිත් කැමති වාරයක් ඉල්වාගනුවයි මට කියා දූන් මා ඉල්ලු වරයට මැලිවව එසේ හෙයින් පළමු තොප කී බසට සරිනොවෙන්නාහයි කීහ.

නැවතත් පෝරිසාද මහණෙනි මිණි මසෙහි කළ ලෝහයෙන් කර්ම ප්‍රාප්තවුද බොහෝ අකුසල් අකිර්ථව අයවට පැමිණියාපියා එබඳුවු මනුෂ්‍යමාංශ භක්ෂණය කෙරෙමියි කෙසේ වරයක්දී පියන්දැයි වරයක් අඬමින් කියේය.

ඉක්බිති මහබෝධිසත්වයෝ පොරිසාදයෙනි යම් සත්වකෙනෙක් කැමති වරයක් දෙමි. යමෙකුට කීවාම නැවත මැලිවෙනම් එසේවු වරය නොදිය යුත්තේය. තොපි වනාහි මට සබඳ නොසැකකොට කැමතිවරයක් ඉල්වා මාගේ ජිවිතය හා ලයත් හැරසෙසු තොප ඉල්වු වරයක් දෙමි. නියතකොට මට කියා දෙතුන් වැනිව ඉල්වියදිත් මැලිවින් නම් සත්‍යවාදී කමෙක් නොවෙයි තවද මෙලෝකයෙහි සත්වයෝ හස්තපාදාදී අවයව රැකගන්නා පිණිස සම්පත් දීපියන්නා හා ජිවිතය රැකගන්නා කැමැත්තේ හස්තපාදාදී අවයව හැර පියන්නේය සත්‍යවචන සංඛ්‍යාතවු සුචරිත ධර්මයාගේ අනුසස් සිහිකරණ සත්වයෝ අවයව ධන ජිවිතය යන මේ සියල්ල හැර සුචරිතයම පුරති රාජොත්තමයානෝ එසේ හෙයින් මට දෙමි කී වරය නොමැලිව වහාදි සත්‍ය වචන කුසලය පුරාගනුවයි යනාදින් නොයෙක් කාරණා කියා පෝරිසාදයන් සත්‍ය වචනයෙහි පිහිටුවා ඉක්බිති මහබෝධිසත්වයානෝ තමන් ගරුබව දක්වන්නාහු පෝරිසාදයෙනි යමක්හු කෙරෙන් යමෙක් කුසලා කුසල ප්‍රකාශවු බණ කථාවක් උගත්තේ ද යම් උත්තමයෙක් යමක්හුගේ සිත සැකයේ දුරුකොට නිසසංකාළෙද එසේවු ආචාරියතෙම එබඳුවු පුද්ගලයක්හට මුහුද නැවු නැගිගිය සත්වයක් හට පැමිණි දිවයිනක් පරිද්දෙන් පිහිටවන්නේය. හයක් පැමිණිකල ගොස් ගැලවියන තැනක් පරිද්දෙන් පරම ප්‍රතිශ්ඨාද වන්නේ. එබඳුවු උත්තමයා හා කල මිත්‍රත්වය නුවනැත්තෝ නොදිරවන්නෝය. නොනසා රක්නේයයි යනාදීන් සබඳ පොරිසාදයෙනි යහපත් ගුණ ඇති ආචාරිකෙනෙකුන්ගේ බස් නොගිවිසිම කටයුතු නොවෙයි මම තොප බාලකල ප්‍රිප්ති ආචාරීව බොහෝ ශිල්ප ඉගැන්විම් දූන් බුද්ධ විලාසමයන් සතරහා ගාථා කිමි. එසේ හෙයින් මා කීවා කරන්ට තොපි සුදුසු වන්නාහයි කීහ.

එබස් අසා පෝරිසාදයෝ සිතන්නාහු සුතසෝම රජ්ජුරුවෝ මට අචාරිවත් සිටියාහ. මා විසින් කැමති වරයක් ගනුවයි කීවා වරයකුත් දෙනලද ඉතිකින් කළමනා කින්ද එක් ජාතියෙක උපන්කල මියයාම ඒකාන්තයෙන්ම සැබෑව මිනිමස් නොකම් යන වරය දෙමියි කඳුළු ධාරා වැහෙන මුහුනින් යුක්තව උණසනෙන් නැගීසිට සුතසෝම රජ්ජුරුවන් ශ්‍රිපාද මුලයෙහි වැඳ වැතිර සබඳ සුතසෝම රජ්ජුරුවෙනි ඒකාන්තයෙන් ඒ මිනිමස් කැමට ප්‍රියය. ඒ නිසා රාජ සම්පත් හැරපියා මහවනයට වැදගියෙමි. ඒ නියාව දූනත් ඉන් වැලකයන්ට මට කිවුනම් නිරාහාරව ප්‍රාණය යෙනමුත් ඒ වාරය තොපට දිපියෙමි මිනිමස් නොකම් කීහ.

SANHIDA LANKA

ඒ අසා බෝධිසත්වයෝ සබඳ පෝරිසාදයෙනි එසේමය සිලගුණයෙහි පිහිටා සත්වයාගේ මරණත් උත්තමයයි කියමි. මහරජ තොප විසින් මටද වරය දීපියන්ට වදාලදා පටන් ආර්යමාර්ගයෙහි පිහිටායව එතකුදු විනමුත් නැවතත් යාඥාකෙරෙමි ඉදින් මා කෙරෙහිම තොපගේ මෛත්‍රීයෙක් ඇත්නම් මහරජ පන්සිල් අරගනුවයි කීය.

එබස් අසා පෝරිසාදයෝ යහපතැයි සබඳ මට පින්සිල් දිලවයි කියාම බෝධිසත්වයන් පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව උන්නේය. මහබෝධිසත්වයෝත් එබඳු තද රූක්ෂවූ ගුණයෙන් යුත් මිනීමස් කා ඇවිදිනාවූ පෝරිසාදයන් නොයෙක් බණකතා හා හේතු කාරණා වචනයෙන් මොළොක් සිත් වචනයෙන් ඇතිකොට ඒ ජාතියෙහි අනුන්ගේ ජිවිතය නොනස්නසේ පඤ්චසීලයෙහි පිහිටුවූහ. එකණෙහි එතනට රැස්වූ භූමාටු දෙවියයෝ මහබෝධිසත්වයන් කෙරෙහි සමාධිව අවිචියෙහි පටන් භයාශ්‍රය දක්වා ලොකකුහරය මුළුල්ලෙහි දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීන් පෝරිසාදයන් මිනීමස් කෑම වලකාලන්ට නිසි කෙණෙක් නැත. අනේ සුතසෝම රජ්ජුරුවන් කාලෙදුස්කරයෙක කලද ඉතා යහපතැයි වන ලැහැබ එකකොළාහල කෙරෙමින් තුඩ තුඩ සාධුකාර දුන්හ. භූමාටු දෙවියන්ගේ සාධුනාද ශබ්දය අසා චාතුම්භාරාජිකාදී දිව්‍ය ලෝකයෙහි දෙවියන් ආදිවූ සදිව්‍යලෝකයෙහි දෙවියන් ආදීවූ සියලු දෙවියන් හා සොළොස් බ්‍රහ්මලෝකයෙහි දෙවියෝ සාධුකාර දුන්හ. එදවස් සුතසෝම රජ්ජුරුවෝ විසින් පෝරිසාදයන්ට බන කියා පඤ්චසීලයෙහි පිහිටුවාලුහ. ඒ ඓශ්චර්යය දැක සමාධිවූ වෘක්ෂදේවතාවාද විමානයෙහි සිට සාධුකාර දින. ඒ වෘක්ෂදේවතාවා දුන් සාධුකාර ශබ්දය අසා සුතසෝම රජ්ජුරුවන් කළසේ ඉතා දුෂ්කරය දෙවියන් විසිනුත් දමනෙලිය නොහැකි සාහක්‍රියා ඇති පවිත්‍රවුහු දමනේලු බව තුන්ලොවට් සාන්තිජාල දුන්නා වැන්නැයි යනාදීන් මහබෝසතානන්ට ස්තුති කළහ. පෝරිසාදද සුතසෝම රජ්ජුරුවන් වැඳ එකත් පසෙක සිටියේය. එසඳ මහබෝධිසත්වයෝ රජ දරුවන් උනාපුවහොත් යහපතැයි කීහ.

එපවත් අසා පොරිසාධතෙම මම මේ රජ්ජුරුවන් ඇමදෙනා මට සතුරුව සිටියෙමි. එසේහෙයින් මා විසින් මුදනලද මේ රජ්ජුරුවෝ වටින් එක්වලා කොල අපගේ සතුරා නොහැර අල්වවයි කීයා මරාපුනම් නපුරැයි සිතා මා විසිනුත් සුතසෝම රජ්ජුරුවන්ගෙන් භාරගත් පඤ්චශීලය මාගේ ජිවිතය යතත් බිඳපියැ නොහැක්කැයි සිතා මුන් වහන්සේ හා කැටිවගොසින්ම බිඳිය යුතුය. එසේකල්හි මට අභය වේවායි කියා මහබෝසතානන් වැඳ ස්වාමිනි  දෙදෙනාම ගොසින් රජ දරුවන් මුදම්හයි කීය.

මෙසේ මහබෝසතානන් මෙලොව භගවා වදාළ කළ නරක භයින් ත්‍රස්ථලම සුතසෝම රජ්ජුරුවන්ට දෙමි කි වරය නොදෙන්ටත් නොපිළිවන. මීනිමස් කෑමෙන් වලකින්ටත් නොපිළිවන. කුමක් කෙරෙම්දෝහෝයි කඳුළු පිරුනුවූ දෑසින් යුක්තව මහරජ මීනීමස් ඉතා ප්‍රිය වචන බව වදාරා අනික්වරයක් ඉල්ලුව මැනවැයි මෙයින් වැලැක්ක නොහෙමියි ඇසීය.

බෝධිසත්වයෝ එපවත් අසා වදාරණසේක් සබඳ යම් සත්වකෙණෙක් මෙමට ප්‍රියයි ආත්ම සෙනහයහැර අකුසල කර්මයෙහි ව්‍යවෘතව කාරණා කාරණා පරීක්ෂාකොට ගත නොහෙන්නාවූ ප්‍රිය වචනයට පිණිස විසමිශ්‍රවුරා අනුභව කොට එතනම මියවැටෙන්නාවූ රා සොඬුන් පරලොවිහි නරකයෙහි උපදනාහුය.තවද මහරජ මේ ලෝකයෙහි යම් සත්වකෙනෙක් නුවනින් පරීක්ෂාකොට සුරාපානාදීවූ ප්‍රියකාරණය කායික චෛතසිකවු දුකට හේතුයයි නුවනින් දැන එබඳුවූ අර්ථව්‍යඤ්ජනයෙන් දුරුව උත්සාහයෙන් දාන ශිලාදීවූ සුචරිතයෙහි යෙදෙන්නේය. එසේවු සත්වතෙම තීත්ත කටුකාදී ඖෂධ අනුභවයෙන් නිර්ව්‍යාධි වන සත්වයක්හු මෙන් තමාකල සුචරිතයාගේ මෙලොවත් සුවවිඳ මිය පරලොව ගිය කල්හිත් දිව්‍ය මනුෂ්‍යාදී සම්පතට පැමිණ සුවපත්වන්නේයයි  වදාළසේකී.

එපවත් අසා පොරිසාදතෙම බැගෑපත්ව අඬන්වන්ය. මහාපුරුෂයාණෙනි මේ මිනිස්මසෙහි කල ලෝභයෙන් ජිවිතය හා සමකොට සිතන්නාවූ මව්පිය දෙදෙනාද මනොඥවූ වස්තුකාම ක්ලේශකාමයෙහිද ආලයහැර උදාකලාව වනයට වැද මේ නියාවූ එබඳු මිනීමස් කෑමෙන් වැලකියෙම්යි යතන වරය කෙසේදීපියන්ද ඒ මට නොපිළිවනැයි කීයේය.

නැවත ඉක්බිති මහබෝධිසත්වයෝ එම්බා පොප්‍රසාදයෙනි නුවනැත්තාවූ උත්තමයෝ දෙබසක් නොකියාම සත්‍යවචනයෙම කියති. එබඳුවූ තොපිත් කැමති වාරයක් ඉල්වාගනුවයි මට කියා දූන් මා ඉල්ලු වරයට මැලිවව එසේ හෙයින් පළමු තොප කී බසට සරිනොවෙන්නාහයි කීහ.

SANHIDA LANKA

නැවතත් පෝරිසාද මහණෙනි මිණි මසෙහි කළ ලෝභයෙන් කර්ම ප්‍රාප්තවුද බොහෝ අකුසල් අකිර්ථව අයවට පැමිණියාපියා එබඳුවූ මනුෂ්‍යමාංශ භක්‍ෂණය කෙරෙමියි කෙසේ වරයක්දී පියන්දැයි වරයක් අඬමින් කියේය.

ඉක්බිති මහබෝධිසත්වයෝ පොරිසාදයෙනි යම් සත්වකෙනෙක් කැමති වරයක් දෙමි. යමෙකුට කීවාම නැවත මැලිවෙනම් එසේවූ වරය නොදිය යුත්තේය. තොපි වනාහි මට සබඳ නොසැකකොට කැමතිවරයක් ඉල්වා මාගේ ජීවිතය හා ලයත් හැරසෙසු තොප ඉල්වූ වරයක් දෙමි. නියතකොට මට කියා දෙතුන් වැනිව ඉල්වියදිත් මැලිවින් නම් සත්‍යවාදී කමෙක් නොවෙයි තවද මෙලෝකයෙහි සත්වයෝ හස්තපාදාදී අවයව රැකගන්නා පිණිස සම්පත් දීපියන්නා හා ජීවිතය රැකගන්නා කැමැත්තේ හස්තපාදාදී අවයව හැර පියන්නේය සත්‍යවචන සංඛ්‍යාතවූ සුචරිත ධර්මයාගේ අනුසස් සිහිකරණ සත්වයෝ අවයව ධන ජීවිතය යන මේ සියල්ල හැර සුචරිතයම පුරති රාජොත්තමයානෝ එසේ හෙයින් මට දෙමි කී වරය නොමැලිව වහාදි සත්‍ය වචන කුසලය පුරාගනුවයි යනාදින් නොයෙක් කාරණා කියා පෝරිසාදයන් සත්‍ය වචනයෙහි පිහිටුවා ඉක්බිති මහබෝධිසත්වයානෝ තමන් ගරුබව දක්වන්නාහු පෝරිසාදයෙනි යමක්හු කෙරෙන් යමෙක් කුසලා කුසල ප්‍රකාශවූ බණ කථාවක් උගත්තේ ද යම් උත්තමයෙක් යමක්හුගේ සිත සැකයේ දුරුකොට නිසසංකාළෙද එසේවූ ආචාරියතෙම එබඳුවූ පුද්ගලයක්හට මුහුද නැවු නැගිගිය සත්වයක් හට පැමිණි දිවයිනක් පරිද්දෙන් පිහිටවන්නේය. භයක් පැමිණිකල ගොස් ගැලවියන තැනක් පරිද්දෙන් පරම ප්‍රතිශ්ටාද වන්නේ. එබඳුවූ උත්තමයා හා කල මිත්‍රත්වය නුවනැත්තෝ නොදිරවන්නෝය. නොනසා රක්නේයයි යනාදීන් සබඳ පොරිසාදයෙනි යහපත් ගුණ ඇති ආචාරිකෙනෙකුන්ගේ බස් නොගිවිසිම කටයුතු නොවෙයි මම තොප බාලකල ප්‍රිෂ්ටි ආචාරීව බොහෝ ශිල්ප ඉගැන්විම් දූන් බුද්ධ විලාසමයන් සතරහා  ගාථා කිමි. එසේ හෙයින් මා කීවා කරන්ට තොපි සුදුසු වන්නාහයි කීහ.

එබස් අසා පෝරිසාදයෝ සිතන්නාහු සුතසෝම රජ්ජුරුවෝ මට අචාරිවත් සිටියාහ. මා විසින් කැමති වරයක් ගනුවයි කීවා වරයකුත් දෙනලද ඉතිකින් කළමනා කින්ද එක් ජාතියෙක උපන්කල මියයාම ඒකාන්තයෙන්ම සැබැව මිනිමස් නොකමි යන වරය දෙමියි කඳුළු ධාරා වැහෙන මුහුනින් යුක්තව උණස්නෙන් නැගීසිට සුතසෝම රජ්ජුරුවන් ශ්‍රිපාද මුලයෙහි වැඳ වැතිර සබඳ සුතසෝම රජ්ජුරුවෙනි ඒකාන්තයෙන් ඒ මිනිමස් කැමට ප්‍රියය. ඒ නිසා රාජ සම්පත් හැරපියා මහවනයට වැදගියෙමි. ඒ නියාව දනත් ඉන් වැලකයන්ට මට කිවුනම් නිරාහාරව ප්‍රාණය යෙනමුත් ඒ වාරය තොපට දිපියෙමි මිනිමස් නොකමි කීහ.

ඒ අසා බෝධිසත්වයෝ සබඳ පෝරිසාදයෙනි එසේමය සිලගුණයෙහි පිහිටා සත්වයාගේ මරණත් උත්තමයයි කියමි. මහරජ තොප විසින් මටද වරය දීපියන්ට වදාලදා පටන් ආර්යමාර්ගයෙහි පිහිටායව එතකුදු විනමුත් නැවතත් යාඥාකෙරෙමි ඉදින් මා කෙරෙහිම තොපගේ මෛත්‍රීයෙක් ඇත්නම් මහරජ පන්සිල් අරගනුවයි කීය.

එබස් අසා පෝරිසාදයෝ යහපතැයි සබඳ මට පින්සිල් දිලවයි කියාම බෝධිසත්වයන් පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව උන්නේය. මහබෝධිසත්වයෝත් එබඳු තද රූක්ෂවූ ගුණයෙන් යුත් මිනීමස් කා ඇවිදිනාවූ පෝරිසාදයන් නොයෙක් බණකතා හා හේතු කාරණා වචනයෙන් මොළොක් සිත් වචනයෙන් ඇතිකොට ඒ ජාතියෙහි අනුන්ගේ ජීවිතය නොනස්නසේ පඤ්චසීලයෙහි පිහිටුවුහ. එකෙණෙහි එතනට රැස්වූ භූමාටු දෙවියයෝ මහබෝධිසත්වයන් කෙරෙහි සමාධිව අවිචියෙහි පටන් භයාශ්‍රය දක්වා ලොකකුහරය මුළුල්ලෙහි දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීන් පෝරිසාදයන් මිනීමස් කෑම වලකාලන්ට නිසි කෙණෙක් නැත. අනේ සුතසෝම රජ්ජුරුවන් කාලෙදුස්කරයෙක කලද ඉතා යහපතැයි වන ලැහැබ එකකොළාහල කෙරෙමින් තුඩ තුඩ සාධුකාර දුන්හ. භූමාටු දෙවියන්ගේ සාධුනාද ශබ්දය අසා චාතුම්හාරාජිකාදී දිව්‍ය ලෝකයෙහි දෙවියන් ආදිවූ සදිව්‍යලෝකයෙහි දෙවියන් ආදීවූ සියලු දෙවියන් හා සොළොස් බ්‍රහ්මලෝකයෙහි දෙවියෝ සාධුකාර දුන්හ. එදවස් සුතසෝම රජ්ජුරුවෝ විසින් පොරිසාදයන්ට බණකියා පඤ්චසීලයෙහි පිහිටුවා ලූහී ඒ ඓශවයෑ දැක සමාධිවූ වෘක්ෂදෙවතාවාද විමානයෙහි සිට සාධුකාර දින. ඒවෘක්ෂදෙවතාවා දුන් සාධුකාර ශබ්දය අසා සුතසෝම රජ්ජුරුවන් කළසේ ඉතා දුෂ්කරය දෙවියන් විසිනුත් දමනේලිය නොහැකි සාහසිකක්‍රියා ඇති පවිත්‍රවුහු දමනේලූ බව තුන්ලොවට සාන්තිජල දුන්නා වැන්නයි යනාදීන් මහාබෝසතානන්ට ස්තූතිකළහ. පොරිසාදද සුතසෝම රජ්ජුරුවන් වැඳ එකක් පසෙක සිටියේය. එසඳ බොධිසත්වයෝ රජදරුවන් උනාපුවහොත් යහපතැයි කීහ.

එපවත් අසා පොරාසාදතෙම මම මේ රජදරුවන් ඇදදෙනා මව සතුරුව සිටියෙමි. එසේහෙයින් මාවිසින් මුදනලද මේ රජ්ජුරුවෝ වටින් එක්වලා කොළ අපගේ සතුරා නොහැර අල්වවයි කියා මරාපූනම් නපුරැයි සිතා මා විසිනුත් සුතසෝම රජ්ජුරුවන්ගෙන් භාරගත් පඤ්චසීලය මාගේ ජීවිතය යතත් බිඳපියැ නොහැක්කැයි සිතා මුන්වහන්සේ හා කැටිවගොසින්ම බිදියයුතුය. එසේකල්හි මට අභයවේවයි කියා මහාබෝසතානන් වැඳ ස්වාමිනි දෙදෙනම ගොසින් රජදරුවන් මුදම්හයි කීය.

SANHIDA LANKA

එපවත් අසා මහබෝසතානෝ දෙදෙනම යහපතැයි කියා නුගගස ඡායාව අන්තරයට ගොස් සිතනසේක් රජදරුවෝ නම් ඉතා දග්ධවූ මාන ඇත්තැහ. එසේහෙයින් මොහු විසින් අප වෙහෙස ලදුම්හයි පොරාසාදයාද අල්වාගෙන මරාපූනම් මාකළ වික්‍රමය මුදුන්පත්නුවුහ. සාදෘසා හා එසේ හෙයින් මේ රජ්ජුරුවන්ගෙන් ප්‍රතිඥාගෙණ මිදියයුතුයයි සිතා වදාරණසේක් මහරජ්ජුරුවෙනි මේ පොරිසාද රජ්ජුරුවන් තොප හා මා විසින් වැලිත් දූෂ්‍ය වියනොහැක්කැයි ප්‍රතිඥා ඇරගෙන පොරිසාදයන් ලඟට කැඳවා සබඳ රජ්ජුරුවන් උනාපිවයි වදාළසේක.

ඉක්බිති පොරිසාදයෝ කඩුව අතින්ගෙන එක් රජ්ජුරුකෙනෙක් බැඳ එල්ලාලූ වැල් පොලුගසාපිය එකල සත්දවසක් මුළුල්ලෙහි නිරාහාරව මහත්වූ වේදනාවෙන් සුලගෙහි එල්වනලද කටුකරඬු මල්දම් පරිද්දෙන් ඈත මෑත කරකැවිකැවීආයාස විඳිමින් එල්ලෙන්නාවූ රජ්ජුරුවෝ බැම්බ කපනලදුව සිටපියන්ට අසවත්වව මෘතරූපයක්මෙන් බිමවැටීහුන්න එසඳ බෝධිසත්වයෝ මහත් වූ කරුණාවෙන් උපදවාගෙණ සබඳ එලෙස නිදියාව මිදිය නොහැක්කයි දෙවෙනිව රජ්ජුරුවන් පටන්ගෙන තමන්වහන්සේ දෑතින් අල්වාගෙන වැටියනොදී රඳව රඳවා වැල්කපවයි බැඳුම් කප්පවා තමන් වහන්සේ මහබල ඇති හෙයින් ප්‍රියදරුවන් වඩාගන්නා පියානකෙනෙක් පරිද්දෙන් සෙමෙන් ගෙළෙහි වැඳහොවාගෙන එකින් එකට බිමට බා සතප්පා තමන් වහන්සේ ඔවුන් අතුල්වල අවුණාලු වැල් ඇදදමා ලේ සැරව හැර වණ නිදොස්කොට සබඳ පෝරිසාදයෙනි ගසින් උපුටාගෙණ ගලගලා ගෙනෙවයි විධානකළසේක. පොරිසාද යෝද ඒ නුගගසින් පොත්තක්ගෙණගලගලා දින. බෝධිසත්යෝඒ හැර ගෙන සත්‍යක්‍රියාකොට අතුල්තලවල ගැලූසේක. එකෙණෙහි මහබෝසතානන්ගේ පිරුපාරමිතාවන්ගේ ආනුභාවයෙන් බේත්ගා ඇද අත අලමනා හා සමඟ සුවවැමසත්වස්ථවීය.

එකල පොරිසාදයෝ සසාල් ඇරගෙන දිය උළුකැන් පිස මහබෝසතානන් හා දෙදෙනා තෙසු සීයක් රජදරුවන් දියඋළුකැන් පොවා සන්තපීනය කොට පසුව දවස් නිදා නැගී මධ්‍යාහ්නවේලෙහිද දිය උළුකැන් පොවා තුන්වෙනිදවස් උළුකැන් සහිතවූ කැඳ පොවා මෙසේ තුන්දවසක් පරිහරණය කරණලද රජදරුවෝ නිදුක් නිරෝගිවුහ.

ඉක්බිත් බෝධිසත්වයෝ ඒ රජදරුවන් කැඳවා තොපගේ රට නැගීයන්ට ශක්ති ඇද්දයි විචාරා වදාළසේක.

එකළ රජදරුවෝත් ඉතින් පළායම්හයි කීහ.

ඉක්බිති බෝධිසත්වයෝ පොරාසාද කැඳවා සියරටට යම්හයි වදාළහ, එපවත් අසාපොරිසාද රජ්ජුවෝ මහහඬින් හඬා බෝධිසත්වයන්ගේ ශ්‍රීපාදයෙහි වැටී හී ස්වාමීනි නුඹවහන්සේ මේ රජදරුවන් ඇරගෙන වැඩපුව මැනවයි මම වනමුල් ඵලාඵලාහාරයෙන් ජීවත්වන්නෙමි මෙහිම වෙසෙම්යි ඇඬූකල්හි සබඳ මේ වනයෙහි ඉඳ කරන්නේ කිම්ද අතිශයින්ම රමණියවූ බරණැස්නුවරට යම්හයි වදාළසේක.
එපවත් අසා පොරිසාදයෝ ස්වාමීනි කුමක් වදාරණසේක්ද ඉදින් මම රාජ්‍යයට ගියෙම්නම් නුවරවාසීහු මේ රජතෙම මාගේ මව මරා කෑයය් පියා මරා යනාදීන් මහත් වූ වෛර ඇත්තාහු මේ සොරහු අල්වාගෙන මරාපියව යනාදීන් ආක්‍රොස පරහව බෙණෙමින් මහත් වූ සරුපාහනියට පමුණුවා කැටින් මුතුරෙන් ජීවිතක්ෂයට පමුණුවාපියන්නාහුය.

එසඳ නුඹ වහන්සේ සමීපයෙන් ගන්නාලද පිරිසිදු වූ සීලයෙහි පිහිටි හෙයින් ජීවිතය පිණිස අනික් කිසිවක්හු මා විසින් මැරියහැක්කේ නොවෙයි.

එසේ හෙයින් මා නුවරට යා නොහැක්ක. තවද මහරජ ප්‍රිය වූ මිනීම්ස් කෑමෙන් වැලකුනා වු මම කීපපදවසක් ජීවත්වෙද්ද ඉනිඹ නුඹ වහන්සේ දක්නට නොලැබෙමි වෙව්දැයි මහහඬින් හඬා ස්වාමීනි නුඹවහන්සේ වැඩපුව මැනවවැයි කීහ.

ඉක්බිති මහ බෝසතානෝ මහත් වූ කරුණාවෙන් ඔහුගේ පිට පිරිමැද සබඳ එහෙයින් තොප ඒ රාජ්‍යයෙහි පිහිටුවමින් සුතසෝම රජ්ජුරුවෝනම් මමය තොපවැනි තදපරුෂ වූ සාහසිකක්‍රියා ඇති එකක්හු පවා දමනේ ලීම් එබඳුවූ මම බරණැස්නුවර ඇත්තන් සරුවක්කොට මා කීවා කරව් ද එසේ හෙයින් තොප ඒ රාජ්‍යසම්පත්තිය දෙකක්කොට බෙදාපියා එකක් දෙමි. එසේහෙයින් තොප මාකී වචනය කළ තැනැත්තන්තේ තරම් හා දින පුරාතනය සැපයෙහි පිහිටුවාලී මාම බඳුවුවන්ටම සුදුසුයයි ඔහු රාජ්‍යසම්පත්තීන් ලොභකරවනසේක්.

SANHIDA LANKA

මහරජ තොපගේ මුළුතැන්ගෙයි අරක්කැමියන් විසින් මනාකොට දුරු මිරිස් ආදී නොයෙකක් කුළුබඩු හා පිසන සුවඳකවනලද තෙල් හූරුමස්ද ගිරා ආදී පක්ෂි සතුන් තෙළ පැදීම් මැලවීම් ආදීවූ නොයෙක් රසමසවුලෙන් යුක්තවූ ශක්‍රයාගේ සුධාභෝජනබඳුවූ රාජභෝජනය මේ නිමවමින් බලමද පුරුෂමද වර්ධනය කෙරෙමින් සැපසේ රාජ්‍යසම්පත්තිය අනුභවකරන්නා තබාලා කවර කාරණයක් හේතුකොටගෙණ මෙම වනයෙහි වසන්නෙහිද,

තවද මහරජ නොයෙක් නොයෙක් දෙසයෙහි රජදරුවන් විසින්සරහා එලවනලද මාණික්‍යකුන්ඩලාභරණා දීවූ නොයෙක් ආභරණ ආදියෙන් සැරහුණු තාගේ සොළොස්දහසක් බිසෝවරුන් ප්‍රධානකොට ඇති සියගණන් නාටකස්ත්‍රීහූ ශක්‍රයා පිරවැරූ දෙවඟනන් මෙන් රාජ්‍යසම්පත්තියෙහි පිහිටි යාවුතා පිරිවරාගෙණ නෙයෙක් ලීලා විලාසයෙන් සිත ඇති යම් උකවලීයෙක් ඇත්නම් දුරුකරන්නාහුය.

තවද මහරජ නානාප්‍රකාර වර්ණ කම්බිල හා සිහ ව්‍යාඝ්‍රසම් අඳුන්දිසම් කෙහෙල් මුවසම් ආදීනොයෙක් සැප ආස්තරණයන් හා කොඳුපලස් බහා අතුරණලද ශ්‍රීහයන් මස්තකයෙහි සැතපී තවද නඟනලද ධවලාතලත්‍ර ඇති විශිෂ්ටවූ සිංහාසන මස්තකයෙහි ඉඳ රාජමණ්ඩලී මහාමාත්‍යාදීන් විසින් පිරිවරණලදුව රාජ්‍යානුශාසනය කිරීම තවද දෙවඟනක් බඳු වරඟනක් ගසන වයන පංචාඞ්ගික තූර්‍යනාදයෙන් හා මනාවූ භාවභාවලීලා විලාසයෙන් යුක්ත වන්දිභට්ටාදීන් විසින් කියන ලද ගීතිකා නාදයෙන් සිත්පිණවමින් කරණලද උතුම් වූ රාජ්‍යශ්‍රී සම්පත් හැර උදකලාව මේ වනයෙහි දුබ්භාජන දුශ්ශාය්‍යාවෙන් දුක්විඳ කිම්ද තවද තාගේ සිත්කළු වූ උද්‍යානයෙහි නඟන පුන්නණය කරන්නාහු නොයෙක් ලිපද චතුස්පදජාතීන් හා පස්පියුමෙන් කළ නොයෙක් විල්පන්තියෙන් හා හංස චක්‍රවාදීවූ ජලචරපක්ෂීන්ගේ අති මධුරවූ අනොන්‍යාන්‍ය රාවප්‍රතිරාවයෙන් හා කුසුමොදය පිණිස අත්පසින් අඬාබස්නාහු පංචවනී භෘඞ්ගසමූහයන්ගේ රමණියවූ ඣාකාර නාදයෙන් උපලක්ෂිත මනහර උයන්කෙළියෙන් ග්‍රීෂ්ම ඍතුසම්භවන කෙරෙමින් වසන්නාහු අතිශයින් රමණීයවූ බරණැස්නුවර රාජ්‍යය හැර වනයෙහි කුමන සැපයක් තකාරඳවූද? එසේහෙයින් සබඳ රාජ්‍යයට යම්හයි වදාළසේක.

එසේ මහබෝසතානන් විසින් පෙර අනුභවකරණලද නොයෙක් පංචකාමගුණයෙන් යුක්තවූ රාසම්පත්ති සඳහන්කරවා වදාළකළ පෝරිසාද රජ්ජුරුවෝ සිතන්නාහු මීනිමස්කෑම් නැමති සැපයක් නැතිකල මුන් කී රාජසම්පත්තියට වඩනා සම්පත්තියක් නැත්තේ නියමය මේ සාමිදරවෝ සර්වප්‍රකාරයෙන් මම මෙලොව පරලොව පරලොව දෙකින් මාකෙරෙහි හිත කැමතිව පළමු කොට මා කල්‍යාණ කර්මයෙහි පිහිටුවා දෙවනුව පුරානුභතවූ රාජශ්‍රියෙහි පිහිටවනුකැමතියෙක් මුන්වහන්සේ වීනා මා රාජ්‍යසම්පත්තියෙහි පිහිටුවා උත්තම රාජෙන්ද්‍රයාගේ සමවායෙන් පූරාතන සමයෙි පිහිටුවා ගියමැනවැයි සිතක් සිතකි සකල ශරිරයේ මැඩගෙණ පවත්නා වූ ප්‍රීතිප්‍රමෝදයෙන් මහබෝසතාණන්ගේ ගුණවර්ණාකරන්නැයි මහරජ කෘෂණපක්ෂයෙහි චන්ද්‍රමණ්ඩල යම්සේ දවසින් දවසසට හායනපක්ෂයට පැමිණේද එමෙන්ම අසත්පුරුෂයන් හා එක්වූඋත්තමයොත් දවසින් දවස ශ්‍රීහානියට පැමිණෙන්නේය, ඒ එසේමය යම්බඳවූ මම සත්වධර්ම වූ අරක්කැමියා හා එක්වීමෙන් මිනීමසෙහි රසදැන කරණලද අකුසල කර්මයෙන් නුඹවහන්සේ සඳහා වීනා මදකින් නරකයටගියෙම්වෙයි එහෙයින් මහරජ නුඹවහන්සේ වැනි ශුක්ලපක්ෂයෙහි වර්ධමානවූ චන්ද්‍රමණ්ඩලයක් මෙන් මහත් යසශ්‍රීන් වඩන්නෙම් බොහෝ කුසල් කොට මතු දිව්‍යලෝකයට යන්නෙම්වේදැයි යනාදී මහාබෝසතාන්ගේ ගුණවර්ණාකොට නැවතත් මහරජ යම්සේ ගොඩ වස්නා වැසිවට පමණ හා සමඟ මැටි වියලන පමණක්වූත් බොහෝකලක් නොපවතින අසත්පුරුෂයන් ගේ සමාගමයත් බොහෝකලක් තට විපාක පවත්වාලන්ට අසමත්විය. යම්සේ විල්හී වස්නාලද වැස්සෙහි ජලයය බොහෝදවසක් ස්ථිරම්යර ඇතිහෙයිනුත් ජලාශ්‍රය ඇතිහෙයින් බොහෝ දවසක් පවත්නේය. එසේහෙයින් ම ළෙහි මහත් වූ කරුණා ගුණ ඇති නුඹවහන්සේ බඳු මහාත්මයන් එක් වූ සත්වතෙම විල්හි වට වර්ෂාජලයසෙයින් බොහෝකලක් පවත්නේයයි යනාදීන් අනෙකපරියායෙන් මහබෝසතානන්ගේ ගුණ වර්ණනා කළහ.

ඉක්බිති ඒ ශ්‍රීමහා බෝධිසත්වයෝ පෝරිසාදයන් හා සියක් රජදරුවන් කැඳවාගෙන වනයෙහි පිටත්ව පසල්ගමකට අවුදින්වන්හ. එසඳ ඒ ප්‍රත්‍යන්ත වාසීහු සුතසෝම රජ්ජුරුවන්වහන්සේ දැක යුහුව ඉදිපත් නුවරට ගොස් කීහ.

SANHIDA LANKA

එකල අමාත්‍යයෝ සිවුරඟසෙනඟ ගෙණඅවුත් රජ්ජුරුවන් පිරිවරා රැකවල්ගත්හ. එසඳ මහාබෝධිසත්වයෝ සිවුරඟසෙනග පිරිවරා බාරානසී රාජ්‍යයට නික්මුනාහ. අතරමඟ දනව්වැසි සත්වයෝ බොහෝ පඬුරු පාක්කුඩම්ගෙණ රජ්ජුරුවන් පිරිවරාකැටුවම නික්මුණාහ, මෙසේම මහපක්ෂිත් හා සමඟ බරණැස් නුවරට පැමිණිසේක.

එකල පොරිසාදයන්ගේ පුතනුවෝත් රාජ්‍යයකරන්නාහුය. සෙනෙවි රද්දු නම් කාලහසතිනම් සෙනෙවිරද්දුමය, එකල නුවරවැස්සෝ සුතසෝම රජ්ජුරුවන්වහන්සේ පෝරිසාදයන් දමනෙහිලා කැඳවාගෙන එනසේක්ලයි අසා නුවරට ඔහු වැද්ද නොදෙම්හයි වාසල්එලා ආයුධගත් අත් ඇතිව සටනට සැරහී සිටගත්හ.

මහබෝසතානන්වහන්සේ වහසල්එලාගත්බව දැන පෝරිසාදයන් හා සීයක් රජදරුවන් දුරම රඳවා අමාත්‍යයන් ගණනක් හැරගෙන වාසල්කරා ගොස් තමන්වහන්සේ වැඩිබව දන්වායුසේක. එපවත් අසා රජුවරුවෝ හුනස්සෙන් නැගීසිට වහා දොරහැර රජගෙට වඩාගෙනවැයි විධාන කළහ.

ඉක්බිති බෝධිසත්වයෝ අරණලද දොරින් නුවරට වන්සේක. රජ්ජුරුවෝද සෙනෙවිරද්දුද පෙර ගමන්කොට ගොස් ප්‍රසාදයට වඩාගෙනවුත්දීන් රාජාසනමස්තකයෙහි වඩා හිඳවා බඬාඤ්ජලීව සිටියාහ. එසඳ ශ්‍රී මහා බෝධි සත්වයන් වහන්සේද පොරිසාද රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන්ද තෙයු අමාත්‍යවරුන්ද සමීපයට කැඳවා වදාරා රජ්ජුරුවන් නුවරට වැද්ද නොදෙන්ට කාරණා කවරේදැයි සෙනෙවිරදුන් විචාළ සේක. එසඳ කාලහස්ති නම් සෙනෙවිරද්දු මහරජ ඒ රජ මෙනුවර රාජ්‍යකරන්නේ බොහෝ ස්ත්‍රී පුරුෂයන් මරාකා රජදරුවන් නොකළ මනා නොකළේය. වැලි නුවරින් පිටත් වු හෙයින් වන මද්දෙහි ඉදත් මිණිමරා කන්නේ සියලු දඹදිවට සිදුරුම කළේය. එසේ හෙයින් මෙබඳ පවිටු ගුණයක් ස්වභාව කොට ඇත්තාවූ එකෙක් ‍ කාරණයෙන් නුවරට වැද්ද නොදෙම්හයි කීහ.

එපවත් අසා මහාබෝධිසත්වයෝ වදාරණ සෙක් සෙනවිරත්නී දැන් ඒ රජ්ජුරුවෝ එබන්දක් නොකරති. කාරණා කිම්දැයි යත් ? මම උන් දමනය ළා ශීලය පිහිටුවා ප්‍රතිඥා ගතිමි. එසේ හෙයින් ජීවිත පිණිස ප්‍රාණවධ ආදී වූ හිංසා පිඩාවක් නොකරන්නාහුය. මෙතැන් පටන් ඒ රජ්ජුරුවන් පිණිස තොපඇමට බයෙක් වීනම් අපිට බාරවැයි වදාරා රාජ පුත්‍රයාට වදාරණ සෙක්. රජ්ජුවෙනි, දරුවන් විසින් දෙමාපියන්ට උපස්ථාන කළ යුතුය. යම්තාක් දෙමව්පියන්ට උපස්ථාන කළ වුනට වඩා පළමු දිව්‍යලෝකයට යන්නාහු සත්ව කෙනෙක් මේ ලෝකයේ නැත. ඉදින් වැලිත් දෙමව්පියන්ට දුශ්‍ය වූ සත්ව කෙනෙක් නරකයට යන්නාහු යනනාදීන් රජ්ජුරුවන්ට අවවාද කියා සෙනවිරදුන්ට දනවා කාල හස්තිය තෝද රජ්ජුරුවන්ගේ අත්‍යන්ත මිත්‍රයෙහි රජ්ජුරුවන්ට සේවකයෙහිය. ඒ රජ්ජුරුවන් විසින්ම ඉතා මහත් වූ ඓශ්වර්යයෙහි පිහිටුවන ලද එසේ හෙයින් තොප විසිනුත් රජ්ජුරුවන් වැඩෙහි හැසිරිය යුතු යැයි සෙනෙවිරදුන්ටත් අවවාද කියා බිසවුන් ද කැඳවා දේවවියන් තොපද කුලයෙන් අවුත් මේ රජ්ජුරුවන් සමීපයෙන් අගමෙහෙසුන් තනතුරු ලදින් සමානව වයස් ඇතිව රජ්ජුරුවන් හා සබඳව විසී එක්ව රාජ්‍යශ්‍රී අනුභවකරව. එහෙයින් තොප විසිනුත් කෙළෙහි ගුණ දැන දේවතාව විසීම උත්තමාංගනාවන්ට සුදුසු යැයි යනාදී වූ නොයෙක් පරිද්දේන් රජ්ජුරුවන්ටද සෙනෙවිරදුන්ටද බිසවුන්ටද ධර්මදේශනා කොට තෙසුත් අමාත්‍යමණ්ඩලය හා නුවර වාසින්ටත් එම්බා රාජද්‍රෘශ්‍යකර්ම නම් ඉතා බර දෙයක එසේ හෙයින් තොප හැම විසිනුත් ඒ රජ හට අගිය නොහැක්කැයි කාරණා කිම්ද යත් තොපගේ මේ රාජ්‍යයට ප්‍රවෙනි රජය, තවද ළඳරු වයසේ සිටියේය. මාඅතින් සත්පුරුෂ ධර්මය අසා සතුටුව සතරවවරයක් දී දසරාජධර්මයේ පිහිටියේය. එසේ හෙයින් ඔහු කෙරෙහි කිසි නොකටයුත්තක් නොසිතවයි නුවර වැස්සනුත් එම දෙස අස් වසා ධර්ද දේශනා කළ සේක. මෙසේ ඒ සර්වඥවිලාසයෙන් වදාරණලද කෘතෝපකාර සංඛ්‍යාතවූ බණ කථා අසා රජ්ජුරුවෝද සෙනවිරදුද බිසවුද බුවර වාසිහු මහජනයෝද සතුටුව නුවර බෙරපියවි කරවා නුවරසරසවා සියලු නුවර ාසීන් රැස්කොට රජ්ජුරුවෝ ධර්මිෂ්ටයෙහි පිහිටියේල. ඉනිඹ තොපි හැමදෙනා නොබවයි යනාදීන් නුවරසීන් අසා මහරජ්ජුරුවන්වඬා නුවරට ගෙනෙම්හයි වැව් මියරක් බිඳ ගෙන නික්මුණු මහ වතුරක් මෙන් මහබෝසතාණන් ඉදිරියට එකපැතිර රජ්ජුරුවන් කරා ගොස් වැඳ මඟුල් කපුවන් එලවා දැලි රැවුලු අන්දම් තබා සුවඳ පැන් සොළාත් කළයකින් ඉස් සොදා නහවා සත් රුවන් සත් මත්තෙහි සිටුවා දක්ෂිණාවෘත ස්වේතසංඛයෙන් මුද්ධාභිෂේකය කොට නුවර පැදකුණු කොටවා රජගෙට වඩාගෙන ගියහ. එසඳ ඒ රජ්ජුරුවන්ට අප්‍රමාණ වූ ඓශ්වර්ය ඇති විය. පොරිසාද රජ්ජුරුවෝ සුතසෝම රජ්ජුරුවන් හා සියක් රජ දරුවන් හා මහත් සත්කාර සම්මාන කළහ.

SANHIDA LANKA

සුතසෝම නරේන්ද්‍රයානන්වහන්සේ විසින් පොරිසාදයන් දමනෙහිලා රජයෙහි පිහිටුවාලුසෙක්ලයි සියලු දඹදිව එකකොලාහලවිය.

මහාබොධිසත්වයෝ ඒ රජු විසින් කරණලද සත්කාර විඳින් මසක් පමණ එහි දවස්යවා වැස නැවත පෝරිසාදයන් කැඳවා සබඳ මෙතැන්හි මින් දන්හල් පසක්කරවා දුගී මගී ව වණිබ්බක යාචකයන්ට මහදන්දි

දසරාජධම්මයට අකෝපාසයක් නොකොට රාජ්‍යකරවැයි අවවාදකොට ඒ රජ්ජුරුවන් දූතයන් දැක ඉනිඹ අප නියමනා කලැයි වදාරා බලඇනි සේනාව පිරිවරණලදුව නුවරින් නික්මුණු සෙක් පෝරිසාද රජ්ජුරුවන් විසින්ද පසුගමන්කොට නික්ම දෙමංසන්ධියෙහි සිටි වැඳ සමුගෙන වැලැක්කාහ.

තෙසු රජදරුවන් මහා බොසතාණන්වහන්සේ වැඳ සිපගැනීම ආදීවූ සාමීචිකොට මහබෝසතානන් වින් දෙන ලද යාන වාහනාදියට නැගී ක්‍රමයෙන්ම තම තමුන්ගේ සියරටට පිවිසීය, මහබෝසතානන්වහන්සේ ඉඳිපත් නුවර වැස්සන් විසින් දිව්‍යපුරයක්මෙන් සරහනලදුව නුවර අසුරවිජයකොට ශක්‍රභවනයට වදනාවූ සක්දෙව්රජහු පරිද්දෙන් ඇතුළු නුවරටවැඳ නුවරතුන් විටක් පැදකුණු කොට ප්‍රසාදයට නැගී දෙමව්පියන්ට වැඳ පැදකුණු කොට මිහිරි වූ පිළිසඳරකථාකොට දවස්පටන් සතරසංග්‍රහවතින් වියෝනොව දැහැමෙන් රජකරණසෙක් මෙසේ සිතුසේකි.

කෙසේද යත්?
වෘක්ෂදේවතාව මට බොහෝ උපකාරීව සිටියේය. එසේහෙයින් ඕහට බලිකර්මයෙන් කළමනවැයි නුගගසට නුදුරුතැන්හි මහවැවක් බඳවා බොහෝ මනුෂ්‍යයන් යවා එතැන්හි මහගමක් කරවූසේක. ඒගම මහත කොපමණ යත්? මේ සත්වලෝකයෙහි පවත්නා වූ වස්තුවෙන් අසෝවස්වෙක් මෙහි නැතැයි නොකියන පරිද්දෙන් කස්තුරු කපුරු සඳුන් කළුවැල් ලමඟතකුල් පටපිල් දේවංග මුතු මැනික් රත්රන් රිදී ආදී වූ නොයෙක් වස්ත්‍රාභරණයෙන් සුගන්ධාපන රත්තාපනදී වූ අසුදහසක් සළුපිලි ඇත්තතේ ය. ඒ නුගලසද ශාඛා මණ්ඩයෙහි පටන්ගෙන සමතලකොට වට පවුරු බඳවා සතරදොරින් යුක්ත කොට දවස්පතා සුවඳ තෙල් පහන් නඟා රසමසුවුලෙන් යුක්තවූ ආහාරය රන් තලියෙහි පුදා කරණලද පූජා සත්කාර අපමණ විය. දේවතාද මහබෝසතානන්වහන්සේ කෙරෙහි අතිශයින් ප්‍රසන්ව සියලු උපද්‍රව නිවාරණය කෙරෙමින් රැකවල්ගත. ඒගම වනාහි අකුසල කර්මයෙහි ව්‍යාවෘත වූ පාපි පුද්ගලයන් දම නේලූ තැන කරණලදහෙයින් කම්මාහසදම්ම නම් නියම්ගම් වීයයි ඉරසඳ පවත්නා තෙක් ප්‍රසිද්ධ කොට වදාළසේක දැන් වර්තමානයෙහි එම කම්මාස්සදම්ම නම් නියම් ගම් වැඩ හිඳ,

චත්තාරොසතිපට්ඨාන, ඉධභික්ඛු ජක්ඛත්තං කායෙ කායාපසසි විහරති
බහිද්ධා වා කායෙ කායානුපස්සි විහරති
අජ්ඣත්තබහිද්ධා වා කායෙ කායානුපස්සි විහරති
සම්පජානො, සතිමාවිනෙය්‍යය ලොකෙ අභිජ්ඣා දෙමනස්සං

යනාදීන් සතිපට්ඨානසූත්‍රදේශනාව දසසහශ්‍රිලෝකධාතු උපුල්වා වදාළ සේකැයි දතයුතු මෙසේ මහබෝසතාණනෝ සියළු ජම්බුදීපයෙහි රජදරුවන් අවවාද අනුශාසනාකොට තමන්වහන්සේද දසරාජධර්මයෙන් රාජ්‍යකොට සහ පිරිවරින් දෙව්ලොව වැඩිසේකැයි යනාදීන් බුදුහු මේ ජාතක ධර්මදේශනාව ගෙණහැරදක්වා වදාරා මහණෙනි, මොහු දැන්මතුනොවෙයි පෙරත් මේලෙස දමනයන්ලුයෙම් වේදැයි පූර්වාපරසන්ධිගලපා මහණෙනි එකල පෝරිසාදයෝ නම් අංගුලිමාල ස්ථිවරයෝය. ඒසමයෙහි කාල හස්ති නම් සෙනෙවිරද්දු දැන් මාගේ සාසනෙයෙහි ධර්මයට සෙනෙවිරද්දු දම්සෙනවි සැරියුත් මහතෙරහුය. එදවස් සතාරහගාථා පඬුරක් කොට ගෙනවුත් මාසමීපයෙන් බොහෝ උපකාර කරනලද්දා වූ නන්දබ්‍රාහ්මණ නම් ආනන්ද මහ තෙරහුය. එකල වෘක්ෂදේවතාවා නම් දැන් බුඬානුබුඬ තපොනිධාවවූ මහාකාශ්‍යප ස්ථිවිරයෝය. එදවස් උප දෙස දායක ශක්‍රදෙවෙන්ද්‍රයොනම් දැන් දිවස් ඇත්තවුන් කෙරෙහි අග්‍රවූ අනුරුඬ ස්ථිවිරයෝය. තෙසු සියක් රජ දරුවෝ නම් මේ බුදුපිරිස, එදවස් දෙමව්පිය දෙදෙනාම මෙදවස් සුද්ධෝදන මහාමයා දෙදෙනය, එකල ඒසා මහත් ලෝවැඩකළාවූ සූතසෝම රජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

SANHIDA LANKA

# මුගපක්ඛ ජාතකය

තවද එක්සමයෙක්හි සකල ජනහිත විධායක විසුඬ බුඬ ඇති කරුණා නිධානවූ සම්‍යක්සම්බුඬ සර්වඥරාජොත්තමයානන්වහන්සේ සැවැත්නුවර නිසා දෙව්රම්වෙහෙර වැඩවසනසේක් මේ මුගපක්ඛ ජාතක ධර්මදේශනාව තමන්වහන්සේගේ මහාභිනික්මන් අරභයාගෙණහැරදක්වා වදාළසේක.

එක් දවසක් දම්සභාවෙහි රැස්වඋන්නාවූ භික්ෂූහු බුදුන්ගේ මහාභිනික්මනෙහි ගුණ කිය කියා උන්නාහුය. සර්වඥයන්වහන්සේ එතැන්හි වැඩ මහණෙනි දැනි මා එන්නාට පූර්වභාගයෙහි මේ දම්සභායෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා නුඹවහන්සේගේ මහාභිනික්මනෙහි ගුණ කිය කියා උනුම්හයි කීකල්හි මහනෙනි, දැන් පුරනලද බොධිසම්භාර ඇති මා විසින් රාජ්‍යසම්පත්තිය හැර මහාභිනික්මන්කළ නියාව ආශර්වයඝීනෙවෙයි මම වනාහි නුමුහුකළාවූ ප්‍රඥාඇතිකල්හිද දාන සිලාදීවූ සමතිස් පෙරුම් පුරන්නේ මේ රජසැපත් හැර මහාභිනික්මන් කෙළෙම්වේදැයි වදාරා ඒ මහනුන් විසින් ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉතුත්වත් ගෙණහැරදක්වා වදාළ සේක.

හේ කෙසේදයත්?

පෙරබරණැස්නුවර කසීනම් රජෙක් දැහැමෙන් රාජ්‍යකරන්නේය. ඒ රජුගේ සොළොස් දහසක් බිසෝවරුන් වුවාහුය. ඔහුන් අතුරෙන් එකද ස්ත්‍රීයක්හට දුවෙක් හා පුතෙක් නුපන්නේය. නුවරවාසීන් කියන්නාහුඅපගේ රජ්ජුරුවන් වහන්සේගේ වංශය රක්ෂා කරන්නාහු පුත්‍රයෙක් නැතයි කුස ජාතකයේ හි අවාහු ක්‍රමයෙන් රැස්ව රජහට කියන්නාහු පුතකු ප්‍රාර්ථනා කීයේය. ඒ ස්ත්‍රීහු  චන්ද්‍රසූර්‍ය්‍යාදීන්ට වැඳීම් පිදීම් ආදි වූ උපස්ථාන කොට පාර්ථනා කරන්නාහුද දරුවන් නොලද්දාහුය. බිසවක් ඇත. ඒ බිසවුන්ට දරුවන් ප්‍රාර්ථනා කරවයි කීයේය.

එකල්හි ඒ චන්ද්‍රාදේවීතොම පෞණිමී දිනයෙහි පෙහෙවස් සමාදන්ව මිටි ආසනයක සැතපෙන්නී තමාගේ සීලය පරික්ෂා කොට ඕතොමෝ සත්‍ය ක්‍රියා කරන්නී මම අඛණ්ඩකොට රක්ෂාකළ සිල් ඇත්තෙම්ද මේ සත්‍යවචනය හේතුකොටගෙණ මට දරුවෝ ඇති වෙත්වයි මෙසේ සත්‍යක්‍රියා කළහ.

ඇගේ සීලානුභාවයෙන් ශක්‍රභවනය උනුආකාරයෙන් දැක්වීය. සක්දෙව් රජ තෙම පරික්ෂා කොට ඒ කාරණය දැන චන්ද්‍රාදේවී පුතකුපැතීය. ඈට සුදුසු පුතකු බතනුයේ බෝධිසත්වයන් දුටුයේය. එකල බෝධිසත්වයන්වහන්සේ විසිදහසක් අවුරුදු බරණැස රාජ්‍යයකොට එයිනුත් චුතව ඔසුපත්නරකයේ උපන්සේක් අසූදහසක් අවුරුදු එහි පැසි තව්තිසාභවනයෙහි උපන්සේක.

ඒ දිව්‍යලෝකයෙහිද ජීවිතාන්තය දක්වා හිට එයින් චුතව මත්තෙහි දිව්‍ය ලෝකයෙහි උපදනා කැමතිවිය. ශක්‍රදේවේන්ද්‍ර තෙම උන්වහන්සේ සමීපයට ගොස් කියනුයේ යහළු තොප මිනිස් ලොව උපන්කල්හි තොපගේ පාරමිතාවන් පිරෙන්නනේය. මහජනයාට මහත්වැඩද වන්නේය. මේ කසීරජුගේ මේ චන්දා නම් අගමෙහෙසුන් බුසවුතොම පුතකු පතන්නී ඇගේ කුස පිළිසිඳගනුවයි කීයේය. එකල්හි මහ බොසතාණන් වහන්සේ සක්දෙවිරජුගේ වචනයන් පිලිගෙන පන්සියක් දිව්‍යපුත්‍රයන් හා සමඟ ඒ දිව්‍යලෝකයෙන් චුතව තමන් වහන්සේ ඒ චන්ද්‍රානම් අගමෙහෙසුන්කුස පිළිසඳගත්සේක. සෙසුදිව්‍යපුත්‍රයෝද අමාත්‍යයන්ගේ භාර්යාවන්ගේ කුස පිළිසඳගත්තාහුය. බිසවගේ කුස විදුරුපිරුවාක් මෙන් වූයේය. ඒ බිසව්තොම ගැබ්පිහිටි බව දැන රජහට දැන්වූවාය. රජ ඒ බව දැන ගැබ්පෙරහැර දෙවුයේය. ඕතොමෝ පිරුණු දරුගැබ් ඇත්තීය. පින්ලකුණු ඇත්තාවූ පුතකු වැදුවාය. එදවස් ඇමැත්තන්ගේ ගෙට ලද පන්සියක් කුමරුවෝ උපන්නයි කී කල්හි රජ ඇමතිගණ පිරිවරා මතුමහල්තලයෙහි උන්නේය. ඉක්බිති ඒ රජරට ඒ කුමාරයා උපන්බව කීවාහුය. ඕහට එබස් අසාම පුත්‍රසෙනහ උපන්නේය. ඒ සෙනඝ' සිවි ආදිය විනිවිඳ ගොස් ඇටමිදුළු පැහැර සිටියේය. චින්තාභ්‍යන්තරයෙහි ප්‍රීති උපන්නේය. ළය සිහිල් වූවේය. මාගේ පුත්‍රයාගේ ඉපදීමෙන් තෙපි සතුටුවුදැයි අමාත්‍යයන් විචාළේය. එසඳ අමාත්‍යයෝ කුමක් කියනසේක් ද දේවයන්වහන්ස? අපි පෙර පිහිටක් නැත්තම්හ. දැන්වනාහි පිහිටක් ලදුම්හ, අප විසින් හිමිකෙනෙකුත් ලබන ලදැයි කීවාහුය. මාගේ පුත්‍රයාට පිරිවර උවමැනයි එබැවින් අමාථ්‍යකුලයෙහි උපන් කුමරුවන් මෙතෙකැයි බලා නියමදැන එවයි වහා සේන ගුප්තය යනඅමාත්‍යයෙකුට නියෝග කළේය. ඒ අමාත්‍යතෙම පන්සියයක් කුමරුන් දැක අවුත් රජරට දැන්වීය. එසඳ රාජකුමාර සතුටුව පන්සියයක් කුමාරාභරණ ගමන්කරවා පන්සියයක් කිරිමවුන්ද ගමන්කරවි. ඉතා උස් ස්ත්‍රීන්ගේ ඇකයෙහි හිඳ කිරි බොන දරුවන්ගේ කලවා රිදෙන හෙයිද ඉතා තරවූ ස්ත්‍රියගේ ඇකයෙහි හිඳ කිරිබොන දරුවන්ගේ නාසා පැතලිවන හෙයින්ද සමහර ස්ත්‍රින්ගේ කිරිඇඹුල් රස හෙයින්ද සමහර ස්ත්‍රින්ගේ කිරි කුලුරස ආදිවූ වෙන වෙන රස ඇති හෙයින්ද මෙකී සියලු දෝෂ ඇති ස්ත්‍රීන් හැර මධුරවූ කිරිඇතිසේ

SANHIDA LANKA

තනසිටි සිවුසැටක් කිරිමවුන් බොසතාණන්ට තොරා දී මහත්වූ සත්කාර කොට චන්ද්‍රා දේවීන්ට වරයක් දුන්නේය. ඒ චන්ද්‍රාදේවී තොම ඒ වරය කැමති විට ඇර ගනිමියි නොගෙන තිබුවාය. ඒ කුමාරයාට නම් තබන්නාහු දිනයෙහි ලක්ෂණ කියන්නාවූ බ්‍රාහ්මණයන්ට බොහෝ සත්කාර කොට ඔහට මතු උපද්‍රවයෙක් ඇද්ද නැද්දයි විචාළේය. ඔහු ඒ කුමාරයාගේ සාමුද්‍රිකා ලක්ෂණ සමුර්ධිය දැක මහරජ්ජුරුවන්වහන්ස, මෙතෙම පින් ඇති කුමාරයෙක. මෝඑක දිවයින තබා සතරමහදිවයින රාජ්ජ්‍යය කරන්නට සමර්‍ථවන්නේය. මෝහට වනාහි කිසි උපද්‍රවයක් නුදුටුම්හයි කීවාහුය. ඒ බමුණක් කී නිමිති අසා සතුටු වූ රජ තෙම කුමාරයාට නම් තබන්නේ මොහු උපන් දවස්හී සියලු කසී රට තෙම වැසි වටුහෙයින්ද තමාගේ ද ඇමති ආදීන්ගේ ද සිත් මෙමින් උපන් හෙයින් තෙකමිය කුමාරයයි නම් තුබුවේය. ඉක්බිති එක්මැසි කුමාරයා සරහා රජුගේ සමීපයට ගෙණහියාහුය. රජතෙම ප්‍රිය වූ පුත්‍රයා බලා වඩාගෙන ඇකයෙහි හිඳුවා සන්තෝෂයෙන් සනහා උන්නේය එකෙණෙහි සොරුන් සතරදෙනෙකු ගෙනාහුයාය. රජ්ජුරුවෝ ඔවුන් අතුරෙන් එකකුට කටුසැමිටියෙන් දහසක් පාරදෙවයි කීය. එකෙකු ඇල්කීලෙවයි කීයේය. එකෙකුගේ අත් පා හරුවයි කීයේය. එකෙකු උල තබවයි නියම කලේය. මහ බොසතාණෝ පිය රජ්ජුරුවන්ගේ වධයෙදීම් අසා හයින් තැතිගෙණ මාගේ පිය රජ්ජුරුවන් වහන්සේ රාජ්‍යය නිසා නිරයගාමීවු බොහෝ අකුසල් කොට නැසෙන්නැයි සිතු සේක. දෙවැනි දවස් උන්වහන්සේ සේසතනය සරහන ලද ශ්‍රී යහන් මස්ත්‍රකයෙහි පිනවූවාය. ඒ කුමාර මදක් සැතපී පිබිදුනේය. ඇස්හයා සේසත් බලන්නේ මහත් ඓශ්වර්‍ය්‍ය දුටුයේය. ස්වභාවයෙන්ම අකුශලයෙහි භය ඇත්තාහු ඔහට ඒ ඓශ්වර්‍ය්‍ය දැක අධිකතරවූ භය උපන් නේය. ඒ රාජකුමාර තෙම මම මේ රජගෙට කොතැන්හි සිට ආයෙම්දැයි ජාතිස්මරණ ඥාණයෙන් බලනුයේ දිව්‍ය ලෝකයෙහි සිට ආබව දැන එයින් ඈතත් බලනුයේ නරකයෙහි පැසුනුබව දුටුයේය. එයිනුත් ඈත බලනුයේ එම නුවර රාජ්‍යය කළබව දුටුයේය. තුමුදු විසිවසරක් රාජ්‍ය කොට එකල්හි සිද්ධවූ අකුශල යෙන් අසුදහසක් අවුරුදු නරකයෙහි පැසුනෙමි. නැවතත් දැන් මේ සිර ගෙහිම උපනිමි. මාගේ පිය රජ්ජුරුවන් වහන්සේද ඊයේ දවස සොරුන් සතරදෙනකු ගෙනා කල්හි ඔවුන්ට කර්‍කශවූ තෙපුල් කියනුයේ තමාත් නරකයෙහි ඉපදීමට සුදුසුවූ බස් කීයේය.

SANHIDA LANKA

# මහාජනක ජාතකය

සර්වඥ රාජෝත්තමයන් වහන්සේ ජේතවනරාමයේ වැඩ වාසය කරන සේක්. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව අරභයා මේ ජාතකය වදාල සේක.

නිදන කථාව - බුදුරජාණන් වහන්සේ මහාභිනික්මන් කළ නියාව ගැන දිනක් දම්සභා මණ්ඩපයේ භික්ෂුන් අතර උපන් කථාවක් අරභයා මහණෙනි, මේ ජාතියෙහි මෙය පුදුමයක් නොවේ. පෙර නමුහු කළ නුවණැති සමයෙහි පවා රාජ්‍ය හැර මහභිනික්මන් කළෝ වේදැයි ඉකුත් වත වදල සේක.

ආරාධනය - භික්ෂූන් වහන්සේ

යටගිය දවස මියුලු රාජ්‍ය කළ මහාජනක නම් රජ්ජුරුකෙනෙකුන්ට අරිටුජනකය පොලෝජනකය යයි දරුවන් දෙදෙනෙක් වූහ. කල්යාමේදී අරිටුජනක කුමාරුවන්ට යුවරජු තනතුරද පොලෝජනක කුමාරුවන්ට සෙනෙවිරත් තනතුර දී මහාජනක රජ්ජුරුවෝ මියපරලොව ගියහ. එවිට අරිටුජනක යුවරජ්ජුරුවෝ රාජ්‍යයට පැමිණ සෙනෙවිරත්ධූරයෙහි සිටි මල් රාජ කුමාරුවන්ට යුවරජ තනතුර දී දැහැමෙන් රාජ්‍ය කරන සමයෙහි එක් අමාත්‍යයෙක් අරිටුජනක රජ්ජුරුවන්ට කියන්නේ ස්වාමීනී, ඔබගේ රාජ්‍යය යුවරජ්ජුරුවන් වහන්සේ පැහැර ගැනීමට උත්සාහ කරතියි කියා මුසා කිය බිඳපීය. රජ්ජුවෝ මූ නැවත නැවතත් කියන්නේ සැබවයි සිතා මල් රජ්ජුවන් දඟගෙයි ලැවූහ.

යුව රජ්ජුරුවෝ එහි බොහො පීඩා විඳිමින් සිතන්නාහු මාගේ බෑණන් කෙරෙහි වරදක් නොසිතූ මට මෙවැනි දුකක් විඳීමට සිදු විය. මම ඔහු කෙරෙහි තිදොරින්ම වරදක් නොකෙළෙමි. ඒ මේ සත්‍ය බලයෙන් මේ මා බැඳි දම්වැල් පිපිරී යේවායි සත්‍ය ක්‍රියා කරන්නාම ඒ පිපිරින. එතනින් පලා ගිය යුවරජ්ජුරුවෝ පිටිසර ගමක ඉද ඒ ගම මිනිසුන්ගේ සිත් ගෙන වාසය කරන්නේ ඒ බව දැනගත් රජ්ජුරුවෝ ඔහු කැටුව ඒමට පිරිස යැවූහ. එවිට ගම්වාසීහු එක්ව ඊට විරුද්ධව නැගී සිට අවට ගම්වල මිනිසුන් හා ගොස් මිනිසුන් හා ගොස් මියුළු නුවර වට කොට ගත්හ. මියුළු නුවරිනුත් සිව්රඟ සෙනඟින් යුත් අමාත්‍යයෙක් පැමිණ යුව රජ්ජුරුවන්ට එක් වූහ. යුව රජ්ජුරුවෝ රජ්ජුරුවන්ට කියා යවන්නාහු සමඟ මම සතුරු කමක් නැතිව සිටියදීත් මට සතුරුකම් කළ සේක. එහෙයින් මමත් දැන් සතුරු වීමි. එබැවින් මා සමඟ යුද්ධ හෝ කරව, රාජ්‍ය හෝ දුන මැනවයි කියා යැවූහ. අරිටුජනක රජ්ජුරුවෝ එපවත් අසා කෝපයට පත්ව යුධ කරවයි කියා යවා සේනාව සමෘද්ධ කොට තබා දරුගැබින් සිටි තම අග්‍රමෙහෙසිකාව ලඟට කැඳවා කියන්නාහු යුද්ධයෙන් පැරදුනහොත් තෙපි ගර්භය ඉඳුරා රැකගෙන දන්නා තැනකට පළා යවයි කියා විධානය කොට ගොස් යුද්ධ කොට තබා මල් පොලෝ ජනක රජ්ජුරුවන් අතින් මරණයට පත්වූහ. එවිට අරිටුජනක රජ්ජුරුවන්ගේ උවමනා මුතු මැණික් ආදිය පැසක ලා ගෙන ඊ පිට කුණුරොඩු අසුරාගෙන කිළිටි වතක් ඇඳ ගෙන උතුරු වාසලින් පිටත්ව නම් පමණක් අසා ඇති කාලචම්පා නුවරට යෙමියි සිතා නික්මුණාහ. බඩ පිළිසිඳී දරු ගර්භය නම් අප මහා බෝධිසත්වයෝය. මෙසේ ගමන් පීඩාවට පැමිණී සිටි බිසව දුටු සක්දෙව් රජ මහළුවෙසකින් රථයක් අරගෙන අවුත් නාගචම්පා නම් නුවරට යන්නෝ ඇත්දැයි කියා බිසවුන් කරා රථය ලං කළේය. බිසව නොකැමෙත්තෙන් ස්වාමීනි, මම දරුගර්භයක් ඇත්තෙක්මි. මේ පැස පමණක් රථයෙහි තබා මම පයින් එන්නෙමි කීය. එවිට ශක්‍රයෝ කියන්නාහු මා හා සමාන රථ පදවන්නෙක් මේ දඹදිව නැත. නොබියව නැගෙවයි නංවාගෙන පෙරවරු තිස්යොදුනක් ගොසින් බිසවට පලා බත් මුලක් දී රථයෙහිම සැතපෙන්ට සලස්වා පස්වරු අනිත් තිස් යොදුන ගෙවා කාලචම්පා නුවරට වන්හ. බිසව පිබිද තිස් පැයකින් සැට යොදුනක් ගෙවීම තැන පුදුමයට පත්ව ළඟ මගකින් ගෙනාමියි ශක්‍රයාගේ බස් අසා සතුටුවූවාය. බිසව නුවර ශාලාවක නැවැත්වූ ශක්‍රයා දෙව්ලොව ගියහ. එනුවර ප්‍රසිද්ධ බ්‍රාහ්මණයෙක් පන්සියයක් තම ශිෂ්‍ය මානවකයන් පිරවරා ජලස්නානය පිණිස ශාලාව අසලින යන්නේ බිසව දැක කුසහොත් බෝසතුන්ගේ ආනුභාවයෙන් නැගෙණිය යන සඥාවක් ඇතිවී ඉතා ප්‍රසන්නව පිරිස මඟ නවතා තුමූ ශාලාවට පැමිණ සියළු තොරතුරු විමසා බිසවත් දරු ගර්භයත් රකිමියි සිතා ඈ කැටුව ගොස් තම සොයුරියක් බව අඟවා තම බැමිණිය ලවා සියළු උවටැන් කරවූහ. මේ නියායෙන් කල් යවන අවස්ථාවේ උපන් බෝසත් කුමරුට “මහජනක”යයි තම මුත්තනුවන්ගේ නමම තැබූහ. කුඩා කුමරුවා බොහෝ කුමාරවරුන් එක්ක කෙළිනා ගමනේ දබරයක් වූ විට පියා නැති පුතා යයි අන් කුමාරවරු මහජනක කුමාරයට කවටකම් කරන්නාහ. බෝධිසත්වයෝ මැණියන් කරා ගොස් එපවත් කියා බොහෝ ඇවටිලි කොට තම පියා ගැන අසා ගත නොහී එක් දිනක් කිරි බොන පරිද්දෙන් තනය කටේ දමාගෙන මගේ පියා කවුදැයි සත්‍ය වශයෙන් දන්වන තුරු තනය නොහරිමියි තදින් විකා ගත්හ. එවිට බිසව වේදනාව ඉවසා ගත නොහී ආදී වූ දෙය තත්වූ පරිද්දෙන් කීවාය. බෝධිසත්වයෝ එබස් අසා රාජ ධෛර්යයෙන් නිහඬව ඉතා උනන්දුවෙන් උගතමනා ශිල්ප ශාස්ත්‍රය ඉගෙන සොළොස් හැවිරිදි වූ කළ මැණියන් ලඟ තිබූ මුතු මැණික් වලින් භාගයක් ඉල්වාගෙන සම්පත් ලබනු සඳහා වෙළඳුන් සත් සියයක් හා කැටුව නැවත නැගී යාත්‍රාවට නික්මුණාහ. එදවසම පොලෝ ජනක රජ්ජුරුවෝත් ගිලන් බවට පැමිණියහ. මහා ජනක කුමාරයන් නැගි නැව සැඩ පවන් වේගයෙන් සත් දවසින් සත් සියයක් යොදුන් දිව මුහුද මධ්‍යයෙහි නැව නසින්නට වන් අවස්ථාවේ මස් කැස්බෝ නැවටම කොට ගත්හ. එවිට බෝධිසත්වයෝ ගිතෙල් සහ හකුරු බඩපුරා කා පිළි සඟලක් තෙලින් තෙමා තර කොට ඇඳ ගිතෙල් මුළු ශරීරයෙහි ගල්වා කුඹ අගට නැගී මියුළු නුවර දිසාව බලා ඉස්බක් දුර පැන්නාහ. එදවසම පොලෝජනක

SANHIDA LANKA

රජ්ජුරුවෝ පරලොව ගියාහ. බෝධිසත්වයන් දින හතක් මුහුදෙහි පීනා හත්වන දින අහස මැද සම්පූර්ණ චන්ද්‍රයා දැක අටසිල් සමාදන්ව පීනන අවස්ථාවට මහ මුහුද රැකවලෙහි යෙදුණ මණිමේඛලා නම් දෙව්දුව මහා බෝසතුන් කරා ගොස් වීයර්‍ය ගැන ඉතා ප්‍රසංසා කොට පුතකු මෙන් දැතින් වඩා තුරුළු කොට ගෙන මියුළු නුවර මඟුල් සල්වට මත්තේ වැදහොව දේවතාවන්ගේ ආරක්ෂාව සලස්වා තමාගේ විමානයට  ගියාය. පොලෝ ජනක රජ්ජුරුවන් ස්වර්ගස්ථවන අවස්ථාවේ ඇමතියෝ ගොස් දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ සීවලී නම් දියණියන් හැර අන් රාජ කුමාරයෙක් නැත. එබැවින් නුඹ වහන්සේගේ අයාමෙන් රාජ්‍යය කවුරුන්ට සලසමෝදැයි විචාළහ. එවිට  රජ්ජුරුවෝ

1. සීවලීයගේ සිත්ගත් කොනෙකුට හෝ

2. සිව්රැස්යානේ ඉස්දොරපාමුල දැනගත් කෙනෙකුට හෝ

3. දායක් දෙනා අදින මාගේ දුන්න ඇදපු කෙනෙකුට හෝ

4. සොළොස්මහා නිධානය තිබූ තැන් දැන ගන්නා කෙනෙකුට හෝ රාජ්‍යය දෙවයි කීහ.

එවිට අමාත්‍යයෝ සොළොස්මහා නිධාන හඳුනා ගැනීමට සඟ ඇද්දැයි විචාළහ. එවිට රජ්ජුරුවෝ ඒ නිධානය සඟවා කියන්නාහු

1. ඉර නැගෙන තැනය

2. ඉර බසින තැන්ය

3. ඇතුළය

4. පිටත

5. මධ්‍යයෙහිය

6. නැගෙන  තැනය

7. බස්නා තැන්ය

8-11 සල්ගස් අතරේ සතරේක

12. අවටින් යොත්නත් මධ්‍යයෙහි එකෙක

13. දළ ගෙහිය

14. වළගෙහිය

15. කෙබුකෙහි එකෙක

16. සල්ගස් අග එකෙකැයි මෙසේ සොළොස් නිධා පෙන්වාදී ස්වර්ගස්ථ වූහ.

රජ්ජුරුවන්ගේ ආදාහන කෘත්‍යයෙන් පසු එක් රැස් වූ අමාත්‍යවරු සීවලී බිසවගේ අභිප්‍රාය දතමනාවේදැයි සිතා පළමුකොට සෙනෙවිරදුන් යවූහ. ඔහු දුටු බිසව මුගේ ධෛර්‍ය බලන්ට උවමැනවයි සිතා චන්ද්‍රිකා ශාලාව වටේ දුවවයි කීහ. ඔහු මානයට දිව ලඟට වැදින. තම පය අල්ලවයි නැවත විධාන කොට එසේ කළ කල්හි ළමැදට පයින් ඇන හෙල බෙල්ල අල්ලා ඉණින් පාතට දමාපිහ. එවිට සෙනෙවිරදුන් මුදලිවරුන්ගේ ගෙට ගොස් බිසව යකින්නක් හා සමානව තමාට කළ ගැහැට කියා ගියහ. එබස් අසා අමාත්‍යයෝ එසේ වී නම් මම බිසවුන්ගේ හිත ලබමියි වෙන වෙනම ගොස් බිසවගෙන් පාරකා ගියාහ. මෙසේ සත් දිනක් ගියවිට රජ දරුවන් නැති රාජ්‍යය යහපත් නොවන්නේ ය. ඒ බැවින් පුස් රථය ඇර පින් ඇති කෙනෙකු ලබමුයයි එය සරසවා පඤ්චකකුධ භාණ්ඩ එහි තබා සිව්රඟ සෙනඟ ඇතිව මන්ත්‍රය පුරවා රථයට පැන් ඉස පින් ඇති කෙනෙකු වෙත යේවායි රථය යවූහ. එය රජමාලිගාව සහ නුවර තුන්විට බැගින් ප්‍රදක්ෂිණා කොට මඟුල් උයන බලා නික්මිණ. එවිට අමාත්‍යයෝ රථය තම තමන්ගේ ගෙවල් කරා එතියි බලාසිටි මුත් එය උයන බලා ගොස් බෝසතුන් වැදහොත් සලවට ගාවට ලඟාවී නුවරට මූණලා බෝසතුන් දිසාවට පිටිපා සිටියේය. එපිට පුරෝහිත බ්‍රාහ්මණයා ගොසින් පාද ලක්ෂණ බලා මුළු දඹදිව රජ කරන්නට හේතු සම්පත් දැක ආරාධනා කොට සුවඳ පැනින් නාවා අභරණින් සරසවා රුවන් රැසක් පිට සිටුවා අභිෂේක කොට නුවරට කැඳවා ගෙන ගියහ. බෝධිසත්වයන් වහන්සේ මාලිගාවේ විසිතුරු බලමින් බිසෝ ගෙට ගියහ. රජ්ජුරුවන්ගේ තේජසින් උන් තැනම සිට ගත නොහැකි වූ බිසව වහා පෙර ගමන් කොට අත අල්ලා තමන්ගේ වාසස්ථානය ඇරගෙන ගියාය. රජ්ජුරුවෝ සතරස් යානාව දැක ඉස තිබූ රන් මුද්ද ගලවා බිසවුන් අතට දුන්හ. ඈ එය ගෙන ඉස්දොර තිබුවාය. එවිට රජ්ජුරුවෝ ඉස්දොර දැන අමාත්‍යයන් අමතා සීවලී බිසව තමා ලත් නියාව පහදා යාන ඉස්දොරත් පෙන්වා දහසක් දෙනා ඇඳලන දුන්හ. යානාපිටම සිටම ඇද පෙන්වා නැවත සොළොස් නිධාන පෙන්වන්නේ ඉරනැගෙන තැන නිධානය නම් පසේ බුදුන් වහන්සේ පිඬුසිඟා පැමිණ වැඩ

SANHIDA LANKA

සිටිනා තැනය. ඉර බස්නා තැන නිධානය නම් පසේ බුදුන්ට පසු ගමන් කොට රජුන් නතරවුන තැනය. ඇතුළේ නිධානය නම් එළිපතින් ඇතුළය. පිටත නිධානය නම් එළිපතින් පිටතය. මධ්‍යයේ නිධානය නම් එළිපත මධ්‍යයේය. ගස් සතර මුල නිධානය තම සල් දණ්ඩෙන් කල යාන කකුල් සතරයට නිධාන සතරය. අවටින් යොත්නෙක නිධානය නම් යහන් කකුල් සතර මධ්‍යයෙහි නිධානයය. නැඟෙන තැන නිධානය නම් ඇතුනැගෙන තැනය. බටතැන නිධානය නම් ඇතුන් බස්නා තැනය. දළ අග නිධානය නම් ඇතුන්ගේ දළතිබූ ඡායායෙහි නිධානයය වලග නිධානය නම් මඟුලසාගේ වල්ග ඡායාවෙහි නිධානයය. කෙබුකෙහි නිධානය නම් මඟුල් පොකුණ මධ්‍යයෙහි නිධානයය. සල්ගස අග නිධානය නම් මධ්‍යාන වේගාවට ඡායා අග වැටුන තැන නිධානය කියා මෙසේ සොළොස් මහ නිධාන පෙන්වා උඩ නංවා දැක්වූහ. මෙසේ දැහැමින් සියළු දෙනාගේ සිත්ගෙන දශරාජ ධර්මයෙන් වාසය කරන රජ්ජුරුවන්ට දාව සීවලී බිසවුන් කුමාර කෙනෙකුන් වැදූහ. ඒ කුමාරයාට දීඝායු කුමාරයෝයි නම් තබා සොළොස් හැවිරිදි කලට යුවරජ තනතුර දුන්හ. දිනක් රජ්ජුරුවෝ මහාසේනාව පිරිවරා ඇතු පිටින් උයනට ගොස් එන්නේ පල දැරූ රුකක් සැපසේ ද තිබෙනු දැක ඊට හේතු කිම්දැයි ඇමතියන් අතින් විචාළහ. එවිට අමාත්‍යයෝ කියන්නාහු දේවයන් වහන්ස, පළදැරු වෘක්ෂය විනාශයට පැමිණියේය. නොපලදා වෘක්ෂයට කිසි හානියක් නොවීයයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ සිතන්නාහු සම්පත් ඇතිවීමෙන් වන්නාහු හානිය අඹ ගසට වූවාක් මෙනැයි සම්පත් නැතිව සැපසේ තපස්කොට ජීවත්වීම නොපලදා අඹ ගස මෙන් විනාශයට පත් නොවන්නේයැයි සිතා උඩුමහලට ගොස් බිමට නොබැස සත් මසක්ම තපස් රැක්කාහ. මේ බව දැනගත් මහ ජනයා මහත් සේ සොෂා කරන්නට වූහ. රජ්ජුරුවෝ ඒ කිසිවක් නොසිතා මෙතරම් සම්පත් රැසක් අත් හැරදා කවරදා මහණ වෙම්ද කවරදා තුන් සිවුරු පාත්‍ර ධරව පිඬු සිඟා ඇවිදිම්ද කවරදා රුක් මුල හිඳ භාවනා කොට මහණ දම් පුරමුදැයි සිත සිතා ඉන්නාහ.

එසමයෙහි මනුෂ්‍යයන්ගේ පරමායුෂ දසදහසක් අවුරුදුය. රජ්ජුරුවන්ගේ ආයුෂද සත් දහසක් ඉක්ම ගියේය. එබැවින් රජ්ජුරුවෝ මෙහි තවත් ඉඳීමෙන් කවර වැඩෙක්දැයි රහසින් පාත්‍ර සිවුරු ගෙන්වා ගෙන හිසකේ කපා මහණ වෙස්ගෙන මටවූ සැපය. සොඳනියායයි සිතා  දෙවන දවස මහභිනික්මන් කෙරෙමියි ඉණින් පහතට බසිමින් උන්නේය. ඒ වේලාවට සීවලී බිසව සත් සියයක් බිසෝ වරුන් පිරිවරා රජ්ජුරුවන් දැකීම සඳහා උඩුමහලට නැගෙන්නාහු මහණ වෙසින් බසින රජ්ජුරුවන් නොහැඳින පසේ බුදුනැයි සිතා වැඳලා උඩු මහලට ගොස් රජ්ජුරුවන් ගේ කෙස් වැටිය හා රන් ආභරණ දැක දැන් බැස ගියේ රජ්ජුරුවන් වහන්සේ යයි සිතා වහා බැස විලාප කියමිනන් දුව ගොස් රාජාඞගනයෙහි යන රජ්ජුරුවන්ගේ පාමුල අක්‍ෂා වැටුනාහ. නුවරවාසි හුද බිසොවරුද අමාත්‍යයෝද අඬමින් ගමන වලක්වන්නට දැරූ තැන නොබලා නික්මී යොදුන් හැටක් පමණ ගියහ. සීවලී බිසවද කැටිව මහහ සේනාවද පසු එන්නාහ එදින හිමාල වනයෙහි දින හතක් ධ්‍යාන සැපයෙන් දවස් යවා නැගී සිටි නාරද තාපසයන් වහන්සේ මෙවැනි උතුම් සැපතක් ලබා ගැනීමට තවත් පතන්නෙක් ඇවිද්දැයි දිවැසින් බලා මහජනක රජ්ජුරුවන් තාපස වේසය ඇරුගෙන එන්නවුන් දැක උන් කරා ගොස් උන්ට සතර බඹ විහරණ පඤ්චසෘඩී අෂ්ටසමාපත්ති උපදවාගෙන බඹලොව යන සේ අවවාද කොට තමා වසන්නා වූ ගල් ගුහාවට ගියාහ. ඉක්බිති මිගාරජින නම් තාපස කෙනෙක්ද මෙසේ ධ්‍යානයෙන් නැගී සිට රාජ තාපසයන් කරා අවුත් තොරතුරු අසා අනුශාසනා කොට වැඩියහ. එවිට සීවලී බිසවුන් වහන්සේ පැමිණ ස්වාමිණී නුඹ වහන්සේ මහණ වූ කල මම කුමක් කෙරෙම්දැයි විචාරා තොපත් රාජ සම්පත් හැර මහණ වනුවැයි කියා රාත්‍රී ගසක් මුල මෛත්‍රී භාවනා කරමින් කල් යවා සීවලී බිසවට සේනාව සමඟ එන්ට සලස්වා නික්මී රුහුණී නම් නුවරට ගියහ. ඒ වේලාවට එක් බල්ලෙක් කෑමට පිලිස්සු මස්කැටියක් අරක්කැමියකුගෙන් සොරා ගෙන එන්නේ රාජ තාපසයන් හා බිසවුන් අතර දමා දිවපීය. තාපසයන් වහන්සේද මස් කැටිය තමන් පාමුල එලාපු හෙයින් කැපය කියා පාත්‍රයට ගෙන පැන් පාසු තැනකට ගොස් වලදන්නට වූ කලට බිසවු කියන්නාහු ස්වාමිනි දින කීපයක් කුස ගින්නේ පසු වුවත් බලු ඉඳුල් අනුභවය රාජ ගෞරවයට කැලලක් නොවේදැයි කරුණු කීවාය. එවිට රජ්ජුරුවෝ ආහාර කැප වීම පමණක් ම විනා ගෞරවයක් නොපතම් කියා වලදා පාත්‍රය සොදාපූ සේක.

නොබෝ වේලාවකින් දෙදෙනාම ඇතුළුනුවරට යන්නාහු එක් කුමාරිකාවක් අතක වලලු දෙකක් හා එක් අතක එක් වල්ලක් තබා ගෙන කෙලින් වී වලලු දෙක ඇති අත අඬන්නේය. එක වලල්ලේ අත නාඬන්නීය. බෝධි සත්වයෝ ඒ දැක සීවලී දේවී මා කැටිව ඒමෙන් මෝඩ ජනයා නින්දා බස් උපදවයි. ඊට කුඩා කෙල්ලම දොස්කියන්නීයැයි කෙල්ල අමතා තොපගේ එක් අතක වලලු අඬන්නේ අනෙකේ වලලු නාඬන්නේ මන්දැයි විචාලහ. එවිට ඈ කියන්නී ස්වාමිනී වලලු දෙක තිබූ හෙයින් එක් අතෙක් අඬන්නේය. අනෙකේ එක වලල්ල නිසා නොහඬන්නේයැයි කීහ. එසේහෙයින් රජතුමනි, රජ සැප හැර තියා තනිව ගොස් තපස් කරතොත් විනා බිසවුන් වූ සමඟ මේ කිම්ද කිව. එබස්අසා සතුටුව විසවුන්ට කියන්නාහ බිසවුනි මට නින්දා නොකරවා මේ මඟින්පලා යව. අද පටන් තොපි මට බිසෝ කෙනෙක් නොවෙව මම තොපට ස්වාමි කෙනෙක්ද නොවෙමි. කියා අවවාද කොට පිටත් කර හැරිය මුත් ටික දුරක් ගොස් දුක ඉවසා ගතනොහි ආපසු පැමිණ එක්ව නුවරට වන්හ. පසු දින වීතියෙහි පිඩු සිඟා යන්නේ ඊ වඩුවකුගේ ගෙදරට පැමිණියාය. ඊ වඩුවා කාඩියේ ඊ දඬු ගල්ව ගල්වා එක ඇසකින් ඊ දණ්ඩ ඇඳ මඩින්න වුන් දැක බෝධිසත්වයෝ විචාරන්නාහු ඇයි තා එක ඇසින් ඊ දන්ඩ ඇඳ අරින්නේ කුමක් නිසාදැයි විචාරන්නා. දැසින්බැලුවවොත් නොපෙනෙයි. එක ඇසින්බැලුවොත් පෙනෙයි කියාත් නැවත අවවාද කියන්නී නුඹ වහන්සේ තනිව තපස් කළ මැනවයි කීහ. බෝධිසත්වයෝ පාසු තැනකදී වළදා සීවලී බිසවුනි, තෙපි රඳවයි කියා නික්මුණාහ. එසේ කීවත් එක්වම එන බිසව බලා තණ පදුරක් අතින් කඩා බිසවුනි මේ කැඩුන තණ දෙමිට එක්වේ. නමුත් තොප හා මා එක්වීමෙක් නැත. තෘෂ්ණාව අලෙනි රඳවයි කීහ. එවිට බිසව ශෝකය ඉවසා ගත

SANHIDA LANKA

නොහි මුර්චඡා වී මුනින් වැටුනාහ. ඒ අවස්ථාවේ රජ්ජුරුවෝ වහා වලට වැද හිමාලයට ගොස් තුන්දහසක් අවුරුදු ඝෝර තපස් කොට බඹ ලොව උපන්හ.

සීවලී බිසවුන් පස්සේ පැමිණි අමාත්‍යයෝ බිසවුන්ට පැන් ඉස සුවපත් කළහ. බිසවුන් නැගී සිට අමාත්‍යයන් අතින් රජතුමා කොයිදැයි විචාරා වටපිට බලා නොදැක වියෝ වූ තැන එක් දාගැබක්ද ඊ වඩුවාගේ දොර එක් දාගැබක්ද කෙල්ල දුටු තැන දාගැබක්ද මස් කැටිය වැලඳු තැන දාගැබක්ද මිගාරජින සහ නාරද තාපසවරු දෙදෙනා හමුවූ තැන් වල දාගැබ් දෙකක් ද බඳවා මියුළු නුවරට අවුත් දිඝායු කුමාරයන්ට ඔටුනු පලඳවා රාජ්‍ය භාරදී සීවලී බිසවු තමා ම මඟුල් උයනේ මහණව කිසුනු පිරියම් භාවනා කොට කම් වූ පරිදි මිය පරලොව ගියාහයි වදාරා මේ ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි මණිමේඛලා දිව්‍ය ස්ත්‍රිය නම් උපුල්වන් මහස්ථවිරිය මිගාරජින තාපසයෝ මුගලන් තෙරුන් වූ අතර දැන් සැරියුත් තෙරුන් වුයේ එදා නාරද තාපසයන් වහන්සේය. වැලි කෙලි කුමාරිකාව නම් දකුණත් සවු වූ ඛේමා කුමාරිකාවයි. ඊ වඩුවා නම් ආනන්ද ස්ථවිරයෝය. සීවලී බිසව යසෝදරා මහ ස්ථවිරියන් වූ අතර දිඝායු කුමාරයි වූයේ රාහුල මහ ස්ථවිරයෝය. එම මවුපිය දෙදෙනා වූයේ මෙකල ම මව්පිය දෙදෙනාමය. රාජ්‍යශ්‍රී හැර අභිනික්මන් කළ මහාජනක රජ්ජුරුවෝ නම් දැන් තිලෝගුරු බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# සාම ජාතකය

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මව්පියන්ට උවටැන් කරන එක් භික්ෂුවක් අරභය මේ ජාතකය වදාළ සේක.

නිදාන කථාව - සැවැත් නුවර අසූ කෙළක් ධනය ඇති එක් සිටු පුත්‍රකේ මව්පියන්ට අතිශයින් ප්‍රිය කරන්නේ ඒ දෙදෙනාට අවශ්‍ය උවටැන් සියල්ලක්ම තමා අතින් ඉටු කරන්නේය. හේ දිනක් බුදුන් හමුවට ගොස් බණ අසා මහණවනු කැමතිව ඉතා දුකසේ මව්පියන්ගෙන් අවසර ලබගෙන පැවිදිව ආරණ්‍යසේනාසනය පැමිණ දොළොස් අවුරුද්දක් උත්සාහ කොටත් කිසියම් ගුණ විශේෂයක් උපදවාගත නොහැකි විය.
උන්වහන්සේ මහණ වූ තැන් පටන් මව්පියන් දෙදෙනා ක්‍රමයෙන් දුක්පත් බවට පැමිණියාහුය. වස්තුව එකිනෙකා අත්කර ගත්හ. දැසිදස් ආදීහු මුතුමැණික් ආදී දේ රැගෙන පළා ගියහ. මෑත භාගයෙහි පැන් බිඳකුදු ලබා ගැනීමට තරම් කිසිවෙකුගෙන් සහායක් නොලැබ කිලිටි කඩමාලු හැඳ කබල් ගත් අත් ඇතිව සිඟා කා අවිදින්නාහුය.
එකල එක් භික්ෂුවක් සැවත ජේතවනාරාමයෙන් පිටත්ව ක්‍රමයෙන් ගොස් ආරණ්‍යවාසී භික්ෂුව සිටිනා පන්සලට වැඩිසේක. එහිදී තම දෙමව්පියන්ගේ දුක්ඛිත තත්වය දැනගත් එම භික්ෂුව මට මේ මහණ කමින් කම්නැත. මාර්ගයක් හෝ ඵලයක් ලබා ගැනීමට තවමත් නොහැකි විය. මම ගිහි වී මව්පියන් ආරක්ෂා කර ගනිමියි එතැනින් පිටත්ව සැවැත් නුවරට පැමිණ ජේතවනාරාමය අසලදී බුදුන් දැක යමියි සිතා එහි ගොස් බුදුරජාණන් වහන්සේ මාතුපෝසක සූත්‍රයෙන් දෙසූ ධර්මය අසා මට ගිහි නොවී මෙසේ පැවිදිව සිටම මව්පියන් රක්ෂා කෙරෙමියි සිතා දෙවන දවස් උදෑසනම හිස්අතින් නොයායුතු හෙයින් හුළුකැඳ ගෙන මව්පියන් පළමු විසූ ගෙදරට ගිය සේක. ඒ වෙලාවට මම්පියෝ කැඳ සිඟා ඇවිද ගොස් වෙහෙසී ඒ අසල වැටී උන්නාහුය. ඔවුන් දැක ළඟට ගොස් මව්පියන් දෙදෙන අස්වසා කැඳ අනුභව කරවා පිඩුසිඟා ගොස් ආහාරද වළඳවා එක්තැනක හිඳුවා එතැන් පටන් පෝෂ්‍ය කෙරෙති. වස්ත්‍රද සොයා දෙන සේක. මේ බව දැනගත් භික්ෂූන් වහන්සේලා ඒ බව බුදුරජාණන් වහන්සේට දැන්වූහ. බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂුව ගෙන්වා සැබෑදැයි ගෙන්වා ඒ ක්‍රියාව වර්ණනාකර තුන් විටක් සාදුකාර දී තෙපි මා ගියාහු මාර්ගයේ ගියාහුයයි දක්වා මේ පිළිබඳ ඉකුත්වත වදාළ සේක.

ආරාධනය - භික්ෂූන් වහන්සේ

ජාතක කථාව - යටගිය දවස බරණැස් පිලියක් නම් රජ කෙනෙක් රාජ්‍ය කරන සමයෙහි බරණැසට නුදුරු ගංගාවෙක් විය. ඒ ගඟ එතෙර සහ මෙතෙර පන්සියයක් බැගින ගෙවල් ඇති වැදි ගම් දෙකක් වූහ. ඒ ගම් දෙකෙහි ප්‍රධානියෝ දෙදෙනාගේ කතිකාව අනුව එක් ප්‍රධානියෙකුගේ දූකුල නම් කුමාරයන් අනෙක් ප්‍රධානියාගේ පරිකා නම් කුමාරිය සමඟ ආවාහ විවාහ කර දුන්හ. ඒ දෙදෙනා බඹ ලොවින් චුතව පැමිණ උපන් හෙයින් කාම අදහස් ඔවුන් තුල නොවීය. එබැවින් ඔවුන් දෙදෙනා අඹු සැමියන් මෙන් එක් නොවී වාසය කළහ. ප්‍රාණවධ ආදිය ද නොකෙරති. එවාට හවුල්ද නොවෙති. කල්යෑමේදී ඔවුන් දෙදෙනා මව්පියන්ගෙන් අවසර ගෙන මිගසම්මත නම් ගඟ අද්දරට ගොස් ශක්‍රයා විසින් මවා දෙන ලද තවුස් පිරිකර ගෙන මහණව එම පන්සලෙහිම මෛත්‍රී භාවනාව කෙරෙමින් විසූහ. ඔවුන්ගේ උපස්ථානයට නිතර එන ශක්‍රයෝ ඒ දෙදෙනාගේම ඇස් අන්ධ වීමට අන්තරායක් දැක දූකුල පණ්ඩිතයන් කරා එළඹ ස්වාමීනි, නුඹ වහන්සේලාට එක් අන්තරායෙක් පෙනෙයි. එබැවින් මතු රක්නා පිණිස පුත්‍රයෙක් ලබන්ට වටනේය. එසේ හෙයින් ලෝකධර්මය සේවනය කළ මැනවැයි කීහ. දූකුල පණ්ඩිතයන් වහන්සේ එය ඉතා පිළිකුල් කොට ප්‍රතික්ෂෙප කළ කල්හි එසේ නම් පාරිකාවන් මල්වර වූ කල අතින් නාභිය පිරිමැද්ද මැනවයි කීහ. තාපසයෝ මැනවයි එය ඉවසා එසේ කොට දසමස් අවෑමෙන් බිසව පුතෙකු වැදුවාය. ස්වර්නයකට බඳු රූ දරන හෙයින් ඒ කුමාරයාට සාම කුමාරයෝ යයි නම් තැබූහ. මෑනියෝද පර්වත අතරේ වෙසෙන කින්නරාඞගනාවෝද ඒ කුමාරයන්ට කිරි මව් කම් කෙරෙති. ක්‍රමයෙන් කෙළ ඇවිදිනා වේලේ සිවුපා සතුන් හා මිතුරුව වනයේ ඇවිදිනා වේලේ සිව්පා සතුන් හා මිතුරුව වනයේ ඇවිද කල් යවන්නාහ. මෙසේ සොළොස් හැවිරිදි වූ කල සාම කුමාරයන් තවුස් වෙස් ගන්වා පන්සලේ නවතා මව්පියන් දෙදෙනා වනයට ගොස් පළවැල ගෙනවුත් රක්ෂාකරන්නාහ. දිනක් මව්පියන් දෙදෙනා පලවැල සඳහා වනයට ගියාහු අකල් මේඝයක් හට ගත්තෙන් ඒ දෙදෙන ගසක් මුල තුඹසක් පිට සැකනැතිව සිටි කල්හි ඔවුන් ඇඟින් තෙමී බට ඩාදිය බින්දු ඒ හුඹස් කට ඔත් නා රජුගේ නාසා පුටයේ වැගුරුනේය. එයින් කිපුණු නා රජු විෂධූමයක් යවා ඒ දෙදෙනාගේ ඇස් සතරම අන්ධ කළේය. ඔවුන් දෙඅත් අල්වාලෙන හඬා වැලප සවස් වනතෙක් පන්සලට යා ගත නොහැකි වූයේ ඔබ්මොබ සක්මන් කරමින් කල් යැවූහ. සවස් වන තෙක් සිටි සාම කුමාරයෝ තම මව්පියන්ගේ ප්‍රමාදය දැක පෙරමගට ගොස්

SANHIDA LANKA

බලා ඇස් අන්ධ වූ මව්පියන් ඈත එනවා දැක ඉතා දුකින් දික් ලීයක් අල්වා ගන්නට සලස්වා තුඹය සමීපයට කැඳවා ගොස් කරුණු පරීක්ෂා කර බලා තතු පහදා ගෙන අඩා වැළප එකවරම සිනාසුනේය. ඒ දෙදෙනා කුමාරයා සිනාසෙනු අසා ඊට කාරණා විචාළහ. ඔබ දෙදෙනා වහන්සේට මෙතැන් පටන් උවටැන් කිරීමේ භාග්‍ය මම ලද්දෙමි. එබැවින් සිනාසුනෙමියි දන්වා එතැනින් මව්පියන් දෙදෙනා පන්සලට කැඳවා ගොස් එතැන් පටන් සියළුම උවටැන් කරමින් කිසි දුකක් නොදී පෝෂ්‍ය කරන්නාහ.

එකල බරණැස් නුවැර රජ මුව දඩයමෙහි යන්නේ මගසම්මත නම් ගඟ දැක එහි බැස නා ගිම් නිවා ඒ අවට බලනුයේ එ පන්සල සිට ගඟට එන මුවන්ගේ පා සලකුණු දැක දුන්න තරයේ ඇද විෂ පෙවූ ඊයක් අතින් ගෙන සැඟවී සිට මුවන් පිරිවරා ගෙන පැන් ගෙන ඒමට ගඟට එන සාම කුමාරයන් දැක මීට පෙර කිසි දිනක මෙබඳු රූපයක් නොදුටුවිරූ හෙයින් කවුරුන් බවත් නොදැක මොහු විද ඔබලත් වූ කල විචාරා ගනිම් සිතා උරපුරා ඇද විෂ පෙවූ හීය යැවීය. එය කුමරාගේ වම් ඇලයෙන් ඇතුල් වී දකුණු ඇලයෙන් පිටවී බිම සැඟවුණේය.

එකල්හි කැටුව සිටි මුවෝ මරණ භයින් තැතිගෙන පැන දිවූහ. ඒ ශරපහර ලත් සාමකුමාරයෝ බිම වැටෙන වේලෙත් මව්පියන් සිටින දිශාව බලා එදෙසට හිස නමා රන් පිළිමයක් මෙන් වැල්ලේ වැදහොත්තේ මදක් සිහිඑලවාගෙන විදි කෙනෙකු නොදැක කියන්නේ උපන් තැන් පටන් මේ දක්වා අඛණ්ඩ අෂ්ටාඞගසීලය රක්‍ෂා කොට දසපින් කිරියවත් පුරා මෙත් වඩා දවස් යවන හෙයින් මට මේ වෙනෙහි සතුරුව ඉන්නා කෙනෙකුන් නැත. එසේ වූ මාගේ මිනී මසින් ප්‍රයෝජනයකුත් නැතිව නිවැරදිව වූ මා විදලා කුමට සැඟවුණුද? යනාදින් කියන නොයෙක් බැගෑ තෙපුල් අසා සැඟවී සිටි පිළියක් රජ කොටුපතින් එළිබැස සාමයන් ලඟව ගොස් සියළු තොරතුරු අසා ඉවසා ගත නොහැකි ශෝකයෙන් යුතුව මව්පියන් කැඳවා ගෙනු එනු සඳහා පන්සල බලා පිටත් වී ගියහ. ඒ වේලාවේම සාම කුමාරයන්ගේ නෙත් පියවී අතපය විසිරී අවමඞගල්‍ය වේශයෙන් ඇතිවිය. ඒ සාමයන්ට සත්වැනි ජාතියෙහි මවු වූ බහුසොදරී නම් දෙව් දුවක් වැදහොත් සාම කුමාරයන් දැක වහා එහි පැමිණ රජහට භය ගන්වා මොහුගේ දෙමාපියන් මෙතැන් පටන් රකුවයි රජහට භාරකොට සාමයන් රැකවල් ලා ගෙන සිටියදී පිළියක් රජ පැන් කලයද ගෙන පාසටහන් අනුව පන්සල සොයා ගියහ. අඳ මව්පිය දෙදෙන පිටතින් එන පා හඩ අසා සාමයන් නොවන බව දැන කවුරුන්දැයි විචාරා පිළියක් රජ යයි කී කල්හි තෙල පන්සල හිද මිහිරි පලවැල වලඳවයි කී විට එය පසුව හැක්කේ යයි සාම කුමාරයන්ට සිදු වූ අනතුර කියන්නාම අඩා රජ්ජුරුවන්ගේ පා මුල ඇද පෙරළී කුමාරයාගේ ගුණ කියමින් වැලපෙන්නට වූහ. ඉක්බිති රජ්ජුවන් ඔවුන් ලවා සැරයටිය අල්වා ගෙන සාම කුමාරයන් වැදහොත් තැනට ගෙන ගොස් තොපගේ පුතණුවන් බලනුවයි අත අල්වා පෑ කල්හි මහත් ශෝකාග්නියෙන් අඩා දෙපා මෑණියන් තුරුල්ලේ ද හිස පියාණන් තුරුල්ලේද තබාගෙන ලෝකපාල දෙවියන්ට යැද ලෙහි අත තබා පණ කඳ සැඟවුණු බව දැන නැවතත් සත්‍ය ක්‍රියා කරන්නාහු. මාගේ පුතණුවෝ උපන් තැන් පටන් ජිවිතාන්තය දක්වා අඛණ්ඩ වූ බ්‍රහ්මචර්යාව රක්‍ෂා කළේ සැබෑවීනම් ඒ සත්‍ය ක්‍රියාවෙන් ද මහණ වූ තැන් පටන් අද දක්වාම නොකඩවා රැකි අෂ්ටාඞග ශීලයේ බලයෙන්ද වහා සුවපත් වේවායි කීහ. එම සත්‍ය ක්‍රියා බලයෙන්ද ඒ වෙනෙහි දෙවියන්ගේ බලයෙන්ද සාම කුමාරයෝ සිහි ලැබ වැදහොත් ඇලයෙන් දෙවන ඇලයට නැමුන කල්හි පියාණන් වහන්සේද එසේ සත්‍ය ක්‍රියා කළහ. එවිට දෙවන ඇලයෙන් නැගී වැදහොත්හ. බහුසොදරී දිව්‍යාඞගනාවගේ සත්‍ය ක්‍රියා බලයෙන් දෙමව්පිය දෙදෙනාගේ ඇස් ලැබීමද සාමයන්ගේ දිවි ලැබීමද දිවිසුරු උදවීමද මේ තුන් කාරණය එක විට සිදු විය.

එකල්හි පිළියක් රජු නම් දැන් ආනන්ද ස්ථවිරයෝය. දිව්‍ය ස්ත්‍රී නම් උපුල්වන් මහ ස්ථවිරිය. ශක්‍රදේවේන්ද්‍රයෝ නම් අනුරුද්ධ මහ ස්ථවිරයෝය. පියාණෝ නම් මහා කාශ්‍යප ස්ථවිරයෝය. මෑණියෝ නම් භද්දකාපිලානීය. සාම පණ්ඩිතව උපන්නේ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# නිමි ජාතකය

බුදුරජාණන් වහන්සේ මියුලු නුවර මුවදෙව් නම් අඹ උයන්හි සැරිසරා ඇවිදිනා සේක්. එක් සිත් කළු භූමි ප්‍රදේශයක් දැක පූර්ව චරිතයක් සිහි වී සිනහ පහළ කළ සේක. ඒ දුටු ආනන්දතෙරන් වහන්සේ උත්කටුකයෙන් හිඳ දොහොත් මුදුන් දී වැඳ ඊට හේතුව විචාල සේක. එවිට බුදුරජාණන් වහන්සේ ආනන්දයෙනි, මේ භූමිය පෙර මම මඛාදෙව නමින් රජව ධ්‍යාන කෙළි කෙළ විසූ තැන යයි පවසා තවත් පැහැදිළි කරනු සඳහා ඉකුත්වත වදළ සේක.

ආරාධනය - ආනන්ද මහ තෙරුන් වහන්සේ

ජාතක කථාව - එද වේදේහ රට මියුළු නුවර රාජ්‍ය කළ මඛාදේව නම් රජ්ජුරු කෙනෙකුන් සුවාසු දහසක් අවුරුදු කුමාර කෙලියෙන් ද සුවාසු දහසක් අවුරුදු යුවරජු කමින් ද සුවාසු දහසක් අවුරුදු මහ රජ කමින් ද කල් යව කපුවා විසින් රන් අඬුවෙන් උගුල්ලා තම අතෙහි තුබූ නර කෙස දැක මරණය නලලට පැමිණියාක් මෙන් යයි නුවණින් සලකා බලා මගුල් කපුවාට ගම්වරයක් දී ජ්‍යෝෂ්ඨ පුත්‍රයා කැඳවා මම මහණ වෙමි. රාජ්‍ය ගනුවයි කී කල නුඹවහන්සේ මහණවන කාරණය කවරේදැයි විචාල සඳ

උත්තමඞග රුහාමය්හං - ඉමෙජාතාවයොහරා
පාතභූතා දෙවදූතා - පබ්බජ්ජා සමයො මමන්ති

යනාදින් පුත, සත්වයන් හිස නරකෙස් හට ගැනීම මරණය ලන් බව කීමට එන දේවදූතයන් වැන්න. එසේ හෙයින් මාගේ හිස නරකෙස් හට ගත. ඒ කාරණයෙන් මම ජරාවට පැමිණියෙමි. මහණ වනු කැමැත්තෙමි. තොපි රාජ්‍ය කරව් කියා අවවාද කොට නුවරින් නික්ම මුවදෙව් නම් උයනෙහිදි පැවිදිව අසූසාර දහසක් අවුරුදු සතර බ්‍රහ්මවිහාර භාවනා කොට බඹලොව ගියාහ. ඒ රජ්ජුරුවන්ගේ පුත්‍රයාද මෙසේම හිස නරකෙස් දැක රාජ්‍යය තම පුත්‍රයාට භාරදී පැවිදිව භාවනා කොට බඹලොව ගියහ. මෙසේ ඔහුගේ පුත්‍රයාදැයි පුතුන් දෙදෙනෙක් අඩු සුවාසු දහසක් රජහු බඹලොව ගිය මඛාදේව රජ්ජුරුවෝ මාගේ ප්‍රවෘජ්‍යාවංශය කඩ නොකොට මතු පවතීදැයි බලා නොපමාව තීන බව දැන මමම එය කඩ නොකොට පවත්වමියා සිතා එයින් චුතව මියුලු නුවර මහරජහුගේ අගමෙහෙසුන් කුස පිළිසිඳ දසමසකින් බිහි වුයේය. ඒ කුමාරයන්ට නම් තබන දවසෙහි නිමිත්තපාඨකයෝ ලකණ බලා මේ කුමාරයෝ තොපගේ වංශයට රථ සකෙහි කෙමියක් මෙන් වංශය රකිමින් උපන් හෙයින් නිමි කුමාරයෝ යයි නම් තැබීය. ඒ කුමාරයා කුඩාකල පටන් දන්දෙමින් සිල් රකිමින් කුසල ක්‍රියාව කරන්නේය. ඒ කුමාරයා පියාගේ අවෑමෙන් රාජ්‍යයට පැමිණ නුවර සතර වාසලෙහිම දන්හල් කරවා දවස පන්ලක්ෂයක් ධන විසද මහදන් පැවැත්වූහ. මහාජනයාද දනාදි වූ කුසල ධර්මයෙහි යොදවා ස්වර්ගමාර්ගය කියා අනුශාසනා කරන්නේය. එකල දෙව්ලොව පිරී නරකාදිය සිස් වූ කලක් මෙන් විය.
ඒ නිමි රජ්ජුරුවෝ පසළොස්වක් පොහෝ දිනයක පෙහෙවස් සමාදන්ව සැතපී පශ්චිම යාමයෙහි පිබිද පලක් බැඳ යහන් මතුයෙහි හිඳ මෙසේ සැකයක් සිතුවාය. මම වනාහි මහජනයාට නිත්පතා මහා දන් දෙමි. නිති සිල් ආරක්‍ෂා කෙරෙමි. මේ දෙකින් දනයෙහි එල මහත් වේදේ හෝ සීලයෙහි එල මහත් වේදේ හෝයි, මෙසේ වූ සැකයක් සිතා ඒ සැකයෙහි පසිඳ පිය නොහී උන්හ. ඒ සිතූ ක්‍ෂණයෙහි ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු වී ඊට කාරණා බලන්නේ නිමි රජ්ජුරුවන්ගේ සිත උපන් සැකය දැක හුදකලාවම වහා අවුත් රාජ භවනයම බබුළුවා ශ්‍රී යහන් ගබඩාවට ඇතුළුව ආකාශයෙහි හිඳ තමා ශක්‍රයා බව හගවා කැමති පැණයක් මා අතින් විචාල මැනවයි කීහ. එවිට රජ්ජුරුවෝ එම්බා ශක්‍රය, දනය ශීලය දෙකින් කවරෙක් මහත්ඵල වේදැයි විචාළේය. එවිට ශක්‍රයෝ

හීනෙ නබ්‍රහ්මචරියේන - ඛත්තියෙ උප්පජ්ජති
මජ්ඣිමෙන ච දෙවතතං - උත්තමෙන විසුජ්ඣති

SANHIDA LANKA

යනුවෙන් මහරජ, හීන බ්‍රහ්මචර්යාවෙන් රජවරුද එම මධ්‍ය බ්‍රහ්මචර්යාවෙන් දෙවිවරුද උපදනේය. උත්තම බ්‍රහ්මචර්යාවෙන් පිරිසිදු වන්නේය. දනයට වඩා සතසහස්‍ර ගුණයෙන් සිල් රැකීම මහාත්ඵල මහානිශංසයි වර්ණනා කළහ.
තවද මහරජ අතීතයේ දුදීප, සාගර, සේල, මුචලින්ද, භාගිරථ, උසීනර, අට්ඨක, අස්සක ආදී රජ දරුවෝද

බ්‍රාහ්මණාදී වූ බොහෝදෙනාද අනේකප්‍රකාර දන් දී මරණින් මතු කාමස්වර්ගයෙහි ම උපන්හ. සාමහනු, සෝම්යෝග, මනෝජව, ආදී ඍෂිවරයෝ එකොළොස්දෙන සිල් රක්‍ෂා කොට දෙව්ලොව ඉක්ම බඹලොව උපන්නාහ.
තවද ශීලය මහත් බව හගවනු පිණිස කථාවක දන්වන්නාවූ ශක්‍රයෝ මහරජ, පෙරඋතුරු හිමවත ස්වර්ණ පර්වත දෙකට අතර පැවැත්තාවූ සීද නම් වූ ගංගාවක් වූවාය. ඒ අවට සිත් කළු වූ භූමි ප්‍රදේශයෙහි වාසය කළ දසදහසක් ඍෂිවරු සමාපත්තිලාභීහුමය. පිඩුසිගා වළඳති. එක් තාපස කෙනෙක අහසින් බරණැස්නුවරට ගොස් පුරෝහිත බ්‍රාහ්මණයාගේ ගෙදරට පිඩු පිණිස පැමිණි සේක. පුරෝහිත තෙමේ දැමුණු ඉදුරන් දැක ඉතා පැහැද ගෙට කැඳවා වඩා හිඳුවා දන් පිළිගන්වා තොරතුරු සුවදුක් විචාරා තමාත් මහණවනු කැමතිව ස්වාමීනි, මාවද පැවිදිකර වදළ මැනව. මම රජ්ජුරුවන්ගෙන් අවසර ගෙන එමියි දන්වා තම රජ්ජුරුවන් ළඟට ගොස් ඊට කැමත්ත ඊට කැමැත්ත අයැද සිටි සඳ ආචාර්‍යයෙනි, කුමක් නිසා පැවිදිවනු කැමතිදැයි විචාළ වේලේ කාමයෙහි ආදීනව හා මහණ වීමෙහි ආනිශංස දැක යයි කීයෙන් එසේ නම් මහණව මා දැකීම පිණිස එවයි අවසර ගෙන ඒ බව තාපසයන් වහන්සේට දැන්වීය. තාපසයන් වහන්සේ තම ඍධි බලයෙන් ඔහුවද අහසින් ගෙන ගොස් පැවිදි කරවා කසින පරිකම් ඉගන්වූ සේක. ඔහු කීපදවසකින් සමාපත්ති උපදවාගෙන මම රජ්ජුරුවන්ට දුන්ප්‍රතිඥාවෙන් මිදෙමියි සිතා තාපසයන් වැඳ අවසර ගෙන අහසින් අවුත් රජතුමා සමීපයට වැඩ සතුටුසාමීචි කථා කොට දන් වළඳ ධර්ම දේශනා කළ සේක. රජ්ජුරුවෝ ඒ තාපසයන් ගැන අසා ඉතා පැහැද ඒ සියළු දසදහසක් තාපසවරුන්ට දන්දෙනු කැමති බව දැන්වීය. මහරජ කුමක් කෙරෙම්ද ඍෂිවරයෝ රසයෙහි ගිජු නොවන බැවින් මෙහි කැඳවාගෙන එන්ට නොහැක. එබැවින් මම එක් උපායක් කියමි. මෙයින් නික්ම සීද නම් ගංතෙර සිට දන්දෙවයි කියා වැඩියහ. රජ්ජුරුවෝ යහපතැයි සියළු උපකරණ ගෙන චතුරඞ්ගනී සේනාව සමඟ නික්ම ගංතෙර කඳවුරු බැඳගෙන තපස්වීවරයන්ට දසදහස් අවුරුදු මහදන් දී එම ගංතෙරම නුවරක් කරවා ගොවිතැන් කර්මාන්ත කරවූහ. මහරජ ඒ රජ්ජුරුවන්ගේ අනිත් කෙනෙක් නොවෙත් මම්මය. මම එකල දන් දීමෙහි ශ්‍රේෂ්ඨව මහ දන් දී දෙව්ලොව ඉක්මවා බ්‍රහ්ම ලෝකයෙහි ඉපදීමට නොහැකි වී මා දුන් දන් වළඳ සිල් රැකි තපස්වරු කාමලෝකය ඉක්මවා බඹලොව උපන්නාහ. මහරජ මම දනයෙහි ඉතා ශ්‍රේෂ්ඨ වීමි. ඒ තපස්වරු සීලයෙන් උත්තමවූහයි කියා ශක්‍රදේවේන්‍ද්‍රයෝ දෙව්ලොවට ගියහ.
දෙව්ලොව දෙවියෝද බ්‍රහ්මවිෂ්ණු මහේෂ්වරයෝද නිමි රජ්ජුරුවන්ගේ ගුණ අසා ඒ නුවරට ගොස් බණ අසනු කැමති බව සක්දෙව් රජුට දැන්වූහ. එවිට සක්දෙව් රජ තෙපි හැම එහි ගියාහු නම් අසුරයෝ අවුත් තොපගේ විමන් පැහැර ගතහොත් නපුරුය. එබැවින් මාතලී පුත් යවා නිමි රජ්ජුරුවන් මෙහි ගෙන්වමියි මාතලී දිව්‍ය පුත්‍රයන්ට නියම කළේය. මාතලී දෙව්පුත් අශ්වයන් දහසක් යෙදූ නාරිවාහන නම් රථය ගෙන නිමි රජ්ජුරුවන්ගේ මාළිගාවට ගොස් සක්දෙව් රජ්ජුරුවන්ගේ ආරාධනාව දන්වා සිටියහ.
නිමි රජ්ජුරුවන්ගේ මහාජනයා රැස්කරවා අවවාද අනුශාසනා කොට අප්‍රමාදව දන්සිල් රකුවයි නියම කොට බොහෝ දෙන බල බලා සිටියදීම රාජහංසයෙකු සේ රථයෙන් අහසට නැංගාහුය. මාතලී දෙව්පුත් කියන්නේ මහරජ, දෙව්ලොව බලා පදිම්ද නරකය බලා පදිම්දැයි කීය. නිමි මහරජාණෝ නරකය බලා පදුවයි කීහ. නරකය බලා යන්ට වූ කලි නිමි රජ්ජුරුවන්ගේ සිරුර තුන්ගව් පමණ විය. ගව්වක් පමණ මිණි ඔටුන්නක් විය. ගැල් හැටක් පමණ ආභරණ විය. හිසට රන් සේසත් ඇතිව ශක්‍රයා සේ බබළන්නට විය. රථය ක්‍රමයෙන් ලඟා වී පළමුවෙන් වේතරණී නම් නරකයට ඇතුල් විය. එහි දිග සැට යොදුනකි. පළල සැට යොදුනකි. ගැඹුර සැට යොදුනකි. සිසාරා ගිනිගෙන දිළිසෙන මේ නරකයෙහි දගැබ් පිළිම ගෙවල් කඩා බිඳ දමා සඟසතු දේ අනිසි අන්දමින් පරිභොග කළවුන් උපදින නරකය බව මාතලී දෙව්පුත් අතින් දැනගත් නිමි රජ්ජුරුවෝ නැවත අම්බලම් ඒ දඬු සාදවම්හයි මුදල් එකතුකොට වංචාකළවුන් ඉපිද දුක්විඳින ඔසුපත් නරකයට දැයි මෙසේ එක් සිය සතිස් නරකයම බලා එතැනින් දෙව්ලොවට ගොස් සියළු දෙව් විමන් බලා ඔවුන් කරන ලද කුසලා කුසල කර්ම අසා දැන සියළු දෙවියන්ට ධර්ම දේශනා කර නැවත රාජ්‍යයට පැමිණ තමා හිස නරකෙසක් දැක රාජ්‍යය පුතුට භාරදී මහණව භාවනා කොට බඹලොව ගියහ.
නිමි රජව උපන්නේ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# බණ්ඩහාල් ජාතකය

ශාන්ති නායකයන් වහන්සේ රජගහනුවර තිසා වැව් ගිජුකුළු පව්වෙහි වසන සේක. දෙව්දත් තෙරුන් අරභයා මේ ජාතකය වදාළ සේක.

නිදාන කථාව - දෙව්දත් තෙරුන් බුදුරජාණන් වහන්සේට විද ජීවිතක්ෂයට පත් කිරීම සඳහා දුනුවායන් යවා තම උත්සාහය සඵලමත් නොවීය, මේ ගැන ධර්මසභා මණ්ඩපයෙහි භික්ෂූන් අතර කථාවක් උපන් කල්හි එහි වැඩි බුදුරජාණන් වහන්සේ මහණෙනි, පෙරත් මේ දේවදත්තයෝ මේ ජාතියේ මාවත් විදීමට ගිය දුනුවායනුත් මැරීමට උත්සාහ කොට ව්‍යර්ත වූවත් මෙන්ම පෙරත් මා ඇතළු බොහෝ දෙනෙක් මරුමුවට පත් කිරීමට වෙසෙස නිෂ්ඵල වූහයි ඉකුත්වත් වදාළ සේක.

ආරාධනය - භික්ෂූන් වහන්සේ

ජාතක කථාව - යටගිය දවස බරණැස පුෂ්පවතී නුවර වසවර්ත්ති නම් රජකෙනෙකුගේ පුත්‍ර ඒකරාජ නම් රජ කෙනෙක් රාජ්‍ය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ගේ පුත්‍ර චන්‍ද්‍ර කුමාරයෝ යුව රජු තනතුර දරති. බණ්ඩහාල නම් පුරෝහිත බ්‍රාහ්මණයා අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන අතර අත්ලසම අගය කොට නීතියට පිටු පා අයුක්තියටම අදින්නේය. හිමියන් අහිමියන් කෙරෙයි. අහිමියන් හිමියන් කෙරෙයි. දවසක් යුක්තියෙන් පැරදී එක් මිනිසෙක් අධිකරණ ශාලාවෙහි මුරගාගෙන නික්මෙන්නේ රාජය සේවයට යන්නා වූ චන්‍ද්‍ර කුමාරයන්ගේ දෙපය වැඳ වැතිර පුරෝහිත බ්‍රාහ්මණයාගේ අසාධාරණ විනිශ්චය කීය. එකල්හි කුමාරයේ ඔහු අස්වසා නැවත විනිශ්චය මණ්ඩලයට කැඳවා යුක්ති විචාරා සාධාරණ අන්දමින් තීන්දුව දුන්හ. එය පිළිගත් මහජනයා මහ හඬින් සාධුකාර දුන්හ. රජ්ජුරුවෝ ඒ සාධුකා හඬ අසා කිමෙක්දැයි විචාරා චන්‍ද්‍ර කුමාරයන් ගෙන්වා ප්‍රශංසා කොට එතැන් පටන් විනිශ්වය මණ්ඩලයේ නායකකම් කරවයි විධානය කොට යැවූහ. එතැන් පටන් බණ්ඩහාල් බ්‍රාහ්මණයාට අත්ලස් නැති වූයෙන් යුව රජු කෙරෙහි අඝාත බැද දෝශයක් තබාම ඇවිදින්නේය. ඒකරාජ රජ්ජුරුවෝ වනාහි පරීක්ෂාකාරී නොකොට දුසිරිතෙහි ඇලී අධාර්මිකව කටයුතු කරන්නෙකි. ඔහු දිනක් අළුයම් වේලෙහි "මනාකොට සැරසූ දොරටු ඇතිසැට යොදුන් ඉස ස්වර්ණ වීථි ඇති කෙළ ගණන් දිව්‍ය පුත්‍රයන්ගෙන් ගැවසී ගත්තා වූ මනස්කාන්ත දර්ශනයෙන් යුත් තව්තිසා භවන" ස්වප්නයෙන් දැක එය දිව්‍ය ලෝකයට යනු පුරෝහිත බ්‍රාහ්මණයාව උදෑසනින්ම රජවාසලට ගෙන්වා මූඪ වූ බණ්ඩහාල් බ්‍රාහ්මණයා අතින් ස්වර්ණ මාර්ගය විචාරන්නාහු. බමුණ, කුසල් කොට මනුෂ්‍යයෝ ස්වර්ගලෝකයට යම් පරිද්දෙකින් යෙත් නම් එබදු වූ සුගතියට යන්නා වු මාර්ගය මට කියවයි කීහ. බුදුවරයන් වහන්සේවත් ඒ නැති කල්හි බෝධිසත්ව වරයන් වහන්සේවත් සමීපයට ගොස් විසඳිය යුතු මේ ප්‍රශ්නය මංමුලා වූවෙකු, මංමුලාවූවෙකුගෙන් මාර්ගය අසන්නා සේ මේ අඥානයා අතින් විචාල කල්හි මේ මාගේ සතුරු යුව රජුගෙන් පළිගැනීමට හොදම වේලාව බැවින් ඔහු ජීවිතක්ෂයට පත්කොට මාගේ මනදොළ පුරවාගනිමියි සිතා රජ්ජුරුවන්ට කියන්නේ රජතුමනි, මෙලොව සත්වයෝ අතිදානයේදී නොමැරිය යුත්තවුන් මරා මෙබදු වූ කුසල් කොට ස්වර්ගලෝකයට යන්නාහුය. ඔබතුමාද එබදූ කුසල් කොට වැඩිය මැනවයි කීහ. එවිට රජ්ජුරුවෝ බමුණ, අතිදානය නම් කුමක්ද නොමැරිය යුත්තෝ නම කවරහුද වහා පහදා දෙව. එවිට දනුත් දෙම්හ. යාගත් කරම්හයි කීවූය. බමුණා කියන්නේ රජතුමනි ඔබවහන්සේට දාව උපන් පුත්‍රයන් සතර දෙනෙක් හා අග්‍රමෙහෙසිකාව වූ ප්‍රිය භාරයාවන් හා සිටුවරුන් මඟුලැතුන් හා මගුලසුන් සමඟ අවශේෂ ආදීන් ගෙනුත් සතර සතර දෙනෙකු මරා සර්ව චතුස්ත නම් වූ යාගය කටයුතු යයි කීයේය.
කඩුවෙන් මේ සියල්ලවුන්ගේ හිස් කපා තලියේ වත්කොට එය සාගාවාටයේ බහා යාග කරන්නා වූ රජ්ජුරුවෝ දිව්‍ය ලෝකයට යන්නෝ වේද? තවද රජතුමනි ශ්‍රමණ බ්‍රාහ්මණයින්ට බත්, රෙදිපිළි දීම දාන නම වෙයි. පුත්‍රදාරාදීන් මරා ඔවුන්ගේ ලේ වලින් යාග කිරීම අතිදාන නම් වේයයි කියා දිව්‍ය ලෝකයට මං වැසූ රජ්ජුරුවන්ට නරකයට මාර්ගය පාදා දුන්හ. මේ ගැන රජ්ජුරුවන්ට නොයෙක් කාරණයෙන් ගිවිස්සා ගත්හ. ඉඳින් චන්‍ද්‍ර කුමාරයාද පමණක් මැරිය යුතුයයි නියම කෙළේ නම් ඔහු සමඟ වෛරයෙන් යෙදූ උපක්‍රමයක් බව ප්‍රකට වන නිසා බිසෝවරු සිටුවරු ආදීන්වද මීට ඈදා ගත්තේය. පුරෝහිත බ්‍රාහ්මණයාගේ බස් ඇසූ අන්තඃපුර වාසී ජනයෝ භයින් තැති ගෙන එක පැහැර මහ හඬින් හඬන්නට පටන් ගත්හ. රජ කුමර කුමරියෝ ද බිසෝවරු සහ සිටුවරුද මාළිගාවට පැමිණ ඒකඝෝෂා කරමින් කෝලාහල කරන්නට වූහ. බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ට කියන්නේ කිමෙක්ද රජතුමනි යාග කරන්නට එන සේක්ද නොඑන සේක් දැයි විචාළේය. එවිට රජ්ජුරුවෝ බමණ කුමක් කියවුද? යාග කොට දෙව්ලොවට යන්නෙම් වේදැයි කිවූය. බ්‍රාහ්මණයා රජතුමනි, දුර්වල වූ සිත් ඇති සත්වයෝ යාග කරන්නට අසමර්ථ වෙති. එබැවින් ඔබතුමා

SANHIDA LANKA

මෙතැනට සියල්ලන් රැස්කර වුව මැනව. මම පිරිස් කැටුව නුවරින් නික්ම ගොස් යාග කරන භූමිය ද සූදානම් කෙළෙම්යි කීය. එතැනට ධාර්මික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෙක් හෝ එතියි යන බියෙන් ලොකු වැටක් ද බැන්ද වූයේය.

රජතුමා රාජපුරුෂයන් සහ ඇමතියන් කැඳවා තම අදහස ප්‍රකාශකොට තම දූ පුතුන් එතැනට කැඳවන නියෝග කළේය. එබස් ඇසූ රාජපුරුෂයෝ පළමු චන්‍ද්‍ර කුමාරයන් සමීපයට ගොස් කුමාරයන් වහන්ස නුඹ වහන්සේගේ පියරජතුමා මෙබඳු දෙයකට කැඳවන්නේ යයි සියළු පුවත දන්වා සිටියහ. එබස් ඇසූ කුමාරයා මේ ඛණ්ඩහාල බමුණාගේ උපායක් බව සිතා ඔහුට සෙස්සවුන් හා වෛරයෙක් නැත. මා සමඟ වෛරයෙන් බොහෝ දෙනා මරවන්නේය. පියාණන් වහන්සේ සමීපයට ගොස් සියළු සත්වයින් මරණින් ගලවා ගනිමි. තොප හැම පියාණන්ගේ නියෝගය කරවයි කිවූය. එවිට රාජපුරුෂයෝ කුමාරයන් අල්වා ගෙන ගොස් රාජාංගනයෙහි එකත් පසෙක සිටුවූය. ඒ අසල සූර්ය, භද්දසේන සහ සූර්ය යන කුමාරවරුද උපසේනිය, කෝකිලය, මුදුතා සහ චන්‍ද්‍ර කුමාරී යන දූ කුමාරිකාවරුද විජය, ඒරාපථී, සුකෙසි සහ සුනන්දා යන බිසෝවරුද පූර්ණමුඛ, භද්දිය, සිඟාලය සහ චන්දිය යන සිටුවරුද කැඳවාගෙන අවුත් සිටවූහ. සිටුවරුන් අල්වාගෙනා වහාම නුවරවාසී බොහෝ දෙනා පැමිණ සෝෂා කරන්නටවූ නමුත් ඒ කිසි කෙනෙකුට ජීවිත දානය ලබා ගැනීමට අසමර්ථ වූහ. ඇතුන් අසුන් ආදී සතුන්ව ද එක්රැස් කොට රජ්ජුරුවන් කියන්නේ මාගේ මේ උසස් යාගය වූ කලී සෙට දා අළුයම් වේලෙහි කෙරෙමි. එබැවින් අද මේ එක රාත්‍රියෙහි පංචකාම සැපතෙහි සිත්සේ යෙදෙන සේ කුමර කුමරියන්ට කියව්. අද මේ අවසාන රාත්‍රියයි. ඌරන් කුකුළන් ආදී සතුන්වද නිසි සේ එක්රැස් කොට තබවයි විධානය කළහ. ඒකරාජ රජ්ජුරුවන්ගේ දෙමව්පියෝ එකල ජීවත්ව උන්නාහුය. මේ අපාය ගාමී යාගය දැනගත් වහාම ඔවුන් දෙදෙනා පැමිණ සැබව දැයි විචාරා පුත්‍රය දරුවන් මරා කන්නා වූ මේ යාගයෙන් දෙව්ලොව උත්පත්තිය නොව සතර අපාය හිමි වන්නේය. කොණ්ඩඤ්ඤ ගොත්‍රයෙහි උපන්නාවූ පුත්‍රය තොපට මම කියමි මේ යාගය පැවැත්වීමට උපදෙස් දුන් අඥානයාගේ බස් නොගිවිස මහා දන් දෙව, සිල් රකුව, භාවනා කරව එම සප්තකාම ස්වර්ගය මාර්ගය වන්නේයයි අවවාද කොටත් තමන්ගේ බස් ගිවිස්වා ගතනොහී අඬා වැලප ගියාහුය.

එවිට චන්‍ද්‍රකුමාරයෝ සිතන්නෝ මෙතෙක් දෙනාට දුක් උපන්නේ මා නිසාමය. එබැවින් පියාණන් වහන්සේට දන්වා මෙතෙක් දෙනා මරණ දුකින් මුදවමියි සිතා පියාණන් අමතා පියාණන් වහන්ස, අප නොමැරුව මැනව. ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාට අප හැමදෙනා ගැති කොට දුන මැනව. අපි ඔහුට කැමති පරිද්දෙන් ගැතිකම් කරන්නෙමු. අපගේ කිසි දෝෂයෙක් ඇත්නම් රටින් නෙරපුව මැනවයි කියමින් විලාප නගා හඬන්නට වන්හ. එවිට රජ්ජුරුවන්ගේ ලය උණු වී ඇස් කඳුලින් පිරී මම කිසිවෙක් නොමරමි. මට දිව්‍ය ලෝකයෙන් ප්‍රයෝජන නැත. උන් මුදා හැරපියවයි විධානය කළහ. ඒ නියමයෙන් රාජපුරුෂයෝ ප්‍රධාන සියළු ප්‍රාණීන් හැරපුවාහ. එකල ඛණ්ඩහාල බ්‍රාහ්මණයෝ ඒ පුවත එක් පුරුෂයෙක් අතින් අසා කලබලයට පත්ව යාග භූමියේ සිට වහා දිව අවුත් මහ රජ්ජුරුවන් වහන්ස, මේ යාගය ඔබතුමා වැනි බියජනක සිත් ඇති අය විසින් නොකොට හැක්කේය. මහත් උත්සාහයෙන් පිළියෙල කළ මේ යාගයට කුමක් නිසා බාධා කරන සේක්ද? රජතුමනි, යමෙක් යාගයක් කරත්ද? කරවත්ද? ඒ පින් අනුමෝදන් වෙත්ද? ඒ හැම දෙනෙක් ස්වර්ගයට යන්නාහ. මේ යාගයෙහි මහත් අනුසස් ඇත්තේය. වහාම මෙය නැවත විධානය කරන සේක් මැනවැයි කීය.

එවිට චන්‍ද්‍ර කුමාරයෝ පියාණෙනි, ඉඳින් මා මැරිය යුත්තේ වී නම් මා උපන් කල්හිම මේ බ්‍රාහ්මණයා අතින් මේ කුමාරයන්ට වන අන්තරාය කවරේදැයි නුඹ වහන්සේ විසින් විචාරන ලදුව මාගේ ලක්ෂණ බලා දේවයන් වහන්ස, ඔබගේ ඇවෑමෙන් පසුව මේ කුමාරයා රාජ්‍යයට පැමිණෙති. කුමාරයන්ට අතරෙහි වන අන්තරායෙක් නැතැයි අපගේ නෑයන් මධ්‍යයෙහි කුමක් නිසා එසේ කීද? මොහු බොරු කියා වෛරයෙන් මා මරවන බවට මේ කාරණා නොවේද? එසේ හෙයින් මොහුගේ කථාව පූර්වාපර සම්බන්ධයෙක් නැත. නිකරුණේ අප හැම මරවන්නට උත්සාහ කරවන්නේ වේද එසේ නම් ඔබතුමාද අපව මරවන්නට සිතන කළ පළමු අප බාල කාලයෙහිම ඔබතුමාගේ අතින් මරවන්නක් වත් අනුන් ලවා මරවන්නක්වත් නොකර වූයේ ඇයි ද? දැන් වූ කලී අපි තරුණයම්හ. දූ පුතුන් ඇතිව සිටිමු. මෙතෙක් කල් ඔබතුමාට ද්‍රෝහී නුවූම්හ. එසේ හෙයින් කුමක් නිසා දැන් මරවන සේක්ද? දරුවන් නැති රජ්ජුරුවෝ අනාථ අසරණයෝය. මෙබඳු සෞරවීර්‍ය්‍ය හා බාහු වික්‍රම ඇති අප සතර බෑයෝ යාගයක් නිසා නිකරුණේ මරවාපියන්ට නිස්සමෝද? පියරජතුමනි, බමුණෝ නම් බොහෝ සේම කෙළෙහි ගුණ නොදන්නෝය. එසේ වූ බමුණාගේ බස් නොඇදහුව මැනව, මේ යාගය සතර අපායට මාර්ගයක් මිස දෙව්ලොවට ආධාරයක් පිණිස හේතුනොවේ යයි යනාදී වශයෙන් චන්‍ද්‍ර කුමාරයන් කී බස් අසා රජ්ජුරුවෝ කඳුළු පිරි දෙනෙතින් සිත නැවතත් යාගය ප්‍රතික්ෂේප කළ පමණකින් ඛණ්ඩහාල බ්‍රාහ්මණයා රජ්ජුරුවන් අමතා රජ්ජුරුවනි පසු නොබැස මේ උතුම් යාගය කරවයි නැවත අයැද සිටියේය. එවිට චන්‍ද්‍ර කුමාරයා පියරජතුමනි, දරුවන් මරා යාග කොට දෙව්ලොව උපන්නාහු වී නම් මේ

SANHIDA LANKA

බමුණා ඔහුගේ පුත්‍රදාරාවන් මරා ප්‍රථම කොට යාගකර දෙව්ලොව ගිය කල්හි නුඹ වහන්සේ පසුව යාග කළ මැනව, නුඹ වහන්සේ මධුර රස ඇති භොජනයක් ලැබූ පළමු කොට අනුන් ලවා පළමු කොට මේ කරන්නට කාරණා කවරේද?

තවද පියාණෙනි පුත්‍රදාරාවන් මරා යාගකොට දෙව්ලොව යන මන් දන්නාවූ මේ බමුණා මෙතෙක් එවැනි යාගයක් නොකොට ප්‍රමාද වන්නේ මන්ද? මෙය මා මැරවීමට ඒ බමුණා කරන ලද ප්‍රයෝගයකි. මෙසේ පිය රජ්ජුරුවන් ගිවිස්වා ගත නොවී අවසේස ප්‍රදානීන් ලවාද තම බිසෝවරු ලවාද රජ්ජුරුවන්ට කන්නලව් කළ කල්හි නැවතත් රජ්ජුරුවන් පසු බැස්සේය. එවිට ඛණ්ඩහාල බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ට කරුණු කියා නැවතත් දිරි ගැන්වූයෙන් චන්‍ද්‍ර කුමාරයා ප්‍රදාන සියළු දෙනාවම නැවතත් අල්වා බැඳ ගෙන යාග කරන භූමිය කරා නික්මුණු කල්හි සත්සියයක් පමණ අන්තඃපුර ස්ත්‍රීහු නොයෙක් වාක්විලාප කියමින් පසුපස ගමන් ගත්හ. සියළු නුවර වාසී සත්වයෝ නුවරින් නික්ම ඒ ස්ථානය කරා අඬමින් එක්වූහ. ඛණ්ඩහාල බ්‍රාහ්මණයා බොහෝ වූ ජනයා දැක කුමකින් කුමක් වේදැයි සිතා වාසල් දොර අගුළු ලැව්වාහ. එකල්හි මහජනයා වාසල් දොර සමීපයෙහි උයනට වී හැඬුවාය.

චන්‍ද්‍ර කුමාරයන් යාග භූමියට ගෙනගිය කල්හි ඒ කුමාරයන්ගේ මෑණියන් වූ ගෞතම දේවී තොමෝ ඉදිරියට පැමිණ මාගේ ඇසක් බඳු වූ මේ චන්‍ද්‍ර කුමාරයන් මැරුයේ වී නම් නොරැකෙමි. දුෂ්ට වූ බමුණනි, චන්‍ද්‍ර කුමාරයන් මරන්නට ආ කල්හි මාගේ ළෙහි යම් දරු ගින්නක් උපන්නේ නම් ඒ ශෝකය තාගේ මව කරා පැමිණෙත්වා, තාද විඳුව, තාගේ අඹුවටද, දරුවන්ට ද මේ දුක් නොඅඩුව ලැබේවායි මෙසේ අනෙකප්‍රාකාරයෙන් අක්‍රොෂ කළහ.

නැවතත් චන්‍ද්‍ර කුමාරයෝ පියරජ්ජුරුවන්ට යාඥා කරමින් අපව නොවුරුව මැනවයි බැගෑපත්ව ඇඬූහ. නැවතත් මව් පැමිණ රජ කෙනෙකුට නියමිත ස්වර්ණාභරණයෙන් පුතු සරසවා අන්තිම දැක්ම යයි අඬමින් එකත්පස්ව උන්නීය. ඉක්බිති චන්‍ද්‍ර නම් අග මෙහෙසුන් පැමිණ විලාප දෙමින් කන්නලව් කළාය. එවිට චන්‍ද්‍ර කුමාරයෝ බිසවුනි, මාගෙන් තොපට දෙන අවසාන පරිත්‍යාගය මෙයයි තමා පැළඳ ගෙන සියළු ආභරණ ගලවා දුන්හ. චන්ද්‍ර කුමාරිය කන්නලව් කොට අඬා වැලපෙන බෝසත් චන්‍ද්‍ර කුමාරයන්ව බන්ධනයෙන් මුදවා ගත් නොහැකි වූයේ සත්‍ය ක්‍රියා කොට ගලවා ගනිමියි සිතා දොහොත් මුදුන් දී දසදිග වඳිමින් සත්‍ය ක්‍රියා කරන්නී. මේ ඛණ්ඩහාල බමුණා ඒකාන්තයෙන් කරන්නේ අඥාන පවිටු කමකි. මේ සත්‍ය බලය මාගේ චන්‍ද්‍ර කුමාරයාට නිදහස ලැබේවා, උතුම් දිව්‍ය බ්‍රහ්ම කෙනෙක් ඇත්නම් ඒ අයගේ උපකාරය මත ලැබේවායි සත්‍ය ක්‍රියා කොට දෙවියන් ආරාධනා කළාය. එවිටම ශක්‍ර දේවේන්ද්‍රයෝ දිලිසෙන යකුලක් ගෙන වහා පැමිණ රජ්ජුරුවන් තැති ගන්වා කුමාරයන් ප්‍රධාන සියළු දෙනාම බන්ධනයෙන් ගලවා රජ්ජුරුවන් අමතා රාජ මුගධය, රාජකණ්හය, ස්වර්ග ලෝකෝත්පත්තිය ලබා ගැනීම සඳහා දරුවන් මරා යාග කිරීම කොහිදී දක්නා ලදදැයි ආක්‍රොශ පරිභව කොට භය ගැන්වූහ. එවිට රජ්ජුරුවන් සහ ඛණ්ඩහාල බමුණා සියළු සත්වයන් බන්ධනයෙන් මිදූහ. එහි රැස්වූ පිරිස දුෂ්ට බමුණා කළ අපරාධයට මේ වධයයි එක් එක් ගල් කැටයෙන් ගසා මරැමුවට පත්කොට රජ්ජුරුවන්ට වධ දීමට පටන් ගත්හ. එවිට චන්‍ද්‍ර කුමාරයෝ වහා ඉදිරිපත්ව පියා වැළඳ ගෙන මැරීමට ඉඩ නුදුන්හ. ඉක්බිති මහාජනයා එක්ව මේ අඥාන රජුට ජීවිත දානය දෙම්හ. රාජ්‍ය නොදෙම්හයි රටින් පිට කරවා චණ්ඩාල ග්‍රාමයෙහි නතර කරවා චන්‍ද්‍ර කුමාරයන්ව රාජ්‍යයෙහි පිහිට වූහ.

එසමයෙහි ඛණ්ඩහාල බ්‍රාහ්මණයා නම් මේ දෙව්දත් තෙරුන්ය. ගෞතම දේවිය මහාමායා දේවිය වූ අතර චන්ද්‍රා දේවිය නම් බිම්බා දේවිය වූවාය. චන්ද්‍ර කුමාරයෝ නම් තිලෝගුරු බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# මහානාරද කාශ්‍යප ජාතකය

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ රජගහනුවර ලට්ඨි වනොද්‍යානයෙහි වසනසේක් උරුවෙල කාශ්‍යප දමනය අරභයා මේ ජාතකය වදාළසේක.

බුදුරජාණන් වහන්සේ තුන්බෑ ජටිලයන් දමන යෙහිලා ඔවුන් දහසක් දෙනා පිරිවරන ලදුව ලට්ඨි වනොද්‍යානයට වැඩිසේක. ඒ අතර විසිදහසක් පමණ බ්‍රාහ්මණ ගෘහපතීන් හා සමඟ එහි පැමිණ බිම්සර රජ්ජුරුවන් බුදුරජාණන් වහන්සේට නමස්කාර කොට උන්හ. ඒ පිරිස අතර උන් ඇතැම් බ්‍රාහ්මණ ගෘහපතීන්ට ජටිල තාපසයන් දැක සංකාවෙන් උපන්නේය. කීමෙක්ද? උරුවෙල කාශ්‍යපයෝ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ගෝලයෙක්ද? ශ්‍රමණභවත් ගෞතමයෝ උරුවෙල කාශ්‍යපයන්ගේ ගෝලයෙක්ද? ශ්‍රමණභවත් ගෞතමයෝ උරුවෙල කාශ්‍යපයන්ගේ ගෝලයෙක් ද? යන සැකයකි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ උරුවෙල් දනවු වැසි කාශ්‍යපය, කවර අරමුණක් දැක ගිනි දෙවියාට කරන්නාවූ පූජාව ඇරපීද? මේකරුණ කා අතිනි විචාරමි. කියවයි වදාළසේක. පඤ්චකාමයෙහි ආදීනව දැක නිශ්ශාර වූ ගිනි දෙවියාට පිදීමෙන්වෙන්උනෙමි. මම ඔබවහන්සේ ගේ ශ්‍රාවකයෙක්මි ප්‍රකාශ කොට අහසට පැන නැගී බැස බුදුන්ගේ ශ්‍රීපාද පත්මය නමස්කාර කොට සිටිසේක. මේකරුණ අරභයා මිනිසුන් අතර බුදුරජාණන් ගුණ කථනය පැතිරී ගියහ. සර්වඥයන් වහන්සේ ඔවුන් අමතා සත්වයෙනි, දැන් මොහු දමනයෙහි ලීම ආශ්චර්යයී නොවන්නේය. පෙර මම නාරද නම් බ්‍රාහ්මණයාට ඉපිද මොහුගේ දෘෂ්ටි ජාලය බිඳ සන්තානගත වූ ක්ලේශ නමැති විෂ විනාශ කෙළෙයි ඉකුත් වන වදාළ සේක.

ඉහත විදෙහ රට මියුළුනුවර අඞගාති නම් ධාර්මිෂ්ඨ රජකෙනෙක් විය. ඒ රජුට මහකුසල් ඇති රූපා නම් රූපත් දියණියක්ද විජය, සුමන, අලාත නමින් අමාත්‍යයෝ තිදෙනෙක්ද වූහ. දිනක් රජ්ජුරුවෝ ආහර කිස නිමවා උඩුමහල් තලයෙහි ඇමති ගනයා පිරිවරා සිටින්නේ පඤ්චවා පක්ලේශයෙන් විනිර්මුක්තට අහස් කුසට නැංගාවූ චන්ද්‍රමණ්ඩලය දැක ඉතා ප්‍රීතියට පත්ව ඇමතියන් අමතා අද මේ ප්‍රීතිමත් රාත්‍රියෙහි කවර රතියකින් සිත් අලව මොදැයි විචාළහ.

ඉක්බිති ඒ ප්‍රධාන තුන්දෙනා අතරෙන් අලාත ඇමති කියන්නේ මහ රජතුමනි, අපට මහත් බලකායක් ඇත. එබැවින් යුඬකොට සතුරන් පරදවා ජය ලනුම්හයි කීහ. රජ්ජුරුවෝ ඒ කීමට සතුටු අසතුටු බවක් නොකීහ. එවිට සුමණ ඇමති මේ රජතුමා යුද්දයට නොකැමති සේක. පඤ්චකාමී ගුණයෙහි ඇලීම ප්‍රකාශ කෙරෙමියි සිතා මහ රජතුමනි, අදවූ කලී උතුම්වූ මඟුල් දවසෙක එබැවින් අද රසවත් ආහාරපාන අනුභව කොට ගැයීම් වැයීම් වලින් කල් යැවීම මැනවයි කීහ. රජ්ජුරුවෝ ඊටද නිහඬවූ බව දත් විජය ඇමති, ධර්මශ්‍රවණයේ ගුණ වර්ණනා කොට රජ්ජුරුවන්ගේ සිත් දිනාගනිමියි සිතා රජතුමනි, කාමය නම් හැම කල්හිම ලැබෙන දෙයක බැවින් අපි බොහෝ ඇසු පිරූ තැන් ඇති ධර්මදර ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙකුන් කරා ගොස් උපන් සැක විචාරා ගනිමුයි මැනවයි කීය. ඒ ඇසු රජ්ජුරුවෝද ඊට එකඟව කවර ප්‍රාඥයක්හු කරා එලඹමෝදැයි විචාළහ. එවිට අලාත අමති කියන්නේ මහරජතුමනි , මේ මෘගදායනම් උයනෙහි ප්‍රශ්න විසඳීමෙහි ප්‍රසිද්ධ වූ ගුණ නම් නිසණ්ඨාජීවකයෙක් ඇත. ඉතා බහුශ්‍රැත්‍රය, මධුර කථා ඇත්තේය. තමාගේ කුලුපග වූ ආජීවකයා ගැන කීය. එබස් ඇසු අඞගාති රජ්ජුරුවෝ එසේනම් එහි යනු කැමතියම්හ. රථය සුදානම් කරවයි නියම කොට මහ පිරිස පිරිවරා එහි පගාවී එකත් පස්ව සිට සුවදුක් විමසු රජ්ජුරුවෝ ආජීවකයා අමතා ගුණාජීවකයෙනි, මේ ලෝකයේ සත්වයෝ දෙමව්පියන් කෙරෙහි ආචාර්‍යවරුන් කෙරෙහි, පුත්‍රදාරාවන් කෙරෙහි, වැඩිහිටියන් කෙරෙහි, මහණ බමුණන් කෙරෙහි, සේනාව කෙරෙහි, දනවූ වැසියන් කෙරෙහි කෙසේ පිළිපැදිය යුතුද? සුගතිගාමී වීමට කුමක් කළ යුතුද? සමහරෙක් සුගතියටත් සමහරෙක් දුගතියටත් යන්නේ කවර කාරණයක් නිසාද? මෙය තත්වූ පරිදි කියා දෙවයි කීහ. බුදු පසේ බුදු මහ රහතුන් අතින් විචාළ යුතු මේ කාරණය කිසිම ගුණයක් නැති නමින් ගුණ නම් වූ මේ අඥාණ ආජීවකයා අතින් විමසු විට ඔහුගේ මිථ්‍යා මත ප්‍රකාශ කරන්නේ මහ රජතුමනි කරන ලද හොඳ හෝ නරක දෙකට ඉෂ්ටානිෂ්ට විපාකයෙක් නැත. පරලොවකුත් නැත. ඒ පරලොව නැති හෙයින්ම පරලොවෙන් මේලොවට ආවේ කවරෙක්ද? මහ රජතුමනි, ආචාරවරයෝද නැත. ඔවුන් නැති හෙයින් නොදැමුනාවූ සත්වයින් කවරෙක් දමනයෙහි ලා ද? මෙලොව සත්වයෝ විශේෂයෙන්ම සමයය උසස් පහත් බේදයක් නැත. එබැවින් කුල දෙටුවන් පුදන්නාහු නැත. බලයෙන් හෝ වීර්යයෙන් සත්වයින්ට කම් නැත. එහෙයින් උට්ඨාන වීරයෙන් යුතු පුරුෂයෙක් කොයින්ද? එබන්දෙක් නැත. තවද රජතුමනි, මෙලොව සතුන් ලද මනා වස්තුවම ලබන්නේය. එසේ ලබන කල විපාකයෙක් කොයින්ද දානයේ විපාක නැත. ආදී වශයෙන් මිථ්‍යාදෘෂ්ටික වූ මේ ගුණ නම් පව්ටාණන් දෙසු තෙපුල් ඇසු අලාත නම් ඇමති ද එයම ස්ථිර කළේය.

SANHIDA LANKA

ඉක්බිත්තෙන් එය මිථිලා නම් රාජධානියෙහි දිළිඳු බීජක නම් දාසයෙක් විය. ඔහු පෙහෙවස්වසන්නේ එක්

අවවාදයක් අසා ගනු සඳහා ගුණ නම්නිවටා සමිපයට ගියේ පව්ටාණන්ගේ ධර්මය හා අලාත ඇමතියාගේ බස් අසා කඳුළු වගුරන්ට විය. ඒදුටු රජ්ජුරුවෝ අඬන බීජක දාසයා අමතා දරුව, තා කුමක් නිසා අඬන්නෙහි දැයි විචාළහ. එවිට ඔහු කියන්නේ රජ්ජුරුවන්වහන්ස මාගේ තෙපුල් ඇසුව මැනව. මම පෙර ජාතියෙහි විඳිමින් උන් සැපයක් සිහිකෙරෙමි. මම පෙර සාකෙත නම් නුවර දහමෙහි ඇලුනු අසු කෙලක් ධනය ඇත භාව නම් සිටු පුත්‍රයෙක් වීමි. ධානයේ ඇලුනේ වෙමි. පිරිසිදු කාය වාක් කර්ම ඇති පුජ්‍ය වූයෙමි. ස්වල්ප වූද අකුසලයක් නොකෙළෙමි. එසේ නමුත් මම උන් චුතව මෙසේ දිළිඳුව උපන්නෙමි. අලාත නම් ඇමති කීවාක් නම් මම ද ධානාදිවූ කුසල කර්මයන් නිශ්ඵල බව කියමි. රජතුමනි මා විසූ පෙහෙවස් වලද ප්‍රයෝජනයක් නැති බැවින් මම අඬමියි කීය.

එසේ වීමට මේ බීජකක දාසයාකරන ලද අකුසල කර්ම කවරේද යත්? කසුප් බුදුන් සමයෙහි වල ගොස් ගොනකු සොයන්නෙ මංමුලාවූ එක් භික්ෂුවක් විසින් මග විචාළ කල්හි මුවෙන් නොබැන සිට නැවත විචාළ කල්හි කිපී ශ්‍රමණ කොල්ලෝ, තා ඇති මුබරියයි අපහාස කොටකීය. ඒ පාපය සැඟවුන ගිනි පුපපුර මෙන් මරණාසන්නයෙහි අන් කර්මයෙක් එළඹ ඉන්චුතව සාකෙත නුවර සිටු කුළයක ඉපිද පින්කම් කෙළේය. ඒ කුසළය පොළොව යට සැගවුනු නිධානයක් මෙන් සිටියේ අවසරයක් ලැබ මතු විපාක දෙන්නේය. භික්ෂුව ට කළ ආක්‍රොශය නිසා දිළිඳු කුලයක උපන්නේය. ඔහු මුලින් කළ අකුසලය සිහිකර ගත නොහැකිවූයේ පුණ්‍ය විපාකයක් නැගැයි කීයේය. මේ තුන් දෙනාගේ බස් ඇසු රජ්ජුරුවෝ දැඩිකොට මිථ්‍යා දෘෂ්ටි ගෙන දෙව්ලොව යෑමට කිසිම උපායෙක් නැතැයි සිතා බීජකය, තො ඉක්මන් නොවව, මමත් පෙර බොහෝ පින් දහම් කෙළෙමි. ප්‍රමාද උනෙමු. දැන් ආචාර්‍ය වරයෙක් ලද්දෙමු. මෙතැන් සිට කාමරතී යම අනුභව කරමු. එහෙයින් ඔබගෙන් බණ ඇසීමටද ප්‍රමාදනොවී අපි යන්නෙමු. ඔබ නවතින්න, නැවත ඔබ දැක්මට ඒමෙන් අපටවන කුසලය කවරේදැයි කියා රජ්ජුරුවෝ දෙවන දවස අමාත්‍යයන් රැස්කරවා මට පඤ්ච කාගුණය එළවව්, මෙතැන් පටන් පඤ්චකාම සැපයට අනුභව කරෙමි. රාජ්‍යය කටයුතු නොකෙරෙමියි ඇමතියන්ට එය පවරා පඤ්චකාම සැපයෙහි නිරතවූහ. පින් දහමින් ඈත් විය.

එයින් තුදුස් දවසක් ගිය කළ රුජා නම් රාජ දියණිය පිය රජ්ජුරුවන් සමීපයට යනු කැමතිව පන්සියයක් කුමාරිකාවන් පිරිවරන ලදුව කිරිමව් සමුහයා කැඳවාගෙණ මහත් ශ්‍රී විලාසයෙන් රතිවර්ධන නම් තම ප්‍රසාදයෙන් බැස ප්‍රිය රජ්ජුරුවන් සමීපයට ගියාය. පෙර දවස් තමා පැමිණිවිට දන්දීම සඳහා දහසක්දෙන පිය රජ්ජුරුවන් ගුණ නම් පැමිණිවිට දන්දීම සඳහා දහසක් දෙන පිය රජ්ජුරුවන් ගුණ නම් නිවටයාගේ බොරු බසින් මුලාව මිථ්‍යාදෘෂ්ටිකව සිටිනාබව එකත්පසව උන්හ. එවිට රජ්ජුරුවෝ අලංකාර ස්ත්‍රී සමානව දැක දරුව රජ්ජුරුවෙනි, තොපට කුමණ සැපතකින් අඩුවෙක්ද? සියළුම සැප සම්පත් ලැබෙන සේ මම පිළියෙළ කොට ඇත්තෙමි. අහස මැද බබලන චන්ද්‍රයා ඉල්ලුවද ඒ සමාන දෙයක් දීමට මම සමත්වෙමි කීහ. එවිට ඈ කියන්නී රජතුමනි, ඔබතුමා සමීපයෙන් ඒ සියල්ලම ලැබෙන්නේය. සෙට පසළොස්වක දිනය මා දන්දෙන දවසය. ඒ සඳහා මසුරන් දහස දුන මැනවයි කීවාය. එවිට රජ්ජුරුවෝ දරුව නිශ්ඵල වූ දන්දීමෙහි හා සිල් රැකිමෙහි නියුතු වු තොප විසින් බොහෝ වස්තුව නසන්නේය. එවැනි දේ මින්මතු නොකරවයි මසුරන් දහස වස්තුව නසන්නේය. එවැනි දේ මින් මතු නොකරවයි මසුරන් දහස නොදී කාරණා කීය. තවද දරුව, ගුණවාරීන් විසින් මෙලොව පරලොව නැත. මව් නැත. පියා නැත. කර්මඵල නැත. උපදනා කෙනෙකුත් නැත. මිය යන කෙනෙකුත් නැත. හොඳ ධර්මයෙහි පිළිපදිනා මහණ බමුණෙකුත් නැත. මේ ඇසු රුජා කුමාරිහාමි අතිශයින් සංවේගයට පැමිණ පියා මිථ්‍යා දෘෂ්ටියෙන් මුදවනු කැමතිව පිය රජතුමනි, යම් පුද්ගලයෙක් මෝඩ අඥානයෙකු ඇසුරු කරන්නේ නම් තමා මෝඩයකු වන බව මම මීට පලමුව අසන ලද්දේය. දැන් එය ප්‍රත්‍යක්ෂ කොට ඇස් හමුයේ දක්නා ලද්දෙමි. පියතුමනි, මංමුළා වූවෙකුගෙන් මංවුළාවූවෙක් මං විචාරන්නාක් මෙන් ප්‍රඥාවෙන් අන්ධ වූ ලාමක අදහස් ඇති හීන වූ අලාන සෙන්පතියා සමල ඊටත් වඩා ගුණයෙන් පිරිහුණු ගුණනම් නිවටයා ලඟට ගොස් මෙසේ මුළා වීම ඔවුන්ට සුදුසු මුත් ඔබ වැනියවුන්ට නුසුදුය. පිය රජතුමනි, ඔබ ප්‍රඥාවෙන් ශ්‍රේෂ්ඨය. අර්‍ථානර්‍ථ දන්නේය. එබඳවූ ඔබ වහන්සේ මේ අන්ද බාලයන් සමග සාකච්ඡා කොට මිථ්‍යා දෘෂ්ටියට කෙසේ පැමිණ සේක්දැයි විචාරා පාපමිත්‍රයන් සේවනය කිරිමෙහි ගුණ දක්වා ස්වර්‍ගෝත්පත්තිය සඳහා පින් කළ මැනවයි අවවාද කළහ. මෙසේ පිය රජ්ජුරුවන්ට ධර්මදේශනා කොට තමන් අතීතයෙහි අනුභව තකළාහු දුක් දක්වන්නාහු මෙසේ කීවූය.

SANHIDA LANKA

මහරජතුමනි, මෙලොව පරලොව ඇත. කර්ම කර්මඵල ඇත. සංසාරය සත්වයන් ශුඬ කරන්නට අසමත්වී වන්නේය. තමන් විසින් කුසල කර්මයන්ගේ සත්වයෝ ශුඬ වන්නාහ. අලාත සෙන්පති හා බීජක දාසයා එක් ජාතියක් සිහි කෙරෙති. එහෙයින් උදක් ජාති ස්මරණ ඥානය ඇත්තේ ඔහු දෙදෙනාම නොවෙති. මම අතීතයේ සත් ජාතියක්ද මතු උපදින ජාති හතක්ද සිහිකර ගත හැක්කෙමි. තවද පෙර මාගේ සත්වන ජාතියෙක් වීද ඒ ජාතියෙහි මගධ රට රජගහ නුවර තරහල් පුත්‍රයෙක්ව උපන්නාහු මම පාප මිත්‍රයන් හා එක්ව

බොහෝ පව් කළෙමි. පර ස්ත්‍රීන් සේවනය කර මින් ධූතීව ඇවිද්දෙමි. ඒ අකුසලය සැඟවුණු ගින්නක් මෙන් භවයෙන් වැසී තිබී අවකාශලත් විට මතු විපාක දෙනුව සිටියේය. නැවත අන් පවක් හේතු කොට වංග නම් රට උපන්නෙමි. එසේම අන් පවක් හේතුකොට ගෙන වංග නම් රට උපන්නෙමි. එසේම කොසඹෑ නුවර සියල්ලන් විසින් පුදන ලද එකම සිටු පුත්‍රයෙක් විමි. එහිදී කල්‍යාණ මිත්‍රයන් ඇසුර කොට පින් දහම්හී යෙදුනෙමි. ඒ කළාවූ කුසල කම් නිධානයක් මෙන් මතු විපාක දෙනුව භවයෙන් සැඟවී සිටියේය. ඒ ලඟ අත්බැව්හී පෙර මගධ රටේදී කළ පරදාර කර්මයේ විපාක දෙනුවස් කොසැඹෑ නුවර සිටු කුලයෙන් වෙන්වූ මම භයානක රෞරව නරකයෙහි උපන්නෙමි. එහි අපමණ දුක් විඳ ඉන් චුතව කර්ණාට නම් රට බීජොඬරණය කරණ ලදුව ශක්ති සම්පන්න එළුවෙක් වීමි. රාජ පුත්‍රයන් සහ ඇමති පුත්‍රයෝ මා පිටට නැගත් රථයෙහි යොදා ගෙනත් යන්නාහ. ඒ මා කළ පරදාර කර්මයෙහි විපාක වන්නේය. එළුවකුවිමි, බීජෝඬරණය, තමා පිට නංවා ගෙන යෑම රථ ගැල් ඇදීම, පරස්ත්‍රී සේවනයෙහි විපාකය. එතනින් චුතව පැමිණ වනයෙහි වානර යොනියක පිළිසිඳ උපන් දිනමි. වානර රජ්ජුරුවෝ මා ආදරයෙන් ඉල්ලා ගෙන මා අඬව අඬවා මා බීජොඬරණය කෙලේය. එතනින් චුතව මම ස්වරණා නම් රට ගොන්ය උපන්නෙමි. එහීදීද කරන ලද බීජොඬරණය ඇත්තේවීමි. ගව යෝනියෙන් චුතව වැදෑරට මහත් සම්පත් ඇති සිටු කුලයක නපුංසකව උපනිමි. එහි සිතින් ලතවී සිට චුතව තව්තිසා භවනෙහි නන්දන උයනෙහි බොහෝ ආත්ම මවා ගන්නට සමත් දිව්‍යප්සරාවත්ම ඉලිඳ සක්‍ර දෙවේන්ද්‍රයාට අග මෙහෙසුන්වීමි. එහි සිටියදී අනාගතයෙහි උපදින ජාතීන් සිහි කළෙමි. මම මේ ආත්මයෙන්ද චුතව දිව්‍ය මනුෂ්‍ය සංඛ්‍යාතවූ සුගතියෙහි චුති ප්‍රතිසන්ධි වශයෙන් ඇවිදිමි. තවද රජතුමනි, උසස් ආත්මවල උපන්නට සම්භාවනා ලද්දේ පෙර කරන ලද කුසල කර්මයෙන් යයි තව දුරටත් කරුණු දක්වන්නී යම් ස්ත්‍රී පුරුෂයෝ දෙපා ඇත්තෝ මඩ වලක්වන්නාක් මෙන් පරස්ත්‍රීන් පර පුරුෂයන් දුරු කරන්නේය. යම් ස්ත්‍රියක් පුරුෂයකු වනු කැමති නම් සුජාතාව ප්‍රධාන අවශේෂ දිව්‍යාඞගනාවන් ශක්‍ර දේවේන්ද්‍රයන්ට යටහත්ව ආදරයෙන් උපස්ථාන කරන්නාක් මෙන් ස්වාමි පුත්‍රයාහට අනවරතයෙන් සකසා අත් පා මෙහෙවර කරන්නේය.

යම් සත්වයෙක් බොහෝ වස්තුව කැමැත්තෙන් වීනම් පව්කම් දුරින් දුරුකොට ත්‍රිවිධවූ සුජරිත ධර්මයෙහි හැසිරෙන්නේය. යනාදී වශයෙන් සකල රාත්‍රියෙහිම සුගති මාර්ගය කියා සුචරිත ධර්මය දේශනා කළාය.

එකල මහ බෝසතාණෝ නාරද නම් මහා බ්‍රහ්මව ඉපද උන්හ. උන් වහන්සේ වරින්වර සත්වයාගේ යහපත පිණිස මිනිස් ලොව බලන්නාහ. එදවස මේ රුජා නම් රාජ කන්‍යාව පිය රජ්ජුරුවන්ගේ මිථ්‍යා දෘෂ්ටිය හරවන පිණිස ධර්මදේශනා කරන නියාව දැක මම එහිගොස් ඔවුන් සියළු දෙනාටම යහපතක් කටයුතු වන්නේයයි සිතා පැවිදි වේශයෙන් මවාගෙන ජටා මඬුල්ලක් බැඳ ගෙන ජටාව අතරෙහි රන් ඉද්දක් බහා ඉද්ද මත්තෙහි මොණර පිල් තනා රන් පනවුලක් හැඳ රිදීමය වූ අඳුන් දිවි සමක් ඒකාංශ කොට රන්කෙන්ඩියක්ද ගෙන අහසින් අවුත් රජ්ජුරුවන්ට අභිමුඛයෙහි සිට ඔවුන්ගේ නමස්කාර ලබා අහසින් බැස පනවන ලද ආසනයෙහි වැඩ සිටි නාම ගොත්‍රය විචාරණ ලදුව මහා නාරද කාශ්‍යපයෝ යයි පැවසූ සේක. ඉක්බිති රජ්ජුරුවෝ මේ අහසින් යන මහා සෘඬි ඇති කෙනෙක. පරලොව පසුව විචාරමි. මෙතරම් බලයක් ඇතිව අහසෙහි ඇවිදින්නට සමර්ථ බව ලබා ගත්තේ කෙසේ දැයි විචාරමියි සිති තාපසයන් අමතා තපස්විනි, ලබා ගත්තේ කෙසේදැයි විචාරමියි සිතා තාපසයන් අමතා තපස්විනි, මනස්කාන්ත ශරිරවර්ණයෙන් යුතුව අහසෙහි සිටිම. ඇවිදීම ඉතා ආශ්චර්යජනකය. ඒ කෙසේදැයි තොප අතින් විචාරමියි කීහ. එවිට තාපසයෝ රජ්ජුරුවෙනි, ත්‍රිවිධවූ සුචරිතධර්මය හා කිසුණු පිරියම් නිමිති කොට පැමිණෙන ධ්‍යානාදී ධර්මය ඉඳුරන් මනාකොට පිහිටුවීමද දනාදී කුසලකර්මද කරණකොට ගෙන මේ උසස් තත්වයට පත්විමියි පෙන්වා ධර්මදේශනා කොට ඔහුගේ මිථ්‍යා දෘෂ්ටිට බොහෝදුරට තුනී කළ සේක. තව දුරටත් රජ්ජුරුවන්ගේ මිථ්‍යා දෘෂ්ටිය තුනී කරනු සඳහා අපායවල විඳීනා අපමණ දුක් විඳ වද වේදනා එකිනෙකට විස්තර කොට එහි උපන් පව් කාරයන් පෙන්වා භයකොට දෙතිස් කුණුභයෙන් සැඳ පිළිකුල් කටයුතු තම ශරිරයෙන් නියම ප්‍රයෝජන ලබාගත යුතු ක්‍රමය පෙන්වා දිව්‍ය ලෝකවල ඉපදීමට මාර්ගය දක්වා රජ්ජුරුවන් සතුටු කරවූහ. තවද කාරණා කියන්නාහු මහ බෝසතාණෝ

"ආචික්ඛ මේ නාරද සුධි මග්ගං

යථා අහං නො නිරයං පතෙය්‍යං"

SANHIDA LANKA

මෙසේ මහ රජ්ජුරුවෙනි, මම තොපට අනේක ප්‍රකාරයෙන් මෙළොව පරලොව පෙන්වා කාරණා දැක්වුයෙමි. මෙතැන් පටන් සියළු පාපයන් දුරුකොට කල්‍යාණ මිත්‍රයන් සේවනය කොට දශරාජ ධර්මයෙන් රාජ්‍යය කිරීමෙන් අප්‍රමාදව වාසය කරවයි කියා රජ්ජුරුවන්ට අවාද කොට සියල්ලවුන් බල බලා සිටියදී මහත් සෘඬි භාවයෙන් බ්‍රහ්ම ලෝකයට ගියාය.

එසමයෙහි අලාත සේනාපති නම් දැන් දෙව්දත් තෙරුන්ය. රුජා රාජකුමාරිකාව නම් ආනන්ද ස්ථවිරයොය. පාප දෘෂ්ටියෙන් අඬගානි රජ්ජුරුවෝ නම් උරුවෙල කාශ්‍යප ස්තවිරයෝ්ය. මහා නාරද බ්‍රාහ්මණ වූයේ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# භූරිදත්ත ජාතකය

සද්ධර්ම රාජයන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරන සේක් පෙහෙවස් විසූ උපාසකවරුන් අරඹයා මේ ජාතකය වදාළසේක.
යටගිය දවස බරණැස රාජ්‍යය කළ බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් තම පුත්‍රයාට යුවරජ තනතුර දී ඔහුගේ යස පිරිවර දැක මා මරා රාජ්‍යය පැහැර ගනිද්දෝ යන බියෙන් පුත තෙපි රටින් පිටව ගොස් මාගේ ඇවෑමෙන් පැමිණ රාජ්‍යය භාර ගනුවයි කීහ. කුමාරයෝ පියා වැඳ සමුගෙන නුවරින් නික්ම යමුනා ගංගාවටත් මුහුදටත් අතර පන්සලක් කොට ගෙන වන මුල් ඵලාපල අනුභව කරමින් වාසය කරන්නාහ. එසමයෙහි නාග භවනෙහි තම වල්ලභයා මළ එක් නාග මානවිකාවක් අන් අයගේ සම්පත් බලා දොම්නස්ව නාග භවනින් නික්ම මුහුදු වෙරළෙහි ඇවිදින්නී කුමාරයාගේ පියවර සටහන් දැක ඒ අනුව පන්සලට පැමිණියාය. එකල්හි කුමාරයෝ පලවැල සඳහා ගොස්ය. ඈ පන්සලට වැද තවුස් පිරිකර ආදිය දැක සිතන්නී මේ තාපසයෙක් වසන තැනකි. මොහු සැදැහැයෙන් පැවිදි වූ කෙනෙක්ද? නොහොත් රටින් නගන ලදුව පැවිදි වූ කෙනෙක්දැයි පරීක්‍ෂා කරමි. ඉදින් සැදැහැයෙන් පැවිදි වූයේ නම් මා විසින් සරසන ලද යහන නොඉවසති. පඤ්චකාමයෙහි ඇළුනෝ වීනම් සැදැහැයෙන් මහණනුවූ නම් මාගේ යහනෙහි සැතපෙති. එවිට ඔහු මට ස්වාමිකර මෙහිම වෙසෙමි සිතා නාග භවනින් දිව මල් දිව සුවඳ ගෙනවුත් මල් යහන් සරසා පන්සල මුළුල්ලෙහි සුවඳ විසුරුවා මනා කොට සරසා නාග භවනයට ගියාය. සවස පැමිණි රාජ කුමාරයෝ මේ ක්‍රියාව දැක සැදැහැයෙන් පැවිදි නොවූ නිසා ප්‍රීතියට පත්ව ඒ යහනේ කාමයෙන් මත්ව සැතපී දෙවෙනි දවස් නැගී සිට පන්සල නොමැද වනයට ගියහ. එකෙනෙහි නාග මානවිකාව අවුත් යහනේ මලානිකවූ මල් දැක ඉතා ප්‍රීතියට පත්ව එදිනද යහනත් අසපුවත් සරසා සක්මනෙහි මල් විසුරුව ගියාය. කුමාරයා එදිනද යහනෙහි සැතපී සිට පසුවදා නැගිට මේ කවරෙකුගේ ක්‍රියාවක්ද දකිමියි සැඟවී සිට එදිනද ඈමල් ගෙන වුත් යහන සරසන්නට වන් කල්හි රූපත් ඈ දැකීමෙන් ඈ පිළිබඳ සිත් ඇතිව වහා ගොස් තී කවුදැයි විමසා ඔවුනොවුන්ගේ තොරතුරු අසා දැන දෙදෙනාම එක් හිත්ව එහිම නතරවූහ. නාගමානවිකාව තමාගේ බලයෙන් එහි මා හැඟි ගෙයක් මවා යහන් පනවා දිව්‍යමය වූ ආහාර පාන වර්ග අනුභව කරමින් ප්‍රීතියෙන් කල් යවන්නාහ. ටික කලක් අවෑමෙන් නාගමානවිකාව කුමාර කෙනෙකුන් වැදූවාය. ඔහු නමින් සාගර බ්‍රහ්මදත්තයෝ වූ අතර ඊට පසුව ලැබුන කුමාරිකාව සමුද්‍රජාවෝ යන නමින් ප්‍රකට විය.
එක් දිනක් බරණැස් නුවර වසන එක් වනචරයෙක් ඒ අසලින් යන්නේ කුමාරයන් දැක හැඳින කථාකොට ඔබතුමා මෙහි වසන නියාව රජ්ජුරුවන්ට දන්වමියි කියා නුවරට ගියේය. එකල්හි රජ්ජුරුවෝ කාලක්‍රියා කළහ. දින හතක් ඇවෑමෙන් රාජ්‍යයට කුමාරයන් වසන තැනක් සොයන්නේ වනචරකයා අතින් දැන ඔහුට සත්කාර කොට පෙළහරින් කුමාරයා වසන තැනට ගොස් රාජ්‍යය පිළිපැද්ද මැනවයි කීහ. කුමාරයෝ නාගමානවිකාවගෙන් ඒ පිළිබඳ අදහස් විමසීය. ඈ කියන්නී ස්වාමීනී අපි උග්‍රවූ විස තේජස් ඇත්තෝ වෙමු. මොහොතින් කිපෙනසුළු වම්හ. සැපතෙහි රොෂය නම් ඉතා බැරෑරුම් දෙයක. මම ඉදින් කිසිවක් දැකවත් අසාවත් කිපී බැලින්නම් පරඬලා මිටක් මෙන් සියල්ලෝම සුණු විසුණුව විසිරයෙති. මේ කාරණයෙන් මට යාමට නොපිළිවනැයි කිව. කුමාරයෝ දෙවෙනි දවසත් යාඥා කොට කියා කැමතිකරවා ගත නොහැකි විය. ඈ කියන්නී මම කිසි සේක් නොයමි. මේ පුත්‍රයෝ නාග කුමාරයෝ නොවෙති. තොප නිසා උපන්හෙයින් මනුෂ්‍ය ජාති ඇත්තාහ. මා කෙරෙහි ආදරය ඇත්නම් මොවුන් ප්‍රේමයෙන් තනව. මේ දරුවෝ දිය බිජුවටින් උපන්හ. එබැවින් ඉතා සියුමැළියෝය. මාර්ගයෙහි ගෙනයනකළ අවු සුළං නොවදිනසේ ඔරුවක් තනා පැන් පුරවා මේ දරුවන් එහි ලා නුවරට ගෙනගොස් එහි පැන් පොකුණු කරවා ජලක්‍රීඩාවට නිතරම යොදවවයි කීවාය. මෙසේ කියා කුමාරයන්ට වැඳ පැදකුණු කොට දරුවන් සිඹ සනසා අඬා වැලප එතනින් අතුරුදහන්ව නාග භවනයට ගියාය. කුමාරයෝද අඬා වැලප අමාත්‍යයන් සමඟ පෙළහරින් නුවරට ගොස් රාජ්‍ය භාරගත්හ. නාග මානවිකාව කී පරිදි දිය ඔරුවක් රථයක සවිකොට කුමර කුමරියන් දෙදෙනා නුවරට ගෙනවුත් ඔවුන් සඳහා අලංකාර පැන් පොකුණු කරවා දුන්හ. ඉක්බිත්තෙන් එක් දිනක් පොකුණට සොරොව්වවෙන් පැන් ගන්නා කල්හි ඒ සමඟ කැස්බෙක්ද ඇතුළුව නික්මෙන්ට නිසි මගක් නොදැක පොකුණු පත්ලේ වැදහෙව දරුවන් කෙළනා කල්හි දියෙන් උඩට හිස මෑත් කොට දරුවන් දෙස බලා නැවත ගිලී ගියේය. ඒ දරුවෝ කැස්බා දැක භයින් ත්‍රස්තව පියාණන් සමීපයට දුව ගොස් එක් යක්‍ෂයෙක් අප භය ගන්වන්නේයයි කීහ. එවිට රජ්ජුරුවෝ ඔහු අල්ලවයි රාජපුරුෂයන්ට නියම කළහ. ඔවුන් දැලක් දමා ඉබ්බා අල්ලා ගෙනවුත් රජ්ජුරුවන්ට දැක්වූහ. කුමර කුමරියන් භයට පත්ව කෑ ගසන්නට වූහ. රජ්ජුරුවෝ ඉබ්බා ගෙන ගොස් වධදී මරවයි නියම කළහ. එතැන්හි සමහර කෙනෙක් මේ රාජද්‍රෝහියා වනයක ලා මොහොලින් කොටා දමවයි කීහ. සමහරෙක් මොහු තුන් පාකයකින් පිස කන්ට වටනේයයි කීහ. තවත් සමහරෙක් අඟුරෙහි පලහා කන්ට වටනේයයි කීහ. සමහර කෙනෙක් ඉදිබූ කබලින්ම පලහා කන්ට වටනේයයි කීහ. එවිට උදකහිරුක නම් අමාත්‍යයෙක්

SANHIDA LANKA

කියන්නේ මොහු යමුනා ගංගාවෙහි මහා දිය බැවුමකට දමන්නට වටනේය. එවිට මහත් විනාශයට පැමිණෙන්නේය. මොහුට මීට වඩා වධයක් නැත යයි කීහ. එවිට කැස්බා ඇමති බස් අසා හිස එලියට ගෙන කියන්නේ පින්වත මා විසින් තට කෙසේ වූ අපරාධයක් කරන ලද්ද? මෙබඳු දුකක් මට නියම කෙරෙහිද? පළමු කී සියළු වධ ඉවසා ගෙන සිටියත් ඔබ කී වධයනම් ඉවසිය නොහැකැයි කීය. එවිට රජ්ජුරුවෝ මොහු නොකැමැති වධයම දිය යුතුයයි කියා යමුනා ගංගාවෙහි දිය වැටුවමට දැම්මවුය.
දියට වැටුන කැස්බා එක්වරම නාග භවනයට ගියේය. ඔහු දුටු ධ්‍රතරාෂ්ට නා රජ්ජුරුවන්ගේ පුත්‍ර නාගමානවකයෝ මොහු වහා අල්ලවයි කීහ. එවිට කැස්බා සිතන්නේ බරණැස් රජ්ජුරුවන් අතින් බොරු බිය පෙන්නා බේරී ආ නමුත් මේ පරුෂ වූ නයින් අතින් බේරීමක් නොවන්නේ යයි බොරුවක් ගොතා කියන්නේ මම චිත්‍රසූල නම් කැස්බෙක්මි. බරණැස් රජ්ජුරුවන්ගේ දූතයෙක්මි. ධ්‍රතරාෂ්ට නම් නා රජ්ජුරුවන් සමීපයට මෙහෙවර සඳහා ආමි. අපගේ රජතුමාගේ දූ කුමරිය නා රජ්ජුරුවන්ට දෙනු කැමතිව ඒ බව දැන්වීමට මා එවූ සේක. නා රජ්ජුරුවන්ට මා දක්වවයි කීය. නාග මානවකයෝ සතුටුව එහි කැඳවාගෙන ගියහ. රජතුමා ඔහු දැක නොසතුටු සිත් ඇතිව ලාමක ශරීර ඇති මෙබඳු සතත්වයෝ දූත මෙහෙවර කරන්නට අසමත්ථයෝ යයි කීහ. එවිට කැස්බා කිමෙක්ද? රජතුමනි දූතයෝ තල් ගස් පොල්ගස් සේ උස් විය යුතුද? ශරීරයේ පමණින් නොව ගියතැන කාය්‍ය සිද්ධ කිරීමට හැකිනම් ප්‍රමාණවත් නොවේද? තවද රජතුමනි අපගේ රජ්ජුරුවන්ට බොහෝ දූතයෝ වන්නාහ. ගොඩ දූත මෙහෙවර මනුෂ්‍යයෝ කෙරෙති. අවකාශයෙහි දූත මෙහෙවර පක්ෂීහු කෙරෙති. දියෙහි දූත මෙහෙවර මම කෙරෙමි. එබැවින් මට නින්දා පරිභව නොකරවයි කීය. එවිට නා රජ්ජුරුවෝ තා කුමක් නිසා පැමිණියෙහිදැයි විචාළ සඳ නා රජතුමනි අපගේ රජ්ජුරුවන් වහන්සේ මුළු දඹදිව රජ දරුවන් වහන්සේලා සමග මිත්‍රධර්‍මය ඇත්තාහ. එවැනි සම්බන්ධයක් තවම නැත්තේ ඔබ වහන්සේ සමඟ පමණකි. එබැවින් ඒ රජතුමාගේ සමුද්‍රජාවෝ නම් රාජ කන්‍යාව ඔබ වහන්සේට පාවාදීමෙන් මිත්‍රවීමට අදහස ඇත. එබැවින් මා සමග පිරිස එවා ඒ කුමාරිකාවන් වහන්සේ පාවාගත මැනව. එවිට නා රජතුමා සතුටුව කැස්බාට සත්කාර කොට දවස් නියම කොට ගෙන එවයි සතර දෙනෙකු පිටත් කර යවූහ. එකල්හි කැස්බා යමුණාවටත් බරණැස් නුවරටත් අතරේ එක් පියුම් විලක් දැක උපායකින් පලා යෙමියි සිතා කියන්නේ පින්වත් නාග මානවකයිනි අප රජ්ජුරුවන්ගේ දූදරුවෝ මම ගිය කළ අපට ඇඹුල ඉපුල නෙළුම් මල් දෙවයි ඉල්ලන සේක. එබැවින් මම ඒවා කඩාගනු කැමැත්තෙමි. මම එහි යමි. මම ඒමට පෙර තෙපි රජ්ජුරුවන් සමීපයට යව. එතැන්හි මා දක්නමෝ වේ දැයි කිවුය. නාග මානවකයෝ ඔහුගේ කීම පිළිගෙන රජ්ජුරුවන් සමීපයට ගිය අතර විලෙහි සැඟවින. රජතුමා නාග මානවකයන් සතුටින් පිළිගෙන කුමක් නිසා කොහි සිට අවුදැයි විචාලහ. රජතුමනි අප නා ලොව සිට නා රජ්ජුරුවන්ට ඔබගේ දූ කුමරිය සරණ ගිවිස්වා ගැනීම සඳහා පැමිණියෙමියි කීහ. එවිට රජ්ජුරුවෝ අපි කිසි කලක නයින් හා විවාහයක් කළ විරූ නැත. අපි මනුෂ්‍ය ජාති ඇතිව සිට තිරිසනුන් හා සමඟ කෙසේ විවාහ බන්ධන කරමෝදැයි කීහ. එ ඇසූ නාගමානවකයෝ රජතුමනි ඉතින් නුසුදුසු නම් කුමක් නිසා ඒ සඳහා විචාරා චිත්‍රසූල නම් කැස්බා අප රජ්ජුරුවන් සමීපයට එවූ සේක්ද? එසේ එවා දැන් අපේ රජ්ජුරුවන්ට පරිභව කරන නුඹවහන්සේට කළමනා කටයුතු අපි දනුම්හ. අපි නයි නියාව නොදක්නා සේක්දැයි රජ්ජුරුවන් භය ගැන්වූහ. එවිට රජ්ජුරුවෝ මානවකයිනි මම තොපගේ රජ්ජුරුවන්ට පරිභව නොකරමි. මහත් සම්පත් විඳින තේජස් ඇති ඔහු නාලොව නයින්ට නායකයහ. කෙසේවුවද සර්පයෙක් හෙයින් මාගේ දියණියන් නුසුදුසුය. මණ්ඩුක භක්ෂණය කරන්නා වූ සර්පයින්ට මාගේ සමුද්‍රජාවෝ සුදුසු නොවෙතියි කීහ.
එකල්හි නාගමානවකයෝ එතැන්හිදීම නාසාවාතයෙන් රජ්ජුරුවන් මරා දමනු කැමතිවත් දූත මෙහෙවරක පැමිණ එසේ කිරීම නුසුදුසු යයි සිතා එතැන්හිම පොළෝ කිමිද නා ලොවට වැද නා රජ්ජුරුවන්ට බරණැස් රජ්ජුරුවන්ගේ අදහස් දෙගුණ තෙගුණ කොට කියා පාමින් කෝපවත් කළහ. එකල්හි නා රජ්ජුරුවෝ සියළු නාගයින්ට රැස්වන්ට විධානය කොට උන් පැමිණ දේවයන් වහන්ස කුමක් කරමෝද කවරක්හු විෂ වාතයෙන් භෂ්මකර මෝදැයි විචාළ කළ සමුද්‍රජාවන් කෙරෙහි සිත් ඇති නිසා එසේ කරනු අකමැතිව තොපි හැම බරණැස් නුවරට ගොසින් මහත්වූ ශරීර මවා ගෙන රජ මාළිගාවේත් අවශේෂ ගෙවලත් පොකුණුවලත් වීථිවලත් වෘක්ෂවලත් තොරණෙහිත් ඇඳ පුටු මේස යාන වාහනවලත් ෂූ ෂූ යන ශබ්ද පවත් වමින් මහත් කොට පෙනගැබ ඇති කොට ගෙන සිටුව. බාල, මහළු, ගර්භනී  යන අයට සහ සමුද්‍රජාවන්ටද තොපව නොදක්වව. මමත් ධවලවූ මහත් නාග ශරීරයක් මවා ගෙන කසී පුරය සත් දරණපටකින් වටලාගෙන මහත් පෙණ ගර්භයකින් නුවර වසා ගෙන ඒකාන්ධකාර කොට කශීපුර වාසීන්ට භය උපදවමින් වැද හොවමියි කීහ. එබස් ඇසු සියළුම නාගයෝ රක්ත, නීල, ශෙවතාදී නොයෙක් පැහැ ඇති නාග වෙස් මවා ගෙන මධ්‍යම රාත්‍රී වේලෙහි නුවරට වැද රජ්ජුරුවන් විසින් කියන ලද ක්‍රමයට සිටගත්හ. කලින් රජ මාළිගාවට පැමිණි නාගමානවකයෝ සතර දෙන බරණැස් රජ්ජුරුවන්ගේ ශ්‍රී යහනෙහි පා සතර වෙලාගෙන රජතුමාගේ හිසට තුඩින් ඇණ ඇණ ෂූ ෂූ ගාමින් සිටියාහ. තවද පාන්වූ කල්හි නුවරවාසීහු භයින් ත්‍රස්තව නා රජ්ජුරුවෙනි කුමක් නිසා අප හැමට පීඩා කරවුදැයි කිවුය. එවිට නාගයෝ තොපගේ රජ්ජුරුවන්ගේ දියණියන් අපේ නා

SANHIDA LANKA

රජ්ජුරුවන්ට දෙනබවට දූතයන් යවා නැවත නොහැකි යයි නා රජ්ජුරුවන් වහන්සේට අක්‍රොෂ පරිභව කළසේක. ඉදින් අපේ නා රජ්ජුරුවන්ට ඒ දියණියන් දුන් සේක් වීනම් අපි තොපි හැරපියම්හ. නැත්නම් තොප හැමගේ ජීවිත නැතිවන්නමෝ වේදකීහ. එවිට නුවර වැස්සෝ එක්වී මාළිගා දොරට ගොස් නා රජ්ජුරුවන්ට රාජ දියණියන් දුන මැනවයි එක පැහැර ඇඬූහ. ඒ නාග මානවකයෝ සතර දෙනත් දුනමැනව. දුනමැනවයි රජ්ජුරුවන්ගේ හිසට තම තුඩින් පහර දුන්හ. එවිට බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කරගත හැකි දෙයක් නොවුයේ නා රජ්ජුරුවන්ට මාගේ දියණියන් දෙමියි තුන් විටක් කීහ. එබස් අසා නා රජ්ජුරුවෝ ගව්වක් තැන් පසු බැස දිව්‍ය පුරයක් මෙන් නුවරක් මවා ඒ නුවර සිට දියණියන් එව්ව මැනවයි පඬුරු යවූහ. රජ්ජුරුවෝ පඬුරු ගෙන තෙපි යව දියණියන් අමාත්‍යයන් අතට පාවාදී එවමියි නාග මානවකයන් යවා දියණියන් කැඳවා මාළිගාවේ උඩුමහල් තලයට ගොස් කවුළුව හැර ඇතින් ඇති අලංකාර පුරය පෙන්වා දියණිය තෙපි එනුවර රජ්ජුරුවන්ට අග මෙහෙසුන්වව නුවරද ලඟ බැවින් නිතර ඒමටද පිළිවන. තෙපි ඒ නුවරට යා යුතුයයි වහාම සරසවා අමාත්‍යයන්ට පාවාදී යවුය. අමාත්‍යයෝ ඇ කැටුව ගොස් නා රජ්ජුරුවන්ට භාරදී බොහෝ සතුටු පඬුරුද භාරගෙන පෙරළා ආහ. එකෙනෙහි නාග මානවිකාවෝ කුරුන් කුරුන් වෙස් ගෙන මිනිස් පරිචාරිකාවන් මෙන් කුමාරිකාව පිරිවරා ගත්හ. ඇ දිව යහනේ හොත් පමණින් දිව පහස් විද නිදන්නට පටන් ගත්හ.

එකල්හි නා රජ්ජුරුවෝ එතැන්හිම අන්තර්ධානව සමුද්‍රජාවන් ගෙන නාග භවනයට ගියහ. ටික වේලාවකින් ඇ පිබිද සරසන ලද දිව යහනත් අන්‍ය වූ රන් රිදී මැණික්මය වූ ප්‍රසාසාදියත් උද්‍යාන පුස්කරණිත් දැක පරිවාර ස්ත්‍රීන් අතින් මේ කුමන පුරයක් දැයි විචාළාය. පරිවාර ස්ත්‍රීහු කියන්නෝ දේවීන් වහන්ස මේ ඔබගේ ස්වාමි පුත්‍රයන් සන්තක නුවර වන්නේය. මද පිනැති සත්වයෝ මෙබඳු සම්පත් නොලබති. ඔබ වහන්සේ මහ පින් ඇති බැවින් මේ සා මහත් සම්පත් ලබන ලදැයි කීහ. නා රජ්ජුරුවෝත් පන්සියයක් යොදුන් පමණවූ නාග භවනයෙහි බෙර ලවන්නාහු යමෙක් සමුද්‍රජාවන්ට සර්පවේශයක් දැක්වූයේ වීනම් ඔහුට රාජාඥා වන්නේයයි නියම කළහ. සමුද්‍රජාවෝ ඒ මනුෂ්‍ය ලෝකය යන සඥාවෙන් නා රජ්ජුරුවන් සමඟ සතුටුව ප්‍රීතියෙන් විසූහ. මෑත භාගයෙහි ඇ නා රජ්ජුරුවන්ට දාව පුතනු කෙනෙකුන් වැදූහ. ඒ කුමාරයා ප්‍රිය දැකුම්කළු හෙයින් ඔහුට සුදර්ශන යයි නම් තැබූහ. දෙවන වර උපන් පුත්‍රයා දත්ත නම් වූ අතර තෙවෙනි පුත්‍රයාට සුභග යයි නම් තැබූහ. හතරවන වරට උපන් කුමාරයා අරිට්ඨ නම් විය. මෙසේ පුතුන් සතර දෙනෙකුන් වදාත් නාගභවනය නියාව ඇ නොදත්හ. දිනක් අරිට්ඨ කුමාරයන්ට නාග මානවිකාවෝ කියන්නේ තොපගේ මෑණියෝ මනුෂ්‍ය ස්ත්‍රිය. නාගමානවිකාවක් නොවෙයි කීහ. එබස් ඇසූ කුමාරයෝ පරීක්ෂා කරමියි සිතා දිනක් කිරිබොමින් ඉඳ සර්ප වේෂයක් මවා නගුටින් මෑණියන්ගේ පිටිපතුලට ඇනලූය. එවිට මෑණියෝ ඔහුගේ සර්ප ශරීරය දැක භයින් ත්‍රස්තව මහත් හඬින් කෑ ගසා ඔහු බිමට දැමීය. කුමාරයන්ගේ ඇසක් කණ විය. නා රජ්ජුරුවෝ වහා පැමිණ හේතුව විමසා කුමාරයාව ජීවිතක්ෂයට පමුණුවයි විධාන කළහ. එවිට කුමාරිකාවෝ දේවයන්වහන්ස පුතණුවන්ගේ ඇසක් නිය ඇනී අන්ධ වී ගියේය. උන්ට ක්ෂමා වුව මැනවයි කිවුය. රජතුමා ඉවසුය. ඒ දවස මේ නාග භවන බව කුමාරිකාව දත් අතර කුමාරයා කණාරිට්ඨ නමින් ප්‍රකට විය. ක්‍රමයෙන් වැඩිවිය පැමිණ විඥබවට පත් කුමාරවරු සතරදෙනාට පිය රජ්ජුරුවෝ යොදුන් සියය බැගින් වෙන්කර ඒවායේ රාජ්‍ය භාරදුන්හ.

දන්ත කුමාරයෝ වනාහි අපේ බෝධිසත්වයන් වහන්සේය. නාග භවනයෙහි උපන්නාවූ ප්‍රශ්නයෙක් ඇත්නම් උන්වහන්සේම විසඳන සේක. පිය රජ්ජුරුවන් සමඟ විරූපාක්ෂ නම් වරම් මහ රජ්ජුරුවන් සමීපයටත් උපස්ථානයට යන්නාහ. ඒ රජ්ජුරුවන් සමීපයෙහි උපන් ප්‍රශ්නද විසඳන්නාහ. දිනක් වරම් මහ රජ්ජුරුවෝ නාග පර්ෂත් සමඟ ත්‍රයතිංශත් දිව්‍යලෝකයට ගොස් සක්දෙව් රජ්ජුරුවන් පිරිවරා උන් කල්හි දෙවියන් අතරෙහි ප්‍රශ්නයෙක් උපන්නේය. ඒ ප්‍රශ්නය විසඳන්ට එකද සදත්ථියෙක් නුවූයේය. දන්ත කුමාරයන් උතුම් පයඞ්කයෙහි හිඳ එය විසඳා ශක්‍ර දේවේන්ද්‍රයන්ගෙන් දිව සුවඳ මල් වලින් පූජා ලත් සේක. එසේම ශක්‍ර දේවේන්ද්‍රයෝ බෝසතුන් අමතා දන්තයෙනි තෙපි පොළව හා සමාන වූ ප්‍රඥාවෙන් යුක්තවන බැවින් මෙතැන් පටන් භූරිදත්ත කුමාරයෝයයි මහ බෝසතුන්ට නම් තැබූහ. එතැන් පටන් නිතර දිව්‍යලෝකයට යන බෝසතුන් ශක්‍ර සම්පත් දැක දිව්‍ය ලෝකොත්පත්තියෙහි ආශාකොට මට මේ මණ්ඩුක භක්ෂණය කරන්නාවූ ආත්ම භාවයෙන් ප්‍රයෝජන කිම්දැයි මව්පියන්ගෙන් අවසර ගෙන නාග භවනයෙහි ශුන්‍ය විමානයක හිඳ පෙහෙවස් රක්ෂා කරන්නාහ. එනමුත් එහි නිතර එළඹෙන නාටිකාංගනාවන් නිසා සිල් ආරක්ෂා කරනු නොහැකිව එතැනින් නික්මී තම බිසව අමතා සොඳුර මම මිනිස් ලොවට ගොස් යමුනා ගඟ අද්දර මහ නුග ගස යට ඇති තුඹස මත්තේ දරණවැල ලා ගෙන භාවනා කරමි. දස දිනෙන් දස දිනට එන්නෙමියි දන්වා නගුලිසක් පමණ ශරීරයක් මවා ගෙන යමෙක් මාගේ සම් මස් නහර ඇට ලේ කැමැත්තේ වී නම් ගනීවයි ඉටාගෙන පෙහෙවස් රක්ෂාකළහ. දස දිනකට වරක් නාග කන්‍යාවෝ තූර්ය භාණ්ඩ රැගෙන පෙළහරින් පැමිණ බෝසතුන් කැටුව නාග භවනයට යන්නාහ.

එසමයෙහි බරණැස් නුවරවාසී සොමදත්ත නම් බමුණෙකු පුත්‍රයා සමඟ දිනක් දඩයමේ යන්නේ කිසිවක්

SANHIDA LANKA

නොලැබ හිස් අතින් එන අතරමග මුවෙකු දැක මහත් ප්‍රීතියට පත්ව විද සම ගසා මස්කඳ බැඳගෙන එන්නේ හිරු හස්තයට ගිය හෙයින් න්‍යග්‍රොධ වෘක්ෂයකට නැගී වැද හොත්තාහ. අළුයම් වේලෙහි මිහිරි හඬක් ඇසී අවදිවී බැලූ ඔවුන්ට ගී කියමින් නටන නාග කන්‍යාවන් හා ඒ මැද ශක්‍රදෙවෙන්ද්‍ර ලීලාවෙන් බබල බබලා සිටින බෝසතුන් පෙනී මහා ගසින් බැස ඒ ස්ථානයට ගියේය. බමුණාව දුටු නාගමානවිකාවෝ මොහොතින් පොළව කිමිද නාග භවනයට ගියාහුය. බෝධිසත්‍වයෝ තනිවිය. බමුණා එතුමන් සමීපයට ගොස් බබලමින් සිටින තොප කවුද? නටමින් සිට නැතිවී ගිය ස්ත්‍රීහු කවුරුද? තත්වූ පරිදි කියවයි කීහ. එවිට බෝසතාණෝ සත්‍යම කිවයුතුයයි සිතා කියන්නාහු මම මහත් ඍද්ධ්‍යානුභාව ඇති උග්‍ර තේජසින් යුතු නාග රාජයෙක්මි. ඉදින් මම කිපී පොළවේ මහදළ වැදගත් පමණින් සියලු ජනපදය භස්මවන්නේය. මාගේ මැණියෝ සමුද්‍රජානම් බිසවය. ධ්‍රතරාෂ්ට නා රජ්ජුරුවෝ පියතුමාය. මේ ආදී වශයෙන් තමා පිළිබඳ තොරතුරු කියා සිතන්නේ මේ චණ්ඩ පුරුෂයා අහිගුණ්ඨිකයන් හට කියා මාගේ ශීලයට අන්තරායක් කරතහොත් නොමැනවි. මොහු නාගභවනයට ගෙන ගොස් මහත් සම්පත් දීමෙන් සීලය බොහෝ කලක් පැවැත් වූයේ නම් ඉතා යහපතැයි සිතා නාග භවනය ගැන වර්ණනාකොට ඔවුන් දෙදෙනාවම කැටුව නාග භවනයට ගියහ. ඔවුන් දෙදෙනාට නාග භවනයෙහිදී දිව්‍ය ආත්ම පහළ වූයේය. සාරසියයක් නාග කන්‍යාවන් පිරිවරාගෙන මහත් දිව්‍ය සම්පත් විඳිමින් වෂීයක් පමණ කල්ගත විය.

සොමදත්තයාගේ පිය වූ නේසාද බමුණාට එහි විසීමට තරම් පිණක් නැත්තේ ඔහුට ඒ දිව්‍ය සම්පත් නරකයක්මෙන් වැටහී පුත්‍රයා ලඟට ගොස් දරුව උකටලී නොව මෙහි වසන්නේ කෙසේද? දැන් තොපගේ මැණියන් සහ මල් බෑයන් නොදුටු බැවින් ශෝක ඇත්තෙමි. වහාම මනුෂ්‍ය ලෝකයට යමුයයි බලවත් සේ ඇවිටිලි කොටත් කැමති කරවා ගත නොහැකි වූයේ උපායකින් පැණයම් සිතා බෝසතු සමීපයට ගොස් මම මනුෂ්‍ය ලෝකයට ගොස් නෑදැයින් දැක පැවිදිව මහණ දම් පුරමියි අවසර ඉල්වා ගෙන නා රජුන් විසින් දුන් බොහෝ සම්පත් ඇතිව රෝ දුක් වලින් තොරව සුඛිත මුදිත විය හැකිමහා බලසම්පන්න නාග මානික්‍ය රත්නයද ප්‍රතික්ෂෙප කොට නාග මානවකයන්ගේ මාර්ගයෙන් බරණැස් නුවරට ලඟා වී අතරමග පොකුණක් දැක නාම්හයි ඇඳ සිටි දිව්‍යාභරණ සහ දිව්‍ය වස්ත්‍ර ගලවා තබා දියට බැස නාන්නට පටන් ගත්හ. එකෙනෙහිම ඒ දිව්‍ය වස්ත්‍රාභරණ අන්තර්ධාන වී ගියේය. නාගභවනයට යන දින ඇද සිටි කළු දැලි රෙදි ඒ දෙදෙනාගේ හිත වැලද ගත්තේය. වැදි වෙසින් සිටියාහ. එවිට සෝමදත්තයා පියාණෙනි නුඹ වහන්සේ විසින් අප නසන ලද්දමෝ වේදැයි හඬා වැලපෙන්නට පටන්ගත්හ. එවිට පියා පුත වනයේ මුවන් ඇත්නම් මරා ජීවත්වෙමුයි කියා පුතු අස්වසා ගෙදරගොස් මුවන් මරා ජීවත් වුහ.

එසමයෙහි එක් දිනක් මහ ගරුඬ පක්ෂියෙක් මුහුදු දිය දෙබෑකොට නාගරාජයා අල්වා ගෙන හිමාල වන ප්‍රදේශයෙහි එක් තාපසයෙක් භාවනා කරන පන්සල කෙළවර ඇති මහා නුගගසක් මත්තෙන් යන්නේ නාගයා නුගගස වෙලා ගත්තේය. ගරුඬ පක්ෂියා ඔහු නුගගස වෙලා ගත් බව නොදැන වේගයෙන් ගිය බැවින් නුග වෘක්ෂයද ඉගිලී ගියේය. නා රජ්ජුරුවන් දික් හිඹුල් වනයට ගොස් නාගයාගේ බඩ පලා රුධිරය පානය කොට ශරීරය සමුද්‍රය මස්තකයෙහි හෙළුයේය. නුග ගසද නාගයා සමඟ මුහුදට වැටෙන්නේ මහත් ශබ්දයක් ඇති වූ හෙයින් මේ කිම්දැයි බලන්නේ නුග ගසක් වැටෙන බව දැක මේ කිමෙක් දැයි සිතා තාපසයන් වහන්සේ භාවනා කරන තැන නුග ගසයයි දැන මා විසින් බොහෝ අකුසල් සිදුකර ගන්නා ලද්දේම යයි සැක ඉපිද වහාම මානවක වේශයක් මවා ගෙන තාපසයන් සමීපයට අවුත් ස්වාමීනී එක් ගුරුළුවෙක් නාගයෙක් ඩැහැගෙන යන්නේ ඔබතුමාගේ සක්මන් කෙළවර වූ නුගගසද නාගයාගේ නගුටේ දැවටී ගැලවී ගියේය. ඉන් ඒ නාගයනට පාපයක් සිදුවේදැයි විමසීය. මානවකය ඔහු නොදැන කළ වරදට පාපයක් නැත. ඔහුගේ එබඳු චේතනාවක් නොවීයයි කීය. ඒ අසා සතුටට පත් ගරුඬ රාජයා ස්වාමීනී ඒ ගුරුළු රාජයා මම වෙමි. ඔබතුමා කෙරෙහි පැහැදුනෙමි. නුඹ වහන්සේ වනයෙහි වසන බැවින් සර්පයන් ඇල්වීමෙහි සුදුසු ආලම්භන නම් මන්ත්‍රයක් දෙන්නෙමි කියා තාපසයන්ගේ නොකැමැත්තෙන් මන්ත්‍රයද ඖෂධ කීපයක්ද කියා ගියේය.

එකල්හි බරණැස් නුවර එක් දිළිඳු බමුණෙක් බොහෝ ණය මුදලින් පිරීගියේ වනයට වැද මියයමියි සිතා ක්‍රමයෙන් යන්නේ ඒ තපස්වීන්ගේ පන්සලට වැද තාපසයන්ගේ අත්පා මෙහෙවර කොට සිත් දිනා ගෙන මා හැගි ආලම්භන මන්ත්‍රයද රැගෙන මට ජීවත් වීමට සුදුසු උපායක් ලදිමියි සතුටුව වනයෙන් නික්ම යමුනා ගංතෙරට පැමිණ ඒ මන්ත්‍රය කියමින් යන්නේය. එවිට නාගමානවිකාවෝ පැමිණ බෝසතුන් පිරිවරාගෙන උවටැන් කොට නාගමාණික්‍යා ඒ අසල වැලිතලා මත්තෙහි තබා ක්‍රීඩා කරමින් උන්හ. බමුණාද මන්ත්‍රය පුරවමින් එතනට පැමිණියේය. ඔවුන් සියල්ලෝම ඒ හඬ අසා මේ ගරුඬ රාජයක්හු විය යුතුයයි භයින් ත්‍රස්තව නාගභවනයට වන්හ. බමුණා එය ගෙන පලා ගියහ.

SANHIDA LANKA

දිනක් සෝමදත්තයා පියා සමඟ දඩයමේ යන්නේ බමුණා අත තිබුණ මැණික දැක පුත මේ මැණික භූරිදත්ත රජ්ජුරුවන් වහන්සේ අපට දුන් මැණික සේ පෙනෙයි. මේ බමුණාට මෙහි ඇති නුගුණ කියා මොහු වක්ව‍ා කොට එය ගනුම්හයි කීහ. එවිට පුත්‍රයා පියාණෙනි නුඹ වහන්සේට නා රජ්ජුරුවන් වහන්සේ එය දුන්විට

ප්‍රතික්ෂෙප කොට දැන් බමුණා වක්‍ද්වාකරන්නේයයි කියා නිහඬ විය. නෙසාද බමුණා මැණික ඇති බමුණා ළඟට ගොස් ඒ මැණික ලබාගත් අයුරු අසා ඒ කෙරෙහි ලොබ කොට කියන්නේ මේ මැණිකට යමෙක් සම්භාවනා නොකරන්නේ නම් විනාශයට පැමිණෙන්නේය. අපගේ ගෙයි නම් බොහෝ මැණික් ඇත. එහෙයින් මේ මැණිකට කළ යුතු උපචාර විධි දනුම්හ. මම තට මැණික් සියයක් දෙමි. මේ මැණික මට දෙවයි කීය. එවිට ආලම්බනයා කියන්නේ එය වස්තුවකට නොවිකුණමි. මහා තේජස් බල ඇති නාගයෙක් ඇති තැනක් කියන්නාහුට තෑගි දෙමැයි කියා ඉදිරියටත් කරුණු විමසූ නෙසාද බමුණට තමා ළඟ ඇති ආලම්භන මන්ත්‍රය ගැනද තොරතුරු පැවසීය. නෙසාද බමුණා සිතන්නේ මොහුට භූරිදත්ත නා රජ්ජුරුවන්ව දක්වා මැණික ගනිමියි සිතා පුත්‍රයාගේද අදහස් විමසීය. එවිට සෝමදත්ත බමුණා පියාණෙනි තමාට කරන ලද උපකාර අමතක කොට මෙවැනි මිත්‍රද්‍රෝහී ක්‍රියාවක් කිරීම බලවත් අකුසලයකි. නරකාදියෙහි උපදවන මෙවැනි දේ කරන තොපවැනි පියෙකු සමග ජීවත් වීමද ඉතා නොවටනේයයි දෙවියන්ට ඇසෙන සේ මහ හඬින් පවසා හිමාලය වනයට ගොස් පැවිදිව ධ්‍යාන වඩා බඹ ලොව ගියහ. නෙසාද බ්‍රාහ්මණයා ටික වේලාවක් සිට ආලම්භනයා සමීපයට ගොස් තෝ සැක නොකරව තට භූරිදත්ත නා රජ්ජුරුවන් දක්වමි ඔහු කැඳවාගෙන ගොස් නුදුරු තැනක සිටගෙන තුඹස මත්තේ වැදහොත් නා රජ්ජුරුවන් දැක අත් දික් කොට එම්බල බමුණ තෙල මහා නාරජ්ජුරුවන් අල්වාගෙන මැණික මට දීපියවයි කීය. නා රජ්ජුරුවන්වහන්සේ ඒ ශබ්දය අසා හිස ඔසවා බලා ඔවුන් දෙදෙනාගේ අදහස් දැක මාගේ සීලයට අනතුරක් කරන්නේයයි සිතා මම දැන් කිපියේනම් මාගේ ශීලය වණ්ඩ වන්නේය. මුන් දෙදෙනා දෙස කිපී බැලුයේනම් සුණු විසුණු වී යන්නේය. එය මාගේ ශීලයට බාධාවකියි නිහඬව දරණවැල අස්සේ හිස තබා ගෙන වැද හොත්තේය. ආලම්භනයා නා රජ්ජුරුවන් දැක ඉතා සතුටට පත්ව කිසිවක් නොසිතා මැණික නෙසාද බමුණා අතට දැමුයේය. ඒ මැණික ඔහු අතින් ගිලිහී බිමට වැටුනේය. ඒ මොහොතින්ම එය පොළවට වැද නාග භවනයට ගියේය. වැදි බමුණාට මැණිකත් පුත්‍රරත්නයත් නා රජ්ජුරුවන් වහන්සේ හා වූ මිත්‍ර ධර්මයත් යන තුනින්ම පිරිහී සිතන්නේ පුත්‍රයාගේ බස් නොගිවිස විනාශ භාවයට පත්වූයයි හඬමින් තම ගෙට ගියේය. ආලම්භකයාත් දිව්‍ය ඖෂධ ටිකක් අනුභව කොට මන්ත්‍රය පුරවා නා රජ්ජුරුවන් කරා ගොස් හිස මිරිකා මුව දල්වා ඖෂධ ස්වල්පයක් විකා කටට කෙළ වත් කළාය. සිල්වත් නා රජ්ජුරුවෝ ශීලභේද භයින් ඇස දල්වාත් නොබැලූහ. අහිගුණ්ඨිකයා නාගරාජයා අල්ලා තලා පෙලා බිම හොවා ඇට පොඩි කොට වැලින් පෙට්ටියක් වියා එහි ලන්නට පටන්ගත. ශරීරය මහත් බැවින් ඒ පෙට්ටියේ නොවදනේය. එකල විළුඹින් තෙරපා දමා පෙට්ටිය කර තබා ගෙන ගම මාධ්‍යයට ගොස් සෙනඟ රැස්කොට නොයෙක් අයුරින් නා රජ්ජුරුවන් නටවා බොහෝ තෑගි බෝග ලබා ගත්හ. මේ නා රජුන්ගේ පෙන මැවීම, ලොකු කුඩා වීම, නාසා පුටයෙන් දුම් කඳන් යැවීම ආදී ප්‍රාතිහාර්‍ය දුටු මනුෂ්‍යයෝ කඳුළු ධාරා වගුරවන්ට වූහ. එගමින් බොහෝ වස්තුව ලත් අහිගුණ්ඨිකයා නා රජුන් කැටුව තවත් වස්තුව ලබමියි එනුවර රජ්ජුරුවන් සමීපයට ගොස් එපවත් කීහ. රජතුමා සෙට දින නාගයා කෙළවයි මහජනයා රැස්කරවූයේය. එදින රාත්‍රී බෝසතුන්ගේ මෑණියෝ ස්වප්නයෙන් "රත් ඇස් ඇති කළු වූ පුරුෂයෙකු කඩුවක් ගෙන තමන් අත කපා ලේ පෙර පෙරා ගෙන යන්නා" දැක මේ නම් පුත්‍ර භූරිදත්ත කුමාරයා උදෙසාම දකින ලද්දකැයි සිතා බොහෝ ශෝකවී කඳුලු වගුරවමින් මාසයක් ඉක්මී ඉක්බිති තමා හමුවට ආ සුදර්ශන පුතු අමතා තමා දුටු සීනය දක්වා ඔවුන් සමඟ බෝසතුන් වසන මාළිගාවට ගියහ.

එකල්හි නා රජ්ජුරුවන්ගේ බිසවු නාගමානවිකාවෝ බෝධිසත්‍වයන් පෙහෙවස් රක්‍ෂා කරන්නා වූ තුඹස මත්තේ නොදැක මෑණියන්ගේ ගෙට යන්ට ඇතැයි සිතා නිසැකව වැද උන්නී මෑණියන්ද මසකින් නා රජුන් නොදුටු බව පැවසීමෙන් පසු ඔවුනොවුන් වැළඳගෙන හඬා වැලප මෑණියෝ කියන්නේ දරුවනි අද රාත්‍රී නා රජ්ජුරුවන් නො දක්නා වූ මම ජීවත් නොවෙමියි කිවුය. එවිට අරිෂ්ට, සුභග, සුදර්ශන යන පුත්‍රයෝ තිදෙනා මෑණියෙනි ශෝක නොවුව මැනවි. දශ රාත්‍රියකින් මෙපිට බෑණන් වහන්සේ ගෙනවුත් දෙන්නෙමැයි කියා අරිෂ්ට නා රජු නපුරු හෙයින් මනුෂ්‍යලෝකයට නොයවා ඔහු දිව්‍ය ලෝකයට යවා සුභගයන් පංචමහා ගංගාවන් බැලීම සඳහා හිමාලවනයට පිටත් කොට තුමූ මනුෂ්‍ය ලෝකයට යනු කැමතිව තාපස වේශයක් මවා ගෙන මෑණියන් වැඳ නික්මුණාහ. බෝධිසත්වයන්ට අච්චිමුඛී නම් ඥාති නැගෙණියක් ඇත. ඈද බෝධිසත්වයන්ට මහත් ස්නේහ ඇත්තී මමද කුඩා මැඩිපැටියකගේ වේශයක් මවා ගෙන ඔබගේ ජටාව අස්සේ වැද හෙව එමියි කියා අවසර ගෙන එසේ වැඳ හොත්තේය. සුදර්ශක නා රජ්ජුරුවෝ බෝධිසත්වයන් භාවනා කළ තැන්පටන් ක්‍රමයෙන් බලා යන්නේ එහි තිබූ ලේ වැලි දැක කවරෙකු හෝ අල්වා ගන්නා ලදැයි උපන්නා වූ බලවත් ශෝකයෙන් යුතුව මනුෂ්‍යයන් අතින් විචාරමින් මාළිගා දොරටම ගොස් නා රජ්ජුරුවන් නටවන්නට සූදානම් කොට තිබුන වේදිකාව ලඟටම ගියේය. ඒ වේලාවට රජ්ජුරුවන්ගේ අවසරය පරිදි ආලම්භනයා පෙට්ටිය හැර නා රජ්ජුරුවෙනි කීය. මහ බෝසතාණෝ හිස මැත් කොට තමාට උවදුරු ඇති වන ගරුඬයන් හෝ ලැජ්ජා ඇති වීමට නෑයින් හෝ ඇද්දැයි බලන්නේ නෑයන් අතර සුදර්ශන සහෝදරයන් දැක දෑස කඳුළු පුරවාගෙන පෙට්ටියෙන් බැස ඔහු ළඟට ඒ තාපස නා රජ්ජුරුවන්ගේ පතුල්පිට හිස තබාගෙන අඬා වැලප පෙරළා ගොස් පෙට්ටියට වන්හ. ආලම්භනයා මේදැක නා රජ්ජුරුවන් විසින්

SANHIDA LANKA

තාපසයන්ට දෂ්ට කරන්නට ඇතැයි සිතා වහා ලඟට ගොස් කිමෙක්ද? තපස්වීනි තොප දෂ්ට කළෝද? එසේ නම් මම විෂබාමි බිය නොවවයි කිවුය. එවිට සුදර්ශන තපස්වී ආලම්බනය තාගේ නා රජ්ජුරුවෝ මට දෂ්ට කරන්නට අසමත්ය. ලෝකයේ සර්පයන් අල්ලා කෙළවා තා වැනි ඇවිදිනා වූ යම්තාක් අහිගුණ්ටික බ්‍රාහ්මණ කෙනෙක් ඇත්නම් මම උන් හැමට ශ්‍රේෂ්ට වෙමි.

එවිට ආලම්බනයා ඔහු ගැන නොදැන කිපී තාපස වේශයෙන් ආ තොපි කොහිසිට ආවෙහිද? නුවණ නැති වියරු වූවෙක්ද? මෙහි සිටින පිරිස මා ගැන නොකිපෙත්වා? මම මොහුට නා රජ්ජුරුවන් ලවා දෂ්ට කරවමි. මාගේ දෝෂයෙක් නැතැයි කීහ. එවිට සුදර්ශන නා රජ්ජුරුවෝ ඔහුට කියන්නාහු ආලම්බනය තෝ මා නා රජ්ජුරුවන්  ලවා දෂ්ට කරවුයේ නම් මම මාගේ මැඬිපැටියා ලවා තට දෂ්ට කරවමි. මේ පිරිස මා කීවා අසා අපගේ යුද්ධයට පන්දහස බැගින් ඔට්ටු තැබිය යුතුය. පැරදී ගිය කෙනෙක් දිනුම්කරුට පන්දහස දිය යුතු යයි කීහ. එවිට ආලම්හනයා කියන්නේ තාපසයෙනි මම වූ කලී ප්‍රසිද්ධ ප්‍රභූව සිටිමි. තා වනාහි දිළිදුය. එබැවින් තට ඇප කවුරුදැයි කීහ. එවිට සුදර්ශන නා රජ්ජුරුවෝ මාළිගාවට ඇතුළුව මයිලණුවන්වූ සාගර බ්‍රහ්මදත්ත රජු සමීපයට ගොස් මහ රජතුමනි මා කීවා අසා පන්දහසක් වස්තුව මට ඇපවුව මැනවැයි කිවුය. එවිට රජ්ජුරුවෝ සිතන්නෝ මේ තාපසයෝ බොහෝ වස්තුව මාගෙන් ඉල්ලති. මට කුමණ වැඩෙක්දැයි සිතා තපස්වීනි තොප අතින් මා පියාණන් වහන්සේ ගත් ණයක් ඇද්ද? නැත්නම් මා ගත් ණයෙක් ඇද්දැයි ඇසුහ. එබස් අසා සුදර්ශන නා රජ්ජුරුවෝ  ආලම්හනයා අතර ඇතිවූ ඔට්ටුව පිළිබඳව දන්වා මහා රාජාංගනයට වැඩ මට අපගේ යුද්ධය බලවයි කීහ. එවිට බරණැස් රජ්ජුරුවෝ තාපසයන් කැටුව නික්මුණාහ. රජ්ජුරුවන් දුටු ආලම්හනයා සිතන්නේ මොහු ගිය ඇසිල්ලෙහිම රජ්ජුරුවන් කැඳවා ගෙන අවුය. එබැවින් මොහු රාජ කුළුපග කෙනෙකුන් විය යුතුයයි සිතා කියන්නේ තාපසයෙනි ඔබ විෂ විද්‍යාවෙන් අග්‍ර කොට සලකමි. නමුත් මාගේ මේ නා රජ්ජුරුවන් දියබරියකු කොට නොසිතවයි කීය. එවිට තාපසයෝ ආලම්බනය මමත් විෂ විද්‍යාවෙන් තා මැඩ නොපවත්වමි. නමුත් තා මේ විෂ නැත්තාවූ නා රජ්ජුරුවන් ගෙන ලෝ වැස්සන් මුලා කොට ඇවිදින්නෙහිය. මේ නා රජ්ජුරුවන් විෂ නැති නියාව මා දන්නා සේ මේ ලෝවැස්සන් දනිත්නම් තොපට අක්සුණු පමණකුත් නොලැබෙන්නේ යයි කීහ. එබසට කිපුණු ආලම්බනයා තාපසය මෙතරම් උග්‍ර තේජස් ඇති නා රජ්ජුරුවන්ට නින්දා නොකරව. උන් සමීපයට ගොස් විෂ ඇති නැති නියාව බලව. ඉදින් තා නිර්භීතව ගියෙහි නම් ඇසිල්ලකින් තා අළු මිටක් මෙන් කරතියි කීහ.

ඉක්බිත්තෙන් තාපසයෝ ආලම්බනය මේ නා රජ්ජුරුවන්ගේ විෂ පණුවකුගේ තරම්වත් නැත. මේ අච්චිමුඛී නම් මැඬි පැටියා උග්‍ර විෂ ඇත්තීය. ඇය ලවා තා දෂ්ට කරවමි. මෝ තොමෝ ධ්‍රතරාෂ්ඨ නා රජ්ජුරුවන්ගේ දුවවූ මාගේ නැගණියෝය. මොහොතින් උග්‍ර විෂ පෙන්වමියි කියා මැඩියා අමතා මාගේ අත්ලට එවයි අතදිගු කොට පෑවේය. එවිට මැඬි පැටියා තුන්විටක් මැඬි හඬ නිකුත්කොට මහජනයා බලා සිටියදී තාපසයන්ගේ ජටා මඩුල්ලෙන් එළියට පැමිණ අත්ලට අවුත් විෂ බින්දු තුනක් තපස්වීන්ගේ අත්ලෙහි හෙළා නැවත ජටාව තුළට වන. එවිට තාපසයෝ ඒ විෂ අනිත් අතට ගෙන මුළු ජනපදයමද මේ ජනපදය විශේෂයෙන්මද නසන්නේයයි තුන් විටක් කීහ. ඔවුන්ගේ ශබ්දය දොළොස් යොදුනක් ඈත විහිදී ගියේය. එවිට බරණැස් රජ්ජුරුවෝ කුමක් නිසා ජනපදය නසී දැයි විචාළේය. තාපසයෝ කියන්නේ මහ රජ්ජුරුවන් වහන්ස මේ විෂය ඉසිපිය හැකි තැනක් නොදක්මියි කීය. දරුව පොළව මහත ඒ මේ පොළවෙහි ඉසිපියවයි කී කල්හි නොපිලිවන මහරජ ඉදින් මම මේ විෂ බිමට දැමීම් නම් බිම ඇති තෘෂ්ණලතා ඒකාන්තයෙන් වියලී යන්නාහයි කීය. එසේ නම් දරුව අහසට දමවයි කී කල්හි මහරජතුමණි ඉදින් මේ විෂය අහසට දැමීම් නම් සත් අවුරුද්දක් මුළුල්ලෙහි වැසිනැති වන්නේයයි කීහ. එසේ නම් විෂ දියෙහි ඉසිපියවයි කී කල්හි දියෙහි ඉසපීනම් සියළුම ප්‍රාණීන් වඳවී යන්නාහ. එබැවින් නොපිළිවනැයි කී විට එසේනම් දරුව තෙපිම සුදුසුතැනක් දනුවයි කී කල්හි එසේ නම් මහරජ මේ ස්ථානයෙහි පිළිවෙලින් වල් තුනක් කැනවුව මැනවයි කියා වල් කනවා මාධ්‍යයේ වළ හෛෂද්‍යායෙන් සම්පූර්ණ පුරවා දෙවෙනි වල ගොම වලින් පුරවා තුන්වෙනි වල බෙහෙත් වලින් පුරවා විෂ බින්දු මාධ්‍යයේ වැළලූය. එකෙනෙහි දුම නැගී ගිනි දැල් උඩ නැංගේය. ඒ ගිනි කඳ ගොස් ගොමවළ වැද ඖෂධ නිමවා නිවී ගියේය. ආලම්බනයා ඒ වලට නුදුරු තැන සිටියේ ඒ විෂ උෂ්ණය වැදගෙන සකල ශරීරයෙහි සම ඉපිල ගියේය. ඒ තෙම සුදුකබර ඇත්තෙකු මෙන් වී මරණ භයින් භයපත්ව නා රජ්ජුරුවන් හරිමියි කියා තුන්විටක් කෑ ගැසීය. ඒ හඬ අසා භූරිදත්ත නා රජ්ජුරුවෝ පෙට්ටියෙන් එළියට නික්ම සර්වාභරණයෙන් සැරසුණාවූ දිව්‍යාත්මභාවය මවාගෙන ශක්‍රදේවේන්ද්‍ර ලීලාවෙන් පෙනී සිටියහ. සුදර්ශනයෝත් අච්චිමුඛීත් එතැන්ම සිටියහ. එවිට සුදර්ශනයෝ බරණැස් රජ්ජුරුවන්ට අප හඳුනන්නේ දැයි අසා සමුද්‍රජාවන්ගෙන් පුතුන් නියාව විස්තර කොට කිවුය. එවිට බරණැස් රජ්ජුරුවෝ ඔවුන් තුන්දෙනා වැලඳ ගෙන සිඹ සනහා අඬා වැලප උඩු මහල් තලයට ගොස් භූරිදත්ත නා රජ්ජුරුවන් අමතා පුත මෙතරම් තේජස් ඇති තොපව ආලම්බනයා කෙසේ අල්ලා ගත්තෙහිදැයි විචාල සඳ නා රජ්ජුරුවෝ සියළු විස්තර කොට බරණැස් රජ්ජුරුවන්ට ධර්මදේශනා කොට නාගලෝකයට යෑම සඳහා සමුගත්හ. එවිට බරණැස් රජ්ජුරුවෝ මමද නැගණියන් දකිනු කැමැත්තෙමි. ඇගේ පියා වු කසී රජ්ජුරුවෝ ඈ නැති සොවින් පීඩිතව

SANHIDA LANKA

රාජ්‍යය හැර වල් වැදී පැවිදිව අසවල් වන ලැහැබේ වසන සේකැයි කීහ. එවිට සුදර්ශනයෝ, මයිපණුවන් වහන්ස අපගේ මෑණියන් වහන්සේ ඔබවහන්සේවත් මුත්තනුවන් වහන්සේවත් දක්නා කැමති සේක. එබැවින් අපි මෑණියන් කැටුව මුත්තණුවන්ගේ පන්සලට එන්නෙමි. ඔබද එතනට වැඩිය මැනවයි කියා පිටත්ව ඔවුන් තුන්දෙනා පොළව කිමිද නාගභවනයට ගියහ. භූරිදත්ත නා රජ්ජුරුවන් මසක් මුළුල්ලෙහි බොහෝ පීඩා විදි බැවින් ගිලන්ව වැද හොත්තාහුය. සැප දුක් බැලීමට එන නා රජුන්ගේ ප්‍රමාණයෙක් නැත. දිව්‍යලෝකයට ගිය කණාරීඨයෝ භූරිදත්ත නා රජ්ජුරුවන් නොදැක නාගභවනයට අවුය. සුභගයෝත් හිමාලවනය පරීක්ෂාකර පෙරලා අතරමග එමින් සිටියහ. එකල්හි නෙසාද බ්‍රාහ්මණයා කුෂ්ඨ රෝගයෙන් පීඩිත වූ ආලම ධනයා දැක සිතන්නේ නා රජ්ජුරුවන්ට පීඩා කොට මොහු කුෂ්ට රෝගයෙන් විරූපී විය. මටද බොහෝ උපකාරකළ ඒ නා රජ්ජුරුවන්ව මොහුට පෙන්වීමෙන් මමද බොහෝ අකුසල් සිදුකර ගතිමි. මේ පාපය මා කරා ඒමට පෙර යමුනා ගංගාවට ගොස් පව් සෝදා හරිමියි කියා වහා එහි ගොස් දියෙහි ගිලිගිලී තමාකළ වරද කියමින් උන්නේය. ඒ අසලින් ගිය සුමුගයෝ  ඔහුගේ වචන අසා මෙතරම් උපකාර කළ මාගේ සහෝදරයාට මොහු කළ අපරාධයට පළිගනිමියි දියයටින් අවුත් ඔහුගේ කකුල් නගුටින් වෙලා දියඹට ඇද හුස්ම හිරවීමට ප්‍රථම නැවත බුරුල් කොට නැවත නැවතත් යටට අදිමින් පීඩා කළහ. වරක් හිස උඩට ආ ඔහු කියන්නේ පව් සෝදා දමා පියා සැනසෙමියි ආ මා කවර සත්වයෙක් අනුභව කරන්නට අල්වා ගත්දැයි බැගෑපත්ව කීය. එවිට සුභගයෝ නේසාද බමුණ මම වනාහි මුළු බරණැස් නුවරම සත්වයින්ට භය ඉපිදවූ මහ තේජස් ඇති ධ්‍රතරාෂ්ඨ නම් නා රජ්ජුරුවන්ගේ පුත්‍ර සුභග නා රජ වෙමියි කීය. එවිට නේසාදයා සිතන්නේ මොහු භූරිදත්ත නා රජ්ජුරුවන්ගේ බෑයෝය. එබැවින් මට අද ගැලවීමක් නොවන්නේයයි මුන්ගේ දෙමව්පියන්ගේ ගුණ කියා හිත මොළොක් කොට ජීවිතය ලබා ගන්නෙමියි සිතා මව්පියන් වර්ණනා කොට මෙබඳු ශ්‍රේෂ්ඨ දරු මුණුපුරුව සිටියාවූ කෙනෙක් මා වැනි දාසයකු දියෙහි ගිල්වා මරන්ට සුදුසු නොවේයයි ජීවිත දානය ඉල්වූයේය. එවිට සුභගයෝ දුෂ්ට බමුණ තෝ මා වංචාකොට මිදෙමියි නොසිතව තාගේ දිවි නොදෙමියි භූරිදත්ත නා රජ්ජුරුවන්ගේ මාර්ගයෙන් නාග භවනයෙහි විදි සම්පත් සිහි කරවා තා කළ මිත්‍රද්‍රෝහී කර්මය දැන් තොට පල දෙවන්නෙමියි කීය. එවිට නේසාදයා මොහු උපායකින් රවටා ගැලවෙමියි සිතා ඔහු අමතා නා රජතුමෙනි ත්‍රිවේදය දත් දක්ෂිනාර්ඝ වු බ්‍රාහ්මණයන් මැරීමෙන් තොපට නරකය අත් වන්නේය. එබැවින් එසේ නොකරනු මැනවයි කීය. එවිට සුභගයෝ සැකයට පත්ව මොහු නාග භවනයට ගෙන ගොස් බෑයන් අතින් විචාරා මෝහට කලමනා දෙය දන්නෙම් වේදැයි බොටුයෙන් අල්ලා ගෙන භූරිදත්ත රජ්ජුරුවන් වසන මාළිගා දොරට ගෙන ගියහ.

එකල්හි දොරටුව රකිමින් සිටි කණාරීඨයෝ බොටුව අල්ලගෙන එන බමුණාදැක පෙරමගට ගොස් සුභගයෙනි නොමරව බමුණෝ මහාබ්‍රහ්මයාගේ දරුවෝය. ඉදින් මහබ්‍රහ්මයා දත්තේ නම් කිපී සියළු නාග භවනය නසා පියන්නේයයි තමාත් පෙර අත් බැව්හි බ්‍රාහ්මණයෙක්ව ඉපිද යාග කළ පුරුද්ද නිසා බ්‍රාහ්මණයාගේ ගුණ වර්ණනා කොට මේ ලෝකය කවුරු විසින් මවන ලද්දැයි විචාරා නොදනිමියි කී කල්හි මහා බ්‍රහ්මයා විසින් ලෝකය නිර්මිත කළ අයුරු දක්වන්නේ පළමුකොට බමුණන් ආදී වූ චතුර්වර්ණයන් මවා ආයතිවූ බ්‍රාහ්මණයන්ට තෙපි වෙද මන්ත්‍ර හදාරව අන් කිසිවක් නොකරවයිද රජ දරුවන්ට පොළව ජය ගෙන අනුශාසනා කරවයිද වෙළඳුන්ට කෘෂිවණික්  ආදිය කරවයිද ශූද්‍රයන්ට ඉහතකී තුන් පක්ෂයේ ඇත්තන්ට අත්පා මෙහෙවර කරවයිද සම්මතකොට විධානය කළේය. ඔවුන් අතුරෙන් බ්‍රාහ්මණයන් ශ්‍රේෂ්ඨයහ. එබැවින් බ්‍රාහ්මණයින්ට දන්දීමෙන් වැදීමෙන් පිදීමෙන් සුගතිගාමී වන්නේය.මුචලින්ද, දුදිප, සාගර, අඟු ආදි රජවරු බ්‍රාහ්මණයන්ට පූජා කොට යාග හෝම පවත්වා දිව්‍යලෝකයේ ගිය සැටි විස්තර වශයෙන් දක්වා සුභගය හිමාලය ආදී මහා පර්වත මැවුන හැටි දන්නෙහිදැයි අසා නැතැයි කී කල එසේ නම් අසව පෙර බරණැස් නුවර එක් රජකෙනෙක් බමුණන් අතින් දෙව්ලෝ යන්ට මන් විචාරා දන්දී හිඳීමට ආසන ගල් උළු වලින් බැඳ කරවා දුන්හ. ඒ ආසන පීඨිකාවෝ බමුණන්ගේ ආනුභාවයෙන් වැඩී හිමාලය පර්වතය ගිජ්ඣකූට පර්වතය, සුදර්ශන පර්වතය, නිසභ පර්වතය, කා කනේරු පර්වතය ආදී පර්වත වූහ.

තවද සුභගයෙනි සමුද්‍රය කවර කාරණයකින් ලවන රසයෙන් යුක්තවීද තොප දන්නෙහිදැයි විචාරා නැතැයි කී කල තෙපි බමුණන් මරන්ට මිස මේවා නොදන්නේයයි නින්දා කොට කියන්නේ බමුණෙක් එක් දවසක් පව් සෝදා හරිනු සඳහා ගොඩ සිට මුහුදෙන් පැන්ගෙන තමාගේ ඇඟට දමදමා ජලස්නානය කරන්නේය. ඒ අතර මහ රැළක් අවුත් බමුණාව මුහුදට ගසා ගෙන ගොස් මුහුදු බත් විය. මේ දුටු මහා බ්‍රහ්මයා අතිශයින් කිපුනේ පානය කල නොහැකි වන සේ මුහුදෙහි ජලය ලුණු රස වේවායි අධිෂ්ඨාන කළේයයි තවතවත් බමුණනුත් යාගයත් වර්ණනා කොට කිවුය.

ඒ කණාරීඨයන්ගේ සියළු කතා අසා සිටි බොහෝ නාගයෝ මේ කතා සත්‍යමයයි මිත්‍යා දෘෂ්ඨිගත් අයුරු දැක්වූහ. භූරිදත්ත නා රජ්ජුරුවෝද මේ සියල්ල අසමින් ගිලන් ඇඳ මත වැතිරී සිතන්නේ මේ කණාරීඨයෝ මිත්‍යා මාර්ගය වර්ණනා කෙරෙති. එබැවින් උන්ගේ වාදය බිඳ නා පිරිස සම්‍යක් දෘෂ්ටි කෙරෙමියි සිතා යහනින් නැගිට ධර්මාසනයෙහි වැඩ හිඳ සියළු පිරිස කැඳවා යාග හෝම, වේද , මන්ත්‍ර කිරීමේ නිසරු බව

SANHIDA LANKA

පෙන්නා කර්මාන්ත කිරීමට ප්‍රයෝජන ගන්නා ගින්න දෙවියෙක් කොට සිතා පුදා දෙව්ලොව යා නොහැකි බව දන්වා ඔවුන්ගේ වැරදි මත දුරුකළ සේක. තවද ධර්මදේශනා කරන්නේ මහා බ්‍රහ්මයා මෙලොව මැවූ සේක්නම් ලෝවැස්සන් කුමක් නිසා ප්‍රාණඝාතාදී අකුශල ධර්ම හා එක් කොට මැවූ සේක්ද? එසේ නම් ඔහු අධර්මිෂ්ඨයෙකි. සතුන් බිළිදී තමා පිරිසිදු වෙතියි කියති. ඒ වැරදි හැඟීමකි. බමුණන්ගේ බස් මුළාවකියි මෙසේ නොයෙක් අයුරින් කණාරිඨයන්ගේ මිථ්‍යාවාදයන් බිඳ තම මතයෙහි පිහිටවූහ. භූරිදත්ත නා රජුන්ගේ ධර්ම කතාව අසා සිටි නාග පිරිස සොම්නසට පැමිණියහ. නෙසාද බමුණාට කිසිදු ගැහැටක් නොකොට මනුෂ්‍ය ලෝකයට ලැවූහ.
සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් පළමු නියම කරගත් පරිදි සිව් සේනාවෙන් යුතුව තපස්වීව සිටි රජ්ජුරුවන් සමීපයට ගියහ. භූරිදත්ත නා රජ්ජුරුවෝද මල්බෑයන් හා දෙමව්පියන් සමඟ තම මුත්තණුවන් හා මයිලණුවන් බැලීමට යමුනා නම් වූ ගංගාවෙන් උඩ නැගී පන්සල බලා ගොස් ඔවුනොවුන් හමුව අඬා වැලපා ප්‍රීතිවී නික්ම නැවත නාග භවනයට වන්හ. සමුද්‍රජාවෝ නොබෝ දිනකින් නාග භවනයෙහිදී සවර්ගස්ථ වූහ. භූරිදත්ත නා රජ්ජුරුවෝ දිවි පමණින් සිල් රැක ස්වර්ග ලෝකයෙහි උපන්හ.
එසමයෙහි දෙමවුපියෝ නම් දැන් සුද්ධෝදන රජු හා මහාමායා දේවිය. නේසාද බමුණා නම් දෙව්දත් තෙරුන්ය. සෝමදත්තයෝ නම් ආනන්ද තෙරුන්ය. අච්චිමුඛී නම් උත්පලවර්ණා මහා ස්ථවීරිය. සුදර්ශන, සුභග, කණාරිඨ යන නා රජවරු පිළිවෙලින් සැරියුත්, මුගලන් අගසව් දෙනම හා සුනක්ඛත්ත ලිච්ඡවී පුත්‍රවිය. භූරිදත්ත නා රජ්ජුරුවෝ නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# විධුර ජාතකය

සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරන සේක්. බුදුන්ගේ ප්‍රඥාව ගැන භික්ෂූන් අතර උපන් කථාවක් අරභයා මේ ජාතකය වදාළ සේක.

ආරාධනය :- භික්ෂූන් වහන්සේලා

ජාතක කථාව :- යටගිය දවස කුරුරට ඉඳිපත් නුවර ධනඤ්ජය කොරව්‍ය රජු දශරාජ ධර්මයෙන් රාජ්‍ය කරන කල්හි විධුර පණ්ඩිත නම් ආමාත්‍යයෙක් ඒ රජුට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නේය. හේ මහා නුවණැතිය. ධර්ම කථිකය. සර්වඥ විලාශයෙන් මහා ජනයාට ධර්මදේශනා කරමින් යසශ්‍රී විඳිමින් වාසය කරන්නේය.
එසමයෙහි බරණැස් නුවර බමුණු මහසල් කුලෙහි උපන්නාවූ බ්‍රාහ්මණයෝ සතර දෙනෙක් හිමාල වනයට වැද පැවිදිව සමාපත්ති උපදවා වන මුල් පලාඵල අනුභව කරමින් එහි ගොස් බොහෝකල් වැස ලුණු ඇඹුල් සෙවුනා පිණිස සැරි සරා ඇවිදිනාහු අඟුරට කාලචම්පා නම් නුවරට පැමිණ දෙවන දවස් පිඬු සිඟා වන්හ. එනුවර යහළු කෙළෙඹි පුත්‍රයෝ සතර දෙනෙක් ඒ තාපසයන් සතර දෙනා කෙරෙහි පැහැදී තම තමන්ගේ ගෙවලට වැඩමවා නිති දන් දෙන්නාහ. තාපසයන් වහන්සේලා ඒ ගෙවල දන් වළඳා දිවා විහරණය පිණිස කෙනෙක් තව්තිසා දිව්‍යලෝකයටද කෙනෙක් නාග භවනයටද කෙනෙක් ගරුඬ භවනයටද කෙනෙක් ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන්ගේ මහා රුචි නම් උද්‍යානයටද යන්නාහ. පසුවදා දන් වැළඳීම පැමිණි විට තමාගිය දිව්‍යලෝකාදී තන්හි දුටු විසිතුරු ඒ දායකයන්ට පවසන්නාහ.
එබස් අසා කෙළෙඹි පුත්‍රයෝ සතර දෙනම ඒ ඒ තැන් පතා දානාදී පින්කම් කොට ආයු කෙළවර මිය ගොස් කෙනෙක් ශක්‍රදේවේන්ද්‍රවද කෙනෙක් නාග භවනෙහිද කෙනෙක් ගුරුළු භවනෙහි ගුරුළු රාජවද කෙනෙක් ධනඤ්ජය කොරව්‍ය රජුගේ අග බිසව කුසද පිළිසිඳ ගත්තාහ. තාපසයෝ සතරදෙන බ්‍රහ්ම ලෝකයෙහි උපන්හ. කොරව්‍ය කුමාරයෝ මව් කුසින් බිහිව වැඩිවිය පැමිණ රාජ්‍යයට පත්ව විධුර පණ්ඩිතයන්ගේ අවවාදයෙහි පිහිටා දන් දෙති. සිල් රකිති. පෙහෙවස් වෙසෙති.
දිනක් රජ්ජුරුවෝ උපෝසථ සීලය සමාදන්ව උයනට වැද භාවනා කළහ. ශක්‍ර දේවේන්ද්‍රයෝත්, ගරුඬ රජ්ජුරුවෝත්, නා රජ්ජුරුවෝත් සමාදන් වූ පෙහෙවස් ඇත්තේ තම තමන් සිටින තැන් පලිබොධ බැවින් විවේකව සිල් රැකීමට එම උයනට වෙන වෙනම පැමිණ මහණදම් පුරා දිනක් සවස් වේලේ පොකුණු තෙරදී සතර දෙනම එක්තැන් වූවාහු පූර්ව ස්නේහ වශයෙන් සතුටු සාමීචිව කථාකොට මගුල් සල්වට මත්තේ උන්නාහු අප සතර දෙනාගෙන් කවරෙකුගේ ශීලය ශ්‍රේෂ්ඨ දැයි ඔවුන් අතර විවාදයක් උපන් කල්හි වරුණ නා රජ්ජුරුවෝ කියන්නේ මා අසළින් සිටින ගරුඬ රජ්ජුරුවෝ වූ කලී සෑම කල්හිම අපට විරුද්ධව සිටියාහ. අපගේ ජීවිත විනාශ කරන්නා වූ පස මිතුරා දැක දැකත් කෝප නොකර සිල් ආරක්ෂා කළ බැවින් මාගේ ශීලය උතුම්යයි කීහ.
එබස් අසා ගරුඬ රජ්ජුරුවෝ කියන්නාහු මේ නා රජ්ජුරුවෝ මට අග්‍ර භොජනව සිටියදීත් ක්ෂුධාව ඉවසාගෙන ශීලය ආරක්ෂා කෙළෙමි. එබැවින් මාගේ ශීලය ශ්‍රේෂ්ට යයි කීහ.
ඉක්බිත්තෙන් ශක්‍ර දේවේන්ද්‍රයෝ කියන්නාහු මම වූ කලී සියළු සුරසැප අතහැර සිල් රැකීමට මිනිස් ලොවට ආමි. එබැවින් මාගේ ශීලය මහතැයි වර්ණනා කළහ.
එවිට ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ මම වස්තුකාමය හා සොළොස් දහසක් නාටක ස්ත්‍රීන්ගෙන් සම්පූර්ණ වූ අන්තඃපුරය හැර මහණදම් කෙරෙමි. මේ කාරණයෙන් මාගේ සීලය උතුම්යයි කීහ. මෙසේ ඔහු හැම දෙනම තම තමන්ගේ සීලය මහතැයි වර්ණනාකර කොරව්‍ය රජ්ජුරුවෝ අතින් විචාරන්නාහු රජ්ජුරුවෙනි යමෙක් අපේ සැකය දුරුකරන්නේ නම් එබඳු පණ්ඩිතයෙක් සමීපයට යමු යයි කීහ. එවිට රජ්ජුරුවෝ එසේ නම් රජදරුවෙනි මට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාවූ ප්‍රඥාවන් සමුදුර හා සමාන වූ විධුර නම් පණ්ඩිත කෙනෙක් ඇත. ඔහු අපේ සැකය දුරු කරන්නාහ. එබැවින් උන් සමීපයට යමුයයි කීහ.
ඉක්බිත්තෙන් ඔහු සතරදෙනම උයනින් ධර්ම සභා මණ්ඩපයට ගොස් විධුර පණ්ඩිතයන් සමග පිළිසඳර කතා කොට උතුම් පර්‍යංකයක වඩා හිඳුවා අපට සංකාවෙක් උපන. එය දුරුකරවයි තම තමන් සිත්තුළ උපන් සැකය කීහ. එවිට විධුර පණ්ඩිතයෝ කියන්නාහු රාජෙන්ද්‍රයෙනි තොප හැමගේ ශීලයෙහි වටිනාකම දැන් තොප විසින් කියන ලදහ. කී නියාත් යහපත. තොප සතරදෙනාගේම ශීලය එක හා සමානවම උසස්යයි කීහ.
එබස් අසා සතුටු වූ සතර දෙනා තොප වැනි උත්තරීතර කෙනෙක් ලෝකයෙහි නැති හෙයින් නිරුත්තරයයි ස්තුති කොට ශක්‍ර දේවේන්ද්‍රයෝ දිවහුලකින්ද, ගුරුළු රජ්ජුරුවෝ රන්මාලාවකින්ද වරුණ නා රජ්ජුරුවෝ කණ්ඨ මාණික්‍යයෙන්ද කොරව්‍ය රජ්ජුරුවෝ ගවයන් දහසක්ද ඇතෙකුද අජානීය සෛධව අශ්වයන් යොදන ලද රථ දහසක්ද ගම්වර සොළොසක්ද පූජා පිණිස දී ගියහ.

SANHIDA LANKA

නා ලොවට ගිය වරුණ රජ්ජුරුවන්ගේ භාර්‍යාවවූ විමලා බිසව රජ්ජුරුවන්ගේ කර පළඳනා වූ කණ්ඨ මාණික්‍ය නොදැක එය කොයිදැයි විචාළාය. එවිට වරුණ නා රජ්ජුරුවෝ විධුර පණ්ඩිතයන් ගැන සියල්ල කියා සොඳුර එම පණ්ඩිතයන්ගේ ධර්‍ම කථාවෙන් ප්‍රසන්නවූ මම කණ්ඨ මාණික්‍යයෙන් පූජා කෙළෙමියි කීය. විමලා බිසව විධුර පණ්ඩිතයන්ගේ ගුණ කථාව අසා ප්‍රමුදිත වූයේ ධර්‍මය අසනු කැමතිව සිතන්නී මම පණ්ඩිතයන් මෙහි කැඳවා ගෙන එවයි කියු නම් එය සිදු නොවෙයි. එබැවින් මට දොළක් උපනැයි ගිලන් ආකාරය දැක්වීනම් යහපතැයි සිතා එපවත් පරිවාර ස්ත්‍රීන්ට කියා වැද හොත්තීය. නා රජ්ජුරුවෝ පැමිණ විචාරා විමලාවෝ ගිලන්සේකැයි කී කල්හි වහා එතනට ගොස් විමලාවෙනි තොපගේ ශරීරයට පීඩා ගෙන දෙන රෝගය කුමක්දැයි විචාළහ. එවිට විමලාවෝ කියන්නාහු රජ්ජුරුවන් වහන්ස ස්ත්‍රීන්ට දොළ නම් ස්වභාවයකි. එහෙයින් විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශය ප්‍රාර්ථනා කරමි. එය ලබන්නාවූ මම ජීවත්වෙමි. නැත්නම් දිවි නොතිබේයයි කීහ. නා රජ්ජුරුවෝ එබසට කියන්නාහු විමලාවෙනි තෙපි කිසිවක් හු විසින් ලැබගත නෙහැක්කා වූ විධුර පණ්ඩිතයන් ගෙනෙන්නා දැක්මටවත් අපහසු වන්නේය. දඹදිව සියළු රජදරුවෝ ඔහුට රැකවරණ එලවා ඇත. එබැවින් කෙසේ එය කරමෝදැයි කීහ. විමලාවෝ එබස් අසා එසේනම් මට මෙතනම මරණය වන්නේයයි යහනේ පෙරළී සළුකොනින් මුහුණ වසා ගෙන වැදහොත්තීය.

එකල්හි නා රජ්ජුරුවෝ තමන්ගේ ශ්‍රීයහන් ගබඩාවට වැද මෙය කෙසේ කරමෝදැයි සිතමින් කල්යැවූහ. එවිට ඒ රජ්ජුරුවන්ගේ දූ වූ ඉරන්දතී නම් නාග කන්‍යාව සර්‍වාභරණයෙන් සැරසී පියා දක්නට අවුත් වැඳ එකත්පස්ව සිට දොම්නස් වූ කාරණා කිම්දැයි විචාරා මෑණියන්ගේ දොළදුක සංසිඳවී මෙහි ලා පියා සිතමින් කල්යවන බව දැන ඔහු අස්වසා මෑණියන් වසන තැනට ගොස් සර්‍වාභරණයෙන් සැරසී එම රාත්‍රීයෙහි නාගභවනයෙන් නික්ම හිමාල වනය අසල සමුද්‍ර තීරයෙහි පිහිටියාවූ සැට යොදුන් උසැති කාලගිරි නම්වූ අඤ්ජන ගිරි පර්‍වතයට ගොස් එය මලින් සරසා ගෙන ඒ මතට වී ගී ගයමින් උන්නීය.

වෙසවුණු රජ්ජුරුවන්ගේ බෑණනුවූ පූර්ණක නම් යක්ෂ සේනාධිපති තෙම සෛන්ධවයකු පිට නැගී යක්ෂ සමාගමට ඒ අසලින් යන්නේ ඉරන්දතියගේ ගීත ශබ්දය ඇසී පෙර ආත්මයක තම භාර්‍යාව වූ ඇගේ ගීතිකා ශබ්දය ඇසී පෙර ආත්මයක තම භාර්‍යාව වූ ඇගේ ගීතිකා ශබ්දය තම ඡවි ආදිය විනිවිද ගොස් ඇට මිදුළු පැහැර සිටියේය. ඔහු ඈ පිළිබඳව සිත් ඇතිව සෛන්ධවයා පිට සිටම ඇගෙන් සියළු විස්තර අසා දැන සොඳුර මම මාගේ ප්‍රඥායෙන් දැහැමින් සෙමින් විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශය ගෙනෙන්නට සමර්ථයෙමි. තී ශෝක නොකරව බය නොසිතව මම තිට ස්වාමීවෙමි. තී මට භාර්‍යාව වන්නෙහිදැයි අසා ඒ කන්‍යාව අසුපිට ඉඳුවා ගෙන යමියි සිතා ඈ අල්වා ගන්නට අත දික් කළේය. ඕ තොමෝ තම අත අල්වා ගැනීමට නොදී පෙර ජාතියෙහි ස්වාමීවූ ඔහු කෙරෙහි ස්නේහයෙන් ඔහුගේ අත අල්වාගෙන මම අනාථ අසරණියක් නොවෙමි. මා පියාණෝ නා රජ්ජුරුවෝය. මෑණියෝ විමලා නම් බිසව්ය. එබැවින් මාගේ පියා සමීපයට දෙදෙනාම යම්හ. ඔහුගේ තීරණය අනුව අපි එක්වෙමුයි කියා පිය රජ්ජුරුවන් සමීපයට ගොස් නා රජ්ජුරුවන් වහන්ස. මේ ඉරන්දතී නම් නාග කන්‍යාව තමා හිමිකොට දෙව. නා රජ්ජුරුවෙනි තොපට පඬුරු පිණිස ඇතුන් සියයක්ද අසුන් සියයක්ද, රථ සියයක්ද, සර්‍ව රත්නයන්ගෙන් පූර්ණ වූ ගබඩා සියයක්ද දෙන්නෙමියි කීහ.

ඉක්බිත්තෙන් නා රජ්ජුරුවෝ යක්ෂ සේනාධිපතිය මම තට ඉරන්දතිය පාවා දෙමි. මදක් ඉවසවයි කියා ඔහු පිටත නවතා විමලා බිසව ළඟට ගොස් මේ පුවත කියා මේ වස්තු ලාභය ගෙන අපගේ ප්‍රිය වූ දියණිය ඕහට භාර්‍යාව කොට පාවා දෙමෝදැයි විචාළහ. එබස් ඇසූ විමලාදේවී කියන්නේ නා රජතුමනි ඉරන්දතිය වස්තුව නිසා පාවා නොදෙමු. ඉදින් විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශය ගෙනාවොත් ඈ පාවාදෙමු යයි කීය. නා රජ්ජුරුවෝ නැවත පූර්ණිකයා ළඟට පැමිණ යක්ෂ සේනාපතිය අපගේ දුව වස්තුව නිසා ලබා නොගත හැක. කුරුරට වාසීවූ ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුරුවන්ගේ ප්‍රඥාවෙන් මහත්වූ විධුර පණ්ඩිත නම් අමාත්‍යයෙක් ඇත. ඒ විධුර පණ්ඩිතයන් දැහැමින් ලැබ අප කරා ගෙනව. එවිට තොප මෝතොම පාදපරිචාරිකා වන්නීයයි කීහ. එවිට පූර්ණකයා විශේෂයෙන් ප්‍රීතිමත් වූයේ මනාකොට සැරසී සෛන්ධව අශ්වයෙකු පිටට පැන නැගී අහසින් ගොස් වෛසාණ නම් රාජධානියට නායක කුවෙර නම් රජ්ජුරුවන් සමීපයට ලංවී වරුණ නම් නා රජ්ජුරුවන්ව සහ නාග භවන වර්ණනා කොට මහ රජ්ජුරුවන් වහන්ස ඔහුගේ දියණිය වූ ඉරන්දතිය මට පාවාදීමට පොරොන්දු විය. මට යාමට අවසර දෙවයි කීය. වෙසවුණු රජ්ජුරුවන් වහන්සේ ඔහුගේ කථාවට සවන් නොදී දිව්‍ය පුත්‍රයන් දෙදෙනෙකුගේ යුක්තියක් පසිඳමින් සිට නිවැරදිකරු වූ දිව්‍ය පුත්‍රයන් අමතා තොප තොපගේ විමානයෙහි වසවයි නියෝග කළේය. මෙතෙක් යාමට අවසරගත නොහැකිව ලතවෙමින් සිටි පූර්ණකයා කුවේර රජ්ජුරුවන් වහන්සේ තමාට යාමට කීබව හැම දෙනම දනුවයි සෙසු දිව්‍ය පුත්‍රයන් ශාක්ෂි වශයෙන් තබා අශ්වයා පිට නැගී අහසින් යමින් සිට සිතන්නේ විධුර පණ්ඩිතයෝ මහත් පිරිවර ඇත්තාහ. එබැවින් උන් බලෙන් අල්වා ගන්ට නොපිළිවන ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ වූකලි දූ කෙළියෙහි අභිලාශ ඇත්තෝය. ඒ හෙයින් උන් කැටුව තරඟ කොට රජ්ජුරුවන් දූ කෙළියෙන් පරදවා මම ජය ගෙන විදුර පණ්ඩිතයන් ගනිමි. ඔහුගේ භාණ්ඩාගාරයේ බොහෝ රුවන් ඇත. ඊට වඩා වටිනා රත්නයක්

SANHIDA LANKA

ඔට්ටු කොට දූ කෙළිය යුතු වන්නේය. රජගහ නුවර සමීපයෙහි වූ වේපුල්ල පර්වතාභ්‍යන්තරයෙහි චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ පරිභෝගයට සුදුසු මැණිකක් ඇත. ඒ බලසම්පන්න වූ මැණික ගෙන රජ්ජුරුවන් පොළඹවා ජය ගනිමියි සිතා මැණික ලබා ගැනීමට යක්ෂ කුම්භාණ්ඩයන් ලක්ෂයක් පිරිවරා එය ආරක්ෂා කරමින් සිටි කුම්භීර නම් යක්ෂයා ලඟට ගොස් කිපී ඔරවා ඔහු දෙස බලා පලවාහැර විදුලියක් මෙන් බබලමින් තිබූ හිතු පැතු කැමති වස්තු එලවන්නා වූ ඒ මනොහර නම් වූ මාණික්‍ය රත්නය ගෙන කුරුරට ඉඳිපත් නුවරට ගොස් අසු පිටින් බැස අසු නොපෙනෙන පරිද්දෙන් සිටුවා රජ දරුවන්ගේ සමීපයට මානවක වෙසින් ගොස් නිර්භීතව එහි උන් සියයක් රජ දරුවන් සූදු ක්‍රීඩාවට කැඳවීය.

ඉක්බිති කොරව්‍ය රජ්ජුරුවෝ, මා විසින් මීට පළමු මෙසේ නිර්භීතව කියන්නාවූ එකක්හු දුටුවිරූ නැත. මොහු කවරෙක්දැයි සිතා මානවකයා තාගේ රට කොයිද? තා පිළිබඳ තතු වහා කියවයි කීය. පූර්ණකයයි කියා දාසයන්ට කමක් වන්නේය. ඉදින් මම ඒ නම කීයේ නම් මට නින්දා කොට හෙළා දක්නා හෙයින් මම පෙර අත්බැව්හි නම කියමියි සිතා කෘත්‍යායන නම් මානවකයෙක් වෙමි. අනූන කියාත් ඥාති මිත්‍රයෝ මා කැඳවන්නාහ. මගේ බන්ධුහු අඟුරට කාලචම්පා නුවර වසන්නාහ. සූදු ක්‍රීඩාවෙහි කැමැත්තෙන් මෙහි ආමියි කීය. එවිට රජ්ජුරුවෝ මානවකය තෝ කෙළියෙහි පැරදුනහොත් කුමක්දෙද්ද? තාගේ කෙබඳු වස්තුවෙක් ඇද්දැයි විචාළහ. ඉක්බිත්තෙන් පූර්ණකයා කියන්නේ මහ රජතුමනි මා ළඟ මැණිකක් ඇත. ඒ මැණික සිතුපැතු සම්පත් දෙන හෙයින් මනොහර නමි. එසේම සතුන් පරාජය කිරීමෙහි දක්ෂ අජානීය අශ්ව රත්නයක්ද ඇත. මේ වස්තු දෙක මා ඔට්ටුවට තබා දූ කෙළින්නේය. මා පරදවා හැකිනම් ඒවා ගන්නැයි කීය. එවිට රජ්ජුරුවෝ, මානවකයා තාගේ ඒ වස්තු දෙක කවර අර්ථයෙක් සිද්ධ කොට පියන්ට සමර්ථදැයි ඇසීය. රජ්ජුරුවන් වහන්ස කුමක් කියන සේක්ද? මේ එක අශ්වයා අසුන් දහසකටත් වඩා වටින්නේය. මේ එක් මැණික මැණික් දහසකටත් වඩා අගනේය. බැලුව මැනවයි කියා අසුපිටට පැන නැගී පවුරසේ සිටින්නට අසුන් විහිදුවූයේය. සත් යොදුනක් පමණ ඉඳිපත් නුවර වටේ අශ්වයන් පෙළක් දුවන්නාක් මෙන් විය. ඉක්බිති අශ්වයාත් නොපෙනී බඳවට බැඳි රන්පට පමණක් වට ඇඳි රේඛාවක් මෙන් දිස්විය. එවිට පූර්ණකයා අසුපිටින් බැස මහ රජ්ජුරුවන් වහන්ස අශ්වයාගේ ජව දුටුසේක්දැයි කීය. එසේය දුටිමි කී කල්හි පොකුණෙහි දිය පිට කුර පමණවත් නොතෙමෙන සේ විහිදුවිය. දෙවනු පියුම්පත් මත්තේ ඇවිදුවා අත්ලෙන් අත්ල ගසා අත දික් කළේය. එකල අශ්වයා අවුත් සතර කුරෙන් අත්ලෙහි සිටියේය. අනතුරුව පූර්ණකයා රජ්ජුරුවන් ලඟට පැමිණ රජතුමනි අශ්වරත්නයේ අගය දුටුදැයි අසා මාණික්‍ය රත්නයේ ආනුභාවය බලනු මැනව මහරජාණන් වහන්ස අලංකාර ස්ත්‍රී පුරුෂ රූප නොයෙක් මෘග පක්ෂි සමූහයාගේ සටහන් දිව්‍යලෝකය සහ නාගලෝකාදිය මේ මාණික්‍ය රත්නයෙන් මැවී පෙනෙයි. බළා වඳාල මැනව තවද රජතුමනි තමන්ට උවමනා කරන ගම් නියම්ගම් රාජධානි බැළුව මැනවි. අනේක ප්‍රකාර ගංගා, ඇල, දොල, වැව්, පොකුණු බලා ප්‍රීතිවනු මැනව මමවූ කලි දූ කෙළියෙන් පැරැද්දේ වීනම් මේ මාණික්‍ය දෙමි. නුඹ වහන්සේ කුමක් දෙන සේක්දැයි කීය. දරුව මාගේ ශරීරයත් ධවලචත්‍රයත් හැර සෙසු මා සන්තක සියල්ලම දෙමියි කිවුය. එවිට පූර්ණකයා එසේ නම් මහරජතුමනි කල් නොයවනු මැනවයි කීය. රජ්ජුරුවෝ එපවත් අසා අමාත්‍යයන්ට සූදු ක්‍රීඩා ශාලාව සරසා අසුන් පනවන්නට විධානය කොට දෙදෙනාම එම ශාලාවට ගොස් රජදරුවන් පිරිවරා වාඩිවූහ.

ඉක්බිති පූර්ණකයා අයුක්තියක් නොවන සේ ශූරසේන, මච්ච, මද්‍ර, කෙක යන රජ දරුවන් සහ අමාත්‍යයන් අමතා රාජසභාවෙහි උන් ඔබ හැම දෙනෙක්ම ඇසූ දුටු යුක්තිය පක්ෂපාත නොවී මධ්‍යස්ථව කිවයුතු යයි රජදරුවන් දෙස්ගන්වා දූ පෝරුවෙහි රන්පස ඇට තබා රජතුමනි පස ඇටයෙහි අයනම් මලියය, සාවටය, බහුලය, සන්නිභද්‍රය යනාදී විස්සක් අය ඇත. එබඳු අයින් ඔබ වහන්සේට කැමති අයක් ගත මැනවයි කීය. රජ්ජුරුවෝ යහපතැයි බහුල නම් අය ගත්හ. පූර්ණයා සාවටය නම් අය ගත්හ. පූර්ණකයාගේ ඉල්ලීම පිට ප්‍රථමවාරයෙහි රජ්ජුරුවෝ පස ඇට දැමූහ. රජ්ජුරුවන්ගේ තුන්වැනි ආත්මභාවයෙහි මැණියෝ දේවතා දුවක්ව සිටින්නී ඇගේ ආනුභාවයෙන් රජ්ජුරුවෝ දූ කෙළියෙහි ජය ගත්තාහ. ඈ රජ්ජුරුවන්ට නුදුරින් සිටින්නීය. රජ්ජුරුවෝ ඈ සිහිකොට කථ වයස්සාරය තුන භාසය යනාදීන් අභිමත ද්‍යූත ගීතිකාවක් කියමින් පස ඇට ගෙන අහසට දැමූයේ තෙවරක්ම තමාට පරාජය වන ලකුණු දැක අහසෙහිදීම එය අල්ලා නැවතත් දැමීය. පූර්ණකයා මෙම රහස දැක බලන්නේ දේවතා දුව දැක ඔරවාපීය. ඈ සක්වල ගල මුදුනට පලා ගොස් වෙවුලා වෙවුලා සිටියාය.

SANHIDA LANKA

රජ්ජුරුවෝ එපවත් නොදැක නැවතත් ක්‍රීඩා කරන්නේ පරාජයටම පත්කරවමින් පසඇට දූ පෝරුවෙහි වැටින. එවිට පූර්ණකයා මහත්වූ ශබ්දයෙන් අත්පොළසන්දී ජය ගතිමි, ජය ගතිමි කියා තුන් විටක් හඬ ගැසුයේය. ඒ ශබ්දය සියළු දසදහසක් යොදුන් දඹදිව පැතිර ගියේය. රජ්ජුරුවෝ නොසතුටු සිත් ඇතිවූහ.

පූර්ණකයා රජ්ජුරුවන් අස්වසා මහ රජතුමනි ජය පරාජය ගැන කණගාටු නොවිය යුතුයි. දැන් ඔබ වහන්සේ ධනයෙන් පිරිහුණසේක. එබැවින් මට වහාම ජය පඬුරු දුන මැනවයි කීය. එවිට රජ්ජුරුවෝ කෘත්‍යායනය මා සන්තක සියළු වස්තුව තා කැමති පරිද්දෙන් ඇර ගනුව. එසේ ගෙන කැමති මාර්ගයකින් නික්මෙවයි කීහ.

එබස් අසා පූර්ණකයා කියන්නේ මහ රජතුමනි ඔබ සන්තක සියළු වස්තුවට වඩා විධුර නම් අමාත්‍යතෙම උතුම් වන්නේය. එබැවින් ඔහු මට ජය පඬුරු කොට දුන මැනව. පොළෝ තලයෙහි යම්කිසි රත්නයෙක් ඇත්නම් ඒ සියළු රත්නයම මා විසින් පැරදවීමියි කීය. එවිට රජ්ජුරුවෝ පූර්ණකයා ඒ විධුර පණ්ඩිතයෝ මාගේ ආත්මයය. මට සරණය. පිහිටය. රක්ෂාස්ථානය. එබැවින් ඔහු දෙන්නට නොපිළිවනැයි කීහ. පූර්ණකයා එබස් අසා රජතුමනි මේ ගැන විවාද කරමින් කල්යැවීම නිශ්ඵලය. ඒ පණ්ඩිතයන් සමීපයට ගොස් විචාරම්හ. උන් කී කාරණාව අපි දෙපක්ෂයම පිළිගත යුතුයයි කීය.

ඊට සතුටු වූ රජ්ජුරුවෝ සියයක් රජදරුවන්ද කැටුව පූර්ණකයා සමඟ විධුර පණ්ඩිතයන් ලඟට ගිය පසු පූර්ණකයා බෝසතුන් අමතා පණ්ඩිතයෙනි තෙපි ධර්මයෙහි පිහිටියවා ජීවිතය නිසාවත් බොරු නොකියව මම වූ කලි අද තොප ධර්මයෙහි පිහිටි නියාව දන්නා කැමැත්තම්හ. සැබවක්ම කියව. තෙපි රජ්ජුරුවන්ගේ නෑ කෙනෙක්ද? විධුර නම් ඇති තොප කවර කෙනෙකු නැයී ප්‍රකාශ කෙරේද? තෙපි රජ්ජුරුවන්ගේ ගැත්තහු කෙනෙක්ද නොහොත් ඉතා හීන කෙනෙක්ද රජ්ජුරුවන් හා සම කෙනෙක්ද? නැතහොත් ඊටත් වඩා උතුමෙක්ද? නොවලහා ඇති හැටියට කියවයි කීය. එවිට විදුර පණ්ඩිතයෝ කියන්නාහු මේ මානවකයා මා අතින් මෙසේ විචාරන්නේය. මම වූ කලි රජ්ජුරුවන්ගේ නෑ කෙනෙක්මි. කියාවත් ඊට උතුම්යයි කියාවත් රජ්ජුරුවන්ට මාගෙන් වන දෙයක් නැතැයි කියාවත් මොහු ගිවිස්සන්ට සමර්ථයෙමි. එසේද වුවත් මේ ලෝකයෙහි සත්‍ය සමාන තව පිහිටක් නැත්තේය. සැබවක්ම කියමියි සිතා මානවකයා මම රජුන්ගේ නෑ කෙනෙකුත් උත්තරීතර කෙනෙකුත් නොවෙමි. මේ ලෝකයෙහි දාසයෝ සතර පක්ෂයෙක් ඇත. ඔවුන් අතරෙන් මමත් එක් දාසයෙක්මි. මානවකයා මෙලොව සමහර කෙනෙක් දාසියක කුසින් උපන්නාහු දාස වන්නාහ. සමහර කෙනෙක් තුමූම බත්කඩ නිසා සේවක බවට පැමිණ දාස වන්නාහ.

සමහර කෙනෙක් රාජ චොරභයින් ස්වාමී විශේෂයෙන් චුතකොට බලහත්කාරයෙන් පරවිෂයට පමුණුවනු ලද්දාහු දාස වන්නාහ. එසේ හෙයින් මමත් චතුර්විධ දාස යෝනියෙන් උපස්ථායකත්‍වයෙන් ස්වයංදාසභාවයට පැමිණි දාසයෙක්මි. රජ්ජුරුවන් වහන්සේට වැඩෙක් වුවත් අවැඩක් වුවත් බොරු නොකියමි. රජ්ජුරුවන් වහන්සේ ජය පඬුරට තබා තට මා දෙන සේක් අධර්මයෙන් නොව ධර්මයෙන් දෙන සේකැයි කීහ.

පූර්ණකයා අතිශයින් ප්‍රීතියට පත්ව අත්පොළසන්දී පළමු ද්‍යූත ක්‍රීඩාවෙන් ලද්දාවූ ජය මාගේ පළමු ජය වන්නේය. විධුර පණ්ඩිතයන් කළ ප්‍රශ්න ව්‍යාකරණය මාගේ දෙවෙනි ජය වන්නේය. මෙසේ සත්‍යවාදී වූ පණ්ඩිතයන් කවර කාරණයකින් මට නොදෙන සේක්දැයි කීහ. එබස් අසා රජ්ජුරුවෝ ඉතා අසතුටට පත්ව බෝසතාණන්ට කිපී ඉදින් උඹතුමූ දාස වූ නම් ඇරගෙන යවයි කියා නැවත සිතන්නේ පණ්ඩිතයන් ඇරගෙන මානවකයා කැමති පරිද්දෙන් යන්නේය. උන් ගිය වේලේ පටන් මට ධර්මකතාවක් ඇසීමට නැති වන්නේය. එබැවින් ගෘහවාස ප්‍රශ්නය විචාරමියි සිතා පණ්ඩිතයෙනි අලංකෘත වූ ධර්මාසනයෙහි හිඳ සකල ලෝක පූජිත වූ ගෘහාවාස ප්‍රශ්නය කියවයි කීහ. මහ බෝසතාණෝ රජ්ජුරුවන් කී බස් අසා සතර සංග්‍රහ වස්තුයෙන් සමන්විත වීමේ ගුණ වනා ධර්මදේශනා කොට ආසනයෙන් බැස රජ්ජුරුවන්ට වැන්දාහ. රජ්ජුරුවෝ මහත් සත්කාර කොට සියයක් රජ දරුවන් සමඟ පිටවී ගියහ. පූර්ණකයා එවිට විධුර පණ්ඩිතයන් අමතා දැන් තොපව මම ලබන ලද්දේවෙමි. නොපමාව දැන්ම වරෝ යම්හයි කීහ. පූර්ණකයෙනි පුත්‍රදාරාවන්ට අවවාදානුශාසනා කරන තෙක් තුන් දවසක් මෙහිම නවතිනු මැනවයි පූර්ණකයා කැටුව තමාගේ ගෙට ගොස් තමා සඳහා තුන් සෘතුවට කරන ලද කොඤ්ච, මයුර, ප්‍රියකෙත නම් ප්‍රසාද තුනෙන් අති රම්‍ය වූ ප්‍රසාදයෙහි නවතා ආහාරපාන වර්ග වලින් පිනවා ධර්මපාල කුමාරයා ප්‍රධාන කොට ඇති දූ පුතුන් සිඹ සනහා අනොජා අගබිසවට අවවාද දී දහසක් පුතුන් හා දහසක් දූන්ද දහසක් දෙවඟනන් වැනි භාර්‍යාවන්ද සත්සියයක් කම්මිත්තන් හා අවශේෂ දාස කර්මකාර බන්ධු මිත්‍රාදී වූ මෙතෙක් දෙන ශෝක සාගරයෙහි ගිල්වා අසම්භීත වූ කෙශර සිංහයෙකු මෙන් සිංහ නාදකොට අධිෂ්ඨාන පාරමිතාව පෙරදැරි කොට ගෙන සෛන්ධවයාගේ වාලධියෙහි එල්ලී අසුගේ කලවය වෙලා පටලවා ගෙන මානවකයා මා විසින් අසුගේ වාලධිය අල්වා ගත්තෙමි. දැන්වූ කලි තා කැමති පරිදි නික්මෙවයි කීහ. එසඳ පූර්ණකයා සෛන්ධවයාට සන්කොට අහසින් පිටත්විය. එසඳ පූර්ණකයා සිතන්නේ දුරට නොගොස්ම විධුර පණ්ඩිතයන් හිමාල වන ප්‍රදේශයෙහි වෘක්ෂ පර්වතවල ගසා තලා මරාපියා හෘදය මාංශය ඇරගෙන මෘත කලේබරය පර්වත අතරකට දමාපියා නාග භවනයට යම්යි සිතා ගස් ගල් පර්වත මග නොහැර ඒ අතරින් අසු විහිදු වූයේය. මහ බෝසතාණන්ගේ ආනුභාවයෙන් ඉන් කිසිම ගැහැටක් නොවීය. එයින් කිපුණු පූර්ණකයා මොහු වෙරම්භ වාතයෙන් සුණු විසුණු කරමියි සිතා ක්‍රොධයෙන් මඩනා ලදුව ඉතා ඉහළ සත්වන වාතස්කන්ධයට දිව ගත්තේය. එයින්ද බෝසතාණන් වහන්සේට ගැහැටක් නොවූයෙන් ඔහු රැගෙන නාලාගිරි නම් අඤ්ජන පර්වත මස්තකයට ගියේය.

SANHIDA LANKA

මෙසේ පූර්ණකයා මහ බෝසතාණන් රැගෙන ගිය පසු විධුර පණ්ඩිතයන්ගේ ඥාති මිත්‍ර හිතෛෂිහු රජමාළිගාවේ දොරටුව ලඟට පැමිණ පූර්ණක නම් යක්ෂයා මානවක වේශයෙන් අවුත් පණ්ඩිතයන් ඇරගෙන ගියේයයි දොහොත් හිස තබා හැඬූහ. රජ්ජුරුවෝ ඒ මහත් විලාප ශබ්දය අසා ඉදිරියට පැමිණි විට හැම දෙනම

කියන්නාහු රජ්ජුරුවන් වහන්ස ඒ මානවකයා වූ කලි බ්‍රාහ්මණයෙක් නොවෙයි යක්‍ෂයෙක ඔහු අපව මුළා කළේය. පණ්ඩිතයන් නැතිව අපගේ ජීවත් වීමෙක් නැත. ඉදින් අදට සත්වන දවසට පණ්ඩිතයෝ නාවාහු වීනම් අපි හැම දෙනම ගිනිවැද මියයම්හයි කීහ. එවිට රජ්ජුරුවෝ මහජනයෙනි ඒ පණ්ඩිතයෝ විචාරණ ප්‍රඥායෙන් සමන්විතයෝය. තීක්‍ෂණයෝය. ස්ථානොචිත කාරණා දන්නෝය. එබැවින් ඔහු යක්‍ෂයා අතින් ගැලවීමද දවසකින් තොප ඇස් හමුවට එන්නාහ. තොප හැම ශෝක නොකරවයි මෙසේ නුවර වාසීන් අස්වැසූහ. එකල්හි ඒ හැමදෙන පණ්ඩිතයෝ රජ්ජුරුවන් වහන්සේට කියා ගියෝවනැයි අස්වැසිලි ලත්හ.
පූර්ණකයා බෝධිසත්‍වයන් වහන්සේව නාලාගිරි පර්වත මස්තකයෙහි තබා සිතන්නේ මොහු ජීවත් වන කල්හි මට වැඩෙක් නැත. මොහු මරා හෘදය මාංශය ගෙන නාග භවනයට ගොස් විමලාවන්ට දී ඉරන්දතිය ගෙන දිව්‍යලෝකයට යෙමියි කල්පනා කොට නැවත සිතන්නේ මොහු සියතින් නොමරා භයංකාර රූපයක් මැවීමෙන් ජීවිතක්‍ෂයට පත්කෙරෙමියි සිතා බියකරු රාක්‍ෂ රූපයක් මවා මහාහඬින් අවුත් බෝධිසත්‍වයන් හෙළා මුඛයෙන් දළ හස්සේ ලා ගෙන කනු කැමැත්තක්හූ මෙන් වූයේය. බෝධිසත්වයන් වහන්සේට ලොමු දැහැගැනීම් පමණකුදු නූයේය. දෙවනු භයානක සතුන්ගේ වෙස් දක්වා නොබිය වන්නා වූ බෝධිසත්වයන්ව ඔරු කඳක් හා සමාන සර්ප වේශයක් මවා අවුත් ශරීරය වෙලා ගෙන හිස මදුනේ පෙණ ගර්භය තබාගෙන බිය ගැන්වීය. ඉන්ද බිය නොවූයේ පර්වත මස්තකයෙන් වැටී සුණුවිසුණු වීමට මහා පවණක් හැම්මවූයේය. එයින් බෝධිසත්වයන්ගේ කෙසඟක් පමණ කුදු නොසෙල් විය. ඉන් පසු තල්ගසක් මෙන් පර්වතය අල්ලා සෙලවීය. එයින්ද පලක් නොවීය.
ඉක්බිති ශබ්ද නගා භයගන්වමියි සිතා පර්වතය ඇතුළට වැද පෘථිවියත් ආකාශයත් එකනින්නාද කරවමින් මහත්සේ හඬ ගැසුයේය. බෝධිසත්වයන්ට චිත්ත සන්තාප මාත්‍රයකුත් නූවූයේය. මෙසේ නොයෙක් වද හින්සා කොටත් තම අදහස මුදුන්පත් කරවා ගත නොහැකිවූයේ සිය අතින්ම මරමියි සිතා බෝධිසත්වයන් තරකොට අල්වා ගෙන ඉස යටිකුරු වන සේ දෙපයින් අල්ලා කීප විටක් උඩ වීසිකොට නැවත අල්ල අල්ලා බලා නොමිය බව දැන පර්වතයෙන් පහතට හෙලා තමාගේ බලයෙන් අත දිගුකොට ගෙන නැවතත් එසවීය. එවිට බෝධිසත්වයන් වහන්සේ ඔහු අමතා එම්බල පූර්ණකය තෝ රූපයෙන් දිව්‍ය පුත්‍රයෙක් වැන්නෙහිය. එනමුත් තාගේ කිසිම උත්තම ගුණයක් නැත. අසඤ්ඤතවූ පාප ක්‍රියා කරන්නෝය. මාගේ මැරීමෙන් තට කවර ප්‍රයෝජනයෙක් ඇද්ද? අද වූ කලි තා මේ කරන්නා වු කාර්‍ය්‍ය අමනුෂ්‍යයකුගේ ක්‍රියාවක් මෙන් වන්නේය. නොවලහා මට කියව තා කවර යක්‍ෂ නිකායක උපන් යක්‍ෂයෙක්දැයි විචාළහ. එසඳ පූර්ණකයා තමාගේ තත්‍වය සහ තම අදහස ප්‍රකාශ කළ කල්හි බෝධිසත්වයෝ යක්‍ෂයා තෝ මුඪ නොවේවා මේ ලෝකයෙහි බොහෝ සත්වයෝ කටයුතු නොකටයුතු මේ මේ යයි නොදැන ක්‍රියා කිරීම නිසා විනාශ භාවයට පත්වූහ. පූර්ණකය විමලාවන්ට මාගේ හෘදය මාංශයෙන් ප්‍රයෝජන නැත. වරුණ නම් නා රජ්ජුරුවෝ මාගෙන් ධර්මය අසා පැහැදී කණ්ඨ මාණික්‍යයෙන් පූජාකොට ගොස් විමලාවන් සමඟ මාගේ ධර්මකතික භාවය වර්ණණා කළේය. එවිට විමලාවන්ටද ධර්මය ඇසීමට මා ගෙන්වීම සඳහා මේ කරන ලද උපායකි. තොප එය වරදවා තේරුම්ගෙන මා මරන්ට තැත් කරන්නේය. මම සාධුනර ධර්මය දනිමි. මා මියයන්ට පෙර ධර්ම ගෞරවය උපදවා එය අසා පසුව තට කැමැත්තක් කරවයි කියා ඔහුලවා ස්නානය කරවාගෙන මනහර අසුනක වැඩහිඳ සර්වඥ විලාසයෙන් ඔහු අමතා මානවකය.

1. උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කරව
2. තෙත්වූ අත නොදවව
3. මිත්‍රද්‍රෝහීකම් කිසිවිටකත් නොකරව
4. අසත් පුරුෂ ස්ත්‍රීන්ගේ වසඟයට නොයව යි

සාධු නර ධර්ම සතර කොටින් ප්‍රකාශ කොට එකිනෙක විස්තර කරන්නේ මානවකය එක් දිනක් හෝ සුළු උපකාරයක් කළහුට පෙරලා උපකාර කිරීම සත්පුරුෂ ධර්මයක් වන්නේය. මේ ප්‍රථම සාධුනර ධර්මයයි. යමෙක් යම් කෙනෙකුගේ ගෙයි එක් රැයක් නතරවී ආහාර ගෙන ඒ ගේ හිමියාට නපුරක් කරන්නට සිතතොත් ඒ මිත්‍රද්‍රෝහියා අනුභව කිරීම නිසා සේදීමෙන් තෙත්වූ තමාගේ බත්කන අතට දැව්වා නම් වෙයි. මානවකය මේ දෙවන සාධුනර ධර්මයයි. යම් වෘක්ෂයක් යට ඉදීමක් හෝ සැතපීමක් කලේ වීනම් ඒ වෘක්‍ෂයෙන් අත්තක් හෝ පතක්වේවයි නොකඩන්නේය. එසේ කළේ නම් මිත්‍රද්‍රෝහීකමක් වන්නේය. සෙවන දුන් ගසට මෙසේ කිරීම නරකනට උපකාර කළ මනුෂ්‍යයින්ට ගැහැට කිරීම කොතරම් නරකදැයි කියනුම කවරේද? මේ තුන්වන සාධුනර ධර්මයයි. තවද මානවකය දශවිධ රත්නයෙන් සම්පූර්ණ වූ මේ මුළු පොළව ප්‍රතිවෘතා ධර්මය රක්‍ෂා කරමියි සිතා විශ්වාසී වූ ස්ත්‍රීයකට දුන්නේ වී නමුත් ඉඩලත් විටදී ඈ අසද්ධර්මයෙහි යෙදෙන්නීය. එසේ වූ අසත්පුරුෂ ස්ත්‍රීන්ගේ වසඟයට කාර්‍ය්‍ය දන්නා සත්වයෙක් කිසිසේත් නොපැමිණෙන්නේය. මේ ස්ත්‍රීන් නිසා පව් නොකිරීම සතරවන සාධුනර ධර්මයයි. මානවකය තොප මේ සාධුනර ධර්ම සතර දැන ගත්තෙහිය. නා ලොවට මා දැන් ගෙනයවයි කීහ. එවිට පූර්ණකයා පණ්ඩිතයෙනි ඔබගේ සතුරන් වසන නා

SANHIDA LANKA

ලොවට යෑමට කුමක් නිසා සිතව්ද? මානවකය මම අකුශල නොකළ හෙයින් මරණයට බිය නොවෙමි. මාගේ එහි යාමෙන් ඔවුන්ට යහපතක්ම වන්නේයයි කීහ. මේ ධර්‍මය ඇසූ මානවකයා ඉහතකී සාධුනර ධර්‍ම සතරම කඩකළ කෙනෙක් හෙයින්ද මේ පාපය කිරීමට පෙළඹුනේ ස්ත්‍රියක් නිසාම හෙයින් ඉතා ලජ්ජාවට පැමිණ කතා කරන්නේ විධුර පණ්ඩිතයෙනි මම තොපි හැරපියා යනු කැමැත්තෙමි. පොළව හා සමාන වූ උතුම් ගුණැති නුවණැති උතුමාණනි තොපගේ මාළිගාවට පලායව විමලාවට තොපගේ හෘදය මාංශයෙන් වන ප්‍රයොජණත් මට ඉරන්දතිය ලැබීමත් නැති වන්නේය. තොපගේ සුභාෂිතය නිසා අද මාගෙන් මිදී ගියේ වේදැයි ස්තුති කළේය. එවිට බෝධිසත්වයන් වහන්සේ මානවකය තෝ මා අතහැර නොයා නාග භවනයට ගෙන යවා වරුණ නා රජ්ජුරුවන්ටත් තටත් වැඩක්ම සිද්ධ කරමි. මමත් නාගලෝකය දැක මත්තේ හිඳ දිව්‍ය සම්පත් විදීමට කැමැත්තෙමි කීය. එවිට පූර්ණකයා අසුපිට තබා ගෙන පණ්ඩිතයන්ව නාග භවනයට ගෙන ගොස් නා රජ්ජුරුවන් හමුවට එළඹ තොප බලාපොරොත්තු වූ විධුර පණ්ඩිතයන් ගෙන ආමියි කීය. නා රජ ඉතා ප්‍රීතියට පත්ව පිළිගෙන සතුටු සාමීචි කතාවෙහි යෙදීතමා නාග ලෝකයෙහි නා රජ්ජුරුවන්ව ඉපදීමට පෙර මනුෂ්‍ය ලෝකයේ ඉපදී විමලාවන් හා එක්ව දානපතිව දන්දුන් නියාව විස්තර කොට කීහ. එවිට විධුර පණ්ඩිතයෝ නා රජ්ජුරුවෙනි තොප කරන ලද දාන ශීල භාවනාදී පුණ්‍ය කර්මයන් නිසාම මේසා විශාල දිව්‍ය සම්පත්තියක් ලද්දේය. දැන් අධර්මය දුරු කොට ධර්මයෙහි යෙදෙවයි අවවාද කළහ. විමලා නා බිසවද විධුර පණ්ඩිතයන්ගේ ධර්‍ම දේශනාව අසා ප්‍රමුදිත වූවා පණ්ඩිතයෙනි යම් උත්තම කෙනෙකුන්ට දන්දී මේ දිව්‍ය ඓශ්වර්යය ලබමෝ නම් එබඳ ශ්‍රමණ බ්‍රාහ්මණයෙක් මෙහි නැති බැවින් ඔබතුමා බොහෝ දවසක් මෙහි නතරවී අපට අනුශාසනා කරවයි කීය.

එවිට බෝධිසත්වයන් වහන්සේ විමලාවෙනි සියළු සත්වයන් කෙරෙහි වෙෂයක් නූපදවා වාරත්‍රයෙන් හිතෛෂිව ත්‍රිවිධ කුසල කර්මයන්හි නිරතව කාලය ගෙවා සදෙව් ලෝ සැප විඳුවයි අවවාද කොට නා රජ්ජුරුවෙනි විමලාවෙනි මාගේ හෘදය මාංශය කැමැත්තෙන් මා මෙහි ගෙනාවහු නම් දැන් මා ජීවිතක්ෂයට පත් කොට ලබා ගනුවයි කීහ. එවිට රජ්ජුරුවෝ පණ්ඩිතයෙනි යමෙකුගේ හෘදය මාංශය නම් ඒ කාන්තයෙන් ප්‍රඥාවම වන්නේය. දැන් අපි වූකලි තොපගේ උත්තම ධර්මය හෘදය මාංශය ලැබ මනදොළ පුරා ගතුම්හ. එසේම ඉරන්දතිය ලබා ගෙන ඔහුගේ මනදොළ පුරවා ගෙන ස්වකීය ස්ථානයට යේවයි කියා ඉරන්දතිය පූර්ණකයාට පාවා දුන්හ.

එයින් ප්‍රීතියට පත් පූර්ණකයා විධුර පණ්ඩිතයෙනි තොප මාගේ අදහස පිරිදි ඉරන්දතිය හා එක් කෙළෙහිය. මමද තොපගේ රජ්ජුරුවන් හා නුවර වැසි බන්ධුවර්ගයා සතුටු කරවමි. එසේම තොපට තෑගි වශයෙන් චක්‍රවර්තී රජවරුන් ප්‍රයෝජන විඳිනා මේ චින්තා මාණික්‍ය පඬුරු කොට දෙමි. අදම තොපව ඉඳිපත් නුවරට ගොස් ඇරලමියි කියා සෙනධවයා පිට බෝධි සත්වයන් හිඳුවා ගෙන ඉඳිපත් නුවරට පැමිණ ධර්ම සභා මණ්ඩපයෙහි හිඳුවා තම වාස භවනයට ගියේය.

මහා බෝධිසත්වයන් නුවරට පැමිණෙන දවස අළුයම ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ ස්වප්නයක් දුටහ. කෙසේද යත්? රජ්ජුරුවන්ගේ මාළිගා දොරකඩ (ප්‍රඥා නමැති) කඳ ඇති (සිල් නමැති) අතුපතර ඇති (පස්ගොරස නමැති) එල ඇති චතුරංගනී සේනාවෙන් ගැවසීගත් මහා වෘක්ෂයෙක් පිහිටියේය. මහජනයා ඒ වෘක්ෂයට පූජා විධි පවත්වා නමස්කාර කොට ගියේය. එසඳ කළු පුරුෂයෙක් රතක් ඇඳ රතක් පොරවා රතු මලින් සැරසී කඩුවක් අතින් ගෙන අවුත් මහජනයා භය ගන්වා සියළු දෙනා අඬා වැලපෙද්දී වෘක්ෂය මුලින් කපා ඇරගෙන ගොස් නැවත ගෙනවුත් පළමුතැනම පිහිටුවා ගියේය. රජ්ජුරුවෝ මේ සිහිනය දැක පරීක්ෂාකොට බලා අද ඒකාන්තයෙන් පණ්ඩිතයන් දක්නට ලැබීමේ පූර්ව නිමිත්තකැයි සතුටට පත්ව සියළු නුවර දිව්‍ය පුරයක් මෙන් සරසවා රජ දරුවන් හා නුවර වාසීන් රැස් කරවා අද අපි හැමදෙනෙක් විධුර පණ්ඩිතයන් දක්නමෝ වේදැයි පෙරමග බලමින් උන්හ.

එවිට පෙර කී සේ පූර්ණිකයා අසු පිටින් කැඳවා ගෙන පැමිණ විධුර පණ්ඩිතයන් ධර්ම සභා මණ්ඩපයෙහි හිඳුවා ඉරන්දතිය ගෙන අහසින් දිව්‍ය ලෝකයටම ගියේය. ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ හුනස්නෙන් නැගී සිට විධුර පණ්ඩිතයන් අල්ලා වැලඳ ගෙන අඬා වැලප සතුටු සාමීචි බස් දොඩා මෙතෙක් දින ගත කළ හැටි නොවලහා කීයවයි සියළු තොරතුරු අසා ඉතා ප්‍රීතියට පත්ව බන්ධන ගතවූ සත්වයන් සියළු දෙනාවම ඉන් මුදවා මසක් මුළුල්ලෙහි මුළු නුවර මහත් උත්සව පවත්වා බෝධි සත්වයන්ට මහත් පුද පඬුරු දී සම්භාවනා කළහ. බෝධි සත්වයෝද මහ ජනයාට ධර්මදේශනා කරමින් දිවි පමණින් සිට ආයු කෙළවර ගොස් තව්තිසා දෙව්ලොව උපන්හ.

SANHIDA LANKA

එසමයෙහි විධුර පණ්ඩිතයන්ගේ දෙමාපියෝ නම් දැන් සුද්ධෝදන රජ්ජුරුවන් හා මහාමායා දේවිය. අනෝජා බිසව නම් රාහුල මාතාවය. ධර්‍මපාල කුමාරයා නම් දැන් රාහුල පුතණුවෝය. වරුණ නා රජ්ජුරුවෝ දැන් සැරියුත් තෙරුන් වූ අතර එදා ගුරුළු රජ දැන් මුගලන් තෙරුන්ය. ධනඤ්ජ කොරව්‍ය රජ්ජුරුවෝ නම් ආනන්ද ස්ථවිරයෝය. සියල්ලවුන්ට සවගී සම්පත් සාදා දුන් විධුර පණ්ඩිතයෝ නම් තිලෝගුරු බුදුරජාණන් වහන්සේය.

# උම්මග්ග ජාතකය

අප සම්මා සම්බුදු රජාණන් වහන්සේ ජේතවන නම් උයනෙහි දවස් යවන සේක් ප්‍රඥා පාරමිතාව අරභයා මේ ජාතකය වදාළසේක.

නිදාන කථාව:- දිනක් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ වඩනා පෙරමග බල බලා ධර්මාසන පිරිවරා වැඩ හිඳ සර්වඥයන් වහන්සේ ප්‍රඥාවෙන් අධම පුරුෂයන් දමනය කළ නියාව කෙතරම් විශ්ම ජනකදැයි කථාවක් උපන් කලට එහි වැඩි බුදුරජාණන් වහන්සේ මහණෙනි බුදුහු නුවණැත්තෝ වූයේ දැන් මතු නොවෙයි පෙරත් නුවණැත්තෝවේදැයි මේ ජාතකය වදාල සේක.

ආරාධනයඃ- භික්ෂූන් වහන්සේ

ජාතක කථාව:- යටගිය දවස මියුළු නුවර වේදේහ රජ්ජුරුවෝ රාජ්‍ය කරන කල්හි උන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන සේනකය, පුක්කුසය, කාවින්දය, දෙවින්දය යන පණ්ඩිතවරු සතරදෙනෙක් වූහ. එසමයෙහි බෝධිසත්වයන් වහන්සේ මව්කුස පිළිසිඳ ගන්නා දවස වේදේහ රජ්ජුරුවෝ මෙබඳු ස්වප්නයක් දුටහ. කෙසේද යත්? සතර පවුරු කොන නාඹ තල් කඳන් සා ගිනිකඳන් සතරක් පවුරේ උසට නැගී දිලිසෙන්නේය. ඒ සතරට මැද කදෝ පැණියකු සා ගිනි පුපුරක් නැගිලා එම ඇසිල්ලෙහිම සතරකොන ගිනි කඳ සතරෙහි ආලෝකය මැඩගෙන බඹලොව උසට එළිය පතුරුවමින් දිලිසෙන්නේය. සියළු දෙවි මිනිසුන් සහිත ලෝ වැස්සෝ ගඳින් මලින් පූජා කෙරෙමින් ඒ ගිනිදැල් ඇතුලේම වැද ඇවිදින්නාහුය. උන්ගේ රෝමකූප මාත්‍රයකුදු හුණු නොවන්නේය.

වේදේහ රජ්ජුරුවෝ මේ සීනය දුටු වේලේ පටන් මරණභයින් භය පත්ව නොනිදා පහන් කොට උදැසන සේනකාදී පණ්ඩිතවරු සතරදෙනා ගෙන්වා සිහිනය දැන්වූ විට සේනක පණ්ඩිතයෝ දේවයන් වහන්ස! නොබව මැනව! මේ මංගල සීනයකි. එයින් ඔබට වැඩක්ම වන්නේය. අප සතරදෙනාගේ නුවණ යට කොට ඔබ වහන්සේට පස්වන පණ්ඩිත කෙනෙක් උපදනාහ. අප සතරදෙනා සතර කොන නැගි ගිනිකඳු සතරක් වැන්නම්හ. මධ්‍යයෙහි ගිනි කඳ මෙන් පස්වන පණ්ඩිතයෝ උපදනාහ. ඒ පණ්ඩිතයෝ අසමවූ නුවණැත්තාහයි දැන්වූහ. දැන් කොයි දැයි රජ්ජුරුවන් කී කල්හි දේවයන් වහන්ස අද උන්ගේ මව්කුස පිළිසිඳ ගැන්ම හෝ මව්කුසින් බිහිවීම හෝ වන්නේය. තමන්ගේ ශාස්ත්‍ර බලයෙන් සීනයෙහි අර්ථ රජ්ජුරුවන්ට කීහ.

රජ්ජුරුවෝ එදා පටන් එය සිහි කරමින් උන්හ. මියුළු නුවර නැගෙනහිර යවමැඳුම් ගම සිරිවර්ධන නම් සිටාණන්ගේ බිසවවූ සුමනා දේවී කුස මහ බෝසතාණන් වහන්සේ රජ්ජුරුවන් සීනය දුටු වේලෙහිම තව්තිසා දෙව්ලොවින් චුතව පිළිසිඳ ගත් සේක. අනිකුත් දිව්‍ය පුත්‍රයෝ දහසක් ඒ දෙව්ලොවින් චුතව එගම වැඩිමහළු සිටුවරුන්ගේ ගෙවල පිළිසිඳ ගත්හ. සුමනා දෙවිය දසමස් ඇවෑමෙන් රන්වන් පුතණු කෙනෙකුන් වැදූය. ඒ ඇසිල්ලෙහිම සක්දෙව් රජ නොපෙණෙන ශරීර ඇතිව පැමිණ බෝධිසත්වයන් අත රන්වන් සඳුන් ගැටයක් තබලා ගියහ. බෝසතාණෝ ඒ සඳුන් ගැටය මිටින් ගත්සේක. මෑණියන්දෑ පුතණුවන් අත තිබූ සඳුන් ගැටය දැක පුතණ්ඩ! තොප අත කුමක්දැයි ඇසීය. මෑණියනි! මහ ඖෂධයකැයි කියා දිව සඳුන්ගැටය මෑණියන් අත තබා මේ ඖෂධය ඇරගෙන යම් රෝගයකින් පීඩිත කෙනෙකුට දෙනු මැනවයි වදාළසේක. ඇ ඉතා සතුටුව සිටාණන්ට කීය. ඒ සිටාණන්ට සත් අවුරුද්දක් මුළුල්ලෙහි වේදනා ගෙන දෙන ඉසරුජාවෙක් ඇත. ඔහු ඉතා සතුටුව මේ කුමාරයා මහෞෂධයක් ගෙන ආහ. උපන් ඇසිල්ලෙහි මෑණියන් හා කථා කළේය. මෙබඳු පින් ඇත්තහු විසින් දුන් මේ බෙහෙත මහත් බල ඇත්තේ යයි සිතා ඒ බෙහෙත අතට ගෙන මඳක් ගලගා නළල ගැල්වූහ. සත් වර්ෂයක් දුක් විඳි එම වේදනාව නෙළුම් පතට වන් දියත්තක් මෙන් පහව ගියේය.

මේ ඖෂධය ගැන දැනගත් බොහෝ රෝගීහු දිනපතාම පැමිණෙන්ට වූහ. සිටාණෝ සඳුන් ගැටය ගලගා වතුරට කලතා ස්වල්පය බැගින්දී සුවපත් කළහ. නම් තබන දවසෙහි මහෞෂධයක් රැගෙන උපන් හෙයින් මහෞෂධ කුමාරයෝ යයි නම් තැබූහ. අනිත් සිටාණන්ගේ ගෙවල්වල එදිනම උපන් කුමාරවරු දහසටද සිටාණෝ කුමාර පළඳනා හා සහ කිරිමවුන් යැවූහ. කුමාරවරුන් දහස සරසා දිනපතා මහ බෝසතාණන් ළඟට ගෙනෙන්නාහ. උන් හා කෙළිමින් කල් යැවූ සත්හැවිරිදි කුමාරයා සණ රන් පිළිමයක් මෙන් මනාරූප ඇතිවූ සේක.

SANHIDA LANKA

එක් දවසක් උන් කෙළිමින් සිටියදී නොකල් වැස්සක් ඇති විය. බෝසතාණන් වහන්සේ දුවගොස් ගේකට වන්සේක. සෙසු කුමාරවරු පසුපස්සේ දුවන්නාහු ඔවුනොවුන් පය පැකිල වැටී තුවාල ලද්දෝය. බෝසතාණන් වහන්සේ මෙතන කෙළිනට ගෙයක් කළයුතුය. එවිට අවු වැසි පීඩා නොවිඳ ක්‍රීඩා කළහැක. එබැවින් තොපි හැම එක එක මැස්ස බැගින් ගෙනවයි නියම කළහ. උනුන් එලෙසම කළහ. බෝධිසත්වයන් වහන්සේ වඩුවකු ගෙන්වා මෙතන ගෙයක් කරවයි විධානය කොට තමාට උවමනා පරිද්දෙන් රැන් ගස්වා ගෙය බෙදාලූය. ඒ ශාලාවෙහි එක් තැනක දුප්පතුන් වසන තැනය. දුප්පත් ගැහැණුන් වදන තිඹිරි ගෙයය.

ආගන්තුක බමුණන් වසන තැනය. මහණ බමුණන් වසන තැනය. මෙපරිද්දෙන් පිටතින් දොරකඩ තබා ශාලාව විධාන කොට කරවූසේක. ඒ ශාලාතොමෝ සුධර්මා නම් ශාලාව හා සමාන වූවාය. එපමණක්ද නොව පැන් පොකුණු මල් පලතුරු උයන් සක්මළු ආදියෙන්ද යුක්ත විය. බෝසතාණන්ගේ මේ ක්‍රියාව ලොව පතල විය. බොහෝ මිනිස්සු එහි රැස්වී තමා පිළිබඳවූ දුක් ගැනවිලි කියා පාන්නාහ. බෝසතාණන් වහන්සේ ඔවුන්ගේ යුක්ති අයුක්ති විචාරමින් බුදුන් ලොව පහළ වූ කල්හි මෙන් පතළ වූ සේක.
එසමයෙහි වේදේහ රජ්ජුරුවෝ සීනය දැකීමෙන් සත් අවුරුද්දක් ගතවූ පසු එහි සඳහන් පරිදි ඒ පණ්ඩිතයෝ කොහිදැයි සිහිකර උන් වසනතැන් දනුවයි සතර වාසලින් ඇමතියන් සතර දෙනෙකු යැවූහ. නැගෙනහිර වාසලින් නික්මුණු අමාත්‍ය තෙම නැගෙනහිර යව මැඳුම් ගමට ගොස් බෝධිසත්වයන් වහන්සේ විසින් කරවන ලද ශාලාදිය දැක මේ කාගේ නිර්මාණයක්දැයි එගම මිනිසුන්ගෙන් අසා සත් හැවිරිදි මහෞෂධ පණ්ඩිතයන්ගේ විධානයෙන් කරන ලද්දෙකැයි අසා මොහු නම් රජ්ජුරුවෝ සීනෙන් දුටු පස්වන පණ්ඩිත රත්නයමයයි සනිටුහන් කොට ගෙන මෙවැනි පණ්ඩිත රත්නයක් ලද්දෙමු. ඔහු ගෙනෙම්ද නොගෙනෙම්දැයි අසා රජ්ජුරුවන් වෙත මෙහෙවර කරන්නකු යැවීය. රජ්ජුරුවෝ එපවත් අසා ප්‍රීතියට පත් වූයේ සේනක පණ්ඩිතයන් ගෙන්වා එපවත් උන්ට කියා කිමෙක්ද? සබඳ ඒ මහෞෂධ පණ්ඩිතයන් ගෙන්න මෝ දැයි විචාළහ. ගුණමකුවූ ඒ සේනකයා දේවයෙනි! ගෙවල් ආදිය කරවූ තරමින් පණ්ඩිතයෙක් නොවෙයි. ඒ ඉතා ස්වල්ප දෙයකියි කීහ. වේදේහ රජ්ජුරුවෝත් ඒත් එක් කාරණයෙකැයි මුවෙන් නොබැන ඒ ගම හිඳ එම පණ්ඩිතයන් ගැන තවත් පරීක්ෂා කරවයි අමාත්‍යයන්ට පණිවිඩ යැවූහ. ඔහු එගම වාසය කරමින් මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ මතු විමසූ ප්‍රශ්න සංක්ෂෙපයෙන් මෙසේය.
මංසං ගොණො ගණ්ඨි සුත්තං පුත්තං ගොල රථෙනච
දණ්ඩා සීසං අහිචෙව කුක්කුටො මණි විජායනං
ඕදනං වාලුකංචාපි තළාකුය්‍යාන මථ ගද්‍රහොමණි

## පළමුවැනි මාංශ ප්‍රශ්නය කෙසේද යත්?

දිනක් කුමාරවරු ක්‍රීඩා කරමින් උන් කල්හි එක් උකුස්සෙක් මස් වැදැල්ලක් ගෙන අහසින් ගියේය. කුමාරවරු උකුස්සා ලුහු බැඳගෙන දුවන්නාහු ගල් ආදිය පය පැකිල වැටී පීඩාවට පත්වූහ. මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ මේ මස් වැදැල්ල බිම හෙළා පියවම්දැයි අසා යහපතියි කුමාරවරු කී කල්හි එසේ නම් බලවයි! උඩ නොබලා පවනට බඳු වේගයෙන් දිව උකුස්සාගේ ඡායාව මැඩගෙන අත්පුඩි ගසා මහත්සේ නාද කළසේක. ඒ නාදය උකුස්සාගේ ලෙන් ඇනී පිටින් නැංගාසේ වූයේය.
උකුස්සා භය පත්ව මස් වැදැල්ල හෙළීය. බෝසතාණන් වහන්සේ එය වැටෙන ඡායාව දැක බිමට වැටිය නොදී අල්වා ගත්සේක. ඒ ආශ්චර්යය දුටු බොහෝ දෙනා ඔල්වරසන් දුන්හ. මේ කාරණය ඇමතියන් අතින් දැනගත් වේදේහ රජ්ජුරුවෝ සේනක පණ්ඩිතයෙනි! මහෞෂධ පණ්ඩිතයන් ගෙන්නමෝදැයි විචාළහ. උන් මේ නුවරට ආ තැන් පටන් අපට වන්නේ මහත් අලාභයකැයි සිතා තමා ගුණමකු බැවින් දේවයන් වහන්ස! මේ අල්ප දෙයකි. තව බලමුයි කීහ.

## දෙවෙනි වූ ගොන් ප්‍රශ්නය කෙසේදයත්?

යව මැඳුම්ගම වසන පුරුෂයෙක් අතවැසි කල්හි සී සාමියි අසල් ගමකින් ගොන්බානක් මිලට ගෙන අවුත් තමාගේ ගෙයිම ලග්ගවා දෙවන දවස තණ කවන පිණිස ගෙන ගොස් විඩාවට පත්ව ගසක් මුල හිඳගෙන නිදන්ට වන. ඒ ඇසිල්ලෙන් එක් සොරෙක් ගොන් බාන ගෙන පැන ගියේය. ඒ පුරුෂයා පිබිඳ ගොනා නොදැක ඔබ මොබ බලා ගොන්බාන ගෙනයන සොරා දැක වහා දිව ගොස් මාගේ ගොන් කොහේ ගෙනයාදැයි ඇසීය. සොරා කියන්නේ මාගේ ගොන් මා කැමති තැනකට ගෙනයමියි කීය. උන් දෙන්නාගේ කලහය අසා බොහෝ දෙනා රැස්වූහ. පණ්ඩිතයන් වහන්සේ ඒ ශබ්දය අසා දෙන්නාම ගෙන්වා ඔවුන්දෙන්නාගේ බස් අසා මම තොපට යුක්තිය දැහැමින් විනිශ්චය කොට දෙමි. මා කීවක් පිළිගන්නෙහිදැයි අසා එසේ යයි කී කල්හි සොරා ගෙන්වා තෝ මේ ගොනුන් කුමක් කවා පොවා වැඩීදැයි විචාළ කල්හි සොරා කියන්නේ උළුකැන් පොවා තල සහ උඳු කවන ලදැයි කීය. ඉක්බිති ගොන් අයිතිකරු කැඳවා තෝ කුමක් කවන ලදැයි විචාල කල්හි ස්වාමීනී තණම කවන ලදැයි කීය. පණ්ඩිතයන් වහන්සේ දෙන්නාගේ බස් අසා පුවඟු කොළ ගෙන්වා කොටා පැන් කලතා ගොනුන්ට පෙවූ සේක. ගොනුන් තණ වැමෑරූහ. පණ්ඩිතයන් වහන්සේ බොහෝ දෙනාට බලවයි කියා සොරා අමතා වරදකරුද නිවැරදි කරුදැයි අසා වරදකරු යයි කී කල්හි මින් මතු එසේ නොකරවයි අවවාද කොට යැවූහ. එහි සිටි පුරුෂයෝ සොරාට අතින් පයින් තලා එලවා දැමූහ. අමාත්‍යයා එපවත් අසා රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ සේනකයන් අතින් විචාරා ඔහු අකමැති වූ බැවින් නිහඬවූහ.

SANHIDA LANKA

අමාත්‍යයෝ රජ්ජුරුවන්ට කියා යවන නියාවද රජ්ජුරුවෝ සේනකයන් අතින් විචාරන නියාවද සේනකයන් වලකන නියාවද හැම පැණෙහිම මෙලෙසින් දතයුතුයි.

## තුන්වැනිවූ ගැටහු පළඳනාවේ විනිශ්චය කෙසේද යත්?

එක් ගැහැනියක් නා නා වර්ණ හුයින් ගැට ගසන ලද ගැටහු පළඳනාවක් කරින් ගලවා කඩ මත්තේ තබා පණ්ඩිතයන් වහන්සේ විසින් කරවන ලද පොකුණෙන් නහන්නට වන. අනික් ලදැරියක් ඒ දැක ලෝභ උපදවා එය ගෙන මැණියෙනි! මේ ඉතා හොබනේය. කවර කෙනෙකුන් විසින් කරන ලද්දේද? මමද මෙවැනි පළඳනාවක් කෙරෙමි කර පැලඳ මඳක් බලම්දැයි විචාරා යහපතැයි කී කල්හි එය පැලඳගෙන පැන ගියාය. පළඳනාව ඇති තැනැත්තී වහා ගොඩ නැගී ඈ ලුහුබැඳ ගොස් අරගල කළාය. පණ්ඩිතයන් වහන්සේ ඒ ගෑණුන් දෙන්නාගේ ශබ්දය අසා උන් දෙන්නා ගෙන්නා පළමුකොට සොර තැනැත්තිය අතින්, තී මේ පළඳනාව පළඳිනෙහි කවර සුවඳක් ගැල්වීදැයි විචාළ සේක. ඒ මම නිතර සර්ව සංහාරකම් සුවඳක් ගල්වමියි කීවාය. ඉක්බිති පළඳනාව ඇති තැනැත්තිය විචාළ කල්හි ස්වාමීනී! මා දුක් පත්මි. මා නිතර පුවඟු මලෙහි සුවඳ පොවමියි කීවාය. පණ්ඩිතයන් වහන්සේ පැන් තලියක් ගෙන්වා පළඳනාව එහි දමා ඖෂධ පිළිබඳ දක්ෂයෙකු ගෙන්වා මේ තලියෙහි පැන් සිඹ කිනම් සුවඳදැයි කියවයි වදාළසේක. ඔහු ඒ පැන් සිඹ පුවඟු මලෙහි සුවඳ නියාව දැන ගාථාවකින් සර්වසංහාරක සුවදෙක් මෙහි කොයින්ද? පුවඟු මලෙහි සුවඳ හමන්නේය. බෝසතාණන් වහන්සේ බොහෝ දෙනා අමතා මේ දැරිය කීවේ බොරුවකි. ඈ සෙරය. මැහැළිය කීවේ සැබවයි කියා සෙර ලියට අවවාද කොට යැවූ සේක.

## සතරවැනිවූ හූ වැටියෙහි විනිශ්චය කෙසේද යත්?

කපුහේනක් රක්නා එක් ස්ත්‍රීයක් කපුකැට නූල් ඔතා හූ වැටිය ඉන තබා ගෙන ගමට එන්නී ඉහත කී පොකුණෙන් නහමියි සිතා ලින්කඩ මත්තේ හූ වැටිය තබා නහන්නට වූවා අනික් ස්ත්‍රීයක් එය ගෙන නැගී ගියාය. සෙස්ස පෙර මෙනි. බෝසතාණන් වහන්සේ සෙර අමතා මේ හූ වැටිය කුමක ඔතා තිබේදැයි විචාළ සේක. ඈ කියන්නී කපු ඇටයක් ඇතුළේ ලා වට කෙළෙමියි කීය. එය අයිති තැනැත්තිය කියන්නී ස්වාමීනි! එය තිඹිරි ඇටයක් ඇතුළේ ලා වට කෙළෙමියි කීය. දෙදෙනාගේ බස් අසා හූ වැටිය ගලවා ඇතුළේ තිබුන තිඹිරි ඇටය දැක පළමු කී තැනැත්තී සෙර බව ගිවිස්වා අවවාද කොට යැවූසේක.

## පස්වැනිවූ පුත්‍ර ප්‍රශ්නය කෙසේද යත්?

එක් ස්ත්‍රියක් තම පුතු නහවා පොකුණ ලඟ තබා තොමෝ නහන්නට දියට බට කල්හි යකින්නක් ගැහැණු වෙසකින් අවුත් ආදරය කොට දරුවා වඩාගෙන මේ දරුවාට කිරි පොවම්දැයි අසා යහපතැයි කී කල්හි මදක් කිරිපොවා වඩාගෙන පලා ගියාය. මැණියෝ දරුවා නොදැක ඈ පස්සේ එලවා ගොස් අල්ලාගෙන කළහ කරන්නට වූවාය. බෝසතාණන් වහන්සේ උන් දෙන්නා ගෙන්වා කුමණ ඩබරයක්දැයි අසා ඇස් පිය නොමරන බැවින්ද රක්ත වර්ණවූ ඇස් ඇති බැවින්ද මේ යකින්නෙකැයි දැන මා කී යුක්තියක සිටිවු දැයි විචාරා එසේ යයි කී කල්හි බිම ඉරක් අඳවා ඉරමැඳ දරුවා තබා යකින්න ලවාදෑතද මැණියන් ලවා දෙපයද අල්වා දෙදෙනා ඇද ගනුව. දරුවා ඇදගත් එකකුටැයි වදාළ සේක. දෙන්නාම දරුවා අදින්නට වන්හ. එයින් වේදනාවට පත් දරුවා අඬන්නට විය. මැණියෝ තම ලය පැළුන කලක් මෙන් සෝකයට පැමිණ ඇදීම නැවැත්වූවාය. යකින්න වේදනා කිසිත් නොතැකුවාය. බලාසිටි පිරිස පණ්ඩිතයන් වහන්ස! වැදුවන්ගේ ලයනේද මොළොක් වන්නේ? මේ දරුවා අතහැර ඇත්තේ නියම මවයයි කීහ. පණ්ඩිතයන් වහන්සේ එසේය පින්වත්නි! මේ සෙර යකින්නක, දරුවන් කන පිණිස ගතැයි වදාරා ඈට අවවාද කොට පන්සිල්හි පිහිටුවා යැවූ සේක.

## සයවැනිවූ කාලගෝල ප්‍රශ්නය කෙසේද යත්?

මිටි හෙයින් ගෝල යයි කියාද කළුපැහැ හෙයින් කාළ යයිකියාද (කාළගෝල යයි) නම් ඇති මිනිසෙක් සත් අවුරුද්දක් දාසකම් කොට අඹුවක් ලද්දේය. ඕ නමින් දික්තල නම්. කාලගෝලයා දිනක් අඹුව බනවා සොඳුර දෙමව්පියන් බලා පියම්හ. කැවුම් පෙවුම් ඉදිකොට ලවයි කීහ. මව්පියන්ගෙන් කවර කාර්‍යයෙක්දැයි ඈ දෙවරක්ම එය ප්‍රතික්ෂෙප කළාය. තුන්වෙනි වාරයෙහි ගිවිස්වා ගෙන කැවුම් පෙවුම් ආදිය ඇරගෙන අඹුව හා මගට පිළිපන්නේ අතර මග පැතිර දියයන ඔයක් දැක ගැඹුර නොගැඹුර නොදත් බැවින් එතර යා ගත නොහැකිව ගංතෙර නතරවූහ. ඒ වේලාවට දික්පිටියා යන නමක් ඇති දුක්පත් පුරුෂයෙක් ඒ අසලින් යන්නේ උන් සිටි තැනට එනවා දැක කාලගෝලයා අමතා යහළු! මේ ගඟ ගැඹුරුදැයි ඇසීය. කාලගෝළයා

SANHIDA LANKA

ගඟට හයබව දැනගත් දික්පිටියා මුසා කියන්නේ මේ ඉතා ගැඹුරුය. කිඹුලන් හා දැති මෝරන් ගහණය. නමුත් උන් අප හා පුරුදුකම් ඇතැයි කීය. එවිට කාලගෝලයා එසේ වී නම් අපවත් එතෙර කරවයි කන බොන දෑ ඔහුට දුන්හ. සබඳ! කවුරුන් පළමුකොට ගෙන යම්දැයි විචාලේය. එවිට කාලගෝලයා කියන්නේ මාගේ සොඳුර පළමුකොට ගෙනයව! මම පසුව එමියි කීය. පුරුෂයා යහපතැයි දික්තල කර හිඳුවාගෙන කැවිලි මල්ලත් ගෙන ගඟට බැස හිඳ හිඳ ගැඹුරු බව දක්වමින් ගියේය. කාලගෝලයා මෙතෙක් සිටියේ උස පුරුෂයාවත් මෙහි පොවනා බව පෙනේ. ඉතා ගැඹුරුය. මා යන්නේ කෙසේදැයි ලතවෙමින් උන්නේය. දික්පිටියා ගඟ මැදදී දික්තල අමතා සොඳුර! මම තිට සුරසැප දෙමින් රැක ගනිමි. ඒ අඟුටුමිට්ටාගෙන් වෙන්වී එවයි කීය. දික්තල කියන්නී ස්වාමීනි! ඉදින් මා අත්නොහරින්නෙහි වීනම් එන්නෙමියි කාලගෝලයා බලා සිටියදීම කැවුම් කකා යන්ට වන්හ. කාලගෝලයා උන්දෙන්නා යන්නා දැක කෝපයෙන් මියෙම්වා, රැකෙම්වායි ගඟට පැන නොගැඹුරු බව දැන ඔහු පස්සේ දුව ගොස් කොළ දුෂ්ටය! මාගේ අඹුව කොහි ගෙනයේදැයි විචාළේය. දික්පිටියා කියන්නේ අඟුටුමිටිය තට! අඹුවෝ කොයින්ද? මේ අඹුවෝ මගේ යයි කියමින් කර අල්ලා හෙළීය. බෝසතාණන් වහන්සේ මේ අරගලය අසා ඔවුන් කැඳවා දික්පිටියා බණවා නම කුමක්දැයි විචාළ සේක. දික්පිටියා නම්’යි කීය. තගේ අඹුවගේ නම කුමක්දැයි විචාළසේක. ඇගේ නම නොදන්නේ අනික් නමක් කීය. තගේ අඹුවගේ දෙමව්පියන්ගේ නම් කුමක්දැයි අසා ඒවාද කිය නොහැකි වූයේ ඉක්බිති ඔහු පිටත්කර කාලගෝලයා ගෙන්වා ඈ පිළිබඳ නම් ගම් අසා සියළු තොරතුරු නිවැරදිව සඳහන් වූ හෙයින් දික්තල ගෙන්වා තිගේ ස්වාමියා කවුදැයි විචාරා කාළගෝලයාට ඈ පාවාදී දික්පිටියාට අවවාදකොට යැවූසේක.

# සත්වැනි වූ රථ ප්‍රශ්නය කෙසේදයත්?

එක් පුරුෂයෙක් රථයක ඉද මුහුණ සෝදන පිණිස නික්මුණේය. ඒ ඇසිල්ලෙහි සක්දෙව්රජ මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥානුභාවය ප්‍රකාශ කෙරෙමියි සිතා මිනිස් වෙසින් අවුත් රථයෙහි පසුකඩ අල්වා ගෙන යන්නාහුය. රථයෙහි උන් පුරුෂයා තොප කුමක් නිසා අවුදැයි විචාරා නුඹ දෑ සමීපයෙහි සිටිනා නිසා ආමියි කී විට යහපතැයි ගිවිස රථයෙන් බැස ශරීරකෘත්‍ය පිණිස ගියේය. එකෙනෙහි ශක්‍රයා රථයට පැන නැගී වහවහා රථය පදවන්නාහ. රථය ඇති පුරුෂයා එය ගෙන යන්නා දැක යුහුව ගොස් සිටුව මේ මාගේ රථය කොයි ගෙනයන්නෙහිදැයි විචාළකල්හි ඔහු හා සමඟ කලහ කෙරෙමින් ශාලාව දොරකඩට පැමිණියේය. බෝධිසත්වයන් වහන්සේ උන්දෙන්නා බලා බය නැති බැවින්ද ඇස් නොමරන බැවින්ද ශක්‍රයායයි දැන රථ හිමියා අනිකායයි තේරුම්ගෙන මේ කලහය විචාරමියි සිතා මාගේ යුක්තියක සිටිව්දැයි විචාරා සිටුම්හයි කී කල්හි මම රථය පදවමි. තොප දෙන්නාම රථය පස්සෙන් එව. රථය ඇති තැනැත්තේ නොහරනේය. අනිත් තැනැත්තේ හරනේයයි කියා තමන්ගේ පුරුෂයෙකුට රථය පදවයි වදාළසේක. ඒ යුහුව රථය පදවන්ට වන. ඔහු දෙන්නත් පස්සෙන් අල්ලාගෙන යන්නාහ. රථය හිමියා මදක් දුර ගියේ විඩාවට පත්විය. ශක්‍රයා රථය සමග දිව්වේය. බෝධිසත්වයන් වහන්සේ රථය නවතා මිනිසුන් කැඳවා මේ පුරුෂයා මදක් ගොස් නතරවිය. රථය සමග දිවූ මොහුගේ ශරීරයෙහි ඩා බිඳුවකුත් නැත. භයකුත් නැත. ඇස්පිය නොහෙලන්නේය. මේ තෙම සක්දෙව් රජයයි වදාළසේක. සක්දෙව්රජාණෝත් තමාගේ දිව්‍යාත්මභාවයෙන් සිට බෝධිසත්වයන්ගේ ප්‍රඥාව ගැන ප්‍රශංසා කොට ගියහ. පණ්ඩිතයන්ගේ නුවණ පරීක්ෂාකිරීමට නතර කළ ඇමතියන් අතින් මේ බව දැනගත් වේදේහ රජ්ජුරුවෝ සේනකයන් අතින් විමසා අකමැති වූයෙන් නිහඬ විය.

# අට වැනිවූ කිහිරි දණ්ඩෙන් විමසූ ප්‍රශ්නය කෙසේදයත්?

දිනක් පණ්ඩිතයන් විමසම්හයි වියතක පමණ කිහිරි දණ්ඩක් ගෙන ලියවා සකස්කොට නැගෙනහිර යවමැඳුම්ගම වසන පුරුෂයෝ නුවණැත්තෝල මේ දණ්ඩෙහි අගමුල දැනගෙන එව! ඉදින් නොදනිත්නම් දහසක් දඩයයි කියා යැවූහ. ගම්වැස්සෝ රැස්ව එහි අග මුල දැනගත නොහෙන්නාහු සිරිවර්ධන සිටුපුත් මහෞෂධ පණ්ඩිතයෝ මෙය දැනගන්නාහ උන් කැඳවාගෙන එවයි කියා ගෙන්වා පුත! මේ කිහිරි දණ්ඩෙහි අග මුල දැනගන්ට අපි නොපොහොසතුම්හ. තොපට හැකිදැයි විචාළහ. ඒ ඇසූ පණ්ඩිතයන් වහන්සේ පියාණෙනි! රජ්ජුරුවන්ට මේ කිහිරි දණ්ඩෙහි අගින් හෝ මුලින් ප්‍රයෝජනයක් නැත. මා විමසනු පිණිස එවන ලද්දේ වන්නේයයි සිතා ගෙනව! මම පොහොසත්මි’යි එය ගෙන්වා අතින් ගෙන මේ අගමුල යයි දැනත් බොහෝ දෙන සිත් ගන්නා පිණිස පැන් තලියක් ගෙන්වා කිහිරි දණ්ඩ මැදින් නූලක් බැඳ නූලෙහි අග අල්වා ගෙන කිහිරි දණ්ඩ දිය පිට තබාලූසේක. මුල බර බැවින් පළමුකොට දියේ ගිලින. ඉක්බිත්තෙන් ගසේ මුල බරවේද? අගබර වේදැයි? පිරිස අමතා විමසා මුලබරවේයයි කී කල්හි එසේ වී නම් පළමුකොට ගිලුණ අත මුලයයි වදාළසේක. ගම්වැස්සෝ එය රජ්ජුරුවන්ට කියා යවූහ. රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන් එය විමසූ බව අසා සතුටුව කිමෙක්ද? සේනකය! ඔහු ගෙන්වමෝදැයි විචාළහ. ඉවසුව මැනව දේවයන් වහන්ස! අනික් උපායකින්

SANHIDA LANKA

විමසම්හයි නැවතුහ.

## නව වැනිවූ ගැණු හිසකින් හා පිරිමි හිසකින් විමසූ ප්‍රශ්නය කෙසේදයත්?

දිනක් ගැහැණියකගේද පිරිමියකුගේද හිස් දෙකක් ගෙන්වා මේ ගැණු හිසය. මේ පිරිමි හිසය දනිත්වයි නොදන්නාහුනම් දහසක් දඩයයි පණ්ඩිතයන් වසන නැගෙනහිර යව මැඳුම්ගම් වැස්සන්ට යැවූහ. ගම්වැස්සෝ එහි විභාග නොදත්තාහු හිස්දෙක ගෙන පණ්ඩිතයන් අතින් විචාළහ. උන්වහන්සේ හිස්දෙක දුටු වහාම ඒ හිස මේ මේයයි දත් නමුදු ගම්වැස්සන් අමතා පිරිමි හිස්කබල මත මැස්ම වක්නොව කෙළින් යන්නේය. ගැහැණු හිසේ මැස්ම වක්ව යන්නේය. කරකැවී යන්නේය. මේ කාරණයෙන් මේ පිරිමි හිසය. මේ ගැහැණු හිසයයි තෝරා දී යවූහ. රජ්ජුරුවෝ විචාළ නියාවද සේනක පණ්ඩිතයන් වැලකූ නියාවද පෙරසේමය.

## දසවැනිවූ සර්පයන් දෙදෙනාගෙන් විමසූ ප්‍රශ්නය කෙසේදයත්?

දිනක් නයෙකු හා සැපින්නකු ගෙන්වාගෙන මේ සර්පයාය මේ සැපින්නයයි දනිත්වායි නොදන්නාහු නම් දහසක් දඩයයි පෙරසේම යවූහ. ගම්වැස්සෝ එය ගෙන ගොස් පණ්ඩිතයන් වහන්සේ අතින් දැනගත් සේක. සර්පයාගේ නගුට මහත්වන්නේය සැපින්නගේ නගුට සිහින්ය. සර්පයාගේ හිස මහත්ය. දිගය ඇස්වටය. මහත්ය. පෙණය හාත්පසින් සම්පූර්ණ වන්නේය. සැපින්නගේ හිස දිගය. ඇස් කුඩාව පෙනෙන්නේය. පෙණය එක් දිසාවකින් කැපුවාසේ අඩුව තිබෙන්නේය. මේ සලකුණෙන් මේ සර්පයාය. මෝ සැපින්නයයි වදාළ සේක. සෙස්ස යට කියන ලද්දාවූ ක්‍රමය මැය.

## එකොළොස් වැනි වූ කුකුළාගෙන් විමසූ ප්‍රශ්නය කෙසේදයත්?

දිනක් සර්වාංගයෙන් ධවලවූ පය අං ඇති ඉස මොල්ලියක් ඇති කාලත්‍රය නොයික්මවා හඬන්නාවූ ගොනකු එවත්වයි යව මැඳුම්ගම වැස්සන්ට පෙරසේම කියා යවූහ. ගම්වැස්සෝ පණ්ඩිතයන් වහන්සේගෙන් විචාළහ. පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවෝ තොප අතින් හැළිකුකුළකු ගෙන්වතියි වදාරා පය පොරකටු ඇති බැවින් පය අං ඇත්තේවෙයි. ඉසමල් ඇති බැවින් ඉස මොල්ලියක් ඇත්තේවෙයි. හ්‍රස්ව, දීර්ඝ, ජලුත යන තුන්කාලයට උච්චාරණ ශුධකොට හඬනගන හෙයින් කාලත්‍රය නොයික්මවා හඬන්නේවෙයි. එබැවින් මෙබඳු කුකුළකු යවවයි වදාළසේක.

## දොළොස් වැනිවූ මැණිකකින් විමසූ ප්‍රශ්නය කෙසේදයත්?

ශක්‍රදෙවෙන්ද්‍රයා විසින් කුස රජ්ජුරුවන්ට දුන් මැණික අටතැනකින් වක්වූයේය. ඒ අටවක් මැණිකෙහි ශක්‍රයන් ඇමුණූ පුරාතන හුය (නූල) දිරාගොස් කැඩී ගියේය. පරණ හුය හැරපියා අළුත් හුයක් අවුණා ලන්නට කිසිවෙක් නොපොහොසත්ය. දිරාගිය හුය හැරපියා අළුත් ලණුවක් ලත්මැයි කියා නැගෙනහිර යවමැදුම්ගම් වැස්සන්ට යවූහ. ගම්වැස්සෝ එය ගෙන ගොස් පණ්ඩිතයන් වහන්සේට පැවාහ. පණ්ඩිතයන් වහන්සේ ඔවුන් විධානයකොට මී පැණි ටිකක් ගෙන්වා මැණික දෙකලවර සිදුරුවල මී ගල්වා පලස්හුයින් නූලක් අඹරා මැණිකේ සිදුරට ඔබා කුහුඹුවන් නික්මෙන බිලයක තබාලූ සේක. කුහුඹුවෝ මීයෙහි ගඳින් මැණිකෙහි දිරාගිය පරණහුය කාගෙන පලස්හුය ඩැහැගෙන යටින් අදනාහු අනිත් ඇලයෙන් පිටත්කොට පීහ. පණ්ඩිතයන් වහන්සේ මැණිකේ ලණුව ඇවිණීගිය බැව් දැනගෙන රජ්ජුරුවන්ට දෙවයි කියා යැවූහ.

## තෙළෙස් (13) වැනිවූ විජායන ප්‍රශ්නය කෙසේදයත්?

දිනක් රජ්ජුරුවන්ගේ මඟුල් ගොනුට උඳු බොහෝකොට කවා බඩ මහත් කොට හම සකස් කොට සර්වාංගයෙහි තෙල් ගල්වා මේ රජ්ජුරුවන්ගේ මඟුල් ගොනාය පිහිටි දරුගැබ් ඇත්තේය. මොහු වදවාපියා පැටවා සමඟ ගෙන එවයි දඩ නියම කොට යව මැදුම්ගමට යවූහ. ගම්වැස්සෝ මේ ගොනු දරුවන් වදන්නේ කෙසේදැයි ගොස් පණ්ඩිතයන් වහන්සේ අතින් විචාළහ. උන්වහන්සේ මෙය සමාන පැනයකින් විසඳිය යුතුයයි හිතා කථාකිරීමෙහි දක්ෂ පුරුෂයෙකු කැඳවා පින්වත් පුරුෂය! තොප හිසකේ පිට මැද හෙලාගෙන මහා විලාප කියකියා රජවාසලටයව. සෙස්සවුන් විචාරන ලදුයෙහි කිසිවක් නොකියා රජ්ජුරුවන් ලඟට ගොස් දේවයන් වහන්ස! මාපියාණෝ වදාගත නොහී විලිපහරනේ අදට සත්දවසය. මට පිළිසරණ වුව මැනව! වදන උපායෙක් වදාළ මැනවයි කියා රජ්ජුරුවන් විසින් කිමෙක්ද? තා නන් දොඩයිද ඒ කාරණයෙක් නොවෙයි. පිරිමින් වදන්නාහු නැතැයි කී කල්හි දේවයන් වහන්ස එසේ වී නම් නැගෙනහිර යවමැදුම් ගම් වැස්සෝ කෙසේ මඟුල් ගොනා වද වද්දැයි විචාරවයි වදාළසේක. රජ්ජුරුවෝ සමාන ප්‍රශ්නය කා විසින් සිතන ලද්දැයි

SANHIDA LANKA

විචාරා මහෞෂධ පණ්ඩිතයන් විසින් යයි අසා සතුටුවූහ.

## තුදුස් (14) වැනිවූ පැසිබතින් විමසූ ප්‍රශ්නය කෙසේදයත්?

දිනක් අට කාරණයකින් සමන්විත වූ පැසිබතක් අපට පිස එවත්වයි නැගෙනහිරි යවමැදුම්ගම් වැස්සන්ට කියා යවූහ. අටකාරණයෙන් යුත් පැසිබත නම් සාලිනුත් නොපිසුව මැනව දියෙනුත් නොපිසුව මැනව! සැලියෙනුත් නොපිසුව මැනව! ගින්නෙනුත් නොපිසුව මැනව! දර උදුනක ලාත් නොපිසුව මැනව! මෙසේ වූ පැසිබත ගැහැණියක අතත්, පිරිමියෙකු අතත් නො එවුව මැනව මගෙකත් නො එවුව මැනව මේ අට කාරණයෙන් යුත් පැසිබත නො එවතහොත් දහසක් දඩයයි කියා යවූහ. පණ්ඩිතයන් වහන්සේ එය විසඳා දක්වන්නේ නො සාල් නම් සුන්සාල් ගෙන නොදිය. පිණිදිය ගෙන නොසැළීය නම් අනිත් බඳුනක් ගෙන නො උදුන නම් අළුත් කණු ගසා නො ගිණි නම් පියවි ගිණිහැර දණ්ඩෙන් හෙළු ගිනි ගෙන නො දර නම් පරඬලා ගෙන පැසිබත පිසවා අළුත් බදනක ලා අස්ඹබා නො ගැණු නොපිරිමියෙකු නම් නපුංසකයෙකු ඉස තබාලා නො මග නම් මාවත හැර අඩි පාරකින් රජ්ජුරුවන්ට යවයි කී සේක. රජ්ජුරුවෝ ඒ බලා ප්‍රීතිමත්වූහ.

## පසළොස් වැනි වූ වැලියොතින් විමසූ ප්‍රශ්නය කෙසේදයත්?

තව දිනක් රජ්ජුරුවන් විමසනු පිණිස එම ගම්වැස්සන්ට අස්නක් යවන්නාහු රජ්ජුරුවෝ ඔංචිලි පදිනා කැමැත්තෝය. පරණ වැලි යොත කැඩී ගියේය. එක් වැලි යොතක් අඹරා එවත්වයි දඩ නියම කොට යැවූහ. පණ්ඩිතයන් වහන්සේ ඒ පැනයත් සමාන පැණයකින් විසඳිය යුතුයයි සිතා ගම්වැස්යෙනි! නොබියවයි කතාවෙහි දක්ෂ පුරුෂයන් තුන්දෙනෙකු කැඳවා යව! ගොස් රජ්ජුරුවන්ට කියව දේවයන් වහන්ස! ඒ වැලි යොතෙහි පමණ නොදන්නාහ. පරණ වැලි යොතින් රියනක පමණ රන් කැල්ලක් එව්ව මැනව. ඒ බලා ඊට සමාන යොතත් අඹරන්නාහයි කියව. ඉදින් තොපට රජ්ජුරුවෝ අපගේ ගෙයි වැලි යොතක් නම් කිසිකලෙකත් නොවූ විරූහයි කියත් නම් එවිට රජ්ජුරුවන් වහන්ස ඉදින් එසේ වීනම් නැගෙනහිර යවමැදුම් ගම් වැස්සෝ කෙසේ වැලියොතක් අඹරා එවත්දැයි කියාලවයි යවූසේක. ඒ පුරුෂයෝ මහ බොසතාණන් වහන්සේ වදාළ ලෙසම කළහ. රජ්ජුරුවෝ ඒ අසා ඒ පිළිතුරු මහෞෂධ පණ්ඩිතයන් අතින් එවන ලද්දකැයි දැන සතුටුවූහ.

## සොළොස් (16) වැනිවූ පොකුණකින් විමසූ තටාක ප්‍රශ්නය කෙසේදයත්?

දවසක් රජ්ජුරුවෝ දිය කෙළිනා කැමැත්තෝය. පස් පියුමෙන් ගැවසීගත් පොකුණක් එවත්වයි කියා යවූහ. එයද සමාන ප්‍රශ්නයකින් විසඳිය යුතුයයි සිතා මුබරී මිනිසුන් කීපදෙනෙකු කැඳවා තෙපි දිය කෙළ ඇස් ඔළිද ඇට සේ රතුකොට තෙත් ඉසකේ ඇතිව තෙත රෙදි පිළි හැඳ මඩ වැකුණු ශරීර ඇතිව වියදඬු කැට්වි මහත් කැට මුගුරු ගත් අත් ඇතිව රජගෙට ගොස් රජ්ජුරුවන් වැඳ දේවයන් වහන්ස! නුඹ වහන්සේගේ නියමය පරිදි යවමැදුම්ගම් වැස්සන් වූ අපි ඔබතුමාට දිය කෙළිනා පිණිස පස් පියුමෙන් සැදුම්ලත් පොකුණක් ඇරගෙන ආම්හ. ඒ පොකුණ මෙතෙක් කල් වනයේ තිබූ බැවින් මේ වනයටම පලා ගියාය. අපි පසුපස එලවා ගොස් කැට මුගුරු වලින් ගැසුවත් නවතා ගත නොහැකිවිය. නුඹ වහන්සේ මීට පෙර වනයෙන් ගෙන එන ලද පොකුණක් එව්ව මැනව! ඒ පොකුණ හා අපගේ පොකුණ එක්කොට යොදා ගෙනෙම්හයි කීය. රජ්ජුරුවන් විසින් කිසිකලෙකත් මා විසින් පොකුණක් නොගෙනාවෙමියි කී කල්හි එසේවීනම් දේවයන් වහන්ස නැගෙනහිරි යවමැදුම් ගම් වැස්සෝ පොකුණක් ඔබ වහන්සේට කෙසේ එවත්දැයි කියවයි කී සේක. උනුත් එසේම කළහ. රජ්ජුරුවෝ ඒ මිනිසුන් අතින් එය අසා ප්‍රීතියට පත්වූහ.

## සතළොස් (17) වැනිවූ උයනින් විමසූ ප්‍රශ්නය කෙසේදයත්?

නැවත දිනක් උයන් කෙළි කෙළිනා කැමැත්තම්හ. අපගේ උයන පරනව ගියේය. නැගෙනහිර යවමැදුම්ගම් වැස්සෝ චම්පකාශොක වකුල තිලකාදී පුෂ්පයන්ගෙන් පිරුණ අළුත් උයනක් එවත්වයි කියා යවූහ. පණ්ඩිතයන් වහන්සේ මෙයද සමාන පැනයකින් විසඳිය යුතුයයි මුබරී මිනිසුන් කැඳවා පෙරපොකුණට කියා යවූ පරිද්දෙන්ම කියා යවූ සේක. එවරද රජතුමා සතුටට පත්ව සේනකයන් අමතා පණ්ඩිතයන් ගෙන්වා ගනුමෝදැයි විචාළහ. ඔහු ඊර්ෂ්‍යා සහගත වූයේ මෙපමණකින්ම පණ්ඩිත නම්නොවෙති. පසුව හැකියයි කීය. එබස් ඇසූ රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයෝ තුමූ වැලි කෙළියේ පටන් විසඳූ මාංශ ආදී ප්‍රශ්න සතින්ම මා සිත් ගත්තාහ. උන්ගේ ප්‍රශ්න විසර්ජනය බුදු කෙනෙකුන්ගේ විලාසයම ඇත්තේය. සේනකයා උන් ගෙන්වීමට ඉඩ නොදෙයි. සේනකයාගෙන් මට කාර්‍ය්‍ය කිම්ද? පණ්ඩිතයන් ගෙනෙමියි මහත් පෙරහරින් යුක්තව පණ්ඩිතයන් වහන්සේ වසන නැගෙනගිරි යවමැදුම්ගමට නික්මුණාහ. එහිදී රජ්ජුරුවන් නැගීගිය මගුලසුගේ පය පැකිලී වලක වැටී බිඳී ගියේය. රජ්ජුරුවෝ එතනම සිට නැවතී නුවරට වන්නාහ. ඉක්බිත්තෙන් එසේ හැරී ආ

SANHIDA LANKA

වේදේහ රජ්ජුරුවෝ සමීපයට සේනක පණ්ඩිතයන් එළඹ දේවයන් වහන්ස පණ්ඩිතයන් ගෙන එන්නට යව මැදුම්ගමට වැඩිසේක්දැයි විචාළහ. එසේය පණ්ඩිතයෙනියි! රජ්ජුරුවෝ කීහ. දේවයන් වහන්ස! මම තවත් ප්‍රමාද වුව මැනවයි කියද්දීත් ඉක්බිතිව ගොස් මගුලසුගේ පය බිඳී ගියෝ වේදැයි කීහ. රජ්ජුරුවෝ එබස් අසා නිහඬව සිට නැවත දිනක් සේනකයන් අමතා සේනක පණ්ඩිතයෙනි! දැන් මහෞෂධ පණ්ඩිතයන් ගෙන්නමෝදැයි විචාළහ. එසේනම් දේවයන් වහන්ස! නුඹ වහන්සේ නොගොස් පණ්ඩිතයෙනි! තොපගේ සමීපයට එන්නාවූ අපගේ මගුලසුන් පය බිඳී ගියේය අශ්වතරයෙකු හෝ ශේෂ්ඨතරයෙකු එවත්වයි දූතයෙකු යැව්ව මැනව. ඉදින් අශ්වතරයකු එවත්නම් තුමූම එන්නාහ. ශේෂ්ඨතරයකු එවත්නම් පියාණන් එවන්නාහ. මෙය අපට ප්‍රශ්නයෙක්ද වන්නේමයයි කීහ. රජ්ජුරුවෝ යහපතැයි එලෙසම යවූහ.

## ගද්‍රභ ප්‍රශ්නය

මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ ඒ බස් අසා රජ්ජුරුවෝ මාද පියාණන් වහන්සේ ද දක්නා කැමැත්තෝයයි සිතා පියාණන් අමතා එපවත් ඔහුට සැල කොට නුඹවහන්සේ පළමුකොට සිටුවරුන් දහසක් පිරිවරා වැඩිය මැනව. රජ්ජුරුවෝ ඔබතුමා සමග පිළිසඳර කතාකොට සුදුසු අස්නක් බලා හිඳුවයි කියති. ඔබවහන්සේ එසේ කළ මැනව. මමද ඒ වේලෙහි එමි. රජ්ජුරුවෝ මටද සුදුසු අස්නක් බලා හිඳුවයි කියති. එවිට මම නුඹ වහන්සේගේ මූණ බලමි. ඒ සළකුනෙන් හුනස්නෙන් නැගී පුත මහෞෂධ පණ්ඩිතයෙනි! මේ අස්නේ හිටුවයි වදාළ මැනවි. එසේ කල්හි එක් පැනයෙක් අපට වන්නේ යයි වදාළසේක.

සිටාණෝ යහපතැයි ගිවිස පුතණුවන් කී සැටියේම ගොස් එපරිද්දෙන්ම රජ්ජුරුවන් සමීපයෙහි උන්නාහ. මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ සර්‍වාලංකාරයෙන් සැරසී කුමාරවරුන් දහසක් පිරිවරන ලදුව උතුම් රථයක හිඳ නුවරට වදනා සේක් අගල පිට තන කන එක් කොටළුවෙකු දැක ශක්තිමත් තරුණ පුරුෂයන් අමතා මේ කොටළුවා අල්වා ගෙන ශබ්ද නොනගින සේ මුඛය බැඳගෙන නොපෙන්නාගෙන එවයි වදාළසේක. පුරුෂයෝද එලෙසම කළහ. පණ්ඩිතයන් වහන්සේ ශක්‍රදේවේන්ද්‍ර ලීලාවෙන් නුවරට වන්සේක. කලින් පැතිරී ඇති කීර්තිය නිසා නුවර වැස්සෝ පණ්ඩිතයන් වහන්සේ දෙස බලබලා ස්තුති කළහ. පණ්ඩිතයොද රජවාසලට ගොස් දොරටුපාලයන් අත දන්වා යවා දහසක් කුමරුවන් සමග රජු සමීපයට ගොස් සිටිසේක. රජ්ජුරුවෝද ඔහු සමඟ මිහිරි කතාකොට පණ්ඩිතයෙනි! සුදුසු අස්නක් බලා හිඳුවයි කීහ. පණ්ඩිතයන් වහන්සේ පියාණන් දෑ මූණ බැලූසේක. එවිට පියාණෝ අස්නෙන් නැගී පණ්ඩිතයෙනි! මේ අස්නේ සිටුවයි කීහ. පණ්ඩිතයන් වහන්සේ පියා උන් අස්නෙහි වැඩ උන්සේක. එවිටම ඒ අසලම සිටි සේනක, පුක්කුස, කාවින්ද, දෙවින්ද පණ්ඩිතවරු සතර දෙනාද සෙසු නුවණැත්තහුද අත්ලෙන් අත්ල ගසා මහත් කොට සිනාසී මේ නුවණ නැති කෙනෙකි. තම පියා අස්නෙන් නගා තෙමේ අස්නේ හුන්නේය. මොහු නුවණැතියන් කියන්ට යුක්ති නැතැයි පරිභව කළහ. රජ්ජුරුවෝ දුර්මුඛ වූහ. එවිට මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් අමතා කිමෙක්ද? දේවයන් වහන්ස! කනස්සළු සේක්ද? එසේය පණ්ඩිතයෙනි! පියාණන් අස්නෙන් නඟා උන් හෙයිනැයි කීහ. කිමෙක්ද දේවයන් වහන්ස! ඔබවහන්සේ හැම තන්හිම පුතුන්ට වඩා පියෝම උතුම්හයි කියන සේක්දැයි විචාළසේක! එසේය පණ්ඩිතයෙනි! කීහ. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් අමතා ඔබ වහන්සේ අපට අශ්වතරයෙකු හෝ ශ්‍රේෂ්ඨතරයෙකු හෝ එවන්නැයි අසුන් යවනලදුදේ වේදැයි කියා හුනස්නෙන් නැගී මානවකයන් බැඳගෙන ආ කොටළුවා ගෙන්වා ගෙන රජ්ජුරුවන්ගේ පාමුල තබාල දේවයන් වහන්ස මේ කොටළුවා කෙතෙක් අගීදැයි විචාළසේක. රජ්ජුරුවෝ ඉදින් උපකාර ඇත්තේ වී නම් අටමස්සක් අගනේයයි කීහ. මූ නිසා සෛන්ධව කුලයෙහි වෙළඹ බඩ උපන් අජානීය අශ්වයා කෙතෙක් අගීදැයි විචාළසේක. පණ්ඩිතයෙනි! අගය නැතැයි කීහ. දේවයන් වහන්ස කුමක් හෙයින් එසේ කියන සේක්ද? ඔබතුමා දැන් හැමතැනම පුතුන්ට වඩා පියෝම උත්තමහයි කියන ලද්දේවේද? ඉදින් එය සැබෑවීනම් ඔබතුමාගේ වාදයෙහි අජානීය අශ්වයාට වඩා කොටළුවා උතුම් වන්නේය. කිමෙක්ද දේවයන් වහන්ස ඔබතුමාගේ පණ්ඩිතවරු මෙපමණකුත් දැනගන්නට අසමර්ථව අත්පුඩි ගසා සිනාසෙන්නාහ. ඔබ පණ්ඩිතවරුන්ගේ නුවණ විශේෂය ආශ්චර්‍ය්‍යී. ඔබතුමා කොයින් මුත් සොයාගත් සේක්දැයි පණ්ඩිතවරු සතරදෙනාට පරිභව කොට රජ්ජුරුවන්ට ගද්‍රභ ප්‍රශ්නයෙහි එම කාරණා ගාථාවකින් කියා දේවයන් වහන්ස පුතුනට වඩා පියාණෝ උතුම්නම් මපියාණන් ඔබතුමාට වැඩ පසස්නා පිණිස ගත මැනව. ඉදින් පියන්ට වඩා පුත්‍රයෝ උත්තමයෝනම් මා ඔබතුමා සමීපයෙහි රඳවාගත මැනවයි වඳාලසේක. රජ්ජුරුවෝ ඇතුළු සියළු රාජ පර්‍ෂද් පණ්ඩිතයන් විසින් ප්‍රශ්නය මනාකොට කියන ලදැයි ඔල්වර හඬ සහ සාධුකාර පැවැත්වූහ. සේනකාදී පණ්ඩිතවරු සතරදෙන දුර්මුඛ වූහ. (මහෞෂධ පණ්ඩිතයන් හා සමාන මව්පිය ගුණදත් අන් උතුමෙක් නැත) එසේ වුවද පියාණන් අස්නෙන් නගා තමා ඒ අස්නේ වැඩඋන්නේ පියාණන්ට අවමානයක් පිණිස නොවන්නේය. රජ්ජුරුවන් විසින් අශ්වතරයෙකුගේ ශ්‍රේෂ්ඨතරයෙකු එවන්නේයයි අසුන් යවන ලද හෙයින් ඒ පැනය විසඳුන පිණිසත් තමන් නුවණැති බව හඟවන පිණිසත් සේනකාදී පණ්ඩිතවරු සතරදෙනාගේ

SANHIDA LANKA

බැබලීම නැතිකරන පිණිසත් මෙසේ කළ බව දතයුතුයි.

## "මණි ප්‍රශ්නයයි"

රජ්ජුරුවෝ ඉතා සතුටට පත්වම මහෞෂධ පණ්ඩිතයන්ගේ දෙමාපියන්ට බොහෝ සතුටු පඬුරුදී පිටත්කර යවා පණ්ඩිත කුමාරයන් මෙවක් පටන් මාගේ පුතණුවෝ යයි බොහෝ සම්පත් දෙමින් ඇති දැඩි කළහ. දිනක් රජ්ජුරුවෝ පණ්ඩිතයන් විමසනු කැමතිවූහ. නුවර දකුණු වාසලට නුදුරුවූ තන්හි පොකුණුතෙර එක් තල් ගසක් උඩ කවුඩු කැදැල්ලක මාණික්‍ය රත්නයක් ඇත. එහි ඡායාව පොකුණෙහි පෙනෙන්නේය. පොකුණේ මැණිකක් ඇතැයි රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ සේනකයන් ගෙන්වා ඒ මැණික කෙසේ ගනුමෝදැයි විචාරා පැන් ඉස්සවා පියා ගැනීම සුදුසු යයි කී කල්හි එසේත් කොට මැණික නුදුටුවාහ. පොකුණෙහි දිය පිරී ගිය කල්හි නැවතත් මැණික පෙනෙන්නට විය. සේනකයන්ගේ උත්සාහය නැවත නැවතත් ව්‍යර්ථවූයේය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ කැඳවා ඒ මැණික ගත හැකිදැයි විචාළසේක. පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් වහන්ස බැරිනොවෙයි වැඩිය මැනවයි බොහෝ පිරිස සමග කැඳවා ගෙන ගොස් පොකුණු තෙර සිට මැණික බලන සේක්මි! මේ මැණික පොකුණෙහි නොවෙයි. මේ තල් ගහ උඩ වියයුතුයයි දැන දේවයන් වහන්ස පැන්තලියක් ගෙන්වා බැළුව මැනව! එහිද මැණික පෙනෙයි. මේ ඇත්තේ ඡායාවක්ය. මැණික වනාහි මේ තල්ගස උඩ කවුඩු කැදැල්ලේය. මිනිසකු නංවා ගත මැනවයි වදාළසේක. රජ්ජුරුවෝ මිනිසකු නංවා මැණික ගෙන බොහෝ ප්‍රීතියට පත්ව සේනක පණ්ඩිතයන්ගේ ක්‍රියාවට ගරහා රජ්ජුරුවන් කරපැළඳි රන් ලක්‍ෂයක් වටිනා මුත්හර දී කුමාරවරුන් දහසටද මුතුපට බැගින්දී රාජසේවයට එනවිට ඒවා පැළඳගෙන පැමිණිය යුතුයයි සම්මත කළහ.

මාංශ ප්‍රශ්නය ආදීවූ පැන දස නවය නිමි.

## "කකණ්ටක ප්‍රශ්නයයි"

නැවත දිනක් රජ්ජුරුවෝ පණ්ඩිතයන් සමඟ උයනට යන්නේ තොරණේ සිටි එක් බොහොඩෙක් එන්නාවූ රජ්ජුරුවන් දැක වහා බිමට බැස වැදහොත්තේය. ඒ දුටු රජ්ජුරුවෝ පණ්ඩිතයෙනි! මේ බොහොඩා කුමක් කෙරේදැයි විචාළහ. දේවයන් වහන්ස නුඹවහන්සේට සේවය කරන්නේයයි වදාළසේක. රජ්ජුරුවෝ එසේවීනම් ඕහට වස්තුවක් දෙමි. කුමක් දියයුතුදැයි විචාළහ. දේවයන් වහන්ස! රත්රන් වියැට සමාරක් පමණ වටිනා මස්දීම සුදුසු යයි වදාළසේක. රජ්ජුරුවෝ එසේවිනම් තවත් වැඩිය දෙමියි රත්රන් දෙවියැට සමාරක් අගනා මස් ගෙනහැර දෙවයි කියා එක් පුරුෂයෙකුට නියම කළහ. ඒ පුරුෂයාත් ඒ නියෝගය පරිදි දිනපතා මස් ගෙන බොහොඩාට දෙන්නේය.

ඒ පුරුෂයා එක් දවසක් පොහොය දිනයෙහි රාජසම්මත හෙයින් මස් නොලැබ දෙවියැට සමාරක් පමණවූ රත්රන් මැදින් විද බොහොඩාගේ කරේ බැන්දේය. බොහොඩාට ඒ රත්රන් මාලය නිසා මානයෙක් උපන්නේය. නැවත දිනක් රජ්ජුරුවෝ උයනට ගියහ. ඒ බොහොඩ තෙමේ රජ්ජුරුවන් එන්නවුන් දැක වස්තුව නිසා උපන් මානය කරණකොට ගෙන වේදේහයෙනි! වස්තුව ඇත්තේ තොපට පමණක් නොව මමත් වස්තු ඇත්තෙමි. රජ්ජුරුවන් හා සමඟ තමා සම කරන්නේ තොරණ අගින් නොබැස එහිම හිස සලමින් වැදහොත්තේය. ඒ දුටු රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයෙනි! මේ තෙමේ පෙරසේ අද නොබස්නේය. කුමක් හෙයින් මානය ඇතිවීදැයි ගාථාවකින් විචාළහ. පණ්ඩිතයන් වහන්සේ පොහෝ දවස් මස් නැති හෙයින් රාජපුරුෂයා විසින් තමා කරබැඳි රත්රන් දෙවියැට සමාර නිසා මානය ඔහුට වියයුතුයයි දැන එය ගාථාවකින් කියන සේක්. නොලත් විරූ වස්තුව ලදින් මමත් මා පමණ වස්තුව ඇත්තෙමි. වේදේහ රජුනි! තොපට වඩා මා අඩු කිමෙක්දැයි ඉක්ම සිතන්නේයයි මේ කකණ්ටක ප්‍රශ්නය විසඳා වදාළසේක. රජ්ජුරුවෝ බොහොඩාට මස් දෙන්නට නියෝග කළ පුරුෂයා ගෙන්වා පණ්ඩිතයන් කීවා සැබෑදැයි විචාළහ. ඒ වූ පරිද්දෙන්ම කීයේය.

SANHIDA LANKA

කිසිවකුගෙන් නොවිමසා සියල්ල බුදු මුවින් මෙන් බොහොඩාගේ අදහස දන්නා ලදැයි වඩ වඩාත් පැහැද පණ්ඩිතයන්ට සතර වාසල ලබන සුන්වත් අය දුන්හ. බොහොඩා කෙරෙහි කිපුණු රජ්ජුරුවෝ තමන් කළ නියෝගය අත්හළහ. ඒ පණ්ඩිතයන් වහන්සේ එය සුදුසු නොවේයයි නැවතත් නියම කළහ.

## සිරි කාලකණ්ණි ප්‍රශ්නයයි

මියුළු නුවර වැසි පිංගුත්තර නම් ළදරුවෙක් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි ශිල්ප

උගෙන නිමවූයේ, සිරිත් ලෙස ආචාර්‍යවරයා තමාගේ දෙවඟනක් බඳු දියණියද කැඳවා ගෙන යවයි ඔහුට පාවා දුන්නාහ. ඔහු නමින් පිංගුත්තර වුවද පින් නැත්තෙක. කාලකණ්ණිය. කුමාරිකාව මහ පිණැත්තීය. ඈ කෙරෙහි සිත නොඇළුන මානවකයා ඈ නුරුස්නේ ආචාරීන්ගේ බස් අකමැත්තෙන් ඉවසා රාත්‍රීයෙහි සකස් කර දුන් මංගල යහනෙහි සැතපීහ. කුමාරිකාව අවුත් ඇඳට නැගෙන්නාහාම මානවකයා ඇඳින් බැස බිම වැදහොත්තේය. කුමාරිකාවද ඇඳින් බැස ඔහු සමීපයට ගිය විට ඔහු එතනින් නැගිට ඇඳට යන්නේය. මෙසේ ඇඳට බිමට යාමෙන් වෙහෙසට පත් කුමාරිය ඇඳෙහිම සැතපුනීය. ඒ කාලකණ්ණියා බිම වැදහොත්තේය. මෙසේ සතියක් ආචාරීන්ගේ නිවසෙහි සතියක් යවා ඈ කෙරෙහි සෙනෙහෙ නැතිවත් ආචාරීන්ගේ බස පැහැර නොහැරිය හැකි බැවින් ඈ තමාගේ නුවරට කැඳවා ගෙන නික්මුණේය. අතර මගදී කිසි කතාබහක් පමණ කුදු නැති මියුළුනුවරට පැමිණියේ පලගත් දිඹුල් ගසක් දැක සාදුකින් පීඩිතවූයේ ගසට නැගීලා දිඹුල් කඩාගෙන කන්නට වන. කුමාරිකාවද සා දුකින් පීඩිත වූයේ මටත් දෙවයි ඇයදීය. ඇයි තිට අත්පා නැද්ද? ගසට නැගී දිඹුල් කඩාගෙන කවයි කීහ. සා දුකට වඩා දුකක් නැති හෙයින් කුමාරිකාවද ගසට නැග දිඹුල් කඩාගෙන කන්නටවන. මානවකයාත් ඈ ගසට නැගී බව දැන වහා ගසින් බැස ගසවට කටු ගසාලා කාලකණ්ණියා කෙරෙන් මිදිනියි කියාලා නුවරටම පැනගියේය. කුමරිය ගසමුල කටු හෙයින් බැසපීයන්ට නොහැකිව උඩම හුන්නීය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ එදවස් උයන්කෙළි කෙළ සවස්වේලේ නුවරටම වදනාහු දිඹුල් ගස උන් කුමාරිකාව දැක ඈ පිළිබඳව සිත් ඇතිව පුරුෂයන් ඇත්ත නැත්ත විචාරා පාවාදුන් ස්වාමියා පලාගිය බව අසා කුමාරිකාව ගසින් බස්වා ඇතුපිට නංවා ගෙන මාළිගාවට ගෙන ගොස් රුවන් රැසක් පිට සිටුවා අගමෙහෙසුන් කළහ. ඈ රජ්ජුරුවන්ට ප්‍රියය. මන වඩිති. දිඹුල් ගසදී දුටුබැවින් උදුම්බරා දේවිය යි ප්‍රසිද්ධ වූහ.

දිනක් රජ්ජුරුවෝ උයන් කෙළියට යන පිණිස ගම්වැස්සන් ලවා මාගීය ඉදිකරවූහ. පින්ගුත්තරයාද රාජසම්මත බැවින් මෙහෙවර කරන්නේ කැසපට කවාගෙන උදැල්ලකින් මග නසින්නටවන. මාගීය සාදා නිමවන්නට පෙර රජ්ජුරුවෝ උදුම්බරා දේවීන් සමග මංගල රථයෙන් උයන් කෙළියට නික්මුණාහ. උදුම්බරා දේවිය මාර්ගය සසිමින් සිටි ඒ කාලකණ්ණියා දැක මෙබඳු සම්පතක් දරාගත නොහැකි වීයයි උඟ දිසාව බලමින් සිනාසුනාහ. රජ්ජුරුවෝ බිසවුන් සිනාසෙනවා දැක කිපී කුමක් නිසා සිනාසෙන්නෙහිදැයි විචාළහ. බිසව ඊට හේතුව ඇතිසැටියෙන් කීවාය. රජ්ජුරුවෝ තී කියන්නේ බොරුය. අනික් පුරුෂයකු දැක තී සිනාසුනේය. තී මරමියි කඩුව කොපුවෙන් ඇදගත්හ. බිසව භයපත්ව දේවයනි! යළි පණ්ඩිතවරුන් විචාළ මැනවයි කීහ. රජ්ජුරුවෝ සේනකයන් අතින් විචාළහ. දේවයන් වහන්ස! මැගේ බස් නො අදහමියි කවරෙක් නම් මෙබඳු ගැහැණියක් හැරපියා නැගීයේදැයි කීහ. බිසව සේනකයන්ගේ බස් අසා වඩාත් බියවූහ.

ඉක්බිති රජ්ජුරුවෝ සේනකයා කුමක් දනීද? මහෞෂධ පණ්ඩිතයන් විචාරමියි සිතා පණ්ඩිතයන් අමතා ගාථාවකින් විචාරන්නාහු ස්ත්‍රීයක් තොමෝ අධික රූ ඇත්තීද ආචාරශීලී වූද ඈ පුරුෂයෙක් නොකමැත්තේල. තෙපි ඒ අදහව්දැයි විචාළහ. එබස් අසා දේවයිනි! මම අදහමි. පුරුෂයා දෛවය නැත්තේ වී නම් ශ්‍රී කාන්තාවද කාලකණ්ණියාද යන මොහු දෙදෙනා මුහුද එතෙර මෙතෙර සේද අහස හා පොළව සේද එක් නොවෙතියි වදාළහ. රජ්ජුරුවෝ ඒ අසා සතුටට පත්ව පණ්ඩිතයෙනි! ඉදින් තෙපි අද මෙතන නැත්තාහු නම් අනුවණ සේනකයාගේ බස් අසා මෙබඳු ගැහැණු රුවණක් නොලද්දේ වෙමියි. මසු දහසක් පූජා කළහ. ඉක්බිති බිසව රජ්ජුරුවන් වැඳ ස්වාමීනී! මේ පණ්ඩිතයන් නිසා මාගේ දිවි ලද්දේ වෙමි. එබැවින් මොහු මාගේ මලනු තනතුරෙහි තබා ගැනීමට අවසරය දෙනු මැනවි. මොහු හැර කිසි මිහිරි රසයක් අනුභව නොකරමි. කැමති වේලාවක වාසල් දොර හරවා පණ්ඩිතයන්ට මිහිරි රසයක් යවන්නට ලබන වරයක් ගතිමියි වර ලබාගත්හ.

## එළක ප්‍රශ්නයයි

එක් දවසක් රජ්ජුරුවෝ එක් එළුවකු හා බල්ලකු හිතමිත්‍රකමින් වාසය කරනවා සී මැඳුරු කවුළුවෙන් දුටහ. දිනක් එළුවා ඇත්හළ තුලට ගොස් ඇතුන්ට ලාලූ තණ අනුභව කොට ඇත්හලයාගෙන් පිට අවුරා පහරක් ලබාගෙන වේදනාවෙන් මිරිකි මිරිකී ගොස් රජගෙයි අගුවේ වැද හොත්තේය. එදවස්ම බල්ලාත් මුළුතැන්ගෙට ගොස් මාංශ අනුභව කොට අරක්කැමියාගෙන් පහර කා වේදනාව විදිමින් එන්නේ කෙඳිරිගාමින් පසුවන තම මිත්‍ර එළුවා දැක සබඳ දැන් ඉතින් කෙසේ ජීවත්වමෝදැයි කීහ. එළුවා කියන්නේ මිත්‍රය! තොප තණ

SANHIDA LANKA

නොකන බැවින් තොප ගැන සැකයෙක් නැත. ඇත්හළට ගොස් එහි හැසිර අවසරයක් බලා තණ කට්ටයක් රැගෙන එව. මා ගැනද සැක නොකරන බැවින් මමද මුළුතැන්ගෙයි හැසිර අවසරයක් බලා මස් කැටියක් රැගෙන එන්නෙමි. එය තොපට අනුභව කරත හැක. මේ නියායෙන් අපි දෙදෙනා ජීවත්වන්නමෝවේදැයි කීහ. උන් දෙදෙනා මෙසේ සැපසේ වෙසෙති.

රජ්ජුරුවෝ උන්දෙන්නාගේ මිත්‍ර ධර්මය දැක මා විසින් නොදුටු විරූ කාරණයක් දුටුවෙමි. මොහු දෙන්නා ඔවුනොවුන්ට පස මිතුරුවත් එකට වාසය කරති. මේ කාරණය අලලා පැනයක් ගොතා පණ්ඩිතවරු පස්දෙනාගෙන් අසා ඒ නොදත් කෙනෙකුන් රටින් යවන්නෙමි. දත් කෙනෙකුන්ට උපකාර කරන්නෙමි. අද වේලා මදව ගියේය. සෙට සේවයට ආකල විචාරන්නෙමියි සිතූහ. දෙවන දින සේවයට අවුත් උන් කල්හි ගාථාවකින් මේ සත්ව ලෝකයෙහි කිසි විශ්වාසයෙක් නැති පසමිතුරු වූ දෙදෙනෙක් සබඳවූහ. මිත්‍ර ධර්මය පවත්වමින් ඇවිදිනාහ. එයට කරුණු කිමෙක්දැයි කීහ. අද පෙරවරු වේලෙහි මේ පැනය නොවිසඳන්නහු නම් තොප හැම දෙනම රටින් නෙරපන්නෙමි. නුවණ නැත්තවුන්ගෙන් මට ප්‍රයෝජණ නැතැ"යි කීහ. සේනකයෝ මුල් අසුනෙහි හුන්හ. මහෞෂධ පණ්ඩිතයෝ කෙළවර අසුනෙහි වැඩ උන්සේක. උන්වහන්සේ ඒ පැනය පරීක්ෂා කෙරෙමින් අර්ථනොදැන "මේ රජතෙමේ බොළඳ ගුණ ඇත්තේය. මේ පැනය සිතා ගෙන දැනගන්ට නොපොහොසත. ඔහු විසින් කිසිවක් දක්නා ලදැයි සිතා එක දවසකට අවසර ලබන්නෙම් වීනම් මේ පැනය දැනගනිම් යි සිතූසේක.
සේනකාදී පණ්ඩිතවරු සතරදෙන අඳුරු ගබඩාවකට වන්නවුන් මෙන් කිසිවක් නුදුටුවහ. එබැවින් රජ්ජුරුවන් වැඳ එක්දිනයකට අවසර ලබාගෙන ගියාහ. මහෞෂධ පණ්ඩිතයෝද හුනස්නෙන් නැගී උදුම්බරා දේවීන් සමීපයට ගොස් දේවීන්වහන්ස අද හෝ ඊයේ රජ්ජුරුවෝ බොහෝ වේලාවක් කොතැන සිටියෝ"දැයි විචාළසේක.
සේනකාදී පණ්ඩිතවරු සතරදෙන අඳුරු ගබඩාවකට වන්නවුන් මෙන් කිසිවක් නුදුටුවහ. එබැවින් රජ්ජුරුවන් වැඳ එක් දිනයකට අවසර ලබාගෙන ගියාහ. මහෞෂධ පණ්ඩිතයෝද හුනස්නෙන් නැගී උදුම්බරා දේවීන් සමීපයට ගොස් දේවීන්වහන්ස! අද හෝ ඊයේ රජ්ජුරුවෝ බොහෝ වේලාවක් කොතැන සිටියෝ" දැයි විචාළසේක.
මලණ්ඩ සී මැදුරු කවුළුවෙන් පිටත බලමින් සක්මන් කළහයි බිසව කීහ. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් මේ දිසාවේ කිසිවක් දක්නාලද වන්නේයයි සිතා ඒ ස්ථානයට ගොස් පිටත බලා එළුවාගේ හා බල්ලාගේ ක්‍රියාව දැක මේ දෙදෙනා ගැනම මේ පැනය සලකන ලදැයි සනිටුහන් කොට ගෙන ගෙට වැඩිසේක. පුක්කුසාදී වූ අනික් තුන්දෙනාට ප්‍රශ්නය විසඳා ගත නොහැකිව එක්ව පැනය නොවිසඳු කල්හි රජ්ජුරුවෝ කිපෙති. කුමක් කරමෝද? අපට වර්ෂයක් සිතුවත් මෙහි අදහස නොවැටහෙයි. මහෞෂධ පඬිතුමා මෙය සත සහශ්‍ර ගුණයෙන් සිතා නිමවා ඇත. උන් සමීපයට යම්හයි එහි ගොසින් එකත්පස්ව සිට පණ්ඩිතයෙනි! නුඹවහන්සේ විසින් පැනය විසඳන ලදදැයි විචාළහ.

උන්වහන්සේ මා පැනය නොවිසඳනකල්හි භුවනත්‍රයේ අනික් කවරෙක් විසඳන්නේද? එසේය පැනය සිතන ලදැයි වදාළසේක. අනික් පණ්ඩිතවරු සතරදෙන එසේවීනම් අපටත් වදාළ මැනවයි කීහ. මහාකරුණා ගුණයෙන් යුතු මහතාණෙනි" ඉදින් මම මුන් සතරදෙනාට පැනය නොකියෙන්නම් රජ්ජුරුවෝ මේ ජඩ කොල්ලන් සතර දෙනාවම රටින් නෙරපනාහ. මට සත්රුවනින් පුදන්නාහ. එය මාගේ කරුණාවට තරම් නොවේයයි උන් කෙරෙහි කරුණාවෙන් උන් මිටි අසුන්වල හිඳුවා තමා දෙසට දොහොත් මුදුන්දී වැඳගෙන ඉන්නා ලෙස නියමකොට රජ්ජුරුවන් දුටු නියාව නොහඟවා රජ්ජුරුවන් විචාළකල මෙසේ කියවයි ගාථාසතරක් උගන්වා එහි අර්ථය නොවුගන්වා යවූසේක.

දෙවන දින රාජ සභාවේදී සේනකයෝ දේවයන් වහන්ස මා පැනය නොදන්නා කළ අනික් කවරෙක් දනීදැයි වැඳුවන් ඉදිරියෙහි කොළඹු ලන්නාසේ මහෞෂධ පණ්ඩිතයන් හමුවෙහි තමාගේ වියත්කම අඟවා කලින් ඉගෙන ගත් ගාථාව කීහ.

SANHIDA LANKA
ඒ ගාථාවේ අදහස නම්:- ප්‍රසිද්ධ අමාත්‍ය පුත්‍රාදීන්ට එළුමස් ප්‍රියය. ඔවුහු බළුමස් අනුභව නොකරන්නාහ. එසේවූ බල්ලාගේ හා එළුවාගේ සමගි සංඛ්‍යාත විශ්වාස වී" ගාථාව කී මුත් සේනකයෝ අර්ථය නොදන්නාහ. රජ්ජුරුවෝ අර්ථය තේරුම්ගෙන පුක්කුසයන් අතින් විචාළහ. ඔහුද කටමැත දොඩා කටපාඩම් කරගත් ගාථාවකීහ.
එහි අදහසः- අසුපිට ඇතිරීම සඳහා එළුසම් ගන්නාහ. බල්ලන්ගේ සම් නොගන්නාහ. එසේ වුවද එළුවාගේ සහ බල්ලාගේ විශ්වාසය වී ඔහුද අර්ථය නොදත් නමුත් රජ්ජුරුවෝ එයද තේරුම්ගෙන කාවින්ද පණ්ඩිතයන්

අතින් විචාළහ. උයිත් තමා උගත් ධර්මය නොදත් ගාථාව කීහ. ඒ ගාථාවේ අදහස මෙසේ දතයුතුයි:- එළුතෙමේ ඇඹරී ඇති අංඇත්තේය. බල්ලාට අං නැත්තේය. එළුතෙමේ තණ හා කොළ කන්නේය. බළුමස් නොකන්නේය. බළුතෙම සාවුන් හා බළලුන් කන්නේය. එසේද වුවත් එළුවාගේ හා බල්ලාගේ විශ්වාසය වී"

මෙසේ සේනකාදී සතරදෙන තමන් උගත් ගාථා පමණක් කී කල්හි රජ්ජුරුවෝ අර්ථ දත් හෙයින් නොවිමසා පස්වැනි
වූ අසරණ සරණ මහෞෂධ පණ්ඩිතයන් අතින් විචාළහ. උන්වහන්සේ එසේ නම් ඇසුව මැනවයි සිංහනාද කොට තත්වූ පරිදි ගාථා දෙකකින් කීසේක. "සතර පයෙහි අටකුරෙක් ඇති එළුතෙමේ මස්ගන්නා වේලෙහි කිසි කෙනෙකුන්ට නොපෙනී මේ බල්ලාට මස් ගෙනෙන්නේය. මේ බල්ලාද එළුවාට තණ ගෙනෙන්නේය. මොවුන් දෙදෙනාගේ පෙරළිය ජන ප්‍රධාන වූ වේදේහ රජතෙමේ ප්‍රසාදයෙහි සිටියේ දිටීයයි වදාළසේක. රජ්ජුරුවෝ සතර දෙනා ගැනම පැහැදී ගාථා දෙකකින් ඔවුන්ට ප්‍රශංසාකොට අජානීය අශ්වයින් යෙදූ අලංකාර රථයක් සමග සියළු සැපතින් සමෘද්ධ වූ ගම්වරය බැගින්ද දෙවූහ.

## "සිරිමන්‍ද ප්‍රශ්නයයි''

උදුම්බරාදේවී වනාහි සේනකාදී පණ්ඩිතවරු සතරදෙනම මහෞෂධ පණ්ඩිතයන් නිසා ප්‍රශ්නය දත් බව දැන රජ්ජුරුවන්ට එය සැළකොට දේවයන් වහන්ස ඒ සේනකාදී සතරදෙන කුමක් දනිද්ද මහෞෂධ පණ්ඩිතයෝ වනාහි මේ අඥානයෝ සිව්දෙන නොනසිත්වයි සිතා පැනය ඉගැන්වූහ. නුඹවහන්සේ හැම දෙනාටම සමසේ උපකාර කළ සේක. ඒ අයුක්තියයි කීහ. රජ්ජුරුවෝ තමන් නිසා පැනය දත්බව නොකීවූයයි මහෞෂධ පණ්ඩිතයන් කෙරෙහි වඩාත් පැහැදී වඩා උපකාරයක් කරනු කැමතිව මපුතනුවන්ගෙන් එක් පැනයක් විචාරා මහත් සත්කාර කරන්නෙමියි සිතුහ.මෙසේ සිතා සිරිමන්‍ද ප්‍රශ්නය ගොතාගෙන දිනක් පණ්ඩිතවරුන් සේවයට ආ කල්හි සේනක පණ්ඩිතයෙනි පැනයක් විචාරමි. කියව. "නුවණ ඇති සම්පත් නැති, පිරිවර සම්පත් ඇති නුවණ නැති" මුන් දෙන්නා අතරෙන් නුවණැත්තෝ කවුරුන් උතුමැයි කියද්ද? වහාම කියවයි කීහ. එවිට සේනකයන් මහරජ්ජුරුවනි ඒකාන්තයෙන් නුවණැත්තෝද නුවණ නැත්තෝද ශිල්ප දත් නොදත් අයද උතුම් ජාති ඇත්තාහුද සම්පත් ඇති තැනැත්තහුට යටත්වන්නාහ. මේ කාරණය දැන කියමි. නුවණැති තැනැත්තේ යටත්මය. සම්පත් ඇති තැනැත්තේ උතුමැයි කීහ.

රජ්ජුරුවෝ සේනකයාගේ බස් අසා සෙසු තිදෙනා අතින් නොවිමසා කෙළවර උන් මහෞෂධ පණ්ඩිතයන් අතින් විචාළහ. එවිට පණ්ඩිතයන් වහන්සේ දේවයන් වහන්ස! කිසි ලාභ සම්පත්තියක් ලදින් උතුම්යයි සිතන්නාවූ අඥානතෙමේ පස්පව් කරන්නේය. ඔහු ඉසුරු මදයෙන් පව්කොට නරකාදියෙහි උපදනේය. නුවණ නැති හෙයින් මෙලොවද පරාජයක් ගන්නේය. මේ කාරණය දැක මම නුවණැත්තේම උතුම්යයි වදාළසේක.

එවිට රජ්ජුරුවෝ සේනකයන් මුහුණ බලා ආචාර්යයෙනි! මහෞෂධ පණ්ඩිතයෝ ළදරුවෝය. උන්ගේ කටින් තවම කිරි සුවඳ හමන්නේය. මේ බාල දරුවෝ කුමක් දනිද්දැයි ගාථාවකින් කියා මේ නුවණතෙමේ භොගසම්පත් සිද්ධ නොකරන්නේය. ඊට හේතු කවරේද? දෙතොළින් බස්නා කෙළධාරා ඇති රූප සම්පත්තියක් නැති ධන සම්පත්තියෙන් යුතුව සුවවිඳිනා මේ ගොරිමන්‍ද නම් සිටුහු ශ්‍රී කාන්තා සෙවුනිය. දේවයන් වහන්ස බලා වදාළ මැනව මේ කාරණය දැක නුවණැතිවත් ඉසුරුමත් තෙමේ උතුමැයි මම කියමියි කීහ.

ඒ ගොරිමන්ද සිටාණෝ ඒ මියුළු නුවරම අසූකෙළක් සම්පත් ඇති සිටාණ කෙනෙකි. විරූපය දූ පුතුන්ද නැත්තාහ. ශිල්ප නොදත්හ. කථා කරන කල්හි ඒ සිටාණන්ගේ දෙතොළින් කෙළධාරාවන් වැගිරෙන්නේය. දෙපසින් සිටින සියළු ආභරණයෙන් සැරසුන රූපත් ස්ත්‍රීන් දෙදෙනෙක් නිලුපුල් මලින් ඒ කෙළ පිස වීථියට දමන්නාහ. රා සොඬහුද රා හලට යන්නාහු කෙළ පිසදැමූ මල්ගෙන සෝදා පැළඳගෙන රා හලට වදනාහ. ගොරිමන්‍ද සිටාණෝ මෙබඳු සම්පත් ඇත්තාහයි සේනකයෝ මෙය ශාක්ෂි කොට කීහ.

SANHIDA LANKA

එවිට මහෞෂධ පණ්ඩිතයෝ දේවයන් වහන්ස! සේනකයෝ කුමක් දනිද්ද? බත්හුළු ඇහිඳ කන කපුටුවකු වැන්න. තමාපිට හෙන පහර නොබලා කිරිබොන්නට වන් බල්ලකු වැන්න. මෙලොව විඳින සම්පතම බලයි නුවණැත්තේ සුවයක් ලදින් එහිම ඇළුනේ කුසල කර්මයෙහි පවා වන්නේය. දුකින් වඩනා ලද්දේ විශේෂයෙන්ම මුලාබවට පත් වන්නේය. එබැවින් නුවණැත්තේම උතුමැයි මම කියමි කීහ.

එබස් ඇසූ සේනකයෝ දේවයන් වහන්ස! මූ කුමක් දනීද? ඵලසම්පන්නවූ ගසටම පක්ෂීහුම එළබෙන්නාහ.

එපරිද්දෙන්ම බොහෝ වස්තුව ඇති පුරුෂයා බොහෝ දෙන තමන්ට වැඩ පිණිස සෙවිනාහ. මේ කාරණය දැක ධනවත් තැනැත්තේම උතුමැයි කියමියිකීහ.

එසඳ මහෞෂධ පණ්ඩිතයෝ රජතුමනි! "පවත්වන ලද අනසක ඇති නුවණ නැත්තේ උතුම් නොවෙයි. කුමක් හෙයින්දයත්? ජනයාට දුක්දී වස්තුව ලබන්නේය. ඒ හේතුවෙන් නරකාදියෙහි යමපල්ලෝ ඔවුන්ව හඬව හඬවා වද දෙන්නාහ. මෙයින් ඉසුරුවත් වූවත් නුවණ නැත්තේ උතුම් නොවෙයි යයි කියමියි වදාළසේක.

ඒ ඇසූ සේනකයෝ රජ්ජුරුවන් වහන්ස ඇල දොළ කඳුරැලි ආදී කිසි ජලාශ කෙනෙක් ගලාගොස් ගඟට අඬාබසිත්ද ඒ හැම දෙනම තමාගේ පෙර නම් හරනාහ. ගංගා ජලය මුහුද හා එක්වීමෙන් ගංගා යන නම අත්හැර මුහුද යන නම ලබන්නේද? එපරිද්දෙන් ලො වැස්සෝ තුමූ සම්පත් ඇත්තවුන්ම පිහිටකොට ඇත්තාහ.

සේනකයෝ "අසනුමැනව දේවයන් වහන්ස! යමෙක් ඉසුරුමත් නම් ඒ පුරුෂතෙම මහපිරිස් පිරිවරා අධිකරණයෙහි හිඳ යමක් කියන්නේ නම් තේජස්වී හෙයින් සභා මධ්‍යයෙහි ඔහුගේ බසම නැගෙන්නේය. ඉසුරුමත් නොවූ ප්‍රඥාවන්තයාට එසේ නොකොට හැක්ක. එසේ හෙයින් ශ්‍රීමත් තැනැත්තේම උතුමැයි කියමි. මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ රජතුමනි! මද නුවණැති බාලතෙමේ අනුන් නිසාවත් තමා නිසාවත් බොරු බෙනෙයි නම් හේ සභා මැද නින්දාත් ලබයි. පරලොව අපාය ගාමීද වෙයි. මේ කාරණයෙන් නුවණැත්තේම උතුම් වෙයි.

සේනකයෝ, මහරජුනි! වී නැළියක් පමණවත් නැති වෙලාවෙන් වෙලාවට දුකසේ ජීවත්වන පොළව සමාන නුවණැත්තේ සභා මාධ්‍යයේ ඉඳ ඉදින් යමක් කියානම් ඔහුගේ වචනයට සභාව නො නැගෙන්නේය. යමෙක් ඉසුරුමත් නම් ඔහු ඉදිරියේ නුවණැත්තේ කදෝ පැණියකු මෙන් වන්නේය. ඉසුරුමතාම ශ්‍රේෂ්ඨ යයි කියමි.

එවිට මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ වදාරණසේක් රජතුමනි! නුවණ මඳ තැනැත්තහු දිරාගිය හැවයක් හරන සර්පයකු මෙන් තමා කරා එන ශ්‍රී තොමෝ හරනීය. ඊට කාරණා කිමෙක්ද? යතහොත් ප්‍රථම කල්පයෙහි අකුසල් නම් කළු හෝ සුදු බව නොදන්නා මිනිසුන්ට ආයු බොහෝ සමයෙහි දඹදිව චේතිය නම් රජෙක් ඇතිවූහ. උන්ගේ ශරීරයෙන් සුවඳ හමන්නේය. මුඛයෙන් මහනෙල් මල් සුවඳ විහිදෙන්නේය. ආකාශයෙහි පලක් බැඳගෙන ඉඳිනට සෘද්ධි ඇත්තාහ. කාමාවචර දෙවියෝ සතර දෙනෙක් රැකවල්ගෙන සිටිනාහ. දසදහසක් යොදුන් දඹදිවට අගරජ කරන්නාහ. එසේවූ චේතිය රජ්ජුරුවන් කී බොරුවෙන් ශරීරයෙන් හා මුඛයෙන් දුගඳ හමන්නට වන රැකවලෙහි යෙදුන දෙවියෝ නැගී ගියාහ. සෘධි නැතිවිය. ජීවමාන ශරීරයෙන් පොළව විවරව අවීචියෙන් ගිනිදැල් අවුත් නරකයට ඇදගෙන ගියහ. මේ කාරණයෙන්ම නුවණ නැති තැනැත්තේ උතුම් නොවෙයි කියමි.

එසඳ සේනකයෝ, දේවයන් වහන්ස! නුවණින් තීරණය කළ යුතුවූ කාරණයෙහිම සැක උපන් කල සේනකාදී පණ්ඩිතවරුන් කැඳවයි ඔබවහන්සේ සක්දෙව් රජහු මෙන් මහත් සම්පතින් සිටිනා සේක. ඉදින් නුවණැත්තහු උතුම් වුවහොත් ඔබවහන්සේ අපට යටත් වුවමනාවේද? එසේ නොවන හෙයින් පරිවාර සම්පත් ඇති තැනැත්තේම උතුමැයි කියමියි කීහ.

රජතුමා ඇමතු මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ දේවයන් වහන්ස! මේ අනුවණ සේනකයා කුමක් දනීද? ඇසුව මැනව! නුවණින් විසඳිය යුතු යමක් උපන් කල්හි නුවණ නැති ඉසුරුමත් තැනැත්තේ නුවණ ඇත්තහුට ගැත්තකුමෙන් පවත්නේය. නුවණැත්තේ සියුම්වූ යුක්තිය සැකහැර කියාද එබඳු කාරණයෙනුදු නුවණැති තැනැත්තේ මුළාවට පැමිණෙන්නේය. මේ කාරණය දැක නුවණැත්තේම උතුම්ය. සම්පත් ඇති නුවණ නැති තැනැත්තේ උතුම් නොවේයයි වඳාළ සේක.

SANHIDA LANKA

මේ ඇසූ සේනකයෝ කොටුවෙහි පැටවූ විකා නිමවූ මීයෙකුමෙන් උගත් උත්තර නිමවා පියා කියාගතයුතු දෙයක් නොමැත්තේ කරබා ගෙන කොඳුරු කොඳුරා සිතිවිල්ලේ උන්නේය. එදින සේනකයෝ අනික් උත්තරයක් ගෙනහැර කිවුනම් ගාථා දහසකින්වත් මේ උම්මග ජාතකය නොනිමෙන්නේය. ඉක්බිති මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ ප්‍රඥාවම වර්ණනා කොට වඳාළසේක. එයින් ප්‍රමුදිත වූ රජතුමා ප්‍රශංසා කොට ගෙරි දහසක්ද සරසන ලද හස්ති රාජයෙක් සහ අජානීය අශ්වයන් යෙදූ රථ දහසක්ද ලක්ෂය බැගින් අය ලැබෙන නියම්ගම් සොළොසක්ද දෙවූහ.

## "ඡන්ත පඨ ප්‍රශ්නයයි"

එතැන් පටන් මහෞෂධ පණ්ඩිතයන්ගේ යසස කිරිමුහුද පරිද්දෙන් මහත් වූයේය. උදුම්බරා දේවිය පණ්ඩිතයන්ගේ දුක සැප නිතර විචාරන්නී සොළොස් හැවිරිදිවූ කල මාගේ මළණුවෝ වැඩිමළුව සිටගත. යශසත් මහත. උන්ට සමාන කුලයකින් සරණපාවා දෙන්ට සුදුසුයයි සිතූ එපවත් රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝද සොම්නස්ව යහපත සොඳුර එපවත් උන්ට කියවයි කීහ. එය දැනගත් පණ්ඩිතයන් වහන්සේ "අනුන් පාවාදෙන කුමාරිකාවක් කිසිසේත් මට අභිප්‍රාය නොවන්නීය. එහෙයින් මමම පළමුකොට සොයා ගනිමියි සිතා දේවීන් වහන්ස! කීප දවසක් රජ්ජුරුවන් වහන්සේට මා අසවල් කාර්යයට ගියයි නොකිව මැනව! කුමාරිකාවත් පරීක්ෂාකොට ඔබ වහන්සේට දන්වා ලමියි කීහ. එසේ පවසා එක්තරා වේශයකින් සන්නාලි උපකරණ ගෙන හුදකලාව උතුරු වාසල් දොරින් නික්ම උතුරු යවමැදුම් ගමට වැඩිසේක.

එගම දුප්පත්ව සිටි පුරාතන සිටුකුලයෙක "අමරාදේවී" නම් රූපත් මහා පිනැති දුවක් වූවාය. ඈ එදවස හුළුකැන් පිසගෙන පියාණන් සානතැනට යන්නී පණ්ඩිතයන් වඩනා මගට පිළිපන්හ. පණ්ඩිතයන් වහන්සේ ඒ කුමාරිකාව දැක "මෝ තොමෝ මට බිරින්දට සුදුසුයයි සිතූසේක. අමරා දේවියද පණ්ඩිතයන් දැකලා ඉදින් මෙබඳු පුරුෂයෙක් ඇත්නම් වස්තු රැස්කරන්ට පිළිවනැයි සිතූහ. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ මැගේ සැමියන් ඇති නැති බව නොදනිමි. එපවත් හස්ත මුද්‍රායෙන් විචාරමි. ඉදින් මෙ නුවණැත්තී විනම් එය දැන ගන්නීයයි සිතා දුර සිටම "ඇඟිලි හකුළුවා මිට හළසේක". ඈත් මේ පුරුෂයා මාගෙන් සැමියන් ඇත්ත, නැත්ත විචාරන්නේයයි දැන "අත්ල විදහාලූහ" පණ්ඩිතයන් වහන්සේ ඈ සරණ නූනබව දැන සමීපයට ගොස් සොඳුර! තෙපි කිනම්මු දැයි විචාළේය. ස්වාමීනී! ගිය දවස වේවයි දැන් වේවයි මතු දවස වේවයි මුළු ලෝකයෙහි යම් නමෙක් ඇත්නම් මම ඒ නම්"යි කීහ. ඇගේ නම අමරා" බව දැනගත් පණ්ඩිතයන් වහන්සේ සොඳුර කවුරුන්ට කැඳගෙන යව්දැයි විචාළහ. පූර්‍ව දේවතාවන්ට යයි කීහ. පූර්‍ව දේවතාවෝ නම් මව්පියෝය. තොපගේ සිටාණෝ කුමක් කෙරෙත්දැයි විචාළහ. එකක් දෙකක් කෙරෙතියි කීහ. එකක් දෙකක් කිරීම නම් සී සෑමය. තොපගේ පියාණෝ කොතනක සාත්දැයි විචාළසේක. යම් තැනකට එක්වරක් ගිය කෙනෙක් නොඑද්ද එතැනයයි කීහ. එසේ තැන නම් සොහොනය. සාන්නේ සොහොනක් සමීපයේය. සොඳුර! අදම එව්දැයි විචාළසේක. ඉදින් ආවොත් නොඑමි. නාවොත් එමි. කීහ පියා ගඟකින් එතර සාති. ගඟදිය ආවොත් නො එන නියාව කී බව තේරුම්ගෙන එසේදැයි විමසීය. එසේයයි කීහ. ඉක්බිති අමරාදේවී හුළුකැන් පූව මැන. ස්වාමීනි පැවරූහ. පණ්ඩිතයන් වහන්සේ ප්‍රථමයෙන් කළ ආරාධනාව නොඉවසීම අවමඟුලැයි සිතා යහපත බොමියි වදාලසේක. අමරා දේවිය කැඳ සැලිය ඉසින් බා තැබූහ. පණ්ඩිතයන් වහන්සේ ඉදින් මණ්ඩය නොදෙව අතට පැන් නොදීම කැඳ අතට දිනි නම් මෙතැනම හැරපියා යෙමි'යි සිතූසේක. ඈ මණ්ඩයෙන් පැන් ගෙන අතට දීලා සිස් මණ්ඩය අත නොතබා බිම තබා සැළියේ කැඳ අල්ලා හුළු කැනින් මණ්ඩය පුරාලූහ. ඒ කැඳෙහි හුළු මඳ වූයේය. පණ්ඩිතයන් වහන්සේ කිමෙක්ද? සොඳුර! හුළුකැන් ඉතාම බොල්වනැයි වදාළසේක. පැන් නොලද්දේය. ස්වාමීනියි කීහ. තොපගේ කුඹුර පූදිනා අහදිය නොලද්දයි සිතමියි වදාරා හුළු කැන් සියල්ලම පානය කොට අත කට සෝදා

සොඳුර! තොපගේ ගෙට මග කියවයි වදාළසේක.
අමරාදේවිය යහපතැයි, ගෙට මග කියන්නී "මේ මග ඔස්සේ ගොස් ඇතුළු ගමට වන්කළ යම් තැනක අත්සුණු තබා විකුණන සල්පිලක්ද ඉන් ඔබ්බට ගියකල යම් අතකින් අනුභව කරත්ද ඒ අත මග යන්ට කියමි. ඒ යව මැඳුම්ගම අපගේ දෙමාපියන්ගේ ගෙට මඟය. මා හඟවා කීමග දැන වදාළ මැනවයි" කීහ.

## "ස්ත්‍රී ප්‍රශ්නයයි"

මෙසේ අමරා දේවිය පණ්ඩිතයන් වහන්සේට මග කියාලා පියාට හුළුකැන් ගෙනගියාය. පණ්ඩිතයන් වහන්සේ ඇගේ ගෙට වැඩ මෑණියන් පෙන්නූ අසුනක හිඳ පුතණ්ඩ! හුළු කැඳක් පූව මැනවයි දුන් බදුන ප්‍රතික්ෂෙප කොට මෑණියෙනි! අපගේ නැගණියෝ අමරාදේවී මගදී කැදිත්තක් පෙවූහයි වදාළසේක. මෑණියෝ මේ මාගේ දියණියන් නිසා ආ කෙනෙකැයි සිතූය. පණ්ඩිතයන් වහන්සේ උන් දුක්පත් නියාව දන්නාහුද මෑණියෙනි! මම සන්නාලියෙක්මි. ගෙත්තම් කටයුතුවූ කිසිවක් ඇද්දැයි විචාරා පුතණ්ඩ! මැසිය යුතුදේ ඇතත් ඊට ගෙවිය

SANHIDA LANKA

යුතු මිලයෙක් නැතැයි කී කළ මැණියෙනි! මිලෙන් කම්නැත. ගෙනෙවයි වදාරා ඒ සියල්ල තමාගේ පුණ්‍ය බලයෙන් මොහොතකින් නිමවාදී මැණියෙනි! වීරියක් පාසා අඩගා පියවයි වදාරා ගම ඇත්තන් ගෙනා සියළු කඩින් සන්නාලි මේවර කොට එක දවසින් මසු දහසක් ලත්සේක. මැණියෝ දාවල් බත් පිස කවා පුතණ්ඩ රෑට සාල් කෙතෙක් ගරම්දැයි විචාරා ගෙදර සියළු දෙනාටම බත් පිසුව මැනවයි වදාරා රාත්‍රියෙහිද රස මස වුලෙන් යුතුව බත් අනුහව කොට අමරා දේවීන් විමසන සේක්. කීපදවසක් එහිම විසූසේක.

දිනක් උන් විමසන සේක් අමරාදේවීනි! හාල් මනාවක් ගෙන ඉන් මට කැඳත් බතුත් අවුලු පතුත් පිසවයි කීහ. ඇත් එක සාල් මනාවෙන් මෙතෙක් දෑ කෙසේ පිසම්දැයි" නොකියා යහපතැයි ඒ බස ගිවිස සහල් පැස මුල්සහලින් බත්ද කඩ සහලින් කැඳද සුන්සාලින් කැවුම් ආදී අවුලුපත්ද පිස පණ්ඩිතයන් වහන්සේට අවුලු සහිත කැඳ දුන්හ. කැඳ ටිකක් මුඛයට ගත් පමණින්ම සියළු රස නහර වැල් පිනා ගිය නමුත් ඈ විමසනු පිණිසම සොඳුර! තොප පිසමන් නොදන්නා කළ කුමක් නිසා මාගේ සහල් නසාපුදැයි කියා කාරා දමාපීසේක. අමරා දේවීත් නොකිපී කැඳ යහපත් නොවීනම් කැවුම් කෑව මැනවයි ඒ අතට දුන්හ. ඒ මුඛයට ගත් පමණින් රස නහර වැල් පිනා ගියේය. මුලින් කී අයුරු එයද කාරා දැමූසේක. ඊටත් නොකිපී එසේ වීනම් බත් අනුභව කළ මැනවයි කියා බත් අත තැබූහ. ඉන් ආලෝපයක් මුඛයෙහි තබන්නාම සියළු රස නහර පිනාගිය නමුත් එයද පෙරසේම ප්‍රතික්ෂෙපකොට පිසමන් නොදන්නේයයි ගරහා තුන්වගයම එක්කොට ඇගේ ඉස පටන් මුළු ශරීරයෙහි ගල්වා දොර අව්වෙහි සිටින්නට නියම කළසේක. ඈද ඊට මදකුත් නොකිපී යහපත ස්වාමීනි!යි දොර අව්වෙහි හුන්නාහ. පණ්ඩිතයන් වහන්සේ ඈමන් නැති බව දැන සොඳුර! මෙහි එවයි වදාළසේක. දෙවිටක් කැඳවන තුරු නොසිට එක බසින්ම සමීපයට අවුය. පණ්ඩිතයන් වහන්සේ නුවරින් එන විට බුලත් පයියේ සඟවාගෙන ආ මසු දහසක් වටිනා එක් සිහින් සළුවක් තෑගිකොට නා පියා මේ කඩ ඇඳගෙන එවයි වදාරා සන්නාලි කමින් උපයාගත් මසුරන්ද යන මේ සියල්ල අමරා දේවීන්ගේ මව්පියන්ට දීලා ඈද කැටුව තම නුවරට ගොස් තවත් විමසනු සඳහා දොරටුපාලයාගේ ගෙයි හිඳුවා තමාගේ ගෙට ගොස් පිරිමින් දෙදෙනකු කැඳවා අසවල් ගෙයි ගැහැණියක රඳවා ආමි. මේ මසු දහස ඇරගෙන ගොස් ඈ විමසුවයි දහසක් දී යවූසේක. උයිත් එළෙසම කළහ. ඈ මේ මසු දහස මාගේ ස්වාමියාගේ පා දූවිලි පමණකුදු නො අගනේයයි කියා එබස් නොගිස්වාහ. තුන්වන වර දක්වාත් ඈ නොගිවිස්නා හෙයින් සතරවන වාරයෙහි ඈ බලයෙන් ඇදගෙන එවයි විධාන කොට එසේ කරවූහ.

ඈට සැපතෙහි යෙදී සිටි පණ්ඩිතයන්ව හඳුනාගත නොහැකිව මුහුණ බලා වරක් සිනාසී වරක් හඬාපීහ. පණ්ඩිතයන් වහන්සේ ඒ දැක ඊට කාරණා විචාළහ. ඉක්බිති අමරාදේවී ස්වාමීනී ඔබ වහන්සේගේ මුහුණ බලා සිනාසෙන්නෙම් ඔබගේ දිව්‍ය සැපතක් සමාන මේ සම්පත් පෙර පින්කොට ලබන ලද කුසල කර්මයාගේ විපාකය. එබැවින් සිනාසුනෙමි. දැන් වනාහි අනුන් සන්තක බිරියක් ගෙන්වා පරදාර කර්මය කොට මතුනරකයට යන්නාහ. එබැවින් ඔබ කෙරෙහි දයාවෙන් හැඬීමියි කීහ. පණ්ඩිතයන් වහන්සේ ඈ පරීක්ෂා කොට පිරිසිදු අදහස් ඇතිබව දැන එහිම යවා නැවත සන්නාලි වෙස්ගෙන එදා රෑ උන් ලඟට ගොස් සැතපීලා දෙවන දවස් රජගෙට ගොස් උදුම්බරා දේවීන්ට සහ රජ්ජුරුවන්ටද දන්වා මහත් උත්සව ශ්‍රීයෙන් පෙළහර පවත්වා ඈ තම ගෙට කැඳවාගෙනවුත් රජ්ජුරුවන්ට අනුශාසනා කරමින් වාසයකළසේක.

## "බජ්ජොපන ප්‍රශ්නයයි"

ඉක්බිති එක් දිනක් සේනකයෝ අතින් තුන්දෙනා අමතා පින්වත්නි මහෞෂධ පණ්ඩිතයන්ට උන්ටත් වඩා වියත් අඹුවක් ඇත. උන් කෙරේ රජ්ජුරුවන් කෙසේ හෝ බිඳවාපුව මැනවයි කතිකාකොට නිසි උපායක් යොදන්නේ මම රජ්ජුරුවන්ගේ චූඩා මාණික්‍යය සොරා ගනිමි. පුක්කුසයෙනි! තොපි රන්මාලාව ගෙනෙව කාවින්දයෙනි! තොපි රජුන් පොරවන රන්පලස ගෙනෙව. දේවින්දයෙනි! තෙපි රන්මිරිවැඩි සඟල ගෙනෙවයි විධානය කොට සතර දෙනම වන්වාවෙන් එසේ කොට රහසින් මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙට යවමියි කියා මැණික මෝරු කලයක දමා මෙය අනික් කෙනෙකුන්ට නොදී මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙයි ඉදින් ගනිත්නම් මිළ නොගෙන දීපියා එවයි කියා කෙල්ලක අත යවූහ.

SANHIDA LANKA

ඒ කෙළි පණ්ඩිතයන්ගේ ගේ දොරකඩම මෝරු ගනුවයි කියමින් දුර නොගොස් සිටින්නීය. ඒ දුටු අමරා දේවිය ඇත නොගොස් මෙහිම සිටින්නී යම් කාරණයක් ඇතැයි දැන කැඳවා එහි තුළවූ මැණික දැක නම්ගොත් විචාරා "අසවල්දින අසවල් දවස සේනක පඩිතුමා තම අසල්වැසි කෙල්ල අත චූඩා මාණික්‍ය පණයම් පිණිස එවූහ"යි පතක ලියවා ගත්හ. එසේම රන් මාලාව සමන් මල් කරඬුවකද පලස පලා පැසකද රන් මිරිවැඩි සඟල පිදුරු කැරැල්ලක් ඇතුළේද දමා නොයෙක් උපක්‍රම ලෙසින් පෙරසේම යවූහ. අමරා

දේවියද ඒ සියල්ලම තත්වූ පරිදි සියළු තොරතුරු ලියවා තැබූහ.

ඒ සේනකාදී සතර දෙන රජගෙට ගොස් ඒ ඒ වස්තු කෙරෙහි රජ්ජුරුවන්ගේ සිත යොමුකොට රජතුමනි! මේ සියල්ලම මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙහිය. ඔහු එකී වස්තු පළඳිනාහ. ඔබ වහන්සේට සතුරුකම් කරන්නේයයි පණ්ඩිතයන් කෙරෙහි රජ්ජුරුවන් බිඳවූහ. එය දැනගත් පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් හමුවට ගියහ. රජ්ජුරුවෝ පණ්ඩිතයන් කෙරෙහි කිපී නොදනිමි, නුඹ අවුත් කුමක් කෙරේදැයි තමන් දැක්ක නුදුම්හ. පණ්ඩිතයන් වහන්සේ වහා ගෙට අවුත් පලායන්ට සුදුසු කලැයි අමරා දේවීන්ට සලකුණු කියාදී අප්‍රසිද්ධ වේශයෙන් නුවරින් නික්ම දකුණු යවමැදුම්ගමට ගොස් කුඹල්කම් කරමින් වසන සේක. නුවර මුළුල්ලෙහිම මහෞෂධ පණ්ඩිතයෝ පලාගියහයි ඒක කෝලාහල විය.

ඉක්බිති සේනකාදී සතරදෙන කිමෙක්ද අපිත් පණ්ඩිතවරු නොවමෝද එක්වෙමුයයි ඔවුනොවුන් නොදන්නාම අමරා දේවීන්ට පත් යවූහ. ඈද ඒවා බලා අසවල් වේලාවට එන්නැයි වෙන වෙනම ගෙන්වා නොසැලෙන සේ අත පය බැඳ හිස මුඩු කොට පැඳුරු මාළුවල ඔතා බොහෝ හිංසා කොට රජ්ජුරුවන්ට කියා යවා මහෞෂධ පණ්ඩිතයෝ සොර නොවෙති. රාජකීය භාණ්ඩ සොරකම් කළෝ මුන් සතරදෙන යයි කලින් ලියවා ගත් පත් දක්වා බලා වදාළ මැනවයි කියා ගෙට ගොස් ඒ බඩු සතරද සේනකාදී සතර දෙනාවද පාවා දුන්හ.රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන් නැගීගිය බැවින් උන්කෙරේ සැකයෙන්ද අනික් මන්ත්‍රී කෙනෙකුන් නැති බැවින්ද සේනකාදී පණ්ඩිතවරු සතරදෙනාට කිසිවක් නොකියා නා පියා තොප තොපගේ ගෙවලට යවයි කීහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවන්ගේ දළපුඩු සේසත අධිගෘහිත දේවතා දූ පණ්ඩිතයන් ගෙන්වන උපායක් කෙරෙමියි මධ්‍යම රාත්‍රියෙහි දළපුඩු සේසත් සිදුරෙහි සිට අඩ ශරීරයක් දක්වා

"හන්ති හත්‍ථෙහි පාදෙහි මුඛඤ්ච පරි සුම්භති
සවෙ රාජ පියො හොති කංතෙන මභි පස්සසී"

යනාදී ගාථා සතරකින් ප්‍රශ්න සතරක් රජ්ජුරුවන්ගෙන් විචාළීය. රජ්ජුරුවෝ එකී අර්ථ නොදන්නාහු මම නොදනිමි. සේනකාදීන්ගෙන් විචාරමි'යි එක් දවසකට අවසර ගෙන ඒ සතර දෙනාට වහා එවත්වයි අසුන් යවා අපේ හිස් මුඩු බැවින් වීථිදිගේ බස්නට විළි ඇතැයි කී කල්හි පයිසතරක් විද්දවා එය හිසලාගෙන එත්වයි දන්වා යවූහ. (හිස්වැසුම් ඇති වූයේ එතැන් පටන්) පණ්ඩිතවරු සතර දෙන අසුන් ගත්කල දෙව්දුව ඇසූ පැණ සතර ඉදිරිපත් කළහ. උන්ට කිසිවක් කියාගත නොහැකිව දොඩමළුව කරබා ගත්හ.

රජ්ජුරුවෝ දොම්නස්ව එදින රාත්‍රී අර්ථ විසඳා ගත නොහැකි බව දෙව්දුවට පැවසූහ. දෙව්දුව සේනකාදීන්ට ගරහා මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වා මේ පැනය උන්ලවා නොකියවූනම් මේ දිලිසෙන යකුලින් ගසා තොපගේ හිස සත්කඩකට බිඳ පියමියි රජ්ජුරුවන් බිය ගන්වා රජතුමනි ගින්නෙන් ප්‍රයෝජන ඇති කල්හි කණමැදිරියන්ගෙන් ප්‍රයෝජන කිම්ද? කිරෙන් ප්‍රයෝජන ඇති කල්හි අඟ මිරිකීමෙන් එලයක් වේදැයි ඉදින් තොපගේ පණ රකිනා කැමැත්තෙහි නම් දිලිසෙන මහ ගිනිකඳක් බඳු නුවණින් යුතු මහෞෂධ පණ්ඩිතයන්ගෙන් විචාරා මට අර්ථ කියාලව නැතහොත් තොපගේ ජීවිතය නොරඳීයයි කියා යවූහ.

## "භූරි ප්‍රශ්නයයි"

ඉක්බිති රජ්ජුරුවෝ මරණ භයින් තැතිගෙන අමාත්‍යයන් සතරදෙනෙකු කැඳවා සතර වාසලින් නික්ම ගොස් මහෞෂධ පණ්ඩිතයන් දුටුතැන සත්කාර කොට රථයට නංවා ගෙන එවයි විධානය කොට යවූහ. දකුණු වාසලින් නික්මුණු අමාත්‍යයා වනාහි පණ්ඩිතයන් වහන්සේ කුඹල් කමින් වසන ගමට ගොස් ඔහු දැක සත්කාර කොට ගෙන ගිය පිළිද මසුරන් දහසද අත තැබූයේය. කුඹලාණෝත් මා මෙතෙක් වැඩ ගත්තේ මහෞෂධ පණ්ඩිතයන් අතිනැයි දැන බියට පත්වූහ. පණ්ඩිතයන් වහන්සේ නොබව ආචාර්‍යයෙනි! තොප

SANHIDA LANKA

අපට බොහෝ උපකාර කෙළෙහියයි අසා මසුරන් දහසද ඔහුට දී මැටි වැකුණ ඇඟින්ම රථයේ නැග රජ්ජුරුවන් සමීපයට ගොස් දේවයන් වහන්ස අසවල් ගම කුඹල්කම් කොට ජීවත් වෙමි. ඔබ වහන්සේ කැඳවීමෙන් මැටි වැකුණ ඇඟින්ම ආමියි කීහ. රජ්ජුරුවෝ ඉදින් මොහු මට විරුද්ධ නම් සේනාව රැස්කරමින් ඇවිදිති. මූ මට සතුරු නොවෙතියි සිතා වහා ගොස් නහාපියා සර්වාලංකාරයෙන් සැරසී එවයි නියම කළහ. පණ්ඩිතයන් වහන්සේ උසස් අන්දමින් ඇඳ පැළඳ සිව්රඟ සෙනග සමග සක්දෙව් රජුමෙන් පැමිණ එකත් පස්ව සිටිසේක. එවිට රජ්ජුරුවන් වහන්සේ පණ්ඩිතයන් අමතා පුත පණ්ඩිතයෙනි! තෙපි බොහෝ අර්ථ චින්තනයෙහි දක්ෂයහ. සිතුවොත් දසදහසක් යොදුන් දඹදිව රජ්ජුරුවන් මරා රාජ්‍ය ගැනීමට පොහොසත්ය. එසේ සිටියදීත් මාමරා පියා රාජ්‍ය නොගන්නේ මන්දැයි විචාළහ.

එවිට පණ්ඩිතයන් වහන්සේ රජතුමනි නුවණැත්තෝ සුව පිණිස පව්කම් නොකරන්නාහ. කුමණ හේතුවක් නිසාවත් අනුන්ට හිංසා පීඩා නොකරන්නාහයි වදාරා තමාටත් පියාටත් මහත් සම්පත් දුන් රජ්ජුරුවන් කෙරෙහි ද්‍රෝහී නොවන බැව් දන්වා පරීක්ෂාකාරීව දශරාජ ධර්මයෙන් රාජ්‍ය කරන ලෙස අවවාද කළසේක.

## "දේවතා ප්‍රශ්නයයි"

රජ්ජුරුවෝ පණ්ඩිතයන් වහන්සේව රාජාසනයෙහි වඩා හිඳුවා තුමූ මිටි අස්නෙක හිඳ පණ්ඩිතයෙනි! සේසතෙහි වසන දෙව්දුව මාගෙන් පැන සතරක් විචාළීය. සේනකාදීන්ටද නොවැටහින. ඒ කියවයි ආරාධනා කළහ. එදවස් මහ බෝසතාණන් වහන්සේ සැට යොදුන් රත් ගල මුදුනෙහි සිංහනාද කරන අභීත කේශර සිංහයකුසේ දේවයනි, සේසතෙහි වසන දේවතාවා චේවයි චාතුර්මහාරාජිකාදීවූ සදිව්‍ය ලෝකයෙහි දේවතාවෝ වෙත්වයි, සොළොස් බඹ තෙලෙහි බඹහු වෙත්වයි, යම්කිසි කෙනෙකුන් විසින් විචාරණ ලද්දාවූ පැන තියුණු මුවහත් ඇති කඩුවකින් ඇඹුල මල් මිටියක් කපා වගුරුවන බල ඇති පිරිමියෙක් හු මෙන් මාගේ නිර්මල නුවණ නමැති කඩුවෙන් පිරිසිඳ කීයම්, කිව දේවයෙනි, දෙව් දූ විචාළ පැනයයි සර්වඥ ප්‍රචාරණයක් පරිද්දෙන් වදාළ සේක. (එදවස් මහබෝසතාණෝ සිව්නේ නොදත්තෝ නම් කෙසේද? මතු ලොව්තුරා බුදුව සියලු සතුන් සිත සැක දුරුකොට ධර්ම සිංහනාද කිරීමට මෙම දෘෂ්ටාන්ත නොවේද? වැලිකෙලියෙහි එතෙක් පැන විසඳු ඒ මහතාණන් වහන්සේට දැන් එක දේවතාවකු විචාළ පැනයක් විසඳීම් නම් කවර අරුමයක්ද? ඉක්බිති රජ්ජුරුවෝ දේවතා දුව විචාළ එලෙසම කියන්නාහුඃ-

"හන්ති හත්‍ථෙහි පාදෙහි මුඛඤ්ච පරිසුම්භති
සවෙරාජා පියො හොති කං තෙත මහිපස්සසි"
යනුවෙන් දක්වන ලද පළමුවන පැනය කීහ.

මහ බෝසතාණන් වහන්සේට ගාථාව අසමින්ම ආකාශයේ නිගාලු පුන් සඳ මඬලක් මෙන් අර්ථවබෝධය විය. ඉක්බිති බෝධිසත්වයන් වහන්සේ අසව! දේවයෙනි! වදාරා"යම් වෙලෙක්හි මෑණියන්ගේ ඇකයෙහි හොත්තාවූ ළඳරු කුමාරයා කිරි බී බඩ පුරාගෙන සතුටුව මෑණියන් හා සමඟ කෙළනේ තමාගේ ළා හෝ පළු පත් සේ මොළකැටි අතින් මෑණියනව මරන්නේද, ඉසකේ ඇඳ කඩන්නේද, මිටින් මෑණියන් මූණ අන්නේද, එවෙළෙහි වගුළ සඳ රැසින් ඔද වැඩි කිරිමුහුද සේ සෙනහයෙන් ඔදවැඩියාවූ සිත් ඇති මෑණියෝ පුතණු වන්ට"සෙරගේ පුත, මා කුමට මරන්නේදැයි"යනාදි සෙනහවශයෙන් කියා සෙනෙහෙ ධරාගන්නට අසමර්ථව දරුවන් ලෙහි හොවා සිප ගනිති, මෙසේ ඔරහිඳතමන් මරා කෙළනා වේලෙහි මෑණියන්ට දරුවෝ ආදී ඇති ප්‍රේමයට වඩා ලාම ප්‍රිය වන්නාහ, පියාණන්ටත් එසේම ප්‍රිය වෙති" මෙසේ නභොමඬ්‍යයෙහි සූර්‍ය මණ්ඩලය ඔසවා පන්නාහුමෙන් ප්‍රශ්නය පහළ කොට වදාළසේක. ඒ ප්‍රශ්න විසර්ජනය අසා දේවතා දූ දළපුඬු සේසත් විවරයෙන් මැත්ව අර්ධ ශරීරකේ දක්වා "ප්‍රශ්නය වදාළ නියාව ඉතා යහපතැයි"මිහිරි කටහඬින් ශබ්ද පවත්වා සත්රුවන් කරඬුවක් දිව මල් දිවසුවඳින් පුරා මහබෝසතාණන් වහන්සේට පූජාකොට සැඟවී ගියාය.

රජ්ජුරුවෝද මහබෝසතාණන් වහන්සේට ගඳින් මලින් පූජාකොට දෙවන පැනයට ආරාධනා කොට කියව දේවයෙනියි වදාළ කල්හිඃ-

SANHIDA LANKA

"අක්කොසතී යථා කාමං ආගමඤ්ච න ඉච්ඡති
සවෙ රාජ, පියො හොති කං තෙන මහිපස්සසි"
යන ගාථාවෙන් දෙවන පැනයට කීහ.

ඉක්බිති රජ්ජුරුවන්ට බෝසතාණන්වහන්සේ "රජ්ජුරුවෙනි, කකුල් දඩ ගොසින් කී දේ කටලන්නට සමර්ථ

සත් හැවිරිදි පුතණුවන්ට කෙතට යව සල්පිලට යව කියා 'ඉදින් මට මේ කැවුම් දුන්නේවීනම්යෙමි'යි කියන්නා එසේද පුතණ්ඩ, යි උන් කැමති කැමති කැවුම ඉදිකොට දුන්කල්හි ඒ කැවුම් කාලා තොපි සිහිල් සෙවනේ ගෙයි හිඳුව, මම තොපට පිටත ඇවිද මෙහෙවර කෙරෙම්දැයි කියා හස්ත විකාර මුඛ විකාරාදි නොයෙක් උසුළු පපා කී මෙහෙවරට නොගොසින් සිටිනා පුතණුවන්ට මෑණිතොමෝ කිපී මරන්නට දණ්ඩක් හැරගෙන මා සන්තක දෙය කාලා කුඹුරේ කුරුල්ලන් පමණ පලවාපියන්නවත් නොයෙදැයි භයගැන්වූ කල වේගයෙන් දිවගත් පුතණුවන් ලුහුබැඳ අල්වාගන්නට අසමර්ථව සෝනට යේවයි බිල්ලට යේවයි සොරු තා කඩ කඩ කොට කපා පියත්වයි යනාදීන් කියා කැමති පරිද්දෙන් කට හෙලන පමණක් හැවිලි අවන්ති යමක් මුඛයෙන් බෙනේ නම් සිඟිත්තකුත් දරුවන්ටවන්නා නොකැමත්තීය, ඒ කුමරා දවස මුළුල්ලෙහි කොල්ලන් හා එක්ව කෙළපියා සවස ගෙට වදනට නොපොහොසත් වූයේ නෑයන්ගේ ගෙට යන්නේය. මෑණියෝද දරුවෝ දැන් එත් දෝහෝ දැන් එත්දෝයි පෙරමගබලා හිඳ සවස් වනතුරු නොඑන්නා දැක මා උරණ හෙයින් ගෙට එන්නට භය ඇතිව නොඑතියි සිත ශෝකයෙන් පූරාගෙන කඳුළු පිරුණු මුහුණින් යුක්තව නෑයන්ගේ ගෙවල් බලන්නාහු පුතණුවන් දැක වඩාගෙන සිප සනහා පියා දැතින් තරකොට අල්වාගෙන පුත, මා කී බසුත් සිත තබද්දැයි ආදී ඇති ප්‍රේමයටත් වඩාලා ප්‍රේම උපදන්නාහ, මෙසේ දේවයනි, දරුවෝ මෑනියන්ට කිසිකලෙකත් වඩාලාම පියවන්නාහයි දෙවන පැනය විසඳා වදාළ සේක. දේවතා දූ පෙර පරිදිදෙන්ම සාධුකාර දී පූජා කළාය.

රජ්ජුරුවෝද පූජාකොට තුන්වන පැනයට ආරාධනාකොට කියව දේවයනි, වදාළකල්හිඃ-

"අබ්භක්ඛාති අභූතෙන අලිකෙන අභිසාරයෙ
සවෙ රාජ, පියො හොති කං තෙන මහිපස්සසි"

යන ගාථාවෙන් තුන්වන පැනය කීහ.

ඉක්බිති මහබෝසතාණන් වහන්සේ දේවයනි, යම් වේලෙක අඹු සැමි දෙමහල්ලෝ රහසිගතව ලෝකස්වාද රතියෙන් කෙළනාවූ ඔවුනොවුන්ට තොප මා කෙරෙහි මඳකුත් ප්‍රේමයක් නැත, තොපගේ සිත බැහැරයයි මෙසේ ඔවුනොවුන්ට නැත්තක් කියද්ද, බොරුවෙන් චෝදනා කෙරෙද්ද, එවේලෙහි ඔහු දෙමහල්ලෝ ඔවුනොවුන්ට අධික ය වන්නාහයි මෙසේ මේ ප්‍රශ්ණයේ අර්ථ දනුවයි තුන්වන පැනය වදාළසේක. දේවතා දූ පෙරසේම පූජාකළාය.

රජ්ජුරුවෝද පූජාකොට අනික් පැනයට ආරාධනාකොට කියව දේවයෙනි, වාළ කල්හිඃ-

"හරං අන්නඤ්ච පානඤ්ච වත්‍ථසෙනාසනානිච
අඤ්ඤදත්‍ථු හරාසන්තා
තෙ වෙ පියොහොන්ති රාජ, කං තෙන මහිපසස්සි"

යන ගාථාවෙන් සතරවන පැනය කීහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවන්ට දේවයෙනි, මේ පැනය තෙමේ ධර්මිෂ්ඨ වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සඳහාය, ඔවුන් තමන්ගේ ගෙදොර සිඟා සිටි කල්හි තමන් විසින් පිළිගන්වන ලද ආහාරදිය පිළිගෙනයන්නාවූද, ගොස් වළදන් නාද දැක අපම සිතන්නාහ, අපම සන්තකවූ ආහාරාදිය ගෙනයන්නාහ. ගොස් අනුභවකරන්නාහයි ඒ ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් සැදැහැති උපාසක කුලයෝ තමන් දෙන ලද්දාවූ සතරපසය පැනය වදාළ කල්හි දේවතා දූ පෙරපරිද්දෙන් පූජා කොට සාධුකාරදී සත්රුවන් පිරූ රුවන් කරඬුවක් ගනුව පණ්ඩිතයෙනි, යි මහබෝසතාණන් වහන්සේ ගේ ශ්‍රී පාදමූලයෙහි පූජාකළාය, රජ්ජුරුවෝද පැහැද සෙනෙවිරත් තනතුරු දුන්හ. එතැන් පටන් කොට මහබෝසතාණන් වහන්සේගේ යශස මහත්වූයේය.

පණ්ඩිතයන් වහන්සේ අභීත කේශර සිංහ පෝතකයෙකු සේ රජ්ජුරුවන් අමතා දේවයිනි!යි ගාථාසතරේ අදහස් සර්වඥ විලාසයෙන් පහදා දී සියළු දෙනාවම මහත් ප්‍රසාදයට පත් කොට දේවතා දූවගෙන් සතර වරම දිවමල් පිරවූ සත්රුවන් කරඬුව බැගින්ද රජ්ජුරුවන්ගෙන් නොයෙක් පූජාද ලැබ මහත් යශසට පත්වූහ.

## පඤ්ච පණ්ඩිත ප්‍රශ්නයයි.

SANHIDA LANKA

නැවත සේනකාදී සතරදෙන යශසට පත් මහෞෂධ පණ්ඩිතයන් කෙරෙහි ඊර්ෂ්‍යාකොට ඔහුට කුමක් කරමෝදැයි කුමන්ත්‍රණය කළහ. ඉක්බිති සේනකයෝ අනිත් තුන්දෙනා අමතා කියන්නාහු රජ්ජුරුවන් කෙරෙහි ඔහු බිඳුවා පියන්ට මා උපායක් කියමි. අපි සිව්දෙන ඔහු සමීපයට ගොස් "රහස් නම් කාට කිවහොත් යහපත්දැයි" විචාරම්හ. ඔහු මහා මන්ත්‍රී හෙයින් "කිසිවෙක් හට රහස් කිව නොහැක්කැයි" ඉදින් කීයේ වීනම් එය රජ්ජුරුවන්ට කියා ඔහු බිඳුවමුයි කතිකාකොට සිංහ රජකු සමීපයට යන ජරාවට පත් සිවලුන් සතර දෙනෙකු

පරිද්දෙන් පණ්ඩිතයන් සමීපයට ගොස් පණ්ඩිතයෙනි! පුරුෂයා විසින් පළමු කොට කුමක් කටයුතුදැයි විචාළහ. සත්‍ය භාවයෙහි පිහිටිය යුතු යයි වදාළ සේක. එහි පිහිටිය උන් විසින් කුමක් කටයුතුදැයි විචාළහ. වස්තුව සෙවිය යුතුදැයි වදාළසේක. වස්තුව උපයාගෙන කුමක් කටයුතුදැයි පිළිවිස්සාහ. මන්ත්‍රණ උගත යුතුයයි වදාළ සේක. පසු කුමක් කටයුතුදැයි විචාළ ගමනේ තමාසිත රහස් කටයුතු අනුන්ට නොකිය යුතුයයි වදාළසේක.

ඔවුන් සතරදෙන යහපත පණ්ඩිතයෙනි!යි සතුටුව රජ්ජුරුවන් සමීපයට ගොස් දේවයන් වහන්ස මහෞෂධ පණ්ඩිතයෝ ඔබ වහන්සේට විරුද්ධව සිටිනේයයි කීහ. රජ්ජුරුවෝ මම තොපගේ බස් නොඅදහමි. උන් මට විරුද්ධ නොවේයයි නොගිවිස්සාහ. දේවයන් වහන්ස! අප කී බස් නො අදහනසේක් වී නම් උන් මෙහි ආකල "තමා සිත උපන් රහස කාට කියයුතුදැයි උන්ගෙන් විචාළ මැනව. ඉදින් ඔබ වහන්සේට විරුද්ධ නොවෙත් නම් අසවලුන්ට කිව යුතුයයි කියති. ඉදින් ද්‍රෝහී වෙත්නම් කිසිවක් හට නොකිව යුතුය. මනදොළ පිරුණ කල කියයුතුයයි කියති. එවිට අප අදහාගෙන සැක හළ මැනවයි කීහ. රජ්ජුරුවෝ යහපතැයි උන් ගිවිස පසුදින රාජසභාව රැස්වූකල රජ්ජුරුවෝ උන් අමතා මම ප්‍රශ්නයක් අසමි. නින්දා කටයුතු හෝ ප්‍රශංසා කටයුතු රහසක් කාට කිව යුතුදැයි විචාළහ. එවිට සේනකයෝ රජ්ජුරුවන් මුහුණ බලා දේවයන් වහන්ස! නුඹවහන්සේම ආදිකොට වදාළ මැනව ඔබ වහන්සේගේ අදහස් බලා පණ්ඩිතවරු පස්දෙනාත් කියන්නාහයි කීහ.

ඒ අසා රජ්ජුරුවෝ තමන් කෙළෙස් වසඟ හෙයින් යම්ස්ත්‍රියක් පතිව්‍රතා ධර්මය රක්‍ෂා කරන්නීද පුරුෂයාගේ අදහස් දනීද එසේවූ තමාගේ අඹුවට සියළුම රහස් පැවසිය යුතුයයි කීහ. ඉක්බිති සේනකයෝ රජතුමනි! දුක සැප දෙකෙහි පිහිටවන මිත්‍රයාට රහස් කිව යුතුයයි පැවසූහ. කාවින්‍දයෝද යම් පුත්‍රයෙක් අනුජාතව හැසිරේද අලාමකවූ නුවණ ඇත්තේද එවැනි පුතුට රහස කිවයුත්තේයයි කීහ. දේවින්‍දයෝද රජතුමනි! හිතකාමී වූ තම මෑණියන්ට රහස් කිවයුතුයයි කීහ. ඉක්බිති මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවෙනි රහස් දෙය නම් නින්දා කටයුතුවත් කිම? ප්‍රශංසා කටයුතුවත් කිම? සැඟවීමම උතුම්ය. රහස් ප්‍රකාශ කිරීම නුවණැත්තන් විසින් ප්‍රශස්ත නොවන්නේය. තමා සිතුදෙය මුදුන් නොපැමිණියේ වීනම් නුවණැති තෙම ඒ තාක්කල්ම කිසිකෙනෙකුන්ට ප්‍රකාශ නොකරන්නේය. එය මුදුන් පැමිණියේ වීනම් එය සභා මධ්‍යයෙහි සැකහැර කියන්නේයයි ප්‍රකාශ කළහ. රජ්ජුරුවෝ මෙය අසා නොසතුටුව සේනකයන්ගේ මුහුණ බැලූහ. එවිට පණ්ඩිතයන් වහන්සේ උන් දෙන්නාගේ ක්‍රියාව දැකලා මුන් සතර දෙනාම මුසා කියා මා කෙරෙහි රජ්ජුරුවන් බිඳුවාපී වත්හ. වහා මෙතැනින් නැගී යාම සුදුසු යයි සිතා රජ්ජුරුවන් වැඳ අවසර ගෙන පලාගොස් සේනකාදීන්ගේ කුමන්ත්‍රණ ගැන පරීක්ෂාකාරී වන්නේ උන් නිතර කථාකරමින් සිටිනා මහ ඔරු කඳක් දැක ඒ යට සැඟවී සිට උන්ගේ රහස් දැනගත යුතුයයි සම්මත කරගත්හ. ඒ අතර සේනකයෝද රජ්ජුරුවන් අමතා දේවයන් වහන්ස දැන් අප කීවා සැබෑදැයි විමසීය. රජතුමා භයින් ත්‍රස්තව ඉදින් කුමක් කරමෝදැයි විචාළහ. කල් නොයවාම රහසින් මරවාපීම යහපතැයි සේනකයෝ කීහ. සේනකයෙනි! තොප විනා අනිකෙක් නැත. මිත්‍රයන් සමග ගොස් ඔහු රාජසේවයට එනවිට මේ කඩුවෙන් කපා මරාදමවයි තමන්ගේ මගුල් කඩුව සේනකයන්ට දුන්හ. උන් සතරදෙනා ගොස් ඔරුකඳ මත්තේ සිට කථාකරන්නාහු සේනක පඩිතුමනි ඔබගේ රහස් යහළුවාට කිවයුතුයයි වදාළේ මන්දැයි කීහ. සබඳ පණ්ඩිතවරුනි! මේ රහස රජතුමා දැනගතහොත් අපගේ දිවි නොරැකෙයි. නමුත් මේ ඔරුවයට මහෞෂධ පණ්ඩිතයෝ සැඟවී ඇද්දැයි ඔරු කඳට නිය පිරින් ගැසීය. සේනක පණ්ඩිතයෙනි මහෞෂධ පණ්ඩිතයෝ මහත් සම්පත් ඇත්තෙක. මේ අපවිත්‍ර තැන කුමට ලගීද? ඔබගේ රහස සැක හැර කියවයි කීහ. එවිට සේනකයෝ මම දිනක් මගුල් සල් උයනේදී අසවල වෛශ්‍යා දූ සමඟ මෛථුන සේවනය කොට ඇගේ පළඳනා ලෝභයෙන් ඈ මරා ඇගේ රෙදිකඩින් ඒ ඔතාගෙන අපගේ ගෙයි ගබඩාවක මුව අංකොක්කේ එල්වාලීමි. මේ දක්වා කිසිවක් ඉන් අලෙවි කළේ නැත. පරණවනතුරු බලා ඉදිමි. මේ රාජඅපරාධය මාගේ යහළුවකුට කීමි. ඌ කිසිවෙකුට නොකී විරුය. මේ කාරණයෙන් යහළුවාට රහස් කිවයුතු බව කීමියි කීහ.

පුක්කුසයෝ තමන් රහස ප්‍රකාශකරන්නාහු එම්බා මගේ කලවයේ අසාධ්‍ය කුෂ්ටයෙක් ඇත. මගේ මලණුවෝ උදෑසනින් ඒ වනය කසටින් සෝදා බෙත් ගල්වා බඳනාහ. රජ්ජුරුවෝ මා කෙරෙහි මොලොක් සිතින් මා කැඳවා මගේ කලවයෙහි හිසතබා සැතපෙන්නාහ. මේ නොකටයුතු දෙය දන්නෙහිනම් මා මරාපියන්නාහ. ඒ කාරණය හේතුකොටගෙන රහස් නම් මලණුවන්ට කිවයුතුයයි මා විසින් කියන ලදැයි කීහ.
කාවින්දයෝද මා වරද අසව් අව පසළොස්වක් දවසේ නරදේව නම් යක්ෂයෙක් මා ඇඟට ආරූඪ වන්නේය. ඒ යක්ෂයා වැහුන කල්හි මම වියරු බල්ලකු මෙන් හඬමි. මම ඒ බව පුතණුවන්ට කීමි. ඌ ඒ හඬ නො ඇසෙනු පිණිස දොරළග සිට නොයෙක් භාණ්ඩ වාදනය කරන්නාහ. මේ කාරණය නිසා රහස නම් පුතුන්ට

SANHIDA LANKA

කිවයුතුයයි මා කියෙමියි කීහ.

දේවින්ද පණ්ඩිතයෝ යහළුවනි! ශුක්‍රයා විසින් කුස රජ්ජුරුවන්ට දුන්නාවූ මාණික්‍ය රත්නය පරම්පරාවෙන් පැවත අවුත් භාණ්ඩාගාරයේ තුබුවා මා විසින් සොරා ඇරගෙන මාගේ මෑණියන්ට දුනිමි. රජගෙට යන වේලේ මෑණියෝ රහසින් එය මට දෙන්නාහ. මම ඒ මැණිකේ ශොභාවෙන් මුහුණ ආලෝකමත් කරගෙන රජගෙට යන්නෙමි. රජ්ජුරුවෝ කා සමගවත් නොදොඩා මා හා සුව දුක් දොඩන්නාහ. දිනපතා තෑගි දෙන්නාහ. ඉදින් එය සොරාගත් බව කිසිවෙක් දතුනම් මාගේ දිවි නැසෙයි. එබැවින් රහස්කම් මෑණියන්ට කිවයුතු යයි මම කීවෙමියි කීහ. මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ ඔරු කඳයට සිට සියළු දෙනාගේ රහස් සිතේ තබාගත් සේක. උන් හැම කතාකොට පමානොව මහෞෂධයා මැරීමට උදෑසනම එවයි කියා තමතමන්ගේ ගෙවලට ගියාහ. උන්ගියපසු පණ්ඩිතයන් වහන්සේ තමපුරුෂයන්ගේ ආධාරයෙන් එලියට පැමිණ ගෙටගොස් සැතපී ගත්හ.

රජ්ජුරුවෝද මහෞෂධ පණ්ඩිතයන්ගේ ගුණ සිහිකරන්නේ සත්හැවිරිදි කල් පටන් මට යහපතක්ම මිස අවැඩක් නොකළේය. දේවතා දූ විචාළ පැනයෙහි ඔහු නැත්නම් මාගේ ජීවනයද නැත. වෛරී පසමිතුරන්ගෙන් බස්ගෙන මහා නුවණැති පණ්ඩිතයන් මරවයි කඩුව දුනිමි. මා කළේ මහා අයුත්තියෙක. සෙට පටන් ඒ පණ්ඩිත රත්නය මට නැතිවන්නේයයි ලය පැලීයන පරිද්දෙන් ශොක ඉපදවූහ.ඩා වැගුරුනේය. චිත්තාස්වාදයක් නොලද්දාහ. උදුම්බරා දේවියද ඒ යහනේ පසෙකින් උන්නී රජ්ජුරුවන්ගේ වික්‍ෂිප්තභාවය දැක රජ්ජුරුවෙනි! මාගෙන් හෝ යමෙකුගෙන් ඔබතුමාට වරදක් උනීද? ඒ මට කියවයිකීහ. රජ්ජුරුවෝ සොඳුර! සේනකාදී සතරදෙන පැමිණ මහෞෂධ පණ්ඩිතයෝ මා මරා රාජ්‍ය ගන්ට සිතතියි මට කීහ. මා තත්වය පරීක්ෂා නොකොට එසේ වීනම් ඌ මරාපියවයි මගුල් කඩුව අතට දීලා පිටත් කළහ. දැන් උන්ට පෙර මාගේ මරණය උනිනම් යහපත්ය. මින්පසු උන් නොදකින බැවින් ශෝක වෙමියි කීහ.

එවිට බිසවුන් වහන්සේද මහෞෂධ පණ්ඩිතයන් කෙරෙහි ව්‍යාජ වෛරයක් පලකොට උපායකින් රජ්ජුරුවන් අස්වසා නින්දට සලස්වා වහා එතනින් පිටව ගොස් තල්පතක සියළු විස්තර ලියා අග්ගලයක් තුළ ලා එය බැඳ නැවුම් සැලියක දමා යෙහෙළිය අතක් රහසින් මහෞෂධ පණ්ඩිතයන්ට යවා වහා පැමිණ රජ්ජුරුවන් සමග සැතපුනාය.

මහෞෂධ පණ්ඩිතයෝ අග්ගලාව තුළවූ ලිපිය බලා තත්වූ පරිදි දැන කළයුතු සියල්ල විමසා සැතපුනහ. සේනකාදී සතරදෙන ඒ රාත්‍රිය වර්‍ෂයක් මෙන් සිතසිතා ගතකොට උදෑසනම කඩුව ගත් අත් ඇතිව වාසල ඇලී රැකසිට පණ්ඩිතයන් වහන්සේ නොදැක රජ්ජුරුවන් සමීපයට ගොස් රජතුමනි මහෞෂධ පණ්ඩිතයන් නොදුටුවෙමුයි කීහ.
මහෞෂධ පණ්ඩිතයෝද හිරු නැගෙන්නාහාම මුළු සත්යොදුන් මියුළු නුවරම වසඟ කොට ඒ ඒ ස්ථානයෙහි රැකවල් තරකොට තබා බොහෝ දෙනා විසින් පිරිවරණ ලදුව සර්‍වාභරණයෙන් සැරසී උතුම් රථයකින් අවුත් රජ්ජුරුවන් වැඳ සිටිසේක. රජ්ජුරුවෝද ඉදින් පණ්ඩිතයෝ මට සතුරුවෙත්නම් මා නොවඳනාහයි සිතා මපුතණුවෝ වහා එවත්වයි වහා කැඳවාගෙන ගොස් අසුන්ගන්වා පුත මහෞෂධ පණ්ඩිතයෙනි! ඊයේ සන්ධ්‍යාවෙහි ගියෙහිය. අද හිරු නැගී මෙතෙක් වේලෙන් අවුත් මා දුටුවෙහිය. තොපගේ සිතට කුමන සැකයෙක්වීද කවරෙකු තොපට රජ්ජුරුවන් දැක්මට නොඑවයි බසක් කිව්ද තොප පමාවූ කාරණය කියවයි විචාළහ.

දේවයන් වහන්ස ඔබ විසින් මට සතුරු වූ සේනකාදී සතරදෙන බස් ගෙන මා මරන්ට නියෝග කරන ලද්දේ වේද එසේ හෙයින් නොආයෙමි'යි රජ්ජුරුවන්ට චෝදනා කරනසේක් ජන ප්‍රධාන වූ දේවයන් වහන්ස ඔබ වහන්සේ විසින් ප්‍රඥාසම්පන්නවූ මහෞෂධ පණ්ඩිතයෝ මැරිය යුත්තෝයයි නියෝගකර යම්හෙයකින් ඊයේ මධ්‍යම රාත්‍රී වේලෙහි බිසවුන්ට රහසිගතව කියන ලදද එබඳු වූ ඔබවහන්සේගේ රහස් කටයුත්ත මා විසින් අසන ලදැයි වදාළ සේක. රජ්ජුරුවෝ එය කණ වැකුණු ඇසිල්ලෙහිම කිපී බිසවුන් මූණ බැලූහ. රජ්ජුරුවෝ බිසවුන්ට කිපී තියාව දැන පණ්ඩිතයන් වහන්සේ දේවයන් වහන්ස! බිසවුන් වහන්සේට කුමට කිපෙනසේක්ද? මම කාලත්‍රයෙහිවූ සියල්ලම දනිමි. ඔබවහන්සේගේ රහස් මට බිසවුන් වහන්සේ විසින් කියන ලද්දේ වේවා! සේනකාදී සතරදෙනාගේ රහස් මට කා විසින් කියන ලදද? උන්ගේ රහසුත් දනිමියයි කියා ඊටපෙර ඔරුකඳ යට සිට අසාගත් උන්ගේ රහස් සියල්ලම පිළිවෙළින් හෙළිකළහ. රජ්ජුරුවන් වහන්සේ උන්වෙන වෙනම ගෙන්වා සැබෑදැයි විචාරා දඟගෙයි ලවාපීහ. උන් සතරදෙනා පණ්ඩිතයන් වහන්සේ මරම්හයි හැම දෙනම හිරගෙට වන්හ. දේවයන් වහන්ස! "තමන් සිත උපන් රහස මුදුන් පැමිණෙනතුරා අනුන්ට නොකිය යුතුය"යි

SANHIDA LANKA

කීයේ මේ නිසා යයි කියා සේනකාදීන් රහස් අනුන්ට කීම නිසා විනාශයට පත්වූ නියාව දක්වා ධර්මදේශනා කරන්නේ රජතුමනි! විශේෂයෙන් රහස් නොකිය යුත්තන් අසා වදාළ මැනව. මේ ලෝකයෙහි ස්ත්‍රීය හදවතක්සේ වෙසේ. නමුත් ගැහැණිටත්, යමෙක් ආමිශයෙන් සිත් ගතයුතුනම් ඔහුටත් යමෙක් සතුරකුව මිතුරකුසේ හැසිරේනම් ඔහුටත් රහස් නොකියන්නේය. රහස් කීමෙන් නිතර තමා ඔහුට දාසයකු මෙන් බියෙන් කල් යැවීමටද නින්දා ඉවසීමටද සිදුවන්නේය. දහවල් රහස් කියනු කැමතිනම් එළිමහණකදීද රාත්‍රී රහස් කියනු කැමති නම් උන්ගේ කණින් බැහැරට නොයනසේද කිවයුතු වන්නේයයි වදාළසේක.

රජ්ජුරුවෝ පණ්ඩිතයන් වහන්සේගේ ධර්ම කථාව අසා සේනකාදී සතරදෙන මට විරුද්ධව රාජද්‍රෝහීව නිරපරාධවූ මේ පණ්ඩිතයන් මට ද්‍රෝහියයි මුසා කීවෝයයි කිපී යව කොල! මුන් සිව්දෙනා මරමරා නුවරින් පිටතට ගෙනගොස් හුල හිඳුවා හිස්කපා දමාපියවයි නියම කළහ. උන් පිටිතලහයා බැඳ සිය ගණන් පහර ගසගසා මරන්ට ගෙනයන වේලෙහි පණ්ඩිතයන් වහන්සේ දේවයනි! මුන් පෙර ඇමතියෝය. ක්ෂමාකළ මැනවයි වදාරා උන්ගෙන්වා උන්නිදහස්කොට තමාගේ දාසකමට පවරා දෙද්දීත් එය ප්‍රතික්ෂෙප කොට උන්ගේ පෙර තනතුරුමදෙවා මෛත්‍රීය පතුරුවා සතුටුවූහ. එතැන් පටන් සේනකාදී සතරදෙන දළසුන් සර්පයන් මෙන් ප්‍රභූ ශක්තියක් නැතිව පණ්ඩිතයන් වහන්සේට කිසිවක් කියන්ට අසමර්ථවූහ.
"පරිඛණ්ඩ කථා නිමි."
එතැන් පටන් පණ්ඩිතයන් වහන්සේම රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නේ සතුරු භයින් ආරක්ෂාවනු පිණිස මියුළු නුවර වටා අටළොස් රියන් පමණ උස මහා ප්‍රාකාරයක් බඳවා වැව් පොකුණු දිය අගල් තනවා නුවර සශ්‍රීක කළසේක. අවට රාජධානිවල රජවරුන්ට මැණික් ආභරණ ආදී වටිනා තෑගි බෝග යැවීමෙන් ඔවුන් සිත්ගත්හ.

මහෞෂධ පණ්ඩිතයන් වහන්සේට මහා නුවණැති ගිරා පෝතකයෙක් වූහ. දිනක් උන් අමතා සබඳ! ගොස් දඹදිව මුළුල්ලෙහි ඇවිද ඒ ඒ රට පුවත් දැනගෙන එවයි කියා විළඳ කවා මී පැණි පොවා තෙල් ගල්වා දෙපියාපත් මැඩ ගිරාපෝතකයා නැගෙනහිර සී මැදුරු කවුළුව සමීපයෙහි සිට හලසේක. ගිරාපෝතකයෝද ඒ ඒ රට ක්‍රමයෙන් ගොස් පරීක්ෂාකොට කම්පිල්ලරට උත්තර පඤ්චාල නුවරට පැමිණියහ. එහි රජ කරන චූලනී බ්‍රහ්මදත්ත රජුට කේවට්ට නම් බමුණෙක් ඇත. ඌ තුමූ නුවණැත්තාහ. වියත්හ. දිනක් ඔහු තම රජ්ජුරුවන් සියළු දඹදිවට අගරජ කළහොත් තමාගේ යසස වැඩිවෙන්නේයයි සිතා රජ්ජුරුවන්ව රහසින් උයනට කැඳවාගෙන ගොස් වටේ රැකවල් තබා මඟුල් සල්වට උන්හ. ගිරා පෝතකයෝද මේ කරුණ දැක වැදගත් රහසෙකැයි සිතා එම ගසේ කොළ අතරේ සැඟවී ගත්හ. කේවට්ටයා රජ්ජුරුවන් අමතා දේවයන් වහන්ස! මේ සතර කන් මන්ත්‍රයකි. අනික් කනකට නොයා යුත්තේය. ඉදින් ඔබ මා කීවා කරන සේක් වීනම් ඔබව මුළු දඹදිවට අගරජ කරලම්'යි කීහ. රජ්ජුරුවෝද දැඩි ලෝභකමින් යුක්තවූයේ එසේ කරමියි කීහ. දේවයන් වහන්ස! අපි සේනාව රැස්කොට කුඩා නුවරක් වට කොට ගනුම්හ. මම ගොස් එහි රජ්ජුරුවන්ට දේවයිනි! තොප හා සටන් කිරීමෙන් කම්නැත. තොපගේ රාජ්‍යය තොපටම වන්නේය. සටන් කළෝනම් තොපත් සේනාවත් විනාශයට යන්නේය. එබැවින් අපට යටත් වේව'යි කියමි. මෙසේ එකසියයක් රාජධානිම අත්පත් කොටගෙන අපගේ නුවරට සියළුම රජවරුන් කැඳවා ජය පානය කරම්හයි රා වලට විෂ යොදා දී උන් හැමදෙනාවම විනාශයට පමුණුවා ගඟට දමා එකසියයක් රාජධානිවල රාජ්‍යය අත්පත් කොට ගෙන අගරජ වනසේකැයි කීහ. රජ්ජුරුවෝ යහපත! කල්නොයවා නික්මුන මැනවයි කියා එතැනින් නැගී සිටිත්ම ගිරාපෝතකයා කේවට්ට බමුණාගේ හිසට වර්චස් පිඬක් හෙළා කට ඇරගෙන මේ කුමක්දැයි උඩ බලන කල්හි කටටද එසේම වර්චස් කොට කේවට්ටය! සතර කන් මන්ත්‍රණය සය කණකට ගියේය. නැවත සිය දහස් කණකට යන්නේය කියා ක්‍රීං යන හඬින් පලාගොස් මහෞෂධ පණ්ඩිතයන්ගේ දසරුවෙහි බැස උන්හ.

ඒ ගිරවාගේ මෙබඳු සිරිතෙක් ඇත. කිසි තැනකින් ගෙනෙන පණිවුඩයක් පණ්ඩිතයන්ට පමණක් කිවයුතුනම් උන්වහන්සේගේ දසරුවට බස්නාහ. අමරා දේවීන් ඇසුවමනා නම් ඇකයෙහි හිඳනාහ. බොහෝ දෙන ඇසුව මනානම් බිමට බස්නාහ.

SANHIDA LANKA
ඉක්බිති ගිරාපෝතකයෝ පණ්ඩිතයන් අමතා තමා ඇසූ සියළු තොරතුරු සැළකළහ. මහෞෂධ පණ්ඩිතයෝ ගිරා පෝතකයාට සත්කාරකොට "කේවට්ටයා මා මහෞෂධ පණ්ඩිත බව නොදනිතියි සිතමි. ඔහුගේ මන්ත්‍රණය මුදුන් පැමිණිය නොදෙමියි සිතා ඇතුළු නුවර හුන් සියළු දිළිඳුන් පිට නුවරට යවා ධනවතුන් ඇතුළු නුවර නවත්වා බොහෝධනය රැස්කරවූ සේක.

චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද කේවට්ටයාගේ බසින් මහෞෂධ පණ්ඩිතයන් අනුශාසනා කරන වේදේහ

රජ්ජුරුවන්ගේ රාජ්‍යය හැර අනිත් සියළුම රාජ්‍යවල් තමා අතට පත්කර ගත්හ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ හත්අවුරුදු හත්මස් හත් දවසකින් සෙසු දඹදිව රාජ්‍ය ගෙන කේවට්ට බමුණු අමතා ආචාර්‍යයෙනි! වේදේහ රජ්ජුරුවන්ගේ රාජ්‍යය හැර නොගෙන කුමණ ජය පානයෙක්ද? එයද ගනිමුයි කීහ. දේවයන් වහන්ස! මහෞෂධ පණ්ඩිතයෝ ඉතා නුවණැතියහ. උපායෙහි දක්‍ෂයහ. එබැවින් කෙසේවත් එය නොකළ හැක්කැයි පසුබැස ගොස් තමාට යටත්වූ රටවල්වල රජදරුවන් සමඟ ජය පානය කොට ඔවුන් මරා දැමීමට කටයුතු පිළියෙළ කරගත්හ. මේ බව තම චර පුරුෂයන් අතින් දැනගත් පණ්ඩිතයන් වහන්සේ තමා හා එකදින උපන් යොධයන් දහස බණවා සබඳිනි චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ උයන සරසවා එක්සියයක් රජ්ජුරුවන් පිරිවරා සුරාපානය අනුභව කරනු කැමැත්තෝල තොප එහි ගොස් කෝලාහලකොට විෂ යෙදූ සුරාභාජන පොඩිකොට අපි වේදේහ රජ්ජුරුවන්ගේ සේනාව වෙමු. අපගේ රජ්ජුරුවන්ට හස්නක් පවානොයැවූ තොපට රාත් පියන්නට නොදෙම්හයි වාසී බෙනෙමින් මහත් අරගල කොට මියුළුනුවර මහෞෂධ පණ්ඩිතයන්ගේ යොධයම්හ. පිළිවන්නම් අල්ලාගනුවයි තොප ගියබව හඟවා එවයි කියා යවූසේක. උන් එසේම කොට ආහ.

චූලනී බ්‍රහ්මදත්ත රජුද එකසියයක් රජදරුවන් මරණ පිණිස ඉදිකළ සුරාපානයට මහෞෂධ පණ්ඩිතයන් බාධා කළේයයි කිපුණාහ. එකසියයක් රජදරුවෝද සේනාවද සුරාපානය නොලද්දම්හයි නොසතුටු වූහ. ඔවුන් හැම දෙන රජ්ජුරුවන් අමතා දේවයන් වහන්ස! අපි හැම එක්ව ගොස් මියුළු නුවර වේදේහ රජ්ජුරුවන්ගේ ඉස කඩුවෙන් කපා එය දෙපයින් මැඩගෙනහිඳ ජයපානය බොම්හයි කේවට්ටයාටද එපවත් දන්වා අප හා යම්හ. ආචාර්‍යයෙනි'යි කීහ. බමුණානෝ නුවණැති බැවින් එනුවර මහෞෂධ පණ්ඩිතයන් නිසා ගන්ට නොපිළිවන. ගියොත් අපට මහා ලජ්ජාවන්නීය. එබැවින් මම නොකමැත්තෙමියි කීහ. රජ්ජුරුවෝ රාජමානයෙන්ද ඉසුරු මදයෙන්ද මත්ව පහරලත් සර්පයකුසේ කෝපයෙන් දිලිහි දිලිහී ඒ මහෞෂධයා කුමක් කරන්නේදැයි කියා එකසියයක් රජවරුන් පිරිවරා නික්මුණාහ. කේවට්ටයෝද රජ්ජුරුවන්ට පටහැනි නොවියයුතු යයි සිතා රජ්ජුරුවන් සමඟ එක්වූහ. ඔවුන් යුද්ධයට එන බව චරපුරුෂයන් අතින් දැනගත් පණ්ඩිතයෝ සියළු ආරක්‍ෂා සංවිධාන යෙදූහ. ඒ ඒ තන්හි බලඇණි හිටවූහ. සතුරන්ගේ පංචාංගික තූර්‍යනාදයෙන්ද සිව්රඟ සෙනගෙහි ගර්ජනාවෙන්ද පොළව පැළී යන පරිද්දෙන් වූයේය. සේනකාදී වූ සතරදෙන මහත් වූ ශබ්දය අසා සී මැදුරු කවුළුවෙන් පිටත බලන්නාහු බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ආ බැව් දැන භයින් ත්‍රස්තව ඉතිකින් අපගේ දිවි නැත. බ්‍රහ්මදත්තයා දැන් අප හැමම මරන්නේයයි සේනකාදියන් සමග කථා කරමින් හුන්හ.

මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ චූලනී රජු ආ බව දැන කිසි භයක් නැතිව සිංහයෙකු මෙන් අපේ රජතුමා භයින් දිලිහී ඇත. උන් අස්වසාලුව මැනවයි මතු මාලයට නැගී රජ්ජුරුවන් වැඳ එකත් පස්ව සිටිසේක. රජ්ජුරුවෝ ඔහු දැක ප්‍රීතියට පත්ව මා මේ දුකින් මුදවන්ට මොහු හැර අන් කිසිවෙක් නැතැයි දැන පණ්ඩිතයෙනි එකසියයක් රාජධානියෙහි අටලොස් අක්ෂෞහණියක් පමණ සේනාව ගෙන ප්‍රඥාවාල දේශවාසීවූ චූලනී බ්‍රහ්මදත්ත රජ ආයේය. ඒ වීර වික්‍රමාන්විත සේනාවෙහි පොළව හා සමාන නුවණ ඇති අහස පොළව ගැටලන්ට සමත්වූ පණ්ඩිතවරු දසදෙනෙක් ඇත්තාහ. ඔවුන්ට වඩා අධික ප්‍රඥා ඇති රජ්ජුරුවන්ගේ මැණියෝ තලතා දේවිය එකොළොස් වැනිව හිඳ සේනාවට අනුශාසනා කරන්නීය. පණ්ඩිතයෙනි! තොප හා සමාන නුවණ ඇති කෙනෙක් අපට නැත. නුවණ නම් මෙසේ වූ තැනට නේද? එහෙයින් තෙපිම දනුවයි කීහ.

මෙසේ රජ්ජුරුවන් මරණ භයින් යුක්තව කියන බස් අසා "මේ රජ්ජුරුවන්ට මා මුත් අනික් පිළිසරණෙක් නැතැයි සිතා රජ්ජුරුවන් වහන්ස! බිය නොවනු මැනවි. කැටක් ගසා එලවන කපුටු රැලක් මෙන්ද ඔවුන් ගෙනා වස්තුවවත් අස්වාමික කරවා නිගණ්ඨ සේනාවක් පරිද්දෙන් හිස් ලූ ලූ අත ලුහු බඳවා පියමි. එය මට භාරය. ඔබතුමා සුවසේ රාජශ්‍රී අනුභව කළමැනවයි කී සේක. මෙසේ කියා මාළිගාවෙන් බැස නුවර බෙරලවා පින්වත්නි! තෙපි හැම සතුරෝ වටලා ගත්තෝ වේදැයි නොසිතා මල් ගඳ විලවුන් පැළඳ රා මස් ගනිමින් උත්සවයට පටන් ගනුව! බෙර ගසව! ගී කියව! ඔල්වරසන් අසුරුසන් දෙව! ඒවා නැති අයට මාගෙන් දෙමි. මහෞෂධ පණ්ඩිතයෝ නම් මමය. කිසි භයක් නොගනුව! මාගේ බලය බලවයි කියා අස්වසා වදාළ සේක. නුවර ඇතුළෙහි ගී හඬ පිටත සිටි සතුරෝ අසන්නාහ. බ්‍රහ්මදත්ත රජු ඒ හඬ අසා පින්වතුනි! මෙතෙක් සතුරු සේනාවක් පැමිණි මුත් කිසි භයක් නැතිව පස්වනක් ප්‍රීතියෙන් යුක්තව සිටින්නාහ. කුමණ පුදුමයෙක් දැයි කීහ.

SANHIDA LANKA

එවිට චරපුරුෂයෙක් බොරුවක් ගොතා කියන්නේ රජතුමනි! මා සොරෙන් ඇතුළු නුවරට ගොස් ඒ ගැන විමසා බැළුවෙමි. වේදේහ රජු කුඩාකළ දසදහසක් යොදුන් දඹදිව රජවරුන් සහ සේනාව අවුත් මාගේ නුවර පිරිවරා සිටි කල්හි සැනකෙළි කෙළිමියි දොළක් උපන. එබැවින් සත් දවසක් උත්සව පවත්වවයි නුවර අණබෙර ලවා තමන් මතු මහලේ ඇමතියන් පිරිවරා ජයපානය බොනසේක්ය. සතුරු සේනාව ආ බවද

දන්නා සේකැයි කීහ.

එවිට බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ තම යෝධයන් අමතා කොල! නුවරට ඇතුළුවී හැම සුනුවිසුණු කොට වේදේහ රජුගේ ඉස කපා වහා ගෙනවයි විධානය කළහ. ඒ අසා දුව එන යෝධයන් බිම දමන ලද කලල් වැලි ආදිය නිසා එහි ලිස්සා වැටී මහත් විනාශයට පත්වන්නාහ. සමහර අය ඒ වටේ ඇති මහ දිය අගල්වල පතිතව තම තමාගේ ආයුධ වලින්ම ජීවිතක්‍ෂයට පත්වන්නාහ. මහෞෂධ පණ්ඩිතයන්ගේ යෝධයෝ ඇතුළු නුවර සිට බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යෝධයන්ට උසුළු විසුළු කරන්නාහ. උන්ට කිසිවක් කරගත නොහැකිව බ්‍රහ්ම දත්ත රජ්ජුරුවන් අමතා ස්වාමීනී! මේ නුවර ගැනීමට නම් ඍද්ධිමත් කෙනෙකුන් අහසින් යවා මිස මිනිසුන්ට නම් සිතන්ටවත් බැරියයි කීහ. එබස් ඇසූ රජ්ජුරුවෝ කේවට්ටයා අමතා ආචාර්‍ය්‍යයෙනි! කුමක් කරමෝදැයි කීහ. මහ රජතුමනි නුවරට පැන් ආහාර සහ දර පිටතින් ගෙනෙන්නේය. ඒ වලක්වාලිය යුතුයයි කීහ. නමුත් නුවර තුළම කල්තියා ඒ සියල්ලක් සම්පාදනය කොට තුබූහෙයින් එයින්ද ප්‍රයෝජනයක් නොවීය. එවිට චූලනී රජු ආචාර්‍ය්‍යයෙනි! දැන් කළයුත්තෙක් නැත. ආපසු නුවරට යම්හයි කීහ. මහළු වූ කේවට්ට බමුණු කියන්නේ දේවයන් වහන්ස! මහෞෂධ පණ්ඩිතයන් මහ නුවණැත්තෝය. මමද නුවණැත්තෙමි. ඔහු බාලයෝය. මම ඔහු හමුවී ධර්‍ම යුද්ධයක් කරමියි පතක් ලියා මහෞෂධ පණ්ඩිතයන්ට යැවීය. මහෞෂධ පණ්ඩිතයෝ ඒ පත බලා යහපත බස්නාහිර වාසලින් පිටත ධර්‍ම යුධ මණ්ඩපයට එවයි පතක් යවා දෙවන දවස් වේදේහ රජ්ජුරුවන්ගෙන් අෂ්ට වංක මාණික්‍ය රත්නයද ගෙන එහි ගියසේක. කේවට්ටයෝද මහෞෂධ පණ්ඩිතයන් එනු දැක ඉදිරියට ලංව අපි දෙන්නාම පණ්ඩිතවරු වම්හ. තොප නිසා පැමිණ මෙතෙක් කල් මෙහි ලැග්ගෙමි. අපට අමුතු පඬුරක් පමණවත් නො එවූ විරූයයි කීය. කේවට්ට පණ්ඩිතයෙනි! තොපට සුදුසු පඬුරක් සොයන්නෙම් අද ලද්දෙමියි මෙන්න ගනුවයි මහෞෂධ පඬිතුමා එය දිගුකරමින් බැරිවීමකින් මෙන් ඇඟිලි අගින් බිමට හෙළීය. එය ගැනීමට වහා පාත්වූ කේවට්ට බමුණාගේ හිස එසවීමට ඉඩනොදී බෙල්ලෙන් තරයේ අල්වාගත් මහෞෂධයෝ ආචාර්‍ය්‍යයෙනි! මම බාලයෙමි. මට නොවඳුව! මට නොවඳුවයි නලල වරින්වර බිම උලා නුවණැත්තව තමා අතින් වැඳුම්ගන්ට ආවෙහිදැයි බොටුව අල්ලා දමාලූසේක. ඔහු ඇත වීසිවී වැටී වැලි පිස දමදමා පලාගියේය. ඒ දුටු පිරිස හිස්ලූ ලූ අත පැන යමින් අපේ ආචාර්‍ය්‍යතුමා මහෞෂධ පණ්ඩිතයන්ගේ පා වදිනා ලදහ. එබැවින් අපි පැරදුනෙමුයි ඉදිරියට ඒමට බියවූහ. ඒ යන පිරිස දුටු වේදේහ රජ්ජුරුවන්ගේ පිරිස බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක සියයක් රජුන් හා සේනාව පැරද පලායන්නාහයි ඔල්වරසන් දුන්හ. ඔවුන් දොළොස් යොදුනක්ම පසුබැස පලා ගිය පසු පසුපසින් ආ කේවට්ටයා පින්වත්නි මම මහෞෂධයා නොවැන්දෙමි. සිටුව සිටුවයි කීය. එය ගණන් නොගත් බ්‍රහ්මදත්ත සේනාව කේවට්ට බමුණාට නින්දා අපහාස කොට ජඩ මහල්ල කට මැත නොදොඩා තගේ පණ රැකගෙන යවයි කියා නොනැවතීම ගියහ. කේවට්ටයා නැවතත් උන් සමීපයට ගොස් මම උන් නොවැන්දෙමි. වඳින කෙනෙක් නළල දණ වැලමිටි ලේ ලාගනීද උන් මාණික්‍ය රත්නයෙන් තමා වඤ්චාකළ හැටි කියා පිරිස අස්වසා නැවත සේනාව කැටුව පැමිණ පළමුපරිද්දෙන්ම නුවර වටලා ගත්හ.

මහෞෂධ පණ්ඩිතයන්ගේ ආනුභාවයෙන් නොසිතූ නමුත් ඒ සතුරු සේනාව එක එක පස්මිට බැගින්වත් දැමුවේනම් නුවර වටේ තනා ඇති අගල් තුන පුරවාගෙන අටළොස් රියන් පවුර දක්වා ගොඩනන්වන්නට හැකිවන්නේය. ඒ එසේමයි "බොධිසත්තානං අධිප්පායා නාම ඉජ්ඣන්තී" බෝසතුන්ගේ අදහස් නම් සිදුවෙති.

මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ සිතන්නේ මේ සතුරන් බොහෝ දවසක් මෙතැන විසීමෙන් අප සිතට සැපයක් නැත්තේය. උපායකින් මුන් පලවා යවමියි සිතා මන්ත්‍රණයෙහි දක්‍ෂවූ එක් පුරුෂයක්හු පරීක්‍ෂාකොට කේවට්ටයා බඳු කෙනෙකු දැක ඔහු ගෙන්වා තොප සතුරු සේනා මාධ්‍යයට ගොස් බ්‍රහ්මදත්ත රජු සමඟ මිත්‍රවී අප සමග තොපගේ ඇති විරුද්ධත්වය බොරුවට ප්‍රකාශ කොට ඔහුගේ සිත් ගෙන එම සේනාවේ නායක කමට පත්ව ඒ රජ්ජුරුවන්ට මෙසේ කියව! මහරජ මහෞෂධ පණ්ඩිතයෝ බොහෝ මායම් දන්නාහ. තොපගේ සේනාවට දැනටමත් බොහෝ අත්ලස් දී ඔහුගේ බසට නමාගෙන ඇත්තාහ. කීප දවසක් මෙතන රැඳුන සේක්නම් නුඹ වහන්සේගේ සියළු සෙනඟ ඔහු අතට ගෙන ඔබවහන්සේ ජීවිතක්‍ෂයට පමුණුව'යි එබැවින් ප්‍රමාද නොවී අද මධ්‍යම රාත්‍රියෙහිම අසුපිට හිඳගෙන පලායම්හයි සතුරන් අත මියයෑමෙක් අපට නොවේවයි කියා ඒ රජ්ජුරුවන් ගිවිස්වාගෙන ඔහු නික්මෙන වේලාවරහසින් අපට දන්වවයි වදාළසේක. ඒ පුරුෂයාද මහෞෂධ පණ්ඩිතයන් පිටුවහල් කළ පුරුෂයෙකු මෙන් ගොස් ඒ බ්‍රහ්මදත්ත රජුට ගතු කියා ඔහුගේ හිත් ගෙන සේනාවේ නායකත්වයට පත්වී එක් එක් කොටස් ගෙන ගොස් මිනීකන කිඹුලන් ඇති අගලට හෙලා විනාශයට පත්කොට මහෞෂධ පණ්ඩිතයන්ගේ උපක්‍රමය පරිදි සියල්ලම ක්‍රියාවේ යොදවා ගමන සූදානම් කොට චර පුරුෂයන් අත මහෞෂධ පණ්ඩිතයන්ට දන්වා එවූහ. රජ්ජුරුවෝ අසු නැගී පලාගියහ. ඒ අසු නැවැත්වීමට යම්සේ කඩියාලම අදීද එකල තවත් වේගයෙන් දුවන්නට සන්දෙන සේ එය

SANHIDA LANKA

සාදා තිබුන බැවින් රජ්ජුරුවන්ට මගදී නතරවිය නොහැකිව ගියේය. ඒ පුරුෂයාද මඳ දුරක් ගොස් මගදී නතරව මහාපිරිස මැදට පැමිණ චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් පැහැර ගෙන ගොස් යයි කෑගැසීය. චර පුරුෂයෝද ශබ්ද පැවැත්වූහ. එකසියයක් රජවරුද අපට වූයේ මහත් විනාශයෙක. දැන් අපව මහෞෂධ පණ්ඩිතයන්ට අසු වෙතැයි මහත් බියට පත්ව ගෙන ආ සියළු වස්තුවත් මඟුල්කඩු උතුරු සළු ආදීදේද හැරදමා නිසණ්ඨ පිරිසක් මෙන් හිස් ලූ ලූ අත පලාගියහ. චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එකසියයක් රජදරුවන්ගෙන් වෙන්ව තමන්ගේ නුවරටම පැමිණ නතරවූහ. දෙවන දවස් උන්දමා ගිය වස්තුවෙන් රජවරුන් සතු වස්තුව වේදේහ රජ්ජුරුවන්ටද සිටුවරුන් සතු වස්තුව තමාටද සෙසු පිරිස සතු වස්තුව නුවර වැස්සන්ටද සමසේ බෙදා දුන්හ. ඒ වස්තුව ඇද නිමකිරීමට සාරමසක් ඉක්මී ගියේය. අනුකේවට්ටයා ලෙසින් ගොස් රජු පලවා හැරීමට උපායෙදූ පුරුෂයාට බොහෝ වස්තුව දුන්නේය.

මෙසේ අවුරුද්දක් ඉක්ම ගිය පසුකේවට්ට බමුණා දිනක් කැටපතකින් තම මුහුණ බලන්නේ නලල කබරව දාගිය වන කැලැල් දැක ක්‍රෝධයෙන් දිලිහී කවදා හෝ මහෞෂධ පණ්ඩිතයන්ගෙන් පලි ගනිමියි උපායක් සිතන්නේ චූලනී රජ්ජුරුවන්ගේ විශිෂ්ඨ රූපයෙන් යුත් පඤ්චාල චණ්ඩි කුමාරිකාව වේදේහ රජ්ජුරුවන්ට පාවා දෙන්නෙමියි පත්යවා මහෞෂධ පණ්ඩිතයන් සමඟ දෙදෙනාවම ගෙන්වා මෙහිදී ඔවුන් ජීවිතක්ෂයට පත්කොට ජයපානය කිරීම යහපතැයි සිතා තමාගේ අදහස් රහසින් චූලනී රජ්ජුරුවන්ට දැන්වීය. රජ්ජුරුවෝද එය අසා වරක් තොපගේ නුවණේ තරම දුටිමි. අපගේ ඇදි වතත් දමා ඒමට සිදුවිය. මෙවර කුමක්වේද නොදනිමියි කියා යහපත තොපකී ලෙස මෙවරත් කරමියි ගිවිස්සාහ. මේ දෙදෙනාගේ රහස් කථා චූලනී රජ්ජුරුවන්ගේ එක් සැළලිහිණියක් මනාකොට අසා සිතතබා ගත්තීය. ඉක්බිති රජ්ජුරුවෝ තම දියණියගේ රූපලාවන්‍ය මිහිරි ගීයට නගා ඒ ගී කියන්නවුන්ට උගන්වා මියුළු නුවරට ගොස් ඒ ගායනා කරවයි යවූහ. සැළලිහිණියන්ට උගන්වා තාලම්පට බඳවා රාත්‍රී ගස්උඩ ඉඳ ගීතිකාවක් ගයන ලෙස සැළැස්වූහ. ඒ කුමක් නිසාදයත්? තම දුවණියගේ රූප විලාසය දේවතාවෝ පවා කියන්නාහයි දඹදිව ප්‍රසිද්ධවන පිණිසය.

වේදේහ රජ්ජුරුවෝ ඒ අසා ගායනා කාරයන් කැඳවා මෙබඳු රූපත් දුවණියන් මට දෙත්ලයි සොම්නස්ව ඔවුන්ට මහත් සත්කාර කොට යැවූහ. ඔවුන් ගොස් චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට කීහ. ඊට අමතරව කේවට්ට බමුණු කියන්නේ මහරජ! දැන්මම ගොස් නැකැත් දැන දින නියම කොට එමියි කියා පිටත්ව මහපිරිවරින් මියුළු නුවරට පැමිණියේය.

පරසිත් දන්නා මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ සිතන්නේ මේ විවාහය කියා කේවට්ටයා එන ගමන මට නුරුස්නේය. තත්‍වය පරීක්ෂාකරමියි සිතා ඒ තත්වූ පරිදි කියා එවයි චරපුරුෂයන් අතින් විමසා යවූහ. ඔහු කියා එවන්නාහු අපිත් එහි තත්‍වය නොදනුම්හ. කේවට්ටයෝ රජුන් සමඟ මතු මහලේ කල රහස් කුමන්ත්‍රණය එක් සැළලිහිණියෙක් ඉඳුරා දන්නීයයි කියා යැවූහ. ඒ අසා පණ්ඩිතයන් වහන්සේ මා සුරැකිව රැකි මෙනුවර මේ දුෂ්ට කේවට්ටයාට නොපාමියි සිතා නුවර මහවාසල පටන් රජගෙයි දොරකඩ දක්වාද එතැන් පටන් තමන්ගේ දොරකඩ දක්වාද මාගී දෙපස බට පැලලි එල්වා මුදුනෙහි පැදුරු බඳවා සිත්තම් කොට බිම සුදුවැලි ලවා මල් ඉස්වා පුන්කලස් තබා ධජ නංවා සරසාලූසේක. කේවට්ටයාත් එනුවරට වන්නේ ගෙවල් ආදිය නොදැකතමා එන නිසා මෙසේ සරසන ලදැයි සිතීය. තමාට නුවර නොපෙනෙන පිණිස කළ නියාව නොදන්නේය. කේවට්ටයා තමා ගෙනා පඬුරු රජ්ජුරුවන්ටදී මියුරු කතා කොට රජකුමරිය ගැන දන්වා රජ්ජුරුවන් වහන්සේ වහා වැඩිය මැනවයි ආරාධනා කළේය. වේදේහ රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා කුමාරිකාව ගැන සිත් බැඳී ආචාරිනී යව මපුත් මහෞෂධ පණ්ඩිතයන් දකුවයි කීහ. එදවස් උදැසන පණ්ඩිතයන් වහන්සේද ඒ පව්ටා මා හා එක්ව කථාවක් නොවේවයි සිතා තමන්ගේ බසට කැප පිණිස එළගිතෙල් හුඟක් අනුභව කොට ගෙයි ගොම පිරිබඩ ගාවනසේක් දැගුලක් උසට ගාවා මිදුනු තෙල් ගල්වා තමන් නිඳන එක් ඇඳක් තබා අනික් අසුන් අස් කොට එහි සිටියවුන්ට විධානය කරන්නේ බමුණු මා හා කතාවට වන් කල පණ්ඩිත වහන්සේ සමඟ නොදොඩව! අද බෙහෙත් තෙලක් අනුභව කළසේකැයි ඔහු නවතා මාත් දොඩන්ට වන්කල්හි ස්වාමීනී! බෙහෙත් තෙලක් වැළඳූසේක් වේද නොදොඩා වඳාළ මැනව'යි කියවයි විධානය කොට රත්වතක් පොරවාගෙන සත්වන දොරටුවේ යටමාලේ වැදහොත්සේක.

SANHIDA LANKA

කේවට්ටයා පැමිණ පණ්ඩිතයෝ කොහිදැයි විමසීය. රැකවල් සිටියෝ බමුණ! මහත්කොට නොදොඩා ගොළුවකුසේ එව! අද අපගේ ස්වාමී බෙහෙත් තෙලක් වැලඳූසේකැයි කීහ. ඒ ගිය බමුණා හා පණ්ඩිතයන් වහන්සේ කථාවට පටන්ගත් කල්හි ස්වාමීනි! ගිලන්ව සිට මේ දුෂ්ටවූ බමුණා හා කථාවෙන් ප්‍රයෝජන කිම්දැයි කියා නැවතූහ. කේවට්ටයා පණ්ඩිතයන් සමීපයෙහිහිඳිනා අසුනක්වත් මිහිරිබසක්වත් නොලදින් පණ්ඩිතයෙනි! අපි යම්හයි කීහ. එහි සිටියකු එවිටම බමුණ! නොදොඩා යව! අපි තගේ ඇට බැටදී

තලාපියම්හයි කීය. එකෙක් හුණ පත්තකින් පිටට
පහරක් ගැසීය. එකෙක් අතුල් පහරක් ගැසීය. කේවට්ටයා හයින් තැතිගෙන වෙව්ල වෙව්ලා ගොස් රජගෙට පැමිණියේය.

රජ්ජුරුවෝත් මපුතණුවෝ අද මාගේ විවා මගුල් අසා සතුටු වන්නාහ. පණ්ඩිතවරු දෙදෙනා අතර ධර්මයෙන් යුක්තවූ කථාවකුත් වන්නේය. එබැවින් මට වූයේ මහත් ලාභයෙකැයි සිතා උන්නාහ. එවේලෙහි එතනට ආ කේවට්ටයා දැක "කිමෙක්ද? කේවට්ටයෙනි පණ්ඩිතයන් හා තොප ක්ෂමාකරවා ගතුද? මගුල් විවාහය අසා මපුතණුවෝ සතුටුවූදැයි කීහ.

එවිට කේවට්ටයා තමාටවූ සියළු ගැහැට විස්තරව කියා පණ්ඩිතයන්ගේ නුගුණම ප්‍රකාශ කෙළේය. රජ්ජුරුවෝ ඒ අසා පණ්ඩිතයන්ගේ මේ ක්‍රියාවේ යම් අර්ථයක් ඇතැයි සිතා ඔවුන්ට සැතපෙන්නට සලස්වාදී ඒ ගැන සිතමින් සිටිනාතර සේනකාදී සතරදෙන ආහ. රජ්ජුරුවෝ ඔවුන් සතරදෙනාටද මේ ගැන දන්වා කිමෙක්ද? පණ්ඩිතවරුනි! චූලනී රජ්ජුරුවන්ගේ දුවණියන් ගෙනමෝද්දැයි විචාළහ. එවිට ඒ සතර දෙනාද තමාට සිදුවන ලාභප්‍රයෝජණ සලකා එකහෙළා සුදුසු බව ප්‍රකාශ කළහ.

පණ්ඩිතයන් වහන්සේ ඔහු ගිය බව දැන රාජ සේවයට අවුත් රජ්ජුරුවන් වැඳ එකත්පස්ව උන්සේක. එවිට රජතුමා රාගයෙන් මත්ව මෝහයෙන් මුළාව පුත මහෞෂධ පණ්ඩිතයෙනි සේනකාදී සතරදෙනාගේත් මගේත් අදහස චූලනී රජ්ජුරුවන්ගේ දියණිය ගෙනඒම පිණිස උත්තර පඤ්චාල දේශයට යාම සඳහාය. තෙපිත් කියව! යමෝද නොයමෝද්දැයි කීහ.

පණ්ඩිතයන් වහන්සේ මහරජ! බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මෙනුවරට අවුත් පැරද පලාගිය හෙයින් පලිගන්නා අදහසින් දුව සරණ දෙමියි එහි ගෙන්වා දැලට අසුවූ මුවකු පරිද්දෙන් විනාශයට පත්කරති'යි සිතමි. තවද ඇම කෙරෙහි ගිජුවූ මසකු පරිද්දෙන් වහා නස්නා සේක. එබැවින් මේ ගමන මම නොකමැත්තෙමියි කීහ. එබස් අසා නුවණ නැති රජ තමන්ව හෙලා දෙඩුවැයි සිතා මොහු මා රජකු බව ටිකකුදු නොසලකා බිලියක් ගිලූ මසකු මෙන්ද පණ හසුවූ මුවකුසේද මහත් වූ විනාශයට පැමිණෙතියි කියයි'යි කිපී නින්දා පරිභවකොට මොහු අල්වා පිටතට යවයි කීහ.
පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් කිපි නියාව දැන රජහු වැඳ නික්ම තමන්ගේ ගෙට ගොස් සිතන්නේ රජ්ජුරුවෝ නුවණ මද හෙයින් කාමයෙහි ගිජුව ගොස් මහා විනාශයට පැමිණෙන්නාහ. මම මොහුට පිහිට වියයුතු යයි දැන පළමුකොට ගිරවාණන් යවා තත්වය දැන පසුව මම යන්නෙමියි සිතා එනුවරට ගිරවාණන් යැවූසේක. ගිරවාණෝ ගොසින් සැළලිහිණියා සිටින තැන සොයා වටපිට පරීක්ෂාකොට ළඟට ගොස් සබඳ! මම මියුළු නුවර සිට ආමියි  බොරුවක් ගොතා කියන්නාහු මම එසේ මෙසේ කෙනෙක් නොවෙමි. සිවි රජ්ජුරුවන්ගේ යාන බලන්නාවූ ගිරවා වෙති. රජ්ජුරුවෝ ඉතා ධර්මිෂ්ඨයහ. මැදිරිවල හිඳිනා පක්ෂීන්ද හරවනසේක් මාවද හැරිසේක. මා කැමති තැනක ඇවිද ගොදුරු කා මාගේ රන්මැදිරියට යන්නෙමියි කියා සැළලිහිණියාගේ සිත් ගෙන සොඳුර! මටද තොප මෙන් සුරතල් බිරිඳක් වූවා හදිස්සියේ උකුස්සකු විසින් ඩැහැගෙන ගියේයයි අඬන්ටවන. එවිට සැළලිහිණියා ඔහුගේ සිත සනසා පෙම්බස් දොඩා ඔහුගේ සිත්ගෙන අපි දෙදෙනා එක්වී ප්‍රීතියෙන් පසුවෙමුයි පැවසීය. එවිට ගිරවාණෝ දැන් ඇගෙන් රහස අසාගත හැකැයි ඒ පිළිබඳ තොරතුරු විමසා කලින් චූලනී රජ්ජුරුවෝ සමඟ කේවට්ටයා කී මන්ත්‍රණය පරීක්ෂාකාරීව දැනගෙන මේ උපායෙන් අපගේ රජු මේ නුවරට ගෙනවුත් මරන්ට බැරිනැතැයි දැන සොඳුර! මා සිවි රටට ගොස් මට යහපත් බිරිඳක් ලද බව රජ්ජුරුවන්ට දන්වා පිරිවර සමඟ එමියි දින හතක් කල් ලබාගෙන ඈ සනසා සිතින් සිතන්නාවූ තිගෙන් මට කම්නැතැයි පියාඹා මියුළු නුවරට ගොසින් පණ්ඩිතයන් වහන්සේට සියළු තොරතුරු දැන්වූහ.

පණ්ඩිතයන් වහන්සේ ඒ අසා රජ්ජුරුවෝ මා නොකමැති කරවා ගොසින් මහා විනාශයට පැමිනෙන්නාහ. පිටතින් මට නින්දාද කරන්නාහ. මම පළමුව ගොස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දැක වේදේහ රජ්ජුරුවන්ට යහපත් නුවරක් තිමවා ගව්වක් පමණ සුළු උමගක් හා දෙගව්වක් පමණ මහ උමගක් කරවාලා චූලනී රජ්ජුරුවන්ගේ දියණියන් අපගේ රජ්ජුරුවන්ට අභිෂෙක කරවාදී එකසියයක් රජදරුවන් හා මහා සේනාව අපේ අළුත් නුවර වටලාගෙන සිටියදී රාහු මුඛයට වන් සඳමඬලක් පරිද්දෙන් ගලවාගෙන එන ගමන මට භාරවන්නේයයි සිතා පස්වනක් ප්‍රීතියෙන් යුතුව සුවඳ පැනින් ඉස් සෝදා නා සර්වාභරණයෙන් සැරසී මහ පෙරහරින් රජගෙට ගොස් රජහු වැඳ කිමෙක්ද මහරජ! උත්තර පඤ්චාල දේශයට යන සේක්දැයි විචාළසේක.

SANHIDA LANKA

එසේය පුත! යෙමි. ඒ කුමාරිකාව නොලබන්නාවූ මට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්ද? තෙපිත් මා හා කැටිව එවයි කීහ. මහරජ එසේවීනම් මම පළමුකොට ගොස් ඔබවහන්සේට මාලිගාවක් නංවාලා යම් දවසෙක කියා එවීනම් එදා වැඩිය මැනවයි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ ම පුත් මා අත් නොහරිනා සැටිය'යි ඉතා සතුටුව පුත! එසේනම් කැමති දෙයක් ගෙනයවයි කීහ. පණ්ඩිතයන් වහන්සේ මහා බලසම්පන්න යෝධයන්ද නොයෙක් කර්මාන්තයෙහි දක්‍ෂවූවන්ද පොරෝ උදළු ආදී උපකරණ භාණ්ඩද රැගෙන සේනාව පිරිවරාගෙන යන්නේ සතර ගව්වෙන් සතර ගව්වට එකි එකී ගම බැගින් කරවා ආරක්‍ෂා සංවිධාන යොදවා මහපෙරහරින් නුවරට වන්සේක. චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන් ආ බව අසා අපගේ අදහස් මුදුන් පැමිණියේයයි සතුටට පත්ව හැමට කලින් අසා මාලිගානංවන්ට ආමි'යි අසා පුත! තොපගේ රජ්ජුරුවන් එන තෙක් උකටලී නොව අපටත් කල මනා දෙයක් කරවාලා සුවසේ ඉඳුවයි කීහ. පණ්ඩිතයන් වහන්සේ එබසින් සතුටටපත්ව රජගෙට නැගෙනසේක්ම හිණිපාමුල සුළු උමඟ දොරකඩ තැබිය යුතුයයි සිතූසේක. උමඟ කරන කල මේ හිණ නොවැටෙන ලෙසත් කරමියි අදහස් කොට මහරජ මාළිගාවේ නව කර්මාන්ත බැලීම්. මේ හිණ යම් වරදෙක් ඇත. ඔබ කැමති සේක්නම් විශ්වකර්මයාත් නපුරුයි නොකියන ලෙස කරවාලමියි කියා අවසර ගෙන පරණ හිණ අස්කොට ඒ යට පස් හරවා එය නොවැටෙන සේ පෝරු අතුරුවා පසුව හිණ සිටවූහ. රජ්ජුරුවෝ මේ අනතුර නොදන්නහු තමා කෙරේ ඉතසිතින් කෙරෙතියි සිතූහ. මෙසේ කර්මාන්ත කොට රජ්ජුරුවන්ගේ සිත් ගෙන අපගේ රජ්ජුරුවන් සඳහා මාලිගා නංවමියි අවසර ගෙන ගඟින් එතෙර ගල්ගමුව නම් ගමක් කරවා උමඟ කර්මාන්තයට පටන් ගත්හ. දසදහසක් පමණ යෝධයෝ මහ උමඟ කැණ ඒ පස් ගඟ දියෙහි ලන්නාහ. ඒ පස් ඇත්තු මඩනාහ. නුවරවාසීහු මහෞෂධ පණ්ඩිතයන් ආවක් පටන් පැන් බී ගත නොහැකැයි කළකිරී පරීක්‍ෂාකර බලන්නාහු ඇතුන් දිය කෙළිනා දැක සමාධිවූහ.

පණ්ඩිතයන් වහන්සේ සිතූදෙය සිද්ධවන්නේය. ඒ උමඟ ගලක් හෝ මුලක් නැතිව බිම ගිලී අන්තර්ධාන විය. සුළු
උමඟ දොරකඩ උපකාරී නුවර වූයේය. සත්සියයක් පමණ යෝධයෝ ඒ උමග කණින්නාහ. මහ උමඟට වදනා දොරකඩ එම නුවර වූයේය. ඒ උමග අටලොස් රියන් උසඇති දොරවල් අසූවකින් ගැවසීගත්තේය. ඒ උමග මුළුල්ල එක ඇණයක් මිරිකා ලන්නාහාම සියළු දොරවල් වැසී යන්නේය. ගබඩා එක් සියයක ශ්‍රී යහන් ගබඩා වූයේය. ඒ තුල මනෝහර සිත්තම් කරවන ලද්දේය. ඒ සුධර්මා දිව්‍ය සභාවසේ ඉතා අලංකාරවිය. ගඟ නැව් තුන්සියයක් වූයේය. ඒ නුවර වට පැන් අගලය. කලල් අගලය. වියලි අගලයයි අඟල් තුනක් කැණවූයේය. මේ වැඩ සියල්ල සාරමසකින් නිමවා වේදේහ රජ්ජුරුවන් කැඳවා දූතයන් යැවූසේක. රජ්ජුරුවෝ පෙරමග බලා සිට දූතයාගේ බස් අසමින්ම සේනාව පිරිවරා නික්මී සාරසිය ගව්ගෙවා ගංතෙරට පැමිණියහ. පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන්ට පෙරගමන් කොට කැඳවා ගෙන තමන් කරවූ නුවරට ගෙනගිය සේක. රජ්ජුරුවෝ ආහාර අනුභව කොට කැඳවාගෙන තමන් කරවූ නුවරට ගෙන ගියසේක. රජ්ජුරුවෝ ආහාර අනුභව කොට මඳක් සැතපී සිට පස්වරු වේලෙහි තමා ආ බව චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට කියා යැවූහ.

චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මහත් සොම්නසට පැමිණ සෙට උන් දෙන්නාගේ හිස් කපා ජය පානය කරම්හයි සිතින් ක්‍රෝධ උපදවා ආ දූතයාට සතුට හඟවා වේදේහ රජ්ජුරුවන්ගේ පැමිණීම ඉතා යහපත! දුවණියන් පාවාදෙමි'යි කියා යැවූහ. වේදේහ රජ්ජුරුවෝ ඒ අසා අද සුභ නැකැත් වන්නේය. දුවණියන් සරසවා එව්වමැනවයි නැවතත් කියා යැවූහ. චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ දැන්ම එවමියි බොරු කියා එකසියයක් රජදරුවන්ට දන්වා යවන්නේ එදා මියුළු නුවරට ගියාසේ උපකාරී නුවර බලා නික්ම සතුරන් දෙදෙනාගේ හිස්කපා සෙට ජයපානය බොම්හයි කියා යවා තම මෑණියන් වූ තලතා දේවියද පුතණුවන් වූ පඤ්චාලචණ්ඩ කුමාරයන්ද දුවණියන් වූ පඤ්චාලචණ්ඩි කුමාරිකාවන්ද යන මේ සතරදෙනා මාළිගාවේ දෙවන මාලේ රඳවා රැකවල්ලවා උපකාරී නුවරට පිටත්වී අවුත් අටලොස් අක්ෂෞහණියක් සේනාව සමඟ එනුවර වටලා ගත්හ.

එවිට මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ සහජාත යෝධයන් තුන්සියදෙනා අමතා තොපි හැම සුළු උමගෙයින් ගොස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මෑණියන්වද අගබිසවද දරුවන් දෙදෙනාද මාලිගාවෙන් රැගෙන එම උමගින් ගෙනවුත් මහා උමඟට බලා ඔවුන් එහි රඳවා අප එනතෙක් රැකවල්ගෙන සිටිව'යි වදාළසේක. උන්ද පණ්ඩිතයන් වහන්සේගේ උපදෙස් පරිදි ගොස් ඒ සතර දෙනා අමතා දේවයන් වහන්ස! අපගේ රජ්ජුරුවන් වහන්සේ වේදේහ රජුත් මහෞෂධ පණ්ඩිතයාත් අල්වාගෙන මරා සියළු දඹදිව රාජ්‍යය එක්සත් කොට එක්සියයක් රජුන් පිරිවරා මහා පෙළහරින් ජය පානය බොන්නාහු ඒ මගුලට නුඹ සතරදෙනාත් කැඳවාගෙන යනු පිණිස අප එවූහයි බොරුකියා උන් කැඳවාගෙන උමගින් ආහ. තවත් යෝධයෝ සමහරෙක් නැවත හැරී

SANHIDA LANKA

මාලිගාවට ගොස් ගබඩා බිඳ හැකිතරම් වටිනා මුතු මැණික් පොදි බැඳගෙන ආහ.

වේදේහ රජ්ජුරුවෝ දැන් දැන් කුමරිය එවතියි කාමයෙන් මුසපත්ව සිට වහා නැගී කවුළුවෙන් නුවර පිටත බලන්නේ මහත් යුධසේනාව දැක අතිශයින් සැකව සේනකාදීන් අමතා පණ්ඩිතවරුනි! මේ සේනාව අප කෙරෙහි සතුටින් අවුද? රුහැනිව අවුදැයි කීය.

ඒ අසා සේනකයා මහරජ! නොසිතා වඳාළ මැනව බොහෝ ආලෝක විලක්කු පෙනෙයි. දුවණියන් හැරගෙන බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ආහයි සිතම්'යි කීහ. වේදේහ රජ්ජුරුවෝ සන්නාහ සන්නද්ධව යුද්ධයට සැරසී සිටින්නවුන් දැක මරණ භයින් තැතිගෙන මහෞෂධ පණ්ඩිතයන්ගේ බසක් ප්‍රාර්ථනා කරන්නාහු මේ සේනාව අපට කුමක් කරන්නීදැයි කීහ. ඒ අතර පැමිණි පණ්ඩිතයන් වහන්සේ මහරජ! බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සේනාව සමග පැමිණ සිටිති. අළුයම් වේලෙහි ඔබවහන්සේ අල්වා මරත්මය. දුවණියන් සරණ දෙන්නට ආ ගමනක් නොවේයයි වඳාළසේක. එබස් අසමින් සේනකාදීවූ සියල්ලෝම මරණ භයින් තැතිගෙන කිසිවකුත් කියන්නට අසමත්වූහ. රජහු උගුර කෙළ සිඳී ගියේය. ඇඟ ඩා වැගිරෙමින් මහෞෂධ පණ්ඩිතයෙනි! කුමක් කටයුතුදැයි අඬන්නට වූහ. පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන්ගේ බැගෑපත් හඬ අසා මොහු මගේකීම ප්‍රථම පිළිනොගත්තේය. මතු කීකරුවන ලෙස තවත් නිග්‍රහ කොට අඳුන්වාලමියි සිතා මහරජ! ඔබවහන්සේ කාම ලෝභයෙන් අන්ධවූයේ මෝහයෙන් මුලාවූයේ මාගේ බස් නොගිවිස සේනකාදීන්ගේ බස් අසා ක්‍රියාකොට මේ සා මහත් වූ භයකට පැමිණිසේක. එදා මම මේ ගැන ඔබවහන්සේට කාරණ කී කල්හි මාගේ බොටුව අල්වා බැහැර ලවයි වඳාළසේක් නොවේද? එදවස් එසේ කී ඔබවහන්සේ අද ඔහුගෙන් ගැලවෙන උපාය විචාරන්නේය. මා කිසිවක් නොදනිමි. සේනකාදීන්ගෙන් ගැලවීමේ මන් විමසා ගනිත්වායි වඳාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ පුත! මහෞෂධ පණ්ඩිතයෙනි! ගියදවස මා නුවණ නැතිව කියාපී කථා සිහිකොට මට තවත් දුක්වේදනා නොකොට මින් ගැලවෙන උපායක් කියව! තොපහැර මට අනික් පිහිටක් නැතැයි කියා ඇඬූහ.
ඒ අසා කරුණාවෙන් බරවූ පණ්ඩිතයන් වහන්සේ, මහරජ! මේ විපතින් ගැලවීමට මාර්ගයක් කියනුතබා සිතීමටත් නොපිළිවන. දැන් ඔබවහන්සේට හැකි උපායකින් ගැලවීගත මැනව'යි කීහ! සේනකාදී පණ්ඩිතවරුද අඬමින් වැලපෙමින් මේ දුකින් අප ගලවාගත මැනව'යි යාඥා කළහ. මෙසේ ඇසුවන් ලය කම්පාකරවන පරිද්දෙන් අඬන්නාවූ රජ්ජුරුවන්ගේද සේනකාදීන්ගේද බස් අසා මේ රජ මරණ භයින් ක්ලාන්තවිය. මාමුත් අනික් පිහිටක් නැත. එබැවින් අස්වසා ලමියි සිතා රජු අස්වසමින්

"මාත්‍වං භායි මහාරාජ!
මාත්‍වං භායි රථෙ සභ!
අහං ත්‍වං මොචයිස්සාමි
රාහු ගහිතංව චන්දිමං!"

මහරජ! නොබව මැනව! රාහුමුඛයට වන් සඳමඩලමෙන් ගලවාගනිමි. සතුරු සේනාව කපුටු සමූහයක් නෙරනාසේ පලවා හරින්නෙමි. ඔබ වහන්සේ මේ භයින් මුදවා මියුළු නුවර ලාලම්'යි වඳාළසේක.

වේදේහ රජ්ජුරුවෝ අභීත කේශර සිංහ රාජයෙකුසේ පණ්ඩිතයන් වහන්සේ කියන බස් අසා මෙවිට මාගේ ජීවිතය ලදිමි'යි අතිශයින් සතුටුව අස්වැසී ගත්හ. සේනකාදිහුද ඉතා ප්‍රීතියට පත්ව ස්වාමීනී මේ සා සතුරු සේනාවක් පැමිණ සිටියදී කෙසේ ගලවාගන්නාසේක්දැයි කීය. එම්බල සේනකය! මේ සතුරන් ලුහුබඳවා උන්හැම නොදන්නා පරිද්දෙන් සරසන ලද උමගින් ගෙනයම්'යි වදාරා සේනකය! තෝ ගමනට සැරසී ගනුව'යි කියා උමග දොර හරිනට නියමකොට රජ්ජුරුවන්ට එහි වඩින ලෙස ආරාධනාකොට මහරජ! වහා වැඩිය මැනවයි කැඳවාගෙන ගොස් පඤ්චාලචණ්ඩි කුමාරිකාවන් රජ්ජුරුවන්ට අභිෂේක කොටදී ගං තෙරට පැමිණ තුන්සියයක් නැව්වලට සියළුදෙනාවම නංවා කුමාරියගේ මැණියන්වද බිසවද මළනුවන්වද වේදේහ රජ්ජුරුවන්ට භාරදී මනාසේ රැකගන්නා ලෙස අවවාදකොට මෙහි නොරඳා වහා වැඩිය මැනවයි වඳාළ සේක. තමාගේ සේනාව දමා යාම යුක්ති සහගත නොවන නිසා රජ්ජුරුවන් වැඳ එහිම රැඳුණුසේක.

SANHIDA LANKA

වේදේහ රජ්ජුරුවෝ සතුරන් අතින් මිදී සොයා ආ බිසවුනුත් ලැබී මනදොළ මුදුන් පැමිණියේයයි උපන් පස්වනක් ප්‍රීතියෙන් යුතුව මහෞෂධ පණ්ඩිතයන්ගේ ගුණවමින් සාරසිය ගව්ගෙවා දෙවන දවස් පෙරවරු බතට මියුළු නුවරට වන්හ.

පණ්ඩිතයන් වහන්සේ උමඟ දොරට වැඩ සුවඳ පැනින්නහා රසයෙන් යුත් බොජුන් වළඳා මගේ මනදොළ පිරුණේයයි සොම්නසින් යුතුව සුවසේ සැතපුන සේක. චූලනී රජ්ජුරුවෝ රාත්‍රිය පහන්වූ කල්හි නුවර සමීපයට පැමිණ සේනාවට විධානය කෙරෙමින් වේදේහ රජු නොමරා අල්වා ගනුව! අටළොස් රියන් පවුරු බිඳ පියා දමව්යයි කියා ඒ ඒ තන්හි ඔවුනොවුන් යොදවන්නාහ.

මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ ශ්‍රී යහනින් නැගීසිට චූලනී රජ්ජුරුවන්ට තමන්ව පෙනෙන පරිදි සී මැඳුරු කවුළුවෙන් පිටත බලා ඇයි මහරජ! ඉක්මනට ඇතුමෙහෙයවන සේක්. තමාගේ අභිමතාර්ථය සිද්ධවීයයි සිතනසේක්ද? කිසිවිටෙකත් එසේ නොසිතුව මැනව! මහරජ නුඹවහන්සේ හා කේවට්ටයා මතුමාලේ සිට රහස් මන්ත්‍රණයක් කළාහුද ඒ රහස මා නොදනිත්යයි නොසිතුව මැනව ඒ මන්ත්‍රණය භින්නව ගියේය. එසේ හෙයින් අපගේ රජ්ජුරුවෝ පඤ්චාලචණ්ඩි කුමාරිකාවද රැගෙන තම නුවරට පලා ගියහ. එපමණක්ද නොව ඔබගේ මෑණියන්ද දේවියද, පුතාද දැනට අප රජතුමා සතුව ඇත. ඔබට හැකිනම් ලුහුබඳවා අල්වා ගනුවයි වදාළසේක.
චූලනී රජ්ජුරුවෝ පණ්ඩිතයන් වහන්සේ කිසි චකිතයක් නැතිව කියන බස් අසා අමාත්‍යයන් යවා තම මාළිගාව පරීක්ෂාකර බලා ඉහත කී සතරදෙනා සහ සියළු වස්තුව පැහැරගෙන ගොස් ඇතිබව ඔවුන් අතින් දැන දණ්ඩෙන් පහරලත් සර්පයකු මෙන් ක්‍රෝධ උපදවා වහසි බස් කියන්නට වන්හ.

පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන්ගේ විලාශය දැක මොහු මා කරා පමුණුවා ගනිමි'යි සිතා නන්දා දේවියගේ රූපලාවණ්‍ය වඩවඩාත් වර්ණනා කරන්නට වූහ. එවිට චූලනී රජු නන්දා දේවිය තමාපෙර නොදුටු විරූ කෙනෙකුන් පරිද්දෙන් බලවත් ස්නෙහ ඉපදවූහ. රජහුගේ ස්නෙහය දත් පණ්ඩිතයන් වහන්සේ මහරජ! මෙබඳු රූපත් බිසවුන් මියයාමෙහි සතුටු සේක්ද? උන් මළකල ඔබවහන්සේට කෙතරම් පාඩුවෙක්ද? ඔබවහන්සේ මෙහිදී මාව මරාපුනම් මාගේ රජ්ජුරුවෝ එහිදී නන්දා දේවිය මරාදමන්නාහ. එකල නන්දා දේවිත් මාත් දෙන්නා සමඟ යමරජු ලගට යම්හ. එවිට යමරජු අපි දෙදෙනා බලා සුදුසුකම් සලකා ඈමට පාවාදී පියන්නාහ. එබැවින් මා මියත් එබඳු ස්ත්‍රී රත්නයක් ලබන කල සෙසු කුමක් මට සිද්ධ නොවේද? ඒ නිසා මා මිය යාමෙන් කිසි හානියෙක් නැතැයි වදාළසේක. එවිට රජ්ජුරුවෝ සිතන්නාහු නන්දා දේවින් මට ගෙනවුත් දීමට මේ මහෞෂධ පණ්ඩිතයන් හැර අනික් කෙනෙකුන් සමර්ථ නැත. මේ කිමෙක්දැයි විචාරා බලමියි සිතා පණ්ඩිතයෙනි! මේ සා රාජ සේනාවක් වටලාගෙන සිටියදී මාගේ නෑයන් සතරදෙනා නුවරින් පිටත්කොට යවාපු තෙපි දිව්‍ය මායාවක් දනුද විචාළහ. මහරජ! මම දිව්‍යමායමුත් ඉන්ද්‍රජාලත් දනිමි. නුවණැත්තහු දිව්‍ය මායම් ඉගෙන තමහට භයක් උපන් කල්හි තුමූත් ගැලවී ආශ්‍රය කළවුනුත් ගලවන්නේ වෙත්ය. මහරජ! උමන් බිදීමෙහි දක්ෂවූ මාගේ තරුණ යෝධයන් විසින් දෙව්පුරයක් මෙන් සරසන ලද විසිතුරු උමඟකින් වේදේහ රජ්ජුරුවෝ ඔබවහන්සේගේ නෑයනුත් ඇරගෙන මියුළු නුවරට පලාගියසේකැයි වදාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ එකකු දෙන්නෙකු පවා උමඟක් තුළින් යනකල මහත් ගැහැට වන්නේය. මේ පණ්ඩිතයෝ සේනා සහිත රජ්ජුරුවන් සුවසේ පලා ගියහයි කියති. මේ උමග බැලිය යුතුයයි සිතූහ. ඒ අදහස දැනගත් පණ්ඩිතයන් වහන්සේ මහරජ උමඟ බලා වදාළ මැනවයි කීහ. එසේම මහරජ මා කෙරේ පරණ වෛරයක් සිත ඇත්නම් එසේ වූ දුර්මත අත්හැර වහා වැඩිය මැනවයි කීහ. චූලනී රජ්ජුරුවෝ එකසියයක් රජුන් හා අමාත්‍ය මණ්ඩලය පිරිවරා උමඟතුලට වැද ඒ ආශ්චර්යය බලා පුදුමයට පත්ව මහෞෂධ පණ්ඩිතයන් ගුණ කියන්නාහු එම්බා රජදරුවෙනි! මේ පණ්ඩිතයන් වැනි කෙනෙක් යම් රටක වෙසෙත්නම් ඒ රටට වන්නේ මහත් යහපතකි කීහ. පණ්ඩිතයන් වහන්සේ බලාසිට රජ්ජුරුවෝ උමන් දොරින් පිටතට ආකල්හිම එක් සංඥාවකින් උමගෙහි සියළුම දොරවල් වසාදැමූහ. මුළු උමගය ලෝකාන්තරික නරකය මෙන් අන්ධකාරවිය. ඇතුළෙහිවූ දහස් ගණන් මහා සේනාව භයින් ත්‍රස්තව අඳෝනා හඬ නගන්නට වූහ. පණ්ඩිතයන් වහන්සේ වැල්ලේ සඟවා තිබූ කඩුව අතට ගෙන රජ්ජුරුවන්ගේ බෙල්ල වමතින් අල්ලාගෙන කඩුව බොටුවට තබා බය ගන්වා මේ සියළු දඹදිව රාජ්‍යය කාටදැයි විචාළසේක. රජ්ජුරුවෝ භයින් තැති ගෙන පණ්ඩිතයෙනි! තොපටමය. තොපටමයයි තුන්වරක් කියා මා නොමරා මට අභය දෙවයි කීහ. එවිට පණ්ඩිතයන් වහන්සේ මහරජ නොබව මැනව ඔබ මරන පිණිස කඩුව එසවූයෙම් නොවෙමි. මාගේ ප්‍රඥාවේ ආනුභාවය දක්වන පිණිස එසේ කළෙමියි කියා රජ්ජුරුවන් අතට කඩුව දී මහරජ ඉදින් ඔබ කැමතිසේක් වීනම් මේ කඩුවෙන් දැන්ම මා මැරුව මැනව! නොමරන සේක් වීනම් අභය දුන මැනවයි වදාළ සේක. ඒ අසා රජ්ජුරුවෝ මා විසින් තොපට අභය දෙන ලද්දේය. තොත් මා කෙරෙහි සැක නොකරවයි මතුත් ඔවුනොවුන්ට නො වරදනා ලෙස කඩුව ගෙන සපථ කළහ. ඉක්බිති රජ්ජුරුවෝ පණ්ඩිතයෙනි! තොප ප්‍රඥාවෙන් අගතැන්පත්ව සිටත් කුමක් නිසා සියළු රජ දරුවන් මරා රාජ්‍ය නොගනුදැයි කීහ. මහරජ! හැකිකම තිබුනද අනුන් සතු යසස් උදුරා

SANHIDA LANKA

ගැන්ම නුවණැත්තන් විසින් නින්දා කරන ලදැයි වදාරා උමංදොර හළසේක. එවිටම එකසියයක් රජදරුවෝ සේනාව සමග වහා පිටතට අවුත් පණ්ඩිතයෙනි! තොප නිසා අපි ජීවිත ලද්දෙමු. තව ඇසිල්ලකින් උමඟ තුලම මලම්හයි කීහ. ඒ අසා පණ්ඩිතයෝ රජදරුවනි! දැන් මතු නොවෙයි පළමුත් මා නිසාම තොප හැම රැකුණේ වේද? උත්තර පඤ්චාල නුවර මගුල් උයනේදී විෂයෙදූ සුරාපානය කිරීමට සූදානම්ව සිටියදී සිදුවූදෙය සිහිකරව්යයි කීහ. එවිටම රජදරුවෝ මෙය කේවට්ටයාගේ බස්ගෙන කළ දරුණු කුමන්ත්‍රණයක් බව දැන සැබෑද? මහරජ එසේ කෙළේදැයි විචාළහ. එසේය! පණ්ඩිතයන් කී බස් සැබවයිකීහ. ඒ රජ්ජුරුවෝ හැමදෙන පණ්ඩිතයන් සිපගෙන බොහෝ ප්‍රශංසා කොට උත්තරපඤ්චාල වේදේහ යන දෙරට සේනාව එක්ව සත්දවසක් උත්සව පවත්වා මහෞෂධ පණ්ඩිතයෙනි! තොපට බොහෝ සම්පත් දෙමි. මාගේ රාජ්‍යයෙහි සෙනෙවිරත් ධූරය ගෙන ක්‍රියාකරවයි ආරාධනා කරත්දීත් එය ප්‍රතික්ෂෙපකොට තෑගි වශයෙන් දෙන ලද බොහෝ වස්තුවද පිළිගෙන තමාගේ රටට යාමට රජ්ජුරුවන් වැඳ සමුගෙන මහරජ! ඔබගේ නෑයෝ බොහෝ ඈතයයි නොසිතුව මැනව මා ගිය නොබෝ දවසකින් මෑණියන්වද නන්දා දේවියද පුත්‍රයාවද වහා එවාලන්නෙමියි වදාළසේක. යහපත! පණ්ඩිතයෙනි! දුවණියන්ට දායාද වශයෙන් මේ මේ වස්තුව ගෙනයව'යි දශවිධ රුවන්ද ඇත් අස් ආදී වාහන සමූහයද අලංකාර වස්ත්‍රාභරණද පාවාදී සුවසේ මියුළු නුවරට යවයි සත්කාරකොට යැවූහ. පණ්ඩිතයන් වහන්සේට තෑගි වශයෙන්ද කුමාරියට දායාද වශයෙන්ද ලැබුණු දොළොස් දහසක් බලඇණිය දොළොස් දහසක් අස් ඇණිය. එපමණම ඇත්ඇණිය. එපමණම රථ ඇණිය. යන මේවා පිරිවරාගෙන වේදේහ රටට ළගාවන්නේ දුර එන මහ සේනාව සී මැඳුරු කවුළුවෙන් දුටු රජ්ජුරුවෝ මහත් සේ බියට පත්ව සේනකයා බණවා කිමෙක්දැයි විමසා ලොකස්වාමිවූ, ප්‍රඥාදීවූ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ බව දැන ප්‍රීතියට පත්ව මියුළු නුවර දිව්‍යපුරයක් මෙන් සරසා පණ්ඩිතයන්ට පෙරගමන්කරවයි බෙර ලැවූසේක.

පණ්ඩිතයන් වහන්සේ රජගෙට වැද රජ්ජුරුවන් වැඳ සියළුම තොරතුරු පවසා චූලනී රජ්ජුරුවන්ගේ මෑණියන්වද පුතණුවන්වද බිසවුන්ද වහා යැව්ව මැනවයි වදාළසේක. යහපත පුත! මට කියන්නේ කුමක්ද යවා පියවයි කියා නුවර සත් දිනක් උත්සව පවත්වන්නට විධානය කොට මහා පෙළහරින් ගෙනගොස් උන්ටම පාවාදී යැවූසේක. උන් ගොස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට වේදේහ රජ්ජුරුවන්ගේ ගුණ කියන්නාහු අපට බොහෝ උසස් අන්දමින් සත්කාර සම්මාන කරන ලදැයි මුව නොසෑහෙන පරිද්දෙන් ගුණ කීහ. රජ්ජුරුවෝ එබස් අසා සතුටට පැමිණ බෑණනුවන්ට බොහෝ සතුටු පඬුරු යැවූහ.එතැන් පටන් දෙපක්‍ෂයේ ඇත්තෝම ඔවුනොවුන් හා සමග එක්සිත්ව විසූහ.

"මහා උම්මග්ග කාණ්ඩය නිමි"

## දියරකුසු පැනය

පඤ්චාලචණ්ඩි දේවිය වේදේහ රජ්ජුරුවන්ට ප්‍රියව වසන්නී දෙවන අවුරුද්දේ පුතණු කෙනෙකුන් වැදූය. ඒ කුමාරයන් වැඩී දස අවුරුදු කල වේදේහ රජ්ජුරුවෝ සවර්ගස්ථ වූහ. පණ්ඩිතයන් වහන්සේ ඒ කුමාරයන් රාජ්‍යයෙහි පිහිටුවා දේවයන් වහන්ස! මම නුඹවහන්සේගේ මුතුන් රජ්ජුරුවන් සමීපයට යෙමියි වදාළසේක. කුමාරයෝ මා බාල තැනැත්තාවූ ඇරපියා නොයව! මම තොප පිය තනතුරේ තබා රකිමි. නොයවම්'යි කීය. පඤ්චාලචණ්ඩි බිසවද පණ්ඩිතයෙනි මම වේදේහ රජුට පාවාදුන්නේත් දෙරජුන්ගේ වෛරය හරවා සමගි කළේත් නුඹවහන්සේමය. එහි ගියකල අපට කිසි පිහිටෙක් නැත. මෙහිම රඳාපියා සියළු සම්පත් වළඳාපී මැනවයි කීහ. එවිට පණ්ඩිතයන් වහන්සේ එසේය මා එන ගමනේ වේදේහ රජ්ජුරුවෝ මළ කල මා එන්නෙමියි බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට ප්‍රතිඥාදී ආවෙමි. එබැවින් රඳන්ට නොපිළිවෙනැයි කියා මියුළු නුවර බොහෝ දෙනාගේ බැගෑහඬ අසන්නේ අමරා දේවින්ද සහජාත යෝධයින්ද කැටිව නික්මුණු සේක් පඤ්චාලනුවරට පැමිණිසේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද මහා පෙළහරින් අවුත් පිළිගෙන ඉදිනට මා හැගි මාළිගාවක් දුන්හ. වැටුපක් නොදුන්හ. නමුත් පණ්ඩිතයෝ කළමනා රාජ සේවය පමානොකොට කරන සේක.

එසමයෙහි ඉතා නුවණැති කීමෙහි දක්ෂ ඉතා ධර්මිෂ්ට "භෙරි" නම් වූ පරිබ්‍රාජිකා කෙනෙකුන්දැ රජගෙයිදී වළඳා මගුල් උයන ඉදිනා සේක. පණ්ඩිතයන් වහන්සේ උන් කිසි දිනක දැක නැත. ඔවුනොවුන් ගැන දෙදෙනාම පිටතින් දන්නාහ. නන්දා දේවිත් උමගින් සොරා ගෙන ගිය දින පටන් මහෞෂධ පණ්ඩිතයන් කෙරෙහි හටගත් වෛරයෙන් පසුවන්නී තම වල්ලභ ස්ත්‍රීන් පස්දෙනෙකුට කියන්නාහු තෙපි හැම මහෞෂධ පණ්ඩිතයාගේ අපරාධයක් පරීක්ෂාකොට රජ්ජුරුවන්ට කියා බිඳවා පියවයි කීහ. ඔව්හු පස්දෙන මහතාණන්ගේ වරදක් රහසින් සොයමින් ඇවිදිනාහ.

SANHIDA LANKA

එක් දවසක් පරිබ්‍රාජිකාවන් දෑ රජගෙයි වළදා එන අතරමග පණ්ඩිතයන් වහන්සේ දැක "මේ පණ්ඩිතයෝ නුවණැත්තෝල හස්ත මුද්‍රාවෙන් ප්‍රශ්නයක් විචාරමියි සිතා පණ්ඩිතයන් මුහුණ බලා "අතක් විදහා පෑ සේක. ඒ කුමක් නිසාද යත් රජ්ජුරුවෝ තොප රටින් මෙරටට ගෙන්වාගෙන අත පුරා සම්පත් දී පියා සුවසේ රකිත්දැයි නොරකිත්දැයි සිතින් සිතාය. පණ්ඩිතයන් වහන්සේ ප්‍රඥා නැමැති දිවැසින් ඒ දැක තමන් වහන්සේ මිට හකුළුවා පෑසේක. කුමක්කී නිසාදයත්? මා සමීපයට එවයි මාගේ රටින් ගෙන්වා කලින් දුන් තෑගි විනා මට කිසිවක් දැන් නොදෙන්නාහයි සිතින් සිතා ඒ විසඳුනියාය දෙවනු පරිබ්‍රාජිකාව තමාගේ හිස පිරිමැඩ ලූ සේක. ඉන් කුමක් හැඟවීදයත්? ඉදින් උකටලී වූනම් අපසේ මහණව නොගනුදැයි හැඟවූ නියාය. එවිට පණ්ඩිතයන් වහන්සේ තමා විසින් රකිනා බඩවල් බොහෝ යයි හැගවීම සඳහා තමබඩ පිරිමැඩලූසේක.

නන්දා දේවියගේ වල්ලභ ස්ත්‍රීහු නිතර පණ්ඩිතයන් වහන්සේ ගැන පරීක්ෂා කාරීව උන්නාහු මේ දෙදෙනාගේ ක්‍රියා දැක රජ්ජුරුවන් සමීපයට ගොස් දේවයන් වහන්ස! මහෞෂධ පණ්ඩිතයෝ පරිබ්‍රාජිකාවන් හා එක්ව ඔබ වහන්සේ සතු රාජ්‍යය ප්‍රාර්ථනා කරන්නාහයි වරදවා කියා බඳුවාපීහ. ඒ ඇසූ රජ්ජුරුවෝ පණ්ඩිතයන් විසින් මා කෙරේ ඒ දනට නොපිළිවන. මේ දෙය පරිබ්‍රාජිකාවන් අතින් විචාරා දැනපියම්'යි සිතා දෙවන දින දන් වැළඳීමට ආ කල්හි කිමෙක්ද? පණ්ඩිතයන් දුටුද? උන් හා කළ කථාබස් ඇත්දැයි කීහ. මහරජ උන්හා බසින් කී දෙයක් නැත. හස්තමුද්‍රාවෙන් ප්‍රශ්නයක් විචාරම්හ. අප විචාළ ප්‍රශ්න අප සිත්වූ පරිද්දෙන් විසඳූහයි ඒ වූ නියායෙන් වදාළසේක. මහරජ ඔහු නුවණැත්තෝය. උන් හා සමාන කෙනෙක් මුළු දඹදිව නැත්තාහයි වර්ණනාකළසේක. උන්වහන්සේ ගිය ඉක්බිති පැමිණි පණ්ඩිතයන් වහන්සේද පරිබ්‍රාජිකාවන් දෑ කී පරිද්දෙන්ම කී සේක.

ඒ ඇසූ රජ්ජුරුවෝ මහත් සොම්නසට පැමිණ තවතවත් පැහැද දසදහසක් යොදුන් දඹදිව මුළුල්ලට නායක කොට සෙනෙවිරත් ධූරය දී මේ රාජ්‍යය මුළුල්ලෙහි පණ්ඩිතයන් කීවක්ම කළ යුතුයයි විධානය කොට පාවා දුන්හ. පණ්ඩිතයන් වහන්සේගේ ගෙට සියළු සම්පත් මහමුහුදට වඩ බාදිය සේ ප්‍රමාණාතික්‍රාන්තව ගියේය. රජහු තමාට යසස් දුන් ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ සිතන්නේ මට මේ සා මහත් තනතුරක් දී මහත් යසසෙහි පිහිටුවාලූහ. රජදරුවෝ යමෙක් කෙරෙහි වෛරවූ නම් පෙරවරු යසස්දී පස්වරු නසන්නාහ. දැන් මටත් මහත් සම්පත් දීපීහ. රජ්ජුරුවන් මා කෙරෙහි ඉත සිතින් මේ සම්පත් දුන් සේක්ද? අහිත සිතින් දුන් සේක්දැයි කල් නොයවා දැනගතිම්'යි සිතා මල් සහ ගිලන්පසද රැගෙන පරිබ්‍රාජිකාවන් වසන පන්සලට ගොසින් ස්වාමීනී! නුඹවහන්සේ මාගේ ගුණ කීතැන් පටන් රජ්ජුරුවෝ මට මහත් සම්පත් දුන්හ. ඒ මා කෙරෙහි සම සිතින් දුන් සේක්ද නොදනිමි. රජහු මා කෙරෙහි ඇති සමගි ගුණය තත්වූ පරිදි දැනපිය මැනවයි කීසේක.

පරිබ්‍රාජිකාවද යහපතැයි ගිවිස දෙවන දවස් රජගෙට ගොස් දියරකුසු පැනයයි එක් ප්‍රශ්නයක් ගොතා වදාළා අන්තයෙහි මහරජ! රහස් කථාවක් කියනු කැමැත්තම්හ. විසඳනු මැනව'යි කියා ගාථාවකින් ප්‍රශ්නය විචාළසේක. එහි අදහස කෙසේදයත්?
තොපගේ වැදූ මෑණියන්ද නන්දා දේවියද සහෝදර තීක්ෂණ මන්ත්‍රී කුමාරයෝද යහළු ධනුශේඛර කුමාරයෝද අග්‍රපුරෝහිත කේවට්ට බ්‍රාහ්මණයෝද මහෞෂධ පණ්ඩිතයෝද තෙපිද යන සත් දෙනා මහාසමුද්‍රයෙහි එක් නැවකින් යන කල්හි උදක රාක්ෂසයෙක් මිනිස් බිල්ලක් සොයා ඇවිදින්නේ තොපගේ නැව දැක මුහුදු දිය දෙබෑකොට අවුත් මහරජ මේ තොප හා කැටිව නැවෙන් යන සදෙනා පිළිවෙලින් දුනහොත් මුත් නැව නාරිම්'යි කීනම් ඒ සදෙනාගෙන් කවුරු පළමුව දෙව්ද? දෙවැනි තුන්වැනිව කවුරු කවුරුන් බිලිදී ඒ ජල රකුසා අතින් ගැලවෙම්දැයි විචාළහ.

ඒ අසා රජ්ජුරුවෝ තමන් සිත වඤ්චානැතිව අදහස්වූ පරිද්දෙන් කියන්නාහු ස්වාමීනී ප්‍රථමයෙන් ජලරකුසාට මෑණියන්ව බිළිදෙමි. දෙවැනිව නන්දා දේවිය, තුන්වනුව මගේ මළනුවන්වද, සතර වැනිව යහළුවාවද, පස්වැනිව කේවට්ටයාවද දී තවත් ඉල්ලානම් මහෞෂධ පණ්ඩිතයන්ව පිටිපස්සට දමා එම්බල මා කාපියව'යි ඒ රාක්ෂසයාගේ දල්වාවූ කටට පැන බිළිවෙමි. මා ඇසින් බල බලා සිටියදී මගේ පණ්ඩිතයන් නොදෙම්හයි කීය. ඒ අසා ගොස් දෙවන දින පරිබ්‍රාජිකාව රාජාංගනයට පැමිණ රාජසභාව පිරිවරා ගෙන සිටින රජුන් හමුවට ගොස් ලද විශේෂ අසුනක හිඳ රජ්ජුරුවන් අමතා මහරජ දියරකුසා තොප අල්වාගත්කල වැදූ මෑණියන් පටන් තොප සදෙනා පිළිවෙලින් බිලිදී පණ්ඩිතයන් රකිමියි කිව. බැලූකල මහෞෂධ පණ්ඩිතයන් තරම් තොපට සතුරෙක් නැත. තොපගේ මෑණියෝ තොපට බොහෝ උපකාරී වූ සේක. එසේවූ මෑණියන් කුමක් පිණිස ප්‍රථමයෙන් බිළිදෙව්දැයි විචාළසේක.

SANHIDA LANKA

මහෞෂධ පණ්ඩිතයන්ගේ ගුණ ලෝකයේ ඉරහඳ සේ ප්‍රකට කරනු සඳහා සහා මාධ්‍යයෙහි පරිබ්‍රාජිකාව විසින් රජ්ජුරුවන් සමග මේ වාදය කරන බව දතයුත්තේය. එවිට රජ්ජුරුවෝ මාගේ මෑණියන් දෑගේ ගුණ බොහෝ බව දනිමි. ඔබ දන්නා ගුණයට වඩා මා දන්නා නුගුණ බොහෝය. ඒ හැම කියන්නට නොපිළිවන. යම්තම් දෙයක් කියමි. අසා වදාළ මැනව!

තමන් ඉතා වයස්ගතව සිට බොහෝ මණිමේඛලා දාමා දියෙන් සැරසී රාජසභාව රුස්වූ කල ඔබිමොබ හැසිරෙන්නීය. මම ඒ ශබ්දය අසා බොහෝ කොට ලැජ්ජා වන්නෙමි. අමාත්‍ය සමූහයා ඔවුනොවුන් මුහුණ බලන්නාහ. තවද මුන්දෑගේ ඉඳුල් බත් කන්ට තරම් නොවූ ප්‍රත්‍යන්ත රජ්ජුරුවන්ට මා යැව්වාකොට පත් ලියා යවන කල මාගේ මෑණියන් මහළු නොවනදෑය. සොළොස් හැවිරිදි කෙල්ලන් මීට වඩා සංවර වන්නාහ. රජ්ජුරුවන්ට යවනා පත් හරවා අපට ආකල සහා මාධ්‍යයෙහි ඒ කියවිය නොහැක්කේය. පොළව පැලීයන්නාසේය. මේ වැරදි නිසා මෑණියන්ව දියරකුසාට දෙමියි කීහ.

මෑණියන් මේ වරදින් ජලරකුසාට දෙව! නන්දා දේවිය බාල අවස්ථාවේ පටන් තොපට මහත් උපකාර ඇත්තීය. කුමක් නිසා බිලි දෙන්නෙහිදැයි විමසීය.

ස්වාමීනි! නන්දා දේවිය රහසිගතව ලෝකාස්වාද රතියෙන් සතුටුව මා තමා වසඟයට පමුණුවා මාගේ සෙසු බිසෝවරුන්ට හා උන්ගෙන් උපන් දරුවන්ට මා විසින් ස්නේහයෙන් කරවා පලඳවන ලද නොඉල්වියයුතු පළඳනා මා අතින් ඉල්වයි. මා කාමරාගයෙන් මත්ව ඒ ගනුවයි කීකල අනික් බිසෝවරු සහ දරුවෝ හඬමින් මා සමීපයට අවුත් ශෝක වන්නාහ. මමද පසුතැවිලි වන්නෙමි. ඒ වරදින් ඈ ජලරකුසාට දෙමියි කීහ. මෙසේ ක්‍රමයෙන් මළණුවන්වද ධනුශේඛර කුමාරයන්වද යහළුවාද කේවට්ට බමුණාවද බිලිදීමට ඇති සුදුසුකම් ප්‍රකාශකොට මහෞෂධ පණ්ඩිතයන්ගේ ගුණ කියන්නේ මා තබා දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මයන් හා නාග සුපර්ණාදිවූ දෙවියෝද කියා නිමවාලිය නොහැක්කැයි සිතමි. උන් සමාන අන් පණ්ඩිතයෙක් ගිය දවස උපන්නෙත් දැන් ඉපදීත් නැත. මතු උපදින්නෙත් නැතැයි කියා ඉඳිකටු මලින් අහස පාන්නාසේ ගුණ ප්‍රකාශකළහ.

මෙසේ ප්‍රඥාතොමෝ මහත් සෘද්ධි ඇත්තීය. ඓහ ලෞකික පාර ලෞකික සකලාර්ථ සිද්ධිය පිණිස උපකාරී වන්නේයයි පරිබ්‍රාජිකාවන්දෑ පණ්ඩිතයන් වහන්සේගේ ප්‍රඥාගුණය තමන්ගේ නුවණින් දේශනා කොට කුළුගන්වා දියරකුසු පැනයෙන් මේ උම්මග්ග ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි පරිබ්‍රාජිකාවන්දෑ දැන් උපුල්වන් මහා ස්ථවිරිය. පියවූ සිරිවඩීන සිටාණෝ සුද්ධෝදන මහ රජ්ජුරුවෝය. මෑණියෝ මහාමායා දේවිය. අමරා දේවීනම් යශෝධරාවය. ගිරවා නම් ආනන්ද ස්ථවිරයෝය. චූලනී බ්‍රහ්මදත්ත රජනම් සාරිපුත්‍ර ස්ථවිරය. මහෞෂධ පණ්ඩිතයෝනම් දැන් ලොව්තුරා ශාන්තිනායක බුදුපියාණෝය.

SANHIDA LANKA

# කකණ්ටක (ප්‍රශ්නය) ජාතකය

මෙය ඉහත කී උම්මග්ග ජාතකයෙහි විස්තරව එන්නේය. කටුස්සාගේ කරේ රත්‍රන් එල්ලීමේදී විසඳූ ප්‍රශ්නය බලා දත යුත්තේය.

ජාතක කථාව :- නැවත දිනක් රජ්ජුරුවෝ පණ්ඩිතයන් සමඟ උයනට යන්නේ තොරණේ සිටි එක් බොහොඬෙක් එන්නාවූ රජ්ජුරුවන් දැක වහා බිමට බැස වැදහොත්තේය. ඒ දුටු රජ්ජුරුවෝ පණ්ඩිතයෙනි! මේ බොහොඬා කුමක් කෙරේදැයි විචාළහ. දේවයන් වහන්ස නුඹවහන්සේට සේවය කරන්නේයයි වදාළසේක. රජ්ජුරුවෝ එසේවීනම් ඕහට වස්තුවක් දෙමි. කුමක් දියයුතුදැයි විචාළහ. දේවයන් වහන්ස! රත්‍රන් වියැට සමාරක් පමණ වටිනා මස්දීම සුදුසු යයි වදාළසේක. රජ්ජුරුවෝ එසේවිනම් තවත් වැඩිය දෙමියි රත්‍රන් දෙවියැට සමාරක් අගනා මස් ගෙනහැර දෙවයි කියා එක් පුරුෂයෙකුට නියම කළහ. ඒ පුරුෂයාත් ඒ නියෝගය පරිදි දිනපතා මස් ගෙන බොහොඬාට දෙන්නේය.

ඒ පුරුෂයා එක් දවසක් පොහොය දිනයෙහි රාජසම්මත හෙයින් මස් නොලැබ දෙවියැට සමාරක් පමණවූ රත්‍රන් මැදින් විද බොහොඬාගේ කරේ බැන්දේය. බොහොඬාට ඒ රත්‍රන් මාලය නිසා මානයෙක් උපන්නේය. නැවත දිනක් රජ්ජුරුවෝ උයනට ගියහ. ඒ බොහොඬ තෙමේ රජ්ජුරුවන් එන්නවුන් දැක වස්තුව නිසා උපන් මානය කරණකොට ගෙන වේදේහයෙනි! වස්තුව ඇත්තේ තොපට පමණක් නොව මමත් වස්තු ඇත්තෙමි. රජ්ජුරුවන් හා සමඟ තමා සම කරන්නේ තොරණ අගින් නොබැස එහිම හිස සලමින් වැදහොත්තේය. ඒ දුටු රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයෙනි! මේ තෙමේ පෙරසේ අද නොබස්නේය. කුමක් හෙයින් මානය ඇතිවීදැයි ගාථාවකින් විචාළහ. පණ්ඩිතයන් වහන්සේ පොහෝ දවස් මස් නැති හෙයින් රාජපුරුෂයා විසින් තමා කරබැඳි රත්‍රන් දෙවියැට සමාර නිසා මානය ඔහුට වියයුතුයයි දැන එය ගාථාවකින් කියන සේක්. නොලත් විරූ වස්තුව ලදින් මමත් මා පමණ වස්තුව ඇත්තෙමි. වේදේහ රජුනි! තොපට වඩා මා අඩු කිමෙක්දැයි ඉක්ම සිතන්නේයයි මේ කකණ්ටක ප්‍රශ්නය විසඳා වදාළසේක. රජ්ජුරුවෝ බොහොඬාට මස් දෙන්නට නියෝග කළ පුරුෂයා ගෙන්වා පණ්ඩිතයන් කීවා සැබෑදැයි විචාළහ. ඒ වූ පරිද්දෙන්ම කීයේය.

කිසිවකුගෙන් නොවිමසා සියල්ල බුදු මුවින් මෙන් බොහොඬාගේ අදහස දන්නා ලදැයි වඩ වඩාත් පැහැද පණ්ඩිතයන්ට සතර වාසල ලබන සුන්වත් අය දුන්හ. බොහොඬා කෙරෙහි කිපුණු රජ්ජුරුවෝ තමන් කළ නියෝගය අත්හළහ. ඒ පණ්ඩිතයන් වහන්සේ එය සුදුසු නොවේයයි නැවතත් නියම කළහ.

SANHIDA LANKA

# භූරිපඤ්ඤ (ප්‍රශ්නය) ජාතකය

මේද උම්මග්ග ජාතකයෙහි භූරි ප්‍රශ්නය බලා දත යුත්තේය.

ජාතක කථාව :- ඉක්බිති රජ්ජුරුවෝ මරණ භයින් තැතිගෙන අමාත්‍යයන් සතරදෙනෙකු කැඳවා සතර වාසලින් නික්ම ගොස් මහෞෂධ පණ්ඩිතයන් දුටුතැන සත්කාර කොට රථයට නංවා ගෙන එවයි විධානය කොට යවූහ. දකුණු වාසලින් නික්මුණු අමාත්‍යයා වනාහි පණ්ඩිතයන් වහන්සේ කුඹල් කමින් වසන ගමට ගොස් ඔහු දැක සත්කාර කොට ගෙන ගිය පිළිද මසුරන් දහසද අත තැබූයේය. කුඹලාණෝත් මා මෙතෙක් වැඩ ගත්තේ මහෞෂධ පණ්ඩිතයන් අතිනැයි දැන බියට පත්වූහ. පණ්ඩිතයන් වහන්සේ නොබව ආචාර්‍ය්‍යයෙනි! තොප අපට බොහෝ උපකාර කෙළෙහියයි අසා මසුරන් දහසද ඔහුට දී මැටි වැකුණ ඇගින්ම රථයේ නැග රජ්ජුරුවන් සමීපයට ගොස් දේවයන් වහන්ස අසවල් ගම කුඹල්කම් කොට ජීවත් වෙමි. ඔබ වහන්සේ කැඳවීමෙන් මැටි වැකුණ ඇගින්ම ආමියි කීහ. රජ්ජුරුවෝ ඉදින් මොහු මට විරුද්ධ නම් සේනාව රැස්කරමින් ඇවිදිති. මූ මට සතුරු නොවෙතියි සිතා වහා ගොස් නහාපියා සර්‍වාලංකාරයෙන් සැරසී එවයි නියම කළහ. පණ්ඩිතයන් වහන්සේ උසස් අන්දමින් ඇඳ පැළඳ සිව්රඟ සෙනග සමග සක්දෙව් රජුමෙන් පැමිණ එකත් පස්ව සිටිසේක. එවිට රජ්ජුරුවන් වහන්සේ පණ්ඩිතයන් අමතා පුත පණ්ඩිතයෙනි! තෙපි බොහෝ අර්‍ථ චින්තනයෙහි දක්‍ෂයහ. සිතුවොත් දසදහසක් යොදුන් දඹදිව රජ්ජුරුවන් මරා රාජ්‍ය ගැනීමට පොහොසත්ය. එසේ සිටියදීත් මාමරා පියා රාජ්‍ය නොගන්නේ මන්දැයි විචාළහ.

එවිට පණ්ඩිතයන් වහන්සේ රජතුමනි නුවණැත්තෝ සුව පිණිස පව්කම් නොකරන්නාහ. කුමණ හේතුවක් නිසාවත් අනුන්ට හිංසා පීඩා නොකරන්නාහයි වදාරා තමාටත් පියාටත් මහත් සම්පත් දුන් රජ්ජුරුවන් කෙරෙහි ද්‍රෝහි නොවන බැව් දන්වා පරීක්ෂාකාරීව දශරාජ ධර්‍මයෙන් රාජ්‍ය කරන ලෙස අවවාද කළසේක.

SANHIDA LANKA

## සබ්බසංහාරක (ප්‍රශ්නය) ජාතකය

උම්මග්ග ජාතකයෙහි වේදේහ රජු ඇසූ කාරණාවන් පහදා දුන් නියාව දක්වයි.

SANHIDA LANKA

# ගද්‍රභ (ප්‍රශ්නය) ජාතකය

ඉහත කී උම්මග්ග ජාතකයෙහි කොටළු පැන විසඳූ නියාව බලා දත යුතුයි.

ජාතක කථාව :- මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ ඒ බස් අසා රජ්ජුරුවෝ මාද පියාණන් වහන්සේ ද දක්නා කැමැත්තෝයයි සිතා පියාණන් අමතා එපවත් ඔහුට සැල කොට නුඹවහන්සේ පළමුකොට සිටුවරුන් දහසක් පිරිවරා වැඩිය මැනව. රජ්ජුරුවෝ ඔබතුමා සමග පිළිසඳර කතාකොට සුදුසු අස්නක් බලා හිඳුවයි කියති. ඔබවහන්සේ එසේ කළ මැනව. මමද ඒ වේලෙහි එමි. රජ්ජුරුවෝ මටද සුදුසු අස්නක් බලා හිඳුවයි කියති. එවිට මම නුඹ වහන්සේගේ මූණ බලමි. ඒ සළකුනෙන් හුනස්නෙන් නැගී පුත මහෞෂධ පණ්ඩිතයෙනි! මේ අස්නේ හිටුවයි වදාළ මැනවි. එසේ කල්හි එක් පැනයෙක් අපට වන්නේ යයි වදාළසේක.

සිටාණෝ යහපතැයි ගිවිස පුතණුවන් කී සැටියේම ගොස් එපරිද්දෙන්ම රජ්ජුරුවන් සමීපයෙහි උන්නාහ. මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ සර්වාලංකාරයෙන් සැරසී කුමාරවරුන් දහසක් පිරිවරන ලදුව උතුම් රථයක හිඳ නුවරට වදනා සේක් අගල පිට තන කන එක් කොටළුවෙකු දැක ශක්තිමත් තරුණ පුරුෂයන් අමතා මේ කොටළුවා අල්වා ගෙන ශබ්ද නොනගින සේ මුඛය බැඳගෙන නොපෙන්නාගෙන එවයි වදාළසේක. පුරුෂයෝද එලෙසම කළහ. පණ්ඩිතයන් වහන්සේ ශක්‍රදේවේන්ද්‍ර ලීලාවෙන් නුවරට වන්සේක. කලින් පැතිරී ඇති කීර්තිය නිසා නුවර වැස්සෝ පණ්ඩිතයන් වහන්සේ දෙස බලබලා ස්තුති කළහ. පණ්ඩිතයොද රජවාසලට ගොස් දොරටුපාලයන් අත දන්වා යවා දහසක් කුමරුවන් සමග රජු සමීපයට ගොස් සිටිසේක. රජ්ජුරුවෝද ඔහු සමඟ මිහිරි කතාකොට පණ්ඩිතයෙනි! සුදුසු අස්නක් බලා හිඳුවයි කීහ. පණ්ඩිතයන් වහන්සේ පියාණන් දැ මූණ බැලූසේක. එවිට පියාණෝ අස්නෙන් නැගී පණ්ඩිතයෙනි! මේ අස්නේ සිටුවයි කීහ. පණ්ඩිතයන් වහන්සේ පියා උන් අස්නෙහි වැඩ උන්සේක. එවිටම ඒ අසලම සිටි සේනක, පුක්කුස, කාවින්ද, දෙවින්ද පණ්ඩිතවරු සතර දෙනාද සෙසු නුවණැත්තහුද අත්ලෙන් අත්ල ගසා මහත් කොට සිනාසී මේ නුවණ නැති කෙනෙකි. තම පියා අස්නෙන් නගා තෙමේ අස්නේ හුන්නේය. මොහු නුවණැතියන් කියන්ට යුක්ති නැතැයි පරිභව කළහ. රජ්ජුරුවෝ දුර්මුඛ වූහ. එවිට මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් අමතා කිමෙක්ද? දේවයන් වහන්ස! කනස්සළු සේක්ද? එසේය පණ්ඩිතයෙනි! පියාණන් අස්නෙන් නගා උන් හෙයිනැයි කීහ. කිමෙක්ද දේවයන් වහන්ස! ඔබවහන්සේ හැම තන්හිම පුතුන්ට වඩා පියෝම උතුම්හයි කියන සේක්දැයි විචාළසේක! එසේය පණ්ඩිතයෙනි! කීහ. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් අමතා ඔබ වහන්සේ අපට අශ්වතරයෙකු හෝ ශ්‍රේෂ්ඨතරයෙකු හෝ එවන්නැයි අසුන් යවනලදුදේ වේදැයි කියා හුනස්නෙන් නැගී මානවකයන් බැඳගෙන ආ කොටළුවා ගෙන්වා ගෙන රජ්ජුරුවන්ගේ පාමුල තබාල දේවයන් වහන්ස මේ කොටළුවා කෙතෙක් අගීදැයි විචාළසේක. රජ්ජුරුවෝ ඉදින් උපකාර ඇත්තේ වී නම් අටමස්සක් අගනේයයි කීහ. මූ නිසා සෛන්ධව කුලයෙහි වෙළඹ බඩ උපන් අජානීය අශ්වයා කෙතෙක් අගීදැයි විචාළසේක. පණ්ඩිතයෙනි! අගය නැතැයි කීහ. දේවයන් වහන්ස කුමක් හෙයින් එසේ කියන සේක්ද? ඔබතුමා දැන් හැමතැනම පුතුන්ට වඩා පියෝම උත්තමහයි කියන ලද්දේවේද? ඉදින් එය සැබෑවීනම් ඔබතුමාගේ වාදයෙහි අජානීය අශ්වයාට වඩා කොටළුවා උතුම් වන්නේය. කිමෙක්ද දේවයන් වහන්ස ඔබතුමාගේ පණ්ඩිතවරු මෙපමණකුත් දැනගන්නට අසමර්ථව අත්පුඩි ගසා සිනාසෙන්නාහ. ඔබ පණ්ඩිතවරුන්ගේ නුවණ විශේෂය ආශ්චර්‍ය්‍යී. ඔබතුමා කොයින් මුත් සොයාගත් සේක්දැයි පණ්ඩිතවරු සතරදෙනාට පරිභව කොට රජ්ජුරුවන්ට ගද්‍රභ ප්‍රශ්නයෙහි එම කාරණා ගාථාවකින් කියා දේවයන් වහන්ස පුතුනට වඩා පියාණෝ උතුම්නම් මපියාණන් ඔබතුමාට වැඩ පසස්නා පිණිස ගත මැනව. ඉදින් පියන්ට වඩා පුත්‍රයෝ උත්තමයෝනම් මා ඔබතුමා සමීපයෙහි රඳවාගත මැනවයි වදාලසේක. රජ්ජුරුවෝ ඇතුළු සියළු රාජ පර්ෂද් පණ්ඩිතයන් විසින් ප්‍රශ්නය මනාකොට කියන ලදැයි ඔල්වර හඬ සහ සාධුකාර පැවැත්වූහ. සේනකාදී පණ්ඩිතවරු සතරදෙන දුර්මුඛ වූහ. (මහෞෂධ පණ්ඩිතයන් හා සමාන මව්පිය ගුණදත් අන් උතුමෙක් නැත) එසේ වුවද පියාණන් අස්නෙන් නගා තමා ඒ අස්නේ වැඩඋන්නේ පියාණන්ට අවමානයක් පිණිස නොවන්නේය. රජ්ජුරුවන් විසින් අශ්වතරයෙකුගේ ශ්‍රේෂ්ඨතරයෙකු එවන්නේයයි අසුන් යවන ලද හෙයින් ඒ පැනය විසඳුන පිණිසත් තමන් නුවණැති බව හගවන පිණිසත් සේනකාදී පණ්ඩිතවරු සතරදෙනාගේ බැබලීම නැතිකරන පිණිසත් මෙසේ කළ බව දතයුතුයි.

SANHIDA LANKA

# අමරා දේවි (ප්‍රශ්නය) ජාතකය

මේ උම්මග්ග ජාතකයෙහි මහොෂධ පණ්ඩිතයන් වහන්සේ අමරා දේවී ප්‍රශ්නය විසඳූ නියාව දැක්වෙයි.

ජාතක කථාව :- එතැන් පටන් මහෞෂධ පණ්ඩිතයන්ගේ යසස කිරිමුහුද පරිද්දෙන් මහත් වූයේය. උදුම්බරා දේවිය පණ්ඩිතයන්ගේ දුක සැප නිතර විචාරන්නී සොළොස් හැවිරිදිවූ කල මාගේ මළණුවෝ වැඩිමළුව සිටගත. යශසත් මහත. උන්ට සමාන කුලයකින් සරණපාවා දෙන්ට සුදුසුයයි සිතූ එපවත් රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝද සොම්නස්ව යහපත සොඳුර එපවත් උන්ට කියවයි කීහ. එය දැනගත් පණ්ඩිතයන් වහන්සේ "අනුන් පාවාදෙන කුමාරිකාවක් කිසිසේත් මට අභිප්‍රාය නොවන්නීය. එහෙයින් මමම පළමුකොට සොයා ගනිමියි සිතා දේවීන් වහන්ස! කීප දවසක් රජ්ජුරුවන් වහන්සේට මා අසවල් කාර්යයට ගියයි නොකිව මැනව! කුමාරිකාවත් පරීක්ෂාකොට ඔබ වහන්සේට දන්වා ලම්යි කීහ. එසේ පවසා එක්තරා වේශයකින් සන්නාලි උපකරණ ගෙන හුදකලාව උතුරු වාසල් දොරින් නික්ම උතුරු යවමැදුම් ගමට වැඩිසේක.

එගම දුප්පත්ව සිටි පුරාතන සිටුකුලයෙක "අමරාදේවී" නම් රූපත් මහා පිනැති දුවක් වූවාය. ඈ එදවස හුළුකැන් පිසගෙන පියාණන් සානතැනට යන්නී පණ්ඩිතයන් වඩනා මගට පිළිපන්හ. පණ්ඩිතයන් වහන්සේ ඒ කුමාරිකාව දැක "මෝ තොමෝ මට බිරින්දට සුදුසුයයි සිතූසේක. අමරා දේවියද පණ්ඩිතයන් දැකලා ඉදින් මෙබඳු පුරුෂයෙක් ඇත්නම් වස්තු රැස්කරන්ට පිළිවනැයි සිතූහ. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ මැගේ සැමියන් ඇති නැති බව නොදනිමි. එපවත් හස්ත මුද්‍රායෙන් විචාරමි. ඉදින් මෙ නුවණැත්තී විනම් එය දැන ගන්නීයයි සිතා දුර සිටම "ඇඟිලි හකුළුවා මිට හළසේක". ඈත් මේ පුරුෂයා මාගෙන් සැමියන් ඇත්ත, නැත්ත විචාරන්නේයයි දැන "අත්ල විදහාලූහ" පණ්ඩිතයන් වහන්සේ ඈ සරණ නූනබව දැන සමීපයට ගොස් සොඳුර! තෙපි කිනම්මු දැයි විචාළේය. ස්වාමීනී! ගිය දවස වේවයි දැන් වේවයි මතු දවස වේවයි මුළු ලෝකයෙහි යම් නමෙක් ඇත්නම් මම ඒ නම්"යි කීහ. ඇගේ නම අමරා" බව දැනගත් පණ්ඩිතයන් වහන්සේ සොඳුර කවුරුන්ට කැඳගෙන යව්දැයි විචාළහ. පූර්ව දේවතාවන්ට යයි කීහ. පූර්ව දේවතාවෝ නම් මව්පියෝය. තොපගේ සිටාණෝ කුමක් කෙරෙත්දැයි විචාළහ. එකක් දෙකක් කෙරෙතියි කීහ. එකක් දෙකක් කිරීම නම් සී සෑමය. තොපගේ පියාණෝ කොතනක සාත්දැයි විචාළසේක. යම් තැනකට එක්වරක් ගිය කෙනෙක් නොඑද්ද එතැනයයි කීහ. එසේ තැන නම් සොහොනය. සාන්නේ සොහොනක් සමීපයේය. සොඳුර! අදම එව්දැයි විචාළසේක. ඉදින් ආවොත් නොඑම්. නාවොත් එම්. කීහ පියා ගඟකින් එතර සාති. ගඟදිය ආවොත් නො එන නියාව කී බව තේරුම්ගෙන එසේදැයි විමසීය. එසේයයි කීහ. ඉක්බිති අමරාදේවී හුළුකැන් පූව මැන. ස්වාමීනි පැවරූහ. පණ්ඩිතයන් වහන්සේ ප්‍රථමයෙන් කළ ආරාධනාව නොඉවසීම අවමඟුලැයි සිතා යහපත බොමියි වදාලසේක. අමරා දේවිය කැඳ සැලිය ඉසින් බා තැබූහ. පණ්ඩිතයන් වහන්සේ ඉදින් මණ්ඩය නොදෙව අතට පැන් නොදීම කැඳ අතට දිනි නම් මෙතැනම හැරපියා යෙමි'යි සිතූසේක. ඈ මණ්ඩයෙන් පැන් ගෙන අතට දීලා සිස් මණ්ඩය අත නොතබා බිම තබා සැළියේ කැඳ අල්ලා හුළු කැනින් මණ්ඩය පුරාලූහ. ඒ කැඳෙහි හුළු මඳ වූයේය. පණ්ඩිතයන් වහන්සේ කිමෙක්ද? සොඳුර! හුළුකැන් ඉතාම බොල්වනැයි වදාළසේක. පැන් නොලද්දේය. ස්වාමීනියි කීහ. තොපගේ කුඹුර පූදිනා අහදිය නොලද්දයි සිතමියි වදාරා හුළු කැන් සියල්ලම පානය කොට අත කට සෝදා

සොඳුර! තොපගේ ගෙට මග කියවයි වදාළසේක.
අමරාදේවිය යහපතැයි, ගෙට මග කියන්නී "මේ මග ඔස්සේ ගොස් ඇතුළු ගමට වන්කළ යම් තැනක අත්සුණු තබා විකුණන සල්පිලක්ද ඉන් ඔබ්බට ගියකල යම් අතකින් අනුභව කරත්ද ඒ අත මග යන්ට කියමි. ඒ යව මැඳුම්ගම අපගේ දෙමාපියන්ගේ ගෙට මඟය. මා හඟවා කීමග දැන වදාළ මැනවයි" කීහ.

SANHIDA LANKA

# දෙවතා පඤ්හ ජාතකය

මේ ජාතකයද උම්මග්ග ජාතකයෙහි එන්නේය.

ජාතක කථාව :- රජ්ජුරුවෝ පණ්ඩිතයන් වහන්සේව රාජාසනයෙහි වඩා හිඳුවා තුමූ මිටි අස්නෙක හිඳ පණ්ඩිතයෙනි! සේසතෙහි වසන දෙව්දුව මාගෙන් පැන සතරක් විචාළේය. සේනකාදීන්ටද නොවැටහින. ඒ කියවයි ආරාධනා කළහ. එදවස් මහ බෝසතාණන් වහන්සේ සැට යොදුන් රත් ගල මුදුනෙහි සිංහනාද කරන අභීත කේශර සිංහයකුසේ දේවයනි, සේසතෙහි වසන දේවතාවා චේවයි චාතුර්මහාරාජිකාදීවූ සදිව්‍ය ලෝකයෙහි දේවතාවෝ වෙත්වයි, සොළොස් බඹ තෙලෙහි බඹහු වෙත්වයි, යම්කිසි කෙනෙකුන් විසින් විචාරණ ලද්දාවූ පැන තියුණු මුවහත් ඇති කඩුවකින් ඇඹුල මල් මිටියක් කපා වගුරුවන බල ඇති පිරිමියෙක් හු මෙන් මාගේ නිර්මල නුවණ නමැති කඩුවෙන් පිරිසිඳ කීයම්, කිව දේවයෙනි, දෙව් දූ විචාළ පැනයයි සර්වඥ ප්‍රචාරණයක් පරිද්දෙන් වදාළ සේක. (එදවස් මහබෝසතාණෝ සිව්නේ නොදත්තෝ නම් කෙසේද? මතු ලොව්තුරා බුදුව සියලු සතුන් සිත සැක දුරුකොට ධර්ම සිංහනාද කිරීමට මෙම දෘෂ්ටාන්ත නොවේද? වැලිකෙලියෙහි එතෙක් පැන විසඳූ ඒ මහතාණන් වහන්සේට දැන් එක දේවතාවකු විචාළ පැනයක් විසඳීම් නම් කවර අරුමයක්ද? ඉක්බිති රජ්ජුරුවෝ දේවතා දුව විචාළ එලෙසම කියන්නාහුඃ-

"හන්ති හත්‍ථෙහි පාදෙහි මුඛඤ්ච පරිසුම්භති
සවෙරාජා පියො හොති කං තෙත මභිපස්සසි"

යනුවෙන් දක්වන ලද පළමුවන පැනය කීහ.
මහ බෝසතාණන් වහන්සේට ගාථාව අසමින්ම ආකාශයේ නිගාලු පුන් සඳ මඬලක් මෙන් අර්ථවබෝධය විය. ඉක්බිති බෝධිසත්වයන් වහන්සේ අසව! දේවයෙනි! වදාරා"යම් වෙලෙක්හි මෑණියන්ගේ ඇකයෙහි හොත්තාවූ ළඳරු කුමාරයා කිරි බී බඩ පුරාගෙන සතුටුව මෑණියන් හා සමඟ කෙළනේ තමාගේ ළා හෝ පළු පත් සේ මොළකැටි අතින් මෑණියනව මරන්නේද, ඉසකේ ඇඳ කඩන්නේද, මිටින් මෑණියන් මූණ අන්නේද, එවෙළෙහි වගුළ සඳ රැසින් ඔද වැඩි කිරිමුහුද සේ සෙනහයෙන් ඔදවැඩියාවූ සිත් ඇති මෑණියෝ පුතණු වන්ට"සෙරගේ පුත, මා කුමට මරන්නේදැයි"යනාදි සෙනහවශයෙන් කියා සෙනෙහෙ ධරාගන්නට අසමර්ථව දරුවන් ලෙහි හොවා සිප ගනිති, මෙසේ ඔරහිඳතමන් මරා කෙළනා වේලෙහි මෑණියන්ට දරුවෝ ආදී ඇති ප්‍රේමයට වඩා ලාම ප්‍රිය වන්නාහ, පියාණන්ටත් එසේම ප්‍රිය වෙති" මෙසේ නභොමඬ්‍යයෙහි සූර්‍ය්‍යය මණ්ඩලය ඔසවා පන්නාහුමෙන් ප්‍රශ්නය පහළ කොට වදාළසේක. ඒ ප්‍රශ්න විසර්ජනය අසා දේවතා දූ දළපුඩු සේසත් විවරයෙන් මෑත්ව අර්ධ ශරීරකේ දක්වා "ප්‍රශ්නය වදාළ නියාව ඉතා යහපතැයි"මිහිරි කටහඬින් ශබ්ද පවත්වා සත්රුවන් කරඬුවක් දිව මල් දිවසුවඳින් පුරා මහබෝසතාණන් වහන්සේට පූජාකොට සැඟවී ගියාය.

රජ්ජුරුවෝද මහබෝසතාණන් වහන්සේට ගඳින් මලින් පූජාකොට දෙවන පැනයට ආරාධනා කොට කියව දේවයෙනියි වදාළ කල්හිඃ-

"අක්කොසතී යථා කාමං ආගමඤ්ච න ඉච්ඡති
සවෙ රාජ, පියො හොති කං තෙන මභිපස්සසි"

යන ගාථාවෙන් දෙවන පැනයට කීහ.
ඉක්බිති රජ්ජුරුවන්ට බෝසතාණන්වහන්සේ "රජ්ජුරුවෙනි, කකුල් දඩ ගොසින් කී දේ කටලන්නට සමර්ථ සත් හැවිරිදි පුතණුවන්ට කෙතට යව සල්පිලට යව කියා 'ඉදින් මට මේ කැවුම් දුන්නේවීනම්යෙමි'යි කියන්නා එසේද පුතණ්ඩ, යි උන් කැමති කැමති කැවුම ඉදිකොට දුන්කල්හි ඒ කැවුම් කාලා තොපි සිහිල් සෙවනේ ගෙයි හිඳුව, මම තොපට පිටත ඇවිද මෙහෙවර කෙරෙම්දැයි කියා හස්ත විකාර මුඛ විකාරාදි නොයෙක් උසුළු පපා කී මෙහෙවරට නොගොසින් සිටිනා පුතණුවන්ට මෑණිතොමෝ කිපී මරන්නට දණ්ඩක් හැරගෙන මා සන්තක දෙය කාලා කුඹුරේ කුරුල්ලන් පමණ පලවාපියන්නවත් නොයෙදැයි භයගැන්වූ කල වේගයෙන් දිවගත් පුතණුවන් ලුහුබැඳ අල්වාගන්නට අසමර්ථව සෝනට යේවයි බිල්ලට යේවයි සොරු තා කඩ කඩ කොට කපා පියත්වයි යනාදීන් කියා කැමති පරිද්දෙන් කට හෙලන පමණක් හැව්ලි අවන්ති යමක් මුඛයෙන් බෙනේ නම් සිඟිත්තකුත් දරුවන්ටවන්නා නොකැමත්තීය, ඒ කුමරා දවස මුළුල්ලෙහි

SANHIDA LANKA

කොල්ලන් හා එක්ව කෙළපියා සවස ගෙට වදනට නොපොහොසත් වූයේ නෑයන්ගේ ගෙට යන්නේය. මැණියෝද දරුවෝ දැන් එත් දෝහෝ දැන් එත්දෝයි පෙරමගබලා හිඳ සවස් වනතුරු නොඑන්නා දැක මා උරණ හෙයින් ගෙට එන්නට භය ඇතිව නොඑතියි සිත ශෝකයෙන් පූරාගෙන කඳුළු පිරුණු මුහුණින් යුක්තව නෑයන්ගේ ගෙවල් බලන්නාහු පුතණුවන් දැක වඩාගෙන සිප සනහා පියා දෑතින් තරකොට අල්වාගෙන පුත, මා කී බසුත් සිත තබද්දැයි ආදී ඇති ප්‍රේමයටත් වඩාලා ප්‍රේම උපදන්නාහ, මෙසේ දේවයනි, දරුවෝ මැනියන්ට කිසිකලෙකත් වඩාලාම පියවන්නාහයි දෙවන පැනය විසඳා වදාළ සේක. දේවතා දූ පෙර පරිදිදෙන්ම සාධුකාර දී පූජා කළාය.
රජ්ජුරුවෝද පූජාකොට තුන්වන පැනයට ආරාධනාකොට කියව දේවයනි, වදාළකල්හිඃ-

"අබ්භක්ඛාති අභූතෙත අලිකෙන අභිසාරයෙ
සවෙ රාජ, පියො හොති කං තෙන මහිපස්සසි"

යන ගාථාවෙන් තුන්වන පැනය කීහ.
ඉක්බිති මහබෝසතාණන් වහන්සේ දේවයනි, යම් වේලෙක අඹු සැමි දෙමහල්ලෝ රහසිගතව ලෝකස්වාද රතියෙන් කෙළනාවූ ඔවුනොවුන්ට තොප මා කෙරෙහි මඳකුත් ප්‍රේමයක් නැත, තොපගේ සිත බැහැරයයි මෙසේ ඔවුනොවුන්ට නැත්තක් කියද්ද, බොරුවෙන් චෝදනා කෙරෙද්ද, එවේලෙහි ඔහු දෙමහල්ලෝ ඔවුනොවුන්ට අධික ය වන්නාහයි මෙසේ මේ ප්‍රශ්ණයේ අර්ථ දනුවයි තුන්වන පැනය වදාළසේක. දේවතා දූ පෙරසේම පූජාකළාය.
රජ්ජුරුවෝද පූජාකොට අනික් පැනයට ආරාධනාකොට කියව දේවයෙනි, වාළ කල්හිඃ-

"හරං අන්නඤ්ච පානඤ්ච වත්‍ථසෙනාසනානිච
අඤ්ඤදත්‍ථු හරාසන්තා
තෙ වෙ පියොහොන්ති රාජ, කං තෙන මහිපසස්සි"

යන ගාථාවෙන් සතරවන පැනය කීහ.
ඉක්බිත්තෙන් රජ්ජුරුවන්ට දේවයෙනි, මේ පැනය තෙමේ ධර්මිෂ්ඨ වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සඳහාය, ඔවුන් තමන්ගේ ගෙදොර සිඟා සිටි කල්හි තමන් විසින් පිළිගන්වන ලද ආහාරදිය පිළිගෙනයන්නාවූද, ගොස් වළදත් නාද දැක අපම සිඟන්නාහ, අපම සන්තකවූ ආහාරාදිය ගෙනයන්නාහ. ගොස් අනුභවකරන්නාහයි ඒ ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් සැදැහැති උපාසක කුලයෝ තමන් දෙන ලද්දාවූ සතරපසය පැනය වදාළ කල්හි දේවතා දූ පෙරපරිද්දෙන් පූජා කොට සාධුකාරදී සත්රුවන් පිරූ රුවන් කරඬුවක් ගනුව පණ්ඩිතයෙනි, යි මහබෝසතාණන් වහන්සේ ගේ ශ්‍රී පාදමූලයෙහි පූජාකළාය, රජ්ජුරුවෝද පැහැද සෙනෙවිරත් තනතුරු දුන්හ. එතැන් පටන් කොට මහබෝසතාණන් වහන්සේගේ යශස මහත්වූයේය. පණ්ඩිතයන් වහන්සේ අභීත කේශර සිංහ පෝතකයෙකු සේ රජ්ජුරුවන් අමතා දේවයිනි!යි ගාථාසතරේ අදහස් සර්‍වඥ විලාසයෙන් පහදා දී සියළු දෙනාවම මහත් ප්‍රසාදයට පත් කොට දේවතා දූවගෙන් සතර වරම දිවමල් පිරවූ සත්රුවන් කරඬුව බැගින්ද රජ්ජුරුවන්ගෙන් නොයෙක් පූජාද ලැබ මහත් යශසට පත්වූහ.

SANHIDA LANKA

# බජ්ජොපනක ජාතකය

යට කියන ලද උම්මග්ග ජාතකයෙහි දේවතාදුව ඇසූ ප්‍රශ්න විසඳූ නියාව බලා දත යුත්තේ ය.

ජාතක කථාව :- ඉක්බිති එක් දිනක් සේනකයෝ අතින් තුන්දෙනා අමතා පින්වත්නි මහෞෂධ පණ්ඩිතයන්ට උන්ටත් වඩා වියත් අඹුවක් ඇත. උන් කෙරේ රජ්ජුරුවන් කෙසේ හෝ බිඳවාපුව මැනවයි කතිකාකොට නිසි උපායක් යොදන්නේ මම රජ්ජුරුවන්ගේ චූඩා මාණික්‍යය සොරා ගනිමි. පුක්කුසයෙනි! තොපි රන්මාලාව ගෙනෙව කාවින්දයෙනි! තොපි රජුන් පොරවන රන්පලස ගෙනෙව. දේවින්දයෙනි! තෙපි රන්මිරිවැඩි සඟල ගෙනෙවයි විධානය කොට සතර දෙනම වන්වාවෙන් එසේ කොට රහසින් මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙට යවමියි කියා මැණික මෝරු කලයක දමා මෙය අනික් කෙනෙකුන්ට නොදී මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙයි ඉදින් ගනිත්නම් මිළ නොගෙන දීපියා එවයි කියා කෙල්ලක අත යවූහ.

ඒ කෙළි පණ්ඩිතයන්ගේ ගේ දොරකඩම මෝරු ගනුවයි කියමින් දුර නොගොස් සිටින්නීය. ඒ දුටු අමරා දේවිය ඇත නොගොස් මෙහිම සිටින්නී යම් කාරණයක් ඇතැයි දැන කැඳවා එහි තුළවූ මැණික දැක නම්ගොත් විචාරා "අසවල්දින අසවල් දවස සේනක පඩිතුමා තම අසල්වැසි කෙල්ල අත චූඩා මාණික්‍ය පණයම් පිණිස එවූහ"යි පතක ලියවා ගත්හ. එසේම රන් මාලාව සමන් මල් කරඬුවකද පලස පලා පැසකද රන් මිරිවැඩි සඟල පිදුරු කැරැල්ලක් ඇතුළේද දමා නොයෙක් උපක්‍රම ලෙසින් පෙරසේම යවූහ. අමරා දේවියද ඒ සියල්ලම තත්වූ පරිදි සියළු තොරතුරු ලියවා තැබූහ.

ඒ සේනකාදී සතර දෙන රජගෙට ගොස් ඒ ඒ වස්තු කෙරෙහි රජ්ජුරුවන්ගේ සිත යොමුකොට රජතුමනි! මේ සියල්ලම මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙහිය. ඔහු එකී වස්තු පළඳිනාහ. ඔබ වහන්සේට සතුරුකම් කරන්නේයයි පණ්ඩිතයන් කෙරෙහි රජ්ජුරුවන් බිඳවූහ. එය දැනගත් පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් හමුවට ගියහ. රජ්ජුරුවෝ පණ්ඩිතයන් කෙරෙහි කිපී නොදනිමි, නුඹ අවුත් කුමක් කෙරේදැයි තමන් දැක්ක නුදුම්හ. පණ්ඩිතයන් වහන්සේ වහා ගෙට අවුත් පලායන්ට සුදුසු කලැයි අමරා දේවීන්ට සලකුණු කියාදී අප්‍රසිද්ධ වේශයෙන් නුවරින් නික්ම දකුණු යවමැදුම්ගමට ගොස් කුඹල්කම් කරමින් වසන සේක. නුවර මුළුල්ලෙහිම මහෞෂධ පණ්ඩිතයෝ පලාගියහයි ඒක කෝලාහල විය.

ඉක්බිති සේනකාදී සතරදෙන කිමෙක්ද අපිත් පණ්ඩිතවරු නොවමෝද එක්වෙමුයයි ඔවුනොවුන් නොදන්නාම අමරා දේවීන්ට පත් යවූහ. ඈද ඒවා බලා අසවල් වේලාවට එන්නැයි වෙන වෙනම ගෙන්වා නොසැලෙන සේ අත පය බැඳ හිස මුඩු කොට පැදුරු මාළුවල ඔතා බොහෝ හිංසා කොට රජ්ජුරුවන්ට කියා යවා මහෞෂධ පණ්ඩිතයෝ සොර නොවෙති. රාජකීය භාණ්ඩ සොරකම් කළෝ මුන් සතරදෙන යයි කලින් ලියවා ගත් පත් දක්වා බලා වදාළ මැනවයි කියා ගෙට ගොස් ඒ බඩු සතරද සේනකාදී සතර දෙනාවද පාවා දුන්හ.රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන් නැගීගිය බැවින් උන්කෙරේ සැකයෙන්ද අනික් මන්ත්‍රී කෙනෙකුන් නැති බැවින්ද සේනකාදී පණ්ඩිතවරු සතරදෙනාට කිසිවක් නොකියා නා පියා තොප තොපගේ ගෙවලට යවයි කීහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවන්ගේ දළපුඬු සේසත අධිගෘහිත දේවතා දූ පණ්ඩිතයන් ගෙන්වන උපායක් කෙරෙමියි මධ්‍යම රාත්‍රියෙහි දළපුඬු සේසත් සිදුරෙහි සිට අඩ ශරීරයක් දක්වා

"හන්ති හත්‍ථෙහි පාදෙහි මුඛඤ්ච පරි සුම්භති
සවෙ රාජ පියො හොති කංතෙන මහි පස්සසී"

යනාදී ගාථා සතරකින් ප්‍රශ්න සතරක් රජ්ජුරුවන්ගෙන් විචාළීය. රජ්ජුරුවෝ එකී අර්‍ථ නොදන්නාහු මම නොදනිමි. සේනකාදීන්ගෙන් විචාරමි'යි එක් දවසකට අවසර ගෙන ඒ සතර දෙනාට වහා එවත්වයි අසුන් යවා අපේ හිස් මුඩු බැවින් වීථිදිගේ බස්නට විළි ඇතැයි කී කල්හි පයිසතරක් විද්දවා එය හිසලාගෙන එත්වයි දන්වා යවූහ. (හිස්වැසුම් ඇති වූයේ එතැන් පටන්) පණ්ඩිතවරු සතර දෙන අසුන් ගත්කල දෙව්දුව ඇසූ පැණ සතර ඉදිරිපත් කළහ. උන්ට කිසිවක් කියාගත නොහැකිව දොඩමළුව කරබා ගත්හ.

SANHIDA LANKA

රජ්ජුරුවෝ දොම්නස්ව එදින රාත්‍රී අර්‍ථ විසඳා ගත නොහැකි බව දෙව්දුවට පැවසූහ. දෙව්දුව සේනකාදීන්ට ගරහා මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වා මේ පැනය උන්ලවා නොකියවූනම් මේ දිලිසෙන යකුලින් ගසා තොපගේ හිස සත්කඩකට බිඳ පියම්යි රජ්ජුරුවන් බිය ගන්වා රජතුමනි ගින්නෙන් ප්‍රයෝජන ඇති කල්හි කණාමැදිරියන්ගෙන් ප්‍රයෝජන කිම්ද? කිරෙන් ප්‍රයෝජන ඇති කල්හි අඟ මිරිකීමෙන් ඵලයක් වේදැයි ඉදින් තොපගේ පණ රකිනා කැමැත්තෙහි නම් දිලිසෙන මහ ගිනිකඳක් බඳු නුවණින් යුතු මහෞෂධ පණ්ඩිතයන්ගෙන් විචාරා මට අර්‍ථ කියාලව නැතහොත් තොපගේ ජීවිතය නොරඳීයයි කියා යවූහ.

SANHIDA LANKA

# දක රක්ඛස ජාතකය

ඉහත සඳහන් උම්මග්ග ජාතකයේ එන දියරකුසු පැණය බලා මේ ජාතකය දත යුත්තේය.

ජාතක කථාව :- පඤ්චාලචණ්ඩි දේවිය වේදේහ රජ්ජුරුවන්ට ප්‍රියව වසන්නී දෙවන අවුරුද්දේ පුතණු කෙනෙකුන් වැදූය. ඒ කුමාරයන් වැඩී දස අවුරුදු කල වේදේහ රජ්ජුරුවෝ සවර්ගස්ථ වූහ. පණ්ඩිතයන් වහන්සේ ඒ කුමාරයන් රාජ්‍යයෙහි පිහිටුවා දේවයන් වහන්ස! මම නුඹවහන්සේගේ මුතුන් රජ්ජුරුවන් සමීපයට යෙමියි වදාළසේක. කුමාරයෝ මා බාල තැනැත්තාවූ ඇරපියා නොයව! මම තොප පිය තනතුරේ තබා රකිමි. නොයවමි'යි කීය. පඤ්චාලචණ්ඩි බිසවද පණ්ඩිතයෙනි මම වේදේහ රජුට පාවාදුන්නේත් දෙරජුන්ගේ වෛරය හරවා සමගි කළේත් නුඹවහන්සේමය. එහි ගියකල අපට කිසි පිහිටෙක් නැත. මෙහිම රඳාපියා සියළු සම්පත් වළඳාපී මැනවයි කීහ. එවිට පණ්ඩිතයන් වහන්සේ එසේය මා එන ගමනේ වේදේහ රජ්ජුරුවෝ මළ කල මා එන්නෙමියි බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට ප්‍රතිඥාදී ආවෙමි. එබැවින් රඳන්ට නොපිළිවෙනැයි කියා මියුළු නුවර බොහෝ දෙනාගේ බැගෑහඬ අසන්නේ අමරා දේවින්ද සහජාත යෝධයින්ද කැටිව නික්මුණු සේක් පඤ්චාලනුවරට පැමිණිසේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද මහා පෙළහරින් අවුත් පිළිගෙන ඉදිනට මා හැගි මාළිගාවක් දුන්හ. වැටුපක් නොදුන්හ. නමුත් පණ්ඩිතයෝ කළමනා රාජ සේවය පමානොකොට කරන සේක.

එසමයෙහි ඉතා නුවණැති කීමෙහි දක්ෂ ඉතා ධර්මිෂ්ට "භෙරි" නම් වූ පරිබ්‍රාජිකා කෙනෙකුන්දෑ රජගෙයිදී වළඳා මඟුල් උයන ඉඳිනා සේක. පණ්ඩිතයන් වහන්සේ උන් කිසි දිනක දැක නැත. ඔවුනොවුන් ගැන දෙදෙනාම පිටතින් දන්නාහ. නන්දා දේවිත් උමගින් සොරා ගෙන ගිය දින පටන් මහෞෂධ පණ්ඩිතයන් කෙරෙහි හටගත් වෛරයෙන් පසුවන්නී තම වල්ලභ ස්ත්‍රීන් පස්දෙනෙකුට කියන්නාහු තෙපි හැම මහෞෂධ පණ්ඩිතයාගේ අපරාධයක් පරීක්ෂාකොට රජ්ජුරුවන්ට කියා බිඳවා පියවයි කීහ. ඔව්හු පස්දෙන මහතාණන්ගේ වරදක් රහසින් සොයමින් ඇවිදිනාහ.

එක් දවසක් පරිබ්‍රාජිකාවන් දෑ රජගෙයි වළඳා එන අතරමග පණ්ඩිතයන් වහන්සේ දැක "මේ පණ්ඩිතයෝ නුවණැත්තෝල හස්ත මුද්‍රාවෙන් ප්‍රශ්නයක් විචාරමියි සිතා පණ්ඩිතයන් මුහුණ බලා "අතක් විදහා පෑ සේක. ඒ කුමක් නිසාද යත් රජ්ජුරුවෝ තොප රටින් මෙරටට ගෙන්වාගෙන අත පුරා සම්පත් දී පියා සුවසේ රකිත්දැයි නොරකිත්දැයි සිතින් සිතාය. පණ්ඩිතයන් වහන්සේ ප්‍රඥා නැමැති දිවැසින් ඒ දැක තමන් වහන්සේ මිට හකුළුවා පෑසේක. කුමක්කී නිසාදයත්? මා සමීපයට එවයි මාගේ රටින් ගෙන්වා කලින් දුන් තෑගි විනා මට කිසිවක් දැන් නොදෙන්නාහයි සිතින් සිතා ඒ විසඳුනියාය දෙවනු පරිබ්‍රාජිකාව තමාගේ හිස පිරිමැඩ ලූ සේක. ඉන් කුමක් හැඟවීදයත්? ඉදින් උකටලී වූනම් අපසේ මහණව නොගනුදැයි හැඟවූ නියාය. එවිට පණ්ඩිතයන් වහන්සේ තමා විසින් රකිනා බඩවල් බොහෝ යයි හැගවීම සඳහා තමබඩ පිරිමැඩලූසේක.

නන්දා දේවියගේ වල්ලභ ස්ත්‍රීහු නිතර පණ්ඩිතයන් වහන්සේ ගැන පරීක්ෂා කාරීව උන්නාහු මේ දෙදෙනාගේ ක්‍රියා දැක රජ්ජුරුවන් සමීපයට ගොස් දේවයන් වහන්ස! මහෞෂධ පණ්ඩිතයෝ පරිබ්‍රාජිකාවන් හා එක්ව ඔබ වහන්සේ සතු රාජ්‍යය ප්‍රාර්ථනා කරන්නාහයි වරදවා කියා බිඳුවාපීහ. ඒ ඇසූ රජ්ජුරුවෝ පණ්ඩිතයන් විසින් මා කෙරේ ඒ දනට නොපිළිවන. මේ දෙය පරිබ්‍රාජිකාවන් අතින් විචාරා දැනපියමි'යි සිතා දෙවන දින දන් වැළඳීමට ආ කල්හි කිමෙක්ද? පණ්ඩිතයන් දුටුද? උන් හා කළ කථාබස් ඇත්දැයි කීහ. මහරජ උන්හා බසින් කී දෙයක් නැත. හස්තමුද්‍රාවෙන් ප්‍රශ්නයක් විචාරම්හ. අප විචාළ ප්‍රශ්න අප සිත්වූ පරිද්දෙන් විසඳූහයි ඒ වූ නියායෙන් වදාළසේක. මහරජ ඔහු නුවණැත්තෝය. උන් හා සමාන කෙනෙක් මුළු දඹදිව නැත්තාහයි වර්ණනාකළසේක. උන්වහන්සේ ගිය ඉක්බිති පැමිණි පණ්ඩිතයන් වහන්සේද පරිබ්‍රාජිකාවන් දෑ කී පරිද්දෙන්ම කී සේක.

ඒ ඇසූ රජ්ජුරුවෝ මහත් සොම්නසට පැමිණ තවතවත් පැහැද දසදහසක් යොදුන් දඹදිව මුළුල්ලට නායක කොට සෙනෙවිරත් ධූරය දී මේ රාජ්‍යය මුළුල්ලෙහි පණ්ඩිතයන් කීවක්ම කළ යුතුයයි විධානය කොට පාවා දුන්හ. පණ්ඩිතයන් වහන්සේගේ ගෙට සියළු සම්පත් මහමුහුදට වඩ බාදිය සේ ප්‍රමාණාතික්‍රාන්තව ගියේය. රජහු තමාට යසස් දුන් ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ සිතන්නේ මට මේ සා මහත් තනතුරක් දී මහත් යසසෙහි පිහිටුවාලූහ. රජදරුවෝ යමෙක් කෙරෙහි වෛරවූ නම් පෙරවරු යසස්දී පස්වරු නසන්නාහ. දැන් මටත් මහත් සම්පත් දීපීහ. රජ්ජුරුවන් මා කෙරෙහි ඉත සිතින් මේ සම්පත් දුන් සේක්ද? අහිත සිතින් දුන්

SANHIDA LANKA

සේක්දැයි කල් නොයවා දැනගතිමි'යි සිතා මල් සහ ගිලන්පසද රැගෙන පරිබ්‍රාජිකාවන් වසන පන්සලට ගොසින් ස්වාමීනී! නුඹවහන්සේ මාගේ ගුණ කීතැන් පටන් රජ්ජුරුවෝ මට මහත් සම්පත් දුන්හ. ඒ මා කෙරෙහි සම සිතින් දුන් සේක්ද නොදනිමි. රජහු මා කෙරෙහි ඇති සමගි ගුණය තත්වූ පරිදි දැනපිය මැනවයි කීසේක.

පරිබ්‍රාජිකාවද යහපතැයි ගිවිස දෙවන දවස් රජගෙට ගොස් දියරකුසු පැනයයි එක් ප්‍රශ්නයක් ගොතා වදාළා අන්තයෙහි මහරජ! රහස් කථාවක් කියනු කැමැත්තම්හ. විසඳනු මැනව'යි කියා ගාථාවකින් ප්‍රශ්නය විචාළසේක. එහි අදහස කෙසේදයත්?
තොපගේ වැදූ මෑණියන්ද නන්දා දේවියද සහෝදර තීක්ෂණ මන්ත්‍රී කුමාරයෝද යහළු ධනුශේඛර කුමාරයෝද අග්‍රපුරෝහිත කේවට්ට බ්‍රාහ්මණයෝද මහෞෂධ පණ්ඩිතයෝද තෙපිද යන සත් දෙනා මහාසමුද්‍රයෙහි එක් නැවකින් යන කල්හි උදක රාක්‍ෂසයෙක් මිනිස් බිල්ලක් සොයා ඇවිදින්නේ තොපගේ නැව දැක මුහුදු දිය දෙබෑකොට අවුත් මහරජ මේ තොප හා කැටිව නැවෙන් යන සදෙනා පිළිවෙලින් දුනහොත් මුත් නැව නාරිමි'යි කීනම් ඒ සදෙනාගෙන් කවුරු පළමුව දෙව්ද? දෙවැනි තුන්වැනිව කවුරු කවුරුන් බිලිදී ඒ ජල රකුසා අතින් ගැලවෙම්දැයි විචාළහ.

ඒ අසා රජ්ජුරුවෝ තමන් සිත වඤ්චානැතිව අදහස්වූ පරිද්දෙන් කියන්නාහු ස්වාමීනී ප්‍රථමයෙන් ජලරකුසාට මෑණියන්ව බිළිදෙමි. දෙවැනිව නන්දා දේවිය, තුන්වනුව මගේ මළනුවන්වද, සතර වැනිව යහළුවාවද, පස්වැනිව කේවට්ටයාවද දී තවත් ඉල්ලානම් මහෞෂධ පණ්ඩිතයන්ව පිටිපස්සට දමා එම්බල මා කාපියව'යි ඒ රාක්‍ෂසයාගේ දල්වාවූ කටට පැන බිළිවෙමි. මා ඇසින් බල බලා සිටියදී මගේ පණ්ඩිතයන් නොදෙම්හයි කීය. ඒ අසා ගොස් දෙවන දින පරිබ්‍රාජිකාව රාජාංගනයට පැමිණ රාජසභාව පිරිවරා ගෙන සිටින රජුන් හමුවට ගොස් ලද විශේෂ අසුනක හිඳ රජ්ජුරුවන් අමතා මහරජ දියරකුසා තොප අල්වාගත්කල වැදූ මෑණියන් පටන් තොප සදෙනා පිළිවෙලින් බිලිදී පණ්ඩිතයන් රකිමියි කිව. බැලූකල මහෞෂධ පණ්ඩිතයන් තරම් තොපට සතුරෙක් නැත. තොපගේ මෑණියෝ තොපට බොහෝ උපකාරී වූ සේක. එසේවූ මෑණියන් කුමක් පිණිස ප්‍රථමයෙන් බිළිදෙව්දැයි විචාළසේක.

මහෞෂධ පණ්ඩිතයන්ගේ ගුණ ලෝකයේ ඉරහඳ සේ ප්‍රකට කරනු සඳහා සභා මාධ්‍යයෙහි පරිබ්‍රාජිකාව විසින් රජ්ජුරුවන් සමග මේ වාදය කරන බව දතයුත්තේය. එවිට රජ්ජුරුවෝ මාගේ මෑණියන් දෑගේ ගුණ බොහෝ බව දනිමි. ඔබ දන්නා ගුණයට වඩා මා දන්නා නුගුණ බොහෝය. ඒ හැම කියන්නට නොපිළිවන. යම්තම් දෙයක් කියමි. අසා වදාළ මැනව!

තමන් ඉතා වයස්ගතව සිට බොහෝ මණිමේඛලා දාමා දියෙන් සැරසී රාජසභාව රැස්වූ කල ඔබ්මොබ හැසිරෙන්නීය. මම ඒ ශබ්දය අසා බොහෝ කොට ලැජ්ජා වන්නෙමි. අමාත්‍ය සමූහයා ඔවුනොවුන් මුහුණ බලන්නාහ. තවද මුන්දෑගේ ඉඳුල් බත් කන්ට තරම් නොවූ ප්‍රත්‍යන්ත රජ්ජුරුවන්ට මා යැව්වාකොට පත් ලියා යවන කල මාගේ මෑණියන් මහළු නොවනදෑය. සොළොස් හැවිරිදි කෙල්ලන් මීට වඩා සංවර වන්නාහ. රජ්ජුරුවන්ට යවනා පත් හරවා අපට ආකල සභා මාධ්‍යයෙහි ඒ කියවිය නොහැක්කේය. පොළව පැලීයන්නාසේය. මේ වැරදි නිසා මෑණියන්ව දියරකුසාට දෙමියි කීහ.

මෑණියන් මේ වරදින් ජලරකුසාට දෙව! නන්දා දේවිය බාල අවස්ථාවේ පටන් තොපට මහත් උපකාර ඇත්තීය. කුමක් නිසා බිලි දෙන්නෙහිදැයි විමසීය.

ස්වාමීනි! නන්දා දේවිය රහසිගතව ලෝකාස්වාද රතියෙන් සතුටුව මා තමා වසඟයට පමුණුවා මාගේ සෙසු බිසෝවරුන්ට හා උන්ගෙන් උපන් දරුවන්ට මා විසින් ස්නේහයෙන් කරවා පලඳවන ලද නොඉල්වියයුතු පළඳනා මා අතින් ඉල්වයි. මා කාමරාගයෙන් මත්ව ඒ ගනුවයි කීකල අනික් බිසෝවරු සහ දරුවෝ හඬමින් මා සමීපයට අවුත් ශෝක වන්නාහ. මමද පසුතැවිලි වන්නෙමි. ඒ වරදින් ඈ ජලරකුසාට දෙමියි කීහ. මෙසේ ක්‍රමයෙන් මළණුවන්වද ධනුශේඛර කුමාරයන්වද යහළුවාද කේවට්ට බමුණාවද බිලිදීමට ඇති සුදුසුකම් ප්‍රකාශකොට මහෞෂධ පණ්ඩිතයන්ගේ ගුණ කියන්නේ මා තබා දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මයන් හා නාග සුපණ්ණාදිවූ දෙවියෝද කියා නිමවාලිය නොහැක්කැයි සිතමි. උන් සමාන අන් පණ්ඩිතයෙක් ගිය දවස උපන්නෙත් දැන් ඉපදීත් නැත. මතු උපදින්නෙත් නැතැයි කියා ඉඳිකටු මලින් අහස පාන්නාසේ ගුණ ප්‍රකාශකළහ.

SANHIDA LANKA

මෙසේ ප්‍රඥාතොමෝ මහත් සෘද්ධි ඇත්තීය. මෙලෙහ ලෞකික පාර ලෞකික සකලාර්‍ථ සිද්ධිය පිණිස උපකාරී වන්නේයයි පරිබ්‍රාජිකාවන්දෑ පණ්ඩිතයන් වහන්සේගේ ප්‍රඥාගුණය තමන්ගේ නුවණින් දේශනා කොට කුළුගන්වා දියරකුසු පැනයෙන් මේ උම්මග්ග ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි පරිබ්‍රාජිකාවන්දෑ දැන් උපුල්වන් මහා ස්ථවීරිය. පියවූ සිරිවඩ්න සිටාණෝ සුද්ධෝදන මහ රජ්ජුරුවෝය. මැණියෝ මහාමායා දේවිය. අමරා දේවීනම් යශෝධරාවය. ගිරවා නම් ආනන්ද ස්ථවිරයෝය. චූලනී බ්‍රහ්මදත්ත රජනම් සාරිපුත්‍ර ස්ථවිරය. මහෞෂධ පණ්ඩිතයෝනම් දැන් ලොව්තුරා ශාන්තිනායක බුදුපියාණෝය.

SANHIDA LANKA

## දහම්සොඬ ජාතකය

ජාතක කථාව:- යටගිය දවස බරණැස රාජ්‍යකළ බ්‍රහ්මදත්ත රජුට දහම්සොඬ නම් කුමාරයෙක් විය. ඒ කුමාරයා ක්‍රමයෙන් වැඩි සූසැට කලා ශිල්පද අෂ්ටා දස පුරාණ ද අවි ශිල්පද නිමවා සොලොස් හැවිරිදි කල්හි යුව රාජ තනතුරට ද පියාගේ ඇවෑමෙන් රජකමද ලැබ චතුර් විධවූ උපායෙන්ද ත්‍රිවිධ ශක්තියෙන්ද ෂඩ් ගුණයෙන්ද සප්තාංග යෙන්ද චතුස්සංග්‍රක වස්තුවෙන්ද යුතු ව රට ආරක්ෂා කරමින් සිටින කල්හි දිනක්මෙබඳු සිතිවිල්ලක්ඇති විය.

සංසාරයෙහි වාසය කරන සත්වයා කෙරෙහි මෛත්‍රී කරුණා වෙන් නිවන් පුරයට පමුණුවන අපගේ සර්වඥයන් වහන්සේ විසින් අමෘතය මෙන් දේශනා කරනලද ශ්‍රී සද්ධර්මය දැන නොගෙන සැළකීමක් නොකොට කරන්නා වූ මේ රජකම මට සුදුසු නොවෙයි. එය වෙරළ නැති රළ මෙන්ද චන්ද්‍රයා නැති අහස මෙන්ද ප්‍රදීපය නිවී ගිය ගෙය මෙන්ද දළසුන් මස්ත හස්තියා මෙන්ද පියුම නැති විල මෙන්ද නාසය බුන් චක්ත්‍රය මෙන්ද නොහොබින්නේයයි මෙසේ සිතා රෑ පහන් වූ කල්හි සුවඳ පැන් සනහා සර්වආභරණින් සැරසී සුර සබයට යන ශක්‍රයා පරිද්දෙන් රාජ සභාවට පැමිණ සිංහාසනාරූඪව අමාත්‍ය මණ්ඩලය අමතා තිලොවට ගුරු වූ මුනිද්‍රයන් වහන්සේ දෙසු ධර්මය මට කියව් තොප එසේ උතුම් ධර්මය ප්‍රකාශ කළ හොත් අපමණ රාජ සම්පත් සමඟ මුළු රාජ්‍යයම පුදමි. මේ ගැන සැකනොකරව් කීහ.

උන් එකෙකුදු ධර්මය නොදන්නා බව ප්‍රකාශකල කල්හී මගුලැතුන් සරසවා දහසින් පබැඳි පියල්ලක් ඒ මත තබාමුනිඳුන් දෙසු ධර්මය එක් ගාථාවකින් හෝ ගාථා අඩකින්වත් මට කිසිවෙකු කිවහොත් මේ සම්පත් ඔහුහට දෙමි. තවද ඔහුගේ දාස බවට පත්වෙමියි ප්‍රකාශකොට යැවූහ. මෙසේ ද විමසා බණ දත් කිසිවෙකු නොලදින් මහත් සේ කළකිරී රාජ්‍ය ශ්‍රී අත්හැර ධර්මය සොයනු පිණිස වනයට නික්ම ගියේය.

තමාගේ පාරමිතා බලයෙන් ඒ මහා වනයේ විෂඝෝර සර්පයන් ගෙන් පීඩා නොවිඳ ගතවෙමින් යන කල්හි මේ මහතාණන්ගේ ප්‍රත්‍ය මහිමයෙන් ශක්‍රදේවේන්ද්‍රයන්ගේ ශෛලාසනය හුණු වී වහා එහි පැමිණ තවත් පරික්ෂා කරමියි සිතා අංජන කැටයක් මෙන් භයානක උස්වූ ශරීරයකින්ද හිසෙහි යකඩ බිලී මෙන් කකීෂවූ කේෂයෙන්ද රෞද්‍රරක්ත වර්ණ ඇස් දෙකකින්ද නැමිගිය දළවලින් යුතු රාක්ෂය වේසකින් දහම්සොඬ රජ්ජුරුවන් වෙතට ළංව එක් අතකින් යගදාව සොළව සොළවා එක් අතකින් දැලි රැවුල ඇද ඇදසිට රැ ත්තේය.

රජ්ජුරුවන් වහන්සේ ඒ බියකරු යක්ෂයා දැක මදකුදු තැතිගැනීමක් නැතිව වහා ඉදිරියට ගොස් පින්වත, දෙලොව ජයගතහැකි බණ පදයක් තා විසින් අද කිවහොත් රාජ්‍ය ශ්‍රී සමග මාගේ ජීවිතයද දෙමියි කීහ. එවිට රකුසා බඩගින්න ඉවසිය නොහැක. තොපව අනුභව කොට බණ කියමි යි කීය. රජ්ජුරුවන් වහන්සේ ඒ අසා බණ ඇත්තේ පණ ඇත්තම් වෙද? මම නැත්තම් තාගේ බණ අසන මෙහි කවුරු වෙක්ද? රකුසානෙනි, තොපගේ සාගින්න සහ මගේ දහම් දොළ දුක එකවිට විසදෙන සේ මඟක් විමසා කියවයි කීය.

එබසට රකුසා ස්වාමිනී, තොපට සදහම් ළාභයද අප හට වන මාංශ ලාභයද එකවිට පසීඳමියි කියා සිය ගණන් කුටයන්ගෙන් යුතු අහසෙහි ගැටි පවත්නා මහා පර්වතයක් මවා තොප මේ ගිරට පැන මාගේ කටට පණිනු මම ඒ අතර තොපට ධර්මය දේශනා කරමි. වහා නැගෙවයි කීහ. රජ්ජුරුවන් වහන්සේ බුදුගුණ සිහිකර කෙනෙක් පර්වත. ගස් වැල් වලින් වැටී ද කෙනෙක් විස පානය කොටද මිය යන්නාහ. ද්වි වලසුන්ට ගොදුරු වන්නාහ. ධර්මය නිසා මාගේ ජීවිතය තොරවීම නිසරු නොවේවැයි සිතා මහා ගිනිසිඛරයට නැග ගිනි වලක් බඳු රාක්ෂයා ගේ දැල් වූ බියකර මුඛය දැක මදකුදු කම්පා නොවී සිට රාක්ෂයා අනිච්චාවත සංඛාරා - උප්පාද වය ධම්මිනො, උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තෙසංවුප සමො සුඛො යන ගාථාව කියන කල්හි බුදු බව පතා එක් වරම රාක්ෂයාගේ මුවට පැන්නේය. ඒ මෙහොතෙහිම ශක්‍රයා බියකරු වේශය අත්හැර නියම වෙස් ගනිමින් දහම් සොඬ රජ්ජුරුවන් දෙ අතින් වඩාගෙන දෙව්ලොව ගෙනයන සිතින් අහසට නික්මී කොදිව් මහදිව් පසුකොට උතුම්වූ තව්තිසා දිව්‍ය ලෝකයට ප්‍රවිෂ්ටම නන්දනොද්‍යානයද නන්දා පොකුණ ද තෙතිසක් කුඹින් ජ්වලිත වූ ඓරාවන හස්තිරාජයාදම් නහර දිව්‍යප්සරාවන්ද දකිමින් සුධර්මා නම් ධර්ම සභාවට ප්‍රවිෂ්ට ව දහම් සොඬරජ්ජුරුවන් ව පාණ්ඩුකම්බුල ශෛලාසනයෙහි වඩා හිඳුවා ගඳ දුම් මල් පුදා ධර්මදේශනා කරන සේ ආරාධනා කළහ.

SANHIDA LANKA

ආකාශ මධ්‍යයට පැමිණි චන්ද්‍රයා මෙන් දහම්සොඬ රජ්ජුරුවන් වහන්සේ දිව්‍ය සමූහයා පිරිවරාගෙන ධර්ම දේශනා කළ සේක. ශක්‍රදේවේන්ද්‍රයා ඒ මිහිරි වූ ශ්‍රී සද්ධර්මය අසා සන්තොසයට පැමිණ ස්තුති ඝෝෂා කොට ආශිර්වාද පතා මනුලොවට ඇරලූහ. දහම්සොඬ රජතුමා නැවත තම රජ සැපතට පත්ව බුදුබව පතා

පෙරසේම දැහැමින් සෙමින් රාජ්‍යය කෙළේය.

එසමයෙහි දහම්සොඬ රජව උපන්නේ දැන් සම්මාසම්බුදු රජුන්ය.

SANHIDA LANKA

# උම්මාදන්ති ජාතකය

ත්‍රෛලෝක තිලක සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ සැවැත් නුවර වාසය කරන සේක් එක් ස්ත්‍රියක් දැක ශාසනය කෙරෙහි උකටලී වූ නමින් රටට ප්‍රකට නැති එක් භික්ෂුවක් අරභයා මේ මන් උදන්වන උම්මාදන්තී ජාතකය වදාළ සේක.

යටගිය දවස සිවි රට ශ්‍රේෂ්ඨීන් තුෂ්ට වූ අරිෂ්ට නම් නුවර විශිෂ්ට ගුණධර අරිෂ්ට නම් රජුට සිවි නමින් කුමාරයෙක් වීය. ඒ කුමාරයා කුඩා කල පටන්ම අභිපාරක නම් සේනාපති පුත්‍රයෙක් සමග මිත්‍රව විසීය. ඒ දෙකුමරුවන් සොළොස් හැවිරිදි කල්හි තක්සලා නුවරට ගොස් සියලු ශිල්ප දැන නිමවා ස්වකීය නුවරට පැමිණ පිය රජතුමාගේ කැමැත්තෙන් රාජ්‍යයට පත්විය. හිතමිත්‍ර අභිපාරකයන් සේනාපති ස්ථානයෙහි තබවා දැහැමින් රජ කරන සේක. එසමයෙහි එම නුවර අසූ කෙළක් ධනය ඇති සිරිට තැන වූ කිරීටවච්ච නම් සිටාණන්ට සුන්දර රූපශ්‍රීයකින් යුත් උම්මාදන්ති නම් කුමාරියක් වූවාය. ඈ දක්නා අන්ධ පෘතග්ජන කෙනෙකු ඇත් ද රහමෙර පුවාක් මෙන් ක්ලේශ මදයෙන් මත් වන්නාහ. දිනක් ඇගේ පියා වූ කිරීටවච්ච සිටාණෝ රජ්ජුරුවන් කරා එළඹ දේවයන් වහන්ස! මාගේ ගෙයි ස්ත්‍රී රත්නයක් ඇත. ඔබ වහන්සේට සුදුසුය. ලක්ෂණ ශාස්ත්‍රයෙහි නිපුනවූවන් යවා උන් ලවා පරීක්ෂා කරවා නිස්සක් කොට වදාළ මැනවයි කීහ. රජ්ජුරුවෝ ඉතා සතුටුව ලක්ෂණ පාඨකයන් යැවූහ. ඔවුන් සිටාණන්ගේ මාළිගාවට ගොස් අනායාසයෙන් පිළියෙල කළ පාසාය අනුභව කළාහුය. එකෙනෙහිම උම්මාදන්තී කුමරිය සර්වාලංකාරයෙන් සැරසී ඔවුන් සමීපයට ගියාය.

ඒ බ්‍රාහ්මණයෝ ඈ දැක සිහි එළවා ගත නොහැකිව ක්ලේශ මදයෙන් මත්ව තමන් බත් අනුභව කොට නොනිමි බව නොදත්තාහු. සමහර කෙනෙක් බත් පිඩ ගෙන අනුභව කෙරෙමියි සිතා හිසෙහි තැබුවාහුය. සමහරෙක් කිසිලි අතුරෙහි ලූවාහුය. සමහරෙක් බත් පිඬු බිත්තියේ ගැසුවාහුය. මේ විප්‍රකාර දුටු කුමාරිකාව මාගේ ලක්ෂණ විමසූයේ මුන් දැයි නොසතුටුව උන් සැමට තරවටු කොට බොටුවෙන් අල්ලා පිටතට දමවයි කියා ගෙන් නික්මවූහ. එයින් කෝපයට පත් ලක්ෂණ පාඨකයෝ වහා රජ ගෙට ගොස් දේවයන් වහන්ස! ඒ ස්ත්‍රිය බාල ජන ලොලවන කාලකණ්නියක. ඔබ වහන්සේට නුසුදුසු ය. ඇගෙන් කම් නැතැයි කීවාහුය. මහ රජ්ජුරුවෝ එපවත් අදහා ඈ කාලකණ්නියකැයි සිතා රජගෙට නොගෙන්වූ සේක. ඕ තොමෝ එපවත් අසා මම වනාහී කාලකණ්නියකැයි සිතා රජ්ජුරුවන් විසින් නොගෙන්වන ලද්දේය. කාලකණ්නීහු නම් මේ බඳු ස්වරූපයෝ මැවෙන්නෝ නොවෙති. ඉදින් ඒ රජ්ජුරුවන් දක්නෙම් වී නම් නිස්සක් දනිමියි සිතා ඔවුන් කෙරෙහි ආඝාත බැන්දාය. ඉක්බිත්තෙන් ඇගේ පියාණෝ අභිපාරක නම් සෙන්පති හට ඒ කුමාරිකාව සරණපාවා දුන්හ. ඕ තොමෝ ඒ සෙන්පති හට ප්‍රිය මනාප වූවාය. කවර කුසලයක්හුගේ විපාකයෙන් ඕ තොමෝ මන වඩනා රූපයෙන් යුක්ත වූවාහුද යත්?

ඕතොමෝ යට ගිය දවස බරණැස් නුවර එක් දිළිඳු කුලයක ඉපිද වසන්නේ එක් උත්සව දවසක ඇඳීමට සිනිඳු වතක් නැතිව ධනවත් කුලයකට ගොස් තෙවසත් අනලස්ව බැල මෙහෙ කොට සණරන් සිනිඳු වස්ත්‍ර දෙකක් ලැබ ජල ස්නානය කොට ඒ පැළඳ ගැනීමට සූදානම් වෙත්ම කාශ්‍යප සර්වඥයන් වහන්සේගේ එක් ශ්‍රාවකයන් වහන්සේ නමක් පැහැර ගත් සිවුරු ඇතිව කොළ අතු ඇඳ පෙරව ඒ ප්‍රදේශයට වඩිනවා දැක, මම වනාහී පූර්වයෙහි වස්ත්‍රයක් නොදුන් බැවින් දැන් මට මේ දනා මැද හොබනා ලෙස අඳිනා පමණට ද වස්ත්‍රයක් දුර්ලභ විය. එහෙයින් දැන් මා අසම්පූර්ණ තුන් අවුරුද්දක් බැලමෙහෙ කොට ලබන ලද මේ වස්ත්‍රය දෙකඩ කොට එක් කැබෙල්ලක් ආර්යයන් වහන්සේට පුදමි. වහා පැමිණ ස්වාමීනී මදක් වැඩ සිටුව මැනවයි කියා එක් කැබැල්ලක් පූජා කළාය. ඒ ආර්යයන් වහන්සේ ද පිළියන් වූ එක් තැනක සිට කොළ අතු ඉවත ලා එක් කොනක් හැඳ එක් කොනක් පෙරව සමීපයට වැඩි සේක. ඒ වස්ත්‍රයාගේ ප්‍රභාවයෙන් සකල ශරීරය ආලෝකවත් විය. ඕ තොමෝ ඒ දැක ආර්යයන් වහන්සේ දැන් වනාහී තරුණ සූර්යයා මෙන් ඉතා ප්‍රභාමත් සේක. මේ ද මුන් වහන්සේට ම පුදමියි සිතා ඉතිරි කැබැල්ල ද උන් වහන්සේට ම පුදා ස්වාමීනී මේ වස්ත්‍රදානමය කුසලයේ බලයෙන් මම යම් තාක් සසර වසම් ද ඒ තාක්කල් උත්තම රූපධර වෙම්වා. මා දුටු කිසි පුරුෂයෙක් ස්වකීය භාවයෙන් සිටීමට නොහැකි වේවා. මට වඩා අභිරූපිකාවක් තවත් ඇති නොවේවායි කියා ප්‍රාර්ථනා කළාය. ඒ ආර්යයන් වහන්සේ ද අනුමෝදනා කොට වැඩි සේක. ඕතොමෝ එයින් චුතව දෙව්ලොව ජනිතව ඉන් නික්ම අරිෂ්ට පුරයෙහි ඉපිද විශිෂ්ට රූපශ්‍රීයකින් අග්‍රප්‍රාප්ත වූ වහයි දත යුත්තේය.

SANHIDA LANKA

ඉක්බිත්තෙන් එනුවර උත්සව දිනයක අභිපාරක සෙන්පති තෙම කුමාරිකාව අමතා සොඳුර, අද උත්සවයෙහි නුවර ප්‍රදක්ෂිණා කරන රජ්ජුරුවන් වහන්සේ අපගේ මේ ගෘහද්වාරයට වඩිනා සේක. එවිට ඒ ජනේන්ද්‍රයන්ට තොපගේ ශරීරය නොදක්වව. ඒ නරේන්ද්‍රයෝ නමුදු තොප දැක සිහි පිහිටුවා ගන්ට නොහැකි වන්නේ යැයි කියා ගියේය. ඕතොමෝ ඒ මම දන්නෙමි වේදැයි සිතා සේනාපතින් ගිය කල්හි දාසියක් කැඳවා

රජතුමා මේ ගෘහවාරයට වැඩි කල්හි මට කියවයි නියෝග කළාය.

ඉක්බිති සර්වාලංකාරයෙන් ප්‍රතිමණ්ඩිත වූ මහා රාජෝත්තම තෙම ඇමති මඬුලු පිරිවරාගෙන නුවර පැදකුණු කරන සේක් අභිපාරක සෙනෙවි රදුන් ගේ ගෘහද්වාරය කරා එළඹුනු සේක. එකෙණෙහි කෙල්ල ගොස් ඒ පුවත උම්මාදන්තියට කීවාය. එවිට ඈ මල කරඬුවක් ගෙන්වා ගෙන සී මැදුරු කවුළුව වෙත ගොස් එහි සිට මහරජු අබිමුඛයට මල් දැමුවාය. මහ රජ්ජුරුවෝ ඈ දැක ක්ලේශ මදයෙන් මත්ව සිහි එලවා ගත නොහැකිව තමා ඉන්නා තැන පමණකුදු දැන ගත නුහුනු සේක. ඉක්බිති සුනන්දා නම් රථාචාර්ය අමතා ඈ පිළිබඳ සියලු තොරතුරු විමසා සියලු තතු ඔහු අතින් දැන වහා මාලිගාවට ගොස් දහසකින් පැරද ගිය එකක් මෙන් දිවා රාත්‍රී දෙක්හි නිදි නොලැබ ඈ ගැනම සිත සිතා විලාප කියමින් කල් යවන සේක. ඒ නුවරහු සෙන්පති අමතා ස්වාමීනි! රජ්ජුරුවන් වහන්සේ ඔබ වහන්සේගේ මාළිගයට ගොස් නැවත වාසලට වැඩ කනස්සල්ලෙන් සිටින සේකැයි කීවාහුය.

එවිට අභිපාරක සෙනෙවි රදු තමන්ගේ ගෙට ගොස් උම්මාදන්තිය කැඳවා කිමෙක්ද සොඳුර රජ හට තෙපි පෙනුනදැයි විචාලේය. ස්වාමීනි! මහත් වූ උදරයක් ඇති දළ ඇති රථයෙහි සිට ආවා වූ එක් පුරුෂයෙක් ඇත. මම ඔහු රජ්ජුරුවන් බවක් හෝ රජකයෙක් බවක් හෝ නොදන්නෙමි. එක් ප්‍රධානියෙකැයි කී කල්හි ද්වාරයෙහි සිට මල් දැම්මෙමි. හෙතෙම එපමණකින්ම නැවිත් ගියේ යැයි කීවාය. හෙතෙම ඒ අසා තී විසින් මම නසන ලද්දේ වීමියි කියා දෙවෙනි දවස් උදෑසන රජ ගෙට ගොස් ශ්‍රී යහන් ගබඩාවෙහි දොරකොඩ සිට උම්මාදන්තිය නිසා කියන ලද රජ්ජුරුවන්ගේ විප්‍රකාර විලාප වචන අසා ඈ නොලබන්නේ නම් රජතුමා මරණ ප්‍රාප්ත වන්නේය. රජතුමාගේ ජීවිතය මා විසින් දෙන්ට වටනේයයි සිහි කොට තමන්ගේ ගෙට ගොස් රහස් අන් හට නොකියන එක් උපස්ථායකයෙකු කැඳවා කියන්නේ හිතවත, අසවල් තැන සිදුරු වූ වෘක්ෂයෙක් ඇත. තොප ඉර බැස ගිය කල්හි ඉතා රහසින් එහි ගොස් ගස් සිදුරේ සැඟවී සිටුව. මම ඒ ඒ තන්හි බලි කර්මාන්ත කරන්නෙමි. ඒ ස්ථානයට පැමිණ දෙවියන් වැඳීමෙන් පසු දිව්‍ය රාජයානන් වහන්ස අප මහා රජාණෝ නුවර සැණකෙළි පවත්නා කල්හි එහි ගොස් සැණකෙළි නොකෙළම ශ්‍රී යහන් ගබඩාවට වැඩ විලාප තියමින් හිඳින්නේය. ඊට කාරණා අප නොදනුම්හ. අප නරේන්‍ද්‍රයානෝ අවුරුදු පතා දහස් ගණන් විසඳා නොමැළිව බළි පූජා කරන සේක. එහෙයින් දේවතාවුන් වහන්ස! රජ්ජුරුවන්ගේ පසුතැවිල්ලට හේතුව වදාළ මැනවයි කියා මම යාඥා කෙරෙමි. තෝ එකෙනෙහි කටහඬ මාරු කොට සේනාධිපතිය තොපගේ රජ්ජුරුවන්ට ව්‍යාධියෙක් නම් නැත. තාගේ භාර්යාව වූ උම්මාදන්තිය කෙරෙහි පිළිබඳ වූ සිතෙක් ඇත. එහෙයින් උමතු විය. ඉදින් ඈ ලද්දේ නම් ජීවත් වන්නේ ය. ඉදින් තොප එම රජහුගේ දිවි කැමැත්තෙහි නම් උම්මාදන්තිය ඔහුට දෙවයි කියා කියවයි විධානය කොට ඔහු ඇරියේය.

දෙවන දවස් හි සෙනෙවි රදුන් ඒ ස්ථානයට ගොස් කී ලෙසින්ම ආයාචනා කරන ලදුව හෙතෙම එසේම කීවේය. එවිට සෙනෙවි රද යහපතැයි දෙවියන් වැඳ මාළිගාවේ ශ්‍රී යහන් ගබඩාවට ගොස් රජ්ජුරුවන් අමතා ස්වාමීනි! ඔබ වහන්සේ ගේ විලාප කාරණය දැන ගන්නා පිණිස වෘක්ෂ දේවතාවන්ට නමස්කාර කරන්නා වූ මට එක් දේවතාවකුගෙන් මෙ කරුණ දැන ගත හැකි විය. එනම් තොප රජහුගේ සිතත උම්මාදන්තිය කෙරෙහි රාග වශයෙන් බලවත්ව පිහිටියේ ය. ඈ ලද හොත් දිවි රැකෙයි. නැතහොත් නොරැකෙයි කීහ. එහෙයින් මම ඔබ වහන්සේට ඈ පරිචාරිකා කොට දෙමි. ඒ සුව අනුභව කොට වදාළ මැනවයි කීහ. එවිට රජ්ජුරුවෝ යහළු අභිපාරකය. ඈ කෙරෙහි ලෝභ සිතින් විලාප කියන ලද බව දෙවියෝත් දන්නා හු දැයි විචාළ සේක. එසේය දේවයන්වහන්සේ යැයි කීය. එවිට නරාධිපති තෙම සර්ව ලෝකයා විසින් මාගේ ලාමක භාවය දන්නා ලද්දේ දැයි ලජ්ජිතව සෙන්පති අමතා යහළු අභිපාරකය, ඈ හා සමඟ අභිරමණය කරන්නා වූ මම මාගේ ගුණධර්ම නසන්නේය. ඈ සමග හැසිරුන පමණකින් ම අජරාමර ද නො වන්නෙමි. මහජනයා ද රජ්ජුරුවන් විසින් අයුක්තක් කරන ලද්දේ යැයි නින්දා කරන්නාහුය. තෙපිද භාර්යාව මට දී පසුව ඈ නොදැක තගේ සිතට ද දොම්නස් වන්නේය. එහෙයින් මට ඇගෙන් කම් නැතැයි කීවේය. නැවත නැවතත් සෙන්පති තෙම රජ්ජුරුවන්ට කැමති සේ උම්මාදන්තිය ගෙන්වා ගැනීමෙන් හෝ ඈ ළඟට යාමෙන් තම සිත උපන් ආශාව සංසිඳවාගත මැනවැයි කීවේය. එවිට රජ්ජුරුවෝ අභිපාරකය රහසින් හෝ පවක් කළ නොහැක්කේය. එහි විපාකය අනිෂ්ට ඵල වන්නේය. එහෙයින් එය මට නොකැමැත්තේ යැයි ප්‍රතික්ෂේප කොට මතු මත්තෙහිද සෙන්පති තෙම ඈ පාවා ගනු මැනවැයි ඇවිටිලි කරන කල්හි මම වනාහී අකුසලයට භයෙන් එසේ නොකරමි. තා නොහඬා හිඳුව. තාගේ අඹුවගෙන් මට කම් නැතැයි කියා භය ගැන් වූ සේක. හෙතෙම ඒ අසා කිසිවක් කියන්නට අසමත්ව රජ්ජුරුවන්ට ස්තුති කොට ඔබ වහන්සේ සකළ ජම්බුද්වීපයෙහි සර්ව නරේන්‍ද්‍රයන්ට ශ්‍රේෂ්ඨ වන සේක. මනාකොට ධර්මය දන්නා සේක. එබැවින් මට ද ධර්මය දේශනාකොට වදාළ මැනවැයි ආරාධනා කළේය.

ඉක්බිත්තෙන් ඔහුට ධර්ම දේශනා කරන්නා වූ රජ්ජුරුවන් වහන්සේ ඉහතින් තෙසකුණ ජාතකයෙහි

SANHIDA LANKA

කී නියායෙන් ගාථා දසයකින් අවවාද කොට ධර්ම දේශනා කළ සේක.

එකල අභිපාරක සේනාපති නම් මෙකල ශාරිපුත්‍ර ස්ථවිරයෝය. එසමයෙහි උම්මාදන්තිය නම් මෙසමයෙහි උපුල්වන් මහා ස්ථවිරිය. සිද්ධ රාජෝත්තමයාණෝ නම් දැන් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ය.

SANHIDA LANKA

# මහාබෝධි ජාතකය

තවද එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවන මහා විහාරයෙහි වැඩවාසය කරනසේක් තමන් වහන්සේගේ මනොඥවූ ප්‍රඥාපාරමිතාව අරභයා මේ මහා බෝධි ජාතකය වදාළසේක.

භික්ෂුන් වහන්සේ

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍යය කරන කල්හි කසීරට අසූකෙළක් ධනය ඇති මහා සාර කුලයක උපන් බෝධිකුමාරයොයැයි නම් ලත් බ්‍රාහ්මණ කුමාරයෙක් පංචකාම සම්පත් හැර හිමාලයට වැද පැවිදිව බොහෝ කාලයක් එහි වැස වස්සාන ඍතුවෙහි හිමවතින් බැස ක්‍රමයෙන් බරණැසට පැමිණ පිඩුසිඟා යන්නේ රජ ගෙදරට වැඩිසේක, රජ්ජුරුවෝ ඒ තාපසයන්ගේ දැමුනු ඉඳුරන් දැක පැහැදී බණ අසා දන් වළඳවා එම උයනෙහිම පන්සලක් කරවා එහිම වැස්වූ සේක. රජතෙම දිනකට තුන්වරක් උපස්ථානයට යන්නේය. තාපසයන් වහන්සේ දානය සඳහා රජ ගෙදරට වඩිනා සේක. මෙසේ දෙළොස් වසක් ඉකුත්විය. ඒ රජහට අමාත්‍යයෝ පස් දෙනෙක් අර්ථ ධර්ම දෙකින් අනුශාසනා කරන්නාහ. උන් අතුරෙන් එකෙක් අහේතුකවාදීය. එකෙක් ඊශ්වර කරණාවාදීය. එකෙක් පූර්ව කෘතිය වාදීය. එකෙක් උච්ජේදවාදීය. එකෙක් ශත්‍රුවිද්‍යාවාදීය. මෙබඳු ප්‍රඥාවෙන් විරහිත ඔවුන් පස්දෙනා මෙසේ යුක්තිය නොවිසඳවා අත්ලස්කන්ට පටන්ගෙන අහිමියන් හිමියන් කිරීම වශයෙන් අනර්ථ කරන්නාහුය. දිනක් දන්වැලදීම සඳහා රජ ගෙට වඩිනා තාපසයන් වහන්සේ හමුවට පැමිණී එක් පුරුෂයකුගේ බලවත් ඉල්ලීම පරිදි නඩුවක් විසඳීම සඳහා බොහෝ දෙනෙකුගේ ප්‍රශංසා ලබා සාධුකාර මධ්‍යයෙහි රජ ගෙට වැඩියේ රජතුමා ඉතා සතුටට පත්ව මෙතැන් පටන් නුඹ වහන්සේම නඩු විනිශ්චය කර වදාළ මැනවයි දැන්වූ සේක.

එතැන් පටන් ඉහත කී අමාත්‍යයෝ පස්දෙනා ලාභයෙන් පිරිහෙන්නට වූයේ තාපසයන් කෙරෙහි ක්‍රෝධ උපදවා මුසාවක් ගොතා ඔහු පලවා හරිමුයයි කතිකා කොට දිනක් රජ්ජුරුවන් හමුවට ගොස් නාරධිප්‍රතිවහන්ස තපස්තෙම ඔබ වහන්සේට අනර්ථ කිරීමට සුදානම්ව සිටින්නේය. සියලු නුවර වාසීහු තමන්ගේ හස්ත ගත කරන ලද්දේය. හුදෙක් ඔබට නොවෙනස්වූ මනස් ඇත්තෙන් අප පස්දෙන පමණක්ම යැයි කීවාහුය. දිනක් රජ්ජුරුවෝ සීමැදුරු කවුළුවෙන් පිටත බලන්නේ තාපසයන් හා එන්නාදු පිරිස් දැක ඒ උන්ගේ පිරිවර යැයි සිතා තාපසයන් කෙරෙහි කිපී අමාත්‍යයන් කැඳවා කුමක් කරමුදැයි විචාළහ. ඔහු අල්ලා මරා දැමුව මැනවැයි දැන්වුවාහුය. එවිට රජ්ජුරුවෝ බලවත් අපරාධයක් නොදැක කෙසේ අල්ලා මරමු දැයි කීහ. එසේ වීනම් දේවයන්වහන්ස උපස්ථානය පිරිහෙලාලුව මැනව. හේ පිරිහීම දැක පලායන්නේයයි කීයෙන් රජ තෙම යහපතැයි දින කීපයක් තුල ක්‍රමයෙන් කරන සියළු උපස්ථාන සැලකුම ආදිය නවතා දැමුහ. තාපසයන් වහන්ස කිසිත් ගනන්නොගෙන ඒ ආහාර ස්වල්පය ගෙන ගොස් උයනෙහි වලඳන සේක. රජ්ජුරුවෝ අමාත්‍යයන් අමතා දැන් කුමක් කරමුදැයි විචාරා ඔහු සෙටම මරවා වදාල මැනවැයි කී කල්හි රජ්ජුරුවෝද යහපතැයි ගිවිස ඔහුන්ගේ අතෙහි තම කඩුව තබා තෙපි සෙට මාලිගාවට ඇතුළු වන ඔහුගේ හිස කඩ කඩ කොට අසුචි වලෙක ලා එවයි කීහ. ඔවුන් පස්දෙනාද සෙට අළුයම එය කරම්වයි තම ගෙවලට ගියහ. ඔවුන් ඒ අනර්ථ කරමුයැයි සිතුපමණක්ම අකුසල් කරන්නා හට ලෙවුයෙහි රහසෙක් නම් නැත්තේය.

එහෙයින් වදාළහ

"නත්ථිලොකෙ රහොනාම - පාපකම්මං පකුබ්බතො

පසන්තවත භූතෘනි - තංබාලො මඤ්ඤතී රහො"

ඉක්බිතියෙන් රාත්‍රි ආහාරයෙන් පසු නරේන්ද්‍ර තෙම ශ්‍රී යහන් හි සැතපී හිඳ තාපසයන්ගේ ගුණ සිහි කළේය. රජ හට ශෝක උපන්නේ ඩා වැගිරෙන්නට විය. ඉක්බිත්තෙන් එහි පැමිණ අග බිසව රජ්ජුරුවන්ගේ කනස්සලු භාවය දැක ඊට හේතුව විමසා තාපසයන් වහන්සේට කිරීමට නියම කළ ව්‍යසනය දැන දේවයන් වහන්ස හෙතෙමේ අපට සතුරු වූයේ නම් නැසීම ගැන කුමට ශෝක කරන්නෙහිදැයි කියා අස්වසාලූවාය. රජ තෙමේ බිසවගේ බස් අසා නිද්‍රාවට පැමිණියේය.

SANHIDA LANKA

එකෙණෙහි තාපසයන් වහන්සේගෙන් නිතර බත් ලැබෙන කොලෙය්‍යක නම් සුනඛ තෙම ඒ කතාව අසා සිට තාපසයන් වහන්සේට ජීවිත දානය දෙන්ට වටනේයැයි සිතා දෙවෙනි දින උදයම මාලිගාවෙන් බැස තාපසයන් වහන්සේ එන එළිපත මත්තේ හිස තබා වැද හොත්තේය. ඇමතියෝ පස්දෙනද දොර මුල්ලේ සැඟවී සිටියාහුය. තාපසයන් වහන්සේද පාත්‍රය ගෙන රජ ගෙදර කරා එළඹී සේක. ඉක්බිති සුනඛ තෙම ඉදිරියට ගොස් කිමෙක්ද? වහන්ස දඹදිව් තලයෙහි අන් තෙනෙක්හි දන් නොලබන්නෙහිද? අප රජ තෙම

තොප මැරීම සඳහා කඩු ගත් පස් ඇමතියන් දොර මුවායෙහි සිටුයේය. මෙතැනින් වහා ඔබ්බට වැඩිය මැනවයි මහ හඩින් හැඬීය. උන් වහන්සේ සත්වයන්ගේ ශබ්දයන්හි අර්ථ දන්නා හෙයින් ඒ දැන එතැනින් හැරී නැවත උයනට ගොස් වඩනා පිණිස පිරිකර ගත් සේක. එවිට සීමැදුරු කවුළුව සමීපයෙහි සිටි රජ තෙම තාපසයන් එන බවද යන බවද දැක ඉදින් මේ තෙම මට සතුරු නම් උයනට ගොස් පිරිස රැස් කොට සටන ට සැරසී එන්නේය. සතුරු නොවූයේ  පිරිකර ගෙන ගමනට සැරසෙන්නේය. එතෙක් ඔහුගේ ක්‍රියාව දැන ගනිමියි සිතා උයනට ගොස් නික්මෙන තාපසයන් වහන්සේ දැක වැඳ කිමෙක්ද ස්වාමිනී! කවර කරුණක් නිසා පිරිකර ගෙන වඩිනා සේක්දැයි විචාලේය. තාපසයන් වහන්සේ මේ රජතෙම තමන්ගේ දුෂ්ටවූ ක්‍රියාව මා නොදනිති'යි කියා සිතන්නේය. ඒ මම දත් බව දන්වමි'යි සිතා සුනඛයාගෙන් දැනගත් පරිදි හෙළිකෙළේය. රජතෙම ඒ අසා තමා අතින්වූ වරදට සමාවී එහිම වැඩසිටියේ ආරාධනා කෙලේය. එවිට තාපසයන් වහන්සේ මහරජ, බොහෝ කලක් එක්තැනක විසීමෙන් ප්‍රියතැනැත්තේ අප්‍රිය වන්නේය. එබැවින් මහරජ, නැවතත් තොපට අපව අප්‍රිය නොවන්නේනම් එකල්හි තොපට දන්වායම්හයි වදාළසේක. ඉක්බිති රජතෙම නැවතත් වඩින ලෙස ආරාධනා කළහ. තාපසයන් වහන්සේ තවුස් පිරිකර ගෙන උයනින් නික්ම සහිමවි පියසටදම වැඩි සේක.

නැවතත් අමාත්‍යයෝ පස්දෙන පෙරසේම අත්ලස් ගනිමින් රට නසන්නාහු මෙසේ සිතුවාහුය. ඉදින් තාපසතෙම නැවත මෙහි පැමිණියේ නම් අප දිවිනැත. එහෙයින් ඔහුගේ ගමන වැලැක්වීමට කුමක් කරමුදැයි මන්ත්‍රණය කරන්නාහු අගමෙහෙසිය තාපසයන්ට හිතවත් බව දැන ඈ රහසින් මරමු යයි කතිකා කොට දිනක් මිහිපල්කරා එළඹ දේවයන් වහන්ස, මේ දවස්හි නුවරුන් අතර එක් කථාවක් පවතී. කවර කථාවෙක්ද? මහාබෝධි තාපසයන් හා අගමෙහෙසියද ඔබව මරා රාජ්‍යගැනීමට හසුන් පත් මාරුකරනාහුයයි දැන්වූවාය. එවිට රජතෙම මේ සැබවයි අදහා දැන් කුමක් කටයුතුදැයි විචාරා දේවිය මරන්නට උවමැනවයි කී කල්හි අපරික්ෂාකාරීව එසේනම් මරාපියවයි කීයේය. අමාත්‍යයෝද එසේ කළහ. නිර්දෝෂ වූ බිසව මැරූ බව නුවර පතල විය. ඉක්බිති රජවරුන්ගේ පුතුන්සතර දෙනා නිකරුනේ අපගේමෑණියන් මරවන ලද්දේ යයි පිය රජ්ජුරුවන්ට විරුඬ වූවාහුය.

තාපසයන් වහන්සේද මිනිසුන් අතින් මේ දැන පියාගෙන් පළිගැන්ම සඳහා සූදානම්ව සිටින පුතුන්ව සමථයකට පත්කොට රජ්ජුරුවන්ට ජීවිත දානය දෙමි කුමාරවරුන්ද පාපයෙන් මුදවමියි සිතා එන්නේ මිනිසුන් මරාදුන් වඳුරු මස් වළදා ඒ වඳුරු සමද පොරවාගෙන ක්‍රමයෙන් අවුත් කුමාරවරු කරා එළඹ ඔවුන්ට අවවාදකොට ඇතුල් පුර උයනට පිවිස වානර සම එලා සල්වට මත්තෙහි වැඩ උන් සේක. උයන්පල්ලා ගොස් රජ්ජුරුවන්ට දැන්වීය. රජ්ජුරුවෝ පැමිණ තාපසයන්ට වැඳ හිඳ පිළිසඳර කථාකොට වඳුරු සම්කඩ පිරිමැද මැදම උන්සේක.

ඉක්බිති රජ්ජුරුවෝ ස්වාමිනි, ඔබ වහන්සේ වඳුරු සමම පිරිමදිමින් සිටිනසේක. කිමෙක්ද? මේ වඳුරුසම ඔබ වහන්සේට බොහෝ උපකාර කරනලද්දැයි විචාළහ එසේය, මහරජ, මේ වඳුරා මට බොහෝ උපකාරය මොහු පිට නැගී ඇවිද්දෙමි. මොහු මට පැන් කල ගෙන වුත් දීලිය. වසනතැන් හැමැද්දේය. වත් පිළිවෙත් කෙළේය. මම දුර්වල බැවින් ඔහුගේ මස් කා සම වියලාගෙන අතුට හිඳිමියි කීසේක. මේ කිසිවක් මුසා නොවන්නේය. සමෙහි උන් බැවින් මොහු පිට ඇවිද්දෙමියි කී සේක. එය ඇකයෙහි තබා පැන් ගෙනා බැවින් පැන් ගෙනෙනලදැයි ද එයින් බිම් පිස දැමූ බැවින් වසන තැන් හැමැද්දේ යයි ද කීසේක. සයින් පීඩිත කල ත්‍රිකොට පරිශුඬ තාවෙන් නිදොස්ව මස් වැළඳු බැවින් සිත දුර්වල කල මස් අනුභව කෙළෙමියි වදාළ සේක. රජතෙම ඒ අසා ඇමතියන් අමතා බලව් තාපසයන්ගේ ගතිය තම්හට කීකරු වඳුරාගේ මස්කා සම්කඩ ගෙන ඇවිදින්නේය. අහෝ! මෙබඳු ගුණැති මහත්තමයෝ ලොව තවත් ඇද්ද සිනාසී නින්දා කළේය. එවිට තාපසයන් වහන්සේ තොප මට කවර හෙයින් නින්දා කරම්දැයි විචාළේය. තාපසයෙනි, මිත්‍රද්‍රෝහී වූ තොප කල ප්‍රාණඝාතය ගැන යයි කීහ. එවිට තාපසයන් වහන්සේ රජ්ජුරුවන් අමතා සූකර මස් ඌ කර ගතම තබා සිඳන්නා සේ ඔහු ගේ වාදයෙන් ඔහුටම නිග්‍රහ කොට මිත්‍ර ද්‍රෝහී වන්නේ තොපමය. තෝ වූ කලී ප්‍රයෝජනයක් බලා සෙවණ දුන් වෘක්ෂය සහ මුලින් උපුටා දමන්නෙහියයි අවවාද කොට බාල පණ්ඩිත සූත්‍රය හා ගොඩ ජාතක, සංජීව ජාතක, අකිර්ති ජාතක වදාලා ඉදින් මෙසේ රජ තෙම අධර්මිෂ්ට වූ කල්හි සියලු රට දුකින් වසන්නේය. තවද මහ රජ භවයන් එතර කරන ගොපල්ලෙක් ගඟට බැස්ස ගවයන් අතරෙන් පෙරෙටුව යන ප්‍රධාන ගවයා කෙලින් එතෙරවයේද ඔහු පස්සේ සියල්ලෝ ද එසේම යන්නාහුද එමෙන්ම මනුෂ්‍යයා අතුරෙන් යමෙක් ශ්‍රේෂ්ඨ යැයි සම්මත වේද ඔහු පාප ධර්ම වලින් තොරව සුචරිත ධර්මයෙහි හැසිරේද එකල්හි විකල් වූ සියල් සත්හුද කුසල ධර්මයෙහි හැසිරෙන්නාහුයයි වදාළ සේක.

SANHIDA LANKA

මෙසේ තාපසයන් වහන්සේ රජ්ජුරුවන්ට පහන්වන ලෙස දහම්සොඬ ක්ෂමා කරවීමට අමාරු කුමාරයන්

සතර දෙන කැඳවා අපවාද නොවන ලෙසට අවවාද කොට ක්ෂමා කරවා මහරජ, මෙතැන් පටන් අපරික්ෂාකාරිව පරිභේදකයන්ගේ වචනය ගෙන මෙබඳු සහාසික කර්මයන් නොකළ මැනවයි අවවාද දුන්සේක.

ඉක්බිතියෙන් මහරජානෝ තාපසයන් වහන්සේට දන්වනුයේ ස්වාමිනි, මම ඔබ වහන්සේට හා බිසවට අපරාධකම් කෙළේ මොවුන් නිසාමය. මොවුන්ගේ කථාව ගෙන මෙසේ වූ අකුසලය කර්මයන් කෙළෙමි. එහෙයින් මාගේ ගුණ විනාශකළ මොවුන් පස්දෙනා මරමියිකී සේක. එවිට තාපසයන් වහන්සේ මහරජ, මනුෂ්‍ය ඝාතනය ඉතා දරුණුය. එහෙයින්එසේනොකරවයි වදාළ සේක. එසේනම් ස්වාමිනි, මොවුන්ට සිත් පරිදි සැප නොවිඳින්ට අත් පා සිඳුවයි කී සේක. මහරජ, ඒද නොවැනමයි වදාළ සේක. එවිට මහ රජ්ජුරුවෝ යහපත ස්වාමිනි පිළිගෙන ඔවුන් සියල්ලම හොරු කොට හිස, කොණ්ඩා පස බැගින් බඳවා බළු කනාවැල් කර බැඳ ගොම දිය ඉසීමෙන් අවමන් කොට වද බෙර ගස්වා රටින් නෙරපූහ.

මහාබෝධි තාපසයන් වහන්සේද කීප දවසක් එහිවැස හිමවතට ගොස් භාවනා කොට බ්‍රහ්ම ලෝකයට ගිය සේක.

එසමයෙහි පඤ්චවිධ දෘෂ්ටි ශතිකයෝනම් මෙ සමයෙහි පූර්ණ කාශ්‍යපය, මඣ්ඛලී ගෝසාලය, පකුධ ච්චායනය, අජිත් කේසකම්බලය, නිගණ්ඨ නාථ පුත්‍රයයි යන මේ පස්දෙනා වන්නේය. මහාබෝධි තාපසයෝ නම් දැන් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# වෙස්සන්තර ජාතකය

ත්‍රිභුවන චක්‍ෂුවූ ජගදානන්ද ලොචන වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවර නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක් බන්ධු සමාගමයෙහි පොකුරු වැසි වැසිම අරභයා මේ ජාතකය වදාළසේක.

බුදුරජාණන් වහන්සේ ඉසිපතනෙහි දම්සක් දෙසා පිළිවෙලින් දනව් සැරිසරා කිඹුල්වත් නුවරට වැඩ මනාව සරසන ලද නිග්‍රොධ නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ උයනෙහි වැඩඋන් සේක. අභිමානයෙන් යුත් ශාක්‍ය රජ්ජුරුවෝ සිතන්නාහු සිද්ධාර්ථ කුමාරයෝ ඉතා බාලයහ. අපගේ කණිටු සොහොවුරුය. අපගේ බෑණාහ. අපගේ පුත්‍රයහ. අපගේ මුණුබුරුහ. යනාදීන් සිතා කුඩා කුමාරවරු ළඟට කැඳවා තෙපි පෙරට ගොස් සිද්ධාර්ථ කුමාරයන් වඳිව්, අපි තොප හැමට පසුවලා නොහඟවා වදුම්හයි යවූහ. එබස් අසා බුදුන්ට බාලවූ රජකුමරුවෝ පෙරටුව සිට බුදුන් වැඳ මහළු නෑයන්ට අවකාශ නොදීම සිටගත්හ.

මෙසේ මහළු නෑයෝ නොවැඳ සිටිකල්හි ඔවුන්ගේ අදහස් දැන මොවුන්ගේ අභිමානය බිඳ දැන්ම මොවුන්ගෙන් වැඳුම් ලබමියි සිතා වදාරා අභිඥාපාදක චතුර්ථධ්‍යානයට සමවැද අහස කුසට පැනනැග ඒ නෑයන්ගේ හිස මුදුන්හි පස්වගුරුවන්නාසේ ගණ්ඩඹ්බනම් අඹරුක් මුල්හිදී යමාමහ පෙළහර පෑවාසේ පෙළහර පා වදාලසේක. ඒ ආශ්චර්‍ය්‍ය දුටු සුද්ධෝදන රජු පුතණුවන්ගේ ශ්‍රීපාද මූලයට ගොස් ස්වාමීනී ඔබ බුදු වීමට පෙර මා දෙවරක් වැන්දෙමි. දැන්ද ඔබගේ මේ ආශ්චර්යය දැක ශ්‍රීපාදය වඳිමි. මේ මාගේ තුන්වන වැඳීමයයි කියා වැන්දාහ. එකල්හි සියළු රජදරුවෝද බිමවැටී වැන්දාහ.

මෙසේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සියළු නෑයින් වන්දවා අහසින් බැස පනවන ලද බුද්ධාසනයෙහි වැඩහුන් සේක. එකල සියළු බන්ධුහුම බිඳුනාවූ මත් ඇතිව එකග සිතින් යුතුව බුදුන් සමීපයෙහි හුන්නාහුය. ඉක්බිති අකාල මේඝයක් නැගී පොකුරු වැස්සක් වටුයේය. ඒ වැස්සෙහි තඹවන් දිය රැව්දෙමින් පොළොවෙහි දිවෙයි. ඉන් තෙමනු කැමැත්තෝ තෙමෙති. අකමැත්තන් සිරුරෙහි දිය බින්දුවකුදු නොවැටෙයි. ඒ ආශ්චර්යය දැක විසිදහසක් භික්ෂූහු බුදුන්ගේ බන්ධු සමාගමෙහි මෙබදු පොකුරු වැස්සක් වටුයේ ඉතා ආශ්චර්යයයි කථාවක් ඉපදවූවාහුය. බුදුරජාණන් වහන්සේ ඒ කතාව අසා වදාරා මහණෙන, පොකුරු වැසි වටුයේ දැන්මතු නොවෙයි. පෙරත් මාගේ බන්ධු සමාගමයෙහි එසේවූයේ වේදැයි වදාරා ඉකුත්වත වදාළසේක.

යටගිය දවස දඹදිව සිවිරට ජයතුරා නම්විය. සියළු සම්පත්තියෙන් සමුර්ධවූ එනුවර සිවිනම් මහරජෙක් රාජ්‍යය කරන්නේය. ඒ රජහට සඤ්ජය නම් පුත්‍රයෙක් උපන්නේය. ඒ පුත්‍රයා වැඩිවිය පැමිණි කල්හි මධුරජ දූ වූ ඵුසතී නම් රාජ කන්‍යාව ගෙන්වා අග මෙහෙසුන් කොට රාජ්‍යය පාවාදුන්නේය. ඒ ඵුසති දේවී තොමෝ පෙරකරන ලද මහා පින් ඇත්තීය.
මෙයට ඒකානුවන කප ලොව පහලවූ විපස්සී නම් පසේ බුදුන්ට සඳුන් සුවඳ පූජාවක් කොට මතු බුදුකෙනෙකුන්ට මව් වන්නෙමියි කරන ලද ප්‍රාර්ථනාව ඇත්තී එයින් චුතව දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා හැසිරෙමින් අවුත් පසු කලෙක සක්දෙව් රජහට අග්‍රමහෙෂිකාව උපන්නී ඉන් චුතව අවුත් මධුරට ක්‍ෂත්‍රිය කුලයෙක ඉතා රූපත්ව ඉපිද සඤ්ජය කුමරුහට අගමෙහෙසුන් වූවාය.

මෙසේ ඒ දෙදෙනා සුවසේ වසන සමයෙහි පිරූ පාරමිතා ඇති ලොවට ඇසක් වැනිවූ මතුබුදු වන මහතාණෝ දෙව්ලොවින් සැව අවුත් ඈ කුස පිළිසිඳගත් කෙනෙහිම සැට දහසක් පමණ කුමාරයෝ ඒ ඒ අමාත්‍යයන්ගේ ගෙවල ස්ත්‍රීන් කුස පිළිසිඳ ගත්හ. ඔවුන් පිළිසිඳගත් කෙනෙහිම දේවියට "දවස සලක්‍ෂයක් ධන වියදම්කොට සදන්හල කරවා දිළිඳු යාචකාදීන්ට දන්දෙනසේ දොළ උපන". බෝසතාණන් මව්කුස පිළිසිඳ ගත් දවස පටන් දඹදිව නොයෙක් රජදරුවන් එවන රන් රුවන් ආදීවූ නොයෙක් පඬුරෙන් අතුරු නැතිවිය. සඳමහ රජාණෝ බිසවගේ දොළ අසා නුවර සඳන්හල් කරවා දේවීන් දොළ නිවා යාචකයන් සිත් නිවා දන් දෙන කල්හි ක්‍රමයෙන් දසමන් පිරුනේය. එසඳ නුවර පැදකුණු කරන්නට දේවීන්ට සිතක් උපන. සඳමහ රජාණෝ එපවත් අසා අමාත්‍යයන් කැඳවා නුවර දෙව්පුරයක් සේ සරසවා මනහර රථයක් ගෙන්වා බිසවුන් එහි වඩා හිඳුවා මහත්වූ පෙළහරින් රාජවීථියට බැස ගමන් ගත්හ. බිසවුන් නුවර පැදකුණු කරවමින් ව්‍යාපාර වීථියට වන් සඳ බිසවුන්ට විලි පහරනට පටන්ගත. එපවත් ඇසූ සඳමහ රජාණෝ එකෙනෙහි විසිතුරු මණ්ඩපයක් කරවා වටතිර බඳවා රැකවල් ලැවූ කල්හි ලොවට ඇසක් වැනිවූ යාචකයන්ට ධන රාශියක් බඳුවූ පිරූ පාරමිතා ඇති අප මහබෝසතාණෝ මව්කුසින් බිහිවත්ම අත දිගුකරමින් මෑණියන් වහන්ස, දන්දෙන්ට සුදුස්සක් ඇද්දැයි කීහ. එබස් ඇසූ මෑණියෝ දහසින් බැඳි පියල්ලක් මහාබෝසතාණන් දික්කල අත තබාලූහ. එදිනම ඔවුන් පූර්වයෙහි කළාවූ කුසල බලයෙන් රිදී පර්වතයක්සේ අතිධවලවූ පණ්ඩරනම්

SANHIDA LANKA

මඟුලැත් පොවුවකු දෙවියෝ තමන්ගේ ආනුභාවයෙන් ඇත්හල ලාගියහ. පිය මහරජාණෝ පුතනුවන්ට නම් තබන්නාහු බමුණන් ගෙන්වා ව්‍යාපාර වීථියෙහි උපන් හෙයින් වෙස්සන්තර කුමාරයෝයයි නම් තැබූහ. ඉක්බිති රජ්ජුරුවෝ එකදා උපන් කුමරුවරු සැට දහසක් දෙන ගෙන්වා පුතණුවන්ට පිරිවර කොට පාවා දුන්හ. සූසැටක් කිරිමව්වරු තෝරා ගෙන උන්ට සම්පත් දුන්හ. මහබෝසතාණෝ එක් හැවිරිදි කල්හි තමන් පළඳවාලූ ලක්‍ෂයක් වටිනා ආභරණ කිරිමව්වරුන්ට දන් දුන්හ. පියමහ රජාණෝ තමන් පැළඳවූ පළඳනා දන්දුන් බව අසා සතුටුව මාහැඟි පළඳනා යවා පළඳවති. මහබෝසතාණෝ තමන් පැළඳවූ පළඳනා දන් ගන්නා සිඟන්නන් නැත්තෙන් තව වාරයක් කිරිමව්වරුන්ටම දන් දුන්නාහ.

මෙසේ ළඳ බොළඳව සිට දන්දීම කෙළිකොට සිතා දන් දෙන්නාහු අටහැවිරිදි කල වෙසතුරු කුමාරයෝ ශ්‍රීයහන් මස්තකයෙහි පලක් බැඳගෙන හිඳ සිතන සේක් මම දාන ක්‍රියාවෙහි සුව නොවිඳ බොහෝ කලක් ඉක්ම ගියේය. ඒ දැන් අට අවුරුද්දෙක ඉඳින් යාචකයෝ පැමිණ මගේ ඉස්මස් ලේ ඉල්ලුනම් දෙමියි මෙසේ සිතත් සිතත්ම දෙලක්‍ෂසතළිස් දහසක් යොදුන් ඝණකඩ බොල් මහපොළව අනෙක ගර්ජනා කරමින් සතුටුව නටන්නට වන. එක්ලක්‍ෂ අටසැට දහසකයොදුන් උස ඇති මහමේරු පර්වතයද ඒ මහතාණන්ගේ දානචේතනා බලයෙන් නටන්නට වන. සප්තකූඨ පර්වතයෝ ගැසෙන්නටවන. මෙසේ මහපොළව ගුගුරුවා දන් දෙන්නාවූ මහතාණෝ ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි වයසට පැමිණ සූසැට ශිල්පයෙහි හා අෂ්ටාදස විද්‍යාවෙහි නිපුණවූහ.

එසමයෙහි පියමහ රජාණෝ මාගේ පුතණුවන්ගේ රාජශ්‍රිය මා ඇස් හමුවෙහි දකිමියි සිතා චෙතිය රට රජ්ජුරුවන්ගේ දූවූ මද්‍රිදේවීන් ගෙන්වා මඟුල් පෙළහරින් මහ බෝසතාණන්ට පාවාදී රාජ්‍යශ්‍රීයට පත්කළහ. මෙසේ අනේකප්‍රකාරයෙන් දන් දෙමින් ප්‍රීතියෙන් වසන මහ බෝසතාණන්ට ටික කලකින් පුතණු කෙනෙකුන් හා දියණි කෙනෙකුන් ලදින් පුතණුවන්ට ජාලීය කුමාරයෝද දියණියන්ට කෘෂ්ණ ජිනාවෝ යයිද නම්තබා සුවයෙන් වසන කල්හි කලිඟුරට වැසි නැතිව දුර්භික්‍ෂයක් ඇතිවිය. එරට මනුෂ්‍යයෝ ජීවත් වන්නට නොහැක්කාවූ සොරකම් කරන්නට පටන්ගත්තාහුය. එයින් පීඩිතවූ දනව් වැස්සෝ රාජාංගනයෙහි රැස්ව මහත් වූ ශබ්ද පැවැත්වූවාහුය.

ඉක්බිති රජ්ජුරුවෝ ඔවුන් අමතා දරුවෙනි, මම පෙහෙවස් වැස සීල සම්පන්නවද වැසි වස්වන්නට නොහැකිවිය. දැන් කුමක් කරමෝදැයි ඇසූහ. ඇමැත්තෝ කියන්නාහු ඉල්ලූ දෙයක් නැතැයි නොකියා දන්දෙන්නෝ වෙස්සන්තර රජ්ජුරුවෝය. උන්ට දෙවියන් විසින් දෙනලද සෙවතමය පණ්ඩර නම් වැසි වස්වා පියන තරම් මහානුභාව ඇති හැළි ඇතෙක් ඇත. ඒ ඇතු ගෙනාවොත් අපගේ රට වැසි වැස දුර්භික්‍ෂ භය සන්සිඳෙති. එසඳ රජ්ජුරුවෝ බමුණන් අට දෙනෙකු ගෙන්වා ඇතු ඉල්ලාගෙන එවයි සිව්රටට පිටත් කර යැවූහ.

වෙසතුරු මහරජාණෝ එදවස් පෝය දන්දෙන්ට සතර දන්හල් විචාරන්ට යන්නාහු ශක්‍රදෙවේන්ද්‍ර ලීලාවෙන් සැරසී සත්රුවණින් හෙබවූ ආභරණ වලින් සැරසූ ඇතුපිට නැඟී සිවුරඟ සෙනඟ පිරිවරා ශක්‍ර දේවේන්ද්‍ර ලීලාවෙන් නැගෙනහිර දිශාවෙහි දන්හලට යන රජ්ජුරුවන්ව දුටු බමුණෝ අටදෙන අත්නගා සිට "ජයතු භවං වෙස්සන්තර මහාරාජ" යි ආශිර්වාද කොට සිටියහ. රජ්ජුරුවෝ මේ බමුණෝ මද දෙයක් නොඉල්වතියි ඇතු ආසන්න කොට බමුණනි, තොප කැමැත්තක් ගනුවයි කීහ. එවිට බමුණෝ කියන්නාහු රජ්ජුරුවෙනි, තොප නැඟී තෙලෙ ඇතු අපට දන් දෙවයි කීහ. බමුණෙනි, මාගේ ශරීරයෙන් භාගයක් නොඉල්වා ඇස්දෙක දෙවයි නොකියා ඇතුම ඉල්වතියි මඳක් දොම්නස්ව යහපත බමුණෙනි, තොප කැමති ඇතු තොපටම දන් දෙම්හයි සොම්නසින් පින පිනා නැවතත් ඇතු සරසවන්නේ සූවිසි ලක්‍ෂයක් වටිනා ආභරණ අඳවන්නට විධානය කෙළේය. පිට මැණිකය. මුදුනෙහි මැණිකය. මුතුහරයෙහි මැණිකය. අකුස්සෙහි මැණිකය. කණ්ඨය වෙළන මුතුහරෙහි මැණිකය. ඇත් කුඹෙහි මැණිකය. යන මේ මැණික් සයෙහි අගයක් නැත්තේය. මහානඝය. මෙසේ ඇතු සරසවා ඇත් වෙදුන් ප්‍රධාන පන්සියයක් කුලවාසීන්ද ඇතුව රුවන් කෙණ්ඩියෙන් අත පැන් වත්කොට ඒකාන්තයෙන් ලොව්තුරා බුදුවෙම්වායි කියා ඇතු දන්දුන්හ. ඒ මහතාණන් ඇතු දන්දෙත්ම මහමෙර නැමී නමස්කාර කෙළේය. මහපොළව සතුටුව ගුගුලේය.

SANHIDA LANKA

ඉක්බිති ඒ බමුණෝ දකුණු දොරදී ඇතු ලදින් ඇතුපිට නැඟී රාජ වීථියට බටහ. ඒ දුටු නුවර වාසීහු එම්බා බ්‍රාහ්මණයෙනි, අපගේ ඇතු නැඟී තෙපි කොයි ගෙනයව්දැයි කීවාහුය. බමුණෝ කියන්නාහු වෙස්සන්තර රජු විසින් අපට ඇතු දෙන ලද්දේය. තෙපි කවරහුද? කෙසේ වලකව්දැයි උසුළු විසුළු කොට බැණ නැඟී ගියහ.

එකල රජ බමුණු වෙළඳ ගොවි ආදීන් හා සෙනෙවිරත් ඈපා මාපා ආදී පඤ්ච ප්‍රධාන මාණ්ඩලික ජනයෝද මුළු මුළුව ගෙන දත්කමින් සියලු නුවර ඇලලී ගොස් කිපී සඳමහ රජාණන් කරා ගොස් හඬා වැලපී ස්වාමීනී දෙවියන් විසින් මිනිස් ලොවට දුන්නාවූ හස්ති ශ්‍රීයෙන් දිලිසෙන අපගේ ඇත්රුවන නුඹගේ පුතණුවෝ කලිඟුරටින් ආ බමුණන්ට දන් දෙමින් අප නැසූ සේක. අනේ ස්වාමීනි, ශ්‍රද්ධාව ඇතිනම් ඇතුනොදී රන්රුවන් දී පිය නොහැකිද? මේසා දුර්ලභවූ මුළු ලොවට වැඩ සදාලන ඇතු දන් දුන්නේ කුමටදැයි කියකියා හඬන්නට පටන් ගත්තාහුය.

එකල සඳමහ රජාණෝ නුවර වාසීන්ගේ රැහැනි බලවත. කළමනා කිම්දෝහෝයි සිතා බාලයන් විසින් නොකළමනාදෑ කළ කල උන්ට තොප කැමති දඬුවමක් කරන්න මෝවේදැයි කීහ. එවිට නගරවාසීහු කියන්නා වෙස්සන්තර රජ්ජුරුවන් දඟගෙයි ලතත් නොපිළිවන. දිවිගනුත් නොපිළිවන. අපගේ රට හිඳ අප නැසූ තැනැත්තන් රටින් දුරුකොට වංකගිරිනම් පර්වතයට යවන්නා කැමැත්තම්හ. අදම යැව්ව මැනවයි කීහ. එසඳ සඳමහ රජාණෝ දැන් මුන්ගේ කීමට එකඟව පසුව සුදුස්සක් කරම්හයි සිතා මහජනයාට කියන්නාහු අඹුදරුවන්ට සමුදී සෙට යන පරිද්දෙන් අවකාශ දෙවයි කීහ. එ ඇසූ නගර වාසීහු ස්වාමීනි, ඔබ වහන්සේට හැඟුනක් කළමැනවයි වැඳ සමුගෙන ගියහ. එසඳ මහ රජාණෝ මහත් ශෝකීව නුවර වාසීන් කිපුණු බව කත්තා නම් ඇමති අත පුතණුවන්ට කියා යැවූහ. ඒ ඇමති ගොස් ඇතු දන්දුන් සොම්නසින් පින පිනා සිටින වෙසතුරු රජ්ජුරුවන් වැඳ පියරජ්ජුරුවන් දන්වා එවූ හසුන කියන්නට භයව ශ්‍රීපාදය වැඳ හඬ හඬා සිටියේය. බෝධිසත්වයෝ ඔහු අත අල්වා නගා සිටුවා තෝනොබා කියවයි වදාළහ. ඇමති තෙමේ කියන්නේ ස්වාමීනි, ඔබ වහන්සේ ඇළි ඇතු දුන් වරදට මේ නුවරින් පහකොට සෙට වංකගිරි පර්වතයට යවන්නට සම්මත කළහයි කීහ.

එබස් අසා වෙස්සන්තර රජ්ජුරුවෝ සිතහ පහළකොට වදාරන්නාහු මා අතින් ඇස් ඉස් මස් ලේ ඉල්වූ නම් ඒ සියල්ල දෙමි. බාහිරවූ ඇතු දන්දුන්හයි වරද කොට සිව්රට වාසීහු රැහැනිවූ නම් මැනව. මා දෙන දන් නොනවත්වමි. සසර වසන්නවුන්ට දානඵල සුවම්ස අනික් සුවයෙක් නම්නැත. පින් නොකටයුතුයයි නගර වාසීහු කියත්නම් වන වාසයට යන බව ඉතා සිත්කළුය. මා කිසිවකු සමඟද කලකිරීමෙක් නොවෙමියි වදාරා කත්තා නම් ඇමතිය අසව, එකක් කියමි. පියාණන්ට දන්වා නුවර වාසීන් කැමතිනම් සෙට සප්ත සතක මහ දනක්දී පියා වනයට යනු කැමැත්තෙමි. එපවත් පියාණන්ට කියවයි නියමකොට යවා ලඟ සිටි සෙනෙවි රඳුන් කැඳවා කියන්නාහු ඇත්, අස්, ස්ත්‍රී, දැසිදස් ආදී සියල්ලෙන් සත් සියය බැගින්ද නානා ප්‍රකාරවූ ආහාර පානාදියද යන සියල්ල පිළියෙල කරවයි අමාත්‍යයන්ට විධාන කොට හුනස්නෙන් නැගී මද්‍රිදේවින් උන් බිසෝ ගෙට ගොස් බිසව අමතා බිසවුනි! මා විසින් දුන්නාවූද දෙමව්පියන්ගෙන් ගෙනාවාවූද රන් රිදී මුතු මැණික් ආදී සියලු ධනය නිධාන් කොට තබවයි කීහ. බිසව කියන්නී ස්වාමීනි, ඔබ වහන්සේ පෙර දන් දෙන්නට කියන බව මුත් තියන්නට නොකියන සේක. දැන් කුමක් සඳහා මෙසේ කී සේක්දැයි පිළිවිස්සාහ. සොඳුර නගා තිබීම නම් දන් දීමය. දන්දෙන්නාහු විළිකුන් එලය වැළඳගත් දිමියන් වැන්නාහ. තුමූද නොකති. අනුන්ටද නොදෙති. එසේ වූවාහු පරලොවට වස්තු නගා නොතබන්නාහු වෙති. එසේ හෙයින් නිධන් කොට තබවයි කීයේ නම් දන් දෙනු සඳහාමය. එවිට බිසව ස්වාමීනි, ඔබ වහන්සේ නිතර දන් දීමෙහි සිත් ඇතිබව නොදන්නා සේක්ද? දැන් අමුතුව මෙවැනි බසක් කියන්නට කාරණා කිම්දැයි කීහ.

එකල්හි වෙසතුරු රජ්ජුරුවෝ, සොඳුර, අප ඇතු දන් දුන්හයි නගර වැස්සෝ කිපී අපට මෙහි ඉන්ට නොදී වංකගිරි පර්වතයට යන්ට සම්මත කළහ. එසේ හෙයින් අප වනයට යම්හ. මම නැතැයි සෝකයෙන් නොතැවී දරු දෙදෙනා කෙරෙහි දයා ඇතිව වසව. අපගිය කල තොප රක්ෂා කරන ස්වාමී කෙනෙකුන් ඇත. උන්ට කීකරුව අත්පා මෙහෙකරව'යි කීහ. රජ්ජුරුවන් වහන්සේ මෙසේ කියත්ම රූපශ්‍රීන් සියළු ස්ත්‍රීන් කෙරෙහි අග්‍රවූ මද්‍රි බිසව ලෙන් නැගි සෝකයෙන් යුතුව රන් ලියක් සේ වැලපෙමින් ලය අල්වාගෙන ස්වාමීනි, මේ කුමන බසෙක්ද? නුඹ වහන්සේගෙන් වියෝව ජීවත්වීමට වඩා අප දෙදෙන එක්ව මියයාම උතුම්. ඔබ වහන්සේගෙන් වෙන්ව කුමක් සඳහා මෙහි වසමෝ ද? මාගේ දරුවන් වඩාගෙන නුඹට පළමුකොට මා වලට යන නියාව නොදන්නේද ස්වාමීනි, උතුම් දාන ක්‍රියාවට විරුද්ධ වූ නගර වාසීන්ගේ සිත් ගන්ට නොපිළිවන. ඔබ වහන්සේ වනයෙහි වැඩහිඳීම මැනවයි බිසවුන් හිමවත වසන කෙනෙකු මෙන් හිමාලය වර්ණනා කරන්නාහු එහි මල්පිපී වැගිරී ගියකල රමනීය මල් යහන් මැද මුළු බැඳ සිටිනා මුව පොව්වන් දක්නා අපට රාජ්‍යශ්‍රී සිහි නොවෙයි. ඒ ඒ තන්හි සෙබඩන් මැද බැස නැටුම්ගත් මත් මොනරුන් අතින් රාජ්‍යය සඳහන් නොවෙයි. පිපී සිටි සල් සපු නා පනා සසල අගරු ආදී නා නා පුෂ්පිත පුෂ්පයන්ගෙන් හෙබි වෘක්ෂ ලතාදියෙන් යුත් වන ලැගුම් සහ රිදී රේඛාවන් බඳු ඇද හැලෙන දියදහරා දකින අපට කවරනම් දුකක් සිහිවේද ස්වාමීනි, ඔබ වහන්සේ පන්සල් හි වඩා හිඳුවා වනමුල් එලා එල කඩාගෙන ඊම මට භාරය යනාදීන් කීහ.

SANHIDA LANKA

එකල්හි ඵුසති දේවිය පුත්‍රයාගේ මේ කටුකවූ අස්න අසා පුතණුවන් කෙරෙහි හටගත් සෝකයෙන් හඬමින් කියන්නාහු ගලින් පැන මියෙම්මය. දිව ඇද කා මියෙම්මය. වසකා මියෙම්මය. ගිනි වැද මියෙම්මය. මද වරදකුත් නැති මාගේ පුතණුවන් දන් දුන් දෝෂයට වනයට යවත්නම් මහරජ, තොපගේ මේ නුවර විනාශ වී යන්නේය. තොපි මපුතණුවන් නොසැලකූ නම් මා දිවි නොතිබෙයි. කියා හඬන බිසවුන් දැක සඳමහ රජාණෝ ශෝකයට පත්ව නගර වාසීන්ගේ ක්‍රොධ බලවත් හෙයින් තෙපි ශෝක නොකරව. මපුතණුවන් වනාන්තරයට යවමි. නොබෝ දවසකින් වනයට යැවූ මපුතණුවන් නගර වාසීන් ලවාම ගෙන්වා ගනිමියි කියා ශෝක සංසිඳවූහ.

වෙස්සන්තර මහබෝසතානෝ ඉතා සොම්නසින් එදා රාත්‍රිය ගෙවා දෙවන දවස් සියළු යාචකයන් රජගෙයි මිදුලේ රැස්කරවා මනා කොට සරසන ලද සත් සියයක් ඇතුන්ද සත් සියයක් අසුන්ද මේ ආදී වශයෙන් සියලු දෙයින්ම සත්සියය බැගින් තබ්බවා දොරවල් හරවා තොපකැමති තරමක් වස්තු ගනුවයි නියෝග කළහ. යාචකයෝද පියුම් වනයකට වදනා බඹර කැලක් සේ රන් රිදී මුතු මැණික් ආදී වස්තුව කැමති කැමති සේ උකාගෙන යන්ට ගියහ. සමහරු පටකඩ සළු පිළි සම් වඩම් ගෙන යන්නෝ සිය දහස් ගණන් පාදාංගලි කන්අගා මිණි ඔටුණු ආදී සියළු දේද යාචකයන්ට දුන්හ.

මෙසේ මහබෝසතාණන් වහන්සේ සප්ත සතක මහ දන් දුන් කෙනෙහිම මහ පොළව කම්පාවිය. මේරු පර්වතය නටන්නටවන. සප්තකුල පර්වතයෝද භුයාපිවේය. ගබඩක්සේ නැමී වැඳුම් ගත්හ. මද්‍රි දේවියද තමාගේ පළඳනා ධන ධාන්‍ය සියලු යාචකයන්ට දන්දුන්හ. එදවස දන් දුන් හෙයින් යා නොහී දෙවන දවස් වෙස්සන්තර රජ්ජුරුවෝ අඹු දරුවන් කැඳවා ගෙන මව්පියන් සමීපයට ගොස් වැඳ සිටියාහ. එවිට මෑණියෝ මද්‍රි දේවින්ට කියන්නාහු යෙහෙළණියෙනි, දන් දුන් දෝෂයට මපුතුන් වනයට යාදෙව, තෙපි නොයව වනයෙහි දුක් බොහෝය. එහිදී දරුවන් රක්ෂා කිරීම ඉතාම දුෂ්කරයයි කීහ. මද්‍රිදේවී කියන්නේ මාගේ ස්වාමීන් හා වසන කල මෙහි සිටීමට වඩා ඉතා පහසුයයි කීවාය.

එසඳ බෝසතාණෝ මද්‍රිදේවී මුහුණ බලා සොඳුර, වල වසන කල මහත් භය ඇත. දාර පිඹුරන් තම දරණින් යොදුන් වල්වට කොට ගෙන තමන් මුවට හසුවූ සිංහ ව්‍යාඝ්‍රයන් ඇතුන් දක්වා අල්වාගෙන ගැල පියති. තවද සොඳුර නාද කරන සිංහයන්ගේ හඬින් කන් පැලී යන්නා වැන්න. ව්‍යාඝ්‍රයන්ගේ ගර්ජනාවෙන් ලය පැලී යන්නා වැන්න. ඒ වනයෙහි යක්ෂ, රාක්ෂ, භූත ප්‍රේතයන්ගේ භය ඇත. සියළු ශරීරයෙහි ඇට දක්වා බිඳ ලේ බොන මදුරුවෝ ඉතා බොහෝය. බොහෝ කොට කීමෙන් කිම්ද එහි ස්ත්‍රී වාසයට බැරිමයයි කීවාහ. එබසට මද්‍රී දේවිය කියන්නී ස්වාමීනි වඳාළ හැම දුකක්ම ඉවසමි. ඔබ වහන්සේ නොදැක නොයිදිමියි කීහ. දරු දෙදෙනා මා නොදැක නොඉඳිති කීවාය. සොළොස් දහසක් පුරඟනෝද නගර වාසිහුද හඬා වැතිර ගියහ. එකල්හි ඇමැත්තෝ මනහර රථයක් සාදා ගෙනවුත් ගමනට කල්බව දැන්වූහ. එසඳ මද්‍රිදේවිය සමනන්ට පළමු කොට දියණියන් වඩාගෙන පුතණුවන් ඇඟිල්ල අල්ලාගෙන පලා ගොස් රථයට පැනනැංගාය. ඉක්බිති බෝධිසත්වයෝ දෙමව්පියන් වැඳ සමුගෙන පුර ස්ත්‍රීන්ට සමුදී ජන සමූහයාට අවවාදදී තමන් දුන් දන්හි පින් අනුමෝදන් කරවමින් මහ ජනයා හඬ හඬා සිටියදී රථය පැදගෙන රාජ වීථියට නික්මුණාහු ආ ආ වුන්ට පින්දී අප්‍රමාදව මෛත්‍රී පෙරටුව පින්කරන ලෙස ප්‍රිය තෙපුලෙන් අවවාද කොට නුවරින් පිටත්ව උතුරු දික් බලා වඩන්ට පටන්ගත්හ. මෙසේ වඩනා බුද්ධාංකුර වූ මහතාණන් නුවර පෙරලා බලමියි සිතා මොහොතින් රථයක් ප්‍රමාණ නැත. පොළොව බිඳී පෙරළා රථය නුවර දිසාවට නමාලීය. එවිට බෝධිසත්වයෝ තමන් දෙමව්පියන්ගේ ප්‍රාසාදාදි පුර සම්පත් බලා සතුටුව නැවත වඩනා කල්හි බෝධිසත්වයන්ගේ මෑණියෝ සිතන්නාහු මපුතණුවෝ වොටුණු මාලාදි රාජාභරණ හා ධන ධාන්‍යාදිය අටළොස් වරෙක දන් දුන්හ. දැන් වනයට යන්නාහ. ඒ යන ගමනේ දන් දෙත්වායි සිතා වස්ත්‍රාභරණයෙන් හා සත් රුවණින් දහසක් ගැල් පුරවා යැවූහ. මෑණියන් එවූ වස්තුව බලා සතුටුව රථය සිඟන්නන් කරා පදවා වස්තුව ඔවුන්ට දී වනාන්තරයට නික්මුණාහ. එකල්හි බමුණෝ සතර දෙනෙක් පැමිණ වෙස්සන්තර රජ්ජුරුවෝ කොයිදැයි විමසා වංකගිරියට වැඩිය බව අසා රැහැනිව අතසලා "යනකල ගෙනගිය දෙයක් ඇද්දැයි" විචාරා වහා දිව ගොස් මග වඩිනා බෝධිසත්වයන් දැක රජ්ජුරුවෙනි යි හඬතගා කෑ ගසා රථය නැවැත්වූ කල්හි එහි ලඟාවී රජතුමනි, දන් පිණිස යමක් ලබාගන්ට පැමිණියෙමි. තෙල රථය අදිනා අශ්වයන් අපට දුනමැනවයි ඉල්වූහ. බෝධිසත්වයෝ ඉතා සතුටුව රථයෙන් බැස සෛන්ධවයන් සතර දෙන බමුණන්ට දන්දුන් කල්හි හිස්වූ රථය අහසෙහි සිටියේය. ශක්‍ර දේවේන්ද්‍ර තෙම ඒ දැක දිව්‍ය පුත්‍රයන් සතර දෙනෙකු කැඳවා කියන්නේ වෙස්සන්තර රජ්ජුරුවෝ තපසට යන්නෝ රථාශ්වයන් බමුණන්ට දන්දී පයින් වඩිති. තොප ගොස් රථය අඳුවයි නියෝග කළේය. දිව්‍යපුත්‍රයෝ සතරදෙන රොහිත මෘග වෙස් මවා ගෙන රථයෙහි යෙදී රථය අදනා කල්හි අනික්

SANHIDA LANKA

බමුණෙක් පෙරසේම අවුත් රජ්ජුරුවෙනි, සිටුවයි හඬගා වහා එහි ලඟාවී "මම ඉතා වෘද්ධයෙමි, රෝගියෙමි, ගමන් විඩායෙන් මිරිකෙමි. තෙල රථය දෙවයි" කියා රජහට ආශීර්වාද කළේය. බෝධිසත්වයෝ සතුටුව අඹුදරුවන් රථයෙන් බස්සා බමුණාට රථය දුන්හ. බිසවුන් පයින් යා නොහෙති. දරුවෝද යා නොහෙති. නොසිතා එදා ඒ මහතාණෝ රථය දන් දෙත්ම එහි යෙදී සිටි දෙවියෝ අන්තර්ධාන වූහ.

ඉක්බිති දේවිය කෘෂ්ණජිනාවන්ද වෙස්සන්තර රජ්ජුරුවෝ ජාලිය කුමාරයන්වද වඩා ගෙන කටුපහරණ ගල් බොරළු මඩිමින් ඇල දොල මැද නාමින් ලිය මලුයෙහි සිසිල් සෙවන සැතපෙමින් දුන් දන් සිහිකරමින් සතුටුව දුටු දුටුවන් කොයි යව්දැයි විචාළකල වංකගිරියට කියමින් ඔවුන්ටද අවවාද කරමින් වඩිති. මග දෙපස සිටි අඹ දඹ ජම්බෝල නා පනා නාරං ආදී ඵලාපල දරුවෝ දැක ඇවිට්ලිව දෙඅත් ඔසවා අම්ම පියාණෙනි, කිය කියා හඬමින් යෙති. බෝධිසත්වයන්ගේ ආනුභාවයෙන් වෘක්ෂයෝ තුමූම නැමී පලාපල දරුවන් අත තබයි. බෝසතාණෝ දේවතානුභාවයෙන් තිස්යොදුන් මග ගෙවා එක දවසින් ගොස් චෙතිය නගර ශාලාවට වන්හ. මද්‍රිදේවිය ශාලාව ඇමද බෝධිසත්වයන්ට ඉඳිනා අසුන් පනවා දරුදෙදෙනා සමඟ රජ්ජුරුවන්ට සහ නුවර වාසීන්ට පෙනෙන පරිද්දෙන් සිටියාහ. එසේ ඉන්ට කාරණා කිම්ද යත්? වෙස්සන්තර රජ්ජුරුවෝ තමන්ගේ නුවරට ආ හෙයින් අපහැර ගියාදෝහෝයි සිතුවහොත් අයහපතැයි සිතා එසේකළහ. එසේ සිටියාවූ බිසවුන් දුටු මග යන එන්නෝ චෙතිය රජ්ජුරුවන්ට කියා යැවූහ. එවිට චේතිය රජ්ජුරුවන් ඇතුළු වූ සැට දහසක් රජවරු අවුත් බෝධිසත්වයන් පාපිට හඬා වැටෙමින් කිම්ද මහරජ ඔබට ලෙඩදුක් නැද්ද නුවර වාසීන්ට පීඩා නැද්ද මේ නම් කුමන විශ්මයක්ද කවර නම් විපත්තියක් දැයි විමසා අලි ඇතු දන්දීම නිසා මෙසේ රටින් පිටවීමට සිදුවූහයි සියළු තොරතුරු බෝධිසත්වයන් වහන්සේ පැවසූ පසු අපගේ රට රාජ්‍ය කළ මැනවයි තමන්ගේ රාජ්‍යයට ආරාධනා කළහ.  එකල්හි බෝධිසත්වයෝ කියන්නාහු තොපට රාජ්‍යය නොකරමි. අපි නෙරපූ රජ්ජුරුවන් නවත්වාගෙන රාජ්‍යය කරවතියි සිව්රට වාසීහු තොපකෙරෙහි වෛරව උනුනුන් යුධකොට විරොධ වෙයි. එබැවින් එසේ නොකරමි. වංකගිරියටම යමියි කීහ. එසේනම් රජගෙට වැඩිය මැනවයි ආරාධනා කළවිට බෝසතාණෝ නොයම්හයි කී හෙයින් ඒ ශාලාවම දිව්‍ය විමානයක් මෙන් සරසා සැට දහසක් රජදරුවෝ ශාලාව වටකොට රැකවල් ගත්හ. බෝධිසත්වයන් සුවඳ පැනින් නාවා සළු හඳවා රස භොජන වළඳවා සතුටු කළහ. බෝසතාණෝ දෙවන දවස් වංකගිරියට යම්හයි කීසඳ වල්ගස්වා මග එළිකරන තෙක් වැඩ හුන මැනවයි වලකා සත්දවසක් එහි රඳවා ගත්හ. මග එළිකල කල බෝධිසත්වයෝ අඹුදරුවන් සමඟ නික්මුණාහ. චේතිය රජ්ජුරුවන් සැට දහසක් රජදරුවෝ පසු ගමන් කොට පහළොස් යොදුනක් ඉදිරියෙහි තිබියදී මහවනය සමීපයේ සේනාපතියෙකු රැකවල්ලවා දකුණත ඔසවා මග කියන්නාහු ස්වාමීනී, මෙතැන සිට ඉදුරා දකුණු දික් බලා ගියකල නිල් වලාකුලක් මෙන් පෙනෙන්නේ විපුල නම් පර්වතයයි. එහි සිට බැලූකල ගන්‍දමාදන පර්වතය පෙනෙන්නේය. ඒ පර්වතය නොයෙක් වෘක්‍ෂයෙන් ප්‍රතිමණ්ඩිතය. එහි සැතපී ශරීර ක්ලාන්ත නිවාගෙන ඉන් ඔබ්බට වැඩිකල බෙතුමතී නම් මහා ගඟෙක් ඇත. එහි ඇති වැද්දාගේ සහායයෙන් ඒ ගඟින් එතරව ඔහුට රන් ඔටුන්න තද  කරන ලක්‍ෂයක් වටිනා රන් ඉද්ද දෙවා ඉන් ඔබ්බට වැඩිකල මැණිකක් කරන ලක්‍ෂයක් වටිනා රන් ඉද්ද දෙවා ඉන් ඔබ්බට වැඩිකල මැණිකක් සේ බබලන සානු නම් පර්‍වතයෙක් ඇත. ඒ අසල ඇති නුග ගසෙහිවූ මධුර පල අනුභව කොට එහි සැතපී සිට ඉන් ඔබ්බට වැඩිකල නිල්වූ මහත් ඊතණ වනයය. ඒ ගෙවා වඩනේ මුචලින්‍ද නම් විල්තෙරින් එතරව ඊසාන දෙසට පැමිණ ඒකපදික මාර්ගයෙන් ගොස් වන ලැහැබට ලඟාවූ කල පස්පියුමෙන් හා වැල්ලෙන් ගැවසීගත් හතරැස් පොකුණක් ඇත. එයින් දකුණු දිග බලා ගියකල නොයෙක් පලාඵලයෙන් ගැවසීගත් අවංකවූ වංකගිරි පර්වතය පෙනෙයි. එහි පන්සල් කොට ගෙන ධ්‍යාන සුවයෙන් දවස් යවමින් අඹු දරුවන් සමඟ වාසය කරවයි කියා නැවත සැට දහසක් රජදරුවෝ බෝධිසත්‍වයන් වැඳ සමුගෙන පෙරළා තම නුවර වලටම ගියහ.

එදවස් ශක්‍රදේවේන්‍ද්‍රතෙමේ මිනිස් ලොව බලන්නේ අප මහබෝසතාණන් වහන්සේ තපස් රකින්නට වංකගිරි පර්වතයට ගොස් පන්සල් දෙකක් සහ සක්මන් මළු දෙකක්ද තවුස් පිරිකරද සූදානම් කොට "තපස් රකින්නවුන්ට කැපයයි" බිත්තියේ අකුරු ලියා එතැන් සිට තිස්ගව්වක් වනයේ වග වලසුන් සිංහ ව්‍යාඝ්‍රයන් ආදී සිව්පාවුන්ද යක් බූ පිසසුන් හා භයානක ශබ්ද ඇති මෘග පක්‍ෂීන්ද පලවා හැර එවයි නියෝග කළේය. ඒ විස්කම් දෙව්පුත් සක්දෙව් රජහුගේ නියෝගය පරිද්දෙන් එකී සියල්ල නිර්මිත කොට තබා දෙව්ලොවටම ගියේය.

SANHIDA LANKA

බෝධිසත්වයෝ කී සලකුණු අනුව මග ගෙවා ගොස් සතරැස් පොකුණුතෙර බිසව නතරකොට විශ්මකර්මයා මැවූ පන්සල් දැක ශක්‍රයා අප ආ බව දන්නේ වනැයි සිතා එහි වැද රාජාභරණ ගලවා තබා අඳුම් දිවිසම් පොරවාගෙන ජටාමඬුලු බැඳ සැරයටිය අතින් ගෙන සක්මන් මළුයෙහි සක්මන් කරමින් සිටියාහ. මද්‍රිදේවි

බෝධිසත්වයන් නැවත එහි නොපැමිණි හෙයින් වහා පන්සල සමීපයට ගොස් තපෝ විලාසයෙන් සිටි සමණන් දැක ලය පැලියන තරම් ශෝකයෙන් හඬා බිම වැටී ස්වාමීනී ඔබ සඳමහා රාජ පුත් වෙස්සන්තර රජ්ජුරුවෝයයි කට කට ඔබගේ රූපශ්‍රීය කියනු ඇසීමි. මාගේ ඇසින්ද ඔබගේ රූපශ්‍රීය දිටිමි. දැන් ඊට විරුද්ධ වූ තවුස් වේශයක් දකිමි. පෙර රජ්ජුරුවෝ යයි ප්‍රසිද්ධව දැන් තවුස්වීයයි යන නම්විය. පෙර පැළඳි රාජාභරණ සියල්ලක් නැත මමද ඔබසේම තවුස් වෙස් ගනිමැයි දරුදෙදෙනා සමඟ අනික් පන්සලට වැද ආභරණ සළුපිළි ගලවා තබා අඳුම් දිවිසම් රිටි සුඹුළු වල්කලා ජටා මඬුළු ධරව දරු දෙදෙනාටද එසේ හඳවාගෙන බෝසතුන් කරාගොස් වැඳ නැගීසිට වහන්ස,  ඔබ අතින් මා වරයක් ඉල්ලමියි වර ඉල්ලන්නී මම පලාඵල ගෙනෙන්නටයමි. ඒ පෙරවරු කාලයෙහි ඔබ වහන්සේ දරු දෙදෙන රක්‍ෂාකල මැනවයි කීවාය. බෝධිසත්වයන් වහන්සේ යහපතැයි උන්ට වරදී කියන්නාහු මා විසින්ද තොපගෙන් ගන්නා වරයෙක් ඇත. වේලේ මුත් නොවේලේ මාගේ පන්සලට නොවදූවයි කියා උන් අතින් වරලදීන් මෙසේ වසන කල්හි සත් මසක් ගෙවීගියේය.

එසේ වසන සමයෙහි කලිඟුරට දුන්නිවිඨ නම් බමුණුගම ජූජක නම් බමුණෙක් බාලකල සිට සිඟන්නේ වෘධ අවස්ථාව දක්වා සිඟා ගෙන කහවනු සියයක් ලදින් එක් අනාථ බමුණෙකු කෙරෙහි තබා ගොස් කල්යාමකින් අවුත් යහළුව මාගේ කහවණු දෙවයි කියා ඉල්වීය. ඒ බමුණු කියන්නේ යහළුව, මා අනාථ වූයෙන් තාගේ කහවණු විකුට කාපීමි. තාගේ කහවනු වෙනුවට මාගේ අමිත්තතාප නම් දුවණිය ගෙනයවයි භාර කෙළේය. උගෙන් අනික් ලැබෙන දෙයක් නැත්තෙන් තමන් කාමදාස බැවින් ඒ බැමිණිය තමන්ගේ ගෙදරට කැඳවාගෙන ගොස් තමාට අඹු කෙළේය. ඈද ජූජක කෙරෙහි මහත් ගෞරවයෙන් උවටැන් කෙරෙමින් සිත්සේ වෙසෙයි. එකල ඒ බමුණුගම සෙසු තරුණ බමුණෝ තමතමන්ගේ අඹුවන්ට රැහැනිව ජරා දූර්වල වෘධ බමුණාට මෙවැනි තරුණ ස්ත්‍රියක් සිත්සේ මෙහෙවර කොට වෙසෙයි. තෙපි අපට මෙහෙවර කිරීමට ප්‍රමාද වන්නේ කිම්දැයි කියා ගැහැට කෙරෙති. ඒ ඇසූ බැමිණියෝ ජූජකයා කෙරෙහි ඈ කලකිරවමියි සිතා පැන්තොට ලඟදී ඈ දැක කියන්නාහු එම්බල පව්කල තැනැත්තිය තී දත් හැලුනු නර මහල්ලෙකුට මෙහෙ කෙරෙහිද ඒ කටදත් මහල්ලාට තී පාවාදුන් තිගේ දෙමාපියෝ තිට සතුරු වන්නාහ. තී පින් නොකල තැනැත්තියක. තී ගිය ජාතියෙහි යාගයෙහි කපුටන්ට ලූ බත් පළමුකොට කෑ මහළු කපුටියක් වන. එසේ හෙයින් වද තී මේ නර මහල්ලාට අඹුවූයේ ? ගැරඬි සමක් වැනි ඇඟරැලි ඇති කඩදත් ඇති කෙළතොලු මහළු බමුණා හා තිගේ කවරනම් පඤ්චකාම සම්පත්තියෙක්ද? සොඳුර තිගේ කෝමල ශරීරය වෙහෙසා ඒ බමුණාට මෙහෙනොකොට ලදරු සැමියකු සොයා ගන්නැයි කීහ. මෙසේ ඕ තමාට පරිභව බණන්නාවූ ගෑණුන් බලා හඬා වැලප කලය ගලේ ගසා දමා පියා අත පොරවාගෙන ගෙට ගොස් බමුණුගේ රැවුල තරයේ අල්වා ගෙන දත්කමින් බමුණු මහල්ල, තා සමඟ ඉදිමෙහි විපාක අද ලදිමි. අද මේ ගම දැරියෝ එක්ව පැන් තොටදී නොකල පරිභවයෙක් නැත. මෙහි ඉදීමට වඩා කරවැල් ලා ගෙන මියයාම යහපත. වහා ගොස් දාසයකු හෝ දාසියක ගෙන එව. නැතහොත් මා වෙන්වී යෙමියි කීවාය.

එවිට දත් නැතත් අඹුසොඬ හෙයින් කී බසට කම්පාව එම්බා සොඳුර නුඹ කණගාටු නොවව මහළු බැවින් දැසි දස්සන් ලද නොහැක. මෙවක් පටන් දරත් දියත් මම්ම ගෙනෙමි. සෙසු කළමනා දෙයද මම්ම කරමි. තෙපි මෙහෙ නොකර ගෙයි රැක ඉඳුවයි ඈ අස්වසා කීහ.

අහෝ බමුණ සැමියන් අතින් මෙහෙ ගන්නා කුලයෙක මා උපන්නේ නැත. නපුරු බස් නොකියා දාසියක හෝ දාසයකු ගෙන එවයි කිවුය. සොඳුර දාසීන් කෙසේ ලබම්ද? බමුණ තට උපායක් කියමි. උසස් ගුණැති වෙස්සන්තර රජ්ජුරුවෝ ඉච්ඡා දන්දෙති. දැන් ඒ උත්තමයා වංකගිරි පර්වතයෙහි තපස් කෙරෙති. තොප එහි ගොස් මට මෙහෙකරන වහලෙක් ගෙනෙයි නම් ඉදිමි. නැත්නම් ගමට යමියි කීය. සොඳුර වංකගිරි පර්වතය ඉතා දුරය. ගෙයි මෙහෙවර මම කරමි. තෙපි ඊට උරණ නොවවයි කීහ.

අහෝ බමුණ සැමියන් අතින් මෙහෙ ගන්නා කුලයෙක මා උපන්නේ නැත. නපුරු බස් නොකියා දාසියක හෝ දාසයකු ගෙන එවයි කිවුය. සොඳුර දාසීන් කෙසේ ලබම්ද? බමුණ තට උපායක් කියමි. උසස් ගුණැති වෙස්සන්තර රජ්ජුරුවෝ ඉච්ඡා දන්දෙති. දැන් ඒ උත්තමයා වංකගිරි පර්වතයෙහි තපස් කෙරෙති. තොප එහි ගොස් මට මෙහෙකරන වහලෙක් ගෙනෙයි නම් ඉදිමි. නැත්නම් ගමට යමියි කීය. සොඳුර! වංකගිරි පර්වතය ඉතා දුරය. ගෙයි මෙහෙවර මම කරමි. තෙපි ඊට උරණ නොවවයි කීහ.

SANHIDA LANKA

ඒ හඬ ඇසුණ චෙතිය වැදිපුත්‍ර තෙම වහා දිව අවුත් රාජ්‍යය හැරපියා මේ හිමයට ආ රජ්ජුරුවන් සොයා

ආයේ බිසවුන්වත් ඉල්වා දැයි කිපී දත්කමින් වටපිට බලමින් දුෂ්ට බමුණු මහල්ල! දැන් දැන් තා දිවි ගනිමියි දුන්න හයා විෂ පෙවූ හීය දුණුමඩලා හයාගෙන සොර බමුණ දැන් තාගේ හෘදය මාංසය කපාගෙන පන්ථ සකුණයන්ට බිලි දෙමි, සල්ව සල්වා තාගේ බඩවැල් ඇරගෙන පක්ෂීන්ට දෙමි. තාගේ පංචමධුර මාංශයෙන් හා හෘදය ලෙයින් දෙවියන් බිලිදෙමි. ඇගමස් බල්ලන්ට ලා කවමි. වහා ගසින් බසුවයි කීය. බමුණු මරණ හයින් මහ හඬින් හඬා බොරුවක් කියාවත් මුන් අතින් ගැලවුන මැනවයි සිතා කියන්නේ මා එසේ මෙසේ මැරිය නොහැක්ක. මම සඳමහ රජුගේ දූතයෙක්මි. මඳ වරදකුත් නැත්තෙමි. මඳක් මාගේ බස් අසව වෙස්සන්තර රජ්ජුරුවන්ගේ සුව දුක් දක්නා පිණිස යවයි සඳමහ රජ්ජුරුවන්ගේ මෙහෙවරින් ආමියි කීය.

එබස් අසා වැදිපුත් සතුටුව හටයන් සේ වටලාගත් බල්ලන් ගස්වල බැඳ ජූජක බමුණා ගසින් බස්සවාගෙන අගුරෙහි පැලහු මස්හා මිහිරි ආහාර කවා ගමන් ශ්‍රම දාහ නිවා සතප්වා යන්ට නික්මුණු කල මගට මී ලබුවක් හා අඟුරෙහි පැලහු මුව ගාතයක්ද දී පසු ගමන් කොට දකුණත ඔසවා බෝසතාණන් වහන්සේ වසන දිශාවට මග කියන්නේ විපුල පර්වතය තෙක් සලකුණු දක්වා ඒ පර්වතයෙහි අච්චුත නම් තපස්වී කෙනෙක් ඇත. එහි වැද සැතපී උන්ගෙන් මග සලකුණු ගනුවයි විස්තර කොට යැවීය. බමුණා ඒ සලකුණු අනුව තපස්වීන් සමීපයට ගොස් එහි සැතපී සිට තාපසයෙනි, මම වෙස්සන්තර රජ්ජුරුවන්ට බාලකල අකුරු කරවීමි. සත් මසකින් මා උන් නොදැක්කෙමි. බලා පියනු සඳහා ආමියි කීය. තපස්වී මු කීයේ සැබෑවයි සිතා වංකගිරි පර්වතය සමීපයෙහි පන්සලටම මාගී සලකුණු කීහ. බමුණු ඒ අසා සතුටුව තුන්විටක් තපස්වීන් වැඳ සමුගෙන කී ලකුණු බලබලා ගොස් ඒ අසල එක් ගිරි ගුහාවක් දැක, බමුණු සිතන්නේ ස්ත්‍රීහුනම් දනට බාධා කරන්නාහුය. එහෙයින් කුමාරවරුන් දන්ලබා පියන්ට නොදෙති. එබැවින් මේ ගුහාවෙහි අද ලැගසිට උදෑසන දේවී පලාඵල සොයාගිය කල දරුවන් දන් ගනිමියි සිතා එදා රෑ ඒ ගුහායෙහිම ලැගුම් ගත්තේය.

එදවස මද්‍රීදේවී පහන් වන වේලෙහි නපුරු ස්වප්නයක් දැක හයපත්ව වහා බෝධිසත්වයන් කරා ගොස් පන්සල මළුයෙහි පියවර සන් කොට සිරිකල බෝධිසත්වයෝ දොර කවුදැයි විචාළහ. වහන්ස, මම යයි කීවාය. දේවීනී, මා කරා මේ අවේලේ මන්දැයි කීහ. ස්වාමීනී ක්ලේශ වශයෙන් නරක සිතකින් ආයේ නොවෙමි. මා දුටු ස්වප්නයක් කියන්ට ආමි ඇසුව මැනවයි එය කියන්නී "එක් කළු මිනිසෙක් කසා පිළි දෙකක් හැඳ දෙකන රත්මල් පැළඳගෙන කඩුවක් ඉස සිසාරමින් මා කරා අවුත් මට බැණ මා හිස ජටාව අල්වා ගෙන ඇද උඩුකුරු කොට බිම හෙලා ගෙන මා හඬව හඬවා මාගේ දෑස උදුරාගෙන දෑතත් කපාගෙන ලය පලා ලේ පෙරපෙරා හෘදය මාංශය උදුරාගෙන ගියේවනැයි" කීවාය. බෝසතාණෝ සීනය අසා සත් මසක් පිරිහී ගියාවූ මාගේ දානපාරමිතාව අද සම්පූර්ණවේයයි සතුටුව දරුවන් දෙන්නා ගෙන යන්ට වනයට බමුණකු ආයේ වනැයි සිතා බිසවුන්ට කියන්නාහු දේවීනි තොපගේ ඇඟට සුවයක් නොලැබ දඬු මැසිවල සැතපෙන හෙයින් පෙණෙන සීනැයි කියා බිසවුන් සන්සිඳුවා යැවූදැය. ඈ ගොස් දරු දෙදෙන කැඳවා මූන සිඹ සනහා දරුවෙනි, මා රෑ දුටු සීනය නපුරුය. තොප පියා ලඟින් බැහැරට නොයවයි ඔවාදී බෝසතාණන් කරාගොස් වැඳ ස්වාමීනි මේ වනයේ මට නෑයෝ නම් ඔබත් දරු දෙදෙනාත් පමණය. මම වනයට යමි. දරුවන් රැකබලා ගත මැනව මා යනමුත් මාගේ ළය ඔබ බව දැන වදාළ මැනවයි කියා දරුදෙදෙනා පාවාදී මල්කරුව හා පෙට්ටිය ඇරගෙන යන්නී හඬමින් වලපමින් වන දෙවියනි, මාගේ දරුවන් රක්‍ෂාකරව් යයි දෙවියන් යදිමින් ගියාය.

බෝධිසත්වයෝ සක්මන් මළුයෙහි කෙළවර බමුණා එන පෙරමග බලබලා උන්හ. දරුවෝ දෙදෙන ඒ ඉදිරියෙහි වැලි කෙළ කෙළ උන්හ. ඉක්බිති බමුණු කල්වේලා බලා පන්සලට ගියේය. ඔහු දුටු බෝධිසත්වයෝ ඉතා සතුටට පත්ව දාන පාරමිතාව පුරවා ගැනීමට සහායවන මිත්‍රයෙක. තිස් යොදුනක් මග ගෙවා නිකමට නොඑන්නේය. දරුවන් දන් ඉල්ලා ආයේවනැයි සොම්නසින් ජාලිය කුමාරයන් කැඳවා කුමාරයෙනි පෙරමඟට ගොස් බමුණා අත කෙණ්ඩිය සහ පිරිකර ඇරගෙන තබවයි කියා ඉදිරියට යවූහ. ජාලිය කුමාරයෝ සතුටුවගොස් කෙණ්ඩිකාවට අත දික්කළහ. බමුණු සිතන්නේ මු රජ්ජුරුවෝ මට දන්දෙන දරුවෝය. මුන්ට මොළොක් වුවහොත් මතුවට මෙහෙ නොකරති. දැන්ම මුන් හයගන්වා ලමියි සිතා උරණව කුමාරයන් මුහුණ බැලීය. කුමාරයෝ හයින් පලාඅවුත් රජ්ජුරුවන් ලඟට වන්හ. බමුණු බෝධිසත්වයන් සමීපයට අවුත් වැඳ සතුටු සාමීචි කතාබස් නිමවා බෝධිසත්වයන් විසින් එලවූ පලාඵල කා පැන්පී මඳ වේලාවක් සැතපී ඉඳ කියන්නේ මහා පුරුෂය ශ්‍රද්ධා ජලයෙන් පිරුණාවූ සියළු යාචකයන්ගේ මනදොළ පුරන උත්තමයෙක් වූ ඔබ වහන්සේ ලඟට අනික් වැඩි කටයුත්තකට ආයෙම් නොවෙමි. ඔබගේ දරු දෙදෙනා ඉල්ලා ආමියි කීය.

මෙකප බුදුවන්නා වූ ඒ මහතාණන් වහන්සේ බමුණ කී බස් අසා දරුවන් මුහුණ බලා බමුණාගේ මුහුණ බලා

SANHIDA LANKA

වලට ගිය බිසව සිහිකොට සිත උපන් සෝගිනි නිවා දන්දීමෙහි එක්සිත්ව බමුණ තා මට පරලොව අමුත්තෙක. තා සේ මට මිත්‍රයෙක් නැත. තොප අන් කිසිවක් නොඉල්වා අපගේ දරුවන් ඉල්ලූබව ඉතා යහපත. එය වැලකීමට සිහිනෙනුත් නොසිතමි. දරුවන් තට සම සිතින් පාවා දෙමි. බල එකක් කියමි. මේ ලද බොළඳ කුමාරයෝ කිසි දුකක් නොදුටු විරූය. දැන් මා දරුවන් දෙමි. උන් දැන් බඩ සයින් පෙලෙති. එබැවින් බිසවුන් පැමිණ උන් දෙදෙනා නාවා වනමුල් පලාඵල කවා ලද බොළඳ බස් දොඩා සෝකය තුනීකරගත් කල අද රෑ මෙහි ලැග සෙට දරුවන් දෙදෙනා ගෙන යව ඒ දරුවන්ගේ මෑණියෝ උන් අපට පාවාදී හුදකලාව වල්ගියෝය. පලාඵල ගෙනවුත් දරුදෙදෙනා නුදුටු නම් ලය පැලී මියෙති. මාගේ ඉෂ්ට මිත්‍රය මේ දරු දෙදෙන සිවි මැල්ලෝය. මොලොකින් මෙහෙ උගන්වාගෙන ගැති මෙහෙකම් ගනුවයි වදාළසේක.

රජ්ජුරුවෙනි! ස්ත්‍රීහු නම් දනට බාධා කරන සුළුය. හොඳ නොහොඳ නොදනිති. අද මෙහි ලගින්ටද නොපොහොසතිමි. දරුවන් දන් දෙව්නම් මට කල්නොයවා දැන්ම දෙව නැත්තම් මම යෙමියි කීය. බමුණ දරුවන් දෙමි කියා නොදෙමි නොකියමි. දනට පසු බස්නා සිතකින් නොවෙයි. බිසවුන් එනතුරු නොලග්නෙහි නම් සිව්මැලි දරුවන් මග නලව නලවා සතප සතපා අස්වසමින් කැඳවා ගෙන සිවි රටට යව ගොස් මා දරුවන් මුත්තණුවූ සඳමහ රජ්ජුරුවන්ට මෙපවත් කීකල මපියාණන් වහන්සේ ඉතා සතුටට පත්ව තව කෙළිකොල්ලන් සමග බොහෝ වස්තුව දෙතියි කීහ. එබස් අසා බමුණු ඉස සලසලා අප ජීවිතය විනාශ කරන්නට සිතු නියාව යහපත! මුණුපුරන් දුටු සඳමහ රජ්ජුරුවෝ මුණුබුරන් ගැති කොට ගෙන යන්නේයයි කිපී මගේ අත්පා කන් නාසා සිඳ දමති. එයින් මට කම්නැත. දරුවන් දෙව්නම් දෙව! නැත්නම් කියවයි කීය. මේ දෙබස අසා දරු දෙදෙනා භයින් ත්‍රස්තව පසුපස බලමින් පන්සල පිටිපස්සට වැද එතනද සිටගත නොහැකිව හයින් වෙවුල වෙවුලා අසල වන ලැහැබකට දිව ගොස් සැඟවුනාහුය. බැලූ බැලූ දිශාවේ බමුණා ළඟ එන්නාසේ පෙනෙත්ය. එතැනද නොසිට අනේ! නගණ්ඩ! කුමක් කරමෝදැයි කියමින් කටුවැලින් හීරීගෙන හඬා දිවන්නාවූ හතරැස් පොකුණට වැද අපි ඔවුනොවුන් සැඟවුන තැන් නොපාම්හයි කතිකා කොට ගෙන කරවටක් දියට බැස නෙළුම් පතින් හිස වසාගෙන සැඟවී කන්දී සොල්මන් අසඅසා මෑණියන් ඊයේ රෑ දුටුසීනය නපුරුයි කී දෑය. පියාණන් ලඟම සිටුවයි කිවුය. මෑණියෝ මේ දුක නොදනිද්දෝ අනේ වන දෙවියනි තෙපි අපි රැක වහා ගොස් මෑණියන්ට කියව්‍යයි බැගෑපත්ව හඬ හඬා වෙවුලමින් දියෙහි සැඟවී සිටියහ.

බෝධිසත්වයන් වහන්සේ දරුවන් සැඟවුන බව නොදැන බමුණාට දන්දෙන්ට කැඳවූහ. දරුවන් නොබිනූ හෙයින් බමුණකියන්නේ රජ්ජුරුවෙනි! තොපසේ බොරු දන්නෝ මුළු රට නැත. තෙපි දරුවන්ට ඉඟිකර සඟවාලා නොදන්නාක් මෙන් හිඳ දරුවන් කැඳවාදැ'යි කීහ. බෝධිසත්වයෝ බොරු කීවයි යන බසට ලජ්ජාව කියන්නාහු බමුණ! තාගේ රළුකම් නිසා භයපත්ව පලාගොස් ඇත. තා මදක් සිටුවයි කියා ඔබමොබ බලා පියවර සටහන් අනුව පොකුණට ගොස් ජාලිය කුමාරයෙනි'යි හඬගෑහ. (බුදුවන ජාතියෙහි රහල් කුමරු වන මහ පින් ඇති) ජාලිය කුමාරයෝ පියාගේ හඬ අසමින් බමුණා මා දිවි ගනීවා! පියාට කීකරු වෙමියි සිතා පියාණනි! කියමින් වහා අවුත් දකුණු පය ගෙන හඬන්නටවන. බෝධිසත්වයෝ ලය වා ගෙන පුත! නැගණියෝ කොයිදැයි විචාළහ. පියාණනි! භයින් පලායන මෘග ජාතිහු උනුණුන්ට කියා පලායෙද්ද? අපට වූ දෑ එබන්දක් වන්නැයි කීහ.

ඒ අසා බෝධිසත්වයෝ මාගේ දුව කෘෂ්ණජිනා වෙනි!යි හඬගෑහ. (බුදුවන ජාතියෙහි තම ශාසනයෙහි උපුල්වන් මහ ස්ථවිරීයයි ප්‍රසිද්ධ වන මහා පිනැති) ඒ දියණියෝ පියාණන්ගේ හඬ අසා නිහඬවී සිටිනු නොහැකිව දෙව්දුවක මෙන් වහා දිව අවුත් පියාගේ වම්පය බදාගෙන හඬන්නට පටන්ගත්හ. දරුවන් දෙදෙන හඬා වගුල කඳුළු රජ්ජුරුවන්ගේ දෙපත්ලෙහි වැගිරෙයි. රජ්ජුරුවන් හඬන කඳුලු දරුවන් පිට වැගිරෙයි. මෙසේ හඬහඬා ශෝක වීමෙන් බුදුබව නොසෑදෙයි. දරුවන් බමුණට දෙමියි සිතා දරුවන් සිඹ සනසා ලෙහි හොවාගෙන මාගේ දරුවනි! මේ සංසාර සාගරයට තොප පසුරු කොට ගෙන මම සංසාරයෙන් එතරව ගොඩ දකිමි. මම ගොඩ දැක තොප ඇතුළු සියළු සත්වයා ගොඩ දක්වාලමි. දරුවෙනි! මාගේ දානපාරමිතා ධ්‍යානය මුදුන්පත් කොට ලුව මැනව! පුතණ්ඩ! තොප නිදහස් වනු කැමැත්තෙහි වීනම් බමුණාට රන් දහසක් දී ද නැගණිය නිදහස් කොට ගන්නා කැමැත්තෙහි වීනම් ඔහුට දාසයන් සියයක්ද ඇතුන් අසුන් සහ වෘෂභයන් සියය බැගින්ද රන් සියයක් ද දී නිදහස් කොට ගනුවයි දෙදෙනා වටිනා මිළකොට පන්සලට කැඳවාගෙනවුත් බමුණා කැඳවා අතපැන් වත්කොට මේ දරුවන් දන්දුන් පිණින් " ලොව්තුරා බුදුබව" ලැබේවායි පතා දරුවන්ගේ අත් බමුණා අත තබා දන්දුන්හ. ඒ මොහොතෙහිම මහා

SANHIDA LANKA

පොළවද මහාමේරුව ඇතුළු සප්තකූට පර්වතයෝද ශෝකයෙන් හඬන්නාසේ කම්පිත වූහ. මහාසාගරය සත්රුවන් ඉස ඉස සැලෙන්නට වන. දෙවියෝ සතුටුව මල්වැසි වැස්වූහ. රජ්ජුරුවෝ දානයෙන් ප්‍රමුදිතව කුමරුවන් බලමින් සිටියාහ. ඉක්බිති බමුණා වනලැහැබට පිවිස වැලක් කඩාගෙනවුත් කුමාරයන්ගේ දකුණත කුමරියගේ වමත හා එකට බැඳ එම වැල කෙළවරින් තලමින් ගෙන ගියේය. ඒ දරුවන්ගේ සිරුරුවල ගැසූ ගැසූ තැන තැන ලේ වැගිරෙයි. නැගණියන් පිට ගැසූ පහර බෑයන් පිට ලබා ගනිති. බෑයන් පිට ගැසූ පහර නැගණියන් පිට ලබාගනිති. මෙසේ දරුවන් රැගෙන යෙමින් සිටි බමුණා ගලකින් බස්නේ පය පැකිල මුනින් වැටීහිණ.

ඒ මොහොතෙහිම දරුවෝ දෙදෙන ගැලවී දිවගෙන අවුත් පන්සලට වැඳ රජ්ජුරුවන්ගේ දෙපත්ලෙහි හිස තබාගෙන හඬා කියන්නාහු ස්වාමීනි! අම්මා නපුරු සීනයක් දැක නුඹවහන්සේට අපව පාවාදී වලට යන්නාහු කී බස ඔබම දෙස් නොවේද? පියාණනි! ඒ සිහි නැද්ද? අප නුදුටු අම්මාගේ ළය කෙසේනම් වෑවේද? අම්මා එනතුරු අප රැකගන්න. පියාණනි! ඒ අවලක්ෂණ බමුණාට අපව දන්නොදී වෙන බමුණෙකුට දන් දෙන්න. මුගේ පා බකලය. ඇඟ කැහැටුය. දික්වූ තොල් ඇත. කෙළ තොලුය. දත් බොල්ය. නාසය බුන්ය. බඩ මහතය. තඹවන් දැළි රැවුලය. ඔහු මිනිස් වෙසින් ආ යක්ෂයෙක. ඔහුට දෙන්නාහු නම් මා පමණක් දන් දෙන්න. නැගණියෝ ඉතා සියුමැළිය. ඈට මෙහේකල නොහැක. උන් කරන මෙහෙත් මම කෙරෙමි. ඈ මිඩී වූ කල රාජවංශයට පරිභවයයි කියමින් හැඬූහ.

රජ්ජුරුවෝ මෙතෙක් දෑ කියතුදු මුවෙන් නොබැන උන්හ. ජාලිය කුමාරයෝ පියාණෙනි! මෙතෙක් දෑ කියද්දී නිහඬ වන්නේ ඔබ වහන්සේගේ ළය ගලක්ද? පසකින් වැසුනේවද? මුවෙන් නොබැන ඉඳිනට කුමණ වරදක් කලේදැයි කියමින් සිටිතැනට අත් පා වලින් ලේ ගලමින් අවුත් වැඳ සිට රජ්ජුරුවන් බලා සිටියදී නැවත අල්වාගෙන ගියහ. රාහු මුඛයටවන් හිරු සඳු මෙන් යමින් සිටි දෙදරුවෝ පෙරලී පියාණන් බලමින් අත් හිස් මුදුනේ තබා වඳිමින් අපගේ පිට වැගිරෙන ලේ බලන්න. පියාණනි! නිහඬව සිටින්නේ මේ යකු අප මරා කාපියන තුරුද? මෑණියන්ට කියන කල අප වැඳ සමුගත්බව කියන්න. අප සුවපත් බවද නැවත දැක්මක් නැතිබවද කියන්නැයි කිය කියා හඬමින් ගියාහ.

බෝධිසත්වයෝ දරුවන්ගේ බැගෑපත් හඬ අසා ළය කකියවා අනේ! බමුණකු ඉතා දැඩි නියාය. මා ඇස් හමුවෙහිදී මෙසේ දැඩිව හිංසා කරන කල ඔබ්බෙහිදී කෙසේ නොකෙරේද? එනදා අප වඩාගෙන ආ දරුවෝ දැන් මේ රළු මග කෙසේ යෙද්දෝ හෝ සයින් විඩාවූ දරුවන් කවුරු සනහා කිරිපොවා ලද්දෝහෝ මෑණියන් තන මැද සැතපුණ දරුවන් අද රෑ කොතනක වැද හෙව නිදද්දෝ හෝ දරුවන් කෙරෙහි ස්නේහයෙන් මා පිට හඬා පෙරලෙන බිසවුන් කෙසේනම් අස්වසන්නෙම්දෝ හෝ සිතා මහත්වූ ශෝකය දරාගත නොහැකිව බමුණා ලුහුබැඳ ජීවිතය විනාශකොට දරුවන් ගෙනෙන්නෙමැයි සිතා නැවත ඒ මොහොතෙහිම දානපාරමිතාවෙහි අනුසස්සලකා තමාගේ සිතුවිල්ලට නින්දා කොට නැවත සිත සනසා ගෙන පන්සල දොරකඩ පුවරුවෙක වැඩ උන්හ.

එවේලෙහි දරු දෙදෙනා යමින් සිට තමන් කෙළ ඇවිදිනා වෘක්ෂ සෙවන සහ ගල් සිදුරුද මැටියෙන් ඇඹූ කෙළිබඩුද සුරතල්වන මෘගයන්ද සිහිවී අප හා පුරුදු ඇත්තෙනි! මෑණියන්ට අප අතුල් පතුල් ඉදීම යා නොහෙන බව කියව. අප විඳිනා සුව කියව් යයි කියමින් හඬමින් වලපමින් ගියහ.

ඉක්බිති වලට ගිය මද්‍රිදේවිය සිතන්නී ඊයේ රෑ මම නපුරු ස්වප්නයක් දිටිමි. මාගේ දරුවෝ පන්සලින් පිටත යාදෝහෝයි ලය කකියවා පලාඵල ගෙන එන අතර යහුල වැටීයයි වරක් පෙට්ටිය වැටෙයි. දෙපය වෙවුලයි. හෘදය කකියවයි. මේ පර්වතයේ දෙවියනි! මට කිමෙක් වේදෝ හෝ මේ වනයේ නපුරු හීන පෙනෙන්නේ කුමටද? හෝයි දුක් වෙමින් පන්සලට එන සඳ ශක්‍රදේවේන්ද්‍රතෙමේ දිව්‍ය පුත්‍රයන් සතර දෙනෙකු කැඳවා කියන්නේ බෝධිසත්වයෝ දරුවන් දන්දෙමින් සිටියහ. එතැනට බිසව ගියෝනම් නපුරුය. තෙපි ගොස් සිංහ ව්‍යාඝ්‍ර වෙස් මවාගෙන මග අවුරා වැද හොවයි නියම කළේය. බිසව එන්නී භයානක රූප දැක මම මීට පෙර මෙවැනි නපුරු සතුන් නුදුටු විරිමි. වෘක්ෂ දේවතාවෙනි! පර්වත දෙවියනි! මොවුන් යවව! මාගේ ස්වාමීන්ට මා ප්‍රතිව්‍රතා වීනම් මගින් ඉවත්වවයි මහා හඬින් කියා අනිත් යන මගක් නැත්තෙන් පෙරමගට දරුවෝ අවුනම් නපුරුයි සිතා නොයෙක් කන්නලව් කරන්නට වූවාය. මෙසේ කියත්ම ඉර අවරට ගියෙන් මෘග ජාතීහු නොපෙනී පලා ගියහ. දේවිය සඳ රැසින් යුත් රාත්‍රියෙහි වනමුල් පලාඵල රැගෙන පන්සලට එන්නේ ඉදිරියෙහි දරුවන් නොදැක මා දරුවන්ට කුමක් වීදෝහෝයි සිට කියන්නී මාගේ දරුවන්ගෙන් මිහිරි බසක්

SANHIDA LANKA

මා කණනොහිණ ලද බොළඳ බසක් නොඇසීමි. මුහුණු නොදුටුයෙමි. පෙර කෙළනා රුක්මුල නොදැක්කෙමි. ජාලිය කුමාරයෝ පෙරමඟට අවුත් අම්ම! අඹ නැද්දැයි? හින බලති. කෘෂ්ණජිනාවෝ අවුත් තනය ගනිති. මේ නුග මුල කෙළෙනා තැනැයි බලමින් ගොස් පන්සලට වැද එහිද නොදැක ඇත්කඳ ලිහිණියෝ ගෙනගියේදෝ හෝයි යක්‍ෂ, භූත, ප්‍රේතයෝ ගෙන ගියේදෝහෝයි ලද බොළඳ මියුරු බසක් කවරවිටෙක ඇසිය හෙම්දෝහෝයි අඬා වැලප බෝසතාණන් අතින් විචාරන්නී ස්වාමීනි! දරුවන් සිඟන්නන්ට දන්දුන්නුදැයි විචාළාය. බෝසතාණෝ නිහඬවූ හෙයින් වහන්ස! දරුවන් නොදක්නා ශෝකයට වඩා ඔබවහන්සේගේ නිහඬතාවය බලවත් ශෝකයකි. පෙර මේ වේලාවට ගිනිතපිනදෑය. අද මුවෙන් නොබනින සේක. මා එනතුරු දරුවන් රකිම්යි මට වර දුන් දෑවේද? දරු ස්නේහයෙන් මා අඬා ඇවිදිනාතුරු නොබැන වැඩහිදිනා දෑය. ඔබගේ දරුවන් කැඳවාලා පලාඵල වැලදුව මැනවි. නැත්නම් මා දිවි නොරැකෙමියි කීහ.

එබස් අසා මද්‍රිදේවී කියන්නී මම වේලේ ආමි. මේ වෙනෙහි පක්‍ෂීහු මහත්කොට හැඬූ හඬ අසා මා දරුවන්ට කුමක් වීදෝහෝයි ලය කකියවා එමින් සිටි කල්හි සිංහ වලස් ආදී වෙස්ගත් තුන්දෙනෙක් මට ඒමට ඉඩනොදී මග අවුරා හොත්ය. එසේ හෙයින් ලස්වීමි කීවාය. එසේ කියා හඬාගෙන පන්සල පිටිපසට ගොස් හඬ නගන්නාහු මාගේ ජාලිය කුමාරයෙනි, කෘෂ්ණජිනාවෙනි! මහත්කොට හඬාලා බසක් නොලදින් මාගේ දරුවන්ට නැස්මෙක් වනැයි නියත කොට සිතා රාත්‍රියෙහි මහා දුකින් හඬා ඇවිද දරුවන් කෙළනා පොකුණු බලා හඬා සීසන් නැතිව වැටී හී මද විගසකින් සීසන් ලදින් නැවත නැගිට වංකගිරි පර්වතයෙහි පසළොස් ගව්වක් තුන්විටක් වටකොට බලා ඇවිද්දාහ. බෝධිසත්වයෝ ඇසිපිය නොඔබා නිදිවියෝව උන්හ. පහන් හිරු නැගෙමින් සිටි වේලෙහි මද්‍රීදේවිය වෙවුලා හඬා සීසන්නැතිව හොත්හ.

බෝධිසත්වයෝ දේවිය හොත් විලස්බලා ලයකකියවා මේ වෙනෙහි මාගේ නැකෙනෙක් නැත. තෙපි වනයෙහි මළාදැයි කියා සිත් කැළඹීගොස් ශෝකයට පත්ව නුවණින් ශෝක දුරුකොට පොකුණට ගොස් දිය ගෙනවුත් සත්මසක් විසූ බ්‍රහ්ම චයර්‍යායෙන් සත්‍ය ක්‍රියාකොට මුහුණට දිය ඉස සිව්රට සිට මියගියෝනම් මහත් රජ පෙරහරින් දවන්නාහ. මා හුදකලාව මේ වෙනෙහි කුමක් කෙරෙම්දැයි සිතා මහත් වූ ශෝකයෙන් තැවිතැවී උන්කලට බිසව සිහිය ලදින් ලජ්ජාව බෝසතාණන් වැඳ වහන්ස! මා දරුවෝ කොයිදැයි විචාළහ. දේවීනි! ඉතා මහළු බමුණෙකුට දරුවන් දන් දුනිම්යි කීහ. එවිට පොළොව හඬනගා ගුගුළාය. සියළු දෙවියෝ සාධුකාර දුන්හ. දේවීනි! දාන පාරමිතාවට අහිතක් නොසිතා පින් අනුමෝදන්වවයි වදාළහ. බිසව ස්වාමීනි මට මෙසේ නොකියා හඬා ඇවිද්දදී නොබැන්නහුදැයි කියමින් දොහොත් මුදුනේ තබා පින් අනුමෝදන් වෙමියි සාධුකාරදී පින් අනුමෝදන්ව ස්වාමීනි! දරුවන්ට වඩා දස ලක්‍ෂ ගුණයකින් බුදුබව උතුම්යයි සිත සන්සිඳුවා ගෙන නැවතත් ස්වාමීනි! මුළු ලොව සතුන්ටත් පින් දුන මැනවයි පින් දෙන සිත් ප්‍රසන්නකොට දානපාරමිතාව මුදුන්පත් කළහ. සියළු දෙවියෝ සාධුකාරදී පින් අනුමෝදන්ව මල්වැසි වැස්වූහ.

ඉක්බිත්තෙන් ශක්‍රදේවේන්‍ද්‍රතෙමේ සිතන්නේ බෝධිසත්වයෝ දරු දෙදෙනා බමුණාට දන්දුන්හ. බිසවනුදු යම් හීන පුරුෂයකුහට දන් දුනහොත් නපුරැයි සිතා මහළු වෙසක් ගෙන අවුත් කියන්නේ ගමන් විඩායෙන් මිරිකුණෙමි. රජ්ජුරුවෙනි෧ මා ඉතා වයෝවෘධයෙමි. තොප අතින් රන් රුවන් ඉල්ලා ආයේ නොවෙමි. මාගේ ගෙයි මෙහෙ කරන වාලෙක් නැත්තෙමි. තොපගේ බිසවුන් මෙහෙකිරීමට ඉල්වා ආමිකීහ. බෝධිසත්වයෝ කළ මනා කිම්දෝහෝයි බිසවුන් මුහුණ බැලූහ. බිසව බෝධිසත්වයන්ගේ අදහස දැන ඔබ වහන්සේ මට අධිපතිය. එබැවින් යමෙක් හට දාස බවට දෙනුකැමති සේක්නම් එසේ දුන මැනව. වස්තු සඳහා දෙනු කැමති සේක්නම් එසේ දුනමැනව යමෙක් හට  මස්පිණිස දෙනු කැමති සේක්නම් එසේ දුන මැනව. තවද ඔබ වහන්සේට අභිමතයක් කළ මැනවයි කීහ.

එවිට මහබෝසතාණෝ සතුටුව බ්‍රාහ්මණයා කැඳවා අතපැන් වත්කොට බිසවගේ අතගෙන "මම ඒකාන්තයෙන් සම්මා සම්බුදු බවට පැමිණ සියළු ලෝ වැස්සන් නිවන් පුරයෙහි පිහිටුවාලීය හෙම්වයි" පතාගෙන බමුණාට දන් දුන්හ. ඒ හාම මහපොළව සතුටුව ගුගුළාය. සදෙව්ලොව දෙවියෝද සතුටුව සාධුකාර දුන්හ. බමුණු කියන්නේ රජ්ජුරුවෙනි! තොප බිසව මට දන්දුන් බැවින් ඕ තොමෝ අප සන්තකයෝය. තොප සතු දෙයක් මුත් අනුන් සතුදෙය දන්දිය නොහැක්කේ වේදැයි කියා මා එනතෙක් බිසවුන් තොපට පාවා දෙමි. තොපි මේ බිසවුන්ට සුදුස්සන්හයි බෝධිසත්වයන්ටම පාවාදී ශක්‍රදේවේන්ද්‍ර බව හඟවා ශක්‍රවිලාසයෙන් සිට කියන්නේ රජ්ජුරුවෙනි! තොප දරුවන් දන් දුන් විටම මහපොළව මහ හඬින් ගුගුළාය. සප්තකූල පර්වතයෝද සතුටුව නැටුම්ගත්හ. තලාටු භූමාටු දෙවියෝද සතුටුව නැටුම් ගත්හ. සදෙව්ලොව දෙවියෝද සොළොස් බඹ තලයෙහි බ්‍රහ්මයෝද සතුටුව නැටුම් ගත්හ. සාධුකාර දුන්හ. එසේම තොපට "ඒකාන්තයෙන්ම ලොව්තුරා බුද්ධත්වය සිද්ධවේවායි" කියා තොපගේ දරු දෙදෙනා මුතුන් මිත්තන් කරා ගෙන ගියේය. අදින් සත් දවසකින් තොප

SANHIDA LANKA

කරා දරුවෝ එති. එබැවින් වර අටක් ගනුවයි දිව්‍යාත්ම භාවයෙන් දිළිසෙමින් ලා හිරු මඬලක් මෙන් අහසෙහි සිට කීයේය.
බෝධිසත්වයෝ වර ඉල්ලන්නාහු එසේ වී නම් ශක්‍රදේවේන්ද්‍රයාණනි (1) මම මේ වනයෙන් ස්වකීය ගෘහයට වන්කල මාගේ පියතෙමේද මේ දානය අනුමෝදන්ව මා කෙරෙහි සතුටුව රාජ්‍යයෙන් පවරනු ලබම්වා (2) කිසිවක් හටත් වධකිරීමට රුචිනොවූයේ රාජ්‍යාපරාධ කළවුන්ද වධයෙන් මුදනු ලබම්මා (3) ළදරු, මහළු, මධ්‍යම යන වයස්වූ සියළු දෙනම මාගෙන් ජීවත්වනු ලබම්වා (4) පරදාර කර්මයෙහි නොඇළුනේ ස්වකීය භාර්‍යාව හා සතුටුවූයේ ස්ත්‍රීන්ගේ වසඟයට නොපැමිණෙම්වා (5) දීර්ඝායුෂ්ක වූ දැහැනේ සෙමෙන් ජීවත් වන්නාවූ පුත්‍රයෝ ලබම්වා, (6) මෙයින් චුතව ගොස් තුසීපුරයෙහි උපන්නේ විශේෂවූ දිව්‍යාත්ම භාවය ඇතිවෙම්වා (7) දන්දෙන කල වස්තුව ක්ෂය නුවූයේ දන්දී නොතැවෙන්නේ සිත පහදවා ගනු ලබම්වා, (8) තුසී පුරයෙන් සැව මිනිස් අත් බවට පැමිණියේ නැවත නූපදිනු ලබම්වා,යි වරගත්හ. මෙසේ එදවස් වරදී ශක්‍රදේවේන්ද්‍ර තෙමේ දෙව්ලොවටම ගියේය.

එවිට මහබෝසතාණෝ සතුටුව බ්‍රාහ්මණයා කැඳවා අතපැන් වත්කොට බිසවගේ අතගෙන "මම ඒකාන්තයෙන් සම්මා සම්බුදු බවට පැමිණ සියළු ලෝ වැස්සන් නිවන් පුරයෙහි පිහිටුවාලීය හෙම්වයි" පතාගෙන බමුණාට දන් දුන්හ. ඒ හාම මහපොළව සතුටුව ගුගුළාය. සදෙව්ලොව දෙවියෝද සතුටුව සාධුකාර දුන්හ. බමුණු කියන්නේ රජ්ජුරුවෙනි! තොප බිසව මට දන්දුන් බැවින් ඕ තොමෝ අප සන්තකයෝය. තොප සතු දෙයක් මුත් අනුන් සතුදෙය දන්දිය නොහැක්කේ වේදැයි කියා මා එනතෙක් බිසවුන් තොපට පාවා දෙමි. තොපි මේ බිසවුන්ට සුදුස්සන්හයි බෝධිසත්වයන්ටම පාවාදී ශක්‍රදේවේන්ද්‍ර බව හඟවා ශක්‍රවිලාසයෙන් සිට කියන්නේ රජ්ජුරුවෙනි! තොප දරුවන් දන් දුන් විටම මහපොළව මහ හඬින් ගුගුළාය. සප්තකුල පර්වතයෝද සතුටුව නැටුම්ගත්හ. තලාටු භූමාටු දෙවියෝද සතුටුව නැටුම් ගත්හ. සදෙව්ලොව දෙවියෝද සොළොස් බඹ තලයෙහි බ්‍රහ්මයෝද සතුටුව නැටුම් ගත්හ. සාධුකාර දුන්හ. එසේම තොපට "ඒකාන්තයෙන්ම ලොව්තුරා බුද්ධත්වය සිද්ධවේවායි" කියා තොපගේ දරු දෙදෙනා මුතුන් මිත්තන් කරා ගෙන ගියේය. අදින් සත් දවසකින් තොප කරා දරුවෝ එති. එබැවින් වර අටක් ගනුවයි දිව්‍යාත්ම භාවයෙන් දිළිසෙමින් ලා හිරු මඬලක් මෙන් අහසෙහි සිට කීයේය.
බෝධිසත්වයෝ වර ඉල්ලන්නාහු එසේ වී නම් ශක්‍රදේවේන්ද්‍රයාණනි (1) මම මේ වනයෙන් ස්වකීය ගෘහයට වන්කල මාගේ පියතෙමේද මේ දානය අනුමෝදන්ව මා කෙරෙහි සතුටුව රාජ්‍යයෙන් පවරනු ලබම්වා (2) කිසිවක් හටත් වධකිරීමට රුචිනොවූයේ රාජ්‍යාපරාධ කළවුන්ද වධයෙන් මුදනු ලබම්වා (3) ළදරු, මහළු, මධ්‍යම යන වයස්වූ සියළු දෙනම මාගෙන් ජීවත්වනු ලබම්වා (4) පරදාර කර්මයෙහි නොඇළුනේ ස්වකීය භාර්‍යාව හා සතුටුවූයේ ස්ත්‍රීන්ගේ වසඟයට නොපැමිණෙම්වා (5) දීර්ඝායුෂ්ක වූ දැහැනේ සෙමෙන් ජීවත් වන්නාවූ පුත්‍රයෝ ලබම්වා, (6) මෙයින් චුතව ගොස් තුසීපුරයෙහි උපන්නේ විශේෂවූ දිව්‍යාත්ම භාවය ඇතිවෙම්වා (7) දන්දෙන කල වස්තුව ක්ෂය නුවූයේ දන්දී නොතැවෙන්නේ සිත පහදවා ගනු ලබම්වා, (8) තුසී පුරයෙන් සැව මිනිස් අත් බවට පැමිණියේ නැවත නූපදිනු ලබම්වා,යි වරගත්හ. මෙසේ එදවස් වරදී ශක්‍රදේවේන්ද්‍ර තෙමේ දෙව්ලොවටම ගියේය.

එකල ජූජක බමුණාද දරු දෙදෙනා රැගෙන සැට යොදුන් මගට පිළිපන්නේය. දේවතාවෝ කුමරුවන් අරක් ගත්තාහුය. ජූජකයා හිරු හස්තයට ගිය වේලෙහි දරු දෙදෙනා ගස්වල බැඳ බිම වැද හොවා තමන් වග වලසුන්ට බියෙන් රුකකට නැගී නිදයි. එකෙනෙහි එක් දිව්‍ය පුත්‍රයෙක් මද්‍රි දේවියගේ වේසයෙන්ද අවුත් කුමරුවන් මුදා සුවඳ පැනින් නාවා බත් අනුභව කරවා දිව යහනෙක හොවා පාන්වූ කල කුමාරවරුන් පළමු බැඳලූ සැටියේම හොවා නොපෙනී ගියහ. ඉක්බිති බමුණා පිබිද පියා පාන්වූ බව දැන ගසින් බැස දරුවන් තමාගේ රටට ගෙනයමියි සිතන්නේ, දේවතානුභාවයෙන් කලිඟු රටට නොගොස් ඔවුන්ගේ මුතුන් මිත්තන්ගේ රට වූ ජයතුරා නුවරට පැමිණියේය.

එදවස් වනාහි සඳමහ රජාණෝ ස්වප්නයක් දක්නෝ තමා වහා විනිශ්චයෙහි යෙදී හුන්කල එක්පුරුෂයෙක් පියුම්දෙකක් ගෙනවුත් තමා අත තැබුයේය. රජ්ජුරුවෝ එය ගෙන දෙකන පැළඳ ගත්හ. එහි රේණු ගිලිහී රජ්ජුරුවන්ගේ උදරයෙහි වැටුණේය. රජ්ජුරුවෝ පිබිද බමුණන් ගෙන්වා ස්වප්නය විචාළහ. බමුණෝ එය විසඳන්නාහු ස්වාමීනි! තොප විසින් ප්‍රිය වන දරු කෙනෙක් එන්නේවනැයි කීවාහුය. රජ්ජුරුවෝ එබස් අසා සතුටුව උදැසනින්ම රස ආහාර අනුභව කොට විනිශ්චාසනයෙහි වැඩ හුන්හ. දේවතානු භාවයෙන් බමුණා දරුවන් දෙදෙනා ගෙනවුත් රාජාංගනයෙහි සිටවූයේය. රජ්ජුරුවෝ ජාලිය කුමාරයන් හා කෘෂ්ණජිනාවන් ඇරගෙන බමුණෙක් ආයේවනැයි යනු අසා බමුණා ගෙන්වා දරුවන් කොයිසිට ගෙනායේදැයි විචාළාහ.

SANHIDA LANKA

එවිට බමුණා බොරුවක් කියා මුන්ගෙන් ගැලවුන මැනවයි සිතා කටදැල්වූ කල්හි දේවතානු භාවයෙන් වෙස්සන්තර රජ්ජුරුවෝ මට දන් දුන්හයි කීය. එසේ කියා මේ සඳමහ රජාණන්ගේ රටබව දැන හයින් ත්‍රස්තව වෙවුලන්ට වන. සඳමහ රජාණෝ වෙනෙහි හිඳ දන්දුන් බව සිතා මහත් කොට දරුවන් ආ බව නගරවාසීන්ට කීහ. නුවරවාසීහු කියන්නාහු ස්වාමීනි! දරුවන් දන් දුන් ඒ උත්තමයාගේ ලය ගලෙක්වීද? ඇළි ඇතු දන්දුන්සේ නපුරැයි රැහැනිව වංකගිරි පර්වතයට යැවුම්හ. දැන් මෙවැනි ලද බොළඳ සිවුමැලි දරුවන් දන්දුන්හ. මෙබඳු පින් ඇති ඒ උත්තමයාගේ ගුණ දැන නුගුණ පහකොට ගොස් මෙහි ගෙණෙම්හයි කීහ. එබස් අසා ජාලිය කුමාරයෝ කියන්නාහු පියාණෝ බමුණා කෙරෙහි කරුණාවෙන් අප දන් දුන් දැය. මපියාණන් වහන්සේ ඉතා තද යයි කුමට නින්දා කළෝදැයි කීහ. එබස් අසා නුවර වාසීහු ඉතා සතුටුව ඊට ක්ෂමාවුව මැනවයි කියා සිටියහ. එකල සඳමහ රජ සියුමැලි කුමරු අමතා මාගේ ඇකයෙහි හිදුවයි කීහ. ජාලිය කුමාරයෝ එබස් අසා බමුණන්ගේ ගැත්තොත් රජදරුවන් ඇකයෙහි හිඳීදැයි කීහ. එසඳ නගරවාසීහු මහා ශෝකයට පත්වූහ. රජ්ජුරුවෝද ඉතා දුකින් ජාලිය කුමාරයෙනි! තොප දනට දෙන කල තොපගේ පියාණෝ කෙතරම් අගය කොට දුන්නෝදැයි ඇසූහ. දේවයන් වහන්ස! මා දන් දෙන්නාවූ පියාණෝ රන් දහසක් අගය කොටද නැගෙණිය ඇත් ආදී සියල්ලෙන් සියය සියය හා බරේ බර වස්තු අගය කොට දුන්හයි කීහ. සඳමහ රජාණෝ ඒ වස්තු හා සත්මහල් ප්‍රාසාදයක්ද බමුණාට දී දරුවන් ගලවා ගත්හ. බමුණාට දෙන ලද පිරිවර බොහෝ වූහ. බමුණා ධනය තැන්පත් කොට තබා ඉස් සෝදා නහා අවුත් රසභොජන අනුභව කොට තමාට දුන් ප්‍රාසාදයට නැගී මහ යහනෙහි හොත්තෝය. රජ්ජුරුවෝ කුමාරයන් නාවා කවා පොවා තමා ඇකයෙහිද කෘෂ්ණජිනාවන් බිසවුන්ගේ ඇකයෙහිද හිඳුවාගෙන සතුටු සාමීචි බස් දොඩා දෙමව්පියන්ගේ තොරතුරු විමසා ඇමතියන් කැඳවා කියන්නාහු වංකගිරි පර්වතයට යනු පිණිස සිව්රග සෙනග පිළියෙළ කරව තවද ජයතුරා නුවර පටන් වංකගිරි පර්වතය දක්වා අට ඉස්බක් පමණවූ මාර්ගයද අලංකාර කරවයි නියෝග කළහ. අමාත්‍යයෝ මග කළුවැලි පිස සුදු වැලි ඉස කෙහෙල්, තැඹිලි, පුන්කලස් ධජ පතාකාදියෙන් මග සරසා ලද පස්මල් ඉස ගඳවිලවුන් ගල්වා උඩුවියන් බැඳ මල්දම් එල්වා තැන තැන දන්සල් අරවා පඤ්චාංගික තූර්‍ය නාදයෙන් යුත්තකරවා මග සැරසූහ. ජූජකයාද රාජ භොජනය පමණ ඉක්මවා අනුභව කිරීමෙන් දිරවාගත නොහැකි වූයේ එදවස් මධ්‍යම රාත්‍රියෙහි කලුරිය කළේය. රජ්ජුරුවෝ මහත් පෙරහරින් ඔහුගේ සිරුර ගෙන ගොස් දවා බමුණාගේ නෑ කෙනෙක් ඇත්නම් මේ වස්තු ගනිත්වයි බෙර ලවා වස්තු භාණ්ඩාගාරයෙහිම තැබ්බවූහ. ඉක්බිති සත්වන දවසෙහි සඳමහ රජ්ජුරුවෝ සියළු සෙනග රැස්කරවා මහා පිරිවරින් යුක්තව දරුවන් දෙදෙනාව ඇතුපිට නංවා ගෙන ක්‍රමයෙන් චෙතියරටට ගොස් එහි රජ්ජුරුවන් ඇතුළු සෙනඟ කැටුව සැට යොදුන් මාර්ගය ගෙවා වංකගිරි පර්වතයට පැමිණියාහුය. බෝධිසත්වයෝ වනයේ එන පෙළහරේ ශබ්දය අසා මද්‍රිදේවිට කියන්නාහු දේවිනි, මපියාණන් වහන්සේ මහළු නිසා සතුරු රජෙක් ඔහු මරා අප මෙහි වාසය කරන බව දැන අප කරා එන්නේ දෝහෝයි බලවයි කීය. දේවිය එම පර්වතයට නැගී බලා තම සේනාව වියයුතු යයි සිතා ස්වාමීනි, ඔබ වහන්සේට කවරනම් සතුරු කෙනෙක් ඇද්ද? එදවස් ශක්‍රදේවේන්ද්‍රයා අපගේ දරුවන් මුතුන් මිත්තන් කරා ගෙන ගොස් අදින් සත් දවසකින් අපි කරා එතියි කීයේය. ඔබ පියාණන් වහන්සේ වනැයි කියා දෙදෙනාම පන්සල් දොරකඩ සිටියාහ.

ඉක්බිති සඳමහ රජ්ජුරුවෝ මහ පෙළහරින් වංකගිරි පර්වතයට ආසන්නව පුසති දේවීන් කැඳවා දේවීනි අපි සියළු දෙනා එකවිට ගිය කල්හි දරුවන් හා අප දක්නාවිට ශෝක බොහෝය. පළමු මා ගොස් උන් දැක ශෝක සංසිඳවූකල තොපි එවයි කියා පන්සලට ගොස් බෝසතාණන් දුටහ. බෝසතාණන් වහන්සේ පෙර ගමන් කොට පියාණන් පිළිගෙන අසුනක වඩා හිඳුවා සතුටු සාමීචි කතාකරමින් උන් කලට මද්‍රිදේවිය මයිලණුවන් දැක ස්වාමීනි, මා දරුවන් ගෙන ගිය බමුණා කොහිදී දුටුදැයි ඇසුවාය. යෙහෙළියෙනි, මාගේ රටදී දැක බමුණාට මිළදී ගලවා ගතිමියි කියත්ම බිසවුන්ට සොම්නස් උපන. එවිටම බෝධිසත්වයන්ගේ මෑණියෝ මහ පෙළහරින් පන්සලට වන්හ. ඊට අනතුරුව කුමර කුමරියන් දෙදෙනා ඇතු පිටින් අවුත් බිමට බැස මෑණියන් දැක දෙපත්ලේ හිස තබා හඬන්නට වන්හ. බිසවුන්ගේ දෙතනයෙන් කිරිධාරා විහිද දෙබිහින්නන් හිස් තෙමී ගියේය. බෝධිසත්වයෝද ඔවුන් දැක ශෝකයෙන් හඬාහුණහ. බෝධිසත්වයන්ගේ මව්පිය දෙදෙනාද චෙතියරජ්ජුරුවන් ඇතුළු රජ දරුවෝද හඬාපීහ. ඒ දැක බෝධිසත්වයන් හා සහජාත වූ සැටදහසක් යෝදයන් හා මහ සෙනග එකහෙලා මහ පවනින් වැගිරගිය සල් වනයක් මෙන් මහා හඬින් හඬාහුණහ. මහාමේරු පර්වතයද මහ මුහුදද කැළඹුනේය. කාමාවචර දිව්‍යලෝකයෙහි එක කෝලාහල විය.

SANHIDA LANKA

එසඳ ශක්‍රදේවේන්‍ද්‍රයෝ රජදරුවෝ සියළු දෙන පිරිස් සහිතව සීසන් නැතිව හොත්තාහු දැක එකකුදු නැගිට කිසිවකුගේ සිරුරෙහි දිය බින්දුවකුදු ඉසින්නට අසමර්ථ බව දැක පොකුරු වැස්සක් වස්සවමියි සිතා ඒ ක්ෂත්‍රිය සමාගමයෙහි පොකුරු වැස්සක් වැස්වූහ. ඒ වැස්සෙන් තෙමෙනු කැමැත්තෝ තෙමෙති. නොකමැති

තැනැත්තන්ගේ සිරුරෙහි දිය බින්දුවකුදු නොවැටෙයි. එයින් විශ්මයට පත් ජනයෝ වෙස්සන්තර රජ්ජුරුවන් කරා එළඹ ස්වාමීනි! ඔබ වහන්සේගේ ගුණ නොදැන නුවරින් නගාපුම්හ. ඊට ක්‍ෂමා කොට අපගේ නුවරට අවුත් වොටුණු පැළඳ අප රක්‍ෂාකළ මැනවයි යාචඤා කළහ. බෝධිසත්වයෝ ඒ අසා රට වැසියනි, මා වොටුණු පළඳවන්ට තොපි අදහස් නොකරවයි කියා නොගිවිස්සාහ. ඉක්බිති සඳමහ රජ්ජුරුවෝ දරුව පෙර මා කියමන අදහා මේ වනයට ආවාද දැනුත් මා කියමන ගෙන වොටුණු පැළඳ රාජ්‍යය කරව තාපස වේශය හැර රජ වෙස් ගනුවයි කීහ.

බෝධිසත්වයන් වහන්සේ පියාගේ ආරාධනය පිළිගෙන වල්කලා දිවිසම් ආදි ඍෂිභාණ්ඩ බහා තබා පන්සලින් නික්ම "මා සත්මාසයක් මහණ දම්කොට පාරමී ධර්‍මයන් කුළුගන්වන්නහු විසින් පොළව කම්පා කරවන ලද තැනයයි" සළකා පන්සල වට තෙවරක් ප්‍රදක්‍ෂිණා කොට පසඟ පිහිටුවා වැඳ අවුත් සහජාත සැටදහසක් යෝධයන් විසින් පිළියෙල කළ සුවඳ පැනින් නහා සුසැට ආභරණයෙන් සැරසී වොටුණු පැළඳ දේවේන්‍ද්‍ර ලීලාවෙන් සිටියාහ. මද්‍රිදේවියද නහවා දෙවඟනක් මෙන් සරසවා වොටුණු පැළඳවූහ. එසඳ මහ බෝසතාණන් වහන්සේ බැලූ බැලූ තැන කම්පාවිය. සියළු තූර්‍යයෝ මහත් ඝෝෂා පැවැත්වූහ. අමාත්‍යයෝ පණ්ඩර නම් ඇලි ඇතු සදාගෙනාහ. බෝධිසත්වයෝ ඇතු දැක රැහැනිව මපියාණන් වහන්සේ මා දන්දුන් ඇතු ගෙන්වා ගත්දැවනැයි සිතා ලජ්ජාවූහ. එබව දත් නගරවාසීහු ස්වාමීනි, කලිඟුරට රජ්ජුරුවෝ තමන් රට වැසිවැස බත් බුලත් සුලභවූ හෙයින් තුමූහ ඇතා එවාපූහ. ඇතු පිට නැගී වදාළ මැනවයි කීහ. බෝධිසත්වයෝ ඇතුපිට නැගී මහත් පෙරහරින් ජයතුරා නුවරට යන සැට යොදුන් මගට පිළිපන්නාහුය. මෙසේ ගමන් කොට දෙමසකින් ජයතුරා නුවරට පැමිණ මෙතැන් පටන් වෙස්සන්තර රජ්ජුරුවන්ගේ ආඥාවයැයි අණබෙර ලැව්වාහුය. ඒ වෙසතුරු රජ්ජුරුවෝ සියළු සත්වයන් බන්ධනයෙන් මුදවා පසුදින අළුයම් කාලයෙහි සිතන්නාහු මා ආ බැව් අසා යාචකයෝ පැමිණෙති. ඔවුන්ට කුමක් දන් දෙම්යයි සිතූහ. ඒ දුටු සක්දෙව් රජ රාජ නිවේශය හාත්පස කටී ප්‍රදේශය පමණ උසට සත්රුවන් වර්‍ෂාවක් වැස්වූයේය. සියළු ජයතුරා නුවරද දනක් පමණ සත්රුවන් වැසි වැස්වූයේය. දෙවෙනි දවසෙහි ඒ ඒ ගෘහ සමීපයෙහි වට දානය ඔවුන්ටම දෙවා අවශේෂ ධනය භාණ්ඩාගාරයෙහි රැස් කරවා දන්වැට තබවා සදන්හල් කරවා සියළු ජනයා කුසල්හි පිහිටුවමින් දශරාජ ධර්‍මය නොපිරිහෙලා රාජ්‍යකොට ජීවිතයාගේ කෙළවර සහ පිරිවරින් ගොස් තුසිතපුර උපන්හ.

එසමයෙහි ජූජක බමුණා නම් දැන් දෙව්දත් තෙරුන්ය. අමිත්තාප බැමිණිය නම් චිඤ්චමානවිකාවෝය. චෙතියපුත්‍ර වැද්දා නම් ඡන්න අමාත්‍යයාය. අච්චුත තාපසයෝනම් සැරියුත් තෙරුන්ය. ශක්‍රයෝ නම් අනුරුද්ධ මහා ස්ථවිරයෝය. සඳමහ රජ්ජුරුවෝනම් සුද්ධෝදන රජ්ජුරුවෝය. ඵුසති දේවිය නම් මහාමායා දේවිය. මද්‍රිදේවිනම් යශෝධරා දේවිය. ජාලිය කුමාරයෝ නම් රාහුල ස්ථවිරයෝය. කෘෂ්ණජිනාවෝ නම් උත්පලවර්‍ණා මහා ස්ථවිරිය. සෙසු පර්‍ෂත් නම් බුදු පිරිසය. පුරන ලද පෙරුම්දම් ඇති වෙස්සන්තර රජ්ජුරුවෝනම් තිලෝගුරු බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# අස්ථාන ජාතකය

සද්ධර්ම චක්‍රවර්තීවූ බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසද්දී එක් කලකිරුණු භික්ෂුවක් ඇරබ දේශනා කළ සේක.

නිධාන කථාව :- මාගමක් ගැන සිතා කලකිරුණු ඒ භික්ෂුව ගෙන්වා බුදුරජාණන් වහන්සේ ඔහුගෙන් මහණ, ඔබ කලකිරුණේ සැබෑදැයි විචාරා සැබෑයයි කී කල්හි මහණ මාගම නම් අකෘතඥය, මිත්‍රද්‍රෝහිය විශ්වාසකළ නොහැකිය. පෙර නුවණැතියෙක් දිනපතා දහසක් දෙමින්ද මාගමක් පෝෂණය කරන්නට නොහැකි වූයේ එක් දිනක් දහස නොලැබූ මාගම විසින් බෙල්ලෙන් අල්වා බැහැර කරන ලද්දේද වීය. එනිසා මෙසේ අකෘතඥවූ මාගමගේ වසඟයට නොයවයි අතීතය ගෙන හැර දැක්වූ සේක.

ජාතක කථාව :- පෙර බරණැස් නුවර බඹදත් රජු රාජ්‍යය කරන කල්හි ඒ රජුගේ බ්‍රහ්මදත්ත කුමාරයාත් බරණැස් සිටුහුගේ පුත්‍රයාත් එක්ව ක්‍රීඩා කොට මිත්‍ර වූහ. එකම ඇඳුරු කුලයෙහි ශිල්ප හැදෑරූහ. පිය රජු ඇවෑමෙන් කුමාරයා රාජ්‍යයෙහි පිහිටියේය. එකල බරණැස් නුවර එක් රූප ශොභාසම්පන්න වෛශ්‍යා ස්ත්‍රියක් වූහ. සිටු පුත්‍රයා දිනපතා දහසක් දී වෛශ්‍යා ස්ත්‍රිය සමග අභිරමණය කරන්නේ සිටු තනතුර ලැබද ඈ අත් නොහළේය. හෙතෙම දවසට තුන්වරක් රාජෝපස්ථානයට ගියේ ආපසු එනවිට බොහෝ රෑ විය. හේ රජ ගෙයින් නික්ම ගෙට ගොස් නැවත ඒමට කල්නැති හෙයින් සේවකයන් යවා තනියම වෛශ්‍යා ස්ත්‍රියගේ ගෙට ඇතුල් විය.

වෛශ්‍යා ස්ත්‍රිය ඔහු දැක දහස ගෙනාවේදැයි ඇසීය. සොඳුරිය, අද මා රජ ගෙයින් පැමිණෙන විට අඳුරු වී තිබුන හෙයින් ගෙට නොගොස්ම මෙහි පැමිණියෙමි. හෙට එනවිට දෙදහසක් ගෙන එන්නෙමි යි සිටුවරයා කීය. එවිට වෛශ්‍යා ස්ත්‍රිය අද මොහුට අවසර දුනිමි නම් අන් දවසකුදු මෙසේ අවසර ගෙන දෙන්ට වන්නේය. අදම මොහුට අවසර නොදෙමියි සිතා මොහුට මෙතැන් සිට මා බැලීමට නොදෙව්! මොහු බෙල්ලෙන් අල්ලා බැහැර කොට දොර වසව්යයි දාසීන්ට නියම කළේය. ඔවුහුද එසේ කළාහුය. සිටුතෙම එතැන් පටන් මාගමුන්ගේ අගුණ සිහි කරන්නේ කල කිරීමට පත්ව ගිහිව සිටීමෙන් කවර ප්‍රයෝජනදැයි සලකා රජුටද නොදන්වා  ගොස් පැවිදිව ධ්‍යාන අභිඥා උපදවා පලාඵල අනුබව කරමින් වනයෙහි විසීය. රජ තමන්ගේ යහළුවා නොදැක නුවර වැස්සන්ගෙන් අසා නගර ශෝභිනිය කළ දෙය දැන ගෙන්වා නුඹ එක් දවසක් දහසක් නොලැබ මාගේ යහළුවා බෙල්ලෙන් අල්ලා බැහැර කෙළේ සැබෑදැයි විචාළේය. ඈය සැබෑයයි කී කල්හි දුෂ්ට තැනැත්තිය! තී කෙසේ හෝ මාගේ මිත්‍රයා වහාම නොගෙනාවොත් තීගේ ජීවිතයද නැතැයි කීය.

රජුගේ ඒ කථාව අසා තැතිගත් නගර ශෝභිනිය ගෙයින් නික්ම රථයකින් ගොස් සිටුහු ගිය තැන සොයන්නේ ආරංචියෙන් දැන ඔහු වසන තැනට ගියාය. එහි ගොස් තවුසාණන්ට වැඳ ස්වාමිනි! මාගේ මෝඩකම නිසා මා කළ වරදට සමාවනු මැනවි. මාගේ ගෙයි ඇති සියලුම වස්තුව ඔබවහන්සේට දෙන්නෙමි. දැන් මා හා මේ රථයෙන් නුවරට යන්ට එන්නැයි කීහ. එවිට තවුසාණෝ තමන් නැවත නුවරට නොයන බව දක්වනුයේ සොඳුරිය! යම් කලෙක සියලු ගඟගාවෝ විල් මෙන් ශාන්ත වෙද්ද? කොවුලෝ සක්මෙන් සුදුපැහැ වෙත්ද? දඹගස්වල තල් ගෙඩි හට ගනීද එකල අපගේ නැවත එක්වීම වන්නේ යයි කීහ.

නැවතද ඕතොමෝ නුවරට යන්ට එන ලෙස ඉල්ලුවාය. එවිට නැවතද තවුසා නොයන බව දක්වනුයේ යම් කලෙක මදුරු දැලින් ශක්තිමත් නොසෙල්වෙන අට්ටාලයක් සාදන්නේද, දෙව් ලොවට යාමට හා අංවලින් ඉණිමඟක් කරන්නේද, මීයෝ හිණිමඟට නැග සඳ කන්නාහුද රාහු අසුරද විනාශ කරන්නාහුද, මැස්සෙක් රා කළයක් බී අඟුරක වාසය කෙරෙහිද, කොටලුවෙක් බිඹු ඵලවන් තොල් ඇතිව යහපත් මුවක් ඇතිව නෘත්‍යගීතයෙහි දක්ෂවේද? කවුඩෝ මහමූණෝ එක්වසිට ඔවුනොවුන්ට ප්‍රියව කථා කෙරෙත්ද? කුඩා කුරුල්ලෙක් ගන්ධ මාදන පර්වතය තුඩින් ගෙන යයිද, එකල අපගේ නැවත එක් වීම වන්නේ යයි කීය. ඒ අසා නගර ශෝභනිය තවුසා ක්ෂමා කරවාගෙන නුවරට අවුත් ඒ සියල්ල රජුට දන්වා ජීවිතය ඉල්වා ගත්තීය. මේ ධර්මදේශනාව අසා සිටි කලකිරුණු භික්ෂුව සෝවාන් ඵලයෙහි පිහිටියේය. එකල රජ ආනන්ද තෙරුන් විය. තවුසාණෝ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# පක්ක ගොධ ජාතකය

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දෙවරම්හි වැඩ වසන සේක් එක් කෙළෙඹියෙකු ඇරඹ මේ ජාතකය දේශනා කළ සේක.

නිධාන කථාව:- එක් දුර ගමනක් යන පුරුෂයා සමඟ භාර්‍යාවකට අතර මගදී හමුවූ වැද්දෙක් "දෙදෙනාම අනුභව කරව්" යයි එක් පිසූ ගොයකු දුන්නේය. ඒ පුරුෂයා භාර්‍යාව පැන් ගෙන ඒමට යවා හොයා සම්පූර්‍ණයෙන්ම අනුභව කොට භාර්‍යාව පැමිණි කල්හි සොඳුර! සොයා පැන ගියේ යැයි කීය. භාර්‍යාවද පිසූ ගොයත් පැන ගියවිට කුමක්කරමුද කියා පැන් බී දෙදෙනාම දෙව්රමට ගොස් බුදුන් වැඳ එකත් පසක සිටියහ.

බුදු රජාණන් වහන්සේ උපාසිකාව! නුඹගේ ස්වාමියා නුඹට ස්නේහවන්තද? උපකරකදැයි විචාරණ ලද ඕතොමෝ ස්වාමීනි! මම නම්මොහුට හිත කැමැත්තෙමි. ස්නේහවන්ත වෙමි. උපකාර වෙමි. මොහු නම් මට එසේ ස්නේහ නැතැයි කීවාය. බුදුරජාණන්වහන්සේ උපාසිකාව මෙසේ නොසිව, යම් කලෙක නුඹගේ ගුණය මොහු දැනගන්නේද එකල මොහු නුඹට සියලු සම්පත් දෙන්නේ යයි අතීතය ගෙනහැර දැක් වූ සේක.

ජාතකකථාව:- අතීත කථාවද යට කියන ලද්දමෙනි. මෙහි වනාහි නැවතුනාවූ ඔවුන්ගේ ක්ලාන්ත බව දැන මගදී එක්වැද්දෙක් දෙදෙනාම අනුභව කරව් යයි කියා එක් පිසූ ගොයකු දුන්නේය. රාජදූතිකාව ඒගොයා වැලකින් බැදගෙන මඟට බැස්සාය. ඔවුහු ටික දුරක් ගොස් විලක් දැක ගොයා අනුභව කිරීමට නැවතුනාහ. එහිදී කුමාරයා සොඳුර, මෙහිදී මස්අනුභව කරමු. නුඹ ගොස් පියුම් පතකින් වතුර ටිකක් ගෙන එන්නැයි කීය. ඕ පැන් ගෙන ඒමට ගිය කල්හි කුමාරයා තනිවම හොයාගේ මස් සියල්ල අනුභව කොට වලිගය කෙළවර පමණක් අත තබාගෙන බිම බලාගෙන සිට කුමාරිකාව පැමිණිවිට සොඳුරිය, ගොයාපැන ගොස් බිලයකට පිවිසුණේය. මා වහා ගොස් වල්ගය අල්ලා ගත්විට වල්ගයත් කඩාගෙන බිලයට පිවිසුනේයයි කියා මේ අල්ලාගත් වල්ග කෑල්ලයයි අතේ තිබුණ වල්ගය පෙන්වීය. ඕ තොමෝ ද ස්වාමිනි, පිසූ ගොයත් පැන ගියවිට අපි කුමක්කරමුදැයි කියා ස්වාමියා සමඟ යන්නට පිටත් වූවාය. දෙදෙනාම බරණැස් නුවරට පැමිණියාහුය. පසුව කුමාරයා රජකම ලැබ ඈ අග මෙහෙසි තනතුරෙහි තැබුවේය. නමුත් කිසිම සත්කාර සම්මානයක් නොකළේය.

බෝධිසත්වයන් වහන්සේ ඈට සත්කාර කරවනු කැමැත්තෙන් රජු සමීපයේ සිට ආර්‍යාවෙනි! ඔබගෙන් අපි කිසිවක් නොලබමු. මොකද අපි ගැන බලන්නේ නැද්දැයි දේවීන් වහන්සේගෙන් ඇසීය. ඕතොමෝ දරුව! මමද රජුගෙන් කිසිවක් නොලබමි. නුඹට අප දෙන්නේ මොනවාද? රජ තෙමේද එදා වනයේ සිට දෙදෙනාම දුකසේ එනවිට ගොයත් තනිව අනුභව කොට දැන් මට කුමක් දෙන්නේදැයි කීහ. දේවිය මෙසේ නොකියව. දේවයන් වහන්සේ එසේ නොකරන්නේයයි බොසත් තෙම කීය. එවිට දේවිය දරුව, එය නුඹට අප්‍රකටය. රජුටත් මටත් ප්‍රකටයයි කියා කීවාය.

එය අසා බෝසත් තෙම දේවයන් වහන්ස! යමෙක් තමාට මෘදු සිතින් නැමේද තමාද ඔහුට නැමෙන්නේ විය යුතුය. තමාගේ වැඩ තමාට අවුන කරන්න හුගේ වැඩ තමාද කළ යුතුය. තමාට අවැඩ කැමැත්වුහට අභිවෘද්ධියෙන් නොකළ යුතුය. තමා හා එක් නොවන්නා හා එක් නොවිය යුතුය. තමන් අත්හරින තැනැත්තා අත්හළ යුතුය. තමාගෙන් වෙන්වන සිතැත්තහු හා එක්නොවිය යුතුය. පක්ෂියෙක් ඵල රහිත ගස අතහැර අන් ඵලහරිත ගසක් සොයායේය. එමෙන් අන් තමාට හිතැති කෙනෙක් සොයා ගතයුත්තේ යයි කීය.

රජතෙම බෝසතුන් කියත්ම දේවියගේ ගුණ සිහි කොට සොඳුර මෙපමණ කලක් නුඹගේ ගුණ නොසලකා හැරිමි. මාගේ අපරාධ සියල්ල ඉවසූ නුඹට මේ සියලුරාජ්‍යම දෙමියි කියා ඕහට සියලු සම්පත් දුන්නේය. මොහු විසින් මැගේ ගුණ සිහිකරවන ලද්දේ යයි බෝසතුන්ට මහත් සම්පත් දුන්නේය.

බුදුරජාණන් වහන්සේ ධර්මදේශනා කොට සිව්වස් දක්වා ජාතකය නිමාව වදාළ සේක. ධර්මදේශනාව සානයෙහි ඒ අඹුසැමි යුවල සෝවාන් ඵලයෙහි පිහිටියාහුය. එකල අඹුසැමි යුවල මෙකල අඹුසැමි යුවලමය. පණ්ඩිත අමාත්‍යයා නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# ධීතීය කොසිය ජාතකය

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් කොසොල් රජු ඇරබ දේශනා කර වදාළ සේක. නිධාන කථාවඃ- කොසොල් රජ පසල් දනව් සංසිඳවීම පිණිස නුසුදුසු කාලයෙහි නික්මුනේය. ඒ නුසුදුසු බව ප්‍රකාශ කිරීම වස් බුදුරජාණන් වහන්සේ අතීතය ගෙනහැර දැක්වූසේක

ජාතක කථාවඃ- මහරජ, පෙර බරණැස් රජ නොකල්හි නික්මී උයනෙහි කඳවුරක විසීය. එකල්හී එක් බමුණෙක් උණ පඳුරකට පිවිස සැඟවූනේය. කපුටු රැලක් පැමිණ නික්ම යනවිට ඌ අල්වා ගැනීමට හාත්පස පිරිවරා සිටියහ. ඌ හිරු බැසයාම නොබලා කලින්ම නික්ම පැනයාමට පටන් ගත්තේය. ඉක්බිති කපුටෝ ඌ පිරිවරා ගෙන තුඩින් කොටා බිම හෙළුහ. රජ බෝසතුන් අමතා පණ්ඩිතය! කුමක් හෙයින් මේ කපුටෝ බකමූණා බිම හෙළුවාහුදැයි විචාලේය. බෝසත් තෙම මහරජ! නොකල්හි තමන්ගේ වසන තැනින් නික්ම යන්නාහු මෙබඳු දුක් ලබත්මය. එහෙයින් නුසුදුසු කාලයෙහි තමන් වසන තැනින් නික්ම යාම නුසුදුසුයයි කියා මෙසේද කීය.

සුදුසු කාලයෙහි නික්මයාම යහපත්ය. නුසුදුසු කාලයෙහි නික්මයාම යහපත් නොවේ. නුසුදුසු කාලයෙහි නික්ම ගොස් කිසියම් අර්ථයක් සිදු නොකර ගනී, බොහෝ ජනයා හුදකලාවූ ඔහු විනාශ කරන්නේය. කපුටෝ බකමූණා විනාශ කලාක් මෙන් සුදුසු කාලය හා සුදුසු ප්‍රදේශය දන්නාවූ නුවණැත්තා අනුන්ගේ දෝෂය අනුව යන්නේ තමන් සියලු සතුරන් වසඟ කොට සැපවත් වන්නේය. සුදුසු කාලයෙහි නික්ම නිදිගත් කවුඩන් නසා සුවපත් වන බකමූණා මෙනි. රජතෙම බෝසතාණන්ගේ වචනය අසා නැවතුනේය.

බුදුරජාණන් වහන්සේ මේ ජාතකය ගෙනහැර දක්වා නිමවා වදාළ සේක. එකල රජ දැන් අනඳ තෙරුන්ය. පණ්ඩිත ඇමති නම් බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# සීහ කොත්ථුක ජාතකය

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන සේක්. කෝකාලිකයන් ඇරබ මේ ජාතකය දේශනා කොට වදාළ සේක.

නිදන කථාව - එක් දවසක් අන් බහුශ්‍රැතයන් ධර්ම දේශනා කරන කල්හි නූගත් කෝකාලික තෙමේත් ධර්ම දේශනා කරනු කැමැත්තේ විය. භික්ෂූන් අතින් ඒ සියල්ල දැන වදාල බුදුරජාණන් වහන්සේ මහණෙනි, කෝකාලික තෙමේ අද පමණක් තම කටහඬින් ප්‍රකට වූයේ නොවේ. පෙරත් කටහඬින් ප්‍රසිද්ධ වූයේ යැයි වදාරා අතීතය ගෙන හැර දැක් වූ සේක.

ආරාධනය - භික්ෂූන් වහන්සේ

ජාතක කථාව - පෙර බඹදත් රජු බරණැස් නුවර රාජ්‍ය කරවන කල්හි බෝසතාණන් වහන්සේ හිමවතැ සිංහයෙක් ව ඉපිද එක් සිවල් දෙනක් හා සංවාසයෙහි යෙදී එක් පුත්‍රයෙක් ලැබීය. ඒ පුත්‍රයා ඇඟිලි වලින්ද, නිය වලින්ද, කෙසුරෙන්ද, වර්ණයෙන්ද, ලක්‍ෂණයෙන්ද පියාට සමානය. ශබ්දයෙන් මවට සමානය. ඉක්බිති දවසක් වැසි වැස අවසන් වූ කල සිංහයන් නාද කරමින් සිංහ ක්‍රීඩා කරන විට මේ තෙමේද සිංහයන් අතර නාද කරනු කැමතිව සිවල් හඬින් නාද කළේය. ඉක්බිති සිංහයෝ ඔහුගේ හඬ අසා නිශ්ශබ්ද වූහ. ඔහුගේ හඬ ඇසූ බෝසතුන්ගේ අන් ස්වජාති පුත්‍රයෙක් පියාණෙනි, මේ සිංහයා වර්ණ දියෙන් අප හා සමානය. මේ කවරෙක්දැයි විචාළේය.

එය අසා බෝසත්තෙම දරුව! මේ නුඹගේ සහෝදරයා සිවලියකගේ පුත්‍රයෙකි. මොහු රූපයෙන් අපට සමානය. ශබ්දයෙන් මවට සමාන යැයි කියා සිවලියගේ පුතා අමතා, දරුව! මෙතැන් පටන් නුඹ මෙහි වාසය කරන්නේ නිහඬව වසව. ඉදින් නැවත නාද කරන්නෙහි නම් නුඹගේ හිවල් බව දැන ගන්නේ යැයි අවවාද කළේය.

බුදුරජාණන් වහන්සේ මේ ධර්ම දේශනාව ගෙන හැර දක්වා ජාතකය නිමවා වදාළ සේක. ඒ කල්හි හිවලා අද කෝකාලියා විය. සිංහ පුත්‍රයා රාහුල කුමරුය. සිංහ රජාණෝ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# මෙණ්ඩක පඤ්හ ජාතකය

මේ ජාතක කථාව උම්මග්ග ජාතකයෙහි එළක ප්‍රශ්නයෙහි ආයේය. එයින් බලා දත යුතුයි.

ජාතක කථාව :- එක් දවසක් රජ්ජුරුවෝ එක් එළුවකු හා බල්ලකු හිතමිත්‍රකමින් වාසය කරනවා සී මැඳුරු කවුළුවෙන් දුටහ. දිනක් එළුවා ඇත්හළ තුලට ගොස් ඇතුන්ට ලාලූ තණ අනුභව කොට ඇත්හලයාගෙන් පිට අවුරා පහරක් ලබාගෙන වේදනාවෙන් මිරිකී මිරිකී ගොස් රජගෙයි අගුවේ වැද හොත්තේය. එදවස්ම බල්ලාත් මුළුතැන්ගෙට ගොස් මාංශ අනුභව කොට අරක්කැමියාගෙන් පහර කා වේදනාව විඳිමින් එන්නේ කෙඳිරිගාමින් පසුවන තම මිත්‍ර එළුවා දැක සබඳ දැන් ඉතින් කෙසේ ජීවත්වමෝදැයි කීහ. එළුවා කියන්නේ මිත්‍රය! තොප තණ නොකන බැවින් තොප ගැන සැකයෙක් නැත. ඇත්හළට ගොස් එහි හැසිර අවසරයක් බලා තණ කට්ටයක් රැගෙන එව. මා ගැනද සැක නොකරන බැවින් මමද මුළුතැන්ගෙයි හැසිර අවසරයක් බලා මස් කැටියක් රැගෙන එන්නෙමි. එය තොපට අනුභව කරත හැක. මේ නියායෙන් අපි දෙදෙනා ජීවත්වන්නමෝවේදැයි කීහ. උන් දෙදෙනා මෙසේ සැපසේ වෙසෙති.

රජ්ජුරුවෝ උන්දෙන්නාගේ මිත්‍ර ධර්මය දැක මා විසින් නොදුටු විරූ කාරණයක් දුටුවෙමි. මොහු දෙන්නා ඔවුනොවුන්ට පස මිතුරුවත් එකට වාසය කරති. මේ කාරණය අලලා පැනයක් ගොතා පණ්ඩිතවරු පස්දෙනාගෙන් අසා ඒ නොදත් කෙනෙකුන් රටින් යවන්නෙමි. දත් කෙනෙකුන්ට උපකාර කරන්නෙමි. අද වේලා මදව ගියේය. සෙට සේවයට ආකල විචාරන්නෙමියි සිතූහ. දෙවන දින සේවයට අවුත් උන් කල්හි ගාථාවකින් මේ සත්ව ලෝකයෙහි කිසි විශ්වාසයෙක් නැති පසමිතුරු වූ දෙදෙනෙක් සබඳවූහ. මිත්‍ර ධර්මය පවත්වමින් ඇවිදිනාහ. එයට කරුණු කිමෙක්දැයි කීහ. අද පෙරවරු වේලෙහි මේ පැනය නොවිසඳන්නහු නම් තොප හැම දෙනම රටින් නෙරපන්නෙමි. නුවණ නැත්තවුන්ගෙන් මට ප්‍රයෝජණ නැතැ"යි කීහ. සේනකයෝ මුල් අසුනෙහි හුන්හ. මහෞෂධ පණ්ඩිතයෝ කෙළවර අසුනෙහි වැඩ උන්සේක. උන්වහන්සේ ඒ පැනය පරීක්‍ෂා කෙරෙමින් අර්ථනොදැන "මේ රජතෙමේ බොළඳ ගුණ ඇත්තේය. මේ පැනය සිතා ගෙන දැනගන්ට නොපොහොසත. ඔහු විසින් කිසිවක් දක්නා ලදැයි සිතා එක දවසකට අවසර ලබන්නෙම් වීනම් මේ පැනය දැනගනිමි යි සිතූසේක.
සේනකාදී පණ්ඩිතවරු සතරදෙන අඳුරු ගබඩාවකට වන්නවුන් මෙන් කිසිවක් නුදුටුවහ. එබැවින් රජ්ජුරුවන් වැඳ එක්දිනයකට අවසර ලබාගෙන ගියාහ. මහෞෂධ පණ්ඩිතයෝද හුනස්නෙන් නැගී උදුම්බරා දේවීන් සමීපයට ගොස් දේවීන්වහන්ස අද හෝ ඊයේ රජ්ජුරුවෝ බොහෝ වේලාවක් කොතැන සිටියෝ"දැයි විචාළසේක.
සේනකාදී පණ්ඩිතවරු සතරදෙන අඳුරු ගබඩාවකට වන්නවුන් මෙන් කිසිවක් නුදුටුවහ. එබැවින් රජ්ජුරුවන් වැඳ එක් දිනයකට අවසර ලබාගෙන ගියාහ. මහෞෂධ පණ්ඩිතයෝද හුනස්නෙන් නැගී උදුම්බරා දේවීන් සමීපයට ගොස් දේවීන්වහන්ස! අද හෝ ඊයේ රජ්ජුරුවෝ බොහෝ වේලාවක් කොතැන සිටියෝ" දැයි විචාළසේක.
මලණ්ඩ සී මැඳුරු කවුළුවෙන් පිටත බලමින් සක්මන් කළහයි බිසව කීහ. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් මේ දිසාවේ කිසිවක් දක්නාලද වන්නේයයි සිතා ඒ ස්ථානයට ගොස් පිටත බලා එළුවාගේ හා බල්ලාගේ ක්‍රියාව දැක මේ දෙදෙනා ගැනම මේ පැනය සලකන ලදැයි සනිටුහන් කොට ගෙන ගෙට වැඩිසේක. පුක්කුසාදී වූ අනික් තුන්දෙනාට ප්‍රශ්නය විසඳා ගත නොහැකිව එක්ව පැනය නොවිසඳූ කල්හි රජ්ජුරුවෝ කිපෙති. කුමක් කරමෝද? අපට වර්ෂයක් සිතුවත් මෙහි අදහස නොවැටහෙයි. මහෞෂධ පඬිතුමා මෙය සත සහශ්‍ර ගුණයෙන් සිතා නිමවා ඇත. උන් සමීපයට යම්හයි එහි ගොසින් එකත්පස්ව සිට පණ්ඩිතයෙනි! නුඹවහන්සේ විසින් පැනය විසඳන ලදදැයි විචාළහ.

උන්වහන්සේ මා පැනය නොවිසඳනකල්හි භුවනත්‍රයේ අනික් කවරෙක් විසඳන්නේද? එසේය පැනය සිතන ලදැයි වදාළසේක. අනික් පණ්ඩිතවරු සතරදෙන එසේවීනම් අපටත් වදාළ මැනවයි කීහ. මහාකරුණා ගුණයෙන් යුතු මහතාණෝ" ඉදින් මම මුන් සතරදෙනාට පැනය නොකියෙන්නම් රජ්ජුරුවෝ මේ ජඩ කොල්ලන් සතර දෙනාවම රටින් නෙරපනාහ. මට සත්‍රුවනින් පුදන්නාහ. එය මාගේ කරුණාවට තරම් නොවේයයි උන් කෙරෙහි කරුණාවෙන් උන් මිටි අසුන්වල හිඳුවා තමා දෙසට දොහොත් මුදුන්දී වැඳගෙන ඉන්නා ලෙස නියමකොට රජ්ජුරුවන් දුටු නියාව නොහඟවා රජ්ජුරුවන් විචාළකල මෙසේ කියවයි ගාථාසතරක් උගන්වා එහි අර්ථය නොවුගන්වා යවූසේක.

SANHIDA LANKA

දෙවන දින රාජ සභාවේදී සේනකයෝ දේවයන් වහන්ස මා පැනය නොදන්නා කළ අනික් කවරෙක් දනීදැයි වැඳුවන් ඉදිරියෙහි කොළඹු ලන්නාසේ මහෞෂධ පණ්ඩිතයන් හමුවෙහි තමාගේ වියත්කම අඟවා කලින් ඉගෙන ගත් ගාථාව කීහ.

ඒ ගාථාවේ අදහස නම්:- ප්‍රසිද්ධ අමාත්‍ය පුත්‍රාදීන්ට එළුමස් ප්‍රියය. ඔවුහු බළුමස් අනුභව නොකරන්නාහ. එසේවූ බල්ලාගේ හා එළුවාගේ සමගි සංඛ්‍යාත විශ්වාස වී" ගාථාව කී මුත් සේනකයෝ අර්ථය නොදන්නාහ. රජ්ජුරුවෝ අර්ථය තේරුම්ගෙන පුක්කුසයන් අතින් විචාළහ. ඔහුද කටමැත දොඩා කටපාඩම් කරගත් ගාථාවකීහ.
එහි අදහසඃ- අසුපිට ඇතිරීම සඳහා එළුසම් ගන්නාහ. බල්ලන්ගේ සම් නොගන්නාහ. එසේ වුවද එළුවාගේ සහ බල්ලාගේ විශ්වාසය වී ඔහුද අර්ථය නොදත් නමුත් රජ්ජුරුවෝ එයද තේරුම්ගෙන කාවින්ද පණ්ඩිතයන් අතින් විචාළහ. උයිත් තමා උගත් ධර්මය නොදත් ගාථාව කීහ. ඒ ගාථාවේ අදහස මෙසේ දතයුතුයි. එළුතෙමේ ඇඹරී ඇති අංඇත්තේය. බල්ලාට අං නැත්තේය. එළුතෙමේ තණ හා කොළ කන්නේය. බළුමස් නොකන්නේය. බළුතෙම සාවුන් හා බළලුන් කන්නේය. එසේද වුවත් එළුවාගේ හා බල්ලාගේ විශ්වාසය වී"

මෙසේ සේනකාදී සතරදෙන තමන් උගත් ගාථා පමණක් කී කල්හි රජ්ජුරුවෝ අර්ථ දත් හෙයින් නොවිමසා පස්වැනි
වූ අසරණ සරණ මහෞෂධ පණ්ඩිතයන් අතින් විචාළහ. උන්වහන්සේ එසේ නම් ඇසුව මැනවයි සිංහනාද කොට තත්වූ පරිදි ගාථා දෙකකින් කීසේක. "සතර පයෙහි අටකුරෙක් ඇති එළුතෙමේ මස්ගන්නා වේලෙහි කිසි කෙනෙකුන්ට නොපෙනී මේ බල්ලාට මස් ගෙනෙන්නේය. මේ බල්ලාද එළුවාට තණ ගෙනෙන්නේය. මොවුන් දෙදෙනාගේ පෙරළිය ජන ප්‍රධාන වූ වේදේහ රජතෙමේ ප්‍රසාදයෙහි සිටියේ දිටීයයි වදාළසේක. රජ්ජුරුවෝ සතර දෙනා ගැනම පැහැදී ගාථා දෙකකින් ඔවුන්ට ප්‍රශංසාකොට අජානීය අශ්වයින් යෙදූ අලංකාර රථයක් සමඟ සියළු සැපතින් සමෘද්ධ වූ ගම්වරය බැගින්ද දෙවූහ.

SANHIDA LANKA

# කුම්භිල ජාතකය

සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වාසය කරන සේක්. තමන් වහන්සේ නසන්නට දෙව්දතුන් කළ ව්‍යසනයක් නිසා මහණෙනි! මොහු මා නසන්ට උපක්‍රම යෙදුවේ දැන් මතු නොවෙයි. පෙරත් කළෝ වේදැයි ඉකුත්වත වදළ සේක.

ආරාධනය - භික්ෂූන් වහන්සේ

ජාතක කථාව - මෙම ජාතක පොතේ 54 වන වානරින්ද ජාතක කථාවෙහි මෙනි.
වඳුරු තෙම උපක්‍රම බලයෙන් කුම්භීලයාගෙන් මිදී එගොඩට පැන්න කල්හි කුම්භීලයන් වානරින්දයන් අමතා

යසෙසතේ චතුරො ධම්මා වානරින්ද! යථා තව
සච්චං ධම්මො ධිති චාගො දිඨංසො අති වතතති

පින්වත් වානරින්දය! යමෙකු ලඟ සතය වචනය, ස්ථානෝචිත ප්‍රඥාව, ධෛර්‍ය්‍යය, ත්‍යාගී බව තිබේද ඔහු නොබියව තම පස මිතුරා (හතුරා) පරදවා ජය ගන්නේය. ඔබද දැන් මාගෙන් මිදුනේ යැයි කියා ගියේය.

එසයෙහි කුම්භිලයා නම් දැන් දෙව්දත් තෙරුන්ය. කුම්භිල ධේනුව නම් චිංචිමානවිකාවෝය. වානරින්දව උපන්නේ බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# කලන්දක ජාතකය

ජාතක කථාව - යටගිය දවස බරණැස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක් රාජ්‍ය කරන කල්හි අප බෝසතාණන් වහන්සේ අපරාපර්‍යාය වේද්‍ය අකුසල කර්මයකින් ලෙහෙනව උපන් සේක. එසමයෙහි එක වන ලැහැබෙක කැදැල්ලක් බැඳ පැටියන් රක්‍ෂා කොට එතැන්හිවසන කල්හි දිනක් මහා මේඝයක් ඇතිව දස දිසා අඳුර කරවමින් මහත් මේඝ ගර්ජනා පවත්වමින් ධාරානිපාත වැසි වසින්නට පටන් ගත. මෙසේ ක්‍රමයෙන් වැස ඇළ දොළ ගංගා දිය පිරී ඉතිරී මහ වතුරෙන් රුක් මුලිනුපුටා හෙළමින් තැන තැන ගල් මුල්හි පැහැර උදුරමින් කුදු මහත් සතුනට ව්‍යසන කරමින් මහ වනය එක හෙළා වෙවුල්වා භයානක ශබ්ද පවත්වමින් රළ රැළි දිවන්නට වන.

එසේ දිවගත් මහ වතුර කලන්දක බෝධිසත්වයන්ගේ දරු පැටියන් හා සමග කැදැල්ල උපුල්වා ගෙන ගොස් මුහුදට හෙලාලීය.

එකල්හි ලෙහෙනව උපන් අප බෝසතාණෝ මුහුද වැටුනාවූ තම දරු පැටියන් ගොඩලා ගනිමියි යන උසස් අදහසින් ආ අධික වීර්‍යයෙන් "මුහුද ඉසිමි"යි පටන් ගෙන වලිගය මුහුදෙහි ඔබ ඔබා දිය ගෙන ගොඩ ඉස ඉස මහ මුහුද දිය ඉස නිමවමියි සිතූ සේක. මෙසේ දරු පැටියන් ගොඩ ගනිමියි යන විර්යය අදහසින් උත්සාහ කරන්නට පටන් ගෙන සත් දිනක් ඉක්මුණු කල්හි අප බෝසතාණන්ගේ උදාරතර වීර්‍යාධ්‍යාශයේ මහත්වයෙන් සක් දෙව්ඳුගේ පාණ්ඩකම්බල ශෛලාසනය හුණුවිය.

එකල්හි සක් දෙව්ඳු මිනිස් ලොව බලනුයේ පුරණ ලද බෝධි සම්භාර ඇති මහ බෝසතාණන්ගේ මේ උදාරතර අදහස දැක මිනිස් ලොවට අවුත් මහා මුහුද ඉස්නා බෝසතුන්ට අභිමුඛව සිට "එම්බා! ලෙහෙනාණෙනි, දිය ඉස ඉස ඉදිනේ කවර කාරණයක් පිණිසද? ඒ කාරණය මට නොවළහා ඉඳුරාම කියවයි කීහ.

අප බෝසතාණෝ එවිට කියන්නාහු මහ වතුරෙන් ගිලිහුනාවූ කැදැල්ල හා මාගේ දරු පැටියන් ගොස් මේ මහ මුහුද හෙළනා ලද්දාහුය. එසේ හෙයින් මේ මුහුද දියත් මාගේ වලිගය තෙමා ගොඩ ඉස මුහුද වියලා දරු පැටියන් ඇර ගන්නා පිණිස උත්සාහ කරමියි කීහ.

එබස් අසා ශක්‍ර දේවේන්ද්‍රයා කියනුයේ එම්බා ලෙහෙනාණෙනි! නුඹ තිරිසන් යෝනියෙහි උපන්න හෙයින

නුවණ මදව නොදන්නමුත් මේ මහා සමුද්‍රය නම් සතිස්ලක්‍ෂ දසදහස් තුන්සිය පනස් යොත්නක් වට ඇත්තේය. සුවාසූ දහසක් යොදුන් ගැඹුර ඇත්තේය. මෙසේවූ මහ මුහුද වලිගය තෙම තෙමා ගොඩ ඉස ඉස දිය නිම වන්නේ කවර කලෙකින්ද? එසේ හෙයින් තිරිසන් යෝනියෙහි උපන් ක්‍ෂුද්‍ර ප්‍රාණීවූ නුඹවැන්නවුන් තබා බලසම්පන්නවූ දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදිවූ යම්කිසි ආනුභාව සම්පන්න මහා පුරුෂයෝ සියෙක් දහසෙක් කෙළෙක් වී නමුත් ඍධි ආදිවූ ආනුභාවයක් නැතිව තමාගේ ශක්තියෙන් මේ මහ මුහුද දියකඳ ඉස නිමවා ගත නොහෙතියි කීහ.

එවිට අප බෝසතාණෝ එබසට ඔහුට කියන්නාහු එම්බල පුරුෂයාණෙනි නුඹසේම කිහිපදෙනෙකුන් ලදහොත් මහ මුහුද ඉස්නා තබා කවර නම් කාරියක් සිද්ධකොට ගත නොහැක්කේද? නුඹ කරන කතාවෙන්ම සිත ඇති වීර්යයවත්කම ප්‍රකාශ විය. එසේ හෙයින් නුඹ වැනි නිරුත්සාහ කුසීතයන් හා සමග කතාකොට දැන් කාලය විනාශ කිරීම අප වැන්නවුන්ට සුදුස්සෙක් නොවෙයි. එහෙයින් මෙතැන මද විගසකුත් නොසිට වහා නික්ම යවයි කීහ.

එවිට ශක්‍රදේවේන්ද්‍රතෙම සිතනුයේ මෙබඳු අසදෘශ වූ වීර්‍යවත් මහා පුරුෂයන් විසින් සිතූ කාරිය සිද්ධ කොට දුනමැනවයි සිතා තමාගේ ශක්‍රාත්ම භාවයෙන් පෙනී සිට බෝධිසත්වයන්ගේ දරු පැටියන් ගොඩ ලා දෙමින් අභිමතාර්‍ථය සිද්ධ කෙළේය.

එසමයෙහි කලන්දකව උපන්නේ අප බුදුරජාණන් වහන්සේය.

SANHIDA LANKA

# කොකාලික ජාතකය

සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ කුමන කරුණක් අරභයා කවර අවස්ථාවක මේ ජාතකය ප්‍රකාශකොට වදාළ සේක් දැයි නොපෙනේ.

යටගිය දවස බරණැස් නුවර රාජ්‍ය කළ බ්‍රහ්මදත්ත රජුට ඇමතිව උපන් පුරණ ලද පෙරුමන් ඇති අප බෝධිසත්ත්වයන් වහන්සේ තම ප්‍රඥා මහිමයෙන් අනිසිමග ගමන් ගත් එම රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කොට සුමඟට යවා දසරාජ ධර්මයෙහි පිහිට වූ සේක.

SANHIDA LANKA

# බ්‍රහ්මඉසි ජාතකය

සුගතයන් වහන්සේගේ මුවින් ප්‍රකාශිත බවක් නොපෙනේ.

යටගිය දවස දඹදිව මගධ දේශයෙහි හාලිද්දිය නම් බමුණු ගම නායක බමුණානන්ට දාව අප බෝසතාණන් වහන්සේ එම දේවිය කුසින් බිහි වූහ. බ්‍රහ්ම රාජයකුගේ ශරීර වර්ණයක් සේ ඉතා පැහැපත් ශරීරයක් ඇති හෙයින් ඒ උතුමානන්ට බ්‍රහ්ම කුමාරයෝ යැයි නම් තුබූහ.

ඒ කුමාරයෝ ඉතා නුවණැති හෙයින් දොළොස් හැවිරිදි කාලයෙහි ත්‍රිවේදයෙහි අක්ෂර, ලිඛිත, ගණිත ගාන්ධර්වාදී වූ අෂ්ට දස විද්‍යාවන්ද සූසැට කලා ශිල්ප ද හදාරා කෙළවරට පැමිණියහ. එකල්හි ඔහු සමීපයෙහි පන්සියයක් පමණ බමුණු කුමරුවෝ ත්‍රිවේදය ඉගෙන නිම වූහ.

ඉක්බිති මහ බෝසතාණෝ මව්පියන්ට කළමනා වත් නිමවා අතවැසි කුමරවරුන් ලඟට කැඳවා තමන් සන්තක සියලු ධනය ඔවුන්ට දන් දී ගිහිගෙන් නික්ම හිමාල වනයට වැද ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව මේ කළ එරක නම් වූ එකළ මුණ්ඩක නම් පර්වත සමීපයෙහි පන්සලක වෙසෙති. එහිදී බොහෝ කුල පුත්‍රයෝ බෝසතුන් කෙරෙහි පැවිදිව කිසුණු පිළියම් ඉගෙන ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්ම ලෝකයෙහි උපන්හ. බෝසතුන්ගේ යට කියන ලද පන්සියයක් පමණ අතවැසි බමුණු කුමරුවෝ ද තම තමන්ගේ මව්පියන් ඇවෑමෙන් බෝසතුන් සමීපයෙහි මහණව ප්‍රර්ව ස්නේහයෙන් බෝසතුන් අත් නොහැර වෙසෙති. ඔවුන් අතුරෙන් මතු බුදුවන මෙත් මහා බෝසතාණෝ ඒ ශිෂ්‍යයන්ට ප්‍රධානව අප මහා බෝසතුන්ට අග්‍ර ශිෂ්‍ය වූහ.

දිනක් මහ බෝසතාණෝ ප්‍රධාන ශිෂ්‍යයාණන් සමග පලාඵල පිණිස ඒ මුණ්ඩක නම් පර්වතයට නැග එක් දිසාවකින් ඒ පර්වත ප්‍රාන්තය බැලුවාහ. එහි දරුවන් වදා කීප දිනක් නිරාහාර හෙයින් ක්‍ෂුදාව ඉවසිය නොහී තමා හා සමග කෙළනා දරු පැටවුන් කනු කැමතිව හොත්තා වූ ව්‍යාඝ්‍ර ධේනුවක් දැක සසර කලකිරී අහෝ! මේ සංසාරයට නින්දා වේවායි යනාදීන් ඛේදයට පැමිණ ප්‍රධාන ශිෂ්‍යයාණන් කැඳවා සබඳ තෙපි මේ වනයෙහි පරික්‍ෂා කොට සිංහ ව්‍යාඝ්‍රාදීන් විසින් මරණ ලද යම් සතෙකුගේ මාංශ දුටු නම් වහා ගෙනවුත් මේ ව්‍යාඝ්‍ර ධේනුවට දෙවයි කියා ශිෂ්‍යයා හික්මවා ඔවුන් නොඑන තෙක් තමන්ගේ ශරීරය නුවණින් පරික්‍ෂා කරන්නාහු හැම ලෙසින්ම ප්‍රතිභය සහිත බව සලකා නැවත මෙබඳු අනේක විධවූ දුක් අනුභව කරන සත්ත්ව වර්ගයා කවර ධර්මානුභාවයකින් ඒ දුකින් මුදා සුවපත් කොට ලියහෙම්දෝ හෝයි පරික්‍ෂා කරන්නාහු අතීත ජාතියෙහි කරන ලද පැතුම් වශයෙන් බුද්ධ කාරක ධර්මයන් දැක මේ ධර්මයෝ නම් ඇස්, ඉස්, මස්, ලේ, අඹු, දරුවන් දන් නොදී දුෂ්කර ක්‍රියාවන් නොකොට එසේ මෙසේ පුරාලිය නොහැක්ක. එහෙයින් සියලු සත්ත්වයන්ට හිත සැප පිණිස බුදු බැව් පතා දැන්ම මේ ව්‍යාඝ්‍ර ධේනුවට දෙමි. එවිට මාගේ බඩගිනි සංසිඳේ. පැටවුන්ගේ ජීවිතය ද රැකේ. මට ද මතු බුදුබව සිද්ධ වන්නේ යයි ඔද වැඩියාවූ සිත් ඇතිව,

තස්ස මේ අනුමෝදන්තු උගො නාරද පබ්බතා
ඉන්‍දොව බ්‍රහ්මාච පජාපතීච - සොමෝ යමො වෙස්සවණොච රාජා
සබ්බෙ දේවානු මෝදන්තු - යම්මං පුඤ්ඤං කතං මයා

යනාදීන් දෙවියන්ට පින් දී පර්වත මුදුනෙහි සිට ව්‍යාඝ්‍ර ධේනුවගේ අභිමුඛයට වතූහ. එකල්හි ව්‍යාඝ්‍ර ධේනුව ඉතා සතුටට පත්ව දරුවන් හැර බෝසතුන්ගේ ශරීර මාංශය අනුභව කළාය. බෝධිසත්ත්වයෝ එම කුසල විපාකයෙන් දෙව් ලොව උපන්හ.

එකල බ්‍රහ්ම කුමාර බෝසතුන්ව උපන්නේ සර්වඥ රාජයන් වහන්සේය.

SANHIDA LANKA